# SUTTAPITAKE KHUDDAKANIKĀYE

## SINHALESE
## Volume II

15TH INTERNATIONAL TIPITAKA CHANTING CEREMONY
BODHGAYA, INDIA



# Dhammagiri Pāli Ganthamālā

## Khuddakanikāye

## Sinhalese

## Sections:
Patisambhidāmaggapāḷi
Nettippakaranapāli

**Suttapitake Khuddakanikāya**
**Buddha Jayanti Tripitaka Committee**


Artwork & Design (c) Light of Buddhadharma Foundation International
First Edition: 2019

Printed for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**


11F, No. 55, Sec. 1, Hang Chow South Road, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org
Mobile Web: m.budaedu.org


**This book is strictly for free distribution, it is not to be sold.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**



Printed in Taiwan

# DEDICATION

Homage to the Buddha, Dharma, and Sangha!

Here under the sacred Bodhi Tree, where Bhagavan Buddha Shakyamuni brought the blessings of Enlightenment into our world, the Mahasangha from eleven countries has assembled once again to recite the Tipitaka. The teachings we commemorate here were spoken to the Sangha at various places in India. They were affirmed by five hundred Arhats who assembled at the Satipattana cave in Rajgir a year after the Blessed One passed into Parinirvana. Led by Mahakassapa, Ananda, and Upali, the noble Arhats, empowered with full recall of all they had heard, recited the teachings and confirmed them as the true words of the Tathagata.

Since this first great council, the Sangha has kept alive the memory of the Buddha's presence and faithfully transmitted the Four Noble Truths and the Eightfold Path in all directions. From their dedication, four major traditions took form and gave rise to eighteen schools. While they emphasized different aspects of the teachings, all relied on the Three Jewels

as the only refuge from the ever-present miseries of Sarvam Dukkam.

Transcending discrimination based on caste and culture, the teachings won the support of the Chakravartin King Ashoka, who recognized the importance of the Dharma and sponsored its transmission throughout his vast empire and beyond, to Sri Lanka and Myanmar, to Kashmir, to lands beyond the Indus, and to Kashgar and Khotan. Through acts of faith and through edicts and inscriptions, Ashoka encouraged people of all regions to awaken faith in the Buddha, cultivate virtue, and practice the Eightfold Path.

For centuries, even as empires flourished and passed away, the Dharma continued to unfold its blessings in land after land. In China, Tibet, and Mongolia; in Korea and Japan, and in all parts of Southeast Asia, the grace and balance inspired by virtuous action manifested in the shapes of temples and stupas, in images of the Enlightened Ones, and in depictions of the Buddha's great actions in this and previous lives. Through the devotion and dedication of countless great beings that transmitted the Dharma across the earth, this Aryadesha is renowned as the spiritual heart of our world. To this day, the pulse of enlightenment still beats within this sacred ground.

We are fortunate that of all the early Dharma traditions, the living lineages of two schools remain: Sarvastivadin, within the Vinaya of the Mahayana traditions, and Theravadin, vital today in the Sanghas of Bangladesh, Cambodia, Indonesia, India, Laos PDR, Myanmar, Nepal, Sri Lanka, Thailand and Vietnam. It has long been my dream that these streams of Sangha would return to Bodh Gaya after an absence of seven hundred years, to bear witness to the Buddha's message of harmony and peace.

Since 2006, the Light of Buddhadharma Foundation International has acted as the primary sponsor of this gathering of the Theravadin Sanghas. Now, in our 15th anniversary, we congratulate all the great Venerable masters and their lay devotees for their exemplary commitment to spreading the Dharma teachings to many parts of the world. We would also like to congratulate the International Mahasangha for organising this ceremony along with the International Tipitaka Chanting Council. We are also grateful to the Bodhgaya Temple Management Committee and the Government of Bihar for their gracious assistance in facilitating this auspicious gathering. These ceremonies are a great symbol of World Peace and help to free us from the bondage of karma and klesha. We have 25 more years to complete the entire 84000 teachings in Pali under the Sacred Bodhi Tree.

We are also grateful to the Corporate Body of the Buddha Education Foundation in Taiwan for printing this volume as a free gift to all lay devotees. Such noble actions are indeed a great cause for all of us to rejoice especially in recognizing their generosity to share the teachings for the benefit of all.

In this chaotic, materialistic world, ruled by self-interest and greed, people everywhere can benefit from prayers that wish all beings freedom from suffering and freedom from thoughts and actions that lead to suffering for self and others. Joined together in this most sacred place, the voices of many cultures can resound as one, reciting Lord Buddha's words that support health and tranquility, easing the force of desire and aggression and promoting harmony and balance in these stressful times of rapid change. Everywhere, people who become disheartened or disillusioned can look for inspiration to the Bodhi Tree and the Mahabodhi Temple, our shining stars that illuminate the way to peace and harmony. It is our great good fortune that we, as humble laypersons, have been granted the honor of supporting these historic assemblies. They manifest the blessings of the Dharma and fill us with hope that the merit generated here will encourage the awakening of more enlightened beings for the benefit of the earth, the

environment, and people everywhere. In these turbulent times, they remind us that there is no need to continue wandering, lost in this samsaric realm. Help is close at hand; the teachings that can awaken us are still here, and we who understand their value must not let them pass away. It is our duty to support the Sangha and keep these teachings alive through our practice and devotion. We pray that we may continue to support these ceremonies as they carry significant blessings for the world.

I am grateful to the leaders of the Sangha for allowing me this opportunity to commemorate the Lord Buddha and honor the beauty of his heritage. I thank my daughter Kunzang Wangmo Dixey and her team, who has coordinated these assemblies over the last fourteen years. May the offering of this year's printed volume of the Khuddakanikāya be received with the great wish that these precious teachings continue to be recited by the Mahasangha for the benefit of all beings. May the sound of the Buddavaccana be loud and heard throughout all realms!

Sarvam Mangalam

Tarthang-pa Kunga Gellek Yeshe Dorje

Tarthang Rinpoche

Founder of the Bodh Gaya Monlam Chenmo,

World Peace Ceremony

Founder, Light of Buddhadharma Foundation International

June 2019

www.lbdfi.org

## Note on Pronunciation of Pāli

Pāli was a spoken language of northern India in the time of Gotama the Buddha. It was written in the Brāhmi script in India in the time of Emperor Asoka and has been preserved in the scripts of the various countries where the language has been maintained. In Roman script, the following set of diacritical marks is used to indicate the proper pronunciation.

The alphabet consists of forty-one characters: eight vowels, thirty-two consonants and one nasal sound (niggahita).

Vowels: a, ā, i, ī, u, ū, e, o

Consonants:

Velar: k, kh, g, gh, ṅ

Palatal: c, ch, j, jh, ñ

Retroflex: ṭ, ṭh, ḍ, ḍh, ṇ

Dental: t, th, d, dh, n

Labial: p, ph, b, bh, m

Miscellaneous: y, r, l, v, s, h, ḷ

Nasal sound (niggahita): ṃ

The vowels a, i, u are short; ā, ī, ū are long; e and o are pronounced short before double consonants: mettā, khetta, koṭṭha, sotthi; and long before single consonants: deva, senā, loka, odana.

a is pronounced like ‘a’ in ‘about’;
ā like ‘a’ in ‘father’;
i is pronounced like ‘i’ in ‘mint’;
ī like ‘ee’ in ‘see’;
u is pronounced like ‘u’ in ‘put’;
ū like ‘oo’ in ‘cool’

Consonants are pronounced mostly as in English. The consonant c is pronounced as ‘ch’ in ‘church’. All the aspirated consonants are pronounced with an audible expulsion of breath following the normal unaspirated sound. Therefore th is not as in ‘three’ but more like the sound in ‘Thailand’, and ph is not as in ‘photo’ but rather is pronounced ‘p’ accompanied by an expulsion of breath.

The retroflex consonants, ṭ, ṭh, ḍ, ḍh, ṇ are pronounced with the tip of the tongue turned back; whereas in the dental consonants, t, th, d, dh, n it touches the upper front teeth.

The palatal nasal, ñ, is the same as the Spanish ‘ñ’, as in ‘señor’. The velar nasal, ṅ, is pronounced like ‘ng’ in ‘singer’ but occurs only with the other consonants in its group: ṅk, ṅkh, ṅg, ṅgh. The pronunciation of ṃ is similar to ṅ but occurs most commonly as a terminal nasalization: ‘evaṃ me sutaṃ’. The Pāli v is a soft ‘v’ or ‘w’ and ḷ produced with the tongue retroflexed, is almost a combined ‘rl’ sound.

Double consonants are very frequent in Pāli and must be strictly pronounced as long consonants, thus nn is like the English ‘nn’ in ‘unnecessary’.

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 35 (i)

සූත්‍රාන්තපිටකයෙහි

29 වන ග්‍රන්ථය

# පටිසම්භිදාමග්ගප්පකරණ

## ඛුද්දකනිකාය

ත්‍රයොදශ භාගය

---

පාඨශෝධනය

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය
ලබුගම ලඞ්කානන්ද අනුනායක ස්ථවිරයන්වහන්සේ

සිංහලානුවාදය

යථොක්ත අනුනායක ස්ථවිරයන්වහන්සේ හා උඩමාකඩවර
පුරාණ විහාරවාසී පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර
ස්ථවිරයන්වහන්සේ

---

බු. ව. 2550
ක්‍රි. ව. 2006

සුත්තන්තපිටකෙ

# පටිසම්භිදාමග්ගො

පඨමො භාගො

සූත්‍රාන්තපිටකයෙහි

# පටිසම්භිදාමාර්ගය

ප්‍රථම භාගය

සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

# පටිසම්භිදාමග්ගො

## 1. පඨමො පණ්ණාසකො

## 1. මහාවග්ගො

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

### මාතිකා

1. සොතාවධානෙ පඤ්ඤා සුතමයෙ ඤාණං.

2. සුත්වාන සංවරෙ පඤ්ඤා සීලමයෙ ඤාණං.

3. සංවරිත්වා සමාදහනෙ පඤ්ඤා සමාධිභාවනාමයෙ ඤාණං.

4. පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිති ඤාණං.

5. අතීතානාගතපච්චුප්පන්නානං ධම්මානං සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං.

6. පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං.

7. ආරම්මණං පටිසඞ්ඛා භඞ්ගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං.

8 භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

9. මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.

10. බහිද්ධා වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභු ඤාණං.

11. දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

12. පයොගපටිප්පස්සද්ධි පඤ්ඤා ඵලෙ ඤාණං.

13. ඡින්නවට්ටමනුපස්සනෙ[1] පඤ්ඤා විමුත්ති ඤාණං.

---

[1] ඡින්නවටුමානුපස්සනෙ—මජසං. ඡින්නමනුපස්සනෙ—සයා PTS

සූත්‍රාන්තපිටකයෙහි

## කුදුගත්සඟිය

# පටිසම්භිදාමාර්ගය

## 1. ප්‍රථම පණ්ණාසකය

## 1. මහාවර්ගය

### ඒ භගවත් අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා.

**මාතෘකා**

1. ශ්‍රොත්‍රද්වාරානුසාරයෙන් දත්නාලද ධර්මජාතයෙහි (ශ්‍රුතියෙහි) පැවැති ප්‍රඥාව ශ්‍රුතමයඥාන යෑ.

2. ශ්‍රවණය කොට (ශ්‍රවණ හෙතුයෙන්) සංවරයෙහි පැවැති ප්‍රඥාව ශීලමයඥාන යෑ.

3. ශීලයෙන් සංවෘත වැ සිත එකඟ කිරීමෙහි පැවැති ප්‍රඥාව සමාධි භාවනාමයඥාන යෑ.

4. ප්‍රත්‍යයධර්මයන් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යෑ.

5. අතීතානාගතප්‍රත්‍යුත්පන්න (පඤ්චස්කන්ධ) ධර්මයන් (කලාප විසින්) රැස් කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යෑ.

6. ප්‍රත්‍යුත්පන්න වූ ස්කන්ධධර්මයන්ගේ විපරිණාමය දැකීමෙහි ප්‍රඥාව උදයව්‍යයානුදර්ශනඥාන යෑ.

7. රූපාදි ආලම්බනය ප්‍රත්‍යවෙක්ෂා කොට භඞ්ගවශයෙන් දැකීමෙහි ප්‍රඥාව විදර්ශනාඥාන යෑ.

8. උත්පාදාදිය භය වශයෙන් වැටහීමෙහි ප්‍රඥාව ආදීනවඥාන යෑ.

9. (උත්පාදාදිය) මුදාලන්නට කැමැති බව ද ප්‍රත්‍යවෙක්ෂාව ද අධ්‍යු-පෙක්ෂණය ද යන (ත්‍රිවිධ) ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන යෑ.

10. සංස්කාර නිමිත්තෙන් නැඟී සිටුනා එයට පරාඞ්මුඛ වීමෙහි ප්‍රඥාව ගොත්‍රභූඥාන යෑ.

11. (කෙලෙසුන් කෙරෙන් ද, තදනුවර්තක ස්කන්ධයන් කෙරෙන් ද යන) දෙකින් නැඟී සිටුනා එයට පරාඞ්මුඛ වීමෙහි ප්‍රඥාව මාර්ගඥාන යෑ.

12. (උභතොවුට්ඨානයෙහි) ප්‍රයොගයාගේ නිෂ්ඨාව (සතර මාර්ගකෘත්‍ය පර්යවසානය) ට හෙතු වූ ප්‍රඥාව ඵලඥාන යෑ.

13. ඒ ඒ මාර්ගයෙන් සිඳුණු කෙලෙස්වට ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙහි ප්‍රඥාව විමුක්තිඥාන යෑ.

14. තදා සමුදාගතෙ[1] ධම්මෙ පස්සනෙ[2] පඤ්ඤා පච්චවෙක්ඛණෙ ඤාණං.

15. අජ්ඣත්තවවත්ථානෙ පඤ්ඤා වත්ථුනානත්තෙ ඤාණං.

16. බහිද්ධාවවත්ථානෙ පඤ්ඤා ගොචරනානත්තෙ ඤාණං.

17. චරියාවවත්ථානෙ[3] පඤ්ඤා චරියානානත්තෙ ඤාණං.

18. චතුධම්මවවත්ථානෙ පඤ්ඤා භූමිනානත්තෙ ඤාණං.

19. නවධම්මවවත්ථානෙ පඤ්ඤා ධම්මනානත්තෙ ඤාණං.

20. අභිඤ්ඤාපඤ්ඤා ඤාතට්ඨෙ ඤාණං.

21. පරිඤ්ඤාපඤ්ඤා තීරණට්ඨෙ ඤාණං.

22. පහානෙ පඤ්ඤා පරිච්චාගට්ඨෙ ඤාණං

23. භාවනාපඤ්ඤා එකරසට්ඨෙ ඤාණං.

24. සච්ඡිකිරියාපඤ්ඤා ඵුසනට්ඨෙ[4] ඤාණං.

25. අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං.

26. ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං.

27. නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං.

28. පටිභාන[5] නානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

29. විහාරනානත්තෙ පඤ්ඤා විහාරට්ඨෙ ඤාණං.

30. සමාපත්තිනානත්තෙ පඤ්ඤා සමාපත්තට්ඨෙ ඤාණං.

31. විහාරසමාපත්තිනානත්තෙ පඤ්ඤා විහාරසමාපත්තට්ඨෙ ඤාණං.

32. අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිස්මිං[6] ඤාණං.

33. දස්සනාධිපතෙය්‍යං සන්තො ච විහාරාධිගමො පණීතාධිමුත්තතා පඤ්ඤා අරණවිහාරෙ ඤාණං.

34. ද්වීහි බලෙහි සමන්නාගතත්තා තයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා සොළසහි ඤාණචරියාහි නවහි සමාධිචරියාහි වසීභාවතා[7] පඤ්ඤා නිරොධසමාපත්තියා ඤාණං.

35. සම්පජානස්ස පවත්තපරියාදානෙ පඤ්ඤා පරිනිබ්බානෙ ඤාණං.

36. සබ්බධම්මානං සම්මා සමුච්ඡෙදෙ නිරොධෙ ච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං.

37. පුථුනානත්තතෙජපරියාදානෙ[8] පඤ්ඤා සල්ලෙඛට්ඨෙ ඤාණං.

---

1. සමුපාගතෙ—ස්‍යා.
2. විපස්සනෙ—PTS. 3 චරියවවත්ථානෙ—පු.
4. ඵස්සනට්ඨෙ—මජ්ඣං, ස්‍යා. 5 පටිභාණ—ස්‍යා. 6 සමාධිම්හි—මජ්ඣං, ස්‍යා
7. වසිභාවතා—පු 8 නානත්තපරියාදානෙ—සී 1, නානත්තතෙජපරියාදානෙ—සී 2.

14. ඒ මාර්ගඵලක්ෂණයෙහි (ප්‍රතිලාභප්‍රතිවේධ වශයෙන්) පැමිණි (මාර්ගඵල චතුස්සත්‍ය) ධර්මයන් දක්නා ප්‍රඥාව ප්‍රත්‍යවෙක්ෂාඥාන යැ.

15. අධ්‍යාත්ම(ආධ්‍යාත්මිකෂඩායතන)යන් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව වස්තු-නානාත්වඥාන යැ.

16. බාහිරවිෂයයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ගොචරනානාත්වඥාන යැ.

17. (විඥානචර්‍ය්‍යාදි වශයෙන්) චර්‍ය්‍යාවන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව චර්‍ය්‍යානානාත්වඥාන යැ.

18. සතර සතර ධර්මයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව භූමිනානාත්වඥාන යැ.

19. නව නව ධර්මයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ධර්මනානාත්වඥාන යැ.

20. අභිඥාප්‍රඥාව ඥාතාර්ථ (ජානන සවභාව) ඥාන යැ.

21. පරිඥාප්‍රඥාව තීරණාර්ථඥාන යැ.

22. ප්‍රහාණප්‍රඥාව පරිත්‍යාගාර්ථඥාන යැ.

23. භාවනා ප්‍රඥාව ඒකරසාර්ථඥාන යැ.

24. (ප්‍රතිවේධ ප්‍රතිලාභ වශයෙන්) සාක්ෂාත් කරන ප්‍රඥාව ස්පර්ශනාර්ථ ඥාන යැ.

25. අර්ථනානාත්වයෙහි ප්‍රඥාව අර්ථප්‍රතිසංවිද්ඥාන යැ.

26. ධර්මනානාත්වයෙහි ප්‍රඥාව ධර්මප්‍රතිසංවිද්ඥාන යැ.

27. නිරුක්තිනානාත්වයෙහි ප්‍රඥාව නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යැ.

28. ප්‍රතිභානනානාත්වයෙහි ප්‍රඥාව ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යැ.

29. (අනිත්‍යානුදර්ශනාදි) විහාරනානාත්වයෙහි ප්‍රඥාව විහාරාර්ථඥාන යැ.

30. සමාපත්තිනානාත්වයෙහි ප්‍රඥාව සමාපත්ත්‍යර්ථඥාන යැ.

31. විහාරසමාපත්තිනානාත්වයෙහි ප්‍රඥාව විහාරසමාපත්ත්‍යර්ථඥාන යැ.

32. අවික්ෂෙපපරිශුද්ධභාවයෙන් කාමාදි ආස්‍රවයන්ගේ සමුච්ඡේදයෙහි ප්‍රඥාව ආනන්තරික (මාර්ග) සමාධිඥාන යැ.

33. දර්ශනාධිපතිභාවය ද, ශාන්තවිහාරාධිගමය ද, ප්‍රණීතාධිමුක්තතා ද යන (ත්‍රිවිධ) ප්‍රඥාව අරණවිහාරඥාන යැ.

34. ශමථවිදර්ශනා යන බල දෙකින් සමන්වාගත බැවින් (වාචාදි) තුන් සංස්කාරයන්ගේ ද නිරුද්ධ කිරීමෙන් ෂොඩශඥානචර්‍ය්‍යායෙන් නව-සමාධිචර්‍ය්‍යායෙන් වශීභාවය ඇති ප්‍රඥාව නිරොධසමාපත්තිඥාන යැ.

35. සම්‍යග්ඥාන ඇත්තහුගේ ක්ලේශ-ස්කන්ධප්‍රවෘත්ති ක්ෂය කිරීමෙහි ප්‍රඥාව පරිනිර්වාණඥාන යැ.

36. සියලු ත්‍රෛභූමක ධර්මයන් මොනොවට නිරුද්ධ කිරීමෙහි ද නිරුද්ධ කල කල්හි නැවත නො ඉපදීමෙහි ද ප්‍රඥාව සමශීර්ෂාර්ථඥාන යැ.

37. පෘථග්‍රාගයන්ගේ ද කාමච්ඡන්දාදීන්ගේ ද දුශ්ශීල්‍යාදීන්ගේ ද ක්ෂය කිරීමෙහි ප්‍රඥාව සල්ලෙඛාර්ථඥාන යැ.

38 අසල්ලීනත්ත පග්ගහිතත්ත-පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං.

39. නානාධම්මප්පකාසනතා[1] පඤ්ඤා අත්ථසන්දස්සනෙ ඤාණං.

40. සබ්බධම්මානං එකසඞ්ගහතානානත්තෙකත්තපටිවෙධෙ පඤ්ඤා දස්සන-විසුද්ධිඤාණං

41. විදිතත්තා පඤ්ඤා ඛන්ති ඤාණං.

42. ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහනෙ[2] ඤාණං.

43. සමොදහනෙ[3] පඤ්ඤා පදෙසවිහාරෙ ඤාණං.

44 අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං.

45. නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං.

46 අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං.

47. සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං.

48. වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං.

49. තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං.

50. කායම්පි චිත්තම්පි එකවවත්ථානතා සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච අධිට්ඨානවසෙන ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා ඉද්ධිවිධෙ ඤාණං.

51. විතක්කවිප්ඵාරවසෙන නානත්තෙකත්ත සද්දනිමිත්තානං පරියොගා-හනෙ[2] පඤ්ඤා සොතධාතුවිසුද්ධිඤාණං.

52. තිණ්ණං[4] චිත්තානං විප්ඵාරත්තා ඉන්ද්‍රියානං පසාදවසෙන නානත්තෙ-කත්තවිඤ්ඤාණචරියාපරියොගාහනෙ පඤ්ඤා චෙතොපරියඤාණං.

53 පච්චයප්පවත්තානං ධම්මානං නානත්තෙකත්තකම්මවිප්ඵාරවසෙන පරියොගාහනෙ[2] පඤ්ඤා පුබ්බෙනිවාසානුස්සති ඤාණං.

54. ඔභාසවසෙන නානත්තෙකත්තරූපනිමිත්තානං දස්සනට්ඨෙ පඤ්ඤා දිබ්බචක්ඛුඤාණං.

55. චතුසට්ඨියා ආකාරෙහි තිණ්ණං ඉන්ද්‍රියානං වසීභාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං.

56. පරිඤ්ඤට්ඨෙ පඤ්ඤා දුක්ඛෙ ඤාණං.

57 පහානට්ඨෙ පඤ්ඤා සමුදයෙ ඤාණං.

1 ධම්මප්පකාසනතා—සයා, මජසං. 2 පරියොගාහණෙ—මජසං.
3 සමොධානෙ—පු 4 තිණ්ණන්නං—මජසං

38. නො හැකුළුණු සිත් ඇති (කායජීවිතනිරපෙක්ෂක වූ) නිවනට මෙහෙයූ ආත්මභාව ඇත්තහුගේ ප්‍රග්‍රහාර්ථයෙහි ප්‍රඥාව වීර්යාරම්භඥාන යෑ.

39. නානාධර්මයන් ප්‍රකාශ කරන ප්‍රඥාව අර්ථසන්දර්ශන ඥාන යෑ.

40. සියලු සඞ්ඛතාසඞ්ඛත ධර්මයන්ගේ එකත්වයෙන් සඞ්ග්‍රහ කිරීම ද කාමච්ඡන්දාදීන්ගේ නානාත්වය ද නෛෂ්ක්‍රම්‍යාදීන්ගේ එකත්වය ද ප්‍රතිවෙධ කිරීමෙහි ප්‍රඥාව දර්ශනවිශුද්ධිඥාන යෑ.

41. රූපස්කන්ධාදිය අනිත්‍යාදි වශයෙන් විදිතභාවයෙන් පැවැති ප්‍රඥාව ක්ෂාන්තිඥාන යෑ.

42. (රූපස්කන්ධාදිය අනිත්‍යාදි වශයෙන් ඥානස්පර්ශයෙන්) ස්පර්ශ කළ බැවින් පැවැති ප්‍රඥාව පර්‍ය්‍යවගාහනඥාන යෑ.

43. (ස්කන්ධාදීන්ගේ එකදෙශ වූ වෙදනාධර්මය) පිඬු කරන ප්‍රඥාව ප්‍රදෙශ-විහාරඥාන යෑ.

44. (නෛෂ්ක්‍රම්‍යාදිය) අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවර්තඥාන යෑ.

45. නානාස්වභාවයෙහි පැවැති ප්‍රඥාව චෙතොවිවර්තඥාන යෑ.

46. (නෛෂ්ක්‍රම්‍යාදි වශයෙන් සිත) පිහිටුවීමෙහි ප්‍රඥාව චිත්තවිවර්තඥාන යෑ.

47. ශුන්‍යත (අනාත්මානුදර්ශන) ප්‍රඥාව ඥානවිවර්තඥාන යෑ.

48. කාමච්ඡන්දාදිය දුරලීමෙහි පැවැති ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන යෑ.

49. (චතුස්සත්‍යයාගේ) අවිපරීතභාවයෙහි පැවැති ප්‍රඥාව සත්‍යවිවර්ත ඥාන යෑ.

50. රූපකාය ද පාදකධ්‍යානචිත්තය ද (පරිකර්මචිත්තයෙන්) එක් කොට තැබීමෙන් සුඛසංඥාව ද ලඝුසංඥාව ද අධිෂ්ඨාන වශයෙන් සමෘද්ධ වන ප්‍රඥාව ඍද්ධිවිධඥාන යෑ.

51. විතර්කවිස්ඵාර වශයෙන් නානාත්ව වූ ද එකත්ව වූ ද ශබ්දනිමිත්තයන්ට බැසගැනීමෙහි (දැනගන්නා) ප්‍රඥාව ශ්‍රොත්‍රධාතුවිශුද්ධිඥාන යෑ.

52. (සොමනස්සසහගතාදි) ත්‍රිවිධ චිත්තයන්ගේ වෙගය හෙතු කොට ගෙන ඉන්ද්‍රියයන්ගේ ප්‍රසාදවශයෙන් නානාස්වභාව එකස්වභාව වූ එකුන්අනූචිත්තයාගේ පැවැත්ම දන්නා ප්‍රඥාව චෙතොපර්‍ය්‍යඥාන යෑ.

53. ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ගේ නානාත්ව එකත්ව කර්මවෙග වශයෙන් දැනගැනීමෙහි ප්‍රඥාව පූර්වනිවාසානුස්මෘතිඥාන යෑ.

54 කසිණොභාස වශයෙන් නානාස්වභාව එකස්වභාව වර්ණායතනය දක්නා ස්වභාව වූ ප්‍රඥාව දිව්‍යචක්ෂුර්ඥාන යෑ.

55. සූසැට අයුරින් (අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියාදි) තුන් ඉන්ද්‍රියයන්ගේ වශීභාවයෙන් පැවැති ප්‍රඥාව ආස්‍රවක්ෂයඥාන යෑ.

56. (දුඃඛයාගේ පීඩනාදි චතුර්විධ අර්ථයන්) පරිඥෙයස්වභාවයෙහි ප්‍රඥාව දුඃඛඥාන යෑ.

57. (සමුදයාගේ ආයූහනාර්ථාදිය) ප්‍රහාතව්‍යස්වභාවයෙහි ප්‍රඥාව සමුදය ඥාන යෑ.

58. සච්ඡිකිරියට්ඨෙ පඤ්ඤා නිරොධෙ ඤාණං.

59. භාවනට්ඨෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

60. දුක්ඛෙ ඤාණං.

61. දුක්ඛසමුදයෙ ඤාණං.

62. දුක්ඛනිරොධෙ ඤාණං.

63. දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං.

64. අත්ථපටිසම්භිදෙ ඤාණං.

65. ධම්මපටිසම්භිදෙ ඤාණං.

66. නිරුත්තිපටිසම්භිදෙ ඤාණං.

67. පටිභානපටිසම්භිදෙ ඤාණං.

68 ඉන්ද්‍රියපරොපරියත්තඤාණං.[1]

69 සත්තානං ආසයානුසයෙ ඤාණං.

70. යමකපාටිහීරෙ ඤාණං.

71. මහාකරුණාසමාපත්තියා ඤාණං.

72. සබ්බඤ්ඤුතඤාණං.

73. අනාවරණඤාණං.

ඉමානි තෙසත්තති ඤාණානි. ඉමෙසං තෙසත්තතියා[2] ඤාණානං සත්තසට්ඨි ඤාණානි සාවකසාධාරණානි. ඡ ඤාණානි අසාධාරණානි සාවකෙහි.[3]

මාතිකා නිට්ඨිතා.

1. ඉන්ද්‍රියවරොවරියත්තඤාණං—පු. ඉන්ද්‍රියපරොපරියත්තඤාණං—පු, මජසං, සයා, PTS, සි 1, 2, 3.
2. තෙසත්තතීනං - PTS.
3 සාවකෙහීති - සයා.

58. (නිරොධයාගේ නිඃසරණාර්ථාදිය) සාක්ෂාත්කර්තව්‍ය ස්වභාවයෙහි ප්‍රඥාව නිරොධඥාන යැ.

59. (මාර්ගයාගේ නියර්‍යාණාර්ථාදිය) භාවිතව්‍ය ස්වභාවයෙහි ප්‍රඥාව මාර්ගඥාන යැ.

60. දුඃඛසත්‍යඥාන යැ.

61. දුඃඛසමුදයසත්‍යඥාන යැ

62. දුඃඛනිරොධසත්‍යඥාන යැ.

63. දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදා සත්‍යඥාන යැ

64. අර්ථප්‍රතිසංවිද්ඥාන යැ.

65. ධර්මප්‍රතිසංවිද්ඥාන යැ.

66. නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යැ.

67. ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යැ.

68. (සත්ත්වයන්ගේ) ඉන්ද්‍රියපරාවරතාඥාන යැ

69. සත්ත්වයන්ගේ ආශයානුශයඥාන යැ.

70. යමකප්‍රාතිහාර්‍යඥාන යැ.

71. මහාකරුණාසමාපත්තිඥාන යැ.

72. සර්වඥතාඥාන යැ.

73. අනාවරණඥාන යැ.

මොහු තෙසැත්තෑ ඥානයෝ යි. මේ තෙසැත්තෑ ඥානයන් කෙරෙහි සත්සැට ඥානයෙක් ශ්‍රාවකයන් හා සාධාරණ යැ. සනුවණෙක් ශ්‍රාවකයන් හා අසාධාරණ යි.

මාතෘකා නිමි.

# ඤාණකථා.

## 1. සුතමයඤාණං

**1.** කථං සොතාවධානෙ පඤ්ඤා සුතමයෙ ඤාණං:

'ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'ඉමෙ ධම්මා පහාතබ්බා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'ඉමෙ ධම්මා භාවෙතබ්බා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'ඉමෙ ධම්මා හානභාගියා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'ඉමෙ ධම්මා ඨිතිභාගියා'ති සොතාවධානං, තංජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'ඉමෙ ධම්මා විසෙසභාගියා'ති සොතාවධානං, තංජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'ඉමෙ ධම්මා නිබ්බෙධභාගියා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති සොතාවධානං, තංපාජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'සබ්බෙ ධම්මා අනත්තා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'ඉදං දුක්ඛං අරියසච්ච'න්ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'ඉදං දුක්ඛසමුදයො[1] අරියසච්ච'න්ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

1 දුක්ඛසමුදයං—මජසං

# ඥානකථා

## 1. ශ්‍රුතමයඥානය

**1.** කිසෙයින් ශ්‍රොත්‍රාවධානයෙහි (අසන ලද්දෙහි) ප්‍රඥාව ශ්‍රුතමයඥාන වෙයි යත්:

'මේ ධර්මයෝ (ස්වභාව ලක්ෂණාවබොධ වශයෙන්) මැනැවින් දතයුත්තාහ'යි (දෙසන්නහුගේ ධර්මය) සොතාවධාන යැ හෙවත් ශ්‍රුතය යි. ඒ ශ්‍රුතය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'මේ ධර්මයෝ (සාමාන්‍ය ලක්ෂණාවබොධ වශයෙන්) පිරිසිඳ දතයුත්තාහ'යි (දෙසන්නහුගේ ධර්මය) සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'මේ ධර්මයෝ ප්‍රහාතව්‍යයෝ යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'මේ ධර්මයෝ වැඩියයුත්තාහ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කළයුත්තාහ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'මේ ධර්මයෝ පරිහාණීය සෙවුනාහ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'මේ ධර්මයෝ ස්ථිතිය සෙවුනාහ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'මේ ධර්මයෝ (මත්තෙහි විශෙෂාධිගම විසින්) විශෙෂය සෙවුනාහ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'මේ ධර්මයෝ ආර්‍යමාර්ග සඞ්ඛ්‍යාත නිර්වේදය සෙවුනාහ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'සියලු සංස්කාරයෝ දුඃඛයෝ යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'සියලු ධර්මයෝ අනාත්මයෝ යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'මේ දුඃඛාර්‍යසත්‍ය යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'මේ දුඃඛසමුදයාර්‍යසත්‍ය යැ' යනු සොතාවධාන නමැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන යැ.

'ඉදං දුක්ඛනිරොධො[1] අරියසච්චන්'ති සොතාවධානං, තංජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

'ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චන්'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

## (2)

කථං 'ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

එකො ධම්මො අභිඤ්ඤෙය්‍යො: සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා

ද්වෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා: ද්වෙ ධාතුයො.

තයො ධම්මා අභිඤ්ඤෙය්‍යා: තිස්සො ධාතුයො.

චත්තාරො ධම්මා අභිඤ්ඤෙය්‍යා: චත්තාරි අරියසච්චානි.

පඤ්ච ධම්මා අභිඤ්ඤෙය්‍යා: පඤ්ච විමුත්තායතනානි.

ඡ ධම්මා අභිඤ්ඤෙය්‍යා: ඡ අනුත්තරියානි.

සත්ත ධම්මා අභිඤ්ඤෙය්‍යා: සත්ත නිද්දසවත්ථූනි.

අට්ඨ ධම්මා අභිඤ්ඤෙය්‍යා: අට්ඨ අභිභායතනානි.

නව ධම්මා අභිඤ්ඤෙය්‍යා: නව අනුපුබ්බවිහාරා.

දස ධම්මා අභිඤ්ඤෙය්‍යා: දස නිජ්ජරවත්ථූනි.

## (3)

"සබ්බං භික්ඛවෙ, අභිඤ්ඤෙය්‍යං. කිඤ්ච භික්ඛවෙ, සබ්බං අභිඤ්ඤෙය්‍යං:

චක්ඛු[2] භික්ඛවෙ, අභිඤ්ඤෙය්‍යං, රූපා අභිඤ්ඤෙය්‍යා, චක්ඛුවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, චක්ඛුසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, යම්පිදං[3] චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අභිඤ්ඤෙය්‍යං.

සොතං අභිඤ්ඤෙය්‍යං, සද්දා අභිඤ්ඤෙය්‍යා -පෙ- ඝානං අභිඤ්ඤෙය්‍යං, ගන්ධා අභිඤ්ඤෙය්‍යා -පෙ- ජිව්හා අභිඤ්ඤෙය්‍යා, රසා අභිඤ්ඤෙය්‍යා -පෙ- කායො අභිඤ්ඤෙය්‍යො, ඵොට්ඨබ්බා අභිඤ්ඤෙය්‍යා -පෙ- මනො අභිඤ්ඤෙය්‍යො, ධම්මා අභිඤ්ඤෙය්‍යා, මනොවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, මනොසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අභිඤ්ඤෙය්‍යං.a

රූපං අභිඤ්ඤෙය්‍යං, වෙදනා අභිඤ්ඤෙය්‍යා, සඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, සඞ්ඛාරා අභිඤ්ඤෙය්‍යා, විඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං.

---

1 දුක්ඛනිරොධං—මජසං. 2 චක්ඛු—මජසං 3 යදිදං—PTS

4 වෙදනාසංයුත්ත—අනිච්චවග්ගෙ චතුත්ථං

'මේ දුඃඛනිරෝධාර්‍ය්‍යසත්‍ය යැ' යනු සොතාවධාන නමි. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමයඥාන යැ.

'මේ දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය යැ' යනු සොතාවධාන නමි. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමයඥාන සි.

(2)

කිසෙයින් මේ ධර්මයෝ අභිඥෙයහ' සි සොතාවධාන වෙයි, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමයඥාන වෙයි යත්:

එක් ධර්මයෙක් අභිඥෙය යැ: හැම සත්හු ආහාරයෙන් සිටුනාහ.

ධර්මයෝ දෙදෙනෙක් අභිඥෙයහ: සඞ්ඛතාසඞ්ඛතධාතූහු දෙදෙන සි.

ධර්මයෝ තිදෙනෙක් අභිඥෙයයෝ යැ: (කාමරූපාරූප යන) තුන් ධාතූහු සි.

ධර්මයෝ සතර දෙනෙක් අභිඥෙයයෝ යැ: චතුරාර්‍ය්‍යසත්‍යයෝ සි.

ධර්මයෝ පස් දෙනෙක් අභිඥෙයයෝ යැ: පඤ්චවිමුක්තායතනයෝ සි.

ධර්මයෝ ස දෙනෙක් අභිඥෙයයෝ යැ: ෂඩානුත්තරියයෝ සි.

ධර්මයෝ සත් දෙනෙක් අභිඥෙයයෝ යැ: සප්තනිර්දශවස්තූහු සි.

ධර්මයෝ අට දෙනෙක් අභිඥෙයයෝ යැ: අෂ්ටඅභිභායතනයෝ සි.

ධර්මයෝ නව දෙනෙක් අභිඥෙයයෝ යැ: නව අනුපූර්විහාරයෝ සි.

ධර්මයෝ දශ දෙනෙක් අභිඥෙයයෝ යැ (සම්‍යග්දෘෂ්ටි ආදි) දශනිර්ජරවස්තූහු සි.

(3)

මහණෙනි, සියල්ල අභිඥෙය යැ. මහණෙනි, කවර සියල්ල අභිඥෙය වෙයි යත්:

මහණෙනි, ප්‍රසාදචක්‍ෂුස (අභිඥෙය) මැනැවින් දතයුතු යැ. රූපයෝ දතයුත්තාහ. චක්‍ෂුර්විඥානය දතයුතු යැ. චක්ඛුසම්ඵස්සය දතයුතු යැ. චක්‍ෂුර්විඥානය හා සම්ප්‍රයුක්ත වූ ස්පර්ශප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදී නම් එ ද දතයුතු සි.

ශ්‍රොත්‍රප්‍රසාදය දතයුතු යැ. ශබ්දයෝ දතයුත්තාහ ... ඝ්‍රාණප්‍රසාදය දතයුතු යැ. ගන්ධයෝ දතයුත්තාහ ... ජිහ්වාප්‍රසාදය දතයුතු යැ රසයෝ දතයුත්තාහ. ... කායප්‍රසාදය දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යයෝ දතයුත්තාහ. ... භවාඞ්ගමනස දතයුතු යැ. ධර්මාලම්බනයෝ දතයුත්තාහ. මනොවිඥානය දතයුතු ය. මනොසම්ඵස්සය දතයුතු යැ මනොසම්ඵස්සප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදී නම් එ ද දතයුතු සි."

රූපය දතයුතු යැ. වෙදනාව දතයුතු යැ. සංඥාව දතයුතු යැ. සංස්කාරයෝ දතයුත්තාහ. විඥානය දතයුතු සි.

චක්ඛුං අභිඤ්ඤෙය්‍යං, සොතං අභිඤ්ඤෙය්‍යං, ඝානං[1] අභිඤ්ඤෙය්‍යං, ජිව්හා අභිඤ්ඤෙය්‍යා, කායො අභිඤ්ඤෙය්‍යො, මනො අභිඤ්ඤෙය්‍යො.

රූපා අභිඤ්ඤෙය්‍යා, සද්දා අභිඤ්ඤෙය්‍යා, ගන්ධා අභිඤ්ඤෙය්‍යා, රසා අභිඤ්ඤෙය්‍යා, ඵොට්ඨබ්බා අභිඤ්ඤෙය්‍යා, ධම්මා අභිඤ්ඤෙය්‍යා.

චක්ඛුවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, සොතවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, ඝානවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, ජිව්හාවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, කායවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, මනොවිඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං.

චක්ඛුසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, සොතසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, ඝානසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, ජිව්හාසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, කායසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො, මනොසම්ඵස්සො අභිඤ්ඤෙය්‍යො.

චක්ඛුසම්ඵස්සජා වෙදනා අභිඤ්ඤෙය්‍යා, සොතසම්ඵස්සජා වෙදනා අභිඤ්ඤෙය්‍යා, ඝානසම්ඵස්සජා වෙදනා අභිඤ්ඤෙය්‍යා, ජිව්හාසම්ඵස්සජා වෙදනා අභිඤ්ඤෙය්‍යා, කායසම්ඵස්සජා වෙදනා අභිඤ්ඤෙය්‍යා, මනොසම්ඵස්සජා වෙදනා අභිඤ්ඤෙය්‍යා.

රූපසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, සද්දසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, ගන්ධසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, රසසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, ඵොට්ඨබ්බසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, ධම්මසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා.

රූපසඤ්චෙතනා අභිඤ්ඤෙය්‍යා, සද්දසඤ්චෙතනා අභිඤ්ඤෙය්‍යා, ගන්ධසඤ්චෙතනා අභිඤ්ඤෙය්‍යා, රසසඤ්චෙතනා අභිඤ්ඤෙය්‍යා, ඵොට්ඨබ්බසඤ්චෙතනා අභිඤ්ඤෙය්‍යා, ධම්මසඤ්චෙතනා අභිඤ්ඤෙය්‍යා.

රූපතණ්හා අභිඤ්ඤෙය්‍යා, සද්දතණ්හා අභිඤ්ඤෙය්‍යා, ගන්ධතණ්හා අභිඤ්ඤෙය්‍යා, රසතණ්හා අභිඤ්ඤෙය්‍යා, ඵොට්ඨබ්බතණ්හා අභිඤ්ඤෙය්‍යා, ධම්මතණ්හා අභිඤ්ඤෙය්‍යා.

රූපවිතක්කො අභිඤ්ඤෙය්‍යො, සද්දවිතක්කො අභිඤ්ඤෙය්‍යො, ගන්ධවිතක්කො අභිඤ්ඤෙය්‍යො, රසවිතක්කො අභිඤ්ඤෙය්‍යො, ඵොට්ඨබ්බවිතක්කො අභිඤ්ඤෙය්‍යො, ධම්මවිතක්කො අභිඤ්ඤෙය්‍යො.

රූපවිචාරො අභිඤ්ඤෙය්‍යො, සද්දවිචාරො අභිඤ්ඤෙය්‍යො, ගන්ධවිචාරො අභිඤ්ඤෙය්‍යො, රසවිචාරො අභිඤ්ඤෙය්‍යො, ඵොට්ඨබ්බවිචාරො අභිඤ්ඤෙය්‍යො, ධම්මවිචාරො අභිඤ්ඤෙය්‍යො.

පඨවීධාතු[2] අභිඤ්ඤෙය්‍යා, ආපොධාතු අභිඤ්ඤෙය්‍යා, තෙජොධාතු අභිඤ්ඤෙය්‍යා, වායොධාතු අභිඤ්ඤෙය්‍යා, ආකාසධාතු අභිඤ්ඤෙය්‍යා, විඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා.

පඨවීකසිණං[3] අභිඤ්ඤෙය්‍යං, ආපොකසිණං අභිඤ්ඤෙය්‍යං, තෙජොකසිණං අභිඤ්ඤෙය්‍යං වායොකසිණං අභිඤ්ඤෙය්‍යං, නීලකසිණං අභිඤ්ඤෙය්‍යං, පීතකසිණං අභිඤ්ඤෙය්‍යං, ලොහිතකසිණං අභිඤ්ඤෙය්‍යං, ඔදාතකසිණං අභිඤ්ඤෙය්‍යං, ආකාසකසිණං අභිඤ්ඤෙය්‍යං, විඤ්ඤාණකසිණං අභිඤ්ඤෙය්‍යං.

---

1 ඝාණං - මජසං   2 පඨවිධාතු - මජසං   3 පඨවිකසිණං - මජසං.

ප්‍රසාදචක්ෂුස දතයුතු යැ. ශ්‍රොත්‍රප්‍රසාදය දතයුතු යැ. ඝ්‍රාණප්‍රසාදය දතයුතු යැ. ජිහ්වාප්‍රසාදය දතයුතු යැ. කායප්‍රසාදය දතයුතු යැ. භවාඞ්ගමනස දතයුතු යැ. රූපයෝ දතයුත්තාහ. ශබ්දයෝ දතයුත්තාහ. ගන්ධයෝ දතයුත්තාහ. රසයෝ දතයුත්තාහ. ස්ප්‍රෂ්ටව්‍යයෝ දතයුත්තාහ. ධර්මාලම්බනයෝ දතයුත්තාහ.

චක්ෂුර්විඥානය දතයුතු යැ. ශ්‍රොත්‍රවිඥානය දතයුතු යැ. ඝ්‍රාණවිඥානය දතයුතු යැ. ජිහ්වාවිඥානය දතයුතු යැ. කායවිඥානය දතයුතු යැ. මනෝවිඥානය දතයුතු යි.

චක්ඛුසම්ඵස්සය දතයුතු යැ. සෝතසම්ඵස්සය දතයුතු යැ. ඝානසම්ඵස්සය දතයුතු යැ. ජිව්හාසම්ඵස්සය දතයුතු යැ. කායසම්ඵස්සය දතයුතු යැ. මනෝසම්ඵස්සය දතයුතු යි.

චක්ෂුස්සංස්පර්ශයෙන් උපන් වේදනාව දතයුතු යැ. ශ්‍රොත්‍රසංස්පර්ශයෙන් උපන් වේදනාව දතයුතු යැ. ඝ්‍රාණසංස්පර්ශයෙන් උපන් වේදනාව දතයුතු යැ. ජිහ්වාසංස්පර්ශයෙන් උපන් වේදනාව දතයුතු ය. කායසංස්පර්ශයෙන් උපන් වේදනාව දතයුතු යැ. මනස්සංස්පර්ශයෙන් උපන් වේදනාව දතයුතු යි.

රූපසංඥාව දතයුතු යැ. ශබ්දසංඥාව දතයුතු යැ ගන්ධසංඥාව දතයුතු යැ. රසසංඥාව දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යසංඥාව දතයුතු යැ. ධර්මසංඥාව දතයුතු යි.

රූපසඤ්චේතනාව දතයුතු යැ. ශබ්දසඤ්චේතනාව දතයුතු යැ. ගන්ධසඤ්චේතනාව දතයුතු යැ. රසසඤ්චේතනාව දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යසඤ්චේතනාව දතයුතු යැ. ධර්මසඤ්චේතනාව දතයුතු යි.

රූපතෘෂ්ණාව දතයුතු යැ. ශබ්දතෘෂ්ණාව දතයුතු යැ. ගන්ධතෘෂ්ණාව දතයුතු යැ. රසතෘෂ්ණාව දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණාව දතයුතු යැ ධර්මතෘෂ්ණාව දතයුතු යි.

රූපවිතර්කය දතයුතු යැ. ශබ්දවිතර්කය දතයුතු යැ. ගන්ධවිතර්කය දතයුතු යැ. රසවිතර්කය දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යවිතර්කය දතයුතු යැ. ධර්මවිතර්කය දතයුතු යි.

රූපවිචාරය දතයුතු යැ. ශබ්දවිචාරය දතයුතු යැ. ගන්ධ චාරය දතයුතු යැ. රසවිචාරය දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යවිචාරය දතයුතු යැ. ධර්මවිචාරය දතයුතු යි.

පෘථිවීධාතුව දතුයුතු යැ. අබ්ධාතුව දතයුතු යැ. තේජෝධාතුව දතයුතු යැ. වායුධාතුව දතයුතු යැ. ආකාශධාතුව දතයුතු යැ. විඥානධාතුව දතයුතු යි.

පඨවිකසිණය දතයුතු යැ. ආපොකසිණය දතයුතු යැ. තේජෝකසිණය දතයුතු යැ. වායොකසිණය දතයුතු යැ. නීලකසිණය දතයුතු යැ. පීතකසිණය දතයුතු යැ: ලොහිතකසිණය දතයුතු යැ. ඔදාතකසිණය දතයුතු යැ. ආකාසකසිණය දතයුතු යැ විඤ්ඤාණකසිණය දතයුතු යි.

කෙසා අභිඤ්ඤෙය්‍යා, ලොමා අභිඤ්ඤෙය්‍යා, නඛා අභිඤ්ඤෙය්‍යා, දන්තා අභිඤ්ඤෙය්‍යා, තචො අභිඤ්ඤෙය්‍යා, මංසං අභිඤ්ඤෙය්‍යං, නහාරූ[1] අභිඤ්ඤෙය්‍යා, අට්ඨී අභිඤ්ඤෙය්‍යා, අට්ඨිමිඤ්ජං[2] අභිඤ්ඤෙය්‍යං, වක්කං අභිඤ්ඤෙය්‍යං, හදයං අභිඤ්ඤෙය්‍යං, යකනං අභිඤ්ඤෙය්‍යං, කිලොමකං අභිඤ්ඤෙය්‍යං, පිහකං අභිඤ්ඤෙය්‍යං, පප්ඵාසං අභිඤ්ඤෙය්‍යං, අන්තං අභිඤ්ඤෙය්‍යං, අන්තගුණං අභිඤ්ඤෙය්‍යං, උදරියං අභිඤ්ඤෙය්‍යං, කරීසං අභිඤ්ඤෙය්‍යං, පිත්තං අභිඤ්ඤෙය්‍යං, සෙම්හං අභිඤ්ඤෙය්‍යං, පුබ්බො අභිඤ්ඤෙය්‍යො, ලොහිතං අභිඤ්ඤෙය්‍යං, සෙදො අභිඤ්ඤෙය්‍යා, මෙදො අභිඤ්ඤෙය්‍යො, අස්සු අභිඤ්ඤෙය්‍යං, වසා අභිඤ්ඤෙය්‍යා, ඛෙළො අභිඤ්ඤෙය්‍යො, සිඞ්ඝාණිකා අභිඤ්ඤෙය්‍යා, ලසිකා අභිඤ්ඤෙය්‍යා, මුත්තං අභිඤ්ඤෙය්‍යං, මත්ථලුඞ්ගං අභිඤ්ඤෙය්‍යං.

චක්ඛායතනං අභිඤ්ඤෙය්‍යං, රූපායතනං අභිඤ්ඤෙය්‍යං, සොතායතනං අභිඤ්ඤෙය්‍යං, සද්දායතනං අභිඤ්ඤෙය්‍යං, ඝානායතනං අභිඤ්ඤෙය්‍යං, ගන්ධායතනං අභිඤ්ඤෙය්‍යං, ජිව්හායතනං අභිඤ්ඤෙය්‍යං, රසායතනං අභිඤ්ඤෙය්‍යං, කායායතනං අභිඤ්ඤෙය්‍යං, ඵොට්ඨබ්බායතනං අභිඤ්ඤෙය්‍යං, මනායතනං අභිඤ්ඤෙය්‍යං, ධම්මායතනං අභිඤ්ඤෙය්‍යං.

චක්ඛුධාතු අභිඤ්ඤෙය්‍යා, රූපධාතු අභිඤ්ඤෙය්‍යා, චක්ඛුවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා, සොතධාතු අභිඤ්ඤෙය්‍යා, සද්දධාතු අභිඤ්ඤෙය්‍යා, සොතවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා, ඝානධාතු අභිඤ්ඤෙය්‍යා, ගන්ධධාතු අභිඤ්ඤෙය්‍යා, ඝානවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා, ජිව්හාධාතු අභිඤ්ඤෙය්‍යා, රසධාතු අභිඤ්ඤෙය්‍යා, ජිව්හාවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා, කායධාතු අභිඤ්ඤෙය්‍යා. ඵොට්ඨබ්බධාතු අභිඤ්ඤෙය්‍යා, කායවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා, මනොධාතු අභිඤ්ඤෙය්‍යා, ධම්මධාතු අභිඤ්ඤෙය්‍යා, මනොවිඤ්ඤාණධාතු අභිඤ්ඤෙය්‍යා.

චක්ඛුන්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, සොතින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, ඝානින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, ජිව්හින්ද්‍රියං අභිඤ්ඤෙයං, කායින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, මනින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, ජීවිතින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, ඉත්ථින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, පුරිසින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, සුඛින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, දුක්ඛින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, සොමනස්සින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, දොමනස්සින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, උපෙක්ඛින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, සද්ධින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, විරියින්ද්‍රියං[3] අභිඤ්ඤෙය්‍යං, සතින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, සමාධින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, පඤ්ඤින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, අඤ්ඤින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, අඤ්ඤාතාවින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං.

කාමධාතු අභිඤ්ඤෙය්‍යා, රූපධාතු අභිඤ්ඤෙය්‍යා, අරූපධාතු අභිඤ්ඤෙය්‍යා, කාමභවො අභිඤ්ඤෙය්‍යො, රූපභවො අභිඤ්ඤෙය්‍යො, අරූපභවො අභිඤ්ඤෙය්‍යො, සඤ්ඤාභවො අභිඤ්ඤෙය්‍යො, අසඤ්ඤාභවො අභිඤ්ඤෙය්‍යො, නෙවසඤ්ඤානාසඤ්ඤාභවො අභිඤ්ඤෙය්‍යො, එකවොකාරභවො අභිඤ්ඤෙය්‍යො, චතුවොකාරභවො අභිඤ්ඤෙය්‍යො, පඤ්චවොකාරභවො අභිඤ්ඤෙය්‍යො.

පඨමං ඣානං[4] අභිඤ්ඤෙය්‍යං, දුතියං ඣානං අභිඤ්ඤෙය්‍යං, තතියං ඣානං අභිඤ්ඤෙය්‍යං, චතුත්ථං ඣානං අභිඤ්ඤෙය්‍යං, මෙත්තා චෙතොවිමුත්ති අභිඤ්ඤෙය්‍යා, කරුණාචෙතොවිමුත්ති අභිඤ්ඤෙය්‍යා, මුදිතාචෙතොවිමුත්ති අභිඤ්ඤෙය්‍යා, උපෙක්ඛාචෙතොවිමුත්ති අභිඤ්ඤෙය්‍යා, ආකාසානඤ්චායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, විඤ්ඤාණඤ්චායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා.

---

1 නහාරූ - මජසං  2 අට්ඨිමිඤ්ජං අභිඤ්ඤෙය්‍යං - සයා, PTS
විරියින්ද්‍රියං - මජසං  4 පඨමජ්ඣානං - සයා

කෙස් දතයුතු යැ. ලොම් දතයුතු යැ. නිය දතයුතු යැ. දත් දතයුතු යැ. සම් දතයුතු යැ. මස් දතයුතු යැ. නහර දතයුතු යැ. ඇට දතයුතු යැ. ඇටමිදුළු දතයුතු යැ. වකුගඩුව දතයුතු යැ. හදවත් දතයුතු යැ. අක්මාව දතයුතු යැ. දලබුව දතයුතු යැ. බඩදිව දතයුතු යැ. පපුමස දතයුතු යැ. අතුනු දතයුතු යැ. අතුනුබහන් දතයුතු යැ. නො පැසුණු අහර (උදරිය) දතයුතු යැ. පැසුණු අහර (කරීස) දතයුතු යැ. පිත් දතයුතු යැ. සෙම් දතයුතු යැ. පූයා දතයුතු යැ. ලෙහෙ දතයුතු යැ. සෝදිය දතයුතු යැ. මෙදතෙල් දතයුතු ය. කඳුළු දතයුතු යැ. වුරුණු තෙල් දතයුතු යැ. කෙළ දතයුතු යැ. මූකුණු දතයුතු යැ. සඳමිදුළු දතයුතු යැ. සුලුදිය දතයුතු යැ. හිස්මුල් දතයුතු යි.

චක්ෂුරායතනය දතයුතු යැ. රූපායතනය දතයුතු යැ. ශ්‍රොත්‍රායතනය දතයුතු යැ. ශබ්දායතනය දතයුතු යැ. ඝ්‍රාණායතනය දතයුතු යැ. ගන්ධායතනය දතයුතු යැ. ජිහ්වායතනය දතයුතු යැ. රසායතනය දතයුතු යැ. කායායතනය දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යායතනය දතයුතු යැ. මනායතනය දතයුතු යැ. ධර්මායතනය දතයුතු යි.

චක්ෂුර්ධාතුව දතයුතු යැ. රූපධාතුව දතයුතු යැ. චක්ෂුර්විඥාන ධාතුව දතයුතු යැ. ශ්‍රොත්‍රධාතුව දතයුතු යැ. ශබ්දධාතුව දතයුතු යැ. ශ්‍රොත්‍රවිඥානධාතුව දතයුතු යැ. ඝ්‍රාණධාතුව දතයුතු යැ. ගන්ධධාතුව දතයුතු යැ. ඝ්‍රාණවිඥානධාතුව දතයුතු යැ. ජිහ්වාධාතුව දතයුතු යැ. රසධාතුව දතයුතු යැ. ජිහ්වාවිඥානධාතුව දතයුතු යැ. කායධාතුව දතයුතු යැ. ස්ප්‍රෂ්ටව්‍යධාතුව දතයුතු යැ. කායවිඥානධාතුව දතයුතු යැ. මනොධාතුව දතයුතු යැ. ධර්මධාතුව දතයුතු යැ. මනොවිඥානධාතුව දතයුතු යි.

චක්ෂුරින්ද්‍රිය දතයුතු යැ. ශ්‍රොත්‍රෙන්ද්‍රිය දතයුතු යැ. ඝ්‍රාණෙන්ද්‍රිය දතයුතු යැ. ජිහ්වෙන්ද්‍රිය දතයුතු යැ. කායෙන්ද්‍රිය දතයුතු යැ. මනඉන්ද්‍රිය දතයුතු යැ. ජීවිතෙන්ද්‍රිය දතයුතු යැ. ස්ත්‍රීන්ද්‍රිය දතයුතු යැ. පුරුෂෙන්ද්‍රිය දතයුතු යැ. සුඛෙන්ද්‍රිය දතයුතු යැ. දුඃඛෙන්ද්‍රිය දතයුතු යැ. සොමනස්සින්ද්‍රිය දතයුතු යැ. දොමනස්සින්ද්‍රිය දතයුතු යැ. උපෙක්ඛින්ද්‍රිය දතයුතු යැ. සද්ධින්ද්‍රිය දතයුතු යැ. විරියින්ද්‍රිය දතයුතු යැ. සතින්ද්‍රිය දතයුතු යැ. සමාධින්ද්‍රිය දතයුතු යැ. පඤ්ඤින්ද්‍රිය දතයුතු යැ. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය දතයුතු යැ. අඤ්ඤින්ද්‍රිය දතයුතු යැ. අඤ්ඤාතාවින්ද්‍රිය දතයුතු යි.

කාමධාතුව දතයුතු යැ. රූපධාතුව දතයුතු යැ. අරූපධාතුව දතයුතු යැ. කාමභවය දතයුතු යැ. රූපභවය දතයුතු යැ. අරූපභවය දතයුතු යැ. සංඥාභවය දතයුතු යැ. අසංඥාභවය දතයුතු යැ. නෛවසංඥානාසංඥාභවය දතයුතු යැ. එකවොකාරභවය දතයුතු යැ. චතුවොකාරභවය දතයුතු යැ. පඤ්චවොකාරභවය දතයුතු යි.

ප්‍රථමධ්‍යානය දතයුතු යැ. ද්විතීයධ්‍යානය දතයුතු යැ. තෘතීයධ්‍යානය දතයුතු යැ. චතුර්ථධ්‍යානය දතයුතු යැ. මෛත්‍රීචිත්තවිමුක්තිය දතයුතු යැ. කරුණාචිත්තවිමුක්තිය දතයුතු යැ. මෘදුතාචිත්තවිමුක්තිය දතයුතු යැ. උපෙක්ෂාචිත්තවිමුක්තිය දතයුතු යැ. ආකාසානඤ්චායතන සමාපත්තිය දතයුතු යැ. විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය දතයුතු යැ. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය දතයුතු යැ. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය දතයුතු යි.

අවිජ්ජා අභිඤ්ඤෙය්‍යා, සඞ්ඛාරා අභිඤ්ඤෙය්‍යා, විඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං, නාමරූපං අභිඤ්ඤෙය්‍යං, සළායතනං අභිඤ්ඤෙය්‍යං, ඵස්සො අභිඤ්ඤෙය්‍යො, වෙදනා අභිඤ්ඤෙය්‍යා, තණ්හා අභිඤ්ඤෙය්‍යා, උපාදානං අභිඤ්ඤෙය්‍යං, භවො අභිඤ්ඤෙය්‍යො, ජාති අභිඤ්ඤෙය්‍යා, ජරාමරණං අභිඤ්ඤෙය්‍යං.

දුක්ඛං අභිඤ්ඤෙය්‍යං, දුක්ඛසමුදයො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධගාමිනී පටිපදා අභිඤ්ඤෙය්‍යා.

රූපං අභිඤ්ඤෙය්‍යං, රූපසමුදයො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධගාමිනී පටිපදා අභිඤ්ඤෙය්‍යා.

වෙදනා අභිඤ්ඤෙය්‍යා -පෙ- සඤ්ඤා අභිඤ්ඤෙය්‍යා -පෙ- සඞ්ඛාරා අභිඤ්ඤෙය්‍යා -පෙ- විඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං -පෙ-

චක්ඛුං[1] අභිඤ්ඤෙය්‍යං -පෙ- ජරාමරණං අභිඤ්ඤෙය්‍යං, ජරාමරණසමුදයො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධගාමිනී පටිපදා අභිඤ්ඤෙය්‍යා.

දුක්ඛස්ස පරිඤ්ඤට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛසමුදයස්ස පහානට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධස්ස සච්ඡිකිරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය භාවනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

රූපස්ස පරිඤ්ඤට්ඨො අභිඤ්ඤෙය්‍යො, රූපසමුදයස්ස පහානට්ඨො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධස්ස සච්ඡිකිරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධගාමිනියා පටිපදාය භාවනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස -පෙ- චක්ඛුස්ස -පෙ- ජරාමරණස්ස පරිඤ්ඤට්ඨො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණසමුදයස්ස පහානට්ඨො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධස්ස සච්ඡිකිරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධගාමිනියා පටිපදාය භාවනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

දුක්ඛස්ස පරිඤ්ඤාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛසමුදයස්ස පහානපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධස්ස සච්ඡිකිරියාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය භාවනාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො.

රූපස්ස පරිඤ්ඤාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, රූපසමුදයස්ස පහානපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධස්ස සච්ඡිකිරියාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධගාමිනියා පටිපදාය භාවනාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස -පෙ- චක්ඛුස්ස -පෙ- ජරාමරණස්ස පරිඤ්ඤාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණසමුදයස්ස පහානපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධස්ස සච්ඡිකිරියාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධගාමිනියා පටිපදාය භාවනාපටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො.

1 චක්ඛු - මජසං.

අවිද්‍යාව දතයුතු යැ. සංස්කාරයෝ දතයුත්තාහ. විඥානය දතයුතු යැ. නාමරූපය දතයුතු යැ. ෂඩායතනය දතයුතු යැ. ස්පර්ශය දතයුතු යැ. වේදනාව දතයුතු යැ. තෘෂ්ණාව දතයුතු යැ. උපාදානය දතයුතු යැ. භවය දතයුතු යැ. ජාතිය දතයුතු යැ. ජරාමරණ දතයුතු යි.

දුඃඛය දතයුතු යැ. දුඃඛසමුදය දතයුතු යැ. දුඃඛනිරෝධය දතයුතු යැ. දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදා දතයුතු යැ. රූපය දතයුතු යැ. රූපසමුදය දතයුතු යැ. රූපනිරෝධය දතයුතු යැ. රූපනිරෝධගාමිනී ප්‍රතිපදා දතයුතු යැ.

වේදනාව දතයුතු යැ ... සංඥාව දතයුතු යැ ... සංස්කාරයෝ දතයුත්තාහ ... විඥානය දතයුතු යි. ..

චක්ෂුස දතයුතු යැ ... ජරාමරණ දතයුතු යැ. ජරාමරණසමුදය දතයුතු යැ. ජරාමරණනිරෝධය දතයුතු යැ. ජරාමරණනිරෝධගාමිනී ප්‍රතිපදා දතයුතු යි.

දුඃඛයාගේ පරිඥාර්ථය දතයුතු යැ. දුඃඛසමුදයාගේ ප්‍රහාණාර්ථය දතයුතු යැ. දුඃඛනිරෝධයාගේ සාක්ෂාත්ක්‍රියාර්ථය දතයුතු යැ. දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාවගේ භාවනාර්ථය දතයුතු යි.

රූපයාගේ පරිඥාර්ථය දතයුතු යැ. රූපසමුදයාගේ ප්‍රහාණාර්ථය දතයුතු යැ. රූපනිරෝධයාගේ සාක්ෂාත්ක්‍රියාර්ථය දතයුතු යැ. රූපනිරෝධගාමිනී ප්‍රතිපදාවගේ භාවනාර්ථය දතයුතු යි.

වේදනාවගේ ... සංඥාවගේ සංස්කාරයන්ගේ ... විඥානයාගේ ... චක්ෂුස්හුගේ ... ජරාමරණයාගේ පරිඥාර්ථය දතයුතු යැ. ජරාමරණසමුදයාගේ ප්‍රහාණාර්ථය දතයුතු යැ. ජරාමරණනිරෝධයාගේ සාක්ෂාත්ක්‍රියාර්ථය දතයුතු යැ. ජරාමරණනිරෝධගාමිනීප්‍රතිපදාවගේ භාවනාර්ථය දතයුතු යි.

දුඃඛයාගේ පරිඥාප්‍රතිවේධාර්ථය දතයුතු යැ. දුඃඛසමුදයාගේ ප්‍රහාණප්‍රතිවේධාර්ථය දතයුතු යැ. දුඃඛනිරෝධයාගේ සාක්ෂාත්ක්‍රියාප්‍රතිවේධාර්ථය දතයුතු යැ. දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාවගේ භාවනාප්‍රතිවේධාර්ථය දතයුතු යි.

රූපයාගේ පරිඥාප්‍රතිවේධාර්ථය දතයුතු යැ. රූපසමුදයාගේ ප්‍රහාණප්‍රතිවේධාර්ථය දතයුතු යැ. රූපනිරෝධයාගේ සාක්ෂාත්ක්‍රියාප්‍රතිවේධාර්ථය දතයුතු යැ. රූපනිරෝධගාමිනීප්‍රතිපදාවගේ භාවනාප්‍රතිවේධාර්ථය දතයුතු යි.

වේදනාවගේ ... සංඥාවගේ ... සංස්කාරයන්ගේ ... විඥානයාගේ ... චක්ෂුස්හුගේ ... ජරාමරණයාගේ පරිඥාප්‍රතිවේධාර්ථය දතයුතු යැ. ජරාමරණසමුදයාගේ ප්‍රහාණප්‍රතිවේධාර්ථය දතයුතු යැ. ජරාමරණනිරෝධයාගේ සාක්ෂාත්ක්‍රියාප්‍රතිවේධාර්ථය දතයුතු යැ. ජරාමරණනිරෝධගාමිනීප්‍රතිපදාවගේ භාවනාප්‍රතිවේධාර්ථය දතයුතු යි.

දුක්ඛං අභිඤ්ඤෙය්‍යං, දුක්ඛසමුදයො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස සමුදයනිරොධො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස ඡන්දරාගනිරොධො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස අස්සාදො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස ආදීනවො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස නිස්සරණං අභිඤ්ඤෙය්‍යං.

රූපං අභිඤ්ඤෙය්‍යං, රූපසමුදයො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස සමුදයනිරොධො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස ඡන්දරාගනිරොධො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස අස්සාදො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස ආදීනවො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස නිස්සරණං අභිඤ්ඤෙය්‍යං.

වෙදනා අභිඤ්ඤෙය්‍යා -පෙ- සඤ්ඤා අභිඤ්ඤෙය්‍යා -පෙ- සඞ්ඛාරා අභිඤ්ඤෙය්‍යා -පෙ- විඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං -පෙ- චක්ඛුං අභිඤ්ඤෙය්‍යං -පෙ- ජරාමරණං අභිඤ්ඤෙය්‍යං, ජරාමරණසමුදයො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස සමුදයනිරොධො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස ඡන්දරාගනිරොධො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස අස්සාදො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස ආදීනවො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස නිස්සරණං අභිඤ්ඤෙය්‍යං.

දුක්ඛං අභිඤ්ඤෙය්‍යං, දුක්ඛසමුදයො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛනිරොධගාමිනී පටිපදා අභිඤ්ඤෙය්‍යා, දුක්ඛස්ස අස්සාදො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස ආදීනවො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස නිස්සරණං අභිඤ්ඤෙය්‍යං.

රූපං අභිඤ්ඤෙය්‍යං, රූපසමුදයො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධො අභිඤ්ඤෙය්‍යො, රූපනිරොධගාමිනී පටිපදා අභිඤ්ඤෙය්‍යා, රූපස්ස අස්සාදො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස ආදීනවො අභිඤ්ඤෙය්‍යො, රූපස්ස නිස්සරණං අභිඤ්ඤෙය්‍යං.

වෙදනා අභිඤ්ඤෙය්‍යා -පෙ- සඤ්ඤා අභිඤ්ඤෙය්‍යා -පෙ- සඞ්ඛාරා අභිඤ්ඤෙය්‍යා -පෙ- විඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං -පෙ- ජරාමරණං අභිඤ්ඤෙය්‍යං, ජරාමරණසමුදයො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණනිරොධගාමිනී පටිපදා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණස්ස අස්සාදො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස ආදීනවො අභිඤ්ඤෙය්‍යො, ජරාමරණස්ස නිස්සරණං අභිඤ්ඤෙය්‍යං.

අනිච්චානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, දුක්ඛානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, අනත්තානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, නිබ්බිදානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, විරාගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, නිරොධානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, පටිනිස්සග්ගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා.

රූපෙ අනිච්චානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, රූපෙ දුක්ඛානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, රූපෙ අනත්තානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, රූපෙ නිබ්බිදානුපස්සනා[1] අභිඤ්ඤෙය්‍යා, රූපෙ විරාගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, රූපෙ නිරොධානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, රූපෙ පටිනිස්සග්ගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා.

1 නිබ්බානුපස්සනා - PTS.

දුඃඛය දතයුතු යැ. දුඃඛසමුදය දතයුතු යැ. දුඃඛනිරෝධය දතයුතු යැ. දුඃඛයාගේ සමුදයනිරෝධය දතයුතු යැ. දුඃඛයාගේ ඡන්දරාග නිරෝධය දතයුතු යැ. දුඃඛයාගේ ආස්වාදය දතයුතු යැ. දුඃඛයාගේ ආදීනවය දතයුතු යැ. දුඃඛයාගේ නිස්සරණය දතයුතු යි.

රූපය දතයුතු යැ. රූපසමුදය දතයුතු යැ. රූපනිරෝධය දතයුතු යැ. රූපයාගේ සමුදයනිරෝධය දතයුතු යැ. රූපයාගේ ඡන්දරාගනිරෝධය දතයුතු යැ. රූපයාගේ ආස්වාදය දතයුතු යැ. රූපයාගේ ආදීනවය දතයුතු ය. රූපයාගේ නිස්සරණය දතයුතු යි.

වෙදනාව දතයුතු යැ. ... සංඥාව දතයුතු යැ. ... සංස්කාරයෝ දතයුත්තාහ. ... විඥානය දතයුතු යැ. ... චක්ෂුස දතයුතු යැ. ... ජරාමරණ දතයුතු යැ. ජරාමරණසමුදය දතයුතු යැ. ජරාමරණනිරෝධය දතයුතු යැ. ජරාමරණයාගේ සමුදයනිරෝධය දතයුතු යැ. ජරාමරණයාගේ ඡන්දරාගනිරෝධය දතයුතු යැ. ජරාමරණයාගේ ආස්වාදය දතයුතු යැ. ජරාමරණයාගේ ආදීනවය දතයුතු යැ. ජරාමරණයාගේ නිස්සරණය දතයුතු යි.

දුඃඛය දතයුතු යැ. දුඃඛසමුදය දතයුතු යැ. දුඃඛනිරෝධය දතයුතු යැ. දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදා දතයුතු යැ. දුඃඛයාගේ ආස්වාදය දතයුතු යැ. දුඃඛයාගේ ආදීනවය දතයුතු යැ. දුඃඛයාගේ නිස්සරණය දතයුතු යි.

රූපය දතයුතු යැ. රූපසමුදය දතයුතු යැ. රූපනිරෝධය දතයුතු යැ. රූපනිරෝධගාමිනීප්‍රතිපදාව දතයුතු යැ. රූපයාගේ ආස්වාදය දතයුතු යැ. රූපයාගේ ආදීනවය දතයුතු යැ. රූපයාගේ නිස්සරණය දතයුතු යි.

වෙදනාව දතයුතු යැ. ... සංඥාව දතයුතු යැ. .. සංස්කාරයෝ දතයුත්තාහ. ... විඥානය දතයුතු යැ. ... චක්ෂුස දතයුතු යැ. ... ජරාමරණ දතයුතු යැ. ජරාමරණසමුදය දතයුතු යැ. ජරාමරණනිරෝධය දතයුතු යැ. ජරාමරණනිරෝධගාමිනීප්‍රතිපදාව දතයුතු යැ. ජරාමරණයාගේ ආස්වාදය දතයුතු යැ. ජරාමරණයාගේ ආදීනවය දතයුතු යැ. ජරාමරණයාගේ නිස්සරණය දතයුතු යි.

අනිච්චානුපස්සනාව දතයුතු යැ. දුක්ඛානුපස්සනාව දතයුතු යැ. අනත්තානුපස්සනාව දතයුතු යැ. නිබ්බිදානුපස්සනාව දතයුතු යැ. විරාගානුපස්සනාව දතයුතු යැ. නිරෝධානුපස්සනාව දතයුතු යැ. පටිනිස්සග්ගානුපස්සනාව දතයුතු යි.

රූපයෙහි අනිච්චානුපස්සනාව දතයුතු යැ. රූපයෙහි දුක්ඛානුපස්සනාව දතයුතු යැ. රූපයෙහි අනත්තානුපස්සනාව දතයුතු යැ. රූපයෙහි නිබ්බිදානුපස්සනාව දතයුතු යැ. රූපයෙහි විරාගානුපස්සනාව දතයුතු යැ. රූපයෙහි නිරෝධානුපස්සනාව දතයුතු යැ. රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව දතයුතු යි.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණෙ දුක්ඛානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණෙ අනත්තානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණෙ නිබ්බිදානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණෙ විරාගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණෙ නිරොධානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා.

උප්පාදො අභිඤ්ඤෙය්‍යො, පවත්තං[1] අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං අභිඤ්ඤෙය්‍යං, ආයූහනා[2] අභිඤ්ඤෙය්‍යා, පටිසන්ධි අභිඤ්ඤෙය්‍යා, ගති අභිඤ්ඤෙය්‍යා, නිබ්බත්ති අභිඤ්ඤෙය්‍යා, උපපත්ති අභිඤ්ඤෙය්‍යා, ජාති අභිඤ්ඤෙය්‍යා, ජරා අභිඤ්ඤෙය්‍යා, ව්‍යාධි අභිඤ්ඤෙය්‍යො, මරණං අභිඤ්ඤෙය්‍යං, සොකො අභිඤ්ඤෙය්‍යො, පරිදෙවො අභිඤ්ඤෙය්‍යො, උපායාසො අභිඤ්ඤෙය්‍යො.

අනුප්පාදො අභිඤ්ඤෙය්‍යො, අප්පවත්තං අභිඤ්ඤෙය්‍යං, අනිමිත්තං අභිඤ්ඤෙය්‍යං, අනායූහනා අභිඤ්ඤෙය්‍යා, අප්පටිසන්ධි අභිඤ්ඤෙය්‍යා, අගති අභිඤ්ඤෙය්‍යා, අනිබ්බත්ති අභිඤ්ඤෙය්‍යා, අනුපපත්ති අභිඤ්ඤෙය්‍යා, අජාති අභිඤ්ඤෙය්‍යා, අජරා අභිඤ්ඤෙය්‍යා, අව්‍යාධි අභිඤ්ඤෙය්‍යො, අමරණං අභිඤ්ඤෙය්‍යං, අසොකො අභිඤ්ඤෙය්‍යො, අපරිදෙවො අභිඤ්ඤෙය්‍යො, අනුපායාසො අභිඤ්ඤෙය්‍යො.

උප්පාදො අභිඤ්ඤෙය්‍යො, අනුප්පාදො අභිඤ්ඤෙය්‍යො, පවත්තං අභිඤ්ඤෙය්‍යං, අප්පවත්තං අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං අභිඤ්ඤෙය්‍යං, අනිමිත්තං අභිඤ්ඤෙය්‍යං, ආයූහනා අභිඤ්ඤෙය්‍යා, අනායූහනා අභිඤ්ඤෙය්‍යා, පටිසන්ධි අභිඤ්ඤෙය්‍යා, අප්පටිසන්ධි අභිඤ්ඤෙය්‍යා, ගති අභිඤ්ඤෙය්‍යා, අගති අභිඤ්ඤෙය්‍යා, නිබ්බත්ති අභිඤ්ඤෙය්‍යා, අනිබ්බත්ති අභිඤ්ඤෙය්‍යා, උපපත්ති අභිඤ්ඤෙය්‍යා, අනුපපත්ති අභිඤ්ඤෙය්‍යා, ජාති අභිඤ්ඤෙය්‍යා, අජාති අභිඤ්ඤෙය්‍යා, ජරා අභිඤ්ඤෙය්‍යා, අජරා අභිඤ්ඤෙය්‍යා, ව්‍යාධි අභිඤ්ඤෙය්‍යො, අව්‍යාධි අභිඤ්ඤෙය්‍යො, මරණං අභිඤ්ඤෙය්‍යං, අමරණං අභිඤ්ඤෙය්‍යං, සොකො අභිඤ්ඤෙය්‍යො, අසොකො අභිඤ්ඤෙය්‍යො, පරිදෙවො අභිඤ්ඤෙය්‍යො, අපරිදෙවො අභිඤ්ඤෙය්‍යො, උපායාසො අභිඤ්ඤෙය්‍යො, අනුපායාසො අභිඤ්ඤෙය්‍යො.

උප්පාදො දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා[2] දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, ගති දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං සොකො දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො දුක්ඛන්ති අභිඤ්ඤෙය්‍යං.

අනුප්පාදො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පවත්ති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අනිමිත්තං සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අනායූහනා සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පටිසන්ධි සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අගති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අනිබ්බත්ති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපපත්ති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අජාති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අජරා සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අව්‍යාධි සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අමරණං සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අසොකො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අපරිදෙවො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපායාසො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං.

---

1 පවත්ති - සයා. 2 ආයුහනා - සයා.

වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂු-සෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව දතයුතු යැ. ජරාමරණයෙහි දුඃඛානුපස්සනාව දතයුතු යැ. ජරාමරණයෙහි අනාත්තානුපස්සනාව දතයුතු යැ. ජරාමරණයෙහි නිබ්බිදානුපස්සනාව දතයුතු යැ. ජරාමරණයෙහි විරාගා-නුපස්සනාව දතයුතු යැ. ජරාමරණයෙහි නිරොධානුපස්සනාව දතයුතු යැ. ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව දතයුතු යි.

පූර්වකර්මප්‍රත්‍යයෙන් මෙහි ඉපැදීම දතයුතු යැ. (උපන්හුගේ) පැවැත්ම දතයුතු යැ. සංස්කාරනිමිත්ත දතයුතු යැ. ආයතිප්‍රතිසන්ධිහෙතු වූ කර්මය දතයුතු යැ. ප්‍රතිසන්ධිය දතයුතු යැ. ගතිය දතයුතු යැ. ස්කන්ධයන්ගේ නිපැත්ම දතයුතු යැ. විපාකප්‍රවෘත්තිය දතයුතු යැ. ජාතිය දතයුතු යැ. ජරාව දතයුතු යැ. ව්‍යාධිය දතයුතු යැ. මරණය දතයුතු යැ. ශොකය දතයුතු යැ. පරිදෙවය දතයුතු යැ. උපායාසය දතයුතු යි.

අනුත්පාදය දතයුතු යැ. අප්‍රවෘත්තිය දතයුතු යැ. අනිමිත්ත දතයුතු යැ. අනායූහනය දතයුතු යැ. අප්‍රතිසන්ධිය දතයුතු යැ අගතිය දතයුතු යැ. නො නිපැත්ම දතයුතු යැ. විපාකයාගේ නො පැවැත්ම දතයුතු ය. නො පහළවීම දතයුතු යැ. නො දිරීම දතයුතු යැ. අව්‍යාධිය දතයුතු යැ. නො මැරීම දතයුතු යැ. ශොක නො කිරීම දතයුතු යැ. නො වැලපීම දතයුතු යැ. අනුපායාසය දතයුතු යි.

උත්පාදය දතයුතු යැ. අනුත්පාදය දතයුතු යැ. පැවැත්ම දතයුතු යැ. නො පැවැත්ම දතයුතු යැ. සංස්කාරනිමිත්ත දතයුතු යැ. අනිමිත්ත දතයුතු යැ. කර්මායූහනය දතයුතු යැ. අනායූහනය දතයුතු යැ. ප්‍රතිසන්ධිය දතයුතු යැ. අප්‍රතිසන්ධිය දතයුතු යැ. ගතිය දතයුතු යැ. අගතිය දතයුතු යැ. නිර්වෘත්තිය දතයුතු යැ. අනිර්වෘත්තිය දතයුතු යැ. උපප්‍රාප්තිය දතයුතු යැ. අනුපප්‍රාප්තිය දතයුතු යැ. ජාතිය දතයුතු යැ. අජාතිය දතයුතු යැ. ජරාව දතයුතු යැ. අජරාව දතයුතු යැ. ව්‍යාධිය දතයුතු යැ. අව්‍යාධිය දතයුතු යැ. මරණය දතයුතු යැ. අමරණය දතයුතු යැ ශොකය දතයුතු යැ. අශො-කය දතයුතු යැ. පරිදෙවය දතයුතු ය. අපරිදෙවය දතයුතු යැ. උපායාසය දතයුතු යැ. අනුපායාසය දතයුතු යි.

උත්පාදය දුක්‍ඛ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය දුක්‍ඛ යි දතයුතු යැ. සඞ්ඛාර-නිමිත්ත දුක්‍ඛ යි දතයුතු යැ. කර්මායූහනය දුක්‍ඛ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය දුක්‍ඛ යි දතයුතු යැ. ගතිය දුක්‍ඛ යි දතයුතු යැ. නිර්වෘත්තිය දුක්‍ඛ යි දතයුතු යැ. උපප්‍රාප්තිය දුක්‍ඛ යි දතයුතු යැ. ජාතිය දුක්‍ඛ යි දතයුතු යැ. ජරාව දුක්‍ඛ යි දතයුතු යැ ව්‍යාධිය දුක්‍ඛ යි දතයුතු යැ. මරණය දුක්‍ඛ යි දතයුතු යැ. ශොකය දුක්‍ඛ යි දතයුතු යැ. පරිදෙවය දුක්‍ඛයි දතයුතු යැ. උපායාසය දුක්‍ඛ යි දතයුතු යි.

අනුත්පාදය සුඛ යැ යි දතයුතු යැ. අප්‍රවෘත්තිය සුඛ යැ යි දතයුතු යැ. අනිමිත්ත සුඛ යැ යි දතයුතු යැ. අනායූහනය සුඛ යැ යි දතයුතු යැ. අප්‍රතිසන්ධිය සුඛ යැ යි දතයුතු යැ. අගතිය සුඛ යැ යි දතයුතු යැ. අනිර්වෘ-ත්තිය සුඛ යැ යි දතයුතු යැ. අනුපප්‍රාප්තිය සුඛ යැ යි දතයුතු යැ. අජාතිය සුඛ යැ යි දතයුතු යැ. අජරාව සුඛ යැ යි දතයුතු යැ. අව්‍යාධිය සුඛ යැ යි දතයුතු යැ. අමරණය සුඛ යැ යි දතයුතු යැ. අශොකය සුඛ යැ යි දතයුතු යැ. අපරිදෙවය සුඛ යැ යි දතයුතු යැ. අනුපායාසය සුඛ යැ යි දතයුතු යි.

උප්පාදො දුක්ඛං, අනුප්පාදො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං දුක්ඛං, අප්පවත්තං සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං දුක්ඛං, අනිමිත්තං සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා දුක්ඛං, අනායූහනා[1] සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි දුක්ඛං, අප්පටිසන්ධි සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, ගති දුක්ඛං, අගති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති දුක්ඛං, අනිබ්බත්ති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති දුක්ඛං, අනුපපත්ති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති දුක්ඛං, අජාති සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා දුක්ඛං, අජරා සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි දුක්ඛං, අව්‍යාධි සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං දුක්ඛං, අමරණං[2] සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, සොකො දුක්ඛං, අසොකො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො දුක්ඛං, අපරිදෙවො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො දුක්ඛං අනුපායාසො සුඛන්ති අභිඤ්ඤෙය්‍යං.

උප්පාදො භයන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං භයන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං භයන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා භයන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි භයන්ති අභිඤ්ඤෙය්‍යං, ගති භයන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති භයන්ති අභිඤ්ඤෙය්‍යං. උපපත්ති භයන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති භයන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා භයන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි භයන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං භයන්ති අභිඤ්ඤෙය්‍යං, සොකො භයන්ති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො භයන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො භයන්ති අභිඤ්ඤෙය්‍යං.

අනුප්පාදො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පවත්තං ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අනිමිත්තං ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අනායූහනා ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පටිසන්ධි ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අගති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අනිබ්බත්ති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපපත්ති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අජාති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අජරා ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අව්‍යාධි ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අමරණං[2] ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අසොකො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අපරිදෙවො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපායාසො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං.

උප්පාදො භයං, අනුප්පාදො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං භයං, අප්පවත්තං ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං භයං. අනිමිත්තං ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා භයං, අනායූහනා[1], ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි භයං, අප්පටිසන්ධි ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, ගති භයං, අගති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති භයං, අනිබ්බත්ති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති භයං, අනුපපත්ති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති භයං, අජාති ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා භයං, අජරා ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි භයං, අව්‍යාධි ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං භයං, අමරණං,[2] ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, සොකො භයං, අසොකො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො භයං, අපරිදෙවො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො භයං, අනුපායාසො ඛෙමන්ති අභිඤ්ඤෙය්‍යං.

---

1. ආයුහනා - අනායුහනා - සී.
2. අමතං - මජයං සී, PTS.

උත්පාදය දුක යැ අනුත්පාදය සුඛ යැ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය දුක යැ අප්‍රවෘත්තිය සුඛ යැ යි දතයුතු යැ. සංස්කාරනිමිත්ත දුක යැ අනිමිත්ත සුඛ යැ යි දතයුතු යැ. කර්මායූහනය දුක යැ අනායූහනය සුඛ යැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය දුක යැ අප්‍රතිසන්ධිය සුඛ යැ යි දතයුතු යැ. ගතිය දුක යැ අගතිය සුඛ යැ යි දතයුතු යැ. නිර්වෘත්තිය දුක යැ අනිර්වෘත්තිය සුඛ යැ යි දතයුතු යැ. උපප්‍රාප්තිය දුක යැ අනුපප්‍රාප්තිය සුඛ යැ යි දතයුතු යැ. ජාතිය දුක යැ අජාතිය සුඛ යැ යි දතයුතු යැ. ජරාව දුක යැ අජරාව සුඛ යැ යි දතයුතු යැ. ව්‍යාධිය දුක යැ අව්‍යාධිය සුඛ යැ යි දතයුතු යැ. මරණය දුක යැ අමරණය සුඛ යැ යි දතයුතු යැ. ශෝකය දුක යැ අශෝකය සුඛ යැ යි දතයුතු යැ. පරිදේවය දුක යැ අපරිදේවය සුඛ යැ යි දතයුතු යැ. උපායාසය දුක යැ අනුපායාසය සුඛ යැ යි දතයුතු යි.

උත්පාදය බියෙකැ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය බියෙකැ යි දතයුතු යැ. සංස්කාරනිමිත්ත බියෙකැයි දතයුතු යැ. කර්මායූහනය බියෙකැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය බියෙකැ යි දතයුතු යැ. ගතිය බියෙකැ යි දතයුතු යැ. නිර්වෘත්තිය බියෙකැ යි දතයුතු යැ. උපප්‍රාප්තිය බියෙකැ යි දතයුතු යැ. ජාතිය බියෙකැයි දතයුතු යැ. ජරාව බියෙකැ යි දතයුතු යැ. ව්‍යාධිය බියෙකැ යි දතයුතු යැ. මරණය බියෙකැ යි දතයුතු යැ. ශෝකය බියෙකැයි දතයුතු යැ. පරිදේවය බියෙකැ යි දතයුතු යැ. උපායාසය බියෙකැ යි දතයුතු යි.

අනුත්පාදය ක්ෂෙම යැ යි දතයුතු යැ. අප්‍රවෘත්තිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අනිමිත්ත ක්ෂෙම යැ යි දතයුතු යැ. අනායූහනය ක්ෂෙම යැ යි දතයුතු යැ. අප්‍රතිසන්ධිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අගතිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අනිර්වෘත්තිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අනුපප්‍රාප්තිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අජාතිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අජරාව ක්ෂෙම යැ යි දතයුතු යැ. අව්‍යාධිය ක්ෂෙම යැ යි දතයුතු යැ. අමරණය ක්ෂෙම යැ යි දතයුතු යැ. අශෝකය ක්ෂෙම යැ යි දතයුතු යැ. අපරිදේවය ක්ෂෙම යැ යි දතයුතු යැ. අනුපායාසය ක්ෂෙම යැ යි දතයුතු යි.

උත්පාදය බියෙකැ අනුත්පාදය ක්ෂෙම යැ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය බියෙකැ අප්‍රවෘත්තිය ක්ෂෙම යැ යි දතයුතු යැ. සංස්කාරනිමිත්ත බියෙකැ අනිමිත්ත ක්ෂෙම යැ යි දතයුතු යැ. ආයූහනය බියෙකැ අනායූහනය ක්ෂෙම යැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය බියෙකැ අප්‍රතිසන්ධිය ක්ෂෙම යැ යි දතයුතු යැ. ගතිය බියෙකැ අගතිය ක්ෂෙම යැ යි දතයුතු යැ. නිර්වෘත්තිය බියෙකැ අනිර්වෘත්තිය ක්ෂෙම යැ යි දතයුතු යැ. උපප්‍රාප්තිය බියෙකැ අනුපප්‍රාප්තිය ක්ෂෙම යැ යි දතයුතු යැ. ජාතිය බියෙකැ අජාතිය ක්ෂෙම යැ යි දතයුතු යැ. ජරාව බියෙකැ අජරාව ක්ෂෙම යැ යි දතයුතු යැ. ව්‍යාධිය බියෙකැ අව්‍යාධිය ක්ෂෙම යැ යි දතයුතු යැ. මරණය බියෙකැ අමරණය ක්ෂෙම යැ යි දතයුතු යැ. ශෝකය බියෙකැ අශෝකය ක්ෂෙම යැ යි දතයුතු යැ. පරිදේවය බියෙකැ අපරිදේවය ක්ෂෙම යැ යි දතයුතු යැ. උපායාසය බියෙකැ අනුපායාසය ක්ෂෙම යැ යි දතයුතු යි.

උප්පාදො සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා[1], සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ගති සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, සොකො සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො සාමිසන්ති අභිඤ්ඤෙය්‍යං.

අනුප්පාදො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පවත්තං නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අනිමිත්තං නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අනායූහනා නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පටිසන්ධි නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අගති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අනිබ්බත්ති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපපත්ති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අජාති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අජරා නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අව්‍යාධි නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අමරණං[2] නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අසොකො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අපරිදෙවො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපායාසො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං.

උප්පාදො සාමිසං, අනුප්පාදො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං සාමිසං, අප්පවත්තං නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං සාමිසං, අනිමිත්තං නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා සාමිසං, අනායූහනා නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි සාමිසං, අප්පටිසන්ධි නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ගති සාමිසං, අගති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති සාමිසං, අනිබ්බත්ති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති සාමිසං, අනුපපත්ති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති සාමිසං, අජාති නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා සාමිසං, අජරා නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි සාමිසං, අව්‍යාධි නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං සාමිසං, අමරණං[2] නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, සොකො සාමිසං අසොකො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො සාමිසං, අපරිදෙවො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො සාමිසං, අනුපායාසො නිරාමිසන්ති අභිඤ්ඤෙය්‍යං.

උප්පාදො සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, පවත්තං සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, ගති සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, ජාති සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, ජරා සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, මරණං සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, සොකො සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, පරිදෙවො සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං, උපායාසො සඞ්ඛාරාති අභිඤ්ඤෙය්‍යං.

අනුප්පාදො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පවත්තං නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අනිමිත්තං නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අනායූහනා නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අප්පටිසන්ධි නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අගති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අනිබ්බත්ති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපපත්ති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අජාති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අජරා නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අව්‍යාධි නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අමරණං නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අසොකො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අපරිදෙවො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, අනුපායාසො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං.

---

1 ආයුහනා - ස්‍යා 2 අමතං - මජසං, ස්‍යා, PTS.

උත්පාදය වට්ටාමිස ලෝකාමිස සහිත බැවින් සාමිස යැයි දතයුතු යැ. ප්‍රවෘත්තිය සාමිස යැයි දතයුතු යැ. සංස්කාරනිමිත්ත සාමිස යැයි දතයුතු යැ. ආයූහනය සාමිස යැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය සාමිස යැ යි දතයුතු යැ. ගතිය සාමිස යැ යි දතයුතු යැ නිර්වෘත්තිය සාමිස යැ යි දතයුතු යැ. උපපත්තිය සාමිස යැයි දතයුතු යැ ජාතිය සාමිස යැයි දතයුතු යැ. ජරාව සාමිස යැයි දතයුතු යැ. ව්‍යාධිය සාමිස යැයි දතයුතු යැ. මරණය සාමිස යැයි දතයුතු යැ. ශෝකය සාමිස යැයි දතයුතු යැ. පරිදේවය සාමිස යැයි දතයුතු යැ. උපායාසය සාමිස යැ යි දතයුතු යි.

අනුත්පාදය නිරාමිස යැ යි දතයුතු යැ. අප්‍රවෘත්තිය නිරාමිස යැ යි දතයුතු යැ. අනිමිත්ත නිරාමිස යැ යි දතයුතු යැ. අනායූහනය නිරාමිස යැ යි දතයුතු යැ. අප්‍රතිසන්ධිය නිරාමිස යැ යි දතයුතු යැ. අගතිය නිරාමිස යැ යි දතයුතු යැ. නො නිපැත්ම නිරාමිස යැ යි දතයුතු යැ. අනුපපත්තිය නිරාමිස යැ යි දතයුතු යැ. අජාතිය නිරාමිස යැ යි දතයුතු යැ. අජරාව නිරාමිස යැ යි දතයුතු යැ. අව්‍යාධිය නිරාමිස යැ යි දතයුතු යැ අමරණය නිරාමිස යැ යි දතයුතු යැ. අශෝකය නිරාමිස යැ යි දතයුතු යැ. අපරි-දේවය නිරාමිස යැ යි දතයුතු යැ. අනුපායාසය නිරාමිස යැ යි දතයුතු යි.

උත්පාදය සාමිස යැ අනුත්පාදය නිරාමිස යැ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය සාමිස යැ අප්‍රවෘත්තිය නිරාමිස යැ යි දතයුතු යැ. සංස්කාරනිමිත්ත සාමිස යැ අනිමිත්ත නිරාමිස යැ යි දතයුතු යැ. ආයූහනය සාමිස යැ අනායූහ-නය නිරාමිස යැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය සාමිස යැ, අප්‍රතිසන්ධිය නිරාමිස යැ යි දතයුතු යැ. ගතිය සාමිස යැ අගතිය නිරාමිස යැ යි දතයුතු යැ. නිර්වෘත්තිය සාමිස යැ අනිර්වෘත්තිය නිරාමිස යැ යි දතයුතු යැ. ජාතිය සාමිස යැ අජාතිය නිරාමිස යැ යි දතයුතු යැ. ජරාව සාමිස යැ අජරාව නිරාමිස යැ යි දතයුතු යැ. ව්‍යාධිය සාමිස යැ අව්‍යාධිය නිරාමිස යැ යි දතයුතු යැ. මරණය සාමිස යැ. අමරණය නිරාමිස යැ යි දතයුතු යැ. ශෝකය සාමිස යැ අශෝකය නිරාමිස යැ යි දතයුතු යැ. පරිදේවය සාමිස යැ අපරිදේවය නිරාමිස යැ යි දතයුතු යැ. උපායාසය සාමිස යැ. අනුපා-යාසය නිරාමිස යැ යි දතයුතු යි.

උත්පාදය සංස්කාරග යි දතයුතු යැ. ප්‍රවෘත්තිය සංස්කාරග යි දතයුතු යැ. නිමිත්ත සංස්කාරග යි දතයුතු යැ. ආයූහනය සංස්කාරග යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය සංස්කාරග යි දතයුතු යැ. ගතිය සංස්කාරග යි දතයුතු යැ. නිර්වෘත්තිය සංස්කාරග යි දතයුතු යැ. උපපත්තිය සංස්කාරග යි දතයුතු යැ. ජාතිය සංස්කාරග යි දතයුතු යැ. ජරාව සංස්කාරග යි දතයුතු යැ. ව්‍යාධිය සංස්කාරග යි දතයුතු යැ. මරණය සංස්කාරග යි දතයුතු යැ. ශෝකය සංස්කාරග යි දතයුතු යැ. පරිදේවය සංස්කාරග යි දතයුතු යැ. උපායාසය සංස්කාරග යි දතයුතු යි.

අනුත්පාදය නිර්වාණ යැ යි දතයුතු යැ. අප්‍රවෘත්තිය නිර්වාණ යැ යි දතයුතු යැ. අනිමිත්ත නිර්වාණ යැ යි දතයුතු යැ. අනායූහනය නිර්වාණ යැ යි දතයුතු යැ. අප්‍රතිසන්ධිය නිර්වාණ යැ යි දතයුතු යැ. අගතිය නිර්වාණ යැ යි දතයුතු යැ. අනිර්වෘත්තිය නිර්වාණ යැ යි දතයුතු යැ. අනුපපත්තිය නිර්වාණ යැ යි දතයුතු යැ. අජාතිය නිර්වාණ යැ යි දතයුතු යැ අජරාව නිර්වාණ යැ යි දතයුතු යැ. අව්‍යාධිය නිර්වාණ යැ යි දතයුතු යැ. අමරණය නිර්වාණ යැ යි දතයුතු යැ. අශෝකය නිර්වාණ යැ යි දතයුතු යැ. අපරිදේවය නිර්වාණ යැ යි දතයුතු යැ. අනුපායාසය නිර්වාණ යැ යි දතයුතු යි.

උප්පාදො සඞ්ඛාරා, අනුප්පාදො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, පවත්තං සඞ්ඛාරා, අප්පවත්තං නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, නිමිත්තං සඞ්ඛාරා, අනිමිත්තං නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, ආයූහනා සඞ්ඛාරා, අනායූහනා නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, පටිසන්ධි සඞ්ඛාරා, අප්පටිසන්ධි නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, ගති සඞ්ඛාරා, අගති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, නිබ්බත්ති සඞ්ඛාරා, අනිබ්බත්ති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, උපපත්ති සඞ්ඛාරා, අනුපපත්ති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, ජාති සඞ්ඛාරා, අජාති නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, ජරා සඞ්ඛාරා, අජරා නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, ව්‍යාධි සඞ්ඛාරා, අව්‍යාධි නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, මරණං සඞ්ඛාරා, අමරණං නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, සොකො සඞ්ඛාරා, අසොකො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං. පරිදෙවො සඞ්ඛාරා, අපරිදෙවො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං, උපායාසො සඞ්ඛාරා, අනුපායාසො නිබ්බානන්ති අභිඤ්ඤෙය්‍යං.

## පඨමභාණවාරං.

පරිග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, පරිවාරට්ඨො අභිඤ්ඤෙය්‍යො, පරිපූරට්ඨො[1] අභිඤ්ඤෙය්‍යො, එකග්ගට්ඨො අභිඤ්ඤෙය්‍යො, අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, අවිසාරට්ඨො අභිඤ්ඤෙය්‍යො, අනාවිලට්ඨො අභිඤ්ඤෙය්‍යො, අනිඤ්ජනට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකත්තුපට්ඨානවසෙන[2] චිත්තස්ස ඨිතට්ඨො අභිඤ්ඤෙය්‍යො, ආරම්මණට්ඨො අභිඤ්ඤෙය්‍යො, ගොචරට්ඨො අභිඤ්ඤෙය්‍යො, පහානට්ඨො අභිඤ්ඤෙය්‍යො පරිච්චාගට්ඨො අභිඤ්ඤෙය්‍යො, වුට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිවත්තනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සන්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, පණීතට්ඨො අභිඤ්ඤෙය්‍යො, විමුත්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, අනාසවට්ඨො අභිඤ්ඤෙය්‍යො, තරණට්ඨො අභිඤ්ඤෙය්‍යො, අනිමිත්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, අප්පණිහිතට්ඨො අභිඤ්ඤෙය්‍යො, සුඤ්ඤතට්ඨො අභිඤ්ඤෙය්‍යො, එකරසට්ඨො අභිඤ්ඤෙය්‍යො, අනතිවත්තනට්ඨො අභිඤ්ඤෙය්‍යො, යුගනද්ධට්ඨො,[3] අභිඤ්ඤෙය්‍යො, නිය්‍යානට්ඨො අභිඤ්ඤෙය්‍යො, හෙතුට්ඨො අභිඤ්ඤෙය්‍යො, දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, ආධිපතෙය්‍යට්ඨො අභිඤ්ඤෙය්‍යො.

සමථස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, විපස්සනාය අනුපස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමථවිපස්සනානං එකරසට්ඨො අභිඤ්ඤෙය්‍යො, යුගනද්ධස්ස[4] අනතිවත්තනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

සික්ඛාය සමාදානට්ඨො අභිඤ්ඤෙය්‍යො, ආරම්මණස්ස ගොචරට්ඨො අභිඤ්ඤෙය්‍යො, ලීනස්ස චිත්තස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, උද්ධතස්ස චිත්තස්ස නිග්ගහට්ඨො[5] අභිඤ්ඤෙය්‍යො, උභොවිසුද්ධානං අජ්ඣුපෙක්ඛනට්ඨො අභිඤ්ඤෙය්‍යො, භාවනා විසෙසාධිගමට්ඨො[6] අභිඤ්ඤෙය්‍යො, උත්තරි පටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, සච්චාභිසමයට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිරොධෙ පතිට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො.

1. පරිපූරිට්ඨො - ස, 2. එකත්තපට්ඨානවසෙන - PTS
3. යුගනද්ධට්ඨො - මජසං, 4. යුගනද්ධස්ස - මජසං 5 විනිග්ගහට්ඨො - PTS
6. විසෙසාධිගමට්ඨො - මජසං, සහ,

උත්පාදය සංස්කාරයහ අනුත්පාදය නිවනැ යි දතයුතු යැ. ප්‍රවෘත්තිය සංස්කාරයහ අප්‍රවෘත්තිය නිවනැ යි දතයුතු යැ. නිමිත්ත සංස්කාරයහ අනිමිත්ත නිවනැ යි දතයුතු යැ ආයූහනය සංස්කාරයහ අනායූහනය නිවනැ යි දතයුතු යැ. ප්‍රතිසන්ධිය සංස්කාරයහ අප්‍රතිසන්ධිය නිවනැ යි දතයුතු යැ. ගතිය සංස්කාරයහ අගතිය නිවනැයි දතයුතු යැ. නිර්වෘත්තිය සංස්කාරයහ. අනිර්වෘත්තිය නිවනැ යි දතයුතු ය. උපප්‍රාප්තිය සංස්කාරයහ අනුපප්‍රාප්තිය නිවනැ යි දතයුතු යැ. ජාතිය සංස්කාරයහ අජාතිය නිවනැ යි දතයුතු යැ. ජරාව සංස්කාරයහ අජරාව නිවනැ යි දතයුතු යැ. ව්‍යාධිය සංස්කාරයහ අව්‍යාධිය නිවනැ යි දතයුතු යැ. මරණය සංස්කාරයහ අමරණය නිවනැ යි දතයුතු යැ. ශෝකය සංස්කාරයහ අශෝකය නිවනැ යි දතයුතු යැ. පරිදේවය සංස්කාරයහ අපරිදේවය නිවනැ යි දතයුතු යැ. උපායාසය සංස්කාරයහ අනුපායාසය නිවනැ යි දතයුතු යි.

## පළමු වන බණවර යි.

පරිග්‍රහාර්ථය (ආර්යමාර්ගසම්ප්‍රයුක්තධර්මයන් පරිග්‍රහණය කරන බව) දතයුතු යැ. (අන්‍යෝන්‍ය) පරිවාරාර්ථය දතයුතු යැ. (භාවනායෙන්) වැඩීම් වශයෙන් පරිපූරාර්ථය ගතයුතු යැ. (සමාධි අරමුණෙහි) ඒකාග්‍රාර්ථය දතයුතු යැ. අවික්ෂේපාර්ථය දතයුතු යැ. (වීර්යවශයෙන්) ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. (අරමුණෙහි නො විසිරෙන) අවිසාරාර්ථය දතයුතු යැ. (නො කැළඹුණු හෙයින්) අනාවිලාර්ථය දතයුතු යැ. (අවිකම්පිත හෙයින්) අනිඤ්ජනාර්ථය දතයුතු යැ. ඒකත්වයෙහි පිහිටා සිටීම් වශයෙන් චිත්තයාගේ ස්ථිතාර්ථය දතයුතු යැ. ආලම්බනාර්ථය දතයුතු යැ. ගෝචරාර්ථය දතයුතු යැ. ප්‍රහාණාර්ථය දතයුතු යැ. පරිත්‍යාගාර්ථය දතයුතු යැ. (උභතෝව්‍යුත්ථාන වශයෙන්) ව්‍යුත්ථානාර්ථය දතයුතු යැ. නිවර්තනාර්ථය දතයුතු යැ. ශාන්තාර්ථය දතයුතු යැ. ප්‍රණීතාර්ථය දතයුතු යැ. විමුක්තාර්ථය දතයුතු යැ. අනාස්‍රවාර්ථය දතයුතු යැ. තරණාර්ථය දතයුතු යැ. අනිමිත්තාර්ථය දතයුතු යැ. අප්‍රණිහිතාර්ථය දතයුතු යැ. ශූන්‍යතාර්ථය දතයුතු යැ. ඒකරසාර්ථය දතයුතු යැ. අනතිවර්තනාර්ථය දතයුතු යැ. යුගනද්ධාර්ථය දතයුතු යැ. නෛර්‍යාණාර්ථය දතයුතු යැ. හේත්වර්ථය දතයුතු යැ. දර්ශනාර්ථය දතයුතු යැ. අධිපතිභාවාර්ථය දතයුතු යි.

ශමථයාගේ අවික්ෂේපාර්ථය (අවික්ෂේප ස්වභාවය) දතයුතු යැ. විදර්ශනාවගේ අනුපස්සනාර්ථය දතයුතු යැ. ශමථවිදර්ශනාවන්ගේ ඒකරසාර්ථය දතයුතු යැ. යුගනද්ධයාගේ අනතිවර්තනාර්ථය දතයුතු යි.

ශික්ෂාවගේ සමාදානාර්ථය දතයුතු යැ. ආලම්බනයාගේ ගෝචරාර්ථය දතයුතු යැ. ලීනචිත්තයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. උද්ධත චිත්තයාගේ නිග්‍රහාර්ථය දතයුතු යැ. ලීනෝද්ධත දෙකින් විශුද්ධ (චිත්ත) යන්ගේ අධ්‍යුපේක්ෂණාර්ථය දතයුතු යැ. විශේෂාධිගමාර්ථය දතයුතු යැ. (ආර්යමාර්ගයාගේ) පහළවීම් වශයෙන් උත්තරිප්‍රතිවේධාර්ථය දතයුතු යැ. (චතුස්සත්‍යප්‍රතිවේධ වශයෙන්) සත්‍යාභිසමයාර්ථය දතයුතු යැ. (ඵලසමාපත්ති වශයෙන්) නිරෝධයෙහි ප්‍රතිෂ්ඨාපකාර්ථය දතයුතු යි.

සද්ධින්ද්‍රියස්ස අධිමොක්ඛට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියින්ද්‍රියස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, සතින්ද්‍රියස්ස උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමාධින්ද්‍රියස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, පඤ්ඤින්ද්‍රියස්ස දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

සද්ධාබලස්ස අස්සද්ධියෙ අකම්පියට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියබලස්ස කොසජ්ජෙ අකම්පියට්ඨො අභිඤ්ඤෙය්‍යො, සතිබලස්ස පමාදෙ අකම්පියට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමාධිබලස්ස උද්ධච්චෙ අකම්පියට්ඨො අභිඤ්ඤෙය්‍යො, පඤ්ඤාබලස්ස අවිජ්ජාය අකම්පියට්ඨො අභිඤ්ඤෙය්‍යො.

සතිසම්බොජ්ඣඞ්ගස්ස උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස පවිචයට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියසම්බොජ්ඣඞ්ගස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, පීතිසම්බොජ්ඣඞ්ගස්ස උපසමට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමාධිසම්බොජ්ඣඞ්ගස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස පටිසඞ්ඛානට්ඨො අභිඤ්ඤෙය්‍යො.

සම්මාදිට්ඨියා දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාසඞ්කප්පස්ස අභිනිරොපනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාවාචාය පරිග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාකම්මන්තස්ස සමුට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාආජීවස්ස වොදානට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාවායාමස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාසතියා උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මාසමාධිස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො.

ඉන්ද්‍රියානං ආධිපතෙය්‍යට්ඨො[1] අභිඤ්ඤෙය්‍යො, බලානං අකම්පියට්ඨො අභිඤ්ඤෙය්‍යො, බොජ්ඣඞ්ගානං නිය්‍යානට්ඨො අභිඤ්ඤෙය්‍යො, මග්ගස්ස හෙතුට්ඨො අභිඤ්ඤෙය්‍යො, සතිපට්ඨානානං උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, සම්මප්පධානානං පදහනට්ඨො[2] අභිඤ්ඤෙය්‍යො, ඉද්ධිපාදානං ඉජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සච්චානං තථට්ඨො අභිඤ්ඤෙය්‍යො, පයොගානං[3] පටිප්පස්සද්ධට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඵලානං සච්ඡිකිරියට්ඨො අභිඤ්ඤෙය්‍යො.

විතක්කස්ස අභිනිරොපනට්ඨො අභිඤ්ඤෙය්‍යො, විචාරස්ස උපවිචාරට්ඨො අභිඤ්ඤෙය්‍යො, පීතියා ඵරණට්ඨො අභිඤ්ඤෙය්‍යො, සුඛස්ස අභිසන්දනට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස එකග්ගට්ඨො අභිඤ්ඤෙය්‍යො.

ආවජ්ජනට්ඨො අභිඤ්ඤෙය්‍යො, විජානනට්ඨො[4] අභිඤ්ඤෙය්‍යො, පජානනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සඤ්ජානනට්ඨො අභිඤ්ඤෙය්‍යො, [එකාරම්මණට්ඨො අභිඤ්ඤෙය්‍යො,] එකොදට්ඨො[5] අභිඤ්ඤෙය්‍යො, අභිඤ්ඤාය ඤාතට්ඨො අභිඤ්ඤෙය්‍යො, පරිඤ්ඤාය තීරණට්ඨො අභිඤ්ඤෙය්‍යො, පහානස්ස පරිච්චාගට්ඨො අභිඤ්ඤෙය්‍යො, භාවනාය එකරසට්ඨො අභිඤ්ඤෙය්‍යො, සච්ඡිකිරියාය ඵස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඛන්ධානං ඛන්ධට්ඨො අභිඤ්ඤෙය්‍යො, ධාතූනං ධාතුට්ඨො[6] අභිඤ්ඤෙය්‍යො, ආයතනානං ආයතනට්ඨො අභිඤ්ඤෙය්‍යො, සඞ්ඛතානං සඞ්ඛතට්ඨො අභිඤ්ඤෙය්‍යො, අසඞ්ඛතස්ස අසඞ්ඛතට්ඨො අභිඤ්ඤෙය්‍යො.

---

1 අධිපතෙය්‍යට්ඨො - PTS, 2 පධානට්ඨො - පු.
3. මග්ගානං - මජ්ඣං, යොගානං - සා, 4. විජාතනට්ඨො - ස්‍යා.
5 එකරසට්ඨො - මජ්ඣං, එකාරම්මණට්ඨො - සං. 6. ධාතට්ඨො - ස්‍යා.

ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමොක්ෂාර්ථය දතයුතු යැ. වීර්යෙන්ද්‍රියයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. ස්මෘතීන්ද්‍රියයාගේ (අරමුණට එළැඹ සිටීම් වශයෙන්) උපස්ථානාර්ථය දතයුතු යැ. සමාධීන්ද්‍රියයාගේ අවික්ෂෙපාර්ථය දතයුතු යැ. ප්‍රඥෙන්ද්‍රියයාගේ දර්ශනාර්ථය දතයුතු යි.

ශ්‍රද්ධාබලයාගේ අශ්‍රද්ධායෙන් අකම්ප්‍යාර්ථය දතයුතු යැ. වීර්යබලයාගේ කුසීදභාවයෙන් අකම්ප්‍යාර්ථය දතයුතු යැ. ස්මෘතිබලයාගේ ප්‍රමාදයෙන් අකම්ප්‍යාර්ථය දතයුතු යැ. සමාධිබලයාගේ උද්ධතභාවයෙන් අකම්ප්‍යාර්ථය දතයුතු යැ. ප්‍රඥාබලයාගේ අවිද්‍යායෙන් අකම්ප්‍යාර්ථය දතයුතු යි.

ස්මෘතිසම්බොධ්‍යඞ්ගයාගේ උපස්ථානාර්ථය දතයුතු යැ. ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයාගේ (විමසීම් විසින්) ප්‍රවිචයාර්ථය දතයුතු යැ. වීර්යසම්බොධ්‍යඞ්ගයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ ස්ඵුරණාර්ථය දතයුතු යැ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයාගේ ව්‍යුපශමාර්ථය දතයුතු යැ. සමාධිසම්බොධ්‍යඞ්ගයාගේ අවික්ෂෙපාර්ථය දතයුතු යැ. උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ ප්‍රතිසංඛානාර්ථය දතයුතු යි.

සම්‍යග්දෘෂ්ටිහුගේ දර්ශනාර්ථය දතයුතු යැ. සම්‍යක්සංකල්පයාගේ (සිත අරමුණට නැඟීම් විසින්) අභිනිරොපණාර්ථය දතයුතු යැ. සම්‍යග්වචනයාගේ (වාක්සංවර විසින්) පරිග්‍රහාර්ථය දතයුතු යැ. සම්‍යක්කර්මාන්තයාගේ (කායසංවර විසින්) සමුත්ථානාර්ථය දතයුතු යැ. සම්‍යගාජීවයාගේ පරිශුද්ධාර්ථය දතයුතු යැ. සම්‍යග්ව්‍යායාමයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. සම්‍යක්ස්මෘතියගේ උපස්ථානාර්ථය දතයුතු යැ. සම්‍යක්සමාධිහුගේ අවික්ෂෙපාර්ථය දතයුතු යි.

ඉන්ද්‍රියයන්ගේ අධිපත්‍යාර්ථය දතයුතු යැ. බලයන්ගේ අකම්ප්‍යාර්ථය දතයුතු යැ. බොධ්‍යඞ්ගයන්ගේ නිර්යාණාර්ථය දතයුතු යැ. මාර්ගයාගේ හෙත්වර්ථය දතයුතු යැ. සතිපට්ඨානයන්ගේ (අරමුණෙහි එළැඹ සිටීම් වශයෙන්) උපස්ථානාර්ථය දතයුතු යැ. සම්‍යක්ප්‍රධානයන්ගේ ප්‍රදහනාර්ථය දතයුතු යැ. ඍද්ධිපාදයන්ගේ සමෘද්ධ්‍යර්ථය දතයුතු යැ. සත්‍යයන්ගේ තථාර්ථය දතයුතු යැ. සතර ආර්යමාර්ගප්‍රයොගයන්ගේ ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යර්ථය දතයුතු යැ. ඵලයන්ගේ සාක්ෂාත්ක්‍රියාර්ථය දතයුතු යි.

විතර්කයාගේ අභිනිරොපණාර්ථය දතයුතු යැ. විචාරයාගේ අනුමජ්ජනාර්ථය දතයුතු යැ. ප්‍රීතියගේ විස්ඵරණාර්ථය (පැතිරීම) දතයුතු යැ. සුඛයාගේ අභිසන්දන (තෙමීම්) අර්ථය දතයුතු යැ. චිත්තයාගේ (සමාධි වශයෙන්) ඒකාග්‍රතාර්ථය දතයුතු යි.

ආවර්ජනාර්ථය දතයුතු යැ. (විඥානයාගේ) විජානනාර්ථය දතයුතු යැ. (ප්‍රඥාවගේ) ප්‍රජානනාර්ථය දතයුතු යැ. (සංඥාවගේ) සඤ්ජානනාර්ථය දතයුතු යැ. (සමාධිහුගේ) ඒකාලම්බනාර්ථය දතයුතු යැ. අසහාය වූ උදයාර්ථය දතයුතු යැ. අභිඥා (ඥාතපරිඥා) වගේ ඥාතාර්ථය දතයුතු යැ. තීරණපරිඥාවගේ (අනිත්‍යාදි වශයෙන්) තීරණාර්ථය දතයුතු යැ. ප්‍රහාණපරිඥාවගේ (ප්‍රතිපක්ෂධර්ම) පරිත්‍යාගාර්ථය දතයුතු යැ. භාවනාවගේ ඒකරසාර්ථය දතයුතු යැ. සාක්ෂාත්ක්‍රියාවගේ ස්පර්ශන (විඳන) අර්ථය දතයුතු යැ. ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථය දතයුතු යැ. ධාතූන්ගේ (ශූන්‍යාදි) ධාත්වර්ථය දතයුතු යැ. ආයතනයන්ගේ ආයතනාර්ථය දතයුතු යැ. සංස්කෘත ධර්මයන්ගේ (ප්‍රත්‍යයසමවායෙන් කරන ලද විසින්) සංස්කෘතාර්ථය දතයුතු යැ. අසංස්කෘතධාතුහුගේ අසංස්කෘතාර්ථය දතයුතු යි.

චිත්තට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, චිත්තානන්තරියට්ඨෙන[1] අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස වුට්ඨානට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස විවට්ටනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස හෙතුට්ඨෙන[2] අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස පච්චයට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස වත්ථුට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස භුම්මට්ඨෙන.[3] අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස ආරම්මණට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස ගොචරට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස චරියට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස ගතට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස අභිනීහාරට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස නිය්‍යානට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, චිත්තස්ස නිස්සරණට්ඨෙන අභිඤ්ඤෙය්‍යා.

එකත්තෙ ආවජ්ජනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ විජානනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ පජානනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ සඤ්ජානනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ එකොදට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ උපනිබන්ධනට්ඨෙන[4] අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ පක්ඛන්දනට්ඨෙන[5] අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ පසීදනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ සන්තිට්ඨනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ විමුච්චනට්ඨෙන[6] අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ 'එතං සන්ත'න්ති පස්සනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ යානීකතට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ වත්ථුකතට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ අනුට්ඨිතට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ පරිචිතට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ සුසමාරද්ධට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ පරිග්ගහට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ පරිවාරට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ පරිපූරට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ සමොධානට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ අධිට්ඨානට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ ආසෙවනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ භාවනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ බහුලීකම්මට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ සුසමුග්ගතට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ සුවිමුත්තට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ බුජ්ඣනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ අනුබුජ්ඣනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ පටිබුජ්ඣනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ සම්බුජ්ඣනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ බොධනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ අනුබොධනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ පටිබොධනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ සම්බොධනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ බොධපක්ඛියට්ඨෙන:[7] අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ අනුබොධපක්ඛියට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ පටිබොධපක්ඛියට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ සම්බොධපක්ඛියට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ ජොතනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ උජ්ජොතනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ අනුජොතනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ පටිජානනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, එකත්තෙ සඤ්ජාතනට්ඨෙන අභිඤ්ඤෙය්‍යා.

---

1. චිත්තානන්තරිතට්ඨෙන - PTS.: 2. හෙතට්ඨෙන - ස්‍යා.
3. භුම්මට්ඨෙන - මජසං. 4. උපනිබන්ධට්ඨෙන - ස්‍යා 5. පක්ඛන්ධනට්ඨෙන - ස
6. මුච්චනට්ඨෙන - ස, 7 බොධිපක්ඛියට්ඨෙන - මජසං, ස්‍යා PTS

(චිත්තයාගේ ආරම්මණ චින්තනාදි) චිත්තාර්ථය දතයුතු යැ. චිත්තයාගේ අනන්තරභාවාර්ථය දතයුතු යැ. (ගොත්‍රභූ-මාර්ග) චිත්තයාගේ (නිමිත්ත-නිමිත්තප්‍රවෘත්තියෙන්) ව්‍යුත්ථානාර්ථය දතයුතු යැ. චිත්තයාගේ (නිර්වාණ-යෙහි) විවර්තනාර්ථය දතයුතු යැ. චිත්තයාගේ හෙත්වර්ථය දතයුතු යැ. චිත්තයාගේ (වස්ත්වාලම්බනාදීන් පිළිබඳ) ප්‍රත්‍යයාර්ථය දතයුතු යැ. චිත්තයාගේ (චක්ෂුරාදි වස්තූන්ට) වස්තුභාවාර්ථය දතයුතු යැ. චිත්තයාගේ (කාමාවචරාදි) භූම්‍යර්ථය දතයුතු යැ. චිත්තයාගේ (රූපාදි) ආලම්බනාර්ථය දතයුතු යැ. චිත්තයාගේ (ආලම්බන) ගොචරාර්ථය දතයුතු යැ. චිත්තයාගේ චර්‍ය්‍යාර්ථය දතයුතු යැ. චිත්තයාගේ (දූරසන්තික ආලම්බනග්‍රහණ වශයෙන්) ගතාර්ථය දතයුතු යැ. චිත්තයාගේ (අරමුණු ගැනීමට) අභිනීහරණාර්ථය දතයුතු යැ. මාර්ගචිත්තයාගේ (වට්ටයෙන්) නිර්‍ය්‍යාණාර්ථය දතයුතු යැ. චිත්තයාගේ නිස්සරණාර්ථය දතයුතු යි.

එකත්වයෙහි (එක් අරමුණෙහි) ආවර්ජනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි විජානනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි ප්‍රජානනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි සඤ්ජානනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි එකොදයාර්ථය දතයුතු යැ. එකත්වයෙහි උපනිබන්ධනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (ප්‍රථමධ්‍යාන වශයෙන්) ප්‍රස්කන්දනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (ද්විතීය-ධ්‍යාන වශයෙන්) ප්‍රසීදනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (තෘතීයධ්‍යාන වශයෙන්) සන්තිට්ඨනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (චතුර්ථධ්‍යාන වශයෙන්) විමුච්චනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (ප්‍රත්‍යවෙක්ෂා වශ-යෙන්) 'තෙල ශාන්ත යැ'යි දර්ශනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි යානීකෘතාර්ථය (යෙදූ යානයක් මෙන් කළ අර්ථය) දතයුතු යැ. එකත්වයෙහි මැනැවින් පටන්ගන්නා ලද වීර්‍ය්‍යය ඇති බව දතයුතු යැ. එකත්වයෙහි පරිග්‍රහාර්ථය දතයුතු යැ. එකත්වයෙහි පරිවාරාර්ථය දතයුතු යැ. එකත්ව-යෙහි පරිපූරාර්ථය දතයුතු යැ. එකත්වයෙහි සමවධානාර්ථය දතයුතු යැ. එකත්වයෙහි අධිෂ්ඨානාර්ථය දතයුතු යැ. එකත්වයෙහි ආසෙවනාර්ථය දත-යුතු යැ. එකත්වයෙහි භාවනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි බහුලවශයෙන් කරන බව දතයුතු යැ. එකත්වයෙහි මොනොවට නැඟීසිටි බව දතයුතු යැ. එකත්වයෙහි මොනොවට මිදුණ බව දතයුතු යැ. එකත්වයෙහි (ශ්‍රොතා-පත්තිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) අවබොධාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (සකෘදාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) අනුබොධාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (අනාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) ප්‍රතිබොධාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (අර්හත්මාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) සම්බොධාර්ථය දතයුතු යැ. එකත්වයෙහි ශ්‍රොතාපත්තිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) බොධනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (සකෘදාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) අනුබොධනාර්ථය දතයුතු යැ. එකත්ව-යෙහි අනාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) ප්‍රතිබොධනාර්ථය දතයුතු යැ එකත්වයෙහි අර්හත්මාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) සම්බොධනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (ශ්‍රොතාපත්තිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) බොධිපාක්ෂිකාර්ථය දත-යුතු යැ. එකත්වයෙහි (සකෘදාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ අනුබොධිපාක්ෂි-කාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (අනාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) ප්‍රති-බොධිපාක්ෂිකාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (අර්හත්මාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) සම්බොධිපාක්ෂිකාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (විදර්ශනාප්‍රඥාවශයෙන්) ජ්‍යොතනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (ශ්‍රොතාපත්තිමාර්ගඥානවශයෙන්) උද්‍යොතනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (සකෘදාගාමිමාර්ගඥාන වශයෙන්) අනුද්‍යොතනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (අනාගාමිමාර්ගඥානවශයෙන්) ප්‍රතිද්‍යොතනාර්ථය දතයුතු යැ. එකත්වයෙහි (අර්හත්මාර්ගඥානවශයෙන්) සංද්‍යොතනාර්ථය දතයුතුයි.

පකාසනට්ඨො[1] අභිඤ්ඤෙය්‍යො, විරොචනට්ඨො අභිඤ්ඤෙය්‍යො, කිලෙසානං සන්තාපනට්ඨො අභිඤ්ඤෙය්‍යො, අමලට්ඨො අභිඤ්ඤෙය්‍යො, විමලට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිම්මලට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමයට්ඨො අභිඤ්ඤෙය්‍යො, විවෙකට්ඨො අභිඤ්ඤෙය්‍යො, විවෙකචරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරාගට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරාගචරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිරොධට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිරොධචරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, වොස්සග්ගට්ඨො[2] අභිඤ්ඤෙය්‍යො, වොස්සග්ගචරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, විමුත්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, විමුත්තිචරියට්ඨො අභිඤ්ඤෙය්‍යො.

ඡන්දට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස මූලට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස පාදට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස පධානට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස ඉජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස අධිමොක්ඛට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඡන්දස්ස දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

විරියට්ඨො[3] අභිඤ්ඤෙය්‍යො, විරියස්ස[4] මූලට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස පාදට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස පධානට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස ඉජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස අධිමොක්ඛට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, විරියස්ස දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

චිත්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස මූලට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස පාදට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස පධානට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස ඉජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස අධිමොක්ඛට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, චිත්තස්ස දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

වීමංසට්ඨො අභිඤ්ඤෙය්‍යො වීමංසාය මූලට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය පාදට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය පධානට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය ඉජ්ඣනට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය අධිමොක්ඛට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය පග්ගහට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය උපට්ඨානට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය අවික්ඛෙපට්ඨො අභිඤ්ඤෙය්‍යො, වීමංසාය දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො.

*දුක්ඛස්ස පීළනට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස සඞ්ඛතට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස සන්තාපට්ඨො අභිඤ්ඤෙය්‍යො, දුක්ඛස්ස විපරිණාමට්ඨො අභිඤ්ඤෙය්‍යො.

සමුදයස්ස ආයූහනට්ඨො[5], අභිඤ්ඤෙය්‍යො, සමුදයස්ස නිදානට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමුදයස්ස සඤ්ඤොගට්ඨො අභිඤ්ඤෙය්‍යො, සමුදයස්ස පලිබොධට්ඨො[6] අභිඤ්ඤෙය්‍යො.

---

1. පතාපනට්ඨො - මජසං, සතා, PTS, 2 වොසග්ගට්ඨො - මජසං,
3. විරියට්ඨො - මජසං, 4. විරියස්ස - මජසං,
5. ආයුහනට්ඨො - සතා, 6. පලිබොධනට්ඨො - PTS,
* දුක්ඛට්ඨොති ආදීනි මූලපදානි මරම්ම ඡට්ඨසඞ්ගීතිපොත්ථකාදීසු අධිකානි.

(ආර්‍ය්‍යමාර්ගයාගේ) ප්‍රකාශනාර්ථය දතයුතු යැ. (ප්‍රභාස්වර බැවින්) විරෝචනාර්ථය දතයුතු යැ. ක්ලේශයන්ගේ සන්තාපනාර්ථය දතයුතු යැ. (නිර්මල නිර්වාණාලම්බන බැවින්) අමලාර්ථය දතයුතු යැ. (සම්ප්‍රයුක්තමලරහිත බැවින්) විමලාර්ථය දතයුතු යැ. (ආලම්බන කරන මල රහිත බැවින්) නිර්මලාර්ථය දතයුතු යැ. (කෙලෙස් විෂම නැති බැවින්) ශමාර්ථය දතයුතු යැ. විවේකාර්ථය දතයුතු යැ. විවේකචර්‍ය්‍යාර්ථය දතයුතු යැ. විරාගාර්ථය දතයුතු යැ. විරාගචර්‍ය්‍යාර්ථය දතයුතු යැ. නිරෝධාර්ථය දතයුතු යැ. නිරෝධචර්‍ය්‍යාර්ථය දතයුතු යැ. වොස්සග්ගාර්ථය දතයුතු යැ. වොස්සග්ගචර්‍ය්‍යාර්ථය දතයුතු යැ. විමුක්ත්‍යර්ථය දතයුතු යැ. විමුක්තිචර්‍ය්‍යාර්ථය දතයුතු.

(කර්තෘකාම්‍යතා) ඡන්දාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ මූලාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ (සහජාතයනට ප්‍රතිෂ්ඨා බැවින්) පාදාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ (අධිපති බැවින්) ප්‍රධානාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ සමෘද්ධ්‍යර්ථය දතයුතු යැ. ඡන්දයාගේ අධිමොක්ෂාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ උපස්ථානාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ අවික්ෂෙපාර්ථය දතයුතු යැ. ඡන්දයාගේ දර්ශනාර්ථය දතයුතු.

වීර්‍ය්‍යාර්ථය දතයුතු යැ. වීර්‍ය්‍යයාගේ මූලාර්ථය දතයුතු යැ. වීර්‍ය්‍යයාගේ ප්‍රතිෂ්ඨාර්ථය දතයුතු යැ. වීර්‍ය්‍යයාගේ ප්‍රධානාර්ථය දතයුතු යැ. වීර්‍ය්‍යයාගේ සමෘද්ධ්‍යර්ථය දතයුතු යැ. වීර්‍ය්‍යයාගේ අධිමොක්ෂාර්ථය දතයුතු යැ. වීර්‍ය්‍යයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. වීර්‍ය්‍යයාගේ උපස්ථානාර්ථය දතයුතු යැ. වීර්‍ය්‍යයාගේ අවික්ෂෙපාර්ථය දතයුතු යැ. වීර්‍ය්‍යයාගේ දර්ශනාර්ථය දතයුතු.

(චින්තනාදී) චිත්තාර්ථය දතයුතු යැ. චිත්තයාගේ මූලාර්ථය දතයුතු යැ. චිත්තයාගේ ප්‍රතිෂ්ඨාර්ථය දතයුතු යැ. චිත්තයාගේ ප්‍රධානාර්ථය දතයුතු යැ. චිත්තයාගේ අධිමොක්ෂාර්ථය දතයුතු යැ. චිත්තයාගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. චිත්තයාගේ උපස්ථානාර්ථය දතයුතු යැ. චිත්තයාගේ අවික්ෂෙපාර්ථය දතයුතු යැ. චිත්තයාගේ දර්ශනාර්ථය දතයුතු.

වීමංසාර්ථය දතයුතු යැ. වීමංසාවගේ මූලාර්ථය දතයුතු යැ. වීමංසාවගේ ප්‍රතිෂ්ඨාර්ථය දතයුතු යැ. වීමංසාවගේ ප්‍රධානාර්ථය දතයුතු යැ. වීමංසාවගේ සමෘද්ධ්‍යර්ථය දතයුතු යැ. වීමංසාවගේ අධිමොක්ෂාර්ථය දතයුතු යැ. වීමංසාවගේ ප්‍රග්‍රහාර්ථය දතයුතු යැ. වීමංසාවගේ උපස්ථානාර්ථය දතයුතු යැ. වීමංසාවගේ අවික්ෂෙපාර්ථය දතයුතු යැ. වීමංසාවගේ දර්ශනාර්ථය දතයුතු.

දුඃඛයාගේ පීඩනාර්ථය දතයුතු යැ. දුඃඛයාගේ සඞ්ඛතාර්ථය දතයුතු යැ. දුඃඛයාගේ සන්තාපාර්ථය දතයුතු යැ. දුඃඛයාගේ විපරිණාමාර්ථය දතයුතු.

සමුදයාගේ ආයූහනාර්ථය දතයුතු යැ. සමුදයාගේ නිදානාර්ථය දතයුතු යැ. සමුදයාගේ සංයෝගාර්ථය දතයුතු යැ. සමුදයාගේ පරිබොධාර්ථය දතයුතු.

නිරොධස්ස නිස්සරණට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිරොධස්ස විවෙකට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිරොධස්ස අසඞ්ඛතට්ඨො අභිඤ්ඤෙය්‍යො, නිරොධස්ස අමතට්ඨො අභිඤ්ඤෙය්‍යො.

මග්ගස්ස නිය්‍යානට්ඨො අභිඤ්ඤෙය්‍යො, මග්ගස්ස හෙතුට්ඨො[1] අභිඤ්ඤෙය්‍යො, මග්ගස්ස දස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, මග්ගස්ස ආධිපතෙය්‍යට්ඨො අභිඤ්ඤෙය්‍යො.

තථට්ඨො අභිඤ්ඤෙය්‍යො, අනත්තට්ඨො අභිඤ්ඤෙය්‍යො, සච්චට්ඨො අභිඤ්ඤෙය්‍යො, පටිවෙධට්ඨො අභිඤ්ඤෙය්‍යො, අභිජානනට්ඨො අභිඤ්ඤෙය්‍යො, පරිජානනට්ඨො අභිඤ්ඤෙය්‍යො, ධම්මට්ඨො අභිඤ්ඤෙය්‍යො, ධාතුට්ඨො[2] අභිඤ්ඤෙය්‍යො, ඤාතට්ඨො අභිඤ්ඤෙය්‍යො, සච්ඡිකිරියට්ඨො අභිඤ්ඤෙය්‍යො, ඵස්සනට්ඨො අභිඤ්ඤෙය්‍යො, අභිසමයට්ඨො අභිඤ්ඤෙය්‍යො.

නෙක්ඛම්මං අභිඤ්ඤෙය්‍යං, අබ්‍යාපාදො අභිඤ්ඤෙය්‍යො, ආලොකසඤ්ඤා අභිඤ්ඤෙය්‍යා, අවික්ඛෙපො අභිඤ්ඤෙය්‍යො, ධම්මවවත්ථානං අභිඤ්ඤෙය්‍යං, ඤාණං අභිඤ්ඤෙය්‍යං, පාමොජ්ජං.[3] අභිඤ්ඤෙය්‍යං.

පඨමං ඣානං[4] අභිඤ්ඤෙය්‍යං, දුතියං ඣානං අභිඤ්ඤෙය්‍යං, තතියං ඣානං අභිඤ්ඤෙය්‍යං, චතුත්ථං ඣානං අභිඤ්ඤෙය්‍යං, ආකාසානඤ්චායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, විඤ්ඤාණඤ්චායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති අභිඤ්ඤෙය්‍යා.

අනිච්චානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, දුක්ඛානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, අනත්තානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, නිබ්බිදානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, විරාගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, නිරොධානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, පටිනිස්සග්ගානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, ඛයානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, වයානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, විපරිණාමානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, අනිමිත්තානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, අප්පණිහිතානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, සුඤ්ඤතානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, අධිපඤ්ඤාධම්මවිපස්සනා අභිඤ්ඤෙය්‍යා, යථාභූතඤාණදස්සනං අභිඤ්ඤෙය්‍යං, ආදීනවානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, පටිසඞ්ඛානුපස්සනා අභිඤ්ඤෙය්‍යා, විවට්ටානුපස්සනා අභිඤ්ඤෙය්‍යා.

සොතාපත්තිමග්ගො අභිඤ්ඤෙය්‍යො, සොතාපත්තිඵලසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, සකදාගාමිමග්ගො අභිඤ්ඤෙය්‍යො, සකදාගාමිඵලසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, අනාගාමිමග්ගො අභිඤ්ඤෙය්‍යො, අනාගාමිඵලසමාපත්ති අභිඤ්ඤෙය්‍යා, අරහත්තමග්ගො අභිඤ්ඤෙය්‍යො, අරහත්තඵලසමාපත්ති අභිඤ්ඤෙය්‍යා.

අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං[5] අභිඤ්ඤෙය්‍යං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං අභිඤ්ඤෙය්‍යං.

අස්සද්ධියෙ අකම්පියට්ඨෙන සද්ධාබලං අභිඤ්ඤෙය්‍යං, කොසජ්ජෙ අකම්පියට්ඨෙන විරියබලං අභිඤ්ඤෙය්‍යං, පමාදෙ අකම්පියට්ඨෙන සතිබලං අභිඤ්ඤෙය්‍යං, උද්ධච්චෙ අකම්පියට්ඨෙන සමාධිබලං අභිඤ්ඤෙය්‍යං, අවිජ්ජාය අකම්පියට්ඨෙන පඤ්ඤාබලං අභිඤ්ඤෙය්‍යං.

---

1. හෙතට්ඨො - සයා. 2. ධාතට්ඨො - සයා, 3. පාමුජ්ජං - සයා,
4 පඨමජ්ඣානං (ආදි) සයා, PTS, . වීරියින්ද්‍රියං - මජසං

නිරෝධයාගේ නිස්සරණාර්ථය දතයුතු යැ. නිරෝධයාගේ විවේකාර්ථය දතයුතු යැ. නිරෝධයාගේ අසඞ්ඛතාර්ථය දතයුතු යැ. නිරෝධයාගේ අමෘතාර්ථය දතයුතු.

මාර්ගයාගේ නියර්‍යාණාර්ථය දතයුතු යැ. මාර්ගයාගේ හෙත්වර්ථය දතයුතු යැ. මාර්ගයාගේ දර්ශනාර්ථය දතයුතු යැ. මාර්ගයාගේ ආධිපත්‍යාර්ථය දතයුතු.

යථාස්වභාවාර්ථය දතයුතු යැ. අනාත්මාර්ථය දතයුතු යැ. සත්‍යාර්ථය දතයුතු යැ. ප්‍රතිවෙධාර්ථය දතයුතු යැ. වෙසෙසින් දතයුතු අර්ථය දතයුතු යැ. ඥාතතීරණපරිඥායෙන් දතයුතු අර්ථය දතයුතු යැ. ධර්මාර්ථය දතයුතු යැ. (ශූන්‍යතාදි) ධාත්වර්ථය දතයුතු යැ. දතහැකි අර්ථය දතයුතු යැ. සාක්‍ෂාත්-කර්තව්‍යාර්ථය දතයුතු යැ. ඥානයෙන් සපර්ශ කළයුතු අර්ථය දතයුතු යැ. (ප්‍රත්‍යවෙක්‍ෂාඥානයෙන්) මොනොවට අවබොධ කළයුතු අර්ථය දතයුතු.

නෛෂ්ක්‍රම්‍ය (කාමච්ඡන්ද ප්‍රතිපක්‍ෂඅලෝභ) ය දතයුතු යැ. අව්‍යාපාදය දතයුතු යැ. (ස්ත්‍යානමිද්ධප්‍රතිපක්‍ෂ) ආලෝකසංඥාව දතයුතු යැ. අවික්‍ෂෙපය දතයුතු යැ. ධම්මවවත්ථාන (නිශ්චය) ය දතයුතු යැ. ඥානය දතයුතු යැ. (අරතිප්‍රතිපක්‍ෂ) ප්‍රාමොද්‍යය දතයුතු.

ප්‍රථමධ්‍යානය දතයුතු යැ. ද්විතීයධ්‍යානය දතයුතු යැ. තෘතීයධ්‍යානය දතයුතු යැ. චතුර්ථධ්‍යානය දතයුතු යැ. ආකාසානඤ්චායතන සමාපත්තිය දතයුතු යැ. විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය දතයුතු යැ. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය දතයුතු යැ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය දතයුතු.

අනිත්‍යානුදර්ශනය දතයුතු යැ. දුඃඛානුදර්ශනය දතයුතු යැ. අනාත්මානු දර්ශනය දතයුතු යැ. නිර්වේදනුදර්ශනය දතයුතු යැ. විරාගානුදර්ශනය දතයුතු යැ. නිරොධානුදර්ශනය දතයුතු යැ. ප්‍රතිනිඃසර්ගානුදර්ශනය දතයුතු යැ. ක්‍ෂයානුදර්ශනය දතයුතු යැ. ව්‍යයානුදර්ශනය දතයුතු යැ. විපරිණාමානු-දර්ශනය දතයුතු යැ. අනිමිත්තානුදර්ශනය දතයුතු යැ. අප්‍රණිහිතානුදර්ශනය දතයුතු යැ. ශූන්‍යතානුදර්ශනය දතයුතු යැ. අධිප්‍රඥා සඞ්ඛ්‍යාත ධර්මවිදර්ශනාව දතයුතු යැ. යථාභූතඥානදර්ශනය දතයුතු යැ. ආදීනවානුදර්ශනය දතයුතු යැ. පටිසඞ්ඛා (අනිත්‍ය-දුඃඛ-අනාත්මා)නුදර්ශනය දතයුතු යැ. විවර්තානුදර්ශන (ගොත්‍රභූඥාන)ය දතයුතු.

සෝවන් මාර්ගය දතයුතු යැ. සෝවන් ඵලසමාපත්තිය දතයුතු යැ. සකෘදාගාමි මාර්ගය දතයුතු යැ. සකෘදාගාමි ඵලසමාපත්තිය දතයුතු යැ. අනාගාමි මාර්ගය දතයුතු යැ. අනාගාමි ඵලසමාපත්තිය දතයුතු යැ. අර්හත්මාර්ගය දතයුතු යැ. අර්හත්ඵලසමාපත්තිය දතයුතු.

අධිමොක්‍ෂ (නිශ්චය කිරීම්) අර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය දතයුතු යැ. ප්‍රග්‍රහ (උත්සාහ) අර්ථයෙන් වීර්යෙන්ද්‍රිය දතයුතු යැ. අපිලාපන (අරමුණෙහි බැසගැනීම්) අර්ථයෙන් සමෘතීන්ද්‍රිය දතයුතු යැ. අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය දතයුතු යැ. දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රිය දතයුතු.

අශ්‍රද්ධායෙහි නො සැලෙන අර්ථයෙන් ශ්‍රද්ධාබලය දතයුතු යැ. කුසීත බැව්හි නො සැලෙන අර්ථයෙන් වීර්යබලය දතයුතු යැ. ප්‍රමාදයෙහි නො සැලෙන අර්ථයෙන් සමෘතිබලය දතයුතු යැ. උද්ධත බැව්හි නො සැලෙන අර්ථයෙන් සමාධිබලය දතයුතු යැ. අවිද්‍යායෙහි නො සැලෙන අර්ථයෙන් ප්‍රඥාබලය දතයුතු.

උපට්ඨානට්ඨෙන සතිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො, පවිචයට්ඨෙන ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො, පග්ගහට්ඨෙන විරියසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො, ඵරණට්ඨෙන පීතිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො, උපසමට්ඨෙන පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො, අවික්ඛෙපට්ඨෙන සමාධිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො, පටිසඞ්ඛානට්ඨෙන උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤෙය්‍යො.

දස්සනට්ඨෙන සම්මාදිට්ඨි අභිඤ්ඤෙය්‍යා, අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො අභිඤ්ඤෙය්‍යො, පරිග්ගහට්ඨෙන සම්මාවාචා අභිඤ්ඤෙය්‍යා, සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො අභිඤ්ඤෙය්‍යො, වොදානට්ඨෙන සම්මාආජීවො අභිඤ්ඤෙය්‍යො, පග්ගහට්ඨෙන සම්මාවායාමො අභිඤ්ඤෙය්‍යො, උපට්ඨානට්ඨෙන සම්මාසති අභිඤ්ඤෙය්‍යා, අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි අභිඤ්ඤෙය්‍යො.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියා අභිඤ්ඤෙය්‍යා, අකම්පියට්ඨෙන බලා අභිඤ්ඤෙය්‍යා, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගා අභිඤ්ඤෙය්‍යා, හෙතුට්ඨෙන මග්ගො අභිඤ්ඤෙය්‍යො, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානා අභිඤ්ඤෙය්‍යා, පදහනට්ඨෙන සම්මප්පධානා අභිඤ්ඤෙය්‍යා, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදා අභිඤ්ඤෙය්‍යා, තථට්ඨෙන සච්චා අභිඤ්ඤෙය්‍යා.

අවික්ඛෙපට්ඨෙන සමථො අභිඤ්ඤෙය්‍යො, අනුපස්සනට්ඨෙන විපස්සනා අභිඤ්ඤෙය්‍යා, එකරසට්ඨෙන සමථවිපස්සනා අභිඤ්ඤෙය්‍යා, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං[1] අභිඤ්ඤෙය්‍යං.

සංවරට්ඨෙන සීලවිසුද්ධි අභිඤ්ඤෙය්‍යා, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි අභිඤ්ඤෙය්‍යා, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි අභිඤ්ඤෙය්‍යා, මුත්තට්ඨෙන විමොක්ඛො අභිඤ්ඤෙය්‍යො, පටිවෙධට්ඨෙන විජ්ජා අභිඤ්ඤෙය්‍යා, පරිච්චාගට්ඨෙන විමුත්ති අභිඤ්ඤෙය්‍යා, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං අභිඤ්ඤෙය්‍යං, පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙ ඤාණං අභිඤ්ඤෙය්‍යං.

ඡන්දො මූලට්ඨෙන අභිඤ්ඤෙය්‍යො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන අභිඤ්ඤෙය්‍යො, ඵස්සො සමොධානට්ඨෙන අභිඤ්ඤෙය්‍යො, වෙදනා සමොසරණට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, සමාධි පමුඛට්ඨෙන අභිඤ්ඤෙය්‍යො, සති ආධිපතෙය්‍යට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, පඤ්ඤා තදුත්තරට්ඨෙන[2] අභිඤ්ඤෙය්‍යා, විමුත්ති සාරට්ඨෙන අභිඤ්ඤෙය්‍යා, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන අභිඤ්ඤෙය්‍යං.

යෙ යෙ ධම්මා අභිඤ්ඤාතා හොන්ති, තෙ තෙ ධම්මා ඤාතා හොන්ති, තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: "ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා, සුතමයෙ ඤාණං"න්ති.

අභිඤ්ඤෙය්‍යනිද්දෙසො.

දුතියක භාණවාරං.

---

1 යුගනද්ධං - මජසං. 2 තදුත්තරට්ඨෙන - මජසං.

අපිලාපනාර්ථයෙන් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය දතයුතු යැ. විමසීම් අර්ථයෙන් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය දතයුතු යැ. ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය දතයුතු යැ. පැතිරීම් අර්ථයෙන් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය දතයුතු යැ. සන්හිඳීම් අර්ථයෙන් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය දතයුතු යැ. නො විසිරීම් අර්ථයෙන් සමාධිසම්බොධ්‍යඞ්ගය දතයුතු යැ. අනිත්‍යාදි විසින් ප්‍රත්‍යවෙක්ෂා කිරීම් අර්ථයෙන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය දතයුතු.

(සත්‍ය) දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය දතයුතු යැ. අරමුණට නැඟීම් අර්ථයෙන් සම්‍යක්සංකල්පය දතයුතු යැ. (සතර වාක්සංවර) පරිග්‍රහාර්ථයෙන් සම්‍යග්වචනය දතයුතු යැ. (ත්‍රිවිධ කායසංවර) සමුත්ථානාර්ථයෙන් සම්‍යක්කර්මාන්තය දතයුතු යැ. පරිශුද්ධාර්ථයෙන් සම්‍යගාජීවය දතයුතු යැ. ප්‍රග්‍රහාර්ථයෙන් සම්‍යග්ව්‍යායාමය දතයුතු යැ. අරමුණෙහි බැසගැනීම් අර්ථයෙන් සම්‍යක්ස්මෘතිය දතයුතු යැ. අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධිය දතයුතු.

ආධිපත්‍යාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ. අකම්ප්‍යාර්ථයෙන් බලයෝ දතයුත්තාහ. නිර්‍ය්‍යාණාර්ථයෙන් බොධ්‍යඞ්ගයෝ දතයුත්තාහ. හෙත්වර්ථයෙන් මාර්ගය දතයුතු යැ. අපිලාපනාර්ථයෙන් සතිපට්ඨානයෝ දතයුත්තාහ. උත්සාහ කිරීම් අර්ථයෙන් සම්‍යක්ප්‍රධානයෝ දතයුත්තාහ. නිෂ්පත්ත්‍යර්ථයෙන් ඍද්ධිපාදයෝ දතයුත්තාහ. යථාස්වභාවාර්ථයෙන් සත්‍යයෝ දතයුත්තාහ.

අවික්ෂෙපාර්ථයෙන් ශමථය දතයුතු යැ. (අනිත්‍යාදිවශයෙන්) පුනපුනා බැලීම් අර්ථයෙන් විදර්ශනාව දතයුතු යැ. (විමුක්තිරසයෙන්) එකකෘත්‍යාර්ථයෙන් ශමථවිදර්ශනා දතයුතු යැ. නො ඉක්ම පවත්නා අර්ථයෙන් (ශමථ විදර්ශනාවන්ගේ) යුගනද්ධය දතයුතු.

සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය දතයුතු යැ. අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධිය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය දතයුතු යැ. මිදීම් අර්ථයෙන් (තදඞ්ග) විමොක්ෂය දතයුතු යැ. ජානනාර්ථයෙන් විද්‍යාව දතයුතු යැ. පරිත්‍යාගාර්ථයෙන් ඵලවිමුක්තිය දතයුතු යැ. සමුච්ඡෙදාර්ථයෙන් ක්ෂය (මාර්ග ඥානය) දතයුතු යැ. ප්‍රතිප්‍රශ්‍රබ්ධි-අර්ථයෙන් අනුත්පාද (ඵල ඥානය) දතයුතු යැ.

(කර්තුකාම්‍යතා) ඡන්දය මූලාර්ථයෙන් දතයුතු යැ. (යොනිසො) මනසකාරය (කුසල් දහම් නඟන බැවින්) සමුත්ථානාර්ථයෙන් දතයුතු යැ. ස්පර්ශය සමවධානාර්ථයෙන් දතයුතු යැ. වෙදනාව සමොසරණ (රැස්වීම්) අර්ථයෙන් දතයුතු යැ. සමාධිය ප්‍රමුඛාර්ථයෙන් දතයුතු යැ. ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් දතයුතු යැ. (මාර්ග) ප්‍රඥාව තදුත්තර (ශ්‍රෙෂ්ඨ) අර්ථයෙන් දතයුතු යැ. (ඵල) විමුක්තිය (සපිර බැවින්) සාරාර්ථයෙන් දතයුතු යැ. අමෘතයට ප්‍රතිෂ්ඨාභූත නිර්වාණය පර්‍ය්‍යවසාන (නිෂ්ඨා) අර්ථයෙන් දතයුතු යැ.

යම් යම් ධර්ම කෙනෙක් අභිමුඛ කොට දන්නා ලද වෙත් ද ඒ ඒ ධර්මයෝ ඥාතයෝ වෙති. ඒ ධර්මයන් දන්නා අර්ථයෙන් ඥාන වෙයි ප්‍රකාරයෙන් (දන්නා අර්ථයෙන්) ප්‍රඥා වේ. එයින් කියනු ලැබෙයි: **‘ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යාති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං’** යි.

**අභිඥෙයනිර්දෙශ යි.**

**දෙවැනි බණවර යි.**

## (1)

**කථං 'ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:**

ඒකො ධම්මො පරිඤ්ඤෙය්‍යො: ඵස්සො සාසවො උපාදානියො.
ද්වෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා: නාමඤ්ච රූපඤ්ච.
තයො ධම්මා පරිඤ්ඤෙය්‍යා: තිස්සො වෙදනා
චත්තාරො ධම්මා පරිඤ්ඤෙය්‍යා: චත්තාරො ආහාරා.
පඤ්ච ධම්මා පරිඤ්ඤෙය්‍යා: පඤ්චුපාදානක්ඛන්ධා.
ඡ ධම්මා පරිඤ්ඤෙය්‍යා: ඡ අජ්ඣත්තිකානි ආයතනානි.
සත්ත ධම්මා පරිඤ්ඤෙය්‍යා: සත්ත විඤ්ඤාණට්ඨිතියො.
අට්ඨ ධම්මා පරිඤ්ඤෙය්‍යා: අට්ඨ ලොකධම්මා.
නව ධම්මා පරිඤ්ඤෙය්‍යා: නව සත්තාවාසා.
දස ධම්මා පරිඤ්ඤෙය්‍යා: දසායතනානි.

## (2)

සබ්බං භික්ඛවෙ, පරිඤ්ඤෙය්‍යං, කිඤ්ච භික්ඛවෙ, සබ්බං පරිඤ්ඤෙය්‍යං.

චක්ඛුං[1] භික්ඛවෙ, පරිඤ්ඤෙය්‍යං, රූපා පරිඤ්ඤෙය්‍යා, චක්ඛුවිඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං, චක්ඛුසම්ඵස්සො පරිඤ්ඤෙය්‍යො, යම්පිදං[2] චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි පරිඤ්ඤෙය්‍යං.

සොතං පරිඤ්ඤෙය්‍යං, සද්දා පරිඤ්ඤෙය්‍යා -පෙ- ඝානං පරිඤ්ඤෙය්‍යං, ගන්ධා පරිඤ්ඤෙය්‍යා -පෙ- ජිව්හා පරිඤ්ඤෙය්‍යා, රසා පරිඤ්ඤෙය්‍යා -පෙ- කායො පරිඤ්ඤෙය්‍යො, ඵොට්ඨබ්බා පරිඤ්ඤෙය්‍යා -පෙ- මනො පරිඤ්ඤෙය්‍යො, ධම්මා පරිඤ්ඤෙය්‍යා, මනොවිඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං, මනොසම්ඵස්සො පරිඤ්ඤෙය්‍යො, යම්පිදං[2] මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි පරිඤ්ඤෙය්‍යං.[a]

රූපං පරිඤ්ඤෙය්‍යං, වෙදනා පරිඤ්ඤෙය්‍යා, සඤ්ඤා පරිඤ්ඤෙය්‍යා, සඞ්ඛාරා පරිඤ්ඤෙය්‍යා, විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං, චක්ඛුං[1] පරිඤ්ඤෙය්‍යං -පෙ- ජරාමරණං පරිඤ්ඤෙය්‍යං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන පරිඤ්ඤෙය්‍යං -පෙ-

යෙසං යෙසං ධම්මානං පටිලාභත්ථාය වායමන්තස්ස තෙ තෙ ධම්මා පටිලද්ධා හොන්ති. එවං තෙ ධම්මා පරිඤ්ඤාතා චෙව හොන්ති තීරිතා ච.

නෙක්ඛම්මං පටිලාභත්ථාය වායමන්තස්ස නෙක්ඛම්මං පටිලද්ධං හොති. එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අබ්‍යාපාදං පටිලාභත්ථාය වායමන්තස්ස අබ්‍යාපාදො පටිලද්ධො හොති එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

---

1. චක්ඛු - මජසං. 2 යදිදං - PTS
a. වෙදනාසංයුත්ත - අනිච්චවග්ග පඤ්චමං,

## (1)

කිසෙයින් 'මේ ධර්මයෝ පිරිසිඳ දතයුත්තාහ' යන දේශනාව සෝතාවධාන (ශ්‍රැත)ය වෙයි, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමයඥාන වෙයි යත්:

එක් ධර්මයෙක් පිරිසිඳ දතයුතු වෙයි: සාස්‍රව වූ උපාදානයන්ට හිත වූ ස්පර්ශය යි.
ධර්මයෝ දෙදෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: නාමරූපයෝ යි.
ධර්මයෝ තිදෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: තුන් වේදනාවෝ යි.
ධර්මයෝ සතර දෙනෙක් පිරිසිඳ දතයුතු වෙති. සතර ආහාරයෝ යි.
ධර්මයෝ පස්දෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: පඤ්චෝපාදානස්කන්ධයෝ යි.
ධර්මයෝ සදෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: ආධ්‍යාත්මික ෂඩායතනයෝ යි.
ධර්මයෝ සත්දෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: සප්තවිඥානස්ථිතීහු යි.
ධර්මයෝ අටදෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: අෂ්ටලෝකධර්මයෝ යි.
ධර්මයෝ නවදෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: නවසත්ත්වාවාසයෝ යි.
ධර්මයෝ දසදෙනෙක් පිරිසිඳ දතයුතු වෙති: දස ආයතනයෝ යි.

## (2)

මහණෙනි, සියල්ල පිරිසිඳ දතයුතුයැ. මහණෙනි, පිරිසිඳ දතයුතු සියල්ල කවර යත්:

මහණෙනි, චක්‍ෂුස පිරිසිඳ දතයුතු යැ. රූපයෝ පිරිසිඳ දතයුත්තාහ. චක්‍ෂුර්විඥානය පිරිසිඳ දතයුතු යැ. චක්ඛුසම්ඵස්සය පිරිසිඳ දතයුතු යැ. චක්ඛුසම්ඵස්ස ප්‍රත්‍යයෙන් සුව වේවයි දුක් වේවයි නො දුක් නො සුව වේවයි යම් වෙදයිතයෙක් උපදී නම් එ ද පිරිසිඳ දතයුතු යැ.

ශ්‍රොත්‍රය පිරිසිඳ දතයුතු යැ. ශබ්දයෝ පිරිසිඳ දතයුත්තාහ ... ඝ්‍රාණය පිරිසිඳ දතයුතු යැ. ගන්ධයෝ පිරිසිඳ දතයුත්තාහ ... ජිහ්වාව පිරිසිඳ දතයුතු යැ. රසයෝ පිරිසිඳ දතයුත්තාහ .. කාය පිරිසිඳ දතයුතු යැ. ස්‍ප්‍රෂ්ටව්‍යය පිරිසිඳ දතයුතු යැ ... මනස පිරිසිඳ දතයුතු යැ. ධර්මයෝ පිරිසිඳ දතයුත්තාහ. මනොවිඥානය පිරිසිඳ දතයුතු යැ. මනොසම්ඵස්සය පිරිසිඳ දතයුතු යැ. මනොසම්ඵස්ස ප්‍රත්‍යයෙන් සුව වේවයි දුක් වේවයි නො දුක් නො සුව වේවයි යම් වෙදයිතයෙක් උපදී නම්, එ ද පිරිසිඳ දතයුතු.

රූපය පිරිසිඳ දතයුතු යැ. වේදනාව පිරිසිඳ දතයුතු යැ. සංඥාව පිරිසිඳ දතයුතු යැ. සංස්කාරයෝ පිරිසිඳ දතයුත්තාහ. විඥානය පිරිසිඳ දතයුතු යැ. චක්‍ෂුස .... ජරාමරණය ... අමෘතයට ප්‍රතිෂ්ඨා වූ නිර්වාණය නිෂ්ඨාර්ථයෙන් පිරිසිඳ දතයුතු යැ.

යම් යම් ධර්ම කෙනකුන් ප්‍රතිලාභය සඳහා වෑයම් කරන්නහු විසින් ඒ ඒ ධර්මයෝ ලබන ලද්දාහු වෙත් ද, මෙසේ ඒ ධර්මයෝ පිරිසිඳ දන්නාහු ද තීරණය කරන ලද්දාහු ද වෙත්.

නෛෂ්ක්‍රම්‍යය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් නෛෂ්ක්‍රම්‍යය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පිරිසිඳ දන්නා ලද්දේ ද තීරණය කරන ලද්දේ ද වේ.

අව්‍යාපාදය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් අව්‍යාපාදය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පිරිසිඳ දන්නා ලද්දේ ද තීරණය කරන ලද්දේ ද වේ.

ආලොකසඤ්ඤං පටිලාභත්ථාය වායමන්තස්ස ආලොකසඤ්ඤා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අවික්ඛෙපං පටිලාභත්ථාය වායමන්තස්ස අවික්ඛෙපො පටිලද්ධො හොති. එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

ධම්මවවත්ථානං පටිලාභත්ථාය වායමන්තස්ස ධම්මවවත්ථානං පටිලද්ධං හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

ඤාණං පටිලාභත්ථාය වායමන්තස්ස ඤාණං පටිලද්ධං හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

පාමොජ්ජං[1], පටිලාභත්ථාය වායමන්තස්ස පාමොජ්ජං පටිලද්ධං හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

පඨමං ඣානං[2] පටිලාභත්ථාය වායමන්තස්ස පඨමං ඣානං[2] පටිලද්ධං හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං පටිලාභත්ථාය වායමන්තස්ස චතුත්ථං ඣානං පටිලද්ධං හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

ආකාසානඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය වායමන්තස්ස ආකාසානඤ්චායතනසමාපත්ති පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය වායමන්තස්ස විඤ්ඤාණඤ්චායතනසමාපත්ති පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය වායමන්තස්ස ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය වායමන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අනිච්චානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස අනිච්චානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

දුක්ඛානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස දුක්ඛානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අනත්තානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස අනත්තානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

නිබ්බිදානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස නිබ්බිදානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

---

1. පාමුජ්ජං - සතා,  2. පඨමජ්ඣානං - PTS.

ආලෝකසංඥාව ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් ආලෝක සංඥාව ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පිරිසිඳ දන්නා ලද්දේ ද තීරණය කරන ලද්දේ ද වේ.

අවික්ෂෙපය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් අවික්ෂෙපය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පිරිසිඳ දන්නා ලද්දේ ද තීරණය කරන ලද්දේ ද වේ.

ධම්මවවත්ථාන (විචිකිත්සා ප්‍රතිපක්ෂඥාන)ය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් ධම්මවවත්ථානය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

(අවිද්‍යා ප්‍රතිපක්ෂ) ඥානය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් ඥානය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

ප්‍රාමොද්‍ය(අරතිප්‍රතිපක්ෂප්‍රීති)ය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් ප්‍රාමොද්‍යය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

ප්‍රථමධ්‍යානය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් ප්‍රථමධ්‍යානය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

ද්විතීයධ්‍යානය ... තෘතීයධ්‍යානය ... චතුර්ථධ්‍යානය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් චතුර්ථධ්‍යානය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පිරිසිඳ දන්නා ලද්දේ ද තීරණය කරන ලද්දේ ද වේ.

ආකාසානඤ්චායතනසමාපත්තිය ප්‍රතිලාභය පිණිස වෑයම් කරන්නහු විසින් ආකාසානඤ්චායතනසමාපත්තිය ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය ලද්දී වෙයි. මෙසෙ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය ලබනු පිණිස වෑයම් කරන්නහු, විසින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

අනිච්චානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අනිච්චානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ

දුක්ඛානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් දුක්ඛානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

අනත්තානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අනත්තානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

නිබ්බිදානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් නිබ්බිදානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

විරාගානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස විරාගානුපස්සනා පටි-ලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච

නිරොධානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස නිරොධානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

පටිනිස්සග්ගානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස පටිනිස්සග්ගානු-පස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

ඛයානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස ඛයානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

වයානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස වයානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

විපරිණාමානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස විපරිණාමානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අනිමිත්තානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස අනිමිත්තානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අප්පණිහිතානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස අප්පණිහිතානු-පස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

සුඤ්ඤතානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස සුඤ්ඤතානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අධිපඤ්ඤාධම්මවිපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස අධිපඤ්ඤාධම්ම-විපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච

යථාභූතඤාණදස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස යථාභූතඤාණ-දස්සනං පටිලද්ධං හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

ආදීනවානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස ආදීනවානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

පටිසඞ්ඛානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස පටිසඞ්ඛානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

විරාගානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් විරාගානු-පස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ.

නිරෝධානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් නිරෝධානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ.

පටිනිස්සග්ගානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් පටිනිස්සග්ගානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ

ඛයානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් ඛයානු-පස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ.

වයානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් වයානු-පස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ.

විපරිණාමානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් විපරි-ණාමානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ.

අනිමිත්තානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අනි-මිත්තානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ.

අප්පණිහිතානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අප්පණිහිතානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ.

සුඤ්ඤතානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් සුඤ්ඤ-තානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ.

අධිපඤ්ඤාධම්මවිපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අධිපඤ්ඤාධම්මවිපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ.

යථාභූතඥානදර්ශනය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් යථා-භූතඥානදර්ශනය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ.

ආදීනවානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් ආදීන-වානුපස්සනාව ලද්දී වෙයි මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ.

පටිසඞ්ඛානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් පටි-සඞ්ඛානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥත ද තීරණය කරන ලද්දේ ද වේ.

විවට්ටානුපස්සනං පටිලාභත්ථාය වායමන්තස්ස විවට්ටානුපස්සනා පටිලද්ධා හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

සොතාපත්තිමග්ගං පටිලාභත්ථාය වායමන්තස්ස සොතාපත්තිමග්ගො පටිලද්ධො හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

සකදාගාමිමග්ගං පටිලාභත්ථාය වායමන්තස්ස සකදාගාමිමග්ගො පටිලද්ධො හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අනාගාමිමග්ගං පටිලාභත්ථාය වායමන්තස්ස අනාගාමිමග්ගො පටිලද්ධො හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

අරහත්තමග්ගං පටිලාභත්ථාය වායමන්තස්ස අරහත්තමග්ගො පටිලද්ධො හොති, එවං සො ධම්මො පරිඤ්ඤාතො චෙව හොති තීරිතො ච.

යෙසං යෙසං ධම්මානං පටිලාභත්ථාය වායමන්තස්ස තෙ තෙ ධම්මා පටිලද්ධා හොන්ති, එවං තෙ ධම්මා පරිඤ්ඤාතා චෙව හොන්ති තීරිතා ච. තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති “ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා’ති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණ”න්ති.

**පරිඤ්ඤෙය්‍යනිද්දෙසො.**

## (3)

කථං ‘ඉමෙ ධම්මා පහාතබ්බා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

එකො ධම්මො පහාතබ්බො: අස්මිමානො.

ද්වෙ ධම්මා පහාතබ්බා: අවිජ්ජා ච භවතණ්හා ච

තයො ධම්මා පහාතබ්බා: තිස්සො තණ්හා.

චත්තාරො ධම්මා පහාතබ්බා: චත්තාරො ඔඝා.

පඤ්ච ධම්මා පහාතබ්බා: පඤ්ච නීවරණානි

ඡ ධම්මා පහාතබ්බා: ඡ තණ්හාකායා.

සත්ත ධම්මා පහාතබ්බා: සත්තානුසයා.

අට්ඨ ධම්මා පහාතබ්බා: අට්ඨ මිච්ඡත්තා.

නව ධම්මා පහාතබ්බා: නව තණ්හාමූලකා

දස ධම්මා පහාතබ්බා: දස මිච්ඡත්තා.

විවට්ටානුපස්සනාව ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් විවට්ටානුපස්සනාව ලද්දී වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

ස්‍රොතාපත්තිමාර්ගය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් ස්‍රොතාපත්තිමාර්ගය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

සකෘදාගාමිමාර්ගය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් සකෘදාගාමිමාර්ගය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

අනාගාමිමාර්ගය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අනාගාමිමාර්ගය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

අර්හත්මාර්ගය ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් අර්හත්මාර්ගය ලද්දේ වෙයි. මෙසේ ඒ ධර්මය පරිඥාත ද තීරණය කරන ලද්දේ ද වේ.

යම් යම් ධර්මයන් ලබනු පිණිස වෑයම් කරන්නහු විසින් ඒ ඒ ධර්මයෝ ලද්දාහු වෙති, මෙසේ ඒ ධර්මයෝ පරිඥාත ද තීරණය කරන ලද්දාහු ද වෙත්. ඒ දන්නා අර්ථයෙන් ඥාන වෙයි. ප්‍රකාරයෙන් දන්නා අර්ථයෙන් ප්‍රඥා වේ. එයින් කියනු ලැබෙයි. **“ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා’ති සොතාවධානං, තං පජානනාපඤ්ඤා සුතමයෙ ඤාණං”**යි.

**පරිඥෙයනිර්දෙශ යි.**

## (3)

කිසෙයින් මේ ධර්මයෝ ප්‍රහාතව්‍යයෝ යැ යන දෙශනාව සොතාවධාන වේ ද, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමය ඥාන වේ ද යත්:

එක් ධර්මයෙක් ප්‍රහාතව්‍ය වෙයි: අස්මිමාන යි.

ධර්මයෝ දෙදෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: අවිද්‍යාව ද භවතෘෂ්ණාව ද යන දෙක යි.

ධර්මයෝ තිදෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: ත්‍රිවිධ තෘෂ්ණාව යි.

ධර්මයෝ සතරදෙනෙක් ප්‍රාහතව්‍යයෝ යැ: චතුරොඝයෝ යි.

ධර්මයෝ පස්දෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: පඤ්චනීවරණයෝ යි.

ධර්මයෝ සදෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: ෂට්තෘෂ්ණාකායයෝ යි.

ධර්මයෝ සත්දෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: සප්තඅනුශයධර්මයෝ යි.

ධර්මයෝ අටදෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: අෂ්ටමිථ්‍යාත්වයෝ යි.

ධර්මයෝ නවදෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: නව තෘෂ්ණාමූලකධර්මයෝ යි.

ධර්මයෝ දසදෙනෙක් ප්‍රහාතව්‍යයෝ යැ: දශමිථ්‍යාත්වයෝ යි.

ද්වෙ පහානානි: සමුච්ඡෙදප්පහානං පටිප්පස්සද්ධිප්පහානං. සමුච්ඡෙදප්පහානඤ්ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො පටිප්පස්සද්ධිප්පහානඤ්ච ඵලක්ඛණෙ.

තීණි පහානානි: කාමානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මං, රූපානමෙතං නිස්සරණං යදිදං ආරුප්පං, යං ඛො පන කිඤ්චි භූතං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං නිරොධො, තස්ස නිස්සරණං නෙක්ඛම්මං පටිලද්ධස්ස කාමා පහීනා චෙව හොන්ති පරිච්චත්තා ච, ආරුප්පං පටිලද්ධස්ස රූපා පහීනා චෙව හොන්ති පරිච්චත්තා ච, නිරොධං පටිලද්ධස්ස සඞ්ඛාරා පහීනා චෙව හොන්ති පරිච්චත්තා ච.

චත්තාරි පහානානි: දුක්ඛසච්චං පරිඤ්ඤ පටිවෙධං පටිවිජ්ඣන්තො පජහාති,[1] සමුදයසච්චං පහානපටිවෙධං පටිවිජ්ඣන්තො පජහාති,[1] නිරොධසච්චං සච්ඡිකිරියාපටිවෙධං පටිවිජ්ඣන්තො පජහාති,[1] මග්ගසච්චං භාවනාපටිවෙධං පටිවිජ්ඣන්තො පජහානි.[1] .

පඤ්ච පහානානි: වික්ඛම්භනප්පහානං තදඞ්ගප්පහානං සමුච්ඡෙදප්පහානං පටිප්පස්සද්ධිප්පහානං නිස්සරණප්පහානං. වික්ඛම්භනප්පහානඤ්ච නීවරණානං පඨමං ඣානං භාවයතො, තදඞ්ගප්පහානඤ්ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදප්පහානඤ්ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිප්පහානඤ්ච ඵලක්ඛණෙ, නිස්සරණප්පහානඤ්ච නිරොධො නිබ්බානං.

## (4)

"සබ්බං භික්ඛවෙ, පහාතබ්බං, කිඤ්ච භික්ඛවෙ, සබ්බං පහාතබ්බං:

චක්ඛුං[2], භික්ඛවෙ, පහාතබ්බං, රූපා පහාතබ්බා, චක්ඛුවිඤ්ඤාණං පහාතබ්බං, චක්ඛුසම්ඵස්සො පහාතබ්බො, යම්පිදං[3], චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි පහාතබ්බං.

සොතං පහාතබ්බං, සද්දා පහාතබ්බා, -පෙ- ඝානං පහාතබ්බං, ගන්ධා පහාතබ්බා -පෙ- ජිව්හා පහාතබ්බා, රසා පහාතබ්බා -පෙ- කායො පහාතබ්බො, ඵොට්ඨබ්බා පහාතබ්බා -පෙ- මනො පහාතබ්බො, ධම්මා පහාතබ්බා, මනොවිඤ්ඤාණං පහාතබ්බං, මනොසම්ඵස්සො පහාතබ්බො, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි පහාතබ්බං.a.

---

1. පජහති - පු, මජසං, සයා.  2. චක්ඛු - මජසං.
3. යදිදං - PTS.
a. වෙදනාසංයුත්ත - අනිච්චවග්ග ඡට්ඨං.

ප්‍රහාණයෝ දෙදෙනෙකි: සමුච්ඡේදප්‍රහාණ යැ, ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණ යි. ලොකෝත්තර වූ ක්‍ෂයගාමිමාර්ගය වඩන්නහුට සමුච්ඡේදප්‍රහාණය ද ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණය ද වේ.

ප්‍රහාණයෝ තිදෙනෙකි: යම් නෛෂ්ක්‍රම්‍යයෙක් වේ ද, තෙල කාමයන්ගේ නිඃසරණ යැ. යම් අරූපධ්‍යානයෙක් වේ ද, තෙල රූපයන්ගේ නිඃසරණ යැ. උපන්නා වූ ප්‍රත්‍යයන් විසින් කරන ලද ප්‍රතීත්‍යසමුත්පන්න (ඒ ඒ ප්‍රත්‍යයන් නිසා උපන්) වූ යම්කිසි සංස්කාරයෙක් වේ ද, අර්හත්ඵල නිරොධය ඒ සංස්කාරයාගේ නිඃසරණ යි. (අශුභධ්‍යාන-අනාගාමිමාර්ග සඞ්ඛ්‍යාත) නෛෂ්ක්‍රම්‍යය ලැබුවහු විසින් කාමයෝ (විෂ්කම්භණ සමුච්ඡේද විසින්) ප්‍රහීණ කරන ලද්දාහු ද පරිත්‍යාග කරන ලද්දාහු ද වෙති. (අරූපධ්‍යාන - අර්හත්මාර්ග සඞ්ඛ්‍යාත) ආරූප්‍ය නිඃසරණය ලැබුවහු විසින් රූපයෝ (විෂ්කම්භණසමුච්ඡේද විසින්) ප්‍රහීණ කරන ලද්දාහු ද පරිත්‍යාග කරන ලද්දාහු ද වෙති. (නිර්වාණ-අර්හත්ඵල සඞ්ඛ්‍යාත) නිරොධ නිඃසරණය ලැබුවහු විසින් (නිඃසරණ-ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණයෙන්) සංස්කාරයෝ ප්‍රහීණ කරන ලද්දාහු ද පරිත්‍යාග කරන ලද්දාහු ද වෙත්.

ප්‍රහාණයෝ සතර දෙනෙකි: පරිඥාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරන්නේ දුඃඛසත්‍යය දුරු කෙරෙයි. ප්‍රහාණප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරන්නේ සමුදයසත්‍යය දුරු කෙරෙයි. සාක්‍ෂාත්ක්‍රියාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරන්නේ නිරොධසත්‍යය දුරු කෙරෙයි. භාවනාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කරන්නේ මාර්ගසත්‍යය දුරු කෙරේ.

ප්‍රහාණයෝ පස්දෙනෙකි: විෂ්කම්භණප්‍රහාණ යැ. තදඞ්ගප්‍රහාණ යැ. සමුච්ඡේදප්‍රහාණ යැ. ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණ යැ. නිඃසරණප්‍රහාණ යි. ප්‍රථමධ්‍යානය වඩන්නහුට නිවරණයන්ගේ විෂ්කම්භණප්‍රහාණය ද, විදර්ශනාසම්ප්‍රයුක්තසමාධිය වඩන්නහුට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගප්‍රහාණය ද, ලොකෝත්තර වූ ක්‍ෂය (නිර්වාණ) ගාමිමාර්ගය වඩන්නහුට සමුච්ඡේදප්‍රහාණය ද, ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණය ද, නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය නිඃසරණප්‍රහාණය ද වේ.

## (4)

මහණෙනි, සියල්ල ප්‍රහාතව්‍ය යැ. මහණෙනි, කවර සියල්ල ප්‍රහාතව්‍ය වෙයි යත්:

"මහණෙනි, චක්‍ෂුස ප්‍රහාතව්‍ය යැ. 'රූපයෝ ප්‍රහාතව්‍යයෝ යැ. චක්‍ෂුර්විඥානය ප්‍රහාතව්‍ය යැ. චක්‍ෂුර්විඥානසම්ප්‍රයුක්ත වූ ස්පර්ශය ප්‍රහාතව්‍ය යැ. චක්‍ෂුඃස්පර්ශප්‍රත්‍යයෙන් සුඛ වූ හෝ දුක්ඛ වූ හෝ අදුක්ඛමසුඛ වූ හෝ යම් වෙදනායෙක් උපදී නම් හෙ ද ප්‍රහාතව්‍ය යැ.

ශ්‍රොත්‍රය ප්‍රහාතව්‍ය යැ. ශබ්දයෝ ප්‍රහාතව්‍යයෝ යැ. ... ඝ්‍රාණය ප්‍රහාතව්‍ය යැ. ගන්ධයෝ ප්‍රහාතව්‍යයෝ යැ ... ජිහ්වාව ප්‍රහාතව්‍ය යැ. රසයෝ ප්‍රහාතව්‍යයෝ යැ ... කාය ප්‍රහාතව්‍ය යැ. ස්ප්‍රෂ්ටව්‍යයෝ ප්‍රහාතව්‍යයෝ යැ .. මනස ප්‍රහාතව්‍ය යැ. ධර්මයෝ ප්‍රහාතව්‍යයෝ යැ. මනොවිඥානය ප්‍රහාතව්‍ය යැ. මනොවිඥානසම්ප්‍රයුක්ත වූ ස්පර්ශය ප්‍රහාතව්‍ය යැ. මනඃස්පර්ශයෙන් සුඛ වූ හෝ දුක්ඛ වූ හෝ අදුක්ඛමසුඛ වූ හෝ යම් වෙදනායෙක් උපදී නම් හෙ ද ප්‍රහාතව්‍ය යි.

රූපං පස්සන්තො පජහාති, වේදනං පස්සන්තො පජහාති, සඤ්ඤං පස්සන්තො පජහාති, සඞ්ඛාරෙ පස්සන්තො පජහාති, විඤ්ඤාණං පස්සන්තො පජහාති, චක්ඛුං -පෙ- ජරාමරණං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන පස්සන්තො පජහාති.

යෙ යෙ ධම්මා පහීනා හොන්ති, තෙ තෙ ධම්මා පරිච්චත්තා හොන්ති. තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති. "ඉමෙ ධම්මා පහාතබ්බා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණ"න්ති.

### පහාතබ්බනිද්දෙසො

### තතියො භාණවාරො.

## (5)

කථං ඉමෙ ධම්මා භාවෙතබ්බා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

එකො ධම්මො භාවෙතබ්බො: කායගතා සති සාතසහගතා.

ද්වෙ ධම්මා භාවෙතබ්බා: සමථො ච විපස්සනා ච.

තයො ධම්මා භාවෙතබ්බා: තයො සමාධී.

චත්තාරො ධම්මා භාවෙතබ්බා: චත්තාරො සතිපට්ඨානා.

පඤ්ච ධම්මා භාවෙතබ්බා: පඤ්චඞ්ගිකො සමාධි.[1]

ඡ ධම්මා භාවෙතබ්බා: ඡ අනුස්සතිට්ඨානානි.

සත්ත ධම්මා භාවෙතබ්බා: සත්ත බොජ්ඣඞ්ගා.

අට්ඨ ධම්මා භාවෙතබ්බා: අරියො අට්ඨඞ්ගිකො මග්ගො.

නව ධම්මා භාවෙතබ්බා: නව පාරිසුද්ධිපධානියඞ්ගානි.[2]

දස ධම්මා භාවෙතබ්බා: දස කසිණායතනානි.

---

1. සම්මා සමාධි - සඃ, 2. පාරිසුද්ධිප්පධානියඞ්ගානි - සඃ,

රූපය (අනිත්‍යාදිවශයෙන්) දක්මින් (කෙලෙසුන්) දුරු කෙරෙයි. වේදනාව (අනිත්‍යාදිවශයෙන්) දක්මින් (කෙලෙසුන්) දුරු කෙරෙයි. සංඥාව (අනිත්‍යාදිවශයෙන්) දක්මින් (කෙලෙසුන්) දුරු කෙරෙයි. සංස්කාරයන් (අනිත්‍යාදිවශයෙන්) දක්මින් (කෙලෙසුන්) දුරු කෙරෙයි. විඥානය (අනිත්‍යාදිවශයෙන්) දක්මින් (කෙලෙසුන්) දුරු කෙරෙයි. චක්ෂුස ... ජරාමරණය ... අමතොගධ නිර්වාණය නිෂ්ඨාර්ථයෙන් දක්මින් (කෙලෙසුන්) දුරු කෙරේ.

යම් යම් ධර්ම කෙනෙක් ප්‍රහීණ වූවාහු වෙත් ද ඒ ඒ ධර්මයෝ පරිත්‍යාග කරන ලද්දාහු වෙත්. එය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යැ. එයින් කියනු ලැබෙයි **"ඉමෙ ධම්මා පහාතබ්බා'ති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං"සි.**

**ප්‍රහාතව්‍යනිර්දෙශ සි.**

**තුන් වැනි බණවර සි**

## (5)

කිසෙයින් 'මේ ධර්මයෝ වැඩියයුත්තාහ, යන දෙශනාව සොතාවධාන වෙයි, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමයඥාන වෙයි යත්:

එක් ධර්මයෙක් වැඩිය යුතු යැ: (මධුරසුඛවෙදනා සඞ්ඛ්‍යාත) සාතය හා සම්ප්‍රයුක්ත කායගතාසතිය යි:

ධර්මයෝ දෙදෙනෙක් වැඩියයුත්තාහ: ශමථය ද විදර්ශනාව ද යන දෙක යි.

ධර්මයෝ තිදෙනෙක් වැඩියයුත්තාහු යැ: (සවිතර්කසවිචාරාදි) තුන් සමාධිහු යැ.

ධර්මයෝ සතර දෙනෙක් වැඩියයුත්තාහු යැ: (කායානුපස්සනාදි) සතරසතිපට්ඨානයෝ යි.

ධර්මයෝ පස්දෙනෙක් වැඩිය යුත්තාහු යැ: (පීතිඵරණතාදි) පඤ්චාඞ්ගික වූ චතුර්ථධ්‍යානසමාධිය යි.

ධර්මයෝ සදෙනෙක් වැඩියයුත්තාහු යැ: (බුද්ධානුස්සති ආදි) සවැදෑරුම් අනුස්සතිස්ථානයෝ යි.

ධර්මයෝ සත්දෙනෙක් වැඩියයුත්තාහු යැ: සප්තබොධ්‍යඞ්ගයෝ යි.

ධර්මයෝ අටදෙනෙක් වැඩියයුත්තාහු යැ: ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය යි.

ධර්මයෝ නවදෙනෙක් වැඩියයුත්තාහු යැ: (ශීලවිශුද්ධිආදි) පරිශුද්ධිභාවයට ප්‍රධාන කාරණ වූ නවධර්මයෝ යි.

ධර්මයෝ දසදෙනෙක් වැඩියයුත්තාහු යැ: දසකසිණායතනයෝ යි.

ද්වෙ භාවනා: ලොකියා ච භාවනා, ලොකුත්තරා ච භාවනා.

තිස්සො භාවනා: රූපාවචරකුසලානං ධම්මානං භාවනා, අරූපාවචරකුසලානං ධම්මානං භාවනා, අපරියාපන්න[1] කුසලානං ධම්මානං භාවනා. රූපාවචරකුසලානං ධම්මානං භාවනා අත්ථි හීනා, අත්ථි මජ්ඣිමා, අත්ථි පණීතා. අරූපාවචරකුසලානං ධම්මානං භාවනා අත්ථි හීනා, අත්ථි මජ්ඣිමා, අත්ථි පණීතා. අපරියාපන්නකුසලානං ධම්මානං භාවනා පණීතා.

චතස්සො භාවනා: දුක්ඛසච්චං පරිඤ්ඤාපටිවෙධං පටිවිජ්ඣන්තො භාවෙති, සමුදයසච්චං පහානපටිවෙධං[2] පටිවිජ්ඣන්තො භාවෙති, නිරොධසච්චං සච්ඡිකිරියාපටිවෙධං පටිවිජ්ඣන්තො භාවෙති, මග්ගසච්චං භාවනාපටිවෙධං පටිවිජ්ඣන්තො භාවෙති. ඉමා චතස්සො භාවනා.

අපරාපි චතස්සො භාවනා. එසනා භාවනා, පටිලාභා භාවනා, එකරසා භාවනා, ආසෙවනා භාවනා.

කතමා එසනා භාවනා: සබ්බෙසං සමාධිං සමාපජ්ජන්තානං තත්ථ ජාතා ධම්මා එකරසා හොන්තීති අයං එසනා භාවනා.

කතමා පටිලාභා භාවනා: සබ්බෙසං සමාධිං සමාපන්නානං තත්ථ ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති අයං පටිලාභා භාවනා.

කතමා එකරසා භාවනා: අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං භාවයතො සද්ධින්ද්‍රියස්ස වසෙන චත්තාරි ඉන්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං[3] භාවයතො විරියින්ද්‍රියස්ස වසෙන චත්තාරි ඉන්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං භාවයතො සතින්ද්‍රියස්ස වසෙන චත්තාරි ඉන්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං භාවයතො සමාධින්ද්‍රියස්ස වසෙන චත්තාරි ඉන්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං භාවයතො පඤ්ඤින්ද්‍රියස්ස වසෙන චත්තාරි ඉන්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා.

අස්සද්ධියෙ අකම්පියට්ඨෙන සද්ධාබලං භාවයතො සද්ධාබලස්ස වසෙන චත්තාරි බලානි එකරසා හොන්තීති බලානං එකරසට්ඨෙන භාවනා, කොසජ්ජෙ අකම්පියට්ඨෙන විරියබලං භාවයතො විරියබලස්ස වසෙන චත්තාරි බලානි එකරසා හොන්තීති බලානං එකරසට්ඨෙන භාවනා, පමාදෙ අකම්පියට්ඨෙන සතිබලං භාවයතො සතිබලස්ස වසෙන චත්තාරි බලානි එකරසා හොන්තීති බලානං එකරසට්ඨෙන භාවනා, උද්ධච්චෙ අකම්පියට්ඨෙන සමාධිබලං භාවයතො සමාධිබලස්ස වසෙන චත්තාරි බලානි එකරසා හොන්තීති බලානං එකරසට්ඨෙන භාවනා, අවිජ්ජාය අකම්පියට්ඨෙන පඤ්ඤාබලං භාවයතො පඤ්ඤාබලස්ස වසෙන චත්තාරි බලානි එකරසා හොන්තීති බලානං එකරසට්ඨෙන භාවනා.

---

1 අපරියාපන්නානං - සයා. 2 පහානපටිවෙධං - මජසං, සයා.
3 වීරියින්ද්‍රියං - මජසං.

භාවනාවෝ දෙදෙනෙකි: ලෞකිකභාවනා යැ, ලොකොත්තරභාවනා යි.

භාවනාවෝ තිදෙනෙකි: රූපාවචරකුශලධර්මයන්ගේ භාවනා යැ, අරූපාවචරකුශලධර්මයන්ගේ භාවනා යැ, අපයර්‍යාපන්න (ලොකොත්තර) කුශලධර්මයන්ගේ භාවනා යි. රූපාවචරකුශලධර්මයන්ගේ හීන වූ භාවනාවක් ඇත. මධ්‍ය වූ භාවනාවක් ඇත. ප්‍රණීත වූ භාවනාවක් ඇති. අරූපාවචර කුශලධර්මයන්ගේ හීන වූ භාවනාවක් ඇත. මධ්‍ය වූ භාවනාවක් ඇත. ප්‍රණීත වූ භාවනාවක් ඇති. අපයර්‍යාපන්නකුශලධර්මයන්ගේ භාවනාව ප්‍රණීත යි.

භාවනා සතරෙකි: දුඃඛසත්‍යය පරිඥාප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කෙරෙමින් (ආර්‍යමාර්ගය) වඩයි. සමුදයසත්‍යය ප්‍රහාණප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කෙරෙමින් වඩයි. නිරොධසත්‍යය සාක්‍ෂාත්ක්‍රියාප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කෙරෙමින් වඩයි. මාර්ගසත්‍යය භාවනාප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කෙරෙමින් වඩයි. මොහු සතරභාවනා යි.

අනෙකුදු භාවනා සතරෙකි. එසනභාවනා යැ. පටිලාභභාවනා යැ. එකරසභාවනා යැ. ආසෙවනභාවනා යි.

එෂනභාවනා කවර යත්: සමවතට සමවන් සියල්ලන්ගේ ඒ පූර්වභාගයෙහි උපන් ධර්මයෝ අර්ණොත්පාදනයෙහි සමානකෘත්‍ය වෙත් නු යි මේ එසනභාවනා යැ.

ප්‍රතිලාභභාවනා කවර යත්: සමවතට සමවන් සියල්ලන්ගේ එහි උපන් ධර්මයෝ ඔවුනොවුන් නො ඉක්ම පවත්නාහු නු යි මේ ප්‍රතිලාභභාවනා යැ.

එකරසභාවනා කවර යත්: අධිමොක්‍ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය වඩන්නහුට ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ (විමුක්තිරසයෙන්) එකකෘත්‍ය වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසභාවයෙන් භාවනා යැ. ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රිය වඩන්නහුට වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ සමානකෘත්‍ය වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. අපිලාපනාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය වඩන්නහුට ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ සමානකෘත්‍ය වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය වඩන්නහුට සමාධීන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ සමානකෘත්‍ය වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රිය වඩන්නහුට ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ සමානකෘත්‍ය වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යි.

අශ්‍රද්ධායෙහි අකම්ප්‍යාර්ථයෙන් ශ්‍රද්ධාබලය වඩන්නහුට ශ්‍රද්ධාබලයාගේ වශයෙන් සතර බලයෝ සමානකෘත්‍ය වෙත් නු යි බලයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. කෞසීද්‍යයෙහි අකම්ප්‍යාර්ථයෙන් වීර්‍යබලය වඩන්නහුට වීර්‍යබලයාගේ වශයෙන් සතරබලයෝ සමානකෘත්‍ය වෙත් නු යි බලයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ප්‍රමාදයෙහි අකම්ප්‍යාර්ථයෙන් ස්මෘතිබලය වඩන්නහුට ස්මෘතිබලයාගේ වශයෙන් සතර බලයෝ එකරස වෙත් නු යි බලයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ඖද්ධත්‍යයෙහි අකම්ප්‍යාර්ථයෙන් සමාධිබලය වඩන්නහුට සමාධිබලයාගේ වශයෙන් සතර බලයෝ එකරස වෙත් නු යි බලයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. අවිද්‍යායෙහි අකම්ප්‍යාර්ථයෙන් ප්‍රඥාබලය වඩන්නහුට ප්‍රඥාබලයාගේ වශයෙන් සතර බලයෝ එකරස වෙත් නු යි බලයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යි.

උපට්ඨානට්ඨෙන සතිසම්බොජ්ඣඞ්ගං භාවයතො සතිසම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා, පවිචයට්ඨෙන ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවයතො ධම්මවිචය-සම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා, පග්ගහට්ඨෙන විරියසම්බොජ්ඣඞ්ගං භාවයතො විරියසම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා, ඵරණට්ඨෙන පීතිසම්බොජ්ඣඞ්ගං භාවයතො පීතිසම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා, උපසමට්ඨෙන පස්සද්ධිසම්බොජ්ඣ-ඞ්ගං භාවයතො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා, අවික්ඛෙපට්ඨෙන සමාධිසම්බොජ්ඣඞ්ගං භාවයතො සමාධිසම්බොජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා, පටිසඞ්ඛානට්ඨෙන උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවයතො උපෙක්ඛාසම්බො-ජ්ඣඞ්ගස්ස වසෙන ඡ බොජ්ඣඞ්ගා එකරසා හොන්තීති බොජ්ඣඞ්ගානං එකරසට්ඨෙන භාවනා.

දස්සනට්ඨෙන සම්මාදිට්ඨිං භාවයතො සම්මාදිට්ඨියා වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පං භාවයතො සම්මාසඞ්කප්පස්ස වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, පරිග්ගහට්ඨෙන සම්මාවාචං භාවයතො සම්මාවාචාය වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තං භාවයතො සම්මාකම්මන්තස්ස වසෙන සත්ත මග්ගඞ්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, වොදානට්ඨෙන සම්මාආජීවං භාවයතො සම්මාආජීවස්ස වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, පග්ගහට්ඨෙන සම්මාවායාමං භාවයතො සම්මාවායාමස්ස වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, උපට්ඨානට්ඨෙන සම්මාසතිං භාවයතො සම්මාසතියා වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා, අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධිං භාවයතො සම්මාසමාධිස්ස වසෙන සත්ත මග්ගඞ්ගා එකරසා හොන්තීති මග්ගඞ්ගානං එකරසට්ඨෙන භාවනා. අයං එකරසා භාවනා.

කතමා ආසෙවනා භාවනා: "ඉධ භික්ඛු පුබ්බන්හසමයම්පි[1] ආසෙවති, මජ්ඣන්තිකසමයම්පි[2] ආසෙවති, සායන්හසමයම්පි ආසෙවති, පුරෙභත්තම්පි ආසෙවති, පච්ඡාභත්තම්පි ආසෙවති, පුරිමෙපි යාමෙ ආසෙවති, මජ්ඣිමෙපි යාමෙ ආසෙවති, පච්ඡිමෙපි යාමෙ ආසෙවති, රත්තිම්පි ආසෙවති, දිවාපි ආසෙවති, රත්තින්දිවාපි ආසෙවති, කාලෙපි ආසෙවති, ජුණ්හෙපි ආසෙවති, වස්සෙපි ආසෙවති, හෙමන්තෙපි ආසෙවති, ගිම්හෙපි ආසෙවති, පුරිමෙපි වයොඛන්ධෙ ආසෙවති, මජ්ඣිමෙපි වයොඛන්ධෙ ආසෙවති, පච්ඡිමෙපි වයොඛන්ධෙ ආසෙවති. අයං ආසෙවනා භාවනා.

ඉමා චතස්සො භාවනා.

---

1 පුබ්බණ්හසමයං - මජසං. 2 මජ්ඣණ්හිකසමයම්පි - මජසං.

අපිලාපනාර්ථයෙන් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය වඩන්නහුට ස්මෘතිසම්බොධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ප්‍රවිචයාර්ථයෙන් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය වඩන්නහුට ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය වඩන්නහුට වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ස්ඵරණ (පැතිරීම්) අර්ථයෙන් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය වඩන්නහුට ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. උපශමාර්ථයෙන් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය වඩන්නහුට ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. අවික්ෂෙපාර්ථයෙන් සමාධිසම්බොධ්‍යඞ්ගය වඩන්නහුට සමාධිසම්බොධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ප්‍රතිසඞ්ඛ්‍යානාර්ථයෙන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය වඩන්නහුට උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ වශයෙන් ෂඩ්බොධ්‍යඞ්ගයෝ එකරස වෙත් නු යි බොධ්‍යඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යි.

දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය වඩන්නහුට සම්‍යග්දෘෂ්ටියගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. අභිනිරොපණාර්ථයෙන් සම්‍යක්සංකල්පය වඩන්නහුට සම්‍යක්සංකල්පයාගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. පරිග්‍රහාර්ථයෙන් සම්‍යග්වචනය වඩන්නහුට සම්‍යග්වචනයාගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. සමුත්ථානාර්ථයෙන් සම්‍යක්කර්මාන්තය වඩන්නහුට සම්‍යක්කර්මාන්තයාගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ව්‍යවදාන (පාරිශුද්ධි) අර්ථයෙන් සම්‍යගාජීවය වඩන්නහුට සම්‍යගාජීවයාගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. ප්‍රග්‍රහාර්ථයෙන් සම්‍යග්ව්‍යායාමය වඩන්නහුට සම්‍යග්ව්‍යායාමයාගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. උපස්ථානාර්ථයෙන් සම්‍යක්ස්මෘතිය වඩන්නහුට සම්‍යක්ස්මෘතියගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යැ. අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධිය වඩන්නහුට සම්‍යක්සමාධිහුගේ වශයෙන් සප්තමාර්ගාඞ්ගයෝ එකරස වෙත් නු යි මාර්ගාඞ්ගයන්ගේ එකරසාර්ථයෙන් භාවනා යි. මේ එකරස භාවනා යි.

ආසෙවනභාවනා කවර යත්: "මෙ සස්නෙහි මහණ තෙම පෙරවරු කාලයෙහි දු (වශීප්‍රාප්තසමාධිය) ආසෙවන කෙරෙයි. මධ්‍යාහනකාලයෙහි දු ආසෙවන කෙරෙයි. සවස්කාලයෙහි දු ආසෙවන කෙරෙයි. පෙරබත්හි දු ආසෙවන කෙරෙයි. පසුබත්හි දු ආසෙවන කෙරෙයි. පෙරයම්හි දු ආසෙවන කෙරෙයි. මැදියම්හි දු ආසෙවන කෙරෙයි. අළුයම්හි දු ආසෙවන කෙරෙයි. රැයි දු ආසෙවන කෙරෙයි. දවල්හි දු ආසෙවන කෙරෙයි. රෑදවල්හි දු ආසෙවන කෙරෙයි. කෘෂ්ණපක්ෂයෙහි දු ආසෙවන කෙරෙයි. ශුක්ලපක්ෂයෙහි දු ආසෙවන කෙරෙයි. වසන්හි දු ආසෙවන කෙරෙයි. හිමන්හි දු ආසෙවන කෙරෙයි. ගිම්හන්හි දු ආසෙවන කෙරෙයි. පළමුවයස්හි දු ආසෙවන කෙරෙයි. මැදිම්වයස්හි දු ආසෙවන කෙරෙයි. පැසිම්වයස්හි දු (වශීප්‍රාප්තසමාධිය) ආසෙවන කෙරෙයි. මේ ආසෙවනභාවනා යි.

මොහු සතර භාවනා යි.

අපරාපි චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, අසෙවනට්ඨෙන භාවනා.

කථං තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා:

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා. බ්‍යාපාදං පජහතො අබ්‍යාපාදවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ථිනමිද්ධං[1] පජහතො ආලොකසඤ්ඤාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, උද්ධච්චං පජහතො අවික්ඛෙපවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, විචිකිච්ඡං පජහතො ධම්මවවත්ථානවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, අවිජ්ජං පජහතො ඤාණවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, අරතිං පජහතො පාමොජ්ජවසෙන[2] ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා.

නීවරණෙ[3]. පජහතො පඨමජ්ඣානවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, විතක්කවිචාරෙ පජහතො දුතියජ්ඣානවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, පීතිං පජහතො තතියජ්ඣානවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සුඛදුක්ඛෙ පජහතො චතුත්ථජ්ඣානවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා.

---

1. ථිනමිද්ධං - මජසං. 2. පාමුජ්ජවසෙන - ස්‍යා 3. නීවරණං - PTS සී.

අනෙකුදු භාවනා සතරෙකි· (නෙක්ඛම්මාදි) භාවනාවිශෙෂයෙහි
උපන් (සමාධි ප්‍රඥා සඞ්ඛ්‍යාත යුගනද්ධ) ධර්මයන් (ඔවුනොවුන්)
නො ඉක්මැ පවත්නා බැවින් භාවනා යැ. (ශ්‍රද්ධාදි) ඉන්ද්‍රියයන්ගේ එකරස
භාවයෙන් භාවනා යැ. තදනුච්ඡවික වීර්‍යධුරභාවයෙන් භාවනා යැ.
ආසෙවනභාවයෙන් භාවනා යි

කිසෙයින් ඒ භාවනාවිශෙෂයෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණ-
භාවයෙන් (නො ඉක්මැ පවත්නා බැවින්) වූ භාවනා වෙයි යත්:

කාමච්ඡන්දය දුරලන්නාහට නෛෂ්ක්‍රම්‍යවශයෙන් උපන් (සමාධි-ප්‍රඥා
සඞ්ඛ්‍යාත යුගනද්ධ) ධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි
ඒ නෛෂ්ක්‍රම්‍යභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාව-
යෙන් වූ භාවනා යැ. ව්‍යාපාදය දුරලන්නාහට අව්‍යාපාදවශයෙන් උපන්
යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අව්‍යාපාද-
භාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ.
ථීනමිද්ධය දුරලන්නාහට ආලොකසංඥාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ
ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ආලොකසංඥාභාවනායෙහි
උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණයෙන් වූ භාවනා යැ. උද්ධච්චය දුර-
ලන්නාහට අවික්ෂෙපවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො
ඉක්මැ පවත්නාහු නු යි ඒ අවික්ෂෙපභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන්
අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. විචිකිච්ඡාව දුරලන්නාහට ධර්ම-
නිශ්චයවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ
පවත්නාහු නු යි ඒ ධම්මවවත්ථානභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන්
අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. අවිද්‍යාව දුරලන්නාහට ඥානවශයෙන්
උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ
ඥානභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා
යැ. අරතිය දුරලන්නාහට ප්‍රාමොද්‍යවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ
ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ප්‍රාමොද්‍යභාවනායෙහි
උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යි.

නීවරණයන් දුරලන්නාහට ප්‍රථමධ්‍යානවශයෙන් උපන් යුගනද්ධ
ධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ප්‍රථමධ්‍යාන-
භාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ
විතර්කවිචාරයන් දුරලන්නාහට ද්විතීයධ්‍යානවශයෙන් උපන් යුගනද්ධ-
ධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ද්විතීයධ්‍යානභාව-
නායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ.
ප්‍රීතිය දුරලන්නාහට තෘතීයධ්‍යානවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවු-
නොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ තෘතීයධ්‍යානභාවනායෙහි උපන්
යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. සුඛදුඃඛයන් දුර-
ලන්නාහට චතුර්ථධ්‍යානවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන්
නො ඉක්මැ පවත්නාහු නු යි ඒ චතුර්ථධ්‍යානභාවනායෙහි උපන් ධර්මයන්
අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යි.

රූපසඤ්ඤං පටිඝසඤ්ඤං නානත්තසඤ්ඤං පජහතො ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ආකාසානඤ්චායතනසඤ්ඤං පජහතො විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පජහතො ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පජහතො නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා.

නිච්චසඤ්ඤං පජහතො අනිච්චානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සුඛසඤ්ඤං පජහතො දුක්ඛානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, අත්තසඤ්ඤං පජහතො අනත්තානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, නන්දිං පජහතො නිබ්බිදානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, රාගං පජහතො විරාගානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සමුදයං පජහතො නිරොධානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ආදානං පජහතො පටිනිස්සග්ගානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඝනසඤ්ඤං[1] පජහතො ඛයානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤ නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ආයූහනං[2] පජහතො වයානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ධුවසඤ්ඤං පජහතො විපරිණාමානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, නිමිත්තං පජහතො අනිමිත්තානු-

---

1. ඝානසඤ්ඤං - PTS    2. ආයූහනං - සං PTS

රූපසංඥාව - ප්‍රතිඝසංඥාව - නානාත්වසංඥාව දුරලන්නාහට ආකාසානඤ්චායතන සමාපත්තිවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ආකාසානඤ්චායතන සමාපත්තිභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ආකාසානඤ්චායතනසංඥාව දුරලන්නාහට විඤ්ඤාණඤ්චායතනසමාපත්ති වශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ විඤ්ඤාණඤ්චායතනසමාපත්තිභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. විඤ්ඤාණඤ්චායතනසංඥාව දුරලන්නාහට ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති භාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ආකිඤ්චඤ්ඤායතනසංඥාව දුරලන්නාහට නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ නෙවසඤ්ඤානාසඤ්ඤායතනභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යි.

නිත්‍යසංඥාව දුරලන්නාහට අනිත්‍යානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අනිත්‍යානුදර්ශනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. සුඛසංඥාව දුරලන්නාහට දුඃඛානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ දුඃඛානුදර්ශනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ආත්මසංඥාව දුරලන්නාහට අනාත්මානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අනාත්මානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. නන්දිය (සප්‍රීතිකතෘෂ්ණාව) දුරලන්නාහට නිර්වේදානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ නිර්වේදානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ, රාගය (නිෂ්ප්‍රීතිකතෘෂ්ණාව) දුරලන්නාහට විරාගානුදර්ශනා වශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්ම පවත්නාහු නු යි ඒ විරාගානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. සමුදය දුරලන්නාහට නිරෝධානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ නිරෝධානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ආදානය (ග්‍රහණය) දුරලන්නාහට පටිනිස්සග්ගානුපස්සනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ පටිනිස්සග්ගානුපස්සනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ඝනසංඥාව දුරලන්නාහට ක්ෂයානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ක්ෂයානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. කර්මායූහනය දුරලන්නාහට ව්‍යයානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ව්‍යයානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ධ්‍රැවසංඥාව දුරලන්නාහට විපරිණාමානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ විපරිණාමානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන්

පස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, පණිධිං පජහතො අප්පණිහිතානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, අභිනිවෙසං පජහතො සුඤ්ඤතානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සාරාදානාභිනිවෙසං පජහතො අධිපඤ්ඤාධම්මවිපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සම්මොහාභිනිවෙසං පජහතො යථාභූතඤාණදස්සනවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ආලයාභිනිවෙසං පජහතො ආදීනවානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, අප්පටිසඞ්ඛං පජහතො පටිසඞ්ඛානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සඤ්ඤොගාභිනිවෙසං පජහතො විවට්ටනානුපස්සනාවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා.

දිට්ඨෙකට්ඨෙ කිලෙසෙ පජහතො සොතාපත්තිමග්ගවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඔළාරිකෙ කිලෙසෙ පජහතො සකදාගාමිමග්ගවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, අණුසහගතෙ කිලෙසෙ පජහතො අනාගාමිමග්ගවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, සබ්බකිලෙසෙ පජහතො අරහත්තමග්ගවසෙන ජාතා ධම්මා අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා.

එවං තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා.

වූ භාවනා යැ. (නිත්‍ය) නිමිත්තසංඥව දුරලන්නාහට අනිමිත්තානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අනිමිත්තානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ප්‍රණිධිය (සුඛ ප්‍රාර්ථනාව) දුරලන්නාහට අප්‍රණිහිතානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අප්‍රණිහිතානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ආත්මාභිනිවේශය දුරලන්නාහට ශූන්‍යතානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ශූන්‍යතානුදර්ශනා භාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. නිත්‍යසාරආත්මසාරාදි විසින් ග්‍රහණයාගේ අභිනිවේශය දුරලන්නාහට අධිප්‍රඥධර්මවිදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අධිප්‍රඥධර්මවිදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. සම්මොහාභිනිවේශය දුරලන්නාහට යථාභූතඥනදර්ශනවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ යථාභූතඥනදර්ශනභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. ආලයාභිනිවේශය දුරලන්නාහට ආදීනවානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ආදීනවානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. අනුපායග්‍රහණය දුරලන්නාහට පටිසඞ්ඛානුපස්සනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ පටිසඞ්ඛානුපස්සනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. සංයොගාභිනිවේශය (කාමයොගාදිකෙලශප්‍රවෘත්තිය) දුරලන්නාහට විවර්තානුදර්ශනාවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ විවර්තානුදර්ශනාභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ.

දෘෂ්ටීන් හා සමග එක් තැන්හි සිටි කෙලශයන් දුරලන්නාහට ස්‍රොතාපත්තිමාර්ගවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ ස්‍රොතාපත්තිමාර්ගභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ ඖදරික (කාමරාගව්‍යාපාද) කෙලශයන් දුරලන්නාහට සකෘදාගාමිමාර්ගවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ සකෘදාගාමිමාර්ගභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. අණුසහගත (කාමරාග-ව්‍යාපාද) කෙලශයන් දුරලන්නාහට අනාගාමිමාර්ගවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අනාගාමිමාර්ගභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යැ. සියලු කෙලශයන් දුරලන්නාහට අර්හත්මාර්ගවශයෙන් උපන් යුගනද්ධධර්මයෝ ඔවුනොවුන් නො ඉක්මැ පවත්නාහු නු යි ඒ අර්හත්මාර්ගභාවනායෙහි උපන් යුගනද්ධධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යි.

මෙසෙයින් ඒ භාවනාවිශෙෂයෙහි උපන් යුගනද්ධ ධර්මයන් අනතික්‍රමණභාවයෙන් වූ භාවනා යි.

කථං ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා.

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන පඤ්චින්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, බ්‍යාපාදං පජහතො අබ්‍යාපාදවසෙන පඤ්චින්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා -පෙ- සබ්බකිලෙසෙ පජහතො අරහත්තමග්ගවසෙන පඤ්චින්ද්‍රියානි එකරසා හොන්තීති ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා.

එවං ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා.

කථං තදුපගවිරියවාහනට්ඨෙන භාවනා:

කාමච්ඡන්දං පජහන්තො[1] නෙක්ඛම්මවසෙන විරියං[2] වාහෙතීති තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, බ්‍යාපාදං පජහන්තො[1] අබ්‍යාපාදවසෙන විරියං[2] වාහෙතීති තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, –පෙ– සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන විරියං[2] වාහෙතීති තදුපගවිරියවාහනට්ඨෙන භාවනා.

එවං තදුපගවිරියවාහනට්ඨෙන භාවනා.

කථං ආසෙවනට්ඨෙන භාවනා:

කාමච්ඡන්දං පජහන්තො[1] නෙක්ඛම්මං ආසෙවතීති ආසෙවනට්ඨෙන භාවනා, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදං ආසෙවතීති ආසෙවනට්ඨෙන භාවනා –පෙ– සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගං ආසෙවතීති ආසෙවනට්ඨෙන භාවනා.

එවං ආසෙවනට්ඨෙන භාවනා. ඉමා චතස්සො භාවනා.

රූපං පස්සන්තො භාවෙති, වෙදනං පස්සන්තො භාවෙති, සඤ්ඤං පස්සන්තො භාවෙති, සඞ්ඛාරෙ පස්සන්තො භාවෙති, විඤ්ඤාණං පස්සන්තො භාවෙති. චක්ඛුං –පෙ– ජරාමරණං –පෙ– අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන පස්සන්තො භාවෙති.

යෙ යෙ ධම්මා භාවිතා හොන්ති, තෙ තෙ ධම්මා එකරසා හොන්ති. තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: "ඉමෙ ධම්මං භාවෙතබ්බං'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණ"න්ති.

**භාවෙතබ්බනිද්දෙසො**

**චතුත්ථො භාණවාරො.**

1. පජහතො - මජසං. සයා. 2 විරියං - මජසං.

කිසෙයින් ඉන්ද්‍රියයන්ගේ එකරස (කෘත්‍ය) භාවයෙන් භාවනා වෙයි යත්:

කාමච්ඡන්දය දුරලන්නාහට නෛෂ්ක්‍රම්‍යවශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ (විමුක්තිරසයෙන් හෝ කෘත්‍යරසයෙන්) එකරස වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසභාවයෙන් භාවනා යෑ. ව්‍යාපාදය දුරලන්නාහට අව්‍යාපාදවශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ එකරස වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසභාවයෙන් භාවනා යෑ ... සියලු කෙලෙශයන් දුරලන්නාහට අර්හත්මාර්ගවශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ එකරස වෙත් නු යි ඉන්ද්‍රියයන්ගේ එකරසභාවයෙන් භාවනා යි.

මෙසෙයින් ඉන්ද්‍රියයන්ගේ එකරසභාවයෙන් භාවනා වේ.

කිසෙයින් තදනුච්ඡවිකවීර්‍යධුරභාවයෙන් භාවනා වෙයි යත්:

කාමච්ඡන්දය දුරලන්නේ නෛෂ්ක්‍රම්‍යවශයෙන් වීර්‍යය පවත්වා නු යි. තදනුච්ඡවිකවීර්‍යධුරභාවයෙන් භාවනා යෑ. ... ව්‍යාපාදය දුරලන්නේ අව්‍යාපාදවශයෙන් වීර්‍යය පවත්වා නු යි තදනුච්ඡවිකවීර්‍යධුරභාවයෙන් භාවනා යෑ. ... සියලු කෙලෙශයන් දුරලන්නේ අර්හත්මාර්ගවශයෙන් වීර්‍යය පවත්වා නු යි තදනුච්ඡවිකවීර්‍යධුරභාවයෙන් භාවනා යි.

මෙසෙයින් තදනුච්ඡවිකවීර්‍යධුරභාවයෙන් භාවනා වේ.

කිසෙයින් ආසෙවනාර්ථයෙන් භාවනා වෙයි යත්:

කාමච්ඡන්දය දුරලන්නේ නෛෂ්ක්‍රම්‍යය ආසෙවන කෙරේ නු යි ආසෙවනාර්ථයෙන් භාවනා යෑ. ව්‍යාපාදය දුරලන්නේ අව්‍යාපාදය ආසෙවන කෙරේ නු යි ආසෙවනාර්ථයෙන් භාවනා යෑ. ... සියලු කෙලෙශයන් දුරලන්නේ අර්හත්මාර්ගය ආසෙවන කෙරේ නු යි ආසෙවනාර්ථයෙන් භාවනා යි.

මෙසෙයින් ආසෙවනාර්ථයෙන් භාවනා වේ. මොහු සතර භාවනා යි.

රූපය (අනිත්‍යාදි වශයෙන්) දක්නේ (භාවිතව්‍යභාවනාව) වඩයි. වේදනාව (අනිත්‍යාදිවශයෙන්) දක්නේ (භාවිතව්‍යභාවනාව) වඩයි. සංඥාව (අනිත්‍යාදිවශයෙන්) දක්නේ (භාවිතව්‍යභාවනාව) වඩයි. සංස්කාරයන් (අනිත්‍යාදිවශයෙන්) දක්නේ (භාවිතව්‍යභාවනාව) වඩයි. විඥානය (අනිත්‍යාදි වශයෙන්) දක්නේ (භාවිතව්‍යභාවනාව) වඩයි. චක්ෂුස ... ජරාමරණය ... අමතොගධනිර්වාණය නිෂ්ඨාර්ථයෙන් දක්නේ (භාවිතව්‍යභාවනාව) වඩයි.

යම් යම් ධර්ම කෙනෙක් වඩනු ලද්දාහු වෙත් ද ඒ ඒ ධර්මයෝ එකරස වෙත්. එය ඥාතාර්ථයෙන් ඥාන යෑ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යෑ. එයින් කියනු ලැබෙයි. **"ඉමෙ ධම්මා භාවෙතබ්බා'ති සොතාවධානං තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං"යි.**

**භාවෙතබ්බනිද්දෙස යි.**

**සතරවැනි බණවර යි.**

## (6)

කථං 'ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

එකො ධම්මො සච්ඡිකාතබ්බො: අකුප්පා චෙතොවිමුත්ති.

ද්වෙ ධම්මා සච්ඡිකාතබ්බා: විජ්ජා ච විමුත්ති ච.

තයො ධම්මා සච්ඡිකාතබ්බා: තිස්සො විජ්ජා.

චත්තාරො ධම්මා සච්ඡිකාතබ්බා: චත්තාරි සාමඤ්ඤඵලානි.

පඤ්ච ධම්මා සච්ඡිකාතබ්බා: පඤ්ච ධම්මක්ඛන්ධා.

ඡ ධම්මා සච්ඡිකාතබ්බා: ඡ අභිඤ්ඤා.

සත්ත ධම්මා සච්ඡිකාතබ්බා: සත්ත ඛීණාසවබලානි.

අට්ඨ ධම්මා සච්ඡිකාතබ්බා: අට්ඨ විමොක්ඛා.

නව ධම්මා සච්ඡිකාතබ්බා: නව අනුපුබ්බනිරොධා.

දස ධම්මා සච්ඡිකාතබ්බා: දස අසෙක්ඛා ධම්මා.

"සබ්බං භික්ඛවෙ, සච්ඡිකාතබ්බං, කිඤ්ච භික්ඛවෙ, සබ්බං සච්ඡිකාතබ්බං:

චක්ඛුං[1] භික්ඛවෙ, සච්ඡිකාතබ්බං, රූපා සච්ඡිකාතබ්බා, චක්ඛුවිඤ්ඤාණං සච්ඡිකාතබ්බං, චක්ඛුසම්ඵස්සො සච්ඡිකාතබ්බො, යම්පිදං.[2] චක්ඛුසම්ඵස්ස-පච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි සච්ඡිකාතබ්බං.

සොතං සච්ඡිකාතබ්බං, සද්දා සච්ඡිකාතබ්බා -පෙ- ඝානං සච්ඡිකා-තබ්බං, ගන්ධා සච්ඡිකාතබ්බා -පෙ- ජිව්හා සච්ඡිකාතබ්බා, රසා සච්ඡිකාතබ්බා -පෙ- කායො සච්ඡිකාතබ්බො, ඵොට්ඨබ්බා සච්ඡිකාතබ්බා -පෙ- මනො සච්ඡිකාතබ්බො, ධම්මා සච්ඡිකාතබ්බා, මනොවිඤ්ඤාණං සච්ඡිකාතබ්බං, මනොසම්ඵස්සො සච්ඡිකාතබ්බො, යම්පිදං[2] මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි සච්ඡිකාතබ්බං.[a]

රූපං පස්සන්තො සච්ඡිකරොති, වෙදනං පස්සන්තො සච්ඡිකරොති, සඤ්ඤං පස්සන්තො සච්ඡිකරොති, සඞ්ඛාරෙ පස්සන්තො සච්ඡිකරොති, විඤ්ඤාණං පස්සන්තො සච්ඡිකරොති, චක්ඛුං -පෙ- ජරාමරණං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන පස්සන්තො සච්ඡිකරොති.

---

1 චක්ඛු - මජසං. 2 යදිදං - PTS.

a වෙදනාසංයුත්ත - අනිච්චවග්ග - සත්තමං

## (6)

කිසෙයිත් මේ ධර්මයෝ සාක්‍ෂාත්කර්තව්‍යහ යන දෙශනාව සොතාවධාන (ශ්‍රැතය) වේ ද, එය දැනගන්නා ප්‍රඥව ශ්‍රැතමයඥන වෙයි යත්:

එක් ධර්මයෙක් සාක්‍ෂාත්කර්තව්‍ය යැ: අර්හත්ඵල විමුක්තිය යි.

ධර්මයෝ දෙදෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: ත්‍රිවිද්‍යා ද අර්හත්ඵලය ද යන දෙක යි.

ධර්මයෝ තුන් දෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: ත්‍රිවිද්‍යා යි.

ධර්මයෝ සතරදෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: සතර ශ්‍රාමණ්‍ය ඵලයෝ යි.

ධර්මයෝ පස්දෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: පඤ්චවිධ ධර්මස්කන්ධයෝ යි.

ධර්මයෝ සදෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: ෂඩ්අභිඥවෝ යි.

ධර්මයෝ සත්දෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: සප්ත ක්‍ෂීණාස්‍රව බලයෝ යි.

ධර්මයෝ අටදෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: අෂ්ටවිමොක්‍ෂයෝ යි.

ධර්මයෝ නවදෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: නවඅනුපූර්විනිරොධයෝ යි.

ධර්මයෝ දසදෙනෙක් සාක්‍ෂාත්කර්තව්‍ය වෙති: දශඅශෛක්‍ෂ ධර්මයෝ යි.

## (7)

මහණෙනි, සියල්ල සාක්‍ෂාත්කර්තව්‍ය යැ. මහණෙනි, කවර සියල්ල සාක්‍ෂාත්කර්තව්‍ය වෙයි යත්:

මහණෙනි, චක්‍ෂුස සාක්‍ෂාත්කර්තව්‍ය යැ. රූපයෝ සාක්‍ෂාත්කර්තව්‍යයෝ යැ. චක්‍ෂුර්විඥනය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. චක්‍ෂුර්විඥනසම්ප්‍රයුක්ත ස්පර්ශය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. චක්‍ෂුඃස්පර්ශප්‍රත්‍යයෙන් සුඛ වූ හෝ දුක්ඛ වූ හෝ අදුක්ඛමසුඛ වූ හෝ යම් වේදනායෙක් උපදී නම් හෙ ද සාක්‍ෂාත්කර්තව්‍ය යි.

ශ්‍රොත්‍රය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. ශබ්දයෝ සාක්‍ෂාත්කර්තව්‍යයෝ යැ .. ඝ්‍රාණය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. ගන්ධයෝ සාක්‍ෂාත්කර්තව්‍යයෝ යැ ... ජිහ්වාව සාක්‍ෂාත්කර්තව්‍ය යැ. රසයෝ සාක්‍ෂාත්කර්තව්‍යයෝ යැ ... කය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. ස්ප්‍රෂ්ටව්‍යයෝ සාක්‍ෂාත්කර්තව්‍යයෝ යැ ... මනස සාක්‍ෂාත්කර්තව්‍ය යැ. ධර්මයෝ සාක්‍ෂාත්කර්තව්‍යයෝ යැ. මනොවිඥනය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. මනඃස්පර්ශය සාක්‍ෂාත්කර්තව්‍ය යැ. මනඃස්පර්ශප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදනායෙක් උපදී නම් හෙ ද සාක්‍ෂාත්කර්තව්‍ය යි.

රූපය (අනිත්‍යාදි වශයෙන්) දක්මින් ප්‍රත්‍යක්‍ෂ කෙරෙයි. වෙදනාව දක්මින් ප්‍රත්‍යක්‍ෂ කෙරෙයි. සංඥව දක්මින් ප්‍රත්‍යක්‍ෂ කෙරෙයි. සංස්කාරයන් දක්මින් ප්‍රත්‍යක්‍ෂ කෙරෙයි. විඥනය දක්මින් ප්‍රත්‍යක්‍ෂ කෙරෙයි. චක්‍ෂුස ... ජරාමරණ ... අමතොගධ නිර්වාණය නිර්වාණාර්ථයෙන් දක්මින් ප්‍රත්‍යක්‍ෂ කෙරේ.

යෙ යෙ ධම්මා සච්ඡිකතා හොන්ති, තෙ තෙ ධම්මා ඵස්සිතා හොන්ති, තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති "ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා"ති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණ"න්ති.

**සච්ඡිකාතබ්බනිද්දෙසො.**

## (8)

**කථං** "ඉමෙ ධම්මා හානභාගියා, ඉමෙ ධම්මා ඨිතිභාගියා, ඉමෙ ධම්මා විසෙසභාගියා, ඉමෙ ධම්මා නිබ්බෙධභාගියා"ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

**පඨමස්ස ඣානස්ස**[1] ලාභිං කාමසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති ඨිතිභාගියො ධම්මො. අවිතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

**දුතියස්ස ඣානස්ස**[2] ලාභිං විතක්කසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති, ඨිතිභාගියො ධම්මො. උපෙක්ඛාසුඛසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

**තතියස්ස ඣානස්ස**[3] ලාභිං පීතිසුඛසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති, ඨිතිභාගියො ධම්මො. අදුක්ඛමසුඛසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

**චතුත්ථස්ස ඣානස්ස**[4] ලාභිං උපෙක්ඛාසුඛසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති, ඨිතිභාගියො ධම්මො. ආකාසානඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

---

1 පඨමජ්ඣානස්ස - ස්‍යා, PTS  2 දුතියජ්ඣානස්ස - ස්‍යා, PTS.
3 තතියජ්ඣානස්ස - ස්‍යා, PTS.  4 චතුත්ථජ්ඣානස්ස - ස්‍යා, PTS.

යම් යම් ධර්ම කෙනෙක් (ආලම්බන-ප්‍රතිලාභ විසින්) ප්‍රත්‍යක්‍ෂ කරන ලද්දාහු වෙත් ද ඒ ඒ ධර්මයෝ ස්පර්ශ කරන ලද්දාහු වෙත්. එය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි **“ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා’ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං” යි.**

**සච්ඡිකාතබ්බනිද්දෙස යි.**

(8)

කිසෙසින් ‘මේ ධර්මයෝ පරිහාණීය සෙවුනාහ, මේ ධර්මයෝ ස්ථිතිය සෙවුනාහ, මේ ධර්මයෝ විශේෂය සෙවුනාහ, මේ ධර්මයෝ නිර්වේධය සෙවුනාහ යන දෙශනාව සොතාවධාන වෙයි, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන වෙයි යත්:

ප්‍රථමධ්‍යානලාභීහට කාමසහගත (වස්තුකාම–ක්ලේශකාමාලම්බන) සංඥාමනසකාරයෝ පවතිත් නම් හානභාගියධර්ම වෙයි. ඒ ප්‍රථමධ්‍යානය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. අවිතර්ක සහගත (ද්විතීයධ්‍යානාලම්බන) වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගියධර්ම වෙයි. විරාගුපසංහිත වූ නිර්වේදසහගත (විදර්ශනාලම්බන) වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

ද්විතීයධ්‍යානලාභීහට විතර්කසහගත (ප්‍රථමධ්‍යානාලම්බන) වූ සංඥා-මනසකාරයෝ පවතිත් නම් හානභාගියධර්ම වෙයි. ඒ ද්විතීයධ්‍යානය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. උපෙක්‍ෂා සහගත (තෘතීයධ්‍යානාලම්බන) වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගියධර්ම වෙයි. විරාගුපසංහිත වූ නිර්වේදසහගත සංඥාමනසකා-රයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

තෘතීයධ්‍යානලාභීහට ප්‍රීතිසුඛසහගත (ද්විතීයධ්‍යානාලම්බන) වූ සංඥා-මනසකාරයෝ පවතිත් නම් හානභාගියධර්ම වෙයි. ඒ තෘතීයධ්‍යානය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. උපෙක්‍ෂා-සුඛසහගත (චතුර්ථධ්‍යානාලම්බන) වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගියධර්ම වෙයි. විරාගුපසංහිත වූ නිර්වේදසහගත සංඥාමනසකා-රයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

චතුර්ථධ්‍යානලාභීහට උපෙක්‍ෂාසුඛසහගත (තෘතීයධ්‍යානාලම්බන) වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් හානභාගියධර්ම වෙයි. ඒ චතුර්ථධ්‍යානය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. ආකාසා-නඤ්චායතනාරම්මණ වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගිය ධර්ම වෙයි. විරාගුපසංහිත වූ නිර්වේදසහගත (විදර්ශනාලම්බන) වූ සංඥා-මනසකාරයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

ආකාසානඤ්චායතනස්ස ලාභිං රූපසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති, ඨිතිභාගියො ධම්මො. විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

විඤ්ඤාණඤ්චායතනස්ස ලාභිං ආකාසානඤ්චායතනසහගතා සඤ්ඤා-මනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති, ඨිතිභාගියො ධම්මො. ආකිඤ්චඤ්ඤායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

ආකිඤ්චඤ්ඤායතනස්ස ලාභිං විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤා-මනසිකාරා සමුදාචරන්ති, හානභාගියො ධම්මො. තදනුධම්මතා සති සන්තිට්ඨති, ඨිතිභාගියො ධම්මො. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති, විසෙසභාගියො ධම්මො. නිබ්බිදාසහගතා සඤ්ඤාමනසිකාරා සමුදාචරන්ති විරාගූපසංහිතා, නිබ්බෙධභාගියො ධම්මො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: "ඉමෙ ධම්මා හානභාගියා, ඉමෙ ධම්මා ඨිතිභාගියා, ඉමෙ ධම්මා විසෙස-භාගියා, ඉමෙ ධම්මා නිබ්බෙධභාගියා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණන්ති."

### හානභාගියචතුක්කනිද්දෙසො.

## (9)

කථං "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා, සබ්බෙ ධම්මා අනත්තා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං."

'රූපං අනිච්චං ඛයට්ඨෙන, දුක්ඛං භයට්ඨෙන, අනත්තා අසාර-කට්ඨෙනා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං.

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චං ඛයට්ඨෙන, දුක්ඛං භයට්ඨෙන, අනත්තා අසාරකට්ඨෙනා'ති සොතාවධානං. තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං. තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා, සබ්බෙ ධම්මා අනත්තා'ති සොතාවධානං, තං පජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං."

### ලක්ඛණත්තිකනිද්දෙසො.

ආකාසානඤ්චායතනලාභීහට රූපසහගත (රූපධ්‍යානාලම්බන) වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් හානභාගිය ධර්ම වෙයි, ඒ ආකාසානඤ්චායතනය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. විඤ්ඤාණඤ්චායතන සගගත වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගියධර්ම වෙයි. විරාගූපසංහිත වූ නිර්වේදසහගත වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

විඤ්ඤාණඤ්චායතනලාභීහට ආකාසානඤ්චායතන සහගත වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් හානභාගියධර්ම වෙයි, ඒ විඤ්ඤාණඤ්චායතනය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. ආකිඤ්චඤ්ඤායතනසහගත වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගියධර්ම වෙයි. විරාගූපසංහිත වූ නිර්වේදසහගත සංඥාමනසකාරයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

ආකිඤ්චඤ්ඤායතනලාභීහට විඤ්ඤාණඤ්චායතන සහගත වූ සංඥාමනසිකාරයෝ පවතිත් නම් හානභාගියධර්ම වෙයි. ඒ ආකිඤ්චඤ්ඤායතනය අනුව පවත්නා නිකාන්තිය පිහිටා නම් ස්ථිතිභාගියධර්ම වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සහගත වූ සංඥාමනසකාරයෝ පවතිත් නම් විශෙෂභාගියධර්ම වෙයි. විරාගූපසංහිත වූ නිර්වේදසහගත සංඥාමනසකාරයෝ පවතිත් නම් නිර්වේධභාගියධර්ම වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන නමැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා නම්. එයින් කියනු ලැබෙයි: **"ඉමෙ ධම්මා හානභාගියා, ඉමෙ ධම්මා ඨිතිභාගියා, ඉමෙ ධම්මා විසෙසභාගියා, ඉමෙ ධම්මා නිබ්බෙධභාගියාති සොතාවධානං, තංපජානනා පඤ්ඤා, සුතමයෙ ඤාණං"** යි.

හානභාගියචතුක්කනිද්දෙස යි.

## (9)

කිසෙයින් සියලු සංසකාරයෝ අනිත්‍යයෝ යැ සියලු සංසකාරයෝ දුඃඛයෝ යැ සියලු ධර්මයෝ අනාත්මයෝ යැ යන දෙශනාව සොතාවධාන වේ ද, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමයඥාන වේ ද යත්:

රූපය ක්‍ෂය වන බැවින් අනිත්‍ය යැ. ප්‍රතිභය සහිත බැවින් දුඃඛ යැ. ආත්මසාර රහිත බැවින් අනාත්ම යැ යනු සොතාවධාන (ශ්‍රැත) යැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමයඥාන යි.

වෙදනාව ... සංඥාව ... සංසකාරයෝ විඥානය ... චක්ෂුස ... ජරාමරණය ක්‍ෂය වන බැවින් අනිත්‍ය යැ. ප්‍රතිභය සහිත බැවින් දුඃඛ යැ. ආත්මසාර රහිත බැවින් අනාත්ම යැ යනු සොතාවධාන යැ. එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රැතමයඥාන යි. එය ඥාතාර්ථයෙන් ඥාන නමැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා නම්. එයින් කියනු ලැබෙයි: **"සබ්බෙ සඞ්ඛාරා අනිච්චා සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා සබ්බෙ ධම්මා අනත්තා'ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං"** යි.

**ලක්ඛණත්තිකනිද්දෙස යි.**

## (10)

කථං 'ඉදං දුක්ඛං අරියසච්චං, ඉදං දුක්ඛසමුදයො අරියසච්චං, ඉදං දුක්ඛනිරොධො[1] අරියසච්චං, ඉදං දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්ච'න්ති සොතාවධානං. තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණං:

තත්ථ කතමං දුක්ඛං අරියසච්චං: ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා මරණම්පි දුක්ඛං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාපි දුක්ඛා අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා[2] දුක්ඛා.

තත්ථ කතමා ජාති: යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො, අයං වුච්චති ජාති.

තත්ථ කතමා ජරා: යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො, අයං වුච්චති ජරා.

තත්ථ කතමං මරණං: යා තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස[3] නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො, ඉදං වුච්චති මරණං.

තත්ථ කතමො සොකො: යො ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තො සොකො අන්තො පරිසොකො චෙතසො පරිජ්ඣායනා දොමනස්සං සොකසල්ලං, අයං වුච්චති සොකො.

තත්ථ කතමො පරිදෙවො: යො ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා ලාලප්පිතත්තං, අයං වුච්චති පරිදෙවො.

---

1 දුක්ඛනිරොධං - මජසං. 2 ඛන්ධාපි - PTS

3. කළෙබරස්ස - මජසං, සයා

(10)

කිසෙයින් මේ දුඃඛාර්ය්‍යසත්‍ය යැ, මේ දුඃඛසමුදයාර්ය්‍යසත්‍ය යැ, මේ දුඃඛනිරොධාර්ය්‍යසත්‍ය යැ, මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්ය්‍යසත්‍ය යැ යන දෙශනාව සොතාවධාන වෙයි, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමයඥාන වෙයි යත්:

එහි 'දුඃඛාර්ය්‍යසත්‍යය' කවරෙ යත්: ජාතිය ද දුක යැ, ජරාව ද දුක යැ, මරණය ද දුක යැ, සොකපරිදෙවදුක්ඛදොමනස්සඋපායාසයෝ ද දුඃඛයෝ යැ, අප්‍රියයන් හා සමග එක්වීම දුක යැ, ප්‍රියයන් කෙරෙන් වෙන්වීම දුක යැ, යම් හෙයෙකින් ඉස්නේ නො ලබා නම් හෙ ද දුක යැ, සැකෙවින් පඤ්චොපාදානස්කන්ධයෝ දුඃඛයෝ යි.

එහි 'ජාති' කවර යත්: ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙහි යම් ඉපදීමෙක් මොනොවට ඉපදීමෙක් අවක්‍රාන්තියෙක් ප්‍රකට වැ පහළ-වීමෙක් ස්කන්ධයන්ගේ පහළවීමෙක් ආයතනයන්ගේ පහළවීමෙක් වේ ද මේ 'ජාති' යයි කියනු ලැබේ.

එහි 'ජරා' කවර යත්: ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙහි යම් දිරීමෙක් දිරන බවෙක් (දන්තාදීන්ගේ) කැඩුණු බවෙක් (කෙශාදීන්ගේ) පැසුණු බවෙක් ඇඟරැළි වැටුණු බවෙක් ආයුෂයාගේ පිරිහීමෙක් ඉන්ද්‍රිය-යන්ගේ මිහිකිරීමෙක් වේ ද මේ 'ජරා' යයි කියනු ලැබේ.

එහි 'මරණ' කවරෙ යත්: ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකා-යෙන් යම් ච්‍යුතියෙක් ච්‍යුත වන බවෙක් (ස්කන්ධයන්ගේ) බිඳීමෙක් අතුරුදහන් වීමෙක් මෘත්‍යු සඞ්ඛ්‍යාත මරණයෙක් කාලක්‍රියායෙක් ස්කන්ධයන්ගේ භෙදයෙක් කලෙවරයාගේ නික්‍ෂෙපයෙක් ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීමෙක් වේ ද මේ 'මරණ' යයි කියනු ලැබේ.

එහි 'ශොක' කවරෙ යත්: ඥාතිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ භොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ රොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ ශීලව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ දෘෂ්ටිව්‍යසන-යෙන් හෝ පහස්නා ලද්දහුගේ අන්‍යතරාන්‍යතර ව්‍යසනයෙකින් සමන්විත-වූවහුගේ අන්‍යතරාන්‍යතර දුඃඛහෙතුවෙකින් පහස්නා ලද්දහුගේ යම් ශොකයෙක් ශොක කරන අයුරෙක් ශොක කළ බවෙක් ඇතුළත ශොකයෙක් ඇතුළත පරිශොකයෙක් චිත්තයාගේ හාත්පස දැවීමෙක් දෞර්මනසෙක් ශොකශල්‍යයෙක් වේ ද මේ 'ශොක' යයි කියනු ලැබේ.

එහි 'පරිදෙව' කවරෙ යත්: ඥාතිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ භොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ රොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ ශීලව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ දෘෂ්ටි-ව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ අන්‍යතරාන්‍යතරව්‍යසනයෙකින් යුක්ත වූවහුගේ අන්‍යතරාන්‍යතර දුක් හෙතුවෙකින් පහස්නා ලද්දහුගේ යම් නම කියා හැඬීමෙක් ගුණ කියා හැඬීමෙක් නම කියා හඬන අයුරෙක් ගුණ කියා හඬන අයුරෙක් නම කියා හඬන බවෙක් ගුණ කියා හඬන බවෙක් වචනයෙක් ප්‍රලාපයෙක් විප්‍රලාපයෙක් පුනපුනා ලපනයෙක් ලපනාකාරයෙක් ලාලප්පිත බවෙක් වේ ද මේ 'පරිදෙව' යි කියනු ලැබේ.

තත්ථ කතමං දුක්ඛං: යං කායිකං අසාතං, කායිකං දුක්ඛං, කායසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං, කායසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, ඉදං වුච්චති දුක්ඛං.

තත්ථ කතමං දොමනස්සං: යං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං, චෙතොසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා, ඉදං වුච්චති දොමනස්සං.

තත්ථ කතමො උපායාසො: යො ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආයාසො උපායාසො[1] ආයාසිතත්තං උපායාසිතත්තං, අයං වුච්චති උපායාසො.

තත්ථ කතමො අප්පියෙහි සම්පයොගො දුක්ඛො: ඉධ යස්ස[2] තෙ හොන්ති අනිට්ඨා අකන්තා අමනාපා රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා, යෙ වා පනස්ස තෙ හොන්ති අනත්ථකාමා අහිතකාමා අඵාසුකාමා අයොගක්ඛෙමකාමා, යා තෙහි[3] සඞ්ගති සමාගමො සමොධානං මිස්සීභාවො, අයං වුච්චති අප්පියෙහි සම්පයොගො දුක්ඛො.

තත්ථ කතමො පියෙහි විප්පයොගො දුක්ඛො: ඉධ යස්ස[2] තෙ හොන්ති, ඉට්ඨා කන්තා මනාපා රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා, යෙ වා පනස්ස තෙ හොන්ති අත්ථකාමා හිතකාමා ඵාසුකාමා යොගක්ඛෙමකාමා, මාතා වා පිතා වා භාතා වා භගිනී වා මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා[4] යා තෙහි[3] අසඞ්ගති අසමාගමො අසමොධානං අමිස්සීභාවො, අයං වුච්චති පියෙහි විප්පයොගො දුක්ඛො.

තත්ථ කතමං යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං: ජාතිධම්මානං සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති: 'අහො වත මයං න ජාතිධම්මා අස්සාම, න ච වත නො ජාති ආගච්ඡෙය්‍යා'ති, න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං. ජරාධම්මානං සත්තානං -පෙ- ව්‍යාධිධම්මානං සත්තානං -පෙ- මරණධම්මානං සත්තානං -පෙ- සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මානං සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති: 'අහො වත මයං න සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා අස්සාම, න ච වත නො සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා ආගච්ඡෙය්‍යු'න්ති. න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

---

1 'ආයාසතා උපායාසතා' ඉති - මජසං., PTS. 2 යස්ස - මජසං.
3 තෙහි සද්ධිං - මජසං. 4 මිත්තාමච්චා වා ඤාතිසාලොහිතා වා - විප.

එහි **'දුක්ඛ'** කවරෙ යත්: කායික වූ යම් නොමිහිරෙක් කායික වූ දුකෙක් කායසංස්පර්ශයෙහි උපන් අසාත වූ දුඃඛවෙදයිතයෙක් කායසංස්පර්ශයෙහි උපන් අසාත වූ දුඃඛවෙදනායෙක් වේ ද මේ 'දුක'යි කියනු ලැබේ.

එහි **'දෞර්මනස්ස'** කවරෙ යත්: චෛතසික වූ යම් නොමිහිරෙක් චෛතසික වූ දුකෙක් චිත්තසංස්පර්ශයෙහි උපන් අසාත වූ දුඃඛවෙදයිතයෙක් චිත්තසංස්පර්ශයෙහි උපන් අසාත වූ දුඃඛවෙදනායෙක් වේ ද මේ 'දෞර්මනස්ස'යි කියනු ලැබේ.

එහි **'උපායාස'** කවරෙ යත්: ඥාතිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ භොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ රොගව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ ශීලව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ දෘෂ්ටිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ අන්‍යතරාන්‍යතර ව්‍යසනයෙකින් යුක්ත වූවහුගේ අන්‍යතරාන්‍යතර දුක් හෙතුවෙකින් පහස්නා ලද්දහුගේ යම් ආයාසයෙක් දැඩි ආයාසයෙක් ආයාසිත බවෙක් උපායාසිත බවෙක් වේ ද මේ 'උපායාස' යි කියනු ලැබේ.

එහි **'අප්‍රියසම්ප්‍රයොගදුඃඛ'** කවරෙ යත්: මෙලොවැ යම් අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය කෙනෙක් වෙත් ද, තවද යම් අවැඩ කැමැති වූ අහිත කැමැති වූ නොසුව කැමැති වූ අයොගක්ෂෙම කැමැති වූ සත්ත්ව කෙනෙක් හෝ වෙත් ද ඔවුන් සමග යම් සඞ්ගතියෙක් (එක් වීමෙක්) සමාගමයෙක් සමවධානයෙක් මිශ්‍රීභාවයෙක් (මුසු වීමෙක්) වේ ද මේ 'අප්‍රියසම්ප්‍රයොගදුඃඛ'යි කියනු ලැබේ.

එහි **'ප්‍රියවිප්‍රයොගදුඃඛ'** කවරෙ යත්: මෙලොවැ යම් ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය කෙනෙක් වෙත් ද, තවද මවු හෝ පියා හෝ බෑයා හෝ බුන හෝ මිත්‍රයෝ හෝ යහළුවෝ හෝ නෑසහලේනෑයෝ හෝ වැඩ කැමැති වූ හිත කැමැති වූ සුව කැමැති වූ යම් කෙනෙක් වෙත් ද ඔවුන් සමග යම් නො එක්වීමෙක් අසමාගමයෙක් අසහභාවයෙක් අමිශ්‍රීභාවයෙක් වේ ද මේ 'ප්‍රියවිප්‍රයොගදුඃඛ'යි කියනු ලැබේ.

එහි **යමක් ඉස්නේ නො ලබා නම් හෙ ද දුක යැ** යනු කවරෙ යත්: ජාතිය සවභාව කොට ඇති සත්ත්වයනට මෙබඳු තෘෂ්ණාවක් උපදී: 'ඇපි ජාතිය සවභාව කොට ඇතියමෝ නො වන්නමෝ නම් එකැතින් අපට ජාතිය නො ද පැමිණේ නම් ඉතා යෙහෙකැ'යි. එතෙකුදු වත් තෙල ඉච්ඡායෙන් නො ලැබියහැකි වෙයි. මෙ ද 'යමක් ඉස්නේ නො ලබා නම් හෙ ද දුක' නම් වෙයි. ජරාව සවභාව කොට ඇති සත්ත්වයනට ... ව්‍යාධිය සවභාව කොට ඇති සත්ත්වයනට ... මරණය සවභාව කොට ඇති සත්ත්වයනට ... සොකපරිදෙවදුක්ඛදෞර්මනස්ස - උපායාසයන් සවභාව කොට ඇති සත්ත්වයනට මෙබඳු ඉච්ඡායෙක් උපදී: 'ඇපි සොකපරිදෙවදුක්ඛදෞර්මනස්ස උපායාස සවභාව කොට ඇතියමෝ නො වන්නමෝ නම් අපට සොකපරිදෙවදුක්ඛදෞර්මනස්ස උපායාසයෝ නො ද පැමිණෙන්නාහු නම් ඉතායෙහෙකැ'යි. එතෙකුදු වත් තෙල ඉච්ඡායෙන් නො ලැබියහැකි වෙයි. 'මෙ ද යමක් ඉස්නේ නො ලබා නම් හෙ ද දුක' නම් වෙයි.

තත්ථ කතමෙ[1]. සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා: සෙය්‍යථීදං[2] රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො, ඉමෙ වුච්චන්ති සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා. ඉදං වුච්චති දුක්ඛං අරියසච්චං.

**දුක්ඛසච්චනිද්දෙසො.**

තත්ථ කතමං දුක්ඛසමුදයො[3] අරියසච්චං:

යායං තණ්හා පොනොභවිකා[4] නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං:[2] කාමතණ්හා භවතණ්හා විභවතණ්හා. සා ඛො පනෙසා තණ්හා කත්ථ උප්පජ්ජමානා උප්පජ්ජති, කත්ථ නිවිසමානා නිවිසති: යං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.

කිඤ්ච ලොකෙ පියරූපං සාතරූපං: චක්ඛුං[5] ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. සොතං ලොකෙ -පෙ- ඝානං ලොකෙ -පෙ- ජිව්හා ලොකෙ -පෙ- කායො ලොකෙ -පෙ- මනො ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති.

රූපං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති, සද්දා ලොකෙ -පෙ- ධම්මා ලොකෙ -පෙ- චක්ඛුවිඤ්ඤාණං ලොකෙ -පෙ- මනොවිඤ්ඤාණං ලොකෙ -පෙ- චක්ඛුසම්ඵස්සො ලොකෙ -පෙ- මනොසම්ඵස්සො ලොකෙ -පෙ- චක්ඛුසම්ඵස්සජා වෙදනා ලොකෙ -පෙ- මනොසම්ඵස්සජා වෙදනා ලොකෙ -පෙ- රූපසඤ්ඤා ලොකෙ -පෙ- ධම්මසඤ්ඤා ලොකෙ -පෙ- රූපසඤ්චෙතනා ලොකෙ -පෙ- ධම්මසඤ්චෙතනා ලොකෙ -පෙ- රූපතණ්හා ලොකෙ -පෙ- ධම්මතණ්හා ලොකෙ -පෙ- රූපවිතක්කො ලොකෙ -පෙ- ධම්මවිතක්කො ලොකෙ -පෙ- රූපවිචාරො ලොකෙ -පෙ- ධම්මවිචාරො ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ථ නිවිසමානා නිවිසති. ඉදං වුච්චති දුක්ඛසමුදයො[3] අරියසච්චං.

**සමුදයසච්චනිද්දෙසො.**

තත්ථ කතමං දුක්ඛනිරොධො[6] අරියසච්චං:

යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො, සා ඛො පනෙසා තණ්හා කත්ථ පහීයමානා[7] පහීයති, කත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති: යං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති.

---

1. කතමා - PTS
2. සෙය්‍යථිදං - මජසං.
3. දුක්ඛසමුදයං - මජසං
4. පොනොබ්භවිකා - සසා
5. චක්ඛු - මජසං.
6. දුක්ඛනිරොධං - මජසං
7. පහියමානා - සසා

එහි 'සැකෙවින් පඤ්චොපාදානස්කන්ධදුඃඛයෝ' කවරහ යත්: හෙ මෙසේ යැ: රූපොපාදානස්කන්ධ යැ. වෙදනොපාදානස්කන්ධ යැ සංඥොපාදානස්කන්ධ යැ සංස්කාරොපාදානස්කන්ධ යැ විඥානොපාදානස්කන්ධ යි. මොහු 'සැකෙවින් පඤ්චොපාදානස්කන්ධයෝ දුඃඛයෝ' යැ යි කියනු ලැබෙත්. මේ දුඃඛාර්‍ය්‍යසත්‍ය යැ යි කියනු ලැබේ.

**දුක්ඛසච්චනිද්දෙස යි.**

එහි දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යය' කවරේ යත්:

පුනර්භවය ඇතිකරන්නා වූ නන්දිරාගය හා එක් වැ යෙදුණු ඒ ඒ භවයෙහි ඇලෙනසුලු වූ යම් තෘෂ්ණාවක් වේ ද, ඒ මෙසේ යැ: කාමතෘෂ්ණා යැ භවතෘෂ්ණා යැ විභවතෘෂ්ණා යි. ඒ තෘෂ්ණාව උපදනී කොතන්හි උපදී ද පිහිටාසිටින්නී කොතන්හි පිහිටාසිටී ද යත්: ලොවැ යම් ප්‍රියස්වභාවයෙක් මධුරස්වභාවයෙක් වේ ද තෙල ප්‍රියමධුරස්වභාවයෙහි උපදනා වූ, ඒ තෘෂ්ණාව උපදී. පවත්නී වූ ඒ තෘෂ්ණාව තෙල ප්‍රියමධුරස්වභාවයෙහි පවත්නී ය.

ලොකයෙහි ප්‍රියස්වභාවය මධුරස්වභාවය කිමැ යත්: ලොවැ චක්‍ෂුස ප්‍රියස්වභාව යැ මධුරස්වභාව යි. ඒ තෘෂ්ණාව උපදනී තෙල චක්‍ෂුසෙහි උපදී. පවත්නී තෙල චක්‍ෂුසෙහි පවතී. ලොවැ ශ්‍රොත්‍රය ... ලොවැ ඝ්‍රාණය ... ලොවැ ජිහ්වාව ... ලොවැ මනස ප්‍රියරූප යැ සාතරූප යි. ඒ තෘෂ්ණාව උපදනී තෙල මනසෙහි උපදී. පවත්නී තෙල මනසෙහි පවතී.

ලොකයෙහි රූපය ප්‍රියරූප යැ සාතරූප යි. ඒ තෘෂ්ණාව උපදනී තෙල රූපයෙහි උපදී. පවත්නී තෙල රූපයෙහි පවතී. ලොවැ ශබ්දයෝ... ලොවැ ධර්මයෝ ... ලොවැ චක්‍ෂුර්විඥානය... ලොවැ මනොවිඥානය ... ලොවැ චක්‍ෂුඃස්පර්ශය ... ලොවැ මනඃස්පර්ශය ... ලොවැ චක්‍ෂුඃස්පර්ශයෙන් උපන් වෙදනාව .. ලොවැ මනඃස්පර්ශයෙන් උපන් වෙදනාව ... ලොවැ රූපසංඥාව ... ලොවැ ධර්මසංඥාව ... ලොවැ රූපසඤ්චෙතනාව ... ලොවැ ධර්මසඤ්චෙතනාව ... ලොවැ රූපතෘෂ්ණාව ... ලොවැ ධර්මතෘෂ්ණාව ... ලොවැ රූපවිතර්කය ... ලොවැ ධර්මවිතර්කය ... ලොවැ රූපවිචාරය .. ලොවැ ධර්මවිචාරය ප්‍රියරූප යැ සාතරූප යි. උපදනා වූ ඒ තෘෂ්ණාව තෙල ධර්මවිචාරයෙහි උපදී. බැසසිටුනා ඒ තෘෂ්ණාව තෙල ධර්මවිචාරයෙහි පවතී. මේ 'දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍ය යැ'යි කියනු ලැබේ.

**සමුදයසච්චනිද්දෙස යි.**

එහි 'දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යය' කවරේ යත්:

ඒ තෘෂ්ණාවගේ මැ යම් අශෙෂ කොට මාර්ගයෙන් නිරුද්ධ කිරීමෙක් ත්‍යාගයෙක් දුරලීමෙක් මිදීමෙක් නො ඇලීමෙක් වේ ද එය යි. යළි ප්‍රහීණ වන්නා වූ ඒ තෘෂ්ණාව කොහි ප්‍රහීණ වේ ද නිරුද්ධ වන්නී කොහි නිරුද්ධ වේ ද යත්. ලොවැ යම් ප්‍රියස්වභාවයෙක් මධුරස්වභාවයෙක් වේ ද ප්‍රහීණ වන මේ තෘෂ්ණාව තෙල ප්‍රියමධුර ස්වභාවයෙහි ප්‍රහීණ වෙයි. නිරුද්ධ වන්නී තෙල ප්‍රියමධුරස්වභාවයෙහි නිරුද්ධ වෙයි.

කිඤ්ච ලොකෙ පියරූපං සාතරූපං: චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති -පෙ- ධම්මවිචාරො ලොකෙ පියරූපං සාතරූපං, එත්ථෙසා තණ්හා පහීයමානා පහීයති, එත්ථ නිරුජ්ඣමානා නිරුජ්ඣති. ඉදං වුච්චති දුක්ඛනිරොධො අරියසච්චං.

## නිරොධසච්චනිද්දෙසො.

තත්ථ කතමං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං:

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

තත්ථ කතමා සම්මාදිට්ඨි: දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං, අයං වුච්චති සම්මාදිට්ඨි.

තත්ථ කතමො සම්මාසඞ්කප්පො: නෙක්ඛම්මසඞ්කප්පො, අබ්‍යාපාදසඞ්කප්පො, අවිහිංසාසඞ්කප්පො අයං වුච්චති සම්මාසඞ්කප්පො.

තත්ථ කතමා සම්මාවාචා: මුසාවාදා වෙරමණී, පිසුනාවාචා වෙරමණී, ඵරුසාවාචා වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, අයං වුච්චති සම්මාවාචා.

තත්ථ කතමො සම්මාකම්මන්තො: පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී, අයං වුච්චති සම්මාකම්මන්තො.

තත්ථ කතමො සම්මා ආජීවො: ඉධ අරියසාවකො මිච්ඡා ආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං[1] කප්පෙති, අයං වුච්චති සම්මාආජීවො.

තත්ථ කතමො සම්මාවායාමො: ඉධ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති, -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති, අයං වුච්චති සම්මාවායාමො.

1. විජීතං - PTS,

ලොව්හි ප්‍රියස්වභාවය මධුරස්වභාවය කිමැ යත්: ලොව්හි චක්ෂුස ප්‍රියරූප යැ සාතරූප යි. මේ තෘෂ්ණාව ප්‍රහීණ වන්නී තෙල චක්ෂුසෙහි ප්‍රහීණ වෙයි. නිරුද්ධ වන්නී තෙල චක්ෂුසෙහි නිරුද්ධ වේ .. ලොව්හි ධර්මවිචාරය ප්‍රියරූප යැ සාතරූප යි. ප්‍රහීණ වන ඒ තෘෂ්ණාව තෙල ධර්මවිචාරයෙහි ප්‍රහීණ වෙයි. නිරුද්ධ වන්නී තෙල ධර්මවිචාරයෙහි නිරුද්ධ වේ. මේ 'දුඃඛනිරොධාර්යසත්‍ය' යැ යි කියනු ලැබේ.

**නිරොධසච්චනිද්දෙස යි.**

එහි **'දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්යසත්‍ය'** කවරෙ යත්:

මේ ආර්ය අෂ්ටාඞ්ගිකමාර්ගය මැ යි. ඒ මෙසේ යැ: සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යක්සංකල්ප යැ සම්‍යග්වචන යැ සම්‍යක්කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක්ස්මෘති යැ සම්‍යක්සමාධි යි.

එහි **'සම්‍යග්දෘෂ්ටි'** කවර යත්: දුඃඛසත්‍යයෙහි ඥන යැ දුඃඛසමුදයසත්‍යයෙහි ඥන යැ දුඃඛනිරොධයෙහි ඥන යැ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදායෙහි ඥන යි.

එහි **'සම්‍යක්සංකල්ප'** කවරෙ යත්: නෛෂ්ක්‍රම්‍යසංකල්ප යැ අව්‍යාපාදසංකල්ප යැ අවිහිංසා සංකල්ප යි. මේ 'සම්‍යක්සංකල්ප'යයි කියනු ලැබේ.

එහි **'සම්‍යග්වාචා'** කවර යත්: මෘෂාවාදයෙන් වෙන්වීම යැ පිසුනුවචනයෙන් වෙන්වීම යැ පරුෂවචනයෙන් වෙන්වීම යැ ප්‍රලාප බසින් වෙන්වීම යි. මේ 'සම්‍යග්වචන' යයි කියනු ලැබේ.

එහි **'සම්‍යක්කර්මාන්ත'** කවරෙ යත්: ප්‍රාණඝාතයෙන් වෙන්වීම යැ අදත්තාදානයෙන් වෙන්වීම යැ කාමමිථ්‍යාචාරයෙන් වෙන්වීම යි. මේ 'සම්‍යක්කර්මාන්ත' යයි කියනු ලැබේ.

එහි **'සම්‍යගාජීව'** කවරෙ යත්: මෙ ලොව්හි ආර්යශ්‍රාවක තෙම මිථ්‍යාආජීවය හැරපියා සම්‍යගාජීවයෙන් ජීවිකාව කෙරෙයි, මේ 'සම්‍යගාජීව' යයි කියනු ලැබේ.

එහි **'සම්‍යග්ව්‍යායාම'** කවරෙ යත්: මෙ සස්නෙහි මහණ තෙම නූපන් ලාමක වූ අකුශලධර්මයන්ගේ නො ඉපැදීම පිණිස වීර්යච්ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්යය පවත්වයි, සිත දැඩි කොට ගනී, ප්‍රධන්වීර්යය පවත්වයි, උපන් ලාමක වූ අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස ... නූපන් කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස ... උපන් කුශලධර්මයන්ගේ (නැවත නැවත ඉපදීම්වශයෙන්) සිටීම පිණිස අවිනාශය පිණිස බහුල බව පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස සම්පූර්ණ වීම පිණිස වීර්යච්ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්යාරම්භ කෙරෙයි, සිත දැඩි කොට පිහිටුවයි, ප්‍රධන්වීර්ය කෙරෙයි. මේ 'සම්‍යග්ව්‍යායාම' යයි කියනු ලැබේ.

තත්ථ කතමා සම්මාසති: ඉධ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, වෙදනාසු වෙදනානුපස්සී -පෙ- චිත්තෙ චිත්තානුපස්සී -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අයං වුච්චති සම්මාසති.

තත්ථ කතමො සම්මාසමාධි: ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[1], උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තං තතියං ඣානං[2] උපසම්පජ්ජ විහරති, සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, අයං වුච්චති සම්මාසමාධි. ඉදං වුච්චති දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං.

### මග්ගසච්චනිද්දෙසො

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා තෙන වුච්චති: "ඉදං දුක්ඛං අරියසච්චං, ඉදං දුක්ඛසමුදයො අරියසච්චං, ඉදං දුක්ඛනිරොධො අරියසච්චං, ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චන්ති සොතාවධානං, තංපජානනා පඤ්ඤා සුතමයෙ ඤාණන්ති."

එවං සොතාවධානෙ පඤ්ඤා සුතමයෙ ඤාණං.

### චතුසච්චනිද්දෙසො.

### සුතමයඤාණනිද්දෙසො.

1. පඨමජ්ඣානං - ස්‍යා, PTS, සීමු
2. සුඛවිහාරීති තතියජ්ඣානං - ඛනුසු.

එහි **'සම්‍යක් ස්මෘති'** කවර යත්: මෙ සස්නෙහි මහණ තෙම රූප-කායයෙහි කෙලෙසුන් තවන වීර්‍ය ඇත්තේ සම්‍යග්ඥාන ඇත්තේ ස්මෘතිමත් වූයේ කාය සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යය දුරු කොට කාය අනුව බලමින් වෙසෙයි. වෙදනාවන්හි වෙදනා අනුව බලමින් චිත්තයෙහි සිත අනුව බලමින් ... ස්කන්ධාදි ධර්මයන්හි කෙලෙසුන් තවන වීර්‍යය ඇත්තේ සම්‍යග්ඥානයෙන් යුක්ත වූයෙ ස්මෘතිමත් වූයේ ස්කන්ධාදි-ධර්ම සඞ්ඛාත ලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යය දුරු කොට ධර්මයන් අනුව බලමින් වෙසේ මේ 'සම්‍යක්ස්මෘති' යයි කියනු ලැබේ.

එහි **'සම්‍යක් සමාධි'** කවරේ යත්: මෙ සස්නෙහි මහණ තෙම කාමච්ඡන්දයෙන් වෙන් වැ මැ ශෙෂනීවරණ සඞ්ඛ්‍යාත අකුශලධර්මයන්ගෙන් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි, විතර්කවිචාරයන්ගේ සංහිඳී-මෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකොදිභාවය ඇති අවිතර්ක වූ අවිචාර වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වෙසෙයි, ප්‍රීතියගේ ද විරාගයෙන් උපෙක්‍ෂා ඇත්තේ වෙසෙයි, ස්මෘතිමත් වූයේ ද සම්‍යග්ඥාන ඇත්තේ නාමකායින් සුවය ද විඳියි, යම් ධ්‍යානයක් හෙතු කොට ගෙන ඒ ධ්‍යානසමඞ්ගී පුද්ගලයා උපෙක්‍ෂා ඇත්තේ යැ ස්මෘති-මත් වූයේ යැ සුඛවිහරණ ඇත්තේ යැ යි ආර්‍යයෝ ප්‍රකාශ කෙරෙත් ද ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. කායික සුඛයාගේ ද ප්‍රහාණයෙන් කායික-දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පළමු මැ සොම්නස් දොම්නසුන්ගේ අස්තඞ්ගම-යෙන් දුක් නො වූ සුව නො වූ උපෙක්‍ෂායෙන් උපන් ස්මෘතිපාරිශුද්ධිය ඇති සතරවැනි ධ්‍යානයට පැමිණ වෙසෙයි. මේ 'සම්‍යක්සමාධි'යයි කියනු ලැබේ. මේ 'දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍ය' යයි කියනු ලැබේ.

**මග්ගසච්චනිද්දෙස යි**

ඒ සොතාවධානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එහෙයින් කියනු ලැබෙයි **''ඉදං දුක්ඛං අරියසච්චං ඉදං දුක්ඛසමුදයො අරියසච්චං ඉදං දුක්ඛනිරොධො අරියසච්චං ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං යනු සොතාවධාන යි, එය දැනගන්නා ප්‍රඥාව ශ්‍රුතමය ඥාන''** යි.

මෙසේ සොතාවධානයෙහි ප්‍රඥාව ශ්‍රුතමයඥාන යි.

**චතුසච්චනිද්දෙස යි.**

**ශ්‍රුතමයඥාන නිර්දෙශ යි.**

## 2. සීලමයඤාණං

කථං සුත්වාන සංවරෙ පඤ්ඤා සීලමයෙ ඤාණං:

පඤ්ච සීලානි: පරියන්තපාරිසුද්ධිසීලං, අපරියන්තපාරිසුද්ධිසීලං, පරිපුණ්ණපාරිසුද්ධිසීලං, අපරාමට්ඨපාරිසුද්ධිසීලං, පටිප්පස්සද්ධිපාරිසුද්ධිසීලන්ති.[1]

තත්ථ කතමං පරියන්තපාරිසුද්ධිසීලං: අනුපසම්පන්නානං පරියන්තසික්ඛාපදානං ඉදං පරියන්තපාරිසුද්ධිසීලං.

කතමං අපරියන්තපාරිසුද්ධිසීලං: උපසම්පන්නානං අපරියන්තසික්ඛාපදානං ඉදං අපරියන්තපාරිසුද්ධි සීලං.

කතමං පරිපුණ්ණපාරිසුද්ධිසීලං: පුථුජ්ජනකල්‍යාණකානං කුසලධම්මෙ යුත්තානං සෙක්ඛපරියන්තෙ[2] පරිපූරකාරීනං කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛානං පරිච්චත්තජීවිතානං ඉදං පරිපුණ්ණපාරිසුද්ධිසීලං.

කතමං අපරාමට්ඨපාරිසුද්ධි සීලං: සත්තන්නං සෙක්ඛානං[3] ඉදං අපරාමට්ඨපාරිසුද්ධිසීලං.

කතමං පටිප්පස්සද්ධි පාරිසුද්ධි සීලං: තථාගතසාවකානං ඛීණාසවානං, පච්චෙකබුද්ධානං, තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං, ඉදං පටිප්පස්සද්ධි පාරිසුද්ධිසීලං.

අත්ථි සීලං පරියන්තං[4], අත්ථි සීලං අපරියන්තං.

තත්ථ කතමං තං සීලං පරියන්තං: අත්ථි සීලං ලාභපරියන්තං, අත්ථි සීලං යසපරියන්තං, අත්ථි සීලං ඤාතිපරියන්තං, අත්ථි සීලං අඞ්ගපරියන්තං, අත්ථි සීලං ජීවිතපරියන්තං.

කතමං තං සීලං ලාභපරියන්තං: ඉධෙකච්චො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා යථාසමාදින්නං සික්ඛාපදං වීතික්කමති, ඉදං තං සීලං ලාභපරියන්තං.

කතමං තං සීලං යසපරියන්තං: ඉධෙකච්චො යසහෙතු යසපච්චයා යසකාරණා යථාසමාදින්නං සික්ඛාපදං වීතික්කමති, ඉදං තං සීලං යසපරියන්තං.

කතමං තං සීලං ඤාතිපරියන්තං: ඉධෙකච්චො ඤාතිහෙතු ඤාතිපච්චයා ඤාතිකාරණා යථාසමාදින්නං සික්ඛාපදං වීතික්කමති, ඉදං තං සීලං ඤාතිපරියන්තං

---

1: සීලං - PTS. 2 අසෙක්ඛපරියන්තෙ - සයා, සෙඛපරියන්තෙ - සීසි
3 සෙඛානං - වසි. 4. සපරියන්තං - විම.

## 2. සීලමය ඥානය

කිසෙසින් ශ්‍රවණය කොට (ශ්‍රවණ හෙතුයෙන්) සංවරයෙහි පැවැති ප්‍රඥාව ශීලමයඥාන වෙයි යත්:

ශීලයෝ පස්දෙනෙක් වෙති: පර්‍යන්ත වූ පරිශුද්ධභාවය ඇති ශීල යැ, අපර්‍යන්ත වූ පරිශුද්ධභාවය ඇති ශීල යැ, පරිපූර්ණ බැවින් පරිශුද්ධභාවය ඇති ශීල යැ, දෘෂ්ටිපරාමර්ශ රහිත බැවින් පරිශුද්ධභාවය ඇති ශීල යැ, සියලු දරථයන් සන්සිඳීමෙන් පරිශුද්ධභාවය ඇති ශීල යි.

එහි **පර්‍යන්තපාරිශුද්ධිශීලය** කවරේ යත්: අනුපසපන් වූ පර්‍යන්තශික්‍ෂාපද ඇතියන්ගේ මේ ශීලය පර්‍යන්තපාරිශුද්ධිශීල නමැ.

**අපර්‍යන්තපාරිශුද්ධිශීලය** කවරේ යත්: උපසපන් වූ අපර්‍යන්තශික්‍ෂාපද ඇතියන්ගේ මේ ශීලය අපර්‍යන්තපාරිශුද්ධිශීල නමැ.

**පරිපූර්ණපාරිශුද්ධිශීලය** කවරේ යත්: කල්‍යාණපෘථග්ජන වූ විදර්ශනා කුශලධර්මයෙහි යුක්තප්‍රයුක්ත වූ ශෛක්‍ෂධර්මයන් පර්‍යන්ත කොට ඇති ධර්මයෙහි කිසි ශික්‍ෂාවකුදු නො හැර පුරන්නා වූ කයෙහි ද ජීවිතයෙහි ද නිරපෙක්‍ෂ වූ (එහෙයින් මැ ශීලපරිපූරණ පිණිස) පරිත්‍යක්ත වූ ජීවිත ඇතියන්ගේ මේ ශීලය පරිපූර්ණපාරිශුද්ධිශීල නමැ.

**අපරාමෘෂ්ටපාරිශුද්ධිශීලය** කවරේ යත්: සප්ත ශෛක්‍ෂයන්ගේ මේ ශීලය අපරාමෘෂ්ටපාරිශුද්ධිශීල නමැ.

**ප්‍රතිප්‍රශ්‍රබ්ධිපාරිශුද්ධිශීලය** කවරේ යත්: තථාගතශ්‍රාවක වූ ක්‍ෂීණාස්‍රවයන්ගේ ද ප්‍රත්‍යෙකබුද්ධයන්ගේ ද තථාගත වූ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධයන්ගේ ද මේ ශීලය ප්‍රතිප්‍රශ්‍රබ්ධිපාරිශුද්ධිශීල නමි.

පර්‍යන්ත වූ ශීලයෙක් ඇත. අපර්‍යන්ත වූ ශීලයෙක් ඇති. එහි ඒ පර්‍යන්තශීලය කවරේ යත්: ලාභපර්‍යන්ත වූ ශීලයෙක් ඇත. යශස් (පිරිවර) පර්‍යන්ත වූ ශීලයෙක් ඇත. ඥාතිපර්‍යන්තශීලයෙක් ඇත. අඞ්ගපර්‍යන්තශීලයෙක් ඇත. ජීවිතපර්‍යන්තශීලයෙක් ඇති.

ඒ **ලාභපර්‍යන්තශීලය** කවරේ යත්: මෙහි එකෙක් ලාභහෙතුයෙන් ලාභප්‍රත්‍යයෙන් ලාභකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද සිකපද ඉක්මේ නම් මේ ඒ ලාභපර්‍යන්තශීල යයි.

ඒ **යශස්පර්‍යන්තශීලය** කවරේ යත්: මෙහි එකෙක් යශස්හෙතුයෙන් යශස්ප්‍රත්‍යයෙන් යශස්කාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද සිකපද ඉක්මේ නම් මේ ඒ යශස්පර්‍යන්තශීල යයි

ඒ **ඥාතිපර්‍යන්තශීලය** කවරේ යත්: මෙහි එකෙක් ඥාතිහෙතුයෙන් ඥාතිප්‍රත්‍යයෙන් ඥාතිකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද සිකපද ඉක්මේ නම් මේ ඒ ඥාතිපර්‍යන්තශීල යයි.

කතමං තං සීලං අඞ්ගපරියන්තං: ඉධෙකච්චො අඞ්ගහෙතු අඞ්ගපච්චයා අඞ්ගකාරණා යථාසමාදින්නං සික්ඛාපදං වීතික්කමති, ඉදං තං සීලං අඞ්ගපරියන්තං.

කතමං තං සීලං ජීවිතපරියන්තං: ඉධෙකච්චො ජීවිතහෙතු ජීවිතපච්චයා ජීවිතකාරණා යථාසමාදින්නං සික්ඛාපදං වීතික්කමති, ඉදං තං සීලං ජීවිතපරියන්තං.

එවරූපානි සීලානි ඛණ්ඩානි ඡිද්දානි සබලානි කම්මාසානි, න භුජිස්සානි, න විඤ්ඤුප්පසත්ථානි, පරාමට්ඨානි, න සමාධිසංවත්තනිකානි,[1] න අවිප්පටිසාරවත්ථුකානි, න පාමොජ්ජවත්ථුකානි,[2] න පීතිවත්ථුකානි, න පස්සද්ධිවත්ථුකානි, න සුඛවත්ථුකානි, න සමාධිවත්ථුකානි, න යථාභූතඤාණදස්සනවත්ථුකානි, න එකන්තනිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තන්ති. ඉදං තං සීලං පරියන්තං.

කතමං තං සීලං අපරියන්තං: අත්ථි සීලං න ලාභපරියන්තං, අත්ථි සීලං න යසපරියන්තං, අත්ථි සීලං න ඤාතිපරියන්තං, අත්ථි සීලං න අඞ්ගපරියන්තං, අත්ථි සීලං න ජීවිතපරියන්තං.

කතමං තංසීලං න ලාභපරියන්තං: ඉධෙකච්චො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා යථාසමාදින්නසික්ඛාපද[3] වීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති, කිං සො වීතික්කමිස්සති. ඉදං තං සීලං න ලාභපරියන්තං

කතමං තං සීලං න යසපරියන්තං: ඉධෙකච්චො යසහෙතු යසපච්චයා යසකාරණා යථාසමාදින්නසික්ඛාපදවීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති, කිං සො වීතික්කමිස්සති. ඉදං තං සීලං න යසපරියන්තං.

කතමං තං සීලං න ඤාතිපරියන්තං: ඉධෙකච්චො ඤාතිහෙතු ඤාතිපච්චයා ඤාතිකාරණා යථාසමාදින්නසික්ඛාපදවීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති, කිං සො වීතික්කමිස්සති. ඉදං තං සීලං න ඤාති පරියන්තං.

කතමං තං සීලං න අඞ්ගපරියන්තං: ඉධෙකච්චො අඞ්ගහෙතු අඞ්ගපච්චයා අඞ්ගකාරණා යථාසමාදින්නසික්ඛාපදවීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති, කිං සො වීතික්කමිස්සති. ඉදං තං සීලං න අඞ්ගපරියන්තං.

කතමං තං සීලං න ජීවිතපරියන්තං: ඉධෙකච්චො ජීවිතහෙතු ජීවිතපච්චයා ජීවිතකාරණා යථාසමාදින්නසික්ඛාපදවීතික්කමාය චිත්තම්පි න උප්පාදෙති, කිං සො වීතික්කමිස්සති. ඉදං තං සීලං න ජීවිතපරියන්තං.

---

1. අසමාධිසංවත්තනිකානි - මජසං, ස්‍යා    2. න පාමුජ්ජවත්ථුකානි - ස්‍යා
3 යථාසමාදින්නං සික්ඛාපදං - මජසං, ස්‍යා, PTS.

ඒ **අඞ්ගපර්යන්තශීලය** කවරේ යත්: මෙහි එකෙක් අඞ්ගහෙතුයෙන් අඞ්ගප්‍රත්‍යයෙන් අඞ්ගකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද සිකපද ඉක්මේ නම් මේ ඒ අඞ්ගපර්යන්තශීලය යි.

ඒ **ජීවිතපර්යන්තශීලය** කවරේ යත්: මෙහි එකෙක් ජීවිතහෙතුයෙන් ජීවිතප්‍රත්‍යයෙන් ජීවිතකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද සිකපද ඉක්මේ නම් මේ ඒ ජීවිතපර්යන්තශීලය යි.

මෙබඳු ශීලයෝ කැඩුණාහු සිදුරු වූවාහු සබල (කබර) වූවාහු කල්මාෂ (කැලැල්) වූවාහු දාසව්‍යයෙන් නො මිදුණාහු විඥයන් විසින් නො පසස්නා ලද්දාහු (තෘෂ්ණාදෘෂ්ටි දෙකින්) පරාමෘෂ්ට වූවාහු සමාධිය පිණිස නො පවත්නාහු අවිප්‍රතිසාරයට කරුණු නො වූවාහු ප්‍රාමෝද්‍යයට කරුණු නො වූවාහු ප්‍රීතියට වස්තු නො වූවාහු (කායචිත්ත) ප්‍රශ්‍රබ්ධියට වස්තු නො වූවාහු සුඛයට වස්තු නො වූවාහු (උපචාර අර්පණ) සමාධියට වස්තු නො වූවාහු යථාභූතඥානදර්ශනයට වස්තු නො වූවාහු එකාන්තනිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස උපශමය පිණිස අභිඥාව පිණිස සම්බෝධිය පිණිස නිර්වාණය පිණිස නො පවත්නාහු ය. මේ ඒ පර්යන්තශීලය යි.

එහි ඒ **අපර්යන්තශීලය** කවරේ යත්: ලාභපර්යන්ත නොවූ ශීලයෙක් ඇත. යශස්පර්යන්ත නො වූ ශීලයෙක් ඇත. ඥාතිපර්යන්ත නො වූ ශීලයෙක් ඇත. අඞ්ගපර්යන්ත නො වූ ශීලයෙක් ඇත. ජීවිතපර්යන්ත නො වූ ශීලයෙක් ඇති.

ඒ **ලාභපර්යන්ත නො වූ ශීලය** කවරේ යත්: මෙහි එකෙක් ලාභහෙතුයෙන් ලාභප්‍රත්‍යයෙන් ලාභකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද ශික්ෂාපදය ව්‍යතික්‍රම පිණිස සිතකුදු නො උපදවන්නේ යැ. හේ ව්‍යතික්‍රම කෙරෙයි යනු කිම? මේ ඒ ලාභපර්යන්ත නො වූ ශීලය යි

ඒ **යශස්පර්යන්ත නො වූ ශීලය** කවරේ යත්: මෙහි එකෙක් යශස්හෙතුයෙන් යශස්ප්‍රත්‍යයෙන් යශස් කාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද ශික්ෂාපදය ව්‍යතික්‍රම පිණිස සිතකුදු නො උපදවන්නේ යැ. හේ ව්‍යතික්‍රම කෙරෙයි යනු කිම? මෙ ඒ යශස්පර්යන්ත නො වූ ශීලය යි.

ඒ **ඥාතිපර්යන්ත නො වූ ශීලය** කවරේ යත්. මෙහි එකෙක් ඥාතිහෙතුයෙන් ඥාතිප්‍රත්‍යයෙන් ඥාතිකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද ශික්ෂාපදය ව්‍යතික්‍රම පිණිස සිතකුදු නො උපදවන්නේ යැ. හේ ව්‍යතික්‍රම කෙරෙයි යනු කිම? මේ ඒ ඥාතිපර්යන්ත නො වූ ශීලය යි.

ඒ **අඞ්ගපර්යන්ත නො වූ ශීලය** කවරේ යත්: මෙහි එකෙක් අඞ්ගහෙතුයෙන් අඞ්ගප්‍රත්‍යයෙන් අඞ්ගකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද ශික්ෂාපදය ව්‍යතික්‍රම පිණිස සිතකුදු නො උපදවන්නේ යැ. හේ ව්‍යතික්‍රම කෙරෙයි යනු කිම? මේ ඒ අඞ්ගපර්යන්ත නො වූ ශීල යි.

ඒ **ජීවිතපර්යන්ත නො වූ ශීලය** කවරේ යත්: මෙහි එකෙක් ජීවිතහෙතුයෙන් ජීවිතප්‍රත්‍යයෙන් ජීවිතකාරණයෙන් යම් පරිද්දෙකින් සමාදන් වන ලද සිකපදය ව්‍යතික්‍රම පිණිස සිතකුදු නො උපදවන්නේ යැ. හේ ව්‍යතික්‍රම කෙරෙයි යනු කිම? මේ ඒ ජීවිතපර්යන්ත නො වූ ශීල යි.

එවරූපානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි අවිප්පටි- සාරවත්ථුකානි පාමොජ්ජවත්ථුකානි පීතිවත්ථුකානි පස්සද්ධිවත්ථුකානි සුඛ- වත්ථුකානි සමාධිවත්ථුකානි යථාභූතඤාණදස්සනවත්ථුකානි එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. ඉදං තං සීලං අපරියන්තං.

කිං සීලං, කති සීලානි, කිංසමුට්ඨානං සීලං, කතිධම්මසමොධානං සීලං:

**කිං සීලන්ති**: චෙතනා සීලං, චෙතසිකං සීලං, සංවරො සීලං, අවීතික්කමො සීලං.

**කති සීලානීති**: තීණි සීලානි: කුසලසීලං, අකුසලසීලං, අබ්‍යාකත සීලං.

**කිංසමුට්ඨානං සීලන්ති**: කුසලචිත්තසමුට්ඨානං කුසලසීලං, අකුසල- චිත්තසමුට්ඨානං අකුසලසීලං, අබ්‍යාකතචිත්තසමුට්ඨානං අබ්‍යාකතසීලං.

**කතිධම්මසමොධානං සීලන්ති**. සංවරසමොධානං සීලං, අවීතික්කම- සමොධානං සීලං, තථාභාවෙ ජාතචෙතනාසමොධානං සීලං.

පාණාතිපාතං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. අදින්නාදානං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. කාමෙසු මිච්ඡාචාරං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. මුසාවාදං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. පිසුනං වාචං[1] සංවරට්ඨෙන සීලං, අවීතික්ක- මට්ඨෙන සීලං. ඵරුසං වාචං[2] සංවරට්ඨෙන සීලං. අවීතික්කමට්ඨෙන සීලං. සම්ඵප්පලාපං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. අභිජ්ඣං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. බ්‍යාපාදං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. මිච්ඡාදිට්ඨිං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං.

නෙක්ඛම්මෙන කාමච්ඡන්දං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. අබ්‍යාපාදෙන බ්‍යාපාදං සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං. අලොකසඤ්ඤාය ථිනමිද්ධං[3] -පෙ- අවික්ඛෙපට්ඨෙන උද්ධච්චං -පෙ- ධම්ම- වවත්ථානෙන විචිකිච්ඡං -පෙ- ඤාණෙන අවිජ්ජං -පෙ- පාමොජ්ජෙන[4] අරතිං -පෙ-

1. පිසුනාවාචං - මසි, පිසුණං - සයා PTS, 2. ඵරුසාවාචං - මසි, ඵරුසවාචං - සයා, PTS
3 ථිනමිද්ධං - මජසං. 4. පාමුජ්ජෙන - මසි, සයා.

මෙබඳු වූ ශීලයෝ අඛණ්ඩ වූවාහු අච්ඡිද්‍ර වූවාහු අශබල වූවාහු අකල්මාෂ වූවාහු අදාස වූවාහු විඥයන් විසින් ප්‍රශස්ත වූවාහු (තෘෂ්ණාදෘෂ්ටීන්) පරාමෘෂ්ට නො වූවාහු (උපචාරඅර්පණ) සමාධිය පිණිස පවත්නාහු විප්‍රතිසාරයට වස්තු නො වූවාහු ප්‍රාමොද්‍යයට වස්තු වූවාහු ප්‍රීතියට වස්තු වූවාහු ප්‍රශ්‍රබ්ධියට වස්තු වූවාහු (කායික චෛතසික) සුඛයට වස්තු වූවාහු සමාධියට වස්තු වූවාහු යථාභූතඥානදර්ශනයට වස්තු වූවාහු එකාන්තයෙන් (වර්තයෙහි) නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස උපශමය පිණිස අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවත්නාහු යැ.

(සවරූප විසින්) සිල් නම් කිම, ශීලයෝ කෙතෙක් වූවාහු ද, ශීලය කුමක් සමුත්ථාන කොට ඇත්තේ ද, ශීලය කෙතෙක් ධර්මයන්ගේ සමවාය ඇත්තේ ද යත්:

ශීල නම් කිමැ යත්: චෙතනාසීල යැ චෛතසික සීල යැ සංවරසීල යැ අවීතික්කමසීල සි.

ශීලයෝ කෙතෙක් ද යත්: ශීලයෝ තිදෙනෙක් වෙති: කුශලශීල යැ අකුශලශීල යැ අව්‍යාකෘතශීල සි.

ශීලය කුමක් සමුත්ථාන කොට ඇත්තේ ද යත්: කුශලශීලය කුශල චිත්තය සමුත්ථාන කොට ඇත්තේ යැ. අකුශලශීලය අකුශලචිත්තය සමුත්ථාන කොට ඇත්තේ යැ. අව්‍යාකෘතශීලය අව්‍යාකෘතචිත්තය සමුත්ථාන කොට ඇත්තේ සි.

ශීලය කෙතෙක් ධර්මයන්ගේ සමවාය ඇත්තේ ද යත්: ශීලය සංවරය හා සමවාය ඇත්තේ යැ. ශීලය අව්‍යතික්‍රමය සමවාය කොට ඇත්තේ යැ. ශීලය සංවර අව්‍යතික්‍රමභාවයෙහි උපන් චෙතනා සමවාය කොට ඇත්තේ සි.

ප්‍රාණවධය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. අදත්තාදානය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. කාමමිථ්‍යාචාරය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. මෘෂාවාදය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. ශුන්‍යවචනය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. පරුෂවචනය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. ප්‍රලාප බස් වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. අභිධ්‍යා වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. ව්‍යාපාද වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. මිථ්‍යාදෘෂ්ටි වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල සි.

නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යැ. ආලොකසංඥයෙන් ථිනමිද්ධය ... අවික්ෂෙපාර්ථයෙන් උද්ධතභාවය ... ධර්මනිශ්චයයෙන් විචිකිත්සාව ... ඥානයෙන් අවිද්‍යාව ... ප්‍රාමොද්‍යයෙන් අරතිය ...

පඨමෙන ඣානෙන[1] නීවරණෙ[2] -පෙ- දුතියෙන ඣානෙන විතක්කවිචාරෙ -පෙ- තතියෙන ඣානෙන පීතිං -පෙ- චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛං -පෙ- ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤං පටිඝසඤ්ඤං නානත්තසඤ්ඤං -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤං -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං -පෙ-

අනිච්චානුපස්සනාය නිච්චසඤ්ඤං -පෙ- දුක්ඛානුපස්සනාය සුඛසඤ්ඤං -පෙ- අනත්තානුපස්සනාය අත්තසඤ්ඤං -පෙ- නිබ්බිදානුපස්සනාය නන්දිං -පෙ- විරාගානුපස්සනාය රාගං -පෙ- නිරොධානුපස්සනාය සමුදයං -පෙ- පටිනිස්සග්ගානුපස්සනාය ආදානං -පෙ- ඛයානුපස්සනාය ඝනසඤ්ඤං -පෙ-[3] වයානුපස්සනාය ආයූහනං[4] -පෙ- විපරිණාමානුපස්සනාය ධුවසඤ්ඤං -පෙ- අනිමිත්තානුපස්සනාය නිමිත්තං -පෙ- අප්පණිහිතානුපස්සනාය පණිධිං -පෙ- සුඤ්ඤතානුපස්සනාය අභිනිවෙසං -පෙ- අධිපඤ්ඤාධම්මවිපස්සනාය සාරාදානාභිනිවෙසං[5] -පෙ- යථාභූතඤාණදස්සනෙන සම්මොහාභිනිවෙසං -පෙ- ආදීනවානුපස්සනාය ආලයාභිනිවෙසං -පෙ- පටිසඞ්ඛානුපස්සනාය අප්පටිසඞ්ඛං -පෙ- විවට්ටානුපස්සනාය සඤ්ඤොගාභිනිවෙසං -පෙ-.

සොතාපත්තිමග්ගෙන දිට්ඨෙකට්ඨෙ කිලෙසෙ -පෙ- සකදාගාමිමග්ගෙන ඔළාරිකෙ කිලෙසෙ -පෙ- අනාගාමිමග්ගෙන අණුසහගතෙ කිලෙසෙ -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ සංවරට්ඨෙන සීලං, අවීතික්කමට්ඨෙන සීලං.

පඤ්ච සීලානි: පාණාතිපාතස්ස පහානං සීලං, වෙරමණී සීලං, චෙතනා සීලං, සංවරො සීලං, අවීතික්කමො සීලං. එවරූපානි සීලානි චිත්තස්ස අවිප්පටිසාරාය සංවත්තන්ති, පාමොජ්ජාය[6] සංවත්තන්ති, පීතියා සංවත්තන්ති, පස්සද්ධියා සංවත්තන්ති, සොමනස්සාය සංවත්තන්ති, ආසෙවනාය සංවත්තන්ති, භාවනාය සංවත්තන්ති, බහුලීකම්මාය සංවත්තන්ති, අලඞ්කාරාය සංවත්තන්ති, පරික්ඛාරාය සංවත්තන්ති, පරිවාරාය සංවත්තන්ති, පාරිපූරියා සංවත්තන්ති, එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති.

එවරූපානං සීලානං සංවරපාරිසුද්ධි අධිසීලං, සංවරපාරිසුද්ධියා ඨිතං චිත්තං න වික්ඛෙපං[7] ගච්ඡති, අවික්ඛෙපපාරිසුද්ධි අධිචිත්තං, සංවරපාරිසුද්ධිං සම්මා පස්සති, අවික්ඛෙපපාරිසුද්ධිං සම්මා පස්සති, දස්සනපාරිසුද්ධිං අධිපඤ්ඤා, යො තත්ථ සංවරට්ඨො අයං අධිසීලසික්ඛා, යො තත්ථ අවික්ඛෙපට්ඨො අයං අධිචිත්තසික්ඛා, යො තත්ථ දස්සනට්ඨො අයං අධිපඤ්ඤාසික්ඛා.

1. පඨමජ්ඣානෙන - සී., PTS, 2. නීවරණං - PTS, 3. ඛණසඤ්ඤං - වසි
4. ආයූහනං - සී., 5. සාරාගාභිනිවෙසං - PTS, 6 පාමුජ්ජාය - වසි, සී.
7. අවික්ඛෙපං -මජසං.

ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් . ද්විතීයධ්‍යානයෙන් විතර්කවිචාරයන් ... තෘතීයධ්‍යානයෙන් ප්‍රීතිය ... චතුර්ථධ්‍යානයෙන් සුඛදුඃඛය ... ආකාසානඤ්චායතනසමාපත්තියෙන් රූපසංඥාව ප්‍රතිඝසංඥාව නානාත්වසංඥාව ... විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙන් ආකාසානඤ්චායතනසංඥාව ... ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතනසංඥාව ... නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සංඥාව ...

අනිත්‍යානුදර්ශනායෙන් නිත්‍යසංඥාව ... දුඃඛානුදර්ශනායෙන් සුඛසංඥාව ... අනාත්මානුදර්ශනායෙන් ආත්මසංඥාව ... නිර්වේදානුදර්ශනායෙන් නන්දිය .. විරාගානුදර්ශනායෙන් රාගය ... නිරොධානුදර්ශනායෙන් සමුදය ... ප්‍රතිනිඃසර්ගානුදර්ශනායෙන් ආදානය ... ක්ෂයානුදර්ශනායෙන් ඝනසංඥාව ... ව්‍යයානුදර්ශනායෙන් කර්මායූහනය ... විපරිණාමානුදර්ශනායෙන් ධ්‍රැවසංඥාව ... අනිමිත්තානුදර්ශනායෙන් නිමිති ... අප්‍රණිහිතානුදර්ශනායෙන් ප්‍රණිධිය ... ශූන්‍යතානුදර්ශනායෙන් අභිනිවෙශය ... අධිප්‍රඥාධර්මවිදර්ශනායෙන් ආත්මය සාර කොට ගන්නා අභිනිවෙශය ... යථාභූතඥානදර්ශනායෙන් සම්මොහාභිනිවෙශය ... ආදීනවානුදර්ශනායෙන් ආලයාභිනිවෙශය ... පටිසංඛානුපස්සනායෙන් අප්පටිසංඛාව ... විවර්තානුදර්ශනායෙන් සංයොගාභිනිවෙශය ...

ස්‍රොතාපත්තිමාර්ගයෙන් දෘෂ්ටිය හා සමග එක් වැ සිටි ක්ලේශයන්... සකෘදාගාමිමාර්ගයෙන් ඖදාරිකක්ලේශයන් ... අනාගාමිමාර්ගයෙන් අණුසහගත ක්ලේශයන් ...අර්හත්මාර්ගයෙන් සියලු ක්ලේශයන් වැළකීම් අර්ථයෙන් ශීල යැ අව්‍යතික්‍රමාර්ථයෙන් ශීල යි.

**ශීලයෝ පස්දෙනෙකි**: ප්‍රාණවධයාගේ ප්‍රහාණය ශීල යැ (ප්‍රාණවධයෙන්) වෙන්වීම ශීල යැ (ප්‍රාණවධයට ප්‍රතිපක්ෂ වූ) චෙතනාව ශීල යැ (ප්‍රාණවධයෙන්) වැළකීම ශීල යැ (ප්‍රාණවධයාගේ) අව්‍යතික්‍රමය ශීල යි. මෙබඳු ශීලයෝ චිත්තයාගේ නො විපිළිසර බව පිණිස පවතිත් ප්‍රාමොද්‍යය පිණිස පවතිත්, ප්‍රීතිය පිණිස පවතිත්, සන්හිඳීම පිණිස පවතිත්, සොම්නස පිණිස පවතිත්, ආසෙවනය පිණිස පවතිත්, වැඩීම පිණිස පවතිත්, බහුල කිරීම පිණිස පවතිත්, අලඞ්කාරය පිණිස පවතිත්, පරිෂ්කාරය පිණිස පවතිත්, පරිවාරය පිණිස පවතිත්, පරිපූර්ණභාවය පිණිස පවතිත්, එකාන්තයෙන් නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස උපශමය පිණිස අභිඥාව පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතිත්.

මෙබඳු ශීලයන්ගේ සංවර සංඛ්‍යාත පාරිශුද්ධිය අධිශීල වෙයි. සංවරපාරිශුද්ධියෙහි සිටි චිත්තය වික්ෂෙපයට නො යෙයි. අවික්ෂෙප සඞ්ඛ්‍යාත පාරිශුද්ධිය අධිචිත්ත වෙයි සංවරපාරිශුද්ධිය මොනොවට දකී, අවික්ෂෙපපාරිශුද්ධිය මොනොවට දකී, (ඔහුගේ) දර්ශන සඞ්ඛ්‍යාත පාරිශුද්ධිය අධිප්‍රඥා වෙයි. එහි යම් සංවරභාවයෙක් වේ ද මේ අධිශීලශික්ෂා නමු. එහි යම් අවික්ෂෙපභාවයෙක් වේ ද මේ අධිචිත්තශික්ෂා නමු. එහි යම් දර්ශනභාවයෙක් වේ ද මේ අධිප්‍රඥාශික්ෂා නමු.

ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛති, ජානන්තො සික්ඛති, පස්සන්තො සික්ඛති, පච්චවෙක්ඛන්තො සික්ඛති, චිත්තං අධිට්ඨහන්තො සික්ඛති, සද්ධාය අධිමුච්චන්තො සික්ඛති, විරියං පග්ගණ්හන්තො සික්ඛති, සතිං උපට්ඨපෙන්තො සික්ඛති, චිත්තං සමාදහන්තො සික්ඛති, පඤ්ඤාය පජානන්තො සික්ඛති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛති, පහාතබ්බං පජහන්තො සික්ඛති, භාවෙතබ්බං භාවෙන්තො සික්ඛති,* සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛති.

පඤ්ච සීලානි: අදින්නාදානස්ස -පෙ- කාමෙසු මිච්ඡාචාරස්ස -පෙ- මුසාවාදස්ස -පෙ- පිසුණාය වාචාය -පෙ- ඵරුසාය වාචාය -පෙ- සම්ඵප්පලාපස්ස -පෙ- අභිජ්ඣාය -පෙ- ව්‍යාපාදස්ස -පෙ- මිච්ඡාදිට්ඨියා -පෙ-

නෙක්ඛම්මෙන කාමච්ඡන්දස්ස -පෙ- අබ්‍යාපාදෙන බ්‍යාපාදස්ස -පෙ- ආලොකසඤ්ඤාය ථිනමිද්ධස්ස[1] -පෙ- අවික්ඛෙපෙන උද්ධච්චස්ස -පෙ- ධම්මවවත්ථානෙන විචිකිච්ඡාය -පෙ- ඤාණෙන අවිජ්ජාය -පෙ- පාමොජ්ජෙන[2] අරතියා -පෙ-

පඨමෙන ඣානෙන[3] නීවරණානං -පෙ- දුතියෙන ඣානෙන විතක්කවිචාරානං -පෙ- තතියෙන ඣානෙන පීතියා -පෙ- චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛානං -පෙ- ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤාය -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය -පෙ-- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය -පෙ-

අනිච්චානුපස්සනාය නිච්චසඤ්ඤාය -පෙ- දුක්ඛානුපස්සනාය සුඛසඤ්ඤාය -පෙ- අනත්තානුපස්සනාය අත්තසඤ්ඤාය -පෙ- නිබ්බිදානුපස්සනාය නන්දියා -පෙ- විරාගානුපස්සනාය රාගස්ස -පෙ- නිරොධානුපස්සනාය සමුදයස්ස -පෙ- පටිනිස්සග්ගානුපස්සනාය ආදානස්ස -පෙ- ඛයානුපස්සනාය ඝනසඤ්ඤාය[4] -පෙ- වයානුපස්සනාය ආයූහනස්ස[5] -පෙ- විපරිණාමානුපස්සනාය ධුවසඤ්ඤාය -පෙ- අනිමිත්තානුපස්සනාය නිමිත්තස්ස -පෙ- අප්පණිහිතානුපස්සනාය පණිධියා -පෙ- සුඤ්ඤතානුපස්සනාය අභිනිවෙසස්ස -පෙ- අධිපඤ්ඤාධම්මවිපස්සනාය සාරාදානාභිනිවෙසස්ස[6] -පෙ- යථාභූතඤාණදස්සනෙන සම්මොහාභිනිවෙසස්ස -පෙ- ආදීනවානුපස්සනාය ආලයාභිනිවෙසස්ස -පෙ- පටිසඞ්ඛානුපස්සනාය අප්පටිසඞ්ඛාය -පෙ- විවට්ටානුපස්සනාය සඤ්ඤොගාභිනිවෙසස්ස -පෙ-

---

1 ථිනමිද්ධස්ස - මජසං. 2. පාමුජ්ජෙන - ස්‍යා, වසි.
3 පඨමජ්ඣානෙන (ඉච්චාදි) - ස්‍යා - PTS. 4. ඝනසඤ්ඤාය - වසි.
5 ආයූහනස්ස - ස්‍යා. 6. සාරාගාභිනිවෙසස්ස - PTS.
* භාවෙතබ්බ - සච්ඡිකාතබ්බපදානි මජසං පොත්ථකෙ විපරීතානි දිස්සන්ති

මේ තුන් ශික්ෂාවන් (එකක් එකක්) ආවර්ජනා කෙරෙමින් හික්මෙයි. (ආවර්ජනා කොට) දනිමින් හික්මෙයි. (දැන පුනපුනා) බලමින් හික්මෙයි. (දැක) ප්‍රත්‍යවේක්ෂා කෙරෙමින් හික්මෙයි. (ප්‍රත්‍යවේක්ෂා කොට) සිත නිසල කොට පිහිටුවමින් හික්මෙයි. ශ්‍රද්ධායෙන් බැසගනිමින් හික්මෙයි. වීර්‍ය්‍ය දැඩි කොට ගනිමින් හික්මෙයි. සිහි එළවා තබමින් හික්මෙයි. සිත පිහිටුවමින් හික්මෙයි. ප්‍රඥායෙන් දනිමින් හික්මෙයි. ස්වභාවලක්ෂණාව-බොධයෙන් දතයුතු ධර්මජාතය වෙසෙසින් දනිමින් හික්මෙයි. සාමාන්‍ය ලක්ෂණාවබොධවශයෙන් දතයුතු ධර්මජාතය හාත්පසින් දනිමින් හික්මෙයි. ප්‍රහාතව්‍යය දුරු කෙරෙමින් හික්මෙයි. වැඩියයුත්ත වඩමින් හික්මෙයි' ප්‍රත්‍යක්ෂ කටයුත්ත ප්‍රත්‍යක්ෂ කෙරෙමින් හික්මෙයි.

**ශීලයෝ පස්දෙනෙකි**: අදත්තාදානයාගේ ... කාමමිථ්‍යාචාරයාගේ... මෘෂාවාදයාගේ .. පිශුනවචනයාගේ ... පරුෂවචනයාගේ... ප්‍රලාපයාගේ... අභිධ්‍යාවගේ ... ව්‍යාපාදයාගේ ... මිථ්‍යාදෘෂ්ටිහුගේ ...

නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දයාගේ .. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයාගේ... ආලෝකසංඥායෙන් ථීනමිද්ධයාගේ ... අවික්ෂෙපයෙන් උද්ධතභාවයාගේ... ධර්මනිශ්චයයෙන් විචිකිත්සාවගේ ... ඥානයෙන් අවිද්‍යාවගේ ... ප්‍රාමොද්‍යයෙන් අරතියගේ...

ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගේ ... ද්විතීයධ්‍යානයෙන් විතර්ක-විචාරයන්ගේ ... තෘතීයධ්‍යානයෙන් ප්‍රීතියගේ ... චතුර්ථධ්‍යානයෙන් සුඛ-දුඃඛයන්ගේ ... ආකාසානඤ්චායතනසමාපත්තියෙන් රූපසංඥාවගේ ... ප්‍රතිඝසඥායෙන් නානාත්වසංඥාවගේ... විඤ්ඤාණඤ්චායතනසමාපත්තියෙන් ආකාසානඤ්චායතනසංඥාවගේ ... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතන සංඥාවගේ ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති-යෙන් ආකිඤ්චඤ්ඤායතන සංඥාවගේ ...

අනිච්චානුපස්සනායෙන් නිත්‍යසංඥාවගේ ... දුක්ඛානුපස්සනායෙන් සුඛ-සංඥාවගේ .. අනත්තානුපස්සනායෙන් ආත්මසංඥාවගේ... නිබ්බිදානුපස්සනා-යෙන් නන්දිය (තෘෂ්ණාව) ගේ.. විරාගානුපස්සනායෙන් රාගයාගේ.. නිරො-ධානුපස්සනායෙන් සමුදයාගේ.. පටිනිස්සග්ගානුපස්සනායෙන් ආදානයාගේ... ඛයානුපස්සනායෙන් ඝනසංඥාවගේ . වයානුපස්සනායෙන් කර්මායූහන-යාගේ .. විපරිණාමානුපස්සනායෙන් ධ්‍රැවසංඥාවගේ .. අනිමිත්තානුපස්සනා-යෙන් (නිත්‍ය) නිමිත්තයාගේ ... අප්පණිහිතානුපස්සනායෙන් ප්‍රණිධිහු (සුඛප්‍රාර්ථනාව) ගේ ... සුඤ්ඤතානුපස්සනායෙන් ආත්මාභිනිවේශයාගේ ... අධිපඤ්ඤාධම්මවිපස්සනායෙන් ආත්මසාරාභිනිවේශයාගේ .... යථාභූතඤාණ-දස්සනයෙන් සම්මූඪාභිනිවේශයාගේ ... ආදීනවානුපස්සනායෙන් ආලයා-භිනිවේශයාගේ ... පටිසඞ්ඛානුපස්සනායෙන් අනුපායග්‍රහණයාගේ ... විවට්ටානුපස්සනායෙන් සංයොගාභිනිවේශයාගේ ...

සොතාපත්තිමග්ගෙන දිට්ඨෙකට්ඨානං කිලෙසානං -පෙ- සකදාගාමි-මග්ගෙන ඔළාරිකානං කිලෙසානං -පෙ- අනාගාමිමග්ගෙන අණුසහගතානං කිලෙසානං -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසානං පහානං සීලං, වෙරමණී සීලං, චෙතනා සීලං, සංවරො සීලං, අවීතික්කමො සීලං. එවරූපානි සීලානි චිත්තස්ස අවිප්පටිසාරාය සංවත්තන්ති, පාමොජ්ජාය සංවත්තන්ති, පීතියා සංවත්තන්ති, පස්සද්ධියා සංවත්තන්ති, සොමනස්සාය සංවත්තන්ති, ආසෙවනාය සංවත්තන්ති, භාවනාය සංවත්තන්ති, බහුලීකම්මාය සංවත්තන්ති, අලඞ්කාරාය සංවත්තන්ති, පරික්ඛාරාය සංවත්තන්ති, පරිවාරාය සංවත්තන්ති, පාරිපූරියා සංවත්තන්ති, එකන්ත-නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති.

එවරූපානං සීලානං සංවරපාරිසුද්ධි අධිසීලං, සංවරපාරිසුද්ධියා ඨිතං චිත්තං න වික්ඛෙපං[1] ගච්ඡති, අවික්ඛෙපපාරිසුද්ධි අධිචිත්තං, සංවර-පාරිසුද්ධිං සම්මා පස්සති, අවික්ඛෙපපාරිසුද්ධිං සම්මා පස්සති, දස්සනපාරිසුද්ධි අධිපඤ්ඤා, යො තත්ථ සංවරට්ඨො අයං අධිසීලසික්ඛා, යො තත්ථ අවික්ඛෙ-පට්ඨො අයං අධිචිත්තසික්ඛා, යො තත්ථ දස්සනට්ඨො අයං අධිපඤ්ඤාසික්ඛා.

ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛති, ජානන්තො සික්ඛති පස්සන්තො සික්ඛති, පච්චවෙක්ඛන්තො සික්ඛති, චිත්තං අධිට්ඨහන්තො සික්ඛති, සද්ධාය අධිමුච්චන්තො සික්ඛති, විරියං[2] පග්ගණ්හන්තො සික්ඛති, සතිං උපට්ඨපෙන්තො සික්ඛති, චිත්තං සමාදහන්තො සික්ඛති, පඤ්ඤාය පජානන්තො සික්ඛති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛති, පහාතබ්බං පජහන්තො සික්ඛති, භාවෙතබ්බං භාවෙන්තො සික්ඛති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: "සුත්වාන සංවරෙ පඤ්ඤා සීලමයෙ ඤාණං."

**සීලමයඤාණනිද්දෙසො.**

## 3. සමාධිභාවනාමයඤාණං

කථං සංවරිත්වා සමාදහනෙ පඤ්ඤා සමාධිභාවනාමයෙ ඤාණං:

එකො සමාධි චිත්තස්ස එකග්ගතා.

ද්වෙ සමාධී: ලොකියො සමාධි, ලොකුත්තරො සමාධි.

තයො සමාධී: සවිතක්කසවිචාරො සමාධි, අවිතක්කවිචාරමත්තො සමාධි, අවිතක්කඅවිචාරො සමාධි.

---

1 අවික්ඛෙපං - මජසං, 2. වීරියං - මජසං.

සොවත්මඟින් දෘෂ්ටිය හා සමග එක් වැ සිටි කෙලශයන්ගේ ... සෙදගැමිමඟින් ඖදරික කෙලශයන්ගේ ... අනගැමිමඟින් අණුසහගත කෙලශයන්ගේ ... රහත්මඟින් සියලු කෙලශයන්ගේ ප්‍රහාණය ශීල වෙයි. විරතිය ශීල වෙයි. චෙතනාව ශීල වෙයි. සංවරය ශීල වෙයි. අව්‍යතික්‍රමය ශීල වේ. මෙබඳු ශීලයෝ චිත්තයාගේ නො විපිළිසරයට වැටෙති, ප්‍රමොදභාවයට වැටෙති, ප්‍රීතියට වැටෙති, සන්හිඳීමට වැටෙති, සොම්නසට වැටෙති, ආසෙවනයට වැටෙති, භාවනාවට වැටෙති, බහුල කිරීමට වැටෙති, අලඞ්කාරයට වැටෙති, පරිෂ්කාරයට වැටෙති, පිරිවරට වැටෙති, පිරිපුන් බවට වැටෙති, එකාන්තයෙන් නිර්වේදයට විරාගයට නිරොධයට උපශමයට අභිඥවට සම්බොධයට නිර්වාණයට වැටෙත්.

මෙබඳු ශීලයන්ගේ සංවර සඞ්ඛ්‍යාත පාරිශුද්ධිය අධිශීල නමැ. පරිශුද්ධභාවයෙහි සිටි චිත්තය වික්ෂෙපයට නො යෙයි. අවික්ෂෙප සඞ්ඛ්‍යාත පාරිශුද්ධිය අධිචිත්ත නමැ. සංවරපාරිශුද්ධිය මොනොවට දකියි. අවික්ෂෙපපාරිශුද්ධිය මොනාවට දකියි. දර්ශන සඞ්ඛ්‍යාත පාරිශුද්ධිය අධිප්‍රඥා නමු. එහි යම් සංවර බවෙක් වේ ද මේ අධිශීල ශික්ෂා නමු. එහි යම් අවික්ෂෙප බවෙක් වේ ද මේ අධිචිත්තශික්ෂා නමු. එහි යම් දර්ශනාර්ථයෙක් වේ ද මෙ අධිප්‍රඥා ශික්ෂා නමු.

මේ තුන් ශික්ෂාවන් ආවර්ජනා කෙරෙමින් හික්මෙයි. දනිමින් හික්මෙයි. බලමින් හික්මෙයි. ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් හික්මෙයි. සිත නිසල කොට පිහිටුවමින් හික්මෙයි. ශ්‍රද්ධායෙන් බැසගනිමින් හික්මෙයි. වීර්යය දැඩි කොට ගනිමින් හික්මෙයි. සිහි එළවා තබමින් හික්මෙයි. සිත පිහිටුවමින් හික්මෙයි. ප්‍රඥායෙන් දනිමින් හික්මෙයි. ස්වලක්ෂණාවබොධයෙන් දතයුතු ධර්මජාතය වෙසෙසින් දැනගනිමින් හික්මෙයි. සාමාන්‍යලක්ෂණාවබොධයෙන් දතයුතු ධර්මජාතය හාත්පසින් දනිමින් හික්මෙයි. ප්‍රහාතව්‍යය ප්‍රහාණය කෙරෙමින් හික්මෙයි. භාවිතව්‍යය භාවනා කෙරෙමින් හික්මෙයි. සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කෙරෙමින් හික්මෙයි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **‘සුත්වාන සංවරෙ පඤ්ඤා, සීලමයෙ ඤාණං’යි.**

**ශීලමයඥානනිර්දෙශ යි.**

## 3. සමාධිභාවනාමය ඥානය

නිසෙයින් (ශීලයෙන්) සංවෘත වැ සිත එකඟ කිරීමෙහි පැවැති ප්‍රඥාව සමාධිභාවනාමයඥාන වෙයි. යත්:

**එක් සමාධියෙක්** වෙයි: චිත්තෛකාග්‍රතා යි.

**සමාධීහු දෙදෙනෙක්** වෙති: ලෞකිකසමාධි යැ ලොකොත්තරසමාධි යි

**සමාධීහු තිදෙනෙක්** වෙති: සවිතර්කසවිචාරසමාධි යැ. අවිතර්කවිචාරමාත්‍රසමාධි යැ අවිතර්කඅවිචාරසමාධි යි.

චත්තාරො සමාධී: හානභාගියො සමාධි, ඨිතිභාගියො සමාධි, විසෙසභාගියො සමාධි, නිබ්බෙධභාගියො සමාධි.

පඤ්ච සමාධී: පීතිඵරණතා, සුඛඵරණතා, උපෙක්ඛාඵරණතා, ආලොකඵරණතා, පච්චවෙක්ඛණනිමිත්තං.

ඡ සමාධී: බුද්ධානුස්සතිවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, ධම්මානුස්සතිවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, සඞ්ඝානුස්සතිවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, සීලානුස්සතිවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, චාගානුස්සතිවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, දෙවතානුස්සතිවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි.

සත්ත සමාධී: සමාධිකුසලතා, සමාධිස්ස සමාපත්තිකුසලතා සමාධිස්ස ඨිතිකුසලතා, සමාධිස්ස වුට්ඨානකුසලතා, සමාධිස්ස කල්ලතාකුසලතා,[1] සමාධිස්ස ගොචරකුසලතා, සමාධිස්ස අභිනීහාරකුසලතා.

අට්ඨ සමාධී: පඨවිකසිණ[2]වසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, ආපොකසිණවසෙන -පෙ- තෙජොකසිණවසෙන -පෙ- වායොකසිණවසෙන -පෙ- නීලකසිණවසෙන -පෙ- පීතකසිණවසෙන -පෙ- ලොහිතකසිණවසෙන -පෙ- ඔදාතකසිණවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි.

නව සමාධී: රූපාවචරො සමාධි අත්ථි හීනො, අත්ථි මජ්ඣිමො, අත්ථි පණීතො. අරූපාවචරො සමාධි අත්ථි හීනො, අත්ථි මජ්ඣිමො, අත්ථි පණීතො. සුඤ්ඤතො සමාධි, අනිමිත්තො සමාධි, අප්පණිහිතො සමාධි.

දස සමාධී: උද්ධුමාතකසඤ්ඤාවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, විනීලකසඤ්ඤාවසෙන -පෙ- විපුබ්බකසඤ්ඤාවසෙන -පෙ- විච්ඡිද්දකසඤ්ඤාවසෙන -පෙ- වික්ඛායිතකසඤ්ඤාවසෙන -පෙ- වික්ඛිත්තකසඤ්ඤාවසෙන -පෙ- හතවික්ඛිත්තකසඤ්ඤාවසෙන -පෙ- ලොහිතකසඤ්ඤාවසෙන -පෙ- පුළවකසඤ්ඤාවසෙන -පෙ- අට්ඨිකසඤ්ඤාවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි ඉමෙ පඤ්චපඤ්ඤාස සමාධී.

1. කල්‍යතා කුසලතා - මජසං, PTS. කල්ලිතකුසලතා ස්‍යා, කල්ලකුසලතා - චසි
2. පථවිකසිණ - මජසං.

**සමාධීහු සතර දෙනෙක්** වෙති: හානභාගියසමාධි යැ ස්ථිතිභාගිය-සමාධි යැ විශෙෂභාගියසමාධි යැ නිර්වේදභාගියසමාධි යි.

**සමාධීහු පස්දෙනෙක්** වෙති: ප්‍රීතියගේ පැතිරීම ඇති සමාධි යැ සුඛයාගේ පැතිරීම ඇති සමාධි යැ උපෙක්‍ෂාවගේ පැතිරීම ඇති සමාධි යැ ආලොකසංඥවගේ පැතිරීම ඇති සමාධි යැ ප්‍රත්‍යවෙක්‍ෂානිමිත්ත ඇති සමාධි යි.

**සමාධීහු සදෙනෙකි**: බුද්ධානුස්මෘති වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙපසමාධි යැ. ධර්මානුස්මෘති වශයෙන් චිත්තයාගේ එකඟ බව අවි-ක්‍ෂෙපසමාධි යැ. සංඝානුස්මෘති වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙ-පසමාධි යැ. ශීලානුස්මෘති වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙප සමාධි යැ. ත්‍යාගානුස්මෘති වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙප සමාධි යැ. දෙවතානුස්මෘති වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙප සමාධි යි.

**සමාධීහු සත්දෙනෙක්** වෙති: සමාධියෙහි කුශල බව යැ සමාධියට සමවැදීමෙහි කුශල බව යැ සමාධිය (රිසිසේ) තැබීමෙහි කුශල බව යැ සමාධියෙන් නැඟීසිටීමෙහි කුශල බව යැ සමාධිහුගේ කල්‍යතා (අගිලානභාව) යෙහි කුශල බව යැ සමාධිහුගේ ගොචර (ආරම්මණ) යෙහි කුශල බව යැ සමාධිහුගේ (මතුමත්තෙහි) සමාධියට එළැවීමෙහි කුශල බව යි.

**සමාධීහු අටදෙනෙක්** වෙති: පෘථිවිකසිණ වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙපසමාධි යැ. ආපොකසිණ වශයෙන් ... තෙජොකසිණ වශයෙන් ... වායොකසිණ වශයෙන් .. නීලකසිණ වශයෙන් ... පීත-කසිණ වශයෙන් ... ලොහිතකසිණ වශයෙන් ... ඔදාතකසිණ වශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙපසමාධි යි.

**සමාධීහු නවදෙනෙක්** වෙති: රූපාවචරසමාධිය හීන වූයේ ඇත, මධ්‍යම වූයේ ඇත, ප්‍රණීත වූයේ ඇති. අරූපාවචරසමාධිය හීන වූයේ ඇත, මධ්‍යම වූයේ ඇත, ප්‍රණීත වූයේ ඇති. ශූන්‍යතසමාධි යැ අනිමිත්ත-සමාධි යැ අප්‍රණිහිතසමාධි යි.

**සමාධීහු දස දෙනෙක්** වෙති: උද්ධුමාතක සංඥවශයෙන් චිත්තයා-ගේ එකඟ බව අවික්‍ෂෙපසමාධි යැ, විනීලකසංඥවශයෙන් ... විපුබ්බක සංඥවශයෙන් ... විච්ඡිද්දකසංඥවශයෙන් ... වික්ඛායිතකසංඥවශයෙන් ... වික්ඛිත්තකසංඥවශයෙන් ... හතවික්ඛිත්තකසංඥවශයෙන් ... ලොහිතකසංඥවශයෙන් ... පුළුවකසංඥවශයෙන් ... අට්ඨිකසංඥවශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙපසමාධි යි. මොහු පස්පනස්සමාධීහු **වෙත්.**

අපි ච පඤ්චවීසති සමාධිස්ස සමාධට්ඨා: පරිග්ගහට්ඨෙන සමාධි, පරිවාරට්ඨෙන සමාධි, පරිපූරට්ඨෙන සමාධි, එකග්ගට්ඨෙන සමාධි, අවික්ඛෙපට්ඨෙන සමාධි, අවිසාරට්ඨෙන සමාධි, අනාවිලට්ඨෙන සමාධි, අනිඤ්ජනට්ඨෙන සමාධි, විමුත්තට්ඨෙන සමාධි, එකත්තුපට්ඨානවසෙන චිත්තස්ස ඨිතත්තා සමාධි, සමං එසතීති සමාධි, විසමං නෙසතීති සමාධි, සමං එසිතත්තා සමාධි, විසමං නෙසිතත්තා සමාධි, සමං ආදියතීති සමාධි, විසමං අනාදියතීති සමාධි, සමං ආදින්නත්තා සමාධි, විසමං අනාදින්නත්තා සමාධි, සමං පටිපජ්ජතීති සමාධි, විසමං නප්පටිපජ්ජතීති සමාධි, සමං පටිපන්නත්තා සමාධි, විසමං නප්පටිපන්නත්තා සමාධි, සමං ඣායතීති සමාධි, විසමං ඣාපෙතීති සමාධි, සමං ඣාතත්තා සමාධි, විසමං ඣාපිතත්තා සමාධි, සමො ච හිතො ච සුඛො චාති සමාධි. ඉමෙ පඤ්චවීසති සමාධිස්ස සමාධට්ඨා.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: “සංවරිත්වා සමාදහනෙ පඤ්ඤා සමාධිභාවනාමයෙ ඤාණං.”

**සමාධිභාවනාමයඤාණනිද්දෙසො.**

## 4. ධම්මට්ඨිතිඤාණං

කථං පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං:

අවිජ්ජා සඞ්ඛාරානං උප්පාදට්ඨිති ච, පවත්තට්ඨිති ච, නිමිත්තට්ඨිති ච, ආයූහනට්ඨිති ච, සඤ්ඤොගට්ඨිති ච, පලිබොධට්ඨිති ච, සමුදයට්ඨිති ච, හෙතුට්ඨිති ච, පච්චයට්ඨිති ච. ඉමෙහි නවහාකාරෙහි අවිජ්ජා පච්චයො, සඞ්ඛාරා පච්චයසමුප්පන්නා. උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නා’ති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිති ඤාණං.

අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං අවිජ්ජා සඞ්ඛාරානං උප්පාදට්ඨිති ච, පවත්තට්ඨිති ච, නිමිත්තට්ඨිති ච, ආයූහනට්ඨිති ච, සඤ්ඤොගට්ඨිති ච, පලිබොධට්ඨිති ච, සමුදයට්ඨිති ච, හෙතුට්ඨිති ච, පච්චයට්ඨිති ච. ඉමෙහි නවහාකාරෙහි අවිජ්ජා පච්චයො, සඞ්ඛාරා පච්චයසමුප්පන්නා, උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නා’ති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

තවද සමාධිහුගේ සමාධිසවභාවයෝ පස්විසිදෙනෙකි: පරිග්‍රහ සවභාවයෙන් සමාධි යැ පරිවාරසවභාවයෙන් සමාධි යැ පරිපූර්ණසවභාවයෙන් සමාධි යැ ඒකාග්‍රසවභාවයෙන් සමාධි යැ අවික්ෂෙපසවභාවයෙන් සමාධි යැ අවිසාරණ (නො පැතිරීම්) සවභාවයෙන් සමාධි යැ නො කැලඹෙන සවභාවයෙන් සමාධි යැ නො සැලෙන සවභාවයෙන් සමාධි යැ විමුක්තසවභාවයෙන් සමාධි යැ ඒකත්වයෙන් එළඹසිටීම් විසින් සිත සිටි බැවින් සමාධි යැ අභීණාව සොයා නු යි සමාධි යැ (ධ්‍යානප්‍රත්‍යනීක) විසමය නො සොයා නු යි සමාධි යැ සමය සොයන ලද වන බැවින් සමාධි යැ විසමය නො සොයන ලද වන බැවින් සමාධි යැ සමය ගනී නු යි සමාධි යැ විසමය නො ගනී නු යි සමාධි යැ සමය ගන්නා ලද වන බැවින් සමාධි යැ විසමය නො ගන්නා ලද වන බැවින් සමාධි යැ සමය (අභීණාව) ට පිළිපදී නු යි සමාධි යැ විසමයට නො පිළිපදී නු යි සමාධි යැ සමයට පිළිපන් බැවින් සමාධි යැ විසමයට නො පිළිපන් බැවින් සමාධි යැ සම වැ දිලියේ නු යි සමාධි යැ විසමය දවා නු යි සමාධි යැ සම වැ ජ්වලිත වන බැවින් සමාධි යැ විසමය දවන ලද බැවින් සමාධි යැ සම වූයේ ද හිත වූයේ ද සුඛ වූයේ ද සමාධි යි. මොහු පස්විසි දෙන සමාධිහුගේ සමාධි සවභාවයෝ යි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එහෙයින් කියනු ලැබෙයි: ‘සංවරිත්වා සමාදහනෙ පඤ්ඤා සමාධිභාවනාමයෙ ඤාණං’යි.

**සමාධිභාවනාමයඥානනිර්දෙශ යි.**

# 4. ධම්මට්ඨිති ඥානය

**කිසෙයින් ප්‍රත්‍යය පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ධර්මස්ථිතිඥාන වේ ද යත්:**

අවිද්‍යාව සංස්කාරයන්ගේ උත්පාදයට කාරණ ද ප්‍රවෘත්තියට කාරණ ද නිමිත්ත වූ කාරණ ද ආයූහන වූ කාරණ ද සංයොග වූ කාරණ ද පලිබොධ වූ කාරණ ද සමුදය වූ කාරණ ද හෙතු වූ කාරණ ද ප්‍රත්‍යය වූ කාරණ ද වෙයි. මේ නව අයුරින් අවිද්‍යාව ප්‍රත්‍යය වෙයි. සංස්කාරයෝ ප්‍රත්‍යයසමුත්පන්න වෙත්. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

අතීතකාලයෙහි ද අනාගත කාලයෙහි ද අවිද්‍යාව සංස්කාරයන්ගේ උත්පාදයට කාරණ ද ප්‍රවෘත්තියට කාරණ ද නිමිත්තකාරණ ද ආයූහනකාරණ ද සංයොගකාරණ ද පරිබොධකාරණ ද සමුදයකාරණ ද හෙතුකාරණ ද ප්‍රත්‍යයකාරණ ද වෙයි. මේ නව අයුරින් අවිද්‍යාව ප්‍රත්‍යය වෙයි. සංස්කාරයෝ ප්‍රත්‍යයසමුත්පන්න වෙත්. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

සඞ්ඛාරා විඤ්ඤාණස්ස -පෙ- විඤ්ඤාණං නාමරූපස්ස -පෙ- නාමරූපං සළායතනස්ස -පෙ- සළායතනං ඵස්සස්ස -පෙ- ඵස්සො වෙදනාය -පෙ- වෙදනා තණ්හාය -පෙ- තණ්හා උපාදානස්ස -පෙ- උපාදානං භවස්ස -පෙ- භවො ජාතියා -පෙ- ජාති ජරාමරණස්ස උප්පාදට්ඨිති ච, පවත්තට්ඨිති ච, නිමිත්තට්ඨිති ච, ආයූහනට්ඨිති ච, සඤ්ඤොගට්ඨිති ච, පලිබොධට්ඨිති ච, සමුදයට්ඨිති ච, හෙතුට්ඨිති ච, පච්චයට්ඨිති ච, ඉමෙහි නවහාකාරෙහි ජාති පච්චයො, ජරාමරණං පච්චයසමුප්පන්නං. උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං ජාති ජරාමරණස්ස උප්පාදට්ඨිති ච, පවත්තට්ඨිති ච, නිමිත්තට්ඨිති ච, ආයූහනට්ඨිති ච, සඤ්ඤොගට්ඨිති ච, පලිබොධට්ඨිති ච, සමුදයට්ඨිති ච, හෙතුට්ඨිති ච, පච්චයට්ඨිති ච. ඉමෙහි නවහාකාරෙහි ජාති පච්චයො, ජරාමණං පච්චයසමුප්පන්නං, උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නා'ති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

අවිජ්ජා හෙතු, සඞ්ඛාරා හෙතුසමුප්පන්නා, උභොපෙතෙ ධම්මා හෙතුසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිති ඤාණං. අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං අවිජ්ජා හෙතු, සඞ්ඛාරා හෙතුසමුප්පන්නා, උභොපෙතෙ ධම්මා හෙතුසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

සඞ්ඛාරා හෙතු, විඤ්ඤාණං හෙතුසමුප්පන්නං -පෙ- විඤ්ඤාණං හෙතු, නාමරූපං හෙතුසමුප්පන්නං -පෙ- නාමරූපං හෙතු, සළායතනං හෙතුසමුප්පන්නං -පෙ- සළායතනං හෙතු, ඵස්සො හෙතුසමුප්පන්නො -පෙ- ඵස්සො හෙතු, වෙදනා හෙතුසමුප්පන්නා -පෙ- වෙදනා හෙතු, තණ්හා හෙතුසමුප්පන්නා -පෙ- තණ්හා හෙතු, උපාදානං හෙතුසමුප්පන්නං -පෙ- උපාදානං හෙතු, භවො හෙතුසමුප්පන්නො -පෙ- භවො හෙතු, ජාති හෙතු සමුප්පන්නා -පෙ- ජාති හෙතු, ජරාමරණං හෙතුසමුප්පන්නං. උභොපෙතෙ ධම්මා හෙතුසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං. අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං ජාති හෙතු, ජරාමරණං හෙතුසමුප්පන්නං, උභොපෙතෙ ධම්මා හෙතුසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

අවිජ්ජා පටිච්ච, සඞ්ඛාරා පටිච්චසමුප්පන්නා. උභොපෙතෙ ධම්මා පටිච්චසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං. අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං අවිජ්ජා පටිච්ච, සඞ්ඛාරා පටිච්චසමුප්පන්නා. උභොපෙතෙ ධම්මා පටිච්චසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

සංස්කාරයෝ විඥානයාගේ ... විඥානය නාමරූපයාගේ ... නාමරූපය ෂඩායතනයාගේ ... ෂඩායතනය ස්පර්ශයාගේ ... ස්පර්ශය වේදනාවගේ ... වේදනාව තෘෂ්ණාවගේ ... තෘෂ්ණාව උපාදානයාගේ ... උපාදානය භවයා-ගේ ... භවය ජාතිහුගේ ... ජාතිය ජරාමරණයාගේ උත්පාදයට කාරණ ද ප්‍රවෘත්තියට කාරණ ද නිමිත්තකාරණ ද ආයූහනකාරණ ද සංයෝගකාරණ ද පරිබෝධකාරණ ද සමුදයකාරණ ද හෙතුකාරණ ද ප්‍රත්‍යයකාරණ ද වෙයි මේ නව අයුරින් ජාතිය ප්‍රත්‍යය වෙයි, ජරාමරණ ප්‍රත්‍යයසමුත්පන්න වේ. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

අතීතකාලයෙහි ද අනාගතකාලයෙහි ද ජාතිය ජරාමරණයාගේ උත්පාදයට කාරණ ද ප්‍රවෘත්තියට කාරණ ද නිමිත්තකාරණ ද ආයූහන-කාරණ ද සංයෝගකාරණ ද පරිබෝධකාරණ ද සමුදයකාරණ ද හෙතු-කාරණ ද ප්‍රත්‍යයකාරණ ද වෙයි. මේ නව අයුරින් ජාතිය ප්‍රත්‍යය වෙයි. ජරාමරණ ප්‍රත්‍යය සමුත්පන්න වේ. තෙල උභයධර්මයෝ මැ ප්‍රත්‍යය-සමුත්පන්නයෝ යැ'යි ප්‍රත්‍යය පරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

අවිද්‍යාව (ජනකප්‍රත්‍යය හෙයින්) හෙතු යැ, සංස්කාරයෝ හෙතු-සමුත්පන්න වෙති. තෙල උභයධර්මයෝ මැ හෙතුසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි. අතීතකාලයෙහි ද අනාගතකාල-යෙහි ද අවිද්‍යාව හෙතු වෙයි. සංස්කාරයෝ හෙතුසමුත්පන්නයෝ වෙත්. තෙල උභයධර්මයෝ මැ හෙතු සමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

සංස්කාරයෝ හෙතු වෙති. විඥානය හෙතුසමුත්පන්න වෙයි ... විඥානය හෙතු යැ නාමරූපය හෙතු සමුත්පන්න යි ... නාමරූපය හෙතු යැ ෂඩා-යතනය හෙතුසමුත්පන්න යි ... ෂඩායතනය හෙතු යැ ස්පර්ශය හෙතු-සමුත්පන්න යි ... ස්පර්ශය හෙතු යැ වේදනාව හෙතුසමුත්පන්න යි ... වේදනාව හෙතු යැ තෘෂ්ණාව හෙතුසමුත්පන්න යි ... තෘෂ්ණාව හෙතු යැ උපාදානය හෙතුසමුත්පන්න යි . උපාදානය හෙතු යැ භවය හෙතුසමුත්පන්න යි ... භවය හෙතු යැ ජාතිය හෙතුසමුත්පන්න යි ... ජාතිය හෙතු යැ ජරාමරණ හෙතුසමුත්පන්න යි. තෙල උභයධර්මයෝ මැ හෙතුසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි. අතීතකාලයෙහි දු අනාගතකාලයෙහි දු ජාතිය හෙතු යැ ජරාමරණ හෙතුසමුත්පන්න යි. තෙල උභයධර්මයෝ මැ හෙතුසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

අවිද්‍යාව (සංස්කාරයන් විසින් ප්‍රතිමුඛ වැ ඉයයුතු හෙයින්) ප්‍රතීත්‍ය යැ. සංස්කාරයෝ ප්‍රතීත්‍යසමුත්පන්නයෝ යි. තෙල උභයධර්මයෝ මැ ප්‍රතීත්‍ය-සමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යය පරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි, අතීතකාලයෙහි දු අනාගතකාලයෙහි දු අවිද්‍යාව ප්‍රතීත්‍ය යැ, සංස්කාරයෝ ප්‍රතීත්‍යසමුත්පන්නයෝ යි. තෙල උභයධර්මයෝ මැ ප්‍රතීත්‍යසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

සඞ්ඛාරා පටිච්ච, විඤ්ඤාණං පටිච්චසමුප්පන්නං, -පෙ- විඤ්ඤාණං පටිච්ච නාමරූපං පටිච්චසමුප්පන්නං -පෙ- නාමරූපං පටිච්ච, සළායතනං පටිච්චසමුප්පන්නං -පෙ- සළායතනං පටිච්ච, ඵස්සො පටිච්චසමුප්පන්නො -පෙ- ඵස්සො පටිච්ච, වෙදනා පටිච්චසමුප්පන්නා -පෙ- වෙදනා පටිච්ච, තණ්හා පටිච්චසමුප්පන්නා -පෙ- තණ්හා පටිච්ච, උපාදානං පටිච්චසමුප්පන්නං -පෙ- උපාදානං පටිච්ච, භවො පටිච්චසමුප්පන්නො -පෙ- භවො පටිච්ච, ජාති පටිච්චසමුප්පන්නා -පෙ- ජාති පටිච්ච, ජරාමරණං පටිච්චසමුප්පන්නං, උභොපෙතෙ ධම්මා පටිච්චසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං. අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං ජාති පටිච්ච, ජරාමරණං පටිච්චසමුප්පන්නං, උභොපෙතෙ ධම්මා පටිච්චසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

අවිජ්ජා පච්චයො, සඞ්ඛාරා පච්චයසමුප්පන්නා, 'උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නා'ති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං. අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං අවිජ්ජා පච්චයො, සඞ්ඛාරා පච්චයසමුප්පන්නා, උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

සඞ්ඛාරා පච්චයො,[1] විඤ්ඤාණං පච්චයසමුප්පන්නං -පෙ- විඤ්ඤාණං පච්චයො, නාමරූපං පච්චයසමුප්පන්නං -පෙ- නාමරූපං පච්චයො, සළායතනං පච්චයසමුප්පන්නං -පෙ- සළායතනං පච්චයො, ඵස්සො පච්චයසමුප්පන්නො -පෙ- ඵස්සො පච්චයො, වෙදනා පච්චයසමුප්පන්නා -පෙ- වෙදනා පච්චයො, තණ්හා පච්චයසමුප්පන්නා -පෙ- තණ්හා පච්චයො, උපාදානං පච්චයසමුප්පන්නං -පෙ- උපාදානං පච්චයො, භවො පච්චයසමුප්පන්නො -පෙ- භවො පච්චයො, ජාති පච්චයසමුප්පන්නා -පෙ- ජාති පච්චයො, ජරාමරණං පච්චයසමුප්පන්නං, උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං. අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං ජාතිපච්චයො, ජරාමරණං පච්චයසමුප්පන්නං, උභොපෙතෙ ධම්මා පච්චයසමුප්පන්නාති පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

පුරිමකම්මභවස්මිං මොහො අවිජ්ජා, ආයූහනා[2] සඞ්ඛාරා, නිකන්ති තණ්හා, උපගමනං උපාදානං, චෙතනා භවො, ඉමෙ පඤ්ච ධම්මා පුරිමකම්මභවස්මිං ඉධ පටිසන්ධියා පච්චයා.

ඉධ පටිසන්ධි විඤ්ඤාණං, ඔක්කන්ති නාමරූපං, පසාදො ආයතනං, ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වෙදනා, ඉමෙ පඤ්ච ධම්මා ඉධූපපත්තිභවස්මිං පුරෙ කතස්ස කම්මස්ස පච්චයා.

---

1. පච්චයා - මජසං - චසි. 2. ආයුහනා - මජසං සයා, PTS.

සංස්කාරයෝ ප්‍රතීත්‍ය යැ විඥානය ප්‍රතීත්‍යසමුත්පන්න යි ... විඥානය ප්‍රතීත්‍ය යැ නාමරූප ප්‍රතීත්‍ය සමුත්පන්න යි ... නාමරූප ප්‍රතීත්‍ය යැ ෂඩායතනය ප්‍රතීත්‍යසමුත්පන්න යි ... ෂඩායතනය ප්‍රතීත්‍ය යැ ස්පර්ශය ප්‍රතීත්‍ය-සමුත්පන්න යි ... ස්පර්ශය ප්‍රතීත්‍ය යැ වේදනාව ප්‍රතීත්‍යසමුත්පන්න යි ... වේදනාව ප්‍රතීත්‍ය යැ තෘෂ්ණාව ප්‍රතීත්‍යසමුත්පන්න යි ... තෘෂ්ණාව ප්‍රතීත්‍ය යැ උපාදානය ප්‍රතීත්‍යසමුත්පන්න යි ... උපාදානය ප්‍රතීත්‍ය යැ භවය ප්‍රතීත්‍ය-සමුත්පන්න යි ... භවය ප්‍රතීත්‍ය යැ ජාතිය ප්‍රතීත්‍යසමුත්පන්න යි ... ජාතිය ප්‍රතීත්‍ය යැ ජරාමරණ ප්‍රතීත්‍යසමුත්පන්න යි. මෙසේ උභයධර්මයෝ මැ ප්‍රතීත්‍යසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි. අතීතකාලයෙහි ද ... අනාගතකාලයෙහි ද ජාතිය ප්‍රතීත්‍ය යැ ජරාමරණ ප්‍රතීත්‍යසමුත්පන්න යි. මෙසේ උභයධර්මයෝ මැ ප්‍රතීත්‍යසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

අවිද්‍යාව (උපස්ථම්භක හෙයින්) ප්‍රත්‍යය වෙයි, සංස්කාරයෝ ප්‍රත්‍යය-සමුත්පන්න වෙති. (ඒ ඒ ප්‍රත්‍යයෙන් උපන්) මෙසේ උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි. අතීතකාලයෙහි ද අනාගතකාලයෙහි ද අවිද්‍යාව ප්‍රත්‍යය වෙයි. සංස්කා-රයෝ ප්‍රත්‍යයසමුත්පන්න වෙති. මෙසේ උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්න-යෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

සංස්කාරයෝ ප්‍රත්‍යය වෙති. විඥානය ප්‍රත්‍යයසමුත්පන්න වේ ... විඥානය ප්‍රත්‍යය වෙයි. නාමරූප ප්‍රත්‍යයසමුත්පන්න වේ ... නාමරූප ප්‍රත්‍යය වෙයි. ෂඩායතනය ප්‍රත්‍යයසමුත්පන්න වේ ... ෂඩායතනය ප්‍රත්‍යය වෙයි. ස්පර්ශය ප්‍රත්‍යයසමුත්පන්න වේ ... ස්පර්ශය ප්‍රත්‍යය වෙයි. වේදනාව ප්‍රත්‍යයසමුත්පන්න වේ .. වේදනාව ප්‍රත්‍යය වෙයි. තෘෂ්ණාව ප්‍රත්‍යයසමුත්පන්න වේ ... තෘෂ්ණාව ප්‍රත්‍යය වෙයි. උපාදානය ප්‍රත්‍යයසමුත්පන්න වේ ... උපාදානය ප්‍රත්‍යය වෙයි. භවය ප්‍රත්‍යයසමුත්පන්න වේ ... භවය ප්‍රත්‍යය වෙයි. ජාතිය ප්‍රත්‍යය-සමුත්පන්න වේ ... ජාතිය ප්‍රත්‍යය වෙයි. ජරාමරණ ප්‍රත්‍යයසමුත්පන්න වේ. මෙසේ උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි. අතීතකාලයෙහි ද අනාගතකාලයෙහි ද ජාතිය ප්‍රත්‍යය වෙයි. ජරාමරණ ප්‍රත්‍යයසමුත්පන්න වේ. මෙසේ උභයධර්මයෝ මැ ප්‍රත්‍යයසමුත්පන්නයෝ යැ යි ප්‍රත්‍යයපරිග්‍රහයෙහි ප්‍රඥාව ධර්මස්ථිතිඥාන යි.

පූර්වකර්මභවය කරන කල්හි මෝහය අවිද්‍යා යැ, ආයූහනචේතනාවෝ සංස්කාරයෝ යැ, භවනිකාන්තිය තෘෂ්ණා යැ, දෘෂ්ටිග්‍රහණය උපාදාන යැ, චේතනාව භවය යි. මේ පඤ්චධර්මයෝ පූර්වකර්මභවය කරන කල්හි පැවැත්-තාහු වර්තමානප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වූවාහු යැ.

වර්තමානභවයෙහි ප්‍රතිසන්ධිය විඥාන යැ, (රූපාරූපධර්මයන්ගේ) අව-ක්‍රාන්තිය නාමරූප යැ, ප්‍රසාදය ආයතන යැ, අරමුණු ස්පර්ශ කෙරෙමින් උපන්නේ ස්පර්ශ යැ, (විපාක) වේදයිතය වේදනා යි. මේ පඤ්චධර්මයෝ වර්තමානවිපාකභවයෙහි පූර්වකෘතකර්මයාගේ ප්‍රත්‍යයෙන් පවත්නාහු යි.

ඉධ පරිපක්කත්තා ආයතනානං මොහො අවිජ්ජා, ආයූහනා සඞ්ඛාරා, නිකන්ති තණ්හා, උපගමනං උපාදානං, චෙතනා භවො, ඉමෙ පඤ්ච ධම්මා ඉධ කම්මභවස්මිං ආයතිං පටිසන්ධියා පච්චයා.

ආයතිං[1] පටිසන්ධි විඤ්ඤාණං, ඔක්කන්ති නාමරූපං, පසාදො ආයතනං, ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වෙදනා, ඉමෙ පඤ්ච ධම්මා ආයතිං උපපත්තිභවස්මිං ඉධ කතස්ස කම්මස්ස පච්චයා.

ඉති ඉමෙ[2] චතුසඞ්ඛෙපෙ තයො අද්ධෙ වීසතියා ආකාරෙහි තිසන්ධිං පටිච්චසමුප්පාදං ජානාති, පස්සති, අඤ්ඤාති, පටිවිජ්ඣති. තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා තෙන වුච්චති: පච්චයපරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං.

**ධම්මට්ඨිතිඤාණනිද්දෙසො**

## 5. සම්මසනඤාණං

කථං අතීතානාගතපච්චුප්පන්නානං ධම්මානං සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං:

යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ වා සන්තිකෙ වා, සබ්බං රූපං අනිච්චතො වවත්ථෙති, එකං සම්මසනං. දුක්ඛතො වවත්ථෙති, එකං සම්මසනං, අනත්තතො වවත්ථෙති, එකං සම්මසනං.

යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං අනිච්චතො වවත්ථෙති, එකං සම්මසනං. දුක්ඛතො වවත්ථෙති, එකං සම්මසනං. අනත්තතො වවත්ථෙති, එකං සම්මසනං.

චක්ඛුං -පෙ- ජරාමරණං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චතො වවත්ථෙති, එකං සම්මසනං. දුක්ඛතො වවත්ථෙති, එකං සම්මසනං. අනත්තතො වවත්ථෙති, එකං සම්මසනං.

---

1 ආයති - සයා, වයි. 2. ඉතිමෙ - සයා

වර්තමානභවයෙහි ආයතනයන් මුහුකුරාගිය බැවින් මෝහය අවිද්‍යා යැ, ආයූහනචේතනාවෝ සංස්කාරයෝ යැ, භවනිකාන්තිය තෘෂ්ණා යැ, දෘෂ්ටි-ග්‍රහණය උපාදාන යැ, ආයූහනචේතනාවෝ භව යැ යි. මේ පඤ්චධර්මයෝ වර්තමානකර්මභවයෙහි පැවැත්තාහු අනාගතභවයෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වෙත්.

අනාගතභවයෙහි ප්‍රතිසන්ධිය විඥාන යැ, (රූපාරූපධර්මයන්ගේ) අවක්‍රාන්තිය නාමරූප යැ, ප්‍රසාදය ආයතන යැ, අරමුණු සපර්ශ කෙරෙමින් උපන්නේ සපර්ශ යැ, (විපාක) වේදයිතය වේදනා යැ යි මේ පඤ්චධර්මයෝ ආයතිභාවයෙහි උපප්‍රාප්තියට වර්තමානභවයෙහි කරන ලද කර්මයාගේ ප්‍රත්‍යයෙන් පවතිත්.

මෙසේ මේ සතර සංක්ෂේපයන් ද තුන් කාලයන් ද ත්‍රිසන්ධියක් ඇති ප්‍රතීත්‍යසමුත්පාදය ද විසි අයුරෙකින් (ශ්‍රැතානුසාරයෙන්) දනී නම් (නුවණින්) දකී නම් (නුවණින් දැනගනී නම්) ප්‍රතිවේධ කෙරේ නම් ඒ දැනීම ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එහෙයින් කියනු ලැබෙයි: **'පච්චය පරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිතිඤාණං'** යි.

**ධර්මස්ථිතිඥානනිර්දෙශ යි.**

## 5. සම්මර්ශන ඥානය

කිසෙයින් අතීතානාගත ප්‍රත්‍යුත්පන්න (පඤ්චස්කන්ධ) ධර්මයන් (කලාප විසින්) රැස් කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන වෙයි යත්.

අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වූ අධ්‍යාත්ම වූ හෝ බාහ්‍ය වූ හෝ ඖදාරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි රූපයෙක් වේ ද, දුරැ වූ හෝ ළඟ වූ හෝ යම් රූපයෙක් වේ ද, එ හැම රූපය අනිත්‍ය හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකැ. දුක් හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකැ. අනාත්ම හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකි.

යම් කිසි වේදනායෙක් ... යම් කිසි සංඥායෙක් ... යම් කිසි සංස්කාර කෙනෙක් ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ අධ්‍යාත්ම වූ හෝ බාහ්‍ය වූ හෝ ඖදාරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි විඥානයෙක් වේ ද, දුරැ වූ හෝ ළඟ වූ හෝ යම් විඥානයෙක් වේ ද, එ හැම විඥානය අනිත්‍ය හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකැ. දුඃඛ හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකැ. අනාත්ම හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකි.

චක්ෂුස ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ජරාමරණය අනිත්‍ය හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකැ. දුක් හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකැ. අනාත්ම හෙයින් නිශ්චය කෙරේ නම් එක් සම්මර්ශනයෙකි.

රූපං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං ඛයට්ඨෙන, දුක්ඛං භයට්ඨෙන, අනත්තා අසාරකට්ඨෙනා'ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං, 'වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං ඛයට්ඨෙන, දුක්ඛං භයට්ඨෙන, අනත්තා අසාරකට්ඨෙනා'ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං.

රූපං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්ම'න්ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං, 'වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්ම'න්ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං.

ජාතිපච්චයා ජරාමරණං, අසති ජාතියා නත්ථි ජරාමරණ'න්ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං, අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං ජාතිපච්චයා ජරාමරණං, අසති ජාතියා නත්ථි ජරාමරණ'න්ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං.

භවපච්චයා ජාති, අසති -පෙ- උපාදානපච්චයා භවො, අසති -පෙ- තණ්හාපච්චයා උපාදානං, අසති -පෙ- වෙදනාපච්චයා තණ්හා, අසති -පෙ- ඵස්සපච්චයා වෙදනා, අසති -පෙ- සළායතනපච්චයා ඵස්සො, අසති -පෙ- නාමරූපපච්චයා සළායතනං, අසති -පෙ- විඤ්ඤාණපච්චයා නාමරූපං, අසති -පෙ- සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, අසති සඞ්ඛාරෙසු -පෙ- අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, අසති අවිජ්ජාය නත්ථි සඞ්ඛාරා'ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං.

'අතීතම්පි අද්ධානං අනාගතම්පි අද්ධානං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, අසති අවිජ්ජාය නත්ථි සඞ්ඛාරා'ති සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අතීතානාගතපච්චුප්පන්නානං ධම්මානං සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං'.

**සම්මසනඤාණනිද්දෙසො.**

අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ රූපය ක්ෂය වන බැවින් අනිත්‍ය යැ, ප්‍රතිභය සහිත බැවින් දුඃඛ යැ, ආත්මසාර රහිත බැවින් අනාත්ම යැ යි සංක්ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යැ. වේදනාව ... සංඥාව ... සංස්කාරයෝ ... විඥානය ... චක්ෂුස ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ජරාමරණය ක්ෂය වන බැවින් අනිත්‍ය යැ, ප්‍රතිභය සහිත බැවින් දුඃඛ යැ, ආත්මසාර රහිත බැවින් අනාත්ම යැ යි සංක්ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යි.

අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ රූපය අනිත්‍ය යැ. ප්‍රත්‍යයසමවායෙන් කරන ලද. ප්‍රත්‍යයන් නිසා උපන්නේ යැ, ක්ෂය වන සුලු යැ, නැසෙන සුලු යැ, නො ඇලෙන සුලු යැ, නිරුද්ධ වනසුලු යැ යි සංක්ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යැ. වේදනාව ... සංඥාව ... සංස්කාරයෝ ... විඥානය ... චක්ෂුස ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ජරාමරණය අනිත්‍ය යැ ප්‍රත්‍යයන් විසින් කරන ලද. ප්‍රත්‍යයන් නිසා උපන්නේ යැ, ක්ෂය වනසුලු යැ, නැසෙනසුලු යැ, නො ඇලෙනසුලු යැ, නිරුද්ධ වනසුලු යැ යි සංක්ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යි.

ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වෙයි. ජාතිය නැති කල්හි ජරාමරණ නැතැ යි සංක්ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යැ අතීතකාලයෙහි දු ... අනාගතකාලයෙහි දු ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වෙයි. ජාතිය නැති කල්හි ජරාමරණ නැතැ යි සංක්ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යි.

භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි ... උපාදානප්‍රත්‍යයෙන් භවය වෙයි ... තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදානය වෙයි ... වේදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වෙයි ... ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව වෙයි ... ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වෙයි ... නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතන වෙයි ... විඥානප්‍රත්‍යයෙන් නාම රූප වෙයි ... සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වෙයි ... අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. අවිද්‍යාව නැති කල්හි සංස්කාරයෝ නැත්තාහ යි සංක්ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යි.

අතීතකාලයෙහි දු ... අනාගතකාලයෙහි දු අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති. අවිද්‍යාව නැති කල්හි සංස්කාරයෝ නැත්තාහ'යි සංක්ෂිප්ත කොට නිශ්චය කිරීමෙහි ප්‍රඥාව සම්මර්ශනඥාන යි.

ඒ දැනීම ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එසින් කියනු ලැබෙයි. **'අතීතානාගතපච්චුප්පන්නානං ධම්මානං සඞ්ඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං'** යි.

**සම්මර්ශනඥානනිර්දෙශ යි.**

## 6. උදයබ්බයඤාණං

කථං පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං?

ජාතං රූපං පච්චුප්පන්නං, තස්ස නිබ්බත්තිලක්ඛණං උදයො, විපරිණාම ලක්ඛණං වයො, අනුපස්සනා ඤාණං.

ජාතා වෙදනා -පෙ- ජාතා සඤ්ඤා -පෙ- ජාතා සඞ්ඛාරා -පෙ- ජාතං විඤ්ඤාණං -පෙ- ජාතං චක්ඛු -පෙ- ජාතො භවො පච්චුප්පන්නො, තස්ස නිබ්බත්තිලක්ඛණං උදයො, විපරිණාමලක්ඛණං වයො, අනුපස්සනා ඤාණං.

පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති.

පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො පඤ්චවීසති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො පඤ්චවීසති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො පඤ්ඤාස ලක්ඛණානි පස්සති.

රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති. වෙදනාක්ඛන්ධස්ස -පෙ- සඤ්ඤාක්ඛන්ධස්ස -පෙ- සඞ්ඛාරක්ඛන්ධස්ස -පෙ- විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති.

රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො පඤ්ච ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො පඤ්ච ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො දස ලක්ඛණානි පස්සති. වෙදනාක්ඛන්ධස්ස -පෙ- සඤ්ඤාක්ඛන්ධස්ස -පෙ- සඞ්ඛාරක්ඛන්ධස්ස -පෙ- විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සන්තො පඤ්ච ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො පඤ්ච ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො දස ලක්ඛණානි පස්සති.

රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො කතමානි පඤ්ච ලක්ඛණානි පස්සති: 'අවිජ්ජාසමුදයා රූපසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති, 'තණ්හාසමුදයා රූපසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති, 'කම්මසමුදයා රූපසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති, 'ආහාරසමුදයා රූපසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති, නිබ්බත්තිලක්ඛණං පස්සන්තොපි රූපක්ඛන්ධස්ස උදයං පස්සති. රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති.

## 6. උදයව්‍යය ඥානය

කිසෙසින් වර්තමාන ස්කන්ධධර්මයන්ගේ විපරිණාමය දැකීමෙහි ප්‍රඥාව උදයව්‍යයානුදර්ශනඥාන වෙයි යත්:

(සන්තතිවශයෙන්) උපන් රූපය ප්‍රත්‍යුත්පන්න වෙයි. ඒ රූපයාගේ නිර්වෘත්තිලක්ෂණය (අභිනවාකාරය) උදය නමි. විපරිණාමලක්ෂණය ව්‍යය නමි. පුනපුනා නුවණින් බැලීම උදයව්‍යයඥාන යි.

උපන් වේදනාව ... උපන් සංඥාව ... උපන් සංස්කාරයෝ ... උපන් විඥානය ... උපන් චක්ෂුස .... උපන් භවය ප්‍රත්‍යුත්පන්න වෙයි. ඒ භවයාගේ නිර්වෘත්තිලක්ෂණය උදය නමි. විපරිණාමලක්ෂණය ව්‍යය නමි. අනුපස්සනාව උදයව්‍යයඥාන යි.

පඤ්චස්කන්ධයන්ගේ උදය දකිනුයේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, ව්‍යය දකිනුයේ කෙතෙක් ලක්ෂණයන් දකී ද උදයව්‍යය දකිනුයේ කෙතෙක් ලක්ෂණයන් දකී ද යත්:

පඤ්චස්කන්ධයන්ගේ උදය දකිනුයේ පස්විසි ලක්ෂණයන් දකී. ව්‍යය දකිනුයේ පස්විසි ලක්ෂණයන් දකී. උදයව්‍යය දකිනුයේ පනස් ලක්ෂණයන් දකී.

රූපස්කන්ධයාගේ උදය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, ව්‍යය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, උදයව්‍යය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, වේදනාස්කන්ධයාගේ ... සංඥාස්කන්ධයාගේ ... සංස්කාරස්කන්ධයාගේ ... විඥානස්කන්ධයාගේ උදය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, ව්‍යය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, උදයව්‍යය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දකී ද, යත්:

රූපස්කන්ධයාගේ උදය දක්නේ ලක්ෂණ පසක් දකී. ව්‍යය දක්නේ ලක්ෂණ පසක් දකී. උදයව්‍යය දක්නේ ලක්ෂණ දසයක් දකී. වේදනාස්කන්ධයාගේ .. සංඥාස්කන්ධයාගේ ... සංස්කාරස්කන්ධයාගේ ... විඥානස්කන්ධයාගේ උදය දක්නේ ලක්ෂණ පසක් දකී. ව්‍යය දක්නේ ලක්ෂණ පසක් දකී. උදයව්‍යය දක්නේ ලක්ෂණ දසයක් දකී.

රූපස්කන්ධයාගේ උදය දක්නේ කවර පඤ්චලක්ෂණයන් දකී ද යත්, අවිද්‍යාසමුදයෙන් රූපයාගේ ඉපදීම වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් රූපස්කන්ධයාගේ උදය දකී. තෘෂ්ණාසමුදයෙන් රූපයාගේ ඉපදීම වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් රූපස්කන්ධයාගේ උදය (ඉපැදීම) දකී. කර්මසමුදයෙන් රූපයාගේ ඉපැදීම වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් රූපස්කන්ධයාගේ උදය දකී. ආහාරසමුදයෙන් රූපයාගේ ඉපැදීම වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් රූපස්කන්ධයාගේ උදය දකී. (අද්ධා-සන්තති-ක්ෂණවශයෙන් රූපයාගේ) උත්පාදලක්ෂණය දක්නේ ද රූපස්කන්ධයාගේ ඉපැදීම දකී. රූපස්කන්ධයාගේ උදය දක්නේ මේ ලක්ෂණ පස දකී.

වයං පස්සන්තො කතමානි පඤ්චලක්ඛණානි පස්සති: අවිජ්ජානිරොධා රූපනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති, 'තණ්හානිරොධා රූපනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති, 'කම්මනිරොධා රූපනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති, 'ආහාරනිරොධා රූපනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති, විපරිණාමලක්ඛණං පස්සන්තොපි රූපක්ඛන්ධස්ස වයං පස්සති, රූපක්ඛන්ධස්ස වයං පස්සන්තො ඉමානි පඤ්චලක්ඛණානි පස්සති.

උදයබ්බයං පස්සන්තො ඉමානි දස ලක්ඛණානි පස්සති.

වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සන්තො කතමානි පඤ්ච ලක්ඛණානි පස්සති. 'අවිජ්ජාසමුදයා වෙදනාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති, 'තණ්හාසමුදයා වෙදනාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති, 'කම්මසමුදයා වෙදනාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති, 'ඵස්සසමුදයා වෙදනාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති, නිබ්බත්තිලක්ඛණං පස්සන්තොපි වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සති. වෙදනාක්ඛන්ධස්ස උදයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති.

වයං පස්සන්තො කතමානි පඤ්චලක්ඛණානි පස්සති: 'අවිජ්ජානිරොධා වෙදනානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස වයං පස්සති, 'තණ්හානිරොධා වෙදනානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස වයං පස්සති, 'කම්මනිරොධා වෙදනානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස වයං පස්සති, ඵස්සනිරොධා වෙදනානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන වෙදනාක්ඛන්ධස්ස වයං පස්සති, විපරිණාමලක්ඛණං පස්සන්තොපි වෙදනාක්ඛන්ධස්ස වයං පස්සති. වෙදනාක්ඛන්ධස්ස වයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති.

උදයබ්බයං පස්සන්තො ඉමානි දස ලක්ඛණානි පස්සති.

සඤ්ඤාක්ඛන්ධස්ස -පෙ- සඞ්ඛාරක්ඛන්ධස්ස -පෙ- විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සන්තො කතමානි පඤ්ච ලක්ඛණානි පස්සති: 'අවිජ්ජාසමුදයා විඤ්ඤාණසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සති, 'තණ්හාසමුදයා විඤ්ඤාණසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සති, 'කම්මසමුදයා විඤ්ඤාණසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සති, 'නාමරූපසමුදයා විඤ්ඤාණසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සති, නිබ්බත්තිලක්ඛණං පස්සන්තොපි විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සති. විඤ්ඤාණක්ඛන්ධස්ස උදයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති.

ව්‍යය දක්නේ කවර පඤ්චලක්ෂණයන් දකී ද යත්: අවිද්‍යානිරොධයෙන් රූපනිරොධය වේ යැ යි ප්‍රත්‍යයාගේ නිරුද්ධභාවයෙන් රූපස්කන්ධයාගේ ව්‍යය දකියි. තෘෂ්ණානිරොධයෙන් රූපයාගේ අනුත්පාදනිරොධය වේ යැ යි ප්‍රත්‍යයනිරුද්ධභාවයෙන් රූපස්කන්ධයාගේ ව්‍යය දකියි. කර්මයාගේ නිරොධයෙන් රූපයාගේ අනුත්පාදනිරොධය වේ යැ යි ප්‍රත්‍යයාගේ නිරුද්ධභාවයෙන් රූපස්කන්ධයාගේ ව්‍යය දකියි. ආහාරනිරොධයෙන් රූපයාගේ අනුත්පාදනිරොධය වේ යැ යි ප්‍රත්‍යයාගේ නිරුද්ධභාවයෙන් රූපස්කන්ධයාගේ ව්‍යය දකියි. (අද්ධා-සන්තති-ඛණවශයෙන් රූපයාගේ) භඞ්ගය දක්නේ ද රූපස්කන්ධයාගේ ව්‍යය දකී රූපස්කන්ධයාගේ ව්‍යය දක්නේ මේ පඤ්චලක්ෂණයන් දකී.

උදයව්‍යය දක්නේ මේ දශලක්ෂණයන් දකී.

වෙදනාස්කන්ධයාගේ උදය දක්නේ කවර ලක්ෂණ පසක් දකී ද යත්: අවිද්‍යාසමුදයෙන් වෙදනාවගේ ඉපැදීම වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් වෙදනාස්කන්ධයාගේ ඉපැදීම දකියි. තෘෂ්ණාසමුදයෙන් වෙදනාසමුදය වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් වෙදනාස්කන්ධයාගේ උදය දකියි කර්මසමුදයෙන් වෙදනාසමුදය වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් වෙදනාස්කන්ධයාගේ උදය දකියි. ස්පර්ශයාගේ සමුදයෙන් වෙදනාසමුදය වේ යැ යි ප්‍රත්‍යය උපන් බැවින් වෙදනාස්කන්ධයාගේ උදය දකියි. උත්පාදලක්ෂණය දක්නේ ද වෙදනාස්කන්ධයාගේ උදය දකී. වෙදනාස්කන්ධයාගේ උදය දක්නේ මේ පඤ්චලක්ෂණයන් දකී.

ව්‍යය දක්නේ කවර පඤ්චලක්ෂණයන් දකී ද යත්: අවිද්‍යාවගේ අනුත්පාද නිරොධයෙන් වෙදනාවගේ නිරොධය වේ යැ යි ප්‍රත්‍යය නිරුද්ධ බැවින් වෙදනාස්කන්ධයාගේ ව්‍යය දකියි. තෘෂ්ණානිරොධයෙන් වෙදනානිරොධය වේ යැ යි ප්‍රත්‍යනිරුද්ධ බැවින් වෙදනාස්කන්ධයාගේ ව්‍යය දකියි. කර්මනිරොධයෙන් වෙදනානිරොධය වේ යැ යි ප්‍රත්‍යයනිරුද්ධ බැවින් වෙදනාස්කන්ධයාගේ ව්‍යය දකියි. ස්පර්ශනිරොධයෙන් වෙදනානිරොධය වේ යැ යි ප්‍රත්‍යයනිරුද්ධභාවයෙන් වෙදනාස්කන්ධයාගේ ව්‍යය දකියි. විපරිණාමලක්ෂණය (වෙදනාභඞ්ගය) දක්නේ ද වෙදනාස්කන්ධයාගේ ව්‍යය දකී. වෙදනාස්කන්ධයාගේ ව්‍යය දක්නේ මේ පඤ්චලක්ෂණයන් දකී.

උදයව්‍යය දක්නේ මේ දශලක්ෂණයන් දකී.

සංඥාස්කන්ධයාගේ ... සංස්කාරස්කන්ධයාගේ ... විඥානස්කන්ධයාගේ උදය දක්නේ කවර පඤ්චලක්ෂණයන් දකී ද යත්: අවිද්‍යාසමුදයෙන් විඥානයාගේ ඉපදීම වේ යැ යි ප්‍රත්‍යයසමුදයභාවයෙන් විඥානස්කන්ධයාගේ ඉපැදීම දකියි. තෘෂ්ණාසමුදයෙන් විඥානසමුදය වේ යැ යි ප්‍රත්‍යයසමුදයභාවයෙන් විඥානස්කන්ධයාගේ ඉපැදීම දකියි. කර්මසමුදයෙන් විඥානසමුදය වේ යැ යි ප්‍රත්‍යය සමුදයභාවයෙන් විඥානස්කන්ධයාගේ ඉපැදීම දකියි. නාමරූපසමුදයෙන් විඥානසමුදය වේ යැ යි ප්‍රත්‍යයසමුදයභාවයෙන් විඥානස්කන්ධයාගේ ඉපැදීම දකියි. උත්පාදලක්ෂණය දක්නේ ද විඥානස්කන්ධයාගේ ඉපැදීම දකී. විඥානස්කන්ධයාගේ උදය දක්නේ මේ පඤ්චලක්ෂණයන් දකී.

වයං පස්සන්තො කතමානි පඤ්ච ලක්ඛණානි පස්සති: 'අවිජ්ජානිරොධා විඤ්ඤාණනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස වයං පස්සති, 'තණ්හානිරොධා විඤ්ඤාණනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස වයං පස්සති, 'කම්මනිරොධා විඤ්ඤාණනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස වයං පස්සති, 'නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන විඤ්ඤාණක්ඛන්ධස්ස වයං පස්සති, විපරිනාමලක්ඛණං පස්සන්තොපි විඤ්ඤාණක්ඛන්ධස්ස වයං පස්සති. විඤ්ඤාණක්ඛන්ධස්ස වයං පස්සන්තො ඉමානි පඤ්චලක්ඛණානි පස්සති.

උදයබ්බයං පස්සන්තො ඉමානි දස ලක්ඛණානි පස්සති.

පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො ඉමානි පඤ්චවීසති ලක්ඛණානි පස්සති. වයං පස්සන්තො ඉමානි පඤ්චවීසති ලක්ඛණානි පස්සති. උදයබ්බයං පස්සන්තො ඉමානි පඤ්ඤාස[1] ලක්ඛණානි පස්සති.

තං ඤාතට්ඨෙන ඤාණං පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: පච්චුප්පන්නානං ධම්මානං විපරිනාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං.

රූපක්ඛන්ධො ආහාරසමුදයො,[2] වෙදනා සඤ්ඤා සඞ්ඛාරා[3] තයො ඛන්ධා ඵස්සසමුදයා, විඤ්ඤාණක්ඛන්ධො නාමරූපසමුදයො[4].

**උදයබ්බයඤාණනිද්දෙසො**

## 7. භඞ්ගානුපස්සනාඤාණං

කථං ආරම්මණං පටිසඞ්ඛා භඞ්ගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං:

රූපාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති, තං ආරම්මණං පටිසඞ්ඛා තස්ස චිත්තස්ස භඞ්ගං අනුපස්සති.

**අනුපස්සතීති** කථං අනුපස්සති: අනිච්චතො අනුපස්සති, නො නිච්චතො. දුක්ඛතො අනුපස්සති, නො සුඛතො. අනත්තතො අනුපස්සති, නො අත්තතො. නිබ්බින්දති, නො නන්දති. විරජ්ජති, නො රජ්ජති. නිරොධෙති, නො සමුදෙති පටිනිස්සජ්ජති, නො ආදියති.

අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති.

---

1. පඤ්ඤාසං - සයා
2. රූපක්ඛන්ධා ආහාරසමුදයා - සයා,
3. ....සඞ්ඛාරාති සෙසා - විසි, සයා
4. විඤ්ඤාණක්ඛන්ධා නාමරූපසමුදයා - විසි, සයා

ව්‍යය දක්නේ කවර පඤ්චලක්ෂණයන් දකී ද යත්: අවිද්‍යාවගේ නිරොධයෙන් විඥානයාගේ නිරොධය වේ යැ යි ප්‍රත්‍යය නිරුද්ධභාවයෙන් විඥානයාගේ ව්‍යය (නැසීම) දකියි. තෘෂ්ණානිරොධයෙන් විඥානනිරොධය වේ යැ යි ප්‍රත්‍යය නිරුද්ධභාවයෙන් විඥානස්කන්ධයාගේ ව්‍යය දකියි. කර්මනිරොධයෙන් විඥානනිරොධය වේ යැ යි ප්‍රත්‍යය නිරුද්ධභාවයෙන් විඥානස්කන්ධයාගේ ව්‍යය දකියි. නාමරූපනිරොධයෙන් විඥානනිරොධය වේ යැ යි ප්‍රත්‍යය නිරුද්ධභාවයෙන් විඥානස්කන්ධයාගේ ව්‍යය දකියි. විපරිණාමලක්ෂණය දක්නේ ද විඥානස්කන්ධයාගේ ව්‍යය දකියි. විඥානස්කන්ධයාගේ ව්‍යය දක්නේ මේ පඤ්චලක්ෂණයන් දකී.

උදයව්‍යය දක්නේ මේ දශලක්ෂණයන් දකී.

පඤ්චස්කන්ධයන්ගේ උදය දක්නේ මේ පස්විසි ලක්ෂණයන් දකියි. ව්‍යය දක්නේ මේ පස්විසි ලක්ෂණයන් දකියි. උදයව්‍යය දක්නේ මේ පනස් ලක්ෂණයන් දකී.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං**'යි.

රූපස්කන්ධය ආහාරසමුදය කොට ඇත්තේ යැ. වෙදනා යැ සංඥා යැ සංස්කාරයෝ යැ යන තුන් ස්කන්ධයෝ ස්පර්ශසමුදය කොට ඇත්තාහ. විඥානස්කන්ධය නාමරූපසමුදය කොට ඇත්තේ යි.

**උදයව්‍යයඥාන නිර්දෙශ යි.**

## 7 භඞ්ගානුදර්ශන ඥානය

කිසෙයින් රූපස්කන්ධාදි ආලම්බනය ප්‍රත්‍යවෙක්ෂා කොට භඞ්ගානුදර්ශනයෙහි ප්‍රඥාව විදර්ශනාඥාන වෙයි යත්:

රූපය අරමුණු කොට ඇති සිත ඉපැද බිඳෙයි. ඒ අරමුණ ප්‍රත්‍යවෙක්ෂා කොට ඒ චිත්තයාගේ භඞ්ගය (අපරචිත්තයෙන්) පුනපුනා දකියි.

**අනුපස්සති** යනු: කිසෙයින් පුනපුනා දකී ද යත්: අනිත්‍ය හෙයින් පුනපුනා දකියි, නිත්‍ය හෙයින් නො දකී. දුඃඛ හෙයින් දකියි, සුඛ හෙයින් නො දකී. අනාත්ම හෙයින් දකියි, ආත්ම හෙයින් නො දකී. උකටලී වෙයි. සතුටු නො වෙයි. විරක්ත වෙයි. නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි, නූපදවයි, දුරු කෙරෙයි, ග්‍රහණය නො කෙරේ.

අනිත්‍ය හෙයින් පුනපුනා දක්නේ නිත්‍යසංඥාව දුරලයි. දුඃඛ හෙයින් දක්නේ සුඛසංඥාව දුරලයි. අනාත්ම හෙයින් දක්නේ ආත්මසංඥාව දුරලයි. උකටලී වනුයේ සප්‍රීතිකතෘෂ්ණාව දුරලයි. නො ඇලෙනුයේ රාගය (ශෛෂතෘෂ්ණාව) දුරලයි. නිරුද්ධ කරනුයේ සමුදය (රාගොත්පත්තිය) දුරලයි. දුරලනුයේ (ඉපදීම් වශයෙන් කෙලෙසුන්ගේ) ආදානය දුරලයි.

වේදනාරම්මණතා -පෙ- සඤ්ඤාරම්මණතා -පෙ- සඞ්ඛාරාරම්මණතා -පෙ- විඤ්ඤාණාරම්මණතා -පෙ- චක්ඛාරම්මණතා[1] -පෙ- ජරාමරණාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති, තං ආරම්මණං පටිසඞ්ඛා තස්ස චිත්තස්ස භඞ්ගං අනුපස්සති.

**අනුපස්සතීති** කථං අනුපස්සති: අනිච්චතෝ අනුපස්සති, නෝ නිච්චතෝ. දුක්ඛතෝ අනුපස්සති, නෝ සුඛතෝ. අනත්තතෝ අනුපස්සති, නෝ අත්තතෝ. නිබ්බින්දති, නෝ නන්දති. විරජ්ජති, නෝ රජ්ජති. නිරෝධෙති, නෝ සමුදෙති. පටිනිස්සජ්ජති, නෝ ආදියති.

අනිච්චතෝ අනුපස්සන්තෝ නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතෝ අනුපස්සන්තෝ සුඛසඤ්ඤං පජහති, අනත්තතෝ අනුපස්සන්තෝ අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තෝ නන්දිං පජහති, විරජ්ජන්තෝ රාගං පජහති, නිරෝධෙන්තෝ සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තෝ ආදානං පජහති.

1. වත්ථුසඞ්කමනා චේව සඤ්ඤාය[2] ච විවට්ටනා
   ආවජ්ජනාබලං චේව පටිසඞ්ඛා විපස්සනා.

2. ආරම්මණං[3] අන්වයේන උභෝ ඒකවවත්ථනා
   නිරෝධෙ අධිමුත්තතා[4] වයලක්ඛණවිපස්සනා.

3. ආරම්මණඤ්ච පටිසඞ්ඛා භඞ්ගඤ්ච අනුපස්සති
   සුඤ්ඤතෝ ච උපට්ඨානං අධිපඤ්ඤාවිපස්සනා

4. කුසලෝ තීසු අනුපස්සනාසු චතස්සෝ ච[5] විපස්සනාසු
   තයෝ උපට්ඨානකුසලතා නානාදිට්ඨීසු න කම්පතී'ති.

තං ඤාතට්ඨේන ඤාණං, පජානනට්ඨේන පඤ්ඤා. තේන වුච්චති: 'ආරම්මණං පටිසඞ්ඛා භඞ්ගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං.

**භඞ්ගානුපස්සනාඤාණනිද්දෙසෝ.**

1. චක්ඛු, චක්ඛුං -සබ්බත්ථ 2. පඤ්ඤාය - මජ්සං, විමන්, PTS
3. ආරම්මණා - වසි, PTS. ආරම්මණතාවසෙනාපි - විමු.
4 අවිමුත්තතා - PTS 5. චතුද්ව - සයා, චතුසු ච - PTS.

වේදනාව අරමුණු කොට ඇති ... සංඥාව අරමුණු කොට ඇති ... සංස්කාරයන් අරමුණු කොට ඇති ... විඥානය අරමුණු කොට ඇති ... චක්ෂුස ... ජරාමරණ අරමුණු කොට ඇති සිත ඉපැද බිඳෙයි. ඒ ආලම්බනය ප්‍රත්‍යවෙක්ෂා කොට ඒ චිත්තයාගේ භඞ්ගය පුනපුනා දකී.

**අනුපස්සති** යනු: කිසෙයින් පුනපුනා දකී ද යත්: අනිත්‍ය හෙයින් දකියි, නිත්‍ය හෙයින් නො දකී. දුඃඛ හෙයින් දකියි, සුඛ හෙයින් නො දකී. අනාත්ම හෙයින් දකියි, ආත්ම හෙයින් නො දකී. උකටලී වෙයි, සතුටු නොවෙයි. විරක්ත වෙයි. නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි. නූපද-වයි. දුරලයි. ආදානය නො කෙරේ.

අනිත්‍ය හෙයින් පුනපුනා දක්නේ නිත්‍යසංඥාව දුරලයි. දුඃඛ හෙයින් පුනපුනා දක්නේ සුඛසංඥාව දුරලයි. අනාත්ම හෙයින් පුනපුනා දක්නේ ආත්මසංඥාව දුරලයි. උත්කණ්ඨිත වනුයේ සප්‍රීතිකතෘෂ්ණාව දුරලයි. විරක්ත වනුයේ රාගය දුරලයි. නිරුද්ධ කරනුයේ සමුදය (රාගෝත්පත්තිය) දුරලයි. දුරලනුයේ ආදානය දුරලයි.

1 පූර්වවස්තුවෙන් අපරවස්තුවකට සඞ්ක්‍රමණය ද (උදයව්‍යයවිදර්ශනා වශයෙන් පවත්නා විදර්ශනා) ප්‍රඥාවගේ (ව්‍යයග්‍රහණවශයෙන් උදයෙන්) විනිවර්තනය ද (භඞ්ගාරම්මණ වූ චිත්තයාගේ භඞ්ගය දැකීම පිණිස අනතුරුව මැ) ආවර්ජනයෙහි සමර්ථ බව ද යන (මේ තොමෝ) පටිසඞ්ඛා-විපස්සනා (භඞ්ගානුපස්සනා) නම්.

2 ආලම්බනය අනුව යැමෙන් අතීතානාගත දෙදෙනාගේ එක-ස්වභාවයෙන් නිශ්චය කිරීම ද (භඞ්ග සඞ්ඛ්‍යාත වූ) නිරෝධයෙහි මැ අධිමුක්ත බව ද යන (මේ තොමෝ) ව්‍යයලක්ෂණවිදර්ශනා නම්.

3 පූර්ව වූ ආලම්බනය ද ප්‍රත්‍යවෙක්ෂා කොට (තදාලම්බනචිත්තයාගේ) භඞ්ගයත් දකී ද, (සංස්කාරයන්) ශූන්‍ය හෙයින් වැටහීම ද යන මේ තොමෝ අධිප්‍රඥාවිදර්ශනා නම්.

4 (අනිත්‍යානුදර්ශනාදී) තුන් අනුපස්සනායෙහි දක්ෂ වූ යෝගාවචර මහණ තෙම (නිබ්බිදානුපස්සනාදි) සතර අනුපස්සනායෙහි ද (ක්ෂය-ව්‍යය ශූන්‍යතා යන) ත්‍රිවිධ උපස්ථානයෙහි (වැටහීමෙහි ද) දක්ෂ බැවින් (ශාශ්වතාදී) නානාප්‍රකාර දෘෂ්ටීන්හි නො සැලේ යයි.

ඒ භඞ්ගානුදර්ශනය ඥාත බැවින් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙසි: ‘**ආරම්මණං පටිසඞ්ඛා භඞ්ගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං**’යි.

**භඞ්ගානුදර්ශනඥානනිර්දෙශ යි.**

# 8. ආදීනවඤාණං

කථං භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං:

'උප්පාදො භය'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං. 'පවත්තං භය'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, 'නිමිත්තං භය'න්ති –පෙ– 'ආයුහනා[1] භය'න්ති –පෙ– 'පටිසන්ධි භය'න්ති –පෙ– 'ගති භය'න්ති –පෙ– 'නිබ්බත්ති භය'න්ති –පෙ– 'උපපත්ති භය'න්ති –පෙ– 'ජාති භය'න්ති –පෙ– 'ජරා භය'න්ති –පෙ– 'ව්‍යාධි භය'න්ති –පෙ– 'මරණං භය'න්ති –පෙ– 'සොකො භය'න්ති –පෙ– 'පරිදෙවො භය'න්ති –පෙ– 'උපායාසො භය'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

'අනුප්පාදො ඛෙම'න්ති සන්තිපදෙ ඤාණං, 'අප්පවත්තං ඛෙම'න්ති සන්තිපදෙ ඤාණං –පෙ– 'අනුපායාසො ඛෙම'න්ති සන්තිපදෙ ඤාණං.

'උප්පාදො භයං, අනුප්පාදො ඛෙම'න්ති සන්තිපදෙ ඤාණං, 'පවත්තං භයං, අප්පවත්තං ඛෙම'න්ති සන්තිපදෙ ඤාණං –පෙ– 'උපායාසො භයං, අනුපායාසො ඛෙම'න්ති සන්තිපදෙ ඤාණං.

'උප්පාදො දුක්ඛ'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, 'පවත්තං දුක්ඛ'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං –පෙ– 'උපායාසො දුක්ඛ'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

'අනුප්පාදො සුඛ'න්ති සන්තිපදෙ ඤාණං, 'අප්පවත්තං සුඛ'න්ති සන්තිපදෙ ඤාණං –පෙ– 'අනුපායාසො සුඛ'න්ති සන්තිපදෙ ඤාණං.

'උප්පාදො දුක්ඛං, අනුප්පාදො සුඛ'න්ති සන්තිපදෙ ඤාණං, 'පවත්තං දුක්ඛං, අප්පවත්තං සුඛ'න්ති සන්තිපදෙ ඤාණං –පෙ– 'උපායාසො දුක්ඛං, අනුපායාසො සුඛ'න්ති සන්තිපදෙ ඤාණං.

'උප්පාදො සාමිස'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, 'පවත්තං සාමිස'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා –පෙ– 'උපායාසො සාමිස'න්ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

'අනුප්පාදො නිරාමිස'න්ති සන්තිපදෙ ඤාණං, 'අප්පවත්තං නිරාමිස'න්ති සන්තිපදෙ ඤාණං –පෙ– 'අනුපායාසො නිරාමිස'න්ති සන්තිපදෙ ඤාණං.

'උප්පාදො සාමිසං, අනුප්පාදො නිරාමිස'න්ති සන්තිපදෙ ඤාණං, 'පවත්තං සාමිසං, අප්පවත්තං නිරාමිස'න්ති සන්තිපදෙ ඤාණං –පෙ– 'උපායාසො සාමිසං, අනුපායාසො නිරාමිස'න්ති සන්තිපදෙ ඤාණං.

---

1 ආයූහනා – මජසං, සහා, PT

## 8. ආදීනව ඥානය

කිසෙසින් උත්පාදාදීන් භයවශයෙන් වැටහීමේ ප්‍රඥාව ආදීනවඥාන වෙයි යත්:

(පූර්වකර්මප්‍රත්‍යයෙන් මෙහි) ඉපැදීම (අක්ෂේම හෙයින් ද භය වස්තු හෙයින් ද) භය යැ යි භය හෙයින් වැටහීමේ ප්‍රඥාව ආදීනවඥාන නමැ. (උපන්හුගේ)පැවැත්ම භයැ යි භය හෙයින් වැටහීමේ ප්‍රඥාව ආදීනවඥාන නමැ. හැම සංස්කාර නිමිත්ත භයැයි ... (අනාගතප්‍රතිසන්ධියට හෙතු වූ)කර්මය භයැ යි ... ආයතිප්‍රතිසන්ධිය භයැ යි ... ගතිය භයැ යි ... ස්කන්ධයන්ගේ පහළ වීම භයැ යි ... (විපාකප්‍රවෘත්ති සඞ්ඛ්‍යාත) උපප්‍රාප්තිය භයැ යි ... (භවප්‍රත්‍යයෙන් වූ) ජාතිය භයැ යි ... (ස්කන්ධසන්තානයාගේ පුරාණභාව සඞ්ඛ්‍යාත ජරාව භයැ යි ... ව්‍යාධිය භයැයි ... මරණය භයැ යි ... (චිත්තසන්තාප සඞ්ඛ්‍යාත) ශොකය භයැයි ... (වාක්ප්‍රලාප සඞ්ඛ්‍යාත) පරිදෙවය භයැ යි, දුඃඛ ආයාසය භයැ යි භය හෙයින් වැටහීමේ ප්‍රඥාව ආදීනවඥාන නම්.

අනුත්පාද (නිවන) (නිර්භයභාවයෙන්) ක්ෂෙම යැ යි (සංස්කාරොපශම වූ) අමෘතපදයෙහි ඥාන යැ. (සංස්කාරයන්ගේ) අප්‍රවෘත්තිය (නිවන) ක්ෂෙම යැ යි ශාන්තිපදයෙහි ඥාන යැ ... අනුපායාසය ක්ෂෙම යැ යි ශාන්තිපදයෙහි ඥාන යි.

උත්පත්තිය භය යැ, අනුත්පාදය ක්ෂෙම යැ යි අමෘතපදයෙහි ඥාන යැ. ප්‍රවෘත්තිය භය යැ, අප්‍රවෘත්තිය ක්ෂෙම යැ යි අමෘතපදයෙහි ඥාන යැ ... උපායාසය භය යැ, අනුපායාසය ක්ෂෙම යැ යි අමෘතපදයෙහි ඥාන යි.

උත්පත්තිය දුක්‍ඛ යැ යි භය හෙයින් වැටහීමෙහි ප්‍රඥාව ආදීනවයෙහි ඥාන යැ. ප්‍රවෘත්තිය දුක්‍ඛ යැ යි භය හෙයින් වැටහීමෙහි ප්‍රඥාව ආදීනව-ඥාන යැ ... උපායාසය දුක්‍ඛ යැ යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යි.

අනුත්පාදය සුව යැ යි අමෘතපදයෙහි ඥාන යැ. අප්‍රවෘත්තිය සුව යැ යි අමෘතපදයෙහි ඥාන යැ ... අනුපායාසය සුව යැ යි අමෘතපදයෙහි ඥාන යි.

උත්පාදය දුක් යැ. අනුත්පාදය සුව යැ යි අමෘතපදයෙහි ඥාන යැ, ප්‍රවෘත්තිය දුක් යැ, අප්‍රවෘත්තිය සුව යැ යි අමෘතපදයෙහි ඥාන යැ ... උපායාසය දුක් යැ, අනුපායාසය සුව යැ යි අමෘතපදයෙහි ඥාන යි.

උත්පාදය සාමිෂ යැ යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යැ. ප්‍රවෘත්තිය සාමිෂ යැ යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යැ ... උපායාසය සාමිෂ යැ යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යි.

අනුත්පාදය නිරාමිෂ යැ යි අමෘතපදයෙහි ඥාන යැ. අප්‍රවෘත්තිය නිරාමිෂ යැ යි අමෘතපදයෙහි ඥාන යැ ... අනුපායාසය නිරාමිෂ යැ යි අමෘත-පදයෙහි ඥාන යි.

උත්පාදය සාමිෂ යැ, අනුත්පාදය නිරාමිෂ යැ යි අමෘතපදයෙහි ඥාන යැ. ප්‍රවෘත්තිය සාමිෂ යැ, අප්‍රවෘත්තිය නිරාමිෂ යැ යි අමෘතපදයෙහි ඥාන යැ ... උපායාසය සාමිෂ යැ, අනුපායාසය නිරාමිෂ යැ යි අමෘතපද-යෙහි ඥාන යි.

‘උප්පාදො සඞ්ඛාරා’ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං, ‘පවත්තං සඞ්ඛාරා’ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං -පෙ- ‘උපායාසො සඞ්ඛාරා’ති භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

‘අනුප්පාදො නිබ්බාන’න්ති සන්තිපදෙ ඤාණං, ‘අප්පවත්තං නිබ්බාන’න්ති සන්තිපදෙ ඤාණං -පෙ- ‘අනුපායාසො නිබ්බාන’න්ති සන්තිපදෙ ඤාණං.

‘උප්පාදො සඞ්ඛාරා, අනුප්පාදො නිබ්බාන’න්ති සන්තිපදෙ ඤාණං, ‘පවත්තං සඞ්ඛාරා අප්පවත්තං නිබ්බාන’න්ති සන්තිපදෙ ඤාණං -පෙ- ‘උපායාසො සඞ්ඛාරා, අනුපායාසො නිබ්බාන’න්ති සන්තිපදෙ ඤාණං.

1. උප්පාදඤ්ච පවත්තඤ්ච නිමිත්තං දුක්ඛන්ති පස්සති
ආයූහනං පටිසන්ධිං ඤාණං ආදීනවෙ ඉදං

2. අනුප්පාදං අප්පවත්තං අනිමිත්තං සුඛන්ති ච
අනායූහනං අප්පටිසන්ධිං[1] ඤාණං සන්තිපදෙ ඉදං

3. ඉදං ආදීනවෙ ඤාණං පඤ්චට්ඨානෙසු ජායති
පඤ්චට්ඨානෙ සන්තිපදෙ දස ඤාණෙ පජානාති,

ද්වින්නං ඤාණානං කුසලතා නානාදිට්ඨීසු න කම්පතී’ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති. භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං.

**ආදීනවඤාණනිද්දෙසො.**

## 9. මුඤ්චිතුකම්යතාඤාණං

කථං මුඤ්චිතුකම්යතා පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං:

උප්පාදං[2] මුඤ්චිතුකම්යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.[3] මුඤ්චිතුකම්යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, නිමිත්තං මුඤ්චිතුකම්යතා -පෙ- ආයූහනං මුඤ්චිතුකම්යතා -පෙ- පටිසන්ධිං මුඤ්චිතුකම්යතා -පෙ- ගතිං මුඤ්චිතුකම්යතා -පෙ- නිබ්බත්තිං මුඤ්චිතුකම්යතා -පෙ- උපපත්තිං මුඤ්චිතුකම්යතා -පෙ- ජාතිං මුඤ්චිතුකම්යතා -පෙ- ජරං මුඤ්චිතුකම්යතා -පෙ- ව්‍යාධිං මුඤ්චිතුකම්යතා -පෙ- මරණං මුඤ්චිතුකම්යතා -පෙ- සොකං මුඤ්චිතුකම්යතා -පෙ- පරිදෙවං මුඤ්චිතුකම්යතා -පෙ- උපායාසං මුඤ්චිතුකම්යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.

1 අනායූහනප්පටිසන්ධි - විම   2 උප්පාදමුඤ්ච ... - ස්‍යා
3 පවත්තමුඤ්චිතු ... (ඉච්චාදි) - ස්‍යා.

උත්පාදය සංස්කාරභය’යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යැ. ප්‍රවෘත්තිය සංස්කාරභය’යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යැ ... උපායාසය සංස්කාරභය’යි භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවඥාන යි.

අනුත්පාදය නිවනැ යි ශාන්තිපදයෙහි ඥාන යැ. අප්‍රවෘත්තිය නිවනැ යි ශාන්තිපදයෙහි ඥාන යැ ... අනුපායාසය නිවනැ යි ශාන්තිපදයෙහි ඥාන යි.

උත්පාදය සංස්කාරයයහ, අනුත්පාදය නිවනැ යි ශාන්තිපදයෙහි ඥාන යැ, ප්‍රවෘත්තිය සංස්කාරයයහ, අප්‍රවෘත්තිය නිවනැ යි ශාන්තිපදයෙහි ඥාන යැ ... උපායාසය සංස්කාරයයහ, අනුපායාසය නිවනැ යි ශාන්තිපදයෙහි ඥාන යි.

1. උත්පත්තිය ද ප්‍රවෘත්තිය ද නිමිත්ත ද ආයූහනය ද ප්‍රතිසන්ධිය ද දුකැ යි දකී ද, මේ (පඤ්චවස්තුකඥානය) ආදීනවඥාන යැ.

2. අනුත්පාදය ද අප්‍රවෘත්තිය ද අනිමිත්ත ද අනායූහනය ද අප්‍රති-සන්ධිය ද සුව යැ යි දකී ද, මේ (පඤ්චවස්තුකඥානය) ශාන්තිපදයෙහි ඥාන යැ.

3. මේ ආදීනවඥානය (උත්පාදාදි) පඤ්චස්ථානයෙහි උපදී. අමෘත-පදයෙහි ඥානය (අනුත්පාදාදි) පඤ්චස්ථානයෙහි උපදී. (යම් යොගාවචර මහණෙක්) මේ දශඥානයන් දනී ද (ආදීනවඥාන ශාන්තිපදඥාන යන) ඥානද්වයයාගේ නිපුණ බව හෙතු කොට ගෙන ශාශ්වතාදි විවිධ දෘෂ්ටීන්හි නො සැලේ යයි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: ‘භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං’යි.

ආදීනවඥානනිර්දෙශ යි.

## 9. මුඤ්චිතුකම්‍යතා ඥානය

කිසෙයින් මුඤ්චිතුකම්‍යතා යැ ප්‍රත්‍යවෙක්ෂා යැ අධ්‍යුපෙක්ෂා යැ යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන වෙයි යත්:

උත්පත්තිය මුදනු කැමැති බව, ප්‍රත්‍යවෙක්ෂාව, අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන නමැ. ප්‍රවෘත්තිය මුදනු කැමැතිබව, ප්‍රත්‍යවෙක්ෂාව, අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන නමැ. (සංස්කාර) නිමිත්ත මුදනු කැමැති බව ... කර්මායූහනය මුදනු කැමැතිබව ... ප්‍රතිසන්ධිය මුදනු කැමැතිබව ... ගතිය මුදනු කැමැති බව ... (ස්කන්ධයන්ගේ) පහළවීම මුදනු කැමැති බව ... විපාකප්‍රවෘත්තිය මුදනු කැමැතිබව ... ජාතිය මුදනු කැමැතිබව ... ජරාව මුදනු කැමැති බව ... ව්‍යාධිය මුදනු කැමැතිබව ... මරණය මුදනු කැමැතිබව ... ශොකය මුදනු කැමැති බව ... පරිදෙවය මුදනු කැමැති බව ... උපායාසය මුදනු කැමැතිබව’ ප්‍රත්‍යවෙක්ෂාව, අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරොපෙක්ෂාඥාන නමි.

'උප්පාදො දුක්ඛ'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. 'පවත්තං දුක්ඛ'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. –පෙ– 'උපායාසො දුක්ඛ'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.

'උප්පාදො භය'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. 'පවත්තං භය'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. –පෙ– 'උපායාසො භය'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.

'උප්පාදො සාමිස'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. 'පවත්තං සාමිස'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං –පෙ– 'උපායාසො සාමිස'න්ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.

'උප්පාදො සඞ්ඛාරා'ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. පවත්තං සඞ්ඛාරා'ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. –පෙ– 'උපායාසො සඞ්ඛාරා'ති මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං.

උප්පාදො සඞ්ඛාරා, තෙ සඞ්ඛාරෙ අජ්ඣුපෙක්ඛතීති සඞ්ඛාරුපෙක්ඛා. යෙ ච සඞ්ඛාරා යා ච උපෙක්ඛා උභොපෙතෙ සඞ්ඛාරා, තෙ සඞ්ඛාරෙ අජ්ඣුපෙක්ඛතීති සඞ්ඛාරුපෙක්ඛා.

පවත්තං සඞ්ඛාරා –පෙ– නිමිත්තං සඞ්ඛාරා –පෙ– ආයූහනා සඞ්ඛාරා –පෙ– පටිසන්ධි සඞ්ඛාරා –පෙ– ගති සඞ්ඛාරා –පෙ– නිබ්බත්ති සඞ්ඛාරා –පෙ– උපපත්ති සඞ්ඛාරා –පෙ– ජාති සඞ්ඛාරා –පෙ– ජරා සඞ්ඛාරා –පෙ– බ්‍යාධි සඞ්ඛාරා –පෙ– මරණං සඞ්ඛාරා –පෙ– සොකො සඞ්ඛාරා –පෙ– පරිදෙවො සඞ්ඛාරා –පෙ– උපායාසො සඞ්ඛාරා, තෙ සඞ්ඛාරෙ අජ්ඣුපෙක්ඛතීති සඞ්ඛාරුපෙක්ඛා. යෙ ච සඞ්ඛාරා යා ච උපෙක්ඛා උභොපෙතෙ සඞ්ඛාරා, තෙ සඞ්ඛාරෙ අජ්ඣුපෙක්ඛතීති සඞ්ඛාරුපෙක්ඛා.

කතිහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති: අට්ඨහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති.

පුථුජ්ජනස්ස කතිහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති, සෙක්ඛස්ස කතිහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති, වීතරාගස්ස කතිහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති:

උත්පාදය දුක්ඛ යි මුදනු කැමැති බව, ප්‍රත්‍යවෙක්ෂාව, අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරෝපෙක්ෂාඥාන නමැ. ප්‍රවෘත්තිය දුක්ඛ යි මුදනු කැමැති බව ප්‍රත්‍යවෙක්ෂාව අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරෝ-පෙක්ෂාඥාන නමැ. ... උපායාසය දුක්ඛ යි මුදනු කැමැතිබව ප්‍රත්‍යවෙක්ෂාව අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරෝපෙක්ෂාඥාන නමි.

උත්පාදය භය යැ යි මුදනු කැමැති බව ප්‍රත වෙක්ෂාව අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරෝපෙක්ෂාඥාන යැ. ප්‍රවෘත්තිය භය යැ යි මුදනු කැමැති බව ප්‍රත්‍යවෙක්ෂාව අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරෝ-පෙක්ෂාඥාන යැ ... උපායාසය භය යැ යි මුදනු කැමැතිබව ප්‍රත්‍යවෙක්ෂාව අධ්‍යුපෙක්ෂාව යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරෝපෙක්ෂාඥාන යි.

උත්පාදය සාමිෂ යැ යි මුඤ්චිතුකම්‍යතා ප්‍රත්‍යවෙක්ෂා අධ්‍යුපෙක්ෂා යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරෝපෙක්ෂාඥාන යැ. ප්‍රවෘත්තිය සාමිෂ යැ යි මුඤ්චිතු-කම්‍යතා ප්‍රත්‍යවෙක්ෂා අධ්‍යුපෙක්ෂා යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරෝපෙක්ෂා-ඥාන යැ ... උපායාසය සාමිෂ යැ යි මුඤ්චිතුකම්‍යතා ප්‍රත්‍යවෙක්ෂා අධ්‍යු-පෙක්ෂා යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරෝපෙක්ෂාඥාන යි.

උත්පාදය සංස්කාරහ යි මුඤ්චිතුකම්‍යතා ප්‍රත්‍යවෙක්ෂා අධ්‍යුපෙක්ෂා යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරෝපෙක්ෂාඥාන යැ. ප්‍රවෘත්තිය සංස්කාරහ යි මුඤ්චිතුකම්‍යතා ප්‍රත්‍යවෙක්ෂා අධ්‍යුපෙක්ෂා යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරෝ-පෙක්ෂාඥාන යැ. ... උපායාසය සංස්කාරයහ යි මුඤ්චිතුකම්‍යතා ප්‍රත්‍යවෙක්ෂා අධ්‍යුපෙක්ෂා යන ත්‍රිවිධ ප්‍රඥාව සංස්කාරෝපෙක්ෂාඥාන යි.

උත්පාදය සංස්කාරයහ. ඒ සංස්කාරයන් වෙසෙසින් උපෙක්ෂා කෙරේ නු යි සංස්කාරෝපෙක්ෂා නමැ. යම් සංස්කාර කෙනෙක් වෙත් ද යම් උපෙක්ෂාවකුත් වේ ද තුලුහු දෙදෙන මැ සංස්කාරයෝ යැ. ඒ සංස්කාර-යන් වෙසෙසින් උපෙක්ෂා කෙරේ නු යි සංස්කාරෝපෙක්ෂා නමැ.

ප්‍රවෘත්තිය සංස්කාරයහ ... (සංස්කාර) නිමිත්ත සංස්කාරයහ ... කර්මා-යූහනය සංස්කාරයහ ... ප්‍රතිසන්ධිය සංස්කාරයහ. ... ගතිය සංස්කාරයහ ... නිර්වෘත්තිය සංස්කාරයහ .. උපපත්තිය සංස්කාරයහ ... ජාතිය සංස්කාර-යහ ... ජරාව සංස්කාරයහ ... ව්‍යාධිය සංස්කාරයහ ... මරණය සංස්කා-රයහ ... ශොකය සංස්කාරයහ ... පරිදෙවය සංස්කාරයහ ... උපායාසය සංස්කාරයහ. ඒ සංස්කාරයන් අධ්‍යුපෙක්ෂා කෙරේ නු යි., සංස්කාරෝ-පෙක්ෂා නමැ. යම් සංස්කාර කෙනෙක් වෙත් ද යම් උපෙක්ෂාවකුත් වේ ද තුලුහු දෙදෙන මැ සංස්කාරයෝ යැ. ඒ සංස්කාරයන් අධ්‍යුපෙක්ෂා කෙරේ නු යි සංස්කාරෝපෙක්ෂා නමි.

කිහි අයුරෙකින් සංස්කාරෝපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය (සංස්කාරෝපෙක්ෂායෙහි අභිමුඛ කොට අතිශයින් එළැවීම) වෙයි යත්: අට අයුරෙකින් සංස්කාරෝපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වෙයි.

පෘථග්ජනයාහට කිහි අයුරෙකින් සංස්කාරෝපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ ද, ශෛක්ෂයාහට කිහි අයුරෙකින් සංස්කාරෝ-පෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ ද, රහත්හට කිහි අයුරෙකින් සංස්කාරෝපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ ද යත්:

පුථුජ්ජනස්ස ද්වීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති, සෙක්ඛස්ස තීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති, වීතරාගස්ස තීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති.

පුථුජ්ජනස්ස කතමෙහි ද්වීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති: පුථුජ්ජනො සඞ්ඛාරුපෙක්ඛං අභිනන්දති වා, විපස්සති වා පුථුජ්ජනස්ස ඉමෙහි ද්වීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති.

සෙක්ඛස්ස කතමෙහි තීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති: සෙක්ඛො සඞ්ඛාරුපෙක්ඛං අභිනන්දති වා විපස්සති වා පටිසඞ්ඛාය වා ඵලසමාපත්තිං සමාපජ්ජති, සෙක්ඛස්ස ඉමෙහි තීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති.

වීතරාගස්ස කතමෙහි තීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති: වීතරාගො සඞ්ඛාරුපෙක්ඛා විපස්සති වා, පටිසඞ්ඛාය වා ඵලසමාපත්තිං සමාපජ්ජති, තදජ්ඣුපෙක්ඛිත්වා සුඤ්ඤතවිහාරෙන වා අනිමිත්තවිහාරෙන වා අප්පණිහිතවිහාරෙන වා විහරති; වීතරාගස්ස ඉමෙහි තීහාකාරෙහි සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො හොති.

කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො එකත්තං හොති: පුථුජ්ජනස්ස සඞ්ඛාරුපෙක්ඛං අභිනන්දතො චිත්තං කිලිස්සති, භාවනාය පරිපන්ථො හොති, පටිවෙධස්ස අන්තරායො හොති, ආයතිං පටිසන්ධියා පච්චයො හොති, සෙක්ඛස්සපි සඞ්ඛාරුපෙක්ඛං අභිනන්දතො චිත්තං කිලිස්සති, භාවනාය පරිපන්ථො හොති, උත්තරිං පටිවෙධස්ස අන්තරායො හොති, ආයතිං පටිසන්ධියා පච්චයො හොති. එවං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො එකත්තං හොති අභිනන්දනට්ඨෙන.

කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො එකත්තං හොති: පුථුජ්ජනො සඞ්ඛාරුපෙක්ඛං අනිච්චතොපි දුක්ඛතොපි අනත්තතොපි විපස්සති, සෙක්ඛොපි සඞ්ඛාරුපෙක්ඛං අනිච්චතොපි දුක්ඛතොපි අනත්තතොපි විපස්සති. වීතරාගොපි සඞ්ඛාරුපෙක්ඛං අනිච්චතොපි දුක්ඛතොපි අනත්තතොපි විපස්සති එවං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො එකත්තං හොති අභිනීහාරට්ඨෙන.

කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති: පුථුජ්ජනස්ස සඞ්ඛාරුපෙක්ඛා කුසලා හොති, සෙක්ඛස්ස සඞ්ඛාරුපෙක්ඛා කුසලා හොති, වීතරාගස්ස සඞ්ඛාරුපෙක්ඛා අබ්‍යාකතා හොති. එවං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති කුසලාබ්‍යාකතට්ඨෙන.

පෘථග්ජනයාහට දෙඅයුරෙකින් සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනිහාරය වෙයි. ශෛක්‍ෂයාහට තුන් අයුරෙකින් සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වෙයි. රහත්හට තුන් අයුරෙකින් සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ.

පෘථග්ජනයාහට කවර දෙඅයුරින් සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වෙයි යත්: පෘථග්ජන තෙම සංස්කාරොපෙක්‍ෂාවට සතුටු හෝ වෙයි. විදර්ශනා හෝ කෙරෙයි. පෘථග්ජනයාහට මේ දෙඅයුරින් සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ.

ශෛක්‍ෂයාහට කවර තුන් අයුරින් සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වෙයි යත්: ශෛක්‍ෂ තෙමේ සංස්කාරොපෙක්‍ෂාව අභිනන්දනය හෝ කෙරෙයි. විදර්ශනා හෝ කෙරෙයි. (අනිත්‍යාදි විසින්) ප්‍රත්‍යවෙක්‍ෂා කොට ඵලසමාපත්තියට හෝ සමවදියි. ශෛක්‍ෂයාහට මේ තුන් අයුරින් සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ.

රහත්හට කවර තුන් අයුරෙකින් සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනිහාරය වෙයි යත්: රහත් තෙමේ සංස්කාරොපෙක්‍ෂාව විදර්ශනා හෝ කෙරෙයි. (අනිත්‍යාදි විසින්) ප්‍රත්‍යවෙක්‍ෂා කොට ඵලසමවතට හෝ සමවදියි. ඒ සංස්කාරොපෙක්‍ෂාව (තාදෘශ වූ අන්‍ය විදර්ශනාඥානයෙකින්) අධ්‍යුපෙක්‍ෂා කොට ශූන්‍යතවිහාරයෙන් හෝ අනිමිත්තවිහාරයෙන් හෝ අප්‍රණිහිත විහාරයෙන් හෝ වෙසෙයි. රහත්හට මේ තුන් අයුරින් සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය වේ.

කිසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්‍ෂයාගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනිහාරය එකෙක් වෙයි යත්: සංස්කාරොපෙක්‍ෂාවට සප්‍රීතිකතෘෂ්ණාව උපදවන පෘථග්ජනයාගේ සිත කෙලෙසෙයි. (ප්‍රතිලබ්ධ) විදර්ශනාභාවනාවට උපද්‍රව වෙයි. ප්‍රතිවෙධයට අන්තරාය වෙයි. අනාගතයෙහි සුගතිප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වෙයි. සංස්කාරොපෙක්‍ෂාවට සප්‍රීතික තෘෂ්ණාව උපදවන ශෛක්‍ෂයාගේ ද සිත කෙලෙසෙයි. භාවනාවට උපද්‍රව වෙයි. මත්තෙහි (සත්‍ය) ප්‍රතිවෙධයට අන්තරාය වෙයි. අනාගත ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වේ මෙසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්‍ෂයාගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය අභිනන්දනභාවයෙන් එකෙක් වේ.

කිසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්‍ෂයාගේ ද රහත්හුගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය එකෙක් වෙයි යත්: පෘථග්ජන තෙම සංස්කාරොපෙක්‍ෂාව අනිත්‍ය හෙයින් ද දුඃඛ හෙයින් ද අනාත්ම හෙයින් ද විදර්ශනා කෙරෙයි. ශෛක්‍ෂ තෙමේත් සංස්කාරොපෙක්‍ෂාව අනිත්‍ය හෙයින් ද දුඃඛ හෙයින් ද අනාත්ම හෙයින් ද විදර්ශනා කෙරෙයි. රහත් තෙමේ ද සංස්කාරොපෙක්‍ෂාව අනිත්‍ය හෙයින් ද දුඃඛ හෙයින් ද අනාත්ම හෙයින් ද විදර්ශනා කෙරේ. මෙසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්‍ෂයාගේ ද රහත්හුගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය (අනිත්‍යාදි හෙයින්) අනුපස්සනභාවයෙන් එකෙක් වේ.

කිසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්‍ෂයාගේ ද රහත්හුගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය නානාත්ව වෙයි යත්: පෘථග්ජනයාගේ සංස්කාරොපෙක්‍ෂාව කුශල වෙයි. ශෛක්‍ෂයාගේ සංස්කාරොපෙක්‍ෂාව කුශල වෙයි. රහත්හුගේ සංස්කාරොපෙක්‍ෂාව අව්‍යාකෘත වේ. මෙසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්‍ෂයාගේ ද රහත්හුගේ ද සංස්කාරොපෙක්‍ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය කුශලාව්‍යාකෘත භාවයෙන් නානාත්ව වේ.

කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති: පුථුජ්ජනස්ස සඞ්ඛාරුපෙක්ඛා කිඤ්චි කාලෙ සුවිදිතා හොති, කිඤ්චි කාලෙ න සුවිදිතා හොති, සෙක්ඛස්සාපි සඞ්ඛාරුපෙක්ඛා කිඤ්චි කාලෙ සුවිදිතා හොති, කිඤ්චි කාලෙ න සුවිදිතා හොති, වීතරාගස්ස සඞ්ඛාරුපෙක්ඛා අච්චන්තං සුවිදිතා හොති. එවං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති විදිතට්ඨෙන ච අවිදිතට්ඨෙන ච.

කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති: පුථුජ්ජනො සඞ්ඛාරුපෙක්ඛං[1], අතිත්තත්තා විපස්සති, සෙක්ඛොපි සඞ්ඛාරුපෙක්ඛං[1] අතිත්තත්තා විපස්සති, වීතරාගො සඞ්ඛාරුපෙක්ඛං තිත්තත්තා විපස්සති. එවං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති තිත්තට්ඨෙන ච අතිත්තට්ඨෙන ච.

කථං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති: පුථුජ්ජනො සඞ්ඛාරුපෙක්ඛං තිණ්ණං සංයොජනානං පහානාය සොතාපත්තිමග්ගං පටිලාභත්ථාය විපස්සති, සෙක්ඛො සඞ්ඛාරුපෙක්ඛං තිණ්ණං සංයොජනානං පහීනත්තා උත්තරිපටිලාභත්ථාය විපස්සති, වීතරාගො සඞ්ඛාරුපෙක්ඛං සබ්බකිලෙසානං පහීනත්තා දිට්ඨධම්මසුඛවිහාරත්ථාය විපස්සති. එවං පුථුජ්ජනස්ස ච සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අනීහාරො නානත්තං හොති පහීනට්ඨෙන ච අප්පහීනට්ඨෙන ච.

කථං සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරෙ නානත්තං හොති: සෙක්ඛො සඞ්ඛාරුපෙක්ඛං අභිනන්දති වා, විපස්සති වා, පටිසඞ්ඛාය වා ඵලසමාපත්තිං සමාපජ්ජති; වීතරාගො සඞ්ඛාරුපෙක්ඛං විපස්සති වා, පටිසඞ්ඛාය වා ඵලසමාපත්තිං සමාපජ්ජති, තදජ්ඣුපෙක්ඛිත්වා සුඤ්ඤතවිහාරෙන වා අනිමිත්තවිහාරෙන වා අප්පණිහිතවිහාරෙන වා විහරති. එවං සෙක්ඛස්ස ච වීතරාගස්ස ච සඞ්ඛාරුපෙක්ඛාය චිත්තස්ස අභිනීහාරො නානත්තං හොති විහාරසමාපත්තට්ඨෙන.

කති සඞ්ඛාරුපෙක්ඛා සමථවසෙන උප්පජ්ජන්ති, කති සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති: අට්ඨ සඞ්ඛාරුපෙක්ඛා සමථවසෙන උප්පජ්ජන්ති, දස සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති.

1. සඞ්ඛාරුපෙක්ඛා - සයා.

කිසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්ෂයාගේ ද රහත්හුගේ ද සංස්කාරෝපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය නානාත්ව වෙයි යත්: පෘථග්ජනයාගේ සංස්කාරෝපෙක්ෂාව කිසි කලෙක (විදර්ශනාකාලයෙහි) මොනොවට දන්නා ලද වෙයි. කිසි කලෙක (අභිනන්දන කාලයෙහි) සුවිදිත නො වෙයි. ශෛක්ෂයාගේ ද සංස්කාරෝපෙක්ෂාව කිසි කලෙක සුවිදිත වෙයි. කිසි කලෙක සුවිදිත නො වෙයි. රහත්හුගේ සංස්කාරෝපෙක්ෂාව ඒකාන්තයෙන් සුවිදිත වෙයි. මෙසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්ෂයාගේ ද රහත්හුගේ ද සංස්කාරෝපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය විදිතභාවයෙන් ද අවිදිතභාවයෙන් ද නානාත්ව වේ.

කිසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්ෂයාගේ ද වීතරාගයාගේ ද සංස්කාරෝපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය නානාත්ව වෙයි යත්: පෘථග්ජන තෙම සංස්කාරෝපෙක්ෂාව අතෘප්ත බැවින් විදර්ශනා කෙරෙයි. ශෛක්ෂ තෙමේත් සංස්කාරෝපෙක්ෂාව අතෘප්ත බැවින් විදර්ශනා කෙරෙයි. රහත් තෙමේ සංස්කාරෝපෙක්ෂාව තෘප්ත බැවින් විදර්ශනා කෙරෙයි. මෙසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්ෂයාගේ ද වීතරාගයාගේ ද සංස්කාරෝපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය තෘප්ත බැවින් ද අතෘප්ත බැවින් ද නානාත්ව වේ.

කිසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්ෂයාගේ ද වීතරාගයාගේ ද සංස්කාරෝපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය නානාත්ව වෙයි යත්: පෘථග්ජන තෙම සංස්කාරෝපෙක්ෂාව තුන් සංයෝජනයන්ගේ ප්‍රහාණය පිණිස ස්‍රොතාපත්තිමාර්ගය ලබනු පිණිස විදර්ශනා කෙරෙයි. ශෛක්ෂ තෙම සංස්කාරෝපෙක්ෂාව තුන් සංයොජනයන් ප්‍රහීණ බැවින් මතුමත්තෙහි මාර්ග ප්‍රතිලාභය පිණිස විදර්ශනා කෙරෙයි. වීතරාග තෙමේ සංස්කාරෝපෙක්ෂාව හැම කෙලෙසුන් ප්‍රහීණ බැවින් ඉහාත්මසුඛවිහරණ පිණිස විදර්ශනා කෙරෙයි. මෙසෙයින් පෘථග්ජනයාගේ ද ශෛක්ෂයාගේ ද වීතරාගයාගේ ද සංස්කාරෝපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය ප්‍රහීණ බැවින් ද අප්‍රහීණ බැවින් ද නානාත්ව වේ.

කිසෙයින් ශෛක්ෂයාගේ ද වීතරාගයාගේ ද සංස්කාරෝපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය නානාත්ව වෙයි යත්: ශෛක්ෂ තෙම සංස්කාරෝපෙක්ෂාව අභිනන්දනය (සප්‍රීතිකතෘෂ්ණාව) හෝ කෙරෙයි, විදර්ශනා හෝ කෙරෙයි. ප්‍රත්‍යවෙක්ෂා කොට ඵලසමවත්තට හෝ සමවදී. වීතරාග තෙමෙ සංස්කාරෝපෙක්ෂාව විදර්ශනා හෝ කෙරෙයි, ප්‍රත්‍යවෙක්ෂා කොට ඵලසමවත්තට හෝ සමවදී. ඒ සංස්කාරෝපෙක්ෂාව අධ්‍යුපෙක්ෂා කොට ශූන්‍යතවිහාරයෙන් හෝ අනිමිත්තවිහාරයෙන් හෝ අප්‍රණිහිතවිහාරයෙන් හෝ වාසය කෙරෙයි. මෙසෙයින් ශෛක්ෂයාගේ ද වීතරාගයාගේ ද සංස්කාරෝපෙක්ෂායෙහි චිත්තයාගේ අභිනීහාරය විහාරසමාපත්තිභාවයෙන් නානාත්ව වේ.

කෙතෙක් සංස්කාරෝපෙක්ෂාවෝ සමාධි වශයෙන් උපදිත් ද, කෙතෙක් සංස්කාරෝපෙක්ෂාවෝ විදර්ශනාවශයෙන් උපදිත් ද යත්: සංස්කාරෝපෙක්ෂාවෝ අට දෙනෙක් සමාධිවශයෙන් උපදිත්. සංස්කාරෝපෙක්ෂාවෝ දසදෙනෙක් විදර්ශනාවශයෙන් උපදිත්.

කතමා අට්ඨ සඞ්ඛාරුපෙක්ඛා සමථවසෙන උප්පජ්ජන්ති: පඨමං ඣානං[1] පටිලාභත්ථාය නීවරණෙ පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, දුතියං ඣානං පටිලාභත්ථාය විතක්කවිචාරෙ පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, තතියං ඣානං පටිලාභත්ථාය පීතිං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, චතුත්ථං ඣානං පටිලාභත්ථාය සුඛදුක්ඛෙ පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, ආකාසානඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය රූපසඤ්ඤං පටිඝසඤ්ඤං නානත්තසඤ්ඤං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය ආකාසානඤ්චායතනසඤ්ඤං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය විඤ්ඤාණඤ්චායතන සඤ්ඤං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. ඉමා අට්ඨ සඞ්ඛාරුපෙක්ඛා සමථවසෙන උප්පජ්ජන්ති.

කතමා දස සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති: සොතාපත්තිමග්ගං පටිලාභත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං[2] පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං ව්‍යාධිං මරණං සොකං පරිදෙවං උපායාසං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං සොතාපත්තිඵලසමාපත්තත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං පටිසන්ධිං -පෙ- උපායාසං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං, සකදාගාමිමග්ගං පටිලාභත්ථාය -පෙ- සකදාගාමිඵලසමාපත්තත්ථාය අනාගාමිමග්ගං පටිලාභත්ථාය -පෙ- අනාගාමිඵලසමාපත්තත්ථාය -පෙ- අරහත්තමග්ගං පටිලාභත්ථාය -පෙ- අරහත්තඵලසමාපත්තත්ථාය -පෙ- සුඤ්ඤතවිහාරසමාපත්තත්ථාය -පෙ- අනිමිත්තවිහාරසමාපත්තත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං අයූහනං පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං ව්‍යාධිං මරණං සොකං පරිදෙවං උපායාසං පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං. ඉමා දස සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවසෙන උප්පජ්ජන්ති.

කති සඞ්ඛාරුපෙක්ඛා කුසලා, කති අකුසලා, කති අබ්‍යාකතා: පණ්ණරස සඞ්ඛාරුපෙක්ඛා කුසලා, තිස්සො සඞ්ඛාරුපෙක්ඛා අබ්‍යාකතා. නත්ථි සඞ්ඛාරුපෙක්ඛා අකුසලා.

1. ''පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා අට්ඨ චිත්තස්ස ගොචරා
පුථුජ්ජනස්ස ද්වෙ හොන්ති තයො සෙක්ඛස්ස ගොචරා
තයො ච වීතරාගස්ස යෙහි චිත්තං විවට්ටති.

1 පඨමජ්ඣානං - PTS 2 ආයුහනං - සයා - PTS

කවර සංස්කාරොපෙක්ෂාවෝ අටදෙනෙක් ශමථවශයෙන් උපදිත් ද යත්: ප්‍රථමධ්‍යානප්‍රතිලාභය සඳහා පඤ්චනීවරණයන් (ප්‍රහාතව්‍යභාවයෙන්) නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥාව (නීවරණ සඞ්ඛ්‍යාත) සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥාන යැ. ද්විතීයධ්‍යාන ප්‍රතිලාභය සඳහා විතර්කවිචාරයන් නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥාව සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥාන යැ. තෘතීයධ්‍යාන ප්‍රතිලාභය සඳහා ප්‍රීතිය නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥාව සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥාන යැ, චතුර්ථධ්‍යාන ප්‍රතිලාභය සඳහා සුඛදුඃඛයන් නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥාව සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥාන යැ. ආකාසානඤ්චායතනසමාපත්ති ප්‍රතිලාභය සඳහා රූපසංඥාව ප්‍රතිඝසංඥාව නානාත්වසංඥාව නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥාව සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥාන යැ. විඤ්ඤාණඤ්චායතනසමාපත්තිප්‍රතිලාභය සඳහා ආකාසානඤ්චායතනසංඥාව නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥාව සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥාන යැ. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිප්‍රතිලාභය සඳහා විඤ්ඤාණඤ්චායතනසංඥාව නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥාව සංස්කාරයන්ගේ උපෙක්ෂායෙහි ඥාන යැ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිප්‍රතිලාභය සඳහා ආකිඤ්චඤ්ඤායතනසංඥාව නුවණින් සලකා මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥාව සංස්කාරයන්ගේ උපෙක්ෂාඥාන යි මේ සංස්කාරොපෙක්ෂාවෝ අටදෙන ශමථවශයෙන් උපදිත්.

කවර සංස්කාරොපෙක්ෂාවෝ දසදෙනෙක් විදර්ශනාවශයෙන් උපදිත් ද යත්: සෝවාන්මාර්ගය ලැබීම පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත කර්මායූහනය ප්‍රතිසන්ධිය ගතිය නිර්වෘත්තිය උපප්‍රාප්තිය ජාතිය ජරාව ව්‍යාධිය මරණය ශොකය පරිදෙවය උපායාසය ප්‍රත්‍යවෙක්ෂා කොට මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥාව සංස්කාරොපෙක්ෂා ඥාන යැ. සෝවාන් ඵලසමාපත්තිය පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත කර්මායූහනය ප්‍රතිසන්ධිය ... ප්‍රත්‍යවෙක්ෂා කොට මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥාව සංස්කාරොපෙක්ෂා ඥාන යැ. සෙදගැමි මාර්ගය ලැබීම පිණිස ... සෙදගැමි ඵලසමවත පිණිස ... අනාගැමි මාර්ගය ලැබීම පිණිස ... අනාගැමි ඵලසමවත පිණිස ... රහත්මඟ ලැබීම පිණිස ... රහත් ඵලසමවත පිණිස ... ශූන්‍යතවිහාරසමාපත්තිය පිණිස ... අනිමිත්තවිහාරසමාපත්තිය පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත ආයූහනය ප්‍රතිසන්ධිය ගතිය නිර්වෘත්තිය උපප්‍රාප්තිය ජාතිය ජරාව ව්‍යාධිය මරණය ශොකය පරිදෙවය උපායාසය ප්‍රත්‍යවෙක්ෂා කොට මධ්‍යස්ථභාවයෙන් සිටුනා ප්‍රඥාව සංස්කාරොපෙක්ෂා ඥාන යි. මේ සංස්කාරොපෙක්ෂාවෝ දසදෙන විදර්ශනාවශයෙන් උපදිත්.

කෙතෙක් සංස්කාරොපෙක්ෂාවෝ කුශලයෝ ද, කෙතෙක් අකුශලයෝද, කෙතෙක් අව්‍යාකෘතයෝ ද යත්: සංස්කාරොපෙක්ෂාවෝ පසළොස් දෙනෙක් කුශලයෝ යැ. සංස්කාරොපෙක්ෂාවෝ තිදෙනෙක් අව්‍යාකෘතයෝ යැ. අකුශල වූ සංස්කාරොපෙක්ෂායෙක් නැති.

1. යම් (සංස්කාරොපෙක්ෂාධර්මයෙකින් විතර්කවිචාරාදීයෙන්) සිත අපගම වේ ද ඒ පටිසඞ්ඛා සන්තිට්ඨනා (සංස්කාරොපෙක්ෂා) ප්‍රඥාවෝ (ශමථ වශයෙන්) චිත්තගොචර වූවාහු අටදෙනෙක් වෙති. පෘථග්ජනයා හට (ශමථවිදර්ශනාසමාපත්ති වශයෙන්) තිදෙනෙක් ගොචර වෙති. රහත්හට (අප්‍රණිහිත, ශූන්‍යත, ඵලසමාපත්ති වශයෙන්) තිදෙනෙක් ගොචර වෙත්.

2. අට්ඨ සමාධිස්ස පච්චයා දස ඤාණස්ස ගොචරා
අට්ඨාරස සඞ්ඛාරුපෙක්ඛා තිණ්ණං විමොක්ඛාන පච්චයා.

3. ඉමෙ අට්ඨාරසාකාරා පඤ්ඤා යස්ස පරිචිතා[1]
කුසලො සඞ්ඛාරුපෙක්ඛාසු නානාදිට්ඨීසු න කම්පතී”ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති ‘මුඤ්චිතුකම්‍යතාපටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං’.

**සඞ්ඛාරුපෙක්ඛාඤාණනිද්දෙසො.**

## 10. ගොත්‍රභුඤාණං

කථං බහිද්ධා වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභු ඤාණං:

උප්පාදං අභිභුය්‍යතීති ගොත්‍රභූ, පවත්තං අභිභුය්‍යතීති ගොත්‍රභූ, නිමිත්තං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ආයූහනං අභිභුය්‍යතීති ගොත්‍රභූ, පටිසන්ධිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ගතිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, නිබ්බත්තිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, උපපත්තිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ජාතිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ජරං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ව්‍යාධිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, මරණං අභිභුය්‍යතීති ගොත්‍රභූ, සොකං අභිභුය්‍යතීති ගොත්‍රභූ, පරිදෙවං අභිභුය්‍යතීති ගොත්‍රභූ, උපායාසං අභිභුය්‍යතීති ගොත්‍රභූ, බහිද්ධා සඞ්ඛාරනිමිත්තං අභිභුය්‍යතීති ගොත්‍රභූ.

අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, අප්පවත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ -පෙ- නිරොධං නිබ්බානං පක්ඛන්දතීති ගොත්‍රභූ.

උප්පාදං අභිභුය්‍යිත්වා අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, පවත්තං අභිභුය්‍යිත්වා අප්පවත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, නිමිත්තං අභිභුය්‍යිත්වා අනිමිත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, -පෙ- බහිද්ධා සඞ්ඛාර නිමිත්තං අභිභුය්‍යිත්වා නිරොධං නිබ්බානං පක්ඛන්දතීති ගොත්‍රභූ.

උප්පාදා වුට්ඨාතීති ගොත්‍රභූ, පවත්තා වුට්ඨාතීති ගොත්‍රභූ, නිමිත්තා වුට්ඨාතීති ගොත්‍රභූ, ආයූහනා වුට්ඨාතීති ගොත්‍රභූ, පටිසන්ධියා වුට්ඨාතීති ගොත්‍රභූ, ගතියා වුට්ඨාතීති ගොත්‍රභූ, නිබ්බත්තියා වුට්ඨාතීති ගොත්‍රභූ උපපත්තියා වුට්ඨාතීති ගොත්‍රභූ, ජාතියා වුට්ඨාතීති ගොත්‍රභූ, ජරාය වුට්ඨාතීති ගොත්‍රභූ බ්‍යාධිම්හා වුට්ඨාතීති ගොත්‍රභූ, මරණා වුට්ඨාතීති ගොත්‍රභූ, සොකා වුට්ඨාතීති ගොත්‍රභූ, පරිදෙවා වුට්ඨාතීති ගොත්‍රභූ, උපායාසා වුට්ඨාතීති ගොත්‍රභූ, බහිද්ධා සඞ්ඛාරනිමිත්තා වුට්ඨාතීති ගොත්‍රභූ.

---
1. පරිච්චිතා, මජසං

2. ශමථ වශයෙන් කියන ලද අටදෙන අර්පණාසමාධියට ප්‍රත්‍යය වෙති. විදර්ශනාවශයෙන් කියන ලද දසදෙන මාර්ගඥානයට ද ඵලඥානයට ද ගොචර වෙති. මේ අටළොස් සංස්කාරොපෙක්ෂාඥානයෝ (ශූන්‍යතාදී) ත්‍රිවිධ විමොක්ෂයන්ට (උපනිශ්‍රයප්‍රත්‍යයෙන්) ප්‍රත්‍යය වෙත්.

3. මේ අටළොස් වැදෑරුම් වූ ප්‍රඥාවෝ යම් යොගාවචරයක්හු විසින් පුරුදු කරන ලද්දාහු ද (හෙතෙම) සංස්කාරොපෙක්ෂාඥානයෙහි නිපුණ වූයේ (ශාශ්වතාදී) නානාදෘෂ්ටියෙහි නො සැලේ යයි.

එය ඥාතාර්ථයෙන් ඥාන නමැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා නමි. එයින් කියනු ලැබෙයි: 'පටිසඞ්ඛාසන්තිට්ඨනා පඤ්ඤා සඞ්ඛාරුපෙක්ඛාසු ඤාණං' යි.

**සංස්කාරොපෙක්ෂාඥාන නිර්දේශ යි.**

## 10. ගොත්‍රභූ ඥානය

කිසෙයින් බාහ්‍ය වූ සංස්කාර නිමිත්තෙන් නැගී සිටුනා එයට පරාඞ්මුඛ වීමෙහි ප්‍රඥාව ගොත්‍රභූඥාන වෙයි යත්:

උත්පාදය ඉක්මවා (අභිභවනය කෙරේ) නු යි ගොත්‍රභූ නමැ. ප්‍රවෘත්තිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. නිමිත්ත ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ආයූහනය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ප්‍රතිසන්ධිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ගතිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. නිර්වෘත්තිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. උපප්‍රාප්තිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ජාතිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ජරාව ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ව්‍යාධිය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. මරණය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. ශොකය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. පරිදෙවය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. උපායාසය ඉක්මවා නු යි ගොත්‍රභූ නමැ. වාහ්‍ය සංස්කාරනිමිත්ත ඉක්මවා නු යි ගොත්‍රභූ නමි.

අනුත්පාදයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ, අප්‍රවෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නුයි ගොත්‍රභූ නමැ ... නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමි.

උත්පාදය ඉක්මවා අනුත්පාදයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. ප්‍රව ත්තිය ඉක්මවා අප්‍රවෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ. නිමිත්ත ඉක්මවා අනිමිත්තට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමැ ... වාහ්‍ය සංස්කාරනිමිත්ත ඉක්මවා නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නමි.

උත්පාදයෙන් නැගීසිටී නු යි ගොත්‍රභූ නමැ ප්‍රවෘත්තියෙන් නැගීසිටී නු යි ගොත්‍රභූ නමැ. නිමිත්තයෙන් නැගිසිටී නු යි ගොත්‍රභූ නමැ. කර්මායූහනයෙන් නැගීසිටී නු යි ගොත්‍රභූ නමැ. ප්‍රතිසන්ධියෙන් නැගී සිටී නු යි ගොත්‍රභූ නමැ. ගතියෙන් නැගීසිටී නු යි ගොත්‍රභූ නමැ. නිර්වෘත්තියෙන් නැගී සිටී නු යි ගොත්‍රභූ නමැ. උපප්‍රාප්තියෙන් නැගීසිටී නු යි ගොත්‍රභූ නමැ. ජාතියෙන් නැගීසිටී නු යි ගොත්‍රභූ නමැ. ජරායෙන් නැගි සිටී නු යි ගොත්‍රභූ නමැ. ව්‍යාධියෙන් නැගීසිටී නු යි ගොත්‍රභූ නමැ. මරණ-යෙන් නැගීසිටී නු යි ගොත්‍රභූ නමැ. ශොකයෙන් නැගීසිටී නු යි ගොත්‍රභූ නමැ. පරිදෙවයෙන් නැගීසිටී නු යි ගොත්‍රභූ නමැ. උපායාසයෙන් නැගී සිටී නු යි ගොත්‍රභූ නමැ. වාහ්‍ය සංස්කාරනිමිත්තයෙන් නැගීසිටී නු යි ගොත්‍රභූ නමි.

අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, අප්පවත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, -පෙ- නිරොධං නිබ්බානං පක්ඛන්දතීති ගොත්‍රභූ.

උප්පාදා වුට්ඨහිත්වා අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, පවත්තා වුට්ඨහිත්වා අප්පවත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, නිමිත්තා වුට්ඨහිත්වා අනිමිත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, ආයූහනා වුට්ඨහිත්වා අනායූහනං පක්ඛන්දතීති ගොත්‍රභූ, පටිසන්ධියා වුට්ඨහිත්වා අප්පටිසන්ධිං පක්ඛන්දතීති ගොත්‍රභූ, ගතියා වුට්ඨහිත්වා අගතිං පක්ඛන්දතීති ගොත්‍රභූ, නිබ්බත්තියා වුට්ඨහිත්වා අනිබ්බත්තිං පක්ඛන්දතීති ගොත්‍රභූ, උපපත්තියා වුට්ඨහිත්වා අනුපපත්තිං පක්ඛන්දතීති ගොත්‍රභූ, ජාතියා වුට්ඨහිත්වා අජාතිං පක්ඛන්දතීති ගොත්‍රභූ, ජරාය වුට්ඨහිත්වා අජරං පක්ඛන්දතීති ගොත්‍රභූ, බ්‍යාධිම්හා වුට්ඨහිත්වා අබ්‍යාධිං පක්ඛන්දතීති ගොත්‍රභූ, මරණා වුට්ඨහිත්වා අමරණං පක්ඛන්දතීති ගොත්‍රභූ, සොකා වුට්ඨහිත්වා අසොකං පක්ඛන්දතීති ගොත්‍රභූ, පරිදෙවා වුට්ඨහිත්වා අපරිදෙවං පක්ඛන්දතීති ගොත්‍රභූ, උපායාසා වුට්ඨහිත්වා අනුපායාසං පක්ඛන්දතීති ගොත්‍රභූ, බහිද්ධාසඞ්ඛාරනිමිත්තා වුට්ඨහිත්වා නිරොධං නිබ්බානං පක්ඛන්දතීති ගොත්‍රභූ.

උප්පාදා විවට්ටතීති ගොත්‍රභූ, පවත්තා විවට්ටතීති ගොත්‍රභූ, -පෙ- බහිද්ධා සඞ්ඛාරනිමිත්තා විවට්ටතීති ගොත්‍රභූ.

අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, අප්පවත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, -පෙ- නිරොධං නිබ්බානං පක්ඛන්දතීති ගොත්‍රභූ.

උප්පාදා විවට්ටිත්වා අනුප්පාදං පක්ඛන්දතීති ගොත්‍රභූ, පවත්තා විවට්ටිත්වා අප්පවත්තං පක්ඛන්දතීති ගොත්‍රභූ, -පෙ- බහිද්ධා සඞ්ඛාරනිමිත්තා විවට්ටිත්වා නිරොධං නිබ්බානං පක්ඛන්දතීති ගොත්‍රභූ.

කති ගොත්‍රභූධම්මා සමථවසෙන උප්පජ්ජන්ති, කති ගොත්‍රභූධම්මා විපස්සනා වසෙන උප්පජ්ජන්ති: අට්ඨ ගොත්‍රභූධම්මා සමථවසෙන උප්පජ්ජන්ති, දස ගොත්‍රභූධම්මා විපස්සනාවසෙන උප්පජ්ජන්ති.

කතමෙ[1] අට්ඨ ගොත්‍රභූධම්මා සමථවසෙන උප්පජ්ජන්ති: පඨමං ඣානං[2] පටිලාභත්ථාය නීවරණෙ අභිභුය්‍යතීති ගොත්‍රභූ, දුතියං ඣානං පටිලාභත්ථාය විතක්කවිචාරෙ අභිභුය්‍යතීති ගොත්‍රභූ, තතියං ඣානං පටිලාභත්ථාය පීතිං අභිභුය්‍යතීති ගොත්‍රභූ, චතුත්ථං ඣානං පටිලාභත්ථාය සුඛදුක්ඛෙ අභිභුය්‍යතීති ගොත්‍රභූ, ආකාසානඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය රූපසඤ්ඤං පටිඝසඤ්ඤං නානත්තසඤ්ඤං අභිභුය්‍යතීති ගොත්‍රභූ, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය ආකාසානඤ්චායතනසඤ්ඤං අභිභුය්‍යතීති ගොත්‍රභූ, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං අභිභුය්‍යතීති ගොත්‍රභූ, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං අභිභුය්‍යතීති ගොත්‍රභූ. ඉමෙ අට්ඨ ගොත්‍රභූධම්මා සමථවසෙන උප්පජ්ජන්ති.

---

1. කතමා - සී 1. 2. පඨමජ්ඣානං - PTS සී 1.

අනුත්පාදයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. අප්‍රවෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම් ... නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්.

උත්පාදයෙන් නැගී අනුත්පාදයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. ප්‍රවෘත්තියෙන් නැගී අප්‍රවෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. නිමිත්තයෙන් නැගී අනිමිත්තයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. අයූහනයෙන් නැගී අනායූහනයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. ප්‍රතිසන්ධියෙන් නැගී අප්‍රතිසන්ධියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. ගතියෙන් නැගී අගතියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. නිර්වෘත්තියෙන් නැගී අනිර්වෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. උපප්‍රාප්තියෙන් නැගී අනුපප්‍රාප්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. ජාතියෙන් නැගී අජාතියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. ජරායෙන් නැගී අජරාවට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. ව්‍යාධියෙන් නැගී අව්‍යාධියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. මරණයෙන් නැගී අමරණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. ශොකයෙන් නැගී අශොකයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. උපායාසයෙන් නැගී අනුපායාසයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. ව්‍යාහ්‍යසංස්කාර නිමිත්තෙන් නැගී නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්.

උත්පාදයෙන් අපගත වේ නු යි ගොත්‍රභූ නම්. ප්‍රවෘත්තියෙන් අපගත වේ නු යි ගොත්‍රභූ නම්. ... ව්‍යාහ්‍ය සංස්කාර නිමිත්තෙන් අපගත වේ නු යි ගොත්‍රභූ නම්.

අනුත්පාදයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම් ... අප්‍රවෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම් ... නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්.

උත්පාදයෙන් අපගත වැ අනුත්පාදයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්. ප්‍රවෘත්තියෙන් අපගත වැ අප්‍රවෘත්තියට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම් ... ව්‍යාහ්‍ය සංස්කාර නිමිත්තෙන් අපගත වැ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට ප්‍රස්කන්දනය කෙරේ නු යි ගොත්‍රභූ නම්.

කෙතෙක් ගොත්‍රභූධර්මයෝ ශමථවශයෙන් උපදිත් ද: කෙතෙක් ගොත්‍රභූධර්මයෝ විදර්ශනාවශයෙන් උපදිත් ද යත්: ගොත්‍රභූධර්මයෝ අට-දෙනෙක් ශමථවශයෙන් උපදිත්. ගොත්‍රභූධර්මයෝ දසදෙනෙක් විදර්ශනා-වශයෙන් උපදිත්.

කවර ගොත්‍රභූධර්මයෝ අටදෙනෙක් ශමථවශයෙන් උපදිත් ද යත්: ප්‍රථමධ්‍යානය ලබනු පිණිස නීවරණයන් ඉක්මවා (අභිභවනය කෙරේ) නු යි ගොත්‍රභූ යැ. ද්විතීධ්‍යානය ලබනු පිණිස විතර්කවිචාරයන් ඉක්මවා, නු යි ගොත්‍රභූ යැ. තෘතීයධ්‍යානය ලබනු පිණිස ප්‍රීතිය ඉක්මවා, නු යි ගොත්‍රභූ යැ. චතුර්ථධ්‍යානය ලබනු පිණිස සුඛදුඃඛයන් ඉක්මවා, නු යි ගොත්‍රභූ යැ ආකාසානඤ්චායතන සමාපත්තිය ලබනු පිණිස රූපසංඥාව ප්‍රතිඝසංඥාව නානාත්වසාංඥාව ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. විඥානඤ්චා-යතනසමාපත්තිය ලබනු පිණිස ආකාසානඤ්චායතනසංඥාව ඉක්මවා, නු යි ගොත්‍රභූ යැ. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය ලබනු පිණිස විඥානඤ්චා-යතනසංඥාව ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන-සමාපත්තිය ලබනු පිණිස ආකිඤ්චඤ්ඤායතනසංඥාව ඉක්මවා, නු යි ගොත්‍රභූ යැ. මේ ගොත්‍රභූධර්මයෝ අටදෙන ශමථ වශයෙන් උපදිත්.

කතමෙ දස ගොත්‍රභුධම්මා විපස්සනාවසෙන උප්පජ්ජන්ති: සොතාපත්තිමග්ගං පටිලාභත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං බ්‍යාධිං මරණං සොකං පරිදෙවං උපායාසං බහිද්ධාසඞ්ඛාරනිමිත්තං අභිභුය්‍යතීති ගොත්‍රභු, සොතාපත්තිඵලසමාපත්තත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං පටිසන්ධිං -පෙ- අභිභුය්‍යතීති ගොත්‍රභු, සකදාගාමිමග්ගං පටිලාභත්ථාය -පෙ- සකදාගාමිඵලසමාපත්තත්ථාය -පෙ- අනාගාමිමග්ගං පටිලාභත්ථාය -පෙ- අනාගාමිඵල සමාපත්තත්ථාය -පෙ- අරහත්තමග්ගං පටිලාභත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං පටිසන්ධිං ගතිං නිබ්බත්තිං උපපත්තිං ජාතිං ජරං බ්‍යාධිං මරණං සොකං පරිදෙවං උපායාසං බහිද්ධාසඞ්ඛාරනිමිත්තං අභිභුය්‍යතීති ගොත්‍රභු, අරහත්තඵලසමාපත්තත්ථාය -පෙ- සුඤ්ඤතවිහාරසමාපත්තත්ථාය -පෙ- අනිමිත්තවිහාරසමාපත්තත්ථාය උප්පාදං පවත්තං නිමිත්තං ආයූහනං පටිසන්ධිං -පෙ- අභිභුය්‍යතීති ගොත්‍රභු, ඉමෙ දස ගොත්‍රභුධම්මා විපස්සනාවසෙන උප්පජ්ජන්ති.

කති ගොත්‍රභුධම්මා කුසලා, කති අකුසලා, කති අබ්‍යාකතා. පන්නරස ගොත්‍රභුධම්මා කුසලා, තයො ගොත්‍රභුධම්මා අබ්‍යාකතා, නත්ථි ගොත්‍රභුධම්මා අකුසලා.

1. "සාමිසඤ්ච නිරාමිසං පණිහිතඤ්ච අප්පණිහිතං
සුඤ්ඤතඤ්ච විසඤ්ඤුත්තං වුට්ඨිතඤ්ච අවුට්ඨිතං

2. අට්ඨ සමාධිස්ස පච්චයා දස ඤාණස්ස ගොචරා
අට්ඨාරස ගොත්‍රභුධම්මා තිණ්ණං විමොක්ඛාන පච්චයා,

3. ඉමෙ අට්ඨාරසාකාරා පඤ්ඤා යස්ස පරිචිතා
කුසලො විවට්ටෙ වුට්ඨානෙ නානාදිට්ඨීසු න කම්පතී'ති

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: "බහිද්ධාවුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභු ඤාණං"

**ගොත්‍රභුඤාණනිද්දෙසො.**

## 11. මග්ගඤාණං

කථං දුභතො වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මිච්ඡාදිට්ඨියා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති. තෙන වුච්චති: දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

කවර ගොත්‍රභූධර්මයෝ දසදෙනෙක් විදර්ශනාවශයෙන් උපදිත් ද යත්: ස්‍රෝතාපත්තිමාර්ගප්‍රතිලාභය පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත ආයූහනය ප්‍රතිසන්ධිය ගතිය නිර්වෘත්තිය උපප්‍රාප්තිය ජාතිය ජරාව ව්‍යාධිය මරණය ශෝකය පරිදේවය උපායාසය බාහ්‍ය සංස්කාරනිමිත්ත ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. ස්‍රෝතාපත්තිඵලසමාපත්තිය පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත ආයූහනය ප්‍රතිසන්ධිය ... ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. සකෘදාගාමිමාර්ගප්‍රතිලාභය පිණිස ... සකෘදාගාමිඵලසමාපත්තිය පිණිස ... අනාගාමිමාර්ගප්‍රතිලාභය පිණිස ... අනාගාමිඵලසමාපත්තිය පිණිස ... අර්හත්මාර්ගප්‍රතිලාභය පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත ආයූහනය ප්‍රති-සන්ධිය ගතිය නිර්වෘත්තිය උපප්‍රාප්තිය ජාතිය ජරාව ව්‍යාධිය මරණය ශෝකය පරිදේවය උපායාසය බාහ්‍ය සංස්කාරනිමිත්ත ඉක්මවා නූ යි ගොත්‍රභූ යැ. අර්හත්ඵලසමාපත්තිය පිණිස ... ශූන්‍යතවිහාර සමාපත්තිය පිණිස ... අනිමිත්තවිහාරසමාපත්තිය පිණිස උත්පාදය ප්‍රවෘත්තිය නිමිත්ත ආයූහනය ප්‍රතිසන්ධිය ... ඉක්මවා නු යි ගොත්‍රභූ යැ. මේ ගොත්‍රභූධර්මයෝ දසදෙන විදර්ශනාවශයෙන් උපදිත්.

කෙතෙක් ගොත්‍රභූධර්මයෝ කුශලයෝ ද කෙතෙක් අකුශලයෝ ද කෙතෙක් අව්‍යාකෘතයෝ ද යත්: ගොත්‍රභූධර්මයෝ පසළොස්දෙනෙක් කුශලයෝ යැ. ගොත්‍රභූධර්මයෝ තිදෙනෙක් අව්‍යාකෘතයෝ යැ. ගොත්‍රභූ-ධර්මයෝ අකුශල වූවාහු නැති යි.

1. නිකාන්ති සහිත බැවින් සාමිෂ යැ (නිකාන්ති රහිත බැවින්) නිරාමිෂ යැ. (නිකාන්ති ප්‍රණිධියෙන් සිටි බැවින්) ප්‍රණිහිත යැ (තදභාවයෙන්) අප්‍රණිහිත යැ (නිකාන්ති සංයොගයෙන්) සංයුක්ත යැ (තදභාවයෙන්) විසංයුක්ත යැ (නිකාන්තිය සිඳුනා බැවින්) ව්‍යුත්ථිත යැ (තදභාවයෙන්) අව්‍යුත්ථිත යි.

2. ගොත්‍රභූධර්මයෝ අටදෙනෙක් සමාධියට ප්‍රත්‍යයෝ වෙති. දසදෙනෙක් ඥානයට ගොචර වූවාහු වෙති. අටළොස් ගොත්‍රභූධර්මයෝ තුන් විමොක්ෂ-යනට ප්‍රත්‍යයෝ වෙත්.

3. මේ අටළොස් ආකාර ප්‍රඥාවෝ යමක්හු විසින් පුරුදු කරන ලද්දාහු ද ඒ විවර්තයෙහි හා ව්‍යුත්ථානයෙහි නිපුණ වූයේ නානා දෘෂ්ටීන්හි නො සැලේ යයි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'බහිද්ධා වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභූඤාණං' යි.

**ගොත්‍රභූඥාන නිර්දෙශ යි.**

## 11. මාර්ගඥානය

කිසෙයින් උභතොව්‍යුත්ථානවිවර්තනයෙහි ප්‍රඥාව මාර්ගඥාන වෙයි යත්:

ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි සත්‍යදර්ශනස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය (දෙසැට) මිථ්‍යාදෘෂ්ටියෙන් නැඟෙයි. තදනුවර්තක (මිථ්‍යාදෘෂ්ටිය අනුවැ පවත්නා) කෙලශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. බාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්ත කෙරෙන් ද නැගේ. එයින් කියනු ලැබෙයි. 'දුභතොවුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං' යි.

අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො මිච්ඡාසඞ්කප්පා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: දුහතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

පරිග්ගහට්ඨෙන සම්මාවාචා මිච්ඡාවාචාය වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: දුහතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො මිච්ඡාකම්මන්තා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: දුහතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං

වොදානට්ඨෙන සම්මා ආජීවො මිච්ඡාආජීවා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: දුහතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

පග්ගහට්ඨෙන සම්මාවායාමො මිච්ඡාවායාමා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: දුහතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

උපට්ඨානට්ඨෙන සම්මාසති මිච්ඡාසතියා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: ‘දුහතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි මිච්ඡාසමාධිතො වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: දුහතො වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

සකදාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: දුහතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

අනාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි අණුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා, අණුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: දුහතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං’.

අභිනිරෝපණස්වභාවයෙන් සම්‍යක්සංකල්පය මිථ්‍යාසංකල්පය කෙරෙන් නැඟෙයි. තදනුවර්තීක ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. වාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'යි.

පරිග්‍රහ (සතර වාක්සංවර) ස්වභාවයෙන් සම්‍යග්වචනය මිථ්‍යාවචනයෙන් නැඟෙයි. තදනුවර්තීක ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. වාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං' යි.

සමුත්ථාන (කාරණ) භාවයෙන් සම්‍යක්කර්මාන්තය (ප්‍රාණවධාදි) මිථ්‍යාකර්මාන්තයෙන් නැඟෙයි. තදනුවර්තීක ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. බාහ්‍ය වූ හැම සංස්කාර නිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'යි.

පරිශුද්ධභාවයෙන් සම්‍යගාජීවය මිථ්‍යාආජීවයෙන් නැඟෙයි. තදනුවර්තීකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. බාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'යි.

ප්‍රග්‍රහභාවයෙන් සම්‍යග්ව්‍යායාමය මිථ්‍යාව්‍යායාමයෙන් නැඟෙයි. තදනුවර්තීක ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. බාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'යි.

එළඹ සිටුනා බැවින් සම්‍යක්ස්මෘතිය මිථ්‍යාස්මෘතියෙන් නැඟෙයි. තදනුවර්තීක ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි බාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්ත කෙරෙන් ද නැඟේ. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'යි.

අවික්ෂේපාර්ථස්වභාවයෙන් සම්‍යක්සමාධිය මිථ්‍යාසමාධියෙන් නැඟී සිටී, තදනුවර්තීක වූ ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟීසිටී, බාහ්‍ය වූ හැම සංස්කාරනිමිත්තයන් ගෙන් ද නැඟීසිටී. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'යි.

සකෘදාගාමිමාර්ගක්ෂණයෙහි සත්‍යදර්ශනස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂේපස්වභාවයෙන් සම්‍යක්සමාධිය ඖදාරික වූ කාමරාගසංයොජනයෙන් ප්‍රතිඝසංයෝජනයෙන් ඖදාරික වූ කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් නැඟිසිටී, තදනුවර්තීක වූ ක්ලේශයන් කෙරෙන් ද, ස්කන්ධයන් කෙරෙන් ද නැඟීසිටී, බාහ්‍ය වූ ද හැම සංස්කාරනිමිත්තයන් කෙරෙන් නැඟීසිටී. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'යි.

අනාගාමිමාර්ගක්ෂණයෙහි දර්ශනස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂේපස්වභාවයෙන් සම්‍යක්සමාධිය අණුසහගත (සියුම්) වූ කාමරාගසංයොජනයෙන් ද ප්‍රතිඝසංයොජනයෙන් ද අණුසහගත වූ කාමරාගානුශයෙන් ද ප්‍රතිඝානුශයෙන් ද නැඟීසිටී. තදනුවර්තීක වූ ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟිසිටී. බාහ්‍ය වූ ද හැම සංස්කාරනිමිත්තයන් කෙරෙන් නැඟීසිටී. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'යි.

අරහත්තමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තෙන වුච්චති: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං.

1. "අජාතං ඣාපෙති[1] ජාතෙන ඣානං[2] තෙන පවුච්චති
ඣානවිමොක්ඛෙ[3] කුසලතා නානාදිට්ඨීසු න කම්පති[4]

2. සමාදහිත්වා යථා චෙ විපස්සති
විපස්සමානො තථා චෙ සමාදහෙ
විපස්සනා ච සමථො තදා අහු
සමානභාගා යුගනද්ධා වත්තරෙ.

3. දුක්ඛා සඞ්ඛාරා සුඛො නිරොධොති දස්සනං
දුභතො වුට්ඨිතා පඤ්ඤා ඵස්සෙති අමතං පදං

4. විමොක්ඛචරියං ජානාති නානත්තෙකත්ත[5] කොවිදො
ද්වින්නං ඤාණානං කුසලතා නානාදිට්ඨීසු න කම්පතී"ති,

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති "දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං."

**මග්ගඤාණනිද්දෙසො.**

## 12. ඵලඤාණං

කථං පයොගපටිප්පස්සද්ධිපඤ්ඤා ඵලෙ ඤාණං.

සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මිච්ඡාදිට්ඨියා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොග[6] පටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාදිට්ඨි, මග්ගස්සෙතං ඵලං.

---

1 ඤාපෙති - PTS, 2. ඤාණං - PTS, 3. ඤාණවිමොක්ඛ - PTS.
4. න කම්පතීති - සී. 5. නානත්තෙකත්ත - PTS. 6. තප්පයොග විම

අර්හත්මාර්ගක්ෂණයෙහි දර්ශනස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂෙපභාවයෙන් සම්‍යක්සමාධිය රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යායෙන් මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් නැගීසිටී, තදනුවර්තක වූ කෙලශයන් කෙරෙන් ද, ස්කන්ධයන් කෙරෙන් ද නැගීසිටී, බාහ්‍ය වූ ද හැම සංස්කාරනිමිත්තයන් කෙරෙන් නැගීසිටී. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'යි.

1. ස්වසන්තානයෙහි උපන් ලොකොත්තරධ්‍යානයෙන් (තත්සමඞ්ගී පුද්ගල තෙමේ) නූපන් කෙලශය දවයි, එකාරණෙන් එය ධ්‍යාන යයි කියනු ලැබේ. ඒ ආර්‍ය්‍යමාර්ගසම්ප්‍රයුක්ත වූ ධ්‍යානයෙහි ද විමොක්ෂ සඞ්ඛ්‍යාත ආර්‍ය්‍යමාර්ගයෙහි ද කුශල බව හෙතු කොටගෙන නානා දෘෂ්ටීන්හි කම්පා නො වේ.

2. ආලම්බනොපචාරක්ෂණිකසමාධීන් අතුරෙන් එක්තරා සමාධියකින් චිත්තසමාධානය කොට යම්සේ විදර්ශනා කෙරේ ද, විදර්ශනා කරනුයේ එසෙයින් ම චිත්තසමාධානය ද කරන්නේ ය. එකල්හි විදර්ශනාව ද ශමථය ද වෙති. සමභාග වූ ශමථවිදර්ශනාධර්මයෝ යුගනද්ධ වූවාහු පවත්නාහ.

3. සංස්කාරයෝ දුඃඛයෝ යැ, නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණ සුව යැ යි දර්ශන සඞ්ඛ්‍යාත ආර්‍ය්‍යමාර්ගඥානය 'දුභතො වුට්ඨානපඤ්ඤා නමු. (ඒ ප්‍රඥාව මැ) අමෘතපද සඞ්ඛ්‍යාත නිවන ආලම්බනස්පර්ශයෙන් ස්පර්ශ කෙරෙයි.

4. විමොක්ෂයන් ගේ නානාත්වයෙහි ද එකත්වයෙහි ද නිපුණ වූයේ විමොක්ෂප්‍රවෘත්තිය අසම්මූඪවශයෙන් දැනගනී, දර්ශන සඞ්ඛ්‍යාත වූ ද භාවනා-සඞ්ඛ්‍යාත වූ ද ඥානද්වයයාගේ නිපුණබව හෙතු කොටගෙන ශාශ්වතාදි නානාදෘෂ්ටියෙහි නො සැලේ යයි.

ඒ මාර්ගඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'දුභතො වුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'යි.

**මාර්ගඥාන නිර්දෙශ යි.**

## 12. ඵලඥානය

ප්‍රයොගනිෂ්ඨාවෙහි (-ආර්‍ය්‍යමාර්ගනිමිත්තෙන් කෙලශයන්ගේ සන්හිඳීමෙහි) ප්‍රඥාව කිසෙයින් ඵලඥාන නම් වෙයි යත්:

ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි සම්‍යග්දෘෂ්ටි තොමෝ ස්වප්‍රතිපක්ෂයන් දර්ශනභාවයෙන් මිථ්‍යාදෘෂ්ටිය කෙරෙන් නැගීසිටී. ඒ මිථ්‍යාදෘෂ්ටිය අනුව පවත්නා කෙලශයන් කෙරෙනු දු ස්කන්ධයන් කෙරෙනු දු නැගීසිටී. (යථොක්ත කෙලශ-ස්කන්ධයන් කෙරෙන්) පිටත්හි වූ හැම සංස්කාර-නිමිත්තයන් කෙරෙනු දු නැගීසිටී. ඒ (අජ්ඣත්තබහිද්ධා දෙකින්) වුත්ථානාදී ප්‍රයොගය සන්හුන්වන බැවින් (මාර්ගානන්තර වැ එක් දෙ වටෙක හෝ, ඵලසමාපත්තිකාලයෙහි නො එක් වට, නිරොධයෙන් නැඟෙනුවහුට දෙවටෙක) සම්‍යග්දෘෂ්ටිය උපදී, තෙල (විපාකසම්‍යග්දෘෂ්ටිය) ආර්‍ය්‍යමාර්ගයා ගේ ඵල යි.

අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො මිච්ඡාසඞ්කප්පා වුට්ඨාති තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොග[1] පටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාසඞ්කප්පො, මග්ගස්සෙතං ඵලං.

පරිග්ගහට්ඨෙන සම්මාවාචා මිච්ඡාවාචාය වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති. තංපයොගපටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාවාචා, මග්ගස්සෙතං ඵලං.

සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො මිච්ඡාකම්මන්තා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොගපටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාකම්මන්තො. මග්ගස්සෙතං ඵලං.

වොදානට්ඨෙන සම්මාආජීවො මිච්ඡාආජීවා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොගපටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාආජීවො, මග්ගස්සෙතං ඵලං.

පග්ගහට්ඨෙන සම්මාවායාමො මිච්ඡාවායාමා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොග[1] පටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාවායාමො. මග්ගස්සෙතං ඵලං.

උපට්ඨානට්ඨෙන සම්මාසති මිච්ඡාසතියා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයො ගපිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාසති, මග්ගස්සෙතං ඵලං.

අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි මිච්ඡාසමාධිතො වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති. තංපයොගපටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාසමාධි, මග්ගස්සෙතං ඵලං.

සකදාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි –පෙ– අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි ඔළාරිකා කාමරාගසංයොජනා පටිඝසංයොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති. තංපයොග පටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාසමාධි, මග්ගස්සෙතං ඵලං.

1. තප්පයොග .... විම

අභිනිරොපණාර්ථයෙන් සම්‍යක්සඞ්කල්පය තෙමේ මිථ්‍යාසඞ්කල්පයෙන් නැගිසිටී. ඒ මිථ්‍යාසඞ්කල්පය අනුව පවත්නා ක්ලේශයන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැගෙයි. එයින් පිටත්හි වූ සියලු සංස්කාරනිමිත්ත-යෙනුදු නැගෙයි ඒ (අජ්ඣත්තබහිද්ධාවුට්ඨාන) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යක්සඞ්කල්පය උපදී. තෙල විපාක සම්‍යක්සඞ්කල්පය ආර්ය-මාර්ගයාගේ ඵල යි.

සම්‍යග්වචනය පරිග්‍රහභාවයෙන් මිථ්‍යාවචනයෙන් නැගිසිටී ඒ මිථ්‍යා-වචනය හා අනුව පවත්නා ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැගිසිටී. එයින් පිටත්හි වූ හැම සංස්කාරනිමිත්තයන් කෙරෙනුදු නැගිසිටී. ඒ (අජ්ඣත්තබහිද්ධාවුට්ඨාන) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යග්වචනය උපදී, තෙල විපාක වූ සම්‍යග්වචනය ආර්යමාර්ගයාගේ ඵලය යි.

සම්‍යක්කර්මාන්ත තෙමේ සමුට්ඨානභාවයෙන් මිථ්‍යාකර්මාන්තයෙන් නැගෙයි. තදනුවර්තික වූ ක්ලේශයන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැගෙයි. එයින් පිටත්හි වූ හැම සංස්කාරනිමිත්තයෙනුදු නැගෙයි. ඒ (අජ්ඣත්තබහිද්ධාවුට්ඨාන) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යක්කර්මාන්තය උපදී. තෙල විපාක වූ සම්‍යක්කර්මාන්තය ආර්යමාර්ගයාගේ ඵල යි.

සම්‍යගාජීව තෙමේ ව්‍යවදානභාවයෙන් මිථ්‍යාආජීවයෙන් නැගෙයි. තදනුවර්තික වූ ක්ලේශයන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැගෙයි. එයින් පිටත්හි වූ හැම සංස්කාරනිමිත්තයෙනුදු නැගෙයි ඒ (අජ්ඣත්ත-බහිද්ධාවුට්ඨාන) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යගාජීවය උපදී. තෙල විපාක වූ සම්‍යගාජීවය ආර්යමාර්ගයාගේ ඵල යි.

සම්‍යග්ව්‍යායාම තෙමේ ප්‍රග්‍රහාර්ථයෙන් මිථ්‍යාව්‍යායාමයෙන් නැගෙයි. තදනුවර්තික වූ ක්ලේශයන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැගෙයි එයින් පිටත්හි වූ සියලු සංස්කාරනිමිත්තයන් කෙරෙනුදු නැගෙයි. ඒ (අජ්ඣත්තබහිද්ධාවුට්ඨාන) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යග්ව්‍යායාමය උපදී. තෙල විපාක වූ සම්‍යග්ව්‍යායාමය මාර්ගයාගේ ඵල යි.

සම්‍යක්ස්මෘති තොමෝ උපස්ථානභාවයෙන් මිථ්‍යාස්මෘතියෙන් නැගෙයි. තදනුවර්තික වූ ක්ලේශයන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැගෙයි. එයින් පිටත්හි වූ හැම සංස්කාරනිමිත්තයන් කෙරෙනුදු නැගෙයි. ඒ (අජ්ඣත්තබහිද්ධාවුට්ඨාන) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යක්ස්මෘති තොමෝ උපදී. තෙල විපාක වූ සම්‍යක්ස්මෘතිය ආර්යමාර්ගයාගේ ඵල යි.

සම්‍යක්සමාධි තෙමේ අවික්ෂෙපභාවයෙන් මිථ්‍යාසමාධිය කෙරෙන් නැගෙයි, තදනුවර්තික වූ කෙලෙසුන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැගෙයි. ඒ (ක්ලේශස්කන්ධයන්) කෙරෙන් පිටත්හි වූ සියලු සංස්කාර-නිමිත්තයන් කෙරෙනුදු නැගෙයි. ඒ (අජ්ඣත්ත-බහිද්ධා දෙකින් වුට්ඨා-නාදි) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යක්සමාධිය උපදී තෙල විපාක වූ සම්‍යක්සමාධිය ආර්යමාර්ගයාගේ ඵල යි.

සකෘදාගාමිමාර්ගය උපදනා ඇසිල්ලෙහි සම්‍යග්දෘෂ්ටි තොමෝ දර්ශනභාවයෙන් ... සම්‍යක්සමාධි තෙමේ අවික්ෂෙපභාවයෙන් ඖදාරික වූ කාමරාගසංයොජනය කෙරෙන් ප්‍රතිඝසංයොජනය කෙරෙන් කාමරාගානු-ශය කෙරෙන් ප්‍රතිඝානුශය කෙරෙන් නැගෙයි. ඒ කාමරාගසංයොජනාදීන් හා අනුව පවත්නා ක්ලේශයන් කෙරෙනුදු ස්කන්ධයන් කෙරෙනුදු නැගෙයි. ඒ ක්ලේශ-ස්කන්ධයන් කෙරෙන් පිටත්හි වූ හැම සංස්කාර-නිමිත්තයන් කෙරෙනුදු නැගිසිටී. ඒ, (ව්‍යුත්ථානාදි) ප්‍රයොගය සන්හුන්වන බැවින් සම්‍යක්සමාධිය උපදී. තෙල විපාක වූ සම්‍යක්සමාධිය (සකෘදා-ගාමි) **ආර්යමාර්ගයා** ගේ ඵල යි.

අනාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛපට්ඨෙන සම්මාසමාධි අණුසහගතා කාමරාග සඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා අණුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොගපටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාසමාධි, මග්ගස්සෙතං ඵලං.

අරහත්තමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය, මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, තංපයොගපටිප්පස්සද්ධත්තා උප්පජ්ජති සම්මාසඞ්කප්පො මග්ගස්සෙතං ඵලං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: පයොගපටිප්පස්සද්ධිපඤ්ඤා ඵලෙ ඤාණං.

ඵලඤාණනිද්දෙසො.

## 13. විමුත්තිඤාණං

කථං ඡින්නවට්ටමනුපස්සනෙ[1] පඤ්ඤා විමුත්තිඤාණං:

සොතාපත්තිමග්ගෙන සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාසො, දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො, අත්තනො චිත්තස්ස උපක්කිලෙසා සම්මාසමුච්ඡින්නා හොන්ති, ඉමෙහි පඤ්චහි උපක්කිලෙසෙහි සපරියුට්ඨානෙහි චිත්තං විමුත්තං හොති සුවිමුත්තං. තංවිමුත්ති ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: ඡින්නවට්ටමනුපස්සනෙ[1] පඤ්ඤා විමුත්ති ඤාණං.

සකදාගාමිමග්ගෙන ඔළාරිකං කාමරාගසඤ්ඤොජනං, පටිඝසඤ්ඤොජනං ඔළාරිකො කාමරාගානුසයො පටිඝානුසයො අත්තනො චිත්තස්ස උපක්කිලෙසා සම්මා සමුච්ඡින්නා හොන්ති, ඉමෙහි චතූහි උපක්කිලෙසෙහි පරියුට්ඨානෙහි චිත්තං විමුත්තං හොති සුවිමුත්තං. තංවිමුත්ති ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති 'ඡින්නවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්ති ඤාණං.

---

1. ඡින්නවටුමානුපස්සනෙ - මජසං. ඡින්න මනුපස්සනෙ - සයා, PTS.

අනාගාමිමාර්ගය උපදනා ඇසිල්ලෙහි සම්‍යග්දෘෂ්ටි තොමෝ දර්ශනභාවයෙන් ... අවික්ෂේපභාවයෙන් සම්‍යක්සමාධි තෙමේ අණුසහගත වූ කාමරාගසංයෝජනයා කෙරෙන් ප්‍රතිඝසංයෝජනයා කෙරෙන් අණුසහගත කාමරාගානුශයා කෙරෙන් ප්‍රතිඝානුශයා කෙරෙන් නැඟීසිටී, තදනුවර්තක වූ ක්ලේශයන් කෙරෙනු දු ස්කන්ධයන් කෙරෙනු දු නැඟීසිටී (ඒ ක්ලේශ-ස්කන්ධයන් කෙරෙන්) පිටත්හි වූ සියලු සංස්කාරනිමිත්තයන් කෙරෙනු දු නැඟීසිටී. ඒ (ව්‍යුත්ථානාදී) ප්‍රයෝගය සන්හුන් වන බැවින් සම්‍යක්සමාධිය උපදී. තෙල විපාක වූ සම්‍යක්සමාධිය අනාගාමිමාර්ගයා ගේ ඵල සි.

අර්හත්මාර්ගක්ෂණයෙහි දර්ශනභාවයෙන් සම්‍යග්දෘෂ්ටි තොමෝ .. අවික්ෂේපභාවයෙන් සම්‍යක්සමාධි තෙමේ රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යායෙන් මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් නැඟීසිටී. තදනුවර්තක වූ ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟීසිටී. (ඒ ක්ලේශ-ස්කන්ධයන් කෙරෙන්) පිටත්හි වූ හැම සංස්කාරනිමිත්තයන් කෙරෙනු දු නැඟීසිටී. ඒ (ව්‍යුත්ථානාදි) ප්‍රයෝගය සන්හුන්වන බැවින් සම්‍යක්සමාධිය උපදී. තෙල විපාක වූ සම්‍යක්සමාධිය අර්හත්මාර්ගයා ගේ ඵල සි.

ඒ ඵලඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා සි. එයින් කියනු ලැබෙසි: "පයොගපටිප්පස්සද්ධිපඤ්ඤා ඵලෙ ඤාණං" සි.

**ඵලඥාන නිර්දෙශ සි.**

## 13. විමුක්තිඥානය

කිසෙයින් ඒ ඒ ආර්‍ය්‍යමාර්ගයෙන් සමුච්ඡින්න වූ උපක්ලේශයන් පසුව බැලීමෙහි ප්‍රඥාව විමුක්තිඥාන වෙසි යත්:

ස්‍රොතාපත්තිමාර්ගයෙන් සත්කායදෘෂ්ටි යැ විචිකිත්සා යැ ශීලව්‍රතපරාමර්ශ යැ දෘෂ්ට්‍යනුශය යැ විචිකිත්සානුශය යැ යන ස්වකීය චිත්තයාගේ උපක්ලේශයෝ (සමුච්ඡේදප්‍රහාණයෙන් අනුත්පාදනිරොධයෙන්) මැනැවින් සිඳුනා ලද්දාහු වෙති, පර්‍ය්‍යුත්ථාන සහිත වූ මේ පඤ්චොපක්ලේශයන් කෙරෙන් සිත විමුක්ත වූයේ සුවිමුක්ත වූයේ වෙසි. ඒ විමුක්තිය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා සි. එයින් කියනු ලැබෙසි. "ඡින්නවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං" සි.

සකෘදාගාමිමාර්ගයෙන් ඖදාරික වූ කාමරාගසංයෝජන යැ ප්‍රතිඝසංයෝජන යැ ඖදාරික වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ යන ස්වකීය චිත්තයා ගේ උපක්ලේශයෝ මැනැවින් සිඳුනා ලද්දාහු වෙති. පර්‍ය්‍යුත්ථානක්ලේශයන් සහිත වූ මේ සතර උපක්ලේශයන් කෙරෙන් චිත්තය විමුක්ත සුවිමුක්ත වූයේ වෙසි. ඒ විමුක්තිය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා සි. එයින් කියනු ලැබෙසි: "ඡින්නවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං" සි.

අනාගාමිමග්ගෙන අණුසහගතං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං අණුසහගතො කාමරාගානුසයො පටිඝානුසයො අත්තනො චිත්තස්ස උපක්කිලෙසා සම්මා සමුච්ඡින්නා හොන්ති, ඉමෙහි චතූහි උපක්කිලෙසෙහි සපරියුට්ඨානෙහි චිත්තං විමුත්තං හොති සුමුත්තං. තංවිමුත්ති ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: 'ඡින්නවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්ති ඤාණං.

අරහත්තමග්ගෙන රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා මානානුසයො භවරාගානුසයො අවිජ්ජානුසයො අත්තනො චිත්තස්ස උපක්කිලෙසා සම්මා සමුච්ඡින්නා හොන්ති, ඉමෙහි අට්ඨහි උපක්කිලෙසෙහි සපරියුට්ඨානෙහි චිත්තං විමුත්තං හොති සුවිමුත්තං, තංවිමුත්ති ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: 'ඡින්නවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං.'

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: ඡින්නවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං.

**විමුත්තිඤාණනිද්දෙසො.**

## 14. පච්චවෙක්ඛනඤාණං

**කථං තදා සමුදාගතෙ[1] ධම්මෙ පස්සනෙ[2] පඤ්ඤා පච්චවෙක්ඛනෙ ඤාණං:**

සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි තදා සමුදාගතා.[3] අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො තදා සමුදාගතො, පරිග්ගහට්ඨෙන සම්මාවාචා තදා සමුදාගතා, සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො තදා සමුදාගතො, වොදානට්ඨෙන සම්මාආජීවො තදා සමුදාගතො, පග්ගහට්ඨෙන සම්මාවායාමො තදා සමුදාගතො, උපට්ඨානට්ඨෙන සම්මාසති තදා සමුදාගතා, අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි තදා සමුදාගතො.

උපට්ඨානට්ඨෙන සතිසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො, පවිචයට්ඨෙන ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො, පග්ගහට්ඨෙන විරියසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො, ඵරණට්ඨෙන පීතිසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො, උපසමට්ඨෙන පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො, අවික්ඛෙපට්ඨෙන සමාධිසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො, පටිසඞ්ඛානට්ඨෙන උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තදා සමුදාගතො.

---

1 සමුපාගතෙ - ස්‍යා
2. විපස්සනෙ - PTS
3. සමුපගතා - ස්‍යා

අනාගාමිමාර්ගයෙන් අණුසහගත වූ කාමරාගසංයොජන යැ ප්‍රතිඝ-සංයොජන යැ අණුසහගත වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ යන ස්වකීය චිත්තයාගේ උපක්ලේශයෝ මැනැවින් සිඳුනා ලද්දාහු වෙති. පර්‍ය්‍යුත්ථානක්ලේශයන් සහිත වූ මේ සතර උපක්ලේශයන් කෙරෙන් චිත්තය විමුක්ත සුවිමුක්ත වූයේ වෙයි. ඒ විමුක්තිය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: "ජිත්තාවට්ටමනු-පස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං"යි.

අර්හත්මාර්ගයෙන් රූපරාග යැ අරූපරාග යැ මාන යැ ඖද්ධත්‍ය යැ අවිද්‍යා යැ මානානුශය යැ භවරාගානුශය යැ අවිජ්ජානුශය යැ යන ස්වකීය චිත්තයාගේ උපක්ලේශයෝ මැනැවින් සිඳුනා ලද්දාහු වෙති. පර්‍ය්‍යුත්ථානක්ලේශයන් සහිත වූ මේ අට උපක්ලේශයන් කෙරෙන් චිත්තය විමුක්ත වූයේ සුවිමුක්ත වූයේ වෙයි. ඒ විමුක්තිය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: "ජිත්තාවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං"යි.

ඒ විමුක්තිඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: "ජිත්තාවට්ටමනුපස්සනෙ පඤ්ඤා විමුත්තිඤාණං"යි.

**විමුක්තිඥානනිර්දෙශ යි.**

## 14. ප්‍රත්‍යවෙක්ෂා ඥානය

කිසෙයින් ඒ මාර්ග-ඵලක්ෂණයෙහි ප්‍රතිලාභ-ප්‍රතිවෙධ වශයෙන් පැමිණි මාර්ගඵලධර්මයන් ද චතුස්සත්‍යධර්මයන් ද දක්නා ප්‍රඥාව ප්‍රත්‍යවෙක්ෂා ඥාන වෙයි යත්:

ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි (පරිඥාභිසමයාදි ලක්ෂණයෙන් චතුස්සත්‍ය) දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටි තොමෝ ඒ මාර්ගක්ෂණයෙහි (හෙතුයෙන්) පහළවූ යැ, අභිනිරොපණාර්ථයෙන් සම්‍යක්සඞ්කල්ප තෙමේ ඒ මඟකෙණෙහි පහළ වූයෙ යැ, පරිග්‍රහාර්ථයෙන් සම්‍යග්වචනය ඒ මඟකෙණෙහි සමුදාගත යැ, සමුත්ථාන (කාරණ) භාවාර්ථයෙන් සම්‍යක්කර්මාන්ත තෙමේ ඒ මඟ කෙණෙහි සමුදාගත යැ, පරිශුද්ධාර්ථයෙන් සම්‍යගාජීව තෙමේ මඟකෙණෙහි සමුදාගත යැ, ප්‍රග්‍රහාර්ථයෙන් සම්‍යග්ව්‍යායාම තෙමේ ඒ මඟකෙණෙහි සමුදාගත යැ, උපස්ථානාර්ථයෙන් සම්‍යක්සමෘතිය ඒ මඟකෙණෙහි සමුදා-ගත යැ, අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධි තෙමේ ඒ මඟකෙණෙහි පහළ වූයේ යැ.

උපස්ථාන (-අරමුණට පැමිණ සිටුනා) භාවයෙන් සමෘතිසම්බොධ්‍යඞ්ග තෙමේ ඒ මඟකෙණෙහි සමුදාගත යැ, ප්‍රවිචයාර්ථයෙන් ධර්මවිචයසම්බො-ධ්‍යඞ්ග තෙමේ ඒ මඟකෙණෙහි සමුදාගත යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍ය-සම්බොධ්‍යඞ්ග තෙමේ ඒ මඟකෙණෙහි සමුදාගත යැ, ස්ඵරණාර්ථයෙන් ප්‍රීතිසම්බොධ්‍යඞ්ග තෙමේ ඒ මඟකෙණෙහි සමුදාගත යැ, උපශමාර්ථයෙන් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග තෙමේ ඒ මඟකෙණෙහි සමුදාගත යැ, අවික්ෂෙපාර්ථ-යෙන් සමාධිසම්බොධ්‍යඞ්ග තෙමේ ඒ මඟකෙණෙහි සමුදාගත යැ, ප්‍රති-සඞ්ඛ්‍යානාර්ථයෙන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග තෙමේ ඒ මඟකෙණෙහි සමුදාගත යැ.

අස්සද්ධියෙ අකම්පියට්ඨෙන සද්ධාබලං තදා සමුදාගතං, කොසජ්ජෙ අකම්පියට්ඨෙන විරියබලං තදා සමුදාගතං, පමාදෙ අකම්පියට්ඨෙන සතිබලං තදා සමුදාගතං උද්ධච්චෙ අකම්පියට්ඨෙන සමාධිබලං තදා සමුදාගතං අවිජ්ජාය අකම්පියට්ඨෙන පඤ්ඤාබලං තදා සමුදාගතං.

ආධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං තදාසමුදාගතං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං තදා සමුදාගතං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං තදා සමුදාගතං අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං තදා සමුදාගතං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං තදා සමුදාගතං.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියා තදා සමුදාගතා, අකම්පියට්ඨෙන බලා තදා සමුදාගතා නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගා තදා සමුදාගතා, හෙතුට්ඨෙන[1] මග්ගො තදා සමුදාගතො, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානා තදා සමුදාගතා, පදහනට්ඨෙන සම්මප්පධානා තදා සමුදාගතා, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදා තදා සමුදාගතා, තථට්ඨෙන සච්චා තදා සමුදාගතා, අවික්ඛෙපට්ඨෙන සමථො තදා සමුදාගතො, අනුපස්සනට්ඨෙන විපස්සනා තදා සමුදාගතා, එකරසට්ඨෙන සමථවිපස්සනා තදා සමුදාගතා, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං තදා සමුදාගතං, සංවරට්ඨෙන සීලවිසුද්ධි තදා සමුදාගතා, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි තදාසමුදාගතා, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි තදා සමුදාගතා, විමුත්තට්ඨෙන විමොක්ඛා තදා සමුදාගතා, පටිවෙධට්ඨෙන විජ්ජා තදා සමුදාගතා, පරිච්චාගට්ඨෙන විමුත්ති තදා සමුදාගතා, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං තදා සමුදාගතං.

ඡන්දො මූලට්ඨෙන තදා සමුදාගතො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන තදා සමුදාගතො, ඵස්සො සමොධානට්ඨෙන තදා සමුදාගතො, වෙදනා සමොසරණට්ඨෙන තදා සමුදාගතා, සමාධි පමුඛට්ඨෙන තදා සමුදාගතො, සති ආධිපතෙය්‍යට්ඨෙන තදා සමුදාගතා, පඤ්ඤා තදුත්තරට්ඨෙන තදා සමුදාගතා, විමුත්ති සාරට්ඨෙන තදා සමුදාගතා, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන තදා සමුදාගතං, වුට්ඨහිත්වා පච්චවෙක්ඛති. ඉමෙ ධම්මා තදා සමුදාගතා.

---

1. හෙතට්ඨෙන - ස්‍යා

අශ්‍රද්ධායෙහි අචලාර්ථයෙන් ශ්‍රද්ධාබලය ඒ මඟකෙණෙහි සමුදාගත යැ, කෞසීද්‍යයෙහි අචලාර්ථයෙන් වීර්‍යබලය ඒ මඟකෙණෙහි සමුදාගත යැ, ප්‍රමාදයෙහි අචලාර්ථයෙන් ස්මෘතිබලය එකෙණෙහි සමුදාගත යැ, ඖද්ධත්‍යයෙහි අචලාර්ථයෙන් සමාධිබලය එකෙණෙහි සමුදාගත යැ, අවිද්‍යායෙහි අචලාර්ථයෙන් ප්‍රඥාබලය ඒ මඟකෙණෙහි සමුදාගත යැ.

අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ එකෙණෙහි සමුදාගත යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රිය එකෙණෙහි සමුදාගත යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය තෙමේ එකෙණෙහි සමුදාගත යැ, අවික්ෂේපාර්ථයෙන් සමාධීන්ද්‍රිය තෙමේ එකෙණෙහි සමුදාගත යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රිය තෙමේ එකෙණෙහි සමුදාගත යැ.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියයෝ ඒ මාර්ගක්ෂණයෙහි පහළවූවාහු යැ, අචලභාවාර්ථයෙන් බලයෝ ඒ මඟකෙණෙහි සමුදාගතයෝ යැ, නිර්‍යාණාර්ථයෙන් සම්බොධ්‍යඞ්ගයෝ ඒ මඟකෙණෙහි සමුදාගතයෝ යැ, හෙත්වර්ථයෙන් මාර්ගය තෙමේ එකෙණෙහි සමුදාගත යැ, උපස්ථානාර්ථයෙන් සතිපට්ඨානයෝ එකෙණෙහි සමුදාගතයෝ යැ, ප්‍රධානාර්ථයෙන් සම්‍යක්ප්‍රධානයෝ ඒ මාර්ගක්ෂණයෙහි සමුදාගතයෝ යැ, සමෘද්ධිභාවයෙන් ඍද්ධිපාදයෝ එකෙණෙහි සමුදාගතයෝ යැ, අවිසංවාදකාර්ථයෙන් සත්‍යයෝ එකෙණෙහි සමුදාගතයෝ යැ, අවික්ෂේපාර්ථයෙන් ශමථය එකෙණෙහි සමුදාගත යැ, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනා තොමෝ එකෙණෙහි සමුදාගත යැ, එකකෘත්‍යභාවයෙන් ශමථවිදර්ශනා එකෙණෙහි සමුදාගත යැ, (ඔවුනොවුන්) නො ඉක්මැ පවත්නා අර්ථයෙන් යුගනද්ධය එකෙණෙහි සමුදාගත යැ, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය එකෙණෙහි සමුදාගත යැ, අවික්ෂේපභාවයෙන් චිත්තවිශුද්ධිය එකෙණෙහි සමුදාගත යැ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය එකෙණෙහි සමුදාගත යැ, විමුක්ත (-කෙලෙසුන් කෙරෙන් මිදුණු) බැවින් විමොක්ෂයෝ එකෙණෙහි සමුදාගතයෝ යැ, සත්‍ය ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව එකෙණෙහි සමුදාගත යැ, (කෙලශයන් ගේ) පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය එකෙණෙහි සමුදාගත යැ, කෙලශසමුච්ඡින්දනාර්ථයෙන් ක්ෂය (ආර්යමාර්ගයෙහි) ඥානය එකෙණෙහි සමුදාගත යැ.

කුශලධර්මයන් ගේ කත්තුකම්‍යතා ඡන්ද තෙමේ (ප්‍රතිපත්තියට ද නිෂ්පත්තියට ද මූල හෙයින්) මූලාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, යොනිසොමනසිකාර තෙමේ (කුශලධර්මයන් උපදවන හෙයින්) සමුට්ඨානාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, ස්පර්ශ තෙමේ සමවධානාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, වේදනා තොමෝ සමවසරණාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, සමාධි තෙමේ ප්‍රමුඛාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ. ස්මෘති තොමෝ අධිපතිභාවාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, ආර්යමාර්ගප්‍රඥා තොමෝ ඒ කුශලධර්මයන්ට ශ්‍රෙෂ්ඨාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, ඵලවිමුක්තිය (ස්ථිර හෙයින්) සාරාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, අමෘත හෙයින් සත්නට ප්‍රතිෂ්ඨා වූ නිර්වාණය (ශාසනයාගේ නිෂ්ඨාව හෙයින්) පර්‍යවසානාර්ථයෙන් ඒ මාර්ගක්ෂණයෙහි සමුදාගත යැ, (ඵලාවසානයෙහි) නැඟිසිට මේ උක්තප්‍රකාරධර්මයෝ ඒ මාර්ගක්ෂණයෙහි පහළවූවාහ' යි ප්‍රත්‍යවෙක්ෂා කෙරේසි.

සොතාපත්තිඵලක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි තදා සමුදාගතා, අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො තදා සමුදාගතො, –පෙ– පටිප්පස්සද්ධට්ඨෙන[1] අනුප්පාදෙ ඤාණං තදා සමුදාගතං. ඡන්දො මූලට්ඨෙන තදා සමුදාගතො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන තදා සමුදාගතො, ඵස්සො සමොධානට්ඨෙන තදා සමුදාගතො, වෙදනා සමොසරණට්ඨෙන තදා සමුදාගතා, පඤ්ඤා තදුත්තරට්ඨෙන තදා සමුදාගතා, විමුත්ති සාරට්ඨෙන තදා සමුදාගතා, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන තදා සමුදාගතං, වුට්ඨහිත්වා පච්චවෙක්ඛති. ඉමෙ ධම්මා තදා සමුදාගතා.

සකදාගාමිමග්ගක්ඛණෙ –පෙ– සකදාගාමිඵලක්ඛණෙ –පෙ– අනාගාමිමග්ගක්ඛණෙ –පෙ– අනාගාමිඵලක්ඛණෙ –පෙ– අරහත්තමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි තදා සමුදාගතා, –පෙ– සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං තදා සමුදාගතං. ඡන්දො මූලට්ඨෙන තදා සමුදාගතො –පෙ– අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන තදා සමුදාගතං, වුට්ඨහිත්වා පච්චවෙක්ඛති. ඉමෙ ධම්මා තදා සමුදාගතා.

අරහත්තඵලක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි තදා සමුදාගතා –පෙ– පටිප්පස්සද්ධට්ඨෙන[1] අනුප්පාදෙ ඤාණං තදා සමුදාගතං. ඡන්දො මූලට්ඨෙන තදා සමුදාගතො, –පෙ– අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන තදා සමුදාගතං, වුට්ඨහිත්වා පච්චවෙක්ඛති. ඉමෙ ධම්මා තදා සමුදාගතා.

තං ඤාතට්ඨෙන[2] ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති 'තදා සමුදාගතෙ ධම්මෙ පස්සනෙ[3] පඤ්ඤා පච්චවෙක්ඛනෙ ඤාණං.'

**පච්චවෙක්ඛනඤාණනිද්දෙසො.**

## 15. වත්ථුනානත්තඤාණං.

කථං අජ්ඣත්තවවත්ථානෙ පඤ්ඤා වත්ථුනානත්තෙ ඤාණං:

කථං අජ්ඣත්තධම්මෙ[4] වවත්ථෙති:

චක්ඛුං අජ්ඣත්තං වවත්ථෙති, සොතං අජ්ඣත්තං වවත්ථෙති, ඝානං අජ්ඣත්තං වවත්ථෙති, ජිව්හං අජ්ඣත්තං වවත්ථෙති, කායං අජ්ඣත්තං වවත්ථෙති, මනං අජ්ඣත්තං වවත්ථෙති.

---

1. පටිපස්සද්ධට්ඨෙන - PTS.
2. තඤ්ඤාතට්ඨෙන - PTS.
3. විපස්සනෙ - PTS.

ස්‍රොතාපත්තිඵලක්‍ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටි තොමෝ ඒ ඵලක්‍ෂණයෙහි පහළවූ යැ .. (මාර්ගප්‍රයොගය නිෂ්ඨිත බැවින්) ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යර්ථයෙන් අනුත්පාදයෙහි ඥානය ඒ ඵලක්‍ෂණයෙහි සමුදාගත යැ, කත්තුකම්‍යතාඡන්ද තෙමේ මූලාර්ථයෙන් ඒ ඵලක්‍ෂණයෙහි සමුදාගත යැ, යොනිසොමනසිකාර තෙමේ (කුශලධර්මයන් උපදවන හෙයින්) සමුට්ඨානාර්ථයෙන් ඒ ඵලක්‍ෂණයෙහි සමුදාගත යැ, ස්පර්ශ තෙමේ සමවධානාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, වේදනා තොමෝ සමවසරණාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, සමාධි තෙමේ ප්‍රමුඛාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, ස්මෘති තොමෝ අධිපතිභාවාර්ථයෙන් ඒ ඵලක්‍ෂණයෙහි සමුදාගත යැ, ආර්යඵලප්‍රඥා තොමෝ ඒ කුශලධර්මයන්ට ශ්‍රෙෂ්ඨාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, ඵලවිමුක්ති තොමෝ සාරාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, අමතොගධ වූ නිර්වාණය පර්යවසානාර්ථයෙන් එකෙණෙහි සමුදාගත යැ, ඵලාවසානයෙහි නැඟිසිට මේ උක්තප්‍රකාරධර්මයෝ ඒ ඵලක්‍ෂණයෙහි පහළවූහ'යි ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි.

සකෘදාගාමිමාර්ගක්‍ෂණයෙහි ... සකෘදාගාමිඵලක්‍ෂණයෙහි ... අනාගාමිමාර්ගක්‍ෂණයෙහි ... අනාගාමිඵලක්‍ෂණයෙහි ... අර්හත්වමාර්ගක්‍ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටි තොමෝ ඒ මාර්ගක්‍ෂණයෙහි සමුදාගත යැ .. ක්ලෙශසමුච්ඡෙදනාර්ථයෙන් ක්‍ෂයඥානය ඒ මාර්ගක්‍ෂණයෙහි සමුදාගත යැ, කත්තුකම්‍යතාඡන්ද තෙමේ මූලාර්ථයෙන් ඒ මාර්ගක්‍ෂණයෙහි සමුදාගත යැ ... අමතොගධ වූ නිර්වාණය පර්යවසානාර්ථයෙන් ඒ මාර්ගක්‍ෂණයෙහි සමුදාගත යැ, ඵලාවසානයෙන් නැඟිසිට මේ උක්තප්‍රකාරධර්මයෝ ඒ මාර්ගක්‍ෂණයෙහි පහළවූවාහ'යි ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි.

අර්හත්වඵලක්‍ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටි තොමෝ ඒ ඵලක්‍ෂණයෙහි පහළවූ යැ ... (මාර්ගප්‍රයොගය නිෂ්ඨිත බැවින්) ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යර්ථයෙන් අනුත්පාදයෙහි ඥානය ඒ ඵලක්‍ෂණයෙහි සමුදාගත යැ, කත්තුකම්‍යතාඡන්ද තෙමේ මූලාර්ථයෙන් ඒ ඵලක්‍ෂණයෙහි සමුදාගත යැ ... අමතොගධ වූ නිර්වාණය පර්යවසානාර්ථයෙන් ඒ ඵලක්‍ෂණයෙහි සමුදාගත යැ, ඵලාවසානයෙන් නැඟිසිට මේ උක්තප්‍රකාරධර්මයෝ ඒ අර්හත්වඵලක්‍ෂණයෙහි පහළ වූවාහ'යි ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි.

ඒ ප්‍රත්‍යවෙක්‍ෂාඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **"තදා සමුදාගතෙ ධම්මෙ පස්සනෙ පඤ්ඤා පච්චවෙක්ඛණෙ ඤාණං"**යි.

**ප්‍රත්‍යවෙක්‍ෂාඥානනිර්දෙශ යි.**

## 15. වස්තුනානාත්වඥානය

කිසෙයින් අධ්‍යාත්මධර්මයන් පිරිසිඳ දැනීමෙහි ප්‍රඥාව වස්තුනානාත්වයෙහි (නානාවස්තුන්හි) ඥාන නම් වෙයි යත්:

කිසෙයින් අධ්‍යාත්මධර්මයන් පිරිසිඳ (නියම කොට) දනී ද යත්:

(සසම්භාර ප්‍රසාද සඞ්ඛ්‍යාත) අධ්‍යාත්ම චක්‍ෂුස නිශ්චය කෙරෙයි. (පිරිසිඳ දනී.) අධ්‍යාත්ම වූ ශ්‍රොත්‍රය නිශ්චය කෙරෙයි. අධ්‍යාත්ම වූ ඝ්‍රාණය නිශ්චය කෙරෙයි. අධ්‍යාත්ම වූ ජිහ්වාව නිශ්චය කෙරෙයි. අධ්‍යාත්ම වූ කාය නිශ්චය කෙරෙයි, අධ්‍යාත්ම වූ මනස නිශ්චය කෙරෙයි.

කථං චක්ඛුං අජ්ඣත්තං වවත්ථෙති: චක්ඛුං අවිජ්ජාසම්භූත'න්ති වවත්ථෙති, චක්ඛුං තණ්හාසම්භූත'න්ති වවත්ථෙති, චක්ඛුං කම්මසම්භූත'න්ති වවත්ථෙති, චක්ඛුං ආහාරසම්භූත'න්ති වවත්ථෙති, 'චක්ඛුං චතුන්නං මහාභූතානං උපාදායා'ති වවත්ථෙති, 'චක්ඛුං උප්පන්න'න්ති වවත්ථෙති, 'චක්ඛුං සමුදාගත'න්ති වවත්ථෙති, 'චක්ඛුං අහුත්වා සම්භූතං, හුත්වා න භවිස්සතී'ති වවත්ථෙති, චක්ඛුං අන්තවන්තතො වවත්ථෙති, චක්ඛුං අද්ධුවං අසස්සතං විපරිණාමධම්ම'න්ති වවත්ථෙති, 'චක්ඛුං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්ම'න්ති වවත්ථෙති.

චක්ඛුං අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො, දුක්ඛතො වවත්ථෙති, නො සුඛතො; අනත්තතො වවත්ථෙති, නො අත්තතො, නිබ්බින්දති, නො නන්දති, විරජ්ජති, නො රජ්ජති, නිරොධෙති, නො සමුදෙති: පටිනිස්සජ්ජති, නො ආදියති අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො වවත්ථෙන්තො අත්තසඤ්ඤං පජහති නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති එවං චක්ඛුං අජ්ඣත්තං වවත්ථෙති.

කථං සොතං අජ්ඣත්තං වවත්ථෙති: 'සොතං අවිජ්ජාසම්භූත'න්ති වවත්ථෙති, -පෙ- එවං සොතං අජ්ඣත්තං වවත්ථෙති.

කථං ඝානං අජ්ඣත්තං වවත්ථෙති ඝානං අවිජ්ජාසම්භූත'න්ති වවත්ථෙති, -පෙ- එවං ඝානං අජ්ඣත්තං වවත්ථෙති.

කථං ජිව්හං අජ්ඣත්තං වවත්ථෙති: 'ජිව්හා අවිජ්ජාසම්භූතා'ති වවත්ථෙති, 'ජිව්හා තණ්හාසම්භූතා'ති වවත්ථෙති, ජිව්හා කම්මසම්භූතා'ති වවත්ථෙති 'ජිව්හා ආහාරසම්භූතා'ති වවත්ථෙති, ජිව්හා චතුන්නං මහාභූතානං උපාදායා'ති වවත්ථෙති, 'ජිව්හා උප්පන්නා'ති වවත්ථෙති, 'ජිව්හා සමුදාගතා'ති වවත්ථෙති, 'ජිව්හා අහුත්වා සම්භූතා හුත්වා න භවිස්සතී'ති වවත්ථෙති, ජිව්හා අන්තවන්තතො වවත්ථෙති, ජිව්හා අද්ධුවා අසස්සතා විපරිණාමධම්මා'ති වවත්ථෙති, ජිව්හා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා'ති වවත්ථෙති.

1. අජ්ඣත්තං ධම්මං - ස්‍යා, PTS.

අධ්‍යාත්ම වූ චක්ෂුස කිසෙයින් නිශ්චය කෙරෙයි යත්: චක්ෂුස (ඇස) අවිද්‍යාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි, ඇස තෘෂ්ණාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. ඇස කර්මහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. ඇස ආහාරහෙතුයෙන් සම්භූත යැයි නිශ්චය කෙරෙයි, ඇස සතර මහාභූතයන් නිසා පැවැත්තැ'යි නිශ්චය කෙරෙයි ඇස (අධ්වා-වශයෙන් හෝ සන්තතිඛණවශයෙන් හෝ) උත්පන්න යයි නිශ්චය කෙරෙයි ඇස හෙතුයෙන් සමුත්ථිත යයි නිශ්චය කෙරෙයි, ඇස (උදයෙන් පෙර) නොතිබී හටගත. (ව්‍යයෙන් පසු) තිබී නොවන්නේ යයි නිශ්චය කෙරෙයි. ඇස අන්තවත් හෙයින් නිශ්චය කෙරෙයි. ඇස අස්ථිර යැ අශාශ්වත යැ (ජරාවෙන් හා මරණයෙන්) විපරිණාමස්වභාව යැයි නිශ්චය කෙරෙයි ඇස අනිත්‍ය යැ ප්‍රත්‍යයොත්පන්න යැ ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්‍ෂයවන ස්වභාව යැ නැසෙන ස්වභාව යැ විරාගස්වභාව යැ නිරුද්ධවන ස්වභාව යැයි නිශ්චය කෙරෙයි.

ඇස අනිත්‍යහෙයින් නිශ්චය කෙරෙයි, නිත්‍යහෙයින් නිශ්චය නො කෙරෙයි. දුඃඛහෙයින් නිශ්චය කෙරෙයි, සුඛහෙයින් නිශ්චය නො කෙරෙයි. අනාත්මහෙයින් නිශ්චය කෙරෙයි. ආත්මහෙයින් නිශ්චය නො කෙරෙයි. නිර්වේදයට පැමිණෙයි. සතුටු නොවෙයි. විරාගයට පැමිණෙයි. නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි නූපදවයි. දුරලයි ග්‍රහණය නො කෙරෙයි. අනිත්‍යහෙයින් නිශ්චය කරනුයේ නිත්‍යසංඥව දුරු කෙරෙයි, දුක්ඛහෙයින් නිශ්චය කරනුයේ සුඛසංඥව දුරු කෙරෙයි. අනාත්මහෙයින් නිශ්චය කරනුයේ ආත්මසංඥව දුරු කෙරෙයි උකටලී වනුයේ තෘෂ්ණාව දුරු කෙරෙයි. නො ඇලෙනුයේ රාගය දුරු කෙරෙයි නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි. දුරලනුයේ ආදානය දුරු කෙරෙයි. මෙසෙයින් අධ්‍යාත්ම වූ චක්ෂුස නිශ්චය කෙරේ.

කිසෙයින් අධ්‍යාත්ම වූ ශ්‍රොත්‍රය නිශ්චය කෙරෙයි යත්: ශ්‍රොත්‍රය අවිද්‍යාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි ... මෙසෙයින් අධ්‍යාත්ම වූ ශ්‍රොත්‍රය නිශ්චය කෙරේ.

කිසෙයින් අධ්‍යාත්ම වූ ඝ්‍රාණය නිශ්චය කෙරෙයි යත්: ඝ්‍රාණය අවිද්‍යාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි ... මෙසෙයින් අධ්‍යාත්ම වූ ඝ්‍රාණය නිශ්චය කෙරේ.

කිසෙයින් අධ්‍යාත්ම වූ ජිහ්වාව නිශ්චය කෙරෙයි යත්: ජිහ්වාව අවිද්‍යාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. දිව තෘෂ්ණාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. දිව කර්මහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. දිව ආහාරහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. දිව සතර මහාභූතයන් නිසා පැවැත්තැ'යි නිශ්චය කෙරෙයි. දිව (අද්ධාවශයෙන් හෝ සන්තති-ඛණවශයෙන් හෝ) උපනැ'යි නිශ්චය කෙරෙයි. දිව හෙතුයෙන් සමුත්ථිත යයි නිශ්චය කෙරෙයි. දිව (උදයෙන් පෙර) නො තිබී හටගත, (ව්‍යය-යෙන් පසු) තිබී නො වන්නේ යයි නිශ්චය කෙරෙයි. දිව අන්තවත් හෙයින් නිශ්චය කෙරෙයි. දිව අස්ථිර යැ අශාශ්වත යැ (ජරාවෙන් හා මරණයෙන්) විපරිණාමස්වභාව යැයි නිශ්චය කෙරෙයි. දිව අනිත්‍ය යැ ප්‍රත්‍යයොත්පන්න යැ ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්‍ෂයස්වභාව යැ ව්‍යයස්වභාව යැ විරාගස්වභාව යැ නිරොධස්වභාව යැයි නිශ්චය කෙරේ.

ජිව්හං අනිච්චතො වවත්ථෙති නො නිච්චතො, -පෙ- පටිනිස්සජ්ජති නො ආදියති. අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති, එවං ජිව්හං අජ්ඣත්තං වවත්ථෙති.

කථං කායං අජ්ඣත්තං වවත්ථෙති: 'කායො අවිජ්ජාසම්භූතො'ති වවත්ථෙති, කායො තණ්හාසම්භූතො'ති වවත්ථෙති, 'කායො කම්මසම්භූතො'ති වවත්ථෙති, 'කායො ආහාරසම්භූතො'ති වවත්ථෙති, කායො චතුන්නං මහාභූතානං උපාදාය'ති වවත්ථෙති, කායො උප්පන්නො'ති වවත්ථෙති, කායො සමුදාගතො'ති වවත්ථෙති, කායො අහුත්වා සම්භූතො, හුත්වා න භවිස්සතී'ති වවත්ථෙති, කායං අන්තවන්තතො වවත්ථෙති, 'කායො අද්ධුවො අසස්සතො විපරිනාමධම්මො'ති වවත්ථෙති, කායො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො ඛයධම්මො වයධම්මො නිරොධධම්මො'ති වවත්ථෙති, කායං අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො; දුක්ඛතො වවත්ථෙති, නො සුඛතො -පෙ- පටිනිස්සජ්ජති, නො ආදියති, අනිච්චතො වවත්ථෙන්තො, නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති, එවං කායං අජ්ඣත්තං වවත්ථෙති.

කථං මනං අජ්ඣත්තං වවත්ථෙති, 'මනො අවිජ්ජාසම්භූතො,ති වවත්ථෙති, මනො තණ්හාසම්භූතොති වවත්ථෙති, මනො කම්මසම්භූතො'ති වවත්ථෙති, මනො ආහාරසම්භූතො'ති වවත්ථෙති, මනො උප්පන්නො'ති වවත්ථෙති, මනො සමුදාගතො'ති වවත්ථෙති, 'මනො අහුත්වා සම්භූතො, හුත්වා න භවිස්සතී'ති වවත්ථෙති, මනං අන්තවන්තතො වවත්ථෙති, මනො අද්ධුවො අසස්සතො විපරිනාමධම්මො'ති වවත්ථෙති, 'මනො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො ඛයධම්මො වයධම්මො විරාගධම්මො නිරොධධම්මො'ති වවත්ථෙති. මනං අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො; දුක්ඛතො වවත්ථෙති නො සුඛතො, අනත්තතො වවත්ථෙති, නො අත්තතො, නිබ්බින්දති, නො නන්දති; විරජ්ජති, නො රජ්ජති; නිරොධෙති, නො සමුදෙති; පටිනිස්සජ්ජති, නො ආදියති. අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො වවත්ථෙන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති, එවං මනං අජ්ඣත්තං වවත්ථෙති, එවං අජ්ඣත්තධම්මෙ[1] වවත්ථෙති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා තෙන වුච්චති: 'අජ්ඣත්තවවත්ථානෙ පඤ්ඤා වත්ථුනානත්තෙ ඤාණං'

**වත්ථුනානත්තඤාණනිද්දෙසො.**

[1] අජ්ඣත්තං ධම්මෙ - සෑ PTS.

දිව අනිත්‍ය හෙයින් නිශ්චය කෙරෙයි. නිත්‍ය හෙයින් නිශ්චය නො කෙරෙයි ... දුරුලයි. ආදානය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් නිශ්චය කරනුයේ නිත්‍යසංඥාව දුරුලයි ... දුරුලනුයේ ආදානය හැරපියයි. මෙසෙයින් අධ්‍යාත්ම වූ ජිහ්වාව නිශ්චය කෙරේ.

කිසෙයින් අධ්‍යාත්ම වූ කාය නිශ්චය කෙරෙයි යත්: කාය අවිද්‍යාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. කාය තෘෂ්ණාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. කාය කර්මහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි කාය ආහාරහෙතුයෙන් සම්භූත යැයි නිශ්චය කෙරෙයි කාය සතර මහාභූතයන් නිසා පැවැත්තැ' යි නිශ්චය කෙරෙයි කාය (අධ්වා වශයෙන් හෝ සන්තති-ඛණ වශයෙන් හෝ උත්පන්න යැයි නිශ්චය කෙරෙයි. කාය හෙතුයෙන් සමුත්ථිත යැයි නිශ්චය කෙරෙයි කාය (උදයෙන් පෙර) නො තිබී හටගත (ව්‍යයයෙන් පසු) තිබී නොවන්නේ යයි නිශ්චය කෙරෙයි කාය අනන්තවත් හෙයින් නිශ්චය කෙරෙයි. කාය අස්ථිර යැ අශාශ්වත යැ විපරිණාමස්වභාව යැයි නිශ්චය කෙරෙයි. කාය අනිත්‍ය යැ ප්‍රත්‍යයෙන් උපන. ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්ෂය වන ස්වභාව යැ නැසෙන පියවි ඇත්තේ යැ නිරුද්ධ වන පියවි ඇත්තේ යැයි නිශ්චය කෙරෙයි. කාය අනිත්‍ය හෙයින් නිශ්චය කෙරෙයි. නිත්‍ය හෙයින් නිශ්චය නො කෙරෙයි. දුඃඛ හෙයින් නිශ්චය කෙරෙයි. සුඛ හෙයින් නිශ්චය නො කෙරෙයි. ... දුරුලයි. ග්‍රහණය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් නිශ්චය කරනුයේ නිත්‍යසංඥාව දුරුලයි. දුඃඛ හෙයින් නිශ්චය කරනුයේ සුඛසංඥාව දුරුලයි. ... හැරපියනුයේ ආදානය දුරුලයි. මෙසෙයින් අධ්‍යාත්ම වූ කාය නිශ්චය කෙරේ

කිසෙයින් අධ්‍යාත්ම වූ මනස නිශ්චය කෙරෙයි යත්: (භවාඞ්ග) මනස අවිද්‍යාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. මනස තෘෂ්ණාහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. මනස කර්මහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. මනස ආහාරහෙතුයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. මනස (අධ්වාසන්තති විසින්) උත්පන්න යයි නිශ්චය කෙරෙයි. මනස ප්‍රත්‍යයෙන් උපනැ'යි නිශ්චය කෙරෙයි. මනස (උදයෙන් පෙර) නො තිබී හටගත, (ව්‍යයයෙන් පසු) තිබී නො වන්නේ යයි නිශ්චය කෙරෙයි. මනස අනන්තවත් යයි නිශ්චය කෙරෙයි. මනස අස්ථිර යැ අශාශ්වත යැ විපරිණාම ස්වභාව යයි නිශ්චය කෙරෙයි. මනස අනිත්‍ය යැ සඞ්ඛත යැ ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්ෂයස්වභාව යැ ව්‍යයස්වභාව යැ විරාගස්වභාව යැ නිරොධ ස්වභාව යයි නිශ්චය කෙරෙයි. මනස අනිත්‍ය හෙයින් නිශ්චය කෙරෙයි. නිත්‍ය හෙයින් නිශ්චය නො කෙරෙයි. දුඃඛ හෙයින් නිශ්චය කෙරෙයි, සුඛ හෙයින් නිශ්චය නො කෙරෙයි. අනාත්ම හෙයින් නිශ්චය කෙරෙයි, ආත්ම හෙයින් නිශ්චය නො කෙරෙයි. උකටලීවෙයි, සතුටු නො වෙයි. විරාගයට පැමිණෙයි, නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි, නූපදවයි දුරුලයි, ග්‍රහණය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් නිශ්චය කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි දුඃඛ හෙයින් නිශ්චය කරනුයේ සුඛසංඥාව දුරු කෙරෙයි. අනාත්ම හෙයින් නිශ්චය කරනුයේ ආත්මසංඥාව දුරු කෙරෙයි. නිර්වේදයට පැමිණෙනුයේ තෘෂ්ණාව දුරු කෙරෙයි. නො ඇලෙනුයේ රාගය දුරු කෙරෙයි. නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි. දුරුලනුයේ ආදානය දුරු කෙරෙයි. මෙසෙයින් අධ්‍යාත්ම වූ මනස නිශ්චය කෙරෙයි, මෙසේ අධ්‍යාත්මධර්මයන් නිශ්චය කෙරේ.

ඒ වස්තුනානාත්වඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි '**අජ්ඣත්තවවත්ථානෙ පඤ්ඤා වත්ථුනානත්තෙ ඤාණං**' යි.

**වත්ථුනානත්තඤාණනිද්දෙස යි.**

## 16. ගොචරනානත්තඤාණං

කථං බහිද්ධා වවත්ථානෙ පඤ්ඤා ගොචරනානත්තෙ ඤාණං.

කථං බහිද්ධා ධම්මෙ වවත්ථෙති: රූපෙ බහිද්ධා වවත්ථෙති, සද්දෙ බහිද්ධා වවත්ථෙති, ගන්ධෙ බහිද්ධා වවත්ථෙති, රසෙ බහිද්ධා වවත්ථෙති, ඵොට්ඨබ්බෙ බහිද්ධා වවත්ථෙති, ධම්මෙ බහිද්ධා වවත්ථෙති.

කථං රූපෙ බහිද්ධා වවත්ථෙති, රූපා අවිජ්ජාසම්භූතා'ති වවත්ථෙති, රූපා තණ්හා සම්භූතා'ති වවත්ථෙති, 'රූපා කම්මසම්භූතා'ති වවත්ථෙති, 'රූපා ආහාරසම්භූතා'ති වවත්ථෙති, රූපා චතුන්නං මහාභූතානං උපාදායා'ති වවත්ථෙති, 'රූපා උප්පන්නා'ති වවත්ථෙති, 'රූපා සමුදාගතා'ති වවත්ථෙති, රූපා අහුත්වා සම්භූතා හුත්වා න භවිස්සන්තී'ති වවත්ථෙති, රූපෙ අන්තවන්තතො වවත්ථෙති, 'රූපා අද්ධුවා අසස්සතා විපරිණාමධම්මා'ති වවත්ථෙති, 'රූපා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා'ති වවත්ථෙති,

රූපෙ අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො, දුක්ඛතො වවත්ථෙති, නො සුඛතො, අනත්තතො වවත්ථෙති, නො අත්තතො, නිබ්බින්දති, නො නන්දති, විරජ්ජති, නො රජ්ජති; නිරොධෙති, නො සමුදෙති; පටිනිස්සජ්ජති නො ආදියති, අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං ජහති, අනත්තතො වවත්ථෙන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. එවං රූපෙ බහිද්ධා වවත්ථෙති.

කථං සද්දෙ බහිද්ධා වවත්ථෙති *සද්දා චතුන්නං මහාභූතානං උපාදායාති, වවත්ථෙති, 'සද්දා උප්පන්නා'ති වවත්ථෙති, සද්දා සමුදාගතා'ති වවත්ථෙති, 'සද්දා අහුත්වා සම්භූතා, හුත්වා න භවිස්සන්තීති වවත්ථෙති, සද්දෙ අන්තවන්තතො වවත්ථෙති, 'සද්දා අද්ධුවා අසස්සතා විපරිණාමධම්මා'ති වවත්ථෙති, සද්දා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා'ති වවත්ථෙති.

සද්දෙ අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො, –පෙ– එවං සද්දෙ බහිද්ධා වවත්ථෙති.

---

*සද්දා අවිජ්ජාසම්භූතා'ති වවත්ථෙති -පෙ-" ඉති මජසං, සයා සී, PTS. පොත්ථකෙසු දිස්සති, තං පන පාළියා න සමෙති, සද්දස්ස උතුචිත්තසමුට්ඨානත්තා, අට්ඨකථායපි අවිජ්ජාසම්භූතාදි චතුක්කං න වුත්ත'න්ති වුත්තං.

# 16. ගොචරනානත්වඥානය

කිසෙයින් බාහිරවිෂයයන් පිරිසිඳදැනීමේ ප්‍රඥාව ගොචරනානත්වඥාන වෙයි යත්:

කිසෙයින් බාහිරධර්මයන් නිශ්චය කෙරෙයි යත්: අධ්‍යාත්මයෙන් බාහිර වූ රූපායතනධර්මයන් නිශ්චය කෙරෙයි. බාහිර වූ ශබ්දායතනධර්මයන් නිශ්චය කෙරෙයි. බාහිර වූ ගන්ධායතනධර්මයන් නිශ්චය කෙරෙයි. බාහිර වූ රසායතනධර්මයන් නිශ්චය කෙරෙයි. බාහිර වූ ස්ප්‍රෂ්ටව්‍යධර්මයන් නිශ්චය කෙරෙයි. (භවාඞ්ගමනස්සම්ප්‍රයුක්ත) වූ බාහිර ධර්මායතනපර්යාපන්න-ධර්මයන් නිශ්චය කෙරේ.

කිසෙයින් බාහිරරූපයන් නිශ්චය කෙරෙයි යත්: රූපායතනධර්මයෝ අවිද්‍යාහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ තෘෂ්ණාහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ කර්මහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ ආහාරහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ සතර මහාභූතයන් නිසා පවත්නාහ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ (අද්ධාවශයෙන් සන්තතිඛණ වශයෙන්) උපන්හ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ හෙතුයෙන් හටගත්තාහ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ (උදයෙන් පෙර) නො තිබී උපන්නාහ. (ව්‍යයයෙන් මත්තෙහි) තිබී නො වන්නාහ'යි නිශ්චය කෙරෙයි. රූපයන් අන්තවත් හෙයින් නිශ්චය කෙරෙයි, රූපයෝ අස්ථිරයහ, අශාශ්වතයහ, විපරිණාමස්වභාවයහ'යි නිශ්චය කෙරෙයි. රූපයෝ අනිත්‍යයහ ප්‍රත්‍යයොත්පන්නයහ ප්‍රතීත්‍යසමුත්පන්නයහ ක්ෂය-ස්වභාවයහ ව්‍යයස්වභාවයහ විරාගස්වභාවයහ නිරොධස්වභාවයහ'යි නිශ්චය කෙරේ.

රූපායතනධර්මයන් අනිත්‍ය හෙයින් නිශ්චය කෙරෙයි, නිත්‍ය හෙයින් නිශ්චය නො කෙරෙයි. දුඃඛ හෙයින් නිශ්චය කෙරෙයි, සුඛ හෙයින් නිශ්චය නො කෙරෙයි. අනාත්ම හෙයින් නිශ්චය කෙරෙයි, ආත්ම හෙයින් නිශ්චය නො කෙරෙයි. උකටලී වෙයි, සතුටු නො වෙයි. විරාගයට පැමිණෙයි, නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි, නූපදවයි. දුරු කෙරෙයි, ග්‍රහණය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් නිශ්චය කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි. දුඃඛ හෙයින් නිශ්චය කරනුයේ සුඛසංඥාව දුරු කෙරෙයි. අනාත්ම හෙයින් නිශ්චය කරනුයේ ආත්මසංඥාව දුරු කෙරෙයි. උකටලි වනුයේ තෘෂ්ණාව දුරු කෙරෙයි. නො ඇලෙනුයේ රාගය දුරු කෙරෙයි. නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි. දුරුලනුයේ ආදානය දුරු කෙරෙයි. මෙසෙයින් බාහිරරූපායතනධර්මයන් නිශ්චය කෙරේ.

කිසෙයින් බාහිර ශබ්දායතනධර්මයන් නිශ්චය කෙරෙයි යත්: ශබ්දයෝ සතර මහාභූතයන් නිසා පවත්නාහ'යි නිශ්චය කෙරෙයි. ශබ්දයෝ (අද්ධාවශයෙන් ඛණසන්තති වශයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි. ශබ්දයෝ හෙතුයෙන් හටගත්තාහ' යි නිශ්චය කෙරෙයි. ශබ්දයෝ (උදයෙන් පෙර) නොතිබී උපන්නාහ. (ව්‍යයයෙන් මත්තෙහි) තිබී නො වන්නාහ'යි නිශ්චය කෙරෙයි. ශබ්දායතන ධර්මයන් අන්තවත් හෙයින් නිශ්චය කෙරෙයි. ශබ්දයෝ අස්ථිරයහ අශාශ්වතයහ විපරිණාමස්වභාවයහ'යි නිශ්චය කෙරෙයි. ශබ්දයෝ අනිත්‍යයහ ප්‍රත්‍යයොත්පන්නයහ ප්‍රතීත්‍යසමුත්පන්නයහ ක්ෂයස්වභාවයහ ව්‍යයස්වභාවයහ විරාගස්වභාවයහ නිරොධස්වභාවයහ'යි නිශ්චය කෙරෙයි. ශබ්දයන් අනිත්‍ය හෙයින් නිශ්චය කෙරෙයි, නිත්‍ය හෙයින් නිශ්චය නො කෙරෙයි ... මෙසෙයින් බාහිර වූ ශබ්දායතනධර්ම-යන් නිශ්චය කෙරේ.

කථං ගන්ධෙ බහිද්ධා වවත්ථෙති: ‘ගන්ධා අවිජ්ජාසම්භූතා’ති වවත්ථෙති, ‘ගන්ධා තණ්හාසම්භූතා’ති වවත්ථෙති, –පෙ– එවං ගන්ධෙ බහිද්ධා වවත්ථෙති.

කථං රසෙ බහිද්ධා වවත්ථෙති: ‘රසා අවිජ්ජාසම්භූතා’ති වවත්ථෙති ‘රසා තණ්හාසම්භූතාති වවත්ථෙති, –පෙ– එවං රසෙ බහිද්ධා වවත්ථෙති.

කථං ඵොට්ඨබ්බෙ බහිද්ධා වවත්ථෙති: ‘ඵොට්ඨබ්බා අවිජ්ජාසම්භූතා’ති වවත්ථෙති: ඵොට්ඨබ්බා තණ්හාසම්භූතාති වවත්ථෙති, ‘ඵොට්ඨබ්බා කම්ම–සම්භූතා’ති වවත්ථෙති, ඵොට්ඨබ්බා ආහාරසම්භූතාති, වවත්ථෙති, ඵොට්ඨබ්බා උප්පන්නා’ති වවත්ථෙති, ඵොට්ඨබ්බා සමුදාගතාති වවත්ථෙති –පෙ– එවං ඵොට්ඨබ්බෙ බහිද්ධා වවත්ථෙති.

කථං ධම්මෙ බහිද්ධා වවත්ථෙති: ‘ධම්මා අවිජ්ජාසම්භූතා’ති වවත්ථෙති, ‘ධම්මා තණ්හාසම්භූතා’ති වවත්ථෙති ධම්මා කම්ම සම්භූතාති වවත්ථෙති, ධම්මා ආහාරසම්භූති’ති වවත්ථෙති, ධම්මා චතුන්නං මහාභූතානං උපාදායා’ති වවත්ථෙති,* ධම්මා උප්පන්නා’ති, වවත්ථෙති, ධම්මා සමුදාගතා’ති වවත්ථෙති, ‘ධම්මා අහුත්වා සම්භූතාති, හුත්වා න භවිස්සන්තී’ති වවත්ථෙති, ධම්මෙ අන්තවන්තතො වවත්ථෙති, ධම්මා අද්ධුවා අසස්සතා විපරිනාමධම්මා’ති වවත්ථෙති, ධම්මා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා’ති වවත්ථෙති.

ධම්මෙ අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො; දුක්ඛතො වවතෙති නො සුඛතො; අනත්තතො වවත්ථෙති, නො අත්තතො, නිබ්බින්දති, නො නන්දති, විරජ්ජති, නො රජ්ජති, නිරොධෙති නො සමුදෙති; පටිනිස්සජ්ජති නො ආදියති, -පෙ– අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛ–තො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො වවත්ථෙන්තො අත්ත–සඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. එවං ධම්මෙ බහිද්ධා වවත්ථෙති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: ‘බහිද්ධා වවත්ථානෙ පඤ්ඤා ගොචරනානත්තෙ ඤාණං’

### ගොචරනානත්තඤාණනිද්දෙසො

* චතුන්නං මහාභූතානං උපාදායාති පදං – ස්‍යා මජ්ඣං පොත්ථකෙසු ච කෙසුචි සීහල පොත්ථකෙසු ච න ගහිතං

කිසෙයින් බාහිර වූ ගන්ධායතනධර්මයන් නිශ්චය කෙරෙයි යත්: ගන්ධයෝ අවිද්‍යාහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි ගන්ධයෝ තෘෂ්ණා හෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි ... මෙසෙයින් බාහිර වූ ගන්ධායතනධර්මයන් නිශ්චය කෙරේ.

කිසෙයින් බාහිර වූ රසායතනධර්මයන් නිශ්චය කෙරෙයි යත්: රසයෝ අවිද්‍යාහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි රසයෝ තෘෂ්ණා හෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි ... මෙසෙයින් බාහිර වූ රසායතනධර්මයන් නිශ්චය කෙරේ.

කිසෙයින් බාහිර වූ ස්ප්‍රෂ්ටව්‍යධර්මයන් නිශ්චය කෙරෙයි යත් ස්ප්‍රෂ්ටව්‍යායතනධර්මයෝ අවිද්‍යාහෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි ස්ප්‍රෂ්ටව්‍යයෝ තෘෂ්ණාහෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි ස්ප්‍රෂ්ටව්‍යයෝ කර්මහෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි. ස්ප්‍රෂ්ටව්‍යයෝ ආහාර හෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි ස්ප්‍රෂ්ටව්‍යයෝ (අද්ධා වශයෙන් ඛණසන්තති වශයෙන්) උපන්නාහ'යි නිශ්චය කෙරෙයි ස්ප්‍රෂ්ටව්‍යයෝ හෙතුයෙන් හටගත්තාහ'යි නිශ්චය කෙරෙයි ... මෙසෙයින් බාහිර වූ ස්ප්‍රෂ්ටව්‍යායතනධර්මයන් නිශ්චය කෙරේ.

කිසෙයින් ධර්මායතනපර්‍ය්‍යාපන්නධර්මයන් නිශ්චය කෙරෙයි යත්: ධර්මයෝ අවිද්‍යාහෙතුයෙන් උපන්හ'යි නිශ්චය කෙරෙයි ධර්මයෝ තෘෂ්ණා-හෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ කර්මහෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ ආහාරහෙතුයෙන් උපන්නාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ සතර මහාභූතයන් නිසා පවත්නාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ (අද්ධා වශයෙන් ඛණසන්තති වශයෙන්) උපන්නාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ හෙතුයෙන් හටගත්තාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ (උදයෙන් පෙර) නොතිබී උපන්නාහ, තිබී (ව්‍යයෙන් මත්තෙහි) නොවත්නාහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයන් අනනවත් හෙයින් නිශ්චය කෙරෙයි. ධර්මයෝ අස්ථිරයහ අශාශ්වතයහ. විපරිණාමස්වභාවයහ'යි නිශ්චය කෙරෙයි. ධර්මයෝ අනිත්‍යයහ. ප්‍රත්‍යයොත්පන්නයහ. ප්‍රතීත්‍ය-සමුත්පන්නයහ.. ක්ෂයස්වභාවයහ. ව්‍යයස්වභාවයහ. විරාගස්වභාවයහ නිරොධස්වභාවයහ'යි නිශ්චය කෙරෙයි.

ධර්මයන් අනිත්‍ය හෙයින් නිශ්චය කෙරෙයි, නිත්‍ය හෙයින් නිශ්චය නො කෙරෙයි දුඃඛ හෙයින් නිශ්චය කෙරෙයි. සුඛ හෙයින් නිශ්චය නො කෙරෙයි. අනාත්ම හෙයින් නිශ්චය කෙරෙයි. ආත්ම හෙයින් නිශ්චය නො කෙරෙයි. උකටලී වෙයි. සතුටු නො වෙයි. විරාගයට පැමිණෙයි, නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි. නූපදවයි. දුරලයි. ග්‍රහණය නො කෙරෙයි. ... අනිත්‍ය හෙයින් නිශ්චය කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි. දුඃඛ හෙයින් නිශ්චය කරනුයේ සුඛසංඥාව දුරු කෙරෙයි. අනාත්ම හෙයින් නිශ්චය කරනුයේ ආත්මසංඥාව දුරු කෙරෙයි. උකටලී වනුයේ තෘෂ්ණාව දුරු කෙරෙයි. විරාගයට පැමිණෙනුයේ රාගය දුරු කෙරෙයි. නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි. දුරලනුයේ ආදානය දුරු කෙරෙයි. මෙසෙයින් බාහිර වූ ධර්මායතනපර්‍ය්‍යාපන්නධර්මයන් නිශ්චය කෙරේ.

ඒ ගොචරඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'බහිද්ධා වවත්‍ථානෙ පඤ්ඤා ගොචරනානත්තෙ ඤාණං'යි.

**ගොචරනානත්වඥාන නිර්දේශ යි.**

# 17. චරියානානත්තඤාණං

කථං චරියාවවත්ථානෙ පඤ්ඤා චරියානානත්තෙ ඤාණං.

චරියාති තිස්සො චරියායො: විඤ්ඤාණචරියා, අඤ්ඤාණචරියා. ඤාණචරියා.

කතමා විඤ්ඤාණචරියා:[1]

රූපෙසු දස්සනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා* රූපෙසු දස්සනත්ථො චක්ඛුවිඤ්ඤාණං විඤ්ඤාණචරියා, රූපෙසු දිට්ඨත්තා අභිනිරොපනා විපාකමනොධාතු විඤ්ඤාණචරියා, රූපෙසු අභිනිරොපිතත්තා විපාකමනො විඤ්ඤාණධාතු විඤ්ඤාණචරියා.

සද්දෙසු සවනත්ථාය ආජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, සද්දෙසු සවනත්ථො සොතවිඤ්ඤාණං විඤ්ඤාණචරියා, සද්දෙසු සුතත්තා අභිනිරොපනා[2] විපාක මනොධාතු විඤ්ඤාණචරියා, සද්දෙසු අභිනිරොපිතත්තා විපාක මනොවිඤ්ඤාණධාතු විඤ්ඤාණචරියා.

ගන්ධෙසු ඝායනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, ගන්ධෙසු ඝායනත්ථො ඝානවිඤ්ඤාණං විඤ්ඤාණචරියා, ගන්ධෙසු ඝායිතත්තා අභිනිරොපනා විපාකමනොධාතු විඤ්ඤාණචරියා, ගන්ධෙසු අභිනිරොපිතත්තා විපාකමනොවිඤ්ඤාණධාතු විඤ්ඤාණචරියා.

රසෙසු සායනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, රසෙසු සායනත්ථො ජිව්හාවිඤ්ඤාණං විඤ්ඤාණචරියා, රසෙසු සායිතත්තා අභිනිරොපනා විපාකමනොධාතු විඤ්ඤාණචරියා, රසෙසු අභිනිරොපිතත්තා විපකමනො විඤ්ඤාණධාතු විඤ්ඤාණචරියා.

ඵොට්ඨබ්බෙසු ඵුසනත්ථාය[3] ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, ඵොට්ඨබ්බෙසු ඵුසනත්ථො කායවිඤ්ඤාණං විඤ්ඤාණචරියා, ඵොට්ඨබ්බෙසු ඵුට්ඨත්තා අභිනිරොපනා විපාකමනොධාතු විඤ්ඤාණචරියා, ඵොට්ඨබ්බෙසු අභිනිරොපිතත්තා විපාකමනොවිඤ්ඤාණධාතු විඤ්ඤාණචරියා.

ධම්මෙසු විජානනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, ධම්මෙසු විජානනත්ථො මනොවිඤ්ඤාණං විඤ්ඤාණචරියා, ධම්මෙසු විඤ්ඤාතත්තා අභිනිරොපනා විපාකමනොධාතු විඤ්ඤාණචරියා, ධම්මෙසු අභිනිරොපිතත්තා විපාකමනොවිඤ්ඤාණධාතු විඤ්ඤාණචරියා.

---

1. කතමං විඤ්ඤාණචරියං - සී 1,
2. අභිරොපනා - ස්‍යා,
3 ඵුස්සනත්ථාය - PTS,
* 'රූපෙසු' ආදීනි සත්තම්‍යන්තපදානි සබ්බත්ථ වාක්‍යතො පයුත්තානි මජ්ඣං පොත්ථකෙ,

# 17. චර්යානානාත්වඥානය

**කිසෙයින් චර්යාවන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව චර්යානානාත්වඥාන වෙයි යත්:**

**චර්යා යනු චර්යා තුනෙකි: විඥානචර්යා යැ අඥානචර්යා යැ ඥානචර්යා යි.**

**විඥානචර්යා කවර යත්:**

රූපවිෂයෙහි රූපදර්ශනය සඳහා පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතය විඥානචර්යා යැ, රූපවිෂයෙහි දර්ශනය මැ අර්ථ කොට ඇති (කුශලවිපාක වූ හෝ අකුශලවිපාක වූ හෝ) චක්ෂුර්විඥානය විඥානචර්යා යැ, රූපවිෂයෙහි (චක්ෂුර්විඥානයෙන් රූපාලම්බනය) දුටු බැවින් පැවැති අරමුණට නගන කුශලාකුශලවිපාකසම්පටිච්ඡනමනොධාතුව විඥානචර්යා යැ, රූපවිෂයෙහි අරමුණට නැඟුණු බැවින් කුශලාකුශලවිපාක වූ සන්තීරණමනොවිඥානධාතුව විඥානචර්යා යි.

ශබ්දාලම්බනයෙහි ශ්‍රවණය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතය විඥානචර්යා යැ, ශබ්දාලම්බනයෙහි ශ්‍රවණය මැ අර්ථ කොට ඇති (කුශලාකුශල විපාක) ශ්‍රොත්‍රවිඥානය විඥානචර්යා යැ, ශබ්දාලම්බනයෙහි (ශ්‍රොත්‍රවිඥානයෙන් ශබ්දාලම්බනය) අසනලද බැවින් අරමුණට නගන කුශලාකුශලවිපාක වූ සම්පටිච්ඡනමනොධාතුව විඥානචර්යා යැ. ශබ්දාලම්බනයෙහි අරමුණට නැඟුණු බැවින් කුශලාකුශලවිපාක වූ සන්තීරණමනොවිඥානධාතුව විඥානචර්යා යි.

ගන්ධාලම්බනයෙහි ආඝ්‍රාණය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතය විඥානචර්යා යැ, ගන්ධාලම්බනයෙහි ආඝ්‍රාණය මැ අර්ථ කොට ඇති (කුශලාකුශලවිපාක) ඝ්‍රාණවිඥානය විඥානචර්යා යැ, ගන්ධාලම්බනයෙහි (ඝ්‍රාණවිඥානයෙන් ගන්ධාලම්බනය) ආඝ්‍රාණය කළ බැවින් අරමුණට නගන කුශලාකුශලවිපාක වූ සම්පටිච්ඡනමනොධාතුව විඥානචර්යා යැ, ගන්ධාලම්බනයෙහි අරමුණට නැඟුණු බැවින් කුශලාකුශලවිපාක වූ සන්තීරණමනොවිඥානධාතුව විඥානචර්යා යි.

රසාලම්බනයෙහි රසවිඳීම පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතය විඥානචර්යා යැ, රසාලම්බනයෙහි රසවිඳීම මැ අර්ථ කොට ඇති (කුශලාකුශලවිපාක) ජිහ්වාවිඥානය විඥානචර්යා යැ, රසාලම්බනයෙහි (ජිහ්වාවිඥානයෙන් රසාලම්බනය) විඳිනාලද බැවින් අරමුණට නගන කුශලාකුශල විපාක වූ සම්පටිච්ඡනමනොධාතුව විඥානචර්යා යැ. රසාලම්බනයෙහි අරමුණට නැඟුණු බැවින් කුශලාකුශලවිපාක වූ සන්තීරණමනොවිඥානධාතුව විඥානචර්යා යි.

ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි ස්පර්ශය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතය විඥානචර්යා යැ, ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි ස්පර්ශය මැ අර්ථ කොට ඇති (කුශලාකුශලවිපාක) ජිහ්වාවිඥානය විඥානචර්යා යැ. ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි (කායවිඥානයෙන් ස්ප්‍රෂ්ටව්‍යාලම්බනය) ස්පර්ශ කරනලද බැවින් අරමුණට නගන කුශලාකුශලවිපාක වූ සම්පටිච්ඡනමනොධාතුව විඥානචර්යා යැ. ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි අරමුණට නැඟුණු බැවින් කුශලාකුශලවිපාක වූ සන්තීරණමනොවිඥානධාතුව විඥානචර්යා යි.

ධර්මාලම්බනයෙහි විජානනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතය විඥානචර්යා යැ. ධර්මාලම්බනයෙහි ආලම්බනය දැනගැනීම මැ අර්ථ කොට ඇති මනොවිඥානය විඥානචර්යා යැ. ධර්මාලම්බනයෙහි (මනොවිඥානයෙන් ධර්මාලම්බනය) දන්නා ලද බැවින් අරමුණට නගන විපාකමනොධාතුව විඥානචර්යා යැ ධර්මාලම්බනයෙහි අභිනිරොපිත බැවින් විපාකමනොවිඥාන ධාතුව විඥානචර්යා යි.

විඤ්ඤාණධාතු තෙනට්ඨෙන විඤ්ඤාණචරියා.

නීරාගා[1] චරතීති විඤ්ඤාණචරියා, නිද්දොසා[2] චරතීති විඤ්ඤාණචරියා නිම්මොහා[3] චරතීති විඤ්ඤාණචරියා, නිම්මානා[4] චරතීති විඤ්ඤාණචරියා, නිද්දිට්ඨි[5] චරතීති විඤ්ඤාණචරියා, නිරුද්ධච්චා[6] චරතීති විඤ්ඤාණචරියා, නිබ්බිචිකිච්ඡා[7] චරතීති විඤ්ඤාණචරියා, නානුසයා චරතීති විඤ්ඤාණචරියා, රාගවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, දොසවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, මොහවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, මානවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, දිට්ඨිවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, උද්ධච්චවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, විචිකිච්ඡාවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, අනුසයවිප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, කුසලෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤාණචරියා, අකුසලෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, සාවජ්ජෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, අනවජ්ජෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, කණ්හෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, සුක්කෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, සුඛුද්‍රයෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, දුක්ඛුද්‍රයෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා සුඛවිපාකෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, දුක්ඛවිපාකෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති විඤ්ඤාණචරියා, විඤ්ඤාතෙ[8] චරතීති විඤ්ඤාණචරියා විඤ්ඤාණස්ස එවරූපා චරියා හොතීති විඤ්ඤාණචරියා, පකතිපරිසුද්ධමිදං චිත්තං නික්කිලෙසට්ඨෙනාති විඤ්ඤාණචරියා, අයං විඤ්ඤාණචරියා.

කතමා අඤ්ඤාණචරියා:[9]

මනාපියෙසු[10] රූපෙසු රාගස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, රාගස්ස ජවනා අඤ්ඤාණචරියා අමනාපියෙසු රූපෙසු දොසස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, දොසස්ස ජවනා අඤ්ඤාණචරියා, තදුභයෙන[11] අසමපෙක්ඛනස්මිං වත්ථුස්මිං මොහස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, මොහස්ස ජවනා අඤ්ඤාණචරියා, විනිබද්ධස්ස මානස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, මානස්ස ජවනා අඤ්ඤාණචරියා, පරාමට්ඨාය[12] දිට්ඨියා ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, දිට්ඨියා ජවනා අඤ්ඤාණචරියා, වික්ඛෙපගතස්ස උද්ධච්චස්ස ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, උද්ධච්චස්ස ජවනා අඤ්ඤාණචරියා, අනිට්ඨඞ්ගතාය[13] විචිකිච්ඡාය ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, විචිකිච්ඡාය ජවනා අඤ්ඤාණචරියා, ථාමගතස්ස අනුසයස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, අනුසයස්ස ජවනා අඤ්ඤාණචරියා.

---

1. නිරාගා-පු, මජසං, ස්‍යා PTS, නිරාගං සී.1, 2. නිද්දොසා - PTS. නිද්දොසං - සී 1
3. නිම්මොහා - PTS, නිම්මොහං - සී 1 4. නිම්මානා - PTS, නිම්මානං - සී 1
5. නිද්දිට්ඨි - PTS, සී 1 6. නිමුද්ධච්චා-ස්‍යා, නිරුද්ධච්චා - සී1. 7. නිබ්බිචිකිච්ඡා - PTS, සී 1
8. විඤ්ඤාණෙ - PTS, 9. අඤ්ඤාණ චරියා-සී. 1 10 මනාපිකෙසු- ස.
11 තදුභයෙ - සී. 1-2. 12 පරාමට්ඨාය - PTS, 13. අනිට්ඨංගතාය - ස්‍යා

**විඤ්ඤාණචරියා** යනු: කවර අරුතෙකින් විඥානචර්‍යා වී ද යත්:

රාග රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, ද්වෙෂ රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, මොහ රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, මාන රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, දෘෂ්ටි රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, ඖද්ධත්‍ය රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු. විචිකිත්සා රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, අනුශය රහිත වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, රාගයෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, ද්වෙෂයෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, මොහයෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, මානයෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, දෘෂ්ටියෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, ඖද්ධත්‍යයෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, විචිකිත්සායෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, අනුශයයෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, කුශලකර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, අකුශලකර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණ චරියා නමු. සාවද්‍යකර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, අනවද්‍යකර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, කෘෂ්ණකර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, (හිරිඔතප් සඞ්ඛ්‍යාත) ශුක්ලකර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, සුඛෝදය ඇති කර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, දුඃඛෝදය ඇති කර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤානචරියා නමු, සුඛවිපාක වූ කර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, දුඃඛවිපාක වූ කර්මයන්ගෙන් වෙන් වැ හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, විඥාතයෙහි (විඥානයෙන් දැනගත් අරමුණෙහි) හැසිරේ නු යි විඤ්ඤාණචරියා නමු, උක්තප්‍රකාර විඤ්ඤාණයාගේ මෙබඳු වූ චර්‍යා වේ නු යි විඤ්ඤාණචරියා නමු, රාගාදි කෙලෙස් නැති බැවින් මේ සිත පියවින් පිරිසුදු නු යි විඤ්ඤාණචරියා නමු. මේ විඥානචර්‍යා යි.

**අඥානචර්‍යා** කවර යත්:

මනවඩන රූපයන්හි (සන්තති වශයෙන්) රාගයාගේ ජවනය පිණිස පැවැති (චක්ෂුර්ද්වාරයෙහි අයොනිසොමනසිකාර වූ) ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යා යැ. රාගයාගේ ජවනය අඥානචර්‍යා යි. අමනොඥ වූ රූපයන්හි ද්වෙෂයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යා යැ. ද්වෙෂයාගේ ජවනය අඥානචර්‍යා යි. එ දෙකින් (රාගද්වෙෂ වශයෙන්) නො දක්නා රූපාලම්බන සඞ්ඛ්‍යාත වස්තුයෙහි (විචිකිත්සා ඖද්ධත්‍ය වශයෙන්) මොහයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජන ක්‍රියාව්‍යාකෘත මනොවිඥානධාතුව විඥානචර්‍යා යැ මොහොයාගේ ජවනය අඥානචර්‍යා යි. (උන්නති වශයෙන්) විනිබන්ධ වැ සිටි මානයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොවිඥානධාතුව විඥානචර්‍යා යැ. මානයාගේ ජවනය අඥානචර්‍යා යි. පරාමෘෂ්ට වූ දෘෂ්ටියගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යා යැ. දෘෂ්ටියගේ ජවනය අඥානචර්‍යා යි. (රූපාලම්බනයෙහි) වික්ෂෙපබවට ගිය ඖද්ධත්‍යයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොවිඥාන ධාතුව විඥානචර්‍යා යැ. ඖද්ධත්‍යයාගේ ජවනය අඥානචර්‍යා යි. නිශ්චය රහිත බවට ගිය විචිකිත්සාවගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යා යැ. විචිකිත්සාවගේ ජවනය අඥානචර්‍යා යි. ස්ථිර බවට ගිය අනුශයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්‍යා යැ. අනුශයාගේ ජවනය අඥානචර්‍යා යි

මනාපියෙසු සද්දෙසු -පෙ- මනාපියෙසු ගන්ධෙසු -පෙ- මනාපියෙසු රසෙසු -පෙ- මනාපියෙසු ඵොට්ඨබ්බෙසු -පෙ- මනාපියෙසු ධම්මෙසු රාගස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, රාගස්ස ජවනා අඤ්ඤාණචරියා, අමනාපියෙසු ධම්මෙසු[1] දෝසස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, දෝසස්ස ජවනා අඤ්ඤාණචරියා, තදුභයෙන අසමපෙක්ඛනස්මිං වත්ථුස්මිං මොහස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, මොහස්ස ජවනා අඤ්ඤාණචරියා, විනිබන්ධනස්ස මානස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, මානස්ස ජවනා අඤ්ඤාණචරියා, පරාමට්ඨාය දිට්ඨියා ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා දිට්ඨියා ජවනා අඤ්ඤාණචරියා, වික්ඛෙපගතස්ස උද්ධච්චස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, උද්ධච්චස්ස ජවනා අඤ්ඤාණචරිය, අනිට්ඨඞ්ගතාය විචිකිච්ඡාය ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, විචිකිච්ඡාය ජවනා අඤ්ඤාණචරියා, ථාමගතස්ස අනුසයස්ස ජවනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, අනුසයස්ස ජවනා අඤ්ඤාණචරියා.

අඤ්ඤාණචරියාති කෙනට්ඨෙන අඤ්ඤාණචරියා:

සරාගා චරතීති අඤ්ඤාණචරියා, සදෝසා චරතීති අඤ්ඤාණචරියා, සමොහා චරතීති අඤ්ඤාණචරියා, සමානා චරතීති අඤ්ඤාණචරියා, සදිට්ඨි චරතීති අඤ්ඤාණචරියා, සඋද්ධච්චා චරතීති අඤ්ඤාණචරියා, සවිචිකිච්ඡා චරතීති අඤ්ඤාණචරියා සානුසයා චරතීති අඤ්ඤාණචරියා, රාගසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, දෝසසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, මොහසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, මානසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, දිට්ඨිසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, උද්ධච්චසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, විචිකිච්ඡාසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, අනුසයසම්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, කුසලෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, අකුසලෙහි කම්මෙහි සම්පයුත්තා[2] චරතීති අඤ්ඤාණචරියා, සාවජ්ජෙහි කම්මෙහි සම්පයුත්තා[2] චරතීති අඤ්ඤාණචරියා, අනවජ්ජෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, කණ්හෙහි කම්මෙහි සම්පයුත්තා[2] චරතීති අඤ්ඤාණචරියා, සුක්කෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, සුඛුද්‍රයෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, දුක්ඛුද්‍රයෙහි කම්මෙහි සම්පයුත්තා[2] චරතීති අඤ්ඤාණචරියා, සුඛවිපාකෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති අඤ්ඤාණචරියා, දුක්ඛවිපාකෙහි කම්මෙහි සම්පයුත්තා[2] අඤ්ඤාතෙ[3] චරතීති අඤ්ඤාණචරියා, අඤ්ඤාණස්ස එවරූපා චරියා හොතීති අඤ්ඤාණචරියා, අයං අඤ්ඤාණචරියා.

---

1. රූපෙසු - PTS
2. විප්පයුත්තා - PTS
3. අඤ්ඤාණෙ - සී 1-2

මනවඩන ශබ්දයන්හි ... මනවඩන ගන්ධයන්හි ... මනවඩන රසයන්හි ... මනවඩන ස්ප්‍රෂ්ටව්‍යයන්හි ... මනවඩන (රූපාදි වූ හෝ ධර්මාලම්බන වූ හෝ) ධර්මයන්හි රාගයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්යා යැ රාගයාගේ ජවනය අඥානචර්යා යි. අමනොඥ වූ ධර්මයන්හි ද්වෙෂයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්යා යැ ද්වෙෂයාගේ ජවනය අඥානචර්යා යි. එදෙකින් (රාගද්වෙෂ වශයෙන්) නො දක්නා ධර්මාලම්බන සඞ්ඛ්‍යාත වස්තුයෙහි මොහයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘත මනොධාතුව විඥානචර්යා යැ මොහයාගේ ජවනය අඥානචර්යා යි. විනිබද්ධ වූ මානයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘත මනොධාතුව විඥානචර්යා යැ මානයාගේ ජවනය අඥානචර්යා යි. පරාමෘෂ්ට වූ දෘෂ්ටියගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්යා යැ දෘෂ්ටියගේ ජවනය අඥානචර්යා යි. වික්ෂෙපයට පැමිණි ඖද්ධත්‍යයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘත මනොධාතුව විඥානචර්යා යැ ඖද්ධත්‍යයාගේ ජවනය අඥානචර්යා යි. අනිෂ්ඨාවට ගිය විචිකිත්සාවගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්යා යැ විචිකිත්සාවගේ ජවනය අඥානචර්යා යි. ස්ථිර බවට ගිය අනුශයයාගේ ජවනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්යා යැ අනුශයයාගේ ජවනය අඥානචර්යා යි.

**අඤ්ඤාණචරියා** යනු: කුමක් හෙයින් අඥානචර්යා වී ද යත්:

රාගසහිත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ ද්වෙෂ සහිත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ මොහ සහිත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ මාන සහිත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ දෘෂ්ටි සහිත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ ඖද්ධත්‍යය සහිත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ විචිකිත්සා සහිත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ අනුශය සහිත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ රාගසම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා, යැ ද්වෙෂසම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ මොහසම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ මාන සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ දෘෂ්ටි සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ ඖද්ධත්‍ය සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ විචිකිත්සා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ අනුශය සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ. කුශලකර්මයන් හා විප්‍රයුක්තක වැ හැසිරේ නු යි අඥානචර්යා යැ අකුශලකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ සාවද්‍යකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ අනවද්‍යකර්මයන් හා, විප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ කෘෂ්ණකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ ශුක්ලකර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ සුඛොදය ඇති කර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ දුඃඛොදය ඇති කර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ සුඛවිපාක වූ කර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ දුඃඛවිපාක වූ කර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි අඥානචර්යා යැ (යථාස්වභාවයෙන්) අඥාත වූ ආලම්බනයෙහි හැසිරේ නු යි අඥානචර්යා යැ උක්තප්‍රකාර වූ අඥානයාගේ මෙබඳු වූ චර්යා වේ නු යි අඥානචර්යා නමු. මේ අඥානචර්යා යි.

කතමා ඤාණචරියා.

අනිච්චානුපස්සනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, අනිච්චානුපස්සනා ඤාණචරියා, දුක්ඛානුපස්සනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, දුක්ඛානුපස්සනා ඤාණචරියා, අනත්තානුපස්සනත්ථාය අවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණධරියා, අනත්තානුපස්සනා ඤාණචරියා, නිබ්බිදානුපස්සනත්ථාය -පෙ- විරාගානුපස්සනත්ථාය -පෙ- නිරොධානුපස්සනත්ථාය -පෙ- පටිනිස්සග්ගානුපස්සනත්ථාය -පෙ- ඛයානුපස්සනත්ථාය -පෙ- වයානුපස්සනත්ථාය -පෙ- විපරිණාමානුපස්සනත්ථාය -පෙ- අනිමිත්තානුපස්සනත්ථාය -පෙ- අප්පනිහිතානුපස්සනත්ථාය -පෙ- සුඤ්ඤතානුපස්සනත්ථාය -පෙ- අධිපඤ්ඤාධම්මානුපස්සනත්ථාය -පෙ- යථාභූතඤාණදස්සනත්ථාය -පෙ- ආදීනවානුපස්සනත්ථාය -පෙ- පටිසඞ්ඛානුපස්සනත්ථාය ආවජ්ජනකිරියාබ්‍යාකතා විඤ්ඤාණචරියා, පටිසඞ්ඛානුපස්සනා ඤාණචරියා, විවට්ටානුපස්සනා ඤාණචරියා, සොතාපත්තිමග්ගො ඤාණචරියා සොතාපත්තිඵලසමාපත්ති ඤාණචරියා, සකදාගාමිමග්ගො ඤාණචරියා, සකදාගාමිඵලසමාපත්ති ඤාණචරියා, අනාගාමිමග්ගො ඤාණචරියා, අනාගාමිඵලසමාපත්ති ඤාණචරියා, අරහත්තමග්ගො ඤාණචරියා අරහත්තඵලසමාපත්ති ඤාණචරියා.

ඤාණචරියා කෙනට්ඨෙන ඤාණචරියා.

නීරාගා චරතීති ඤාණචරියා, නිද්දොසා චරතීති ඤාණචරියා නිම්මොහා චරතීති ඤාණචරියා, නිම්මානා චරතීති ඤාණචරියා, නිද්දිට්ඨි චරතීති ඤාණචරියා, නිඋද්ධච්චා චරතීති ඤාණචරියා, නිබ්බිචිකිච්ඡා චරතීති ඤාණචරියා, නානුසයා චරතීති ඤාණචරියා, රාගවිප්පයුත්තා චරතීති ඤාණචරියා, දොසවිප්පයුත්තා චරතීති ඤාණචරියා මොහවිප්පයුත්තා චරතීති ඤාණචරියා, මානවිප්පයුත්තා චරතීති ඤාණචරියා, දිට්ඨිවිප්පයුත්තා චරතීති ඤාණචරියා, උද්ධච්චවිප්පයුත්තා චරතීති ඤාණචරියා, විචිකිච්ඡාවිප්පයුත්තා චරතීති ඤාණචරියා, අනුසයවිප්පයුත්තා චරතීති ඤාණචරියා, කුසලෙහි කම්මෙහි සම්පයුත්තා[1] චරතීති ඤාණචරියා, අකුසලෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති ඤාණචරියා, සාවජ්ජෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති ඤාණචරියා, අනවජ්ජෙහි කම්මෙහි සම්පයුත්තා චරතීති ඤාණචරියා, කණ්හෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති ඤාණචරියා, සුක්කෙහි කම්මෙහි සම්පයුත්තා[1] චරතීති ඤාණචරියා, සුඛුද්‍රයෙහි කම්මෙහි සම්පයුත්තා චරතීති ඤාණචරියා, දුක්ඛුද්‍රයෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති ඤාණචරියා, සුඛවිපාකෙහි කම්මෙහි සම්පයුත්තා[1] චරතීති ඤාණචරියා, දුක්ඛවිපාකෙහි කම්මෙහි විප්පයුත්තා චරතීති ඤාණචරියා, ඤාතෙ[2] චරතීති ඤාණචරියා, ඤාණස්ස එවරූපා චරියා හොතීති ඤාණචරියා, අයං ඤාණචරියා.

අඤ්ඤා විඤ්ඤාණචරියා, අඤ්ඤා අඤ්ඤාණචරියා, අඤ්ඤා ඤාණචරියාති. තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා තෙන වුච්චති: චරියාවවත්ථානෙ පඤ්ඤා චරියානානත්තෙ ඤාණං.

**චරියානානත්තඤාණනිද්දෙසො.**

1. විප්පයුත්තා - PTS, 2. ඤාණෙ - සී. 1, 2.

**ඥානචර්යා කවර යත්:**

අනිත්‍යානුදර්ශනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්යා යැ අනිත්‍යානුදර්ශනය ඥානචර්යා යි. දුඃඛානුදර්ශනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්යා යැ දුඃඛානුදර්ශනය ඥානචර්යා යි අනාත්මානුදර්ශනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘතමනොධාතුව විඥානචර්යා යැ අනාත්මානුදර්ශනය ඥානචර්යා යි. නිර්වේදානුදර්ශනය පිණිස විරාගානුදර්ශනය පිණිස ... නිරොධානුදර්ශනය පිණිස ... පටිනිස්සග්ගානුදර්ශනය පිණිස ... ක්ෂයානුදර්ශනය පිණිස .. ව්‍යයානුදර්ශනය පිණිස ... විපරිණාමානුදර්ශනය පිණිස ... අනිමිත්තානුදර්ශනය පිණිස ... අප්‍රණිහිතානුදර්ශනය පිණිස ... ශූන්‍යතානුදර්ශනය පිණිස ... අධිප්‍රඥධර්මානුදර්ශනය පිණිස ... යථාභූතඥානදර්ශනය පිණිස ... ආදීනවානුදර්ශනය පිණිස ... පටිසඞ්ඛානුදර්ශනය පිණිස පැවැති ආවර්ජනක්‍රියාව්‍යාකෘත මනොධාතුව විඥානචර්යා යැ පටිසඞ්ඛානුදර්ශනය ඥානචර්යා යි. විවට්ටනානුදර්ශනය ඥානචර්යා යැ ස්‍රොතාපත්තිමාර්ගය ඥානචර්යා යැ ස්‍රොතාපත්තිඵලසමාපත්තිය ඥානචර්යා යැ සකෘදගාමිමාර්ගය ඥානචර්යා යැ සකෘදගාමිඵලසමාපත්තිය ඥානචර්යා යැ අනාගාමිමාර්ගය ඥානචර්යා යැ අනාගාමිඵලසමාපත්තිය ඥානචර්යා යැ අර්හත්වමාර්ගය ඥානචර්යා යැ අර්හත්වඵලසමාපත්තිය ඥානචර්යා යි.

**ඥානචර්යා යනු: කවර අරුතෙකින් ඥානචර්යා වෙයි යත්:**

රාග රහිත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, ද්වෙෂ රහිත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, මොහ රහිත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, මාන රහිත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, දෘෂ්ටි රහිත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, ඖද්ධත්‍ය රහිත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, විචිකිත්සා රහිත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, අනුශය රහිත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, රාගයෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, ද්වෙෂයෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, මොහයෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, මානයෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, දෘෂ්ටියෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, ඖද්ධත්‍යයෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, විචිකිත්සායෙන් විප්‍රයුතක වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, අනුශයයෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, කුශලකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, අකුශලකර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, සාවද්‍යකර්මයන්ගෙන් විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, අනවද්‍යකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, කෘෂ්ණකර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ ශුක්ලකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, සුඛොදයකර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, දුඃඛොදයකර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, සුඛවිපාක වූ කර්මයන් හා සම්ප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, දුඃඛවිපාක වූ කර්මයන් හා විප්‍රයුක්ත වැ හැසිරේ නු යි ඥානචර්යා යැ, යථාස්වභාවය වූ ඥානාලම්බනයෙහි හැසිරේ නු යි ඥානචර්යා යැ, උක්තප්‍රකාර වූ ඥානයාගේ මෙබඳු වූ චර්යාව වේ නු යි ඥානචර්යා යැ. මේ ඥානචර්යා යි.

විඥානචර්යාව අනෙකක, අඥානචර්යාව අනෙකක, ඥානචර්යාව අනෙකකැ'යි ඒ චර්යානානාත්වඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: "**චරියාවවත්ථානෙ පඤ්ඤා චරියානානත්තෙ ඤාණං**"යි.

**චර්යානානාත්වඥානනිර්දෙශ යි.**

## 18. භූමිනානත්තඤාණං

කථං චතුධම්මවවත්ථානෙ පඤ්ඤා භූමිනානත්තෙ ඤාණං.

චතස්සො භූමියො: කාමාවචරා භූමි, රූපාවචරා භූමි, අරූපාවචරා භූමි, අපරියාපන්නා භූමි.

කතමා කාමාවචරා භූමි: හෙට්ඨතො අවීචිනිරයං පරියන්තං කරිත්වා, උපරිතො පරනිම්මිතවසවත්ති දෙවෙ අන්තො කරිත්වා යං එතස්මිං අන්තරෙ එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධධාතුආයතනා රූපා වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, අයං කාමාවචරා භූමි.

කතමා රූපාවචරා භූමි: හෙට්ඨතො බ්‍රහ්මලොකං පරියන්තං කරිත්වා, උපරිතො අකනිට්ඨෙ දෙවෙ අන්තො කරිත්වා, යං එතස්මිං අන්තරෙ එත්ථාවචරා එත්ථ පරියාපන්නා සමාපන්නස්ස වා උපපන්නස්ස[1] වා දිට්ඨ-ධම්මසුඛවිහාරිස්ස වා චිත්තචෙතසිකා ධම්මා, අයං රූපාවචරා භූමි.

කතමා අරූපාවචරා භූමි. හෙට්ඨතො ආකාසානඤ්චායතනූපගෙ දෙවෙ පරියන්තං කරිත්වා උපරිතො නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගෙ දෙවෙ අන්තො කරිත්වා, යං එතස්මිං අන්තරෙ එත්ථාවචරා එත්ථ පරියා-පන්නා සමාපන්නස්ස වා උපපන්නස්ස[1] වා දිට්ඨධම්මසුඛවිහාරිස්ස වා චිත්ත-චෙතසිකා ධම්මා, අයං අරූපාවචරා භූමි.

කතමා අපරියාපන්නා භූමි. අපරියාපන්නා මග්ගා ච මග්ගඵලානි ච අසඞ්ඛතා ච ධාතු, අයං අපරියාපන්නා භූමි, ඉමා චතස්සො භූමියො.

අපරාපි චතස්සො භූමියො: චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා චත්තාරි ඣානානි, චතස්සො අප්ප-මඤ්ඤායො, චතස්සො අරූපසමාපත්තියො, චතස්සො පටිසම්භිදා, චතස්සො පටිපදා, චත්තාරි ආරම්මණානි, චත්තාරො අරියවංසා, චත්තාරි සඞ්ගහවත්ථූනි, චත්තාරි චක්කානි, චත්තාරි ධම්මපදානි, ඉමා චතස්සො භූමියො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: චතුධම්මවවත්ථානෙ පඤ්ඤා භූමිනානත්තෙ ඤාණං.

**භූමිනානත්තඤාණනිද්දෙසො**

1 උප්පන්නස්ස - මජසං, සයා, PTS,

# 18. භූමිනානාත්වඥානය

කිසෙයින් සතර ධර්මයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව භූමිනානාත්වඥාන වෙයි යත්:

භූමි සතරෙකි: කාමාවචරභූමි යැ රූපාවචරභූමි යැ අරූපාවචරභූමි යැ අපරියාපන්නභූමි සි.

කාමාවචරභූමි කවර යත්: යටින් අවීචිනිරය පිරියත් කොට මතු-භාගයෙන් පරනිර්මිතවශවර්තිදෙවියන් ඇතුළු කොට තෙල අවකාශයෙහි මෙහි හැසිරෙන්නා වූ මෙහි පයඕපන්න වූ යම් ස්කන්ධධාතුආයතන කෙනෙක් වෙත් ද රූප - වෙදනා - සංඥා - සංස්කාර - විඥාන කෙනෙක් වෙත් ද මේ කාමාවචරභූමි නම.

රූපාවචරභූමි කවර යත්: යටින් බ්‍රහ්මලොව පිරියත් කොට මතුභාග-යෙන් අකනිට්ඨදෙවියන් ඇතුළු කොට තෙල අවකාශයෙහි මෙහි හැසිරෙන්නා වූ මෙහි පයඕපන්න වූ සමවතට සමවන්හුගේ හෝ (විපාක විසින් බ්‍රහ්මලොව) උපන්නහු ගේ හෝ ඉහාත්මසුඛවිහරණ ඇත්තහු (රහත්හු) ගේ හෝ යම් චිත්තචෛතසිකධර්ම කෙනෙක් වෙත් ද මේ රූපාවචරභූමි නම.

අරූපාවචරභූමි කවර යත්: යටින් ආකාසානඤ්චායතනූපගදෙවියන් පිරියත් කොට මතුභාගයෙන් නෛවසංඥානාසංඥායතනදෙවියන් ඇතුළු කොට තෙල අවකාශයෙහි මෙහි හැසිරෙන්නා වූ මෙහි පයඕපන්න වූ සමවතට සමවන්හුගේ හෝ (විපාක විසින් අරූතලයෙහි) උපන්නහුගේ හෝ ඉහාත්මසුඛවිහරණ ඇත්තහු (රහත්හු) ගේ හෝ යම් චිත්තචෛත-සිකධර්ම කෙනෙක් වෙත් ද මේ අරූපාවචරභූමි නම.

අපයඕපන්නභූමි කවර යත්: මාර්ගයෝ ද මාර්ගඵලයෝ ද අසඞ්ඛත-ධාතුව ද අපයඕපන්නයෝ යැ. මේ අපයඕපන්නභූමි නම්.

මොහු සතර භූමි නම් වෙත්.

අනෙකුදු භූමි සතරෙකි: සතර සතිපට්ඨානයෝ යැ සතර සම්‍යක් ප්‍රධානයෝ යැ සතර ඍද්ධිපාදයෝ යැ සතර ධ්‍යානයෝ යැ සතර අප්‍රා-මාණ්‍යයෝ යැ සතර අරූපසමාපත්තිහු යැ සතර ප්‍රතිසංවිද්හු යැ සතර ප්‍රතිපත්හු යැ සතර ආලම්බනයෝ යැ සතර ආර්‍යවංශයෝ යැ සතර සඞ්ග්‍රහවස්තුහු යැ චතුශ්චක්‍රයෝ යැ සතර ධර්මපදයෝ යි. මොහු සතරභූමි නම් වෙත්.

ඒ භූමිනානාත්වඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'චතුධම්මවවත්ථානෙ පඤ්ඤා, භූමිනානත්තෙ ඤාණං'** යි.

**භූමිනානාත්වඥානනිර්දේශ යි.**

# 19. ධම්මනානත්තඤාණං

කථං නවධම්මවවත්ථානෙ පඤ්ඤා ධම්මනානත්තෙ ඤාණං:

කථං ධම්මෙ වවත්ථෙති: කාමාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අකුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති. රූපාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති. අරූපාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති. අපරියාපන්නෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති.

කථං කාමාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අකුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති: දස කුසලකම්මපථෙ කුසලතො වවත්ථෙති, දස අකුසලකම්මපථෙ අකුසලතො වවත්ථෙති, රූපඤ්ච විපාකඤ්ච කිරියඤ්ච අබ්‍යාකතතො වවත්ථෙති. එවං කාමාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අකුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති.

කථං රූපාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති අබ්‍යාකතතො වවත්ථෙති: ඉධට්ඨස්ස චත්තාරි ඣානානි කුසලතො වවත්ථෙති, තත්‍රූපපන්නස්ස චත්තාරි ඣානානි අබ්‍යාකතතො වවත්ථෙති. එවං රූපාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති.

කථං අරූපාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති: ඉධට්ඨස්ස චතස්සො අරූපාවචරසමාපත්තියො කුසලතො වවත්ථෙති, තත්‍රූපපන්නස්ස චතස්සො අරූපාවචරසමාපත්තියො අබ්‍යාකතතො වවත්ථෙති. එවං අරූපාවචරෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති.

කථං අපරියාපන්නෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති: චත්තාරො අරියමග්ගෙ කුසලතො වවත්ථෙති, චත්තාරි ච සාමඤ්ඤඵලානි නිබ්බානඤ්ච අබ්‍යාකතතො වවත්ථෙති. එවං අපරියාපන්නෙ ධම්මෙ කුසලතො වවත්ථෙති, අබ්‍යාකතතො වවත්ථෙති. එවං ධම්මෙ වවත්ථෙති.

නව පාමොජ්ජමූලකා ධම්මා: අනිච්චතො මනසිකරොතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙ චිත්තෙ යථාභූතං ජානාති[1] පස්සති, යථාභූතං ජානං පස්සං නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. දුක්ඛතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- අනත්තතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ-

1. පජානාති - මජසං, සයා, PTS

# 19. ධර්මනානත්වඥානය

කිසෙයින් නවධර්මයන් පිරිසිඳ දැනීමේ ප්‍රඥාව ධර්මනානත්වඥාන වෙයි යත්:

කිසෙයින් ධර්මයන් ව්‍යවස්ථා කෙරේ ද යත්: කාමාවචර ධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අකුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. රූපාවචරධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. අරූපාවචර ධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. අපර්යාපන්නධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි.

කිසෙයින් කාමාවචරධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරේ ද, අකුශල හෙයින් ව්‍යවස්ථා කෙරේ ද, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරේ ද යත්: දශකුශලකර්මපථයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, දශ අකුශල කර්මපථයන් අකුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. රූපය ද විපාකය ද ක්‍රියාව ද අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. මෙසෙයින් කාමාවචර-ධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. අකුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරේ.

කිසෙයින් රූපාවචරධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි යත්: මෙ මිනිස්ලොවැ සිටියහුගේ සතර ධ්‍යානයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. (විපාක වශයෙන්) එ බඹලොවැ උපන්නහුගේ සතර විපාකධ්‍යානයන් අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. මෙසෙයින් රූපාවචරධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරේ.

කිසෙයින් අරූපාවචරධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි යත්: මෙ මිනිස්ලොවැ සිටියහුගේ සතර අරූපාවචරසමාපත්තීන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, ඒ අරූතලයෙහි උපන්නහුගේ සතර විපාක අරූපාවචරසමාපත්තීන් අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. මෙසෙයින් අරූපාවචරධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරේ.

කිසෙයින් අපර්යාපන්නධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි, අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි යත්: සතර ආර්යමාර්ගයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. සතර ශ්‍රාමණ්‍යඵලයන් ද නිර්වාණය ද අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. මෙසෙයින් අපර්යාපන්නධර්මයන් කුශල හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. අව්‍යාකෘත හෙයින් ව්‍යවස්ථා කෙරෙයි. මෙසෙයින් ධර්මයන් ව්‍යවස්ථා කෙරේ.

ප්‍රාමොද්‍යමූලකධර්මයෝ නව දෙනෙකි: අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදී. ප්‍රීතිසිත් ඇත්තහුගේ නාමකාය සන්හුන් දරථ ඇත්තේ වෙයි. නිවුණුකය ඇත්තේ චෛතසික සුඛය විඳී. සුව ඇත්තහුගේ සිත එකඟ වෙයි. සිත එකඟ වූ කල්හි (උදයව්‍යයඥානාදි වශයෙන් සංස්කාරයන්) යථා-ස්වභාවයෙන් දැනගනී. නුවණැසින් දකී. යථාස්වභාවයෙන් දත්තේ නුවනැසින් දක්තේ සංස්කාරයන්හි උකටලී වෙයි. උත්කණ්ඨිත වනුයේ සංස්කාරයන් කෙරෙන් විරක්ත වෙයි. විරාගය හෙතු කොට ගෙන නිර්වාණයෙහි (අධිමොක්ෂයෙන්) මිදෙයි. දුඃඛ වශයෙන් මෙනෙහිකරන්නා-හට ප්‍රාමොද්‍යය උපදී. ... අනාත්ම වශයෙන් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ...

රූපං අනිච්චතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- රූපං දුක්ඛතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- රූපං අනත්තතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- ජරාමරණං දුක්ඛතො මනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- ජරාමරණං අනත්තතො මනසිකරොතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙ චිත්තෙ යථාභූතං ජානාති පස්සති, යථාභූතං ජානං පස්සං නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. ඉමෙ නව පාමොජ්ජමූලකා ධම්මා.

නව යොනිසොමනසිකාරමූලකා ධම්මා: අනිච්චතො යොනිසො මනසිකරොතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙන චිත්තෙන 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

දුක්ඛතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙන චිත්තෙන 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

අනත්තතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- රූපං අනිච්චතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- රූපං දුක්ඛතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- රූපං අනත්තතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- ජරාමරණං දුක්ඛතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති -පෙ- ජරාමරණං අනත්තතො යොනිසොමනසිකරොතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙන චිත්තෙන 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති, 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමෙ නව යොනිසොමනසිකාරමූලකා ධම්මා.

රූපය අනිත්‍ය වශයෙන් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ... වේදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ... චක්ඛුස ... ජරාමරණය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ... ජරාමරණය දුඃඛ වශයෙන් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී ... ජරාමරණය අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිසිත් ඇත්තහුගේ නාමකාය සන්හුන් දරථ ඇත්තේ වෙයි. සැහැල්ලු වූ කය ඇත්තේ චෛතසිකසුඛය විඳී. සුව ඇත්තහුගේ සිත එකඟ වෙයි. සිත එකඟ වූ කල්හි (සංස්කාරයන්) යථාස්වභාවයෙන් දැනගනී. නුවණැසින් දකී. යථාස්වභාවයෙන් දන්නේ නුවණැසින් දක්නේ උකටලී වෙයි. උත්කණ්ඨිත වනුයේ සංස්කාරයන් කෙරෙන් විරක්ත වෙයි. විරාගය හෙතු කොට ගෙන නිර්වාණයෙහි (අධිමොක්ෂයෙන්) මිදෙයි. මොහු නවදෙන **ප්‍රාමොද්‍යමූලකධර්මයෝ** යි.

යොනිසොමනසිකාරමූලකධර්මයෝ නව දෙනෙකි: අනිත්‍ය වශයෙන් නුවණින් මෙනෙහි කරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහු ගේ නාමකාය සන්හිඳෙයි. සන්හුන් කය ඇත්තේ චෛතසිකසුඛය විඳී. සුව ඇත්තහුගේ සිත අරමුණෙහි සමාහිත වෙයි. සමාහිත වූ සිතින් 'මේ දුකැ' යි යථාස්වභාවයෙන් (නුවණින්) දැනගනී. මේ 'දුඃඛසමුදය'යි යථාස්වභාවයෙන් දැනගනී. මේ 'දුඃඛනිරොධය'යි යථාස්වභාවයෙන් දැනගනී. මේ 'දුඃඛනිරොධගාමිනීප්‍රතිපදා' යැ යි යථාස්වභාවයෙන් දැනගනී.

දුඃඛ විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී, ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ නාමකය සන්හිඳෙයි. සන්හුන් කය ඇත්තේ චෛතසිකසුඛය විඳී. සුව ඇත්තහුගේ සිත සමාහිත වෙයි. සමාහිත වූ සිතින් 'මේ දුකැ'යි යථාස්වභාවයෙන් දැනගනී. මේ 'දුඃඛසමුදය'යි යථාස්වභාවයෙන් දැනගනී. මේ 'දුඃඛනිරොධය'යි යථාස්වභාවයෙන් දැනගනී. 'මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදා'යැ යි යථාස්වභාවයෙන් දැනගනී.

අනාත්ම විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී ... රූපය අනිත්‍ය විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී.... රූපය දුඃඛ විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ... රූපය අනාත්ම විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ... වේදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ... චක්ඛුස ... ජරාමරණය අනිත්‍ය විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී ... ජරාමරණය දුඃඛ විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී ... ජරාමරණය අනාත්ම විසින් නුවණින් මෙනෙහිකරන්නාහට ප්‍රාමොද්‍යය උපදී. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ නාමකය සන්හිඳෙයි. සන්හුන් කය ඇත්තේ චෛතසිකසුඛය විඳී. සුව ඇත්තහුගේ සිත සමාහිත වෙයි. සමාහිත වූ සිතින් 'මේ දුකැ'යි යථාස්වභාවයෙන් දැනගනී. 'මේ දුඃඛසමුදය'යි යථාස්වභාවයෙන් දැනගනී. 'මේ දුඃඛනිරොධය'යි යථාස්වභාවයෙන් දැනගනී. 'මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදා'යි යථාස්වභාවයෙන් දැනගනී. මොහු නවදෙන **යොනිසොමනසිකාරමූලකධර්මයෝ** යි.

නව නානත්තා: ධාතුනානත්තං පටිච්ච උප්පජ්ජති ඵස්සනානත්තං, ඵස්සනානත්තං පටිච්ච උප්පජ්ජති වෙදනානානත්තං, වෙදනානානත්තං පටිච්ච උප්පජ්ජති සඤ්ඤානානත්තං, සඤ්ඤානානත්තං පටිච්ච උප්පජ්ජති සඞ්කප්පනානත්තං, සඞ්කප්පනානත්තං පටිච්ච උප්පජ්ජති ඡන්දනානත්තං, ඡන්දනානත්තං පටිච්ච උප්පජ්ජති පරිළාහනානත්තං, පරිළාහනානත්තං පටිච්ච උප්පජ්ජති පරියෙසනානානත්තං, පරියෙසනානානත්තං පටිච්ච උප්පජ්ජති ලාභනානත්තං. ඉමෙ නවනානත්තා.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'නව ධම්මවවත්ථානෙ පඤ්ඤා ධම්මනානත්තෙ ඤාණං'.

**ධම්මනානත්තඤාණනිද්දෙසො.**

## 20-24. ඤාණපඤ්චකං

කථං අභිඤ්ඤාපඤ්ඤා ඤාතට්ඨෙ[1] ඤාණං, පරිඤ්ඤාපඤ්ඤා තීරණට්ඨෙ[2] ඤාණං, පහානපඤ්ඤා පරිච්චාගට්ඨෙ[3] ඤාණං, භාවනාපඤ්ඤා එකරසට්ඨෙ[4] ඤාණං, සච්ඡිකිරියාපඤ්ඤා ඵුසනට්ඨෙ[5] ඤාණං:

යෙ යෙ ධම්මා අභිඤ්ඤාතා හොන්ති තෙ තෙ ධම්මා ඤාතා හොන්ති, යෙ යෙ ධම්මා පරිඤ්ඤාතා හොන්ති තෙ තෙ ධම්මා තීරිතා හොන්ති, යෙ යෙ ධම්මා පහීනා හොන්ති තෙ තෙ ධම්මා පරිච්චත්තා හොන්ති, යෙ යෙ ධම්මා භාවිතා හොන්ති තෙ තෙ ධම්මා එකරසා හොන්ති, යෙ යෙ ධම්මා සච්ඡිකතා හොන්ති තෙ තෙ ධම්මා ඵස්සිතා[6] හොන්ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අභිඤ්ඤාපඤ්ඤා ඤාතට්ඨෙ ඤාණං, පරිඤ්ඤාපඤ්ඤා තීරණට්ඨෙ ඤාණං, පහානපඤ්ඤා පරිච්චාගට්ඨෙ ඤාණං, භාවනාපඤ්ඤා එකරසට්ඨෙ ඤාණං, සච්ඡිකිරියාපඤ්ඤා ඵුසනට්ඨෙ ඤාණං'

**ඤාණපඤ්චකනිද්දෙසො**

1. ඤාතට්ඨෙන - සී 1,2,3, ස්‍යා
2 තීරණට්ඨෙන - සී 1, 2, 3. ස්‍යා
3 පරිච්චාගට්ඨෙන - සී 1,2,3, ස්‍යා
4 එකරසට්ඨෙන - සී. 1,2,3, ස්‍යා.
5. ඵස්සනට්ඨෙන - සී 1,2,3, ස්‍යා.
6. ඵුසිතා - ස්‍යා, මජසං.

නානාත්වයෝ නවදෙනෙකි: ධාතුනානාත්වය නිසා ස්පර්ශනානාත්වය උපදී. ස්පර්ශනානාත්වය නිසා වේදනානානාත්වය උපදී. වේදනානානාත්වය නිසා සංඥානානාත්වය උපදී. සංඥානානාත්වය නිසා සංකල්පනානාත්වය උපදී. සංකල්පනානාත්වය නිසා ඡන්දනානාත්වය උපදී. ඡන්දනානාත්වය නිසා පරිදාහනානාත්වය උපදී. පරිදාහනානාත්වය නිසා පර්යේෂණනානාත්වය උපදී. පර්යේෂණනානාත්වය නිසා ලාභනානාත්වය උපදී. **මොහු නව නානාත්වයෝ** යි.

ඒ ධර්මනානාත්වඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'නව ධම්මවවත්ථානෙ පඤ්ඤා ධම්මනානත්තෙ ඤාණං'යි.

**ධර්මනානාත්වඥානනිර්දේශ** යි.

## 20-24. ඥානපඤ්චකය

කිසෙයින් අභිඥප්‍රඥව ඥාතාර්ථඥාන වෙයි, පරිඥප්‍රඥව තීරණාර්ථඥාන වෙයි, ප්‍රහාණප්‍රඥව පරිත්‍යාගාර්ථඥාන වෙයි, භාවනාප්‍රඥව එකරසාර්ථඥාන වෙයි, සාක්ෂාත්ක්‍රියාප්‍රඥව ස්පර්ශනාර්ථඥාන වෙයි යත්:

යම් යම් ධර්ම කෙනෙක් (ධර්මස්වභාවලක්ෂණ දැනීම් වශයෙන්) මොනොවට දන්නාලද්දහු වෙත් ද ඒ ඒ ධර්මයෝ දන්නාලද්දහු වෙති. යම් යම් ධර්ම කෙනෙක් (සාමාන්‍ය ලක්ෂණ වශයෙන්) හාත්පසින් දන්නාලද්දහු වෙත් ද ඒ ඒ ධර්මයෝ තීරණය කරනලද්දහු වෙති. යම් යම් ධර්ම කෙනෙක් (භඞ්ගානුදර්ශනයෙහි පටන්) ප්‍රහීණ වූවාහු වෙත් ද ඒ ඒ ධර්මයෝ පරිත්‍යක්ත වූවාහු වෙති. යම් යම් ධර්ම කෙනෙක් වඩනලද්දහු වෙත් ද ඒ ඒ ධර්මයෝ එකකෘත්‍ය වූවාහු වෙති. යම් යම් ධර්ම කෙනෙක් ප්‍රත්‍යක්ෂ කරනලද්දහු වෙත් ද ඒ ඒ ධර්මයෝ (ප්‍රතිලාභප්‍රතිවේධස්පර්ශයෙන්) ස්පර්ශ කරනලද්දහු වෙත්.

ඒ ඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **අභිඤ්ඤාපඤ්ඤා ඤාතට්ඨෙ ඤාණං, පරිඤ්ඤාපඤ්ඤා තීරණට්ඨෙ ඤාණං, පහාණපඤ්ඤා පරිච්චාගට්ඨෙ ඤාණං, භාවනාපඤ්ඤා එකරසට්ඨෙ ඤාණං, සච්ඡිකිරියාපඤ්ඤා ඵුසනට්ඨෙ ඤාණං**'යි

**පඤ්චකඥානනිර්දේශ** යි.

# 25-28. පටිසම්භිදාඤාණං

කථං අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්ති-පටිසම්භිදෙ ඤාණං, පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

සද්ධින්ද්‍රියං ධම්මො, විරියින්ද්‍රියං ධම්මො, සතින්ද්‍රියං ධම්මො, සමාධින්ද්‍රියං ධම්මො, පඤ්ඤින්ද්‍රියං ධම්මො, අඤ්ඤො සද්ධින්ද්‍රියං ධම්මො[1] අඤ්ඤො විරියින්ද්‍රියං ධම්මො, අඤ්ඤො සතින්ද්‍රියං ධම්මො, අඤ්ඤො සමාධින්ද්‍රියං ධම්මො, අඤ්ඤො පඤ්ඤින්ද්‍රියං ධම්මො, යෙන ඤාණෙන ඉමෙ නානා ධම්මා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා ධම්මා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං'.

අධිමොක්ඛට්ඨො අත්ථො පග්ගහට්ඨො අත්ථො, උපට්ඨානට්ඨො අත්ථො, අවික්ඛෙපට්ඨො අත්ථො, දස්සනට්ඨො අත්ථො. අඤ්ඤො අධිමොක්ඛට්ඨො අත්ථො, අඤ්ඤො පග්ගහට්ඨො අත්ථො, අඤ්ඤො උපට්ඨානට්ඨො අත්ථො, අඤ්ඤො අවික්ඛෙපට්ඨො අත්ථො, අඤ්ඤො දස්සනට්ඨො අත්ථො යෙන ඤාණෙන ඉමෙ නානා අත්ථා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා අත්ථා පටිවිදිතා'ති. තෙන වුච්චති 'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටි-සම්භිදෙ ඤාණං'.

පඤ්ච ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්චත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා. අඤ්ඤා ධම්මනිරුත්තියො, අඤ්ඤා අත්ථනිරුත්තියො. යෙන ඤාණෙන ඉමා නානා නිරුත්තියො ඤාතා, තෙනෙව ඤාණෙන ඉමා නානා නිරුත්තියො පටිවිදිතා'ති. තෙන වුච්චති: 'නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං'.

පඤ්චසු ධම්මෙසු ඤාණානි, පඤ්චසු අත්ථෙසු ඤාණානි, දසසු නිරුත්තීසු ඤාණානි. අඤ්ඤානි ධම්මෙසු ඤාණානි, අඤ්ඤානි අත්ථෙසු ඤාණානි, අඤ්ඤානි නිරුත්තීසු ඤාණානි. යෙන ඤාණෙන ඉමෙ නානා ඤාණා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා ඤාණා පටිවිදිතාති. තෙන වුච්චති: 'පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'.

සද්ධාබලං ධම්මො, විරියබලං ධම්මො, සතිබලං ධම්මො, සමාධිබලං ධම්මො, පඤ්ඤාබලං ධම්මො. අඤ්ඤො සද්ධාබලං ධම්මො, අඤ්ඤො විරිය-බලං ධම්මො, අඤ්ඤො සතිබලං ධම්මො, අඤ්ඤො සමාධිබලං ධම්මො, අඤ්ඤො පඤ්ඤාබලං ධම්මො. යෙන ඤාණෙන ඉමෙ නානා ධම්මා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා ධම්මා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං.'

---

1. සද්ධින්ද්‍රිය ධම්මො (ඉච්චාදි) - සී 1. 3.

# 25-28. ප්‍රතිසංවිද්ඥානය

කිසෙයින් අර්ථනානාත්වයෙහි ප්‍රඥාව අර්ථප්‍රතිසංවිද්ඥාන වෙයි, ධර්මනානාත්වයෙහි ප්‍රඥාව ධර්මප්‍රතිසංවිද්ඥාන වෙයි, නිරුක්තිනානාත්වයෙහි ප්‍රඥාව නිරුක්තිප්‍රතිසංවිද්ඥාන වෙයි, ප්‍රතිභානනානාත්වයෙහි ප්‍රඥාව ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන වෙයි යත්:

ශ්‍රද්ධෙන්ද්‍රිය ධර්මයෙක, වීර්යෙන්ද්‍රිය ධර්මයෙක, සමාධීන්ද්‍රිය ධර්මයෙක, ප්‍රඥෙන්ද්‍රිය ධර්මයෙකි. ශ්‍රද්ධෙන්ද්‍රියධර්මය අනෙකෙක, වීර්යෙන්ද්‍රියධර්මය අනෙකෙක, සමාධීන්ද්‍රියධර්මය අනෙකෙක, ප්‍රඥෙන්ද්‍රියධර්මය අනෙකෙකි. යම් ඥානයෙකින් මේ නානාධර්මයෝ දත්නාලද්දාහු ද ඒ ඥානයෙන් මැ මේ නානාධර්මයෝ අභිමුඛභාවයෙන් දත්නාලද්දාහු වෙත්. එයින් කියනු ලැබෙයි: **'ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං'**යි

අධිමොක්ෂකෘත්‍යය අර්ථයෙක, ප්‍රග්‍රහකෘත්‍යය අර්ථයෙක, උපස්ථාන (වැටහීම්) කෘත්‍යය අර්ථයෙක, අවික්ෂෙපකෘත්‍යය අර්ථයෙක, දර්ශනකෘත්‍යය අර්ථයෙකි. අධිමොක්ෂකෘත්‍යසඞ්ඛ්‍යාත අර්ථය අනෙකෙක, ප්‍රග්‍රහකෘත්‍යසංඛ්‍යාත අර්ථය අනෙකෙක, උපස්ථානකෘත්‍යසඞ්ඛ්‍යාත අර්ථය අනෙකෙක, අවික්ෂෙපකෘත්‍යසඞ්ඛ්‍යාත අර්ථය අනෙකෙක, දර්ශනකෘත්‍යසඞ්ඛ්‍යාත අර්ථය අනෙකෙකි. යම් ඥානයෙකින් මේ නානාර්ථයෝ දත්නා ලද්දාහු ද, එ මැ ඥානයෙන් මේ නානාර්ථයෝ ප්‍රකට වූවාහු වෙත් යයි. එයින් කියනු ලැබෙයි: **''අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං'** යි.

සද්ධින්ද්‍රියාදි පඤ්චධර්මයන් (පරහට) දක්වනු සඳහා චතුර්විධ නාමව්‍යඤ්ජන නාමනිරුක්ති නාමාභිලාපයෝ වෙති. (අධිමොක්ෂාදි) පඤ්චාර්ථයන් දක්වනු සඳහා නාමව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙත්. ධර්මනිරුක්තීහු අන්‍යයෝ යැ, අර්ථනිරුක්තීහු අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ විවිධ වූ නිරුක්තීහු දත්නා ලද්දාහු වෙත් ද, එ මැ ඥානයෙන් මේ නානානිරුක්තීහු ප්‍රකට කොට දත්නා ලද්දාහු වෙත් යයි. එයින් කියනු ලැබෙයි: **"නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං"**යි.

පඤ්චධර්මයෙහි ඥානයෝ යැ, පඤ්චඅර්ථයෙහි ඥානයෝ යැ, දශනිරුක්තියෙහි ඥානයෝ යි. ධර්මයෙහි ඥානයෝ අන්‍යයෝ යැ, අර්ථයෙහි ඥානයෝ අන්‍යයෝ යැ, නිරුක්තියෙහි ඥානයෝ අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ විවිධ වූ ඥානයෝ දත්නා ලද්දාහු වෙත් ද, එ මැ ඥානයෙන් මේ විවිධ වූ ඥානයෝ දත්නා ලද්දාහු වෙත් යයි. එයින් කියනු ලැබෙයි: **"පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං"** යි.

ශ්‍රද්ධාබලය ධර්මයෙක, වීර්යබලය ධර්මයෙක, ස්මෘතිබලය ධර්මයෙක, සමාධිබලය ධර්මයෙක, ප්‍රඥාබලය ධර්මයෙකි. ශ්‍රද්ධාබලය අන්‍යධර්මයෙක, වීර්යබලය අන්‍යධර්මයෙක, ස්මෘතිබලය අන්‍යධර්මයෙක, සමාධිබලය අන්‍යධර්මයෙක, ප්‍රඥාබලය අන්‍යධර්මයෙකි. යම් ඥානයෙකින් මේ විවිධ ධර්මයෝ දත්නා ලද්දාහු ද, එ මැ ඥානයෙන් මේ නානාධර්මයෝ ප්‍රකට කොට දත්නා ලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි. **"ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං"** යි.

අස්සද්ධියෙ අකම්පියට්ඨො අත්ථො, කොසජ්ජෙ අකම්පියට්ඨො අත්ථො, පමාදෙ අකම්පියට්ඨො අත්ථො, උද්ධච්චෙ අකම්පියට්ඨො අත්ථො, අවිජ්ජාය අකම්පියට්ඨො අත්ථො. අඤ්ඤො අස්සද්ධියෙ අකම්පියට්ඨො අත්ථො, අඤ්ඤො කොසජ්ජෙ අකම්පියට්ඨො අත්ථො, අඤ්ඤො පමාදෙ අකම්පියට්ඨො අත්ථො, අඤ්ඤො උද්ධච්චෙ අකම්පියට්ඨො අත්ථො, අඤ්ඤො අවිජ්ජාය අකම්පියට්ඨො අත්ථො. යෙන ඤාණෙන ඉමෙ නානා අත්ථා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා අත්ථා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං'.

පඤ්ච ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්ච අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා. අඤ්ඤා ධම්මනිරුත්තියො, අඤ්ඤා අත්ථනිරුත්තියො. යෙන ඤාණෙන ඉමා නානා නිරුත්තියො ඤාතා, තෙනෙව ඤාණෙන ඉමා නානා නිරුත්තියො පටිවිදිතා'ති. තෙන වුච්චති: 'නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං'.

පඤ්චසු ධම්මෙසු ඤාණානි, පඤ්චසු අත්ථෙසු ඤාණානි, දසසු නිරුත්තීසු ඤාණානි. අඤ්ඤානි ධම්මෙසු ඤාණානි, අඤ්ඤානි අත්ථෙසු ඤාණානි, අඤ්ඤානි නිරුත්තීසු ඤාණානි. යෙන ඤාණෙන ඉමෙ නානාඤාණා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා ඤාණා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'.

සතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො ධම්මො, විරියසම්බොජ්ඣඞ්ගො ධම්මො, පීතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, සමාධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ධම්මො. අඤ්ඤො සතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො විරියසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො පීතිසම්බොජ්ඣඞ්ගො ධම්මො අඤ්ඤො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො සමාධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, අඤ්ඤො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ධම්මො. යෙන ඤාණෙන ඉමෙ නානා ධම්මා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානාධම්මා පටිවිදිතා'ති තෙන වුච්චති: 'ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං.'

උපට්ඨානට්ඨො අත්ථො, පවිචයට්ඨො අත්ථො, පග්ගහට්ඨො අත්ථො, ඵරණට්ඨො අත්ථො, උපසමට්ඨො අත්ථො, අවික්ඛෙපට්ඨො අත්ථො, පටිසඞ්ඛානට්ඨො අත්ථො. අඤ්ඤො උපට්ඨානට්ඨො අත්ථො, අඤ්ඤො පවිචයට්ඨො අත්ථො, අඤ්ඤො පග්ගහට්ඨො අත්ථො, අඤ්ඤො ඵරණට්ඨො අත්ථො, අඤ්ඤො උපසමට්ඨො අත්ථො, අඤ්ඤො අවික්ඛෙපට්ඨො අත්ථො, අඤ්ඤො පටිසඞ්ඛානට්ඨො අත්ථො. යෙන ඤාණෙන ඉමෙ නානා අත්ථා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා අත්ථා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං.'

අශ්‍රද්ධායෙන් අකම්ප්‍යභාවය අර්ථයෙක, කෞශීද්‍යයෙන් අකම්ප්‍යභාවය අර්ථයෙක, ප්‍රමාදයෙන් අකම්ප්‍යභාවය අර්ථයෙක, ඖද්ධත්‍යයෙන් අකම්ප්‍යභාවය අර්ථයෙක, අවිද්‍යායෙන් අකම්ප්‍යභාවය අර්ථයෙකි. අශ්‍රද්ධායෙන් අකම්ප්‍යභාවාර්ථය අනෙකෙක, කෞශීද්‍යයෙන් අකම්ප්‍යභාවාර්ථය අනෙකෙක, ප්‍රමාදයෙන් අකම්ප්‍යභාවාර්ථය අනෙකෙක, ඖද්ධත්‍යයෙන් අකම්ප්‍යභාවාර්ථය අනෙකෙක, අවිද්‍යායෙන් අකම්ප්‍යභාවාර්ථය අනෙකෙකි. යම් ඥානයෙකින් මේ නානාර්ථයෝ දන්නා ලද්දාහු වෙත් ද එ මැ ඥානයෙන් මේ නානාර්ථයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **"අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං"** යි.

ශ්‍රද්ධාබලාදි පඤ්චධර්මයන් දක්වනු සඳහා බ්‍යඤ්ජනනිරුක්ත්‍යාභිලාපයෝ වෙති. පඤ්ච අර්ථයන් දක්වනු සඳහා බ්‍යඤ්ජනනිරුක්ත්‍යාභිලාපයෝ වෙත්. ධර්මනිරුක්තීහු අන්‍යයෝ යැ අර්ථනිරුක්තීහු අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ විවිධනිරුක්තීහු දන්නාලද්දාහු වෙත් ද එ මැ ඥානයෙන් මේ විවිධ නිරුක්තීහු ප්‍රකට කොට දන්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **"නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං"** යි.

පඤ්චධර්මයෙහි ඥානයෝ යැ, පඤ්චඅර්ථයෙහි ඥානයෝ යැ, දශනිරුක්තියෙහි ඥානයෝ යි. ධර්මඥානයෝ අන්‍යයෝ යැ, අර්ථඥානයෝ අන්‍යයෝ යැ, නිරුක්තිඥානයෝ අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ විවිධඥානයෝ දන්නාලද්දාහු ද එ මැ ඥානයෙන් මේ විවිධඥානයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **'පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'** යි.

ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ධර්මයෙක, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ධර්මයෙක, වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය ධර්මයෙක, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ධර්මයෙක, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ධර්මයෙක, සමාධිසම්බොධ්‍යඞ්ගය ධර්මයෙක, උපෙක්‍ෂාසම්බොධ්‍යඞ්ගය ධර්මයෙකි. ස්මෘතිසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙක, ධර්මවිචය සම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙක, වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙක, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙක, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙක, සමාධිසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙක, උපෙක්‍ෂාසම්බොධ්‍යඞ්ගධර්මය අනෙකෙකි. යම් ඥානයෙකින් මේ විවිධධර්මයෝ දන්නාලද්දාහු ද එ මැ ඥානයෙන් මේ විවිධධර්මයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: **"ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං"** යි.

උපස්ථාන (එළඹසිටි) ස්වභාවය අර්ථයෙක, ප්‍රවිචය ස්වභාවය අර්ථයෙක, ප්‍රග්‍රහස්වභාවය අර්ථයෙක, පැතිරීම් ස්වභාවය අර්ථයෙක, උපශම ස්වභාවය අර්ථයෙක, අවික්‍ෂෙප ස්වභාවය අර්ථයෙක, මධ්‍යස්ථ ස්වභාවය අර්ථයෙකි. උපස්ථානස්වභාවාර්ථය අනෙකෙක, ප්‍රවිචයස්වභාවාර්ථය අනෙකෙක, ප්‍රග්‍රහස්වභාවාර්ථය අනෙකෙක, පැතිරීම් ස්වභාවාර්ථය අනෙකෙක, උපශමස්වභාවාර්ථය අනෙකෙක, අවික්‍ෂෙපස්වභාවාර්ථය අනෙකෙක, මධ්‍යස්ථස්වභාවාර්ථය අනෙකෙකි. යම් ඥානයෙකින් මේ ඥානාර්ථයෝ දන්නාලද්දාහු වෙත් ද එ මැ ඥානයෙන් මේ නානාර්ථයෝ අභිමුඛ කොට දන්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි **'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං'** යි.

සත්ත ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, සත්ත අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා. අඤ්ඤා ධම්මනිරුත්තියො, අඤ්ඤා අත්ථනිරුත්තියො, යෙන ඤාණෙන ඉමා නානානිරුත්තියො ඤාතා, තෙනෙව ඤාණෙන ඉමා නානානිරුත්තියො පටිවිදිතා'ති. තෙන වුච්චති: 'නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං'.

සත්තසු ධම්මෙසු ඤාණානි, සත්තසු අත්ථෙසු ඤාණානි, චුද්දසසු නිරුත්තීසු ඤාණානි, අඤ්ඤානි ධම්මෙසු ඤාණානි, අඤ්ඤානි අත්ථෙසු ඤාණානි, අඤ්ඤානි නිරුත්තීසු ඤාණානි, යෙන ඤාණෙන ඉමෙ නානාඤාණා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානාඤාණා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'.

සම්මාදිට්ඨි ධම්මො, සම්මාසඞ්කප්පො ධම්මො, සම්මාවාචා ධම්මො, සම්මාකම්මන්තො ධම්මො සම්මාආජීවො ධම්මො, සම්මාවායාමො ධම්මො, සම්මාසති ධම්මො, සම්මාසමාධි ධම්මො. අඤ්ඤො සම්මාදිට්ඨි ධම්මො, අඤ්ඤො සම්මාසඞ්කප්පො ධම්මො, අඤ්ඤො සම්මාවාචා ධම්මො, අඤ්ඤො සම්මාකම්මන්තො ධම්මො, අඤ්ඤො සම්මාආජීවො ධම්මො, අඤ්ඤො සම්මාවායාමො ධම්මො, අඤ්ඤො සම්මාසති ධම්මො, අඤ්ඤො සම්මාසමාධි ධම්මො, යෙන ඤාණෙන ඉමෙ නානාධම්මා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානාධම්මා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං'.

දස්සනට්ඨො අත්ථො, අභිනිරොපනට්ඨො අත්ථො, පරිග්ගහට්ඨො අත්ථො, සමුට්ඨානට්ඨො අත්ථො, වොදානට්ඨො අත්ථො, පග්ගහට්ඨො අත්ථො, උපට්ඨානට්ඨො අත්ථො, අවික්ඛෙපට්ඨො අත්ථො. අඤ්ඤො දස්සනට්ඨො අත්ථො, අඤ්ඤො අභිනිරොපනට්ඨො අත්ථො, අඤ්ඤො පරිග්ගහට්ඨො අත්ථො, අඤ්ඤො සමුට්ඨානට්ඨො අත්ථො, අඤ්ඤො වොදානට්ඨො අත්ථො, අඤ්ඤො පග්ගහට්ඨො අත්ථො, අඤ්ඤො උපට්ඨානට්ඨො අත්ථො, අඤ්ඤො අවික්ඛෙපට්ඨො අත්ථො, යෙන ඤාණෙන ඉමෙ නානා අත්ථා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානා අත්ථා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං'.

අට්ඨ ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, අට්ඨ අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා. අඤ්ඤා ධම්මනිරුත්තියො, අඤ්ඤා අත්ථනිරුත්තියො. යෙන ඤාණෙන ඉමා නානානිරුත්තියො ඤාතා, තෙනෙව ඤාණෙන ඉමා නානානිරුත්තියො පටිවිදිතා'ති. තෙන වුච්චති: 'නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං'.

සතිසම්බොජ්ඣඞ්ගාදි සප්තධර්මයන් දක්වනු සඳහා ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති. උපස්ථානාදි සප්තාර්ථයන් දක්වනු සඳහා ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙත්. ධර්මනිරුක්තීහු අන්‍යයෝ යැ, අර්ථනිරුක්තීහු අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ නානා නිරුක්තීහු දත්නාලද්දෑහු වෙත් ද, එ මැ ඥානයෙන් මේ නානා නිරුක්තීහු ප්‍රකට කොට දත්නාලද්දෑහු යයි. එයින් කියනු ලැබෙයි: **'නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං'** යි.

සප්තධර්මඥානයෝ යැ සප්ත අර්ථඥානයෝ යැ. තුදුස්නිරුක්තිඥානයෝ යි. ධර්මඥානයෝ අන්‍යයෝ යැ, අර්ථඥානයෝ අන්‍යයෝ යැ. නිරුක්තිඥානයෝ අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ විවිධඥානයෝ දත්නා ලද්දෑහු වෙත් ද එ මැ ඥානයෙන් මේ විවිධඥානයෝ ප්‍රකට කොට දත්නාලද්දෑහු යයි. එයින් කියනු ලැබෙයි: **'පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'** යි.

සම්‍යග්දෘෂ්ටිය ධර්මයෙක, සම්‍යක්සංකල්පය ධර්මයෙක, සම්‍යග්වචනය ධර්මයෙක, සම්‍යක්කර්මාන්තය ධර්මයෙක, සම්‍යගාජීවය ධර්මයෙක, සම්‍යග්ව්‍යායාමය ධර්මයෙක, සම්‍යක්ස්මෘතිය ධර්මයෙක, සම්‍යක්සමාධිය ධර්මයෙකි. සම්‍යග්දෘෂ්ටිධර්මය අනෙකෙක, සම්‍යක්සංකල්පධර්මය අනෙකෙක, සම්‍යග්වචනධර්මය අනෙකෙක, සම්‍යක්කර්මාන්තධර්මය අනෙකෙක, සම්‍යගාජීවධර්මය අනෙකෙක, සම්‍යග්ව්‍යායාමධර්මය අනෙකෙක, සම්‍යක්ස්මෘතිධර්මය අනෙකෙක, සම්‍යක්සමාධිධර්මය අනෙකෙකි. යම් ඥානයෙකින් මේ නානාධර්මයෝ දත්නාලද්දෑහු ද එ මැ ඥානයෙන් මේ නානාධර්මයෝ ප්‍රකට කොට දත්නා ලද්දෑහු යයි. එයින් කියනු ලැබෙයි: **'ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං'** යි.

දර්ශනස්වභාවය අර්ථයෙක, අභිනිරෝපණ (සිත අරමුණට නගන) ස්වභාවය අර්ථයෙක, පරිග්‍රහ (චතුර්විධ වාක්සංවර) ස්වභාවය අර්ථයෙක, සමුත්ථාන (ත්‍රිවිධ කායසංවර) ස්වභාවය අර්ථයෙක, පරිශුද්ධස්වභාවය අර්ථයෙක, (වීර්‍ය්‍ය වශයෙන්) ප්‍රග්‍රහ ස්වභාවය අර්ථයෙක, උපස්ථානාර්ථය අර්ථයෙක, අවික්ෂෙපාර්ථය අර්ථයෙකි. දර්ශනස්වභාවාර්ථය අනෙකෙක, අභිනිරෝපණස්වභාවාර්ථය අනෙකෙක, පරිග්‍රහස්වභාවාර්ථය අනෙකෙක, සමුත්ථානස්වභාවාර්ථය අනෙකෙක, පරිශුද්ධස්වභාවාර්ථය අනෙකෙක, ප්‍රග්‍රහස්වභාවාර්ථය අනෙකෙක, උපස්ථානස්වභාවාර්ථය අනෙකෙක, අවික්ෂෙපස්වභාවාර්ථය අනෙකෙකි. යම් ඥානයෙකින් මේ නානාඅර්ථයෝ දත්නාලද්දෑහු ද එ මැ ඥානයෙන් මේ නානා අර්ථයෝ ප්‍රකට කොට දත්නා ලද්දෑහු යයි. එයින් කියනු ලැබෙයි: **'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං'** යි.

අෂ්ටධර්මයන් (මෙරමාහට) දක්වනු පිණිස ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති. අෂ්ටඅර්ථයන් දක්වනු පිණිස ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙත්. ධර්මනිරුක්තීහු අන්‍යයෝ යැ, අර්ථනිරුක්තීහු අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ නානානිරුක්තීහු දත්නා ලද්දෑහු ද එ මැ ඥානයෙන් මේ නානානිරුක්තීහු ප්‍රකට කොට දත්නා ලද්දෑහු යයි. එයින් කියනු ලැබෙයි: **'නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං'** යි.

අට්ඨසු ධම්මෙසු ඤාණානි, අට්ඨසු අත්ථෙසු ඤාණානි, සොළසසු නිරුත්තීසු ඤාණානි. අඤ්ඤානි ධම්මෙසු ඤාණානි, අඤ්ඤානි අත්ථෙසු ඤාණානි, අඤ්ඤානි නිරුත්තීසු ඤාණානි. යෙන ඤාණෙන ඉමෙ නානාඤාණා ඤාතා, තෙනෙව ඤාණෙන ඉමෙ නානාඤාණා පටිවිදිතා'ති. තෙන වුච්චති: 'පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'.

**පටිසම්භිදාඤාණනිද්දෙසො.**

## 29-31. ඤාණත්තයං

කථං විහාරනානත්තෙ පඤ්ඤා විහාරට්ඨෙ ඤාණං, සමාපත්තිනානත්තෙ පඤ්ඤා සමාපත්තට්ඨෙ ඤාණං, විහාරසමාපත්තිනානත්තෙ පඤ්ඤා විහාරසමාපත්තට්ඨෙ ඤාණං:

නිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති අනිමිත්තො විහාරො, පණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති අප්පණිහිතො විහාරො, අභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති සුඤ්ඤතො විහාරො.

නිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අනිමිත්තං ආවජ්ජිත්වා සමාපජ්ජති, අනිමිත්තා සමාපත්ති. පණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අප්පණිහිතං ආවජ්ජිත්වා සමාපජ්ජති, අප්පණිහිතා සමාපත්ති. අභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං සුඤ්ඤතං ආවජ්ජිත්වා සමාපජ්ජති, සුඤ්ඤතා සමාපත්ති.

අෂ්ටධර්මඥානයෝ යැ අෂ්ටඅර්ථඥානයෝ යැ සොළොස් නිරුක්තිඥානයෝ යි. ධර්මඥානයෝ අන්‍යයෝ යැ අර්ථඥානයෝ අන්‍යයෝ යැ. නිරුක්තිඥානයෝ අන්‍යයෝ යි. යම් ඥානයෙකින් මේ විවිධඥානයෝ දත්නාලද්දාහු ද එ මැ ඥානයෙන් මේ විවිධඥානයෝ මොනොවට දත්නාලද්දාහු යයි. එයින් කියනු ලැබෙයි: '**පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං**'යි.

ඒ ඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානනානත්තෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං'යි.

**ප්‍රතිසංවිද්ඥානනිර්දේශ යි.**

## 29-31. ඥානත්‍රය

කිසෙයින් (අනිත්‍යානුදර්ශනාදි) විහාරනානාත්වයෙහි ප්‍රඥාව විහාරාර්ථඥාන වෙයි, (අනිමිත්තාදි) සමාපත්තිනානාත්වයෙහි ප්‍රඥාව සමාපත්ත්‍යර්ථඥාන වෙයි, විහාරසමාපත්තිනානාත්වයෙහි ප්‍රඥාව විහාරසමාපත්ත්‍යර්ථඥාන වෙයි යත්:

සංස්කාරනිමිත්ත භය විසින් මොනොවට දක්නේ සංස්කාරනිමිත්තප්‍රතිපක්ෂ නිර්වාණයෙහි අධිමුක්ත (නිම්න) බැවින් (සංස්කාරනිමිත්ත නුවණින්) ස්පර්ශ කොට කොට (එහි) භඞ්ගය (විදර්ශනාඥානයෙන්) දකී නම් (ඒ) අනිමිත්තවිහාර නම් වෙයි. තෘෂ්ණාව භය විසින් මොනොවට දක්නේ (තෘෂ්ණාප්‍රතිපක්ෂ) නිර්වාණයෙහි අධිමුක්ත බැවින් (තෘෂ්ණාව නුවණින්) ස්පර්ශ කොට කොට (එහි) භඞ්ගය දකී නම් (ඒ) අප්‍රණිහිතවිහාර නම් වෙයි. ආත්මාභිනිවේශය භය විසින් මොනොවට දක්නේ (ආත්මවිරහිත වූ) නිර්වාණයෙහි අධිමුක්ත බැවින් (අභිනිවේශය නුවණින්) ස්පර්ශ කොට කොට (එහි) භඞ්ගය දකී නම් (ඒ) ශූන්‍යතවිහාර නම් වේ.

නිමිත්ත භය විසින් මොනොවට දක්නේ අනිමිත්ත(නිර්වාණ)යෙහි අධිමුක්ත බැවින් (විපාක) ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට නිමිත්තප්‍රතිපක්ෂ වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් (ඒ) අනිමිත්තසමාපත්ති නම් වෙයි. ප්‍රණිධිය භය විසින් මොනොවට දක්නේ අප්‍රණිහිත(නිර්වාණ)යෙහි අධිමුක්ත බැවින් (විපාක) ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට තෘෂ්ණාප්‍රතිපක්ෂ වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් (ඒ) අප්‍රණිහිතසමාපත්ති නම් වෙයි. ආත්මාභිනිවේශය භය විසින් මොනොවට දක්නේ ශූන්‍යත(නිර්වාණ)යෙහි අධිමුක්ත බැවින් (විපාක) ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට ශූන්‍යත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් (ඒ) ශූන්‍යතසමාපත්ති නම් වේ.

නිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අනිමිත්තං ආවජ්ජිත්වා සමාපජ්ජති, අනිමිත්තා විහාරසමාපත්ති. පණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අප්පණිහිතං ආවජ්ජිත්වා සමාපජ්ජති, අප්පණිහිතා විහාරසමාපත්ති. අභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං සුඤ්ඤතං ආවජ්ජිත්වා සමාපජ්ජති, සුඤ්ඤතා විහාරසමාපත්ති.

රූපනිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, අනිමිත්තො විහාරො. රූපපණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, අප්පණිහිතො විහාරො. රූපාභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, සුඤ්ඤතො විහාරො.

රූපනිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අනිමිත්තං ආවජ්ජිත්වා සමාපජ්ජති, අනිමිත්තා සමාපත්ති. රූපපණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අප්පණිහිතං ආවජ්ජිත්වා සමාපජ්ජති, අප්පණිහිතා සමාපත්ති. රූපාභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං සුඤ්ඤතං ආවජ්ජිත්වා සමාපජ්ජති, සුඤ්ඤතා සමාපත්ති.

රූපනිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අනිමිත්තං ආවජ්ජිත්වා සමාපජ්ජති, අනිමිත්තා විහාරසමාපත්ති. රූපපණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අප්පණිහිතං ආවජ්ජිත්වා සමාපජ්ජති, අප්පණිහිතා විහාරසමාපත්ති. රූපාභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං සුඤ්ඤතං ආවජ්ජිත්වා සමාපජ්ජති, සුඤ්ඤතා විහාරසමාපත්ති.

නිමිත්ත භය විසින් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අභිමුඛත බැවින් (සංස්කාරනිමිත්ත නුවණින් ස්පර්ශ කොට කොට (එහි) භඞ්ගය දකී නම්, (විපාක) ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට නිමිත්තප්‍රතිපක්ෂ වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් (ඒ) අනිමිත්තවිහාරසමාපත්ති නම් වෙයි. ප්‍රණිධිය භය විසින් මොනො-වට දක්නේ අප්‍රණිහිතයෙහි අභිමුඛත බැවින් (තෘෂ්ණාව නුවණින්) ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම්, විපාක ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට අප්‍රණිහිත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵල-සමවතට සමවදී නම් (ඒ) අප්‍රණිහිත විහාරසමාපත්ති නම් වෙයි. ආත්මාභිනිවේශය භය විසින් මොනොවට දක්නේ ශූන්‍යතයෙහි අභිමුඛත බැවින් (ආත්මාභිනිවේශය නුවණින්) ස්පර්ශ කොට කොට (එහි) භඞ්ගය දකී නම්, (විපාක) ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට ශූන්‍යත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් (ඒ) ශූන්‍යතවිහාර සමාපත්ති නම් වේ.

රූපනිමිත්ත භය විසින් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අභි-මුඛත බැවින් (රූපනිමිත්ත නුවණින්) ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම්, අනිමිත්තවිහාර නම් වෙයි. රූපතෘෂ්ණාව භය විසින් මොනොවට දක්නේ අප්‍රණිහිත (නිර්වාණ)යෙහි අභිමුඛත බැවින් (රූපප්‍රණිධිය නුවණින්) ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම්, අප්‍රණිහිතවිහාර නම් වෙයි. රූපාභිනිවේශය භය විසින් මොනොවට දක්නේ ශූන්‍යත(නිර්වාණ)යෙහි අභිමුඛත බැවින් (රූපාභිනිවේශය නුවණින්) ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම්, ශූන්‍යතවිහාර නම් වේ.

රූපනිමිත්ත භයවශයෙන් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අභි-මුඛත බැවින් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට නිමිත්තප්‍රතිපක්ෂ වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අනිමිත්ත සමාපත්ති නම් වෙයි. රූපප්‍රණිධිය භයවශයෙන් මොනොවට දක්නේ අප්‍රණිහිතයෙහි අභිමුඛත බැවින් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට අප්‍රණිහිත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අප්‍රණිහිතසමාපත්ති නම් වෙයි. රූපාභිනිවේශය භයවශයෙන් මොනොවට දක්නේ ශූන්‍යතයෙහි අභිමුඛත බැවින් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට ශූන්‍යත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵල-සමවතට සමවදී නම් ශූන්‍යතසමාපත්ති නම් වේ.

රූපනිමිත්ත භයවශයෙන් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අභි-මුඛත බැවින් (රූපනිමිත්ත නුවණින්) ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම්, ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට නිමිත්තප්‍රතිපක්ෂ වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අනිමිත්තවිහාර-සමාපත්ති නම් වෙයි. රූපප්‍රණිධිය භයවශයෙන් මොනොවට දක්නේ අප්‍රණිහිතයෙහි අභිමුඛත බැවින් (රූපප්‍රණිධිය නුවණින්) ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට අප්‍රණිහිත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අප්‍රණිහිතවිහාරසමාපත්ති නම් වෙයි. රූපාභිනිවේශය භයවශයෙන් මොනොවට දක්නේ ශූන්‍යතයෙහි අභිමුඛත බැවින් ස්පර්ශ කොට කොට භඞ්ගය දකී නම්, ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්ෂා කොට ශූන්‍යත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරොධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් ශූන්‍යත-විහාරසමාපත්ති නම් වේ.

වෙදනානිමිත්තං -පෙ- සඤ්ඤානිමිත්තං -පෙ- සඞ්ඛාරනිමිත්තං -පෙ- විඤ්ඤාණනිමිත්තං -පෙ- චක්ඛුනිමිත්තං -පෙ- ජරාමරණනිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, අනිමිත්තො විහාරො. ජරාමරණපණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, අප්පණිහිතො විහාරො. ජරාමරණාභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, සුඤ්ඤතො විහාරො.

ජරාමරණනිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අනිමිත්තං ආවජ්ජිත්වා සමාපජ්ජති, අනිමිත්තා සමාපත්ති. ජරාමරණපණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අප්පණිහිතං ආවජ්ජිත්වා සමාපජ්ජති, අප්පණිහිතා සමාපත්ති. ජරාමරණාභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං සුඤ්ඤතං ආවජ්ජිත්වා සමාපජ්ජති සුඤ්ඤතා සමාපත්ති.

ජරාමරණනිමිත්තං භයතො සම්පස්සමානො අනිමිත්තෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අනිමිත්තං ආවජ්ජිත්වා සමාපජ්ජති අනිමිත්තා විහාරසමාපත්ති. ජරාමරණපණිධිං භයතො සම්පස්සමානො අප්පණිහිතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං අප්පණිහිතං ආවජ්ජිත්වා සමාපජ්ජති, අප්පණිහිතා විහාරසමාපත්ති. ජරාමරණාභිනිවෙසං භයතො සම්පස්සමානො සුඤ්ඤතෙ අධිමුත්තත්තා ඵුස්ස ඵුස්ස වයං පස්සති, පවත්තං අජ්ඣුපෙක්ඛිත්වා නිරොධං නිබ්බානං සුඤ්ඤතං ආවජ්ජිත්වා සමාපජ්ජති, සුඤ්ඤතා විහාරසමාපත්ති.

අඤ්ඤො අනිමිත්තො විහාරො, අඤ්ඤො අප්පණිහිතො විහාරො, අඤ්ඤො සුඤ්ඤතො විහාරො. අඤ්ඤා අනිමිත්තා සමාපත්ති, අඤ්ඤා අප්පණිහිතා සමාපත්ති, අඤ්ඤා සුඤ්ඤතා සමාපත්ති. අඤ්ඤා අනිමිත්තා විහාරසමාපත්ති, අඤ්ඤා අප්පණිහිතා විහාරසමාපත්ති, අඤ්ඤා සුඤ්ඤතා විහාරසමාපත්ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'විහාරනානත්තෙ පඤ්ඤා විහාරට්ඨෙ ඤාණං, සමාපත්තිනානත්තෙ පඤ්ඤා සමාපත්තට්ඨෙ ඤාණං, විහාරසමාපත්තිනානත්තෙ පඤ්ඤා විහාරසමාපත්තට්ඨෙ ඤාණං.'

ඤාණත්තයනිද්දෙසො.

වේදනානිමිත්ත ... සංඥානිමිත්ත ... සංස්කාරනිමිත්ත ... විඥානනිමිත්ත ... චක්ඛුනිමිත්ත ... ජරාමරණනිමිත්ත භයවශයෙන් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අධිමුක්ත බැවින් (ජරාමරණනිමිත්ත) සපර්ශී කොට කොට භඞ්ගය දකී නම්, අනිමිත්තවිහාර නම් වෙයි. ජරාමරණප්‍රණිධිය භය-වශයෙන් මොනොවට දක්නේ අප්‍රණිහිතයෙහි අධිමුක්ත බැවින් (ජරාමරණ ප්‍රණිධිය) සපර්ශී කොට කොට භඞ්ගය දකී නම් අප්‍රණිහිතවිහාර නම් වෙයි. ජරාමරණාභිනිවේශය භයවශයෙන් මොනොවට දක්නේ ශූන්‍යතයෙහි අධිමුක්ත බැවින් (ජරාමරණාභිනිවේශය) සපර්ශී කොට කොට භඞ්ගය දකී නම් ශූන්‍යතවිහාර නම් වේ.

ජරාමරණනිමිත්ත භයවශයෙන් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අධිමුක්ත බැවින් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට අනිමිත්ත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අනිමිත්ත සමාපත්ති නම් වෙයි. ජරාමරණප්‍රණිධිය භයවශයෙන් මොනොවට දක්නේ අප්‍රණිහිතයෙහි අධිමුක්ත බැවින් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට අප්‍රණිහිත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අප්‍රණිහිතසමාපත්ති නම් වෙයි. ජරාමරණාභිනිවේශය භය-වශයෙන් මොනොවට දක්නේ ශූන්‍යතයෙහි අධිමුක්ත බැවින් ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට ශූන්‍යත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් ශූන්‍යතසමාපත්ති නම් වේ.

ජරාමරණනිමිත්ත භයවශයෙන් මොනොවට දක්නේ අනිමිත්තයෙහි අධිමුක්ත බැවින් (ජරාමරණනිමිත්ත) සපර්ශී කොට කොට භඞ්ගය දකී නම්, ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට නිමිත්තප්‍රතිපක්‍ෂ වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අනිමිත්තවිහාර-සමාපත්ති නම් වෙයි. ජරාමරණප්‍රණිධිය භයවශයෙන් මොනොවට දක්නේ අප්‍රණිහිතයෙහි අධිමුක්ත බැවින් (ජරාමරණප්‍රණිධිය) සපර්ශී කොට කොට භඞ්ගය දකී නම්, ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට අප්‍රණිහිත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵලසමවතට සමවදී නම් අප්‍රණිහිතවිහාරසමාපත්ති නම් වෙයි. ජරාමරණාභිනිවේශය භයවශයෙන් මොනොවට දක්නේ ශූන්‍යතයෙහි අධිමුක්ත බැවින් (ජරාමරණාභිනි-වේශය) සපර්ශී කොට කොට භඞ්ගය දකී නම්, ප්‍රවෘත්තිය අධ්‍යුපෙක්‍ෂා කොට ශූන්‍යත වූ නිර්වාණ සඞ්ඛ්‍යාත නිරෝධය ආවර්ජනා කොට ඵල-සමවතට සමවදී නම් ශූන්‍යතවිහාරසමාපත්ති නම් වේ.

අනිමිත්තවිහාරය අනෙකෙක, අප්‍රණිහිතවිහාරය අනෙකෙක, ශූන්‍යත-විහාරය අනෙකෙකි. අනිමිත්තසමාපත්තිය අනෙකක, අප්‍රණිහිතසමා-පත්තිය අනෙකක, ශූන්‍යතසමාපත්තිය අනෙකකි. අනිමිත්තවිහාරසමා-පත්තිය අනෙකක, අප්‍රණිහිතවිහාරසමාපත්තිය අනෙකක, ශූන්‍යත විහාරසමාපත්තිය අනෙකකි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යි. එයින් කියනු ලැබෙයි: **'විහාරනානත්තෙ පඤ්ඤා විහාරට්ඨෙ ඤාණං, සමාපත්තිනා-නත්තෙ පඤ්ඤා සමාපත්තට්ඨෙ ඤාණං, විහාරසමාපත්තිනානත්තෙ පඤ්ඤා විහාරසමාපත්තට්ඨෙ ඤාණං'යි**

ඥානකථානිර්දේශ යි.

# 32. ආනන්තරිකසමාධිඤාණං

කථං අවික්ඛෙපපරිසුද්ධත්තා[1] ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිස්මිං[2] ඤාණං:

නෙක්ඛම්මවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි, තස්ස සමාධිස්ස වසෙන උප්පජ්ජති ඤාණං, තෙන ඤාණෙන ආසවා ඛීයන්ති, ඉති පඨමං සමථො, පච්ඡා ඤාණං, තෙන ඤාණෙන ආසවානං ඛයො හොති. තෙන වුච්චති: 'අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිස්මිං[3] ඤාණං'.

**ආසවාති** කතමෙ තෙ ආසවා: කාමාසවො, භවාසවො, දිට්ඨාසවො අවිජ්ජාසවො.

කත්ථෙතෙ ආසවා ඛීයන්ති: සොතාපත්තිමග්ගෙන අනවසෙසො දිට්ඨාසවො ඛීයති, අපායගමනීයො කාමාසවො ඛීයති, අපායගමනීයො භවාසවො ඛීයති, අපායගමනීයො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

සකදාගාමිමග්ගෙන ඔළාරිකො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

අනාගාමිමග්ගෙන අනවසෙසො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

අරහත්තමග්ගෙන අනවසෙසො භවාසවො ඛීයති, අනවසෙසො අවිජ්ජාසවො ඛියති. එත්ථෙතෙ අසවා ඛීයන්ති.

අබ්‍යාපාදවසෙන -පෙ- ආලොකසඤ්ඤාවසෙන -පෙ- අවික්ඛෙපවසෙන -පෙ- ධම්මවවත්ථානවසෙන -පෙ- ඤාණවසෙන -පෙ- පාමොජ්ජවසෙන -පෙ- පඨමජ්ඣානවසෙන -පෙ- දුතියජ්ඣානවසෙන -පෙ- තතියජ්ඣානවසෙන -පෙ- චතුත්ථජ්ඣානවසෙන -පෙ- ආකාසානඤ්චායතනසමාපත්තිවසෙන -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවසෙන -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවසෙන -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවසෙන -පෙ- පඨවිකසිණවසෙන -පෙ- ආපොකසිණවසෙන -පෙ- තෙජොකසිණවසෙන -පෙ- වායොකසිණවසෙන -පෙ- නීලකසිණවසෙන -පෙ- පීතකසිණවසෙන -පෙ- ලොහිතකසිණවසෙන -පෙ- ඔදාතකසිණවසෙන -පෙ- ආකාසකසිණවසෙන -පෙ- විඤ්ඤාණකසිණවසෙන -පෙ- බුද්ධානුස්සතිවසෙන -පෙ- ධම්මානුස්සතිවසෙන -පෙ- සඞ්ඝානුස්සතිවසෙන -පෙ- සීලානුස්සතිවසෙන -පෙ- චාගානුස්සතිවසෙන -පෙ- දෙවතානුස්සතිවසෙන -පෙ- ආනාපානසති[4]වසෙන -පෙ- මරණසති[5]වසෙන -පෙ- කායගතාසතිවසෙන -පෙ- උපසමානුස්සතිවසෙන -පෙ- උද්ධුමාතකසඤ්ඤාවසෙන -පෙ- විනීලකසඤ්ඤාවසෙන -පෙ- විපුබ්බකසඤ්ඤාවසෙන -පෙ- විච්ඡිද්දකසඤ්ඤාවසෙන -පෙ- වික්ඛායිතකසඤ්ඤාවසෙන -පෙ-

1. පාරිසුද්ධත්තා - සී, 2. සමාධිම්හි - මජසං, 3. ආනන්තරියසමාධිස්මිං - සී 1,2.
4 ආනාපානස්සති - PTS 5 මරණස්සති - PTS

# 32. ආනන්තරිකසමාධිඥානය

කිසෙයින් අවික්ෂෙපපරිශුද්ධභාවයෙන් කාමාදි ආශ්‍රවයන්ගේ සමුච්ඡේදයෙහි ප්‍රඥාව ආනන්තරික (මාර්ග) සමාධිඥාන වෙයි යත්:

නෛෂ්ක්‍රම්‍යවශයෙන් සිතෙහි එකඟ බව යයි කියනලද අවික්ෂෙපසමාධිය වෙයි. ඒ සමාධිහුගේ වශයෙන් මාර්ගඥානය (යථාක්‍රමයෙන්) උපදී. ඒ ඥානයෙන් ආස්‍රවයෝ (සමුච්ඡේදවශයෙන්) ක්ෂය වෙත්. මෙසේ පූර්වභාගයෙහි ශමථය වෙයි. අපරභාගයෙහි (මාර්ගක්ෂණයෙහි) ඥානය වේ. ඒ මාර්ගඥානයෙන් ආස්‍රවයන්ගේ ක්ෂය වේ. එයින් කියනු ලැබෙයි: 'අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිස්මිං ඤාණං'යි.

ආසවා යනු: ඒ ආස්‍රවයෝ කවරහු යත්: කාමාස්‍රව යැ භවාස්‍රව යැ දෘෂ්ට්‍යාස්‍රව යැ අවිද්‍යාස්‍රව යි.

කොතැන්හි ඒ ආස්‍රවයෝ ක්ෂය වෙති යත්: සෝවාන්මගින් අනවශෙෂ වූ දෘෂ්ට්‍යාස්‍රවය ක්ෂය වෙයි. අපායගමනීය වූ කාමාස්‍රවය ක්ෂය වෙයි. අපායගමනීය වූ භවාස්‍රවය ක්ෂය වෙයි. අපායගමනීය වූ අවිද්‍යාස්‍රවය ක්ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්ෂය වෙති.

සෙදගැමිමගින් ඖදාරික වූ කාමාස්‍රවය ක්ෂය වෙයි. එය හා සමග එක්වැ සිටි භවාස්‍රවය ක්ෂය වෙයි. එය හා එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්ෂය වෙති.

අනැගැමිමගින් අනවශෙෂ වූ කාමාස්‍රවය ක්ෂය වෙයි. ඒ හා එක් වැ සිටි භවාස්‍රවය ක්ෂය වෙයි. එය හා එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්ෂය වෙති.

රහත්මගින් අනවශෙෂ වූ භවාස්‍රවය ක්ෂය වෙයි අනවශෙෂ වූ අවිද්‍යාස්‍රවය ක්ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්ෂය වෙත්.

අව්‍යාපාදවශයෙන් ... ආලොකසංඥාවශයෙන් ... අවික්ෂෙපවශයෙන් ... ධම්මවවත්ථානවශයෙන් ... ඥානවශයෙන් ... ප්‍රාමොද්‍යවශයෙන් ... ප්‍රථමධ්‍යානවශයෙන් ... ද්විතීයධ්‍යානවශයෙන් ... තෘතීයධ්‍යානවශයෙන් ... චතුර්ථධ්‍යානවශයෙන් ... ආකාසානඤ්චායතනසමාපත්තිවශයෙන් ... විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවශයෙන් ... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවශයෙන් ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවශයෙන් ... පඨවිකසිණවශයෙන් ... ආපොකසිණ වශයෙන් ... තෙජොකසිණ වශයෙන් ... වායොකසිණ වශයෙන් ... නීලකසිණ වශයෙන් ... පීතකසිණ වශයෙන් ... ලොහිතකසිණ වශයෙන් ඔදාතකසිණ වශයෙන් ... ආකාසකසිණ වශයෙන් ... විඤ්ඤාණකසිණ වශයෙන් ... බුද්ධානුස්සති වශයෙන් ... ධම්මානුස්සති වශයෙන් ... සඞ්ඝානුස්සති වශයෙන් ... සීලානුස්සති වශයෙන් ... චාගානුස්සති වශයෙන් ... දෙවතානුස්සති වශයෙන් ... ආනාපානසති වශයෙන් ... මරණසති වශයෙන් ... කායගතාසති වශයෙන් ... උපසමානුස්සති වශයෙන් ... උද්ධුමාතක සංඥා වශයෙන් ... විනීලක සංඥා වශයෙන් ... විපුබ්බක සංඥා වශයෙන් ... විච්ඡිද්දක සංඥා වශයෙන් ... වික්ඛායිතක සංඥා වශයෙන් ...

විකඛිත්තකසඤ්ඤාවසෙන -පෙ- හතවිකඛිත්තකසඤ්ඤාවසෙන -පෙ- ලොහිතකසඤ්ඤාවසෙන -පෙ- පුළුවකසඤ්ඤාවසෙන -පෙ- අට්ඨිකසඤ්ඤාවසෙන -පෙ- දීඝං අස්සාසවසෙන -පෙ- දීඝං පස්සාසවසෙන -පෙ- රස්සං අස්සාසවසෙන -පෙ- රස්සං පස්සාසවසෙන -පෙ- සබ්බකායපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- සබ්බකායපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසවසෙන -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං පස්සාසවසෙන -පෙ- පීතිපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- පීතිපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- සුඛපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- සුඛපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සාසවසෙන -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සාසවසෙන -පෙ- චිත්තපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- චිත්තපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- අභිප්පමොදයං චිත්තං අස්සාසවසෙන -පෙ- අභිප්පමොදයං චිත්තං පස්සාසවසෙන -පෙ- සමාදහං චිත්තං -පෙ- විමොචයං චිත්තං -පෙ- අනිච්චානුපස්සී -පෙ- විරාගානුපස්සී -පෙ- නිරොධානුපස්සී -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන -පෙ- පටිනිස්සග්ගානුපස්සී පස්සාසවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමාධි. තස්ස සමාධිස්ස වසෙන උප්පජ්ජති ඤාණං, තෙන ඤාණෙන ආසවා ඛීයන්ති. ඉති පඨමං සමථො, පච්ඡා ඤාණං, තෙන ඤාණෙන ආසවානං ඛයො හොති. තෙන වුච්චති: 'අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිස්මිං ඤාණං'.

**ආසවාති** කතමෙ තෙ ආසවා: කාමාසවො, භවාසවො, දිට්ඨාසවො, අවිජ්ජාසවො.

කත්ථෙතෙ ආසවා ඛීයන්ති: සොතාපත්තිමග්ගෙන අනවසෙසො දිට්ඨාසවො ඛීයති, අපායගමනීයො කාමාසවො ඛීයති, අපායගමනීයො භවාසවො ඛීයති, අපායගමනීයො අවිජ්ජාසවො ඛීයති. එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

සකදාගාමිමග්ගෙන ඔළාරිකො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

අනාගාමිමග්ගෙන අනවසෙසො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති. එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

අරහත්තමග්ගෙන අනවසෙසො භවාසවො ඛීයති, අනවසෙසො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරිකසමාධිස්මිං ඤාණං'.

**ආනන්තරිකසමාධිඤාණනිද්දෙසො.**

විඛිත්තතා සංඥා වශයෙන් ... හතවිඛිත්තතා සංඥා වශයෙන් ... පුළුවක සංඥාවශයෙන් ... අට්ඨික සංඥා වශයෙන් ... දීඝ කොට ආශ්වාස කිරීම් වශයෙන් .. දීඝ කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් . හ්‍රස්ව කොට ආශ්වාස කිරීම් වශයෙන්... හ්‍රස්ව කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... සියලු ආශ්වාස ප්‍රශ්වාසකාය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කිරීම් වශයෙන් ... සියලු ආශ්වාස ප්‍රශ්වාසකාය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් .. (ඖදාරික වූ ආශ්වාසප්‍රශ්වාස සඞ්ඛ්‍යාත) කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කිරීම් වශයෙන් ... කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... ප්‍රීතිය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කිරීම් වශයෙන් ... ප්‍රීතිය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... සුඛය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කිරීම් වශයෙන් ... සුඛය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... (සංඥාවේදනා සඞ්ඛ්‍යාත) චිත්තසංස්කාරය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කිරීම් වශයෙන් ... චිත්තසංස්කාරය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... චිත්තසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කිරීම් වශයෙන් චිත්තසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... චිත්තය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කිරීම් වශයෙන් ... චිත්තය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... සිත සතුටු කෙරෙමින් ආශ්වාස කිරීම් වශයෙන් ... සිත සතුටු කෙරෙමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් ... (අරමුණෙහි) සිත සම වැ තබමින් ... සිත (නීවරණාදියෙන්) මුදමින් ... අනිත්‍යානුපස්සනා වශයෙන් බලමින් ... විරාගානුපස්සනා වශයෙන් බල-මින් ... නිරොධානුපස්සනා වශයෙන් බලමින් ... වුට්ඨානගාමිනීවිපස්සනා වශයෙන් බලමින් ආශ්වාස කිරීම් වශයෙන් ... වුට්ඨානගාමිනීවිපස්සනා වශයෙන් බලමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිතෙතකාග්‍රතාව අවික්ෂෙප-සමාධි නම් වෙයි. ඒ සමාධිහුගේ වශයෙන් මාර්ගඥානය උපදී. ඒ ඥානයෙන් ආස්‍රවයෝ ක්‍ෂය වෙත්. මෙසේ පූර්වභාගයෙහි ශමථය වෙයි. අපරභාග-යෙහි ඥානය වෙයි. ඒ ඥානයෙන් ආස්‍රවයන්ගේ ක්‍ෂය වෙයි. එයින් කියනු ලැබෙයි: **'අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනාපානසතිසමාධිස්මිං ඤාණං'යි.**

**ආසවා** යනු: ඒ ආස්‍රවයෝ කවරහ යත්: කාමාස්‍රව යැ භවාස්‍රව යැ දෘෂ්ට්‍යාස්‍රව යැ අවිද්‍යාස්‍රව යි.

කොතැන්හි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙත් ද යත්: සෝවාන්මඟින් අනවශෙෂ වූ දෘෂ්ට්‍යාස්‍රවය ක්‍ෂය වෙයි. අපායගමනීය වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි. අපායගමනීය වූ භවාස්‍රවය ක්‍ෂය වෙයි. අපායගමනීය වූ අවිද්‍යාස්‍රවය ක්‍ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙත්.

සෙදගැමිමඟින් ඖදාරික වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි. එය හා එක් වැ සිටි භවාස්‍රවය ක්‍ෂය වෙයි. එය හා එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්‍ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙත්.

අනාගාමි මඟින් අනවශෙෂ වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි. එය හා එක් වැ සිටි භවාස්‍රවය ක්‍ෂය වෙයි. එය හා එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්‍ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙත්.

රහත්මඟින් අනවශෙෂ වූ භවාස්‍රවය ක්‍ෂය වෙයි. අනවශෙෂ වූ අවිද්‍යා-ස්‍රවය ක්‍ෂය වේ. මෙහි ඒ ආස්‍රවයෝ ක්‍ෂය වෙත්.

ඒ ඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි **''අවික්ඛෙපපරිසුද්ධත්තා ආසවසමුච්ඡෙදෙ පඤ්ඤා ආනාපානසතිසමාධිස්මිං ඤාණං'** යි.

**ආනාපානසතිසමාධිඥාන නිර්දේශ යි.**

# 33. අරණවිහාරඤාණං

කථං දස්සනාධිපතෙය්‍යං සන්තො ච විහාරාධිගමො පණීතාධිමුත්තතා පඤ්ඤා අරණවිහාරෙ ඤාණං:

**දස්සනාධිපතෙය්‍යන්ති** අනිච්චානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, දුක්ඛානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, අනත්තානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, රූපෙ අනිච්චානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, රූපෙ දුක්ඛානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, රූපෙ අනත්තානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, ජරාමරණෙ දුක්ඛානුපස්සනා දස්සනාධිපතෙය්‍යං, ජරාමරණෙ අනත්තානුපස්සනා දස්සනාධිපතෙය්‍යං.

**සන්තො ච විහාරාධිගමොති** සුඤ්ඤතො විහාරො සන්තො විහාරාධිගමො, අනිමිත්තො විහාරො සන්තො විහාරාධිගමො, අප්පණිහිතො විහාරො සන්තො විහාරාධිගමො.

**පණීතාධිමුත්තතාති** සුඤ්ඤතෙ අධිමුත්තතා පණීතාධිමුත්තතා, අනිමිත්තෙ අධිමුත්තතා පණීතාධිමුත්තතා, අප්පණිහිතෙ අධිමුත්තතා පණීතාධිමුත්තතා.

**අරණවිහාරොති** පඨමං ඣානං[1] අරණවිහාරො, දුතියං ඣානං අරණවිහාරො, තතියං ඣානං අරණවිහාරො, චතුත්ථං ඣානං අරණවිහාරො, ආකාසානඤ්චායතනසමාපත්ති අරණවිහාරො -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති අරණවිහාරො.

**අරණවිහාරොති** කෙනට්ඨෙන අරණවිහාරො: පඨමෙන ඣානෙන[2] නීවරණෙ හරතීති අරණවිහාරො, දුතියෙන ඣානෙන විතක්කවිචාරෙ හරතීති අරණවිහාරො, තතියෙන ඣානෙන පීතිං හරතීති අරණවිහාරො, චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛෙ හරතීති අරණවිහාරො, ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤං පටිඝසඤ්ඤං නානත්තසඤ්ඤං හරතීති අරණවිහාරො, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤං හරතීති අරණවිහාරො, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං හරතීති අරණවිහාරො, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං හරතීති අරණවිහාරො. අයං අරණවිහාරො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'දස්සනාධිපතෙය්‍යං සන්තො ච විහාරාධිගමො පණීතාධිමුත්තතා පඤ්ඤා අරණවිහාරෙ ඤාණං'.

**අරණවිහාරඤාණනිද්දෙසො.**

---

1. පඨමජ්ඣානං - මජසං. 2 පඨමජ්ඣානෙන - මජසං.

# 33. අරණවිහාරඥානය

කිසෙයින් දර්ශනාධිපතිභාවය ද ශාන්තවිහාරාධිගමය ද ප්‍රණීතාධිමුක්තතා ද යන (ත්‍රිවිධ) ප්‍රඥාව අරණවිහාරඥාන වෙයි යත්:

**දස්සනාධිපතෙය්‍යං** යනු: අනිත්‍යානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. දුඃඛානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. අනාත්මානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. රූපයෙහි අනිත්‍යානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. රූපයෙහි දුඃඛානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. රූපයෙහි අනාත්මානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි ... විඥනයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිත්‍යානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. ජරාමරණයෙහි දුඃඛානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වෙයි. ජරාමරණයෙහි අනාත්මානුදර්ශනය දස්සනාධිපතෙය්‍ය නම් වේ.

**සන්තො ච විහාරාධිගමො** යනු: ශූන්‍යතාකාරයෙන් පැවැති අර්හත්ඵලසමාපත්තිය ශාන්තවිහාරාධිගම නම් වෙයි. අනිමිත්තාකාරයෙන් පැවැති අර්හත්ඵලසමාපත්තිය ශාන්තවිහාරාධිගම නම් වෙයි. අප්‍රණිහිතාකාරයෙන් පැවැති අර්හත්ඵලසමාපත්තිය ශාන්තවිහාරාධිගම නම් වේ.

**පණීතාධිමුත්තතා** යනු: ශූන්‍යතඵලසමාපත්තියෙහි (පූර්වභාගප්‍රඥ වශයෙන්) අධිමුක්ත බව ප්‍රණීතාධිමුක්තතා නම් වෙයි. අනිමිත්තඵලසමාපත්තියෙහි අධිමුක්ත බව ප්‍රණීතාධිමුක්තතා නම් වෙයි. අප්‍රණිහිතඵලසමාපත්තියෙහි අධිමුක්ත බව ප්‍රණීතාධිමුක්තතා නම් වේ.

**අරණවිහාරො** යනු: (අර්හත්ඵලසමාපත්තියට සමවදිනු කැමැත්තහුගේ විදර්ශනාවට අරමුණු වූ) ප්‍රථමධ්‍යානසමාපත්තිය අරණවිහාර නම් වෙයි. ද්විතීයධ්‍යාන සමාපත්තිය අරණවිහාර නම් වෙයි. තෘතීයධ්‍යානසමාපත්තිය අරණවිහාර නම් වෙයි. චතුර්ථධ්‍යානසමාපත්තිය අරණවිහාර නම් වෙයි. ආකාසානඤ්චායතන සමාපත්තිය අරණවිහාර නම් වෙයි ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය අරණවිහාර නම් වේ.

**අරණවිහාරො** යනු කවර අරුතෙකින් අරණවිහාර වේ ද යත්: ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. ද්විතීයධ්‍යානයෙන් විතර්කවිචාරයන් දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. තෘතීයධ්‍යානයෙන් ප්‍රීතිය දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. චතුර්ථධ්‍යානයෙන් සුඛදුඃඛයන් දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. ආකාසානඤ්චායතනසමාපත්තියෙන් රූපසංඥව ප්‍රතිඝසංඥව නානාත්වසංඥව දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. විඤ්ඤාණඤ්චායතනසමාපත්තියෙන් ආකාසානඤ්චායතනසංඥව දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතනසංඥව දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතනසංඥව දුරු කෙරේ නු යි අරණවිහාර නම් වෙයි. මේ අරණවිහාර යි.

ඒ අරණවිහාරඥානය ඥතාර්ථයෙන් ඥන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යි. එයින් කියනු ලැබෙයි: '**දස්සනාධිපතෙය්‍යං සන්තො ච විහාරාධිගමො පණීතාධිමුත්තතා පඤ්ඤා අරණවිහාරෙ ඤාණං**' යි.

**අරණවිහාරඥාන නිර්දේශ යි.**

# 34. නිරොධසමාපත්තිඤාණං

කථං ද්වීහි බලෙහි සමන්නාගතත්තා තයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා සොළසහි ඤාණචරියාහි නවහි සමාධිචරියාහි වසීභාවතා පඤ්ඤා නිරොධසමාපත්තියා ඤාණං:

**ද්වීහි බලෙහීති** ද්වෙ බලානි: සමථබලං, විපස්සනාබලං.

කථං සමථබලං: නෙක්ඛම්මවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමථබලං, අබ්‍යාපාදවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමථබලං, ආලොකසඤ්ඤාවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමථබලං, අවික්ඛෙපවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමථබලං, -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමථබලං, පටිනිස්සග්ගානුපස්සී පස්සාසවසෙන චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපො සමථබලං.

**සමථබලන්ති** කෙනට්ඨෙන සමථබලං: පඨමෙන ඣානෙන නීවරණෙ න කම්පතීති සමථබලං, දුතියෙන ඣානෙන විතක්කවිචාරෙ න කම්පතීති සමථබලං, තතියෙන ඣානෙන පීතියා න කම්පතීති සමථබලං, චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛෙ න කම්පතීති සමථබලං, ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය න කම්පතීති සමථබලං, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤාය න කම්පතීති සමථබලං, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය න කම්පතීති සමථබලං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය න කම්පතීති සමථබලං, උද්ධච්චෙ ච උද්ධච්චසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච න කම්පති, න චලති, න වෙධතීති සමථබලං. ඉදං සමථබලං.

කතමං විපස්සනාබලං: අනිච්චානුපස්සනා විපස්සනාබලං, දුක්ඛානුපස්සනා විපස්සනාබලං, අනත්තානුපස්සනා විපස්සනාබලං, නිබ්බිදානුපස්සනා විපස්සනාබලං, විරාගානුපස්සනා විපස්සනාබලං, නිරොධානුපස්සනා විපස්සනාබලං, පටිනිස්සග්ගානුපස්සනා විපස්සනාබලං. රූපෙ අනිච්චානුපස්සනා විපස්සනාබලං -පෙ- රූපෙ පටිනිස්සග්ගානුපස්සනා විපස්සනාබලං, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා විපස්සනාබලං.

# 34. නිරොධසමාපත්තිඥානය

කිසෙයින් (ශමථවිදර්ශනා යන) බල දෙකින් සමන්වාගතවන බැවින් (වාචාදි) තුන් සංස්කාරයන්ගේ ද නිරුද්ධ කිරීමෙන් ෂොඩශඥානචර්‍ය්‍යායෙන් නව සමාධිචර්‍ය්‍යායෙන් වශීභාවය ඇති ප්‍රඥාව නිරොධසමාපත්තිඥාන වෙයි යත්:

**ද්වීහි බලෙහි** යනු. බල දෙකෙකි: ශමථබල යැ විදර්ශනාබල යි.

ශමථබලය කවරෙ යත්: නෛෂ්ක්‍රම්‍ය වශයෙන් චිත්තෛකාග්‍රතා-සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල නම් වෙයි. අව්‍යාපාද වශයෙන් චිත්තෛකා-ග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල නම් වෙයි. ආලොකසංඥා වශයෙන් චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල නම් වෙයි. අවික්ෂෙප වශයෙන් චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල නම් වෙයි ... ව්‍යුත්ථානගාමිනීවිපස්සනා වශයෙන් බලමින් ආශ්වාස කිරීම් වශයෙන් චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල නම් වෙයි. ව්‍යුත්ථානගාමිනී විපස්සනා වශයෙන් බලමින් ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල නම් වේ.

**සමථබලං** යනු: කවර අරුතෙකින් ශමථබල වෙයි යත්: ප්‍රථම-ධ්‍යානයෙන් නීවරණයෙහි (නීවරණ නිමිති කොට) නො සැලේ නු යි ශමථබල නම් වෙයි. ද්විතීයධ්‍යානයෙන් විතර්කවිචාරයෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි. තෘතීයධ්‍යානයෙන් ප්‍රීතියෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි. චතුර්ථධ්‍යානයෙන් සුඛදුක්ඛයෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි ආකාසානඤ්චායතනසමාපත්තියෙන් රූපසංඥායෙහි ප්‍රතිඝසංඥායෙහි නානාත්වසංඥායෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි. විඤ්ඤාණඤ්චායතනසමාපත්තියෙන් ආකාසානඤ්චායතනසංඥායෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙන් විඤ්ඤාණඤ්චායතනසංඥායෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතනසංඥායෙහි නො සැලේ නු යි ශමථබල නම් වෙයි. ඖද්ධත්‍යයෙහි ද ඖද්ධත්‍ය-සහගතක්ලේශයෙහි ද (ඖද්ධත්‍යසම්ප්‍රයුක්ත) සතර නාමස්කන්ධයෙහි ද කම්පා නො වෙයි නො සැලෙයි නො වෙවුලා නු යි ශමථබල නම්. මේ ශමථබල යි.

**විදර්ශනාබල** කවරෙ යත්: අනිත්‍යානුදර්ශනය විදර්ශනාබල යැ. දුඃඛානු-දර්ශනය විදර්ශනාබල යැ. අනාත්මානුදර්ශනය විදර්ශනාබල යැ. නිර්වේදානුදර්ශනය විදර්ශනාබල යැ. විරාගානුදර්ශනය විදර්ශනාබල යැ. නිරොධානුපස්සනාව විදර්ශනාබල යැ. පටිනිස්සග්ගානුපස්සනාව විදර්ශනාබල යැ. රූපයෙහි අනිච්චානුපස්සනාව විදර්ශනාබල යැ ... රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව විදර්ශනාබල යැ. වෙදනායෙහි .. සංඥායෙහි සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව විදර්ශනාබල යි.

**විපස්සනාබලන්ති** කෙනට්ඨෙන විපස්සනාබලං: අනිච්චානුපස්සනාය නිච්චසඤ්ඤාය න කම්පතීති විපස්සනාබලං, දුක්ඛානුපස්සනාය සුඛසඤ්ඤාය න කම්පතීති විපස්සනාබලං, අනත්තානුපස්සනාය අත්තසඤ්ඤාය න කම්පතීති විපස්සනාබලං, නිබ්බිදානුපස්සනාය නන්දියා න කම්පතීති විපස්සනාබලං, විරාගානුපස්සනාය රාගෙ න කම්පතීති විපස්සනාබලං, නිරොධානුපස්සනාය සමුදයෙ න කම්පතීති විපස්සනාබලං, පටිනිස්සග්ගානුපස්සනාය ආදානෙ න කම්පතීති විපස්සනාබලං, අවිජ්ජාය ච අවිජ්ජාසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච න කම්පති, න චලති, න වෙධතීති විපස්සනාබලං. ඉදං වුච්චති විපස්සනාබලං.

**තයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියාති** කතමෙසං තිණ්ණන්නං සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා: දුතියජ්ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා වචීසඞ්ඛාරා පටිප්පස්සද්ධා හොන්ති, චතුත්ථජ්ඣානං සමාපන්නස්ස අස්සාසපස්සාසා කායසඞ්ඛාරා පටිප්පස්සද්ධා හොන්ති, සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරා පටිප්පස්සද්ධා හොන්ති, ඉමෙසං තිණ්ණන්නං සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා.

**සොළසහි ඤාණචරියාහීති** කතමෙහි සොළසහි ඤාණචරියාහි: අනිච්චානුපස්සනා ඤාණචරියා, දුක්ඛානුපස්සනා ඤාණචරියා, අනත්තානුපස්සනා ඤාණචරියා, නිබ්බිදානුපස්සනා ඤාණචරියා, විරාගානුපස්සනා ඤාණචරියා, නිරොධානුපස්සනා ඤාණචරියා, පටිනිස්සග්ගානුපස්සනා ඤාණචරියා, විවට්ටානුපස්සනා ඤාණචරියා, සොතාපත්තිමග්ගො ඤාණචරියා, සොතාපත්තිඵලසමාපත්ති ඤාණචරියා, සකදාගාමිමග්ගො ඤාණචරියා, සකදාගාමිඵලසමාපත්ති ඤාණචරියා, අනාගාමිමග්ගො ඤාණචරියා, අනාගාමිඵලසමාපත්ති ඤාණචරියා, අරහත්තමග්ගො ඤාණචරියා, අරහත්තඵලසමාපත්ති ඤාණචරියා. ඉමෙහි සොළසහි ඤාණචරියාහි.

**නවහි සමාධිචරියාහීති** කතමෙහි නවහි සමාධිචරියාහි: පඨමං ඣානං සමාධිචරියා, දුතියං ඣානං සමාධිචරියා, තතියං ඣානං සමාධිචරියා, චතුත්ථං ඣානං සමාධිචරියා, ආකාසානඤ්චායතනසමාපත්ති -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්ති -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති සමාධිචරියා, පඨමං ඣානං පටිලාභත්ථාය විතක්කො ච විචාරො ච පීති ච සුඛං ච චිත්තෙකග්ගතා ච -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය විතක්කො ච විචාරො ච පීති ච සුඛං ච චිත්තෙකග්ගතා ච. ඉමාහි නවහි සමාධිචරියාහි

**විපස්සනාබලං** යනු කවර අරුතෙකින් විදර්ශනාබල නම් වෙයි යත්: අනිච්චානුපස්සනායෙන් නිත්‍යසංඥයෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, දුක්ඛානුපස්සනායෙන් සුඛසංඥයෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, අනත්තානුපස්සනායෙන් ආත්මසංඥයෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, නිබ්බිදානුපස්සනායෙන් තෘෂ්ණායෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, විරාගානුපස්සනායෙන් රාගයෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, නිරොධානුපස්සනායෙන් සමුදයෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, පටිනිස්සග්ගානුපස්සනායෙන් ආදානයෙහි නො සැලේ නු යි විදර්ශනාබල යැ, අවිද්‍යායෙහි ද අවිද්‍යාසහගත කෙලශයෙහි ද සතර නාමස්කන්ධයෙහි ද කම්පා නො වෙයි, නො සැලෙයි, නො වෙවුලා නු යි විදර්ශනාබල යි. මේ විදර්ශනා බල නම් වේ.

**තයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා** යනු: කවර තුන් සංස්කාර-යන්ගේ සන්හිඳීමෙනැ යත්: ද්විතීයධ්‍යානයට සමවත්තුගේ විතර්කවිචාර සඞ්ඛ්‍යාත වාක්සංස්කාරයෝ ද සන්හිඳුනාහු වෙති. චතුර්ථධ්‍යානයට සමවත්තුගේ ආශ්වාස ප්‍රශ්වාස සඞ්ඛ්‍යාත කායසංස්කාරයෝ සන්හිඳුනාහු වෙති. සංඥවෙදයිතනිරොධසමාපත්තියට සමවත්තුගේ සංඥව ද වෙදනාව ද යන චිත්තසංස්කාරයෝ සන්හිඳුනාහු වෙත්. මේ තුන් සංස්කාරයන්ගේ සන්හිඳීමෙයා.

**සොළසහි ඤාණචරියාහි** යනු: කවර සොළොස් ඥානචර්‍ය්‍යායෙන යත්: අනිච්චානුපස්සනාව ඥානචර්‍ය්‍යා යැ, දුක්ඛානුපස්සනාව ඥානචර්‍ය්‍යා යැ, අනත්තානුපස්සනාව ඥානචර්‍ය්‍යා යැ, නිබ්බිදානුපස්සනාව ඥානචර්‍ය්‍යා යැ, විරාගානුපස්සනාව ඥානචර්‍ය්‍යා යැ, නිරොධානුපස්සනාව ඥානචර්‍ය්‍යා යැ, පටිනිස්සග්ගානුපස්සනාව ඥානචර්‍ය්‍යා යැ, විවට්ටානුපස්සනාව ඥානචර්‍ය්‍යා යැ, ස්‍රොතාපත්තිමාර්ගය ඥානචර්‍ය්‍යා යැ, ස්‍රොතාපත්තිඵලසමාපත්තිය ඥානචර්‍ය්‍යා යැ, සකෘදාගාමිමාර්ගය ඥානචර්‍ය්‍යා යැ, සකෘදාගාමිඵලසමාපත්තිය ඥානචර්‍ය්‍යා යැ, අනාගාමිමාර්ගය ඥානචර්‍ය්‍යා යැ, අනාගාමිඵලසමාපත්තිය ඥානචර්‍ය්‍යා යැ, අර්හත්මාර්ගය ඥානචර්‍ය්‍යා යැ, අර්හත්ඵලසමාපත්තිය ඥානචර්‍ය්‍යා යි. මේ සොළොස් ඥානචර්‍ය්‍යායෙනි.

**නවහි සමාධිචරියාහි** යනු: කවර නව සමාධිචර්‍ය්‍යායෙනැ යත්: ප්‍රථමධ්‍යානය සමාධිචර්‍ය්‍යා යැ, ද්විතීයධ්‍යානය සමාධිචර්‍ය්‍යා යැ, තෘතීය-ධ්‍යානය සමාධිචර්‍ය්‍යා යැ, චතුර්ථධ්‍යානය සමාධිචර්‍ය්‍යා යැ, ආකාසානඤ්චා-යතනසමාපත්තිය ... විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය ... ආකිඤ්චඤ්ඤා-යතනසමාපත්තිය ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය සමාධිචර්‍ය්‍යා යැ. ප්‍රථමධ්‍යානය ලැබීම පිණිස විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෙකාග්‍රතාව ද ... නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලැබීම පිණිස විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෙකාග්‍රතාව ද, (සමාධිචර්‍ය්‍යා යි.) මේ නව සමාධිචර්‍ය්‍යායෙනි.

**වසීති** පඤ්ච වසියො: ආවජ්ජන[1] වසී, සමාපජ්ජනවසී, අධිට්ඨානවසී, වුට්ඨානවසී, පච්චවෙක්ඛන[2]වසී.

පඨමං ඣානං යත්ථිච්ඡකං[3] යදිච්ඡකං යාවතිච්ඡකං ආවජ්ජති, ආවජ්ජනාය දන්ධායිතත්තං නත්ථීති ආවජ්ජනවසී, පඨමං ඣානං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං සමාපජ්ජති, සමාපජ්ජනාය දන්ධායිතත්තං නත්ථීති සමාපජ්ජනවසී, පඨමං ඣානං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං අධිට්ඨාති. අධිට්ඨානෙ දන්ධායිතත්තං නත්ථීති අධිට්ඨානවසී, පඨමං ඣානං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං වුට්ඨාති, වුට්ඨානෙ දන්ධායිතත්තං නත්ථීති වුට්ඨානවසී, පඨමං ඣානං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං පච්චවෙක්ඛති, පච්චවෙක්ඛනාය දන්ධායිතත්තං නත්ථීති පච්චවෙක්ඛනවසී.

දුතියං ඣානං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං ආවජ්ජති, ආවජ්ජනාය දන්ධායිතත්තං නත්ථීති ආවජ්ජනවසී, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං සමාපජ්ජති -පෙ- අධිට්ඨාති -පෙ- වුට්ඨාති -පෙ- පච්චවෙක්ඛති, පච්චවෙක්ඛනාය දන්ධායිතත්තං නත්ථීති පච්චවෙක්ඛනවසී. ඉමා පඤ්ච වසියො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'ද්වීහි බලෙහි සමන්නාගතත්තා තයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා සොළසහි ඤාණචරියාහි නවහි සමාධිචරියාහි වසීභාවතා පඤ්ඤා නිරොධසමාපත්තියා ඤාණං'.

**නිරොධසමාපත්තිඤාණනිද්දෙසො.**

## 35. පරිනිබ්බානඤාණං

**කථං සම්පජානස්ස පවත්තපරියාදානෙ පඤ්ඤා පරිනිබ්බානෙ ඤාණං:**

ඉධ සම්පජානො නෙක්ඛම්මෙන කාමච්ඡන්දස්ස පවත්තං පරියාදියති, අබ්‍යාපාදෙන බ්‍යාපාදස්ස පවත්තං පරියාදියති, ආලොකසඤ්ඤාය ථිනමිද්ධස්ස පවත්තං පරියාදියති, අවික්ඛෙපෙන උද්ධච්චස්ස පවත්තං පරියාදියති, ධම්මවවත්ථානෙන විචිකිච්ඡාය -පෙ- ඤාණෙන අවිජ්ජාය -පෙ- පාමොජ්ජෙන අරතියා -පෙ- පඨමෙන ඣානෙන නීවරණානං පවත්තං පරියාදියති -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසානං පවත්තං පරියාදියති.

---

1. ආවජ්ජනා . . . සමාපජ්ජනා - PTS, 2. පච්චවෙක්ඛණා - මජසං, සී 1, PTS
3 යථිච්ඡකං - PTS,

**වසී** යනු: පඤ්චවශීහු යැ: ආවර්ජනවශී යැ සමාපජ්ජනවශී යැ අධිෂ්ඨානවශී යැ ව්‍යුත්ථානවශී යැ ප්‍රත්‍යවෙක්ෂණවශී යයි.

ප්‍රථමධ්‍යානය යම් යම් තැනෙකැ කැමැති වේ ද යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද ඒ තාක් ආවර්ජන කෙරේ නම් මනොද්වාරාවර්ජනයෙහි අවශයෙහි පවත්නා (දන්ධායිත) බවෙක් නැත් නු යි ආවජ්ජන වසී නම. ප්‍රථමධ්‍යානය යම් යම් තැනෙකැ කැමැති වේ ද යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද, ඒ තාක් සමවදී නම් සමවැදීමෙහි දන්ධායිත බවෙක් නැත් නු යි සමාපජ්ජනවසී නම. ප්‍රථමධ්‍යානය යම් යම් තැනෙකැ කැමැති වේ ද යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද ඒ තාක් අධිෂ්ඨාන කෙරේ නම් අධිෂ්ඨානයෙහි දන්ධායිත බවෙක් නැත් නු යි අධිට්ඨානවසී නම. ප්‍රථමධ්‍යානයෙන් යම් යම් තැනෙකැ කැමැති වේ ද යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද, ඒ තාක් නැඟීසිටී නම් නැඟීසිටීමෙහි දන්ධායිත බවෙක් නැත් නු යි වුට්ඨානවසී නම. ප්‍රථමධ්‍යානයෙන් නැඟී යම් යම් තැනෙකැ කැමැති වේ ද යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද ඒ තාක් ප්‍රත්‍යවෙක්ෂා කෙරේ නම් ප්‍රත්‍යවෙක්ෂායෙහි දන්ධායිත බවෙක් නැත් නු යි පච්චවෙක්ඛනා වසී නම්.

ද්විතීයධ්‍යානය ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය යම් යම් තැනෙකැ කැමැති වේ ද, යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද, ඒ තාක් ආවර්ජනා කෙරේ නම් ආවර්ජනායෙහි දන්ධායිත බවෙක් නැත් නු යි ආවජ්ජන වසී නම. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය යම් යම් තැනෙකැ කැමැති වේ ද යම් යම් කලෙකැ කැමැති වේ ද යම් තාක් කල් කැමැති වේ ද, ඒ තාක් සමවදී නම් ... අධිෂ්ඨාන කෙරේ නම් ... නැඟීසිටී නම් ... ප්‍රත්‍යවෙක්ෂා කෙරේ නම් ප්‍රත්‍යවෙක්ෂායෙහි දන්ධායිත බවෙක් නැත් නු යි පච්චවෙක්ඛන වසී නම. මොහු පඤ්චවශීහු යැ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **ද්විහි බලෙහි සමන්නාගතත්තා තයො ච සඞ්ඛාරානං පටිප්පස්සද්ධියා සොළසහි ඤාණචරියාහි නවහි සමාධිචරියාහි වසීභාවතාපඤ්ඤා නිරොධසමාපත්තියා ඤාණං' යි.**

**නිරොධසමාපත්තිඥානනිර්දේශ යි.**

## 35. පරිනිර්වාණඥානය

**කිසෙයින්** සම්‍යග්ඥාන ඇත්තහු ගේ කෙලශ -ස්කන්ධප්‍රවෘත්ති ක්ෂය කිරීමෙහි ප්‍රඥාව පරිනිර්වාණඥාන වෙයි යත්:

**මෙ** සස්නෙහි සම්‍යග්ඥාන ඇත්තේ නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දයාගේ (අනුශය වශයෙන්) පැවැත්ම ක්ෂය කෙරෙයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයාගේ පැවැත්ම ක්ෂය කෙරෙයි. ආලෝක සංඥායෙන් ථිනමිද්ධයාගේ පැවැත්ම ක්ෂය කෙරෙයි. අවික්ෂෙපයෙන් ඖද්ධත්‍යයාගේ පැවැත්ම ක්ෂය කෙරෙයි. ධර්මනිශ්චයයෙන් විචිකිත්සාවගේ ... ඥානයෙන් අවිද්‍යාවගේ ... ප්‍රාමොද්‍යයෙන් අරතියගේ ... ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගේ පැවැත්ම ක්ෂය කෙරෙයි ... අර්හත්මාර්ගයෙන් සියලු කෙලෙසුන්ගේ පැවැත්ම ක්ෂය කෙරේ.

අථවා පන සම්පජානස්ස අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්තස්ස ඉදඤ්චෙව චක්ඛුපවත්තං[1] පරියාදියති, අඤ්ඤඤ්ච චක්ඛුපවත්තං න උප්පජ්ජති, ඉදඤ්චෙව සොතපවත්තං -පෙ- ඝානපවත්තං -පෙ- ජිව්හාපවත්තං -පෙ- කායපවත්තං -පෙ- මනොපවත්තං පරියාදියති, අඤ්ඤඤ්ච මනොපවත්තං න උප්පජ්ජති, ඉදං සම්පජානස්ස පවත්තපරියාදානෙ පඤ්ඤා පරිනිබ්බානෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'සම්පජානස්ස පවත්තපරියාදානෙ පඤ්ඤා පරිනිබ්බානෙ ඤාණං'.

**පරිනිබ්බානඤාණනිද්දෙසො.**

## 36. සමසීසට්ඨඤාණං

කථං සබ්බධම්මානං සම්මාසමුච්ඡෙදෙ නිරොධෙ ච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං:

**සබ්බධම්මානන්ති**: පඤ්චක්ඛන්ධා, ද්වාදසායතනානි, අට්ඨාරසධාතුයො, කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා, කාමාවචරා ධම්මා, රූපාවචරා ධම්මා, අරූපාවචරා ධම්මා, අපරියාපන්නා ධම්මා.

**සම්මාසමුච්ඡෙදෙති**: නෙක්ඛම්මෙන කාමච්ඡන්දං සම්මා සමුච්ඡින්දති, අබ්‍යාපාදෙන බ්‍යාපාදං සම්මා සමුච්ඡින්දති, ආලොකසඤ්ඤාය ථීනමිද්ධං සම්මා සමුච්ඡින්දති, අවික්ඛෙපෙන උද්ධච්චං සම්මා සමුච්ඡින්දති, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං සම්මා සමුච්ඡින්දති, ඤාණෙන අවිජ්ජං සම්මා සමුච්ඡින්දති, පාමොජ්ජෙන අරතිං සම්මා සමුච්ඡින්දති, පඨමෙන ඣානෙන නීවරණෙ සම්මා සමුච්ඡින්දති -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ සම්මා සමුච්ඡින්දති.

**නිරොධෙති**: නෙක්ඛම්මෙන කාමච්ඡන්දං නිරොධෙති, අබ්‍යාපාදෙන බ්‍යාපාදං නිරොධෙති, ආලොකසඤ්ඤාය ථීනමිද්ධං නිරොධෙති, අවික්ඛෙපෙන උද්ධච්චං නිරොධෙති, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං නිරොධෙති, ඤාණෙන අවිජ්ජං නිරොධෙති, පාමොජ්ජෙන අරතිං නිරොධෙති, පඨමෙන ඣානෙන නීවරණෙ නිරොධෙති -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ නිරොධෙති.

**අනුපට්ඨානතාති**: නෙක්ඛම්මං පටිලද්ධස්ස කාමච්ඡන්දො න උපට්ඨාති, අබ්‍යාපාදං පටිලද්ධස්ස බ්‍යාපාදො න උපට්ඨාති, ආලොකසඤ්ඤං පටිලද්ධස්ස ථීනමිද්ධං න උපට්ඨාති, අවික්ඛෙපං පටිලද්ධස්ස උද්ධච්චං න උපට්ඨාති, ධම්මවවත්ථානං පටිලද්ධස්ස විචිකිච්ඡා න උපට්ඨාති, ඤාණං පටිලද්ධස්ස අවිජ්ජා න උපට්ඨාති, පාමොජ්ජං පටිලද්ධස්ස අරති න උපට්ඨාති, පඨමං ඣානං පටිලද්ධස්ස නීවරණා න උපට්ඨහන්ති[2] -පෙ- අරහත්තමග්ගං පටිලද්ධස්ස සබ්බකිලෙසා න උපට්ඨහන්ති.[3]

1. චක්ඛුසම්පවත්තං - සී 1. 2,
2. නීවරණං න උප්පජ්ජති - සී 2. උපට්ඨන්ති - PTS, ස්‍යා
3. සබ්බකිලෙසා න උප්පජ්ජති - සී 1, උප්පජ්ජති - සී 2, උපට්ඨන්ති - PTS, ස්‍යා

තොහොත් සම්‍යග්ඥාන ඇති අනුපාදිශේෂනිර්වාණධාතුයෙන් පිරිනිවෙන්නාහුගේ මේ චක්ෂුෂ්ප්‍රවෘත්තිය ද ක්ෂය වෙයි. අන්‍ය වූ ද චක්ෂුෂ්ප්‍රවෘත්තියෙක් නූපදී. මේ ශ්‍රොත්‍රප්‍රවෘත්තිය ද ... ඝ්‍රාණප්‍රවෘත්තිය ... ජිහ්වාප්‍රවෘත්තිය ... කායප්‍රවෘත්තිය ... මනඃප්‍රවෘත්තිය ක්ෂය වෙයි. අන්‍ය වූ ද මනඃප්‍රවෘත්තියෙක් නූපදී. මේ සම්‍යග්ඥාන ඇත්තහුගේ ස්කන්ධප්‍රවෘත්ති ක්ෂය කිරීමෙහි ප්‍රඥාව පරිනිර්වාණඥාන නම් වේ.

ඒ පරිනිර්වාණඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'සම්පජානස්ස පවත්තපරියාදානෙ පඤ්ඤා පරිනෙබ්බානෙ ඤාණං'** යි.

**පරිනිර්වාණඥානනිර්දේශ යි.**

## 36. සමශීර්ෂාර්ථඥානය

කිසෙයින් සියලු ත්‍රෛභූමකධර්මයන් මොනොවට නිරුද්ධ කිරීමෙහි ද නිරුද්ධ කළ කල්හි නැවැත නො ඉපදීමෙහි ද ප්‍රඥාව සමශීර්ෂාර්ථඥාන වෙයි යත්:

**සබ්බධම්මානං** යනු: පඤ්චස්කන්ධ යැ දොළොස් ආයතනයෝ යැ අටළොස් ධාතු යැ කුශලධර්මයෝ යැ අකුශලධර්මයෝ යැ අව්‍යාකෘතධර්මයෝ යැ කාමාවචරධර්මයෝ යැ රූපාවචරධර්මයෝ යැ අරූපාවචරධර්මයෝ යැ අපර්‍යාපන්නධර්මයෝ යි.

**සම්මාසමුච්ඡෙදෙ** යනු: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය (විෂ්කම්භණවශයෙන්) මොනොවට සිඳියි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය මොනොවට සිඳියි. ආලොකසංඥායෙන් ස්ත්‍යානමිද්ධය මොනොවට සිඳියි. අවික්ෂෙපයෙන් ඖද්ධත්‍යය මොනොවට සිඳියි. ධර්මනිශ්චයයෙන් විචිකිත්සාව (තදඞ්ගවශයෙන්) මොනොවට සිඳියි. (මාර්ග) ඥානයෙන් අවිද්‍යාව (සමුච්ඡෙදවශයෙන්) මොනොවට සිඳියි. ප්‍රාමොද්‍යයෙන් අරතිය මොනොවට සිඳියි. ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් (විෂ්කම්භණ වශයෙන්) මොනොවට සිඳියි. ... අර්හත්මාර්ගයෙන් සියලු ක්ලේශයන් (සමුච්ඡෙදවශයෙන්) මොනොවට සිඳී.

**නිරොධෙ** යනු: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය නිරුද්ධ කෙරෙයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය නිරුද්ධ කෙරෙයි. ආලොකසංඥායෙන් ස්ත්‍යානමිද්ධය නිරුද්ධ කෙරෙයි. අවික්ෂෙපයෙන් ඖද්ධත්‍යය නිරුද්ධ කෙරෙයි. ධර්මනිශ්චයයෙන් විචිකිත්සාව නිරුද්ධ කෙරෙයි. ඥානයෙන් අවිද්‍යාව නිරුද්ධ කෙරෙයි. ප්‍රාමොද්‍යයෙන් අරතිය නිරුද්ධ කෙරෙයි. ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් නිරුද්ධ කෙරෙයි ... අර්හත්මාර්ගයෙන් සියලු කෙලෙසුන් නිරුද්ධ කෙරේ.

**අනුපට්ඨානතා** යනු: නෛෂ්ක්‍රම්‍යය ලද්දහුට කාමච්ඡන්දය නූපදියි. අව්‍යාපාදය ලද්දහුට ව්‍යාපාදය නූපදියි. ආලොකසංඥාව ලද්දහුට ස්ත්‍යානමිද්ධය නූපදියි. අවික්ෂෙපය ලද්දහුට ඖද්ධත්‍යය නූපදියි. ධර්මනිශ්චය ලද්දහුට විචිකිත්සාව නූපදියි. ඥානය ලද්දහුට අවිද්‍යාව නූපදියි. ප්‍රාමොද්‍යය ලද්දහුට අරතිය නූපදියි. ප්‍රථමධ්‍යානය ලද්දහුට නීවරණයෝ නූපදිති ... අර්හත්මාර්ගය ලද්දහුට සියලු ක්ලේශයෝ නූපදිත්

**සමන්ති** කාමච්ඡන්දස්ස පහීනත්තා නෙක්ඛම්මං සමං, බ්‍යාපාදස්ස පහීනත්තා අබ්‍යාපාදො සමං, ථීනමිද්ධස්ස පහීනත්තා ආලොකසඤ්ඤා සමං, උද්ධච්චස්ස පහීනත්තා අවික්ඛෙපො සමං, විචිකිච්ඡාය පහීනත්තා ධම්මවවත්ථානං සමං, අවිජ්ජාය පහීනත්තා ඤාණං සමං -පෙ- සබ්බකිලෙසානං පහීනත්තා අරහත්තමග්ගො සමං.

**සීසන්ති** තෙරස සීසානි: පලිබොධසීසඤ්ච තණ්හා, විනිබන්ධනසීසඤ්ච[1] මානො, පරාමාසසීසඤ්ච දිට්ඨි, වික්ඛෙපසීසඤ්ච උද්ධච්චං, කිලෙසසීසඤ්ච[2] අවිජ්ජා, අධිමොක්ඛසීසඤ්ච සද්ධා, පග්ගහසීසඤ්ච විරියං, උපට්ඨානසීසඤ්ච සති, අවික්ඛෙපසීසඤ්ච සමාධි, දස්සනසීසඤ්ච පඤ්ඤා, පවත්තසීසඤ්ච ජීවිතින්ද්‍රියං, ගොචරසීසඤ්ච විමොක්ඛො, සඞ්ඛාරසීසඤ්ච නිරොධො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා, තෙන වුච්චති: 'සබ්බධම්මානං සම්මා සමුච්ඡෙදෙ නිරොධෙ ච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං'.

**සමසීසට්ඨඤාණනිද්දෙසො.**

## 37. සල්ලෙඛට්ඨඤාණං

කථං පුථුනානත්තෙකත්තතෙජපරියාදානෙ[3] පඤ්ඤා සල්ලෙඛට්ඨෙ ඤාණං:

**පුථූති** රාගො පුථු, දොසො පුථු, මොහො පුථු, කොධො -පෙ- උපනාහො -පෙ- මක්ඛො -පෙ- පළාසො -පෙ- ඉස්සා -පෙ- මච්ඡරියං -පෙ- මායා -පෙ- සාඨෙය්‍යං -පෙ- ථම්භො -පෙ- සාරම්භො -පෙ- මානො -පෙ- අතිමානො -පෙ- මදො -පෙ- පමාදො -පෙ- සබ්බෙ කිලෙසා -පෙ- සබ්බෙ දුච්චරිතා -පෙ- සබ්බෙ අභිසඞ්ඛාරා -පෙ- සබ්බෙ භවගාමී කම්මා පුථු.

**නානත්තෙකත්තන්ති** කාමච්ඡන්දො නානත්තං, නෙක්ඛම්මං එකත්තං. බ්‍යාපාදො නානත්තං, අබ්‍යාපාදො එකත්තං. ථීනමිද්ධං නානත්තං, ආලොකසඤ්ඤා එකත්තං. උද්ධච්චං නානත්තං, අවික්ඛෙපො එකත්තං. විචිකිච්ඡා නානත්තං, ධම්මවවත්ථානං එකත්තං. අවිජ්ජා නානත්තං, ඤාණං එකත්තං. අරති නානත්තං, පාමොජ්ජං එකත්තං. නීවරණා නානත්තං, පඨමං ඣානං එකත්තං -පෙ- සබ්බෙ කිලෙසා නානත්තං, අරහත්තමග්ගො එකත්තං.

**තෙජොති** පඤ්ච තෙජා: චරණතෙජො, ගුණතෙජො, පඤ්ඤාතෙජො, පුඤ්ඤතෙජො, ධම්මතෙජො, චරණතෙජෙන තෙජිතත්තා දුස්සීල්‍යතෙජං පරියාදියති, ගුණතෙජෙන තෙජිතත්තා අගුණතෙජං පරියාදියති, පඤ්ඤාතෙජෙන තෙජිතත්තා දුප්පඤ්ඤතෙජං පරියාදියති, පුඤ්ඤතෙජෙන තෙජිතත්තා අපුඤ්ඤතෙජං පරියාදියති, ධම්මතෙජෙන තෙජිතත්තා අධම්මතෙජං පරියාදියති.

---

1 බන්ධනසීසඤ්ච - සං, සී 2 සංකිලෙසසීසඤ්ච - මජසං.
3. පුථුනානත්තෙකත්ත . - කත්ථචි

**සමං** යනු: කාමච්ඡන්දය ප්‍රහීණ බැවින් නෛෂ්ක්‍රම්‍යය සම යැ ව්‍යාපාදය ප්‍රහීණ බැවින් අව්‍යාපාදය සම යැ ස්ත්‍යානමිද්ධය ප්‍රහීණ බැවින් ආලෝකසංඥාව සම යැ ඖද්ධත්‍යය ප්‍රහීණ බැවින් අවික්ෂෙපය සම යැ විචිකිත්සාව ප්‍රහීණ බැවින් ධර්මනිශ්චය සම යැ අවිද්‍යාව ප්‍රහීණ බැවින් ඥානය සම යැ අරතිය ප්‍රහීණ බැවින් ප්‍රාමොද්‍යය සම යැ නීවරණයන් ප්‍රහීණ බැවින් ප්‍රථමධ්‍යානය සම යැ ... සියලු කෙලෙසුන් ප්‍රහීණ බැවින් අර්හත්මාර්ගය සම යි.

**සීසං** යනු: තෙළෙස් ශීර්ෂ කෙනෙක් වෙති: තෘෂ්ණාව පරිබොධශීර්ෂ ද මානය විනිබන්ධශීර්ෂ ද දෘෂ්ටිය පරාමර්ශශීර්ෂ ද ඖද්ධත්‍යය වික්ෂෙපශීර්ෂ ද අවිද්‍යාව ක්ලෙශශීර්ෂ ද ශ්‍රද්ධාව අධිමොක්ෂශීර්ෂ ද වීර්‍ය්‍යය ප්‍රග්‍රහශීර්ෂ ද ස්මෘතිය උපස්ථානශීර්ෂ ද සමාධිය අවික්ෂෙපශීර්ෂ ද ප්‍රඥාව දර්ශනශීර්ෂ ද ජීවිතේන්ද්‍රිය ප්‍රවෘත්තිශීර්ෂ ද විමොක්ෂය ගොචරශීර්ෂ ද නිරොධය සංස්කාරශීර්ෂ ද වේ.

ඒ සමශීර්ෂඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි එයින් කියනු ලැබෙයි: **'සබ්බධම්මානං සම්මාසමුච්ඡෙදෙ නිරොධෙ ච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං.'** යි.

**සමශීර්ෂාර්ථඥාන නිර්දේශ යි.**

## 37. සංලෙඛාර්ථඥානය

කිසෙයින් පෘථග්ජනාදීන් ද නානාස්වභාව වූ කාමච්ඡන්දාදීන් ද එක-ස්වභාව වූ නෛෂ්ක්‍රම්‍යාදීන් ද තෙජස් සඞ්ඛ්‍යාත දුශ්ශීල්‍යාදීන් ද ක්ෂය කිරීමෙහි ප්‍රඥාව සංලෙඛාර්ථඥාන වෙයි යත්:

**පුථු** යනු: රාගය (ලොකොත්තරයෙන්) අසම්මිශ්‍ර යැ ද්වේෂය අසම්මිශ්‍ර යැ මෝහය අසම්මිශ්‍ර යැ ක්‍රොධය .. බද්ධවෛරය ... ගුණමකු බව ... යුගග්‍රාහය ... ඊර්ෂ්‍යාව ... මාත්සර්‍ය්‍යය ... මායාව .. සඨ බව ... සිත ඉදිමුණු බව ... කරණොත්තරියකරණය ... මානය ... අතිමානය ... මදය .. ප්‍රමාදය ... සියලු කෙලශයෝ ... සියලු දුශ්චරිතයෝ ... සියලු අභිසංස්කාරයෝ ... සියලු භවගාමිකර්මයෝ අසම්මිශ්‍රයෝ යි.

**නානත්තෙකත්තං** යනු: කාමච්ඡන්දය නානාස්වභාව යැ නෛෂ්ක්‍රම්‍යය එකස්වභාව යැ ව්‍යාපාදය නානාස්වභාව යැ අව්‍යාපාදය එකස්වභාව යැ ස්ත්‍යානමිද්ධය නානාස්වභාව යැ ආලොකසංඥාව එකස්වභාව යැ ඖද්ධත්‍යය නානාස්වභාව යැ අවික්ෂෙපය එකස්වභාව යැ විචිකිත්සාව නානාස්වභාව යැ ධර්මනිශ්චය එකස්වභාව යැ අවිද්‍යාව නානාස්වභාව යැ ඥානය එකස්වභාව යැ අරතිය නානාස්වභාව යැ ප්‍රාමොද්‍යය එකස්වභාව යැ නීවරණයෝ නානාස්වභාව යැ ප්‍රථමධ්‍යානය එකස්වභාව යැ ... සියලු කෙලශයෝ නානාස්වභාව යැ අර්හත්මාර්ගය එකස්වභාව යි.

**තෙජො** යනු: තෙජස් පසෙකි: ශීල සඞ්ඛ්‍යාත චරණතෙජස යැ සමාධි සඞ්ඛ්‍යාත ගුණතෙජස යැ විදර්ශනා සඞ්ඛ්‍යාත ප්‍රඥාතෙජස යැ ආර්‍ය්‍යමාර්ගකුශල සඞ්ඛ්‍යාත පුණ්‍යතෙජස යැ බුද්ධවචනසඞ්ඛ්‍යාත ධර්ම-තෙජස යි. ශීලතෙජසින් තියුණු කළ බැවින් දුශ්ශීලභාව සඞ්ඛ්‍යාත තෙජස ක්ෂය කෙරෙයි. සමාධිතෙජසින් තියුණු කළ බැවින් වික්ෂෙප සඞ්ඛ්‍යාත අගුණතෙජස ක්ෂය කෙරෙයි. විදර්ශනාතෙජසින් තියුණු කළ බැවින් මොහතෙජස ක්ෂය කෙරෙයි. ආර්‍ය්‍යමාර්ග කුශලතෙජසින් තියුණු කළ බැවින් අකුශලකර්මතෙජස ක්ෂය කෙරෙයි. ධර්මතෙජසින් තියුණු කළ බැවින් නානාතීර්ථකසමයවචන සඞ්ඛ්‍යාත අධර්මතෙජස ක්ෂය කෙරේ.

**සල්ලෙඛොති** කාමච්ඡන්දො අසල්ලෙඛො, නෙක්ඛම්මං සල්ලෙඛො, බ්‍යාපාදො අසල්ලෙඛො, අබ්‍යාපාදො සල්ලෙඛො, ථීනමිද්ධං අසල්ලෙඛො, ආලොකසඤ්ඤා සල්ලෙඛො, උද්ධච්චං අසල්ලෙඛො, අවික්ඛෙපො සල්ලෙඛො, විචිකිච්ඡා අසල්ලෙඛො, ධම්මවවත්ථානං සල්ලෙඛො, අවිජ්ජා අසල්ලෙඛො, ඤාණං සල්ලෙඛො, අරති අසල්ලෙඛො, පාමොජ්ජං සල්ලෙඛො, නීවරණා අසල්ලෙඛො, පඨමං ඣානං සල්ලෙඛො -පෙ- සබ්බෙ කිලෙසා අසල්ලෙඛො, අරහත්තමග්ගො සල්ලෙඛො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'පුථුනානත්තෙකත්තතෙජපරියාදනෙ පඤ්ඤා සල්ලෙඛට්ඨෙ ඤාණං'.

**සල්ලෙඛට්ඨඤාණනිද්දෙසො.**

## 38 විරියාරම්භඤාණං

කථං අසල්ලීනත්තපහිතත්තපග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං:

අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං.

අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස අනුප්පාදාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, උප්පන්නස්ස කාමච්ඡන්දස්ස පහානාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, අනුප්පන්නස්ස නෙක්ඛම්මස්ස උප්පාදාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, උප්පන්නස්ස නෙක්ඛම්මස්ස ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං -පෙ- අනුප්පන්නානං සබ්බකිලෙසානං අනුප්පාදාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, උප්පන්නානං සබ්බකිලෙසානං පහානාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං, අනුප්පන්නස්ස අරහත්තමග්ගස්ස උප්පාදාය අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං. උප්පන්නස්ස අරහත්තමග්ගස්ස ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා අසල්ලීනත්තා පහිතත්තා පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අසල්ලීනත්තපහිතත්තපග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං'.

**විරියාරම්භඤාණනිද්දෙසො.**

**සල්ලෙඛො** යනු: කාමච්ඡන්දය අසල්ලෙඛ යැ නෛෂ්ක්‍රම්‍යය සල්ලෙඛ යැ ව්‍යාපාදය අසල්ලෙඛ යැ අව්‍යාපාදය සල්ලෙඛ යැ ස්ත්‍යානමිද්ධය අසල්ලෙඛ යැ ආලොකසංඥාව සල්ලෙඛ යැ ඖද්ධත්‍යය අසල්ලෙඛ යැ අවික්ෂෙපය සල්ලෙඛ යැ විචිකිත්සාව අසල්ලෙඛ යැ ධර්මනිශ්චය සල්ලෙඛ යැ අවිද්‍යාව අසල්ලෙඛ යැ ඥානය සල්ලෙඛ යැ අරතිය අසල්ලෙඛ යැ ප්‍රාමොද්‍යය සල්ලෙඛ යැ නීවරණයෝ අසල්ලෙඛ යැ ප්‍රථමධ්‍යානය සල්ලෙඛ යැ සියලු කෙලෙශයෝ අසල්ලෙඛ යැ අර්හත්මාර්ගය සල්ලෙඛ යි.

ඒ සල්ලෙඛඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'පුථුනානත්තෙකත්තතෙජපරියාදානෙ පඤ්ඤා සල්ලෙඛට්ඨෙ ඤාණං'** යි.

**සංලෙඛාර්ථඥානනිර්දේශ යි.**

## 38. වීර්‍යාරම්භඥානය

කිසෙසිත් නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍යාරම්භඥාන වෙයි යත්:

නූපන් ලාමක අකුශලධර්මයන් නූපදනා පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍යාරම්භඥාන යැ. උපන් ලාමක අකුශලධර්මයන් දුරුකරන පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍යාරම්භඥාන යැ. නූපන් කුශලධර්මයන් උපදනා පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍යාරම්භඥාන යැ. උපන් කුශලධර්මයන් සිටුනා පිණිස නො නස්නා පිණිස පුනපුනා උපදනා පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස පරිපූරණය පිණිස නො හැකුළුණුසිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍යාරම්භඥාන යි.

නූපන් කාමච්ඡන්දය නූපදනා පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍යාරම්භඥාන යැ. උපන් කාමච්ඡන්දය දුරු කරනු පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍යාරම්භඥාන යැ. නූපන් නෛෂ්ක්‍රම්‍යය උපදනා පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍යාරම්භඥාන යැ. උපන් නෛෂ්ක්‍රම්‍යය සිටුනා පිණිස නො නස්නා පිණිස පුනපුනා උපදනා පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස පරිපූරණය පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍යාරම්භඥාන යැ. නූපන් සියලු කෙලෙසුන් නූපදනා පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රඥාව වීර්‍යාරම්භඥාන යැ. උපන් සියලු කෙලෙසුන් දුරු කරනු පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රඥාව වීර්‍යාරම්භඥාන යැ. නූපන් අර්හත්මාර්ගය උපදනා පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ ආත්ම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍යාරම්භඥාන යැ. උපන් අර්හත්මාර්ගය (ස්ථිති-ක්ෂණයෙහි) සිටුනා පිණිස නො නස්නා පිණිස බහුලභාවය පිණිස විපුලබව පිණිස වැඩීම පිණිස පරිපූරණය පිණිස නො හැකුළුණු සිත් ඇති නිවනට මෙහෙයූ අතම ඇත්තහුගේ ප්‍රග්‍රහස්වභාවයෙහි ප්‍රඥාව වීර්‍යාරම්භඥාන යි.

ඒ වීර්‍යාරම්භඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ. ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'අසල්ලීනත්තපහිතත්තපග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං'** යි.

**වීර්‍යාරම්භඥානනිර්දේශ යි.**

## 39. අත්ථසන්දස්සනඤාණං

කථං නානාධම්මප්පකාසනතා පඤ්ඤා අත්ථසන්දස්සනෙ ඤාණං:

**නානාධම්මාති** පඤ්චක්ඛන්ධා, ද්වාදසායතනානි, අට්ඨාරස ධාතුයො, කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා, කාමාවචරා ධම්මා, රූපාවචරා ධම්මා, අරූපාවචරා ධම්මා, අපරියාපන්නා ධම්මා.

**පකාසනතාති** රූපං අනිච්චතො පකාසෙති, රූපා දුක්ඛතො පකාසෙති, රූපං අනත්තතො පකාසෙති. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො පකාසෙති, ජරාමරණං දුක්ඛතො පකාසෙති, ජරාමරණං අනත්තතො පකාසෙති.

**අත්ථසන්දස්සනෙති** කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මත්ථං සන්දස්සෙති, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදත්ථං සන්දස්සෙති, ථිනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤත්ථං සන්දස්සෙති, උද්ධච්චං පජහන්තො අවික්ඛෙපත්ථං සන්දස්සෙති, විචිකිච්ඡං පජහන්තො ධම්මවවත්ථානත්ථං සන්දස්සෙති, අවිජ්ජං පජහන්තො ඤාණත්ථං සන්දස්සෙති, අරතිං පජහන්තො පාමොජ්ජත්ථං සන්දස්සෙති, නීවරණෙ පජහන්තො පඨමජ්ඣානත්ථං සන්දස්සෙති -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගත්ථං සන්දස්සෙති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'නානාධම්මප්පකාසනතා පඤ්ඤා අත්ථසන්දස්සනෙ ඤාණං'.

**අත්ථසන්දස්සනඤාණනිද්දෙසො.**

## 40. දස්සනවිසුද්ධිඤාණං

කථං සබ්බධම්මානං එකසඞ්ගහතා[1] නානත්තෙකත්තපටිවෙධෙ පඤ්ඤා දස්සනවිසුද්ධිඤාණං:

**සබ්බධම්මානන්ති** පඤ්චක්ඛන්ධා -පෙ- අපරියාපන්නා ධම්මා.

**එකසඞ්ගහතාති**[1] ද්වාදසහි ආකාරෙහි සබ්බෙ ධම්මා[2] එකසඞ්ගහිතා තථට්ඨෙන අනත්තට්ඨෙන සච්චට්ඨෙන පටිවෙධට්ඨෙන අභිජානනට්ඨෙන පරිජානනට්ඨෙන ධම්මට්ඨෙන ධාතුට්ඨෙන[3] ඤාතට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵුසනට්ඨෙන අභිසමයට්ඨෙන ඉමෙහි ද්වාදසහි ආකාරෙහි සබ්බෙ ධම්මා එකසඞ්ගහිතා.

1. එකසඞ්ගහිතා සී, 1, 2 2 සබ්බධම්මා - සී 1, 2.
3 ධාතට්ඨෙන - ස්‍යා

## 39. අත්ථසන්දර්ශනඥානය

කිසෙයින් නානාධර්මයන් ප්‍රකාශ කරන ප්‍රඥාව අර්ථසන්දර්ශනඥාන වෙයි යත්:

**නානාධම්මා** යනු: පඤ්චස්කන්ධයෝ යැ දොළොස් ආයතනයෝ යැ අටළොස් ධාතූහු යැ කුශලධර්මයෝ යැ අකුශලධර්මයෝ යැ අව්‍යාකෘත ධර්මයෝ යැ කාමාවචරධර්මයෝ යැ රූපාවචරධර්මයෝ යැ අරූපාවචර ධර්මයෝ යැ අපර්‍ය්‍යාපන්නධර්මයෝ යි.

**පකාසනතා** යනු රූපය අනිත්‍ය විසින් ප්‍රකාශ කෙරෙයි. රූපය දුඃඛ විසින් ප්‍රකාශ කෙරෙයි. රූපය අනාත්ම විසින් ප්‍රකාශ කෙරෙයි. වේදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ... චක්ෂුස ජරාමරණය අනිත්‍ය විසින් ප්‍රකාශ කෙරෙයි. ජරාමරණය දුඃඛ විසින් ප්‍රකාශ කෙරෙයි. ජරාමරණය අනාත්ම විසින් ප්‍රකාශ කෙරේ.

**අත්ථසන්දස්සන** යනු: කාමච්ඡන්දය දුරු කරවනුයේ නෛෂ්ක්‍රම්‍යාර්ථය (ශ්‍රොතෘත්ව) මොනොවට දක්වයි. ව්‍යාපාදය දුරු කරවනුයේ අව්‍යාපාදාර්ථය මොනොවට දක්වයි. ස්ත්‍යානමිද්ධය දුරු කරවනුයේ ආලෝකසංඥාර්ථය මොනොවට දක්වයි. ඖද්ධත්‍යය දුරු කරවනුයේ අවික්ෂෙපාර්ථය මොනොවට දක්වයි. විචිකිත්සාව දුරු කරනුවයේ ධර්මනිශ්චයාර්ථය මොනොවට දක්වයි. අවිද්‍යාව දුරු කරවනුයේ ඥානාර්ථය මොනොවට දක්වයි. අරතිය දුරු කරවනුයේ ප්‍රාමොද්‍යාර්ථය මොනොවට දක්වයි. නීවරණයන් දුරු කරවනුයේ ප්‍රථමධ්‍යානාර්ථය මොනොවට දක්වයි. ... සියලු කෙලෙසුන් දුරු කරවනුයේ අර්හත්මාර්ගාර්ථය මොනොවට දක්වයි.

ඒ අර්ථසන්දර්ශනඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: '**නානාධම්මපකාසනතා පඤ්ඤා අත්ථසන්දස්සනෙ ඤාණං**' යි.

**අර්ථසන්දර්ශනඥානනිර්දේශ යි.**

## 40. දර්ශනවිශුද්ධිඥානය

කිසෙයින් සියලු සංඛතාසංඛතධර්මයන් ගේ ඒකසංග්‍රහත්වය ද කාමච්ඡන්දාදීන් ගේ නානාත්වය ද නෛෂ්ක්‍රම්‍යාදීන්ගේ ඒකත්වය ද ප්‍රතිවේධ කිරීමෙහි ප්‍රඥාව දර්ශනවිශුද්ධි ඥාන වෙයි යත්:

**සබ්බධම්මානං** යනු: පඤ්චස්කන්ධයෝ යැ ... අපර්‍ය්‍යාපන්නධර්මයෝ යි.

**ඒකසඞ්ගහතා** යනු: දොළොස් අයුරෙකින් සියලු සංඛතාසංඛතධර්මයෝ ඒකසංඛ්‍යායෙන් පිරිසිඳුනාලදහ: විද්‍යමානස්වභාවයෙනැ අනාත්මස්වභාවයෙනැ සත්‍යස්වභාවයෙනැ ප්‍රතිවේධ කළයුතු ස්වභාවයෙනැ අභිජානනස්වභාවයෙනැ පරිජානනස්වභාවයෙනැ (ස්වභාවධාරණාදි) ධර්මාර්ථයෙනැ (නිජ්ජීවතාදි) ධාතුස්වභාවයෙනැ දතහැකි ස්වභාවයෙනැ සාක්ෂාත්කර්තව්‍යස්වභාවයෙනැ ස්පර්ශ කළයුතු ස්වභාවයෙනැ අභිසමයස්වභාවයෙනි. මේ දොළොස් අයුරින් සියලු සංඛතාසංඛතධර්මයෝ ඒකසංඛ්‍යායෙන් පිරිසිඳුනාලදහ.

**නානත්තෙකත්තන්ති** කාමච්ඡන්දො නානත්තං, නෙක්ඛම්මං එකත්තං, -පෙ- සබ්බකිලෙසා නානත්තං, අරහත්තමග්ගො එකත්තං.

**පටිවෙධෙති** දුක්ඛසච්චං පරිඤ්ඤාපටිවෙධං පටිවිජ්ඣති, සමුදයසච්චං පහානපටිවෙධං පටිවිජ්ඣති, නිරොධසච්චං සච්ඡිකිරියාපටිවෙධං පටිවිජ්ඣති, මග්ගසච්චං භාවනාපටිවෙධං පටිවිජ්ඣති.

**දස්සනවිසුද්ධීති** සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනං විසුජ්ඣති, සොතාපත්තිඵලක්ඛණෙ දස්සනං විසුද්ධං, සකදාගාමිමග්ගක්ඛණෙ දස්සනං විසුජ්ඣති, සකදාගාමිඵලක්ඛණෙ දස්සනං විසුද්ධං, අනාගාමිමග්ගක්ඛණෙ දස්සනං විසුජ්ඣති, අනාගාමිඵලක්ඛණෙ දස්සනං විසුද්ධං, අරහත්තමග්ගක්ඛණෙ දස්සනං විසුජ්ඣති, අරහත්තඵලක්ඛණෙ දස්සනං විසුද්ධං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: **'සබ්බධම්මානං එකසඞ්ගහතානානත්තෙකත්තපටිවෙධෙ පඤ්ඤා දස්සනවිසුද්ධි ඤාණං'.**

**දස්සනවිසුද්ධිඤාණනිද්දෙසො.**

## 41. ඛන්තිඤාණං

**කථං විදිතත්තා පඤ්ඤා ඛන්තිඤාණං:**

රූපං අනිච්චතො විදිතං, රූපං දුක්ඛතො විදිතං, රූපං අනත්තතො විදිතං, යං යං විදිතං තං තං ඛමතීති විදිතත්තා පඤ්ඤා ඛන්තිඤාණං. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො විදිතං, ජරාමරණං දුක්ඛතො විදිතං, ජරාමරණං අනත්තතො විදිතං, යං යං විදිතං තං තං ඛමතීති විදිතත්තා පඤ්ඤා ඛන්තිඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: **'විදිතත්තා පඤ්ඤා ඛන්තිඤාණං'.**

**ඛන්තිඤාණනිද්දෙසො.**

**නානත්තෙකත්තං** යනු: කාමච්ඡන්දය නානාත්ව යැ නෛෂ්ක්‍රම්‍යය එකත්ව යැ ... සියලු කෙලශයෝ නානාත්ව යැ රහත්මග එකත්ව යි.

**පටිවෙධෙ** යනු: දුඃඛසත්‍යය පරිඥප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි. සමුදයසත්‍යය ප්‍රහාණප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි. නිරොධසත්‍යය සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි. මාර්ගසත්‍යය භාවනාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරේ.

**දස්සනවිසුද්ධි** යනු: ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි (ඥාන) දර්ශනය විශුද්ධ වෙයි. ස්‍රොතාපත්තිඵලක්ෂණයෙහි ඥානදර්ශනය විශුද්ධ වූයේ වෙයි. සකෘදගාමිමාර්ගක්ෂණයෙහි දර්ශනය විශුද්ධ වෙයි. සකෘදගාමිඵලක්ෂණයෙහි දර්ශනය විශුද්ධ වූයේ වෙයි. අනාගාමිමාර්ගක්ෂණයෙහි දර්ශනය විශුද්ධ වෙයි. අනාගාමිඵලක්ෂණයෙහි දර්ශනය විශුද්ධ වූයේ වෙයි. අර්හත්මාර්ගක්ෂණයෙහි දර්ශනය විශුද්ධ වෙයි. අර්හත්ඵලක්ෂණයෙහි දර්ශනය විශුද්ධ වූයේ වේ.

ඒ දර්ශනවිශුද්ධිඥානය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යි. එයින් කියනු ලැබෙයි: **'සබ්බධම්මානං එකසඞ්ගහතානානත්තෙකත්තපටිවෙධෙ පඤ්ඤා දස්සනවිසුද්ධිඤාණං'** යි.

**දර්ශනවිශුද්ධිඥානනිර්දේශ යි.**

## 41. ක්ෂාන්තිඥානය

කිසෙයින් (රූපස්කන්ධාදිය අනිත්‍යාදිවශයෙන්) විදිතභාවයෙන් පැවැති ප්‍රඥව ක්ෂාන්තිඥාන වෙයි යත්:

රූපය අනිත්‍ය විසින් (අනිත්‍යානුදර්ශනයෙන්) දත්නාලද යැ. රූපය දුඃඛ විසින් (දුඃඛානුදර්ශනයෙන්) දත්නාලද යැ. රූපය අනාත්ම විසින් (අනාත්මානුදර්ශනයෙන්) දත්නාලද යැ. යම් යම් රූපයෙක් (අනිත්‍යාදි විසින්) දත්නාලද ද ඒ ඒ (රූපය අනිත්‍යාදි විසින්) රිසි වේ නු යි විදිතභාවයෙන් පැවැති ප්‍රඥව ක්ෂාන්තිඥාන නම් වෙයි. වෙදනාව ... සංඥව-සංස්කාරයෝ - විඥානය - චක්ෂුස ... ජරාමරණය අනිත්‍ය විසින් දත්නාලද යැ. ජරාමරණය දුඃඛ විසින් දත්නාලද යැ. ජරාමරණය අනාත්ම විසින් දත්නාලද යැ. යම් යම් ජරාමරණයෙක් (අනිත්‍යාදි විසින්) දත්නාලද ද ඒ ඒ ජරාමරණය (අනිත්‍යාදි විසින්) රිසි වේ නු යි විදිතභාවයෙන් පැවැති ප්‍රඥව ක්ෂාන්තිඥාන නම් වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යි. එයින් කියනු ලැබෙයි: **'විදිතත්තා පඤ්ඤා ඛන්තිඤාණං'** යි.

**ක්ෂාන්තිඥානනිර්දේශ යි.**

## 42. පරියොගාහනඤාණං

කථං ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහනෙ ඤාණං:

රූපං අනිච්චතො ඵුසති, රූපං දුක්ඛතො ඵුසති, රූපං අනත්තතො ඵුසති, යං යං ඵුසති තං තං පරියොගාහතීති ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහනෙ ඤාණං. වෙදනං පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො ඵුසති, ජරාමරණං දුක්ඛතො ඵුසති, ජරාමරණං අනත්තතො ඵුසති, යං යං ඵුසති තං තං පරියොගාහතීති ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහනෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහනෙ ඤාණං'.

**පරියොගාහනඤාණනිද්දෙසො**

## 43. පදෙසවිහාරඤාණං

කථං සමොදහනෙ[1] පඤ්ඤා පදෙසවිහාරෙ ඤාණං:

මිච්ඡාදිට්ඨිපච්චයාපි වෙදයිතං, මිච්ඡාදිට්ඨිවූපසමපච්චයාපි වෙදයිතං, සම්මාදිට්ඨිපච්චයාපි වෙදයිතං, සම්මාදිට්ඨිවූපසමපච්චයාපි වෙදයිතං, මිච්ඡාසඞ්කප්පපච්චයාපි වෙදයිතං, මිච්ඡාසඞ්කප්පවූපසමපච්චයාපි වෙදයිතං, සම්මාසඞ්කප්පපච්චයාපි වෙදයිතං, සම්මාසඞ්කප්පවූපසමපච්චයාපි වෙදයිතං, -පෙ- මිච්ඡාවිමුත්තිපච්චයාපි වෙදයිතං, මිච්ඡාවිමුත්තිවූපසමපච්චයාපි වෙදයිතං, සම්මාවිමුත්තිපච්චයාපි වෙදයිතං, සම්මාවිමුත්තිවූපසමපච්චයාපි වෙදයිතං, ඡන්දපච්චයාපි වෙදයිතං, ඡන්දවූපසමපච්චයාපි වෙදයිතං, විතක්කපච්චයාපි වෙදයිතං, විතක්කවූපසමපච්චයාපි වෙදයිතං, සඤ්ඤාපච්චයාපි වෙදයිතං, සඤ්ඤාවූපසමපච්චයාපි වෙදයිතං.

ඡන්දො ච අවූපසන්තො හොති, විතක්කො ච අවූපසන්තො හොති, සඤ්ඤා ච අවූපසන්තා[2] හොති, තප්පච්චයාපි වෙදයිතං, ඡන්දො ච වූපසන්තො හොති, විතක්කො ච අවූපසන්තො හොති, සඤ්ඤා ච අවූපසන්තා හොති, තප්පච්චයාපි වෙදයිතං, ඡන්දො ච වූපසන්තො හොති, විතක්කො ච වූපසන්තො හොති, සඤ්ඤා ච අවූපසන්තා හොති, තප්පච්චයාපි වෙදයිතං, ඡන්දො ච වූපසන්තො හොති, විතක්කො ච වූපසන්තො හොති, සඤ්ඤා ච වූපසන්තා හොති, තප්පච්චයාපි වෙදයිතං, අප්පත්තස්ස පත්තියා අත්ථි ආසවං[3] තස්මිම්පි ඨානෙ අනුප්පත්තෙ තප්පච්චයාපි වෙදයිතං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'සමොදහනෙ[1] පඤ්ඤා පදෙසවිහාරෙ ඤාණං.'

**පදෙසවිහාරඤාණනිද්දෙසො.**

---

1 සමොදහනෙ PTS. 2 අවූපසන්තො - සී. 1, 2 PTS.
3 ආසාවං - මු, ආසවං - මජසං, ස,

## 42. පර්යාවගාහණඥානය

කිසෙයින් (රූපස්කන්ධාදිය අනිත්‍යාදිවශයෙන් ඥානසපර්ශයෙන්) සපර්ශ කළ බැවින් පැවැති ප්‍රඥාව පර්යාවගාහණඥාන වෙයි යත්:

රූපය අනිත්‍යවශයෙන් (විදර්ශනාඥානසපර්ශයෙන්) සපර්ශ කෙරෙයි. රූපය දුඃඛවශයෙන් සපර්ශ කෙරෙයි. රූපය අනාත්මවශයෙන් සපර්ශ කෙරෙයි. යම් යම් රූපයක් (අනිත්‍යාදිවශයෙන්) සපර්ශ කෙරේ ද ඒ ඒ රූපයට (අනිත්‍යාදිවශයෙන්) පිවිසේ නු යි සපර්ශ කළ බැවින් පැවැති ප්‍රඥාව පර්යාවගාහණ ඥාන නම් වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: ‘ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහණෙ ඤාණං’ යි.

**පර්යාවගාහණඥානනිර්දේශ යි.**

## 43. ප්‍රදේශවිහාරඥානය

කිසෙයින් (ස්කන්ධාදීන්ගේ එකදෙශ වූ වේදනාධර්මය) පිඩු කරන ප්‍රඥාව ප්‍රදේශවිහාරඥාන වෙයි යත්:

මිථ්‍යාදෘෂ්ටිප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. මිථ්‍යාදෘෂ්ටිය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි සම්‍යග්දෘෂ්ටිප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. සම්‍යග්දෘෂ්ටිය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. මිථ්‍යාසඞ්කල්පප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. මිථ්‍යාසඞ්කල්පය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. සම්‍යක්සඞ්කල්පප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. සම්‍යක්සඞ්කල්පය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි ... මිථ්‍යාවිමුක්තිප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. මිථ්‍යාවිමුක්තිය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. සම්‍යග්විමුක්තිප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. සම්‍යග්විමුක්තිය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි: ලෝභප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. ලෝභය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. විතර්කප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. විතර්කය සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. සංඥාප්‍රත්‍යයෙනුදු වේදයිතය වෙයි. සංඥාව සන්හිඳීම් ප්‍රත්‍යයෙනුදු වේදයිතය වේ.

ඉදින් ඡන්දය (ලෝභය) ද නො සන්හිඳුණේ වේ නම් විතර්කය ද නො සන්හිඳුණේ වේ නම් සංඥාව ද නො සන්හිඳුණේ වේ නම් එකරුණෙනුදු වේදයිතය වෙයි. ඡන්දය සන්හිඳුණේ වේ නම් විතර්කය ද නො සන්හිඳුණේ වේ නම් සංඥාව ද නො සන්හිඳුණේ වේ නම් එකරුණෙනුදු වේදයිතය වෙයි. ඡන්දය ද ව්‍යුපශාන්ත වේ නම් විතර්කය ද ව්‍යුපශාන්ත වේ නම් සංඥාව අව්‍යුපශාන්ත වේ නම් එකරුණෙනුදු වේදයිතය වෙයි. ඡන්දය ද ව්‍යුපශාන්ත වේ නම් විතර්කය ද ව්‍යුපශාන්ත වේ නම් සංඥාව ද ව්‍යුපශාන්ත වේ නම් එකරුණෙනුදු වේදයිතය වෙයි. නො පත් රහත්ඵලයට පැමිණෙනු පිණිස වියර්යයෙක් ඇති, එ (රහත්ඵලයට) කාරණ වූ ආර්යමාර්ගය පැමිණි කල්හි එකරුණෙනුදු වේදයිතය වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: ‘සමොදහනෙ පඤ්ඤා පදෙසවිහාරෙ ඤාණං’ යි.

**ප්‍රදේශවිහාරඥානනිර්දේශ යි.**

# 44-49, විවට්ටඤාණඡක්කං.

## (44 සඤ්ඤාවිවට්ටඤාණං)

කථං අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං:

නෙක්ඛම්මාධිපතත්තා[1] පඤ්ඤා කාමච්ඡන්දතො සඤ්ඤාය විවට්ටතීති[2] අධිපතත්තා[3] පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ[4] ඤාණං, අබ්‍යාපාදාධිපතත්තා පඤ්ඤා බ්‍යාපාදතො සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං, ආලොකසඤ්ඤාධිපතත්තා පඤ්ඤා ථිනමිද්ධතො සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං, අවික්ඛෙපාධිපතත්තා පඤ්ඤා උද්ධච්චතො සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං, ධම්මවවත්ථානාධිපතත්තා පඤ්ඤා විචිකිච්ඡාය සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං, ඤාණාධිපතත්තා පඤ්ඤා අවිජ්ජාය සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං, පාමොජ්ජාධිපතත්තා පඤ්ඤා අරතියා සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං, පඨමජ්ඣානාධිපතත්තා පඤ්ඤා නීවරණෙහි සඤ්ඤා විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤා විවට්ටෙ ඤාණං -පෙ- අරහත්තමග්ගත්තා පඤ්ඤා සබ්බකිලෙසෙහි සඤ්ඤාය විවට්ටතීති අධිපතත්තා පඤ්ඤා සඤ්ඤා විවට්ටෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං'.

## (45. චෙතොවිවට්ටඤාණං)

කථං නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං:

කාමච්ඡන්දො නානත්තං, නෙක්ඛම්මං[5] එකත්තං, නෙක්ඛම්මෙකත්තං චෙතයතො කාමච්ඡන්දතො චිත්තං විවට්ටතීති[2] නානත්තෙ පඤ්ඤා-චෙතොවිවට්ටෙ ඤාණං. බ්‍යාපාදො නානත්තං, අබ්‍යාපාදො එකත්තං, අබ්‍යාපාදෙකත්තං චෙතයතො බ්‍යාපාදතො චිත්තං විවට්ටතීති නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං. ථිනමිද්ධං නානත්තං, ආලොකසඤ්ඤා එකත්තං, ආලොකසඤ්ඤෙකත්තං චෙතයතො ථිනමිද්ධතො චිත්තං විවට්ටතීති නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං -පෙ- සබ්බකිලෙසා නානත්තං,[6] අරහත්තමග්ගො එකත්තං, අරහත්තමග්ගෙකත්තං චෙතයතො සබ්බකිලෙසෙහි චිත්තං විවට්ටතීති නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං'.

---

1 නෙක්ඛම්මාධිපවත්තා - ස. 2 විවත්තතීති - සී 1,2
3. අධිපවත්තා - ස. 4 සඤ්ඤාවිවත්තෙ - සී 1, 2,
5 නික්ඛම්මං - සී 1, 2 6. නානත්තෙ - සී 2.

## 44-49. විවට්ටඥානෂට්කය

### (44. සඤ්ඤාවිවට්ටඥානය)

කිසෙයින් (නෛෂ්ක්‍රම්‍යාදිය) අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥා-විවට්ටඥාන වෙයි යත්:

නෛෂ්ක්‍රම්‍යය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන කාමච්ඡන්දයෙන් පෙරළෙන් නුයි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවට්ටඥාන නම් වෙයි. අව්‍යාපාදය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන ව්‍යාපාදයෙන් පෙරළෙන් නුයි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවට්ටඥාන නම් වෙයි. ආලොකසංඥාව අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන ථීනමිද්ධයෙන් පෙරළෙන් නුයි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවට්ටඥාන නම් වෙයි. අවික්ෂෙපය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන ඖද්ධත්‍යයෙන් පෙරළෙන් නුයි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවට්ටඥාන නම් වෙයි. ධර්ම-නිශ්චය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන විචිකිත්සායෙන් පෙරළෙන් නුයි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවට්ටඥාන නම් වෙයි. ඥානය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥා-සම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන අවිද්‍යායෙන් පෙරළෙන් නුයි අධික-භාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවට්ටඥාන නම් වෙයි ප්‍රාමොද්‍යය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන අරති-යෙන් පෙරළෙන් නුයි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවට්ටඥාන නම් වෙයි. ප්‍රථමධ්‍යානය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන නීවරණයන් කෙරෙන් පෙරළෙන් නුයි අධිකභාව-යෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවට්ටඥාන නම් වෙයි. ... අර්හත්මාර්ගය අධික කොට පැවැති ප්‍රඥාව ප්‍රඥාසම්ප්‍රයුක්ත සංඥාව හෙතු කොට ගෙන සියලු කෙලෙසුන් කෙරෙන් පෙරළෙන් නුයි අධිකභාවයෙන් පැවැති ප්‍රඥාව සංඥාවිවට්ටඥාන නම් වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'අධිපතත්තා පඤ්ඤා සඤ්ඤාවිවට්ටෙ ඤාණං' යි.

### (45. චෙතොවිවට්ටඥානය)

කිසෙයින් නානා ස්වභාවයෙහි පැවැති ප්‍රඥාව චෙතොවිවට්ටඥාන වෙයි යත්:

කාමච්ඡන්දය නානාස්වභාව යැ නෛෂ්ක්‍රම්‍යය එක ස්වභාව යැ (කාමච්ඡන්දයෙහි ආදීනව දැක්මෙන්) නෛෂ්ක්‍රම්‍යයාගේ එකස්වභාවය සිතන්නහුට (නෛෂ්ක්‍රම්‍යක්ෂණයෙහි) කාමච්ඡන්දයෙන් සිත පරාවර්තනය වේ නුයි නානාත්වයෙහි ප්‍රඥාව චෙතොවිවට්ටඥාන වෙයි. ව්‍යාපාදය නානා ස්වභාව යැ අව්‍යාපාදය එක ස්වභාව යැ (ව්‍යාපාදයාගේ ආදීනව දැක්මෙන්) අව්‍යාපාදයාගේ එකත්වය සිතන්නහුට ව්‍යාපාදයෙන් සිත පරාවර්තනය වේ නුයි නානාත්වයෙහි ප්‍රඥාව චෙතොවිවට්ටඥාන වෙයි. ථීනමිද්ධය නානා ස්වභාව යැ ආලොකසංඥාව එකස්වභාව යැ (ථීනමිද්ධයාගේ ආදීනව දැක්මෙන්) ආලොකසංඥාවගේ එකත්වය සිතන්නහුට ථීනමිද්ධයෙන් සිත පරාවර්තනය වේ නුයි නානාත්වයෙහි ප්‍රඥාව චෙතොවිවට්ටඥාන වෙයි. සියලු කෙලශයෝ නානාස්වභාව යැ අර්හත්මාර්ගය එකස්වභාව යැ (සියලු කෙලෙසුන්ගේ ආදීනව දැක්මෙන්) අර්හත්මාර්ගයාගේ එකත්වය සිතන්නහුට සියලු කෙලෙසුන් කෙරෙන් සිත පරාවර්තනය වේ නුයි නානාත්වයෙහි ප්‍රඥාව චෙතොවිවට්ටඥාන වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: 'නානත්තෙ පඤ්ඤා චෙතොවිවට්ටෙ ඤාණං' යි.

## (46. චිත්තවිවට්ටඤාණං)

කථං අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං:

කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං. බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං. ථීනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤාවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං. –පෙ– සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං'.

## (47. ඤාණවිවට්ටඤාණං)

කථං සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං:

චක්ඛුං සුඤ්ඤං[1] අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වාති යථාභූතං ජානතො[2] පස්සතො චක්ඛාභිනිවෙසතො[3] ඤාණං විවට්ටතීති සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං. 'සොතං සුඤ්ඤං –පෙ– ඝානං සුඤ්ඤං –පෙ– ජිව්හා සුඤ්ඤා –පෙ– කායො සුඤ්ඤො –පෙ– මනො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා'ති යථාභූතං ජානතො[2] පස්සතො මානාභිනිවෙසතො[3] ඤාණං විවට්ටතීති සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති 'සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං'.

## (48. විමොක්ඛවිවට්ටඤාණං)

කථං වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං:

නෙක්ඛම්මෙන කාමච්ඡන්දං වොස්සජ්ජතීති වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං, අබ්‍යාපාදෙන බ්‍යාපාදං වොස්සජ්ජතීති වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං, ආලොකසඤ්ඤාය ථීනමිද්ධං වොස්සජ්ජතී'ති වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං, අවික්ඛෙපෙන උද්ධච්චං වොස්සජ්ජතීති වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං වොස්සජ්ජතීති වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං –පෙ– අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ වොස්සජ්ජතීති වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං'

1 චක්ඛු සුඤ්ඤං - මජසං, ස  2. පජානතො - සහා.
3 පස්සතො ච කාමාභිනිවෙසතො - සහා

## (46 චිත්තවිවර්තඥානය)

කිසෙයින් (නෛෂ්ක්‍රම්‍යාදි වශයෙන්) සිත පිහිටුවීමෙහි ප්‍රඥාව චිත්ත-විවර්තඥාන වෙයි යත්:

කාමච්ඡන්දය දුරු කරනුයේ නෛෂ්ක්‍රම්‍යයාගේ වශයෙන් සිත පිහිටා සිටී නු යි අධිෂ්ඨානයෙහි ප්‍රඥාව චිත්තවිවර්තඥාන යැ. ව්‍යාපාදය දුරු කරනුයේ අව්‍යාපාදයාගේ වශයෙන් සිත පිහිටා, සිටී නු යි අධිෂ්ඨානයෙහි ප්‍රඥාව චිත්තවිවර්තඥාන යැ ථිනමිද්ධය දුරු කරනුයේ ආලෝකසංඥාවගේ වශයෙන් සිත පිහිටා සිටී නු යි අධිෂ්ඨානයෙහි ප්‍රඥාව චිත්තවිවර්තඥාන යැ. ... සියලු කෙලෙසුන් දුරු කරනුයේ අර්හත්මාර්ගයාගේ වශයෙන් සිත පිහිටා සිටී නු යි අධිෂ්ඨානයෙහි ප්‍රඥාව චිත්තවිවර්තඥාන යි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ, ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'අධිට්ඨානෙ පඤ්ඤා චිත්තවිවට්ටෙ ඤාණං'** යි.

## (47. ඥානවිවර්තඥානය)

කිසෙයින් ශූන්‍යත (අනාත්මානුදර්ශන) ප්‍රඥාව ඥානවිවර්තඥාන වෙයි යත්:

චක්ෂුස ආත්ම හෙයින් හෝ ආත්මනිය හෙයින් හෝ නිත්‍ය හෙයින් හෝ ධ්‍රැව හෙයින් හෝ ශාශ්වත හෙයින් හෝ අවිපරිණාමස්වභාව හෙයින් හෝ ශූන්‍ය යැ යි යථාස්වභාවයෙන් දන්නාහට දක්නාහට චක්ෂුසෙහි බැස-ගැනීමෙන් ඥානය පෙරළේ නු යි ශූන්‍යත ප්‍රඥාව ඥානවිවර්තඥාන වෙයි. ශ්‍රොත්‍රය ශූන්‍ය යැ ඝ්‍රාණය ශූන්‍ය යැ .. ජිහ්වාව ශූන්‍ය යැ ... කාය ශූන්‍ය යැ ... මනස ආත්ම හෙයින් හෝ ආත්මනිය හෙයින් හෝ නිත්‍ය හෙයින් හෝ ධ්‍රැව හෙයින් හෝ ශාශ්වත හෙයින් හෝ අවිපරිණාමධර්ම හෙයින් හෝ ශූන්‍ය යැ යි යථාස්වභාවයෙන් දන්නාහට දක්නාහට මනසෙහි බැසැගැනීමෙන් ඥානය පෙරළේ නු යි ශූන්‍යත ප්‍රඥාව ඥානවිවර්තඥාන වේ

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං'** යි.

## (48. විමොක්ෂවිවර්තඥානය)

කිසෙයින් (කාමච්ඡන්දාදිය) දුරලීමෙහි පැවැති ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන වෙයි යත්:

නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය හැරපියා නු යි හැරපීමෙහි ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන වෙයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය හැරපියා නු යි. හැරපී-මෙහි ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන වෙයි. ආලෝකසංඥායෙන් ථිනමිද්ධය හැරපියා නු යි. හැරපීමෙහි ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන වෙයි. අවික්ෂෙප-යෙන් ඖද්ධත්‍යය හැරපියා නු යි හැරපීමෙහි ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන වෙයි. ධර්මනිශ්චයයෙන් විචිකිත්සාව හැරපියා නු යි හැරපීමෙහි ප්‍රඥාව විමොක්ෂ-විවර්තඥාන වෙයි ... අර්හත්මාර්ගයෙන් සියලු කෙලෙසුන් හැරපියා නු යි හැරපීමෙහි ප්‍රඥාව විමොක්ෂවිවර්තඥාන වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛවිවට්ටෙ ඤාණං'** යි.

## (49. සච්චවිවට්ටඤාණං)

කථං තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං:

දුක්ඛස්ස පීළනට්ඨං සඞ්ඛතට්ඨං සන්තාපට්ඨං විපරිණාමට්ඨං පරිජානන්තො විවට්ටතීති තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං, සමුදයස්ස ආයූහනට්ඨං නිදානට්ඨං සඤ්ඤොගට්ඨං පලිබොධට්ඨං පජහන්තො විවට්ටතීති තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං, නිරොධස්ස නිස්සරණට්ඨං විවෙකට්ඨං අසඞ්ඛතට්ඨං අමතට්ඨං සච්ඡිකරොන්තො විවට්ටතීති තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං, මග්ගස්ස නිය්‍යානට්ඨං හෙතුට්ඨං[1] දස්සනට්ඨං ආධිපතෙය්‍යට්ඨං භාවෙන්තො විවට්ටතීති තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං.

සඤ්ඤාවිවට්ටො,[2] චෙතොවිවට්ටො, චිත්තවිවට්ටො, ඤාණවිවට්ටො, විමොක්ඛවිවට්ටො, සච්චවිවට්ටො. සඤ්ජානන්තො විවට්ටතීති සඤ්ඤාවිවට්ටො, චෙතයන්තො විවට්ටතීති චෙතොවිවට්ටො, විජානන්තො විවට්ටතීති චිත්තවිවට්ටො, ඤාණං කරොන්තො විවට්ටතීති ඤාණවිවට්ටො, වොස්සජ්ජන්තො විවට්ටතීති විමොක්ඛවිවට්ටො, තථට්ඨෙ විවට්ටතීති සච්චවිවට්ටො.

යත්ථ සඤ්ඤාවිවට්ටො තත්ථ චෙතොවිවට්ටො. යත්ථ චෙතොවිවට්ටො තත්ථ සඤ්ඤාවිවට්ටො, යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො තත්ථ චිත්තවිවට්ටො, යත්ථ චිත්තවිවට්ටො තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො, යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො තත්ථ ඤාණවිවට්ටො, යත්ථ ඤාණවිවට්ටො තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො, යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො තත්ථ විමොක්ඛවිවට්ටො, යත්ථ විමොක්ඛවිවට්ටො තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො, යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො විමොක්ඛවිවට්ටො තත්ථ සච්චවිවට්ටො, යත්ථ සච්චවිවට්ටො තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො විමොක්ඛවිවට්ටො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං.'

**විවට්ටඤාණඡක්කනිද්දෙසො.**

1. හෙතට්ඨං - සං.
2. සඤ්ඤාවිවට්ටො තාව (ඉච්චාදි) - සී 1, 2.

## (49. සත්‍යවිවර්තඥානය)

කිසෙයින් (චතුස්සත්‍යයාගේ) අවිපරීතස්වභාවයෙහි පැවැති ප්‍රඥාව සත්‍යවිවර්තඥාන වෙයි යත්:

දුඃඛයාගේ පීඩනස්වභාවය ප්‍රත්‍යයන් විසින් රැස් වැ කරන ලද ස්වභාවය සන්තාපස්වභාවය පෙරළෙන ස්වභාවය දකිමින් පරාවර්තනය කෙරේ නු යි අවිපරීතස්වභාවයෙහි ප්‍රඥාව සත්‍යවිවර්තඥාන වෙයි. සමුදයාගේ දුක් රැස් කරන ස්වභාවය දුකට කරුණු වන ස්වභාවය සංයොග (යොදන) ස්වභාවය වළකන ස්වභාවය දකිමින් පරාවර්තනය කෙරේ නු යි අවිපරීතස්වභාවයෙහි ප්‍රඥාව සත්‍යවිවර්තඥාන වෙයි. නිරෝධයාගේ සසරින් පහවූ ස්වභාවය සියලු සංස්කාරයන් කෙරෙන් ශූන්‍ය ස්වභාවය ප්‍රත්‍යයන් විසින් රැස් වැ නො කරන ලද ස්වභාවය අමරණ ස්වභාවය සාක්‍ෂාත් කොරෙමින් පරාවර්තනය කෙරේ නු යි අවිපරීතස්වභාවයෙහි ප්‍රඥාව සත්‍යවිවර්තඥාන වෙයි. මාර්ගයාගේ නිර්යාණස්වභාවය හෙතු ස්වභාවය දර්ශනස්වභාවය සම්ප්‍රයුක්තයන් තමා වසයෙහි පවත්වන ස්වභාවය වඩමින් පරාවර්තනය කෙරේ නු යි අවිපරීතස්වභාවයෙහි ප්‍රඥාව සත්‍යවිවර්තඥාන වේ

සංඥාවිවර්ත යැ චෙතොවිවර්ත යැ චිත්තවිවර්ත යැ ඥානවිවර්ත යැ විමොක්‍ෂවිවර්ත යැ සත්‍යවිවර්ත යි. (නෛෂ්ක්‍රම්‍යාදිය අධිපතිභාවයෙන්) හැඳිනගනිමින් (කාමච්ඡන්දාදියෙන්) පරාවර්තනය කෙරේ නු යි සංඥාවිවර්ත නම. (නෛෂ්ක්‍රම්‍යාදිය) සිතමින් (කාමච්ඡන්දාදියෙන්) පරාවර්තනය කෙරේ නු යි චෙතොවිවර්ත නම. (නෛෂ්ක්‍රම්‍යාදිවශයෙන්) දැනගන්මින් (කාමච්ඡන්දාදියෙන්) පරාවර්තනය කෙරේ නු යි චිත්තවිවර්ත නම. (ආධ්‍යාත්මිකායතන ශූන්‍යත හෙයින්) අවබොධ කෙරෙමින් (දෘෂ්ට්‍යභිනිවෙශයෙන්) පරාවර්තනය කෙරේ නු යි ඥානවිවර්ත නම. (නෛෂ්ක්‍රම්‍ය-කාමච්ඡන්දාදිය) දුරලමින් (කාමච්ඡන්දයෙන්) පරාවර්තනය කෙරේ නු යි විමොක්‍ෂවිවර්ත නම. යථාස්වභාවයෙහි (දුභතොවුට්ඨාන වශයෙන්) පරාවර්තනය කෙරේ නු යි සත්‍යවිවර්ත නමි.

යම් තැනෙකැ සංඥාවිවර්තය වේ ද එහි චෙතොවිවර්තය වෙයි. යම් තැනෙකැ චෙතොවිවර්තය වේ ද එහි සංඥාවිවර්තය වෙයි. යම් තැනෙකැ සංඥාවිවර්තය චෙතොවිවර්තය වෙත්ද එහි චිත්තවිවර්තය වෙයි. යම් තැනෙකැ චිත්තවිවර්තය වේ ද එහි සංඥාවිවර්ත චෙතොවිවර්ත වෙති. යම් තැනෙකැ සංඥාවිවර්ත චෙතොවිවර්ත චිත්තවිවර්ත වෙත් ද එහි ඥානවිවර්තය වෙයි. යම් තැනෙකැ ඥානවිවර්තය වේ ද එහි සංඥාවිවර්ත චෙතොවිවර්ත චිත්තවිවර්ත වෙති. යම් තැනෙකැ සංඥාවිවර්ත චෙතොවිවර්ත චිත්තවිවර්ත ඥානවිවර්ත වෙත් ද එහි විමොක්‍ෂවිවර්තය වෙයි. යම් තැනෙකැ විමොක්‍ෂවිවර්තය වේ ද එහි සංඥාවිවර්ත චෙතොවිවර්ත චිත්තවිවර්ත ඥානවිවර්ත වෙති. යම් තැනෙකැ සංඥාවිවර්ත චෙතොවිවර්ත චිත්තවිවර්ත ඥානවිවර්ත විමොක්‍ෂවිවර්ත වෙත් ද එහි සත්‍යවිවර්තය වෙයි. යම් තැනෙකැ සත්‍යවිවර්තය වේ ද එහි සංඥාවිවර්ත චෙතොවිවර්ත චිත්තවිවර්ත ඥානවිවර්ත විමොක්‍ෂවිවර්ත වෙත්.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: '**තථට්ඨෙ පඤ්ඤා සච්චවිවට්ටෙ ඤාණං**'යි

**විවර්තඥානෂට්ක නිර්දේශ යි.**

# 50. ඉද්ධිවිධඤාණං

කථං කායම්පි චිත්තම්පි එකවවත්ථානතා සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච අධිට්ඨානවසෙන ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා ඉද්ධිවිධෙ ඤාණං:

ඉධ භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, සො ඉමෙසු චතූසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙති, පරිදමෙති, මුදුං කරොති කම්මනියං. සො ඉමෙසු චතූසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙත්වා පරිදමෙත්වා මුදුං කරිත්වා කම්මනියං කායම්පි චිත්තෙ සමොදහති, චිත්තම්පි කායෙ සමොදහති, කායවසෙන චිත්තං පරිනාමෙති, චිත්තවසෙන කායං පරිනාමෙති, කායවසෙන චිත්තං අධිට්ඨාති, චිත්තවසෙන කායං අධිට්ඨාති, කායවසෙන චිත්තං පරිනාමෙත්වා, චිත්තවසෙන කායං පරිනාමෙත්වා, කායවසෙන චිත්තං අධිට්ඨහිත්වා, චිත්තවසෙන කායං අධිට්ඨහිත්වා, සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච කායෙ ඔක්කමිත්වා විහරති. සො තථා භාවිතෙන චිත්තෙන පරිසුද්ධෙන පරියොදාතෙන ඉද්ධිවිධඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති, බහුධාපි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි[1] උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙපි පල්ලඞ්කෙන කමති[2] සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'කායම්පි චිත්තම්පි එකවවත්ථානතා සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච අධිට්ඨානවසෙන ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා ඉද්ධිවිධෙ ඤාණං'.

ඉද්ධිවිධඤාණනිද්දෙසො.

---

1. පථවියාපි - මජසං, චඞ්කමති - සයා,

## 50. සෘද්ධිවිධඥානය

කිසෙයින් රූපකාය ද පාදකධ්‍යානචිත්තය ද (පරිකර්මචිත්තයෙන්) එක් කොට තැබීමෙන් සුඛසංඥාව ද ලඝුසංඥාව ද අධිෂ්ඨානවශයෙන් සමෘද්ධ වන ප්‍රඥාව සෘද්ධිවිධඥාන වෙයි යත්:

මෙසස්නෙහි මහණ තෙම ඡන්දය අධික කොට ඇති සමාධිය හා ප්‍රධන් වීර්‍ය්‍යයෙන් සමන්විත වූ සෘද්ධිපාදය වඩයි. වීර්‍ය්‍යය අධික කොට ඇති සමාධිය ... චිත්තය අධික කොට ඇති සමාධිය ... විමංසාව අධික කොට ඇති සමාධිය හා ප්‍රධාන වීර්‍ය්‍යයෙන් සමන්විත වූ සෘද්ධිපාදය වඩයි. හෙතෙම මේ සතර සෘද්ධිපාදයන්හි සිත පුනපුනා වඩයි දමනය කෙරෙයි. මෘදු වූ (එහෙයින් මැ) කර්මණ්‍ය වූවක් කෙරෙයි. හෙතෙම මේ සතර සෘද්ධිපාදයන්හි සිත පුනපුනා වඩා දමනය කොට මෘදුවූවක් කර්මණ්‍ය වූවක් කොට (තමාගේ) කරජකාය ද පාදකධ්‍යානචිත්තයෙහි ප්‍රවේශ කෙරෙයි. පාදකධ්‍යානචිත්තය ද (තමාගේ) කරජකායයෙහි ප්‍රවේශ කෙරෙයි. කායවශයෙන් සිත පිරිනමයි. චිත්තවශයෙන් කය පිරිනමයි. කායවශයෙන් චිත්තය අධිෂ්ඨාන කෙරෙයි. චිත්තවශයෙන් කය අධිෂ්ඨාන කෙරෙයි. කායවශයෙන් සිත පිරිනමා චිත්තවශයෙන් කය පිරිනමා කායවශයෙන් චිත්තය අධිෂ්ඨාන කොට චිත්තවශයෙන් කය අධිෂ්ඨාන කොට සුඛසංඥාව ද ලඝුසංඥාව ද කරජකයෙහි ප්‍රවේශ කොට වාසය කෙරෙයි. හෙතෙම එසෙයින් වඩනලද පරිශුද්ධ වූ ප්‍රභාස්වර වූ සිතින් සෘද්ධිවිධඥානය ලැබීම පිණිස (පරිකර්ම) සිත එළවයි. නැඹුරු කෙරෙයි.

හෙතෙම අනෙක ප්‍රකාර වූ සෘද්ධිකොට්ඨාසය ස්පර්ශ කෙරේ: එකෙක් වැ බහුප්‍රකාර වෙයි. බහුප්‍රකාර වී එකෙක් වෙයි. ප්‍රකට බවට ප්‍රතිච්ඡන්න බවට ගෙබිතින් ඔබට පවුරින් ඔබට පව්වෙන් ඔබට අහස්හි සෙයින් නො ලැගෙමින් යෙයි පොළොව්හි දු දියෙහි සෙයින් ගැලීම් නැගීම් කෙරෙයි. නො බිඳෙන දියෙහි දු පොළොව්හි සෙයින් යෙයි. අහස්හි දු පියා ඇති ලිහිණියකු සෙයින් පලඟින් යෙයි. මෙසේ මහත් සෘද්ධි ඇති මෙසේ මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙන ද අත්තලින් පරාමර්ශ කෙරෙයි. පිරිමදියි. බඹලොව දක්වාත් වශයෙහි පවත්වයි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **‘කායම්පි චිත්තම්පි එකවවත්ථානතා සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච අධිට්ඨානවසෙන ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා ඉද්ධිවිධෙ ඤාණං’**යි.

**ඉද්ධිවිධඤාණනිද්දේස යි.**

## 51. සොතධාතුවිසුද්ධිඤාණං

කථං විතක්කවිප්ඵාරවසෙන නානත්තෙකත්තසද්දනිමිත්තානං පරියොගාහනෙ පඤ්ඤා සොතධාතුවිසුද්ධිඤාණං:

ඉධ භික්ඛු ඡන්දසමාධි -පෙ- විරියසමාධි -පෙ- චිත්ත සමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. සො ඉමෙසු චතුසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙති, පරිදමෙති, මුදුං කරොති කම්මනියං. සො ඉමෙසු චතුසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙත්වා පරිදමෙත්වා මුදුං කරිත්වා කම්මනියං, දූරෙපි සද්දානං[1] සද්දනිමිත්තං මනසි කරොති, සන්තිකෙපි සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, ඔළාරිකානම්පි සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, සුඛුමානම්පි සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, සණ්හසණ්හානම්පි සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, පුරත්ථිමායපි දිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, පච්ඡිමායපි දිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, උත්තරායපි දිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, දක්ඛිණායපි දිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, පුරත්ථිමායපි අනුදිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, පච්ඡිමායපි අනුදිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, උත්තරායපි අනුදිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, දක්ඛිණායපි අනුදිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, හෙට්ඨිමායපි දිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති, උපරිමායපි දිසාය සද්දානං සද්දනිමිත්තං මනසිකරොති.

සො තථා භාවිතෙන චිත්තෙන පරිසුද්ධෙන පරියොදාතෙන සොතධාතු[2] විසුද්ධිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය[3] උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච, යෙ දූරෙ ච සන්තිකෙ ච.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'විතක්කවිප්ඵාරවසෙන නානත්තෙකත්තසද්දනිමිත්තානං පරියොගාහනෙ පඤ්ඤා සොතධාතුවිසුද්ධිඤාණං'.

**සොතධාතුවිසුද්ධිඤාණනිද්දෙසො**

## 52. චෙතොපරියඤාණං

කථං තිණ්ණං චිත්තානං විප්ඵාරත්තා ඉන්ද්‍රියානං පසාදවසෙන නානත්තෙකත්තවිඤ්ඤාණචරියාපරියොගාහනෙ පඤ්ඤා චෙතොපරියඤාණං:

ඉධ භික්ඛු ඡන්දසමාධි -පෙ- විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. සො ඉමෙසු චතුසු ඉද්ධිපාදෙසු භාවිතෙසු චිත්තං පරිභාවෙති, පරිදමෙති, මුදුං කරොති කම්මනියං. සො ඉමෙසු චතුසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙත්වා පරිදමෙත්වා මුදුං කරිත්වා කම්මනියං එවං ජානාති:[4] 'ඉදං රූපං සොමනස්සින්ද්‍රියසමුට්ඨිතං, ඉදං රූපං දොමනස්සින්ද්‍රියසමුට්ඨිතං, ඉදං රූපං උපෙක්ඛින්ද්‍රියසමුට්ඨිත'න්ති.

1. සත්තානං - සී. 1    2. සොතධාතුයා - සයා
3. අතික්කන්තමානුසකාය - ස    4. පජානාති - මජසං, PTS

## 51 ශ්‍රොත්‍රධාතුවිශුද්ධිඥානය

කිසෙයිත් විතර්කවිස්ඵාරවශයෙන් නානාත්ව වූ ද එකත්ව වූ ද ශබ්ද-නිමිත්තයන්ට බැසගැනීමෙහි ප්‍රඥව ශ්‍රොත්‍රධාතු විශුද්ධිඥාන වෙයි යත්:

මෙ සස්නෙහි මහණ තෙම ඡන්දය අධිපති කොට ඇති සමාධිය ... වීර්‍ය්‍යය අධිපති කොට ඇති සමාධිය ... චිත්තය අධිපති කොට ඇති සමාධිය ... වීමංසාව අධිපති කොට ඇති සමාධිය හා ප්‍රධාන වීර්‍ය්‍යයෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩයි. හේ මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුන පුනා වඩයි, දමනය කෙරෙයි, මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කෙරෙයි. හේ මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුන පුනා වඩා දමනය කොට මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කොට දුරු වූ ද ශබ්දයන් ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. ළඟ වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. ඖදාරික වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. සූක්ෂ්ම වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. අතිසූක්ෂ්ම වූ ද ශබ්දයන්ගේ ශබ්ද-නිමිත්ත මෙනෙහි කෙරෙයි. පැදුම්දිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. පැළදිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. උතුරුදිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. දකුණුදිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. පැදුම් අනුදිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. පැසුම් අනුදිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. උතුරඅනුදිග වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. දකුණුඅනුදිග වූ ද ශබ්දයන්ගේ ශබ්ද නිමිත්ත මෙනෙහි කෙරෙයි. යට දිශායෙහි වූ ද ශබ්දයන්ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරෙයි. උඩ දිශායෙහි වූ ද ශබ්දයන් ගේ ශබ්දනිමිත්ත මෙනෙහි කෙරේ.

හේ එසේ භාවිත වූ පරිශුද්ධ වූ ප්‍රභාස්වර වූ සිතින් ශ්‍රොත්‍රධාතු විශුද්ධි-ඥානය පිණිස සිත එළවයි නැඹුරු කෙරෙයි. හෙතෙම විශුද්ධ වූ මිනිසැස ඉක්මසිටි දිව්‍යශ්‍රොත්‍රධාතුයෙන් දුරු වූ ද ළඟ වූ ද දෙවියන්ගේ ද මිනිසුන් ගේ ද උභයශබ්දයන් අසයි.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥ යි. එයින් කියනු ලැබෙයි: **'විතක්කවිප්ඵාරවසෙන නානත්තෙකත්තසද්දනිමිත්තානං පරියොගාහනෙ පඤ්ඤා සොතධාතුවිසුද්ධි ඤාණං'** යි.

**ශ්‍රොත්‍රධාතු විශුද්ධිඥානනිර්දේශ යි.**

## 52. චෙතොපරියඥානය

කිසෙයිත් (සොමනස්සසහගතාදි) ත්‍රිවිධ චිත්තයන්ගේ වෙගය හෙතු කොට ගෙන ඉන්ද්‍රියයන්ගේ ප්‍රසාද වශයෙන් නානාස්වභාව එකස්වභාව වූ එකුන් අනූ චිත්තයාගේ පැවැත්ම දන්නා ප්‍රඥව චෙතොපරියඥාන වෙයි යත්:

මෙසස්නෙහි මහණ ඡන්දසමාධිය ... වීර්‍ය්‍යසමාධිය .. චිත්තසමාධිය ... වීමංසාසමාධිය ... වඩා ද හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුන-පුනා වඩයි දමනය කෙරෙයි. මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කෙරෙයි. හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුනපුනා වඩා දමනය කොට මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කොට මෙසේ දැනගනියි. මේ සිත සොමනස්සින්ද්‍රිය යෙන් උපන. මේ සිත දෞර්මනස්සින්ද්‍රියයෙන් උපන, මේ සිත උපෙක්ඛින්ද්‍රි යෙන් උපනැ'යි.

සො තථා භාවිතෙන චිත්තෙන පරිසුද්ධෙන පරියොදාතෙන චෙතො-පරියඤාණාය චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං ‘සරාගං චිත්ත’න්ති පජානාති, වීතරාගං වා චිත්තං ‘වීතරාගං චිත්ත’න්ති පජානාති, සදොසං වා චිත්තං -පෙ- වීතදොසං වා චිත්තං -පෙ- සමොහං වා චිත්තං -පෙ- වීතමොහං වා චිත්තං -පෙ- සඞ්ඛිත්තං වා චිත්තං -පෙ- වික්ඛිත්තං වා චිත්තං -පෙ- මහග්ගතං වා චිත්තං -පෙ- අමහග්ගතං වා චිත්තං -පෙ- සඋත්තරං වා චිත්තං -පෙ- අනුත්තරං වා චිත්තං -පෙ- සමාහිතං වා චිත්තං -පෙ- අසමාහිතං වා චිත්තං -පෙ- විමුත්තං වා චිත්තං -පෙ- අවිමුත්තං වා චිත්තං ‘අවිමුත්තං චිත්ත’න්ති පජානාති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: ‘තිණ්ණං චිත්තානං විප්ඵාරත්තා ඉන්ද්‍රියානං පසාදවසෙන නානත්තෙකත්තවිඤ්ඤාණචරියාපරියොගාහනෙ පඤ්ඤා චෙතොපරියඤාණං’.

චෙතොපරියඤාණනිද්දෙසො.

## 53. පුබ්බෙනිවාසානුස්සතිඤාණං

කථං පච්චයපවත්තානං[1] ධම්මානං නානත්තෙකත්තකම්මවිප්ඵාරවසෙන පරියොගාහනෙ පඤ්ඤා පුබ්බෙනිවාසානුස්සතිඤාණං:

ඉධ භික්ඛු ඡන්දසමාධි -පෙ- මුදුං කරිත්වා කම්මනියං එවං ජානාති:[2] ‘ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, යදිදං අවිජ්ජා-පච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදාන-පච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං, සොකපරි-දෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛ-ක්ඛන්ධස්ස සමුදයො හොති.

සො තථා භාවිතෙන චිත්තෙන පරිසුද්ධෙන පරියොදාතෙන පුබ්බෙ-නිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති: සො අනෙක-විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං, ද්වෙපි ජාතියො, තිස්සොපි ජාතියො, චතස්සොපි ජාතියො, පඤ්චපි ජාතියො, දසපි ජාතියො, වීසම්පි ජාතියො, තිංසම්පි ජාතියො, චත්තාළීසම්පි ජාතියො, පඤ්ඤාසම්පි ජාතියො, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසත-සහස්සම්පි, අනෙකෙපි සංවට්ටකප්පෙ, අනෙකෙපි විවට්ටකප්පෙ, අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ, ‘අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛප්පටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො ඉධූපපන්නො’ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙ-නිවාසං අනුස්සරති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: ‘පච්චය පවත්තානං ධම්මානං නානත්තෙකත්තකම්මවිප්ඵාරවසෙන පරියො-ගාහනෙ පඤ්ඤා පුබ්බෙනිවාසානුස්සතිඤාණං.’

පුබ්බෙනිවාසානුස්සතිඤාණනිද්දෙසො.

1. පච්චයානං වත්තනානං - සී   2 පජානාති - සයා, PTS

හෙතෙම එපරිද්දෙන් භාවිත වූ පරිශුද්ධ වූ ප්‍රභාස්වර වූ සිතින් චේතොපර්‍යයඥානය පිණිස සිත එලවයි. නැමුරු කෙරෙයි. හෙතෙම පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ සිත තමාගේ සිතින් පිරිසිඳ දැනගනී යි: සරාග වූ සිත ද 'සරාග සිතැ'යි දැනගනියි, වීතරාග වූ සිත ද 'වීතරාග සිතැ'යි දැනගනියි, සද්වෙස වූ සිත ද 'සද්වෙස සිතැ'යි දැනගනියි, වීතද්වෙස වූ සිත ද ... සමෝහ වූ සිත ද ... වීතමෝහ වූ සිත ද .. (ථිනමිද්ධ වශයෙන්) හැකුළුණු සිත ද ... (උද්ධච්ච වශයෙන්) විසුරුණු සිත ද ... මහද්ගත වූ සිත ද ... මහද්ගත නො වූ සිත ද ... ස උත්තර වූ සිත ද ... අනුත්තර වූ සිත ද ... සමාහිත වූ සිත ද අසමාහිත වූ සිත ද ... විමුක්ත වූ සිත ද ... අවිමුක්ත වූ සිත ද 'අවිමුක්ත වූ සිතැ' යි දැනගනී.

එය ඥානාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'තිණ්ණං චිත්තානං විප්ඵාරතා ඉන්ද්‍රියානං පසාදවසෙන නානත්තෙකත්තවිඤ්ඤාණචරියා පරියොගාහණෙ පඤ්ඤා චෙතොපරියඤාණං'යි.**

**චේතෝපර්‍යයඥානනිර්දේශ යි.**

## 53. පූර්වනිවාසානුස්මෘතිඥානය

කිසෙයින් ප්‍රත්‍යයොත්පන්නධර්මයන්ගේ නානාත්ව ඒකත්ව කර්මවෙගවශයෙන් දැනගැනීමෙහි ප්‍රඥාව පූර්වනිවාසානුස්මෘතිඥාන වෙයි යත්:

මෙ සස්නෙහි මහණ ඡන්දසමාධිය ... මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කොට මෙසේ දැනගනියි: මේ ප්‍රත්‍යය ඇති කල්හි මේ ප්‍රත්‍යයොත්පන්නය වෙයි, මේ ප්‍රත්‍යයාගේ උත්පාදය හෙතු කොට ගෙන මේ ප්‍රත්‍යයොත්පන්නය උපදී. ඒ මෙසේ යැ: අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ උපදිති. සංස්කාරප්‍රත්‍යයෙන් ප්‍රතිසන්ධිවිඥානය උපදියි. විපාකවිඥානප්‍රත්‍යයෙන් නාමරූපය උපදියි. නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතනය උපදියි. ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය උපදියි. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාව උපදියි. වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව උපදියි. තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදානය උපදියි. උපාදාන ප්‍රත්‍යයෙන් භවය උපදියි. කර්මභවප්‍රත්‍යයෙන් ජාතිය උපදියි. ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණය උපදියි. ශොකපරිදෙව දුඃඛදෞර්මනස්‍යොපායාසයෝ උපදිත්. මෙසේ තෙල අසම්මිශ්‍ර වූ දුඃඛරාශිහුගේ සමුදය වේ. හෙතෙම එසේ භාවිත වූ පරිශුද්ධ වූ ප්‍රභාස්වර වූ සිතින් පූර්වනිවාසානුස්මෘතිඥානය පිණිස සිත එලවයි, නැමුරු කෙරෙයි.

හෙතෙම අනෙක ප්‍රකාර වූ පෙරවිසූ කඳපිළිවෙළ සිහි කෙරෙයි. ඒ මෙසේ යි: එක් ජාතියකුදු ජාති දෙකකුදු ජාති තුනකුදු ජාති සතරකුදු ජාති පසකුදු ජාති දසයකුදු ජාති විස්සකුදු ජාති තිසකුදු ජාති සතළිසකුදු ජාති පනසකුදු ජාති සියයකුදු ජාති දහසකුදු ජාති සුවහසකුදු නොයෙක් සංවර්තකල්පයකුදු නොයෙක් විවර්තකල්පයකුදු නොයෙක් සංවර්තවිවර්තකල්පයකුදු අසුවල් තැන මෙබඳු නම් ඇතියෙම් මෙබඳු ගොත්‍ර ඇතියෙම් මෙබඳු පැහැසටහන් ඇත්තෙම් මෙබඳු ආහාර ඇත්තෙම් මෙබඳු සුවදුක් විඳුනාසුලු වූයෙම් මෙබඳු ආයුපරිච්ඡේද ඇතියෙම් වීමි. ඒ මම එයින් සැව මෙහි උපන්මි'යි. මෙසේ (නම්ගොත් විසින්) උද්දෙශ සහිත වූ (පැහැසටහන් විසින්) ආකාර සහිත වූ නානාප්‍රකාර වූ පෙර විසූ කඳ පිළිවෙළ සිහි කෙරෙයි.

එය ඥානාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'පච්චයපවත්තානං ධම්මානං නානත්තෙකත්තකම්මවිප්ඵාරවසෙන පරියොගාහණෙ පඤ්ඤා පුබ්බෙනිවාසානුස්සති ඤාණං'යි**

**පූර්වනිවාසානුස්මෘතිඥානනිර්දේශ යි**

## 54. දිබ්බචක්ඛුඤාණං.

කථං ඔභාසවසෙන නානත්තෙකත්තරූපනිමිත්තානං දස්සනට්ඨෙ පඤ්ඤා දිබ්බචක්ඛුඤාණං:

ඉධ භික්ඛු ඡන්දසමාධි පධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. විරියසමාධි -පෙ- චිත්තසමාධි -පෙ- වීමංසාසමාධි පධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. සො ඉමෙසු චතූසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙති, පරිදමෙති, මුදුං කරොති කම්මනියං. සො ඉමෙසු චතූසු ඉද්ධිපාදෙසු චිත්තං පරිභාවෙත්වා පරිදමෙත්වා මුදුං කරිත්වා කම්මනියං ආලොකසඤ්ඤං මනසිකරොති, දිවාසඤ්ඤං අධිට්ඨාති, 'යථා දිවා තථා රත්ති, යථා රත්ති තථා දිවා' ඉති විවටෙන[1] චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති.

සො තථා භාවිතෙන චිත්තෙන පරිසුද්ධෙන පරියොදාතෙන සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති, සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[2] හීනෙ පණීතෙ සුවණ්ණෙ[3] දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: 'ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[2] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'ඔභාසවසෙන නානත්තෙකත්ත රූපනිමිත්තානං දස්සනට්ඨෙ පඤ්ඤා දිබ්බචක්ඛුඤාණං.'

**දිබ්බචක්ඛුඤාණනිද්දෙසො**

1. විවත්තෙන - සී, මු, 2. උපපජ්ජමානෙ - මජ්සං, සසා PTS.
3. සවණ්ණෙ - PTS.

# 54. දිව්‍යචක්ෂුර්ඥානය

කිසෙයින් කසිණෝභාස වශයෙන් නානාස්වභාව ඒකස්වභාව වර්ණායතනය දක්නා ස්වභාව වූ ප්‍රඥාව දිව්‍යචක්ෂුර්ඥාන වෙයි යත්:

මේ සස්නෙහි මහණ ඡන්දය අධික කොට ඇති සමාධිය හා ප්‍රධාන වීර්‍ය්‍යයෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩයි. වීර්‍ය්‍යය අධික කොට ඇති සමාධිය ... චිත්තය අධික කොට ඇති සමාධිය ... විමංසාව අධික කොට ඇති සමාධිය හා ප්‍රධාන වීර්‍ය්‍යයෙන් සමන්විත වූ ඍද්ධිපාදය වඩයි. හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුනපුනා වඩයි. දමනය කෙරෙයි මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කෙරෙයි. හෙතෙම මේ සතර ඍද්ධිපාදයන්හි සිත පුනපුනා වඩා දමනය කොට මෘදු වූවක් කර්මණ්‍ය වූවක් කොට ආලෝක සංඥාව මෙනෙහි කෙරෙයි. 'දවාලැ'යි යන සංඥාව ඉටයි. යම්සේ දහවල්හි අලොකය දක්නාලද ද එසේ මැ රාත්‍රියෙහි දු මෙනෙහි කෙරෙයි. යම්සේ රාත්‍රියෙහි දිබ්බචක්ඛුආලෝකයෙන් දක්නාලද ද එසේ මැ දහවල්හි දු මෙනෙහි කෙරෙයි. මෙසේ විවෘත වූ හාත්පසින් නො වැසුණු සිතින් අවභාස සහිත වූ සිත වඩයි.

හේ එසෙයින් භාවිත වූ පරිශුද්ධ වූ ප්‍රභාස්වර වූ සිතින් සත්ත්වයන්ගේ ච්‍යුතිඋත්පත්ති දක්නා ඥානය පිණිස සිත එළවයි, නැඹුරු කෙරෙයි. හේ පරිශුද්ධ වූ මිනිසැස ඉක්මසිටි දිවැසින් ච්‍යුත වන්නා වූ උපදනා වූ හීන වූ ප්‍රණීත වූ සුන්දරවර්ණ වූ දුර්වර්ණ වූ සුගතියට ගිය දුගතියට ගිය සත්ත්වයන් දකී. කම් වූ පරිද්දෙන් පරලොව ගිය සත්ත්වයන් දැනගනියි; 'ඒකාන්තයෙන් මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යෝපවාදක වූවාහු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදාන ඇත්තාහු ය. ඔහු කාබුන් මරණින් මත්තෙහි සැපයෙන් පහ වූ දූක ටගති වූ විවස ව පතිත වන නිරයට (ප්‍රතිසන්ධි විසින්) පැමිණියාහු ය. තවද මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනසසුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යෝපවාද නො කළාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටිකර්මසමාදාන ඇත්තාහු ය. ඔහු කාබුන් මරණින් මත්තෙහි සුන්දරගති ඇති සුවයෙන් අග්‍ර වූ දෙව්ලොවට (ප්‍රතිසන්ධි විසින්) පැමිණියාහු' යයි. මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්මසිටි දිවැසින් ච්‍යුත වන්නා වූ උපදනා වූ හීන වූ ප්‍රණීත වූ සුවර්ණ වූ දුර්වර්ණ වූ සුගතියට ගිය දුගතියට ගිය සත්ත්වයන් දකී. කම් වූ පරිද්දෙන් පරලොව ගිය සත්ත්වයන් දැනගනී.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'ඔභාසවසෙන නානත්තෙකත්තරූපනිමිත්තානං දස්සනට්ඨෙ පඤ්ඤා, දිබ්බචක්ඛුඤාණං'** යි.

**දිව්‍යචක්ෂුර්ඥානනිර්දෙශ යි.**

# 55. ආසවක්ඛයඤාණං.

කථං චතුසට්ඨියා ආකාරෙහි තිණ්ණං[1] ඉන්ද්‍රියානං වසීභාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං:

කතමෙසං තිණ්ණං[1] ඉන්ද්‍රියානං: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස, අඤ්ඤින්ද්‍රියස්ස, අඤ්ඤාතාවින්ද්‍රියස්ස.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං කති ඨානානි ගච්ඡති, අඤ්ඤින්ද්‍රියං කති ඨානානි ගච්ඡති, අඤ්ඤාතාවින්ද්‍රියං කති ඨානානි ගච්ඡති: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං එකං ඨානං ගච්ඡති: සොතාපත්තිමග්ගං. අඤ්ඤින්ද්‍රියං ඡ ඨානානි ගච්ඡති: සොතාපත්තිඵලං, සකදාගාමිමග්ගං, සකදාගාමිඵලං, අනාගාමිමග්ගං, අනාගාමිඵලං, අරහත්තමග්ගං. අඤ්ඤාතාවින්ද්‍රියං එකං ඨානං ගච්ඡති: අරහත්තඵලං.

සොතාපත්තිමග්ගක්ඛණෙ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛපරිවාරං හොති, විරියින්ද්‍රියං පග්ගහපරිවාරං හොති, සතින්ද්‍රියං උපට්ඨානපරිවාරං හොති, සමාධින්ද්‍රියං අවික්ඛෙපපරිවාරං හොති, පඤ්ඤින්ද්‍රියං දස්සනපරිවාරං හොති, මනින්ද්‍රියං විජානනපරිවාරං හොති, සොමනස්සින්ද්‍රියං අභිසන්දනපරිවාරං[2] හොති, ජීවිතින්ද්‍රියං පවත්තසන්තතාධිපතෙය්‍යපරිවාරං හොති. සොතාපත්තිමග්ගක්ඛණෙ ජාතා ධම්මා ඨපෙත්වා චිත්තසමුට්ඨානං රූපං සබ්බෙව කුසලා හොන්ති, සබ්බෙව අනාසවා හොන්ති, සබ්බෙව නිය්‍යානිකා හොන්ති, සබ්බෙව අපචයගාමිනො හොන්ති, සබ්බෙව ලොකුත්තරා හොන්ති, සබ්බෙව නිබ්බානාරම්මණා හොන්ති, සොතාපත්තිමග්ගක්ඛණෙ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස ඉමානි අට්ඨින්ද්‍රියානි සහජාතපරිවාරා හොන්ති, අඤ්ඤමඤ්ඤපරිවාරා හොන්ති, නිස්සයපරිවාරා හොන්ති, සම්පයුත්තපරිවාරා හොන්ති, සහගතා හොන්ති. සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති. තෙව තස්ස ආකාරා චෙව හොන්ති පරිවාරා ච.

සොතාපත්තිඵලක්ඛණෙ අඤ්ඤින්ද්‍රියස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛපරිවාරං හොති, විරියින්ද්‍රියං පග්ගහපරිවාරං හොති, සතින්ද්‍රියං උපට්ඨානපරිවාරං හොති, සමාධින්ද්‍රියං අවික්ඛෙපපරිවාරං හොති, පඤ්ඤින්ද්‍රියං දස්සනපරිවාරං හොති, මනින්ද්‍රියං විජානනපරිවාරං හොති, සොමනස්සින්ද්‍රියං අභිසන්දනපරිවාරං[2] හොති, ජීවිතින්ද්‍රියං පවත්තසන්තතාධිපතෙය්‍යපරිවාරං හොති, සොතාපත්තිඵලක්ඛණෙ ජාතා ධම්මා සබ්බෙව අබ්‍යාකතා හොන්ති ඨපෙත්වා චිත්තසමුට්ඨානං රූපං, සබ්බෙව අනාසවා හොන්ති, සබ්බෙව ලොකුත්තරා හොන්ති, සබ්බෙව නිබ්බානාරම්මණා හොන්ති, සොතාපත්තිඵලක්ඛණෙ අඤ්ඤින්ද්‍රියස්ස ඉමානි අට්ඨින්ද්‍රියානි සහජාතපරිවාරා හොන්ති, අඤ්ඤමඤ්ඤපරිවාරා හොන්ති, නිස්සයපරිවාරා හොන්ති, සම්පයුත්තපරිවාරා හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති, තෙව තස්ස ආකාරා චෙව හොන්ති පරිවාරා ච.

1. තිණ්ණන්නං මජසං, - සතා PTS,
2 අභිසන්දනපරිවාරං - සතා, PTS, සී 1, 2

## 55 ආස්‍රවක්ෂයඥානය

කිසෙයින් සූසැට අයුරින් (අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියාදි) තුන් ඉන්ද්‍රියයන්ගේ වශීභාවයෙන් පැවැති ප්‍රඥාව ආස්‍රවක්ෂයඥාන වෙයි යත්:

කවර තුන් ඉන්ද්‍රියයන්ගේ ද යත්: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියයාගේ යැ අඤ්ඤින්ද්‍රියයාගේ යැ අඤ්ඤාතාවින්ද්‍රියයාගේ යි.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියය කිහි තැනෙක උපදී ද, අඤ්ඤින්ද්‍රියය කිහි තැනෙක උපදී ද, අඤ්ඤාතාවින්ද්‍රියය කිහි තැනෙක උපදී ද යත්: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියය එක් තැනෙකැ උපදියි: ස්‍රොතාපත්තිමාර්ගයෙහි යැ. අඤ්ඤින්ද්‍රියය සතැනෙකැ උපදියි: ස්‍රොතාපත්තිඵලයෙහි යැ සකෘදාගාමිමාර්ගයෙහි යැ සකෘදාගාමිඵලයෙහි යැ අනාගාමිමාර්ගයෙහි යැ අනාගාමිඵලයෙහි යැ අර්හත්මාර්ගයෙහි යි. අඤ්ඤාතාවින්ද්‍රියය එක් තැනෙකැ උපදියි: අර්හත්ඵලයෙහි යි.

ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂභාවයෙන් පරිවාර වෙයි, වීර්යෙන්ද්‍රියය ප්‍රග්‍රහභාවයෙන් පරිවාර වෙයි, ස්මෘතීන්ද්‍රියය උපස්ථානභාවයෙන් පරිවාර වෙයි, සමාධීන්ද්‍රියය අවික්ෂෙපභාවයෙන් පරිවාර වෙයි. ප්‍රඥෙන්ද්‍රියය දර්ශනභාවයෙන් පරිවාර වෙයි. මනින්ද්‍රියය විජානනභාවයෙන් පරිවාර වෙයි, සෞමනස්සින්ද්‍රියය අභිසන්දනභාවයෙන් පරිවාර වෙයි, ජීවිතින්ද්‍රියය වර්තමානසන්තතියට අධිපතිභාවයෙන් පරිවාර වේ. ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි උපන් ධර්මයෝ චිත්තසමුත්ථානරූපය තබා සියල්ලෝ මැ කුශල වෙති, සියල්ලෝ මැ අනාස්‍රව වෙති, සියල්ලෝ මැ නෛර්‍යාණික වෙති, සියල්ලෝ මැ අපචයගාමී වෙති, සියල්ලෝ මැ ලොකුත්තර වෙති, සියල්ලෝ මැ නිර්වාණාලම්බන වෙති. ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට මේ අට ඉන්ද්‍රියයෝ සහජාතභාවයෙන් පරිවාර වෙති, අන්‍යොන්‍යභාවයෙන් පරිවාර වෙති, නිශ්‍රයභාවයෙන් පරිවාර වෙති, සම්ප්‍රයුක්තභාවයෙන් පරිවාර වෙති, සහගත වෙති, සහජාත වෙති, සංසෘෂ්ට වෙති, සම්ප්‍රයුක්ත වෙත්. ඒ අෂ්ටෙන්ද්‍රියයෝ මැ ඒ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට ආකාර ද පරිවාර ද වෙත්.

ස්‍රොතාපත්තිඵලක්ෂණයෙහි අඤ්ඤින්ද්‍රියට ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂභාවයෙන් පරිවාර වෙයි, වීර්යෙන්ද්‍රියය ප්‍රග්‍රහභාවයෙන් පරිවාර වෙයි, ස්මෘතීන්ද්‍රියය උපස්ථානභාවයෙන් පරිවාර වෙයි, සමාධීන්ද්‍රියය අවික්ෂෙපභාවයෙන් පරිවාර වෙයි, ප්‍රඥෙන්ද්‍රියය දර්ශනභාවයෙන් පරිවාර වෙයි, මනින්ද්‍රියය විජානනභාවයෙන් පරිවාර වෙයි, සෞමනස්සින්ද්‍රියය අභිසන්දනභාවයෙන් පරිවාර වෙයි, ජීවිතෙන්ද්‍රියය වර්තමානසන්තතියට අධිපතිභාවයෙන් පරිවාර වේ. ස්‍රොතාපත්තිඵලක්ෂණයෙහි උපන් ධර්මයෝ චිත්තසමුත්ථානරූපය තබා සියල්ලෝ මැ අව්‍යාකෘත වෙති, සියල්ලෝ මැ අනාස්‍රව වෙති, සියල්ලෝ මැ ලොකොත්තර වෙති, සියල්ලෝ මැ නිර්වාණාලම්බන වෙති. ස්‍රොතාපත්තිඵලක්ෂණයෙහි අඤ්ඤින්ද්‍රියට මේ අෂ්ට ඉන්ද්‍රියයෝ සහජාතභාවයෙන් පරිවාර වෙති, අන්‍යොන්‍යභාවයෙන් පරිවාර වෙති, නිශ්‍රයභාවයෙන් පරිවාර වෙති, සම්ප්‍රයුක්තභාවයෙන් පරිවාර වෙති, සහගත වෙති, සහජාත වෙති, සංසෘෂ්ට වෙති, සම්ප්‍රයුක්ත වෙත්. ඒ අෂ්ටෙන්ද්‍රියයෝ මැ ඒ අඤ්ඤින්ද්‍රියට ආකාර ද පරිවාර ද වෙත්.

සකදාගාමිමග්ගක්ඛණෙ -පෙ- සකදාගාමිඵලක්ඛණෙ -පෙ- අනාගාමිමග්ගක්ඛණෙ -පෙ- අනාගාමිඵලක්ඛණෙ -පෙ- අරහත්තමග්ගක්ඛණෙ අඤ්ඤින්ද්‍රියස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛපරිවාරං හොති -පෙ- ජීවිතින්ද්‍රියං පවත්තසන්තතාධිපතෙය්‍යපරිවාරං හොති.

අරහත්තමග්ගක්ඛණෙ ජාතා ධම්මා ඨපෙත්වා චිත්තසමුට්ඨානං රූපං සබ්බෙව කුසලා හොන්ති, සබ්බෙව අනාසවා හොන්ති, සබ්බෙව නිය්‍යානිකා හොන්ති, සබ්බෙව අපචයගාමිනො හොන්ති, සබ්බෙව ලොකුත්තරා හොන්ති, සබ්බෙව නිබ්බානාරම්මණා හොන්ති අරහත්තමග්ගක්ඛණෙ අඤ්ඤින්ද්‍රියස්ස ඉමානි අට්ඨින්ද්‍රියානි සහජාතපරිවාරා හොන්ති, අඤ්ඤමඤ්ඤපරිවාරා හොන්ති, නිස්සයපරිවාරා හොන්ති, සම්පයුත්තපරිවාරා හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති. තෙව තස්ස ආකාරා චෙව හොන්ති පරිවාරා ච.

අරහත්තඵලක්ඛණෙ අඤ්ඤාතාවින්ද්‍රියස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛපරිවාරං හොති, විරියින්ද්‍රියං -පෙ- ජීවිතින්ද්‍රියං පවත්තසන්තතාධිපතෙය්‍යපරිවාරං හොති. අරහත්තඵලක්ඛණෙ ජාතා ධම්මා සබ්බෙව අබ්‍යාකතා හොන්ති, ඨපෙත්වා චිත්තසමුට්ඨානං රූපං, සබ්බෙව අනාසවා හොන්ති, සබ්බෙව ලොකුත්තරා හොන්ති, සබ්බෙව නිබ්බානාරම්මණා හොන්ති. අරහත්තඵලක්ඛණෙ අඤ්ඤාතාවින්ද්‍රියස්ස ඉමානි අට්ඨින්ද්‍රියානි සහජාතපරිවාරා හොන්ති, අඤ්ඤමඤ්ඤපරිවාරා හොන්ති, නිස්සයපරිවාරා හොන්ති, සම්පයුත්තපරිවාරා හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති. තෙව තස්ස ආකාරා චෙව හොන්ති පරිවාරා ච. ඉති ඉමානි අට්ඨට්ඨකානි චතුසට්ඨි හොන්ති.

**ආසවාති** කතමෙ තෙ ආසවා: කාමාසවො, භවාසවො, දිට්ඨාසවො, අවිජ්ජාසවො.

කත්ථෙතෙ ආසවා ඛීයන්ති: සොතාපත්තිමග්ගෙන අනවසෙසො දිට්ඨාසවො ඛීයති, අපායගමනීයො කාමාසවො ඛීයති, අපායගමනීයො භවාසවො ඛීයති, අපායගමනීයො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

සකදාගාමිමග්ගෙන ඔළාරිකො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

අනාගාමිමග්ගෙන අනවසෙසො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

අරහත්තමග්ගෙන අනවසෙසො භවාසවො ඛීයති, අනවසෙසො අවිජ්ජාසවො ඛීයති, එත්ථෙතෙ ආසවා ඛීයන්ති.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'චතුසට්ඨියා ආකාරෙහි තිණ්ණං ඉන්ද්‍රියානං වසීභාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං'.

**ආසවක්ඛයඤාණනිද්දෙසො.**

සකෘදාගාමිමාර්ගක්ෂණයෙහි ... සකෘදාගාමිඵලක්ෂණයෙහි ... අනාගාමි-මාර්ගක්ෂණයෙහි... අනාගාමිඵලක්ෂණයෙහි ... අර්හත්මාර්ගක්ෂණයෙහි අඤ්ඤින්ද්‍රි-යට ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂභාවයෙන් පරිවාර වෙයි ... ජීවිතෙන්ද්‍රියය වර්තමානසන්තතියට අධිපතිභාවයෙන් පරිවාර වේ.

අර්හත්මාර්ගක්ෂණයෙහි උපන් ධර්මයෝ චිත්තසමුත්ථානරූපය තබා සියල්ලෝ මැ කුශල වෙති, සියල්ලෝ මැ අනාස්‍රව වෙති, සියල්ලෝ මැ නෛර්යාණික වෙති, සියල්ලෝ මැ අපචයගාමී වෙති, සියල්ලෝ මැ ලොකොත්තර වෙති, සියල්ලෝ මැ නිර්වාණාලම්බන වෙති. අර්හත්මාර්ගක්ෂ-ණයෙහි අඤ්ඤින්ද්‍රියට මේ අෂ්ටෙන්ද්‍රියයෝ සහජාතභාවයෙන් පරිවාර වෙති, අන්‍යොන්‍යභාවයෙන් පරිවාර වෙති, නිශ්‍රයභාවයෙන් පරිවාර වෙති, සම්ප්‍රයුක්තභාවයෙන් පරිවාර වෙති, සහගත වෙති. සහජාත වෙති, සංසෘෂ්ට වෙති, සම්ප්‍රයුක්ත වෙති. ඒ අෂ්ටෙන්ද්‍රියයෝ මැ ඒ අඤ්ඤින්ද්‍රියට ආකාර ද පරිවාර ද වෙත්.

අර්හත්ඵලක්ෂණයෙහි අඤ්ඤාතාවින්ද්‍රියට ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂභාවයෙන් පරිවාර වෙයි, වීර්‍ය්‍යෙන්ද්‍රියය ... ජීවිතෙන්ද්‍රියය වර්තමානසන්තතියට අධිපති-භාවයෙන් පරිවාර වේ. අර්හත්ඵලක්ෂණයෙහි උපන් ධර්මයෝ සියල්ලෝ මැ අව්‍යාකෘත වෙති, චිත්තසමුත්ථානරූපය තබා සියල්ලෝ මැ අනාස්‍රව වෙති, සියල්ලෝ මැ ලොකොත්තර වෙති, සියල්ලෝ මැ නිර්වාණාලම්බන වෙත්. අර්හත්ඵලක්ෂණයෙහි අඤ්ඤාතාවින්ද්‍රියට මේ අෂ්ටෙන්ද්‍රියයෝ සහජාතභාවයෙන් පරිවාර වෙති, අන්‍යොන්‍යභාවයෙන් පරිවාර වෙති, නිශ්‍රයභාවයෙන් පරිවාර වෙති, සම්ප්‍රයුක්තභාවයෙන් පරිවාර වෙති, සහගත වෙති, සහජාත වෙති, සංසෘෂ්ට වෙති, සම්ප්‍රයුක්ත වෙත්. ඒ අෂ්ටෙන්ද්‍රියයෝ මැ ඒ අඤ්ඤාතාවින්ද්‍රියට ආකාර ද පරිවාර ද වෙත්. මෙසේ මේ අෂ්ටාෂ්ටකය සූසැටෙක් වේ.

**ආසවා** යනු: ඒ ආස්‍රවයෝ කවරහ යත්: කාමාස්‍රව යැ භවාස්‍රව යැ දෘෂ්ට්‍යාස්‍රව යැ අවිද්‍යාස්‍රව යි.

තෙල ආස්‍රවයෝ කොහි ක්ෂය වෙති යත්: සෝවන්මඟින් අනවශෙෂ වූ දෘෂ්ට්‍යාස්‍රවය ක්ෂය වෙයි, අපායගාමී වූ කාමාස්‍රවය ක්ෂය වෙයි, අපායගාමී වූ භවාස්‍රය ක්ෂය වෙයි, අපායගාමී වූ අවිද්‍යාස්‍රවය ක්ෂය වෙයි. තෙල ආස්‍රවයෝ මෙහි ක්ෂය වෙත්.

සෙදගැමිමඟින් ඖදාරික වූ කාමාස්‍රවය ක්ෂය වෙයි, එය හා සමග එක් වැ සිටි භවාස්‍රවය ක්ෂය වෙයි, එය හා සමග එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්ෂය වෙයි. තෙල ආස්‍රවයෝ මෙහි ක්ෂය වෙත්.

අනගැමි මඟින් අනවශෙෂ වූ කාමාස්‍රවය ක්ෂය වෙයි, එය හා සමග එක් වැ සිටි භවාස්‍රවය ක්ෂය වෙයි, එය හා සමග එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්ෂය වෙයි. තෙල ආස්‍රවයෝ මෙහි ක්ෂය වෙත්.

අර්හත්මාර්ගයෙන් අනවශෙෂ වූ භවාස්‍රවය ක්ෂය වෙයි, අනවශෙෂ වූ අවිද්‍යාස්‍රවය ක්ෂය වෙයි. තෙල ආස්‍රවයෝ මෙහි ක්ෂය වෙත්.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'චතුසට්ඨියා ආකාරෙහි තිණ්ණං ඉන්ද්‍රියානං වසීභාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං'** යි.

**ආස්‍රවක්ෂයඥාන නිර්දෙශ යි.**

## 56–63. සච්චඤාණචතුක්කද්වයං

කථං පරිඤ්ඤට්ඨෙ පඤ්ඤා දුක්ඛෙ ඤාණං, පහානට්ඨෙ පඤ්ඤා සමුදයෙ ඤාණං, සච්ඡිකිරියට්ඨෙ පඤ්ඤා නිරොධෙ ඤාණං, භාවනට්ඨෙ පඤ්ඤා මග්ගෙ ඤාණං:

දුක්ඛස්ස පීළනට්ඨො සඞ්ඛතට්ඨො සන්තාපට්ඨො විපරිණාමට්ඨො පරිඤ්ඤට්ඨො.

සමුදයස්ස ආයූහනට්ඨො නිදානට්ඨො සඤ්ඤොගට්ඨො පලිබොධට්ඨො පහානට්ඨො.

නිරොධස්ස නිස්සරණට්ඨො විවෙකට්ඨො අසඞ්ඛතට්ඨො අමතට්ඨො සච්ඡිකිරියට්ඨො.

මග්ගස්ස නිය්‍යානට්ඨො හෙතුට්ඨො දස්සනට්ඨො ආධිපතෙය්‍යට්ඨො භාවනට්ඨො.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති 'පරිඤ්ඤට්ඨෙ පඤ්ඤා දුක්ඛෙ ඤාණං, පහානට්ඨෙ පඤ්ඤා සමුදයෙ ඤාණං, සච්ඡිකිරියට්ඨෙ පඤ්ඤා නිරොධෙ ඤාණං, භාවනට්ඨෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'.

කථං දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං:

මග්ගසමඞ්ගිස්ස ඤාණං දුක්ඛෙපෙතං ඤාණං, දුක්ඛසමුදයෙපෙතං ඤාණං, දුක්ඛනිරොධෙපෙතං ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදායපෙතං ඤාණං.

තත්ථ කතමං දුක්ඛෙ ඤාණං: දුක්ඛං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි. ඉදං වුච්චති දුක්ඛෙ ඤාණං. දුක්ඛසමුදයං ආරබ්භ -පෙ- දුක්ඛනිරොධං ආරබ්භ -පෙ- දුක්ඛනිරොධගාමිනිං පටිපදං ආරබ්භ -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි. ඉදං වුච්චති දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං'.

**සච්චඤාණචතුක්කද්වයනිද්දෙසො.**

## 56-63. සත්‍යඥානචතුෂ්කද්වය

කිසෙයින් (දුඃඛයාගේ පීඩනාදි චතුර්විධ අර්ථයන්) පරිඥෙයස්වභාව-යෙහි ප්‍රඥාව දුඃඛඥාන වෙයි, ප්‍රහාතව්‍යස්වභාවයෙහි ප්‍රඥාව සමුදයඥාන වෙයි, සාක්ෂාත්කර්තව්‍යස්වභාවයෙහි ප්‍රඥාව නිරොධඥාන වෙයි, භාවිතව්‍ය ස්වභාවයෙහි ප්‍රඥාව මාර්ගඥාන වෙයි යත්:

දුඃඛයාගේ පීඩනස්වභාවය ප්‍රත්‍යයන් විසින් රැස් වැ කරනලද ස්වභාවය සන්තාපස්වභාවය පෙරළෙන ස්වභාවය පරිඥෙයස්වභාව වෙයි.

සමුදයාගේ දුක් රැස් කරන ස්වභාවය දුකට කරුණු වන ස්වභාවය සංයොග ස්වභාවය වළහන ස්වභාවය ප්‍රහාතව්‍ය ස්වභාව වෙයි.

නිරොධයාගේ සසරින් පහවූ ස්වභාවය සංස්කාරයන් කෙරෙන් ශූන්‍ය ස්වභාවය ප්‍රත්‍යයන් විසින් රැස් වැ නො කරනලද ස්වභාවය අමරණ ස්වභාවය සාක්ෂාත්කර්තව්‍ය ස්වභාව වෙයි.

මාර්ගයාගේ නියර්‍යාණස්වභාවය හෙතුස්වභාවය දර්ශනස්වභාවය ආධිපත්‍යස්වභාවය භාවිතව්‍යස්වභාව වේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'පරිඤ්ඤෙය්‍යට්ඨෙ පඤ්ඤා දුක්ඛෙ ඤාණං පහාතබ්බට්ඨෙ පඤ්ඤා සමුදයෙ ඤාණං සච්ඡිකාතබ්බට්ඨෙ පඤ්ඤා නිරොධෙ ඤාණං භාවෙතබ්බට්ඨෙ පඤ්ඤා මග්ගෙ ඤාණං'**යි.

කිසෙයින් දුඃඛඥාන, දුඃඛසමුදයඥාන, දුඃඛනිරොධඥාන, දුඃඛනිරොධ-ගාමිනීප්‍රතිපදඥාන වෙයි යත්:

මාර්ගසමඞ්ගීහුගේ යම් ඥානයෙක් වේ ද තෙල දුඃඛඥාන නමුදු වෙයි තෙල දුඃඛසමුදයඥාන නමුදු වෙයි, තෙල දුඃඛනිරොධඥාන නමුදු වෙයි, තෙල දුඃඛනිරොධගාමිනීප්‍රතිපදඥාන නමුදු වේ.

එහි දුඃඛඥානය කවරෙ යත්: දුඃඛසත්‍යය අරමුණු කොට යම් ප්‍රඥා-යෙක් ප්‍රජානනාකාරයෙක් විමසීමෙක් ප්‍රකාරයෙන් විමසීමෙක් සිව්සස්දහම් විමසීමෙක් (අනිත්‍යාදිය ලක්ෂණ විසින්) සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පාණ්ඩිත්‍යයෙක් කුශලභාවයෙක් නිපුණභාවයෙක් (අනිත්‍යාදිය) විභාවනයෙක් චින්තායෙක් උපපරීක්ෂායෙක් භූරිප්‍රඥායෙක් මෙධායෙක් (යථාස්වභාව ප්‍රතිවෙධයෙහි නැමෙන) පරිණායිකායෙක් විදර්ශනායෙක් (අනිත්‍යාදිය ප්‍රකාරයෙන් දන්නා) සම්‍යග්ඥානයෙක් පතොද-ප්‍රඥායෙක් ප්‍රඥාසඞ්ඛ්‍යාත ඉන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥා ප්‍රාසාදයෙක් ප්‍රඥා ආලොකයෙක් ප්‍රඥා අවභාසයෙක් ප්‍රඥා ප්‍රද්‍යොතයෙක් ප්‍රඥා රත්නයෙක් අමොහයෙක් ධර්මවිචයෙක් සම්‍යග්දෘෂ්ටියක් උපදී ද මේ දුඃඛඥාන යැ යි කියනු ලැබේ. දුඃඛසමුදයසත්‍යය අරමුණු කොට ... දුඃඛ නිරොධසත්‍යය අරමුණු කොට ... දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාසත්‍යය අරමුණු කොට යම් ප්‍රඥායෙක් ප්‍රජානනාකාරයෙක් .. අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් උපදී ද මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදඥාන යැ යි කියනු ලැබේ.

එය ඥාතාර්ථයෙන් ඥාන යැ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **'දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං'** යි.

**සත්‍යඥානචතුෂ්කද්වයනිර්දෙශ යි.**

## 64–67 සුද්ධිකපටිසම්භිදාඤාණං

කථං අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානපටිසම්භිදෙ ඤාණං?

අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා, ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා, නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා, පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා.

අත්ථනානත්තෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මනානත්තෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිනානත්තෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං.

අත්ථවවත්ථානෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මවවත්ථානෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිවවත්ථානෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානවවත්ථානෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

අත්ථසල්ලක්ඛණෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මසල්ලක්ඛණෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිසල්ලක්ඛණෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානසල්ලක්ඛණෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

අත්ථූපලක්ඛණෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මූපලක්ඛණෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තූපලක්ඛණෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානූපලක්ඛණෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

අත්ථප්පභෙදෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මප්පභෙදෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිප්පභෙදෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානප්පභෙදෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

අත්ථප්පභාවනෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මප්පභාවනෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිප්පභාවනෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානප්පභාවනෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

අත්ථජොතනෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මජොතනෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිජොතනෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානජොතනෙ පඤ්ඤා පටිභාන පටිසම්භිදෙ ඤාණං.

# 64-67. ශුද්ධිකප්‍රතිසංවිද් ඥානය

කිසෙයින් අර්ථප්‍රතිසංවිද්ඥාන, ධර්මප්‍රතිසංවිද්ඥාන, නිරුක්තිප්‍රතිසංවිද්-ඥාන, ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන වෙයි යත්:

හෙතුඵල (අර්ථ)යන්හි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද් යෑ ප්‍රත්‍යය (ධර්ම) යන්හි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද් යෑ නිරුක්තිශබ්දයෙහි ප්‍රභෙදගත ඥානය නිරුක්තිප්‍රතිසංවිද් යෑ ඥානයන්හි ප්‍රභෙදගතඥානය ප්‍රතිභාන-ප්‍රතිසංවිද් යෑ.

අර්ථනානාත්වයෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මනානාත්ව-යෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිනානාත්වයෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද් ඥානයෑ ඥානනානාත්වයෙහි ප්‍රභෙදගත-ඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි.

අර්ථනිශ්‍රවයෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මනිශ්‍රවයෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිනිශ්‍රවයෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානනිශ්‍රවයෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රති-සංවිද්ඥාන යි.

අර්ථය මොනොවට දැකීමෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මය මොනොවට දැකීමෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිය මොනොවට දැකීමෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානය මොනොවට දැකීමෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥානයි.

අර්ථය ප්‍රත්‍යක්ෂයෙන් දැකීමෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මය ප්‍රත්‍යක්ෂයෙන් දැකීමෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිය ප්‍රත්‍යක්ෂයෙන් දැකීමෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්-ඥාන යෑ ඥානය ප්‍රත්‍යක්ෂයෙන් දැකීමෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද් ඥාන යි.

අර්ථප්‍රභෙදයෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මප්‍රභෙදයෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිප්‍රභෙදයෙහි ප්‍රභෙදගත ඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානප්‍රභෙදයෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි.

අර්ථය පහළ කිරීමෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මය පහළ කිරීමෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිය පහළ කිරීමෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානය පහළ කිරීමෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද් ඥාන යි

අර්ථය බැබැළවීමෙහි ප්‍රභෙදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මය බැබැළවීමෙහි ප්‍රභෙදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිය බැබැළ-වීමෙහි ප්‍රභෙදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානය බැබැළවීමෙහි ප්‍රභෙදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි.

අත්ථවිරොචනෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මවිරොචනෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිවිරොචනෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානවිරොචනෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

අත්ථප්පකාසනෙ පඤ්ඤා අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මප්පකාසනෙ පඤ්ඤා ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිප්පකාසනෙ පඤ්ඤා නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානප්පකාසනෙ පඤ්ඤා පටිභානපටිසම්භිදෙ ඤාණං.

තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති: 'අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානපටිසම්භිදෙ ඤාණං'.

**සුද්ධිකපටිසම්භිදාඤාණනිද්දෙසො.**

## 68 ඉන්ද්‍රියපරොපරියත්තඤාණං.

කතමං තථාගතස්ස ඉන්ද්‍රියපරොපරියත්ත[1] ඤාණං.

ඉධ තථාගතො සත්තෙ පස්සති: අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො.

**අප්පරජක්ඛෙ මහාරජක්ඛෙති** සද්ධො පුග්ගලො අප්පරජක්ඛො, අස්සද්ධො[2] පුග්ගලො මහාරජක්ඛො; ආරද්ධවීරියො පුග්ගලො අප්පරජක්ඛො, කුසීතො පුග්ගලො මහාරජක්ඛො; උපට්ඨිතස්සති පුග්ගලො අප්පරජක්ඛො, මුට්ඨස්සති පුග්ගලො මහාරජක්ඛො; සමාහිතො පුග්ගලො අප්පරජක්ඛො, අසමාහිතො පුග්ගලො මහාරජක්ඛො; පඤ්ඤවා පුග්ගලො අප්පරජක්ඛො, දුප්පඤ්ඤො පුග්ගලො මහාරජක්ඛො.

**තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙති** සද්ධො පුග්ගලො තික්ඛින්ද්‍රියො, අස්සද්ධො පුග්ගලො මුදින්ද්‍රියො; ආරද්ධවීරියො පුග්ගලො තික්ඛින්ද්‍රියො, කුසීතො පුග්ගලො මුදින්ද්‍රියො; උපට්ඨිතස්සති පුග්ගලො තික්ඛින්ද්‍රියො, මුට්ඨස්සති පුග්ගලො මුදින්ද්‍රියො; සමාහිතො පුග්ගලො තික්ඛින්ද්‍රියො අසමාහිතො පුග්ගලො මුදින්ද්‍රියො; පඤ්ඤවා පුග්ගලො තික්ඛින්ද්‍රියො, දුප්පඤ්ඤො පුග්ගලො මුදින්ද්‍රියො.

---

1. ඉන්ද්‍රියානං පරොපරියත්ත - සතා, ඉන්ද්‍රියපරොපරියත්ත - මජසං, PTS, සී 1,2,3
2. අසද්ධො - PTS,

අර්ථය විවිධ කොට දීප්ත කිරීමෙහි ප්‍රභේදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මය විවිධ කොට දීප්ත කිරීමෙහි ප්‍රභේදගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිය විවිධ කොට දීප්ත කිරීමෙහි ප්‍රභේදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානය විවිධ කොට දීප්ත කිරීමෙහි ප්‍රභේදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි.

අර්ථප්‍රකාශනයෙහි ප්‍රභේදගතඥානය අර්ථප්‍රතිසංවිද්ඥාන යෑ ධර්මප්‍රකාශනයෙහි ප්‍රභෙගතඥානය ධර්මප්‍රතිසංවිද්ඥාන යෑ නිරුක්තිප්‍රකාශනයෙහි ප්‍රභේදගතඥානය නිරුක්තිප්‍රතිසංවිද්ඥාන යෑ ඥානප්‍රකාශනයෙහි ප්‍රභේදගතඥානය ප්‍රතිභානප්‍රතිසංවිද්ඥාන යි.

එය ඥාතාර්ථයෙන් ඥාන යෑ ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥා යි. එයින් කියනු ලැබෙයි: **‘අත්ථපටිසම්භිදෙ ඤාණං, ධම්මපටිසම්භිදෙ ඤාණං, නිරුත්තිපටිසම්භිදෙ ඤාණං, පටිභානපටිසම්භිදෙ ඤාණං’යි**.

**ක්ෂුද්‍රිකපටිසම්භිදා ඥානනිර්දෙශ යි.**

## 68. ඉන්ද්‍රියපරාවරතාඥානය

තථාගතයන් වහන්සේගේ (සත්ත්වයන් පිළිබඳ) ඉන්ද්‍රියපරාවරතාඥානය කවරේ යත්:

මෙහි තථාගත තෙම අල්ප වූ කෙලෙස් රජස් ඇති මහත් වූ කෙලෙස් රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉන්ද්‍රියයන් ඇති මෘදු වූ ඉන්ද්‍රියයන් ඇති සුන්දර වූ ආකාර ඇති කුත්සිත වූ ආකාර ඇති සුවසේ හැඟැවිය හැකි දුකසේ හැඟවිය හැකි සත්ත්වයන් පරලොව ද (රාගාදි) වද්‍යය ද භය වශයෙන් දක්නා වූ ඇතැම් සත්ත්වයන් පරලොව ද (රාගාදි) වද්‍යය ද භය වශයෙන් නො දක්නා වූ ඇතැම් සත්ත්වයන් (ඉන්ද්‍රියපරාවරතාඥානයෙන්) දකී.

**අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම අල්පරජසක යෑ ශ්‍රද්ධා නැති පුද්ගල තෙම මහාරජසක යෑ ආරබ්ධවීර්ය ඇති පුද්ගල තෙම අල්පරජසක යෑ කුසීද පුද්ගල තෙම මහාරජසක යෑ එළඹ සිටි සිහි ඇති පුද්ගල තෙම අල්පරජසක යෑ මුළාසිහි ඇති පුද්ගල තෙම මහාරජසක යෑ සමාහිතපුද්ගල තෙම අල්පරජසක යෑ අසමාහිතපුද්ගල තෙම මහාරජසක යෑ (උදයව්‍යයගාමිනී) ප්‍රඥාව ඇයි පුද්ගල තෙම අල්පරජසක යෑ දුෂ්ප්‍රාඥ පුද්ගල තෙම මහාරජසක යි.

**තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉන්ද්‍රිය ඇත්තේ යෑ ශ්‍රද්ධා නැති පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යෑ රැකුළු වැර ඇති පුද්ගල තෙම තියුණු වූ ඉන්ද්‍රිය ඇත්තේ යෑ කුසීත වූ පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යෑ එළඹසිටි සිහි ඇති පුද්ගල තෙම තියුණු වූ ඉන්ද්‍රිය ඇත්තේ යෑ මුළාසිහි ඇති පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යෑ සමාහිත වූ පුද්ගල තෙම තියුණු වූ ඉන්ද්‍රිය ඇත්තේ යෑ අසමාහිත වූ පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යෑ ප්‍රඥාව ඇති පුද්ගල තෙම තියුණු වූ ඉන්ද්‍රිය ඇත්තේ යෑ දුෂ්ප්‍රාඥ වූ පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යි.

**ස්වාකාරෙ ද්වාකාරෙති** සද්ධො පුග්ගලො ස්වාකාරො, අස්සද්ධො පුග්ගලො ද්වාකාරො; ආරද්ධවිරියො පුග්ගලො ස්වාකාරො, කුසීතො පුග්ගලො ද්වාකාරො; උපට්ඨිතස්සති පුග්ගලො ස්වාකාරො, මුට්ඨස්සති පුග්ගලො ද්වාකාරො; සමාහිතො පුග්ගලො ස්වාකාරො, අසමාහිතො පුග්ගලො ද්වාකාරො; පඤ්ඤවා පුග්ගලො ස්වාකාරො, දුප්පඤ්ඤො පුග්ගලො ද්වාකාරො

**සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙති** සද්ධො පුග්ගලො සුවිඤ්ඤාපයො, අස්සද්ධො පුග්ගලො දුවිඤ්ඤාපයො; ආරද්ධවිරියො පුග්ගලො සුවිඤ්ඤාපයො, කුසීතො පුග්ගලො දුවිඤ්ඤාපයො; උපට්ඨිතස්සති පුග්ගලො සුවිඤ්ඤාපයො, මුට්ඨස්සති පුග්ගලො දුවිඤ්ඤාපයො; සමාහිතො පුග්ගලො සුවිඤ්ඤාපයො, අසමාහිතො පුග්ගලො දුවිඤ්ඤාපයො; පඤ්ඤවා පුග්ගලො සුවිඤ්ඤාපයො, දුප්පඤ්ඤො පුග්ගලො දුවිඤ්ඤාපයො.

**අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනොති** සද්ධො පුග්ගලො පරලොකවජ්ජභය-දස්සාවී, අස්සද්ධො පුග්ගලො න පරලොකවජ්ජභයදස්සාවී; ආරද්ධවිරියො පුග්ගලො පරලොකවජ්ජභයදස්සාවී, කුසීතො පුග්ගලො න පරලොක-වජ්ජභයදස්සාවී; උපට්ඨිතස්සති පුග්ගලො පරලොකවජ්ජභයදස්සාවී, මුට්ඨස්සති පුග්ගලො න පරලොකවජ්ජභයදස්සාවී; සමාහිතො පුග්ගලො පරලොකවජ්ජභයදස්සාවී, අසමාහිතො පුග්ගලො න පරලොකවජ්ජ-භයදස්සාවී; පඤ්ඤවා පුග්ගලො පරලොකවජ්ජභයදස්සාවී, දුප්පඤ්ඤො පුග්ගලො න පරලොකවජ්ජභයදස්සාවී.

**ලොකොති** ඛන්ධලොකො, ධාතුලොකො, ආයතනලොකො, විපත්ති-භවලොකො, විපත්තිසම්භවලොකො, සම්පත්තිභවලොකො, සම්පත්ති-සම්භවලොකො.

එකො ලොකො: සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා, ද්වෙ ලොකා: නාමඤ්ච රූපඤ්ච, තයො ලොකා: තිස්සො වෙදනා, චත්තාරො ලොකා: චත්තාරො ආහාරා, පඤ්ච ලොකා: පඤ්චුපාදානක්ඛන්ධා, ඡ ලොකා: ඡ අජ්ඣත්තිකානි ආයතනානි, සත්ත ලොකා: සත්ත විඤ්ඤාණට්ඨිතියො, අට්ඨ ලොකා: අට්ඨ ලොකධම්මා, නව ලොකා: නව සත්තාවාසා, දස ලොකා: දසායතනානි, ද්වාදස ලොකා: ද්වාදසායතනානි, අට්ඨාරස ලොකා: අට්ඨාරස ධාතුයො.

**වජ්ජන්ති** සබ්බෙ කිලෙසා වජ්ජා, සබ්බෙ දුච්චරිතා වජ්ජා, සබ්බෙ අභිසඞ්ඛාරා වජ්ජා, සබ්බෙ භවගාමී කම්මා වජ්ජා.

**සද්ධාකාරෙ ද්වාකාරෙ** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම සුන්දර වූ ආකාර ඇත්තේ යැ ශ්‍රද්ධා නැති පුද්ගල තෙම කුත්සිත වූ ආකාර ඇත්තේ යැ ආරබ්ධවීර්‍ය්‍ය ඇති පුද්ගල තෙම සුන්දර වූ ආකාර ඇත්තේ යැ කුත්සිත වූ පුද්ගල තෙම කුත්සිත වූ ආකාර ඇත්තේ යැ එළඹසිටිසිහි ඇති පුද්ගල තෙම සුන්දර වූ ආකාර ඇත්තේ යැ මුළාසිහි ඇති පුද්ගල තෙම කුත්සිත වූ ආකාර ඇත්තේ යැ සමාහිත වූ පුද්ගල තෙම සුන්දර වූ ආකාර ඇත්තේ යැ අසමාහිත වූ පුද්ගල තෙම කුත්සිත වූ ආකාර ඇත්තේ යැ ප්‍රඥ ඇති පුද්ගල තෙම සුන්දර වූ ආකාර ඇත්තේ යැ දුෂ්ප්‍රාඥ වූ පුද්ගල තෙම කුත්සිත වූ ආකාර ඇත්තේ යි.

**සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ** යනු: සැදැහැති පුද්ගල තෙම සුවිඥප්‍ය (සුවසේ හැඟැවිය හැකි) යැ සැදැහැ නැති පුද්ගල තෙම දුර්විඥප්‍ය (දුකසේ හැඟැවිය හැකි) යැ ආරබ්ධවීර්‍ය්‍ය ඇති පුද්ගල තෙම සුවිඥප්‍ය යැ කුසීද වූ පුද්ගල තෙම දුර්විඥප්‍ය යැ එළඹසිටි සිහි ඇති පුද්ගල තෙම සුවිඥප්‍ය යැ මුළාසිහි ඇති පුද්ගල තෙම දුර්විඥප්‍ය යැ සමාහිත පුද්ගල තෙම සුවිඥප්‍ය යැ අසමාහිත පුද්ගල තෙම දුර්විඥප්‍ය යැ ප්‍රාඥ පුද්ගල තෙම සුවිඥප්‍ය යැ දුසප්‍රාඥ පුද්ගල තෙම දුර්විඥප්‍ය යි.

**අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො** යනු: සැදැහැති පුද්ගල තෙම පරලොව හා (රාගාදි) වද්‍යය භය වශයෙන් දක්තේ (දක්නාසුලු) යැ සැදැහැ නැති පුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් නො දක්තේ යැ ආරබ්ධවීර්‍ය්‍ය ඇති පුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් දක්තේ යැ කුසීදපුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් නො දක්තේ යැ එළඹසිටි සිහි ඇති පුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් දක්තේ යැ මුළාසිහි ඇති පුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් නො දක්තේ යැ සමාහිත පුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් දක්තේ යැ අසමාහිතපුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් නො දක්තේ යැ ප්‍රාඥපුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් දක්තේ යැ දුෂ්ප්‍රාඥ පුද්ගල තෙම පරලොව හා වද්‍යය භයවශයෙන් නො දක්තේ යි.

**ලොකො** යනු: සකන්ධලොක යැ ධාතුලොක යැ ආයතනලොක යැ විපත්තිභව (අපාය) ලොක යැ විපත්තිසම්භව (අපායූපගකම්ම) ලොක යැ සම්පත්තිභව (සුගති) ලොක යැ සම්පත්තිසම්භව (සුගතූපගකම්ම) ලොක යි.

**එක්** ලොවෙකැ: හැම සත්හු ආහාරයෙන් සිටුනාහු යැ. **ලොකයෝ** දෙදෙනෙකැ: නාමයත් රූපයත් යැ. ලොකයෝ තුන්දෙනෙකැ: තුන් වෙදනා යැ. ලොකයෝ සතරදෙනෙකැ: සතර ආහාරයෝ යැ. ලොකයෝ පස්දෙනෙකැ: පඤ්චොපාදානසකන්ධයෝ යැ. ලොකයෝ සදෙනෙකැ: ආධ්‍යාත්මික ආයතනයෝ සදෙන යැ. ලොකයෝ සත්දෙනෙකැ: සප්ත විඥනස්ථිතිහු යැ. ලොකයෝ අටදෙනෙකැ: අෂ්ටලොකධර්මයෝ යැ ලොකයෝ නවදෙනෙකැ: නවසත්ත්වාවාසයෝ යැ. ලොකයෝ දසදෙනෙකැ. දසආයතනයෝ යැ. ලොකයෝ දෙළොස්දෙනෙකැ: දෙළොස් ආයතනයෝ යැ. ලොකයෝ අටළොස්දෙනෙකැ: අටළොස් ධාතුහු යි.

**වජ්ජං** යනු: හැම කෙලශයෝ වද්‍යයෝ යැ හැම දුශ්චරිතයෝ වද්‍යයෝ යැ හැම අභිසංස්කාරයෝ වද්‍යයෝ යැ හැම භවගාමිකර්මයෝ වද්‍යයෝ යි.

ඉති ඉමස්මිඤ්ච ලොකෙ ඉමස්මිඤ්ච වජ්ජෙ තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොති, සෙය්‍යථාපි උක්ඛිත්තාසිකෙ වධකෙ. ඉමෙහි පඤ්ඤාසාය ආකාරෙහි ඉමානි පඤ්චින්ද්‍රියානි ජානාති, පස්සති, අඤ්ඤාති, පටිවිජ්ඣති.

ඉදං තථාගතස්ස ඉන්ද්‍රියපරොපරියත්තඤාණං.

**ඉන්ද්‍රියපරොපරියත්තඤාණනිද්දෙසො.**

## 69 ආසයානුසයඤාණං.

කතමං තථාගතස්ස සත්තානං ආසයානුසයඤාණං:

ඉධ තථාගතො සත්තානං ආසයං ජානාති, අනුසයං ජානාති, චරිතං ජානාති, අධිමුත්තිං ජානාති, භබ්බාභබ්බෙ සත්තෙ ජානාති.

කතමො ච සත්තානං ආසයො: 'සස්සතො ලොකො'ති වා 'අසස්සතො ලොකො'ති වා 'අන්තවා ලොකො'ති වා 'අනන්තවා ලොකො'ති වා 'තං ජීවං තං සරීර'න්ති වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති වා 'හොති තථාගතො පරම්මරණා'ති වා 'න හොති තථාගතො පරම්මරණා'ති වා 'හොති ච න හොති ච[1] තථාගතො පරම්මරණා'ති වා 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති වා. ඉති භවදිට්ඨිසන්නිස්සිතා වා සත්තා හොන්ති විභවදිට්ඨිසන්නිස්සිතා වා.

එතෙ වා පන උභො අන්තෙ අනුපගම්ම ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අනුලොමිකා ඛන්ති[2] පටිලද්ධා හොති, යථාභූතං වා ඤාණං.

කාමං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො කාමගරුකො කාමාසයො කාමාධිමුත්තො'ති, කාමං[3] සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො නෙක්ඛම්මගරුකො නෙක්ඛම්මාසයො නෙක්ඛම්මාධිමුත්තො'ති, නෙක්ඛම්මං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො නෙක්ඛම්මගරුකො නෙක්ඛම්මාසයො නෙක්ඛම්මාධිමුත්තො'ති, නෙක්ඛම්මං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො කාමගරුකො කාමාසයො කාමාධිමුත්තො'ති.

බ්‍යාපාදං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො බ්‍යාපාදගරුකො බ්‍යාපාදාසයො බ්‍යාපාදාධිමුත්තො'ති, බ්‍යාපාදං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො අබ්‍යාපාදගරුකො අබ්‍යාපාදාසයො අබ්‍යාපාදාධිමුත්තො'ති, අබ්‍යාපාදං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො අබ්‍යාපාදගරුකො අබ්‍යාපාදාසයො අබ්‍යාපාදාධිමුත්තො'ති, අබ්‍යාපාදං සෙවන්තමෙව ජානාති 'අයං පුග්ගලො බ්‍යාපාදගරුකො බ්‍යාපාදාසයො බ්‍යාපාදාධිමුත්තො'ති.

---

1 හොති ච න ච හොති - මජසං, සී 2 අනුලොමිකඛන්ති - සී 1, 2,
3. කායං, PTS

මෙසේයින් මේ ලෝකයෙහි ද මේ වද්‍යයෙහි ද බලවත් භයසංඥාව නගනලද අසිපත ඇති වධකයකු කෙරෙහි සේයින් එළඹසිටියා වෙයි. මේ පනස් අයුරින් මේ (ශ්‍රද්ධාදි) පඤ්චේන්ද්‍රියයන් (නුවණින්) දනියි (දිව්‍යසින්) දකියි. හාත්පසින් දනියි. ප්‍රතිවේධ කෙරේ.

මේ තථාගතයන් වහන්සේගේ (සත්ත්වයන් පිළිබඳ) ඉන්ද්‍රියපරාවරතා-ඥාන නම්.

**ඉන්ද්‍රියපරාවරතාඥානනිර්දෙශ යි.**

## 69. ආශයානුශයඥානය

තථාගතයන් වහන්සේගේ සත්ත්වයන් පිළිබඳ ආශයඅනුශය දන්නා නුවණ කවරෙ යත්:

මෙහි තථාගත තෙම සත්ත්වයන්ගේ ආශය (සන්තානය) දැනැගනී. අනුශය (ථාමගත කාමරාගාදිය) දැනැගනී. චරිතය (පූර්වකෘතකර්ම) දැනැගනී. අධිමුක්තිය දැනැගනී. භව්‍යාභව්‍යසත්ත්වයන් දැනැගනී.

සත්ත්වයන්ගේ ආශය කවරෙ යත්: 'ලෝකය ශාශ්වතැ' යි හෝ 'ලෝකය අශාශ්වතැ' යි හෝ 'ලෝකය අනන්ත ඇත්තේ යැ' යි හෝ 'ලෝකය අනන්ත නැත්තේ යැ' යි හෝ 'එ මැ ජීව යැ එ මැ ශරීර යැ' යි හෝ 'ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ' යි හෝ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන වේ' යයි හෝ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වේ' යයි හෝ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන වන්නේත් නො වන්නේත් වේ' යයි හෝ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වේ' යයි හෝ මෙසේයින් සත්ත්වයෝ ශාශ්වතදෘෂ්ටිය ඇසිරි කළාහු හෝ වෙති. උච්ඡේදදෘෂ්ටිය ඇසිරි කළාහු හෝ වෙත්.

මේ උභයාන්තයට ද නො පැමිණ ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්න-ධර්මයන්හි අනුලෝමඥානය ලබනලද වෙයි. යථාභූතඥානය හෝ ලබන ලද්දේ වේ.

කාමය සෙවුණාහු මැ 'මේ පුද්ගල තෙම කාමගරුක යැ කාමාශය ඇත්තේ යැ කාමාධිමුක්ත යැ'යි දැනගනියි. කාමය සෙවුණාහු මැ මේ පුද්ගල තෙම නෛෂ්ක්‍රම්‍යගරුක යැ නෛෂ්ක්‍රම්‍යාශය ඇත්තේ යැ නෛෂ්ක්‍රම්‍යාධි-මුක්ත යැ' යි දැනගනියි. නෛෂ්ක්‍රම්‍යය සෙවුණාහු මැ 'මේ පුද්ගල තෙම නෛෂ්ක්‍රම්‍යගරුක යැ නෛෂ්ක්‍රම්‍යාශය ඇත්තේ යැ නෛෂ්ක්‍රම්‍යාධිමුක්ත යැ' යි දැනගනියි. නෛෂ්ක්‍රම්‍යය සෙවුණාහු මැ 'මේ පුද්ගල තෙම කාම ගරුක යැ කාමාශය ඇත්තේ යැ කාමාධිමුක්ත යැ' යි දැනැගනී.

ව්‍යාපාදය සෙවුණාහු මැ 'මේ පුද්ගල තෙම ව්‍යාපාදගරුක යැ ව්‍යාපාද-ශය ඇත්තේ යැ ව්‍යාපාදාධිමුක්ත යැ' යි දැනගනියි. ව්‍යාපාදය සෙවුණාහු මැ 'මේ පුද්ගල තෙම අව්‍යාපාදගරුක යැ අව්‍යාපාදාශය ඇත්තේ යැ අව්‍යාපාදාධි-මුක්ත යැ' යි දැනගනියි. අව්‍යාපාදය සෙවුණාහු මැ 'මේ පුද්ගල තෙම අව්‍යාපාදගරුක යැ අව්‍යාපාදාශය ඇත්තේ යැ අව්‍යාපාදාධිමුක්ත යැ' යි දැනගනියි. අව්‍යාපාදය සෙවුණාහු මැ 'මේ පුද්ගල තෙම ව්‍යාපාදගරුක යැ ව්‍යාපාදාශය ඇත්තේ යැ ව්‍යාපාදාධිමුක්ත යැ' යි දැනැගනී.

ථීනමිද්ධං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො ථීනමිද්ධගරුකො ථීනමිද්ධාසයො ථීනමිද්ධාධිමුත්තො'ති, ථීනමිද්ධං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො ආලොකසඤ්ඤාගරුකො ආලොකසඤ්ඤාසයො අලොකසඤ්ඤාධිමුත්තො'ති, ආලොකසඤ්ඤං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො ආලොකසඤ්ඤාගරුකො ආලොකසඤ්ඤාසයො ආලොකසඤ්ඤාධිමුත්තො'ති, ආලොකසඤ්ඤං සෙවන්තඤ්ඤෙව ජානාති 'අයං පුග්ගලො ථීනමිද්ධගරුකො ථීනමිද්ධාසයො ථීනමිද්ධාධිමුත්තො'ති*. අයං සත්තානං ආසයො.

කතමො ච සත්තානං අනුසයො: සත්තානුසයා, කාමරාගානුසයො, පටිඝානුසයො, මානානුසයො, දිට්ඨානුසයො, විචිකිච්ඡානුසයො, භවරාගානුසයො, අවිජ්ජානුසයො.

යං ලොකෙ පියරූපං සාතරූපං, එත්ථ සත්තානං කාමරාගානුසයො අනුසෙති; යං ලොකෙ අප්පියරූපං[1] අසාතරූපං, එත්ථ සත්තානං පටිඝානුසයො අනුසෙති; ඉති ඉමෙසු ද්වීසු ධම්මෙසු අවිජ්ජා අනුපතිතා තදෙකට්ඨො මානො ච දිට්ඨි ච විචිකිච්ඡා ච දට්ඨබ්බා. අයං සත්තානං අනුසයො.

කතමං ච සත්තානං චරිතං: පුඤ්ඤාභිසඞ්ඛාරො, අපුඤ්ඤාභිසඞ්ඛාරො, ආනෙඤ්ජාභිසඞ්ඛාරො පරිත්තභූමකො වා මහාභූමකො වා, ඉදං සත්තානං චරිතං.

කතමා ච සත්තානං අධිමුත්ති: සන්ති සත්තා හීනාධිමුත්තිකා, සන්ති සත්තා පණීතාධිමුත්තිකා, හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙ සත්තෙ සෙවන්ති භජන්ති පයිරුපාසන්ති, පණීතාධිමුත්තිකා සත්තා පණීතාධිමුත්තිකෙ සත්තෙ සෙවන්ති භජන්ති පයිරුපාසන්ති. අතීතම්පි අද්ධානං හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙ සත්තෙ සෙවිංසු භජිංසු පයිරුපාසිංසු, පණීතාධිමුත්තිකා සත්තා පණීතාධිමුත්තිකෙ සත්තෙ සෙවිංසු භජිංසු පයිරුපාසිංසු, අනාගතම්පි අද්ධානං හීනාධිමුත්තිකා සත්තා හීනාධිමුත්තිකෙ සත්තෙ සෙවිස්සන්ති භජිස්සන්ති පයිරුපාසිස්සන්ති, පණීතාධිමුත්තිකා සත්තා පණීතාධිමුත්තිකෙ සත්තෙ සෙවිස්සන්ති භජිස්සන්ති පයිරුපාසිස්සන්ති. අයං සත්තානං අධිමුත්ති.

කතමෙ සත්තා අභබ්බා: යෙ තෙ සත්තා කම්මාවරණෙන සමන්නාගතා, කිලෙසාවරණෙන සමන්නාගතා, විපාකාවරණෙන සමන්නාගතා, අස්සද්ධා අච්ඡන්දිකා, දුප්පඤ්ඤා අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. ඉමෙ තෙ සත්තා අභබ්බා.

කතමෙ සත්තා භබ්බා: යෙ තෙ සත්තා න කම්මාවරණෙන සමන්නාගතා, න කිලෙසාවරණෙන සමන්නාගතා, න විපාකාවරණෙන සමන්නාගතා, සද්ධා ඡන්දිකා පඤ්ඤවන්තො, භබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. ඉමෙ තෙ සත්තා භබ්බා.

ඉදං තථාගතස්ස සත්තානං ආසයානුසයෙ ඤාණං.

ආසයානුසයඤාණනිද්දෙසො.

---

* 'කාම'න්තිච්චාදි වාක්‍යප්පදෙසො - ස්‍යා PTS පොත්ථකෙසු ච කත්ථචි සිහලක්ඛර පොත්ථකෙසු ච ව්‍යාකුලො විසදිසො ච දිස්සතෙ.

1 අප්පියරූපං - PTS.

ථීනමිද්ධය සෙවුණහු මැ ‘මේ පුද්ගල තෙම ථීනමිද්ධගරුක යැ ථීනමිද්ධාසය ඇත්තේ යැ ථීනමිද්ධාධිමුක්ත යැ’යි දැනගනියි. ථීනමිද්ධය සෙවුණහු මැ ‘මේ පුද්ගල තෙම ආලෝකසංඥාගරුක යැ ආලෝකසංඥාශය අත්තේ යැ ආලෝකසංඥාධිමුක්ත යැ’යි දැනගනියි. ආලෝකසංඥාව සෙවුණහු මැ ‘මේ පුද්ගල තෙම ආලෝකසංඥාගරුක යැ ආලෝකසංඥාශය ඇත්තේ යැ ආලෝකසංඥාධිමුක්ත යැ’යි දැනගනියි. ආලෝකසංඥාව සෙවුණහු මැ ‘මේ පුද්ගල තෙම ථීනමිද්ධගරුක යැ ථීනමිද්ධාසය ඇත්තේ යැ ථීනමිද්ධාධිමුක්ත යැ’යි දැනැගනී. මේ සත්ත්වයන්ගේ ආශය වේ.

සත්ත්වයන්ගේ අනුශය කවරේ යත්: අනුශයයෝ සත්දෙනෙකි: කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ මානානුශය යැ දෘෂ්ට්‍යනුශය යැ විචිකිත්සානුශය යැ භවරාගානුශය යැ අවිද්‍යානුශය යි.

යමක් ලෝකයෙහි ප්‍රියස්වභාව සාතස්වභාව ඇත්තේ ද මෙහි සත්ත්වයන්ගේ කාමරාගානුශය ලැගසිටී. යමෙක් ලෝකයෙහි අප්‍රියස්වභාව අසාතස්වභාව ඇත්තේ ද මෙහි සත්ත්වයන්ගේ ප්‍රතිඝානුශය ලැගසිටී. මෙසෙයින් මේ දෙදහම්හි අවිද්‍යාව අනුවගියා ය. ඒ අවිද්‍යාව හා සමග (සහජේකට්ඨවශයෙන්) එක් වැ සිටි මානය ද දෘෂ්ටිය ද විචිකිත්සාව ද දතයුත්තාහ. මේ සත්ත්වයන්ගේ අනුශය වේ.

සත්ත්වයන්ගේ චරිතය කවරේ යත්: පරිත්තභූමක වූ හෝ මහාභූමක වූ හෝ පුණ්‍යාභිසංස්කාර යැ අපුණ්‍යාභිසංස්කාර යැ ආනෙඤ්ජාභිසංස්කාර යි. මේ සත්ත්වයන්ගේ චරිත යි.

සත්ත්වයන්ගේ අධිමුක්ති කවර යත්: හීන වූ අධිමුක්ති (අදහස්) ඇති සත්ත්වයෝ ඇත්තාහ. ප්‍රණීත වූ අධිමුක්ති ඇති සත්ත්වයෝ ඇත්තාහ. හීනාධිමුක්තික සත්ත්වයෝ හීනාධිමුක්තික සත්ත්වයන් සෙවන - භජන - පර්යුපාසන කෙරෙති. ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයෝ ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයන් සෙවන භජන පර්යුපාසන කෙරෙති. අතීතකාලයෙහි දු හීනාධිමුක්තිකසත්ත්වයෝ හීනාධිමුක්තිකසත්ත්වයන් සෙවන -භජන- පර්යුපාසන කළහ. ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයෝ ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයන් සෙවන -භජන- පර්යුපාසන කළහ. අනාගතකාලයෙහි දු හීනාධිමුක්තිකසත්ත්වයෝ හීනාධිමුක්තිකසත්ත්වයන් සෙවන --භජන- පර්යුපාසන කරන්නාහ. ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයෝ ප්‍රණීතාධිමුක්තිකසත්ත්වයන් සෙවන -භජන- පර්යුපාසන කරන්නාහු යි. මේ සත්ත්වයන්ගේ අධිමුක්ති යි.

අභව්‍යසත්ත්වයෝ කවරහ යත්: යම් සත්ත්ව කෙනෙක් කර්මාවරණයෙන් සමන්වාගතයෝ ද ක්ලේශාවරණයෙන් සමන්වාගතයෝ ද විපාකාවරණයෙන් සමන්වාගතයෝ ද සැදැහැ නැත්තාහු ද කර්තුකාම්‍යතාකුශලච්ඡන්ද නැත්තාහු ද භවාඞ්ගප්‍රඥ රහිතයෝ ද කුශලධර්මයන්හි සම්‍යක්ත්වනියාම සඞ්ඛ්‍යාත ආර්යමාර්ගයට බැසැගන්නට අභව්‍යයෝ ද මේ සත්ත්වයෝ අභව්‍යයෝ යි.

භව්‍යසත්ත්වයෝ කවරහ යත්: යම් සත්ත්ව කෙනෙක් කර්මාවරණයෙන් සමන්වාගත නො වූවාහු ක්ලේශාවරණයෙන් සමන්වාගත නො වූවාහු විපාකාවරණයෙන් සමන්වාගත නො වූවාහු සැදැහැ ඇත්තාහු කර්තුකාම්‍යතාකුශලච්ඡන්ද ඇත්තාහු භවාඞ්ගප්‍රඥ ඇත්තාහු කුශලධර්මයන්හි සම්‍යක්ත්වනියාම සඞ්ඛ්‍යාත ආර්යමාර්ගයට බැසැගන්නට භව්‍ය වෙත් ද මේ සත්ත්වයෝ භව්‍යයෝ යි.

මේ තථාගතයන් වහන්සේගේ සත්ත්වයන් පිළිබඳ ආශය අනුශය දන්නා නුවණ යි.

**ආශයානුශයඥානනිර්දෙශ යි.**

## 70 යමකපාටිහීරඤාණං

කතමං තථාගතස්ස යමකපාටිහීරෙ ඤාණං.

ඉධ තථාගතො යමකපාටිහීරං කරොති අසාධාරණං සාවකෙහි. උපරිමකායතො අග්ගික්ඛන්ධො පවත්තති, හෙට්ඨිමකායතො උදකධාරා පවත්තති; හෙට්ඨිමකායතො අග්ගික්ඛන්ධො පවත්තති, උපරිමකායතො උදකධාරා පවත්තති; පුරත්ථිමකායතො අග්ගික්ඛන්ධො පවත්තති, පච්ඡිමකායතො උදකධාරා පවත්තති; පච්ඡිමකායතො අග්ගික්ඛන්ධො පවත්තති, පුරත්ථිමකායතො උදකධාරා පවත්තති; දක්ඛිණක්ඛිතො අග්ගික්ඛන්ධො පවත්තති, වාමක්ඛිතො උදකධාරා පවත්තති; වාමක්ඛිතො අග්ගික්ඛන්ධො පවත්තති, දක්ඛිණක්ඛිතො උදකධාරා පවත්තති. දක්ඛිණකණ්ණසොතතො අග්ගික්ඛන්ධො පවත්තති, වාමකණ්ණසොතතො උදකධාරා පවත්තති; වාමකණ්ණසොතතො අග්ගික්ඛන්ධො පවත්තති, දක්ඛිණකණ්ණසොතතො උදකධාරා පවත්තති, දක්ඛිණනාසිකාසොතතො අග්ගික්ඛන්ධො පවත්තති, වාමනාසිකාසොතතො උදකධාරා පවත්තති; වාමනාසිකාසොතතො අග්ගික්ඛන්ධො පවත්තති, දක්ඛිණනාසිකාසොතතො උදකධාරා පවත්තති; දක්ඛිණංසකූටතො[1] අග්ගික්ඛන්ධො පවත්තති, වාමංසකූටතො[2] උදකධාරා පවත්තති; වාමංසකූටතො අග්ගික්ඛන්ධො පවත්තති, දක්ඛිණංසකූටතො උදකධාරා පවත්තති; දක්ඛිණහත්ථතො අග්ගික්ඛන්ධො පවත්තති, වාමහත්ථතො උදකධාරා පවත්තති; වාමහත්ථතො අග්ගික්ඛන්ධො පවත්තති, දක්ඛිණහත්ථතො උදකධාරා පවත්තති; දක්ඛිණපස්සතො අග්ගික්ඛන්ධො පවත්තති, වාමපස්සතො උදකධාරා පවත්තති; වාමපස්සතො අග්ගික්ඛන්ධො-පවත්තති, දක්ඛිණපස්සතො උදකධාරා පවත්තති; දක්ඛිණපාදතො අග්ගික්ඛන්ධො පවත්තති, වාමපාදතො උදකධාරා පවත්තති; වාමපාදතො අග්ගික්ඛන්ධො පවත්තති, දක්ඛිණපාදතො උදකධාරා පවත්තති, අඞ්ගුලඞ්ගුලෙහි අග්ගික්ඛන්ධො පවත්තති, අඞ්ගුලන්තරිකාහි උදකධාරා පවත්තති; අඞ්ගුලන්තරිකාහි අග්ගික්ඛන්ධො පවත්තති, අඞ්ගුලඞ්ගුලෙහි උදකධාරා පවත්තති; එකෙකලොමතො අග්ගික්ඛන්ධො පවත්තති, එකෙකලොමතො උදකධාරා පවත්තති, ලොමකූපතො ලොමකූපතො අග්ගික්ඛන්ධො පවත්තති, ලොමකූපතො ලොමකූපතො උදකධාරා පවත්තති, ඡන්නං වණ්ණානං නීලානං පීතකානං ලොහිතකානං ඔදාතානං මඤ්ජිට්ඨානං[3] පභස්සරානං.

භගවා චඞ්කමති,* නිම්මිතො තිට්ඨති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති. භගවා තිට්ඨති, නිම්මිතො චඞ්කමති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති; භගවා නිසීදති, නිම්මිතො චඞ්කමති වා තිට්ඨති වා නිසීදති වා; නිම්මිතො චඞ්කමති, භගවා තිට්ඨති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති; නිම්මිතො තිට්ඨති, භගවා චඞ්කමති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති; නිම්මිතො නිසීදති, භගවා චඞ්කමති වා තිට්ඨති වා සෙය්‍යං වා කප්පෙති; නිම්මිතො සෙය්‍යං කප්පෙති, භගවා චඞ්කමති වා තිට්ඨති වා නිසීදති වාති'.

ඉදං තථාගතස්ස යමකපාටිහීරෙ ඤාණං.

**යමකපටිහීරඤාණනිද්දෙසො**

---

1. දක්ඛිණමංසකූටතො - PTS, දක්ඛිණඅංස ... මජසං,
2. වාමමංසකූටතො - PTS, වාමඅංස... මජසං, 3. මඤ්ජෙට්ඨානං - PTS,

*. පාළිපාඨදෙසො'ත්‍ර ස්‍යාමක්ඛරපොත්ථකෙ විසදිසො දිස්සති.

# 70 යමකප්‍රාතිහාර්‍ය්‍යඥානය

තථාගතයන් වහන්සේගේ යමකප්‍රාතිහාර්‍ය්‍යඥානය කවරේ යත්:

මෙහි තථාගත තෙම ශ්‍රාවකයන් හා අසාධාරණ වූ යමකප්‍රාති-හාර්‍ය්‍යය කෙරෙයි. උඩුකයින් ගිනිකඳ පවත්වයි, යටිකයින් දියදහර පවත්වයි, යටිකයින් ගිනිකඳ පවත්වයි, උඩුකයින් දියදහර පවත්වයි; පෙරපසින් ගිනිකඳ පවත්වයි, පසුපසින් දියදහර පවත්වයි; පසුපසින් ගිනිකඳ පවත්වයි, පෙරපසින් දියදහර පවත්වයි: දකුණැසින් ගිනිකඳ පවත්වයි, වමැසින් දියදහර පවත්වයි; වමැසින් ගිනිකඳ පවත්වයි, දකුණැසින් දියදහර පවත්වයි; දකුණුකන්සිළින් ගිනිකඳ පවත්වයි, වම්කන්සිළින් දියදහර පවත්වයි; වම්කන්සිළින් ගිනිකඳ පවත්වයි, දකුණුකන්සිළින් දියදහර පවත්වයි; දකුණුනැහැසිළින් ගිනිකඳ පවත්වයි, වම්නැහැසිළින් දියදහර පවත්වයි; වම්නැහැසිළින් ගිනිකඳ පවත්වයි, දකුණුනැහැසිළින් දියදහර පවත්වයි; දකුණුදසරියෙන් ගිනිකඳ පවත්වයි, වම්දසරියෙන් දියදහර පවත්වයි; වම්දසරියෙන් ගිනිකඳ පවත්වයි, දකුණුදසරියෙන් දියදහර පවත්වයි; දකුණතින් ගිනිකඳ පවත්වයි, වමතින් දියදහර පවත්වයි; වමතින් ගිනිකඳ පවත්වයි, දකුණතින් දියදහර පවත්වයි; දකුණුපසින් ගිනිකඳ පවත්වයි, වම්පසින් දියදහර පවත්වයි; වම්පසින් ගිනිකඳ පවත්වයි, දකුණුපසින් දියදහර පවත්වයි; දකුණුපයින් ගිනිකඳ පවත්වයි, වම්පයින් දියදහර පවත්වයි; වම්පයින් ගිනිකඳ පවත්වයි, දකුණුපයින් දියදහර පවත්වයි; එකෙකි ඇඟිල්ලෙන් ගිනිකඳ පවත්වයි, ඇඟිලි අතුරින් දියදහර පවත්වයි; ඇඟිලි අතුරින් ගිනිකඳ පවත්වයි, එකෙකි ඇඟිල්ලෙන් දියදහර පවත්වයි; එකෙකි රෝමයෙන් ගිනිකඳ පවත්වයි, එකෙකි රෝමයෙන් දියදහර පවත්වයි; එකෙකි රෝමකූපයෙන් ගිනිකඳ පවත්වයි, එකෙකි රෝමකූපයෙන් දිය-දහර පවත්වයි; නීල යැ පීත යැ ලොහිත යැ අවදාත යැ මාඤ්ජිෂ්ඨ යැ ප්‍රභාස්වර යැ යන ෂඩ්වර්ණයන්ගේ රශ්මිහු යුගළ වැ පවතිත්.

බුදුහු සක්මන් කෙරෙති, නිර්මිත බුදුහු සිටිති හිඳිති ශයනය හෝ කෙරෙති; බුදුහු සිටිති, නිර්මිත බුදුහු සක්මන් කෙරෙති හිඳිති ශයනය හෝ කෙරෙති; බුදුහු හිඳිති, නිර්මිත බුදුහු සක්මන් කෙරෙති සිටිති ශයනය හෝ කෙරෙති; බුදුහු ශයනය කෙරෙති, නිර්මිත බුදුහු සක්මන් කෙරෙති සිටිති නිසීදනය හෝ කෙරෙති; නිර්මිත බුදුහු සක්මන් කෙරෙති, බුදුහු සිටිති හිඳිති ශයනය හෝ කෙරෙති; නිර්මිත බුදුහු සිටිති, බුදුහු සක්මන් කෙරෙති හිඳිති ශයනය හෝ කෙරෙති; නිර්මිත බුදුහු හිඳිති, බුදුහු සක්මන් කෙරෙති සිටිති ශයනය හෝ කෙරෙති; නිර්මිත බුදුහු ශයනය කෙරෙති, බුදුහු සක්මන් කෙරෙති සිටිති නිසී-දනය හෝ කෙරෙත් යයි.

මේ තථාගතයන් වහන්සේගේ යමකප්‍රාතිහාර්‍ය්‍යඥාන යි.

**යමකප්‍රාතිහාර්‍ය්‍යඥානනිර්දෙශ යි.**

## 71. මහාකරුණාසමාපත්තිඤාණං

කතමං තථාගතස්ස මහාකරුණාසමාපත්තියා ඤාණං:

බහුකෙහි ආකාරෙහි පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති: 'ආදිත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'උය්‍යුත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'පයාතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'කුම්මග්ගපටිපන්නො.[1] 'ලොකසන්නිවාසො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'උපනීයති ලොකො අද්ධුවො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'අතාණො[2] ලොකො අනභිස්සරො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'අස්සකො ලොකො සබ්බං පහාය ගමනීය'න්ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'ඌනො ලොකො අතිත්තො තණ්හාදාසො'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති. 'අතායනො[3] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'අලෙණො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'අසරණො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'අසරණීභූතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ-

'උද්ධතො ලොකො අවූපසන්තො'ති පස්සන්තානං -පෙ- 'සසල්ලො ලොකසන්නිවාසො විද්ධො පුථුසල්ලෙහි, තස්ස නත්ථඤ්ඤො කොචි සල්ලානං උද්ධාතා[4] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'අවිජ්ජන්ධකාරාවරණො ලොකසන්නිවාසො[5] කිලෙසපඤ්ජරපක්ඛිත්තො,[6] තස්ස නත්ථඤ්ඤො කොචි ආලොකං දස්සෙතා අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'අවිජ්ජාගතො ලොකසන්නිවාසො අණ්ඩභූතො[7] පරියොනද්ධො[8] තන්තාකුලකජාතො[9] ගුලාගුණ්ඨිකජාතො[10] මුඤ්ජබබ්බජභූතො[11] අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තතී'ති පස්සන්තානං -පෙ- 'අවිජ්ජාවිසදොසසංලිත්තො[12] ලොකසන්නිවාසො කිලෙසකලලීභූතො'ති[13] පස්සන්තානං -පෙ-

'රාගදොසමොහජටාජටිතො[14] ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි ජටං විජටෙතා[15] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'තණ්හාසඞ්ඝාටපටිමුක්කො[16] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'තණ්හාජාලෙන ඔත්ථටො[17] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'තණ්හාසොතෙන වුය්හති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'තණ්හාසංයොජනෙන සඤ්ඤුත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'තණ්හානුසයෙන අනුසටො[18] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'තණ්හාසන්තාපෙන සන්තප්පති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- තණ්හාපරිළාහෙන පරිඩය්හති[19] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ-

1. කුම්මග්ගප්පටිපන්නො - PTS, 2 අපාතාණො - සයා, 3. අතාණො - PTS
4. උද්ධතා - මජසං, උද්ධත්තො - PTS, උද්ධරකො - සී 2, උද්ධුතා - සයා,
5 ...සන්නිවාසො අණ්ඩභූතො - මජසං, 6. පඤ්ජරං පක්ඛිත්තා - සයා,
7 අණ්ඩභූතා - PTS, 8. පරියොනන්ධා - PTS. 9. තන්තාකුලජාතා - සයා, PTS
10. කුලාගුණ්ඨිකජාතො-මජසං, ගුලාගුණ්ඨිකා - සයා 11. මුඤ්ජබබ්බජභූතා - PTS,
12 ...දොසසල්ලිත්තො - PTS, 13 කිලෙසකලිභූතො - PTS,
14 මොහජටිතො - PTS. සයා 15. විජටිතා - සයා. PTS.
16 සඞ්ඝාතපටිමුක්කො - සී 1,2, 17. ඔත්ථතො - PTS,
18. අනුසංගතො - PTS, සී 2- 19 පරිළිය්හති - PTS.

## 71 මහාකරුණාසමාපත්තිඥානය

තථාගතයන් වහන්සේගේ මහාකරුණාසමාපත්තිඥානය කවරේ යත්:

බහුප්‍රකාරයෙන් (නුවණැසින් හා බුදු ඇසින් හා) බලන්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී: 'ලොකසන්නිවාසය තෙම (රාගාදීන් විසින්) ආදීප්ත යැ'යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී. 'ලොකසන්නිවාසය තෙම (නොයෙක් කටයුත්තෙහි) උත්සාහ සහිත යැ'යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී. 'ලොකසන්නිවාසය තෙම මරණයට නික්මැගියේ යැ'යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී. 'ලොකසන්නිවාසය තෙම නො මඟට පිළිපන්නේ යැ'යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී. ලෝවැසි තෙම අස්ථිර වූයේ ජරාවශයෙන් මරණයට ගෙනයනු ලැබේ ය'යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී. 'ලෝවැසි තෙම අස්වාසලිය හැක්කෙක් නැත්තේ අනාරක්ෂක වූයේ යැ'යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී. 'ලෝවැසි තෙම (අයැති යයි ගන්නාලද) සියල්ල හැරපියා යායුතු යැ (එහෙයින් මැ) තමා අයැතියක් නැත්තේ යැ'යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී. 'ලෝවැසි තෙම තෘෂ්ණාවට දාස වූයේ නො තිත් වූයේ ඌන වූයේ යැ'යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී. 'ලොකසන්නිවාසය තෙම අනාරක්ෂක යැ'යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී. ලොකසන්නිවාසය තෙම නිශ්‍රය රහිත යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම අසරණ යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම අසරණ වූයේ යැ'යි දක්නා වූ ...

'ලෝවැසි තෙම නො සන්හුන් වූයේ උද්ධත යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම බොහෝ වූ හුලින් විදිනා ලද්දේ සශල්‍ය වූයේ යැ. මා තබා ඒ ලොකසන්නිවාසයාගේ හුල් උදුරන අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... ලොකසන්නිවාසය තෙම කෙලෙස්මැදිරියෙහි බහාලනලද්දේ අවිද්‍යාන්ධකාර නැමැති ආවරණ ඇත්තේ යැ, මා තබා ඒ ලොකසන්නිවාසයට ආලොකය දක්වනසුලු අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම අවිද්‍යාවට පිවිසියේ අවිද්‍යාණ්ඩකොෂයෙහි උපන්නේ හාත්පසින් බඳනාලද්දේ හුවටක් සෙයින් ආකුල වූයේ ලිහිණිකසල්ලක් බඳු වූයේ මුඤ්ජතණබබුස්තණ බඳු වූයේ අය සඞ්ඛ්‍යාත සැපයෙන් පහවූ දුකට ගති වූ විවස වැ පතිත වන සසර නො ඉක්මේ'යයි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම අවිද්‍යා සඞ්ඛ්‍යාත විෂදෝෂයෙන් මොනොවට තැවැරුණේ හටගත් කෙලෙස්කලල් ඇත්තේ යැ'යි දක්නා වූ . 'ලොකසන්නිවාසය තෙම රාගද්වෙෂමොහ සඞ්ඛ්‍යාත ජටායෙන් මැඩුණේ යැ, මා තබා ඒ ලොකසන්නිවාසයාගේ (කෙලෙස්) ජටා සිඳුනා අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම තෘෂ්ණා නැමැති සඟුළෙයෙහි පිවිසියේ යැ'යි දක්නා වූ 'ලොකසන්නිවාසය තෙම තෘෂ්ණා නැමැති දැලින් හාත්පසින් වෙළනා ලද්දේ යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම තෘෂ්ණාස්‍රොතසින් අදනාලැබේ ය'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම තෘෂ්ණාසංයොජනයෙන් බඳනාලද්දැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම තෘෂ්ණානුශයයෙන් අනුගත යැ'යි දක්නා වූ .. 'ලොකසන්නිවාසය තෙම තෘෂ්ණාසන්තාපයෙන් තවනු ලැබේ'යයි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම තෘෂ්ණාපරිදාහයෙන් දවනුලැබේ'යයි දක්නා වූ ...

'දිට්ඨිසඞ්ඝාටපටිමුක්කො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- දිට්ඨිජාලෙන ඔත්ථටො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දිට්ඨිසොතෙන වුය්හති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දිට්ඨිසංයොජනෙන සඤ්ඤුත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දිට්ඨානුසයෙන අනුසටො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දිට්ඨිසන්තාපෙන සන්තප්පති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- දිට්ඨිපරිළාහෙන පරිඩය්හති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ-

'ජාතියා අනුගතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'ජරාය අනුසටො[1] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'බ්‍යාධිනා අභිභූතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- මරණෙන අබ්භාහතො[2] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- දුක්ඛෙ පතිට්ඨිතො[3] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ-

'තණ්හාය උඩ්ඩිතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'ජරාපාකාරපරික්ඛිත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'මච්චුපාසෙන[4] පරික්ඛිත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'මහාබන්ධනබද්ධො[5] ලොකසන්නිවාසො රාගබන්ධනෙන දොසබන්ධනෙන මොහබන්ධනෙන මානබන්ධනෙන දිට්ඨිබන්ධනෙන කිලෙසබන්ධනෙන දුච්චරිතබන්ධනෙන, තස්ස නත්ථඤ්ඤො කොචි බන්ධනං මොචෙතා අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාසම්බාධපටිපන්නො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි ඔකාසං දස්සෙතා අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාපළිබොධෙන පළිබුද්ධො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි පළිබොධං ඡෙත්තා[6] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාපපාතෙ පතිතො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි පපාතා උද්ධාතා[7] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාකන්තාරපටිපන්නො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි කන්තාරං තාරෙතා අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාසංසාරපටිපන්නො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි සංසාරමොචෙතා[8] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාවිදුග්ගෙ සම්පරිවත්තති ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි විදුග්ගා උද්ධාතා[7] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහාපළිපෙ පළිපන්නො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි පළිපා උද්ධාතා[7] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ-

'අබ්භාහතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'ආදිත්තො ලොකසන්නිවාසො රාගග්ගිනා දොසග්ගිනා මොහග්ගිනා ජාතියා ජරාමරණෙන[9] සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, තස්ස නත්ථඤ්ඤො කොචි නිබ්බාපෙතා අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- උන්නීතකො[10] ලොකසන්නිවාසො හඤ්ඤති නිච්චමතාණො[11] පත්තදණ්ඩො

---

1 අනුසහගතො - PTS  2 අභිහතො - සයා, PTS
3 දුක්ඛපතිතො - සයා. PTS  4 පච්චුපාසෙන - PTS,  5 බන්ධො - PTS,
6 ඡෙදිතා - මජසං, ඡෙදෙතා සයා, PTS.  7 උද්ධතා - මජසං. උද්ධත්තා සයා,
8 සංසාරා මොචෙතා - මජසං, PTS.  9 ජරාය මරණෙන - මජසං,
10 උන්නිතකො - සයා  11 නිච්චමත්තාණො - සයා

'ලොකසන්නිවාසය තෙම දෘෂ්ටි නැමැති ගහණයෙහි පිවිසියේ යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම දෘෂ්ටිජාලයෙන් වෙළනලද්දැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම දෘෂ්ටිස්‍රොතසින් අදනාලැබේ යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම දෘෂ්ටිසංයෝජනයෙන් බඳනාලද්දැ'යි දක්නා වූ ... ලොකසන්නිවාසය තෙම දෘෂ්ට්‍යනුශයයෙන් අනුගත යැ'යි දක්නා වූ . ලොකසන්නිවාසය තෙම දෘෂ්ටිසන්තාපයෙන් තැවේ'යයි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම දෘෂ්ටිපරිදාහයෙන් දැවේ'යයි දක්නා වූ ..

'ලොකසන්නිවාසය තෙම ජාතියෙන් අනුගත වූයේ යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම ජරායෙන් ලුහුබඳනා ලද්දැ'යි දක්නා වූ ... ලොකසන්නිවාසය තෙම ව්‍යාධියෙන් මඩනාලද්දේ යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම මරණයෙන් පහරන ලද්දේ යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම දුක්හි පිහිටියේ යැ'යි දක්නා වූ ...

'ලොකසන්නිවාසය තෙම තෘෂ්ණායෙන් නඟනලද්දයේ යැ'යි දක්නා වූ .. 'ලොකසන්නිවාසය තෙම ජරා නැමැති ප්‍රාකාරයෙන් පරික්ෂිප්ත යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම මරණපාශයෙන් පරික්ෂිප්ත යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම මහාබන්ධනයෙන් බැඳුණේ යැ රාගබන්ධනයෙන් ද්වෙෂබන්ධනයෙන් මොහබන්ධනයෙන් මානබන්ධනයෙන් දෘෂ්ටිබන්ධනයෙන් කෙලශබන්ධනයෙන් දුශ්චරිතබන්ධනයෙන් බැඳුණේ යැ, මා තබා ඒ ලොකසන්නිවාසයාගේ බන්ධනය මුදනා අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම මහත් වූ කෙලශසම්බාධයට පිළිපන්නේ යැ, මා තබා ඒ ලොකසන්නිවාසයට අවකාශ දක්වන අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... ලොකසන්නිවාසය තෙම මහාපළිබොධයෙන් ඇවුරුණේ යැ, මා තබා ඒ ලොකසන්නිවාසයාගේ පළිබොධ සිඳුනා අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම පඤ්චගති සඞ්ඛ්‍යාත මහාප්‍රපාතයෙහි වැටුණේ යැ, මා තබා ඒ ලොකසන්නිවාසය ප්‍රපාතයෙන් නඟන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... ලොකසන්නිවාසය තෙම (ජාත්‍යාදි) මහකතරට පිළිපන්නේ යැ, මා තබා ඒ ලොකසන්නිවාසය කතර තරවන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... ලොකසන්නිවාසය තෙම මහසසරට පිළිපන්නේ යැ, මා තබා ඒ ලොකසන්නිවාසය සසරින් මුදන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම සංසාර සඞ්ඛ්‍යාත මහාදුර්ගයෙහි පරිවර්තන වෙයි, මා තබා ඒ ලොකසන්නිවාසය දුර්ගයෙන් නඟාලන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම මහමඩෙහි ලැගුණේ යැ, මා තබා ඒ ලොකසන්නිවාසය මඩෙන් නඟාලන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ...

'ලොකසන්නිවාසය තෙම (හැම උවදුරින්) මඩනාලද්දේ යැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම රාගාග්නියෙන් ද්වෙෂාග්නියෙන් මොහාග්නියෙන් ජාතියෙන් ජරාමරණයෙන් ශොකයෙන් පරිදෙවයෙන් දුක්න් දෞර්මනස්සින් දැඩිආයාසයෙන් ඇවිළගත්තේ යැ, මා තබා ඒ ලොකසන්නිවාසය නිවාලන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලොකසන්නිවාසය තෙම (ජාතිය විසින් ජරාදි උපද්‍රවයට) ඔසවාගෙනයනලද්දේ පැමිණි දඬුවම් ඇති සොර වූයේ නිරන්තර අනාරක්ෂක වැ පෙළේ යැ'යි

තක්කරෝ'ති පස්සන්තානං -පෙ- 'උජ්ජබඣනබද්ධො ලොකසන්නිවාසො ආඝාතනපච්චුපට්ඨිතො, තස්ස නත්ථඤ්ඤො කොචි මොචෙතා[1] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'අනාථො ලොකසන්නිවාසො පරමකාපඤ්ඤප්පත්තො[2] තස්ස නත්ථඤ්ඤො කොචි තායෙතා[3] අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'දුක්ඛාභිතුන්නො[4] ලොකසන්නිවාසො චිරරත්තපීළිතො'ති[5] පස්සන්තානං -පෙ- 'නිච්චගධිතො[6] ලොකසන්නිවාසො නිච්චපිපාසිතො'ති[7] පස්සන්තානං -පෙ-

'අන්ධො ලොකසන්නිවාසො අචක්ඛුකො'ති පස්සන්තානං -පෙ- 'හතනෙත්තො ලොකසන්නිවාසො අපරිනායකො'ති පස්සන්තානං -පෙ- 'විපථපක්ඛන්නො[8] ලොකසන්නිවාසො අඤ්ජසාපරද්ධො, තස්ස නත්ථඤ්ඤො කොචි අරියපථං ආනෙතා අඤ්ඤත්‍ර මයා'ති පස්සන්තානං -පෙ- 'මහොඝපක්ඛන්නො ලොකසන්නිවාසො, තස්ස නත්ථඤ්ඤො කොචි ඔඝා උද්ධාතා[9] අඤ්ඤත්‍ර මයා'යි පස්සන්තාණං -පෙ-

'ද්වීහි දිට්ඨිගතෙහි පරියුට්ඨිතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'තීහි දුච්චරිතෙහි විප්පටිපන්නො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'චතූහි යොගෙහි යුත්තො[10] ලොකසන්නිවාසො චතුයොගයොජිතො'ති පස්සන්තානං -පෙ- 'චතූහි ගන්ථෙහි ගන්ථිතො[11] ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'චතූහි උපාදානෙහි උපාදීයති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'පඤ්චගතිසමාරූළ්හො ලොකසන්නිවාසො'ති පස්සන්තන්තානං -පෙ- 'පඤ්චහි කාමගුණෙහි රජ්ජති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'පඤ්චහි නීවරණෙහි ඔත්ථටො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'ඡහි විවාදමූලෙහි විවදති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'ඡහි තණ්හාකායෙහි රජ්ජති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'ඡහි දිට්ඨිගතෙහි පරියුට්ඨිතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'සත්තහි අනුසයෙහි අනුසටො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'සත්තහි සංයොජනෙහි සඤ්ඤුත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'සත්තහි මානෙහි උන්නතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'අට්ඨහි ලොකධම්මෙහි සම්පරිවත්තති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'අට්ඨහි මිච්ඡත්තෙහි නිය්‍යාතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'අට්ඨහි පුරිසදොසෙහි දුස්සති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'නවහි ආඝාතවත්ථූහි ආඝාතිතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'නවවිධමානෙහි උන්නතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'නවහි තණ්හාමූලකෙහි ධම්මෙහි රජ්ජති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දසහි කිලෙසවත්ථූහි කිලිස්සති ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දසහි ආඝාතවත්ථූහි ආඝාතිතො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ- 'දසහි අකුසලකම්මපථෙහි සමන්නාගතො ලොසකන්නවාසො'ති පස්සන්තානං -පෙ- 'දසහි සඤ්ඤොජනෙහි සඤ්ඤුත්තො ලොකසන්නිවාසො'ති පස්සන්තානං -පෙ-

1. බන්ධං මොචෙතා - මජසං, 2. පරමකාරුඤ්ඤප්පත්තො - මජසං, සයා PTS
3 තායිතා - තායිතාති වා පාඨො සුන්දරො - ස. (අට්ඨකථා)
4. දුක්ඛාභිතුණ්ණො PTS ස 5 චිරරත්තං පීළිතො - මජසං 6. ගධිතො - මජසං
7. නිච්චං පිපාසිතො මජසං 8 පක්ඛන්දො - මජසං, පක්ඛන්තො - බහුසු
9. උද්ධතා - මජසං, PTS, උද්ධත්තා - සයා' 10 පූරිතො - සයා,
11 ගණ්ඨෙහි ගණ්ඨිතො - සයා

දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම (රාගාදි) වද්ධබන්ධනයෙන් බඳනාලදුයේ දම්ගෙඩිය කරා එළඹ සිටියේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය මුදලන අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම අනාථ වූයේ පරම දිළිඳු බවට පැමිණියේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය රක්නා අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ .. 'ලෝකසන්නිවාසය තෙම දුකින් පෙළනලදුයේ දිගුකලක් පෙළුණේ යැ'යි දක්නා වූ .. 'ලෝකසන්නිවාසය තෙම (තෘෂ්ණායෙන්) නිරතුරු ගිජු වූයේ නිරතුරු හටගත් පවස් ඇත්තේ යැ'යි දක්නා වූ ...

'ලෝකසන්නිවාසය තෙම (ප්‍රඥාවගේ අභාවයෙන්) අන්ධ වූයේ යැ ඇස් නැත්තේ යැ'යි දක්නා වූ .. ලෝකසන්නිවාසය තෙම නට ඇස් ඇත්තේ පරිනායකයකු රහිත වූයේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම විපරීතමාර්ගයට බටුයේ ඍජුමාර්ගයෙහි වැරැද්දේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය ආර්‍ය්‍යමාර්ගයට ගෙන එන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ .. 'ලෝකසන්නිවාසය තෙම (කාමාදි) මහාඕඝයට පිවිසියේ යැ, මා තබා ඒ ලෝකසන්නිවාසය ඕඝයෙන් නගාලන්නා වූ අන් කිසිවෙක් නැතැ'යි දක්නා වූ ...

'ලෝකසන්නිවාසය තෙම (ශාශ්වත-උච්ඡෙද) දෘෂ්ටි දෙකින් පර්‍ය්‍යවස්ථිත වූයේ (හාත්පසින් ගෙන සිටියේ) යැ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම තුන් දුශ්චරිතයන් විසින් විප්‍රතිපන්න යැ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම (කාමාදි) සතර යෝගයන් ගෙන් යුක්ත වූයේ සතර යෝගයන් විසින් බඳනා ලද්දේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම සතර ග්‍රන්ථයන් විසින් ගෙතුණේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම සතර උපාදානයන් විසින් දැඩි කොට ගන්නාලැබේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම පඤ්චගතියට සමාරූඪ වූයේ යැ'යි දක්නා වූ .. 'ලෝකසන්නිවාසය තෙම පඤ්චකාමගුණයන් විසින් රඳනා ලැබේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම පඤ්චනීවරණයන් විසින් වතුරුවනලදැ'යි දක්නා වූ . ලෝකසන්නිවාසය තෙම සවැදෑරුම් විවාදමූලයන්ගෙන් විවාද කෙරේ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම සවැදෑරුම් තෘෂ්ණාකායයෙන් ඇලේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම ෂඩ්දෘෂ්ටීන් විසින් පර්‍ය්‍යවස්ථිත යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම සප්ත අනුශයයන් විසින් ලුහුබඳනාලද යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම සත් සංයෝජනයන් විසින් සංයුක්ත යැ'යි දක්නා වු ... 'ලෝකසන්නිවාසය තෙම සප්තවිධ මානයන් විසින් උන්නත වූයේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම අෂ්ටලෝකධර්මයෙන් පෙරළේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම අෂ්ටමිථ්‍යාත්වයෙන් නිර්‍ය්‍යාත යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම අටවැදෑරුම් පුරුෂදෝෂයෙන් දුෂ්‍ය වේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම නවවිධ ආඝාතවස්තුයෙන් ගැටුණේ යැ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම නවවිධ මානයෙන් උන්නත වූයේ යැ'යි දක්නා වූ ... ලෝකසන්නිවාසය තෙම නව තෘෂ්ණාමූලකධර්මයන්ගෙන් ඇලේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දශ ක්ලේශවස්තුයෙන් කෙලෙසේ'යයි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දශආඝාතවස්තුයෙන් ගැටුණේ යැ'යි දක්නා වූ . 'ලෝකසන්නිවාසය තෙම දශඅකුශලකර්මපථයෙන් සමන්වාගත යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසිය තෙම දශ සංයෝජනයෙන්

දසහි මිච්ඡත්තෙහි නියාතො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘දසවත්ථුකාය මිච්ඡාදිට්ඨියා සමන්නාගතො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘දසවත්ථුකාය අන්තග්ගාහිකාය[1] දිට්ඨියා සමන්නාගතො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘අට්ඨසතතණ්හාපපඤ්චසතෙහි පපඤ්චිතො ලොකසන්නිවාසො’ති පස්සන්තානං -පෙ- ‘ද්වාසට්ඨියා දිට්ඨිගතෙහි පරියුට්ඨිතො ලොකසන්නිවාසො’ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති.

‘අහඤ්චම්හි තිණ්ණො, ලොකො ච අතිණ්ණො; අහඤ්චම්හි මුත්තො, ලොකො ච අමුත්තො; අහඤ්චම්හි දන්තො, ලොකො ච අදන්තො; අහඤ්චම්හි සන්තො, ලොකො ච අසන්තො; අහඤ්චම්හි අස්සත්ථො, ලොකො ච අනස්සත්ථො; අහඤ්චම්හි පරිනිබ්බුතො, ලොකො ච අපරිනිබ්බුතො. පහොමි ක්වාහං තිණ්ණො තාරෙතුං, මුත්තො මොචෙතුං, දන්තො දමෙතුං, සන්තො සමෙතුං, අස්සත්ථො අස්සාසෙතුං, පරිනිබ්බුතො පරිනිබ්බාපෙතු’න්ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති.

ඉදං තථාගතස්ස මහාකරුණාසමාපත්තියා ඤාණං.

**මහාකරුණාසමාපත්තිඤාණ නිද්දෙසො.**

## 72-73. සබ්බඤ්ඤුත-අනාවරණඤාණානි

**කතමං** තථාගතස්ස සබ්බඤ්ඤුතඤාණං:

සබ්බං සඞ්ඛතමසඞ්ඛතං[2] අනවසෙසං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.[3]

අතීතං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

අනාගතං සබ්බං ජනාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

පච්චුප්පන්නං සබ්බං ජනාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

චක්ඛුඤ්චෙව[4] රූපා ච එතං සබ්බං[5] ජානාතීති සබ්බඤ්ඤුතඤාණං තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං, සොතඤ්චෙව සද්දා ච -පෙ- ඝානඤ්චෙව ගන්ධා ච -පෙ- ජිව්හා චෙව රසා ච -පෙ- කායො චෙව ඵොට්ඨබ්බා ච -පෙ- මනො චෙව ධම්මා ච එතං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං

---

1 අන්තග්ගාහිකදිට්ඨියා - සී 1 2 සබ්බසඞ්ඛතමසඞ්ඛතං - ස්‍යා, සී 2
5 අනාවරණං ඤාණං - ස්‍යා 4 චක්ඛු චෙව - මජ්සං 5 එවං තං සබ්බං - මජ්සං

බැඳුණේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දශවිධමිථ්‍යාත්වයන් විසින් නියතීකෘත යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දශවස්තුක මිථ්‍යාදෘෂ්ටියෙන් සමන්වාගත යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දශවස්තුක වූ අන්තග්‍රාහිකදෘෂ්ටියෙන් සමන්වාගත යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම 'අටතුරාසියකැ'යි සලකනලද තෘෂ්ණාප්‍රපඤ්චසතයෙන් ප්‍රපඤ්ච කරනලද්දේ යැ'යි දක්නා වූ ... 'ලෝකසන්නිවාසය තෙම දෙසැටමිසදිටුයෙන් පර්‍යුත්ථිත යැ'යි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ මහාකරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී.

මම් වූකලි තරණය කෙළෙම් වෙමි, ලෝවැසි තෙමේ වැළිත් තරණය නො කෙළේ යැ, මම් වූකලි මිදුණෙම් වෙමි, ලෝවැසි තෙමේ වැළිත් නො මිදුණේ යැ; මම් වූකලි දැමුණෙම් වෙමි, ලෝවැසි තෙමේ වැළිත් නො දැමුණේ යැ; මම් වූකලි සිහිල් වූයෙම් වෙමි, ලෝවැසි තෙමේ වැළිත් නො සිහිල් වූයේ යැ; මම් වූකලි අස්වැසුණෙම් වෙමි, ලෝවැසි තෙමේ වැළිත් නො අස්වැසුණේ යැ; මම් වූකලි පිරිනිවියෙම් වෙමි, ලෝවැසි තෙමේ වැළිත් නො පිරිනිවියේ යැ; එකත්නෙත් මම් තරණය කෙළෙම් මෙරමා තරවන්නට, මිදුනෙම් මෙරමා මූදන්නට, දැමුණෙම් මෙරමා දමන්නට, සිහිල් වූයෙම් මෙරමා සිහිල් කරන්නට, අස්වැසුණෙම් මෙරමා අස්වසාලන්නට, පිරිනිවියෙම් මෙරමා පිරිනිවාලන්නට සමර්ථයෙමි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන්ගේ කරුණාව සත්ත්වයන් කෙරෙහි බැසැගනී.

මේ තථාගතයන් වහන්සේගේ මහාකරුණාසමාපත්තියෙහි ඥාන යි.

**මහාකරුණාසමාපත්තිඥානනිර්දේශ යි.**

## 72–73 සර්වඥතා – අනාවරණඥානයෝ

තථාගතයන් වහන්සේගේ සර්වඥතාඥානය කවරේ යත්:

හැම සඞ්ඛතය අසඞ්ඛතය නිරවශේෂ කොට දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ.

අතීත වූ සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ.

අනාගත වූ සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ.

ප්‍රත්‍යුත්පන්න වූ සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ.

ඇස ද රූපයෝ ද යන තෙල සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ. කන ද ශබ්දයෝ ද ... නැහැය ද ගන්ධයෝ ද ... දිව ද රසයෝ ද ... කය ද ස්ප්‍රෂ්ටව්‍යයෝ ද ... මනස ද ධර්මයෝ ද යන තෙල සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යාවතා අනිච්චට්ඨං දුක්ඛට්ඨං අනත්තට්ඨං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං. යාවතා රූපස්ස අනිච්චට්ඨං දුක්ඛට්ඨං අනත්තට්ඨං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤු-තඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං. යාවතා වෙදනාය -පෙ- යාවතා සඤ්ඤාය -පෙ- යාවතා සඞ්ඛාරානං -පෙ- යාවතා විඤ්ඤාණස්ස -පෙ- යාවතා චක්ඛුස්ස -පෙ- යාවතා ජරාමරණස්ස අනිච්චට්ඨං දුක්ඛට්ඨං අනත්තට්ඨං තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යාවතා අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං, යාවතා පරිඤ්ඤාය පරිඤ්ඤට්ඨං -පෙ- යාවතා පහානස්ස[1] පහානට්ඨං -පෙ- යාවතා භාවනාය භාවනට්ඨං -පෙ- යාවතා සච්ඡිකිරියාය සච්ඡිකිරියට්ඨං -පෙ-

යාවතා ඛන්ධානං ඛන්ධට්ඨං -පෙ- යාවතා ධාතූනං ධාතුට්ඨං -පෙ- යාවතා ආයතනානං ආයතනට්ඨං -පෙ- යාවතා සඞ්ඛතානං සඞ්ඛතට්ඨං -පෙ- යාවතා අසඞ්ඛතස්ස අසඞ්ඛතට්ඨං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුත ඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යාවතා කුසලෙ ධම්මෙ සබ්බං* ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං. යාවතා අකුසලෙ ධම්මෙ -පෙ- යාවතා අබ්‍යාකතෙ ධම්මෙ -පෙ-

යාවතා කාමාවචරෙ ධම්මෙ -පෙ- යාවතා රූපාවචරෙ ධම්මෙ -පෙ- යාවතා අරූපාවචරෙ ධම්මෙ -පෙ- යාවතා අපරියාපන්නෙ ධම්මෙ සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨං -පෙ- යාවතා සමුදයස්ස සමුදයට්ඨං -පෙ- යාවතා නිරොධස්ස නිරොධට්ඨං -පෙ- යාවතා මග්ගස්ස මග්ගට්ඨං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යාවතා අත්ථපටිසම්භිදාය අත්ථපටිසම්භිදට්ඨං -පෙ- යාවතා ධම්මපටි-සම්භිදාය ධම්මපටිසම්භිදට්ඨං -පෙ- යාවතා නිරුත්තිපටිසම්භිදාය නිරුත්ති-පටිසම්භිදට්ඨං -පෙ- යාවතා පටිභානපටිසම්භිදාය පටිභානපටිසම්භිදට්ඨං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනා-වරණඤාණං.

යාවතා ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං -පෙ- යාවතා සත්තානං ආසයානුසයෙ ඤාණං -පෙ- යාවතා යමකපාටිහීරෙ ඤාණං -පෙ- යාවතා මහාකරුණාසමාපත්තියා ඤාණං, තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණ ඤාණං.

---

1 පහානාය - සතා.

* "සබ්බෙ ජානාතීති බහුවචනපාඨො සුන්දරො, එකවචනසොතෙ පතිතත්තා පන පොත්ථකෙසු එකවචනෙන ලිඛිතං." යනු අටුවායි.

යම්තාක් අනිත්‍යස්වභාව දුඃඛස්වභාව අනාත්මස්වභාව වේ ද ඒ සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ, යම්තාක් රූපයාගේ අනිත්‍යස්වභාව දුඃඛස්වභාව අනාත්මස්වභාව වේ ද ඒ සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ. යම්තාක් වේදනාවගේ ... යම්තාක් සංඥාවගේ ... යම්තාක් සංස්කාරයන්ගේ ... යම්තාක් විඥානයාගේ ... යම්තාක් චක්ෂුස්හුගේ ... යම්තාක් ජරාමරණයාගේ අනිත්‍ය ස්වභාව දුඃඛස්වභාව අනාත්මස්වභාව වේ ද ඒ සියල්ල දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් අභිඥාවගේ අභිඥාස්වභාව වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යැ. යම්තාක් පරිඥාවගේ පරිඥාස්වභාව වේ ද ... යම්තාක් ප්‍රහාණයාගේ ප්‍රහාණස්වභාව .. යම්තාක් භාවනාවගේ භාවනාස්වභාව ... යම්තාක් සාක්ෂාත්ක්‍රියාවගේ සාක්ෂාත්ක්‍රියාස්වභාව ...

යම්තාක් ස්කන්ධයන්ගේ ස්කන්ධස්වභාව ... යම්තාක් ධාතූන්ගේ ධාතුස්වභාව ... යම්තාක් ආයතනයන්ගේ ආයතනස්වභාව ... යම්තාක් සංඛතයන්ගේ සංඛතස්වභාව ... යම්තාක් අසංඛතයාගේ අසංඛත ස්වභාව වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් කුශලධර්මය වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ එහි ආවරණයෙක් නැත් නු යි ආවරණඥාන යැ. යම්තාක් අකුශලධර්මය ... යම්තාක් අව්‍යාකෘතධර්මය ...

යම්තාක් කාමාවචරධර්මය ... යම්තාක් රූපාවචරධර්මය ... යම්තාක් අරූපාවචරධර්මය ... යම්තාක් අපර්‍යාපන්නධර්මය වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් දුඃඛයාගේ දුඃඛස්වභාව ... යම්තාක් සමුදයාගේ සමුදය ස්වභාව ... යම්තාක් නිරෝධයාගේ නිරෝධස්වභාව ... යම්තාක් මාර්ගයාගේ මාර්ගස්වභාවය වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් අර්ථපටිසම්භිදාවගේ අර්ථපටිසම්භිදා ස්වභාව ... යම්තාත් ධම්මපටිසම්භිදාවගේ ධම්මපටිසම්භිදා ස්වභාව ... යම්තාක් නිරුක්තිපටිසම්භිදාවගේ නිරුක්තිපටිසම්භිදා ස්වභාව ... යම්තාක් පටිභානපටිසම්භිදාවගේ පටිභානපටිසම්භිදාස්වභාව වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් ඉන්ද්‍රියපරෝපරියත්තඥානය ... යම්තාක් සත්ත්වයන්ගේ ආශයානුශයඥානය ... යම්තාක් යමකප්‍රාතිහාර්‍යඥානය ... යම්තාක් මහාකරුණාසමාපත්තිඥානය වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යාවතා සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණ–බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණ ඤාණං.

1. 'න තස්ස අද්දිට්ඨමිධත්ථි[1] කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං,
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි නෙය්‍යං[2]
තථාගතො තෙන සමන්තචක්ඛූ'ති.

සමන්තචක්ඛූති කෙනට්ඨෙන සමන්තචක්ඛු:

චුද්දස බුද්ධඤාණානි: දුක්ඛෙ ඤාණං බුද්ධඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං බුද්ධඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං බුද්ධඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං බුද්ධඤාණං, අත්ථපටිසම්භිදෙ ඤාණං බුද්ධඤාණං, ධම්මපටිසම්භිදෙ ඤාණං බුද්ධඤාණං, නිරුත්තිපටිසම්භිදෙ ඤාණං බුද්ධඤාණං, පටිභානපටිසම්භිදෙ ඤාණං බුද්ධඤාණං, ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං බුද්ධඤාණං, ආසයානුසයෙ ඤාණං බුද්ධඤාණං, යමකපාටිහීරෙ ඤාණං බුද්ධඤාණං, මහාකරුණාසමාපත්තියා ඤාණං බුද්ධඤාණං, සබ්බඤ්ඤුතඤාණං බුද්ධඤාණං, අනාවරණඤාණං බුද්ධඤාණං, ඉමානි චුද්දස බුද්ධඤාණානි. ඉමෙසං චුද්දසන්නං බුද්ධඤාණානං අට්ඨ ඤාණානි සාවකසාධාරණානි, ඡ ඤාණානි අසාධාරණානි සාවකෙහි.

යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨො සබ්බො ඤාතො, අඤ්ඤාතො දුක්ඛට්ඨො නත්ථීති සබ්බඤ්ඤුතඤාණං. තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨො සබ්බො දිට්ඨො -පෙ- සබ්බො විදිතො -පෙ- සබ්බො සච්ඡිකතො -පෙ- සබ්බො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය දුක්ඛට්ඨො නත්ථීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණ ඤාණං.

යාවතා සමුදයස්ස සමුදයට්ඨො -පෙ- යාවතා නිරොධස්ස නිරොධට්ඨො -පෙ- යාවතා මග්ගස්ස මග්ගට්ඨො -පෙ- යාවතා අත්ථපටිසම්භිදාය අත්ථපටිසම්භිදට්ඨො -පෙ- යාවතා ධම්මපටිසම්භිදාය ධම්මපටිසම්භිදට්ඨො -පෙ- යාවතා නිරුත්තිපටිසම්භිදාය නිරුත්තිපටිසම්භිදට්ඨො -පෙ- යාවතා පටිභානපටිසම්භිදාය පටිභානපටිසම්භිදට්ඨො සබ්බො ඤාතො -පෙ- සබ්බො දිට්ඨො -පෙ- සබ්බො විදිතො -පෙ- සබ්බො සච්ඡිකතො -පෙ- සබ්බො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය පටිභානපටිසම්භිදට්ඨො නත්ථීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යම්තාක් මරුන් සහිත වූ බඹුන් සහිත වූ සදෙවක ලෝකයා විසින් මහණබමුණන් සහිත වූ දෙවිමිනිසුන් සහිත ප්‍රජාව විසින් දක්නාලද රූපායතනයෙක් ශබ්දායතනයෙක් ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යායතනයෙක් ධර්මායතනයෙක් පැමිණෙනලද රූපාදියෙක් සොයනලද රූපාදියෙක් මනසින් විමසනලද රූපාදියෙක් වේ ද එ හැම දනී නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

ඒ තථාගතයන් විසින් මේ ත්‍රෛධාතුක ලෝකයෙහි (මෙකල හෝ) පැනැසින් නුදුටු කිසිවෙක් නැත. යළි (අතීත වූ) නො දත් කිසිවෙක් නැත, (අනාගත වූ) නො දූනෙන කිසි (ධර්මජාතයෙකු) දු නැත, දතයුතු වූ යම් ධර්මජාතයෙක් වේ නම් ඒ සියල්ල අවබොධ කළහ. එහෙයින් තථාගතයෝ සමන්තචක්ඛු වූහ.

**සමන්තචක්ඛු** යනු: කවර අර්ථයෙන් සමන්තචක්ඛු වේ ද යත්:

බුද්ධඥාන තුදුසෙකි: දුඃඛසත්‍යයෙහි ඥානය බුද්ධඥාන යැ දුඃඛසමුදය සත්‍යයෙහි ඥානය බුද්ධඥාන යැ දුඃඛනිරොධසත්‍යයෙහි ඥානය බුද්ධඥාන යැ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාසත්‍යයෙහි ඥානය බුද්ධඥාන යැ අත්ථපටිසම්භිදායෙහි ඥානය බුද්ධඥාන යැ ධම්මපටිසම්භිදායෙහි ඥානය බුද්ධඥාන යැ නිරුත්තිපටිසම්භිදායෙහි ඥානය බුද්ධඥාන යැ පටිභානපටිසම්භිදායෙහි ඥානය බුද්ධඥාන යැ ඉන්ද්‍රියපරාවරාතාඥානය බුද්ධඥාන යැ ආශයානුශයඥානය බුද්ධඥාන යැ යමකප්‍රාතිහාර්යඥානය බුද්ධඥාන යැ මහාකරුණාසමාපත්තියෙහි ඥානය බුද්ධඥාන යැ සර්වඥතාඥානය බුද්ධඥාන යැ අනාවරණඥානය බුද්ධඥාන යි. මොහු තුදුස් බුද්ධඥානයෝ යි. මේ තුදුස් බුද්ධඥානයන් අතුරෙන් ඥානයෝ අටදෙනෙක් ශ්‍රාවකසාධාරණ වෙති. ඥානයෝ සදෙනෙක් ශ්‍රාවකයන් හා සමග අසාධාරණ වෙත්.

යම්තාක් දුඃඛයාගේ දුඃඛස්වභාවයෙක් වේ ද සියල්ල නුවණින් දත්නාලද්දේ යැ අඥාත වූ දුඃඛස්වභාවයෙක් නැත් නු යි සර්වඥතාඥාන යැ එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් දුඃඛයාගේ දුඃඛස්වභාවයෙක් වේ ද සියල්ල (ඇසින් මෙන් නුවණින්) දක්නා ලද්දේ යැ ... සියල්ල ප්‍රකට කොට දත්නාලද්දේ යැ ... සියල්ල සාක්ෂාත් කරනලද්දේ යැ ... සියල්ල නුවණින් ස්පර්ශ කරනලද්දේ යැ, නුවණින් ස්පර්ශ නො කරනලද දුඃඛාර්ථයෙක් නැත් නු යි සර්වඥතාඥාන යැ, එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් සමුදයාගේ සමුදයස්වභාවයෙක් ... යම්තාක් නිරොධයාගේ නිරොධස්වභාවයෙක් ... යම්තාක් මාර්ගයාගේ මාර්ගස්වභාවයෙක් ... යම්තාක් අත්ථපටිසම්භිදාවගේ අත්ථපටිසම්භිදාස්වභාවයෙක් ... යම්තාක් ධම්මපටිසම්භිදාවගේ ධම්මපටිසම්භිදාස්වභාවයෙක් ... යම්තාක් නිරුත්තිපටිසම්භිදාවගේ නිරුත්තිපටිසම්භිදාස්වභාවයෙක් ... යම්තාක් පටිභානපටිසම්භිදාවගේ පටිභානපටිසම්භිදා ස්වභාවයෙක් වේ ද සියල්ල නුවණින් දත්නා ලද්දේ යැ – සියල්ල නුවණින් දක්නාලද්දේ යැ – සියල්ල ප්‍රකට කොට දත්නාලද්දේ යැ – සියල්ල සාක්ෂාත් කරනලද්දේ යැ – සියල්ල නුවණින් ස්පර්ශ කරනලද්දේ යැ – නුවණින් ස්පර්ශ නො කරනලද පටිභානපටිසම්භිදාස්වභාවයෙක් නැත් නු යි සර්වඥතාඥාන යැ. එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යාවතා ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං -පෙ- යාවතා සත්තානං ආසයානුසයෙ ඤාණං -පෙ- යාවතා යමකපාටිහීරෙ ඤාණං -පෙ- යාවතා මහාකරුණාසමාපත්තියා ඤාණං සබ්බං ඤාතං -පෙ- සබ්බං දිට්ඨං -පෙ- සබ්බං විදිතං -පෙ- සබ්බං සච්ඡිකතං -පෙ- සබ්බං ඵස්සිතං පඤ්ඤාය, අඵස්සිතං පඤ්ඤාය මහාකරුණාසමාපත්තියා ඤාණං නත්ථීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

යාවතා සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, සබ්බං ඤාතං -පෙ- සබ්බං දිට්ඨං -පෙ- සබ්බං විදිතං -පෙ- සබ්බං සච්ඡිකතං -පෙ- සබ්බං ඵස්සිතං පඤ්ඤාය, අඵස්සිතං පඤ්ඤාය නත්ථීති සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.

න තස්ස අද්දිට්ඨමිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං,
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි නෙය්‍යං
තථාගතො තෙන සමන්තචක්ඛු'ති.

සබ්බඤ්ඤුතඤාණනිද්දෙසො.

ඤාණකථා සමත්තා.

යම්තාක් ඉන්ද්‍රියපරොපරියත්තඥානයෙක් ... යම්තාක් සත්ත්වයන්ගේ ආශයානුශයඥානයෙක් ... යම්තාක් යමකප්‍රාතිහාර්‍ය්‍යඥානයෙක් ... යම්තාක් මහාකරුණාසමාපත්තිඥානයෙක් වේ ද සියල්ල නුවණින් දන්නාලද යෑ ... සියල්ල නුවණින් දක්නාලද යෑ ... සියල්ල ප්‍රකට කොට දන්නා ලද යෑ ... සියල්ල සාක්ෂාත් කරනලද යෑ ... සියල්ල නුවණින් ස්පර්ශ කරනලද යෑ. නුවණින් ස්පර්ශ නො කරනලද මහාකරුණාසමාපත්තිඥානයෙක් නැත් නු යි සර්වඥතාඥාන යෑ. එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

යම්තාක් මරුන් සහිත වූ බඹුන් සහිත වූ සදෙවකලෝකයා විසින් මහණබමුණන් සහිත වූ දෙව්මිනිසුන් සහිත ප්‍රජාව විසින් දක්නා ලද රූපායතනයෙක් ශබ්දායතනයෙක් ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍යායතනයෙක් ධර්මායතනයෙක් පැමිණෙනලද රූපාදියෙක් සොයනලද රූපාදියෙක් මනසින් විමසනලද රූපාදියෙක් වේ ද සියල්ල නුවණින් දන්නාලද යෑ ... සියල්ල නුවණින් දක්නාලද යෑ ... සියල්ල ප්‍රකට කොට දක්නාලද යෑ ... සියල්ල සාක්ෂාත් කරනලද යෑ ... සියල්ල නුවණින් ස්පර්ශ කරනලද යෑ. නුවණින් ස්පර්ශ නො කරන ලද රූපාදියෙක් නැත් නු යි සර්වඥතාඥාන යෑ. එහි ආවරණයෙක් නැත් නු යි අනාවරණඥාන යි.

ඒ තථාගතයන් විසින් මේ ත්‍රෛධාතුකලෝකයෙහි (මෙකල හෝ) පැනැසින් නුදුටු කිසිවෙක් නැත. යළි (අතීත වූ) නො දත් කිසිවෙක් නැත. (අනාගත වූ) නො දැනෙන කිසි (ධර්මජාතයෙකු) දු නැත. දතයුතු වූ යම් ධර්මජාතයෙක් වේ නම් ඒ සියල්ල අවබොධ කළහ, එහෙයින් තථාගතයෝ 'සමන්තචක්ඛු' වූහ'යි.

**සර්වඥතාඥානනිර්දේශ යි.**

**ඥානකථා නිමි.**

# 2

# දිට්ඨිකථා

කා දිට්ඨි[1] කති දිට්ඨිට්ඨානානි, කති දිට්ඨිපරියුට්ඨානානි, කති දිට්ඨියො, කති දිට්ඨාභිනිවෙසා, කතමො දිට්ඨිට්ඨාන සමුග්ඝාතොති.

1. **කාදිට්ඨීති**: අභිනිවෙසපරාමාසො දිට්ඨි[2].

2. **කතිදිට්ඨිට්ඨානානීති**: අට්ඨ දිට්ඨිට්ඨානානි.

3. **කතිදිට්ඨිපරියුට්ඨානානීති**: අට්ඨාරස දිට්ඨිපරියුට්ඨානානි,

4. **කතිදිට්ඨියොති**: සොළස දිට්ඨියො.

5. **කතිදිට්ඨාභිනිවෙසාති**: තීණි සතං[3] දිට්ඨාභිනිවෙසා,

6. **කතමො දිට්ඨිට්ඨානසමුග්ඝාතොති**: සොතාපත්තිමග්ගො දිට්ඨිට්ඨානසමුග්ඝාතො.

කථං[4] අභිනිවෙසපරාමාසො දිට්ඨි.

රූපං ‘එතං මම, එසො’හමස්මි, එසො මෙ අත්තා’ති අභිනිවෙස පරාමාසො දිට්ඨි, වෙදනං ‘එතං මම -පෙ- සඤ්ඤං එතං මම -පෙ- සඞ්ඛාරෙ ‘එතං මම -පෙ- විඤ්ඤාණං ‘එතං මම, එසො’හමස්මි, එසො මෙ අත්තාති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛුං එතං මම -පෙ- සොතං එතං මම -පෙ- ඝානං එතං මම -පෙ- ජිව්හං එතං මම -පෙ- කායං එතං මම -පෙ- මනං ‘එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා’ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, රූපෙ[5] එතං මම -පෙ- සද්දෙ එතං මම -පෙ- ගන්ධෙ එතං මම -පෙ- රසෙ එතං මම -පෙ- ඵොට්ඨබ්බෙ එතං මම -පෙ- ධම්මෙ ‘එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා’ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛුවිඤ්ඤාණං එතං මෙ -පෙ- සොතවිඤ්ඤාණං එතං මම -පෙ- ඝානවිඤ්ඤාණං එතං මම -පෙ- ජිව්හාවිඤ්ඤාණං එතං මම -පෙ- කායවිඤ්ඤාණං එතං මම -පෙ- මනොවිඤ්ඤාණං ‘එතං මම, එසො’හමස්මි, එසො මෙ අත්තා’ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛුසම්ඵස්සං එතං මම -පෙ- සොතසම්ඵස්සං එතං මම -පෙ- ඝානසම්ඵස්සං එතං මම -පෙ- ජිව්හාසම්ඵස්සං එතං මම -පෙ- කායසම්ඵස්සං එතං මම -පෙ- මනොසම්ඵස්සං ‘එතං මම, එසො’හමස්මි, එසො මෙ අත්තා’ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

---

1. කාදිට්ඨීති - ස්‍යා, කම්. 2. කති අභිනිවෙසපරාමාසො දිට්ඨි - ස්‍යා
3. තිංසසතං - ස්‍යා 4. කති - ස්‍යා 5. රූපං සද්දං (ඉච්චා) - ස්‍යා, සී 1.2

2

# දෘෂ්ටිකථා

දෘෂ්ටි කවර යැ, දෘෂ්ටිකාරණයෝ කෙතෙකැ, දෘෂ්ටිපර්‍යුත්ථානයෝ කෙතෙකැ, දෘෂ්ටිහු කෙතෙකැ, දෘෂ්ටිඅභිනිවේශයෝ කෙතෙකැ, දෘෂ්ටිකාරණසමුද්ඝාතය කවරෙ යත්:

1. **දෘෂ්ටිය කවර** යනු: අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ.

2. **දෘෂ්ටිකාරණයෝ කෙතෙකැ** යනු: දෘෂ්ටිකාරණයෝ අටදෙනෙකි.

3. **දෘෂ්ටිපර්‍යුත්ථානයෝ කෙතෙකැ** යනු: දෘෂ්ටිපර්‍යුත්ථානයෝ අටළොස්දෙනෙකි.

4. **දෘෂ්ටිහු කෙතෙකැ** යනු: දෘෂ්ටිහු සොළොස්දෙනෙකි.

5. **දෘෂ්ට්‍යභිනිවේශයෝ කෙතෙකැ** යනු: දෘෂ්ට්‍යභිනිවේශ තුන්සියයෙකි.

6. **දෘෂ්ටිකාරණසමුද්ඝාතය කවරෙ** යනු සෝවාන්මාර්ගය දෘෂ්ටිකාරණසමුද්ඝාතය වේ.

කිසෙයින් අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි වෙයි යත්:

රූපය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. වේදනාව 'තෙල මාගේ යැ ... සංඥාව 'තෙල මාගේ යැ ... සංස්කාර 'තෙල මාගේ යැ ... විඥානය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ.

චක්ෂුස 'තෙල මාගේ යැ ... ශ්‍රොත්‍රය 'තෙල මාගේ යැ ... ඝ්‍රාණය 'තෙල මාගේ යැ ... ජිහ්වාව 'තෙල මාගේ යැ ... කාය 'තෙල මාගේ යැ ... මනස 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. රූපයන් 'තෙල මාගේ යැ ... ශබ්දයන් 'තෙල මාගේ යැ ... ගන්ධයන් ,තෙල මාගේ යැ ... රසයන් 'තෙල මාගේ යැ ... ස්ප්‍රෂ්ටව්‍යයන් තෙල මාගේ යැ ... ධර්මයන් 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ.

චක්ෂුර්විඥානය 'තෙල මාගේ යැ ... ශ්‍රොත්‍රවිඥානය 'තෙල මාගේ යැ ... ඝ්‍රාණවිඥානය 'තෙල මාගේ යැ ... ජිහ්වාවිඥානය 'තෙල මාගේ යැ ... කායවිඥානය 'තෙල මාගේ යැ ... මනොවිඥානය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ.

චක්ඛුසම්ඵස්සය 'තෙල මාගේ යැ ... සොතසම්ඵස්සය 'තෙල මාගේ යැ ... ඝානසම්ඵස්සය 'තෙල මාගේ යැ ... ජිව්හාසම්ඵස්සය 'තෙල මාගේ යැ ... කායසම්ඵස්සය 'තෙල මාගේ යැ ... මනොසම්ඵස්සය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවේශ පරාමර්ශය දෘෂ්ටි යැ.

චක්ඛුසම්ඵස්සජං වෙදනං එතං මම -පෙ- සොතසම්ඵස්සජං වෙදනං -පෙ- ඝානසම්ඵස්සජං වෙදනං -පෙ- ජිව්හාසම්ඵස්සජං වෙදනං -පෙ- කායසම්ඵස්සජං වෙදනං -පෙ- මනොසම්පස්සජං වෙදනං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

රූපසඤ්ඤං එතං මම -පෙ- සද්දසඤ්ඤං එතං මම -පෙ- ගන්ධසඤ්ඤං එතං මම -පෙ- රසසඤ්ඤං එතං මම -පෙ- ඵොට්ඨබ්බසඤ්ඤං එතං මම -පෙ- ධම්මසඤ්ඤං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

රූපසඤ්චෙතනං එතං මම -පෙ- සද්දසඤ්චෙතනං එතං මම -පෙ- ගන්ධසඤ්චෙතනං එතං මම -පෙ- රසසඤ්චෙතනං එතං මම -පෙ- ඵොට්ඨබ්බසඤ්චෙතනං එතං මම-පෙ- ධම්මසඤ්චෙතනං 'එතං මම එසො හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

රූපතණ්හං එතං මම -පෙ- සද්දතණ්හං එතං මම -පෙ- ගන්ධතණ්හං එතං මම -පෙ- රසතණ්හං එතං මම -පෙ- ඵොට්ඨබ්බතණ්හං එතං මම -පෙ- ධම්මතණ්හං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

රූපවිතක්කං එතං මම -පෙ- සද්දවිතක්කං එතං මම -පෙ- ගන්ධවිතක්කං එතං මම -පෙ- රසවිතක්කං එතං මම -පෙ- ඵොට්ඨබ්බවිතක්කං එතං මම -පෙ- ධම්මවිතක්කං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

රූපවිචාරං එතං මම -පෙ- සද්දවිචාරං එතං මම -පෙ- ගන්ධවිචාරං එතං මම -පෙ- රසවිචාරං එතං මම -පෙ- ඵොට්ඨබ්බවිචාරං එතං මම -පෙ- ධම්මවිචාරං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

පඨවීධාතුං එතං මම -පෙ- ආපොධාතුං එතං මම -පෙ- තෙජොධාතුං එතං මම -පෙ- වායොධාතුං එතං මම -පෙ- ආකාසධාතුං එතං මම -පෙ- විඤ්ඤාණධාතුං 'එතං මම, එසො 'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

පඨවිකසිණං එතං මම -පෙ- ආපොකසිණං -පෙ- තෙජොකසිණං -පෙ- වායොකසිණං -පෙ- නීලකසිණං -පෙ- පීතකසිණං -පෙ- ලොහිතකසිණං -පෙ- ඔදාතකසිණං -පෙ- ආකාසකසිණං -පෙ- විඤ්ඤාණකසිණං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛුසම්ඵස්සයෙන් උපන් වේදනාව 'තෙල මාගේ යැ ... සොත-සම්ඵස්සයෙන් උපන් වේදනාව ... ඝාණසම්ඵස්සයෙන් උපන් වේදනාව ... ජිව්හාසම්ඵස්සයෙන් උපන් වේදනාව ... කායසම්ඵස්සයෙන් උපන් වේද-නාව ... මනොසම්ඵස්සයෙන් උපන් වේදනාව 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ.

රූපසංඥාව 'තෙල මාගේ යැ ... ශබ්දසංඥාව තෙල මාගේ යැ ... ගන්ධසංඥාව 'තෙල මාගේ යැ ... රසසංඥාව 'තෙල මාගේ යැ... ස්‍පෘෂ්ටව්‍ය-සංඥාව 'තෙල මාගේ යැ ... ධර්මසංඥාව 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ.

රූපසඤ්චෙතනාව 'තෙල මාගේ යැ ... ශබ්දසඤ්චෙතනාව 'තෙල මාගේ යැ ... ගන්ධසඤ්චෙතනාව 'තෙල මාගේ යැ ... රසසඤ්චෙතනාව 'තෙල මාගේ යැ. ... ස්‍පෘෂ්ටව්‍යසඤ්චෙතනාව 'තෙල මාගේ යැ ... ධර්මසඤ්චෙතනාව තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ.

රූපතෘෂ්ණාව 'තෙල මාගේ යැ ... ශබ්දතෘෂ්ණාව 'තෙල මාගේ යැ ... ගන්ධතෘෂ්ණාව 'තෙල මාගේ යැ ... රසතෘෂ්ණාව 'තෙල මාගේ යැ ... ස්‍පෘෂ්ටව්‍යතෘෂ්ණාව 'තෙල මාගේ යැ ... ධර්මතෘෂ්ණාව 'තෙල මාගේ යැ තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ.

රූපවිතර්කය තෙල මාගේ යැ ... ශබ්දවිතර්කය 'තෙල මාගේ යැ ... ගන්ධ-විතර්කය 'තෙල මාගේ යැ ... රසවිතර්කය 'තෙල මාගේ යැ ... ස්‍පෘෂ්ටව්‍ය-විතර්කය 'තෙල මාගේ යැ ... ධර්මවිතර්කය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ' යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ.

රූපවිචාරය 'තෙල මාගේ යැ ... ශබ්දවිචාරය 'තෙල මාගේ යැ ... ගන්ධවිචාරය 'තෙල මාගේ යැ ... රසවිචාරය 'තෙල මාගේ යැ ... ස්‍පෘෂ්ට-ව්‍යවිචාරය 'තෙල මාගේ යැ ... ධර්මවිචාරය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ.

පෘථිවීධාතුව 'තෙල මාගේ යැ ... අබ්ධාතුව 'තෙල මාගේ යැ ... තෙජෝධාතුව 'තෙල මාගේ යැ ... වායුධාතුව 'තෙල මාගේ යැ ... ආකාශ-ධාතුව 'තෙල මාගේ යැ ... විඥානධාතුව 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ.

පඨවිකසිණය 'තෙල මාගේ යැ ... ආපොකසිණය... තෙජොකසිණය ... වායොකසිණය .. නීලකසිණය ... පීතකසිණය ... ලොහිතකසිණය ... ඔදාතකසිණය ... ආකාසකසිණය ... විඤ්ඤාණකසිණය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ' යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ.

කෙසං එතං මම -පෙ- ලොමං එතං මම -පෙ- නඛං එතං මම -පෙ- දන්තං එතං මම -පෙ- තචං එතං මම -පෙ- මංසං එතං මම -පෙ- න්හාරුං එතං මම -පෙ- අට්ඨිං එතං මම -පෙ- අට්ඨිමිඤ්ජං එතං, මම -පෙ- වක්කං එතං මම -පෙ- හදයං එතං මම -පෙ- යකනං එතං මම -පෙ- කිලොමකං එතං මම -පෙ- පිහකං එතං මම -පෙ- පප්ඵාසං එතං මම -පෙ- අන්තං එතං මම -පෙ- අන්තගුණං එතං මම -පෙ- උදරියං එතං මම -පෙ- කරීසං එතං මම -පෙ- පිත්තං එතං මම -පෙ- සෙම්හං එතං මම -පෙ- පුබ්බං එතං මම -පෙ- ලොහිතං එතං මම -පෙ- සෙදං එතං මම -පෙ- මෙදං එතං මම -පෙ- අස්සුං එතං මම -පෙ- වසං එතං මම -පෙ- ඛෙළං එතං මම -පෙ- සිඞ්ඝාණිකං එතං මම -පෙ- ලසිකං එතං මම -පෙ- මුත්තං එතං මම -පෙ- මත්ථලුඞ්ගං 'එතං මම' එසො හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛායතනං එතං මම -පෙ- රූපායතනං එතං මම -පෙ- සොතායතනං එතං මම -පෙ- සද්දායතනං එතං මම -පෙ- ඝානායතනං එතං මම -පෙ- ගන්ධායතනං එතං මම -පෙ- ජිව්හායතනං එතං මම -පෙ- රසායතනං එතං මම -පෙ- කායායතනං එතං මම -පෙ- ඵොට්ඨබ්බායතනං එතං මම -පෙ- මනායතනං එතං මම -පෙ- ධම්මායතනං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛුධාතුං එතං මම -පෙ- රූපධාතුං එතං මම -පෙ- චක්ඛුවිඤ්ඤාණධාතුං එතං මම -පෙ- සොතධාතුං එතං මම -පෙ- සද්දධාතුං -පෙ- සොතවිඤ්ඤාණධාතුං -පෙ- ඝානධාතුං -පෙ- ගන්ධධාතුං -පෙ- ඝානවිඤ්ඤාණධාතුං -පෙ- ජිව්හාධාතුං -පෙ- රසධාතුං -පෙ- ජිව්හාවිඤ්ඤාණධාතුං -පෙ- කායධාතුං -පෙ- ඵොට්ඨබ්බධාතුං -පෙ- කාය විඤ්ඤාණධාතුං -පෙ- මනොධාතුං එතං මම -පෙ- ධම්මධාතුං එතං මම -පෙ- මනොවිඤ්ඤාණධාතුං 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

චක්ඛුන්ද්‍රියං එතං මම පෙ- සොතින්ද්‍රියං එතං මම -පෙ- ඝානින්ද්‍රියං එතං මම -පෙ- ජිව්හින්ද්‍රියං එතං මම -පෙ- කායින්ද්‍රියං එතං මම -පෙ- මනින්ද්‍රියං එතං මම -පෙ- ජීවිතින්ද්‍රියං එතං මම -පෙ- ඉත්ථින්ද්‍රියං එතං මම -පෙ- පුරිසින්ද්‍රියං එතං මම -පෙ- සුඛින්ද්‍රියං එතං මම -පෙ- දුක්ඛින්ද්‍රියං එතං මම -පෙ- සොමනස්සින්ද්‍රියං එතං මම -පෙ- දොමනස්සින්ද්‍රියං එතං මම -පෙ- උපෙක්ඛින්ද්‍රියං එතං මම -පෙ- සද්ධින්ද්‍රියං එතං මම -පෙ- විරියින්ද්‍රියං එතං මම -පෙ- සතින්ද්‍රියං එතං මම -පෙ- සමාධින්ද්‍රියං එතං මම -පෙ- පඤ්ඤින්ද්‍රියං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

කාමධාතුං එතං මම -පෙ- රූපධාතුං එතං මම -පෙ- අරූපධාතුං එතං මම -පෙ- කාමභවං එතං මම -පෙ- රූපභවං එතං මම -පෙ- අරූපභවං එතං මම -පෙ- සඤ්ඤාභවං එතං මම -පෙ- අසඤ්ඤාභවං එතං මම -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එතං මම -පෙ- එකවොකාරභවං එතං මම -පෙ- චතුවොකාරභවං එතං මම -පෙ- පඤ්චවොකාරභවං එතං මම -පෙ-

කෙස් 'තෙල මාගේ යැ ... ලොම් 'තෙල මාගේ යැ ... නිය 'තෙල මාගේ යැ ... දත් 'තෙල මාගේ යැ ... සම් 'තෙල මාගේ යැ ... මස් 'තෙල මාගේ යැ ... නහර 'තෙල මාගේ යැ ... ඇට 'තෙල මාගේ යැ ... ඇටමිදුළු 'තෙල මාගේ යැ ... වකුගඩුව 'තෙල මාගේ යැ ... හදවත 'තෙල මාගේ යැ ... අක්මාව 'තෙල මාගේ යැ ... දලබුව 'තෙල මාගේ යැ .... බඩදිව 'තෙල මාගේ යැ ... පපුමස 'තෙල මාගේ යැ ... අතුනු 'තෙල මාගේ යැ ... අතුනුබහන 'තෙල මාගේ යැ ... නොපැසුණු අහර 'තෙල මාගේ යැ ... පැසුණු අහර 'තෙල මාගේ යැ .. පිත් 'තෙල මාගේ යැ ... සෙම් 'තෙල මාගේ යැ ... පූයා 'තෙල මාගේ යැ ... ලෙහෙ 'තෙල මාගේ යැ ... සෝදිය 'තෙල මාගේ යැ ... මෙදතෙල් 'තෙල මාගේ යැ ... කඳුළු 'තෙල මාගේ යැ ... වුරුණුතෙල් 'තෙල මාගේ යැ ... කෙළ 'තෙල මාගේ යැ ... මුකුණු 'තෙල මාගේ යැ ... සඳමිදුළු 'තෙල මාගේ යැ ... සුලුදිය 'තෙල මාගේ යැ ... හිස්මුල් 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආතම යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ.

චක්ඛායතනය 'තෙල මාගේ යැ ... රූපායතනය 'තෙල මාගේ යැ ... සොතායතනය 'තෙල මාගේ යැ ... සද්දායතනය 'තෙල මාගේ යැ ... ඝානායතනය 'තෙල මාගේ යැ ... ගන්ධායතනය 'තෙල මාගේ යැ ... ජිව්හායතනය 'තෙල මාගේ යැ ... රසායතනය 'තෙල මාගේ යැ ... කායායතනය 'තෙල මාගේ යැ ... ස්ප්‍රෂ්ටව්‍යායතනය 'තෙල මාගේ යැ ... මනායතනය 'තෙල මාගේ යැ ... ධර්මායතනය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආතම යැ'යි අභිනිවෙශ පරාමර්ශය දෘෂ්ටි යැ.

චක්ෂුර්ධාතුව 'තෙල මාගේ යැ ... රූපධාතුව 'තෙල මාගේ යැ ... චක්ෂුර්විඥානධාතුව 'තෙල මාගේ යැ ... ශ්‍රොත්‍රධාතුව 'තෙල මාගේ යැ ... ශබ්දධාතුව ... ශ්‍රොත්‍රවිඥානධාතුව ... ඝ්‍රාණධාතුව ... ගන්ධධාතුව ... ඝ්‍රාණ-විඥානධාතුව ... ජිව්හාධාතුව ... රසධාතුව ... ජිහ්වාවිඥාන ධාතුව ... කායධාතුව ... ස්ප්‍රෂ්ටව්‍යධාතුව ... කායවිඥානධාතුව ... මනොධාතුව 'තෙල මාගේ යැ ... ධම්මධාතුව 'තෙල මාගේ යැ ... මනොවිඥානධාතුව 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආතම යැ'යි අභිනිවෙශ-පරාමර්ශය දෘෂ්ටි යැ.

චක්ෂුරින්ද්‍රියය 'තෙල මාගේ යැ ... ශ්‍රොත්‍රෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... ඝ්‍රාණෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... ජිහෙවින්ද්‍රියය 'තෙල මාගේ යැ ... කායෙන්ද්‍රියය 'තෙල මාගේ යැ... මනඉන්ද්‍රියය 'තෙල මාගේ යැ...ජීවිතෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... ස්ත්‍රීන්ද්‍රියය 'තෙල මාගේ යැ ... පුරුෂෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... සුඛෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... දුඃඛෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... සොමනස්සින්ද්‍රියය 'තෙල මාගේ යැ ... දෞමනස්සින්ද්‍රියය 'තෙල මාගේ යැ... උපෙක්ෂෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... ශ්‍රද්ධෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... වීර්‍ය්‍යෙන්ද්‍රියය 'තෙල මාගේ යැ ... ස්මෘතීන්ද්‍රියය 'තෙල මාගේ යැ ... සමාධීන්ද්‍රියය 'තෙල මාගේ යැ ... ප්‍රඥෙන්ද්‍රියය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආතම යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ.

කාමධාතුව 'තෙල මාගේ යැ ... රූපධාතුව 'තෙල මාගේ යැ ... අරූප-ධාතුව 'තෙල මාගේ යැ ... කාමභවය 'තෙල මාගේ යැ ... රූපභවය 'තෙල මාගේ යැ ... අරූපභවය 'තෙල මාගේ යැ ... සංඥාභවය 'තෙල මාගේ යැ ... අසංඥාභවය 'තෙල මාගේ යැ ... නෛවසංඥානාසංඥාභවය 'තෙල මාගේ යැ ... එකවොකාරභවය 'තෙල මාගේ යැ ... චතුවොකාර-භවය 'තෙල මාගේ යැ ... පඤ්චවොකාරභවය 'තෙල මාගේ යැ ;...

පඨමං ඣානං[1] එතං මම -පෙ- දුතියං ඣානං එතං මම -පෙ- තතියං ඣානං එතං මම -පෙ- චතුත්ථං ඣානං එතං මම -පෙ- මෙත්තං චෙතොවිමුත්තිං[2] එතං මම -පෙ- කරුණං චෙතොවිමුත්තිං එතං මම -පෙ- මුදිතං චෙතොවිමුත්තිං එතං මම -පෙ- උපෙක්ඛං චෙතොවිමුත්තිං එතං මම -පෙ- ආකාසානඤ්චායතනසමාපත්තිං එතං මම -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං එතං මම -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං එතං මම -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං 'එතං මම එසොහමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

අවිජ්ජං එතං මම -පෙ- සඞ්ඛාරෙ එතං මම -පෙ- විඤ්ඤාණං එතං මම -පෙ- නාමරූපං එතං මම -පෙ- සළායතනං එතං මම -පෙ- ඵස්සං එතං මම -පෙ- වෙදනං එතං මම -පෙ- තණ්හං එතං මම -පෙ- උපාදානං එතං මම -පෙ- භවං එතං මම -පෙ- ජාතිං එතං මම -පෙ- ජරාමරණං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි.

**එවං අභිනිවෙසපරාමාසො දිට්ඨි.**

කතමානි අට්ඨ දිට්ඨිට්ඨානානි:

ඛන්ධාපි දිට්ඨිට්ඨානං, අවිජ්ජාපි දිට්ඨිට්ඨානං, ඵස්සොපි දිට්ඨිට්ඨානං සඤ්ඤාපි දිට්ඨිට්ඨානං, විතක්කොපි[3] දිට්ඨිට්ඨානං අයොනිසොමනසිකාරොපි දිට්ඨිට්ඨානං, පාපමිත්තොපි දිට්ඨිට්ඨානං, පරතොපි ඝොසො[4] දිට්ඨිට්ඨානං.

ඛන්ධා හෙතු ඛන්ධා පච්චයො දිට්ඨීනං[5] උප්පාදාය සමුට්ඨානට්ඨෙන, එවං ඛන්ධාපි දිට්ඨිට්ඨානං.

අවිජ්ජා හෙතු අවිජ්ජා පච්චයො දිට්ඨීනං[5] උප්පාදාය[6] සමුට්ඨානට්ඨෙන එවං අවිජ්ජාපි දිට්ඨිට්ඨානං.

ඵස්සො හෙතු ඵස්සො පච්චයො දිට්ඨීනං[5] උප්පාදාය සමුට්ඨානට්ඨෙන එවං ඵස්සොපි දිට්ඨිට්ඨානං.

සඤ්ඤා හෙතු සඤ්ඤා පච්චයො දිට්ඨීනං උප්පාදාය සමුට්ඨානට්ඨෙන එවං සඤ්ඤාපි දිට්ඨිට්ඨානං.

විතක්කො[7] හෙතු විතක්කො[7] පච්චයො දිට්ඨීනං උප්පාදාය සමුට්ඨානට්ඨෙන, එවං විතක්කොපි දිට්ඨිට්ඨානං.

අයොනිසො මනසිකාරො හෙතු අයොනිසො මනසිකාරො පච්චයො දිට්ඨීනං උප්පාදාය සමුට්ඨානට්ඨෙන, එවං අයොනිසො මනසිකාරොපි දිට්ඨිට්ඨානං.

පාපමිත්තො හෙතු පාපමිත්තො පච්චයො දිට්ඨීනං උප්පාදාය සමුට්ඨානට්ඨෙන, එවං පාපමිත්තොපි දිට්ඨිට්ඨානං.

පරතොඝොසො හෙතු පරතොඝොසො පච්චයො දිට්ඨීනං උප්පාදාය සමුට්ඨානට්ඨෙන, එවං පරතොපි ඝොසො[4] දිට්ඨිට්ඨානං.

**ඉමානි අට්ඨ දිට්ඨිට්ඨානානි.**

---

1. පඨමජ්ඣානං - (ඉච්චාදි) බහුසු 2. මෙත්තාචෙතොවිමුත්තිං- (ඉච්චාදි) ස්‍යා PTS සී 1,2.3
3. විතක්කාපි - ස්‍යා 4: පරතොඝොසොපි - මජ්ඣං, ස්‍යා, PTS.
5 දිට්ඨිට්ඨානං - මජ්ඣං, PTS, ස්‍යා, සී 1 2 6 උපාදාය - මජ්ඣං, ස්‍යා, PTS
7: විතක්කා - ස්‍යා.

ප්‍රථමධ්‍යානය 'තෙල මාගේ යැ ... ද්විතීයධ්‍යානය 'තෙල මාගේ යැ ... තෘතීයධ්‍යානය 'තෙල මාගේ යැ ... චතුර්ථධ්‍යානය 'තෙල මාගේ යැ ... මෛත්‍රීචිත්තවිමුක්තිය 'තෙල මාගේ යැ ... කරුණාචිත්තවිමුක්තිය 'තෙල මාගේ යැ... මුදිතාචිත්තවිමුක්තිය 'තෙල මාගේ යැ... උපෙක්ෂාචිත්තවිමුක්තිය 'තෙල මාගේ යැ ... ආකාසානඤ්චායතනසමාපත්තිය 'තෙල මාගේ යැ ... විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය 'තෙල මාගේ යැ ... ආකිඤ්චඤ්ඤායතන-සමාපත්තිය 'තෙල මාගේ යැ ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය 'තෙල මාගේ ය, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශ පරාමර්ශය දෘෂ්ටි යැ.

අවිද්‍යාව 'තෙල මාගේ යැ ... සංස්කාරයන් 'තෙල මාගේ යැ ... විඥානය 'තෙල මාගේ යැ ... නාමරූපය 'තෙල මාගේ යැ ... ෂඩායතනය 'තෙල මාගේ යැ ... ස්පර්ශය 'තෙල මාගේ යැ ... වේදනාව 'තෙල මාගේ යැ ... තෘෂ්ණාව 'තෙල මාගේ යැ ... උපාදානය 'තෙල මාගේ යැ ... භවය 'තෙල මාගේ යැ ... ජාතිය 'තෙල මාගේ යැ ... ජරාමරණය 'තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යැ'යි අභිනිවෙශ පරාමර්ශය දෘෂ්ටි යැ.

**මෙසෙයින් අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි වේ.**

දෘෂ්ටිකාරණයෝ අටදෙන කවරහ යත්:

ස්කන්ධයෝ ද දෘෂ්ටිකාරණයෙක, අවිද්‍යාව ද දෘෂ්ටිකාරණයෙක, ස්පර්ශය ද දෘෂ්ටිකාරණයෙක, සංඥාව ද දෘෂ්ටිකාරණයෙක, විතර්කය ද දෘෂ්ටිකාරණයෙක, අයොනිසොමනසිකාරය ද දෘෂ්ටිකාරණයෙක, පාපමිත්‍ර තෙමේ ද දෘෂ්ටි-කාරණයෙක, පරතොඝොෂය ද දෘෂ්ටිකාරණයෙක.

ස්කන්ධයෝ (ජනක) හෙතු යැ ස්කන්ධයෝ (උපස්ථම්භක) ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි. මෙසෙයින් ස්කන්ධයෝ ද දෘෂ්ටි-කාරණයෙක.

අවිද්‍යාව හෙතු යැ අවිද්‍යාව ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි. මෙසෙයින් අවිද්‍යාව ද දෘෂ්ටිකාරණයෙක.

ස්පර්ශය හෙතු යැ ස්පර්ශය ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි. මෙසෙයින් ස්පර්ශය ද දෘෂ්ටිකාරණයෙක.

සංඥාව හෙතු යැ සංඥාව ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි. මෙසෙයින් සංඥාව ද දෘෂ්ටිකාරණයෙක.

විතර්කය හෙතු යැ විතර්කය ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි. මෙසෙයින් විතර්කය ද දෘෂ්ටිකාරණයෙක.

අයොනිසොමනසිකාරය හෙතු යැ අයොනිසොමනසිකාරය ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි. මෙසෙයින් අයොනිසොමනසිකාරය ද දෘෂ්ටිකාරණයෙක.

පාපමිත්‍ර හෙතු යැ පාපමිත්‍ර ප්‍රත්‍යය යැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි, මෙසෙයින් පාපමිත්‍ර තෙමේ ද දෘෂ්ටිකාරණයෙක.

පරතොඝොෂය හෙතු යැ පරතොඝොෂය ප්‍රත්‍යයැ දෘෂ්ටීන්ගේ උපැත්මට කාරණ බැවිනි, මෙසෙයින් පරතොඝොෂය ද දෘෂ්ටිකාරණයෙකි.

**මොහු අටදෙන දෘෂ්ටිකාරණයෝ යි.**

කතමානි අට්ඨාරස දිට්ඨිපරියුට්ඨානානි:

යා දිට්ඨි දිට්ඨිගතං; දිට්ඨිගහනං, දිට්ඨිකන්තාරං, දිට්ඨිවිසූකං[1] දිට්ඨිවිප්ඵන්දිතං, දිට්ඨිසඤ්ඤොජනං, දිට්ඨිසල්ලං, දිට්ඨිසම්බාධො,[2] දිට්ඨිපළිබොධො[3] දිට්ඨිබන්ධනං, දිට්ඨිපපාතො, දිට්ඨානුසයො, දිට්ඨිසන්තාපො, දිට්ඨිපරිළාහො, දිට්ඨිගන්ථො, දිට්ඨුපාදානං, දිට්ඨාභිනිවෙසො, දිට්ඨිපරාමාසො.

**ඉමානි අට්ඨාරස දිට්ඨිපරියුට්ඨානානි.**

කතමා සොළස දිට්ඨියො:

අස්සාදදිට්ඨි, අත්තානුදිට්ඨි, මිච්ඡාදිට්ඨි, සක්කායදිට්ඨි, සක්කාය වත්ථුකා සස්සතදිට්ඨි, සක්කායවත්ථුකා උච්ඡෙදදිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි, පුබ්බන්තානු දිට්ඨි, අපරන්තානුදිට්ඨි, සඤ්ඤොජනිකා දිට්ඨි, 'අහ'න්ති මානවිනිබන්ධා දිට්ඨි, 'මම'න්ති මානවිනිබන්ධා දිට්ඨි, අත්තවාදපටිසංයුත්තා දිට්ඨි, ලොකවාදපටිසංයුත්තා දිට්ඨි, භවදිට්ඨි, විභවදිට්ඨි.

**ඉමා සොළස දිට්ඨියො.**

කතමෙ තීණි සතං දිට්ඨාභිනිවෙසා:

අස්සාදදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

අත්තානුදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

මිච්ඡාදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

සක්කායදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

සක්කායවත්ථුකාය සස්සතදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති.

සක්කායවත්ථුකාය උච්ඡෙදදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

අන්තග්ගාහිකාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

පුබ්බන්තානුදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

අපරන්තානුදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

සඤ්ඤොජනිකාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

---

1. දිට්ඨිවිසූකායිකං - ධම්මසඞ්ගණී
2. දිට්ඨිසම්භවො - සයා.    3. දිට්ඨිපලිබොධො - මජසං. සයා PTS

* ''කතමෙ තීණි සතං දිට්ඨාභිනිවෙසා''ති පුච්ඡා සයා - PTS, පොත්ථකෙසු න ගහිතා

අටළොස් දෘෂ්ටිපර්‍යුත්ථානයෝ කවරහ යත්:

යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටි නමැති හුලෙක් දෘෂ්ටිහුගේ විරූප වූ චලනයෙක් දෘෂ්ටිසංයොජනයෙක් දෘෂ්ටිශල්‍යයෙක් දෘෂ්ටිසම්බාධයෙක් දෘෂ්ටිපරිබොධයෙක් දෘෂ්ටිබන්ධනයෙක් දෘෂ්ටිප්‍රපාතයෙක් දෘෂ්ට්‍යනුශයයෙක් දෘෂ්ටිසන්තාපයෙක් දෘෂ්ටිපරිදාහයෙක් දෘෂ්ටිග්‍රන්ථයෙක් දෘෂ්ට්‍යුපාදානයෙක් දෘෂ්ට්‍යභිනිවෙශයෙක් දෘෂ්ටිපරාමර්ශයෙක් වේ ද,

**මොහු අටළොස් දෘෂ්ටිපර්‍යුත්ථානයෝ යි.**

සොළොස් දෘෂ්ටිහු කවරහ යත්:

ආස්වාදදෘෂ්ටි යැ අත්තානුදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටි යැ සත්කායදෘෂ්ටි යැ සත්කායවස්තුක වූ ශාශ්වතදෘෂ්ටි යැ සත්කාය වස්තුක වූ උච්ඡෙදදෘෂ්ටි යැ අන්තග්‍රාහික දෘෂ්ටි යැ පූර්වාන්තානුදෘෂ්ටි යැ අපරාන්තානුදෘෂ්ටි යැ සංයොජ-නිකදෘෂ්ටි යැ 'මම' යයි (උපන්) මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ 'මාගේ යැ'යි (උපන්) මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ ආත්මවාදයෙන් බැඳුණු දෘෂ්ටි යැ ලොකවාදයෙන් බැඳුණු දෘෂ්ටි යැ භවදෘෂ්ටි යැ විභවදෘෂ්ටි යි.

**මොහු සොළොස් දෘෂ්ටිහු වෙත්.**

තුන්සියයක් දෘෂ්ට්‍යභිනිවෙශයෝ කවරහ යත්:

කිහි අයුරෙකින් ආස්වාදදෘෂ්ටියෙහි අභිනිවෙශය (බැසැ ගැනීම) වේ ද?

කිහි අයුරෙකින් ආත්මානුදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් මිථ්‍යාදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් සත්කායදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් සත්කායවස්තුක ශාශ්වතදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් සත්කායවස්තුක උච්ඡෙදදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් පූර්වාන්තානුදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් අපරාන්තානුදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

කිහි අයුරෙකින් සංයොජනිකදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ ද?

'අහං'ති මානවිනිබන්ධාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

'මම'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

අත්තවාදපටිසංයුත්තාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

ලොකවාදපටිසංයුත්තාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

භවදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

විභවදිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති:

අස්සාදදිට්ඨියා පඤ්චතිංසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

අත්තානුදිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති.

මිච්ඡාදිට්ඨියා දසහාකාරෙහි අභිනිවෙසො හොති.

සක්කායදිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති.

සක්කායවත්ථුකාය සස්සතදිට්ඨියා පන්නරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

සක්කායවත්ථුකාය උච්ඡෙදදිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්ඤාසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

පුබ්බන්තානුදිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

අපරන්තානුදිට්ඨියා චතුචත්තාලීසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

සඤ්ඤොජනිකාය දිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

'අහං'ති මානවිනිබන්ධාය දිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

'මම'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

අත්තවාදපටිසංයුත්තාය දිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති

ලොකවාදපටිසංයුත්තාය දිට්ඨියා අට්ඨහි ආකාරෙහි අභිනිවෙසො හොති.

භවදිට්ඨියා එකෙන ආකාරෙන[1] අභිනිවෙසො හොති.

විභවදිට්ඨියා එකෙන ආකාරෙන[1] අභිනිවෙසො හොති.

---

1 එකූනවීසතියා ආකාරෙහි - සසා

කිහි අයුරෙකින් 'මම' යයි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද?

කිහි අයුරෙකින් 'මාගේ යැ'යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද?

කිහි අයුරෙකින් ආත්මවාද ප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද?

කිහි අයුරෙකින් ලෝකවාද ප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද?

කිහි අයුරෙකින් භවදෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද?

කිහි අයුරෙකින් විභවදෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද යත්:

පන්තිස් අයුරෙකින් ආස්වාදදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

විසි අයුරෙකින් ආත්මානුදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

දස අයුරෙකින් මිථ්‍යාදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

විසි අයුරෙකින් සත්කායදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

පසළොස් අයුරෙකින් සත්කායවස්තුක ශාශ්වතදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

පස් අයුරෙකින් සත්කායවස්තුක උච්ඡේදදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

පනස් අයුරෙකින් අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

අටළොස් අයුරෙකින් පූර්වාන්තානුදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

සිව්සාලිස් අයුරෙකින් අපරාන්තානුදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

අටළොස් අයුරෙකින් සංයෝජනිකදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

අටළොස් අයුරෙකින් 'මම' යයි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

අටළොස් අයුරෙකින් 'මාගේ යැ'යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

විසි අයුරෙකින් ආත්මවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

අට අයුරෙකින් ලෝකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

එක් අයුරෙකින් භවදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි.

එක් අයුරෙකින් විභවදෘෂ්ටියෙහි අභිනිවේශය වේ.

## 2 - 1. අස්සාදදිට්ඨි

අස්සාදදිට්ඨියා කතමෙහි පඤ්චතිංසාය ආකාරෙහි අභිනිවෙසො හොති:

'යං රූපං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං රූපස්ස අස්සාදො'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි. දිට්ඨි න අස්සාදො, අස්සාදො න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤො අස්සාදො; යා ච දිට්ඨි, යො ච අස්සාදො, අයං වුච්චති අස්සාදදිට්ඨි.

අස්සාදදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි[1] දිට්ඨිවිපත්ති, තාය දිට්ඨිවිපත්තියා සමන්නාගතො පුග්ගලො දිට්ඨිවිපන්නො, දිට්ඨිවිපන්නො පුග්ගලො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා. යො දිට්ඨියා රාගො,[2] සො න දිට්ඨි, දිට්ඨි න රාගො, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤො රාගො; යා ච දිට්ඨි යො ච රාගො, අයං වුච්චති දිට්ඨිරාගො. තාය ච දිට්ඨියා තෙන ච රාගෙන සමන්නාගතො පුග්ගලො දිට්ඨිරාගරත්තො[3] දිට්ඨිරාගරත්තෙ පුග්ගලෙ දින්නං දානං න මහප්ඵලං හොති න මහානිසංසං. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා.

අස්සාදදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස ද්වෙව ගතියො: නිරයො වා තිරච්ඡානයොනි වා. මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං.[4] සමාදින්නං, යඤ්ච වචීකම්මං -පෙ- යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා, යා ච පත්ථනා, යො ච පණිධි, යෙ ච සඞ්ඛාරා, සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා. සෙය්‍යථාපි නිම්බබීජං වා කොසාතකීබීජං වා තිත්තකාලාබුබීජං[5] වා අල්ලාය පථවියා නික්ඛිත්තං යඤ්චෙව පථවිරසං උපාදියති, යඤ්ච ආපොරසං උපාදියති, සබ්බං තං තිත්තකත්තාය[6] කටුකත්තාය[7] අසාතත්තාය[8] සංවත්තති. තං කිස්ස හෙතු: බීජං හිස්ස පාපකං. එවමෙව මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං -පෙ- යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා යා ච පත්ථනා යො ච පණිධි යෙ ච සඞ්ඛාරා, සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා.

අස්සාදදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි[9] දිට්ඨිගතං, දිට්ඨිගහනං, දිට්ඨිකන්තාරං, දිට්ඨිවිසූකං, දිට්ඨිවිප්ඵන්දිතං, දිට්ඨිසඤ්ඤොජනං, දිට්ඨිසල්ලං, දිට්ඨිසම්බාධො, දිට්ඨිපලිබොධො, දිට්ඨිබන්ධනං, දිට්ඨිපපාතො, දිට්ඨානුසයො, දිට්ඨිසන්තාපො දිට්ඨිපරිළාහො, දිට්ඨිගන්ථො, දිට්ඨුපාදානං, දිට්ඨාභිනිවෙසො, දිට්ඨිපරාමාසො,[10] ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි පරියුට්ඨිතචිත්තස්ස සඤ්ඤොගො.

---

1 'මිච්ඡාදිට්ඨි' ඉති සෑම පොත්පතක නැත 2 යා දිට්ඨියො රාගො - සයා PTS
3 දිට්ඨිරාගරත්තො - සයා 4 යථාදිට්ඨිසමත්තං - සී 2 5 තිත්තකලාබුබීජං - බහුසු
6 තිත්තකත්තාය - සයා PTS 7 කටුකත්තාය සයා PTS 8 අසාරත්තාය - සයා PTS
9 යා දිට්ඨි - සයා 10 දිට්ඨාභිනිවෙසපරාමාසො හොති - සයා

## 2 – 1. ආස්වාදදෘෂ්ටිය

**කවර පන්තිස් අයුරින් ආස්වාදදෘෂ්ටියෙහි අභිනිවේශය වෙයි යත්:**

‘රූපස්කන්ධය පිණිස යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මේ රූපයාගේ ආස්වාද යැ’යි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය ආස්වාද නො වෙයි. ආස්වාදය දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකෙක, ආස්වාදය අනෙකෙක; යම් දෘෂ්ටියෙකුත් යම් ආස්වාදයෙකුත් වේ ද, මේ ‘ආස්වාදදෘෂ්ටි’ යයි කියනු ලැබෙ.

ආස්වාදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙක, මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්තියෙක, ඒ දෘෂ්ටිවිපත්තියෙන් සමන්‍වාගත පුද්ගල තෙම දෘෂ්ටිවිපන්න නම. දෘෂ්ටිවිපන්න පුද්ගල තෙම සෙවනය නො කටයුත්තේ යැ, භජනය නො කටයුත්තේ යැ, පයුර්‍යුපාසනය නො කටයුත්තේ යි. එ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක වූ ද එහෙයිනි. දෘෂ්ටියෙහි (උපදනා) යම් රාගයෙක් වේ ද හේ දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය රාග නො වෙයි. දෘෂ්ටිය අනෙකෙක, රාගය අනෙකෙකි. යම් දෘෂ්ටියෙකුත් යම් රාගයෙකුත් වේ ද මේ ‘දිට්ඨිරාග ය’යි කියනු ලැබේ. ඒ දෘෂ්ටියෙනුදු ඒ රාගයෙනුදු සමන්‍වාගත පුද්ගල තෙම දෘෂ්ටිරාගරක්ත නම. දෘෂ්ටිරාගරක්ත පුද්ගලයා කෙරෙහි දෙන ලද දානය මහත්ඵල නො වෙයි, මහානෘශංස නො වේ. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක ද එහෙයිනි.

මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගලහට ගති දෙකෙක් මැ වෙයි. නිරය හෝ තිරිසන් යොනිය හෝ යි. මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගල විසින් දෘෂ්ට්‍යනුරූප වැ පුරනලද ගන්නාලද යම් කායකර්මයෙකුත් වේ ද ... යම් වාක්කර්මයෙකුත් වේ ද, දෘෂ්ට්‍යනුරූප වැ පුරනලද ගන්නා ලද යම් මනඃකර්මයෙකුත් වේ ද, යම් චෙතනාවකුත් යම් ප්‍රාර්ථනාවකුත් යම් ප්‍රණිධියෙකුත් යම් සංස්කාර කෙනෙකුත් වෙත් ද, එ හැම ධර්මයෝ අනිෂ්ට බව පිණිස අකාන්ත බව පිණිස අමනාප බව පිණිස අහිත පිණිස දුක් පිණිස පවතිත්. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක වූ ද එහෙයිනි. යම්සේ කොසොඹ බිජුවටෙක් හෝ තිත්ත වැටකොළු බිජුවටෙක් හෝ තෙත් වූ පොළොව්හි රොපණය කරන ලද්දේ යම් පෘථිවිරසයෙකුත් ගනු ලැබේද යම් අබ්රසයෙකුත් ගනු ලැබේ ද එ හැම තිත්ත බවට කටුක බවට නො මිහිරි බවට වැටෙයි. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඒ කොසොඹ ආදියෙහි බිජුවට ලාමක ද එහෙයිනි. එපරිද්දෙන් මැ මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගල විසින් දෘෂ්ට්‍යනුරූප වැ පුරනලද ගන්නාලද යම් කායකර්මයෙකුත් වේ ද .. යම් වාක්කර්මයෙකුත් වේ ද, දෘෂ්ට්‍යනුරූප වැ පුරන ලද ගන්නා ලද යම් මනඃකර්මයෙකුත් වේ ද යම් චෙතනාවකුත් යම් ප්‍රාර්ථනාවකුත් යම් ප්‍රණිධියෙකුත් යම් සංස්කාර කෙනෙකුත් වෙත් ද එ හැම ධර්මයෝ අනිෂ්ට බවට අකාන්ත බවට අමනාප බවට අහිතයට දුකට වැටෙත්. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක ද එහෙයිනි.

ආස්වාදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ. මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිගතයෙක, දෘෂ්ටිගහනයෙක, දෘෂ්ටිකාන්තාරයෙක, දෘෂ්ටි නමැති හුලෙක, දෘෂ්ටියගේ විරූප චලනයෙක, දෘෂ්ටිසංයොජනයෙක, දෘෂ්ටිශල්‍යයෙක, දෘෂ්ටිසම්බාධයෙක, දෘෂ්ටිපරිබොධයෙක, දෘෂ්ටිබන්ධනයෙක, දෘෂ්ටිප්‍රපාතයෙක, දෘෂ්ට්‍යනුශයෙක, දෘෂ්ටිසන්තාපයෙක, දෘෂ්ටිපරිදාහයෙක, දෘෂ්ටිග්‍රන්ථයෙක, දෘෂ්ට්‍යුපාදානයෙක, දෘෂ්ට්‍යභිනිවේශයෙක, දෘෂ්ටිපරාමර්ශයෙකි. මේ අටළොස් අයුරින් සමුද්‍රාචාරයට පැමිණි සිත් ඇත්තහුගේ (සසර) සංයොගය වේ.

අත්ථි සඤ්ඤොජනානි චෙව දිට්ඨියො ච, අත්ථි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

කතමානි සඤ්ඤොජනානි චෙව දිට්ඨියො ච: සක්කායදිට්ඨි සීලබ්බතපරාමාසො, ඉමානි සඤ්ඤොජනානි චෙව දිට්ඨියො ච.

කතමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො: කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං මානසඤ්ඤොජනං විචිකිච්ඡාසඤ්ඤොජනං භවරාගසඤ්ඤොජනං ඉස්සාසඤ්ඤොජනං මච්ඡරියසඤ්ඤොජනං අනුනයසඤ්ඤොජනං අවිජ්ජාසඤ්ඤොජනං, ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.*

යං වෙදනං පටිච්ච -පෙ- යං සඤ්ඤං පටිච්ච -පෙ- යං සඞ්ඛාරෙ පටිච්ච -පෙ- යං විඤ්ඤාණං පටිච්ච -පෙ- යං චක්ඛුං පටිච්ච -පෙ- යං සොතං පටිච්ච -පෙ- යං ඝානං පටිච්ච -පෙ- යං ජිව්හං පටිච්ච -පෙ- යං කායං පටිච්ච -පෙ- යං මනං පටිච්ච -පෙ- යං රූපෙ පටිච්ච -පෙ- යං සද්දෙ පටිච්ච -පෙ- යං ගන්ධෙ පටිච්ච -පෙ- යං රසෙ පටිච්ච -පෙ- යං ඵොට්ඨබ්බෙ පටිච්ච -පෙ- යං ධම්මෙ පටිච්ච -පෙ- යං චක්ඛුවිඤ්ඤාණං පටිච්ච -පෙ- යං සොතවිඤ්ඤාණං පටිච්ච -පෙ- යං ඝානවිඤ්ඤාණං පටිච්ච -පෙ- යං ජිව්හාවිඤ්ඤාණං පටිච්ච -පෙ- යං කායවිඤ්ඤාණං පටිච්ච -පෙ- යං මනොවිඤ්ඤාණං පටිච්ච -පෙ- යං චක්ඛුසම්ඵස්සං පටිච්ච -පෙ- යං සොතසම්ඵස්සං පටිච්ච -පෙ- යං ඝානසම්ඵස්සං පටිච්ච -පෙ- යං ජිව්හාසම්ඵස්සං පටිච්ච -පෙ- යං කායසම්ඵස්සං පටිච්ච -පෙ- යං මනොසම්ඵස්සං පටිච්ච -පෙ- යං චක්ඛුසම්ඵස්සජං වෙදනං පටිච්ච -පෙ- යං සොතසම්ඵස්සජං වෙදනං පටිච්ච -පෙ- යං ඝානසම්ඵස්සජං වෙදනං පටිච්ච -පෙ- යං ජිව්හාසම්ඵස්සජං වෙදනං පටිච්ච -පෙ- යං කායසම්ඵස්සජං වෙදනං පටිච්ච -පෙ- යං මනොසම්ඵස්සජං වෙදනං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං මනොසම්ඵස්සජාය වෙදනාය අස්සාදො'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි. දිට්ඨි න අස්සාදො, අස්සාදො න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤො අස්සාදො. යා ච දිට්ඨි යො ච අස්සාදො, අයං වුච්චති අස්සාදදිට්ඨි.

අස්සාදදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති. තාය දිට්ඨිවිපත්තියා සමන්නාගතො පුග්ගලො දිට්ඨිවිපන්නො; දිට්ඨිවිපන්නො පුග්ගලො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො. තං කිස්ස හෙතු දිට්ඨි හිස්ස පාපිකා. යො දිට්ඨියා රාගො, සො න දිට්ඨි, දිට්ඨි න රාගො, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤො රාගො. යා ච දිට්ඨි, යො ච රාගො, අයං වුච්චති දිට්ඨිරාගො. තාය ච දිට්ඨියා තෙන ච රාගෙන සමන්නාගතො පුග්ගලො දිට්ඨිරාගරත්තො. දිට්ඨිරාගරත්තෙ පුග්ගලෙ දින්නං දානං න මහප්ඵලං හොති න මහානිසංසං. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා.

---

* 'ඉමෙහි අට්ඨාරසහි' ආදිං කත්වා යාව 'න ච දිට්ඨියො'ති - ස්‍යා PTS පොත්ථකෙසු ඌනකං.

දෘෂ්ටි ද වූ සංයොජනයෝ ද ඇත. දෘෂ්ටි නො වූ සංයෝජනයෝ ද ඇති.

දෘෂ්ටි ද වූ සංයොජනයෝ කවරහ යත්: සත්කායදෘෂ්ටි යැ ශීලව්‍රත-පරාමර්ශ යි. මොහු දෘෂ්ටි ද වූ සංයොජනයෝ යි.

දෘෂ්ටි නො වූ සංයොජනයෝ කවරහ යත්: කාමරාග සංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ මානසංයෝජන යැ විචිකිත්සා සංයොජන යැ භවරාග-සංයොජන යැ ඊර්ෂ්‍යා සංයොජන යැ මාත්සර්‍ය්‍ය සංයොජන යැ අනුනය-සංයොජන යැ අවිද්‍යාසංයොජන යි. මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

වෙදනාව නිසා .. සංඥාව නිසා ... සංස්කාරයන් නිසා ... විඥානය නිසා ... චක්ෂුස නිසා .... ශ්‍රොත්‍රය නිසා ... ඝ්‍රාණය නිසා ... ජිහ්වාව නිසා ... කාය නිසා ... මනස නිසා ... රූපයන් නිසා ... ශබ්දයන් නිසා ... ගන්ධයන් නිසා ... රසයන් නිසා ... ස්ප්‍රෂ්ටව්‍යයන් නිසා ... ධර්මයන් නිසා ... චක්ෂුර්-විඥානය නිසා ... ශ්‍රොත්‍රවිඥානය නිසා ... ඝ්‍රාණ විඥානය නිසා ... ජිහ්වාවිඥා-නය නිසා ... කාය විඥානය නිසා ... මනොවිඥානය නිසා ... චක්ඛුසම්ඵස්සය නිසා ... සොතසම්ඵස්සය නිසා ... ඝානසම්ඵස්සය නිසා ... ජිව්හාසම්ඵස්සය නිසා ...කායසම්ඵස්සය නිසා ... මනොසම්ඵස්සය නිසා ... චක්ඛුසම්ඵස්සයෙන් උපන් වෙදනාව නිසා ... සොතසම්ඵස්සයෙන් උපන් වෙදනාව නිසා ... ඝානසම්ඵස්සයෙන් උපන් වෙදනාව නිසා ... ජිව්හාසම්ඵස්සයෙන් උපන් වෙදනාව නිසා ... කායසම්ඵස්සයෙන් උපන් වෙදනාව නිසා ... මනො-සම්ඵස්සයෙන් උපන් වෙදනාව නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මේ මනොසම්ඵස්සයෙන් උපන් වෙදනාවගේ ආස්වාද යි. අභිනිවේශ පරාමර්ශ දෘෂ්ටි යැ. දෘෂ්ටිය ආස්වාද නො වෙයි. ආස්වාදය දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකෙක, ආස්වාදය අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් වේ ද යම් ආස්වාදයෙකුත් වේ ද මේ 'ආස්වාද දෘෂ්ටි යැ'යි කියනු ලැබේ.

ආස්වාදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ, මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ, ඒ දෘෂ්ටි-විපත්තියෙන් සමන්වාගත පුද්ගල තෙමේ 'දෘෂ්ටිවිපන්න' නම. දෘෂ්ටිවිපන්න පුද්ගල තෙම සෙවනය නො කටයුත්තේ යැ, භජනය නො කටයුත්තේ යැ, පයර්‍යුපාසනය නො කටයුත්තේ යි. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක ද එහෙයිනි. දෘෂ්ටියෙහි (උපදනා) යම් රාගයෙක් වේ ද හේ දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය රාග නො වෙයි. දෘෂ්ටිය අනෙකෙක. රාගය අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් රාගයෙකුත් වේ ද මේ 'දෘෂ්ටිරාග' යයි කියනු ලැබේ. ඒ දෘෂ්ටියෙනුදු ඒ රාගයෙනුදු සමන්වාගත පුද්ගල තෙම 'දෘෂ්ටිරාගරක්ත' නම් වෙයි. දෘෂ්ටිරාගරක්ත පුද්ගලයා කෙරෙහි දුන් දන් මහත්ඵල නො වෙයි. මහ අනුසස් ඇත්තේ නො වෙයි. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක ද එහෙයිනි.

අස්සාදදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස ද්වෙව ගතියො: නිරයො වා තිරච්ඡානයොනි වා. මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං -පෙ- යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා යා ච පත්ථනා යො ච පණිධි යෙ ච සඞ්ඛාරා සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා. සෙය්‍යථාපි නිම්බබීජං වා කොසාතකීබීජං වා තිත්තකාලාබුබීජං වා අල්ලාය පථවියා නික්ඛිත්තං යඤ්චෙව පථවිරසං උපාදියති, යඤ්ච ආපොරසං උපාදියති, සබ්බං තං තිත්තකත්තාය කටුකත්තාය අසාතත්තාය සංවත්තති. තං කිස්ස හෙතු: බීජං හිස්ස පාපකං.[1] එවමෙව මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං -පෙ- යඤ්ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා යා ච පත්ථනා යො ච පණිධි යෙ ච සඞ්ඛාරා, සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු: දිට්ඨි හිස්ස පාපිකා අස්සාදදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං -පෙ- දිට්ඨාභිනිවෙසො දිට්ඨිපරාමාසො. ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි පරියුට්ඨිතචිත්තස්ස සඤ්ඤොගො.

අත්ථි සඤ්ඤොජනානි චෙව දිට්ඨියො ච, අත්ථි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. කතමානි සඤ්ඤොජනානි චෙව දිට්ඨියො ච: සක්කායදිට්ඨි, සීලබ්බතපරාමාසො,[2] ඉමානි සඤ්ඤොජනානි චෙව දිට්ඨියො ච.

කතමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො: කාමරාගසඤ්ඤොජනං, පටිඝසඤ්ඤොජනං, මානසඤ්ඤොජනං, විචිකිච්ඡාසඤ්ඤොජනං, භවරාගසඤ්ඤොජනං, ඉස්සාසඤ්ඤොජනං, මච්ඡරියසඤ්ඤොජනං, අනුනයසඤ්ඤොජනං, අවිජ්ජාසඤ්ඤොජනං, ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

අස්සාදදිට්ඨියා ඉමෙහි පඤ්චතිංසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 - 2. අත්තානුදිට්ඨි

අත්තානුදිට්ඨියා කතමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති:

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී,[3] සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං.

1 පාපිකං - මජසං
2 සක්කායදිට්ඨි පරාමාසො චෙව සක්කායදිට්ඨි සීලබ්බතපරාමා සො ච - ස්‍යා
3 'සප්පුරිසානං අදස්සාවී'ති - ස්‍යාමපොත්ථකෙ නත්ථි

ආස්වාදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ. මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගලහට ගති දෙකෙක් මැ වෙයි, නිරය හෝ තිර්‍යග්යෝනි හෝ යි. මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගල විසින් දෘෂ්ට්‍යනුරූප වැ පුරන ලද ගන්නා ලද යම් කායකර්මයෙකුත් වේ ද ... යම් වාක්කර්මයෙකුත් වේ ද, දෘෂ්ට්‍යනුරූප වැ පුරන ලද ගන්නා ලද යම් මනඃකර්මයෙක් වේ ද යම් චෙතනාවකුත් යම් ප්‍රාර්ථනාවකුත් යම් ප්‍රණිධියෙකුත් යම් සංස්කාර කෙනෙකුත් වෙත් ද, එ හැම ධර්මයෝ අනිෂ්ටයට අකාන්තයට අමනාපයට අහිතයට දුකට වැටෙත්. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක ද එහෙයිනි. යම්සේ කොසොඹබිජුවටෙක් වේවයි තිත්තවැටකොළු බිජුවටෙක් වේවයි තිත්තලබුබිජුවටෙක් වේවයි තෙත් පොළොව්හි රොපණය කරන ලද්දේ යම් පෘථිවිරසයෙකුත් ගන්නා ලැබේ ද, යම් අබ්රසයෙකුත් ගන්නා ලැබේ ද, එ හැම තිත්ත බවට කටුක බවට අමධුර බවට වැටෙයි. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඒ කොසොඹ ආදිහුගේ බිජුවට ලාමක ද එහෙයිනි. එසෙයින් මැ මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගල විසින් දෘෂ්ට්‍යනුරූප වැ පුරන ලද ගන්නා ලද යම් කායකර්මයෙකුත් වේ ද ... යම් වාක්කර්මයෙකුත් වේ ද, දෘෂ්ට්‍යනුරූප වැ පුරන ලද ගන්නාලද යම් මනඃකර්මයෙකුත් වේ ද, යම් චෙතනාවකුත් යම් ප්‍රාර්ථනාවකුත් යම් ප්‍රණිධියෙකුත් යම් සංස්කාර කෙනෙකුත් වෙත් ද, එ හැම ධර්මයෝ අනිෂ්ටයට අකාන්තයට අමනාපයට අහිතයට දුකට වැටෙත්. ඒ කවර හෙයින යත්: යම් හෙයකින් ඔහුගේ දෘෂ්ටිය ලාමක ද එහෙයිනි. ආස්වාදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ. මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිගත යැ දෘෂ්ටිගහන යැ ... දෘෂ්ට්‍යභිනිවෙශ යැ දෘෂ්ටිපරාමර්ශ යි. මේ අටළොස් අයුරින් සමුදාචාරයට පැමිණි සිත් ඇත්තහුගේ සංයොගය වේ.

දෘෂ්ටි ද වූ සංයෝජනයෝ ඇත. දෘෂ්ටි නො වූ සංයෝජනයෝ ද ඇති. දෘෂ්ටි ද වූ සංයෝජනයෝ කවරහ යත්: සත්කායදෘෂ්ටි යැ ශීලව්‍රතපරාමර්ශ යි. මොහු දෘෂ්ටි ද වූ සංයෝජනයෝ යි.

දෘෂ්ටි නො වූ සංයෝජනයෝ කවරහ යත්: කාමරාගසංයෝජන යැ ප්‍රතිඝසංයෝජන යැ මානසංයෝජන යැ විචිකිත්සාසංයෝජන යැ භවරාග සංයෝජන යැ ඊර්ෂ්‍යාසංයෝජන යැ මාත්සර්‍යසංයෝජන යැ අනුනය සංයෝජන යැ අවිද්‍යාසංයෝජන යි. මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි.

මේ පන්තිස් අයුරින් ආස්වාදදෘෂ්ටියෙහි අභිනිවෙශය වේ.

## 2 – 2 ආත්මානුදෘෂ්ටිය

කවර විසි අයුරින් ආත්මානුදෘෂ්ටියෙහි අභිනිවෙශය වෙයි යත්:

මෙ ලොව්හි (බුද්ධාදි) ආර්‍යයන් නො දක්නාසුලු ආර්‍යධර්මයෙහි අදක්ෂ වූ ආර්‍යධර්මයෙහි අවිනීත වූ සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂ ධර්මයෙහි අවිනීත වූ අශ්‍රුතවත් පෘථග්ජන තෙම රූපය ආත්මවශයෙන් (විපරීතසංඥායෙන්) දකී. ආත්මය රූපවත් කොට හෝ රූපය ආත්මයෙහි ලා හෝ ආත්මය රූපයෙහි ලා හෝ දකී. වෙදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ආත්මවශයෙන් (විපරීතසංඥායෙන්) දකී. ආත්මය විඥානවත් කොට හෝ විඥානය ආත්මයෙහි ලා හෝ ආත්මය විඥානයෙහි ලා හෝ දකී.

කථං රූපං අත්තතො සමනුපස්සති: ඉධෙකච්චො පඨවීකසිණං[1] අත්තතො සමනුපස්සති, 'යං පඨවීකසිණං, සො අහං, යො අහං, තං පඨවීකසිණ'න්ති පඨවීකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො 'යා අච්චි,[2] සො වණ්ණො, යො වණ්ණො, සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො පඨවීකසිණං අත්තතො සමනුපස්සති, 'යං පඨවීකසිණං, සො අහං; යො අහං තං පඨවීකසිණ'න්ති පඨවීකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා රූපවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස ද්වෙව ගතියො -පෙ- ඉමානි සඤ්ඤොජනානි, න ච දිට්ඨියො.

ඉධෙකච්චො ආපොකසිණං -පෙ- තෙජොකසිණං -පෙ- වායොකසිණං -පෙ- නීලකසිණං -පෙ- පීතකසිණං -පෙ- ලොහිතකසිණං -පෙ- ඔදාතකසිණං අත්තතො සමනුපස්සති. 'යං ඔදාතකසිණං සො අහං, යො අහං තං ඔදාතකසිණ'න්ති ඔදාතකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො 'යා අච්චි සො වණ්ණො යො වණ්ණො සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො -පෙ- ඔදාතකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා රූපවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි, න ච දිට්ඨියො. එවං රූපං අත්තතො සමනුපස්සති.

කථං රූපවන්තං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමිනා රූපෙන රූපවා'ති රූපවන්තං අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි රුක්ඛො ඡායාසම්පන්නො අස්ස, තමෙනං[3] පුරිසො එවං වදෙය්‍ය: 'අයං රුක්ඛො, අයං ඡායා; අඤ්ඤො රුක්ඛො, අඤ්ඤා ඡායා; සො ඛො පනායං රුක්ඛො ඉමාය ඡායාය ඡායාවා'ති ඡායාවන්තං රුක්ඛං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන අයං අත්තා ඉමිනා රූපෙන රූපවා'ති රූපවන්තං අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං දුතියා රූපවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං රූපවන්තං අත්තානං සමනුපස්සති.

---

1 පඨවිකසිණං - මජසං   2 අච්චි - සීමු   3 තමෙනං - ස්‍යා, PTS

කිසෙයින් රූපය ආත්මවශයෙන් දකී ද යත්: මෙ ලොව්හි ඇතැමෙක් පඨවිකසිණය ආත්මවශයෙන් දකී. 'යම් පඨවිකසිණයෙක් වේ ද හේ මම යෑ, යමෙක් මම් වේ ද හේ පඨවිකසිණ යෑ යි පඨවිකසිණයත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දැල්වෙන තෙල්පහනක්හුගේ යම් සිළුවක් වේ ද හේ වර්ණ යෑ, යමෙක් වර්ණය වේ ද හේ සිළුවැ'යි සිළුවත් වර්ණයත් එකක් මැ කොට දකී. එපරිද්දෙන් මැ මෙලොව්හි ඇතැමෙක් පඨවිකසිණය ආත්මවශයෙන් දකී. 'යම් පඨවිකසිණයෙක් වේ ද, හේ මම යෑ, යමෙක් මම් වේ ද හේ පඨවිකසිණ යෑ යි පඨවිකසිණයත් තමාත් එකක් මැ කොට දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යෑ, දෘෂ්ටිය වස්තු නො වෙයි. වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යමක් දෘෂ්ටි වේ ද යමෙකුත් වස්තු වේ ද මේ පළමු වැනි රූපවස්තුක ආත්මානුදෘෂ්ටි වෙයි. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යෑ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යෑ... ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යෑ. මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂපුද්ගලහට ගති දෙකෙක් මැ වෙයි ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

මෙ ලොව්හි ඇතැමෙක් ආපොකසිණය ... තෙජොකසිණය .. වායොකසිණය... නීලකසිණය... පීතකසිණය... ලොහිතකසිණය... ඔදාතකසිණය ආත්මවශයෙන් දකී. 'යම් ඔදාතකසිණයෙක් වේ ද, හේ මම යෑ, යමෙක් මම් වේ ද, හේ ඔදාතකසිණ යෑ'යි ඔදාතකසිණයත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දැල්වෙන තෙල්පහනක්හුගේ යම් සිළුවක් වේ ද, හේ වර්ණ යෑ, යමෙක් වර්ණය වේ ද, හේ සිළුවැ'යි සිළුවත් වර්ණයත් එකක් මැ කොට දකී. එපරිද්දෙන් මැ මෙලොව්හි ඇතැමෙක් ... ඔදාතකසිණයත් තමාත් එකක් මැ කොට දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යෑ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක. වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් වේ ද යම් වස්තුවකුත් වේ ද, මේ පළමු වැනි රූපවස්තුක ආත්මානුදෘෂ්ටි වෙයි. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යෑ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යෑ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් රූපය ආත්මවශයෙන් දකී.

කිසෙයින් ආත්මය රූපවත් කොට දකී ද යත්: මෙ ලොව්හි ඇතැමෙක් වෙදනාව සංඥව සංස්කාරයන් විඥනය ආත්මවශයෙන් (විපරීතසංඥයෙන්) දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යෑ, මාගේ මේ ආත්ම මේ (ශරීරය කසිණ) රූපයෙන් රූපවත් යෑ'යි ආත්මය රූපවත් කොට දකී. යම්සේ ඡායාසම්පන්නවෘක්ෂයෙක් වන්නේ ද, ඒ වෘක්ෂය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ යෑ. 'මේ වෘක්ෂය යෑ, මේ ඡායා යෑ, වෘක්ෂය අනෙකෙක, ඡායාව අනෙකක, වැළිත් ඒ මේ වෘක්ෂය මේ ඡායායෙන් ඡායාවත් යෑ'යි (මෙසේ) වෘක්ෂය ඡායාවක් කොට දකී ද, එපරිද්දෙන් මැ මෙ ලොව්හි ඇතැමෙක් වෙදනාව-සංඥව-සංස්කාරයන්-විඥනය ආත්මවශයෙන් දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි. 'මේ වූකලී මාගේ ආත්ම යෑ, මාගේ මේ ආත්මය මේ රූපයෙන් රූපවත් යෑ'යි ආත්මය රූපවත් කොට දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යෑ, දෘෂ්ටි යෑ වස්තු නො වෙයි. වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ දෙවනු වූ රූපවස්තුක ආත්මානුදෘෂ්ටි වෙයි. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යෑ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යෑ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් ආත්මය රූපවත් කොට දකී.

කථං අත්තනි රූපං සමනුපස්සති: ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා ඉමස්මිං ච පන අත්තනි ඉදං රූප'න්ති අත්තනි රූපං සමනුපස්සති. සෙය්‍යථාපි පුප්ඵං ගන්ධසම්පන්නං අස්ස, තමෙන[1] පුරිසො එවං වදෙය්‍ය: ඉදං පුප්ඵං, අයං ගන්ධො, අඤ්ඤං පුප්ඵං, අඤ්ඤො ගන්ධො, සො ඛො පනායං ගන්ධො ඉමස්මිං පුප්ඵෙ'ති පුප්ඵස්මිං ගන්ධං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, ඉමස්මිං ච පන අත්තනි ඉදං රූප'න්ති අත්තනි රූපං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි, යඤ්ච වත්ථු; අයං තතියා රූපවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති: -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං අත්තනි රූපං සමනුපස්සති.

කථං රූපස්මිං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමස්මිං රූපෙ'ති රූපස්මිං අත්තානං සමනුපස්සති, සෙය්‍යථාපි මණි කරණ්ඩකෙ පක්ඛිත්තො අස්ස, තමෙන[1] පුරිසො එවං වදෙය්‍ය: 'අයං මණි අයං කරණ්ඩකො; අඤ්ඤො මණි, අඤ්ඤො කරණ්ඩකො, සො ඛො පනායං මණි ඉමස්මිං කරණ්ඩකෙ'ති කරණ්ඩකස්මිං මණිං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමස්මිං රූපෙ'ති රූපස්මිං අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි: අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි, යඤ්ච වත්ථු, අයං චතුත්ථා රූපවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං රූපස්මිං අත්තානං සමනුපස්සති.

කථං වෙදනං අත්තතො සමනුපස්සති: ඉධෙකච්චො චක්ඛුසම්ඵස්සජං වෙදනං -පෙ- සොතසම්ඵස්සජං වෙදනං -පෙ- ඝානසම්ඵස්සජං වෙදනං -පෙ- ජිව්හාසම්ඵස්සජං වෙදනං -පෙ- කායසම්ඵස්සජං වෙදනං -පෙ- මනොසම්ඵස්සජං වෙදනං අත්තතො සමනුපස්සති, 'යා මනොසම්ඵස්සජා වෙදනා, සො අහං; යො අහං, සා මනොසම්ඵස්සජා වෙදනා'ති මනොසම්ඵස්සජං වෙදනඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලපදීපස්ස ඣායතො යා අච්චි සො වණ්ණො, යො වණ්ණො සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති එවමෙව ඉධෙකච්චො මනොසම්ඵස්සජං වෙදනං අත්තතො සමනුපස්සති 'යා මනොසම්ඵස්සජා වෙදනා සො අහං, යො අහං සා මනොසම්ඵස්සජා වෙදනා'ති මනොසම්ඵස්සජං වෙදනඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා වෙදනාවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං වෙදනං අත්තතො සමනුපස්සති.

---

1 තමෙනං - සයා, PTS

කිසෙයින් ආත්මයෙහි ලා රූපය දකී ද යත්: මෙ ලොව, ඇතැමෙක් වෙදනාව සංඥාව සංස්කාරයන් විඥානය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මේ ආත්මයෙහි මේ රූප යැ'යි ආත්මයෙහි ලා රූපය දකී. යම්සේ ගන්ධසම්පන්න වූ පුෂ්පයෙක් වන්නේ ද, ඒ පුෂ්පය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ යැ: "මේ පුෂ්ප යැ, මේ ගන්ධ යැ, පුෂ්පය අනෙකෙක, ගන්ධය අනෙකෙකි. වැළිත් ඒ මේ ගන්ධය තෙමේ මේ පුෂ්පයෙහි වේ යයි. මෙසේ පුෂ්පයෙහි ලා ගන්ධය දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් වෙදනාව සංඥාව සංස්කාරයන් විඥානය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මේ ආත්මයෙහි මේ රූපය වේ'යයි ආත්මයෙහි ලා රූපය දකී. අභිනිවෙශපරාමර්ශිය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ තුන් වනු වූ රූපවස්තුක ආත්මානුදෘෂ්ටි වෙයි. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් ආත්මයෙහි ලා රූපය දකී.

කිසෙයින් රූපයෙහි ලා ආත්මය දකී ද යත්: මෙ ලොව, ඇතැමෙක් වෙදනාව සංඥාව සංස්කාරයන් විඥානය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය මේ රූපයෙහි වේ' යයි රූපයෙහි ලා ආත්මය දකී. යම්සේ කරඬුවෙක බහාලන ලද මැණිකෙක් වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ය: 'මේ මැණික යැ, මේ කරඬුව යැ, මැණික අනෙකෙක කරඬුව අනෙකෙකි. වැළිත් ඒ මේ මැණික තෙමේ මේ කරඬුවෙහි වේ යයි මෙසේ කරඬුවෙහි ලා මැණික දකී ද, එපරිද්දෙන් මැ මෙලොව, ඇතැමෙක් වෙදනාව සංඥාව සංස්කාරයන් විඥානය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූ කලි මාගේ ආත්ම යැ වැළිත් මාගේ මේ ආත්මය මේ රූපයෙහි වේ යයි රූපයෙහි ලා ආත්මය දකී. අභිනිවෙශපරාමර්ශිය දෘෂ්ටි වෙයි. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ සතර වනු වූ රූපවස්තුක ආත්මානුදෘෂ්ටි වෙයි ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් රූපයෙහි ලා ආත්මය දකී.

කිසෙයින් වෙදනාව ආත්මවශයෙන් දකී ද යත්: මෙලොව ඇතැමෙක් චක්ඛුසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... සොතසම්ඵස්සයෙන් උපන් වෙදනාව... ඝානසම්ඵස්සයෙන් උපන් වෙදනාව... ජිව්හාසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... කායසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... මනොසම්ඵස්සයෙන් උපන් වෙදනාව ආත්මවශයෙන් දකී. යමක් මනොසම්ඵස්සයෙන් උපන් වෙදනා වේ ද, හේ මම් වෙමි. යමෙක් මම් වේ ද, හේ මනොසම්ඵස්සයෙන් උපන් වෙදනා වේ' යයි මනොසම්ඵස්සජ වෙදනාවත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දල්වෙන පහනක්හුගේ යම් සිළෙයෙක් වේ ද, ඒ වර්ණ යැ, යම් වර්ණයෙක් වේ ද, ඒ සිළ යැ'යි සිළවත් වර්ණයත් එකක් මැ කොට දකී ද, එපරිද්දෙන් මැ මෙලොව, ඇතැමෙක් මනොසම්ඵස්සයෙන් උපන් වෙදනාව ආත්මවශයෙන් දකී. යමක් මනොසම්ඵස්සයෙන් උපන් වෙදනා වේ ද, හේ මම් වෙමි. යමෙක් මම් වේ ද, ඒ මනොසම්ඵස්සජ වෙදනා වේ' යයි මනොසම්ඵස්සජ වෙදනාවත් තමාත් එකක් මැ කොට දකී. අභිනිවෙශපරාමර්ශිය දෘෂ්ටි වෙයි. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ පළමුවනු වූ වෙදනා වස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ. මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් වෙදනාව ආත්මවශයෙන් දකී.

කථං වෙදනාවන්තං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය වෙදනාය වෙදනාවා'ති වෙදනාවන්තං අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි රුක්ඛො ඡායාසම්පන්නො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'අයං රුක්ඛො අයං ඡායා, අඤ්ඤො රුක්ඛො අඤ්ඤා ඡායා, සො ඛො පනායං රුක්ඛො ඉමාය ඡායාය ඡායාවා'ති ඡායාවන්තං රුක්ඛං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය වෙදනාය වෙදනාවා'ති වෙදනාවන්තං අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි, යඤ්ච වත්ථු; අයං දුතියා වෙදනාවත්ථුකා අත්තානුදිට්ඨි අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සංයොජනානි න ච දිට්ඨියො. එවං වෙදනාවන්තං අත්තානං සමනුපස්සති.

කථං අත්තනි වෙදනං සමනුපස්සති: ඉධෙකච්චො සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, ඉමස්මිඤ්ච පන අත්තනි අයං වෙදනා'ති අත්තනි වෙදනං සමනුපස්සති. සෙය්‍යථාපි පුප්ඵං ගන්ධසම්පන්නං අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'ඉදං පුප්ඵං, අයං ගන්ධො, අඤ්ඤං පුප්ඵං අඤ්ඤො ගන්ධො; සො ඛො පනායං ගන්ධො ඉමස්මිං පුප්ඵෙ'ති පුප්ඵස්මිං ගන්ධං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා: ඉමස්මිං ච පන අත්තනි අයං වෙදනා'ති අත්තනි වෙදනං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි, යඤ්ච වත්ථු; අයං තතියා වෙදනාවත්ථුකා අත්තානුදිට්ඨි අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සංයොජනානි න ච දිට්ඨියො. එවං අත්තනි වෙදනං සමනුපස්සති.

කථං වෙදනාය අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය වෙදනායා'ති වෙදනාය අත්තානං සමනුපස්සති. 'සෙය්‍යථාපි මණී කරණ්ඩකෙ පක්ඛිත්තො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'අයං මණී, අයං කරණ්ඩකො; අඤ්ඤො මණී, අඤ්ඤො කරණ්ඩකො. සො ඛො පනායං මණී ඉමස්මිං කරණ්ඩකෙ'ති කරණ්ඩකස්මිං මණිං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං අත්තතො සමනුපස්සති තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය වෙදනායා'ති වෙදනාය අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං චතුත්ථා වෙදනා වත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සංයොජනානි න ච දිට්ඨියො, එවං වෙදනාය අත්තානං සමනුපස්සති.

කිසෙයින් ආත්මය වෙදනාවත් කොට දකී ද යත්: මෙලොවැ ඇතැමෙක් සංඥාව සංසකාරයන් විඥානය රූපය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය මේ වෙදනායෙන් වෙදනාවත් යැ'යි ආත්මය වෙදනාවත් කොට දකී. යම්සේ ඡායාසමපන්න රුකෙක් වන්නේ ද එරුක ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ යැ: 'මේ රුක යැ, මේ සෙවණලු යැ, රුක අනෙකෙක, සෙවණැල්ල අනෙකෙකි. වැළිත් ඒ මේ රුක මේ සෙවණලුයෙන් සෙවණලු ඇත්තේ යැ'යි (මෙසේ) රුක සෙවණලු ඇත්තක් කොට දකී ද එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් සංඥාව සංසකාරයන් විඥානය රූපය ආත්මවශයෙන් දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙම මේ වෙදනායෙන් වෙදනාවත් වේ'යයි ආත්මය වෙදනාවත් කොට දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි වෙයි. දෘෂ්ටිය වසතු නො වෙයි, වසතුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වසතුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වසතුවකුත් වේ ද මේ දෙවනු වූ වෙදනාවසතුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්තියැ . මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් ආත්මය වෙදනාවත් කොට දකී.

කිසෙයින් ආත්මයෙහි ලා වෙදනාව දකී ද යත්: මෙ ලොවැ ඇතැමෙක් සංඥාව සංසකාරයන් විඥානය රූපය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මේ ආත්මයෙහි මේ වෙදනාව වේ' යයි ආත්මයෙහි ලා වෙදනාව දකී. යම්සේ ගන්ධසමපන්නපුෂපයෙක් වේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ යැ: 'මේ පුෂප යැ, මේ ගන්ධ යැ, පුෂපය අනෙකෙක, ගන්ධය අනෙකෙකි. වැළිත්, ඒ මේ ගන්ධය තෙමේ මේ පුෂපයෙහි වේ' යයි මෙසේ පුෂපයෙහි ලා ගන්ධය දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් සංඥාව සංසකාරයන් විඥානය රූපය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මේ වූකලි මාගේ ආත්ම යැ, වැළිත් මේ ආත්මයෙහි මේ වෙදනාව වේ' යයි ආත්මයෙහි ලා වෙදනාව දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වසතු නො වෙයි. වසතුව දෘෂ්ටි නො වෙයි දෘෂ්ටිය අනෙකක, වසතුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වසතුවකුත් වේ ද, මේ තුන්වනු වූ වෙදනාවසතුක-ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් ආත්මයෙහි ලා වෙදනාව දකී.

කිසෙයින් වෙදනායෙහි ලා ආත්මය දකී ද යත්: මෙලොවැ ඇතැමෙක් සංඥාව සංසකාරයන් විඥානය රූපය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූ කලි මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙමේ මේ වෙදනායෙහි වේ' යයි වෙදනායෙහි ලා ආත්මය දකී. යම්සේ මැණිකෙක් කරඬුවෙක බහාලන ලද්දේ වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ යැ: මේ මැණිකැ මේ කරඬු යැ, මැණික අනෙකෙක කරඬුව අනෙකෙකි. වැළිත් මේ මැණික කරඬුයෙහි වේ යයි (මෙසේ) කරඬුයෙහි ලා මැණික දකී ද, එපරිද්දෙන් මැ මෙලොවැ ඇතැමෙක් සංඥාව සංසකාරයන් විඥානය රූපය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූ කලි මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙමේ මේ වෙදනායෙහි වේ' යයි වෙදනායෙහි ලා ආත්මය දකී. අභිනිවෙපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වසතු නො වෙයි, වසතුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වසතුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වසතුවකුත් වේ ද, මේ සතරවනු වූ වෙදනාවසතුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ, මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් වෙදනායෙහි ලා ආත්මය දකී.

කථං සඤ්ඤං අත්තතො සමනුපස්සති: ඉධෙකච්චො චක්ඛුසම්ඵස්සජං සඤ්ඤං–පෙ– සොතසම්ඵස්සජං සඤ්ඤං–පෙ– ඝානසම්ඵස්සජං සඤ්ඤං–පෙ– ජිව්හාසම්ඵස්සජං සඤ්ඤං –පෙ– කායසම්ඵස්සජං සඤ්ඤං –පෙ– මනොසම්ඵස්සජං සඤ්ඤං අත්තතො සමනුපස්සති. 'යා මනොසම්ඵස්සජා සඤ්ඤා, සො අහං; යො අහං සා මනොසම්ඵස්සජා සඤ්ඤා'ති මනොසම්ඵස්සජං සඤ්ඤඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො යා අච්චි, සො වණ්ණො; යො වණ්ණො, සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො මනොසම්ඵස්සජං සඤ්ඤං අත්තතො සමනුපස්සති, යා මනොසම්ඵස්සජා සඤ්ඤා සො අහං, යො අහං සා මනොසම්ඵස්සජා සඤ්ඤා'ති මනොසම්ඵස්සජං සඤ්ඤඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති, අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි, යඤ්ච වත්ථු, අයං පඨමා සඤ්ඤාවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො, එවං සඤ්ඤං අත්තතො සමනුපස්සති.

කථං සඤ්ඤාවන්තං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං වෙදනං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය සඤ්ඤාය සඤ්ඤාවා'ති සඤ්ඤාවන්තං අත්තානං සමනුපස්සති, සෙය්‍යථාපි රුක්ඛො ඡායාසම්පන්නො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'අයං රුක්ඛො, අයං ඡායා, අඤ්ඤො රුක්ඛො අඤ්ඤා ඡායා, සො ඛො පනායං රුක්ඛො ඉමාය ඡායාය ඡායාවා'ති ඡායාවන්තං රුක්ඛං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං වෙදනං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය සඤ්ඤාය සඤ්ඤාවා'ති සඤ්ඤාවන්තං අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං දුතියා සඤ්ඤාවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං සඤ්ඤාවන්තං අත්තානං සමනුපස්සති.

කථං අත්තනි සඤ්ඤං සමනුපස්සති: ඉධෙකච්චො සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං වෙදනං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, ඉමස්මිං ච පන අත්තනි අයං සඤ්ඤා'ති අත්තනි සඤ්ඤං සමනුපස්සති. සෙය්‍යථාපි පුප්ඵං ගන්ධසම්පන්නං අස්ස, තමෙනපුරිසො, එවං වදෙය්‍ය: 'ඉදං පුප්ඵං, අයං ගන්ධො, අඤ්ඤං පුප්ඵං, අඤ්ඤො ගන්ධො, සො ඛො පනායං ගන්ධො ඉමස්මිං පුප්ඵෙ'ති පුප්ඵස්මිං ගන්ධං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං වෙදනං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති 'අයං ඛො මෙ අත්තා, ඉමස්මිං ච පන අත්තනි අයං සඤ්ඤා'ති අත්තනි සඤ්ඤං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි, යඤ්ච වත්ථු, අයං තතියා සඤ්ඤාවත්ථුකා අත්තානුදිට්ඨි අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි –පෙ– ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො, එවං අත්තනි සඤ්ඤං සමනුපස්සති.

කිසෙසින් සංඥාව ආත්මවශයෙන් දකී ද යත්: මෙලොවැ ඇතැමෙක් චක්ඛුසම්ඵස්සයෙන් උපන් සංඥාව ... සොතසම්ඵස්සයෙන් උපන් සංඥාව ... ඝානසම්ඵස්සයෙන් උපන් සංඥාව ... ජිව්හාසම්ඵස්සයෙන් උපන් සංඥාව ... කායසම්ඵස්සයෙන් උපන් සංඥාව ... මනොසම්ඵස්සයෙන් උපන් සංඥාව ආත්මවශයෙන් දකී. 'යමක් මනොසම්ඵස්සයෙන් උපන් සංඥා වේ ද හේ මම් වෙමි, යමෙක් මම් වේ ද, හෝ මනොසම්ඵස්සයෙන් උපන් සංඥාව වේ' යයි මනොසම්ඵස්සයෙන් උපන් සංඥාවත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දැල්වෙන තෙල් පහනක්හුගේ යමක් සිළුව වේ ද, ඒ වර්ණ ය, යමෙක් වර්ණය වේ ද, ඒ සිළුවැ'යි සිළුවත් වර්ණයත් එකක් මැ කොට දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් මනොසම්ඵස්සයෙන් උපන් සංඥාව ආත්මවශයෙන් දකී. 'යමක් මනොසම්ඵස්සයෙන් උපන් සංඥාව වේ ද, හේ මම් වෙමි, යමෙක් මම් වේ ද හෝ මනොසම්ඵස්සයෙන් උපන් සංඥාව වේ' යයි මනොසම්ඵස්සයෙන් උපන් සංඥාවත් තමාත් එකක් මැ කොට දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ පළමුවනු වූ සංඥාවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙසින් සංඥාව ආත්මවශයෙන් දකී.

කිසෙසින් ආත්මය සංඥාවත් කොට දකී ද යත්: මෙ ලොවැ ඇතැමෙක් සංස්කාරයන් විඥානය රූපය වෙදනාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙමේ මේ සංඥායෙන් සංඥාවත් වේ' යයි ආත්මය සංඥාවත් කොට දකී. යම්සේ ඡායාසම්පන්නවෘක්ෂයෙක් වන්නේ ද එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද 'මේ වෘක්ෂ යැ, මේ ඡායා යැ, වෘක්ෂය අනෙකෙක, ඡායාව අනෙකක; වැළිත් මේ වෘක්ෂය තෙමේ මේ ඡායායෙන් ඡායාවත් වේ' යයි (මෙසේ) වෘක්ෂය ඡායාවත් කොට දකී ද එපරිද්දෙන් මැ මෙලොවැ ඇතැමෙක් සංස්කාරයන් විඥානය රූපය වෙදනාව ආත්මවශයෙන් දකී ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙමේ මේ සංඥායෙන් 'සංඥාවත් වේ' යයි ආත්මය සංඥාවත් කොට දකී අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නොවෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ දෙවනු වූ සංඥාවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙසින් ආත්මය සංඥාවත් කොට දකී.

කිසෙසින් ආත්මයෙහි ලා සංඥාව දකී ද යත්: මෙ ලොවැ ඇතැමෙක් සංස්කාරයන් විඥානය රූපය වෙදනාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යැ වැළිත් මේ ආත්මයෙහි මේ සංඥාව වේ' යයි ආත්මයෙහි ලා සංඥාව දකී. යම්සේ ගන්ධසම්පන්න පුෂ්පයෙක් වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද 'මේ පුෂ්ප යැ, මේ ගන්ධ යැ; පුෂ්පය අනෙකෙක, ගන්ධය අනෙකෙකි. වැළිත් ඒ මේ ගන්ධය මේ පුෂ්පයෙහි වේ' යයි (මෙසේ) පුෂ්පයෙහි ලා ගන්ධය දකී ද, එපරිද්දෙන් මැ මෙලොවැ ඇතැමෙක් සංස්කාරයන් විඥානය රූපය වෙදනාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මේ ආත්මයෙහි මේ සංඥාව වේ' යයි ආත්මයෙහි ලා සංඥාව දකී. අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ දෘෂ්ටිය වස්තු නො වෙයි. වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. මේ තුන්වනු වූ සංඥාවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටි මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙසින් ආත්මයෙහි ලා සංඥාව දකී.

කථං සඤ්ඤාය අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං වෙදනං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය සඤ්ඤාය'ති සඤ්ඤාය අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි මණි කරණ්ඩකෙ පක්ඛිත්තො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'අයං මණි, අයං කරණ්ඩකො අඤ්ඤො මණි, අඤ්ඤො කරණ්ඩකො, සො ඛො පනායං මණි ඉමස්මිං කරණ්ඩකෙ'ති කරණ්ඩකස්මිං මණිං සමනුපස්සති, එවමෙව ඉධෙකච්චො සඞ්ඛාරෙ විඤ්ඤාණං රූපං වෙදනං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමාය සඤ්ඤාය'ති සඤ්ඤාය අත්තානං සමනුපස්සති, අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු අයං චතුත්ථා සඤ්ඤාවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං සඤ්ඤාය අත්තානං සමනුපස්සති.

කථං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති: ඉධෙකච්චො චක්ඛුසම්ඵස්සජං චෙතනං -පෙ- සොතසම්ඵස්සජං චෙතනං -පෙ- ඝානසම්ඵස්සජං චෙතනං -පෙ- ජිව්හාසම්ඵස්සජං චෙතනං -පෙ- කායසම්ඵස්සජං චෙතනං -පෙ- මනොසම්ඵස්සජං චෙතනං අත්තතො සමනුපස්සති: 'යා මනොසම්ඵස්සජා චෙතනා සො අහං, යො අහං සා මනොසම්ඵස්සජා චෙතනා'ති මනොසම්ඵස්සජං චෙතනඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො යා අච්චි, සො වණ්ණො; යො වණ්ණො, සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො මනොසම්ඵස්සජං චෙතනං අත්තතො සමනුපස්සති; 'යා මනොසම්ඵස්සජා චෙතනා සො අහං යො අහං සා මනොසම්ඵස්සජා චෙතනා'ති මනොසම්ඵස්සජං චෙතනඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා සඞ්ඛාරවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති.

කථං සඞ්ඛාරවන්තං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො විඤ්ඤාණං රූපං වෙදනං සඤ්ඤං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමෙහි සඞ්ඛාරෙහි සඞ්ඛාරවා'ති සඞ්ඛාරවන්තං අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි රුක්ඛො ඡායාසම්පන්නො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: අයං රුක්ඛො, අයං ඡායා, අඤ්ඤො රුක්ඛො, අඤ්ඤා ඡායා; සො ඛො පනායං රුක්ඛො ඉමාය ඡායාය ඡායාවා'ති ඡායාවන්තං රුක්ඛං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො විඤ්ඤාණං රූපං වෙදනං සඤ්ඤං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා සො ඛො පන මෙ අයං අත්තා ඉමෙහි සඞ්ඛාරෙහි සඞ්ඛාරවා'ති සඞ්ඛාරවන්තං අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු: යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං දුතියා සඞ්ඛාරවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං සඞ්ඛාරවන්තං අත්තානං සමනුපස්සති

කිසෙයින් සංඥායෙහි ලා ආත්මය දකී ද යත්: මෙලොව ඇතැමෙක් සංස්කාරයන් විඥානය රූපය වේදනාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. ‘මේ වූකලී මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය මේ සංඥායෙහි වේ’ යයි සංඥායෙහි ලා ආත්මය දකී. යම්සේ මැණිකෙක් කරඬුවෙක බහාලන ලද්දේ වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද: ‘මේ මැණික, මේ කරඬුව, මැණික අනෙකෙක, කරඬුව අනෙකෙකි. වැලිත් මේ මැණික මේ කරඬුවෙහි වේ’ යයි කරඬුවෙහි ලා මැණික දකී ද, එපරිද්දෙන් මැ මෙ ලොව ඇතැමෙක් සංස්කාරයන් විඥානය රූපය වේදනාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: ‘මේ වූකලී මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය මේ සංඥායෙහි වේ’යයි සංඥායෙහි ලා ආත්මය දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද මේ සතර වනු වූ සංඥාවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටිය නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් සංඥායෙහි ලා ආත්මය දකී.

කිසෙයින් සංස්කාරයන් ආත්මවශයෙන් දකී ද යත්: මෙලොව ඇතැමෙක් චක්ඛුසම්ඵස්සයෙන් උපන් චේතනාව ... සොතසම්ඵස්සයෙන් උපන් චේතනාව ... ඝානසම්ඵස්සයෙන් උපන් චේතනාව ... ජිව්හාසම්ඵස්සයෙන් උපන් චේතනාව ... කායසම්ඵස්සයෙන් උපන් චේතනාව ... මනොසම්ඵස්සයෙන් උපන් චේතනාව ... ආත්මවශයෙන් දකී. යමක් මනොසම්ඵයෙන් උපන් චේතනා වේ ද හේ මම් වෙමි, යමෙක් මම් වේ ද හෝ මනොසම්ඵස්සයෙන් උපන් චේතනා වේ’ යයි මනොසම්ඵස්සජචේතනාවත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දැල්වෙන තෙල් පහනක්හුගේ යම් සිළුවක් වේ ද ඒ වණී වෙයි. යමෙක් වණීය වේ ද ඒ සිළුව වේ’ යයි සිළුවත් වණීයත් එකක් මැ කොට දකී ද එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් මනොසම්ඵස්සයෙන් උපන් චේතනාව ආත්මවශයෙන් දකී. ‘යමක් මනොසම්ඵස්සයෙන් උපන් චේතනා වේ ද හේ මම් වෙමි. යමෙක් මම් වේ ද හෝ මනොසම්ඵස්සයෙන් උපන් චේතනා වේ’ යයි මනොසම්ඵස්සජචේතනාවත් තමාත් එකක් මැ කොට දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පළමුවනු වූ සංස්කාර වස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් සංස්කාරයන් ආත්මවශයෙන් දකී.

කිසෙයින් ආත්මය සංස්කාරවත් කොට දකී ද යත්: මෙ ලොව ඇතැමෙක් විඥානය රූපය වේදනාව සංඥාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: ‘මේ වූකලි මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය තෙමේ මේ සංස්කාරයන්ගෙන් සංස්කාරවත් වේ’ යයි ආත්මය සංස්කාරවත් කොට දකී. යම්සේ ඡායාසම්පන්න වෘක්ෂයෙක් වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද, මේ වෘක්ෂ යැ, මේ ඡායා යැ, වෘක්ෂය අනෙකෙක, ඡායාව අනෙකකි. වැලිත් මේ වෘක්ෂය මේ ඡායායෙන් ඡායාවත් වේ’යයි මෙසේ වෘක්ෂය ඡායාවත් කොට දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් විඥානය රූපය වේදනාව සංඥාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. ‘මේ වූකලී මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය මේ සංස්කාරයන්ගෙන් සංස්කාරවත් වේ’ යයි ආත්මය සංස්කාරවත් කොට දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ දෙවනු වූ සංස්කාරවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් ආත්මය සංස්කාරවත් කොට දකී.

කථං අත්තනි සඞ්ඛාරෙ සමනුපස්සති: ඉධෙකච්චො විඤ්ඤාණං රූපං වෙදනං සඤ්ඤං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: ‘අයං ඛො මෙ අත්තා, ඉමස්මිඤ්ච පන අත්තනි ඉමෙ සඞ්ඛාරාති අත්තනි සඞ්ඛාරෙ සමනුපස්සති. සෙය්‍යථාපි පුප්ඵං ගන්ධසම්පන්නං අස්ස, තමෙනං පුරිසො එවං වදෙය්‍ය: ‘ඉදං පුප්ඵං අයං ගන්ධො, අඤ්ඤං පුප්ඵං අඤ්ඤො ගන්ධො, සො ඛො පනායං ගන්ධො ඉමස්මිං පුප්ඵෙ’ති පුප්ඵස්මිං ගන්ධං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො විඤ්ඤාණං රූපං වෙදනං සඤ්ඤං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: ‘අයං ඛො මෙ අත්තා, ඉමස්මිඤ්ච පන අත්තනි ඉමෙ සඞ්ඛාරා’ති අත්තනි සඞ්ඛාරෙ සමනුපස්සති, අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං තතියා සඞ්ඛාරවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං අත්තනි සඞ්ඛාරෙ සමනුපස්සති.

කථං සඞ්ඛාරෙසු අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො විඤ්ඤාණං රූපං වෙදනං සඤ්ඤං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: ‘අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමෙසු සඞ්ඛාරෙසූ’ති සඞ්ඛාරෙසු අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි මණි කරණ්ඩකෙ පක්ඛිත්තො අස්ස, තමෙනං පුරිසො එවං වදෙය්‍ය: ‘අයං මණි, අයං කරණ්ඩකො; අඤ්ඤො මණි, අඤ්ඤො කරණ්ඩකො; සො ඛො පනායං මණි ඉමස්මිං කරණ්ඩකෙ’ති කරණ්ඩකස්මිං මණිං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො විඤ්ඤාණං රූපං වෙදනං සඤ්ඤං අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: ‘අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමෙසු සඞ්ඛාරෙසූ’ති සඞ්ඛාරෙසු අත්තානං සමනුපස්සති, අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං චතුත්ථා සඞ්ඛාරවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං සඞ්ඛාරෙසු අත්තානං සමනුපස්සති.

කථං විඤ්ඤාණං අත්තතො සමනුපස්සති: ඉධෙකච්චො චක්ඛුවිඤ්ඤාණං -පෙ- සොතවිඤ්ඤාණං -පෙ- ඝානවිඤ්ඤාණං -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- කායවිඤ්ඤාණං -පෙ- මනොවිඤ්ඤාණං අත්තතො සමනුපස්සති: ‘යං මනොවිඤ්ඤාණං සො අහං, යො අහං තං මනොවිඤ්ඤාණ’න්ති මනොවිඤ්ඤාණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො යා අච්චි සො වණ්ණො, යො වණ්ණො සා අච්චී’ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො මනොවිඤ්ඤාණං අත්තතො සමනුපස්සති: ‘යං මනොවිඤ්ඤාණං සො අහං, යො අහං තං මනොවිඤ්ඤාණ’න්ති මනොවිඤ්ඤාණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඤ්චමා විඤ්ඤාණවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි, -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො, එවං විඤ්ඤාණං අත්තතො සමනුපස්සති.

කිසෙයින් ආත්මයෙහි ලා සංස්කාරයන් දකී ද යත්: මෙලොවැ ඇතැමෙක් විඥානය රූපය වේදනාව සංඥාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මේ වූකලි මාගේ ආත්ම යැ, වැලිත් මේ ආත්මයෙහි මේ සංස්කාරයෝ වෙති' ආත්මයෙහි ලා සංස්කාරයන් දකී. යම්සේ ගන්ධසම්පන්න පුෂ්පයෙක් වන්නේ ද එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද 'මේ පුෂ්ප යැ, මේ ගන්ධ යැ, පුෂ්පය අනෙකෙක, ගන්ධය අනෙකෙකි. වැලිත් මේ ගන්ධය මේ පුෂ්පයෙහි වේ'යයි පුෂ්පයෙහි ලා ගන්ධය දකී ද, එපරිද්දෙන් මැ මෙලොවැ ඇතැමෙක් විඥානය රූපය වේදනාව සංඥාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලි මාගේ ආත්ම යැ, වැලිත් 'මේ ආත්මයෙහි මේ සංස්කාරයෝ වෙති' ආත්මයෙහි ලා සංස්කාරයන් දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි. වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ තුන්වනු වූ සංස්කාරවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් ආත්මයෙහි ලා සංස්කාරයන් දකී.

කිසෙයින් සංස්කාරයන්හි ලා ආත්මය දකී ද යත්: මෙලොවැ ඇතැමෙක් විඥානය රූපය වේදනාව සංඥාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලි මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය තෙමේ මේ සංස්කාරයන්හි වේ'යයි සංස්කාරයන්හි ලා ආත්මය දකී. යම්සේ මැණිකෙක් කරඬුවෙක බහාලනලද්දේ වේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද: 'මේ මැණිකැ, මේ කරඬුවැ. මැණික අනෙකෙක, කරඬුව අනෙකෙකි. වැලිත් මේ මැණික මේ කරඬුවෙහි වේ' යයි (මෙසේ) කරඬුවෙහි ලා මැණික දකී ද, එපරිද්දෙන් මැ මෙලොවැ ඇතැමෙක් විඥානය රූපය වේදනාව සංඥාව ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මේ වූ කලි මාගේ ආත්ම යැ, වැලිත් මාගේ මේ ආත්මය තෙමේ මේ සංස්කාරයන්හි වේ'යයි සංස්කාරයන්හි ලා ආත්මය දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ සතර වනු වූ සංස්කාරවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් සංස්කාරයන්හි ලා ආත්මය දකී.

කිසෙයින් විඥානය ආත්මවශයෙන් දක් ද යත්: මෙලොව ඇතැමෙක් චක්ෂුර්විඥානය, ශ්‍රොත්‍රවිඥානය, ඝ්‍රාණවිඥානය, ජිහ්වාවිඥානය, කායවිඥානය, මනොවිඥානය ආත්මවශයෙන් දකී. යමෙක් මනොවිඥාන වේ ද, හේ මම් වෙමි. යමෙක් මම් වේ ද ඒ මනොවිඥාන වේ' යයි මනොවිඥානයත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දැල්වෙන තෙල් පහනක්හු ගේ යම් සිළුවක් වේ ද හේ වර්ණ යැ, යමෙක් වර්ණ වේ ද; ඒ සිළුවැ' යි සිළුවත් වර්ණයත් එකක් මැ කොට දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් මනොවිඥානය ආත්මවශයෙන් දකී. යමෙක් මනො-විඥාන වේ ද හේ මම වෙමි. යමෙක් මම් වේ ද හේ මනොවිඥාන වේ' යයි මනොවිඥානයත් තමාත් එකක් මැ කොට දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තුව නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකෙක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ, පළමුවනු වූ විඥානවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් විඥානය ආත්මවශයෙන් දකී.

කථං විඤ්ඤාණවන්තං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමිනා විඤ්ඤාණෙන විඤ්ඤාණවා'ති විඤ්ඤාණවන්තං අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි රුක්ඛො ඡායාසම්පන්නො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: අයං රුක්ඛො, අයං ඡායා, අඤ්ඤො රුක්ඛො, අඤ්ඤා ඡායා; සො ඛො පනායං රුක්ඛො ඉමාය ඡායාය ඡායාවා'ති ඡායාවන්තං රුක්ඛං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමිනා විඤ්ඤාණෙන විඤ්ඤාණවා'ති විඤ්ඤාණවන්තං අත්තානං සමනුපස්සති, අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු: යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං දුතියා විඤ්ඤාණවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො, එවං විඤ්ඤාණවන්තං අත්තානං සමනුපස්සති.

කථං අත්තනි විඤ්ඤාණං සමනුපස්සති: ඉධෙකච්චො රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති. 'අයං ඛො මෙ අත්තා, ඉමස්මිං ච පන අත්තනි ඉදං විඤ්ඤාණ'න්ති අත්තනි විඤ්ඤාණං සමනුපස්සති. සෙය්‍යථාපි පුප්ඵං ගන්ධසම්පන්නං අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'ඉදං පුප්ඵං, අයං ගන්ධො: අඤ්ඤං පුප්ඵං අඤ්ඤො ගන්ධො, සො ඛො පනායං ගන්ධො ඉමස්මිං පුප්ඵෙ'ති පුප්ඵස්මිං ගන්ධං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, ඉමස්මිං ච පන අත්තනි ඉදං විඤ්ඤාණ'න්ති අත්තනි විඤ්ඤාණං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො' දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං තතියා විඤ්ඤාණවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං අත්තනි විඤ්ඤාණං සමනුපස්සති.

කථං විඤ්ඤාණස්මිං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති. 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමස්මිං විඤ්ඤාණෙ'ති විඤ්ඤාණස්මිං අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි මණි කරණ්ඩකෙ පක්ඛිත්තො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'අයං මණි, අයං කරණ්ඩකො; අඤ්ඤො මණි, අඤ්ඤො කරණ්ඩකො; සො ඛො පනායං මණි ඉමස්මිං කරණ්ඩකෙ'ති කරණ්ඩකස්මිං මණිං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො රූපං වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති. තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමස්මිං විඤ්ඤාණෙ'ති විඤ්ඤාණස්මිං අත්තානං සමනුපස්සති. අභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං චතුත්ථා විඤ්ඤාණවත්ථුකා අත්තානුදිට්ඨි. අත්තානුදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං විඤ්ඤාණස්මිං අත්තානං සමනුපස්සති.

අත්තානුදිට්ඨියා ඉමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති.

කිසෙයින් ආත්මය විඥානවත් කොට දකී ද යත්: මෙලොව ඇතැමෙක් රූපය, වේදනාව, සංඥාව, සංස්කාරයන් ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙමේ මේ විඥානයෙන් විඥානවත් වේ' යයි ආත්මය විඥානවත් කොට දකී. යම්සේ ඡායාසම්පන්නවෘක්ෂයෙක් වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද, 'මේ වෘක්ෂ යැ, මේ ඡායා යැ, වෘක්ෂය අනෙකෙක, ඡායාව අනෙකෙකි. වැළිත් ඒ මේ වෘක්ෂය මේ ඡායායෙන් ඡායාවත් වේ'යයි, මෙසේ වෘක්ෂය ඡායාවත් කොට දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් රූපය, වේදනාව, සංඥාව, සංස්කාරයන් ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි, මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙමේ මේ විඥානයෙන් විඥානවත් වේ' යයි ආත්මය විඥානවත් කොට දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් විස්තුවක් හා වේ ද, මේ දෙවනු වූ විඥානවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් ආත්මය විඥානවත් කොට දකී.

කිසෙයින් ආත්මයෙහි ලා විඥානය දකී ද යත්: මෙලොව ඇතැමෙක් රූපය වේදනාව සංඥාව සංස්කාරයන් ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මේ ආත්මයෙහි මේ විඥානය වේ' යයි විඥානය ආත්මයෙහි ලා දකී. යම්සේ ගන්ධසම්පන්න පුෂ්පයෙක් වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද, මේ පුෂ්ප යැ, මෙ ගන්ධ යැ; පුෂ්පය අනෙකෙක, ගන්ධය අනෙකෙකි, වැළිත් මේ ගන්ධය මේ පුෂ්පයෙහි වේ' යයි (මෙසේ) ගන්ධය පුෂ්පයෙහි ලා දකී ද, එපරිද්දෙන් මැ මෙ ලොව ඇතැමෙක් රූපය වේදනාව සංඥාව සංස්කාරයන් ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මෙ ආත්මයෙහි මේ විඥානය වේ' යයි ආත්මයෙහි ලා විඥානය දකී අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ, දෘෂ්ටිය වස්තුව නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ තුන්වනු වූ විඥානවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් ආත්මයෙහි ලා විඥානය දකී.

කිසෙයින් විඥානයෙහි ලා ආත්මය දකී ද යත්: මෙලොව ඇතැමෙක් රූපය වේදනාව සංඥාව සංස්කාරයන් ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය මේ විඥානයෙහි වේ'යයි විඥානයෙහි ලා ආත්මය දකී. යම්සේ මැණිකෙක් කරඬුවෙක බහාලන ලද්දේ වේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද, 'මේ මැණිකැ, මේ කරඬුවැ, මැණික අනෙකෙක, කරඬුව අනෙකෙකි. වැළිත් මේ මැණික කරඬුවෙහි වේ'යයි. (මෙසේ) කරඬුවෙහි ලා මැණික දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් රූපය, වේදනාව සංඥාව, සංස්කාරයන් ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙමේ මේ විඥානයෙහි වේ'යයි විඥානයෙහි ලා ආත්මය දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ සතරවනු වූ විඥානවස්තුක ආත්මානුදෘෂ්ටි වේ. ආත්මානුදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. මෙසෙයින් විඥානයෙහි ලා ආත්මය දකී

ආත්මානුදෘෂ්ටියෙහි මේ විසි අයුරින් අභිනිවේශය වේ.

## 2 - 3. මිච්ඡාදිට්ඨි

මිච්ඡාදිට්ඨියා කතමෙහි දසහාකාරෙහි අභිනිවෙසො හොති:

'නත්ථි දින්න'න්ති වත්ථු[1] එවංවාදො මිච්ඡාභිනිවෙසපරාමාසො[2] දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා මිච්ඡාවත්ථුකා මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි, න ච දිට්ඨියො.

'නත්ථි යිට්ඨ'න්ති වත්ථු -පෙ- 'නත්ථි හුත'න්ති වත්ථු -පෙ- 'නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො'ති වත්ථු -පෙ- 'නත්ථි අයං ලොකො'ති වත්ථු -පෙ- 'නත්ථි පරො ලොකො'ති වත්ථු -පෙ- 'නත්ථි මාතා'ති වත්ථු -පෙ- 'නත්ථි පිතා'ති වත්ථු -පෙ- 'නත්ථි සත්තා ඔපපාතිකා'ති වත්ථු -පෙ- 'නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තී'ති වත්ථු, එවංවාදො මිච්ඡාභිනිවෙසපරාමාසො දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං දසමා මිච්ඡාවත්ථුකා මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- මිච්ඡාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස ද්වෙව ගතියො -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. මිච්ඡාදිට්ඨියා ඉමෙහි දසහාකාරෙහි අභිනිවෙසො හොති.

## 2 - 4. සක්කායදිට්ඨි

'සක්කායදිට්ඨියා කතමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති:

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං.

කථං රූපං අත්තතො සමනුපස්සති. ඉධෙකච්චො පථවීකසිණං -පෙ- ඔදාතකසිණං අත්තතො සමනුපස්සති: 'යං ඔදාතකසිණං සො අහං, යො අහං තං ඔදාතකසිණ'න්ති ඔදාතකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො -පෙ- එවමෙව ඉධෙකච්චො ඔදාතකසිණං අත්තතො සමනුපස්සති, අභිනිවෙසපරාමාසො දිට්ඨි -පෙ- අයං පඨමා රූපවත්ථුකා සක්කායදිට්ඨි. සක්කායදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං රූපං අත්තතො සමනුපස්සති -පෙ- සක්කායදිට්ඨියා ඉමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති.

---

1. වත්ථුං - සයා. සයා PTS සීහළක්ඛරපොත්ථකෙසු නත්ථි.
2. මිච්ඡාදිට්ඨාභිනිවෙසපරාමාසො - සයා PTS

## 2 – 3. මිථ්‍යාදෘෂ්ටිය

මිථ්‍යාදෘෂ්ටියෙහි කවර දස අයුරෙකින් අභිනිවේශ වෙයි යත්:

'දානයෙහි ඵල නැත' යනු වස්තු යැ. මෙ බඳු වාද ඇති මිථ්‍යාභිනිවේශයාගේ පරාමර්ශය දෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පළමුවනු වූ මිථ්‍යාවස්තුක මිථ්‍යාදෘෂ්ටි වේ. මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'යාගයෙහි ඵල නැත' යනු වස්තු යැ ... 'මහායාගයෙහි ඵල නැත' යනු වස්තු යැ ... 'සුකෘතදුෂ්කෘතකර්මයන්ගේ ඵල විපාක නැත' යනු යනු වස්තු යැ ... (පෙර කළ කර්මයෙන්) 'මෙලොව නැත' යනු වස්තු යැ ... (මෙහි කළ කර්මයෙන්) 'පරලොව නැත' යනු වස්තු යැ ... 'මවු නැත' යනු වස්තු යැ ... 'පියා නැත' යනු වස්තු යැ ... 'ඖපපාතිකසත්ත්වයෝ නැත' යනු වස්තු යැ ... 'යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ අභිඥායෙන් ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් නම් එ බඳු සම්‍යග්ගත සම්‍යක්ප්‍රතිපන්න ශ්‍රමණබ්‍රාහ්මණයෝ ලොවැ නැත' යනු වස්තු යැ මෙ බඳු වාද ඇති මිථ්‍යාභිනිවේශයාගේ පරාමර්ශය දෘෂ්ටි නම්. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ දසවනු වූ මිථ්‍යාවස්තුක මිථ්‍යාදෘෂ්ටි වේ. මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්ති යැ ... මිථ්‍යාදෘෂ්ටි ඇති පුරුෂ පුද්ගලහට ගති දෙකෙක් මැ වෙයි ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මිථ්‍යාදෘෂ්ටියෙහි මේ දසඅයුරින් අභිනිවේශය වේ.

## 2 – 4. සත්කායදෘෂ්ටිය

සත්කායදෘෂ්ටියෙහි කවර විසි අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

මෙලොවැ (බුද්ධාදි) ආර්‍ය්‍යයන් නො දක්නාසුලු ආර්‍ය්‍යධර්මයෙහි අදක්ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත වූ සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූ අශ්‍රැතවත් පෘථග්ජන තෙම රූපය ආත්මවශයෙන් (විපරීතසංඥායෙන්) දකී. ආත්මය රූපවත් කොට හෝ, රූප ආත්මයෙහි ලා හෝ, ආත්මය රූපයෙහි ලා හෝ වේදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ආත්මවශයෙන් දකී. ආත්මය විඥානවත් කොට හෝ, විඥානය ආත්මයෙහි ලා හෝ, ආත්මය විඥානයෙහි ලා හෝ දකී.

කිසෙසින් රූපය ආත්මවශයෙන් දකී ද යත්: මෙලොවැ ඇතැමෙක් පඨවිකසිණය ... ඔදාතකසිණය ආත්මවශයෙන් දකී. යමෙක් ඔදාතකසිණ වේ ද සේ මම් වෙමි, යමෙක් මම් වේ ද ඒ ඔදාතකසිණ වේ' යයි ඔදාතකසිණයත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දැල්වෙන පහනක්හුගේ... එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් ඔදාතකසිණය ආත්මවශයෙන් දකී. අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ .. මේ පළමුවනු වූ රූපවස්තුකසත්කායදෘෂ්ටි වේ. සත්කාය දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි ය ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි මෙසෙයින් රූපය ආත්මවශයෙන් දකී සත්කායදෘෂ්ටියෙහි මේ විසිඅයුරින් අභිනිවේශය වේ.

## 2 - 5. සක්කායවත්ථුකා සස්සතදිට්ඨි.

සක්කායවත්ථුකාය සස්සතදිට්ඨියා කතමෙහි පන්නරසහි ආකාරෙහි අභිනිවෙසො හොති:

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනාවන්තං වා අත්තානං -පෙ- සඤ්ඤාවන්තං වා අත්තානං -පෙ- සඞ්ඛාරවන්තං වා අත්තානං -පෙ- විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං.

කථං රූපවන්තං අත්තානං සමනුපස්සති: ඉධෙකච්චො වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, තස්ස එවං හොති: 'අයං ඛො මෙ අත්තා, සො ඛො පන මෙ අයං අත්තා ඉමිනා රූපෙන රූපවා'ති රූපවන්තං අත්තානං සමනුපස්සති. සෙය්‍යථාපි රුක්ඛො ඡායාසම්පන්නො අස්ස, තමෙනපුරිසො එවං වදෙය්‍ය: 'අයං රුක්ඛො, අයං ඡායා, අඤ්ඤො රුක්ඛො, අඤ්ඤා ඡායා. සො ඛො පනායං රුක්ඛො ඉමාය ඡායාය ඡායාවා'ති ඡායාවන්තං රුක්ඛං සමනුපස්සති, එවමෙව ඉධෙකච්චො වෙදනං -පෙ- අයං පඨමා සක්කායවත්ථුකා සස්සතදිට්ඨි සස්සතදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං රූපවන්තං අත්තානං සමනුපස්සති. -පෙ- සක්කායවත්ථුකාය සස්සතදිට්ඨියා ඉමෙහි පන්නරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 - 6. සක්කායවත්ථුකා උච්ඡෙදදිට්ඨි.

සක්කායවත්ථුකාය උච්ඡෙදදිට්ඨියා කතමෙහි පඤ්චහි ආකාරෙහි අභිනිවෙසො හොති.

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, වෙදනං අත්තතො සමනුපස්සති, සඤ්ඤං අත්තතො සමනුපස්සති, සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, විඤ්ඤාණං අත්තතො සමනුපස්සති.

කථං රූපං අත්තතො සමනුපස්සති: ඉධෙකච්චො පථවීකසිණං -පෙ- ඔදාතකසිණං අත්තතො සමනුපස්සති: 'යං ඔදාතකසිණං සො අහං, යො අහං තං ඔදාතකසිණ'න්ති ඔදාතකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො -පෙ- අයං පඨමා සස්සතවත්ථුකා උච්ඡෙදදිට්ඨි, උච්ඡෙදදිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. එවං රූපං අත්තතො සමනුපස්සති -පෙ- සක්කායවත්ථුකාය උච්ඡෙදදිට්ඨියා ඉමෙහි පඤ්චහි ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 – 5. සත්කායවස්තුකශාශ්වතදෘෂ්ටිය

සත්කායවස්තුකශාශ්වතදෘෂ්ටියෙහි කවර පසළොස් අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

මෙලොව්හි ආර්යයන් නො දක්නාසුලු ආර්යධර්මයෙහි අදක්‍ෂ වූ ආර්යධර්මයෙහි අවිනීත වූ සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි අදක්‍ෂ වූ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූ අශ්‍රුතවත් පෘථග්ජන තෙම ආත්මය රූපවත් කොට හෝ රූපය ආත්මයෙහි ලා හෝ ආත්මය රූපයෙහි ලා හෝ ආත්මය වේදනාවත් කොට හෝ ... ආත්මය සංඥාවත් කොට හෝ ... ආත්මය සංස්කාරවත් කොට හෝ ... ආත්මය විඥානවත් කොට හෝ ... විඥානය ආත්මයෙහි ලා හෝ ... ආත්මය විඥානයෙහි ලා හෝ දකී.

කිසෙයින් ආත්මය රූපවත් කොට දකී ද යත්: මෙලොව්හි ඇතැමෙක් වේදනාව සංඥාව සංස්කාරයන් විඥානය ආත්මවශයෙන් දකී. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි 'මේ වූකලී මාගේ ආත්ම යැ, වැළිත් මාගේ මේ ආත්මය තෙම මෙ රූපයෙන් රූපවත් වේ'යයි ආත්මය රූපවත් කොට දකී. යම්සේ ඡායාසම්පන්නවෘක්‍ෂයෙක් වන්නේ ද, එය ගැන පුරුෂයෙක් මෙසේ කියන්නේ ද: 'මේ වෘක්‍ෂ යැ, මේ ඡායා යැ, වෘක්‍ෂය අනෙකෙක, ඡායාව අනෙකෙකි. වැළිත් ඒ මේ වෘක්‍ෂය මේ ඡායායෙන් ඡායාවත් වේ' යයි (මෙසේ) වෘක්‍ෂය ඡායාවත් කොට දකී ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් වේදනාව ... මේ පළමුවනු වූ සත්කායවස්තුක ශාශ්වතදෘෂ්ටි නම. ශාශ්වතදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් ආත්මය රූපවත් කොට දකී ... සත්කායවස්තුක ශාශ්වතදෘෂ්ටියෙහි මේ පසළොස් අයුරින් අභිනිවේශය වේ.

## 2 – 6. සත්කාය වස්තුක උච්ඡේද දෘෂ්ටිය

කවර පස් අයුරෙකින් සත්කාය වස්තුක උච්ඡේද දෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද යත්:

මෙ ලොව්හි ආර්යයන් නො දක්නාසුලු ආර්යධර්මයෙහි අදක්‍ෂ වූ ආර්යධර්මයෙහි අවිනීත වූ සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි අදක්‍ෂ වූ සත්පුරුෂ ධර්මයෙහි අවිනීත වූ අශ්‍රුතවත් පෘථග්ජන තෙම රූපය ආත්මවශයෙන් දකී. වේදනාව ආත්මවශයෙන් දකී, සංඥාව ආත්මවශයෙන් දකී, සංස්කාරයන් ආත්මවශයෙන් දකී, විඥානය ආත්මවශයෙන් දකී.

කිසෙයින් රූපය ආත්මවශයෙන් දක්නේ ද යත්: මෙලොව්හි ඇතැමෙක් පඨවිකසිණය ... ඔදාතකසිණය ආත්මවශයෙන් දකී. යමෙක් ඔදාතකසිණ වේ ද හේ මම් වෙමි, යමෙක් මම් වේ ද ඒ ඔදාතකසිණ වේ' යයි ඔදාතකසිණයත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දල්වෙන තෙල් පහනක්හු ගේ ... මේ පළමුවනු වූ සත්කාය වස්තුක උච්ඡේදදෘෂ්ටි නම. උච්ඡේදදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් රූපය ආත්මවශයෙන් දකී ... මේ පස් අයුරින් සත්කායවස්තුක උච්ඡේදදෘෂ්ටියෙහි අභිනිවේශය වේ.

# 2 - 7. අන්තග්ගාහිකාදිට්ඨි

අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්ඤාසාය ආකාරෙහි අභිනිවෙසො හොති:

සස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති. 'අසස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති. අන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා -පෙ- 'අනන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා -පෙ- 'තං ජීවං තං සරීරන්ති අන්තග්ගාහිකාය දිට්ඨියා -පෙ- 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා -පෙ- හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා -පෙ- 'න හොති තථාගතො පරං මරණා'ති -පෙ- 'හොති ච න ච හොති තථාගතො පරං මරණා'ති -පෙ- 'නෙව හොති න න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතිහාකාරෙහි අභිනිවෙසො හොති.

'සස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසොහොති -පෙ- 'නෙව හොති න න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'සස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: 'රූපං ලොකො චෙව සස්සතඤ්චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි. දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි; අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු; යා ච දිට්ඨි යඤ්ච වත්ථු. අයං පඨමා 'සස්සතො ලොකො'ති අන්තග්ගාහිකා දිට්ඨි. අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'වෙදනා ලොකො චෙව සස්සතා චා'ති -පෙ- 'සඤ්ඤා ලොකො චෙව සස්සතා චා'ති -පෙ- 'සඞ්ඛාරා ලොකො චෙව සස්සතා චා'ති -පෙ- 'විඤ්ඤාණං ලොකො චෙව සස්සතඤ්චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඤ්චමී 'සස්සතො ලොකො'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. 'සස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'අසස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: 'රූපං ලොකො චෙව අසස්සතඤ්චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි-පෙ- අයං පඨමා අසස්සතො ලොකො'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

# 2 – 7 අන්තග්‍රාහිකදෘෂ්ටිය

කවර පනස් අයුරෙකින් අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි අභිනිවේශය වේ ද යත්:

'ලෝකය ශාශ්වතය'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කිහි අයුරෙකින් අභිනිවේශය වේ ද, 'ලෝකය අශාශ්වතය'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කිහි අයුරෙකින් අභිනිවේශය වේ ද, 'ලෝකය අන්ත ඇත්තේ යැ'යි අන්තග්‍රාහික දෘෂ්ටියෙහි ... 'ලෝකය අන්ත නැත්තේ යැ'යි අන්තග්‍රාහික දෘෂ්ටියෙහි ... හෙ මැ ජීව යැ හෙ මැ ශරීර යැ'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි ...'ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ' යි අන්තග්‍රාහික දෘෂ්ටියෙහි ... 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි වේ' යයි ... 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො වේ' යයි ... 'සත්ත්වතෙම මරණින් මත්තෙහි වන්නේත් නො ද වන්නේත් වේ' යයි ... 'සත්ත්වතෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වේ' යයි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කිහි අයුරෙකින් අභිනිවේශය වේ ද යත්:

ලෝකය ශාශ්වතය'යි අන්තග්‍රාහික දෘෂ්ටියෙහි පස් අයුරෙකින් අභිනිවේශය වෙයි ... 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වේ' යයි අන්තග්‍රාහික දෘෂ්ටියෙහි පස් අයුරෙකින් අභිනිවේශය වේ.

'ලෝකය ශාශ්වතය'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: 'රූපයත් ලෝකයත් ශාශ්වත ද වේ' යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද නු යි අන්තග්‍රාහිකදෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පළමු වනු වූ 'ලෝකය ශාශ්වත යැ යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි.

'වේදනාව ලෝක ද ශාශ්වත ද වේ' යයි ... 'සංඥාව ලෝක ද ශාශ්වත ද වේ' යයි ... සංස්කාරයෝ ලෝක ද ශාශ්වත ද වෙති... 'විඥානය ලෝක ද ශාශ්වත ද වේ' යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද නුයි අන්තග්‍රාහික දෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පස්වනු වූ 'ලෝකය ශාශ්වත යැ, යන අන්තග්‍රාහිකදෘෂ්ටි නමි. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. 'ලෝකය ශාශ්වත යැ'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'ලෝකය අශාශ්වත යැ'යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: 'රූපයත් ලෝකයත් අශාශ්වත ද වේ' යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද නුයි අන්තග්‍රාහිකදෘෂ්ටි නම ... මේ පළමු වනු වූ 'ලෝකය අශාශ්වත යැ යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිවිපත්තියැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි.

'වෙදනා ලොකො චෙව අසස්සතා චා'ති -පෙ- 'සඤ්ඤා ලොකො චෙව අසස්සතා චා'ති -පෙ- 'සඞ්ඛාරා ලොකො චෙව අසස්සතා චා'ති -පෙ- විඤ්ඤාණං ලොකො චෙව අසස්සතඤ්චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි. තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. 'අසස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'අන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: ඉධෙකච්චො පරිත්තං ඔකාසං නීලකතො ඵරති, තස්ස එවං හොති: 'අන්තවා අයං ලොකො පරිවටුමො'ති අන්තසඤ්ඤී හොති. 'යං ඵරති, තං වත්ථු චෙව ලොකො ච, යෙන ඵරති, සො අත්තා චෙව ලොකො චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'අන්තවා ලොකො'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

ඉධෙකච්චො පරිත්තං ඔකාසං පීතකතො ඵරති -පෙ- ලොහිතකතො ඵරති -පෙ- ඔදාතකතො ඵරති -පෙ- ඔභාසකතො ඵරති, තස්ස එවං හොති: 'අන්තවා අයං ලොකො පරිවටුමො'ති අන්තසඤ්ඤී හොති. 'යං ඵරති තං වත්ථු චෙව ලොකො ච, යෙන ඵරති, සො අත්තා චෙව ලොකො චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි. තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි -පෙ- 'අන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'අනන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: ඉධෙකච්චො විපුලං ඔකාසං නීලකතො ඵරති. තස්ස එවං හොති: 'අනන්තවා අයං ලොකො අපරියන්තො'ති අනන්තසඤ්ඤී හොති. 'යං ඵරති, තං වත්ථු චෙව ලොකො ච, යෙන ඵරති, සො අත්තා චෙව ලොකො චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි. දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'අනන්තවා ලොකො'ති අන්තග්ගාහිකා දිට්ඨි. අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

ඉධෙකච්චො විපුලං ඔකාසං පීතකතො ඵරති -පෙ- ලොහිතකතො ඵරති -පෙ- ඔදාතකතො ඵරති -පෙ- ඔභාසකතො ඵරති, තස්ස එවං හොති. 'අනන්තවා අයං ලොකො අපරියන්තො'ති අනන්තසඤ්ඤී හොති. 'යං ඵරති, තං වත්ථු චෙව ලොකො ච, යෙන ඵරති, සො අත්තා චෙව ලොකො චා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි -පෙ- 'අනන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'වේදනාව ලොක ද අශාශ්වත ද වේ' යයි ... සංඥාව ලොක ද අශාශ්වත ද වේ යයි ... සංස්කාරයෝ ලොක ද අශාශ්වත ද වෙත්' යයි ... විඥානය ලොක ද අශාශ්වත ද වේ' යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යෑ ... ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද්දු යි අන්තග්‍රාහික දෘෂ්ටි නාම. ... අන්තග්‍රාහික දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යෑ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. 'ලොකය අශාශ්වත යෑ, යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'ලොකය අන්ත ඇත්තේ යෑ' යි අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: මෙලොවැ ඇතැමෙක් අල්ප අවකාශ-යක් නීල වශයෙන් අරමුණු කෙරෙයි. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි: 'මෙලොවැ අන්තවත් යෑ පිරිසිඳීම් ඇත්තේ ය'යි. අන්තසංඥ ඇත්තේ වෙයි. යම් කසිණරූපයක් අරමුණු කෙරේ ද ඒ කසිණරූපය වස්තු (අරමුණ) ද ලොක ද වෙයි, යම් සිතෙකින් අරමුණු කෙරේ ද එ සිත ආත්ම ද ලොක ද වේ'යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යෑ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද මේ පළමුවනු වූ ''ලොකය අන්තවත් යෑ' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යෑ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

මෙ ලොවැ ඇතැමෙක් මඳ අවකාශයක් පීත වශයෙන් අරමුණු කෙරෙයි ...ලොහිතවශයෙන් අරමුණු කෙරෙයි...අවදාත වශයෙන් අරමුණු කෙරෙයි .. අවභාසවශයෙන් අරමුණු කෙරෙයි. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මෙලොවැ අන්තවත් යෑ පිරිසිඳීම් ඇත්තේ යෑ'යි අන්තසංඥ ඇත්තේ වෙයි. 'යම් කසිණරූපයක් අරමුණු කෙරේ ද, ඒ කසිණරූපය වස්තු ද ලොක ද වෙයි. යම් සිතෙකින් අරමුණු කෙරේ ද එ සිත ආත්ම ද ලොක ද වේ යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යෑ, ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද්දු යි අන්තග්‍රාහික දෘෂ්ටි නම, ... 'ලොකය අන්තවත් යෑ' යන අන්තග්‍රාහික දෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'ලොකය අන්ත නැත්තේ යෑ'යි අන්තග්‍රාහික දෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: මෙලොව අතැමෙක් මහත් අවකාශයක් නීල වශයෙන් අරමුණු කෙරෙයි. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. 'මෙලොව අන්ත නැත්තේ යෑ පරිච්ඡෙද නැත්තේ යෑ'යි අනන්තසංඥ ඇත්තේ වෙයි. යම් කසිණරූපයක් අරමුණ කෙරේ ද ඒ කසිණරූපය වස්තු ද ලොක ද වෙයි, යම් සිතෙකින් අරමුණු කෙරේ ද එ සිත ආත්ම ද ලොක ද වේ' යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යෑ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද්දා යි අන්තග්‍රාහික දෘෂ්ටි නාම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පළමුවනු වූ 'ලොකය අන්ත නැත්තේ යෑ' යන අන්ත-ග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහික දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යෑ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

මෙලොව ඇතැමෙක් මහත් අවකාශයක් පීත වශයෙන් අරමුණු කෙරෙයි ... ලොහිත වශයෙන් අරමුණු කෙරෙයි ... අවදාතවශයෙන් අරමුණු කෙරෙයි ... අවභාස වශයෙන් අරමුණු කෙරෙයි. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි. මෙලොව අන්තවත් නො වෙයි පරිච්ඡෙද නැත්තේ යෑ'යි අනන්තසංඥ ඇත්තේ වෙයි. 'යම් කසිණරූපයක් අරමුණු කෙරේ ද ඒ කසිණරූපය වස්තු ද ලොක ද වෙයි, යම් සිතෙකින් අරමුණ කෙරේ ද එ සිත ආත්මද ලොක ද වේ'යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යෑ, ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද්දු යි අන්තග්‍රාහික දෘෂ්ටි යෑ ... ලොකය අන්ත-නැත්තේ ය' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'තං ජීවං තං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: 'රූපං ජීවඤ්චෙව සරීරඤ්ච, යං ජීවං තං සරීරං, යං සරීරං තං ජීව'න්ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'තං ජීවං තං සරීර'න්ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'වෙදනා ජීවං[1] චෙව සරීරඤ්ච -පෙ- සඤ්ඤා ජීවං චෙව සරීරඤ්ච -පෙ- සඞ්ඛාරා ජීවං චෙව සරීරඤ්ච -පෙ- 'විඤ්ඤාණං ජීවඤ්චෙව සරීරඤ්ච, යං ජීවං තං සරීරං, යං සරීරං තං ජීව'න්ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි -පෙ- 'තං ජීවං තං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: 'රූපං සරීරං න ජීවං, ජීවං න සරීරං. අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි. දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති අන්තග්ගාහිකා දිට්ඨි අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

වෙදනා සරීරං න ජීවං -පෙ- සඤ්ඤා සරීරං න ජීවං -පෙ- සඞ්ඛාරා සරීරං න ජීවං -පෙ- විඤ්ඤාණං සරීරං න ජීවං, ජීවං න සරීරං. අඤ්ඤං ජීවං, අඤ්ඤං සරීර'න්ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි -පෙ- 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'හොති තථාගතො පරම්මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: 'රූපං ඉධෙව මරණධම්මං, තථාගතො කායස්ස භෙදා හොති'පි තිට්ඨතිපි උප්පජ්ජතිපි නිබ්බත්තතිපී'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'වෙදනා ඉධෙව මරණධම්මා -පෙ- සඤ්ඤා ඉධෙව මරණධම්මා -පෙ- සඞ්ඛාරා ඉධෙව මරණධම්මා -පෙ- විඤ්ඤාණං ඉධෙව මරණධම්මං, තථාගතො කායස්ස භෙදා හොතිපි තිට්ඨතිපි උප්පජ්ජතිපි නිබ්බත්තතිපී'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි -පෙ- 'හොති තථාගතො පරම්මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

---

1 ජීවා - ඉජසං, සතා

'හෙ මැ ජීව යැ හෙ මැ ශරීර යැ'යි අනන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස්-අයුරෙකින් අභිනිවෙශය වේ ද යත්: 'රූපය ජීව ද ශරීර ද වෙයි. යමෙක් ජීව ද හේ ශරීර යැ, යමෙක් ශරීර ද හේ ජීව යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පළමු වනු වූ 'හෙ මැ ජීව යැ හෙ මැ ශරීර යැ' යන අනන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අනන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

වෙදනාව ජීව ද ශරීර ද වෙයි, සංඥාව ජීව ද ශරීර ද වෙයි, සංස්කාරයෝ ජීව ද ශරීර ද වෙති, විඥානය ජීව ද ශරීර ද වෙයි. යමෙක් ජීව වේ ද, හේ ශරීර යැ, යමෙක් ශරීර වේ ද හේ ජීව යැ'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද නු යි අනන්තග්‍රාහිකදෘෂ්ටි නම ... 'හෙ මැ ජීව යැ හෙ මැ ශරීර යැ' යන අනන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවෙශය වේ.

'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකි' යන අනන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස්අයුරෙකින් අභිනිවෙශය වේ ද යත්: රූපය ශරීර යැ ජීව නො වෙයි, ජීවය ශරීර නො වෙයි, ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකි යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අනන්තග්‍රාහිකදෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකෙක වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද, මේ පළමුවනු වූ 'ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකි' යන අනන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අනන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'වෙදනාව ශරීර යැ ජීව නො වෙයි ... සංඥාව ශරීර යැ ජීව නො වෙයි ... සංස්කාරයෝ ශරීර යැ ජීව නො වෙයි ... විඥානය ශරීර යැ ජීව නො වෙයි. ජීවය ශරීර නො වෙයි. ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකි'යි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අනන්තග්‍රාහික දෘෂ්ටි නම ... ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකි' යන අනන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවෙශය වේ.

'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන වෙයි' යන අනන්තග්‍රාහික දෘෂ්ටියෙහි කවර පස්අයුරෙකින් අභිනිවෙශය වේ ද යත්: රූපය මෙලොව්හි මැ නැසෙන සැහැවි යැ, සත්ත්ව තෙම ශරීරභෙදයෙන් මත්තෙහි විද්‍යමාන වන්නේ ද (ශාශ්වත බැවින්) සිටුනේ ද, (අණ්ඩජ ජරායුජ විසින්) උපදනේ ද (සංස්වේදජ ඖපපාතික විසින්) සකන්ධ පහළ වන්නේ ද වේ'යයි අභි-නිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අනන්ත-ග්‍රාහිකදෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද මේ පළමුවනු වූ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන වෙයි' යන අනන්තග්‍රාහික දෘෂ්ටි වේ. අනන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'වෙදනාව මෙහි මැ නැසෙනසැහැවි යැ ... සංඥාව මෙහි මැ නැසෙන-සැහැවි යැ ... සංස්කාරයෝ මෙහි මැ නැසෙනසැහැවියහ ... විඥානය මෙහි මැ නැසෙනසැහැවි යැ. සත්ත්ව තෙම ශරීරභෙදයෙන් මත්තෙහි විද්‍යමාන වන්නේ ද සිටුනේ ද උපදනේ ද පහළවන්නේ ද වේ'යයි අභිනිවෙශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අනන්තග්‍රාහිකදෘෂ්ටි නම්. ... 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි වෙයි' යන අනන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවෙශය වේ.

'න හොති තථාගතො පරංමරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා, කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති. 'රූපං ඉධෙව මරණධම්මං, තථාගතොපි කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති තථාගතො පරංමරණා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'වෙදනා ඉධෙව මරණධම්මා -පෙ- සඤ්ඤා ඉධෙව මරණධම්මා -පෙ- සඞ්ඛාරා ඉධෙව මරණධම්මා -පෙ විඤ්ඤාණං ඉධෙව මරණධම්මං, තථාගතොපි කායස්සභෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති තථාගතො පරංමරණා'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි-පෙ- 'න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'හොති ච න ච හොති තථාගතො පරංමරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති: 'රූපං ඉධෙව මරණධම්මං, තථාගතො කායස්ස භෙදා හොති ච න ච හොතී'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'හොති ච න ච හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'වෙදනා ඉධෙව මරණධම්මා -පෙ- සඤ්ඤා ඉධෙව මරණධම්මා -පෙ- සඞ්ඛාරා ඉධෙව මරණධම්මා -පෙ- විඤ්ඤාණං ඉධෙව මරණධම්මං, තථාගතො කායස්ස භෙදා හොති ච න ච හොතී'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි -පෙ- 'හොති ච න ච හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

'නේව හොති න න හොති තථාගතො පරංමරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා කතමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති. 'රූපං ඉධෙව මරණධම්මං, තථාගතො කායස්ස භෙදා[1] පරං මරණා නෙව හොති න න හොතී'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අන්තො ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'නෙව හොති න න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකා දිට්ඨි. අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

---

1. කායස්සභෙදා පරං මරණා - මජසං.

'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: 'රූපය මෙහි මැ නැසෙනසැහැවි යැ සත්ත්ව තෙමේ ද ශරීරභෙදයෙන් මත්තෙහි සිඳෙයි වැනැසෙයි සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වේ' යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්තග්‍රාහිකදෘෂ්ටි නම්. දෘෂ්ටිය වස්තු නො වෙයි වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද මේ පළමු වනු වූ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වේ' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

වේදනාව මෙහි මැ නැසෙනසැහැවි යැ ... සංඥව මෙහි මැ නැසෙනසැහැවි යැ... සංස්කාරයෝ මෙහි මැ නැසෙනසැහැවියහ... විඥනය මෙහි මැ නැසෙනසැහැවි යැ. සත්ත්ව තෙමේ ද ශරීරභෙදයෙන් මත්තෙහි සිඳෙයි වැනැසෙයි සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වේ'යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්තග්‍රාහිකදෘෂ්ටි නම 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වේ' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'සත්ත්ව තෙම මරණින් මත්තෙහි වන්නේත් නො ද වන්නේත් වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වෙයි යත් රූපය මෙහි මැ නැසෙන සවභාව ඇත්තේ යැ, සත්ත්ව තෙමේ ශරීරභෙදයෙන් මත්තෙහි වන්නේත් නො ද වන්නේත් වේ'යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නා ලද නු යි අන්තග්‍රාහික දෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියක් හා යම් වස්තුවක් හා වේ ද මේ පළමුවනු වූ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි වන්නේත් නො ද වන්නේත් වේ' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ .. මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'වේදනාව මෙහි මැ නැසෙනපියවි ඇත්තේ යැ .. සංඥව මෙහි මැ නැසෙනපියවි ඇත්තේ යැ ... සංස්කාරයෝ මෙහි මැ නැසෙනපියවි ඇත්තාහ ... විඥනය මෙහි මැ නැසෙනපියවි ඇත්තේ යැ. සත්ත්ව තෙම ශරීර භෙදයෙන් මත්තෙහි වන්නේත් නො ද වන්නේත් වේ'යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්තග්‍රාහිකදෘෂ්ටි නම් ... 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි වන්නේත් නො ද වන්නේත් වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි කවර පස් අයුරෙකින් අභිනිවේශය වේ ද යත්: රූපය මෙහි මැ නැසෙනපියවි ඇත්තේ යැ, සත්ත්ව තෙම කාබුන්මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වේ' යයි අභිනිවේශපරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්තග්‍රාහික දෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි, දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ පළමුවනු වූ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

'වෙදනා ඉධෙව මරණධම්මා -පෙ- සඤ්ඤා ඉධෙව මරණධම්මා -පෙ- සඞ්ඛාරා ඉධෙව මරණධම්මා -පෙ- විඤ්ඤාණා ඉධෙව මරණධම්මං, තථාගතො කායස්ස භෙදා නෙව හොති න න හොතී'ති අභිනිවෙසපරාමාසො දිට්ඨි, තාය දිට්ඨියා සො අත්තා ගහිතො'ති අන්තග්ගාහිකා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඤ්චමී 'නෙව හොති න න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකා දිට්ඨි, අන්තග්ගාහිකා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො. 'නෙව හොති න න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්චහාකාරෙහි අභිනිවෙසො හොති.

අන්තග්ගාහිකාය දිට්ඨියා ඉමෙහි පඤ්ඤාසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 - 8. පුබ්බන්තානුදිට්ඨි

පුබ්බන්තානුදිට්ඨියා කතමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති:

චත්තාරො සස්සතවාදා, චත්තාරො එකච්චසස්සතිකා, චත්තාරො අන්තානන්තිකා, චත්තාරො අමරාවික්ඛෙපිකා, ද්වෙ අධිච්චසමුප්පන්නිකා.

පුබ්බන්තානුදිට්ඨියා ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 - 9. අපරන්තානුදිට්ඨි

අපරන්තානුදිට්ඨියා කතමෙහි චතුචත්තාලීසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

සොළස සඤ්ඤීවාදා, අට්ඨ අසඤ්ඤීවාදා, අට්ඨ නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා, සත්ත උච්ඡෙදවාදා, පඤ්ච දිට්ඨධම්මනිබ්බානවාදා.

අපරන්තානුදිට්ඨියා ඉමෙහි චතුචත්තාලීසාය ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 - 10. සඤ්ඤොජනිකා දිට්ඨි

සඤ්ඤොජනිකාය දිට්ඨියා කතමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති:

යා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං -පෙ- දිට්ඨාභිනිවෙසො දිට්ඨිපරාමාසො.

සඤ්ඤොජනිකාය දිට්ඨියා ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති,

'වේදනාව මෙහි මැ නැසෙනපියවි ඇත්තේ යැ ... සංඥාව මෙහි මැ නැසෙනපියවි ඇත්තේ යැ ... සංස්කාරයෝ මෙහි මැ නැසෙන පියවි ඇත්තාහ. ... විඥානය මෙහි මැ නැසෙනපියවි ඇත්තේ යැ, සත්ත්ව තෙම කාබුන්මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වෙයි' යන අභිනිවේශ පරාමර්ශය දෘෂ්ටි යැ. ඒ දෘෂ්ටි විසින් ඒ අන්තය ගන්නාලද නු යි අන්තග්‍රාහික දෘෂ්ටි නම. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද මේ පස්වනු වූ 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටි වේ. අන්තග්‍රාහිකදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි. 'සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වෙයි' යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පස් අයුරින් අභිනිවේශය වේ.

අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි මේ පනස් අයුරින් අභිනිවේශය වේ.

## 2 – 8. පූර්වාන්තානුදෘෂ්ටිය

පූර්වාන්තානුදෘෂ්ටියෙහි කවර අටළොස් අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

චතුර්විධ ශාශ්වතවාද යැ චතුර්විධ එකත්‍යශාශ්වතවාද යැ චතුර්විධ අන්තානන්තිකවාද යැ චතුර්විධ අමරාවික්ෂේපිකවාද යැ ද්විවිධ අධීත්‍ය-සමුත්පන්නිකවාද යි.

පූර්වාන්තානුදෘෂ්ටියෙහි මේ අටළොස් අයුරින් අභිනිවේශය වේ.

## 2 – 9. අපරාන්තානුදෘෂ්ටිය

අපරාන්තානුදෘෂ්ටියෙහි කවර සියුසාලිස්අයුරින් අභිනිවේශය වෙයි යත්:

ෂොඩශප්‍රකාර සංඥීවාද යැ අෂ්ටප්‍රකාර අසංඥීවාද යැ අෂ්ටප්‍රකාර නෛවසංඥීනාසංඥීවාද යැ සප්තප්‍රකාර උච්ඡේදවාද යැ පඤ්චප්‍රකාර දෘෂ්ටධර්මනිර්වාණවාද යි.

අපරාන්තානුදෘෂ්ටියෙහි මේ සියුසාලිස්අයුරින් අභිනිවේශය වේ.

## 2 - 10. සංයෝජනිකදෘෂ්ටි

සංයෝජනිකදෘෂ්ටියෙහි කවර අටළොස්අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් ... දෘෂ්ට්‍යභිනිවේශ-යෙක් දෘෂ්ටිපරාමර්ශයෙක් වේ ද,

සංයෝජනිකදෘෂ්ටියෙහි මේ අටළොස්අයුරින් අභිනිවේශය වේ.

## 2 - 11. අහන්තිමානවිනිබන්ධා දිට්ඨි

'අහ'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා කතමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති:

'චක්ඛුං අහ'න්ති අභිනිවෙසපරාමාසො 'අහන්ති මානවිනිබන්ධා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'අහ'න්ති මානවිනිබන්ධා දිට්ඨි, මානවිනිබන්ධා දිට්ඨි මිච්ඡා-දිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'සොතං අහ'න්ති -පෙ- 'ඝානං අහ'න්ති -පෙ- 'ජිව්හා අහ'න්ති -පෙ- 'කායො අහ'න්ති -පෙ- 'මනො අහ'න්ති -පෙ- 'රූපා අහ'න්ති -පෙ- 'ධම්මා අහ'න්ති -පෙ- 'චක්ඛුවිඤ්ඤාණං අහ'න්ති -පෙ- 'මනොවිඤ්ඤාණං අහං'න්ති අභිනිවෙසපරාමාසො 'අහ'න්ති මානවිනිබන්ධා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං අට්ඨාරසමී 'අහ'න්ති මානවිනිබන්ධා දිට්ඨි, මාන විනිබන්ධා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'අහ'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති

## 2 - 12. මමන්තිමානවිනිබන්ධා දිට්ඨි

'මම'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා කතමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති:

'චක්ඛුං මම'න්ති අභිනිවෙසපරාමාසො, 'මම'න්ති මානවිනිබන්ධා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං පඨමා 'මම'න්ති මානවිනිබන්ධා දිට්ඨි, මානවිනිබන්ධා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'සොතං මම'න්ති -පෙ- 'ඝානං මම'න්ති -පෙ- 'ජිව්හා මම'න්ති -පෙ- 'කායො මම'න්ති -පෙ- 'මනො මම'න්ති -පෙ- 'රූපා මම'න්ති -පෙ- 'ධම්මා මම'න්ති -පෙ- 'චක්ඛුවිඤ්ඤාණං මම'න්ති -පෙ- 'මනොවිඤ්ඤාණං මම'න්ති 'අභිනිවෙසපරාමාසො මම'න්ති මානවිනිබන්ධා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි. අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං අට්ඨාරසමී 'මම'න්ති මානවිනිබන්ධා දිට්ඨි, මානවිනිබන්ධා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

''මම'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා ඉමෙහි අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 – 11 අහන්තිමානවිනිබන්ධදෘෂ්ටිය

'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි කවර අටලොස්අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

'ඇස මම වෙමි' අභිනිවේශපරාමර්ශය 'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ පළමුවනු වූ 'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ. මානයෙන් බැඳුණු දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි.

'කන මම වෙමි' ... 'නැහැය මම වෙමි' ... 'දිව මම වෙමි' ... 'කය මම වෙමි' ... 'මනස මම වෙමි' ... 'රූපයෝ මම වෙමි' ... 'ධර්මයෝ මම වෙමි' ... 'චක්ෂුර්විඥානය මම වෙමි' ... 'මනොවිඥානය මම වෙමි' අභිනිවේශපරාමර්ශය 'මම'යි මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේද, මේ අටලොස්වනු වූ 'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටි වේ. මානයෙන් බැඳුණු දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි.

'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි මේ අටලොස්අයුරින් අභිනිවේශය වේ.

## 2 – 12. මමන්තිමානවිනිබන්ධදෘෂ්ටිය

'මාගේ යැ'යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි කවර අටලොස්අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

'ඇස මාගේ යැ'යි අභිනිවේශපරාමර්ශය 'මාගේ යැ'යි මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ පළමුවනු වූ 'මාගේ යැ'යි මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ. මානයෙන් බැඳුණු දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි.

'කන මාගේ යැ' යි ... 'නැහැය මාගේ යැ' යි ... 'දිව මාගේ යැ'යි ... 'කය මාගේ යැ'යි ... 'මනස මාගේ යැ'යි ... 'රූපයෝ මාගේ යැ'යි ... 'ධර්මයෝ මාගේ යැ'යි ... 'චක්ෂුර්විඥානය මාගේ යැ' යි ... 'මනොවිඥානය මාගේ යැ'යි අභිනිවේශපරාමර්ශය 'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටි යැ දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි; දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ අටලොස්වනු වූ 'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටි වේ. මානයෙන් බැඳුණු දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයෝජනයෝ යි.

'මම' යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි මේ අටලොස්අයුරින් අභිනිවේශය වේ.

## 2 – 13. අත්තවාදපටිසංයුත්තා දිට්ඨි.

අත්තවාදපටිසංයුත්තාය දිට්ඨියා කතමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති:

ඉධ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං -පෙ- වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං අත්තනිවා විඤ්ඤාණං විඤ්ඤාණස්මිං වා අත්තානං -පෙ-

කථං රූපං අත්තතො සමනුපස්සති:

ඉධෙකච්චො පඨවීකසිණං -පෙ- ඔදාතකසිණං අත්තතො සමනුපස්සති, 'යං ඔදාතකසිණං සො අහං, යො අහං තං ඔදාතකසිණ'න්ති ඔදාතකසිණඤ්ච අත්තඤ්ච අද්වයං සමනුපස්සති. සෙය්‍යථාපි 'තෙලප්පදීපස්ස ඣායතො යා අච්චි, සො වණ්ණො, යො වණ්ණො, සා අච්චී'ති අච්චිඤ්ච වණ්ණඤ්ච අද්වයං සමනුපස්සති. එවමෙව ඉධෙකච්චො ඔදාතකසිණං අත්තතො සමනුපස්සති-පෙ-අයං පඨමා රූපවත්ථුකා අත්තවාදපටිසංයුත්තා දිට්ඨි අත්තවාදපටිසංයුත්තා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො, එවං රූපං අත්තතො සමනුපස්සති -පෙ-

අත්තවාදපටිසංයුත්තාය දිට්ඨියා ඉමෙහි වීසතියා ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 – 14. ලොකවාදපටිසංයුත්තා දිට්ඨි

ලොකවාදපටිසංයුත්තාය දිට්ඨියා කතමෙහි අට්ඨහි ආකාරෙහි අභිනිවෙසො හොති.

'සස්සතො අත්තා ච ලොකො චා'ති අභිනිවෙසපරාමාසො ලොකවාදපටිසංයුත්තා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු, යා ච දිට්ඨි, යඤ්ච වත්ථු, අයං පඨමා ලොකවාදපටිසංයුත්තා දිට්ඨි. ලොකවාදපටිසංයුත්තා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

'අසස්සතො අත්තා ච ලොකො චා'ති -පෙ- 'සස්සතො ච අසස්සතො ච අත්තා ච ලොකො චා'ති -පෙ- 'නෙව සස්සතො නාසස්සතො අත්තා ච ලොකො චා'ති -පෙ- 'අන්තවා අත්තා ච ලොකො චා'ති -පෙ- 'අනන්තවා අත්තා ච ලොකො චා'ති -පෙ- 'අන්තවා ච අනන්තවා ච අත්තා ච ලොකො චා'ති -පෙ- 'නෙව අන්තවා න අනන්තවා අත්තා ච ලොකො චා'ති අභිනිවෙසපරාමාසො ලොකවාදපටිසංයුත්තා දිට්ඨි, දිට්ඨි න වත්ථු, වත්ථු න දිට්ඨි, අඤ්ඤා දිට්ඨි, අඤ්ඤං වත්ථු. යා ච දිට්ඨි යඤ්ච වත්ථු, අයං අට්ඨමී ලොකවාදපටිසංයුත්තා දිට්ඨි, ලොකවාදපටිසංයුත්තා දිට්ඨි මිච්ඡාදිට්ඨි -පෙ- ඉමානි සඤ්ඤොජනානි න ච දිට්ඨියො.

ලොකවාද පටිසංයුත්තාය දිට්ඨියා ඉමෙහි අට්ඨහි ආකාරෙහි අභිනිවෙසො හොති.

## 2 – 13. ආත්මවාදප්‍රතිසංයුක්තදෘෂ්ටිය

ආත්මවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි කවර විසි අයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

මෙලොව (බුද්ධාදි) ආර්‍ය්‍යයන් නො දක්නාසුලු ආර්‍ය්‍යධර්මයෙහි අදක්‍ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත වූ සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි අදක්‍ෂ වූ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූ අශ්‍රුතවත් පෘථග්ජන තෙම රූපය ආත්මවශයෙන් දකී. ආත්මය රූපවත් කොට හෝ රූපය ආත්මයෙහි ලා හෝ ආත්මය රූපයෙහි ලා හෝ ... වේදනාව ... සංඥාව ... සංස්කාරයන් විඥානය ආත්මවශයෙන් දකී. ආත්මය රූපවත් කොට හෝ විඥානය ආත්මයෙහි ලා හෝ ආත්මය විඥානයෙහි ලා හෝ ...

කිසෙයින් රූපය ආත්මවශයෙන් දක්නේ ද යත්:

මෙලොව ඇතැමෙක් පඨවිකසිණය ... ඔදාතකසිණය ආත්මවශයෙන් දකී. "යමෙක් ඔදාතකසිණ වේ ද, හේ මම වෙමි. යමෙක් මම වේ ද හේ ඔදාතකසිණ වේ" යයි ඔදාතකසිණයත් තමාත් එකක් මැ කොට දකී. යම්සේ දල්වෙන තෙල්පහනක්හුගේ යම් සිළුවක් වේ ද හේ වර්ණ වෙයි, යමෙක් වර්ණ වේ ද හෝ සිළුව වේ" යයි සිළුවත් වර්ණයත් එකක් මැ කොට දක්නේ ද, එපරිද්දෙන් මැ මෙලොව ඇතැමෙක් ඔදාතකසිණය ආත්මවශයෙන් දකී ... මේ පළමුවනු වූ රූපවස්තුකආත්මවාදප්‍රතිසංයුක්තදෘෂ්ටි වේ. ආත්මවාදප්‍රතිසංයුක්තදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ .. මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි. මෙසෙයින් රූපය ආත්මවශයෙන් දකී ...

ආත්මවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි මේ විසිඅයුරින් අභිනිවේශය වේ.

## 2 – 14. ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටිය

ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි කවර අටඅයුරෙකින් අභිනිවේශය වෙයි යත්:

"ආත්මයත් ලොකයත් ශාශ්වත යැ'යි අභිනිවේශපරාමර්ශය ලොකවාද-ප්‍රතිසංයුක්තදෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද, මේ පළමුවනු වූ ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටි වේ. ලොකවාදප්‍රතිසං-යුක්තදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

"ආත්මයත් ලොකයත් අශාශ්වත යැ"යි ... "ආත්මයත් ලොකයත් ශාශ්වත ද අශාශ්වත ද වේ" යයි ... "ආත්මයත් ලොකයත් නො මැ ශාශ්වත වූයේ අශාශ්වත නො වේ" යයි ... "ආත්මයත් ලොකයත් අන්ත ඇත්තේ යැ" යි ... "ආත්මයත් ලොකයත් අන්ත නැත්තේ යැ" යි ... "ආත්මයත් ලොකයත් අන්ත ඇත්තේ ද අන්ත නැත්තේ ද වේ" යයි ... ආත්මයත් ලොකයත් නො මැ අන්ත ඇත්තේ අන්ත නැත්තේ නො වේ" යයි අභිනිවේශපරාමර්ශය ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටි යැ. දෘෂ්ටිය වස්තු නො වෙයි, වස්තුව දෘෂ්ටි නො වෙයි. දෘෂ්ටිය අනෙකක, වස්තුව අනෙකෙකි. යම් දෘෂ්ටියකුත් යම් වස්තුවකුත් වේ ද මේ අටවනු වූ ලොකවාදප්‍රතිසංයුක්ත දෘෂ්ටි වේ. ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටි යැ ... මොහු දෘෂ්ටි නො වූ සංයොජනයෝ යි.

ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි මේ අටඅයුරින් අභිනිවේශය වේ.

## 2 – 15, 16. භවදිට්ඨි – විභවදිට්ඨියො.

ඔලීයනාභිනිවෙසො[1] භවදිට්ඨි, අතිධාවනාභිනිවෙසො විභවදිට්ඨි, අස්සාදදිට්ඨියා පඤ්චතිංසාය ආකාරෙහි අභිනිවෙසො කති භවදිට්ඨියො, කති විභවදිට්ඨියො: අත්තානුදිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො කති භවදිට්ඨියො, කති විභවදිට්ඨියො -පෙ- ලොකවාදපටිසංයුත්තාය දිට්ඨියා අට්ඨහි ආකාරෙහි අභිනිවෙසො කති භවදිට්ඨියො, කති විභවදිට්ඨියො:

අස්සාදදිට්ඨියා පඤ්චතිංසාය ආකාරෙහි අභිනිවෙසො සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. අත්තානුදිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො පන්නරස භවදිට්ඨියො, පඤ්ච විභවදිට්ඨියො, මිච්ඡාදිට්ඨියා දසහි අකාරෙහි අභිනිවෙසො සබ්බාව තා විභවදිට්ඨියො. සක්කායදිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො පන්නරස භවදිට්ඨියො, පඤ්ච විභවදිට්ඨියො. සක්කායවත්ථුකාය සස්සතදිට්ඨියා පන්නරසහි ආකාරෙහි අභිනිවෙසො සබ්බාව තා භවදිට්ඨියො. සක්කායවත්ථුකාය උච්ඡෙදදිට්ඨියා, පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා විභවදිට්ඨියො.

සස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා භවදිට්ඨියො. 'අසස්සතො ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා විභවදිට්ඨියො. 'අන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. 'අනන්තවා ලොකො'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො. සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. තං ජීවං තං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා විභවදිට්ඨියො. 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර'න්ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා භවදිට්ඨියො. 'හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා භවදිට්ඨියො. 'න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො සබ්බාව තා විභවදිට්ඨියො. 'හොති ච න ච හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. 'නෙව හොති න න හොති තථාගතො පරං මරණා'ති අන්තග්ගාහිකාය දිට්ඨියා පඤ්චහාකාරෙහි අභිනිවෙසො, සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො.

පුබ්බන්තානුදිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො, සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. අපරන්තානුදිට්ඨියා චතුචත්තාලීසාය ආකාරෙහි අභිනිවෙසො, සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. සඤ්ඤොජනිකාය දිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො, සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො. 'අහ'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො, සබ්බාව තා විභවදිට්ඨියො. 'මම'න්ති මානවිනිබන්ධාය දිට්ඨියා අට්ඨාරසහි ආකාරෙහි අභිනිවෙසො. සබ්බාව තා භවදිට්ඨියො. අත්තවාදපටිසංයුත්තාය දිට්ඨියා වීසතියා ආකාරෙහි අභිනිවෙසො, පන්නරස භව දිට්ඨියො, පඤ්ච විභවදිට්ඨියො. ලොකවාදපටිසංයුත්තාය දිට්ඨියා අට්ඨහි ආකාරෙහි අභිනිවෙසො සියා භවදිට්ඨියො, සියා විභවදිට්ඨියො.

1. ඔලියනාභිනිවෙසො - සභා.

## 2 - 15, 16. භව - විභවදෘෂ්ටි

(ශාශ්වතසංඥා හෙයින් නිර්වාණයෙහි සිත) හැකිළීමෙහි අභිනිවේශය භවදෘෂ්ටි නම. (උච්ඡේදසංඥා හෙයින් නිරොධගාමිනීප්‍රතිපදායෙහි) අතිධාවනයෙහි අභිනිවේශය විභවදෘෂ්ටි නම්. ආස්වාදදෘෂ්ටියෙහි පන්තිස් අයුරෙකින් අභිනිවේශය වෙයි. (එහි) භවදෘෂ්ටීහු කෙතෙක් ද, විභවදෘෂ්ටීහු කෙතෙක් ද, ආත්මානුදෘෂ්ටියෙහි විසිඅයුරෙකින් අභිනිවේශය වෙයි. (එහි) භවදෘෂ්ටීහු කෙතෙක් ද, විභවදෘෂ්ටීහු කෙතෙක් ද, ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි අටඅයුරෙකින් අභිනිවේශය වෙයි. (එහි) භවදෘෂ්ටීහු කෙතෙක් ද, විභව දෘෂ්ටීහු කෙතෙක් ද යත්:

ආස්වාදදෘෂ්ටියෙහි පන්තිස්අයුරින් අභිනිවේශය භවදෘෂ්ටීහු ද වන්නාහ. විභවදෘෂ්ටීහු ද වන්නාහ. ආත්මානුදෘෂ්ටියෙහි විසිඅයුරෙකින් අභිනිවේශය වෙයි. (එහි) භවදෘෂ්ටි පසළොසෙක, විභවදෘෂ්ටි පසෙකි. මිථ්‍යාදෘෂ්ටියෙහි දසඅයුරෙකින් අභිනිවේශය වෙයි. එ හැම විභවදෘෂ්ටීහු වෙති. සත්කායදෘෂ්ටියෙහි විසිඅයුරෙකින් අභිනිවේශය වෙයි. (එහි) භවදෘෂ්ටි පසළොසෙක, විභවදෘෂ්ටි පසෙකි. සත්කායවස්තුකශාශ්වතදෘෂ්ටියෙහි පසළොස්අයුරෙකින් අභිනිවේශය වෙයි. එ හැම භවදෘෂ්ටි වෙයි. සත්කායවස්තුකඋච්ඡේදදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි. එහැම විභවදෘෂ්ටීහු වෙති.

"ලොකය ශාශ්වත යැ" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි. එහැම භවදෘෂ්ටීහු යැ "ලොකය අශාශ්වත යැ" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි. එහැම විභව දෘෂ්ටීහු යැ. "ලොකය අන්ත ඇත්තේ යැ" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරින් අභිනිවේශය භවදෘෂ්ටීහු ද වන්නාහ. විභවදෘෂ්ටීහු ද වන්නාහ. 'ලොකය අන්ත නැත්තේ යැ" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරින් අභිනිවේශය භවදෘෂ්ටීහු ද වන්නාහ. විභවදෘෂ්ටීහු ද වන්නාහ. "හෙ මැ ජීව යැ හෙ මැ ශරීර යැ" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි. එහැම විභවදෘෂ්ටීහු යැ. "ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකි" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි, එහැම භවදෘෂ්ටීහු යැ. "සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන වෙයි" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි. එ හැම භවදෘෂ්ටීහු යැ. "සත්ත්ව තෙම මරණින් මත්තෙහි විද්‍යමාන නො වෙයි" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරෙකින් අභිනිවේශය වෙයි, එහැම විභවදෘෂ්ටීහු යැ. "සත්ත්ව තෙම මරණින් මත්තෙහි වන්නේත් නො වන්නේත් වෙයි" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස් අයුරින් අභිනිවේශය භවදෘෂ්ටීහු ද වන්නාහ. විභවදෘෂ්ටීහු ද වන්නාහ. "සත්ත්ව තෙම මරණින් මත්තෙහි නො මැ වෙයි නො ද නො වෙයි" යන අන්තග්‍රාහිකදෘෂ්ටියෙහි පස්අයුරින් අභිනිවේශය භවදෘෂ්ටීහු ද වන්නාහ. විභවදෘෂ්ටීහු ද වන්නාහු යැ.

පූර්වාන්තානුදෘෂ්ටියෙහි අටළොස් අයුරින් අභිනිවේශය භවදෘෂ්ටිහු ද වන්නාහ. විභවදෘෂ්ටිහු ද, වන්නාහ. අපරාන්තානුදෘෂ්ටියෙහි සිව්සාලිස්-අයුරින් අභිනිවේශය භවදෘෂ්ටිහු ද වන්නාහ. විභවදෘෂ්ටිහු ද වන්නාහ. සංයොජනිකදෘෂ්ටියෙහි අටළොස් අයුරින් අභිනිවේශය භවදෘෂ්ටිහු ද වන්නාහ. විභවදෘෂ්ටිහු ද වන්නාහ. "මම"යි මානයෙන් බැඳුණු දෘෂ්ටි-යෙහි අටළොස් අයුරින් අභිනිවේශය වෙයි. එ හැම විභවදෘෂ්ටිහු යැ, "මාගේ යැ"යි මානයෙන් බැඳුණු දෘෂ්ටියෙහි අටළොස් අයුරෙකින් අභිනිවේශය වෙයි. එහැම භවදෘෂ්ටිහු යැ ආත්මවාද ප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි විසිඅයුරෙකින් අභිනිවේශය වෙයි. (එහි) භවදෘෂ්ටි පසළොසෙක, විභවදෘෂ්ටි පසෙකි. ලොකවාදප්‍රතිසංයුක්තදෘෂ්ටියෙහි අටඅයුරින් අභිනිවේශය භවදෘෂ්ටි-හු ද වන්නාහ. විභවදෘෂ්ටීහු ද වන්නාහු ය.

සබ්බාව තා දිට්ඨියො අස්සාදදිට්ඨියො. සබ්බාව තා දිට්ඨියො අත්තානුදිට්ඨියො. සබ්බාව තා දිට්ඨියො මිච්ඡාදිට්ඨියො. සබ්බාව තා දිට්ඨියො සක්කායදිට්ඨියො. සබ්බාව තා දිට්ඨියො අන්තග්ගාහිකා දිට්ඨියො. සබ්බාව තා දිට්ඨියො සඤ්ඤොජනිකා දිට්ඨියො. සබ්බාව තා දිට්ඨියො අත්තවාදපටිසංයුත්තා දිට්ඨියො.

"භවඤ්ච දිට්ඨිං විභවඤ්ච දිට්ඨිං[1]
එතං ද්වයං තක්කිකා නිස්සිතා සෙ[2]
තෙසං නිරොධම්හි න හත්ථි[3] ඤාණං
යත්ථායං ලොකො විපරීතසඤ්ඤී"ති.

"ද්වීහි භික්ඛවෙ දිට්ඨිගතෙහි පරියුට්ඨිතා දෙවමනුස්සා ඔලීයන්ති[4] එකෙ, අතිධාවන්ති එකෙ, චක්ඛුමන්තො ච පස්සන්ති.

කථඤ්ච භික්ඛවෙ, ඔලීයන්ති එකෙ: භවාරාමා භික්ඛවෙ, දෙවමනුස්සා භවරතා භවසම්මුදිතා, තෙසං භවනිරොධාය ධම්මෙ දෙසියමානෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති[5] න සන්තිට්ඨති නාධිමුච්චති. එවං ඛො භික්ඛවෙ ඔලීයන්ති එකෙ.

කථඤ්ච භික්ඛවෙ, අතිධාවන්ති එකෙ: භවෙනෙව[6] ඛො පනෙකෙ අට්ටීයමානා.[7] හරායමානා ජිගුච්ඡමානා විභවං අභිනන්දන්ති: 'යතො කිර භො අයං අත්තා කායස්ස භෙදා[8] උච්ඡිජ්ජති විනස්සති න හොති පරං මරණා, එතං සන්තං එතං පණීතං එතං යාථාවන්ති[9] එවං ඛො භික්ඛවෙ අතිධාවන්ති එකෙ.

කථඤ්ච භික්ඛවෙ චක්ඛුමන්තො ච පස්සන්ති: ඉධ භික්ඛවෙ භික්ඛු භූතං භූතතො පස්සති, භූතං භූතතො දිස්වා භූතස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. එවං ඛො භික්ඛවෙ චක්ඛුමන්තො ච පස්සන්ති.

'යො භූතං භූතතො දිස්වා භූතස්ස ච අතික්කමං,
යථාභූතෙ'ධිමුච්චති භවතණ්හා පරික්ඛයා' (1)

ස වෙ[10] භූත පරිඤ්ඤාතො[11] වීතතණ්හො භවාභවෙ
භූතස්ස විභවා භික්ඛු නාගච්ඡති පුනබ්භව"න්ති (2)

තයො පුග්ගලා විපන්නදිට්ඨී, තයො පුග්ගලා සම්පන්නදිට්ඨී.

කතමෙ තයො පුග්ගලා විපන්නදිට්ඨී. තිත්ථියො ච තිත්ථියසාවකො ච යො ච මිච්ඡාදිට්ඨිකො. ඉමෙ තයො පුග්ගලා විපන්නදිට්ඨී.

කතමෙ තයො පුග්ගලා සම්පන්නදිට්ඨී. තථාගතො ච තථාගතසාවකො ච යො ච සම්මාදිට්ඨිකො, ඉමෙ තයො පුග්ගලා සම්පන්නදිට්ඨී.

---

1 භවදිට්ඨියො විභවදිට්ඨියො - ස්‍යා PTS 2 නිස්සිතා යෙ - ස්‍යා PTS
3 නත්ථි - ස්‍යා PTS 4 ඔලියන්ති - ස්‍යා PTS
5 න පසීදති - මජසං PTS න සම්පසීදති - ස්‍යා
6 භවෙන - ස්‍යා 7 අට්ටියමානා - ස්‍යා PTS 8 භෙදා පරං මරණා - මජසං
9 යථාවන්ති - ස්‍යා - PTS
10 සවෙ - ස්‍යා 11 භූතස්ස පරිඤ්ඤා - PTS භූතස්ස පරිඤ්ඤාතො සො - ස්‍යා

එහැම දෘෂ්ටිහු ආස්වාද දෘෂ්ටි වෙති. එහැම දෘෂ්ටිහු ආත්මානුදෘෂ්ටි වෙති. එහැම දෘෂ්ටිහු මිථ්‍යාදෘෂ්ටි වෙති. එ හැම දෘෂ්ටිහු සත්කායදෘෂ්ටි වෙති. එහැම දෘෂ්ටිහු අන්තග්‍රාහිකදෘෂ්ටි වෙති. එහැම දෘෂ්ටිහු සංයෝජනිකා දෘෂ්ටි වෙති. එහැම දෘෂ්ටිහු ආත්මවාදප්‍රතිසංයුක්ත දෘෂ්ටි වෙත්.

"තාර්කිකයෝ තුමූ භවදෘෂ්ටිය ද, විභවදෘෂ්ටිය ද යන මෙ දෙක ඇසුරු කළාහු වෙති. යම් කරුණෙකින් මේ ලෝවැසි තෙම යම් නිරොධ-සුඛයෙක්හි විපරීතසංඥා ඇත්තේ ද, ඔවුනට ඒ නිරෝධයෙහි ඥානයෙක් නැද්ද එහෙයිනි."

"මහණෙනි, ද්විවිධ දෘෂ්ටිගතයන් විසින් සමුදාචාරයට පත් දෙව්මිනිස්සු ඇතැම් කෙනෙක් ඔලීයන (ශාශ්වත සංඥා හෙයින් නිර්වාණයෙන් හැකිළීම) කෙරෙති. ඇතැම් කෙනෙක් (උච්ඡේද හෙයින් නිරොධගාමිනීප්‍රතිපදායෙහි) අතිධාවන කෙරෙත්. නුවණැස් ඇත්තාහු මැ දකිත්.

මහණෙනි, කිසෙයින් ඇතැම් කෙනෙක් ඔලීයන කෙරෙති යත් මහණෙනි, දෙව්මිනිස්සු භවය අභිරමණස්ථානය කොට ඇත්තාහු යැ. භවයෙහි ඇලුණාහු යැ, භවයෙන් සතුටු වූවාහු යැ. භවනිරොධය පිණිස දහම් දෙසනු ලබන කල්හි ඔවුන්ගේ සිත (ධර්මදෙශනාවට හෝ භව-නිරොධයට) නො පිවිසෙයි. නො පහදී. නො පිහිටයි. අධිමුක්ත නො වේ. මහණෙනි, මෙසෙයින් ඇතැම් කෙනෙක් ඔලීයන කෙරෙත්.

මහණෙනි, කිසෙයින් ඇතැම් කෙනෙක් අතිධාවන කෙරෙති. යත්: තවද ඇතැම් කෙනෙක් භවයෙන් මැ පෙළෙනු ලබන්නාහු ලජ්ජාවට පැමිණෙන්නාහු ජුගුප්සාවට පැමිණෙන්නාහු උච්ඡේදයට සතුටු වෙත්. භවත්නි, යම් තැනෙක පටන් මේ ආත්මය කාබුන් මරණින් මත්තෙහි සිඳේ ද වැනසේ ද මරණින් මත්තෙහි විද්‍යමාන නො වේ ද, තෙල (සිඳීම) ශාන්ත යැ තෙල ප්‍රණීත යැ තෙල යථාස්වභාවය ලැ'යි. මහණෙනි, මෙසෙයින් ඇතැම් කෙනෙක් අතිධාවන කෙරෙත්.

මහණෙනි, කිසෙයින් ඇස් ඇත්තාහු මැ දකිති යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙම භූතය (හෙතුයෙන් උපන් සකන්ධපඤ්චක සඞ්ඛ්‍යාත දුඃඛය) භූත (දුඃඛ) වශයෙන්, දකී. භූතය භූතවශයෙන් දැක භූතයාගේ නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ. මහණෙනි, මෙසෙයින් ඇස් ඇත්තාහු මැ දකිත්.

"යමෙක් භූතය භූතවශයෙන් දැක භූතයාගේ ඉක්මවීම (නිරොධය) ද දැක භවතෘෂ්ණාවගේ ක්‍ෂය කිරීමෙන් යථාස්වභාව වූ නිරොධයෙහි අධිමුක්ත වේ ද, (1)

ඒ අර්හත් තෙමේ එකාන්තයෙන් භූත සඞ්ඛ්‍යාත දුඃඛය පිරිසිඳ දත්තේ කුදුමහත් භවයෙහි පහවූ තෘෂ්ණා ඇත්තේ භූත සඞ්ඛ්‍යාත වත්ත දුඃඛයාගේ සිඳීමෙන් පුනර්භවයට නො පැමිණේ"යයි. (2)

පුද්ගලයෝ තිදෙනෙක් විරූපභාවයට ගිය දෘෂ්ටි ඇත්තාහු යැ. පුද්ගලයෝ තිදෙනෙක් සුන්දරභාවයට ගිය දෘෂ්ටි ඇත්තාහු යැ.

කවර පුද්ගලයෝ තිදෙනෙක් විරූපභාවයට ගිය දෘෂ්ටි ඇත්තාහු ද යත්: තීර්ථක යැ තීර්ථකශ්‍රාවක යැ යමෙකුත් මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ නම් හේ යැ. මොහු විරූපභාවයට ගිය දෘෂ්ටි ඇති තුන් පුහුලෝ යි.

කවර පුද්ගලයෝ තිදෙනෙක් සුන්දරභාවයට ගිය දෘෂ්ටි ඇත්තාහු ද යත්: තථාගත යැ තථාගතශ්‍රාවක යැ යමෙකුත් සම්‍යග්දෘෂ්ටි ඇත්තේ නම් හේ යැ. මොහු සුන්දරභාවයට ගිය දෘෂ්ටි ඇති තුන් පුහුලෝ යි.

‘කොධනො උපනාහී ච පාපමක්ඛී ච යො නරො,
විපන්නදිට්ඨි මායාවී තං ජඤ්ඤා වසලො ඉති, (1)

අක්කොධනො අනුපනාහී විසුද්ධො[1] සුද්ධතං ගතො,
සම්පන්නදිට්ඨි මෙධාවී තං ජඤ්ඤා අරියො ඉතී’ති, (2)

තිස්සො විපන්නදිට්ඨියො, තිස්සො සම්පන්නදිට්ඨියො.

කතමා තිස්සො විපන්නදිට්ඨියො: ‘එතං මමා’ති[2] විපන්නදිට්ඨි ‘එසො’හමස්මීති විපන්නදිට්ඨි, ‘එසො මෙ අත්තා’ති විපන්නදිට්ඨි, ඉමා තිස්සො විපන්නදිට්ඨියො.

කතමා තිස්සො සම්පන්නදිට්ඨියො. ‘නෙතං මමා’ති[2] සම්පන්නදිට්ඨි, ‘නෙසො හමස්මී’ති සම්පන්නදිට්ඨි, ‘න මෙසො අත්තා’ති සම්පන්නදිට්ඨි, ඉමා තිස්සො සම්පන්නදිට්ඨියො.

‘එතං මමා’ති[2] කා දිට්ඨි. කති දිට්ඨියො: කතමන්තානුග්ගහිතා තා දිට්ඨියො. ‘එසො හමස්මී’ති කා දිට්ඨි. කති දිට්ඨියො. කතමන්තානුග්ගහිතා තා දිට්ඨියො. ‘එසො මෙ අත්තා’ති කා දිට්ඨි. කති දිට්ඨියො. කතමන්තානුග්ගහිතා තා දිට්ඨියො.

‘එතං මමා’ති පුබ්බන්තානුදිට්ඨි, අට්ඨාරස දිට්ඨියො, පුබ්බන්තානුග්ගහිතා තා දිට්ඨියො, ‘එසො හමස්මී’ති අපරන්තානුදිට්ඨි, චතුචත්තාලීසං දිට්ඨියො, අපරාන්තානුග්ගහිතා තා දිට්ඨියො, ‘එසො මෙ අත්තා’ති වීසතිවත්ථුකා අත්තානුදිට්ඨි, වීසති වත්ථුකා සක්කායදිට්ඨි, සක්කායදිට්ඨිපපමුඛානි[3] ද්වාසට්ඨිදිට්ඨිගතානි, පුබ්බන්තාපරන්තානුග්ගහිතා තා දිට්ඨියො.

‘යෙ කෙචි භික්ඛවෙ, මයි නිට්ඨං ගතා, සබ්බෙ තෙ දිට්ඨිසම්පන්නා, තෙසං දිට්ඨිසම්පන්නානං පඤ්චන්නං ඉධ නිට්ඨා, පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.

කතමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා: සත්තක්ඛත්තුපරමස්ස, කොලංකොලස්ස, එකබීජිස්ස, සකදාගාමිස්ස, යො ච දිට්ඨෙව ධම්මෙ අරහා. ඉමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා.

කතමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා: අන්තරාපරිනිබ්බායිස්ස, උපහච්චපරිනිබ්බායිස්ස, අසඞ්ඛාරපරිනිබ්බායිස්ස, සසඞ්ඛාරපරිනිබ්බායිස්ස, උද්ධංසොතස්ස අකනිට්ඨගාමිනො, ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.

1. අමක්ඛි - ස්‍යා PTS. 2. මමන්ති - ස්‍යා PTS.
3. දිට්ඨිපමුඛෙන - ස්‍යා

යම් මිනිසෙක් කිපෙනසුලු ද බද්ධවෛර ඇත්තේ ද ලාමක වූ මකුගුණ ඇත්තේ ද විරූපභාවයට ගිය දෘෂ්ටි ඇත්තේ ද කල වරද වසනසුලු ද ඔහු 'වසල' යයි දත්තේ යැ. (1)

(යමෙක්) නො කිපෙනසුලු ද බද්ධවෛර නැත්තේ ද (ඥානදර්ශනවිශුද්ධියෙන්) විශුද්ධ වූයේ ද, (මාර්ගඵල සඞ්ඛ්‍යාත) ශුද්ධභාවයට ගියේ ද සුන්දරභාවයට ගිය දෘෂ්ටි ඇත්තේ ද ප්‍රඥ ඇත්තේ ද ඔහු 'ආර්‍ය්‍ය' යයි දත්තේ ය'යි. (2)

විපන්නදෘෂ්ටීහු තිදෙනෙක, සම්පන්නදෘෂ්ටීහු තිදෙනෙකි.

තුන් විපන්නදෘෂ්ටීහු කවරහ යත්: 'තෙල මාගේ යැ'යනු විපන්නදෘෂ්ටි යැ "තෙල මම වෙමි" යනු විපන්නදෘෂ්ටි යැ "තෙල මාගේ ආත්ම යැ" යනු විපන්නදෘෂ්ටි යි. මොහු තුන් විපන්නදෘෂ්ටීහු වෙත්.

තුන් සම්පන්නදෘෂ්ටීහු කවරහ යත්: "තෙල මාගේ නො වෙයි" යනු සම්පන්නදෘෂ්ටි යැ, "තෙල මම නො වෙමි' යනු සම්පන්නදෘෂ්ටි යැ. "තෙල මාගේ ආත්මය නො වෙයි" යනු සම්පන්නදෘෂ්ටි යි. මොහු තුන් සම්පන්න දෘෂ්ටීහු වෙත්.

"තෙල මාගේ යැ" යනු කවර දෘෂ්ටි ද, දෘෂ්ටීහු කෙතෙක් ද, ඒ දෘෂ්ටීහු කවර අන්තයෙකින් අනුගෘහීත වූවාහු ද, "තෙල මම වෙමි" යනු කවර දෘෂ්ටි ද, දෘෂ්ටීහු කෙතෙක් ද, ඒ දෘෂ්ටීහු කවර අන්තයෙකින් අනුගෘහීත වූවාහු ද, "තෙල මාගේ ආත්ම යැ" යනු කවර දෘෂ්ටි ද, දෘෂ්ටීහු කෙතෙක් ද, ඒ දෘෂ්ටීහු කවර අන්තයෙකින් අනුගෘහීත වූවාහු ද යත්:

"තෙල මාගේ යැ" යනු පූර්වාන්තානුදෘෂ්ටි යැ දෘෂ්ටි අටළොසෙකි. ඒ දෘෂ්ටීහු පූර්වාන්තයෙන් අනුගෘහීතයහ. "තෙල මම වෙමි" යනු අපරාන්තානුදෘෂ්ටි යැ. දෘෂ්ටි සිවුසාළිසෙකි. ඒ දෘෂ්ටීහු අපරාන්තයෙන් අනුගෘහීතයහ. "තෙල මාගේ ආත්ම යැ" යනු විංශද්වස්තුක ආත්මානුදෘෂ්ටි යැ. විංශද්වස්තුක සත්කායදෘෂ්ටි යැ, සත්කායදෘෂ්ටිය ප්‍රමුඛ කොට ඇති දෘෂ්ටිගත දෙසැටෙකි. ඒ දෘෂ්ටීහු පූර්වාන්තාපරාන්තයෙන් අනුගෘහීත වෙත්.

මහණෙනි, යම් කිසි කෙනෙක් මා කෙරෙහි ('භාග්‍යවත්හු සම්‍යක්සම්බුද්ධහය'යි) මාර්ගඥානවශයෙන් නිෂ්ඨාවට ගියාහු ද ඒ සියල්ලෝ දෘෂ්ටිසම්පන්නයෝ යි. ඒ දෘෂ්ටිසම්පන්නයන් අතුරින් පස්දෙනකුන්හට මේ කාමධාතුයෙහි නිෂ්ඨා (පරිනිර්වාණය) වෙයි. පස්දෙනකුන්හට මේ කාමභවය හැරපියා නිෂ්ඨා වෙයි.

කවර පස්දෙනකුන්හට මෙහි නිෂ්ඨා වේ ද යත්: සත්තක්ඛත්තුපරමහට යැ කොලංකොලහට යැ එකබීජීහට යැ සකෘදාගාමීහට යැ යමෙකුත් මේ අත්බැව්හි මැ අර්හත් වේ ද ඔබට යැ යන මේ පස්දෙනාහට මෙහි නිෂ්ඨා වේ.

කවර පස්දෙනකුන්හට මේ කාමධාතුව හැරපියා නිෂ්ඨා වේ ද යත්: අන්තරාපරිනිබ්බායීහට යැ උපහච්චපරිනිබ්බායීහට යැ අසඞ්ඛාරපරිනිබ්බායීහට යැ සසඞ්ඛාරපරිනිබ්බායීහට යැ උද්ධංසොත අකනිට්ඨගාමීහට යැ යන මේ පස්දෙනාහට මේ කාමධාතුව හැරපියා නිෂ්ඨාව වේ.

යෙ කෙචි භික්ඛවෙ මයි නිට්ඨං ගතා, සබ්බෙ තෙ දිට්ඨිසම්පන්නා, තෙසං දිට්ඨිසම්පන්නානං ඉමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා, ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.

යෙ කෙචි භික්ඛවෙ මයි අවෙච්චප්පසන්නා, සබ්බෙ තෙ සොතාපන්නා, තෙසං සොතාපන්නානං පඤ්චන්නං ඉධ නිට්ඨා, පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.

කතමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා: සත්තක්ඛත්තුපරමස්ස, කොලංකොලස්ස, එකබීජිස්ස, සකදාගාමිස්ස, යො ච දිට්ඨෙව ධම්මෙ අරහා, ඉමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා.

කතමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා: අන්තරාපරිනිබ්බායිස්ස, උපහච්චපරිනිබ්බායිස්ස, අසඞ්ඛාරපරිනිබ්බායිස්ස, සසඞ්ඛාර පරිනිබ්බායිස්ස, උද්ධංසොතස්ස අකනිට්ඨගාමිනො, ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.

යෙ කෙචි භික්ඛවෙ මයි අවෙච්චප්පසන්නා, සබ්බෙ තෙ සොතාපන්නා, තෙසං සොතාපන්නානං ඉමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා, ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.”

**දිට්ඨිකථං සමත්තං.**

මහණෙනි, යම් කිසි කෙනෙක් මා කෙරෙහි නිෂ්ඨාවට ගියාහු ද එහැම දෙන දෘෂ්ටියෙන් සුන්දර බවට ගියාහු යැ. ඒ දෘෂ්ටියෙන් සුන්දර බවට ගියවුන් අතුරින් මොවුන් පස්දෙනහට ඉධනිෂ්ඨා යැ මොවුන් පස්දෙනහට ඉධ-විහාය[ නිෂ්ඨා සි.

මහණෙනි, යම් කිසි කෙනෙක් මා කෙරෙහි අචල ප්‍රසාදයෙන් ප්‍රසන්නයෝ වෙත් ද, එහැම දෙන ආර්යමාර්ගශ්‍රොතසට පැමිණියාහු යැ. ඒ ආර්යමාර්ගශ්‍රොතසට පැමිණියවුන් අතුරින් පස්දෙනකුන්හට මේ කාම-ධාතුයෙහි නිෂ්ඨා වෙයි. පස් දෙනකුන්හට මේ කාමධාතුව හැරපියා නිෂ්ඨා වෙයි.

කවර පස්දෙනකුන්හට මේ කාමධාතුයෙහි නිෂ්ඨා වෙයි යත්: සත්තක්ඛත්තුපරමහට යැ. කොලංකොලහට යැ එකබීජහට යැ සකෘදාගාමී-හට යැ යමෙකුත් මෙ අත්බැව්හි මැ අර්හත් වේ ද ඔබට යැ යන මොවුන් පස්දෙනහට මේ කාමධාතුයෙහි නිෂ්ඨා වේ.

කවර පස්දෙනකුන්හට මේ කාමධාතුව හැරපියා නිෂ්ඨා වෙයි යත්: අන්තරාපරිනිබ්බායීහට යැ උපහච්චපරිනිබ්බායීහට යැ අසඞ්ඛාරපරිනිබ්බායී-හට යැ සසඞ්ඛාරපරිනිබ්බායීහට යැ උද්ධංසොතඅකනිට්ඨගාමීහට යැ යන මොවුන් පස්දෙනහට මේ කාමධාතුව හැරපියා නිෂ්ඨාව වේ.

මහණෙනි, යම් කිසි කෙනෙක් මා කෙරෙහි අචල ප්‍රසාදයෙන් ප්‍රසන්නයෝ වෙත් ද එහැම දෙන ආර්යමාර්ගශ්‍රොතසට පැමිණියාහු වෙති. ඒ ආර්යමාර්ගශ්‍රොතසට පැමිණියවුන් අතුරෙන් මොවුන් පස්දෙනහට මේ කාමධාතුයෙහි නිෂ්ඨා වෙයි. මොවුන් පස්දෙනහට මේ කාමධාතුව හැරපියා නිෂ්ඨා වේ යයි.

**දෘෂ්ටිකථා නිමි.**

# 3

# ආනාපානසතිකථා.

## 3 - 1. ගණනුද්දෙසො

සොළසවත්ථුකං ආනාපානසති සමාධිං[1] භාවයතො සමධිකානි[2] ද්වෙ ඤාණසතානි උප්පජ්ජන්ති: අට්ඨ පරිපන්ථෙ ඤාණානි, අට්ඨ[3] උපකාරෙ ඤාණානි, අට්ඨාරස උපක්කිලෙසෙ ඤාණානි, තෙරස වොදානෙ ඤාණානි, බත්තිංස[4] සතොකාරිස්ස[5] ඤාණානි, චතුවීසති සමාධිවසෙන ඤාණානි, ද්වෙසත්තති විපස්සනාවසෙන ඤාණානි, අට්ඨ නිබ්බිදාඤාණානි, අට්ඨ නිබ්බිදානුලොමඤාණානි, අට්ඨ නිබ්බිදාපටිප්පස්සද්ධිඤාණානි, එකවීසති විමුත්තිසුඛෙ ඤාණානි.

**ගණනුද්දෙසො සමත්තො**

## 3 - 2. පරිපන්ථ - උපකාරසොළස ඤාණානි

**කතමානි අට්ඨ පරිපන්ථෙ ඤාණානි, අට්ඨ ච උපකාරෙ ඤාණානි.**

කාමච්ඡන්දො සමාධිස්ස පරිපන්ථො, නෙක්ඛම්මං සමාධිස්ස උපකාරං; බ්‍යාපාදො සමාධිස්ස පරිපන්ථො, අබ්‍යාපාදො සමාධිස්ස උපකාරං; ථීනමිද්ධං[6] සමාධිස්ස පරිපන්ථො, ආලොකසඤ්ඤා සමාධිස්ස උපකාරං; උද්ධච්චං සමාධිස්ස පරිපන්ථො, අවික්ඛෙපො සමාධිස්ස උපකාරං; විචිකිච්ඡා සමාධිස්ස පරිපන්ථො, ධම්මවවත්ථානං සමාධිස්ස උපකාරං; අවිජ්ජා සමාධිස්ස පරිපන්ථො, ඤාණං සමාධිස්ස උපකාරං; අරති සමාධිස්ස පරිපන්ථො, පාමොජ්ජං සමාධිස්ස උපකාරං; සබ්බෙපි අකුසලා ධම්මා සමාධිස්ස පරිපන්ථා, සබ්බෙපි කුසලා ධම්මා සමාධිස්ස උපකාරා. ඉමානි අට්ඨ පරිපන්ථෙ ඤාණානි, අට්ඨ ච උපකාරෙ ඤාණානි.

ඉමෙහි සොළසහි ආකාරෙහි උදුචිතං චිත්තං[7] සමුදුචිතං[8] එකත්තෙ සන්තිට්ඨති, නීවරණෙහි විසුජ්ඣති.

කතමෙ තෙ එකත්තා: නෙක්ඛම්මං එකත්තං, අබ්‍යාපාදො එකත්තං, ආලොකසඤ්ඤා එකත්තං, අවික්ඛෙපො එකත්තං, ධම්මවවත්ථානං එකත්තං, ඤාණං එකත්තං, පාමොජ්ජං එකත්තං, සබ්බෙපි කුසලා ධම්මා එකත්තා.

කතමෙ[9] තෙ නීවරණා: කාමච්ඡන්දො නීවරණං, බ්‍යාපාදො නීවරණං, ථීනමිද්ධං නීවරණං, උද්ධච්චකුක්කුච්චං නීවරණං, විචිකිච්ඡා නීවරණං, අවිජ්ජා නීවරණං, අරති නීවරණං, සබ්බෙපි අකුසලා ධම්මා නීවරණා.

---

1. ආනාපානස්සතිසමාධිං - මජසං, සයා 2 සමාධිකානි - මජසං, සයා PTS,
3. අට්ඨ ච - මජසං, 4. බාත්තිංසං - මජසං, බත්තිං සං - PTS, සයා
5. සතොකාරිසු - සයා, PTS, 6. ථිනමිද්ධං - මජසං.
7. උද්ධතං චිත්තං - PTS උදුපිතචිත්තං - සයා,
8. සමුදුචිතං චිත්තං - මජසං, සමුදුපිත චිත්තං - සයා සමුදුචිත්තං - PTS. උදුජිතං චිත්තං- සමුදුජිතං-පු, උදජිතං චිත්තං සමුදජිතං - පු.
9 නිවරණානි කතමෙ - මජසං.

# 3

# ආනාපානස්මෘති කථා

## 3 – 1. ගණනවාරය

ෂොඩශවස්තුක ආනාපානසමෘති සමාධිය වඩන්නහුට සාතිරෙක දෙසියක් ඥානයෝ උපදිති. උවදුරු අරමුණු කොට පැවැති ඥානයෝ අට දෙනෙක, උපකාර අරමුණු කොට පැවැති ඥානයෝ අටදෙනෙක, උපක්ලේශ අරමුණු කොට පැවැති ඥානයෝ අටළොසෙක, වොදානඥාන තුදුසෙක, සිහි ඇති ව කරන්නහුගේ ඥාන දෙතිසෙක, සමාධිවශයෙන් පැවැති ඥානයෝ සූවිස්සෙක, විදර්ශනාවශයෙන් පැවැති ඥානයෝ දෙසැත්තෑවෙක, නිර්වේදඥානයෝ අටදෙනෙක, නිර්වේදයට අනුලෝම වූ ඥානයෝ අටදෙනෙක, නිර්වේදයාගේ සන්හිඳීමෙහි ඥානයෝ අටදෙනෙක, විමුක්තිසුඛසම්ප්‍රයුක්ත-ඥානයෝ එක්විස්සෙකි.

**ගණනවාරය නිමි.**

## 3 – 2. පරිපන්ථ උපකාර ෂොඩශඥානයෝ

උවදුරු අරමුණ කොට පැවැති ඥානයෝ අටදෙන, උපකාර අරමුණු කොට පැවැති ඥානයෝ අටදෙන කවරහ යත්:

කාමච්ඡන්දය සමාධියට උවදුරු යැ, නෛෂ්ක්‍රම්‍යය සමාධියට උපකාර යැ. ව්‍යාපාදය සමාධියට උවදුරු යැ, අව්‍යාපාදය සමාධියට උපකාර යැ. ථිනමිද්ධය සමාධියට උවදුරු යැ, ආලොකසංඥාව සමාධියට උපකාර යැ. ඖද්ධත්‍යය සමාධියට උවදුරු යැ, අවික්ෂෙපය සමාධියට උපකාර යැ. විචිකිත්සාව සමාධියට උවදුරු යැ, ධර්මනිශ්චය සමාධියට උපකාර යැ. අවිද්‍යාව සමාධියට උවදුරු යැ, ඥානය සමාධියට උපකාර යැ. අරතිය සමාධියට උවදුරු යැ, ප්‍රාමොද්‍යය සමාධියට උපකාර යැ. හැම අකුශලධර්මයෝ සමාධියට උවදුරු වෙති, හැම කුශලධර්මයෝ සමාධියට උපකාර වෙත්. මොහු උවදුරු අරමුණු කොට පැවැති ඥානයෝ අටදෙන ද උපකාර අරමුණු කොට පැවැති ඥානයෝ අටදෙන ද වෙත්.

මේ සොළොස් අයුරින් මතුමත්තෙහි කළ පරිචය ඇති මොනොවට මතුමත්තෙහි කළ පරිචය ඇති සිත එකත්වයෙහි පිහිටයි, නීවරණයන් කෙරෙන් විශුද්ධ වෙයි.

ඒ එකත්වයෝ කවරහ යත්: නෛෂ්ක්‍රම්‍යය එකත්ව යැ අව්‍යාපාදය එකත්ව යැ ආලොකසංඥාව එකත්ව යැ අවික්ෂෙපය එකත්ව යැ ධර්මනිශ්චය එකත්ව යැ ඥානය එකත්ව යැ ප්‍රාමොද්‍යය එකත්ව යැ හැම කුශලධර්මයෝ එකත්වයෝ යි.

ඒ නීවරණයෝ කවරහ යත්: කාමච්ඡන්දය නීවරණ යැ ව්‍යාපාදය නීවරණ යැ ථිනමිද්ධය නීවරණ යැ ඖද්ධච්චකුක්කුච්චය නීවරණ යැ විචි-කිච්ඡාව නීවරණ යැ අවිජ්ජාව නීවරණ යැ අරතිය නීවරණ යැ හැම අකුශලධර්මයෝ නීවරණයෝ යි.

නීවරණා'ති කෙනට්ඨෙන[1] නීවරණා: නිය්‍යානාවරණට්ඨෙන[2] නීවරණා.

කතමෙ තෙ නිය්‍යානා: නෙක්ඛම්මං අරියානං නිය්‍යානං, තෙන ච නෙක්ඛම්මෙන අරියා නීයන්ති;[3] කාමච්ඡන්දො නිය්‍යානාවරණං, තෙන ච කාමච්ඡන්දෙන නිවුතත්තා නෙක්ඛම්මං අරියානං නිය්‍යානං නප්පජානාතීති[5] කාමච්ඡන්දො නිය්‍යානාවරණං, අබ්‍යාපාදො අරියානං නිය්‍යානං, තෙන ච අබ්‍යාපාදෙන අරියා නීයන්ති;[3] බ්‍යාපාදො නිය්‍යානාවරණං, තෙන ච බ්‍යාපාදෙන නිවුතත්තා අබ්‍යාපාදං අරියානං නිය්‍යානං නප්පජානාතීති[4], බ්‍යාපාදො නිය්‍යානාවරණං. ආලොකසඤ්ඤා අරියානං නිය්‍යානං, තාය ච ආලොකසඤ්ඤාය අරියා නීයන්ති; ථීනමිද්ධං නිය්‍යානාවරණං, තෙන ච ථීනමිද්ධෙන නිවුතත්තා ආලොකසඤ්ඤං අරියානං නිය්‍යානං නප්පජානාතීති ථීනමිද්ධං නිය්‍යානාවරණං. අවික්ඛෙපො අරියානං නිය්‍යානං, තෙන ච අවික්ඛෙපෙන අරියා නීයන්ති; උද්ධච්චං නිය්‍යානාවරණං, තෙන ච උද්ධච්චෙන නිවුතත්තා අවික්ඛෙපං අරියානං නිය්‍යානං නප්පජානාතීති උද්ධච්චං නිය්‍යානාවරණං. ධම්මවවත්ථානං අරියානං නිය්‍යානං, තෙන ච ධම්මවවත්ථානෙන අරියා නීයන්ති; විචිකිච්ඡා නිය්‍යානාවරණං, තාය ච විචිකිච්ඡාය නිවුතත්තා ධම්මවවත්ථානං අරියානං නිය්‍යානං නප්පජානාතීති විචිකිච්ඡා නිය්‍යානාවරණං, ඤාණං අරියානං නිය්‍යානං, තෙන ච ඤාණෙන අරියා නීයන්ති; අවිජ්ජා නිය්‍යානාවරණං, තාය ච අවිජ්ජාය නිවුතත්තා ඤාණං අරියානං නිය්‍යානං නප්පජානාතීති අවිජ්ජා නිය්‍යානාවරණං, පාමොජ්ජං[5] අරියානං නිය්‍යානං තෙන ච පාමොජ්ජෙන අරියා නීයන්ති; අරති නිය්‍යානාවරණං, තාය ච අරතියා නිවුතත්තා පාමොජ්ජං අරියානං නිය්‍යානං නප්පජානාතීති අරති නිය්‍යානාවරණං, සබ්බෙපි කුසලා ධම්මා අරියානං නිය්‍යානං, තෙහි ච කුසලෙහි ධම්මෙහි අරියා නීයන්ති; සබ්බෙපි අකුසලා ධම්මා නිය්‍යානාවරණා, තෙහි ච අකුසලෙහි ධම්මෙහි නිවුතත්තා කුසලෙ ධම්මෙ අරියානං නිය්‍යානං නප්පජානාතීති සබ්බෙපි අකුසලා ධම්මා නිය්‍යානාවරණා.

**සොළසඤාණනිද්දෙසො සමත්තො.**

## 3 – 3. උපක්කිලෙසඤාණානි.

ඉමෙහි ච පන නීවරණෙහි විසුද්ධචිත්තස්ස සොළසවත්ථුකං[6] ආනාපානසතිසමාධිං භාවයතො ඛණිකසමොධානා කතමෙ අට්ඨාරස උපක්කිලෙසා උප්පජ්ජන්ති:

---

1. කෙනට්ඨෙන - සයා. 2. නිය්‍යානාවාරණට්ඨෙන - පු.
3. නිය්‍යන්ති - මජසං, PTS 4. න පජානාතීති - PTS
5. පාමුජ්ජං - සයා, 6. සොළසකවත්ථුකං - සී 2

**නීවරණා** යනු: කවර අරුතින් නීවරණ වෙයි යත්: නිර්යාණාවරණාර්ථයෙන් නීවරණ යැ.

ඒ නිර්යාණයෝ කවරහ යත්: නෛෂ්ක්‍රම්‍යය ආර්යයන්ගේ නිර්යාණයෙක. ඒ නෛෂ්ක්‍රම්‍යය හෙතුකොටගෙන ද ආර්යයෝ (කාමයෙන්) නික්ම යෙති. කාමච්ඡන්දය නිර්යාණාවරණයෙක. ඒ කාමච්ඡන්දයෙනුදු වැසුණු බැවින් ආර්යයන්ගේ නිර්යාණය වූ නෛෂ්ක්‍රම්‍යය නො දනී නු යි කාමච්ඡන්දය නිර්යාණාවරණ යැ. අව්‍යාපාදය ආර්යයන්ගේ නිර්යාණයෙක. ඒ අව්‍යාපාදය හෙතුකොටගෙන ද ආර්යයෝ (ව්‍යාපාදයෙන්) නික්ම යෙති. ව්‍යාපාදය නිර්යාණයට ආවරණයෙක. ඒ ව්‍යාපාදයෙනුදු වැසුණු බැවින් ආර්යයන්ගේ නිර්යාණය වූ අව්‍යාපාදය නො දනී නු යි ව්‍යාපාදය නිර්යාණාවරණ යැ. ආලොකසංඥාව ආර්යයන්ගේ නිර්යාණයෙක. ඒ ආලොක සංඥාව හෙතුකොටගෙන ද ආර්යයෝ (ථීනමිද්ධයෙන්) නික්ම යෙති. ථීනමිද්ධය නිර්යාණයට ආවරණයෙක. ඒ ථීනමිද්ධයෙනු දු වැසුණු බැවින් ආර්යයන්ගේ නිර්යාණය වූ ආලොකසංඥාව නො දනී නු යි ථීනමිද්ධය නිර්යාණාවරණ යැ. අවික්ෂෙපය ආර්යයන්ගේ නිර්යාණයෙක. ඒ අවික්ෂෙපය හෙතුකොටගෙන ද ආර්යයෝ (ඖද්ධත්‍යයෙන්) නික්ම යෙති. ඖද්ධත්‍යය නිර්යාණයට ආවරණයෙක. ඒ ඖද්ධත්‍යයෙනුදු වැසුණු බැවින් ආර්යයන්ගේ නිර්යාණය වූ අවික්ෂෙපය නො දනී නු යි ඖද්ධත්‍යය නිර්යාණාවරණ යැ. ධර්මනිශ්චය ආර්යයන්ගේ නිර්යාණයෙක. ඒ ධර්මනිශ්චය හෙතුකොටගෙන ද ආර්යයෝ (විචිකිත්සායෙන්) නික්ම යෙති. විචිකිත්සාව නිර්යාණයට ආවරණයෙක. ඒ විචිකිත්සායෙනුදු වැසුණු බැවින් ආර්යයන්ගේ නිර්යාණය වූ ධර්මනිශ්චය නො දනී නු යි විචිකිත්සාව නිර්යාණාවරණ යැ. ඥානය ආර්යයන්ගේ නිර්යාණයෙක. ඒ ඥානය හෙතුකොටගෙන ද ආර්යයෝ (අවිද්‍යායෙන්) නික්ම යෙති. අවිද්‍යාව නිර්යාණයට ආවරණයෙක. ඒ අවිද්‍යායෙනුදු වැසුණු බැවින් ආර්යයන්ගේ නිර්යාණය වූ ඥානය නො දනී නු යි අවිද්‍යාව නිර්යාණාවරණ යැ. ප්‍රාමොද්‍යය ආර්යයන්ගේ නිර්යාණයෙක. ඒ ප්‍රාමොද්‍යය හෙතුකොටගෙන ද ආර්යයෝ (අරතියෙන්) නික්ම යෙති. අරතිය නිර්යාණාවරණයෙක. ඒ අරතියෙනුදු වැසුණු බැවින් ආර්යයන්ගේ නිර්යාණය වූ ප්‍රාමොද්‍යය නො දනී නු යි අරතිය නිර්යාණාවරණ යැ. හැම කුශලධර්මයෝ ආර්යයන්ගේ නිර්යාණයෙක. ඒ කුශලධර්මයන් හෙතුකොට ගෙන ද ආර්යයෝ (හැම අකුශලයෙන්) නික්ම යෙති. හැම අකුශල ධර්මයෝ නිර්යාණාවරණයෝ යැ. ඒ අකුශලධර්මයන් විසිනුදු වැසුණු බැවින් ආර්යයන්ගේ නිර්යාණය වූ කුශලධර්මයන් නො දනී නු යි හැම අකුශලධර්මයෝ නිර්යාණාවරණයෝ යි.

**ෂොඩශඥානනිර්දේශය නිමි.**

## 3 – 3. උපක්ලෙශඥාන

තවද මේ නීවරණයන් කෙරෙන් (උපචාරභූමියෙහි) විශුද්ධ වූ සිත් ඇති, ෂොඩශවස්තුක ආනාපානස්මෘතිය වඩන්නහුට **ක්ෂණිකසමවධානය** (උපක්ලෙශසමාගමය) හෙතුකොටගෙන **කවර අටළොස් උපක්ලෙශයෝ උපදනාහු ද යත්:**

අස්සාසාදිමජ්ඣපරියොසානං සතියා අනුගච්ඡතො අජ්ඣත්තවික්ඛෙපගතං චිත්තං සමාධිස්ස පරිපන්ථො, පස්සාසාදිමජ්ඣපරියොසානං සතියා අනුගච්ඡතො බහිද්ධාවික්ඛෙපගතං චිත්තං සමාධිස්ස පරිපන්ථො, අස්සාසපටිකඞ්ඛනා නිකන්තිතණ්හාචරියා සමාධිස්ස පරිපන්ථො, පස්සාසපටිකඞ්ඛනා නිකන්තිතණ්හාචරියා සමාධිස්ස පරිපන්ථො, අස්සාසෙනාභිතුන්නස්ස පස්සාසපටිලාභෙ මුච්ඡනා සමාධිස්ස පරිපන්ථො, පස්සාසෙනාභිතුන්නස්ස අස්සාසපටිලාභෙ මුච්ඡනා සමාධිස්ස පරිපන්ථො.

“අනුගච්ඡනා ච අස්සාසං පස්සාසං අනුගච්ඡනා,
සති අජ්ඣත්තවික්ඛෙපා කඞ්ඛනා බහිද්ධා වික්ඛෙපපත්ථනා[1] (1)

අස්සාසෙනාභිතුන්නස්ස පස්සාසපටිලාභෙ මුච්ඡනා,
පස්සාසෙනාභිතුන්නස්ස අස්සාසපටිලාභෙ මුච්ඡනා[2] (2)

ඡ එතෙ උපක්කිලෙසා ආනාපානසති[3] සමාධිස්ස,
යෙහි වික්ඛිප්පමානස්ස[4] නො ච[5] චිත්තං විමුච්චති
විමොක්ඛං අප්පජානන්තා තෙ හොන්ති පරපත්තියා’ති. (3)

පඨමං ඡක්කං.

නිමිත්තං ආවජ්ජතො අස්සාසෙ චිත්තං විකම්පති, සමාධිස්ස පරිපන්ථො; අස්සාසං ආවජ්ජතො නිමිත්තෙ චිත්තං විකම්පති, සමාධිස්ස පරිපන්ථො, නිමිත්තං ආවජ්ජතො පස්සාසෙ චිත්තං විකම්පති, සමාධිස්ස පරිපන්ථො, පස්සාසං ආවජ්ජතො නිමිත්තෙ චිත්තං විකම්පති, සමාධිස්ස පරිපන්ථො; අස්සාසං ආවජ්ජතො පස්සාසෙ චිත්තං විකම්පති, සමාධිස්ස පරිපන්ථො; පස්සාසං ආවජ්ජතො අස්සාසෙ චිත්තං විකම්පති, සමාධිස්ස පරිපන්ථො.

“නිමිත්තං ආවජ්ජමානස්ස අස්සාසෙ වික්ඛිප්පතෙ[6] මනො
අස්සාසං ආවජ්ජමානස්ස නිමිත්තෙ චිත්තං විකම්පති (4)

නිමිත්තං ආවජ්ජමානස්ස පස්සාසෙ වික්ඛිප්පතෙ මනො,
පස්සාසං ආවජ්ජමානස්ස නිමිත්තෙ චිත්තං විකම්පති, (5)

අස්සාසං ආවජ්ජමානස්ස පස්සාසෙ වික්ඛිප්පතෙ මනො,
පස්සාසං ආවජ්ජමානස්ස අස්සාසෙ චිත්තං විකම්පති. (6)

ඡ එතෙ උපක්කිලෙසා ආනාපානසතිසමාධිස්ස,
යෙහි වික්ඛිප්පමානස්ස නො ච චිත්තං විකම්පති,
විමොක්ඛං අප්පජානන්තා තෙ හොන්ති පරපත්තියා”ති, (7)

දුතියං ඡක්කං.

1. වික්ඛෙපපත්ථනා - සයා 2. ’අස්සාසෙනාති අයං ගාථා සයාම පොත්ථකෙ න දිස්සති
3. ආනාපානස්සති – මජසං සයා 4. වික්ඛෙපමානස්ස - PTS, සයා, කම්පමානස්ස - සයා
5. නොචෙ – සයා 6 වික්ඛිපතෙ - මජසං, PTS.

ආශ්වාසයාගේ ආදි-මධ්‍ය-පර්‍ය්‍යවසානය සිහියෙන් අනුව යන්නහුගේ අධ්‍යාත්මයෙහි වික්ෂෙපයට ගිය සිත සමාධියට උවදුරෙක. ප්‍රශ්වාසයාගේ ආදි-මධ්‍ය-පර්‍ය්‍යවසානය සිහියෙන් අනුව යන්නහුගේ බාහ්‍යායතනයෙහි වික්ෂෙපයට ගිය සිත සමාධියට උවදුරෙක. ආශ්වාසය පිළිබඳ ප්‍රාර්ථනා සඞ්ඛ්‍යාත නිකාමය වූ තෘෂ්ණාවගේ පැවැත්ම සමාධියට උවදුරෙක. ප්‍රශ්වාසය පිළිබඳ ප්‍රාර්ථනා සඞ්ඛ්‍යාත නිකාමනය වූ තෘෂ්ණාවගේ පැවැත්ම සමාධියට උවදුරෙක. ආශ්වාසයෙන් පෙළුණහුගේ ප්‍රශ්වාසප්‍රතිලාභයෙහි ඇලීම සමාධියට උවදුරෙක. ප්‍රශ්වාසයෙන් පෙළුණහුගේ ආශ්වාසප්‍රතිලාභයෙහි ඇලීම සමාධියට උවදුරෙකි.

ආශ්වාසය අනුව යන්නා වූ අධ්‍යාත්මවික්ෂෙපයට හෙතු වූ ස්මෘතිය ද, ප්‍රශ්වාසය අනුව යන්නා වූ බාහ්‍යවික්ෂෙපයට හෙතු වූ ස්මෘතිය ද, අධ්‍යාත්මවික්ෂෙපය (ආශ්වාසය) පිළිබඳ ප්‍රාර්ථනාව ද, බාහ්‍යවික්ෂෙපය (ප්‍රශ්වාසය) පිළිබඳ ප්‍රාර්ථනාව ද, (1)

ආශ්වාසයෙන් මඩනාලද්දහුගේ ප්‍රශ්වාසප්‍රතිලාභයෙහි ඇලීම ද, ප්‍රශ්වාසයෙන් මඩනාලද්දහුගේ ආශ්වාසප්‍රතිලාභයෙහි ඇලීම ද, යන (2)

මොහු සදෙන ආනාපානස්මෘතිසමාධියට උපක්ලෙශ වෙති. යම් උපක්ලෙශ කෙනකුන් විසින් වික්ෂෙපයට පමුණුවනුලබන්නහුගේ සිත (කෙලෙසුන් කෙරෙන්) නො මිදේ නම් (ආශ්වාසප්‍රශ්වාසාලම්බනයෙහි ද) නො බැඳේ නම් ඔහු යැ. විමොක්ෂය නො දන්නා වූ ඔහු පරප්‍රත්‍යයට (මෙරමා හැදහීමට) සුදුසු වෙත්. (3)

**ප්‍රථම ෂට්කය යි.**

(ආශ්වාස) නිමිත්ත ආවර්ජනා කරන්නාහට ආශ්වාසයෙහි සිත සැලෙයි. ඒ සමාධියට උවදුරෙක. ආශ්වාසය ආවර්ජනා කරන්නාහට නිමිත්තයෙහි සිත සැලෙයි. ඒ සමාධියට උවදුරෙක. (ප්‍රශ්වාස) නිමිත්ත ආවර්ජනා කරන්නාහට ප්‍රශ්වාසයෙහි සිත සැලෙයි, ඒ සමාධියට උවදුරෙක. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නාහට නිමිත්තයෙහි සිත සැලෙයි, ඒ සමාධියට උවදුරෙක. ආශ්වාසය ආවර්ජනා කරන්නාහට ප්‍රශ්වාසයෙහි සිත සැලෙයි. ඒ සමාධියට උවදුරෙක. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නාහට ආශ්වාසයෙහි සිත සැලෙයි, ඒ සමාධියට උවදුරෙකි.

නිමිත්ත ආවර්ජනා කරන්නහුගේ සිත ආශ්වාසයෙහි විසිරෙයි. ආශ්වාසය ආවර්ජනා කරන්නහුගේ සිත නිමිත්තයෙහි සැලෙයි. (4)

නිමිත්ත ආවර්ජනා කරන්නහුගේ සිත ප්‍රශ්වාසයෙහි විසිරෙයි. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නහුගේ සිත නිමිත්තයෙහි සැලෙයි. (5)

ආශ්වාසය ආවර්ජනා කරන්නහුගේ සිත ප්‍රශ්වාසයෙහි විසිරෙයි. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නහුගේ සිත ආශ්වාසයෙහි සැලෙයි. (6)

මොහු සදෙන ආනාපානස්මෘතිසමාධියට උපක්ලෙශ වෙති. යම් උපක්ලෙශ කෙනකුන් විසින් වික්ෂෙපයට පමුණුවනුලබන්නහුගේ සිත (කෙලෙසුන් කෙරෙන්) නො මිදේ නම් (ආශ්වාසප්‍රශ්වාසාලම්බනයෙහි ද) නො බැඳේ නම් ඔහු යැ විමොක්ෂය නො දන්නා වූ ඔහු පරප්‍රත්‍යයට සුදුසු වෙත්. (7)

**ද්විතීය ෂට්කය යි.**

අතීතානුධාවනං චිත්තං වික්ඛෙපානුපතිතං සමාධිස්ස පරිපන්ථො, අනාගතපටිකඞ්ඛනං චිත්තං විකම්පිතං[1] සමාධිස්ස පරිපන්ථො, ලීනං චිත්තං කොසජ්ජානුපතිතං සමාධිස්ස පරිපන්ථො, අතිපග්ගහිතං චිත්තං උද්ධච්චානුපතිතං සමාධිස්ස පරිපන්ථො, අභිනතං[2] චිත්තං රාගානුපතිතං සමාධිස්ස පරිපන්ථො, අපනතං[3] චිත්තං බ්‍යාපාදානුපතිතං සමාධිස්ස පරිපන්ථො.

''අතීතානුධාවනං චිත්තං - අනාගතපටිකඞ්ඛනං ලීනං,
අතිපග්ගහිතං අභිනතං[2] - අපනතං[3] චිත්තං න සමාධියති. (8)

ඡ එතෙ උපක්කිලෙසා - ආනාපානසතිසමාධිස්ස,
යෙහි උපක්කිලිට්ඨසඞ්කප්පො - අධිචිත්තං නප්පජානාතී''ති. (9)

තතියං ඡක්කං.

අස්සාසාදිමජ්ඣපරියොසානං සතියා අනුගච්ඡතො අජ්ඣත්තං වික්ඛෙපගතෙන චිත්තෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, පස්සාසාදිමජ්ඣපරියොසානං සතියා අනුගච්ඡතො බහිද්ධා වික්ඛෙපගතෙන චිත්තෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච; අස්සාසපටිකඞ්ඛනාය නිකන්තියා තණ්හාචරියාය කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, පස්සාසපටිකඞ්ඛනාය නිකන්තියා තණ්හාචරියාය කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච; අස්සාසෙනාභිතුන්නස්ස පස්සාසපටිලාභෙ මුච්ඡිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, පස්සාසෙනාභිතුන්නස්ස අස්සාසපටිලාභෙ මුච්ඡිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච; නිමිත්තං ආවජ්ජතො අස්සාසෙ චිත්තං විකම්පිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, අස්සාසං ආවජ්ජතො නිමිත්තෙ චිත්තං විකම්පිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච; නිමිත්තං ආවජ්ජතො පස්සාසෙ චිත්තං විකම්පිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, පස්සාසං ආවජ්ජතො නිමිත්තෙ චිත්තං විකම්පිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච; අස්සාසං ආවජ්ජතො පස්සාසෙ චිත්තං විකම්පිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, පස්සාසං ආවජ්ජතො අස්සාසෙ චිත්තං විකම්පිතත්තා කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච; ඵන්දිතා ච අතීතානුධාවනෙන චිත්තෙන වික්ඛෙපානුපතිතෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, අනාගතපටිකඞ්ඛනෙන චිත්තෙන විකම්පිතෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, ලීනෙන චිත්තෙන කොසජ්ජානුපතිතෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, අතිපග්ගහිතෙන චිත්තෙන උද්ධච්චානුපතිතෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච; අභිනතෙන චිත්තෙන රාගානුපතිතෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච, අපනතෙන චිත්තෙන බ්‍යාපාදානුපතිතෙන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච.

1 'වික්ඛම්භිතං - PTS 2. 'අභිණතං - PTS. අභිඤ්ඤතං - ස්‍යා.
3 අපණතං - PTS, අපඤ්ඤතං - ස්‍යා.

අතීත (ආශ්වාසප්‍රශ්වාස) ය ලුහුබඳනා සිත වික්ෂෙපය අනුව ගියේ සමාධියට උවදුරෙක, අනාගත (ආශ්වාසප්‍රශ්වාස) ය ප්‍රාර්ථනාකරනු ලබන සිත සැලුණේ සමාධියට උවදුරෙක, ලීන වූ සිත කෞසීද්‍යය අනුව ගියේ සමාධියට උවදුරෙක, ඉතා දැඩිව ගන්නාලද සිත ඖද්ධත්‍යය අනුව ගියේ සමාධියට උවදුරෙක, වෙසෙසින් නැමුණු සිත රාගය අනුව ගියේ සමාධියට උවදුරෙක, නතු නො වූ සිත ව්‍යාපාදය අනුව ගියේ සමාධියට උවදුරෙකි.

අතීතය ලුහුබඳනා සිත ද අනාගතය ප්‍රාර්ථනා කරන සිත ද ලීන සිත ද ඉතා දැඩි වැ ගන්නාලද සිත ද වෙසෙසින් නැමුණු සිත ද සමාහිත නො වෙත් (8)

යම් උපක්ලේශ කෙනකුත් විසින් කෙලසනලද සංකල්ප ඇත්තේ අධිචිත්තය නො දනී නම් තෙල සදෙන ආනාපානස්මෘතිසමාධියට උපක්ලේශයෝ සි. (9)

**තෘතීය ෂට්කය සි.**

ආශ්වාසයාගේ ආදිමධ්‍යපර්‍යවසානය සිහියෙන් අනු වැ යන්නහුගේ අධ්‍යාත්මයෙහි වික්ෂෙපයට ගිය සිතින් කය ත් සිත ත් (මහත් කැලඹීමෙන්) දරථ සහිත ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ප්‍රශ්වාසයාගේ ආදිමධ්‍යපර්‍යවසානය සිහියෙන් අනු වැ යන්නහුගේ බාහ්‍යාලම්බනයෙහි වික්ෂෙපයට ගිය සිතින් කය ත් සිත ත් දරථ සහිත ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ආශ්වාසය ප්‍රාර්ථනා කරන්නා වූ නිකාන්ති සඞ්ඛ්‍යාත තෘෂ්ණාචර්‍යායෙන් කයත් සිතත් දරථ සහිත ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ප්‍රශ්වාසය ප්‍රාර්ථනා කරන්නා වූ නිකාන්ති සඞ්ඛ්‍යාත තෘෂ්ණාචර්‍යායෙන් කයත් සිතත් දරථ සහිත ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ආශ්වාසයෙන් පීඩිත වූවහුගේ ප්‍රශ්වාසප්‍රතිලාභයෙහි ඇලුණු බැවින් කයත් සිතත් දරථ සහිත ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ප්‍රශ්වාසයෙන් පීඩිත වූවහුගේ ආශ්වාසප්‍රතිලාභයෙහි ඇලුණු බැවින් කයත් සිතත් දරථ සහිත ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. නිමිත්ත ආවර්ජනා කරන්නහුගේ ආශ්වාසයෙහි සිත වෙසෙසින් සැලුණු බැවින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ආශ්වාසය ආවර්ජනා කරන්නහුගේ නිමිත්තෙහි සිත වෙසෙසින් සැලුණු බැවින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. නිමිත්ත ආවර්ජනා කරන්නහුගේ ප්‍රශ්වාසයෙහි සිත වෙසෙසින් සැලුණු බැවින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නහුගේ නිමිත්තෙහි සිත වෙසෙසින් සැලුණු බැවින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ආශ්වාසය ආවර්ජනා කරන්නහුගේ ප්‍රශ්වාසයෙහි සිත වෙසෙසින් සැලුණු බැවින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ප්‍රශ්වාසය ආවර්ජනා කරන්නහුගේ ආශ්වාසයෙහි සිත වෙසෙසින් සැලුණු බැවින් කය ත් සිත ත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. වික්ෂෙපය අනු වැ ගිය අතීතය ලුහුබඳනා සිතින් කය ත් සිත ත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. අනාගතය ප්‍රාර්ථනා කරන්නා වූ විකම්පිත වූ සිතින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ලීන වූ කෞසීද්‍යය අනු වැ ගිය සිතින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. ඉතා දැඩි වැ ගන්නාලද ඖද්ධත්‍යය අනු වැ ගිය සිතින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. වෙසෙසින් නැමුණු රාගය අනු වැ ගිය සිතින් කයත් සිතත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙති. නතු වූ ව්‍යාපාදය අනු වැ ගිය සිතින් කයත් සිත ත් දරථ සහිත වූවාහු ද කම්පිත වූවාහු ද සැලුණාහු ද වෙත්.

“ආනාපානසති යස්ස පරිපුණ්ණං[1] අභාවිතා
කායොපි ඉඤ්ජිතො හොති චිත්තම්පි හොති ඉඤ්ජිතං
කායොපි ඵන්දිතො හොති චිත්තම්පි හොති ඵන්දිතං (10)

ආනාපානසති යස්ස පරිපුණ්ණං සුභාවිතා
කායොපි අනිඤ්ජිතො හොති චිත්තම්පි හොති අනිඤ්ජිතං
කායොපි අඵන්දිතො හොති චිත්තම්පි හොති අඵන්දිත”න්ති, (11)

තෙහි ච පන නීවරණෙහි විසුද්ධචිත්තස්ස සොළසවත්ථුකං ආනාපානසතිසමාධිං භාවයතො ඛණිකසමොධානා ඉමෙ අට්ඨාරස උපක්කිලෙසා උප්පජ්ජන්ති.

**උපක්කිලෙසඤාණ නිද්දෙසො.**

## 3 – 4. වොදානඤාණානි

කතමානි තෙරස වොදානෙ ඤාණානි: අතීතානුධාවනං චිත්තං වික්ඛෙපානුපතිතං, තං විවජ්ජයිත්වා එකට්ඨානෙ සමාදහති, එවම්පි චිත්තං න වික්ඛෙපං ගච්ඡති, අනාගතපටිකඞ්ඛනං චිත්තං විකම්පිතං,[2] තං විවජ්ජයිත්වා තත්ථෙව අධිමොචෙති, එවම්පි චිත්තං න වික්ඛෙපං ගච්ඡති, ලීනං චිත්තං කොසජ්ජානුපතිතං, තං පග්ගණ්හිත්වා කොසජ්ජං පජහති, එවම්පි චිත්තං න වික්ඛෙපං ගච්ඡති. අතිපග්ගහිතං චිත්තං උද්ධච්චානුපතිතං, තං නිග්ගණ්හිත්වා[3] උද්ධච්චං පජහති, එවම්පි චිත්තං න වික්ඛෙපං ගච්ඡති, අභිනතං චිත්තං රාගානුපතිතං, තං සම්පජානො හුත්වා රාගං පජහති, එවම්පි චිත්තං න වික්ඛෙපං ගච්ඡති අපනතං චිත්තං බ්‍යාපාදානුපතිතං, තං සම්පජානො හුත්වා, බ්‍යාපාදං පජහති, එවම්පි චිත්තං න වික්ඛෙපං ගච්ඡති, ඉමෙහි ඡහි ඨානෙහි පරිසුද්ධං චිත්තං පරියොදාතං එකත්තගතං හොති.

කතමෙ තෙ එකත්තා: දානවොස්සග්ගුපට්ඨානෙකත්තං,[4] සමථනිමිත්තුපට්ඨානෙකත්තං, වයලක්ඛණුපට්ඨානෙකත්තං, නිරොධුපට්ඨානෙකත්තං.

දානවොස්සග්ගුපට්ඨානෙකත්තං චාගාධිමුත්තානං, සමථනිමිත්තුපට්ඨානෙකත්තඤ්ච අධිචිත්තමනුයුත්තානං, වයලක්ඛණුපට්ඨානෙකත්තඤ්ච විපස්සකානං, නිරොධුපට්ඨානෙකත්තඤ්ච අරියපුග්ගලානං, ඉමෙහි චතූහි ඨානෙහි එකත්තගතං චිත්තං පටිපදාවිසුද්ධිපක්ඛන්තඤ්චෙව[5] හොති, උපෙක්ඛානුබ්‍රූහිතඤ්ච ඤාණෙන ච සම්පහංසිතං.

පඨමස්ස ඣානස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: පඨමස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි, උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ, සම්පහංසනා පරියොසානං.

---

1. ආනාපානස්සති යස්ස පරිපුණ්ණා - මජසං... යස්ස අපරිපුණ්ණා - සෑ, PTS,
2, විකම්භිතං - PTS, සී 2
3. විනිග්ගණ්හිත්වා - මජසං,
4. දානවොසග්ගුපට්ඨානෙකත්තා - මජසං.
5. පක්ඛන්දඤ්චෙව - මජසං පසන්නඤ්චෙව - සෑ PTS,

යමක්හු විසින් ආනාපානස්මෘතිය පරිපූර්ණ කොට අභාවිත වූවා ද (ඔහුගේ) කයත් කම්පිත වූයේ වෙයි. සිතත් කම්පිත වූයේ වෙයි. කයත් සැලුණේ වෙයි සිතත් සැලුණේ වේ. (10)

යමක්හු විසින් ආනාපානස්මෘතිය පරිපූර්ණ කොට මොනොවට වඩනලද ද (ඔහුගේ) කයත් කම්පිත නො වූයේ වෙයි. සිතත් කම්පිත නො වූයේ වෙයි. කයත් නො සැලුණේ වෙයි. සිතත් නො සැලුණේ වේ. (11)

තවද මේ නීවරණයන් කෙරෙන් (උපචාරභූමියෙහි) විශුද්ධ වූ සිත් ඇති, ෂොඩශවස්තුක ආනාපානස්මෘතිසමාධිය වඩන්නහුට ක්ෂණිකසමවධානය (උපක්ලේශසමාගමය) හෙතු කොට ගෙන මේ අටළොස් උපක්ලේශයෝ උපදිත්.

**උපක්ලේශඥානනිර්දේශ යි.**

## 3 - 4. ව්‍යවදානඥාන

තෙළෙස් ව්‍යවදානඥානයෝ කවරහ යත්: අතීතය ලුහුබඳනා වික්ෂේපය අනු වැ ගිය සිතෙක් වේ ද, එය හැරපියා (ආශ්වාසප්‍රශ්වාසයන් අතුරෙන්) එක්තැනෙක පිහිටුවයි. මෙසේත් සිත වික්ෂේපයට නො යෙයි. අනාගතය ප්‍රාර්ථනා කරන වෙසෙසින් කම්පිත වූ සිතෙක් වේ ද, එය හැරපියා එහි මැ සනිටුහන් කෙරෙයි. මෙසේත් සිත වික්ෂේපයට නො යෙයි. ලීන වූ කෞසීද්‍යය අනු වැ ගිය සිතෙක් වේ ද, එය ප්‍රග්‍රහණය කොට කෞසීද්‍යය දුරු කෙරෙයි, මෙසේත් සිත වික්ෂේපයට නො යෙයි. ඉතා දැඩි කොට ගන්නා ලද ඖද්ධත්‍යය අනු වැ ගිය සිතෙක් වේද, එය නිග්‍රහ කොට ඖද්ධත්‍යය දුරු කෙරෙයි. මෙසේත් සිත වික්ෂේපයට නො යෙයි. වෙසෙසින් නැමුණු රාගය අනු වැ ගිය සිතෙක් වේද, සම්‍යග්ඥාන ඇති වැ ඒ රාගය දුරු කෙරෙයි. මෙසේත් සිත වික්ෂේපයට නො යෙයි. නතු නො වූ ව්‍යාපාදය අනු වැ ගිය සිතෙක් වේ ද, සම්‍යග්ඥාන ඇති වැ ඒ ව්‍යාපාදය දුරු කෙරෙයි. මෙසේත් සිත වික්ෂේපයට නො යෙයි. මේ සකරුණින් පිරිශුද්ධ වූ සිත ප්‍රභාස්වර වූයේ එකත්වයට ගියේ වේ.

ඒ එකත්වයෝ කවරහ යත්: දානවස්තුපරිත්‍යාගයාගේ එළඹසිටීමෙන් වූ එකත්ව යැ ශමථනිමිත්ත එළඹසිටීමෙන් වූ එකත්ව යැ භඞ්ගලක්ෂණය එළඹසිටීමෙන් වූ එකත්ව යැ නිරොධය එළඹසිටීමෙන් වූ එකත්ව යයි.

දානවස්තුපරිත්‍යාගයාගේ එළඹසිටීමෙන් වූ එකත්වය දානයෙහි අධිමුක්තයනට වෙයි. විදර්ශනාපාදකසමාධිය අනු වැ යෙදුණවුනට ශමථනිමිත්ත එළඹසිටීමෙන් වූ එකත්වය ද විදර්ශකයනට භඞ්ගලක්ෂණය එළඹසිටීමෙන් වූ එකත්වය ද අර්යපුද්ගලයනට නිරොධය එළඹසිටීමෙන් වූ එකත්වය ද වෙයි. මේ සතර කරුණින් එකත්වයට ගිය සිත ප්‍රතිපද්විශුද්ධියට පිවිසියේ ද වෙයි. උපෙක්ෂායෙන් වඩනලද්දේත් ඥානයෙන් විශොධිත වූයේත් වේ.

ප්‍රථමධ්‍යානයාගේ ආදිය කවරෙ යැ මධ්‍යය කවරෙ යැ පර්යවසානය කවරෙ යත්: ප්‍රතිපද්විශුද්ධිය ප්‍රථමධ්‍යානයාගේ ආදි යැ උපෙක්ෂානුබෘංහණය මධ්‍ය යැ සම්ප්‍රහර්ෂණය පර්යවසාන යි.

පඨමස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි, ආදිස්ස කති ලක්ඛණානි; ආදිස්ස තීණි ලක්ඛණානි: යො තස්ස පරිපන්ථො තතො චිත්තං විසුජ්ඣති, විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, පටිපන්නත්තා තත්ථ චිත්තං පක්ඛන්දති; යඤ්ච පරිපන්ථතො චිත්තං විසුජ්ඣති, යඤ්ච විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, යඤ්ච පටිපන්නත්තා තත්ථ චිත්තං පක්ඛන්දති, පඨමස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි, ආදිස්ස ඉමානි තීණි ලක්ඛණානි, තෙන වුච්චති පඨමං ඣානං ආදිකල්‍යාණඤ්චෙව හොති ලක්ඛණසම්පන්නඤ්ච.

පඨමස්ස ඣානස්ස උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ, මජ්ඣස්ස කති ලක්ඛණානි. මජ්ඣස්ස තීණි ලක්ඛණානි: විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති, එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති; යඤ්ච විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, යඤ්ච සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති, යඤ්ච එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති, පඨමස්ස ඣානස්ස උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ, මජ්ඣස්ස ඉමානි තීණි ලක්ඛණානි, තෙන වුච්චති පඨමං ඣානං මජ්ඣෙකල්‍යාණඤ්චෙව හොති ලක්ඛණසම්පන්නඤ්ච.

පඨමස්ස ඣානස්ස සම්පහංසනා පරියොසානං පරියොසානස්ස කති ලක්ඛණානි; පරියොසානස්ස චත්තාරි ලක්ඛණානි; තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන සම්පහංසනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන සම්පහංසනා, තදුපගවිරියවාහනට්ඨෙන සම්පහංසනා, ආසෙවනට්ඨෙන සම්පහංසනා; පඨමස්ස ඣානස්ස සම්පහංසනා පරියොසානං. පරියොසානස්ස ඉමානි චත්තාරි ලක්ඛණානි, තෙන වුච්චති පඨමං ඣානං පරියොසානකල්‍යාණඤ්චෙව හොති ලක්ඛණසම්පන්නඤ්ච.

එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං විතක්කසම්පන්නඤ්චෙව හොති විචාරසම්පන්නඤ්ච පීතිසම්පන්නඤ්ච සුඛසම්පන්නඤ්ච චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධාසම්පන්නඤ්ච විරියසම්පන්නඤ්ච සතිසම්පන්නඤ්ච සමාධිසම්පන්නඤ්ච පඤ්ඤාසම්පන්නඤ්ච.

දුතියස්ස ඣානස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: දුතියස්ස ඣානස්ස පටිපදාවිසුද්ධි ආදි, උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ, සම්පහංසනා පරියොසානං -පෙ- එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං පීතිසම්පන්නඤ්චෙව හොති සුඛසම්පන්නඤ්ච චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධාසම්පන්නඤ්ච විරියසම්පන්නඤ්ච සතිසම්පන්නඤ්ච සමාධිසම්පන්නඤ්ච පඤ්ඤාසම්පන්නඤ්ච.

තතියස්ස ඣානස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: -පෙ- එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං සුඛසම්පන්නඤ්චෙව හොති චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධාසම්පන්නඤ්ච විරියසම්පන්නඤ්ච සතිසම්පන්නඤ්ච සමාධිසම්පන්නඤ්ච පඤ්ඤාසම්පන්නඤ්ච.

ප්‍රතිපද්විශුද්ධිය ප්‍රථමධ්‍යානයාගේ ආදි යැ. ආදිහුගේ ලක්‍ෂණ කොතෙක් ද යත්: ආදිහුගේ ලක්‍ෂණ තුනෙකි. යමෙක් ඒ ප්‍රථමධ්‍යානයට පරිපන්‍ථ වේ නම් එයින් සිත විශුද්ධ වෙයි. විශුද්ධ බැවින් සිත මධ්‍යමශමථ-නිමිත්තට (අර්පණාසමාධියට) පැමිණෙයි. පිළිපන් බැවින් එහි සිත පිවිසෙයි. පරිපන්‍ථයෙන් යම් චිත්තවිශුද්ධියකුත් වේ ද විශුද්ධ බැවින් චිත්තය මධ්‍යමශමථනිමිත්තට යම් බැසගැනීමකුත් වේ ද පිළිපන් බැවින් එහි යම් සිත පිවිසගැනීමකුත් වේ ද, ප්‍රතිපද්විශුද්ධිය ප්‍රථමධ්‍යානයාගේ ආදි යැ ආදිහුගේ මේ තුන් ලක්‍ෂණයෝ වෙති. එයින් කියනු ලැබෙයි. 'ප්‍රථම-ධ්‍යානය ආදිකල්‍යාණ ද ලක්‍ෂණසම්පන්න ද වේ යයි.

උපෙක්‍ෂානුබෘංහණය ප්‍රථමධ්‍යානයාගේ මධ්‍යය වෙයි. මධ්‍යයාගේ ලක්‍ෂණ කොතෙක් ද යත්: මධ්‍යයාගේ ලක්‍ෂණ තුනෙකි. විශුද්ධ සිත අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි. ශමථයට පිළිපන් සිත අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි. එකත්වයෙන් එළඹසිටි සිත අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි. යම් විශුද්ධ සිතක් අධ්‍යුපෙක්‍ෂා කෙරේ ද යම් ශමථයට පිළිපන් සිතක් අධ්‍යුපෙක්‍ෂා කෙරේ ද යම් එකත්වයෙන් එළඹසිටි සිතක් අධ්‍යුපෙක්‍ෂා කෙරේ ද, ඒ උපෙක්‍ෂානු-බෘංහණය ප්‍රථමධ්‍යානයාගේ මධ්‍යය වෙයි. මධ්‍යයාගේ මේ තුන් ලක්‍ෂණයෝ වෙති. එයින් කියනු ලැබෙයි. 'ප්‍රථමධ්‍යානය මධ්‍යකල්‍යාණ ද ලක්‍ෂණ-සම්පන්න ද වේ' යයි.

සම්ප්‍රහර්ෂණය ප්‍රථමධ්‍යානයාගේ පර්‍යවසානය වෙයි. පර්‍යවසානයාගේ ලක්‍ෂණ කොතෙක් ද යත්: පර්‍යවසානයාගේ ලක්‍ෂණ සතරෙකි. ඒ භාවනාවිශෙෂයෙහි උපන් (සමාධිප්‍රඥ සඞ්ඛ්‍යාත යුගනද්ධ) ධර්මයන් (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් සම්ප්‍රහර්ෂණ යැ (ශ්‍රද්ධාදි) ඉන්ද්‍රියයන්ගේ එකකෘත්‍යභාවයෙන් සම්ප්‍රහර්ෂණ යැ තදනුවර්ජවීක-වීර්‍යාධුර ස්වභාවයෙන් සම්ප්‍රහර්ෂණ යැ ආසෙවන ස්වභාවයෙන් සම්ප්‍රහර්ෂණ යි. සම්ප්‍රහර්ෂණය ප්‍රථමධ්‍යානයාගේ පර්‍යවසානය වෙයි. පර්‍යවසානයාගේ මේ සතර ලක්‍ෂණයෝ වෙති. එයින් කියනු ලැබෙයි. 'ප්‍රථමධ්‍යානය පර්‍යවසානකල්‍යාණ ද ලක්‍ෂණසම්පන්න ද වේ' යයි.

මෙසෙයින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධකල්‍යාණ ඇත්තේ දශලක්‍ෂණ-සම්පන්න වූයේ විතර්කසම්පන්න ද විචාරසම්පන්න ද ප්‍රීතිසම්පන්න ද සුඛ-සම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨානසම්පන්න ද ශ්‍රද්ධාසම්පන්න ද වීර්‍යසම්පන්න ද ස්මෘතිසම්පන්න ද සමාධිසම්පන්න ද ප්‍රඥාසම්පන්න ද වේ.

ද්විතීයධ්‍යානයාගේ ආදිය කවරේ යැ මධ්‍යය කවරේ යැ පර්‍යවසානය කවරේ යැ යත්: ප්‍රතිපද්විශුද්ධිය ද්විතීයධ්‍යානයාගේ ආදි යැ. උපෙක්‍ෂානු-බෘංහණය මධ්‍ය යැ සම්ප්‍රහර්ෂණය පර්‍යවසාන යි ... මෙසෙයින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධකල්‍යාණ ඇත්තේ දශලක්‍ෂණසම්පන්න වූයේ ප්‍රීතිසම්පන්න ද සුඛසම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨානසම්පන්න ද ශ්‍රද්ධාසම්පන්න ද වීර්‍යසම්පන්න ද ස්මෘතිසම්පන්න ද සමාධිසම්පන්න ද ප්‍රඥාසම්පන්න ද වේ.

තෘතීයධ්‍යානයාගේ ආදිය කවරේ යැ මධ්‍යය කවරේ යැ පර්‍යව-සානය කවරේ යැ යත්: ... මෙසෙයින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධ-කල්‍යාණ ඇත්තේ දශලක්‍ෂණසම්පන්න වූයේ සුඛසම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨානසම්පන්න ද ශ්‍රද්ධාසම්පන්න ද වීර්‍යසම්පන්න ද ස්මෘතිසම්පන්න ද සමාධිසම්පන්න ද ප්‍රඥාසම්පන්න ද වේ.

චතුත්ථස්ස ඣානස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: -පෙ- එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං උපෙක්ඛාසම්පන්නඤ්චෙව හොති චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධාසම්පන්නඤ්ච විරියසම්පන්නඤ්ච සතිසම්පන්නඤ්ච සමාධිසම්පන්නඤ්ච පඤ්ඤාසම්පන්නඤ්ච.

ආකාසානඤ්චායතනසමාපත්තියා -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං -පෙ- එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං උපෙක්ඛාසම්පන්නඤ්චෙව හොති චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච -පෙ- පඤ්ඤාසම්පන්නඤ්ච.

අනිච්චානුපස්සනාය කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: -පෙ- එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං විතක්කසම්පන්නඤ්චෙව හොති විචාරසම්පන්නඤ්ච පීතිසම්පන්නඤ්ච සුඛසම්පන්නඤ්ච චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධාසම්පන්නඤ්ච විරියසම්පන්නඤ්ච සතිසම්පන්නඤ්ච සමාධිසම්පන්නඤ්ච පඤ්ඤාසම්පන්නඤ්ච.

දුක්ඛානුපස්සනාය -පෙ- අනත්තානුපස්සනාය -පෙ- නිබ්බිදානුපස්සනාය -පෙ- විරාගානුපස්සනාය -පෙ- නිරොධානුපස්සනාය -පෙ- පටිනිස්සග්ගානුපස්සනාය -පෙ- ඛයානුපස්සනාය -පෙ- වයානුපස්සනාය -පෙ- විපරිණාමානුපස්සනාය -පෙ- අනිමිත්තානුපස්සනාය -පෙ- අප්පණිහිතානුපස්සනාය -පෙ- සුඤ්ඤතානුපස්සනාය -පෙ- අධිපඤ්ඤාධම්මවිපස්සනාය -පෙ- යථාභූතඤාණදස්සනාය -පෙ- ආදීනවානුපස්සනාය -පෙ- පටිසඞ්ඛානුපස්සනාය -පෙ- විවට්ටනානුපස්සනාය -පෙ-

සොතාපත්තිමග්ගස්ස -පෙ- සකදාගාමිමග්ගස්ස -පෙ- අනාගාමිමග්ගස්ස -පෙ- අරහත්තමග්ගස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: අරහත්තමග්ගස්ස පටිපදාවිසුද්ධි ආදි, උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ, සම්පහංසනා පරියොසානං. අරහත්තමග්ගස්ස පටිපදාවිසුද්ධි ආදි, ආදිස්ස කති ලක්ඛණානි: ආදිස්ස තීණි ලක්ඛණානි: යො තස්ස පරිපන්ථො, තතො චිත්තං විසුජ්ඣති, විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, පටිපන්නත්තා තත්ථ චිත්තං පක්ඛන්දති: යඤ්ච පරිපන්ථතො චිත්තං විසුජ්ඣති, යඤ්ච විසුද්ධත්තා චිත්තං මජ්ඣිමං සමථනිමිත්තං පටිපජ්ජති, යඤ්ච පටිපන්නත්තා තත්ථ චිත්තං පක්ඛන්දති. අරහත්තමග්ගස්ස පටිපදාවිසුද්ධි ආදි, ආදිස්ස ඉමානි තීණි ලක්ඛණානි. තෙන වුච්චති අරහත්තමග්ගො ආදිකල්‍යාණො චෙව හොති ලක්ඛණසම්පන්නො ච.

අරහත්තමග්ගස්ස උපෙක්ඛානුබ්‍රූහනා මජ්ඣෙ. මජ්ඣස්ස කති ලක්ඛණානි: මජ්ඣස්ස තීණි ලක්ඛණානි: විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති, එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති. යඤ්ච විසුද්ධං චිත්තං අජ්ඣුපෙක්ඛති, යඤ්ච සමථපටිපන්නං අජ්ඣුපෙක්ඛති, යඤ්ච එකත්තුපට්ඨානං අජ්ඣුපෙක්ඛති තෙන වුච්චති අරහත්තමග්ගො මජ්ඣෙකල්‍යාණො චෙව හොති ලක්ඛණසම්පන්නො ච.

චතුර්ථධ්‍යානයාගේ ආදිය කවරේ යැ, මධ්‍යය කවරේ යැ, පර්‍යවසානය කවරේ යැ, යත්: ... මෙසෙයින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධකල්‍යාණ ඇත්තේ දශලක්‍ෂණසම්පන්න වූයේ උපෙක්‍ෂාසම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨානසම්පන්න ද ශ්‍රද්ධාසම්පන්න ද වීර්‍යසම්පන්න ද ස්මෘතිසම්පන්න ද සමාධිසම්පන්න ද ප්‍රඥාසම්පන්න ද වේ.

ආකාසානඤ්චායතනසමාපත්තිහුගේ ... විඤ්ඤාණඤ්චායතනසමාපත්ති-හුගේ ... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිහුගේ .. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිහුගේ ආදිය කවරේ යැ, මධ්‍යය කවරේ යැ, පර්‍යවසානය කවරේ යැ, යත්: ... මෙසෙයින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධකල්‍යාණ ඇත්තේ දශලක්‍ෂණසම්පන්න වූයේ උපෙක්‍ෂාසම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨාන-සම්පන්න ද ... ප්‍රඥාසම්පන්න ද වේ.

අනිච්චානුපස්සනාවගේ ආදිය කවරේ යැ, මධ්‍යය කවරේ යැ, පර්‍යව-සානය කවරේ යැ, යත්: ... මෙසෙයින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධකල්‍යාණ ඇත්තේ දශලක්‍ෂණසම්පන්න වූයේ විතර්කසම්පන්න ද විචාරසම්පන්න ද ප්‍රීතිසම්පන්න ද සුඛසම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨානසම්පන්න ද ශ්‍රද්ධා-සම්පන්න ද වීර්‍යසම්පන්න ද ස්මෘතිසම්පන්න ද සමාධිසම්පන්න ද ප්‍රඥා-සම්පන්න ද වේ.

දුක්ඛානුපස්සනාවගේ ... අනත්තානුපස්සනාවගේ ... නිබ්බිදානුපස්සනා-වගේ ... විරාගානුපස්සනාවගේ ... නිරොධානුපස්සනාවගේ ... පටිනිස්සග්ගා-නුපස්සනාවගේ ... ඛයානුපස්සනාවගේ ... වයානුපස්සනාවගේ ... විපරිණා-මානුපස්සනාවගේ ... අනිමිත්තානුපස්සනාවගේ ... අප්පණිහිතානුපස්සනා-වගේ ... සුඤ්ඤතානුපස්සනාවගේ .. අධිපඤ්ඤාධම්මවිපස්සනාවගේ ... යථාභූතඤාණදස්සනයාගේ ... ආදීනවානුපස්සනාවගේ ... පටිසඞ්ඛානු පස්සනාවගේ ... විවට්ටානුපස්සනාවගේ ...

ශ්‍රොතාපත්තිමාර්ගයාගේ ... සකෘදාගාමිමාර්ගයාගේ ... අනාගාමිමාර්ගයාගේ ... අර්හත්මාර්ගයාගේ ආදිය කවරේ යැ, මධ්‍යය කවරේ යැ, පර්‍යවසානය කවරේ යැ, යත්: ප්‍රතිපද්විශුද්ධිය අර්හත්මාර්ගයාගේ ආදි යැ, උපෙක්‍ෂානුබෘහණය මධ්‍ය යැ, සම්ප්‍රහර්ෂණය පර්‍යවසාන යි. ප්‍රතිපද්විශුද්ධිය අර්හත්මාර්ගයාගේ ආදිය වෙයි. ආදිහුගේ ලක්‍ෂණ කෙතෙක් ද, ආදිහුගේ ලක්‍ෂණ තුනෙකි. යම් ධර්මයෙක් ඒ ප්‍රතිපද්විශුද්ධියට පරිපන්ථ වේ ද එයින් සිත විශුද්ධ වෙයි. විශුද්ධ බැවින් සිත මධ්‍යමශමථනිමිත්තට පැමිණෙයි. පිළිපන් බැවින් එහි සිත පිවිසගනී. පරිපන්ථයෙන් යම් චිත්තවිශුද්ධියකුත් වේ ද විශුද්ධ බැවින් සිත මධ්‍යමශමථනිමිත්තට යම් පැමිණීමෙකුත් වේ ද පිළිපන් බැවින් එහි යම් සිත පිවිසගැනීමෙකුත් වේ ද ඒ ප්‍රතිපද්විශුද්ධිය අර්හත්මාර්ගයාගේ ආදිය වෙයි. ආදිහුගේ මේ තුන් ලක්‍ෂණයෝ වෙති. එයින් කියනු ලැබෙයි. 'අර්හත්මාර්ගය ආදිකල්‍යාණ ද ලක්‍ෂණසම්පන්න ද වේ' යයි

උපෙක්‍ෂානුබෘහණය අර්හත්මාර්ගයාගේ මධ්‍යය වෙයි, මධ්‍යයාගේ ලක්‍ෂණ කෙතෙක් ද යත්: මධ්‍යයාගේ ලක්‍ෂණ තුනෙකි: විශුද්ධ සිත අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි. ශමථයට පිළිපන් සිත අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි. එකත්වයෙන් එළඹ-සිටි සිත අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි. යම් විශුද්ධ සිතක් අධ්‍යුපෙක්‍ෂා කෙරේ නම් යම් ශමථයට පිළිපන් සිතක් අධ්‍යුපෙක්‍ෂා කෙරේ නම් යම් එකත්වයෙන් එළඹසිටි සිතක් අධ්‍යුපෙක්‍ෂා කෙරේ නම් එයින් කියනු ලැබෙයි: 'අර්හත්මාර්ගය මධ්‍යකල්‍යාණ ද ලක්‍ෂණසම්පන්න ද වේ' යයි.

අරහත්තමග්ගස්ස සම්පහංසනා පරියොසානං. පරියොසානස්ස කති ලක්ඛණානි. පරියොසානස්ස චත්තාරි ලක්ඛණානි: තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන සම්පහංසනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන සම්පහංසනා, තදුපගවිරියවාහනට්ඨෙන සම්පහංසනා, ආසෙවනට්ඨෙන සම්පහංසනා. අරහත්තමග්ගස්ස සම්පහංසනා පරියොසානං, පරියොසානස්ස ඉමානි චත්තාරි ලක්ඛණානි. තෙන වුච්චති: අරහත්තමග්ගො පරියොසානකල්‍යාණො චෙව හොති ලක්ඛණසම්පන්නො ච. එවං තිවත්තගතං චිත්තං තිවිධකල්‍යාණකං දසලක්ඛණසම්පන්නං විතක්කසම්පන්නඤ්චෙව හොති විචාරසම්පන්නඤ්ච පීතිසම්පන්නඤ්ච සුඛසම්පන්නඤ්ච චිත්තස්ස අධිට්ඨානසම්පන්නඤ්ච සද්ධාසම්පන්නඤ්ච විරියසම්පන්නඤ්ච සතිසම්පන්නඤ්ච සමාධිසම්පන්නඤ්ච පඤ්ඤාසම්පන්නඤ්ච.

නිමිත්තං අස්සාසපස්සාසා අනාරම්මණමෙකචිත්තස්ස,[1]
අජානතො ච තයො ධම්මෙ භාවනා නුපලබ්භති. (1)

නිමිත්තං අස්සාසපස්සාසා අනාරම්මණමෙකචිත්තස්ස,
ජානතො ච තයො ධම්මෙ භාවනා උපලබ්භතී'ති. (2)

කථං ඉමෙ තයො ධම්මා එකචිත්තස්ස ආරම්මණා න හොන්ති, න චිමෙ තයො ධම්මා අවිදිතා හොන්ති, න ච චිත්තං වික්ඛෙපං ගච්ඡති, පධානඤ්ච පඤ්ඤායති, පයොගඤ්ච සාධෙති, විසෙසමධිගච්ඡති:

සෙය්‍යථාපි රුක්ඛො සමෙ භූමිභාගෙ නික්ඛිත්තො,[2] තමෙනං පුරිසො කකචෙන ඡින්දෙය්‍ය, රුක්ඛෙ ඵුට්ඨකකචදන්තානං වසෙන පුරිසස්ස සති උපට්ඨිතා හොති, න ආගතෙ වා ගතෙ වා කකචදන්තෙ මනසිකරොති, න ආගතා වා ගතා වා කකචදන්තා අවිදිතා හොන්ති, පධානඤ්ච පඤ්ඤායති, පයොගඤ්ච සාධෙති. යථා රුක්ඛො සමෙ භූමිභාගෙ නික්ඛිත්තො, එවං උපනිබන්ධනානිමිත්තං. යථා කකචදන්තා, එවං අස්සාසපස්සාසා. යථා රුක්ඛෙ ඵුට්ඨකකචදන්තානං වසෙන පුරිසස්ස සති උපට්ඨිතා හොති න ආගතෙ වා ගතෙ වා කකචදන්තෙ මනසි කරොති, න ආගතා වා ගතා වා කකචදන්තා අවිදිතා හොන්ති, පධානඤ්ච පඤ්ඤායති, පයොගඤ්ච සාධෙති. එවමෙව භික්ඛු නාසිකග්ගෙ වා මුඛනිමිත්තෙ වා සතිං උපට්ඨපෙත්වා නිසින්නො හොති, න ආගතෙ වා ගතෙ වා අස්සාසපස්සාසෙ මනසි කරොති, න ආගතා වා ගතා වා අස්සාසපස්සාසා අවිදිතා හොන්ති, පධානඤ්ච පඤ්ඤායති, පයොගඤ්ච සාධෙති, විසෙසමධිගච්ඡති.

---

1. අනාරම්මණමෙකස්ස චිත්තස්ස - සී 1, 2 අනාරම්මණමෙකචිත්තස්ස - මජසං, අනාරම්මණං එකචිත්තස්ස - පු 2. නික්ඛිපිතො - සී 1, 2

සම්ප්‍රහර්ෂණය අර්හත්මාර්ගයාගේ පර්‍යවසානය වෙයි. පර්‍යවසානයාගේ ලක්ෂණ කෙතෙක් ද යත්: පර්‍යවසානයාගේ ලක්ෂණ සතරෙකි. ඒ භාවනා විශේෂයෙහි උපන් (සමාධි-ප්‍රඥා සඞ්ඛ්‍යාත යුගනද්ධ) ධර්මයන් (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් සම්ප්‍රහර්ෂණ යැ, ඉන්ද්‍රියයන් ගේ ඒක-කෘත්‍යස්වභාවයෙන් සම්ප්‍රහර්ෂණ යැ, තදනුවජ්ජිකවීර්‍යධුරස්වභාවයෙන් සම්ප්‍රහර්ෂණ යැ, ආසෙවනස්වභාවයෙන් සම්ප්‍රහර්ෂණ යි. සම්ප්‍රහර්ෂණය අර්හත්මාර්ගයාගේ පර්‍යවසානය වෙයි. පර්‍යවසානයාගේ මේ සතර ලක්ෂණ-යෝ වෙති. එයින් කියනු ලැබෙයි 'අර්හත්මාර්ගය පර්‍යවසානලක්ෂණ ද ලක්ෂණසම්පන්න ද වේ'යයි. මෙසෙයින් ත්‍රිවිධභාවයට ගිය සිත ත්‍රිවිධ-කල්‍යාණ ඇත්තේ දශලක්ෂණසම්පන්න වූයේ විතර්කසම්පන්න ද විචාර සම්පන්න ද ප්‍රීතිසම්පන්න ද සුඛසම්පන්න ද චිත්තයාගේ අධිෂ්ඨානසම්පන්න ද ශ්‍රද්ධාසම්පන්න ද වීර්‍යසම්පන්න ද ස්මෘතිසම්පන්න ද සමාධිසම්පන්න ද ප්‍රඥාසම්පන්න ද වේ.

නිමිත්ත යැ ආශ්වාසප්‍රශ්වාසයෝ යැ යන මොහු එක් සිතට අරමුණු නො වන්නාහු වෙති. (නිමිත්තාදි) තුන් ධර්මයන් නො දන්නාහට (ආනා-පානසතිසමාධි) භාවනාව නො ලැබෙයි. (1)

නිමිත්ත යැ ආශ්වාසප්‍රශ්වාසයෝ යැ යන මොහු එක් සිතට අරමුණු නො වන්නාහු වෙති. (නිමිත්තාදි) තුන් ධර්මයන් දන්නාහට වැලිත් (ආනාපානසතිසමාධි) භාවනාව ලැබේ යයි. (2)

කිසෙයින් මේ තුන් ධර්මයෝ එක් සිතට අරමුණු නො වන්නාහු ද, මේ තුන් ධර්මයෝ නො ද අවිදිතයෝ වෙත් ද, සිත වික්ෂේපයට නො ද යෙයි. ප්‍රදහන ද පැනෙයි. ප්‍රයොගය (නීවරණවිෂ්කම්භකධ්‍යානය) ද සාධයි. මාර්ගයට පැමිණෙයි යත්:

යම්සේ සම වූ භූමිභාගයෙහි රෝපණය කරන ලද වෘක්ෂයෙක් වේ ද, ඒ මේ වෘක්ෂය පුරුෂයෙක් තෙම කියතින් සිඳුනේ නම් වෘක්ෂයෙහි ස්පර්ශ කරන ලද කියත්දත් වශයෙන් පුරුෂයාගේ සිහිය එළඹසිටියා වෙයි. (වෘක්ෂය ස්පර්ශ කොට තමා වෙතට) ආවා වූ හෝ (වෘක්ෂය ස්පර්ශ කොට පරභාගයට) ගියා වූ හෝ කියත්දත් නො මෙනෙහි කෙරෙයි. ආවා වූ හෝ ගියා වූ හෝ කියත්දත් නො දන්නා ලද්දාහු නො වෙති, ප්‍රදහන ද පැනෙයි, ප්‍රයොගය ද සාධයි. සම වූ භූමිභාගයෙහි රෝපණය කරනලද වෘක්ෂය යම්බඳු ද උපනිබන්ධනා (ස්මෘති) නිමිත්ත එබඳු යැ. කියත්දත් යම් බඳු ද ආශ්වාසප්‍රශ්වාසයෝ එබඳු යැ. යම්සේ වෘක්ෂයෙහි ස්පර්ශ කරනලද කියත්දත් වශයෙන් පුරුෂයාගේ ස්මෘතිය එළඹසිටියා වේ ද ආගිය කියත්දත් නො මෙනෙහි කෙරේ ද ආගිය කියත්දත් නොදන්නාලද්දාහු නො වෙත් ද ප්‍රදහනත් පැනේ ද ප්‍රයො-ගයත් සාධා ද, එසෙයින් මැ මහණ තෙම නාසිකාග්‍රයෙහි හෝ මුඛ-නිමිත්තෙහි හෝ සිහි එළවා හුන්නේ වෙයි. ආවා වූ හෝ ගියා වූ හෝ ආශ්වාසප්‍රශ්වාසයන් නො මෙනෙහි කෙරෙයි. ආවා වූ හෝ ගියා වූ හෝ ආශ්වාසප්‍රශ්වාසයන් නො දන්නාලද්දාහු නො වෙති, ප්‍රදහන ද පැනෙයි, ප්‍රයොගය ද සාධයි, විශේෂයට (මාර්ගයට) පැමිණේ.

**පධානන්ති**[1] කතමං පධානං: ආරද්ධවිරියස්ස කායොපි චිත්තම්පි කම්මනියං හොති, ඉදං පධානං. කතමො පයොගො: ආරද්ධවිරියස්ස උපක්කිලෙසා පහීයන්ති, විතක්කා වූපසමන්ති, අයං පයොගො. කතමො විසෙසො: ආරද්ධවිරියස්ස සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති[2] අයං විසෙසො.

එවං ඉමෙ තයො ධම්මා එකචිත්තස්ස ආරම්මණා න හොන්ති, න චිමෙ[3] තයො ධම්මා අවිදිතා හොන්ති, න ච චිත්තං වික්ඛෙපං ගච්ඡති, පධානඤ්ච පඤ්ඤායති, පයොගඤ්ච සාධෙති, විසෙසමධිගච්ඡති.

ආනාපානසති යස්ස පරිපුණ්ණා සුභාවිතා,
අනුපුබ්බං පරිචිතා යථා බුද්ධෙන දෙසිතා,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා”ති. (3),

**ආනන්ති** අස්සාසො, නො පස්සාසො. **අපානන්ති** පස්සාසො, නො අස්සාසො. අස්සාසවසෙන උපට්ඨානං සති, පස්සාසවසෙන උපට්ඨානං සති. යො අස්සසති, තස්සුපට්ඨාති; යො පස්සසති, තස්සුපට්ඨාති.

**පරිපුණ්ණාති** පරිග්ගහට්ඨෙන පරිපුණ්ණා, පරිවාරට්ඨෙන පරිපුණ්ණා, පරිපූරට්ඨෙන පරිපුණ්ණා.

**සුභාවිතාති** චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා. තස්සිමෙ චත්තාරො භාවනට්ඨා යානීකතා[4] හොන්ති වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා.

**යානීකතාති** යත්ථ යත්ථ ආකඞ්ඛති, තත්ථ තත්ථ වසිප්පත්තො හොති බලප්පත්තො වෙසාරජ්ජප්පත්තො. තස්ස[5] තෙ ධම්මා ආවජ්ජනපටිබද්ධා[6] හොන්ති ආකඞ්ඛනපටිබද්ධා[7] මනසිකාරපටිබද්ධා චිත්තුප්පාදපටිබද්ධා. තෙන වුච්චති: ‘යානීකතා’ති.

**වත්ථුකතාති** යස්මිං යස්මිං වත්ථුස්මිං චිත්තං ස්වාධිට්ඨිතං හොති තස්මිං තස්මිං වත්ථුස්මිං සති සූපට්ඨිතා[8] හොති. යස්මිං යස්මිං වා පන වත්ථුස්මිං සති සූපට්ඨිතා හොති, තස්මිං තස්මිං වත්ථුස්මිං චිත්තං ස්වාධිට්ඨිතං හොති. තෙන වුච්චති: ‘වත්ථුකතා’ති.

**අනුට්ඨිතාති**[9] යෙන යෙන චිත්තං අභිනීහරති, තෙන තෙන සති අනුපරිවත්තති. යෙන යෙන වා පන සති අනුපරිවත්තති, තෙන තෙන චිත්තං අභිනීහරති. තෙන වුච්චති: ‘අනුට්ඨිතා’ති.

---

1. විසෙසමධිගච්ඡති පධානඤ්ච - මජ්ඣං., ‘පධානන්ති’ පදං - ස්‍යා, PTS පොත්ථකෙසු න දිස්සති.
2. බ්‍යාසන්ති - ස්‍යා, බ්‍යන්තිහොන්ති - PTS  3. න චිමෙ - පු  4 යානිකතා - PTS.
5. තස්ස මෙ - මජ්ඣං.  6 අවජ්ජනපටිබද්ධා - PTS
7. ආකඞ්ඛපටිබද්ධා - මජ්ඣං., ආකඞ්ඛණපටිබද්ධා - PTS ආකඞ්ඛනපටිබද්ධා ස්‍යා.
8. සුපට්ඨිතා - මජ්ඣං., සුපතිට්ඨිතා - PTS.  9. අනුට්ඨිතාති වත්ථුස්මිං - මජ්ඣං.

**පධානං** යනු: ප්‍රදහන කවරේ යත්: ආරබ්ධවීර්‍ය්‍ය ඇත්තහුගේ කයත් සිතත් කර්මණ්‍ය වෙයි. මේ ප්‍රදහන වෙයි. ප්‍රයොග කවරෙ යත්: ආරබ්ධවීර්‍ය්‍ය ඇත්තහුගේ උපක්ලේශයෝ ප්‍රහීණ වෙති. විතර්කයෝ සන්හිදෙත්. මේ ප්‍රයොගය වෙයි. විශෙෂ කවරෙ යත්: ආරබ්ධවීර්‍ය්‍ය ඇත්තහුගේ සංයොජනයෝ ප්‍රහීණ වෙති. අනුශයයෝ විගත වෙත්. මේ විශෙෂය වෙයි.

මෙසෙයින් මේ තුන් ධර්මයෝ එක් සිතට අරමුණු නො වෙති. මේ තුන් ධර්මයෝ නො දන්නාලද්දාහු නො ද වෙති. සිත වික්ෂෙපයට නො ද යෙයි. ප්‍රදහන ද පැනෙයි. ප්‍රයොගය ද සාධයි විශෙෂයට පැමිණේ.

යමක්හු විසින් ආනාපානසමෘතිය බුදුන් වදාළ සෙයින් පරිපූර්ණ වූවා මොනොවට වඩනලද ද පිළිවෙළින් ප්‍රගුණ කරනලද ද හෙතෙම වලායෙන් මිදුණු සඳ සෙයින් මෙලොව දීප්ත කෙරේ. (3)

**ආන** යනු. ආශ්වාස යෑ ප්‍රශ්වාසය නො වෙයි. **අපාන** යනු: ප්‍රශ්වාස යෑ ආශ්වාසය නො වෙයි, ආශ්වාස වශයෙන් එළඹසිටීම සමෘති යෑ, ප්‍රශ්වාස වශයෙන් එළඹ සිටීම සමෘති යි. යමෙක් ආශ්වාස කෙරේ ද ඔහුගේ සිහිය ආශ්වාසයට එළඹසිටියි. යමෙක් ප්‍රශ්වාස කෙරේ ද ඔහුගේ සිහිය ප්‍රශ්වාසයට එළඹසිටී.

**පරිපුණ්ණා** යනු: පරිග්‍රහසවභාවයෙන් පරිපූර්ණ යෑ පරිවාරසවභාවයෙන් පරිපූර්ණ යෑ (භාවනා) පරිපූර සවභාවයෙන් පරිපූර්ණ යි.

**සුභාවිතා** යනු: භාවනා සතරෙකි: ඒ භාවනා විශෙෂයෙහි උපන් (සමාධි – ප්‍රඥ සඞ්ඛ්‍යාත යුගනද්ධ) ධර්මයන් (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා සවභාවයෙන් භාවනා යෑ, ඉන්ද්‍රියයන්ගේ එකකෘත්‍යසවභාවයෙන් භාවනා යෑ තදනුවත්තක වීර්‍ය්‍යවිධුර සවභාවයෙන් භාවනා යෑ ආසෙවන සවභාවයෙන් භාවනා යි. ඔහු විසින් මේ සතර භාවනාවීයෝ යුක්තයානයක් මෙන් කරනලද්දාහු (ප්‍රතිෂ්ඨාවීයෙන්) වාසතුවක් මෙන් කරනලද්දාහු එළඹසිටියාහු හාත්පසින් රැස්කරන ලද්දාහු මොනොවට කරන ලද්දාහු වෙත්.

**යානීකතා** යනු: යම් යම් ධ්‍යානවිදර්ශනායෙක්හි කැමැති වේ නම් ඒ ඒ ධ්‍යානවිදර්ශනායෙහි වශයට පැමිණියේ බලයට පැමිණියේ විශාරද බවට පැමිණියේ වෙයි. ඔහුගේ ඒ (ශමථවිදර්ශනා) ධර්මයෝ ආවර්ජනප්‍රතිබද්ධවූවාහු ආකාඞ්ක්ෂාප්‍රතිබද්ධ වූවාහු මනසිකාරප්‍රතිබද්ධ වූවාහු චිත්තොත්පාදප්‍රතිබද්ධ වූවාහු වෙත්. එයින් කියනු ලැබෙයි: 'යානීකතා' යි.

**වත්ථුකතා** යනු: යම් යම් වස්තුයෙකැ සිත මොනොවට පිහිටියේ වේ ද ඒ ඒ වස්තුයෙහි සිහි එළඹසිටියා වෙයි. තවද යම් යම් වස්තුයෙකැ සිහි එළඹසිටියා වේ ද ඒ ඒ වස්තුයෙහි සිත මොනොවට පිහිටියේ වෙයි. එයින් කියනු ලැබෙයි. 'වත්ථුකතා' යි.

**අනුට්ඨිතා** යනු: යම් යම් භාවනාවිශෙෂයෙක්හි සිත එළවා ද ඒ ඒ භාවනාවිශෙෂයෙහි සිහිය අනුකූල වැ පවතී. තවද යම් යම් භාවනාවිශෙෂයෙක්හි සිහිය අනුකූල වැ පෙරළේ ද ඒ ඒ භාවනාවිශෙෂයෙහි සිත එළවයි. එයින් කියනු ලැබෙයි: 'අනුට්ඨිතා' යි.

**පරිචිතාති** පරිග්ගහට්ඨෙන පරිචිතා, පරිවාරට්ඨෙන පරිචිතා, පරිපූරට්ඨෙන පරිචිතා, සතියා පරිග්ගණ්හන්තො ජිනාති පාපකෙ අකුසලෙ ධම්මෙ. තෙන වුච්චති: 'පරිචිතා'ති.[1]

**සුසමාරද්ධාති** චත්තාරො සුසමාරද්ධා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන සුසමාරද්ධා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන සුසමාරද්ධා, තදුපගවිරියවාහනට්ඨෙන සුසමාරද්ධා, තප්පච්චනීකානං කිලෙසානං සමුග්ඝාතත්තා[2] 'සුසමාරද්ධා.'

**සුසමන්ති** අත්ථි සමං, අත්ථි සුසමං. කතමං සමං: යෙ තත්ථ ජාතා අනවජ්ජා කුසලා බොධිපක්ඛියා,[3] ඉදං සමං. කතමං සුසමං: යං තෙසං තෙසං ධම්මානං ආරම්මණං නිරොධො නිබ්බානං, ඉදං සුසමං, ඉති ඉදඤ්ච සමං ඉදඤ්ච සුසමං ඤාතං හොති දිට්ඨා[4] විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය, ආරද්ධං හොති විරියං අසල්ලීනං, උපට්ඨිතා සති අපම්මුට්ඨා,[5] පස්සද්ධො කායො අසාරද්ධො, සමාහිතං චිත්තං එකග්ගං. තෙන වුච්චති: 'සුසමාරද්ධා'ති.

**අනුපුබ්බං පරිචිතාති** දීඝං අස්සාසවසෙන පුරිමා පුරිමා පරිචිතා, පච්ඡිමා පච්ඡිමා අනුපරිචිතා, දීඝං පස්සාසවසෙන පුරිමා පුරිමා පරිචිතා, පච්ඡිමා පච්ඡිමා අනුපරිචිතා. රස්සං අස්සාසවසෙන පුරිමා පුරිමා පරිචිතා, පච්ඡිමා පච්ඡිමා අනුපරිචිතා. රස්සං පස්සාසවසෙන පුරිමා පුරිමා පරිචිතා, පච්ඡිමා පච්ඡිමා අනුපරිචිතා -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන පුරිමා පුරිමා පරිචිතා, පච්ඡිමා පච්ඡිමා අනුපරිචිතා. පටිනිස්සග්ගානුපස්සී පස්සාසවසෙන පුරිමා පුරිමා පරිචිතා පච්ඡිමා පච්ඡිමා අනුපරිචිතා. සබ්බාපි සොළසවත්ථුකා ආනාපානසතියො අඤ්ඤමඤ්ඤං පරිචිතා චෙව හොන්ති අනුපරිචිතා ච. තෙන වුච්චති: 'අනුපුබ්බං පරිචිතා'ති.

**යථාති** දස යථත්ථා: අත්තදමථට්ඨො යථත්ථො, අත්තසමථට්ඨො යථත්ථො, අත්තපරිනිබ්බාපනට්ඨො යථත්ථො, අභිඤ්ඤට්ඨො[6] යථත්ථො, පරිඤ්ඤට්ඨො යථත්ථො, පහානට්ඨො යථත්ථො, භාවනට්ඨො යථත්ථො, සච්ඡිකිරියට්ඨො යථත්ථො, සච්චාභිසමයට්ඨො යථත්ථො, නිරොධෙ පතිට්ඨාපකට්ඨො යථත්ථො.

---

1 ධම්මෙ පරිචිතා - මජසං  2 සුසමූහතත්තා - මජසං. සුසමුග්ඝාතත්තා - සයා, PTS.
3. බොධිපක්ඛියා - PTS.  4. දිට්ඨං - PTS.  5. අසම්මුට්ඨා මජසං අපම්මුට්ඨා - සයා, PTS.
6 අභිඤ්ඤත්ථො - මජසං

**පරිචිතා** යනු: පරිග්‍රහස්වභාවයෙන් හාත්පසින් රැස්කරන ලද්දාහු යැ පරිවාරස්වභාවයෙන් හාත්පසින් රැස් කරනලද්දාහු යැ පරිපූරස්වභාවයෙන් හාත්පසින් රැස්කරනලද්දාහු යැ ස්මෘතියෙන් පරිග්‍රහ කරනුයේ ලාමක අකුශල ධර්මයන් දිනා තු යි පරිචිතයෝ යි.

**සුසමාරද්ධා** යනු: සුසමාරබ්ධයෝ (මොනොවට හාරනලද්දාහු) සතර දෙනෙකි: ඒ භාවනාවිශේෂයෙහි උපන් යුගනද්ධධර්මයන් නොඉක්ම පවත්නාස්වභාවයෙන් සුසමාරබ්ධ යැ, ඉන්ද්‍රියයන්ගේ ඒකකෘත්‍යස්වභාවයෙන් සුසමාරබ්ධ යැ. තදනුච්ඡවිකවීර්‍ය්‍යධුරස්වභාවයෙන් සුසමාරබ්ධ යැ, ඒ ධ්‍යාන-විදර්ශනාමාර්ගයන්ට ප්‍රතිපක්ෂ වූ ක්ලේශයන් මොනොවට නැසූ බැවින් සුසමාරබ්ධ යි.

**සුසමං** යනු: ශමයෙක් ඇති සුශමයෙක් ඇති. 'ශම' නම් කවරෙ යත්: ඒ භාවනාවිශේෂයෙහි උපන් යම් නිරවද්‍ය වූ කුශල වූ බොධිපාක්ෂිකධර්ම කෙනෙක් වෙත් ද මේ ශම නම. සුශම' නම් කවරෙ යත්: ඒ ඒ ධර්මයන්ට අරමුණු වූ යම් නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයෙක් වේ ද, මේ සුශම නම් මෙසෙයින් මේ ශමයත් මේ සුශමයත් දන්නා ලද්දේ දක්නා ලද්දේ විදිත වූයේ ප්‍රඥයෙන් සාක්ෂාත් කරන ලද්දේ ස්පර්ශ කරන ලද්දේ වෙයි. නො හැකුළුණු වීර්‍ය්‍යය පටන්ගන්නාලද වෙයි, නො නට සිහි එළඹසිටියා වෙයි. දරථ රහිත කය නිවුණේ වෙයි. එකාග්‍ර වූ සිත (අරමුණෙහි) සම වැ තබනලද යැ. එසින් කියනු ලැබෙයි 'සුසමාරද්ධා' යි.

**අනුපුබ්බං පරිචිතා** යනු: දීර්ඝ කොට ආශ්වාස කිරීම් වශයෙන් පළමු පළමු සතිය ප්‍රගුණ කරන ලද යැ පැසුළු පැසුළු සතිය පුන පුනා ප්‍රගුණ කරන ලද යැ, දීර්ඝ කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් පළමු පළමු සතිය ප්‍රගුණ කරන ලද යැ පැසුළු පැසුළු සතිය පුනපුනා ප්‍රගුණ කරන ලද යැ, හ්‍රස්ව කොට ආශ්වාස කිරීම් වසයෙන් පළමු පළමු සතිය ප්‍රගුණ කරන ලද යැ. පැසුළු පැසුළු සතිය පුනපුනා ප්‍රගුණ කරන ලද යැ හ්‍රස්ව කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් පළමු පළමු සතිය ප්‍රගුණ කරන ලද යැ. පැසුළු පැසුළු සතිය පුනපුනා ප්‍රගුණ කරනලද යැ, ... පටිනිස්සජනය අනු වැ බලමින් ආශ්වාස කිරීම් වශයෙන් පළමු පළමු සතිය ප්‍රගුණ කරන ලද යැ පැසුළු පැසුළු සතිය පුනපුනා ප්‍රගුණ කරන ලද යැ, පටිනිස්සජනය අනු වැ බලමින් ප්‍රශ්වාස කිරීම් වසයෙන් පළමු පළමු සතිය ප්‍රගුණ කරන ලද යැ පැසුළු පැසුළු සතිය පුනපුනා ප්‍රගුණ කරන ලද යැ, හැම ෂොඩශවස්තුක ආනාපානස්මෘතීහු ඔවුනොවුන් ප්‍රගුණ කරන ලද්දාහු ද පුනපුනා ප්‍රගුණ කරන ලද්දාහු ද වෙත්, එසින් කියනු ලැබෙයි. අනුපුබ්බං පරිචිතා'යි.

**යථා** යනු: යථාස්වභාවයෝ දශ දෙනෙකි: ආත්මදමනස්වභාවය යථාස්වභාව යැ ආත්මශමනස්වභාවය යථාස්වභාව යැ ආත්මපරිනිර්වාපණස්වභාවය යථාස්වභාව යැ අභිඥාස්වභාවය යථාස්වභාව යැ පරිඥාස්වභාවය යථාස්වභාව යැ ප්‍රහාණස්වභාවය යථාස්වභාව යැ භාවනාස්වභාවය යථාස්වභාව යැ සාක්ෂාත්ක්‍රියාස්වභාවය යථාස්වභාව යැ සත්‍යප්‍රතිවෙධස්වභාවය යථාස්වභාව යැ නිරොධයෙහි පිහිටුවන ස්වභාවය යථාස්වභාව යි

**බුද්ධෙනාති** යො සො භගවා සයම්භූ අනාචරියකො පුබ්බෙ[1] අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣි,[2] තත්ථ ච සබ්බඤ්ඤුතං පත්තො බලෙසු ච වසීභාවං.

**බුද්ධොති** කෙනට්ඨෙන බුද්ධො: 'බුජ්ඣිතා සච්චානී'ති බුද්ධො, 'බොධෙතා[3] පජායා'ති බුද්ධො, සබ්බඤ්ඤුතාය බුද්ධො, සබ්බදස්සාවිතාය බුද්ධො, අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො, විසවිතාය[4] බුද්ධො, ඛීණාසවසඞ්ඛාතෙන බුද්ධො, නිරුපලෙපසඞ්ඛාතෙන[5] බුද්ධො, 'එකන්තවීතරාගො'ති බුද්ධො, 'එකන්තවීතදොසො'ති බුද්ධො, 'එකන්තවීතමොහො'ති බුද්ධො, 'එකන්තනික්කිලෙසො'ති බුද්ධො, 'එකායනමග්ගං ගතො'ති බුද්ධො, 'එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති බුද්ධො, අබුද්ධිවිහතත්තා බුද්ධිපටිලාභා බුද්ධො. 'බුද්ධො'ති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති, යදිදං 'බුද්ධො'ති.

**දෙසිතාති** අත්තදමථට්ඨො යථත්ථො යථා බුද්ධෙන දෙසිතො, අත්තසමථට්ඨො යථත්ථො යථා බුද්ධෙන දෙසිතො, අත්තපරිනිබ්බාපනට්ඨො යථත්ථො යථා බුද්ධෙන දෙසිතො -පෙ- නිරොධෙ පතිට්ඨාපකට්ඨො යථත්ථො යථා බුද්ධෙන දෙසිතො.

**සො ති[6]** ගහට්ඨො වා හොති පබ්බජිතො වා.

**ලොකොති** ඛන්ධලොකො ධාතුලොකො ආයතනලොකො විපත්තිභවලොකො විපත්තිසම්භවලොකො සම්පත්තිභවලොකො සම්පත්තිසම්භවලොකො එකො ලොකො: සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා -පෙ- අට්ඨාරස ලොකා අට්ඨාරස ධාතුයො.

**'පභාසෙතී'ති** අත්තදමථට්ඨං යථත්ථං අභිසම්බුද්ධත්තා සො ඉමං ලොකං ඔභාසෙති භාසෙති පභාසෙති, අත්තසමථට්ඨං යථත්ථං අභිසම්බුද්ධත්තා සො ඉමං ලොකං ඔභාසෙති භාසෙති පභාසෙති, අත්තපරිනිබ්බාපනට්ඨං යථත්ථං අභිසම්බුද්ධත්තා සො ඉමං ලොකං ඔභාසෙති භාසෙති පභාසෙති -පෙ- නිරොධෙ පතිට්ඨාපකට්ඨං යථත්ථං අභිසම්බුද්ධත්තා සො ඉමං ලොකං ඔභාසෙති භාසෙති පභාසෙති.

---

1 බුද්ධෙ - PTS  2 අභිසම්බුජ්ඣති - PTS  3 බොධෙතකා - සයා
4 විසතිතාය - සයා  5 නිරුපක්කිලෙසසඞ්ඛාතෙන - සයා  නිරුපධිසඞ්ඛාතෙන - PTS
6 හොති - සයා  සොති - PTS

**බුද්ධො** යනු: යමෙක් භාග්‍යවත් වූයේ තෙමේ (සත්‍යයන්) අවබොධ කෙළේ ආචාර්යයන් නැත්තේ පෙර නො ඇසූවිරූ දහම්හි තෙමේ සත්‍යයන් අවබොධ කෙළේ ඒ සත්‍යයන්හි දු සර්වඥත්වයට පැමිණියේ බලධර්මයන්හිදු වශීභාවයට පැමිණියේ වේ ද හේ යැ.

**බුද්ධො** යනු: කවර අර්ථයෙන් බුද්ධ වෙයි යත්: සත්‍යයන් අවබොධ කෙළේ නු යි බුද්ධ යැ ප්‍රජාවට අවබොධ කරවා නු යි බුද්ධ යැ, සර්වඥ බැවින් බුද්ධ යැ, සියල්ල දක්නාසුලු බැවින් බුද්ධ යැ, අනුන් විසින් අවබොධ නො කැරැවිය යුතු බැවින් බුද්ධ යැ, (නානාගුණ) විසවනය කරන හෙයින් බුද්ධ යැ, ක්ෂීණාස්‍රව සඞ්ඛ්‍යායෙන් බුද්ධ යැ, තෘෂ්ණාලෙප රහිත සඞ්ඛ්‍යායෙන් බුද්ධ යැ, එකාන්තයෙන් වීතරාග නු යි බුද්ධ යැ, එකාන්තයෙන් වීතදෙස නු යි බුද්ධ යැ, එකාන්තයෙන් වීතමොහ නු යි බුද්ධ යැ, එකාන්තයෙන් නිකෙලශ නු යි බුද්ධ යැ, එකාන්තමාර්ගයට ගියේ නු යි බුද්ධ යැ, එකලා වැ අනුත්තර සම්‍යක් සම්බොධිය අභිසම්බොධ කෙළේ නු යි බුද්ධ යැ, අබුද්ධිය නැසූ බැවින් බුද්ධිප්‍රතිලාභ හෙයින් බුද්ධ යැ, බුද්ධ යන තෙල නාමය මව විසින් නො කරනලද යැ පියා විසින් නො කරනලද යැ බෑයා විසින් නො කරන ලද යැ බූන විසින් නො කරනලද යැ සගයහළුවන් විසින් නො කරන ලද යැ නෑ සහලේනෑයන් විසින් නො කරනලද යැ මහණබමුණන් විසින් නො කරනලද යැ දෙවියන් විසින් නො කරනලද යැ. යම් බුද්ධ යන නමෙක් වී ද තෙල බුද්ධ නාමය භාග්‍යවත් බුදුවරයන්ට විමොක්ෂාන්තයෙහි බෝමුල සර්වඥතාඥනයාගේ ප්‍රතිලාභය හා සමග අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියකි.

**දෙසිතා** යනු: ආත්ම දමනසවභාව වූ යථාසවභාවය යම් ප්‍රකාරයෙකින් බුදුන් විසින් දෙශනා කරනලද ද, ආත්මශමනසවභාව වූ යථාසවභාවය යම් ප්‍රකාරයෙකින් බුදුන් විසින් දෙශනා කරනලද ද, ආත්මපරිනිර්වාපණසවභාව වූ යථාසවභාවය යම් ප්‍රකාරයෙකින් බුදුන් විසින් දෙශනා කරනලද ද ... නිරොධයෙහි පිහිටුවන සවභාව වූ යථාසවභාවය යම් ප්‍රකාරයෙකින් බුදුන් විසින් දෙශනා කරනලද ද,

**සො** යනු: ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ වෙයි.

**ලොකං** යනු: සකන්ධලොක යැ ධාතුලොක යැ ආයතනලොක යැ විපත්තිභව (අපාය) ලොක යැ විපත්තිසම්භව (අපායූපගකර්ම) ලොක යැ සම්පත්තිභව (සුගති) ලොක යැ සම්පත්තිසම්භවලොක යැ එක් ලොවෙක: හැම සත්හු ආහාරයෙන් සිටුනාහු යැ; ... අටලොස් ලොවෙක. අටලොස් ධාතුහු යැ.

**පභාසෙති** යනු: ආත්මදමනසවභාව වූ යථාසවභාවය ප්‍රතිවෙධ කළ බැවින් හෙතෙම මේ ලොකය අවභාසනය කෙරෙයි, භාසනය කෙරෙයි, ප්‍රභාසනය කෙරෙයි. ආත්මශමන සවභාව වූ යථාසවභාවය ප්‍රතිවෙධ කළ බැවින් හෙතෙම මෙ ලොව අවභාසනය කෙරෙයි, භාසනය කෙරෙයි, ප්‍රභාසනය කෙරෙයි. ආත්මපරිනිර්වාපණසවභාව වූ යථාසවභාවය ප්‍රතිවෙධ කළ බැවින් හෙතෙම මේ ලොව අවභාසනය කෙරෙයි, භාසනය කෙරෙයි, ප්‍රභාසනය කෙරෙයි ... නිරොධයෙහි පිහිටුවන සවභාව වූ යථාසවභාවය ප්‍රතිවෙධ කළ බැවින් හෙතෙම මෙ ලොව අවභාසනය කෙරෙයි, භාසනය කෙරෙයි, ප්‍රභාසනය කෙරේ.

**අබ්භාමුත්තොව චන්දිමාති** යථා අබ්භා එවං කිලෙසා, යථා චන්දො එවං අරියඤාණං, යථා චන්දිමා දෙවපුත්තො එවං භික්ඛු, යථා චන්දො අබ්භා මුත්තො මහිකා මුත්තො[1] ධූමරජා මුත්තො[2] රාහුගහණා[3] විප්පමුත්තො භාසතෙ[4] ච තපතෙ[5] ච විරොචතෙ[6] ච, එවමෙව භික්ඛු සබ්බකිලෙසෙහි විප්පමුත්තො භාසතෙ ච තපතෙ ච විරොචතෙ ච. තෙන වුච්චති: 'අබ්භා මුත්තොව චන්දිමා'ති. ඉමානි තෙරස වොදානෙ ඤාණානි.

**වොදානඤාණනිද්දෙසො.**

## 3 – 5. සතොකාරිඤාණානි

**කතමානි බත්තිංස සතොකාරිස්ස[7] ඤාණානි:**

ඉධ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සො සතොව අස්සසති, සතො පස්සසති, දීඝං වා අස්සසන්තො 'දීඝං අස්සසාමී'ති පජානාති, දීඝං වා පස්සසන්තො 'දීඝං පස්සසාමී'ති පජානාති, රස්සං වා අස්සසන්තො 'රස්සං අස්සසාමී'ති පජානාති, රස්සං වා පස්සසන්තො 'රස්සං පස්සසාමී'ති පජානාති 'සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති. 'සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති, 'පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති 'පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති 'පීතිපටිසංවෙදී අස්සසිස්සාමී'ති -පෙ- 'සුඛපටිසංවෙදී -පෙ- චිත්තසඞ්ඛාරපටිසංවෙදී -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං -පෙ- චිත්තපටිසංවෙදී -පෙ- අභිප්පමොදයං චිත්තං -පෙ- සමාදහං චිත්තං -පෙ- විමොචයං චිත්තං -පෙ- අනිච්චානුපස්සී -පෙ- විරාගානුපස්සී -පෙ- නිරොධානුපස්සී -පෙ- 'පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.

**ඉධාති** ඉමිස්සා දිට්ඨියා, ඉමිස්සා ඛන්තියා, ඉමිස්සා රුචියා, ඉමස්මිං ආදායෙ, ඉමස්මිං ධම්මෙ, ඉමස්මිං විනයෙ, ඉමස්මිං ධම්මවිනයෙ, ඉමස්මිං පාවචනෙ, ඉමස්මිං බ්‍රහ්මචරියෙ, ඉමස්මිං සත්ථුසාසනෙ. තෙන වුච්චති: 'ඉධා'ති.

**භික්ඛූති** පුථුජ්ජනකල්‍යාණකො වා හොති භික්ඛු සෙක්ඛො වා අරහා වා අකුප්පධම්මො.

**අරඤ්ඤන්ති** නික්ඛමිත්වා බහි ඉන්දඛීලා, සබ්බමෙතං අරඤ්ඤං.

---

1 මහියා මුත්තො-පු, PTS, මහියා - ස්‍යා  2 ධූමරජමුත්තා - ස්‍යා
3 රාහුපාණා - ස්‍යා  4 භාසති - ස්‍යා PTS  5 තපති - ස්‍යා PTS
6 විරොචති - ස්‍යා TPS  7 සතොකාරීසු - ස්‍යා TPS

**අබ්භාමුත්තොව චන්දිමා** යනු: වලාවෝ යම් බඳු ද කෙලෙස් එබඳු යැ. චන්ද්‍රයා යම් බඳු ද ආර්‍යඥානය එබඳු යැ. චන්ද්‍රිම දිව්‍යපුත්‍ර යම් බඳු ද මහණ එබඳු යැ. යම්සේ චන්ද්‍ර තෙම වලායෙන් මිදුණේ මීහිදුමින් මිදුණේ දුම්-රජසින් මිදුණේ රාහුග්‍රහණයෙන් මිදුණේ බැබැළේ ද තැවේ ද දිළේ ද එසෙසින් මැ මහණ තෙම හැම කෙලෙසුන් කෙරෙන් වෙසෙසින් මිදුණේ බැබැලෙන්නේ ද තැවෙන්නේ ද දිලෙන්නේ ද වෙයි. එයින් කියනු ලැබෙයි: 'අබ්භා මුත්තොව චන්දිමා'යි. මොහු තෙළෙස් ව්‍යවදානඥානයෝ යි.

**ව්‍යවදානඥානනිර්දේශ යි.**

# 3 - 5. සතොකාරිඥානනිර්දේශය

සතොකාරිහු (සිහි ඇති වැ කරන්නාහු) ගේ දෙතිස් ඥානයෝ කවරහ යත්:

මෙසස්නෙහි මහණ තෙම අරනට ගියේ හෝ රුක්මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ පලක් බැඳ (උඩු) කය සෘජු කොට තබා කමටහනට අභිමුඛ වැ සිහි එළවාතබා හිඳියි. හෙතෙම සිහි ඇති වැ මැ ආශ්වාස කෙරෙයි. සිහි ඇති වැ ප්‍රශ්වාස කෙරෙයි. දික් කොට හෝ ආශ්වාස කරන්නේ දික් කොට ආශ්වාස කෙරෙමි දනියි. දික් කොට හෝ ප්‍රශ්වාස කරන්නේ දික් කොට ප්‍රශ්වාස කෙරෙමි දනියි. ලුහුඬු කොට හෝ ආශ්වාස කරන්නේ ලුහුඬු කොට ආශ්වාස කෙරෙමි දනියි. ලුහුඬු කොට හෝ ප්‍රශ්වාස කරන්නේ ලුහුඬු කොට ප්‍රශ්වාස කෙරෙමි දනියි. සියලු ආශ්වාසප්‍රශ්වාස කාය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි හික්මෙයි. සියලු ආශ්වාසප්‍රශ්වාස-කාය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි හික්මෙයි. (ඖදාරික ආශ්වාස ප්‍රශ්වාස සඞ්ඛ්‍යාත) කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි හික්මෙයි. කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කෙරෙමින් ... සුඛය ප්‍රකට කෙරෙමින් ... චිත්තසංස්කාරය (වේදනාසංඥාස්කන්ධ) ප්‍රකට කෙරෙමින් ... චිත්තසංස්කාරය සන්හිඳුවමින් .... චිත්තය ප්‍රකට කෙරෙමින් ... සිත සතුටු කෙරෙමින් ... සිත (අරමුණෙහි) සම වැ තබමින් ... සිත (නීවරණයෙන්) මුදමින් .. අනිත්‍යය අනු වැ බලමින් ... විරාගය අනු වැ බලමින් ... නිරොධය අනු වැ බලමින් ... පටිනිස්සජනය අනු වැ බලමින් ආශ්වාස කරන්නෙමි හික්මෙයි, පටිනිස්සජනය අනු වැ බලමින් ප්‍රශ්වාස කරන්නෙමි හික්මේ.

**ඉධ** යනු: (බුදුන්ගේ) මේ දෘෂ්ටියෙහි මේ ක්ෂාන්තියෙහි මේ රුචියෙහි මේ ග්‍රහණයෙහි මේ ධර්මයෙහි මේ විනයෙහි මේ ධර්මවිනයෙහි මේ ප්‍රවචනයෙහි මේ බ්‍රහ්මචර්‍යයෙහි මේ ශාස්තෘශාසනයෙහි යි. එයින් කියනු ලැබෙයි: 'ඉධ' යි.

**භික්ඛු** යනු: පෘථග්ජනකල්‍යාණක මහණ හෝ වෙයි. ශෛක්ෂ මහණ හෝ වෙයි. අකොප්‍ය (අර්හත්ඵල) ධර්ම ඇති රහතුන් වහන්සේ හෝ වෙත්.

**අරඤ්ඤං** යනු: ඉන්ද්‍රඛීලයෙන් නික්ම පිටත්හි තෙල සියල්ල අරණ්‍ය වේ.

**රුක්ඛමූලන්ති** යත්ථ භික්ඛුනො ආසනං පඤ්ඤත්තං හොති, මඤ්චො වා පීඨං වා භිසි වා තට්ටිකා වා චම්මඛණ්ඩො[1] වා තිණසන්ථාරො[2] වා පණ්ණසන්ථාරො[2] වා පලාලසන්ථාරො[3] වා තත්ථ භික්ඛු චඞ්කමති වා තිට්ඨති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති.

**සුඤ්ඤන්ති** කෙනචි අනාකිණ්ණං හොති ගහට්ඨෙහි වා පබ්බජිතෙහි වා.

**අගාරන්ති**[4] විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහා.

**නිසීදති පල්ලඞ්කං ආභුජිත්වාති** නිසින්නො හොති පල්ලඞ්කං ආභුජිත්වා.

**උජුං කායං පණිධායාති** උජුකො හොති කායො ඨිතො[5] පණිහිතො.[6]

**පරිමුඛං සතිං උපට්ඨපෙත්වාති:** **පරීති** පරිග්ගහට්ඨො, **මුඛන්ති** නිය්‍යානට්ඨො, **සතීති** උපට්ඨානට්ඨො. තෙන වුච්චති: 'පරිමුඛං සතිං උපට්ඨපෙත්වා'ති.

**සතොව අස්සසති සතො පස්සසතීති**[7] බත්තිංසාය[8] ආකාරෙහි සතොකාරී හොති:[9] දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති[10] උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සතොකාරී හොති, දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සතොකාරී හොති, රස්සං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සතොකාරී හොති. රස්සං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සතොකාරී හොති -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන-පෙ- පටිනිස්සග්ගානු-පස්සී පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සතොකාරී හොති.

කථං දීඝං අස්සසන්තො 'දීඝං අස්සසාමී'ති පජානාති, දීඝං පස්සසන්තො 'දීඝං පස්සසාමී'ති පජානාති: දීඝං අස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසති, දීඝං පස්සාසං අද්ධානසඞ්ඛාතෙ පස්සසති, දීඝං අස්සාසපස්සාසං අද්ධාන-සඞ්ඛාතෙ අස්සසතිපි පස්සසතිපි; දීඝං අස්සාසපස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසතොපි පස්සසතොපි ඡන්දො උප්පජ්ජති.

---

1 චම්මඛණ්ඩො - සී 1, 2. සන්ථරො - මජසං, ස, සණ්ඨරො - සයා
3. පලාලසන්ථරො - සයා 4. ආගාරන්ති - PTS, සයා
5. ඨපිතො - සයා 6. සුපණිහිතො - මජසං. PTS සයා
7 'සතො පස්සසති' - කායිපොත්ථකෙ නත්ථි 8. බාත්තිංසාය - මජසං
9. 'හොති' - සයා පොත්ථකෙ නත්ථි. 10. සති - සයා

**රුක්ඛමූලං** යනු: යම් රුක්මූලෙකැ මහණහට මැස්සෙක් වේවයි පුටුයෙක් වේවයි බිස්සෙක් වේවයි තට්ටිකායෙක් වේවයි සම්කඩෙක් වේවයි ඇතිරියෙක් වේවයි කොළඇතිරියෙක් වේවයි පිදුරුඇතිරියෙක් වේවයි අසුනෙක් පනවනලද වේ ද, එහි මහණ තෙම සක්මන් කෙරේ හෝ සිටුනේ හෝ හිඳිනේ හෝ ශයනය හෝ කෙරේ.

**සුඤ්ඤාගාරං** යනු: ගිහීන් විසින් හෝ පැවිද්දන් විසින් හෝ කිසිවකු විසින් අනාකීර්ණ වූයේ වෙයි.

**අගාරං** යනු: විහාර යැ ගරුඩාකාරසෙවෙනි ඇති ගේ යැ ප්‍රාසාද යැ සඳලු ඇති ගේ යැ ගුහා යි.

**නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා** යනු: පලක් බැඳ හිඳිනේ වෙයි.

**උජුං කායං පණිධාය** යනු: කය මොනොවට තබනලද්දේ සෘජු වැ සිටියේ වෙයි.

**පරිමුඛං සතිං උපට්ඨපෙත්වා** යනු: **පරි** යනු: පරිග්‍රහාර්ථ යැ, **මුඛං** යනු. නියඹාණාර්ථ යැ, **සති** යනු: උපස්ථානාර්ථ යැ, එයින් කියනු ලැබෙයි: 'පරිමුඛං සතිං උපට්ඨපෙත්වා' යි.

**සතොව අස්සසති සතො පස්සසති**: යනු දෙතිස් අයුරින් සිහි ඇති වැ කරනසුලු වෙයි. දික් කොට ආශ්වාස කිරීම් වසයෙන් චිත්තයා-ගේ එකඟ බව අවික්ෂේපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් සිහි ඇති වැ කරනසුලු වෙයි. දික්කොට ප්‍රශ්වාස කිරීම් වසයෙන් චිත්තයාගේ එකඟ බව අවික්ෂේපය දන්නාහට සිහි එළඹ සිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් සිහි ඇති වැ කරනසුලු වෙයි. ලුහුඬු කොට ආශ්වාස කිරීම් වසයෙන් චිත්තයාගේ එකඟ බව අවික්ෂේපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් සිහි ඇති වැ කරනසුලු වෙයි. ලුහුඬු කොට ප්‍රශ්වාස කිරීම් වසයෙන් චිත්තයාගේ එකඟ බව අවික්ෂේපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් සිහි ඇති වැ කරනසුලු වෙයි. ... පටිනිස්සජ්ජනය අනු වැ දක්නේ ආශ්වාස කිරීම් වසයෙන් ... පටිනිස්සජ්ජනය අනු වැ දක්නේ ප්‍රශ්වාස කිරීම් වසයෙන් චිත්තයාගේ එකඟ බව අවික්ෂේපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් සිහි ඇති වැ කරනසුලු වේ

කිසෙයින් දික් කොට ආශ්වාස කරන්නේ දික් කොට ආශ්වාස කෙරෙමි දනී ද, දික් කොට ප්‍රශ්වාස කරන්නේ දික්කොට ප්‍රශ්වාස කෙරෙමි දනී ද යත්: දීර්ඝ වූ ආශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස කෙරෙයි. දීර්ඝ වූ ප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ප්‍රශ්වාස කෙරෙයි. දීර්ඝ ආශ්වාසප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස ද කෙරෙයි, ප්‍රශ්වාස ද කෙරෙයි. දීර්ඝ වූ ආශ්වාස ප්‍රශ්වාස දීර්ඝකාලයෙහි ආශ්වාස කරන්නාහට ද ප්‍රශ්වාස කරන්නාහට ද ඡන්දය උපදියි.

ඡන්දවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසති, ඡන්දවසෙන තතො සුඛුමතරං දීඝං පස්සාසං අද්ධානසඞ්ඛාතෙ පස්සසති, ඡන්දවසෙන තතොසුඛුමතරං දීඝං අස්සාසපස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසතිපි පස්සසතිපි. ඡන්දවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාසපස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසතොපි පස්සසතොපි පාමොජ්ජං උප්පජ්ජති.

පාමොජ්ජවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසති, පාමොජ්ජවසෙන තතො සුඛුමතරං දීඝං පස්සාසං අද්ධානසඞ්ඛාතෙ පස්සසති, පාමොජ්ජවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාසපස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසතිපි පස්සසතිපි, පාමොජ්ජවසෙන තතො සුඛුමතරං දීඝං අස්සාසපස්සාසං අද්ධානසඞ්ඛාතෙ අස්සසතොපි පස්සසතොපි දීඝං අස්සාසපස්සාසාපි චිත්තං විවට්ටති[1] උපෙක්ඛා සණ්ඨාති.

ඉමෙහි නවහාකාරෙහි දීඝං අස්සාසපස්සාසා කායො, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, කායො උපට්ඨානං, නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති, තෙන වුච්චති: 'කායෙ කායානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං කායං අනුපස්සති: අනිච්චතො අනුපස්සති, නො නිච්චතො; දුක්ඛතො අනුපස්සති, නො සුඛතො; අනත්තතො අනුපස්සති, නො අත්තතො; නිබ්බින්දති, නො නන්දති, විරජ්ජති, නො රජ්ජති; නිරොධෙති, නො සමුදෙති, පටිනිස්සජ්ජති, නො ආදියති; අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. එවං තං කායං අනුපස්සති.

**භාවනාති** චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා.

දීඝං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති, විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති, විදිතා විතක්කා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති.

1 විවත්තති - මජසං; ස්‍යා,

ඡන්ද වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ආශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස කෙරෙයි. ඡන්ද වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ප්‍රශ්වාස කෙරෙයි. ඡන්ද වශයෙන් එයට වඩා සියුම් වූ දීර්ඝ වූ ආශ්වාසප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස ද කෙරෙයි. ප්‍රශ්වාස ද කෙරෙයි. ඡන්ද වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ආශ්වාසප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස කරන්නාහට ද ප්‍රශ්වාස කරන්නාහට ද ප්‍රාමොද්‍යය උපදියි.

ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ආශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස කෙරෙයි. ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ප්‍රශ්වාස කෙරෙයි. ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ආශ්වාසප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස ද කෙරෙයි. ප්‍රශ්වාස ද කෙරෙයි. ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ දීර්ඝ වූ ආශ්වාසප්‍රශ්වාසය දීර්ඝකාලයෙහි ආශ්වාස කරන්නාහට ද ප්‍රශ්වාස කරන්නාහට ද දීර්ඝ යැ යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන් කෙරෙනුදු සිත පෙරළෙයි. උපෙක්ෂාව පිහිටා සිටියි.

මේ නව අයුරින් දීර්ඝ යයි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයෝ කාය නම. (අරමුණට) එළඹසිටීම සති නම. අනුපස්සනාව ඥාන නම. කය උපස්ථාන යැ සති නො වෙයි. සතිය උපස්ථාන ද සති ද වෙයි ඒ සතියෙන් ඒ ඥානයෙන් ඒ කය අනු වැ ගොස් බලයි. එයින් කියනු ලැබෙයි: 'කායෙ කායානුපස්සනා සතිපට්ඨානභාවනා' යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි, නිත්‍ය හෙයින් අනුපස්සනා නො කෙරෙයි. දුඃඛ හෙයින් අනුපස්සනා කෙරෙයි, සුඛ හෙයින් අනුපස්සනා නො කෙරෙයි. අනාත්ම හෙයින් අනුපස්සනා කෙරෙයි, ආත්ම හෙයින් අනුපස්සනා නො කෙරෙයි, කලකිරෙයි, සතුටු නො වෙයි. විරක්ත වෙයි නො ඇලෙයි. නිරුද්ධ කෙරෙයි. සමුදය නො කෙරෙයි. හැරපියයි. ග්‍රහණය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් අනුපස්සනා කරන්නේ නිත්‍ය සංඥාව දුරු කෙරෙයි. දුඃඛ හෙයින් අනුපස්සනා කරන්නේ සුඛසංඥාව දුරු කෙරෙයි, අනාත්ම හෙයින් අනුපස්සනා කරන්නේ ආත්මසංඥාව දුරු කෙරෙයි. කලකිරෙනුයේ නන්දිය දුරු කෙරෙයි. විරක්ත වනුයේ රාගය දුරු කෙරෙයි. නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි. පටිනිස්සජනය කරනුයේ ග්‍රහණය දුරු කෙරෙයි. මෙසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ.

**භාවනා** යනු: භාවනා සතරෙකි: ඒ භාවනා විශෙෂයෙහි උපන් යුගනද්ධධර්මයන් නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් භාවනා යැ, ඉන්ද්‍රියයන්ගේ එකකෘත්‍යභාවයෙන් භාවනා යැ, තදනුවර්ත්තිකවීර්යධුරස්වභාවයෙන් භාවනා යැ, ආසෙවනස්වභාවයෙන් භාවනා යි.

දීර්ඝ යයි කියනලද ආශ්වාසප්‍රශ්වාස වශයෙන් චිත්තයාගේ එකාග්‍ර බව අවික්ෂෙපය දන්නාහට ප්‍රකට කොට දන්නාලද වෙදනාවෝ උපදිති. ප්‍රකට කොට දන්නාලද්දැහු වැටහෙති ප්‍රකට කොට දන්නාලද්දැහු විනාශයට යෙති. ප්‍රකට කොට දන්නාලද සංඥාවෝ උපදිති. ප්‍රකට කොට දන්නාලද්දැහු වැටහෙති. ප්‍රකට කොට දන්නාලද්දැහු විනාශයට යෙති. ප්‍රකට කොට දන්නාලද විතර්කයෝ උපදිති. ප්‍රකට කොට දන්නාලද්දැහු වැටහෙති. ප්‍රකට කොට දන්නාලද්දැහු විනාශයට යෙත්.

කථං විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති: කථං වෙදනාය උප්පාදෙ විදිතො හොති: 'අවිජ්ජාසමුදයා වෙදනාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන වෙදනාය උප්පාදෙ විදිතො හොති. 'තණ්හාසමුදයා වෙදනාසමුදයො'ති -පෙ- 'කම්මසමුදයා වෙදනාසමුදයො'ති -පෙ- 'ඵස්සසමුදයා වෙදනාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන වෙදනාය උප්පාදෙ විදිතො හොති. නිබ්බත්තිලක්ඛණං පස්සතොපි වෙදනාය උප්පාදෙ විදිතො හොති. එවං වෙදනාය උප්පාදෙ විදිතො හොති.

කථං වෙදනාය උපට්ඨානං විදිතං හොති: අනිච්චතො මනසිකරොතො ඛයතුපට්ඨානං විදිතං හොති, දුක්ඛතො මනසිකරොතො භයතුපට්ඨානං විදිතං හොති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතුපට්ඨානං විදිතං හොති. එවං වෙදනාය උපට්ඨානං විදිතං හොති.

කථං වෙදනාය අත්ථඞ්ගමො විදිතො හොති: 'අවිජ්ජානිරොධා වෙදනානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන වෙදනාය අත්ථඞ්ගමො විදිතො හොති. 'තණ්හානිරොධා වෙදනානිරොධො'ති -පෙ- 'කම්මනිරොධා වෙදනානිරොධො'ති-පෙ-ඵස්සනිරොධා වෙදනානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන වෙදනාය අත්ථඞ්ගමො විදිතො හොති, විපරිනාමලක්ඛණං පස්සතොපි වෙදනාය අත්ථඞ්ගමො විදිතො හොති එවං වෙදනාය අත්ථඞ්ගමො විදිතො හොති.

එවං විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති.

කථං විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති: කථං සඤ්ඤාය උප්පාදෙ විදිතො හොති: 'අවිජ්ජාසමුදයා සඤ්ඤාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන සඤ්ඤාය උප්පාදෙ විදිතො හොති, 'තණ්හාසමුදයා සඤ්ඤාසමුදයො'ති -පෙ- 'කම්මසමුදයා සඤ්ඤාසමුදයො'ති -පෙ- 'ඵස්සසමුදයා සඤ්ඤාසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන සඤ්ඤාය උප්පාදෙ විදිතො හොති, නිබ්බත්තිලක්ඛණං පස්සතොපි සඤ්ඤාය උප්පාදෙ විදිතො හොති. එවං සඤ්ඤාය උප්පාදෙ විදිතො හොති.

කථං සඤ්ඤාය උපට්ඨානං විදිතං හොති: අනිච්චතො මනසිකරොතො ඛයතුපට්ඨානං විදිතං හොති, දුක්ඛතො මනසිකරොතො භයතුපට්ඨානං විදිතං හොති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතුපට්ඨානං විදිතං හොති. එවං සඤ්ඤාය උපට්ඨානං විදිතං හොති.

කිසෙයින් ප්‍රකට කොට දන්නාලද වේදනාවෝ උපදිත් ද, ප්‍රකට කොට දන්නාලද්දාහු වැටහෙත් ද, ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත් ද: කිසෙයින් වේදනාවගේ උත්පාදය දන්නාලද වේ ද යත්: අවිද්‍යාසමුදයෙන් වේදනාසමුදය වේ යයි ප්‍රත්‍යයසමුදයසවභාවයෙන් වේදනාවගේ උත්පාදය දන්නාලද වෙයි. තෘෂ්ණාසමුදයෙන් වේදනාසමුදය වේ යයි ... කර්මසමුදයෙන් වේදනාසමුදය වේ යයි ස්පර්ශසමුදයෙන් වේදනාසමුදය වේ යයි ප්‍රත්‍යයසමුදය සවභාවයෙන් වේදනාවගේ උත්පාදය දන්නාලද වෙයි. නිර්වෘත්තිලක්‍ෂණය දක්නාහු විසින් ද වේදනාවගේ උත්පාදය දන්නාලද වේ· මෙසෙයින් වේදනාවගේ උත්පාදය දන්නාලද්දේ වේ.

කිසෙයින් වේදනාවගේ වැටහීම දන්නාලද වේ ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහු විසින් ක්‍ෂය වශයෙන් වැටහීම දන්නාලද වෙයි දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහු විසින් භය වශයෙන් වැටහීම දන්නාලද වෙයි. අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහු විසින් ශූන්‍යවශයෙන් වැටහීම දන්නාලද වෙයි. මෙසෙයින් වේදනාවගේ වැටහීම දන්නාලද වේ.

කිසෙයින් වේදනාවගේ විනාශය දන්නාලද වේ ද යත්: අවිද්‍යානිරොධයෙන් වේදනානිරොධය වේ යයි ප්‍රත්‍යයනිරොධසවභාවයෙන් වේදනාවගේ විනාශය දන්නාලද වෙයි. තෘෂ්ණානිරොධයෙන් වේදනානිරොධය වේ යයි ... කර්මනිරොධයෙන් වේදනානිරොධය වේ යයි ... ස්පර්ශනිරොධයෙන් වේදනානිරොධය වේ යයි ප්‍රත්‍යයනිරොධසවභාවයෙන් වේදනාවගේ විනාශය දන්නාලද වෙයි. විපරිණාමලක්‍ෂණය දක්නාහු විසින් ද වේදනාවගේ විනාශය දන්නාලද වෙයි. මෙසෙයින් වේදනාවගේ විනාශය දන්නාලද වේ.

මෙසෙයින් ප්‍රකට කොට දන්නාලද වේදනාවෝ උපදිති. ප්‍රකට කොට දන්නාලද්දාහු වැටහෙති. ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත්.

කිසෙයින් ප්‍රකට කොට දන්නාලද සංඥාවෝ උපදිත් ද, ප්‍රකට කොට දන්නාලද්දාහු වැටහෙත් ද, ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත් ද: කිසෙයින් සංඥාවගේ උත්පාදය දන්නාලද වේ ද යත්: අවිද්‍යාසමුදයෙන් සංඥාසමුදය වේ යයි ප්‍රත්‍යයසමුදයසවභාවයෙන් සංඥාවගේ උත්පාදය දන්නාලද වෙයි. තෘෂ්ණාසමුදයෙන් සංඥාසමුදය වේ යයි ... කර්මසමුදයෙන් සංඥාසමුදය වේ යයි ... ස්පර්ශසමුදයෙන් සංඥාසමුදය වේ යයි ප්‍රත්‍යයසමුදයසවභාවයෙන් සංඥාවගේ උත්පාදය දන්නාලද වෙයි. නිර්වෘත්තිලක්‍ෂණය දක්නාහු විසින් ද සංඥාවගේ උත්පාදය දන්නාලද වෙයි· මෙසෙයින් සංඥාවගේ උත්පාදය දන්නාලද්දේ වේ.

කිසෙයින් සංඥාවගේ වැටහීම දන්නාලද වේ ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහු විසින් ක්‍ෂයවශයෙන් වැටහීම දන්නාලද වෙයි. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහු විසින් භයවශයෙන් වැටහීම දන්නාලද වෙයි. අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහු විසින් ශූන්‍යවශයෙන් වැටහීම දන්නාලද වෙයි. මෙසෙයින් සංඥාවගේ වැටහීම දන්නාලද්දේ වේ.

කථං සඤ්ඤාය අත්ථඞ්ගමො විදිතො හොති: 'අවිජ්ජානිරොධා සඤ්ඤානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන සඤ්ඤාය අත්ථඞ්ගමො විදිතො හොති, 'තණ්හානිරොධා සඤ්ඤානිරොධො'ති -පෙ- 'කම්මනිරොධා සඤ්ඤානිරොධො'ති -පෙ- 'ඵස්සනිරොධා සඤ්ඤානිරොධො'ති පච්චයනිරොධට්ඨෙන සඤ්ඤාය අත්ථඞ්ගමො විදිතො හොති, විපරිනාමලක්ඛණං පස්සතොපි සඤ්ඤාය අත්ථඞ්ගමො විදිතො හොති එවං සඤ්ඤාය අත්ථඞ්ගමො විදිතො හොති.

එවං විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති.

කථං විදිතා විතක්කා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති: කථං විතක්කානං උප්පාදො විදිතො හොති: 'අවිජ්ජාසමුදයා විතක්කසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන විතක්කානං උප්පාදො විදිතො හොති, 'තණ්හාසමුදයා විතක්කසමුදයො'ති -පෙ- 'කම්මසමුදයා විතක්කසමුදයො'ති -පෙ- 'සඤ්ඤාසමුදයා විතක්කසමුදයො'ති පච්චයසමුදයට්ඨෙන විතක්කානං උප්පාදො විදිතො හොති, නිබ්බත්තිලක්ඛණං පස්සතොපි විතක්කානං උප්පාදො විදිතො හොති. එවං විතක්කානං උප්පාදො විදිතො හොති.

කථං විතක්කානං උපට්ඨානං විදිතං හොති. අනිච්චතො මනසිකරොතො ඛයතුපට්ඨානං විදිතං හොති, දුක්ඛතො මනසිකරොතො භයතුපට්ඨානං විදිතං හොති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතුපට්ඨානං විදිතං හොති, එවං විතක්කානං උපට්ඨානං විදිතං හොති.

කථං විතක්කානං අත්ථඞ්ගමො විදිතො හොති: 'අවිජ්ජානිරොධා විතක්කනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන විතක්කානං අත්ථඞ්ගමො විදිතො හොති, 'තණ්හානිරොධා විතක්කනිරොධො'ති -පෙ- 'කම්මනිරොධා විතක්කනිරොධො'ති -පෙ- 'සඤ්ඤානිරොධා විතක්කනිරොධො'ති පච්චයනිරොධට්ඨෙන විතක්කානං අත්ථඞ්ගමො විදිතො හොති, විපරිනාමලක්ඛණං පස්සතොපි විතක්කානං අත්ථඞ්ගමො විදිතො හොති. එවං විතක්කානං අත්ථඞ්ගමො විදිතො හොති.

එවං විදිතා විතක්කා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති.

දීඝං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති. [බලානි -පෙ- බොජ්ඣඞ්ගෙ -පෙ- මග්ගං] -පෙ- ධම්මෙ සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති.

කිසෙයින් සංඥාවගේ විනාශය දන්නාලද වේ ද යත්: අවිද්‍යානිරොධ-යෙන් සංඥානිරොධය වේ යයි ප්‍රත්‍යයනිරොධස්වභාවයෙන් සංඥාවගේ විනාශය දන්නා ලද වෙයි. තෘෂ්ණානිරොධයෙන් සංඥානිරොධය වේ යයි ... කර්මනිරොධයෙන් සංඥානිරොධය වේ යයි ... ස්පර්ශනිරොධයෙන් සංඥානිරොධය වේ යයි ප්‍රත්‍යයනිරොධස්වභාවයෙන් සංඥාවගේ විනාශය දන්නාලද වෙයි. විපරිණාමලක්‍ෂණය දක්නහු විසින් ද සංඥාවගේ විනාශය දන්නා ලද වෙයි. මෙසෙයින් සංඥාවගේ විනාශය දන්නා ලද්දේ වේ.

මෙසෙයින් ප්‍රකට කොට දන්නාලද සංඥාවෝ උපදිති. ප්‍රකට කොට දන්නාලද්දාහු වටහති. ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත්.

කිසෙයින් ප්‍රකට කොට දන්නාලද විතර්කයෝ උපදිත් ද, ප්‍රකට කොට දන්නාලද්දාහු වැටහෙත් ද, ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත් ද, කිසෙයින් විතර්කයන්ගේ උත්පාදය දන්නාලද වේ ද යත්: අවිද්‍යාසමුදයෙන් විතර්කසමුදය වේ යයි ප්‍රත්‍යයසමුදයස්වභාවයෙන් විතර්කයන්ගේ උත්පාදය දන්නාලද වෙයි. තෘෂ්ණාසමුදයෙන් විතර්කසමුදය වේ යයි ... කර්මසමුදයෙන් විතර්කසමුදය වේ යයි ... සංඥාසමුදයෙන් විතර්කසමුදය වේ යයි ප්‍රත්‍යය-සමුදයස්වභාවයෙන් විතර්කයන්ගේ උත්පාදය දන්නාලද වෙයි. නිර්වෘත්ති ලක්‍ෂණය දක්නහු විසින් ද විතර්කයන්ගේ උත්පාදය දන්නාලද වෙයි. මෙසෙයින් විතර්කයන්ගේ උත්පාදය දන්නාලද්දේ වේ.

කිසෙයින් විතර්කයන්ගේ වැටහීම දන්නා ලද වේ ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නහු විසින් ක්‍ෂයවශයෙන් වැටහීම දන්නාලද වෙයි. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නහු විසින් භයවශයෙන් වැටහීම දන්නාලද වෙයි. අනාත්ම හෙයින් මෙනෙහි කරන්නහු විසින් ශූන්‍ය වශයෙන් වැටහීම දන්නාලද වෙයි. මෙසෙයින් විතර්කයන්ගේ වැටහීම දන්නාලද්දේ වේ.

කිසෙයින් විතර්කයන්ගේ විනාශය දන්නාලද වේ ද යත්: අවිද්‍යා-නිරොධයෙන් විතර්කනිරොධය වේ යයි ප්‍රත්‍යයනිරොධස්වභාවයෙන් විතර්ක-යන්ගේ විනාශය දන්නාලද වෙයි. තෘෂ්ණානිරොධයෙන් විතර්කනිරොධය වේ යයි ... කර්මනිරොධයෙන් විතර්කනිරොධය වේ යයි ... සංඥානිරොධ-යෙන් විතර්කනිරොධය වේ යයි ප්‍රත්‍යයනිරොධස්වභාවයෙන් විතර්කයන්ගේ විනාශය දන්නාලද වෙයි. විපරිණාමලක්‍ෂණය දක්නහු විසින් ද විතර්ක-යන්ගේ විනාශය දන්නාලද වෙයි. මෙසෙයින් විතර්කයන්ගේ විනාශය දන්නාලද්දේ වේ.

මෙසෙයින් ප්‍රකට කොට දන්නාලද විතර්කයෝ උපදිති. ප්‍රකට කොට දන්නාලද්දාහු වටහති. ප්‍රකට කොට දන්නාලද්දාහු විනාශයට යෙත්.

දීර්ඝ යයි කියනලද ආශ්වාසප්‍රශ්වාසවශයෙන් චිත්තයාගේ එකඟ බව අවික්‍ෂෙපය දැනගන්නේ ඉන්ද්‍රියයන් (අරමුණෙහි) පිහිටුවයි. ආලම්බනය ද දැනගනියි. ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරෙයි ... මාර්ගය සමවධානය කෙරෙයි. ධර්මයන් සමවධානය කෙරෙයි. ගොචරය ද දැනගනියි. ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරේ.

**ඉන්ද්‍රියානි සමොධානෙතීති** කථං ඉන්ද්‍රියානි සමොධානෙති: අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං සමොධානෙති, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං සමොධානෙති, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං සමොධානෙති, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං සමොධානෙති, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං සමොධානෙති. අයං පුග්ගලො ඉමානි ඉන්ද්‍රියානි ඉමස්මිං ආරම්මණෙ සමොධානෙති. තෙන වුච්චති: 'ඉන්ද්‍රියානි සමොධානෙතී'ති.

**ගොචරඤ්ච පජානාතීති** යං තස්ස ආරම්මණං, තං තස්ස ගොචරං; යං තස්ස ගොචරං, තං තස්ස ආරම්මණං, **පජානාතීති** පුග්ගලො, පජානනා පඤ්ඤා.

**සමන්ති** ආරම්මණස්ස උපට්ඨානං සමං, චිත්තස්ස අවික්ඛෙපො සමං, චිත්තස්ස අධිට්ඨානං සමං, චිත්තස්ස වොදානං සමං. **අත්ථොති** අනවජ්ජට්ඨො නික්කිලෙසට්ඨො වොදානට්ඨො පරමට්ඨො.

**පටිවිජ්ඣතීති** ආරම්මණස්ස උපට්ඨානට්ඨං පටිවිජ්ඣති, චිත්තස්ස අවික්ඛෙපට්ඨං පටිවිජ්ඣති, චිත්තස්ස අධිට්ඨානට්ඨං පටිවිජ්ඣති, චිත්තස්ස වොදානට්ඨං පටිවිජ්ඣති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති.

**බලානි සමොධානෙතීති** කථං බලානි සමොධානෙති: අස්සද්ධියෙ අකම්පියට්ඨෙන සද්ධාබලං සමොධානෙති, කොසජ්ජෙ අකම්පියට්ඨෙන විරියබලං සමොධානෙති, පමාදෙ අකම්පියට්ඨෙන සතිබලං සමොධානෙති, උද්ධච්චෙ අකම්පියට්ඨෙන සමාධිබලං සමොධානෙති, අවිජ්ජාය අකම්පියට්ඨෙන පඤ්ඤාබලං සමොධානෙති. අයං පුග්ගලො ඉමානි බලානි ඉමස්මිං ආරම්මණෙ සමොධානෙති. තෙන වුච්චති: 'බලානි සමොධානෙතී'ති. **ගොචරඤ්ච පජානාතීති** –පෙ– තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති.

**බොජ්ඣඞ්ගෙ සමොධානෙතීති** කථං බොජ්ඣඞ්ගෙ සමොධානෙති: උපට්ඨානට්ඨෙන සතිසම්බොජ්ඣඞ්ගං සමොධානෙති, පවිචයට්ඨෙන ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං සමොධානෙති, පග්ගහට්ඨෙන විරියසම්බොජ්ඣඞ්ගං සමොධානෙති, ඵරණට්ඨෙන පීතිසම්බොජ්ඣඞ්ගං සමොධානෙති, උපසමට්ඨෙන පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං සමොධානෙති, අවික්ඛෙපට්ඨෙන සමාධිසම්බොජ්ඣඞ්ගං සමොධානෙති පටිසඞ්ඛානට්ඨෙන උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං සමොධානෙති, අයං පුග්ගලො ඉමෙ බොජ්ඣඞ්ගෙ ඉමස්මිං ආරම්මණෙ සමොධානෙති. තෙන වුච්චති: 'බොජ්ඣඞ්ගෙ සමොධානෙතී'ති. **ගොචරඤ්ච පජානාතීති** –පෙ– තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති.

**ඉන්ද්‍රියානි සමොධානෙති** යනු: කිසෙයින් ඉන්ද්‍රියයන් සමවධානය කෙරේ ද යත්: අධිමොක්ෂ ස්වභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය සමවධාන කෙරෙයි ප්‍රග්‍රහස්වභාවයෙන් වීර්‍යෙන්ද්‍රියය සමවධාන කෙරෙයි. එළඹ සිටීම් ස්වභාවයෙන් සමෘතීන්ද්‍රියය සමවධාන කෙරෙයි. අවික්ෂෙපස්වභාවයෙන් සමාධීන්ද්‍රියය සමවධාන කෙරෙයි. දර්ශනස්වභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියය සමවධාන කෙරෙයි. මේ පුද්ගල තෙම මේ ඉන්ද්‍රියයන් මේ අරමුණෙහි සමවධාන කෙරෙයි. (පිහිටුවයි) එයින් කියනු ලැබෙයි. 'ඉන්ද්‍රියානි සමොධානෙති'යි.

**ගොචරඤ්ච පජානාති** යනු: යමෙක් ඔහුට ආලම්බන වේ ද ඒ ඔහුට ගොචර වෙයි. යමෙක් ඔහුට ගොචර වේ ද ඒ ඔහුට ආලම්බන වේ **පජානාතීති පුග්ගලො පජානනා පඤ්ඤා**, යනු: පුද්ගල තෙම ප්‍රඥායෙන් දැනගනී.

**සමං** යනු: ආලම්බනයාගේ එළඹසිටීම ශම යැ චිත්තයාගේ අවික්ෂෙපය ශම යැ චිත්තයාගේ අධිෂ්ඨානය ශම යැ චිත්තයාගේ ව්‍යවදානය ශම යි. **අත්ථො** යනු: අනවද්‍යස්වභාව යැ නික්ලේශස්වභාව යැ පරිශුද්ධස්වභාව යැ උත්තමස්වභාව යි.

**පටිවිජ්ඣති** යනු: ආලම්බනයාගේ එළඹසිටීම ප්‍රතිවෙධ කෙරෙයි. චිත්තයාගේ අවික්ෂෙපස්වභාව ප්‍රතිවෙධ කෙරෙයි. චිත්තයාගේ අධිෂ්ඨාන ස්වභාව ප්‍රතිවෙධ කෙරෙයි. චිත්තයාගේ පරිශුද්ධස්වභාව ප්‍රතිවෙධ කෙරේ. එයින් කියනු ලැබෙයි. 'සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි.

**බලානි සමොධානෙති** යනු: කිසෙයින් බලයන් සමවධාන කෙරේ ද යත්: අශ්‍රද්ධායෙහි සලනු නො හැකි ස්වභාවයෙන් ශ්‍රද්ධාබලය සමවධාන කෙරෙයි. කෞසීද්‍යයෙහි සලනු නො හැකි ස්වභාවයෙන් වීර්‍යබලය සමවධාන කෙරෙයි. ප්‍රමාදයෙහි සලනු නො හැකි ස්වභාවයෙන් සමෘතිබලය සමවධාන කෙරෙයි. උද්ධතභාවයෙහි සලනු නො හැකි ස්වභාවයෙන් සමාධිබලය සමවධාන කෙරෙයි. අවිද්‍යායෙහි සලනු නො හැකි ස්වභාවයෙන් ප්‍රඥාබලය සමවධාන කෙරේ. මේ පුද්ගල තෙම මේ බලයන් මේ අරමුණෙහි සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'බලානි සමොධානෙති'යි. **ගොචරඤ්ච පජානාති** යනු: එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි.

**බොජ්ඣඞ්ගෙ සමොධානෙති** යනු: කිසෙයින් බොධ්‍යඞ්ගයන් සමවධාන කෙරේ ද යත්: එළඹසිටුනා ස්වභාවයෙන් සමෘතිසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරෙයි. ප්‍රවිචයස්වභාවයෙන් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරෙයි. ප්‍රග්‍රහස්වභාවයෙන් වීර්‍යසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරෙයි පැතිරීම් ස්වභාවයෙන් ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරෙයි. ව්‍යුපශමස්වභාවයෙන් ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරෙයි. අවික්ෂෙප ස්වභාවයෙන් සමාධිසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරෙයි. සමවහිතස්වභාවයෙන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය සමවධාන කෙරේ. මේ පුද්ගල තෙම මේ බොධ්‍යඞ්ගයන් මේ අරමුණෙහි සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'බොජ්ඣඞ්ග සමොධානෙති'යි. **ගොචරඤ්ච පජානාති** යනු: ... **එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි.**

**මග්ගං සමොධානෙතීති** කථං මග්ගං සමොධානෙති: දස්සනට්ඨෙන සම්මාදිට්ඨිං සමොධානෙති, අවික්ඛෙපට්ඨෙන සම්මාසඞ්කප්පං සමොධානෙති, පරිග්ගහට්ඨෙන සම්මාවාචං සමොධානෙති, සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තං සමොධානෙති, වොදානට්ඨෙන සම්මාආජීවං සමොධානෙති, පග්ගහට්ඨෙන සම්මාවායාමං සමොධානෙති, උපට්ඨානට්ඨෙන සම්මාසතිං සමොධානෙති, අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධිං සමොධානෙති. අයං පුග්ගලො ඉමං මග්ගං ඉමස්මිං ආරම්මණෙ සමොධානෙති. තෙන වුච්චති: 'මග්ගං සමොධානෙතී'ති. **ගොචරඤ්ච පජානාතීති** -පෙ- තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති.

**ධම්මෙ සමොධානෙතීති** කථං ධම්මෙ සමොධානෙති: ආධිපතෙය්‍යට්ඨෙන[1] ඉන්ද්‍රියානි සමොධානෙති, අකම්පියට්ඨෙන බලානි සමොධානෙති, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගෙ සමොධානෙති, හෙතුට්ඨෙන මග්ගං සමොධානෙති, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානං සමොධානෙති, පදහනට්ඨෙන සම්මප්පධානං සමොධානෙති, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදං සමොධානෙති, තථට්ඨෙන සච්චං සමොධානෙති, අවික්ඛෙපට්ඨෙන සමථං සමොධානෙති, අනුපස්සනට්ඨෙන විපස්සනං සමොධානෙති, එකරසට්ඨෙන සමථවිපස්සනං සමොධානෙති, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං[2] සමොධානෙති, සංවරට්ඨෙන සීලවිසුද්ධිං සමොධානෙති, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධිං සමොධානෙති, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධිං සමොධානෙති, විමුත්තට්ඨෙන[3] විමොක්ඛං සමොධානෙති, පටිවෙධට්ඨෙන විජ්ජං සමොධානෙති, පරිච්චාගට්ඨෙන විමුත්තිං සමොධානෙති, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං සමොධානෙති, පටිප්පස්සද්ධට්ඨෙන[4] අනුප්පාදෙ ඤාණං සමොධානෙති, ඡන්දං මූලට්ඨෙන සමොධානෙති, මනසිකාරං සමුට්ඨානට්ඨෙන සමොධානෙති, ඵස්සං සමොධානට්ඨෙන සමොධානෙති, වෙදනං සමොසරණට්ඨෙන සමොධානෙති, සමාධිං පමුඛට්ඨෙන සමොධානෙති, සතිං ආධිපතෙය්‍යට්ඨෙන[1] සමොධානෙති, පඤ්ඤං[5] තතුත්තරට්ඨෙන සමොධානෙති, විමුත්තිං සාරට්ඨෙන සමොධානෙති, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන සමොධානෙති. අයං පුග්ගලො ඉමෙ ධම්මෙ ඉමස්මිං ආරම්මණෙ සමොධානෙති. තෙන වුච්චති: 'ධම්මෙ සමොධානෙතී'ති.

---

1. අධිපතෙය්‍යට්ඨෙන - PTS 2. යුගනන්ධං - කත්ථචි.
3. මුත්තට්ඨෙන - සයා. 4. පටිපස්සද්ධට්ඨෙන - PTS.
5. සතිසම්පජඤ්ඤං - සයා.

**මග්ගං සමොධානෙති** යනු: කිසෙයින් මාර්ගය සමවධාන කෙරේ ද යත්: දර්ශනස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය සමවධාන කෙරෙයි. අභිනිරෝපණ ස්වභාවයෙන් සම්‍යක්සංකල්පය සමවධාන කෙරෙයි. පරිග්‍රහස්වභාවයෙන් සම්‍යග්වචනය සමවධාන කෙරෙයි. සමුට්ඨානස්වභාවයෙන් සම්‍යක්කර්මාන්තය සමවධාන කෙරෙයි. පරිශුද්ධස්වභාවයෙන් සම්‍යගාජීවය සමවධාන කෙරෙයි. ප්‍රග්‍රහස්වභාවයෙන් සම්‍යග්ව්‍යායාමය සමවධාන කෙරෙයි· එළඹසිටුනාස්වභාවයෙන් සම්‍යක්ස්මෘතිය සමවධාන කෙරෙයි. අවික්ෂෙපස්වභාවයෙන් සම්‍යක්සමාධිය සමවධාන කෙරේ. මේ පුද්ගල තෙම මේ මාර්ගය මේ අරමුණෙහි සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'මග්ගං සමොධානෙති'යි. **ගොචරඤ්ච පජානාති** යනු: ... එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි.

**ධම්මෙ සමොධානෙති** යනු: කිසෙයින් ධර්මයන් සමවධාන කෙරේ ද යත්: ආධිපත්‍යස්වභාවයෙන් ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි, අකම්ප්‍ය ස්වභාවයෙන් බලයන් සමවධාන කෙරෙයි, නියර්‍යාණ ස්වභාවයෙන් බොධ්‍යඞ්ගයන් සමවධාන කෙරෙයි. හෙතු ස්වභාවයෙන් මාර්ගය සමවධාන කෙරෙයි, (අරමුණට) එළඹ සිටීම් ස්වභාවයෙන් සතිපට්ඨානය සමවධාන කෙරෙයි. ප්‍රදහන ස්වභාවයෙන් සම්‍යක්ප්‍රධානය සමවධාන කෙරෙයි. සමෘද්ධ වන ස්වභාවයෙන් ඍද්ධිපාදය සමවධාන කෙරෙයි, තථස්වභාවයෙන් සත්‍යය සමවධාන කෙරෙයි. අවික්ෂෙපස්වභාවයෙන් සමථය සමවධාන කෙරෙයි. අනුපස්සනාස්වභාවයෙන් විදර්ශනාව සමවධාන කෙරෙයි, එකකෘත්‍යස්වභාවයෙන් ශමථවිදර්ශනා සමවධාන කෙරෙයි, නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් යුගනද්ධය (ශමථ-විදර්ශනා) සමවධාන කෙරෙයි, සංවරස්වභාවයෙන් ශීලවිශුද්ධිය සමවධාන කෙරෙයි. අවික්ෂෙපස්වභාවයෙන් චිත්තවිශුද්ධිය සමවධාන කෙරෙයි, දර්ශනස්වභාවයෙන් දෘෂ්ටිවිශුද්ධිය සමවධාන කෙරෙයි. විමුක්තිස්වභාවයෙන් විමොක්ෂය සමවධාන කෙරෙයි, ප්‍රතිවෙධස්වභාවයෙන් විද්‍යාව සමවධාන කෙරෙයි, පරිත්‍යාගස්වභාවයෙන් විමුක්තිය සමවධාන කෙරෙයි, සමුච්ඡෙදස්වභාවයෙන් ක්ෂයඥානය සමවධාන කෙරෙයි, ප්‍රතිප්‍රශ්‍රබ්ධිස්වභාවයෙන් අනුත්පාද ඥානය සමවධාන කෙරෙයි, ඡන්දය මූලස්වභාවයෙන් සමවධාන කෙරෙයි, මනසිකාරය සමුට්ඨානස්වභාවයෙන් සමවධාන කෙරෙයි, ස්පර්ශය සමවධානස්වභාවයෙන් සමවධාන කෙරෙයි, වෙදනාව සමවසරණස්වභාවයෙන් සමවධාන කෙරෙයි, සමාධිය ප්‍රමුඛස්වභාවයෙන් සමවධාන කෙරෙයි, ස්මෘතිය ආධිපත්‍යස්වභාවයෙන් සමවධාන කෙරෙයි, ප්‍රඥාව තදුත්තර ස්වභාවයෙන් සමවධාන කෙරෙයි, විමුක්තිය සාරස්වභාවයෙන් සමවධාන කෙරෙයි, අමෘතොගධනිර්වාණය පර්‍යවසානස්වභාවයෙන් සමවධාන කෙරෙයි, මේ පුද්ගල තෙම මේ ධර්මයන් මේ අරමුණෙහි සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'ධම්මෙ සමොධානෙති'යි.

**ගොචරඤ්ච පජානාතීති** යං තස්ස ආරම්මණං තං තස්ස ගොචරං, යං තස්ස ගොචරං තං තස්ස ආරම්මණං, **පජානාතීති** පුග්ගලො, පජානනා පඤ්ඤා.

**සමන්ති** ආරම්මණස්ස උපට්ඨානං සමං, චිත්තස්ස අවික්ඛෙපො සමං, චිත්තස්ස අධිට්ඨානං සමං, චිත්තස්ස වොදානං සමං. **අත්ථොති** අනවජ්ජට්ඨො නික්කිලෙසට්ඨො වොදානට්ඨො පරමට්ඨො, **පටිවිජ්ඣතීති** ආරම්මණස්ස උපට්ඨානට්ඨං පටිවිජ්ඣති, චිත්තස්ස අවික්ඛෙපට්ඨං පටිවිජ්ඣති, චිත්තස්ස අධිට්ඨානට්ඨං පටිවිජ්ඣති, චිත්තස්ස වොදානට්ඨං පටිවිජ්ඣති, තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති (1)

කථං රස්සං අස්සසන්තො 'රස්සං අස්සසාමී'ති පජානාති, රස්සං පස්සසන්තො 'රස්සං පස්සසාමී'ති පජානාති:

රස්සං අස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසති, රස්සං පස්සාසං ඉත්තරසඞ්ඛාතෙ පස්සසති, රස්සං අස්සාසපස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසතිපි පස්සසතිපි, රස්සං අස්සාසපස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසතොපි පස්සසතොපි ඡන්දො උප්පජ්ජති.

ඡන්දවසෙන තතො සුඛුමතරං රස්සං අස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසති, ඡන්දවසෙන තතො සුඛුමතරං රස්සං පස්සාසං ඉත්තරසඞ්ඛාතෙ පස්සසති, ඡන්දවසෙන තතො සුඛුමතරං රස්සං අස්සාසපස්සාසං ඉත්තර සඞ්ඛාතෙ අස්සසතිපි පස්සසතිපි ඡන්දවසෙන තතො සුඛුමතරං රස්සං අස්සාසපස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසතොපි පස්සසතොපි පාමොජ්ජං උප්පජ්ජති.

පාමොජ්ජවසෙන තතො සුඛුමතරං රස්සං අස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසති, පාමොජ්ජවසෙන තතො සුඛුමතරං රස්සං පස්සාසං ඉත්තරසඞ්ඛාතෙ පස්සසති, පාමොජ්ජවසෙන තතො සුඛුමතරං රස්සං අස්සාසපස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසතිපි පස්සසතිපි. පාමොජ්ජවසෙන තතො සුඛුමතරං රස්සං අස්සාසපස්සාසං ඉත්තරසඞ්ඛාතෙ අස්සසතොපි පස්සසතොපි රස්සා අස්සාසපස්සාසා චිත්තං විවට්ටති, උපෙක්ඛා සණ්ඨාති.

ඉමෙහි නවහාකාරෙහි රස්සා අස්සාසපස්සාසා කායො, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, කායො උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති. තෙන වුච්චති: 'කායෙ කායානුපස්සනා සතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං කායං අනුපස්සති: -පෙ- එවං තං කායං අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා. රස්සං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො විදිතා වෙදනා උප්පජ්ජන්ති -පෙ- රස්සං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති -පෙ- තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (2)

**ගොචරඤ්ච පජානාති** යනු: යමක් ඒ පුද්ගලහට ආලම්බන වේ ද ඒ ආලම්බන තෙම ඒ පුද්ගලහට ගොචර වෙයි, යමක් ඒ පුද්ගලහට ගොචර වේ ද ඒ ගොචරය තෙම ඒ පුද්ගලහට ආලම්බන වේ. **පජානාති** යනු: (හෙ තෙම) පුද්ගල යැ, **පජානනා** ප්‍රඥ යැ, පුද්ගල ප්‍රඥයෙන් දැනගනී යනු යි.

**සමං** යනු: අරමුණ එළඹසිටීම ශම ය චිත්තයාගේ අවික්ෂෙපය ශම යැ, චිත්තයාගේ අධිෂ්ඨානය ශම යැ, චිත්තයාගේ ව්‍යවදානය ශම යි. **අත්ථං** යනු: අනවද්‍යස්වභාව යැ නිකෙලශස්වභාව යැ ව්‍යවදානස්වභාව යැ උත්තම ස්වභාව යි. **පටිවිජ්ඣති** යනු: ආලම්බනයාගේ එළඹසිටීම ප්‍රතිවෙධ කෙරෙයි. චිත්තයාගේ අවික්ෂෙපස්වභාවය ප්‍රතිවෙධ කෙරෙයි, චිත්තයාගේ අධිෂ්ඨාන ස්වභාවය ප්‍රතිවෙධ කෙරෙයි, චිත්තයාගේ පරිශුද්ධස්වභාවය ප්‍රතිවෙධ කෙරේ. එයින් කියනු ලැබෙයි: ‘සමත්ථඤ්ච පටිවිජ්ඣති’යි. (1)

කිසෙයින් ලුහුඬු කොට ආශ්වාස කරනුයේ ‘ලුහුඬු කොට ආශ්වාස කෙරෙමි’යි දැනගනී ද, ‘ලුහුඬු කොට ප්‍රශ්වාස කරනුයේ ලුහුඬු කොට ප්‍රශ්වාස කෙරෙමි’යි දැනගනී ද යත්:

ලුහුඬු වූ ආශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස කෙරෙයි, ලුහුඬු වූ ප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ප්‍රශ්වාස කෙරෙයි, ලුහුඬු වූ ආශ්වාස-ප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස ද කෙරෙයි, ප්‍රශ්වාස ද කෙරෙයි. ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස කරන්නාහට ද ප්‍රශ්වාස කරන්නාහට ද ඡන්දය උපදී.

ඡන්දවශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ආශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස කෙරෙයි. ඡන්ද වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ප්‍රශ්වාස කෙරෙයි. ඡන්ද වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස ද කෙරෙයි, ප්‍රශ්වාස ද කෙරෙයි. ඡන්ද වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස කරන්නාහට ද ප්‍රශ්වාස කරන්නාහට ද ප්‍රාමොද්‍යය උපදී.

ප්‍රාමොද්‍යවශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ආශ්වාසය අල්ප-සඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස කෙරෙයි. ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ප්‍රශ්වාස කෙරෙයි. ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස ද කෙරෙයි, ප්‍රශ්වාස ද කෙරෙයි. ප්‍රාමොද්‍ය වශයෙන් එයට වඩා ඉතා සියුම් වූ ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසය අල්පසඞ්ඛ්‍යාත කාලයෙහි ආශ්වාස කරන්නාහට ද ප්‍රශ්වාස කරන්නාහට ද ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසයෙන් සිත පෙරළෙයි. උපෙක්ෂාව පිහිටයි.

මේ නව අයුරින් ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසයෝ කාය නම, (අරමුණට) එළඹසිටීම සමෘති නම, අනුපස්සනාව ඥන නම, කය උපස්ථාන යැ සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥනයෙන් ඒ කය අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: ‘කායෙ කායානුපස්සනා සතිපට්ඨානභාවනා’යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ ද යත්: ... මෙසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවනස්වභාවයෙන් භාවනා යි. ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාසවශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ප්‍රකට කොට දන්නාලද වෙදනාවෝ උපදිති ... ලුහුඬු වූ ආශ්වාසප්‍රශ්වාස වශයෙන් චිත්තයාගේ එකාග්‍රතාසඞ්ඛ්‍යාත අවික්ෂෙපය දැනගන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි ... එයින් කියනු ලැබෙයි: ‘සමත්ථඤ්ච පටිවිජ්ඣති’යි. (2)

කථං 'සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති, 'සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති:

**කායොති** ද්වෙ කායා: නාමකායො ච රූපකායො ච. කතමො නාමකායො: වෙදනා සඤ්ඤා චෙතනා ඵස්සො මනසිකාරො, නාමඤ්ච නාමකායො ච, යෙ ච වුච්චන්ති චිත්තසඞ්ඛාරා, අයං නාමකායො. කතමො රූපකායො: චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං අස්සාසො ච පස්සාසො ච නිමිත්තඤ්ච උපනිබන්ධනා, යෙ ච වුච්චන්ති කායසඞ්ඛාරා, අයං රූපකායො.

කථං තෙ කායා පටිවිදිතා හොන්ති: දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ කායා පටිවිදිතා හොන්ති, දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ කායා පටිවිදිතා හොන්ති, රස්සං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ කායා පටිවිදිතා හොන්ති, රස්සං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ කායා පටිවිදිතා හොන්ති.

ආවජ්ජතො තෙ කායා පටිවිදිතා හොන්ති, පජානතො තෙ කායා පටිවිදිතා හොන්ති, පස්සතො තෙ කායා පටිවිදිතා හොන්ති, පච්චවෙක්ඛතො තෙ කායා පටිවිදිතා හොන්ති, චිත්තං අධිට්ඨහතො තෙ කායා පටිදිතා හොන්ති, සද්ධාය අධිමුච්චතො තෙ කායා පටිවිදිතා හොන්ති, විරියං පග්ගණ්හතො තෙ කායා පටිවිදිතා හොන්ති, සතිං උපට්ඨාපයතො තෙ කායා පටිවිදිතා හොන්ති, චිත්තං සමාදහතො තෙ කයා පටිවිදිතා හොන්ති, පඤ්ඤාය පජානතො තෙ කායා පටිවිදිතා හොන්ති, අභිඤ්ඤෙය්‍යං අභිජානතො තෙ කායා පටිවිදිතා හොන්ති, පරිඤ්ඤෙය්‍යං පරිජානතො තෙ කායා පටිවිදිතා හොන්ති, පහාතබ්බං පජහතො තෙ කායා පටිවිදිතා හොන්ති, භාවෙතබ්බං භාවයතො තෙ කායා පටිවිදිතා හොන්ති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොතො තෙ කායා පටිවිදිතා හොන්ති, එවං තෙ කායා පටිවිදිතා හොන්ති.

සබ්බකායපටිසංවෙදී අස්සාසපස්සාසා කායො, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, කායො උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති. තෙන වුච්චති: 'කායෙ කායානුපස්සනා සතිපට්ඨානභාවනා'ති.

කිසෙයින් 'සියලු ආශ්වාසප්‍රශ්වාසකාය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'සියලු ආශ්වාසප්‍රශ්වාසකාය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

**කායො** යනු: දෙ කයෙකි: නාමකාය ද රූපකාය දැ යි. නාමකාය කවරෙ යත්: වෙදනා යැ සංඥා යැ චෙතනා යැ ස්පර්ශ යැ මනසිකාර යි. නාමය ද නාමකාය ද යම් ධර්ම කෙනෙක් චිත්තසංස්කාරයහ යි කියනු ලැබෙත් නම් ඔහු දැ යි මේ නාමකාය නම් වෙයි. රූපකාය කවරෙ යත්: සතර මහාභූත යැ සතර මහාභූතයන් නිසා පවත්නා රූප යැ ආශ්වාස යැ ප්‍රශ්වාස යැ නිමිත්ත යැ උපනිබන්ධනා (ආශ්වාසප්‍රශ්වාසයන් ස්පර්ශ කරන තැන) යැ, යම් ධර්ම කෙනෙක් කායසංස්කාරයහ'යි කියනු ලැබෙත් නම් ඔහු යැ යන මේ රූපකාය නම්.

කිසෙයින් ඒ (ආශ්වාසප්‍රශ්වාස) කායයෝ දන්නාලද්දාහු වෙත් ද යත්: දික් කොට ආශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟබව වූ අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ කායයෝ දන්නාලද්දාහු වෙති. දික් කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟබව වූ අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ කායයෝ දන්නාලද්දාහු වෙති. ලුහුඩු කොට ආශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟබව වූ අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි ඒ සිහියෙන් ඒ නුවණින් ඒ කායයෝ දන්නාලද්දාහු වෙති. ලුහුඩු කොට ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකඟබව වූ අවික්ෂෙපය දන්නා-හට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ කායයෝ දන්නාලද්දාහු වෙත්.

ආවර්ජනා කරන්නාහට ඒ (ආශ්වාසප්‍රශ්වාස) කායයෝ ප්‍රකට වූවාහු වෙති දන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. දක්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. චිත්තය අධිෂ්ඨාන කරන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. ශ්‍රද්ධායෙහි අධිමුක්තයාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති වීර්‍ය්‍යය දැඩි කොට ගන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. සිහි එළවන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. සිත (අරමුණෙහි) පිහිටුවන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති ප්‍රඥායෙන් දන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති ස්වලක්ෂණ විසින් දතයුත්ත ස්වලක්ෂණ විසින් දන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. සාමාන්‍යලක්ෂණ විසින් දතයුත්ත සාමාන්‍ය ලක්ෂණ විසින් දන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. ප්‍රහාතව්‍යය ප්‍රහාණය කරන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති භාවිතව්‍යය භාවනා කරන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කරන්නාහට ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙති. මෙසෙයින් ඒ කායයෝ ප්‍රකට වූවාහු වෙත්.

සියලු ආශ්වාසප්‍රශ්වාසකාය ප්‍රකට කරන්නා වූ ආශ්වාසප්‍රශ්වාසයෝ කාය නම. (ආශ්වාසප්‍රශ්වාසයන්ට) එළඹ සිටීම සමෘති නාම. අනුපස්සනාව ඥාන නම කය උපස්ථාන වෙයි. සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ කාය අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි· 'කායෙ කායානුපස්සනාසතිපට්ඨානභාවනා' යි.

**අනුපස්සතීති** කථං තං කායං අනුපස්සති. -පෙ- එවං තං කායං අනුපස්සති, **භාවෙතීති** චතස්සො භාවනා: -පෙ- ආසෙවනට්ඨෙන භාවනා, සබ්බකායපටිසංවෙදී අස්සාසපස්සාසානං[1] සංවරට්ඨෙන සීලවිසුද්ධිං අවික්ඛෙපට්ඨෙන චිත්ත විසුද්ධි, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි, යො තත්ථ සංවරට්ඨො, අයං අධිසීලසික්ඛා, යො තත්ථ අවික්ඛෙපට්ඨො, අයං අධිචිත්තසික්ඛා, යො තත්ථ දස්සනට්ඨො, අයං අධිපඤ්ඤාසික්ඛා, ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛති, ජානන්තො සික්ඛති, පස්සන්තො සික්ඛති පච්චවෙක්ඛන්තො සික්ඛති, චිත්තං අධිට්ඨහන්තො සික්ඛති සද්ධාය අධිමුච්චන්තො සික්ඛති, විරියං පග්ගණ්හන්තො සික්ඛති, සතිං උපට්ඨපෙන්තො සික්ඛති, චිත්තං සමාදහන්තො සික්ඛති, පඤ්ඤාය පජානන්තො සික්ඛති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛති, පහාතබ්බං පජහන්තො සික්ඛති, භාවෙතබ්බං භාවෙන්තො සික්ඛති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛති.

සබ්බකායපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො විදිතා වෙදනා උප්පජ්ජන්ති -පෙ- සබ්බකායපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති -පෙ- තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (3)

කථං 'පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති, 'පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති.

කතමො කායසඞ්ඛාරො: දීඝං අස්සාසා කායිකා, එතෙ ධම්මා කායපටිබද්ධා කායසඞ්ඛාරා, තෙ කායසඞ්ඛාරෙ පස්සම්භෙන්තො නිරොධෙන්තො වූපසමෙන්තො සික්ඛති. දීඝං පස්සාසා කායිකා, එතෙ ධම්මා කායපටිබද්ධා කායසඞ්ඛාරා, තෙ කායසඞ්ඛාරෙ පස්සම්භෙන්තො නිරොධෙන්තො වූපසමෙන්තො සික්ඛති. රස්සං අස්සාසා -පෙ- රස්සං පස්සාසා -පෙ- සබ්බකායපටිසංවෙදී අස්සාසා -පෙ- සබ්බකායපටිසංවෙදී පස්සාසා කායිකා, එතෙ ධම්මා කායපටිබද්ධා කායසඞ්ඛාරා, තෙ කායසඞ්ඛාරෙ පස්සම්භෙන්තො නිරොධෙන්තො වූපසමෙන්තො සික්ඛති.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ ද යත් ... මෙසෙයින් ඒ කාය අනුපස්සනා කෙරේ. **භාවෙති** යනු: භාවනා සතරෙකි ... ආසෙවන ස්වභාවයෙන් භාවනා යි. සියලු ආශ්වාසප්‍රශ්වාස කය ප්‍රකට කරන්නා වූ ආශ්වාසප්‍රශ්වාසයන් ගේ සංවරස්වභාවයෙන් ශීලවිශුද්ධි යැ අවික්ෂෙපස්වභාවයෙන් චිත්තවිශුද්ධි යැ දර්ශන ස්වභාවයෙන් දෘෂ්ටිවිශුද්ධි යි. එහි යම් සංවරස්වභාවයෙක් වේ ද මේ අධිශීලශික්ෂා යැ. එහි යම් අවික්ෂෙපස්වභාවයෙක් වේ ද මේ අධිචිත්තශික්ෂා යැ. එහි යම් දර්ශන-ස්වභාවයෙක් වේ ද මේ අධිප්‍රඥශික්ෂා යි. මේ තුන් ශික්ෂාවන් ආවර්ජනා කෙරෙමින් හික්මෙයි, දනිමින් හික්මෙයි, දකිමින් හික්මෙයි, ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් හික්මෙයි, අධිෂ්ඨාන කෙරෙමින් හික්මෙයි, ශ්‍රද්ධායෙහි අධි-මුක්ත වෙමින් හික්මෙයි, වීර්‍ය්‍යය දැඩි කොට ගනිමින් හික්මෙයි, සිහි එළවමින් හික්මෙයි, සිත (අරමුණෙහි) පිහිටුවමින් හික්මෙයි, ප්‍රඥයෙන් ප්‍රජානනය කෙරෙමින් හික්මෙයි, ස්වලක්ෂණ විසින් දතයුත්ත ස්වලක්ෂණ විසින් දනිමින් හික්මෙයි, සාමාන්‍ය ලක්ෂණ විසින් දතයුත්ත සාමාන්‍ය ලක්ෂණ විසින් දන්මින් හික්මෙයි, ප්‍රහාතව්‍යය ප්‍රහාණය කෙරෙමින් හික්මෙයි, භාවිතව්‍යය භාවනා කෙරෙමින් හික්මෙයි, සාක්ෂාත් කතව්‍යය සක්ෂාත් කෙරෙමින් හික්මේ.

සියලු ආශ්වාසප්‍රශ්වාස කය ප්‍රකට කරන්නා වූ ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකඟබව යයි කියනලද අවික්ෂෙපය දන්නාහට ප්‍රකට වූ වෙදනාවෝ උපදිත්. ... සියලු ආශ්වාසප්‍රශ්වාස කාය ප්‍රකට කරන්-නා වූ ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකඟබව යයි කියන ලද අවික්ෂෙපය දැනගන්නේ ඉන්ද්‍රියයන් සමොධානය කෙරෙයි. ... එයින් කියනු ලැබෙයි: ''සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි.(3)

කිසෙයින් 'කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

කායසංස්කාර කවරෙ යත්: රූපකයෙහි උපන් දීඝ යයි කියන ලද ආශ්වාස කෙනෙක් වෙත් ද තෙල ධර්මයෝ කය පිළිබඳ වූවාහු කාය-සංස්කාර නම් වෙති. ඒ කායසංස්කාරයන් සන්හිඳුවමින් නිරුද්ධ කෙරෙමින් ව්‍යුපශමනය කෙරෙමින් හික්මෙයි. රූපකයෙහි උපන් දීඝ යයි කියන ලද ප්‍රශ්වාස කෙනෙක් වෙත් ද තෙල ධර්මයෝ කය පිළිබඳ වූවාහු කායසංස්කාර නම් වෙති. ඒ කායසංස්කාරයන් සන්හිඳුවමින් නිරුද්ධ කෙරෙමින් ව්‍යුපශමනය කෙරෙමින් හික්මෙයි. හ්‍රස්ව යයි කියන ලද ආශ්වාසයෝ ... හ්‍රස්ව යයි කියන ලද ප්‍රශ්වාසයෝ ... සියලු ආශ්වාස-ප්‍රශ්වාස කය ප්‍රකට කරන්නා වූ ආශ්වාසයෝ ... සියලු ආශ්වාසප්‍රශ්වාස කය ප්‍රකට කරන්නා වූ කායික ප්‍රශ්වාස කෙනෙක් වෙත් ද තෙල ධර්මයෝ කය පිළිබඳ වූවාහු කායසංස්කාර නම් වෙති. ඒ කාය සංස්කාරයන් සන්හිඳුවමින් නිරුද්ධ කෙරෙමින් ව්‍යුපශමනය කෙරෙමින් හික්මෙයි.

යථාරූපෙහි කායසඞ්ඛාරෙහි යා කායස්ස ආනමනා විනමනා සන්නමනා පනමනා ඉඤ්ජනා ඵන්දනා චලනා පකම්පනා,[1] 'පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති, 'පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති. යථාරූපෙහි කායසඞ්ඛාරෙහි යා කායස්ස න ආනමනා න විනමනා න සන්නමනා න පනමනා[2] අනිඤ්ජනා අඵන්දනා අචලනා අකම්පනා, 'සන්තං සුඛුමං පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති, 'පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති. ඉති කිර පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති, 'පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති. එවං සන්තෙ වාතූපලද්ධියා[3] ච පභාවනා න හොති, අස්සාසපස්සාසානඤ්ච පභාවනා න හොති, ආනාපානසතියා ච පභාවනා න හොති, ආනාපානසතිසමාධිස්ස ච පභාවනා න හොති, න ච නං තං[4] සමාපත්තිං පණ්ඩිතා සමාපජ්ජන්තිපි වුට්ඨහන්තිපි. ඉති කිර 'පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති, 'පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති. එවං සන්තෙ වාතූපලද්ධියා[3] ච පභාවනා හොති, අස්සාසපස්සාසානඤ්ච පභාවනා හොති, ආනාපානසතියා ච පභාවනා හොති, ආනාපානසතිසමාධිස්ස ච පභාවනා හොති, තඤ්ච නං සමාපත්තිං පණ්ඩිතා සමාපජ්ජන්තිපි වුට්ඨහන්තිපි.

යථා කථං විය: සෙය්‍යථාපි කංසෙ ආකොටිතෙ පඨමං ඔළාරිකා සද්දා පවත්තන්ති, ඔළාරිකානං සද්දානං නිමිත්තං සුග්ගහිතත්තා සුමනසිකතත්තා සූපධාරිතත්තා නිරුද්ධෙපි ඔළාරිකෙ සද්දෙ අථ පච්ඡා සුඛුමකා සද්දා පවත්තන්ති, සුඛුමකානං සද්දානං නිමිත්තං සුග්ගහිතත්තා සුමනසිකතත්තා නිරුද්ධෙපි සුඛුමෙ සද්දෙ අථ පච්ඡා සුඛුමසද්දනිමිත්තාරම්මණතාපි[5] චිත්තං සූපධාරිතත්තා පවත්තති. එවමෙව පඨමං ඔළාරිකා අස්සාසපස්සාසා පවත්තන්ති ඔළාරිකානං අස්සාසපස්සාසානං නිමිත්තං සුග්ගහිතත්තා සුමනසිකතත්තා සූපධාරිතත්තා නිරුද්ධෙපි ඔළාරිකෙ අස්සාසපස්සාසෙ අථ පච්ඡා සුඛුමකා අස්සාසපස්සාසා පවත්තන්ති, සුඛුමකානං අස්සාසපස්සාසානං නිමිත්තං සුග්ගහිතත්තා සුමනසිකතත්තා සූපධාරිතත්තා නිරුද්ධෙපි සුඛුමකෙ අස්සාසපස්සාසෙ අථ පච්ඡා සුඛුමකඅස්සාසපස්සාසානං නිමිත්තාරම්මණතාපි[6] චිත්තං න වික්ඛෙපං ගච්ඡති.

එවං සන්තෙ වාතූපලද්ධියා ච පභාවනා හොති, අස්සාසපස්සාසානඤ්ච පභාවනා හොති, ආනාපානසතියා ච පභාවනා හොති, ආනාපානසතිසමාධිස්ස ච පභාවනා හොති, තඤ්ච නං සමාපත්තිං පණ්ඩිතා සමාපජ්ජන්තිපි වුට්ඨහන්තිපි.

---

1. කම්පනා - සයා, PTS,  2. න පණමනා - සයා
3. වාතූපලද්ධියා - සයා,  4. න ච තං - සයා - තඤ්ච නං PTS
5. සුඛුමනිමිත්තාරම්මණතොපි - සයා. සුඛුමසද්දනිමිත්තාරම්මණතාපි - PTS
6. නිමිත්තාරම්මණතාපි - සයා, PTS.

යම්බඳු කායසංස්කාර කෙනකුත් කාරණ කොටගෙන කය පිළිබඳ යම් ආපසු නැමීමෙක් දෙපසට නැමීමෙක් මොනොවට නැමීමෙක් පෙරට නැමීමෙක් කම්පනයෙක් මඳ වූ චලනයෙක් බලවත් චලනයෙක් ප්‍රකම්පනයෙක් වේ ද එබඳු කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි හික්මෙයි. 'කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. යම්බඳු කායසංස්කාර කෙනකුත් කාරණ කොට ගෙන කය පිළිබඳ යම් ආපසු නො නැමීමෙක් දෙපසට නො නැමීමෙක් මොනොවට නො නැමීමෙක් පෙරට නො නැමීමෙක් අනිඤ්ජනයෙක් අඵන්දනයෙක් අචලනයෙක් අකම්පනයෙක් වේ ද එබඳු වූ ශාන්ත වූ සූක්ෂම වූ කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. 'කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. ඉදින් මෙසෙයින් 'කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි හික්මේ ද 'කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද මෙසේ ඇති කල්හි වාතොපලබ්ධ විඥනයාගේ ද ඉපදීමෙක් නො වේ නම් ආශ්වාසප්‍රශ්වාසයන්ගේ ද ඉපදීමෙක් නො වේ නම් ආනාපානස්මෘතියගේ ද ඉපදීමෙක් නො වේ නම් ආනාපානස්මෘති සමාධිහුගේ ද ඉපදීමෙක් නො වේ නම නුවණැතියෝ ඒ සමවතට සමවදනාහු ද (ඉන්) නැඟීසිටුනාහු ද නො ද වෙති. ඉදින් මෙසෙයින් 'කායසංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි, හික්මේ ද 'කායසංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද මෙසේ ඇති කල්හි වාතොපලබ්ධවිඥනයාගේ ද ඉපදීම වේ නම් ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ ද ඉපදීම වේ නම් අනාපානස්මෘතියගේ ද ඉපදීම වේ නම් ආනාපානස්මෘතිසමාධිහුගේ ද ඉපදීම වේ නම් නුවණැතියෝ වැළිත් ඒ සමවතට සමවදනාහු ද ඉන් නැඟී සිටුනාහු ද වෙත්.

ඒ කිසෙයින යත්: යම්සේ කස්බඳුන පහළ, කල්හි පළමු වැ ඖදරික ශබ්දයෝ පවතිත්. ඔදරික වූ ශබ්දයන්ගේ නිමිත්ත මොනොවට ගත්නා ලද බැවින් මොනොවට මෙනෙහි කරන ලද බැවින් මොනොවට සිත්හි තබන ලද බැවින් ඖදරික ශබ්දය නිරුද්ධ කල්හිදු එයින් පසු සූක්ෂම වූ ශබ්දයෝ පවතිත්. සූක්ෂමශබ්දයන්ගේ නිමිත්ත මොනොවට ගත්නාලද බැවින් මොනොවට මෙනෙහිකරනලද බැවින් මොනොවට සිත්හි තබන ලද බැවින් සූක්ෂමශබ්දය නිරුද්ධ කල්හිදු එයින් පසු සූක්ෂමශබ්දනිමිත්තාලම්බන බැවිනුදු සිත පවතී ද, එසෙයින් මැ පළමු වැ ඖදරික වූ ආශ්වාසප්‍රශ්වාසයෝ පවතිත්. ඖදරික වූ ආශ්වාසප්‍රශ්වාසයන්ගේ නිමිත්ත මොනොවට ගත්නාලද බැවින් මොනොවට මෙනෙහි කරන ලද බැවින් මොනොවට සිත්හි තබනලද බැවින් ඖදරික වූ ආශ්වාසප්‍රශ්වාසය නිරුද්ධ කල්හිදු එයින් පසු සූක්ෂම වූ ආශ්වාසප්‍රශ්වාසයෝ පවතිත්. සූක්ෂම වූ ආශ්වාසප්‍රශ්වාසයන් ගේ නිමිත්ත මොනොවට ගත්නාලද බැවින් මොනොවට මෙනෙහිකරනලද බැවින් මොනොවට සිත්හි තබන ලද බැවින් සූක්ෂම වූ ආශ්වාසප්‍රශ්වාසය නිරුද්ධ කල්හිදු එයින් පසු සූක්ෂම වූ ආශ්වාසප්‍රශ්වාසයන්ගේ නිමිත්තාලම්බන බැවිනුදු සිත වික්ෂෙපයට නො යෙයි.

මෙසේ ඇති කල්හි වාතොපලබ්ධවිඥනයාගේ ද ඉපදීම වෙයි, ආශ්වාසප්‍රශ්වාසයන්ගේ ද ඉපදීම වෙයි, ආනාපානස්මෘතියගේ ද ඉපදීම වෙයි. ආනාපානස්මෘතිසමාධිහුගේ ද ඉපදීම වෙයි. නුවණැතියෝ වැළිත් ඒ සමවතට සමවදනාහු ද ඉන් නැඟීසිටුනාහු ද වෙත්.

පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසපස්සාසා කායො, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, කායො උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති, තෙන වුච්චති: 'කායෙ කායානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං කායං අනුපස්සති. -පෙ- එවං තං කායං අනුපස්සති, **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා, පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසපස්සාසානං[1] සංවරට්ඨෙන සීලවිසුද්ධි, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි, යො තත්‍ථ සංවරට්ඨො, අයං අධිසීලසික්ඛා. යො තත්‍ථ අවික්ඛෙපට්ඨො අයං අධිචිත්තසික්ඛා, යො තත්‍ථ දස්සනට්ඨො අයං අධිපඤ්ඤාසික්ඛා. ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛති -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛති.

පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො විදිතා වෙදනා උප්පජ්ජන්ති -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං, පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති -පෙ- තෙන වුච්චති: 'සමත්‍ථඤ්ච පටිවිජ්ඣතී'ති. (4)

අට්ඨ අනුපස්සනෙ[2] ඤාණානි, අට්ඨ ච උපට්ඨානානුස්සතියො,[3] චත්තාරි සුත්තන්තිකවත්ථූනි කායෙ කායානුපස්සනාය.

**පඨමචතුක්කං**

කථං පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, 'පීතිපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.

කතමා පීති: දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො උප්පජ්ජති පීතිපාමොජ්ජං, යා පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො උප්පජ්ජති පීති පාමොජ්ජං -පෙ- රස්සං අස්සාසවසෙන -පෙ- රස්සං පස්සාසවසෙන -පෙ- සබ්බකායපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- සබ්බකායපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසවසෙන -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො උප්පජ්ජති පීතිපාමොජ්ජං, යා පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති[4] ඔදග්‍යං[5] අත්තමනතා චිත්තස්ස අයං පීති.

---

1. අස්සාසපස්සාසං - සයා  2. අනුපස්සනා - මජසං,
3. අට්ඨ චුපට්ඨානානුස්සතියො - පු  4. චිත්තස්ස - සයා,
5. ඔදග්ගං - ස.

'පස්සම්භයං කායසඞ්ඛාරං'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයෝ කාය නම්, (අරමුණට) එළඹසිටීම ස්මෘති නම්, අනුපස්සනාව ඥාන නම්, කාය උපස්ථාන වෙයි. ස්මෘති නො වෙයි. ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි, ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ ආශ්වාසප්‍රශ්වාස කය අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'කායෙ කායානුපස්සනා සතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ ද යත්. ... මෙසෙයින් ඒ කය අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි:... ආසෙවන ස්වභාවයෙන් භාවනා යි. 'පස්සම්භයං කායසංඛාරං' යි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවර ස්වභාවයෙන් ශීලවිශුද්ධි යැ අවික්ෂෙප ස්වභාවයෙන් චිත්තවිශුද්ධි යැ දර්ශන ස්වභාවයෙන් දෘෂ්ටිවිශුද්ධි යි. එහි යම් සංවරස්වභාවයෙක් වේ ද මේ අධිශීල ශික්ෂා යැ එහි යම් අවික්ෂෙප ස්වභාවයෙක් වේ ද මේ අධිචිත්ත ශික්ෂා යැ එහි යම් දර්ශන ස්වභාවයෙක් වේ ද මේ අධිප්‍රඥාශික්ෂා යි. මේ තුන් ශික්ෂාවන් ආවර්ජනා කෙරෙමින් හික්මෙයි ... සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කෙරෙමින් හික්මේ.

'පස්සම්භයං කායසඞ්ඛාරං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකඟබව වූ අවික්ෂෙපය දන්නාහට ප්‍රකට වූ වෙදනාවෝ උපදිති ... 'පස්සම්භයං කායසඞ්ඛාරං' යි කියන ලද ආශ්වාස-ප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකඟ බව වූ අවික්ෂෙපය දැන-ගන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි ... එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි. (4)

කයෙහි කය අනුව බැලීමෙහි අනුදර්ශනාඥානයෝ අට දෙනෙක, උපස්ථානානුස්මෘතීහු ද අටදෙනෙක, සෞත්‍රාන්තික වස්තූහු සතරදෙනෙකි.

**ප්‍රථමචතුෂ්කය යි.**

කිසෙයින් 'ප්‍රීතිය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද 'ප්‍රීතිය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

ප්‍රීති කවරැ යත්: 'දීඝං' යි කියන ලද ආශ්වාසයා ගේ වශයෙන් චිත්ත-යාගේ එකඟ බව වූ අවික්ෂෙපය දන්නාහට ප්‍රීතිප්‍රාමොද්‍යය උපදී. යම් ප්‍රීතියෙක් ප්‍රමුදිත බවෙක් ආමොදනාකාරයෙක් ප්‍රමොදනාකාරයෙක් හර්ෂියෙක් ප්‍රහර්ෂියෙක් (ධනය වැනි බැවින්) විත්තියෙක් උදග්‍ර බවෙක් චිත්තයාගේ සියමන බවෙක් වේ ද, 'දීඝං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟබව වූ අවික්ෂෙපය දන්නාහට ප්‍රීතිය ප්‍රාමොද්‍යය උපදී ... 'රස්සං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් 'රස්සං' යි ... කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් ... 'සබ්බකායපටිසංවෙදී'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... සබ්බකායපටිසංවෙදී'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් ... 'පස්සම්භයං කායසඞ්ඛාරං'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... 'පස්සම්භ-යං කායසඞ්ඛාරං'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකඟ-බව වූ අවික්ෂෙපය දන්නාහට ප්‍රීතිය ප්‍රාමොද්‍යය උපදී. යම් ප්‍රීතියක් ප්‍රමුදිත බවෙක් ආමොදනාකාරයෙක් ප්‍රමොදනාකාරයෙක් හර්ෂියෙක් ප්‍රහර්ෂියෙක් විත්තියක් උදග්‍ර බවෙක් චිත්තයාගේ සියමනබවෙක් වේ ද මේ ප්‍රීති නමු.

කථං සා පීති[1] පටිවිදිතා හොති දීඝං අස්සාසවසෙන[2] චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සා පීති පටිවිදිතා හොති. දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සා පීති පටිවිදිතා හොති, රස්සං අස්සාසවසෙන -පෙ- රස්සං පස්සාසවසෙන -පෙ- සබ්බකායපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- සබ්බකායපටිසංවෙදී පස්සාසවසෙන -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං අස්සාසවසෙන -පෙ- පස්සම්භයං කායසඞ්ඛාරං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන සා පීති පටිවිදිතා හොති, ආවජ්ජතො සා පීති පටිවිදිතා හොති, ජානතො -පෙ- පස්සතො -පෙ- පච්චවෙක්ඛතො -පෙ- චිත්තං අධිට්ඨහතො -පෙ- සද්ධාය අධිමුච්චතො -පෙ- විරියං පග්ගණ්හතො -පෙ- සතිං උපට්ඨාපයතො -පෙ- චිත්තං සමාදහතො -පෙ- පඤ්ඤාය පජානතො -පෙ- අභිඤ්ඤෙය්‍යං අභිජානතො -පෙ- පරිඤ්ඤෙය්‍යං පරිජානතො -පෙ- පහාතබ්බං පජහතො -පෙ- භාවෙතබ්බං භාවයතො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොතො සා පීති පටිවිදිතා හොති. එවං සා පීති පටිවිදිතා හොති.

පීතිපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන වෙදනා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, වෙදනා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං වෙදනං අනුපස්සති. තෙන වුච්චති: 'වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං වෙදනං අනුපස්සති: අනිච්චතො අනුපස්සති -පෙ- එවං තං වෙදනං අනුපස්සති, **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

පීතිපටිසංවෙදී අස්සාසපස්සාසානං[3] සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- පීතිපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති, තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති.

කථං 'සුඛපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති,[4] 'සුඛපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.

**සුඛන්ති** ද්වෙ සුඛානි: කායිකඤ්ච සුඛං, චෙතසිකඤ්ච සුඛං. කතමං කායිකං සුඛං. යං කායිකං සාතං කායිකං සුඛං කායසම්ඵස්සජං සාතං සුඛං[5] වෙදයිතං කායසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං කායිකං සුඛං. කතමං චෙතසිකං සුඛං: යං චෙතසිකං සාතං[6] චෙතසිකං සුඛං චෙතොසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං, චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං චෙතසිකං සුඛං.

---

1. 'කථං සා පීති' තායි පොත්ථකෙ න දිස්සති,
2. අස්සාසපස්සාසවසෙන - මජ්ඣං
3. අස්සාසපස්සාසා - සනා, අස්සාසපස්සාස සංවරට්ඨෙන - සී 1,
4. 'සුඛ -පෙ- සික්ඛති' තායිපොත්ථකෙ නත්ථි.
5. කායසම්ඵස්සජං සාතං සුඛං' තායිපොත්ථකෙ නත්ථි.
6. චෙතසිකං සුඛං' තායිපොත්ථකෙ නත්ථි.

කිසෙයින් ඒ ප්‍රීතිය ප්‍රකට කොට දන්නාලද වේ ද යත්: 'දීඝං' යි කියන ලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ ප්‍රීතිය ප්‍රකට කොට දන්නාලද වෙයි. 'දීඝං'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ ප්‍රීතිය ප්‍රකට කොට දන්නාලද වෙයි. 'රස්සං'යි කියන ලද ආශ්වාසයාගේ වශයෙන් ... 'රස්සං'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් ... 'සබ්බකායපටිසංවෙදී'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... සබ්බකායපටිසංවෙදී'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් ... පස්සම්භයං කායසඞ්ඛාරං'යි කියන ලද ආශ්වාසයාගේ වශයෙන් ... 'පස්සම්භයං කායසඞ්ඛාරං'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ ප්‍රීතිය ප්‍රකට කොට දන්නාලද වෙයි. ආවර්ජනා කරන්නාහට ඒ ප්‍රීතිය ප්‍රකට වූවා වෙයි. දන්නාහට ... දක්නාහට ... ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට ... චිත්තය අධිෂ්ඨාන කරන්නාහට... ශ්‍රද්ධායෙහි අධිමුක්තයහට ... වීර්‍ය්‍යය දැඩි කොට ගන්නාහට... සිහි එළවන්නාහට ... සිත (අරමුණෙහි) පිහිටුවන්නාහට ... ප්‍රඥායෙන් ප්‍රකට කොට දන්නාහට ... ස්වභාවලක්ෂණ විසින් දතයුත්ත ස්වභාවලක්ෂණ විසින් දන්නාහට ... සාමාන්‍ය ලක්ෂණ විසින් දතයුත්ත සාමාන්‍යලක්ෂණ විසින් දන්නාහට ... ප්‍රහාතව්‍යය ප්‍රහාණය කරන්නාහට ... භාවිතව්‍යය භාවනා කරන්නාහට ... සාක්ෂාත්කතීව්‍යය සාක්ෂාත් කරන්නාහට ඒ ප්‍රීතිය ප්‍රකට වූවා වෙයි. මෙසෙයින් ඒ ප්‍රීතිය ප්‍රකට කොට දන්නාලද වේ.

'පීතිපටිසංවෙදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් වේදනා වෙයි. උපස්ථානය ස්මෘති යැ අනුපස්සනාව ඥාන යැ. වේදනාව උපස්ථාන වෙයි, ස්මෘති නො වෙයි, ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘති-යෙන් ඒ ඥානයෙන් ඒ වේදනාව අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'වේදනාසු වේදනානුපස්සනාසතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු; කිසෙයින් ඒ වේදනාව අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි. ... මෙසෙයින් ඒ වේදනාව අනුපස්සනා කෙරෙයි. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවන ස්වභාවයෙන් භාවනා යි.

'පීතිපටිසංවෙදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරස්වභාව-යෙන් ශීලවිශුද්ධි වෙයි ... 'පීතිපටිසංවෙදී' යි කියනලද ආශ්වාසප්‍රශ්වාස-යන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි. 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි. (1)

කිසෙයින් 'සුඛය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'සුඛය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

**සුඛං** යනු: සුඛයෝ දෙදෙනෙකි: කායිකසුඛය ද චෛතසිකසුඛය ද'යි. කායිකසුඛය කවරැ යත්: යම් කායිකසාතයෙක් (මිහිරෙක්) කායිකසුඛ-යෙක් කායසම්ඵස්සයෙන් උපන් සාත-සුඛවෙදයිතයෙක් කායසම්ඵස්සයෙන් උපන් සාතසුඛවේදනාවක් වේ ද, මේ කායිකසුඛ නම් වෙයි. චෛතසික සුඛ කවරැ යත්: යම් චෛතසිකසාතයෙක් චෛතසිකසුඛයෙක් චෙතො-සම්ඵස්සයෙන් උපන් සාතසුඛවෙදයිතයෙක් චෙතොසම්ඵස්සයෙන් උපන් සාතසුඛවේදනාවක් වේ ද මේ චෛතසිකසුඛ නම් වේ.

කථං තෙ සුඛෙ පටිවිදිතා හොන්ති: දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ සුඛෙ පටිවිදිතා හොන්ති, දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ සුඛෙ පටිවිදිතා හොන්ති -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො තෙ සුඛෙ පටිවිදිතා හොන්ති, එවං තෙ සුඛෙ පටිවිදිතා හොන්ති.

සුඛපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන වෙදනා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං. වෙදනා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං වෙදනං අනුපස්සති. තෙන වුච්චති: 'වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං වෙදනං අනුපස්සති: අනිච්චතො අනුපස්සති -පෙ- එවං තං වෙදනං අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

සුඛපටිසංවෙදී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- සුඛපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (2)

කථං 'චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති, 'චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.

කතමො චිත්තසඞ්ඛාරො: දීඝං අස්සාසවසෙන සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසඞ්ඛාරා; දීඝං පස්සාසවසෙන සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසඞ්ඛාරා -පෙ- සුඛපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- සුඛපටිසංවෙදී පස්සාසවසෙන සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසඞ්ඛාරා. අයං චිත්තසඞ්ඛාරො.

කථං තෙ චිත්තසඞ්ඛාරා පටිවිදිතා හොන්ති: දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තෙ චිත්තසඞ්ඛාරා පටිවිදිතා හොන්ති, දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති. තාය සතියා තෙන ඤාණෙන තෙ චිත්තසඞ්ඛාරා පටිවිදිතා හොන්ති. -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො තෙ චිත්තසඞ්ඛාරා පටිවිදිතා හොන්ති. එවං තෙ චිත්තසඞ්ඛාරා පටිවිදිතා හොන්ති.

කිසෙයින් ඒ සුඛයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු වෙත් ද යත්: 'දීඝං'යි කියන ලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ සුඛයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු වෙති. 'දීඝං'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ සුඛයෝ ප්‍රකට කොට දන්නා ලද්දාහු වෙති ... සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කරන්නාහට ඒ සුඛයෝ ප්‍රකට වූවාහු වෙති. මෙසෙයින් ඒ සුඛයෝ ප්‍රකට වූවාහු වෙත්.

'සුඛපටිසංවෙදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් වේදනා වෙයි. (අරමුණට) එළඹසිටීම සමෘති යැ අනුපස්සනාව ඥාන යැ වේදනාව උපස්ථාන වෙයි. සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ වේදනාව අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'වේදනාසු වේදනානුපස්සනාසතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ වේදනාව අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි ... මෙසෙයින් ඒ වේදනාව අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවන-ස්වභාවයෙන් භාවනා යි.

'සුඛපටිසංවෙදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරස්වභාව-යෙන් ශීලවිශුද්ධි වෙයි ... 'සුඛපටිසංවෙදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාස-යන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි; 'සමන්තඤ්ච පටිවිජ්ඣති'යි. (2)

කිසෙයින් චිත්තසංස්කාරය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද 'චිත්තසංස්කාරය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

චිත්තසංස්කාර කවරැ යත්: 'දීඝං'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් සංඥාවත් වේදනාවත් චෛතසික වෙති. මෙහි ධර්මයෝ සිත පිළිබඳ වූවාහු චිත්තසංස්කාර වෙති. 'දීඝං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් සංඥාවත් වේදනාවත් චෛතසික වෙති. මෙහි ධර්මයෝ සිත පිළිබඳ වූවාහු චිත්තසංස්කාර වෙති. ... 'සුඛපටිසංවෙදී'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් - සුඛපටිසංවෙදී'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් සංඥාවත් වේදනාවත් චෛතසික වෙති. මෙහි ධර්මයෝ සිත පිළිබඳ වූවාහු චිත්ත-සංස්කාර වෙති. මේ චිත්තසංස්කාර නම් වේ.

කිසෙයින් ඒ චිත්තසංස්කාරයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු වෙත් ද යත්: 'දීඝං'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ චිත්තසංස්කාරයෝ ප්‍රකට කොට දන්නා ලද්දාහු වෙති. 'දීඝං'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි, ඒ සිහියෙන් ඒ නුවණින් ඒ චිත්තසංස්කාරයෝ ප්‍රකට කොට දන්නාලද්දාහු වෙති. ... සාක්ෂාත් කර්තව්‍යය සාක්ෂාත්කරන්නාහට ඒ චිත්තසංස්කාරයෝ ප්‍රකට වූවාහු වෙති. මෙසෙයින් ඒ චිත්තසංස්කාරයෝ ප්‍රකට වූවාහු වෙත්.

චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන වෙදනා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, වෙදනා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං වෙදනං අනුපස්සති තෙන වුච්චති: වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං වෙදනං අනුපස්සති. අනිච්චතො අනුපස්සති, -පෙ- එවං තං වෙදනං අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (3)

**කථං පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති, 'පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති:**

කතමො චිත්තසඞ්ඛාරො: දීඝං අස්සාසවසෙන සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසඞ්ඛාරා, තෙ චිත්තසඞ්ඛාරෙ පස්සම්භෙන්තො නිරොධෙන්තො වූපසමෙන්තො සික්ඛති, දීඝං පස්සාසවසෙන සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසඞ්ඛාරා, තෙ චිත්තසඞ්ඛාරෙ පස්සම්භෙන්තො නිරොධෙන්තො වූපසමෙන්තො සික්ඛති, චිත්තසඞ්ඛාරපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- චිත්තසඞ්ඛාරපටිසංවෙදී පස්සාසවසෙන සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා, එතෙ ධම්මා චිත්තපටිබද්ධා චිත්තසඞ්ඛාරා, තෙ චිත්තසඞ්ඛාරෙ පස්සම්භෙන්තො නිරොධෙන්තො වූපසමෙන්තො සික්ඛති.

පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සාසපස්සාසවසෙන වෙදනා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, වෙදනා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං වෙදනං අනුපස්සති. තෙන වුච්චති: 'වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං වෙදනං අනුපස්සති: අනිච්චතො අනුපස්සති -පෙ- එවං තං වෙදනං අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (4)

අට්ඨ අනුපස්සනෙ ඤාණානි, අට්ඨ ච උපට්ඨානානුස්සතියො, චත්තාරි සුත්තන්තිකවත්ථූනි වෙදනාසු වෙදනානුපස්සනාය.

**දුතියචතුක්කං**

'චිත්තසඞ්ඛාරපටිසංවෙදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් වෙදනා වෙයි. උපස්ථානය සමෘති යැ අනුපස්සනාව ඥාන යැ වෙදනාව උපස්ථාන වෙයි. සමෘති නො වෙයි, සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ වෙදනාව අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි.; 'වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ වෙදනාව අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි. ... මෙසෙයින් ඒ වෙදනාව අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවන සවභාවයෙන් භාවනා යි.

'චිත්තසඞ්ඛාරපටිසංවෙදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවර සවභාවයෙන් ශීලවිශුද්ධි වෙයි. ... 'චිත්තසඞ්ඛාරපටිසංවෙදී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි. (3)

කිසෙයින් 'චිත්තසංසකාරය සන්හිඳුවමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද 'චිත්තසංසකාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

චිත්තසංසකාර කවරැ යත්: 'දීඝං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් සංඥාවත් වෙදනාවත් චෛතසික වෙති. මෙල ධර්මයෝ සිත පිළිබඳ වූවාහු චිත්තසංසකාර වෙති. ඒ චිත්තසංසකාරයන් සන්හිඳුවමින් නිරුද්ධ කෙරෙමින් ව්‍යුපශමනය කෙරෙමින් හික්මෙයි. 'දීඝං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් සංඥාවත් වෙදනාවත් චෛතසික වෙති. මෙල ධර්මයෝ සිත පිළිබඳ වූවාහු චිත්තසංසකාර වෙති. ඒ චිත්තසංසකාරයන් සන්හිඳුවමින් නිරුද්ධ කෙරෙමින් ව්‍යුපශමනය කෙරෙමින් හික්මෙයි. 'චිත්තසඞ්ඛාරපටිසංවෙදී'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... 'චිත්තසඞ්ඛාරපටිසංවෙදී'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් සංඥාවත් වෙදනාවත් චෛතසික වෙති. මෙල ධර්මයෝ සිත පිළිබඳ වූවාහු චිත්තසංසකාර වෙති. ඒ චිත්තසංසකාරයන් සන්හිඳුවමින් නිරුද්ධ කෙරෙමින් ව්‍යුපශමනය කෙරෙමින් හික්මේ.

'පස්සම්භයං චිත්තසඞ්ඛාරං'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් වෙදනා වෙයි (අරමුණට) එළඹසිටීම සමෘති යැ. අනුපස්සනාව ඥාන යැ, වෙදනාව උපස්ථාන වෙයි. සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ වෙදනාව අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ වෙදනාව අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි. ... මෙසෙයින් ඒ වෙදනාව අනුපස්සනා කෙරේ. **භාවනා** යනු භාවනා සතරෙකි: ... ආසෙවනසවභාවයෙන් භාවනා යි.

'පස්සම්භයං චිත්තසඞ්ඛාරං'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි යැ ... 'පස්සම්භයං චිත්තසඞ්ඛාරං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි. (4)

වෙදනාවන්හි වෙදනාව අනුවැ බැලීමෙහි අනුදර්ශනාඥානයෝ අට දෙනෙක, උපස්ථානානුසමෘතීහු ද අටදෙනෙක, සෞත්‍රාන්තික වස්තූහු සතර දෙනෙකි.

**ද්විතීයචතුෂ්කය යි.**

කථං 'චිත්තපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති, චිත්තපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති.

කතමං තං චිත්තං: දීඝං අස්සාසවසෙන විඤ්ඤාණං චිත්තං,[1] යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො[2] මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනො[3] විඤ්ඤාණධාතු,[4] දීඝං පස්සාසවසෙන -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සාසවසෙන -පෙ- පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සාසවසෙන විඤ්ඤාණං චිත්තං[1] යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනො[3] විඤ්ඤාණධාතු[4] ඉදං චිත්තං.

කථං තං චිත්තං පටිවිදිතං හොති: දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං පටිවිදිතං හොති, දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො සති උපට්ඨිතා හොති, තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං පටිවිදිතං හොති -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොතො තං චිත්තං පටිවිදිතං හොති, එවං තං චිත්තං පටිවිදිතං හොති.

චිත්තපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන විඤ්ඤාණං චිත්තං,[1] උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, චිත්තං උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං අනුපස්සති. තෙන වුච්චති: 'චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතී**ති කථං තං චිත්තං අනුපස්සති: අනිච්චතො අනුපස්සති -පෙ- එවං තං චිත්තං අනුපස්සති. **භාවනා**ති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

චිත්තපටිසංවෙදී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි. -පෙ- චිත්තපටිසංවෙදී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං-පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (1)

කථං 'අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති, 'අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති:

කතමො[5] චිත්තස්ස අභිප්පමොදො: දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො උප්පජ්ජති චිත්තස්ස අභිප්පමොදො. යා චිත්තස්ස ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති[6] ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස. දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො උප්පජ්ජති චිත්තස්ස අභිප්පමොදො, යා චිත්තස්ස ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස -පෙ- චිත්තපටිසංවෙදී අස්සාසවසෙන -පෙ- චිත්තපටිසංවෙදී පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො උප්පජ්ජති චිත්තස්ස අභිප්පමොදො, යා චිත්තස්ස ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස, අයං චිත්තස්ස අභිප්පමොදො.

1. විඤ්ඤාණචිත්තං - ස්‍යා, PTS. 2. 'මනො' නාසිපොත්ථකෙ නත්ථි,
3. තජ්ජමනො - PTS, 4 විඤ්ඤාණධාතු -PTS
5. කතමො ච - ස්‍යා 6. චිත්තස්ස - ස්‍යා

කිසෙයින් 'චිත්තය ප්‍රකට කෙරෙමින් ආශ්වාස කරන්නෙමි'යි හික්මේ ද 'චිත්තය ප්‍රකට කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි'යි හික්මේ ද යත්:

ඒ චිත්තය කවරැ යත්: 'දීඝං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් විඥනය චිත්ත නම. යම් සිතෙක් මනසෙක් මානසයෙක් හෘදයයෙක් පණ්ඩර වූ භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රිය-යෙක් විඥනයෙක් විඥනස්කන්ධයෙක් තදනුරූප මනොවිඥනධාතුයෙක් වේ ද, 'දීඝං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් ... 'පස්සම්භයං චිත්ත-සඞ්ඛාරං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... 'පස්සම්භයං චිත්ත-සඞ්ඛාරං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් විඥනය චිත්ත නම. යම් සිතෙක් මනසෙක් මානසයෙක් හෘදයයෙක් පණ්ඩර වූ භවාඞ්ග සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥනයෙක් විඥනස්කන්ධයෙක් තදනුරූප මනොවිඥනධාතුයෙක් වේ ද මේ චිත්ත නම් වේ.

කිසෙයින් ඒ චිත්තය ප්‍රකට කොට දන්නාලද වේ ද යත්: 'දීඝං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹ සිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ සිත ප්‍රකට කොට දන්නාලද වෙයි. 'දීඝං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට සිහි එළඹසිටියා වෙයි. ඒ සිහියෙන් ඒ නුවණින් ඒ සිත ප්‍රකට කොට දන්නාලද වෙයි ... සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කරන්නාහට ඒ සිත ප්‍රකට වූයේ වෙයි. මෙසෙයින් ඒ සිත ප්‍රකට කොට දන්නාලද වේ.

'චිත්තපටිසංවෙදී' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් විඥනය චිත්ත නම. (අරමුණට) එළඹසිටීම සමෘති යැ. අනුපස්සනාව ඥන යැ. චිත්තය උපස්ථාන වෙයි සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥනයෙන් ඒ සිත අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'චිත්තෙ චිත්තානුපස්සනා සතිපට්ඨානභාවනා' යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ සිත අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි ... මෙසෙයින් ඒ සිත අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි...ආසෙවනසවභාවයෙන් භාවනා යි.

'චිත්තපටිසංවෙදී' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරසවභාව-යෙන් ශීලවිශුද්ධි යැ ... 'චිත්තපටිසංවෙදී' යි කියනලද ආශ්වාසප්‍රශ්වාස-යන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'සමන්තං ච පටිවිජ්ඣති' යි. (1)

කිසෙයින් 'සිත ප්‍රමුදිත කෙරෙමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'සිත ප්‍රමුදිත කෙරෙමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

චිත්තයාගේ ප්‍රමොදය (අධික තුෂ්ටිය) කවර යත්: 'දීඝං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට චිත්තයාගේ ප්‍රමොදය උපදී. චිත්තයාගේ යම් ආමොදනාකාර-යෙක් ප්‍රමොදනාකාරයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් (ධනය වැනි බැවින්) චිත්තියක් උදග්‍ර බවෙක් චිත්තයාගේ සියමන බවෙක් වේ ද, 'දීඝං' යි කියන ලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට චිත්තයාගේ ප්‍රමොදය උපදී. චිත්තයාගේ යම් ආමොදනාකාර-යෙක් ප්‍රමොදනාකාරයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් චිත්තියක් උදග්‍ර බවෙක් චිත්තයාගේ සියමන බවෙක් වේ ද .. 'චිත්තපටිසංවෙදී' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... 'චිත්තපටිසංවෙදී' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට චිත්තයාගේ ප්‍රමොදය උපදී. චිත්තයාගේ යම් ආමොදනාකාරයෙක් ප්‍රමොදනාකාරයෙක් හර්ෂයෙක් ප්‍රහර්ෂයෙක් චිත්තියක් උදග්‍ර බවෙක් චිත්තයාගේ සියමන බවෙක් වේ ද මේ චිත්තයාගේ ප්‍රමොදය යි.

අභිප්පමොදයං චිත්තං අස්සාසපස්සාසවසෙන විඤ්ඤාණං චිත්තං, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, චිත්තං උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං අනුපස්සති. තෙන වුච්චති: 'චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං චිත්තං අනුපස්සති: -පෙ- එවං තං චිත්තං අනුපස්සති, **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

අභිප්පමොදයං චිත්තං අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි-පෙ- අභිප්පමොදයං චිත්තං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති, තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (2)

කථං 'සමාදහං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති, 'සමාදහං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති:

කතමො සමාධි.[1] දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි, යා චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති[2]. අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා[3] සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි. දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි -පෙ- සමාදහං චිත්තං අස්සාසවසෙන -පෙ- සමාදහං චිත්තං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි, යා චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි, අයං සමාධි.

සමාදහං චිත්තං අස්සාසපස්සාසවසෙන විඤ්ඤාණං චිත්තං, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, චිත්තං උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං අනුපස්සති, තෙන වුච්චති: 'චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තං චිත්තං අනුපස්සති: -පෙ- එවං තං චිත්තං අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

සමාදහං චිත්තං අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- සමාදහං චිත්තං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (3)

1 කතමඤ්ච සමාධින්ද්‍රියං - සයා
2 අධිට්ඨිති -පෙ- සයා,
3. අවිසාහතමානසතා - සයා

'අභිප්පමෝදයං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් විඥානය චිත්ත නම්. උපස්ථානය සමෘති යෑ. අනුපස්සනාව ඥාන යෑ. චිත්තය උපස්ථාන වෙයි, සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් එ සිත අනුපස්සනා කෙරේ. එයින් කියනු ලැබෙයි: 'චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානභාවනා' යි.

**අනුපස්සති** යනු: කිසෙයින් එ සිත අනුපස්සනා කෙරේ ද යත්: ... මෙසෙයින් එ සිත අනුපස්සනා කෙරේ **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවනසවභාවයෙන් භාවනා යි.

'අභිප්පමෝදයං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි යෑ ... 'අභිප්පමෝදයං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි. (2)

**කිසෙයින් 'සිත (අරමුණෙහි) පිහිටුවමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'සිත පිහිටුවමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:**

**සමාධි කවරැ යත්:** 'දීඝං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි නම. චිත්තයාගේ යම් (අරමුණෙහි) සිටීමෙක් මොනොවට සිටීමෙක් බැසගෙන සිටීමෙක් නො විසිර යෑමෙක් අවික්ෂෙපයෙක් නො විසුලසිත් ඇති බවෙක් ශමථයෙක් සමාධින්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් වේ ද, 'දීඝං' යි කියන ලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි නම ... 'සමාදහං චිත්තං' යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් ... 'සමාදහං චිත්තං' යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි නම. චිත්තයාගේ යම් (අරමුණෙහි) සිටීමෙක් මොනොවට සිටීමෙක් බැසගෙන සිටීමෙක් නො විසිරීමෙක් අවික්ෂෙපයෙක් නො විසුලසිත් ඇති බවෙක් ශමථයෙක් සමාධින්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් වේ ද මේ සමාධි නම් වේ.

'සමාදහං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයාගේ වශයෙන් විඥානය චිත්ත නම. උපස්ථානය සමෘති යෑ අනුපස්සනාව ඥාන යෑ. චිත්තය උපස්ථාන වෙයි, සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් එසිත අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානභාවනා' යි.

**අනුපස්සති** යනු: කිසෙයින් එසිත අනුපස්සනා කෙරේ ද යත්: ... මෙසෙයින් එසිත අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවනසවභාවයෙන් භාවනා යි.

'සමාදහං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි යෑ ... 'සමාදහං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි. (3)

කථං 'විමොචයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති. විමොචයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති.

'රාගතො විමොචයං චිත්තං අස්සසිස්සාමී'ති, සික්ඛති 'රාගතො විමොචයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති, 'දොසතො විමොචයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති, 'දොසතො විමොචයං චිත්තං පස්සසිස්සා'මීති. සික්ඛති, 'මොහතො විමොචයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති -පෙ- මානතො විමොචයං චිත්තං -පෙ- දිට්ඨියා විමොචයං චිත්තං -පෙ- විචිකිච්ඡාය විමොචයං චිත්තං -පෙ- ථීනතො[1] විමොචයං චිත්තං -පෙ- උද්ධච්චතො විමොචයං චිත්තං- පෙ- අහිරිකතො විමොචයං චිත්තං-පෙ- 'අනොත්තප්පතො විමොචයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති, 'අනොත්තප්පතො විමොචයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති, විමොචයං චිත්තං අස්සාසපස්සාසවසෙන විඤ්ඤාණං චිත්තං, උපට්ඨානං සති -පෙ-

**අනුපස්සතීති** කථං තං චිත්තං අනුපස්සති. -පෙ- එවං තං චිත්තං අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

විමොචයං චිත්තං අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- විමොචයං චිත්තං අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (4)

අට්ඨ අනුපස්සනෙ ඤාණානි, අට්ඨ ච උපට්ඨානානුස්සතියො, චත්තාරි සුත්තන්තිකවත්ථූනි චිත්තෙ චිත්තානුපස්සනාය.

**තතියචතුක්කං.**

කථං 'අනිච්චානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'අනිච්චානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති: **අනිච්චන්ති** කිං අනිච්චං. පඤ්චක්ඛන්ධා අනිච්චා. කෙනට්ඨෙන අනිච්චා, උප්පාදවයට්ඨෙන අනිච්චා. පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති: පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො පඤ්චවීසති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො පඤ්චවීසති ලක්ඛණානි පස්සති, පඤ්චන්නං ඛන්ධානං උදයබ්බයං පස්සන්තො ඉමානි පඤ්ඤාස ලක්ඛණානි පස්සති.

'රූපෙ අනිච්චානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'රූපෙ අනිච්චානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- 'ජරාමරණෙ අනිච්චානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'ජරාමරණෙ අනිච්චානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.

අනිච්චානුපස්සී අස්සාසපස්සාසවසෙන ධම්මා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, ධම්මා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තෙ ධම්මෙ අනුපස්සති, තෙන වුච්චති: 'ධම්මෙසු ධම්මානුපස්සනා සතිපට්ඨානභාවනා'ති.

1 ථීනතො - මජසං, ථීනමිද්ධතො - සයා, PTS

කිසෙයින් 'සිත මුදමින් ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'සිත මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්: රාගයෙන් සිත මුදමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'රාගයෙන් සිත මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'ද්වෙෂයෙන් සිත මුදමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'ද්වෙෂයෙන් සිත මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'මොහයෙන් සිත මුදමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'මානයෙන් සිත මුදමින් ... දෘෂ්ටියෙන් සිත මුදමින් ... විචිකිත්සායෙන් සිත මුදමින් ... ස්ත්‍යානයෙන් සිත මුදමින් ... ඖද්ධත්‍යයෙන් සිත මුදමින් .. අහිරිකයෙන් සිත මුදමින් ... ... අනොත්තප්පයෙන් සිත මුදමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. අනොත්තප්පයෙන් සිත මුදමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ.

'විමොචයං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් විඥානය චිත්ත නම්. උපස්ථානය සමෘති යැ ...

**අනුපස්සති** යනු: කිසෙයින් එ සිත අනුපස්සනා කෙරේ ද යත්: ... මෙසෙයින් එ සිත අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි .. ආසෙවනස්වභාවයෙන් භාවනා යි.

'විමොචයං චිත්තං' යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරස්වභාවයෙන් ශීලවිශුද්ධි යැ ... 'විමොචයං චිත්තං' යි කියනලද ආශ්වාස-ප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති' යි. (4)

සිතෙහි සිත අනුව බැලීමෙහි අනුදර්ශනාඥානයෝ අටදෙනෙක, උපස්ථානානුසමෘතීහු අටදෙනෙක, සෞත්‍රාන්තිකවස්තූහු සතර දෙනෙකි.

**තෘතීයචතුෂ්කය යි.**

කිසෙයින් අනිත්‍යානුදර්ශී (අනිත්‍ය අනු වැ බලනසුලු) වැ ආශ්වාස කරන්නෙමි' හික්මේ ද,'අනිත්‍යානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි'හික්මේ ද යත්:

**අනිච්චං** යනු: අනිත්‍ය කවර ගත්: පඤ්චස්කන්ධයෝ අනිත්‍යයහ. කවර අරුතින් අනිත්‍යයහ යත්: උත්පාදව්‍යයස්වභාවයෙන් අනිත්‍යයහ. පඤ්චස්කන්ධයන්ගේ උදය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දක්නේ ද, ව්‍යය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දක්නේ ද, උදයව්‍යය දක්නේ කෙතෙක් ලක්ෂණයන් දක්නේ ද යත්: පඤ්චස්කන්ධයන්ගේ උදය දක්නේ පස්විසි ලක්ෂණයන් දකී. ව්‍යය දක්නේ පස්විසි ලක්ෂණයන් දකී පඤ්චස්කන්ධයන්ගේ උදයව්‍යය දක්නේ මේ පනස් ලක්ෂණයන් දකී.

'රූපයෙහි අනිත්‍යානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'රූපයෙහි අනිත්‍යානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි, වෙදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි .. විඥානයෙහි ... චක්ෂුසෙහි ... 'ජරා-මරණයෙහි අනිත්‍යානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි, 'ජරාමරණයෙහි අනිත්‍යානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ.

'අනිච්චානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් ධර්මයෝ වෙති. උපස්ථානය සමෘති යැ අනුපස්සනාව ඥාන යැ. ධර්මයෝ උපස්ථානය සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි.. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ ධර්මයන් අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සතී**ති කථං තෙ ධම්මෙ අනුපස්සති: -පෙ- එවං තෙ ධම්මෙ අනුපස්සති, **භාවනා**ති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

අනිච්චානුපස්සී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- අනිච්චානුපස්සී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති, තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (1)

කථං 'විරාගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'විරාගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති:

රූපෙ ආදීනවං දිස්වා රූපවිරාගෙ ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං 'රූපෙ විරාගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'රූපෙ විරාගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ ආදීනවං දිස්වා ජරාමරණවිරාගෙ ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං, 'ජරාමරණෙ විරාගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'ජරාමරණෙ විරාගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති,

විරාගානුපස්සී අස්සාසපස්සාසවසෙන ධම්මා, උපට්ඨානං සති, අනුපස්සනාඤාණං, ධම්මා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තෙ ධම්මෙ අනුපස්සති, තෙන වුච්චති: 'ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතී**ති කථං තෙ ධම්මෙ අනුපස්සති -පෙ- එවං තෙ ධම්මෙ අනුපස්සති. **භාවනා**ති. චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

විරාගානුපස්සී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- විරාගානුපස්සී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති (2)

කථං 'නිරොධානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'නිරොධානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති:

රූපෙ ආදීනවං දිස්වා රූපනිරොධෙ ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො[1], චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං. 'රූපෙ නිරොධානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'රූපෙ නිරොධානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ ආදීනවං දිස්වා ජරාමරණනිරොධෙ ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො,[1] චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං, 'ජරාමරණෙ නිරොධානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, ජරාමරණෙ නිරොධානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.

---

1. සද්ධාවිමුත්තො - සී 1

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ ද යත් ... මෙසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවනසවභාවයෙන් භාවනා යි.

'අනිච්චානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි යැ ... 'අනිච්චානුපස්සී'යි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්‍ෂෙපය දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්‍ද්‍රියයන් සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'සමත්‍ථඤ්ච පටිවිජ්ඣති'යි (1)

කිසෙයින් විරාගානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, විරාගානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

රූපයෙහි ආදීනව දැක රූපවිරාගයෙහි උපන් ඡන්‍ද ඇත්තේ ශ්‍රද්ධාධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි 'රූපයෙහි විරාගානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි 'රූපයෙහි විරාගානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි, වෙදනායෙහි ... සංඥයෙහි- සංස්කාරයන්හි- විඥනයෙහි- චක්‍ෂුසෙහි ... ජරාමරණයෙහි ආදීනව දැක ජරාමරණවිරාගයෙහි උපන් ඡන්‍ද ඇත්තේ ශ්‍රද්ධාධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි, ජරාමරණයෙහි විරාගානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. 'ජරාමරණයෙහි විරාගානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ.

විරාගානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් ධර්මයෝ වෙති. උපස්ථානය සමෘති යැ, අනුපස්සනාව ඥනය යැ. ධර්ම උපස්ථාන වෙයි. සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි, ඒ සමෘතියෙන් ඒ ඥනයෙන් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ. එයින් කියනු ලැබෙයි: 'ධම්මෙසු ධම්මානුපස්සනාපතිට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ ද යත්: ... මෙසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවන සවභාවයෙන් භාවනා යි.

'විරාගානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ සංවරසවභාවයෙන් ශීලවිශුද්ධි යැ ... 'විරාගානුපස්සී'යි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්‍ෂෙපය ප්‍රකට කොට දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්‍ද්‍රියයන් සමවධාන කෙරේ. එයින් කියනු ලැබෙයි: 'සමත්‍ථඤ්ච පටිවිජ්ඣති'යි. (2)

කිසෙයින් නිරොධානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, නිරොධානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්:

රූපයෙහි ආදීනව දැක රූපනිරොධයෙහි උපන් ඡන්‍ද ඇත්තේ ශ්‍රද්ධාධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි. 'රූපයෙහි නිරොධානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි 'රූපයෙහි නිරොධානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. වෙදනායෙහි ... සංඥයෙහි - සංස්කාරයන්හි - විඥනයෙහි - චක්‍ෂුසෙහි ... ජරාමරණයෙහි ආදීනව දැක ජරාමරණනිරොධයෙහි උපන් ඡන්‍ද ඇත්තේ ශ්‍රද්ධාධිමුක්ත වෙයි ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි. ජරාමරණයෙහි නිරොධානුදර්ශී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. ජරාමරණයෙහි නිරොධානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ.

කතිහාකාරෙහි අවිජ්ජාය ආදීනවො හොති, කතිහාකාරෙහි අවිජ්ජා නිරුජ්ඣති: පඤ්චහාකාරෙහි අවිජ්ජාය ආදීනවො හොති, අට්ඨහාකාරෙහි අවිජ්ජා නිරුජ්ඣති.

කතමෙහි පඤ්චහාකාරෙහි අවිජ්ජාය ආදීනවො හොති: අනිච්චට්ඨෙන අවිජ්ජාය ආදීනවො හොති, දුක්ඛට්ඨෙන අවිජ්ජාය අදීනවො හොති, අනත්තට්ඨෙන අවිජ්ජාය ආදීනවො හොති, සන්තාපට්ඨෙන අවිජ්ජාය ආදීනවො හොති, විපරිනාමට්ඨෙන අවිජ්ජාය ආදීනවො හොති, ඉමෙහි පඤ්චහාකාරෙහි අවිජ්ජාය ආදීනවො හොති.

කතමෙහි අට්ඨහාකාරෙහි අවිජ්ජා නිරුජ්ඣති: නිදානනිරොධෙන අවිජ්ජා නිරුජ්ඣති, සමුදයනිරොධෙන අවිජ්ජා නිරුජ්ඣති, ජාතිනිරොධෙන අවිජ්ජා නිරුජ්ඣති, පභවනිරොධෙන[1] අවිජ්ජා නිරුජ්ඣති, හෙතුනිරොධෙන අවිජ්ජා නිරුජ්ඣති පච්චයනිරොධෙන අවිජ්ජා නිරුජ්ඣති, ඤාණුප්පාදෙන අවිජ්ජා නිරුජ්ඣති, නිරොධුපට්ඨානෙන අවිජ්ජා නිරුජ්ඣති. ඉමෙහි අට්ඨහාකාරෙහි අවිජ්ජා නිරුජ්ඣති.

ඉමෙහි පඤ්චහාකාරෙහි අවිජ්ජාය ආදීනවං දිස්වා ඉමෙහි අට්ඨහාකාරෙහි අවිජ්ජානිරොධෙ[2] ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං. අවිජ්ජාය 'නිරොධානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, අවිජ්ජාය නිරොධානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.

කතිහාකාරෙහි සඞ්ඛාරෙසු ආදීනවො හොති, කතිහාකාරෙහි සඞ්ඛාරා නිරුජ්ඣන්ති: -පෙ- කතිහාකාරෙහි විඤ්ඤාණෙ ආදීනවො හොති, කතිහාකාරෙහි විඤ්ඤාණං නිරුජ්ඣති. -පෙ- කතිහාකාරෙහි නාමරූපෙ ආදීනවො හොති, කතිහාකාරෙහි නාමරූපං නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි සළායතනෙ ආදීනවො හොති, කතිහාකාරෙහි සළායතනං නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි ඵස්සෙ ආදීනවො හොති, කතිහාකාරෙහි ඵස්සො නිරුජ්ඣති-පෙ- කතිහාකාරෙහි වෙදනාය ආදීනවො හොති, කතිහාකාරෙහි වෙදනා නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි තණ්හාය ආදීනවො හොති, කතිහාකාරෙහි තණ්හා නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි උපාදානෙ ආදීනවො හොති, කතිහාකාරෙහි උපාදානං නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි භවෙ ආදීනවො හොති, කතිහාකාරෙහි භවො නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි ජාතියා ආදීනවො හොති, කතිහාකාරෙහි ජාති නිරුජ්ඣති -පෙ- කතිහාකාරෙහි ජරාමරණෙ ආදීනවො හොති, කතිහාකාරෙහි ජරාමරණං නිරුජ්ඣති: පඤ්චහාකාරෙහි ජරාමරණෙ ආදීනවො හොති, අට්ඨහාකාරෙහි ජරාමරණං නිරුජ්ඣති.

කතමෙහි පඤ්චහාකාරෙහි ජරාමරණෙ ආදීනවො හොති: අනිච්චට්ඨෙන ජරාමරණෙ ආදීනවො හොති, දුක්ඛට්ඨෙන -පෙ- අනත්තට්ඨෙන -පෙ- සන්තාපට්ඨෙන -පෙ- විපරිනාමට්ඨෙන ජරාමරණෙ ආදීනවො හොති. ඉමෙහි පඤ්චහාකාරෙහි ජරාමරණෙ ආදීනවො හොති.

---

1 ආහාරනිරොධෙන - ස්‍යා

2 අවිජ්ජනිරොධෙන - ස්‍යා, PTS,

කිහි අයුරෙකින් අවිද්‍යායෙහි ආදීනව වේ ද? කිහි අයුරෙකින් අවිද්‍යාව නිරුද්ධ වේ ද යත්: පස් අයුරෙකින් අවිද්‍යායෙහි ආදීනව වෙයි. අට අයුරෙකින් අවිද්‍යාව නිරුද්ධ වේ.

කවර පස්අයුරෙකින් අවිද්‍යායෙහි ආදීනව වේ ද යත්: අනිත්‍යස්වභාවයෙන් අවිද්‍යායෙහි ආදීනව වෙයි. දුඃඛස්වභාවයෙන් අවිද්‍යායෙහි ආදීනව වෙයි. අනාත්මස්වභාවයෙන් අවිද්‍යායෙහි ආදීනව වෙයි. සන්තාපස්වභාවයෙන් අවිද්‍යායෙහි ආදීනව වෙයි. විපරිණාමස්වභාවයෙන් අවිද්‍යායෙහි ආදීනව වේ. මේ පස්අයුරින් අවිද්‍යායෙහි ආදීනව වේ.

කවර අටඅයුරෙකින් අවිද්‍යාව නිරුද්ධ වේ ද යත්: මූලප්‍රත්‍යය නිරෝධයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, ආසන්නප්‍රත්‍යය නිරෝධයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, මූලප්‍රත්‍යයාගේ උත්පත්තිනිරෝධයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, ආසන්නප්‍රත්‍යයාගේ උත්පත්තිනිරෝධයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, ජනක ප්‍රත්‍යය නිරෝධයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි: උපස්ථම්භකප්‍රත්‍යය නිරෝධයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි, (විදර්ශනා-මාර්ග) ඥනොත්පාදයෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි. නිරෝධය එළඹසිටීමෙන් අවිද්‍යාව නිරුද්ධ වෙයි. මේ අට අයුරින් අවිද්‍යාව නිරුද්ධ වේ. මේ පස් අයුරින් අවිද්‍යායෙහි ආදීනව දැක මේ අට අයුරින් අවිද්‍යානිරෝධයෙහි හටගත් ඡන්ද ඇත්තේ ශ්‍රද්ධාධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි. 'අවිද්‍යාවගේ නිරෝධය අනුව බලමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. 'අවිද්‍යාවගේ නිරෝධය අනුව බලමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ.

කිහි අයුරෙකින් 'සංස්කාරයන්හි ආදීනව වේ ද, කිහි අයුරෙකින් සංස්කාරයෝ නිරුද්ධ වෙත් ද, ... කිහි අයුරෙකින් විඥනයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් විඥනය නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් නාමරූපයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් නාමරූපය නිරුද්ධ වේ ද? කිහි අයුරෙකින් සළායතනයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් සළායතනය නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් ස්පර්ශයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් ස්පර්ශය නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් වෙදනායෙහි ආදීනව වේ ද. කිහි අයුරෙකින් වෙදනාව නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් තෘෂ්ණාවගේ ආදීනව වේ ද, කිහි අයුරෙකින් තෘෂ්ණාව නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් උපාදානයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් උපාදානය නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් භවයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් භවය නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් ජාතියෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් ජාතිය නිරුද්ධ වේ ද, කිහි අයුරෙකින් ජරාමරණයෙහි ආදීනව වේ ද, කිහි අයුරෙකින් ජරාමරණය නිරුද්ධ වේ ද යත්: පස් අයුරෙකින් ජරාමරණයෙහි ආදීනව වෙයි. අට අයුරෙකින් ජරාමරණය නිරුද්ධ වේ.

කවර පස් අයුරින් ජරාමරණයෙහි ආදීනව වේ ද යත්: අනිත්‍ය ස්වභාවයෙන් ජරාමරණයෙහි ආදීනව වෙයි. දුඃඛස්වභාවයෙන් ... අනාත්ම ස්වභාවයෙන් ... සන්තාපස්වභාවයෙන් .. විපරිණාමස්වභාවයෙන් ජරාමරණයෙහි ආදීනව වෙයි. මේ පස් අයුරින් ජරාමරණයෙහි ආදීනව වේ.

කතමෙහි අට්ඨහාකාරෙහි ජරාමරණං නිරුජ්ඣති: නිදානනිරොධෙන ජරාමරණං නිරුජ්ඣති, සමුදයනිරොධෙන -පෙ- ජාතිනිරොධෙන -පෙ- පභවනිරොධෙන[1] -පෙ- හෙතුනිරොධෙන -පෙ- පච්චයනිරොධෙන -පෙ- ඤාණුප්පාදෙන -පෙ- නිරොධුපට්ඨානෙන ජරාමරණං නිරුජ්ඣති. ඉමෙහි අට්ඨහාකාරෙහි ජරාමරණං නිරුජ්ඣති.

ඉමෙහි පඤ්චහාකාරෙහි ජරාමරණෙ ආදීනවං දිස්වා ඉමෙහි අට්ඨහාකාරෙහි ජරාමරණනිරොධෙ ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො,[2] චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං, 'ජරාමරණෙ නිරොධානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, ජරාමරණෙ නිරොධානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති.

නිරොධානුපස්සී අස්සාසපස්සාසවසෙන ධම්මා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, ධම්මා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තෙ ධම්මෙ අනුපස්සති. තෙන වුච්චති: 'ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

**අනුපස්සතීති** කථං තෙ ධම්මෙ අනුපස්සති -පෙ- එවං තෙ ධම්මෙ අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

නිරොධානුපස්සී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- නිරොධානුපස්සී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො -පෙ- පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති. තෙන වුච්චති: 'සමත්ථඤ්ච පටිවිජ්ඣතී'ති. (3)

කථං 'පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති:

**පටිනිස්සග්ගාති** ද්වෙ පටිනිස්සග්ගා: පරිච්චාගපටිනිස්සග්ගො ච, පක්ඛන්දනපටිනිස්සග්ගො ච. 'රූපං පරිච්චජතී'ති පරිච්චාගපටිනිස්සග්ගො 'රූපනිරොධෙ නිබ්බානෙ චිත්තං පක්ඛන්දතී'ති පක්ඛන්දනපටිනිස්සග්ගො, රූපෙ පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, රූපෙ 'පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- 'ජරාමරණං පරිච්චජතී'ති පරිච්චාගපටිනිස්සග්ගො, 'ජරාමරණනිරොධෙ නිබ්බානෙ චිත්තං පක්ඛන්දතී'ති පක්ඛන්දනපටිනිස්සග්ගො.

'ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති, 'ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සමී'ති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී අස්සාසපස්සාසවසෙන ධම්මා, උපට්ඨානං සති, අනුපස්සනා ඤාණං, ධම්මා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන තෙ ධම්මෙ අනුපස්සති. තෙන වුච්චති: 'ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානභාවනා'ති.

1. භවනිරොධෙන - ස්‍යා, සී 1
2. සද්ධාවිමුත්තො - සී 1.

කවර අට අයුරින් ජරාමරණය නිරුද්ධ වේ ද යත්: නිදානනිරොධයෙන් ජරාමරණය නිරුද්ධ වෙයි. සමුදයනිරොධයෙන් ... ජාතිනිරොධයෙන් ... පභවනිරොධයෙන් ... හෙතුනිරොධයෙන් ... ප්‍රත්‍යයනිරොධයෙන් ... ඥානොත්පාදයෙන් ... නිරොධය එළඹසිටීමෙන් ජරාමරණය නිරුද්ධ වෙයි. මේ අට අයුරින් ජරාමරණය නිරුද්ධ වේ. මේ පස් අයුරින් ජරාමරණයෙහි ආදීනව දැක මේ අට අයුරින් ජරාමරණනිරොධයෙහි හටගත් ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි. 'ජරාමරණයෙහි නිරොධය අනුව බලමින් ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. ජරාමරණයෙහි නිරොධය අනුව බලමින් ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. 'නිරොධානුපස්සී'යි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් ධර්මයෝ වෙයි. උපස්ථානය ස්මෘති යෑ, අනුපස්සනාව ඥාන යෑ. ධර්ම උපස්ථාන වෙයි. ස්මෘති නො වෙයි. ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ ධර්මයන් අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි. 'ධම්මේසු ධම්මානුපස්සනාසතිපට්ඨානභාවනා'යි.

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ ද යත්: ... මෙසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරෙයි. **භාවනා** යනු: භාවනා සතරෙකි ... ආසෙවනස්වභාවයෙන් භාවනා යි. 'නිරොධානුපස්සී'යි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් සංවර ස්වභාවයෙන් ශීලවිශුද්ධි යෑ ... 'නිරොධානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ප්‍රකට කොට දන්නාහට ... ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි. සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි.

කිසෙයින් 'පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කරන්නෙමි' හික්මේ ද, 'පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මේ ද යත්: **පටිනිස්සග්ගා** යනු: ප්‍රතිනිඃසර්ගයෝ දෙදෙනෙකි: පරිත්‍යාගප්‍රතිනිඃසර්ග යෑ ප්‍රස්කන්දනප්‍රතිනිඃසර්ග යෑ යි. රූපය පරිත්‍යාග කෙරේ නු යි පරිත්‍යාගප්‍රතිනිඃසර්ග වෙයි. රූපනිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි චිත්තය ප්‍රස්කන්දනය කෙරේ නු යි ප්‍රස්කන්දනප්‍රතිනිඃසර්ග වෙයි. 'රූපයෙහි පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. 'රූපයෙහි පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. වෙදනාව ... සංඥාව ... සංස්කාරයන් .. විඥානය ... චක්ෂුෂ ... ජරාමරණය පරිත්‍යාග කෙරේ නු යි පරිත්‍යාගප්‍රතිනිඃසර්ග වෙයි, ජරාමරණනිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි චිත්තය ප්‍රස්කන්දන කෙරේ නු යි ප්‍රස්කන්දනප්‍රතිනිඃසර්ග වෙයි. 'ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කරන්නෙමි' හික්මෙයි. ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කරන්නෙමි' හික්මෙයි. පටිනිස්සග්ගානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් ධර්මයෝ වෙති. උපස්ථානය ස්මෘති යෑ, අනුපස්සනාව ඥාන යෑ, ධර්ම උපස්ථාන වෙයි. ස්මෘති නො වෙයි ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ ධර්මයන් අනුපස්සනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි. 'ධම්මේසු ධම්මානුපස්සනාසතිපට්ඨාන භාවනා'යි.

**අනුපස්සතීති** කථං තෙ ධම්මෙ අනුපස්සති: අනිච්චතො අනුපස්සති, නො නිච්චතො -පෙ- පටිනිස්සජ්ජති, නො ආදියති. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. එවං තෙ ධම්මෙ අනුපස්සති. **භාවනාති** චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

පටිනිස්සග්ගානුපස්සී අස්සාසපස්සාසානං සංවරට්ඨෙන සීලවිසුද්ධි, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි, යො තත්ථ සංවරට්ඨො, අයං අධිසීලසික්ඛා. යො තත්ථ අවික්ඛෙපට්ඨො, අයං අධිචිත්තසික්ඛා, යො තත්ථ දස්සනට්ඨො, අයං අධිපඤ්ඤාසික්ඛා. ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛති, ජානන්තො සික්ඛති -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛති.

පටිනිස්සග්ගානුපස්සී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානතො විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසපස්සාසවසෙන චිත්තස්ස එකග්ගතං අවික්ඛෙපං පජානන්තො ඉන්ද්‍රියානි සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති, බලානි සමොධානෙති, බොජ්ඣඞ්ගෙ සමොධානෙති, මග්ගං සමොධානෙති, ධම්මෙ සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති.

**ඉන්ද්‍රියානි සමොධානෙතීති** කථං ඉන්ද්‍රියානි සමොධානෙති: අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං සමොධානෙති -පෙ- තෙන වුච්චති: '**සමත්ථඤ්ච පටිවිජ්ඣතී**'ති. (4)

අට්ඨ අනුපස්සනෙ ඤාණානි, අට්ඨ ච උපට්ඨානානුස්සතියො, චත්තාරි සුත්තන්තිකවත්ථූනි ධම්මෙසු ධම්මානුපස්සනාය.

ඉමානි බත්තිංස සතොකාරිස්ස ඤාණානි.

**චතුත්ථ චතුක්කං.**

**සතොකාරිඤාණ නිද්දෙසො.**

**අනුපස්සති** යනු: කිසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරේ ද යත්: අනිත්‍ය හෙයින් අනුපස්සනා කෙරෙයි. නිත්‍ය හෙයින් අනුපස්සනා නො කෙරෙයි. ... පරිත්‍යාග කෙරෙයි. ග්‍රහණය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් අනුපස්සනා කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි ... පරිත්‍යාග කරනුයේ ආදානය දුරු කෙරෙයි. මෙසෙයින් ඒ ධර්මයන් අනුපස්සනා කෙරෙයි. **භාවනා** යනු: භාවනා සතරෙකි: ඒ භාවනාවිශෙෂයෙහි උපන් යුගනද්ධ (සමාධි-ප්‍රඥා) ධර්මයන්ගේ නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් භාවනා යෑ ... ආසෙවනස්වභාවයෙන් භාවනා යි.

'පටිනිස්සග්ගානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් සංවරස්වභාවයෙන් ශීලවිශුද්ධි යෑ අවික්ෂෙපස්වභාවයෙන් චිත්තවිශුද්ධි යෑ දර්ශනස්වභාවයෙන් දෘෂ්ටිවිශුද්ධි යෑ, එහි යම් සංවරස්වභාවයෙක් වේ ද මේ අධිශීලශික්ෂා යෑ, එහි යම් අවික්ෂෙපස්වභාවයෙක් වේ ද මේ අධිචිත්තශික්ෂා යෑ එහි යම් දර්ශනස්වභාවයෙක් වේ ද මේ අධිප්‍රඥාශික්ෂා යි. මේ තුන් ශික්ෂාවන් ආවර්ජනා කරන්නේ හික්මෙයි දන්නේ හික්මෙයි. ... සාක්ෂාත්-කර්තව්‍යය සාක්ෂාත් කරන්නේ හික්මේ.

'පටිනිස්සග්ගානුපස්සී'යි කියන ලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය දන්නාහට ප්‍රකට කොට දන්නාලද වෙදනාවෝ උපදිති, ප්‍රකට කොට දන්නාලද්දාහු වටහති ප්‍රකට කොට දන්නා ලද්දාහු අස්තයට යෙති ... 'පටිනිස්සග්ගානුපස්සී'යි කියනලද ආශ්වාසප්‍රශ්වාසයන්ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ප්‍රකට කොට දන්නේ ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි. ගොචරය ද ප්‍රකට කොට දැනගනී. ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරෙයි. බලයන් සමවධාන කෙරෙයි. බොධ්‍යඞ්ගයන් සමවධාන කෙරෙයි. මාර්ගය සමවධාන කෙරෙයි. ධර්මයන් සමවධාන කෙරෙයි. ගොචරය ද ප්‍රකට කොට දැනගනී. ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරේ.

**ඉන්ද්‍රියානි සමොධානෙති** යනු: කිසෙයින් ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි, යත්: අධිමොක්ෂස්වභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය සමවධාන කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'සමත්ථඤ්ච පටිවිජ්ඣති'යි.

ධර්මයන්හි ධර්මානුදර්ශනායෙහි අනුදර්ශනාඥානයෝ අටදෙනෙක උපස්ථානානුස්මෘතීහු ද අට දෙනෙක, සෞත්‍රානතිකාවස්තූහු සතර දෙනෙකි.

මොහු සතොකාරීහුගේ දෙතිස් ඥානයෝ යි.

චතුර්ථ චතුෂ්කය යි.

**සතොකාරිඥානනිර්දේශය නිමි.**

## 3 - 6, 11. ඤාණරාසිඡක්කං

(6) කතමානි චතුවීසති සමාධිවසෙන ඤාණානි:

දීඝං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි, දීඝං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි -පෙ- විමොචයං චිත්තං අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි, විමොචයං චිත්තං පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි.

ඉමානි චතුවීසති සමාධිවසෙන ඤාණානි.

(7) කතමානි ද්වෙසත්තති විපස්සනාවසෙන ඤාණානි:

දීඝං අස්සාසං අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා, අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දීඝං පස්සාසං අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා, අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා -පෙ- විමොචයං චිත්තං අස්සාසං -පෙ- විමොචයං චිත්තං පස්සාසං අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා.

ඉමානි ද්වෙසත්තති විපස්සනාවසෙන ඤාණානි.

(8) කතමානි අට්ඨ නිබ්බිදාඤාණානි:

අනිච්චානුපස්සී අස්සාසං යථාභූතං ජානාති පස්සතීති නිබ්බිදාඤාණං, අනිච්චානුපස්සී පස්සාසං යථාභූතං ජානාති පස්සතීති නිබ්බිදාඤාණං -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසං යථාභූතං ජානාති පස්සතීති නිබ්බිදාඤාණං, පටිනිස්සග්ගානුපස්සී පස්සාසං යථාභූතං ජානාති පස්සතීති නිබ්බිදාඤාණං.

ඉමානි අට්ඨ නිබ්බිදාඤාණානි.

(9) කතමානි අට්ඨ නිබ්බිදානුලොමෙ ඤාණානි.

අනිච්චානුපස්සී අස්සාසං භයතුපට්ඨානෙ පඤ්ඤා නිබ්බිදානුලොමෙ ඤාණං, අනිච්චානුපස්සී පස්සාසං භයතුපට්ඨානෙ පඤ්ඤා නිබ්බිදානුලොමෙ ඤාණං -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසං භයතුපට්ඨානෙ පඤ්ඤා නිබ්බිදානුලොමෙ ඤාණං, පටිනිස්සග්ගානුපස්සී පස්සාසං භයතුපට්ඨානෙ පඤ්ඤා නිබ්බිදානුලොමෙ ඤාණං.

ඉමානි අට්ඨ නිබ්බිදානුලොමෙ ඤාණානි.

# 3 – 6, 11. ඥානරාශිෂට්ක

සමාධිවශයෙන් සූවිසි ඥානයෝ කවරහ යත්:

'දීඝං'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි යැ 'දීඝං'යි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි යැ ... 'විමොචයං චිත්තං'යි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි යැ 'විමොචයං චිත්තං'යි කියනලද ප්‍රශ්වාසයා ගේ වශයෙන් චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි යි.

මොහු සමාධි වශයෙන් සූවිසි ඥානයෝ යි. (1)

විදර්ශනා වශයෙන් දෙසැත්තෑ ඥානයෝ කවරහ යත්:

දීඝී වූ ආශ්වාසය අනිත්‍ය හෙයින් අනුදර්ශනාසවභාවයෙන් විදර්ශනා යැ දුඃඛ හෙයින් අනුදර්ශනාසවභාවයෙන් විදර්ශනා යැ අනාත්ම හෙයින් අනුදර්ශනාසවභාවයෙන් විදර්ශනා යැ දීඝී වූ ප්‍රශ්වාසය අනිත්‍ය හෙයින් අනුදර්ශනාසවභාවයෙන් විදර්ශනා යැ දුඃඛ හෙයින් අනුදර්ශනාසවභාවයෙන් විදර්ශනා යැ අනාත්ම හෙයින් අනුදර්ශනාසවභාවයෙන් විදර්ශනා යැ... සිත මුදමින් ආශ්වාසය ... සිත මුදමින් ප්‍රශ්වාසය අනිත්‍ය හෙයින් අනුදර්ශනා සවභාවයෙන් විදර්ශනා යැ දුඃඛ හෙයින් අනුදර්ශනාසවභාවයෙන් විදර්ශනා යැ අනාත්ම හෙයින් අනුදර්ශනාසවභාවයෙන් විදර්ශනා යි.

මොහු විදර්ශනා වශයෙන් දෙසැත්තෑ ඥානයෝ යි. (2)

අෂ්ටනිර්වේදඥානයෝ කවරහ යත්:

අනිත්‍යානුදර්ශී වැ ආශ්වාස කරනුයේ ඇති සැටියෙන් දනී දකී නු යි නිර්වේදඥාන යැ අනිත්‍යානුදර්ශී වැ ප්‍රශ්වාසය කරනුයේ ඇති සැටියෙන් දනී දකී නු යි නිර්වේදඥාන යැ ... ප්‍රතිනිඃසර්ගානුදර්ශී වැ ආශ්වාසකරනුයේ ඇති සැටියෙන් දනී දකී නු යි නිර්වේදඥාන යැ ප්‍රතිනිඃසර්ගානු දර්ශීවැ ප්‍රශ්වාස කරනුයේ ඇති සැටියෙන් දනී දකී නු යි නිර්වේදඥාන යි.

මොහු අෂ්ට නිර්වේදඥානයෝ යි. (3)

අෂ්ටනිර්වේදානුලොමඥානයෝ කවරහ යත්:

අනිත්‍යානුදර්ශී වැ ආශ්වාස කරන්නහුට භය හෙයින් වැටහීමේ ප්‍රඥාව නිර්වේදානුලොමඥාන යැ අනිත්‍යානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නහුට භය හෙයින් වැටහීමේ ප්‍රඥාව නිර්වේදානුලොමඥාන යැ ... පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කරන්නහුට භය හෙයින් වැටහීමේ ප්‍රඥාව නිර්වේදානුලොම-ඥාන යැ පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කරන්නහුට භය හෙයින් වැටහීමේ ප්‍රඥාව නිර්වේදානුලොමඥාන යි.

මොහු අෂ්ට නිර්වේදානුලොමඥානයෝ යි. (4)

(10) කතමානි අට්ඨ නිබ්බිදාපටිප්පස්සද්ධි ඤාණානි:

අනිච්චානුපස්සී අස්සාසං පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා නිබ්බිදාපටිප්පස්සද්ධිඤාණං, අනිච්චානුපස්සී පස්සාසං පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා නිබ්බිදාපටිප්පස්සද්ධිඤාණං -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසං පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා නිබ්බිදාපටිප්පස්සද්ධිඤාණං, පටිනිස්සග්ගානුපස්සී පස්සාසං පටිසඞ්ඛා සන්තිට්ඨනා පඤ්ඤා නිබ්බිදාපටිප්පස්සද්ධිඤාණං.

ඉමානි අට්ඨ නිබ්බිදාපටිප්පස්සද්ධිඤාණානි.

(11) කතමානි එකවීසති විමුත්තිසුඛෙ ඤාණානි:

සොතාපත්තිමග්ගෙන සක්කායදිට්ඨියා පහීනත්තා සමුච්ඡින්නත්තා උප්පජ්ජති විමුත්තිසුඛෙ ඤාණං, විචිකිච්ඡාය පහීනත්තා සමුච්ඡින්නත්තා උප්පජ්ජති විමුත්තිසුඛෙ ඤාණං, සීලබ්බතපරාමාසස්ස -පෙ- දිට්ඨානුසයස්ස -පෙ- විචිකිච්ඡානුසයස්ස පහීනත්තා සමුච්ඡින්නත්තා උප්පජ්ජති විමුත්තිසුඛෙ ඤාණං, සකදාගාමිමග්ගෙන ඔළාරිකස්ස කාමරාගසඤ්ඤොජනස්ස -පෙ- පටිඝසඤ්ඤොජනස්ස -පෙ- ඔළාරිකස්ස කාමරාගානුසයස්ස, පටිඝානුසයස්ස පහීනත්තා සමුච්ඡින්නත්තා උප්පජ්ජති විමුත්තිසුඛෙ ඤාණං, අනාගාමිමග්ගෙන අනුසහගතස්ස කාමරාගසඤ්ඤොජනස්ස -පෙ- පටිඝසඤ්ඤොජනස්ස, අනුසහගතස්ස කාමරාගානුසයස්ස, පටිඝානුසයස්ස පහීනත්තා සමුච්ඡින්නත්තා උප්පජ්ජති විමුත්තිසුඛෙ ඤාණං, අරහත්තමග්ගෙන රූපරාගස්ස -පෙ- අරූපරාගස්ස, මානස්ස, උද්ධච්චස්ස, අවිජ්ජාය මානානුසයස්ස, භවරාගානුසයස්ස, අවිජ්ජානුසයස්ස පහීනත්තා සමුච්ඡින්නත්තා උප්පජ්ජති විමුත්තිසුඛෙ ඤාණං.

ඉමානි එකවීසති විමුත්තිසුඛෙ ඤාණානි.

සොළසවත්ථුකං ආනාපානසතිසමාධිං භාවයතො සමධිකානි ඉමානි ද්වෙ ඤාණසතානි උප්පජ්ජන්ති.

**ආනාපානසතිකථා සමත්තා.**

නිර්වේදප්‍රතිප්‍රශ්‍රබ්ධිඥානයෝ අටදෙන කවරහ යත්:

අනිත්‍යානුදර්ශී වැ ආශ්වාස කරන්නහුට පටිසඞ්ඛාසන්තිට්ඨනා ප්‍රඥව නිර්වේදප්‍රතිප්‍රශ්‍රබ්ධිඥාන වෙයි, අනිත්‍යානුදර්ශී වැ ප්‍රශ්වාස කරන්නහුට පටිසඞ්ඛාසන්තිට්ඨනා ප්‍රඥව නිර්වේදප්‍රතිප්‍රශ්‍රබ්ධිඥාන වෙයි, පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කරන්නහුට පටිසඞ්ඛාසන්තිට්ඨනා ප්‍රඥව නිර්වේදප්‍රතිප්‍රශ්‍රබ්ධිඥාන වෙයි, පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කරන්නහුට පටිසඞ්ඛාසන්තිට්ඨනා ප්‍රඥව නිර්වේදප්‍රතිප්‍රශ්‍රබ්ධිඥාන වේ.

මොහු නිර්වේදඥානයෝ අටදෙන වෙත්. (5)

එක්විසි විමුක්තිසුඛඥානයෝ කවරහ යත්:

ස්‍රොතාපත්තිමාර්ගයෙන් සත්කායදෘෂ්ටිය පුහුත් බැවින් මුලුසුන් කරන ලද බැවින් විමුක්තිසුඛඥානය උපදී. විචිකිත්සාව පුහුත් බැවින් මුලුසුන් කරනලද බැවින් විමුක්තිසුඛඥානය උපදී. ශීලව්‍රතපරාමර්ශය ... දෘෂ්ට්‍යනුශය විචිකිත්සානුශය පුහුත් බැවින් මුලුසුන් කරනලද බැවින් විමුක්තිසුඛඥානය උපදී. සකෘදාගාමිමාර්ගයෙන් ඖදාරිකකාමරාගසංයොජනය ... ප්‍රතිඝසංයෝජනය ඖදාරික වූ කාමරාගානුශය ප්‍රතිඝානුශය පුහුත් බැවින් මුලුසුන් කරනලද බැවින් විමුක්තිසුඛඥානය උපදී. අනාගාමිමාර්ගයෙන් අනුසහගත වූ කාමරාගසංයොජනය...ප්‍රතිඝසංයොජනය අනුසහගත වූ කාමරාගානුශය ප්‍රතිඝානුශය පුහුත් බැවින් මුලුසුන් කරනලද බැවින් විමුක්තිසුඛඥානය උපදී. අර්හත්මාර්ගයෙන් රූපරාගය .. අරූපරාගය මානය ඖද්ධත්‍යය අවිද්‍යාව මානානුශය භවරාගානුශය අවිද්‍යානුශය පුහුත් බැවින් මුලුසුන් කරනලද බැවින් විමුක්තිසුඛඥානය උපදී.

මොහු එක්විසි විමුක්තිඥානයෝ යි.

ෂොඩශවස්තුක වූ ආනාපානසතිසමාධිය වඩන්නාහට සාධික වූ මේ ඥානයෝ දෙසියදෙන උපදිත්.

ආනාපානසමෘතිකථා නිමි

# 4

# ඉන්ද්‍රිය කථා.

## 4 – 1. පඨමසුත්තන්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර බො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති. 'භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි, කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. ඉමානි බො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි.

ඉමානි පඤ්චින්ද්‍රියානි කතිහාකාරෙහි විසුජ්ඣන්ති: ඉමානි පඤ්චින්ද්‍රියානි පන්නරසහි ආකාරෙහි විසුජ්ඣන්ති. අස්සද්ධෙ පුග්ගලෙ පරිවජ්ජයතො, සද්ධෙ පුග්ගලෙ සෙවතො භජතො පයිරුපාසතො, පසාදනීයෙ සුත්තන්තෙ පච්චවෙක්ඛතො, ඉමෙහි තීහාකාරෙහි සද්ධින්ද්‍රියං විසුජ්ඣති.

කුසීතෙ පුග්ගලෙ පරිවජ්ජයතො, ආරද්ධවිරියෙ පුග්ගලෙ සෙවතො භජතො පයිරුපාසතො, සම්මප්පධානෙ පච්චවෙක්ඛතො, ඉමෙහි තීහාකාරෙහි විරියින්ද්‍රියං විසුජ්ඣති.

මුට්ඨස්සතී පුග්ගලෙ පරිවජ්ජයතො, උපට්ඨිතසතී[2], පුග්ගලෙ සෙවතො භජතො පයිරුපාසතො, සතිපට්ඨානෙ පච්චවෙක්ඛතො, ඉමෙහි තීහාකාරෙහි සතින්ද්‍රියං විසුජ්ඣති.

අසමාහිතෙ පුග්ගලෙ පරිවජ්ජයතො, සමාහිතෙ පුග්ගලෙ සෙවතො භජතො පයිරුපාසතො, ඣානවිමොක්ඛෙ පච්චවෙක්ඛතො, ඉමෙහි තීහාකාරෙහි සමාධින්ද්‍රියං විසුජ්ඣති.

දුප්පඤ්ඤෙ පුග්ගලෙ පරිවජ්ජයතො, පඤ්ඤවන්තෙ පුග්ගලෙ සෙවතො භජතො පයිරුපාසතො, ගම්භීරඤාණචරියං පච්චවෙක්ඛතො, ඉමෙහි තීහාකාරෙහි පඤ්ඤින්ද්‍රියං විසුජ්ඣති.

ඉති ඉමෙ පඤ්ච පුග්ගලෙ පරිවජ්ජයතො, පඤ්ච පුග්ගලෙ සෙවතො භජතො පයිරු පාසතො, පසාදනීයෙ සුත්තන්තෙ[3] පච්චවෙක්ඛතො, ඉමෙහි පන්නරසහි ආකාරෙහි ඉමානි පඤ්චින්ද්‍රියානි විසුජ්ඣන්ති.

කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවීයන්ති[4], කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවනා හොති: දසහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවීයන්ති,[4] දසහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවනා හොති.

---

1. වීරියින්ද්‍රියං - මජසං.
2. උපට්ඨිතස්සති - මජසං, ස්‍යා
3. පඤ්ච සුත්තන්තක්ඛන්ධෙ - මජසං, ස්‍යා
4. භාවියන්ති - මජසං, ස්‍යා.

# 4

# ඉන්ද්‍රියකථා

## 4 – 1. ප්‍රථම සූත්‍රය

“මා විසින් මෙසේ අසනලද නොහොත් මා ගේ ඇසීම මෙසේ යි. කෙසේ ද යත්: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ අරම්හි වාසය කරන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි භික්ෂූන් ඇමතූ සේක. ‘ස්වාමීනි භාග්‍යවතුන් වහන්සැ’යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මේ ඉන්ද්‍රියසූත්‍රය වදාළ සේක.

මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පස් දෙනෙක. කවර පස්දෙනෙක් ද යත්: ශ්‍රද්ධෙන්ද්‍රිය යැ වීර්‍ය්‍යෙන්ද්‍රිය යැ ස්මෘතීන්ද්‍රිය යැ සමාධීන්ද්‍රිය යැ ප්‍රඥෙන්ද්‍රිය යි. මහණෙනි, මොහු පඤ්චෙන්ද්‍රියයෝ යි.

මේ පඤ්චෙන්ද්‍රියයෝ කිහි අයුරෙකින් විශුද්ධ වෙත් ද යත්: මේ පඤ්චෙන්ද්‍රියයෝ පසළොස් අයුරෙකින් විශුද්ධ වෙති. ශ්‍රද්ධා නැති පුද්ගලයන් දුරුලන්නාහට ශ්‍රද්ධා ඇති පුද්ගලයන් සෙවුනාහට භජනය කරන්නාහට පර්‍ය්‍යුපාසනය කරන්නාහට ප්‍රසාද එළවන සූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට, මේ තුන් අයුරින් ශ්‍රද්ධෙන්ද්‍රියය විශුද්ධ වෙයි.

කුසීදපුද්ගලයන් දුරුලන්නාහට, ආරබ්ධවීර්‍ය්‍ය පුද්ගලයන් සෙවන-භජන-පර්‍ය්‍යුපාසන කරන්නාහට, සම්‍යක්ප්‍රධානයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට, මේ තුන් අයුරින් වීර්‍ය්‍යෙන්ද්‍රියය විශුද්ධ වෙයි.

මුළාසිහි ඇති පුද්ගලයන් දුරුලන්නාහට, එළඹසිටි සිහි ඇති පුද්ගලයන් සෙවන - භජන - පර්‍ය්‍යුපාසන කරන්නාහට, සිවටන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට, මේ තුන් අයුරින් ස්මෘතීන්ද්‍රියය විශුද්ධ වෙයි.

අසමාහිත පුද්ගලයන් දුරුලන්නාහට, සමාහිතපුද්ගලයන් සෙවන-භජන - පර්‍ය්‍යුපාසන කරන්නාහට, ධ්‍යාන - විමොක්ෂයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට, මේ තුන් අයුරින් සමාධීන්ද්‍රිය විශුද්ධ වෙයි.

ප්‍රඥා නැති පුද්ගලයන් දුරුලන්නාහට, ප්‍රඥා ඇති පුද්ගලයන් සෙවන-භජන-පර්‍ය්‍යුපාසන කරන්නාහට, ගම්භීරඥානචර්‍ය්‍යා ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට මේ තුන් අයුරින් ප්‍රඥෙන්ද්‍රියය විශුද්ධ වෙයි.

මෙසෙයින් මේ පඤ්චපුද්ගලයන් දුරුලන්නාහට පඤ්චපුද්ගලයන් සෙවන-භජන-පර්‍ය්‍යුපාසන කරන්නාහට පඤ්චසූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහට මේ පසළොස් අයුරින් මේ පඤ්චෙන්ද්‍රියයෝ විශුද්ධ වෙත්.

කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනුලැබෙත් ද කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ භාවනාව වේ ද යත්: දසඅයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනු ලැබෙති. දසඅයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ භාවනාව වෙයි.

අස්සද්ධියං පජහන්තො සද්ධින්ද්‍රියං භාවෙති, සද්ධින්ද්‍රියං භාවෙන්තො අස්සද්ධියං පජහති. කොසජ්ජං පජහන්තො විරියින්ද්‍රියං භාවෙති, විරියින්ද්‍රියං භාවෙන්තො කොසජ්ජං පජහති. පමාදං පජහන්තො සතින්ද්‍රියං භාවෙති, සතින්ද්‍රියං භාවෙන්තො පමාදං පජහති. උද්ධච්චං පජහන්තො සමාධින්ද්‍රියං භාවෙති, සමාධින්ද්‍රියං භාවෙන්තො උද්ධච්චං පජහති. අවිජ්ජං පජහන්තො පඤ්ඤින්ද්‍රියං භාවෙති, පඤ්ඤින්ද්‍රියං භාවෙන්තො අවිජ්ජං පජහති.

ඉමෙහි දසහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවියන්ති, ඉමෙහි දසහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවනා හොති.

කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි: දසහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි.

අස්සද්ධියස්ස පහීනත්තා සුප්පහීනත්තා සද්ධින්ද්‍රියං භාවිතං හොති සුභාවිතං, සද්ධින්ද්‍රියස්ස භාවිතත්තා සුභාවිතත්තා අස්සද්ධියං පහීනං හොති සුප්පහීනං, කොසජ්ජස්ස පහීනත්තා සුප්පහීනත්තා විරියින්ද්‍රියං භාවිතං හොති සුභාවිතං, විරියින්ද්‍රියස්ස භාවිතත්තා සුභාවිතත්තා කොසජ්ජං පහීනං හොති සුප්පහීනං, පමාදස්ස පහීනත්තා සුප්පහීනත්තා සතින්ද්‍රියං භාවිතං හොති සුභාවිතං, සතින්ද්‍රියස්ස භාවිතත්තා සුභාවිතත්තා පමාදො පහීනො හොති සුප්පහීනො, උද්ධච්චස්ස පහීනත්තා සුප්පහීනත්තා සමාධින්ද්‍රියං භාවිතං හොති සුභාවිතං, සමාධින්ද්‍රියස්ස භාවිතත්තා සුභාවිතත්තා උද්ධච්චං පහීනං හොති සුප්පහීනං, අවිජ්ජාය පහීනත්තා සුප්පහීනත්තා පඤ්ඤින්ද්‍රියං භාවිතං හොති සුභාවිතං, පඤ්ඤින්ද්‍රියස්ස භාවිතත්තා සුභාවිතත්තා අවිජ්ජා පහීනා හොති සුප්පහීනා.

ඉමෙහි දසහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි.

කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවියන්ති,[1] කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච, පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච: චතුහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවියන්ති, චතුහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච, පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච.

සොතාපත්තිමග්ගක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවියන්ති, සොතාපත්තිඵලක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච,[2] පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච, සකදාගාමිමග්ගක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවියන්ති, සකදාගාමිඵලක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච, පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච, අනාගාමිමග්ගක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවියන්ති, අනාගාමිඵලක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච, අරහත්තමග්ගක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවියන්ති, අරහත්තඵලක්ඛණෙ පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච, පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච.

---

1 භාවියන්ති - මජසං, ස්‍යා

2. සුභාවිතානි - සී 1, 2,

ශ්‍රද්ධා නැති බව දුරලනුයේ ශ්‍රද්ධෙන්ද්‍රියය වඩයි. ශ්‍රද්ධෙන්ද්‍රියය වඩනුයේ ශ්‍රද්ධා නැති බව දුරලයි. කුසීද බව දුරලනුයේ වීර්‍ය්‍යෙන්ද්‍රියය වඩයි. වීර්‍ය්‍යෙන්ද්‍රියය වඩනුයේ කුසීද බව දුරලයි. ප්‍රමාදය දුරලනුයේ ස්මෘතීන්ද්‍රියය වඩයි, ස්මෘතීන්ද්‍රියය වඩනුයේ ප්‍රමාදය දුරලයි. උද්ධතභාවය දුරලනුයේ සමාධීන්ද්‍රියය වඩයි. සමාධීන්ද්‍රියය වඩනුයේ උද්ධතභාවය දුරලයි. අවිද්‍යාව දුරලනුයේ ප්‍රඥෙන්ද්‍රියය වඩයි. ප්‍රඥෙන්ද්‍රියය වඩනුයේ අවිද්‍යාව දුරලයි.

මේ දස අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනු ලැබෙත්. මේ දස අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ භාවනාව වේ.

කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලද්දාහු මොනොවට වඩනා ලද්දාහු වෙත් ද යත්: දස අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු මොනොවට වඩනාලද්දාහු වෙති.

ශ්‍රද්ධා නැති බව ප්‍රහීණ බැවින් මොනොවට ප්‍රහීන බැවින් ශ්‍රද්ධෙන්ද්‍රියය වඩනාලද්දේ මොනොවට වඩනාලද්දේ වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියය වඩනාලද බැවින් මොනොවට වඩනාලද බැවින් ශ්‍රද්ධා නැති බව ප්‍රහීණ වූයේ මොනොවට ප්‍රහීණ වූයේ වෙයි. කුසීද බව ප්‍රහීණ බැවින් මොනොවට ප්‍රහීණ බැවින් වීර්‍ය්‍යෙන්ද්‍රියය වඩනාලද්දේ මොනොවට වඩනා ලද්දේ වෙයි. වීර්‍ය්‍යෙන්ද්‍රියය වඩනාලද බැවින් මොනොවට වඩනාලද බැවින් කුසීද බව ප්‍රහීණ වූයේ මොනොවට ප්‍රහීණ වූයේ වෙයි. ප්‍රමාදය ප්‍රහීණ බැවින් මොනොවට ප්‍රහීණ බැවින් ස්මෘතීන්ද්‍රියය වඩනාලද්දේ මොනොවට වඩනාලද්දේ වෙයි. ස්මෘතීන්ද්‍රියය වඩනාලද බැවින් මොනොවට වඩනා ලද බැවින් ප්‍රමාදය ප්‍රහීණ වූයේ මොනොවට ප්‍රහීණ වූයේ වෙයි. උද්ධතභාවය ප්‍රහීණ බැවින් මොනොවට ප්‍රහීණ බැවින් සමාධීන්ද්‍රිය වඩනා ලද්දේ මොනොවට වඩනාලද්දේ වෙයි. සමාධීන්ද්‍රියය වඩනාලද බැවින් මොනොවට වඩනාලද බැවින් උද්ධතභාවය ප්‍රහීණ වූයේ මොනොවට ප්‍රහීණ වූයේ වෙයි අවිද්‍යාව ප්‍රහීණ බැවින් මොනොවට ප්‍රහීණ බැවින් ප්‍රඥෙන්ද්‍රියය වඩනාලද්දේ මොනොවට වඩනා ලද්දේ වෙයි. ප්‍රඥෙන්ද්‍රියය වඩනාලද බැවින් මොනවට වඩකාලද බැවින් අවිද්‍යාව ප්‍රහීණ වූවා මොනොවට ප්‍රහීණ වූවා වෙයි.

මේ දශ අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලද්දාහු මොනොවට වඩනා ලද්දාහු වෙත්.

කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලැබෙත් ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු ද මොනොවට වඩනා ලද්දාහු ද සන්හිඳුණාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙති යත්: සියු අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලැබෙති. සියුඅයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලද්දාහු ද මොනොවට වඩනා ලද්දාහු ද සන්හිඳුණාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙති.

ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලැබෙති. ස්‍රොතාපත්තිඵලක්ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු ද මොනොවට වඩනා ලද්දාහු ද සන්හිඳුණාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙති. සකෘදාගාමී මාර්ගක්ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලැබෙති. සකෘදාගාමීඵලක්ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු ද මොනොවට වඩනාලද්දාහු ද සන්සිඳුනාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙති. අනාගාමීමාර්ගක්ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලැබෙති. අනාගාමීඵලක්ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු ද මොනොවට වඩනාලද්දාහු ද සන්හිඳුනාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙති. අර්හත්මාර්ගක්ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනා ලැබෙති. අර්හත්ඵලක්ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු ද මොනොවට වඩනාලද්දාහු ද සන්හිඳුණාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙත්.

ඉති චතස්සො මග්ගවිසුද්ධියො, චතස්සො ඵලවිසුද්ධියො, චතස්සො සමුච්ඡේදවිසුද්ධියො, චතස්සො පටිප්පස්සද්ධිවිසුද්ධියො. ඉමෙහි චතූහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවීයන්ති, ඉමෙහි චතූහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච, පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච.

කතිනන්නං[1] පුග්ගලානං ඉන්ද්‍රියභාවනා. කති පුග්ගලා භාවිතින්ද්‍රියා. අට්ඨන්නං පුග්ගලානං ඉන්ද්‍රියභාවනා, තයො පුග්ගලා භාවිතින්ද්‍රියා.

කතමෙසං අට්ඨන්නං පුග්ගලානං ඉන්ද්‍රියභාවනා: සත්තන්නඤ්ච සෙක්ඛානං පුථුජ්ජනකල්‍යාණකස්ස ච[2] ඉමෙසං අට්ඨන්නං පුග්ගලානං ඉන්ද්‍රියභාවනා, කතමෙ තයො පුග්ගලා භාවිතින්ද්‍රියා: සවනෙන බුද්ධො[3] තථාගතස්ස සාවකො[4] ඛීණාසවො භාවිතින්ද්‍රියො, සයං භූතට්ඨෙන[5] පච්චෙකබුද්ධො[6] භාවිතින්ද්‍රියො, අප්පමෙය්‍යට්ඨෙන තථාගතො අරහං සම්මාසම්බුද්ධො භාවිතින්ද්‍රියො. ඉමෙ තයො පුග්ගලා භාවිතින්ද්‍රියා.

ඉති ඉමෙසං අට්ඨන්නං පුග්ගලානං ඉන්ද්‍රියභාවනා, ඉමෙ තයො පුග්ගලා භාවිතින්ද්‍රියා.

**පඨමසුත්ත නිද්දෙසො.**

## 4 - 2. දුතියසුත්තං

[සාවත්ථිනිදානං.]

පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං.

යෙ හි කෙචි[7] භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච අදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති, නමෙතෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා, බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා, න ච පන තෙ[8] ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා[9] බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

යෙ ච ඛො කෙචි[10] භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානන්ති, තෙ ඛො මෙ[11] භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා, බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා, තෙ ච පනායස්මන්තො[12] සාමඤ්ඤත්ථං වා[13] බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තී'ති.

---

1. කතිනං - මජසං, සයා   2. පුථුජ්ජනස්ස ච කල්‍යාණකස්ස - සී 1
3. භාවිතින්ද්‍රියවසෙන බුද්ධොති - සයා, සී 1, 2,   4. තථාගතසාවකො - සයා
5. සයම්භූඤාණෙන - සී 1.   6 පච්චෙකසම්බුද්ධො - මජසං, පච්චෙකබුද්ධො - සී 1, 2.
7. යෙ හි කොචි - සී 2,   8. න ච පනෙතෙ - මජසං,
9. සාමඤ්ඤත්තං - සී. 1   10. යෙ කෙචි ඛො - සයා
11. තෙ ඛො - සී. 1   12. පනායස්මන්තා - මජසං, සයා
13. සාමඤ්ඤත්ථඤ්ච - මජසං සයා

මෙසෙයින් මාර්ගවිශුද්ධි සතරෙක, ඵලවිශුද්ධි සතරෙක, සමුච්ඡෙද විශුද්ධි සතරෙක, ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිශුද්ධි සතරෙකි. මේ සියු අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලැබෙති. මේ සියු අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ වඩනාලද්දාහු ද මොනොවට වඩනාලද්දාහු ද සන්හිඳුණාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙත්.

කෙතෙක් පුද්ගලයනට ඉන්ද්‍රියභාවනා වේ ද, කෙතෙක් පුද්ගලයෝ භාවිතඉන්ද්‍රිය ඇත්තාහු වෙත් ද යත්: පුද්ගලයන් අටදෙනකුන්හට ඉන්ද්‍රිය භාවනා වෙයි. පුද්ගලයෝ තිදෙනෙක් භාවිතඉන්ද්‍රිය ඇත්තාහු වෙති.

කවර පුද්ගලයන් අටදෙනෙකුන්හට ඉන්ද්‍රියභාවනා වේ ද යත්: සප්තශෛක්‍ෂයනට ද පෘථග්ජනකල්‍යාණකයහට ද යි මේ පුද්ගලයන් අට-දෙනාහට ඉන්ද්‍රියභාවනා වෙයි. කවර පුද්ගලයෝ තිදෙනෙක් භාවිත ඉන්ද්‍රිය ඇත්තාහු ද, යත්: ශ්‍රවණයෙන් චතුසත්‍යාවබෝධය කළා වූ තථා-ගතශ්‍රාවක වූ ක්‍ෂීණාස්‍රව තෙමේ භාවිත ඉන්ද්‍රිය ඇත්තේ වෙයි. තමා මැ ආයතිජාතියෙහි ජාතස්වභාවයෙන් පසේබුදුහු භාවිත ඉන්ද්‍රිය ඇත්තාහු වෙති. අප්‍රමෙය ස්වභාවයෙන් තථාගත වූ අර්හත් වූ සම්මාසම්බුදුහු භාවිත ඉන්ද්‍රිය ඇත්තාහු වෙත්. මේ පුද්ගලයෝ තිදෙන භාවිත ඉන්ද්‍රිය ඇත්තාහු වෙත්. මෙසෙයින් මේ පුද්ගලයන් අටදෙනාහට ඉන්ද්‍රියභාවනා වෙයි. මේ තුන් පුද්ගලයෝ භාවිත ඉන්ද්‍රිය ඇත්තාහු වෙත්.

ප්‍රථම සූත්‍රාන්තනිර්දේශ යි.

## 4 - 2. ද්විතීයසූත්‍රය

[සාවත්ථිනිදාන යි]

මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති. කවර පස්දෙනෙක යත්: ශ්‍රද්ධෙන්ද්‍රිය යැ වීර්‍ය්‍යෙන්ද්‍රිය යැ ස්මෘතීන්ද්‍රිය යැ සමාධීන්ද්‍රිය යැ ප්‍රඥෙන්ද්‍රිය යි.

මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය (ප්‍රත්‍යය)ත් අස්තඞ්ගමයත් ආශ්වාදයත් ආදීනවයත් නිස්සරණයත් යථාස්වභාවයෙන් නො දනිත් ද, මහණෙනි, මා විසින් ඒ මහණහු වේවයි බමුණහු වේවයි ශමිතපාපී ශ්‍රමණයන් කෙරෙහි හෝ ‘ශ්‍රමණ යැ’යි’ සම්මතයෝ නො වෙති. බාහිතපාපී බ්‍රාහ්මණයන් කෙරෙහි හෝ ‘බ්‍රාහ්මණ යැ’යි සම්මතයෝ නො වෙති. තවද තෙල ආයුෂ්මත්හු ශ්‍රමණභාවාර්ථය හෝ බ්‍රාහ්මණභාවාර්ථය හෝ මෙ අත්බැව්හි මැ තුමූ අභිඥායෙන් ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ නො ද වාසය කෙරෙති.

තවද මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීන-වයත් නිස්සරණයත් යථාස්වභාවයෙන් දැනගනිත් ද, මහණෙනි, මා විසින් වැළිත් ඒ මහණහු වේවයි බමුණහු වේවයි (ශමිතපාපී) ශ්‍රමණයන් කෙරෙහි ‘ශ්‍රමණ යැ’යි සම්මතයෝ වෙති. (බාහිතපාපී) බ්‍රාහ්මණයන් කෙරෙහි ‘බ්‍රාහ්මණ යැ’යි සම්මතයෝ වෙති. තවද තෙල ආයුෂ්මත්හු ශ්‍රමණ-භාවාර්ථය ද බ්‍රාහ්මණභාවාර්ථය ද මෙ අත්බැව්හි මැ තුමූ අභිඥායෙන් ප්‍රත්‍යක්‍ෂ කොට එයට පැමිණ වාසය කෙරෙත් යයි.

කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං සමුදයො හොති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං සමුදයං පජානාති. කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං අත්ථඞ්ගමො හොති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං අත්ථඞ්ගමං පජානාති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං අස්සාදො හොති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං අස්සාදං පජානාති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං ආදීනවො හොති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං ආදීනවං පජානාති, කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං නිස්සරණං හොති. කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං නිස්සරණං පජානාති:

චත්තාරීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං සමුදයො හොති, චත්තාරීසාය ආකාරෙහි සමුදයං පජානාති. චත්තාරීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං අත්ථඞ්ගමො හොති. චත්තාරීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං අත්ථඞ්ගමං පජානාති. පඤ්චවීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං අස්සාදො හොති, පඤ්චවීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං අස්සාදං පජානාති, පඤ්චවීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං ආදීනවො හොති, පඤ්චවීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං ආදීනවං පජානාති, අසීතිසතං ආකාරෙහි[1] පඤ්චන්නං ඉන්‍ද්‍රියානං නිස්සරණං හොති, අසීතිසතං ආකාරෙහි[1] පඤ්චන්නං ඉන්‍ද්‍රියානං නිස්සරණං පජානාති.

කතමෙහි චත්තාරීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං සමුදයො හොති, කතමෙහි චත්තාරීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්‍ද්‍රියානං සමුදයං පජානාති:

අධිමොක්ඛත්ථාය ආවජ්ජනාය සමුදයො සද්ධින්‍ද්‍රියස්ස සමුදයො හොති, අධිමොක්ඛවසෙන ඡන්දස්ස සමුදයො සද්ධින්‍ද්‍රියස්ස සමුදයො හොති, අධිමොක්ඛවසෙන මනසිකාරස්ස සමුදයො සද්ධින්‍ද්‍රියස්ස සමුදයො හොති, සද්ධින්‍ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං සද්ධින්‍ද්‍රියස්ස සමුදයො හොති, පග්ගහත්ථාය ආවජ්ජනාය සමුදයො විරියින්‍ද්‍රියස්ස සමුදයො හොති, පග්ගහවසෙන ඡන්දස්ස සමුදයො විරියින්‍ද්‍රියස්ස සමුදයො හොති, පග්ගහවසෙන මනසිකාරස්ස සමුදයො විරියින්‍ද්‍රියස්ස සමුදයො හොති, විරියින්‍ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං විරියින්‍ද්‍රියස්ස සමුදයො හොති. උපට්ඨානත්ථාය ආවජ්ජනාය සමුදයො සතින්‍ද්‍රියස්ස සමුදයො හොති, උපට්ඨානවසෙන ඡන්දස්ස සමුදයො සතින්‍ද්‍රියස්ස සමුදයො හොති, උපට්ඨානවසෙන මනසිකාරස්ස සමුදයො සතින්‍ද්‍රියස්ස සමුදයො හොති, සතින්‍ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං සතින්‍ද්‍රියස්ස සමුදයො හොති, අවික්ඛෙපත්ථාය ආවජ්ජනාය සමුදයො සමාධින්‍ද්‍රියස්ස සමුදයො හොති, අවික්ඛෙපවසෙන ඡන්දස්ස සමුදයො සමාධින්‍ද්‍රියස්ස සමුදයො හොති, අවික්ඛෙපවසෙන මනසිකාරස්ස සමුදයො සමාධින්‍ද්‍රියස්ස සමුදයො හොති, සමාධින්‍ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං සමාධින්‍ද්‍රියස්ස සමුදයො හොති, දස්සනත්ථාය ආවජ්ජනාය සමුදයො පඤ්ඤින්‍ද්‍රියස්ස සමුදයො හොති, දස්සනවසෙන ඡන්දස්ස සමුදයො පඤ්ඤින්‍ද්‍රියස්ස සමුදයො හොති, දස්සනවසෙන මනසිකාරස්ස සමුදයො පඤ්ඤින්‍ද්‍රියස්ස සමුදයො හොති, පඤ්ඤින්‍ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං පඤ්ඤින්‍ද්‍රියස්ස සමුදයො හොති.

---

1. අසීතිසතාකාරෙහි - ස්‍යා, අසීතිසතආකාරෙහි - සී 1.

කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය වේ ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය දැනගනී ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය වේ ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය දැනගනී ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය වේ ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය දැනගනී ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව වේ ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව දැනගනී ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය වේ ද, කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය දැනගනී ද යත්:

සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය වෙයි, සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය දැනගනී. සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය වෙයි, සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය දැනගනී. පස්විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය වෙයි, පස්විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය දැනගනී. පස්විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව වෙයි, පස්විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව දැනගනී. එක්සියඅසූ අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය වෙයි. එක්සියඅසූ අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය දැනගනී.

කවර සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය වේ ද, කවර සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය දැනගනී ද යත්:

අධිමොක්ෂය (ශ්‍රද්ධාව) පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. (ඡන්දසම්ප්‍රයුක්ත) අධිමොක්ෂයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි, අධිමොක්ෂයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ සමුදය ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් පැවැති එකාලම්බනයෙහි අවලත්වයෙන් සිටීම ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ප්‍රග්‍රහ පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය වීර්‍ය්‍යෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. (ඡන්දසම්ප්‍රයුක්ත) ප්‍රග්‍රහයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය වීර්‍ය්‍යෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ප්‍රග්‍රහයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ සමුදය වීර්‍ය්‍යෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් පැවැති එකාලම්බනයෙහි අවලභාවයෙන් සිටීම වීර්‍ය්‍යෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. (අරමුණට) එළඹසිටීම පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය ස්මෘතීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. (අරමුණට) එළඹසිටීම් වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය ස්මෘතීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. (අරමුණට) එළඹසිටීම් වශයෙන් පැවැති මනසිකාරයාගේ සමුදය ස්මෘතීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් එකාලම්බනයෙහි අවලභාවයෙන් සිටීම ස්මෘතීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අවික්ෂෙපය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය සමාධීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි අවික්ෂෙපයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය සමාධීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අවික්ෂෙපයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ සමුදය සමාධීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. සමාධීන්ද්‍රියයාගේ වශයෙන් පැවැති එකාලම්බනයෙහි අවලභාවයෙන් සිටීම සමාධීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. දර්ශනය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය ප්‍රඥෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. දර්ශනයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය ප්‍රඥෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි දර්ශනයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ සමුදය ප්‍රඥෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් පැවැති එකාලම්බනයෙහි අවලභාවයෙන් සිටීම ප්‍රඥෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි.

අධිමොක්ඛත්ථාය ආවජ්ජනාය සමුදයො සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති, පග්ගහත්ථාය ආවජ්ජනාය සමුදයො විරියින්ද්‍රියස්ස සමුදයො හොති, උපට්ඨානත්ථාය ආවජ්ජනාය සමුදයො සතින්ද්‍රියස්ස සමුදයො හොති, අවික්ඛෙපත්ථාය ආවජ්ජනාය සමුදයො සමාධින්ද්‍රියස්ස සමුදයො හොති. දස්සනත්ථාය ආවජ්ජනාය සමුදයො පඤ්ඤින්ද්‍රියස්ස සමුදයො හොති, අධිමොක්ඛවසෙන ඡන්දස්ස සමුදයො සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති, පග්ගහවසෙන ඡන්දස්ස සමුදයො විරියින්ද්‍රියස්ස සමුදයො හොති, උපට්ඨානවසෙන ඡන්දස්ස සමුදයො සතින්ද්‍රියස්ස සමුදයො හොති, අවික්ඛෙපවසෙන ඡන්දස්ස සමුදයො සමාධින්ද්‍රියස්ස සමුදයො හොති, දස්සනවසෙන ඡන්දස්ස සමුදයො පඤ්ඤින්ද්‍රියස්ස සමුදයො හොති.

අධිමොක්ඛවසෙන මනසිකාරස්ස සමුදයො සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති, පග්ගහවසෙන මනසිකාරස්ස සමුදයො විරියින්ද්‍රියස්ස සමුදයො හොති, උපට්ඨානවසෙන මනසිකාරස්ස සමුදයො සතින්ද්‍රියස්ස සමුදයො හොති, අවික්ඛෙපවසෙන මනසිකාරස්ස සමුදයො සමාධින්ද්‍රියස්ස සමුදයො හොති, දස්සනවසෙන මනසිකාරස්ස සමුදයො පඤ්ඤින්ද්‍රියස්ස සමුදයො හොති, සද්ධින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති, විරියින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං විරියින්ද්‍රියස්ස සමුදයො හොති, සතින්ද්‍රියස්ස වසෙන එකත්තු පට්ඨානං සතින්ද්‍රියස්ස සමුදයො හොති, සමාධින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං සමාධින්ද්‍රියස්ස සමුදයො හොති, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස සමුදයො හොති.

ඉමෙහි චත්තාලීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයො හොති, ඉමෙහි චත්තාලීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයං පජානාති.

කතමෙහි චත්තාලීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අත්ථඞ්ගමො හොති, කතමෙහි චත්තාලීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අත්ථඞ්ගමං පජානාති:

අධිමොක්ඛත්ථාය ආවජ්ජනාය අත්ථඞ්ගමො සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අධිමොක්ඛවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අධිමොක්ඛවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, සද්ධින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං[1], සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

පග්ගහත්ථාය ආවජ්ජනාය අත්ථඞ්ගමො විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පග්ගහවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පග්ගහවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, විරියින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

1 එකත්තං අනුපට්ඨානං - සයා.

අධිමොක්ෂය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ප්‍රග්‍රහ පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය වීර්‍යෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අරමුණට එළඹසිටීම පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය ස්මෘතීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අවික්ෂෙපය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය සමාධීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. දර්ශනය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ සමුදය ප්‍රඥෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අධිමොක්ෂයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි ප්‍රග්‍රහවශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ සමුදය වීර්‍යෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අරමුණට එළඹසිටීම් වශයෙන් ධර්මච්ඡන්දයාගේ සමුදය ස්මෘතීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. අවික්ෂෙපයාගේ වශයෙන් ධර්මච්ඡන්දයාගේ සමුදය සමාධීන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. දර්ශනයාගේ වශයෙන් ධර්මච්ඡන්දයාගේ සමුදය ප්‍රඥෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි.

අධිමොක්ෂයාගේ වශයෙන් මනසිකාරයාගේ සමුදය ශ්‍රද්ධෙන්ද්‍රියට ප්‍රත්‍යය වෙයි. ප්‍රග්‍රහවශයෙන් මනසිකාරයාගේ සමුදය වීර්‍යෙන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. අරමුණට එළඹසිටීම් වශයෙන් මනසිකාරයාගේ සමුදය ස්මෘතීන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. අවික්ෂෙපයාගේ වශයෙන් මනසිකාරයාගේ සමුදය සමාධීන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. දර්ශනයාගේ වශයෙන් මනසිකාරයාගේ සමුදය ප්‍රඥෙන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් එකාලම්බනයෙහි අචලභාවයෙන් සිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් එකාලම්බනයෙහි අචලභාවයෙන් සිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් එකාලම්බනයෙහි අචලභාවයෙන් සිටීම ස්මෘතීන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. සමාධීන්ද්‍රියයාගේ වශයෙන් එකාලම්බනයෙහි අචලභාවයෙන් සිටීම සමාධීන්ද්‍රියයට ප්‍රත්‍යය වෙයි. ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් එකාලම්බනයෙහි අචලභාවයෙන් සිටීම ප්‍රඥෙන්ද්‍රියයට ප්‍රත්‍යය වේ.

මේ සතලිස් අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය වෙයි. මේ සතලිස් අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ සමුදය දැනගනී.

කවර සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය වේ ද, කවර සතලිස් අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය දැනගනී ද යත්:

අධිමොක්ෂය පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ අස්තඞ්ගමය ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. අධිමොක්ෂයාගේ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ අස්තඞ්ගමය ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. අධිමොක්ෂයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ අස්තඞ්ගමය ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නො සිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි.

ප්‍රග්‍රහ පිණිස පැවැති මනොද්වාරාවර්ජනචිත්තයාගේ අස්තඞ්ගමය වීර්‍යෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. ප්‍රග්‍රහ වශයෙන් පැවැති ධර්මච්ඡන්දයාගේ අස්තඞ්ගමය වීර්‍යෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. ප්‍රග්‍රහ වශයෙන් පැවැති මනසිකාරයාගේ අස්තඞ්ගමය වීර්‍යෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නො සිටීම වීර්‍යෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි.

උපට්ඨානට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, උපට්ඨානවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, උපට්ඨානවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, සතින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

අවික්ඛෙපට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අවික්ඛෙපවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අවික්ඛෙපවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, සමාධින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

දස්සනට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, දස්සනවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, දස්සනවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

අධිමොක්ඛට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පග්ගහට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, උපට්ඨානට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අවික්ඛෙපට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, දස්සනට්ඨාය ආවජ්ජනාය අත්ථඞ්ගමො පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

අධිමොක්ඛවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පග්ගහවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, උපට්ඨානවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අවික්ඛෙපවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, දස්සනවසෙන ඡන්දස්ස අත්ථඞ්ගමො පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

අධිමොක්ඛවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පග්ගහවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, උපට්ඨානවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, අවික්ඛෙපවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, දස්සනවසෙන මනසිකාරස්ස අත්ථඞ්ගමො පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

අරමුණට එළඹසිටීම පිණිස පැවැති මනොද්වාරාවජ්ජනචිත්තයාගේ අසාධාරණ්‍ය සමෘතීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. අරමුණට එළඹසිටීම් වශයෙන් පැවැති ධම්මච්ඡන්දයාගේ අසාධාරණ්‍ය සමෘතීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. අරමුණට එළඹසිටීම් වශයෙන් පැවැති මනසිකාරයාගේ අසාධාරණ්‍ය සමෘතීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. සමෘතීන්ද්‍රියයාගේ වශයෙන් පැවැති එකත්වයෙහි නො සිටීම් සමෘතීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි.

අවික්ෂෙපය පිණිස පැවැති මනොද්වාරාවජ්ජන චිත්තයාගේ අසාධාරණ්‍ය සමාධීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. අවික්ෂෙපයාගේ වශයෙන් ධම්මච්ඡන්ද-යාගේ අසාධාරණ්‍ය සමාධීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. අවික්ෂෙපයාගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ අසාධාරණ්‍ය සමාධීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. සමාධීන්ද්‍රියයාගේ වශයෙන් පැවැති එකත්වයෙහි නො සිටීම සමාධීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි.

දර්ශනය පිණිස පැවැති මනොද්වාරාවජ්ජනචිත්තයාගේ අසාධාරණ්‍ය ප්‍රඥෙන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. දර්ශනයාගේ වශයෙන් පැවැති ධම්මච්ඡන්දයාගේ අසාධාරණ්‍ය ප්‍රඥෙන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. දර්ශනයා-ගේ වශයෙන් පැවැති මනසිකාරයාගේ අසාධාරණ්‍ය ප්‍රඥෙන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නො සිටීම ප්‍රඥෙන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වේ.

අධිමොක්ෂය පිණිස පැවැති මනොද්වාරාවජ්ජනචිත්තයාගේ අසාධාරණ්‍ය ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. ප්‍රග්‍රහ පිණිස පැවැති මනොද්වාරා-වජ්ජනචිත්තයාගේ අසාධාරණ්‍ය වීර්‍යෙන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. අරමුණට එළඹසිටීම පිණිස පැවැති මනොද්වාරාවජ්ජනචිත්තයාගේ අසාධාරණ්‍ය සමෘතීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. අවික්ෂෙපය පිණිස පැවැති මනොද්වාරා-වජ්ජනචිත්තයාගේ අසාධාරණ්‍ය සමාධීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. දර්ශනය පිණිස පැවැති මනොද්වාරාවජ්ජනචිත්තයාගේ අසාධාරණ්‍ය ප්‍රඥෙන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වේ.

අධිමොක්ෂයාගේ වශයෙන් පැවැති ධම්මච්ඡන්දයාගේ අසාධාරණ්‍ය ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. ප්‍රග්‍රහවශයෙන් පැවැති ධම්මච්ඡන්දයාගේ අසාධාරණ්‍ය වීර්‍යෙන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. උපස්ථානවශයෙන් පැවැති ධම්මච්ඡන්දයාගේ අසාධාරණ්‍ය සමෘතීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. අවික්ෂෙපවශයෙන් පැවැති ධම්මච්ඡන්දයාගේ අසාධාරණ්‍ය සමාධීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. දර්ශනවශයෙන් පැවැති ධම්මච්ඡන්දයාගේ අසාධාරණ්‍ය ප්‍රඥෙන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වේ.

අධිමොක්ෂවශයෙන් පැවැති මනසිකාරයාගේ අසාධාරණ්‍ය ශ්‍රද්ධෙන්ද්‍රිය-යාගේ අසාධාරණ්‍ය වෙයි. ප්‍රග්‍රහවශයෙන් පැවැති මනසිකාරයාගේ අසාධාරණ්‍ය වීර්‍යෙන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. උපස්ථානවශයෙන් පැවැති මනසිකාරයාගේ අසාධාරණ්‍ය සමෘතීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. අවික්ෂෙපවශයෙන් පැවැති මනසිකාරයාගේ අසාධාරණ්‍ය සමාධීන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වෙයි. දර්ශනවශයෙන් පැවැති මනසිකාරයාගේ අසාධාරණ්‍ය ප්‍රඥෙන්ද්‍රියයාගේ අසාධාරණ්‍ය වේ.

සද්ධින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං සද්ධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති. විරියින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං විරියින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, සතින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං සතින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, සමාධින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං සමාධින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන එකත්තඅනුපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස අත්ථඞ්ගමො හොති.

ඉමෙහි චත්තාලීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අත්ථඞ්ගමො හොති, ඉමෙහි චත්තාලීසාය ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අත්ථඞ්ගමං පජානාති.

කතමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදො හොති, කතමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදං පජානාති:

අස්සද්ධියස්ස අනුපට්ඨානං සද්ධින්ද්‍රියස්ස අස්සාදො හොති, අස්සද්ධියපරිළාහස්ස අනුපට්ඨානං සද්ධින්ද්‍රියස්ස අස්සාදො හොති, අධිමොක්ඛචරියාය වෙසාරජ්ජං සද්ධින්ද්‍රියස්ස අස්සාදො හොති, සන්තො ච විහාරාධිගමො සද්ධින්ද්‍රියස්ස අස්සාදො හොති, යං සද්ධින්ද්‍රියං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං සද්ධින්ද්‍රියස්ස අස්සාදො.

කොසජ්ජස්ස අනුපට්ඨානං විරියින්ද්‍රියස්ස අස්සාදො හොති, කොසජ්ජපරිළාහස්ස අනුපට්ඨානං විරියින්ද්‍රියස්ස අස්සාදො හොති, පග්ගහචරියාය වෙසාරජ්ජං විරියින්ද්‍රියස්ස අස්සාදො හොති, සන්තො ච විහාරාධිගමො විරියින්ද්‍රියස්ස අස්සාදො හොති, යං විරියින්ද්‍රියං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං විරියින්ද්‍රියස්ස අස්සාදො.

පමාදස්ස අනුපට්ඨානං සතින්ද්‍රියස්ස අස්සාදො හොති, පමාදපරිළාහස්ස අනුපට්ඨානං සතින්ද්‍රියස්ස අස්සාදො හොති, උපට්ඨානචරියාය වෙසාරජ්ජං සතින්ද්‍රියස්ස අස්සාදො හොති, සන්තො ච විහාරාධිගමො සතින්ද්‍රියස්ස අස්සාදො හොති, යං සතින්ද්‍රියං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං සතින්ද්‍රියස්ස අස්සාදො.

උද්ධච්චස්ස අනුපට්ඨානං සමාධින්ද්‍රියස්ස අස්සාදො හොති, උද්ධච්චපරිළාහස්ස අනුපට්ඨානං සමාධින්ද්‍රියස්ස අස්සාදො හොති, අවික්ඛෙපචරියාය වෙසාරජ්ජං සමාධින්ද්‍රියස්ස අස්සාදො හොති, සන්තො ච විහාරාධිගමො සමාධින්ද්‍රියස්ස අස්සාදො හොති, යං සමාධින්ද්‍රියං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං සමාධින්ද්‍රියස්ස අස්සාදො.

අවිජ්ජාය අනුපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස අස්සාදො හොති, අවිජ්ජාපරිළාහස්ස අනුපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස අස්සාදො හොති, දස්සනචරියාය වෙසාරජ්ජං පඤ්ඤින්ද්‍රියස්ස අස්සාදො හොති, සන්තො ච විහාරාධිගමො පඤ්ඤින්ද්‍රියස්ස අස්සාදො හොති, යං පඤ්ඤින්ද්‍රියං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං පඤ්ඤින්ද්‍රියස්ස අස්සාදො.

ඉමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදො හොති, ඉමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදං පජානාති.

ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නොසිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නො සිටීම වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් එකත්ව-යෙහි නො සිටීම ස්මෘතීන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. සමාධීන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නො සිටීම සමාධීන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වෙයි. ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් එකත්වයෙහි නො සිටීම ප්‍රඥෙන්ද්‍රියයාගේ අස්තඞ්ගමය වේ.

මේ සතලිස් අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය වෙයි. මේ සතලිස් අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ අස්තඞ්ගමය දැනගනී.

කවර පස්විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය වේ ද, කවර පස්විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය දැනගනී ද යත්:

අශ්‍රද්ධභාවයාගේ නො එළඹසිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයට ආස්වාදය වෙයි. අශ්‍රද්ධභාව සඞ්ඛ්‍යාත පරිදාහයාගේ නො එළඹසිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයට ආස්වාද වෙයි. අධිමොක්ෂචර්‍ය්‍යායෙහි විශාරද බව ශ්‍රද්ධෙන්ද්‍රියයට ආස්වාද වෙයි. ශාන්තවිහාරාධිගමය (ශමථවිදර්ශනාප්‍රතිලාභය) ශ්‍රද්ධෙන්ද්‍රියයට ආස්වාදය වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මේ ශ්‍රද්ධෙන්ද්‍රියයට ආස්වාදය වේ.

කෞසීද්‍යයාගේ නො එළඹසිටීම වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආස්වාද වෙයි. කෞසීද්‍ය පරිදාහයාගේ නො එළඹසිටීම වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආස්වාද වෙයි. ප්‍රග්‍රහචර්‍ය්‍යා-යෙහි විශාරද බව වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආස්වාද වෙයි. ශාන්තවිහාරාධිගමය වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආස්වාද වෙයි. වීර්‍ය්‍යෙන්ද්‍රියය නිසා යම් සුවයෙක් සොම්-නසෙක් උපදී ද, මේ වීර්‍ය්‍යෙන්ද්‍රියයට ආස්වාද වේ.

ප්‍රමාදයාගේ නො එළඹසිටීම ස්මෘතීන්ද්‍රියයට ආස්වාද වෙයි. ප්‍රමාද-පරිදාහයාගේ නො එළඹසිටීම ස්මෘතීන්ද්‍රියයට ආස්වාද වෙයි. උපස්ථාන-චර්‍ය්‍යායෙහි විශාරද බව ස්මෘතීන්ද්‍රියයට ආස්වාද වෙයි. ශාන්තවිහාරාධිගමය ස්මෘතීන්ද්‍රියයට ආස්වාද වෙයි. ස්මෘතීන්ද්‍රියය නිසා යම් සුවයෙක් සොම්න-සෙක් උපදී ද, මේ ස්මෘතීන්ද්‍රියයට ආස්වාද වේ.

ඖද්ධත්‍යයාගේ නො එළඹසිටීම සමාධීන්ද්‍රියයට ආස්වාද වෙයි. ඖද්ධත්‍ය-පරිදාහයාගේ නො එළඹසිටීම සමාධීන්ද්‍රියයට ආස්වාද වෙයි. අවික්ෂෙපචර්‍ය්‍යා-යෙහි විශාරද බව සමාධීන්ද්‍රියයට ආස්වාද වෙයි. ශාන්තවිහාරාධිගමය සමාධීන්ද්‍රියයට ආස්වාද වෙයි. සමාධීන්ද්‍රියය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මේ සමාධීන්ද්‍රියයට ආස්වාද වේ.

අවිද්‍යාවගේ නො එළඹසිටීම ප්‍රඥෙන්ද්‍රියයට ආස්වාද වෙයි. අවිද්‍යාපරිදාහ-යාගේ නො එළඹසිටීම ප්‍රඥෙන්ද්‍රියයට ආස්වාද වෙයි. දර්ශනචර්‍ය්‍යායෙහි විශාරද බව ප්‍රඥෙන්ද්‍රියයට ආස්වාද වෙයි. ශාන්තවිහාරාධිගමය ප්‍රඥෙන්ද්‍රියයට ආස්වාද වෙයි. ප්‍රඥෙන්ද්‍රියය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මේ ප්‍රඥෙන්ද්‍රියයට ආස්වාද වේ.

මේ පස්විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාද වෙයි. මේ පස්විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආස්වාදය දැනගනී. (1)

කතමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදීනවො හොති, කතමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදීනවං පජානාති:

අස්සද්ධියස්ස උපට්ඨානං සද්ධින්ද්‍රියස්ස ආදීනවො හොති, අස්සද්ධියපරිළාහස්ස උපට්ඨානං සද්ධින්ද්‍රියස්ස ආදීනවො හොති, අනිච්චට්ඨෙන සද්ධින්ද්‍රියස්ස ආදීනවො හොති, දුක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියස්ස ආදීනවො හොති, අනත්තට්ඨෙන සද්ධින්ද්‍රියස්ස ආදීනවො හොති.

කොසජ්ජස්ස උපට්ඨානං විරියින්ද්‍රියස්ස ආදීනවො හොති, කොසජ්ජපරිළාහස්ස උපට්ඨානං විරියින්ද්‍රියස්ස ආදීනවො හොති, අනිච්චට්ඨෙන විරියින්ද්‍රියස්ස ආදීනවො හොති, දුක්ඛට්ඨෙන -පෙ- අනත්තට්ඨෙන විරියින්ද්‍රියස්ස ආදීනවො හොති.

පමාදස්ස උපට්ඨානං සතින්ද්‍රියස්ස ආදීනවො හොති, පමාදපරිළාහස්ස උපට්ඨානං සතින්ද්‍රියස්ස ආදීනවො හොති, අනිච්චට්ඨෙන සතින්ද්‍රියස්ස ආදීනවො හොති, දුක්ඛට්ඨෙන -පෙ- අනත්තට්ඨෙන සතින්ද්‍රියස්ස ආදීනවො හොති.

උද්ධච්චස්ස උපට්ඨානං සමාධින්ද්‍රියස්ස ආදීනවො හොති, උද්ධච්චපරිළාහස්ස උපට්ඨානං සමාධින්ද්‍රියස්ස ආදීනවො හොති, අනිච්චට්ඨෙන සමාධින්ද්‍රියස්ස ආදීනවො හොති, දුක්ඛට්ඨෙන -පෙ- අනත්තට්ඨෙන සමාධින්ද්‍රියස්ස ආදීනවො හොති.

අවිජ්ජාය උපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස ආදීනවො හොති, අවිජ්ජාපරිළාහස්ස උපට්ඨානං පඤ්ඤින්ද්‍රියස්ස ආදීනවො හොති, අනිච්චට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස ආදීනවො හොති, දුක්ඛට්ඨෙන -පෙ- අනත්තට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස ආදීනවො හොති

ඉමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදීනවො හොති, ඉමෙහි පඤ්චවීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදීනවං පජානාති.

කතමෙහි අසීතිසතං ආකාරෙහි[1] පඤ්චන්නං ඉන්ද්‍රියානං නිස්සරණං හොති. කතමෙහි අසීතිසතං ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං නිස්සරණං පජානාති.

අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං අස්සද්ධියා නිස්සටං[2] හොති, අස්සද්ධියපරිළාහා නිස්සටං[2] හොති තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච නිස්සටං හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි නිස්සටං හොති, තතො පණීතතරසද්ධින්ද්‍රියස්ස පටිලාභා පුරිමතරසද්ධින්ද්‍රියා නිස්සටං හොති.

පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං කොසජ්ජා නිස්සටං හොති, කොසජ්ජපරිළාහා නිස්සටං හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච නිස්සටං හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි නිස්සටං හොති, තතො පණීතතරවිරියින්ද්‍රියස්ස පටිලාභා පුරිමතරවිරියින්ද්‍රියා නිස්සටං හොති.

---

1 අසීතිසතාකාරෙහි - සයා

2 නිස්සතං - සී 1

කවර පස්විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව වේ ද, කවර පස්විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව දැනගනී ද යත්:

අශ්‍රද්ධාව එළඹසිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයට ආදීනව වෙයි. අශ්‍රද්ධභාව සඞ්ඛ්‍යාත පරිදාහයාගේ එළඹසිටීම ශ්‍රද්ධෙන්ද්‍රියයට ආදීනව වෙයි. අනිත්‍ය සවභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයට ආදීනව වෙයි. දුඃඛසවභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයට ආදීනව වෙයි. අනාත්මසවභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයට ආදීනව වේ.

කෞසීද්‍යයාගේ එළඹසිටීම වීර්යෙන්ද්‍රියයට ආදීනව වෙයි. කෞසීද්‍ය-පරිදාහයාගේ එළඹසිටීම වීර්යෙන්ද්‍රියයට ආදීනව වෙයි. අනිත්‍යසවභාවයෙන් වීර්යෙන්ද්‍රියයට ආදීනව වෙයි. දුඃඛසවභාවයෙන් ... අනාත්මසවභාවයෙන් වීර්යෙන්ද්‍රියයට ආදීනව වේ.

ප්‍රමාදයාගේ එළඹසිටීම සමෘතීන්ද්‍රියයට ආදීනව වෙයි ප්‍රමාදපරිදාහයා-ගේ එළඹසිටීම සමෘතීන්ද්‍රියයට ආදීනව වෙයි අනිත්‍යසවභාවයෙන් සමෘතීන්ද්‍රි-යට ආදීනව වෙයි. දුඃඛසවභාවයෙන් ... අනාත්මසවභාවයෙන් සමෘතීන්ද්‍රියයට ආදීනව වේ.

ඖද්ධත්‍යයාගේ එළඹසිටීම සමාධීන්ද්‍රියයට ආදීනව වෙයි. ඖද්ධත්‍යපරිදා-හයාගේ එළඹසිටීම සමාධීන්ද්‍රියයට ආදීනව වෙයි. අනිත්‍යසවභාවයෙන් සමාධීන්ද්‍රියයට ආදීනව වෙයි. දුඃඛසවභාවයෙන් ... අනාත්මසවභාවයෙන් සමාධීන්ද්‍රියයට ආදීනව වේ.

අවිද්‍යාවගේ එළඹසිටීම ප්‍රඥෙන්ද්‍රියට ආදීනව වෙයි. අවිද්‍යාපරිදාහයාගේ එළඹසිටීම ප්‍රඥෙන්ද්‍රියයට ආදීනව වෙයි. අනිත්‍යසවභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියයට ආදීනව වෙයි. දුඃඛසවහවායෙන් ප්‍රඥෙන්ද්‍රියයට ආදීනව වෙයි. අනාත්ම-සවභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියට ආදීනව වේ.

මේ පස්විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව වෙයි. මේ පස්විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ ආදීනව දැනගනී. (2)

කවර එක්සියඅසූ අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය වේ ද, කවර එක්සියඅසූ අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය දැනගනී ද යත්:

අධිමොක්‍ෂසවභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අශ්‍රද්ධායෙන් නික්මුණේ වෙයි. අශ්‍රද්ධභාව සඞ්ඛ්‍යාත පරිදාහයෙන් නික්මුණේ වෙයි. එය අනුව පවත්නා කෙලශයන් කෙරෙන් ද සකන්ධයන් කෙරෙන් ද නික්මුණේ වෙයි. බාහ්‍ය වූ ද සියලු කෙලෙසුන් කෙරෙන් නික්මුණේ වෙයි. එයට වඩා අතිශයින් ප්‍රණීත වූ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ ප්‍රතිලාභයෙන් පූර්වතරශ්‍රද්ධෙන්ද්‍රියය කෙරෙන් නික්මුණේ වේ.

ප්‍රග්‍රහසවභාවයෙන් වීර්යෙන්ද්‍රියය කෞසීද්‍යයෙන් නික්මුණේ වෙයි. කෞසීද්‍යපරිදාහයෙන් නික්මුණේ වෙයි. තදනුවර්තක කෙලශයන් කෙරෙන් ද සකන්ධයන් කෙරෙන් ද නික්මුණේ වෙයි. බාහ්‍ය වූ ද සියලු කෙලෙසුන් කෙරෙන් නික්මුණේ වෙයි. එයට වඩා අතිශයින් ප්‍රණීත වූ වීර්යෙන්ද්‍රිය-යාගේ ප්‍රතිලාභයෙන් පූර්වතරවීර්යෙන්ද්‍රිය කෙරෙන් නික්මුණේ වේ.

උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං පමාදා නිස්සටං හොති. පමාදපරිළාහා නිස්සටං හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච නිස්සටං හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි නිස්සටං හොති, තතො පණීතතරසතින්ද්‍රියස්ස පටිලාභා පුරිමතරසතින්ද්‍රියා නිස්සටං හොති.

අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං උද්ධච්චා නිස්සටං හොති, උද්ධච්චපරිළාහා නිස්සටං හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච නිස්සටං හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි නිස්සටං හොති, තතො පණීතතරසමාධින්ද්‍රියස්ස පටිලාභා පුරිමතරසමාධින්ද්‍රියා නිස්සටං හොති.

දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං අවිජ්ජාය නිස්සටං හොති, අවිජ්ජාපරිළාහා නිස්සටං හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච නිස්සටං හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි නිස්සටං හොති, තතො පණීතතරපඤ්ඤින්ද්‍රියස්ස පටිලාභා පුරිමතරපඤ්ඤින්ද්‍රියා නිස්සටං හොති.

පුබ්බභාගෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි පඨමජ්ඣානවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, පඨමෙ ඣානෙ[1] පඤ්චහි ඉන්ද්‍රියෙහි[2] දුතියජ්ඣානවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, දුතියෙ ඣානෙ[3], පඤ්චහි ඉන්ද්‍රියෙහි[2] තතියජ්ඣානවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, තතියෙ ඣානෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි චතුත්ථජ්ඣානවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, චතුත්ථෙ ඣානෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි ආකාසානඤ්චායතනසමාපත්තිවසෙන[4] පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති. ආකාසානඤ්චායතනසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි අනිච්චානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති,

1. පඨමජ්ඣානෙ - ස්‍යා සී 1,
2. පඤ්චහින්ද්‍රියෙහි - මජ්සං, ස්‍යා, පඤ්චින්ද්‍රියෙහි - සී 1.
3. දුතියජ්ඣානෙ - ස්‍යා සී 1
4. සමාපත්තියා වසෙන - සී 1,

උපස්ථානස්වභාවයෙන් ස්මෘතීන්ද්‍රියය ප්‍රමාදය කෙරෙන් නික්මුණේ වෙයි. ප්‍රමාදපරිදාහයෙන් නික්මුණේ වෙයි. තදනුවර්තීනක ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නික්මුණේ වෙයි. බාහ්‍ය වූ ද සියලු කෙලෙසුන් කෙරෙන් නික්මුණේ වෙයි. එයට වඩා අතිශයින් ප්‍රණීත වූ ස්මෘතීන්ද්‍රියයාගේ ප්‍රතිලාභයෙන් පූර්වතරස්මෘතීන්ද්‍රිය කෙරෙන් නික්මුණේ වේ.

අවික්ෂෙපස්වභාවයෙන් සමාධීන්ද්‍රියය ඖද්ධත්‍යයෙන් නික්මුණේ වෙයි. ඖද්ධත්‍යපරිදාහයෙන් නික්මුනේ වෙයි. තදනුවර්තීකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නික්මුණේ වෙයි. බාහ්‍ය වූ ද හැම කෙලෙසුන් කෙරෙන් නික්මුණේ වෙයි. එයට වඩා අතිශයින් ප්‍රණීත වූ සමාධීන්ද්‍රියයාගේ ප්‍රතිලාභයෙන් පූර්වතරසමාධීන්ද්‍රිය කෙරෙන් නික්මුණේ වේ.

දර්ශනස්වභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියය අවිද්‍යායෙන් නික්මුණේ වෙයි. අවිද්‍යා-පරිදාහයෙන් නික්මුණේ වෙයි. තදනුවර්තීකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධ-යන් කෙරෙන් ද නික්මුණේ වෙයි. බාහ්‍ය වූ ද හැම කෙලෙසුන් කෙරෙන් නික්මුණේ වෙයි. එයට වඩා අතිශයින් ප්‍රණීත වූ ප්‍රඥෙන්ද්‍රියයාගේ ප්‍රතිලාභ-යෙන් පූර්වතරප්‍රඥෙන්ද්‍රිය කෙරෙන් නික්මුණේ වේ.

පූර්වභාගයෙහි (ප්‍රථමධ්‍යානොපචාරයෙහි) පැවැති පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් ප්‍රථමධ්‍යානයාගේ වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ප්‍රථමධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් ද්විතීයධ්‍යානයාගේ වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ද්විතීයධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් තෘතීයධ්‍යානයාගේ වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. තෘතීයධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් චතුර්ථධ්‍යානයාගේ වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. චතුර්ථධ්‍යානයෙහි පඤ්චෙ-න්ද්‍රියයන් කෙරෙන් ආකාසානඤ්චායතනසමාපත්තිහුගේ වශයෙන් පඤ්චෙ-න්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ආකාසානඤ්චායතනසමාපත්තියෙහි පඤ්චෙ-න්ද්‍රියයන් කෙරෙන් විඤ්ඤාණඤ්චායතනසමාපත්තිහුගේ වශයෙන් පඤ්චෙ-න්ද්‍රියයෝ නික්මුණාහු වෙති. විඤ්ඤාණඤ්චායතනසමාපත්තියෙහි පඤ්චෙ-න්ද්‍රියයන් කෙරෙන් ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිහුගේ වශයෙන් පඤ්චෙ-න්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙහි පඤ්චෙ-න්ද්‍රියයන් කෙරෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිහුගේ වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමා-පත්තියෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙන් අනිත්‍යානුදර්ශනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙත්. (3)

අනිච්චානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි දුක්ඛානුපස්සනාවසෙන
පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, දුක්ඛානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි
අනත්තානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, අනත්තානු-
පස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි නිබ්බිදානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි
නිස්සටානි හොන්ති, නිබ්බිදානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි විරාගානු-
පස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, විරාගානුපස්සනාය
පඤ්චහි ඉන්ද්‍රියෙහි නිරොධානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි
හොන්ති, නිරොධානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි පටිනිස්සග්ගානුපස්සනා-
වසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, පටිනිස්සග්ගානුපස්සනාය
පඤ්චහි ඉන්ද්‍රියෙහි ඛයානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි
හොන්ති, ඛයානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි වයානුපස්සනාවසෙන
පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, වයානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි
විපරිණාමානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, විපරිණාමානු-
පස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි අනිමිත්තානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි
නිස්සටානි හොන්ති, අනිමිත්තානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි අප්පණිහිතානු
පස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, අප්පණිහිතානුපස්සනාය
පඤ්චහි ඉන්ද්‍රියෙහි සුඤ්ඤතානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි
හොන්ති, සුඤ්ඤතානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි අධිපඤ්ඤාධම්මවිපස්ස-
නාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, අධිපඤ්ඤාධම්මවිපස්සනාය
පඤ්චහි ඉන්ද්‍රියෙහි යථාභූතඤාණදස්සනවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි
හොන්ති, යථාභූතඤාණදස්සනෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි ආදීනවානුපස්සනාව-
සෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, ආදීනවානුපස්සනාය පඤ්චහි
ඉන්ද්‍රියෙහි පටිසඞ්ඛානුපස්සනාවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති,
පටිසඞ්ඛානුපස්සනාය පඤ්චහි ඉන්ද්‍රියෙහි විවට්ටනානුපස්සනාවසෙන
පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, විවට්ටනානුපස්සනාය පඤ්චහි
ඉන්ද්‍රියෙහි සොතාපත්තිමග්ගවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති,
සොතාපත්තිමග්ගෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි සොතාපත්තිඵලසමාපත්තිවසෙන
පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, සොතාපත්තිඵලසමාපත්තියා පඤ්චහි
ඉන්ද්‍රියෙහි සකදාගාමිමග්ගවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, සකදා-
ගාමිමග්ගෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි සකදාගාමිඵලසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි
නිස්සටානි හොන්ති, සකදාගාමිඵලසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි අනාගාමි-
මග්ගවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, අනාගාමිමග්ගෙ පඤ්චහි
ඉන්ද්‍රියෙහි අනාගාමිඵලසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති,
අනාගාමිඵලසමාපත්තියා පඤ්චහි ඉන්ද්‍රියෙහි අරහත්තමග්ගවසෙන
පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති, අරහත්තමග්ගෙ පඤ්චහි ඉන්ද්‍රියෙහි
අරහත්තඵලසමාපත්තිවසෙන පඤ්චින්ද්‍රියානි නිස්සටානි හොන්ති.

අනිච්චානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් දුක්ඛානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. දුක්ඛානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් අනත්තානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. අනත්තානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් නිබ්බිදානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති නිබ්බිදානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් විරාගානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. විරාගානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් නිරෝධානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. නිරෝධානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් පටිනිස්සග්ගානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. පටිනිස්සග්ගානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් ඛයානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ඛයානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් වයානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. වයානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් විපරිණාමානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. විපරිණාමානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් අනිමිත්තානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. අනිමිත්තානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් අප්පණිහිතානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. අප්පණිහිතානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් සුඤ්ඤතානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. සුඤ්ඤතානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් අධිපඤ්ඤාධම්මවිපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. අධිපඤ්ඤාධම්මවිපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් යථාභූතඤාණදස්සන වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. යථාභූතඤාණදස්සනයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් ආදීනවානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ආදීනවානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් පටිසඞ්ඛානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. පටිසඞ්ඛානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් විවට්ටානුපස්සනා වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. විවට්ටානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් සොතාපත්තිමග්ග වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ස්‍රොතාපත්තිමාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් ස්‍රොතාපත්තිඵලසමාපත්තිවශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. ස්‍රොතාපත්තිඵලසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් සකෘදාගාමිමාර්ගවශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. සකෘදාගාමිමාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් සකෘදාගාමිඵලසමාපත්ති වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. සකෘදාගාමිඵලසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් අනාගාමිමාර්ග වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. අනාගාමිමාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් අනාගාමිඵලසමාපත්ති වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති, අනාගාමිඵලසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් අර්හත්මාර්ග වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙති. අර්හත්මාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයන් කෙරෙත් අර්හත්ඵලසමාපත්ති වශයෙන් පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු වෙත්.

නෙක්ඛම්මෙ[1], පඤ්චින්ද්‍රියානි කාමච්ඡන්දතො නිස්සටානි හොන්ති, අබ්‍යාපාදෙ පඤ්චින්ද්‍රියානි බ්‍යාපාදතො නිස්සටානි හොන්ති, ආලොකසඤ්ඤාය පඤ්චින්ද්‍රියානි ථිනමිද්ධතො නිස්සටානි හොන්ති, අවික්ඛෙපෙ පඤ්චින්ද්‍රියානි උද්ධච්චතො නිස්සටානි හොන්ති, ධම්මවවත්ථානෙ පඤ්චින්ද්‍රියානි විචිකිච්ඡාය නිස්සටානි හොන්ති, ඤාණෙ පඤ්චින්ද්‍රියානි අවිජ්ජාය නිස්සටානි හොන්ති, පාමොජ්ජෙ පඤ්චින්ද්‍රියානි අරතියා නිස්සටානි හොන්ති.

පඨමෙ ඣානෙ පඤ්චින්ද්‍රියානි නීවරණෙහි නිස්සටානි හොන්ති, දුතියෙ ඣානෙ පඤ්චින්ද්‍රියානි විතක්කවිචාරෙහි නිස්සටානි හොන්ති, තතියෙ ඣානෙ පඤ්චින්ද්‍රියානි පීතියා නිස්සටානි හොන්ති, චතුත්ථෙ ඣානෙ පඤ්චින්ද්‍රියානි සුඛදුක්ඛෙහි නිස්සටානි හොන්ති, ආකාසානඤ්චායතනසමාපත්තියා පඤ්චින්ද්‍රියානි රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය නිස්සටානි හොන්ති, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා පඤ්චින්ද්‍රියානි ආකාසානඤ්චායතනසඤ්ඤාය නිස්සටානි හොන්ති, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා පඤ්චින්ද්‍රියානි විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය නිස්සටානි හොන්ති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා පඤ්චින්ද්‍රියානි ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය නිස්සටානි හොන්ති.

අනිච්චානුපස්සනාය පඤ්චින්ද්‍රියානි නිච්චසඤ්ඤාය නිස්සටානි හොන්ති, දුක්ඛානුපස්සනාය පඤ්චින්ද්‍රියානි සුඛසඤ්ඤාය නිස්සටානි හොන්ති, අනත්තානුපස්සනාය පඤ්චින්ද්‍රියානි අත්තසඤ්ඤාය නිස්සටානි හොන්ති. නිබ්බිදානුපස්සනාය පඤ්චින්ද්‍රියානි නන්දියා නිස්සටානි හොන්ති, විරාගානුපස්සනාය පඤ්චින්ද්‍රියානි රාගතො නිස්සටානි හොන්ති, නිරොධානුපස්සනාය පඤ්චින්ද්‍රියානි සමුදයතො නිස්සටානි හොන්ති, පටිනිස්සග්ගානුපස්සනාය පඤ්චින්ද්‍රියානි ආදීනවතො නිස්සටානි හොන්ති, ඛයානුපස්සනාය පඤ්චින්ද්‍රියානි ඝනසඤ්ඤාය නිස්සටානි හොන්ති, වයානුපස්සනාය පඤ්චින්ද්‍රියානි ආයූහනතො නිස්සටානි හොන්ති, විපරිණාමානුපස්සනාය පඤ්චින්ද්‍රියානි ධුවසඤ්ඤාය නිස්සටානි හොන්ති, අනිමිත්තානුපස්සනාය පඤ්චින්ද්‍රියානි නිමිත්තතො නිස්සටානි හොන්ති, අප්පණිහිතානුපස්සනාය පඤ්චින්ද්‍රියානි පණිධියා නිස්සටානි හොන්ති, සුඤ්ඤතානුපස්සනාය පඤ්චින්ද්‍රියානි අභිනිවෙසතො නිස්සටානි හොන්ති, අධිපඤ්ඤාධම්මවිපස්සනාය පඤ්චින්ද්‍රියානි සාරාදානාභිනිවෙසතො නිස්සටානි හොන්ති, යථාභූතඤාණදස්සනෙ පඤ්චින්ද්‍රියානි සම්මොහාභිනිවෙසතො නිස්සටානි හොන්ති, ආදීනවානුපස්සනාය පඤ්චින්ද්‍රියානි ආලයාභිනිවෙසතො නිස්සටානි හොන්ති, පටිසඞ්ඛානුපස්සනාය පඤ්චින්ද්‍රියානි අප්පටිසඞ්ඛාය නිස්සටානි හොන්ති, විවට්ටනානුපස්සනාය පඤ්චින්ද්‍රියානි සඤ්ඤොගාභිනිවෙසතො නිස්සටානි හොන්ති.

---

1. නික්ඛම්මෙ - ස්‍යා, සී, 1

නෛෂ්ක්‍රම්‍යයෙහි පඤ්චෙන්ද්‍රියයෝ කාමච්ඡන්දය කෙරෙන් නික්මුණාහු වෙති. අව්‍යාපාදයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ව්‍යාපාදයෙන් නික්මුණාහු වෙති. ආලෝකසංඥායෙහි පඤ්චෙන්ද්‍රියයෝ ථීනමිද්ධය කෙරෙන් නික්මුණාහු වෙති. අවික්ෂෙපයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ඖද්ධත්‍යය කෙරෙන් නික්මුණාහු වෙති. ධර්මනිශ්චයෙහි පඤ්චෙන්ද්‍රියයෝ විචිකිත්සාව කෙරෙන් නික්මුණාහු වෙති. ඥානයෙහි පඤ්චෙන්ද්‍රියයෝ අවිද්‍යාව කෙරෙන් නික්මුණාහු වෙති. ප්‍රාමෝද්‍යයෙහි පඤ්චෙන්ද්‍රියයෝ අරතිය කෙරෙන් නික්මුණාහු වෙත්.

ප්‍රථමධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයෝ නීවරණයන් කෙරෙන් නික්මුණාහු වෙති. ද්විතීයධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයෝ විතර්කවිචාරයන් කෙරෙන් නික්මුණාහු වෙති. තෘතීයධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ප්‍රීතිය කෙරෙන් නික්මුණාහු වෙති. චතුර්ථධ්‍යානයෙහි පඤ්චෙන්ද්‍රියයෝ සුඛදුඃඛයන් කෙරෙන් නික්මුණාහු වෙති. ආකාසානඤ්චායතනසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයෝ රූපසංඥා, ප්‍රතිඝසංඥා, නානාත්වසංඥා කෙරෙන් නික්මුණාහු වෙති. විඤ්ඤාණඤ්චායතනසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයෝ ආකාසානඤ්චායතනසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයෝ විඤ්ඤාණඤ්චායතනසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියෙහි පඤ්චෙන්ද්‍රියයෝ ආකිඤ්චඤ්ඤායතනසංඥාව කෙරෙන් නික්මුණාහු වෙත්.

අනිත්‍යානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ නිත්‍යසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. දුඃඛානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ සුඛසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. අනාත්මානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ආත්මසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. නිර්වේදානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ නන්දිය කෙරෙන් නික්මුණාහු වෙති. විරාගානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ රාගය කෙරෙන් නික්මුණාහු වෙති. නිරෝධානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ සමුදය කෙරෙන් නික්මුණාහු වෙති. පටිනිස්සග්ගානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයෝ ආදීනවය කෙරෙන් නික්මුණාහු වෙති. ක්ෂයානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ඝනසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. ව්‍යයානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ආයූහනය කෙරෙන් නික්මුණාහු වෙති. විපරිණාමානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ධ්‍රැවසංඥාව කෙරෙන් නික්මුණාහු වෙති. අනිමිත්තානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ නිමිත්ත කෙරෙන් නික්මුණාහු වෙති. අප්‍රණිහිතානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ප්‍රණිධිය කෙරෙන් නික්මුණාහු වෙති. ශූන්‍යතානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ අභිනිවේශය කෙරෙන් නික්මුණාහු වෙති. අධිප්‍රඥාධර්මවිදර්ශනායෙහි පඤ්චෙන්ද්‍රියයෝ නිත්‍යසාරග්‍රහණාභිනිවේශය කෙරෙන් නික්මුණාහු වෙති. යථාභූතඥානදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ සම්මෝහාභිනිවේශය කෙරෙන් නික්මුණාහු වෙති. ආදීනවානුදර්ශනයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ආලයාභිනිවේශය කෙරෙන් නික්මුණාහු වෙති. පටිසඞ්ඛානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයෝ අප්පටිසඞ්ඛාව (අසමවාහිතභාවය) කෙරෙන් නික්මුණාහු වෙති. විවට්ටානුපස්සනායෙහි පඤ්චෙන්ද්‍රියයෝ සංයෝගාභිනිවේශය කෙරෙන් නික්මුණාහු වෙත්.

සොතාපත්තිමග්ගෙ පඤ්චින්ද්‍රියානි දිට්ඨෙකට්ඨෙහි කිලෙසෙහි නිස්සටානි හොන්ති, සකදාගාමිමග්ගෙ පඤ්චින්ද්‍රියානි ඔළාරිකෙහි කිලෙසෙහි නිස්සටානි හොන්ති, අනාගාමිමග්ගෙ පඤ්චින්ද්‍රියානි අණුසහගතෙහි කිලෙසෙහි නිස්සටානි හොන්ති, අරහත්තමග්ගෙ පඤ්චින්ද්‍රියානි සබ්බකිලෙසෙහි නිස්සටානි හොන්ති, සබ්බෙසඤ්ඤෙව ඛීණාසවානං තත්ථ තත්ථ පඤ්චින්ද්‍රියානි නිස්සටානි චෙව හොන්ති සුනිස්සටානි ච පටිප්පස්සද්ධානි ච සුප්පටිප්පස්සද්ධානි ච.

ඉමෙහි අසීතිසතංආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං නිස්සරණං හොති. ඉමෙහි අසීතිසතං ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං නිස්සරණං පජානාති.

**දුතියසුත්තන්තනිද්දෙසො.**

**භාණවාරං පඨමං.**

# 4 – 3. තතියසුත්තන්තං

[**සාවත්ථිනිදානං:**]

“පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි, කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං.

කත්ථ ච භික්ඛවෙ, සද්ධින්ද්‍රියං දට්ඨබ්බං: චතුසු සොතාපත්තියඞ්ගෙසු එත්ථ සද්ධින්ද්‍රියං දට්ඨබ්බං. කත්ථ ච භික්ඛවෙ, විරියින්ද්‍රියං දට්ඨබ්බං, චතුසු සම්මප්පධානෙසු, එත්ථ විරියින්ද්‍රියං දට්ඨබ්බං. කත්ථ ච භික්ඛවෙ, සතින්ද්‍රියං දට්ඨබ්බං, චතුසු සතිපට්ඨානෙසු, එත්ථ සතින්ද්‍රියං දට්ඨබ්බං. කත්ථ ච භික්ඛවෙ, සමාධින්ද්‍රියං දට්ඨබ්බං. චතුසු ඣානෙසු, එත්ථ සමාධින්ද්‍රියං දට්ඨබ්බං කත්ථ ච භික්ඛවෙ, පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, චතුසු අරියසච්චෙසු එත්ථ පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං;[a]

චතුසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි: චතුසු සම්මප්පධානෙසු විරියින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතුසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතුසු ඣානෙසු සමාධින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතුසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

චතුසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතුසු සම්මප්පධානෙසු විරියින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතුසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතුසු ඣානෙසු සමාධින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි, චතුසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

a ඉන්ද්‍රියසංයුත්ත - සුද්ධිකවග්ග.

ස්‍රොතාපත්තිමාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයෝ දෘෂ්ටිය හා සමග එක් වැ සිටි කෙලෙසුන් කෙරෙන් නික්මුණාහු වෙති. සකෘදාගාමිමාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ඖදාරික වූ කෙලෙසුන් කෙරෙන් නික්මුණාහු වෙති. අනාගාමිමාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයෝ අණුසහගත වූ කෙලෙසුන් කෙරෙන් නික්මුණාහු වෙති. අර්හත්මාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයෝ හැම කෙලෙසුන් කෙරෙන් නික්මුණාහු වෙති. හැම රහත්නට මැ ඒ ඒ තන්හි පඤ්චෙන්ද්‍රියයෝ නික්මුණාහු ද මොනොවට නික්මුණාහු ද සන්හිඳුණාහු ද මොනොවට සන්හිඳුණාහු ද වෙත්.

මේ එක්සියඅසූ අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය වෙයි, මේ එක්සියඅසූ අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය දනගනී.

**ද්විතීයසූත්‍රනිර්දේශය යි.**

**පළමුවන බණවර යි**

# 4 – 3. තෘතීය සූත්‍රය

සැවැත් නිදන යි.

“මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පස්දෙනෙක් වෙති. කවර පස්දෙනෙක් ද යත්: ශ්‍රද්ධෙන්ද්‍රිය යැ වීර්‍ය්‍යෙන්ද්‍රිය යැ සමෘතීන්ද්‍රිය යැ සමාධීන්ද්‍රිය යැ ප්‍රඥෙන්ද්‍රිය යි.

මහණෙනි, කොතැන්හි ලා ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු ද යත්: සතර ශ්‍රොතාපත්තිඅඞ්ගයන්හි යැ, මෙහි ලා ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ. මහණෙනි, කොතැන්හි ලා වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු ද යත්: සතර සම්‍යක්ප්‍රධානයන්හි යැ, මෙහි ලා වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ. මහණෙනි, කොතැන්හි ලා සමෘතීන්ද්‍රියය දතයුතු ද යත්: සතර සතිපට්ඨානයන්හි යැ, මෙහි ලා සමෘතීන්ද්‍රියය දතයුතු යැ. මහණෙනි, කොතැන්හි ලා සමාධීන්ද්‍රියය දතයුතු ද යත්: සතර ධ්‍යානයන්හි යැ, මෙහි ලා සමාධීන්ද්‍රියය දතයුතු යැ. මහණෙනි, කොතැන්හි ලා ප්‍රඥෙන්ද්‍රියය දතයුතු ද යත්: සතර ආර්‍ය්‍යසත්‍යයන්හි යැ, මෙහි ලා ප්‍රඥෙන්ද්‍රියය දතයුතු”.

සතර ශ්‍රොතාපත්තිඅඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද, සතර සම්‍යක්ප්‍රධානයන්හි වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද, සතර සතිපට්ඨානයන්හි සමෘතීන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද, සතර ධ්‍යානයන්හි සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද, සතර ආර්‍ය්‍යසත්‍යයන්හි පඤ්චෙන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහ, සතර සම්‍යක්ප්‍රධානයන්හි වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහ. සතර සතිපට්ඨානයන්හි සමෘතීන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහ. සතර ධ්‍යානයන්හි සමාධීන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහ. සතර ආර්‍ය්‍යසත්‍යයන්හි ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු යි.

චතූසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි:

සප්පුරිසසංසෙවෙ සොතාපත්තියඞ්ගෙ අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, සද්ධම්මස්සවනෙ සොතාපත්තියඞ්ගෙ -පෙ- යොනිසො මනසිකාරෙ සොතාපත්තියඞ්ගෙ -පෙ- ධම්මානුධම්මපටිපත්තියා සොතාපත්තියඞ්ගෙ අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං.

චතූසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

චතූසු සම්මප්පධානෙසු විරියින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි:

අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය සම්මප්පධානෙ පග්ගහාධිපතෙය්‍යට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, විරියින්ද්‍රියස්ස වසෙන උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය සම්මප්පධානෙ -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය සම්මප්පධානෙ -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භියොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සම්මප්පධානෙ පග්ගහාධිපතෙය්‍යට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, විරියින්ද්‍රියස්ස වසෙන උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං.

චතූසු සම්මප්පධානෙසු විරියින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

චතූසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි:

කායෙ කායානුපස්සනාසතිපට්ඨානෙ උපට්ඨානාධිපතෙය්‍යට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, සතින්ද්‍රියස්ස වසෙන අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානෙ -පෙ- චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානෙ උපට්ඨානාධිපතෙය්‍යට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං. සතින්ද්‍රියස්ස වසෙන අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං.

සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

සත්පුරුෂසංසෙවා සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි අධිමොක්‍ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ, උපස්ථානාර්ථ (එළඹසිටුනාසවභාව)-යෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ, අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ. සද්ධර්මශ්‍රවණ සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි ... යොනිසොමනසිකාර සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි ... ධර්මානුධර්මප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි අධිමොක්‍ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ' ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ, අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු.

සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු යි.

සතර සම්‍යක්ප්‍රධානයන්හි වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

නූපන් ලාමක වූ අකුශලධර්මයන් නූපදනා පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ප්‍රග්‍රහාධිපතිභාවාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ, වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය දතයුතු යැ, අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, අධිමොක්‍ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, උපන් ලාමක වූ අකුශලධර්මයන් ප්‍රහාණය කරනු පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ... නූපන් කුශලධර්මයන් උපදනා පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ... උපන් කුශලධර්මයන් සිටුනා පිණිස නො නස්නා පිණිස බහුලභාවය පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස පරිපූර්ණ බව පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ප්‍රග්‍රහාධිපතිභාවාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ, වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ, අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, අධිමොක්‍ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු.

සතර සම්‍යක්ප්‍රධානයන්හි වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු යි.

සතර සතිපට්ඨානයන්හි ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

කායෙහි කායානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි උපස්ථානාධිපති භාවාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ; ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, අධිමොක්‍ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු යැ, වෙදනාවන්හි වෙදනානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි ... චිත්තයෙහි චිත්තානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි ... ධර්මයන්හි ධර්මානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි උපස්ථානාධිපතිභාවාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ. ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, අධිමොක්‍ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියය දතයුතු.

චතූසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

චතූසු ඣානෙසු සමාධින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි:

පඨමෙ ඣානෙ අවික්ඛෙපාධිපතෙය්‍යට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, සමාධින්ද්‍රියස්ස වසෙන දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, දුතියෙ ඣානෙ -පෙ- තතියෙ ඣානෙ -පෙ- චතුත්ථෙ ඣානෙ අවික්ඛෙපාධිපතෙය්‍යට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, සමාධින්ද්‍රියස්ස වසෙන දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං.

චතූසු ඣානෙසු සමාධින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි:

දුක්ඛෙ අරියසච්චෙ දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං. පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දුක්ඛසමුදයෙ අරියසච්චෙ -පෙ- දුක්ඛනිරොධෙ අරියසච්චෙ -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චෙ දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං.

චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි.

චතූසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා, චතූසු සම්මප්පධානෙසු -පෙ- චතූසු සතිපට්ඨානෙසු -පෙ- චතූසු ඣානෙසු -පෙ- චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන කතිහාකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා: චතූසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා, චතූසු සම්මප්පධානෙසු -පෙ- චතූසු සතිපට්ඨානෙසු -පෙ- චතූසු ඣානෙසු -පෙ- චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා.

සතර සතිපට්ඨානයන්හි ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු වෙත්.

සතර ධ්‍යානයන්හි සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

ප්‍රථමධ්‍යානයෙහි අවික්ෂේපාධිපතිභාවාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, අධිමෝක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්යෙන්ද්‍රියය දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ. ද්විතීයධ්‍යානයෙහි ... තෘතීයධ්‍යානයෙහි ... චතුර්ථධ්‍යානයෙහි අවික්ෂේපාධිපතිභාවාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, අධිමෝක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්යෙන්ද්‍රියය දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු.

සතර ධ්‍යානයන්හි සමාධීන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු වෙත්.

සතර ආර්යසත්‍යයන්හි ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

දුඃඛාර්යසත්‍යයෙහි දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමෝක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්යෙන්ද්‍රියය දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ, අවික්ෂේපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු. දුඃඛසමුදයාර්යසත්‍යයෙහි ... දුඃඛනිරෝධාර්යසත්‍යයෙහි ... දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාර්යසත්‍යයෙහි දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමෝක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්යෙන්ද්‍රියය දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ, අවික්ෂේපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු.

සතර ආර්යසත්‍යයන්හි ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයෝ දතයුත්තාහු වෙත්.

සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්යාව දතයුතු ද, සතර සම්‍යක්ප්‍රධානයන්හි ... සතර සතිපට්ඨානයන්හි ... සතර ධ්‍යානයන්හි ... සතර ආර්යසත්‍යයන්හි ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් කිහි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්යාව දතයුතු ද යත්: සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්යාව දතයුතු යැ, සතර සම්‍යක්ප්‍රධානයන්හි ... සතරසතිපට්ඨානයන්හි ... සතර ධ්‍යානයන්හි ... සතර ආර්යසත්‍යයන්හි ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්යාව දතයුතු.

චතුසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා.

සප්පුරිසසංසෙවෙ සොතාපත්තියඞ්ගෙ අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා. සද්ධම්මසවනෙ සොතාපත්තියඞ්ගෙ -පෙ- යොනිසොමනසිකාරෙ සොතාපත්තියඞ්ගෙ -පෙ- ධම්මානුධම්මපටිපත්තියා සොතාපත්තියඞ්ගෙ අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා.

චතුසු සොතාපත්තියඞ්ගෙසු සද්ධින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා.

චතුසු සම්මප්පධානෙසු විරියින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා:

අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය සම්මප්පධානෙ පග්ගහාධිපතෙය්‍යට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, විරියින්ද්‍රියස්ස වසෙන උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය සම්මප්පධානෙ -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය සම්මප්පධානෙ -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සම්මප්පධානෙ පග්ගහාධිපතෙය්‍යට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා -පෙ-

චතුසු ධම්මප්පධානෙසු විරියින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා.

චතුසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා:

කායෙ කායානුපස්සනාසතිපට්ඨානෙ උපට්ඨානාධිපතෙය්‍යට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, සතින්ද්‍රියස්ස වසෙන අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, වෙදනාසු වෙදනානුපස්සනාසතිපට්ඨානෙ -පෙ- චිත්තෙ චිත්තානුපස්සනාසතිපට්ඨානෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානෙ උපට්ඨානාධිපතෙය්‍යට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා-පෙ-

චතුසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා.

සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍යාව දතයුතු ද යත්:

සත්පුරුෂසංසෙවා සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි අධිමොක්ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ප්‍රග්‍රහස්වභාවයෙන් වීර්‍යෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, උපස්ථානස්වභාවයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, අවික්ෂෙපස්වභාවයෙන් සමාධීන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, දර්ශනස්වභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු. සද්ධර්මශ්‍රවණ සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි ... යොනිසොමනසිකාර සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි ... ධර්මානුධර්මප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත ශ්‍රොතාපත්ත්‍යඞ්ගයෙහි අධිමොක්ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ප්‍රග්‍රහස්වභාවයෙන් වීර්‍යෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, උපස්ථානස්වභාවයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, අවික්ෂෙපස්වභාවයෙන් සමාධීන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, දර්ශනස්වභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු.

සතර ශ්‍රොතාපත්ත්‍යඞ්ගයන්හි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍යාව දතයුතු.

සතර සම්‍යක්ප්‍රධානයන්හි වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍යාව දතයුතු ද යත්:

නූපන් ලාමක වූ අකුශලධර්මයන් නූපදනා පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ප්‍රග්‍රහාධිපතිභාවාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් උපස්ථානස්වභාවයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, අවික්ෂෙපස්වභාවයෙන් සමාධීන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, දර්ශනස්වභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, අධිමොක්ෂස්වභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, උපන් ලාමක වූ අකුශලධර්මයන් ගේ ප්‍රහාණය පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ... නූපන් කුශලධර්මයන් උපදනා පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ... උපන් කුශලධර්මයන්ගේ සිටීම පිණිස නො නැසීම පිණිස බහුල බව පිණිස විපුල බව පිණිස වැඩීම පිණිස පරිපූර්ණ බව පිණිස සම්‍යක්ප්‍රධානයෙහි ප්‍රග්‍රහාධිපතිභාවාර්ථයෙන් වීර්‍යෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු. ...

සතර සම්‍යක්ප්‍රධානයන්හි වීර්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍යාව දතයුතු.

සතර සතිපට්ඨානයන්හි ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍යාව දතයුතු ද යත්:

කයෙහි කායානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි උපස්ථානාධිපතිභාවාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් අවික්ෂෙපස්වභාවයෙන් සමාධීන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, දර්ශනස්වභාවයෙන් ප්‍රඥෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, අධිමොක්ෂස්වභාවයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, ප්‍රග්‍රහස්වභාවයෙන් වීර්‍යෙන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු යැ, වෙදනාවන්හි වෙදනානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි ... චිත්තයෙහි චිත්තානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි ... ධර්මයන්හි ධර්මානුපස්සනා සඞ්ඛ්‍යාත සතිපට්ඨානයෙහි උපස්ථානාධිපතිභාවාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියයාගේ චර්‍යාව දතයුතු. ...

සතර සතිපට්ඨානයන්හි ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍යාව දතයුතු.

චතූසු ඣානෙසු සමාධින්ද්‍රියස්ස වසෙන කතමෙහි විසතියා ආකාරෙහි ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා:

පඨමෙ ඣානෙ අවික්ඛෙපාධිපතෙය්‍යට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, සමාධින්ද්‍රියස්ස වසෙන දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා. දුතියෙ ඣානෙ –පෙ– තතියෙ ඣානෙ –පෙ– චතුත්ථෙ ඣානෙ අවික්ඛෙපාධිපතෙය්‍යට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා –පෙ–

චතූසු ඣානෙසු සමාධින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා:

චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන කතමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා:

දුක්ඛෙ අරියසච්චෙ දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, දුක්ඛසමුදයෙ අරියසච්චෙ –පෙ– දුක්ඛනිරොධෙ අරියසච්චෙ –පෙ– දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චෙ දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියස්ස චරියා දට්ඨබ්බා.

චතූසු අරියසච්චෙසු පඤ්ඤින්ද්‍රියස්ස වසෙන ඉමෙහි වීසතියා ආකාරෙහි පඤ්චන්නං ඉන්ද්‍රියානං චරියා දට්ඨබ්බා.

චාරො ච විහාරො ච අනුබුද්ධො හොති පටිවිද්ධො, යථාචරන්තං යථාවිහරන්තං විඤ්ඤූ සබ්‍රහ්මචාරී ගම්භීරෙසු ඨානෙසු ඔකප්පෙය්‍යුං: අද්ධා අයමායස්මා පත්තො වා පාපුණිස්සති වා.

**චරියාති** අට්ඨ චරියායො: ඉරියාපථචරියා, ආයතනචරියා, සතිචරියා, සමාධිචරියා, ඤාණචරියා, මග්ගචරියා, පත්තිචරියා, ලොකත්ථචරියා’ති.[1]

**ඉරියාපථචරියාති** චතූසු[2] ඉරියාපථෙසු.

**ආයතනචරියාති** ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු.

**සතිචරියාති** චතූසු සතිපට්ඨානෙසු.

**සමාධිචරියාති** චතූසු ඣානෙසු.

**ඤාණචරියාති** චතූසු අරියසච්චෙසු.

1. ලොකත්ථචරියා - ස්‍යා.
2. චතුසු - මජ්ඣං, ස්‍යා.

සතර ධ්‍යානයන්හි සමාධීන්‍ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු ද යත්:

ප්‍රථමධ්‍යානයෙහි අවික්ෂෙපාධිපතිභාවාර්ථයෙන් සමාධීන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, සමාධීන්‍ද්‍රියයාගේ වශයෙන් දර්ශනාන්‍ද්‍රියෙන් ප්‍රඥෙන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ. අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් සමෘතීන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ. ද්විතීයධ්‍යානයෙහි ... තෘතීය ධ්‍යානයෙහි ... චතුර්ථධ්‍යානයෙහි අවික්ෂෙපාධිපතිභාවාර්ථයෙන් සමාධීන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු. ...

සතර ධ්‍යානයන්හි සමාධීන්‍ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු.

සතර ආර්‍ය්‍යසත්‍යයන්හි ප්‍රඥෙන්‍ද්‍රියයාගේ වශයෙන් කවර විසි අයුරෙකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු ද යත්:

දුඃඛාර්‍ය්‍යසත්‍යයෙහි දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, ප්‍රඥෙන්‍ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් සමෘතීන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ. දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍යයෙහි ... දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යයෙහි ... දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍යයෙහි දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, ප්‍රඥෙන්‍ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, උපස්ථානාර්ථයෙන් සමෘතීන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු යැ, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්‍ද්‍රියයාගේ චර්‍ය්‍යාව දතයුතු.

සතර ආර්‍ය්‍යසත්‍යයන්හි ප්‍රඥෙන්‍ද්‍රියයාගේ වශයෙන් මේ විසි අයුරින් පඤ්චෙන්ද්‍රියයන්ගේ චර්‍ය්‍යාව දතයුතු.

චර්‍ය්‍යාව ද විහරණය ද අනුමානයෙන් දන්නාලද්දේ ප්‍රත්‍යක්ෂයෙන් දන්නාලද්දේ වෙයි. යම් පරිද්දෙකින් හැසිරෙන්නහු යම් පරිද්දෙකින් වෙසෙන්නහු 'එකාන්තයෙන් මේ ආයුෂ්මත් තෙම අධිගම කෙළේ යැ'යි හෝ අධිගම කරන්නේ යැ'යි හෝ නුවණැති සබ්‍රම්සරහු ධ්‍යානාදි ගැඹුරු තන්හි හඳහන්නාහු යි.

**චරියා** යනු: චර්‍ය්‍යාවෝ අටදෙනෙකි: ඊර්‍ය්‍යාපථචර්‍ය්‍යා යැ ආයතනචර්‍ය්‍යා යැ සමෘතිචර්‍ය්‍යා යැ සමාධිචර්‍ය්‍යා යැ ඥානචර්‍ය්‍යා යැ මාර්ගචර්‍ය්‍යා යැ ඵලචර්‍ය්‍යා යැ ලොකාර්ථචර්‍ය්‍යා යි.

**ඉරියාපථචරියා** යනු: සතර ඉරියව්හි යැ.

**ආයතනචරියා** යනු: සවැදෑරුම් ආධ්‍යාත්මික බාහිර ආයතනයන්හි යැ.

**සතිචරියා** යනු: සතර සතිපට්ඨානයන්හි යැ.

**සමාධිචරියා** යනු: සතර ධ්‍යානයන්හි යැ.

**ඤාණචරියා** යනු: සතර ආර්‍ය්‍යසත්‍යයන්හි යැ.

**මග්ගචරියාති** චතූසු අරියමග්ගෙසු.

**පත්තිචරියාති** චතූසු සාමඤ්ඤඵලෙසු.

**ලොකත්ථචරියාති** තථාගතෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු, පදෙසෙ[1] පච්චෙකබුද්ධෙසු, පදෙසෙ[1] සාවකෙසු.

ඉරියාපථචරියා ච පණිධිසම්පන්නානං. ආයතනචරියා ච ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරානං. සතිචරියා ච අප්පමාදවිහාරීනං. සමාධිචරියා ච අධිචිත්තමනුයුත්තානං, ඤාණචරියා ච බුද්ධිසම්පන්නානං, මග්ගචරියා ච සම්මාපටිපන්නානං,[3] පත්තිචරියා ච අධිගතඵලානං, ලොකත්ථචරියා ච තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං, පදෙසෙ[1] පච්චෙකබුද්ධානං, පදෙසෙ[1] සාවකානං, ඉමා අට්ඨ චරියායො.

අපරාපි අට්ඨ චරියායො: අධිමුච්චන්තො සද්ධාය චරති, පග්ගණ්හන්තො විරියෙන චරති, උපට්ඨාපෙන්තො සතියා චරති, අවික්ඛෙපං කරොන්තො සමාධිනා චරති, පජානන්තො පඤ්ඤාය චරති, විජානන්තො විඤ්ඤාණචරියාය[4] චරති, එවං පටිපන්නස්ස කුසලා ධම්මා ආයාපෙන්තීති[5] ආයතනචරියාය චරති, එවං පටිපන්නො විසෙසමධිගච්ඡතීති විසෙසචරියාය චරති, ඉමා අට්ඨ චරියායො.

අපරාපි අට්ඨ චරියායො: දස්සනචරියා ච සම්මාදිට්ඨියා, අභිනිරොපනචරියා ච සම්මාසඞ්කප්පස්ස, පරිග්ගහචරියා ච සම්මාවාචාය, සමුට්ඨානචරියා ච සම්මාකම්මන්තස්ස, වොදානචරියා ච සම්මාආජීවස්ස, පග්ගහචරියා ච සම්මාවායාමස්ස. උපට්ඨානචරියා ච සම්මාසතියා, අවික්ඛෙපචරියා ච සම්මාසමාධිස්ස, ඉමා අට්ඨ චරියායො.

**විහාරොති** අධිමුච්චන්තො සද්ධාය විහරති, පග්ගණ්හන්තො විරියෙන විහරති, උපට්ඨාපෙන්තො සතියා විහරති, අවික්ඛෙපං කරොන්තො සමාධිනා විහරති, පජානන්තො පඤ්ඤාය විහරති.

**අනුබුද්ධොති** සද්ධින්ද්‍රියස්ස අධිමොක්ඛට්ඨො අනුබුද්ධො හොති, විරියින්ද්‍රියස්ස පග්ගහට්ඨො අනුබුද්ධො හොති, සතින්ද්‍රියස්ස උපට්ඨානට්ඨො අනුබුද්ධො හොති, සමාධින්ද්‍රියස්ස අවික්ඛෙපට්ඨො අනුබුද්ධො හොති, පඤ්ඤින්ද්‍රියස්ස දස්සනට්ඨො අනුබුද්ධො හොති.

**පටිවිද්ධොති** සද්ධින්ද්‍රියස්ස අධිමොක්ඛට්ඨො පටිවිද්ධො හොති, විරියින්ද්‍රියස්ස පග්ගහට්ඨො පටිවිද්ධො හොති, සතින්ද්‍රියස්ස උපට්ඨානට්ඨො පටිවිද්ධො හොති, සමාධින්ද්‍රියස්ස අවික්ඛෙපට්ඨො පටිවිද්ධො හොති, පඤ්ඤින්ද්‍රියස්ස දස්සනට්ඨො පටිවිද්ධො හොති.

---

1. පදෙසො - සයා, සප්පදෙසො - සී 1,
2. පදෙසො - සයා, සප්ප දෙසු - සී 1,
3. සමාපත්තිසම්පන්නානං - සී 1,
4. විඤ්ඤාණෙන - සයා, විඤ්ඤාණචරියා - සී;
5. අභාපෙන්තීති - සී 1,

**මග්ගචරියා** යනු: සතර ආර්‍යමාර්ගයන්හි යැ.

**පත්තිචරියා** යනු: සතර ශ්‍රාමණ්‍යඵලයන්හි යැ.

**ලොකත්ථචරියා** යනු: තථාගත වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධයන් කෙරෙහි (නිප්පදෙසයෙහි) ප්‍රත්‍යෙකබුද්ධයන් කෙරෙහි (ලොකාර්ථචර්‍යා පිළිබඳ) එකදෙශයෙක්හි, ශ්‍රාවකයන් කෙරෙහි (ලොකාර්ථචර්‍යා පිළිබඳ) එකදෙශයෙක් යි යැ.

ප්‍රණිධිසම්පන්නයනට ඡන්දවශීභාවය ද ඉන්ද්‍රියයන්හි පියනඟද ධෛර්‍ය ඇතියනට ආයතනවශීභාවය ද අප්‍රමාදවිහාර ඇතියනට ස්මෘතිවශීභාවය ද සමාධියෙහි අනුයුක්තයනට සමාධිවශීභාවය ද බුද්ධිසම්පන්නයනට ඥානවශීභාවය ද සම්‍යක්ප්‍රතිපන්නයනට මාර්ගවශීභාවය ද පැමිණි ඵල ඇතියනට ප්‍රාප්තිවශීභාවය ද තථාගත වූ අර්හත් වූ සම්‍යක්සම්බුද්ධයනට (නිප්පදෙසයෙහි) ලොකාර්ථවශීභාවය ද ප්‍රත්‍යෙකබුද්ධයනට එකදෙශයෙහි (ලොකාර්ථවශීභාවය) ද ශ්‍රාවකයනට එකදෙශයෙහි (ලොකාර්ථවශීභාවය) ද යන මොහු වශීභාවෝ අටදෙන වෙත්.

අනෙකුදු වශීභාවෝ අටදෙනෙකි: නිශ්චය කරනුයේ ශ්‍රද්ධාවශයෙන් පවතී. ප්‍රග්‍රහ කරනුයේ වීර්‍යවශයෙන් පවතී. (අරමුණෙහි) එළවනුයේ ස්මෘතිවශයෙන් පවතී. අවික්ෂෙප කරනුයේ සමාධිවශයෙන් පවතී. දැනගන්නේ ප්‍රඥාවශයෙන් පවතී. (ආවර්ජන සිතින්) විජානනය කරනුයේ විඥානවශීභාවයෙන් පවතී. මෙසෙසින් පිළිපන්නහුට කුශලධර්මයෝ අතිශයින් යෑපෙත් නු යි ආයතනවශීභාවවශයෙන් පවතී. මෙසෙසින් පිළිපන්නේ විශෙෂයට පැමිණේ නු යි විශෙෂවශීභාවවශයෙන් පවතී. මොහු වශීභාවෝ අටදෙන වෙත්.

අනෙකුදු වශීභාවෝ අටදෙනෙකි: සම්‍යග්දෘෂ්ටියගේ දර්ශනවශී යැ සම්‍යක්සංකල්පයාගේ අභිනිරොපණ (අරමුණට නැඟීම්) වශී යැ සම්‍යග්වචනයාගේ පරිග්‍රහවශී යැ සම්‍යක්කර්මාන්තයාගේ සමුත්ථානවශී යැ සම්‍යගාජීවයාගේ පරිශුද්ධවශී යැ සම්‍යග්ව්‍යායාමයාගේ ප්‍රග්‍රහවශී යැ සම්‍යක්ස්මෘතියගේ උපස්ථානවශී යැ සම්‍යක්සමාධිහුගේ අවික්ෂෙපවශී යි. මොහු වශීභාවෝ අටදෙන වෙත්.

**විහාරො** යනු: නිශ්චය කරනුයේ ශ්‍රද්ධාවශයෙන් වෙසෙයි, ප්‍රග්‍රහ කරනුයේ වීර්‍යවශයෙන් වෙසෙයි. (අරමුණෙහි) එළවනුයේ ස්මෘතිවශයෙන් වෙසෙයි. අවික්ෂෙප කරනුයේ සමාධිවශයෙන් වෙසෙයි. දැනගන්නේ ප්‍රඥාවශයෙන් වෙසේ.

**අනුබුද්ධො** යනු: ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමොක්ෂස්වභාවය අනුමානයෙන් දන්නාලද වෙයි. වීර්‍යෙන්ද්‍රියයාගේ ප්‍රග්‍රහස්වභාවය අනුමානයෙන් දන්නාලද වෙයි, ස්මෘතීන්ද්‍රියයාගේ උපස්ථානස්වභාවය අනුමානයෙන් දන්නාලද වෙයි, සමාධීන්ද්‍රියයාගේ අවික්ෂෙපස්වභාවය අනුමානයෙන් දන්නාලද වෙයි, ප්‍රඥෙන්ද්‍රියයාගේ දර්ශනස්වභාවය අනුමානයෙන් දන්නාලද වේ.

**පටිවිද්ධො** යනු: ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමොක්ෂස්වභාවය ප්‍රත්‍යක්ෂයෙන් දන්නාලද වෙයි., වීර්‍යෙන්ද්‍රියයාගේ ප්‍රග්‍රහස්වභාවය ප්‍රත්‍යක්ෂයෙන් දන්නාලද වෙයි, ,ස්මෘතීන්ද්‍රියයාගේ උපස්ථානස්වභාවය ප්‍රත්‍යක්ෂයෙන් දන්නාලද වෙයි. සමාධීන්ද්‍රියයාගේ අවික්ෂෙපස්වභාවය ප්‍රත්‍යක්ෂයෙන් දන්නා ලද වෙයි. ප්‍රඥෙන්ද්‍රියයාගේ දර්ශනස්වභාවය ප්‍රත්‍යක්ෂයෙන් දන්නාලද වේ.

**යථාචරන්තන්ති**[1] එවං සද්ධාය චරන්තං, එවං විරියෙන චරන්තං, එවං සතියා චරන්තං, එවං සමාධිනා චරන්තං, එවං පඤ්ඤාය චරන්තං.

**යථාවිහරන්තන්ති** එවං සද්ධාය විහරන්තං, එවං විරියෙන විහරන්තං, එවං සතියා විහරන්තං, එවං සමාධිනා විහරන්තං, එවං පඤ්ඤාය විහරන්තං.

**විඤ්ඤූති** විඤ්ඤූ විභාවී මෙධාවී පණ්ඩිතා බුද්ධිසම්පන්නා.

**සබ්‍රහ්මචාරීති** එකකම්මං,[2] එකුද්දෙසො සමසික්ඛතා.[3]

**ගම්භීරෙසු ඨානෙසූති** ගම්භීරානි ඨානානි වුච්චන්ති: ඣානා[4] ච විමොක්ඛා ච සමාධී[5] ච සමාපත්තියො ච මග්ගා ච ඵලානි ච අභිඤ්ඤායො ච පටිසම්භිදා ච.

**ඔකප්පෙය්‍යුන්ති** සද්දහෙය්‍යුං අධිමුච්චෙය්‍යුං.

**අද්ධාති** එකංසවචනමෙතං, නිස්සංසයවචනමෙතං, නික්කඞ්ඛවචනමෙතං,[6] අද්වෙජ්ඣවචනමෙතං, අද්වෙළ්හකවචනමෙතං, නියොගවචනමෙතං[7], අපණ්ණකවචනමෙතං, අවත්ථාපනවචනමෙතං 'අද්ධා'ති.

**ආයස්මාති** පියවචනමෙතං, ගරුවචනමෙතං, සගාරවසප්පතිස්සාධිවචන[8] මෙතං 'ආයස්මා'ති.

**පත්තො වාති** අධිගතො වා[9].

**පාපුණිස්සති වාති** අධිගමිස්සති වා.[10]

**තතියසුත්තනිද්දෙසො.**

## 4 - 4. චතුත්ථසුත්තං

[සාවත්ථිනිදානං[11]]

පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි: කතමානි පඤ්ච. සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං, ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි.

ඉමානි පඤ්චින්ද්‍රියානි කතිහාකාරෙහි කෙනට්ඨෙන[12] දට්ඨබ්බානි: ඉමානි පඤ්චින්ද්‍රියානි ඡහාකාරෙහි තෙනට්ඨෙන[13] දට්ඨබ්බානි. ආධිපතෙය්‍යට්ඨෙන, ආදිවිසොධනට්ඨෙන, අධිමත්තට්ඨෙන, අධිට්ඨානට්ඨෙන, පරියාදානට්ඨෙන, පතිට්ඨාපකට්ඨෙන.

කථං ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි:

අස්සද්ධියං පජහතො අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං.

---

1. යථාචරන්ති - සී 1, 2. එකං කම්මං - සී, 3. සමසික්ඛතා - ස්‍යා
4. ඣානානි - ස්‍යා PTS, 5. සමාධි - ස්‍යා, සී 1, 6. නික්කඞ්ඛාවචනමෙතං - ස්‍යා, සී 1,
7. නිය්‍යානිකවචනමෙතං - ස්‍යා, 8. සප්පතිස්සාධිවචනං - ස්‍යා,
9. අධිගතො - ස්‍යා PTS, 10. අධිගමිස්සති - ස්‍යා, PTS,
11. පරිපුණ්ණනිදානං - ස්‍යා, සී, PTS, 12. කතිහාකාරෙහි - ස්‍යා PTS,
13. ඡහාකාරෙහි - ස්‍යා,

**යථා චරන්තං** යනු: මෙසේ ශ්‍රද්ධාවශයෙන් පවත්නහු, මෙසේ වීර්‍ය්‍යවශයෙන් පවත්නහු, මෙසේ ස්මෘතිවශයෙන් පවත්නහු, මෙසේ සමාධිවශයෙන් පවත්නහු, මෙසේ ප්‍රඥාවශයෙන් පවත්නහු යැ.

**යථා විහරන්තං** යනු: මෙසේ ශ්‍රද්ධාවශයෙන් වෙසෙන්නහු, මෙසේ වීර්‍ය්‍යවශයෙන් වෙසෙන්නහු, මෙසේ ස්මෘතිවශයෙන් වෙසෙන්නහු, මෙසේ සමාධිවශයෙන් වෙසෙන්නහු, මෙසේ ප්‍රඥාවශයෙන් වෙසෙන්නහු යැ.

**විඤ්ඤූ** යනු: විඥ වූවාහු විමංසක වූවාහු ධාරණප්‍රඥ ඇත්තාහු පණ්ඩිත වූවාහු බුද්ධිමත් වූවාහු යැ.

**සබ්‍රහ්මචාරී** යනු: එකකර්ම එකොද්දෙශ සමානශික්‍ෂා ඇති බව යි.

**ගම්භීරෙසු ඨානෙසු** යනු: ධ්‍යානයෝ ද විමොක්‍ෂයෝ ද සමාධීහු ද සමාපත්තීහු ද මාර්ගයෝ ද ඵලයෝ ද අභිඥාවෝ ද ප්‍රතිසංවිදාවෝ ද ගම්භීර-ස්ථානහ යි කියනු ලැබෙත්.

**ඔකප්පෙය්‍යුං** යනු: හදහන්නාහු යැ අධිමුක්ත වන්නාහු යි.

**අද්ධා** යනු: තෙල 'අද්ධා' යනු ඒකාන්තවචන යැ නිස්සංශයවචන ය නිසැක වචන යැ අද්වෛධවචන යැ නො දෙගිත් වචන යැ නියොගවචන යැ අවිරුද්ධවචන යැ සනිටුහන් වචන යි.

**ආයස්මා** යනු: තෙල 'ආයස්මා' යනු: ප්‍රියවචන යැ ගරුවචන යැ සගෞරවසප්‍රතිශ්‍රයාධිවචන යි.

**පත්තා වා** යනු: පැමිණියේ හෝ යැ.

**පාපුණිස්සන්ති වා** යනු: පැමිණෙන්නේ හෝ යි.

**තෘතීයසූත්‍රනිර්දේශ** යි.

## 4 - 4. චතුර්ථසූත්‍රය

**[සැවැත්නිදාන යි:]**

මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පස්දෙනෙකි: කවර පස්දෙනෙක් ද යත්: ශ්‍රද්ධෙන්ද්‍රිය යැ වීර්‍ය්‍යෙන්ද්‍රිය යැ ස්මෘතීන්ද්‍රිය යැ සමාධීන්ද්‍රිය යැ ප්‍රඥෙන්ද්‍රිය යි. මහණෙනි, මොහු පඤ්චෙන්ද්‍රියයෝ යි.

මේ පඤ්චෙන්ද්‍රියයෝ කිහි අයුරෙකින් කවර අරුතෙකින් දතයුත්තාහු ද යත්: මේ පඤ්චෙන්ද්‍රියයෝ ෂඅයුරෙකින් එ මැ අරුතින් දතයුත්තාහ. අධිපතිභාවාර්ථයෙන ආදිවිශොධනාර්ථයෙන අධිමාත්‍රාර්ථයෙන අධිෂ්ඨානාර්ථයෙන පර්‍ය්‍යාදානාර්ථයෙන ප්‍රතිෂ්ඨාපකාර්ථයෙනි.

කිසෙසින් අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

අශ්‍රද්ධාව දුරුකරන්නාහට අධිමොක්‍ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දත-යුතු යැ එළඹසිටුනා අර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්‍ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු.

කොසජ්ජං පජහතො පග්ගහාධිපතෙය්‍යට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, විරියින්ද්‍රියස්ස වසෙන උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං.

පමාදං පජහතො උපට්ඨානාධිපතෙය්‍යට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, සතින්ද්‍රියස්ස වසෙන අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං.

උද්ධච්චං පජහතො අවික්ඛෙපාධිපතෙය්‍යට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං සමාධින්ද්‍රියස්ස වසෙන දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං.

අවිජ්ජං පජහතො දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං.

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං.

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන පග්ගහාධිපතෙය්‍යට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, විරියින්ද්‍රියස්ස වසෙන උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං.

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන උපට්ඨානාධිපතෙය්‍යට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, සතින්ද්‍රියස්ස වසෙන අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං.

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන අවික්ඛෙපාධිපතෙය්‍යට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, සමාධින්ද්‍රියස්ස වසෙන දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං.

කාමච්ඡන්දං පජහතො නෙක්ඛම්මවසෙන දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං.

කෞසීද්‍යය දුරු කරන්නාහට ප්‍රග්‍රහාධිපතිභාවාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් එළඹසිටීම් අර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු.

ප්‍රමාදය දුරු කරන්නාහට උපස්ථානාධිපතිභාවාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු.

ඖද්ධත්‍යය දුරුකරන්නාහට අවික්ෂෙපාධිපතිභාවාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ සමාධීන්ද්‍රියයාගේ වශයෙන් දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු.

අවිද්‍යාව දුරුකරන්නාහට දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු.

කාමච්ඡන්දය දුරු කරන්නාහට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් අධිමොක්ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු.

කාමච්ඡන්දය දුරු කරන්නාහට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් ප්‍රග්‍රහාධිපතිභාවාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ වශයෙන් උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු.

කාමච්ඡන්දය දුරු කරන්නාහට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් උපස්ථානාධිපතිභාවාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ ස්මෘතීන්ද්‍රියයාගේ වශයෙන් අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු.

කාමච්ඡන්දය දුරු කරන්නාහට නෛෂ්ක්‍රම්‍ය වශයෙන් අවික්ෂෙපාධිපතිභාවාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ සමාධීන්ද්‍රියයාගේ වශයෙන් දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු.

කාමච්ඡන්දය දුරු කරන්නාහට නෛෂ්ක්‍රම්‍යවශයෙන් දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු.

බ්‍යාපාදං පජහතො අබ්‍යාපාදවසෙන -පෙ- ථිනමිද්ධං පජහතො ආලොකසඤ්ඤාවසෙන -පෙ- සබ්බකිලෙසෙ පජහතො අරහත්තමග්ගවසෙන අධිමොක්ඛාධිපතෙය්‍යට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, සද්ධින්ද්‍රියස්ස වසෙන පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං, දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, -පෙ- සබ්බකිලෙසෙ පජහතො අරහත්තමග්ගවසෙන දස්සනාධිපතෙය්‍යට්ඨෙන පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං දට්ඨබ්බං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං දට්ඨබ්බං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං දට්ඨබ්බං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං දට්ඨබ්බං.

එවං අධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි.

කථං ආදිවිසොධනට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි:

අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං අස්සද්ධිය[1] සංවරට්ඨෙන සීලවිසුද්ධි සද්ධින්ද්‍රියස්ස ආදිවිසොධනා, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං කොසජ්ජ[2] සංවරට්ඨෙන සීලවිසුද්ධි විරියින්ද්‍රියස්ස ආදිවිසොධනා, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං පමාද[3] සංවරට්ඨෙන සීලවිසුද්ධි සතින්ද්‍රියස්ස ආදිවිසොධනා, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං උද්ධච්ච[4] සංවරට්ඨෙන සීලවිසුද්ධි සමාධින්ද්‍රියස්ස ආදිවිසොධනා දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං අවිජ්ජා[5] සංවරට්ඨෙන සීලවිසුද්ධි පඤ්ඤින්ද්‍රියස්ස ආදිවිසොධනා.

නෙක්ඛම්මෙ පඤ්චින්ද්‍රියානි කාමච්ඡන්ද[6] සංවරට්ඨෙන සීලවිසුද්ධි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදිවිසොධනා, අබ්‍යාපාදෙ පඤ්චින්ද්‍රියානි බ්‍යාපාද[7] සංවරට්ඨෙන සීලවිසුද්ධි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදිවිසොධනා, ආලොකසඤ්ඤාය පඤ්චින්ද්‍රියානි ථිනමිද්ධ[8] සංවරට්ඨෙන සීලවිසුද්ධි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදිවිසොධනා, අරහත්තමග්ගෙ පඤ්චින්ද්‍රියානි සබ්බකිලෙස[9] සංවරට්ඨෙන සීලවිසුද්ධි පඤ්චන්නං ඉන්ද්‍රියානං ආදිවිසොධනා.

එවං ආදිවිසොධනට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි.

කථං අධිමත්තට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි:

සද්ධින්ද්‍රියස්ස භාවනාය ඡන්දො උප්පජ්ජති, *ඡන්දවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, ඡන්දවසෙන පාමොජ්ජං උප්පජ්ජති, පාමොජ්ජවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, පාමොජ්ජවසෙන පීති උප්පජ්ජති, පීතිවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, පීතිවසෙන පස්සද්ධි උප්පජ්ජති, පස්සද්ධිවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, පස්සද්ධිවසෙන සුඛං උප්පජ්ජති, සුඛවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සුඛවසෙන ඔභාසො උප්පජ්ජති, ඔභාසවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, ඔභාසවසෙන සංවෙගො උප්පජ්ජති, සංවෙගවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සංවෙජෙත්වා චිත්තං සමාදහති, සමාධිවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති. තථා සමාහිතං චිත්තං සාධුකං පග්ගණ්හාති, පග්ගහවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, තථාපග්ගහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛති. උපෙක්ඛාවසෙන සද්ධාවසෙන

1. අස්සද්ධියං - සයා, සී 1 PTS. 2 කොසජ්ජං - සයා. සී 1, PTS.
3. පමාදං - සයා, සී 1.2, PTS. 4 උද්ධච්චං - සයා, සී 1.2, PTS 5 අවිජ්ජං - සයා PTS අවිජ්ජාය සී 2. 6. කාමච්ඡන්දං - සයා, සී 1, PTS. 7. බ්‍යාපාදං - සයා, සී 1 PTS
8. ථිනමිද්ධං - සයා. සී 1,2 ,PTS, ථිනමිද්ධ - මජසං. 9, සබ්බකිලෙසෙ - සයා සී 1, PTS.
* 'ඡන්දවසෙනා'ති ආදිං කත්වා යාව 'අස්සද්ධියස්සා'ති පදං සයා PTS පොත්ථකෙසු න දිස්සති.

ව්‍යාපාදය දුරු කරන්නාහට අව්‍යාපාද වශයෙන් ... ථීනමිද්ධය දුරු කරන්නාහට ආලෝකසංඥා වශයෙන් ... හැම කෙලෙසුන් දුරු කරන්නාහට අර්හත්මාර්ගයාගේ වශයෙන් අධිමෝක්ෂාධිපතිභාවාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ශ්‍රද්ධෙන්ද්‍රියාගේ වශයෙන් ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය දතයුතු යැ අවික්ෂේපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ ... හැම කෙලෙසුන් දුරු කරන්නාහට අර්හත්මාර්ගයාගේ වශයෙන් දර්ශනාධිපතිභාවාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමෝක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය දතයුතු යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය දතයුතු යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය දතයුතු යැ අවික්ෂේපාර්ථයෙන් සමාධීන්ද්‍රියය දතයුතු.

මෙසෙයින් අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ යි.

කිසෙයින් ආදිවිශෝධනාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

අධිමෝක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය වෙයි. අශ්‍රද්ධා සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය ශ්‍රද්ධෙන්ද්‍රියට ආදි (ශීල) විශෝධන යැ ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රියය වෙයි. කෞසීද්‍ය සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය වීර්‍ය්‍යෙන්ද්‍රියට ආදිවිශෝධන යැ උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රියය වෙයි. ප්‍රමාද සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය ස්මෘතීන්ද්‍රියට ආදිවිශෝධන යැ අවික්ෂේපාර්ථයෙන් සමාධීන්ද්‍රිය වෙයි. ඖද්ධත්‍යසංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය සමාධීන්ද්‍රියට ආදිවිශෝධන යැ දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය වෙයි, අවිද්‍යාසංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය ප්‍රඥෙන්ද්‍රියට ආදිවිශෝධන යි.

නෛෂ්ක්‍රම්‍යයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වෙති, කාමච්ඡන්දසංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය පඤ්චෙන්ද්‍රියනට ආදිවිශෝධන යැ, අව්‍යාපාදයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වෙති, ව්‍යාපාද සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය පඤ්චෙන්ද්‍රියනට ආදිවිශෝධන යැ, ආලෝකසංඥායෙහි පඤ්චෙන්ද්‍රියයෝ වෙති, ථීනමිද්ධ සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය පඤ්චෙන්ද්‍රියනට ආදිවිශෝධන යැ අර්හත්මාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයෝ වෙති, සර්වක්ලේශසංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය පඤ්චෙන්ද්‍රියනට ආදිවිශෝධන යි.

මෙසෙයින් ආදිවිශෝධනාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

කිසෙයින් අධිමාත්‍රාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ භාවනායෙහි කුශලච්ඡන්දය උපදී. ඡන්ද වශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර (බලවත්) වෙයි, ඡන්ද වශයෙන් ප්‍රාමෝද්‍යය උපදී. ප්‍රාමෝද්‍යවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, ප්‍රාමෝද්‍යවශයෙන් ප්‍රීතිය උපදී, ප්‍රීතිවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, ප්‍රශ්‍රබ්ධිවශයෙන් සුඛය උපදී, සුඛවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, සුඛවශයෙන් ඥානාවභාසය උපදී. අවභාසවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, අවභාස වශයෙන් සංවේගය උපදී, සංවේගවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, සංවේග උපදවා සිත සමාහිත කෙරෙයි, සමාධි වශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, එසෙයින් සමාහිත වූ සිත (ලීනෞද්ධත්‍යභාවයෙන් මුදා) මොනොවට ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, එසෙයින් ප්‍රග්‍රහ කරන ලද සිත මොනොවට අධ්‍යුපෙක්ෂා කෙරෙයි, උපෙක්ෂාවශයෙන් ශ්‍රද්ධාවශයෙන්

සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, උපෙක්ඛාවසෙන නානත්තකිලෙසෙහි චිත්තං විමුච්චති, විමොක්ඛවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, විමුත්තත්තා තෙ ධම්මා එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනාවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, භාවිතත්තා තතො පණීතතරෙ විවට්ටන්ති, විවට්ටනාවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, විවට්ටිතත්තා තතො වොස්සජති.[1] වොස්සග්ගවසෙන[2] සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, වොස්සජ්ජිතත්තා[3] තතො නිරුජ්ඣන්ති, නිරොධවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, නිරොධවසෙන ද්වෙ වොස්සග්ගා: පරිච්චාගවොස්සග්ගො ච පක්ඛන්දනවොස්සග්ගො ච, කිලෙසෙ ච ඛන්ධෙ ච පරිච්චජතීති පරිච්චාගවොස්සග්ගො, නිරොධනිබ්බානධාතුයා චිත්තං පක්ඛන්දතීති පක්ඛන්දනවොස්සග්ගො, නිරොධවසෙන ඉමෙ ද්වෙ වොස්සග්ගා.

අස්සද්ධියස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- අස්සද්ධියපරිළාහස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- දිට්ඨෙකට්ඨානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- ඔළාරිකානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- අණුසහගතානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- සබ්බකිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති, ඡන්දවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිමත්තං හොති -පෙ-

විරියින්ද්‍රියස්ස භාවනාය ඡන්දො උප්පජ්ජති -පෙ- කොසජ්ජස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- කොසජ්ජපරිළාහස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- දිට්ඨෙකට්ඨානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- සබ්බකිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ-

සතින්ද්‍රියස්ස භාවනාය ඡන්දො උප්පජ්ජති -පෙ- පමාදස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- පමාදපරිළාහස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- සබ්බකිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ-

සමාධින්ද්‍රියස්ස භාවනාය ඡන්දො උප්පජ්ජති -පෙ- උද්ධච්චස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- උද්ධච්ච පරිළාහස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- සබ්බකිලෙසානං සහානාය ඡන්දො උප්පජ්ජති -පෙ-

---

1. වොසජ්ජති - මජසං,
2. වොසග්ගවසෙන - මජසං,
3. වොසජ්ජිතත්තා - මජසං,

ශ්‍රද්ධේන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, උපෙක්ෂාවශයෙන් නානාස්වභාව වූ කෙලෙසුන් කෙරෙන් සිත මිදෙයි, විමොක්ෂවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධේන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, (නානාස්වභාව කෙලෙසුන් කෙරෙන්) විමුක්ත බැවින් ඒ (ඡන්දාදි) ධර්මයෝ එකරස (එකකෘත්‍ය) වෙති. එකරසාර්ථයෙන් භාවනා-වශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධේන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, භාවිත බැවින් ඒ විදර්ශනාලම්බනයට වඩා ප්‍රණීතතර (නිර්වාණාලම්බන) යෙහි නවතිත්. විවර්තන වශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධේන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, විවර්තිත (නැවැතුණු) බැවින් එහෙයින් මැ (කෙලෙසුන් හා ස්කන්ධයන් හා) දුරු කෙරෙයි, දුරලීම් වශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධේන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, දුරලූ බැවින් එකරුණෙන් මැ (කෙලෙස් හා ස්කන්ධයෝ හා) නිරුද්ධ වෙති, නිරෝධ-වශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධේන්ද්‍රියය අධිමාත්‍ර වෙයි, නිරෝධවශයෙන් වොස්සග්ග දෙකෙකි: පරිච්චාගවොස්සග්ග යැ පක්ඛන්දනවොස්සග්ග යි. කෙලෙසුන් හා ස්කන්ධයන් හා දුරු කෙරේ නු යි පරිච්චාගවොස්සග්ග නම. නිරෝධ සංඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත ප්‍රස්කන්දනය කෙරේ නු යි පක්ඛන්දන වොස්සග්ග නම්. නිරෝධවශයෙන් මේ වොස්සග්ගයෝ දෙදෙන වෙත්.

අශ්‍රද්ධාභාවයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... අශ්‍රද්ධාපරිදාහයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... දෘෂ්ටිය හා එකස්වභාව වූ ක්ලේශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... ඖදාරික ක්ලේශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... අණුසහගත ක්ලේශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... සියලු කෙලෙසුන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී, ඡන්දවශයෙන් ශ්‍රද්ධා වශයෙන් ශ්‍රද්ධේන්ද්‍රිය අධිමාත්‍ර වෙයි ...

වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ භාවනායෙහි ඡන්දය උපදී ... කෞසීද්‍යයාගේ දුරලීම පිණිස ඡන්දය උපදී ... කෞසීද්‍යපරිදාහයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... දෘෂ්ටිය හා එකස්වභාව වූ ක්ලේශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... සර්වක්ලේශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ...

සමෘතීන්ද්‍රියයාගේ භාවනායෙහි ඡන්දය උපදී ... ප්‍රමාදයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... ප්‍රමාදපරිදාහයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... සියලු කෙලෙසුන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ...

සමාධීන්ද්‍රියයාගේ භාවනායෙහි ඡන්දය උපදී ... ඖද්ධත්‍යයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... ඖද්ධත්‍යපරිදාහයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... සියලු කෙලෙසුන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ...

පඤ්ඤින්ද්‍රියස්ස භාවනාය ඡන්දො උප්පජ්ජති -පෙ- අවිජ්ජාය පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- අවිජ්ජාපරිළාහස්ස පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- දිට්ඨෙකට්ඨානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- ඔළාරිකානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ- අණුසහගතානං කිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති -පෙ-

සබ්බකිලෙසානං පහානාය ඡන්දො උප්පජ්ජති, ඡන්දවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, ඡන්දවසෙන පාමොජ්ජං උප්පජ්ජති, පාමොජ්ජවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පාමොජ්ජවසෙන පීති උප්පජ්ජති, පීතිවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පීතිවසෙන පස්සද්ධි උප්පජ්ජති, පස්සද්ධිවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති. පස්සද්ධිවසෙන සුඛං උප්පජ්ජති, සුඛවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, සුඛවසෙන ඔභාසො උප්පජ්ජති, ඔභාසවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, ඔභාසවසෙන සංවෙගො උප්පජ්ජති, සංවෙගවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, සංවෙජෙත්වා[1] චිත්තං සමාදහති, සමාධිවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, තථා සමාහිතං චිත්තං සාධුකං පග්ගණ්හාති, පග්ගහවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, තථා පග්ගහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛති, උපෙක්ඛාවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති. උපෙක්ඛාවසෙන නානත්තකිලෙසෙහි චිත්තං විමුච්චති, විමොක්ඛවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, විමුත්තත්තා තෙ ධම්මා එකරසා හොන්ති, එකරසට්ඨෙන[2] භාවනාවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, භාවිතත්තා තතො පණීතතරෙ විවට්ටනාති[3] විවට්ටනාවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, විවට්ටිතත්තා තතො වොස්සජති[4] වොස්සග්ගවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, වොස්සජ්ජිතත්තා තතො නිරුජ්ඣන්ති, නිරොධවසෙන පඤ්ඤාවසෙන පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, නිරොධවසෙන ද්වෙ වොස්සග්ගා: පරිච්චාගවොස්සග්ගො ච, පක්ඛන්දනවොස්සග්ගො ච, කිලෙසෙ ච ඛන්ධෙ ච පරිච්චජතීති පරිච්චාගවොස්සග්ගො, නිරොධනිබ්බානධාතුයා චිත්තං පක්ඛන්දතීති පක්ඛන්දනවොස්සග්ගො, නිරොධවසෙන ඉමෙ ද්වෙ වොස්සග්ගා.

එවං අධිමත්තට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි.

භාණවාරො දුතියො[5]

කථං අධිට්ඨානට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි:

සද්ධින්ද්‍රියස්ස භාවනාය ඡන්දො උප්පජ්ජති, ඡන්දවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිට්ඨාති, ඡන්දවසෙන පාමොජ්ජං උප්පජ්ජති, පාමොජ්ජවසෙන සද්ධාවසෙන සද්ධින්ද්‍රියං අධිට්ඨාති. -පෙ-

එවං අධිට්ඨානට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි.

---

1. සංවෙජත්වා - PT 2 එකරසට්ඨෙන - මජසං පොත්ථකෙ නත්ථි,
3. විවත්තනාති - සී 1 4. වොසජ්ජති - මජසං. 5. භාණවාරං නිට්ඨිතං - ස්‍යා, සී, PTS

ප්‍රඥෙන්ද්‍රියයාගේ භාවනායෙහි ඡන්දය උපදී ... අවිද්‍යාවගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... අවිද්‍යාපරිදාහයාගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... දෘෂ්ටිය හා එකස්වභාව වූ ක්ලේශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... ඖදාරික ක්ලේශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ... අණුසහගත ක්ලේශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී ...

සර්වක්ලේශයන්ගේ ප්‍රහාණය පිණිස ඡන්දය උපදී, ඡන්දවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වෙයි. ඡන්දවශයෙන් ප්‍රාමොද්‍යය උපදී, ප්‍රාමොද්‍ය වශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. ප්‍රාමොද්‍යවශයෙන් ප්‍රීතිය උපදී, ප්‍රීතිවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. ප්‍රීතිවශයෙන් ප්‍රශ්‍රබ්ධිය උපදී. ප්‍රශ්‍රබ්ධිවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. ප්‍රශ්‍රබ්ධිවශයෙන් සුඛය උපදී, සුඛවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. සුඛවශයෙන් අවභාසය උපදී, අවභාස වශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. අවභාස වශයෙන් සංවේගය උපදී, සංවේගවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. සංවේග දනවා සිත සමාහිත කෙරෙයි, සමාධිවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. එසේ සමාහිත වූ සිත මොනොවට ප්‍රග්‍රහ කෙරෙයි. ප්‍රග්‍රහවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. එසේ ප්‍රගෘහීත වූ සිත මොනොවට අධ්‍යුපෙක්‍ෂා කෙරෙයි, උපෙක්‍ෂා වශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. උපෙක්‍ෂාවශයෙන් නානාස්වභාව වූ කෙලෙසුන් කෙරෙන් සිත මිදෙයි, විමොක්‍ෂවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. විමුක්ත බැවින් ඒ (ඡන්දාදි) ධර්මයෝ එකකෘත්‍ය වෙති, එකකෘත්‍ය වූ භාවනාවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. භාවිත බැවින් එයට වඩා ප්‍රණීතතර වූ අරමුණෙහි නවතිත්. විවර්තනාවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. විවර්තිත බැවින් එයින් මැ (කෙලෙසුන් ද ස්කන්ධයන් ද) දුරු කෙරෙයි. ව්‍යොත්සර්ගවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. දුරළූ බැවින් එකරුණින් මැ කෙලෙසුන් හා ස්කන්ධයන් හා අනුත්පාද නිරොධවශයෙන් නිරුද්ධ වෙති. නිරොධවශයෙන් ප්‍රඥාවශයෙන් ප්‍රඥෙන්ද්‍රිය අධිමාත්‍ර වේ. නිරොධවශයෙන් ව්‍යොත්සර්ගයෝ දෙදෙනෙකි: පරිත්‍යාගව්‍යොත්සර්ග යැ පක්ඛන්දනව්‍යොත්සර්ග යි. කෙලෙසුන් ද ස්කන්ධයන් ද දුරු කෙරේ නු යි පරිත්‍යාගව්‍යොත්සර්ග නම, නිරොධසඞ්ඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත ප්‍රස්කන්දනය කෙරේ නු යි පක්ඛන්දනව්‍යොත්සර්ග නම්. නිරොධවශයෙන් මේ ව්‍යොත්සර්ගයෝ දෙදෙන වෙත්.

මෙසේ අධිමාත්‍රාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

**දෙවැනි බණවර යි.**

කිසෙයින් අධිෂ්ඨානාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ භාවනායෙහි කුශලච්ඡන්දය උපදී. ඡන්දවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය පිහිටයි. ඡන්දවශයෙන් ප්‍රාමොද්‍යය උපදී. ප්‍රාමොද්‍යවශයෙන් ශ්‍රද්ධාවශයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය පිහිටයි ...

මෙසෙයින් අධිෂ්ඨානාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ යි.

කථං පරියාදානට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි:

අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං අස්සද්ධියං පරියාදියති. අස්සද්ධියපරිළාහං පරියාදියති. පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං කොසජ්ජං පරියාදියති, කොසජ්ජපරිළාහං පරියාදියති. උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං පමාදං පරියාදියති, පමාදපරිළාහං පරියාදියති. අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං උද්ධච්චං පරියාදියති, උද්ධච්චපරිළාහං පරියාදියති. දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං අවිජ්ජං පරියාදියති, අවිජ්ජාපරිළාහං පරියාදියති.

නෙක්ඛම්මෙ පඤ්චින්ද්‍රියානි කාමච්ඡන්දං පරියාදියන්ති, අබ්‍යාපාදෙ පඤ්චින්ද්‍රියානි බ්‍යාපාදං පරියාදියන්ති. ආලොකසඤ්ඤාය පඤ්චින්ද්‍රියානි ථිනමිද්ධං පරියාදියන්ති. අවික්ඛෙපෙ පඤ්චින්ද්‍රියානි උද්ධච්චං පරියාදියන්ති. -පෙ- අරහත්තමග්ගෙ පඤ්චින්ද්‍රියානි සබ්බකිලෙසෙ පරියාදියන්ති.

එවං පරියාදානට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි.

කථං පතිට්ඨාපකට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි:

සද්ධො සද්ධින්ද්‍රියං අධිමොක්ඛෙ පතිට්ඨාපෙති, සද්ධස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛෙ පතිට්ඨාපෙති. විරියවා විරියින්ද්‍රියං පග්ගහෙ පතිට්ඨාපෙති විරියවතො විරියින්ද්‍රියං පග්ගහෙ පතිට්ඨාපෙති. සතිමා සතින්ද්‍රියං උපට්ඨානෙ පතිට්ඨාපෙති, සතිමතො සතින්ද්‍රියං උපට්ඨානෙ පතිට්ඨාපෙති. සමාහිතො සමාධින්ද්‍රියං අවික්ඛෙපෙ පතිට්ඨාපෙති, සමාහිතස්ස සමාධින්ද්‍රියං අවික්ඛෙපෙ පතිට්ඨාපෙති. පඤ්ඤවා පඤ්ඤින්ද්‍රියං දස්සනෙ පතිට්ඨාපෙති, පඤ්ඤවතො පඤ්ඤින්ද්‍රියං දස්සනෙ පතිට්ඨාපෙති.

යොගාවචරො පඤ්චින්ද්‍රියානි නෙක්ඛම්මෙ පතිට්ඨාපෙති, යොගාවචරස්ස පඤ්චින්ද්‍රියානි නෙක්ඛම්මෙ පතිට්ඨාපෙති. යොගාවචරො පඤ්චින්ද්‍රියානි අබ්‍යාපාදෙ පතිට්ඨාපෙති, යොගාවචරස්ස පඤ්චින්ද්‍රියානි අබ්‍යාපාදෙ පතිට්ඨාපෙති. යොගාවචරො පඤ්චින්ද්‍රියානි ආලොකසඤ්ඤාය පතිට්ඨාපෙති, යොගාවචරස්ස පඤ්චින්ද්‍රියානි ආලොකසඤ්ඤාය පතිට්ඨාපෙති. යොගාවචරො පඤ්චින්ද්‍රියානි අවික්ඛෙපෙ පතිට්ඨාපෙති, යොගාවචරස්ස පඤ්චින්ද්‍රියානි අවික්ඛෙපෙ පතිට්ඨාපෙති -පෙ- යොගාවචරො පඤ්චින්ද්‍රියානි අරහත්තෙ පතිට්ඨාපෙති, යොගාවචරස්ස පඤ්චින්ද්‍රියානි අරහත්තෙ පතිට්ඨාපෙති.

එවං පතිට්ඨාපකට්ඨෙන ඉන්ද්‍රියානි දට්ඨබ්බානි.

චතුත්ථසුත්තන්තනිද්දෙසො.

පුථුජ්ජනො සමාධිං භාවෙන්තො[1] කතිහාකාරෙහි උපට්ඨානකුසලො හොති, සෙක්ඛො[2] සමාධිං භාවෙන්තො කතිහාකාරෙහි උපට්ඨානකුසලො හොති, වීතරාගො සමාධිං භාවෙන්තො කතිහාකාරෙහි උපට්ඨානකුසලො හොති:

පුථුජ්ජනො සමාධිං භාවෙන්තො සත්තහි ආකාරෙහි උපට්ඨානකුසලො හොති. සෙක්ඛො සමාධිං භාවෙන්තො අට්ඨහි ආකාරෙහි උපට්ඨානකුසලො හොති. වීතරාගො සමාධිං භාවෙන්තො දසහි ආකාරෙහි උපට්ඨානකුසලො හොති.

1 භාවයන්තො - PTS 2 සෙඛො - PTS සී

කිසෙයින් පර්‍ය්‍යාදානාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ අශ්‍රද්ධාව ක්ෂය කෙරෙයි, අශ්‍රද්ධාපරිදාහය ක්ෂය කෙරෙයි, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රිය තෙමේ කුසීද බව ක්ෂය කෙරෙයි, කෞසීද්‍යපරිදාහය ක්ෂය කෙරෙයි, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය තෙමේ ප්‍රමාදය ක්ෂය කෙරෙයි, ප්‍රමාද පරිදාහය ක්ෂය කෙරෙයි, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය තෙමේ උද්ධතභාවය ක්ෂය කෙරෙයි, ඖද්ධත්‍යපරිදාහය ක්ෂය කෙරෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රිය තෙමේ අවිද්‍යාව ක්ෂය කෙරෙයි, අවිද්‍යාපරිදාහය ක්ෂය කෙරෙයි.

නෛෂ්ක්‍රම්‍යයෙහි පඤ්චෙන්ද්‍රියයෝ කාමච්ඡන්දය ක්ෂය කෙරෙත්, අව්‍යාපාදයෙහි පඤ්චෙන්ද්‍රියයෝ ව්‍යාපාදය ක්ෂය කෙරෙති, ආලෝකසංඥායෙහි පඤ්චෙන්ද්‍රියයෝ ථිනමිද්ධය ක්ෂය කෙරෙති, අවික්ෂෙපයෙහි පඤ්චෙන්ද්‍රියයෝ උද්ධතභාවය ක්ෂය කෙරෙති ... අර්හත්මාර්ගයෙහි පඤ්චෙන්ද්‍රියයෝ හැම කෙලෙසුන් ක්ෂය කෙරෙත්.

මෙසෙයින් පර්‍ය්‍යාදානාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

කිසෙයින් ප්‍රතිෂ්ඨාපකාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහු ද යත්:

ශ්‍රද්ධා ඇත්තේ ශ්‍රද්ධෙන්ද්‍රිය අධිමොක්ෂයෙහි පිහිටුවයි, ශ්‍රද්ධා ඇතියහුගේ ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂයෙහි පිහිටුවයි, වීර්‍ය්‍ය ඇත්තේ වීර්‍ය්‍යෙන්ද්‍රියය ප්‍රග්‍රහයෙහි පිහිටුවයි, වීර්‍ය්‍ය ඇතියහුගෙ වීර්‍ය්‍යෙන්ද්‍රියය ප්‍රග්‍රහයෙහි පිහිටුවයි, සිහි ඇත්තේ ස්මෘතීන්ද්‍රියය උපස්ථානයෙහි පිහිටුවයි, සිහි ඇතියහුගේ ස්මෘතීන්ද්‍රියය උපස්ථානයෙහි පිහිටුවයි, සමාහිත වූයේ සමාධීන්ද්‍රියය අවික්ෂෙපයෙහි පිහිටුවයි, සමාහිත වූවහුගේ සමාධීන්ද්‍රියය අවික්ෂෙපයෙහි පිහිටුවයි, ප්‍රඥා ඇත්තේ ප්‍රඥෙන්ද්‍රියය දර්ශනයෙහි පිහිටුවයි, ප්‍රඥා ඇතියහුගේ ප්‍රඥෙන්ද්‍රියය දර්ශනයෙහි පිහිටුවා.

යොගාවචර තෙම පඤ්චෙන්ද්‍රියයන් නෛෂ්ක්‍රම්‍යයෙහි පිහිටුවයි, යොගාවචරයාගේ පඤ්චෙන්ද්‍රියයන් නෛෂ්ක්‍රම්‍යයෙහි පිහිටුවයි, යොගාවචර තෙම පඤ්චෙන්ද්‍රියයන් අව්‍යාපාදයෙහි පිහිටුවයි, යොගාවචරයාගේ පඤ්චෙන්ද්‍රියයන් අව්‍යාපාදයෙහි පිහිටුවයි, යොගාවචර තෙම පඤ්චෙන්ද්‍රියයන් ආලෝකසංඥායෙහි පිහිටුවයි, යොගාවොචරයාගේ පඤ්චෙන්ද්‍රියයන් ආලෝකස ඥායෙහි පිහිටුවයි, යොගාවචර තෙම පඤ්චෙන්ද්‍රියයන් අවික්ෂෙපයෙහි පිහිටුවයි, යොගාවචරයාගේ පඤ්චෙන්ද්‍රියයන් අවික්ෂෙපයෙහි පිහිටුවයි .. යොගාවචර තෙම පඤ්චෙන්ද්‍රියයන් අර්හත්ත්වයෙහි පිහිටුවයි, යොගාවචරයාගේ පඤ්චෙන්ද්‍රියයන් අර්හත්ත්වයෙහි පිහිටුවා.

මෙසෙයින් ප්‍රතිෂ්ඨාපකාර්ථයෙන් ඉන්ද්‍රියයෝ දතයුත්තාහ.

## චතුර්ථසූත්‍ර නිර්දේශ යි.

පෘථග්ජන තෙම (නිර්වේදභාගිය) සමාධිය වඩනුයේ කිහි අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, ශෛක්ෂ තෙම සමාධිය වඩනුයේ කිහි අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, වීතරාග (රහත්) තෙම සමාධිය වඩනුයේ කිහි අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද යත්:

පෘථග්ජන තෙම සමාධිය වඩනුයේ සත් අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි. ශෛක්ෂ තෙම සමාධිය වඩනුයේ අට අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි. වීතරාග තෙම සමාධිය වඩනුයේ දස අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ.

පුථුජ්ජනො සමාධිං භාවෙන්තො කතමෙහි සත්තහාකාරෙහි උපට්ඨානකුසලො හොති:

ආවජ්ජිතත්තා ආරම්මණූපට්ඨානකුසලො හොති, සමථනිමිත්තූපට්ඨානකුසලො හොති, පග්ගහනිමිත්තූපට්ඨානකුසලො හොති, අවික්ඛෙපූපට්ඨානකුසලො හොති, ඔභාසූපට්ඨානකුසලො හොති, සම්පහංසනූපට්ඨානකුසලො හොති, උපෙක්ඛූපට්ඨානකුසලො හොති. පුථුජ්ජනො සමාධිං භාවෙන්තො ඉමෙහි සත්තහාකාරෙහි උපට්ඨානකුසලො හොති.

සෙක්ඛො සමාධිං භාවෙන්තො කතමෙහි අට්ඨහා'කාරෙහි උපට්ඨානකුසලො හොති:

ආවජ්ජිතත්තා ආරම්මණූපට්ඨානකුසලො හොති, -පෙ- උපෙක්ඛූපට්ඨානකුසලො හොති, එකත්තූපට්ඨානකුසලො හොති. සෙක්ඛො සමාධිං භාවෙන්තො ඉමෙහි අට්ඨහාකාරෙහි උපට්ඨානකුසලො හොති.

වීතරාගො සමාධිං භාවෙන්තො කතමෙහි දසහාකාරෙහි උපට්ඨානකුසලො හොති:

ආවජ්ජිතත්තා ආරම්මණූපට්ඨානකුසලො හොති -පෙ- එකත්තූපට්ඨානකුසලො හොති, ඤාණූපට්ඨානකුසලො හොති, විමුත්තූපට්ඨානකුසලො[3] හොති. වීතරාගො සමාධිං භාවෙන්තො ඉමෙහි දසහා'කාරෙහි උපට්ඨානකුසලො හොති.

පුථුජ්ජනො විපස්සනං භාවෙන්තො[1] කතිහා'කාරෙහි උපට්ඨානකුසලො හොති, කතිහා'කාරෙහි අනුපට්ඨානකුසලො හොති, සෙක්ඛො[2] විපස්සනං භාවෙන්තො කතිහා'කාරෙහි උපට්ඨානකුසලො හොති, කතිහා'කාරෙහි අනුපට්ඨානකුසලො හොති, වීතරාගො විපස්සනං භාවෙන්තො කතිහා'කාරෙහි උපට්ඨානකුසලො හොති, කතිහාකාරෙහි අනුපට්ඨානකුසලො හොති:

පුථුජ්ජනො විපස්සනං භාවෙන්තො නවහාකාරෙහි උපට්ඨානකුසලො හොති, නවහාකාරෙහි අනුපට්ඨානකුසලො හොති. සෙක්ඛො විපස්සනං භාවෙන්තො දසහාකාරෙහි උපට්ඨානකුසලො හොති, දසහාකාරෙහි අනුපට්ඨානකුසලො හොති. වීතරාගො විපස්සනං භාවෙන්තො ද්වාදසහි ආකාරෙහි උපට්ඨානකුසලො හොති, ද්වාදසහි ආකාරෙහි අනුපට්ඨානකුසලො හොති.

පුථුජ්ජනො විපස්සනං භාවෙන්තො[1] කතමෙහි නවහාකාරෙහි උපට්ඨානකුසලො හොති, කතමෙහි නවහා'කාරෙහි අනුපට්ඨානකුසලො හොති:

අනිච්චතො උපට්ඨානකුසලො හොති, නිච්චතො අනුපට්ඨානකුසලො හොති, දුක්ඛතො උපට්ඨානකුසලො හොති, සුඛතො අනුපට්ඨානකුසලො හොති, අනත්තතො උපට්ඨානකුසලො හොති, අත්තතො අනුපට්ඨානකුසලො හොති, ඛයතො උපට්ඨානකුසලො හොති, ඝනතො අනුපට්ඨානකුසලො හොති. වයතො උපට්ඨානකුසලො හොති, ආයූහනානුපට්ඨානකුසලො හොති. විපරිණාමූපට්ඨානකුසලො හොති, ධුවතො අනුපට්ඨානකුසලො හොති, අනිමිත්තූපට්ඨානකුසලො හොති, නිමිත්තානුපට්ඨානකුසලො හොති. අප්පණිහිතූපට්ඨානකුසලො හොති, පණිධානුපට්ඨානකුසලො හොති, සුඤ්ඤතූපට්ඨානකුසලො හොති, අභිනිවෙසානුපට්ඨානකුසලො හොති. පුථුජ්ජනො විපස්සනං භාවෙන්තො ඉමෙහි නවහාකාරෙහි උපට්ඨානකුසලො හොති, ඉමෙහි නවහාකාරෙහි අනුපට්ඨානකුසලො හොති.

1. භාවයන්තො - PTS. 2. සෙඛො - PTS, සී. 3 විත්තුපට්ඨානකුසලො - ස්‍යා.

පෘථග්ජන තෙම සමාධිය වඩනුයේ කවර සත් අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි යත්:

ආවර්ජනා කළ බැවින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ශමථ–නිමිත්තට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ප්‍රග්‍රහනිමිත්තට එළඹසිටීමෙහි නිපුණ වෙයි, අවික්ෂෙපයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, අවභාසයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, සම්ප්‍රහර්ෂණයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, උපෙක්ෂාවට එළඹසිටීමෙහි නිපුණ වෙයි, පෘථග්ජන තෙම සමාධිය වඩනුයේ මේ සත් අයුරින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ.

ශෛක්ෂ තෙම සමාධිය වඩනුයේ කවර අටඅයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි යත්:

ආවර්ජනා කළ බැවින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි ... උපෙක්ෂා–වට එළඹසිටීමෙහි නිපුණ වෙයි. (නෛෂ්ක්‍රම්‍යාදි) එකත්වයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ශෛක්ෂ තෙම සමාධිය වඩනුයේ මේ අටඅයුරින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ.

වීතරාග තෙම සමාධිය වඩනුයේ කවර දස අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි යත්:

ආවර්ජනා කළ බැවින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි ... එකත්වයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, (අසම්මොහ) ඥානයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, (අර්හත්ඵල) විමුක්තියට එළඹසිටීමෙහි නිපුණ වෙයි. වීතරාග තෙම සමාධිය වඩනුයේ මේ දස අයුරින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ.

පෘථග්ජන තෙම විදර්ශනා වඩනුයේ කිහි අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, කිහි අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ ද, ශෛක්ෂ තෙම විදර්ශනා වඩනුයේ කිහි අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, කිහි අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ ද, වීතරාග (රහත්) තෙම විදර්ශනා වඩනුයේ කිහි අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, කිහි අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ ද යත්:

පෘථග්ජන තෙම විදර්ශනා වඩනුයේ නව අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, නව අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. ශෛක්ෂ තෙම විදර්ශනා වඩනුයේ දස අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, දස අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. වීතරාග තෙම විදර්ශනා වඩනුයේ දොළොස් අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, දොළොස් අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ.

පෘථග්ජන තෙම විදර්ශනා වඩනුයේ කවර නව අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, කවර නව අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ ද යත්:

අනිත්‍ය විසින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, නිත්‍ය විසින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. දුඃඛ විසින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, සුඛ විසින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. අනාත්ම විසින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ආත්ම විසින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. ක්ෂය විසින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ඝන විසින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි, ව්‍යය විසින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ආයූහනයට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. විපරිණාමයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ධ්‍රැව විසින් නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. අනිමිත්තයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, නිමිත්තයට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. අප්‍රණිහිතයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, ප්‍රණිධියට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි, ශූන්‍යතයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, අභිනිවෙශයට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. පෘථග්ජන තෙම විදර්ශනා වඩනුයේ මේ නවඅයුරින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, මේ නවඅයුරින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ.

සෙක්ඛො විපස්සනං භාවෙන්තො කතමෙහි දසහා'කාරෙහි උපට්ඨානකුසලො හොති, කතමෙහි දසහා'කාරෙහි අනුපට්ඨානකුසලො හොති:

අනිච්චතො උපට්ඨානකුසලො හොති, නිච්චතො අනුපට්ඨානකුසලො හොති -පෙ- සුඤ්ඤතුපට්ඨානකුසලො හොති, අභිනිවෙසානුපට්ඨානකුසලො හොති. ඤාණුපට්ඨානකුසලො හොති, අඤ්ඤාණානුපට්ඨානකුසලො හොති. සෙක්ඛො විපස්සනං භාවෙන්තො ඉමෙහි දසහාකාරෙහි උපට්ඨානකුසලො හොති, ඉමෙහි දසහාකාරෙහි අනුපට්ඨානකුසලො හොති.

වීතරාගො විපස්සනං භාවෙන්තො කතමෙහි ද්වාදසහි ආකාරෙහි උපට්ඨානකුසලො හොති, කතමෙහි ද්වාදසහි ආකාරෙහි අනුපට්ඨානකුසලො හොති:

අනිච්චතො උපට්ඨානකුසලො හොති, නිච්චතො අනුපට්ඨානකුසලො හොති -පෙ- ඤාණුපට්ඨානකුසලො හොති, අඤ්ඤාණානුපට්ඨානකුසලො හොති, විසඤ්ඤොගුපට්ඨානකුසලො හොති, සඤ්ඤොගානුපට්ඨානකුසලො හොති. නිරොධුපට්ඨානකුසලො හොති, සඞ්ඛාරානුපට්ඨානකුසලො හොති. වීතරාගො විපස්සනං භාවෙන්තො ඉමෙහි ද්වාදසහි ආකාරෙහි උපට්ඨානකුසලො හොති, ඉමෙහි ද්වාදසහි ආකාරෙහි අනුපට්ඨානකුසලො හොති.

ආවජ්ජිතත්තා ආරම්මණුපට්ඨානකුසලවසෙන ඉන්ද්‍රියානි සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති, -පෙ- ධම්මෙ සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති.

**ඉන්ද්‍රියානි සමොධානෙතීති** කථං ඉන්ද්‍රියානි සමොධානෙති: අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං සමොධානෙති, -පෙ- සමථනිමිත්තුපට්ඨානකුසලවසෙන -පෙ- පග්ගහනිමිත්තුපට්ඨානකුසලවසෙන -පෙ- අවික්ඛෙපුපට්ඨානකුසලවසෙන -පෙ- ඔභාසුපට්ඨානකුසලවසෙන -පෙ- සම්පහංසනුපට්ඨානකුසලවසෙන -පෙ- උපෙක්ඛුපට්ඨානකුසලවසෙන -පෙ- එකත්තුපට්ඨානකුසලවසෙන -පෙ- ඤාණුපට්ඨානකුසලවසෙන -පෙ- විමුත්තුපට්ඨාන[1] කුසලවසෙන -පෙ-.

අනිච්චතො උපට්ඨානකුසලවසෙන -පෙ- නිච්චතො අනුපට්ඨානකුසලවසෙන -පෙ- දුක්ඛතො උපට්ඨානකුසලවසෙන -පෙ- සුඛතො අනුපට්ඨානකුසලවසෙන -පෙ- අනත්තතො උපට්ඨානකුසලවසෙන -පෙ- අත්තතො අනුපට්ඨානකුසලවසෙන -පෙ- ඛයතො උපට්ඨානකුසලවසෙන -පෙ- ඝනතො අනුපට්ඨානකුසලවසෙන -පෙ- වයතො උපට්ඨානකුසලවසෙන -පෙ- ආයූහනානුපට්ඨානකුසලවසෙන -පෙ- විපරිණාමුපට්ඨානකුසලවසෙන -පෙ- ධුවතො අනුපට්ඨානකුසලවසෙන -පෙ- අනිමිත්තුපට්ඨානකුසලවසෙන -පෙ- නිමිත්තානුපට්ඨානකුසලවසෙන -පෙ- අප්පණිහිතුපට්ඨානකුසලවසෙන -පෙ- පණිධානුපට්ඨාන[2] කුසලවසෙන -පෙ- සුඤ්ඤතුපට්ඨානකුසලවසෙන -පෙ- අභිනිවෙසානුපට්ඨානකුසලවසෙන -පෙ- ඤාණුපට්ඨානකුසලවසෙන -පෙ- අඤ්ඤාණානුපට්ඨානකුසලවසෙන -පෙ- විසඤ්ඤොගුපට්ඨානකුසලවසෙන -පෙ- සඤ්ඤොගානුපට්ඨානකුසලවසෙන -පෙ- නිරොධුපට්ඨානකුසලවසෙන -පෙ- සඞ්ඛාරානුපට්ඨානකුසලවසෙන ඉන්ද්‍රියානි සමොධානෙති, ගොචරඤ්ච පජානාති, සමත්ථඤ්ච පටිවිජ්ඣති.

---

1 විත්තුපට්ඨාන - ස්‍යා, 2. පණිධිඅනුපට්ඨාන - මජසං

ශෛක්‍ෂ තෙම විදර්ශනා වඩනුයේ කවර දසඅයුරෙකින් අරමුණට එළඹ සිටීමෙහි නිපුණ වේ ද, කවර දසඅයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ ද යත්:

අනිත්‍ය විසින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, නිත්‍ය විසින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි ... ශූන්‍යතයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, අභිනිවේශයට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. ඥානයට එළඹසිටීමෙහි නිපුණ වෙයි, අඥානයට නො එළඹසිටීමෙහි නිපුණ වෙයි. ශෛක්‍ෂ තෙම විදර්ශනා වඩනුයේ මේ දසඅයුරින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, මේ දසඅයුරින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ.

වීතරාග තෙම විදර්ශනා වඩනුයේ කවර දෙළොස්අයුරෙකින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වේ ද, කවර දෙළොස්අයුරෙකින් අරමුණට නො එළඹසිටීමෙහි නිපුණ වේ ද යත්:

අනිත්‍ය විසින් අරමුණට එළඹසිටීමෙහි නිපුණ වෙයි, නිත්‍ය විසින් අරමුණට නො එළඹීමෙහි නිපුණ වෙයි ... ඥානයට එළඹීමෙහි නිපුණ වෙයි, අඥානයට නො එළඹීමෙහි නිපුණ වෙයි. විසංයොගයට එළඹීමෙහි නිපුණ වෙයි, සංයොගයට නො එළඹීමෙහි නිපුණ වෙයි. නිරොධයට එළඹීමෙහි නිපුණ වෙයි, සංස්කාරයනට නො එළඹීමෙහි නිපුණ වෙයි. වීතරාග තෙම විදර්ශනා වඩනුයේ මේ දෙළොස් අයුරින් අරමුණට එළඹීමෙහි නිපුණ වෙයි, මේ දෙළොස් අයුරින් අරමුණට නො එළඹීමෙහි නිපුණ වේ.

ආවර්ජනා කළ බැවින් ආලම්බනොපස්ථානයෙහි කෞශල්‍ය (නිපුණ බව) වශයෙන් ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි, (අරමුණෙහි පිහිටුවයි) අරමුණ ද දැනගනී, ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරෙයි ... ධර්මයන් සමවධාන කෙරෙයි, අරමුණ ද දැනගනී, ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරේ.

**ඉන්ද්‍රියානි සමොධානෙති** යනු: කිසෙසින් ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි යත්: අධිමොක්‍ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය සමවධාන කෙරෙයි ... සමථනිමිත්තොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... ප්‍රග්‍රහනිමිත්තොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... අවික්ෂෙපොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... අවභාසොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... සම්ප්‍රහර්ෂණොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... උපෙක්‍ෂොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... ඒකත්වොපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ... ඥානොපස්ථානයෙහි කෞශල්‍ය වශයෙන් ... විමුක්ත්‍යුපස්ථානයෙහි කෞශල්‍යවශයෙන් ...

අනිත්‍ය විසින් අරමුණට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... නිත්‍ය විසින් අරමුණට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... දුඃඛ විසින් අරමුණට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... සුඛ විසින් අරමුණට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... අනාත්ම විසින් අරමුණට එළඹීමෙහි කෞශල්‍ය වශයෙන් ... ආත්ම විසින් අරමුණට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ක්‍ෂය විසින් අරමුණට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ඝන විසින් අරමුණට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ව්‍යය විසින් අරමුණට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ආයූහනයට නො එළඹීමෙහි කෞශල්‍ය වශයෙන් ... විපරිණාමයට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ධ්‍රැව විසින් අරමුණට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... අනිමිත්තයට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... නිමිත්තයට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... අප්‍රණිහිතයට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ප්‍රණිධියට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ශූන්‍යතයට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... අභිනිවේශයට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ඥානයට එළඹසිටීමෙහි කෞශල්‍යවශයෙන් ... අඥානයට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... විසංයොගයට එළඹසිටීමෙහි කෞශල්‍යවශයෙන් ... සංයොගයට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... නිරොධයට එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... සංස්කාරයනට නො එළඹීමෙහි කෞශල්‍යවශයෙන් ... ඉන්ද්‍රියයන් සමවධාන කෙරෙයි, අරමුණ ද දැනගනී, ශමාර්ථය ද ප්‍රතිවෙධ කෙරේ.

චතුසට්ඨියා ආකාරෙහි තිණ්ණන්නං ඉන්ද්‍රියානං වසීභාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං, කතමෙසං තිණ්ණන්නං ඉන්ද්‍රියානං: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස අඤ්ඤින්ද්‍රියස්ස අඤ්ඤාතාවින්ද්‍රියස්ස.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං කති ඨානානි ගච්ඡති, අඤ්ඤින්ද්‍රියං කති ඨානානි ගච්ඡති, අඤ්ඤාතාවින්ද්‍රියං කති ඨානානි ගච්ඡති:

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං එකං ඨානං ගච්ඡති, සොතාපත්තිමග්ගං. අඤ්ඤින්ද්‍රියං ඡ ඨානානි ගච්ඡති, සොතාපත්තිඵලං. සකදාගාමිමග්ගං සකදාගාමිඵලං අනාගාමිමග්ගං අනාගාමිඵලං අරහත්තමග්ගං, අඤ්ඤාතාවින්ද්‍රියං එකං ඨානං ගච්ඡති, අරහත්තඵලං.

සොතාපත්තිමග්ගක්ඛණෙ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛපරිවාරං හොති, විරියින්ද්‍රියං පග්ගහපරිවාරං හොති, සතින්ද්‍රියං උපට්ඨානපරිවාරං හොති, සමාධින්ද්‍රියං අවික්ඛෙපපරිවාරං හොති, පඤ්ඤින්ද්‍රියං දස්සනපරිවාරං හොති, මනින්ද්‍රියං විජානනපරිවාරං හොති, සොමනස්සින්ද්‍රියං අභිසන්දනපරිවාරං[1] හොති, ජීවිතින්ද්‍රියං පවත්තසන්තතාධිපතෙය්‍යපරිවාරං හොති. සොතාපත්තිමග්ගක්ඛණෙ ජාතා ධම්මා සබ්බෙව කුසලා හොන්ති ඨපෙත්වා චිත්තසමුට්ඨානං රූපං, සබ්බෙව අනාසවා හොන්ති, සබ්බෙව නිය්‍යානිකා හොන්ති, සබ්බෙව අපචයගාමිනො හොන්ති, සබ්බෙව ලොකුත්තරා හොන්ති, සබ්බෙව නිබ්බානාරම්මණා හොන්ති. සොතාපත්තිමග්ගක්ඛණෙ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස ඉමානි අට්ඨින්ද්‍රියානි සහජාතපරිවාරා හොන්ති, අඤ්ඤමඤ්ඤපරිවාරා හොන්ති, නිස්සයපරිවාරා හොන්ති, සම්පයුත්තපරිවාරා හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති. තෙව තස්ස ආකාරා චෙව හොන්ති පරිවාරා ච.[2]

සොතාපත්තිඵලක්ඛණෙ -පෙ- අරහත්තඵලක්ඛණෙ අඤ්ඤාතාවින්ද්‍රියස්ස සද්ධින්ද්‍රියං අධිමොක්ඛපරිවාරං හොති -පෙ- ජීවිතින්ද්‍රියං පවත්තසන්තතාධිපතෙය්‍යපරිවාරං හොති. අරහත්තඵලක්ඛණෙ ජාතා ධම්මා සබ්බෙව අබ්‍යාකතා හොන්ති ඨපෙත්වා චිත්තසමුට්ඨානං රූපං, සබ්බෙව අනාසවා හොන්ති, සබ්බෙව ලොකුත්තරා හොන්ති, සබ්බෙව නිබ්බානාරම්මණා හොන්ති. අරහත්තඵලක්ඛණෙ අඤ්ඤාතාවින්ද්‍රියස්ස ඉමානි අට්ඨින්ද්‍රියානි සහජාතපරිවාරා හොන්ති. -පෙ- තෙව තස්ස ආකාරා චෙව හොන්ති පරිවාරා ච. ඉති ඉමානි අට්ඨට්ඨකානි[3] චතුසට්ඨි හොන්ති.

**ආසවාති** කතමෙ තෙ ආසවා: කාමාසවො භවාසවො දිට්ඨාසවො අවිජ්ජාසවො.

කත්ථෙතෙ ආසවා ඛීයන්ති: සොතාපත්තිමග්ගෙන අනවසෙසො දිට්ඨාසවො ඛීයති, අපායගමනීයො කාමාසවො ඛීයති, අපායගමනීයො භවාසවො ඛීයති, අපායගමනීයො අවිජ්ජාසවො ඛීයති; එත්ථෙ'තෙ ආසවා ඛීයන්ති. සකදාගාමිමග්ගෙන ඔළාරිකො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති. එත්ථෙ'තෙ ආසවා ඛීයන්ති. අනාගාමිමග්ගෙන අනවසෙසො කාමාසවො ඛීයති, තදෙකට්ඨො භවාසවො ඛීයති, තදෙකට්ඨො අවිජ්ජාසවො ඛීයති. එත්ථෙ'තෙ ආසවා ඛීයන්ති; අරහත්තමග්ගෙන අනවසෙසො භවාසවො ඛීයති, අනවසෙසො අවිජ්ජාසවො ඛීයති. එත්ථෙ'තෙ ආසවා ඛීයන්ති.

---

1 අභිනන්දනපරිවාරං - ස්‍යා, PTS 2. පරිවාරා - සී 1, 3. අට්ඨකානි - PTS, අට්ඨඅට්ඨකානි - මජසං, අට්ඨාධිකානි - සී 1

සූසැට අයුරෙකින් තුන් ඉන්ද්‍රියයන්ගේ වශීභාවයෙහි පැවැති ප්‍රඥාව ආශ්‍රවයන්ගේ ක්‍ෂයඥාන වෙයි. කවර තුන් ඉන්ද්‍රිය කෙනකුන්ගේ ද යත්: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියයාගේ යැ අඤ්ඤින්ද්‍රියයාගේ යැ අඤ්ඤාතාවින්ද්‍රියයාගේ යි.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය කිහි තැනෙක උපදී ද, අඤ්ඤින්ද්‍රිය කිහි තැනෙක උපදී ද, අඤ්ඤාතාවින්ද්‍රිය කිහි තැනෙක උපදී ද යත්:

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය එක් තැනෙක උපදී· සෝතාපත්තිමාර්ගයෙහි යැ, අඤ්ඤින්ද්‍රිය සතැනෙක උපදී: ස්‍රොතාපත්තිඵලයෙහි යැ සකෘදාගාමිමාර්ගයෙහි යැ සකෘදාගාමිඵලයෙහි යැ අනාගාමිමාර්ගයෙහි යැ අනාගාමිඵලයෙහි යැ අර්හත්මාර්ගයෙහි යි. අඤ්ඤාතාවින්ද්‍රිය එක් තැනෙක උපදී: අර්හත්ඵලයෙහි යි.

ස්‍රොතාපත්තිමාර්ගක්‍ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ අධිමොක්‍ෂාර්ථයෙන් පිරිවර වෙයි, වීර්‍ය්‍යෙන්ද්‍රිය තෙමේ ප්‍රග්‍රහාර්ථයෙන් පිරිවර වෙයි, ස්මෘතීන්ද්‍රිය තෙමේ උපස්ථානාර්ථයෙන් පිරිවර වෙයි, සමාධීන්ද්‍රිය තෙමේ අවික්‍ෂෙපාර්ථයෙන් පිරිවර වෙයි, ප්‍රඥෙන්ද්‍රිය තෙමේ දර්ශනාර්ථයෙන් පිරිවර වෙයි, මනින්ද්‍රිය තෙමේ විජානනාර්ථයෙන් පිරිවර වෙයි, සෞමනස්සින්ද්‍රිය තෙමේ අභිසන්දන (චිත්තචෛතසිකයන් තෙමන) අර්ථයෙන් පිරිවර වෙයි, ජීවිතින්ද්‍රිය තෙමේ ප්‍රවෘත්තිසන්තතියට අධිපති භාවයෙන් පිරිවර වෙයි, ස්‍රොතාපත්තිමාර්ගක්‍ෂණයෙහි උපන් ධර්මයෝ චිත්තසමුට්ඨානරූපය තබා සියල්ලෝ මැ කුසල් වෙති, සියල්ලෝ මැ අනාස්‍රව වෙති, සියල්ලෝ මැ නෛර්‍ය්‍යාණික වෙති, සියල්ලෝ මැ අපචයගාමී වෙති, සියල්ලෝ මැ ලොකොත්තර වෙති, සියල්ලෝ මැ නිර්වාණාලම්බන වෙති, ස්‍රොතාපත්තිමාර්ගක්‍ෂණයෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට මේ අෂ්ටෙන්ද්‍රියයෝ සහජාතභාවයෙන් පිරවර වෙති, අන්‍යෝන්‍යභාවයෙන් පිරිවර වෙති. නිශ්‍රයභාවයෙන් පිරවර වෙති, සම්ප්‍රයුක්තභාවයෙන් පිරිවර වෙති, සහගත වෙති, සහජාත වෙති, සංසෘෂ්ට වෙති, සම්ප්‍රයුක්ත වෙති, ඒ අෂ්ටෙන්ද්‍රිය ධර්මයෝ මැ ඒ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියට ආකාර ද පරිවාර ද වෙත්.

ස්‍රොතාපත්තිඵලක්‍ෂණයෙහි ... අර්හත්ඵලක්‍ෂණයෙහි අඤ්ඤාතාවින්ද්‍රියට ශ්‍රද්ධෙන්ද්‍රිය තෙමේ අධිමොක්‍ෂාර්ථයෙන් පිරිවර වෙයි ... ජීවිතින්ද්‍රිය තෙමේ ප්‍රවෘත්තිසන්තතියට අධිපතිභාවයෙන් පිරිවර වෙයි, අර්හත්ඵලක්‍ෂණයෙහි උපන් ධර්මයෝ චිත්තසමුට්ඨානරූපය තබා සියල්ලෝ මැ අව්‍යාකෘත වෙති, සියල්ලෝ මැ අනාස්‍රව වෙති, සියල්ලෝ මැ ලොකොත්තර වෙති, සියල්ලෝමැ නිර්වාණාලම්බන වෙති, අර්හත්ඵලක්‍ෂණයෙහි අඤ්ඤාතාවින්ද්‍රියට මේ අෂ්ටෙන්ද්‍රියයෝ සහජාතභාවයෙන් පිරිවර වෙති ... ඒ ධර්මයෝ මැ ඒ අඤ්ඤාතාවින්ද්‍රියට ආකාර ද පරිවාර ද වෙති. මෙසේ මේ අෂ්ටකයෝ අටදෙන සූසැටක් වෙත්.

**ආසවා** යනු: ඒ ආස්‍රවයෝ කවරහ යත්: කාමාස්‍රව යැ භවාස්‍රව යැ දෘෂ්ට්‍යාස්‍රව යැ අවිද්‍යාස්‍රව යි.

කොතැන්හි තෙල ආස්‍රවයෝ ක්‍ෂය වෙත් යත්: ස්‍රොතාපත්තිමාර්ගයෙන් නිරවශෙෂ වූ දෘෂ්ට්‍යාස්‍රවය ක්‍ෂය වෙයි. අපායගමනීය වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි, අපායගමනීය වූ භවාස්‍රවය ක්‍ෂය වෙයි, අපායගමනීය වූ අවිද්‍යාස්‍රවය ක්‍ෂය වෙයි, මෙතැන්හි තෙල ආස්‍රවයෝ ක්‍ෂය වෙති. සකෘදාගාමිමාර්ගයෙන් ඖදාරික වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි, එය හා සමග එක් වැ සිටි භවාස්‍රවය ක්‍ෂය වෙයි, එය හා සමග එක් වැ සිටි අවිද්‍යාස්‍රවය ක්‍ෂය වෙයි, මෙතැන්හි තෙල ආස්‍රවයෝ ක්‍ෂය වෙති, අනාගාමිමාර්ගයෙන් නිරවශෙෂ වූ කාමාස්‍රවය ක්‍ෂය වෙයි, තදෙකස්ථ වූ භවාස්‍රවය ක්‍ෂය වෙයි, තදෙකස්ථ වූ අවිද්‍යාස්‍රවය ක්‍ෂය වෙයි, මෙතැන්හි තෙල ආස්‍රවයෝ ක්‍ෂය වෙති, අර්හත්මාර්ගයෙන් නිරවශෙෂ වූ භවාස්‍රවය ක්‍ෂය වෙයි, නිරවශෙෂ වූ අවිද්‍යාස්‍රවය ක්‍ෂය වෙයි, මෙතැන්හි තෙල ආස්‍රවයෝ ක්‍ෂය වෙත්.

න තස්ස අද්දිට්ඨ[1]මිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං,
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි නෙය්‍යං
තථාගතො තෙන සමන්තචක්ඛූ'ති.

**සමන්තචක්ඛූති** කෙනට්ඨෙන සමන්තචක්ඛු: චුද්දස බුද්ධඤාණානි: දුක්ඛෙ ඤාණං බුද්ධඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං බුද්ධඤාණං, -පෙ- සබ්බඤ්ඤුතඤාණං බුද්ධඤාණං, අනාවරණඤාණං බුද්ධඤාණං, ඉමානි චුද්දස බුද්ධඤාණානි. ඉමෙසං චුද්දසන්නං බුද්ධඤාණානං අට්ඨ ඤාණානි සාවකසාධාරණානි, ඡ ඤාණානි අසාධාරණානි සාවකෙහි.

'යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨො ඤාතො, අඤ්ඤාතො දුක්ඛට්ඨො නත්ථී'ති සමන්තචක්ඛු. යං සමන්තචක්ඛු, තං පඤ්ඤින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං.

'යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය දුක්ඛට්ඨො නත්ථී'ති සමන්තචක්ඛු. යං සමන්තචක්ඛු, තං පඤ්ඤින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං.

'යාවතා සමුදයස්ස සමුදයට්ඨො -පෙ- යාවතා නිරොධස්ස නිරොධට්ඨො -පෙ- යාවතා මග්ගස්ස මග්ගට්ඨො -පෙ- යාවතා අත්ථපටිසම්භිදාය අත්ථපටිසම්භිදට්ඨො -පෙ- යාවතා ධම්මපටිසම්භිදාය ධම්මපටිසම්භිදට්ඨො -පෙ- යාවතා නිරුත්තිපටිසම්භිදාය නිරුත්තිපටිසම්භිදට්ඨො -පෙ- යාවතා පටිභානපටිසම්භිදාය පටිභානපටිසම්භිදට්ඨො -පෙ- යාවතා ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං -පෙ- යාවතා සත්තානං ආසයානුසයෙ ඤාණං -පෙ- යාවතා යමකපාටිහීරෙ ඤාණං -පෙ- යාවතා මහාකරුණාසමාපත්තියා ඤාණං -පෙ- යාවතා සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තං[2] ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය, අඵස්සිතං පඤ්ඤාය නත්ථී'ති සමන්තචක්ඛු. යං සමන්තචක්ඛු, තං පඤ්ඤින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං, පග්ගහට්ඨෙන විරියින්ද්‍රියං, උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං, අවික්ඛෙපට්ඨෙන සමාධින්ද්‍රියං.

---

1. අදිට්ඨ - ස්‍යා, PTS.
2. 'තං' ඉති - ස්‍යා PTS, පොත්ථකෙසු නත්ථි.

ඒ තථාගතයන් වහන්සේ විසින් නුවණැසින් නො දක්නා කිසි ධර්මජාතයෙක් මේ ත්‍රෛධාතුකලොකධාතුයෙහි නැත, තවද නො දත් (අනාගතයෙහි) නො දතයුතු කිසි ධර්මජාතයෙක් නැත, දතයුතු වූ යම් ධර්මජාතයෙක් ඇද්ද ඒ සියල්ල වෙසෙසින් දතුවහ. එහෙයින් තථාගතයන් වහන්සේ 'සමන්තචක්ඛු' නම් වෙත්.

**සමන්තචක්ඛු** යනු: කවර අරුතින් 'සමන්තචක්ඛු' වෙයි යත්: බුද්ධඥාන තුදුසෙකි: දුඃඛසත්‍යයෙහි ඥානය බුද්ධඥාන යැ දුඃඛසමුදයසත්‍ය-යෙහි ඥානය බුද්ධඥාන යැ ... සර්වඥතාඥානය බුද්ධඥාන යැ අනාවරණඥානය බුද්ධඥාන යි. මොහු තුදුස් බුද්ධඥානයෝ යි. මේ තුදුස් බුද්ධඥානයන් අතුරින් ඥානයෝ අටදෙනෙක් ශ්‍රාවකසාධාරණ වෙති. ඥානයෝ සදෙනෙක් ශ්‍රාවකයන් හා සමග අසාධාරණ වෙත්.

යම් පමණ දුඃඛයාගේ දුඃඛාර්ථය වේ ද ඒ දත්නාලද යැ නො දත්නාලද දුඃඛාර්ථයෙක් නැත් නු යි 'සමන්තචක්ඛු' යැ යමක් සමන්තචක්ඛු වේ ද ඒ ප්‍රඥෙන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රිය වෙයි, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය වෙයි, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය වේ.

යම් පමණ දුඃඛයාගේ දුඃඛාර්ථය වේ ද ඒ දක්නාලද යැ ප්‍රකට කරන ලද යැ සාක්ෂාත් කරනලද යැ ප්‍රඥයෙන් පහස්නාලද යැ ප්‍රඥයෙන් නො පහස්නාලද දුඃඛාර්ථයෙක් නැත් නු යි 'සමන්තචක්ඛු' යැ. යමක් 'සමන්ත-චක්ඛු' වේ ද, ඒ ප්‍රඥෙන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථ-යෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රිය වෙයි, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය වෙයි, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය වේ.

යම් පමණ සමුදයයාගේ සමුදයාර්ථය වේ ද ... යම් පමණ නිරොධයාගේ නිරොධාර්ථය වේ ද ... යම් පමණ මාර්ගයාගේ මාර්ගාර්ථය වේ ද ... යම් පමණ අර්ථප්‍රතිසංවිදාවගේ අර්ථප්‍රතිසංවිදාර්ථය වේ ද ... යම් පමණ ධර්මප්‍රතිසංවිදාවගේ ධර්මප්‍රතිසංවිදාර්ථය වේ ද ... යම් පමණ නිරුක්තිප්‍රතිසංවිදාවගේ නිරුක්ති-ප්‍රතිසංවිදාර්ථය වේ ද ... යම් පමණ ප්‍රතිභානප්‍රතිසංවිදාවගේ ප්‍රතිභානප්‍රතිසං-විදාර්ථය වේ ද ... යම් පමණ ඉන්ද්‍රියපරාවරතාඥානය වේ ද ... යම් පමණ සත්ත්වයන්ගේ ආශය අනුශය දන්නා ඥානය වේ ද ... යම් පමණ යමක-ප්‍රාතිහාර්‍ය්‍යඥානය වේ ද ... යම් පමණ මහාකරුණාසමාපත්තිඥානය වේ ද ... යම් පමණ මරුන් සහිත වූ බඹුන් සහිත වූ සදෙවකාලොකයා විසින් මහණ බමුණන් සහිත වූ දෙවිමිනිසුන් සහිත වූ ප්‍රජාව විසින් දක්නාලද රූපායත-නයෙක් අසනලද ශබ්දායතනයෙක් ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍යායතනයෙක් දත්නා ලද ධර්මායතනයෙක් (සොයා හෝ නො සොයා හෝ) ලබනලද්දෙක් (ලබන ලද හෝ නො ලබනලද හෝ) සොයන ලද්දෙක් සිතින් විමසනලද්දෙක් වේ ද ඒ දත්නාලද යැ දක්නාලද යැ ප්‍රකට කරනලද යැ සාක්ෂාත් කරන ලද යැ ප්‍රඥයෙන් පහස්නාලද යැ, ප්‍රඥයෙන් නො පහස්නාලද්දෙක් නැත් නු යි 'සමන්තචක්ඛු' යැ. යමක් 'සමන්තචක්ඛු' වේ ද, ඒ ප්‍රඥෙන්ද්‍රිය වෙයි, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය වෙයි, ප්‍රග්‍රහාර්ථයෙන් වීර්‍ය්‍යෙන්ද්‍රිය වෙයි, උපස්ථානාර්ථයෙන් ස්මෘතීන්ද්‍රිය වෙයි, අවික්ෂෙපාර්ථයෙන් සමාධීන්ද්‍රිය වේ.

සද්දහන්තො පග්ගණ්හාති, පග්ගණ්හන්තො සද්දහති. සද්දහන්තො උපට්ඨාපෙති, උපට්ඨාපෙන්තො සද්දහති. සද්දහන්තො සමාදහති, සමාදහන්තො සද්දහති සද්දහන්තො පජානාති, පජානන්තො සද්දහති. පග්ගණ්හන්තො උපට්ඨාපෙති, උපට්ඨාපෙන්තො පග්ගණ්හාති. පග්ගණ්හන්තො සමාදහති, සමාදහන්තො පග්ගණ්හාති. පග්ගණ්හන්තො පජානාති, පජානන්තො පග්ගණ්හාති. පග්ගණ්හන්තො සද්දහති, සද්දහන්තො පග්ගණ්හාති. උපට්ඨාපෙන්තො සමාදහති, සමාදහන්තො උපට්ඨාපෙති. උපට්ඨාපෙන්තො පජානාති, පජානන්තො උපට්ඨාපෙති. උපට්ඨාපෙන්තො සද්දහති, සද්දහන්තො උපට්ඨාපෙති. උපට්ඨාපෙන්තො පග්ගණ්හාති, පග්ගණ්හන්තො උපට්ඨාපෙති. සමාදහන්තො පජානාති, පජානන්තො සමාදහති. සමාදහන්තො සද්දහති, සද්දහන්තො සමාදහති. සමාදහන්තො පග්ගණ්හාති, පග්ගණ්හන්තො සමාදහති. සමාදහන්තො උපට්ඨාපෙති, උපට්ඨාපෙන්තො සමාදහති. පජානන්තො සද්දහති, සද්දහන්තො පජානාති. පජානන්තො පග්ගණ්හාති, පග්ගණ්හන්තො පජානාති. පජානන්තො උපට්ඨාපෙති උපට්ඨාපෙන්තො පජානාති. පජානන්තො සමාදහති, සමාදහන්තො පජානාති.

සද්දහිතත්තා පග්ගහිතං, පග්ගහිතත්තා සද්දහිතං; සද්දහිතත්තා උපට්ඨාපිතං, උපට්ඨාපිතත්තා සද්දහිතං; සද්දහිතත්තා සමාදහිතං, සමාදහිතත්තා සද්දහිතං; සද්දහිතත්තා පජානිතං, පජානිතත්තා සද්දහිතං; පග්ගහිතත්තා උපට්ඨාපිතං, උපට්ඨාපිතත්තා පග්ගහිතං; පග්ගහිතත්තා සමාදහිතං, සමාදහිතත්තා පග්ගහිතං; පග්ගහිතත්තා පජානිතං, පජානිතත්තා පග්ගහිතං; පග්ගහිතත්තා සද්දහිතං, සද්දහිතත්තා පග්ගහිතං; උපට්ඨාපිතත්තා සමාදහිතං, සමාදහිතත්තා උපට්ඨාපිතං; උපට්ඨාපිතත්තා පජානිතං, පජානිතත්තා උපට්ඨාපිතං; උපට්ඨාපිතත්තා සද්දහිතං, සද්දහිතත්තා උපට්ඨාපිතං; උපට්ඨාපිතත්තා පග්ගහිතං, පග්ගහිතත්තා උපට්ඨාපිතං; සමාදහිතත්තා පජානිතං, පජානිතත්තා සමාදහිතං; සමාදහිතත්තා සද්දහිතං, සද්දහිතත්තා සමාදහිතං; සමාදහිතත්තා පග්ගහිතං, පග්ගහිතත්තා සමාදහිතං; සමාදහිතත්තා උපට්ඨාපිතං, උපට්ඨාපිතත්තා සමාදහිතං; පජානිතත්තා සද්දහිතං, සද්දහිතත්තා පජානිතං; පජානිතත්තා පග්ගහිතං, පග්ගහිතත්තා පජානිතං; පජානිතත්තා උපට්ඨාපිතං, උපට්ඨාපිතත්තා පජානිතං; පජානිතත්තා සමාදහිතං, සමාදහිතත්තා පජානිතං.

යං බුද්ධචක්ඛු, තං බුද්ධඤාණං; යං බුද්ධඤාණං, තං බුද්ධචක්ඛු, යෙන චක්ඛුනා තථාගතො සත්තෙ පස්සති අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො[1] අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො.

1. භයදස්සාවිනො – සයා,

හදහනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ හදහයි, හදහනුයේ (අරමුණෙහි සිත) එළවයි, (අරමුණෙහි සිත) එළවනුයේ හදහයි, හදහනුයේ සිත පිහිටුවයි, සිත පිහිටුවනුයේ හදහයි, හදහනුයේ දැනගනී, දැනගනුයේ හදහයි, ප්‍රග්‍රහ කරනුයේ සිත එළවයි, සිත එළවනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ සිත පිහිටුවයි, සිත පිහිටුවනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ දැනගනී, දැනගනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ හදහයි, හදහනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, සිත් එළවනුයේ සිත පිහිටුවයි. සිත පිහිටුවනුයේ සිත එළවයි, සිත එළවනුයේ දැනගනී, දැනගනුයේ සිත එළවයි, සිත එළවනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ සිත එළවයි, සිත පිහිටුවනුයේ දැනගනී, දැනගනුයේ සිත පිහිටුවයි, සිත පිහිටුවනුයේ හදහයි, හදහනුයේ සිත පිහිටුවයි, සිත පිහිටුවනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ සිත පිහිටුවයි, සිත පිහිටුවනුයේ සිත එළවයි, සිත එළවනුයේ සිත පිහිටුවයි, දැනගනුයේ හදහයි, හදහනුයේ දැනගනී, දැනගනුයේ ප්‍රග්‍රහ කෙරෙයි, ප්‍රග්‍රහ කරනුයේ දැනගනී, දැනගනුයේ සිත එළවයි, සිත එළවනුයේ දැනගනී, දැනගනුයේ සිත පිහිටුවයි, සිත පිහිටුවනුයේ දැනගනී.

හදහනලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද, ප්‍රග්‍රහකරනලද වන බැවින් හදහනලද; හදහනලද වන බැවින් අරමුණෙහි එළවනලද, අරමුණෙහි එළවනලද වන බැවින් හදහනලද; හදහනලද වන බැවින් පිහිටුවනලද, පිහිටුවනලද වන බැවින් හදහනලද; හදහනලද වන බැවින් දත්නාලද, දත්නාලද වන බැවින් හදහනලද; ප්‍රග්‍රහ කරනලද වන බැවින් අරමුණෙහි එළවනලද, අරමුණෙහි එළවනලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද; ප්‍රග්‍රහ කරනලද වන බැවින් පිහිටුවනලද, පිහිටුවනලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද; ප්‍රග්‍රහ කරනලද වන බැවින් දත්නාලද, දත්නාලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද; ප්‍රග්‍රහ කරනලද වන බැවින් හදහනලද; හදහනලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද; අරමුණෙහි එළවනලද වන බැවින් පිහිටුවනලද, සමාදහිත බැවින් අරමුණෙහි එළවනලද; අරමු-ණෙහි එළවනලද වන බැවින් දත්නාලද; දත්නාලද වන බැවින් අරමුණෙහි එළවනලද; අරමුණෙහි එළවනලද වන බැවින් හදහනලද; හදහනලද වන බැවින් අරමුණෙහි එළවනලද; අරමුණෙහි එළවනලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද, ප්‍රග්‍රහ කරනලද වන බැවින් අරමුණෙහි එළවනලද; (අරමුණෙහි) පිහිටුවනලද වන බැවින් දත්නාලද, දත්නාලද වන බැවින් පිහිටුවනලද; පිහිටුවනලද වන බැවින් හදහනලද; හදහනලද වන බැවින් පිහිටුවනලද; පිහිටුවනලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද, ප්‍රග්‍රහ කරනලද වන බැවින් පිහිටුවනලද; පිහිටුවනලද වන බැවින් අරමුණෙහි එළවනලද, අරමුණෙහි එළවනලද වන බැවින් පිහිටුවනලද; දත්නාලද වන බැවින් හදහනලද, හදහනලද වන බැවින් දත්නාලද; දත්නාලද වන බැවින් ප්‍රග්‍රහ කරනලද, ප්‍රග්‍රහ කරනලද වන බැවින් දත්නාලද; දත්නාලද වන බැවින් අරමුණෙහි එළවනලද, අරමුණෙහි එළවනලද වන බැවින් දත්නාලද; දත්නාලද වන බැවින් පිහිටුවනලද, පිහිටුවනලද වන බැවින් දත්නාලද.

යමක් 'බුද්ධචක්ඛු' වේ ද, ඒ බුද්ධඥාන වෙයි, යමක් බුද්ධඥාන වේ ද, ඒ බුද්ධචක්ඛු වෙයි, යම් නුවණෙකින් තථාගතයන් වහන්සේ සත්ත්වයන් අල්ප වූ (රාගාදි) රජස් ඇතියන් මහත් වූ රාගාදි රජස් ඇතියන් තියුණු වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය ඇතියන් මෘදු වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය ඇතියන් සුන්දර වූ ශ්‍රද්ධාදි ආකාර ඇතියන් ගර්හිත වූ ශ්‍රද්ධාදි ආකාර ඇතියන් සුවසේ හැඟැවිය හැකි දුකසේ හැඟැවියහැකි ඇතැමකුත් පරලොකවද්‍යයෙහි භය දක්නාසුල්ලන් ඇතැමකුත් පරලොකවද්‍යයෙහි භය නො දක්නාසුල්ලන් දකිත් ද ඒ බුද්ධචක්ෂුස යි.

**අප්පරජක්ඛෙ මහාරජක්ඛෙති** සද්ධො පුග්ගලො අප්පරජක්ඛො, අස්සද්ධො පුග්ගලො මහාරජක්ඛො; ආරද්ධවිරියො පුග්ගලො අප්පරජක්ඛො, කුසීතො පුග්ගලො මහාරජක්ඛො; උපට්ඨිතස්සති[1], පුග්ගලො අප්පරජක්ඛො, මුට්ඨස්සති පුග්ගලො මහාරජක්ඛො; සමාහිතො පුග්ගලො අප්පරජක්ඛො, අසමාහිතො පුග්ගලො මහාරජක්ඛො; පඤ්ඤවා පුග්ගලො අප්පරජක්ඛො, දුප්පඤ්ඤො පුග්ගලො මහාරජක්ඛො.

**තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙති**. සද්ධො පුග්ගලො තික්ඛින්ද්‍රියො, අස්සද්ධො පුග්ගලො මුදින්ද්‍රියො -පෙ- පඤ්ඤවා පුග්ගලො තික්ඛින්ද්‍රියො, දුප්පඤ්ඤො පුග්ගලො මුදින්ද්‍රියො.

**ස්වාකාරෙ ද්වාකාරෙති** සද්ධො පුග්ගලො ස්වාකාරො, අස්සද්ධො පුග්ගලො ද්වාකාරො -පෙ- පඤ්ඤවා පුග්ගලො ස්වාකාරො, දුප්පඤ්ඤො පුග්ගලො ද්වාකාරො.

**සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙති** සද්ධො පුග්ගලො සුවිඤ්ඤාපයො, අස්සද්ධො පුග්ගලො දුවිඤ්ඤාපයො -පෙ- පඤ්ඤවා පුග්ගලො සුවිඤ්ඤාපයො, දුප්පඤ්ඤො පුග්ගලො දුවිඤ්ඤාපයො.

**අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනොති** සද්ධො පුග්ගලො පරලොකවජ්ජභයදස්සාවී, අස්සද්ධො පුග්ගලො න පරලොකවජ්ජභයදස්සාවී -පෙ- පඤ්ඤවා පුග්ගලො පරලොකවජ්ජභයදස්සාවී, දුප්පඤ්ඤො පුග්ගලො න පරලොකවජ්ජභයදස්සාවී.

**ලොකොති** ඛන්ධලොකො ධාතුලොකො ආයතනලොකො විපත්තිභවලොකො විපත්තිසම්භවලොකො සම්පත්තිභවලොකො සම්පත්තිසම්භවලොකො.

එකො ලොකො: සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා, ද්වෙ ලොකා: නාමඤ්ච රූපඤ්ච, තයො ලොකා: තිස්සො වෙදනා, චත්තාරො ලොකා: චත්තාරො ආහාරා, පඤ්ච ලොකා: පඤ්චුපාදානක්ඛන්ධා, ඡ ලොකා: ඡ අජ්ඣත්තිකානි ආයතනානි, සත්ත ලොකා: සත්ත විඤ්ඤාණට්ඨිතියො, අට්ඨ ලොකා: අට්ඨ ලොකධම්මා, නව ලොකා: නව සත්තාවාසා, දස ලොකා: දසායතනානි, ද්වාදස ලොකා: ද්වාදසායතනානි, අට්ඨාරස ලොකා: අට්ඨාරසධාතුයො.

**වජ්ජන්ති** සබ්බෙ කිලෙසා වජ්ජා, සබ්බෙ දුච්චරිතා වජ්ජා, සබ්බෙ අභිසඞ්ඛාරා වජ්ජා, සබ්බෙ භවගාමිකම්මා වජ්ජා. ඉති ඉමස්මිඤ්ච ලොකෙ ඉමස්මිඤ්ච වජ්ජෙ තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොන්ති, සෙය්‍යථාපි උක්ඛිත්තාසිකෙ වධකෙ.

ඉමෙහි පඤ්ඤාසාය ආකාරෙහි ඉමානි පඤ්චින්ද්‍රියානි ජානාති පස්සති අඤ්ඤාති පටිවිජ්ඣතීති.

**තතියො භාණවාරො.**

**ඉන්ද්‍රියකථා සමත්තා**

1. උපට්ඨිතස්සති - විසං.

**අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ** යනු: සැදැහැති පුද්ගල තෙම අල්පරජස්ක යැ සැදැහැ නැති පුද්ගල තෙම මහාරජස්ක යැ ආරබ්ධවීර්‍ය්‍ය ඇති පුද්ගල තෙම අල්පරජස්ක යැ කුසීත වූ පුද්ගල තෙම මහාරජස්ක යැ එළඹසිටි සිහි ඇති පුද්ගල තෙම අල්පරජස්ක යැ මුළාසිහි ඇති පුද්ගල තෙම මහාරජස්ක යැ සමාහිත වූ පුද්ගල තෙම අල්පරජස්ක යැ සමාහිත නො වූ පුද්ගල තෙම මහාරජස්ක යැ ප්‍රඥා ඇති පුද්ගල තෙම අල්පරජස්ක යැ ප්‍රඥා නැති පුද්ගල තෙම මහාරජස්ක යි.

**තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම තියුණු ඉන්ද්‍රිය ඇත්තේ යැ ශ්‍රද්ධා නැති පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යැ ... ප්‍රඥා ඇති පුද්ගල තෙම තියුණු ඉන්ද්‍රිය ඇත්තේ යැ ප්‍රඥා නැති පුද්ගල තෙම මෘදු වූ ඉන්ද්‍රිය ඇත්තේ යි.

**ස්වාකාරෙ ද්වාකාරෙ** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම සුන්දරආකාර ඇත්තේ යැ. ශ්‍රද්ධා නැති පුද්ගල තෙම ගර්හිත ආකාර ඇත්තේ යැ ... ප්‍රඥා ඇති පුද්ගල තෙම සුන්දර ආකාර ඇත්තේ යැ ප්‍රඥා නැති පුද්ගල තෙම ගර්හිත ආකාර ඇත්තේ යි.

**සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම සුවසේ හැඟැවිය හැක්කේ යැ ශ්‍රද්ධා නැති පුද්ගල තෙම දුකසේ හැඟැවිය හැක්කේ යැ ... ප්‍රඥා ඇති පුද්ගල තෙම සුවසේ හැඟැවිය හැක්කේ යැ ප්‍රඥා නැති පුද්ගල තෙම දුකසේ හැඟැවිය හැක්කේ යි.

**අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො** යනු: ශ්‍රද්ධා ඇති පුද්ගල තෙම පරලොකවද්‍යභය දක්නාසුලු යැ ශ්‍රද්ධා නැති පුද්ගල තෙම පරලොකවද්‍යභය දක්නාසුලු නො වෙයි. ආරබ්ධවීර්‍ය්‍ය ඇති පුද්ගල තෙම පරලොකවද්‍යභයදක්නාසුලු යැ කුසීද පුද්ගල තෙම පරලොකවද්‍යභය දක්නාසුලු නො වෙයි ... ප්‍රඥා ඇති පුද්ගල තෙම පරලොකවද්‍යභය දක්නාසුලු යැ ප්‍රඥා නැති පුද්ගල තෙම පරලොකවද්‍යභය දක්නාසුලු නො වේ.

**ලොකො** යනු: ස්කන්ධලොක යැ ධාතුලොක යැ ආයතනලොක යැ විපත්තිභව (අපාය) ලොක යැ විපත්තිසම්භව (අපායොපගකර්‍ම) ලොක යැ සම්පත්තිභව (සුගති) ලොක යැ සම්පත්තිසම්භව (සුගතූපගකම්ම) ලොක යි.

ලෝ එකෙක් වෙයි: හැම සත්හු ආහාරයෙන් සිටුනාහු යැ, ලොව්හු දෙදෙනෙක් වෙති: නාමය හා රූපය හා යැ, ලොව්හු තිදෙනෙක් වෙති: තුන් වේදනා යැ, ලොව්හු සතර දෙනෙක් වෙති: සතර ආහාරයෝ යැ, ලොව්හු පස්දෙනෙක් වෙති: පඤ්චොපාදානස්කන්ධයෝ යැ, ලොව්හු සදෙනෙක් වෙති: ආධ්‍යාත්මිකආයතනයෝ සදෙන යැ, ලොව්හු සත් දෙනෙක් වෙති: සප්තවිඥනස්ථිතීහු යැ, ලොව්හු අටදෙනෙක් වෙති: අෂ්ටලොකධර්‍මයෝ යැ, ලොව්හු නවදෙනෙක් වෙති: නවසත්ත්වාවාසයෝ යැ, ලොව්හු දසදෙනෙක් වෙති: දශආයතනයෝ යැ, ලොව්හු දොළොස් දෙනෙකි දොළොස් ආයතනයෝ යැ, ලොව්හු අටළොස් දෙනෙකි: අටළොස්ධාතුහු යි.

**වජ්ජං** යනු: හැම කෙලෙස්හු වද්‍යයෝ යැ, හැම දුසිරිත්හු වද්‍යයෝ යැ. හැම අභිසංස්කාරයෝ වද්‍යයෝ යැ, හැම භවගාමීකර්‍මයෝ වද්‍යයෝ යි. මෙසේ මෙලෙව්හි ද මේ වද්‍යයෙහි ද බලවත් වූ 'භය' සංඥාවෝ ඔසවනලද අසිපත් ඇති වධකයකු කෙරෙහි සෙයින් එළඹසිටියාහු වෙති.

මේ පනස් අයුරින් මේ පඤ්චෙන්ද්‍රියයන් (තථාගතයෝ) දැනගනිති, දකිති, හාත්පසින් දැනගනිති, ප්‍රතිවෙධ කෙරෙත්.

**තුන්වැනි බණවර යි.**

**ඉන්ද්‍රියකථා නිමි.**

# 5

# විමොක්ඛකථා

## [සාවත්ථිනිදානං:][1]

5-1. "තයොමෙ භික්ඛවෙ, විමොක්ඛා, කතමෙ තයො: සුඤ්ඤතො විමොක්ඛො, අනිමිත්තො විමොක්ඛො, අප්පණිහිතො විමොක්ඛො. ඉමෙ ඛො භික්ඛවෙ, තයො විමොක්ඛා."

අපිච- අට්ඨසට්ඨි විමොක්ඛා: සුඤ්ඤතො විමොක්ඛො, අනිමිත්තො විමොක්ඛො, අප්පණිහිතො විමොක්ඛො, අජ්ඣත්තවුට්ඨානො විමොක්ඛො බහිද්ධාවුට්ඨානො විමොක්ඛො, දුභතොවුට්ඨානො විමොක්ඛො, අජ්ඣත්තවුට්ඨානා චත්තාරො විමොක්ඛා, බහිද්ධාවුට්ඨානා චත්තාරො විමොක්ඛා, දුභතොවුට්ඨානා චත්තාරො විමොක්ඛා, අජ්ඣත්තවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා, බහිද්ධාවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා, දුභතොවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා, අජ්ඣත්තවුට්ඨානපටිප්පස්සද්ධී[2] චත්තාරො විමොක්ඛා, බහිද්ධාවුට්ඨානපටිප්පස්සද්ධී චත්තාරො විමොක්ඛා, දුභතොවුට්ඨානපටිප්පස්සද්ධී චත්තාරො විමොක්ඛා. 'රූපී රූපානි පස්සතී'ති විමොක්ඛො, 'අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධාරූපානි පස්සතී'ති විමොක්ඛො, 'සුභන්තෙව අධිමුත්තො හොතී'ති විමොක්ඛො. ආකාසානඤ්චායතනසමාපත්තිවිමොක්ඛො, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවිමොක්ඛො, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො, සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තිවිමොක්ඛො. සමයවිමොක්ඛො, අසමයවිමොක්ඛො, සාමයිකො[3] විමොක්ඛො, අසාමයිකො විමොක්ඛො. කුප්පො විමොක්ඛො අකුප්පො විමොක්ඛො. ලොකියො විමොක්ඛො, ලොකුත්තරො විමොක්ඛො, සාසවො විමොක්ඛො, අනාසවො විමොක්ඛො. සාමිසො විමොක්ඛො, නිරාමිසො විමොක්ඛො, නිරාමිසා[4] නිරාමිසතරො විමොක්ඛො, පණිහිතො විමොක්ඛො, අප්පණිහිතො විමොක්ඛො, පණිහිතපටිප්පස්සද්ධි විමොක්ඛො. සඤ්ඤුත්තො විමොක්ඛො, විසඤ්ඤුත්තො විමොක්ඛො, එකත්තවිමොක්ඛො, නානත්තවිමොක්ඛො, සඤ්ඤාවිමොක්ඛො, ඤාණවිමොක්ඛො, සීතිසියාවිමොක්ඛො,[5] ඣානවිමොක්ඛො, අනුපාදා චිත්තස්ස විමොක්ඛො.

**විමොක්ඛුද්දෙසො.**

කතමො සුඤ්ඤතො විමොක්ඛො: "ඉධ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති: 'සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා'ති. 'සො තත්ථ අභිනිවෙසං න කරොතී'ති සුඤ්ඤතො විමොක්ඛො. අයං සුඤ්ඤතො විමොක්ඛො.

---

1. පරිපුණ්ණනිදානං - සයා, සී, PTS, පුරිමනිදානං - මජසං, 2 අජ්ඣත්තවුට්ඨානා පටිප්පස්සද්ධි - සයා, PTS, සී, 3. සාමායිකො - පු.
4 'නිරාමිසා'ති තාසිපොත්ථකෙ නත්ථි. 5 සීතිසිතා විමොක්ඛො - පු.

# 5

# විමොක්ෂකථා

[සැවැත්නිදාන යි.]

5-1. "මහණෙනි, මේ විමොක්ෂයෝ තිදෙනෙක් වෙති. කවර තිදෙනෙක් ද යත්: ශූන්‍යතවිමොක්ෂ යැ අනිමිත්තවිමොක්ෂ යැ අප්‍රණිහිත විමොක්ෂ යි. මහණෙනි, මොහු තුන්විමොක්ෂයෝ යි."

තවද විමොක්ෂයෝ අටසැට දෙනෙක් වෙති: ශූන්‍යතවිමොක්ෂ යැ අනිමිත්තවිමොක්ෂ යැ අප්‍රණිහිතවිමොක්ෂ යැ (සතර ධ්‍යානයෝ අධ්‍යාත්මයෙහි නීවරණාදියෙන් නැගීසිටුනා හෙයින්) අජ්ඣත්තවුට්ඨානවිමොක්ඛ යැ (සතර අරූපසමාපත්තිහු ආලම්බනයන් කෙරෙන් නැගිසිටුනා හෙයින්) බහිද්ධාවුට්ඨානවිමොක්ඛ යැ දුභතොවුට්ඨාන (සමුච්ඡෙද) විමොක්ඛ යැ අජ්ඣත්තවුට්ඨාන වූ ධ්‍යාන සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ යැ බහිද්ධාවුට්ඨාන වූ අරූපසමාපත්ති සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ යැ දුභතොවුට්ඨාන වූ සතර විමොක්ෂයෝ යැ අජ්ඣත්තවුට්ඨානයන්ට අනුලොම් වූ සතර විමොක්ෂයෝ යැ බහිද්ධාවුට්ඨානයන්ට අනුලොම් වූ සතර විමොක්ෂයෝ යැ දුභතොවුට්ඨානයන්ට අනුලොම් වූ සතර විමොක්ෂයෝ යැ අජ්ඣත්තවුට්ඨානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ යැ බහිද්ධාවුට්ඨානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ යැ දුභතොවුට්ඨානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ යැ රූපධ්‍යාන ඇත්තේ (කසිණාදි බාහිර) රූපයන් (ධ්‍යානචක්ෂුසින්) දකී නු'යි විමොක්ෂ යැ අධ්‍යාත්මයෙහි 'රූප' යැ යන සංඥ නැත්තේ බාහිරරූපයන් දකී නු'යි විමොක්ෂ යැ 'ශුභ' යැ යි අධිමුක්ත වේ නු'යි විමොක්ෂ යැ ආකාසානඤ්චායතනසමාපත්ති විමොක්ෂ යැ විඤ්ඤාණඤ්චායතනසමාපත්ති විමොක්ෂ යැ ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති විමොක්ෂ යැ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති විමොක්ෂ යැ සංඥාවෙදයිතනිරොධසමාපත්ති විමොක්ෂ යැ සමය විමොක්ෂ යැ අසමය විමොක්ෂ යැ සාමයිකවිමොක්ෂ යැ අසාමයික විමොක්ෂ යැ කොප්‍යවිමොක්ෂ යැ අකොප්‍යවිමොක්ෂ යැ ලෞකික විමොක්ෂ යැ ලොකොත්තර විමොක්ෂ යැ සාස්‍රව විමොක්ෂ යැ අනාස්‍රව විමොක්ෂ යැ සාමිෂ විමොක්ෂ යැ නිරාමිෂ විමොක්ෂ යැ නිරාමිෂයට වඩා අතිශයින් නිරාමිෂ වූ විමොක්ෂ යැ ප්‍රණිහිත විමොක්ෂ යැ අප්‍රණිහිතවිමොක්ෂ යැ ප්‍රණිධි සන්හිඳීම් සඞ්ඛ්‍යාත විමොක්ෂ යැ සංයුක්ත විමොක්ෂ යැ විසංයුක්තවිමොක්ෂ යැ එකත්ව විමොක්ෂ යැ නානාත්ව විමොක්ෂ යැ සංඥාවිමොක්ෂ යැ ඥානවිමොක්ෂ යැ (විදර්ශනාඥානය මැ) 'සිහිල් වන්නේ යැ'යි පවත්නා විමොක්ෂ යැ ධ්‍යාන විමොක්ෂ යැ උපාදාන නො කොට චිත්තයාගේ විමොක්ෂය යි.

### විමොක්ෂොද්දෙශ යි.

ශූන්‍යතවිමොක්ෂ කවරෙ යත්: මෙසස්නෙහි මහණ තෙම අරනට ගියේ හෝ රුක්මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ මෙසෙයින් ප්‍රත්‍යවෙක්ෂා කෙරෙයි: 'මේ පඤ්චස්කන්ධය තෙම ආත්මයෙන් හෝ ආත්මීයයෙන් හෝ ශූන්‍ය වේ'' යයි. හෙතෙම එහි අභිනිවෙශ නො කෙරේ නු' යි ශූන්‍යත විමොක්ෂ නම. මේ ශූන්‍යතවිමොක්ෂ නම් වෙයි.

කතමො අනිමිත්තො විමොක්ඛො: ඉධ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති: 'සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා'ති. සො තත්ථ නිමිත්තං න කරොතී'ති අනිමිත්තො විමොක්ඛො. අයං අනිමිත්තො විමොක්ඛො.

කතමො අප්පණිහිතො විමොක්ඛො: ඉධ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසඤ්චික්ඛති: 'සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා'ති. සො තත්ථ පණිධිං න කරොතී'ති අප්පණිහිතො විමොක්ඛො. අයං අප්පණිහිතො විමොක්ඛො.

කතමො අජ්ඣත්තවුට්ඨානො විමොක්ඛො: චත්තාරි ඣානානි. අයං අජ්ඣත්තවුට්ඨානො විමොක්ඛො.

කතමො බහිද්ධාවුට්ඨානො විමොක්ඛො: චතස්සො අරූපසමාපත්තියො, අයං බහිද්ධාවුට්ඨානො විමොක්ඛො.

කතමො දුභතොවුට්ඨානො විමොක්ඛො: චත්තාරො අරියමග්ගා. අයං දුභතොවුට්ඨානො විමොක්ඛො.

කතමෙ අජ්ඣත්තවුට්ඨානා චත්තාරො විමොක්ඛා: පඨමං ඣානං[1] නීවරණෙහි වුට්ඨාති, දුතියං ඣානං විතක්කවිචාරෙහි වුට්ඨාති, තතියං ඣානං පීතියා වුට්ඨාති, චතුත්ථං ඣානං සුඛදුක්ඛෙහි වුට්ඨාති. ඉමෙ අජ්ඣත්තවුට්ඨානා චත්තාරො විමොක්ඛා.

කතමෙ බහිද්ධාවුට්ඨානා චත්තාරො විමොක්ඛා: ආකාසානඤ්චායතනසමාපත්ති රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය වුට්ඨාති, විඤ්ඤාණඤ්චායතනසමාපත්ති ආකාසානඤ්චායතනසඤ්ඤාය වුට්ඨාති, ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය වුට්ඨාති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය වුට්ඨාති. ඉමෙ බහිද්ධාවුට්ඨානා චත්තාරො විමොක්ඛා.

කතමෙ දුභතො වුට්ඨානා චත්තාරො විමොක්ඛා: සොතාපත්තිමග්ගො සක්කායදිට්ඨිවිචිකිච්ඡාසීලබ්බතපරාමාසා දිට්ඨානුසයා විචිකිච්ඡානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති; සකදාගාමිමග්ගො ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති; අනාගාමිමග්ගො අණුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා අණුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති,

1. පඨමජ්ඣානං - සී, PTS.

අනිමිත්තවිමෝක්ෂ කවරේ යත්: මෙසස්නෙහි මහණ තෙම අරනට ගියේ හෝ රුක්මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ මෙසෙයින් ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි: "මේ පඤ්චස්කන්ධය තෙම ආත්මයෙන් හෝ ආත්මීයයෙන් හෝ ශූන්‍ය වේ" යයි. හෙතෙම එහි (නිත්‍ය) නිමිත්ත නො කෙරේ නු'යි අනිමිත්තවිමෝක්ෂ නම. මේ අනිමිත්තවිමෝක්ෂ නම් වෙයි.

අප්‍රණිහිතවිමෝක්ෂ කවරේ යත්: මෙ සස්නෙහි මහණ තෙම අරනට ගියේ හෝ රුක්මුලට ගියේ හෝ ශූන්‍යාගාරයට ගියේ හෝ මෙසෙයින් ප්‍රත්‍යවේක්ෂා කෙරෙයි: "මේ පඤ්චස්කන්ධය තෙම ආත්මයෙන් හෝ ආත්මීය-යෙන් හෝ ශූන්‍ය වේ" යයි. හෙතෙම එහි ප්‍රණිධි නො කෙරේ නු' යි. අප්‍රණිහිතවිමෝක්ෂ නම. මේ අප්‍රණිහිතවිමෝක්ෂ නම් වෙයි.

අජ්ඣත්තවුට්ඨානවිමොක්ඛ කවරෙ යත්: සතර ධ්‍යානයෝ යි. මේ අජ්ඣත්තවුට්ඨානවිමොක්ඛ නම් වෙයි.

බහිද්ධාවුට්ඨානවිමොක්ඛ කවරෙ යත්: සතර අරූපසමාපත්තිහු යි. මේ බහිද්ධාවුට්ඨානවිමොක්ඛ නම් වෙයි.

දුභතොවුට්ඨානවිමොක්ෂ කවරෙ යත්: සතර ආර්‍යමාර්ගයෝ යි. මේ දුභතොවුට්ඨානවිමොක්ඛ නම් වෙයි.

අධ්‍යාත්මව්‍යුත්ථාන වූ සතර විමෝක්ෂයෝ කවරහ යත්: ප්‍රථමධ්‍යානය (අධ්‍යාත්මයෙහි) නීවරණයන් කෙරෙන් නැඟෙයි, ද්විතීයධ්‍යානය විතර්ක-විචාරයන් කෙරෙන් නැඟෙයි, තෘතීයධ්‍යානය ප්‍රීතිය කෙරෙන් නැඟෙයි, චතුර්ථධ්‍යානය සුඛදුඃඛයන් කෙරෙන් නැඟේ. මොහු අධ්‍යාත්මව්‍යුත්ථාන වූ සතර විමෝක්ෂයෝ වෙති.

බහිර්ව්‍යුත්ථාන වූ සතර විමෝක්ෂයෝ කවරහ යත්: ආකාසානඤ්චා-යතනසමාපත්තිය රූපසංඥයෙන් ප්‍රතිඝසංඥයෙන් නානාත්වසංඥයෙන් නැඟෙයි, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය ආකාසානඤ්චායතනසංඥව කෙරෙන් නැඟෙයි, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය විඤ්ඤාණඤ්චායතන සංඥව කෙරෙන් නැඟෙයි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය ආකිඤ්චඤ්ඤායතනසංඥව කෙරෙන් නැඟේ. මොහු බහිර්ව්‍යුත්ථාන වූ සතර විමෝක්ෂයෝ වෙති.

දුභතොවුට්ඨාන වූ සතර විමෝක්ෂයෝ කවරහ යත්: ස්‍රොතාපත්තිමාර්ගය සත්කායදෘෂ්ටිවිචිකිත්සාශීලව්‍රතපරාමර්ශ කෙරෙන් දෘෂ්ට්‍යනුශය කෙරෙන් විචි-කිත්සානුශය කෙරෙන් නැඟෙයි, එය අනුව පවත්නා කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි, බාහිර වූ ත් සියලු නිමිති කෙරෙන් නැඟෙයි, සකෘදාගාමිමාර්ගය ඖදාරික වූ කාමරාගසංයොජනය කෙරෙන් ප්‍රතිඝසංයොජනය කෙරෙන් ඖදාරික වූ කාමරාගානුශය කෙරෙන් ප්‍රතිඝා-නුශය කෙරෙන් නැඟෙයි, එය අනුව පවත්නා කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. බාහිර වූ ත් සියලු නිමිති කෙරෙන් නැඟෙයි, අනාගාමිමාර්ගය අණුසහගත වූ කාමරාගසංයොජනය කෙරෙන් ප්‍රතිඝසංයොජනය කෙරෙන් අණුසහගත වූ කාමරාගානුශය කෙරෙන් ප්‍රතිඝානුශය කෙරෙන් නැඟෙයි. එය අනුව පවත්නා කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි. බාහිර වූ ත් සියලු නිමිති කෙරෙන් නැඟෙයි;

අරහත්තමග්ගො රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා වුට්ඨාති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨාති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි වුට්ඨාති, ඉමෙ දුභතො වුට්ඨානා චත්තාරො විමොක්ඛා.

කතමෙ අජ්ඣත්තවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා: පඨමං ඣානං පටිලාභත්ථාය විතක්කො ච විචාරො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච, දුතියං ඣානං පටිලාභත්ථාය -පෙ- තතියං ඣානං පටිලාභත්ථාය -පෙ- චතුත්ථං ඣානං පටිලාභත්ථාය විතක්කො ච විචාරො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච, ඉමෙ අජ්ඣත්තවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා.

කතමෙ බහිද්ධාවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා: ආකාසානඤ්චායතනසමාපත්තිං පටිලාභත්ථාය විතක්කො ච විචාරො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං පටිලාභත්ථාය විතක්කො ච විචාරො ච පීති ච සුඛඤ්ච චිත්තෙකග්ගතා ච, ඉමෙ බහිද්ධාවුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා.

කතමෙ දුභතො වුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා: සොතාපත්තිමග්ගං පටිලාභත්ථාය අනිච්චානුපස්සනා දුක්ඛානුපස්සනා අනත්තානුපස්සනා, සකදාගාමිමග්ගං පටිලාභත්ථාය -පෙ- අනාගාමිමග්ගං පටිලාභත්ථාය -පෙ- අරහත්තමග්ගං පටිලාභත්ථාය අනිච්චානුපස්සනා දුක්ඛානුපස්සනා අනත්තානුපස්සනා. ඉමෙ දුභතො වුට්ඨානානං අනුලොමා චත්තාරො විමොක්ඛා.

කතමෙ අජ්ඣත්තවුට්ඨාන[1] පටිප්පස්සද්ධි චත්තාරො විමොක්ඛා: පඨමස්ස ඣානස්ස[2] පටිලාභො වා විපාකො වා, දුතියස්ස ඣානස්ස -පෙ- තතියස්ස ඣානස්ස -පෙ- චතුත්ථස්ස ඣානස්ස පටිලාභො වා විපාකො වා, ඉමෙ අජ්ඣත්තවුට්ඨානපටිප්පස්සද්ධී චත්තාරො විමොක්ඛා.

කතමෙ බහිද්ධා වුට්ඨාන[3] පටිප්පස්සද්ධි චත්තාරො විමොක්ඛා: ආකාසානඤ්චායතනසමාපත්තියා පටිලාභො වා විපාකො වා, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා පටිලාභො වා විපාකො වා, ඉමෙ බහිද්ධාවුට්ඨානපටිප්පස්සද්ධී චත්තාරො විමොක්ඛා.

කතමෙ දුභතො වුට්ඨානපටිප්පස්සද්ධී චත්තාරො විමොක්ඛා: සොතාපත්තිමග්ගස්ස සොතාපත්තිඵලං, සකදාගාමිමග්ගස්ස සකදාගාමිඵලං, අනාගාමිමග්ගස්ස අනාගාමිඵලං, අරහත්තමග්ගස්ස අරහත්තඵලං. ඉමෙ දුභතො වුට්ඨානපටිප්පස්සද්ධී චත්තාරො විමොක්ඛා.

---

1. අජ්ඣත්තවුට්ඨානා - සයා, PTS,
2. පඨමජ්ඣානස්ස - සයා, PTS,
3. බහිද්ධාවුට්ඨානා - සයා, PTS,

අර්හත්මාර්ගය රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යායෙන් මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් නැඟෙයි, එය අනුව පවත්නා කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙයි, බාහිර වූත් සියලු නිමිති කෙරෙන් නැඟේ. මොහු දුභතොවුට්ඨාන වූ සතර විමොක්ෂයෝ වෙති.

අධ්‍යාත්මව්‍යුත්ථානයන්ට අනුලොම් වූ සතර විමොක්ෂයෝ කවරහ යත්: ප්‍රථමධ්‍යානය ලැබීම පිණිස විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෛකාග්‍රතාව ද, ද්විතීයධ්‍යානය ලැබීම පිණිස ... තෘතීයධ්‍යානය ලැබීම පිණිස ... චතුර්ථධ්‍යානය ලැබීම පිණිස විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෛකාග්‍රතාව ද යන මොහු අධ්‍යාත්මව්‍යුත්ථානයන්ට අනුලොම් වූ සතර විමොක්ෂයෝ වෙති.

බාහිර ව්‍යුත්ථානයන්ට අනුලොම් වූ සතර විමොක්ෂයෝ කවරහ යත්: ආකාසානඤ්චායතන සමාපත්තිය ලැබීම පිණිස විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෛකාග්‍රතාව ද, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය ... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය ... නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලැබීම පිණිස විතර්කය ද විචාරය ද ප්‍රීතිය ද සුඛය ද චිත්තෛකාග්‍රතාව ද යන මොහු බාහිර ව්‍යුත්ථානයන්ට අනුලොම් වූ සතර විමොක්ෂයෝ වෙති.

දුභතොවුට්ඨානයන්ට අනුලොම් වූ සතර විමොක්ෂයෝ කවරහ යත්: ස්‍රොතාපත්තිමාර්ගය ලැබීම පිණිස අනිත්‍යානුදර්ශනය දුඃඛානුදර්ශනය අනාත්මානුදර්ශනය යැ, සකෘදාගාමිමාර්ගය ලැබීම පිණිස ... අනාගාමිමාර්ගය ලැබීම පිණිස ... අර්හත්මාර්ගය ලැබීම පිණිස අනිත්‍යානුදර්ශනය දුඃඛානුදර්ශනය අනාත්මානුදර්ශනය යි. මොහු දුභතොවුට්ඨානයන්ට අනුලොම් වූ සතර විමොක්ෂයෝ වෙති.

අධ්‍යාත්මව්‍යුත්ථානයන් ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ කවරහ යත්: ප්‍රථමධ්‍යානයාගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යැ, ද්විතීය-ධ්‍යානයාගේ ... තෘතීයධ්‍යානයාගේ ... චතුර්ථධ්‍යානයාගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යි. මොහු අධ්‍යාත්මව්‍යුත්ථානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ වෙති.

බාහිර ව්‍යුත්ථානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ කවරහ යත්: ආකාසානඤ්චායතනසමාපත්තියගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යැ, විඤ්ඤාණඤ්චායතන සමාපත්තියගේ ... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය-ගේ ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යි. මොහු බාහිරව්‍යුත්ථානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ වෙති.

දුභතොවුට්ඨානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ කවරහ යත්: ස්‍රොතාපත්තිමාර්ගයට ස්‍රොතාපත්තිඵල යැ සකෘදාගාමිමාර්ගයට සකෘදාගාමිඵල යැ අනාගාමිමාර්ගයට අනාගාමිඵල යැ අර්හත්මාර්ගයට අර්හත්ඵල යි. මොහු දුභතොවුට්ඨානයන්ගේ සන්හිඳීම් සඞ්ඛ්‍යාත සතර විමොක්ෂයෝ වෙති.

කථං 'රූපී රූපානි පස්සතී'ති විමොක්ඛො: ඉධෙකච්චො අජ්ඣත්තං පච්චත්තං නීලනිමිත්තං මනසිකරොති, නීලසඤ්ඤං පටිලභති, සො තං නිමිත්තං සුග්ගහිතං කරොති, සූපධාරිතං උපධාරෙති, ස්වාවත්ථිතං අවත්ථාපෙති[1] සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා ස්වාවත්ථිතං අවත්ථාපෙත්වා බහිද්ධා නීලනිමිත්තෙ චිත්තං උපසංහරති, නීලසඤ්ඤං පටිලභති. සො තං නිමිත්තං සුග්ගහිතං කරොති, සූපධාරිතං උපධාරෙති, ස්වාවත්ථිතං අවත්ථාපෙති,[1] සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා ස්වාවත්ථිතං[2] අවත්ථාපෙත්වා ආසෙවති භාවෙති බහුලීකරොති. තස්ස එවං හොති: 'අජ්ඣත්තඤ්ච බහිද්ධා ච උභයමිදං රූප'න්ති රූපසඤ්ඤී හොති.

ඉධෙකච්චො අජ්ඣත්තං පච්චත්තං පීතනිමිත්තං -පෙ- ලොහිතනිමිත්තං -පෙ- ඔදාතනිමිත්තං මනසිකරොති, ඔදාතනිමිත්තං පටිලභති; සො තං නිමිත්තං සුග්ගහිතං කරොති, සූපධාරිතං උපධාරෙති, ස්වාවත්ථිතං අවත්ථාපෙති;[1] සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා ස්වාවත්ථිතං අවත්ථාපෙත්වා, බහිද්ධා ඔදාතනිමිත්තෙ චිත්තං උපසංහරති, ඔදාතසඤ්ඤං පටිලභති; සො තං නිමිත්තං සුග්ගහිතං කරොති, සූපධාරිතං උපධාරෙති, ස්වාවත්ථිතං අවත්ථාපෙති: සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා ස්වාවත්ථිතං අවත්ථාපෙත්වා ආසෙවති භාවෙති බහුලීකරොති. තස්ස එවං හොති: 'අජ්ඣත්තඤ්ච බහිද්ධා ච උභයමිදං රූප'න්ති රූපසඤ්ඤී හොති. එවං 'රූපී රූපානි පස්සතී'ති විමොක්ඛො.

කථං 'අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සතී'ති විමොක්ඛො: ඉධෙකච්චො අජ්ඣත්තං පච්චත්තං නීලනිමිත්තං න මනසි කරොති, නීලසඤ්ඤං න පටිලභති, බහිද්ධා නීලනිමිත්තෙ චිත්තං උපසංහරති, නීලං සඤ්ඤං පටිලභති; සො තං නිමිත්තං සුග්ගහිතං කරොති, සූපධාරිතං උපධාරෙති, ස්වාවත්ථිතං අවත්ථාපෙති. සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා, සූපධාරිතං උපධාරෙත්වා ස්වාවත්ථිතං අවත්ථාපෙත්වා ආසෙවති භාවෙති බහුලීකරොති, තස්ස එවං හොති: 'අජ්ඣත්තං අරූපං[3] බහිද්ධා රූපමිද'න්ති රූපසඤ්ඤී හොති.

ඉධෙකච්චො අජ්ඣත්තං පච්චත්තං පීතනිමිත්තං -පෙ- ලොහිතනිමිත්තං -පෙ- ඔදාතනිමිත්තං න මනසි කරොති, ඔදාතසඤ්ඤං න පටිලභති, බහිද්ධා ඔදාතනිමිත්තෙ චිත්තං උපසංහරති, ඔදාතසඤ්ඤං පටිලභති; සො තං නිමිත්තං සුග්ගහිතං කරොති; සූපධාරිතං උපධාරෙති, ස්වාවත්ථිතං අවත්ථාපෙති; සො තං නිමිත්තං සුග්ගහිතං කත්වා සූපධාරිතං උපධාරෙත්වා ස්වාවත්ථිතං අවත්ථාපෙත්වා ආසෙවති භාවෙති බහුලීකරොති, තස්ස එවං හොති: 'අජ්ඣත්තං අරූපං බහිද්ධා රූපමිද'න්ති රූපසඤ්ඤී, හොති, එවං 'අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සතී'ති විමොක්ඛො.

1. වවත්ථාපෙති - පු,
2. සාවත්ථිතං - සී 2
3. අරූපසඤ්ඤී - ස්‍යා සී 1, 2,

කිසෙයින් රූපධ්‍යාන ඇත්තේ රූපයන් දකී නු'යි විමොක්ෂ වෙයි යත්: මෙසස්නෙහි ඇතැමෙක් තමා කෙරෙහි පවත්නා තමා පිණිස පවත්නා නීලනිමිත්ත මෙනෙහි කෙරෙයි, 'නීල' යැ යන සංඥව ලබයි. හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගත්නාලද්දක් කෙරෙයි, සූපධාරිත කොට විමසයි, සුනිශ්චිත කොට නිශ්චය කෙරෙයි. හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගත්නාලද්දක් කොට සූපධාරිත කොට විමසා සුනිශ්චිත වැ නිශ්චය කොට බාහිර වූ නීල (කසිණ) නිමිත්තෙහි සිත එළවයි. 'නීල' යැ යන සංඥව ලබයි. හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගත්නාලද්දක් කෙරෙයි, සූපධාරිත කොට විමසයි, සුනිශ්චිත කොට නිශ්චය කෙරෙයි, හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගත්නාලද්දක් කොට සූපධාරිත කොට විමසා සුනිශ්චිත වැ නිශ්චය කොට ආසෙවන කෙරෙයි, භාවනා කෙරෙයි, බහුල කෙරෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "අධ්‍යාත්ම වූ ත් බාහිර වූ ත් මෙදෙක රූප වේ"යයි. 'රූප' යැ යන සංඥ ඇත්තේ වෙයි.

මෙසස්නෙහි ඇතැමෙක් තමා කෙරෙහි පවත්නා තමා පිණිස පවත්නා පීත නිමිත්ත ... ලොහිතනිමිත්ත... ඔදාත නිමිත්ත මෙනෙහි කෙරෙයි, ඔදාත නිමිත්ත ලබයි; හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගත්නාලද්දක් කෙරෙයි, සූපධාරිත කොට විමසයි, සුනිශ්චිත කොට නිශ්චය කෙරෙයි; හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගත්නාලද්දක් කොට සූපධාරිත කොට විමසා සුනිශ්චිත වැ නිශ්චය කොට බාහිර වූ ඔදාත (කසිණ) නිමිත්තෙහි සිත එළවයි. ඔදාත යැ යන සංඥව ලබයි; හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගත්නා ලද්දක් කෙරෙයි. සූපධාරිත කොට විමසයි, සුනිශ්චිත කොට නිශ්චය කෙරෙයි; හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගත්නා ලද්දක් කොට සූපධාරිත කොට විමසා සුනිශ්චිත වැ නිශ්චය කොට ආසෙවන කෙරෙයි, භාවනා කෙරෙයි, බහුල කෙරෙයි; ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "අධ්‍යාත්ම වූ ත් බාහිර වූ ත් මෙදෙක රූප වේ"යයි. 'රූප' යැ යන සංඥ ඇත්තේ වෙයි. මෙසෙයින් 'රූපධ්‍යාන ඇත්තේ රූපයන් දකී නු'යි විමොක්ෂ නම් වෙයි.

කිසෙයින් "අධ්‍යාත්මයෙහි 'රූප' යැ යන සංඥ නැත්තේ බාහිරරූපයන් දකී" නු'යි විමොක්ෂ වෙයි යත්: මෙසස්නෙහි ඇතැමෙක් තමා කෙරෙහි පවත්නා තමා පිණිස පවත්නා නීලනිමිත්ත නො මෙනෙහි කෙරෙයි, 'නීල'යැ යන සංඥව නො ලබයි, බාහිර වූ නීලනිමිත්තෙහි සිත එළවයි, 'නීල'යැ යන සංඥව ලබයි, හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගත්නාලද්දක් කෙරෙයි, සූපධාරිත කොට විමසයි, සුනිශ්චිත කොට නිශ්චය කෙරෙයි. හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගත්නාලද්දක් කොට සූපධාරිත කොට විමසා සුනිශ්චිත වැ නිශ්චය කොට ආසෙවන කෙරෙයි, භාවනා කෙරෙයි, බහුල කෙරෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "අධ්‍යාත්මයෙහි 'රූප' නො වෙයි, මේ බාහිර රූපය වේ"යයි 'රූප'යැ යන සංඥ ඇත්තේ වෙයි.

මෙසස්නෙහි ඇතැමෙක් තමා කෙරෙහි පවත්නා තමා පිණිස පවත්නා 'පීත' නිමිත්ත ... 'ලොහිත' නිමිත්ත ... 'ඔදාත' නිමිත්ත නො මෙනෙහි කෙරෙයි, 'ඔදාත' යැ යන සංඥව නො ලබයි, බාහිර වූ ඔදාත නිමිත්තෙහි සිත එළවයි, 'ඔදාත'යැ යන සංඥව ලබයි; හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගත්නාලද්දක් කෙරෙයි. සූපධාරිත කොට විමසයි, සුනිශ්චිත කොට නිශ්චය කෙරෙයි. හෙතෙම ඒ නිමිත්ත මොනොවට ගත්නාලද්දක් කොට සූපධාරිත කොට විමසා සුනිශ්චිත වැ නිශ්චය කොට ආසෙවන කෙරෙයි, භාවනා කෙරෙයි, බහුල කෙරෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: "අධ්‍යාත්මයෙහි රූප නො වෙයි, මේ බාහිර රූපය වේ"යයි රූපය යන සංඥ ඇත්තේ වෙයි. මෙසෙයින් 'අධ්‍යාත්මයෙහි රූපය යන සංඥ නැත්තේ බාහිර රූපයන් දකී නු'යි විමොක්ෂ නම් වෙයි.

කථං සුභන්තෙ'ව අධිමුත්තො[1] හොතීති විමොක්ඛො: ඉධ භික්ඛු මෙත්තා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති, තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං.[2] ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන[3] ඵරිත්වා විහරති, මෙත්තාය භාවිතත්තා සත්තා අප්පටිකූලා[4] හොන්ති. කරුණාසහගතෙන චෙතසා එකං දිසං -පෙ- කරුණාය භාවිතත්තා සත්තා අප්පටිකූලා හොන්ති. මුදිතාසහගතෙන චෙතසා එකං දිසං -පෙ- මුදිතාය භාවිතත්තා සත්තා අප්පටිකූලා හොන්ති. උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං -පෙ- උපෙක්ඛාය භාවිතත්තා සත්තා අප්පටිකූලා හොන්ති. එවං 'සුභන්තෙ'ව අධිමුත්තො හොතී'ති විමොක්ඛො.

කතමො ආකාසානඤ්චායතනසමාපත්තිවිමොක්ඛො: ඉධ භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා, පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං ආකාසානඤ්චායතනසමාපත්තිවිමොක්ඛො.

කතමො විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවිමොක්ඛො: ඉධ භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණ'න්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං විඤ්ඤාණඤ්චායතනසමාපත්තිවිමොක්ඛො.

කතමො ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො: ඉධ භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො.

කතමො නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො: ඉධ භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිවිමොක්ඛො.

කතමො සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තිවිමොක්ඛො: ඉධ භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. අයං සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තිවිමොක්ඛො.

කතමො සමයවිමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො අයං සමයවිමොක්ඛො.

කතමො අසමයවිමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං අසමයවිමොක්ඛො.

කතමො සාමයිකො විමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං සාමයිකො විමොක්ඛො.

---

1. අධිමුත්තො - PTS අධිමොක්ඛො - සී 1,2. 2 චතුත්ථං - මජසං, සයා, සී 1, PTS
3. අබ්‍යාපජ්ඣෙන - සයා, සී 1, PTS. 4. අප්පතිකූලා - සී 1,2.

කිසෙයින් 'ශුභ' යයි අධිමුක්ත වේ නු යි විමොක්ෂ වේ ද යත්: මෙ සස්නෙහි මහණ තෙම මෛත්‍රී සහගිය සිතින් එක් දිශායෙක්හි සත්ත්වයන් අරමුණු කොට වෙසෙයි, එසෙයින් දෙවැනි තුන්වැනි සතරවැනි දිශායෙහි සත්ත්වයන් අරමුණු කොට වෙසෙයි, මෙසෙයින් උඩ යට සරස හැමතන්හි හැම සතුන් ඇති ලොව සියල්ලන් ආත්මසමතායෙන් යුතු වැ විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ අව්‍යාපාද වූ මෛත්‍රීසහගිය සිතින් අරමුණු කොට වෙසෙයි, මෛත්‍රිය වැඩූ බැවින් සත්ත්වයෝ නො පිළිකුල් වෙති. කරුණාසහගිය සිතින් එක් දිශායෙක්හි සත්ත්වයන් ... කරුණාව වැඩූ බැවින් සත්ත්වයෝ නො පිළිකුල් වෙති. මෘදුතා සහගිය සිතින් එක් දිශායෙක්හි සත්ත්වයන් .. මෘදුතාව වැඩූ බැවින් සත්ත්වයෝ නො පිළිකුල් වෙති. උපෙක්ෂා සහගිය සිතින් එක් දිශායෙක්හි සත්ත්වයන් ... උපෙක්ෂාව වැඩූ බැවින් සත්ත්වයෝ නො පිළිකුල් වෙත්. මෙසෙයින් 'ශුභ' යැ යි අධිමුක්ත වේ' නු යි විමොක්ෂ නම් වෙයි.

ආකාසානඤ්චායතනසමාපත්ති සඞ්ඛ්‍යාත විමොක්ෂ කවරෙ යත්: මෙ සස්නෙහි මහණ තෙම සර්වාකාරයෙන් රූපසංඥවන් ඉක්මවීමෙන් ප්‍රතිස-සංඥවන් ප්‍රහාණයෙන් නානාත්වසංඥවන් නො මෙනෙහි කිරීමෙන් 'ආකාශය අනන්ත යැ'යි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කෙරෙයි මේ ආකාසානඤ්චායතනසමාපත්ති සඞ්ඛ්‍යාත විමොක්ෂ නම් වෙයි.

විඤ්ඤාණඤ්චායතනසමාපත්ති සඞ්ඛ්‍යාත විමොක්ෂ කවරෙ යත්: මෙ සස්නෙහි මහණ තෙම සර්වාකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා 'විඥනය අනන්ත යැ'යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කෙරෙයි. මේ විඤ්ඤාණඤ්චායතනසමාපත්ති විමොක්ෂ නම් වෙයි.

ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති සඞ්ඛ්‍යාත විමොක්ෂ කවරෙ යත්: මෙ සස්නෙහි මහණ තෙම සර්වාකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා 'කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කෙරෙයි. මේ ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති විමොක්ෂ නම් වෙයි.

නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති සඞ්ඛ්‍යාත විමොක්ෂ කවරෙ යත්: මෙසස්නෙහි මහණ තෙම සර්වාකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කෙරෙයි. මේ නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනසමාපත්ති විමොක්ෂ නම් වෙයි.

සංඥවෙදයිතනිරොධසමාපත්ති සඞ්ඛ්‍යාත විමොක්ෂ කවරෙ යත්: මෙ සස්නෙහි මහණ තෙම සර්වාකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සංඥවෙදයිතනිරොධයට පැමිණ වාසය කෙරෙයි. මේ සංඥ-වෙදයිතනිරොධසමාපත්ති විමොක්ෂ නම් වෙයි.

සමයවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූප-සමාපත්තිහු ද යන මේ සමයවිමොක්ෂ නම් වෙයි.

අසමයවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ආර්‍ය්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ අසමයවිමොක්ෂ නම් වෙයි.

සාමයිකවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූප-සමාපත්තිහු ද යන මේ සාමයිකවිමොක්ෂ නම් වෙයි.

කතමො අසාමයිකො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං අසාමයිකො විමොක්ඛො.

කතමො කුප්පො විමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං කුප්පො විමොක්ඛො.

කතමො අකුප්පො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං අකුප්පො විමොක්ඛො.

කතමො ලොකියො විමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං ලොකියො විමොක්ඛො.

කතමො ලොකුත්තරො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං ලොකුත්තරො විමොක්ඛො.

කතමො සාසවො විමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං සාසවො විමොක්ඛො.

කතමො අනාසවො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං අනාසවො විමොක්ඛො.

කතමො සාමිසො විමොක්ඛො: රූපපටිසඤ්ඤුත්තො[1] විමොක්ඛො. අයං සාමිසො විමොක්ඛො.

කතමො නිරාමිසො විමොක්ඛො: අරූපපටිසඤ්ඤුත්තො[2] විමොක්ඛො. අයං නිරාමිසො විමොක්ඛො.

කතමො නිරාමිසා[3] නිරාමිසතරො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං නිරාමිසා නිරාමිසතරො විමොක්ඛො.

කතමො පණිහිතො විමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො, අයං පණිහිතො විමොක්ඛො.

කතමො අප්පණිහිතො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං අප්පණිහිතො විමොක්ඛො.

කතමො පණිහිතපටිප්පස්සද්ධි[4] විමොක්ඛො: පඨමස්ස ඣානස්ස[5] පටිලාභො වා විපාකො වා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා පටිලාභො වා විපාකො වා. අයං පණිහිතපටිප්පස්සද්ධිවිමොක්ඛො.

කතමො සඤ්ඤුත්තො විමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං සඤ්ඤුත්තො විමොක්ඛො.

කතමො විසඤ්ඤුත්තො විමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං විසඤ්ඤුත්තො විමොක්ඛො.

කතමො එකත්තවිමොක්ඛො: චත්තාරො ච අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. අයං එකත්තවිමොක්ඛො.

---

1. රූපප්පටිසඤ්ඤුත්තො මජසං, සයා, PTS 2. අරූපප්පටිසඤ්ඤුත්තො-මජසං, සයා, PTS
3. නිරාමිසා’ති තායිපොත්ථකෙ නත්ථි 4. පණිහිතප්පටිප්පස්සද්ධි - මජසං, සයා, PTS
5. පඨමජ්ඣානස්ස - සයා, සී 1;2. PTS

අසාමයිකවිමොක්ෂ නම් කවරේ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ අසාමයිකවිමොක්ෂ නම් වෙයි.

කොප්‍යවිමොක්ෂ නම් කවරේ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූපසමාපත්තිහු ද යන මේ කොප්‍යවිමොක්ෂ නම් වේ.

අකොප්‍යවිමොක්ෂ නම් කවරේ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ අකොප්‍යවිමොක්ෂ නම් වෙයි.

ලෞකිකවිමොක්ෂ නම් කවරේ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූපසමාපත්තිහු ද යන මේ ලෞකිකවිමොක්ෂ නම් වෙයි.

ලොකොත්තරවිමොක්ෂ නම් කවරේ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ ලොකොත්තරවිමොක්ෂ නම් වෙයි.

සාස්‍රවවිමොක්ෂ නම් කවරේ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූපසමාපත්තිහු ද යන මේ සාස්‍රවවිමොක්ෂ නම් වෙයි.

අනාස්‍රවවිමොක්ෂ නම් කවරේ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ අනාස්‍රවවිමොක්ෂ නම් වෙයි.

සාමිෂ විමොක්ෂ නම් කවරේ යත්: රූපධ්‍යානප්‍රතිසංයුක්ත වූ විමොක්ෂය යි. මේ සාමිෂ විමොක්ෂ නම් වෙයි.

නිරාමිෂවිමොක්ෂ නම් කවරේ යත්: අරූපසමාපත්තිප්‍රතිසංයුක්ත වූ විමොක්ෂය යි. මේ නිරාමිෂවිමොක්ෂ නම් වෙයි.

නිරාමිෂයට වඩා අතිශයින් නිරාමිෂ වූ විමොක්ෂ නම් කවරේ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ නිරාමිෂයට වඩා නිරාමිෂතර වූ විමොක්ෂ නම් වෙයි.

ප්‍රණිහිතවිමොක්ෂ නම් කවරේ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූපසමාපත්තිහු ද යන මේ ප්‍රණිහිතවිමොක්ෂ නම් වෙයි.

අප්‍රණිහිතවිමොක්ෂ නම් කවරේ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ අප්‍රණිහිතවිමොක්ෂ නම් වෙයි.

ප්‍රණිධි සන්හිඳීම් සඞ්ඛ්‍යාත විමොක්ෂ නම් කවරේ යත්: ප්‍රථමධ්‍යානයාගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යැ ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යි. මේ ප්‍රණිධි සන්හිඳීම් සඞ්ඛ්‍යාත විමොක්ෂ නම් වෙයි.

සංයුක්තවිමොක්ෂ නම් කවරේ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූපසමාපත්තිහු ද යන මේ සංයුක්තවිමොක්ෂ නම් වෙයි.

විසංයුක්තවිමොක්ෂ නම් කවරේ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ විසංයුක්තවිමොක්ෂ නම් වෙයි.

එකත්වවිමොක්ෂ නම් කවරේ යත්: සතර ආර්‍යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද නිර්වාණය ද යන මේ එකත්වවිමොක්ෂ නම් වෙයි.

කතමො නානත්තවිමොක්ඛො: චත්තාරි ච ඣානානි, චතස්සො ච අරූපසමාපත්තියො. අයං නානත්තවිමොක්ඛො,

කතමො සඤ්ඤාවිමොක්ඛො: සියා එකො සඤ්ඤාවිමොක්ඛො දස සඤ්ඤාවිමොක්ඛා හොන්ති, දස සඤ්ඤාවිමොක්ඛා එකො සඤ්ඤාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.[1]

**සියාති** කථඤ්ච සියා: අනිච්චානුපස්සනා ඤාණං[2] නිච්චතො සඤ්ඤාය මුච්චතීති[3] සඤ්ඤාවිමොක්ඛො, දුක්ඛානුපස්සනා ඤාණං සුඛතො සඤ්ඤාය මුච්චතීති[3] සඤ්ඤාවිමොක්ඛො, අනත්තානුපස්සනා ඤාණං අත්තතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, නිබ්බිදානුපස්සනා ඤාණං නන්දියා සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, විරාගානුපස්සනා ඤාණං රාගතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, නිරොධානුපස්සනා ඤාණං සමුදයතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො. පටිනිස්සග්ගානුපස්සනා ඤාණං ආදානතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, අනිමිත්තානුපස්සනා ඤාණං නිමිත්තතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, අප්පණිහිතානුපස්සනා ඤාණං පණිධියා සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, සුඤ්ඤතානුපස්සනා ඤාණං අභිනිවෙසතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො.

එවං සියා එකො සඤ්ඤාවිමොක්ඛො දස සඤ්ඤාවිමොක්ඛා හොන්ති, දස සඤ්ඤාවිමොක්ඛා එකො සඤ්ඤාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

රූපෙ අනිච්චානුපස්සනා ඤාණං නිච්චතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො -පෙ- රූපෙ සුඤ්ඤතානුස්සනා ඤාණං අභිනිවෙසතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො. එවං සියා එකො සඤ්ඤාවිමොක්ඛො දසසඤ්ඤාවිමොක්ඛා හොන්ති, දස සඤ්ඤාවිමොක්ඛා එකො සඤ්ඤාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා ඤාණං නිච්චතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො -පෙ- ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනා ඤාණං අභිනිවෙසතො සඤ්ඤාය මුච්චතීති සඤ්ඤාවිමොක්ඛො, එවං සියා එකො සඤ්ඤාවිමොක්ඛො දස සඤ්ඤාවිමොක්ඛා හොන්ති, දස සඤ්ඤාවිමොක්ඛා එකො සඤ්ඤාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන. අයං සඤ්ඤාවිමොක්ඛො.

කතමො ඤාණවිමොක්ඛො: සියා එකො ඤාණවිමොක්ඛො දස ඤාණවිමොක්ඛා හොන්ති. දස ඤාණවිමොක්ඛා එකො ඤාණවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.[1]

1 පරියායෙන සියාති - මජසං, 2 අනිච්චානුපස්සනඤාණ'න්ති සමාසපදං, අනිච්චානුපස්සනා ඤාණන්ති වා පාඨො, තථා සෙසෙසුපි - අට්ඨකථා, 3. විමුච්චතීති - සී 2,

නානාත්තවිමොක්ෂ නම් කවරෙ යත්: සතර ධ්‍යානයෝ ද සතර අරූපසමාපත්තිහු ද යන මේ නානාත්තවිමොක්ෂ නම් වෙයි.

සංඥාවිමොක්ෂ නම් කවරෙ යත්: එක් සංඥාවිමොක්ෂය දශසංඥාවිමොක්ෂයෝ වෙතී ද දශසංඥාවිමොක්ෂයෝ එක් සංඥාවිමොක්ෂය වේ යයි ද වස්තුවශයෙන්, පර්‍ය්‍යායයෙන් වන්නේ යි.

සියා යනු: කිසෙයින් වන්නේ ද යත්: අනිච්චානුපස්සනාඥානය නිත්‍ය වශයෙන් පැවැති සංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, දුක්ඛානුපස්සනාඥානය සුඛසංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, අනත්තානුපස්සනාඥානය ආත්මසංඥායෙන් මිදේ නු'යි සංඥාවිමොක්ෂ නම, නිබ්බිදානුපස්සනාඥානය නන්දි වශයෙන් පැවැති සංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, විරාගානුපස්සනා ඥානය රාගසංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, නිරොධානුපස්සනා ඥානය සමුදයසංඥායෙන් මිදේ නු'යි සංඥාවිමොක්ෂ නම, පටිනිස්සග්ගානුපස්සනා ඥානය ආදානසංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, අනිමිත්තානුපස්සනා ඥානය නිමිත්තසංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, අප්පණිහිතානුපස්සනා ඥානය ප්‍රණිධි සංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම, සුඤ්ඤතානුපස්සනා ඥානය අභිනිවෙශසංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම්.

මෙසෙයින් එක් සංඥාවිමොක්ෂය දශසංඥාවිමොක්ෂයෝ වෙතී ද දශසංඥා විමොක්ෂයෝ එක් සංඥාවිමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍ය්‍යායයෙන් වන්නේ යි.

රූපයෙහි අනිච්චානුපස්සනා ඥානය නිත්‍යසංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම ... රූපයෙහි සුඤ්ඤතානුපස්සනා ඥානය අභිනිවෙශ සංඥායෙන් මිදේ නු' යි සංඥාවිමොක්ෂ නම්. මෙසෙයින් එක් සංඥාවිමොක්ෂය දශසංඥාවිමොක්ෂයෝ වෙතී ද දශසංඥාවිමොක්ෂයෝ එක් සංඥාවිමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍ය්‍යායයෙන් වන්නේ යි.

වෙදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාඥානය නිත්‍යසංඥායෙන් මිදේ නු යි සංඥාවිමොක්ෂ නම ... ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනාඥානය අභිනිවෙශසංඥායෙන් මිදේ නු යි සංඥාවිමොක්ෂ නම්. මෙසෙයින් එක් සංඥාවිමොක්ෂය දශසංඥාවිමොක්ෂයෝ වෙතී ද දශසංඥාවිමොක්ෂයෝ එක් සංඥාවිමොක්ෂය වේ යයි ද වස්තුවශයෙන් පර්‍ය්‍යායෙන් වන්නේ යි. මේ සංඥාවිමොක්ෂ නම්.

ඥානවිමොක්ෂ නම් කවරෙ යත්: එක් ඥානවිමොක්ෂය දශ ඥානවිමොක්ෂයෝ වෙතී ද දශ ඥානවිමොක්ෂයෝ එක් ඥානවිමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍ය්‍යායයෙන් වන්නේ යි.

සියාති කථඤ්ච සියා: අනිච්චානුපස්සනා යථාභූතං ඤාණං නිච්චතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, දුක්ඛානුපස්සනා යථාභූතං ඤාණං සුඛතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො. අනත්තා-නුපස්සනා යථාභූතං ඤාණං අත්තතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, නිබ්බිදානුපස්සනා යථාභූතං ඤාණං නන්දියා සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, විරාගානුපස්සනා යථාභූතං ඤාණං රාගතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, නිරොධානු-පස්සනා යථාභූතං ඤාණං සමුදයතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, පටිනිස්සග්ගානුපස්සනා යථාභූතං ඤාණං ආදානතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, අනිමිත්තානුපස්සනා යථාභූතං ඤාණං නිමිත්තතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණ-විමොක්ඛො, අප්පණිහිතානුපස්සනා යථාභූතං ඤාණං පණිධියා සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො, සුඤ්ඤතානුපස්සනා යථාභූතං ඤාණං අභිනිවෙසතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො.

එවං සියා එකො ඤාණවිමොක්ඛො දස ඤාණවිමොක්ඛා හොන්ති, දස ඤාණවිමොක්ඛා එකො ඤාණවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

රූපෙ අනිච්චානුපස්සනා යථාභූතං ඤාණං නිච්චතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති, ඤාණවිමොක්ඛො -පෙ- රූපෙ සුඤ්ඤතානුපස්සනා යථාභූතං ඤාණං අභිනිවෙසතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණ-විමොක්ඛො. එවං සියා එකො ඤාණවිමොක්ඛො දස ඤාණවිමොක්ඛා හොන්ති, දසඤාණවිමොක්ඛා එකො ඤාණවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා යථාභූතං ඤාණං නිච්චතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො -පෙ- ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනා යථාභූතං ඤාණං අභිනිවෙසතො සම්මොහා අඤ්ඤාණා මුච්චතීති ඤාණවිමොක්ඛො එවං සියා එකො ඤාණවිමොක්ඛො දස ඤාණවිමොක්ඛා හොන්ති, දස ඤාණවිමොක්ඛා එකො ඤාණවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන, අයං ඤාණවිමොක්ඛො.

කතමො සීතිසියා විමොක්ඛො: සියා එකො සීතිසියාවිමොක්ඛො දස සීතිසියාවිමොක්ඛා හොන්ති, දස සීතිසියාවිමොක්ඛා එකො සීතිසියා විමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන

සියා යනු: කිසෙයිත් වන්නේ ද යත්: අනිච්චානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය නිත්‍ය වශයෙන් පැවැති සම්මෝහ සඞ්ඛ්‍යාත නො දැනීමෙන් මිදේ නු' යි ඥානවිමොක්ෂ නම, දුක්ඛානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය සුඛ වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥානවිමොක්ෂ නම, අනත්තානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය ආත්ම වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥානවිමොක්ෂ නම, නිබ්බිදානු-පස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය නන්දි වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥානවිමොක්ෂ නම, විරාගානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය රාග වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥානවිමොක්ෂ නම, නිරොධානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය සමුදය වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥාන-විමොක්ෂ නම, පටිනිස්සග්ගානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය ආදාන වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥානවිමොක්ෂ නම, අනිමිත්තානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය නිමිත්ත වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥානවිමොක්ෂ නම, අප්පණිහිතානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය ප්‍රණිධි වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥානවිමොක්ෂ නම, සුඤ්ඤතානු-පස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය අභිනිවෙශ වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥානවිමොක්ෂ නමි.

මෙසෙයින් එක් ඥානවිමොක්ෂය දශඥානවිමොක්ෂයෝ වෙති ද දශඥාන-විමොක්ෂයෝ එක් ඥානවිමොක්ෂය වේ යයි ද වස්තුවශයෙන් පය්‍ර්‍යායයෙන් වන්නේ යි.

රූපයෙහි අනිච්චානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය නිත්‍ය වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥානවිමොක්ෂ නම ... රූපයෙහි සුඤ්ඤතානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය අභිනිවෙශ වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥානවිමොක්ෂ නමි. මෙසෙයින් එක් ඥානවිමොක්ෂය දශ ඥානවිමොක්ෂයෝ වෙති ද, දශඥාන-විමොක්ෂයෝ එක් ඥානවිමොක්ෂය වේ යයි ද වස්තුවශයෙන් පය්‍ර්‍යායයෙන් වන්නේ යි.

වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූතඥානය නිත්‍ය වශයෙන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥාන-විමොක්ෂ නම ... ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනා සඞ්ඛ්‍යාත යථාභූත ඥානය අභිනිවෙශ වශවයන් පැවැති සම්මෝහය වූ නො දැනීමෙන් මිදේ නු' යි ඥානවිමොක්ෂ නමි. මෙසෙයින් එක් ඥානවිමොක්ෂය දශඥානවිමොක්ෂයෝ වෙති ද, දශඥානවිමොක්ෂයෝ එක් ඥානවිමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන් පය්‍ර්‍යායයෙන් වන්නේ යි. මේ ඥානවිමොක්ෂ නම් වේ.

ශීතිස්‍යාද්විමොක්ෂ නම් කවරෙ යත්: එක් ශීතිස්‍යාද්විමොක්ෂය දශ ශීතිස්‍යාද්විමොක්ෂයෝ වෙති ද දශ ශීතිස්‍යාද්විමොක්ෂයෝ එක් ශීතිස්‍යාද් විමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන් පය්‍ර්‍යායයෙන් වන්නේ යි.

**සියාති** කථඤ්ච සියා: අනිච්චානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං[1] නිච්චතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. දුක්ඛානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං සුඛතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. අනත්තානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං අත්තතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියා විමොක්ඛො. නිබ්බිදානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං නන්දියා සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො, විරාගානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං රාගතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියා විමොක්ඛො. නිරොධානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං සමුදයතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. පටිනිස්සග්ගානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං ආදානතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. අනිමිත්තානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං නිමිත්තතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. අප්පණිහිතානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං පණිධියා සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. සුඤ්ඤතානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං අභිනිවෙසතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියා විමොක්ඛො.

එවං සියා එකො සීතිසියාවිමොක්ඛො දස සීතිසියාවිමොක්ඛා හොන්ති, දස සීතිසියාවිමොක්ඛා එකො සීතිසියාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

රූපෙ අනිච්චානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං නිච්චතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො, -පෙ- රූපෙ සුඤ්ඤතානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං අභිනිවෙසතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො. එවං සියා එකො සීතිසියාවිමොක්ඛො දස සීතිසියාවිමොක්ඛා හොන්ති, දස සීතිසියාවිමොක්ඛා එකො සීතිසියාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං නිච්චතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො -පෙ- ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනා අනුත්තරං සීතිභාවං ඤාණං අභිනිවෙසතො සන්තාපපරිළාහදරථා මුච්චතීති සීතිසියාවිමොක්ඛො.

එවං සියා එකො සීතිසියාවිමොක්ඛො දස සීතිසියාවිමොක්ඛා හොන්ති, දස සීතිසියාවිමොක්ඛා එකො සීතිසියාවිමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන. අයං සීතිසියාවිමොක්ඛො.

1 සීතිභාවඤාණං - සී 1, 2

**සීසා** යනු: **කිසෙයින් වන්නේ ද යත්:** අනිච්චානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තර (උතුම්) වූ ශීතිභාව (නිර්වාණ) ඥානය නිත්‍ය වශයෙන් පැවැති (කෙලශ සඞ්ඛ්‍යාත) සන්තාපපරිදාහදරථයෙන් (තැවීම්දැවීම්උෂ්ණසුම්න්) මිදේ නු' යි ශීතීස්‍යාද්විමොක්‍ෂ නම, දුක්ඛානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තර ශීතිභාවඥානය සුඛ වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතිස්‍යාද්විමොක්‍ෂ නම, අනත්තානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තරශීතිභාව ඥානය ආත්ම වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතීස්‍යාද්විමොක්‍ෂ නම, නිබ්බිදානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තරශීතිභාවඥානය නන්දි වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතීස්‍යාද් විමොක්‍ෂ නම, විරාගානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තර ශීතිභාවඥානය රාග වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතීස්‍යාද්විමොක්‍ෂ නම, නිරොධානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තරශීතිභාවඥානය සමුදය වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතිස්‍යාද්විමොක්‍ෂ නම, පටිනිස්සග්ගානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තර ශීතිභාවඥානය ආදාන වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේනු'යි ශීතීස්‍යාද් විමොක්‍ෂ නම, අනි-මිත්තානුපස්සනා සංඛ්‍යාත අනුත්තර ශීතිභාවඥානය නිමිත්ත වශයෙන් පැවැති සන්තාපරිදාහදරථයෙන් මිදේ නු'යි ශීතීස්‍යාද්විමොක්‍ෂ නම, අප්පණිහිතානු-පස්සනා සංඛ්‍යාත අනුත්තරශීතිභාවඥානය ප්‍රණිධි වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු'යි ශීතීස්‍යාද්විමොක්‍ෂ නම, සුඤ්ඤතානු-පස්සනා සඞ්ඛ්‍යාත අනුත්තර ශීතිභාවඥානය අභිනිවෙශ වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු'යි ශීතීස්‍යාද්විමොක්‍ෂ නමි.

මෙසෙයින් එක් ශීතීස්‍යාද්විමොක්‍ෂය දශශීතීස්‍යාද්විමොක්‍ෂයෝ වෙතී ද දශශීතිස්‍යාද්විමොක්‍ෂයෝ එක් ශීතීස්‍යාද්විමොක්‍ෂය වේ යයි ද වස්තු වශයෙන්, පර්‍යායයෙන් වන්නේ යැ.

රූපයෙහි අනිච්චානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තර ශීතිභාවඥානය නිත්‍ය වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු'යි ශීතීස්‍යාද්විමොක්‍ෂ නම ... රූපයෙහි සුඤ්ඤතානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තරශීතිභාවඥානය අභිනිවෙශ වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථ-යෙන් මිදේ නු' යි ශීතිස්‍යාද්විමොක්‍ෂ නමි. මෙසෙයින් එක් ශීතිස්‍යාද් විමොක්‍ෂය දශශීතිස්‍යාද්විමොක්‍ෂයෝ වෙතී ද දශ ශීතිස්‍යාද්විමොක්‍ෂයෝ එක් ශීතීස්‍යාද්විමොක්‍ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍යායයෙන් වන්නේ යැ.

වෙදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්‍ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තරශීති-භාවඥානය නිත්‍ය වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථයෙන් මිදේ නු' යි ශීතීස්‍යාද්විමොක්‍ෂ නම ... ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනා සඞ්ඛ්‍යාත අනුත්තරශීතිභාවඥානය අභිනිවෙශ වශයෙන් පැවැති සන්තාපපරිදාහදරථ-යෙන් මිදේ නු' යි ශීතීස්‍යාද්විමොක්‍ෂ නමි

මෙසෙයින් එක් ශීතීස්‍යාද්විමොක්‍ෂය දශශීතීස්‍යාද්විමොක්‍ෂයෝ වෙතී ද දශශීතිස්‍යාද්විමොක්‍ෂයෝ එක් ශීතිස්‍යාද්විමොක්‍ෂය වේ යයි ද වස්තු වශයෙන්, පර්‍යායයෙන් වන්නේ යි. මේ ශීතීස්‍යාද්විමොක්‍ෂ නම් වේ.

කතමො ඣානවිමොක්ඛො: නෙක්ඛම්මං ඣායතීති[1] ඣානං කාමච්ඡන්දං ඣාපෙතීති ඣානං, ඣායන්තො[2] මුච්චතීති ඣානවිමොක්ඛො, ඣාපෙන්තො මුච්චතීති ඣානවිමොක්ඛො. ඣායන්තීති[3] ධම්මා, ඣාපෙතීති කිලෙසෙ, ඣාතෙ[4] ච ඣාපෙ ච ජානාතීති ඣානවිමොක්ඛො. අබ්‍යාපාදො ඣායතීති[1] ඣානං, බ්‍යාපාදං ඣාපෙතීති ඣානං, ඣායන්තො[2] මුච්චතීති ඣානවිමොක්ඛො, ඣාපෙන්තො මුච්චතීති ඣානවිමොක්ඛො. ඣායන්තීති[3] ධම්මා' ඣාපෙතීති කිලෙසෙ, ඣාතෙ[4] ච ඣාපෙ ච ජානාතීති ඣානවිමොක්ඛො ආලොකසඤ්ඤා ඣායතීති ඣානං, ථීනමිද්ධං ඣාපෙතීති ඣානං -පෙ- අවික්ඛෙපො ඣායතීති ඣානං, උද්ධච්චං ඣාපෙතීති ඣානං -පෙ- ධම්මවවත්ථානං ඣායතීති ඣානං, විචිකිච්ඡං ඣපෙතීති ඣානං -පෙ- ඤාණං ඣායතීති ඣානං, අවිජ්ජං ඣාපෙතීති ඣානං, -පෙ- පාමොජ්ජං ඣයතීති ඣානං, අරතිං ඣාපෙතීති ඣානං -පෙ- පඨමං ඣානං, ඣායතීති ඣානං, නීවරණෙ[1] ඣාපෙතීති ඣානං -පෙ- අරහත්තමග්ගො ඣායතීති ඣානං, සබ්බකිලෙසෙ ඣාපෙතීති ඣානං, ඣායන්තො මුච්චතීති ඣානවිමොක්ඛො, ඣාපෙන්තො මුච්චතීති ඣානවිමොක්ඛො. ඣායන්තීති ධම්මා, ඣාපෙතීති කිලෙසෙ, ඣාතෙ ච ඣාපෙ ච ජානාතීති ඣානවිමොක්ඛො. අයං ඣානවිමොක්ඛො.

කතමො අනුපාදචිත්තස්ස විමොක්ඛො: සියා එකො අනුපාදචිත්තස්ස විමොක්ඛො දස අනුපාදචිත්තස්ස විමොක්ඛා හොන්ති, දස අනුපාදචිත්තස්ස විමොක්ඛා එකො අනුපාදචිත්තස්ස විමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

**සියාති** කථඤ්ච සියා: අනිච්චානුපස්සනා ඤාණං නිච්චතො උපාදනා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. දුක්ඛානුපස්සනා ඤාණං සුඛතො උපාදනා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. අනත්තානුපස්සනා ඤාණං අත්තතො උපාදනා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. නිබ්බිදානුපස්සනා ඤාණා නන්දියා උපාදනා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. විරාගානුපස්සනා ඤාණං රාගතො උපාදනා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. නිරොධානුපස්සනා ඤාණං සමුදයතො උපාදනා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. පටිනිස්සග්ගානුපස්සනා ඤාණං ආදානතො උපාදනා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. අනිමිත්තානුපස්සනා ඤාණා නිමිත්තතො උපාදනා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. අප්පණිහිතානුපස්සනා ඤාණං පණිධියා උපාදනා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො. සුඤ්ඤතානුපස්සනා ඤාණං අභිනිවෙසතො උපාදනා මුච්චතීති අනුපාදචිත්තස්ස විමොක්ඛො.

එවං සියා එකො අනුපාදචිත්තස්ස විමොක්ඛො දස අනුපාදචිත්තස්ස විමොක්ඛා හොන්ති, දස අනුපාදචිත්තස්ස විමොක්ඛා එකො අනුපාදචිත්තස්ස විමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

---

1. ජායතීති - සයා, පු. 2. ජායන්තො - සයා 3. ජායන්තීති - සයා 4. ජාතෙ - සයා
5 නීවරණං - සයා.

ධ්‍යානවිමොක්ෂ නම් කවරෙ යත්: නෛෂ්ක්‍රම්‍ය තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, කාමච්ඡන්දය දවා නු’ යි ධ්‍යාන නම, ධ්‍යාන කරනුයේ මිදේ නු’ යි ධ්‍යානවිමොක්ෂ නම, දවනුයේ මිදේ නු’ යි ධ්‍යානවිමොක්ෂ නම. **ඣායන්ති** යනු: ධර්මයෝ යෑ, **ඣාපෙන්ති** යනු: කෙලෙසුන් යෑ; ධ්‍යාන කළ ධර්මයන් ද දැවුණු කෙලෙසුන් ද දනී නු’ යි ධ්‍යානවිමොක්ෂ නම, අව්‍යාපාද තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, ව්‍යාපාදය දවා නු’ යි ධ්‍යාන නම, ධ්‍යාන කරනුයේ මිදේ නු’ යි ධ්‍යානවිමොක්ෂ නම, දවනුයේ මිදේ නු’ යි ධ්‍යානවිමොක්ෂ නම. **ඣායන්ති** යනු: ධර්මයෝ යෑ, **ඣාපෙන්ති** යනු: කෙලෙසුන් යෑ, ධ්‍යාන කළ ධර්මයන් ද දැවුණු කෙලෙසුන් ද දනී නු’ යි ධ්‍යානවිමොක්ෂ නම. ආලොකසංඥා තොමෝ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නමු, ථීනමිද්ධය දවා නු’ යි ධ්‍යාන නමු ... අවික්ෂෙප තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, ඖද්ධත්‍යය දවා නු’ යි ධ්‍යාන නම ... ධම්මව්‍යවත්ථාන තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, විචිකිත්සාව දවා නු’ යි ධ්‍යාන නම ... ඥාන තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, අවිද්‍යාව දවා නු’ යි ධ්‍යාන නම ... ප්‍රාමොද්‍ය තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, අරතිය දවා නු’ යි ධ්‍යාන නම ... ප්‍රථමධ්‍යාන තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, නීවරණයන් දවා නු’ යි ධ්‍යාන නම ... අර්හත්මාර්ග තෙමේ ධ්‍යාන කෙරේ නු’ යි ධ්‍යාන නම, හැම කෙලෙසුන් දවා නු’ යි ධ්‍යාන නම ... ධ්‍යාන කරනුයේ මිදේ නු’ යි ධ්‍යානවිමොක්ෂ නම, දවනුයේ මිදේ නු’ යි ධ්‍යාන විමොක්ෂ නම. **ඣායන්ති** යනු: ධර්මයෝ යෑ, **ඣාපෙන්ති** යනු: කෙලෙසුන් යෑ, ධ්‍යාන කළ දහමුදු දැවුණු කෙලෙසුනුදු දනී නු’ යි ධ්‍යානවිමොක්ෂ නමි. මේ ධ්‍යානවිමොක්ෂ නම් වේ.

අනුපාදචිත්තවිමොක්ෂ කවරෙ යත්: එක් අනුපාදචිත්තවිමොක්ෂය දශ අනුපාදචිත්තවිමොක්ෂයෝ වෙති ද දශ අනුපාදචිත්තවිමොක්ෂයෝ එක් අනුපාදචිත්තවිමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍යායයෙන් වන්නේ යි.

**සියං** යනු: කිසෙයින් වන්නේ යෑ යත්: අනිච්චානුපස්සනාඥානය නිත්‍යවශයෙන් පැවැති උපාදානයෙන් (ග්‍රහණයෙන්) මිදේ නු’ යි අනුපාද-චිත්තවිමොක්ෂ යෑ, දුක්ඛානුපස්සනාඥානය සුඛවශයෙන් පැවැති උපාදාන-යෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්ෂ යෑ, අනත්තානුපස්සනාඥානය ආත්මවශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්ෂ යෑ, නිබ්බිදානුපස්සනාඥානය නන්දිවශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්ෂ යෑ විරාගානුපස්සනාඥානය රාගවශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්ෂ යෑ නිරොධානුපස්සනා-ඥානය සමුදය වශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු’ යි අනුපාදචිත්ත-විමොක්ෂ යෑ පටිනිස්සග්ගානුපස්සනාඥානය ආදානවශයෙන් පැවැති උපාද-නයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්ෂ යෑ අනිමිත්තානුපස්සනාඥානය නිමිත්තවශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්ෂ යෑ අප්පණිහිතානුපස්සනාඥානය ප්‍රණිධිවශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්ෂ යෑ සුඤ්ඤතානුපස්සනාඥානය අභිනිවෙශ වශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු’ යි අනුපාදචිත්තවිමොක්ෂ යි.

මේ සෙයින් එක් අනුපාදචිත්තවිමොක්ෂය දශ අනුපාදචිත්තවිමොක්ෂයෝ වෙති ද දශ අනුපාදචිත්තවිමොක්ෂයෝ එක් අනුපාදචිත්තවිමොක්ෂය වේ යයි ද වස්තුවශයෙන් පර්‍යායයෙන් වන්නේ යි.

රූපෙ අනිච්චානුපස්සනා ඤාණං නිච්චතො උපාදානා මුච්චතීති අනුපාදාචිත්තස්ස විමොක්ඛො. -පෙ- රූපෙ සුඤ්ඤතානුපස්සනා ඤාණං අභිනිවෙසතො උපාදානා මුච්චතීති අනුපාදාචිත්තස්ස විමොක්ඛො. එවං සියා එකො අනුපාදාචිත්තස්ස විමොක්ඛො දස අනුපාදාචිත්තස්ස විමොක්ඛා හොන්ති, දස අනුපාදාචිත්තස්ස විමොක්ඛා එකො අනුපාදාචිත්තස්ස විමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනා ඤාණං අභිනිවෙසතො උපාදානා මුච්චතීති අනුපාදාචිත්තස්ස විමොක්ඛො. එවං සියා එකො අනුපාදාචිත්තස්ස විමොක්ඛො දස අනුපාදාචිත්තස්ස විමොක්ඛා හොන්ති, දස අනුපාදාචිත්තස්ස විමොක්ඛා එකො අනුපාදාචිත්තස්ස විමොක්ඛො හොති වත්ථුවසෙන පරියායෙන.

අනිච්චානුපස්සනා ඤාණං කතීහුපාදානෙහි[1] මුච්චති. දුක්ඛානුපස්සනා ඤාණං කතීහුපාදානෙහි මුච්චති. අනත්තානුපස්සනා ඤාණං කතීහුපාදානෙහි මුච්චති. නිබ්බිදානුපස්සනා ඤාණං -පෙ- විරාගානුපස්සනා ඤාණං -පෙ- නිරොධානුපස්සනා ඤාණං -පෙ- පටිනිස්සග්ගානුපස්සනා ඤාණං -පෙ- අනිමිත්තානුපස්සනා ඤාණං -පෙ- අප්පණිහිතානුපස්සනා ඤාණං -පෙ- සුඤ්ඤතානුපස්සනා ඤාණං කතීහුපාදානෙහි මුච්චතීති.

අනිච්චානුපස්සනා ඤාණං තීහුපාදානෙහි මුච්චති, දුක්ඛානුපස්සනා ඤාණං එකුපාදානා[2] මුච්චති, අනත්තානුපස්සනා ඤාණං තීහුපාදානෙහි මුච්චති, නිබ්බිදානුපස්සනා ඤාණං එකුපාදානා මුච්චති, විරාගානුපස්සනා ඤාණං එකුපාදානා මුච්චති, නිරොධානුපස්සනා ඤාණං චතුහුපාදානෙහි මුච්චති, පටිනිස්සග්ගානුපස්සනා ඤාණං චතුහුපාදානෙහි මුච්චති, අනිමිත්තානුපස්සනා ඤාණං තීහුපාදානෙහි මුච්චති, අප්පණිහිතානුපස්සනා ඤාණං එකුපපාදානා මුච්චති, සුඤ්ඤතානුපස්සනා ඤාණං තීහුපාදානෙහි මුච්චති.

අනිච්චානුපස්සනා ඤාණං කතමෙහි තීහුපාදානෙහි මුච්චති දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා[3] අත්තවාදුපාදානා. අනිච්චානුපස්සනා ඤාණං ඉමෙහි තීහුපාදානෙහි මුච්චති.

දුක්ඛානුපස්සනා ඤාණං කතමා එකුපාදානා මුච්චති: කාමුපාදානා. දුක්ඛානුපස්සනා ඤාණං ඉදං එකුපාදානා[4] මුච්චති.

අනත්තානුපස්සනා ඤාණං කතමෙහි තීහුපාදානෙහි මුච්චති: දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. අනත්තානුපස්සනා ඤාණං ඉමෙහි තීහුපාදානෙහි මුච්චති.

නිබ්බිදානුපස්සනා ඤාණං කතමා එකුපාදානා මුච්චති: කාමුපාදානා. නිබ්බිදානුපස්සනා ඤාණං ඉදං එකුපාදානා මුච්චති.

විරාගානුපස්සනා ඤාණං කතමා එකුපාදානා මුච්චති: කාමුපාදානා. විරාගානුපස්සනා ඤාණං ඉදං එකුපාදානා මුච්චති.

---

1 කතිහු පාදානෙහි - මජසං, සයා
2. එකුපාදානා - මජසං, සයා,
3. සීලබ්බතුපාදානා -මජසං, සයා
4 ඉතොපාදානා - සයා· ඉමා එකුපාදානා - සී 1, ඉමං එකුපාදානං - PTS,

රූපයෙහි අනිච්චානුපස්සනාඥාණය නිත්‍යවශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු' යි අනුපාදවිත්තවිමොක්ෂ යැ ... රූපයෙහි සුඤ්ඤතානුපස්සනාඥාණය අභිනිවේශ වශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු' යි අනුපාදවිත්තවිමොක්ෂ යි. මෙසෙයින් එක් අනුපාදවිත්තවිමොක්ෂය දශ අනුපාදවිත්තවිමොක්ෂයෝ වෙතී ද දශ අනුපාදවිත්තවිමොක්ෂයෝ එක් අනුපාදවිත්තවිමොක්ෂය වේ යයි ද වස්තුවශයෙන් පර්‍යායයෙන් වන්නේ යැ.

වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනාඥාණය අභිනිවේශ වශයෙන් පැවැති උපාදානයෙන් මිදේ නු' යි අනුපාදවිත්තවිමොක්ෂ යි. මෙසෙයින් එක් අනුපාදවිත්තවිමොක්ෂය දශ අනුපාදවිත්තවිමොක්ෂයෝ වෙතී ද දශ අනුපාදවිත්තවිමොක්ෂයෝ එක් අනුපාදවිත්තවිමොක්ෂය වේ යයි ද වස්තු වශයෙන් පර්‍යායයෙන් වන්නේ යි.

අනිච්චානුපස්සනාඥාණය කෙතෙක් උපාදානයන් කෙරෙන් මිදේ ද, දුක්ඛානුපස්සනාඥාණය කෙතෙක් උපාදානයන් කෙරෙන් මිදේ ද, අනත්තානුපස්සනාඥාණය කෙතෙක් උපාදානයන් කෙරෙන් මිදේ ද, නිබ්බිදානුපස්සනාඥාණය ... විරාගානුපස්සනාඥාණය ... නිරොධානුපස්සනාඥාණය ... පටිනිස්සග්ගානුපස්සනාඥාණය ... අනිමිත්තානුපස්සනාඥාණය ... අප්පණිහිතානුපස්සනාඥාණය ... සුඤ්ඤතානුපස්සනාඥාණය කෙතෙක් උපාදානයන් කෙරෙන් මිදේ ද යත්:

අනිච්චානුපස්සනාඥාණය තුන් උපාදානයෙකින් මිදෙයි, දුක්ඛානුපස්සනාඥාණය එක් උපාදානයෙකින් මිදෙයි, අනත්තානුපස්සනාඥාණය තුන් උපාදානයෙකින් මිදෙයි, නිබ්බිදානුපස්සනාඥාණය එක් උපාදානයෙකින් මිදෙයි, විරාගානුපස්සනාඥාණය එක් උපාදානයෙකින් මිදෙයි, නිරොධානුපස්සනාඥාණය සතර උපාදානයෙකින් මිදෙයි, පටිනිස්සග්ගානුපස්සනාඥාණය සතර උපාදානයෙකින් මිදෙයි, අනිමිත්තානුපස්සනාඥාණය තුන් උපාදානයෙකින් මිදෙයි, අප්පණිහිතානුපස්සනාඥාණය එක් උපාදානයෙකින් මිදෙයි, සුඤ්ඤතානුපස්සනාඥාණය තුන් උපාදානයෙකින් මිදේ.

අනිච්චානුපස්සනාඥාණය කවර තුන් උපාදානයෙකින් මිදෙයි යත්: දෘෂ්ට්‍යුපාදානයෙන ශීලව්‍රතොපාදානයෙන ආත්මවාදොපාදානයෙනි. අනිච්චානුපස්සනාඥාණය මේ තුන් උපාදානයෙන් මිදෙයි.

දුක්ඛානුපස්සනාඥාණය කවර එක් උපාදානයෙකින් මිදෙයි යත්: කාමොපාදානයෙනි. දුක්ඛානුපස්සනාඥාණය මේ එක් උපාදානයෙන් මිදෙයි.

අනත්තානුපස්සනාඥාණය කාවර තුන් උපාදානයෙකින් මිදෙයි යත්: දෘෂ්ට්‍යුපාදානයෙන, ශීලව්‍රතොපදානයෙන, ආත්මවාදොපාදානයෙනි. අනත්තානුපස්සනාඥාණය මේ තුන් උපාදානයෙන් මිදෙයි.

නිබ්බිදානුපස්සනාඥාණය කවර එක් උපාදානයෙකින මිදෙයි යත්: කාමොපදානයෙනි. නිබ්බිදානුපස්සනාඥාණය මේ එක් උපාදානයෙන් මිදෙයි.

විරාගානුපස්සනාඥාණය කවර එක් උපාදානයෙකින් මිදෙයි යත්: කාමොපාදානයෙනි. විරාගානුපස්සනාඥාණය මේ එක් උපාදානයෙන් මිදෙයි.

නිරොධානුපස්සනා ඤාණං කතමෙහි චතූහුපාදානෙහි මුච්චති: කාමු-පාදානා දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. නිරොධානුපස්සනා ඤාණං ඉමෙහි චතූහුපාදානෙහි මුච්චති.

පටිනිස්සග්ගානුපස්සනා ඤාණං කතමෙහි චතූහුපාදානෙහි මුච්චති: කාමුපාදානා දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. පටිනිස්සග්ගානු-පස්සනා ඤාණං ඉමෙහි චතූහුපාදානෙහි මුච්චති.

අනිමිත්තානුපස්සනා ඤාණං කතමෙහි තීහුපාදානෙහි මුච්චති: දිට්ඨු-පාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. අනිමිත්තානුපස්සනා ඤාණං ඉමෙහි තීහුපාදානෙහි මුච්චති

අප්පණිහිතානුපස්සනා ඤාණං කතමා එකුපාදානා මුච්චති: කාමු-පාදානා. අප්පණිහිතානුපස්සනා ඤාණං ඉදං එකුපාදානා මුච්චති.

සුඤ්ඤතානුපස්සනා ඤාණං කතමෙහි තීහුපාදානෙහි මුච්චති: දිට්ඨු-පාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. සුඤ්ඤතානුපස්සනා ඤාණං ඉමෙහි තීහුපාදානෙහි මුච්චති.

යඤ්ච අනිච්චානුපස්සනා ඤාණං, යඤ්ච අනත්තානුපස්සනා ඤාණං, යඤ්ච අනිමිත්තානුපස්සනා ඤාණං, යඤ්ච සුඤ්ඤතානුපස්සනා ඤාණං, ඉමානි චත්තාරි ඤාණානි තීහුපාදානෙහි මුච්චන්ති: දිට්ඨුපාදානා සීලබ්බතු-පාදානා අත්තවාදුපාදානා. යඤ්ච දුක්ඛානුපස්සනා ඤාණං, යඤ්ච නිබ්බිදානු-පස්සනා ඤාණං, යඤ්ච විරාගානුපස්සනා ඤාණං, යඤ්ච අප්පණිහිතානු-පස්සනා ඤාණං, ඉමානි චත්තාරි ඤාණානි එකුපාදානා මුච්චන්ති: කාමු-පාදානා. යඤ්ච නිරොධානුපස්සනා ඤාණං, යඤ්ච පටිනිස්සග්ගානුපස්සනා ඤාණං, ඉමානි ද්වෙ ඤාණානි චතූහුපාදානෙහි මුච්චන්ති: කාමුපාදානා දිට්ඨුපාදානා සීලබ්බතුපාදානා අත්තවාදුපාදානා. අයං අනුපාද[1] චිත්තස්ස විමොක්ඛො.

**විමොක්ඛකථාය පඨමභාණවාරං.[2]**

තීණි ඛො පනිමානි විමොක්ඛමුඛානි, ලොකනිය්‍යානාය සංවත්තන්ති: සබ්බසඞ්ඛාරෙ පරිච්ඡෙදපරිවටුමතො[3] සමනුපස්සනතාය අනිමිත්තාය ච ධාතුයා චිත්තසම්පක්ඛන්දනතාය, සබ්බසඞ්ඛාරෙසු මනොසමුත්තෙජනතාය අප්පණිහිතාය ච ධාතුයා චිත්තසම්පක්ඛන්දනතාය, සබ්බධම්මෙ පරතො සමනුපස්සනතාය, සුඤ්ඤතාය ච ධාතුයා චිත්තසම්පක්ඛන්දනතාය ඉමානි තීණි විමොක්ඛමුඛානි ලොකනිය්‍යානාය සංවත්තන්ති.

අනිච්චතො මනසිකරොතො කථං සඞ්ඛාරා උපට්ඨහන්ති.[4] දුක්ඛතො මනසිකරොතො කථං සඞ්ඛාරා උපට්ඨහන්ති. අනත්තතො මනසිකරොතො කථං සඞ්ඛාරා උපට්ඨහන්ති: අනිච්චතො මනසිකරොතො ඛයතො සඞ්ඛාරා උපට්ඨහන්ති, දුක්ඛතො මනසිකරොතො භයතො සඞ්ඛාරා උපට්ඨහන්ති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතො සඞ්ඛාරා උපට්ඨහන්ති.

---

1. අනුපාදය - සී 1,
2. පඨමභාණවාරො - මජසං, පඨමභාණවාරං - සෑම PTS,
3. පරිවටුමතො සෑම, පරිවටවතො - PTS
4. උපට්ඨාති - මජසං, සෑ

නිරොධානුපස්සනාඥානය කවර සතර උපාදානයෙකින් මිදෙයි යත්: කාමොපාදානයෙන, දෘෂ්ටුපාදානයෙන, ශීලව්‍රතොපාදානයෙන, ආත්මවාදෙ- පාදානයෙනි. නිරොධානුපස්සනාඥානය මේ සතර උපාදානයෙන් මිදෙයි.

පටිනිස්සග්ගානුපස්සනාඥානය කවර සතර උපාදානයෙකින් මිදෙයි යත්: කාමොපාදානයෙන, දෘෂ්ටුපාදානයෙන, ශීලව්‍රතොපාදානයෙන, ආත්මවාදෙ- පාදානයෙනි. පටිනිස්සග්ගානුපස්සනාඥානය මේ සතර උපාදානයෙන් මිදෙයි.

අනිමිත්තානුපස්සනාඥානය කවර තුන් උපාදානයෙකින් මිදෙයි යත්: දෘෂ්ටුපාදානයෙන, ශීලව්‍රතොපාදානයෙන, ආත්මවාදෙපාදානයෙනි. අනි- මිත්තානුපස්සනාඥානය මේ තුන් උපාදානයෙන් මිදෙයි.

අප්පණිහිතානුපස්සනාඥානය කවර එක් උපාදානයෙකින් මිදෙයි යත්: කාමොපාදානයෙනි. අප්පණිහිතානුපස්සනාඥානය මේ එක් උපාදානයෙන් මිදෙයි.

සුඤ්ඤතානුපස්සනාඥානය කවර තුන් උපාදානයෙකින් මිදෙයි යත් දෘෂ්ටුපාදානයෙන, ශීලව්‍රතොපාදානයෙන, ආත්මවාදෙපාදානයෙනි. සුඤ්ඤ- තානුපස්සනාඥානය මේ තුන් උපාදානයෙන් මිදෙයි.

යම් අනිච්චානුපස්සනාඥානයෙකුත් යම් අනත්තානුපස්සනාඥානයෙ- කුත් යම් අනිමිත්තානුපස්සනාඥානයෙකුත් යම් සුඤ්ඤතානුපස්සනාඥාන- යෙකුත් වේ ද, මේ සතර ඥානයෝ තුන් උපාදානයෙකින් මිදෙති: දෘෂ්ටුපා- දානයෙන, ශීලව්‍රතොපාදානයෙන, ආත්මවාදෙපාදානයෙනි. යම් දුක්ඛානු- පස්සනාඥානයෙකුත් යම් නිබ්බිදානුපස්සනාඥානයෙකුත් යම් විරාගානු- පස්සනාඥානයෙකුත් යම් අප්පණිහිතානුපස්සනාඥානයෙකුත් වේ ද, මේ සතර ඥානයෝ එක් උපාදානයෙකින් මිදෙති: කාමොපාදානයෙනි. යම් නිරොධානුපස්සනාඥානයෙකුත් යම් පටිනිස්සග්ගානුපස්සනාඥානයෙකුත් වේ ද මේ ඥානයෝ දෙදෙන සතර උපාදානයෙකින් මිදෙති: කාමොපා- දානයෙන දෘෂ්ටුපාදානයෙන, ශීලව්‍රතොපාදානයෙන, ආත්මවාදෙපාදානයෙනි. මේ අනුපාදචිත්තවිමොක්ෂ යි.

**විමොක්ෂකථායෙහි පළමු වන බණවර යි.**

මේ තුන් විමොක්ෂමුඛයෝ (ත්‍රෛධාතුක) ලොකයෙන් නික්මීම පිණිස පවතිත්: හැම සංස්කාරයන් පරිච්ඡෙද වශයෙන් පර්‍යන්ත වශයෙන් නුවණින් විමසන බැවින් ද අනිමිත්ත සඞ්ඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත පිවිසෙන බැවින් ද (ලොකනිර්‍යාණය වෙයි), හැම සංස්කාරයන්හි සිත සංවෙග කරන බැවින් ද අප්‍රණිහිත සඞ්ඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත පිවිසෙන බැවින් ද (ලොකනිර්‍යාණය වෙයි), හැම ධර්මයන් අනාත්ම වශයෙන් නුවණින් විමසන බැවින් ද ශූන්‍යත සඞ්ඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත පිවිසෙන බැවින් ද (ලොකනිර්‍යාණය වෙයි). මේ තුන් විමොක්ෂමුඛයෝ ලොක- නිර්‍යාණය පිණිස පවතිත්.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට කිසෙයින් සංස්කාරයෝ වටහත් ද, දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට කිසෙයින් සංස්කාරයෝ වටහත් ද, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට කිසෙයින් සංස්කාරයෝ වටහත් ද, අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට ක්ෂය වියින් සංස්කාරයෝ වටහති. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට භය වියින් සංස්කාරයෝ වටහති. අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට ශූන්‍ය වියින් සංස්කාරයෝ වටහත්.

අනිච්චතො මනසිකරොතො කිංබහුලං චිත්තං හොති, දුක්ඛතො මනසිකරොතො කිංබහුලං චිත්තං හොති, අනත්තතො මනසිකරොතො කිංබහුලං චිත්තං හොති: අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලං චිත්තං හොති, දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලං චිත්තං හොති, අනත්තතො මනසිකරොතො වෙදබහුලං චිත්තං හොති.

අනිච්චතො මනසිකරොන්තො අධිමොක්ඛබහුලො කතමින්ද්‍රියං පටිලභති, දුක්ඛතො මනසිකරොන්තො පස්සද්ධිබහුලො කතමින්ද්‍රියං පටිලභති, අනත්තතො මනසිකරොන්තො වෙදබහුලො කතමින්ද්‍රියං පටිලභති: අනිච්චතො මනසිකරොන්තො අධිමොක්ඛබහුලො සද්ධින්ද්‍රියං පටිලභති, දුක්ඛතො මනසිකරොන්තො පස්සද්ධිබහුලො සමාධින්ද්‍රියං පටිලභති, අනත්තතො මනසිකරොන්තො වෙදබහුලො පඤ්ඤින්ද්‍රියං පටිලභති.

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය කතින්ද්‍රියානි තදන්වයානි[1] හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කො භාවෙති:

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කො භාවෙති:

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය කතින්ද්‍රියා තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කො භාවෙති:

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස සද්ධින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, යො සම්මාපටිපන්නො සො භාවෙති, නත්ථි මිච්ඡාපටිපන්නස්ස ඉන්ද්‍රියභාවනා.

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස සමාධින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, යො සම්මාපටිපන්නො සො භාවෙති, නත්ථි මිච්ඡාපටිපන්නස්ස ඉන්ද්‍රියභාවනා.

---

1. තදන්වයා - මජසං, ස,

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට සිත කුමක් බහුල කොට ඇත්තේ වේ ද, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට සිත කුමක් බහුල කොට ඇත්තේ වේ ද, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට සිත කුමක් බහුල කොට ඇත්තේ වේ ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට අධිමොක්ෂය බහුල කොට ඇති සිත වෙයි, දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රශ්‍රබ්ධිය බහුල කොට ඇති සිත වෙයි, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට තුෂ්ටිය බහුල කොට ඇති සිත වේ.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ අධිමොක්ෂය බහුල කොට ඇතියේ කවර ඉන්ද්‍රියයක් ලබා ද, දුඃඛ හෙයින් මෙනෙහිකරනුයේ ප්‍රශ්‍රබ්ධිය බහුල කොට ඇතියේ කවර ඉන්ද්‍රියයක් ලබා ද, අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ තුෂ්ටිය බහුල කොට ඇතියේ කවර ඉන්ද්‍රියයක් ලබා ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ අධිමොක්ෂය බහුල කොට ඇතියේ ශ්‍රද්ධෙන්ද්‍රිය ලබයි, දුඃඛ හෙයින් මෙනෙහිකරනුයේ ප්‍රශ්‍රබ්ධිය බහුල කොට ඇතියේ සමාධීන්ද්‍රිය ලබයි, අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ තුෂ්ටිය බහුල කොට ඇතියේ ප්‍රඥෙන්ද්‍රිය ලබා.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂ බහුලයාහට කවර ඉන්ද්‍රියයෙක් අධිපති කොට ඇත්තේ වේ ද, භාවනායෙහි කෙතෙක් ඉන්ද්‍රියයෝ එය අනුව යන්නාහු වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකකෘත්‍යයෝ වෙත් ද, කවර අර්ථයෙකින් භාවනා වේ ද, කවරෙක් භාවනා කෙරේ ද,

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට කවර ඉන්ද්‍රියයෙක් අධිපති කොට ඇත්තේ වේ ද, භාවනායෙහි කෙතෙක් ඉන්ද්‍රියයෝ එය අනුව යන්නාහු වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙකින් භාවනා වේ ද, කවරෙක් භාවනා කෙරේ ද,

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටිබහුලයාහට කවර ඉන්ද්‍රියයෙක් අධිපති කොට ඇත්තේ වේ ද, භාවනායෙහි කෙතෙක් ඉන්ද්‍රියයෝ එය අනුව යන්නාහු වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙකින් භාවනා වේ ද, කවරෙක් භාවනා කෙරේ ද යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂබහුලයාහට ශ්‍රද්ධෙන්ද්‍රිය අධිපති වෙයි, භාවනායෙහි සතර ඉන්ද්‍රිය කෙනෙක් තදනුකූල වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, (විමුක්තිරසයෙන්) එකරසාර්ථයෙන් භාවනාව වෙයි, යමෙක් සම්‍යක්ප්‍රතිපන්න වේ ද හෙතෙම භාවනා කෙරෙයි, මිථ්‍යාප්‍රතිපන්නයාහට ඉන්ද්‍රියභාවනා නැති.

දුඃඛ හෙයින් මෙනෙහි කරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට සමාධීන්ද්‍රිය අධිපති වෙයි, භාවනායෙහි සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි. යමෙක් සම්‍යක් ප්‍රතිපන්න වේ ද හෙතෙම භාවනා කෙරෙයි. මිථ්‍යාප්‍රතිපන්නයාහට ඉන්ද්‍රියභාවනා නැති.

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස පඤ්ඤින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, යො සම්මාපටිපන්නො සො භාවෙති, නත්ථි මිච්ඡාපටිපන්නස්ස ඉන්ද්‍රියභාවනා.

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිවෙධකාලෙ කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, පටිවෙධාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කෙනට්ඨෙන පටිවෙධො:

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිවෙධකාලෙ කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, පටිවෙධාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කෙනට්ඨෙන පටිවෙධො:

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිවෙධකාලෙ කතමින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, පටිවෙධාය කතින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කෙනට්ඨෙන පටිවෙධො:

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස සද්ධින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිවෙධකාලෙ පඤ්ඤින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, පටිවෙධාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පටිවෙධො. එවං පටිවිජ්ඣන්තොපි භාවෙති, භාවෙන්තොපි පටිවිජ්ඣති.

අනාත්ම හෙයින් මෙනෙහි කරන්නා වූ තුෂ්ටිබහුලයාහට ප්‍රඥෙන්ද්‍රිය අධිපති වෙයි, භාවනායෙහි සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි, යමෙක් සම්‍යක්ප්‍රතිපන්න වේ ද හෙතෙම භාවනා කෙරෙයි, මිථ්‍යාප්‍රතිපන්නයාහට ඉන්ද්‍රියභාවනා නැති.

අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නා වූ අධිමොක්ෂ බහුලයාහට කවර ඉන්ද්‍රියයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රය-ප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, (සත්‍ය) ප්‍රතිවෙධ කාලයෙහි කවර ඉන්ද්‍රියයෙක් අධිපති වේ ද, සත්‍යප්‍රතිවෙධය පිණිස කෙතෙක් ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍ය-ප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙකින් භාවනා වේ ද, කවර අර්ථයෙකින් ප්‍රතිවෙධය වේ ද යත්:

දුඃඛ හෙයින් මෙනෙහි කරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට කවර ඉන්ද්‍රියයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, ප්‍රතිවෙධ කාලයෙහි කවර ඉන්ද්‍රියයෙක් අධිපති වේ ද, ප්‍රතිවෙධය පිණිස කෙතෙක් ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙන් භාවනා වේ ද, කවර අර්ථයෙන් ප්‍රතිවෙධ වෙයි යත්:

අනාත්ම හෙයින් මෙනෙහි කරන්නා වූ තුෂ්ටිබහුලයාහට කවර ඉන්ද්‍රියයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙත් ද, සහජාත ප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, ප්‍රතිවෙධකාලයෙහි කවර ඉන්ද්‍රියයෙක් අධිපති වේ ද, ප්‍රතිවෙධය පිණිස කෙතෙක් ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙන් භාවනා වේ ද, කවර අර්ථයෙන් ප්‍රතිවෙධ වෙයි යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නා වූ අධිමොක්ෂ බහුලයාහට ශ්‍රද්ධෙන්ද්‍රිය අධිපති වෙයි, භාවනායෙහි සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ප්‍රතිවෙධකාලයෙහි ප්‍රඥෙන්ද්‍රිය අධිපති වෙයි, ප්‍රතිවෙධය පිණිස සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාත-ප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රතිවෙධය වෙයි, මෙසෙයින් ප්‍රතිවෙධ කරනුයේ ද භාවනා කෙරෙයි, භාවනා කරනුයේ ද, ප්‍රතිවෙධ කෙරේ.

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස සමාධින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා-හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිවෙධකාලෙ පඤ්ඤින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, පටිවෙධාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, ඒකරසා හොන්ති, ඒකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පටිවෙධො, එවං පටිවිජ්ඣන්තොපි භාවෙති, භාවෙන්තොපි පටිවිජ්ඣති.

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස පඤ්ඤින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, භාවනාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිවෙධකාලෙ[1], පඤ්ඤින්ද්‍රියං ආධිපතෙය්‍යං හොති, පටිවෙධාය චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, ඒකරසා හොන්ති, ඒකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පටිවෙධො, එවං පටිවිජ්ඣන්තොපි භාවෙති, භාවෙන්තොපි පටිවිජ්ඣති.

අනිච්චතො මනසිකරොතො කතමින්ද්‍රියං අධිමත්තං හොති, කතමින්ද්‍රියස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො[2] හොති. දුක්ඛතො මනසිකාරොතො කතමින්ද්‍රියං අධිමත්තං හොති, කතමින්ද්‍රියස්ස අධිමත්තත්තා කායසක්ඛී[3] හොති. අනත්තතො මනසිකරොතො කතමින්ද්‍රියං අධිමත්තං හොති, කතමින්ද්‍රියස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති.

අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො,[2] හොති, දුක්ඛතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති, අනත්තතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති.

'සද්දහන්තො විමුත්තො'ති[4] සද්ධාවිමුත්තො,[2] ඵුට්ඨත්තා සච්ඡිකතො'ති[5] කායසක්ඛි, 'දිට්ඨත්තා පත්තො'ති දිට්ඨිප්පත්තො, සද්දහන්තො විමුච්චතී'ති[6] සද්ධාවිමුත්තො,[2] 'ඣානඵස්සං පඨමං ඵුසති, පච්ඡා නිරොධං නිබ්බානං සච්ඡිකරොතී'ති කායසක්ඛි, 'දුක්ඛා සඞ්ඛාරා, සුඛො නිරොධො'ති ඤාතං.[7] හොති දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය'ති දිට්ඨිප්පත්තො.

යො චායං පුග්ගලො සද්ධාවිමුත්තො, යො ච කායසක්ඛි, යො ච දිට්ඨිප්පත්තො, සියා ඉමෙ තයො පුග්ගලා සද්ධාවිමුත්තාපි කායසක්ඛීපි දිට්ඨිප්පත්තාපි වත්ථුවසෙන පරියායෙන.[8]

---

1. පටිවෙධකාලෙපි - මජසං.
2. සද්ධාධිමුත්තො - ස්‍යා
3. කායසක්ඛි - ස්‍යා
4. අධිමුත්තොතාති - ස්‍යා.
5. සච්ඡිකරොතීති - ස්‍යා. PTS.
6. අධිමුච්චතීති - ස්‍යා.
7. ඤාණං - ස්‍යා.
8. පරියායෙන සියාති - මජසං.

දුඃඛ හෙයින් මෙනෙහි කරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට සමාධීන්ද්‍රිය අධිපති වෙයි, භාවනායෙහි සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාත-ප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ප්‍රතිවෙධකාලයෙහි ප්‍රඥෙන්ද්‍රිය අධිපති වෙයි, ප්‍රතිවෙධය පිණිස සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්ත-ප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රතිවෙධය වෙයි, මෙසෙයින් ප්‍රතිවෙධ කරනුයේ ද, භාවනා කෙරෙයි, භාවනා කරනුයේ ද, ප්‍රතිවෙධ කෙරේ.

අනාත්ම හෙයින් මෙනෙහි කරන්නා වූ, තුෂ්ටිබහුලයාහට ප්‍රඥෙන්ද්‍රිය අධිපති වෙයි, භාවනායෙහි සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජා-තප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ප්‍රතිවෙධ කාලයෙහි ප්‍රඥෙන්ද්‍රිය අධිපති වෙයි, ප්‍රතිවෙධය පිණිස සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝ'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්ත-ප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි, දර්ශනාර්ථ-යෙන් ප්‍රතිවෙධය වෙයි, මෙසෙයින් ප්‍රතිවෙධ කරනුයේ ද භාවනා කෙරෙයි, භාවනා කරනුයේ ද ප්‍රතිවෙධ කෙරේ.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට කවර ඉන්ද්‍රියයෙක් බලවත් වේ ද, කවර ඉන්ද්‍රියයක් බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වේ ද, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට කවර ඉන්ද්‍රියයෙක් බලවත් වේ ද, කවර ඉන්ද්‍රියයක් බලවත් බැවින් කායසාක්ෂි වේ ද, අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට කවර ඉන්ද්‍රියයෙක් බලවත් වේ ද, කවර ඉන්ද්‍රියයක් බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වෙයි යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වෙයි, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් කාය-සාක්ෂි වෙයි, අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වේ.

හදහමින් මිදුණේ නු'යි ශ්‍රද්ධාවිමුක්ත යැ (ධ්‍යානස්පර්ශය) ස්පර්ශ කළ බැවින් ප්‍රත්‍යක්ෂ කරන ලද නු'යි කායසාක්ෂි යැ (ප්‍රඥෙන්ද්‍රියයෙන්) දක්නා ලද බැවින් (නිවනට) පැමිණියේ නු'යි දෘෂ්ටිප්‍රාප්ත යි. හදහමින් මිදේ නු'යි ශ්‍රද්ධාවිමුක්ත යැ, ධ්‍යානස්පර්ශය පළමු වැ ස්පර්ශ කෙරෙයි, පසුව නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය සාක්ෂාත් කෙරේ නු'යි කායසාක්ෂි යැ, සංස්කාරයෝ දුඃඛයෝ යැ, නිරොධය සුඛ යැ'යි ප්‍රඥයෙන් දන්නා ලද දක්නා ලද ප්‍රකට කරන ලද සාක්ෂාත් කරන ලද ස්පර්ශ කරනලද වේ නු'යි දෘෂ්ටිප්‍රාප්ත යි.

යමෙකුත් ශ්‍රද්ධාවිමුක්තපුද්ගල වේ ද යමෙකුත් කායසාක්ෂි වේ ද යමෙකුත් දෘෂ්ටිප්‍රාප්ත වේ ද මේ පුද්ගලයෝ තිදෙන වස්තුවශයෙන් පර්යායයෙන් ශ්‍රද්ධාවිමුක්ත ද වන්නාහ, කායසාක්ෂි ද වන්නාහ, දෘෂ්ටිප්‍රාප්ත ද වන්නාහු යි.

**සියාති** කථඤ්ච සියා. අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො හොති, දුක්ඛතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො හොති, අනත්තතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො හොති, එවං ඉමෙ තයො පුග්ගලා සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා.

දුක්ඛතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති, අනත්තතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති, අනිච්චතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති, එවං ඉමෙ තයො පුග්ගලා සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී.

අනත්තතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති. අනිච්චතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති, දුක්ඛතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති. එවං ඉමෙ තයො පුග්ගලා පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යො චායං පුග්ගලො සද්ධාවිමුත්තො, යො ච කායසක්ඛී, යො ච දිට්ඨිප්පත්තො, එවං සියා ඉමෙ තයො පුග්ගලා සද්ධාවිමුත්තාපි කායසක්ඛීපි දිට්ඨිප්පත්තාපි වත්ථුවසෙන පරියායෙන.

යො චායං පුග්ගලො සද්ධාවිමුත්තො, යො ච කායසක්ඛී, යො ච දිට්ඨිප්පත්තො, සියා ඉමෙ තයො පුග්ගලා අඤ්ඤො යෙව සද්ධාවිමුත්තො, අඤ්ඤො කායසක්ඛී, අඤ්ඤො දිට්ඨිප්පත්තො.

**සියාති** කථඤ්ච සියා. අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො හොති, දුක්ඛතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති. අනත්තතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති.

යො චායං පුග්ගලො සද්ධාවිමුත්තො, යො ච කායසක්ඛී, යො ච දිට්ඨිප්පත්තො, එවං සියා ඉමෙ තයො පුග්ගලා සද්ධාවිමුත්තාපි කායසක්ඛීපි දිට්ඨිප්පත්තාපි වත්ථුවසෙන පරියායෙන, අඤ්ඤො යෙව සද්ධාවිමුත්තො අඤ්ඤො කායසක්ඛී, අඤ්ඤො දිට්ඨිප්පත්තො.

අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්තිමග්ගං පටිලභති, තෙන වුච්චති සද්ධානුසාරී. චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, සද්ධින්ද්‍රියස්ස වසෙන චතුන්නං ඉන්ද්‍රියානං භාවනා හොති. යෙ හි කෙචි සද්ධින්ද්‍රියස්ස වසෙන සොතාපත්තිමග්ගං පටිලභන්ති, සබ්බෙ තෙ සද්ධානුසාරිනො.

**සියා** යනු: කිසෙයින් වන්නේ ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ශ්‍රද්ධා-විමුක්ත වෙයි. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වෙයි. අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වෙයි. මෙසෙයින් මේ තුන් පුද්ගලෝ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වන්නාහ.

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් කායසාක්ෂි වෙයි. අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් කායසාක්ෂි වෙයි. අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් කායසාක්ෂි වේ. මෙසෙයින් මේ තුන් පුද්ගලෝ සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වන්නාහ.

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වෙයි. අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වෙයි. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වේ. මෙසෙයින් මේ තුන් පුද්ගලෝ ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වන්නාහ.

යමෙකුත් ශ්‍රද්ධාවිමුක්තපුද්ගල වේ ද යමෙකුත් කායසාක්ෂි වේ ද යමෙකුත් දෘෂ්ටිප්‍රාප්ත වේ ද මෙසෙයින් මේ පුද්ගලයෝ තිදෙන වස්තුවශයෙන් පර්යා-යයෙන් ශ්‍රද්ධාවිමුක්ත ද කායසාක්ෂි ද දෘෂ්ටිප්‍රාප්ත ද වන්නාහු යි.

යම් ද පුද්ගලයෙක් ශ්‍රද්ධාවිමුක්ත වේ ද යමෙකුත් කායසාක්ෂි වේ ද යමෙකුත් දෘෂ්ටිප්‍රාප්ත වේ ද මේ පුද්ගලයෝ තිදෙන අනෙකෙක් මැ ශ්‍රද්ධා-විමුක්ත වන්නේ යැ, අනෙකෙක් මැ කායසාක්ෂි වන්නේ යැ, අනෙකෙක් මැ දෘෂ්ටිප්‍රාප්ත වන්නේ යි.

**සියා** යනු: කිසෙයින් වන්නේ ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ශ්‍රද්ධා-විමුක්ත වෙයි. දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් කායසාක්ෂි වෙයි. අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වේ.

යම් ද පුද්ගලයෙක් ශ්‍රද්ධාවිමුක්ත වේ ද යමෙකුත් කායසාක්ෂි වේ ද යමෙකුත් දෘෂ්ටිප්‍රාප්ත වේ ද මෙසෙයින් මේ පුද්ගලයෝ තිදෙන වස්තුවශයෙන් පර්යායයෙන් ශ්‍රද්ධාවිමුක්ත ද වන්නේ යැ කායසාක්ෂි ද වන්නේ යැ දෘෂ්ටිප්‍රාප්ත ද වන්නේ යැ, අනෙකෙක් මැ ශ්‍රද්ධාවිමුක්ත වන්නේ යැ අනෙකෙක් මැ කායසාක්ෂි වන්නේ යැ අනෙකෙක් මැ දෘෂ්ටිප්‍රාප්ත වන්නේ යි.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ස්‍රෝතාපත්තිමාර්ගය ලබයි, එයින් කියනු ලැබෙයි 'ශ්‍රද්ධානුසාරී' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්ත-ප්‍රත්‍යයෝ වෙත්. ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයන්ගේ භාවනා වෙයි. යම් කිසි කෙනෙක් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ස්‍රෝතාපත්තිමාර්ගය ලබත් ද එ හැම දෙන 'ශ්‍රද්ධානුසාරී' වෙති.

අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්තිඵලං සච්ඡිකතං හොති, තෙන වුච්චති සද්ධාවිමුත්තො: චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, සද්ධින්ද්‍රියස්ස වසෙන චත්තාරින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි, යෙ හි කෙචි සද්ධින්ද්‍රියස්ස වසෙන සොතාපත්තිඵලං සච්ඡිකතා, සබ්බෙ තෙ සද්ධාවිමුත්තා.

අනිච්චතො මනසිකරොතො සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධින්ද්‍රියස්ස අධිමත්තත්තා සකදාගාමිමග්ගං පටිලභති -පෙ- සකදාගාමිඵලං සච්ඡිකතං හොති -පෙ- අනාගාමිමග්ගං පටිලභති -පෙ- අනාගාමිඵලං සච්ඡිකතං හොති -පෙ- අරහත්තමග්ගං පටිලභති -පෙ- අරහත්තං.[1] සච්ඡිකතං හොති, තෙන වුච්චති සද්ධාවිමුත්තො, චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති -පෙ- සම්පයුත්තපච්චයා හොන්ති, සද්ධින්ද්‍රියස්ස වසෙන චත්තාරින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි, යෙ හි කෙචි සද්ධින්ද්‍රියස්ස වසෙන අරහත්තං සච්ඡිකතා[2] සබ්බෙ තෙ සද්ධාවිමුත්තා.

දුක්ඛතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්තිමග්ගං පටිලභති, තෙන වුච්චති කායසක්ඛී; චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, සමාධින්ද්‍රියස්ස වසෙන චතුන්නං ඉන්ද්‍රියානං භාවනා හොති, යෙ හි කෙචි සමාධින්ද්‍රියස්ස වසෙන සොතාපත්තිමග්ගං පටිලභන්ති, සබ්බෙ තෙ කායසක්ඛී.

දුක්ඛතො මනසිකරොතො සමාධින්ද්‍රියං අධිමත්තං හොති, සමාධින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්තිඵලං සච්ඡිකතං හොති පෙ- සකදාගාමිමග්ගං පටිලභති -පෙ- සකදාගාමිඵලං සච්ඡිකතං හොති -පෙ- අනාගාමිමග්ගං පටිලභති -පෙ- අනාගාමිඵලං සච්ඡිකතං හොති -පෙ- අරහත්තමග්ගං පටිලභති -පෙ- අරහත්තං සච්ඡිකතං හොති, තෙන වුච්චති කායසක්ඛී; චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා සමාධින්ද්‍රියස්ස වසෙන චත්තාරින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි, යෙහි කෙචි සමාධින්ද්‍රියස්ස වසෙන අරහත්තං සච්ඡිකතා, සබ්බෙ තෙ කායසක්ඛී,

අනත්තතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්ති මග්ගං පටිලභති, තෙන වුච්චති ධම්මානුසාරී; චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති; පඤ්ඤින්ද්‍රියස්ස වසෙන චතුන්නං ඉන්ද්‍රියානං භාවනා හොති, යෙ හි කෙචි පඤ්ඤින්ද්‍රියස්ස වසෙන සොතාපත්තිමග්ගං පටිලභන්ති සබ්බෙ තෙ ධම්මානුසාරිනො.

---

1. අරහත්තඵලං - සයා PTS,
2. සච්ඡිකතං - මජසං

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් ස්‍රොතාපත්තිඵලය සාක්ෂාත් කරනලද වෙයි. එයින් කියනු ලැබෙයි 'ශ්‍රද්ධාවිමුක්ත' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යොන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති. ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ වඩනලද්දාහු මොනොවට වඩනලද්දාහු වෙත්. යම් කිසි කෙනෙක් ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ස්‍රොතාපත්තිඵලය සාක්ෂාත් කළාහු ද එහැම දෙන ශ්‍රද්ධාවිමුක්ත වෙති.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙයි, ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් බැවින් සකෘදාගාමිමාර්ගය ලබයි... සකෘදාගාමිඵලය සාක්ෂාත් කරනලද වෙයි ... අර්හත්මාර්ගය ලබයි... අර්හත්ඵලය සාක්ෂාත් කරනලද වෙයි, එයින් කියනු ලැබෙයි 'ශ්‍රද්ධාවිමුක්ත' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති ...සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ වඩනලද්දාහු මොනොවට වඩනලද්දාහු වෙති. යම් කිසි කෙනෙක් ශ්‍රද්ධෙන්ද්‍රි-යයාගේ වශයෙන් අර්හත්ඵලය සාක්ෂාත් කළාහු ද එහැම දෙන ශ්‍රද්ධාවිමුක්ත වෙත්.

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් ස්‍රොතාපත්තිමාර්ගය ලබයි, එයින් කියනු ලැබෙයි 'කායසාක්ෂි' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යොන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්ත-ප්‍රත්‍යයයෝ වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයන්ගේ භාවනා වෙයි, යම් කිසි කෙනෙක් සමාධීන්ද්‍රියයාගේ වශයෙන් ස්‍රොතාපත්තිමාර්ගය ලබත් ද එහැම දෙන 'කායසාක්ෂි වෙත්.

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට සමාධීන්ද්‍රිය බලවත් වෙයි, සමාධීන්ද්‍රිය බලවත් බැවින් ස්‍රොතාපත්තිඵලය පසක් කරනලද වෙයි ... සකෘදාගාමි මාර්ගය ලබයි ... සකෘදාගාමිඵලය පසක් කරනලද වෙයි ... අනාගාමිමාර්ගය ලබයි ... අනාගාමිඵලය පසක් කරනලද වෙයි ... අර්හත්මාර්ගය ලබයි ... අර්හත්ඵලය පසක් කරනලද වෙයි, එයින් කියනු ලැබෙයි 'කායසාක්ෂි' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යොන්‍ය-ප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති. සමාධීන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ වඩනලද්දාහු මොනොවට වඩනලද්දාහු වෙත්. යම් කිසි කෙනෙක් සමාධීන්ද්‍රියයාගේ වශයෙන් අර්හත්ඵලය පසක් කළාහු ද එහැම දෙන 'කායසාක්ෂි' වෙත්.

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් ස්‍රොතාපත්තිමාර්ගය ලබයි, එයින් කියනු ලැබෙයි 'ධර්මානුසාරී' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යොන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයන්ගේ භාවනා වෙයි. යම් කිසි කෙනෙක් ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් ස්‍රොතාපත්තිමාර්ගය ලබත් ද, එහැම දෙන 'ධර්මානුසාරී' වෙත්.

අනත්තතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා සොතාපත්තිඵලං සච්ඡිකතං හොති; තෙන වුච්චති දිට්ඨිප්පත්තො: චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන චත්තාරින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි, යෙ හි කෙචි පඤ්ඤින්ද්‍රියස්ස වසෙන සොතාපත්තිඵලං සච්ඡිකතා, සබ්බෙ තෙ දිට්ඨිප්පත්තා.

අනත්තතො මනසිකරොතො පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤින්ද්‍රියස්ස අධිමත්තත්තා සකදාගාමිමග්ගං පටිලභති -පෙ- සකදාගාමිඵලං සච්ඡිකතං හොති -පෙ- අනාගාමිමග්ගං පටිලභති -පෙ- අනාගාමිඵලං සච්ඡිකතං හොති -පෙ- අරහත්තමග්ගං පටිලභති -පෙ- අරහත්තං සච්ඡිකතං හොති, තෙන වුච්චති දිට්ඨිප්පත්තො; චත්තාරින්ද්‍රියානි තදන්වයානි හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන චත්තාරින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි, යෙ හි කෙචි පඤ්ඤින්ද්‍රියස්ස වසෙන අරහත්තං සච්ඡිකතා, සබ්බෙ තෙ දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි නෙක්ඛම්මං[1], භාවිතා වා භාවෙන්ති වා භාවිස්සන්ති වා, අධිගතා වා අධිගච්ඡන්ති වා අධිගමිස්සන්ති වා, පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, පටිලද්ධා වා පටිලභන්ති වා පටිලභිස්සන්ති වා පටිවිද්ධා වා පටිවිජ්ඣන්ති වා පටිවිජ්ඣිස්සන්ති වා, සච්ඡිකතා වා සච්ඡිකරොන්ති වා සච්ඡිකරිස්සන්ති වා, ඵස්සිතා වා ඵස්සන්ති වා ඵස්සිස්සන්ති වා, වසිප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, පාරමිප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, වෙසාරජ්ජප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, සබ්බෙ තෙ සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා,[2] සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි අබ්‍යාපාදං -පෙ- ආලොකසඤ්ඤං -පෙ- අවික්ඛෙපං -පෙ- ධම්මවවත්ථානං -පෙ- ඤාණං -පෙ- පාමොජ්ජං[3] -පෙ- පඨමං ඣානං[4] -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- ආකාසානඤ්චායතනසමාපත්තිං -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං -පෙ- අනිච්චානුපස්සනං -පෙ- දුක්ඛානුපස්සනං -පෙ- අනත්තානුපස්සනං -පෙ- නිබ්බිදානුපස්සනං -පෙ- විරාගානුපස්සනං -පෙ- නිරොධානුපස්සනං -පෙ- පටිනිස්සග්ගානුපස්සනං -පෙ- ඛයානුපස්සනං -පෙ- වයානුපස්සනං -පෙ- විපරිණාමානුපස්සනං -පෙ- අනිමිත්තානුපස්සනං -පෙ- අප්පණිහිතානුපස්සනං -පෙ- සුඤ්ඤතානුපස්සනං -පෙ- අධිපඤ්ඤාධම්මවිපස්සනං -පෙ- යථාභූතඤාණදස්සනං -පෙ- ආදීනවානුපස්සනං -පෙ- පටිසඞ්ඛානුපස්සනං -පෙ- විවට්ටනානුස්සනං -පෙ- සොතාපත්තිමග්ගං -පෙ- සකදාගාමිමග්ගං -පෙ- අනාගාමිමග්ගං -පෙ- අරහත්තමග්ගං -පෙ- යෙ හි කෙචි චත්තාරො සතිපට්ඨානෙ -පෙ- චත්තාරො සම්මප්පධානෙ -පෙ- චත්තාරො ඉද්ධිපාදෙ -පෙ- පඤ්චින්ද්‍රියානි -පෙ- පඤ්ච බලානි -පෙ- සත්ත බොජ්ඣඞ්ගෙ -පෙ- අරියං අට්ඨඞ්ගිකං මග්ගං -පෙ- යෙ හි කෙචි අට්ඨ විමොක්ඛෙ භාවිතා වා භාවෙන්ති වා භාවිස්සන්ති වා, අධිගතා වා අධිගච්ඡන්ති වා අධිගමිස්සන්ති වා,

1. නික්ඛම්මං - සී1, 2. සද්ධාධිමුත්තා - ස්‍යා,
3. පාමුජ්ජං - ස්‍යා. 4. පඨමජ්ඣානං - ස්‍යා. PTS.

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් ස්‍රොතාපත්තිඵලය සාක්ෂාත්කෘත වෙයි, එයින් කියනු ලැබෙයි 'දෘෂ්ටිප්‍රාප්ත' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාත-ප්‍රත්‍යයයෝ වෙති, අන්‍යො'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ වඩනලද්දාහු මොනොවට වඩනලද්දාහු වෙති, යම් කිසි කෙනෙක් ප්‍රඥෙන්ද්‍රිය-යාගේ වශයෙන් ස්‍රොතාපත්තිඵලය සාක්ෂාත්කෘත වෙත් ද එහැම දෙන 'දෘෂ්ටිප්‍රාප්ත' වෙත්.

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට ප්‍රඥෙන්ද්‍රිය බලවත් වෙයි, ප්‍රඥෙන්ද්‍රිය බලවත් බැවින් සකෘදාගාමිමාර්ගය ලබයි ... සකෘදාගාමිඵලය සාක්ෂාත්කෘත වෙයි ... අනාගාමිමාර්ගය ලබයි ... අනාගාමිඵලය සාක්ෂාත්කෘත වෙයි ... අර්හත්මාර්ගය ලබයි ... අර්හත්ඵලය සාක්ෂාත්කෘත වෙයි, එයින් කියනු ලැබෙයි 'දෘෂ්ටිප්‍රාප්ත' යි. සතර ඉන්ද්‍රියයෝ තදනුගාමී වෙති, සහජාත-ප්‍රත්‍යයයෝ වෙති, අන්‍යො'න්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් සතර ඉන්ද්‍රියයෝ වඩනලද්දාහු මොනොවට වඩන ලද්දාහු වෙති. යම් කිසි කෙනෙක් ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් අර්හත්ඵලය සාක්ෂාත්කෘත වෙත් ද එහැම දෙන 'දෘෂ්ටිප්‍රාප්ත' වෙත්.

යම් කිසි කෙනෙක් නෛෂ්ක්‍රම්‍යය වැඩූහු ද වඩත් ද වඩන්නාහු ද, අධිගම කළාහු ද අධිගම කෙරෙත් ද අධිගම කරන්නාහු ද. පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, ලැබූහු ද ලබත් ද ලබන්නාහු ද, ප්‍රතිවෙධ කළාහු ද ප්‍රතිවෙධ කෙරෙත් ද ප්‍රතිවෙධ කරන්නාහු ද ප්‍රත්‍යක්ෂ කළාහු ද ප්‍රත්‍යක්ෂ කෙරෙත් ද ප්‍රත්‍යක්ෂ කරන්නාහු ද (ඥානස්පර්ශයෙන්) ස්පර්ශ කළාහු ද ස්පර්ශ කෙරෙත් ද ස්පර්ශ කරන්නාහු ද, වශීභාවයට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද; පරතෙරට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්-නාහු ද, විශාරදභාවයට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, එ හැම දෙන ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වෙත්.

යම් කිසි කෙනෙක් අව්‍යාපාදය ... ආලොකසංඥාව ... අවික්ෂෙපය ... ධර්මනිශ්චය ... ඥානය . ප්‍රාමොද්‍යය ... ප්‍රථමධ්‍යානය ... ද්විතීයධ්‍යානය ... තෘතීයධ්‍යානය ... චතුර්ථධ්‍යානය ... ආකාසානඤ්චායතනසමාපත්තිය ... විඤ්ඤාණඤ්චායතනසමාපත්තිය ... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය ... අනිච්චානුපස්සනාව ... දුක්ඛානු-පස්සනාව ... අනත්තානුපස්සනාව ... නිබ්බිදානුපස්සනාව ... විරාගානු-පස්සනාව ... නිරොධානුපස්සනාව ... පටිනිස්සග්ගානුපස්සනාව ... ඛයානු-පස්සනාව .. වයානුපස්සනාව ... විපරිනාමානුපස්සනාව ... අනිමිත්තානු-පස්සනාව ... අප්පණිහිතානුපස්සනාව ... සුඤ්ඤතානුපස්සනාව ... අධි-පඤ්ඤාධම්මවිපස්සනාව ... යථාභූතඤාණදස්සනය ... ආදීනවානුපස්සනාව ... පටිසඞ්ඛානුපස්සනාව ... විවට්ටානුපස්සනාව ... ස්‍රොතාපත්තිමාර්ගය ... සකෘදාගාමිමාර්ගය ... අනාගාමිමාර්ගය ... අර්හත්මාර්ගය ... යම් කිසි කෙනෙක් සතරසතිපට්ඨානයන් ... සතර සම්‍යක්ප්‍රධානයන් ... සතර ඍද්ධිපාදයන් ... පඤ්චෙන්ද්‍රියයන් ... පඤ්චබලයන් ... සප්තබොධ්‍යඞ්ගයන් ... ආර්ය-අෂ්ටාඞ්ගිකමාර්ගය ... යම් කිසි කෙනෙක් අෂ්ටවිමොක්ෂයන් වැඩූහු ද වඩත් ද වඩන්නාහු ද, අධිගම කළාහු ද අධිගම කෙරෙත් ද අධිගම කරන්නාහු ද,

පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, පටිලද්ධා වා පටිලභන්ති වා පටිලභිස්සන්ති වා, පටිවිද්ධා වා පටිවිජ්ඣන්ති වා පටිවිජ්ඣිස්සන්ති වා, සච්ඡිකතා වා සච්ඡිකරොන්ති වා සච්ඡිකරිස්සන්ති වා, ඵස්සිතා වා ඵස්සන්ති වා ඵස්සිස්සන්ති වා, වසිප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, පාරමිප්පත්තා වා පපුණන්ති වා පාපුණිස්සන්ති වා, වෙසාරජ්ජප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා සබ්බෙ තෙ සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා, සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි චතස්සො පටිසම්භිදා පත්තා වා පාපුණන්ති පාපුණිස්සන්ති වා -පෙ- සබ්බෙ තෙ සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා, සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි තිස්සො විජ්ජා පටිවිද්ධා වා පටිවිජ්ඣන්ති වා පටිවිජ්ඣිස්සන්ති වා, -පෙ- සබ්බෙ තෙ සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි තිස්සො සික්ඛා සික්ඛිතා වා සික්ඛන්ති වා සික්ඛිස්සන්ති වා සච්ඡිකතා වා සච්ඡිකරොන්ති වා සච්ඡිකරිස්සන්ති වා, ඵස්සිතා වා ඵස්සන්ති වා ඵස්සිස්සන්ති වා, වසිප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, පාරමිප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, වෙසාරජ්ජප්පත්තා වා පාපුණන්ති වා පාපුණිස්සන්ති වා, සබ්බෙ තෙ සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා, සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි දුක්ඛං පරිජානන්ති -පෙ- සමුදයං පජහන්ති -පෙ- නිරොධං සච්ඡිකරොන්ති -පෙ- මග්ගං භාවෙන්ති, සබ්බෙ තෙ සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තා, සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තා.

කතිහාකාරෙහි සච්චපටිවෙධො හොති. කතිහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති: චතුහාකාරෙහි සච්චපටිවෙධො හොති, චතුහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති. දුක්ඛසච්චං පරිඤ්ඤාපටිවෙධං පටිවිජ්ඣති, සමුදයසච්චං පහානපටිවෙධං පටිවිජ්ඣති, නිරොධසච්චං සච්ඡිකිරියාපටිවෙධං පටිවිජ්ඣති, මග්ගසච්චං භාවනාපටිවෙධං පටිවිජ්ඣති. ඉමෙහි චතුහාකාරෙහි සච්චපටිවෙධො හොති, ඉමෙහි චතුහාකාරෙහි සච්චානි පටිවිජ්ඣන්තො සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තො, සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තො.

පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, ලැබූහු ද ලබත් ද ලබන්නාහු ද, ප්‍රතිවේධ කළාහු ද ප්‍රතිවේධ කෙරෙත් ද ප්‍රතිවේධ කරන්නාහු ද, ප්‍රත්‍යක්ෂ කළාහු ද ප්‍රත්‍යක්ෂ කෙරෙත් ද ප්‍රත්‍යක්ෂ කරන්නාහු ද, (ඥාන පහසින්) පැහැසුහු ද පහසිත් ද පහස්නාහු ද, ඉසුරු බවට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, පරතෙරට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, විශාරද බවට පැමිණියාහු ද පැමිණෙත් ද, පැමිණෙන්නාහු ද, ඒ හැම දෙන ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වෙත්.

යම් කිසි කෙනෙක් සතර ප්‍රතිසංවිදාවනට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද ... ඒ හැම දෙන ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වෙත්.

යම් කිසි කෙනෙක් ත්‍රිවිද්‍යාවන් ප්‍රතිවේධ කළාහු ද ප්‍රතිවේධ කෙරෙත් ද ප්‍රතිවේධ කරන්නාහු ද ... ඒ හැම දෙන ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වෙත්.

යම් කිසි කෙනෙක් ත්‍රිවිධශික්ෂාවන් හික්මුණාහු ද හික්මෙත් ද හික්මෙන්නාහු ද, සාක්ෂාත් කළාහු ද සාක්ෂාත් කෙරෙත් ද සාක්ෂාත් කරන්නාහු ද, (නුවණපහසින්) පැහැසුහු ද පහසිත් ද පහස්නාහු ද, ඉසුරු බවට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, අවසනට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, වෙසරද බවට පැමිණියාහු ද පැමිණෙත් ද පැමිණෙන්නාහු ද, ඒ හැම දෙන ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වෙත්.

යම් කිසි කෙනෙක් දුඃඛසත්‍යය (ඥාතතීරණපරිඥයෙන්) දැනගතිත් ද ... සමුදයසත්‍යය ... දුරු කෙරෙත් ද... නිරොධසත්‍යය සාක්ෂාත් කෙරෙත් ද, මාර්ගසත්‍යය වඩත් ද, ඒ හැම දෙන ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙති, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙති, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වෙත්.

කිනි අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වේ ද, කිනි අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවේධ කෙරේ ද යත්: සියු අයුරෙකින් සත්‍යප්‍රතිවේධය වෙයි, සියු අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවේධ කෙරෙයි: දුඃඛසත්‍යය පරිඥප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කෙරෙයි, සමුදයසත්‍යය ප්‍රහාණප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කෙරෙයි, නිරොධසත්‍යය සාක්ෂාත්ක්‍රියාප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කෙරෙයි, මාර්ගසත්‍යය භාවනාප්‍රතිවේධයෙන් ප්‍රතිවේධ කෙරේ. මේ සියු අයුරින් සත්‍යප්‍රතිවේධය වෙයි, මේ සියු අයුරින් සත්‍යයන් ප්‍රතිවේධ කරනුයේ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙයි, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙයි, ප්‍රඥෙන්ද්‍රියයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වේ.

කතිහාකාරෙහි සච්චපටිවෙධො හොති. කතිහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති. නවහාකාරෙහි සච්චපටිවෙධො හොති, නවහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති: දුක්ඛසච්චං පරිඤ්ඤාපටිවෙධං පටිවිජ්ඣති, සමුදයසච්චං පහානපටිවෙධං පටිවිජ්ඣති, නිරොධසච්චං සච්ඡිකිරියාපටිවෙධං පටිවිජ්ඣති, මග්ගසච්චං භාවනාපටිවෙධං පටිවිජ්ඣති, අභිඤ්ඤාපටිවෙධො ච සබ්බධම්මානං, පරිඤ්ඤාපටිවෙධො ච සබ්බසඞ්ඛාරානං, පහානපටිවෙධො ච සබ්බාකුසලානං, භාවනාපටිවෙධො ච චතුන්නං මග්ගානං, සච්ඡිකිරියාපටිවෙධො ච නිරොධස්ස. ඉමෙහි නවහාකාරෙහි සච්චපටිවෙධො හොති, ඉමෙහි නවහාකාරෙහි සච්චානි පටිවිජ්ඣන්තො සද්ධින්ද්‍රියස්ස වසෙන සද්ධාවිමුත්තො, සමාධින්ද්‍රියස්ස වසෙන කායසක්ඛී, පඤ්ඤින්ද්‍රියස්ස වසෙන දිට්ඨිප්පත්තො.

### දුතියක භාණවාරං.

අනිච්චතො මනසිකරොතො කථං සඞ්ඛාරා උපට්ඨහන්ති,[1] දුක්ඛතො මනසිකරොතො කථං සඞ්ඛාරා උපට්ඨහන්ති, අනත්තතො මනසිකරොතො කථං සඞ්ඛාරා උපට්ඨහන්ති: (1)

අනිච්චතො මනසිකරොතො ඛයතො සඞ්ඛාරා උපට්ඨහන්ති, දුක්ඛතො මනසිකරොතො භයතො සඞ්ඛාරා උපට්ඨහන්ති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතො සඞ්ඛාරා උපට්ඨහන්ති. (2)

අනිච්චතො මනසිකරොතො කිංබහුලං චිත්තං හොති, දුක්ඛතො මනසිකරොතො කිංබහුලං චිත්තං හොති, අනත්තතො මනසිකරොතො කිංබහුලං චිත්තං හොති: (1)

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලං චිත්තං හොති, දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලං චිත්තං හොති, අනත්තතො මනසිකරොතො වෙදබහුලං චිත්තං හොති. (2)

අනිච්චතො මනසිකරොන්තො අධිමොක්ඛබහුලො කතමං විමොක්ඛං පටිලභති, දුක්ඛතො මනසිකරොන්තො පස්සද්ධිබහුලො කතමං විමොක්ඛං පටිලභති, අනත්තතො මනසිකරොන්තො වෙදබහුලො කතමං විමොක්ඛං පටිලභති: (1)

අනිච්චතො මනසිකරොන්තො අධිමොක්ඛබහුලො අනිමිත්තං විමොක්ඛං පටිලභති, දුක්ඛතො මනසිකරොන්තො පස්සද්ධිබහුලො අප්පණිහිතං විමොක්ඛං පටිලභති, අනත්තතො මනසිකරොන්තො වෙදබහුලො සුඤ්ඤතං විමොක්ඛං පටිලභති. (2)

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති. කෙනට්ඨෙන භාවනා, කො භාවෙති. (1)

1. උපට්ඨන්ති - මජසං. ස්‍යා

කිහි අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වේ ද, කිහි අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ ද යත්: නව අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වෙයි, නව අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරෙයි, දුඃඛසත්‍යය පරිඥාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, සමුදයසත්‍යය ප්‍රහාණප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, නිරොධසත්‍යය සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, මාර්ගසත්‍යය භාවනාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, හැම ධර්මයන්ගේ අභිඥාප්‍රතිවෙධය ද, හැම සංස්කාරයන්ගේ පරිඥාප්‍රතිවෙධය ද, හැම අකුශලයන්ගේ ප්‍රහාණ-ප්‍රතිවෙධය ද, සතර මාර්ගයන්ගේ භාවනාප්‍රතිවෙධය ද, නිරොධයාගේ සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධය ද යන මේ නව අයුරින් සත්‍යප්‍රතිවෙධය වෙයි, මේ නව අයුරින් සත්‍යයන් ප්‍රතිවෙධ කරනුයේ ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත වෙයි, සමාධීන්ද්‍රියයාගේ වශයෙන් කායසාක්ෂි වෙයි, ප්‍රඥෙන්ද්‍රිය-යාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත වේ.

### දෙ වැනි බණවර යි.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවහට කිසෙයින් සංස්කාරයෝ වටහත් ද, දුඃඛ හෙයින් මෙනෙහිකරනුවහට කිසෙයින් සංස්කාරයෝ වටහත් ද, අනාත්ම හෙයින් මෙනෙහි කරනුවහට කිසෙයින් සංස්කාරයෝ වටහත් ද යත්: (1)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවහට ක්ෂය විසින් සංස්කාරයෝ වටහති, දුඃඛ හෙයින් මෙනෙහිකරනුවහට භය විසින් සංස්කාරයෝ වටහති, අනාත්ම හෙයින් මෙනෙහිකරනුවහට ශූන්‍ය විසින් සංස්කාරයෝ වටහත්. (2)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවහට සිත කුමක් බහුල කොට ඇත්තේ වේ ද, දුඃඛ හෙයින් මෙනෙහිකරනුවහට සිත කුමක් බහුල කොට ඇත්තේ වේ ද, අනාත්ම හෙයින් මෙනෙහිකරනුවහට සිත කුමක් බහුල කොට ඇත්තේ වේ ද යත්: (1)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවහට අධිමොක්ෂබහුල වූ සිත වෙයි, දුඃඛ හෙයින් මෙනෙහිකරනුවහට ප්‍රශ්‍රබ්ධිබහුල වූ සිත වෙයි, අනාත්ම හෙයින් මෙනෙහිකරනුවහට තුෂ්ටිබහුල වූ සිත වේ. (2)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂබහුලයා කවර විමොක්ෂයක් ලබා ද, දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයා කවර විමොක්ෂයක් ලබා ද, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටි-බහුලයා කවර විමොක්ෂයක් ලබාද යත්: (1)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂබහුලයා අනිමිත්ත-විමොක්ෂය ලබයි, දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයා අප්‍රණිහිතවිමොක්ෂය ලබයි, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටි-බහුලයා ශූන්‍යතවිමොක්ෂය ලබා. (2)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂබහුලයාහට කවර විමොක්ෂයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් විමොක්ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රය ප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙකින් භාවනා වේ ද, කවරෙක් භාවනා කෙරේ ද යත්:

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති. එකරසා හොන්ති කෙනට්ඨෙන භාවනා, කො භාවෙති: (2)

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති: කෙනට්ඨෙන භාවනා, කො භාවෙති: (3)

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස අනිමිත්තො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, යො සම්මාපටිපන්නො සො භාවෙති, නත්ථි මිච්ඡාපටිපන්නස්ස විමොක්ඛභාවනා. (1)

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස අප්පණිහිතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, යො සම්මාපටිපන්නො සො භාවෙති, නත්ථි මිච්ඡාපටිපන්නස්ස විමොක්ඛභාවනා. (2)

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස සුඤ්ඤතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, යො සම්මාපටිපන්නො සො භාවෙති, නත්ථි මිච්ඡාපටිපන්නස්ස විමොක්ඛභාවනා. (3)

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති: පටිවෙධකාලෙ කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති: පටිවෙධාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කෙනට්ඨෙන පටිවෙධො: (1)

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති: භාවනාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, පටිවෙධකාලෙ කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, පටිවෙධාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, -පෙ- එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කෙනට්ඨෙන පටිවෙධො:

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට කවර විමොක්ෂයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් විමොක්ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත්ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙකින් භාවනා වේ ද, කවරෙක් භාවනා කෙරේ ද යත්:

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටිබහුලයාහට කවර විමොක්ෂයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් විමොක්ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අර්ථයෙකින් භාවනා වේ ද, කවරෙක් භාවනා කෙරේද යත්: (3)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂබහුලයාහට අනිමිත්තවිමොක්ෂය අධිපති වෙයි, භාවනායෙහි (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි. යමෙක් සම්‍යක්ප්‍රතිපන්න වේ ද හේ භාවනා කෙරෙයි, මිථ්‍යාප්‍රතිපන්නයාහට විමොක්ෂභාවනා නැති. (1)

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට අප්‍රණිහිතවිමොක්ෂය අධිපති වෙයි, භාවනායෙහි (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි, යමෙක් සම්‍යක්ප්‍රතිපන්න වේ ද හේ භාවනා කෙරෙයි, මිථ්‍යාප්‍රතිපන්නයාහට විමොක්ෂභාවනා නැති. (2)

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටිබහුලයාහට ශූන්‍යතවිමොක්ෂය අධිපති වෙයි, භාවනායෙහි (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි. යමෙක් සම්‍යක්ප්‍රතිපන්න වේ ද හේ භාවනා කෙරෙයි, මිථ්‍යාප්‍රතිපන්නයාහට විමොක්ෂභාවනා නැති. (3)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂ බහුලයාහට කවර විමොක්ෂයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් විමොක්ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, ප්‍රතිවෙධකාලයෙහි කවර විමොක්ෂයෙක් අධිපති වේ ද, ප්‍රතිවෙධය පිණිස කෙතෙක් විමොක්ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, කවර අරුතෙකින් භාවනා වේ ද, කවර අරුතෙකින් ප්‍රතිවෙධය වේ ද යත්: (1)

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට කවර විමොක්ෂයෙක් අධිපති වේ ද, භාවනායෙහි කෙතෙක් විමොක්ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යෝන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, ප්‍රතිවෙධකාලයෙහි කවර විමොක්ෂයෙක් අධිපති වේ ද, ප්‍රතිවෙධය පිණිස කෙතෙක් විමොක්ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, ... එකරස වෙත් ද, කවර අරුතෙකින් භාවනා වේ ද, කවර අරුතෙකින් ප්‍රතිවෙධය වේ ද යත්:

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය කති විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්ත පච්චයා හොන්ති, එකරසා හොන්ති, පටිවෙධකාලෙ කතමො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, පටිවෙධාය කති-විමොක්ඛා තදන්වයා හොන්ති -පෙ- එකරසා හොන්ති, කෙනට්ඨෙන භාවනා, කෙනට්ඨෙන පටිවෙධො: (3)

අනිච්චතො මනසිකරොතො අධිමොක්ඛබහුලස්ස අනිමිත්තො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සය-පච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, පටි-වෙධකාලෙ[1] අනිමිත්තො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, පටිවෙධාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤ-පච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පටිවෙධො, එවං පටිවිජ්ඣන්තොපි භාවෙති, භාවෙන්තොපි පටිවිජ්ඣති. (1)

දුක්ඛතො මනසිකරොතො පස්සද්ධිබහුලස්ස අප්පණිහිතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, පටිවෙධකාලෙ.[1] අප්පණිහිතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, පටිවෙධාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති -පෙ- එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පටිවෙධො, එවං පටි-විජ්ඣන්තොපි භාවෙති, භාවෙන්තොපි පටිවිජ්ඣති. (2)

අනත්තතො මනසිකරොතො වෙදබහුලස්ස සුඤ්ඤතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, භාවනාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහ-ජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, එකරසා හොන්ති, පටිවෙධකාලෙ සුඤ්ඤතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, පටිවෙධාය ද්වෙ විමොක්ඛා තදන්වයා හොන්ති, සහජාතපච්චයා හොන්ති -පෙ- එකරසා හොන්ති, එකරසට්ඨෙන භාවනා, දස්සනට්ඨෙන පටිවෙධො. එවං පටිවිජ්ඣන්තොපි භාවෙති, භාවෙන්තොපි පටිවිජ්ඣති. (3)

අනිච්චතො මනසිකරොතො කතමො විමොක්ඛො අධිමත්තො හොති, කතමවිමොක්ඛස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො[1] හොති: දුක්ඛතො මනසිකරොතො කතමො විමොක්ඛො අධිමත්තො හොති, කතම-විමොක්ඛස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති: අනත්තතො මනසි-කරොතො කතමො විමොක්ඛො අධිමත්තො හොති, කතමවිමොක්ඛස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති: (1)

---

1. පටිවෙධකාලෙපි - මජසං.

1 සද්ධාධිමුත්තො - සයා,

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තෘෂ්ණාබහුලයාහට කවර විමොක්ෂයෙක් අධිපති වේ ද, භාවනායෙහි කොතෙක් විමොක්ෂයෝ තදනුගාමී වෙත් ද, සහජාතප්‍රත්‍යයයෝ වෙත් ද, අන්‍යොන්‍යප්‍රත්‍යයයෝ වෙත් ද, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙත් ද, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙත් ද, එකරස වෙත් ද, ප්‍රතිවෙධ කාලයෙහි කවර විමොක්ෂයෙක් අධිපති වේ ද, ප්‍රතිවෙධය පිණිස කොතෙක් විමොක්ෂයෝ තදනුගාමී වෙත් ද ... එකරස වෙත් ද, කවර අරුතෙකින් භාවනා වේ ද, කවර අරුතෙකින් ප්‍රතිවෙධය වේ ද යත්: (3)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නා වූ අධිමොක්ෂබහුලයාහට අනිමිත්ත - විමොක්ෂය අධිපති වෙයි, භාවනායෙහි (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යොන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, ප්‍රතිවෙධ කාලයෙහි අනිමිත්තවිමොක්ෂය අධිපති වෙයි, ප්‍රතිවෙධය පිණිස (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යොන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, එකරසාර්ථයෙන් භාවනා වෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රතිවෙධය වෙයි. මෙසෙයින් ප්‍රතිවෙධ කරනුයේ ද භාවනා කෙරෙයි, භාවනා කරනුයේ ද ප්‍රතිවෙධ කෙරේ. (1)

දුඃඛ හෙයින් මෙනෙහිකරන්නා වූ ප්‍රශ්‍රබ්ධිබහුලයාහට අප්‍රණිහිත- විමොක්ෂය අධිපති වෙයි, භාවනායෙහි (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යොන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති. ප්‍රතිවෙධ- කාලයෙහි අප්‍රණිහිතවිමොක්ෂය අධිපති වෙයි, ප්‍රතිවෙධය පිණිස (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති... එකරස වෙති. එකරසාර්ථයෙන් භාවනා වෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රතිවෙධය වෙයි. මෙසෙයින් ප්‍රතිවෙධ කරනුයේ ද භාවනා කෙරෙයි, භාවනා කරනුයේ ද ප්‍රතිවෙධ කෙරේ. (2)

අනාත්ම හෙයින් මෙනෙහිකරන්නා වූ තුෂ්ටිබහුලයාහට ශූන්‍යත- විමොක්ෂය අධිපති වෙයි, භාවනායෙහි (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති, අන්‍යොන්‍යප්‍රත්‍යයයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයයෝ වෙති, එකරස වෙති, ප්‍රති- වෙධ කාලයෙහි ශූන්‍යතවිමොක්ෂය අධිපති වෙයි, ප්‍රතිවෙධය පිණිස (සෙසු) විමොක්ෂයෝ දෙදෙන තදනුගාමී වෙති, සහජාතප්‍රත්‍යයයෝ වෙති ... එකරස වෙති. එකරසාර්ථයෙන් භාවනා වෙයි, දර්ශනාර්ථයෙන් ප්‍රතිවෙධය වේ. මෙසෙයින් ප්‍රතිවෙධ කරනුයේ ද භාවනා කෙරෙයි, භාවනා කරනුයේ ද ප්‍රතිවෙධ කෙරේ. (3)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවහට කවර විමොක්ෂයෙක් බලවත් වේ ද, කවර විමොක්ෂයක්හු බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වේ ද, දුඃඛ හෙයින් මෙනෙහිකරනුවහට කවර විමොක්ෂයෙක් බලවත් වේ ද, කවර විමොක්ෂයක්හු බලවත් බැවින් කායසාක්ෂි වේ ද, අනාත්ම හෙයින් මෙනෙහි කරනුවහට කවර විමොක්ෂයෙක් බලවත් වේ ද, කවර විමොක්ෂයක්හු බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වේ ද යත්: (1)

අනිච්චතො මනසිකරොතො අනිමිත්තො විමොක්ඛො අධිමත්තො හොති, අනිමිත්තවිමොක්ඛස්ස අධිමත්තත්තා සද්ධාවිමුත්තො[1] හොති, දුක්ඛතො මනසිකරොතො අප්පණිහිතො විමොක්ඛො අධිමත්තො හොති, අප්පණිහිතවිමොක්ඛස්ස අධිමත්තත්තා කායසක්ඛී හොති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතො විමොක්ඛො අධිමත්තො හොති, සුඤ්ඤතවිමොක්ඛස්ස අධිමත්තත්තා දිට්ඨිප්පත්තො හොති. (2)

"සද්දහන්තො විමුත්තො'ති[2] සද්ධාවිමුත්තො,[1] 'ඵුට්ඨත්තා සච්ඡිකතො'ති[3], කායසක්ඛී, 'දිට්ඨත්තා පත්තො'ති දිට්ඨිප්පත්තො. සද්දහන්තො විමුච්චතීති[4]. සද්ධාවිමුත්තො, 'ඣානඵස්සං පඨමං ඵුසති, පච්ඡා නිරොධං නිබ්බානං සච්ඡිකරොතී'ති කායසක්ඛී, 'දුක්ඛා සඞ්ඛාරා, සුඛො නිරොධො'ති ඤාතං[5], හොති දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය'ති දිට්ඨිප්පත්තො. -පෙ-*

යෙ හි කෙචි නෙක්ඛම්මං භාවිතා වා භාවෙන්ති වා භාවිස්සන්ති වා -පෙ- සබ්බෙ තෙ අනිමිත්තවිමොක්ඛස්ස වසෙන සද්ධාවිමුත්තා, අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන කායසක්ඛී, සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන දිට්ඨිප්පත්තා.

යෙ හි කෙචි අබ්‍යාපාදං -පෙ- ආලොකසඤ්ඤං -පෙ- අවික්ඛෙපං -පෙ- යෙ හි කෙචි දුක්ඛං පරිජානන්ති -පෙ- සමුදයං පජහන්ති -පෙ- නිරොධං සච්ඡිකරොන්ති -පෙ- මග්ගං භාවෙන්ති, සබ්බෙ තෙ අනිමිත්තවිමොක්ඛස්ස වසෙන සද්ධාවිමුත්තා, අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන කායසක්ඛී, සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන දිට්ඨිප්පත්තා.

කතිහාකාරෙහි සච්චපටිවෙධො[6] හොති, කතිහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති: චතූහාකාරෙහි සච්චපටිවෙධො හොති, චතූහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති.

දුක්ඛසච්චං පරිඤ්ඤාපටිවෙධං පටිවිජ්ඣති, සමුදයසච්චං පහානපටිවෙධං පටිවිජ්ඣති, නිරොධසච්චං සච්ඡිකිරියාපටිවෙධං පටිවිජ්ඣති, මග්ගසච්චං භාවනාපටිවෙධං පටිවිජ්ඣති. ඉමෙහි චතූහාකාරෙහි සච්චපටිවෙධො හොති, ඉමෙහි චතූහාකාරෙහි සච්චානි පටිවිජ්ඣන්තො අනිමිත්තවිමොක්ඛස්ස වසෙන සද්ධාවිමුත්තො, අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන කායසක්ඛී, සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන දිට්ඨිප්පත්තො.

කතිහාකාරෙහි සච්චපටිවෙධො හොති: කතිහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති: නවහාකාරෙහි සච්චපටිවෙධො හොති, නවහාකාරෙහි සච්චානි පටිවිජ්ඣති: දුක්ඛසච්චං පරිඤ්ඤාපටිවෙධං පටිවිජ්ඣති -පෙ- අභිඤ්ඤාපටිවෙධො ච සබ්බධම්මානං, පරිඤ්ඤාපටිවෙධො ච සබ්බසඞ්ඛාරානං, පහානපටිවෙධො ච සබ්බාකුසලානං, භාවනාපටිවෙධො ච චතුන්නං මග්ගානං, සච්ඡිකිරියාපටිවෙධො ච නිරොධස්ස. ඉමෙහි නවහාකාරෙහි සච්චපටිවෙධො හොති, ඉමෙහි නවහාකාරෙහි සච්චානි පටිවිජ්ඣන්තො අනිමිත්තවිමොක්ඛස්ස වසෙන සද්ධාවිමුත්තො, අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන කායසක්ඛී, සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන දිට්ඨිප්පත්තො.

---

1 සද්ධාධිමුත්තො - සයා 2. අධිමුත්තොති - සයා.
3 සච්ඡිකරොතීති - සයා PTS 4. අධිමුච්චතීති - සයා
5 විඤ්ඤාතං - මජසං, ඤාණං - සයා 6. සච්චප්පටිවෙධො - මජසං සයා
* 'යොචායං පුග්ගලො සද්ධාවිමුත්තො'ති ආදිකා තයො වාරා සංඛිත්තා

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවහට අනිමිත්තවිමොක්ෂය බලවත් වෙයි, අනිමිත්තවිමොක්ෂය බලවත් බැවින් ශ්‍රද්ධාවිමුක්ත වෙයි. දුඃඛ හෙයින් මෙනෙහිකරනුවහට අප්‍රණිහිතවිමොක්ෂය බලවත් වෙයි, අප්‍රණිහිත-විමොක්ෂය බලවත් බැවින් කායසාක්ෂි වෙයි. අනාත්ම හෙයින් මෙනෙහි කරනුවහට ශූන්‍යතවිමොක්ෂය බලවත් වෙයි, ශූන්‍යවිමොක්ෂය බලවත් බැවින් දෘෂ්ටිප්‍රාප්ත වේ. (2)

හදහමින් විමුක්ත නු' යි ශ්‍රද්ධාවිමුක්ත යැ (ධ්‍යානසපර්ශය) පහස්නා ලද බැවින් (නිර්වාණය) ප්‍රත්‍යක්‍ෂ කරනලද නු'යි කායසාක්ෂි යැ (ප්‍රඥෙන්ද්‍රියයෙන්) දක්නාලද බැවින් (නිවනට) පැමිණියේ නු'යි දෘෂ්ටිප්‍රාප්ත යැ හදහමින් මිදේ නු'යි ශ්‍රද්ධාවිමුක්ත යැ ධ්‍යානසපර්ශය පළමු වැ සපර්ශ කෙරෙයි, පසු වැ නිරොධසඞ්ඛ්‍යාත නිර්වාණය ප්‍රත්‍යක්‍ෂ කෙරේ නු'යි කායසාක්ෂි යැ 'සංසකාර-යෝ දුඃඛයෝ යැ නිරෝධය සුඛය යැයි දත්නාලද, දක්නාලද, ප්‍රකට කරන ලද, ප්‍රත්‍යක්‍ෂ කරනලද, සපර්ශකරනලද වේ නු'යි දෘෂ්ටිප්‍රාප්ත වේ ...

යම් කිසි කෙනෙක් නෛෂ්ක්‍රම්‍යය වැඩූහු ද වඩත් ද වඩින්නාහු ද ... එ හැම දෙන අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්තයෝ යැ අප්‍රණිහිතවිමොක්ෂයාගේ වශයෙන් කායසාක්ෂිහු යැ ශූන්‍යතවිමොක්ෂයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්තයෝ යි.

යම් කිසි කෙනෙක් අව්‍යාපාදය ... ආලොකසංඥාව ... අවික්ෂෙපය ... යම් කිසි කෙනෙක් දුඃඛය පරිජානනය කෙරෙත් ද ... සමුදය දුරු කෙරෙත් ද ... නිරොධය ප්‍රත්‍යක්‍ෂ කෙරෙත් ද ... මාර්ගය වඩත් ද, එ හැම දෙන අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්තයෝ යැ අප්‍රණිහිතවිමොක්ෂ-යාගේ වශයෙන් කායසාක්ෂිහු යැ ශූන්‍යතවිමොක්ෂයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්තයෝ යි.

කිහි අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වේ ද, කිහි අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ ද: සියු අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වෙයි, සියු අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ.

දුඃඛසත්‍යය පරිඥප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, සමුදයසත්‍යය ප්‍රහාණප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, නිරොධසත්‍යය සාක්ෂාත්ක්‍රියා ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි, මාර්ගසත්‍යය භාවනාප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරේ. මේ සියු අයුරින් සත්‍යප්‍රතිවෙධය වෙයි. මේ සියු අයුරින් සත්‍යයන් ප්‍රතිවෙධ කරනුයේ අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් ශ්‍රද්ධා-විමුක්ත යැ අප්‍රණිහිතවිමොක්ෂයාගේ වශයෙන් කායසාක්ෂි යැ ශූන්‍යත-විමොක්ෂයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත යි.

කිහි අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වේ ද, කිහි අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ ද යත්: නව අයුරෙකින් සත්‍යප්‍රතිවෙධය වෙයි, නව අයුරෙකින් සත්‍යයන් ප්‍රතිවෙධ කෙරෙයි, දුඃඛසත්‍යය පරිඥප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ කෙරෙයි ... හැම ධර්මයන්ගේ අභිඥප්‍රතිවෙධය ද හැම සංසකාර-යන්ගේ පරිඥප්‍රතිවෙධය ද හැම අකුශලයන්ගේ ප්‍රහාණප්‍රතිවෙධය ද සතර මාර්ගයන්ගේ භාවනාප්‍රතිවෙධය ද නිරෝධයාගේ සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධය ද යන මේ නව අයුරින් සත්‍යප්‍රතිවෙධය වෙයි. මේ නව අයුරින් සත්‍යයන් ප්‍රතිවෙධ කරනුයේ අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් ශ්‍රද්ධාවිමුක්ත යැ අප්‍රණිහිතවිමොක්ෂයාගේ වශයෙන් කායසාක්ෂි යැ ශූන්‍යතවිමොක්ෂයාගේ වශයෙන් දෘෂ්ටිප්‍රාප්ත යි.

අනිච්චතො මනසිකරොතො කතමෙ ධම්මෙ යථාභූතං ජානාති[1] පස්සති, කථං සම්මාදස්සනං හොති, කථං තදන්වයෙන සබ්බෙ සඞ්ඛාරා අනිච්චතො සුදිට්ඨා හොන්ති, කත්ථ කඞ්ඛා පහීයති, (1)

දුක්ඛතො මනසිකරොතො කතමෙ ධම්මෙ යථාභූතං ජානාති පස්සති, කථං සම්මාදස්සනං හොති, කථං තදන්වයෙන සබ්බෙ සඞ්ඛාරා දුක්ඛතො සුදිට්ඨා හොන්ති, කත්ථ කඞ්ඛා පහීයති. (2)

අනත්තතො මනසිකරොතො කතමෙ ධම්මෙ යථාභූතං ජානාති පස්සති, කථං සම්මාදස්සනං හොති, කථං තදන්වයෙන සබ්බෙ ධම්මා අනත්තතො සුදිට්ඨා හොන්ති, කත්ථ කඞ්ඛා පහීයති. (3)

අනිච්චතො මනසිකරොතො නිමිත්තං යථාභූතං ජානාති පස්සති, තෙන වුච්චති සම්මාදස්සනං. එවං තදන්වයෙන සබ්බෙ සඞ්ඛාරා අනිච්චතො සුදිට්ඨා හොන්ති, එත්ථ කඞ්ඛා පහීයති. (1)

දුක්ඛතො මනසිකරොතො පවත්තං යථාභූතං ජානාති පස්සති, තෙන වුච්චති සම්මාදස්සනං. එවං තදන්වයෙන සබ්බෙ සඞ්ඛාරා දුක්ඛතො සුදිට්ඨා හොන්ති, එත්ථ කඞ්ඛා පහීයති. (2)

අනත්තතො මනසිකරොතො නිමිත්තඤ්ච පවත්තඤ්ච යථාභූතං ජානාති පස්සති, තෙන වුච්චති සම්මාදස්සනං එවං තදන්වයෙන සබ්බෙ ධම්මා අනත්තතො සුදිට්ඨා හොන්ති, එත්ථ කඞ්ඛා පහීයති. (3)

යඤ්ච යථාභූතං ඤාණං, යඤ්ච සම්මාදස්සනං, යා ච කඞ්ඛාවිතරණා, ඉමෙ ධම්මා නානත්ථා[2] චෙව නානාබ්‍යඤ්ජනා ච; උදාහු එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානන්ති: යඤ්ච යථාභූතං ඤාණං, යඤ්ච සම්මාදස්සනං, යා ච කඞ්ඛාවිතරණා, ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං.

අනිච්චතො මනසිකරොතො කිං භයතො උපට්ඨාති: දුක්ඛතො මනසිකරොතො කිං භයතො උපට්ඨාති: අනත්තතො මනසිකරොතො කිං භයතො උපට්ඨාති:

අනිච්චතො මනසිකරොතො නිමිත්තං භයතො උපට්ඨාති, දුක්ඛතො මනසිකරොතො පවත්තං භයතො උපට්ඨාති, අනත්තතො මනසිකරොතො නිමිත්තඤ්ච පවත්තඤ්ච භයතො උපට්ඨාති.

---

1. පජානාති - ස්‍යා
2. නානත්තා - සී 1

අනිත්‍ය විසින් මෙනෙහිකරනුයේ කවර ධර්මයන් යථාස්වභාවයෙන් දනී ද, දකී ද, කිසෙයින් සම්‍යග්දර්ශනය වේ ද, කිසෙයින් එය අනුව යැමෙන් හැම සංස්කාරයෝ අනිත්‍ය හෙයින් මොනොවට දක්නාලද්දාහු වෙත් ද, කොහි සැකය ප්‍රහීණ වේ ද: (1)

දුඃඛ හෙයින් මෙනෙහිකරනුයේ කවර ධර්මයන් යථාස්වභාවයෙන් දනී ද, දකී ද, කිසෙයින් සම්‍යග්දර්ශනය වේ ද, කිසෙයින් එය අනුව යැමෙන් හැම සංස්කාරයෝ දුඃඛ හෙයින් මොනොවට දක්නාලද්දාහු වෙත් ද කොහි සැකය ප්‍රහීණ වේ ද: (2)

අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ කවර ධර්මයන් යථාස්වභාව-යෙන් දනී ද, දකී ද, කිසෙයින් සම්‍යග්දර්ශනය වේ ද, කිසෙයින් එය අනුව යැමෙන් හැම ධර්මයෝ අනාත්ම හෙයින් මොනොවට දක්නාලද්දාහු වෙත් ද කොහි සැකය ප්‍රහීණ වේ ද යත්: (3)

අනිත්‍ය හෙයින් මෙනෙහි කරනුයේ නිමිත්ත යථාස්වභාවයෙන් දනී, දකී. එයින් කියනු ලැබෙයි 'සම්‍යග්දර්ශන' යනු. මෙසෙයින් එය අනුව යැමෙන් හැම සංස්කාරයෝ අනිත්‍ය හෙයින් මොනවට දක්නා ලද්දාහු වෙති, මෙහි සැකය ප්‍රහීණ වේ. (1)

දුඃඛ හෙයින් මෙනෙහි කරනුයේ ප්‍රවෘත්තිය යථාස්වභාවයෙන් දනී, දකී. එයින් කියනු ලැබෙයි 'සම්‍යග්දර්ශන' යි. මෙසෙයින් එය අනුව යැමෙන් හැම සංස්කාරයෝ දුඃඛ හෙයින් මොනොවට දක්නා ලද්දාහු වෙති, මෙහි සැකය ප්‍රහීණ වේ. (2)

අනාත්ම හෙයින් මෙනෙහි කරනුයේ නිමිත්තත් ප්‍රවෘත්තියත් යථා ස්වභාවයෙන් දනී, දකී. එයින් කියනු ලැබෙයි 'සම්‍යග්දර්ශන' යි. මෙසෙයින් එය අනුව යැමෙන් හැම ධර්මයෝ අනාත්ම හෙයින් මොනොවට දක්නා ලද්දාහු වෙති, මෙහි සැකය ප්‍රහීණ වේ. (3)

යම් යථාභූතඥානයෙකුත් වේ ද, යම් සම්‍යග්දර්ශනයෙකුත් වේ ද, යම් සැකදුරු කිරීමෙකුත් වේ ද, මේ ධර්මයෝ නානාර්ථ ද ඇත්තාහු මැ නානා ව්‍යඤ්ජන ඇත්තාහු ද, නොහොත් එකාර්ථ වූවාහු ව්‍යඤ්ජන නානාත්ව මැ ඇත්තාහු ද යත්: යම් යථාභූතඥානයෙකුත් වේ ද, යම් සම්‍යග්දර්ශනයෙකුත් වේ ද යම් සැක දුරු කිරීමෙකුත් වේ ද, මේ ධර්මයෝ එකාර්ථ ඇත්තාහු යැ ව්‍යඤ්ජන මැ වෙනසි.

අනිත්‍ය හෙයින් මෙනෙහි කරන්නාහට කුමක් භය හෙයින් වටහා ද, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට කුමක් භය හෙයින් වටහා ද, අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට කුමක් භය හෙයින් වටහා ද යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට නිමිත්ත භය හෙයින් වටහයි, දුඃඛ හෙයින් මෙනෙහි කරන්නාහට ප්‍රවෘත්තිය භය හෙයින් වටහයි, අනාත්ම හෙයින් මෙනෙහි කරන්නාහට නිමිත්තත් ප්‍රවෘත්තියත් භය හෙයින් වටහා.

යා ච භයතුපට්ඨානෙ පඤ්ඤා, යඤ්ච ආදීනවෙ ඤාණං, යා ච නිබ්බිදා, ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච: උදාහු එකත්ථා බ්‍යඤ්ජනමෙව නානන්ති: යා ච භයතුපට්ඨානෙ පඤ්ඤා, යඤ්ච ආදීනවෙ ඤාණං, යා ච නිබ්බිදා, ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං.

යා ච අනත්තානුපස්සනා, යා ච සුඤ්ඤතානුපස්සනා, ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච: උදාහු එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානන්ති: යා ච අනත්තානුපස්සනා, යා ච සුඤ්ඤතානුපස්සනා, ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං.

අනිච්චතො මනසිකරොතො, කිං පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති: දුක්ඛතො මනසිකරොතො කිං පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති: අනත්තතො මනසිකරොතො කිං පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති.

අනිච්චතො මනසිකරොතො නිමිත්තං පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති, දුක්ඛතො මනසිකරොතො පවත්තං පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති, අනත්තතො මනසිකරොතො නිමිත්තඤ්ච පවත්තඤ්ච පටිසඞ්ඛා ඤාණං උප්පජ්ජති. (1)

යා ච මුඤ්චිතුකම්‍යතා[1] යා ච පටිසඞ්ඛානුපස්සනා යා ච සඞ්ඛාරුපෙක්ඛා ඉමෙ ධම්මා, නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච, උදාහු එකත්ථා බ්‍යඤ්ජනමෙව නානන්ති: යා ච මුඤ්චිතුකම්‍යතා යා ච පටිසඞ්ඛානුපස්සනා යා ච සඞ්ඛාරුපෙක්ඛා ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං, (2)

අනිච්චතො මනසිකරොතො කුතො චිත්තං වුට්ඨාති, කත්ථ චිත්තං පක්ඛන්දති: දුක්ඛතො මනසිකරොතො කුතො චිත්තං වුට්ඨාති, කත්ථ චිත්තං පක්ඛන්දති: අනත්තතො මනසිකරොතො කුතො චිත්තං වුට්ඨාති, කත්ථ චිත්තං පක්ඛන්දති.

අනිච්චතො මනසිකරොතො නිමිත්තා චිත්තං වුට්ඨාති, අනිමිත්තෙ චිත්තං පක්ඛන්දති, දුක්ඛතො මනසිකරොතො පවත්තා චිත්තං වුට්ඨාති, අප්පවත්තෙ චිත්තං පක්ඛන්දති, අනත්තතො මනසිකරොතො නිමිත්තා ච පවත්තා ච චිත්තං වුට්ඨාති, අනිමිත්තෙ අප්පවත්තෙ නිරොධ[2] නිබ්බානධාතුයා චිත්තං පක්ඛන්දති. (3)

යා ච බහිද්ධාවුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා යෙ ච ගොත්‍රභූධම්මා, ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච, උදාහු එකත්ථා බ්‍යඤ්ජනමෙව නානන්ති: යා ච බහිද්ධාවුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා යෙ ච ගොත්‍රභූධම්මා, ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං. (4)

---

1. මුච්චිතුකම්‍යතා - මජසං
2. නිරොධෙ - පු, මජසං

යම් භයතුපට්ඨාන ප්‍රඥවකුත් වේ ද, යම් ආදීනව ඥනයෙකුත් වේ ද, යම් නිබ්බිදවකුත් වේ ද, මේ ධර්මයෝ නානාර්ථ ද ඇත්තාහු මැ නානා ව්‍යඤ්ජනත් ඇත්තාහු ද, නොහොත් එකාර්ථ වූවාහු ව්‍යඤ්ජන නානාත්ව මැ ඇත්තාහු ද යත්: යම් භයතුපට්ඨාන ප්‍රඥවකුත් වේ ද, යම් ආදීනව ඥනයෙකුත් වේ ද, යම් නිබ්බිදවකුත් වේ ද, මේ ධර්මයෝ එකාර්ථ ඇත්තාහු යැ ව්‍යඤ්ජන මැ වෙනසි.

යම් අනත්තානුපස්සනාවකුත් වේ ද, යම් සුඤ්ඤතානුපස්සනාවකුත් වේ ද, මේ ධර්මයෝ නානාර්ථ ද ඇත්තාහු මැ නානා ව්‍යඤ්ජන ද ඇත්තාහු ද, නොහොත් එකාර්ථ වූවාහු ව්‍යඤ්ජන නානාත්ව මැ ඇත්තාහු ද යත්: යම් අනත්තානුපස්සනාවකුත් යම් සුඤ්ඤතානුපස්සනාවකුත් වේ ද, මේ ධර්මයෝ එකාර්ථ ඇත්තාහු යැ. ව්‍යඤ්ජන මැ වෙනසි.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරත්නාහට කුමක් ප්‍රත්‍යවෙක්ෂා කොට ඥනය උපදී ද, දුඃඛ හෙයින් මෙනෙහි කරත්නාහට කුමක් ප්‍රත්‍යවෙක්ෂා කොට ඥනය උපදී ද, අනාත්ම හෙයින් මෙනෙහි කරත්නාහට කුමක් ප්‍රත්‍යවෙක්ෂා කොට ඥනය උපදී ද යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහිකරත්නාහට සංස්කාර නිමිත්ත ප්‍රත්‍යවෙක්ෂා කොට ඥනය උපදී, දුඃඛ හෙයින් මෙනෙහි කරත්නාහට ප්‍රවෘත්තිය ප්‍රත්‍යවෙක්ෂා කොට ඥනය උපදී, අනාත්ම හෙයින් මෙනෙහිකරත්නා-හට නිමිත්තත් ප්‍රවෘත්තියත් ප්‍රත්‍යවෙක්ෂා කොට ඥනය උපදී. (1)

යම් මුඤ්චිතුකම්‍යතා ඥනයෙකුත් වේ ද, යම් පටිසඞ්ඛානුපස්සනා ඥනයෙකුත් වේ ද, යම් සඞ්ඛාරුපෙක්ඛා ඥනයෙකුත් වේ ද, මේ ධර්මයෝ නානාර්ථත් නානාව්‍යඤ්ජනත් ඇත්තාහු ද, නොහොත් එකාර්ථ වූවාහු ව්‍යඤ්ජනනානාත්ව මැ ඇත්තාහු ද යත්: යම් මුඤ්චිතුකම්‍යතා ඥනයෙකුත් වේ ද, යම් පටිසඞ්ඛානුපස්සනා ඥනයෙකුත් වේ ද, යම් සඞ්ඛාරුපෙක්ඛා ඥනයෙකුත් වේ ද, මේ ධර්මයෝ එකාර්ථ ඇත්තාහු යැ. ව්‍යඤ්ජන මැ වෙනසි. (2)

අනිත්‍ය හෙයින් මෙනෙහිකරත්නාහට කොයින් සිත නැඟිසිටී ද, කොහි සිත පිවිසගනී ද, දුඃඛ හෙයින් මෙනෙහි කරත්නාහට කොයින් සිත නැඟිසිටී ද, කොහි සිත පිවිසගනී ද, අනාත්ම හෙයින් මෙනෙහි-කරත්නාහට කොයින් සිත නැඟී සිටී ද, කොහි සිත පිවිසගනී ද යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහි කරත්නාහට සංස්කාර නිමිත්ත කෙරෙත් සිත නැඟීසිටියි, අනිමිත්ත සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි සිත පිවිසගනියි. දුඃඛ හෙයින් මෙනෙහිකරත්නාහට ප්‍රවෘත්තියෙන් සිත නැඟී සිටියි, අප්‍රවෘත්තියෙහි සිත පිවිස ගනියි. අනාත්ම හෙයින් මෙනෙහිකරත්නාහට නිමිත්ත කෙරෙත් ද ප්‍රවෘත්තිය කෙරෙත් ද සිත නැඟී සිටියි, අනිමිත්තයෙහි අප්‍රවෘත්තියෙහි නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණධාතුයෙහි සිත පිවිසගනී. (3)

සංස්කාරනිමිත්ත කෙරෙත් නැඟී පරාමමුඛ වැ සිටුනා යම් ප්‍රඥවකුත් වේ ද, යම් ගොත්‍රභූ ධර්ම කෙනෙකුත් වෙත් ද, මේ ධර්මයෝ නානාර්ථත් නානාව්‍යඤ්ජනත් ඇත්තාහු ද නොහොත් එකාර්ථ වූවාහු ව්‍යඤ්ජන-නානාත්ව මැ ඇත්තාහු ද, යත්: යම් බහිර්ධා වුට්ඨාන විවට්ටන ප්‍රඥවකුත් වේ ද, යම් ගොත්‍රභූ ධර්ම කෙනෙකුත් වෙත් ද, මේ ධර්මයෝ එකාර්ථ ඇත්තාහු යැ. ව්‍යඤ්ජන මැ වෙනසි. (4)

අනිච්චතො මනසිකරොන්තො කතමෙන විමොක්ඛෙන විමුච්චති: දුක්ඛතො මනසිකරොන්තො කතමෙන විමොක්ඛෙන විමුච්චති: අනත්තතො මනසිකරොන්තො කතමෙන විමොක්ඛෙන විමුච්චති

අනිච්චතො මනසිකරොන්තො අනිමිත්තවිමොක්ඛෙන විමුච්චති, දුක්ඛතො මනසිකරොන්තො අප්පණිහිතවිමොක්ඛෙන විමුච්චති, අනත්තතො මනසිකරොන්තො සුඤ්ඤතවිමොක්ඛෙන විමුච්චති. (5)

යා ච දුහතොවුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා යඤ්ච මග්ගෙ ඤාණං, ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච, උදාහු එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානන්ති යා ච දුහතොවුට්ඨානවිවට්ටනෙ පඤ්ඤා යඤ්ච මග්ගෙ ඤාණං ඉමෙ ධම්මා එකත්ථා, බ්‍යඤ්ජනමෙව නානං. (6)

කතිහාකාරෙහි තයො විමොක්ඛා නානාඛණෙ[1] හොන්ති; කතිහාකාරෙහි තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති: චතූහාකාරෙහි තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති, සත්තහාකාරෙහි තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති.

කතමෙහි චතූහාකාරෙහි තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති: ආධිපතෙය්‍යට්ඨෙන අධිට්ඨානට්ඨෙන අභිනීහාරට්ඨෙන නිය්‍යානට්ඨෙන.

කථං ආධිපතෙය්‍යට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති: අනිච්චතො මනසිකරොතො අනිමිත්තො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, දුක්ඛතො මනසිකරොතො අප්පණිහිතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, අනත්තතො මනසිකරොතො සුඤ්ඤතො විමොක්ඛො ආධිපතෙය්‍යො හොති, එවං ආධිපතෙය්‍යට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති, (1)

කථං අධිට්ඨානට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති: අනිච්චතො මනසිකරොන්තො අනිමිත්තවිමොක්ඛස්ස වසෙන චිත්තං අධිට්ඨාති, දුක්ඛතො මනසිකරොන්තො අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන චිත්තං අධිට්ඨාති අනත්තතො මනසිකරොන්තො සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන චිත්තං අධිට්ඨාති, එවං අධිට්ඨානට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති. (2)

කථං අභිනීහාරට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති අනිච්චතො මනසිකරොන්තො අනිමිත්තවිමොක්ඛස්ස වසෙන චිත්තං අභිනීහරති, දුක්ඛතො මනසිකරොන්තො අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන චිත්තං අභිනීහරති, අනත්තතො මනසිකරොන්තො සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන චිත්තං අභිනීහරති. එවං අභිනීහාරට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති. (3)

කථං නිය්‍යානට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති: අනිච්චතො මනසිකරොන්තො අනිමිත්තවිමොක්ඛස්ස වසෙන නිරොධං නිබ්බානං නිය්‍යාති, දුක්ඛතො මනසිකරොන්තො අප්පණිහිතවිමොක්ඛස්ස වසෙන නිරොධං නිබ්බානං නිය්‍යාති. අනත්තතො මනසිකරොන්තො සුඤ්ඤතවිමොක්ඛස්ස වසෙන නිරොධං නිබ්බානං නිය්‍යාති, එවං නිය්‍යානට්ඨෙන තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති, (4)

1 නානාක්ඛණෙ - මජසං

අනිත්‍ය හෙයින් මෙනෙහි කරනුයේ කවර විමොක්ෂයෙකින් මිදේ ද, දුඃඛ හෙයින් මෙනෙහි කරනුයේ කවර විමොක්ෂයෙකින් මිදේ ද, අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ කවර විමොක්ෂයෙකින් මිදේ ද යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ අනිමිත්ත විමොක්ෂයෙන් මිදෙයි, දුඃඛ හෙයින් මෙනෙහිකරනුයේ අප්‍රණිහිත විමොක්ෂයෙන් මිදෙයි, අනාත්ම හෙයින් මෙනෙහි කරනුයේ ශූන්‍යතවිමොක්ෂයෙන් මිදේ. (5)

කෙලෙසුන් කෙරෙන් ද සංස්කාරනිමිත්ත කෙරෙන් ද යන දෙකින් නැගී පරාමුඛ වූ සිටුනා යම් ප්‍රඥාවකුත් වේ ද, යම් මාර්ගඥානයෙකුත් වේ ද, මේ ධර්මයෝ නානාර්ථත් නානාව්‍යඤ්ජනත් ඇත්තාහු ද නොහොත් එකාර්ථ වූවාහු ව්‍යඤ්ජනනානාත්ව මැ ඇත්තාහු ද, යත්: යම් දුභතොවුට්ඨාන-විවට්ටන ප්‍රඥාවකුත් වේ ද, යම් මාර්ගඥානයෙකුත් වේ ද, මේ ධර්මයෝ එකාර්ථ ඇත්තාහු යැ ව්‍යඤ්ජන මැ වෙනසි. (6)

කිහි අයුරෙකින් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත් ද, කිහි අයුරෙකින් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත් ද යත්: සතර අයුරෙකින් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙති, සත් අයුරෙකින් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත්.

කවර සතර අයුරෙකින් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත් ද යත්: අධිපතිභාවාර්ථයෙන, ප්‍රතිෂ්ඨාසවභාවයෙන, අභිනීහාර (එළැවීම්) සවභාවයෙන, නිර්‍යාණසවභාවයෙනි.

කිසෙයින් අධිපතිභාවාර්ථයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත් ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරන්නාහට අනිමිත්තවිමොක්ෂය අධිපති වෙයි, දුඃඛ හෙයින් මෙනෙහිකරන්නාහට අප්‍රණිහිතවිමොක්ෂය අධිපති වෙයි, අනාත්ම හෙයින් මෙනෙහිකරන්නාහට ශූන්‍යතවිමොක්ෂය අධිපති වේ. මෙසෙයින් අධිපතිභාවාර්ථයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත්. (1)

කිසෙයින් ප්‍රතිෂ්ඨාසවභාවයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත් ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් සිත පිහිටුවයි. දුඃඛ හෙයින් මෙනෙහිකරනුයේ අප්‍රණිහිත-විමොක්ෂයාගේ වශයෙන් සිත පිහිටුවයි. අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ ශූන්‍යතවිමොක්ෂයාගේ වශයෙන් සිත පිහිටුවා. මෙසෙයින් ප්‍රතිෂ්ඨාසවභාව-යෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත්. (2)

කිසෙයින් අභිනීහාර (එළැවීම්) සවභාවයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත් ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් සිත එළවයි දුඃඛ හෙයින් මෙනෙහි කරනුයේ අප්‍රණිහිතවිමොක්ෂයාගේ වශයෙන් සිත එළවයි. අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ ශූන්‍යතවිමොක්ෂයාගේ වශයෙන් සිත එළවා. මෙසෙයින් අභිනීහාරසවභාවයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත්. (3)

කිසෙයින් නිර්‍යාණසවභාවයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත් ද යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ අනිමිත්තවිමොක්ෂයාගේ වශයෙන් නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට පැමිණෙයි. දුඃඛ හෙයින් මෙනෙහි කරනුයේ අප්‍රණිහිතවිමොක්ෂයාගේ වශයෙන් නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට පැමිණෙයි. අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ ශූන්‍යතවිමොක්ෂයාගේ වශයෙන් නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයට පැමිණේ. මෙසෙයින් නිර්‍යාණ සවභාවයෙන් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත්. (4)

ඉමෙහි චතූහාකාරෙහි තයො විමොක්ඛා නානාඛණෙ හොන්ති.

කතමෙහි සත්තහාකාරෙහි තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති: සමොධානට්ඨෙන අධිගමනට්ඨෙන[1] පටිලාභට්ඨෙන පටිවෙධට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵස්සනට්ඨෙන අභිසමයට්ඨෙන.

කථං සමොධානට්ඨෙන අධිගමනට්ඨෙන පටිලාභට්ඨෙන පටිවෙධට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵස්සනට්ඨෙන අභිසමයට්ඨෙන තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති.

අනිච්චතො මනසිකරොන්තො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො; යතො මුච්චති, තත්‍ථ න පණිදහතීති අප්පණිහිතො විමොක්ඛො; යත්‍ථ න පණිදහති, තෙන සුඤ්ඤොති සුඤ්ඤතො විමොක්ඛො; යෙන සුඤ්ඤො, තෙන නිමිත්තෙන අනිමිත්තොති අනිමිත්තො විමොක්ඛො, එවං සමොධානට්ඨෙන අධිගමනට්ඨෙන පටිලාභට්ඨෙන පටිවෙධට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵස්සනට්ඨෙන අභිසමයට්ඨෙන තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති. (1)

දුක්ඛතො මනසිකරොන්තො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො; යත්‍ථ න පණිදහති, තෙන සුඤ්ඤොති සුඤ්ඤතො විමොක්ඛො; යෙන සුඤ්ඤො තෙන නිමිත්තෙන අනිමිත්තොති අනිමිත්තො විමොක්ඛො, යෙන නිමිත්තෙන අනිමිත්තො, තත්‍ථ න පණිදහතීති අප්පණිහිතො විමොක්ඛො, එවං සමොධානට්ඨෙන අධිගමනට්ඨෙන පටිලාභට්ඨෙන පටිවෙධට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵස්සනට්ඨෙන අභිසමයට්ඨෙන තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති. (2)

අනත්තතො මනසිකරොන්තො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො; යෙන සුඤ්ඤො, තෙන නිමිත්තෙන අනිමිත්තොති අනිමිත්තො විමොක්ඛො; යෙන නිමිත්තෙන අනිමිත්තො, තත්‍ථ න පණිදහතීති අප්පණිහිතො විමොක්ඛො; යත්‍ථ න පණිදහති, තෙන සුඤ්ඤොති සුඤ්ඤතො විමොක්ඛො, එවං සමොධානට්ඨෙන අධිගමනට්ඨෙන පටිලාභට්ඨෙන පටිවෙධට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵස්සනට්ඨෙන අභිසමයට්ඨෙන තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති. (3)

ඉමෙහි සත්තහාකාරෙහි තයො විමොක්ඛා එකක්ඛණෙ හොන්ති.

අත්‍ථි විමොක්ඛො, අත්‍ථි මුඛං, අත්‍ථි විමොක්ඛමුඛං. අත්‍ථි විමොක්ඛපච්චනීකං අත්‍ථි විමොක්ඛානුලොමං, අත්‍ථි විමොක්ඛවිවට්ටො, අත්‍ථි විමොක්ඛභාවනා, අත්‍ථි විමොක්ඛපටිප්පස්සද්ධි,

කතමො විමොක්ඛො: සුඤ්ඤතො විමොක්ඛො, අනිමිත්තො විමොක්ඛො, අප්පණිහිතො විමොක්ඛො:

---

1. අධිගමට්ඨෙන - සතා,

මේ සතර අයුරින් තුන් විමොක්ෂයෝ නානාක්ෂණයෙහි වෙත්.

කවර සත් අයුරෙකින් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත් ද යත්: සමවධානාර්ථයෙන, විඳනාර්ථයෙන, ප්‍රතිලාභාර්ථයෙන, ප්‍රතිවේධාර්ථයෙන, සාක්ෂාත්ක්‍රියාර්ථයෙන, ඥනස්පර්ශනාර්ථයෙන, අභිසමයාර්ථයෙනි.

කිසෙයින් සමවධානාර්ථයෙන් විඳනාර්ථයෙන් ප්‍රතිලාභාර්ථයෙන් ප්‍රතිවේධාර්ථයෙන් සාක්ෂාත්ක්‍රියාර්ථයෙන් ඥනස්පර්ශනාර්ථයෙන් අභිසමයාර්ථයෙන් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත් ද යත්:

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුයේ නිමිත්ත කෙරෙන් මිදේ නු' යි අනිමිත්තවිමොක්ෂ වෙයි, යම් නිමිත්තෙකින් මිදේ නම් එහි ප්‍රාර්ථනා නො කෙරේ නු' යි අප්‍රණිහිතවිමොක්ෂ වෙයි, යම් නිමිත්තෙක්හි ප්‍රාර්ථනා නො කෙරේ නම් ඒ නිමිතින් ශූන්‍ය නු' යි ශූන්‍යතවිමොක්ෂ වෙයි, යම් නිමිත්තෙකින් ශූන්‍ය නම් ඒ නිමිතින් නිමිත්ත රහිත නු' යි අනිමිත්තවිමොක්ෂ වේ. මෙසෙයින් සමවධානාර්ථයෙන් විඳනාර්ථයෙන් ප්‍රතිලාභාර්ථයෙන් ප්‍රතිවේධාර්ථයෙන් සාක්ෂාත්ක්‍රියාර්ථයෙන් ඥනස්පර්ශනාර්ථයෙන් අභිසමයාර්ථයෙන් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙති. (1)

දුඃඛ හෙයින් මෙනෙහිකරනුයේ ප්‍රාර්ථනාව කෙරෙන් මිදේ නු' යි අප්‍රණිහිතවිමොක්ෂ වෙයි, යම් දුඃඛයෙක්හි ප්‍රාර්ථනා නො කෙරේ නම් ඒ දුඃඛයෙන් ශූන්‍ය නු' යි ශූන්‍යතවිමොක්ෂ වෙයි, යම් දුඃඛ නිමිත්තෙකින් ශූන්‍ය නම් ඒ දුඃඛ නිමිතින් නිමිත්ත රහිත නු' යි අනිමිත්තවිමොක්ෂ වෙයි, යම් දුඃඛ නිමිත්තෙකින් අනිමිත්ත වේ නම් එහි ප්‍රාර්ථනා නො කෙරේ නු' යි අප්‍රණිහිතවිමොක්ෂ වේ. මෙසෙයින් සමවධානාර්ථයෙන් විඳනාර්ථයෙන් ප්‍රතිලාභාර්ථයෙන් ප්‍රතිවේධාර්ථයෙන් සාක්ෂාත්ක්‍රියාර්ථයෙන් ඥනස්පර්ශනාර්ථයෙන් අභිසමයාර්ථයෙන් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙති. (2)

අනාත්ම හෙයින් මෙනෙහිකරනුයේ අභිනිවේශය කෙරෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ වෙයි, යම් අභිනිවේශ නිමිත්තෙකින් ශූන්‍ය වේ නම් ඒ නිමිතින් නිමිත්ත රහිත නු' යි අනිමිත්තවිමොක්ෂ වෙයි, යම් අභිනිවේශ නිමිත්තෙකින් නිමිත්ත රහිත වේ නම් ඒ අභිනිවේශ නිමිත්තෙහි ප්‍රාර්ථනා නො කෙරේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ වෙයි, යම් අභිනිවේශ නිමිත්තෙක්හි ප්‍රාර්ථනා නො කෙරේ නම් ඒ අභිනිවේශ නිමිතින් ශූන්‍ය නු'යි ශූන්‍යතවිමොක්ෂ වේ. මෙසෙයින් සමවධානාර්ථයෙන් විඳනාර්ථයෙන් ප්‍රතිලාභාර්ථයෙන් ප්‍රතිවේධාර්ථයෙන් සාක්ෂාත්ක්‍රියාර්ථයෙන් ඥනස්පර්ශනාර්ථයෙන් අභිසමයාර්ථයෙන් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත්: (3)

මේ සත් අයුරින් තුන් විමොක්ෂයෝ එකක්ෂණයෙහි වෙත්.

විමොක්ෂයෙක් ඇත, මුඛයෙක් ඇත, විමොක්ෂමුඛයෙක් ඇත, විමොක්ෂ-ප්‍රත්‍යනීකයෙක් ඇත, විමොක්ෂානුලෝමයෙක් ඇත, විමොක්ෂ විවර්තයෙක් ඇත, විමොක්ෂභාවනායෙක් ඇත, විමොක්ෂප්‍රතිප්‍රශ්‍රබ්ධියෙක් ඇති.

විමොක්ෂ කවරැ යත්: ශූන්‍යතවිමොක්ෂ යැ අනිමිත්තවිමොක්ෂ යැ අප්‍රණිහිතවිමොක්ෂ යි.

කතමො සුඤ්ඤතො විමොක්ඛො: අනිච්චානුපස්සනාඤාණං නිච්චතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො දුක්ඛානුපස්සනාඤාණං සුඛතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, අනත්තානුපස්සනාඤාණං අත්තතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, නිබ්බිදානුපස්සනාඤාණං නන්දියා අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, විරාගානුපස්සනාඤාණං රාගතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො නිරොධානුපස්සනාඤාණං සමුදයතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, පටිනිස්සග්ගානුපස්සනාඤාණං ආදානතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, අනිමිත්තානුපස්සනාඤාණං නිමිත්තතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, අප්පණිහිතානුපස්සනාඤාණං පණිධියා අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, සුඤ්ඤතානුපස්සනාඤාණං සබ්බාභිනිවෙසෙහි මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො.

රූපෙ අනිච්චානුපස්සනාඤාණං නිච්චතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො -පෙ- රූපෙ සුඤ්ඤතානුපස්සනාඤාණං සබ්බාභිනිවෙසෙහි මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනාඤාණං නිච්චතො අභිනිවෙසා මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො -පෙ- ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනාඤාණං සබ්බාභිනිවෙසෙහි මුච්චතීති සුඤ්ඤතො විමොක්ඛො, අයං සුඤ්ඤතො විමොක්ඛො (1)

කතමො අනිමිත්තො විමොක්ඛො: අනිච්චානුපස්සනාඤාණං නිච්චතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, දුක්ඛානුපස්සනාඤාණං සුඛතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, අනත්තානුපස්සනාඤාණං අත්තතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, නිබ්බිදානුපස්සනාඤාණං නන්දියා නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, විරාගානුපස්සනාඤාණං රාගතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො නිරොධානුපස්සනාඤාණං සමුදයතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො. පටිනිස්සග්ගානුපස්සනාඤාණං ආදානතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, අනිමිත්තානුපස්සනාඤාණං සබ්බනිමිත්තෙහි මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, අප්පණිහිතානුපස්සනාඤාණං පණිධියා නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, සුඤ්ඤතානුපස්සනාඤාණං අභිනිවෙසතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො.

රූපෙ අනිච්චානුපස්සනාඤාණං නිච්චතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො -පෙ- රූපෙ අනිමිත්තානුපස්සනාඤාණං සබ්බනිමිත්තෙහි මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, රූපෙ අප්පණිහිතානුපස්සනාඤාණං පණිධියා නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, රූපෙ සුඤ්ඤතානුපස්සනාඤාණං අභිනිවෙසතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනාඤාණං නිච්චතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො -පෙ- ජරාමරණෙ අනිමිත්තානුපස්සනාඤාණං සබ්බනිමිත්තෙහි මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, ජරාමරණෙ අප්පණිහිතානුපස්සනාඤාණං පණිධියා නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනාඤාණං අභිනිවෙසතො නිමිත්තා මුච්චතීති අනිමිත්තො විමොක්ඛො, අයං අනිමිත්තො විමොක්ඛො. (2)

ශූන්‍යතවිමොක්ෂ කවරේ යත්: අනිච්චානුපස්සනාඥාණය නිත්‍යාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යැ දුක්ඛානුපස්සනාඥාණය සුඛාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යැ අනත්තානුපස්සනාඥාණය ආත්මාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යැ නිබ්බිදානුපස්සනාඥාණය නන්‍ද්‍යභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යැ විරාගානුපස්සනාඥාණය රාගාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යැ නිරොධානුපස්සනාඥාණය සමුදයාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යැ පටිනිස්සග්ගානුපස්සනාඥාණය ආදානාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යැ අනිමිත්තානුපස්සනාඥාණය නිමිත්තාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යැ අප්පණිහිතානුපස්සනාඥාණය ප්‍රාර්ථනාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යැ සුඤ්ඤතානුපස්සනාඥාණය සියලු අභිනිවෙශයන් කෙරෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යි.

රූපයෙහි අනිච්චානුපස්සනාඥාණය නිත්‍යාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යැ ... රූපයෙහි සුඤ්ඤතානුපස්සනාඥාණය සියලු අභිනිවෙශයන් කෙරෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යි. වෙදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාඥාණය නිත්‍යාභිනිවෙශයෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යැ ... ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනාඥාණය සියලු අභිනිවෙශයන් කෙරෙන් මිදේ නු'යි ශූන්‍යතවිමොක්ෂ යි. මේ ශූන්‍යතවිමොක්ෂ නම් වේ. (1)

අනිමිත්තවිමොක්ෂ කවරේ යත්: අනිච්චානුපස්සනාඥාණය නිත්‍යනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ දුක්ඛානුපස්සනාඥාණය සුඛනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ අනත්තානුපස්සනාඥාණය ආත්මනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ නිබ්බිදානුපස්සනාඥාණය නන්දිනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ විරාගානුපස්සනාඥාණය රාගනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ නිරොධානුපස්සනාඥාණය සමුදයනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ පටිනිස්සග්ගානුපස්සනාඥාණය ආදානනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ අනිමිත්තානුපස්සනාඥාණය හැම නිමිති කෙරෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ අප්පණිහිතානුපස්සනාඥාණය ප්‍රණිධිනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ සුඤ්ඤතානුපස්සනාඥාණය අභිනිවෙශනිමිත්තයෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යි.

රූපයෙහි අනිච්චානුපස්සනාඥාණය නිත්‍ය නිමිත්තෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ ... රූපයෙහි අනිමිත්තානුපස්සනාඥාණය හැම නිමිති කෙරෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ රූපයෙහි අප්පණිහිතානුපස්සනාඥාණය ප්‍රණිධිනිමිත්තෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ රූපයෙහි සුඤ්ඤතානුපස්සනාඥාණය අභිනිවෙශනිමිත්තෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ. වෙදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාඥාණය නිත්‍යනිමිත්තෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ ... ජරාමරණයෙහි අනිමිත්තානුපස්සනාඥාණය හැම නිමිති කෙරෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ. ජරාමරණයෙහි අප්පණිහිතානුපස්සනාඥාණය ප්‍රණිධි නිමිත්තෙන්, මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යැ. ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනාඥාණය අභිනිවෙශ නිමිත්තෙන් මිදේ නු'යි අනිමිත්තවිමොක්ෂ යි. මේ අනිමිත්තවිමොක්ෂ නම් වේ. (2)

කතමො අප්පණිහිතො විමොක්ඛො: අනිච්චානුපස්සනාඤාණං නිච්චතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, දුක්ඛානුපස්සනාඤාණං සුඛතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, අනත්තානුපස්සනාඤාණං අත්තතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, විරාගානුපස්සනාඤාණං රාගතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, නිරොධානුපස්සනාඤාණං සමුදයතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, පටිනිස්සග්ගානුපස්සනාඤාණං ආදානතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, අනිමිත්තානුපස්සනාඤාණං නිමිත්තතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, අප්පණිහිතානුපස්සනාඤාණං සබ්බපණිධීහි මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, සුඤ්ඤතානුපස්සනාඤාණං අභිනිවෙසතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො.

රූපෙ අනිච්චානුපස්සනාඤාණං නිච්චතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො -පෙ- රූපෙ අනිමිත්තානුපස්සනාඤාණං නිමිත්තතො මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, රූපෙ අප්පණිහිතානුපස්සනාඤාණං සබ්බපණිධීහි මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, රූපෙ සුඤ්ඤතානුපස්සනාඤාණං අභිනිවෙසතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනාඤාණං නිච්චතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො -පෙ- ජරාමරණෙ අනිමිත්තානුපස්සනාඤාණං නිමිත්තතො මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, ජරාමරණෙ අප්පණිහිතානුපස්සනාඤාණං සබ්බපණිධීහි මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, ජරාමරණෙ සුඤ්ඤතානුපස්සනාඤාණං අභිනිවෙසතො පණිධියා මුච්චතීති අප්පණිහිතො විමොක්ඛො, අයං අප්පණිහිතො විමොක්ඛො, (3) අයං විමොක්ඛො, (1)

කතමං මුඛං, යෙ තත්ථ ජාතා අනවජ්ජා කුසලා බොධිපක්ඛියා ධම්මා. ඉදං මුඛං. (2)

කතමං විමොක්ඛමුඛං: යං තෙසං[1] ධම්මානං ආරම්මණං නිරොධො නිබ්බානං, ඉදං විමොක්ඛමුඛං, විමොක්ඛඤ්ච මුඛඤ්ච විමොක්ඛමුඛං[2] ඉදං විමොක්ඛමුඛං. (3)

කතමං විමොක්ඛපච්චනීකං: තීණි අකුසලමූලානි විමොක්ඛපච්චනීකානි, තීණි දුච්චරිතානි විමොක්ඛපච්චනීකානි, සබ්බෙපි අකුසලා ධම්මා විමොක්ඛපච්චනීකා, ඉදං විමොක්ඛපච්චනීකං. (4)

කතමං විමොක්ඛානුලොමං: තීණි කුසලමූලානි විමොක්ඛානුලොමානි, තීණි සුචරිතානි විමොක්ඛානුලොමානි, සබ්බෙපි කුසලා ධම්මා විමොක්ඛානුලොමා. ඉදං විමොක්ඛානුලොමං. (5)

කතමො විමොක්ඛවිවට්ටො: සඤ්ඤාවිවට්ටො, චෙතොවිවට්ටො, චිත්තවිවට්ටො, ඤාණවිවට්ටො, විමොක්ඛවිවට්ටො, සච්චවිවට්ටො:

1 තෙසං තෙසං - සයා

2. විමොක්ඛඤ්ච මුඛඤ්ච විමොක්ඛමුඛ'න්ති සයා, PTS, පොත්ථකෙසු නත්ථි.

අප්‍රණිහිතවිමොක්ෂ කවරේ යත් අනිච්චානුපස්සනාඤාණය නිත්‍යප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යෑ. දුක්ඛානුපස්සනාඤාණය සුඛ ප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිත විමොක්ෂ යෑ. අනත්තානුපස්සනාඤාණය ආත්මප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යෑ. විරාගානුපස්සනාඤාණය රාගප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යෑ. නිරොධානුපස්සනාඤාණය සමුදයප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යෑ. පටිනිස්සග්ගානුපස්සනාඤාණය ආදානප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යෑ. අනිමිත්තානුපස්සනාඤාණය නිමිත්තප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යෑ හැම ප්‍රණිධි කෙරෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යෑ. සුඤ්ඤතානුපස්සනාඤාණය අභිනිවෙශ ප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිත විමොක්ෂ යි.

රූපයෙහි අනිච්චානුපස්සනාඤාණය නිත්‍යප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යෑ ... රූපයෙහි අනිමිත්තානුපස්සනාඤාණය නිමිත්ත කෙරෙන් මිදේ නු'යි අප්‍රණිහිත විමොක්ෂ යෑ රූපයෙහි අප්පණිහිතානුපස්සනාඤාණය හැම ප්‍රණිධීන් කෙරෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යෑ රූපයෙහි සුඤ්ඤතානුපස්සනාඤාණය අභිනිවෙශප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යෑ. වෙදනායෙහි ... සංඥායෙහි .. සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාඤාණය නිත්‍යප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යෑ ... ජරාමරණයෙහි අනිමිත්තානුපස්සනාඤාණය නිමිත්ත කෙරෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යෑ ජරාමරණයෙහි අප්පණිහිතානුපස්සනාඤාණය හැම ප්‍රණිධීන් කෙරෙන් මිදේ නු'යි අප්‍රණිහිත විමොක්ෂ යෑ. ජරාමරණයෙහි සුඤ්ඤතානුපස්සනාඤාණය අභිනිවෙශප්‍රණිධියෙන් මිදේ නු'යි අප්‍රණිහිතවිමොක්ෂ යි. මේ අප්‍රණිහිත විමොක්ෂ නම් වේ. (3) මේ විමොක්ෂ යි. (1)

මුඛ කවරේ යත්: ඒ මාර්ගවිමොක්ෂයෙහි උපන් යම් (රාගාදි වරද නැති බැවින්) නිවරද වූ කුසල් වූ බොධිපාක්ෂිකධර්ම කෙනෙක් වෙත් ද, මේ මුඛ නම් වේ. (2)

විමොක්ෂමුඛ කවරේ යත්: ඒ බොධිපාක්ෂික ධර්මයන්ට අරමුණු වූ යම් නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයෙක් වේ ද, මේ විමොක්ෂමුඛ නම් වෙයි. විමොක්ෂ ද හෙ මැ මුඛ ද හෙ මැ නු'යි විමොක්ෂමුඛ යෑ. මේ විමොක්ෂ මුඛ යි. (3)

විමොක්ෂප්‍රත්‍යනීක (ප්‍රතිපක්ෂ) කවරේ යත්: තුන් අකුශලමූලයෝ විමොක්ෂප්‍රත්‍යනීකයෝ යෑ ත්‍රිවිධ දුශ්චරිතයෝ විමොක්ෂප්‍රත්‍යනීකයෝ යෑ හැම අකුශලධර්මයෝ මැ විමොක්ෂප්‍රත්‍යනීකයෝ යි. මේ විමොක්ෂප්‍රත්‍යනීක නම් වේ. (4)

විමොක්ෂානුලොම කවරේ යත්: තුන් කුශල මූලයෝ විමොක්ෂානුලොමයෝ යෑ, ත්‍රිවිධ සුචරිතයෝ විමොක්ෂානුලොමයෝ යෑ, හැම කුශල ධර්මයෝ මැ විමොක්ෂානුලොමයෝ යි. මේ විමොක්ෂානුලොම යි. (5)

විමොක්ෂවිවර්ත කවරේ යත්: සංඥාවිවර්ත යෑ චෙතොවිවර්ත යෑ චිත්ත විවර්ත යෑ ඥානවිවර්ත යෑ විමොක්ෂවිවර්ත යෑ සත්‍යවිවර්ත යි.

සඤ්ජානන්තො විවට්ටතීති සඤ්ඤාවිවට්ටො, චෙතයන්තො විවට්ටතීති චෙතොවිවට්ටො, විජානන්තො විවට්ටතීති චිත්තවිවට්ටො, ඤාණං කරොන්තො විවට්ටතීති ඤාණවිවට්ටො, වොස්සජ්ජන්තො[1] විවට්ටතීති විමොක්ඛවිවට්ටො, තථට්ඨෙ[2] විවට්ටතීති සච්චවිවට්ටො.

යත්ථ සඤ්ඤාවිවට්ටො, තත්ථ චෙතොවිවට්ටො; යත්ථ චෙතොවිවට්ටො, තත්ථ සඤ්ඤාවිවට්ටො; යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො, තත්ථ චිත්තවිවට්ටො; යත්ථ චිත්තවිවට්ටො, තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො, යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො, තත්ථ ඤාණවිවට්ටො; යත්ථ ඤාණවිවට්ටො, තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො; යත්ථ සඤ්ඤාවිවට්ටො; චෙතොවිවට්ටො චිත්තවිවට්ටො, ඤාණවිවට්ටො, තත්ථ විමොක්ඛවිවට්ටො, යත්ථ විමොක්ඛවිවට්ටො, තත්ථ සඤ්ඤාවිවට්ටො; චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො. යත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො විමොක්ඛවිවට්ටො, තත්ථ සච්චවිවට්ටො, යත්ථ සච්චවිවට්ටො, තත්ථ සඤ්ඤාවිවට්ටො චෙතොවිවට්ටො චිත්තවිවට්ටො ඤාණවිවට්ටො විමොක්ඛවිවට්ටො, අයං විමොක්ඛවිවට්ටො (6)

කතමා විමොක්ඛභාවනා: පඨමස්ස ඣානස්ස[3] ආසෙවනා භාවනා බහුලීකම්මං, දුතියස්ස ඣානස්ස ආසෙවනා භාවනා බහුලීකම්මං, තතියස්ස ඣානස්ස ආසෙවනා භාවනා බහුලීකම්මං, චතුත්ථස්ස ඣානස්ස ආසෙවනා භාවනා බහුලීකම්මං, ආකාසානඤ්චායතනසමාපත්තියා ආසෙවනා භාවනා බහුලීකම්මං, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආසෙවනා භාවනා බහුලීකම්මං, සොතාපත්තිමග්ගස්ස ආසෙවනා භාවනා බහුලීකම්මං, සකදාගාමිමග්ගස්ස-පෙ- අනාගාමිමග්ගස්ස-පෙ-අරහත්තමග්ගස්ස ආසෙවනා භාවනා බහුලීකම්මං, අයං විමොක්ඛභාවනා. (7)

කතමා විමොක්ඛපටිප්පස්සද්ධි: පඨමස්ස ඣානස්ස පටිලාභො වා විපාකො වා, දුතියස්ස ඣානස්ස පටිලාභො වා විපාකො වා, තතියස්ස ඣානස්ස -පෙ- චතුත්ථස්ස ඣානස්ස -පෙ- ආකාසානඤ්චායතනසමාපත්තියා -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා පටිලාභො වා විපාකො වා, සොතාපත්තිමග්ගස්ස සොතාපත්තිඵලං, සකදාගාමිමග්ගස්ස සකදාගාමිඵලං, අනාගාමිමග්ගස්ස අනාගාමිඵලං, අරහත්තමග්ගස්ස අරහත්තඵලං. අයං විමොක්ඛපටිප්පස්සද්ධි.[4] (8)

**තතියක භාණවාරං**[5]

**විමොක්ඛකථා සමත්තා**

1. වොසජ්ජන්තො - මජසං,
2. තථට්ඨෙන - මජසං, සයා
3. පඨමජ්ඣානස්ස - සං, සී 2.
4. විමොක්ඛපටිප්පස්සද්ධි මජසං - විමොක්ඛපටිපස්සද්ධි - සී 2, තතියභාණවාරො - මජසං, තතියභාණවාරං - සයා, PTS,

හැඳිනගනිමින් පරාවර්ත වේ නු'යි සංඥාවිවර්ත යැ සිතමින් පරාවර්ත වේ නු'යි චෙතොවිවර්ත යැ දැනගනිමින් පරාවර්ත වේ නු'යි චිත්තවිවර්ත යැ ප්‍රකට කෙරෙමින් පරාවර්ත වේ නු'යි ඥානවිවර්ත යැ (කාමච්ඡන්දාදිය) හැරපියමින් පරාවර්ත වේ නු'යි විමොක්ෂවිවර්ත යැ තථාර්ථයෙහි පරාවර්ත වේ නු'යි සත්‍යවිවර්ත යි.

යම් තැනෙක සංඥාවිවර්තය වේ ද, එහි චෙතොවිවර්තය වෙයි; යම් තැනෙක චෙතොවිවර්තය වේ ද, එහි සංඥාවිවර්තය වෙයි; යම් තැනෙක සංඥාවිවර්තය චෙතොවිවර්තය වේ ද එහි චිත්තවිවර්තය වෙයි; යම් තැනෙක චිත්තවිවර්තය වේ ද, එහි සංඥාවිවර්තය චෙතොවිවර්තය වෙයි; යම් තැනෙක සංඥාවිවර්තය චෙතොවිවර්තය චිත්තවිවර්තය වේ ද, එහි ඥානවිවර්තය වෙයි; යම් තැනෙක ඥානවිවර්තය වේ ද, එහි සංඥාවිවර්තය චෙතොවිවර්තය චිත්තවිවර්තය වෙයි; යම් තැනෙක සංඥාවිවර්තය චෙතොවිවර්තය චිත්ත-විවර්තය ඥානවිවර්තය වේ ද, එහි විමොක්ෂවිවර්තය වෙයි; යම් තැනෙක විමොක්ෂවිවර්තය වේ ද, එහි සංඥාවිවර්තය චෙතොවිවර්තය චිත්තවිවර්තය ඥානවිවර්තය වෙයි; යම් තැනෙක සංඥාවිවර්තය චෙතොවිවර්තය චිත්ත-විවර්තය ඥානවිවර්තය විමොක්ෂවිවර්තය වේ ද, එහි සත්‍යවිවර්තය වෙයි; යම් තැනෙක සත්‍යවිවර්තය වේ ද, එහි සංඥාවිවර්තය චෙතොවිවර්තය චිත්තවිවර්තය ඥානවිවර්තය විමොක්ෂවිවර්තය වේ. මේ විමොක්ෂවිවර්ත යි. (6)

විමොක්ෂභාවනා කවරේ යත්: ප්‍රථමධ්‍යානයාගේ ආසෙවන යැ භාවනා යැ බහුල කිරීම යැ ද්විතීයධ්‍යානයාගේ ආසෙවන යැ භාවනා යැ බහුල කිරීම යැ තෘතීයධ්‍යානයාගේ ආසෙවන යැ භාවනා යැ බහුල කිරීම යැ චතුර්ථධ්‍යානයාගේ ආසෙවන යැ භාවනා යැ බහුල කිරීම යැ ආකාසානඤ්චායතනසමාපත්තියගේ ආසෙවන යැ භාවනා යැ බහුල කිරීම යැ විඤ්ඤාණඤ්චායතනසමාපත්තියගේ ... ආකිඤ්චඤ්ඤායතන-සමාපත්තියගේ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය ගේ ආසෙවන යැ භාවනා යැ බහුල කිරීම යැ ස්‍රොතාපත්තිමාර්ගයාගේ ආසෙවන යැ භාවනා යැ බහුල කිරීම යැ සකෘදාගාමිමාර්ගයාගේ ... අනාගාමිමාර්ගයාගේ .. අර්හත්මාර්ගයාගේ ආසෙවන යැ භාවනා යැ බහුල කිරීම යි. මේ විමොක්ෂභාවනා යි .(7)

විමොක්ෂප්‍රතිප්‍රශ්‍රබ්ධි කවරැ යත්: ප්‍රථමධ්‍යානයාගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යැ ද්විතීයධ්‍යානයාගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යැ තෘතීයධ්‍යානයාගේ ... චතුර්ථධ්‍යානයාගේ . ආකාසානඤ්චායතනසමා-පත්තිහුගේ .. විඤ්ඤාණඤ්චායතනසමාපත්තිහුගේ ... ආකිඤ්චඤ්ඤායතන-සමාපත්තිහුගේ ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිහුගේ ප්‍රතිලාභය හෝ විපාකය හෝ යැ ස්‍රොතාපත්තිමාර්ගයට ස්‍රොතාපත්තිඵල යැ සකෘදාගාමි මාර්ගයට සකෘදාගාමිඵල යැ අනාගාමිමාර්ගයට අනාගාමිඵල යැ අර්හත්මාර්ගයට අර්හත්ඵල යැ යන මේ විමොක්ෂප්‍රතිප්‍රශ්‍රබ්ධි යි (8)

**තුන්වැනි බණවර යි.**

**විමොක්ෂකථා නිමි.**

# 6

## ගතිකථා

ගතිසම්පත්තියා ඤාණසම්පයුත්තෙ කතිනං[1] හෙතූනං පච්චයා උපපත්ති[2] හොති: ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණසම්පයුත්තෙ කතිනං හෙතූනං පච්චයා උපපත්ති හොති: රූපාවචරානං දෙවානං කතිනං හෙතූනං පච්චයා උපපත්ති හොති: අරූපාවචරානං දෙවානං කතිනං හෙතූනං පච්චයා උපපත්ති හොති.

ගතිසම්පත්තියා ඤාණසම්පයුත්තෙ අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණසම්පයුත්තෙ අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. රූපාවචරානං දෙවානං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. අරූපාවචරානං දෙවානං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති.

ගතිසම්පත්තියා ඤාණසම්පයුත්තෙ කතමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති: කුසලකම්මස්ස ජවනක්ඛණෙ තයො හෙතූ කුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: කුසලමූලපච්චයාපි සඞ්ඛාරා, නිකන්තික්ඛණෙ ද්වෙ හෙතූ අකුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: අකුසලමූලපච්චයාපි සඞ්ඛාරා, පටිසන්ධික්ඛණෙ තයො හෙතූ අබ්‍යාකතා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: නාමරූපපච්චයාපි විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයාපි නාමරූපං.

පටිසන්ධික්ඛණෙ පඤ්චක්ඛන්ධා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ චත්තාරො මහාභූතා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති. පටිසන්ධික්ඛණෙ තයො ජීවිතසඞ්ඛාරා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච රූපඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති පටිසන්ධික්ඛණෙ ඉමෙ චුද්දස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති.

---

1 කතිනං - මජසං, ස්‍යා PTS, කතීනං - ස

2 උපපත්ති - සී 1, 2

# 6

## ගතිකථා

ගතිසම්පත්තියෙන් ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්‍ෂණයෙහි කොතෙක් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද, ක්‍ෂත්‍රියමහාසාරයනට බ්‍රාහ්මණමහාසාරයනට ගෘහපතිමහාසාරයනට කාමාවචර දෙවියනට ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්‍ෂණයෙහි කොතෙක් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද, රූපාවචර දෙවියනට කොතෙක් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද, අරූපාවචර දෙවියනට කොතෙක් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද යත්:

ගතිසම්පත්තියෙන් ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්‍ෂණයෙහි අට වැදෑරුම් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වෙයි. ක්‍ෂත්‍රියමහාසාරයනට බ්‍රාහ්මණමහාසාරයනට ගෘහපතිමහාසාරයනට කාමාවචර දෙවියනට ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්‍ෂණයෙහි අට වැදෑරුම් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වෙයි. රූපාවචර දෙවියනට අට වැදෑරුම් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වෙයි. අරූපාවචර දෙවියනට අට වැදෑරුම් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ.

ගතිසම්පත්තියෙන් ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්‍ෂණයෙහි කවර අට වැදෑරුම් හෙතුන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද යත්: (ත්‍රිහෙතුකකාමාවචර) කුශලකර්මයාගේ ජවනක්‍ෂණයෙහි තුන් කුශලහෙතූහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාතප්‍රත්‍යය වෙති, එයින් කියනු ලැබෙයි: ‘‘කුශලමූලප්‍රත්‍යයෙනුදු සංස්කාරයෝ වෙති’’ යි. (උපදනාවුන්ට) නිකාන්තික්‍ෂණයෙහි දෙ අකුශලහෙතූහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාතප්‍රත්‍යය වෙති, එයින් කියනු ලැබෙයි: ‘‘අකුශලමූලප්‍රත්‍යයෙනුදු ස සකාරයෝ වෙති’’ යි. ප්‍රතිසන්ධික්‍ෂණයෙහි තුන් අව්‍යාකෘතහෙතූහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාතප්‍රත්‍යය වෙති, එයින් කියනු ලැබෙයි: ‘‘නාමරූපප්‍රත්‍යයෙනුදු විඥානය වෙයි, විඥානප්‍රත්‍යයෙනුදු නාමරූපය වේ’’ යයි.

ප්‍රතිසන්ධික්‍ෂණයෙහි පඤ්චස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්‍ෂණයෙහි සතර මහාභූතයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්‍ෂණයෙහි තුන් ජීවිතසංස්කාරයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්‍ෂණයෙහි නාමයත් රූපයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්‍ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝ’න්‍යප්‍රත්‍යයෝ වෙති නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

පටිසන්ධික්ඛණෙ චත්තාරො ඛන්ධා අරූපිනො සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති. පටිසන්ධික්ඛණෙ පඤ්චින්ද්‍රියානි සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සපච්චයා හොන්ති සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ තයො හෙතූ සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච විඤ්ඤාණඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ඉමෙ චුද්දස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති.

පටිසන්ධික්ඛණෙ ඉමෙ අට්ඨවීසති ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති.

ගතිසම්පත්තියා ඤාණසම්පයුත්තෙ ඉමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. (1)

ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණසම්පයුත්තෙ කතමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති කුසලකම්මස්ස ජවනක්ඛණෙ තයො හෙතූ කුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: කුසලමූලපච්චයාපි සඞ්ඛාරා, නිකන්තික්ඛණෙ ද්වෙ හෙතූ අකුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: අකුසලමූලපච්චයාපි සඞ්ඛාරා, පටිසන්ධික්ඛණෙ තයො හෙතූ අබ්‍යාකතා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: ‘නාමරූපපච්චයාපි විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයාපි නාමරූපං’.

පටිසන්ධික්ඛණෙ පඤ්චක්ඛන්ධා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ චත්තාරො මහාභූතා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ තයො ජීවිතසඞ්ඛාරා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච රූපඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ඉමෙ චුද්දස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති.

පටිසන්ධික්ඛණෙ චත්තාරො ඛන්ධා අරූපිනො සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති. පටිසන්ධික්ඛණෙ පඤ්චින්ද්‍රියානි සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ තයො හෙතූ සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච විඤ්ඤාණඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ඉමෙ චුද්දස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති.

ප්‍රතිසන්ධික්ෂණයෙහි අරූපී වූ සතර ස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චේන්ද්‍රියයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්, ප්‍රතිසන්ධික්ෂණයෙහි තුන් හේතූහු සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති. සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයත් විඥානයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ අටවිසි ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ගතිසම්පත්තියෙන් ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි මේ අට වැදෑරුම් හේතූන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ. (1)

කැත්මහසලනට බමුණුමහසලනට ගැහැවිමහසලනට කාමාවචර දෙවියනට ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි කවර අට වැදෑරුම් හේතූන්-ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද යත්: කුශලකර්මයාගේ ජවනක්ෂණයෙහි, තුන් කුශලහේතූහු එකෙණෙහි උපන් චේතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති එයින් කියනු ලැබේ: 'කුසලමූලපච්චයාපි සඞ්ඛාරා' යි නිකාන්තික්ෂණ-යෙහි දෙ අකුශලහේතූහු එකෙණෙහි උපන් චේතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබේ: 'අකුසලමූලපච්චයාපි සඞ්ඛාරා' යි. ප්‍රති-සන්ධික්ෂණයෙහි තුන් අව්‍යාකෘතහේතූහු එකෙණෙහි උපන් චේතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙත්. එයින් කියනු ලැබේ. 'නාමරූපපච්චයාපි විඤ්ඤාණං විඤ්ඤාණපච්චයාපි නාමරූපං' යි.

ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි සතර මහාභූතයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි තුන් ජීවිතසංස්කාරයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණ-යෙහි නාමයත් රූපයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත් ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති. නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ප්‍රතිසන්ධික්ෂණයෙහි අරූපී වූ සතර ස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චේන්ද්‍රියයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි තුන් හේතූහු සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයත් විඥානයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති. සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත් ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

පටිසන්ධික්ඛණෙ ඉමෙ අට්ඨවීසති ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති.

ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණසම්පයුත්තෙන ඉමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති (2)

රූපාවචරානං දෙවානං කතමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති: කුසලකම්මස්ස ජවනක්ඛණෙ තයො හෙතූ කුසලා -පෙ- රූපාවචරානං දෙවානං ඉමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. (3)

අරූපාවචරානං දෙවානං කතමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති කුසලකම්මස්ස ජවනක්ඛණෙ තයො හෙතූ කුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: කුසලමූලපච්චයාපි සඞ්ඛාරා, නිකන්තික්ඛණෙ ද්වෙ හෙතූ අකුසලා තස්මිං ඛණෙ ජාත චෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: අකුසලමූලපච්චයාපි සඞ්ඛාරා, පටිසන්ධික්ඛණෙ තයො හෙතූ අබ්‍යාකතා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: නාමපච්චයාපි විඤ්ඤාණං විඤ්ඤාණපච්චයාපි නාමං

පටිසන්ධික්ඛණෙ චත්තාරො ඛන්ධා අරූපිනො සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ පඤ්චින්ද්‍රියානි සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ තයො හෙතූ සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච විඤ්ඤාණඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ඉමෙ චුද්දස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චය හොන්ති, අරූපාවචරානං දෙවානං ඉමෙසං අට්ඨන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. (4)

ගතිසම්පත්තියා ඤාණවිප්පයුත්තෙන කතිනං හෙතූනං පච්චයා උපපත්ති හොති: ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමචරානං දෙවානං ඤාණවිප්පයුත්තෙන කතිනං හෙතූනං පච්චයා උපපත්ති හොති:[1]

ගතිසම්පත්තියා ඤාණවිප්පයුත්තෙන ඡන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති, ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණවිප්පයුත්තෙන ඡන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති.

1. රූපාවචරානං ... අරූපාවචරානං දෙවානං ඡන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති- PTS, (අඩිසං)

ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ අටවිසි ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ක්ෂත්‍රියමහසලනට බමුණුමහසලනට ගෘහපතිමහසලනට කාමාවචර දෙවියනට ඥානසම්ප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි මේ අට වැදෑරුම් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ. (2)

රූපාවචර දෙවියනට කවර අට වැදෑරුම් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද යත්: කුශලකර්මයාගේ ජවනක්ෂණයෙහි කුසල් වූ තුන් හෙතුහු ... රූපාවචර දෙවියනට මේ අට වැදෑරුම් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ. (3)

අරූපාවචර දෙවියනට කවර අට වැදෑරුම් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් ඉපැදීම වේ ද යත්: කුශලකර්මයාගේ ජවනක්ෂණයෙහි කුසල් වූ තුන් හෙතුහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: 'කුසලමූලපච්චයාපි සඞ්ඛාරා'යි. නිකාන්තික්ෂණයෙහි අකුසල් වූ දෙ හෙතුහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: 'අකුසල මූලපච්චයාපි සඞ්ඛාරා'යි. ප්‍රතිසන්ධික්ෂණයෙහි අව්‍යාකෘත වූ තුන් හෙතුහු එකෙණෙහි උපන් චෙතනාවට සහජාත ප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: 'නාමපච්චයාපි විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයාපි නාමං'යි.

ප්‍රතිසන්ධික්ෂණයෙහි අරූපී වූ සතර ස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍ය ප්‍රත්‍යයෝ වෙති. නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චෙන්ද්‍රියයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි තුන් හෙතුහු සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයත් විඥනයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති. අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. අරූපාවචර දෙවියනට මේ අට වැදෑරුම් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් ඉපදීම වේ. (4)

ගතිසම්පත්තියෙන් ඥනවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි කෙතෙක් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වේ ද, ක්ෂත්‍රියමහාසාරයනට බ්‍රාහ්මණමහාසාරයනට ගෘහපතිමහාසාරයනට කාමාවචර දෙවියනට ඥනවිප්‍රයුක්තප්‍රතිසසන්ධික්ෂණයෙහි කෙතෙක් හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වේ ද යත්:

ගතිසම්පත්තියෙන් ඥනවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි ෂඩ්හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වෙයි, ක්ෂත්‍රියමහාසාරයනට බ්‍රාහ්මණමහාසාරයනට ගෘහපතිමහාසාරයනට කාමාවචර දෙවියනට ඥනවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි ෂඩ්හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වේ.

ගතිසම්පත්තියා ඤාණවිප්පයුත්තෙන කතමෙසං ජන්නං හෙතූනං පච්චය උපපත්ති හොති: කුසලකම්මස්ස ජවනක්ඛණෙ ද්වෙ හෙතූ කුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: කුසලමූලපච්චයාපි සඞ්ඛාරා, නිකන්තික්ඛණෙ ද්වෙ හෙතූ අකුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: අකුසලමූලපච්චයාපි සඞ්ඛාරා. පටිසන්ධික්ඛණෙ ද්වෙ හෙතූ අබ්‍යාකතා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති, තෙන වුච්චති: නාමරූපපච්චයාපි විඤ්ඤාණං විඤ්ඤාණපච්චයාපි නාමරූපං.

පටිසන්ධික්ඛණෙ පඤ්චක්ඛන්ධා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ චත්තාරො මහාභූතා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති. පටිසන්ධික්ඛණෙ තයො ජීවිතසඞ්ඛාරා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච රූපඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ඉමෙ චුද්දස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති.

පටිසන්ධික්ඛණෙ චත්තාරො ඛන්ධා[1] අරූපිනො සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ චත්තාරින්ද්‍රියානි සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ද්වෙ හෙතූ සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ නාමඤ්ච විඤ්ඤාණඤ්ච සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති, පටිසන්ධික්ඛණෙ ඉමෙ ද්වාදස ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයාහොන්ති, සම්පයුත්තපච්චයා හොන්ති.

පටිසන්ධික්ඛණෙ ඉමෙ ඡබ්බීසති ධම්මා සහජාතපච්චයා හොන්ති, අඤ්ඤමඤ්ඤපච්චයා හොන්ති, නිස්සයපච්චයා හොන්ති, විප්පයුත්තපච්චයා හොන්ති.

ගතිසම්පත්තියා ඤාණවිප්පයුත්තෙන ඉමෙසං ජන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති. (1)

ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානං ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණවිප්පයුත්තෙන කතමෙසං ජන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති: කුසලකම්මස්ස ජවනක්ඛණෙ ද්වෙ හෙතූ කුසලා තස්මිං ඛණෙ ජාතචෙතනාය සහජාතපච්චයා හොන්ති. තෙන වුච්චති: කුසමූලපච්චයාපි සඞ්ඛාරා -පෙ- ඛත්තියමහාසාලානං බ්‍රාහ්මණමහාසාලානා ගහපතිමහාසාලානං කාමාවචරානං දෙවානං ඤාණවිප්පයුත්තෙන ඉමෙසං ජන්නං හෙතූනං පච්චයා උපපත්ති හොති.

**ගතිකථා සමත්තා.**

1. ධම්මො - PTS,

ගතිසම්පත්තියෙන් ඥානවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි කවර ෂඩ්හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වෙයි යත්: කුශලකර්මයාගේ ජවනක්ෂණයෙහි කුසල් වූ දෙ හෙතූහු එකෙණෙහි උපන් චේතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: 'කුසලමූලපච්චයාපි සඞ්ඛාරා'යි. නිකාන්තික්ෂණයෙහි අකුසල් වූ දෙ හෙතූහු එකෙණෙහි උපන් චේතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: 'අකුසලමූලපච්චයාපි සඞ්ඛාරා'යි. ප්‍රතිසන්ධික්ෂණයෙහි අව්‍යාකෘත වූ හෙතූහු දෙදෙනෙක් එකෙණෙහි උපන් චේතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: 'නාමරූපපච්චයාපි විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයාපි නාමරූපං' යි.

ප්‍රතිසන්ධික්ෂණයෙහි පඤ්චස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි සතර මහාභූතයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි තුන් ජීවිතසංස්කාරයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයත් රූපයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ තුදුස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ප්‍රතිසන්ධික්ෂණයෙහි අරූපී වූ සතර ස්කන්ධයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි ඉන්ද්‍රියයෝ සතර දෙනෙක් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි හෙතූහු දෙදෙනෙක් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමයත් විඥානයත් සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්. ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ දොළොස් ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ප්‍රතිසන්ධික්ෂණයෙහි මේ සවිසි ධර්මයෝ සහජාතප්‍රත්‍යයෝ වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යයෝ වෙති, නිශ්‍රයප්‍රත්‍යයෝ වෙති, විප්‍රයුක්තප්‍රත්‍යයෝ වෙත්.

ගතිසම්පත්තියෙන් ඥානවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි මේ ෂඩ්හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වේ. (1)

ක්ෂත්‍රියමහාසාරයනට බ්‍රාහ්මණමහාසාරයනට ගෘහපතිමහාසාරයනට කාමාවචර දෙවියනට ඥානවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි කවර ෂඩ්හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වේ ද යත්: කුශලකර්මයාගේ ජවනක්ෂණයෙහි කුශල වූ හෙතූහු දෙදෙනෙක් එකෙණෙහි උපන් චේතනාවට සහජාතප්‍රත්‍යයෝ වෙති, එයින් කියනු ලැබෙයි: 'කුසලමූලපච්චයාපි සඞ්ඛාරා'යි. ... ක්ෂත්‍රියමහාසාරයනට බ්‍රාහ්මණමහාසාරයනට ගෘහපතිමහාසාරයනට කාමාවචර දෙවියනට ඥානවිප්‍රයුක්තප්‍රතිසන්ධික්ෂණයෙහි මේ ෂඩ්හෙතූන්ගේ ප්‍රත්‍යයෙන් උපප්‍රාප්තිය වේ.

**ගතිකථා නිමි.**

## 7

# කම්මකථා

අහොසිකම්මං අහොසිකම්මවිපාකො, අහොසිකම්මං නාහොසිකම්මවිපාකො, අහොසිකම්මං අත්ථිකම්මවිපාකො, අහොසිකම්මං නත්ථිකම්මවිපාකො, අහොසිකම්මං භවිස්සතිකම්මවිපාකො, අහොසිකම්මං නභවිස්සතිකම්මවිපාකො. අත්ථිකම්මං අත්ථිකම්මවිපාකො, අත්ථිකම්මං නත්ථිකම්මවිපාකො, අත්ථිකම්මං භවිස්සතිකම්මවිපාකො, අත්ථිකම්මං නභවිස්සතිකම්මවිපාකො. භවිස්සතිකම්මං භවිස්සතිකම්මවිපාකො, භවිස්සතිකම්මං නභවිස්සතිකම්මවිපාකො.

අහොසි කුසලං කම්මං අහොසි කුසලස්ස කම්මස්ස විපාකො, අහොසි කුසලං කම්මං නාහොසි කුසලස්ස කම්මස්ස විපාකො, අහොසි කුසලං කම්මං අත්ථි කුසලස්ස කම්මස්ස විපාකො, අහොසි කුසලං කම්මං නත්ථි කුසලස්ස කම්මස්ස විපාකො, අහොසි කුසලං කම්මං භවිස්සති කුසලස්ස කම්මස්ස විපාකො, අහොසි කුසලං කම්මං න භවිස්සති කුසලස්ස කම්මස්ස විපාකො. අත්ථි කුසලං කම්මං අත්ථි කුසලස්ස කම්මස්ස විපාකො, අත්ථි කුසලං කම්මං නත්ථි කුසලස්ස කම්මස්ස විපාකො, අත්ථි කුසලං කම්මං භවිස්සති කුසලස්ස කම්මස්ස විපාකො, අත්ථි කුසලං කම්මං න භවිස්සති කුසලස්ස කම්මස්ස විපාකො. භවිස්සති කුසලං කම්මං භවිස්සති කුසලස්ස කම්මස්ස විපාකො, භවිස්සති කුසලං කම්මං න භවිස්සති කුසලස්ස කම්මස්ස විපාකො.

අහොසි අකුසලං කම්මං අහොසි අකුසලස්ස කම්මස්ස විපාකො, අහොසි අකුසලං කම්මං නාහොසි අකුසලස්ස කම්මස්ස විපාකො, අහොසි අකුසලං කම්මං අත්ථි අකුසලස්ස කම්මස්ස විපාකො, අහොසි අකුසලං කම්මං නත්ථි අකුසලස්ස කම්මස්ස විපාකො, අහොසි අකුසලං කම්මං භවිස්සති අකුසලස්ස කම්මස්ස විපාකො, අහොසි අකුසලං කම්මං න භවිස්සති අකුසලස්ස කම්මස්ස විපාකො. අත්ථි අකුසලං කම්මං අත්ථි අකුසලස්ස කම්මස්ස විපාකො, අත්ථි අකුසලං කම්මං නත්ථි අකුසලස්ස කම්මස්ස විපාකො, අත්ථි අකුසලං කම්මං භවිස්සති අකුසලස්ස කම්මස්ස විපාකො, අත්ථි අකුසලං කම්මං න භවිස්සති අකුසලස්ස කම්මස්ස විපාකො. භවිස්සති අකුසලං කම්මං භවිස්සති අකුසලස්ස කම්මස්ස විපාකො, භවිස්සති අකුසලං කම්මං න භවිස්සති අකුසලස්ස කම්මස්ස විපාකො.

අහොසි සාවජ්ජං කම්මං -පෙ- අහොසි අනවජ්ජං කම්මං -පෙ- අහොසි කණ්හං කම්මං -පෙ- අහොසි සුක්කං කම්මං -පෙ- අහොසි සුඛුද්‍රියං කම්මං -පෙ- අහොසි දුක්ඛුද්‍රියං[1]. කම්මං -පෙ- අහොසි දුක්ඛවිපාකං කම්මං අහොසි දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අහොසි දුක්ඛවිපාකං කම්මං නාහොසි දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අහොසි දුක්ඛවිපාකං කම්මං අත්ථි දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අහොසි දුක්ඛවිපාකං කම්මං නත්ථි දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අහොසි දුක්ඛවිපාකං කම්මං භවිස්සති දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අහොසි දුක්ඛවිපාකං කම්මං න භවිස්සති දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො අත්ථි දුක්ඛවිපාකං කම්මං අත්ථි දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අත්ථි දුක්ඛවිපාකං කම්මං නත්ථි දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අත්ථි දුක්ඛවිපාකං කම්මං භවිස්සති දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, අත්ථි දුක්ඛවිපාකං කම්මං න භවිස්සති දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො. භවිස්සති දුක්ඛවිපාකං කම්මං භවිස්සති දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො, භවිස්සති දුක්ඛවිපාකං කම්මං න භවිස්සති දුක්ඛවිපාකස්ස කම්මස්ස විපාකො.

**කම්මකථා සමත්තා[2].**

---

1 දුඛුද්‍රියං - මජසං.

2. නිට්ඨිතා - මජසං

# 7

# කර්මකථා

අභූත්කර්ම යෑ අභූත්කර්මවිපාක යෑ, අභූත්කර්ම යෑ නාභූත්කර්මවිපාක යෑ, අභූත්කර්ම යෑ අස්තිකර්මවිපාක යෑ, අභූත්කර්ම යෑ නාස්තිකර්මවිපාක යෑ, අභූත්කර්ම යෑ භවිෂ්‍යත්කර්මවිපාක යෑ, අභූත්කර්ම යෑ නභවිෂ්‍යත්කර්මවිපාක යෑ, අස්තිකර්ම යෑ අස්තිකර්මවිපාක යෑ අස්තිකර්ම යෑ, නාස්තිකර්මවිපාක යෑ, අස්තිකර්ම යෑ භවිෂ්‍යත්කර්මවිපාක යෑ, අස්තිකර්ම යෑ න භවිෂ්‍යත්කර්මවිපාක යෑ, භවිෂ්‍යත්කර්ම යෑ භවිෂ්‍යත්කර්මවිපාක යෑ, භවිෂ්‍යත්කර්ම යෑ න භවිෂ්‍යත්කර්මවිපාක යි.

අභූත්කුශලකර්ම යෑ අභූත්කුශලකර්මවිපාක යෑ, අභූත්කුශලකර්ම යෑ නාභූත්කුශලකර්මවිපාක යෑ, අභූත්කුශලකර්ම යෑ අස්තිකුශලකර්ම විපාක යෑ අභූත්කුශලකර්ම යෑ නාස්තිකුශලකර්මවිපාක යෑ, අභූත්කුශලකර්ම යෑ භවිෂ්‍යත්කුශලකර්මවිපාක යෑ, අභූත්කුශලකර්ම යෑ නභවිෂ්‍යත්කුශලකර්මවිපාක යෑ, අස්තිකුශලකර්ම යෑ අස්තිකුශලකර්මවිපාක යෑ, අස්තිකුශලකර්ම යෑ නාස්තිකුශලකර්මවිපාක යෑ, අස්තිකුශලකර්ම යෑ නභවිෂ්‍යත්කුශලකර්මවිපාක යෑ, අස්තිකුශලකර්මයෑ නභවිෂ්‍යත්කුශලකර්මවිපාක යෑ, භවිෂ්‍යත්කුශලකර්ම යෑ භවිෂ්‍යත්කුශලකර්මවිපාක යෑ, භවිෂ්‍යත්කුශලකර්ම යෑ නවිෂ්‍යත් කුශලකර්මවිපාක යි.

අභූත් අකුශලකර්ම යෑ අභූත්අකුශලකර්මවිපාක යෑ, අභූත් අකුශලකර්ම යෑ නාභූත්අකුශලකර්මවිපාක යෑ, අභූත්අකුශලකර්ම යෑ අස්තිඅකුශලකර්මවිපාක යෑ, අභූත්අකුශලකර්ම යෑ නාස්තිඅකුශලකර්මවිපාක යෑ, අභූත් අකුශලකර්ම යෑ භවිෂ්‍යත්අකුශලකර්මවිපාක යෑ, අභූත්අකුශලකර්ම යෑ න භවිෂ්‍යත්අකුශලකර්මවිපාක යෑ, අස්තිඅකුශලකර්ම යෑ, අස්තිඅකුශලකර්මවිපාක යෑ, අස්තිඅකුශලකර්ම යෑ නාස්තිඅකුශලකර්මවිපාක යෑ, අස්තිඅකුශලකර්ම යෑ භවිෂ්‍යත්අකුශලකර්මවිපාක යෑ, අස්ති අකුශලකර්ම යෑ නභවිෂ්‍යත්අකුශලකර්මවිපාක යෑ භවිෂ්‍යත්අකුශලකර්ම යෑ භවිෂ්‍යත්අකුශලකර්මවිපාක යෑ, භවිෂ්‍යත්අකුශලකර්ම යෑ නභවිෂ්‍යත්අකුශලකර්මවිපාක යි.

අභූත්සාවද්‍යකර්ම යෑ ... අභූත්අනවද්‍යකර්ම යෑ ... අභූත්කෘෂ්ණකර්ම යෑ ... අභූත්ශුක්ලකර්ම යෑ ... අභූත්සුඛෝදයකර්ම යෑ ... අභූත්දුඃඛෝදයකර්ම යෑ ... අභූත්සුඛවිපාකකර්ම යෑ ... අභූත්දුඃඛවිපාකකර්ම යෑ අභූත්දුඃඛවිපාකකර්මවිපාක යෑ අභූත්දුඃඛවිපාකකර්ම යෑ නාභූත්දුඃඛවිපාකකර්මවිපාක යෑ, අභූත්දුඃඛවිපාකකර්ම යෑ අස්තිදුඃඛවිපාකකර්මවිපාක යෑ, අභූත්දුඃඛවිපාකකර්ම යෑ නාස්තිදුඃඛවිපාකකර්මවිපාක යෑ, අභූත්දුඃඛවිපාකකර්ම යෑ භවිෂ්‍යත්දුඃඛවිපාකකර්මවිපාක යෑ, අභූත්දුඃඛවිපාකකර්ම යෑ නාභවිෂ්‍යත්දුඃඛවිපාකකර්මවිපාක යෑ, අස්තිදුඃඛවිපාකකර්ම යෑ අස්තිදුඃඛවිපාකකර්මවිපාක යෑ අස්තිදුඃඛවිපාකකර්ම යෑ නාස්තිදුඃඛවිපාකකර්මවිපාක යෑ, අස්තිදුඃඛවිපාකකර්ම යෑ භවිෂ්‍යත්දුඃඛවිපාකකර්මවිපාක යෑ, අස්තිදුඃඛවිපාකකර්ම යෑ න භවිෂ්‍යත්දුඃඛවිපාකකර්මවිපාක යෑ, භවිෂ්‍යත්දුඃඛවිපාකකර්ම යෑ භවිෂ්‍යත්දුඃඛවිපාකකර්මවිපාක යෑ, භවිෂ්‍යත් දුඃඛවිපාකකර්ම යෑ නභවිෂ්‍යත් දුඃඛවිපාකකර්මවිපාක යි.

**කර්මකථා නිමි.**

# 8

# විපල්ලාසකථා

සාවත්ථිනිදානං "චත්තාරො මෙ භික්ඛවෙ සඤ්ඤාවිපල්ලාසා චිත්තවිපල්ලාසා දිට්ඨිවිපල්ලාසා, කතමෙ චත්තාරො: අනිච්චෙ භික්ඛවෙ නිච්චන්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො, දුක්ඛෙ භික්ඛවෙ සුඛන්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො, අනත්තනි භික්ඛවෙ අත්තාති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො, අසුභෙ භික්ඛවෙ සුභන්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො. ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො සඤ්ඤාවිපල්ලාසා චිත්තවිපල්ලාසා දිට්ඨිවිපල්ලාසා.

චත්තාරො මෙ භික්ඛවෙ නසඤ්ඤාවිපල්ලාසා නචිත්තවිපල්ලාසා නදිට්ඨිවිපල්ලාසා, කතමෙ චත්තාරො: අනිච්චෙ භික්ඛවෙ අනිච්චන්ති නසඤ්ඤාවිපල්ලාසො නචිත්තවිපල්ලාසො නදිට්ඨිවිපල්ලාසො, දුක්ඛෙ භික්ඛවෙ දුක්ඛන්ති නසඤ්ඤාවිපල්ලාසො නචිත්තවිපල්ලාසො නදිට්ඨිවිපල්ලාසො, අනත්තනි භික්ඛවෙ අනත්තාති නසඤ්ඤාවිපල්ලාසො නචිත්තවිපල්ලාසො නදිට්ඨිවිපල්ලාසො, අසුභෙ භික්ඛවෙ අසුභන්ති නසඤ්ඤාවිපල්ලාසො නචිත්තවිපල්ලාසො නදිට්ඨිවිපල්ලාසො, ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො නසඤ්ඤාවිපල්ලාසා නචිත්තවිපල්ලාසා නදිට්ඨිවිපල්ලාසා. a

1. අනිච්චෙ නිච්චසඤ්ඤිනො දුක්ඛෙ ච සුඛසඤ්ඤිනො
අනත්තනි ච අත්තාති[1] අසුභෙ සුභසඤ්ඤිනො
මිච්ඡාදිට්ඨිහතා[2] සත්තා ඛිත්තචිත්තා විසඤ්ඤිනො,

2. තෙ යොගයුත්තා මාරස්ස අයොගක්ඛෙමිනො ජනා[3]
සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනො,

3. යදා ච බුද්ධා ලොකස්මිං උප්පජ්ජන්ති පභඞ්කරා
තෙ ඉමං ධම්මං පකාසෙන්ති දුක්ඛූපසමගාමිනං,

4. තෙසං සුත්වාන සප්පඤ්ඤා සචිත්තං පච්චලද්ධු[4] තෙ
අනිච්චං අනිච්චතද්දක්ඛුං[5] දුක්ඛමද්දක්ඛු දුක්ඛතො,

5. අනත්තනි අනත්තාති[6] අසුභං අසුභතද්දසුං
සම්මාදිට්ඨිසමාදානා සබ්බං දුක්ඛං[7] උපච්චගුන්ති, a.

---

1. අත්තසඤ්ඤිනො - සයා.
2. මිච්ඡාදිට්ඨිගතා - අනි, PTS.
3. අයොගක්ඛෙමගාමිනො - PTS. අයොගක්ඛෙමිස්ස ගාමිනො - සී 1
4. පච්චලත්ථු - අනි. පච්චලද්ධා - මජසං, සී 2
5. අනිච්චතො දක්ඛුං - අනි, මජසං, සයා, PTS.
6. අනත්තං ච අනත්තතො - සයා.
7. සබ්බදුක්ඛං - සයා, PTS.

a. (4. 1. 5. 9) අඞ්ගුත්තර - චතුක්කනිපාත - රොහිතස්සවග්ග.

# 8

# විපල්ලාස කථා

සැවැත් නිදාන යි ... මහණෙනි, මොහු සතරදෙන සංඥාවිපල්ලාසයෝ යැ චිත්තවිපල්ලාසයෝ යැ දෘෂ්ටිවිපල්ලාසයෝ යි, කවර සතරදෙනෙකැ යත්: මහණෙනි, අනිත්‍ය (වස්තු) යෙහි නිත්‍ය යැ යන සංඥාව සංඥාවිපල්ලාස යැ චිත්ත විපල්ලාස යැ දෘෂ්ටිවිපල්ලාස යි. මහණෙනි, දුඃඛයෙහි සුඛ යැ යනු සංඥාවිපල්ලාස යැ චිත්තවිපල්ලාස යැ දෘෂ්ටිවිපල්ලාස යි. මහණෙනි, අනාත්මයෙහි ආත්ම යැ යනු සංඥාවිපල්ලාස යැ චිත්තවිපල්ලාස යැ දෘෂ්ටි-විපල්ලාස යි මහණෙනි, අශුභයෙහි ශුභ යැ යනු සංඥාවිපල්ලාස යැ චිත්ත විපල්ලාස යැ දෘෂ්ටිවිපල්ලාස යි. මහණෙනි, මොහු සතරදෙන සංඥාවිපල්ලාසයෝ යැ චිත්තවිපල්ලාසයෝ යැ දෘෂ්ටිවිපල්ලාසයෝ යි.

මහණෙනි, මොහු සතරදෙන සංඥාවිපල්ලාසයෝ නො වෙති, චිත්ත-විපල්ලාසයෝ නො වෙති, දෘෂ්ටිවිපල්ලාසයෝ නො වෙත්. කවර සතර-දෙනෙකැ යත්: මහණෙනි, අනිත්‍යයෙහි අනිත්‍ය යැ යනු සංඥාවිපල්ලාස නො වෙයි, චිත්තවිපල්ලාස නො වෙයි, දෘෂ්ටිවිපල්ලාස නො වේ. මහණෙනි, දුඃඛයෙහි දුඃඛ යැ යනු සංඥාවිපල්ලාස නො වෙයි, චිත්තවිපල්ලාස නො වෙයි. දෘෂ්ටිවිපල්ලාස නො වේ. මහණෙනි, අනාත්මයෙහි අනාත්ම යැ යනු සංඥා-විපල්ලාස නො වෙයි, චිත්තවිපල්ලාස නො වෙයි, දෘෂ්ටිවිපල්ලාස නො වේ මහණෙනි, අශුභයෙහි අශුභ යැ යනු සංඥාවිපල්ලාස නො වෙයි, චිත්ත-විපල්ලාස නො වෙයි, දෘෂ්ටිවිපල්ලාස නො වේ. මහණෙනි, මොහු සතරදෙන සංඥාවිපල්ලාසයෝ නො වෙති, චිත්තවිපල්ලාසයෝ නො වෙති, දෘෂ්ටිවිපල්ලා-සයෝ නො වෙත්.

(1) අනිත්‍යයෙහි නිත්‍ය යැ යන සංඥා ඇති දුඃඛයෙහි දු සුඛසංඥා ඇති අනාත්මයෙහි දු ආත්ම යැ යන සංඥා ඇති අශුභයෙහි දු ශුභසංඥා ඇති මිසදිටුයෙන් මඩනාලද භ්‍රාන්ත වූ සිත් ඇති විපරීතසංඥා ඇති යම් සත්ත්ව කෙනෙක් වෙත් ද,

(2) ඒ සත්ත්වයෝ යොගක්ෂෙම සඞ්ඛ්‍යාත නිවනට නො පැමිණියාහු මාරයාගේ යොගයෙහි යෙදුණාහු වෙති. එ මැ සත්ත්වයෝ සසර හැරිසරති, (ඔහු) ජාතිමරණයට පැමිණියාහු ද එහෙයිනි.

(3) යම් කාලෙක ප්‍රඥාලොකය කරන්නා වූ සර්වඥ බුදුවරයෝ ලොවැ උපදිත් ද ඒ බුදුවරයෝ දුක්ඛුපශම සඞ්ඛ්‍යාත නිවනට යන මේ දහම ප්‍රකාශ කෙරෙත්.

(4) සප්‍රාඥ වූ ජනයෝ ඒ බුදුවරයන්ගේ දහම අසා සවචිත්තය ලැබ අනිත්‍යය අනිත්‍ය හෙයින් දුටුවාහු යැ. දුඃඛය දුක් හෙයින් දුටුවාහු යැ.

(5) අනාත්මයෙහි අනාත්ම යැ යි දුටුවාහු යැ අශුභය අශුභ හෙයින් දුටුවාහු යැ සමාදන් කළ සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සියලු වත්දුඃඛය ඉක්මවූවාහු යයි.

ඉමෙ චත්තාරො විපල්ලාසා දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා අප්පහීනාති: කෙචි පහීනා, කෙචි අප්පහීනා. අනිච්චෙ නිච්චන්ති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො පහීනො. දුක්ඛෙ සුඛන්ති සඤ්ඤා උප්පජ්ජති, චිත්තං උප්පජ්ජති, දිට්ඨිවිපල්ලාසො පහීනො. අනත්තනි අත්තාති සඤ්ඤාවිපල්ලාසො චිත්තවිපල්ලාසො දිට්ඨිවිපල්ලාසො පහීනො, අසුභෙ සුභන්ති සඤ්ඤා උප්පජ්ජති, චිත්තං උප්පජ්ජති, දිට්ඨිවිපල්ලාසො පහීනො.

ද්වීසු වත්ථූසු ඡ විපල්ලාසා පහීනා, ද්වීසු වත්ථූසු ද්වෙ විපල්ලාසා පහීනා: චත්තාරො විපල්ලාසා අප්පහීනා, චතූසු වත්ථූසු අට්ඨවිපල්ලාසා පහීනා, චත්තාරො විපල්ලාසා අප්පහීනාති.

**විපල්ලාසකථා සමත්තා.**

## 9

## මග්ගකථා

මග්ගොති කෙනට්ඨෙන මග්ගො: සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මිච්ඡාදිට්ඨියා පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච, පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරි.[1] පටිවෙධාය මග්ගො චෙව හෙතු ච, සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච, නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

අභිනිරොපනට්ඨෙන[2] සම්මාසඞ්කප්පො මිච්ඡාසඞ්කප්පස්ස පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරි පටිවෙධාය මග්ගො චෙව හෙතු ච සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච, නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

පරිග්ගහට්ඨෙන සම්මාවාචා මිච්ඡාවාචාය පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච, පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරි පටිවෙධාය මග්ගො චෙව හෙතු ච, සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

---

1. උත්තරිං - ස්‍යා,
2. අභිරොපනට්ඨෙන - PTS,

මේ සතර විපර්‍යාසයෝ දෘෂ්ටිසම්පන්න (සෝවාන්) පුද්ගලයාහට ප්‍රහීණ වූවාහු ද අප්‍රහීණ වූවාහු ද යත්: කිසි විපර්‍යාස කෙනෙක් ප්‍රහීණයහ. කිසි විපර්‍යාස කෙනෙක් අප්‍රහීණයහ. අනිත්‍යයෙහි නිත්‍ය යැ යන සංඥාවිපර්‍යාසය චිත්තවිපර්‍යාසය දෘෂ්ටිවිපර්‍යාසය ප්‍රහීණ යැ දුඃඛයෙහි සුඛ යැ යන සංඥාව උපදී, චිත්තය උපදී. දෘෂ්ටිවිපර්‍යාසය ප්‍රහීණ යැ, අනාත්මයෙහි අනාත්ම යැ යන සංඥාවිපර්‍යාසය චිත්තවිපර්‍යාසය දෘෂ්ටිවිපර්‍යාසය ප්‍රහීණ යැ, අශුභයෙහි ශුභ යැ යන සංඥාව උපදී, චිත්තය උපදී. දෘෂ්ටිවිපර්‍යාසය ප්‍රහීණ යි.

(අනිත්‍යයෙහි නිත්‍ය යැ අනාත්මයෙහි ආත්ම යැ යන) දෙවත්හි විපර්‍යාසයෝ සදෙනෙක් ප්‍රහීණයහ. (දුඃඛයෙහි සුඛ යැ අශුභයෙහි ශුභ යැ යන) දෙවත්හි විපර්‍යාසයෝ දෙදෙනෙක් ප්‍රහීණයහ, විපර්‍යාසයෝ සතර දෙනෙක් අප්‍රහීණයහ. සතර වත්හි විපර්‍යාසයෝ අට දෙනෙක් ප්‍රහීණයහ විපර්‍යාසයෝ සතර දෙනෙක් අප්‍රහීණයෝ යි.

**විපර්‍යාසකථා නිමි.**

## 9

## මාර්ගකථා

**මග්ගො** යනු: කවර අර්ථයෙකින් මාර්ග වේ ද යත්: ස්‍රොතාපත්ති-මාර්ගක්ෂණයෙහි දර්ශන ස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටිහුගේ ප්‍රහාණයට මාර්ග ද හෙතු ද වෙයි, සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හෙතු ද වෙයි, ප්‍රතිවෙධාදිය විශොධනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තයාගේ අධිෂ්ඨානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තයාගේ වොදානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. විශෙෂාධිගමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි. මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සත්‍යාභිසමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, නිරොධයෙහි පිහිටුවනු පිණිස මාර්ග ද හෙතු ද වේ.

අභිනිරොපණ ස්වභාවයෙන් සම්‍යක්සංකල්පය මිථ්‍යාසංකල්පයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හෙතු ද වෙයි, ප්‍රතිවෙධාදිවිශොධනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තාධිෂ්ඨානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තපාරිශුද්ධිය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, විශෙෂාධිගමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සත්‍යප්‍රතිවෙධය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, නිවන්හි පිහිටුවනු පිණිස මාර්ග ද හෙතු ද වේ.

වාක්සංවර සඞ්ඛ්‍යාත පරිග්‍රහ ස්වභාවයෙන් සම්‍යග් වචනය මිථ්‍යා-වචන ප්‍රහාණය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හෙතු ද වෙයි, ප්‍රතිවෙධාදිවිශොධනය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්තාධිෂ්ඨානය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, චිත්ත පාරිශුද්ධිය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, විශෙෂාධිගමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, සත්‍යාභිසමය පිණිස මාර්ග ද හෙතු ද වෙයි, නිවන්හි පිහිටුවනු පිණිස මාර්ග ද හෙතු ද වේ.

සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො මිච්ඡාකම්මන්තස්ස පහානාය මග්ගො චෙව හෙතු ච -පෙ- වොදානට්ඨෙන සම්මාආජීවො මිච්ඡාජීවස්ස පහානාය මග්ගො චෙව හෙතු ච -පෙ- පග්ගහට්ඨෙන යම්මාවායාමො මිච්ඡාවායාමස්ස පහානාය මග්ගො චෙව හෙතු ච -පෙ- උපට්ඨානට්ඨෙන සම්මාසති මිච්ඡා-සතියා පහානාය මග්ගො චෙව හෙතු ච -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මා-සමාධි මිච්ඡාසමාධිස්ස පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච, පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරි පටිවෙධාය මග්ගො චෙව හෙතු ච, සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච, නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

සකදාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි ඔළාරිකස්ස කාමරාගසඤ්ඤොජනස්ස පටිඝසඤ්ඤොජනස්ස ඔළාරිකස්ස කාමරාගානුසයස්ස පටිඝානුසයස්ස පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච, පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරිපටිවෙධාය මග්ගො චෙව හෙතු ච, සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච, නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

අනාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි අණුසහගතස්ස කාමරාගසඤ්ඤොජනස්ස පටිඝසඤ්ඤොජනස්ස අණුසහගතස්ස කාමරාගානුසයස්ස පටිඝානුසයස්ස පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච, පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරි පටිවෙධාය මග්ගො චෙව හෙතු ච, සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච, නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

අරහත්තමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි රූපරාගස්ස මානස්ස උද්ධච්චස්ස අවිජ්ජාය, මානානුසයස්ස භවරාගානුසයස්ස[1] අවිජ්ජානුසයස්ස පහානාය මග්ගො චෙව හෙතු ච, සහජාතානං ධම්මානං උපත්ථම්භනාය මග්ගො චෙව හෙතු ච, කිලෙසානං පරියාදානාය මග්ගො චෙව හෙතු ච, පටිවෙධාදිවිසොධනාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස අධිට්ඨානාය මග්ගො චෙව හෙතු ච, චිත්තස්ස වොදානාය මග්ගො චෙව හෙතු ච, විසෙසාධිගමාය මග්ගො චෙව හෙතු ච, උත්තරි පටිවෙධාය මග්ගො චෙව හෙතු ච, සච්චාභිසමයාය මග්ගො චෙව හෙතු ච, නිරොධෙ පතිට්ඨාපනාය මග්ගො චෙව හෙතු ච.

1. රාගානුසයස්ස - සයා

සමුට්ඨාන ස්වභාවයෙන් සම්‍යක් කර්මාන්තය මිථ්‍යාකර්මාන්තයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හේතු ද වෙයි ... පරිශුද්ධභාව ස්වභාවයෙන් සම්‍යගාජීවය මිථ්‍යාජීවයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හේතු ද වෙයි ... ප්‍රග්‍රහ ස්වභාවයෙන් සම්‍යග්ව්‍යායාමය මිථ්‍යාව්‍යායාමයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හේතු ද වෙයි ... උපස්ථානස්වභාවයෙන් සම්‍යක්ස්මෘතිය මිථ්‍යාස්මෘතිහුගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හේතු ද වෙයි ... අවික්ෂෙපස්වභාවයෙන් සම්‍යක්සමාධිය මිථ්‍යාසමාධිහුගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හේතු ද වෙයි. සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හේතු ද වෙයි. කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හේතු ද වෙයි. ප්‍රතිවෙධාදිවිශොධනය පිණිස මාර්ග ද හේතු ද වෙයි, චිත්තාධිෂ්ඨානය පිණිස මාර්ග ද හේතු ද වෙයි. චිත්තවොදානය පිණිස මාර්ග ද හේතු ද වෙයි, විශෙෂාධිගමය පිණිස මාර්ග ද හේතු ද වෙයි, මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හේතු ද වෙයි, සත්‍යාභිසමය පිණිස මාර්ග ද හේතු ද වෙයි, නිවන්හි පිහිටුවනු පිණිස මාර්ග ද හේතු ද වේ.

සකෘදාගාමි මාර්ගක්ෂණයෙහි දර්ශන ස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක් සමාධිය ඖදාරික වූ කාමරාගසංයොජනයාගේ ප්‍රතිඝසංයොජනයාගේ ඖදාරික වූ කාමරාගානුශයාගේ ප්‍රතිඝානුශයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හේතු ද වෙයි, සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හේතු ද වෙයි, කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හේතු ද වෙයි, ප්‍රතිවෙධාදිවිශොධනය පිණිස මාර්ග ද හේතු ද වෙයි, චිත්තාධිෂ්ඨානය පිණිස මාර්ග ද හේතු ද වෙයි. චිත්තවොදානය පිණිස මාර්ග ද හේතු ද වෙයි, විශෙෂාධිගමය පිණිස මාර්ග ද හේතු ද වෙයි, මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හේතු ද වෙයි. සත්‍යාභිසමය පිණිස මාර්ග ද හේතු ද වෙයි, නිවන්හි පිහිටුවනු පිණිස මාර්ග ද හේතු ද වේ

අනාගාමිමාර්ගක්ෂණයෙහි දර්ශන ස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂෙපස්වභාවයෙන් සම්‍යක්සමාධිය අණුසහගත වූ කාමරාගසංයොජනයාගේ ප්‍රතිඝසංයොජනයාගේ අණුසහගත වූ කාමරාගානුශයාගේ ප්‍රතිඝානුශයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හේතු ද වෙයි. සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හේතු ද වෙයි. කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හේතු ද වෙයි. ප්‍රතිවෙධාදිවිශොධනය පිණිස මාර්ග ද හේතු ද වෙයි. චිත්තාධිෂ්ඨානය පිණිස මාර්ග ද හේතු ද වෙයි, චිත්තවොදානය පිණිස මාර්ග ද හේතු ද වෙයි, විශෙෂාධිගමය පිණිස මාර්ග ද හේතු ද වෙයි, මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හේතු ද වෙයි, සත්‍යාභිසමය පිණිස මාර්ග ද හේතු ද වෙයි, නිවන්හි පිහිටුවනු පිණිස මාර්ග ද හේතු ද වේ.

අර්හත්මාර්ගක්ෂණයෙහි දර්ශනස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂෙප ස්වභාවයෙන් සම්‍යක්සමාධිය රූපරාගයාගේ අරූපරාගයාගේ මානයාගේ ඖද්ධත්‍යයාගේ අවිද්‍යාවගේ මානානුශයාගේ භවරාගානුශයාගේ අවිද්‍යානුශයාගේ ප්‍රහාණය පිණිස මාර්ග ද හේතු ද වෙයි, සහජාතධර්මයනට උපස්ථම්භනය පිණිස මාර්ග ද හේතු ද වෙයි, කෙලෙසුන් ගෙවීම පිණිස මාර්ග ද හේතු ද වෙයි. ප්‍රතිවෙධාදිවිශොධනය පිණිස මාර්ග ද හේතු ද වෙයි. චිත්තාධිෂ්ඨානය පිණිස මාර්ග ද හේතු ද වෙයි, චිත්තවොදානය පිණිස මාර්ග ද හේතු ද වෙයි, විශෙෂාධිගමය පිණිස මාර්ග ද හේතු ද වෙයි, මත්තෙහි ප්‍රතිවෙධය පිණිස මාර්ග ද හේතු ද වෙයි, සත්‍යාභිසමය පිණිස මාර්ග ද හේතු ද වෙයි, නිවන්හි පිහිටුවනු පිණිස මාර්ග ද හේතු ද වේ.

දස්සනමග්ගො සම්මාදිට්ඨි, අභිනිරොපනමග්ගො සම්මාසඞ්කප්පො, පරිග්ගහමග්ගො සම්මාවාචා, සමුට්ඨානමග්ගො සම්මාකම්මන්තො, වොදානමග්ගො සම්මාආජීවො, පග්ගහමග්ගො සම්මාවායාමො, උපට්ඨානමග්ගො සම්මාසති, අවික්ඛෙපමග්ගො සම්මාසමාධි.

උපට්ඨානමග්ගො සතිසම්බොජ්ඣඞ්ගො, පවිචයමග්ගො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, පග්ගහමග්ගො විරියසම්බොජ්ඣඞ්ගො, ඵරණමග්ගො පීතිසම්බොජ්ඣඞ්ගො, උපසමමග්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, අවික්ඛෙපමග්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො, පටිසඞ්ඛානමග්ගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

අස්සද්ධියෙ අකම්පියමග්ගො සද්ධාබලං, කොසජ්ජෙ අකම්පියමග්ගො විරියබලං, පමාදෙ අකම්පියමග්ගො සතිබලං, උද්ධච්චෙ අකම්පියමග්ගො සමාධිබලං, අවිජ්ජාය අකම්පියමග්ගො පඤ්ඤාබලං.

අධිමොක්ඛමග්ගො සද්ධින්ද්‍රියං, පග්ගහමග්ගො විරියින්ද්‍රියං, උපට්ඨානමග්ගො සතින්ද්‍රියං, අවික්ඛෙපමග්ගො සමාධින්ද්‍රියං, දස්සනමග්ගො පඤ්ඤින්ද්‍රියං,

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියං.[1] මග්ගො, අකම්පියට්ඨෙන බලං.[2] මග්ගො, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගා.[3] මග්ගො, හෙතුට්ඨෙන[4] මග්ගඞ්ගං මග්ගො,[5] උපට්ඨානට්ඨෙන සතිපට්ඨානං මග්ගො, පදහනට්ඨෙන[6]. සම්මප්පධානං මග්ගො, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදො මග්ගො, තථට්ඨෙන සච්චං.[7] මග්ගො, අවික්ඛෙපට්ඨෙන සමථො මග්ගො, අනුපස්සනට්ඨෙන විපස්සනා මග්ගො, එකරසට්ඨෙන සමථවිපස්සනා මග්ගො, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං[8] මග්ගො, සංවරට්ඨෙන සීලවිසුද්ධි මග්ගො, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි මග්ගො, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි මග්ගො, මුත්තට්ඨෙන විමොක්ඛො මග්ගො, පටිවෙධට්ඨෙන විජ්ජා මග්ගො, පරිච්චාගට්ඨෙන විමුත්ති මග්ගො, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං මග්ගො, ඡන්දො මූලට්ඨෙන මග්ගො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන මග්ගො, ඵස්සො සමොධානට්ඨෙන මග්ගො, වෙදනා සමොසරණට්ඨෙන මග්ගො, සමාධි පමුඛට්ඨෙන මග්ගො, සති ආධිපතෙය්‍යට්ඨෙන මග්ගො, පඤ්ඤා තදුත්තරට්ඨෙන[9]. මග්ගො, විමුත්ති සාරට්ඨෙන මග්ගො, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන මග්ගො'ති.

මග්ගකථා සමත්තා.

1 ඉන්ද්‍රියා - මජසං, ස්‍යා.
2 බලා - මජසං.
3. බොජ්ඣඞ්ගා - මජසං.
4. හෙතුට්ඨෙන - සී 2, 3. හෙතට්ඨෙන - ස්‍යා
5. මග්ගා - මජසං
6. පදහට්ඨෙන - PTS.
7. සච්චා - මජසං ස්‍යා, PTS.
8. යුගනද්ධා - මජසං, යුගනන්ධා - ස්‍යා, PTS
9. තතුත්තරට්ඨෙන - මජසං

දර්ශනමාර්ගය සම්‍යග්දෘෂ්ටි යැ, අභිනිරෝපණ (අරමුණට නැඟීම්) මාර්ගය සම්‍යක්සංකල්ප යැ, පරිග්‍රහමාර්ගය සම්‍යග්වචන යැ, සමුත්ථානමාර්ගය සම්‍යක්කර්මාන්ත යැ, ව්‍යවදානමාර්ගය සම්‍යගාජීව යැ, ප්‍රග්‍රහමාර්ගය සම්‍යග්ව්‍යායාම යැ, උපස්ථාන (අරමුණට එළඹසිටීම්) මාර්ගය සම්‍යක්ස්මෘති යැ, අවික්ෂෙපමාර්ගය සම්‍යක්සමාධි යි.

උපස්ථානමාර්ගය ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ, ප්‍රවිචය (විමසීම්) මාර්ගය ධර්මවිචයසම්බොධ්‍යඞ්ග යැ, ප්‍රග්‍රහමාර්ගය වීර්‍යසම්බොධ්‍යඞ්ග යැ, ස්ඵරණමාර්ගය ප්‍රීතිසම්බොධ්‍යඞ්ග යැ, ව්‍යුපශමමාර්ගය ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග යැ, අවික්ෂෙපමාර්ගය සමාධිසම්බොධ්‍යඞ්ග යැ, පටිසඞ්ඛානමාර්ගය උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යි.

අශ්‍රද්ධායෙහි අකම්ප්‍යමාර්ගය ශ්‍රද්ධාබල යැ, කුසීදබැව්හි අකම්ප්‍යමාර්ගය වීර්‍යබල යැ, ප්‍රමාදයෙහි අකම්ප්‍යමාර්ගය ස්මෘතිබල යැ, උද්ධත බැව්හි අකම්ප්‍යමාර්ගය සමාධිබල යැ, අවිද්‍යායෙහි අකම්ප්‍යමාර්ගය ප්‍රඥාබල යි.

අධිමොක්ෂමාර්ගය ශ්‍රද්ධෙන්ද්‍රිය යැ, ප්‍රග්‍රහමාර්ගය වීර්‍යෙන්ද්‍රිය යැ, උපස්ථානමාර්ගය ස්මෘතීන්ද්‍රිය යැ, අවික්ෂෙපමාර්ගය සමාධීන්ද්‍රිය යැ, දර්ශනමාර්ගය ප්‍රඥෙන්ද්‍රිය යි.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රිය මාර්ග වෙයි, අකම්ප්‍යාර්ථයෙන් බල මාර්ග වෙයි, නිර්‍යාණාර්ථයෙන් බොධ්‍යඞ්ගය මාර්ග වෙයි, හෙත්වර්ථයෙන් මාර්ගාඞ්ග මාර්ග වෙයි, උපස්ථානාර්ථයෙන් සතිපට්ඨානය මාර්ග වෙයි, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රධානය මාර්ග වෙයි, සමෘද්ධ වන ස්වභාවයෙන් ඍද්ධිපාදය මාර්ග වෙයි, තථාර්ථයෙන් සත්‍යය මාර්ග වෙයි, අවික්ෂෙපාර්ථයෙන් ශමථය මාර්ග වෙයි. අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව මාර්ග වෙයි, එකරසාර්ථයෙන් ශමථ-විදර්ශනා මාර්ග වෙයි, අනතිවර්තනාර්ථයෙන් යුගනද්ධධර්ම මාර්ග වෙයි, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය මාර්ග වෙයි, අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධිය මාර්ග වෙයි, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය මාර්ග වෙයි, මුක්තාර්ථයෙන් විමොක්ෂය මාර්ග වෙයි, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව මාර්ග වෙයි, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය මාර්ග වෙයි, සමුච්ඡෙදාර්ථයෙන් ක්ෂයඥානය මාර්ග වෙයි, ඡන්දය මූලාර්ථයෙන් මාර්ග වෙයි, මනසිකාරය සමුත්ථානාර්ථයෙන් මාර්ග වෙයි, ස්පර්ශය සමවධානාර්ථයෙන් මාර්ග වෙයි, වෙදනාව සමවසරණාර්ථයෙන් මාර්ග වෙයි, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් මාර්ග වෙයි, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් මාර්ග වෙයි, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් මාර්ග වෙයි, විමුක්තිය සාරාර්ථයෙන් මාර්ග වෙයි, අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍යවසානාර්ථයෙන් මාර්ග වේ යයි.

**මාර්ගකථා නිමි.**

# 10

## මණ්ඩපෙය්‍යකථා

"මණ්ඩපෙය්‍යමිදං භික්ඛවෙ බ්‍රහ්මචරියං, සත්ථා සම්මුඛීභූතො"[1], a, තිධත්තමණ්ඩො.[2] සත්ථරි සම්මුඛීභූතෙ: දෙසනාමණ්ඩො, පටිග්ගහමණ්ඩො,[3] බ්‍රහ්මචරියමණ්ඩො.

කතමො දෙසනාමණ්ඩො: චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා[4] පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.[5] චතුන්නං සතිපට්ඨානානං -පෙ- චතුන්නං සම්මප්පධානානං -පෙ- චතුන්නං ඉද්ධිපාදානං -පෙ- පඤ්චන්නං ඉන්ද්‍රියානං -පෙ- පඤ්චන්නං බලානං -පෙ- සත්තන්නං බොජ්ඣඞ්ගානං -පෙ- අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. අයං දෙසනාමණ්ඩො. (1)

කතමො පටිග්ගහමණ්ඩො: භික්ඛූ භික්ඛුනියො උපාසකා උපාසිකායො දෙවා මනුස්සා, යෙ වා පනඤ්ඤෙපි කෙචි විඤ්ඤාතාරො. අයං පටිග්ගහමණ්ඩො. (2)

කතමො බ්‍රහ්මචරියමණ්ඩො: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං:[6] සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං බ්‍රහ්මචරියමණ්ඩො. (3)

අධිමොක්ඛමණ්ඩො සද්ධින්ද්‍රියං, අස්සද්ධියං කසටො, අස්සද්ධියං කසටං ඡඩ්ඩෙත්වා සද්ධින්ද්‍රියස්ස අධිමොක්ඛමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. පග්ගහමණ්ඩො විරියින්ද්‍රියං, කොසජ්ජං කසටො, කොසජ්ජං කසටං ඡඩ්ඩෙත්වා විරියින්ද්‍රියස්ස පග්ගහමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. උපට්ඨානමණ්ඩො සතින්ද්‍රියං, පමාදො කසටො, පමාදං කසටං ඡඩ්ඩෙත්වා සතින්ද්‍රියස්ස උපට්ඨානමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. අවික්ඛෙපමණ්ඩො සමාධින්ද්‍රියං, උද්ධච්චං කසටො, උද්ධච්චං කසටං ඡඩ්ඩෙත්වා සමාධින්ද්‍රියස්ස අවික්ඛෙපමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. දස්සනමණ්ඩො පඤ්ඤින්ද්‍රියං, අවිජ්ජා[7] කසටො, අවිජ්ජං කසටං ඡඩ්ඩෙත්වා පඤ්ඤින්ද්‍රියස්ස දස්සනමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං.

අස්සද්ධියෙ අකම්පියමණ්ඩො සද්ධාබලං, අස්සද්ධියං කසටො, අස්සද්ධියං කසටං ඡඩ්ඩෙත්වා සද්ධාබලස්ස අස්සද්ධියෙ අකම්පියමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. කොසජ්ජෙ අකම්පියමණ්ඩො විරියබලං, කොසජ්ජං කසටො, කොසජ්ජං කසටං ඡඩ්ඩෙත්වා විරියබලස්ස කොසජ්ජෙ අකම්පියමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. පමාදෙ අකම්පියමණ්ඩො සතිබලං, පමාදො කසටො, පමාදං කසටං ඡඩ්ඩෙත්වා සතිබලස්ස පමාදෙ අකම්පියමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. උද්ධච්චෙ අකම්පියමණ්ඩො සමාධිබලං, උද්ධච්චං කසටො, උද්ධච්චං කසටං ඡඩ්ඩෙත්වා සමාධිබලස්ස උද්ධච්චෙ අකම්පියමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. අවිජ්ජාය අකම්පියමණ්ඩො පඤ්ඤාබලං, අවිජ්ජා කසටො, අවිජ්ජං කසටං ඡඩ්ඩෙත්වා පඤ්ඤාබලස්ස අවිජ්ජාය අකම්පියමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං.

---

1. සත්ථරි සම්මුඛීභූතෙ - සං, PTS 2 තිවිධො මණ්ඩො - සයා, සී 1, 2. PTS.
3. පටිග්ගහමණ්ඩො - මජසං. 4 පඤ්ඤාපනා - සයා, සී 1, 2, PTS.
5 උත්තානිකම්මං - PTS 6. සෙය්‍යථීදං - මජසං.
7. අවිජ්ජං - මජසං, a. සංයුත්තනිකාය - නිදාන බලවග්ග

# 10

# මණ්ඩපෙය්‍ය කථා

මහණෙනි, මේ ශාසනබ්‍රහ්මචර්‍ය්‍යය මණ්ඩපෙය්‍ය (ඝෘතමණ්ඩයක් සෙයින් ප්‍රසන්න වූ හිතසුඛාවහ පානයෙක්) වෙයි. ශාස්තෘහු හමු වූහ. ශාස්තෘන් හමු වූ කල්හි ත්‍රිවිධභාවයෙන් මණ්ඩ (ප්‍රසන්න) වෙයි: දේශනාමණ්ඩ යැ ප්‍රතිග්‍රහමණ්ඩ යැ බ්‍රහ්මචර්‍ය්‍යමණ්ඩ යි.

දේශනාමණ්ඩ කවරේ යත්: සතර ආර්‍ය්‍යසත්‍යයන් නම් වශයෙන් කීම යැ දක්වීම යැ පැනවීම යැ ඥානමුඛයෙහි තැබීම යැ විවෘත කිරීම යැ විභාග කිරීම යැ ප්‍රකට කිරීම යැ සතර සතිපට්ඨානයන් ... සතර සම්‍යක්ප්‍රධානයන් .. සතර ඍද්ධිපාදයන් ... පඤ්චේන්ද්‍රියයන් ... පඤ්චබලයන් සප්ත බොධ්‍යඞ්ගයන් ... ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය නම් වශයෙන් කීම යැ දක්වීම යැ පැනවීම යැ ඥානමුඛයෙහි තැබීම යැ විවෘත කිරීම යැ විභාග කිරීම යැ ප්‍රකට කිරීම යි. මේ දේශනාමණ්ඩ නම් වෙයි. (1)

ප්‍රතිග්‍රහමණ්ඩ කවරැ යත්: මහණහු යැ මෙහෙණහු යැ උවසුවෝ යැ උවැසියෝ යැ දෙවියෝ යැ මිනිස්සු යැ, තවද අන්‍ය වූ හෝ යම් කිසි ධර්මප්‍රතිවෙධක කෙනෙක් වෙත් ද මේ ප්‍රතිග්‍රහමණ්ඩ නම් වෙයි. (2)

බ්‍රහ්මචර්‍ය්‍යමණ්ඩ කවරැ යත්: මෙ මැ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය යි. හෙ මෙසේයි: සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යක්සඞ්කල්ප යැ සම්‍යග්වචන යැ සම්‍යක්-කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක්ස්මෘති යැ සම්‍යක්-සමාධි යි. මේ බ්‍රහ්මචර්‍ය්‍යමණ්ඩ නම් වේ. (3)

ශ්‍රද්ධෙන්ද්‍රිය අධිමොක්ෂමණ්ඩ යැ අශ්‍රද්ධාව කසට යැ අශ්‍රද්ධා සඞ්ඛ්‍යාත කසටය හැරපියා ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමොක්ෂමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, වීර්‍ය්‍යෙන්ද්‍රිය ප්‍රග්‍රහමණ්ඩ යැ කුසීද බව කසට යැ කෞසීද්‍ය සඞ්ඛ්‍යාත කසටය හැරපියා වීර්‍ය්‍යෙන්ද්‍රියයාගේ ප්‍රග්‍රහමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, ස්මෘතීන්ද්‍රිය උපස්ථානමණ්ඩ යැ ප්‍රමාදය කසට යැ ප්‍රමාද සඞ්ඛ්‍යාත කසටය හැරපියා ස්මෘතීන්ද්‍රියයාගේ උපස්ථානමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, සමාධීන්ද්‍රිය අවික්ෂෙපමණ්ඩ යැ උද්ධතභාවය කසට යැ උද්ධතභාව සඞ්ඛ්‍යාත කසටය හැරපියා සමාධීන්ද්‍රියයාගේ අවික්ෂෙප-මණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, ප්‍රඥෙන්ද්‍රිය දර්ශනමණ්ඩ යැ අවිද්‍යාව කසට යැ අවිද්‍යා සඞ්ඛ්‍යාත කසටය හැරපියා ප්‍රඥෙන්ද්‍රියයාගේ දර්ශන-මණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම්.

ශ්‍රද්ධාබලය අශ්‍රද්ධායෙහි අකම්ප්‍ය (නො සැලෙන) මණ්ඩ යැ, අශ්‍රද්ධාව කසට යැ, අශ්‍රද්ධාකසටය හැරපියා ශ්‍රද්ධාබලයාගේ අශ්‍රද්ධායෙහි අකම්ප්‍ය-මණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, වීර්‍ය්‍යබලය කුසීදභාවයෙහි අකම්ප්‍යමණ්ඩ යැ කුසීදභාවය කසට යැ කෞසීද්‍යකසටය හැරපියා වීර්‍ය්‍ය-බලයාගේ කුසීදභාවයෙහි අකම්ප්‍යමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, ස්මෘතිබලය ප්‍රමාදයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, ප්‍රමාදය කසට යැ ප්‍රමාද-කසටය හැරපියා ස්මෘතිබලයාගේ ප්‍රමාදයෙහි අකම්ප්‍යමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම. සමාධිබලය ඖද්ධත්‍යයෙහි අකම්ප්‍යබල යැ ඖද්ධත්‍යය කසට යැ, ඖද්ධත්‍යකසටය හැරපියා සමාධිබලයාගේ ඖද්ධත්‍ය-යෙහි අකම්ප්‍යමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම, ප්‍රඥාබලය අවිද්‍යායෙහි අකම්ප්‍යමණ්ඩ යැ, අවිද්‍යාව කසට යැ, අවිද්‍යාකසටය හැරපියා ප්‍රඥාබලයාගේ අවිද්‍යායෙහි අකම්ප්‍යමණ්ඩය පානය කෙරේ නු'යි මණ්ඩපෙය්‍ය නම්.

උපට්ඨානමණ්ඩො සතිසම්බොජ්ඣඞ්ගො, පමාදො කසටො, පමාදං කසටං ඡඩ්ඩෙත්වා සතිසම්බොජ්ඣඞ්ගස්ස උපට්ඨානමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. පවිචයමණ්ඩො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, අවිජ්ජා කසටො, අවිජ්ජං[1] කසටං ඡඩ්ඩෙත්වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස පවිචයමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. පග්ගහමණ්ඩො විරියසම්බොජ්ඣඞ්ගො, කොසජ්ජං කසටො, කොසජ්ජං කසටං ඡඩ්ඩෙත්වා විරියසම්බොජ්ඣඞ්ගස්ස පග්ගහමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. ඵරණමණ්ඩො පීතිසම්බොජ්ඣඞ්ගො, පරිළාහො කසටො, පරිළාහං කසටං ඡඩ්ඩෙත්වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස ඵරණමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. උපසමමණ්ඩො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, දුට්ඨුල්ලං කසටො, දුට්ඨුල්ලං කසටං ඡඩ්ඩෙත්වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උපසමමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. අවික්ඛෙපමණ්ඩො සමාධිසම්බොජ්ඣඞ්ගො, උද්ධච්චං කසටො, උද්ධච්චං කසටං ඡඩ්ඩෙත්වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස අවික්ඛෙපමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං. පටිසඞ්ඛානමණ්ඩො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, අප්පටිසඞ්ඛා කසටො, අප්පටිසඞ්ඛං කසටං ඡඩ්ඩෙත්වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස පටිසඞ්ඛානමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං.

දස්සනමණ්ඩො සම්මාදිට්ඨි, මිච්ඡාදිට්ඨි කසටො, මිච්ඡාදිට්ඨිං කසටං ඡඩ්ඩෙත්වා සම්මාදිට්ඨියා දස්සනමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, අභිනිරොපනමණ්ඩො සම්මාසඞ්කප්පො, මිච්ඡාසඞ්කප්පො කසටො, මිච්ඡාසඞ්කප්පං කසටං ඡඩ්ඩෙත්වා සම්මාසඞ්කප්පස්ස අභිනිරොපනමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, පරිග්ගහමණ්ඩො සම්මාවාචා, මිච්ඡාවාචා කසටො, මිච්ඡාවාචං කසටං ඡඩ්ඩෙත්වා සම්මාවාචාය පරිග්ගහමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, සමුට්ඨානමණ්ඩො සම්මාකම්මන්තො, මිච්ඡාකම්මන්තො කසටො, මිච්ඡාකම්මන්තං කසටං ඡඩ්ඩෙත්වා සම්මාකම්මන්තස්ස සමුට්ඨානමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, වොදානමණ්ඩො සම්මාආජීවො, මිච්ඡාආජීවො කසටො, මිච්ඡාආජීවං කසටං ඡඩ්ඩෙත්වා සම්මාආජීවස්ස වොදානමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, පග්ගහමණ්ඩො සම්මාවායාමො, මිච්ඡාවායාමො කසටො, මිච්ඡාවායාමං කසටං ඡඩ්ඩෙත්වා සම්මාවායාමස්ස පග්ගහමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, උපට්ඨානමණ්ඩො සම්මාසති, මිච්ඡාසති කසටො, මිච්ඡාසතිං කසටං ඡඩ්ඩෙත්වා සම්මාසතියා උපට්ඨානමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං, අවික්ඛෙපමණ්ඩො සම්මාසමාධි, මිච්ඡාසමාධි කසටො, මිච්ඡාසමාධිං කසටං ඡඩ්ඩෙත්වා සම්මාසමාධිස්ස අවික්ඛෙපමණ්ඩං පිවතීති මණ්ඩපෙය්‍යං.

අත්ථි මණ්ඩො, අත්ථි පෙය්‍යං, අත්ථි කසටො;

අධිමොක්ඛමණ්ඩො සද්ධින්ද්‍රියං, අස්සද්ධියං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පග්ගහමණ්ඩො විරියින්ද්‍රියං, කොසජ්ජං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, උපට්ඨානමණ්ඩො සතින්ද්‍රියං පමාදො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, අවික්ඛෙපමණ්ඩො සමාධින්ද්‍රියං, උද්ධච්චං කසටො, යො තත්ථ අත්ථරසො, ධම්මරසො විමුත්තිරසො ඉදං පෙය්‍යං. දස්සනමණ්ඩො පඤ්ඤින්ද්‍රියං, අවිජ්ජා කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං.

1. අවිජ්ජං - මජසං

සමෘතිසම්බොධ්‍යඞ්ගය උපස්ථානමණ්ඩ යැ, ප්‍රමාදය කසට යැ, ප්‍රමාද-කසටය හැරපියා සමෘතිසම්බොධ්‍යඞ්ගයාගේ උපස්ථානමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ප්‍රවිචය (විමසීම්) මණ්ඩ යැ, අවිද්‍යාව කසට යැ, අවිද්‍යාකසටය හැරපියා ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයාගේ ප්‍රවිචයමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය ප්‍රග්‍රහමණ්ඩ යැ, කෞසීද්‍යය කසට යැ, කෞසීද්‍යකසටය හැරපියා වීර්‍ය්‍ය-සම්බොධ්‍යඞ්ගයාගේ ප්‍රග්‍රහමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ස්ඵරණමණ්ඩ යැ, පිරිදහය කසට යැ, පරිදාහකසටය හැරපියා ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ ස්ඵරණමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ව්‍යුපශමමණ්ඩ යැ, දුට්ඨුල්ලය කසට යැ, දුට්ඨුල්ලකසටය හැරපියා ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයාගේ ව්‍යුපශමමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. සමාධිසම්බොධ්‍යඞ්ගය අවික්ෂෙපමණ්ඩ යැ, ඖද්ධත්‍යය කසට යැ, ඖද්ධත්‍යකසටය හැරපියා සමාධිසම්බොධ්‍යඞ්ගයා-ගේ අවික්ෂෙපමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. උපෙක්ෂා-සම්බොධ්‍යඞ්ගය පටිසඞ්ඛාන (ප්‍රත්‍යවේක්ෂා) මණ්ඩ යැ, අප්පටිසඞ්ඛාව කසට යැ, අප්පටිසඞ්ඛාකසටය හැරපියා උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ පටිසඞ්ඛාන-මණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම.

සම්‍යග්දෘෂ්ටිය දර්ශනමණ්ඩ යැ, මිථ්‍යාදෘෂ්ටිය කසට යැ, මිථ්‍යාදෘෂ්ටිකසටය හැරපියා සම්‍යග්දෘෂ්ටිහුගේ දර්ශනමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යක්සංකල්පය අභිනිරොපණ (අරමුණට නැගීම්) මණ්ඩ යැ, මිථ්‍යාසංකල්පය කසට යැ, මිථ්‍යාසංකල්පකසටය හැරපියා සම්‍යක්සංකල්ප-යාගේ අභිනිරොපණමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යග්වචනය පරිග්‍රහමණ්ඩ යැ, මිථ්‍යාවචනය කසට යැ, මිථ්‍යාවචනකසටය හැරපියා සම්‍යග්වචනයාගේ පරිග්‍රහමණ්ඩය පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යක්කර්මාන්තය සමුත්ථානමණ්ඩ යැ, මිථ්‍යාකර්මාන්තය කසට යැ, මිථ්‍යාකර්මාන්තකසටය හැරපියා සම්‍යක්කර්මාන්තයාගේ සමුත්ථානමණ්ඩය, පානය කෙරේ නු’යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යගාජීවය ව්‍යවදානමණ්ඩ යැ, මිථ්‍යාජීවය කසට යැ, මිථ්‍යාජීවකසටය හැරපියා සම්‍යගාජීවයාගේ ව්‍යවදානමණ්ඩය පානය කෙරේ නු’ යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යග්ව්‍යායාමය ප්‍රග්‍රහමණ්ඩ යැ, මිථ්‍යාව්‍යායාමය කසට යැ, මිථ්‍යාව්‍යායාමකසටය හැරපියා සම්‍යග්ව්‍යායාමයාගේ ප්‍රග්‍රහමණ්ඩය පානය කෙරේ නු’ යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යක්සමෘතිය උපස්ථානමණ්ඩ යැ, මිථ්‍යාසමෘතිය කසට යැ, මිථ්‍යාසමෘති කසටය හැරපියා සම්‍යක්සමෘතිහුගේ උපස්ථානමණ්ඩය පානය කෙරේ නු’ යි මණ්ඩපෙය්‍ය නම. සම්‍යක්සමාධිය අවික්ෂෙපමණ්ඩ යැ, මිථ්‍යාසමාධිය කසට යැ, මිථ්‍යාසමාධිකසටය හැරපියා සම්‍යක්සමාධිහුගේ අවික්ෂෙප-මණ්ඩය පානය කෙරේ නු’ යි මණ්ඩපෙය්‍ය නම.

මණ්ඩ (ප්‍රසන්න) යෙක් ඇත, පියයුත්තෙක් ඇත, කසටයෙක් ඇති.

ශ්‍රද්ධෙන්ද්‍රිය අධිමොක්ෂමණ්ඩ යැ, අශ්‍රද්ධාව කසට යැ, ඒ ශ්‍රද්ධෙන්ද්‍රියෙහි යම් අර්ථරස (සම්පත්ති) යෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. වීර්‍ය්‍යෙන්ද්‍රිය ප්‍රග්‍රහමණ්ඩ යැ, කෞසීද්‍යය කසට යැ, ඒ වීර්‍ය්‍යෙන්ද්‍රියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සමෘතීන්ද්‍රිය උපස්ථානමණ්ඩ යැ, ප්‍රමාදය කසට යැ, ඒ සමෘතීන්ද්‍රියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සමාධීන්ද්‍රිය අවික්ෂෙපමණ්ඩ යැ, ඖද්ධත්‍යය කසට යැ, ඒ සමාධීන්ද්‍රියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ප්‍රඥෙන්ද්‍රිය දර්ශනමණ්ඩ යැ, අවිද්‍යාව කසට යැ, ඒ ප්‍රඥෙන්ද්‍රියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වේ.

අස්සද්ධියෙ අකම්පියමණ්ඩො සද්ධාබලං, අස්සද්ධියං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, කොසජ්ජෙ අකම්පියමණ්ඩො විරියබලං, කොසජ්ජං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පමාදෙ අකම්පියමණ්ඩො සතිබලං, පමාදො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං උද්ධච්චෙ අකම්පියමණ්ඩො සමාධිබලං, උද්ධච්චං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, අවිජ්ජාය අකම්පියමණ්ඩො පඤ්ඤාබලං, අවිජ්ජා කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං.

උපට්ඨානමණ්ඩො සතිසම්බොජ්ඣඞ්ගො, පමාදො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පවිචයමණ්ඩො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, අවිජ්ජා කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පග්ගහමණ්ඩො විරියසම්බොජ්ඣඞ්ගො, කොසජ්ජං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, ඵරණමණ්ඩො පීතිසම්බොජ්ඣඞ්ගො, පරිළාහො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, උපසමමණ්ඩො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, දුට්ඨුල්ලං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, අවික්ඛෙපමණ්ඩො සමාධිසම්බොජ්ඣඞ්ගො, උද්ධච්චං කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පටිසඞ්ඛානමණ්ඩො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, අප්පටිසඞ්ඛා කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං.

දස්සනමණ්ඩො සම්මාදිට්ඨි, මිච්ඡාදිට්ඨි කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, අභිනිරොපනමණ්ඩො සම්මාසඞ්කප්පො, මිච්ඡාසඞ්කප්පො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පරිග්ගහමණ්ඩො සම්මාවාචා, මිච්ඡාවාචා කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, සමුට්ඨානමණ්ඩො සම්මාකම්මන්තො, මිච්ඡාකම්මන්තො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, වොදානමණ්ඩො සම්මාආජීවො, මිච්ඡාආජීවො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, පග්ගහමණ්ඩො සම්මාවායාමො මිච්ඡාවායාමො කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, උපට්ඨානමණ්ඩො සම්මාසති, මිච්ඡාසති කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං, අවික්ඛෙපමණ්ඩො සම්මාසමාධි, මිච්ඡාසමාධි කසටො, යො තත්ථ අත්ථරසො ධම්මරසො විමුත්තිරසො, ඉදං පෙය්‍යං,

ශ්‍රද්ධාබලය අශ්‍රද්ධායෙහි අකම්ප්‍යමණ්ඩ යැ, අශ්‍රද්ධාව කසට යැ, ඒ ශ්‍රද්ධාබලයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. වීර්‍ය්‍යබලය කෞසීද්‍යයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, කෞසීද්‍යය කසට යැ, ඒ වීර්‍ය්‍යබලයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ස්මෘතිබලය ප්‍රමාදයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, ප්‍රමාදය කසට යැ, ඒ ස්මෘතිබලයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සමාධිබලය ඖද්ධත්‍යයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, ඖද්ධත්‍යය කසට යැ, ඒ සමාධිබලයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ප්‍රඥාබලය අවිද්‍යායෙහි අකම්ප්‍යමණ්ඩ යැ, අවිද්‍යාව කසට යැ, ඒ ප්‍රඥාබලයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වේ.

ස්මෘතිසම්බොධ්‍යඞ්ගය උපස්ථානමණ්ඩ යැ, ප්‍රමාදය කසට යැ, ඒ ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ප්‍රවිචයමණ්ඩ යැ, අවිද්‍යාව කසට යැ, ඒ ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය ප්‍රග්‍රහමණ්ඩ යැ, කෞසීද්‍යය කසට යැ, ඒ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ස්ඵරණමණ්ඩ යැ, පරිදාහය කසට යැ, ඒ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය උපශමමණ්ඩ යැ, දුෂ්ඨුල්ලය කසට යැ, ඒ ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සමාධිසම්බොධ්‍යඞ්ගය අවික්ෂෙපමණ්ඩ යැ, ඖද්ධත්‍යය කසට යැ, ඒ සමාධිසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය ප්‍රත්‍යවෙක්ෂාමණ්ඩ යැ, ප්‍රතිවෙක්ෂා නො කිරීම කසට යැ, ඒ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වේ.

සම්‍යග්දෘෂ්ටිය දර්ශනමණ්ඩ යැ, මිථ්‍යාදෘෂ්ටිය කසට යැ, ඒ සම්‍යග්දෘෂ්ටියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යක්සංකල්පය අභිනිරොපණමණ්ඩ යැ, මිථ්‍යාසංකල්පය කසට යැ, ඒ සම්‍යක්සංකල්පයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යග්වචනය පරිග්‍රහ (වාක්සංවර) මණ්ඩ යැ, මිථ්‍යාවචනය කසට යැ, ඒ සම්‍යග්වචනයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යක්කර්මාන්තය සමුත්ථානමණ්ඩ යැ, මිථ්‍යාකර්මාන්තය කසට යැ, ඒ සම්‍යක්කර්මාන්තයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යගාජීවය ව්‍යවදානමණ්ඩ යැ, මිථ්‍යාජීවය කසට යැ, ඒ සම්‍යගාජීවයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යග්ව්‍යායාමය ප්‍රග්‍රහමණ්ඩ යැ, මිථ්‍යාව්‍යායාමය කසට යැ, ඒ සම්‍යග්ව්‍යායාමයෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යක්ස්මෘතිය උපස්ථානමණ්ඩ යැ, මිථ්‍යාස්මෘතිය කසට යැ, ඒ සම්‍යක්ස්මෘතියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වෙයි. සම්‍යක්සමාධිය අවික්ෂෙපමණ්ඩ යැ, මිථ්‍යාසමාධිය කසට යැ, ඒ සම්‍යක්සමාධියෙහි යම් අර්ථරසයෙක් ධර්මරසයෙක් විමුක්තිරසයෙක් වේ ද, මේ පියයුතු වේ.

දස්සනමණ්ඩො සම්මාදිට්ඨි, අභිනිරොපනමණ්ඩො සම්මාසඞ්කප්පො, පරිග්ගහමණ්ඩො සම්මාවාචා, සමුට්ඨානමණ්ඩො සම්මාකම්මන්තො, වොදානමණ්ඩො සම්මාආජීවො, පග්ගහමණ්ඩො සම්මාවායාමො, උපට්ඨානමණ්ඩො සම්මාසති, අවික්ඛෙපමණ්ඩො සම්මාසමාධි.

උපට්ඨානමණ්ඩො සතිසම්බොජ්ඣඞ්ගො, පවිචයමණ්ඩො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො පග්ගහමණ්ඩො විරියසම්බොජ්ඣඞ්ගො, ඵරණමණ්ඩො පීතිසම්බොජ්ඣඞ්ගො, උපසමමණ්ඩො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, අවික්ඛෙපමණ්ඩො සමාධිසම්බොජ්ඣඞ්ගො, පටිසඞ්ඛානමණ්ඩො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

අස්සද්ධියෙ අකම්පියමණ්ඩො සද්ධාබලං, කොසජ්ජෙ අකම්පියමණ්ඩො විරියබලං, පමාදෙ අකම්පියමණ්ඩො සතිබලං, උද්ධච්චෙ අකම්පියමණ්ඩො සමාධිබලං, අවිජ්ජාය අකම්පියමණ්ඩො පඤ්ඤාබලං.

අධිමොක්ඛමණ්ඩො සද්ධාබලං, පග්ගහමණ්ඩො විරියබලං, උපට්ඨානමණ්ඩො සතිබලං, අවික්ඛෙපමණ්ඩො සමාධිබලං, දස්සනමණ්ඩො පඤ්ඤාබලං.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියං[1] මණ්ඩො[2] අකම්පියට්ඨෙන බලං[3] මණ්ඩො, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගො[4] මණ්ඩො, හෙතුට්ඨෙන[5] මග්ගො මණ්ඩො, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානං[6] මණ්ඩො, පදහනට්ඨෙන සම්මප්පධානං[7] මණ්ඩො, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදො[8] මණ්ඩො, තථට්ඨෙන සච්චං[9] මණ්ඩො, අවික්ඛෙපට්ඨෙන සමථො මණ්ඩො, අනුපස්සනට්ඨෙන විපස්සනා මණ්ඩො, එකරසට්ඨෙන සමථවිපස්සනා මණ්ඩො, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං[10] මණ්ඩො, සංවරට්ඨෙන සීලවිසුද්ධි මණ්ඩො, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි මණ්ඩො, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි මණ්ඩො, මුත්තට්ඨෙන විමොක්ඛො මණ්ඩො, පටිවෙධට්ඨෙන විජ්ජා මණ්ඩො, පරිච්චාගට්ඨෙන විමුත්ති මණ්ඩො, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං මණ්ඩො, පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙ ඤාණං මණ්ඩො.

ඡන්දො මූලට්ඨෙන මණ්ඩො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන මණ්ඩො, ඵස්සො සමොධානට්ඨෙන මණ්ඩො, වෙදනා සමොසරණට්ඨෙන මණ්ඩො, සමාධි පමුඛට්ඨෙන මණ්ඩො, සති ආධිපතෙය්‍යට්ඨෙන මණ්ඩො, පඤ්ඤා තදුත්තරට්ඨෙන[11] මණ්ඩො, විමුත්ති සාරට්ඨෙන මණ්ඩො, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන මණ්ඩොති.

මණ්ඩපෙය්‍යකථා සමත්තා.

චතුත්ථභාණවාරං

# මහාවග්ගො පඨමො

තස්ස වග්ගස්ස උද්දානං භවති:

ඤාණ[12]දිට්ඨි ච අස්සාසා
ඉන්ද්‍රියං විමොක්ඛ පඤ්චමා,
ගතිකම්මවිපල්ලාසා
වග්ගො මණ්ඩෙන තෙ දසා'ති.

එස නිකායධරට්ඨපිතො[13]
අසමො පඨමො පවරො වරවග්ගො'ති[14]

---

1. ඉන්ද්‍රියා - මජසං, සයා
2. ඉන්ද්‍රියමණ්ඩො - සී 1, 2, 3, ස
3. බලා - මජසං,
4. බොජ්ඣඞ්ගා - මජසං,
5. හෙතට්ඨෙන - සයා. සී 1, 2, 3
6. සතිපට්ඨානා මජසං, සයා, PTS
7. සම්මප්පධානා - මජසං, සයා PTS.
8. ඉද්ධිපාදා - මජසං, සයා PTS
9. සච්චා - මජසං සයා සච්චමණ්ඩො - සී 1, 2; 3
10. යුගනද්ධා - මජසං යුගනන්ධා - සයා PTS
11. තතුත්තරට්ඨෙන - මජසං. සී 1
12. ඤාණං - සී 2
13. නිකායධරෙහි ඨපිතො - මජසං නිකායවරෙහි ඨපිතො - සයා PTS
14. පඨමො ච පවරො වරවග්ගොති - සයා පවරො වරො ච වග්ගොති - PTS

සම්‍යග්දෘෂ්ටිය දර්ශනමණ්ඩ යැ, සම්‍යක්සංකල්පය අභිනිරෝපණමණ්ඩ යැ, සම්‍යග්වචනය පරිග්‍රහමණ්ඩ යැ, සම්‍යක්කර්මාන්තය සමුට්ඨානමණ්ඩ යැ, සම්‍යගාජීවය ව්‍යවදානමණ්ඩ යැ, සම්‍යග්ව්‍යායාමය ප්‍රග්‍රහමණ්ඩ යැ, සම්‍යක්-ස්මෘතිය උපස්ථානමණ්ඩ යැ, සම්‍යක්සමාධිය අවික්ෂෙපමණ්ඩ යි.

ස්මෘතිසම්බොධ්‍යඞ්ගය උපස්ථානමණ්ඩ යැ, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ප්‍රවිචයමණ්ඩ යැ, වීර්‍යසම්බොධ්‍යඞ්ගය ප්‍රග්‍රහමණ්ඩ යැ, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ස්ඵරණ (පැතිරීම්) මණ්ඩ යැ, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ව්‍යුපශමමණ්ඩ යැ, සමාධිසම්බොධ්‍යඞ්ගය අවික්ෂෙපමණ්ඩ යැ, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය පටිසඞ්ඛානමණ්ඩ යි.

ශ්‍රද්ධාබලය අශ්‍රද්ධායෙහි අකම්ප්‍ය (නො සැලෙන) මණ්ඩ යැ, වීර්‍යබලය කෞසීද්‍යයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, ස්මෘතිබලය ප්‍රමාදයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, සමාධිබලය ඖද්ධත්‍යයෙහි අකම්ප්‍යමණ්ඩ යැ, ප්‍රඥාබලය අවිද්‍යායෙහි අකම්ප්‍යමණ්ඩ යි.

ශ්‍රද්ධාබලය අධිමොක්ෂමණ්ඩ යැ, වීර්‍යබලය ප්‍රග්‍රහමණ්ඩ යැ, ස්මෘතිබලය උපස්ථානමණ්ඩ යැ, සමාධිබලය අවික්ෂෙපමණ්ඩ යැ, ප්‍රඥාබලය දර්ශනමණ්ඩ යි.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රිය මණ්ඩ යැ, අකම්ප්‍යාර්ථයෙන් බල මණ්ඩ යැ, නිර්‍යාණාර්ථයෙන් බොධ්‍යඞ්ග මණ්ඩ යැ, හෙත්වර්ථයෙන් මාර්ග මණ්ඩ යැ, උපස්ථානාර්ථයෙන් සතිපට්ඨාන මණ්ඩ යැ, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රධාන මණ්ඩ යැ, සමෘද්ධ වන අර්ථයෙන් ඍද්ධිපාද මණ්ඩ යැ, තථාර්ථයෙන් සත්‍යය මණ්ඩ යැ, අවික්ෂෙපාර්ථයෙන් ශමථ මණ්ඩ යැ, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව මණ්ඩ යැ, එකරසාර්ථයෙන් ශමථ-විදර්ශනා මණ්ඩ යැ, අනතිවර්තනාර්ථයෙන් යුගනද්ධ මණ්ඩ යැ, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය මණ්ඩ යැ, අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධිය මණ්ඩ යැ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය මණ්ඩ යැ, මුක්තාර්ථයෙන් විමොක්ෂය මණ්ඩ යැ, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව මණ්ඩ යැ, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය මණ්ඩ යැ, සමුච්ඡෙදාර්ථයෙන් ක්ෂයඥානය මණ්ඩ යැ, ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යර්ථයෙන් අනුත්පාද ඥානය මණ්ඩ යි.

ඡන්දය මූලාර්ථයෙන් මණ්ඩ යැ, මනසිකාරය සමුට්ඨානාර්ථයෙන් මණ්ඩ යැ, ස්පර්ශය සමවධානාර්ථයෙන් මණ්ඩ යැ, වෙදනාව සමොසරණාර්ථයෙන් මණ්ඩ යැ, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් මණ්ඩ යැ, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් මණ්ඩ යැ, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් මණ්ඩ යැ, විමුක්තිය සාරාර්ථයෙන් මණ්ඩ යැ, අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍යවසානාර්ථයෙන් මණ්ඩ යයි.

**මණ්ඩපෙය්‍යකථා නිමි.**

**සතරවැනි බණවර යි.**

## පළමුවැනි මහාවර්ගය යි.

ඥානකථා යැ, දෘෂ්ටිකථා යැ, ආනාපානස්මෘතිකථා යැ, ඉන්ද්‍රියකථා යැ, පස්වැනි විමොක්ෂකථා යැ, ගතිකථා යැ, කර්මකථා යැ, විපර්‍යාසකථා යැ, මණ්ඩපෙය්‍යකථා හා සමග මාර්ගකථා යැ යන ඒ දශකථාවෝ ඒ මහාවර්ගයාගේ උද්දානය වේ.

තෙල නිකායධරයන් විසින් තබනලද අසම වූ ප්‍රවර වූ උතුම් වූ පළමුවැනි වර්ගය යි.

# පටිසම්භිදාමගග

# පදාත්ථකකමණිකා

බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලා: 35(ii)

සූත්‍රාන්තපිටකයෙහි

30 වන ග්‍රන්ථය

# පටිසම්භිදාමග්ගප්පකරණ

## ඛුද්දකනිකාය

ත්‍රයෝදශ භාගය

---

පාඨශෝධනය

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්‍ය්‍ය
ලබුගම ලඞ්කානන්ද අනුනායක ස්ථවිරයන්වහන්සේ

සිංහලානුවාදය

යථෝක්ත අනුනායක ස්ථවිරයන්වහන්සේ හා උඩමාකඩවර
පුරාණ විහාරවංශී පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර
ස්ථවිරයන්වහන්සේ

---

බු. ව. 2550
ක්‍රි. ව. 2006

Buddha Jayanti Tripitaka Series, Volume 35 (ii)

The Thirty Book in the
**Suttanta-Pitaka**
**Khuddaka Nikāya (13)**
**30**

# PATISAMBHIDĀ MAGGAPPAKARANA (II)

Edited by
**Ven. Labugama Lankānanda Anunāyaka Thera**

Translated into Sinhala by
**The Said Anunāyaka Thera and**
**Pandit Karahampitigoda Sumanasāra Thera**

සුත්තන්තපිටකෙ

# පටිසම්භිදාමග්ගො

දුතියො භාගො

## යුගනද්ධවග්ගො

සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

# පටිසම්භිදාමග්ගො

## 2. යුගනද්ධවග්ගො

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

1

## යුගනද්ධකථා

එවං මෙ සුතං: එකං සමයං ආයස්මා ආනන්දො කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තත්‍ර ඛො ආයස්මා ආනන්දො භික්ඛූ ආමන්තෙසි 'ආවුසො භික්ඛවො'ති. 'ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසුං. ආයස්මා ආනන්දො එතදවොච:

යො හි කොචි ආවුසො භික්ඛු වා භික්ඛුනී වා මම සන්තිකෙ අරහත්තපත්තං[1] බ්‍යාකරොති, සබ්බො සො[2] චතූහි මග්ගෙහි එතෙසං වා අඤ්ඤතරෙන. කතමෙහි චතූහි:

ඉධාවුසො භික්ඛු සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති, තස්ස සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවයතො මග්ගො සඤ්ජායති, සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති, තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා[3] පහීයන්ති. අනුසයා බ්‍යන්තීහොන්ති.[4]

පුනචපරං ආවුසො භික්ඛු විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති, තස්ස විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවයතො මග්ගො සඤ්ජායති, සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති, තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා[3] පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

පුනචපරං ආවුසො භික්ඛු සමථවිපස්සනං යුගනද්ධං[5] භාවෙති, තස්ස සමථවිපස්සනං යුගනද්ධං භාවයතො මග්ගො සඤ්ජායති, සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති, තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

---

1 අරහත්තප්පත්තිං - අභි, අරහත්තපත්තිං - , අරහත්තං - සභා, අරහත්තපත්තං අත්තානං - පු 2. සබ්බෙසො - මජ්ඣං, සභා, PTS
3 සඤ්ඤොජනානි - මජ්ඣං, සභා, PTS 4 ව්‍යන්ති හොන්ති - අභි
5 යුගනන්ධං - ස

සූත්‍රාන්තපිටකයෙහි

## ඛුද්දගන්සඟිය

# පටිසම්භිදාමාර්ගය

## 2. යුගනද්ධවර්ගය

ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට
නමස්කාර වේවා.

### 1

### යුගනද්ධකථා

මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහි වාසය කරන සේක. එසමයෙහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ‘ඇවැත්නි, මහණෙනි’ යි භික්ෂූන් ඇමතූසේක. ‘ඇවැත්නි’ යි ඒ භික්ෂූහු ආයුෂ්මත් අනඳතෙරුනට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් අනඳතෙරණුවෝ මේ වදාළහ:

ඇවැත්නි, යම්කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ මා සමීපයෙහි තමා රහත්බවට පැමිණීම ප්‍රකාශ කෙරේ නම් සර්වප්‍රකාරයෙන් සතර ප්‍රතිපදාමාර්ගයෙන් හෝ මොවුනතුරෙහි එක්තරයෙකින් හෝ ප්‍රකාශ කෙරේ. කවර සතර ප්‍රතිපදාමාර්ගයෙකින යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ තෙම ශමථපූර්වඞ්ගම වූ විදර්ශනාව වඩයි. ශමථපූර්වඞ්ගම වූ විදර්ශනා වඩන ඔහට මාර්ගය උපදී. හෙතෙම ඒ මාර්ගය ඇසුරු කෙරෙයි වඩයි පුනපුනා වඩයි, ඒ මාර්ගය ඇසුරු කරන වඩන පුනපුනා වඩන ඔහට සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත (කෙළවර) වෙත්.

තවද අනෙකක් කියමි: ඇවැත්නි, මහණ තෙම විදර්ශනා පූර්වඞ්ගම වූ ශමථය වඩයි, විදර්ශනාපූර්වඞ්ගම ශමථය වඩන ඔහට මාර්ගය උපදී. හෙතෙම ඒ මාර්ගය ඇසුරු කෙරෙයි වඩයි පුනපුනා වඩයි, ඒ මාර්ගය ඇසුරු කරන වඩන පුනපුනා වඩන ඔහට සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

තවද ඇවැත්නි, මහණ තෙම ශමථ-විදර්ශනා යුගනද්ධ (යුගළ) කොට වඩයි, ශමථ විදර්ශනා යුගනද්ධ කොට වඩන ඔහට මාර්ගය උපදී. හෙතෙම ඒ මාර්ගය ඇසුරු කෙරෙයි වඩයි පුනපුනා වඩයි, ඒ මාර්ගය ඇසුරු කරන වඩන පුනපුනා වඩන ඔහට සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

පුනචපරං ආවුසො භික්ඛුනො ධම්මුද්ධච්චවිග්ගහිතං මානසං[1] හොති, සො ආවුසො සමයො යං තං චිත්තං අජ්ඣත්තමෙව[2] සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති, තස්ස මග්ගො සඤ්ජායති; සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති, තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො පහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

යො හි කොචි ආවුසො භික්ඛු වා භික්ඛුනී වා මම සන්තිකෙ අරහත්තපත්තං බ්‍යාකරොති, සබ්බො සො[3] ඉමෙහි චතූහි මග්ගෙහි එතෙසං වා අඤ්ඤතරෙනාති. [a]

කථං සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති: නෙක්ඛම්මවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි, තත්ථ ජාතෙ ධම්මෙ අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා, අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා. ඉති පඨමං සමථො, පච්ඡා විපස්සනා. තෙන වුච්චති. "සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති[4]

භාවෙතීති චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා.

මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති: දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මග්ගො සඤ්ජායති, අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො මග්ගො සඤ්ජායති, පරිග්ගහට්ඨෙන සම්මාවාචා මග්ගො සඤ්ජායති, සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො මග්ගො සඤ්ජායති, වොදානට්ඨෙන සම්මාආජීවො මග්ගො සඤ්ජායති, පග්ගහට්ඨෙන සම්මාවායාමො මග්ගො සඤ්ජායති, උපට්ඨානට්ඨෙන සම්මාසති මග්ගො සඤ්ජායති, අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි මග්ගො සඤ්ජායති. එවං මග්ගො සඤ්ජායති.

"සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති." ආසෙවතීති කථං ආසෙවති: ආවජ්ජන්තො ආසෙවති, ජානන්තො ආසෙවති, පස්සන්තො ආසෙවති, පච්චවෙක්ඛන්තො ආසෙවති, චිත්තං අධිට්ඨහන්තො ආසෙවති, සද්ධාය අධිමුච්චන්තො ආසෙවති, විරියං පග්ගණ්හන්තො ආසෙවති, සතිං උපට්ඨපෙන්තො[5] ආසෙවති, චිත්තං සමාදහන්තො ආසෙවති, පඤ්ඤාය පජානන්තො ආසෙවති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො ආසෙවති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො ආසෙවති, පහාතබ්බං පජහන්තො ආසෙවති, භාවෙතබ්බං භාවෙන්තො ආසෙවති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො ආසෙවති. එවං ආසෙවති.

---

1 ධම්මුද්ධච්චාවිග්ගහිතමානසං - සෘ.
2 අජ්ඣත්තංයෙව - අභි. අජ්ඣත්තඤ්ඤෙව - සෘ, සී 1, 3, PTS
3 සබ්බෙ තෙ - මජසං, සෘ, PTS.
4 භාවෙතීති - මජසං
5 උපට්ඨපෙන්තො - මජසං
a අඞ්ගුත්තරනිකාය (4.1.2.10) චතුක්ක - පටිපදාවග්ග

තවද ඇවැත්නි, මහණහට ඔභාසාදිධර්මයෙහි වික්ෂෙපසඞ්ඛ්‍යාත උද්ධතභාවයෙන් විරොධයට පමුණුවනලද සිත වෙයි, යම් කලෙක ඒ (විදර්ශනාවීථියට බැසැගෙන සිටි) සිත ගොචරජ්ඣත්ත සඞ්ඛ්‍යාත අරමුණෙහි මැ පිහිටා ද මොනොවට හිඳී ද එකඟ වේ ද මොනොවට සිටී ද, ඇවැත්නි ඒ විදර්ශනාවීථියට පිළිපන් සමය වෙයි. ඔහට මාර්ගය උපදී. හෙතෙම ඒ මාර්ගය ඇසුරු කෙරෙයි වඩයි පුනපුනා වඩයි, ඒ මාර්ගය ඇසුරු කරන වඩන පුනපුනා වඩන ඔහට සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විනතාන්ත වෙත්.

ඇවැත්නි, යම් කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ මා සමීපයෙහි තමා රහත්බවට පැමිණීම ප්‍රකාශ කෙරේ නම් මේ සතර ප්‍රතිපදාමාර්ගයෙන් හෝ මොවුනතුරෙහි එක්තරයෙකින් හෝ ප්‍රකාශ කෙරේ යයි.

**කිසෙයින් ශමථපූර්වඞ්ගම විදර්ශනා වඩා ද** යත්: නෛෂ්ක්‍රම්‍යවශයෙන් චිත්තයාගේ එකඟබව අවික්ෂෙප සඞ්ඛ්‍යාත සමාධි යැ, ඒ සමාධියෙහි උපන් (චිත්තචෛතසික) ධර්මයන් අනිත්‍යානුදර්ශනස්වභාවයෙන් විදර්ශනා යැ, දුඃඛානුදර්ශනස්වභාවයෙන් විදර්ශනා යැ, අනාත්මානුදර්ශනස්වභාවයෙන් විදර්ශනා යි. මෙසෙයින් පළමු වැ ශමථය වෙයි. පසු වැ විදර්ශනා වේ. එහින් කියනු ලැබෙයි: 'සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති'

**භාවෙති** යනු භාවනා සතරෙකි: ඒ ශමථයෙහි උපන් (චිත්තචෛතසික) ධර්මයන් නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් භාවනා යැ, ඉන්ද්‍රියයන්ගේ ඒකකෘත්‍යස්වභාවයෙන් භාවනා යැ, තදුපගවීර්‍ය්‍යධුරස්වභාවයෙන් භාවනා යැ, ආසෙවනස්වභාවයෙන් භාවනා යි.

**මග්ගං සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත්: දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිසඞ්ඛ්‍යාත මාර්ගය උපදී, අභිනිරොපණාර්ථයෙන් සම්‍යක්සංකල්ප සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. පරිග්‍රහාර්ථයෙන් සම්‍යග්වචන සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. සමුත්ථානාර්ථයෙන් සම්‍යක්කර්මාන්ත සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. ව්‍යවදානාර්ථයෙන් සම්‍යගාජීව සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. ප්‍රග්‍රහාර්ථයෙන් සම්‍යග්ව්‍යායාම සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. උපස්ථානාර්ථයෙන් සම්‍යක්ස්මෘති සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධි සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. මෙසෙයින් මාර්ගය උපදී.

"සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති" **ආසෙවති** යනු: කිසෙයින් ඇසුරු කෙරෙයි යත්: ආවර්ජනා කෙරෙමින් ඇසුරු කෙරෙයි, දනිමින් ඇසුරු කෙරෙයි, දක්මින් ඇසුරු කෙරෙයි, ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් ඇසුරු කෙරෙයි, සිත පිහිටුවමින් ඇසුරු කෙරෙයි, සැදැහැයෙන් නිශ්චය කෙරෙමින් ඇසුරු කෙරෙයි, වීර්‍ය්‍යය දැඩි කොට ගනිමින් ඇසුරු කෙරෙයි, සිහි එළවා තබමින් ඇසුරු කෙරෙයි, සිත අරමුණෙහි සම වැ තබමින් ඇසුරු කෙරෙයි, ප්‍රඥායෙන් දැනගනිමින් ඇසුරු කෙරෙයි, ස්වභාවලක්ෂණාවබොධයෙන් දතයුත්ත අභිජානනය කෙරෙමින් ඇසුරු කෙරෙයි, සාමාන්‍යලක්ෂණාවබොධයෙන් දතයුත්ත පරිජානනය කෙරෙමින් ඇසුරු කෙරෙයි, දුරු කළයුත්ත දුරු කෙරෙමින් ඇසුරු කෙරෙයි, වැඩියයුත්ත වඩමින් ඇසුරු කෙරෙයි, ප්‍රත්‍යක්ෂකටයුත්ත ප්‍රත්‍යක්ෂ කෙරෙමින් ඇසුරු කෙරෙයි, මෙසෙයින් ඇසුරු කෙරේ.

**භාවෙතීති** කථං භාවෙති: ආවජ්ජන්තො භාවෙති, ජානන්තො භාවෙති, පස්සන්තො භාවෙති, පච්චවෙක්ඛන්තො භාවෙති, චිත්තං අධිට්ඨහන්තො භාවෙති, සද්ධාය අධිමුච්චන්තො භාවෙති, විරියං පග්ගණ්හන්තො භාවෙති, සතිං උපට්ඨපෙන්තො භාවෙති, චිත්තං සමාදහන්තො භාවෙති, පඤ්ඤාය පජානන්තො භාවෙති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො භාවෙති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො භාවෙති, පහාතබ්බං පජහන්තො භාවෙති, භාවෙතබ්බං භාවෙන්තො භාවෙති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො භාවෙති. එවං භාවෙති.

**බහුලීකරොතීති** කථං බහුලීකරොති: ආවජ්ජන්තො බහුලීකරොති, ජානන්තො බහුලීකරොති, පස්සන්තො බහුලීකරොති, පච්චවෙක්ඛන්තො බහුලීකරොති, චිත්තං අධිට්ඨහන්තො බහුලීකරොති, සද්ධාය අධිමුච්චන්තො බහුලීකරොති, විරියං, පග්ගණ්හන්තො බහුලීකරොති, සතිං උපට්ඨපෙන්තො බහුලීකරොති, චිත්තං සමාදහන්තො බහුලීකරොති, පඤ්ඤාය පජානන්තො බහුලීකරොති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො බහුලීකරොති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො බහුලීකරොති, පහාතබ්බං පජහන්තො බහුලීකරොති, භාවෙතබ්බං භාවෙන්තො බහුලීකරොති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො බහුලීකරොති, එවං බහුලීකරොති.

**තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා[1] පහීයන්ති අනුසයා බ්‍යන්තීහොන්තී'ති** කථං සංයොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති: සොතාපත්තිමග්ගෙන සක්කායදිට්ඨි විචිකිච්ඡා, සීලබ්බතපරාමාසො ඉමානි තීණි සඤ්ඤොජනානි පහීයන්ති, දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො ඉමෙ ද්වෙ අනුසයා බ්‍යන්තීහොන්ති. සකදාගාමිමග්ගෙන ඔළාරිකං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං ඉමානි ද්වෙ සඤ්ඤොජනානි පහීයන්ති, ඔළාරිකො කාමරාගානුසයො පටිඝානුසයො ඉමෙ ද්වෙ අනුසයා බ්‍යන්තීහොන්ති. අනාගාමිමග්ගෙන අණුසහගතං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං ඉමානි ද්වෙ සඤ්ඤොජනානි පහීයන්ති, අණුසහගතො කාමරාගානුසයො පටිඝානුසයො ඉමෙ ද්වෙ අනුසයා බ්‍යන්තීහොන්ති. අරහත්තමග්ගෙන රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා ඉමානි පඤ්ච සඤ්ඤොජනානි පහීයන්ති, මානානුසයො භවරාගානුසයො අවිජ්ජානුසයො ඉමෙ තයො අනුසයා බ්‍යන්තීහොන්ති, එවං සංයොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

අබ්‍යාපාදවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො, සමාධි -පෙ- ආලොකසඤ්ඤාවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො, සමාධි -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන, පටිනිස්සග්ගානුපස්සී පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි, තත්ථ ජාතෙ ධම්මෙ අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා, අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා, ඉති පඨමං සමථො, පච්ඡා විපස්සනා. තෙන වුච්චති: "සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති"[2]

1. සඤ්ඤොජනානි - මජසං, සයා PTS
2. භාවෙතීති - මජසං.

**භාවේති** යනු: කිසෙයින් වඩා ද යත්: ආවර්ජනා කෙරෙමින් වඩයි, දනිමින් වඩයි, දකිමින් වඩයි, ප්‍රත්‍යවේක්‍ෂා කෙරෙමින් වඩයි, සිත පිහිටුවමින් වඩයි, ශ්‍රද්ධායෙන් නිශ්චය කෙරෙමින් වඩයි, වීර්‍ය්‍ය දැඩි කොට ගන්මින් වඩයි, සිහි එළවා තබමින් වඩයි, සිත අරමුණෙහි සම වැ තබමින් වඩයි, ප්‍රඥායෙන් දැනගනිමින් වඩයි, අභිඥෙයය අභිජානනය කෙරෙමින් වඩයි, පරිඥෙයය පරිජානනය කෙරෙමින් වඩයි, ප්‍රහාතව්‍යය ප්‍රජහනය කෙරෙමින් වඩයි, භාවිතව්‍යය භාවනා කෙරෙමින් වඩයි, සාක්‍ෂාත්කර්තව්‍යය සාක්‍ෂාත් කෙරෙමින් වඩයි, මෙසෙයින් වඩා.

**බහුලීකරෝති** යනු: කිසෙයින් පුනපුනා වඩා ද යත්: ආවර්ජනා කෙරෙමින් පුනපුනා වඩයි, දනිමින් පුනපුනා වඩයි, දකිමින් පුනපුනා වඩයි, ප්‍රත්‍යවේක්‍ෂා කෙරෙමින් පුනපුනා වඩයි, සිත පිහිටුවමින් පුනපුනා වඩයි, සැදැහැයෙන් නිශ්චය කෙරෙමින් පුනපුනා වඩයි, වීර්‍ය්‍ය දැඩි කොට ගනිමින් පුනපුනා වඩයි, සිහි එළවා තබමින් පුනපුනා වඩයි, සිත අරමුණෙහි සම වැ තබමින් පුනපුනා වඩයි, ප්‍රඥායෙන් ප්‍රජානනය කෙරෙමින් පුනපුනා වඩයි, අභිඥෙයය අභිජානනය කෙරෙමින් පුනපුනා වඩයි, පරිඥෙයය පරිජානනය කෙරෙමින් පුනපුනා වඩයි, ප්‍රහාතව්‍යය ප්‍රජහනය කෙරෙමින් පුනපුනා වඩයි, භාවිතව්‍යය භාවනා කෙරෙමින් පුනපුනා වඩයි, සාක්‍ෂාත්-කර්තව්‍යය සාක්‍ෂාත් කෙරෙමින් පුනපුනා වඩයි, මෙසෙයින් පුනපුනා වඩා.

**තස්ස තං මග්ගං ආසේවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනානි පහීයන්ති අනුසයා බ්‍යන්තීහොන්ති** යනු: කිසෙයින් සංයෝජනයෝ ප්‍රහීණ වෙත් ද; අනුශයධර්මයෝ විගතාන්ත වෙත් ද යත්: සෝවන්මගින් සත්කායදෘෂ්ටි යැ විචිකිත්සා යැ ශීලව්‍රතපරාමර්ශ යැ යන මේ තුන් සංයෝජනයෝ ප්‍රහීණ වෙති, දෘෂ්ට්‍යනුශය යැ විචිකිත්සානුශය යැ යන මේ අනුශයධර්මයෝ දෙදෙන විගතාන්ත වෙති. සෙදගැමිමගින් ඖදාරික වූ කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ යන මේ සංයොජනයෝ දෙදෙන ප්‍රහීණ වෙති, ඖදාරික වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ යන මේ අනුශයධර්මයෝ දෙදෙන විගතාන්ත වෙති. අනාගැමිමගින් අණු සහගත වූ කාමරාගසංයෝජන යැ ප්‍රතිඝසංයෝජන යැ යන මේ සංයෝජනයෝ දෙදෙන ප්‍රහීණ වෙති. අණුසහගත වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ යන මේ අනුශයධර්මයෝ දෙදෙන විගතාන්ත වෙති. රහත්මගින් රූපරාග යැ අරූපරාග යැ මාන යැ ඖද්ධත්‍ය යැ අවිද්‍යා යැ යන මේ සංයෝජනයෝ පස්දෙන ප්‍රහීණ වෙති, මානානුශය යැ භවරාගානුශය යැ අවිද්‍යානුශය යැ යන මේ තුන් අනුශයධර්මයෝ විගතාන්ත වෙති, මෙසෙයින් සංයෝජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

අව්‍යාපාද වශයෙන් චිත්තයාගේ එකාග්‍රබව අවික්‍ෂෙප සඞ්ඛ්‍යාත සමාධි යැ ... ආලෝකසංඥා වශයෙන් චිත්තයාගේ එකාග්‍රබව අවික්‍ෂෙප සඞ්ඛ්‍යාත සමාධි යැ ... පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කිරීම් වශයෙන්, පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකාග්‍රබව අවික්‍ෂෙප සඞ්ඛ්‍යාත සමාධි යැ. ඒ ශමථයෙහි උපන් (චිත්තචෛතත) ධර්මයන් අනිත්‍යානුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, දුඃඛානුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, අනාත්මානුදර්ශනාර්ථයෙන් විදර්ශනා යි. මෙසෙයින් පළමු වැ ශමථය වෙයි, පසු වැ විදර්ශනා වේ. එයින් කියනු ලැබෙයි: 'සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති'

භාවෙතීති චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවීරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා.

මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති: දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මග්ගො සඤ්ජායති, අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො මග්ගො සඤ්ජායති -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි මග්ගො සඤ්ජායති. එවං මග්ගො සඤ්ජායති.

"සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති." ආසෙවතීති කථං ආසෙවති: ආවජ්ජන්තො ආසෙවති, ජානන්තො ආසෙවති -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො ආසෙවති, එවං ආසෙවති.

භාවෙතීති කථං භාවෙති: ආවජ්ජන්තො භාවෙති, ජානන්තො භාවෙති -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො භාවෙති, එවං භාවෙති.

බහුලීකරොතීති කථං බහුලීකරොති: ආවජ්ජන්තො බහුලීකරොති ජානන්තො බහුලීකරොති -පෙ- සච්ඡිකරොන්තො බහුලීකරොති. එවං බහුලීකරොති.

තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්තීති කථං සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති: සොතාපත්තිමග්ගෙන සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො ඉමානි තීණි සඤ්ඤොජනානි පහීයන්ති, දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො ඉමෙ ද්වෙ අනුසයා බ්‍යන්තීහොන්ති. සකදාගාමිමග්ගෙන ඔළාරිකං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං ඉමානි ද්වෙ සඤ්ඤොජනානි පහීයන්ති, ඔළාරිකො කාමරාගානුසයො පටිඝානුසයො ඉමෙ ද්වෙ අනුසයා බ්‍යන්තීහොන්ති. අනාගාමිමග්ගෙන අණුසහගතං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං ඉමානි ද්වෙ සඤ්ඤොජනානි පහීයන්ති, අණුසහගතො කාමරාගානුසයො පටිඝානුසයො ඉමෙ ද්වෙ අනුසයා බ්‍යන්තීහොන්ති. අරහත්තමග්ගෙන රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා ඉමානි පඤ්ච සඤ්ඤොජනානි පහීයන්ති, මානානුසයො භවරාගානුසයො අවිජ්ජානුසයො, ඉමෙ තයො අනුසයා බ්‍යන්තීහොන්ති. එවං සඤ්ඤොජනානි පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති

එවං සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති.

කථං විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති: අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා, අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා, තත්ථ ජාතානං ධම්මානඤ්ච වොස්සග්ගාරම්මණතා[1] චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි. ඉති පඨමං විපස්සනා පච්ඡා සමථො. තෙන වුච්චති: "විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති."[2]

---

1 වොස්සග්ගාරම්මණතා - මජ්සං, වවස්සග්ගාරම්මණතා - ස

2. භාවෙතීති - මජ්සං.

**භාවෙති** යනු: භාවනා සතරෙකි: ඒ ශමථයෙහි උපන් (චිත්ත-චෛතසික) ධර්මයන් නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් භාවනා යැ, ඉන්ද්‍රියයන්ගේ ඒකරසාර්ථයෙන් භාවනා යැ, තදුපගවීර්‍යධුරාර්ථයෙන් භාවනා යැ, ආසෙවනාර්ථයෙන් භාවනා යි.

**මග්ගො සඤ්ජායති** යනු· කිසෙයින් මාර්ගය උපදී ද යත්: දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටි සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. අභිනිරොපණාර්ථයෙන් සම්‍යක් සංකල්ප සඞ්ඛ්‍යාත මාර්ගය උපදී ... අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධි සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. මෙසෙයින් මාර්ගය උපදී.

'සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති' **ආසෙවති** යනු: කිසෙයින් ආසෙවන කෙරේ ද යත්: ආවර්ජනා කෙරෙමින් ආසෙවන කෙරෙයි, දනිමින් ආසෙවන කෙරෙයි ... සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කෙරෙමින් ආසෙවන කෙරේ. මෙසෙයින් ආසෙවන කෙරේ.

**භාවෙති** යනු කිසෙයින් භාවනා කෙරේ ද යත්: ආවර්ජනා කෙරෙමින් භාවනා කෙරෙයි, දනිමින් භාවනා කෙරෙයි ... සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කෙරෙමින් භාවනා කෙරේ. මෙසෙයින් භාවනා කෙරේ.

**බහුලීකරොති** යනු: කිසෙයින් බහුලකෙරේ ද යත්: ආවර්ජනා කෙරෙමින් බහුල කෙරෙයි, දනිමින් බහුල කෙරෙයි ... සාක්ෂාත් කෙරෙමින් බහුල කෙරේ. මෙසෙයින් බහුල කෙරේ.

**"තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති අනුසයා බ්‍යන්තිහොන්ති** යනු: කිසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙත් ද, අනුශයධර්මයෝ විගතාන්ත වෙත් ද යත්: ස්‍රොතාපත්තිමාර්ගයෙන් සත්කායදෘෂ්ටි යැ විචිකිත්සා යැ ශීලව්‍රතපරාමර්ශ යැ යන මේ තුන් සංයොජනයෝ ප්‍රහීණ වෙති, දෘෂ්ට්‍යනුශය යැ විචිකිත්සානුශය යැ යන මේ අනුශයධර්මයෝ දෙදෙන විගතාන්ත වෙති. සකෘදාගාමිමාර්ගයෙන් ඖදාරික වූ කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ යන මේ සංයොජනයෝ දෙදෙන ප්‍රහීණ වෙති, ඖදාරික වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ යන මේ අනුශයධර්මයෝ දෙදෙන විගතාන්ත වෙති. අනාගාමිමාර්ගයෙන් අණුසහගත වූ කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ යන මේ සංයොජනයෝ දෙදෙන ප්‍රහීණ වෙති, අණුසහගත වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ යන මේ අනුශයධර්මයෝ දෙදෙන විගතාන්ත වෙති. අර්හත්මාර්ගයෙන් රූපරාග යැ අරූපරාග යැ මාන යැ ඖද්ධත්‍ය යැ අවිද්‍යා යැ යන මේ සංයෝජනයෝ පස්දෙන ප්‍රහීණ වෙති, මානානුශය යැ භවරාගානුශය යැ අවිද්‍යානුශය යැ යන මේ තුන් අනුශය ධර්මයෝ විගතාන්ත වෙත්. මෙසෙයින් සංයෝජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

මෙසෙයින් ශමථපූර්වඞ්ගම විදර්ශනා වඩා.

කිසෙයින් විදර්ශනාපූර්වඞ්ගම ශමථය වඩා ද යත්: අනිත්‍යානුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, දුඃඛානුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, අනාත්මානුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, ඒ විදර්ශනායෙහි උපන්(චිත්තචෛතසික) ධර්මයන් ද නිර්වාණාලම්බන බැවින් (උපදවනලද) චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත (උපචාරඅර්පණාභෙද) අවික්ෂෙපය සමාධි යැ. මෙසෙයින් පළමු වැ විදර්ශනා වෙයි, පසු වැ ශමථය වේ. එයින් කියනු ලැබෙයි: "විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති" යනු.

භාවෙතීති චතස්සො භාවනා, -පෙ- ආසෙවනට්ඨෙන භාවනා. මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති. එවං සඤ්ඤොජනානි පහීයන්ති. අනුසයා බ්‍යන්තීහොන්ති.

රූපං අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, රූපං දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා, රූපං අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා. තත්ථ ජාතානං ධම්මානඤ්ච වොස්සග්ගාරම්මණතා[1] චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි. ඉති පඨමං විපස්සනා, පච්ඡා සමථො. තෙන වුච්චති: "විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති:"[2]

භාවෙතීති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා. මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති. -පෙ- එවං සංයොජනානි පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, ජරාමරණං දුක්ඛතො -පෙ- අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා. තත්ථ ජාතානං ධම්මානඤ්ච වොස්සග්ගාරම්මණතා චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි. ඉති පඨමං විපස්සනා, පච්ඡා සමථො. තෙන වුච්චති: "විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති".

භාවෙතීති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා. මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති -පෙ- එවං සඤ්ඤොජනානි පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

එවං විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති.

කථං සමථවිපස්සනං යුගනද්ධං[3] භාවෙති: සොළසහි ආකාරෙහි සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: ආරම්මණට්ඨෙන, ගොචරට්ඨෙන, පහානට්ඨෙන, පරිච්චාගට්ඨෙන, වුට්ඨානට්ඨෙන, විවට්ටනට්ඨෙන, සන්තට්ඨෙන, පණීතට්ඨෙන, විමුත්තට්ඨෙන, අනාසවට්ඨෙන, තරණට්ඨෙන, අනිමිත්තට්ඨෙන, අප්පණිහිතට්ඨෙන, සුඤ්ඤතට්ඨෙන, එකරසට්ඨෙන, අනතිවත්තනට්ඨෙන, යුගනද්ධට්ඨෙන.

කථං ආරම්මණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධාරම්මණො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධාරම්මණා. ඉති ආරම්මණට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති.[4] තෙන වුච්චති. 'ආරම්මණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං[3] භාවෙති'.

1 වොසග්ගාරම්මණතා - මජසං, වොස්සග්ගාරම්මණතා - සී 1, වවස්සග්ගාරම්මණතා - ස
2 භාවෙතීති - මජසං 4 නාතිවත්තන්තීති - මජසං, සයා PTS
3. යුගනන්ධං - සයා PTS

භාවෙති යනු: භාවනා සතරෙකි ... ආසෙවනාර්ථයෙන් භාවනා යි. **මග්ගං සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ග උපදී ද යත්: ... මෙසෙයින් මාර්ගය උපදී. මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

රූපය අනිත්‍ය හෙයින් අනුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, රූපය දුඃඛ හෙයින් අනුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, රූපය අනාත්ම හෙයින් අනුදර්ශනාර්ථයෙන් විදර්ශනා යි. ඒ විදර්ශනායෙහි උපන් (චිත්තචෛතන) ධර්මයන් ද නිර්වාණාලම්බන බැවින් (උපදවනලද) චිත්තයාගේ එකාග්‍රතා සඬ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි යැ. මෙසෙයින් පළමු වැ විදර්ශනා වෙයි, පසු වැ ශමථය වේ. එයින් කියනු ලැබෙයි: "විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති" යනු.

භාවෙති යනු: භාවනා සතරෙකි ... ආසෙවනාර්ථයෙන් භාවනා යි. **මග්ගං සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත් ... මෙසෙයින් මාර්ගය උපදී ... මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

වෙදනාව ... සංඥව ... සංස්කාරයන් ... විඥනය ... චක්‍ෂුස ... ජරාමරණය අනිත්‍ය හෙයින් අනුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, ජරාමරණය දුඃඛ හෙයින් ... අනාත්ම හෙයින් අනුදර්ශනාර්ථයෙන් විදර්ශනා යි. ඒ විදර්ශනායෙහි උපන් (චිත්තචෛතන) ධර්මයන් ද නිර්වාණාලම්බන බැවින් (උපදවනලද) චිත්තයාගේ එකාග්‍රතා සඬ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි යැ. මෙසෙයින් පළමු වැ විදර්ශනා වෙයි, පසු වැ ශමථය වේ. එයින් කියනු ලැබෙයි: "විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති" යනු.

භාවෙති යනු: භාවනා සතරෙකි: ආසෙවනාර්ථයෙන් භාවනා යි. **මග්ගං සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත් ... මෙසෙයින් මාර්ගය උපදී ... මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

මෙසෙයින් විදර්ශනාපූර්වඞ්ගම ශමථය වඩා.

කිසෙයින් ශමථ විදර්ශනා යුගනද්ධ (යුගළ) කොට වඩා ද යත්: සොළොස් අයුරෙකින් ශමථ - විදර්ශනා යුගනද්ධ කොට වඩයි. ආලම්බන වශයෙන්, ගොචර වශයෙන්, ප්‍රහාණ වශයෙන්, පරිත්‍යාග වශයෙන්, ව්‍යුත්ථාන වශයෙන, නිවර්තන වශයෙන්, ශාන්ත වශයෙන්, ප්‍රණීත වශයෙන, විමුක්ති වශයෙන්, අනාස්‍රව වශයෙන්, අතික්‍රමණ වශයෙන්, නිමිත්තරහිතාර්ථයෙන, ප්‍රණිධිරහිතාර්ථයෙන, ශූන්‍යතාර්ථයෙන, එකත්‍යතාර්ථයෙන, අනතික්‍රමණාර්ථයෙන, යුගනද්ධාර්ථයෙනි.

කිසෙයින් ආලම්බන වශයෙන් ශමථ - විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඬ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය නිරොධාලම්බන වෙයි, අවිද්‍යාව දුරු කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරොධාලම්බන වෙයි. මෙසෙයින් ආලම්බනාර්ථයෙන් ශමථවිදර්ශනාවෝ එකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'ආරම්මණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු.

භාවෙතීති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා. මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති -පෙ- එවං සංයොජනානි පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති. එවං ආරම්මණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.

කථං ගොචරට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධගොචරා' ඉති ගොචරට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: 'ගොචරට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' (භාවෙතීති -පෙ-)

කථං පහානට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධගොචරො, අවිජ්ජාසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධගොචරා. ඉති පහානට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: 'පහානට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං පරිච්චාගට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච පරිච්චජතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධගොචරො, අවිජ්ජාසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච පරිච්චජතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධගොචරා. ඉති පරිච්චාගට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: 'පරිච්චාගට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං වුට්ඨානට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චසහගතකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධගොචරො, අවිජ්ජාසහගතකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨහතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධගොචරා. ඉති වුට්ඨානට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: වුට්ඨානට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං විවට්ටනට්ඨෙන.[1] සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චසහගතකිලෙසෙහි ච ඛන්ධෙහි ච විවට්ටතො[2] චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධගොචරො, අවිජ්ජාසහගතකිලෙසෙහි ච ඛන්ධෙහි ච විවට්ටතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධගොචරා. ඉති විවට්ටනට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති. අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: 'විවට්ටනට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

1 විවත්තනට්ඨෙන - සී 1, 3.
2. විවත්තතො - සී 1, 3.

**භාවේති** යනු: භාවනා සතරෙකි .. ආසේවනාර්ථයෙන් භාවනා යි. **මග්ගං සඤ්ජානති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත් මෙසෙයින් මාර්ගය උපදී ... මෙසෙයින් සංයෝජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්. මෙසෙයින් ආලම්බනාර්ථයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා.

කිසෙයින් ගෝචර වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂේපසමාධිය නිරෝධගෝචර වෙයි, අවිද්‍යාව දුරු කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරෝධගෝචර වෙයි, මෙසෙයින් ගෝචරාර්ථයෙන් ශමථ-විදර්ශනාවෝ ඒකරස වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'ගෝචරට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවේති' යනු. (භාවේති යනු ...)

කිසෙයින් ප්‍රහාණ වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යසහගත ක්ලේශයන් ද ස්කන්ධයන් ද දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂේපසමාධිය නිරෝධගෝචර වෙයි, අවිද්‍යාසහගත ක්ලේශයන් ද ස්කන්ධයන් ද දුරු කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරෝධගෝචර වෙයි, මෙසෙයින් ප්‍රහාණාර්ථයෙන් ශමථ-විදර්ශනාවෝ ඒකරස වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි; 'පහානට්ඨෙන සමථවිපස්සනා යුගනද්ධං භාවේති' යනු ...

කිසෙයින් පරිත්‍යාග වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යසහගත ක්ලේශයන් ද ස්කන්ධයන් ද පරිත්‍යාග කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂේපසමාධිය නිරෝධගෝචර වෙයි, අවිද්‍යාසහගත ක්ලේශයන් ද ස්කන්ධයන් ද පරිත්‍යාග කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරෝධගෝචර වෙයි. මෙසෙයින් පරිත්‍යාගාර්ථයෙන් ශමථ-විදර්ශනාවෝ ඒකරස වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'පරිච්චාගට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවේති' යනු ...

කිසෙයින් ව්‍යුත්ථාන වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්. ඖද්ධත්‍යසහගත ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂේපසමාධිය නිරෝධගෝචර වෙයි, අවිද්‍යාසහගත ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරෝධගෝචර වෙයි, මෙසෙයින් ව්‍යුත්ථානාර්ථයෙන් ශමථ විදර්ශනාවෝ ඒකරස වෙති, යුගනද්ධ වෙති ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි. 'වුට්ඨානට්ඨෙන සමථ-විපස්සනං යුගනද්ධං භාවේති' යනු ..

කිසෙයින් විවර්තන වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යසහගත කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විවර්තනය වන (වටාලා නො පෙරළෙන අයුරින් නවත්නා) යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂේපසමාධිය නිරෝධගෝචර වෙයි, අවිද්‍යාසහගත කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විවර්තනය වන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරෝධගෝචර වෙයි. මෙසෙයින් විවර්තනාර්ථයෙන් ශමථ-විදර්ශනාවෝ ඒකරස වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත් එයින් කියනු ලැබෙයි: 'විවට්ටනට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවේති' යනු ...

කථං සන්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි සන්තො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා සන්තා හොති නිරොධගොචරා. ඉති සන්තට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: 'සන්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' -පෙ-

කථං පණීතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි පණීතො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා පණීතා හොති නිරොධගොචරා. ඉති පණීතට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: 'පණීතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' - පෙ-

කථං විමුත්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි කාමාසවා විමුත්තො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා අවිජ්ජාසවා විමුත්තා හොති නිරොධගොචරා. ඉති රාගවිරාගා චෙතොවිමුත්ති, අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති. ඉති විමුත්තට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: 'විමුත්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' - පෙ-

කථං අනාසවට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි කාමාසවෙන අනාසවො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා අවිජ්ජාසවෙන අනාසවා හොති නිරොධගොචරා. ඉති අනාසවට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: අනාසවට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං තරණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච තරතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධගොචරො, අවිජ්ජාසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච තරතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධගොචරා. ඉති තරණට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: 'තරණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' -පෙ-

කිසෙයින් ශාන්ත වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙප සමාධිය ශාන්ත වූයේ නිරෝධගොචර වෙයි, අවිද්‍යාව දුරු කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව ශාන්ත වූවා නිරෝධගොචර වෙයි. මෙසෙයින් ශාන්ත වශයෙන් ශමථ-විදර්ශනාවෝ ඒකරස වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි 'සන්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කිසෙයින් ප්‍රණීත වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය ප්‍රණීත වූයේ නිරෝධගොචර වෙයි, අවිද්‍යාව දුරු කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව ප්‍රණීත වූවා නිරෝධගොචර වෙයි. මෙසෙයින් ප්‍රණීත වශයෙන් ශමථ-විදර්ශනාවෝ ඒකරස වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'පණීතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කිසෙයින් විමුක්තාර්ථයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය කාමාස්‍රවය කෙරෙන් මිදුණේ නිරෝධගොචර වෙයි, අවිද්‍යාව දුරු කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව අවිද්‍යාස්‍රවය කෙරෙන් මිදුණී නිරෝධගොචර වෙයි. මෙසෙයින් රාගවිරාගයෙන් චිත්තවිමුක්තිය වෙයි, අවිද්‍යාවිරාගයෙන් ප්‍රඥාවිමුක්තිය වෙයි. මෙසෙයින් විමුක්තාර්ථයෙන් ශමථ-විදර්ශනාවෝ ඒකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි 'විමුත්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු

කිසෙයින් අනාස්‍රවාර්ථයෙන් ශමථ විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය කාමාස්‍රවයෙන් අනාස්‍රව වූයේ නිරෝධගොචර වෙයි, අවිද්‍යාව දුරු කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව අවිද්‍යාස්‍රවයෙන් අනාස්‍රව වූවා නිරෝධගොචර වෙයි මෙසෙයින් අනාස්‍රවාර්ථයෙන් ශමථ-විදර්ශනාවෝ ඒකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'අනාසවට්ඨෙන සමථවිපස්සනා යුගනද්ධං භාවෙති' යනු ...

කිසෙයින් තරණාර්ථයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය සහගත ක්ලේශයන් ද ස්කන්ධයන් ද තරණය කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය නිරෝධ-ගොචර වෙයි, අවිද්‍යාසහගත ක්ලේශයන් ද ස්කන්ධයන් ද තරණය කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරෝධගොචර වෙයි. මෙසෙයින් තරණාර්ථයෙන් ශමථ විදර්ශනාවෝ ඒකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'තරණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කථං අනිමිත්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි සබ්බනිමිත්තෙහි අනිමිත්තො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා සබ්බනිමිත්තෙහි අනිමිත්තා හොති නිරොධගොචරා. ඉති අනිමිත්තට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති. තෙන වුච්චති. 'අනිමිත්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං අප්පණිහිතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි සබ්බපණිධීහි අප්පණිහිතො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා සබ්බපණිධීහි අප්පණිහිතා හොති නිරොධගොචරා. ඉති අප්පණිහිතට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති. තෙන වුච්චති: 'අප්පණිහිතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං සුඤ්ඤතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි සබ්බාභිනිවෙසෙහි සුඤ්ඤො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා සබ්බාභිනිවෙසෙහි සුඤ්ඤා හොති නිරොධගොචරා. ඉති සුඤ්ඤතට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති. තෙන වුච්චති: 'සුඤ්ඤතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.'

භාවෙතීති චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා

මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති. එවං සංයොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති. එවං සුඤ්ඤතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.

ඉමෙහි සොළසහි ආකාරෙහි සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.

එවං සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.

කථං ධම්මුද්ධච්චවිග්ගහිතං මානසං[1] හොති: අනිච්චතො මනසිකරොතො ඔභාසො උප්පජ්ජති, 'ඔභාසො ධම්මො'ති ඔභාසං ආවජ්ජති. තතො වික්ඛෙපො උද්ධච්චං. තෙන උද්ධච්චෙන විග්ගහිතමානසො අනිච්චතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, දුක්ඛතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, අනත්තතො උපට්ඨානං යථාභූතං නප්පජානාති. තෙන වුච්චති: 'ධම්මුද්ධච්චවිග්ගහිතමානසො.' හොති සො සමයො: යං තං චිත්තං අජ්ඣත්තමෙව සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති.

1 — විග්ගහිතමානසං - සී 3

කිසෙයින් අනිමිත්ත වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය හැම නිමිත්ත කෙරෙන් වෙන් වූ අනිමිත්ත වූයේ නිරොධගෝචර වෙයි, අවිද්‍යාව දුරු කරන යොගීහට අනුදර්ශනාවයෙන් විදර්ශනාව හැම නිමිත්ත කෙරෙන් වෙන් වූ අනිමිත්ත වූවා නිරොධගොචර වෙයි. මෙසෙයින් අනිමිත්ත වශයෙන් ශමථ විදර්ශනාවෝ එකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'අනිමිත්තවසෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කිසෙයින් අප්‍රණිහිත වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය හැම ප්‍රණිධීන් කෙරෙන් වෙන් වූ අප්‍රණිහිත වූයේ නිරොධගොචර වේයි, අවිද්‍යාව දුරු කරන යෝගීහට අනුදර්ශනාවයෙන් විදර්ශනාව හැම ප්‍රණිධීන් කෙරෙන් වෙන් වූ අප්‍රණිහිත වූවා නිරොධගොචර වෙයි. මෙසෙයින් අප්‍රණිහිත වශයෙන් ශමථ-විදර්ශනාවෝ එකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි; 'අප්පණිහිතවසෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කිසෙයින් ශූන්‍යත වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යොගීහට චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය හැම අභිනිවේශයන් කෙරෙන් ශූන්‍ය වූයේ නිරොධාලම්බන වෙයි. අවිද්‍යාව දුරු කරන යොගීහට අනුදර්ශනාවයෙන් විදර්ශනාව හැම අභිනිවේශයන් කෙරෙන් ශූන්‍ය වූවා නිරොධාලම්බන වෙයි. මෙසෙයින් ශූන්‍යත වශයෙන් ශමථ-විදර්ශනාවෝ එකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'සුඤ්ඤතවසෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු.

භාවෙති යනු භාවනා සතරෙකි: ඒ භාවනාවිශෙෂයෙහි උපන් ශමථ-විදර්ශනා සඞ්ඛ්‍යාත යුගනද්ධධර්මයන් නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් භාවනා යැ, ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ ඒකකෘත්‍යස්වභාවයෙන් භාවනා යැ, තද-නුරූපවීර්‍ය්‍යවහනස්වභාවයෙන් භාවනා යැ, ආසෙවනස්වභාවයෙන් භාවනා යි.

මග්ගො සඤ්ජායති යනු: කිසෙයින් මාර්ග උපදී ද යත් ... මෙසෙයින් මාර්ග උපදී. මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්. මෙසෙයින් ශූන්‍යත වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා.

මේ සොළොස් අයුරින් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩයි.

මෙසෙයින් ශමථ විදර්ශනා යුගනද්ධ කොට වඩා.

කිසෙයින් ඕභාසාදි ධර්මයෙහි වික්ෂෙපයෙන් විරොධයට පමුණුවනලද සිත වෙයි යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවාහට විදර්ශනාවභාසය උපදියි. අවභාසය මාර්ගඵලධර්ම යැ' යි අවභාසය ආවර්ජනා කෙරෙයි. ඒ අවභාසයෙන් උපදනා වික්ෂෙපය ඖද්ධත්‍යය නම. ඒ ඖද්ධත්‍යයෙන් විරෝධයට පමුණුවනලද සිත් ඇත්තේ අනිත්‍ය හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනියි. දුඃඛ හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනියි. අනාත්ම හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනී. එයින් කියනු ලැබෙයි: 'ධම්මුද්ධච්චවිග්ගහිතමානසො' යි. යම් කලෙක ඒ (විදර්ශනාවීථියට බැස සිටි) සිත ගොචරාධ්‍යාත්ම සඞ්ඛ්‍යාත ආලම්බනයෙහි මැ පිහිටා නම් මොනොවට හිඳී නම් එකඟ වේ නම් මොනොවට සිටී නම් එබඳු සමයෙක් වේ.

තස්ස මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති: දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති. -පෙ- එවං සංයොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

අනිච්චතො මනසිකරොතො ඤාණං උප්පජ්ජති පීති උප්පජ්ජති පස්සද්ධි උප්පජ්ජති සුඛං උප්පජ්ජති -පෙ- අධිමොක්ඛො උප්පජ්ජති -පෙ- පග්ගහො[1]. උප්පජ්ජති -පෙ- උපට්ඨානං උප්පජ්ජති -පෙ- උපෙක්ඛා උප්පජ්ජති -පෙ- නිකන්ති උප්පජ්ජති, 'නිකන්ති ධම්මො'ති නිකන්තිං ආවජ්ජති. තතො වික්ඛෙපො උද්ධච්චං, තෙන උද්ධච්චෙන විග්ගහිතමානසො අනිච්චතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, දුක්ඛතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, අනත්තතො උපට්ඨානං යථාභූතං නප්පජානාති. තෙන වුච්චති: 'ධම්මුද්ධච්චවිග්ගහිතමානසො.' හොති සො සමයො, යං තං චිත්තං අජ්ඣත්තමෙව සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති. තස්ස මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති -පෙ- එවං සංයොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

දුක්ඛතො මනසිකරොතො -පෙ- අනත්තතො මනසිකරොතො ඔභාසො උප්පජ්ජති -පෙ- ඤාණං උප්පජ්ජති -පෙ- පීති උප්පජ්ජති-පෙ- පස්සද්ධි උප්පජ්ජති -පෙ- සුඛං උප්පජ්ජති -පෙ- අධිමොක්ඛො උප්පජ්ජති -පෙ- පග්ගහො උප්පජ්ජති පෙ- උපට්ඨානං උප්පජ්ජති -පෙ- උපෙක්ඛා උප්පජ්ජති -පෙ- නිකන්ති උප්පජ්ජති, 'නිකන්ති ධම්මො'ති නිකන්තිං ආවජ්ජති. තතො වික්ඛෙපො උද්ධච්චං, තෙන උද්ධච්චෙන විග්ගහිතමානසො අනත්තතො උපට්ඨානං -පෙ- අනිච්චතො උපට්ඨානං -පෙ- දුක්ඛතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, තෙන වුච්චති: 'ධම්මුද්ධච්චවිග්ගහිතමානසො, -පෙ- එවං සංයොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

රූපං අනිච්චතො මනසිකරොතො -පෙ- රූපං දුක්ඛතො මනසිකරොතො -පෙ- රූපං අනත්තතො මනසිකරොතො -පෙ- වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො මනසිකරොතො -පෙ- ජරාමරණං දුක්ඛතො මනසිකරොතො -පෙ- ජරාමරණං අනත්තතො මනසිකරොතො ඔභාසො උප්පජ්ජති -පෙ ඤාණං උප්පජ්ජති -පෙ- පීති උප්පජ්ජති -පෙ- පස්සද්ධි උප්පජ්ජති -පෙ- සුඛං උප්පජ්ජති -පෙ අධිමොක්ඛො උප්පජ්ජති -පෙ- පග්ගහො උප්පජ්ජති -පෙ- උපට්ඨානං උප්පජ්ජති -පෙ- උපෙක්ඛා උප්පජ්ජති -පෙ- නිකන්ති උප්පජ්ජති, 'නිකන්ති ධම්මො'ති නිකන්තිං ආවජ්ජති, තතො වික්ඛෙපො උද්ධච්චං, තෙන උද්ධච්චෙන විග්ගහිතමානසො ජරාමරණං අනත්තතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, ජරාමරණං අනිච්චතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, ජරාමරණං දුක්ඛතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, තෙන වුච්චති: 'ධම්මුද්ධච්චවිග්ගහිතමානසො, හොති සො සමයො යං තං චිත්තං අජ්ඣත්තමෙව සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති.

---

1. පග්ගාහො - සීමු.

**තස්ස මග්ගො සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත්: දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටි සඞ්ඛ්‍යාත මාර්ගය උපදී ... මෙසෙයින් මාර්ගය උපදී ... මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවාහට විදර්ශනාඥානය උපදියි ... විදර්ශනා ප්‍රීතිය උපදියි ... විදර්ශනා ප්‍රශ්‍රබ්ධිය උපදියි ... විදර්ශනා සුඛය උපදියි ... අධිමොක්ෂය (ශ්‍රද්ධාව) උපදියි ... වීර්‍ය්‍යය උපදියි ... විදර්ශනා සම්ප්‍රයුක්ත ස්මෘතිය උපදියි ... උපෙක්ෂාව උපදියි ... විදර්ශනා නිකාන්තිය උපදියි ... නිකාන්තිය මාර්ගඵල ධර්ම යැ’යි නිකාන්තිය ආවර්ජනා කෙරෙයි. ඒ නිකාන්තියෙන් උපදනා වික්ෂෙපය ඖද්ධත්‍ය නම්. ඒ ඖද්ධත්‍යයෙන් විරොධයට පමුණුවන ලද සිත් ඇත්තේ අනිත්‍ය හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දැයි. දුඃඛ හෙයින් වැටහීම් ඇති සැටියෙන් නො දනියි. අනාත්ම හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනී. එයින් කියනු ලැබෙයි. ‘ධම්මුද්ධච්චවිග්ගහිත මානසො’යි. යම් කලෙක ඒ (විදර්ශනා වීථියට බැස සිටි) සිත ගොචරාධ්‍යාත්ම සඞ්ඛ්‍යාත ආලම්බනයෙහි මැ පිහිටා නම් මොනොවට හිඳී නම් එකඟ වේ නම් මොනොවට සිටී නම් එබඳු සමයෙක් වේ **තස්ස මග්ගො සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත්: .. මෙසෙයින් මාර්ගය උපදියි. ... මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

දුඃඛ හෙයින් මෙනෙහි කරනුවාහට ... අනාත්ම හෙයින් මෙනෙහි කරනුවාහට ඕභාසය උපදී, ... ඥානය උපදියි ... ප්‍රීතිය උපදියි ... ප්‍රශ්‍රබ්ධිය උපදියි ... සුඛය උපදියි ... අධිමොක්ෂය උපදියි ... වීර්‍ය්‍යය උපදියි ... විදර්ශනා සම්ප්‍රයුක්ත ස්මෘතිය උපදියි .. උපෙක්ෂාව උපදියි .. නිකාන්තිය උපදී. නිකාන්තිය මාර්ග . ඵල ධර්ම යැ’යි නිකාන්තිය ආවර්ජනා කෙරෙයි. ඒ නිකාන්තියෙන් උපදනා වික්ෂෙපය ඖද්ධත්‍ය නම්, ඒ ඖද්ධත්‍යයෙන් විරොධයට පමුණුවන ලද සිත් ඇත්තේ අනාත්ම හෙයින් වැටහීම ... අනිත්‍ය හෙයින් වැටහීම ... දුඃඛ හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනී. එයින් කියනු ලැබෙයි: ‘ධම්මුද්ධච්චවිග්ගහිත-මානසො’යි. ... මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති. අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

රූපය අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවාහට ... රූපය දුඃඛ හෙයින් මෙනෙහි කරනුවාහට ... රූපය අනාත්ම හෙයින් මෙනෙහිකරනුවාහට ... වෙදනාව .. සංඥාව ... සංස්කාරයන් .. විඥානය චක්ෂුස ... ජරාමරණය අනිත්‍ය හෙයින් මෙනෙහි කරනුවාහට ... ජරාමරණය දුඃඛ හෙයින් මෙනෙහි කරනුවාහට... ජරාමරණය අනාත්ම හෙයින් මෙනෙහි කරනුවාහට ඕභාසය උපදී. .. විදර්ශනාඥානය උපදී ... ප්‍රීතිය උපදී ... ප්‍රශ්‍රබ්ධිය උපදී ... සුඛය උපදී අධිමොක්ෂය උපදී ... වීර්‍ය්‍යය උපදී ... විදර්ශනා සම්ප්‍රයුක්ත ස්මෘතිය උපදී .. උපෙක්ෂාව උපදී ... නිකාන්තිය උපදී. නිකාන්තිය මාර්ග ඵල ධර්ම යැ’යි නිකාන්තිය ආවර්ජනා කෙරෙයි. ඒ නිකාන්තියෙන් උපදනා වික්ෂෙපය ඖද්ධත්‍ය නම, ඒ ඖද්ධත්‍යයෙන් විරොධයට පමුණුවන ලද සිත් ඇත්තේ ජරාමරණය අනාත්ම හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනී, ජරාමරණය අනිත්‍ය හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනී, ජරාමරණය දුඃඛ හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනී. එයින් කියනු ලැබෙයි: ‘ධම්මුද්ධච්චවිග්ගහිතමානසො’යි. යම් කලෙක ඒ (විදර්ශනාවීථියට බැස සිටි) සිත ගොචරාධ්‍යාත්ම සඞ්ඛ්‍යාත ආලම්බනයෙහි මැ පිහිටා නම් මොනොවට හිඳී නම් එකඟ වේ නම් මොනොවට සිටී නම් එබඳු සමයෙක් වේ.

තස්ස මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති: -පෙ- එවං මග්ගො සඤ්ජායති -පෙ- එවං සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

එවං ධම්මුද්ධච්චවිග්ගහිතං මානසං හොති.

(1) ''ඔභාසෙ චෙව ඤාණෙ ච පීතියා ච විකම්පති
පස්සද්ධියා සුඛෙ චෙව යෙහි චිත්තං පවෙධති,

(2) අධිමොක්ඛෙ ච පග්ගාහෙ උපට්ඨානෙ ච කම්පති
උපෙක්ඛාවජ්ජනාය චෙව[1] උපෙක්ඛාය ච නිකන්තියා,

(3) ඉමානි දස ඨානානි පඤ්ඤා යස්ස පරිචිතා[2]
ධම්මුද්ධච්චකුසලො හොති න ච සම්මොහං ගච්ඡති,[3]

(4) වික්ඛිපති[4] චෙව කිලිස්සති ච චවති චිත්තභාවනා
වික්ඛිපති න කිලිස්සති[5] භාවනා පරිහායති,

(5) වික්ඛිපති න කිලිස්සති භාවනා න පරිහායති
න ච වික්ඛිපතෙ චිත්තං න කිලිස්සති න චවති චිත්තභාවනා,

(6) ඉමෙහි චතූහි ඨානෙහි චිත්තස්ස සඞ්ඛෙපවික්ඛෙපවිග්ගහිතං
දසට්ඨානෙ (මානසං කුසලො) සම්පජානාතී''ති[6]

යුගනද්ධකථා සමත්තා

## 2

## සච්චකථා

පරිපුණ්ණනිදානං, [7]''චත්තාරිමානි භික්ඛවෙ තථානි අවිතථානි අනඤ්ඤථානි. කතමානි චත්තාරි: 'ඉදං දුක්ඛ'න්ති භික්ඛවෙ තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං, ''අයං දුක්ඛසමුදයො'ති තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං 'අයං දුක්ඛනිරොධො'ති තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං, 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං, ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි තථානි අවිතථානි අනඤ්ඤථානී.''[a]

1 උපෙක්ඛාවජ්ජනා චෙව - සයා
2. පරිච්චිතා - මජසං, සයා, පරිචිතා - ස.
3 වික්ඛෙපං ගච්ඡති - විසු, සම්මොහනගච්ඡති - සයා
4. විකම්පති - සයා.
5. වික්ඛපති කිලිස්සති - සයා, PTS,
6 ඔභාසගාථා පොත්ථකෙසු විසදිසා දිස්සන්ති,
අට්ඨකථාය පන සංසන්දනවසෙන පටිසඞ්ඛතා,
7. පුරිමනිදානං - මජසං, පරිපුණ්ණකථානිදානං - සයා PTS
a සච්චසංයුත්ත - ධම්මචක්කප්පවත්තනවග්ග - 10.

**තස්ස මග්ගො සඤ්ජායතීති** යනු: කෙසෙයින් මාර්ගය උපදී ද යත්: ... මෙසෙයින් මාර්ගය උපදී ... මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති. අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

මෙසෙයින් ඔභාසාදි ධර්මයෙහි වික්ෂේපයෙන් විරෝධයට පමුණුවන ලද සිත වේ.

(1) විදර්ශනාවභාස නිමිත්තෙන් ද විදර්ශනාඥාන නිමිත්තෙන් ද විදර්ශනා ප්‍රීති නිමිත්තෙන් ද යොගී තෙම විවිධ වැ කම්පා වෙයි, යම් ප්‍රශ්‍රබ්ධි ආදියෙකින් සිත සැලේ නම් ඒ විදර්ශනා ප්‍රශ්‍රබ්ධි නිමිත්තෙන් ද විදර්ශනා සුඛ නිමිත්තෙන් ද යොගී තෙම කම්පා වෙයි.

(2) අධිමොක්ෂ නිමිත්තෙන් ද වීර්‍ය්‍ය නිමිත්තෙන් ද විදර්ශනා සම්ප්‍රයුක්ත ස්මෘති නිමිත්තෙන් ද ආවර්ජනොපෙක්ෂා නිමිත්තෙන් ද විදර්ශ-නොපෙක්ෂා නිමිත්තෙන් ද විදර්ශනානිකාන්ති නිමිත්තෙන් ද යොගී තෙම කම්පා වෙයි.

(3) මේ අවභාසාදි දශ උපක්ලේශ කාරණයෝ යමක්හු විසින් ප්‍රඥායෙන් පුරුදු කරන ලද්දාහු ද හෙතෙම අවභාසාදි ධර්මයෙහි ඖද්ධත්‍ය සඞ්ඛ්‍යාත වික්ෂේපයෙහි කුශල වූයේ වෙයි, නො ද සම්මොහයට යෙයි.

(4) යොගාවචර තෙම ඔභාසාදියෙහි වික්ෂේප වේ නම් තෘෂ්ණා-මානදෘෂ්ටීන් කිලිටි ද වේ නම් එකල්හි චිත්ත භාවනායෙන් ච්‍යුත වෙයි, වික්ෂේප වේ නම් කිලිටි නො වේ නම් භාවනායෙන් පිරිහෙයි.

(5) වික්ෂේප වේ නම් කිලිටි නො වේ නම් තියුණු නුවණැතියේ භාවනායෙන් නො පිරිහෙයි. නො ද වික්ෂේප වේ නම් සිත කිලිටි නො වේ නම් චිත්තභාවනායෙන් ච්‍යුත නො වෙයි.

(6) මේ සතර කරුණින් අවභාසාදි දශ විධ උපක්ලේශකාරණයෙහි චිත්තයාගේ ලීනොද්ධත භාවයෙන් විරෝධයට පමුණුවන ලද සිත කුශල වූ යොගී තෙම මොනොවට දැනගනී'යයි.

**යුගනද්ධකථා නිමි.**

# 2

# සත්‍ය කථා

පරිපූර්ණනිදාන යි. ''මහණෙනි, මොහු සතර දෙන (යථාස්වභාව හෙයින්) තථ නම් වෙති. (විපරීතාභාවයෙන්) අවිතථ නම් වෙති, (අන්‍යස්වභාව රහිත බැවින්) අනඤ්ඤථ නම් වෙත්. කවර සතර දෙනෙක යත්: මහණෙනි, 'මේ දුක යැ' යන මෙය තථ යැ අවිතථ යැ අනඤ්ඤථ යැ. මේ දුක්ඛසමුදය යැ' යන මෙය තථ යැ අවිතථ යැ අනඤ්ඤථ යැ. 'මේ දුක්ඛනිරොධ යැ' යන මෙය තථ යැ. අවිතථ යැ අනඤ්ඤථ යැ. 'මේ දුක්ඛනිරොධගාමිනී පටිපදා යැ' යන මෙය තථ යැ අවිතථ යැ අනඤ්ඤථ යි. මහණෙනි, මොහු සතර දෙන තථ අවිතථ අනඤ්ඤථ නම් වෙත්.

කථං දුක්ඛං තථට්ඨෙන සච්චං: චත්තාරො දුක්ඛස්ස දුක්ඛට්ඨා තථා අවිතථා අනඤ්ඤථා: දුක්ඛස්ස පීළනට්ඨො සඞ්ඛතට්ඨො සන්තාපට්ඨො විපරිණාමට්ඨො, ඉමෙ චත්තාරො දුක්ඛස්ස දුක්ඛට්ඨා තථා අවිතථා අනඤ්ඤථා, එවං දුක්ඛං තථට්ඨෙන සච්චං.

කථං සමුදයො තථට්ඨෙන සච්චං: චත්තාරො සමුදයස්ස සමුදයට්ඨා තථා අවිතථා අනඤ්ඤථා: සමුදයස්ස ආයූහනට්ඨො නිදානට්ඨො සංයොගට්ඨො පලිබොධට්ඨො, ඉමෙ චත්තාරො සමුදයස්ස සමුදයට්ඨා තථා අවිතථා අනඤ්ඤථා, එවං සමුදයො තථට්ඨෙන සච්චං.

කථං නිරොධො තථට්ඨෙන සච්චං: චත්තාරො නිරොධස්ස නිරොධට්ඨා තථා අවිතථා අනඤ්ඤථා: නිරොධස්ස නිස්සරණට්ඨො විවෙකට්ඨො අසඞ්ඛතට්ඨො අමතට්ඨො, ඉමෙ චත්තාරො නිරොධස්ස නිරොධට්ඨා තථා අවිතථා අනඤ්ඤථා, එවං නිරොධො තථට්ඨෙන සච්චං.

කථං මග්ගො තථට්ඨෙන සච්චං චත්තාරො මග්ගස්ස මග්ගට්ඨා තථා අවිතථා අනඤ්ඤථා: මග්ගස්ස නිය්‍යානට්ඨො හෙතුට්ඨො[1] දස්සනට්ඨො ආධිපතෙය්‍යට්ඨො, ඉමෙ චත්තාරො මග්ගස්ස මග්ගට්ඨා තථා අවිතථා අනඤ්ඤථා. එවං මග්ගො තථට්ඨෙන සච්චං..

කතිහාකාරෙහි චත්තාරි සච්චානි එකපටිවෙධානි[2] චතුහාකාරෙහි චත්තාරි සච්චානි එකපටිවෙධානි: තථට්ඨෙන අනත්තට්ඨෙන සච්චට්ඨෙන පටිවෙධට්ඨෙන. ඉමෙහි චතුහාකාරෙහි චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං තථට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: චතුහාකාරෙහි තථට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස දුක්ඛට්ඨො තථට්ඨො, සමුදයස්ස සමදයට්ඨො තථට්ඨො, නිරොධස්ස නිරොධට්ඨො තථට්ඨො, මග්ගස්ස මග්ගට්ඨො තථට්ඨො, ඉමෙහි චතුහාකාරෙහි තථට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං අනත්තට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: චතුහාකාරෙහි අනත්තට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස දුක්ඛට්ඨො අනත්තට්ඨො, සමුදයස්ස සමුදයට්ඨො අනත්තට්ඨො, නිරොධස්ස නිරොධට්ඨො අනත්තට්ඨො මග්ගස්ස මග්ගට්ඨො අනත්තට්ඨො, ඉමෙහි චතුහාකාරෙහි අනත්තට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

1. හෙතට්ඨො - සයා
2. එකපාටිවෙධානි - මජසං.

කිසෙයින් දුඃඛය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි යත්: දුඃඛයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ දුඃඛාර්ථයෝ සතර දෙනෙක: දුඃඛයාගේ පීඩනාර්ථ යෑ ආයූහනාර්ථ යෑ සන්තාපාර්ථ යෑ විපරිණාමාර්ථ යි. මොහු සතර දෙන දුඃඛයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ දුඃඛාර්ථයෝ යි. මෙසෙයින් දුඃඛය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි.

කිසෙයින් සමුදය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි යත්: සමුදයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ සමුදයාර්ථයෝ සතර දෙනෙක: සමුදයාගේ ආයූහනාර්ථ යෑ නිදානාර්ථ යෑ සංයෝගාර්ථ යෑ පලිබොධාර්ථ යි. මොහු සතර දෙන සමුදයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ සමුදයාර්ථයෝ යි. මෙසෙයින් සමුදය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි.

කිසෙයින් නිරොධය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි යත්: නිරොධයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ නිරොධාර්ථයෝ සතර දෙනෙක: නිරොධයාගේ නිස්සරණාර්ථ යෑ විවේකාර්ථ යෑ අසඞ්ඛතාර්ථ යෑ අමෘතාර්ථ යි. මොහු සතර දෙන නිරොධයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ නිරොධාර්ථයෝ යි. මෙසෙයින් නිරොධය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි.

කිසෙයින් මාර්ගය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි යත්: මාර්ගයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ මාර්ගාර්ථයෝ සතර දෙනෙක: මාර්ගයාගේ නිර්‍ය්‍යාණාර්ථ යෑ හෙත්වර්ථ යෑ දර්ශනාර්ථ යෑ අධිපතිභාවාර්ථ යි. මොහු සතර දෙන මාර්ගයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ මාර්ගාර්ථයෝ යි. මෙසෙයින් මාර්ගය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වේ.”

කිහි අයුරෙකින් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙයි යත්: සතර අයුරෙකින් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති: යථාස්වභාවාර්ථයෙන අනාත්මාර්ථයෙන සත්‍යාර්ථයෙන ප්‍රතිවෙධ කළයුතු අර්ථයෙනි. මේ සතර අයුරින් සතර සත්‍යයෝ එකෙකි අර්ථයෙන් සඞ්ගෘහීත වෙති, යම් හෙයෙකින් එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලද වේ ද එහෙයින් එකත්ව වෙයි. එකත්වය එක් මාර්ගඥානයෙන් ප්‍රතිවෙධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති.

කිසෙයින් තථාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති යත්: සතර අයුරෙකින් තථාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති: දුඃඛයාගේ දුඃඛස්වභාවය තථාර්ථ යෑ, සමුදයාගේ සමුදයස්වභාවය තථාර්ථ යෑ, නිරොධයාගේ නිරොධස්වභාවය තථාර්ථ යෑ, මාර්ගයාගේ මාර්ගස්වභාවය තථාර්ථ යි. මේ සතර අයුරින් තථාර්ථයෙන් සතර සත්‍යයෝ එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලදහ. යම් හෙයෙකින් එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලද ද, එහෙයින් එකත්ව වෙයි, එකත්වය එක් මාර්ගඥානයෙන් ප්‍රතිවෙධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති.

කිසෙයින් අනාත්මාර්ථයෙන් සතර සත්‍යයෝ ඒකප්‍රතිවෙධ වෙති යත්: සතර අයුරෙකින් අනාත්මාර්ථයෙන් සතර සත්‍යයෝ ඒකප්‍රතිවෙධ වෙති: දුඃඛයාගේ දුඃඛස්වභාවය අනාත්මාර්ථ යෑ, සමුදයාගේ සමුදයස්වභාවය අනාත්මාර්ථ යෑ, නිරොධයාගේ නිරොධස්වභාවය අනාත්මාර්ථ යෑ, මාර්ගයාගේ මාර්ගස්වභාවය අනාත්මාර්ථ යි. මේ සතර අයුරින් අනාත්මාර්ථයෙන් සතර සත්‍යයෝ එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලදහ, යම් හෙයෙකින් එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලද ද, එහෙයින් එකත්ව වෙයි, එකත්වය එක් ඥානයෙන් ප්‍රතිවෙධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති.

කථං සච්චට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: චතූහාකාරෙහි සච්චට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස දුක්ඛට්ඨො සච්චට්ඨො, සමුදයස්ස සමුදයට්ඨො සච්චට්ඨො, නිරොධස්ස නිරොධට්ඨො සච්චට්ඨො, මග්ගස්ස මග්ගට්ඨො සච්චට්ඨො. ඉමෙහි චතූහාකාරෙහි සච්චට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි. යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං පටිවෙධට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: චතූහාකාරෙහි පටිවෙධට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස දුක්ඛට්ඨො පටිවෙධට්ඨො, සමුදයස්ස සමුදයට්ඨො පටිවෙධට්ඨො, නිරොධස්ස නිරොධට්ඨො පටිවෙධට්ඨො, මග්ගස්ස මග්ගට්ඨො පටිවෙධට්ඨො. ඉමෙහි චතූහාකාරෙහි පටිවෙධට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි. යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං චත්තාරි සච්චානි එකපටිවෙධානි: යං අනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තං අනිච්චං[1] යං අනිච්චඤ්ච දුක්ඛඤ්ච තං අනත්තා. යං අනිච්චඤ්ච දුක්ඛඤ්ච අනත්තා ච තං තථං, යං අනිච්චඤ්ච දුක්ඛඤ්ච අනත්තා ච තථඤ්ච, තං සච්චං, යං අනිච්චඤ්ච දුක්ඛඤ්ච අනත්තා ච තථඤ්ච සච්චඤ්ච, තං එකසඞ්ගහිතං. යං එකසඞ්ගහිතං, තං එකත්තං. එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කතිහාකාරෙහි[2] චත්තාරි සච්චානි එකපටිවෙධානි: නවහාකාරෙහි චත්තාරි සච්චානි එකපටිවෙධානි: තථට්ඨෙන අනත්තට්ඨෙන සච්චට්ඨෙන පටිවෙධට්ඨෙන අභිඤ්ඤට්ඨෙන පරිඤ්ඤට්ඨෙන පහානට්ඨෙන භාවනට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන. ඉමෙහි නවහාකාරෙහි චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි. යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං තථට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: නවහාකාරෙහි තථට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස දුක්ඛට්ඨො තථට්ඨො, සමුදයස්ස සමුදයට්ඨො තථට්ඨො, නිරොධස්ස නිරොධට්ඨො තථට්ඨො, මග්ගස්ස මග්ගට්ඨො තථට්ඨො, අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨො තථට්ඨො, පරිඤ්ඤාය පරිඤ්ඤට්ඨො තථට්ඨො, පහානස්ස පහානට්ඨො තථට්ඨො, භාවනාය භාවනට්ඨො තථට්ඨො, සච්ඡිකිරියාය සච්ඡිකිරියට්ඨො තථට්ඨො. ඉමෙහි නවහාකාරෙහි තථට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

---

1. "යං දුක්ඛං තං අනිච්චං" ඉති සීමු PTS, පොත්ථකෙසු න දිස්සති
2. කතිහාකාරෙහි - මජසං, සීමු,

කිසෙයින් සත්‍යාර්ථයෙන් සතර සත්‍යයෝ ඒකප්‍රතිවෙධ වෙති යත්: සතර අයුරෙකින් සත්‍යාර්ථයෙන් සතර සත්‍යයෝ ඒකප්‍රතිවෙධ වෙති: දුඃඛයාගේ දුඃඛස්වභාවය සත්‍යාර්ථ යෑ, සමුදයාගේ සමුදයස්වභාවය සත්‍යාර්ථ යෑ, නිරොධයාගේ නිරොධස්වභාවය සත්‍යාර්ථ යෑ, මාර්ගයාගේ මාර්ගස්වභාවය සත්‍යාර්ථ යෑ. මේ සතර අයුරින් සත්‍යාර්ථයෙන් සතර සත්‍යයෝ එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලදහ. යම් හෙයකින් එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරන ලද ද, එහෙයින් එකත්ව වෙයි. එකත්වය එක් ඥානයෙන් ප්‍රතිවෙධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති.

කිසෙයින් ප්‍රතිවෙධ කළයුතු අර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති යත්: සතර අයුරෙකින් ප්‍රතිවෙධ කළයුතු අර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති: දුඃඛයාගේ දුඃඛස්වභාවය ප්‍රතිවෙධාර්ථ යෑ. සමුදයාගේ සමුදයස්වභාවය ප්‍රතිවෙධාර්ථ යෑ නිරොධයාගේ නිරොධස්වභාවය ප්‍රතිවෙධාර්ථ යෑ, මාර්ගයාගේ මාර්ගස්වභාවය ප්‍රතිවෙධාර්ථ යි. මේ සතර අයුරින් ප්‍රතිවෙධ කළයුතු අර්ථයෙන් සතර සත්‍යයෝ එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලදහ. යම් හෙයකින් එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලද ද එහෙයින් එකත්ව වෙයි. එකත්වය එක් ඥානයෙන් ප්‍රතිවෙධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙත්.

කිසෙයින් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති යත්: යමෙක් අනිත්‍ය වේ ද හේ දුඃඛ යෑ, යමෙක් දුඃඛ වේ ද හේ අනිත්‍ය යෑ, යමෙක් අනිත්‍යත් දුඃඛත් වේ ද හේ අනාත්ම යෑ, යමෙක් අනිත්‍යත් දුඃඛත් අනාත්මත් වේ ද හේ තථ යෑ, යමෙක් අනිත්‍යත් දුඃඛත් අනාත්මත් තථත් වේ ද හේ සත්‍ය යෑ යමෙක් අනිත්‍යත් දුඃඛත් අනාත්මත් තථත් සත්‍යත් වේ ද හේ ඒකසඞ්ගෘහීත යෑ, යම් හෙයකින් එකසඞ්ගෘහීත වේ ද එහෙයින් ඒකත්ව වෙයි. එකත්වය එක් ඥානයෙන් ප්‍රතිවෙධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එක ප්‍රතිවෙධ වෙත්.

කීහි අයුරෙකින් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති යත්: නව අයුරෙකින් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති: යථාස්වභාවාර්ථයෙන අනාත්මාර්ථයෙන සත්‍යාර්ථයෙන ප්‍රතිවෙධාර්ථයෙන අභිඥෙයාර්ථයෙන පරිඥෙයාර්ථයෙන ප්‍රහාණාර්ථයෙන භාවනාර්ථයෙන සාක්ෂාත්ක්‍රියාර්ථයෙනි. මේ නව අයුරින් සතර සත්‍යයෝ ඒකසඞ්ගෘහීත වෙති. යම් හෙයකින් ඒකසඞ්ගෘහීත ද එහෙයින් ඒකත්ව වෙයි. ඒකත්වය එක් ඥානයෙන් ප්‍රතිවෙධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති.

කිසෙයින් යථාස්වභාවාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති යත්: නව අයුරෙකින් යථාස්වභාවාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති: දුඃඛයාගේ දුඃඛස්වභාවය තථාර්ථ යෑ, සමුදයාගේ සමුදයස්වභාවය තථාර්ථ යෑ, නිරොධයාගේ නිරොධස්වභාවය තථාර්ථ යෑ, මාර්ගයාගේ මාර්ගස්වභාවය තථාර්ථ යෑ, අභිඥෙයවගේ අභිඥෙයාර්ථය තථාර්ථ යෑ, පරිඥෙයවගේ පරිඥෙයාර්ථය තථාර්ථ යෑ, ප්‍රහාණයාගේ ප්‍රහාණාර්ථය තථාර්ථ යෑ, භාවනාවගේ භාවනාර්ථය තථාර්ථ යෑ, සාක්ෂාත්ක්‍රියාවගේ සාක්ෂාත්ක්‍රියාර්ථය තථාර්ථ යි. මේ නව අයුරින් යථාස්වභාවාර්ථයෙන් සතර සත්‍යයෝ ඒකසඞ්ගෘහීත වෙති. යම් හෙයෙකින් එකසඞ්ගෘහීත ද එහෙයින් ඒකත්ව වෙයි, ඒකත්වය එක් ඥානයෙන් ප්‍රතිවෙධ කෙරේ නු' යි සතර සත්‍යයෝ ඒකප්‍රතිවෙධ වෙති.

කථං අනතතට්ඨෙන -පෙ- සච්චට්ඨෙන -පෙ- පටිවෙධට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: නවහාකාරෙහි පටිවෙධට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස දුක්ඛට්ඨො පටිවෙධට්ඨො, සමුදයස්ස සමුදයට්ඨො පටිවෙධට්ඨො, නිරොධස්ස නිරොධට්ඨො පටිවෙධට්ඨො, මග්ගස්ස මග්ගට්ඨො පටිවෙධට්ඨො, අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨො පටිවෙධට්ඨො, පරිඤ්ඤාය පරිඤ්ඤට්ඨො පටිවෙධට්ඨො, පහානස්ස පහානට්ඨො පටිවෙධට්ඨො, භාවනාය භාවනට්ඨො පටිවෙධට්ඨො, සච්ඡිකිරියාය සච්ඡිකිරියට්ඨො පටිවෙධට්ඨො. ඉමෙහි නවහාකාරෙහි පටිවෙධට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කතිහාකාරෙහි චත්තාරි සච්චානි එක පටිවෙධානි: ද්වාදසහි ආකාරෙහි චත්තාරි සච්චානි එකපටිවෙධානි; තථට්ඨෙන අනත්තට්ඨෙන සච්චට්ඨෙන පටිවෙධට්ඨෙන අභිජානනට්ඨෙන පරිජානනට්ඨෙන ධම්මට්ඨෙන ධාතුට්ඨෙන[1] ඤාතට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵුසනට්ඨෙන[2] අභිසමයට්ඨෙන. ඉමෙහි ද්වාදසහි ආකාරෙහි චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං තථට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: සොළසහි ආකාරෙහි තථට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස පීළනට්ඨො සඞ්ඛතට්ඨො සන්තාපට්ඨො විපරිනාමට්ඨො තථට්ඨො, සමුදයස්ස ආයූහනට්ඨො නිදානට්ඨො සංයොගට්ඨො පලිබොධට්ඨො තථට්ඨො, නිරොධස්ස නිස්සරණට්ඨො විවෙකට්ඨො අසඞ්ඛතට්ඨො අමතට්ඨො තථට්ඨො, මග්ගස්ස නිය්‍යානට්ඨො හෙතුට්ඨො[3] දස්සනට්ඨො ආධිපතෙය්‍යට්ඨො තථට්ඨො, ඉමෙහි සොළසහි ආකාරෙහි තථට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං අනත්තට්ඨෙන -පෙ- සච්චට්ඨෙන -පෙ- පටිවෙධට්ඨෙන -පෙ- අභිජානනට්ඨෙන -පෙ- පරිජානනට්ඨෙන -පෙ- ධම්මට්ඨෙන -පෙ- ධාතුට්ඨෙන -පෙ- ඤාතට්ඨෙන -පෙ- සච්ඡිකිරියට්ඨෙන -පෙ- ඵුසනට්ඨෙන[2] -පෙ- අභිසමයට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි; සොළසහි ආකාරෙහි අභිසමයට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස පීළනට්ඨො සඞ්ඛතට්ඨො සන්තාපට්ඨො විපරිනාමට්ඨො අභිසමයට්ඨො, සමුදයස්ස ආයූහනට්ඨො නිදානට්ඨො සංයොගට්ඨො පලිබොධට්ඨො අභිසමයට්ඨො, නිරොධස්ස නිස්සරණට්ඨො විවෙකට්ඨො අසඞ්ඛතට්ඨො අමතට්ඨො අභිසමයට්ඨො, මග්ගස්ස නිය්‍යානට්ඨො හෙතුට්ඨො[3] දස්සනට්ඨො ආධිපතෙය්‍යට්ඨො අභිසමයට්ඨො. ඉමෙහි සොළසහි ආකාරෙහි අභිසමයට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි. යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

---

1. තථට්ඨෙන - මජසං, ස්‍යා, සී, PTS  2 ඵස්සනට්ඨෙන - මජසං, ස්‍යා, සී
3. හෙතට්ඨො - ස්‍යා

කිසෙයින් අනාත්මාර්ථයෙන් ... සත්‍යාර්ථයෙන් ... ප්‍රතිවේධ කළයුතු අර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති යත්; නව අයුරෙකින් ප්‍රතිවේධ කළයුතු අර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති: දුඃඛයාගේ දුඃඛාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යෑ, සමුදයාගේ සමුදයාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යෑ, නිරෝධයාගේ නිරෝධාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යෑ, මාර්ගයාගේ මාර්ගාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යෑ, අභිඥාවගේ අභිඥාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යෑ, පරිඥාවගේ පරිඥාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යෑ, ප්‍රහාණයාගේ ප්‍රහාණාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යෑ, භාවනාවගේ භාවනාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යෑ, සාක්ෂාත්ක්‍රියාවගේ සාක්ෂාත්ක්‍රියාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යි. මේ නව අයුරින් ප්‍රතිවේධ කළයුතු අර්ථයෙන් සතර සත්‍යයෝ එකසඞ්ගෘහීත වෙති, යම් හෙයකින් එකසඞ්ගෘහීත වේ ද එහෙයින් එකත්ව වෙයි. එකත්වය එක් ඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙත්.

කිහි අයුරෙකින් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති යත්: දොළොස් අයුරෙකින් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති: යථාස්වභාවාර්ථයෙන අනාත්මාර්ථයෙන සත්‍යාර්ථයෙන ප්‍රතිවේධ කළයුතු අර්ථයෙන අභිජානනාර්ථයෙන පරිජානනාර්ථයෙන ධර්මාර්ථයෙන ධාත්වර්ථයෙන ඥාතාර්ථයෙන සාක්ෂාත්ක්‍රියාර්ථයෙන ස්පර්ශාර්ථයෙන අභිසමයාර්ථයෙනි. මේ දොළොස් අයුරින් සතර සත්‍යයෝ එකසඞ්ගෘහීත වෙති. යම් හෙයකින් එකසඞ්ගෘහීත වේ ද එහෙයින් එකත්ව වෙයි, එකත්වය එක් මාර්ගඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙත්.

කිසෙයින් යථාස්වභාවාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති යත්: සොළොස් අයුරෙකින් යථාස්වභාවාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති: දුඃඛයාගේ පීඩනාර්ථය සඞ්ඛතාර්ථය සන්තාපාර්ථය විපරිණාමාර්ථය යථාස්වභාවාර්ථ වෙයි, සමුදයාගේ ආයූහනාර්ථය නිදානාර්ථය සංයෝගාර්ථය පලිබොධාර්ථය යථාස්වභාවාර්ථ වෙයි, නිරෝධයාගේ නිස්සරණාර්ථය විවේකාර්ථය අසඞ්ඛතාර්ථය අමෘතාර්ථය යථාස්වභාවාර්ථ වෙයි, මාර්ගයාගේ නිර්යාණාර්ථය හෙත්වර්ථය දර්ශනාර්ථය අධිපතිභාවාර්ථය යථාස්වභාවාර්ථ වෙයි. මේ සොළොස් අයුරින් යථාස්වභාවාර්ථයෙන් සතර සත්‍යයෝ එකසඞ්ගෘහීත වෙති, යම් හෙයකින් එකසඞ්ගෘහීත වේ ද එහෙයින් එකත්ව වෙයි. එකත්වය එක්මාර්ගඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති.

කිසෙයින් අනාත්මාර්ථයෙන් ... සත්‍යාර්ථයෙන් ... ප්‍රතිවේධාර්ථයෙන් ... අභිජානනාර්ථයෙන් ... පරිජානනාර්ථයෙන් ... ධර්මාර්ථයෙන් ... ධාත්වර්ථයෙන් ... ඥාතාර්ථයෙන් ... සාක්ෂාත්ක්‍රියාර්ථයෙන් ... ස්පර්ශාර්ථයෙන් ... අභිසමයාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙත් ද යත්: සොළොස් අයුරෙකින් අභිසමයාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති: දුඃඛයාගේ පීඩනාර්ථය සඞ්ඛතාර්ථය සන්තාපාර්ථය විපරිණාමාර්ථය අභිසමයාර්ථ (ප්‍රත්‍යවේක්ෂණඥානයෙන් අවබෝධ කටයුතු) අර්ථය වෙයි. සමුදයාගේ ආයූහනාර්ථය නිදානාර්ථය සංයෝගාර්ථය පලිබොධාර්ථය අභිසමයාර්ථ වෙයි, නිරෝධයාගේ නිස්සරණාර්ථය විවේකාර්ථය අසඞ්ඛතාර්ථය අමෘතාර්ථය අභිසමයාර්ථ වෙයි, මාර්ගයාගේ නිර්යාණාර්ථය හෙත්වර්ථය දර්ශනාර්ථය අධිපතිභාවාර්ථය අභිසමයාර්ථ වෙයි. මේ සොළොස් අයුරින් අභිසමයාර්ථයෙන් සතර සත්‍යයෝ එකසඞ්ගෘහීත වෙති. යම් හෙයකින් එකසඞ්ගෘහීත වේ ද එහෙයින් එකත්ව වෙයි, එකත්වය එක් මාර්ගඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙත්.

සච්චානං[1] කති ලක්ඛණානි: සච්චානං ද්වෙ ලක්ඛණානි: සඞ්ඛත ලක්ඛණඤ්ච අසඞ්ඛතලක්ඛණඤ්ච. සච්චානං ඉමානි ද්වෙ ලක්ඛණානි.

සච්චානං කති ලක්ඛණානි: සච්චානං ඡ ලක්ඛණානි: සඞ්ඛතානං සච්චානං උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතානං අඤ්ඤථත්තං පඤ්ඤායති. අසඞ්ඛතස්ස සච්චස්ස න උප්පාදො පඤ්ඤායති, න වයො පඤ්ඤායති, න ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. සච්චානං ඉමානි ඡ ලක්ඛණානි.

සච්චානං කති ලක්ඛණානි: සච්චානං ද්වාදස ලක්ඛණානි: දුක්ඛසච්චස්ස උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. සමුදයසච්චස්ස උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. මග්ගසච්චස්ස උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. නිරොධසච්චස්ස න උප්පාදො පඤ්ඤායති, න වයො පඤ්ඤායති, න ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. සච්චානං ඉමානි ද්වාදස ලක්ඛණානි.

චතුන්නං සච්චානං කති කුසලා, කති අකුසලා, කති අබ්‍යාකතා: සමුදයසච්චං අකුසලං, මග්ගසච්චං කුසලං, නිරොධසච්චං අබ්‍යාකතං, දුක්ඛසච්චං සියා කුසලං, සියා අකුසලං, සියා අබ්‍යාකතං.

සියා තීණි සච්චානි එකසච්චෙන සඞ්ගහිතානි, එකසච්චං තීහි සච්චෙහි සඞ්ගහිතං වත්ථුවසෙන පරියායෙන.

**සියාති** කථඤ්ච සියා: යං දුක්ඛසච්චං අකුසලං සමුදයසච්චං අකුසලං, එවං අකුසලට්ඨෙන ද්වෙ සච්චානි එකසච්චෙන සඞ්ගහිතානි, එකසච්චං ද්වීහි සච්චෙහි සඞ්ගහිතං. යං දුක්ඛසච්චං කුසලං, මග්ගසච්චං කුසලං, එවං කුසලට්ඨෙන ද්වෙ සච්චානි එකසච්චෙන සඞ්ගහිතානි, එකසච්චං ද්වීහි සච්චෙහි සඞ්ගහිතං. යං දුක්ඛසච්චං අබ්‍යාකතං, නිරොධසච්චං අබ්‍යාකතං, එවං අබ්‍යාකතට්ඨෙන ද්වෙ සච්චානි එකසච්චෙන සඞ්ගහිතානි, එකසච්චං ද්වීහි සච්චෙහි සඞ්ගහිතං එවං සියා තීණි සච්චානි එකසච්චෙන සඞ්ගහිතානි, එකසච්චං තීහි සච්චෙහි සඞ්ගහිතං වත්ථුවසෙන පරියායෙනාති.

1. සච්චානි - සී 1, 3

සත්‍යයන්ගේ ලක්‍ෂණයෝ කෙතෙක යත්: සත්‍යයන්ගේ ලක්‍ෂණ දෙකෙකි: සඞ්ඛතලක්‍ෂණ යැ අසඞ්ඛතලක්‍ෂණ යැ යි. මොහු සත්‍යයන්ගේ දෙ ලක්‍ෂණයෝ යි.

සත්‍යයන්ගේ ලක්‍ෂණයෝ කෙතෙක යත්: සත්‍යයන්ගේ ලක්‍ෂණයෝ සදෙනෙකි: සඞ්ඛත සත්‍යයන්ගේ උත්පාදය පැනෙයි, විනාශය පැනෙයි, ස්ථිතිප්‍රාප්තයන්ගේ අන්‍යථාභාව සඞ්ඛ්‍යාත ජරාව පැනෙයි. අසඞ්ඛතසත්‍යයාගේ උත්පාදය නො පැනෙයි, විනාශය නො පැනෙයි, නිත්‍යත්වයෙන් සිටියහුගේ අන්‍යථාභාවය නො පැනේ. මොහු සත්‍යයන්ගේ ස ලක්‍ෂණයෝ යි.

සත්‍යයන්ගේ ලක්‍ෂණයෝ කෙතෙක යත්: සත්‍යයන්ගේ ලක්‍ෂණ දොළොසෙකි: දුඃඛසත්‍යයාගේ උත්පාදය පැනෙයි, විනාශය පැනෙයි, සිටියහුගේ අන්‍යථාභාවය පැනෙයි, සමුදයසත්‍යයාගේ උත්පාදය පැනෙයි, විනාශය පැනෙයි, සිටියහුගේ අන්‍යථාභාවය පැනෙයි, මාර්ගසත්‍යයාගේ උත්පාදය පැනෙයි, විනාශය පැනෙයි, සිටියහුගේ අන්‍යථාභාවය පැනෙයි, නිරොධසත්‍යයාගේ උත්පාදය නො පැනෙයි, විනාශය නො පැනෙයි. නිත්‍යත්වයෙන් සිටියහුගේ අන්‍යථාභාවය නො පැනේ. මොහු සත්‍යයන්ගේ දොළොස් ලක්‍ෂණයෝ යි.

සතර සත්‍යයන් අතුරෙහි කුශලයෝ කෙතෙක් ද, අකුශලයෝ කෙතෙක් ද, අව්‍යාකෘතයෝ කෙතෙක් ද යත්: සමුදයසත්‍යය අකුශල යැ, මාර්ගසත්‍යය කුශල යැ, නිරොධසත්‍යය අව්‍යාකෘත යැ, දුඃඛසත්‍යය කුශල ද වන්නේ යැ, අකුශල ද වන්නේ යැ, අව්‍යාකෘත ද වන්නේ යි.

වස්තු වශයෙන් පර්‍ය්‍යායයෙන් සත්‍යයෝ තිදෙනෙක් එක් සත්‍යයෙකින් ගණනාලදහු ද වන්නාහ, එක් සත්‍යයෙක් තුන් සත්‍යයෙකින් ගණනාලද ද වන්නේ යි.

සියා යනු; කිසෙයින් වන්නේ යැ යත්. යම් අකුශල වූ දුඃඛසත්‍යයෙක් වේ ද අකුශල වූ සමුදයසත්‍යයෙක් වේ ද, මෙසෙයින් අකුශලාර්ථයෙන් සත්‍යයෝ දෙදෙනෙක් එක් සත්‍යයෙකින් ගණනාලදහ, එක් සත්‍යයෙක් සත්‍යදෙකෙකින් ගණනාලද යැ. යම් කුශල වූ දුඃඛසත්‍යයෙක් වේ ද කුශල වූ මාර්ගසත්‍යයෙක් වේ ද, මෙසෙයින් කුශලාර්ථයෙන් සත්‍යයෝ දෙදෙනෙක් එක් සත්‍යයෙකින් ගණනාලදහ. එක් සත්‍යයෙක් සත්‍ය දෙකෙකින් ගණනාලද යැ. යම් අව්‍යාකෘත වූ දුඃඛසත්‍යයෙක් වේ ද අව්‍යාකෘත වූ නිරොධසත්‍යයෙක් වේ ද, මෙසෙයින් අව්‍යාකෘතාර්ථයෙන් සත්‍යයෝ දෙදෙනෙක් එක් සත්‍යයෙකින් ගණනාලදහ. එක් සත්‍යයෙක් සත්‍ය දෙකෙකින් ගණනා ලද යැ. මෙසෙයින් වස්තුවශයෙන් පර්‍ය්‍යායයෙන් සත්‍යයෝ තිදෙනෙක් එක් සත්‍යයෙකින් ගණනා ලදහ. එක් සත්‍යයෙක් තුන් සත්‍යයෙකින් ගණනාලද්ද යි.

[ සාවත්ථිනිදානං: ]

"පුබ්බෙව[1] මෙ භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: කො නු ඛො රූපස්ස අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණං, කො වෙදනාය අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණං. කො සඤ්ඤාය අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණං. කො සඞ්ඛාරානං අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණං. කො විඤ්ඤාණස්ස අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණන්ති. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: 'යං ඛො රූපං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං රූපස්ස අස්සාදො. යං රූපං අනිච්චං දුක්ඛං.[2] විපරිණාමධම්මං, අයං රූපස්ස ආදීනවො. යො රූපස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං රූපස්ස නිස්සරණං. යං වෙදනං පටිච්ච -පෙ- යං සඤ්ඤං පටිච්ච -පෙ- යං සඞ්ඛාරෙ පටිච්ච -පෙ- යං විඤ්ඤාණං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං. අයං විඤ්ඤාණස්ස අස්සාදො, යං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං[2]. විපරිණාමධම්මං, අයං විඤ්ඤාණස්ස ආදීනවො. යො විඤ්ඤාණස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං විඤ්ඤාණස්ස නිස්සරණං.

යාවකීවඤ්චාහං භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං එවං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤාසිං, නෙව තාවාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය 'අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති[3]. පච්චඤ්ඤාසිං. යතො ච ඛ්වාහං භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං එවං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤාසිං, අථාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය 'අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: 'අකුප්පා මෙ චෙතොවිමුත්ති.[4] අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවො''ති [a].

යං රූපං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං රූපස්ස අස්සාදොති පහානපටිවෙධො, සමුදයසච්චං. යං රූපං අනිච්චං දුක්ඛං[2] විපරිණාමධම්මං අයං රූපස්ස ආදීනවො'ති පරිඤ්ඤාපටිවෙධො දුක්ඛසච්චං. යො රූපස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං රූපස්ස නිස්සරණන්ති සච්ඡිකිරියාපටිවෙධො නිරොධසච්චං. යා ඉමෙසු තීසු ඨානෙසු දිට්ඨි සඞ්කප්පො වාචා කම්මන්තො ආජීවො වායාමො සති සමාධි භාවනාපටිවෙධො මග්ගසච්චං.

යං වෙදනං පටිච්ච -පෙ- යං සඤ්ඤං පටිච්ච -පෙ- යං සඞ්ඛාරෙ පටිච්ච -පෙ- යං විඤ්ඤාණං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං විඤ්ඤාණස්ස අස්සාදො'ති පහානපටිවෙධො සමුදයසච්චං. යං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං[2] විපරිණාමධම්මං අයං විඤ්ඤාණස්ස ආදීනවො'ති පරිඤ්ඤාපටිවෙධො දුක්ඛසච්චං. යො විඤ්ඤාණස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං විඤ්ඤාණස්ස නිස්සරණන්ති සච්ඡිකිරියා පටිවෙධො නිරොධසච්චං. යා ඉමෙසු තීසු ඨානෙසු දිට්ඨි සඞ්කප්පො වාචා කම්මන්තො ආජීවො වායාමො සති සමාධි භාවනාපටිවෙධො මග්ගසච්චං.

---

1. පුබ්බෙ - මජසං, සයා, සී, PTS, ස.   2. තං දුක්ඛං - මජසං.
3. අභිසම්බුද්ධො - සයා, PTS.   4. අකුප්පා මෙ විමුත්ති - මජසං.
a ඛන්ධසංයුත්ත - භාරවග්ග.

[සැවැත්නිදාන යි:]

“මහණෙනි, සම්බෝධියෙන් පෙර මා සම්බුද්ධයන් ප්‍රතිවෙධ නො කළ බෝධිසත්ත්ව වූ මා මට මෙ බඳු පරිවිතර්කයෙක් විය: රූපයාගේ ආස්වාද කවරැ, ආදීනව කවරැ, නිස්සරණ කවරැ, වෙදනාවගේ ආස්වාද කවරැ, ආදීනව කවරැ, නිස්සරණ කවරැ. සංඥවගේ ආස්වාද කවරැ, ආදීනව කවරැ, නිස්සරණ කවරැ. සංස්කාරයන්ගේ ආස්වාද කවරැ, ආදීනව කවරැ, නිස්සරණ කවරැ. විඥනයාගේ ආස්වාද කවරැ, ආදීනව කවරැ. නිස්සරණ කවරෙයැ’යි. මහණෙනි, ඒ මට මෙ බඳු සිතෙක් විය: රූපය පිණිස යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මේ රූපයාගේ ආස්වාද වෙයි. යම් රූපයෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව ඇත්තේ වේ ද මේ රූපයාගේ ආදීනව වෙයි. රූපයෙහි යම් ඡන්දරාග සංවරණයෙක් ඡන්දරාගයාගේ දුරු කිරීමෙක් වේ ද මේ රූපයාගේ නිස්සරණය වෙයි. වෙදනාව පිණිස යම් ... සංඥව පිණිස යම් ... සංස්කාරයන් පිණිස යම් ... විඥනය පිණිස යම් සුවයෙක් සොම්නසෙක් වේ ද, මේ විඥනයාගේ ආස්වාද වෙයි, යම් විඥනයෙක් අනිත්‍ය දුඃඛ විපරිණාම ස්වභාව වේ ද, මේ විඥනයාගේ ආදීනව වෙයි. විඥනයෙහි යම් ඡන්දරාගසංවරණයෙක් ඡන්දරාගයාගේ දුරු කිරීමෙක් වේ ද, මේ විඥනයාගේ නිස්සරණය වේ.

මහණෙනි, යම්තාක් මම මේ පඤ්චොපාදානස්කන්ධයන් ගේ මෙසෙයින් ආස්වාදය ද ආස්වාද හෙයින් ආදීනවය ද ආදීනව හෙයින් නිස්සරණය ද නිස්සරණ හෙයින් ඇති සැටියෙන් ප්‍රතිවෙධ නො කෙළෙම් ද, මහණෙනි මම ඒ තාක් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත අවකාශලොකයෙහි මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්ත්වලොකයෙහි ‘නිරුත්තර වූ සම්‍යක් සම්බොධිය ප්‍රතිවෙධ කෙළෙමි’ නො මැ පිළිත කෙළෙමි. වැළිත් මහණෙනි, යම් කලෙක මම මේ පඤ්චොපාදානස්කන්ධයන් ගේ මෙසෙයින් ආස්වාදය ද ආස්වාද හෙයින් ආදීනවය ද ආදීනව හෙයින් නිස්සරණය ද නිස්සරණ හෙයින් ඇති සැටියෙන් ප්‍රතිවෙධ කෙළෙම් ද, මහණෙනි, එකල්හි මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත අවකාශලොකයෙහි මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්ත්වලොකයෙහි ‘නිරුත්තර වූ සම්‍යක් සම්බොධිය (සර්වඥතාඥනය) ප්‍රතිවෙධ කෙළෙමි’ පිළිත කෙළෙමි. දර්ශන සඞ්ඛ්‍යාත ප්‍රත්‍යවෙක්ෂණඥනය ද මට උපන. මාගේ අර්හත්ඵල විමුක්තිය අකොප්‍ය වෙයි. මේ පශ්චිම වූ ස්කන්ධප්‍රවෘත්තිය වෙයි. දැන් පුනර්භවයෙක් නැතැ”යි.

රූපය පිණිස යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මේ රූපයාගේ ආස්වාද ය’යි ප්‍රහාණ ප්‍රතිවෙධය සමුදයසත්‍ය වෙයි. යම් රූපයෙක් අනිත්‍ය දුඃඛ විපරිණාම ස්වභාව වේ ද මේ රූපයාගේ ආදීනව ය’යි පරිඥප්‍රතිවෙධය දුඃඛසත්‍ය වෙයි. රූපයෙහි යම් ඡන්දරාගසංවරණයෙක් ඡන්දරාගයාගේ දුරු කිරීමෙක් වේ ද මේ රූපයාගේ නිස්සරණ යැයි සාක්ෂාත්ක්‍රියා ප්‍රතිවෙධය නිරොධසත්‍ය වේ. මේ තුන් තැන්හි යම් දෘෂ්ටියක් සඞ්කල්පයෙක් වචනයෙක් කර්මාන්තයෙක් ආජීවයෙක් ව්‍යායාමයෙක් ස්මෘතියක් සමාධියෙක් වේ ද (මේ මාර්ගභාවනා සඞ්ඛ්‍යාත) මාර්ගසත්‍යප්‍රතිවෙධය මාර්ගසත්‍ය වේ.

වෙදනාව පිණිස යම් (සුවයෙක්) ... සංඥව පිණිස යම්... සංස්කාරයන් පිණිස යම් ... විඥනය පිණිස යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මේ විඥනයාගේ ආස්වාදය’යි ප්‍රහාණප්‍රතිවෙධය සමුදයසත්‍ය වෙයි. යම් විඥනයෙක් අනිත්‍ය දුඃඛ විපරිණාම ස්වභාව වේ ද මේ විඥනයාගේ ආදීනවය’යි පරිඥප්‍රතිවෙධය දුඃඛසත්‍ය වෙයි. විඥනයෙහි යම් ඡන්දරාගවිනයෙක් ඡන්දරාගප්‍රහාණයෙක් ඇද්ද මේ විඥනයාගේ නිස්සරණ යැ’යි සාක්ෂාත්ක්‍රියාප්‍රතිවෙධය නිරොධසත්‍යය වේ. මේ තුන්තැන්හි යම් දෘෂ්ටියක් සඞ්කල්පයෙක් වචනයෙක් කර්මාන්තයෙක් ආජීවයෙක් ව්‍යායාමයෙක් ස්මෘතියක් සමාධියෙක් වේ ද මේ භාවනාප්‍රතිවෙධය මාර්ගසත්‍ය වේ.

සච්චන්ති.[1] කතිහාකාරෙහි සච්චං: එසනට්ඨෙන පරිග්ගහට්ඨෙන පටිවෙධට්ඨෙන.

කථං එසනට්ඨෙන සච්චං; ජරාමරණං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවන්ති එවං එසනට්ඨෙන සච්චං.

ජරාමරණං ජාතිනිදානං, ජාතිසමුදයං, ජාතිජාතිකං ජාතිප්පභවන්ති එවං පරිග්ගහට්ඨෙන සච්චං. ජරාමරණඤ්ච පජානාති, ජරාමරණසමුදයඤ්ච පජානාති, ජරාමරණනිරොධඤ්ච පජානාති, ජරාමරණනිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

ජාති කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවාති එවං එසනට්ඨෙන සච්චං. ජාති භවනිදානා, භවසමුදයා, භවජාතිකා, භවප්පභවා'ති එවං පරිග්ගහට්ඨෙන සච්චං. ජාතිඤ්ච පජානාති, ජාතිසමුදයඤ්ච පජානාති, ජාතිනිරොධඤ්ච පජානාති, ජාතිනිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

භවො කිංනිදානො. කිංසමුදයො, කිංජාතිකො කිංපභවො'ති එවං එසනට්ඨෙන සච්චං. භවො උපාදානනිදානො, උපාදානසමුදයො, උපාදාන-ජාතිකො, උපාදානප්පභවො'ති එවං පරිග්ගහට්ඨෙන සච්චං, භවඤ්ච පජානාති, භවසමුදයඤ්ච පජානාති, භවනිරොධඤ්ච පජානාති, භව-නිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති. එවං පටිවෙධට්ඨෙන සච්චං.

උපාදානං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවන්ති එවං එසනට්ඨෙන සච්චං, උපාදානං තණ්හානිදානං තණ්හාසමුදයං තණ්හා-ජාතිකං, තණ්හාපභවන්ති එවං පරිග්ගහට්ඨෙන සච්චං. උපාදානඤ්ච පජානාති, උපාදානසමුදයඤ්ච පජානාති, උපාදානනිරොධඤ්ච පජානාති, උපාදානනිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති. එවං පටිවෙධට්ඨෙන සච්චං.

තණ්හා කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවා'ති එවං එස-නට්ඨෙන සච්චං. තණ්හා වෙදනානිදානා වෙදනාසමුදයා, වෙදනා ජාතිකා, වෙදනාපභවා'ති එවං පරිග්ගහට්ඨෙන සච්චං. තණ්හඤ්ච පජානාති, තණ්හා සමුදයඤ්ච පජානාති, තණ්හානිරොධඤ්ච පජානාති, තණ්හානිරොධගාමිනිං පටිපදඤ්ච[2] පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

1. 'සච්චන්ති' නායිපොත්ථකෙ න දිස්සති
2. ගාමිනිපටිපදඤ්ච - PTS.

සච්චං යනු: කිහි අයුරෙකින් සත්‍ය වෙයි යත්: එෂණාර්ථයෙන පරිග්‍රහාර්ථයෙන ප්‍රතිවේධාර්ථයෙනි.

කිසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි යත්: ජරාමරණය කුමක් නිදාන කොට ඇත්තේ ද කුමක් සමුදය කොට ඇත්තේ ද කුමක් ජාති කොට ඇත්තේ ද කුමක් ප්‍රභව කොට ඇත්තේ ද’යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි.

ජරාමරණය ජාතිය නිදාන කොට ඇත්තේ ය, ජාතිය සමුදය කොට ඇත්තේ ය, ජාතිය ජාති කොට ඇත්තේ ය, ජාතිය ප්‍රභව කොට ඇත්තේ ය’ යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. ජරාමරණය ද දැනගනියි, ජරාමරණසමුදය ද දැනගනියි, ජරාමරණනිරොධය ද දැනගනියි, ජරාමරණනිරොධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්ථයෙන් සත්‍ය වේ.

ජාතිය කුමක් නිදාන කොට ඇත්තී ද, කුමක් සමුදය කොට ඇත්තී ද, කුමක් ජාති කොට ඇත්තී ද, කුමක් ප්‍රභව කොට ඇත්තී ද’ යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි. ජාතිය භවය නිදාන කොට ඇත්තී ය, භවය සමුදය කොට ඇත්තී ය, භවය ජාති කොට ඇත්තී ය, භවය ප්‍රභව කොට ඇත්තී ය’ යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. ජාතිය ද දැනගනියි, ජාතිසමුදය ද දැනගනියි, ජාතිනිරොධය ද දැනගනියි, ජාතිනිරොධගාමිනී ප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්ථයෙන් සත්‍ය වේ.

භවය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද’ යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි, භවය උපාදානය නිදාන කොට ඇත්තේ ය, උපාදානය සමුදය කොට ඇත්තේ ය, උපාදානය ජාති කොට ඇත්තේ ය, උපාදානය ප්‍රභව කොට ඇත්තේ ය’ යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි, භවය ද දැනගනියි, භවසමුදය ද දැනගනියි, භවනිරොධය ද දැනගනියි, භවනිරොධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්ථයෙන් සත්‍ය වේ.

උපාදානය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද’ යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි, උපාදානය තෘෂ්ණාව නිදාන කොට ඇත්තේ ය, තෘෂ්ණාව සමුදය කොට ඇත්තේ ය, තෘෂ්ණාව ජාති කොට ඇත්තේ ය, තෘෂ්ණාව ප්‍රභව කොට ඇත්තේ ය’ යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. උපාදානය ද දැනගනියි, උපාදානසමුදය ද දැනගනියි, උපාදාන නිරොධය ද දැනගනියි, උපාදානනිරොධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්ථයෙන් සත්‍ය වේ.

තෘෂ්ණාව කුමක් නිදාන කොට ඇත්තී ද, කුමක් සමුදය කොට ඇත්තී ද, කුමක් ජාති කොට ඇත්තී ද, කුමක් ප්‍රභව කොට ඇත්තී ද’ යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි. තෘෂ්ණාව වේදනාව නිදාන කොට ඇත්තී ය, වේදනාව සමුදය කොට ඇත්තී ය, වේදනාව ජාති කොට ඇත්තී ය, වේදනාව ප්‍රභව කොට ඇත්තී ය’ යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. තෘෂ්ණාව ද දැනගනියි, තෘෂ්ණාසමුදය ද දැනගනියි, තෘෂ්ණානිරොධය ද දැනගනියි, තෘෂ්ණානිරොධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්ථයෙන් සත්‍ය වේ.

වෙදනා කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවාති එවං එසනට්ඨෙන සච්චං, වෙදනා ඵස්සනිදානා ඵස්සසමුදයා, ඵස්සජාතිකා, ඵස්සපභවාති,[1] එවං පරිග්ගහට්ඨෙන සච්චං, වෙදනඤ්ච පජානාති, වෙදනාසමුදයඤ්ච පජානාති, වෙදනානිරොධඤ්ච පජානාති, වෙදනානිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

ඵස්සො කිංනිදානො කිංසමුදයො, කිංජාතිකො, කිංපභවොති එවං එසනට්ඨෙන සච්චං. ඵස්සො සළායතනනිදානො, සළායතනසමුදයො, සළායතනජාතිකො, සළායතනපභවොති එවං පරිග්ගහට්ඨෙන සච්චං. ඵස්සඤ්ච පජානාති, ඵස්සසමුදයඤ්ච පජානාති, ඵස්සනිරොධඤ්ච පජානාති, ඵස්සනිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

සළායතනං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවනති එවං එසනට්ඨෙන සච්චං. සළායතනං නාමරූපනිදානං' නාමාරූපසමුදයං, නාමරූපජාතිකං, නාමරූපපභවනති එවං පරිග්ගහට්ඨෙන සච්චං. සළායතනඤ්ච පජානාති, සළායතනසමුදයඤ්ච පජානාති, සළායතනනිරොධඤ්ච පජානාති, සළායතනනිරොධගාමිනිංපටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

නාමරූපං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං කිංපභවනති එවං එසනට්ඨෙන සච්චං. නාමරූපං විඤ්ඤාණනිදානං, විඤ්ඤාණසමුදයං, විඤ්ඤාණජාතිකං, විඤ්ඤාණපභවනති එවං පරිග්ගහට්ඨෙන සච්චං. නාමරූපඤ්ච පජානාති, නාමරූපසමුදයඤ්ච පජානාති, නාමරූපනිරොධඤ්ච පජානාති, නාමරූපනිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

විඤ්ඤාණං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවනති එවං එසනට්ඨෙන සච්චං. විඤ්ඤාණං සඞ්ඛාරනිදානං, සඞ්ඛාරසමුදයං, සඞ්ඛාරජාතිකං, සඞ්ඛාරපභවනති එවං පරිග්ගහට්ඨෙන සච්චං, විඤ්ඤාණඤ්ච පජානාති, විඤ්ඤාණසමුදයඤ්ච පජානාති, විඤ්ඤාණනිරොධඤ්ච පජානාති, විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

---

1. ඵස්සපපභවාති - මජසං.

වේදනාව කුමක් නිදාන කොට ඇත්තී ද, කුමක් සමුදය කොට ඇත්තී ද, කුමක් ජාති කොට ඇත්තී ද, කුමක් ප්‍රභව කොට ඇත්තී දැ' යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි. වේදනාව ස්පර්ශය නිදාන කොට ඇත්තී යැ, ස්පර්ශය සමුදය කොට ඇත්තී යැ, ස්පර්ශය ජාති කොට ඇත්තී යැ, ස්පර්ශය ප්‍රභව කොට ඇත්තී යැ' යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. වේදනාව ද දැනගනියි, වේදනාසමුදය ද දැනගනියි, වේදනානිරෝධය ද දැනගනියි, වේදනානිරෝධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්ථයෙන් සත්‍ය වේ.

ස්පර්ශය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ දැ' යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි. ස්පර්ශය ෂඩායතනය නිදාන කොට ඇත්තේ යැ, ෂඩායතනය සමුදය කොට ඇත්තේ යැ, ෂඩායතනය ජාති කොට ඇත්තේ යැ, ෂඩායතනය ප්‍රභව කොට ඇත්තේ යැ' යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. ස්පර්ශය ද දැනගනියි, ස්පර්ශසමුදය ද දැනගනියි, ස්පර්ශනිරෝධය ද දැනගනියි, ස්පර්ශනිරෝධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්ථයෙන් සත්‍ය වේ.

ෂඩායතනය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ දැ' යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි. ෂඩායතනය නාමරූපය නිදාන කොට ඇත්තේ යැ, නාමරූපය සමුදය කොට ඇත්තේ යැ, නාමරූපය ජාති කොට ඇත්තේ යැ, නාමරූපය ප්‍රභව කොට ඇත්තේ යැ' යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. ෂඩායතනය ද දැනගනියි, ෂඩායතනසමුදය ද දැනගනියි, ෂඩායතනනිරෝධය ද දැනගනියි, ෂඩායතන නිරෝධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්ථයෙන් සත්‍ය වේ.

නාමරූපය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ දැ' යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි. නාමරූපය විඥානය නිදාන කොට ඇත්තේ යැ, විඥානය සමුදය කොට ඇත්තේ යැ, විඥානය ජාති කොට ඇත්තේ යැ, විඥානය ප්‍රභව කොට ඇත්තේ යැ' යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. නාමරූපය ද දැනගනියි, නාමරූපසමුදය ද දැනගනියි, නාමරූපනිරෝධය ද දැනගනියි, නාමරූපනිරෝධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්ථයෙන් සත්‍ය වේ.

විඥානය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ දැ' යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි. විඥානය සංස්කාරයන් නිදාන කොට ඇත්තේ යැ, සංස්කාරයන් සමුදය කොට ඇත්තේ යැ, සංස්කාරයන් ජාති කොට ඇත්තේ යැ, සංස්කාරයන් ප්‍රභව කොට ඇත්තේ යැ' යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. විඥානය ද දැනගනියි, විඥානසමුදය ද දැනගනියි, විඥානනිරෝධය ද දැනගනියි, විඥානනිරෝධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්ථයෙන් සත්‍ය වේ.

සඞ්ඛාරා කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවාති එවං එකට්ඨෙන සච්චං. සඞ්ඛාරා අවිජ්ජානිදානා, අවිජ්ජාසමුදයා, අවිජ්ජාජාතිකා, අවිජ්ජාපභවාති එවං පරිග්ගහට්ඨෙන සච්චං. සඞ්ඛාරෙ ච පජානාති, සඞ්ඛාරසමුදයඤ්ච පජානාති, සඞ්ඛාරනිරොධඤ්ච පජානාති, සඞ්ඛාරනිරොධගාමිනී පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

ජරාමරණං දුක්ඛසච්චං, ජාතිසමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා[1] මග්ගසච්චං, ජාති දුක්ඛසච්චං, භවො සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. භවො දුක්ඛසච්චං, උපාදානං සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. උපාදානං දුක්ඛසච්චං, තණ්හා සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. තණ්හා දුක්ඛසච්චං වෙදනා සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. වෙදනා දුක්ඛසච්චං, ඵස්සො සමුදයසච්චං උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. ඵස්සො දුක්ඛසච්චං, සළායතනං සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. සළායතනං දුක්ඛසච්චං, නාමරූපං සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. නාමරූපං දුක්ඛසච්චං, විඤ්ඤාණං සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. විඤ්ඤාණං දුක්ඛසච්චං, සඞ්ඛාරා සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. සඞ්ඛාරා දුක්ඛසච්චං, අවිජ්ජා සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං.

ජරාමරණං දුක්ඛසච්චං, ජාති සියා දුක්ඛසච්චං සියා සමුදයසච්චං,[2] උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. ජාති දුක්ඛසච්චං, භවො සියා දුක්ඛසච්චං සියා සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං -පෙ- සඞ්ඛාරා දුක්ඛසච්චං, අවිජ්ජා සියා දුක්ඛසච්චං, සියා සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චන්ති.[3]

සච්චකථං සමත්තා.

භාණවාරං

---

1 නිරොධප්පජානනා - මජසං, සයා 2. ජරාමරණං සියා දුක්ඛසච්චං සියා සමුදයසච්චං මජසං. ජරාමරණං දුක්ඛසච්චං සියා සමුදයසං - සී 3 'සඞ්ඛාරා දුක්ඛසච්චං' යාවපරියොසානං - මජසං - කත්ථචි සීහළපොත්ථකෙසු ච න දිස්සති

සංස්කාරයෝ කුමක් නිදාන කොට ඇත්තාහු ද, කුමක් සමුදය කොට ඇත්තාහු ද, කුමක් ජාති කොට ඇත්තාහු ද, කුමක් ප්‍රභව කොට ඇත්තාහු ද' යි මෙසෙයින් ඒෂණාර්ථයෙන් සත්‍ය වෙයි. සංස්කාරයෝ අවිද්‍යාව නිදාන කොට ඇත්තාහු යැ, අවිද්‍යාව සමුදය කොට ඇත්තාහු යැ, අවිද්‍යාව ජාති කොට ඇත්තාහු යැ, අවිද්‍යාව ප්‍රභව කොට ඇත්තාහු යැ' යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. සංස්කාරයන් ද දැනගනියි, සංස්කාරසමුදය ද දැනගනියි, සංස්කාරනිරෝධය ද දැනගනියි, සංස්කාරනිරෝධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්ථයෙන් සත්‍ය වේ.

ජරාමරණය දුඃඛසත්‍ය යැ, ජාතිය සමුදයසත්‍ය යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, (ආලම්බනකරණයෙන්) නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. ජාතිය දුඃඛසත්‍ය යැ, භවය සමුදයසත්‍ය යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. භවය දුඃඛසත්‍ය යැ, උපාදානය සමුදය සත්‍ය යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. උපාදානය දුඃඛ සත්‍ය යැ, තෘෂ්ණාව සමුදයසත්‍ය යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධ සත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. තෘෂ්ණාව දුඃඛසත්‍ය යැ, වේදනාව සමුදයසත්‍ය යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. වේදනාව දුඃඛසත්‍ය යැ, ස්පර්ශය සමුදයසත්‍ය යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. ස්පර්ශය දුඃඛසත්‍ය යැ, ෂඩායතනය සමුදයසත්‍ය යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. ෂඩායතනය දුඃඛසත්‍ය යැ, නාමරූපය සමුදයසත්‍ය යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. නාමරූපය දුඃඛසත්‍ය යැ, විඥානය සමුදයසත්‍ය යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. විඥානය දුඃඛසත්‍ය යැ, සංස්කාරයෝ සමුදයසත්‍ය යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. සංස්කාරයෝ දුඃඛසත්‍ය යැ, අවිද්‍යාව සමුදය සත්‍ය යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි.

ජරාමරණය දුඃඛසත්‍ය යැ, ජාතිය දුඃඛසත්‍ය ද වත්තේ යැ, සමුදය සත්‍ය ද වත්තේ යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. ජාතිය දුඃඛසත්‍ය යැ, භවය දුඃඛසත්‍ය ද වත්තේ යැ, සමුදයසත්‍ය ද වත්තේ යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යැ ... සංස්කාරයෝ දුඃඛසත්‍ය යැ, අවිද්‍යාව දුඃඛසත්‍ය ද වත්තේ යැ, සමුදයසත්‍ය ද වත්තේ යැ, දෙදෙනාගේ මැ නිස්සරණය නිරෝධසත්‍ය යැ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යයි.

**සත්‍යකථා නිමි.**

**භාණවාරයකි.**

# 2. 3

# බොජ්ඣඞ්ගකථා

[ සාවත්ථිනිදානං: ]

'සත්තිමෙ භික්ඛවෙ බොජ්ඣඞ්ගා. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො විරියසම්බොජ්ඣඞ්ගො පීතිසම්බොජ්ඣඞ්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, ඉමෙ ඛො භික්ඛවෙ සත්ත බොජ්ඣඞ්ගා.[a]

බොජ්ඣඞ්ගාති කෙනට්ඨෙන බොජ්ඣඞ්ගා, බොධාය[1] සංවත්තන්තීති බොජ්ඣඞ්ගා, බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනුබුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පටිබුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සම්බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

බුජ්ඣනට්ඨෙන බොජ්ඣඞ්ගා, අනුබුජ්ඣනට්ඨෙන බොජ්ඣඞ්ගා, පටිබුජ්ඣනට්ඨෙන බොජ්ඣඞ්ගා, සම්බුජ්ඣනට්ඨෙන බොජ්ඣඞ්ගා.

බොධෙන්තීති බොජ්ඣඞ්ගා, අනුබොධෙන්තීති බොජ්ඣඞ්ගා, පටිබොධෙන්තීති බොජ්ඣඞ්ගා, සම්බොධෙන්තීති බොජ්ඣඞ්ගා.

බොධනට්ඨෙන බොජ්ඣඞ්ගා, අනුබොධනට්ඨෙන බොජ්ඣඞ්ගා, පටිබොධනට්ඨෙන බොජ්ඣඞ්ගා, සම්බොධනට්ඨෙන බොජ්ඣඞ්ගා.

බොධිපක්ඛියට්ඨෙන බොජ්ඣඞ්ගා, අනුබොධිපක්ඛියට්ඨෙන බොජ්ඣඞ්ගා, පටිබොධිපක්ඛියට්ඨෙන බොජ්ඣඞ්ගා, සම්බොධිපක්ඛියට්ඨෙන බොජ්ඣඞ්ගා.

බුද්ධිලාභට්ඨෙන[2] බොජ්ඣඞ්ගා බුද්ධිපටිලාභට්ඨෙන[3] බොජ්ඣඞ්ගා, බුද්ධිරොපනට්ඨෙන බොජ්ඣඞ්ගා, බුද්ධිඅභිරොපනට්ඨෙන බොජ්ඣඞ්ගා, බුද්ධිපාපනට්ඨෙන[4] බොජ්ඣඞ්ගා, බුද්ධිසම්පාපනට්ඨෙන බොජ්ඣඞ්ගා.

මූලට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපරිපූරට්ඨෙන[5] බොජ්ඣඞ්ගා, මූලපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

හෙතුට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපරිපාකට්ඨෙන බොඞ්ගඞ්ගා, හෙතුපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

---

a බොජ්ඣඞ්ගසංයුත්ත
1 බොධියා - සයා
2 බුද්ධිලභනට්ඨෙන - මජසං, ස.
3 බුද්ධිපටිලභනට්ඨෙන - මජසං,
4 පාපුණනට්ඨෙන - මජසං. ස. පාපනට්ඨෙන - සී
5 පරිපූරණට්ඨෙන - මජසං, ස.

## 2. 3

# බොධ්‍යඞ්ග කථා

[ සැවැත්නිදාන යි: ]

‘මහණෙනි, මේ බොධ්‍යඞ්ගයෝ සත් දෙනෙකි: කවර සත්දෙනෙකැ යත්: ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ ධර්මවිචයසම්බොධ්‍යඞ්ග යැ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග යැ ප්‍රීතිසම්බොධ්‍යඞ්ග යැ ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ග යැ සමාධිසම්බොධ්‍යඞ්ග යැ උපෙක්‍ෂා සම්බොධ්‍යඞ්ග යි. මහණෙනි, මොහු සත්දෙන බොධ්‍යඞ්ගයෝ යි.

බොජ්ඣඞ්ගා යනු කවර අරුතින් බොධ්‍යඞ්ග වෙති යත්: අවබොධය පිණිස පවතිත් නු’යි බොධ්‍යඞ්ග යැ අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, අනුබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, ප්‍රතිබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, මොනොවට අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

අවබොධ කිරීම් අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනුබොධ කිරීම් අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රතිබොධ කිරීම් අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, සම්බොධ කිරීම් අර්ථයෙන් බොධ්‍යඞ්ග යි.

අවබොධ කරවත් නු’යි බොධ්‍යඞ්ග යැ, අනුබොධ කරවත් නු’යි බොධ්‍යඞ්ග යැ, ප්‍රතිබොධ කරවත් නු’ යි බොධ්‍යඞ්ග යැ සම්බොධය කරවත් නු’යි බොධ්‍යඞ්ග යි.

අවබොධ කරවීම් අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනුබොධ කරවීම් අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රතිබොධ කරවීම් අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, සම්බොධ කරවීම් අර්ථයෙන් බොධ්‍යඞ්ග යි.

බොධිපාක්‍ෂිකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනුබොධිපාක්‍ෂිකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රතිබොධිපාක්‍ෂිකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, සම්බොධිපාක්‍ෂිකාර්ථයෙන් බොධ්‍යඞ්ග යි.

බුද්ධිලාභාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, බුද්ධිප්‍රතිලාභාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, බුද්ධිප්‍රතිෂ්ඨාපනාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, බුද්ධිඅභිරොපණාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, බුද්ධිපාපුණනාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, බුද්ධිසම්පාපුණනාර්ථයෙන් බොධ්‍යඞ්ග යි.

මූලාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, මුල් වැ පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූලපරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූලපරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූලපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, (නිෂ්ඨාවට පැමිණීම් වශයෙන්) මූලපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූල ප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූල ප්‍රතිසංවිදාවට පැමිණවීම් අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූලප්‍රතිසංවිද්ධි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූලප්‍රතිසංවිද්ධි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

(ජනක බැවින්) හේත්වර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු වියින් පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු පරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු පරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු පරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු පරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු ප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු ප්‍රතිසංවිදාවට පමුණුවනා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු ප්‍රතිසංවිද්ධි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු ප්‍රතිසංවිද්ධි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති,

පච්චයට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

විසුද්ධට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

අනවජ්ජට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජ පරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

නෙක්ඛම්මට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

විමුත්තට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා විමුත්තිපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

අනාසවට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

(උපසම්භක බැවින්) ප්‍රත්‍යයාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යය වැ පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යයපරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යය පරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යයපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යයපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යයප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යයප්‍රතිසංවිදවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යයප්‍රතිසංවිද්හි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යයප්‍රතිසංවිද්හි වශීභාවයට පැමිණියවුන් ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

විශුද්ධාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විශුද්ධ වැ පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විශුද්ධිපරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විශුද්ධිපරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විශුද්ධිපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විශුද්ධිපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විශුද්ධිප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විශුද්ධිප්‍රතිසංවිදවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විශුද්ධිප්‍රතිසංවිද්හි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විශුද්ධිප්‍රතිසංවිද්හි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

අනවද්‍යාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනවද්‍ය වැ පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනවද්‍යපරිග්‍රහායෙන් බොධ්‍යඞ්ග යැ, අනවද්‍ය පරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනවද්‍ය පරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනවද්‍යපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනවද්‍ය ප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනවද්‍යප්‍රතිසංවිදවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනවද්‍ය ප්‍රතිසංවිද්හි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනවද්‍ය ප්‍රතිසංවිද්හි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

නෛෂ්ක්‍රම්‍යාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍ය විසින් පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍යපරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍යපරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍ය පරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍ය පරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍යප්‍රතිසංවිදවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිසංවිද්හි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිසංවිද්හි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

විමුක්ත්‍යර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විමුක්ති විසින් පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විමුක්ති පරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විමුක්තිපරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ විමුක්තිපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විමුක්තිපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විමුක්ති ප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විමුක්ති ප්‍රතිසංවිදවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විමුක්තිප්‍රතිසංවිද්හි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විමුක්තිප්‍රතිසංවිද්හි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

අනාස්‍රවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනාස්‍රව වැ පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනාස්‍රවපරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනාස්‍රවපරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනාස්‍රවපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනාස්‍රවපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනාස්‍රවප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනාස්‍රවප්‍රතිසංවිදවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ අනාස්‍රවප්‍රතිසංවිද්හි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනාස්‍රවප්‍රතිසංවිද්හි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

විවෙකට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

වොස්සග්ගට්ඨෙන[1], බොජ්ඣඞ්ගා, වොස්සග්ගචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

මූලට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, හෙතුට්ඨං[2] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පච්චයට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විසුද්ධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනවජ්ජට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමුත්තට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනාසවට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විවෙකට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වොස්සග්ගට්ඨං[3] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

මූලචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, හෙතුචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පච්චයචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විසුද්ධිචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනවජ්ජචරියට්ඨං, බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමුත්තිචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනාසවචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විවෙකචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වොස්සග්ගචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

මූලපරිග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වොස්සග්ගපරිග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මූලපරිවාරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වොස්සග්ගපරිවාරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මූලපරිපූරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, -පෙ- වොස්සග්ගපරිපූරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මූලපරිපාකට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වොස්සග්ගපරිපාකට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වොස්සග්ගපටිසම්භිදට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදාපාපනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වොස්සග්ගපටිසම්භිදාපාපනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදාය වසීභාවට්ඨං[4] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වොස්සග්ගපටිසම්භිදාය වසීභාවට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

---

1. වොසග්ගට්ඨෙන - මජසං,
2. හෙතට්ඨං - සයා
3. වොසග්ගට්ඨං - මජසං.
4. වසීභාවකට්ඨං - PTS

විවෙකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙක විසින් පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙක පරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙක පරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙකපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙකපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙක ප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙකප්‍රතිසංවිදුවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙක ප්‍රතිසංවිද්ධි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙකප්‍රතිසංවිද්ධි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ග වෙති.

ව්‍යවසර්ග (හැරපීම්) අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ග විසින් පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගපරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ග පරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ග ප්‍රතිසංවිදුවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ග ප්‍රතිසංවිද්ධි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගප්‍රතිසංවිද්ධි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙත්.

මූලාර්ථය (මූලස්වභාවය) අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, හේත්වර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යයාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විශුද්ධ්‍යර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, අනවද්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විමුක්ත්‍යර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, අනාශ්‍රවාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විවෙකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

මූලචර්යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, හෙතුචර්යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යයචර්යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විශුද්ධිචර්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, අනවද්‍යචර්යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍යචර්යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විමුක්තිචර්යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, අනාශ්‍රවචර්යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විවෙකචර්යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගචර්යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

මූලපරිග්‍රහාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ව්‍යවසර්ගපරිග්‍රහාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, මූලපරිවාරාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ව්‍යවසර්ගපරිවාරාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, මූලපරිපූරාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ව්‍යවසර්ගපරිපූරාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, මූලපරිපාකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ව්‍යවසර්ගපරිපාකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, මූලප්‍රතිසංවිදර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ව්‍යවසර්ගප්‍රතිසංවිදර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ. මූලප්‍රතිසංවිදුවට පමුණුවන අර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ .. ව්‍යවසර්ගප්‍රතිසංවිදුවට පමුණුවන අර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ. මූලප්‍රතිසංවිද්ධි වශීභාවාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ව්‍යවසර්ගප්‍රතිසංවිද්ධි වශීභාවාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

පරිග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පරිවාරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පරිපූරට්ඨං[1] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකග්ගට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අවික්ඛෙපට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අවිසාරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනාවිලට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනිඤ්ජනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තුපට්ඨානවසෙන චිත්තස්ස ඨිතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ආරම්මණට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ගොචරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පහානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පරිච්චාගට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වුට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විවට්ටනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සන්තට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පණීතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමුත්තට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනාසවට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, තරණට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනිමිත්තට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අප්පණිහිතට්ඨං බුජ්ඣන්තීති, බොජ්ඣඞ්ගා, සුඤ්ඤතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකරසට්ඨං බුජ්ඣන්තීති, බොජ්ඣඞ්ගා, අනතිවත්තනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා යුගනද්ධට්ඨං[2] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිය්‍යානට්ඨං[3] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, හෙතුට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, දස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ආධිපතෙය්‍යට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

සමථස්ස අවික්ඛෙපට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විපස්සනාය අනුපස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සමථවිපස්සනානං එකරසට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, යුගනද්ධස්ස අනතිවත්තනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

සික්ඛාය සමාදානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ආරම්මණස්ස ගොචරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා ලීනස්ස චිත්තස්ස පග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, උද්ධතස්ස චිත්තස්ස නිග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, උභොවිසුද්ධානං අජ්ඣුපෙක්ඛනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විසෙසාධිගමට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, උත්තරි පටිවෙධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සච්චාභිසමයට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිරොධෙ පතිට්ඨාපකට්ඨං[4] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

1. පරිපූරණට්ඨං - මජසං,
2. යුගනන්ධට්ඨං - PTS.
3. නිය්‍යානිකට්ඨං - සී.
4. නිරොධපතිට්ඨාපකට්ඨං - PTS,

පරිග්‍රහාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, පරිවාරාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, පරිපූරාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාග්‍රාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, අවික්ෂෙපාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ප්‍රග්‍රහාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, අවිසාරාර්ථය (නො විසිරෙන ස්වභාවය) අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, අනාවිලාර්ථය (නො කැළැඹුණු ස්වභාවය) අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, (අවිකම්පිත බැවින්) අනිඤ්ජනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි පිහිටීම් වශයෙන් චිත්තයාගේ ස්ථිතාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ආලම්බනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ගොචරාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ප්‍රහාණාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, පරිත්‍යාගාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ව්‍යුත්ථානාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, විවර්තන (නවත්නා) අර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ශාන්තාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ප්‍රණීතාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, විමුක්ත්‍යර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, අනාස්‍රවාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ තරණාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, අනිමිත්තාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, අප්‍රණිහිතාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ශූන්‍යතාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකකෘත්‍යාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, අනතිවර්තනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, යුගනද්ධාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, නිර්‍ය්‍යාණාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, හෙත්වර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, දර්ශනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ආධිපත්‍යාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

ශමථයාගේ අවික්ෂෙපස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, විදර්ශනාවගේ අනුදර්ශනස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ශමථවිදර්ශනාවන්ගේ එකකෘත්‍යස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, යුගනද්ධයාගේ (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

ශික්ෂාවගේ සමාදානස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ආලම්බනයාගේ ගොචරස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ලීන (හැකිළුණු) චිත්තයාගේ ප්‍රග්‍රහස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, උද්ධතචිත්තයාගේ නිග්‍රහස්වභාවය අවබොධ කෙරෙත් නු, යි බොධ්‍යඞ්ග යැ, ලීනොද්ධත දෙකින් විශුද්ධ වූ චිත්තයන්ගේ (ප්‍රග්‍රහනිග්‍රහ දෙක්හි ස්ව්‍යාපාරභාව සඞ්ඛ්‍යාත) අධ්‍යුපෙක්ෂණස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, විශෙෂාධිගමස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, (ආර්‍ය්‍යමාර්ගය පහළවීම් වශයෙන්) මත්තෙහි ප්‍රතිවෙධස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, සත්‍යප්‍රතිවෙධස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, නිරොධයෙහි පිහිටුවන ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

සද්ධින්ද්‍රියස්ස අධිමොක්ඛට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- පඤ්ඤින්ද්‍රියස්ස දස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. සද්ධාබලස්ස අස්සද්ධියෙ අකම්පියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- පඤ්ඤාබලස්ස අවිජ්ජාය අකම්පියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. සතිසම්බොජ්ඣඞ්ගස්ස උපට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස පටිසඞ්ඛානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. සම්මාදිට්ඨියා දස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- සම්මාසමාධිස්ස අවික්ඛෙපට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

ඉන්ද්‍රියානං ආධිපතෙය්‍යට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, බලානං අකම්පියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, බොජ්ඣඞ්ගානං[1] නිය්‍යානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මග්ගස්ස හෙතුට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සතිපට්ඨානානං උපට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සම්මප්පධානානං පදහනට්ඨං[2] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඉද්ධිපාදානං ඉජ්ඣනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සච්චානං තථට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මග්ගානං[3] පටිප්පස්සද්ධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඵලානං සච්ඡිකිරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා[4]

විතක්කස්ස අභිනිරොපනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විචාරස්ස උපවිචාරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පීතියා ඵරණට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සුඛස්ස අභිසන්දනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස එකග්ගට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

ආවජ්ජනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සඤ්ජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකොදට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

අභිඤ්ඤාය ඤාතට්ඨං[5] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පරිඤ්ඤාය තීරණට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පහානස්ස පරිච්චාගට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, භාවනාය එකරසට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සච්ඡිකිරියාය ඵස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඛන්ධානං ඛන්ධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ධාතූනං ධාතුට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ආයතනානං ආයතනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සඞ්ඛතානං සඞ්ඛතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අසඞ්ඛතස්ස අසඞ්ඛතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

1 'බොජ්ඣඞ්ගානං' පාඨොයං - PTS කත්ථචි සීහලක්ඛර පොත්ථකෙසු ච න දිස්සති
2 පදහනට්ඨං - PTS සී 1.   3 පරිසංගානං - ස්‍යා PTS, ඵලොගානං - සී
4 එත්ථ පඤ්ඤාය පජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා'ති - PTS. කත්ථචි සීහල පොත්ථකෙසු දිස්සති.   5 අභිඤ්ඤෙය්‍යට්ඨං - ස්‍යා

ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමොක්‍ෂසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ … ප්‍රඥෙන්ද්‍රියයාගේ දර්ශනසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ. ශ්‍රද්ධාබලයාගේ අශ්‍රද්ධායෙහි නො සැලෙන සවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ … ප්‍රඥාබලයාගේ අවිද්‍යායෙහි නො සැලෙන සවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ. සමෘති-සම්බොධ්‍යඞ්ගයාගේ උපසථානසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ … උපෙක්‍ෂාසම්බොධ්‍යඞ්ගයාගේ පටිසඞ්ඛාන (සමවාහිතලක්‍ෂණ) සවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ. සම්‍යග්දෘෂ්ටිහුගේ දර්ශනසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ .. සම්‍යක්සමාධිහුගේ අවික්‍ෂෙප සවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

ඉන්ද්‍රියයන්ගේ ආධිපතිභාවාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, බලයන්ගේ අකම්ප්‍යාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, බොධ්‍යඞ්ගයන්ගේ නිර්‍යාණාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, මාර්ගයාගේ හෙතුවර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, සතිපට්ඨාන-යන්ගේ උපසථානාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, සම්‍යක්-ප්‍රධානයන්ගේ ප්‍රදහනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ඍද්ධිපාදයන්ගේ සමෘද්ධ වන අර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, සත්‍යයන්ගේ යථාසවභාවාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, මාර්ගයන්ගේ ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ඵලයන්ගේ සාක්‍ෂාත්ක්‍රියාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

විතර්කයාගේ අභිනිරොපණාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, විචාරයාගේ අනුමාර්ජනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ප්‍රීතියගේ පැතිරීම් අර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, සුඛයාගේ අභිසන්‍දන (තෙමීන) අර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ එකාග්‍රාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

ආවර්ජනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, විජානනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ප්‍රජානනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, සඤ්ජානනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකොදයාර්ථය (අග්‍ර වැ උපදනා සවභාවය) අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

අභිඥායෙහි ඥතාර්ථය (සවභාවජානනාර්ථය) අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, පරිඥායෙහි තීරණාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ප්‍රහාණයාගේ පරිත්‍යාගාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, භාවනායෙහි එකරසාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, සාක්‍ෂාත්ක්‍රියායෙහි විඳනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, සකන්‍ධයන්ගේ (පීඩාභාවාදි) සකන්‍ධාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ධාතූන්ගේ (ශූන්‍යතාදි) ධාත්වර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, ආයතනයන්ගේ ආයතනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, සඞ්ඛතයන්ගේ සඞ්ඛතඅර්ථය (ප්‍රත්‍යයන් එක් වැ කරනලද සවභාවය) අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, අසඞ්ඛත-යාගේ අසඞ්ඛත අර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

චිත්තට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තානන්තරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස වුට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස විවට්ටනට්ඨං[1] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස හෙතුට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස පච්චයට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස වත්ථුට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස භුම්මට්ඨං[2] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස ආරම්මණට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස ගොචරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස චරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස ගතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස අභිනීහාරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස නිය්‍යානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස නිස්සරණට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

එකත්තෙ ආවජ්ජනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ විජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ සඤ්ජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ එකොදට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ උපනිබන්ධනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පක්ඛන්දනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පසීදනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ සන්තිට්ඨනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ විමුච්චනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ 'එතං සන්ත'න්ති පස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ යානීකතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ වත්ථුකතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ අනුට්ඨිතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පරිචිතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ සුසමාරද්ධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පරිග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පරිවාරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පරිපූරට්ඨං[3] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ සමොධානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ අධිට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ ආසෙවනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ භාවනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ බහුලීකම්මට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ සුසමුග්ගතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ සුවිමුත්තට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා,

1 විජානනට්ඨං - PTS
2 භූමට්ඨං - මජසං
3 පරිපූරණට්ඨං - මජසං

(අරමුණු සිතීම ආදි) චින්තන ස්වභාවය අවබෝධ කෙරෙත්'නුයි බොධ්‍යඞ්ග යෑ, චිත්තානන්තරයී ස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, චිත්තයාගේ ව්‍යුත්ථාන ස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, චිත්තයාගේ විවර්තන ස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, චිත්තයාගේ හෙතු ස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, චිත්තයාගේ ප්‍රත්‍යයස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, චිත්තයාගේ වස්තුස්වභාවය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, චිත්තයාගේ (කාමාවචරාදි) භූම්‍යර්ථය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, චිත්තයාගේ ආලම්බනාර්ථය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, චිත්තයාගේ ගොචරාර්ථය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, චිත්තයාගේ චර්‍ය්‍යාර්ථය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, චිත්තයාගේ (දූරසන්තිකාලම්බනග්‍රහණවශයෙන්) ගතාර්ථය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, චිත්තයාගේ අභිනීහාරාර්ථය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ චිත්තයාගේ නිර්‍ය්‍යාණාර්ථය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, චිත්තයාගේ නිස්සරණාර්ථය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යි.

එකාලම්බනයෙහි ආවර්ජන ස්වභාවය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි විජානනාර්ථය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි ප්‍රජානනාර්ථය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි සඤ්ජානනාර්ථය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි එකොදයාර්ථය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි උපනිබන්ධනාර්ථය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ එකාලම්බනයෙහි ප්‍රස්කන්දනාර්ථය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි පැහැදීම් ස්වභාවය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි අව්‍යාපාරභාවයෙන් පිහිටීම් ස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි මිදීම් ස්වභාවය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි තෙල ශාන්තය'යි දක්නා ස්වභාවය අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බයෙහි යුගනද්ධයක් මෙන් කරනලද ස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි පිහිටීමට වස්තුවක් මෙන් කරන ලද ස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි එළඹසිටි ස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි හාත්පසින් රැක්කරනලද ස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි සුසමාරබ්ධ ස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි පරිග්‍රහාර්ථය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි පරිවාරාර්ථය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි පරිපූරාර්ථය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි සමවධානාර්ථය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි අධිෂ්ඨානාර්ථය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි ආසෙවනාර්ථය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි භාවනාර්ථය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි පුනපුනා කිරීම් ස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි සුසමුද්ගතස්වභාවය අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි සුවිමුක්තස්වභාව අවබෝධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ,

එකත්තෙන බුජ්ඣනට්ඨං[1] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන අනුබුජ්ඣනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන පටිබුජ්ඣනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන සම්බුජ්ඣනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන බොධනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන අනුබොධනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන පටිබොධනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන සම්බොධනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන බොධපක්ඛියට්ඨං[2] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන අනුබොධපක්ඛියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන පටිබොධපක්ඛියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන සම්බොධපක්ඛියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන ජොතනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන උජ්ජොතනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන අනුජොතනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන පටිජොතනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන සඤ්ජොතනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

පකාසනට්ඨං[3] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විරොචනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, කිලෙසානං සන්තාපනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අමලට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමලට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිම්මලට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සමට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සමයට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විවෙකට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විවෙකචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විරාගට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විරාගචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිරොධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිරොධචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වොස්සග්ගට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වොස්සග්ගචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමුත්තට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමුත්තිචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

---

1 බුජ්ඣනට්ඨං - PTS 2 බොධිපක්ඛියට්ඨං - මජසං සහ PTS

3 පකාසනට්ඨං - මජසං සහ PTS විමංසාය ඡන්දට්ඨං .... නිරොධට්ඨං ... සහ පකාසනට්ඨං — නිරොධට්ඨං ..., – PTS අධිකපදානි දිස්සන්ති

එකාලම්බනයෙහි (ශ්‍රොතාපත්තිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) බොධනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (සකෘදාගාමිමාර්ග බොධ්‍යඞ්ගයන්ගේ) අනුබොධනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (අනාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) ප්‍රතිබොධනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (අර්හත්මාර්ග-බොධ්‍යඞ්ගයන්ගේ) සම්බොධනාර්ථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි බොධනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි අනුබොධනාර්ථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි ප්‍රතිබොධනාර්ථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි සම්බොධනාර්ථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි බොධිපාක්ෂිකාර්ථය (බොධිපක්ෂයෙහි වූ ස්වභාවය) අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි අනුබොධි-පාක්ෂිකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි ප්‍රතිබොධිපාක්ෂිකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකා-ලම්බනයෙහි සම්බොධිපාක්ෂිකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (විදර්ශනාප්‍රඥා විසින්) ද්‍යොතනාර්ථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (ශ්‍රොතාපත්තිමාර්ගප්‍රඥා විසින්) උද්‍යොත-නාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (සකෘදා-ගාමිමාර්ගප්‍රඥා විසින්) අනුද්‍යොතනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (අනාගාමිමාර්ගඥාන විසින්) ප්‍රතිද්‍යොතනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (අර්හත්මාර්ගඥාන විසින්) සන්ද්‍යොතනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

(ආයර්‍යමාර්ගීයාගේ) ප්‍රකාශනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, (ප්‍රභාස්වර බැවින්) බැබැළීම් ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, කෙලශයන් තවන ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, අමලස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, (සම්ප්‍රයුක්ත මලාභාවයෙන්) විමලස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, (අරමුණු කිරීම් මල නැති බැවින්) නිර්මලස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, සමාර්ථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, (කෙලශප්‍රහාණාර්ථයෙන්) සමයාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, විවෙකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, විවෙකචර්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, විරාගස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, විරාගසඞ්ඛ්‍යාත නිර්වාණයෙහි හැසිරෙන ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, නිරොධ ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, නිරොධසඞ්ඛ්‍යාතනිර්වාණ-යෙහි හැසිරෙනස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ව්‍යොසර්ගස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ව්‍යොසර්ගභාවයෙන් හැසිරෙන ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, (සමුච්ඡෙද විමුක්ති බැවින්) විමුක්තිස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, (නිස්සරණ) විමුක්තියෙහි හැසිරීම් ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

ඡන්දට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස මූලට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස පාදට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස පධානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස ඉජ්ඣනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස අධිමොක්ඛට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස පග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස උපට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස අවික්ඛෙපට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස දස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

විරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- චිත්තට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වීමංසට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය මූලට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය පාදට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. වීමංසාය පධානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය ඉජ්ඣනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය අධිමොක්ඛට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය පග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය උපට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය අවික්ඛෙපට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා වීමංසාය දස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

*දුක්ඛස්ස පීළනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, දුක්ඛස්ස සඞ්ඛතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, දුක්ඛස්ස සන්තාපට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, දුක්ඛස්ස විපරිණාමට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. සමුදයස්ස ආයූහනට්ඨං -පෙ- නිදානට්ඨං -පෙ- සඤ්ඤොගට්ඨං -පෙ- පලිබොධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිරොධස්ස නිස්සරණට්ඨං -පෙ- විවෙකට්ඨං -පෙ- අසඞ්ඛතට්ඨං -පෙ- අමතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. මග්ගස්ස නිය්‍යානට්ඨං -පෙ- හෙතුට්ඨං -පෙ- දස්සනට්ඨං -පෙ- ආධිපතෙය්‍යට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

තථට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනත්තට්ඨං[1] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සච්චට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පටිවෙධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අභිජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පරිජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ධම්මට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ධාතුට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඤාතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සච්ඡිකිරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඵස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අභිසමයට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

---

* සච්චානං තථලක්ඛණවසෙන නිද්දිට්ඨෙ සොළසකෙ 'දුක්ඛට්ඨං- සමුදයට්ඨං-නිරොධට්ඨං- මග්ගට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා'ති - මජසං. පොත්ථකෙ පයුත්තං පදචතුක්කං අඤ්ඤත්ථ ච දිස්සති, අට්ඨකථායපි ච සමෙති.

1. අනඤ්ඤථට්ඨං - PTS

(කර්තුකාම්‍යතා සඞ්ඛ්‍යාත) ඡන්දාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ; ඡන්දයාගේ මූලාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ඡන්දයාගේ ප්‍රතිෂ්ඨාස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ඡන්දයාගේ ප්‍රධානස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ඡන්දයාගේ සමෘද්ධ වන ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ඡන්දයාගේ (ශ්‍රද්ධාසම්ප්‍රයොගයෙන්) අධිමොක්ෂස්වභාවය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, ඡන්දයාගේ (වීර්‍ය්‍යසම්ප්‍රයොගයෙන්) ප්‍රග්‍රහාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ඡන්දයාගේ (ස්මෘතිසම්ප්‍රයොගයෙන්) උපස්ථානාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ඡන්දයාගේ (සමාධිසම්ප්‍රයොගයෙන්) අවික්ෂෙපාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ඡන්දයාගේ (ප්‍රඥාසම්ප්‍රයොගයෙන්) දර්ශනස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

වීර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ... චිත්තාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ ... වීමංසාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, වීමංසායෙහි මූලස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, වීමංසායෙහි ප්‍රතිෂ්ඨාස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, වීමංසායෙහි ප්‍රධානස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, වීමංසායෙහි සමෘද්ධ වන ස්වභාවය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, වීමංසායෙහි අධිමොක්ෂස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, වීමංසායෙහි ප්‍රග්‍රහස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, වීමංසායෙහි උපස්ථානස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, වීමංසායෙහි අවික්ෂෙපස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, වීමංසායෙහි දර්ශනස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

දුඃඛයාගේ පීඩනස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, දුඃඛයාගේ සඞ්ඛතස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, දුඃඛයාගේ සන්තාපස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, දුඃඛයාගේ විපරිණාමස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, සමුදයාගේ ආයූහනස්වභාවය ... නිදානස්වභාවය ... සංයොගස්වභාවය ... පලිබොධස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ. නිරොධයාගේ නිස්සරණස්වභාවය ... විවෙකස්වභාවය ... අසඞ්ඛතස්වභාවය ... අමෘත ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ. මාර්ගයාගේ නිර්‍ය්‍යාණ ස්වභාවය ... හෙතුස්වභාවය ... දර්ශනස්වභාවය ... ආධිපත්‍යස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

(හැම ධර්මයන්ගේ) යථාස්වභාවාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, අනාත්මස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, සත්‍යස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ප්‍රතිවෙධ කළයුතු ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ස්වභාව විසින් දතයුතු ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, පිරිසිඳ දතයුතු ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, (ස්වභාවධාරණාදි) ධර්මස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, (ශූන්‍යතාදි) ධාතුස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ඥාත (දතහැකි) ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, සාක්ෂාත්කර්තව්‍යස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ස්ප්‍රෂ්ටව්‍යස්වභාවය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, අභිසමයස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

නෙක්ඛම්මං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අබ්‍යාපාදං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ආලොකසඤ්ඤං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අවික්ඛෙපං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ධම්මවවත්ථානං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඤාණං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පාමොජ්ජං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

පඨමං ඣානං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. අනිච්චානුපස්සනං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- සොතාපත්තිමග්ගං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- අරහත්තමග්ගං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අරහත්තඵලසමාපත්තිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. අස්සද්ධියෙ අකම්පියට්ඨෙන සද්ධාබලං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- අවිජ්ජාය අකම්පියට්ඨෙන පඤ්ඤාබලං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. උපට්ඨානට්ඨෙන සතිසම්බොජ්ඣඞ්ගං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- පටිසඞ්ඛානට්ඨෙන උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. දස්සනට්ඨෙන සම්මාදිට්ඨිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අකම්පියට්ඨෙන බලං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගා බුජ්ඣන්තීති[1] බොජ්ඣඞ්ගා, හෙතුට්ඨෙන මග්ගං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පදහනට්ඨෙන සම්මප්පධානං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, තථට්ඨෙන සච්චං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

අවික්ඛෙපට්ඨෙන සමථං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනුපස්සනට්ඨෙන විපස්සනං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකරසට්ඨෙන සමථවිපස්සනං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

සංවරට්ඨෙන සීලවිසුද්ධිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මුත්තට්ඨෙන විමොක්ඛං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පටිවෙධට්ඨෙන විජ්ජං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පරිච්චාගට්ඨෙන විමුත්තිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙ ඤාණං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

1 නිය්‍යානට්ඨං බුජ්ඣන්තීති - සබ්බත්ථ

නෛෂ්ක්‍රම්‍යය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, අව්‍යාපාදය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, අලොකසංඥව අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, අවික්ෂෙපය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ධර්මනිශ්චය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ඥානය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ප්‍රාමොද්‍යය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

ප්‍රථමධ්‍යානය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ ... නෛවසංඥානාසංඥායතනසමාපත්තිය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ. අනිත්‍යතානුදර්ශනය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ ... ස්‍රොතාපත්තිමාර්ගය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ ... අර්හත්මාර්ගය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, අර්හත්ඵලසමාපත්තිය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

අධිමොක්ෂාර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ ... දර්ශනාර්ථයෙන් ප්‍රඥෙන්ද්‍රියය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ. අශ්‍රද්ධායෙහි අකම්ප්‍යාර්ථයෙන් ශ්‍රද්ධාබලය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ ... අවිද්‍යායෙහි අකම්ප්‍යාර්ථයෙන් ප්‍රඥාබලය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ. උපස්ථානාර්ථයෙන් ස්මෘතිසම්බොධ්‍යඞ්ග ය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ ... සමවාහිතස්වභාවයෙන් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ. දර්ශනස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ ... අවික්ෂෙපස්වභාවයෙන් සම්‍යක්සමාධිය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, අකම්ප්‍යාර්ථයෙන් බලධර්මය අවබොධ කෙරෙත්නු'යි බොධ්‍යඞ්ග යෑ, නිර්‍යාණ ස්වභාවයෙන් බොධ්‍යඞ්ගය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, හෙතුස්වභාවයෙන් මාර්ගය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, උපස්ථාන ස්වභාවයෙන් සතිපට්ඨානය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, ප්‍රදහනස්වභාවයෙන් සම්‍යක්ප්‍රධානය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, සමෘද්ධ වන ස්වභාවයෙන් ඍද්ධිපාදය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, තථාස්වභාවයෙන් සත්‍යය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යි.

අවික්ෂෙපාර්ථයෙන් ශමථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකරසාර්ථයෙන් ශමථවිදර්ශනා අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් යුගනද්ධය (ශමථවිදර්ශනා) අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යි.

සංවරාර්ථයෙන් ශීල විශුද්ධිය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, අවික්ෂෙපාර්ථයෙන් චිත්ත විශුද්ධිය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, මුක්තාර්ථයෙන් විමොක්ෂය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග ය, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය අවබොධ කෙරෙත් නු යි බොධ්‍යඞ්ග යෑ; සමුච්ඡෙද ස්වභාවයෙන් ක්ෂයඥානය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, ප්‍රතිප්‍රශ්‍රබ්ධි ස්වභාවයෙන් අනුත්පාද ඥානය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යි.

ඡන්දං මූලට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මනසිකාරං සමුට්ඨානට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඵස්සං සමොධානට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වෙදනං සමොසරණට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සමාධිං පමුඛට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා සතිං ආධිපතෙය්‍යට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පඤ්ඤං තදුත්තරට්ඨෙන[1] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමුත්තිං සාරට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

[ සාවත්ථිනිදානං: ]

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි 'ආවුසො භික්ඛවො'ති[2] 'ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං, ආයස්මා සාරිපුත්තො එතදවොච:

“සත්තිමෙ ආවුසො බොජ්ඣඞ්ගා, කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, ඉමෙ ඛො ආවුසො සත්ත බොජ්ඣඞ්ගා.

ඉමෙසං ඛ්වාහං ආවුසො සත්තන්නං බොජ්ඣඞ්ගානං යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි පුබ්බණ්හසමයං[3] විහරිතුං, තෙන තෙන බොජ්ඣඞ්ගෙන පුබ්බණ්හසමයං විහරාමි, යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි මජ්ඣන්හසමයං[4] -පෙ- සායන්හසමයං විහරිතුං තෙන තෙන බොජ්ඣඞ්ගෙන සායන්හසමයං විහරාමි, සතිසම්බොජ්ඣඞ්ගො ඉති චෙ මෙ ආවුසො හොති, 'අප්පමාණො'ති මෙ හොති, 'සුසමාරද්ධො'ති මෙ හොති, තිට්ඨන්තං ච නං[5] තිට්ඨතී'ති පජානාමි, සචෙපි මෙ චවති, 'ඉදප්පච්චයා චවතී'ති පජානාමි, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති චෙ මෙ ආවුසො හොති, 'අප්පමාණො'ති මෙ හොති, 'සුසමාරද්ධො'ති මෙ හොති, තිට්ඨන්තං ච නං[6] 'තිට්ඨතී'ති පජානාමි, සචෙපි මෙ චවති, ඉදප්පච්චයා මෙ චවතී'ති පජානාමි.

1. තදනුත්තරට්ඨෙන - පු, මජසං, PTS.
2 ආවුසොති - සයා
3. පුබ්බණ්හං - මජසං, ස, සයා PTS,
4. මජ්ඣන්හික සමයං - මජසං, මජ්ඣන්තිකසමයං - සයා PTS
5 තිට්ඨන්තං වරං - සයා, තිට්ඨන්තං චවන්තං - PTS.

(කර්තෘකාම්‍යතා) ඡන්දය මූලස්වභාවයෙන් අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, මනසිකාරය සමුට්ඨාන ස්වභාවයෙන් අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, ස්පර්ශය සමවධානාර්ථයෙන් අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ වේදනාව සමවසරණාර්ථයෙන් අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් අවබොධ කෙරෙත් කෙරෙත් නු’යි බොධ්‍ය යැ, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, විමුක්තිය සාරාර්ථයෙන් අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍යවසානාර්ථයෙන් අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යි.

**[ සැවැත්නිදාන යි: ]**

එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ‘ඇවැත්නි මහණෙනි’ යි භික්ෂූන් ඇමැතූ සේක. ‘ඇවැත්නි’යි ඒ භික්ෂුහු ආයුෂ්මත්, ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළහ.

“ඇවැත්නි, මේ බොධ්‍යඞ්ගයෝ සත් දෙනෙක් වෙති කවර සත් දෙනෙකැ යත්: ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ, ධර්මවිචය සම්බොධ්‍යඞ්ග යැ ... උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යැ යි. ඇවැත්නි, මොහු සප්තබොධ්‍යඞ්ගයෝ වෙත්.

ඇවැත්නි, මම මේ සප්තබොධ්‍යඞ්ගයන් අතුරින් යම් යම් බොධ්‍යඞ්ගයෙ-කින් යුතු වැ පෙරවරු කල්හි වාසය කරන්නට කැමැති වීම් නම් ඒ ඒ බොධ්‍යඞ්ගයෙන් යුතු වැ පෙරවරු කල්හි වාසය කෙරෙමි. යම් යම් බොධ්‍යඞ්ගයෙකින් යුතු වැ මද්දහන් කල්හි ... සවස් කල්හි වාසය කරන්-නට කැමැති වීම් නම් ඒ ඒ බොධ්‍යඞ්ගයෙන් යුතු වැ සවස් කල්හි වාසය කෙරෙමි. ඇවැත්නි, ‘ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ’යි මෙසේ ත් මට සිත් වෙයි, (හේ) ‘අප්‍රමාණ යැ’යි මෙසේ ත් මට සිත් වෙයි, ‘මොනොවට පරිපූර්ණ යැ’යි මෙසේ ත් මට සිත් වෙයි. තවද තිබෙන් අරමුණු කොට සිටුනා එය නිවන් අරමුණු කොට සිටී යැ’යි දැනගනිමි. ඉදිනුදු මාගේ ස්මෘති-සම්බොධ්‍යඞ්ගය නිවන් අරමුණින් පහ වැ යේ නම් ‘මෙ කරුණින් පහ වැ යේ’ යයි දැනගනිමි. ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය ... ඇවැත්නි, උපේක්ෂා-සම්බොධ්‍යඞ්ග යැ’ යි මෙසේත් මට සිත් වෙයි, (එය) ‘අප්‍රමාණ යැ’යි මෙසේ ත් මට සිත් වෙයි. ‘මොනොවට පරිපූර්ණ යැ’යි මෙසේ ත්, මට සිත් වෙයි. තවද නිවන් අරමුණු කොට සිටුනා එය නිවන් අරමුණු කොට ‘සිටී’ යයි දැනගනිමි. ඉදිනුදු මාගේ උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය නිවන් අරමුණින් පහ වැ යේ නම් ‘මෙ කරුණින් පහ වැ යේ යයි දැනගනිමි.

සෙය්‍යථාපි ආවුසො රඤ්ඤො වා රාජමහාමත්තස්ස වා නානාරත්තානං දුස්සානං දුස්සකරණ්ඩකො පූරො අස්ස, සො යඤ්ඤදෙව දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය පුබ්බණ්හසමයං පාරුපිතුං, තං තදෙව දුස්සයුගං පුබ්බණ්හසමයං පාරුපෙය්‍ය. යඤ්ඤදෙව දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය මජ්ඣණ්හසමයං -පෙ- සායණ්හසමයං පාරුපිතුං, තං තදෙව දුස්සයුගං සායණ්හසමයං පාරුපෙය්‍ය. එවමෙව ඛ්වාහං ආවුසො ඉමෙසං සත්තන්නං බොජ්ඣඞ්ගානං යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි පුබ්බණ්හසමයං විහරිතුං, තෙන තෙන බොජ්ඣඞ්ගෙන පුබ්බණ්හසමයං විහරාමි. යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි මජ්ඣණ්හසමයං -පෙ- සායණ්හසමයං විහරිතුං, තෙන තෙන බොජ්ඣඞ්ගෙන සායණ්හසමයං විහරාමි, සතිසම්බොජ්ඣඞ්ගො ඉති චෙ මෙ ආවුසො හොති, 'අප්පමාණො'ති මෙ හොති, සුසමාරද්ධො'ති මෙ හොති, තිට්ඨන්තං ච නං තිට්ඨතී'ති පජානාමි, සචෙපි මෙ චවති 'ඉදප්පච්චයා මෙ චවතීති පජානාමි. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති චෙ මෙ ආවුසො හොති, 'අප්පමාණො'ති මෙ හොති, 'සුසමාරද්ධො'ති මෙ හොති, තිට්ඨන්තං ච නං 'තිට්ඨතී'ති පජානාමි, සචෙපි මෙ චවති, 'ඉදප්පච්චයා මෙ චවතී'ති පජානාමි.''[a]

කථං 'සතිසම්බොජ්ඣඞ්ගො ඉති චෙ හොතී'ති බොජ්ඣඞ්ගො, යාවතා නිරොධූපට්ඨාති තාවතා 'සතිසම්බොජ්ඣඞ්ගො ඉති චෙ හොතී'ති බොජ්ඣඞ්ගො. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො යාවතා අච්චි. තාවතා වණ්ණො, යාවතා වණ්ණො තාවතා අච්චි, එවමෙව යාවතා නිරොධූපට්ඨාති, තාවතා සතිසම්බොජ්ඣඞ්ගො, 'ඉති චෙ හොතී'ති බොජ්ඣඞ්ගො.

කථං 'අප්පමාණො ඉති චෙ[1] හොතී'ති බොජ්ඣඞ්ගො, පමාණබද්ධා[2] කිලෙසා සබ්බෙ ච පරියුට්ඨානා යෙ ච සඞ්ඛාරා පොනොභවිකා, අප්පමාණො නිරොධො අචලට්ඨෙන අසඞ්ඛතට්ඨෙන, යාවතා නිරොධූපට්ඨාති, තාවතා 'අප්පමාණො ඉති චෙ[3] හොතීති බොජ්ඣඞ්ගො,

කථං 'සුසමාරද්ධො ඉති චෙ හොතී'ති බොජ්ඣඞ්ගො, විසමා කිලෙසා සබ්බෙ ච පරියුට්ඨානා යෙ ච සඞ්ඛාරා පොනොභවිකා, සමධම්මො නිරොධො සන්තට්ඨෙන, පණීතට්ඨෙන, යාවතා නිරොධූපට්ඨාති, තාවතා සුසමාරද්ධො ඉති චෙ හොතී'ති බොජ්ඣඞ්ගො.

---

1. ඉති චෙ මෙ - මජසං,
2. පමාණබන්ධා - PTS, සං, පමාණවන්තා - සසා
3. ඉති මෙ - PTS.

a. බොජ්ඣඞ්ගසංයුත්ත - පබ්බතවග්ග - 4 වන සූත්‍රය

යම් සේ ඇවැත්නි, රජක්හට වේවයි රජ මහ ඇමැත්තක්හට වේවයි නොයෙක් රඞ්ගජාතයෙන් රඳනා ලද පිළියෙන් පිරුණු පෙළායෙක් වී නම් හෙතෙම යම් යම් මැ පිළිසඟලක් පෙරවරු කල්හි පොරෝනට කැමැති වී නම් ඒ ඒ පිළිසඟල මැ පෙරවරු කල්හි පොරෝනේ ද, යම් යම් මැ පිළිසඟලක් මද්දහත් කල්හි ... සවස් කල්හි පොරෝනට කැමැති වී නම් ඒ ඒ පිළිසඟල මැ සවස් කල්හි පොරෝනේ ද, එපරිද්දෙන් මැ ඇවැත්නි මම මේ සප්තබොධ්‍යඞ්ගයන් අතුරින් යම් යම් බොධ්‍යඞ්ගයෙකින් යුතු වැ පෙරවරු කල්හි වාසය කරන්නට කැමැති වීම් නම් ඒ ඒ බොධ්‍යඞ්ගයෙන් යුතු වැ පෙරවරු කල්හි වාසය කෙරෙමි, යම් යම් බොධ්‍යඞ්ගයෙකින් යුතු වැ මද්දහත් කල්හි ... සවස් කල්හි වාසය කරන්නට කැමැති වීම් නම් ඒ ඒ බොධ්‍යඞ්ගයෙන් යුතු වැ සවස් කල්හි වාසය කෙරෙමි. ඇවැත්නි, සමෘතිසම්බොධ්‍යඞ්ග යැ'යි මෙසේත් මට සිත් වෙයි, (හේ) 'අප්‍රමාණ යැ'යි මෙසේත් මට සිත් වෙයි. මොනො- වට පරිපූර්ණ යැ'යි මෙසේත් මට සිත් වෙයි. තවද තිවත් අරමුණු කොට සිටුනා එය තිවත් අරමුණු කොට 'සිටී' යයි දැනගනිමි. ඉදිනුදු මාගේ සමෘතිසම්බොධ්‍යඞ්ගය තිවත් අරමුණින් පහ වැ යේ නම් 'මෙ කරුණින් පහ වැ යේ' යයි දැනගනිමි. ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය ... ඇවැත්නි, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යැ'යි මෙසේත් මට සිත් වෙයි, හේ, 'අප්‍රමාණ යැ'යි මෙසේත් මට සිත් වෙයි, 'මොනොවට පරිපූර්ණ යැ'යි මෙසේත් මට සිත් වෙයි. තවද තිවත් අරමුණු කොට සිටුනා එය තිවත් අරමුණු කොට 'සිටී' යයි දැනගනිමි, ඉදිනුදු මාගේ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය තිවත් අරමුණින් පහ වැ යේ නම් 'මෙ කරුණින් පහ වැ යේ' යයි දැන ගනිමි.

කිසෙයින් 'සතිසම්බොජ්ඣඞ්ගො ඉති වෙ හොති' යි බොධ්‍යඞ්ග වේ ද යත්: යම්තාක් නිරොධය වටහා ද ඒ තාක් 'මෙසේ සමෘතිසම්බොධ්‍යඞ්ගය ද වේ නු'යි බොධ්‍යඞ්ග නම. යම්සේ දැල්වෙන තෙල්පහනක්හු ගේ යම්තාක් සිළුව වී නම් ඒ තාක් පැහැය වේ ද, යම්තාක් පැහැය වී නම් ඒ තාක් සිළුව වේ ද, එපරිද්දෙන් මැ යම්තාක් නිරොධය වටහා ද ඒ තාක් 'මෙසේ සමෘතිසම්බොධ්‍යඞ්ගය ද වේ නු'යි බොධ්‍යඞ්ග නම්.

කිසෙයින් 'අප්පමාණො ඉති වෙ හොති'යි බොධ්‍යඞ්ග වේ ද යත්: (අනුශයභූත) කෙලශයෝ ද හැම පර්‍යුත්ථාන (සමුදාචාරප්‍රාප්තකෙලශ) යෝ ද පුනර්භවය කරනසුලු යම් සංස්කාර කෙනෙක් වෙත් නම් ඔහු ද ප්‍රමාණබද්ධ වෙති. නිරොධය තෙමේ අචලස්වභාවයෙන් අසඞ්ඛතස්වභාවයෙන් අප්‍රමාණ වෙයි. යම් තාක් නිරොධය වටහා ද ඒ තාක් 'මෙසේ අප්‍රමාණය ද වේ නු'යි බොධ්‍යඞ්ග නම්.

කිසෙයින් 'සුසමාරද්ධො ඉති වෙ හොති'යි බොධ්‍යඞ්ග වේ ද යත්: (අනුශය භූත) කෙලශයෝ ද හැම පර්‍යුත්ථානයෝ ද පුනර්භවය කරන සුලු යම් සංස්කාර කෙනෙක් වෙත් නම් ඔහු ද විෂම නම් වෙති. ශාන්ත ස්වභාවයෙන් ප්‍රණීත ස්වභාවයෙන් නිරොධය තෙමේ සමධර්ම ඇත්තේ වෙයි. යම් තාක් නිරොධය වටහා ද ඒ තාක් 'මෙසේ මොනොවට පරිපූර්ණ ද වේ නු'යි බොධ්‍යඞ්ග නම්,

කථං තිට්ඨන්තං ච නං තිට්ඨතීති පජානාමි, සචෙපි චවති, ඉදප්පච්චයා මෙ චවතී'ති පජානාමි, කතිහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති: කතිහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො චවති:

අට්ඨහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, අට්ඨහාකාරෙහි සති-සම්බොජ්ඣඞ්ගො චවති.

කතමෙහි අට්ඨහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති; අනුප්පාදං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, උප්පාදං අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, අප්පවත්තං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, පවත්තං අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, අනිමිත්තං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, නිමිත්තං අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, නිරොධං ආවජ්ජිතත්තා සති-සම්බොජ්ඣඞ්ගො තිට්ඨති, සඞ්ඛාරෙ අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති. ඉමෙහි අට්ඨහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති.

කතමෙහි අට්ඨහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො චවති: උප්පාදං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති, අනුප්පාදං අනාවජ්ජිතත්තා සති-සම්බොජ්ඣඞ්ගො චවති, පවත්තං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති, අප්පවත්තං අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති, නිමිත්තං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති, අනිමිත්තං අනාවජ්ජිතත්තා සති-සම්බොජ්ඣඞ්ගො චවති, සඞ්ඛාරෙ ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති, නිරොධං අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති. ඉමෙහි අට්ඨහා-කාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො චවති.

එවං තිට්ඨන්තං ච නං තිට්ඨතීති පජානාමි, සචෙපි චවති, ඉදප්පච්චයා මෙ චවතීති පජානාමි. කථං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො -පෙ-

කථං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති මෙ හොතී'ති බොජ්ඣඞ්ගො: යාවතා නිරොධූපට්ඨාති. තාවතා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති වෙ හොතී'ති බොජ්ඣඞ්ගො. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො යාවතා අච්චි තාවතා වණ්ණො. යාවතා වණ්ණො තාවතා අච්චි. එවමෙව යාවතා නිරො-ධූපට්ඨාති, තාවතා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති වෙ හොතීති බොජ්ඣඞ්ගො.

කථං 'අප්පමාණො ඉති වෙ හොතී'ති බොජ්ඣඞ්ගො: පමාණබද්ධා කිලෙසා සබ්බෙ ච පරියුට්ඨානා යෙ ච සඞ්ඛාරා පොනොභවිකා, අප්පමාණො නිරොධො අචලට්ඨෙන අසඞ්ඛතට්ඨෙන. යාවතා නිරොධූපට්ඨාති, තාවතා 'අප්පමාණො ඉති වෙ හොතී'ති බොජ්ඣඞ්ගො.

කිසෙයින් (නිර්වාණාලම්බනයෙහි ප්‍රවෘත්ති විසින්) සිටුනා ඒ බොධ්‍යඞ්ගය (නිවන් අරමුණු කොට) සිටී'යයි දැනගනිම් ද, ඉදින් (නිර්වාණාලම්බනයෙන්) පහ වැ යේ නම් 'මාගේ බොධ්‍යඞ්ගය මේ කරුණින් පහ වැ යේ' යයි දැනගනිම් ද: කිනි අයුරෙකින් ස්මෘති සම්බොධ්‍යඞ්ගය සිටුනේ ද කිනි අයුරෙකින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පහ වැ යේ ද යත්:

අට අයුරෙකින් ස්මෘති සම්බොධ්‍යඞ්ගය සිටී. අට අයුරෙකින් ස්මෘති සම්බොධ්‍යඞ්ගය පහ වැ යෙයි.

කවර අට අයුරෙකින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවත්නේ ද යත්: අනුත්පාදය ආවර්ජනා කරන ලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී, උත්පාදය ආවර්ජනා නො කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී, අප්‍රවෘත්තිය ආවර්ජනා කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී, ප්‍රවෘත්තිය ආවර්ජනා නො කරන ලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී, අනිමිත්ත ආවර්ජනා කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී, නිමිත්ත ආවර්ජනා නොකරනලද බැවින් ස්මෘති සම්බොධ්‍යඞ්ගය පවතී, නිරෝධය ආවර්ජනා කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී, සංස්කාරයන් ආවර්ජනා නො කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී. මේ අට අයුරින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී.

කවර අට අයුරෙකින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වේ ද යත්: උත්පාදය ආවර්ජනා කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, අනුත්පාදය ආවර්ජනා නො කරන ලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, ප්‍රවෘත්තිය අවර්ජනා කරන ලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, අප්‍රවෘත්තිය ආවර්ජනා නො කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, නිමිත්ත ආවර්ජනා කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, අනිමිත්ත ආවර්ජනා නො කරනලද බැවින් ස්මෘති-සම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, සංස්කාරයන් ආවර්ජනා කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, නිරෝධය ආවර්ජනා නො කරන ලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ග අපගත වේ. මේ අට අයුරින් ස්මෘතිසම්බො-ධ්‍යඞ්ගය අපගත වේ.

මෙසෙයින් (නිර්වාණාලම්බනයෙහි) පවත්නා ඒ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය (නිර්වාණාලම්බනයෙහි) පවතී'යයි දැනගනිම්. ඉදින් (නිර්වාණාලම්බනයෙන්) අපගත වේ නම් 'මාගේ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය මේ කරුණින් අපගත වේ'යයි දැනගනිම්. කිසෙයින් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ...

කිසෙයින් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති චෙ හොති'යි බොධ්‍යඞ්ග වේ ද යත්: යම් තාක් නිරෝධය වටහා ද ඒ තාක් 'මෙහේ උපෙක්ෂා-සම්බොධ්‍යඞ්ගය ද වේ නු'යි බොධ්‍යඞ්ග නම්. යම්සේ දල් වෙන තෙල් පහනක්හු ගේ යම් තාක් සිළුව වේ නම් ඒ තාක් පැහැය වේ ද, යම් තාක් පැහැය වේ නම් ඒ තාක් සිළුව වේ ද, එසෙයින් මැ මෙහේ යම් තාක් නිරෝධය වටහා නම් ඒ තාක් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය ද වේ නු' යි බොධ්‍යඞ්ග නම් වේ.

කිසෙයින් 'අප්පමාණො ඉති චෙ හොති'යි බොධ්‍යඞ්ග වේ ද යත්: (අනුශය භූත) කෙලේශයෝ ද හැම සමුදාචාර ප්‍රාප්තකෙලේශයෝ ද පුනර්භවය කරනසුලු යම් සංස්කාර කෙනෙක් වෙත් නම් ඔහු ද ප්‍රමාණබද්ධ වෙති. නිරෝධය තෙමේ අචල ස්වභාවයෙන් අසඞ්ඛත ස්වභාවයෙන් අප්‍රමාණ වෙයි. යම් තාක් නිරෝධය වටහා ද ඒ තාක් 'මෙහේ අප්‍රමාණ ද වේ නු'යි බොධ්‍යඞ්ග නම් වේ.

කථං 'සුසමාරද්ධො ඉති ච හොතී'ති බොජ්ඣඞ්ගො: විසමා කිලෙසා සබ්බෙ ච පරියුට්ඨානා යෙ ච සඞ්ඛාරා පොනොභවිකා, සමධම්මො නිරොධො සන්තට්ඨෙන පණීතට්ඨෙන. යාවතා නිරොධූපට්ඨාති, තාවතා 'සුසමාරද්ධො ඉති ච හොතී'ති බොජ්ඣඞ්ගො.

කථං 'තිට්ඨන්තං ච නං තිට්ඨතී'ති පජානාමි, සචෙපි චවති, ඉදප්පච්චයා මෙ චවතී'ති පජානාමි: කතිහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති: කතිහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති:

අට්ඨහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, අට්ඨහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති.

කතමෙහි අට්ඨහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති: අනුප්පාදං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, උප්පාදං අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, අප්පවත්තං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, පවත්තං අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, අනිමිත්තං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, නිමිත්තං අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, නිරොධං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, සඞ්ඛාරෙ අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති. ඉමෙහි අට්ඨහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති.

කතමෙහි අට්ඨහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති: උප්පාදං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති, අනුප්පාදං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති, පවත්තං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති, අප්පවත්තං අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති, නිමිත්තං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති, අනිමිත්තං අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති, සඞ්ඛාරෙ ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති, නිරොධං අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති. ඉමෙහි අට්ඨහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති.

එවං තිට්ඨන්තං ච නං තිට්ඨතීති පජානාමි, සචෙපි චවති, ඉදප්පච්චයා මෙ චවතීති පජානාමි.

බොජ්ඣඞ්ගකථා සමත්තා.

කිසෙයින් 'සුසමාරද්ධො ඉති ච හොති' යි බොධ්‍යඞ්ග වේ ද යත්: (අනුශයභූත) ක්ලේශයෝ ද හැම සමුදචාරප්‍රාප්තක්ලේශයෝ ද පුනර්භවය කරනසුලු යම් සංස්කාර කෙනෙක් වෙත් නම් ඔහු ද විෂම නම් වෙති. නිරෝධය තෙමේ ශාන්තස්වභාවයෙන් ප්‍රණීත ස්වභාවයෙන් සමධර්ම නම් වෙයි. යම් තාක් නිරෝධය වටහා ද ඒ තාක් 'මෙසේ සුසමාරබ්ධ ද වේ නු'යි බොධ්‍යඞ්ග නම් වේ.

කිසෙයින් (නිර්වාණාලම්බනයෙහි) පවත්නා ඒ උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය (නිර්වාණාලම්බනයෙහි) පවතී' යයි දැනගනිම් ද, ඉදින් (නිර්වාණාලම්බනයෙන්) අපගත වේ නම් මෙකරුණින් අපගත වේ යයි දැනගනිම් ද, කිසි අයුරෙකින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවත්නේ ද, කිසි අයුරෙකින් උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය අපගත වේ ද යත්:

අට අයුරෙකින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී. අට අයුරෙකින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වේ.

කවර අට අයුරෙකින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවත්නේ ද යත්: අනුත්පාදය ආවර්ජනා කරනලද බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී, උත්පාදය ආවර්ජනා නො කරන ලද බැවින් උපේක්ෂා සම්බොධ්‍යඞ්ගය පවතී, අප්‍රවෘත්තිය ආවර්ජනා කරනලද බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී, ප්‍රවෘත්තිය ආවර්ජනා නො කරනලද බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී, අනිමිත්ත ආවර්ජනා කරනලද බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී, නිමිත්ත ආවර්ජනා නොකරන ලද බැවින් උපේක්ෂා සම්බොධ්‍යඞ්ගය පවතී. නිරෝධය ආවර්ජනා කරනලද බැවින් උපේක්ෂාසම්බොධඞ්ගය පවතී, සංස්කාරයන් ආවර්ජනා නො කරන ලද බැවින් උපේක්ෂා සම්බොධඞ්ගය පවතී. මේ අට අයුරින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී.

කවර අට අයුරෙකින් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වේ ද යත්: උත්පාදය ආවර්ජනා කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, අනුත්පාදය ආවර්ජනා නොකළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, ප්‍රවෘත්තිය ආවර්ජනා කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, අප්‍රවෘත්තිය ආවර්ජනා නො කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, නිමිත්ත ආවර්ජනා කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, අනිමිත්ත ආවර්ජනා නො කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, සංස්කාරයන් ආවර්ජනා කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, නිරෝධය ආවර්ජනා නො කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි. මේ අට අයුරින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වේ.

මෙසෙයින් පවත්නා වූ ඒ උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී යයි දැනගනිමි. ඉදින් අපගත වේ නම් මාගේ උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය මෙ කරුණින් අපගත වේ'යයි දැනගනිමි.

**බොධ්‍යඞ්ගකථා නිමි.**

## 2. 4

# මෙත්තාකථා

[ සංඛිත්තනිදානං: ]

"මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය එකාදසානිසංසා පාටිකඞ්ඛා. කතමෙ එකාදස: සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති, මනුස්සානං පියො හොති, අමනුස්සානං පියො හොති, දෙවතා රක්ඛන්ති, නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති, තුවටං චිත්තං සමාධියති, මුඛවණ්ණො විප්පසීදති, අසම්මූළ්හො කාලං කරොති, උත්තරිං[1] අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති. මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය. ඉමෙ එකාදසානිසංසා පාටිකඞ්ඛා.[a]

අත්ථි අනොධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති, අත්ථි ඔධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති, අත්ථි දිසාඵරණා මෙත්තාචෙතොවිමුත්ති.

කතිහාකාරෙහි අනොධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති. කතිහාකාරෙහි ඔධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති, කතිහාකාරෙහි දිසාඵරණා මෙත්තාචෙතොවිමුත්ති:

පඤ්චහාකාරෙහි අනොධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති, සත්තහාකාරෙහි ඔධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති, දසහාකාරෙහි දිසාඵරණා මෙත්තාචෙතොවිමුත්ති.

කතමෙහි පඤ්චහාකාරෙහි අනොධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති: සබ්බෙ සත්තා අවෙරා අබ්‍යාපජ්ජා[2] අනීඝා[3] සුඛී අත්තානං පරිහරන්තු. සබ්බෙ පාණා -පෙ- සබ්බෙභූතා -පෙ- සබ්බෙ පුග්ගලා -පෙ- සබ්බෙ අත්තභාවපරියාපන්නා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තූති ඉමෙහි පඤ්චහාකාරෙහි අනොධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති.

කතමෙහි සත්තහාකාරෙහි ඔධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති: සබ්බා ඉත්ථියො අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු. සබ්බෙ පුරිසා -පෙ- සබ්බෙ අරියා -පෙ- සබ්බෙ අනරියා -පෙ- සබ්බෙ දෙවා -පෙ- සබ්බෙ මනුස්සා -පෙ- සබ්බෙ විනිපාතිකා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තූති. ඉමෙහි සත්තහාකාරෙහි ඔධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති.

1 උත්තරි - මජසං    a එකාදසකඞ්ගුත්තර - දුතියවග්ග (11, 2, 5)
2 අබ්‍යාපජ්ඣා - සයා, PTS, ස    3 අනිඝා - සයා

# 2. 4

# මෛත්‍රී කථා

[ සැවැත්නිදානයි ]

'මහණෙනි, මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනාලද කල්හි වඩනාලද කල්හි පුනපුනා කරනලද කල්හි යුක්තයානයක් මෙන් කරනලද කල්හි (ප්‍රතිෂ්ඨාවීයෙන්) වාස්තුවක් මෙන් කරනලද කල්හි එලඹසිටි කල්හි පරචිත කල්හි මොනොවට කරනලද කල්හි එකොළොස් අනුසස් කෙනෙක් කැමැති වියයුත්තාහ. කවර එකොළොස් අනුසස් කෙනෙක යත්: සුවසේ නිදයි, සුවසේ පිබිදී, ලාමක සිහින නො දකී, මනුෂ්‍යයනට ප්‍රිය වෙයි, අමනුෂ්‍යයනට ප්‍රිය වෙයි, (මාපියන්ට පුතකු සෙයින්) දෙවියෝ රකිති, ඔහුගේ සිරුරෙහි අග්නිය හෝ විෂයෙක් හෝ ශස්ත්‍රයෙක් හෝ නො වැදගනී, වහා සිත සමාහිත වෙයි, මුඛවර්ණය ඉතා ප්‍රසන්න වෙයි, නො මුළාසී වැ කළුරිය කෙරෙයි, මත්තෙහි අර්හත්ඵලය ප්‍රතිවේධ නො කරනුයේ බඹලොවැ උපදනේ වෙයි මහණෙනි මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලද කල්හි වඩනාලද කල්හි පුනපුනා කරනලද කල්හි යුක්තයානයක් මෙන් කරන ලද කල්හි (ප්‍රතිෂ්ඨාවීයෙන්) වාස්තුවක් මෙන් කරනලද කල්හි එලඹසිටි කල්හි පරිචිත කල්හි මොනොවට කරනලද කල්හි මේ එකොළොස් අනුසස්හු කැමැති වියයුත්තාහ

මර්‍යාද (සීම්) රහිත වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රී චිත්තවිමුක්තියක් ඇත. මර්‍යාද වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්තියක් ඇත, දිශාවන්හි පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්තියක් ඇති.

කිහි අයුරෙකින් මර්‍යාදරහිත වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්තිය වේ ද, කිහිඅයුරෙකින් මර්‍යාද වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රී චිත්තවිමුක්තිය වේ ද, කිහි අයුරෙකින් දිශාවන්හි පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්තිය වේ ද යත්:

පස් අයුරෙකින් මර්‍යාද රහිත වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්තිය වෙයි, සත් අයුරෙකින් මර්‍යාද වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්තිය වෙයි. දස අයුරෙකින් දිශාවන්හි පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්ති වේ.

කවර පස් අයුරෙකින් මර්‍යාද රහිත වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්ති වේ ද යත්· හැම සත්හු වෛර රහිත වැ ව්‍යාපාද රහිත වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත්වා හැම ප්‍රාණියෝ ... හැම භූතයෝ .. හැම පුද්ගලයෝ ... හැම ආත්මභාවපර්‍යාපන්නයෝ වෛර රහිත වැ ව්‍යාපාද රහිත වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත්ව'යි මේ පස් අයුරින් මර්‍යාද රහිත වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්ති වේ.

කවර සත් අයුරෙකින් මර්‍යාද වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්ති වේ ද යත්: හැම ස්ත්‍රීහු වෛර රහිත වැ ව්‍යාපාද රහිත වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත්වා; හැම පුරුෂයෝ ... හැම ආර්‍යයෝ...හැම අනාර්‍යයෝ ... හැම දෙවියෝ ... හැම මනුෂ්‍යයෝ ... හැම විනිපාතිකයෝ වෛර රහිත වැ ව්‍යාපාද රහිත වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත් ව යි මේ සත් අයුරින් මර්‍යාද වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්ති වේ.

කතමෙහි දසහාකාරෙහි දිසාඵරණා මෙත්තාචෙතොවිමුත්ති: සබ්බෙ පුරත්ථිමාය දිසාය සත්තා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු. සබ්බෙ පච්ඡිමාය දිසාය සත්තා -පෙ- සබ්බෙ උත්තරාය දිසාය සත්තා -පෙ- සබ්බෙ දක්ඛිණාය දිසාය සත්තා -පෙ- සබ්බෙ පුරත්ථිමාය අනුදිසාය සත්තා පෙ- සබ්බෙ පච්ඡිමාය අනුදිසාය සත්තා -පෙ- සබ්බෙ උත්තරාය අනුදිසාය සත්තා -පෙ- සබ්බෙ දක්ඛිණාය අනුදිසාය සත්තා -පෙ- සබ්බෙ හෙට්ඨිමාය දිසාය සත්තා -පෙ- සබ්බෙ උපරිමාය දිසාය සත්තා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු සබ්බෙ පුරත්ථිමාය දිසාය පාණා -පෙ- භූතා -පෙ- පුග්ගලා -පෙ- අත්තභාවපරියාපන්නා -පෙ- සබ්බා ඉත්ථියො -පෙ- සබ්බෙ පුරිසා -පෙ- සබ්බෙ අරියා -පෙ- සබ්බෙ අනරියා -පෙ සබ්බෙ දෙවා -පෙ- සබ්බෙ මනුස්සා -පෙ- සබ්බෙ විනිපාතිකා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු. සබ්බෙ පච්ඡිමාය දිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ උත්තරාය දිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ දක්ඛිණාය දිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ පුරත්ථිමාය අනුදිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ පච්ඡිමාය අනුදිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ උත්තරාය අනුදිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ දක්ඛිණාය අනුදිසාය විනිපාතිකා -පෙ සබ්බෙ හෙට්ඨිමාය දිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තූති ඉමෙහි දසහාකාරෙහි දිසාඵරණා මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙසං සත්තානං පීළනං වජ්ජෙත්වා අපීළනාය, උපඝාතං වජ්ජෙත්වා අනුපඝාතෙන, සන්තාපං වජ්ජෙත්වා අසන්තාපෙන, පරියාදානං වජ්ජෙත්වා අපරියාදානෙන, විහෙසං වජ්ජෙත්වා අවිහෙසාය සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු. මා වෙරිනො, සුඛිනො හොන්තු මා දුක්ඛිනො, සුඛිතත්තා හොන්තු මා දුක්ඛිතත්තා'ති. ඉමෙහි අට්ඨහාකාරෙහි සබ්බෙ සත්තෙ[1] මෙත්තායතීති මෙත්තා, තං ධම්ම චෙතයතීති චෙතො, සබ්බබ්‍යාපාදපරියුට්ඨානෙහි විමුච්චතීති විමුත්ති, මෙත්තා ච චෙතො ච විමුත්ති චාති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සද්ධාය අධිමුච්චති, සද්ධින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති විරියං පග්ගණ්හාති, විරියින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සතිං උපට්ඨාපෙති, සතින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති චිත්තං සමාදහති, සමාධින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති පඤ්ඤාය පජානාති, පඤ්ඤින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති

1 සබ්බ සත්තා - PTS

කවර දස අයුරෙකින් දිශාවන්හි පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්ති වේ ද යත්: පැදුන් දිග හැම සත්හු වෛර නැති වැ ව්‍යාපාද නැති වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත්වා. පැලදිග හැම සත්හු... උතුරු දිග හැම සත්හු ... දකුණුදිග හැම සත්හු ... පැදුන් අනුදිග හැම සත්හු ... පැලඅනුදිග හැම සත්හු ... උතුරු අනුදිග හැම සත්හු ... දකුණුඅනුදිග හැම සත්හු ... යටදෙස හැම සත්හු ... උඩදෙස හැම සත්හු වෛර නැති වැ ව්‍යාපාද නැති වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත්වා. පෙරදිග හැම ප්‍රාණයෝ ... භූතයෝ ... පුද්ගලයෝ ආත්මභාවපර්යාපන්නයෝ ... හැම ස්ත්‍රීහු ... හැම පුරුෂයෝ ... හැම ආර්යයෝ ... හැම අනාර්යයෝ ... හැම දෙවියෝ ... හැම මිනිස්හු හැම විනිපාතිකයෝ වෛර නැති වැ ව්‍යාපාද නැති වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත්වා. පැලදිග හැම විනිපාතිකයෝ ... උතුර දිග හැම විනිපාතිකයෝ ... දකුණුදිග හැම විනිපාතිකයෝ ... පැදුන්අනුදිග හැම විනිපාතිකයෝ ... පැලඅනුදිග හැම විනිපාතිකයෝ ... උතුරුඅනුදිග හැම විනිපාතිකයෝ ... දකුණුදිග හැම විනිපාතිකයෝ .. යටදෙස හැම විනිපාතිකයෝ ... උඩදෙස හැම විනිපාතිකයෝ වෛර නැති වැ ව්‍යාපාද නැති වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත්වා'යි මේ දස අයුරින් දිශාවන්හි පැතිරීම් ඇති මෛත්‍රී චිත්තවිමුක්ති වේ.

හැම සතුන් පිළිබඳ (අභ්‍යන්තර වශයෙන්) පෙළීම (තම සිතින්) හැරපියා නො පෙළෙන අයුරින්, (බාහිර වශයෙන්) ශරීරහිංසා හැරපියා අහිංසාකාරයෙන් සිත් තැවුලී හැරපියා නො තැවුලී අයුරින් ජීවිතාදී වස්තූන්ගේ ක්ෂයවීම හැරපියා අපරියාදානාකාරයෙන් (මෙරමා කෙරෙන්) දිවිවෙහෙස හැරපියා අවිහිංසාකාරයෙන් හැම සත්හු අවෛරීහු වෙත්වා, නහමක් වෛරීහු වෙත්වා, සුවපත් වෙත්වා නහමක් දුක්පත් වෙත්වා, සුඛිතාත්ම වෙත්වා නහමක් දුඃඛිතාත්ම වෙත්වා'යි මේ අට අයුරින් හැම සත්නට මෙත් වඩා නු'යි මෛත්‍රී නමු ඒ ධර්මය සිතා නු'යි චිත්ත නම. (මෛත්‍රියට ප්‍රතිපක්ෂ වූ) හැම ව්‍යාපාදසමුදාචාරයන් කෙරෙන් මිදේ නු'යි විමුක්ති නමු. මෛත්‍රිය ද චිත්තය ද විමුක්තිය ද'යි මෛත්‍රීචිත්තවිමුක්ති නමු.

හැම සත්හු අවෛරීහු වෙත්වා, නිභීය වෙත්වා සුවපත් වෙත්වා'යි ශ්‍රද්ධායෙන් අධිමුක්ත වේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ශ්‍රද්ධෙන්ද්‍රියයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා, නිභීය වෙත්වා, සුවපත් වෙත්වා'යි වීර්‍ය ප්‍රග්‍රහ කෙරේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය වීර්‍යෙන්ද්‍රියයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා, නිභීය වෙත්වා, සුවපත් වෙත්වා'යි සිහි එළවා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ස්මෘතීන්ද්‍රියයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා, නිභීය වෙත්වා, සුවපත් වෙත්වා'යි සිත පිහිටුවා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය සමාධීන්ද්‍රියයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා, නිභීය වෙත්වා, සුවපත් වෙත්වා'යි ප්‍රඥායෙන් දැනගනී නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රඥෙන්ද්‍රියයෙන් පරිභාවිත වූවා වේ.

ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා භාවනා හොන්ති, ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති භාවීයති. ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා බහුලීකතා හොන්ති, ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති බහුලීකරීයති ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා අලඞ්කාරා හොන්ති, ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති ස්වාලඞ්කතා හොති. ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා පරික්ඛාරා හොන්ති, ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරික්ඛතා හොති ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා පරිවාරා හොන්ති, ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරිවුතා හොති.

ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, භාවනා හොන්ති, බහුලීකතා හොන්ති, අලඞ්කාරා හොන්ති, පරික්ඛාරා හොන්ති, පරිවාරා හොන්ති, පාරිපූරී හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති, පක්ඛන්දනා හොන්ති, සංසීදනා[1] හොන්ති, පතිට්ඨනා හොන්ති, විමුච්චනා හොන්ති, 'එතං සන්ත'න්ති ඵස්සනා හොන්ති, යානීකතා හොන්ති, වත්ථුකතා හොන්ති, අනුට්ඨිතා හොන්ති, පරිචිතා හොන්ති, සුසමාරද්ධා හොන්ති, සුභාවිතා හොන්ති, ස්වාධිට්ඨිතා හොන්ති, සුසමුග්ගතා හොන්ති, සුවිමුත්තා හොන්ති, නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පභාසෙන්ති.[2]

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති අස්සද්ධියෙ න කම්පති, සද්ධාබලපරිභාවිතා[3] හොති මෙත්තා චෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති කොසජ්ජෙ න කම්පති, විරියබලපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති පමාදෙ න කම්පති, සතිබලපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති උද්ධච්චෙ න කම්පති, සමාධිබලපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති අවිජ්ජාය න කම්පති, පඤ්ඤාබලපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති

1 පසීදනා - මජසං., PTS
2 පතාපෙන්ති - මජසං., සහං. පකාසෙන්ති - PTS
3. සද්ධාබලං පරිභාවිතා - PTS,

මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියගේ ආසේවනයෝ වෙති. මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි. මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියගේ භාවනයෝ වෙති, මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය වඩනා ලැබෙයි මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියගේ බහුලීකෘතයෝ වෙති මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය බහුල (පුනපුනා) කරනු ලැබෙයි. මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට අලංකාර වෙති, මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට අලංකාර කරනලද වෙයි මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට පරිෂ්කාර වෙති. මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය සුපරිෂ්කෘත වෙයි. මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට පිරිවර වෙති, මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රී චිත්තවිමුක්තිය මොනොවට පිරිවරනලද වේ.

මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියගේ ආසේවනයෝ වෙති, භාවනයෝ වෙති, බහුලීකෘතයෝ වෙති, අලඞ්කාරයෝ වෙති, පරිෂ්කාරයෝ වෙති, පරිවාරයෝ වෙති, පරිපූර්ණභාවයෝ වෙති, සහගතයෝ වෙති, සහජාතයෝ වෙති, සංසෘෂ්ටයෝ වෙති, සම්ප්‍රයුක්තයෝ වෙති, ප්‍රස්කන්දන (ප්‍රවේශන) යෝ වෙති, සංසීදනයෝ වෙති, සන්නිට්ඨාන (ඡධ්‍යාසථකාරණ) යෝ වෙති. විමුක්තිකාරණයෝ වෙති, 'තෙල ශාන්ත යැ'යි ස්පර්ශීකාරණයෝ වෙති. යානීකෘතයෝ වෙති, වාස්තුකෘතයෝ වෙති. අනුෂ්ඨිතයෝ (එලඹසිටියාහු) වෙති, පරිචිතයෝ වෙති, සුසමාරබ්ධයෝ වෙති, සුභාවිතයෝ වෙති, සුපිහිටියාහු වෙති, සුසමුද්ඝාතයෝ වෙති, සුවිමුක්තයෝ වෙති, (මෛත්‍රිය) නිපදවති, ප්‍රකට කෙරෙති, බබළවත්.

හැම සත්හු අවෛරීහු වෙත්වා නිභීය වෙත්වා සුවපත් වෙත්වා'යි අශ්‍රද්ධායෙහි නො සැලේ නම් මෛත්‍රී චිත්තවිමුක්තිය ශ්‍රද්ධායෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා නිභීය වෙත්වා සුවපත් වෙත්වා'යි කුසීදභාවයෙහි නොසැලේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය වීර්‍ය්‍යබලයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා නිභීය වෙත්වා සුවපත් වෙත්වා'යි ප්‍රමාදයෙහි නො සැලේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ස්මෘතිබලයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා නිභීය වෙත්වා සුවපත් වෙත්වා'යි උද්ධතභාවයෙහි නො සැලේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය සමාධිබලයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා නිභීය වෙත්වා සුවපත් වෙත්වා'යි අවිද්‍යායෙහි නො සැලේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රඥාබලයෙන් පරිභාවිත වූවා වේ.

ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තා චෙතොවිමුත්ති ආසෙවීයති, ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතොවිමුත්තියා භාවනා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තාචෙතොවිමුත්ති භාවීයති, ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතොවිමුත්තියා බහුලීකතා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තා-චෙතොවිමුත්ති බහුලීකරීයති, ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතො-විමුත්තියා අලඞ්කාරා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තාචෙතො-විමුත්ති ස්වාලඞ්කතා හොති. ඉමානි පඤ්ච බලානි මෙත්තායචෙතොවිමුත්තියා පරික්ඛාරා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරික්ඛතා හොති. ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතොවිමුත්තියා පරිවාරා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරිවුතා හොති.

ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, භාවනා හොන්ති, බහුලීකතා හොන්ති, අලඞ්කාරා හොන්ති, පරික්ඛාරා හොන්ති, පරිවාරා හොන්ති, පාරිපූරී හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති, පක්ඛන්දනා හොන්ති, පසීදනා හොන්ති, සන්තිට්ඨනා හොන්ති, විමුච්චනා හොන්ති, 'එතං සන්ත'න්ති ඵස්සනා හොන්ති, යානීකතා හොන්ති, වත්ථුකතා හොන්ති, අනුට්ඨිතා හොන්ති, පරිචිතා හොන්ති, සුසමාරද්ධා හොන්ති, සුභාවිතා හොන්ති, ස්වාධිට්ඨිතා හොන්ති, සුසමුග්ගතා හොන්ති, සුවිමුත්තා හොන්ති, නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පතාපෙන්ති

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සතිං උපට්ඨාපෙති, සතිසම්බොජ්ඣඞ්ග[1] පරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති පඤ්ඤාය පවිචිනාති[2] ධම්මවිචයසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති විරියං පග්ගණ්හාති, විරියසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති පරිළාහං පටිප්පස්සම්භෙති, පීතිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති දුට්ඨුල්ලං පටිප්පස්සම්භෙති, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු. ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති චිත්තං සමාදහති, සමාධිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති ඤාණෙන කිලෙසෙ පටිසඞ්ඛාති, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග-පරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

1 සතිසම්බොජ්ඣඞ්ගං පරිභාවිතා - PTS,
2. පරිවිචිනාති - PTS

මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට භාවනයෝ වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය වඩනා ලැබෙයි. මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට බහුලීකෘතයෝ වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය බහුල කරනු ලැබෙයි. මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට අලඞ්කාරයෝ වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට අලඞ්කාර කරනලද වෙයි. මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට පරිෂ්කාර (සම්භාර) යෝ වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය සුපරිෂ්කෘත වෙයි. මේ පඤ්චබලයෝ මෛත්‍රී චිත්තවිමුක්තියට පිරිවර වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට පිරිවරනලද වේ.

මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, භාවනයෝ වෙති. බහුලීකෘතයෝ වෙති, අලඞ්කාරයෝ වෙති, පරිෂ්කාරයෝ වෙති. පරිවාරයෝ වෙති, පරිපූර්ණභාවයෝ වෙති, සහගතයෝ වෙති, සහජාතයෝ වෙති, සංසෘෂ්ටයෝ වෙති, සම්ප්‍රයුක්තයෝ වෙති, ප්‍රස්කන්දනයෝ වෙති, ප්‍රසීදනයෝ වෙති, සන්තිෂ්ඨනයෝ වෙති, විමුක්තිකාරණයෝ වෙති, 'තෙල මෛත්‍රිය ශාන්ත යැ යි සපශ්‍යකාරණයෝ වෙති, යානීකෘතයෝ වෙති, වාස්තුකෘතයෝ වෙති, අනුෂ්ඨිතයෝ වෙති, පරිචිතයෝ වෙති, සුසමාරබ්ධයෝ වෙති, සුභාවිතයෝ වෙති, සුප්‍රතිෂ්ඨිතයාහු වෙති' සුසමුත්පිත වෙති, සුවිමුක්ත වෙති, (මෛත්‍රීචිත්තවිමුක්තිය) නිපදවති, ප්‍රකට කෙරෙති, බබුළුවති.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, භය රහිතයෝ වෙත්වා සුවපත් වෙත්වා'යි සිහි එළවා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ස්මෘතිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, භය රහිතයෝ වෙත්වා, සුවපත් වෙත්වා'යි ප්‍රඥයෙන් විමසා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ධර්මවිචයසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, භය රහිතයෝ වෙත්වා සුවපත් වෙත්වා'යි වීර්‍ය්‍ය ප්‍රග්‍රහ කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, භය රහිතයෝ වෙත්වා, සුවපත් වෙත්වා'යි (ක්ලේශ) පරිදාහය සන්හිඳුවා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රීතිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා භය රහිතයෝ වෙත්වා සුවපත් වෙත්වා'යි අශාන්තභාවය සන්හිඳුවා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, භය රහිතයෝ වෙත්වා, සුවපත් වෙත්වා'යි සිත පිහිටුවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සමාධිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, භය රහිතයෝ වෙත්වා, සුවපත් වෙත්වා'යි නුවණින් කෙලෙසුන් ප්‍රත්‍යවෙක්ෂා කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වේ.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා භාවනා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති භාවීයති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා බහුලීකතා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති බහුලීකරීයති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා අලඞ්කාරා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තා චෙතොවිමුත්ති ස්වාලඞ්කතා හොති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා පරික්ඛාරා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරික්ඛතා හොති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා පරිවාරා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරිවුතා හොති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, භාවනා හොන්ති, බහුලීකතා හොන්ති, අලඞ්කාරා හොන්ති, පරික්ඛාරා හොන්ති, පරිවාරා හොන්ති, පාරිපූරී හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති, පක්ඛන්දනා හොන්ති, පසීදනා හොන්ති, සන්තිට්ඨනා හොන්ති, විමුච්චනා හොන්ති, එතං සන්ත'න්ති ඵස්සනා හොන්ති, යානීකතා හොන්ති, වත්ථුකතා හොන්ති, අනුට්ඨිතා හොන්ති, පරිචිතා හොන්ති, සුසමාරද්ධා හොන්ති, සුභාවිතා හොන්ති, ස්වාධිට්ඨිතා හොන්ති, සුසමුග්ගතා හොන්ති, සුවිමුත්තා හොන්ති, නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පතාපෙන්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා පස්සති, සම්මාදිට්ඨිපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා අභිනිරොපෙති, සම්මාසඞ්කප්පපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා පරිග්ගණ්හාති, සම්මාවාචා පරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා සමුට්ඨාපෙති, සම්මාකම්මන්තපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා වොදාපෙති, සම්මාආජීවපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති. මේ සප්තබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට භාවනයෝ වෙති, මේ සප්තබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය වඩනා ලැබෙයි.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට බහුලීකෘතයෝ වෙති, මේ සප්තබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය බහුල කරනු ලැබෙයි.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට අලඞ්කාරයෝ වෙති, මේ සප්තබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට අලංකාර කරනලද වෙයි.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට පරිෂ්කාරයෝ වෙති, මේ සප්තබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය සුපරිෂ්කෘත වෙයි.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට පරිවාරයෝ වෙති මේ සතපබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට පරිවරන ලද වේ.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, භාවනයෝ වෙති, බහුලීකෘතයෝ වෙති, අලඞ්කාරයෝ වෙති, පිරිකර වෙති, පිරිවර වෙති, පරිපූර්ණභාවයෝ වෙති, සහගියෝ වෙති, සහජාතයෝ වෙති, සංසෘෂ්ටයෝ වෙති, සම්ප්‍රයුක්තයෝ වෙති, ප්‍රස්කන්දනයෝ වෙති, ප්‍රසීදනයෝ වෙති, සන්තිට්ඨනයෝ වෙති, විමුක්තිකාරණයෝ වෙති, තෙල (මෛත්‍රීචිත්තවිමුක්තිය) ශාන්ත යැ'යි සපශීකාරණයෝ වෙති, යානීකෘතයෝ වෙති, වාස්තුකෘතයෝ වෙති, අනුෂ්ඨිතයෝ වෙති, පරිචිතයෝ වෙති, සුසමාරබ්ධයෝ වෙති, සුභාවිතයෝ වෙති, සුපිහිටියාහු වෙති, සුසමූත්පිත වෙති, සුවිමුක්ත වෙති, (මෛත්‍රීචිත්තවිමුක්තිය) නිපදවති, ප්‍රකට කෙරෙති, බබුළුවත්.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි මොනොවට දකී නම් මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යග්දෘෂ්ටි විසින් හාත්පසින් වඩනලද වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි මැනැවින් අරමුණට නඟා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්-සංකල්පය විසින් මොනොවට වඩනාලද වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි මොනොවට පරිග්‍රහ කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යග්-වචන විසින් මොනොවට වඩනලද වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි (ත්‍රිවිධකායසංවරය) මොනොවට සහාතබා නම්, මෛත්‍රීචිත්ත-විමුක්තිය සම්‍යක් කර්මාන්ත විසින් හාත්පසින් වඩනාලද වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි මොනොවට පරිශුද්ධ කරවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍ය-ගාජීව විසින් හාත්පසින් වඩනාලද වෙයි.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා පග්ගණ්හාති, සම්මාවායාමපරිභාවිතා හොති මෙත්තා-චෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා උපට්ඨාපෙති, සම්මාසතිපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා සමාදහති සම්මාසමාධිපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ත

ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති, ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා භාවනා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතො විමුත්ති භාවීයති ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා බහුලීකතා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති බහුලීකරීයති. ඉමෙ අට්ඨමග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා අලඞ්කාරා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති ස්වාලඞ්කතා හොති. ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා පරික්ඛාරා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තා-චෙතොවිමුත්ති සුපරික්ඛතා හොති. ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා පරිවාරා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තා-චෙතොවිමුත්ති සුපරිවුතා හොති.

ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, භාවනා හොන්ති, බහුලීකතා හොන්ති, අලඞ්කාරා හොන්ති, පරික්ඛාරා හොන්ති, පරිවාරා හොන්ති. පාරිපූරී හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති, පක්ඛන්දනා හොන්ති, පසීදනා හොන්ති, සන්තිට්ඨනා හොන්ති, විමුච්චනා හොන්ති, 'එතං සන්ත'න්ති ඵස්සනා හොන්ති, යානීකතා හොන්ති, වත්ථුකතා හොන්ති අනුට්ඨිතා හොන්ති, පරිචිතා හොන්ති, සුසමාරද්ධා හොන්ති, ස්වාධිට්ඨිතා හොන්ති, සුසමුග්ගතා හොන්ති, සුවිමුත්තා හොන්ති, නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පතාපෙන්ති.

සබ්බෙසං පාණානං -පෙ- සබ්බෙසං භූතානං -පෙ- සබ්බෙසං පුග්ගලානං -පෙ- සබ්බෙසං අත්තභාවපරියාපන්නානං -පෙ සබ්බෙසං ඉත්ථීනං -පෙ- සබ්බෙසං පුරිසානං -පෙ- සබ්බෙසං අරියානං -පෙ- සබ්බෙසං අනරියානං -පෙ- සබ්බෙසං දෙවානං -පෙ- සබ්බෙසං මනුස්සානං -පෙ- සබ්බෙසං විනිපාතිකානං පීළනං වජ්ජෙත්වා අපීළනාය, උපඝාතං වජ්ජෙත්වා අනුපඝාතෙන, සන්තාපං වජ්ජෙත්වා අසන්තාපෙන, පරියාදානං වජ්ජෙත්වා අපරියාදානෙන, විහෙසං වජ්ජෙත්වා අවිහෙසාය, සබ්බෙ විනිපාතිකා අවෙරිනො හොන්තු, මා වෙරිනො, සුඛිනො හොන්තු, මා දුක්ඛිනො, සුඛිතත්තා හොන්තු, මා දුක්ඛිතත්තාති ඉමෙහි අට්ඨහාකාරෙහි සබ්බෙ විනිපාතිකෙ මෙත්තායතීති මෙත්තා, තං ධම්මං චෙතයතීති චෙතො, සබ්බබ්‍යාපාද පරියුට්ඨානෙහි විමුච්චතීති විමුත්ති, මෙත්තා ච චෙතො ච විමුත්ති චාති මෙත්තාචෙතොවිමුත්ති.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි මොනොවට ප්‍රග්‍රහ කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යග්-ව්‍යායාම විසින් භාත්පසින් වඩනාලද වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්ව,යි මොනොවට අරමුණෙහි සිත එළවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්ස්මෘති විසින් භාත්පසින් වඩනාලද වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්ව'යි මොනොවට සිත පිහිටුවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්-සමාධි විසින් භාත්පසින් වඩනාලද වේ.

මේ මාර්ගාඞ්ගයෝ අට දෙන මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙනා විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි. මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට භාවනයෝ වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙන විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය වඩනා ලැබෙයි. මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට බහුලීකෘතයෝ වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙන විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය බහුල (පුනපුනා) කරනු ලැබෙයි මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට අලඞ්කාරයෝ වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙනා විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට අලඞ්කාර කරනලද වෙයි, මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට පිරිකර වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙනා විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය පරිෂ්කෘත වෙයි. මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට පිරිවර වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙන විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට පිරිවරනලද වේ.

මේ මාර්ගාඞ්ගයෝ අටදෙනා මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, භාවනයෝ වෙති, බහුලීකෘතයෝ වෙති, අලඞ්කාරයෝ වෙති, පරිෂ්කාරයෝ වෙති, පරිවාරයෝ වෙති, පරිපූර්ණභාවයෝ වෙති, සහගතයෝ වෙති, සහජාතයෝ වෙති, සංසෘෂ්ටයෝ වෙති, සම්ප්‍රයුක්තයෝ වෙති, ප්‍රස්කන්ද-නයෝ වෙති, ප්‍රසීදනයෝ වෙති, සන්තිට්ඨනයෝ වෙති, විමුක්තිකාරණයෝ වෙති, 'මෙල මෛත්‍රීචිත්තවිමුක්තිය ශාන්ත යැ යි සපර්ශකාරණයෝ වෙති, යානීකෘතයෝ වෙති, වාස්තුකෘතයෝ වෙති, අනුෂ්ඨිතයෝ (එළඹිසිටියාහු) වෙති, පරිචිතයෝ වෙති, සුසමාරබ්ධයෝ වෙති. මොනොවට පිහිටියාහු වෙති, සුසමුත්ථිතයෝ වෙති, සුවිමුක්තයෝ වෙති, (මෛත්‍රීචිත්තවිමුක්තිය) නිපදවති, ප්‍රකට කෙරෙති, බබුළුවත්.

හැම ප්‍රාණයන් පිළිබඳ .. හැම භූතයන් පිළිබඳ ... හැම පුද්ගලයන් පිළිබඳ ... හැම ආත්මභාවපර්යාපන්නයන් පිළිබඳ .. හැම මාගමුන් පිළිබඳ ... හැම පිරිමිනින් පිළිබඳ...හැම ආර්යයන් පිළිබඳ... හැම අනාර්යයන් පිළිබඳ... හැම දෙවියන් පිළිබඳ .. හැම මිනිසුන් පිළිබඳ ... හැම විනිපාතිකයන් පිළිබඳ (අභ්‍යන්තරශරීර) පීඩනය (තම සිතින්) හැරපියා අපීඩනාකාරයෙන් බාහිර-ශරීරහිංසාව හැරපියා අහිංසාකාරයෙන් (මනස්) සන්තාපය හැරපියා අසන්තාපාකාරයෙන්, ජීවිතාදිපරික්ෂය හැරපියා අපරියාදානාකාරයෙන්, මෙරමා කෙරෙන් ජීවිතාදිවිහිංසාව හැරපියා අවිහිංසාකාරයෙන්, හැම විනිපාතිකයෝ වෛර නැත්තාහු වෙත්වා, නහමක් වෛරීහු වෙත්වා. සුවපත් වෙත්වා, නහමක් දුක්පත් වෙත්වා, සුඛිතාත්මයෝ වෙත්වා, නහමක් දුඃඛිතාත්මයෝ වෙත්ව'යි මේ අට අයුරින් හැම විනිපාතිකයන්ට මෙත් වඩා නු'යි 'මෙත්තා' නමු. ඒ ධර්මය සිතා නු,යි 'චෙතො' නම, (මෛත්‍රී-ප්‍රතිපක්ෂ) හැම ව්‍යාපාදපර්යුත්ථානයන් කෙරෙන් විමුක්ත වේ නු'යි 'විමුත්ති' නමු. මෙත්තා ද චෙතො ද විමුත්ති දු'යි 'මෙත්තාචෙතොවිමුත්ති' නමු.

සබ්බෙ විනිපාතිකා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සද්ධාය අධිමුච්චති, සද්ධින්ද්‍රිය පරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති -පෙ- නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පකාසෙන්ති.

සබ්බෙසං පුරත්ථිමාය දිසාය සත්තානං -පෙ- සබ්බෙසං පච්ඡිමාය දිසාය සත්තානං -පෙ- සබ්බෙසං උත්තරාය දිසාය සත්තානං -පෙ- සබ්බෙසං දක්ඛිණාය දිසාය සත්තානං -පෙ- සබ්බෙසං පුරත්ථිමාය අනුදිසාය සත්තානං -පෙ- සබ්බෙසං පච්ඡිමාය අනුදිසාය සත්තානං -පෙ- සබ්බෙසං උත්තරාය අනුදිසාය සත්තානං -පෙ- සබ්බෙසං දක්ඛිණාය අනුදිසාය සත්තානං -පෙ- සබ්බෙසං හෙට්ඨිමාය දිසාය සත්තානං -පෙ- සබ්බෙසං උපරිමාය දිසාය සත්තානං පීළනං වජ්ජෙත්වා අපීළනාය උපඝාතං වජ්ජෙත්වා අනුපඝාතෙන, සන්තාපං වජ්ජෙත්වා අසන්තාපෙන, පරියාදානං වජ්ජෙත්වා අපරියාදානෙන, විහෙසං වජ්ජෙත්වා, අවිහෙසාය සබ්බෙ උපරිමාය දිසාය සත්තා අවෙරිනො හොන්තු, මා වෙරිනො, සුඛිනො හොන්තු, මා දුක්ඛිනො, සුඛිතත්තා හොන්තු, මා දුක්ඛිතත්තාති ඉමෙහි අට්ඨහාකාරෙහි සබ්බෙ උපරිමාය දිසාය සත්තෙ මෙත්තායතීති මෙත්තා, තං ධම්මං චෙතයතීති චෙතො, සබ්බබ්‍යාපාදපරියුට්ඨානෙහි විමුච්චතීති විමුත්ති, මෙත්තා ච චෙතො ච විමුත්ති චාති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ උපරිමාය දිසාය සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සද්ධාය අධිමුච්චති, සද්ධින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පකාසෙන්ති.

සබ්බෙසං පුරත්ථිමාය දිසාය පාණානං -පෙ- භූතානං -පෙ- පුග්ගලානං -පෙ- අත්තභාවපරියාපන්නානං -පෙ- සබ්බාසං ඉත්ථීනං -පෙ- සබ්බෙසං පුරිසානං -පෙ- සබ්බෙසං අරියානං -පෙ- සබ්බෙසං අනරියානං -පෙ- සබ්බෙසං දෙවානං -පෙ- සබ්බෙසං මනුස්සානං -පෙ- සබ්බෙසං විනිපාතිකානං -පෙ- සබ්බෙසං පච්ඡිමාය දිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං උත්තරාය දිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං දක්ඛිණාය දිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං පුරත්ථිමාය අනුදිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං පච්ඡිමාය අනුදිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං උත්තරාය අනුදිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං දක්ඛිණාය අනුදිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං හෙට්ඨිමාය දිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං උපරිමාය දිසාය විනිපාතිකානං පීළනං වජ්ජෙත්වා අපීළනාය, උපඝාතං වජ්ජෙත්වා අනුපඝාතෙන, සන්තාපං වජ්ජෙත්වා අසන්තාපෙන, පරියාදානං වජ්ජෙත්වා අපරියාදානෙන, විහෙසං වජ්ජෙත්වා අවිහෙසාය සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරිනො හොන්තු, මා වෙරිනො. සුඛිනො හොන්තු, මා දුක්ඛිනො. සුඛිතත්තා හොන්තු, මා දුක්ඛිතත්තාති ඉමෙහි අට්ඨහාකාරෙහි සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකෙ මෙත්තායතීති මෙත්තා, තං ධම්මං චෙතයතීති චෙතො, සබ්බබ්‍යාපාදපරියුට්ඨානෙහි විමුච්චතීති විමුත්ති, මෙත්තා ච චෙතො ච විමුත්ති චාති මෙත්තාචෙතොවිමුත්ති.

හැම විනිපාතිකයෝ වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි ශ්‍රද්ධායෙන් අධිමුක්ත වේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ශ්‍රද්ධෙන්ද්‍රිය විසින් පරිභාවිත වෙයි ... නිපදවති, ප්‍රකට කෙරෙති, බබුළුවත්.

පැදුන්දෙස හැම සතුන් පිළිබඳ ... පැසිම්දෙස හැම සතුන් පිළිබඳ ... උතුරුදෙස හැම සතුන් පිළිබඳ ... දකුණුදෙස හැම සතුන් පිළිබඳ ... පැදුන්අනුදෙස හැම සතුන් පිළිබඳ ... පැසිම් අනුදෙස හැම සතුන් පිළිබඳ ... උතුරු අනුදෙස හැම සතුන් පිළිබඳ ... දකුණු අනුදෙස හැම සතුන් පිළිබඳ ... යටදෙස හැම සතුන් පිළිබඳ ... උඩදෙස හැම සතුන් පිළිබඳ .. (අභ්‍යන්තර ශරීර) පීඩනය (තම සිතින්) හැර පියා අපීඩනාකාරයෙන් බාහිරශරීරහිංසා හැරපියා අහිංසාකාරයෙන්, චිත්තසන්තාපය හැරපියා අසන්තාපාකාරයෙන්, ජීවිතපරියාදානය හැරපියා අපරියාදානාකාරයෙන් ජීවිතවිහෙසාව හැරපියා අවිහෙසාකාරයෙන්, උඩදෙස හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නහමක් වෛරීහු වෙත්වා සුවපත් වෙත්වා, නහමක් දුක්පත් වෙත්වා සුඛිතාත්ම වෙත්වා, නහමක් දුඃඛිතාත්ම වෙත්වා'යි මේ අට අයුරින් උඩදෙස හැම සත්නට මෙත් වඩාතු'යි 'මෛත්‍රී නමු. ඒ ධර්මය සිතා තු'යි 'චිත්ත' නම. ('මෛත්‍රීප්‍රතිපක්‍ෂ) හැම ව්‍යාපාදපර්‍යවස්ථානයන් කෙරෙන් මිදේ තු'යි විමුක්ති නමු. මෛත්‍රී ද චිත්ත ද විමුක්ති දු'යි 'මෛත්‍රීචිත්තවිමුක්ති නමු.

උඩදෙස හැම සත්හු අවෛරීහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි ශ්‍රද්ධායෙන් අධිමුක්ත වේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ශ්‍රද්ධෙන්ද්‍රිය විසින් පරිභාවිත වූවා වෙයි නිපදවති, පාල කෙරෙති, බබුළුවත්.

පැදුන්දෙස හැම ප්‍රාණයන් පිළිබඳ .. භූතයන් ... පුද්ගලයන් ආත්මභාවපර්‍යාපන්නයන් පිළිබඳ ... හැම ස්ත්‍රීන් ... හැම පුරුෂයන් ... හැම ආර්‍යයන් ... හැම අනාර්‍යයන් ... හැම දෙවියන් ... හැම මිනිසුන් .. හැම විනිපාතිකයන් පිළිබඳ ... පැදුන්දෙස හැම විනිපාතිකයන් ... පැසිම් දෙස හැම විනිපාතිකයන් ... උතුරුදෙස හැම විනිපාතිකයන් ... දකුණුදෙස හැම විනිපාතිකයන් ... පැදුන් අනුදෙස හැම විනිපාතිකයන් ... පැසිම් අනුදෙස හැම විනිපාතිකයන් ... උතුරු අනුදෙස හැම විනිපාතිකයන් ... දකුණු අනුදෙස හැම විනිපාතිකයන් ... යටදෙස හැම විනිපාතිකයන් ... උඩදෙස හැම විනිපාතිකයන් පිළිබඳ පීඩනය හැරපියා අපීඩනාකාරයෙන්, උපඝාතය හැරපියා අනුපඝාතාකාරයෙන්, සන්තාපය හැරපියා අසන්තාපාකාරයෙන්, පරියාදානය හැරපියා අපරියාදානාකාරයෙන්, විහෙසාව හැරපියා අවිහෙසාකාරයෙන්, උඩදෙස හැම විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා, නහමක් වෛරීහු වෙත්වා. සුඛීහු වෙත්වා, නහමක් දුඃඛීහු වෙත්වා. සුඛිතාත්මයෝ වෙත්වා, නහමක් දුඃඛිතාත්ම වෙත්වා'යි මේ අට අයුරින් උඩදෙස හැම විනිපාතිකයනට මෙත් වඩාතු'යි 'මෛත්‍රී' නමු ඒ ධර්මය සිතාතු'යි 'චිත්ත' නමු. හැම ව්‍යාපාදපර්‍යවස්ථානයන් කෙරෙන් මිදේ තු' යි විමුක්ති නමු. මෛත්‍රී ද චිත්ත ද විමුක්ති දු'යි 'මෛත්‍රීචිත්තවිමුක්ති' නමු

සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සද්ධාය අධිමුච්චති, සද්ධින්ද්‍රිය පරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති. සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති විරියං පග්ගණ්හාති, විරියින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති, -පෙ- සති උපට්ඨාපෙති, සතින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති -පෙ- චිත්තං සමාදහති, සමාධින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතො-විමුත්ති -පෙ- පඤ්ඤාය පජානාති, පඤ්ඤින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තා-චෙතොවිමුත්ති.

ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති -පෙ- නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පකාසෙන්ති.

සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති අස්සද්ධියෙ න කම්පති, සද්ධාබලපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- කොසජ්ජෙ න කම්පති, විරියබලපරි-භාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- පමාදෙ න කම්පති, සති බල-පරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- උද්ධච්චෙ න කම්පති, සමාධිබලපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- අවිජ්ජාය න කම්පති, පඤ්ඤාබලපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති -පෙ- නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පකාසෙන්ති.

සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සතිං උපට්ඨාපෙති, සතිසම්බොජ්ඣඞ්ග-පරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති -පෙ- පඤ්ඤාය පවිචිනාති, ධම්මවිචය සම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- විරියං පග්ගණ්හාති, විරියසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති -පෙ- පරිළාහං පටිප්පස්සම්භෙති, පීතිසම්බොජ්ඣඞ්ග-පරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- දුට්ඨුල්ලං පටිප්පස්සම්භෙති, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- චිත්තං සමාදහති, සමාධිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තා-චෙතොවිමුත්ති, ඤාණෙන කිලෙසෙ පටිසඞ්ඛාති, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග-පරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති -පෙ- නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පකාසෙන්ති.

හැම උබදෙස විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා, නිඝීය වෙත්වා, සුවපත් වෙත්වා'යි ශ්‍රද්ධායෙන් අධිමුක්ත වේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ශ්‍රද්ධෙන්ද්‍රිය විසින් පරිභාවිත වූවා වෙයි. උබදෙස හැම විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා, නිඝීය වෙත්වා, සුවපත් වෙත්වා'යි වීර්‍ය්‍යය ප්‍රග්‍රහ කෙරේ නම්, 'මෛත්‍රීචිත්තවිමුක්තිය වීර්‍ය්‍යෙන්ද්‍රිය විසින් පරිභාවිත වූවා වෙයි සිහි එළවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ස්මෘතීන්ද්‍රිය විසින් පරිභාවිත වූවා වෙයි-සිත පිහිටුවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සමාධීන්ද්‍රිය විසින් පරිභාවිත වූවා වෙයි, ප්‍රඥායෙන් දැනගනී නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රඥෙන්ද්‍රිය විසින් පරිභාවිත වූවා වේ.

මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි. ... නිර්‍ය්‍යීනය කෙරෙති, ද්‍යෝතනය කෙරෙති, ප්‍රකාශනය කෙරෙත්.

උබදෙස හැම විනිපාතිකයෝ වෛර නැත්තාහු වෙත්වා, නිඝීය වෙත්වා සුවපත් වෙත්වා'යි අශ්‍රද්ධායෙහි නො සැලේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ශ්‍රද්ධාබල විසින් පරිභාවිත වූවා වෙයි ... කෞසීද්‍යයෙහි නො සැලේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය වීර්‍ය්‍යබල විසින් පරිභාවිත වූවා වෙයි ප්‍රමාදයෙහි නො සැලේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ස්මෘතිබල විසින් පරිභාවිත වූවා වෙයි ... ඖද්ධත්‍යයෙහි නො සැලේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සමාධිබල විසින් පරිභාවිත වූවා වෙයි අවිද්‍යායෙහි නො සැලේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රඥාබල විසින් පරිභාවිත වූවා වේ.

මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි ... නිර්‍ය්‍යීනය කෙරෙති, ද්‍යෝතනය කෙරෙති, ප්‍රකාශනය කෙරෙත්

උබදෙස හැම විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා, නිඝීය වෙත්වා, සුවපත් වෙත්වා'යි සිහි එළවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ස්මෘතිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි ... ප්‍රඥායෙන් විමසා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ධර්මවිචයසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි ... වීර්‍ය්‍යය ප්‍රග්‍රහ කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි... ක්ලේශපරිදාහය සන්හිඳුවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රීතිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි ... අයහපත භාවය සන්හිඳුවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි, සිත සමාදහනය කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සමාධිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි, ඥානයෙන් ක්ලේශයන් ප්‍රත්‍යවේක්‍ෂා කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය උපේක්‍ෂාසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වේ

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති. මේ සප්තබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි උපදවති, බවුළුව පාළු කෙරෙති,ත්.

සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා පස්සති, සම්මාදිට්ඨිපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා අභිනිරොපෙති, සම්මාසඞ්කප්පපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා පරිග්ගණ්හාති, සම්මාවාචාපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා සමුට්ඨාපෙති, සම්මාකම්මන්තපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා වොදාපෙති, සම්මාආජීවපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා පග්ගණ්හාති, සම්මාවායාමපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා උපට්ඨාති, සම්මාසතිපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා සමාදහති, සම්මාසමාධිපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති -පෙ- ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා පරිවාරා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරිවුතා හොති.

ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, භාවනා හොන්ති, බහුලීකතා හොන්ති, අලඞ්කාරා හොන්ති, පරික්ඛාරා හොන්ති, පරිවාරා හොන්ති, පාරිපූරී හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති, පක්ඛන්දනා හොන්ති, පසීදනා හොන්ති, සන්තිට්ඨනා හොන්ති, විමුච්චනා හොන්ති, 'එතං සන්ත'න්ති ඵස්සනා හොන්ති, යානීකතා හොන්ති, වත්ථුකතා හොන්ති, අනුට්ඨිතා හොන්ති, පරිචිතා හොන්ති, සුසමාරද්ධා හොන්ති, සුභාවිතා හොන්ති, ස්වාධිට්ඨිතා හොන්ති, සුසමුග්ගතා හොන්ති, සුවිමුත්තා හොන්ති. නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පතාපෙන්තීති.

මෙත්තාකථා සමත්තා.

## 2. 5

## විරාග කථා

විරාගො මග්ගො, විමුත්ති ඵලං.

කථං විරාගො මග්ගො? සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මිච්ඡාදිට්ඨියා විරජ්ජති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විරජ්ජති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විරජ්ජති, විරාගො විරාගාරම්මණො විරාගගොචරො විරාගෙ සමුදාගතො[1] විරාගෙ ඨිතො විරාගෙ පතිට්ඨිතො.

1. සමොධාගතො-ස්‍යා සමොගතො - ස.

උපරිමදිශායෙහි හැම විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා, නිදුක වෙත්වා, සුවපත් වෙත්වා'යි මොනොවට දකී නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යග්දෘෂ්ටි විසින් පරිභාවිත වූවා වෙයි ... මොනොවට සිත අරමුණට නංවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්සංකල්ප විසින් පරිභාවිත වූවා වෙයි ... මොනොවට පරිග්‍රහ කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යග්වචන විසින් පරිභාවිත වූවා වෙයි ... (ත්‍රිවිධකායසංවරය) මොනොවට ඔසොවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්කර්මාන්ත විසින් පරිභාවිත වූවා වෙයි ... මොනොවට පරිශුද්ධකරවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යගාජීව විසින් පරිභාවිත වූවා වෙයි.. මොනොවට ප්‍රග්‍රහ කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යග්ව්‍යායාම විසින් පරිභාවිත වූවා වෙයි ... මොනොවට වටහා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්ස්මෘති විසින් පරිභාවිත වූවා වෙයි ... මොනොවට පිහිටුවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්සමාධි විසින් පරිභාවිත වූවා වේ.

මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙනා විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි ... මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට පරිවාරයෝ වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙනා විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට පිරිවරනලද වේ.

මේ අෂ්ටමාර්ගාඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසෙවනයෝ වෙති, භාවනයෝ වෙති, බහුලීකෘතයෝ වෙති, අලඞ්කාරයෝ වෙති, පරිෂ්කාරයෝ වෙති, පරිවාරයෝ වෙති, පරිපූර්ණභාවයෝ වෙති, සහගතයෝ වෙති, සහජාතයෝ වෙති, සංසෘෂ්ටයෝ වෙති, සම්ප්‍රයුක්තයෝ වෙති, ප්‍රස්කන්දන-යෝ වෙති, ප්‍රසීදනයෝ වෙති, සන්තිෂ්ඨනයෝ වෙති, විමුක්තිකාරණයෝ වෙති, 'මෙල (මෛත්‍රීචිත්තවිමුක්තිය) ශාන්ත යැ'යි ස්පර්ශකාරණයෝ වෙති, යානීකෘතයෝ වෙති, වාස්තුකෘතයෝ වෙති, අනුෂ්ඨිතයෝ වෙති, පරිචිත-යෝ වෙති, සුසමාරබ්ධයෝ වෙති, සුභාවිතයෝ වෙති, මොනොවට පිහිටියාහු වෙති, සුසමුත්ථිතයෝ වෙති, සුවිමුක්තයෝ වෙති, උපදවති, පාල කෙරෙති, බබුළුවත්.

මෛත්‍රීකථා නිමි.

## 2. 5

## විරාග කථා

විරාගය මාර්ග වෙයි, විමුක්තිය ඵල වෙයි.

කිසෙයිත් විරාගය මාර්ග වෙයි යත්: ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි දර්ශන-ස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙන් විරක්ත වෙයි, එය අනුව පවත්නා ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විරක්ත වෙයි. බාහ්‍ය වූත් හැම නිමිත්ත කෙරෙන් විරක්ත වෙයි, විරාග තෙම නිවන අරමුණු කොට ඇත්තේ යැ, නිවන ගොදුරු කොට ඇත්තේ යැ නිවන් අරමුණුහි උපන්නේ යැ නිවන්හි (ප්‍රවෘත්ති විසින්) සිටියේ යැ නිවන්හි (නො නවත්නා විසින්) පිහිටියේ යි.

**විරාගොති** ද්වෙ විරාගා: නිබ්බානඤ්ච විරාගො, යෙ ච නිබ්බානා-රම්මණතාජාතා ධම්මා සබ්බෙ විරාගා හොන්තීති විරාගා, සහජාතානි සත්තඞ්ගානි විරාගං ගච්ඡන්තීති විරාගො මග්ගො, එතෙන මග්ගෙන බුද්ධා ච සාවකා ච අගතං දිසං නිබ්බානං ගච්ඡන්තීති අට්ඨඞ්ගිකො මග්ගො, යාවතා පුථුසමණබ්‍රාහ්මණානං පරප්පවාදානං මග්ගා අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො අග්ගො ච සෙට්ඨො ච පාමොක්ඛො[1] ච උත්තමො ච පවරො චාති මග්ගානං අට්ඨඞ්ගිකො සෙට්ඨො

අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො මිච්ඡාසඞ්කප්පා විරජ්ජති -පෙ- පරිග්ගහට්ඨෙන සම්මාවාචා මිච්ඡාවාචාය විරජ්ජති -පෙ- සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො මිච්ඡාකම්මන්තා විරජ්ජති -පෙ- වොදානට්ඨෙන සම්මා-ආජීවො මිච්ඡාආජීවා විරජ්ජති -පෙ- පග්ගහට්ඨෙන සම්මාවායාමො මිච්ඡාවායාමා විරජ්ජති -පෙ- උපට්ඨානට්ඨෙන සම්මාසති මිච්ඡාසතියා විරජ්ජති -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි මිච්ඡාසමාධිතො විරජ්ජති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විරජ්ජති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විරජ්ජති, විරාගො විරාගාරම්මණො විරාගගොචරො විරාගෙ සමුදාගතො විරාගෙ ඨිතො විරාගෙ පතිට්ඨිතො

**විරාගොති** ද්වෙ විරාගා: නිබ්බානඤ්ච විරාගො, යෙච නිබ්බානා-රම්මණතාජාතා ධම්මා සබ්බෙ විරාගා හොන්තීති විරාගා, සහජාතානි සත්තඞ්ගානි විරාගං ගච්ඡන්තීති විරාගො මග්ගො, එතෙන මග්ගෙන බුද්ධා ච සාවකා ච අගතං දිසං නිබ්බානං ගච්ඡන්තීති අට්ඨඞ්ගිකො මග්ගො, යාවතා පුථුසමණබ්‍රාහ්මණානං පරප්පවාදානං මග්ගා, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො අග්ගො ච සෙට්ඨො ච පාමොක්ඛො[1] ච උත්තමො ච පවරො චාති මග්ගානං අට්ඨඞ්ගිකො සෙට්ඨො.

සකදාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා විරජ්ජති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විරජ්ජති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විරජ්ජති, විරාගො විරාගාරම්මණො විරාගගොචරො විරාගෙ සමුදාගතො විරාගෙ ඨිතො විරාගෙ පතිට්ඨිතො.

1 විමොක්ඛො - සී, මොක්ඛො - ස

විරාගො යනු: විරාග දෙකෙකි: නිර්වාණය ද (විරාග හෙතු බැවින්) විරාග නම් වෙයි, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙක් වෙත් නම්, හැම විරාග වෙත් හු'යි විරාග නම් වෙති (සම්‍යග්දෘෂ්ටි) සහජාත වූ (සම්‍යක්සංකල්පාදි) සප්තාඞ්ගයෝ විරාග සඞ්ඛ්‍යාත නිර්වාණය අරමුණු කොට යෙත් හු'යි (විරාගාලම්බන බැවින්) විරාග නම් (මාර්ගණාර්ථයෙන්) මාර්ග නම් වෙයි. තෙල මාර්ගයෙන් බුදුවරු ද බුද්ධශ්‍රාවකයෝ ද නො ගියවිරූ දිශාව වූ නිවනට යෙත් හු'යි අෂ්ටාඞ්ගමාර්ග නම් වෙයි. යම්තාක් වෙත් වෙත් මහණබමුණන්ගේ ද මෙසින් අන්‍යලබ්ධි ඇතියන්ගේ ද මාර්ගයෝ වෙත් නම්, (ඔවුනතුරෙහි) මෙ මැ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගමාර්ගය අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වේ හු'යි මාර්ගයන් අතුරින් අෂ්ටාඞ්ගමාර්ගය ඉතා ප්‍රශංසනීය වේ.

අභිනිරෝපණාර්ථයෙන් සම්‍යක්සංකල්පය මිථ්‍යාසංකල්පය කෙරෙන් විරක්ත වෙයි පරිග්‍රහ (චතුර්විධවාක්සංවර) ස්වභාවයෙන් සම්‍යග්වචනය මිථ්‍යාවචනය කෙරෙන් විරක්ත වෙයි .. සමුට්ඨාන (ත්‍රිවිධකායසංවර) ස්වභාවයෙන් සම්‍යක්කර්මාන්තය මිථ්‍යාකර්මාන්තය කෙරෙන් විරක්ත වෙයි ... ව්‍යවදානාර්ථයෙන් සම්‍යගාජීවය මිථ්‍යාජීවය කෙරෙන් විරක්ත වෙයි ... ප්‍රග්‍රහාර්ථයෙන් සම්‍යග්ව්‍යායාමය මිථ්‍යාව්‍යායාමය කෙරෙන් විරක්ත වෙයි ... උපස්ථානාර්ථයෙන් සම්‍යක්ස්මෘතිය මිථ්‍යාස්මෘතිය කෙරෙන් විරක්ත වෙයි... අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධිය මිථ්‍යාසමාධිහු කෙරෙන් විරක්ත වෙයි. එය අනුව පවත්නා කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විරක්ත වෙයි, බාහ්‍ය වූත් හැම නිමිත්ත කෙරෙන් විරක්ත වෙයි. විරාගය විරාග සඞ්ඛ්‍යාත නිවන අරමුණු කොට ඇත්තේ යැ නිවන ගොදුරු කොට ඇත්තේ යැ නිවන් අරමුණුහි උපන්නේ යැ නිවන්හි සිටියේ යැ නිවන්හි පිහිටියේ යි.

විරාගො යනු: විරාග දෙකෙකි: නිවන ද විරාග නම් වෙයි, නිවන් අරමුණුහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙක් වෙත් නම් හැම විරුග වෙත් හු'යි විරුග නම් වෙති, (සම්‍යග්දෘෂ්ටි) සහජාත වූ (සම්‍යක්සංකල්පාදි) සප්තාඞ්ගයෝ විරුගයට යෙත් හු'යි (විරාගාලම්බන බැවින්) විරාග නම් (ගමනාර්ථයෙන්) මාර්ග නම් වෙයි. තෙල මාර්ගයෙන් බුදුවරු ද බුද්ධශ්‍රාවකයෝ ද නො ගියවිරූ දෙස වූ නිවනට යෙත් හු,යි අෂ්ටාඞ්ගමාර්ග නම් වෙයි. යම්තාක් වෙත් වෙත් මහණබමුණන්ගේ ද මෙසින් අන්‍යලබ්ධි ඇතියන්ගේ ද මාර්ග කෙනෙක් වෙත් නම් (ඔවුනතුරින්) මෙ මැ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගමාර්ග අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වේ හු'යි මාර්ගයන් අතුරින් අෂ්ටාඞ්ගමාර්ගය ශ්‍රෙෂ්ඨ යි

සකෘදාගාමිමාර්ගක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය .. අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධිය ඖදාරික වූ කාමරාග සංයොජනයෙන් ප්‍රතිඝසංයොජනයෙන් ඖදාරික වූ කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් විරක්ත වෙයි, තදනුවර්තක කෙලෙශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විරක්ත වෙයි, බාහ්‍ය වූත් හැම නිමිත්ත කෙරෙන් විරක්ත වෙයි විරුගය නිර්වාණය අරමුණු කොට ඇත්තේ යැ, නිර්වාණය ගොදුරු කොට ඇත්තේ ය නිර්වාණාලම්බනයෙහි උපන්නේ යැ නිර්වාණයෙහි (ප්‍රවෘත්ති විසින්) සිටියේ යැ නිර්වාණයෙහි පිහිටියේ යි.

**විරාගොති** ද්වෙ විරාගා: නිබ්බානඤ්ච විරාගො, යෙ ච නිබ්බානාරම්මණතාජාතා ධම්මා සබ්බෙ විරාගා හොන්තීති විරාගා, සහජාතානි සත්තඞ්ගානි විරාගං ගච්ඡන්තීති විරාගො මග්ගො, එතෙන මග්ගෙන බුද්ධා ච සාවකා ච අගතං දිසං නිබ්බානං ගච්ඡන්තීති අට්ඨඞ්ගිකො මග්ගො, යාවතා පුථුසමණබ්‍රාහ්මණානං පරප්පවාදානං මග්ගා, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො අග්ගො ච සෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො චාති මග්ගානං අට්ඨඞ්ගිකො සෙට්ඨො.

අනාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි අණුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා අණුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා විරජ්ජති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විරජ්ජති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විරජ්ජති, විරාගො විරාගාරම්මණො -පෙ- මග්ගානං අට්ඨඞ්ගිකො සෙට්ඨො.

අරහත්තමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා විරජ්ජති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විරජ්ජති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විරජ්ජති, විරාගො විරාගාරම්මණො විරාගගොචරො විරාගෙ සමුදාගතො විරාගෙ ඨිතො විරාගෙ පතිට්ඨිතො.

**විරාගොති** ද්වෙ විරාගා: නිබ්බානඤ්ච විරාගො, යෙ ච නිබ්බානාරම්මණතාජාතා ධම්මා සබ්බෙ විරාගා හොන්තීති විරාගා, සහජාතානි සත්තඞ්ගානි විරාගං ගච්ඡන්තීති විරාගො මග්ගො, එතෙන මග්ගෙන බුද්ධා ච සාවකා ච අගතං දිසං නිබ්බානං ගච්ඡන්තීති අට්ඨඞ්ගිකො මග්ගො, යාවතා පුථුසමණබ්‍රාහ්මණානං පරප්පවාදානං මග්ගා, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො අග්ගො ච සෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො චාති මග්ගානං අට්ඨඞ්ගිකො සෙට්ඨො.

දස්සනවිරාගො සම්මාදිට්ඨි, අභිනිරොපනවිරාගො සම්මාසඞ්කප්පො, පරිග්ගහවිරාගො සම්මාවාචා, සමුට්ඨානවිරාගො සම්මාකම්මන්තො, වොදානවිරාගො සම්මාආජීවො, පග්ගහවිරාගො සම්මාවායාමො, උපට්ඨානවිරාගො සම්මාසති, අවික්ඛෙපවිරාගො සම්මාසමාධි.

**විරාගො** යනු: විරාග දෙකෙකි නිර්වාණය ද විරාගයෙක, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙකුත් වෙත් නම් එ හැම විරාග නම් වෙත් නු'යි විරාගභ (සම්‍යග්දෘෂ්ටි) සහජාත වූ (සම්‍යක්සංකල්පාදි) සප්තාඞ්ගයෝ විරාගයට යෙත් නු'යි (විරාගාලම්බන බැවින්) විරාග නමුදු, (ගමනාර්ථයෙන්) මාර්ග නමුදු වෙයි. තෙල මාර්ගයෙන් බුදුවරු හා බුද්ධශ්‍රාවකයෝ හා නො ගියවිරූ දෙස වූ නිවනට යෙත් නු'යි අෂ්ටාඞ්ගිකමාර්ග නම් වෙයි. යම්තාක් වෙත් වෙත් මහණබමුණන්ගේ ද මෙහිත් අන්‍යලබ්ධි ඇතියන්ගේ ද මාර්ග කෙනෙක් වෙත් නම් (ඔවුනතුරින්) මෙ මැ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වේනු'යි මාර්ගයන් අතුරින් අෂ්ටාඞ්ගිකමාර්ගය ශ්‍රෙෂ්ඨ යි.

අනාගාමිමාර්ගක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය .. අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධිය අණුසහගිය කාමරාගසංයෝජනයෙන් ප්‍රතිඝසංයෝජනයෙන් අනුසහගිය කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් විරක්ත වෙයි. තදනුවර්තීකකෙලශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විරක්ත වෙයි. බාහ්‍ය වූත් හැම නිමිත්ත කෙරෙන් විරක්ත වෙයි. විරාගය නිර්වාණය ආලම්බන කොට ඇත්තේ යැ ... මාර්ගයන් අතුරින් අෂ්ටාඞ්ගිකමාර්ගය ශ්‍රෙෂ්ඨ යි.

අර්හත්මාර්ගක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධිය රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යායෙන් මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් විරක්ත වෙයි, තදනුවර්තීකකෙලශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විරක්ත වෙයි, බාහ්‍ය වූත් හැම නිමිත්ත කෙරෙන් විරක්ත වෙයි, විරාගය නිර්වාණය ආලම්බන කොට ඇත්තේ යැ නිර්වාණය ගොචර කොට ඇත්තේ යැ, නිර්වාණාලම්බනයෙහි උපත්තේ යැ නිර්වාණාලම්බනයෙහි සිටියේ යැ නිර්වාණාලම්බනයෙහි පිහිටියේ යි.

**විරාගො** යනු: විරාග දෙකෙකි: නිර්වාණය ද විරාග යැ, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙක් වෙත් නම් එහැම විරාග වෙත් නු යි විරාගභ, (සම්‍යග්දෘෂ්ටි) සහජාත වූ (සම්‍යක් සංකල්පාදි) සප්තාඞ්ගයෝ විරාගයට යෙත් නු'යි විරාග නම් මාර්ග නම් වෙයි. තෙල මාර්ගයෙන් බුදුවරු ද බුද්ධශ්‍රාවකයෝ ද නො ගියවිරූ දෙස වූ නිර්වාණයට යෙත් නු'යි අෂ්ටාඞ්ගික මාර්ග නම් වෙයි. යම්තාක් වෙත් වෙත් මහණබමුණන්ගේ ද මෙහිත් අන්‍යල යි ඇතියන්ගේ ද මාර්ග කෙනෙක් වෙත් නම් (ඔවුනතුරින්) මෙ මැ ආර්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වේ නු'යි මාර්ගයන් අතුරින් අෂ්ටාඞ්ගිකමාර්ගය ශ්‍රෙෂ්ඨ යි.

දර්ශන සඞ්ඛ්‍යාත විරාගය සම්‍යග්දෘෂ්ටි යැ, අභිනිරොපණ (අරමුණට සිත නැංවීම්) සඞ්ඛ්‍යාත විරාගය සම්‍යක්සංකල්ප යැ, පරිග්‍රහ (චතුර්විධ වාක්සංවර)සඞ්ඛ්‍යාත විරාගය සම්‍යග්වචන යැ, සමුත්ථාන (ත්‍රිවිධ කායසංවර) සඞ්ඛ්‍යාත විරාගය සම්‍යක්කර්මාන්ත යැ, ව්‍යවදාන සඞ්ඛ්‍යාත විරාගය සම්‍යගාජීව යැ, ප්‍රග්‍රහ සඞ්ඛ්‍යාත විරාගය සම්‍යග්ව්‍යායාම යැ උපස්ථාන (වැටහීම්) සඞ්ඛ්‍යාත විරාගය සම්‍යක් ස්මෘති යැ, අවික්ෂෙප සඞ්ඛ්‍යාත විරාගය සම්‍යක් සමාධි යි.

උපට්ඨානවිරාගො සතිසම්බොජ්ඣඞ්ගො, පවිචයවිරාගො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, පග්ගහවිරාගො විරියසම්බොජ්ඣඞ්ගො, ඵරණවිරාගො පීතිසම්බොජ්ඣඞ්ගො, උපසමවිරාගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, අවික්ඛෙපවිරාගො සමාධිසම්බොජ්ඣඞ්ගො, පටිසඞ්ඛානවිරාගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

අස්සද්ධියෙ අකම්පියවිරාගො සද්ධාබලං, කොසජ්ජෙ අකම්පියවිරාගො විරියබලං, පමාදෙ අකම්පියවිරාගො සතිබලං, උද්ධච්චෙ අකම්පියවිරාගො සමාධිබලං, අවිජ්ජාය අකම්පිය විරාගො පඤ්ඤාබලං.

අධිමොක්ඛවිරාගො සද්ධින්ද්‍රියං, පග්ගහවිරාගො විරියින්ද්‍රියං, උපට්ඨානවිරාගො සතින්ද්‍රියං, අවික්ඛෙපවිරාගො සමාධින්ද්‍රියං, දස්සනවිරාගො පඤ්ඤින්ද්‍රියං,

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියානි විරාගො, අකම්පියට්ඨෙන බලං විරාගො, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගා විරාගො, හෙතුට්ඨෙන මග්ගො විරාගො, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානා විරාගො, පදහනට්ඨෙන සම්මප්පධානා විරාගො, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදා විරාගො,[1] තථට්ඨෙන සච්චා විරාගො, අවික්ඛෙපට්ඨෙන සමථො විරාගො, අනුපස්සනට්ඨෙන විපස්සනා විරාගො, එකරසට්ඨෙන සමථවිපස්සනා විරාගො, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං,[2] විරාගො, සංවරට්ඨෙන සීලවිසුද්ධි විරාගො අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි විරාගො, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි විරාගො, විමුත්තට්ඨෙන විමොක්ඛො විරාගො, පටිවෙධට්ඨෙන විජ්ජා විරාගො, පරිච්චාගට්ඨෙන විමුත්ති විරාගො, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං විරාගො, ඡන්දො මූලට්ඨෙන විරාගො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන විරාගො, ඵස්සො සමොධානට්ඨෙන විරාගො, වෙදනා සමොසරණට්ඨෙන විරාගො, සමාධි පමුඛට්ඨෙන විරාගො, සති ආධිපතෙය්‍යට්ඨෙන විරාගො, පඤ්ඤා තදුත්තරට්ඨෙන[3] විරාගො, විමුත්ති සාරට්ඨෙන විරාගො, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන විරාගො.[4]

දස්සනමග්ගො සම්මාදිට්ඨි, අභිනිරොපනමග්ගො සම්මාසඞ්කප්පො -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන මග්ගො. එවං විරාගො මග්ගො.

කථං විමුත්ති ඵලං 'සොතාපත්තිඵලක්ඛණෙ දස්සනට්ඨෙන සම්මා දිට්ඨි මිච්ඡාදිට්ඨියා විමුත්තා හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විමුත්තා හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විමුත්තා හොති. විමුත්ති විමුත්තාරම්මණා, විමුත්තිගොචරා විමුත්තියා සමුදාගතා විමුත්තියා ඨිතා විමුත්තියා පතිට්ඨිතා.

විමුත්තීති ද්වෙ විමුත්තියො: නිබ්බානඤ්ච විමුත්ති, යෙ ච නිබ්බානාරම්මණතා ජාතා ධම්මා සබ්බෙ[5] විමුත්තා හොන්තීති විමුත්තිඵලං.

---

1. විරාගා - සී,
2. යුගනන්ධං - PTS,
3. තදුත්තරට්ඨෙන - මජසං, 7 S.
4. පරියොසානට්ඨෙන මග්ගො - මජසං, පරියොසාන විරාගො - සී. 'අමතොගධං -පෙ- විරාගො''යි පාඨො PTS. පොත්ථකෙසු න දිස්සති.
5. සබ්බෙ ච - මජසං.

උපස්ථාන සඞ්ඛ්‍යාත විරාගය ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ, ප්‍රවිචය (විමසීම්) සඞ්ඛ්‍යාත විරාගය ධර්මවිචයසම්බොධ්‍යඞ්ග යැ, ප්‍රග්‍රහ සඞ්ඛ්‍යාත විරාගය වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග යැ, ඵරණ (අරමුණු කිරීම්) සඞ්ඛ්‍යාත විරාගය ප්‍රීති-සම්බොධ්‍යඞ්ග යැ, ව්‍යුපශම සඞ්ඛ්‍යාත විරාගය ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග යැ, අවික්ෂෙප සඞ්ඛ්‍යාත විරාගය සමාධිසම්බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යවෙක්ෂා සඞ්ඛ්‍යාත විරාගය උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යි.

අශ්‍රද්ධායෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත විරාගය ශ්‍රද්ධාබල යැ, කෞසීද්‍යයෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත විරාගය වීර්‍ය්‍යබල යැ, ප්‍රමාදයෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත විරාගය ස්මෘතිබල යැ, ඖද්ධත්‍යයෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත විරාගය සමාධිබල යැ, අවිද්‍යායෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත විරාගය ප්‍රඥාබල යි.

අධිමොක්ෂ සඞ්ඛ්‍යාත විරාගය ශ්‍රද්ධෙන්ද්‍රිය යැ, ප්‍රග්‍රහ සඞ්ඛ්‍යාත විරාගය වීර්‍ය්‍යෙන්ද්‍රිය යැ, උපස්ථාන සඞ්ඛ්‍යාත විරාගය ස්මෘතීන්ද්‍රිය යැ, අවික්ෂෙප සඞ්ඛ්‍යාත විරාගය සමාධීන්ද්‍රිය යැ, දර්ශන සඞ්ඛ්‍යාත විරාගය ප්‍රඥෙන්ද්‍රිය යි.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියයෝ විරාග යැ, අකම්ප්‍යාර්ථයෙන් බලධර්මය විරාග යැ, නිර්‍ය්‍යාණාර්ථයෙන් බොධ්‍යඞ්ගයෝ විරාග යැ, හෙත්වර්ථයෙන් මාර්ගය විරාග යැ, උපස්ථානාර්ථයෙන් සතිපට්ඨානයෝ විරාග යැ, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රධානයෝ විරාග යැ, සමෘද්ධ වන ස්වභාවයෙන් ඍද්ධිපාදයෝ විරාග යැ, යථාස්වභාවාර්ථයෙන් සත්‍යයෝ විරාග යැ, අවික්ෂෙපාර්ථයෙන් ශමථය විරාග යැ, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව විරාග යැ, නො ඉක්ම පවත්නා අර්ථයෙන් යුගනද්ධය විරාග යැ, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය විරාග යැ, අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධිය විරාග යැ දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය විරාග යැ, විමුක්ත්‍යර්ථයෙන් විමොක්ෂය විරාග යැ, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව විරාග යැ, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය විරාග යැ, සමුච්ඡෙදාර්ථයෙන් ක්ෂයඥානය විරාග යැ, ඡන්දය මූලාර්ථයෙන් විරාග යැ, මනසිකාරය සමුත්ථානාර්ථයෙන් විරාග යැ, ස්පර්ශය සමවධානාර්ථයෙන් විරාග යැ, වෙදනාව සමවසරණාර්ථයෙන් විරාග යැ, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් විරාග යැ, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් විරාග යැ, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් විරාග යැ, විමුක්තිය සාරාර්ථයෙන් විරාග යැ, අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් විරාග යි.

දර්ශන සඞ්ඛ්‍යාත මාර්ගය සම්‍යග්දෘෂ්ටි යැ, අභිනිරොපණ සඞ්ඛ්‍යාත මාර්ගය සම්‍යක් සංකල්ප යැ, .. අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් මාර්ග යි. මෙසෙයින් විරාගය මාර්ග නම් වේ.

කිසෙයින් විමුක්තිය ඵල වෙයි යත්: ශ්‍රොතාපත්තිඵලක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙන් විමුක්ත (මිදුණේ) වෙයි. තදනුවර්තකක්ලෙශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විමුක්ත වෙයි. බාහ්‍ය වූ ත් හැම නිමිත්ත කෙරෙන් විමුක්ත වෙයි විමුක්තිය නිවන අරමුණු කොට ඇත්තී යැ, නිවන ගොදුරු කොට ඇත්තී යැ, නිවන් අරමුණෙහි උපන්නී යැ, නිවන්හි සිටියා යැ, නිවන්හි පිහිටියා වේ.

විමුත්ති යනු: විමුක්ති දෙකෙකි: නිර්වාණය ද විමුක්ති යැ, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙක් වෙත් නම් එ හැම විමුක්ත වෙත් නු'යි විමුක්තිඵල නම් වේ.

අභිනිරොපනට්ඨෙන[1] සම්මාසඞ්කප්පො මිච්ඡාසඞ්කප්පා විමුත්තො හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විමුත්තො හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විමුත්තො හොති. විමුත්ති විමුත්තාරම්මණා විමුත්තිගොචරා විමුත්තියා සමුදගතා විමුත්තියා ඨිතා විමුත්තියා පතිට්ඨිතා.

විමුත්තීති ද්වෙ විමුත්තියො: නිබ්බානඤ්ච විමුත්ති, යෙ ච නිබ්බානාරම්මණතා ජාතා ධම්මා සබ්බෙ විමුත්තා හොන්තීති විමුත්ති ඵලං,

පරිග්ගහට්ඨෙන සම්මාවාචා මිච්ඡාවාචාය විමුත්තා හොති -පෙ- සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො මිච්ඡාකම්මන්තා විමුත්තො හොති -පෙ- වොදානට්ඨෙන සම්මාආජීවො මිච්ඡාආජීවා විමුත්තො හොති -පෙ- පග්ගහට්ඨෙන සම්මාවායාමො මිච්ඡාවායාමා විමුත්තො හොති -පෙ- උපට්ඨානට්ඨෙන සම්මාසති මිච්ඡාසතියා විමුත්තා හොති -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි මිච්ඡාසමාධිතො විමුත්තො හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විමුත්තො හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විමුත්තො හොති. විමුත්ති විමුත්තාරම්මණා විමුත්තිගොචරා විමුත්තියා සමුදගතා විමුත්තියා ඨිතා විමුත්තියා පතිට්ඨිතා.

**විමුත්තීති** ද්වෙ විමුත්තියො: නිබ්බානඤ්ච විමුත්ති, යෙ ච නිබ්බානාරම්මණතා ජාතා ධම්මා සබ්බෙ විමුත්තා හොන්තීති විමුත්තිඵලං.

සකදාගාමිඵලක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා විමුත්තො හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විමුත්තො හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විමුත්තො හොති, විමුත්ති විමුත්තාරම්මණා විමුත්ති ගොචරා විමුත්තියා සමුදගතා විමුත්තියා ඨිතා විමුත්තියා පතිට්ඨිතා.

විමුත්තීති ද්වෙ විමුත්තියො: නිබ්බානඤ්ච විමුත්ති, යෙ ච නිබ්බානාරම්මණතා ජාතා ධම්මා සබ්බෙ විමුත්තා හොන්තීති විමුත්ති ඵලං.

අනාගාමිඵලක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි අණුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා අණුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා විමුත්තො හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විමුත්තො හොති බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විමුත්තො හොති, විමුත්ති විමුත්තාරම්මණා විමුත්තිගොචරා විමුත්තියා සමුදගතා විමුත්තියා ඨිතා විමුත්තියා පතිට්ඨිතා.

විමුත්තීති ද්වෙ විමුත්තියො -පෙ- විමුත්ති ඵලං.

අරහත්තඵලක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භාවරාගානුසයා අවිජ්ජානුසයා විමුත්තො හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විමුත්තො හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විමුත්තො හොති, විමුත්ති විමුත්තාරම්මණා විමුත්තිගොචරා විමුත්තියා ඨිතා විමුත්තියා පතිට්ඨිතා,

1. අභිරොපනට්ඨෙන - සෑ PTS

අභිනිරෝපණාර්ථයෙන් සම්‍යක්සංකල්පය මිථ්‍යාසංකල්පයෙන් විමුක්ත වෙයි, තදනුවර්තීකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විමුක්ත වෙයි, බාහ්‍ය වූ ත් හැම නිමිත්ත කෙරෙන් විමුක්ත වෙයි. විමුක්තිය නිවන් අරමුණු කොට ඇත්තී යෑ, නිවන් ගොදුරු කොට ඇත්තී යෑ, නිවන් අරමුණුහි උපන්නී යෑ, නිවන්හි සිටියා නිවන්හි පිහිටියා වේ.

විමුත්ති යනු විමුක්ති දෙකෙක: නිර්වාණය ද විමුක්ති නම, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙකුන් වෙත් නම් ඒ හැම විමුක්ත වෙත් නු'යි විමුක්තිඵල නම් වේ.

පරිග්‍රහාර්ථයෙන් සම්‍යග්වචනය මිථ්‍යාවචනයෙන් මිදුණේ වෙයි ... සමුත්ථානාර්ථයෙන් සම්‍යක්කර්මාන්තය මිථ්‍යාකර්මාන්තයෙන් මිදුණේ වෙයි- ව්‍යවදානාර්ථයෙන් සම්‍යගාජීවය මිථ්‍යාආජීවයෙන් මිදුණේ වෙයි- ප්‍රග්‍රහාර්ථයෙන් සම්‍යග්ව්‍යායාමය මිථ්‍යාව්‍යායාමයෙන් මිදුණේ වෙයි- උපස්ථානාර්ථයෙන් සම්‍යක්ස්මෘතිය මිථ්‍යාස්මෘතියෙන් මිදුණා වෙයි-· අවික්ෂේපාර්ථයෙන් සම්‍යක්සමාධිය මිථ්‍යාසමාධියෙන් මිදුණේ වෙයි, එය අනුව පවත්නා ක්ලෙශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද මිදුණේ වෙයි, බාහ්‍ය වූ ත් හැම නිමිත්ත කෙරෙන් මිදුණේ වෙයි, විමුක්තිය නිවන් අරමුණු කොට ඇත්තී යෑ, නිවන් ගොදුරු කොට ඇත්තී යෑ නිවන් අරමුණුහු උපන්නී යෑ, විමුක්තියෙහි සිටියා විමුක්තියෙහි පිහිටියා වේ.

විමුත්ති යනු විමුක්ති දෙකෙක· නිවන ද විමුක්ති නම, නිවන්අරමුණුහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙක් වෙත් නම් එ හැම විමුක්ත වෙත් නු'යි විමුක්තිඵල නම් වේ.

සකෘදාගාමිඵලක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය අවික්ෂේපාර්ථයෙන් සම්‍යක් සමාධිය ඖදාරික වූ කාමරාගසංයෝජනයෙන් ප්‍රතිඝසංයෝජනයෙන් ඖදාරික වූ කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් විමුක්ත වෙයි, තදනුවර්තීකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විමුක්ත වෙයි. බාහ්‍ය වූ ත් හැම නිමිත්ත කෙරෙන් විමුක්ත වෙයි. විමුක්තිය නිවන් අරමුණු කොට ඇත්තී යෑ, නිවන් ගොදුරු කොට ඇත්තී යෑ, නිවන් අරමුණුහි උපන්නී යෑ, නිවන්හි සිටියා නිවන්හි පිහිටියා යි.

විමුත්ති යනු: විමුක්ති දෙකෙකි නිර්වාණය ද විමුක්ති යෑ, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙක් වෙත් නම් එ හැම විමුක්ත වෙත් නු'යි විමුක්තිඵල යි.

අනාගාමිඵලක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය .. අවික්ෂේපාර්ථයෙන් සම්‍යක්සමාධිය අණුසහගත වූ කාමරාගසංයෝජනයෙන් ප්‍රතිඝසංයෝජනයෙන් අණුසහගත වූ කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් විමුක්ත වෙයි, තදනුවර්තීකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විමුක්ත වෙයි බාහ්‍ය වූ ත් හැම නිමිත්ත කෙරෙන් විමුක්ත වෙයි. විමුක්තිය නිර්වාණය ආලම්බන කොට ඇත්තී යෑ, නිර්වාණය ගොචර කොට ඇත්තී යෑ, නිර්වාණාලම්බනයෙහි උපන්නී යෑ, නිවන්හි සිටියා නිවන්හි පිහිටියා වේ.

විමුත්ති යනු විමුක්ති දෙකෙකි විමුක්තිඵල යි.

අර්හත්ඵලක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂේපාර්ථයෙන් සම්‍යක් සමාධිය රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යායෙන් මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් විමුක්ත වෙයි තදනුවර්තීකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විමුක්ත වෙයි, බාහ්‍ය වූ ත් හැම නිමිත්ත කෙරෙන් විමුක්ත වෙයි. විමුක්තිය නිර්වාණය ආලම්බන කොට ඇත්තී යෑ, නිර්වාණය ගොචර කොට ඇත්තී යෑ, නිර්වාණාලම්බනයෙහි උපන්නී යෑ, නිර්වාණාලම්බනයෙහි සිටියා නිර්වාණාලම්බනයෙහි පිහිටියා වේ.

**විමුත්තීති** ද්වෙ විමුත්තියො: නිබ්බානඤ්ච විමුත්ති, යෙ ච නිබ්බානාරම්මණතා ජාතා ධම්මා සබ්බෙ විමුත්තා හොන්තීති විමුත්ති ඵලං,

දස්සනවිමුත්ති සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපවිමුත්ති සම්මාසමාධි, උපට්ඨානවිමුත්ති සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- පටිසඞ්ඛානවිමුත්ති උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, අස්සද්ධියෙ අකම්පිය විමුත්ති සද්ධාබලං -පෙ- අවිජ්ජාය අකම්පිය විමුත්ති පඤ්ඤාබලං, අධිමොක්ඛවිමුත්ති සද්ධින්ද්‍රියං -පෙ- දස්සනවිමුත්ති පඤ්ඤින්ද්‍රියං.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියා විමුත්ති, අකම්පියට්ඨෙන බලා විමුත්ති, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගා විමුත්ති, හෙතුට්ඨෙන මග්ගො විමුත්ති, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානා විමුත්ති, පදහනට්ඨෙන සම්මප්පධානා විමුත්ති, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදා විමුත්ති, තථට්ඨෙන සච්චා විමුත්ති, අවික්ඛෙපට්ඨෙන සමථො විමුත්ති, අනුපස්සනට්ඨෙන විපස්සනා විමුත්ති, එකරසට්ඨෙන සමථවිපස්සනා විමුත්ති, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං විමුත්ති, සංවරට්ඨෙන සීලවිසුද්ධි විමුත්ති, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි විමුත්ති, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි විමුත්ති, විමුත්තට්ඨෙන විමොක්ඛො විමුත්ති, පටිවෙධට්ඨෙන විජ්ජා විමුත්ති, පරිච්චාගට්ඨෙන විමුත්ති විමුත්ති, පටිප්පස්සද්ධියට්ඨෙන අනුප්පාදෙ ඤාණං විමුත්ති, ඡන්දො මූලට්ඨෙන විමුත්ති, මනසිකාරො සමුට්ඨානට්ඨෙන විමුත්ති, ඵස්සො සමොධානට්ඨෙන විමුත්ති, වෙදනා සමොසරණට්ඨෙන විමුත්ති, සමාධි පමුඛට්ඨෙන විමුත්ති, සති ආධිපතෙය්‍යට්ඨෙන විමුත්ති, පඤ්ඤා තදුත්තරට්ඨෙන විමුත්ති, විමුත්ති සාරට්ඨෙන විමුත්ති, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන විමුත්ති, එවං විමුත්ති ඵලං.

එවං විරාගො මග්ගො, විමුත්ති ඵලන්ති.

**විරාගකථා සමත්තා**

## 2. 6

## පටිසම්භිදා කථා

එවං මෙ සුතං, එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ තත්‍ර ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තෙසි:

“ද්වෙමෙ භික්ඛවෙ, අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා: කතමෙ ද්වෙ යො චායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො යො චා'යං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො. එතෙ තෙ[1] භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

1 එතෙ ඛො - මජසං

විමුක්ති යනු විමුක්ති දෙකෙකි: නිර්වාණය ද විමුක්ති යැ, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙකුත් වෙත් නම් එ හැම විමුක්ත වෙත් නු’යි විමුක්තිඵල යැ.

දර්ශන සඞ්ඛ්‍යාත විමුක්තිය සම්‍යග්දෘෂ්ටි යැ ... අවික්ෂෙපවිමුක්තිය සම්‍යක් සමාධි යැ උපස්ථානවිමුක්තිය ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ ... පටිසඞ්ඛ්‍යාන විමුක්තිය උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යැ අශ්‍රද්ධායෙහි නො සැලෙන විමුක්තිය ශ්‍රද්ධාබල යැ ... අවිද්‍යායෙහි නො සැලෙන විමුක්තිය ප්‍රඥාබල යැ. අධිමොක්ෂ-විමුක්තිය ශ්‍රද්ධෙන්ද්‍රිය යැ ... දර්ශනවිමුක්තිය ප්‍රඥෙන්ද්‍රිය යි.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියයෝ විමුක්ති යැ, අකම්ප්‍යාර්ථයෙන් බල-ධර්මයෝ විමුක්ති යැ, නිර්යාණාර්ථයෙන් බොධ්‍යඞ්ගයෝ විමුක්ති යැ හෙත්වර්ථයෙන් මාර්ගය විමුක්ති යැ, එළඹෙන අර්ථයෙන් සතිපට්ඨානයෝ විමුක්ති යැ, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රදහනයෝ විමුක්ති යැ, සමෘද්ධ වන අර්ථයෙන් ඍද්ධිපාදයෝ විමුක්ති යැ, යථාස්වභාවාර්ථයෙන් සත්‍යයෝ විමුක්ති යැ, අවික්ෂෙපාර්ථයෙන් ශමථය විමුක්ති යැ අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව විමුක්ති යැ, එකකෘත්‍යාර්ථයෙන් ශමථ-විදර්ශනා විමුක්ති යැ, (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් යුගනද්ධය විමුක්ති යැ, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය විමුක්ති යැ අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධිය විමුක්ති යැ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය විමුක්ති යැ, විමුක්තාර්ථයෙන් විමොක්ෂය විමුක්ති යැ, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව විමුක්ති යැ, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය විමුක්ති යැ, ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යර්ථයෙන් අනුත්පාදඥානය විමුක්ති යැ, ඡන්දය මූලාර්ථයෙන් විමුක්ති යැ, මනස්කාරය සමුත්ථානාර්ථයෙන් විමුක්ති යැ ස්පර්ශය සමවධානාර්ථයෙන් විමුක්ති යැ, වෙදනාව සමවසරණාර්ථයෙන් විමුක්ති යැ, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් විමුක්ති යැ, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් විමුක්ති යැ, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් විමුක්ති යැ, විමුක්තිය සාරාර්ථයෙන් විමුක්ති යැ, අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍යවසානාර්ථයෙන් විමුක්ති යැ, මෙසෙයින් විමුක්තිය ඵල වේ.

මෙසෙයින් විරාගය මාර්ග වෙයි, විමුක්තිය ඵල වේ යයි.

විරාගකථා නිමි.

## 2. 6

## ප්‍රතිසංවිත් කථා

"මා විසින් මෙසේ අසන ලද එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස ඉසිපතන්හි මිගදාය නම් වූ අරම්හි වාසය කරණසේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ පස්වග මහණුන් ඇමතූ සේක:

මහණෙනි, මේ අන්තයෝ දෙදෙනෙක් පැවිද්දහු විසින් නො සෙවිය යුත්තාහ. කවර දෙදෙනෙක යත්: යම් හීන වූ ග්‍රාම්‍ය වූ පෘථග්ජනයන් විසින් ආචීර්ණ වූ අනාර්‍ය වූ අනර්ථසංහිත වූ වස්තුකාමයෙහි ක්ලේශකාම-සුඛයාගේ අනුයෝගයෙකුත් වේ ද, යම් දුක් වූ අනාර්‍ය වූ අනර්ථසංහිත වූ ආත්මක්ලමථයාගේ අනුයෝගයෙකුත් වේ ද මොහු දෙදෙන වෙත් මහණෙනි, තෙල අන්තද්වයට නො පැමිණ තථාගත විසින් ප්‍රතිවෙධ කරන ලද පැසඇස් ඇති කරන්නී වූ නුවණ ඇති කරන්නී වූ මධ්‍යමප්‍රතිපදාව කෙලෙසුන් සන්හිඳීම පිණිස චතුස්සත්‍යයාගේ අභිජානනය පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී.

කතමා ච සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි, අයං ඛො සා භික්ඛවෙ, මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං: ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛො, මරණම්පි දුක්ඛං, අප්පියෙහි සම්පයොගො දුක්ඛො, පියෙහි විප්පයොගො දුක්ඛො, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා

ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛසමුදයො[1] අරියසච්චං: යා'යං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා.

ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛනිරොධො[2] අරියසච්චං: යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො.

ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

ඉදං දුක්ඛං අරියසච්ච'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, 'තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍ය'න්ති මෙ භික්ඛවෙ, -පෙ- පරිඤ්ඤාත'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණ උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උපාදි, ආලොකො උදපාදි.

'ඉදං දුක්ඛසමුදයො[2] අරියසච්ච'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, ත ඛො පනිදං දුක්ඛසමුදයො අරියසච්චං පහාතබ්බ'න්ති මෙ භික්ඛවෙ, පෙ 'පහීන'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි

'ඉදං දුක්ඛනිරොධො[3] අරියසච්ච'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, තං ඛො පනිදං දුක්ඛනිරොධො අරියසච්චං සච්ඡිකාතබ්බං'න්ති මෙ භික්ඛවෙ -පෙ- 'සච්ඡිකත'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

1. දුක්ඛසමුදයං - සී, මජ්ඣ, PTS ස.
2. දුක්ඛනිරොධං - සී මජ්ඣ, PTS ස.

මහණෙනි, තථාගතයන් විසින් ප්‍රතිවේධ කරනලද, පැනැස උපදවන නුවණ උපදවන ඒ කවර මධ්‍යමප්‍රතිපදාවක් කෙලෙසුන් සන්හිඳීම පිණිස චතුසත්‍යයාගේ අභිජානනය පිණිස සම්බෝධය පිණිස නිර්වාණය පිණිස පවතී ද යත්: මෙ මැ ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිමාර්ගී යැ, හෙ මෙසේ යැ: සම්‍යග්දෘෂ්ටි යැ, සම්‍යක් සංකල්ප යැ සම්‍යග්වචන යැ සම්‍යක්කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යක් ව්‍යායාම යැ සම්‍යක් ස්මෘති යැ සම්‍යක් සමාධි යැ යි. මහණෙනි, තථාගතයන් විසින් ප්‍රතිවේධ කරනලද පැනැස උපදවන නුවණ උපදවන මේ ඒ මධ්‍යමප්‍රතිපදාව කෙලෙසුන් සන්හිඳීම පිණිස චතුසත්‍යයාගේ අභිජානනය පිණිස සම්බෝධය පිණිස නිර්වාණය පිණිස පවතී.

මහණෙනි, මේ වනාහි දුඃඛ නම් වූ ආර්‍ය්‍ය සත්‍යය වෙයි, ජාතිය ද දුක් යැ ජරාව ද දුක් යැ ව්‍යාධිය ද දුක් යැ මරණය ද දුක් යැ අප්‍රියයන් හා සමග එක්වීම ද දුක් යැ ප්‍රියයන් කෙරෙන් වෙන්වීම ද දුක් යැ ඉස්නේ යමක් නො ලබා නම් එ ද දුක් යැ සැකෙවින් පඤ්චෝපාදානස්කන්ධයෝ දුඃඛයෝ යි.

මහණෙනි, මේ වනාහි දුඃඛසමුදය නම් වූ ආර්‍ය්‍යසත්‍යය වෙයි: යම් තෘෂ්ණාවක් පුනර්භවය කරනසුලු ද නන්දිරාගය හා සමග එකත්වයට ගියා ද ඒ ඒ භවයෙහි සතුටුවනසුලු ද හෝ තෘෂ්ණා යැ. හේ මෙසේ යැ: කාමතෘෂ්ණා යැ භවතෘෂ්ණා යැ විභවතෘෂ්ණා යි.

මහණෙනි, මේ වනාහි දුඃඛනිරෝධ නම් වූ ආර්‍ය්‍යසත්‍යය වෙයි: ඒ මැ තෘෂ්ණාවෙහි යම් අශේෂවිරාග සඞ්ඛ්‍යාත නිරෝධයෙක් ත්‍යාගයෙක් හැරපීමෙක් මුක්තියක් ආලය රහිත බවෙක් වේ ද හේ යැ.

මහණෙනි, මේ වනාහි දුඃඛනිරෝධගාමිනීප්‍රතිපත් නම් වූ ආර්‍ය්‍යසත්‍යය වෙයි: මෙ මැ ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගී යැ,, හෙ මෙසේ යැ: සම්‍යග්දෘෂ්ටි යැ ... සම්‍යක් සමාධි යැ යි.

මහණෙනි, 'මේ දුඃඛ නම් වූ ආර්‍ය්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූ විරූ දහම්හි මට පැනැස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, මාර්ගවිද්‍යාව පහළ වූ යැ ආලෝකය පහළ විය. නවද මහණෙනි, ඒ මේ දුඃඛ නම් වූ ආර්‍ය්‍යසත්‍යය (සාමාන්‍යලක්ෂණාවබෝධ විසින්) පිරිසිඳ දතයුතු යැ'යි මට ... මහණෙනි, ම විසින් 'පරිඥාත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ඥානය පහළ විය ප්‍රඥාව පහළ විය, මාර්ගවිද්‍යාව පහළ විය. ආලෝකය පහළ වී.

මහණෙනි, 'මේ දුඃඛසමුදය නම් වූ ආර්‍ය්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, මාර්ගවිද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය නවද මහණෙනි, 'ඒ මේ දුඃඛසමුදය නම් වූ ආර්‍ය්‍යසත්‍යය ප්‍රහාතව්‍ය යැ'යි මට ... මහණෙනි, ම විසින් 'ප්‍රහීන යැ'යි පෙර නො ඇසූ විරූ දහම්හි මට පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, මාර්ගවිද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී.

මහණෙනි, 'මේ දුඃඛනිරෝධ නම් වූ ආර්‍ය්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි මට පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, මාර්ගවිද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී. නවද මහණෙනි, 'ඒ මේ දුඃඛනිරෝධ නම් වූ ආර්‍ය්‍යසත්‍යය සාක්ෂාත්කර්තව්‍ය යැ'යි මට ... මහණෙනි, මා විසින් 'සාක්ෂාත්කෘත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, මාර්ගවිද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී.

‘ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්ච’න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. ‘තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං භාවෙතබ්බ’න්ති මෙ භික්ඛවෙ -පෙ- ‘භාවිත’න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

යාවකීවඤ්ච මෙ භික්ඛවෙ, ඉමෙසු චතුසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහොසි. නෙව තාවාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය ‘අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො’ති පච්චඤ්ඤාසිං. යතො ච ඛො මෙ භික්ඛවෙ, ඉමෙසු චතුසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි, අථාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය ‘අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො’ති පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: ‘අකුප්පා මෙ විමුත්ති,[1] අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවො’ති.

ඉදමවොච භගවා, අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතො භාසිතං අභිනන්දු’න්ති.

ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: ‘යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම’න්ති.

පවත්තිතෙ ච පන භගවතා ධම්මචක්කෙ භුම්මා දෙවා සද්දමනුස්සාවෙසුං: එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං[2] සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මි’න්ති. භුම්මානං දෙවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා[3] දෙවා සද්දමනුස්සාවෙසුං: -පෙ- චාතුම්මහාරාජිකානං දෙවානං සද්දං සුත්වා තාවතිංසා දෙවා -පෙ- යාමා දෙවා -පෙ- තුසිතා දෙවා -පෙ- නිම්මානරතී දෙවා -පෙ- පරනිම්මිතවසවත්තී දෙවා -පෙ- බ්‍රහ්මකායිකා දෙවා සද්දමනුස්සාවෙසුං: ‘එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මි’න්ති.

ඉතිහ තෙන ඛණෙන* තෙන මුහුත්තෙන යාව බ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගඤ්ඡි,[4] අයඤ්ච දසසහස්සිලොකධාතු සංකම්පි සම්පකම්පි සම්පවෙධි, අප්පමාණො ච උළාරෙ. ඔභාසො ලොකෙ පාතුරහොසි අතික්කම්ම[5] දෙවානං දෙවානුභාවන්ති.

---

1 චෙතොවිමුත්ති - සයා, PTS. 2. අප්පටිවත්තියං - මජසං සයා PTS
3. චාතුම්මහාරාජිකා - මජසං. 4. අබ්භුග්ගච්ඡි - මජසං සයා PTS
5. අතික්කම්මෙව - සයා PTS.
* තෙන ලයෙනාති - මජසං. පොත්ථකං අයිකං.

මහණෙනි, 'මේ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපත් නම් වූ ආර්‍ය්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි මට පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය. තවද මහණෙනි, ඒ මේ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපත් නම් වූ ආර්‍ය්‍යසත්‍යය භාවිතව්‍ය යැ'යි මට ... මහණෙනි, ම විසින් භාවිත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී.

මහණෙනි, යම්තාක් මට මේ සතර ආර්‍ය්‍යසත්‍යයන්හි මෙසේ තුන් පරිවෘත්තයක් ඇති දොළොස් ආකාරයක් ඇති ඥාන සඞ්ඛ්‍යාත දර්‍ශනය ඇති සැටියෙන් සුවිශුද්ධ නො වී ද, මහණෙනි, ඒ තාක් මට මරුන් සහිත බඹුන් සහිත සදේවකලෝකයෙහි මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජායෙහි 'අනුත්තර වූ සම්‍යක් සම්බෝධිය අභිසම්බුද්ධයෙමි' නො මැ පිළිත කෙළෙමි. මහණෙනි, වැළිත් යම් කලෙක මට මේ සතර ආර්‍ය්‍යසත්‍යයන්හි මෙසේ තුන් පරිවෘත්තයක් ඇති දොළොස් ආකාරයක් ඇති ඥාන සඞ්ඛ්‍යාත දර්‍ශනය ඇති සැටියෙන් සුවිශුද්ධ වී ද, මහණෙනි, එකල්හි මම මරුන් සහිත බඹුන් සහිත සදේවකලෝකයෙහි මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජායෙහි 'අනුත්තර වූ සම්‍යක් සම්බෝධිය අභිසම්බුද්ධයෙමි' පිළිත කෙළෙමි. මට ඥාන සඞ්ඛ්‍යාත දර්‍ශන පහළ විය. මාගේ විමුක්තිය අකොප්‍ය වෙයි. මේ පශ්චිම ස්කන්ධප්‍රවෘත්තිය යැ, දැන් පුනර්භවයෙක් නැතැ'යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ, සතුටුසිත් ඇති පස්වගමහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයට සතුටු වූහ.

මේ වෛය්‍යාකරණය වදරනු ලබන කල්හි ආයුෂ්මත් කෞණ්ඩින්‍ය ස්ථවිරයන්ට පහවූ රාගාදිරජස් ඇති පහවූ රාගාදිමල ඇති ප්‍රථමමාර්ගඥාන සඞ්ඛ්‍යාත ධර්මචක්‍ෂුස පහළ විය: 'යම්කිසි සමුදයස්වභාව ඇති ධර්මයක් වේ නම් එ හැම නිරොධ සවභාව ඇත්තේ යැ'යි.

තවද භාග්‍යවතුන් විසින් දම්සක් පැවැත්වූ කල්හි 'තෙල භාග්‍යවතුන් විසින් බරණැස ඉසිපතනයෙහි මිගදාය නම් අරම්හි දී මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොවැ කිසිවකුහු විසින් හෝ පිළිලොම් වැ නො පැවැත්විය හැකි අනුත්තර වූ දම්සක් පවත්වනලදැ'යි භූමාටු දෙවියෝ සාධුකාර දී හඬ ඇස්වූහ. භූමාටුදෙවියන්ගේ හඬ අසා සිව්මහරදවැසි දෙවියෝ හඬ ඇස්වූහ. ... සිව්මහරද වැසි දෙවියන්ගේ හඬ අසා තව්තිසාවැසි දෙවියෝ ... යාම-දෙවියෝ ... තුසිතදෙවියෝ ... නිර්මමාණරතිදෙවියෝ ... පරනිර්මිතවශ-වර්තිදෙවියෝ ... බ්‍රහ්මකායික දෙවියෝ 'තෙල භාග්‍යවතුන් විසින් බරණැස ඉසිපතනයෙහි මිගදාය නම් අරම්හි දී මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොවැ කිසිවකුහු විසින් හෝ පිළිලොම් වැ නො පැවැත්වියහැකි අනුත්තර වූ දම්සක් පවත්වනලදැ'යි සාධුකාර දී හඬ ඇස්වූහ.

මෙසේ එකෙණෙහි ඒ මොහොතෙහි බඹලොව තෙක් සාධුකාරශබ්දය උස් වැ ගියේ යැ. මේ දශසහස්‍රලෝකධාතුව ද මොනොවට කම්පිත විය මොනොවට ප්‍රකම්පිත විය මොනොවට වෙවුලී යැ, දෙවියන්ගේ දේවානු-භාවය ඉක්ම අප්‍රමාණ වූ මහත් වූ අවභාසයෙක් ද ලෝකයෙහි ප්‍රාදුර්භූත වී.

අථ ඛො භගවා ඉමං උදානං උදානෙසි: 'අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො'ති. ඉතිහිදං ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස 'අඤ්ඤාකොණ්ඩඤ්ඤො' ත්වෙව[1] නාමං අහොසි [2]

'ඉදං දුක්ඛං අරියසච්ච'න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන, 'ඤාණං උදපාදී'ති කෙනට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති කෙනට්ඨෙන, 'විජ්ජා උදපාදී'ති කෙනට්ඨෙන, 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන: 'චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන, 'ඤාණං උදපාදී,ති ඤාතට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති පජානනට්ඨෙන, 'විජ්ජා උදපාදී'ති පටිවෙධට්ඨෙන, 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, ඤාණං ධම්මො, පඤ්ඤා ධම්මො, විජ්ජා ධම්මො, ආලොකො ධම්මො. ඉමෙ පඤ්ච ධම්මා ධම්මපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා'.

දස්සනට්ඨො අත්ථො, ඤාතට්ඨො අත්ථො, පජානනට්ඨො අත්ථො, පටිවෙධට්ඨො අත්ථො, ඔභාසට්ඨො අත්ථො. ඉමෙ පඤ්ච අත්ථා අත්ථපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා'.

පඤ්ච ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්ච අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා. ඉමා දස නිරුත්තියො නිරුත්තිපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා අරම්මණා. තෙන වුච්චති: 'නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා'.

පඤ්චසු ධම්මෙසු ඤාණානි, පඤ්චසු අත්ථෙසු ඤාණානි, දසසු නිරුත්තීසු ඤාණානි ඉමානි වීසති ඤාණානි පටිභානපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා'

'තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍ය'න්ති -පෙ- 'පරිඤ්ඤාත'න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

---

1 අඤ්ඤාසිකොණ්ඩඤ්ඤො - මජ්ඣං. අඤ්ඤාතකොණ්ඩඤ්ඤො - PTS

2 සච්චසංයුත්ත - ධම්මචක්කපවත්තනවග්ග.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භවත් කෞණ්ඩින්‍ය ඒකාන්තයෙන් චතුස්සත්‍යය දත්තේ යැ. භවත් කෞණ්ඩින්‍ය ඒකාන්තයෙන් චතුස්සත්‍යය දත්තේ යැ'යි මේ උදානය පැවැත් වූ සේක. මෙ අයුරින් ආයුෂ්මත් කෞණ්ඩින්‍යස්ථවිරයන්ට 'අඤ්ඤාකොණ්ඩඤ්ඤ යැ'යි නම් වී'.

'මේ දුඃඛ නම් වූ ආර්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසුවිරූ දහම්හි පැනැස පහළ විය නුවණ පහළ විය ප්‍රඥාව පහළ විය විද්‍යාව පහළ විය ආලෝකය පහළ වී.

'චක්ඛුං උදපාදි' යනු කවර අර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු කවර අර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු කවර අර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු කවර අර්ථයෙන, 'ආලොකො උදපාදි' යනු කවර අර්ථයෙන යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු ඥාතාර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු ප්‍රජානනාර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු ප්‍රතිවෙධාර්ථයෙන, 'ආලොකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යැ, ඥානය ධර්ම යැ, ප්‍රඥාව ධර්ම යැ, විද්‍යාව ධර්ම යැ, ආලෝකය ධර්ම යි. මේ පඤ්චධර්මයෝ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති, යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ධර්මප්‍රතිසංවිදාවට ගෝචර වෙති. යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදාවට ගෝචර වෙත් ද ඔහු ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා'යි.

දර්ශනාර්ථය අර්ථ යැ, ඥාතාර්ථය අර්ථ යැ, ප්‍රජානනාර්ථය අර්ථ යැ, ප්‍රතිවෙධාර්ථය අර්ථ යැ, අවභාසාර්ථය අර්ථ යි. මේ පඤ්ච අර්ථයෝ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති, යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඇයට ගොචර වෙති, යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඇයට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා'යි.

පඤ්චධර්මයන් (මෙරමාහට) දක්වන්නට ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති, පඤ්ච අර්ථයන් දක්වන්නට ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති. මේ දශනිරුක්තීහු නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති, යම් නිරුක්ති කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගෝචර වෙති. යම් නිරුක්ති කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා'යි.

පඤ්චධර්මයන්හි ඥානයෝ යැ පඤ්චඅර්ථයන්හි ඥානයෝ යැ දශනිරුක්තීන්හි ඥානයෝ යැ. මේ විංශද්ඥානයෝ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගෝචර වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගෝචර වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා'යි.

තවද, ඒ මේ දුඃඛ නම් වූ ආර්‍යසත්‍යය පිරිසිඳ දතයුතු යැ'යි ... 'පිරිසිඳ දන්නාලද'යි පෙර නො ඇසුවිරූ දහම්හි පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී.

‘චක්ඛුං උදපාදී’ති කෙනට්ඨෙන, ‘ඤාණං උදපාදී’ති කෙනට්ඨෙන, ‘පඤ්ඤා උදපාදී’ති කෙනට්ඨෙන, ‘විජ්ජා උදපාදී’ති කෙනට්ඨෙන, ‘ආලොකො උදපාදී’ති කෙනට්ඨෙන: ‘චක්ඛුං උදපාදී’ති දස්සනට්ඨෙන, ‘ඤාණං උදපාදී’ති ඤාතට්ඨෙන, ‘පඤ්ඤා උදපාදී’ති පජානනට්ඨෙන, ‘විජ්ජා උදපාදී’ති පටිවෙධට්ඨෙන, ‘ආලොකො උදපාදී’ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, ඤාණං ධම්මො, පඤ්ඤා ධම්මො, විජ්ජා ධම්මො, ආලොකො ධම්මො, ඉමෙ පඤ්ච ධම්මා ධම්මපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: ‘ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා.’

දස්සනට්ඨො අත්ථො, ඤාතට්ඨො අත්ථො, පජානනට්ඨො අත්ථො, පටිවෙධට්ඨො අත්ථො, ඔභාසට්ඨො අත්ථො. ඉමෙ පඤ්ච අත්ථා අත්ථපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා, තෙන වුච්චති: ‘අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා.’

පඤ්ච ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්ච අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, ඉමා දස නිරුත්තියො නිරුත්තිපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: ‘නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා.’

පඤ්චසු ධම්මෙසු ඤාණානි, පඤ්චසු අත්ථෙසු ඤාණානි, දසසු නිරුත්තීසු ඤාණානි, ඉමානි වීසති ඤාණානි පටිභානපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: ‘පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා.’

දුක්ඛෙ අරියසච්චෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

‘ඉදං දුක්ඛසමුදයො අරියසච්ච’න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- ‘තං ඛො පනිදං දුක්ඛසමුදයො අරියසච්චං පහාතබ්බ’න්ති -පෙ- ‘පහීන’න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- දුක්ඛසමුදයෙ අරියසච්චෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

'චක්ඛුං උදපාදි' යනු කවර අර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු කවර අර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු කවර අර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු කවර අර්ථයෙන, 'ආලොකො උදපාදි' යනු කවර අර්ථයෙන යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු ඥාතාර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු ප්‍රජානනාර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු ප්‍රතිවෙධාර්ථයෙන, 'ආලොකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යැ, ඥානය ධර්ම යැ, ප්‍රඥව ධර්ම යැ විද්‍යාව ධර්ම යැ, ආලෝකය ධර්ම යැ මේ පඤ්චධර්මයෝ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති. යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ධර්මප්‍රති-සංවිදාවට ගොචර වෙති, යම් ධර්ම කෙනෙක්, ඒ ධර්මප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා'යි.

දර්ශනාර්ථය අර්ථ යැ, ඥාතාර්ථය අර්ථ යැ, ප්‍රජානනාර්ථය අර්ථ යැ, ප්‍රතිවෙධාර්ථය අර්ථ යැ, අවභාසාර්ථය අර්ථ යැ, මේ පඤ්චඅර්ථයෝ අර්ථප්‍රති-සංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසං-විදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ අර්ථප්‍රතිසංවිදාවට ගෝචර වෙති, යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ගෝචර වෙත් ද ඔහු ඒ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා'යි

පඤ්චධර්මයන් (මෙරමාහට) දක්වන්නට ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති, පඤ්චඅර්ථයන් දක්වන්නට ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති මේ දශනිරුක්තීහු නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති. යම් නිරුක්ති අභිලාප කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගෝචර වෙති. යම් නිරුක්ත්‍යභිලාප කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගෝචර වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'නිරුත්තීසු ඤාණං නිරුත්ති-පටිසම්භිදා'යි.

පඤ්චධර්මයන්හි ඥානයෝ යැ පඤ්චඅර්ථයන්හි ඥානයෝ යැ. දශ-නිරුක්තීන්හි ඥානයෝ යැ මේ විංශද්ඥානයෝ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගොචර වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රති-සංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා'යි.

දුඃඛාර්යසත්‍යයෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

'මේ දුඃඛසමුදය නම් වූ ආර්යසත්‍ය යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලෝකය පහළ විය ... තවද ඒ මේ දුඃඛසමුදය නම් වූ ආර්යසත්‍යය ප්‍රහාතව්‍ය යැ'යි ... ප්‍රහීණ යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලොකය පහළ විය .. දුඃඛසමුදයාර්යසත්‍යයෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

'ඉදං දුක්ඛනිරොධො අරියසච්ච'න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. -පෙ- 'තං ඛො පනිදං දුක්ඛනිරොධො අරියසච්චං සච්ඡිකාතබ්බ'න්ති -පෙ- සච්ඡිකත'න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, -පෙ- දුක්ඛනිරොධෙ අරියසච්චෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

'ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්ච'න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. -පෙ- 'තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං භාවෙතබ්බ'න්ති -පෙ- 'භාවිත'න්ති පුබ්බෙ අනනස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

චතූසු අරියසච්චෙසු සට්ඨි ධම්මා, සට්ඨි අත්ථා, වීසංසතං[1] නිරුත්තියො, චත්තාරීසඤ්ච[2] ද්වෙ ච ඤාණසතානි.

''අයං කායෙ කායානුපස්සනා'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. 'සා ඛො පනායං කායෙ කායානුපස්සනා භාවෙතබ්බා'ති මෙ භික්ඛවෙ, -පෙ- භාවිතා'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

''අයං වෙදනාසු -පෙ- අයං චිත්තෙ -පෙ- අයං ධම්මෙසු ධම්මානුපස්සනා'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. සා ඛො පනායං ධම්මෙසු ධම්මානුපස්සනා 'භාවෙතබ්බා'ති -පෙ- භාවිත'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි''[ස].

'අයං කායෙ කායානුපස්සනා'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- සා ඛො පනායං කායෙ කායානුපස්සනා 'භාවෙතබ්බා'ති -පෙ- 'භාවිතා'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන, ඤාණං උදපාදී'ති කෙනට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති කෙනට්ඨෙන, විජ්ජා උදපාදී'ති කෙනට්ඨෙන, 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන: චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන, 'ඤාණං උදපාදී'ති ඤාතට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති පජානනට්ඨෙන, විජ්ජා උදපාදී'ති පටිවෙධට්ඨෙන, 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, ඤාණං ධම්මො, පඤ්ඤා ධම්මො, විජ්ජා ධම්මො, ආලොකො ධම්මො. ඉමෙ පඤ්ච ධම්මා ධම්මපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා.

---

1. වීසංසත - මජ්ඣං., වීසසතං - සං., PTS 2. චත්තාලීසඤ්ච - මජ්ඣං.

ස. සතිපට්ඨාන සංයුත්ත - අනනුස්සුතවග්ගො I

'මේ දුඃඛනිරොධ නම් වූ ආර්‍ය්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය. ... ආලොකය පහළ විය ... තවද ඒ මේ දුඃඛනිරොධ නම් වූ ආර්‍ය්‍යසත්‍යය සාක්ෂාත්කර්තව්‍ය යැ'යි ... සාක්ෂාත්කෘත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය. ... ආලෝකය පහළ විය ... දුඃඛනිරොධ නම් වූ ආර්‍ය්‍යසත්‍යයෙහි ධර්ම පසළොසෙක. අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

'මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදා නම් වූ ආර්‍ය්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලෝකය පහළ විය ... තවද ඒ මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදා නම් වූ ආර්‍ය්‍යසත්‍යය භාවිතව්‍ය යැයි ... භාවිත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලෝකය පහළ විය ... දුඃඛනිරොධගාමිනීප්‍රතිපදා නම් වූ ආර්‍ය්‍යසත්‍යයෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

සතර ආර්‍ය්‍යසත්‍යයන්හි ධර්ම සැටෙක, අර්ථ සැටෙක, නිරුක්ති එක්සිය-විස්සෙක, ඥාන දෙසියසතලිසෙකි.

මහණෙනි, මට 'මේ කයෙහි කායානුපස්සනා භාවනා යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ආලෝකය පහළ විය. තවද මහණෙනි, මට 'ඒ මේ කයෙහි කායානුපස්සනාභාවනාව භාවිතව්‍යය යැ'යි ... මහණෙනි, මා විසින් භාවිත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය. ... ආලොකය පහළ වී.

මහණෙනි, මට 'මේ වෙදනාවන්හි ... මේ චිත්තයෙහි .. මහණෙනි, මට 'මේ ධර්මයන්හි ධම්මානුපස්සනා භාවනා යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලොකය පහළ විය. 'තවද ඒ මේ ධර්මයන්හි ධම්මානු-පස්සනා භාවනාව භාවිතව්‍ය යැ'යි ... භාවිත යැ'යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලොකය පහළ වී.

'මේ කයෙහි කායානුපස්සනාභාවනා යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලෝකය පහළ විය. ... තවද ඒ මේ කයෙහි කායානු-පස්සනාභාවනාව භාවිතව්‍ය යැ'යි ... භාවිත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය. ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලොකය පහළ වී.

'චක්ඛුං උදපාදි' යනු කවර අර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු කවර අර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු කවර අර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු කවර අර්ථයෙන, 'ආලොකො උදපාදි' යනු කවර අර්ථයෙන යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු ඥාතාර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු ප්‍රජානනාර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු ප්‍රතිවෙධාර්ථ-යෙන, 'ආලොකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යැ ඥානය ධර්ම යැ ප්‍රඥාව ධර්ම යැ විද්‍යාව ධර්ම යැ ආලොකය ධර්ම යි. මේ පඤ්චධර්මයෝ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු, ඒ ධර්ම-ප්‍රතිසංවිදාවට ගෝචර වෙති. යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්, එයින් කියනු ලැබෙයි: 'ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා'යි.

දස්සනට්ඨො අත්ථො, ඤාතට්ඨො අත්ථො, පජානනට්ඨො අත්ථො, පටිවෙධට්ඨො අත්ථො, ඔභාසට්ඨො අත්ථො. ඉමෙ පඤ්ච අත්ථා අත්ථපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්ස ආරම්මණා, තෙ තස්ස ගොචරා, යෙ තස්ස ගොචරා, තෙ තස්ස ආරම්මණා. තෙන වුච්චති: 'අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා.'

පඤ්ච ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්ච අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, ඉමා දස නිරුත්තියො නිරුත්තිපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්ස ආරම්මණා, තෙ තස්ස ගොචරා, යෙ තස්ස ගොචරා, තෙ තස්ස ආරම්මණා. තෙන වුච්චති: 'නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා.'

පඤ්චසු ධම්මෙසු ඤාණානි, පඤ්චසු අත්ථෙසු ඤාණානි, දසසු නිරුත්තීසු ඤාණානි, ඉමානි වීසති ඤාණානි පටිභානපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්ස ආරම්මණා, තෙ තස්ස ගොචරා. යෙ තස්ස ගොචරා, තෙ තස්ස ආරම්මණා. තෙන වුච්චති: 'පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා.'

කායෙ කායානුපස්සනාසතිපට්ඨානෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

'අයං වෙදනාසු -පෙ- අයං චිත්තෙ -පෙ- 'අයං ධම්මෙසු ධම්මානුපස්සනා'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- සා ඛො පනායං ධම්මෙසු ධම්මානුපස්සනා භාවෙතබ්බා,ති -පෙ- 'භාවිතා'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. -පෙ- ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

චතූසු සතිපට්ඨානෙසු සට්ඨි ධම්මා, සට්ඨි අත්ථා, වීසංසතං[1] නිරුත්තියො, චත්තාරීසඤ්ච[2] ද්වෙ ච ඤාණසතානි.

'අයං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. සො ඛො පනායං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො 'භාවෙතබ්බො'ති මෙ භික්ඛවෙ, -පෙ- 'භාවිතො'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

'අයං විරියසමාධි -පෙ- අයං චිත්තසමාධි -පෙ- 'අයං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. 'සො ඛො පනායං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො භාවෙතබ්බො'ති මෙ භික්ඛවෙ, -පෙ- 'භාවිතො'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

1 විසතිසතං - මජසං. වීසඋතං - ස්‍යා PTS  2 චත්තාලීසඤ්ච - මජසං

දර්ශනාර්ථය අර්ථ යැ ඥාතාර්ථ යැ අර්ථ යැ ප්‍රජානනාර්ථය අර්ථ යැ ප්‍රතිවෙධාර්ථය අර්ථ යැ අවභාසාර්ථය අර්ථ යි. මේ පඤ්ච අර්ථයෝ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති. යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ අර්ථප්‍රතිසංවිදාවට ගොචර වෙති, යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එහින් කියනු ලැබෙයි: 'අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා' යි.

පඤ්චධර්මයන් (මෙරමාහට) දක්වනුවට ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති, පඤ්ච අර්ථයන් දක්වනුවට ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති. මේ දශනිරුක්තීහු නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති. යම් නිරුක්ත්‍යභිලාප කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිස විදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගොචර වෙති, යම් නිරුක්ත්‍යභිලාප කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්, එහින් කියනු ලැබෙයි: 'නිරුත්තිසු ඤාණං නිරුත්තිපටිසම්භිදා'යි.

පඤ්චධර්මයන්හි ඥානයෝ යැ පඤ්චඅර්ථයන්හි ඥානයෝ යැ දශනිරුක්තීන්හි ඥානයෝ යැ. මේ විංශද්ඥානයෝ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභාන ප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගෝචර වෙති, යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගෝචර වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන වෙති, එහින් කියනු ලැබෙයි: 'පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා'යි.

කයෙහි කායානුපස්සනාසතිපට්ඨානභාවනායෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

'මේ වේදනාවන්හි .. මේ චිත්තයෙහි ... මේ ධර්මයන්හි ධර්මානුදර්ශන යැ'යි පෙර නො ඇසූවිරූ ධර්මයන්හි චක්ෂුස පහළ විය ... ආලොකය පහළ විය ... තවද ඒ මේ ධර්මයන්හි ධර්මානුදර්ශනය භාවිතව්‍ය යැ'යි ... භාවිත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළවිය ... ආලොකය පහළ විය ... ධර්මයන්හි ධම්මානුපස්සනා සතිපට්ඨානයෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

සතර සතිපට්ඨානයන්හි ධර්ම සැටෙක. අර්ථ සැටෙක, නිරුක්ති එක්සියවිස්සෙක, ඥාන දෙසිය සාළිසෙකි.

'මේ කර්තුකාම්‍යතා කුශලච්ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා ප්‍රධන්වීර්යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාද යැ'යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය .. ආලොකය පහළ විය, 'තවද ඒ මේ ඡන්ද සමාධියෙන් හා ප්‍රධන්වීර්යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාදය භාවිතව්‍ය යැ'යි මහණෙනි, මට ... භාවිත යැ'යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලොකය පහළ වී.

'මේ වීර්යාධිපතිසමාධියෙන් මේ චිත්තාධිපතිසමාධියෙන් ... මේ විමංසාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාද ය'යි මහණෙනි, මට පෙර නො ඇසූ විරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. 'තවද ඒ මේ විමංසාධිපති සමාධියෙන් හා ප්‍රධන්වීර්යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාදය භාවිතව්‍ය යැ'යි මහණෙනි, මට 'භාවිත යැ'යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලොකය පහළ වී.

'අයං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- සො ඛො පනායං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො භාවෙතබ්බො'ති -පෙ- 'භාවිතො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන, 'ඤාණං උදපාදී'ති කෙනට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති කෙනට්ඨෙන, 'විජ්ජා උදපාදී'ති කෙනට්ඨෙන, 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන: 'චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන, 'ඤාණං උදපාදී'ති ඤාතට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති පජානනට්ඨෙන, 'විජ්ජා උදපාදී'ති පටිවෙධට්ඨෙන, 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

'චක්ඛුං ධම්මො, ඤාණං ධම්මො, පඤ්ඤා ධම්මො, විජ්ජා ධම්මො, ආලොකො ධම්මො. ඉමෙ පඤ්ච ධම්මා ධම්මපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති 'ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා.'

දස්සනට්ඨො අත්ථො, ඤාතට්ඨො අත්ථො, පජානනට්ඨො අත්ථො, පටිවෙධට්ඨො අත්ථො, ඔභාසට්ඨො අත්ථො. ඉමෙ පඤ්ච අත්ථා අත්ථපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා.

පඤ්ච ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්ච අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, ඉමා දස නිරුත්තියො නිරුත්තිපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා.'

පඤ්චසු ධම්මෙසු ඤාණානි, පඤ්චසු අත්ථෙසු ඤාණානි, දසසු නිරුත්තීසු ඤාණානි, ඉමානි වීසති ඤාණානි පටිභානපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා.'

ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතෙ ඉද්ධිපාදෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

“මේ ඡන්දාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්යයෙන් හා සමන්නාගත ඍද්ධිපාද යැ’යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය ... ‘තවද ඒ මේ ඡන්දාධිපති සමාධියෙන් හා ප්‍රධන්වීර්යයෙන් හා සමන්නාගත වූ ඍද්ධිපාදය භාවිතව්‍ය යැ’යි ... ‘භාවිත යැ’යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී.

‘චක්ඛුං උදපාදි’ යනු කවර අර්ථයෙන, ‘ඤාණං උදපාදි’’ යනු කවර අර්ථයෙන, ‘පඤ්ඤා උදපාදි’ යනු කවර අර්ථයෙන, ‘විජ්ජා උදපාදි’ යනු කවර අර්ථයෙන, ‘ආලෝකො උදපාදි’ යනු කවර අර්ථයෙන යත්: ‘චක්ඛුං උදපාදි’ යනු දර්ශනාර්ථයෙන, ‘ඤාණං උදපාදි’ යනු ඥාතාර්ථයෙන, ‘පඤ්ඤා උදපාදි’ යනු ප්‍රජානනාර්ථයෙන, ‘විජ්ජා උදපාදි’’ යනු ප්‍රතිවෙධාර්ථයෙන, ‘ආලෝකො උදපාදි’ යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යැ, ඥානය ධර්මය, ප්‍රඥාව ධර්ම යැ, විද්‍යාව ධර්ම යැ, ආලෝකය ධර්ම යි. මේ පඤ්චධර්මයෝ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ධර්මප්‍රතිසංවිදාවට ගොචර වෙති. යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්, එයින් කියනු ලැබෙයි: ‘ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා’යි.

දර්ශනාර්ථය අර්ථ යැ, ඥාතාර්ථය අර්ථ යැ, ප්‍රජානනාර්ථය අර්ථ යැ, ප්‍රතිවෙධාර්ථය අර්ථ යැ, අවභාසාර්ථය අර්ථ යි. මේ පඤ්ච අර්ථයෝ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ අර්ථප්‍රතිසංවිදාවට ගෝචර වෙති. යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනුලැබෙයි: ‘අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා’යි.

පඤ්චධර්මයන් (මෙරමාහට) දක්වනුවට ව්‍යඤ්ජන නිරුක්ත්‍යභිලාපයෝ වෙති, පඤ්ච අර්ථයන් දක්වනුවට ව්‍යඤ්ජන නිරුක්ත්‍යභිලාපයෝ වෙති, මේ දශනිරුක්තීහු නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් නිරුක්ත්‍යභිලාප කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගෝචර වෙති. යම් නිරුක්ත්‍යභිලාප කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගෝචර වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනුලැබෙයි: ‘නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා’යි.

පඤ්චධර්මයන්හි ඥානයෝ වෙති, පඤ්චඅර්ථයන්හි ඥානයෝ වෙති, දශනිරුක්තීන්හි ඥානයෝ වෙත්. මේ විංශද්ඥානයෝ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගොචර වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: ‘පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා යි.

ඡන්දාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්යයෙන් හා සමන්නාගත වූ ඍද්ධිපාදයෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

‘අයං විරියසමාධි -පෙ- අයං චිත්තසමාධි -පෙ- ‘අයං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො’ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- ‘සො ඛො පනායං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො භාවෙතබ්බො’ති -පෙ- ‘භාවිතො’ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතෙ ඉද්ධිපාදෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

චතූසු ඉද්ධිපාදෙසු සට්ඨි ධම්මා, සට්ඨි අත්ථා, වීසංසතං නිරුත්තියො, චත්තාරීසඤ්ච ද්වෙ ච ඤාණසතානි.

‘සමුදයො සමුදයො’ති ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි ‘නිරොධො නිරොධො’ති ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. විපස්සිස්ස බොධිසත්තස්ස වෙය්‍යාකරණෙ දස ධම්මා, දස අත්ථා, වීසති නිරුත්තියො චත්තාරීසං ඤාණානි.

සමුදයො සමුදයො’ති ඛො භික්ඛවෙ, සිඛිස්ස බොධිසත්තස්ස -පෙ- වෙස්සභුස්ස බොධිසත්තස්ස -පෙ- කකුසන්ධස්ස බොධිසත්තස්ස -පෙ- කොණාගමනස්ස බොධිසත්තස්ස -පෙ- කස්සපස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. ‘නිරොධො නිරොධො’ති ඛො භික්ඛවෙ, කස්සපස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි පෙ- ආලොකො උදපාදි. කස්සපස්ස බොධිසත්තස්ස වෙය්‍යාකරණෙ දස ධම්මා, දස අත්ථා, වීසති නිරුත්තියො, චත්තාරීසං ඤාණානි.

‘සමුදයො සමුදයො’ති ඛො භික්ඛවෙ, ගොතමස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. ‘නිරොධො නිරොධො’ති ඛො භික්ඛවෙ, ගොතමස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. ගොතමස්ස බොධිසත්තස්ස වෙය්‍යාකරණෙ දස ධම්මා, දස අත්ථා, වීසති නිරුත්තියො, චත්තාරීසං[1] ඤාණානි.

සත්තන්නං බොධිසත්තානං සත්තසු වෙය්‍යාකරණෙසු සත්තති ධම්මා, සත්තති අත්ථා, චත්තාරීසංසතං[2] නිරුත්තියො, අසීති ච ද්වෙ ච ඤාණසතානි.

යාවතා අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය. අඵස්සිතො පඤ්ඤාය අභිඤ්ඤට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං[3] නිරුත්තියො, සතං ඤාණානි.

යාවතා පරිඤ්ඤාය පරිඤ්ඤට්ඨො -පෙ- යාවතා පහානස්ස පහානට්ඨො -පෙ- යාවතා භාවනාය භාවනට්ඨො -පෙ- යාවතා සච්ඡිකිරියාය සච්ඡිකිරියට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය. අඵස්සිතො පඤ්ඤාය සච්ඡිකිරියට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. සච්ඡිකිරියාය සච්ඡිකිරියට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො, සතං ඤාණානි.

1. චත්තාලීස - මජසං, 2. චත්තාලීසසතං - මජසං, චත්තාරීසසතා - සයා. PTS.
3 පඤ්ඤාස - මජසං, සයා, PTS.

‘මේ වීර්‍ය්‍යාධිපතිසමාධියෙන් ... මේ චිත්තාධිපතිසමාධියෙන් ... මේ විමංසාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාද යැ’යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය .. ආලෝකය පහළ විය ... ‘තවද ඒ මේ විමංසාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාදය භාවිතව්‍ය යැ’ යි ... භාවිත යැ’ යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය .. ආලෝකය පහළ විය ... විමංසාධිපති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාදයෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

සතර ඍද්ධිපාදයන්හි ධර්ම සැටෙක, අර්ථ සැටෙක, නිරුක්ති එක්සිය විස්සෙක, ඥාන දෙසියසාළිසෙකි

මහණෙනි, ‘සමුදය යැ සමුදය යැ’යි විපස්සී බෝසත්හට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. මහණෙනි, ‘නිරෝධ යැ නිරෝධ යැ’යි විපස්සී බෝසත්හට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය විපස්සී බෝසත්හට සූත්‍රාන්ත යෙහි ධර්ම දසයෙක, අර්ථ දසයෙක, නිරුක්ති විස්සෙක, ඥාන සතළිසෙකි.

මහණෙනි, ‘සමුදය යැ සමුදය යැ’ යි සිඛී බෝසත්හට ... වෙස්සභූ බෝසත්හට ... කකුසඳ බෝසත්හට .. කෝණාගමන බෝසත්හට ... කාශ්‍යප බෝසත්හට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. මහණෙනි, ‘නිරෝධ යැ නිරෝධ යැ’යි කාශ්‍යප බෝසත්හට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. කාශ්‍යප බෝසත්හට සූත්‍රාන්තයෙහි ධර්ම දසයෙක, අර්ථ දසයෙක, නිරුක්ති විස්සෙක, ඥාන සතළිසෙකි.

මහණෙනි, ‘සමුදය යැ සමුදය යැ’යි ගොයුම් බෝසත්හට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. මහණෙනි, ‘නිරෝධ යැ නිරෝධ යැ’යි ගොයුම් බෝසත්හට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. ගොයුම් බෝසත්හට සූත්‍රාන්තයෙහි ධර්ම දසයෙක, අර්ථ දසයෙක, නිරුක්ති විස්සෙක, ඥාන සතළිසෙකි.

සත් බෝසත්හට සප්තසූත්‍රාන්තයෙහි ධර්ම සැත්තෑවෙක, අර්ථ සැත්තෑවෙක, නිරුක්ති එක්සියසාළිසෙක, ඥාන දෙසියඅසූවෙකි.

යම්තාක් අභිඥයෙහි අභිඥෙය්‍යාර්ථය වේ ද හේ දත්නාලද යැ දක්නා ලද යැ ප්‍රකට කරන ලද යැ සාක්ෂාත්කෘත යැ ප්‍රඥයෙන් (පුනපුනා සමුදාචාර විසින්) පහස්නා ලද යැ. ප්‍රඥයෙන් නො පහස්නාලද අභිඥෙය්‍යාර්ථයෙක් නැතැ’යි චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥව පහළ විය, විද්‍යාව පහළ විය, අලෝකය පහළ වී අභිඥවගේ අභිඥෙය්‍යාර්ථයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

යම්තාක් පරිඥවගේ පරිඥෙය්‍යාර්ථය වේ ද ... යම්තාක් ප්‍රහාණයාගේ ප්‍රහාණාර්ථය වේ ද ... යම්තාක් භාවනායෙහි භාවනාර්ථය වේ ද ... යම්තාක් සාක්ෂාත්ක්‍රියාවගේ සාක්ෂාත්ක්‍රියාර්ථය වේ ද හේ දත්නාලද යැ දක්නා ලද යැ ප්‍රකට කරන ලද යැ සාක්ෂාත්කෘත යැ ප්‍රඥයෙන් පහස්නාලද යැ ප්‍රඥයෙන් නො පහස්නාලද සාක්ෂාත්ක්‍රියාර්ථයෙක් නැතැ’යි චක්ෂුස පහළ විය, ඥානය පහ විය, ප්‍රඥව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය. සාක්ෂාත්ක්‍රියාවගේ සාක්ෂාත්ක්‍රියාර්ථයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨෙ, පරිඤ්ඤාය පරිඤ්ඤට්ඨෙ, පහානාය පහානට්ඨෙ, භාවනාය භාවනට්ඨෙ, සච්ඡිකිරියාය සච්ඡිකිරියට්ඨෙ පඤ්චවීසං සතං ධම්මා, පඤ්චවීසං සතං අත්ථා, අඩ්ඪතෙය්‍යානි නිරුත්තිසතානි, පඤ්ච ඤාණසතානි.

යාවතා ඛන්ධානං ඛන්ධට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය ඛන්ධට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි ඛන්ධානං ඛන්ධට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං[1] නිරුත්තියො, සතං ඤාණානි.

යාවතා ධාතූනං ධාතුට්ඨො -පෙ- යාවතා ආයතනානං ආයතනට්ඨො -පෙ- යාවතා සඞ්ඛතානං සඞ්ඛතට්ඨො -පෙ- යාවතා අසඞ්ඛතස්ස අසඞ්ඛතට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය අසඞ්ඛතට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. අසඞ්ඛතස්ස අසඞ්ඛතට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං[1] නිරුත්තියො, සතං ඤාණානි.

ඛන්ධානං ඛන්ධට්ඨෙ, ධාතූනං ධාතුට්ඨෙ, ආයතනානං ආයතනට්ඨෙ සඞ්ඛතානං සඞ්ඛතට්ඨෙ, අසඞ්ඛතස්ස අසඞ්ඛතට්ඨෙ පඤ්චවීසං සතං ධම්මා, පඤ්චවීසං සතං[2] අත්ථා, අඩ්ඪතෙය්‍යානි නිරුත්තිසතානි,[3] පඤ්ච ඤාණසතානි.

යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො, ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය දුක්ඛට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. දුක්ඛස්ස දුක්ඛට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො, සතං ඤාණානි.

යාවතා සමුදයස්ස සමුදයට්ඨො -පෙ- යාවතා නිරොධස්ස නිරොධට්ඨො -පෙ- යාවතා මග්ගස්ස මග්ගට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය මග්ගට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. මග්ගස්ස මග්ගට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො, සතං ඤාණානි.

චතූසු අරියසච්චෙසු සතං ධම්මා, සතං අත්ථා, ද්වෙ නිරුත්තිසතානි, චත්තාරි ඤාණසතානි.

යාවතා අත්ථපටිසම්භිදාය අත්ථපටිසම්භිදට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය අත්ථපටිසම්භිදට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. අත්ථපටිසම්භිදාය අත්ථපටිසම්භිදට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො, සතං ඤාණානි.

1 පඤ්ඤාසං - මජසං.
2. පඤ්චවීසසතං - මජසං., ස්‍යා., PTS. 3 අඩ්ඪතෙය්‍යනිරුත්තිසතානි - ස්‍යා., PTS

අභිඥාවගේ අභිඥාර්ථයෙහි, පරිඥාවගේ පරිඥාර්ථයෙහි, ප්‍රහාණයාගේ ප්‍රහාණාර්ථයෙහි, භාවනාවගේ භාවනාර්ථයෙහි, සාක්ෂාත් ක්‍රියාවගේ සාක්ෂාත්ක්‍රියාර්ථයෙහි ධර්ම එක්සියපස්විස්සෙක, අර්ථ එක්සියපස්විස්සෙක, නිරුක්ති දෙසියපනසෙක, ඥාන පන්සියයෙකි.

යම්තාක් ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථය වේ ද හේ දන්නාලද යැ දක්නාලද යැ ප්‍රකට කරනලද යැ සාක්ෂාත්කෘත යැ ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද යැ, ප්‍රඥායෙන් ස්පර්ශ නො කරනලද ස්කන්ධාර්ථයෙක් නැතැ'යි චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය. ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

යම්තාක් ධාතූන්ගේ ධාත්වර්ථය වේ ද ... යම්තාක් ආයතනයන්ගේ ආයතනාර්ථය වේ ද ... යම්තාක් සඞ්ඛතයන්ගේ සඞ්ඛතාර්ථය වේ ද ... යම්තාක් අසඞ්ඛතයන්ගේ අසඞ්ඛතාර්ථය වේ ද හේ දන්නාලද යැ දක්නාලද යැ ප්‍රකට කරනලද යැ සාක්ෂාත්කෘත යැ ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද යැ. ප්‍රඥායෙන් ස්පර්ශ නො කරනලද අසඞ්ඛතාර්ථයෙක් නැතැ' යි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. අසඞ්ඛතයාගේ අසඞ්ඛතාර්ථයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි

ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථයෙහි, ධාතූන්ගේ ධාත්වර්ථයෙහි, ආයතනයන්ගේ ආයතනාර්ථයෙහි, සඞ්ඛතයන්ගේ සඞ්ඛතාර්ථයෙහි, අසඞ්ඛතයන්ගේ අසඞ්ඛතාර්ථයෙහි ධර්ම එක්සියපස්විස්සෙක, අර්ථ එක්සියපස්විස්සෙක, නිරුක්ති දෙසියපනසෙක, ඥාන පන්සියයෙකි.

යම්තාක් දුඃඛයාගේ දුඃඛාර්ථය වේ ද, හේ දන්නාලද යැ දක්නාලද යැ ප්‍රකට කරනලද යැ සාක්ෂාත්කෘත යැ ප්‍රඥායෙන් පහස්නාලද යැ ප්‍රඥායෙන් නො පහස්නාලද දුඃඛාර්ථයෙක් නැතැ'යි චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය. දුඃඛයාගේ දුඃඛාර්ථයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

යම්තාක් සමුදයාගේ සමුදයාර්ථය වේ ද ... යම්තාක් නිරෝධයාගේ නිරෝධාර්ථය වේ ද ... යම්තාක් මාර්ගයාගේ මාර්ගාර්ථය වේ ද, හේ දන්නාලද යැ දක්නාලද යැ ප්‍රකට කරනලද යැ සාක්ෂාත්කෘත යැ ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද යැ. ප්‍රඥායෙන් නො පහස්නාලද මාර්ගාර්ථයෙක් නැතැ'යි චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය. මාර්ගයාගේ මාර්ගාර්ථයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

සතර ආර්යසත්‍යයෙහි ධර්ම සියයෙක, අර්ථ සියයෙක, නිරුක්ති දෙසියයෙක, ඥාන සාරසියයෙකි.

යම්තාක් අර්ථප්‍රතිසංවිදායෙහි අර්ථප්‍රතිසංවිදාර්ථය වේ ද, හේ දන්නා ලද යැ, දක්නා ලද යැ ප්‍රකට කරන ලද යැ, සාක්ෂාත්කෘත යැ ප්‍රඥායෙන් පහස්නා ලද යැ, ප්‍රඥායෙන් නො පහස්නා ලද අර්ථප්‍රතිසංවිදායෙක් නැතැ'යි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. අර්ථප්‍රතිසංවිදාවගේ අර්ථප්‍රතිසංවිදාර්ථයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

යාවතා ධම්මපටිසම්භිදාය ධම්මපටිසම්භිදට්ඨො -පෙ- යාවතා නිරුත්තිපටිසම්භිදාය නිරුත්තිපටිසම්භිදට්ඨො -පෙ- යාවතා පටිභානපටිසම්භිදාය පටිභානපටිසම්භිදට්ඨො, ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය පටිභානපටිසම්භිදට්ඨො, නත්ථීති චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, පටිභානපටිසම්භිදට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො, සතං ඤාණානි.

චතූසු පටිසම්භිදාසු සතං ධම්මා, සතං අත්ථා, ද්වෙ නිරුත්තිසතානි, චත්තාරි ඤාණසතානි.

යාවතා ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය, අඵස්සිතං පඤ්ඤාය ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං නත්ථීති චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො සතං ඤාණානි.

යාවතා සත්තානං ආසයානුසයෙ ඤාණං -පෙ- යාවතා යමකපාටිහීරෙ ඤාණං -පෙ- යාවතා මහාකරුණාසමාපත්තියා ඤාණං -පෙ- යාවතා සබ්බඤ්ඤුතඤ්ඤාණං -පෙ- යාවතා අනාවරණං ඤාණං ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය, අඵස්සිතං පඤ්ඤාය අනාවරණං ඤාණං නත්ථීති චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, අනාවරණෙ ඤාණෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො, සතං ඤාණානි.

ඡසු බුද්ධධම්මෙසු දියඩ්ඪසතං ධම්මා, දියඩ්ඪසතං අත්ථා, තීණි නිරුත්ති-සතානි, ඡ ඤාණසතානි.

පටිසම්භිදාධිකරණෙ[1] අඩ්ඪනවධම්මසතානි[2] අඩ්ඪනව අත්ථසතානි, නිරුත්තිසහස්සඤ්ච සත්ත ච නිරුත්තිසතානි, තීණි ච ඤාණසහස්සානි චත්තාරි ච ඤාණසතානීති.

පටිසම්භිදාකථා සමත්තා.

## 2. 7

## ධම්මචක්කකථා

"එකං සමයං භගවා බාරාණසියං විහරති -පෙ- ඉතිහිදං ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤො[3] ත්වෙව නාමං අහොසි.[අ]

'ඉදං දුක්ඛං අරියසච්චන්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

1 පටිසම්භිදාපකරණෙ - සයා
2 අඩ්ඪනවමානි ධම්මසතානි සයා, PTS.
3. අඤ්ඤාසිකොණ්ඩඤ්ඤො - මජසං, අඤ්ඤාතකොණ්ඩඤ්ඤො - සයා, PTS
අ. සච්චසංයුත්ත - ධම්මචක්කප්පවත්තනවග්ග

යම්තාක් ධර්මප්‍රතිසංවිදාව ගේ ධර්මප්‍රතිසංවිදාඥානය වේ ද ... යම්තාක් නිරුක්තිප්‍රතිසංවිදාවගේ නිරුක්තිප්‍රතිසංවිදාඥාන ය වේ ද ... යම්තාක් ප්‍රතිභානප්‍රතිසංවිදාව ගේ ප්‍රතිභානප්‍රතිස විදාඥානය වේ ද, හේ දත්නා ලද යැ, දක්නා ලද යැ ප්‍රකට කරන ලද යැ සාක්‍ෂාත්කෘත යැ ප්‍රඥායෙන් පහස්න ලද යැ, ප්‍රඥායෙන් නො පහස්නාලද ප්‍රතිභානප්‍රතිසංවිදාඥානයෙක් නැතැ’යි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. ප්‍රතිභාන ප්‍රතිසංවිදාඥානයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

සතර ප්‍රතිස විද්හි ධර්ම සියයෙක, අර්ථ සියයෙක, නිරුක්ති දෙසියයෙක. ඥාන සාරසියයෙකි.

යම්තාක් ඉන්ද්‍රියපරාවරතායෙහි ඥානය වේ ද, හේ දත්නාලද යැ දක්නාලද යැ ප්‍රකට කරනලද යැ සාක්‍ෂාත්කෘත යැ ප්‍රඥායෙන් පහස්නාලද යැ, ප්‍රඥායෙන් නො පහස්නාලද ඉන්ද්‍රියපරාවරතාඥානයෙක් නැතැ’යි චක්‍ෂුස පහළ විය .. ආලෝකය පහළ විය. ඉන්ද්‍රියපරාවරතාඥානයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

යම්තාක් සත්ත්වයන්ගේ ආශයානුශය (ආශය අනුශය දත්නා) ඥානය වේ ද .. යම්තාක් යමකප්‍රාතිහාර්යඥානය වේ ද .. යම්තාක් මහා කරුණා සමාපත්තිඥානය වේ ද ... යම්තාක් සර්වඥතාඥානය වේ ද යම්තාක් අනාවරණඥානය වේ ද. හේ දත්නාලද යැ දක්නා ලද යැ ප්‍රකට කරන ලද යැ සාක්‍ෂාත්කෘත යැ, ප්‍රඥායෙන් පහස්නාලද යැ. ප්‍රඥායෙන් නො පහස්නා ලද අනාවරණඥානයෙක් නැතැ’යි චක්‍ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළ විය. අනා-වරණඥානයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

සවැදෑරුම් බුද්ධධර්මයෙහි ධර්ම එක්සිය පනසෙක, අර්ථ එක්සියපනසෙක, නිරුක්ති තුන්සියයෙක, ඥාන සසියයෙකි.

පටිසම්භිදාධිකාරයෙහි ධර්ම අටසියපනසෙක, අර්ථ අටසියපනසෙක නිරුක්ති එක්දහස්සත්සියයෙක, ඥාන තුන්දහස්සාරසියයෙකි.

ප්‍රතිසංවිත්කථා නිමි.

## 2. 7

## දම්සක් කථා

“එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර වැඩ වාසය කරන සේක ... මෙසෙයින් ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ ස්ථවිරයන්හට ‘‘අඤ්ඤාකොණ්ඩඤ්ඤ’ යයි මෙ නම් වී

‘මේ දුඃඛ නම් වූ ආර්‍ය්‍යසත්‍ය යැ’යි පෙර නො ඇසූ විරූ දහම්හි ප්‍රඥා-චක්‍ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, අලෝකය පහළ විය

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන, 'ඤාණං උදපාදී'ති කෙනට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති කෙනට්ඨෙන, 'විජ්ජා උදපාදී'ති කෙනට්ඨෙන, 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන: 'චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන, 'ඤාණං උදපාදී'ති ඤාතට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති පජානනට්ඨෙන, විජ්ජා උදපාදී'ති පටිවෙධට්ඨෙන, 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, දස්සනට්ඨො අත්ථො, ඤාණං ධම්මො, ඤාතට්ඨො අත්ථො, පඤ්ඤා ධම්මො, පජානනට්ඨො අත්ථො, විජ්ජා ධම්මො, පටිවෙධට්ඨො අත්ථො, ආලොකො ධම්මො, ඔභාසට්ඨො අත්ථො. ඉමෙ පඤ්ච ධම්මා, පඤ්ච අත්ථා දුක්ඛවත්ථුකා සච්චවත්ථුකා සච්චාරම්මණා සච්චගොචරා සච්චසඞ්ගහිතා සච්චපරියාපන්නා සච්චෙ සමුදාගතා සච්චෙ ඨිතා සච්චෙ පතිට්ඨිතා.

**ධම්මචක්කන්ති** කෙනට්ඨෙන ධම්මචක්කං: ධම්මඤ්ච පවත්තෙති, චක්කඤ්චාති ධම්මචක්කං, චක්කඤ්ච පවත්තෙති ධම්මඤ්චාති ධම්මචක්කං, ධම්මෙන පවත්තෙතීති ධම්මචක්කං, ධම්මචරියාය පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨාපෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ වසිප්පත්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ වසිං පාපෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පාරමිප්පත්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පාරමිං පාපෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ වෙසාරජ්ජප්පත්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ වෙසාරජ්ජං පාපෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මං සක්කරොන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මං ගරුං කරොන්තො[1] පවත්තෙතීති ධම්මචක්කං, ධම්මං මානෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මං පූජෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මං අපචායමානො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මද්ධජො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මකෙතු පවත්තෙතීති ධම්මචක්කං, ධම්මාධිපතෙය්‍යො පවත්තෙතීති ධම්මචක්කං, තං ඛො පන ධම්මචක්කං අප්පටිවත්තියං[3] සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති ධම්මචක්කං.

සද්ධින්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, විරියින්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සතින්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සමාධින්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, පඤ්ඤින්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

---

1 ගරුකරොන්තො - සයා සී. PTS

3. අප්පටිවත්තියං - මජසං., සයා PTS

'චක්ඛුං උදපාදි' යනු කවර අර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු කවර අර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු කවර අර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු කවර අර්ථයෙන, ආලෝකො උදපාදි' යනු කවර අර්ථයෙන යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු ඥාතාර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු ප්‍රජානනාර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු ප්‍රතිවේධාර්ථයෙන, ආලෝකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යැ, දර්ශනාර්ථය අර්ථ යැ. ඥානය ධර්ම යැ, ඥාතාර්ථය අර්ථ යැ. ප්‍රඥාව ධර්ම යැ, ප්‍රජානනාර්ථය අර්ථ යැ. විද්‍යාව ධර්ම යැ, ප්‍රතිවේධාර්ථය අර්ථ යැ. ආලෝකය ධර්ම යැ, අවභාසාර්ථය අර්ථ යැ. මේ පඤ්චධර්මයෝ පඤ්ච අර්ථයෝ දුඃඛය වස්තු කොට ඇත්තාහු යැ සත්‍යය වස්තු කොට ඇත්තාහු යැ සත්‍යය ආලම්බන කොට ඇත්තාහු යැ සත්‍යය විෂය කොට ඇත්තාහු යැ මාර්ගසත්‍යයෙන් සඞ්ගෘහිතයහ, මාර්ගසත්‍යයට අයත් වූවාහු යැ, දුඃඛසත්‍යයෙහි උපන්නාහු යැ, සත්‍යයෙහි සිටියාහු යැ සත්‍යයෙහි පිහිටියාහු යි.

'ධම්මචක්කං' යනු කවර අරුතෙකින් ධම්මචක්ක නම් වී ද, යත්. ප්‍රතිවේධ ධර්මය ද පවත්වයි. (කෙලෙස්සතුරන් නැසීමට වැටෙන බැවින් ප්‍රහරණචක්‍රයක් වැනි තු' යි) චක්‍රය ද. පවත්වා තු' යි 'ධම්මචක්ක' නමි: (ප්‍රතිවේධධර්මචක්‍රය යි.) චක්‍රය ද පවත්වයි. දේශනාධර්මය ද පවත්වා තු'යි 'ධම්මචක්ක නමි (දේශනා ධර්මචක්‍රය යි) (යථාස්වභාව හෙයින්) ධර්මයෙන් පවත්වා තු' යි 'ධම්මචක්ක යැ, (වෛනෙය සන්තානයෙහි) ධර්මචර්යාපිණිස පවත්වා තු'යි 'ධම්මචක්ක යැ, ධර්මයෙහි (විෂයීභාවයෙන් සිටියේ පවත්වා තු'යි 'ධම්මචක්ක යැ, ධර්මයෙහි (අචලභාවයෙන්) පිහිටියේ පවත්වා තු'යි 'ධම්මචක්ක යැ, ධර්මයෙහි පිහිටුවමින් පවත්වා තු'යි 'ධම්මචක්ක' යැ, ධර්මයෙහි වශී (ඊශ්වර) භාවයට පැමිණියේ පවත්වා තු'යි ,ධම්මචක්ක' යැ,. ධර්මයෙහි වශීභාවයට පමුණුවමින් පවත්වා තු'යි 'ධම්මචක්ක' යැ ධර්මයෙහි කෙළවරට පැමිණියේ පවත්වා තු'යි 'ධම්මචක්ක යැ, ධර්මයෙහි කෙළවරට පමුණුවමින් පවත්වා තු' යි 'ධම්මචක්ක යැ, ධර්මයෙහි විශාරද බවට පැමිණියේ පවත්වා තු'යි 'ධම්මචක්ක යැ, ධර්මයෙහි විශාරද බවට පමුණුවමින් පවත්වා තු'යි 'ධම්මචක්ක යැ; ධර්මයට සත්කාර කෙරෙමින් පවත්වා තු'යි 'ධම්මචක්ක' යැ, ධම්මයට ගුරු කෙරෙමින් පවත්වා තු'යි 'ධම්මචක්ක' යැ, ධර්මයට බුහුමන් කෙරෙමින් පවත්වා තු'යි 'ධම්මචක්ක' යැ, ධර්මය පුදමින් පවත්වා තු'යි 'ධම්මචක්ක' යැ. ධර්මය අපචායන කෙරෙමින් පවත්වා තු'යි 'ධම්මචක්ක' යැ ධර්මය ධ්වජයක් සෙයින් පෙරටු කොට ඇතියේ පවත්වා තු'යි 'ධම්මචක්ක' යැ ධර්මය කෙහෙළි කොට ඇතියේ පවත්වා තු'යි 'මමචක්ක' යැ, ධර්මය අධිපති කොට ඇති වැ පවත්වා තු'යි 'ධම්මචක්ක' යැ, තවද ඒ ධර්මචක්‍රය (අන්‍යලබ්ධික) මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලෙව කිසිවක්හු විසින් හෝ නො පැවැත්විය හැකි තු'යි 'ධම්මචක්ක'යි.

ශ්‍රද්ධේන්ද්‍රියය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, වීර්‍යෙන්ද්‍රියය ධර්ම යැ; ඒ ධර්මය පවත්වා තු'යි 'ධම්මචක්ක' නම, ස්මෘතීන්ද්‍රියය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සමාධීන්ද්‍රියය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, ප්‍රඥෙන්ද්‍රියය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නමි.

සද්ධාබලං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, විරියබලං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සතිබලං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සමාධිබලං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, පඤ්ඤාබලං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

සතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, විරියසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, පීතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සමාධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං,

සම්මාදිට්ඨි ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සම්මාසඞ්කප්පො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සම්මාවාචා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සම්මාකම්මන්තො ධම්මො තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සම්මා ආජීවො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං සම්මාවායාමො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සම්මාසති ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සම්මාසමාධි ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, අකම්පියට්ඨෙන බලං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, හෙතුට්ඨෙන මග්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, පදහනට්ඨෙන සම්මප්පධානා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, තථට්ඨෙන සච්චා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, අවික්ඛෙපට්ඨෙන සමථො ධම්මො තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, අනුපස්සනට්ඨෙන විපස්සනා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, එකරසට්ඨෙන සමථවිපස්සනා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සංවරට්ඨෙන සීලවිසුද්ධි ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙ ඤාණං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, ඡන්දො මූලට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති

ශ්‍රද්ධාබලය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, වීර්‍ය-බලය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, ස්මෘතිබලය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සමාධිබලය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, ප්‍රඥාබලය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නමි.

ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, වීර්‍යසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සමාධිසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නමි.

සම්‍යග්දෘෂ්ටිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සම්‍යක්සංකල්පය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සම්‍යග්වචනය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සම්‍යක්-කර්මාන්තය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සම්‍යගාජීවය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සම්‍යග්ව්‍යායාමය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සම්‍යක්ස්මෘතිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සම්‍යක්සමාධිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නමි.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු'යි 'ධම්මචක්ක' නම, අකම්ප්‍යාර්ථයෙන් බලය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, නිර්‍යාණාර්ථයෙන් බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, හේත්වර්ථයෙන් මාර්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, එළඹන අර්ථයෙන් සතිපට්ඨානයෝ ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රධානයෝ ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සමෘද්ධ වන අර්ථයෙන් ඍද්ධිපාදයෝ ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, යථාස්ව-භාවාර්ථයෙන් සත්‍යයෝ ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, අවික්ෂෙපාර්ථයෙන් ශමථය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, ඔවුනොවුන් නො ඉක්ම පවත්වා අර්ථයෙන් යුගනද්ධය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සංවරාර්ථයෙන් ශීල-විශුද්ධිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, අවික්ෂෙපාර්-යෙන් චිත්තවිශුද්ධිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, මුක්තාර්ථයෙන් විමොක්ෂය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්ම-චක්ක' නම, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, සමුච්ඡෙදාර්ථයෙන් ක්ෂයඥානය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, ප්‍රතිප්‍රශ්‍රබ්ධාර්ථයෙන් අනුත්පාද-ඥානය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම, ඡන්දය මූලාර්ථයෙන් ධර්ම යැ, ඒ ධර්මය පවත්වා තු' යි 'ධම්මචක්ක' නම. මනසිකාරය

ධම්මචක්කං, මනසිකාරො සමුට්ඨානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, ඵස්සො සමොධානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, වෙදනා සමොසරණට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සමාධි පමුඛට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං සති ආධිපතෙය්‍යට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, පඤ්ඤා තදුත්තරට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, විමුත්ති සාරට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍ය'න්ති -පෙ- පරිඤ්ඤාත'න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන -පෙ- 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන -පෙ- ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, දස්සනට්ඨො අත්ථො -පෙ- ආලොකො ධම්මො, ඔභාසට්ඨො අත්ථො, ඉමෙ පඤ්ච ධම්මා පඤ්ච අත්ථා දුක්ඛවත්ථුකා සච්චවත්ථුකා සච්චාරම්මණා සච්චගොචරා සච්චසඞ්ගහිතා සච්චපරියාපන්නා සච්චෙ සමුදාගතා සච්චෙ ඨිතා සච්චෙ පතිට්ඨිතා.

**ධම්මචක්ක**න්ති කෙනට්ඨෙන ධම්මචක්කං: ධම්මඤ්ච පවත්තෙති චක්කඤ්චාති ධම්මචක්ක , චක්කඤ්ච පවත්තෙති ධම්මඤ්චාති ධම්මචක්කං, ධම්මෙන පවත්තෙතීති ධම්මචක්කං, ධම්මචරියාය පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨිතො පවත්තෙතීති ධම්මචක්කං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

'ඉදං දුක්ඛසමුදයො අරියසච්ච'න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- තං ඛො පනිදං දුක්ඛසමුදයො අරියසච්චං 'පහාතබ්බ'න්ති -පෙ- 'පහීන'න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන -පෙ- 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන: 'චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන -පෙ- 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, දස්සනට්ඨො අත්ථො -පෙ- ආලොකො ධම්මො, ඔභාසට්ඨො අත්ථො, ඉමෙ පඤ්ච ධම්මා, පඤ්ච අත්ථා සමුදයවත්ථුකා සච්චවත්ථුකා -පෙ- නිරොධවත්ථුකා සච්චවත්ථුකා -පෙ- මග්ගවත්ථුකා සච්චවත්ථුකා සච්චාරම්මණා සච්චගොචරා සච්චසඞ්ගහිතා සච්චපරියාපන්නා සච්චෙ සමුදාගතා සච්චෙ ඨිතා සච්චෙ පතිට්ඨිතා.

සමුට්ඨානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වානු' යි 'ධම්මචක්ක' නම්, සපර්ග්‍ය සමවධානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වානු' යි 'ධම්මචක්ක' නම, වේදනාව සමවසරණාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වානු' යි 'ධම්මචක්ක' නම, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වානු' යි 'ධම්මචක්ක' නම, සමාධිය අධිපතිභාවාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වානු' යි 'ධම්මචක්ක' නම්, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වානු' යි 'ධම්මචක්ක' නම, විමුක්තිය සාරාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වානු' යි 'ධම්මචක්ක' නම, අමතෝගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්යවසානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වානු' යි 'ධම්මචක්ක' නම්.

තවද ඒ මේ දුඃඛ නම් වූ ආර්‍ය්‍යසත්‍යය 'පිරිසිඳ දතයුතු යෑ' යි ... 'පිරිසිඳ දත්නාලද්දී' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

'චක්ඛුං උදපාදි' යනු කවර අර්ථයෙන ... 'ආලෝකො උදපාදි' යනු කවර අර්ථයෙන යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන ... 'ආලෝකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්‍ෂුස ධර්ම යෑ, දර්ශනාර්ථය අර්ථ යෑ ... ආලෝකය ධර්ම යෑ අවභාසාර්ථය අර්ථ යි. මේ පඤ්චධර්මයෝ පඤ්චඅර්ථයෝ දුඃඛය වස්තු කොට ඇත්තාහු යෑ, සත්‍යය වස්තු කොට ඇත්තාහු යෑ, සත්‍යය ආලම්බන කොට ඇත්තාහු යෑ, සත්‍යය ගොචර කොට ඇත්තාහු යෑ, මාර්ගසත්‍යයෙන් සඞ්ගෘහීත යෑ, මාර්ගසත්‍යයට අයත් වූවාහු යෑ, දුඃඛසත්‍යයෙහි උපන්නාහු යෑ, සත්‍යයෙහි සිටියාහු යෑ, සත්‍යයෙහි පිහිටියාහු යි.

ධම්මචක්කං යනු කවර අර්ථයෙන් 'ධම්මචක්ක' නම් වී ද යත්: ප්‍රතිවෙධ ධර්මය ද පවත්වයි චක්‍රය ද පවත්වානු' යි 'ධම්මචක්ක' යෑ. (ප්‍රතිවෙධධර්ම චක්‍රය යි.) චක්‍රය ද පවත්වයි දෙශනාධර්මය ද පවත්වානු' යි 'ධම්මචක්ක'යෑ (දෙශනාධර්මචක්‍රය යි), ධර්මයෙන් පවත්වානු' යි 'ධම්මචක්ක' යෑ. ධර්මචර්‍ය්‍යා පිණිස පවත්වානු' යි 'ධම්මචක්ක යෑ, ධර්මයෙහි සිටියේ පවත්වානු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙහි පිහිටියේ පවත්වානු' යි 'ධම්මචක්ක යෑ ... අමතෝගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්යවසානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වානු' යි 'ධම්මචක්ක' යි.

'මේ දුඃඛසමුදය නම් වූ ආර්‍ය්‍යසත්‍ය යෑ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ විය .. තවද ඒ මේ දුඃඛ නම් වූ ආර්‍ය්‍යසත්‍යය 'ප්‍රහාතව්‍ය යෑ' යි ... 'ප්‍රහීණ යෑ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

'චක්ඛුං උදපාදි' යනු කවර අර්ථයෙන ... 'ආලෝකො උදපාදි' යනු කවර අර්ථයෙන යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන ... 'ආලොකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්‍ෂුස ධර්ම යෑ, දර්ශනාර්ථය අර්ථ යෑ ... ආලෝකය ධර්ම යෑ, අවභාසාර්ථය අර්ථ යි. මේ පඤ්චධර්මයෝ පඤ්චඅර්ථයෝ සමුදය වස්තු කොට ඇත්තාහු යෑ සත්‍යය වස්තු කොට ඇත්තාහු යෑ නිරෝධය වස්තු කොට ඇත්තාහු යෑ සත්‍යය වස්තු කොට ඇත්තාහු යෑ ... මාර්ගය වස්තු කොට ඇත්තාහු යෑ සත්‍යය වස්තු කොට ඇත්තාහු යෑ සත්‍යය ආලම්බන කොට ඇත්තාහු යෑ සත්‍යය විෂය කොට ඇත්තාහු යෑ මාර්ගසත්‍යයෙන් සඞ්ගෘහීතයහ. (මාර්ග) සත්‍යයට අයත් වූවාහු යෑ (දුඃඛ) සත්‍යයෙහි උපන්නාහු යෑ සත්‍යයෙහි සිටියාහු යෑ සත්‍යයෙහි පිහිටියාහු යි.

**ධම්මචක්කන්ති** කෙනට්ඨෙන ධම්මචක්කං: ධම්මඤ්ච පවත්තෙතීති චක්කඤ්චාති ධම්මචක්කං, චක්කඤ්ච පවත්තෙතීති ධම්මඤ්චාති ධම්මචක්කං, ධම්මෙන පවත්තෙතීති ධම්මචක්කං, ධම්මචරියාය පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨිතො පවත්තෙතීති ධම්මචක්කං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන ධම්මො. තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

අයං කායෙ කායානුපස්සනා'ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, සා ඛො පනායං කායෙ කායානුපස්සනා භාවෙතබ්බා'ති මෙ භික්ඛවෙ -පෙ- 'භාවිතා'ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

'අයං වෙදනාසු -පෙ- අයං චිත්තෙ -පෙ- 'අයං ධම්මෙසු ධම්මානුපස්සනා'ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, 'සා ඛො පනායං ධම්මෙසු ධම්මානුපස්සනා භාවෙතබ්බා'ති මෙ භික්ඛවෙ -පෙ- 'භාවිතා'ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

'අයං කායෙ කායානුපස්සනා'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, 'සා ඛො පනායං කායෙ කායානුපස්සනා භාවෙතබ්බා'ති -පෙ- 'භාවිතා'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන -පෙ- ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන: 'චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන -පෙ- 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, දස්සනට්ඨො අත්ථො -පෙ- ආලොකො ධම්මො, ඔභාසට්ඨො අත්ථො, ඉමෙ පඤ්ච ධම්මා පඤ්ච අත්ථා කායවත්ථුකා සතිපට්ඨානවත්ථුකා -පෙ- වෙදනාවත්ථුකා සතිපට්ඨානවත්ථුකා -පෙ- චිත්තවත්ථුකා සතිපට්ඨානවත්ථුකා -පෙ- ධම්මවත්ථුකා සතිපට්ඨානවත්ථුකා සතිපට්ඨානාරම්මණා සතිපට්ඨානගොචරා සතිපට්ඨානසඞ්ගහිතා සතිපට්ඨානපරියාපන්නා සතිපට්ඨානෙ සමුදාගතා සතිපට්ඨානෙ ඨිතා සතිපට්ඨානෙ පතිට්ඨිතා.

**ධම්මචක්කන්ති** කෙනට්ඨෙන ධම්මචක්කං: ධම්මඤ්ච පවත්තෙතීති චක්කඤ්චාති ධම්මචක්කං, චක්කඤ්ච පවත්තෙතීති ධම්මඤ්චාති ධම්මචක්කං, ධම්මෙන පවත්තෙතීති ධම්මචක්කං, ධම්මචරියාය පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

**ධම්මචක්කං** යනු කවර අර්ථයෙකින් 'ධම්මචක්ක' නම් වී ද යත්: ප්‍රතිවේධධර්මය ද පවත්වයි චක්‍රය ද පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, චක්‍රය ද පවත්වයි දේශනාධර්මය ද පවත්වා නු'යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙන් පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මචර්‍ය්‍යා පිණිස පවත්වානු' යි ධම්මචක්ක' යෑ, ධර්මයෙහි සිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙහි පිහිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ ... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' යි.

මහණෙනි, මට 'මේ කයෙහි කායානුපස්සනා යැ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. තවද මහණෙනි, මට 'ඒ මේ කයෙහි කායානුපස්සනාව භාවිතව්‍ය යැ' යි ... 'භාවිත යැ' යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

'මේ වේදනාවන්හි ... මේ චිත්තයෙහි මේ ධර්මයන්හි ධර්මානුදර්ශනා යැ' යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. 'තවද ඒ මේ ධර්මයන්හි ධර්මානුදර්ශනාව භාවිතව්‍ය යැ' යි මහණෙනි, මට .. 'භාවිත යැ' යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

'මේ කයෙහි කායානුපස්සනා යැ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. 'තවද ඒ මේ කයෙහි කායානුපස්සනාව වැඩියයුතු යැ' යි ... වඩනලද්දැ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

'චක්ඛුං උදපාදි' යනු කවර අර්ථයෙකින ... 'ආලෝකො උදපාදි' යනු කවර අර්ථයෙකින යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන ... 'ආලෝකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යෑ, දර්ශනාර්ථය අර්ථ යෑ ... ආලෝකය ධර්ම යෑ, අවභාසාර්ථය අර්ථ යි. මේ පඤ්චධර්මයෝ පඤ්චඅර්ථයෝ කායවස්තුක වූ සතිපට්ඨානය වස්තු කොට ඇත්තාහු යෑ ... වේදනාවස්තුක වූ සතිපට්ඨානය වස්තු කොට ඇත්තාහු යෑ ... චිත්තවස්තුක වූ සතිපට්ඨානය වස්තු කොට ඇත්තාහු යෑ ... ධර්මවස්තුක වූ සතිපට්ඨානය වස්තු කොට ඇත්තාහු යෑ, සතිපට්ඨානය අරමුණු කොට ඇත්තාහු යෑ, සතිපට්ඨානය ගොදුරු කොට ඇත්තාහු යෑ, සතිපට්ඨානයෙන් සඞ්ගෘහීතය හ, සතිපට්ඨානයට අයත් වූවාහු යෑ, සතිපට්ඨානයෙහි උපන්නාහු යෑ, සතිපට්ඨානයෙහි සිටියාහු යෑ, සතිපට්ඨානයෙහි පිහිටියාහු යි.

**ධම්මචක්කං** යනු කවර අර්ථයෙකින් 'ධම්මචක්ක' වේ ද යත්: ප්‍රතිවේධධර්මය ද පවත්වයි චක්‍රය ද පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, චක්‍රය ද පවත්වයි දේශනාධර්මය ද පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙන් පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මචර්‍ය්‍යා පිණිස පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙහි සිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙහි පිහිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක, යෑ ... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' යි.

'අයං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි. -පෙ- ආලොකො උදපාදි, සො ඛො පනායං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො 'භාවෙතබ්බො'ති මෙ භික්ඛවෙ -පෙ- 'භාවිතො'ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

'අයං විරියසමාධි -පෙ- අයං චිත්තසමාධි -පෙ- 'අයං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, සො ඛො, පනායං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො 'භාවෙතබ්බො'ති මෙ භික්ඛවෙ -පෙ- 'භාවිතො'ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

'අයං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි සො ඛො පනායං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො 'භාවෙතබ්බො'ති -පෙ- 'භාවිතො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන -පෙ- 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන: 'චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන -පෙ- 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, දස්සනට්ඨො අත්ථො, -පෙ- ආලොකො ධම්මො, ඔභාසට්ඨො අත්ථො, ඉමෙ පඤ්ච ධම්මා පඤ්ච අත්ථා ඡන්දවත්ථුකා ඉද්ධිපාදවත්ථුකා ඉද්ධිපාදාරම්මණා ඉද්ධිපාදගොචරා ඉද්ධිපාදසඞ්ගහිතා ඉද්ධිපාදපරියාපන්නා ඉද්ධිපාදෙ සමුදාගතා ඉද්ධිපාදෙ ඨිතා ඉද්ධිපාදෙ පතිට්ඨිතා.

**ධම්මචක්කන්ති** කෙනට්ඨෙන ධම්මචක්කං: ධම්මඤ්ච පවත්තෙති චක්කඤ්චාති ධම්මචක්කං, චක්කඤ්ච පවත්තෙති ධම්මඤ්චාති ධම්මචක්කං, ධම්මෙන පවත්තෙතීති ධම්මචක්කං ධම්මචරියාය පවත්තෙතීති ධම්මචක්කං ධම්මෙ ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨාපෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ වසිප්පත්තො පවත්තෙතීති ධම්මචක්කං ධම්මෙ වසිං පාපෙන්තො පවත්තෙතීති ධම්ම-චක්කං, ධම්මෙ පාරමිප්පත්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පාරමිං පාපෙන්තො පවත්තෙතීති ධම්මචක්කං-පෙ- ධම්මං අපචායමානො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මද්ධජො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මකෙතු පවත්තෙතීති ධම්මචක්කං ධම්මාධිපතෙය්‍යො පවත්තෙතීති ධම්මචක්කං, තං ඛො පන ධම්මචක්කං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති ධම්මචක්කං.

‘මේ ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාද යැ’ යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය .. ආලෝකය පහළ විය. තවද ඒ මේ ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාදය ‘භාවිතව්‍ය යැ’ යි මහණෙනි, මට ... ‘භාවිත යැ’ යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

‘මේ වීර්‍ය්‍යය අධිපති කොට ඇති සමාධියෙන් හා ... මේ චිත්තය අධිපති කොට ඇති සමාධියෙන් හා ... මේ විමංසාව අධිපති කොට ඇති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාද යැ’ යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. තවද ඒ මේ විමංසාධිපති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාදය ‘භාවිතව්‍ය යැ’ යි මහණෙනි, මට ... ‘භාවිත යැ’ යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

‘මේ ඡන්දාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාද යැ’ යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. තවද ඒ මේ ඡන්දාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාදය ‘භාවිතව්‍ය යැ’ යි .... ‘භාවිත යැ’ යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී.

‘චක්ඛුං උදපාදි’ යනු කවර අරුතෙකින ... ‘ආලෝකො උදපාදි’ යනු කවර අරුතෙකින යත්: ‘චක්ඛුං උදපාදි’ යනු දර්ශනාර්ථයෙන ... ‘ආලොකො උදපාදි’ යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යැ, දර්ශනාර්ථය අර්ථ යැ ... ආලෝකය ධර්ම යැ, අවභාසාර්ථය අර්ථ යි. මේ පඤ්ච ධර්මයෝ මේ පඤ්ච අර්ථයෝ ඡන්දවස්තුක වූ ඍද්ධිපාදය වස්තු කොට ඇත්තාහු යැ, ඍද්ධිපාදය ආලම්බන කොට ඇත්තාහු යැ, ඍද්ධිපාදය විෂය කොට ඇත්තාහු යැ, ඍද්ධිපාදයෙන් සංගෘහීතයහ. ඍද්ධිපාදයට අයත් වූවාහු යැ, ඍද්ධිපාදයෙහි උපන්නාහු යැ, ඍද්ධිපාදයෙහි සිටියාහු යැ, ඍද්ධිපාදයෙහි පිහිටියාහු යි.

ධම්මචක්කං යනු කවර අරුතෙකින් ‘ධම්මචක්ක’ නම් වී ද යත්: ප්‍රතිවේධධර්මය ද පවත්වයි චක්‍රය ද පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, චක්‍රය ද පවත්වයි දේශනාධර්මය ද පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙන් පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මචර්‍ය්‍යා පිණිස පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙහි සිටියේ පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙහි පිහිටියේ පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙහි පිහිටුවමින් පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙහි වශීභාවයට පැමිණියේ පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙහි වශීභාවයට පමුණුවමින් පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙහි කෙළවරට පැමිණියේ පවත්වා නු’ යි ධම්මචක්ක’ යැ, ධර්මයෙහි කෙළවරට පමුණුවමින් පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ ... ධර්මය අපචායන කෙරෙමින් පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මය ධ්වජයක් සේ පෙරටු කොට ඇතියේ පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මය කෙහෙළි කොට ඇතියේ පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මය අධිපති කොට ඇතියේ පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යි. තවද ඒ ධර්මචක්‍රය මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොවැ කිසිවක්හු විසින් හෝ නො පැවැත්විය හැකි නු’ යි ‘ධම්මචක්ක’ යි.

සද්ධින්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

'අයං විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- සො ඛො පනායං විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො 'භාවෙතබ්බො'ති -පෙ- 'භාවිතො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන -පෙ- 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන, 'චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන -පෙ- 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, දස්සනට්ඨො අත්ථො -පෙ- ආලොකො ධම්මො, ඔභාසට්ඨො අත්ථො. ඉමෙ පඤ්ච ධම්මා, පඤ්ච අත්ථා විරියවත්ථුකා ඉද්ධිපාදවත්ථුකා -පෙ- චිත්තවත්ථුකා -පෙ- වීමංසාවත්ථුකා ඉද්ධිපාදවත්ථුකා ඉද්ධිපාදාරම්මණා ඉද්ධිපාදගොචරා ඉද්ධිපාදසඞ්ගහිතා ඉද්ධිපාදෙ ඨිතා ඉද්ධිපාදෙ පතිට්ඨිතා.

**ධම්මචක්කන්ති** කෙනට්ඨෙන ධම්මචක්කං: ධම්මඤ්ච පවත්තෙති චක්කඤ්චාති ධම්මචක්කං. චක්කඤ්ච පවත්තෙති ධම්මඤ්චාති ධම්මචක්කං. ධම්මෙන පවත්තෙතීති ධම්මචක්කං; ධම්මචරියාය පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨිතො පවත්තෙතීති ධම්මචක්කං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කන්ති.

**ධම්මචක්කකථා සමත්තා**

## 2. 8

## ලොකුත්තර කථා

කතමෙ ධම්මා ලොකුත්තරා: චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්චබලානි, සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො, චත්තාරො අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. ඉමෙ ධම්මා ලොකුත්තරා.

'ලොකුත්තරා'ති කෙනට්ඨෙන ලොකුත්තරා: ලොකං තරන්තීති ලොකුත්තරා, ලොකා උත්තරන්තීති ලොකුත්තරා, ලොකතො උත්තරන්තීති ලොකුත්තරා, ලොකම්හා උත්තරන්තීති ලොකුත්තරා, ලොකං අතික්කමන්තීති ලොකුත්තරා, ලොකං සමතික්කමන්තීති ලොකුත්තරා, ලොකෙන අතිරෙකාති ලොකුත්තරා, ලොකන්තං තරන්තීති ලොකුත්තරා.

ශ්‍රද්ධෙන්ද්‍රියය ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි ධම්මචක්ක යෑ ... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍යවසානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' යි.

'මේ වීර්‍යාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාද යෑ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලොකය පහළ විය ... තවද ඒ මේ වීර්‍යාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාදය 'භාවිතව්‍ය යෑ' යි ... 'භාවිත යෑ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

'චක්ඛුං උදපාදි' යනු කවර අරුතෙකින ... 'ආලෝකො උදපාදි' යනු කවර අරුතෙකින යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන, ... 'ආලොකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යෑ, දර්ශනාර්ථය අර්ථ යෑ ... ආලෝකය ධර්ම යෑ, අවභාසාර්ථය අර්ථ යි මේ පඤ්චධර්මයෝ පඤ්චඅර්ථයෝ වීර්‍යවස්තුක වූ ඍද්ධිපාදය වස්තු කොට ඇත්තාහු යෑ ... චිත්තවස්තුක වූ ඍද්ධිපාදය වස්තු කොට ඇත්තාහු යෑ ... විමංසාවස්තුක වූ ඍද්ධිපාදය වස්තු කොට ඇත්තාහු යෑ, ඍද්ධිපාදය ආලම්බන කොට ඇත්තාහු යෑ, ඍද්ධිපාදය විෂය කොට ඇත්තාහු යෑ, ඍද්ධිපාදයෙන් සඞ්ගෘහීතයහ. ඍද්ධිපාදයට අයත් වූවාහු යෑ, ඍද්ධිපාදයෙහි උපන්නාහු යෑ, ඍද්ධිපාදයෙහි සිටියාහු යෑ, ඍද්ධිපාදයෙහි පිහිටියාහු යි.

**ධම්මචක්කං** යනු කවර අරුතෙකින් 'ධම්මචක්ක' නම් වි ද යත්: ප්‍රතිවෙධධර්මය ද පවත්වයි චක්‍රය ද පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, චක්‍රය ද පවත්වයි දේශනාධර්මය ද පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙන් පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මචර්‍යා පිණිස පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙහි සිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙහි පිහිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ ... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍යවසානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' යි.

**ධර්මචක්‍ර කථා නිමි.**

## 2. 8

## ලොකොත්තර කථා

ලෝකෝත්තරධර්ම කවරහ යත්: සතර සතිපට්ඨානයෝ යෑ සතර සම්‍යක්ප්‍රධානයෝ යෑ සතර ඍද්ධිපාදයෝ යෑ පඤ්චෙන්ද්‍රියයෝ යෑ පඤ්චබලයෝ යෑ සප්තබොධ්‍යඞ්ගයෝ යෑ අර්‍යාෂ්ටාඞ්ගිකමාර්ගී යෑ සතර ආර්‍යමාර්ගයෝ යෑ සතර ශ්‍රාමණ්‍යඵලයෝ යෑ නිර්වාණ යෑ යන මොහු ලෝකෝත්තරධර්මයෝ යි.

'ලොකුත්තරා' යනු කවර අරුතෙකින් ලොකොත්තර නම් වූහ යත්: ලෝකය තරණය කෙරෙත් නු' යි ලෝකෝත්තරයහ, ලෝකයෙන් උත්තරණය කෙරෙත් නු' යි ලෝකෝත්තරයහ, ලෝකය කෙරෙත් උත්තරණය කෙරෙත් නු' යි ලෝකෝත්තරයහ, ලොවින් උත්තරණය කෙරෙත් නු' යි ලෝකෝත්තරයහ, ලොව ඉක්මයෙත් නු' යි ලෝකෝත්තරයහ, ලොව මොනොවට ඉක්මයෙත් නු' යි ලෝකෝත්තරයහ, ලොව මොනොවට ඉක්ම ගියහ' යි ලෝකෝත්තරයහ, ලෝකය කෙරෙත් අධිකයහ' යි ලෝකෝත්තරයහ, ලෝකාන්තයට තරණය කෙරෙත් නු' යි ලෝකෝත්තරයහ.

ලොකා නිස්සරන්තීති ලොකුත්තරා, ලොකතො නිස්සරන්තීති ලොකුත්තරා, ලොකම්හා නිස්සරන්තීති ලොකුත්තරා, ලොකා නිස්සටාති ලොකුත්තරා, ලොකෙන නිස්සටාති ලොකුත්තරා, ලොකම්හා නිස්සටාති ලොකුත්තරා.

ලොකෙ න තිට්ඨන්තීති ලොකුත්තරා, ලොකස්මිං න තිට්ඨන්තීති ලොකුත්තරා, ලොකෙ න ලිප්පන්තීති[1] ලොකුත්තරා, ලොකෙන න ලිප්පන්තීති ලොකුත්තරා, ලොකෙ අසංලිත්තාති ලොකුත්තරා, ලොකෙන අසංලිත්තාති ලොකුත්තරා, ලොකෙ අනුපලිත්තාති ලොකුත්තරා, ලොකෙන අනුපලිත්තාති ලොකුත්තරා.

ලොකෙ විප්පමුත්තාති ලොකුත්තරා, ලොකෙන විප්පමුත්තාති ලොකුත්තරා, ලොකා විප්පමුත්තාති ලොකුත්තරා, ලොකතො විප්පමුත්තාති ලොකුත්තරා, ලොකම්හා විප්පමුත්තාති ලොකුත්තරා.

ලොකෙ විසඤ්ඤුත්තාති ලොකුත්තරා, ලොකෙන විසඤ්ඤුත්තාති ලොකුත්තරා, ලොකා විසඤ්ඤුත්තාති ලොකුත්තරා, ලොකස්මිං විසඤ්ඤුත්තාති ලොකුත්තරා, ලොකතො විසඤ්ඤුත්තාති ලොකුත්තරා, ලොකම්හා විසඤ්ඤුත්තාති ලොකුත්තරා.

ලොකා සුජ්ඣන්තීති ලොකුත්තරා, ලොකතො සුජ්ඣන්තීති ලොකුත්තරා, ලොකම්හා සුජ්ඣන්තීති ලොකුත්තරා, ලොකා විසුජ්ඣන්තීති ලොකුත්තරා, ලොකතො විසුජ්ඣන්තීති ලොකුත්තරා, ලොකම්හා විසුජ්ඣන්තීති ලොකුත්තරා.

ලොකා වුට්ඨහන්තීති[2] ලොකුත්තරා, ලොකතො වුට්ඨහන්තීති ලොකුත්තරා ලොකම්හා වුට්ඨහන්තීති ලොකුත්තරා.

ලොකා විවට්ටන්තීති ලොකුත්තරා, ලොකතො විවට්ටන්තීති ලොකුත්තරා, ලොකම්හා විවට්ටන්තීති ලොකුත්තරා.

ලොකෙ න සජ්ජන්තීති ලොකුත්තරා, ලොකෙ න ගය්හන්තීති ලොකුත්තරා, ලොකෙ න බජ්ඣන්තීති ලොකුත්තරා.

ලොකං සමුච්ඡින්දන්තීති ලොකුත්තරා, ලොකං සමුච්ඡින්නත්තාති ලොකුත්තරා. ලොකං පටිප්පස්සම්භෙන්තීති ලොකුත්තරා, ලොකං පටිප්පස්සම්භිතත්තාති ලොකුත්තරා.

ලොකස්ස අපථාති ලොකුත්තරා, ලොකස්ස අගතීති ලොකුත්තරා, ලොකස්ස අවිසයාති ලොකුත්තරා, ලොකස්ස අසාධාරණාති ලොකුත්තරා.

---

1 ලිම්පන්තීති - මජසං., ස    2 උට්ඨහන්තීති - ස.

ලොවින් නික්මෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් නික්මෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙන් නික්මෙත් නු' යි ලෝකොත්තරයහ, ලොවින් නික්මුණහ'යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් නික්මුණහ'යි ලෝකොත්තරයහ, ලෝකයෙන් නික්මුණහ'යි ලෝකොත්තරයහ.

(අපර්යාපන්න බැවින්) ලෝකයෙහි නො සිටිත් නු'යි ලෝකොත්තරයහ, ලොවැ නො සිටිත් නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙහි නො තැවැරෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකය හා නො තැවැරෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙහි අසංලිප්ත නු' යි ලෝකොත්තරයහ, ලෝකය හා සමග අසංලිප්ත නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙහි නො තැවැරුණාහු' යි ලෝකොත්තරයහ, ලෝකය හා සමග නො තැවැරුණාහු'යි ලොකොත්තරයහ.

ලෝකයෙහි විප්‍රමුක්ත නු' යි ලෝකොත්තරයහ, ලොකය හා සමග විප්‍රමුක්ත නු' යි ලොකොත්තරයහ, ලෝකයෙන් විප්‍රමුක්ත නු' යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් විප්‍රමුක්ත නු' යි ලෝකොත්තරයහ, ලොවින් විප්‍රමුක්ත නු' යි ලෝකොත්තරයහ.

ලෝකයෙහි විසංයුක්ත නු' යි ලෝකොත්තරයහ, ලෝකය හා සමග විසංයුක්ත නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙන් විසංයුක්ත නු' යි ලෝකොත්තරයහ, ලොවිහි විසංයුක්ත නු' යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් විසංයුක්ත නු' යි ලෝකොත්තරයහ, ලෝවින් විසංයුක්ත නු' යි ලෝකොත්තරයහ.

ලෝකයෙන් (ලෝකමල සෝදා) ශුද්ධ වෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් ශුද්ධ වෙත් නු' යි ලෝකොත්තරයහ, ලොවින් ශුද්ධ වෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙන් විශුද්ධ වෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් විසුද්ධ වෙත් නු' යි ලෝකොත්තරයහ, ලොවින් විශුද්ධ වෙත් නු' යි ලොකොත්තරයහ.

ලෝකයෙන් නැඟීසිටිත් නු' යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් නැඟීසිටිත් නු' යි ලෝකොත්තරයහ, ලොවින් නැඟීසිටිත් නු' යි ලෝකොත්තරයහ.

ලෝකයෙන් නවතිත් නු' යි ලෙකොත්තරයහ, ලෝකය කෙරෙන් නවතිත් නු' යි ලෝකොත්තරයහ, ලොවින් නවතිත් නු' යි ලෝකොත්තරයහ.

ලෝකයෙහි නො ලැගෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙහි (ඝ්‍ය සංසකාර කෙනෙක්) නො ගත්නා ලැබෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙහි නො පෙලෙත් නු' යි ලෝකොත්තරයහ.

ලෝකය මූලුසුන් කෙරෙත් නු' යි ලොකුත්තර නම් වෙති, ලෝකය මූලුසුන් කරනලද බැවිනැ'යි ලොකුත්තර නම් වෙති, ලෝකය සත්හිඳුවත් නු' යි ලොකුත්තර නම් වෙති, ලෝකය සත්හිඳුවන ලද බැවිනැ' යි ලොකුත්තර නම් වෙත්.

ලෝකයට අමාර්ග නු' යි ලෝකුත්තර නම් වෙති, ලෝකයට අප්‍රතිෂ්ඨා නු' යි ලෝකුත්තර නම් වෙති, ලෝකයට අයත් නො වෙත් නු' යි ලෝකුත්තර නම් වෙති, ලෝකයට අසමාන නු' යි ලෝකුත්තර නම් වෙත්.

ලොකං වමතීති ලොකුත්තරං, ලොකං න පච්චාවමතීති[1] ලොකුත්තරං, ලොකං පජහතීති ලොකුත්තරං, ලොකං න උපාදියතීති ලොකුත්තරං, ලොකං විසිනෙතීති ලොකුත්තරං, ලොකං න උස්සිනෙතීති ලොකුත්තරං, ලොකං විධූපෙතීති ලොකුත්තරං, ලොකං න සන්ධූපෙතීති ලොකුත්තරං, ලොකං සමතික්කම්ම අභිභුය්‍ය තිට්ඨතීති ලොකුත්තරං.

ලොකුත්තරකථා සමත්තා.

## 2. 9

## බලකථා

[ සාවත්ථිනිදානං: ]

"පඤ්චිමානි භික්ඛවෙ බලානි: කතමානි පඤ්ච: සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චබලානී"[a]

අපි ච අට්ඨසට්ඨි බලානි: සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං ඔත්තප්පබලං පටිසඞ්ඛානබලං භාවනාබලං අනවජ්ජබලං සඞ්ගහබලං ඛන්තිබලං පඤ්ඤත්තිබලං නිජ්ඣත්තිබලං ඉස්සරියබලං අධිට්ඨානබලං සමථබලං විපස්සනාබලං දස සෙඛබලානි දස අසෙඛබලානි දස ඛීණාසවබලානි දස ඉද්ධිබලානි දස තථාගතබලානි.

කතමං සද්ධාබලං: අස්සද්ධියෙ න කම්පතීති සද්ධාබලං, සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන සද්ධාබලං, කිලෙසානං පරියාදානට්ඨෙන සද්ධාබලං, පටිවෙධාදිවිසොධනට්ඨෙන සද්ධාබලං, චිත්තස්ස අධිට්ඨානට්ඨෙන සද්ධාබලං, චිත්තස්ස වොදානට්ඨෙන සද්ධාබලං, විසෙසාධිගමට්ඨෙන සද්ධාබලං, උත්තරිං පටිවෙධට්ඨෙන සද්ධාබලං, සච්චාභිසමයට්ඨෙන සද්ධාබලං, නිරොධෙ පතිට්ඨාපකට්ඨෙන සද්ධාබලං, ඉදං සද්ධාබලං.

කතමං විරියබලං: කොසජ්ජෙ න කම්පතීති විරියබලං, සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන විරියබලං, කිලෙසානං පරියාදානට්ඨෙන විරියබලං, පටිවෙධාදිවිසොධනට්ඨෙන විරියබලං, චිත්තස්ස අධිට්ඨානට්ඨෙන විරියබලං, චිත්තස්ස වොදානට්ඨෙන විරියබලං, විසෙසාධිගමට්ඨෙන විරියබලං, උත්තරිං පටිවෙධට්ඨෙන විරියබලං, සච්චාභිසමයට්ඨෙන විරියබලං, නිරොධෙ පතිට්ඨාපකට්ඨෙන විරියබලං. ඉදං විරියබලං.

කතමං සතිබලං: පමාදෙ න කම්පතීති සතිබලං, සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන සතිබලං -පෙ- නිරොධෙ පතිට්ඨාපකට්ඨෙන සතිබලං. ඉදං සතිබලං.

1 පච්චාගමතීති - PTS

a පඤ්චකඞ්ගුත්තර - බලවග්ග

ලෝකය නගත් නු' යි ලොකුත්තර නම් වෙති, ලෝකය වටාලා නො නගත් නු' යි ලොකුත්තර නම් වෙති, ලෝකය දුරුකෙරෙත් නු' යි ලෝකුත්තර නම් වෙති, ලෝකය උපාදානය නො කෙරෙත් නු' යි ලෝකුත්තර නම් වෙති, ලෝකය විසුරුවත් නු' යි ලෝකුත්තර නම් වෙති, ලෝකය නො විසුරුවත් නු'යි ලොකුත්තර නම් වෙති, ලෝකය නිවත් නු'යි ලෝකුත්තර නම් වෙති, ලෝකය නො දල්වත් නු' යි ලොකුත්තර නම් වෙති, ලොකය ඉක්ම අභිභවනය කොට සිටිත් නු' යි ලොකුත්තර නම් වෙත්.

**ලොකොත්තර කථා නිමි.**

## 2. 9

## බල කථා

සැවැත්නිදාන යි. "මහණෙනි, මේ බලයෝ පස්දෙනෙක් වෙති. කවර පස් දෙනෙක යත්: ශ්‍රද්ධාබල යැ වීර්‍ය්‍යබල යැ ස්මෘතිබල යැ සමාධිබල යැ ප්‍රඥාබල යි මහණෙනි, මොහු පඤ්චබලයෝ වෙත්."

තවද අටසැට බල කෙනෙක් වෙති: ශ්‍රද්ධාබල යැ වීර්‍ය්‍යබල යැ ස්මෘති-බල යැ සමාධිබල යැ ප්‍රඥාබල යැ හිරිබල යැ ඔත්තප්පබල යැ පටිසඞ්ඛාන-බල යැ භාවනා බල යැ අනවද්‍යබල යැ සඞ්ග්‍රහබල යැ ක්‍ෂාන්තිබල යැ ප්‍රඥප්තිබල යැ නිද්ධ්‍යාසන (අධිතාර්ථාගමන) බල යැ ඓශ්වර්‍ය්‍යබල යැ අධිෂ්ඨානබල යැ ශමථබල යැ විදර්ශනාබල යැ දශ ශෛක්‍ෂබලයෝ යැ දශ අශෛක්‍ෂ බලයෝ යැ දශක්ෂීණාශ්‍රවබලයෝ යැ දශ ඍද්ධිබලයෝ යැ දශ තථාගතබලයෝ යි.

ශ්‍රද්ධාබල කවරෙ යත්: අශ්‍රද්ධායෙහි නො සැලේ නු'යි ශ්‍රද්ධාබල යැ, සහජාත (අරූප) ධර්මයනට උපස්ථම්භනාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ' කෙලෙසුන් ක්‍ෂය කිරීම් අර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, ප්‍රතිවේධාදිවිශොධනාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, චිත්තයාගේ අධිෂ්ඨානාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, චිත්තයාගේ පරිශුද්ධාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, විශෙෂාධිගමාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, මත්තෙහි (මාර්ග) ප්‍රතිවේධාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, සත්‍යාභිසමයාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ නිරොධයෙහි පිහිටුවන අර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, මේ ශ්‍රද්ධාබල යි.

වීර්‍ය්‍යබල කවරෙ යත්: කුසීදභාවයෙහි නො සැලේ නු'යි වීර්‍ය්‍යබල යැ, සහජාතධර්මයනට උපස්ථම්භනාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, කෙලෙසුන් ක්‍ෂය කිරීම් අර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, ප්‍රතිවේධාදිවිශොධනාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, චිත්තයාගේ අධිෂ්ඨානාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, චිත්තයාගේ පරිශුද්ධාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, විශෙෂාධිගමාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, මත්තෙහි (මාර්ග) ප්‍රති-වේධාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, සත්‍යාභිසමයාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, නිරොධයෙහි පිහිටුවන අර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, මේ වීර්‍ය්‍යබල යි.

ස්මෘතිබල කවරෙ යත්: ප්‍රමාදයෙහි නො සැලේ නු'යි ස්මෘතිබල යැ, සහජාත (අරූප) ධර්මයනට උපස්ථම්භනාර්ථයෙන් ස්මෘතිබල යැ... නිරොධ-යෙහි පිහිටුවන අර්ථයෙන් ස්මෘතිබල යැ, මේ ස්මෘතිබල යි.

කතමං සමාධිබලං: උද්ධච්චෙ න කම්පතීති සමාධිබලං, සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන සමාධිබලං -පෙ- නිරොධෙ පතිට්ඨාපකට්ඨෙන සමාධිබලං. ඉදං සමාධිබලං.

කතමං පඤ්ඤාබලං: අවිජ්ජාය න කම්පතීති පඤ්ඤාබලං, සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන පඤ්ඤාබලං -පෙ- නිරොධෙ පතිට්ඨාපකට්ඨෙන පඤ්ඤාබලං. ඉදං පඤ්ඤාබලං.

කතමං හිරිබලං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දං හිරීයතීති[1] හිරිබලං, අබ්‍යාපාදෙන බ්‍යාපාදං හිරීයතීති හිරිබලං, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං[2] හිරීයතීති හිරිබලං, අවික්ඛෙපෙන උද්ධච්චං හිරීයතීති හිරිබලං, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං හිරීයතීති හිරිබලං, ඤාණෙන අවිජ්ජං හිරීයතීති හිරිබලං, පාමොජ්ජෙන අරතිං හිරීයතීති හිරිබලං, පඨමෙන ඣානෙන නීවරණෙ හිරීයතීති හිරිබලං -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ හිරීයතීති හිරිබලං ඉදං හිරිබලං.

කතමං ඔත්තප්පබලං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දං ඔත්තප්පතීති ඔත්තප්පබලං, අබ්‍යාපාදෙන බ්‍යාපාදං ඔත්තප්පතීති ඔත්තප්පබලං, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං ඔත්තප්පතීති ඔත්තප්පබලං, අවික්ඛෙපෙන උද්ධච්චං ඔත්තප්පතීති ඔත්තප්පබලං, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං ඔත්තප්පතීති ඔත්තප්පබලං, ඤාණෙන අවිජ්ජං ඔත්තප්පතීති ඔත්තප්පබලං, පාමොජ්ජෙන අරතිං ඔත්තප්පතීති ඔත්තප්පබලං, පඨමෙන ඣානෙන නීවරණෙ ඔත්තප්පතීති ඔත්තප්පබලං -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ ඔත්තප්පතීති ඔත්තප්පබලං. ඉදං ඔත්තප්පබලං.

කතමං පටිසඞ්ඛානබලං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, අබ්‍යාපාදෙන බ්‍යාපාදං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, අවික්ඛෙපෙන උද්ධච්චං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, ඤාණෙන අවිජ්ජං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, පාමොජ්ජෙන අරතිං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, පඨමෙන ඣානෙන නීවරණෙ පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං. ඉදං පටිසඞ්ඛානබලං.

කතමං භාවනාබලං: කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මං භාවෙතීති භාවනාබලං, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදං භාවෙතීති භාවනාබලං, ථිනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤං භාවෙතීති භාවනාබලං, උද්ධච්චං පජහන්තො අවික්ඛෙපං භාවෙතීති භාවනාබලං, විචිකිච්ඡං පජහන්තො ධම්මවවත්ථානං භාවෙතීති භාවනාබලං, අවිජ්ජං පජහන්තො ඤාණං භාවෙතීති භාවනාබලං, අරතිං පජහන්තො පාමොජ්ජං භාවෙතීති භාවනාබලං, නීවරණෙ පජහන්තො පඨමං ඣානං භාවෙතීති භාවනාබලං, -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගං භාවෙතීති භාවනාබලං. ඉදං භාවනාබලං.

---

1 හිරියතීති - සයා, PTS 2 ථියමිද්ධං - මජසං

සමාධිබල කවරේ යත්: උද්ධතභාවයෙහි නො සැලේ නු'යි සමාධිබල යැ, සහජාතධර්මයනට උපස්ථම්භනාර්ථයෙන් සමාධිබල යැ ... නිරෝධයෙහි පිහිටුවන අර්ථයෙන් සමාධිබල යැ, මේ සමාධිබල යි.

ප්‍රඥාබල කවරේ යත්: අවිද්‍යායෙහි නො සැලේනු'යි ප්‍රඥාබල යැ, සහජාත ධර්මයනට උපස්ථම්භනාර්ථයෙන් ප්‍රඥාබල යැ, ... නිරෝධයෙහි පිහිටුවන අර්ථයෙන් ප්‍රඥාබල යැ, මේ ප්‍රඥාබල යි.

හිරිබල කවරේ යත්: නෛෂ්ක්‍රම්‍ය හෙයින් කාමච්ඡන්දය කෙරෙන් ලජ්ජිත වේ නු'යි හිරිබල යැ, අව්‍යාපාද හෙයින් ව්‍යාපාදය කෙරෙන් ලජ්ජිත වේනු'යි හිරිබල යැ, ආලෝකසංඥා හෙයින් ථිනමිද්ධය කෙරෙන් ලජ්ජිත වේනු'යි හිරිබල යැ, අවික්ෂෙප හෙයින් ඖද්ධත්‍යය කෙරෙන් ලජ්ජිත වේ නු'යි හිරිබල යැ ධර්මනිශ්චය හෙයින් විචිකිත්සාව කෙරෙන් ලජ්ජිත වේ නු'යි හිරිබල යැ, ඥාන හෙයින් අවිද්‍යාව කෙරෙන් ලජ්ජිත වේ නු'යි හිරිබල යැ, ප්‍රාමොද්‍ය හෙයින් අරතිය කෙරෙන් ලජ්ජිත වේ නු'යි හිරිබල යැ, ප්‍රථමධ්‍යාන හෙයින් නීවරණයන් කෙරෙන් ලජ්ජිත වේ නු'යි හිරිබල යැ, ... අර්හත්මාර්ගී හෙයින් හැම කෙලෙසුන් කෙරෙන් ලජ්ජිත වේ නු'යි හිරිබල යැ. මේ හිරිබල යි.

ඔත්තප්පබල කවරේ යත්: නෛෂ්ක්‍රම්‍ය හෙයින් කාමච්ඡන්දය කෙරෙන් තැවේ නු'යි ඔත්තප්පබල යැ, අව්‍යාපාද හෙයින් ව්‍යාපාදය කෙරෙන් තැවේ නු'යි ඔත්තප්පබල යැ, ආලෝකසංඥා හෙයින් ථිනමිද්ධය කෙරෙන් තැවේ නු'යි ඔත්තප්පබල යැ, අවික්ෂෙප හෙයින් ඖද්ධත්‍යය කෙරෙන් තැවේ නු'යි ඔත්තප්පබල යැ, ධර්මනිශ්චය හෙයින් විචිකිත්සාව කෙරෙන් තැවේ නු'යි ඔත්තප්පබල යැ, ඥාන හෙයින් අවිද්‍යාව කෙරෙන් තැවේ නු'යි ඔත්තප්ප-බල යැ, ප්‍රාමොද්‍ය හෙයින් අරතිය කෙරෙන් තැවේ නු'යි ඔත්තප්පබල යැ: ප්‍රථමධ්‍යාන හෙයින් නීවරණයන් කෙරෙන් තැවේ නු'යි ඔත්තප්පබල යැ ... අර්හත්මාර්ගී හෙයින් හැම කෙලෙසුන් කෙරෙන් තැවේ නු'යි ඔත්තප්පබල යැ. මේ ඔත්තප්පබල යි.

පටිසංඛ්‍යානබල කවරේ යත්: නෛෂ්ක්‍රම්‍ය හෙයින් කාමච්ඡන්දය විමසා නු'යි පටිසංඛ්‍යානබල යැ, අව්‍යාපාද හෙයින් ව්‍යාපාදය විමසා නු'යි පටි-සංඛ්‍යානබල යැ, ආලෝකසංඥා හෙයින් ථිනමිද්ධය විමසා නු'යි පටිසංඛ්‍යාන-බල යැ, අවික්ෂෙප හෙයින් ඖද්ධත්‍යය විමසා නු'යි පටිසංඛ්‍යානබල යැ, ධර්මනිශ්චය හෙයින් විචිකිත්සාව විමසා නු'යි පටිසංඛ්‍යානබල යැ, ඥාන හෙයින් අවිද්‍යාව විමසා නු'යි පටිසංඛ්‍යානබල යැ, ප්‍රාමොද්‍ය හෙයින් අරතිය විමසා නු'යි පටිසංඛ්‍යානබල යැ, ප්‍රථමධ්‍යාන හෙයින් නීවරණයන් විමසා නු'යි පටිසංඛ්‍යානබල යැ ... අර්හත්මාර්ගී හෙයින් හැම කෙලෙසුන් විමසා නු'යි පටිසංඛ්‍යානබල යැ, මේ පටිසංඛ්‍යාන බල යි.

භාවනාබල කවරේ යත්: කාමච්ඡන්දය දුරු කෙරෙමින් නෛෂ්ක්‍රම්‍යය වඩා නුයි භාවනාබල යැ, ව්‍යාපාදය දුරු කෙරෙමින් අව්‍යාපාදය වඩා නු'යි භාවනාබල යැ, ථිනමිද්ධය දුරු කෙරෙමින් ආලෝකසංඥාව වඩා නු'යි භාවනාබල යැ, උද්ධතභාවය දුරු කෙරෙමින් අවික්ෂෙපය වඩානුයි භාවනා-බල යැ, විචිකිත්සාව දුරු කෙරෙමින් ධර්මනිශ්චය වඩා නු'යි භාවනාබල යැ, අවිද්‍යාව දුරු කෙරෙමින් ඥානය වඩා නු'යි භාවනාබල යැ, අරතිය දුරු කෙරෙමින් ප්‍රාමොද්‍යය වඩා නු'යි භාවනාබල යැ, නීවරණයන් දුරු කෙරෙමින් ප්‍රථමධ්‍යානය වඩා නු'යි භාවනාබල යැ ... හැම කෙලෙසුන් දුරු කෙරෙමින් අර්හත්මාර්ගය වඩා නු'යි භාවනා බල යැ. මේ භාවනා බල යි.

කතමං අනවජ්ජබලං: කාමච්ඡන්දස්ස පහීනත්තා නෙක්ඛම්මෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, බ්‍යාපාදස්ස පහීනත්තා අබ්‍යාපාදෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, ථිනමිද්ධස්ස පහීනත්තා ආලොකසඤ්ඤාය නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, උද්ධච්චස්ස පහීනත්තා අවික්ඛෙපෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, විචිකිච්ඡාය පහීනත්තා ධම්මවවත්ථානෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, අවිජ්ජාය පහීනත්තා ඤාණෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, අරතියා පහීනත්තා පාමොජ්ජෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, නීවරණානං පහීනත්තා පඨමජ්ඣානෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං -පෙ- සබ්බකිලෙසානං පහීනත්තා අරහත්තමග්ගෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, ඉදං අනවජ්ජබලං.

කතමං සඞ්ගහබලං: කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මවසෙන චිත්තං සඞ්ගණ්හාතීති සඞ්ගහබලං, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදවසෙන චිත්තං සඞ්ගණ්හාතීති සඞ්ගහබලං, ථිනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤාවසෙන චිත්තං සඞ්ගණ්හාතීති සඞ්ගහබලං, -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන චිත්තං සඞ්ගණ්හාතීති සඞ්ගහබලං, ඉදං සඞ්ගහබලං.

කතමං ඛන්තිබලං: කාමච්ඡන්දස්ස පහීනත්තා නෙක්ඛම්මං ඛමතීති ඛන්තිබලං, බ්‍යාපාදස්ස පහීනත්තා අබ්‍යාපාදො ඛමතීති ඛන්තිබලං, ථිනමිද්ධස්ස පහීනත්තා ආලොකසඤ්ඤා ඛමතීති ඛන්තිබලං, උද්ධච්චස්ස පහීනත්තා අවික්ඛෙපො ඛමතීති ඛන්තිබලං, විචිකිච්ඡාය පහීනත්තා ධම්මවවත්ථානං ඛමතීති ඛන්තිබලං, අවිජ්ජාය පහීනත්තා ඤාණං ඛමතීති ඛන්තිබලං, අරතියා පහීනත්තා පාමොජ්ජං ඛමතීති ඛන්තිබලං, නීවරණානං පහීනත්තා පඨමං ඣානං ඛමතීති ඛන්තිබලං, -පෙ- සබ්බකිලෙසානං පහීනත්තා අරහත්තමග්ගො ඛමතීති ඛන්තිබලං, ඉදං ඛන්තිබලං.

කතමං පඤ්ඤත්තිබලං: කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මවසෙන චිත්තං පඤ්ඤපෙතීති පඤ්ඤත්තිබලං, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදවසෙන චිත්තං පඤ්ඤපෙතීති පඤ්ඤත්තිබලං, ථිනමිද්ධං පජහන්තො අලොකසඤ්ඤාවසෙන චිත්තං පඤ්ඤපෙතීති පඤ්ඤත්තිබලං -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන චිත්තං පඤ්ඤපෙතීති පඤ්ඤත්තිබලං, ඉදං පඤ්ඤත්තිබලං.

කතමං නිජ්ඣත්තිබලං: කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මවසෙන චිත්තං නිජ්ඣාපෙතීති නිජ්ඣත්තිබලං, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදවසෙන චිත්තං නිජ්ඣාපෙතීති නිජ්ඣත්තිබලං, ථිනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤාවසෙන චිත්තං නිජ්ඣාපෙතීති නිජ්ඣත්තිබලං -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන චිත්තං නිජ්ඣාපෙතීති නිජ්ඣත්තිබලං, ඉදං නිජ්ඣත්තිබලං.

අනවද්‍යබල කවරේ යත්: කාමච්ඡන්දය ප්‍රහීණ බැවින් නෛෂ්ක්‍රම්‍යයෙහි කිසි (රාගාදි) වද්‍යයෙක් (වරදෙක්) නැත් නු'යි අනවද්‍යබල යැ, ව්‍යාපාදය ප්‍රහීණ බැවින් අව්‍යාපාදයෙහි කිසි වද්‍යයෙක් නැත් නු'යි අනවද්‍යබල යැ, ථීනමිද්ධය ප්‍රහීණ බැවින් ආලෝකසංඥයෙහි කිසි වද්‍යයෙක් නැත්නු'යි අනවද්‍යබල යැ, ඖද්ධත්‍යය ප්‍රහීණ බැවින් අවික්ෂෙපයෙහි කිසි වද්‍යයෙක් නැත් නු'යි අනවද්‍යබල යැ, විචිකිත්සාව ප්‍රහීණ බැවින් ධර්මනිශ්චයෙහි කිසි වද්‍යයෙක් නැත් නු'යි අනවද්‍යබල යැ, අවිද්‍යාව ප්‍රහීණ බැවින් ඥානයෙහි කිසි වද්‍යයෙක් නැත් නු'යි අනවද්‍යබල යැ, අරතිය ප්‍රහීණ බැවින් ප්‍රාමොද්‍යයෙහි කිසි වද්‍යයෙක් නැත්නු'යි අනවද්‍යබල යැ, නීවරණයන් ප්‍රහීණ බැවින් ප්‍රථමධ්‍යානයෙහි කිසි වද්‍යයෙක් නැත් නු' යි අනවද්‍යබල යැ ... හැම කෙලෙසුන් ප්‍රහීණ බැවින් අර්හත්මාර්ගයෙහි කිසි වද්‍යයෙක් නැත්නු'යි අනවද්‍යබල යැ, මේ අනවද්‍යබල යි.

සඞ්ග්‍රහබල කවරේ යත් කාමච්ඡන්දය දුරු කරනුයේ නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත සඞ්ග්‍රහ කෙරේ (බඳී) නු'යි සඞ්ග්‍රහබල යැ, ව්‍යාපාදය දුරු කරනුයේ අව්‍යාපාද වශයෙන් සිත සඞ්ග්‍රහ කෙරේ නු' යි සඞ්ග්‍රහබල යැ, ථීනමිද්ධය දුරු කරනුයේ ආලොකසංඥාවශයෙන් සිත සඞ්ග්‍රහ කෙරේ නු'යි සඞ්ග්‍රහබල යැ. .. හැම කෙලෙසුන් දුරු කරනුයේ අර්හත්මාර්ගවශයෙන් සිත සඞ්ග්‍රහ කෙරේ නු'යි සඞ්ග්‍රහ බල යැ, මේ සඞ්ග්‍රහබල යි.

ක්ෂාන්තිබල කවරේ යත්: කාමච්ඡන්දය ප්‍රහීණ බැවින් (යොගීහට) නෛෂ්ක්‍රම්‍යය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, ව්‍යාපාදය ප්‍රහීණ බැවින් අව්‍යා- පාදය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, ථීනමිද්ධය ප්‍රහීණ බැවින් ආලෝක- සංඥාව රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, ඖද්ධත්‍යය ප්‍රහීණ බැවින් අවික්ෂෙපය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, විචිකිත්සාව ප්‍රහීණ බැවින් ධර්මනිශ්චය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, අවිද්‍යාව ප්‍රහීණ බැවින් ඥානය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, අරතිය ප්‍රහීණ බැවින් ප්‍රාමොද්‍යය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, නීවරණයන් ප්‍රහීණ බැවින් ප්‍රථමධ්‍යානය රිසි වේ නු' යි ක්ෂාන්තිබල යැ ... හැම කෙලෙසුන් ප්‍රහීණ බැවින් අර්හත්මාර්ගය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, මේ ක්ෂාන්තිබල යි.

ප්‍රඥප්තිබල කවරේ යත්: කාමච්ඡන්දය දුරු කරනුයේ නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත පනවා නු'යි ප්‍රඥප්තිබල යැ, ව්‍යාපාදය දුර කරනුයේ අව්‍යාපාද වශයෙන් සිත පනවා නු'යි ප්‍රඥප්තිබල යැ, ථීනමිද්ධය දුරු කරනුයේ ආලොකසංඥාවශයෙන් සිත පනවා නු'යි ප්‍රඥප්තිබල යැ ... හැම කෙලෙසුන් දුරු කරනුයේ අර්හත්මාර්ගවශයෙන් සිත පනවා නු' යි ප්‍රඥප්තිබල යැ, මේ ප්‍රඥප්තිබල යි.

නිදිධ්‍යාසනබල කවරේ යත්: කාමච්ඡන්දය දුරු කරනුයේ නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත නිදිධ්‍යාසන (ශ්‍රුතාර්ථවිමර්ශනය) කරවා නු'යි නිදිධ්‍යාසනබල යැ, ව්‍යාපාදය දුරු කරනුයේ අව්‍යාපාද වශයෙන් සිත නිදිධ්‍යාසන කරවා නු'යි නිදිධ්‍යාසනබල යැ, ථීනමිද්ධය දුරු කරනුයේ ආලෝකසංඥාවශයෙන් සිත නිදිධ්‍යාසන කරවා නු'යි නිදිධ්‍යාසනබල යැ ... හැම කෙලෙසුන් දුරු කරනුයේ අර්හත්මාර්ගවශයෙන් සිත නිදිධ්‍යාසන කරවා නු' යි නිදිධ්‍යාසනබල යැ. මේ නිදිධ්‍යාසනබල යි.

කතමං ඉස්සරියබලං: කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මවසෙන චිත්තං වසං වත්තෙතීති ඉස්සරියබලං, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදවසෙන චිත්තං වසං වත්තෙතීති ඉස්සරියබලං, ථීනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤාවසෙන චිත්තං වසං වත්තෙතීති ඉස්සරියබලං, -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන චිත්තං වසං වත්තෙතීති ඉස්සරියබලං, ඉදං ඉස්සරියබලං.

කතමං අධිට්ඨානබලං, කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානබලං, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානබලං, ථීනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤාවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානබලං -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානබලං, ඉදං අධිට්ඨානබලං.

කතමං සමථබලං නෙක්ඛම්මවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමථබලං, අබ්‍යාපාදවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමථබලං, ආලොකසඤ්ඤාවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමථබලං -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමථබලං, පටිනිස්සග්ගානුපස්සී පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමථබලං.

සමථබලන්ති කෙනට්ඨෙන සමථබලං: පඨමෙන ඣානෙන නීවරණෙ න කම්පතීති සමථබලං, දුතියෙන ඣානෙන විතක්කවිචාරෙ න කම්පතීති සමථබලං, තතියෙන ඣානෙන පීතියා න කම්පතීති සමථබලං, චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛෙ න කම්පතීති සමථබලං, ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය න කම්පතීති සමථබලං, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤාය න කම්පතීති සමථබලං ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය න කම්පතීති සමථබලං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය න කම්පතීති සමථබලං, උද්ධච්චෙ ච උද්ධච්චසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච න කම්පති න චලති න වෙධතීති සමථබලං, ඉදං සමථබලං.

කතමං විපස්සනාබලං: අනිච්චානුපස්සනා විපස්සනාබලං -පෙ- පටිනිස්සග්ගානුපස්සනා විපස්සනාබලං, රූපෙ අනිච්චානුපස්සනා විපස්සනාබලං, රූපෙ දුක්ඛානුපස්සනා විපස්සනාබලං -පෙ- රූපෙ පටිනිස්සග්ගානුපස්සනා විපස්සනාබලං, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා විපස්සනාබලං, ජරාමරණෙ දුක්ඛානුපස්සනා විපස්සනාබලං -පෙ- ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා විපස්සනාබලං.

ඓශ්වර්‍යබල කවරේ යත්: කාමච්ඡන්දය දුරු කරනුයේ නෛෂ්ක්‍රම්‍යවශයෙන් සිත වශයෙහි පවත්වා නු'යි ඓශ්වර්‍යබල යැ, ව්‍යාපාදය දුරු කරනුයේ අව්‍යාපාදවශයෙන් සිත වශයෙහි පවත්වා නු'යි ඓශ්වර්‍යබල යැ, ථීනමිද්ධය දුරු කරනුයේ ආලෝකසංඥාවශයෙන් සිත වශයෙහි පවත්වා නු'යි ඓශ්වර්‍යබල යැ ... හැම කෙලෙසුන් දුරු කරනුයේ අර්හත්මාර්ගයාගේ වශයෙන් සිත වශයෙහි පවත්වා නු'යි ඓශ්වර්‍යබල යැ, මේ ඓශ්වර්‍යබල යි.

අධිෂ්ඨානබල කවරේ යත්: කාමච්ඡන්දය දුරු කරනුයේ නෛෂ්ක්‍රම්‍යවශයෙන් සිත අධිෂ්ඨාන කෙරේ නු'යි අධිෂ්ඨානබල යැ, ව්‍යාපාදය දුරු කරනුයේ අව්‍යාපාදවශයෙන් සිත අධිෂ්ඨාන කෙරේ නු'යි අධිෂ්ඨානබල යැ, ථීනමිද්ධය දුරු කරනුයේ ආලෝකසංඥාවශයෙන් සිත අධිෂ්ඨාන කෙරේ නු'යි අධිෂ්ඨානබල යැ ... හැම කෙලෙසුන් දුරු කරනුයේ අර්හත්මාර්ගවශයෙන් සිත අධිෂ්ඨාන කෙරේ නු'යි අධිෂ්ඨාන බල යැ. මේ අධිෂ්ඨානබල යි

ශමථබල කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යයාගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂේපය ශමථබල යැ, අව්‍යාපාදයාගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂේපය ශමථබල යැ, ආලෝකසංඥාවගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂේපය ශමථබල යැ ... 'පටිනිස්සග්ගානුපස්සී' යැයි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂේපය ශමථබල යැ, පටිනිස්සග්ගානුපස්සී යැයි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂේපය ශමථබල යි.

**ශමථබලං** යනු: කවර අරුතෙකින් ශමථබල නම් වී ද යත්: ප්‍රථමධ්‍යාන හෙයින් නීවරණයෙහි නො සැලේ නු'යි ශමථබල යැ, ද්විතීයධ්‍යාන හෙයින් විතර්කවිචාරයෙහි නො සැලේ නු'යි ශමථබල යැ, තෘතීයධ්‍යාන හෙයින් ප්‍රීතියෙහි නො සැලේ නු'යි ශමථබල යැ, චතුර්ථධ්‍යාන හෙයින් සුඛදුඃඛයෙහි නො සැලේ නු'යි ශමථබල යැ, ආකාසානඤ්චායතනසමාපත්ති හෙයින් රූපසංඥායෙහි ප්‍රතිඝසංඥායෙහි නානාත්වසංඥායෙහි නො සැලේ නු'යි ශමථබල යැ, විඤ්ඤාණඤ්චායතනසමාපත්ති හෙයින් ආකාසානඤ්චායතනසංඥායෙහි නො සැලේ නු'යි ශමථබල යැ, ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති හෙයින් විඤ්ඤාණඤ්චායතනසංඥායෙහි නො සැලේ නු'යි ශමථබල යැ, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති හෙයින් ආකිඤ්චඤ්ඤායතනසංඥායෙහි නො සැලේ නු'යි ශමථබල යැ, ඖද්ධත්‍යයෙහි ද ඖද්ධත්‍යසහගතක්ලේශයෙහි ද ස්කන්ධයෙහි ද කම්පා නො වෙයි නො සැලෙයි වේධනය නො වේ නු'යි ශමථබල යැ, මේ ශමථබල යි.

විදර්ශනාබල කවරේ යත්: අනිච්චානුපස්සනාව විදර්ශනාබල යැ ... පටිනිස්සග්ගානුපස්සනාව විදර්ශනාබල යැ ... රූපයෙහි අනිච්චානුපස්සනාව විදර්ශනාබල යැ ... රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව විදර්ශනාබල යැ; වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව විදර්ශනාබල යැ, ජරාමරණයෙහි දුක්ඛානුපස්සනාව විදර්ශනාබල යැ ... ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව විදර්ශනාබල යි.

**විපස්සනාබලන්ති** කෙනට්ඨෙන විපස්සනාබලං: අනිච්චානුපස්සනාය නිච්චසඤ්ඤාය න කම්පතීති විපස්සනාබලං, දුක්ඛානුපස්සනාය සුඛසඤ්ඤාය න කම්පතීති විපස්සනාබලං, අනත්තානුපස්සනාය අත්තසඤ්ඤාය න කම්පතීති විපස්සනාබලං, නිබ්බිදානුපස්සනාය නන්දියා න කම්පතීති විපස්සනාබලං, විරාගානුපස්සනාය රාගෙ න කම්පතීති විපස්සනාබලං, නිරොධානුපස්සනාය සමුදයෙ න කම්පතීති විපස්සනාබලං, පටිනිස්සග්ගානුපස්සනාය ආදානෙ න කම්පතීති විපස්සනාබලං, අවිජ්ජාය ච අවිජ්ජාසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච න කම්පති න චලති න වෙධතීති විපස්සනාබලං, ඉදං විපස්සනාබලං.

කතමානි දස සෙඛබලානි: දස අසෙඛබලානි: සම්මාදිට්ඨිං, සික්ඛතීති සෙඛබලං, තත්ථ සික්ඛිතත්තා අසෙඛබලං, සම්මාසඞ්කප්පං සික්ඛතීති සෙඛබලං තත්ථ සික්ඛිතත්තා අසෙඛබලං, සම්මාවාචං -පෙ- සම්මාකම්මන්තං සම්මාආජීවං -පෙ- සම්මාවායාමං -පෙ- සම්මාසතිං -පෙ- සම්මාසමාධිං -පෙ- සම්මාඤාණං -පෙ- සම්මාවිමුත්තිං සික්ඛතීති සෙඛබලං, තත්ථ සික්ඛිතත්තා අසෙඛබලං, ඉමානි දස සෙඛබලානි, දස අසෙඛබලානි.

කතමානි දස ඛීණාසවබලානි: ඉධ ඛීණාසවස්ස භික්ඛුනො අනිච්චතො සබ්බෙ සඞ්ඛාරා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, යම්පි ඛීණාසවස්ස භික්ඛුනො අනිච්චතො සබ්බෙ සඞ්ඛාරා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, ඉදම්පි ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවා'ති.

පුන ච පරං ඛීණාසවස්ස භික්ඛුනො 'අඞ්ගාරකාසූපමා කාමා' යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති. යම්පි ඛීණාසවස්ස භික්ඛුනො අඞ්ගාරකාසූපමා කාමා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, ඉදම්පි ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති 'ඛීණා මෙ ආසවා'ති.

පුන ච පරං ඛීණාසවස්ස භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරං විවෙකට්ඨං නෙක්ඛම්මාභිරතං බ්‍යන්තීභූතං සබ්බසො ආසවට්ඨානියෙහි ධම්මෙහි, යම්පි ඛීණාසවස්ස භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරං විවෙකට්ඨං නෙක්ඛම්මාභිරතං බ්‍යන්තීභූතං සබ්බසො ආසවට්ඨානියෙහි ධම්මෙහි, ඉදම්පි ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවා'ති.

පුන ච පරං ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා භාවිතා හොන්ති සුභාවිතා. යම්පි ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා භාවිතා හොන්ති සුභාවිතා, ඉදම්පි ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවා'ති.

**විපස්සනාබලං** යනු: කවර අර්ථයකින් විදර්ශනාබල නම් වී ද යත්: අනිච්චානුපස්සනා හෙයින් නිත්‍යසංඥායෙහි නො සැලේ නු'යි විදර්ශනාබල යැ, දුක්ඛානුපස්සනා හෙයින් සුඛසංඥායෙහි නො සැලේ නු'යි විදර්ශනාබල යැ, අනත්තානුපස්සනා හෙයින් ආත්මසංඥායෙහි නො සැලේ නු'යි විදර්ශනාබල යැ, නිබ්බිදානුපස්සනා හෙයින් නන්දියෙහි නො සැලේ නු'යි විදර්ශනාබල යැ, විරාගානුපස්සනා හෙයින් රූපයෙහි නො සැලේ නු'යි විදර්ශනාබල යැ නිරෝධානුපස්සනා හෙයින් සමුදයෙහි නො සැලේ නු'යි විදර්ශනාබල යැ, පටිනිස්සග්ගානුපස්සනා හෙයින් ග්‍රහණයෙහි නො සැලේ නු'යි විදර්ශනාබල යැ, අවිද්‍යායෙහි ද අවිද්‍යාසහගතක්ලේශයෙහි ද ස්කන්ධයෙහි ද කම්පා නො වෙයි නො සැලෙයි වෙධනය නොවේ නු'යි විදර්ශනාබල යැ, මේ විදර්ශනාබල යි.

දශශෛක්ෂබල දශඅශෛක්ෂබල කවරහ යත්: සම්‍යග්දෘෂ්ටියෙහි හික්මේ නු'යි ශෛක්ෂබල යැ, එහි ශික්ෂිත බැවින් අශෛක්ෂබල යැ. සම්‍යක්සංකල්පයෙහි හික්මේ නු'යි ශෛක්ෂබල යැ, එහි ශික්ෂිත බැවින් අශෛක්ෂබල යැ. සම්‍යග්වචනයෙහි ... සම්‍යක්කර්මාන්තයෙහි .. සම්‍යගාජීවයෙහි ... සම්‍යග්ව්‍යායාමයෙහි ... සම්‍යක්ස්මෘතියෙහි . සම්‍යක්සමාධියෙහි ... සම්‍යග්ඥානයෙහි ... සම්‍යග්විමුක්තියෙහි හික්මේ නු'යි ශෛක්ෂබල යැ, එහි ශික්ෂිත බැවින් අශෛක්ෂබල යැ මොහු දශශෛක්ෂබලයෝ යැ, දශඅශෛක්ෂබලයෝ යි.

දශක්ෂීණාස්‍රවබල කවරහ යත්: මෙ සස්නෙහි ක්ෂීණාස්‍රව මහණුනු විසින් අනිත්‍ය හෙයින් හැම සංස්කාරයෝ යථාභූතයෙන් සම්‍යක්ප්‍රඥායෙන් මොනොවට දක්නා ලද වෙති, යම්සෙයෙකින් ක්ෂීණාස්‍රව මහණුහු විසින් අනිත්‍ය හෙයින් හැම සංස්කාරයෝ යථාභූතයෙන් සම්‍යක්ප්‍රඥායෙන් මොනොවට දක්නා ලද වෙත් ද, යම් බලයක් පිණිස ක්ෂීණාස්‍රව මහණ මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ'යි ආස්‍රවක්ෂය පිළින කෙරේ ද, මෙ ද ක්ෂීණාස්‍රව මහණහට බල වෙයි.

තවද අනෙකෙකි. ක්ෂීණාස්‍රව මහණුහු විසින් අඞ්ගාරකර්ෂූවට (අඟුරු වළට) උපමා කරනලද කාමයෝ යථාස්වභාවයෙන් සම්‍යක්ප්‍රඥායෙන් මොනොවට දක්නාලද වෙති. යම්සෙයෙකින් ක්ෂීණාස්‍රව මහණුහු විසින් අඞ්ගාරකර්ෂූපමකාමයෝ යථාස්වභාවයෙන් සම්‍යක්ප්‍රඥායෙන් මොනොවට දක්නාලද වෙත් ද, යම් බලයක් පිණිස ක්ෂීණාස්‍රව මහණ 'මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ'යි ආස්‍රවක්ෂය පිළින කෙරේ ද, මෙ ද ක්ෂීණාස්‍රව මහණහට බල වෙයි.

තවද ක්ෂීණාස්‍රව මහණහට (උපධි) විවෙකයට නැඹුරු වූ විවෙකප්‍රවණ වූ විවෙකයට බැහැවුම් ඇති විවෙකයෙහි සිටි නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණු සර්වප්‍රකාරයෙන් (සම්ප්‍රයොග වශයෙන්) ආස්‍රවයනට කරුණු වූ ක්ලේශධර්මයන් කෙරෙන් විගතාන්ත වූ සිත වෙයි. යම් සෙයෙකින් ක්ෂීණාස්‍රව මහණහට විවෙකයට නැඹුරු වූ, විවෙකප්‍රවණ වූ, විවෙකයට බැහැවුම් ඇති, විවෙකයෙහි සිටි නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණු සර්වප්‍රකාරයෙන් ආස්‍රවයනට කරුණු වූ ක්ලේශධර්මයන් කෙරෙන් විගතාන්ත වූ සිත වේ ද, යම් බලයක් පිණිස ක්ෂීණාස්‍රව මහණ 'මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ'යි ආස්‍රවක්ෂය පිළින කෙරේ ද මෙ ද ක්ෂීණාස්‍රව මහණහට බල වෙයි.

තවද ක්ෂීණාස්‍රව මහණුහු විසින් සතර සතිපට්ඨානයෝ භාවිත සුභාවිත වෙති. යම් සෙයෙකින් ක්ෂීණාස්‍රව මහණුහු විසින් සතර සතිපට්ඨානයෝ භාවිත සුභාවිත වෙත් ද යම් බලයක් පිණිස ක්ෂීණාස්‍රව මහණ 'මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ'යි ආස්‍රවක්ෂය පිළින කෙරේ ද මෙ ද ක්ෂීණාස්‍රව මහණහට බල වෙයි.

පුනච පරං ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සම්මප්පධානා භාවිතා හොන්ති සුභාවිතා -පෙ- චත්තාරො ඉද්ධිපාදා භාවිතා හොන්ති සුභාවිතා -පෙ- පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි -පෙ- පඤ්ච බලානි භාවිතානි හොන්ති සුභාවිතානි -පෙ- සත්ත බොජ්ඣඞ්ගා භාවිතා හොන්ති සුභාවිතා -පෙ- අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවිතො හොති සුභාවිතො, යම්පි ඛීණාසවස්ස භික්ඛුනො අට්ඨඞ්ගිකො මග්ගො භාවිතො හොති සුභාවිතො, ඉදම්පි ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවා'ති' ඉමානි දස ඛීණාසවබලානි.

කතමානි දස ඉද්ධිබලානි: අධිට්ඨානා ඉද්ධි, විකුබ්බනා ඉද්ධි, මනොමයා ඉද්ධි, ඤාණවිප්ඵාරා ඉද්ධි, සමාධිවිප්ඵාරා ඉද්ධි, අරියා ඉද්ධි, කම්මවිපාකජා ඉද්ධි, පුඤ්ඤවතො ඉද්ධි, විජ්ජාමයා ඉද්ධි, තත්ථ තත්ථ සම්මා පයොගප්පච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි, ඉමානි දස ඉද්ධිබලානි.

කතමානි දස තථාගතබලානි: ඉධ තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති, යම්පි තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති, යම්පි තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති

පුනච පරං තථාගතො සබ්බත්ථගාමිනිං පටිපදං යථාභූතං පජානාති, යම්පි තථාගතො සබ්බත්ථගාමිනිං පටිපදං[1] යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො අනෙකධාතුනානාධාතුලොකං යථාභූතං පජානාති, යම්පි තථාගතො අනෙකධාතුනානාධාතුලොකං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස -පෙ- බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති, යම්පි තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස -පෙ- බ්‍රහ්මචක්කං පවත්තෙති.

1 සබ්බත්ථගාමිනිපටිපදං - සෑ., PTS

තවද ක්ෂීණාස්‍රව මහණහු විසින් සතර සම්‍යක්ප්‍රධානයෝ භාවිත සුභාවිත වෙති ... සතර සෘද්ධිපාදයෝ භාවිත සුභාවිත වෙති ... පඤ්චෙන්ද්‍රියයෝ භාවිත සුභාවිත වෙති ... පඤ්චබලයෝ භාවිත සුභාවිත වෙති ... සප්තබොධ්‍යඞ්ගයෝ භාවිත සුභාවිත වෙති ... ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය භාවිත සුභාවිත වෙයි. යම් සෙයෙකින් ක්ෂීණාස්‍රව මහණහු විසින් අෂ්ටාඞ්ගිකමාර්ගය භාවිත සුභාවිත වේ ද, යම් බලයක් පිණිස ක්ෂීණාස්‍රව මහණ 'මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ'යි ආස්‍රවක්ෂය පිළිත කෙරේ ද, මෙ ද ක්ෂීණාස්‍රව මහණහට බල වෙයි.

දශර්ද්ධිබල කවරහ යත්; අධිෂ්ඨාන සෘද්ධි යැ, විකුර්වණ සෘද්ධි යැ, මනොමය සෘද්ධි යැ, ඥානවිස්ඵාර සෘද්ධි යැ, සමාධිවිස්ඵාර සෘද්ධි යැ, ආර්‍ය සෘද්ධි යැ, කර්මවිපාකජ සෘද්ධි යැ, පුණ්‍යවත්හුගේ සෘද්ධි යැ, විද්‍යාමය සෘද්ධි යැ. ඒ ඒ කරුණෙහි සම්‍යක්ප්‍රයෝග හෙයින් සමෘද්ධ වන අර්ථයෙන් සෘද්ධි යි. මොහු දශර්ද්ධිබලයෝ යි.

දශ තථාගතබල කවරහ යත්: මෙහි තථාගතයෝ කාරණය ද කාරණ හෙයින් අකාරණය ද අකාරණ හෙයින් යථාස්වභාවයෙන් දැනගනිති යම් සෙයෙකින් තථාගතයෝ කාරණය ද කාරණ හෙයින් අකාරණය ද අකාරණ හෙයින් යථාස්වභාවයෙන් දැනගනිත් ද. යම් බලයක් පිණිස තථාගතයෝ ශ්‍රේෂ්ඨස්ථානය පිළිත කෙරෙත් ද, පිරිස් මැද අභීතනාද කෙරෙත් ද බ්‍රහ්මසඞ්ඛ්‍යාත ශ්‍රේෂ්ඨ ධර්මචක්‍රය පවත්වත් ද මෙ ද තථාගතයන්ගේ තථාගත බල වෙයි.

තවද තථාගතයෝ අතීතානාගතප්‍රත්‍යුත්පන්න කර්මසමාදානයන්ගේ ප්‍රත්‍යය විසින් හේතු විසින් විපාකය යථාස්වභාවයෙන් දැනගනිති, යම් සෙයෙකින් තථාගතයෝ අතීතානාගතප්‍රත්‍යුත්පන්නකර්මසමාදානයන්ගේ ප්‍රත්‍යය විසින් හේතු විසින් විපාකය යථාස්වභාවයෙන් දැනගනිත් ද යම් බලයක් පිණිස තථාගතයෝ ශ්‍රේෂ්ඨස්ථානය පිළිත කෙරෙත් ද පර්ෂද්හි සිංහනාද කෙරෙත් ද බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

තවද තථාගතයෝ සර්වත්‍රගාමී (හැම ගතියට අගතියට යනසුලු) මාර්ගය යථාස්වභාවයෙන් දැනගනිති යම්සෙයෙකින් තථාගතයෝ සර්වත්‍රගාමිමාර්ගය යථාස්වභාවයෙන් දැනගනිත් ද, යම් බලයක් පිණිස තථාගතයෝ ශ්‍රේෂ්ඨස්ථානය පිළිත කෙරෙත් ද, පර්ෂද්හි සිංහනාද කෙරෙත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි

තවද තථාගතයෝ අනේකධාතු නානාධාතු ලෝකය යථාස්වභාවයෙන් දැනගනිති. යම් සෙයෙකින් තථාගතයෝ අනෙකධාතුනානාධාතුලොකය යථාස්වභාවයෙන් දැනගනිත් ද ... බ්‍රහ්මචක්‍ර පවත්වත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

තවද තථාගතයෝ සත්ත්වයන් නානාධිමුක්ති ඇති බව යථාස්වභාවයෙන් දැනගනිති. යම් සෙයෙකින් තථාගතයෝ සත්ත්වයන් නානාධිමුක්ති ඇති බව යථාස්වභාවයෙන් දැනගනිත් ද ... බ්‍රහ්මචක්‍ර පවත්වත් ද මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

පුනච පරං තථාගතො පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං පජානාති, යම්පි තථාගතො පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස -පෙ- බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති, යම්පි තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති ඉදම්පි තථාගතස්ස -පෙ- බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, යම්පි තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉදම්පි තථාගතස්ස -පෙ- බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ -පෙ- යම්පි තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ -පෙ- ඉදම්පි තථාගතස්ස-පෙ- බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, යම්පි තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති, ඉමානි දස තථාගතබලානි.

කෙනට්ඨෙන සද්ධාබලං, කෙනට්ඨෙන විරියබලං, කෙනට්ඨෙන සතිබලං, කෙනට්ඨෙන, සමාධිබලං, කෙනට්ඨෙන පඤ්ඤාබලං, කෙනට්ඨෙන හිරිබලං, කෙනට්ඨෙන ඔත්තප්පබලං, කෙනට්ඨෙන පටිසඞ්ඛානබලං, -පෙ- කෙනට්ඨෙන තථාගතබලං:

තවද තථාගතයෝ පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ ඉන්ද්‍රියපරාවරභාවය (වෘද්ධි - හානි) යථාස්වභාවයෙන් දැනගනිති. යම් සේයෙකින් තථාගතයෝ පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ ඉන්ද්‍රියපරාවරභාවය යථාස්වභාවයෙන් දැනගනිත් ද ... බ්‍රහ්මචක්‍ර පවත්වත් ද, මේ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

තවද තථාගතයෝ ධ්‍යානවිමෝක්ෂසමාධිසමාපත්තීන්ගේ සංක්ලේශ (හානභාගියධර්ම) ය ව්‍යවදාන (විශේෂභාගියධර්ම) ය ව්‍යුත්ථානය යථාස්වභාවයෙන් දැනගනිති. යම්සේයෙකින් තථාගතයෝ ධ්‍යානවිමෝක්ෂසමාධිසමාපත්තීන්ගේ සංක්ලේශය ව්‍යවදානය ව්‍යුත්ථානය යථාස්වභාවයෙන් දැනගනිත් ද ... බ්‍රහ්මචක්‍ර පවත්වත් ද, මේ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

තවද තථාගතයෝ අනේකප්‍රකාර වූ පූර්වනිවාස (පෙරවිසූකඳපිළිවෙළ) සිහි කෙරෙති. හේ කෙසේ යැ යත්: එක් ජාතියකුදු ජාති දෙකකුදු .. මෙසෙයින් (වර්ණාදි) ආකාර සහිත වූ (නාමගෝත්‍රාදි) උද්දේශ සහිත වූ අනේකප්‍රකාර පූර්වනිවාස සිහි කෙරෙති යම් සේයෙකින් තථාගතයෝ අනේකප්‍රකාර වූ පූර්වනිවාස සිහි කෙරෙත් ද, හේ කෙසේ යැ යත්: එක් ජාතියකුදු ජාති දෙකකුදු ... බ්‍රහ්මචක්‍ර පවත්වත් ද, මේ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

තවද තථාගතයෝ විශුද්ධ වූ මිනිසත්බව ඉක්මගිය දිවඇසින් සැවයන උපදනා සත්ත්වයන් බලති. යම් සෙයෙකින් තථාගතයෝ විශුද්ධ වූ මිනිසත්බව ඉක්මගිය දිව ඇසින් සැවයන උපදනා ... සත්ත්වයන් බලත් ද... බ්‍රහ්මචක්‍ර පවත්වත් ද, මේ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

තවද තථාගතයෝ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් ආස්‍රව විරහිත වූ චිත්තවිමුක්තිය (අර්හත්ඵලසමාධිය) ප්‍රඥාවිමුක්තිය (අර්හත්ඵලප්‍රඥාව) මෙ අත්බැව්හි මැ තුමූ අභිඥායෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරෙති යම් සෙයෙකින් තථාගතයෝ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් ආස්‍රව විරහිත වූ චිත්තවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය මෙ අත්බැව්හි මැ තුමූ අභිඥායෙන් ප්‍රත්‍යක්ෂ කොටගෙන ඊට පැමිණ වාසය කෙරෙත් ද යම් බලයක් පිණිස තථාගතයෝ ශ්‍රේෂ්ඨස්ථානය පිළින කෙරෙත් ද පර්ෂද්හි අභීතනාද කෙරෙත් ද බ්‍රහ්ම සඞ්ඛ්‍යාත ශ්‍රේෂ්ඨධර්මචක්‍රය පවත්වත් ද මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි. මොහු දශ තථාගතබලයෝ යි.

කවර අරුතෙකින් ශ්‍රද්ධාබල වේ ද, කවර අරුතෙකින් වීර්‍ය්‍යබල වේ ද, කවර අරුතෙකින් ස්මෘතිබල වේ ද, කවර අරුතෙකින් සමාධිබල වේ ද, කවර අරුතෙකින් ප්‍රඥාබල වේ ද, කවර අරුතෙකින් හිරිබල වේ ද, කවර අරුතෙකින් ඔත්තප්පබල වේ ද, කවර අරුතෙකින් පටිසඞ්ඛානබල වේ ද ... කවර අරුතෙකින් තථාගතබල වේ ද යත්:

අස්සද්ධියෙ අකම්පියට්ඨෙන සද්ධාබලං, කොසජ්ජෙ අකම්පියට්ඨෙන විරියබලං, පමාදෙ අකම්පියට්ඨෙන සතිබලං, උද්ධච්චෙ අකම්පියට්ඨෙන සමාධිබලං, අවිජ්ජාය අකම්පියට්ඨෙන පඤ්ඤාබලං, හිරීයති පාපකෙ අකුසලෙ ධම්මෙති හිරිබලං, ඔත්තප්පති පාපකෙ අකුසලෙ ධම්මෙති ඔත්තප්පබලං, ඤාණෙන කිලෙසෙ පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, තත්ථ ජාතා ධම්මා එකරසා හොන්තීති භාවනා බලං, තත්ථ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, තෙන චිත්තං සඞ්ගණ්හාතීති සඞ්ගහබලං, තං ඛමතීති[1] ඛන්තිබලං, තෙන චිත්තං පඤ්ඤපෙතීති පඤ්ඤත්තිබලං තෙන චිත්තං නිජ්ඣාපෙතීති නිජ්ඣත්තිබලං, තෙන චිත්තං වසෙ වත්තෙතීති ඉස්සරිය බලං, තෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානබලං, තෙන චිත්තං එකග්ගං හොතීති සමථබලං, තත්ථ ජාතෙ ධම්මෙ අනුපස්සතීති විපස්සනාබලං, තත්ථ සික්ඛතීති සෙඛබලං, තත්ථ සික්ඛිතත්තා අසෙඛබලං, තෙන ආසවා ඛීණාති ඛීණාසවබලං, තස්ස ඉජ්ඣතීති ඉද්ධිබලං, අප්පමෙය්‍යට්ඨෙන තථාගතබලන්ති.

**බලකථා සමත්තා**

# 2. 10

## සුඤ්ඤතා කථා

"එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

"සුඤ්ඤො ලොකො, සුඤ්ඤො ලොකො'ති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ 'සුඤ්ඤො ලොකො'ති වුච්චතී"ති "යස්මා ඛො ආනන්ද සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, තස්මා සුඤ්ඤො ලොකො'ති වුච්චති, කිඤ්චානන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා; චක්ඛුං ඛො[2] ආනන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, රූපා සුඤ්ඤා අත්තෙන වා අත්තනියෙන වා, චක්ඛුවිඤ්ඤාණං සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, චක්ඛුසම්ඵස්සො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා, යම්පිදං චක්ඛු-සම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා.

---

1 තං තස්ස ඛමතීති - සාමි PTS, තස්ස ඛමතීති - සී.

2 චක්ඛු ඛො - මජසං.

අශ්‍රද්ධායෙහි නො සැලෙන අර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, කෞසීද්‍යයෙහි නො සැලෙන අර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, ප්‍රමාදයෙහි නො සැලෙන අර්ථයෙන් ස්මෘතිබල යැ, ඖද්ධත්‍යයෙහි නො සැලෙන අර්ථයෙන් සමාධිබල යැ, අවිද්‍යායෙහි නො සැලෙන අර්ථයෙන් ප්‍රඥාබල යැ ලාමක වූ අකුසල් දහම්හි ලජ්ජිත වේ නු'යි හිරිබල යැ, ලාමක වූ අකුසල්දහම්හි තැවේ නු'යි ඔත්තප්පබල යැ, නුවණින් කෙලෙසුන් විමසා නු'යි පටිසඞ්ඛානබල යැ. ඒ භාවනා විශේෂයෙහි උපන් චිත්තචෛතසිකධර්මයෝ එකරස වෙත් නු'යි භාවනාබල යැ, එහි කිසි වද්‍යෙක් නැත් නු'යි අනවද්‍යබල යැ, එයින් සිත සඞ්ග්‍රහ කෙරේ නු'යි සඞ්ග්‍රහබල යැ, එය සහනය කෙරේ නු'යි ක්‍ෂාන්තිබල යැ, එයින් සිත ප්‍රකාරයෙන් ඥපනය කෙරේ නු'යි ප්‍රඥප්තිබල යැ, එයින් සිත නිදිධ්‍යාසන (ශ්‍රැතාර්ථවිචාරය) කෙරේ නු' යි නිදිධ්‍යාසනබල යැ. එයින් සිත වශයෙහි පවත්වා නු'යි ඓශ්වර්‍ය්‍යබල යැ, එයින් සිත අධිෂ්ඨාන කෙරේ නු'යි අධිෂ්ඨානබල යැ, එයින් (සමාධියෙන්) සිත එකඟ නු'යි ශමථබල යැ, එහි උපන් (චිත්තචෛතසික) ධර්මයන් අනුපස්සනා කෙරේ නු'යි විදර්ශනාබල යැ, ඒ ශෛක්‍ෂබලයෙහි හික්මේ නු'යි ශෛක්‍ෂබල යැ, එහි (අශෛක්‍ෂබලයෙහි) ශික්‍ෂිත බැවින් අශෛක්‍ෂබල යැ, එයින් (ලෞකිකලෝකෝත්තරඥානයෙන්) ආස්‍රවයෝ ක්‍ෂය කරනලදහ'යි ක්‍ෂීණාස්‍රවබල යැ, ඔහට (ඍද්ධිමත්හට) සමෘද්ධ වේ නු'යි ඍද්ධිබල යැ, ප්‍රමාණ නො කට හැකි අර්ථයෙන් තථාගත බල වේ යයි.

බලකථා නිමි.

## 2. 10

## ශූන්‍යතා කථා

මා විසින් මෙසේ අසනලද. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ අරම්හි වැඩවසනසේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ වැඳ එකත්පස් වැ භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ.

වහන්ස, 'ලෝකය ශූන්‍ය යැ ලෝකය ශූන්‍ය යැ' යි කියනු ලැබෙයි. වහන්ස, කිපමණෙකින් 'ලෝකය ශූන්‍ය යැ'යි කියනු ලැබේ දැ යි. යම් හෙයකින් ආනන්දයෙනි, ආත්ම භාවයෙන් ද ආත්මනීය භාවයෙන් ද ශූන්‍ය වේ නම් එහෙයින් 'ලෝකය ශූන්‍ය යැ'යි කියනු ලැබෙයි. තවද ආනන්දයෙනි, කුමක් ආත්මභාවයෙන් හා ආත්මනීය භාවයෙන් හා ශූන්‍ය වේ ද යත් ආනන්දයෙනි, චක්‍ෂුස ආත්ම භාවයෙන් හා ආත්මනීය භාවයෙන් හා ශූන්‍ය වෙයි, රූපයෝ ආත්ම භාවයෙන් හා ආත්මනීය භාවයෙන් හා ශූන්‍ය වෙති, චක්‍ෂුර් විඥානය ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍ය වෙයි. චක්ඛුසම්ඵස්සය ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍ය වෙයි· චක්ඛුසම්ඵස්ස ප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදී නම් හෙ ද ආත්මභාවයෙන් හා ආත්මනීය භාවයෙන් හා ශූන්‍ය වෙයි.

සොතං සුඤ්ඤං -පෙ- සද්දා සුඤ්ඤා -පෙ- ඝානං සුඤ්ඤං -පෙ- ගන්ධා සුඤ්ඤා -පෙ- ජිව්හා සුඤ්ඤා -පෙ- රසා සුඤ්ඤා -පෙ- කායො සුඤ්ඤො -පෙ- ඵොට්ඨබ්බා සුඤ්ඤා -පෙ- මනො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා, ධම්මා සුඤ්ඤා අත්තෙන වා අත්තනියෙන වා, මනොවිඤ්ඤාණං සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, මනොසම්ඵස්සො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, යස්මා ඛො ආනන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, තස්මා සුඤ්ඤො ලොකො'ති වුච්චතී'ති ෳ

සුඤ්ඤසුඤ්ඤං[1] සඞ්ඛාරසුඤ්ඤං, විපරිනාමසුඤ්ඤං අග්ගසුඤ්ඤං, ලක්ඛණසුඤ්ඤං, වික්ඛම්භනසුඤ්ඤං, තදඞ්ගසුඤ්ඤං, සමුච්ඡෙදසුඤ්ඤං, පටිප්පස්සද්ධිසුඤ්ඤං, නිස්සරණසුඤ්ඤං, අජ්ඣත්තසුඤ්ඤං, බහිද්ධාසුඤ්ඤං දුභතොසුඤ්ඤං, සභාගසුඤ්ඤං, විසභාගසුඤ්ඤං, එසනාසුඤ්ඤං, පරිග්ගහසුඤ්ඤං, පටිලාභසුඤ්ඤං, පටිවෙධසුඤ්ඤං, එකත්තසුඤ්ඤං, නානත්තසුඤ්ඤං, ඛන්තිසුඤ්ඤං, අධිට්ඨානසුඤ්ඤං, පරියොගාහනසුඤ්ඤං[2] සම්පජානස්ස පවත්තපරියාදානං සබ්බසුඤ්ඤතානං පරමත්ථසුඤ්ඤං.

කතමං සුඤ්ඤසුඤ්ඤං· චක්ඛුං[3] සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිනාමධම්මෙන වා, සොතං සුඤ්ඤං-පෙ- ඝානං සුඤ්ඤං-පෙ- ජිව්හා සුඤ්ඤා-පෙ-කායො සුඤ්ඤො-පෙ- මනො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා ඉදං සුඤ්ඤසුඤ්ඤං.

කතමං සඞ්ඛාරසුඤ්ඤං; තයො සඞ්ඛාරා: පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරො ආනෙඤ්ජාභිසඞ්ඛාරො, පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරෙන ච ආනෙඤ්ජාභිසඞ්ඛාරෙන ච සුඤ්ඤො, අපුඤ්ඤාභිසඞ්ඛාරො පුඤ්ඤාභිසඞ්ඛාරෙන ච ආනෙඤ්ජාභිසඞ්ඛාරෙන ච සුඤ්ඤො, ආනෙඤ්ජාභිසඞ්ඛාරො පුඤ්ඤාභිසඞ්ඛාරෙන ච අපුඤ්ඤාභිසඞ්ඛාරෙන ච සුඤ්ඤො, ඉමෙ තයො සඞ්ඛාරා.

අපරෙපි තයො සඞ්ඛාරා: කායසඞ්ඛාරො වචීසඞ්ඛාරො චිත්තසඞ්ඛාරො. කායසඞ්ඛාරො වචීසඞ්ඛාරෙන ච චිත්තසඞ්ඛාරෙන ච සුඤ්ඤො, වචීසඞ්ඛාරො කායසඞ්ඛාරෙන ච චිත්තසඞ්ඛාරෙන ච සුඤ්ඤො, චිත්තසඞ්ඛාරො කායසඞ්ඛාරෙන ච වචීසඞ්ඛාරෙන සුඤ්ඤො, ඉමෙ තයො සඞ්ඛාරා.

අපරෙපි තයො සඞ්ඛාරා: අතීතා සඞ්ඛාරා අනාගතා සඞ්ඛාරා පච්චුප්පන්නා සඞ්ඛාරා, අතීතා සඞ්ඛාරා අනාගතෙහි ච පච්චුප්පන්නෙහි ච සඞ්ඛාරෙහි සුඤ්ඤා, අනාගතා සඞ්ඛාරා අතීතෙහි ච පච්චුප්පන්නෙහි ච සඞ්ඛාරෙහි සුඤ්ඤා, පච්චුප්පන්නා සඞ්ඛාරා අතීතෙහි ච අනාගතෙහි ච සඞ්ඛාරෙහි සුඤ්ඤා, ඉමෙ තයො සඞ්ඛාරා. ඉදං සඞ්ඛාරසුඤ්ඤං.

---

1 සුඤ්ඤ-සුඤ්ඤං - සී.
2 පරියොගහනසුඤ්ඤං - පු.
3 චක්ඛු සුඤ්ඤං - මජසං.
ෳ

ශ්‍රෝත්‍රය ශූන්‍ය යැ ... ශබ්දයෝ ශූන්‍යහ ... ඝ්‍රාණය ශූන්‍ය යැ ... ගන්ධයෝ ශූන්‍ය හ ... ජිහ්වාව ශූන්‍ය යැ ... රසයෝ ශූන්‍යහ ... කය ශූන්‍ය යැ ... ස්ප්‍රෂ්ටව්‍යයෝ ශූන්‍ය හ ... මනස ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍ය යැ, ධර්මයෝ ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍යයෝ යැ, මනොවිඥානය ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍ය යැ, මනොසම්ඵස්සය ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍ය යැ, මනොසම්ඵස්ස ප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදී නම් හෙ ද ආත්මභාවයෙන් හා ආත්මනීය භාවයෙන් හා ශූන්‍ය යැ. යම් හෙයකින් ආනන්දයෙනි, ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍ය වේ නම් එහෙයින් 'ලොකය ශූන්‍ය යැ'යි කියනුලැබේ' යයි.

ශූන්‍ය සඞ්ඛ්‍යාත ශූන්‍ය යැ, සංස්කාරශූන්‍ය යැ, විපරිණාම ශූන්‍ය යැ, අග්‍රශූන්‍ය යැ, ලක්ෂණශූන්‍ය යැ, විෂ්කම්භණශූන්‍ය යැ, තදඞ්ගශූන්‍ය යැ, සමුච්ඡේදශූන්‍ය යැ, ප්‍රතිප්‍රශ්‍රබ්ධිශූන්‍ය යැ, නිස්සරණශූන්‍ය යැ, අධ්‍යාත්මශූන්‍ය යැ, බාහ්‍යශූන්‍ය යැ, උභයතඃශූන්‍ය යැ, සභාගශූන්‍ය යැ, විසභාගශූන්‍ය යැ, එෂණාශූන්‍ය යැ, පරිග්‍රහශූන්‍ය යැ, ප්‍රතිලාභශූන්‍ය යැ, ප්‍රතිවෙධශූන්‍ය යැ, එකත්වශූන්‍ය යැ, නානාත්වශූන්‍ය යැ, ක්ෂාන්තිශූන්‍ය යැ, අධිෂ්ඨානශූන්‍ය යැ, පර්‍ය්‍යවගාහණශූන්‍ය යැ, සම්‍යක්ප්‍රඥ ඇත්තහු (රහත්හු) ගේ ප්‍රවෘත්ත (ස්කන්ධ) යන් ක්ෂය කිරීම නැමි ශූන්‍යතාවන් අතුරින් පරමාර්ථශූන්‍ය යි

ශූන්‍ය සඞ්ඛ්‍යාත ශූන්‍යය කවරැ යත්: චක්ෂුස ආත්මයෙන් හා ආත්මනීයෙන් හා නිත්‍යයෙන් හා ධ්‍රැවයෙන් හා ශාශ්වතයෙන් හා අවිපරිණාමස්වභාවයෙන් හා ශූන්‍ය යැ. ශ්‍රෝත්‍රය ශූන්‍ය යැ .. ඝ්‍රාණය ශූන්‍ය යැ ... ජිහ්වාව ශූන්‍ය යැ ... කය ශූන්‍ය යැ ... මනස ආත්මයෙන් හා ආත්මනීයෙන් හා නිත්‍යයෙන් හා ධ්‍රැවයෙන් හා ශාශ්වතයෙන් හා අවිපරිණාමස්වභාවයෙන් හා ශූන්‍ය යැ. මේ ශූන්‍ය සඞ්ඛ්‍යාත ශූන්‍ය යි.

සංස්කාරශූන්‍යය කවරැ යත්: සංස්කාරයෝ තිදෙනෙක් වෙති: පුණ්‍යාභිසංස්කාර යැ අපුණ්‍යාභිසංස්කාර යැ ආනෙඤ්ජාභිසංස්කාර යැ යි. පුණ්‍යාභිසංස්කාරය අපුණ්‍යාභිසංස්කාරයෙනුදු ආනෙඤ්ජාභිසංස්කාරයෙනුදු ශූන්‍ය යැ. අපුණ්‍යාභිසංස්කාරය පුණ්‍යාභිසංස්කාරයෙනුදු ආනෙඤ්ජාභිසංස්කාරයෙනුදු ශූන්‍ය යැ. ආනෙඤ්ජාභිසංස්කාරය පුණ්‍යාභිසංස්කාරයෙනුදු අපුණ්‍යාභිසංස්කාරයෙනුදු ශූන්‍ය යි මොහු තුන් සංස්කාරයෝ යි.

අන්‍ය වූ ද තුන් සංස්කාර කෙනෙක් වෙති: කායසංස්කාර යැ වාක්සංස්කාර යැ චිත්තසංස්කාර යැ යි. කායසංස්කාරය වාක්සංස්කාරයෙනුදු චිත්තසංස්කාරයෙනුදු ශූන්‍ය යැ. වාක්සංස්කාරය කායසංස්කාරයෙනුදු චිත්තසංස්කාරයෙනුදු ශූන්‍ය යැ, චිත්තසංස්කාරය කායසංස්කාරයෙනුදු වාක්සංස්කාරයෙනුදු ශූන්‍ය යි. මොහු තුන් සංස්කාරයෝ යි.

අන්‍ය වූ ද තුන් සංස්කාර කෙනෙක් වෙති: අතීතසංස්කාර යැ අනාගතසංස්කාර යැ ප්‍රත්‍යුත්පන්නසංස්කාර යැයි අතීතසංස්කාරයෝ අනාගත වූ ද ප්‍රත්‍යුත්පන්න වූ ද සංස්කාරයන්ගෙන් ශූන්‍යහ. අනාගතසංස්කාරයෝ අතීත වූ ද ප්‍රත්‍යුත්පන්න වූ ද සංස්කාරයන්ගෙන් ශූන්‍යහ ප්‍රත්‍යුත්පන්නසංස්කාරයෝ අතීත වූ ද අනාගත වූ ද සංස්කාරයන්ගෙන් ශූන්‍යහ. මොහු තුන් සංස්කාරයෝ යි. මේ සංස්කාරශූන්‍ය නම් වෙයි.

කතමං විපරිණාමසුඤ්ඤං; ජාතං රූපං සභාවෙන සුඤ්ඤං, විගතා රූපං විපරිණතඤ්චෙව සුඤ්ඤඤ්ච, ජාතා වේදනා සභාවෙන සුඤ්ඤා, විගතා වේදනා විපරිණතා චෙව සුඤ්ඤා ච -පෙ- ජාතා සඤ්ඤා -පෙ- ජාතා සඞ්ඛාරා -පෙ- ජාතං විඤ්ඤාණං -පෙ- ජාතං චක්ඛුං -පෙ- ජාතො භවො සභාවෙන සුඤ්ඤො, විගතො භවො විපරිණතො චෙව සුඤ්ඤො ච, ඉදං විපරිණාමසුඤ්ඤං.

කතමං අග්ගසුඤ්ඤං: අග්ගමෙතං පදං, සෙට්ඨමෙතං පදං; විසිට්ඨමෙතං[1] පදං, යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං, ඉදං අග්ගසුඤ්ඤං.

කතමං ලක්ඛණසුඤ්ඤං, ද්වෙ ලක්ඛණානි බාලලක්ඛණඤ්ච පණ්ඩිතලක්ඛණඤ්ච, බාලලක්ඛණං පණ්ඩිතලක්ඛණෙන සුඤ්ඤං, පණ්ඩිතලක්ඛණං බාලලක්ඛණෙන සුඤ්ඤං.

තීණි ලක්ඛණානි: උප්පාදලක්ඛණං වයලක්ඛණං ඨිතඤ්ඤථත්තලක්ඛණං. උප්පාදලක්ඛණං වයලක්ඛණෙන ච ඨිතඤ්ඤථත්තලක්ඛණෙන ච සුඤ්ඤං, වයලක්ඛණං උප්පාදලක්ඛණෙන ච ඨිතඤ්ඤථත්තලක්ඛණෙන ච සුඤ්ඤං, ඨිතඤ්ඤථත්තලක්ඛණං උප්පාදලක්ඛණෙන ච වයලක්ඛණෙන ච සුඤ්ඤං.

රූපස්ස උප්පාදලක්ඛණං වයලක්ඛණෙන ච ඨිතඤ්ඤථත්තලක්ඛණෙන ච සුඤ්ඤං, රූපස්ස වයලක්ඛණං උප්පාදලක්ඛණෙන ච ඨිතඤ්ඤථත්තලක්ඛණෙන ච සුඤ්ඤං, රූපස්ස ඨිතඤ්ඤථත්තලක්ඛණං උප්පාදලක්ඛණෙන ච වයලක්ඛණෙන ච සුඤ්ඤං, වේදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස -පෙ- චක්ඛුස්ස -පෙ- ජරාමරණස්ස උප්පාදලක්ඛණං වයලක්ඛණෙන ච ඨිතඤ්ඤථත්තලක්ඛණෙන ච සුඤ්ඤං, ජරාමරණස්ස වයලක්ඛණං උප්පාදලක්ඛණෙන ච ඨිතඤ්ඤථත්තලක්ඛණෙන ච සුඤ්ඤං, ජරාමරණස්ස ඨිතඤ්ඤථත්තලක්ඛණං උප්පාදලක්ඛණෙන ච වයලක්ඛණෙන ච සුඤ්ඤං, ඉදං ලක්ඛණසුඤ්ඤං.

කතම වික්ඛම්භනසුඤ්ඤං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දො වික්ඛම්භිතො චෙව සුඤ්ඤො ච, අබ්‍යාපාදෙන බ්‍යාපාදො වික්ඛම්භිතො චෙව සුඤ්ඤො ච, ආලොකසඤ්ඤාය ථීනමිද්ධං වික්ඛම්භිතඤ්චෙව සුඤ්ඤඤ්ච, අවික්ඛෙපෙන උද්ධච්චං වික්ඛම්භිතඤ්චෙව සුඤ්ඤඤ්ච, ධම්මවවත්ථානෙන විචිකිච්ඡා වික්ඛම්භිතා චෙව සුඤ්ඤා ච, ඤාණෙන අවිජ්ජා වික්ඛම්භිතා චෙව සුඤ්ඤා ච, පාමොජ්ජෙන අරති වික්ඛම්භිතා චෙව සුඤ්ඤා ච, පඨමෙන ඣානෙන නීවරණා වික්ඛම්භිතා චෙව සුඤ්ඤා ච -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසා වික්ඛම්භිතා චෙව සුඤ්ඤා ච, ඉදං වික්ඛම්භනසුඤ්ඤං.

විපරිණාමශූන්‍ය නම් කවරැ යත්: ජාත (ප්‍රත්‍යුත්පන්න) රූපය ස්වභාව හෙයින් ශූන්‍ය වෙයි. විගත (ඉපැද නිරුද්ධ වූ) රූපය විපරිණාමයට පැමිණියේ ද ශූන්‍ය ද වෙයි. ජාතවේදනාව ස්වභාව හෙයින් ශූන්‍ය වෙයි. විගතවේදනාව විපරිණත ද ශූන්‍ය ද වෙයි ... ජාතසංඥාව ... ජාතසංස්කාරයෝ ... ජාතවිඥානය ... ජාතචක්ෂුස ... ජාතභවය ස්වභාව හෙයින් ශූන්‍ය වෙයි. විගතභවය විපරිණත ද ශූන්‍ය ද වෙයි. මේ විපරිණාමශූන්‍ය නම් වෙයි.

අග්‍රශූන්‍ය නම් කවරැ යත්: යම් මේ හැම සංස්කාරයන්ගේ ශමථයෙක් හැම උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාවගේ ක්‍ෂය කිරීමෙක් විරාගයෙක් නිරෝධයෙක් නිර්වාණයෙක් වේ ද තෙල අග්‍රපද යැ තෙල ශූන්‍ය මැ ප්‍රශංසනීයපද යැ තෙල විශිෂ්ටපද යි. මේ අග්‍රශූන්‍ය නම් වේ.

ලක්ෂණශූන්‍ය නම් කවරැ යත්: ලක්ෂණ දෙකෙකි බාලලක්ෂණ යැ පණ්ඩිතලක්ෂණ යැ යි. බාලලක්ෂණය පණ්ඩිතලක්ෂණයෙන් ශූන්‍ය යැ පණ්ඩිතලක්ෂණය බාලලක්ෂණයෙන් ශූන්‍ය යි.

ලක්ෂණ තුනෙකි: උත්පාදලක්ෂණ යැ ව්‍යයලක්ෂණ යැ සිටියහුගේ අන්‍යථාත්වලක්ෂණ යැ යි. උත්පාදලක්ෂණය ව්‍යයලක්ෂණයෙනුදු සිටියහුගේ අන්‍යථාත්වලක්ෂණයෙනුදු ශූන්‍ය යැ, ව්‍යයලක්ෂණය උත්පාද ලක්ෂණයෙනුදු සිටියහුගේ අන්‍යථාත්වලක්ෂණයෙනුදු ශූන්‍ය යැ, සිටියහුගේ අන්‍යථාත්වලක්ෂණය උත්පාදලක්ෂණයෙනුදු ව්‍යයලක්ෂණයෙනුදු ශූන්‍ය යි.

රූපයාගේ උත්පාදලක්ෂණය ව්‍යයලක්ෂණයෙනුදු සිටියහුගේ අන්‍යථාත්වලක්ෂණයෙනුදු ශූන්‍ය යැ. රූපයාගේ ව්‍යයලක්ෂණය උත්පාදලක්ෂණයෙනුදු සිටියහුගේ අන්‍යථාත්වලක්ෂණයෙනුදු ශූන්‍ය යැ. රූපයාගේ ස්ථිතාන්‍යලක්ෂණය උත්පාදලක්ෂණයෙනුදු ව්‍යයලක්ෂණයෙනුදු ශූන්‍ය යි. වේදනාවගේ ... සංඥාවගේ ... සංස්කාරයන්ගේ ... විඥානයාගේ ... චක්ෂුස්හුගේ ... ජරාමරණයාගේ උත්පාදලක්ෂණය ව්‍යයලක්ෂණයෙනුදු ස්ථිතාන්‍යලක්ෂණයෙනුදු ශූන්‍ය යැ. ජරාමරණයාගේ ව්‍යයලක්ෂණය උත්පාදලක්ෂණයෙනුදු ස්ථිතාන්‍යලක්ෂණයෙනුදු ශූන්‍ය යැ. ජරාමරණයාගේ ස්ථිතාන්‍යලක්ෂණය උත්පාදලක්ෂණයෙනුදු ව්‍යයලක්ෂණයෙනුදු ශූන්‍ය යි. මේ ලක්ෂණශූන්‍ය නම් වේ.

විෂ්කම්භණ ශූන්‍ය නම් කවරෙ යත්: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය විෂ්කම්භණය කරනලද ද ශූන්‍යද වෙයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය විෂ්කම්භණය කරනලදද ශූන්‍ය ද වෙයි. ආලෝකසංඥයෙන් ථීනමිද්ධය විෂ්කම්භණය කරනලද ද ශූන්‍ය ද වෙයි. අවික්ෂෙපයෙන් ඖද්ධත්‍යය විෂ්කම්භණය කරන ලද ද ශූන්‍ය ද වෙයි. ධර්මනිශ්චයෙන් විචිකිත්සාව විෂ්කම්භණය කරනලද ද ශූන්‍ය ද වෙයි. ඥානයෙන් අවිද්‍යාව විෂ්කම්භණය කරනලද ද ශූන්‍ය ද වෙයි. ප්‍රාමෝද්‍යයෙන් අරතිය විෂ්කම්භණය කරනලද ද ශූන්‍ය ද වෙයි. ප්‍රථමධ්‍යානයෙන් නීවරණයෝ විෂ්කම්භණය කරනලද ද ශූන්‍ය ද වෙති ... අර්හත්මාර්ගයෙන් හැම කෙලෙස්හු විෂ්කම්භණය කරනලද ද ශූන්‍ය ද වෙත්. මේ විෂ්කම්භණ ශූන්‍ය නම් වේ.

කතමං තදඞ්ගසුඤ්ඤං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දො තදඞ්ගසුඤ්ඤො, අබ්‍යාපාදෙන බ්‍යාපාදො තදඞ්ගසුඤ්ඤො, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං තදඞ්ගසුඤ්ඤං, අවික්ඛෙපෙන උද්ධච්චං තදඞ්ගසුඤ්ඤං, ධම්මවවත්ථානෙන විචිකිච්ඡා තදඞ්ගසුඤ්ඤා, ඤාණෙන අවිජ්ජා තදඞ්ගසුඤ්ඤා, පාමොජ්ජෙන අරති තදඞ්ගසුඤ්ඤා, පඨමෙන ඣානෙන නීවරණා තදඞ්ගසුඤ්ඤා -පෙ- විවට්ටනානුපස්සනාය සඤ්ඤොගාභිනිවෙසො තදඞ්ගසුඤ්ඤො, ඉදං තදඞ්ගසුඤ්ඤං.

කතමං සමුච්ඡෙදසුඤ්ඤං; නෙක්ඛම්මෙන කාමච්ඡන්දො සමුච්ඡින්නො චෙව සුඤ්ඤො ච, අබ්‍යාපාදෙන බ්‍යාපාදො සමුච්ඡින්නො චෙව සුඤ්ඤො ච, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං සමුච්ඡින්නඤ්චෙව සුඤ්ඤඤ්ච, අවික්ඛෙපෙන උද්ධච්චං සමුච්ඡින්නඤ්චෙව සුඤ්ඤඤ්ච, ධම්මවවත්ථානෙන විචිකිච්ඡා සමුච්ඡින්නා චෙව සුඤ්ඤා ච, ඤාණෙන අවිජ්ජා සමුච්ඡින්නා චෙව සුඤ්ඤා ච, පාමොජ්ජෙන අරති සමුච්ඡින්නා චෙව සුඤ්ඤා ච, පඨමෙන ඣානෙන නීවරණා සමුච්ඡින්නා චෙව සුඤ්ඤා ච -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසා සමුච්ඡින්නා චෙව සුඤ්ඤා ච, ඉදං සමුච්ඡෙදසුඤ්ඤං.

කතමං පටිප්පස්සද්ධිසුඤ්ඤං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දො පටිප්පස්සද්ධො චෙව සුඤ්ඤො ච, අබ්‍යාපාදෙන බ්‍යාපාදො පටිප්පස්සද්ධො චෙව සුඤ්ඤො ච, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං පටිප්පස්සද්ධං චෙව සුඤ්ඤඤ්ච, අවික්ඛෙපෙන උද්ධච්චං පටිප්පස්සද්ධඤ්චෙව සුඤ්ඤඤ්ච, ධම්මවවත්ථානෙන විචිකිච්ඡා පටිප්පස්සද්ධා චෙව සුඤ්ඤා ච, ඤාණෙන අවිජ්ජා පටිප්පස්සද්ධා චෙව සුඤ්ඤා ච, පාමොජ්ජෙන අරති පටිප්පස්සද්ධා චෙව සුඤ්ඤා ච, පඨමෙන ඣානෙන නීවරණා පටිප්පස්සද්ධා චෙව සුඤ්ඤා ච -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසා පටිප්පස්සද්ධා චෙව සුඤ්ඤා ච, ඉදං පටිප්පස්සද්ධිසුඤ්ඤං.

කතමං නිස්සරණසුඤ්ඤං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දො නිස්සටො චෙව සුඤ්ඤො ච, අබ්‍යාපාදෙන බ්‍යාපාදො නිස්සටො චෙව සුඤ්ඤො ච ආලොකසඤ්ඤාය ථිනමිද්ධං නිස්සටඤ්චෙව සුඤ්ඤඤ්ච, අවික්ඛෙපෙන උද්ධච්චං නිස්සටං චෙව සුඤ්ඤඤ්ච, ධම්මවවත්ථානෙන විචිකිච්ඡා නිස්සටා චෙව සුඤ්ඤා ච, ඤාණෙන අවිජ්ජා නිස්සටා චෙව සුඤ්ඤා ච, පාමොජ්ජෙන අරති නිස්සටා චෙව සුඤ්ඤා ච, පඨමෙන ඣානෙන නීවරණා නිස්සටා චෙව සුඤ්ඤා ච -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසා නිස්සටා චෙව සුඤ්ඤා ච, ඉදං නිස්සරණසුඤ්ඤං.

කතමං අජ්ඣත්තසුඤ්ඤං: අජ්ඣත්තං චක්ඛුං සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා. අජ්ඣත්තං සොතං සුඤ්ඤං -පෙ- අජ්ඣත්තං ඝානං සුඤ්ඤං -පෙ- අජ්ඣත්තා ජිව්හා සුඤ්ඤා -පෙ- අජ්ඣත්තො කායො සුඤ්ඤො -පෙ- අජ්ඣත්තං මනො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා, ඉදං අජ්ඣත්තසුඤ්ඤං.

තදඞ්ගශූන්‍ය නම් කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යයෙන් ප්‍රහීණ වූ කාමච්ඡන්දය නෛෂ්ක්‍රම්‍යභාව හෙයින් ඒ (නෛෂ්ක්‍රම්‍ය) අඞ්ගයෙන් ශූන්‍ය යැ. අව්‍යාපාදයෙන් ප්‍රහීණ වූ ව්‍යාපාදය ඒ අඞ්ගයෙන් ශූන්‍ය යැ. ආලෝකසංඥයෙන් ප්‍රහීණ වූ ථීනමිද්ධය ඒ අඞ්ගයෙන් ශූන්‍ය යැ. අවික්ෂෙපයෙන් ප්‍රහීණ වූ ඖද්ධත්‍යය ඒ අඞ්ගයෙන් ශූන්‍ය යැ. ධර්මනිශ්චයෙන් ප්‍රහීණ වූ විචිකිත්සාව ඒ අඞ්ගයෙන් ශූන්‍ය යැ. ඥානයෙන් ප්‍රහීණ වූ අවිද්‍යාව ඒ අඞ්ගයෙන් ශූන්‍ය යැ. ප්‍රාමොද්‍යයෙන් ප්‍රහීණ වූ අරතිය ඒ අඞ්ගයෙන් ශූන්‍ය යැ. ප්‍රථමධ්‍යානයෙන් ප්‍රහීණ වූ නීවරණයෝ ඒ අඞ්ගයෙන් ශූන්‍යහ ... විවර්තානුදර්ශනායෙන් ප්‍රහීණ වූ සංයොගාභිනිවේශය ඒ අඞ්ගයෙන් ශූන්‍ය යි. මේ තදඞ්ගශූන්‍ය නම් වේ.

සමුච්ඡේදශූන්‍ය නම් කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යයෙන් ප්‍රහීණ වූ කාමච්ඡන්දය මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි අව්‍යාපාදයෙන් ප්‍රහීණ වූ ව්‍යාපාදය මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ආලෝකසංඥයෙන් ප්‍රහීණ වූ ථීනමිද්ධය මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. අවික්ෂෙපයෙන් ප්‍රහීණ වූ ඖද්ධත්‍යය මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ධර්මනිශ්චයෙන් ප්‍රහීණ වූ විචිකිත්සාව මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ඥානයෙන් ප්‍රහීණ වූ අවිද්‍යාව මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ප්‍රාමොද්‍යයෙන් ප්‍රහීණ වූ අරතිය මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ප්‍රථමධ්‍යානයෙන් ප්‍රහීණ වූ නීවරණයෝ මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ... අර්හත්මාර්ගයෙන් ප්‍රහීණ වූ හැම කෙලෙස්හු මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වේ. මේ සමුච්ඡේද ශූන්‍ය නම් වේ.

ප්‍රතිප්‍රශ්‍රබ්ධිශූන්‍ය නම් කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යයෙන් ප්‍රහීණ වූ කාමච්ඡන්දය සන්හිඳුනාලද ද (තදඞ්ග හෙයින්) ශූන්‍ය ද වෙයි. අව්‍යාපාදයෙන් ප්‍රහීණ වූ ව්‍යාපාදය සන්හිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ආලෝකසංඥයෙන් ප්‍රහීණ වූ ථීනමිද්ධය සන්හිඳුනා ලද ද ශූන්‍ය ද වෙයි. අවික්ෂෙපයෙන් ප්‍රහීණ වූ ඖද්ධත්‍යය සන්හිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ධර්මනිශ්චයෙන් ප්‍රහීණ වූ විචිකිත්සාව සන්හිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ඥානයෙන් ප්‍රහීණ වූ අවිද්‍යාව සන්හිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ප්‍රාමොද්‍යයෙන් ප්‍රහීණ වූ අරතිය සන්හිඳුනා ලද ද ශූන්‍ය ද වෙයි. ප්‍රථමධ්‍යානයෙන් ප්‍රහීණ වූ නීවරණයෝ සන්හිඳුනා ලදහු ද ශූන්‍යද වෙති... අර්හත්මාර්ගයෙන් ප්‍රහීණ වූ හැම කෙලෙස්හු සන්හිඳුනා ලදහු ද ශූන්‍ය ද වෙත්. මේ ප්‍රතිප්‍රශ්‍රබ්ධිශූන්‍ය නම් වේ.

නිස්සරණ ශූන්‍ය නම් කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යයෙන් ප්‍රහීණ වූ කාමච්ඡන්දය නිස්සෘත (ගැරපියන ලද) ද ශූන්‍ය ද වෙයි. අව්‍යාපාදයෙන් ප්‍රහීණ වූ ව්‍යාපාදය නිස්සෘත ද ශූන්‍ය ද වෙයි. ආලෝකසංඥයෙන් ප්‍රහීණ වූ ථීනමිද්ධය නිස්සෘත ද ශූන්‍ය ද වෙයි. අවික්ෂෙපයෙන් ප්‍රහීණ වූ ඖද්ධත්‍යය නිස්සෘත ද ශූන්‍ය ද වෙයි. ධර්මනිශ්චයෙන් ප්‍රහීණ වූ විචිකිත්සාව නිස්සෘත ද ශූන්‍ය ද වෙයි. ඥානයෙන් ප්‍රහීණ වූ අවිද්‍යාව නිස්සෘත ද ශූන්‍ය ද වෙයි. ප්‍රාමොද්‍යයෙන් ප්‍රහීණ වූ අරතිය නිස්සෘත ද ශූන්‍ය ද වෙයි. ප්‍රථමධ්‍යානයෙන් ප්‍රහීණ වූ නීවරණයෝ නිස්සෘත ද ශූන්‍ය ද වෙත් ... අර්හත්මාර්ගයෙන් ප්‍රහීණ වූ හැම කෙලෙස්හු නිස්සෘත ද ශූන්‍ය ද වෙත්. මේ නිස්සරණශූන්‍ය නම් වේ.

අධ්‍යාත්මශූන්‍ය නම් කවරේ යත්: අධ්‍යාත්ම වූ චක්ෂුය ආත්ම හෙයිනුදු ආත්මීය හෙයිනුදු නිත්‍ය හෙයිනුදු ධ්‍රැව හෙයිනුදු ශාශ්වත හෙයිනුදු අවිපරිණාමසවභාව හෙයිනුදු ශූන්‍ය යැ: අධ්‍යාත්ම වූ ශ්‍රොත්‍රය ... අධ්‍යාත්ම වූ ඝ්‍රාණය .. අධ්‍යාත්ම වූ ජිහ්වාව ... අධ්‍යාත්ම වූ කය ... අධ්‍යාත්ම වූ මනස ... ආත්ම හෙයිනුදු ආත්මීය හෙයිනුදු නිත්‍ය හෙයිනුදු ධ්‍රැව හෙයිනුදු ශාශ්වත හෙයිනුදු අවිපරිණාම සවභාව හෙයිනුදු ශූන්‍ය යි. මේ අධ්‍යාත්ම ශූන්‍ය නම් වේ.

කතමං බහිද්ධාසුඤ්ඤං, බහිද්ධා රූපා සුඤ්ඤා -පෙ- බහිද්ධා ධම්මා සුඤ්ඤා අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාම ධම්මෙන වා. ඉදං බහිද්ධා සුඤ්ඤං.

කතමං දුභතොසුඤ්ඤං, යඤ්ච අජ්ඣත්තං චක්ඛු යෙ ච බහිද්ධා රූපා උභයමෙතං[1] සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා, යඤ්ච අජ්ඣත්තං සොතං යෙ ච බහිද්ධා සද්දා -පෙ- යඤ්ච අජ්ඣත්තං ඝානං යෙ ච බහිද්ධා ගන්ධා -පෙ- යා ච අජ්ඣත්තා ජිව්හා යෙ ච බහිද්ධා රසා -පෙ- යො ච අජ්ඣත්තං කායො යෙ ච බහිද්ධා ඵොට්ඨබ්බා -පෙ- යො ච අජ්ඣත්තං මනො යෙ ච බහිද්ධා ධම්මා උභයමෙතං සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාම ධම්මෙන වා, ඉදං දුභතො සුඤ්ඤං.

කතමං සභාගසුඤ්ඤං; ඡ අජ්ඣත්තිකානි ආයතනානි සභාගානි චෙව සුඤ්ඤානි ච, ඡ බාහිරානි ආයතනානි සභාගානි චෙව සුඤ්ඤානි ච, ඡ විඤ්ඤාණකායා සභාගා චෙව සුඤ්ඤා ච, ඡ ඵස්සකායා සභාගා චෙව සුඤ්ඤා ච, ඡ වෙදනාකායා සභාගා චෙව සුඤ්ඤා ච, ඡ සඤ්ඤාකායා සභාගා චෙව සුඤ්ඤා ච, ඡ චෙතනා කායා සභාගා චෙව සුඤ්ඤා ච, ඉදං සභාගසුඤ්ඤං.

කතමං විසභාගසුඤ්ඤං; ඡ අජ්ඣත්තිකානි ආයතනානි ඡහි බාහිරෙහි ආයතනෙහි විසභාගානි චෙව සුඤ්ඤානි ච, ඡ බාහිරානි ආයතනානි ඡහි විඤ්ඤාණකායෙහි විසභාගානි චෙව සුඤ්ඤානි ච, ඡ විඤ්ඤාණකායා ඡහි ඵස්සායතනෙහි විසභාගා චෙව සුඤ්ඤා ච ඡ ඵස්සකායා ඡහි වෙදනාකායෙහි විසභාගා චෙව සුඤ්ඤා ච, ඡ වෙදනාකායා ඡහි සඤ්ඤාකායෙහි විසභාගා චෙව සුඤ්ඤා ච, ඡ සඤ්ඤාකායා ඡහි චෙතනාකායෙහි විසභාගා චෙව සුඤ්ඤා ච, ඉදං විසභාගසුඤ්ඤං.

කතමං එසනාසුඤ්ඤං: නෙක්ඛම්මෙසනා කාමච්ඡන්දෙන සුඤ්ඤා, අබ්‍යාපාදෙසනා බ්‍යාපාදෙන සුඤ්ඤා, ආලොකසඤ්ඤෙසනා ථිනමිද්ධෙන සුඤ්ඤා, අවික්ඛෙපෙසනා උද්ධච්චෙන සුඤ්ඤා, ධම්මවවත්ථානෙසනා විචිකිච්ඡාය සුඤ්ඤා, ඤාණෙසනා අවිජ්ජාය සුඤ්ඤා, පාමොජ්ජෙසනා අරතියා සුඤ්ඤා, පඨමජ්ඣානෙසනා නීවරණෙහි සුඤ්ඤා -පෙ- අරහත්ත-මග්ගෙසනා සබ්බකිලෙසෙහි සුඤ්ඤා, ඉදං එසනාසුඤ්ඤං.

කතමං පරිග්ගහසුඤ්ඤං: නෙක්ඛම්මපරිග්ගහො කාමච්ඡන්දෙන සුඤ්ඤො, අබ්‍යාපාදපරිග්ගහො බ්‍යාපාදෙන සුඤ්ඤො, ආලොකසඤ්ඤාපරිග්ගහො ථිනමිද්ධෙන සුඤ්ඤො, ධම්මවවත්ථානපරිග්ගහො විචිකිච්ඡාය සුඤ්ඤො, ඤාණපරිග්ගහො අවිජ්ජාය සුඤ්ඤො, පාමොජ්ජපරිග්ගහො අරතියා සුඤ්ඤො, පඨමජ්ඣානපරිග්ගහො නීවරණෙහි සුඤ්ඤො-පෙ- අරහත්තමග්ගපරිග්ගහො සබ්බකිලෙසෙහි සුඤ්ඤො, ඉදං පරිග්ගහසුඤ්ඤං.

1. උභයමෙතං තං - ස්‍යා,

බාහ්‍ය ශූන්‍ය නම් කවරේ යත්: බාහ්‍ය වූ රූපයෝ ... බාහ්‍ය වූ ධර්මයෝ ආත්ම හෙයිනුදු ආත්මීය හෙයිනුදු නිත්‍ය හෙයිනුදු ධ්‍රැව හෙයිනුදු ශාශ්වත හෙයිනුදු අවිපරිණාමස්වභාව හෙයිනුදු ශූන්‍යහ. මේ බාහ්‍ය ශූන්‍ය නම් වේ.

උභතෝ ශූන්‍ය නම් කවරේ යත්: යම් අධ්‍යාත්ම වූ චක්ෂුසෙකුත් යම් බාහ්‍ය වූ රූප කෙනෙකුත් වෙත් ද මේ දෙක ආත්මහෙයිනුදු ආත්මීයහෙයිනුදු නිත්‍ය හෙයිනුදු ධ්‍රැව හෙයිනුදු ශාශ්වත හෙයිනුදු අවිපරිණාමස්වභාව හෙයිනුදු ශූන්‍ය යැ. යම් අධ්‍යාත්ම වූ ශ්‍රොත්‍රයෙකුත් යම් බාහ්‍ය වූ ශබ්ද කෙනෙකුත් වෙත් ද .. යම් අධ්‍යාත්ම වූ ඝ්‍රාණයෙකුත් යම් බාහ්‍ය වූ ගන්ධ කෙනෙකුත් වෙත් ද ... යම් අධ්‍යාත්ම වූ ජිහ්වාවකුත් යම් බාහ්‍ය වූ රස කෙනෙකුත් වෙත් ද ... යම් අධ්‍යාත්ම වූ කයෙකුත් යම් බාහ්‍ය වූ ස්‍ප්‍රෂ්ටව්‍ය කෙනෙකුත් වෙත් ද ... යම් අධ්‍යාත්ම වූ මනසෙකුත් යම් බාහ්‍ය වූ ධර්ම කෙනෙකුත් වෙත් ද මේ දෙක ආත්ම හෙයිනුදු ආත්මීය හෙයිනුදු නිත්‍ය හෙයිනුදු ධ්‍රැව හෙයිනුදු ශාශ්වත හෙයිනුදු අවිපරිණාමස්වභාව හෙයිනුදු ශූන්‍ය යි. මේ උභතොශූන්‍ය නම් වේ.

සභාගශූන්‍ය නම් කවරේ යත්: ආධ්‍යාත්මික වූ ෂඩායතනයෝ සභාග ද ශූන්‍ය ද වෙති, බාහ්‍ය වූ ෂඩායතනයෝ සභාග ද ශූන්‍ය ද වෙති, ෂඩ්විඥාන-කායයෝ සභාග ද ශූන්‍ය ද වෙති, ෂට්ස්පර්ශකායයෝ සභාග ද ශූන්‍ය ද වෙති, ෂඩ්වේදනාකායයෝ සභාග ද ශූන්‍ය ද වෙති, ෂට්සංඥාකායයෝ සභාග ද ශූන්‍ය ද වෙති, ෂට්චෙතනාකායයෝ සභාග ද ශූන්‍ය ද වෙත්. මේ සභාගශූන්‍ය නම් වේ.

විසභාගශූන්‍ය නම් කවරේ යත්. ආධ්‍යාත්මික වූ ෂඩායතනයෝ බාහ්‍ය වූ ෂඩායතනයන් හා සමග විසභාග ද ශූන්‍ය ද වෙති, බාහ්‍ය වූ ෂඩායතනයෝ ෂඩ්විඥානකායයන් හා සමග විසභාග ද ශූන්‍ය ද වෙති, ෂඩ්විඥානකායයෝ ෂට්ස්පර්ශකායයන් හා සමග විසභාග ද ශූන්‍ය ද වෙති, ෂට්ස්පර්ශකායයෝ ෂඩ්වේදනාකායයන් හා සමග විසභාග ද ශූන්‍ය ද වෙති, ෂඩ්වේදනාකායයෝ ෂට්සංඥාකායයන් හා සමග විසභාග ද ශූන්‍ය ද වෙති, ෂට්සංඥාකායයෝ ෂට්චෙතනාකායයන් හා සමග විසභාග ද ශූන්‍ය ද වෙත්. මේ විසභාග ශූන්‍ය නම් වේ.

එෂණාශූන්‍ය නම් කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යෛෂණාව කාමච්ඡන්දයෙන් ශූන්‍යයැ, අව්‍යාපාදෛෂණාව ව්‍යාපාදයෙන් ශූන්‍ය යැ, ආලෝකසංඥෛෂණාව ථිනමිද්ධයෙන් ශූන්‍ය යැ, අවික්ෂෙපෛෂණාව ඖද්ධත්‍යයෙන් ශූන්‍ය යැ, ධර්මනිශ්චයෛෂණාව විචිකිත්සායෙන් ශූන්‍ය යැ, ඥානෛෂණාව අවිද්‍යායෙන් ශූන්‍ය යැ, ප්‍රාමොද්‍යෛෂණාව අරතියෙන් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යානෛෂණාව නීවරණ හෙයින් ශූන්‍ය යැ ... අර්හත්මාර්ගෛෂණාව හැම කෙලෙසුන්ගෙන් ශූන්‍ය යි මේ එෂණාශූන්‍ය නම් වේ.

පරිග්‍රහශූන්‍ය නම් කවරේ යත්. නෛෂ්ක්‍රම්‍යපරිග්‍රහය කාමච්ඡන්ද හෙයින් ශූන්‍ය යැ, අව්‍යාපාදපරිග්‍රහය ව්‍යාපාද හෙයින් ශූන්‍ය යැ, ආලෝක-සංඥාපරිග්‍රහය ථිනමිද්ධ හෙයින් ශූන්‍ය යැ, ධර්මනිශ්චයපරිග්‍රහය විචිකිත්සා හෙයින් ශූන්‍ය යැ, ඥානපරිග්‍රහය අවිද්‍යා හෙයින් ශූන්‍ය යැ, ප්‍රාමොද්‍යපරිග්‍රහය අරති හෙයින් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යානපරිග්‍රහය නීවරණ හෙයින් ශූන්‍ය යැ .. අර්හත්මාර්ගපරිග්‍රහය හැම කෙලෙස් හෙයින් ශූන්‍ය යි. මේ පරිග්‍රහ ශූන්‍ය නම් වේ.

කතමං පටිලාභසුඤ්ඤං, නෙක්ඛම්මපටිලාභො කාමච්ඡන්දෙන සුඤ්ඤො, අබ්‍යාපාදපටිලාභො බ්‍යාපාදෙන සුඤ්ඤො, ආලොකසඤ්ඤාපටිලාභො ථීනමිද්ධෙන සුඤ්ඤො, අවික්ඛෙපපටිලාභො උද්ධච්චෙන සුඤ්ඤො, ධම්මවවත්ථානපටිලාභො විචිකිච්ඡාය සුඤ්ඤො, ඤාණපටිලාභො අවිජ්ජාය සුඤ්ඤො, පාමොජ්ජපටිලාභො අරතියා සුඤ්ඤො, පඨමජ්ඣානපටිලාභො නීවරණෙහි සුඤ්ඤො -පෙ- අරහත්තමග්ගපටිලාභො සබ්බකිලෙසෙහි සුඤ්ඤො, ඉදං පටිලාභසුඤ්ඤං.

කතමං පටිවෙධසුඤ්ඤං: නෙක්ඛම්මපටිවෙධො කාමච්ඡන්දෙන සුඤ්ඤො, අබ්‍යාපාදපටිවෙධො බ්‍යාපාදෙන සුඤ්ඤො, ආලොකසඤ්ඤාපටිවෙධො ථීනමිද්ධෙන සුඤ්ඤො, අවික්ඛෙපපටිවෙධො උද්ධච්චෙන සුඤ්ඤො, ධම්මවවත්ථානපටිවෙධො විචිකිච්ඡාය සුඤ්ඤො, ඤාණපටිවෙධො අවිජ්ජාය සුඤ්ඤො, පාමොජ්ජපටිවෙධො අරතියා සුඤ්ඤො, පඨමජ්ඣානපටිවෙධො නීවරණෙහි සුඤ්ඤො -පෙ- අරහත්තමග්ගපටිවෙධො සබ්බකිලෙසෙහි සුඤ්ඤො, ඉදං පටිවෙධසුඤ්ඤං.

කතමං එකත්තසුඤ්ඤං නානත්තසුඤ්ඤං: කාමච්ඡන්දො නානත්තං, නෙක්ඛම්මං එකත්තං, නෙක්ඛම්මෙකත්තං චෙතයතො කාමච්ඡන්දෙන සුඤ්ඤං, බ්‍යාපාදො නානත්තං අබ්‍යාපාදො එකත්තං, අබ්‍යාපාදෙකත්තං චෙතයතො බ්‍යාපාදෙන සුඤ්ඤං, ථීනමිද්ධං නානත්තං, ආලොකසඤ්ඤා එකත්තං, ආලොකසඤ්ඤෙකත්තං චෙතයතො ථීනමිද්ධෙන සුඤ්ඤං, උද්ධච්චං නානත්තං, අවික්ඛෙපො එකත්තං, අවික්ඛෙපෙකත්තං චෙතයතො උද්ධච්චෙන සුඤ්ඤං, විචිකිච්ඡා නානත්තං, ධම්මවවත්ථානං එකත්තං, ධම්මවවත්ථානෙකත්තං චෙතයතො විචිකිච්ඡාය සුඤ්ඤං, අවිජ්ජා නානත්තං ඤාණං එකත්තං, ඤාණෙකත්තං චෙතයතො අවිජ්ජාය සුඤ්ඤං, අරති නානත්තං, පාමොජ්ජං එකත්තං, පාමොජ්ජෙකත්තං චෙතයතො අරතියා සුඤ්ඤං, නීවරණං නානත්තං, පඨමජ්ඣානං එකත්තං, පඨමජ්ඣානෙකත්තං චෙතයතො නීවරණෙහි සුඤ්ඤං-පෙ- සබ්බකිලෙසා නානත්තං, අරහත්තමග්ගො එකත්තං, අරහත්තමග්ගෙකත්තං චෙතයතො සබ්බකිලෙසෙහි සුඤ්ඤං, ඉදං එකත්තසුඤ්ඤං, නානත්තසුඤ්ඤං.

කතමං ඛන්තිසුඤ්ඤං: නෙක්ඛම්මඛන්ති කාමච්ඡන්දෙන සුඤ්ඤා, අබ්‍යාපාදඛන්ති බ්‍යාපාදෙන සුඤ්ඤා, ආලොකසඤ්ඤාඛන්ති ථීනමිද්ධෙන සුඤ්ඤා, අවික්ඛෙපඛන්ති උද්ධච්චෙන සුඤ්ඤා, ධම්මවවත්ථානඛන්ති විචිකිච්ඡාය සුඤ්ඤා, ඤාණඛන්ති අවිජ්ජාය සුඤ්ඤා, පාමොජ්ජඛන්ති අරතියා සුඤ්ඤා, පඨමජ්ඣානඛන්ති නීවරණෙහි සුඤ්ඤා, -පෙ- අරහත්තමග්ගඛන්ති සබ්බකිලෙසෙහි සුඤ්ඤා, ඉදං ඛන්තිසුඤ්ඤං.

කතමං අධිට්ඨානසුඤ්ඤං, නෙක්ඛම්මාධිට්ඨානං කාමච්ඡන්දෙන සුඤ්ඤං, අබ්‍යාපාදාධිට්ඨානං බ්‍යාපාදෙන සුඤ්ඤං, ආලොකසඤ්ඤාධිට්ඨානං ථීනමිද්ධෙන සුඤ්ඤං, අවික්ඛෙපාධිට්ඨානං උද්ධච්චෙන සුඤ්ඤං, ධම්මවවත්ථානාධිට්ඨානං විචිකිච්ඡාය සුඤ්ඤං ඤාණාධිට්ඨානං අවිජ්ජාය සුඤ්ඤං, පාමොජ්ජාධිට්ඨානං අරතියා සුඤ්ඤං, පඨමජ්ඣානාධිට්ඨානං නීවරණෙහි සුඤ්ඤං -පෙ- අරහත්තමග්ගාධිට්ඨානං සබ්බකිලෙසෙහි සුඤ්ඤං, ඉදං අධිට්ඨානසුඤ්ඤං.

ප්‍රතිලාභශූන්‍ය නම් කවරැ යත්: නෛෂ්ක්‍රම්‍යප්‍රතිලාභය කාමච්ඡන්දයෙන් ශූන්‍ය යැ, අව්‍යාපාදප්‍රතිලාභය ව්‍යාපාදයෙන් ශූන්‍ය යැ, ආලෝකසංඥාප්‍රතිලාභය ථිනමිද්ධයෙන් ශූන්‍ය යැ, අවික්ෂේපප්‍රතිලාභය ඖද්ධත්‍යයෙන් ශූන්‍ය යැ, ධර්මනිශ්චයප්‍රතිලාභය විචිකිත්සායෙන් ශූන්‍ය යැ, ඥානප්‍රතිලාභය අවිද්‍යායෙන් ශූන්‍ය යැ, ප්‍රාමෝද්‍යප්‍රතිලාභය අරතියෙන් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යානප්‍රතිලාභය නීවරණයන්ගෙන් ශූන්‍ය යැ ... අර්හත්මාර්ගප්‍රතිලාභය හැම කෙලෙසුන්ගෙන් ශූන්‍ය යි මේ ප්‍රතිලාභශූන්‍ය නම් වේ.

ප්‍රතිවේධශූන්‍ය නම් කවරැ යත්: නෛෂ්ක්‍රම්‍යප්‍රතිවේධය කාමච්ඡන්දයෙන් ශූන්‍ය යැ, අව්‍යාපාදප්‍රතිවේධය ව්‍යාපාදයෙන් ශූන්‍ය යැ, ආලෝකසංඥාප්‍රතිවේධය ථිනමිද්ධයෙන් ශූන්‍ය යැ, අවික්ෂේපප්‍රතිවේධය ඖද්ධත්‍යයෙන් ශූන්‍ය යැ, ධර්මනිශ්චයප්‍රතිවේධය විචිකිත්සායෙන් ශූන්‍ය යැ, ඥානප්‍රතිවේධය අවිද්‍යායෙන්ශූන්‍ය යැ, ප්‍රාමෝද්‍යප්‍රතිවේධය අරතියෙන් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යානප්‍රතිවේධය නීවරණයන්ගෙන් ශූන්‍ය යැ ... අර්හත්මාර්ගප්‍රතිවේධය හැම කෙලෙසුන්ගෙන් ශූන්‍ය යි. මේ ප්‍රතිවේධශූන්‍ය නම් වේ.

එකත්වශූන්‍ය නම්, නානාත්වශූන්‍ය නම් කවරැ යත්. කාමච්ඡන්දය (ශාන්තවෘත්ති නැති බැවින්) නානාත්ව යැ, නෛෂ්ක්‍රම්‍යය (ශාන්තවෘත්ති බැවින්) ඒකත්ව යි. නෛෂ්ක්‍රම්‍යසඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට කාමච්ඡන්ද විසින් ශූන්‍ය යැ, ව්‍යාපාදය නානාත්ව යැ, අව්‍යාපාදය ඒකත්ව යි. අව්‍යාපාද සඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට ව්‍යාපාද විසින් ශූන්‍ය යැ. ථිනමිද්ධය නානාත්ව යැ, ආලෝකසංඥාව ඒකත්ව යි. ආලෝකසංඥා සඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට ථිනමිද්ධ විසින් ශූන්‍ය යැ. ඖද්ධත්‍යය නානාත්ව යැ, අවික්ෂේපය එකත්ව යි. අවික්ෂේප සඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට ඖද්ධත්‍ය විසින් ශූන්‍ය යැ. විචිකිත්සාව නානාත්ව යැ, ධර්මනිශ්චය ඒකත්ව යි. ධර්මනිශ්චය සඞ්ඛ්‍යාත එකත්වය සිතනුවහට විචිකිත්සා විසින් ශූන්‍ය යැ අවිද්‍යාව නානාත්ව යැ, ඥානය ඒකත්ව යි. ඥාන සඞ්ඛ්‍යාත එකත්වය සිතනුවහට අවිද්‍යා විසින් ශූන්‍ය යැ. අරතිය නානාත්ව යැ, ප්‍රාමෝද්‍යය එකත්ව යි. ප්‍රාමෝද්‍ය සඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට අරති විසින් ශූන්‍ය යැ. නීවරණයෝ නානාත්ව යැ, ප්‍රථමධ්‍යානය ඒකත්ව යි. ප්‍රථමධ්‍යාන සඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට නීවරණ විසින් ශූන්‍ය යැ ... හැම කෙලෙස්හු නානාත්ව යැ. අර්හත්මාර්ගය එකත්ව යි. අර්හත්මාර්ග සඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට හැම කෙලෙසුන් විසින් ශූන්‍ය යි. මේ එකත්වශූන්‍ය නම් නානාත්වශූන්‍ය නම් වේ.

ක්ෂාන්තිශූන්‍ය නම් කවරැ යත්: නෛෂ්ක්‍රම්‍යක්ෂාන්තිය කාමච්ඡන්ද විසින් ශූන්‍ය යැ, අව්‍යාපාදක්ෂාන්තිය ව්‍යාපාද විසින් ශූන්‍ය යැ, ආලෝකසංඥාක්ෂාන්තිය ථිනමිද්ධ විසින් ශූන්‍ය යැ, අවික්ෂේපක්ෂාන්තිය ඖද්ධත්‍ය විසින් ශූන්‍ය යැ, ධර්මනිශ්චයක්ෂාන්තිය විචිකිත්සා විසින් ශූන්‍ය යැ, ඥානක්ෂාන්තිය අවිද්‍යා විසින් ශූන්‍ය යැ, ප්‍රාමෝද්‍යක්ෂාන්තිය අරති විසින් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යාන ක්ෂාන්තිය නීවරණ විසින් ශූන්‍ය යැ ... අර්හත්මාර්ගක්ෂාන්තිය හැම කෙලෙසුන් විසින් ශූන්‍ය යි. මේ ක්ෂාන්තිශූන්‍ය නම් වේ.

අධිෂ්ඨානශූන්‍ය නම් කවරැ යත්: නෛෂ්ක්‍රම්‍යාධිෂ්ඨානය කාමච්ඡන්ද විසින් ශූන්‍ය යැ, අව්‍යාපාදාධිෂ්ඨානය ව්‍යාපාද විසින් ශූන්‍ය යැ, ආලෝකසංඥාධිෂ්ඨානය ථිනමිද්ධ විසින් ශූන්‍ය යැ, අවික්ෂේපාධිෂ්ඨානය ඖද්ධත්‍ය විසින් ශූන්‍ය යැ, ධර්මනිශ්චයාධිෂ්ඨානය විචිකිත්සා විසින් ශූන්‍ය යැ, ඥානාධිෂ්ඨානය අවිද්‍යා විසින් ශූන්‍ය යැ, ප්‍රාමෝද්‍යාධිෂ්ඨානය අරති විසින් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යානාධිෂ්ඨානය නීවරණ විසින් ශූන්‍ය යැ ... අර්හත්මාර්ගාධිෂ්ඨානය හැම කෙලෙසුන් විසින් ශූන්‍ය යි මේ අධිෂ්ඨානශූන්‍ය නම් වේ

කතමං පරියොගාහනසුඤ්ඤං, නෙක්ඛම්මපරියොගාහනං කාමච්ඡන්දෙන සුඤ්ඤං, අබ්‍යාපාදපරියොගාහනං බ්‍යාපාදෙන සුඤ්ඤං, ආලොකසඤ්ඤාපරියොගාහනං ථිනමිද්ධෙන සුඤ්ඤං, අවික්ඛෙපපරියොගාහනං උද්ධච්චෙන සුඤ්ඤං, ධම්මවවත්ථානපරියොගාහනං විචිකිච්ඡාය සුඤ්ඤං, ඤාණපරියොගාහනං අවිජ්ජාය සුඤ්ඤං, පාමොජ්ජපරියොගාහනං අරතියා සුඤ්ඤං, පඨමජ්ඣානපරියොගාහනං නීවරණෙහි සුඤ්ඤං, -පෙ- අරහත්තමග්ගපරියොගාහනං සබ්බකිලෙසෙහි සුඤ්ඤං, ඉදං පරියොගාහනසුඤ්ඤං.

කතමං සම්පජානස්ස පවත්තපරියාදානං සබ්බසුඤ්ඤතානං පරමත්ථසුඤ්ඤං: ඉධ සම්පජානො නෙක්ඛම්මෙන කාමච්ඡන්දස්ස පවත්තං පරියාදියති, අබ්‍යාපාදෙන බ්‍යාපාදස්ස පවත්තං පරියාදියති, ආලොකසඤ්ඤාය ථිනමිද්ධස්ස පවත්තං පරියාදියති, අවික්ඛෙපෙන උද්ධච්චස්ස පවත්තං පරියාදියති, ධම්මවවත්ථානෙන විචිකිච්ඡාය පවත්තං පරියාදියති, ඤාණෙන අවිජ්ජාය පවත්තං පරියාදියති, පාමොජ්ජෙන අරතියා පවත්තං පරියාදියති, පඨමෙන ඣානෙන නීවරණානං පවත්තං පරියාදියති, -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසානං පවත්තං පරියාදියති.

අථ වා පන සම්පජානස්ස අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්තස්ස ඉදං චෙව චක්ඛුපවත්තං පරියාදියති, අඤ්ඤං ච චක්ඛුපවත්තං න උප්පජ්ජති, ඉදං චෙව සොතපවත්තං-පෙ- ඝානපවත්තං -පෙ- ජිව්හාපවත්තං -පෙ- කායපවත්තං -පෙ- මනොපවත්තං පරියාදියති, අඤ්ඤං ච මනොපවත්තං න උප්පජ්ජති, ඉදං සම්පජානස්ස පවත්තපරියාදානං සබ්බසුඤ්ඤතානං පරමත්ථසුඤ්ඤන්ති.

සුඤ්ඤකථා සමත්තා.

යුගනද්ධවග්ගො දුතියො.

තස්සුද්දානං:

යුගනද්ධා සච්චබොජ්ඣඞ්ගා
මෙත්තාවිරාගපඤ්චමා,
පටිසම්භිදා ධම්මචක්කං
ලොකුත්තරබලසුඤ්ඤා'ති

එස නිකායධරෙහි ඨපිතො
අසමො දුතියො පවරො වරවග්ගො'ති.

පර්‍ය්‍යාවගාහණශූන්‍ය නම් කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යයෙහි බැසගැනීම කාමච්ඡන්ද විසින් ශූන්‍ය යැ, අව්‍යාපාදයෙහි බැසගැනීම ව්‍යාපාද විසින් ශූන්‍ය යැ, ආලෝකසංඥායෙහි බැසගැනීම ථිනමිද්ධ විසින් ශූන්‍ය යැ, අවික්ෂෙපයෙහි බැසගැනීම ඖද්ධත්‍ය විසින් ශූන්‍ය යැ, ධර්මනිශ්චයෙහි බැස-ගැනීම විචිකිත්සා විසින් ශූන්‍ය යැ, ඥානයෙහි බැසගැනීම අවිද්‍යා විසින් ශූන්‍ය යැ, ප්‍රාමොද්‍යයෙහි බැසගැනීම අරති විසින් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යානයෙහි බැසගැනීම නීවරණ විසින් ශූන්‍ය යැ ... අර්හත්මාර්ගයෙහි බැසගැනීම හැම කෙලෙසුන් විසින් ශූන්‍ය යි. මේ පර්‍ය්‍යවගාහණශූන්‍ය යි.

සම්‍යග්ඥාන සමන්‍වාගතයා (රහත්හු)ගේ හැම ශූන්‍යතයන් අතුරින් පරමාර්ථශූන්‍ය වූ ප්‍රවෘත්තික්ෂය (අනුපාදපරිනිර්වාණය) කවරේ යත්: මෙ සසුන්හි සම්‍යග්ඥානසමන්‍වාගත වූයේ නෛෂ්ක්‍රම්‍ය හේතුකොටගෙන කාමච්ඡන්දයාගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, අව්‍යාපාදය හේතුකොටගෙන ව්‍යාපාදයාගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, ආලොකසංඥාව හේතුකොටගෙන ථිනමිද්ධයාගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, අවික්ෂෙපය හේතුකොටගෙන ඖද්ධත්‍යයාගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, ධර්මනිශ්චය හේතුකොටගෙන විචිකිත්සාවගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, ඥානය හේතුකොටගෙන අවිද්‍යාවගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, ප්‍රාමොද්‍යය හේතුකොටගෙන අරතියගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, ප්‍රථමධ්‍යානය හේතුකොටගෙන නීවරණයන්ගේ පැවැත්ම ක්ෂය කෙරෙයි ... අර්හත්මාර්ගය හේතුකොටගෙන හැම කෙලෙසුන්ගේ පැවැත්ම ක්ෂය කෙරේ.

තවද සම්‍යග්ඥාන ඇත්තහු අනුපාදිශෙෂපරිනිර්වාණධාතුයෙන් පිරිනි-වෙන්නහුට මේ චක්ෂුඃප්‍රවෘත්තිය ද ක්ෂය වෙයි. අන්‍ය චක්ෂුඃප්‍රවෘත්තියෙ-කුදු නූපදී. මේ ශ්‍රොත්‍රප්‍රවෘත්තිය ද ... ඝ්‍රාණප්‍රවෘත්තිය ද ... ජිහ්වාප්‍රවෘත්ති-ය ද ... කායප්‍රවෘත්තිය ද ... මනඃප්‍රවෘත්තිය ද ක්ෂය වෙයි, අන්‍ය වූ මනඃප්‍රවෘත්තියෙකුදු නූපදී. මේ සම්‍යග්ඥානසමන්‍වාගතයාගේ හැම ශූන්‍යතයන් අතුරින් පරමාර්ථශූන්‍ය වූ ප්‍රවෘත්තික්ෂය නම් වේ යයි.

**ශූන්‍යතාකථා නිමි.**

**දෙවැනි යුගනද්ධවර්ග යි.**

**එහි උද්දානය:**

යුගනද්ධ කථා යැ, සත්‍ය කථා යැ, බොධ්‍යඞ්ග කථා යැ, මෛත්‍රී කථා යැ, පස් වැනි වූ විරාග කථා යැ, ප්‍රතිසංවිත් කථා යැ, ධර්මචක්‍ර කථා යැ, ලොකොත්තර කථා යැ, බල කථා යැ, ශූන්‍ය කථා යැ' යි.

# 3. පඤ්ඤාවග්ගො

## 3. 1.

## පඤ්ඤාකථා

අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති. -පෙ- පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති:

අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා නිබ්බෙධිකපඤ්ඤං පරිපූරෙති, අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා මහාපඤ්ඤං පරිපූරෙති, නිබ්බිදානුපස්සනා භාවිතා බහුලීකතා තික්ඛපඤ්ඤං පරිපූරෙති, විරාගානුපස්සනා භාවිතා බහුලීකතා විපුලපඤ්ඤං පරිපූරෙති, නිරොධානුපස්සනා භාවිතා බහුලීකතා ගම්භීරපඤ්ඤං පරිපූරෙති, පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා අසාමන්තපඤ්ඤං පරිපූරෙති. ඉමා සත්ත පඤ්ඤා භාවිතා බහුලීකතා පණ්ඩිච්චං පරිපූරෙන්ති. ඉමා අට්ඨ පඤ්ඤා භාවිතා බහුලීකතා පුථුපඤ්ඤං පරිපූරෙන්ති. ඉමා නව පඤ්ඤා භාවිතා බහුලීකතා හාසපඤ්ඤං පරිපූරෙන්ති.

හාසපඤ්ඤා පටිභානපටිසම්භිදා, තස්ස.[1] අත්ථවවත්ථානතො අත්ථපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, ධම්මවවත්ථානතො ධම්මපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, නිරුත්තිවවත්ථානතො නිරුත්තිපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය. පටිභානවවත්ථානතො පටිභානපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, තස්සිමා චතස්සො පටිසම්භිදායො අධිගතා හොන්ති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය.

රූපෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති -පෙ- රූපෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති:

රූපෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති -පෙ- රූපෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා අසාමන්තපඤ්ඤං පරිපූරෙති. ඉමා සත්ත පඤ්ඤා භාවිතා බහුලීකතා පණ්ඩිච්චං පරිපූරෙන්ති, ඉමා අට්ඨ පඤ්ඤා භාවිතා බහුලීකතා පුථුපඤ්ඤං පරිපූරෙන්ති, ඉමා නව පඤ්ඤා භාවිතා බහුලීකතා හාසපඤ්ඤං පරිපූරෙන්ති

# 3. ප්‍රඥා වර්ගය

## 3. 1.

## ප්‍රඥා කථා

අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, දුක්ඛානුපස්සනාව වඩනා ලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අනත්තානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද ... පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද යත්:

අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, දුක්ඛානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී නිබ්බෙධිකප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අනත්තානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී මහාප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, නිබ්බිදානුපස්සනාව වඩනා ලද්දී පුනපුනා කරනලද්දී තීක්ෂණප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි. විරාගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා වඩනාලද්දී විපුලප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, නිරොධානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ගම්භීරප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී අසාමන්තප්‍රඥාව පරිපූර්ණ කෙරේ. මේ සප්තප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු පාණ්ඩිත්‍යය පරිපූර්ණ කෙරෙති, මේ අෂ්ටප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු පෘථුප්‍රඥාව පරිපූර්ණ කෙරෙති. මේ නවප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු හාසප්‍රඥාව පරිපූර්ණ කෙරෙත්:

හාසප්‍රඥාව ප්‍රතිභානප්‍රතිසංවිදා යැ. ඒ ආර්‍ය්‍යපුද්ගල විසින් (යථොක්ත) අර්ථනිශ්චය කිරීම් වශයෙන් අර්ථප්‍රතිසංවිද්ඥානය ලබනලද සාක්ෂාත් කරනලද ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද වෙයි ධර්මනිශ්චය කිරීම් වශයෙන් ධර්මප්‍රතිසංවිද්ඥානය ලබනලද සාක්ෂාත් කරනලද ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද වෙයි. නිරුක්තිනිශ්චය කිරීම් වශයෙන් නිරුක්තිප්‍රතිසංවිද්ඥානය ලබනලද සාක්ෂාත් කරන ලද ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද වෙයි ප්‍රතිභානනිශ්චය කිරීම් වශයෙන් ප්‍රතිභානප්‍රතිසංවිද්ඥානය ලබනලද සාක්ෂාත් කරනලද ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද වෙයි. ඔහු විසින් මේ සතර ප්‍රතිසංවිද්හු ලබනලද සාක්ෂාත් කරනලද ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද වෙත්.

රූපයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී බහුල කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, ... රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී බහුල කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද යත්:

රූපයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී බහුල කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි ... රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී බහුල කරනලද්දී අසාමන්තප්‍රඥාව පරිපූර්ණ කෙරේ. මේ සප්තප්‍රඥාවෝ වඩනාලද්දාහු බහුල කරනලද්දාහු පාණ්ඩිත්‍යය පරිපූර්ණ කෙරෙති, මේ අෂ්ටප්‍රඥාවෝ වඩනාලද්දාහු බහුල කරනලද්දාහු පෘථුප්‍රඥාව පරිපූර්ණ කෙරෙති, මේ නවප්‍රඥාවෝ වඩනාලද්දාහු බහුල කරනලද්දාහු හාසප්‍රඥාව පරිපූර්ණ කෙරෙත්.

හාසපඤ්ඤා පටිභානපටිසම්භිදා තස්ස[1] අත්ථවවත්ථානතො අත්ථපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, ධම්මවවත්ථානතො ධම්මපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, නිරුත්තිවවත්ථානතො නිරුත්තිපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, පටිභානවවත්ථානතො පටිභානපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, තස්සිමා චතස්සො පටිසම්භිදායො අධිගතා හොන්ති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති -පෙ- ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති: ජරාමරණෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති -පෙ- ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා අසාමන්තපඤ්ඤං පරිපූරෙති, ඉමා සත්ත පඤ්ඤා භාවිතා බහුලීකතා පණ්ඩිච්චං පරිපූරෙන්ති, ඉමා අට්ඨ පඤ්ඤා භාවිතා බහුලීකතා පුථුපඤ්ඤං පරිපූරෙන්ති. ඉමා නව පඤ්ඤා භාවිතා බහුලීකතා හාසපඤ්ඤං පරිපූරෙන්ති.

හාසපඤ්ඤා පටිභානපටිසම්භිදා, තස්ස අත්ථවවත්ථානතො අත්ථපටිසම්භිදා භාවිතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, ධම්මවවත්ථානතො ධම්මපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, නිරුත්තිවවත්ථානතො නිරුත්තිපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, පටිභානවවත්ථානතො පටිභානපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, තස්සිමා චතස්සො පටිසම්භිදායො අධිගතා හොන්ති සච්ඡිකතා පස්සිතා පඤ්ඤාය.

රූපෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, රූපෙ දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති: රූපෙ අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති: අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, රූපෙ නිබ්බිදානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ නිබ්බිදානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති: රූපෙ විරාගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ විරාගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, රූපෙ නිරොධානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ නිරොධානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, රූපෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති:

---
1 තස්සා - මජසං, තස්ස PTS

හාසප්‍රඥාව ප්‍රතිභානප්‍රතිසංවිදා යැ, ඒ ආර්‍යපුද්ගල විසින් අර්ථනිශ්චය කිරීම් වශයෙන් අර්ථප්‍රතිසංවිද්ඥානය ලබනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. ධර්මනිශ්චය කිරීම් වශයෙන් ධර්මප්‍රතිසංවිද්ඥානය ලබනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. නිරුක්තිනිශ්චය කිරීම් වශයෙන් නිරුක්තිප්‍රතිසංවිද්ඥානය ලබනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. ප්‍රතිභානනිශ්චය කිරීම් වශයෙන් ප්‍රතිභාන ප්‍රතිසංවිද්ඥානය ලබනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. ඔහු විසින් මේ සතර ප්‍රතිසංවිද්හු ලබනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙත්.

වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද ... ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද යත්: ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි ... ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී අසාමන්තප්‍රඥාව පරිපූර්ණ කෙරේ. මේ සප්තප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු පණ්ඩිත බව පරිපූර්ණ කෙරෙති. මේ අෂ්ටප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු පෘථුප්‍රඥාව පරිපූර්ණ කෙරෙති. මේ නවප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු හාසප්‍රඥාව පරිපූර්ණ කෙරෙත්.

හාසප්‍රඥාව ප්‍රතිභානප්‍රතිසංවිදා යැ. ඒ ආර්‍යපුද්ගල විසින් අර්ථනිශ්චය කිරීම් වශයෙන් අර්ථප්‍රතිසංවිද්ඥානය වඩනාලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. ධර්මනිශ්චය කිරීම් වශයෙන් ධර්මප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. නිරුක්තිනිශ්චය කිරීම් වශයෙන් නිරුක්තිප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. ප්‍රතිභානනිශ්චය කිරීම් වශයෙන් ප්‍රතිභානප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වේ. ඔහු විසින් මේ සතර ප්‍රතිසංවිද්හු අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙත්.

රූපයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත අනාගත-ප්‍රත්‍යුත්පන්නරූපයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, රූපයෙහි දුක්ඛානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත-අනාගත ප්‍රත්‍යුත්පන්නරූපයෙහි දුක්ඛානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, රූපයෙහි අනත්තානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්නරූපයෙහි අනත්තානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, රූපයෙහි නිබ්බිදානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි නිබ්බිදානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, රූපයෙහි විරාගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි විරාගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, රූපයෙහි නිරෝධානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි නිරෝධානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්නරූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද යත්:

රූපෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, රූපෙ දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා නිබ්බෙධිකපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති. රූපෙ අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා මහාපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති. රූපෙ නිබ්බිදානුපස්සනා භාවිතා බහුලීකතා තික්ඛපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ නිබ්බිදානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, රූපෙ විරාගානුපස්සනා භාවිතා බහුලීකතා විපුලපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ විරාගානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, රූපෙ නිරොධානුපස්සනා භාවිතා බහුලීකතා ගම්භීරපඤ්ඤං පරිපූරෙති. අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ නිරොධානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, රූපෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා අසාමන්තපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, ඉමා සත්ත පඤ්ඤා භාවිතා බහුලීකතා පණ්ඩිච්චං පරිපූරෙන්ති, ඉමා අට්ඨපඤ්ඤා භාවිතා බහුලීකතා පුථුපඤ්ඤං පරිපූරෙන්ති, ඉමා නව පඤ්ඤා භාවිතා බහුලීකතා හාසපඤ්ඤං පරිපූරෙන්ති.

හාසපඤ්ඤා පටිභානපටිසම්භිදා, තස්ස අත්ථවවත්ථානතො අත්ථපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, ධම්මවවත්ථානතො ධම්මපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, නිරුත්තිවවත්ථානතො නිරුත්තිපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, පටිභානවවත්ථානතො පටිභානපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, තස්සිමා චතස්සො පටිසම්භිදායො අධිගතා හොන්ති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ ජරාමරණෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, -පෙ- ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති:

ජරාමරණෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ ජරාමරණෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකා ජවනපඤ්ඤං පරිපූරෙති -පෙ- තස්සිමා චතස්සො පටිසම්භිදායො අධිගතා හොන්ති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය.

රූපයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, රූපයෙහි දුක්ඛානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී නිර්වේධික (ප්‍රණිධිවිදාරණ) ප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි දුක්ඛානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, රූපයෙහි අනත්තානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරන ලද්දී මහාප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි අනත්තානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, රූපයෙහි නිබ්බිදානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී තීක්ෂණප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි නිබ්බිදානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, රූපයෙහි විරාගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී විපුලප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි විරාගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, රූපයෙහි නිරෝධානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ගම්භීරප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි නිරෝධානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී අසාමන්තප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත-අනාගත ප්‍රත්‍යුත්පන්න රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරේ මේ සප්තප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරන ලද්දාහු පණ්ඩිත බව පරිපූර්ණ කෙරෙති. මේ අෂ්ටප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු පෘථුප්‍රඥාව පරිපූර්ණ කෙරෙති. මේ නවප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු හාසප්‍රඥාව පරිපූර්ණ කෙරෙත්.

හාසප්‍රඥාව ප්‍රතිභානප්‍රතිසංවිද යෑ ඒ ආර්‍ය්‍යපුද්ගල විසින් අර්ථනිශ්චය කිරීම් වශයෙන් අර්ථප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි, ධර්මනිශ්චය කිරීම් වශයෙන් ධර්මප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි, නිරුක්තිනිශ්චය කිරීම් වශයෙන් නිරුක්තිප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි, ප්‍රතිභානනිශ්චය කිරීම් වශයෙන් ප්‍රතිභානප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වේ. ඔහු විසින් මේ සතර ප්‍රතිසංවිද්හු අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙත්.

වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද; අතීත-අනාගත-වර්තමාන වූ ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද ... ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත - අනාගත - වර්තමාන වූ ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද යත්:

ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත-අනාගත-වර්තමාන වූ ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි ... ඔහු විසින් මේ සතර ප්‍රතිසංවිද්හු අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙත්.

"චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා සොතාපත්තිඵල-සච්ඡිකිරියාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො, සද්ධම්මසවනං[1] යොනිසොමනසිකාරො, ධම්මානුධම්මපටිපත්ති, ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සොතාපත්තිඵල-සච්ඡිකිරියාය සංවත්තන්ති.

චත්තාරො මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා සකදාගාමිඵල-සච්ඡිකිරියාය සංවත්තන්ති -පෙ- අනාගාමිඵලසච්ඡිකිරියාය සංවත්තන්ති -පෙ- අරහත්තඵලසච්ඡිකිරියාය සංවත්තන්ති, කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො, සද්ධම්මසවනං,[1] යොනිසොමනසිකාරො, ධම්මානු-ධම්මපටිපත්ති, ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා අරහත්තඵල[2] සච්ඡිකිරියාය සංවත්තන්ති.

චත්තාරො'මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාපටිලාභාය සංවත්තන්ති -පෙ- පඤ්ඤාවුද්ධියා[3] සංවත්තන්ති -පෙ- පඤ්ඤාවෙපුල්ලාය සංවත්තන්ති -පෙ- මහාපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- පුථුපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- විපුලපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- ගම්භීරපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- අසාමන්තපඤ්ඤතාය[4] සංවත්තන්ති -පෙ-භූරිපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- පඤ්ඤාබාහුල්ලාය සංවත්තන්ති -පෙ- සීඝපඤ්ඤතාය ලහුපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- හාසපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- සංවත්තන්ති -පෙ ජවනපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- තික්ඛපඤ්ඤතාය සංවත්තන්ති-පෙ-නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො, සද්ධම්මසවනං,[1] යොනිසොමනසිකාරො, ධම්මානුධම්ම-පටිපත්ති, ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාපටිලාභාය සංවත්තන්ති, පඤ්ඤාවුද්ධියා සංවත්තන්ති -පෙ- නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තන්ති". ස.

පඤ්ඤාපටිලාභාය සංවත්තන්තීති කතමො පඤ්ඤාපටිලාභො: චතුන්නං මග්ගඤාණානං චතුන්නං ඵලඤාණානං චතුන්නං පටිසම්භිදාඤාණානං ඡන්නං අභිඤ්ඤාඤාණානං තෙසත්තතීනං ඤාණානං සත්තසත්තතීනං ඤාණානං ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵස්සනා සච්ඡිකිරියා උපසම්පදා. පඤ්ඤා-පටිලාභාය සංවත්තන්තීති අයං පඤ්ඤාපටිලාභො.

පඤ්ඤාවුද්ධියං[3] සංවත්තන්තීති කතමා පඤ්ඤාවුද්ධි: සත්තන්නඤ්ච සෙඛානං පුථුජ්ජනකල්‍යාණකස්ස ච පඤ්ඤා වඩ්ඪති, අරහතො පඤ්ඤා වඩ්ඪිතවඩ්ඪනා, පඤ්ඤාවුද්ධියා[3] සංවත්තන්තීති අයං පඤ්ඤාවුද්ධි[5]

පඤ්ඤාවෙපුල්ලාය සංවත්තන්තීති කතමං පඤ්ඤාවෙපුල්ලං: සත්තන්නං සෙක්ඛානං පුථුජ්ජනකල්‍යාණකස්ස ච පඤ්ඤා වෙපුල්ලං ගච්ඡති, අරහතො පඤ්ඤා වෙපුල්ලං ගතා,[6] පඤ්ඤාවෙපුල්ලාය සංවත්තන්තීති ඉදං පඤ්ඤා-වෙපුල්ලං,

---

1 සද්ධම්මස්සවනං - මජසං,
2. අරහත්තමග්ගඵල - මජසං,
3. පඤ්ඤාබුද්ධියා-මජසං, PTS පඤ්ඤාබුඩ්ඪියා - සතං,
4. අසාමන්තපඤ්ඤතාය - සතං, PTS.
5. පඤ්ඤාබුද්ධි මජසං, PTS, පඤ්ඤාබුඩ්ඪි - සතං,
6. වෙපුල්ලගතා - මජසං, වෙපුල්ලතා සතං, වෙපුල්ලගතා වෙපුල්ලතං PTS,
ස. සොතාපත්ති සංයුත්ත

මහණෙනි, මේ ධර්මයෝ සතර දෙනෙක් වඩනාලද්දාහු පුනපුනා කරන ලද්දාහු සෝවාන්ඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවතිත්. කවර සතර ධර්ම කෙනෙකැ යත්: සත්පුරුෂසංසෙවන යැ සද්ධර්මශ්‍රවණ යැ යොනිසොමනස්කාර යැ ධර්මානුධර්මප්‍රතිපත්ති යැ යි. මහණෙනි, මේ සතර ධර්මයෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු සෝවාන්ඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවතිත්.

මහණෙනි, මේ සතර ධර්ම කෙනෙක් වඩනාලද්දාහු පුනපුනා කරන ලද්දාහු සකෘදාගාමිඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවතිත් අනාගාමි ඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවතිත් ... අර්හත්ඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවතිත්. කවර සතර ධර්ම කෙනෙකැ යත්: සත්පුරුෂසංසෙවන යැ සද්ධර්මශ්‍රවණ යැ යොනිසොමනස්කාර යැ ධර්මානුධර්මප්‍රතිපත්ති යැ යි. මහණෙනි, මේ සතර ධර්මයෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු අර්හත්ඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවතිත්.

මහණෙනි, මේ සතර ධර්ම කෙනෙක් වඩනාලද්දාහු පුනපුනා කරන ලද්දාහු ප්‍රඥාප්‍රතිලාභය පිණිස පවතිත් ... ප්‍රඥාවෘද්ධිය පිණිස පවතිත් ... ප්‍රඥාවගේ විපුලභාවය පිණිස පවතිත් (මහදර්ථප්‍රතිවේධක බැවින්) මහා ප්‍රඥා බව පිණිස පවතිත් . (නානාර්ථප්‍රතිවේධක බැවින්) පෘථු ප්‍රඥා බව පිණිස පවතිත් ... විපුලප්‍රඥා බව පිණිස පවතිත් .. ගම්භීරප්‍රඥා බව පිණිස පවතිත් .. (යට යට ප්‍රඥා මතු මතු ප්‍රඥාවනට අනාසන්න බැවින්) අසාමන්තප්‍රඥා බව පිණිස පවතිත් .. භූරිප්‍රඥා බව පිණිස පවතිත් ... ප්‍රඥාවගේ බහුල බව පිණිස පවතිත් .. (ශීඝ්‍ර වැ අර්ථ ප්‍රතිවෙධ කරන) ශීඝ්‍රප්‍රඥා බව පිණිස පවතිත් ... (ලුහු වැ අර්ථප්‍රතිවෙධ කරන) ලඝුප්‍රඥා බව පිණිස පවතිත් ... (තුෂ්ටි බහුල බැවින්) හාසප්‍රඥා බව පිණිස පවතිත් ... ජවනප්‍රඥා බව පිණිස පවතිත් ... තීක්ෂණප්‍රඥා බව පිණිස පවතිත් ... නිර්වේධිකප්‍රඥා බව පිණිස පවතිත් ... කවර සතර ධර්ම කෙනෙකැ යත්: සත්පුරුෂසංසේවන යැ සද්ධර්මශ්‍රවණ යැ යෝනිසොමනස්කාර යැ ධර්මානුධර්මප්‍රතිපත්ති යැ යි. මහණෙනි, මේ සතර ධර්මයෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු ප්‍රඥා-ප්‍රතිලාභය පිණිස පවතිත් ... ප්‍රඥාවෘද්ධිය පිණිස පවතිත් ... නිර්වේධිකප්‍රඥා බව පිණිස පවතිත්.

**පඤ්ඤාපටිලාභාය සංවත්තන්ති** යනු: ප්‍රඥාප්‍රතිලාභ නම් කවරේ යත්: සතර මාර්ගඥානය සතර ඵලඥානය සතර ප්‍රතිසංවිද්ඥානය ෂඩ් අභිඥාඥානය තෙසැත්තෑනුවණ සත්සැත්තෑනුවණ යන මොවුන්ගේ ලාභය ප්‍රතිලාභය ප්‍රාප්තිය සම්ප්‍රාප්තිය ස්පර්ශනය සාක්‍ෂාත්කරණය උපසම්ප්‍රාප්තිය ප්‍රඥාව ලැබීම පිණිස පවතිත් නු' යි මේ ප්‍රඥාප්‍රතිලාභ නමි.

**පඤ්ඤාවුඩ්ඪියා සංවත්තන්ති** යනු: ප්‍රඥාවෘද්ධි නම් කවරැ යත්: සප්ත ශෛක්‍ෂයන්ගේ ද කල්‍යාණපෘථග්ජනයාගේ ද ප්‍රඥාව වැඩෙයි, රහත්හුගේ ප්‍රඥාව වැඩුණු වැඩීම් ඇත්තී යා, ප්‍රඥාවගේ වැඩීම පිණිස පවතිත් නු' යි මේ ප්‍රඥාවෘද්ධි නමු.

**පඤ්ඤාවෙපුල්ලාය සංවත්තන්ති** යනු: ප්‍රඥාවෛපුල්‍ය නම් කවරැ යත්: සප්තශෛක්‍ෂයන්ගේ ද කල්‍යාණ පෘථග්ජනයාගේ ද ප්‍රඥාව විපුල බවට යෙයි, රහත්හුගේ ප්‍රඥාව විපුල බවට ගියා වෙයි. ප්‍රඥාවගේ විපුල බව පිණිස පවතිත් නු' යි මේ ප්‍රඥාවෛපුල්‍ය නම.

මහාපඤ්ඤතාය සංවත්තන්තීති කතමා මහාපඤ්ඤා, මහන්තෙ අත්ථෙ පරිගණ්හාතීති[1] මහාපඤ්ඤා, මහන්තෙ ධම්මෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්ති[2] නිරුත්තියො පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තානි පටිභානානි පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ සීලක්ඛන්ධෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ සමාධික්ඛන්ධෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ පඤ්ඤාක්ඛන්ධෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ විමුත්තික්ඛන්ධෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තානි ඨානාට්ඨානානි පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්ති[2] විහාරසමාපත්තියො පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තානි අරියසච්චානි පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ සතිපට්ඨානෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ සම්මප්පධානෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ ඉද්ධිපාදෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තානි ඉන්ද්‍රියානි පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තානි බලානි පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ බොජ්ඣඞ්ගෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තං අරියමග්ගං පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තානි සාමඤ්ඤඵලානි පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්ති[2] අභිඤ්ඤායො පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තං පරමත්ථං නිබ්බානං පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහාපඤ්ඤතාය සංවත්තන්තීති අයං මහාපඤ්ඤා.

පුථුපඤ්ඤතාය සංවත්තන්තී'ති කතමා පුථුපඤ්ඤා: පුථු නානාඛන්ධෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාධාතූසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාආයතනෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාපටිච්චසමුප්පාදෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාසුඤ්ඤතමනුපලබ්භෙසු[3] ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඅත්ථෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාධම්මෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානානිරුත්තිසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාපටිභානෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාසීලක්ඛන්ධෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාසමාධික්ඛන්ධෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාපඤ්ඤාක්ඛන්ධෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානා-විමුත්තික්ඛන්ධෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාවිමුත්තිඤාණ-දස්සනක්ඛන්ධෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඨානෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාවිහාරසමාපත්තීසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඅරියසච්චෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාසතිපට්ඨානෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාසම්මප්පධානෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඉද්ධිපාදෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඉන්ද්‍රියෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානා-බලෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාබොජ්ඣඞ්ගෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඅරියමග්ගෙසු ඤාණං පවත්තතීති පුථු-පඤ්ඤා, පුථුනානාසාමඤ්ඤඵලෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානා-අභිඤ්ඤාසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාජනසාධාරණෙ[4] ධම්මෙ අතික්කම්ම[5] පරමත්ථෙ නිබ්බානෙ ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුපඤ්ඤ-තාය සංවත්තන්තීති අයං පුථුපඤ්ඤා.

---

1. පරිග්ගණ්හාතීති මජසං, සයා, PTS,
2. මහන්තා - මජසං, සයා - PTS.
3. සුඤ්ඤතමනුපලබ්භෙසු - සයා.
4. පුථුජ්ජනසාධාරණෙ - මජසං, සයා PTS,
5. සමතික්කම්ම - සයා, PTS

**මහාපඤ්ඤතාය සංවත්තන්ති** යනු මහාප්‍රඥා නම් කවර යත් (පිළිසැඹියාපත් ආර්යශ්‍රාවක තෙම) මහත් වූ අර්ථයන් (ආලම්බනකරණයෙන්) පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ධර්මයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ නිරුක්තීන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ප්‍රතිභානයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ශීලස්කන්ධයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ සමාධිස්කන්ධයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ප්‍රඥාස්කන්ධයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ විමුක්තිස්කන්ධයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ විමුක්තිඥානදර්ශනස්කන්ධයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ස්ථානාස්ථානයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ විහාරසමාපත්තීන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ආර්යසත්‍යයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ. මහත් වූ සතිපට්ඨානයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ සම්‍යක්ප්‍රධානයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ඍද්ධිපාදයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ඉන්ද්‍රියයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ බලයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ බොධ්‍යඞ්ගයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ආර්යමාර්ගය පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ශ්‍රාමණ්‍යඵලයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ අභිඥාවන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ පරමාර්ථ නිර්වාණය පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යි. මහාප්‍රඥා බව පිණිස පවතිත් නු'යි මේ මහාප්‍රඥා නම.

**පුථුපඤ්ඤතාය සංවත්තන්ති** යනු: පෘථුප්‍රඥා නම් කවර යත් පෘථුනානාස්කන්ධයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාධාතූන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ, පෘථුනානාආයතනයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාප්‍රතීත්‍යසමුත්පාදයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාශූන්‍යතානුපලබ්ධීන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානා අර්ථයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානා ධර්මයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානා නිරුක්තීන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාප්‍රතිභානයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ, පෘථුනානාශීලස්කන්ධයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ, පෘථුනානාසමාධිස්කන්ධයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාප්‍රඥාස්කන්ධයන්හි ඥානය පවතී නු,යි පෘථුප්‍රඥා යැ පෘථුනානාවිමුක්තිස්කන්ධයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාවිමුක්තිඥානදර්ශනස්කන්ධයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාස්ථානාස්ථානයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාවිහාරසමාපත්තීන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාආර්යසත්‍යයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාසතිපට්ඨානයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානා සම්‍යක්ප්‍රධානයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාඍද්ධිපාදයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාඉන්ද්‍රියයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාබලයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාබොධ්‍යඞ්ගයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාආර්යමාර්ගයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාශ්‍රාමණ්‍යඵලයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාඅභිඥාවන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාජනසාධාරණ ධර්මයන් ඉක්ම පරමාර්ථ සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ 'පුථුපඤ්ඤතාය සංවත්තන්ති'යි මේ පෘථුප්‍රඥා නම

**විපුලපඤ්ඤතාය සංවත්තන්තීති** කතමා විපුලපඤ්ඤා: විපුලෙ අත්ථෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ ධම්මෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලා නිරුත්තියො පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලානි පටිභානානි පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ සීලක්ඛන්ධෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ සමාධික්ඛන්ධෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ පඤ්ඤාක්ඛන්ධෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ විමුත්තික්ඛන්ධෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලානි ඨානාඨානානි[1] පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලා විහාරසමාපත්තියො පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලානි අරියසච්චානි පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ සතිපට්ඨානෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ සම්මප්පධානෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ ඉද්ධිපාදෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලානි ඉන්ද්‍රියානි පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලානි බලානි පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ බොජ්ඣඞ්ගෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ අරියමග්ගෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලානි සාමඤ්ඤඵලානි පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලා අභිඤ්ඤායො පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලං පරමත්ථං නිබ්බානං පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලපඤ්ඤතාය සංවත්තන්තීති අයං විපුලපඤ්ඤා.

**ගම්භීරපඤ්ඤතාය සංවත්තන්තීති**: කතමා ගම්භීරපඤ්ඤා: ගම්භීරෙසු ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරාසු ධාතූසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු ආයතනෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු පටිච්චසමුප්පාදෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු සුඤ්ඤතමනුපලබ්භෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු අත්ථෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු ධම්මෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරාසු නිරුත්තීසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු පටිභානෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු සීලක්ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු සමාධික්ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු පඤ්ඤාක්ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු විමුත්තික්ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු ඨානාඨානෙසු[2] ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරාසු විහාරසමාපත්තීසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු අරියසච්චෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු සතිපට්ඨානෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු සම්මප්පධානෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු ඉද්ධිපාදෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු ඉන්ද්‍රියෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු බලෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු බොජ්ඣඞ්ගෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු අරියමග්ගෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු සාමඤ්ඤඵලෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරාසු අභිඤ්ඤාසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙ පරමත්ථෙ නිබ්බානෙ ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරපඤ්ඤතාය සංවත්තන්තීති අයං ගම්භීරපඤ්ඤා.

---

1 ඨානට්ඨානානි - මජසං, සයා, PTS

2 ඨානට්ඨානෙසු - මජසං, සයා, PTS

**විපුලපඤ්ඤතාය සංවත්තන්තී** යනු: විපුලප්‍රඥා කවර යත්: විපුල වූ අර්ථයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ ධර්මයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ නිරුක්තීන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ ප්‍රතිභානයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ ශීලස්කන්ධයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ සමාධිස්කන්ධයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ ප්‍රඥාස්කන්ධයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ විමුක්තිස්කන්ධයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ විමුක්තිඥානදර්ශනස්කන්ධයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ ස්ථානාස්ථානයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ විහාරසමාපත්තීන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ ආර්යසත්‍යයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ සතිපට්ඨානයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ සම්‍යක් ප්‍රධානයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ ඍද්ධිපාදයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ ඉන්ද්‍රියයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ බලයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ බොධ්‍යඞ්ගයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ ආර්යමාර්ගයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ ශ්‍රාමණ්‍යඵලයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල වූ අභිඥාවන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ, විපුල පරමාර්ථ වූ නිර්වාණය ප්‍රතිවේධ කෙරේ නු,යි විපුලප්‍රඥා යැ. 'විපුලපඤ්ඤතාය සංවත්තන්තී'යි මෙය් විපුලප්‍රඥා නමු.

**ගම්භීරපඤ්ඤතාය සංවත්තන්තී** යනු: ගම්භීරප්‍රඥා නම් කවරැ යත්: ගැඹුරු වූ ස්කන්ධයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ධාතූන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ආයතනයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ප්‍රතීත්‍යසමුත්පාදයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ශූන්‍යතානුපලබ්ධීන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ අර්ථයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ධර්මයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ නිරුක්තීන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ප්‍රතිභානයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ශීලස්කන්ධයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ සමාධිස්කන්ධයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ප්‍රඥාස්කන්ධයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ විමුක්තිස්කන්ධයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ විමුක්තිඥානදර්ශනස්කන්ධයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ස්ථානාස්ථානයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ විහාරසමාපත්තීන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ආර්යසත්‍යයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ සතිපට්ඨානයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ සම්‍යක්ප්‍රධානයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ඍද්ධිපාදයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ඉන්ද්‍රියයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ බලයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ බොධ්‍යඞ්ගයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ආර්යමාර්ගයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ශ්‍රාමණ්‍යඵලයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ අභිඥාවන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ පරමාර්ථනිර්වාණයෙහි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යි. 'ගම්භීරපඤ්ඤතාය සංවත්තන්තී'යි මෙය් ගම්භීරප්‍රඥා නමු.

**අසාමන්තපඤ්ඤතාය[1] සංවත්තන්තීති:** කතමා අසාමන්තපඤ්ඤා: යස්ස පුග්ගලස්ස අත්ථවවත්ථානතො අත්ථපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, ධම්මවවත්ථානතො ධම්මපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, නිරුත්තිවවත්ථානතො නිරුත්තිපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, පටිභානවවත්ථානතො පටිභානපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, තස්ස අත්ථෙ ච ධම්මෙ ච නිරුත්තියා ච පටිභානෙ ච න අඤ්ඤො කොචි සක්කොති අභිසම්භවිතුං, අනභිසම්භවනීයො ච සො අඤ්ඤෙහීති අසාමන්තපඤ්ඤො.

පුථුජ්ජනකල්‍යාණකස්ස පඤ්ඤා අට්ඨමකස්ස පඤ්ඤාය දූරෙ විදූරෙ න සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා, පුථුජ්ජනකල්‍යාණකං උපාදාය අට්ඨමකො අසාමන්තපඤ්ඤො. අට්ඨමකස්ස පඤ්ඤා සොතාපන්නස්ස පඤ්ඤාය දූරෙ විදූරෙ සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා, අට්ඨමකං උපාදාය සොතාපන්නො අසාමන්තපඤ්ඤො. සොතාපන්නස්ස පඤ්ඤා සකදාගාමිස්ස පඤ්ඤාය දූරෙ විදූරෙ සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා, සොතාපන්නං උපාදාය සකදාගාමී අසාමන්තපඤ්ඤො. සකදාගාමිස්ස පඤ්ඤා අනාගාමිස්ස පඤ්ඤාය දූරෙ විදූරෙ සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා, සකදාගාමිං උපාදාය අනාගාමී අසාමන්තපඤ්ඤො. අනාගාමිස්ස පඤ්ඤා අරහතො පඤ්ඤාය දූරෙ විදූරෙ සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා, අනාගාමිං උපාදාය අරහා අසාමන්තපඤ්ඤො. අරහතො පඤ්ඤා පච්චෙකබුද්ධස්ස[2] පඤ්ඤාය දූරෙ විදූරෙ සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා, අරහන්තං උපාදාය පච්චෙකබුද්ධො[3] අසාමන්තපඤ්ඤො. පච්චෙකබුද්ධං ච සදෙවකං ච ලොකං උපාදාය තථාගතො අරහං සම්මාසම්බුද්ධො අග්ගො අසාමන්තපඤ්ඤො. පඤ්ඤාපභෙදකුසලො පභින්නඤාණො අධිගතපටිසම්භිදො[4] චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො පුරිසනාගො පුරිසාජඤ්ඤො පුරිසධොරය්හො අනන්තඤාණො අනන්තතෙජො අනන්තයසො අඩ්ඪො මහද්ධනො[5] ධනවා නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤාපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛතා පසාදෙතා.

සො හි භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා, අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා[6] අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො මග්ගානුගා[7] ච පනස්ස එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතා.

---

3 අසාමන්තපඤ්ඤතාය - සං, PTS

1 'න' ඉති මජසං පොත්ථකෙ නත්ථි    2 පච්චෙකසම්බුද්ධස්ස - මජසං

3 පච්චෙකබුද්ධො - මජසං, සං, PTS    4 අධිගතප්පටිසම්භිදො - මජසං

5 මහාධනො - පු    6 සඤ්ජානෙතා - සං    7 මග්ගානුගාමී - මජසං, PTS, ස

අසාමන්තපඤ්ඤතාය සංවත්තන්ති යනු· අසාමන්තප්‍රඥ කවරේ යත්: යම් පුද්ගලයක්හු විසින් අර්ථනිශ්චය කිරීම් වශයෙන් අර්ථප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ඥානයෙන් පහස්නාලද වේ ද, ධර්මනිශ්චය කිරීම් වශයෙන් ධර්මප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥයෙන් පහස්නාලද වේ ද, නිරුක්ති නිශ්චය කිරීම් වශයෙන් නිරුක්ති ප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥයෙන් පහස්නාලද වේ ද, ප්‍රතිභානනිශ්චය කිරීම් වශයෙන් ප්‍රතිභාන ප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥයෙන් පහස්නාලද වේ ද, ඔහුගේ අර්ථයෙහි ද ධර්මයෙහි ද නිරුක්තියෙහි ද ප්‍රතිභානයෙහි ද අන් කිසිවෙක් (ඥානගතියෙන්) පැමිණෙන්නට නො හැකි වෙයි. හෙතෙම අන්‍යයන් විසින් නො පැමිණිය හැක්කේ ද වේ නු'යි 'අසාමන්තප්‍රාඥ' නම් වේ.

පෘථග්ජනකල්‍යාණකයාගේ ප්‍රඥාව අෂ්ටමකයා (ශ්‍රොතාපත්තිමාර්ගස්ථයා)ගේ ප්‍රඥාව කෙරෙන් දූරයෙහි විදූරයෙහි සුවිදූරයෙහි වෙයි, සමීපයෙහි නො වෙයි, සමීපභාගයෙහි නො වෙයි. පෘථග්ජනකල්‍යාණකයා පිණිස අෂ්ටමක තෙම අසාමන්තප්‍රාඥ නම් වෙයි. අෂ්ටමකයාගේ ප්‍රඥාව ශ්‍රොතාපන්නයාගේ ප්‍රඥාව කෙරෙන් දූරයෙහි විදූරයෙහි සුවිදූරයෙහි වෙයි, සමීපයෙහි නො වෙයි, සමීපභාගයෙහි නො වෙයි. අෂ්ටමකයා පිණිස ශ්‍රෝතාපන්න තෙම අසාමන්තප්‍රාඥ නම් වෙයි. ශ්‍රෝතාපන්නයාගේ ප්‍රඥාව සකෘදාගාමීහුගේ ප්‍රඥාව කෙරෙන් දූරයෙහි විදූරයෙහි සුවිදූරයෙහි වෙයි, සමීපයෙහි නො වෙයි, සමීපභාගයෙහි නො වෙයි. ශ්‍රොතාපන්නයා පිණිස සකෘදාගාමී තෙම අසාමන්තප්‍රාඥ නම් වෙයි. සකෘදාගාමීහුගේ ප්‍රඥාව අනාගාමීහුගේ ප්‍රඥාව කෙරෙන් දූරයෙහි විදූරයෙහි සුවිදූරයෙහි වෙයි. සමීපයෙහි නො වෙයි, සමීපභාගයෙහි නො වෙයි සකෘදාගාමීහු පිණිස අනාගාමී තෙම අසාමන්තප්‍රාඥ නම් වෙයි. අනාගාමීහුගේ ප්‍රඥාව රහත්හුගේ ප්‍රඥාව කෙරෙන් දූරයෙහි විදූරයෙහි සුවිදූරයෙහි වෙයි. සමීපයෙහි නො වෙයි. සමීපභාගයෙහි නො වෙයි. අනාගාමීහු පිණිස රහත්හු අසාමන්තප්‍රාඥ නම් වෙති. රහතුන්ගේ ප්‍රඥාව පසේබුදුන්ගේ ප්‍රඥාව කෙරෙන් දූරයෙහි විදූරයෙහි සුවිදූරයෙහි වෙයි, සමීපයෙහි නො වෙයි, සමීපභාගයෙහි නො වෙයි. රහතුන් පිණිස පසේබුදුහු අසාමන්තප්‍රාඥ නම් වෙති. පසේබුදුන් ද සදෙවකලෝකයා ද පිණිස තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයෝ අග්‍ර වූ අසාමන්තප්‍රාඥයහ ප්‍රඥාප්‍රභේදයෙහි ඡේකයහ ප්‍රභේදප්‍රාප්තඥාන ඇතියහ ලබනලද ප්‍රතිසංවිද්ඥාන ඇතියහ චතුර්වෛශාරද්‍යප්‍රාප්තයහ දශබලධාරීහ පුරුෂශ්‍රෙෂ්ඨයහ පුරුෂසිංහයහ පුරුෂාජානීයහ පුරුෂධෞරෙයහ අනන්තඥාන ඇතියහ අනන්තතේජස් ඇතියහ අනන්තයශස් ඇතියහ ආඪ්‍යයහ මහද්ධන ඇතියහ ධනවත්හ නෙතෘහ විනෙතෘහ අනුනෙතෘහ පනවන්නුවහ නිශ්චය කරවන්නුවහ (පිළිවෙත්) දක්වන්නුවහ පහදවන්නුවහ.

තවද ඒ බුදුහු නූපන් මාර්ගය (ස්වසන්තානයෙහි) උපදවන්නුවහ, අසඤ්ජාත-මාර්ගය (වෛනෙයසන්තානයෙහි) දනවන්නුවහ, ප්‍රකාශ නො කළ මාර්ගය ප්‍රකාශ කරන්නුවහ, (ප්‍රත්‍යවේක්ෂාවශයෙන්) මාර්ගය දත්තුවහ, (වෛනෙය සන්තානයෙහි දැනැවියයුතු) මාර්ගය දන්නාසුල්ලහ, මාර්ගයෙහි විචක්ෂණයහ ඒ බුදුන් විසින් හෙළි කළ මාර්ගය හෙතු තොට මෙකල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදිගුණයෙන්) පසුපස යෙමින් වෙසෙත්.

සො හි භගවා ජානං ජානාති, පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො, වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො. නත්ථි තස්ස භගවතො අඤ්ඤාතං අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය. අතීතං අනාගතං පච්චුප්පන්නං[1] උපාදාය සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති. යං කිඤ්චි ඤෙය්‍යං[2] නාම අත්ථි ධම්මං[3] ජානිතබ්බං, අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො උත්තානො වා අත්ථො ගම්භීරො වා අත්ථො ගුළ්හො වා අත්ථො පටිච්ඡන්නො වා අත්ථො නෙය්‍යො වා අත්ථො නීතො වා අත්ථො අනවජ්ජො වා අත්ථො නික්කිලෙසො වා අත්ථො වොදානො වා අත්ථො පරමත්ථො වා අත්ථො. සබ්බං තං අන්තො බුද්ධඤාණෙ පරිවත්තති. සබ්බං කායකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්ති, සබ්බං වචීකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්ති, සබ්බං මනොකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්ති

අතීතෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං, අනාගතෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං, පච්චුප්පන්නෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං, යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං ඤෙය්‍යං, ඤෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං ඤෙය්‍යං, ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති, ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො[4] නත්ථි, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා. යථා ද්වින්නං සමුග්ගපටලානං සම්මා ඵුසිතානං[5] හෙට්ඨිමං සමුග්ගපටලං උපරිමං නාතිවත්තති, උපරිමං සමුග්ගපටලං හෙට්ඨිමං නාතිවත්තති, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො. එවමෙව බුද්ධස්ස භගවතො ඤෙය්‍යඤ්ච ඤාණඤ්ච අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො, යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං ඤෙය්‍යං, ඤෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං ඤෙය්‍යං, ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති, ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා. සබ්බධම්මෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති.

සබ්බෙ ධම්මා බුද්ධස්ස භගවතො ආවජ්ජනපටිබද්ධා ආකඞ්ඛනපටිබද්ධා[6] මනසිකාරපටිබද්ධා චිත්තුප්පාදපටිබද්ධා, සබ්බසත්තෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති. සබ්බෙසං[7] සත්තානං බුද්ධො ආසයං ජානාති, අනුසයං ජානාති, චරිතං[8] ජානාති, අධිමුත්තිං ජානාති, අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ සත්තෙ පජානාති. සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තො බුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි මච්ඡකච්ඡපා අන්තමසො තිමිතිමිඞ්ගලං උපාදාය අන්තො මහාසමුද්දෙ පරිවත්තන්ති එවමෙව සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තො බුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි පක්ඛී[9] අන්තමසො ගරුළං වෙනතෙය්‍යං උපාදාය ආකාසස්ස පදෙසෙ පරිවත්තන්ති, එවමෙව යෙපි තෙ සාරිපුත්තසමා පඤ්ඤාය,[10] තෙපි බුද්ධඤාණස්ස පදෙසෙ පරිවත්තන්ති. බුද්ධඤාණං දෙවමනුස්සානං පඤ්ඤං ඵරිත්වා අභිභවිත්වා තිට්ඨති. යෙපි තෙ ඛත්තියපණ්ඩිතා බ්‍රාහ්මණපණ්ඩිතා ගහපතිපණ්ඩිතා සමණපණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ[11] චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි, තෙ පඤ්හං අභිසඞ්ඛරිත්වා අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති ගුළ්හානි ච පටිච්ඡන්නානි ච, කථිතා විසජ්ජිතාව[12] තෙ පඤ්හා භගවතා

---

1 අතීතානාගතපච්චුප්පන්නං - සයා 2 ඤෙය්‍යං - මජසං, සයා, PTS
3 තං සබ්බං - මජසං, සී 1, අත්ථධම්මං - සයා, PTS 4 ඤෙය්‍යපථො - මජසං, සයා, PTS
5 ඵුසිතානං - සයා 6 ආකඞ්ඛපටිබද්ධා - මජසං 7 සබ්බසං - මජසං
8 චරියං - සයා 9 පක්ඛිනො - මජසං 10 සාරිපුත්තසමා පඤ්ඤවන්තා - සයා, PTS
11 තෙ භින්දන්තා පඤ්ඤ - PTS, පඤ්ඤා - සයා 12 විසජ්ජිතා ච - මජසං

තවද ඒ බුදුහු දතයුතු (ඥෙයධර්මය) දනිති, දක්ක යුත්ත (නුවණැසින්) දකිති, ඇසක් මෙන් වූවහ, ඥානමය වූවහ, ධර්මමය වූවහ, ශ්‍රෙෂ්ඨ වූවහ, වක්තෘහ, ප්‍රවක්තෘහ, අර්ථය එළවා දක්වනුවහ, අමෘතය දෙනුවහ, ධර්මස්වාමීහ, තථාගතයයහ, ඒ බුදුන් විසින් (මහනැණින්) නො දන්නාලද්දෙක් (සව්නේ දත් නැණින්) නො දක්නාලද්දෙක් අවිදිත වූයෙක් ප්‍රත්‍යක්ෂ නො කරනලද්දෙක් ප්‍රඥායෙන් නො පහස්නාලද්දෙක් නැති. ඥෙය නම් වූ දතයුතු යම් කිසි ධර්මයෙක් වේ ද, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්නය ඇතුළු කොට සියලු ධර්මයෝ සර්වාකාරයෙන් භාග්‍යවත් බුදුන්ගේ ඥානමුඛයෙහි ආපාථයට පැමිණෙති. ආත්මාර්ථය ද පරාර්ථය ද උභයාර්ථය ද දෘෂ්ටධාර්මිකාර්ථය ද, සාම්පරායිකාර්ථය ද උත්තානාර්ථය ද ගම්භීරාර්ථය ද ගූඪාර්ථය ද ප්‍රතිච්ඡන්නාර්ථය ද නෙය්‍යාර්ථය ද නීතාර්ථය ද අනවද්‍යාර්ථය ද නික්ලේශාර්ථය ද පරිශුද්ධාර්ථය ද පරමාර්ථය (නිර්වාණාර්ථය) ද යන ඒ සියල්ල බුද්ධඥානය තුළ පවතී. භාග්‍යවත් බුදුන්ගේ සියලු කායකර්මය ඥානය අනුව පවතී සියලු වාක්කර්මය ඥානය අනුව පවතී සියලු මනඃකර්මය ඥානය අනුව පවතී.

අතීතයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත (නිරාවරණ) යැ, අනාගතයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත යැ, ප්‍රත්‍යුත්පන්නයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත යැ, දතයුත්ත යම් පමණ ද ඥානය එපමණ යැ, ඥානය යම් පමණ ද ඥෙයය එපමණ යැ, ඥානය ඥෙය පර්‍යන්තික යැ, ඥෙයය ඥානපර්‍යන්තික යැ, ඥෙයය ඉක්මැ ඥානය නො පවතී. ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති. ඒ ධර්මයෝ අන්‍යෝන්‍යපර්‍යන්තයෙහි පවත්නා සුල්ලහ, යම්සේ මනාකොට පැහැසූ සමුග්ගපටල දෙකෙකින් යට සමුග්ගපටල උපරිමය නො ඉක්මවා ද, උඩ සමුග්ගපටල හෙට්ඨිමය නො ඉක්මැ සිටී ද, ඔහු ඔවුනොවුන්ගේ කෙළවර සිටුනාසුලු වේද් ද, එසෙයින් මැ භාග්‍යවත් බුදුන්ගේ ඥෙයයත් ඥානයත් අන්‍යෝන්‍යපර්‍යන්තයෙහි පවත්නාසුල්ලහ. යම්තාක් ඥෙයය ද ඒ තාක් ඥානය යැ, යම්තාක් ඥානය ද ඒ තාක් ඥෙය යැ, ඥානය ඥෙයපර්‍යන්තික යැ, ඥෙයය ඥානපර්‍යන්තික යැ, ඥෙය ඉක්මැ ඥානය නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති. ඒ දහම්හු අන්‍යෝන්‍යපර්‍යන්තයෙහි සිටුනා සුල්ලහ. හැම දහම්හි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී.

හැම දහම්හු භාග්‍යවත් බුදුන්ගේ මනොද්වාරාවර්ජනයට අයත්හු වෙති, රුචිප්‍රතිබද්ධයහ, මනසිකාරප්‍රතිබද්ධයහ, චිත්තොත්පාදප්‍රතිබද්ධයහ, හැම සතුන් විෂයෙහි භාග්‍යවත් බුදුන් ගේ ඥානය පවතී, බුදුහු හැම සතුන්ගේ ආශය දනිති, අනුශය දනිති, චරිතය දනිති, අධිමුක්තිය දනිති, අල්ප වූ කෙලෙස්රජස් ඇති මහත් වූ කෙලෙස්රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති මෘදු වූ ඉඳුරන් ඇති සුන්දර ආකාර ඇති ගර්හිත ආකාර ඇති සුවසේ හැඟැවිය හැකි දුකසේ හැඟැවිය හැකි භව්‍යාභව්‍යසත්ත්වයන් දනිති, මරුන් බඹුන් සහිත වූ දෙවියන් සහිත වූ ලෝවැසි තෙම මහණබමුණන් සහිත වූ දෙව්මිනිසුන් සහිත වූ ප්‍රජාව බුද්ධඥානය තුළ පවතී, යම්සේ තිමි තිමිංගල පටන් කොට යම් මස්කැසුබු කෙනෙක් වෙත් නම් ඔහු මහමුහුද තුළ පවතිත් ද එසෙයින් මරුන් බඹුන් සහිත වූ සදෙවක ලෝක තෙමේ ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත සදෙවමනුෂ්‍යප්‍රජාව බුද්ධඥානය තුළ පවතී. යම්සේ විනතාපුත්‍ර ගුරුළුරජහු පටන් කොට යම් කිසි පක්ෂි කෙනෙක් වෙත් නම් ඔහු අහසැ පෙදෙසෙක හැසිරෙත් ද, එසෙයින් මැ යම් කෙනෙක් නැණින් සැරියුත් තෙරුන් සම වූවාහු නම් ඔහු ද බුද්ධඥානයා ගේ පෙදෙසෙක පවත්නාහු යැ. බුද්ධඥානය දෙව්මිනිසුන් ගේ ප්‍රඥාව පැතිර මැඩගෙන සිටී මැ යැ. නිපුණ වූ කළ පරවාද ඇති වල්විදුනා දුනුවායන් සෙයින් ප්‍රසිද්ධ වූ යම් ක්ෂත්‍රිය ... බ්‍රාහ්මණ ... ගෘහපති ... ශ්‍රමණපණ්ඩිත කෙනෙක් ප්‍රඥායෙන් දෘෂ්ටිගතයන් බිඳිමින් මෙන් හැසිරෙත් නම් ඔහු ගූඪ වූ ද ප්‍රතිච්ඡන්න වූ ද බොහෝ ප්‍රශ්න සකස් කොටගෙන බුදුන් කරා පැමිණ

හොන්ති නිද්දිට්ඨකාරණා, උපක්ඛිත්තකා ච තෙ භගවතො සම්පජ්ජන්ති. අථ ඛො භගවා[1] තත්ථ අතිරොචති යදිදං පඤ්ඤායාති අග්ගො අසාමන්තපඤ්ඤො අසාමන්තපඤ්ඤතාය සංවත්තන්තීති අයං අසාමන්තපඤ්ඤා.

**භූරිපඤ්ඤතාය සංවත්තන්තීති** කතමා භූරිපඤ්ඤා: රාගං අභිභුය්‍යතීති භූරිපඤ්ඤා, අභිභවිතාති භූරිපඤ්ඤා, දොසං අභිභුය්‍යතීති භූරිපඤ්ඤා, අභිභවිතාති භූරිපඤ්ඤා, මොහං අභිභුය්‍යතීති භූරිපඤ්ඤා, අභිභවිතාති භූරිපඤ්ඤා, කොධං -පෙ- උපනාහං -පෙ- මක්ඛං -පෙ- පළාසං -පෙ- ඉස්සං -පෙ- මච්ඡරියං -පෙ- මායං -පෙ- සාඨෙය්‍යං -පෙ- ථම්භං -පෙ- සාරම්භං -පෙ- මානං -පෙ- අතිමානං -පෙ- මදං -පෙ- පමාදං -පෙ- සබ්බෙ කිලෙසෙ -පෙ- සබ්බෙ දුච්චරිතෙ -පෙ- සබ්බෙ අභිසඞ්ඛාරෙ -පෙ- සබ්බෙ භවගාමිකම්මෙ අභිභුය්‍යතීති භූරිපඤ්ඤා, අභිභවිතාති භූරිපඤ්ඤා.

රාගො අරි, තං අරිං මද්දනී පඤ්ඤාති[2] භූරිපඤ්ඤා, දොසො අරි, තං අරිං මද්දනී පඤ්ඤාති භූරිපඤ්ඤා, මොහො අරි, තං අරිං මද්දනී පඤ්ඤාති භූරිපඤ්ඤා, කොධො -පෙ- උපනාහො -පෙ- මක්ඛො -පෙ- පළාසො -පෙ- ඉස්සා -පෙ- මච්ඡරියං -පෙ- මායා -පෙ- සාඨෙය්‍යං -පෙ- ථම්භො -පෙ- සාරම්භො -පෙ- මානො -පෙ- අතිමානො -පෙ- මදො -පෙ- පමාදො -පෙ- සබ්බෙ කිලෙසා -පෙ- සබ්බෙ දුච්චරිතා -පෙ- සබ්බෙ අභිසඞ්ඛාරා -පෙ- සබ්බෙ භවගාමිකම්මා අරි, තං අරිං මද්දනී පඤ්ඤාති භූරිපඤ්ඤා, භූරි වුච්චති පථවී,[3] තාය පථවිසමාය විත්ථතාය විපුලාය පඤ්ඤාය සමන්නාගතොති භූරිපඤ්ඤා, අපි ච පඤ්ඤායෙතං අධිවචනං: භූරි මෙධා පරිණායිකාති භූරිපඤ්ඤා, භූරිපඤ්ඤතාය සංවත්තන්තීති අයං භූරිපඤ්ඤා.

**පඤ්ඤාබාහුල්ලාය සංවත්තන්තීති** කතමං පඤ්ඤාබාහුල්ලං ඉධෙකච්චො පඤ්ඤාගරුකො හොති, පඤ්ඤාචරිතො පඤ්ඤාසයො පඤ්ඤාධිමුත්තො පඤ්ඤාධජො පඤ්ඤාකෙතු පඤ්ඤාධිපතෙය්‍යො, විචයබහුලො පවිචයබහුලො ඔක්ඛායනබහුලො සමොක්ඛායනබහුලො[4] සම්පෙක්ඛායනධම්මො, විභූතවිහාරී තච්චරිතො තග්ගරුකො තබ්බහුලො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො[5] තදධිමුත්තො තදධිපතෙය්‍යො, යථා ගණගරුකො වුච්චති ගණබාහුලිකො'ති චීවරගරුකො වුච්චති චීවරබාහුලිකො'ති පත්තගරුකො වුච්චති පත්තබාහුලිකො'ති. සෙනාසනගරුකො වුච්චති සෙනාසනබාහුලිකො'ති, එවමෙව ඉධෙකච්චො පඤ්ඤාගරුකො හොති පඤ්ඤාචරිතො පඤ්ඤාසයො පඤ්ඤාවිමුත්තො පඤ්ඤාධජො පඤ්ඤාකෙතු පඤ්ඤාධිපතෙය්‍යො විචයබහුලො පවිචයබහුලො ඔක්ඛායනබහුලො සමොක්ඛායනබහුලො සම්පෙක්ඛායනබහුලො විභූතවිහාරී තච්චරිතො තග්ගරුකො තබ්බහුලො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යො. පඤ්ඤාබාහුල්ලාය සංවත්තන්තීති ඉදං පඤ්ඤාබාහුල්ලං,

1 භගවා ච - PTS
2. මද්දනීපඤ්ඤාති - මජසං,
3. පථවී - මජසං,
4 සමොක්ඛායනබහුලො - සයා,
5. තංපොණො තංපබ්භාරො - සයා, PTS

විචාරති. ඒ ප්‍රශ්නයෝ බුදුන් විසින් සකාරණ වැ කියන ලද්දාහු විසඳන ලද්දාහු ද වෙති. තවද ඔහු භාග්‍යවතුන්ගේ ශ්‍රාවක වූවාහු මැ වෙත්. යළි බුදුහු එහි ප්‍රඥායෙන් අතිශයින් බබලත්. මෙ කරුණින් අග්‍ර අසාමන්ත-ප්‍රාඥ නම් වෙත්. 'අසාමන්තපඤ්ඤතාය සංවත්තන්ති' යි. මේ අසාමන්ත ප්‍රඥා නමු.

**භූරිපඤ්ඤතාය සංවත්තන්ති** යනු: භූරිප්‍රඥා නම් කවර යත්: රාගය අභිභවනය කෙරේ නු' යි 'භූරිපඤ්ඤ' නමු, අභිභවනය කළා නු' යි 'භූරිපඤ්ඤ' නමු, ද්වේෂය අභිභවනය කෙරේ නු' යි 'භූරිපඤ්ඤ' නමු, අභිභවනය කළා නු' යි 'භූරිපඤ්ඤ' නමු, මෝහය අභිභවනය කෙරේ නු' යි 'භූරිපඤ්ඤ' නමු, අභිභවනය කළා නු' යි 'භූරිපඤ්ඤ' නමු, ක්‍රෝධය ... උපනාහය ... මක්ඛය ... පළාසය ... ඊර්ෂ්‍යාව .. මාත්සර්‍ය්‍යය ... මායාව ... සාඨෙය්‍යය ... ස්තම්භය ... සාරම්භය ... මානය ... අතිමානය ... මදය ... ප්‍රමාදය ... සියලු කෙලශයන් ... සියලු දුශ්චරිතයන් ... සියලු අභිසංස්කාර-යන් ... සියලු භවගාමිකර්මයන් අභිභවනය කෙරේ නු' යි 'භූරිපඤ්ඤ' නමු. අභිභවනය කළා නු' යි 'භූරිපඤ්ඤ' නමු.

රාගය සතුරු යැ ඒ සතුරා මඩනා ප්‍රඥාව නු' යි 'භූරිපඤ්ඤ' නමු ද්වේෂය සතුරු යැ ඒ සතුරා මඩනා ප්‍රඥාව නු' යි 'භූරිපඤ්ඤ' නමු මෝහය සතුරු යැ ඒ සතුරා මඩනා ප්‍රඥාව නු' යි 'භූරිපඤ්ඤ' නමු ක්‍රෝධය ... උපනාහය ... මක්ඛය ... පළාසය ... ඊර්ෂ්‍යාව ... මාත්සර්‍ය්‍යය ... මායාව ... සඨ බව ... ස්තම්භය ... සාරම්භය ... මානය ... අතිමානය ... මදය ... ප්‍රමාදය ... සියලු කෙලශයෝ ... සියලු දුශ්චරිතයෝ ... සියලු අභිසංස්කාරයෝ ... සියලු භවගාමිකර්මයෝ සතුරු යැ. ඒ සතුරා මඩනා ප්‍රඥාව නු' යි 'භූරිපඤ්ඤ' නමු. පෘථිවිය 'භූරි' යි කියනු ලැබේ. ඒ පෘථිවිය සම වූ විස්තෘත වූ විපුල වූ ප්‍රඥායෙන් යුක්ත වූයේ නු' යි 'භූරිපඤ්ඤ' නමු තවද ප්‍රඥාවට තෙල නමෙකි: 'භූරි මෙධා පරිණායිකා' යි 'භූරිපඤ්ඤ' නමු. 'භූරිපඤ්ඤතාය සංවත්තන්ති' යි මේ 'භූරිපඤ්ඤ' නමු.

**පඤ්ඤාබාහුල්ලාය සංවත්තන්ති** යනු: ප්‍රඥාබාහුල්‍ය නම් කවර යත්: මේ ශාසනයෙහි කිසිවෙක් ප්‍රඥාගරුක වූයේ ප්‍රඥාචරිත ඇත්තේ ප්‍රඥාශය වූයේ ප්‍රඥාධිමුක්ත වූයේ ප්‍රඥාව ධවජ කොට ඇත්තේ ප්‍රඥාව කෙතු කොට ඇත්තේ ප්‍රඥාව අධිපති කොට ඇත්තේ දහම් විමසීම බහුල කොට ඇත්තේ නානාප්‍රකාරයෙන් දහම් විමසීම බහුල කොට ඇත්තේ ප්‍රඥායෙන් බැසගෙන දහම් ප්‍රකට කිරීම බහුල කොට ඇත්තේ මොනොවට ප්‍රකට කිරීම බහුල කොට ඇත්තේ ධර්මයන් මනාකොට දක්නා ස්වභාව ඇත්තේ විභූතවිහරණ ඇත්තේ ඒ ප්‍රඥාචරිත ඇත්තේ ඒ ප්‍රඥාව ගුරු කොට ඇත්තේ ඒ ප්‍රඥාව බහුල කොට ඇත්තේ ඒ ප්‍රඥාවට නිම්නප්‍රවණ-ප්‍රාග්භාර වූයේ ඒ ප්‍රඥායෙහි අධිමුක්ත වූයේ ඒ ප්‍රඥාව අධිපති කොට ඇත්තේ වෙයි. යම්සේ ගණගරුක වූයේ 'ගණබාහුලික' යි කියනු ලැබේ ද, චීවරගරුක වූයේ 'චීවරබාහුලික, යි කියනු ලැබේ ද, පාත්‍රගරුක වූයේ 'පාත්‍රබාහුලික' යි කියනු ලැබේ ද, සෙනාසනගරුක වූයේ 'සෙනාසනබාහුලික' යි කියනු ලැබේ ද එපරිද්දෙන්මැ මේ ශාසනයෙහි කිසිවෙක් ප්‍රඥාගරුක ප්‍රඥාචරිත ප්‍රඥාශය වූයේ ප්‍රඥා විමුක්ත වූයේ ප්‍රඥාව ධවජ කොට ඇත්තේ ප්‍රඥාව කෙතු කොට ඇත්තේ ප්‍රඥාව අධිපති කොට ඇත්තේ දහම් විමසීම් බහුල කොට ඇත්තේ නානාප්‍රකාරයෙන් දහම් විමසීම් බහුල කොට ඇත්තේ ඔක්ඛායන බහුල කොට ඇත්තේ සමොක්ඛායන බහුල කොට ඇත්තේ සමෙපක්ඛායන බහුල කොට ඇත්තේ විභූතවිහරණ ඇත්තේ තච්චරිත ... තද්ගරුක ... තද්බහුල ... තන්නින්න ... තත්ප්‍රවණ ... තත්ප්‍රාග්භාර ... තදධිමුක්ත වූයේ තදධිපති වූයේ වෙයි. 'පඤ්ඤාබාහුල්ලාය සංවත්තන්ති' යි මේ ප්‍රඥාබාහුල්‍ය නමි.

සීඝපඤ්ඤතාය සංවත්තන්තීති කතමා සීඝපඤ්ඤා, සීඝං සීඝං සීලානි පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං ඉන්ද්‍රියසංවරං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං භොජනෙ මත්තඤ්ඤුතං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං ජාගරියානුයොගං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝසීඝං සීලක්ඛන්ධං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං සමාධික්ඛන්ධං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං පඤ්ඤාක්ඛන්ධං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං විමුත්තික්ඛන්ධං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං විමුත්තිඤාණදස්සනක්ඛන්ධං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං ඨානාට්ඨානානි පටිවිජ්ඣතීති සීඝපඤ්ඤා, සීඝසීඝං විහාරසමාපත්තියො පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං අරියසච්චානි පටිවිජ්ඣතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං සතිපට්ඨානෙ භාවෙතීති සීඝඤ්ඤා, සීඝං සීඝං සම්මප්පධානෙ භාවෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං ඉද්ධිපාදෙ භාවෙතීති සීඝපඤ්ඤා, සීඝා සීඝං ඉන්ද්‍රියානි භාවෙතීති සීඝපඤ්ඤා, සීඝ සීඝං බලානි භාවෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං බොජ්ඣඞ්ගෙ භාවෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං අරියමග්ගං භාවෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං සාමඤ්ඤඵලානි සච්ඡිකරොතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං අභිඤ්ඤායො පටිවිජ්ඣතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං පරමත්ථං නිබ්බානං සච්ඡිකරොතීති සීඝපඤ්ඤා, සීඝපඤ්ඤතාය සංවත්තන්තී'ති අයං සීඝපඤ්ඤා.

ලහුපඤ්ඤතාය සංවත්තන්තීති කතමා ලහුපඤ්ඤා: ලහුං ලහුං සීලානි පරිපූරෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං ඉන්ද්‍රියසංවරං පරිපූරෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං භොජනෙ මත්තඤ්ඤුතං පරිපූරෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං ජාගරියානුයොගං පරිපූරෙතීති ලහුපඤ්ඤා ලහුං ලහු සීලක්ඛන්ධං -පෙ- සමාධික්ඛන්ධං -පෙ- පඤ්ඤාක්ඛන්ධං -පෙ- විමුත්තික්ඛන්ධං -පෙ- විමුත්තිඤාණදස්සනක්ඛන්ධං පරිපූරෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං ඨානාට්ඨානානි පටිවිජ්ඣතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං විහාරසමාපත්තියො පරිපූරෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං අරියසච්චානි පටිවිජ්ඣතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං සතිපට්ඨානෙ භාවෙතීති ලහුපඤ්ඤා, ලහුංලහුං සම්මප්පධානෙ භාවෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං ඉද්ධිපාදෙ භාවෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං ඉන්ද්‍රියානි භාවෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං බලානි භාවෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං බොජ්ඣඞ්ගෙ භාවෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං අරියමග්ගං භාවෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං සාමඤ්ඤඵලානි සච්ඡිකරොතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං අභිඤ්ඤායො පටිවිජ්ඣතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං පරමත්ථං නිබ්බානං සච්ඡිකරොතීති ලහුපඤ්ඤා, ලහුපඤ්ඤතාය සංවත්තන්තීති අයං ලහුපඤ්ඤා.

**සීඝපඤ්ඤතාය සංවත්තන්ති** යනු: ශීඝ්‍රප්‍රඥා නම් කවර යත්: ශීඝ්‍රශීඝ්‍ර වූ ශීලයන් පරිපූර්ණ කෙරේ නු' යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ ඉන්ද්‍රියසංවරය පරිපූර්ණ කෙරේ නු' යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ භොජනයෙහි මාත්‍රාඥතාව පරිපූර්ණ කෙරේ නු'යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ ජාගර්‍ය්‍යානුයොගය පරිපූර්ණ කෙරේ නු' යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ ශීලස්කන්ධය පරිපූර්ණ කෙරේ නු' යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ සමාධිස්කන්ධය පරිපූර්ණ කෙරේ නු' යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ ප්‍රඥාස්කන්ධය පරිපූර්ණ කෙරේ නු'යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ විමුක්තිස්කන්ධය පරිපූර්ණ කෙරේ නු'යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ විමුක්ති-ඥානදර්ශනස්කන්ධය පරිපූර්ණ කෙරේ නු'යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ ස්ථානාස්ථානයන් ප්‍රතිවෙධ කෙරේ නු' යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ විහාරසමාපත්තීන් පරිපූර්ණ කෙරේ නු'යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ ආර්‍ය්‍යසත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ නු'යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ සතිපට්ඨාන-යන් වඩා නු'යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ සම්‍යක්ප්‍රධානයන් වඩා නු' යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ ඍද්ධිපාදයන් වඩා නු' යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ ඉන්ද්‍රියයන් වඩා නු' යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ බලයන් වඩා නු' යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ බොධ්‍යඞ්ගයන් වඩා නු' යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ ආර්‍ය්‍යමාර්ගය වඩා නු' යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ ශ්‍රාමණ්‍යඵල-යන් සාක්ෂාත් කෙරේ නු'යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ අභිඥාවන් ප්‍රතිවෙධ කෙරේ නු'යි ශීඝ්‍රප්‍රඥා යෑ, ශීඝ්‍රශීඝ්‍ර වූ පරමාර්ථ වූ නිර්වාණය සාක්ෂාත් කෙරේ නු'යි ශීඝ්‍රප්‍රඥා යි. 'සීඝපඤ්ඤතාය සංවත්තන්ති' යි මේ ශීඝ්‍රප්‍රඥා නමි.

**ලහුපඤ්ඤතාය සංවත්තන්ති** යනු: ලහුප්‍රඥා නම් කවර යත්: ලුහුලුහු වූ ශීලයන් පරිපූර්ණ කෙරේ නු'යි 'ලහුපඤ්ඤා' නමි. ලුහුලුහු වූ ඉන්ද්‍රිය සංවරය පරිපූර්ණ කෙරේ නු'යි 'ලහුපඤ්ඤා' නමි. ලුහුලුහු වූ බොජුන්හි පමණ දන්නා බව පරිපූර්ණ කෙරේ නු' යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ ජාගර්‍ය්‍යානුයොගය පරිපූර්ණ කෙරේ නු' යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ ශීලස්කන්ධය ... සමාධිස්කන්ධය ... ප්‍රඥාස්කන්ධය ... විමුක්තිස්කන්ධය ... විමුක්තිඥානදර්ශනස්කන්ධය පරිපූර්ණ කෙරේ නු'යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ ස්ථානාස්ථානයන් ප්‍රතිවෙධ කෙරේ නු' යි ලහුපඤ්ඤා නමි ලුහුලුහු වූ විහාරසමාපත්තීන් පරිපූර්ණ කෙරේ නු' යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ ආර්‍ය්‍යසත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ නු'යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ සති-පට්ඨානයන් වඩා නු' යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ සම්‍යක්ප්‍රධානයන් වඩා නු'යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ ඍද්ධිපාදයන් වඩා නු' යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ ඉන්ද්‍රියයන් වඩා නු'යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ බලයන් වඩා නු'යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ බොධ්‍යඞ්ගයන් වඩා නු'යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ ආර්‍ය්‍යමාර්ගය වඩා නු' යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ ශ්‍රාමණ්‍යඵලයන් ප්‍රත්‍යක්ෂ කෙරේනු' යි ලහුපඤ්ඤා නමි. ලුහුලුහු වූ අභිඥාවන් ප්‍රතිවෙධ කෙරේ නු'යි ලහුපඤ්ඤා නමි: ලුහුලුහු වූ පරමාර්ථ වූ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කෙරේ නු'යි ලහුපඤ්ඤා නමි. 'ලහුපඤ්ඤතාය සං-වත්තන්ති' යි මේ ලහුපඤ්ඤා නමි.

**හාසපඤ්ඤතාය සංවත්තන්තීති** කතමා හාසපඤ්ඤා: ඉධෙකච්චො හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො සීලානි පරිපූරෙති හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො ඉන්ද්‍රියසංවරං පරිපූරෙතීති හාසපඤ්ඤා, හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො භොජනෙ මත්තඤ්ඤුතං පරිපූරෙතීති හාසපඤ්ඤා, හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො ජාගරියානුයොගං පරිපූරෙතීති හාසපඤ්ඤා, හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො සීලක්ඛන්ධං -ප- සමාධික්ඛන්ධං -පෙ- පඤ්ඤාක්ඛන්ධං -පෙ- විමුත්තික්ඛන්ධං -පෙ- විමුත්තිඤාණදස්සනක්ඛන්ධං පරිපූරෙතීති -පෙ- ඨානාට්ඨානානි පටිවිජ්ඣතීති -පෙ- විහාරසමාපත්තියො පරිපූරෙතීති -පෙ- අරියසච්චානි පටිවිජ්ඣතීති -පෙ- සතිපට්ඨානෙ භාවෙතීති -පෙ- සම්මප්පධානෙ භාවෙතීති -පෙ- ඉද්ධිපාදෙ භාවෙතීති -පෙ- ඉන්ද්‍රියානි භාවෙතීති -පෙ- බොජ්ඣඞ්ගෙ භාවෙතීති -පෙ- අරියමග්ගං භාවෙතීති -පෙ- සාමඤ්ඤඵලානි සච්ඡිකරොතීති හාසපඤ්ඤා, හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො අභිඤ්ඤායො පටිවිජ්ඣතීති හාසපඤ්ඤා, හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො පරමත්ථං නිබ්බානං සච්ඡිකරොතීති හාසපඤ්ඤා, හාසපඤ්ඤතාය සංවත්තන්තී'ති අයං හාසපඤ්ඤා.

**ජවනපඤ්ඤතාය සංවත්තන්තීති** කතමා ජවනපඤ්ඤා: යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං අනිච්චතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, දුක්ඛතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, අනත්තතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං අනිච්චතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, දුක්ඛතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, චක්ඛුං -පෙ- ජරාමරණං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, දුක්ඛතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, අනත්තතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා.

රූපං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං ඛයට්ඨෙන දුක්ඛං භයට්ඨෙන අනත්තා අසාරකට්ඨෙනාති තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා රූපනිරොධෙ නිබ්බානෙ ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං ඛයට්ඨෙන දුක්ඛං භයට්ඨෙන අනත්තා අසාරකට්ඨෙනාති තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා ජරාමරණනිරොධෙ[1] නිබ්බානෙ ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා.

---

1 ජරාමරණං රූපනිරොධෙ - සං

**හාසපඤ්ඤාය සංවත්තන්ති** යනු: හාසප්‍රඥා නම් කවර යත්: මෙ සසුන්හි කිසිවෙක් ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ ශීලයන් පරිපූර්ණ කෙරේ නු'යි හාසප්‍රඥා යැ, ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ ඉන්ද්‍රියසංවරය පරිපූර්ණ කෙරේ නු'යි හාසප්‍රඥා යැ, ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටි-බහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ භොජනයෙහි මාත්‍රඥතාව පරිපූර්ණ කෙරේ නු'යි හාසප්‍රඥා යැ, ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ ජාගර්‍ය්‍යානුයොගය පරිපූර්ණ කෙරේ නු'යි හාසප්‍රඥා යැ, ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ ශීල-ස්කන්ධය ... සමාධිස්කන්ධය ... ප්‍රඥාස්කන්ධය ... විමුක්තිස්කන්ධය .. විමුක්ති-ඥානදර්ශනස්කන්ධය පරිපූර්ණ කෙරේ නු'යි ... ස්ථානාස්ථානයන් ප්‍රතිවෙධ කෙරේ නු'යි ... විහාරසමාපත්තීන් පරිපූර්ණ කෙරේ නු'යි ... ආර්‍ය්‍යසත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ නු'යි ... සතිපට්ඨානයන් ප්‍රතිවෙධ කෙරේ නු'යි ... සම්‍යක්ප්‍රධානයන් ප්‍රතිවෙධ කෙරේ නු'යි ඍද්ධිපාදයන් වඩා නු'යි ... ඉන්ද්‍රිය-යන් වඩා නු'යි ... බලයන් වඩා නු'යි ... බොධ්‍යඞ්ගයන් වඩා නු'යි ... ආර්‍ය්‍ය-මාර්ගය වඩා නු'යි ... ශ්‍රාමණ්‍යඵලයන් ප්‍රත්‍යක්ෂ කෙරේ නු'යි හාසප්‍රඥා යැ, ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ අභිඥාවන් ප්‍රතිවෙධ කෙරේ නු'යි හාසප්‍රඥා යැ, ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ පරමාර්ථ වූ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කෙරේ නු'යි හාසප්‍රඥා යි. 'හාසපඤ්ඤතාය සංවත්තන්ති'යි මේ හාසප්‍රඥා නමි.

**ජවනපඤ්ඤතාය සංවත්තන්ති** යනු: ජවනප්‍රඥා කවර යත්: අධ්‍යාත්ම වේවයි බාහ්‍ය වේවයි ඖදාරික වේවයි සූක්ෂම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න වූ යම් කිසි රූපයෙක් වේ ද දුර වූ හෝ ලඟ වූ හෝ යම් කිසි රූපයෙක් වේ ද ඒ සියලු රූපය අනිත්‍ය හෙයින් වහා දිවේ නු'යි ජවනප්‍රඥා යැ, දුඃඛ හෙයින් වහා දිවේ නු'යි ජවනප්‍රඥා යැ, අනාත්ම හෙයින් වහා දිවේ නු'යි ජවනප්‍රඥා යි. යම් කිසි වෙදනාවක් .. යම් කිසි සංඥාවක් ... යම් කිසි සංස්කාර කෙනෙක් ... අධ්‍යාත්ම වේවයි බාහ්‍ය වේවයි ඖදාරික වේවයි සූක්ෂම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ යම් කිසි විඥානයෙක් දුර වූ හෝ ලඟ වූ හෝ යම් කිසි විඥානයෙක් වේ ද, එ හැම විඥානය අනිත්‍ය හෙයින් වහා දිවේ නු'යි ජවනප්‍රඥා යැ දුඃඛ හෙයින් වහා දිවේ නු'යි ජවනප්‍රඥා යැ අනාත්ම හෙයින් වහා දිවේ නු'යි ජවනප්‍රඥා යි. චක්ෂුස ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ජරා-මරණය අනිත්‍ය හෙයින් වහා දිවේ නු'යි ජවනප්‍රඥා යැ දුඃඛ හෙයින් වහා දිවේ නු'යි ජවනප්‍රඥා යැ අනාත්ම හෙයින් වහා දිවේ නු'යි ජවනප්‍රඥා යි.

අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ රූපය ක්ෂයාර්ථයෙන් අනිත්‍ය යැ භයාර්ථ-යෙන් දුඃඛ යැ අසාරකාර්ථයෙන් අනාත්ම යැ යි තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට රූපනිරොධය වූ නිර්වාණයෙහි වහා දිවේ නු'යි ජවනප්‍රඥා යැ, වෙදනාව ... සංඥාව ... සංස්කාරයෝ විඥානය ... චක්ෂුස ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ජරාමරණය ක්ෂයාර්ථයෙන් අනිත්‍ය යැ, භයාර්ථයෙන් දුඃඛ යැ අසාරකාර්ථයෙන් අනාත්ම යැ'යි තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට ජරාමරණනිරොධය වූ නිර්වාණයෙහි වහා දිවේ නු'යි ජවනප්‍රඥා යි.

රූපං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා රූපනිරොධෙ නිබ්බානෙ ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා ජරාමරණනිරොධෙ නිබ්බානෙ ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, ජවනපඤ්ඤතාය සංවත්තන්තී'ති අයං ජවනපඤ්ඤා.

**තික්ඛපඤ්ඤතාය සංවත්තන්තීති** කතමා තික්ඛපඤ්ඤා: ඛිප්පං කිලෙසෙ ඡින්දතීති තික්ඛපඤ්ඤා, උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති තික්ඛපඤ්ඤා උප්පන්නං බ්‍යාපාදවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති තික්ඛපඤ්ඤා, උප්පන්නං විහිංසාවිතක්කං නාධිවාසෙති -පෙ- උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති තික්ඛපඤ්ඤා, උප්පන්නං රාගං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති තික්ඛපඤ්ඤා, උප්පන්නං දොසං -පෙ- උප්පන්නං මොහං -පෙ- උප්පන්නං කොධං -පෙ- උප්පන්නං උපනාහං -පෙ- මක්ඛං -පෙ- පළාසං -පෙ- ඉස්සං -පෙ- මච්ඡරියං -පෙ- මායං -පෙ- සාඨෙය්‍යං -පෙ- ථම්භං -පෙ- සාරම්භං -පෙ- මානං -පෙ- අතිමානං -පෙ- මදං -පෙ- පමාදං -පෙ- සබ්බෙ කිලෙසෙ -පෙ- සබ්බෙ දුච්චරිතෙ -පෙ- සබ්බෙ අභිසඞ්ඛාරෙ -පෙ- සබ්බෙ භවගාමිකම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති තික්ඛපඤ්ඤා, එකස්මිං ආසනෙ චත්තාරො ච අරියමග්ගා චත්තාරි ච සාමඤ්ඤඵලානි චතස්සො පටිසම්භිදායො ඡ අභිඤ්ඤායො අධිගතා හොන්ති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤායාති තික්ඛපඤ්ඤා, තික්ඛපඤ්ඤතාය සංවත්තන්තී'ති අයං තික්ඛපඤ්ඤා.

**නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තන්තීති** කතමා නිබ්බෙධිකපඤ්ඤා: ඉධෙකච්චො සබ්බසඞ්ඛාරෙසු උබ්බෙගබහුලො[1] හොති උත්තාසබහුලො උක්කණ්ඨබහුලො[2] හොති. අරතිබහුලො අනභිරතිබහුලො, බහිමුඛො න රමති සබ්බසඞ්ඛාරෙසු, අනිබ්බිද්ධපුබ්බං අප්පදාලිතපුබ්බං ලොභක්ඛන්ධං නිබ්බිජ්ඣති පදාලෙතීති නිබ්බෙධිකපඤ්ඤා, අනිබ්බිද්ධපුබ්බං අප්පදාලිතපුබ්බං දොසක්ඛන්ධං නිබ්බිජ්ඣති පදාලෙතීති නිබ්බෙධිකපඤ්ඤා, අනිබ්බිද්ධපුබ්බං අප්පදාලිතපුබ්බං මොහක්ඛන්ධං නිබ්බිජ්ඣති පදාලෙතීති නිබ්බෙධිකපඤ්ඤා, අනිබ්බිද්ධපුබ්බං අප්පදාලිතපුබ්බං කොධං -පෙ- උපනාහං -පෙ- මක්ඛං -පෙ- පළාසං -පෙ- ඉස්සං -පෙ- මච්ඡරියං -පෙ- මායං -පෙ- සාඨෙය්‍යං -පෙ- ථම්භං -පෙ- සාරම්භං -පෙ- මානං -පෙ- අතිමානං -පෙ- මදං -පෙ- පමාදං -පෙ- සබ්බෙ කිලෙසෙ -පෙ- සබ්බෙ දුච්චරිතෙ -පෙ- සබ්බෙ අභිසඞ්ඛාරෙ -පෙ- සබ්බෙ භවගාමිකම්මෙ නිබ්බිජ්ඣති පදාලෙතීති නිබ්බෙධිකපඤ්ඤා, නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තන්තීති අයං නිබ්බෙධිකපඤ්ඤා ඉමා සොළස පඤ්ඤායො, ඉමාහි සොළසහි පඤ්ඤාහි සමන්නාගතො පුග්ගලො පටිසම්භිදප්පත්තො.

---

1 උබ්බෙධබහුලො - සී.
2 උක්කණ්ඨනබහුලො - සී, හොතී'ති මජ්ඣං පොත්ථකෙ නත්ථි

අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ රූපය අනිත්‍ය යැ සඞ්ඛත යැ ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්‍ෂයධර්ම යැ ව්‍යයධර්ම යැ විරාගධර්ම යැ නිරෝධධර්ම යැ'යි තුලනය කොට තීරණය කොට ප්‍රකට කොට ස්ඵුට කොට රූපනිරෝධය වූ නිර්වාණයෙහි වහා දිවේ නු'යි ජවනප්‍රඥා යැ. වේදනාව ... සංඥාව ... සංස්කාරයෝ ... විඥානය ... චක්‍ෂුස ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ජරාමරණය අනිත්‍ය යැ සඞ්ඛත යැ ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්‍ෂයධර්ම යැ ව්‍යයධර්ම යැ විරාගධර්ම යැ නිරෝධධර්ම යැ'යි තුලනය කොට තීරණය කොට ප්‍රකට කොට ස්ඵුට කොට ජරාමරණනිරෝධය වූ නිර්වාණයෙහි වහා දිවේ නු'යි ජවනප්‍රඥා යි. 'ජවනපඤ්ඤතාය සංවත්තන්ති'යි මේ ජවනප්‍රඥා නම් වේ.

**තික්ඛපඤ්ඤතාය සංවත්තන්ති** යනු: තීක්ෂණප්‍රඥා නම් කවර යත්: වහා කෙලෙසුන් සිඳී නු'යි තීක්ෂණ ප්‍රඥා යැ, උපන් කාමවිතර්කය සන්තානයට නගා වාසය නො කරවයි දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවා නු'යි තීක්ෂණප්‍රඥා යැ, උපන් ව්‍යාපාදවිතර්කය අධිවාස නො කරවයි දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවා නු'යි තීක්ෂණප්‍රඥා යැ, උපන් විහිංසා විතර්කය අධිවාස නො කරවයි ... උපනුපන් ලාමක අකුශල ධර්මයන් අධිවාස නො කරවයි දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවා නු'යි තීක්ෂණප්‍රඥා යැ, උපන් රාගය අධිවාස නො කරවයි දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවා නු'යි තීක්ෂණ ප්‍රඥා යැ. උපන් ද්වේෂය ... උපන් මෝහය ... උපන් ක්‍රෝධය ... උපන් උපනාහය ... ම්‍රක්ෂය ... පලාසය ... ඊර්ෂ්‍යාව ... මාත්සර්යය ... මායාව ... ශාඨ්‍යය ... ස්තම්භය ... සාරම්භය .. මානය ... අතිමානය ... මදය ... ප්‍රමාදය ... හැම කෙලෙසුන් ... හැම දුශ්චරිතයන් ... හැම අභිසංස්කාරයන් ... හැම භවගාමී කර්මයන් අධිවාස නො කරවයි දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවා නු'යි තීක්ෂණප්‍රඥා යැ, එක් අසුන්හි හිඳ සතර ආර්යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද සතර ප්‍රතිසංවිද්හු ද ෂඩ්-අභිඥාවෝ ද අධිගම කරනලද ප්‍රත්‍යක්‍ෂ කරනලද ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද වෙත් නු'යි තීක්ෂණප්‍රඥා යි. 'තික්ඛපඤ්ඤතාය සංවත්තන්ති'යි මෝ තීක්ෂණප්‍රඥා නමු.

**නිබ්බේධිකපඤ්ඤතාය සංවත්තන්ති** යනු: නිර්වේධිකප්‍රඥා නම් කවර යත්: මෙ සසුන්හි කිසිවෙක් හැම සංස්කාරයන්හි උද්වේග බහුල වූයේ උත්‍රාසබහුල වූයේ උත්කණ්ඨා බහුල වූයේ අරතිබහුල වූයේ අනභිරතිබහුල වූයේ බහිර්මුඛ වූයේ වෙයි. හැම සංස්කාරයන්හි නො ඇලෙයි. නො විදුනාලද විරූ ප්‍රදාරණය නො කළ විරූ ලෝභස්කන්ධය බිඳී නු'යි පලා නු'යි නිර්වේධිකප්‍රඥා යැ. නො විදුනාලද විරූ නො පළනලද විරූ ද්වේෂස්කන්ධය බිඳී නු'යි පලා නු'යි නිර්වේධිකප්‍රඥා යැ, නො විදුනාලද විරූ නො පළනලද විරූ මෝහස්කන්ධය බිඳී නු'යි පලා නු'යි නිර්වේධිකප්‍රඥා යැ, නො විදුනාලද විරූ නො පළනලද විරූ ක්‍රෝධය ... උපනාහය ... ම්‍රක්ෂය ... පලාසය ... ඊර්ෂ්‍යාව ... මාත්සර්යය ... මායාව ... ශඨබව ... ස්තම්භය ... සාරම්භය ... මානය ... අතිමානය ... මදය ... ප්‍රමාදය ... හැම කෙලෙසුන් ... හැම දුශ්චරිතයන් ... හැම අභිසංස්කාරයන් ... හැම භවගාමීකර්මයන් බිඳී නු'යි පලා නු'යි නිර්වේධිකප්‍රඥා යි. නිබ්බේධිකපඤ්ඤතාය සංවත්තන්ති යි මෝ නිර්වේධිකප්‍රඥා නමු. මොහු ෂෝඩශප්‍රඥා වෙති. මේ සොළොස් ප්‍රඥායෙන් සමන්වාගත වූ පුද්ගල තෙම ප්‍රතිසංවිත් ප්‍රාප්ත වේ.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: එකො පුබ්බයොගසම්පන්නො එකො න පුබ්බයොගසම්පන්නො, යො පුබ්බයොගසම්පන්නො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති, තස්ස ඤාණං පභිජ්ජති.[1]

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා. එකො බහුස්සුතො, එකො න බහුස්සුතො. යො බහුස්සුතො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති, තස්ස ඤාණං පභිජ්ජති.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, එකො දෙසනා බහුලො, එකො න දෙසනා බහුලො. යො දෙසනා බහුලො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති, තස්ස ඤාණං පභිජ්ජති.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, ද්වෙපි දෙසනාබහුලා. එකො ගරූපනිස්සිතො, එකො න ගරූපනිස්සිතො. යො ගරූපනිස්සිතො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති, තස්ස ඤාණං පභිජ්ජති.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, ද්වෙපි දෙසනාබහුලා, ද්වෙපි ගරූපනිස්සිතා. එකො විහාරබහුලො, එකො න විහාරබහුලො. යො විහාරබහුලො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති, තස්ස ඤාණං පභිජ්ජති.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, ද්වෙපි දෙසනාබහුලා, ද්වෙපි ගරූපනිස්සිතා, ද්වෙපි විහාරබහුලා, එකො පච්චවෙක්ඛණාබහුලො, එකො න පච්චවෙක්ඛණාබහුලො. යො පච්චවෙක්ඛණාබහුලො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති, තස්ස ඤාණං පභිජ්ජති.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, ද්වෙපි දෙසනාබහුලා, ද්වෙපි ගරූපනිස්සිතා, ද්වෙපි විහාරබහුලා, ද්වෙපි පච්චවෙක්ඛණාබහුලා. එකො සෙඛපටිසම්භිදප්පත්තො, එකො අසෙඛපටිසම්භිදප්පත්තො. යො අසෙඛපටිසම්භිදප්පත්තො, සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති. තස්ස ඤාණං පභිජ්ජති.

1 පභිජ්ජන්ති – PTS

ප්‍රතිසංවිත්ප්‍රාප්ත පුද්ගලයෝ දෙදෙනෙක් වෙති: එක් පුද්ගලයෙක් පූර්ව (පූර්ව) යෝගසම්පන්න වෙයි. එක් පුද්ගලයෙක් පූර්වයොගසම්පන්න නො වෙයි. යමෙක් පූර්වයොගසම්පන්න වේ ද හෙතෙම එයින් අතිරික්ත වෙයි, අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි, ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥාන ප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොග-සම්පන්න වෙති, එක් පුද්ගලයෙක් බහුශ්‍රැත වෙයි, එක් පුද්ගලයෙක් බහුශ්‍රැත නො වෙයි. යමෙක් බහුශ්‍රැත වේ ද හේ එයින් අතිරික්ත වෙයි, අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි, ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොග-සම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති, එක් පුද්ගලයෙක් (ධර්ම) දේශනාබහුල වෙයි, එක්පුද්ගලයෙක් දේශනාබහුල නො වෙයි. යමෙක් දේශනාබහුල වේ ද, හේ එයින් අතිරික්ත වෙයි, අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි, ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥාන ප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොග-සම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති, දෙදෙන මැ දෙශනාබහුල වෙති, එක් පුගුලෙක් (නුවණින් වැඩිසිටි) ගුරුන් ඇසුරු කෙළේ වෙයි, එක් පුගු-ලෙක් ගුරුන් ඇසුරුකෙළේ නො වෙයි. යමෙක් ගුරුන් ඇසුරු කෙළේ වේ ද හේ එයින් අතිරික්ත වෙයි, අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි, ඔහුගේ ඥානය ප්‍රති-සංවිද්ඥාන ප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොග-සම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති, දෙදෙන මැ දේශනාබහුල වෙති, දෙදෙන මැ ගුරුන් ඇසුරුකළාහු වෙති, එක් පුගුලෙක් විදර්ශනාවිහාරබහුල වෙයි, එක් පුගුලෙක් විදර්ශනාවිහාරබහුල නො වෙයි, යමෙක් විදර්ශනා-විහාරබහුල වේ ද හේ එයින් අතිරික්ත වෙයි, අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි, ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්ව-යොගසම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති; දෙදෙන මැ දෙශනාබහුල වෙති, දෙදෙන මැ ගුරුන් ඇසුරු කළාහු වෙති, දෙදෙන මැ විදර්ශනාවිහාර-බහුල වෙති, එක් පුගුලෙක් ප්‍රත්‍යවෙක්ෂා බහුල වෙයි. එක් පුගුලෙක් ප්‍රත්‍යවෙක්ෂාබහුල නො වෙයි, යමෙක් ප්‍රත්‍යවෙක්ෂාබහුල වේ ද හේ එයින් අතිරික්ත වෙයි. අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥාන-ප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති දෙදෙන මැ පූර්ව-යොගසම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති, දෙදෙන මැ දෙශනාබහුල වෙති, දෙදෙන මැ ගුරුන් ඇසුරු කළාහු වෙති, දෙදෙන මැ විදර්ශනාවිහාර-බහුල වෙති, දෙදෙන මැ ප්‍රත්‍යවෙක්ෂාබහුල වෙති, එක් පුගුලෙක් ශෛක්ෂ වැ ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙයි, එක් පුගුලෙක් අශෛක්ෂප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙයි. යමෙක් අශෛක්ෂ වැ ප්‍රතිසංවිත්ප්‍රාප්ත වේ ද හේ එයින් අතිරික්ත වෙයි, අධික වෙයි, විශිෂ්ට වෙයි. ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදයට පැමිණෙයි.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, ද්වෙපි දෙසනාබහුලා, ද්වෙපි ගරූපනිස්සිතා, ද්වෙපි විහාරබහුලා, ද්වෙපි පච්චවෙක්ඛණාබහුලා, ද්වෙපි අසෙඛපටිසම්භිදප්පත්තා, එකො සාවකපාරමිප්පත්තො, එකො න සාවකපාරමිප්පත්තො. යො සාවකපාරමිප්පත්තො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති. තස්ස ඤාණං පභිජ්ජති.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, ද්වෙපි දෙසනාබහුලා, ද්වෙපි ගරූපනිස්සිතා, ද්වෙපි විහාරබහුලා ද්වෙපි පච්චවෙක්ඛණාබහුලා, ද්වෙපි අසෙඛපටිසම්භිදප්පත්තා, එකො සාවකපාරමීප්පත්තො, එකො පච්චෙකසම්බුද්ධො, යො පච්චෙකසම්බුද්ධො, සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති. තස්ස ඤාණං පභිජ්ජති.

පච්චෙකබුද්ධස්ස සදෙවකස්ස ලොකං උපාදාය තථාගතො අරහං සම්මාසම්බුද්ධො අග්ගො පටිසම්භිදප්පත්තො පඤ්ඤාපභෙදකුසලො පභින්නඤාණො අධිගතපටිසම්භිදො චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො -පෙ- යෙපි තෙ ඛත්තියපණ්ඩිතා බ්‍රාහ්මණපණ්ඩිතා ගහපතිපණ්ඩිතා සමණපණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි, තෙ පඤ්හං අභිසඞ්ඛරිත්වා අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති ගුළ්හානි ච පටිච්ඡන්නානි ච. කථිතා විස්සජ්ජිතා ච තෙ පඤ්හා භගවතා හොන්ති නිද්දිට්ඨකාරණා, උපක්ඛිත්තකා ච තෙ භගවතො සම්පජ්ජන්ති. අථ ඛො භගවා තත්ථ අතිරොචති යදිදං පඤ්ඤායාති අග්ගො පටිසම්භිදප්පත්තො'ති.

පඤ්ඤාකථා සමත්තා.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොගසම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති, දෙදෙන මැ දේශනාබහුල වෙති, දෙදෙන මැ ගුරුන් ඇසුරු කළාහු වෙති, දෙදෙන මැ විදර්ශනාවිහාරබහුල වෙති, දෙදෙන මැ ප්‍රත්‍යවේක්‍ෂාබහුල වෙති, දෙදෙන ම අශෛක්‍ෂ වැ ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති, එක් පුහුලෙක් ශ්‍රාවකපාරමීප්‍රාප්ත වෙයි, එක් පුහුලෙක් ශ්‍රාවකපාරමීප්‍රාප්ත නො වෙයි. යමෙක් ශ්‍රාවකපාරමීප්‍රාප්ත වේ ද හේ එයින් අතිරික්ත වෙයි, අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි, ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොගසම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති, දෙදෙන මැ දේශනාබහුල වෙති. දෙදෙන මැ ගුරුන් ඇසුරුකළාහු වෙති, දෙදෙන මැ විදර්ශනාවිහාරබහුල වෙති, දෙදෙන මැ ප්‍රත්‍යවෙක්‍ෂාබහුල වෙති, දෙදෙන මැ අශෛක්‍ෂ වැ ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති, එක් පුහුලෙක් ශ්‍රාවකපාරමීප්‍රාප්ත වෙයි, එක්පුහුලෙක් ප්‍රත්‍යෙක සම්බුද්ධ වෙයි. යමෙක් ප්‍රත්‍යෙකසම්බුද්ධ වේ ද හේ එයින් අතිරික්ත වෙයි. අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි. ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදයට පැමිණෙයි.

පසේබුදුන් ද සදේවකලොකයා ද පිණිස තථාගත අර්හත්සම්‍යක්සම්බුද්ධයෝ අග්‍රයහ ප්‍රතිසංවිත්ප්‍රාප්තයහ ප්‍රඥාප්‍රභෙදයෙහි ඡේකයහ ප්‍රභෙදප්‍රාප්තඥාන ඇතියහ ලබනලද ප්‍රතිසංවිද්ඥාන ඇතියහ චතුවෛශාරද්‍යප්‍රාප්තයහ දශබලධාරිහ පුරුෂශ්‍රෙෂ්ඨයහ පුරුෂසිංහයහ ... යම් ඒ ක්‍ෂත්‍රියපණ්ඩිත කෙනෙක් බ්‍රාහ්මණපණ්ඩිත කෙනෙක් ගෘහපතිපණ්ඩිත කෙනෙක් ශ්‍රමණපණ්ඩිත කෙනෙක් නිපුණ වූවාහු කළ පරවාද ඇතියාහු වල්විදුනා දුනුවායන් බඳු වූවාහු ප්‍රඥයෙන් දෘෂ්ටිගතයන් බිඳිමින් මෙන් හැසිරෙත් නම් ඔහු ගුඪ වූ ද බොහෝ ප්‍රශ්න සකස් කොට ගෙන බුදුන් කරා පැමිණ විචාරති. ඒ ප්‍රශ්නයෝ භාග්‍යවතුන් විසින් සකාරණ වැ කියනලද්දාහු විසඳනලද්දාහු ද වෙති. තවද ඔහු භාග්‍යවතුන්ගේ ශ්‍රාවක වූවාහු මැ වෙත්. යළි බුදුහු එහි ප්‍රඥයෙන් අතිශයින් බබලත් නු’යි අග්‍ර වූ ප්‍රතිසංවිත්ප්‍රාප්ත නම් වෙත් යයි.

ප්‍රඥාකථා නිමි.

# 3. 2.

## ඉද්ධිකථා

කා ඉද්ධි, කති ඉද්ධියො, ඉද්ධියා කති භූමියො, කති පාදා, කති පදානි, කති මූලානි:

**කා ඉද්ධී'ති** ඉජ්ඣනට්ඨෙන ඉද්ධි.

**කති ඉද්ධියො'ති** දස ඉද්ධියො.

**ඉද්ධියා කති භූමියො'ති** ඉද්ධියා චතස්සො භූමියො චත්තාරො පාදා අට්ඨ පදානි, සොළස මූලානි.

කතමා දස ඉද්ධියො: අධිට්ඨානා ඉද්ධි, විකුබ්බනා ඉද්ධි, මනොමයා ඉද්ධි, ඤාණවිප්ඵාරා ඉද්ධි, සමාධිවිප්ඵාරා ඉද්ධි, අරියා ඉද්ධි, කම්මවිපාකජා ඉද්ධි, පුඤ්ඤවතො ඉද්ධි, විජ්ජාමයා ඉද්ධි තත්ථ තත්ථ සම්මාපයොගපච්චයා[1] ඉජ්ඣනට්ඨෙන ඉද්ධි.

ඉද්ධියා කතමා චතස්සො භූමියො: විවෙකජා භූමි පඨමං ඣානං, පීතිසුඛභූමි දුතියං ඣානං, උපෙක්ඛාසුඛභූමි තතියං ඣානං, අදුක්ඛමසුඛා භූමි චතුත්ථං ඣානං, ඉද්ධියා ඉමා චතස්සො භූමියො ඉද්ධිලාභාය ඉද්ධිපටිලාභාය ඉද්ධිවිකුබ්බනතාය ඉද්ධිවිසවිතාය ඉද්ධිවසීභාවාය ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්තීති.

ඉද්ධියා කතමෙ[2] චත්තාරො පාදා: ඉධ භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉද්ධියා ඉමෙ චත්තාරො පාදා ඉද්ධිලාභාය ඉද්ධිපටිලාභාය ඉද්ධිවිකුබ්බනතාය ඉද්ධිවිසවිතාය ඉද්ධිවසීභාවාය ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්තීති.

ඉද්ධියා කතමානි අට්ඨ පදානි: ඡන්දං චෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං, ලභති චිත්තස්ස එකග්ගතං, ඡන්දො න සමාධි, සමාධි න ඡන්දො. අඤ්ඤො ඡන්දො, අඤ්ඤො සමාධි. විරියං චෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං, ලභති චිත්තස්ස එකග්ගතං, විරියං න සමාධි, සමාධි න විරියං. අඤ්ඤං විරියං අඤ්ඤො සමාධි. චිත්තං චෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං, ලභති චිත්තස්ස එකග්ගතං, චිත්තං න සමාධි, සමාධි න චිත්තං. අඤ්ඤං චිත්තං, අඤ්ඤො සමාධි. වීමංසං චෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං, ලභති චිත්තස්ස එකග්ගතං. වීමංසා න සමාධි, සමාධි න වීමංසා. අඤ්ඤා වීමංසා, අඤ්ඤො සමාධි. ඉද්ධියා ඉමානි අට්ඨ පදානි, ඉද්ධිලාභාය ඉද්ධිපටිලාභාය ඉද්ධිවිකුබ්බනතාය ඉද්ධිවිසවිතාය ඉද්ධිවසීභාවාය ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්තීති.

---

1 සම්මප්පයොගපච්චයා - ස්‍යා    2 කතමී - PTS

## 3. 2.

# සෘද්ධි කථා

සෘද්ධි කවර යැ, සෘද්ධීහු කෙතෙක් ද, සෘද්ධියට භූමිහු කෙතෙක් ද, පාදයෝ කෙතෙක් ද, පදයෝ කෙතෙක් ද, මූලයෝ කෙතෙක් ද යත්:

**කා ඉද්ධි** යනු: සමෘද්ධ වන අර්ථයෙන් සෘද්ධි යැ.

**කති ඉද්ධියො** යනු: සෘද්ධීහු දශ දෙනෙක.

**ඉද්ධියා කති භූමියො** යනු: සෘද්ධියට භූමි සතරෙක. පාද සතරෙක. පද අටෙක මූල සොළොසෙකි.

දශසෘද්ධීහු නම් කවරහ යත්: අධිෂ්ඨාන සෘද්ධි යැ විකුර්වණසෘද්ධි යැ මනොමය සෘද්ධි යැ ඥානවිස්ඵාර සෘද්ධි යැ සමාධිවිස්ඵාරසෘද්ධි යැ ආර්‍යසෘද්ධි යැ කර්මවිපාකජසෘද්ධි යැ පුණ්‍යවත්හුගේ සෘද්ධි යැ විද්‍යාමයසෘද්ධි යැ ඒ ඒ ධර්මයෙහි සම්‍යක්ප්‍රයොගප්‍රත්‍යයෙන් සමෘද්ධ වන අර්ථයෙන් සෘද්ධි යි.

සෘද්ධියට සතරභූමිහු කවරහ යත්: ප්‍රථමධ්‍යානය විවෙකජභූමි ය ද්විතීයධ්‍යානය ප්‍රීතිසුඛභූමි යැ, තෘතීයධ්‍යානය උපෙක්ෂාසුඛභූමි යැ, චතුර්ථධ්‍යානය අදුක්ඛමසුඛභූමි යැ, මේ සතරභූමිහු සෘද්ධිලාභ පිණිස සෘද්ධිප්‍රතිලාභ පිණිස සෘද්ධිවිකුර්වණතා පිණිස සෘද්ධිවිශෙෂ පවත්වන බවට සෘද්ධිවශීභාවය පිණිස සෘද්ධිවෛශාරද්‍ය පිණිස පවතිත් යයි.

සෘද්ධියට සතර පාදයෝ කවරහ යත්: මෙ සස්නෙහි මහණ තෙම ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා ප්‍රධානසංස්කාරයෙන් (සම්‍යක්ප්‍රධානවීර්‍යයෙන්) සමන්වාගත වූ සෘද්ධිපාදය වඩයි, චිත්තාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍යයෙන් සමන්වාගත වූ සෘද්ධිපාදය වඩයි, වීර්‍යාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍යයෙන් සමන්වාගත වූ සෘද්ධිපාදය වඩයි, වීමංසාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍යයෙන් සමන්වාගත වූ සෘද්ධිපාදය වඩයි. සෘද්ධිය පිළිබඳ මේ සතර පාදයෝ සෘද්ධිලාභ පිණිස සෘද්ධිප්‍රතිලාභ පිණිස සෘද්ධිවිකුර්වණතා පිණිස සෘද්ධිවිශෙෂ පවත්වන පිණිස සෘද්ධිවශීභාව පිණිස සෘද්ධිවිශාරද බව පිණිස පවතිත් යයි.

සෘද්ධියට අටපද කවරහ යත්: ඉදින් මහණ තෙම ඡන්දය නිසා සමාධිය ලබා නම් චිත්තෙකාග්‍රතාව ලබා නම් ඒ ඡන්දය සමාධි නො වෙයි, සමාධිය ඡන්ද නො වෙයි. ඡන්දය අනෙකෙක, සමාධිය අනෙකෙකි. ඉදින් මහණ තෙම චිත්තය නිසා සමාධිය ලබා නම්, චිත්තෙකාග්‍රතාව ලබා නම්, ඒ චිත්තය සමාධි නො වෙයි, සමාධිය චිත්ත නො වෙයි, චිත්තය අනෙකෙක, සමාධිය අනෙකෙකි. ඉදින් මහණ තෙම වීර්‍යය නිසා සමාධිය ලබා නම්, චිත්තෙකාග්‍රතා ලබා නම් ඒ වීර්‍යය සමාධි නො වෙයි, සමාධිය වීර්‍ය නො වෙයි, වීර්‍යය අනෙකෙක, සමාධිය අනෙකෙකි. ඉදින් මහණ තෙම වීමංසාව නිසා සමාධිය ලබා නම්, චිත්තෙකාග්‍රතා ලබා නම්, ඒ වීමංසාව සමාධි නො වෙයි, සමාධිය වීමංසා නො වෙයි, වීමංසාව අනෙකෙක, සමාධිය අනෙකෙකි. සෘද්ධිය පිළිබඳ මේ අටපදයෝ සෘද්ධිලාභ පිණිස සෘද්ධිප්‍රතිලාභ පිණිස සෘද්ධිවිකුර්වණ පිණිස සෘද්ධිවිශෙෂ පවත්වන පිණිස සෘද්ධිවශීභාව පිණිස සෘද්ධිවිශාරද බව පිණිස පවතිත් යයි.

ඉද්ධියා කතමානි සොළස මූලානි: අනොනතං[1] චිත්තං කොසජ්ජෙ න ඉඤ්ජතීති[2] ආනෙඤ්ජං, අනුන්නතං චිත්තං උද්ධච්චෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, අනභිනතං චිත්තං රාගෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, අනපනතං චිත්තං බ්‍යාපාදෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, අනිස්සිතං චිත්තං දිට්ඨියා න ඉඤ්ජතීති ආනෙඤ්ජං, අප්පටිබද්ධං චිත්තං ඡන්දරාගෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, විප්පමුත්තං චිත්තං කාමරාගෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, විසඤ්ඤුත්තං චිත්තං කිලෙසෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, විමරියාදීකතං[3] චිත්තං කිලෙසමරියාදෙ[4] න ඉඤ්ජතීති ආනෙඤ්ජං, එකත්තගතං[5] චිත්තං නානත්තකිලෙසෙ[6] න ඉඤ්ජතීති ආනෙඤ්ජං, සද්ධාය පරිග්ගහිතං චිත්තං අස්සද්ධියෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, විරියෙන පරිග්ගහිතං චිත්තං කොසජ්ජෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, සතියා පරිග්ගහිතං චිත්තං පමාදෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, සමාධිනා පරිග්ගහිතං චිත්තං උද්ධච්චෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, පඤ්ඤාය පරිග්ගහිතං චිත්තං අවිජ්ජාය න ඉඤ්ජතීති ආනෙඤ්ජං, ඔභාසගතං චිත්තං අවිජ්ජන්ධකාරෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං ඉද්ධියා ඉමානි සොළස මූලානි ඉද්ධිලාභාය ඉද්ධිපටිලාභාය ඉද්ධිවිකුබ්බනතාය ඉද්ධිවිසවිතාය ඉද්ධිවසීභාවාය ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්තීති.

කතමා අධිට්ඨානා ඉද්ධි: ඉධ භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති, එකොපි හුත්වා බහුධා හොති, බහුධාපි හුත්වා එකො හොති, ආවීභාවං[7] තිරොභාවං තිරොකුට්ටං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ, පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභිජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි පඨවියං, ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො, ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙතීති.

ඉධාති ඉමිස්සා දිට්ඨියා ඉමිස්සා ඛන්තියා ඉමිස්සා රුචියා ඉමස්මිං ආදායෙ ඉමස්මිං ධම්මෙ ඉමස්මිං විනයෙ ඉමස්මිං ධම්මවිනයෙ ඉමස්මිං පාවචනෙ ඉමස්මිං බ්‍රහ්මචරියෙ ඉමස්මිං සත්ථුසාසනෙ. තෙන වුච්චති 'ඉධා'ති.

භික්ඛූති පුථුජ්ජනකල්‍යාණකො වා හොති භික්ඛු සෙඛො වා අරහා වා අකුප්පධම්මො.

අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොතීති නානප්පකාරං ඉද්ධිවිධං පච්චනුභොති.

එකොපි හුත්වා බහුධා හොතීති පකතියා එකො බහුකං[8] ආවජ්ජති, සතං වා සහස්සං වා සතසහස්සං වා ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති 'බහුකො[9] හොමී'ති බහුකො හොති. යථායස්මා චූළපන්ථකො[10] එකොපි හුත්වා බහුධා හොති, එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො එකොපි හුත්වා බහුධා හොති

---

1 අනොණතං - PTS, සයා 2 ඉජ්ඣතීති - PTS 3 විපරියාදිකතං - PTS
4 කිලෙසපරියාදෙ - PTS 5 එකග්ගතං - සයා, PTS
6 නානත්තකිලෙසෙහි - මජසං 7 ආවිභාවං - මජසං, සයා, PTS
8 බහුලං - PTS 9 බහුලො - PTS 10 චුළපන්ථකො - PTS

ඍද්ධියට සොළොස් මූලයෝ කවරහ යත්: (කෞසීද්‍ය වශයෙන්) නො නැමුණු සිත කෞසීද්‍ය නිමිත්තෙන් නො සැලේ (කම්පා නො වේ) නු'යි ආනෙඤ්ජ නම්. ඖද්ධත්‍යයෙන් නො හුවනලද සිත ඖද්ධත්‍ය නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නාම, රාගවශයෙන් නො නැමුණු (අනභිනත) සිත රාග නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, ක්‍රෝධවශයෙන් ප්‍රතිමුඛ (අදූෂ්‍ය) වූ සිත ව්‍යාපාද නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, දෘෂ්ටි වශයෙන් අනිඃශ්‍රිත වූ සිත දෘෂ්ටි නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, ඡන්දරාගප්‍රතිබද්ධ නො වූ සිත ඡන්දරාග නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, විප්‍රමුක්ත සිත කාමරාග නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, කෙලෙසුන් කෙරෙන් වෙන් වූ සිත කෙලෙස් නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, කෙලෙස්හිමි නො කරනලද සිත කෙලෙස්හිමි නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, එකාග්‍රබවට ගිය සිත නානාස්වභාව කෙලෙස් නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, ශ්‍රද්ධාපරිගෘහීත සිත අශ්‍රද්ධා නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, වීර්‍ය්‍යයෙන් පරිගෘහීත සිත කෞසීද්‍ය නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, ස්මෘතියෙන් පරිගෘහීත සිත ප්‍රසාද නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, සමාධියෙන් පරිගෘහීත සිත ඖද්ධත්‍ය නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, ප්‍රඥායෙන් පරිගෘහීත සිත අවිද්‍යා නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, අවභාසයට ගිය සිත අවිද්‍යාන්ධකාර නිමිත්තෙන් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්. ඍද්ධිය පිළිබඳ මේ සොළොස් මූලයෝ ඍද්ධිලාභ පිණිස ඍද්ධිප්‍රතිලාභ පිණිස ඍද්ධිවිකුර්වණ පිණිස ඍද්ධිවිශෙෂ පවත්වන පිණිස ඍද්ධිවශීභාව පිණිස ඍද්ධිවිශාරදභාව පිණිස පවතිත් යයි.

අධිෂ්ඨාන ඍද්ධි නම් කවර යත්: මෙසස්නෙහි මහණ තෙම අනෙකප්‍රකාර වූ ඍද්ධිවිධ වළඳ කෙරෙයි. තෙමේ එකලා වැ සිට බහුප්‍රකාර ද වෙයි, බහුප්‍රකාර වැ සිට එකලා ද වෙයි, ආවිර්භාවය කෙරෙයි, තිරෝභාවය කෙරෙයි, අහස්හි සෙයින් බිත්තෙන් පිටතට පවුරින් පිටතට පර්වතයෙන් පරභාගයට නො ලැගෙමින් යෙයි. දියෙහි සෙයින් පොළොව්හිදු නැගීම් ගැලීම් කෙරෙයි, පොළොව්හි සෙයින් අභිද්‍යමානඋදකයෙහිදු යෙයි, පියා ඇති ලිහිණියකු සෙයින් අහස්හිදු පලගින් යෙයි, මෙබඳු මහත්ඍද්ධි ඇති මෙබඳු මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙන ද අතින් පරාමර්ශනය කෙරෙයි, පරිමර්ජනය කෙරෙයි, බඹලොව හිමි කොට කයින් වශයෙහි පවත්වයි.

**ඉධ** යනු: මේ දෘෂ්ටියෙහි මේ ක්ෂාන්තියෙහි මේ රුචියෙහි මේ ග්‍රහණයෙහි මේ ධර්මයෙහි මේ විනයෙහි මේ ධර්මවිනයෙහි මේ ප්‍රවචනයෙහි මේ බ්‍රහ්මචර්‍ය්‍යයෙහි මේ ශාස්තෘශාසනයෙහි යි. එයින් කියනුලැබෙයි 'ඉධ' යි.

**භික්ඛු** යනු: කල්‍යාණපෘථග්ජන මහණ හෝ වෙයි, ශෛක්ෂ හෝ වෙයි, අකොප්‍යධර්ම ඇති රහත් හෝ වේ.

**අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති** යනු: නානාප්‍රකාර වූ ඍද්ධි කොටස් වළඳ කෙරෙයි.

**එකොපි හුත්වා බහුධා හොති** යනු: පියවින් එකලා වැ බොහෝ කොට ආවර්ජනා කෙරෙයි. සියක් හෝ දහසක් හෝ සුවහසක් හෝ ආවර්ජනා කෙරෙයි, ආවර්ජනා කොට 'බොහෝ වෙමි' ඥානයෙන් අධිෂ්ඨාන කෙරෙයි. බොහෝ වෙයි, යම්සේ ආයුෂ්මත් චුල්ලපන්ථක පියවින් එකලා වැ බහුප්‍රකාරයෙන් වේ ද එපරිද්දෙන් මැ ඒ චෙතොවශීප්‍රාප්ත වූ ඍද්ධිමත් තෙම පියවින් එකලා වැ බහුප්‍රකාර ද වෙයි.

**බහුධාපි හුත්වා එකො හොතීති** පකතියා බහුකො එකං ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති 'එකො හොමී'ති එකො හොති. යථායස්මා චූළපන්ථකො බහුධාපි හුත්වා එකො හොති. එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො බහුධාපි හුත්වා එකො හොති.

**ආවිභාවන්ති** කෙනචි අනාවටං හොති අප්පටිච්ඡන්නං විවටං පාකටං.

**තිරොභාවන්ති** කෙනචි ආවටං හොති පටිච්ඡන්නං පිහිතං පටිකුජ්ජිතං.

**තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙති** පකතියා ආකාසකසිණසමාපත්තියා ලාභී හොති තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති 'ආකාසො හොතූ'ති ආකාසො හොති. තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති යථා මනුස්සා පකතියා අනිද්ධිමන්තො කෙනචි අනාවටෙ අපරික්ඛිත්තෙ අසජ්ජමානා ගච්ඡන්ති එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති, සෙය්‍යථාපි ආකාසෙ.

**පඨවියාපි[1] උම්මුජ්ජනිමුජ්ජං කරොතීති සෙය්‍යථාපි උදකෙති** පකතියා ආපොකසිණසමාපත්තියා ලාභී හොති, පඨවිං ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති 'උදකං හොතූ'ති උදකං හොති. සො පඨවියා උම්මුජ්ජනිමුජ්ජං කරොති. යථා මනුස්සා පකතියා අනිද්ධිමන්තො උදකෙ උම්මුජ්ජනිමුජ්ජං කරොන්ති. එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො පඨවියා උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ

**උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියන්ති** පකතියා පඨවිකසිණසමාපත්තියා ලාභී හොති, උදකං ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති 'පඨවි හොතූ'ති පඨවි හොති. සො අභිජ්ජමානෙ උදකෙ ගච්ඡති යථා මනුස්සා පකතියා අනිද්ධිමන්තො අභිජ්ජමානාය පඨවියා ගච්ඡන්ති. එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො අභිජ්ජමානෙ උදකෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං.

**ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණොති** පකතියා පඨවිකසිණසමාපත්තියා ලාභී හොති. ආකාසං ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති: 'පඨවි හොතූ'ති පඨවි හොති. සො ආකාසෙ අන්තලික්ඛෙ චඞ්කමතිපි තිට්ඨතිපි නිසීදතිපි සෙය්‍යම්පි කප්පෙති, යථා මනුස්සා පකතියා අනිද්ධිමන්තො පඨවියා චඞ්කමන්තිපි තිට්ඨන්තිපි නිසීදන්තිපි සෙය්‍යම්පි කප්පෙන්ති, එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො ආකාසෙ අන්තලික්ඛෙ චඞ්කමතිපි තිට්ඨතිපි නිසීදතිපි සෙය්‍යම්පි කප්පෙති සෙය්‍යථාපි පක්ඛීසකුණො

**ඉමෙ චන්දිමසුරියෙ[2] එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජතීති** ඉධ සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො නිසින්නකො වා නිපන්නකො වා චන්දිමසුරියෙ ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති: 'හත්ථපාසෙ හොතූ'ති හත්ථපාසෙ හොති, සො නිසින්නකො වා චන්දිමසුරියෙ පාණිනා ආමසති පරාමසති පරිමජ්ජති, යථා මනුස්සා පකතියා අනිද්ධිමන්තො කිඤ්චිදෙව රූපගතං හත්ථපාසෙ ආමසන්ති පරාමසන්ති පරිමජ්ජන්ති. එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො නිසින්නකො වා නිපන්නකො වා චන්දිමසුරියෙ පාණිනා ආමසති පරාමසති පරිමජ්ජති.

1 පඨවියාපි - මජසං. 2 සූරියෙ - මජසං.

**බහුධාපි හුත්වා එකො හොති** යනු: පියවිත් බොහෝ වැ එක් පුගුලකු ආවර්ජනා කෙරෙයි, ආවර්ජනා කොට ඥානයෙන් අධිෂ්ඨාන කෙරෙයි. 'එකලා වෙමි' එකලා වෙයි, යම්සේ ආයුෂ්මත් චූල්ලපන්ථක බොහෝ වැ එකලා වේ ද එපරිද්දෙන් මැ ඒ චෙතොවශීප්‍රාප්ත සෘද්ධිමත් තෙමේ බොහෝ වැ එකලා ද වෙයි.

**ආවිභාවං** යනු: කිසිවකින් ආවෘත නො වූයේ ප්‍රතිච්ඡන්න නො වූයේ විවෘත වූයේ ප්‍රකට වූයේ වෙයි.

**තිරොභාවං** යනු: කිසිවකින් ආවෘත වූයේ ප්‍රතිච්ඡන්න වූයේ වසන ලද්දේ පිහිකුළු වූයේ වෙයි

**තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ** යනු: පියවිත් ආකාශකසිණ සමාපත්තිය ලබනසුලු වෙයි බිත්හි පරභාගය පවුරෙහි පරභාගය පර්වතයෙහි පරභාගය ආවර්ජනා කෙරෙයි, ආවර්ජනා කොට 'ආකාශය වේවයි' ඥානයෙන් අධිෂ්ඨාන කෙරෙයි, හේ ආකාශ වෙයි. බිත්හි පරභාගයට පවුරෙහි පරභාගයට පර්වතයෙහි පරභාගයට නො පැකිළ යෙයි යම්සේ මිනිස්සු පියවිත් සෘද්ධිමත් නො වූවාහු කිසිවකින් අනාවෘත අපරික්ෂිප්ත තැනැ නො පැකිළ යෙත් ද එපරිද්දෙන් මැ ඒ චෙතොවශීප්‍රාප්ත සෘද්ධිමත් තෙමේ බිත්හි පරභාගයට පවුරෙහි පරභාගයට පර්වතයෙහි පරභාගයට අහස්හි සෙයින් නො පැකිළ යෙයි.

**පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ** යනු: පියවිත් ආපොකසිණසමාපත්තිය ලබනසුලු වෙයි. පෘථිවිය ආවර්ජනා කෙරෙයි, ආවර්ජනා කොට 'දිය වේවයි' ඥානයෙන් අධිෂ්ඨාන කෙරෙයි, හේ දිය වෙයි, හේ පෘථිවියෙහි නැගීම ගැලීම කෙරෙයි යම්සේ මිනිස්සු පියවිත් සෘද්ධි නැතියාහු දියෙහි නැගීම ගැලීම කෙරෙත් ද එපරිද්දෙන් මැ හේ චෙතොවශීප්‍රාප්ත වූ සෘද්ධිමත් තෙමේ පොළොවෙහි දියෙහි සෙයින් නැගීම ගැලීම කෙරෙයි.

**උදකෙපි අභිජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි පඨවියං**: යනු පියවිත් පඨවිකසිණසමවත් ලබනසුලු වෙයි. දිය ආවර්ජනා කෙරෙයි. ආවර්ජනා කොට 'පොළොව් වේවයි' නුවණින් ඉටයි, හේ පොළොව් වෙයි, හේ නො බිඳෙන දියෙහි යෙයි. යම්සේ මිනිස්සු පියවිත් සෘද්ධි නැතියාහු නො බිඳෙන පොළොවෙහි යෙත් ද එසෙයින් මැ ඒ චෙතොවශීප්‍රාප්ත වූ සෘද්ධිමත් තෙමේ නො බිඳෙන දියෙහි පොළොවෙහි සෙයින් යේ

**ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො** යනු: පියවිත් පඨවිකසිණසමවත් ලබනසුලු වෙයි, ආකාශය ආවර්ජනා කෙරෙයි, ආවර්ජනා කොට 'පොළොව් වේවයි' නුවණින් ඉටයි. හේ පොළොව් වෙයි. හේ අහස්හි අන්තරීක්ෂයෙහි සක්මන් කෙරෙයි සිටියි හිඳියි හෙව්මුදු කෙරෙයි, යම්සේ මිනිස්සු පියවිත් සෘද්ධි නැතියාහු පොළොවෙහි සක්මන් කෙරෙත් ද සිටිත් ද හිඳිත් ද හෙව්මුදු කෙරෙත් ද එසෙයින් මැ ඒ සිත් විසීබවට පැමිණි ඉඳුහ ඇත්තේ පියා ඇති ලිහිණියකු සෙයින් අහස්හි අන්තරීක්ෂයෙහි සක්මනුදු කෙරෙයි සිටියි හිඳියි හෙව්මුදු කෙරේ.

**ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජති** යනු: මෙ සස්නෙහි ඒ සිත්විසීපත් ඉඳුහ ඇතියේ හුන්නේ වේවයි හොත්තේ වේවයි සඳහිරු දෙදෙන ආවර්ජනා කෙරෙයි, ආවර්ජනා කොට 'අත්පසැ වේව'යි නුවණින් ඉටයි, අත්පසැ වෙයි. හෙතෙම හුන්නේ වේව'යි හොත්තේ වේව'යි සඳහිරු දෙදෙන අතින් ආමර්ශී කෙරෙයි පරාමර්ශී කෙරෙයි පරිමාර්ජන කෙරෙයි. යම්සේ මිනිස්සු පියවිත් සෘද්ධි නැතියාහු අත්පසැ කිසි කවර රූපයක් ආමර්ශී පරාමර්ශී පරිමාර්ජන කෙරෙත් ද එසෙයින් මැ ඒ සිත්විසීපත් ඉඳුහ ඇත්තෝ හුන්නේ වේවයි හොත්තේ වේවයි සඳහිරු දෙදෙන අතින් ආමර්ශී පරාමර්ශී පරිමාර්ජන කෙරේ

යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙතීති සචෙ සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො බ්‍රහ්මලොකං ගන්තුකාමො හොති, දූරෙපි සන්තිකෙ අධිට්ඨාති: ‘සන්තිකෙ හොතූ’ති, සන්තිකෙ හොති, සන්තිකෙපි දූරෙ අධිට්ඨාති ‘දූරෙ හොතූ’ති දූරෙ හොති. බහුකම්පි ථොකං අධිට්ඨාති ථොකං හොතූ’ති ථොකං හොති. ථොකම්පි බහුකං අධිට්ඨාති බහුකං හොතූ’ති බහුකං හොති. දිබ්බෙන චක්ඛුනා තස්ස බ්‍රහ්මුනො රූපං පස්සති, දිබ්බාය සොතධාතුයා තස්ස බ්‍රහ්මුනො සද්දං සුණාති, චෙතොපරියඤාණෙන තස්ස බ්‍රහ්මුනො චිත්තං පජානාති; සචෙ සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො දිස්සමානෙන කායෙන බ්‍රහ්මලොකං ගන්තුකාමො හොති, කායවසෙන චිත්තං පරිණාමෙති, කායවසෙන චිත්තං අධිට්ඨාති. කායවසෙන චිත්තං පරිණාමෙත්වා කායවසෙන චිත්තං අධිට්ඨහිත්වා සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච ඔක්කමිත්වා දිස්සමානෙන කායෙන බ්‍රහ්මලොකං ගච්ඡති. සචෙ සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො අදිස්සමානෙන කායෙන බ්‍රහ්මලොකං ගන්තුකාමො හොති, චිත්තවසෙන කායං පරිණාමෙති චිත්තවසෙන කායං අධිට්ඨාති. චිත්තවසෙන කායං පරිණාමෙත්වා චිත්තවසෙන කායං අධිට්ඨහිත්වා සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච ඔක්කමිත්වා අදිස්සමානෙන කායෙන බ්‍රහ්මලොකං ගච්ඡති. සො තස්ස බ්‍රහ්මුනො පුරතො රූපං[1] අභිනිම්මිනාති මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගං[2] අහීනින්ද්‍රියං සචෙ සො ඉද්ධිමා චඞ්කමති, නිම්මිතොපි තත්‍ථ චඞ්කමති, සචෙ සො ඉද්ධිමා තිට්ඨති, නිම්මිතොපි තත්‍ථ තිට්ඨති. සචෙ සො ඉද්ධිමා නිසීදති, නිම්මිතොපි තත්‍ථ නිසීදති. සචෙ සො ඉද්ධිමා සෙය්‍යං කප්පෙති, නිම්මිතොපි තත්‍ථ සෙය්‍යං කප්පෙති. සචෙ සො ඉද්ධිමා ධූමායති, නිම්මිතොපි තත්‍ථ ධූමායති. සචෙ සො ඉද්ධිමා පජ්ජලති, නිම්මිතොපි තත්‍ථ පජ්ජලති. සචෙ සො ඉද්ධිමා ධම්මං භාසති, නිම්මිතොපි තත්‍ථ ධම්මං භාසති. සචෙ සො ඉද්ධිමා පඤ්හං පුච්ඡති, නිම්මිතොපි තත්‍ථ පඤ්හං පුච්ඡති. සචෙ සො ඉද්ධිමා පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති, නිම්මිතොපි තත්‍ථ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති සචෙ සො ඉද්ධිමා තෙන බ්‍රහ්මුනා සද්ධිං සන්තිට්ඨති සල්ලපති සාකච්ඡං සමාපජ්ජති, නිම්මිතොපි තත්‍ථ තෙන බ්‍රහ්මුනා සද්ධිං සන්තිට්ඨති සල්ලපති සාකච්ඡං සමාපජ්ජති. යඤ්ඤදෙව සො ඉද්ධිමා කරොති, තං තදෙව හි සො නිම්මිතො කරොතීති. අයං අධිට්ඨානා ඉද්ධි.

කතමා විකුබ්බනා ඉද්ධි: සිඛිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අභිභූ නාම සාවකො බ්‍රහ්මලොකෙ ඨිතො සහස්සිලොකධාතුං සරෙන විඤ්ඤාපෙසි.[3] සො දිස්සමානෙනපි කායෙන ධම්මං දෙසෙසි,[4] අදිස්සමානෙනපි කායෙන ධම්මං දෙසෙසි, දිස්සමානෙනපි හෙට්ඨිමෙන උපඩ්ඪකායෙන අදිස්සමානෙනපි උපරිමෙන උපඩ්ඪකායෙන ධම්මං දෙසෙසි, දිස්සමානෙනපි උපරිමෙන උපඩ්ඪකායෙන අදිස්සමානෙනපි හෙට්ඨිමෙන උපඩ්ඪකායෙන ධම්මං දෙසෙසි. සො පකතිවණ්ණං විජහිත්වා කුමාරවණ්ණං වා දස්සෙති, නාගවණ්ණං වා දස්සෙති, සුපණ්ණවණ්ණං වා දස්සෙති, යක්ඛවණ්ණං වා දස්සෙති, අසුරවණ්ණං වා[5] දස්සෙති, ඉන්දවණ්ණං වා දස්සෙති, දෙවවණ්ණං වා දස්සෙති, බ්‍රහ්මවණ්ණං වා දස්සෙති, සමුද්දවණ්ණං දස්සෙති, පබ්බතවණ්ණං වා දස්සෙති, වනවණ්ණං වා දස්සෙති, සීහවණ්ණං වා දස්සෙති, ව්‍යග්ඝවණ්ණං වා දස්සෙති, දීපිවණ්ණං වා දස්සෙති, හත්‍ථිම්පි දස්සෙති, අස්සම්පි දස්සෙති, රථම්පි දස්සෙති, පත්තිම්පි දස්සෙති, විවිධම්පි සෙනාබ්‍යූහං දස්සෙතීති. අයං විකුබ්බනා ඉද්ධි.

---

1 රූපි. - මජසං.   2 සබ්බඞ්ගපච්චඞ්ගිං - මජසං.   3 විඤ්ඤාපෙති - PTS.
4 දෙසෙති - PTS   5 අසුරවණ්ණං - මජසං පොත්‍ථකෙ නත්‍ථි.

**යාව බ්‍රහ්මලෝකාපි කායෙන වසං වත්තෙති** යනු: ඉද්ධිමත් ඒ සිත්-විසිපත් සෘද්ධි ඇත්තේ බඹලොවට යනු කැමැති වෙයි, දුරැදු වුව 'වැළැත් වේව'යි ඉටයි, හේ වැළැත් වෙයි, වැළැතුදු වුව 'දුර වේව'යි ඉටයි, හේ දුර වෙයි. බොහෝ ද වුව 'මඳ වේව'යි ඉටයි හේ මඳ වෙයි. මඳ ද වුව, බොහෝ වේව'යි ඉටයි හේ බොහෝ වෙයි, දිවැසින් ඒ බඹහුගේ රූපය බලයි, දිවසෝතයින් ඒ බඹහුගේ හඬ අසයි. පරසිත්දත්නා නුවණින් ඒ බඹහුගේ සිත දැනගනියි. ඉද්ධිමත් ඒ සිත්විසිපත් ඉදුහ ඇත්තේ පැනෙන සිරිරින් බඹලෙව් යාවි වේ නම් කාය වශයෙන් සිත පිරිනමයි කාය වශයෙන් සිත ඉටයි. කා විසින් සිත පිරිනමා, කා විසින් සිත ඉටා සුඛසංඥාවට ද ලඝුසංඥාවට ද බැසැගෙන පැනෙන සිරිරින් බඹලොවට යෙයි. ඉද්ධිමත් ඒ සිත් විසිපත් සෘද්ධි ඇත්තේ නො පැනෙන සිරිරින් බඹලොවට යාවි වේ නම් චිත්ත වශයෙන් කාය පිරිනමයි, චිත්ත වශයෙන් කාය ඉටයි. චිත්ත වශයෙන් කාය පිරිනමා චිත්ත වශයෙන් කාය ඉටා සුඛසංඥාවට ද ලඝුසංඥාවට ද බැසැගෙන නො පැනෙන සිරිරින් බඹලොවට යෙයි. හේ ඒ බඹහු ඉදිරි-යෙහි සියලු අඟපසඟ ඇති නො පිරිහුණු ඉඳුරන් ඇති මනොමයරූපයක් නිර්මාණය කෙරෙයි ඉද්ධිමත් ඒ සෘද්ධි ඇත්තේ සක්මන් කෙරේ නම් නිර්මිත වූයේ ද එහි සක්මන් කෙරෙයි ඉද්ධිමත් ඒ සෘද්ධි ඇත්තේ සිටී නම් නිර්මිත වූයේ ද එහි සිටී. ඉද්ධිමත් ඒ සෘද්ධි ඇත්තේ හිඳී නම් නිර්මිත වූයේ ද එහි හිඳී. ඉද්ධිමත් ඒ සෘද්ධි ඇත්තේ යහන්හි හොවී නම් නිර්මිත වූයේ ද එහි යහන්හි හොවී. ඉද්ධිමත් ඒ සෘද්ධි ඇත්තේ දුමා නම් නිර්මිත වූයේ ද එහි දුමයි. ඉද්ධිමත් ඒ සෘද්ධි ඇත්තේ දිලියේ නම් නිර්මිත වූයේ ද එහි දිලියෙයි. ඉද්ධිමත් ඒ සෘද්ධි ඇත්තේ බෙණේ නම් නිර්මිත වූයේ ද එහි බෙණෙයි ඉද්ධිමත් ඒ සෘද්ධි ඇත්තේ පැන පුළුවුසී නම් නිර්මිත වූයේ ද එහි පැන පුළුවුස්සි. ඉද්ධිමත් ඒ සෘද්ධි ඇත්තේ පැන පුළුවුස්නාලද්දේ විසඳා නම් නිර්මිත වූයේ ද එහි පැන පුළුවුස්නාලද්දේ විසඳයි: ඉද්ධිමත් ඒ සෘද්ධි ඇත්තේ ඒ බඹුන් හා සමග එක් වැ සිටී නම් සංලාප කෙරේ නම් සාකච්ඡාවට පැමිණේ නම් නිර්මිත වූයේ ද එහි ඒ බඹුන් හා සමග එක් වැ සිටී. සංලාප කෙරෙයි. සාකච්ඡාවට පැමි-ණෙයි. ඒ සෘද්ධි ඇත්තේ යමක් යමක් මැ කෙරේ නම් ඒ නිර්මිත වූයේ ඒ ඒ දැය මැ කෙරේ නු'යි මේ අධිෂ්ඨානසෘද්ධි නම.

විකුර්වණසෘද්ධි නම් කවර යත්: සිඛී නම් වූ භාග්‍යවත් අර්හත් සම්‍යක්-සම්බුද්ධයන්ගේ අභිභූ නම් ශ්‍රාවක තෙම බඹලොව්හි සිටියේ සහස්‍රීලෝක-ධාතුව ස්වරයෙන් විඥාපනය කෙළේ යැ හේ පැනෙන සිරුරිනුදු යුතු වැ දහම් දෙසී, නො පැනෙන සිරුරිනුදු යුතු වැ දහම් දෙසී, පැනෙන යටි අඩකයිනුදු නො පැනෙන උඩු අඩකයිනුදු යුතු වැ දහම් දෙසී, පැනෙන උඩු අඩකයිනුදු නො පැනෙන යටි අඩකයිනුදු යුතු වැ දහම් දෙසී. හේ පියවි පැහැසටහන් හැරපියා කුමරසටහන් හෝ දක්වයි, සර්පසටහන් හෝ දක්වයි, ගුරුළුසටහන් හෝ දක්වයි, යක්සටහන් හෝ දක්වයි, අසුරසටහන් හෝ දක්වයි, සක්සටහන් හෝ දක්වයි, දෙව්සටහන් හෝ දක්වයි, බඹසටහන් හෝ දක්වයි, මුහුදුසටහන් හෝ දක්වයි, පවුසටහන් හෝ දක්වයි, අරනසටහන් හෝ දක්වයි, සිංහසටහන් හෝ දක්වයි, වගසටහන් හෝ දක්වයි, දිවිසටහන් හෝ දක්වයි, ඇතකුදු දක්වයි, අසකුදු දක්වයි, රියදු පාබල ද දක්වයි, නොයෙක් සෙන්මුළුදු දක්වා නු'යි මේ විකුර්වණ සෘද්ධි නම.

කතමා මනොමයා ඉද්ධි: ඉධ භික්ඛු ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගං[1] අහීනින්ද්‍රියං, සෙය්‍යථාපි පුරිසො මුඤ්ජම්හා ඊසිකං පවාහෙය්‍ය, තස්ස එවමස්ස: 'අයං මුඤ්ජො අයං ඊසිකා, අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඊසිකා, මුඤ්ජම්හා ත්වෙව ඊසිකා පවාළ්හා'ති. සෙය්‍යථා වා පන[2] පුරිසො අසිං කොසියා පවාහෙය්‍ය, තස්ස එවමස්ස: 'අයං අසි, අයං කොසි. අඤ්ඤො අසි, අඤ්ඤා කොසි. කොසියා ත්වෙව අසි පවාළ්හො'ති. සෙය්‍යථා වා පන පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස එවමස්ස: 'අයං අහි, අයං කරණ්ඩො, අඤ්ඤො අහි, අඤ්ඤො කරණ්ඩො. කරණ්ඩා ත්වෙව අහි උබ්භතො'ති. එවමෙව භික්ඛු ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගං අහීනින්ද්‍රියං. අයං මනොමයා ඉද්ධි.

කතමා ඤාණවිප්ඵාරා ඉද්ධි අනිච්චානුපස්සනාය නිච්චසඤ්ඤාය පහානට්ඨො ඉජ්ඣතීති ඤාණවිප්ඵාරා ඉද්ධි. දුක්ඛානුපස්සනාය සුඛසඤ්ඤාය -පෙ- අනත්තානුපස්සනාය අත්තසඤ්ඤාය -පෙ- නිබ්බිදානුපස්සනාය නන්දියා -පෙ- විරාගානුපස්සනාය රාගස්ස -පෙ- නිරොධානුපස්සනාය සමුදයස්ස -පෙ- පටිනිස්සග්ගානුපස්සනාය ආදීනවස්ස පහානට්ඨො ඉජ්ඣතීති ඤාණවිප්ඵාරා ඉද්ධි. ආයස්මතො බක්කුලස්ස ඤාණවිප්ඵාරා ඉද්ධි. ආයස්මතො සඞ්කිච්චස්ස ඤාණවිප්ඵාරා ඉද්ධි. ආයස්මතො භූතපාලස්ස ඤාණවිප්ඵාරා ඉද්ධි. අයං ඤාණවිප්ඵාරා ඉද්ධි.

කතමා සමාධිවිප්ඵාරා ඉද්ධි: පඨමෙන ඣානෙන නීවරණානං පහානට්ඨො ඉජ්ඣතීති සමාධිවිප්ඵාරා ඉද්ධි. දුතියෙන ඣානෙන විතක්කවිචාරානං පහානට්ඨො ඉජ්ඣතීති සමාධිවිප්ඵාරා ඉද්ධි. තතියෙන ඣානෙන පීතියා පහානට්ඨො ඉජ්ඣතීති -පෙ- චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛානං පහානට්ඨො ඉජ්ඣතීති-පෙ-ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය පහානට්ඨො ඉජ්ඣතීති -පෙ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤාය පහානට්ඨො ඉජ්ඣතීති -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය පහානට්ඨො ඉජ්ඣතීති -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය පහානට්ඨො ඉජ්ඣතීති සමාධිවිප්ඵාරා ඉද්ධි. ආයස්මතො සාරිපුත්තස්ස සමාධිවිප්ඵාරා ඉද්ධි. ආයස්මතො සඤ්ජීවස්ස සමාධිවිප්ඵාරා ඉද්ධි. ආයස්මතො ඛාණුකොණ්ඩඤ්ඤස්ස සමාධිවිප්ඵාරා ඉද්ධි උත්තරාය උපාසිකාය සමාධිවිප්ඵාරා ඉද්ධි, සාමාවතියා උපාසිකාය සමාධිවිප්ඵාරා ඉද්ධි. අයං සමාධිවිප්ඵාරා ඉද්ධි.

---

1 සබ්බඞ්ගපච්චඞ්ගිං - මජසං 2 සෙය්‍යථාපි වා පන - PTS

මනෝමය ඍද්ධි නම් කවර යත්: මෙ සස්නෙහි මහණ මේ කයින් රූපී වූ මනෝමය වූ සියලු අඟපසඟ ඇති නො පිරිහුණු ඉඳුරන් ඇති අනික් කයක් නිර්මාණය කෙරෙයි, යම්සේ පුරුෂයෙක් මුඤ්ජතෘණයෙන් කඩ (ගොබය) අදනේ නම් ඔහට මෙබඳු සිතෙක් වන්නේ යැ: ''මේ මුඤ්ජතෘණ යැ මේ කඩ යැ මුඤ්ජතෘණය අනෙකෙක, කඩ අනෙකෙකි. මුඤ්ජතෘණයෙන් මැ කඩ අදනාලද්දැ'යි. තවද යම්සේ හෝ පුරුෂයෙක් කඩුව කොපුවෙන් අදනේ නම් ඔහට මෙබඳු සිතෙක් වන්නේ යැ: මේ කඩුව ය මේ කොපුව යැ කඩුව අනෙකෙක, කොපුව අනෙකෙකි. කොපුවෙන් මැ කඩුව අදනාලද්දැ' යි. තවද යම්සේ හෝ පුරුෂයෙක් සර්පයකු නිර්මෝක (සැව) යෙන් නඟන්නේ නම් (සර්පයා තමා මැ සැව නඟතු පුරුෂ තෙම සිතින් ගෙනැ'යි යූ සේ යි) ඔහට මෙබඳු සිතෙක් වන්නේ යැ: 'මේ සර්ප යැ මේ නිර්මෝක යැ සර්පයා අනෙකෙක, නිර්මෝකය අනෙකෙකි. නිර්මෝකයෙන් මැ සර්පයා නඟනලද්දැ' යි. එසෙයින් මැ මහණ තෙම මේ කයින් රූපී වූ මනෝමය වූ සියලු අඟපසඟ ඇති නො පිරිහුණු ඉඳුරන් ඇති අනික් කයක් නිර්මාණය කෙරෙයි මේ මනෝමය ඍද්ධි නම.

ඥානවිස්ඵාරඍද්ධි නම් කවර යත්: අනිත්‍යානුදර්ශනයෙන් නිත්‍යසංඥාවගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ඥානවිස්ඵාර ඍද්ධි යැ දුඃඛානුදර්ශනයෙන් සුඛසංඥාවගේ ... අනාත්මානුදර්ශනයෙන් ආත්මසංඥාවගේ ... නිර්වේදානුදර්ශනයෙන් නන්දියගේ .. විරාගානුදර්ශනයෙන් රාගයාගේ ... නිරෝධානුදර්ශනයෙන් සමුදයාගේ ... පටිනිස්සග්ගානුපස්සනායෙන් ආදීනවයාගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ඥානවිස්ඵාර ඍද්ධි යැ. ආයුෂ්මත් බක්කුලහට ඥානවිස්ඵාර ඍද්ධි යැ. ආයුෂ්මත් සඞ්කිච්චහට ඥානවිස්ඵාර ඍද්ධි යැ. ආයුෂ්මත් භූතපාලහට ඥානවිස්ඵාර ඍද්ධි යැ. මේ ඥානවිස්ඵාරඍද්ධි නම.

සමාධිවිස්ඵාර ඍද්ධි නම් කවර යත්: ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි සමාධිවිස්ඵාර ඍද්ධි යැ. ද්විතීය ධ්‍යානයෙන් විතර්කවිචාරයන්ගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි සමාධිවිස්ඵාර ඍද්ධි යැ. තෘතීයධ්‍යානයෙන් ප්‍රීතියගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ... චතුර්ථධ්‍යානයෙන් සුඛදුඃඛයන්ගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ... ආකාසානඤ්චායතනසමාපත්තියෙන් රූපසංඥාවගේ ප්‍රතිඝසංඥාවගේ නානාත්ව සංඥාවගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ... විඤ්ඤාණඤ්චායතනසමාපත්තියෙන් ආකාසානඤ්චායතනසංඥාවගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි .. ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියෙන් විඥානානන්ත්‍යායතනසංඥාවගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සංඥාවගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි සමාධිවිස්ඵාර ඍද්ධි යැ. ආයුෂ්මත් ශාරිපුත්‍රයන්ට සමාධිවිස්ඵාර ඍද්ධි යැ. ආයුෂ්මත් සඤ්ජීවයන්ට සමාධිවිස්ඵාර ඍද්ධි යැ ආයුෂ්මත් ඛාණුකොණ්ඩඤ්ඤයන්ට සමාධිවිස්ඵාර ඍද්ධි යැ. උත්තරාඋවැසියට සමාධිවිස්ඵාර ඍද්ධි යැ. සාමාවතීඋවැසියට සමාධිවිස්ඵාර ඍද්ධි යැ. මේ සමාධිවිස්ඵාර ඍද්ධි නම.

කතමා අරියා ඉද්ධි: ඉධ භික්ඛු සචෙ ආකඞ්ඛති 'පටික්කූලෙ අප්පටික්කූලසඤ්ඤී විහරෙය්‍ය'න්ති, අප්පටික්කූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති 'අප්පටික්කූලෙ පටික්කූලසඤ්ඤී විහරෙය්‍ය'න්ති පටික්කූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති 'පටික්කූලෙ ච අප්පටික්කූලෙ ච අප්පටික්කූලසඤ්ඤී විහරෙය්‍ය'න්ති අප්පටික්කූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති 'අප්පටික්කූලෙ ච පටික්කූලෙ ච පටික්කූලසඤ්ඤී විහරෙය්‍ය'න්ති පටික්කූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති 'පටික්කූලෙ ච අප්පටික්කූලෙ ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානො'ති උපෙක්ඛකො තත්ථ විහරති සතො සම්පජානො.

කථං පටික්කූලෙ අප්පටික්කූලසඤ්ඤී විහරති: අනිට්ඨස්මිං වත්ථුස්මිං මෙත්තාය වා ඵරති, ධාතුතො වා උපසංහරති, එවං පටික්කූලෙ අප්පටික්කූලසඤ්ඤී විහරති.

කථං අප්පටික්කූලෙ පටික්කූලසඤ්ඤී විහරති: ඉට්ඨස්මිං වත්ථුස්මිං අසුභාය වා ඵරති, අනිච්චතො වා උපසංහරති, එවං අප්පටික්කූලෙ පටික්කූලසඤ්ඤී විහරති.

කථං පටික්කූලෙ ච අප්පටික්කූලෙ ච අප්පටික්කූලසඤ්ඤී විහරති: අනිට්ඨස්මිං ච ඉට්ඨස්මිං ච වත්ථුස්මිං මෙත්තාය වා ඵරති, ධාතුතො වා උපසංහරති. එවං පටික්කූලෙ ච අප්පටික්කූලෙ ච අප්පටික්කූලසඤ්ඤී විහරති.

කථං අප්පටික්කූලෙ ච පටික්කූලෙ ච පටික්කූලසඤ්ඤී විහරති: ඉට්ඨස්මිං ච අනිට්ඨස්මිං ච වත්ථුස්මිං අසුභාය වා ඵරති, අනිච්චතො වා උපසංහරති. එවං අප්පටික්කූලෙ ච පටික්කූලෙ ච පටික්කූලසඤ්ඤී විහරති

කථං පටික්කූලෙ ච අප්පටික්කූලෙ ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරති සතො සම්පජානො: ඉධ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො විහරති සතො සම්පජානො. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො විහරති සතො සම්පජානො. එවං පටික්කූලෙ ච අප්පටික්කූලෙ ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරති සතො සම්පජානො. අයං අරියා ඉද්ධි.

කතමා කම්මවිපාකජා ඉද්ධි: සබ්බෙසං පක්ඛීනං සබ්බෙසං දෙවානං එකච්චානං මනුස්සානං එකච්චානං විනිපාතිකානං. අයං කම්මවිපාකජා ඉද්ධි.

ආර්‍ය්‍ය ඍද්ධි නම් කවර යත්: මෙ සස්නෙහි මහණ තෙම ඉදින් ‘ප්‍රතිකූලයෙහි අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙමි’ කැමැති වි නම් එහි අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි. ඉදින් ‘අප්‍රතිකූලයෙහි ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙමී’ කැමැති වී නම් එහි ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි. ඉදින් ‘ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙමී’ කැමැති වී නම් එහි අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි. ඉදින් ‘අප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙමී’ කැමැති වී නම් එහි ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි. ඉදින් ‘ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද එ දෙක හැරපියා සිහි ඇති වැ සම්‍ප්‍රජ්ඥාන ඇති වැ උපෙක්‍ෂක වැ වාසය කෙරෙමී’ කැමැති වී නම් එහි සිහි ඇති වැ සම්‍ප්‍රජ්ඥාන ඇති වැ උපෙක්‍ෂක වැ වාසය කෙරේ.

කිසෙයින් ප්‍රතිකූලයෙහි අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි යත්: අනිෂ්ටවස්තුවිෂයෙහි මෛත්‍රියෙන් අරමුණු කෙරෙයි. ධාතු හෙයින් හෝ එළවයි. මෙසෙයින් ප්‍රතිකූලයෙහි අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි.

කිසෙයින් අප්‍රතිකූලයෙහි ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරේ ද යත්: ඉෂ්ටවස්තුවිෂයෙහි අශුභසිතින් හෝ සපශී කෙරෙයි, අනිත්‍ය හෙයින් හෝ එළවයි, මෙසෙයින් අප්‍රතිකූලයෙහි ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි.

කිසෙයින් ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරේ ද යත්: අනිෂ්ට වූ ද ඉෂ්ට වූ ද වස්තුවිෂයෙහි මෛත්‍රියෙන් හෝ සපශී කෙරෙයි, ධාතු හෙයින් හෝ එළවයි. මෙසෙයින් ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි.

කිසෙයින් අප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරේ ද යත්: ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද වස්තුවිෂයෙහි අශුභසිතින් හෝ සපශී කෙරෙයි, අනිත්‍ය හෙයින් හෝ එළවයි. මෙසෙයින් අප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි.

කිසෙයින් ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද එ දෙක හැරපියා සිහි ඇති වැ සම්‍ප්‍රජ්ඥාන ඇති වැ උපෙක්‍ෂක වැ වාසය කෙරෙයි යත්: මෙසස්නෙහි ක්‍ෂීණාශ්‍රව මහණ ඇසින් රූපය දැක නො මැ සොම්නස් ඇති වෙයි, නො මැ දොම්නස් ඇති වෙයි. සිහි ඇතියේ සම්‍ප්‍රජ්ඥාන ඇතියේ උපෙක්‍ෂක වැ වාසය කෙරෙයි. කනින් හඬ අසා ... නැහැයෙන් ගඳ අසා ... දිවින් රස විඳ ... කයින් පැහැසියයුතු පැහැස ... මනසින් දහම් දැන නො මැ සොම්නස් ඇති වෙයි නො මැ දොම්නස් ඇති වෙයි, සිහි ඇතියේ සම්‍ප්‍රජ්ඥාන ඇතියේ උපෙක්‍ෂක වැ වාසය කෙරෙයි. මෙසෙයින් ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද එ දෙක හැරපියා සිහි ඇතියේ සම්‍ප්‍රජ්ඥාන ඇතියේ උපෙක්‍ෂක වැ වාසය කෙරේ. මේ ආර්‍ය්‍යඍද්ධි නම.

කර්මවිපාකජ ඍද්ධි නම් කවර යත්: හැම පක්‍ෂීන්ට හැම දෙවියනට ඇතැම් මිනිසුනට ඇතැම් විනිපාතිකයනට, මේ කර්මවිපාකජ ඍද්ධි නම.

කතමා පුඤ්ඤවතො ඉද්ධි: රාජා චක්කවත්ති[1] වෙහාසං ගච්ඡති සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය අන්තමසො අස්සබන්ධගොබන්ධපුරිසෙ[2] උපාදාය, ජොතියස්ස[3] ගහපතිස්ස පුඤ්ඤවතො ඉද්ධි, ජටිලස්ස ගහපතිස්ස පුඤ්ඤවතො ඉද්ධි, මෙණ්ඩකස්ස ගහපතිස්ස පුඤ්ඤවතො ඉද්ධි, ඝොසිතස්ස ගහපතිස්ස පුඤ්ඤවතො ඉද්ධි, පඤ්චන්නං මහාපුඤ්ඤානං පුඤ්ඤවතො ඉද්ධි. අයං පුඤ්ඤවතො ඉද්ධි.

කතමා විජ්ජාමයා ඉද්ධි: විජ්ජාධරා විජ්ජං පරිජප්පෙත්වා[4] වෙහාසං ගච්ඡන්ති, ආකාසෙ අන්තලික්ඛෙ හත්ථිම්පි දස්සෙන්ති, අස්සම්පි දස්සෙන්ති, රථම්පි දස්සෙන්ති, පත්තිම්පි දස්සෙන්ති, විවිධම්පි සෙනාබ්‍යූහං දස්සෙන්ති, අයං විජ්ජාමයා ඉද්ධි.

කථං තත්ථ තත්ථ සම්මා පයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි: නෙක්ඛම්මෙන කාමච්ඡන්දස්ස පහානට්ඨො ඉජ්ඣතීති තත්ථ තත්ථ සම්මාපයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි. අබ්‍යාපාදෙන බ්‍යාපාදස්ස පහානට්ඨො ඉජ්ඣතීති තත්ථ තත්ථ සම්මා පයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසානං පහානට්ඨො ඉජ්ඣතීති තත්ථ තත්ථ සම්මාපයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි. එවං තත්ථ තත්ථ සම්මා පයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි ඉමා දස ඉද්ධියො.

ඉද්ධිකථා සමත්තා.

1. චක්කවත්ති - සයා°, PTS. 2. ගොපුරිසෙ - මජසං, ගොපාලක පුරිසෙ - PTS.
3. ජොතිකස්ස - මජසං, 4. පරිජපෙත්වා - මජසං.

පින්වත්හුගේ සෘද්ධි නම් කවර යත්, සක්විතිරජ සිව්රඟසෙන් හා සමග යටත්පිරිසෙයින් අස්පලූ ගොපලු පුරුෂයන් දක්වා ගෙන අහස්හි යෙයි. ජෝතිය ගැහැවිහට පින්වත්හුගේ සෘද්ධි යැ, ජටිල ගැහැවිහට පින්වත්හුගේ සෘද්ධි යැ, මෙණ්ඩක ගැහැවිහට පින්වත්හුගේ සෘද්ධි යැ, ඝෝෂිත ගැහැවිහට පින්වත්හුගේ සෘද්ධි යැ, මහපිනැති පස්දෙනහට පින්වත්හුගේ සෘද්ධි යැ මේ පින්වත්හුගේ සෘද්ධි නම.

විද්‍යාමය සෘද්ධි නම් කවර යත්: විද්‍යාධරයෝ මතුරු දපා අහස්හි යෙති, අහස්හි අන්තරීක්‍ෂයෙහි ඇතකුදු දක්වති, අසකු දු දක්වති, රිය දු දක්වති, පාබල දු දක්වති, නොයෙක් සෙන්මුළු දු දක්වත් මේ විද්‍යාමය සෘද්ධි නම

කිසෙයින් ඒ ඒ ධර්මයෙහි සම්‍යක්ප්‍රයෝග හේතුයෙන් සිද්ධ වන අර්ථයෙන් සෘද්ධි වෙයි යත්: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දයාගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ඒ ඒ ධර්මයෙහි සම්‍යක්ප්‍රයෝගහෙතුයෙන් සිද්ධ වන අර්ථයෙන් සෘද්ධි යැ. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයාගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ඒ ඒ ධර්මයෙහි සම්‍යක්ප්‍රයෝග හේතුයෙන් සිද්ධ වන අර්ථයෙන් සෘද්ධි යැ ... රහත් මඟින් හැම කෙලෙසුන්ගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ඒ ඒ ධර්මයෙහි සම්‍යක්ප්‍රයෝග හේතුයෙන් සිද්ධ වන අර්ථයෙන් සෘද්ධි යැ. මෙසෙයින් ඒ ඒ ධර්මයෙහි සම්‍යක්ප්‍රයොග හෙතුයෙන් සිද්ධ වන අර්ථයෙන් සෘද්ධි නමි. මොහු දශසෘද්ධිහු වෙත්.

සෘද්ධිකථා නිමි.

## 3. 3.

## අභිසමය කථා

**අභිසමයොති** කෙන අභිසමෙති: චිත්තෙන අභිසමෙති. හඤ්චි චිත්තෙන අභිසමෙති. තෙන හි අඤ්ඤාණී අභිසමෙති, න අඤ්ඤාණී අභිසමෙති, ඤාණෙන අභිසමෙති.

හඤ්චි ඤාණෙන අභිසමෙති, තෙන හි අචිත්තකො[1] අභිසමෙති: න අචිත්තකො අභිසමෙති, චිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති.

හඤ්චි චිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති, තෙන හි කාමාවචරචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න කාමාවචරචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති.

තෙන හි රූපාවචරචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න රූපාවචරචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති. තෙන හි අරූපාවචරචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න අරූපාවචරචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති. තෙන හි කම්මස්සකතචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න කම්මස්සකතචිත්තෙන[2] ච ඤාණෙන ච අභිසමෙති. තෙන හි සච්චානුලොමිකචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න සච්චානුලොමිකචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති. තෙන හි අතීතචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න අතීතචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති. තෙන හි අනාගතචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න අනාගතචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති තෙන හි පච්චුප්පන්නලොකියචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න පච්චුප්පන්නලොකියචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති. ලොකුත්තරමග්ගක්ඛණෙ පච්චුප්පන්නචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති.

කථං ලොකුත්තරමග්ගක්ඛණෙ පච්චුප්පන්නචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: ලොකුත්තරමග්ගක්ඛණෙ උප්පාදාධිපතෙය්‍යං චිත්තං ඤාණස්ස හෙතුපච්චයො ච තංසම්පයුත්තං නිරොධගොචරං දස්සනාධිපතෙය්‍යං ඤාණං චිත්තස්ස හෙතුපච්චයො ච තංසම්පයුත්තං ඤාණං නිරොධගොචරං එවං ලොකුත්තරමග්ගක්ඛණෙ පච්චුප්පන්නචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති.

කිං නු එත්තකොයෙව අභිසමයොති: න හි ලොකුත්තරමග්ගක්ඛණෙ දස්සනාභිසමයො සම්මාදිට්ඨි, අභිනිරොපනාභිසමයො සම්මාසඞ්කප්පො, පරිග්ගහාභිසමයො සම්මාවාචා, සමුට්ඨානාභිසමයො සම්මාකම්මන්තො, වොදානාභිසමයො සම්මාආජීවො, පග්ගහාභිසමයො සම්මාවායාමො, උපට්ඨානාභිසමයො සම්මාසති, අවික්ඛෙපාභිසමයො සම්මාසමාධි.

---

1 අචිත්තෙන ච ඤාණෙන ච අචිත්තකො - මජසං.

කම්මස්සකතාචිත්තෙන - සයා ස කම්මස්සකචිත්තෙන - PTS

## 3. 3.

# අභිසමය කථා

**අභිසමයො** යනු: කුමකින් අභිසමය (ප්‍රතිවේධ) කෙරෙයි යත්: සිතින් අභිසමය කෙරෙයි. ඉදින් සිතින් අභිසමය කෙරේ නම් එසේ වී නම් ඥාන නැතියේ අභිසමය කෙරේ ද යත්: ඥාන නැතියේ අභිසමය නො කෙරෙයි, ඥානයෙන් අභිසමය කෙරෙයි.

ඉදින් ඥානයෙන් අභිසමය කෙරේ නම් එසේ වී නම් සිත් නැතියේ අභිසමය කෙරේ ද යත්: සිත් නැතියේ අභිසමය නො කෙරෙයි, සිතින් ද නැණින් ද අභිසමය කෙරෙයි.

ඉදින් සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ නම් එසේ වී නම් කාමාවචර සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: කාමාවචර සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි.

එසේ වී නම් රූපාවචර සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: රූපාවචර සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. එසේ වී නම් අරූපාවචර සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: අරූපාවචර සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. එසේ වී නම් කර්මස්වකෘත සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: කර්මස්වකෘත සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. එසේ වී නම් සත්‍යානුලෝමික සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: සත්‍යානුලෝමික සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. එසේ වී නම් අතීත සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: අතීත සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. එසේ වී නම් අනාගත සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: අනාගත සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. එසේ වී නම් ප්‍රත්‍යුත්පන්න ලෞකික සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: ප්‍රත්‍යුත්පන්න ලෞකික සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි ප්‍රත්‍යුත්පන්න වූ සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ.

කිසෙයින් ලෝකෝත්තරමාර්ගක්ෂණයෙහි ප්‍රත්‍යුත්පන්න වූ සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: ලෝකෝත්තරමාර්ගක්ෂණයෙහි උත්පාදය අධිපති කොට ඇති චිත්තය මාර්ගඥානයට හෙතු (ජනක) ද ප්‍රත්‍යය (උපස්ථම්භක) ද වෙයි. ඒ ඥානය හා සමග සම්ප්‍රයුක්ත වූ නිර්වාණාලම්බන වූ දර්ශනාධිපති වූ ඥානය චිත්තයට හේතු ද ප්‍රත්‍යය ද වෙයි ඒ චිත්තය හා සමග සම්ප්‍රයුක්ත වූ ඥානය නිර්වාණාලම්බන වෙයි. මෙසෙයින් ලෝ- කෝත්තරමාර්ගක්ෂණයෙහි ප්‍රත්‍යුත්පන්න වූ සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ.

කිම මෙතෙක් මැ අභිසමය වෙයි යත්: නැති. ලොකොත්තරමාර්ගක්ෂ- ණයෙහි සම්‍යග්දෘෂ්ටිය දර්ශන (සඞ්ඛ්‍යාත) අභිසමය වෙයි, සම්‍යක්සඞ්කල්පය අභිනිරොපණාභිසමය වෙයි, සම්‍යග්වචනය පරිග්‍රහාභිසමය වෙයි, සම්‍යක්- කර්මාන්තය සමුත්ථානාභිසමය වෙයි, සම්‍යගාජීවය ව්‍යවදානාභිසමය වෙයි, සම්‍යග්ව්‍යායාමය ප්‍රග්‍රහාභිසමය වෙයි, සම්‍යක්ස්මෘතිය උපස්ථානාභිසමය වෙයි, සම්‍යක්සමාධිය අවික්ෂෙපාභිසමය වේ.

උපට්ඨානාභිසමයො සතිසම්බොජ්ඣඞ්ගො, පවිචයාභිසමයො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, පග්ගහාභිසමයො විරියසම්බොජ්ඣඞ්ගො, ඵරණාභිසමයො පීතිසම්බොජ්ඣඞ්ගො, උපසමාභිසමයො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, අවික්ඛෙපාභිසමයො, සමාධිසම්බොජ්ඣඞ්ගො, පටිසඞ්ඛානාභිසමයො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

අස්සද්ධියෙ අකම්පියාභිසමයො සද්ධාබලං, කොසජ්ජෙ අකම්පියාභිසමයො විරියබලං, පමාදෙ අකම්පියාභිසමයො සතිබලං, උද්ධච්චෙ අකම්පියාභිසමයො සමාධිබලං, අවිජ්ජාය අකම්පියාභිසමයො පඤ්ඤාබලං.

අධිමොක්ඛාභිසමයො සද්ධින්ද්‍රියං, පග්ගහාභිසමයො විරියින්ද්‍රියං, උපට්ඨානාභිසමයො සතින්ද්‍රියං, අවික්ඛෙපාභිසමයො සමාධින්ද්‍රියං, දස්සනාභිසමයො පඤ්ඤින්ද්‍රියං.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියාභිසමයො, අකම්පියට්ඨෙන බලාභිසමයො, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගාභිසමයො, හෙතුට්ඨෙන මග්ගාභිසමයො, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානාභිසමයො, පදහනට්ඨෙන[1] සම්මප්පධානාභිසමයො, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදාභිසමයො, තථට්ඨෙන සච්චාභිසමයො, අවික්ඛෙපට්ඨෙන සමථාභිසමයො, අනුපස්සනට්ඨෙන විපස්සනාභිසමයො, එකරසට්ඨෙන සමථවිපස්සනාභිසමයො, අනතිවත්තනට්ඨෙන යුගනද්ධාභිසමයො,[2] සංවරට්ඨෙන සීලවිසුද්ධිඅභිසමයො, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධිඅභිසමයො, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධිඅභිසමයො, මුත්තට්ඨෙන අධිමොක්ඛාභිසමයො, පටිවෙධට්ඨෙන විජ්ජාභිසමයො, පරිච්චාගට්ඨෙන විමුත්තිඅභිසමයො, සමුච්ඡෙදට්ඨෙන ඛයෙඤාණං අභිසමයො.

ඡන්දො මූලට්ඨෙන අභිසමයො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන අභිසමයො, ඵස්සො සමොධානට්ඨෙන අභිසමයො, වෙදනා සමොසරණට්ඨෙන අභිසමයො, සමාධි පමුඛට්ඨෙන අභිසමයො, සති ආධිපතෙය්‍යට්ඨෙන අභිසමයො, පඤ්ඤා තතුත්තරට්ඨෙන අභිසමයො, විමුත්ති සාරට්ඨෙන අභිසමයො, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන අභිසමයො.

කින්නු එත්තකොයෙව අභිසමයොති: න හි, සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනාභිසමයො සම්මාදිට්ඨි -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන අභිසමයො.

කින්නු එත්තකොයෙව අභිසමයොති: න හි, සොතාපත්තිඵලක්ඛණෙ දස්සනාභිසමයො සම්මාදිට්ඨි -පෙ- පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙ ඤාණං අභිසමයො, ඡන්දො මූලට්ඨෙන අභිසමයො, -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන අභිසමයො.

කින්නු එත්තකොයෙව අභිසමයොති: න හි, සකදාගාමිමග්ගක්ඛණෙ -පෙ- සකදාගාමිඵලක්ඛණෙ -පෙ- අනාගාමිමග්ගක්ඛණෙ -පෙ- අනාගාමිඵලක්ඛණෙ -පෙ- අරහත්තමග්ගක්ඛණෙ -පෙ- අරහත්තඵලක්ඛණෙ දස්සනාභිසමයො සම්මාදිට්ඨි, අභිනිරොපනාභිසමයො සම්මාසඞ්කප්පො -පෙ- පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙ ඤාණං අභිසමයො. ඡන්දො මූලට්ඨෙන අභිසමයො -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන අභිසමයො.

1 පදහනට්ඨෙන - මජසං. 2. යුගනන්ධාභිසමයො - සං

ස්මෘතිසම්බොධ්‍යඞ්ගය උපස්ථානාභිසමය වෙයි, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ප්‍රවිචය සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය ප්‍රග්‍රහාභිසමය වෙයි, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ඵරණ (ආලම්බනස්පර්ශ) සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ව්‍යුපශම සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, සමාධිසම්බොධ්‍යඞ්ගය අවික්ෂෙපාභිසමය වෙයි, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය ප්‍රත්‍යවෙක්ෂාභිසමය වේ.

ශ්‍රද්ධාබලය අශ්‍රද්ධායෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, වීර්‍ය්‍යබලය කුසීදභාවයෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, ස්මෘතිබලය ප්‍රමාදයෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, සමාධිබලය උද්ධතභාවයෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, ප්‍රඥාබලය අවිද්‍යායෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත අභිසමය වේ.

ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂ සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, වීර්‍ය්‍යෙන්ද්‍රියය ප්‍රග්‍රහ සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, ස්මෘතීන්ද්‍රියය උපස්ථාන (අරමුණෙහි එළඹීම) සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, සමාධීන්ද්‍රියය අවික්ෂෙප සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, ප්‍රඥෙන්ද්‍රියය දර්ශන සඞ්ඛ්‍යාත අභිසමය වේ.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියාභිසමය වෙයි, අකම්ප්‍යාර්ථයෙන් බලාභිසමය වෙයි, නියර්‍යාණාර්ථයෙන් බොධ්‍යඞ්ගාභිසමය වෙයි, හෙත්වර්ථයෙන් මාර්ගාභිසමය වෙයි, උපස්ථානාර්ථයෙන් සතිපට්ඨානාභිසමය වෙයි, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රධානාභිසමය වෙයි, සිද්ධ වන අර්ථයෙන් ඍද්ධිපාදාභිසමය වෙයි, යථාස්වභාවාර්ථයෙන් සත්‍යාභිසමය වෙයි, අවික්ෂෙපාර්ථයෙන් ශමථාභිසමය වෙයි, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාභිසමය වෙයි, එකකෘත්‍යාර්ථයෙන් ශමථවිදර්ශනාභිසමය වෙයි, (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා අර්ථයෙන් යුගනද්ධාභිසමය වෙයි, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධි සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධි සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධි සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, මුක්ත්‍යර්ථයෙන් අධිමොක්ෂාභිසමය වෙයි, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාභිසමය වෙයි, පරිත්‍යාගාර්ථයෙන් විමුක්ත්‍යභිසමය වෙයි, සමුච්ඡෙදාර්ථයෙන් ක්ෂයඥාන සඞ්ඛ්‍යාත අභිසමය වේ.

ඡන්දය මූලාර්ථයෙන් අභිසමය වෙයි, මනසිකාරය සමුත්ථානාර්ථයෙන් අභිසමය වෙයි, ස්පර්ශය සමවධානාර්ථයෙන් අභිසමය වෙයි, වෙදනාව සමවසරණාර්ථයෙන් අභිසමය වෙයි, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් අභිසමය වෙයි, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් අභිසමය වෙයි, ප්‍රඥාව තතුත්තරාර්ථයෙන් අභිසමය වෙයි, විමුක්තිය සාරාර්ථයෙන් අභිසමය වෙයි, අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් අභිසමය වේ.

කිම මෙතෙක් මැ අභිසමය වෙයි යත්: නැති. ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි සම්‍යග්දෘෂ්ටිය දර්ශනාභිසමය වෙයි ... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් අභිසමය වේ.

කිම මෙතෙක් මැ අභිසමය වෙයි යත්: නැති. ස්‍රොතාපත්තිඵලක්ෂණයෙහි සම්‍යග්දෘෂ්ටිය දර්ශනාභිසමය වෙයි ... ප්‍රතිප්‍රශ්‍රබ්ධිඅර්ථයෙන් අනුත්පාදයෙහි ඥානය අභිසමය වෙයි, ඡන්දය මූලාර්ථයෙන් අභිසමය වෙයි... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් අභිසමය වේ.

කිම මෙතෙක් මැ අභිසමය වෙයි යත්: නැති. සකෘදාගාමිමාර්ගක්ෂණයෙහි ... සකෘදාගාමිඵලක්ෂණයෙහි ... අනාගාමිමාර්ගක්ෂණයෙහි අනාගාමිඵලක්ෂණයෙහි ... අර්හත්මාර්ගක්ෂණයෙහි ... අර්හත්ඵලක්ෂණයෙහි සම්‍යග්දෘෂ්ටිය දර්ශන සඞ්ඛ්‍යාත අභිසමය වෙයි. සම්‍යක්සංකල්පය අභිනිරොපණ සඞ්ඛ්‍යාත අභිසමය වෙයි ... ප්‍රතිප්‍රශ්‍රබ්ධිඅර්ථයෙන් අනුත්පාදයෙහි ඥානය අභිසමය වෙයි, ඡන්දය මූලාර්ථයෙන් අභිසමය වෙයි ... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් අභිසමය වේ.

ස්වායං කිලෙසෙ පජහති, අතීතෙ කිලෙසෙ පජහති, අනාගතෙ කිලෙසෙ පජහති, පච්චුප්පන්නෙ කිලෙසෙ පජහති? 'අතීතෙ කිලෙසෙ පජහතී'ති හඤ්චි අතීතෙ කිලෙසෙ පජහති? තෙන හි ඛීණං ඛෙපෙති, නිරුද්ධං නිරොධෙති, විගතං විගමෙති, අත්ථඞ්ගතං අත්ථඞ්ගමෙති, අතීතං යං න අත්ථි, තං පජහතීති න අතීතෙ කිලෙසෙ පජහතීති.

අනාගතෙ කිලෙසෙ පජහතීති හඤ්චි අනාගතෙ කිලෙසෙ පජහති, තෙන හි අජාතං පජහති, අනිබ්බත්තං පජහති, අනුප්පන්නං පජහති, අපාතුභූතං පජහති, අනාගතං යං න අත්ථි, තං පජහතීති න අනාගතෙ කිලෙසෙ පජහතීති.

පච්චුප්පන්නෙ කිලෙසෙ පජහතීති හඤ්චි පච්චුප්පන්නෙ කිලෙසෙ පජහති. තෙන හි රත්තො රාගං පජහති, දුට්ඨො දොසං පජහති, මූළ්හො මොහං පජහති, විනිබද්ධො මානං පජහති, පරාමට්ඨො දිට්ඨිං පජහති, වික්ඛෙපගතො උද්ධච්චං පජහති, අනිට්ඨංගතො විචිකිච්ඡං පජහති, ථාමගතො අනුසයං පජහති, කණ්හාසුක්කධම්මා යුගනද්ධා සමමෙව වත්තන්ති, සඞ්කිලෙසිකා[1] මග්ගභාවනා හොති.

න හි අතීතෙ කිලෙසෙ පජහති, න අනාගතෙ කිලෙසෙ පජහති, න පච්චුප්පන්නෙ කිලෙසෙ පජහතීති හඤ්චි න අතීතෙ කිලෙසෙ පජහති, න අනාගතෙ -පෙ- න පච්චුප්පන්නෙ කිලෙසෙ පජහති, තෙන හි නත්ථි මග්ගභාවනා, නත්ථි ඵලසච්ඡිකිරියා, නත්ථි කිලෙසප්පහානං, නත්ථි ධම්මාභිසමයොති: අත්ථි මග්ගභාවනා, අත්ථි ඵලසච්ඡිකිරියා, අත්ථි කිලෙසප්පහානං, අත්ථි ධම්මාභිසමයො, යථාකථං විය: සෙය්‍යථාපි තරුණො රුක්ඛො අජාතඵලො, තමෙනං පුරිසො මූලං ඡින්දෙය්‍ය, යෙ තස්ස රුක්ඛස්ස අජාතඵලා තෙ අජාතායෙව න ජායන්ති, අනිබ්බත්තායෙව න නිබ්බත්තන්ති, අනුප්පන්නායෙව න උප්පජ්ජන්ති, අපාතුභූතායෙව න පාතුභවන්ති. එවමෙවං උප්පාදො හෙතු උප්පාදො පච්චයො කිලෙසානං නිබ්බත්තියාති උප්පාදෙ ආදීනවං දිස්වා අනුප්පාදෙ චිත්තං පක්ඛන්දති, අනුප්පාදෙ චිත්තස්ස පක්ඛන්දත්තා[2] යෙ උප්පාදපච්චයා කිලෙසා නිබ්බත්තෙය්‍යුං, තෙ අජාතායෙව න ජායන්ති, අනිබ්බත්තායෙව න නිබ්බත්තන්ති, අනුප්පන්නායෙව න උප්පජ්ජන්ති, අපාතුභූතායෙව න පාතුභවන්ති. එවං හෙතුනිරොධා දුක්ඛනිරොධො. පවත්තං හෙතු, නිමිත්තං හෙතු, ආයූහනා[3] හෙතු, ආයූහන පච්චයො කිලෙසානං නිබ්බත්තියාති ආයූහනෙ ආදීනවං දිස්වා අනායූහනෙ චිත්තං පක්ඛන්දති, අනායූහනෙ චිත්තස්ස පක්ඛන්දත්තා යෙ ආයූහනපච්චයා කිලෙසා නිබ්බත්තෙය්‍යුං තෙ අජාතායෙව න ජායන්ති, අනිබ්බත්තායෙව න නිබ්බත්තන්ති, අනුප්පන්නායෙව න උප්පජ්ජන්ති, අපාතුභූතායෙව න පාතුභවන්ති. එවං හෙතුනිරොධා දුක්ඛනිරොධො. එවං අත්ථි මග්ගභාවනා, අත්ථි ඵලසච්ඡිකිරියා, අත්ථි කිලෙසප්පහානං, අත්ථි ධම්මාභිසමයොති.

අභිසමයකථා සමත්තා.

---

1 සං. සඞ්කිලෙසිකා - සයා  2. පක්ඛන්දනතා - මජසං, පක්ඛන්දනත්තා - සයා, PTS
3 ආයූහනා - සයා, PTS.

යමෙක් කෙලෙසුන් දුරු කෙරෙයි, අතීත කෙලෙසුන් දුරු කෙරෙයි, අනාගත කෙලෙසුන් දුරු කෙරෙයි. ප්‍රත්‍යුත්පන්න කෙලෙසුන් දුරු කෙරේ. **අතීතෙ කිලෙසෙ පජහති** යනු: ඉදින් අතීත කෙලෙසුන් දුරු කෙරේ ද: එසේ වී නම් ක්ෂය වූවක් මැ ක්ෂය කෙරෙයි, නිරුද්ධ වූවක් මැ නිරුද්ධ කෙරෙයි, අපගත වූවක් මැ අපගත කෙරෙයි, අභාවයට ගියක් මැ අභාවයට යවයි, අතීත වූ යමෙක් නැත් ද එය දුරු කෙරේ නු' යි අතීත කෙලෙසුන් දුරු නො කෙරේ යයි.

**අනාගතෙ කිලෙසෙ පජහති** යනු: ඉදින් අනාගත කෙලෙසුන් දුරු කෙරේ ද: එසේ වී නම් නූපන් ක්ලේශය දුරු කෙරෙයි, ස්වභාවයට නො පත් ක්ලේශය දුරු කෙරෙයි, අනුත්පන්න ක්ලේශය දුරු කෙරෙයි, පහළ නො වූ ක්ලේශය දුරු කෙරෙයි, අනාගත වූ යම් ක්ලේශයෙක් නැත් ද, එය දුරු කෙරේ නු' යි අනාගත කෙලෙසුන් දුරු නො කෙරේ යයි

**පච්චුප්පන්නෙ කිලෙසෙ පජහති** යනු: ඉදින් ප්‍රත්‍යුත්පන්න ක්ලේශයන් දුරු කෙරේ ද, එසේ වී නම් රාගයෙන් රක්ත වූයේ රාගය දුරු කෙරෙයි, ද්වේෂයෙන් දුෂ්ට වූයේ ද්වේෂය දුරු කෙරෙයි, මෝහයෙන් මූඪ වූයේ මෝහය දුරු කෙරෙයි, මානයෙන් බැඳුණේ මානය දුරු කෙරෙයි, දෘෂ්ටියෙන් පරාමෘෂ්ට වූයේ දෘෂ්ටිය දුරු කෙරෙයි, වික්ෂේපයට ගියේ ඖද්ධත්‍යය දුරු කෙරෙයි, නිෂ්ඨාවට නො ගියේ විචිකිත්සාව දුරු කෙරෙයි, තිර බවට ගියේ අනුශය දුරු කෙරෙයි, කෘෂ්ණශුක්ලධර්මයෝ යුගනද්ධ වැ එක්වට මැ පවතිත්. මාර්ගභාවනාව සාංක්ලේශික වේ.

**න හි අතීතෙ කිලෙසෙ පජහති, න අනාගතෙ කිලෙසෙ පජහති, න පච්චුප්පන්නෙ කිලෙසෙ පජහති** යනු: ඉදින් අතීත කෙලෙසුන් දුරු නො කෙරේ ද, අනාගත ... ප්‍රත්‍යුත්පන්න කෙලෙසුන් දුරු නො කෙරේ ද, එසේ වී නම් මාර්ගභාවනාවක් නැත් ද, ඵලසාක්ෂාත්ක්‍රියාවක් නැත් ද, ක්ලේශප්‍රහාණයෙක් නැත් ද, ධර්මප්‍රතිවේධයෙක් නැත් ද යත්. මාර්ගභාවනා ද ඇත, ඵලසාක්ෂාත්ක්‍රියා ද ඇත, ක්ලේශප්‍රහාණය ද ඇත, ධර්මප්‍රතිවේධය ද ඇති. ඒ කෙසේ යැ යත්: යම්සේ නො පලගත් තරුණ රුකෙක් වේ ද, ඒ මේ රුක පුරුෂයෙක් මුලින් සිඳුනේ නම් එ රුක්හි යම් නූපන් ඵල කෙණෙක් වෙත් නම් ඔහු නො හටගත්තාහු මැ නො හටගනිති, ස්වභාවයට නො පැමිණියාහු මැ ස්වභාවයට නො පැමිණෙති, නූපන්නාහු මැ නූපදිති, නො පහළ වූවාහු ම නො පහළ වෙත් ද, එසෙයින් මැ කෙලෙසුන්ගේ නිපැත්මට උත්පාදය හේතු යැ උත්පාදය ප්‍රත්‍යය යැ' යි උත්පාදයෙහි ආදීනව දැක අනුත්පාදයෙහි සිත ප්‍රස්කන්දනය කෙරෙයි. අනුත්පාදයෙහි සිත ප්‍රස්කන්දනය කළ (පැනගත්) බැවින් යම් කෙලෙස් කෙනෙක් උත්පාද ප්‍රත්‍යයෙන් උපදනාහු නම් ඔහු නො හටගත්තාහු මැ නො හටගනිති. ස්වභාවයට නො පැමිණියාහු මැ ස්වභාවයට නො පැමිණෙති, නූපන්නාහු මැ නූපදිති, නො පහළ වූවාහු මැ නො පහළ වෙති. මෙසෙයින් හේතුනිරෝධයෙන් දුඃඛනිරෝධය වෙයි. ප්‍රවෘත්තිය හේතු යැ නිමිත්ත හේතු යැ ආයූහනය හේතු යැ, කෙලෙසුන්ගේ උපැත්මට ආයූහනය ප්‍රත්‍යය යැ' යි ආයූහනයෙහි ආදීනව දැක අනායූහනයෙහි සිත ප්‍රස්කන්දනය කෙරෙයි, අනායූහනයෙන් සිත ප්‍රස්කන්දනය කළ බැවින් යම් කෙලෙස් කෙනෙක් ආයූහනප්‍රත්‍යයෙන් උපදනාහු නම් ඔහු නො හටගත්තාහු මැ නො හටගනිති, ස්වභාවයට නො පැමිණියාහු මැ ස්වභාවයට නො පැමිණෙති, නූපන්නාහු මැ නූපදිති, නො පහළ වූවාහු මැ නො පහළ වෙති. මෙසෙයින් හේතුනිරෝධයෙන් දුඃඛනිරෝධය වෙයි. මෙසෙයින් මාර්ගභාවනා ද ඇත, ඵලසාක්ෂාත්ක්‍රියා ද ඇත, ක්ලේශප්‍රහාණය ද ඇත, ධර්මප්‍රතිවේධය ද ඇති යයි.

**අභිසමය කථා නිමි.**

# 3. 4.

# විවෙක කථා

[සංවණ්ණිනිදානං:]

‘සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කරීයන්ති, සබ්බෙ තෙ පථවිං නිස්සාය පථවියං පතිට්ඨාය එවමෙතෙ බලකරණීයා කම්මන්තා කරීයන්ති. එවමෙව භික්ඛවෙ’ භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ග භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. සම්මාසඞ්කප්පං -පෙ- සම්මාවාචං -පෙ- සම්මාකම්මන්තං -පෙ සම්මාආජීවං -පෙ- සම්මාවායාමං -පෙ- සම්මාසතිං -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති.”[a]

“සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි මෙ[1] බීජගාමභූතගාමා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති, සබ්බෙ තෙ පථවිං නිස්සාය පථවියං පතිට්ඨාය එවමෙතෙ බීජගාමභූතගාමා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, සම්මාසඞ්කප්පං භාවෙති -පෙ- සම්මාවාචං භාවෙති -පෙ- සම්මාකම්මන්තං භාවෙති -පෙ- සම්මාආජීවං භාවෙති -පෙ- සම්මාවායාමං භාවෙති -පෙ- සම්මාසතිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසූ’ති.[b]

සම්මාදිට්ඨියා පඤ්ච විවෙකා, පඤ්ච විරාගා, පඤ්ච නිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදස නිස්සයා. සම්මාසඞ්කප්පස්ස -පෙ- සම්මාවාචාය -පෙ- සම්මාකම්මන්තස්ස -පෙ- සම්මාආජීවස්ස -පෙ- සම්මාවායාමස්ස -පෙ- සම්මාසතියා -පෙ- සම්මාසමාධිස්ස පඤ්ච විවෙකා, පඤ්ච විරාගා, පඤ්ච නිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදස නිස්සයා.

---

1 යෙ කෙචි - මජසං, යෙපිමෙ - සයා PTS.

a. සංයුත්තනිකාය - මහාවග්ග - බලකරණීයවග්ග 1

b. සංයුත්තනිකාය - මහාවග්ග - බලකරණීයවග්ග 2.

# 3. 4.

## විවේක කථා

**[සැවැත්නිදාන යි:]**

යම්සේ මහණෙනි, යම් කිසි බාහුබලයෙන් කටයුතු කර්මාන්ත කෙනෙක් කරනුලැබෙත් ද, එ හැම කර්මාන්තයෝ පොළොව නිසා පොළොවෙහි පිහිටා කරනුලැබෙති. මෙසේ තෙල බලකරණීය කර්මාන්තයෝ කරනුලැබෙත් ද එසෙයින් මැ මහණෙනි, මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩයි. ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පුනපුනා වඩා.

කිසෙයින් මහණෙනි, මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩා ද, ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පුනපුනා වඩා ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙම විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ ක්ලෙශපරිත්‍යාග නිර්වාණප්‍රස්කන්දන සඞ්ඛ්‍යාත වොස්සග්ගයට පිරිනැමුණු සම්‍යග්දෘෂ්ටිය වඩයි සම්‍යක් සංකල්පය ... සම්‍යග්වචනය ... සම්‍යක්කර්මාන්තය ... සම්‍යගාජීවය ... සම්‍යග්ව්‍යායාමය ... සම්‍යක්ස්මෘතිය ... විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ වොස්සග්ගයට පිරිනැමුණු සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, මෙසෙයින් මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩයි, ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පුනපුනා වඩා.

මහණෙනි, යම්සේ යම් කිසි බීජගාමභූතගාම කෙනෙක් වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණෙත් ද, එ හැම පොළොව නිසා පොළොවෙහි පිහිටා පැමිණෙත්. මෙසේ තෙල බීජගාමභූතගාමයෝ වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණෙත් ද, එසෙයින් මැ මහණෙනි, මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩනුයේ ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පුනපුනා වඩනුයේ දහම්හි වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණේ.

මහණෙනි, කිසෙයින් මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩනුයේ ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පුනපුනා වඩනුයේ දහම්හි වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙම විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ වොස්සග්ගයට පිරිනැමුණු සම්‍යග්දෘෂ්ටිය වඩයි ... සම්‍යක්සංකල්පය වඩයි ... සම්‍යග්වචනය වඩයි ... සම්‍යක්කර්මාන්තය වඩයි ... සම්‍යගාජීවය වඩයි ... සම්‍යග්ව්‍යායාමය වඩයි ... සම්‍යක්ස්මෘතිය වඩයි ... විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිර්වාණයට පිරිනැමුණු සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, මෙසෙයින් මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩනුයේ ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පුනපුනා වඩනුයේ දහම්හි වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණේ යයි.

සම්‍යග්දෘෂ්ටියට විවෙක පසෙක, විරාග පසෙක, නිරොධ පසෙක, වොස්සග්ග පසෙක, නිඃශ්‍රය දොළොසෙකි. සම්‍යක්සංකල්පයට ... සම්‍යග්-වචනයට ... සම්‍යක්කර්මාන්තයට .. සම්‍යගාජීවයට ... සම්‍යග්ව්‍යායාමයට ... සම්‍යක්ස්මෘතියට ... සම්‍යක්සමාධියට විවෙක පසෙක, විරාග පසෙක, නිරොධ පසෙක, වොස්සග්ග පසෙක, නිඃශ්‍රය දොළොසෙකි.

සම්මාදිට්ඨියා කතමෙ පඤ්ච විවෙකා: වික්ඛම්භනවිවෙකො තදඞ්ගවිවෙකො සමුච්ඡෙදවිවෙකො පටිප්පස්සද්ධිවිවෙකො නිස්සරණවිවෙකො. වික්ඛම්භනවිවෙකො ච නීවරණානං, පඨමජ්ඣානං භාවයතො. තදඞ්ගවිවෙකො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවිවෙකො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවිවෙකො ච ඵලක්ඛණෙ, නිස්සරණවිවෙකො ච නිරොධො නිබ්බානං. සම්මාදිට්ඨියා ඉමෙ පඤ්ච විවෙකා. ඉමෙසු පඤ්චසු විවෙකෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තං චස්ස ස්වාධිට්ඨිතං.

සම්මාදිට්ඨියා කතමෙ පඤ්ච විරාගා: වික්ඛම්භනවිරාගො තදඞ්ගවිරාගො සමුච්ඡෙදවිරාගො පටිප්පස්සද්ධිවිරාගො නිස්සරණවිරාගො. වික්ඛම්භනවිරාගො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගවිරාගො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවිරාගො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවිරාගො ච ඵලක්ඛණෙ, නිස්සරණවිරාගො ච නිරොධො නිබ්බානං. සම්මාදිට්ඨියා ඉමෙ පඤ්ච විරාගා. ඉමෙසු පඤ්චසු විරාගෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං.

සම්මාදිට්ඨියා කතමෙ පඤ්ච නිරොධා: වික්ඛම්භනනිරොධො තදඞ්ගනිරොධො සමුච්ඡෙදනිරොධො පටිප්පස්සද්ධිනිරොධො නිස්සරණනිරොධො. වික්ඛම්භනනිරොධො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො. තදඞ්ගනිරොධො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදනිරොධො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිනිරොධො ච ඵලක්ඛණෙ, නිස්සරණනිරොධො ච අමතා ධාතු,[1] සම්මාදිට්ඨියා ඉමෙ පඤ්ච නිරොධා. ඉමෙසු පඤ්චසු නිරොධෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තං චස්ස ස්වාධිට්ඨිතං.

සම්මාදිට්ඨියා කතමෙ පඤ්ච වොස්සග්ගා: වික්ඛම්භනවොස්සග්ගො තදඞ්ගවොස්සග්ගො සමුච්ඡෙදවොස්සග්ගො පටිප්පස්සද්ධිවොස්සග්ගො නිස්සරණවොස්සග්ගො. වික්ඛම්භනවොස්සග්ගො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගවොස්සග්ගො ච, දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවොස්සග්ගො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවොස්සග්ගො ච ඵලක්ඛණෙ, නිස්සරණවොස්සග්ගො ච නිරොධො නිබ්බානං. සම්මාදිට්ඨියා ඉමෙ පඤ්ච වොස්සග්ගා, ඉමෙසු පඤ්චසු වොස්සග්ගෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො. චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං. සම්මාදිට්ඨියා ඉමෙ පඤ්ච විවෙකා, පඤ්ච විරාගා, පඤ්ච නිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදස නිස්සයා.

සම්මාසඞ්කප්පස්ස -පෙ- සම්මාවාචාය -පෙ- සම්මාකම්මන්තස්ස -පෙ- සම්මාආජීවස්ස -පෙ- සම්මාවායාමස්ස -පෙ- සම්මාසතියා -පෙ- සම්මාසමාධිස්ස කතමෙ පඤ්ච විවෙකා: වික්ඛම්භනවිවෙකො, තදඞ්ගවිවෙකො, සමුච්ඡෙදවිවෙකො පටිප්පස්සද්ධිවිවෙකො නිස්සරණවිවෙකො. වික්ඛම්භනවිවෙකො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගවිවෙකො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවිවෙකො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවිවෙකො ච ඵලක්ඛණෙ, නිස්සරණවිවෙකො ච නිරොධං නිබ්බානං, සම්මාසමාධිස්ස ඉමෙ පඤ්ච විවෙකා. ඉමෙසු පඤ්චසු විවෙකෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං.

---

1. නිරොධො නිබ්බානං - PTS.

සම්‍යග්දෘෂ්ටියට පඤ්චවිවේකයෝ කවරහ යත්: විෂ්කම්භණවිවේක යෑ තදඞ්ගවිවේක යෑ සමුච්ඡේදවිවේක යෑ ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවේක යෑ නිස්සරණවිවේක යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භණ (දුරුකිරීම් වශයෙන් වන) විවේකය ද නිර්වේදභාගියසමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගවිවේකය ද ලෝකෝත්තර වූ ක්ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේදවිවේකය ද ඵලක්ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවේකය ද නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය නිස්සරණවිවේකය ද වෙයි. සම්‍යග්දෘෂ්ටියට මේ පඤ්චවිවේකයෝ වෙති. මේ පඤ්චවිවේකයන්හි හටගත් ධර්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වූයේ වෙයි, ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ.

සම්‍යග්දෘෂ්ටියට පඤ්චවිරාගයෝ කවරහ යත්: විෂ්කම්භණවිරාග යෑ තදඞ්ගවිරාග යෑ සමුච්ඡේදවිරාග යෑ ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිරාග යෑ නිස්සරණවිරාග යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භණවිරාග ද නිර්වේදභාගිය සමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගවිරාග ද ලෝකෝත්තර වූ ක්ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේදවිරාග ද ඵලක්ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිරාග ද නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය නිස්සරණවිරාග ද වෙයි. සම්‍යග්දෘෂ්ටියට මේ පඤ්චවිරාගයෝ වෙති. මේ පඤ්චවිරාගයන්හි හටගත් ධර්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි, ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ.

සම්‍යග්දෘෂ්ටියට පඤ්චනිරෝධයෝ කවරහ යත්: විෂ්කම්භණනිරෝධ යෑ තදඞ්ගනිරෝධ යෑ සමුච්ඡේදනිරෝධ යෑ ප්‍රතිප්‍රශ්‍රබ්ධිනිරෝධ යෑ නිස්සරණනිරෝධ යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භණනිරෝධ ද නිර්වේදභාගියසමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගනිරෝධ ද ලෝකෝත්තර ක්ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේදනිරෝධ ද ඵලක්ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිනිරෝධ ද අමෘතධාතු වූ නිස්සරණනිරෝධ ද වෙයි. සම්‍යග්දෘෂ්ටියට මේ පඤ්චනිරෝධයෝ වෙති. මේ පඤ්චනිරෝධයන්හි හටගත් ධර්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වූයේ වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ.

සම්‍යග්දෘෂ්ටියට පඤ්චවෝස්සග්ගයෝ කවරහ යත්: විෂ්කම්භණ වෝස්සග්ග යෑ තදඞ්ග වෝස්සග්ග යෑ සමුච්ඡේද වෝස්සග්ග යෑ ප්‍රතිප්‍රශ්‍රබ්ධි වෝස්සග්ග යෑ නිස්සරණ වෝස්සග්ග යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භණ වෝස්සග්ග ද නිර්වේදභාගිය සමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ග වෝස්සග්ග ද ලෝකෝත්තර වූ ක්ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේද වෝස්සග්ග ද ඵලක්ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධි වෝස්සග්ග ද නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය වූ නිස්සරණ වෝස්සග්ග ද වෙයි. සම්‍යග්දෘෂ්ටියට මේ පඤ්චවෝස්සග්ගයෝ වෙති. මේ පඤ්චවෝස්සග්ගයන්හි හටගත් ධර්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි. සම්‍යග්දෘෂ්ටියට මේ පඤ්චවිවේකයෝ පඤ්චවිරාගයෝ පඤ්චනිරෝධයෝ පඤ්චවෝස්සග්ගයෝ දෙලොව් නිඃශ්‍රයයෝ වෙත්.

සම්‍යක්සංකල්පයට ... සම්‍යග්වචනයට ... සම්‍යක්කර්මාන්තයට ... සම්‍යගාජීවයට ... සම්‍යග්ව්‍යායාමයට ... සම්‍යක්ස්මෘතියට ... සම්‍යක්සමාධියට පඤ්චවිවේකයෝ කවරහ යත්: විෂ්කම්භණවිවේක යෑ තදඞ්ගවිවේක යෑ සමුච්ඡේදවිවේක යෑ ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවේක යෑ නිස්සරණවිවේක යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භණවිවේක ද නිර්වේදභාගිය සමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගවිවේක ද ලෝකෝත්තර වූ ක්ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේදවිවේක ද ඵලක්ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවේක ද නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය වූ නිස්සරණවිවේක ද වෙයි. සම්‍යක්සමාධියට මේ පඤ්චවිවේකයෝ වෙති. මේ පඤ්චවිවේකයන්හි හටගත් ධර්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වූයේ වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ.

සම්මාසමාධිස්ස කතමෙ පඤ්ච විරාගා, වික්ඛම්භනවිරාගො තදඞ්ගවිරාගො සමුච්ඡෙදවිරාගො පටිප්පස්සද්ධිවිරාගො නිස්සරණවිරාගො. වික්ඛම්භනවිරාගො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගවිරාගො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවිරාගො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවිරාගො ච ඵලක්ඛණෙ, නිස්සරණවිරාගො ච නිරොධො නිබ්බානං, සම්මාසමාධිස්ස ඉමෙ පඤ්ච විරාගා, ඉමෙසු පඤ්චසු විරාගෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිත .

සම්මාසමාධිස්ස කතමෙ පඤ්ච නිරොධා: වික්ඛම්භනනිරොධො තදඞ්ගනිරොධො සමුච්ඡෙදනිරොධො පටිප්පස්සද්ධිනිරොධො නිස්සරණනිරොධො. වික්ඛම්භනනිරොධො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගනිරොධො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදනිරොධො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිනිරොධො ච ඵලක්ඛණෙ, නිස්සරණනිරොධො ච අමතා ධාතු. සම්මාසමාධිස්ස ඉමෙ පඤ්ච නිරොධා ඉමෙසු පඤ්චසු නිරොධෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං.

සම්මාසමාධිස්ස කතමෙ පඤ්ච වොස්සග්ගා: වික්ඛම්භනවොස්සග්ගො තදඞ්ගවොස්සග්ගො සමුච්ඡෙදවොස්සග්ගො පටිප්පස්සද්ධිවොස්සග්ගො නිස්සරණවොස්සග්ගො. වික්ඛම්භනවොස්සග්ගො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගවොස්සග්ගො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවොස්සග්ගො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවොස්සග්ගො ච ඵලක්ඛණෙ, නිස්සරණවොස්සග්ගො ච නිරොධො නිබ්බානං. සම්මාසමාධිස්ස ඉමෙ පඤ්ච වොස්සග්ගා, ඉමෙසු පඤ්චසු වොස්සග්ගෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං. සම්මාසමාධිස්ස ඉමෙ පඤ්ච විවෙකා පඤ්ච විරාගා පඤ්ච නිරොධා පඤ්ච වොස්සග්ගා ද්වාදස නිස්සයා.

"සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කරීයන්ති, සබ්බෙ තෙ පඨවිං නිස්සාය පඨවියං පතිට්ඨාය, එවමෙතෙ බලකරණීයා කම්මන්තා කරීයන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොති -පෙ- සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙන්තො සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු -පෙ- පඤ්ච බලානි භාවෙති පඤ්ච බලානි බහුලීකරොති. -පෙ- පඤ්ච බලානි භාවෙන්තො, පඤ්ච බලානි බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු. -පෙ- පඤ්චින්ද්‍රියානි භාවෙති පඤ්චින්ද්‍රියානි බහුලීකරොති -පෙ-

සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි මෙ බීජගාමභූතගාමා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති, සබ්බෙ තෙ පඨවිං නිස්සාය පඨවියං පතිට්ඨාය, එවමෙතෙ බීජගාමභූතගාමා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය පඤ්චින්ද්‍රියානි භාවෙන්තො, පඤ්චින්ද්‍රියානි බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු.

සම්‍යක්සමාධියට පඤ්චවිරාගයෝ කවරහ යත්: විෂ්කම්භණවිරාග යැ තදඞ්ගවිරාග යැ සමුච්ඡේදවිරාග යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිරාග යැ නිස්සරණවිරාග යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භණවිරාග ද නිර්වේධභාගිය සමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගවිරාග ද ලෝකෝත්තර වූ ක්‍ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේදවිරාග ද ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිරාග ද නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය වූ නිස්සරණවිරාග ද වෙයි. සම්‍යක් සමාධියට මේ පඤ්චවිරාගයෝ වෙති. මේ පඤ්චවිරාගයන්හි හටගත් ධර්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ.

සම්‍යක්සමාධියට පඤ්චනිරෝධයෝ කවරහ යත්: විෂ්කම්භණනිරෝධ යැ තදඞ්ගනිරෝධ යැ සමුච්ඡේදනිරෝධ යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධිනිරෝධ යැ නිස්සරණනිරෝධ යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භණ-නිරෝධ ද නිර්වේධභාගියසමාධිය වඩනුවහට තදඞ්ගනිරෝධ ද ලෝකෝත්තර වූ ක්‍ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේදනිරෝධ ද ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධි-නිරෝධ ද අමෘතධාතු වූ නිස්සරණනිරෝධ ද වෙයි. සම්‍යක්සමාධියට මේ පඤ්චනිරෝධයෝ වෙති. මේ පඤ්චනිරෝධයන්හි හටගත් ධර්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ.

සම්‍යක්සමාධියට පඤ්ච වොස්සග්ගයෝ කවරහ යත්: විෂ්කම්භණ වොස්සග්ග යැ තදඞ්ග වොස්සග්ග යැ සමුච්ඡේද වොස්සග්ග යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධි වොස්සග්ග යැ නිස්සරණවොස්සග්ග යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණ-යන්ගේ විෂ්කම්භණ වොස්සග්ග ද නිර්වේධභාගියසමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ග වොස්සග්ග ද ලෝකෝත්තර වූ ක්‍ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේද වොස්සග්ග ද ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධි වොස්සග්ග ද නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය වූ නිස්සරණ වොස්සග්ග ද වෙයි. සම්‍යක්-සමාධියට මේ පඤ්චවොස්සග්ගයෝ වෙති. මේ පඤ්ච වොස්සග්ගයන්හි හටගත් ධර්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ. සම්‍යක්සමාධියට මේ පඤ්ච විවේකයෝ පඤ්ච විරාගයෝ පඤ්ච නිරෝධයෝ පඤ්ච වොස්සග්ගයෝ දෙළොස් නිස්සයෝ වෙත්.

යම්සේ මහණෙනි, යම් කිසි බලකරණීය වූ කර්මාන්ත කෙනෙක් කරනු ලැබෙත් ද එ හැම පොළොව නිසා පොළොවෙහි පිහිටා කරනුලැබෙති මෙසේ තෙල බලකරණීය වූ කර්මාන්තයෝ කරනු ලැබෙත් ද එසෙයින් මැ මහණෙනි, මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා සප්තබොධ්‍යඞ්ගයන් වඩයි, සප්තබොධ්‍යඞ්ගයන් පුනපුනා වඩයි ... සප්තබොධ්‍යඞ්ගයන් වඩනුයේ සප්තබොධ්‍යඞ්ගයන් පුනපුනා වඩනුයේ දහම්හි වැඩියට විරූඪ බවට විපුල බවට පැමිණෙයි ... පඤ්චබලයන් වඩයි, පඤ්චබලයන් පුනපුනා වඩයි ... පඤ්චබලයන් වඩනුයේ පඤ්චබලයන් පුනපුනා වඩනුයේ දහම්හි වැඩියට විරූඪ බවට විපුල බවට පැමිණෙයි ... පඤ්චෙන්ද්‍රියයන් වඩයි, පඤ්චෙන්ද්‍රිය-යන් පුනපුනා වඩයි ...

යම්සේ මහණෙනි, යම් කිසි බීජගාමභූතගාම කෙනෙක් වැඩියට විරූඪ බවට විපුල බවට පැමිණෙත් ද එ හැම පොළොව නිසා යැ පොළොවෙහි පිහිටා යැ. මෙසේ තෙල බීජගාමභූතගාමයෝ වැඩියට විරූඪ බවට විපුල බවට පැමිණෙත් ද එසෙයින් මැ මහණෙනි, මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා පඤ්චෙන්ද්‍රියයන් වඩනුයේ පඤ්චෙන්ද්‍රිය-යන් පුනපුනා වඩනුයේ දහම්හි වැඩියට විරූඪ බවට විපුල බවට පැමිණේ.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය පඤ්චින්ද්‍රියානි භාවෙන්තො පඤ්චින්ද්‍රියානි බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු: ඉධ භික්ඛවෙ, භික්ඛු සද්ධින්ද්‍රියං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. විරියින්ද්‍රියං භාවෙති -පෙ- සතින්ද්‍රියං භාවෙති -පෙ- සමාධින්ද්‍රියං භාවෙති -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය -පෙ- පාපුණාති ධම්මෙසූ'ති.[1]

සද්ධින්ද්‍රියස්ස පඤ්ච විවෙකා, පඤ්ච විරාගා, පඤ්ච නිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදස නිස්සයා. විරියින්ද්‍රියස්ස -පෙ- සතින්ද්‍රියස්ස -පෙ- සමාධින්ද්‍රියස්ස -පෙ- පඤ්ඤින්ද්‍රියස්ස පඤ්ච විවෙකා පඤ්ච විරාගා, පඤ්ච නිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදස නිස්සයා.

සද්ධින්ද්‍රියස්ස කතමෙ පඤ්ච විවෙකා: වික්ඛම්භනවිවෙකො තදඞ්ගවිවෙකො සමුච්ඡෙදවිවෙකො පටිප්පස්සද්ධිවිවෙකො නිස්සරණවිවෙකො. වික්ඛම්භනවිවෙකො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගවිවෙකො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවිවෙකො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවිවෙකො ච ඵලක්ඛණෙ, නිස්සරණවිවෙකො ච නිරොධො නිබ්බානං. සද්ධින්ද්‍රියස්ස ඉමෙ පඤ්ච විවෙකා. ඉමෙසු පඤ්චසු විවෙකෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං -පෙ- සද්ධින්ද්‍රියස්ස ඉමෙ පඤ්ච විවෙකා, පඤ්ච විරාගා, පඤ්චනිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදසනිස්සයා.

විරියින්ද්‍රියස්ස -පෙ- සතින්ද්‍රියස්ස -පෙ- සමාධින්ද්‍රියස්ස -පෙ- පඤ්ඤින්ද්‍රියස්ස කතමෙ පඤ්ච විවෙකා: වික්ඛම්භනවිවෙකො තදඞ්ගවිවෙකො සමුච්ඡෙදවිවෙකො පටිප්පස්සද්ධිවිවෙකො නිස්සරණවිවෙකො -පෙ- පඤ්ඤින්ද්‍රියස්ස ඉමෙ පඤ්ච විවෙකා, පඤ්ච විරාගා, පඤ්ච නිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදස නිස්සයාති.

**විවෙකකථා සමත්තා.**

1. සංයුත්තනිකාය

මහණෙනි, කිසෙයින් මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා පඤ්චෙන්ද්‍රියයන් වඩනුයේ පඤ්චෙන්ද්‍රියයන් පුනපුනා වඩනුයේ දහම්හි වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණෙයි. මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙම විවෙකනිඃශ්‍රිත විරාගනිඃශ්‍රිත නිරොධනිඃශ්‍රිත නිවනට පිරිනැමුණු ශ්‍රද්ධෙන්ද්‍රිය වඩයි ... වීර්‍ය්‍යෙන්ද්‍රිය වඩයි ... ස්මෘතීන්ද්‍රිය වඩයි ... සමාධීන්ද්‍රිය වඩයි, විවෙකනිඃශ්‍රිත විරාගනිඃශ්‍රිත නිරොධනිඃශ්‍රිත නිවනට පිරිනැමුණු ප්‍රඥෙන්ද්‍රිය වඩයි. මහණෙනි, මෙසෙයින් මහණ තෙම ශීලය නිසා ... දහම්හි විපුලබවට පැමිණේ යයි.

ශ්‍රද්ධෙන්ද්‍රියට විවෙක පසෙක, විරාග පසෙක, නිරොධ පසෙක, වොස්සග්ග පසෙක, නිඃශ්‍රය දෙළොසෙකි. වීර්‍ය්‍යෙන්ද්‍රියට ... ස්මෘතීන්ද්‍රියට ... සමාධීන්ද්‍රියට ... ප්‍රඥෙන්ද්‍රියට විවෙක පසෙක, විරාග පසෙක, නිරොධ පසෙක, වොස්සග්ග පසෙක, නිඃශ්‍රය දෙළොසෙකි.

ශ්‍රද්ධෙන්ද්‍රියට පඤ්චවිවෙකයෝ කවරහ යත්: විෂ්කම්භනවිවෙක යැ තදඞ්ගවිවෙක යැ සමුච්ඡෙදවිවෙක යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවෙක යැ නිස්සරණ විවෙක යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භනවිවෙක ද නිර්වෙදභාගිය වූ සමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගවිවෙක ද ලොකොත්තර වූ ක්‍ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡෙදවිවෙක ද ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවෙක ද නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය වූ නිස්සරණවිවෙක ද වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියට මේ පඤ්චවිවෙකයෝ වෙති. මේ පඤ්චවිවෙකයන්හි හටගත් ධර්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ ... ශ්‍රද්ධෙන්ද්‍රියට මේ පඤ්චවිවෙකයෝ, පඤ්චවිරාගයෝ, පඤ්චනිරොධයෝ, පඤ්චවොස්සග්ගයෝ දෙළොස් නිඃශ්‍රයයෝ වෙත්.

වීර්‍ය්‍යෙන්ද්‍රියට .. ස්මෘතීන්ද්‍රියට ... සමාධීන්ද්‍රියට ... ප්‍රඥෙන්ද්‍රියට පඤ්චවිවෙකයෝ කවරහ යත්: විෂ්කම්භනවිවෙක යැ තදඞ්ගවිවෙක යැ සමුච්ඡෙදවිවෙක යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවෙක යැ නිස්සරණවිවෙක යැ ... ප්‍රඥෙන්ද්‍රියට මේ පඤ්චවිවෙකයෝ පඤ්චවිරාගයෝ පඤ්චනිරොධයෝ පඤ්චවොස්සග්ගයෝ දෙළොස් නිඃශ්‍රයයෝ වෙත් යයි.

**විවෙක කථා නිමි.**

# 3. 5.

## චරියා කථා

**චරියාති** අට්ඨ චරියායො, ඉරියාපථචරියා ආයතනචරියා සතිචරියා සමාධිචරියා ඤාණචරියා මග්ගචරියා පත්තිචරියා ලොකත්ථචරියාති.

**ඉරියාපථචරියාති** චතූසු ඉරියාපථෙසු.

**ආයතනචරියාති** ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු.

**සතිචරියාති** චතූසු සතිපට්ඨානෙසු.

**සමාධිචරියාති** චතූසු ඣානෙසු.

**ඤාණචරියාති** චතූසු අරියසච්චෙසු.

**මග්ගචරියාති** චතූසු අරියමග්ගෙසු.

**පත්තිචරියාති** චතූසු සාමඤ්ඤඵලෙසු.

**ලොකත්ථචරියාති** තථාගතෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු, පදෙසෙ[1] පච්චෙකබුද්ධෙසු, පදෙසෙ සාවකෙසු.

ඉරියාපථචරියා ච පණිධිසම්පන්නානං, ආයතනචරියා ච ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරානං, සතිචරියා ච අප්පමාදවිහාරීනං, සමාධිචරියා ච අධිචිත්ත-මනුයුත්තානං, ඤාණචරියා ච බුද්ධිසම්පන්නානං, මග්ගචරියා ච සම්මාපටි-පන්නානං, පත්තිචරියා ච අධිගතඵලානං, ලොකත්ථචරියා ච තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං, පදෙසෙ පච්චෙකබුද්ධානං, පදෙසෙ සාව-කානං. ඉමා අට්ඨ චරියායො.

අපරාපි අට්ඨ චරියායො: අධිමුච්චන්තො සද්ධාය චරති. පග්ගණ්හන්තො විරියෙන චරති. උපට්ඨාපෙන්තො සතියා චරති, අවික්ඛෙපං කරොන්තො සමාධිනා චරති, පජානන්තො පඤ්ඤාය චරති, විජානන්තො විඤ්ඤාණචරි-යාය චරති. එවං පටිපන්නස්ස කුසලා ධම්මා ආයාපෙන්තීති ආයතනචරියාය චරති, එවං පටිපන්නො විසෙසමධිගච්ඡතීති විසෙසචරියාය චරති. ඉමා අට්ඨ චරියායො.

අපරාපි අට්ඨ චරියායො: දස්සනචරියා ච සම්මාදිට්ඨියා. අභිනිරොපන-චරියා ච සම්මාසඞ්කප්පස්ස, පරිග්ගහචරියා ච සම්මාවාචාය, සමුට්ඨානචරියා ච සම්මාකම්මන්තස්ස, වොදානචරියා ච සම්මාආජීවස්ස, පග්ගහචරියා ච සම්මාවායාමස්ස, උපට්ඨානචරියා ච සම්මාසතියා, අවික්ඛෙපචරියා ච සම්මා-සමාධිස්ස. ඉමා අට්ඨචරියායොති.

**චරියාකථා සමත්තා**

---

1. පදෙසෙ - සහ, PTS.

## 3. 5.

## චරියා කථා

**චරියා** යනු: චර්යා අටෙකි. ඊර්යාපථචර්යා යැ ආයතනචර්යා යැ ස්මෘතිචර්යා යැ සමාධිචර්යා යැ ඥානචර්යා යැ මාර්ගචර්යා යැ ප්‍රාප්ති (ඵල) චර්යා යැ ලෝකාර්ථචර්යා යැ යි

**ඉරියාපථචරියා** යනු: සතර ඉරියව්හි යැ.

**ආයතනචරියා** යනු: ආධ්‍යාත්මිකබාහිර ෂඩායතනයෙහි යැ.

**සතිචරියා** යනු: සතර සතිපට්ඨානයෙහි යැ.

**සමාධිචරියා** යනු: සතර ධ්‍යානයෙහි යැ.

**ඤාණචරියා** යනු: සතර ආර්‍යසත්‍යයෙහි යැ.

**මග්ගචරියා** යනු: සතර ආර්‍යමාර්ගයෙහි යැ.

**පත්තිචරියා** යනු: සතර ශ්‍රාමණ්‍යඵලයෙහි යැ.

**ලෝකත්ථචරියා** යනු: තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් කෙරෙහි යැ. එක්දෙසෙකැ ප්‍රත්‍යෙකබුද්ධයන් කෙරෙහි යැ, එක්දෙසෙකැ ශ්‍රාවකයන් කෙරෙහි යි.

ප්‍රණිධිසම්පන්නයනට (සත්හුන් ඉරියව් ඇතියනට) ඊර්යාපථචර්යා ද ඉඳුරන්හි වසනලද දොර ඇතියනට ආයතනචර්යා ද අප්‍රමාදවිහාර ඇතියනට ස්මෘතිචර්යා ද සමාධියෙහි යෙදුණවුන්ට සමාධිචර්යා ද බුද්ධි-සම්පන්නයනට ඥානචර්යා ද සම්‍යක්ප්‍රතිපන්නයනට මාර්ගචර්යා ද පැමිණි ඵල ඇතියනට ප්‍රාප්තිචර්යා ද තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයනට, ප්‍රත්‍යෙකබුද්ධයනට එකදෙශයෙක්හි ශ්‍රාවකයනට එකදෙශයෙක්හි ලෝකාර්ථචර්යා ද වේ. මොහු අෂ්ටචර්යා යි.

අන්‍ය වූ ද චර්යා අටෙකි: අධිමොක්ෂ කරනුයේ ශ්‍රද්ධා වශයෙන් පවතී, ප්‍රග්‍රහ කරනුයේ වීර්‍ය වශයෙන් පවතී, අරමුණෙහි සිහි එළවා තබ-නුයේ ස්මෘති වශයෙන් පවතී, අවික්ෂෙප කරනුයේ සමාධි වශයෙන් පවතී, ප්‍රකාරයෙන් දන්නේ, ප්‍රඥා වශයෙන් පවතී, විජානනය කරනුයේ විඥාන-චර්යා වශයෙන් පවතී, මෙසේයින් (ඉන්ද්‍රියචර්යායෙහි) පිළිපන්නහුට (ශමථ-විදර්ශනා විසින් පැවැති) කුශලධර්මයෝ අත්‍යර්ථයෙන් පවතිත් නු’යි ආයතනචර්යා වශයෙන් පවතී මෙසේයින් පිළිපන්නේ (විෂකාමහණාදි) විශෙෂයට පැමිණේ නු’යි විශෙෂචර්යා වශයෙන් පවතී. මොහු අෂ්ටචර්යා වෝ යි.

අන්‍ය වූ ද චර්යා අටෙකි: සම්‍යග්දෘෂ්ටියට දර්ශනචර්යා ද සම්‍යක්සං-කල්පයට අභිනිරොපණචර්යා ද සම්‍යග්වචනයට පරිග්‍රහචර්යා ද සම්‍යක්-කර්මාන්තයට සමුට්ඨානචර්යා ද සම්‍යගාජීවයට ව්‍යවදානචර්යා ද සම්‍යග්-ව්‍යායාමයට ප්‍රග්‍රහචර්යා ද සම්‍යක්ස්මෘතියට උපස්ථානචර්යා ද සම්‍යක්-සමාධියට අවික්ෂෙපචර්යා ද වෙයි. මොහු අෂ්ටචර්යා වෙත් යයි.

**චර්යා කථා නිමි.**

## 3. 6.

## පාටිහාරිය කථා

"තීණිමානි භික්ඛවෙ, පාටිහාරියානි; කතමානි තීණි: ඉද්ධිපාටිහාරියං ආදෙසනාපාටිහාරියං අනුසාසනීපාටිහාරියං.

කතමඤ්ච භික්ඛවෙ, ඉද්ධිපාටිහාරියං: ඉධ භික්ඛවෙ, එකච්චො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති, බහුධාපි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. ඉදං වුච්චති භික්ඛවෙ, ඉද්ධිපාටිහාරියං.

කතමඤ්ච භික්ඛවෙ, ආදෙසනාපාටිහාරියං: ඉධ භික්ඛවෙ එකච්චො, නිමිත්තෙන ආදිසති: "එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉතිපි තෙ චිත්ත'න්ති. සො බහුං චෙච ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා. ඉධ පන භික්ඛවෙ, එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, අපි ච ඛො මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති: 'එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉතිපි තෙ චිත්ත'න්ති. සො බහුං චෙපි ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා. ඉධ පන භික්ඛවෙ, එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, නපි මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති, අපි ච ඛො විතක්කයතො විචාරයතො විතක්කවිප්ඵාරසද්දං[1] සුත්වා ආදිසති: 'එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉතිපි තෙ චිත්ත'න්ති සො බහුං චෙපි ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා. ඉධ පන භික්ඛවෙ, එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, නපි මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති, නපි විතක්කයතො විචාරයතො විතක්කවිප්ඵාරසද්දං සුත්වා ආදිසති, අපි ච ඛො අවිතක්කං අවිචාරං සමාධිං සමාපන්නස්ස චෙතසා චෙතො පරිච්ච පජානාති: 'යථා ඉමස්ස භොතො මනොසඞ්ඛාරා පණිහිතා ඉමස්ස[2] චිත්තස්ස අනන්තරා අමුං නාම විතක්කං විතක්කයිස්සතී'ති[3] සො බහුං චෙපි ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා ඉදං වුච්චති භික්ඛවෙ ආදෙසනාපාටිහාරියං.

කතමඤ්ච භික්ඛවෙ, අනුසාසනීපාටිහාරියං: ඉධ භික්ඛවෙ, එකච්චො එවමනුසාසති: 'එවං විතක්කෙථ, මා එවං විතක්කයිත්ථ, එවං මනසිකරොථ, මා එවං මනසාකත්ථ.[4] ඉදං පජහථ, ඉදං උපසම්පජ්ජ විහරථා'ති. ඉදං වුච්චති භික්ඛවෙ, අනුසාසනීපාටිහාරියං. ඉමානි ඛො භික්ඛවෙ, තීණි පාටිහාරියානී''ති.

නෙක්ඛම්මං ඉජ්ඣතීති ඉද්ධි, කාමච්ඡන්දං පටිහරතීති පාටිහාරියං. යෙ තෙන නෙක්ඛම්මෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පාති ආදෙසනාපාටිහාරියං. තං ඛො පන නෙක්ඛම්මං 'එවං ආසෙවිතබ්බං, එවං භාවෙතබ්බං, එවං බහුලීකාතබ්බං, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

1. විතක්කවිප්ඵාරසද්දං - PTS, සයා 2. යථා ඉමස්ස - සයා, PTS.
3. විතක්කෙස්සතීති - සයා, PTS. 4. මනසිකරිත්ථ - මජසං

## 3. 6.

## ප්‍රාතිහාර්‍ය්‍ය කථා

මහණෙනි, මේ තුන් ප්‍රාතිහාර්‍ය්‍ය කෙනෙක් වෙති: කවර තුන් ප්‍රාතිහාර්‍ය්‍ය කෙනෙකැ යත්: ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය යැ ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යැ යි.

මහණෙනි, ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය නම් කවරැ යත්: මහණෙනි, මෙසස්නෙහි ඇතැමෙක් අනේකප්‍රකාර වූ ඍද්ධිකොට්ඨාස වළඳ කෙරෙ යි: (තෙමේ) එකලා වැ බහුප්‍රකාරයෙහුදු වෙයි, බහුප්‍රකාර වැ එකලා ද වෙයි. ආවිර්භාවයට තිරෝභාවයට ... බඹලොව තෙක් මැ කයින් (තමන්) වශයෙහි පවත්වයි. මහණෙනි, මේ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය යැ යි කියනු ලැබේ.

මහණෙනි, ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය නම් කවරෙ යත්: මහණෙනි, මෙ ලොව්හි ඇතැමෙක් නිමිතින් කියයි: 'තා සිත (සොම්නස් දොම්නස් විසින්) මෙබඳුත් වෙයි, තා සිත මෙ අයුරුත් වෙයි, තා සිත මෙසේත් (මේ මේ දැය සිතමින් පවත්නේත්) වේ' යයි. හේ බොහෝ කොට ද කියයි, ඒ එසේ මැ වෙයි, අන් අයුරෙකින් නො වෙයි. තවද මහණෙනි, මෙ ලො වැ ඇතැමෙක් නිමිතින් නො මැ කියයි, එතෙකුදුවත් මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ හඬ අසා කියයි: "තා සිත මෙබඳුත් වෙයි, තා සිත මෙ අයුරුත් වෙයි, තා සිත මෙසේත් වේ" යයි. හේ බොහෝ කොට ද කියයි, ඒ එසේ මැ වෙයි, අන් අයුරෙකින් නො වෙයි. තවද මහණෙනි, මෙලො වැ ඇතැමෙක් නිමිතින් නො මැ කියයි, මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ හඬ අසා නො ද කියයි. එතෙකුදුවත් විතර්ක කරන්නහුගේ විතර්කසම්ප්‍රයුක්තවිචාර කරන්නහුගේ විතර්කවිෂ්ඵාරශබ්දය අසා කියයි: "තා සිත මෙබඳුත් වෙයි, තා සිත මෙ අයුරුත් වෙයි, තා සිත මෙසේත් වේ" යයි හේ බොහෝ කොට ද කියයි, ඒ එසේ මැ වෙයි. අන් අයුරෙකින් නො වෙයි. තවද මහණෙනි, මෙලො වැ ඇතැමෙක් නිමිතින් නො මැ කියයි, මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හඬ අසා නො ද කියයි, විතර්ක කරන්නහුගේ විතර්කසම්ප්‍රයුක්තවිචාර කරන්නහුගේ විතර්කවිෂ්ඵාරශබ්දය අසා නො ද කියයි, එතෙකුදුවත් අවිතර්කඅවිචාරසමාධියට සමවත්හුගේ සිත (තම) සිතින් පිරිසිඳ දැනගනී, "මේ භවත්හුගේ චිත්තසංස්කාරයෝ යම්සෙයින් පිහිටියාහුද මෙසිතට අනතුරු වැ අසෝ නම් විතර්කය කරන්නේ යැ' යි. හේ බොහෝ කොට ද කියයි, ඒ එසේ මැ වෙයි, අන් අයුරෙකින් නො වේ. මහණෙනි, මේ 'ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය' යි කියනු ලැබේ.

මහණෙනි, අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය නම් කවරෙ යත්: මහණෙනි, මෙ ලොව්, ඇතැමෙක් මෙසේ අනුශාසනා කෙරෙයි: "මෙසේ තකාවූ, නොහමක් මෙසේ තකාවූ, මෙසේ මෙනෙහි කරවූ, නොහමක් මෙසේ මෙනෙහි කරවූ, මෙය දුරු කරවූ, මෙයට පැමිණ වාස කරවූ" යයි. මහණෙනි, මේ 'අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය' යයි කියනු ලැබේ. මහණෙනි, මොහු තුන් ප්‍රාතිහාර්‍ය්‍යයෝ යි.

නෛෂ්ක්‍රම්‍යය තෙමේ සිද්ධ වේ නු' යි ඍද්ධි යැ, කාමච්ඡන්දය පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ. යම් කෙනෙක් ඒ නෛෂ්ක්‍රම්‍යයෙන් සමන්වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැළඹුණු සංකල්ප ඇත්තාහු නු' යි ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ. ඒ නෛෂ්ක්‍රම්‍යය වනාහි මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ නෛෂ්ක්‍රම්‍යයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය' යි අනුශාසනීයප්‍රාතිහාර්‍ය්‍ය යි.

අබ්‍යාපාදො ඉජ්ඣතීති ඉද්ධි, බ්‍යාපාදං පටිහරතීති පාටිහාරියං, යෙ තෙන අබ්‍යාපාදෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පාති ආදෙසනාපාටිහාරියං. සො ඛො පන අබ්‍යාපාදො ,එවං ආසෙවිතබ්බො, එවං භාවෙතබ්බො, එවං බහුලීකාතබ්බො, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

ආලොකසඤ්ඤා ඉජ්ඣතීති ඉද්ධි, ථිනමිද්ධං පටිහරතීති පාටිහාරියං. යෙ තාය ආලොකසඤ්ඤාය සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා. අනාවිලසඞ්කප්පාති ආදෙසනාපාටිහාරියං. සා ඛො පන ආලොකසඤ්ඤා 'එවං ආසෙවිතබ්බා, එවං භාවෙතබ්බා, එවං බහුලීකාතබ්බා, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

අවික්ඛෙපො ඉජ්ඣතීති ඉද්ධි, උද්ධච්චං පටිහරතීති පාටිහාරියං. යෙ තෙන අවික්ඛෙපෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පා'ති ආදෙසනාපාටිහාරියං. සො ඛො පන අවික්ඛෙපො 'එවං ආසෙවිතබ්බො, එවං භාවෙතබ්බො, එවං බහුලීකාතබ්බො, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

ධම්මවවත්ථානං ඉජ්ඣතීති ඉද්ධි, විචිකිච්ඡං පටිහරතීති පටිහාරියං. 'යෙ තෙන ධම්මවවත්ථානෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පා'ති ආදෙසනාපාටිහාරියං. තං ඛො පන ධම්මවවත්ථානං 'එවං ආසෙවිතබ්බං, එවං භාවෙතබ්බං, එවං බහුලීකාතබ්බං, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

ඤාණං ඉජ්ඣතීති ඉද්ධි, අවිජ්ජං පටිහරතීති පටිහාරියං. 'යෙ තෙන ඤාණෙන සමන්නාගතා සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පා'ති ආදෙසනාපාටිහාරියං. තං ඛො පන ඤාණං එවං ආසෙවිතබ්බං, එවං භාවෙතබ්බං, එවං බහුලීකාතබ්බං, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

පාමොජ්ජං ඉජ්ඣතීති ඉද්ධි, අරතිං පටිහරතීති පාටිහාරියං. 'යෙ තෙන පාමොජ්ජෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පා'ති ආදෙසනාපාටිහාරියං. තං ඛො පන පාමොජ්ජං 'එවං ආසෙවිතබ්බං, එවං භාවෙතබ්බං, එවං බහුලීකාතබ්බං, එවං තදනුධම්මතා සති, උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

අව්‍යාපාදය තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ. ව්‍යාපාදය පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ, යම් කෙනෙක් ඒ අව්‍යාපාදයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැලඹුණු සංකල්‍ප ඇත්තාහු නු' යි ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ, ඒ අව්‍යාපාදය වැළින් මෙසේ ආසෙවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ අව්‍යාපාදයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය' යි අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි.

ආලොකසංඥා තොමෝ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ, ථිනමිද්ධය පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ, යම් කෙනෙක් ඒ ආලෝකසංඥයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැලඹුණු සංකල්‍ප ඇත්තාහු නු' යි ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ, ඒ ආලොකසංඥාව වැළින් මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනාකළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ. මෙසේ ඒ ආලොකසංඥාවට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය' යි අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි.

අවික්‍ෂෙපය තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ, ඖද්ධත්‍යය පිළිමල් වැ දුරුලා නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ. යම් කෙනෙක් ඒ අවික්‍ෂෙපයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැලඹුණු සංකල්‍ප ඇත්තාහු නු' යි ආදෙශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ. ඒ අවික්‍ෂෙපය වැළින් මෙසේ ආසෙවන කළයුතුයැ, මෙසේ භාවනාකළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ අවික්‍ෂෙපයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය' යි අනුශාසනී ප්‍රාතිහාර්‍ය්‍ය යි.

ධර්‍මනිශ්චය තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ, විචිකිත්සාව පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ. යම් කෙනෙක් ඒ ධර්‍මනිශ්චයෙන් සමන්‍වා-ගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැලඹුණු සංකල්‍ප ඇත්තාහු නු' යි ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ. ඒ ධර්‍මනිශ්චය වැළින් මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ ධර්‍මනිශ්චයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු නු' යි අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි.

ඥානය තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ. අවිද්‍යාව පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ. යම් කෙනෙක් ඒ ඥානයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැලඹුණු සංකල්‍ප ඇත්තාහු නු'යි ආදෙශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ. ඒ ඥානය වැළින් මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ ඥානයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය' යි අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි.

ප්‍රාමොද්‍යය තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ. අරතිය පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ. යම් කෙනෙක් ඒ ප්‍රාතිහාර්‍ය්‍යයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැලඹුණු සංකල්‍ප ඇත්තාහු නු' යි ආදෙශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ. ඒ ප්‍රාමොද්‍යය වැළින් මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළ යුතු යැ, මෙසේ ඒ ප්‍රාමොද්‍යයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය' යි අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි.

පඨමං ඣානං ඉජ්ඣතීති ඉද්ධි, නීවරණෙ පටිහරතීති පාටිහාරියං. යෙ තෙන පඨමෙන ඣානෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පා'ති ආදෙසනාපාටිහාරියං. තං ඛො පන පඨමං ඣානං 'එවං ආසෙවිතබ්බං, එවං භාවෙතබ්බං, එවං බහුලීකාතබ්බං, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං -පෙ-

අරහත්තමග්ගො ඉජ්ඣතීති ඉද්ධි, සබ්බකිලෙසෙ පටිහරතීති පාටිහාරියං 'යෙ තෙන අරහත්තමග්ගෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පා'ති ආදෙසනාපාටිහාරියං. සො ඛො පන අරහත්තමග්ගො 'එවං ආසෙවිතබ්බො, එවං භාවෙතබ්බො, එවං බහුලීකාතබ්බො, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං

නෙක්ඛම්මං ඉජ්ඣතී'ති ඉද්ධි, කාමච්ඡන්දං පටිහරතීති පාටිහාරියං, යා ච ඉද්ධි යඤ්ච පාටිහාරියං, ඉදං වුච්චති ඉද්ධිපාටිහාරියං. අබ්‍යාපාදො ඉජ්ඣතීති ඉද්ධි, බ්‍යාපාදං පටිහරතීති පාටිහාරියං, යා ච ඉද්ධි යඤ්ච පාටිහාරියං, ඉදං වුච්චති ඉද්ධිපාටිහාරියං. ආලොකසඤ්ඤා ඉජ්ඣතීති ඉද්ධි, ථිනමිද්ධං පටිහරතීති පාටිහාරියං -පෙ- අරහත්තමග්ගො ඉජ්ඣතීති ඉද්ධි, සබ්බකිලෙසෙ පටිහරතීති පාටිහාරියං, යා ච ඉද්ධි යඤ්ච පාටිහාරියං, ඉදං වුච්චති ඉද්ධිපාටිහාරියන්ති.

පාටිහාරිය කථා සමත්තා.

ප්‍රථමධ්‍යානය තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ. නීවරණයන් පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ. යම් කෙනෙක් ඒ ප්‍රථමධ්‍යානයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැලඹුණු සංකල්ප ඇත්තාහු නු' යි ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ. ඒ ප්‍රථමධ්‍යානය වැළිත් මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ ප්‍රථමධ්‍යානයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය' යි අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි ...

අර්හත්මාර්ග තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ. හැම කෙලෙසුන් පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ. යම් කෙනෙක් ඒ අර්හත්මාර්ගයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැලඹුණු සංකල්ප ඇත්තාහු නු' යි ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ. ඒ අර්හත්මාර්ගය වැළිත් මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනාකළයුතු යැ, මෙසේ ඒ අර්හත්මාර්ගයට අනුකූල වැ සිහි එළවා තැබිය යුතු ය' යි අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි.

නෛෂ්ක්‍රම්‍ය තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ, කාමච්ඡන්දය පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ, යම් සෘද්ධියකුත් යම් ප්‍රාතිහාර්‍ය්‍යයෙකුත් වේ ද, මේ 'සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය' ය යි කියනු ලැබේ. අව්‍යාපාද තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ, ව්‍යාපාදය පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ, යම් සෘද්ධියකුත් යම් ප්‍රාතිහාර්‍ය්‍යයෙකුත් වේ ද, මේ 'සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය' යයි කියනු ලැබේ. ආලෝකසංඥා තොමෝ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ, ථිනමිද්ධය පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ ... අර්හත්මාර්ග තෙමේ සිද්ධ වේ නු'යි සෘද්ධි යැ, හැම කෙලෙසුන් පිළිමල් වැ දුරු කෙරේ නු'යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ, යම් සෘද්ධියකුත් යම් ප්‍රාතිහාර්‍ය්‍යයෙකුත් වේ ද, මේ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය' යයි කියනු ලැබේ.

ප්‍රාතිහාර්‍ය්‍ය කථා නිමි.

# 3. 7.

## සමසීසි කථා [1]

සබ්බධම්මානං සම්මාසමුච්ඡෙදෙ නිරොධෙ ච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං.

**සබ්බධම්මානන්ති** පඤ්චක්ඛන්ධා ද්වාදසායතනානි අට්ඨාරසධාතුයො කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකතා ධම්මා කාමාවචරා ධම්මා රූපාවචරා ධම්මා අරූපාවචරා ධම්මා අපරියාපන්නා ධම්මා.

**සම්මාසමුච්ඡෙදෙති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දං සම්මා සමුච්ඡින්දති, අබ්‍යාපාදෙන බ්‍යාපාදං සම්මා සමුච්ඡින්දති, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං සම්මා සමුච්ඡින්දති, අවික්ඛෙපෙන උද්ධච්චං සම්මා සමුච්ඡින්දති, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං සම්මා සමුච්ඡින්දති, ඤාණෙන අවිජ්ජං සම්මා සමුච්ඡින්දති, පාමොජ්ජෙන අරතිං සම්මා සමුච්ඡින්දති, පඨමෙන ඣානෙන නීවරණෙ සම්මා සමුච්ඡින්දති -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ සම්මා සමුච්ඡින්දති.

**නිරොධෙති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දං නිරොධෙති, අබ්‍යාපාදෙන බ්‍යාපාදං නිරොධෙති, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං නිරොධෙති, අවික්ඛෙපෙන උද්ධච්චං නිරොධෙති, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං නිරොධෙති, ඤාණෙන අවිජ්ජං නිරොධෙති, පාමොජ්ජෙන අරතිං නිරොධෙති, පඨමෙන ඣානෙන නීවරණෙ නිරොධෙති -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ නිරොධෙති.

**අනුපට්ඨානතාති** නෙක්ඛම්මං පටිලද්ධස්ස කාමච්ඡන්දො න උපට්ඨාති, අබ්‍යාපාදං පටිලද්ධස්ස බ්‍යාපාදො න උපට්ඨාති, ආලොකසඤ්ඤං පටිලද්ධස්ස ථිනමිද්ධං න උපට්ඨාති, අවික්ඛෙපං පටිලද්ධස්ස උද්ධච්චං න උපට්ඨාති, ධම්මවවත්ථානං පටිලද්ධස්ස විචිකිච්ඡා න උපට්ඨාති, ඤාණං පටිලද්ධස්ස අවිජ්ජා න උපට්ඨාති, පාමොජ්ජං පටිලද්ධස්ස අරති න උපට්ඨාති, පඨමං ඣානං පටිලද්ධස්ස නීවරණා න උපට්ඨන්ති -පෙ- අරහත්තමග්ගං පටිලද්ධස්ස සබ්බකිලෙසා න උපට්ඨන්ති.

**සමන්ති** කාමච්ඡන්දස්ස පහීනත්තා නෙක්ඛම්මං සමං, බ්‍යාපාදස්ස පහීනත්තා අබ්‍යාපාදො සමං, ථිනමිද්ධස්ස පහීනත්තා ආලොකසඤ්ඤා සමං, උද්ධච්චස්ස පහීනත්තා අවික්ඛෙපො සමං, විචිකිච්ඡාය පහීනත්තා ධම්මවවත්ථානං සමං, අවිජ්ජාය පහීනත්තා ඤාණං සමං, අරතියා පහීනත්තා පාමොජ්ජං සමං, නීවරණානං පහීනත්තා පඨමං ඣානං සමං -පෙ- සබ්බකිලෙසානං පහීනත්තා අරහත්තමග්ගො සමං.

**සීසන්ති** තෙරස සීසානි: පලිබොධසීසඤ්ච තණ්හා, විනිබන්ධසීසඤ්ච[2] මානො, පරාමාසසීසඤ්ච දිට්ඨි, වික්ඛෙපසීසඤ්ච උද්ධච්චං, සඞ්කිලෙසසීසඤ්ච අවිජ්ජා, අධිමොක්ඛසීසඤ්ච සද්ධා, පග්ගහසීසඤ්ච විරියං, උපට්ඨානසීසඤ්ච සති, අවික්ඛෙපසීසඤ්ච සමාධි, දස්සනසීසඤ්ච පඤ්ඤා, පවත්තසීසඤ්ච ජීවිතින්ද්‍රියං, ගොචරසීසඤ්ච විමොක්ඛො, සඞ්ඛාරසීසඤ්ච නිරොධොති.

**සමසීසිකථා සමත්තා.**

---

1. සමසීස කථා - මජසං, සයා, PTS. 2 විනිබන්ධනසීසඤ්ච - මජසං

# 3. 7.

## ශමශීර්ෂ කථා

සියලු (ත්‍රෛභූමක) ධර්මයන් මොනොවට නිරුද්ධ කිරීමෙහි ද නිරුද්ධ කල කල්හි යළි නො උපදීමෙහි ද ප්‍රඥාව ශමශීර්ෂාර්ථඥාන නම්.

**සබ්බධම්මානං** යනු: පඤ්චස්කන්ධ යැ දොළොස් ආයතන යැ අටළොස් ධාතු යැ කුශලධර්ම යැ අකුශලධර්ම යැ අව්‍යාකෘතධර්ම යැ කාමාවචරධර්ම යැ රූපාවචරධර්ම යැ අරූපාවචරධර්ම යැ අපර්‍යාපන්නධර්ම යි.

**සම්මාසමුච්ඡෙදෙ** යනු: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය මොනොවට සමුච්ඡේද (මුලුසුන්) කෙරෙයි, අව්‍යාපාදයෙන් ව්‍යාපාදය මොනොවට සමුච්ඡේද කෙරෙයි, ආලෝකසංඥයෙන් ථීනමිද්ධය මොනොවට සමුච්ඡේද කෙරෙයි, අවික්ෂෙපයෙන් ඖද්ධත්‍යය මොනොවට සමුච්ඡේද කෙරෙයි, ධර්මනිශ්චයෙන් විචිකිත්සාව මොනොවට සමුච්ඡේද කෙරෙයි, ඥානයෙන් අවිද්‍යාව මොනොවට සමුච්ඡේද කෙරෙයි, ප්‍රාමොද්‍යයෙන් අරතිය මොනොවට සමුච්ඡේද කෙරෙයි, ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් මොනොවට සමුච්ඡේද කෙරෙයි ... රහත්මගින් හැම කෙලෙසුන් මොනොවට සමුච්ඡේද කෙරේ.

**නිරොධෙ** යනු: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය නිරුද්ධ කෙරෙයි, අව්‍යාපාදයෙන් ව්‍යාපාදය නිරුද්ධ කෙරෙයි, ආලොකසංඥයෙන් ථීනමිද්ධය නිරුද්ධ කෙරෙයි, අවික්ෂෙපයෙන් ඖද්ධත්‍යය නිරුද්ධ කෙරෙයි, ධර්මනිශ්චයෙන් විචිකිත්සාව නිරුද්ධ කෙරෙයි, ඥානයෙන් අවිද්‍යාව නිරුද්ධ කෙරෙයි; ප්‍රාමොද්‍යයෙන් අරතිය නිරුද්ධ කෙරෙයි, ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් නිරුද්ධ කෙරෙයි ... රහත්මගින් හැම කෙලෙසුන් නිරුද්ධ කෙරේ.

**අනුපට්ඨානතා** යනු: නෛෂ්ක්‍රම්‍යය ලදුවහුට කාමච්ඡන්දය නූපදී. (නො එළඹෙයි), අව්‍යාපාදය ලදුවහුට ව්‍යාපාදය නූපදී, ආලොකසංඥ ලදුවහුට ථීනමිද්ධය නූපදී, අවික්ෂෙපය ලදුවහුට ඖද්ධත්‍යය නූපදී, ධර්මනිශ්චය ලදුවහුට විචිකිත්සාව නූපදී, ඥානය ලදුවහුට අවිද්‍යාව නූපදී, ප්‍රාමොද්‍යය ලදුවහුට අරතිය නූපදී, ප්‍රථමධ්‍යානය ලදුවහුට නීවරණයන් නූපදී .. රහත්මග ලදුවහුට හැම කෙලෙස්හු නූපදිත්.

**සමං** යනු: කාමච්ඡන්දය පුහුත් (ප්‍රහීණ) බැවින් නෛෂ්ක්‍රම්‍යය ශම යැ, ව්‍යාපාදය පුහුත් බැවින් අව්‍යාපාදය ශම යැ, ථීනමිද්ධය පුහුත් බැවින් ආලොකසංඥාව ශම යැ, ඖද්ධත්‍යය පුහුත් බැවින් අවික්ෂෙපය ශම යැ, විචිකිත්සාව පුහුත් බැවින් ධර්මනිශ්චය ශම යැ, අවිද්‍යාව පුහුත් බැවින් ඥානය ශම යැ, අරතිය පුහුත් බැවින් ප්‍රාමොද්‍යය ශම යැ, නීවරණයන් පුහුත් බැවින් ප්‍රථමධ්‍යානය ශම යැ ... හැම කෙලෙසුන් පුහුත් බැවින් රහත්මග ශම යි.

**සීසං** යනු: තෙලෙස් ශීර්ෂයෝ යැ: තෘෂ්ණාව පරිරොධශීර්ෂ ද මානය විනිබන්ධශීර්ෂ ද දෘෂ්ටිය පරාමර්ශශීර්ෂ ද ඖද්ධත්‍යය වික්ෂෙපශීර්ෂ ද අවිද්‍යාව සංක්ලෙශශීර්ෂ ද ශ්‍රද්ධාව අධිමොක්ෂශීර්ෂ ද වීර්‍යය ප්‍රග්‍රහශීර්ෂ ද ස්මෘතිය උපස්ථානශීර්ෂ ද සමාධිය අවික්ෂෙපශීර්ෂ ද ප්‍රඥාව දර්ශනශීර්ෂ ද ජීවිතෙන්ද්‍රිය ප්‍රවෘත්තිශීර්ෂ ද විමොක්ෂය ගොචරශීර්ෂ ද නිරොධය සංස්කාරශීර්ෂ ද වේ යයි.

**සමසීසිකථා නිමි.**

## 3. 8.

## සතිපට්ඨාන කථා

[සාවත්ථිනිදානං:]

'චත්තාරොමෙ භික්ඛවෙ, සතිපට්ඨානා, කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙ ඛො, භික්ඛවෙ, චත්තාරො සතිපට්ඨානා'ති''.

කථං කායෙ කායානුපස්සී විහරති: ඉධෙකච්චො පඨවිකායං අනිච්චතො අනුපස්සති නො නිච්චතො, දුක්ඛතො අනුපස්සති නො සුඛතො, අනත්තතො අනුපස්සති නො අත්තතො, නිබ්බින්දති නො නන්දති, විරජ්ජති නො රජ්ජති, නිරොධෙති නො සමුදෙති, පටිනිස්සජ්ජති නො ආදියති. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි කායං අනුපස්සති. කායො උපට්ඨානං නො සති. සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති. තෙන වුච්චති: කායෙ කායානුපස්සනා සතිපට්ඨානා.

භාවනා'ති චතස්සො භාවනා: තත්‍ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා.

ඉධෙකච්චො ආපොකායං -පෙ- තෙජොකායං -පෙ- වායොකායං -පෙ- කෙසකායං -පෙ- ලොමකායං -පෙ- ඡවිකායං -පෙ- චම්මකායං -පෙ- මංසකායං -පෙ- රුධිරකායං -පෙ- නහාරුකායං[1] -පෙ- අට්ඨිකායං -පෙ- අට්ඨිමිඤ්ජකායං අනිච්චතො අනුපස්සති නො නිච්චතො, දුක්ඛතො අනුපස්සති නො සුඛතො, අනත්තතො අනුපස්සති නො අත්තතො, නිබ්බින්දති, නො නන්දති, විරජ්ජති නො රජ්ජති, නිරොධෙති නො සමුදෙති, පටිනිස්සජ්ජති නො ආදියති. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි කායං අනුපස්සති. කායො උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති. තෙන වුච්චති: කායෙ කායානුපස්සනා සතිපට්ඨානා.

1. නහාරුකායං - මජසං,

# 3. 8.

# සතිපට්ඨාන කථා

[සැවැත්නිදාන යි:]

"මහණෙනි, මේ සතිපට්ඨානයෝ සතර දෙනෙක් වෙති: කවර සතර දෙනෙකැ යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙම කෙලෙස් තවන වැර ඇති වැ සම්‍යග්ඥාන ඇති වැ සිහි ඇති වැ කාය සඞ්ඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යයන් දුරු කොට කයෙහි කය අනුව බලනසුලු වැ වාසය කෙරෙයි. වේදනාවන්හි ... චිත්තයෙහි ... කෙලෙස් තවන වැර ඇති වැ සම්‍යග්ඥාන ඇති වැ සිහි ඇති වැ ධර්ම සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යයන් දුරු කොට ධර්මයන්හි ධර්මයන් අනු වැ බලනසුලු වැ වාසය කෙරේ මහණෙනි, මොහු සතර සතිපට්ඨානයෝ" යි.

කිසෙයින් කයෙහි කය අනු වැ බලනසුලු වැ වාසය කෙරේ ද යත් මෙසස්නෙහි ඇතැමෙක් පඨවිධාතුකාය (පෘථිවිධාතු සමූහය) අනිත්‍ය හෙයින් පුනපුනා දක්නේ යැ, නිත්‍ය හෙයින් නො දක්නේ යැ, දුඃඛ හෙයින් පුනපුනා දක්නේ යැ, සුඛ හෙයින් නො දක්නේ යැ, අනාත්ම හෙයින් පුනපුනා දක්නේ යැ, ආත්ම හෙයින් නො දක්නේ යැ, කලකිරෙයි, සතුටු නො වෙයි, විරක්ත වෙයි නො ඇලෙයි, නිරුද්ධ කෙරෙයි, සමුදය නො කෙරෙයි, හැරපියයි නො ගනියි, අනිත්‍ය හෙයින් පුනපුනා දක්නේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි, දුඃඛ හෙයින් පුනපුනා දක්නේ සුඛසංඥාව දුරු කෙරෙයි, අනාත්ම හෙයින් පුනපුනා දක්නේ ආත්මසංඥාව දුරු කෙරෙයි, කලකිරෙනුයේ නන්දිය දුරු කෙරෙයි, නො ඇලෙනුයේ රාගය දුරු කෙරෙයි, නිරුද්ධ කෙරෙනුයේ සමුදය දුරු කෙරෙ යි, හැරපියනුයේ ආදානය දුරු කෙරේ. මේ සත් අයුරින් කාය පුනපුනා දක්නේ යි. කාය උපස්ථාන යැ සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ කාය පුනපුනා දක්නේ යි. එයින් කියනු ලැබෙයි: 'කායෙ කායානුපස්සනා සතිපට්ඨානා'යි.

භාවනා යනු: භාවනා සතරෙක ඒ භාවනාවිශේෂයෙහි උපන් යුගනද්ධධර්මයන් (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා අර්ථයෙන් භාවනා යැ, ඉන්ද්‍රියයන්ගේ එකකෘත්‍යාර්ථයෙන් භාවනා යැ, තදනුකූලවීර්‍ය්‍යවාහිතාර්ථයෙන් භාවනා යැ, ආසෙවනාර්ථයෙන් භාවනා යි.

මෙසස්නෙහි ඇතැමෙක් ආපොකාය ... තේජෝකාය ... වායොකාය ... කෙසකාය ... ලොමකාය ... ඡවිකාය ... චම්මකාය ... මංසකාය ... රුධිරකාය ... නහාරුකාය ... අට්ඨිකාය ... අට්ඨිමිඤ්ජකාය ... අනිත්‍ය හෙයින් අනුදර්ශනා කෙරෙයි නිත්‍ය හෙයින් නො කෙරෙයි, දුඃඛ හෙයින් අනුදර්ශනා කෙරෙයි සුඛ හෙයින් නො කෙරෙයි, අනාත්ම හෙයින් අනුදර්ශනා කෙරෙයි ආත්ම හෙයින් නො කෙරෙයි, කලකිරෙයි සතුටු නො වෙයි, විරක්ත වෙයි නො ඇලෙයි, නිරුද්ධ කෙරෙයි සමුදය නො කෙරෙයි, හැරපියයි නො ගනී, අනිත්‍ය හෙයින් අනුදර්ශනා කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි, දුඃඛ හෙයින් අනුදර්ශනා කරනුයේ සුඛසංඥාව දුරු කෙරෙයි, අනාත්ම හෙයින් අනුදර්ශනා කරනුයේ ආත්මසංඥාව දුරු කෙරෙයි, කලකිරෙනුයේ නන්දිය දුරු කෙරෙයි, නො ඇලෙනුයේ රාගය දුරු කෙරෙයි, නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි, පටිනිස්සජ්ජනය කරනුයේ ආදානය දුරු කෙරේ. මේ සත් අයුරින් කාය අනුදර්ශනා කෙරේ. කාය උපස්ථාන වෙයි සමෘති නො වෙයි, සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ කාය අනුදර්ශනා කෙරේ. එයින් කියනු ලැබෙයි: 'කායෙ කායානුපස්සනා සතිපට්ඨානා' යි.

භාවනාති චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවීරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා එවං කායෙ කායානුපස්සී විහරති.

කථං වෙදනාසු වෙදනානුපස්සී විහරති? ඉධෙකච්චො සුඛං වෙදනං අනිච්චතො අනුපස්සති නො නිච්චතො -පෙ- පටිනිස්සජ්ජති නො ආදියති, අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි වෙදනං අනුපස්සති. වෙදනා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන තං වෙදනං අනුපස්සති. තෙන වුච්චති: වෙදනාසු වෙදනානුපස්සනා සතිපට්ඨානා.

භාවනාති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා -පෙ- ඉධෙකච්චො දුක්ඛං වෙදනං -පෙ- අදුක්ඛමසුඛං වෙදනං -පෙ- සාමිසං සුඛං වෙදනං -පෙ- නිරාමිසං සුඛං වෙදනං -පෙ- සාමිසං දුක්ඛං වෙදනං -පෙ- නිරාමිසං දුක්ඛං වෙදනං -පෙ- සාමිසං අදුක්ඛමසුඛං වෙදනං -පෙ- නිරාමිසං අදුක්ඛමසුඛං වෙදනං -පෙ- චක්ඛුසම්ඵස්සජං වෙදනං -පෙ- සොතසම්ඵස්සජං වෙදනං -පෙ- ඝානසම්ඵස්සජං වෙදනං -පෙ- ජිව්හාසම්ඵස්සජං වෙදනං -පෙ- කායසම්ඵස්සජං වෙදනං -පෙ- මනොසම්ඵස්සජං වෙදනං අනිච්චතො අනුපස්සති නො නිච්චතො -පෙ- පටිනිස්සජ්ජති නො ආදියති. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි වෙදනං අනුපස්සති, වෙදනා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන, තං වෙදනං අනුපස්සති. තෙන වුච්චති: වෙදනාසු වෙදනානුපස්සනා සතිපට්ඨානා.

භාවනාති චතස්සො භාවනා -පෙ- එවං වෙදනාසු වෙදනානුපස්සී විහරති.

කථං චිත්තෙ චිත්තානුපස්සී විහරති: ඉධෙකච්චො සරාගං චිත්තං අනිච්චතො අනුපස්සති නො නිච්චතො -පෙ- පටිනිස්සජ්ජති නො ආදියති. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි චිත්තං අනුපස්සති. චිත්තං උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං අනුපස්සති. තෙන වුච්චති: චිත්තෙ චිත්තානුපස්සනා සතිපට්ඨානා.

භාවනා යනු: භාවනා සතරෙකි: ඒ භාවනාවිශෙෂයෙහි උපන් (යුගනද්ධ) ධර්මයන් (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා අර්ථයෙන් භාවනා යැ, ඉන්ද්‍රියයන්ගේ එකකෘත්‍යස්වභාවයෙන් භාවනා යැ, තදනුරූපවීර්යඝී-ධුරාර්ථයෙන් භාවනා යැ, ආසේවනාර්ථයෙන් භාවනා යි. මෙසෙයින් කයෙහි කායානුදර්ශී වැ වාසය කෙරේ.

කිසෙයින් වෙදනාවන්හි වෙදනානුදර්ශී වැ වාසය කෙරේ යැ යත්: මෙසස්නෙහි ඇතැමෙක් සුඛවෙදනාව අනිත්‍ය හෙයින් පුනපුනා දක්නේ යැ නිත්‍ය හෙයින් නො දක්නේ යැ ... හැරපියයි නො ගනී, අනිත්‍ය හෙයින් පුනපුනා දක්නේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි ... පටිනිස්සජ්ජනය කරනුයේ ආදානය දුරු කෙරෙයි. මේ සත් අයුරින් වෙදනාව අනුදර්ශනා කෙරේ. වෙදනාව උපස්ථාන වෙයි. ස්මෘති නො වෙයි, ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ වෙදනාව අනුදර්ශනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'වෙදනාසු වෙදනානුපස්සනා සතිපට්ඨානා' යි.

භාවනා යනු: භාවනා සතරෙකි: ... ආසෙවනාර්ථයෙන් භාවනා යි ... මෙසස්නෙහි ඇතැමෙක් දුක් වෙදනාව ... නො දුක් නො සුව වෙදනාව ... සාමිෂ වූ සුඛවෙදනාව ... නිරාමිෂ වූ සුඛවෙදනාව ... සාමිෂ වූ දුඃඛ වෙදනාව ... නිරාමිෂ වූ දුඃඛවෙදනාව ... සාමිෂ වූ අදුක්ඛමසුඛවේදනාව ... නිරාමිෂ වූ අදුක්ඛමසුඛවෙදනාව ... චක්ඛුසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... සොතසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... ඝානසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... ජිව්හාසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... කායසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... මනොසම්ඵස්සයෙන් උපන් වෙදනාව අනිත්‍ය හෙයින් අනුදර්ශනා කෙරෙයි නිත්‍ය හෙයින් නො කෙරෙයි ... හැරපියයි නො ගනී, අනිත්‍ය හෙයින් අනුදර්ශනා කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි ... පටිනිස්සජ්ජනය කරනුයේ ආදානය දුරු කෙරේ. මේ සත් අයුරින් වෙදනාව අනුදර්ශනා කෙරේ. වෙදනාව උපස්ථාන වෙයි ස්මෘති නො වෙයි, ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ වෙදනාව අනුදර්ශනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'වෙදනාසු වෙදනානුපස්සනා සතිපට්ඨානා' යි.

භාවනා යනු: භාවනා සතරෙකි ... මෙසෙයින් වෙදනාවන්හි වෙදනානුදර්ශී වැ වාසය කෙරේ.

කිසෙයින් චිත්තයෙහි චිත්තානුදර්ශී වැ වාසය කෙරේ යැ යත්: මෙසස්නෙහි ඇතැමෙක් සරාග සිත අනිත්‍ය හෙයින් අනුදර්ශනා කෙරෙයි නිත්‍ය හෙයින් නො කෙරෙයි ... පටිනිස්සජ්ජනය කෙරෙයි ආදානය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් අනුදර්ශනා කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි ... පටිනිස්සජ්ජනය කරනුයේ ආදානය දුරු කෙරෙයි. මේ සත් අයුරින් චිත්තය අනුදර්ශනා කෙරේ. චිත්තය උපස්ථාන වෙයි ස්මෘති නො වෙයි, ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ සිත අනුදර්ශනා කෙරේ. එයින් කියනු ලැබෙයි: 'චිත්තෙ චිත්තානුපස්සනා සතිපට්ඨානා' යි.

භාවනාති චතස්සො භාවනා: -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

ඉධෙකච්චො වීතරාගං චිත්තං -පෙ- සදොසං චිත්තං -පෙ- වීතදොසං චිත්තං -පෙ- සමොහං චිත්තං -පෙ- වීතමොහං චිත්තං -පෙ- සඞ්ඛිත්තං චිත්තං -පෙ- වික්ඛිත්තං චිත්තං -පෙ- මහග්ගතං චිත්තං -පෙ- අමහග්ගතං චිත්තං -පෙ- සඋත්තරං චිත්තං -පෙ- අනුත්තරං චිත්තං -පෙ- සමාහිතං චිත්තං -පෙ- අසමාහිතං චිත්තං -පෙ- විමුත්තං චිත්තං -පෙ- අවිමුත්තං චිත්තං -පෙ- චක්ඛුවිඤ්ඤාණං -පෙ- සොතවිඤ්ඤාණං -පෙ- ඝානවිඤ්ඤාණං -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- කායවිඤ්ඤාණං -පෙ- මනොවිඤ්ඤාණං අනිච්චතො අනුපස්සති නො නිච්චතො -පෙ- පටිනිස්සජ්ජති නො ආදියති. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි චිත්තං අනුපස්සති. චිත්තං උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං අනුපස්සති. තෙන වුච්චති: චිත්තෙ චිත්තානුපස්සනා සතිපට්ඨානා.

භාවනාති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා. එවං චිත්තෙ චිත්තානුපස්සී විහරති.

කථං ධම්මෙසු ධම්මානුපස්සී විහරති: ඉධෙකච්චො ඨපෙත්වා කායං, ඨපෙත්වා වෙදනං, ඨපෙත්වා චිත්තං තදවසෙසෙ ධම්මෙ අනිච්චතො අනුපස්සති නො නිච්චතො, දුක්ඛතො අනුපස්සති, නො සුඛතො, අනත්තතො අනුපස්සති, නො අත්තතො, නිබ්බින්දති නො නන්දති, විරජ්ජති නො රජ්ජති, නිරොධෙති නො සමුදෙති, පටිනිස්සජ්ජති නො ආදියති, අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි තෙ ධම්මෙ අනුපස්සති, ධම්මා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන තෙ ධම්මෙ අනුපස්සති. තෙන වුච්චති: ධම්මෙසු ධම්මානුපස්සනා සතිපට්ඨානා.

භාවනාති චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවීරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා. එවං ධම්මෙසු ධම්මානුපස්සී විහරතීති.

සතිපට්ඨානකථා සමත්තා.

භාවනා යනු: භාවනා සතරෙක ... ආසෙවනාර්ථයෙන් භාවනා යි.

මෙසස්නෙහි ඇතැමෙක් විතරාග සිත ... සදෙස සිත ... විතදෙස සිත ... සමොහ සිත ... විතමොහ සිත ... සංක්‍ෂිප්ත සිත ... වික්‍ෂිප්ත සිත ... මහද්ගත සිත ... මහද්ගත නො වූ සිත ... සඋත්තර සිත ... අනුත්තර සිත ... සමාහිත සිත ... අසමාහිත සිත ... විමුක්ත සිත ... අවිමුක්ත සිත ... චක්‍ෂුර්විඥානය ... ශ්‍රොත්‍රවිඥානය ... ඝ්‍රාණවිඥානය ... ජිහ්වාවිඥානය ... කායවිඥානය ... මනොවිඥානය අනිත්‍ය හෙයින් අනුදර්ශනා කෙරෙයි නිත්‍ය හෙයින් නො කෙරෙයි ... පටිනිස්සජ්ජනය කෙරෙයි ආදානය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් අනුදර්ශනා කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි ... පටිනිස්සජ්ජනය කරනුයේ ආදානය දුරු කෙරෙයි. මේ සත් අයුරින් සිත අනුදර්ශනා කෙරේ. සිත උපස්ථාන වෙයි ස්මෘති නො වෙයි, ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ සිත අනුදර්ශනා කෙරේ. එයින් කියනු ලැබෙයි: 'චිත්තෙ චිත්තානුපස්සනා සතිපට්ඨානා' යි.

භාවනා යනු: භාවනා සතරෙක .. ආසෙවනාර්ථයෙන් භාවනා යි. මෙසෙයින් චිත්තයෙහි චිත්තානුදර්ශී ව වාසය කෙරේ.

කිසෙයින් ධර්මයන්හි ධර්මානුදර්ශී ව වාසය කෙරෙයි යත්: මෙ සස්නෙහි ඇතැමෙක් කය තබා වෙදනාව තබා සිත තබා තදවශිෂ්ට (ත්‍රෛභූමක) ධර්මයන් අනිත්‍ය හෙයින් අනුදර්ශනා කෙරෙයි නිත්‍ය හෙයින් නො කෙරෙයි, දුඃඛ හෙයින් අනුදර්ශනා කෙරෙයි සුඛ හෙයින් නො කෙරෙයි, අනාත්ම හෙයින් අනුදර්ශනා කෙරෙයි ආත්ම හෙයින් නො කෙරෙයි, කලකිරෙයි සතුටු නො වෙයි, විරක්ත වෙයි නො ඇලෙයි, නිරුද්ධ කෙරෙයි සමුදය නො කෙරෙයි, හැරපියයි නො ගනී, අනිත්‍ය හෙයින් අනුදර්ශනා කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි, දුඃඛ හෙයින් අනුදර්ශනා කරනුයේ සුඛසංඥාව දුරු කෙරෙයි. අනාත්ම හෙයින් අනුදර්ශනා කරනුයේ ආත්මසංඥාව දුරු කෙරෙයි, කලකිරෙනුයේ නන්දිය දුරු කෙරෙයි, නො ඇලෙනුයේ රාගය දුරු කෙරෙයි, නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි, පටිනිස්සජ්ජනය කරනුයේ ආදානය දුරු කෙරෙයි, මේ සත් අයුරින් ඒ ධර්මයන් අනුදර්ශනා කෙරේ. ධර්ම උපස්ථාන වෙයි ස්මෘති නො වෙයි, ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ ධර්මයන් අනුදර්ශනා කෙරේ. එයින් කියනු ලැබෙයි: 'ධම්මෙසු ධම්මානුපස්සනා සතිපට්ඨානා' යි.

භාවනා යනු: භාවනා සතරෙක: ඒ භාවනාවිශෙෂයෙහි උපන් (යුගනද්ධ) ධර්මයන් (බවුනොවුන්) නො ඉක්ම පවත්නා අර්ථයෙන් භාවනා යැ, ඉන්ද්‍රියයන්ගේ එකකෘත්‍යස්වභාවයෙන් භාවනා යැ, තදනුරූපවීර්‍ය්‍යධුරාර්ථයෙන් භාවනා යැ, ආසෙවනාර්ථයෙන් භාවනා යි. මෙසෙයින් ධර්මයන්හි ධර්මානුදර්ශී ව වාසය කෙරේ.

**සතිපට්ඨාන කථා නිමි.**

# 3. 9.

## විපස්සනා කථා

“එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච:

සො වත භික්ඛවෙ, භික්ඛු කඤ්චි සඞ්ඛාරං නිච්චතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති නෙතං ඨානං විජ්ජති, සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං[1] වා සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

සො වත භික්ඛවෙ, භික්ඛු සබ්බසඞ්ඛාරෙ අනිච්චතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති ඨානමෙතං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති ඨානමෙතං විජ්ජති, සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති.

සො වත භික්ඛවෙ භික්ඛු කඤ්චි සඞ්ඛාරං සුඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති නෙතං ඨානං විජ්ජති, සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති

සො වත භික්ඛවෙ, භික්ඛු සබ්බසඞ්ඛාරෙ දුක්ඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති ඨානමෙතං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති ඨානමෙතං විජ්ජති, සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති.

සො වත භික්ඛවෙ භික්ඛු කඤ්චි ධම්මං අත්තතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති නෙතං ඨානං විජ්ජති, සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

1. අරහත්තඵලං - සයා, PTS

# 3. 9.

## විදර්ශනා කථා

“මා විසින් මෙසේ අසනලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ අරම්හි වැඩ වාස කරනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’ යි භික්ෂූන් ඇමැතූසේක. ‘‘භාග්‍යවතුන් වහන්ස,’ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මහණෙනි, එකැතිත් ඒ මහණ කිසි සංස්කාරයක් නිත්‍ය හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත නො වූයේ සම්‍යක්ත්වනියාමයට (ලෝකෝත්තරමාර්ගයට) බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, සම්‍යක්ත්වනියාමයට නො බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනාගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

මහණෙනි, එකැතිත් ඒ මහණ හැම සංස්කාරයන් අනිත්‍ය හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වූයේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි, සම්‍යක්ත්වනියාමයට බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනාගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

මහණෙනි, එකැතිත් ඒ මහණ කිසි සංස්කාරයක් සුව හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත නො වූයේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, සම්‍යක්ත්වනියාමයට නො බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනාගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

මහණෙනි, එකැතිත් ඒ මහණ හැම සංස්කාරයන් දුක් හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි. අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වූයේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි. සම්‍යක්ත්වනියාමයට බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනාගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

මහණෙනි, එකැතිත් ඒ මහණ කිසි ධර්මයක් ආත්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත නො වූයේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, සම්‍යක්ත්වනියාමයට නො බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනාගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

සො වත භික්ඛවෙ, භික්ඛු සබ්බධම්මෙ අනත්තතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති ඨානමෙතං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති ඨානමෙතං විජ්ජති සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති,

සො වත භික්ඛවෙ, භික්ඛු නිබ්බානං දුක්ඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති නෙතං ඨානං විජ්ජති, සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

සො වත භික්ඛවෙ, භික්ඛු නිබ්බානං සුඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති ඨානමෙතං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති ඨානමෙතං විජ්ජති, සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති." [2]

කතිහාකාරෙහි අනුලොමිකං ඛන්තිං පටිලභති, කතිහාකාරෙහි සම්මත්තනියාමං ඔක්කමති:

චත්තාරීසාය ආකාරෙහි අනුලොමිකං ඛන්තිං පටිලභති. චත්තාරීසාය ආකාරෙහි සම්මත්තනියාමං ඔක්කමති.

කතමෙහි චත්තාරීසාය ආකාරෙහි අනුලොමිකං ඛන්තිං පටිලභති, කතමෙහි චත්තාරීසාය ආකාරෙහි සම්මත්තනියාමං ඔක්කමති:

පඤ්චක්ඛන්ධෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො ඊතිතො උපද්දවතො භයතො උපස්සග්ගතො චලතො පභඞ්ගුතො අද්ධුවතො අතාණතො[1] අලෙණතො අසරණතො රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො ආදීනවතො විපරිණාමධම්මතො අසාරකතො අඝමූලතො වධකතො විභවතො සාසවතො සඞ්ඛතතො මාරාමිසතො ජාතිධම්මතො ජරාධම්මතො බ්‍යාධිධම්මතො මරණධම්මතො සොකධම්මතො පරිදෙවධම්මතො උපායාසධම්මතො සඞ්කිලෙසිකධම්මතො.

පඤ්චක්ඛන්ධෙ අනිච්චතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො නිච්චං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ දුක්ඛතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො සුඛං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

---

1. අතාණතො - මජසං, 2. සංයුත්තනිකාය

මහණෙනි, එකැතින් ඒ මහණ හැම ධර්මයන් අනාත්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වූයේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි. සම්‍යක්ත්වනියාමයට බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනාගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

මහණෙනි, එකැතින් ඒ මහණ නිර්වාණය දුඃඛ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත නො වූයේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, සම්‍යක්ත්වනියාමයට නො බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනාගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

මහණෙනි, එකැතින් ඒ මහණ නිර්වාණය සුඛ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වූයේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි, සම්‍යක්ත්වනියාමයට බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනාගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වේ.

කිහි අයුරෙකින් අනුලෝමක්ෂාන්තිය ලබා ද, කිහි අයුරෙකින් සම්‍යක්ත්වනියාමයට බස්නේ ද යත්:

සතලිස් අයුරෙකින් අනුලෝමක්ෂාන්තිය ලබයි, සතලිස් අයුරෙකින් සම්‍යක්ත්වනියාමයට බස්නේ යි.

කවර සතලිස් අයුරෙකින් අනුලෝමක්ෂාන්තිය ලබා ද, කවර සතලිස් අයුරෙකින් සම්‍යක්ත්වනියාමයට බස්නේ ද යත්:

පඤ්චස්කන්ධය අනිත්‍ය හෙයින් දුක් හෙයින් රෝග හෙයින් ගණ්ඩ හෙයින් ශල්‍ය හෙයින් විපත් හෙයින් ආබාධ හෙයින් පර (අවසඟ) හෙයින් බිඳෙන හෙයින් ව්‍යසන හෙයින් උපද්‍රව හෙයින් භය හෙයින් උපසර්ග හෙයින් චල හෙයින් බිඳෙන සුලු හෙයින් අධ්‍රැව හෙයින් අත්‍රාණ හෙයින් අලෙන හෙයින් අසරණ හෙයින් සිස් හෙයින් තුච්ඡ හෙයින් ශූන්‍ය හෙයින් අනාත්ම හෙයින් ආදීනව හෙයින් විපරිණාමස්වභාව හෙයින් අසාර හෙයින් අඝමූල හෙයින් වධක හෙයින් විභව හෙයින් සාස්‍රව හෙයින් සඞ්ඛත හෙයින් මාරාමිෂ හෙයින් ජාතිධර්ම හෙයින් ජරාධර්ම හෙයින් ව්‍යාධිධර්ම හෙයින් මරණධර්ම හෙයින් ශෝකධර්ම හෙයින් පරිදේවධර්ම හෙයින් උපායාසධර්ම හෙයින් සාංක්ලේශිකධර්ම හෙයිනි.

පඤ්චස්කන්ධය අනිත්‍ය හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය නිත්‍ය යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය දුක් හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය සුව යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චක්ඛන්ධෙ රොගතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො ආරොග්‍යං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ගණ්ඩතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අගණ්ඩං[1] නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ සල්ලතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො විසල්ලං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ අඝතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනඝො නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ආබාධතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනාබාධො නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති

පඤ්චක්ඛන්ධෙ පරතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපරප්පච්චයං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ පලොකතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපලොකධම්මො නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ඊතිතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනීතිකං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ උපද්දවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනුපද්දවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ භයතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අභයං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති

පඤ්චක්ඛන්ධෙ උපස්සග්ගතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනුපස්සග්ගං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ චලතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අචලං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ පභඞ්ගුතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපභඞ්ගු නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

1. නිගණ්ඩං - සයා,

පඤ්චස්කන්ධය රෝග හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය ආරෝග්‍ය යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ගඩ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය නො ගඩ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ශල්‍ය හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය විශල්‍ය යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අඝ හෙයින් දක්නේ, අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අනඝ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ආබාධ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අනාබාධ යැ' යි දක්නේ, සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය පර හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය පරප්‍රත්‍යය නො වේ යැ'යි, දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය බිඳෙන හෙයින් දක්නේ, අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය නො බිඳෙන සැහැවි යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ව්‍යසන හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය ව්‍යසන රහිත යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය උපද්‍රව හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අනුපද්‍රව යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයටබස්නේ යැ.

පඤ්චස්කන්ධය භය හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අභය යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය උපසර්ග හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අනුපසර්ග යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය චල හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අචල යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය බිඳෙනසුලු හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය නො බිඳෙනසුලු යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චක්ඛන්ධෙ අද්ධුවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො ධුවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ අතාණතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්න ඛන්ධානං නිරොධො තාණං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ අලෙණතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො ලෙණං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ අසරණතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො සරණං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති

පඤ්චක්ඛන්ධෙ රිත්තතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අරිත්තං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති

පඤ්චක්ඛන්ධෙ තුච්ඡතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අතුච්ඡං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ සුඤ්ඤතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො පරමසුඤ්ඤං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ අනත්තතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො පරමත්ථං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ආදීනවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනාදීනවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති

පඤ්චක්ඛන්ධෙ විපරිණාමධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අවිපරිණාමධම්මං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති

පඤ්චක්ඛන්ධෙ අසාරකතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො සාරං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ අඝමූලතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනඝමූලං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ වධකතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අවධකං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චස්කන්ධය අධ්‍රැව හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය ධ්‍රැව යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අත්‍රාණ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය ත්‍රාණ යැ' යි දක්නේ, සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අලෙණහෙයින් දක්නේ, අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය ලෙණ යැ' යි දක්නේ, සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අසරණ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය සරණ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය සිස් හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය නො සිස් යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය තුච්ඡ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අතුච්ඡ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ශූන්‍ය හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය පරමශූන්‍ය යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අනාත්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය පරමාර්ථ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ආදීනව හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය ආදීනව රහිත යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය විපරිණාම සභාව හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අවිපරිණාමසභාව යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අසාර හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය සාර යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අඝමූල හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අඝමූල නො වේ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය වධක හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය වධක නො වේ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චක්ඛන්ධෙ විභවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අවිභවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ සාසවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනාසවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ සඞ්ඛතතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අසඞ්ඛතං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ මාරාමිසතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අජාතං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ජාතිධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අජාතං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ජරාධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අජරං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ව්‍යාධිධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අව්‍යාධි[1] නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ මරණධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අමතං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ සොකධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අසොකං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ පරිදෙවධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපරිදෙවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ උපායාසධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනුපායාසං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ සඞ්කිලෙසිකධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අසඞ්කිලිට්ඨං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

---

1. අව්‍යාධිධම්මං - සෘා.

පඤ්චස්කන්ධය විභව හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අවිභව යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය සාස්‍රව හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අනාස්‍රව යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය සඞ්ඛත හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අසඞ්ඛත යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය සාරාමිෂ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය නිරාමිෂ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ජාතිධර්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අජාත යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ජරාධර්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අජර යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ව්‍යාධිධර්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය ව්‍යාධි රහිත යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය මරණධර්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අමෘත යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ශෝකධර්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අශෝක යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය පරිදේවධර්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය පරිදේව රහිත යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය උපායාසධර්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අනුපායාස යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය සාංක්ලේශිකධර්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අසංක්ලිෂ්ට යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ සි.

අනිච්චතොති අනිච්චානුපස්සනා.

දුක්ඛතොති දුක්ඛානුපස්සනා.

රොගතොති දුක්ඛානුපස්සනා.

ගණ්ඩතොති දුක්ඛානුපස්සනා.

සල්ලතොති දුක්ඛානුපස්සනා.

අඝතොති දුක්ඛානුපස්සනා

ආබාධතොති දුක්ඛානුපස්සනා

පරතොති අනත්තානුපස්සනා.

පලොකධම්මතොති අනිච්චානුපස්සනා.

ඊතිතොති දුක්ඛානුපස්සනා.

උපද්දවතොති දුක්ඛානුපස්සනා.

භයතොති දුක්ඛානුපස්සනා.

උපස්සග්ගතොති දුක්ඛානුපස්සනා.

චලතොති අනිච්චානුපස්සනා.

පභඞ්ගුතොති අනිච්චානුපස්සනා.

අද්ධුවතොති අනිච්චානුපස්සනා.

අතාණතොති දුක්ඛානුපස්සනා.

අලෙණතොති දුක්ඛානුපස්සනා.

අසරණතොති දුක්ඛානුපස්සනා.

රිත්තතොති අනත්තානුපස්සනා.

තුච්ඡතොති අනත්තානුපස්සනා.

සුඤ්ඤතොති අනත්තානුපස්සනා.

අනත්තතොති අනත්තානුපස්සනා.

ආදීනවතොති දුක්ඛානුපස්සනා.

විපරිණාමධම්මතොති අනිච්චානුපස්සනා

අසාරකතොති අනත්තානුපස්සනා.

අඝමූලතොති දුක්ඛානුපස්සනා.

වධකතොති දුක්ඛානුපස්සනා.

විභවතොති අනිච්චානුපස්සනා.

සාසවතොති දුක්ඛානුපස්සනා.

**අනිච්චතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**දුක්ඛතො** යනු: දුඃඛානුදර්ශනා යැ

**රොගතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**ගණ්ඩතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**සල්ලතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**අඝතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**ආබාධතො** යනු: දුඃඛානුදර්ශනා යැ

**පරතො** යනු: අනාත්මානුදර්ශනා යැ.

**පලොකධම්මතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**ඊතිතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**උපද්දවතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**භයතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**උපසග්ගතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**චලතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**පභඞ්ගුතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**අද්ධුවතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**අතාණතො** යනු දුඃඛානුදර්ශනා යැ.

**අලෙණතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**අසරණතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**රිත්තතො** යනු: අනාත්මානුදර්ශනා යැ.

**තුච්ඡතො** යනු: අනාත්මානුදර්ශනා යැ.

**සුඤ්ඤතො** යනු: අනාත්මානුදර්ශනා යැ.

**අනත්තතො** යනු: අනාත්මානුදර්ශනා යැ.

**ආදීනවතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**විපරිණාමධම්මතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**අසාරකතො** යනු: අනාත්මානුදර්ශනා යැ.

**අඝමූලතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**වධකතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**විභවතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**සාසවතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

සඞ්ඛතතොති අනිච්චානුපස්සනා.

මාරාමිසතොති දුක්ඛානුපස්සනා.

ජරාධම්මතොති දුක්ඛානුපස්සනා.

ජාතිධම්මතොති දුක්ඛානුපස්සනා.

ව්‍යාධිධම්මතොති දුක්ඛානුපස්සනා.

මරණධම්මතොති අනිච්චානුපස්සනා.

සොකධම්මතොති දුක්ඛානුපස්සනා.

පරිදෙවධම්මතොති දුක්ඛානුපස්සනා.

උපායාසධම්මතොති දුක්ඛානුපස්සනා.

සංකිලෙසිකධම්මතොති දුක්ඛානුපස්සනා.

ඉමෙහි චත්තාළීසාය ආකාරෙහි අනුලොමිකං ඛන්තිං පටිලභති. ඉමෙහි චත්තාළීසාය ආකාරෙහි සම්මත්තනියාමං ඔක්කමති.

ඉමෙහි චත්තාළීසාය ආකාරෙහි අනුලොමඛන්තිං පටිලභන්තස්ස ඉමෙහි චත්තාළීසාය ආකාරෙහි සම්මත්තනියාමං ඔක්කමන්තස්ස කති අනිච්චානු-පස්සනා, කති දුක්ඛානුපස්සනා කති අනත්තානුපස්සනා.

පඤ්චවීසති අනත්තානුපස්සනා, පඤ්ඤාසං[1] අනිච්චානුපස්සනා, සතං පඤ්චවීසති චෙව යානි දුක්ඛෙ පවුච්චරෙති.

විපස්සනාකථා සමත්තා.

1. පඤ්ඤාස - මජසං.

සඞ්ඛතතො යනු: අනිත්‍යානුදර්ශනා යැ.

මාරාමිසතො යනු: දුඃඛානුදර්ශනා යැ.

ජාතිධම්මතො යනු: දුඃඛානුදර්ශනා යැ.

ජරාධම්මතො යනු: දුඃඛානුදර්ශනා යැ.

ව්‍යාධිධම්මතො යනු: දුඃඛානුදර්ශනා යැ

මරණධම්මතො යනු: අනිත්‍යානුදර්ශනා යැ.

සොකධම්මතො යනු: දුඃඛානුදර්ශනා යැ.

පරිදෙවධම්මතො යනු: දුඃඛානුදර්ශනා යැ.

උපායාසධම්මතො යනු: දුඃඛානුදර්ශනා යැ.

සඞ්කිලෙසිකධම්මතො යනු: දුඃඛානුදර්ශනා යි.

මේ සතළිස් අයුරින් අනුලොමක්‍ෂාන්තිය ලබයි. මේ සතළිස් අයුරින් සම්‍යක්ත්වනියාමයට බස්නේ යි

මේ සතළිස් අයුරින් අනුලොමක්‍ෂාන්තිය ලබනුවහට මේ සතළිස් අයුරින් සම්‍යක්ත්වනියාමයට බස්නහුට අනිත්‍යානුදර්ශනා කෙතෙක් ද, දුඃඛානුදර්ශනා කෙතෙක් ද, අනාත්මානුදර්ශනා කෙතෙක් ද යත්:

ඒ අනාත්මානුදර්ශනා පස්විස්සෙක් ද, අනිත්‍යානුදර්ශනා පනසෙක් ද, යම් අනුදර්ශනා කෙනෙක් දුඃඛයෙහි (පඤ්චස්කන්ධයෙහි) ලා කියනු ලැබෙත් ද, ඒ දුඃඛානුදර්ශනා එක්සියපස්විස්සෙක් ද වේ යයි.

**විදර්ශනාකථා නිමි**

## 3. 10.

## මාතිකාකථා

නිච්ඡාතො, මොක්ඛො[1] විමොක්ඛො, විජ්ජාවිමුත්ති, අධිසීලං, අධිචිත්තං, අධිපඤ්ඤා, පස්සද්ධි, ඤාණං, දස්සනං, විසුද්ධි,[2] නෙක්ඛම්මං, නිස්සරණං, පවිවෙකො, වොස්සග්ගො, චරියා, ඣානවිමොක්ඛො, භාවනා, අධිට්ඨානං, ජීවිතං.[3]

**නිච්ඡාතොති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දතො නිච්ඡාතො, අබ්‍යාපාදෙන බ්‍යාපාදතො නිච්ඡාතො -පෙ- පඨමෙන ඣානෙන නීවරණෙහි නිච්ඡාතො -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙහි නිච්ඡාතො.[4]

**මොක්ඛො[5] විමොක්ඛොති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දතො මුච්චතීති මොක්ඛො විමොක්ඛො -පෙ- පඨමෙන ඣානෙන නීවරණෙහි මුච්චතීති මොක්ඛො විමොක්ඛො -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙහි මුච්චතීති මොක්ඛො විමොක්ඛො.

**විජ්ජාවිමුත්තීති** නෙක්ඛම්මං විජ්ජතීති විජ්ජා, කාමච්ඡන්දතො මුච්චතීති විමුත්ති, විජ්ජන්තො මුච්චති, මුච්චන්තො විජ්ජතීති විජ්ජාවිමුත්ති. අබ්‍යාපාදො[6] විජ්ජතීති විජ්ජා, බ්‍යාපාදතො මුච්චතීති[7] විමුත්ති, විජ්ජන්තො මුච්චති, මුච්චන්තො විජ්ජතීති විජ්ජාවිමුත්ති -පෙ- අරහත්තමග්ගො විජ්ජතීති විජ්ජා, සබ්බකිලෙසෙහි මුච්චතීති[8] විමුත්ති, විජ්ජන්තො මුච්චති, මුච්චන්තො විජ්ජතීති විජ්ජාවිමුත්ති.

**අධිසීලං අධිචිත්තං අධිපඤ්ඤාති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දං සංවරට්ඨෙන සීලවිසුද්ධි, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි. යො තත්ථ සංවරට්ඨො, අයං අධිසීලසික්ඛා. යො තත්ථ අවික්ඛෙපට්ඨො අයං අධිචිත්තසික්ඛා. යො තත්ථ දස්සනට්ඨො අයං අධිපඤ්ඤාසික්ඛා. අබ්‍යාපාදෙන බ්‍යාපාදං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ සංවරට්ඨෙන සීලවිසුද්ධි, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි. යො තත්ථ සංවරට්ඨො අයං අධිසීලසික්ඛා. යො තත්ථ අවික්ඛෙපට්ඨො අයං අධිචිත්තසික්ඛා. යො තත්ථ දස්සනට්ඨො අයං අධිපඤ්ඤාසික්ඛා.

**පස්සද්ධීති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දං පටිප්පස්සම්භෙති, අබ්‍යාපාදෙන බ්‍යාපාදං පටිප්පස්සම්භෙති -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ පටිප්පස්සම්භෙති.

**ඤාණන්ති** කාමච්ඡන්දස්ස පහීනත්තා නෙක්ඛම්මං ඤාතට්ඨෙන ඤාණං. බ්‍යාපාදස්ස පහීනත්තා අබ්‍යාපාදො ඤාතට්ඨෙන ඤාණං -පෙ- සබ්බකිලෙසානං පහීනත්තා අරහත්තමග්ගො ඤාතට්ඨෙන ඤාණං.

---

1. විමුච්චතීති - සයා, PTS. 2. සුද්ධි - සයා. 3. භාවනාධිට්ඨානජීවිතං - සයා.
4 නිච්ඡාතො මුච්චති - සයා, PTS 5 'මොක්ඛො'ති - සයා, PTS, පොත්ථකෙසු නත්ථි
6 අබ්‍යාපාදං - සයා 7 මුච්චතීති විමොක්ඛො - සයා, PTS 8 විමුච්චතීති - මජසං

## 3. 10.

## මාතෘකාකථා

නිච්ඡාත යැ මොක්ඛවිමොක්ඛ යැ විජ්ජාවිමුත්ති යැ අධිසීල යැ අධිචිත්ත යැ අධිපඤ්ඤා යැ පස්සද්ධි යැ ඤාණ යැ දස්සන යැ විසුද්ධි යැ නෙක්ඛම්ම යැ නිස්සරණ යැ පවිවෙක යැ වොස්සග්ග යැ චරියා යැ ඣානවිමොක්ඛ යැ භාවනා යැ අධිට්ඨාන යැ ජීවිත යි.

**නිච්ඡාතො** යනු: නෛෂ්ක්‍රම්‍ය විසින් කාමච්ඡන්දයෙන් නො මලා වූයේ, අව්‍යාපාද විසින් ව්‍යාපාදයෙන් නො මලා වූයේ ... ප්‍රථමධ්‍යාන විසින් නීවරණයන් ගෙන් නො මලා වූයේ ... රහත්මග විසින් සර්වක්ලේශයන් ගෙන් නො මලා වූයේ වේ.

**මොක්ඛං විමොක්ඛං** යනු: නෛෂ්ක්‍රම්‍ය විසින් කාමච්ඡන්දය කෙරෙන් මිදේ නුයි මොක්ෂ විමොක්ෂ යැ, අව්‍යාපාද විසින් ව්‍යාපාදය කෙරෙන් මිදේ නුයි මොක්ෂ විමොක්ෂ යැ ... ප්‍රථමධ්‍යාන විසින් නීවරණයන් කෙරෙන් මිදේ නුයි මොක්ෂ විමොක්ෂ යැ .. අර්හත්වමාර්ග විසින් සර්වක්ලෙශයන් කෙරෙන් මිදේ නුයි මොක්ෂ විමොක්ෂ යි.

**විජ්ජාවිමුත්ති** යනු: නෛෂ්ක්‍රම්‍යය විද්‍යමාන වේ නුයි (නොහොත් දත්නා ලැබේ නුයි, ලබා නුයි හෝ) විජ්ජා යැ, කාමච්ඡන්දය කෙරෙන් මිදේ නුයි විමුත්ති යැ, විද්‍යමාන වූයේ මිදෙයි, මිදෙනුයේ විද්‍යමාන වේ නුයි විජ්ජාවිමුත්ති යැ. අව්‍යාපාදය ඇත් නුයි විජ්ජා යැ, ව්‍යාපාදය කෙරෙන් මුක්ත වේ නුයි විමුත්ති යැ, විද්‍යමාන වූයේ මුක්ත වෙයි, මුක්ත වනුයේ විද්‍යමාන වේ නුයි විජ්ජාවිමුත්ති යැ ... අර්හත්වමාර්ගය විද්‍යමාන වේ නුයි විජ්ජා යැ, සර්වක්ලේශයන් කෙරෙන් මුක්ත වේ නුයි විමුත්ති යැ, විද්‍යමාන වූයේ මුක්ත වෙයි, මුක්ත වනුයේ (රහත්මග) විද්‍යමාන වේ නුයි විජ්ජාවිමුත්ති නම් වන්නීය.

**අධිසීලං අධිචිත්තං අධිපඤ්ඤා** යනු: නෛෂ්ක්‍රම්‍ය විසින් කාමච්ඡන්දය නිවාරණාර්ථයෙන් (ඒ නෛෂ්ක්‍රම්‍යය) ශීලවිශුද්ධි යැ, (එ මැ) අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධි යැ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධි යැ. එහි යම් සංවරාර්ථයෙක් වේ ද, මේ තෙම අධිශීලශික්ෂා යැ, එහි යම් අවික්ෂෙපාර්ථයෙක් වේ ද, මේ තෙම අධිචිත්තශික්ෂා යැ, එහි යම් දර්ශනාර්ථයෙක් වේ ද, මේ තෙම අධිප්‍රඥාශික්ෂා යි. අව්‍යාපාද විසින් ව්‍යාපාදය නිවරණාර්ථයෙන් (ඒ අව්‍යාපාදය) ශීලවිශුද්ධි යැ ... අර්හත්වමාර්ග විසින් සර්වක්ලේශයන් නිවාරණාර්ථයෙන් (ඒ රහත්මග) ශීලවිශුද්ධි යැ, අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධි යැ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධි යැ, එහි යම් සංවරාර්ථයෙක් වේ ද, මේ අධිශීලශික්ෂා යැ, එහි යම් අවික්ෂෙපාර්ථයෙක් වේ ද, මේ අධිචිත්තශික්ෂා යැ. එහි යම් දර්ශනාර්ථයෙක් වේ ද, මේ අධිප්‍රඥාශික්ෂා යි.

**පස්සද්ධි** යනු: නෛෂ්ක්‍රම්‍ය විසින් (යොගාවචර තෙම) කාමච්ඡන්දය වළහයි, අව්‍යාපාද විසින් ව්‍යාපාදය වළහයි ... රහත්මගින් සර්වක්ලේශයන් වළහයි.

**ඤාණං** යනු: කාමච්ඡන්දය ප්‍රහීණ බැවින් නෛෂ්ක්‍රම්‍යය ඥාතාර්ථයෙන් ඥාන යැ, ව්‍යාපාදය ප්‍රහීණ බැවින් අව්‍යාපාදය ඥාතාර්ථයෙන් ඥාන යැ ... සර්වක්ලේශයන් ප්‍රහීණ බැවින් අර්හත්වමාර්ගය ඥාතාර්ථයෙන් ඥාන යි.

**දස්සනන්ති** කාමච්ඡන්දස්ස පහීනත්තා නෙක්ඛම්මං දිට්ඨත්තා දස්සනං. බ්‍යාපාදස්ස පහීනත්තා අබ්‍යාපාදෙ දිට්ඨත්තා දස්සනං -පෙ- සබ්බකිලෙසානං පහීනත්තා අරහත්තමග්ගො දිට්ඨත්තා දස්සනං.

**විසුද්ධීති** කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මෙන විසුජ්ඣති, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදෙන විසුජ්ඣති -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගෙන විසුජ්ඣති.

**නෙක්ඛම්මන්ති** කාමානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මං. රූපානමෙතං නිස්සරණං යදිදං ආරුප්පං යං ඛො පන කිඤ්චි භූතං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං, නිරොධො තස්ස නෙක්ඛම්මං. බ්‍යාපාදස්ස අබ්‍යාපාදෙ නෙක්ඛම්මං. ථිනමිද්ධස්ස ආලොකසඤ්ඤා නෙක්ඛම්මං -පෙ- සබ්බකිලෙසානං අරහත්තමග්ගො නෙක්ඛම්මං

**නිස්සරණන්ති** කාමානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මං රූපානමෙතං නිස්සරණං යදිදං ආරුප්පං. යං ඛො පන කිඤ්චි භූතං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං, නිරොධො තස්ස නිස්සරණං. කාමච්ඡන්දස්ස නෙක්ඛම්මං නිස්සරණං. බ්‍යාපාදස්ස අබ්‍යාපාදෙ නිස්සරණං -පෙ- සබ්බකිලෙසානං අරහත්තමග්ගො නිස්සරණං.

**පවිවෙකොති** කාමච්ඡන්දස්ස නෙක්ඛම්මං පවිවෙකො -පෙ- සබ්බකිලෙසානං අරහත්තමග්ගො පවිවෙකො.

**වොස්සග්ගොති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දං වොස්සජ්ජතීති වොස්සග්ගො, අබ්‍යාපාදෙන බ්‍යාපාදං වොස්සජ්ජතීති වොස්සග්ගො -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ වොස්සජ්ජතීති වොස්සග්ගො.

**චරියාති** කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මෙන චරති, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදෙන චරති පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගෙන චරති.

**ඣානවිමොක්ඛොති** නෙක්ඛම්මං ඣායතීති ඣානං, කාමච්ඡන්දං ඣාපෙතීති ඣානං, ඣායන්තො මුච්චතීති ඣානවිමොක්ඛො ඣාපෙන්තො මුච්චතීති ඣානවිමොක්ඛො ඣායන්තීති ධම්මා, ඣාපෙන්තීති කිලෙසෙ, ඣාතෙ ච ඣාපෙ ච ජානාතීති ඣානඣායී. අබ්‍යාපාදෙ ඣායතීති ඣානං, බ්‍යාපාදං ඣාපෙතීති ඣානං -පෙ- ආලොකසඤ්ඤා ඣායතීති ඣානං, ථිනමිද්ධං ඣාපෙතීති ඣානං -පෙ- අරහත්තමග්ගො ඣායතීති ඣානං, සබ්බකිලෙසෙ ඣාපෙතීති ඣානං, ඣායන්තො මුච්චතීති ඣානවිමොක්ඛො ඣාපෙන්තො මුච්චතීති ඣානවිමොක්ඛො, ඣායන්තීති ධම්මා, ඣාපෙන්තීති කිලෙසෙ, ඣාතෙ ච ඣාපෙ ච ජානාතීති ඣානඣායී,

දස්සනං යනු: කාමච්ඡන්දය ප්‍රහීණ බැවින් නෛෂ්ක්‍රම්‍ය තෙම දෘෂ්ටාර්ථයෙන් දර්ශන යැ, ව්‍යාපාදය ප්‍රහීණ බැවින් අව්‍යාපාද තෙම දෘෂ්ටාර්ථයෙන් දර්ශන යැ ... සර්වක්ලේශයන් ප්‍රහීණ බැවින් රහත්මග දෘෂ්ටාර්ථයෙන් දර්ශන යි.

විසුද්ධි යනු: කාමච්ඡන්දය දුරලනුයේ නෛෂ්ක්‍රම්‍යයෙන් විශුද්ධ වෙයි, ව්‍යාපාදය දුරලනුයේ අව්‍යාපාදයෙන් විශුද්ධ වෙයි ... සර්වක්ලේශයන් දුරලනුයේ රහත්මගින් විශුද්ධ වේ.

නෙක්ඛම්මං යනු: යම් නෛෂ්ක්‍රම්‍යයෙක් වේ ද, තෙල කාමයන්ගේ නිස්සරණ යැ, යම් ආරූප්‍යයෙක් වේ ද, තෙල රූපයන් ගේ නිස්සරණ යැ, තවද යම් කිසි උත්පන්න වූ සංස්කෘත වූ ප්‍රතීත්‍යසමුත්පන්නයෙක් වේ ද, නිරෝධය ඒ සඞ්ඛතයා ගේ නෛෂ්ක්‍රම්‍ය වේ. අව්‍යාපාදය ව්‍යාපාදයා ගේ නෛෂ්ක්‍රම්‍ය වෙයි, ආලෝකසංඥාව ථිනමිද්ධයා ගේ නෛෂ්ක්‍රම්‍ය වෙයි ... අර්හත්වමාර්ගය සර්වක්ලේශයන් ගේ නෛෂ්ක්‍රම්‍ය වේ.

නිස්සරණං යනු: යම් නෛෂ්ක්‍රම්‍යයෙක් වේ ද, තෙල කාමයන් ගේ නිස්සරණ යැ, යම් ආරූප්‍යයෙක් වේ ද, තෙල රූපයන් ගේ නිස්සරණ යැ, තවද යම් කිසි උත්පන්න වූ සඞ්ඛත වූ ප්‍රතීත්‍යසමුත්පන්නයෙක් වේ ද, නිරෝධය ඒ සඞ්ඛතයා ගේ නිස්සරණය වෙයි, නෛෂ්ක්‍රම්‍යය කාමච්ඡන්දයා ගේ නිස්සරණ යැ, අව්‍යාපාදය ව්‍යාපාදයා ගේ නිස්සරණ යැ ... අර්හත්වමාර්ගය සර්වක්ලේශයන් ගේ නිස්සරණ යි.

පවිවෙකො යනු: නෛෂ්ක්‍රම්‍යය කාමච්ඡන්දයා ගේ පවිවේක යැ ... අර්හත්වමාර්ගය සර්වක්ලේශයන් ගේ පවිවේක යයි.

වොස්සග්ගො යනු: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය හැරපියා නුයි වොස්සග්ග යැ, අව්‍යාපාදයෙන් ව්‍යාපාදය හැරපියා නුයි වොස්සග්ග නම් ... රහත්මගින් හැම කෙලෙසුන් හැරපියා නුයි වොස්සග්ග නම්.

චරියං යනු: කාමච්ඡන්දය දුරලනුයේ නෛෂ්ක්‍රම්‍යයෙන් හැසිරෙයි, ව්‍යාපාදය දුරලනුයේ අව්‍යාපාදයෙන් හැසිරෙයි රහත්මගින් හැම කෙලෙසුන් දුරලමින් හැසිරෙයි.

ඣානවිමොක්ඛො යනු: නෛෂ්ක්‍රම්‍යය ධ්‍යාන කරනු ලැබේ නුයි ධ්‍යාන යැ, කාමච්ඡන්දය දවා නුයි ධ්‍යාන යැ, ධ්‍යාන කෙරෙමින් මිදේ නුයි ඣානවිමොක්ඛ නම, දවමින් මිදේ නුයි ඣානවිමොක්ඛ නම්, 'ඣායන්ති' යනු දහම්හු යැ, 'ඣාපෙන්ති' යනු කෙලෙසුන් යැ, ධ්‍යාන කරන ලදුවන් ද දවන ලදුවන් ද දනී නුයි ඣානඣායී නම. අව්‍යාපාදය ධ්‍යාන කරනු ලැබේ නුයි ධ්‍යාන යැ, ව්‍යාපාදය දවා නුයි ධ්‍යාන යැ ... ආලෝකසංඥාව ධ්‍යාන කරනු ලැබේ නුයි ධ්‍යාන යැ, ථිනමිද්ධය දවා නුයි ධ්‍යාන යැ ... රහත්මග ධ්‍යාන කරනු ලැබේ නුයි ධ්‍යාන යැ, හැම කෙලෙසුන් දවා නුයි ධ්‍යාන යැ, ධ්‍යාන කෙරෙමින් මිදේ නුයි ඣානවිමොක්ඛ යැ, දවමින් මිදේ නුයි ඣානවිමොක්ඛ යැ, 'ඣායන්ති' යනු ධර්මයෝ යැ, 'ඣාපෙන්ති' යනු කෙලෙසුන් යැ, ධ්‍යාන කරන ලදුවන් ද දවන ලදුවන් ද දනී නුයි 'ඣානඣායී' නම් වේ.

භාවනා අධිට්ඨානං ජීවිතන්ති කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මං භාවෙතීති භාවනාසම්පන්නො, නෙක්ඛම්මවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානසම්පන්නො, ස්වායං එවං භාවනාසම්පන්නො අධිට්ඨානසම්පන්නො සමං ජීවති, නො විසමං, සම්මා ජීවති, නො මිච්ඡා, විසුද්ධං ජීවති, නො කිලිට්ඨන්ති ආජීවසම්පන්නො. ස්වායං එවං භාවනාසම්පන්නො අධිට්ඨානසම්පන්නො ආජීවසම්පන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති: යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං විසාරදො උපසඞ්කමති අමඞ්කුභූතො, තං කිස්ස හෙතු; තථා හි සො භාවනාසම්පන්නො අධිට්ඨානසම්පන්නො ආජීවසම්පන්නො.

බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- ථීනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- උද්ධච්චං පජහන්තො අවික්ඛෙපං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- විචිකිච්ඡං පජහන්තො ධම්මවවත්ථානං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- අවිජ්ජං පජහන්තො විජ්ජං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- අරතිං පජහන්තො පාමොජ්ජං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- නීවරණෙ පජහන්තො පඨමං ඣානං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගං භාවෙතීති භාවනාසම්පන්නො· අරහත්තමග්ගවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානසම්පන්නො. ස්වායං එවං භාවනාසම්පන්නො අධිට්ඨානසම්පන්නො සමං ජීවති නො විසමං, සම්මා ජීවති නො මිච්ඡා. විසුද්ධං ජීවති, නො කිලිට්ඨන්ති ආජීවසම්පන්නො. ස්වායං එවං භාවනාසම්පන්නො අධිට්ඨානසම්පන්නො ආජීවසම්පන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං විසාරදො උපසඞ්කමති අමඞ්කුභූතො. තං කිස්ස හෙතු: තථා හි සො භාවනාසම්පන්නො අධිට්ඨානසම්පන්නො ආජීවසම්පන්නොති.

මාතිකාකථා සමත්තා.

පඤ්ඤාවග්ගො තතියො.

තත්‍රුද්දානං භවති:

පඤ්ඤා ඉද්ධි අභිසමයො – විවෙකො චරිය පඤ්චමො
පාටිහාරිය සමසීසි – සතිපට්ඨානං විපස්සනා
පඤ්ඤාවග්ගම්හි තතියෙ – මාතිකාය ච තෙ දසාති.

පටිසම්භිදාමග්ගප්පකරණං සමත්තං.

භාවනා අධිට්ඨානං ජීවිතං යනු: කාමච්ඡන්දය දුරලමින් නෛෂ්ක්‍රම්‍යය වඩා නුයි භාවනාසම්පන්න යැ, නෛෂ්ක්‍රම්‍ය විසින් සිත පිහිටුවා නුයි අධිට්ඨානසම්පන්න යැ, ඒ මේ යෝගාවචර මෙසේ භාවනාසම්පන්න වූයේ අධිට්ඨානසම්පන්න වූයේ සම වැ ජීවත් වෙයි, විෂම වැ නො වෙයි, මැනැවින් ජීවත් වෙයි, මිථ්‍යාවෙන් නො වෙයි, විශුද්ධ වැ ජීවත් වෙයි, කිලිෂ්ට වැ නො වේ නුයි ආජීවසම්පන්න වේ. හේ මෙසේ භාවනාසම්පන්න වූයේ අධිට්ඨානසම්පන්න වූයේ ආජීවසම්පන්න වූයේ යම් යම් පිරිස් කරා එළැඹේ ද, කැත්පිරිසකට හෝ බමුණුපිරිසකට හෝ ගැහැවිපිරිසකට හෝ මහණ පිරිසකට හෝ විශාරද වූයේ තෙද ඇති වැ එළැඹෙයි. ඊට හේතු කිමැ යත්: යම් හෙයකින් හේ භාවනාසම්පන්න වූයේ අධිෂ්ඨානසම්පන්න වූයේ ආජීවසම්පන්න වූයේ ද එහෙයිනි.

ව්‍යාපාදය දුරලනුයේ අව්‍යාපාදය වඩා නුයි භාවනාසම්පන්න යැ ... ථීනමිද්ධය දුරලනුයේ ආලෝකසංඥාව වඩා නුයි භාවනාසම්පන්න යැ ... උද්ධච්චය දුරලනුයේ අවික්ෂේපය වඩා නුයි භාවනාසම්පන්න යැ ... විචිකිච්ඡාව දුරලනුයේ ධම්මවවත්ථානය වඩා නුයි භාවනාසම්පන්න යැ ... අවිද්‍යාව දුරලනුයේ විද්‍යාව වඩා නුයි භාවනාසම්පන්න යැ ... අරතිය දුරලනුයේ ප්‍රාමෝද්‍යය වඩා නුයි භාවනාසම්පන්න යැ .. නීවරණයන් දුරලනුයේ ප්‍රථමධ්‍යානය වඩා නුයි භාවනාසම්පන්න යැ ... හැම කෙලෙසුන් දුරලනුයේ රහත්මග වඩා නුයි භාවනාසම්පන්න යැ. රහත්මග විසින් සිත පිහිටුවා නුයි අධිට්ඨානසම්පන්න යැ, ඒ මේ යෝගාවචර තෙමේ මෙසේ භාවනා-සම්පන්න වූයේ අධිෂ්ඨානසම්පන්න වූයේ සම ව ජීවත් වෙයි, විෂම ව ජීවත් නො වේ. සම්මාජීවයෙන් ජීවත් වෙයි, මිථ්‍යාජීවයෙන් ජීවත් නො වේ. විශුද්ධ ව ජීවත් වෙයි, කිලිෂ්ට ව ජීවත් නො වේ නුයි ආජීවසම්පන්න යැ. හේ මෙසේ භාවනාසම්පන්න වූයේ අධිෂ්ඨානසම්පන්න වූයේ ආජීවසම්පන්න වූයේ යම් මැ පිරිස් කරා එළැඹේ ද, කැත්පිරිසකට හෝ බමුණුපිරිසකට හෝ ගැහැවිපිරිසකට හෝ මහණපිරිසකට හෝ විශාරද වූයේ නො හැකුළුණේ (තෙද ඇති වැ) එළැඹෙයි. ඊට කාරණ කිමැ යත්: යම් හෙයකින් හේ භාවනාසම්පන්න වූයේ අධිෂ්ඨානසම්පන්න වූයේ ආජීවසම්පන්න වූයේ ද එහෙයිනැ' යි.

**මාතෘකාකථා සමාප්ත යි.**

**තුන්වැනි ප්‍රඥාවර්ගය යි.**

**එහි උද්දානය වෙයි:**

ප්‍රඥා කථා යැ, ඍද්ධි කථා යැ, අභිසමය කථා යැ, විවේක කථා යැ, පස්වැනි වූ චර්‍ය්‍යා කථා යැ, ප්‍රාතිහාර්‍ය්‍ය කථා යැ, සමසීසි කථා යැ, සතිපට්ඨාන කථා යැ, විදර්ශනා කථා යැ යන මොහු ද, මාතෘකා කථාව ද සමග තුන්වැනි ප්‍රඥාවර්ගයෙහි දශ කථාවෝ වෙත්.

## ප්‍රතිසම්භිදාමාර්ගප්‍රකරණ සමාප්ත යි.

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 39

සූත්‍රාන්තපිටකයෙහි

34 වන ග්‍රන්ථය

# නෙත්තිප්පකරණ

ලංකා බෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන්

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පරිවෙණාධිපති

**රාජකීය පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද**

මහානායක ස්ථවිරයන් වහන්සේ විසින් කරනලද

පාඨශෝධන පූර්වක සිංහල අනුවාදය

**ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය**

විසින් සම්මත යි

බු. ව. 2550
ක්‍රි. ව. 2006

# නෙත්තිප්පකරණං

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස

## සංගහවාරො

1. යං ලොකො පූජයතෙ-සලොකපාලො සදා නමස්සති ච,
තස්සෙතං සාසනවරං-විදූහි ඤෙය්‍යං නරවරස්ස.

2. ද්වාදස පදානි සුත්තං-තං සබ්බං බ්‍යඤ්ජනඤ්ච අත්ථො ච,
තං විඤ්ඤෙය්‍යං උභයං-කො අත්ථො බ්‍යඤ්ජනං කතමං.

3. සොළස හාරා නෙත්ති-පඤ්චනයා සාසනස්ස පරියෙට්ඨි,
අට්ඨාරස මූලපදා-මහාකච්චානෙන[1] නිද්දිට්ඨා.[2]

4. හාරා බ්‍යඤ්ජනවිචයො-සුත්තස්ස නයා තයො ච සුත්තත්ථො,
උභයං පරිග්ගහිතං-වුච්චති සුත්තං යථාසුත්තං.

5. යා චෙව දෙසනා යං ච-දෙසිතං උභයමෙව විඤ්ඤෙය්‍යං,
තත්‍රායමානුපුබ්බී-නවවිධ සුත්තන්තපරියෙට්ඨී'ති.

---

1. මහාකච්චායනෙන - මජසං.
2. කච්චායනගොත්ත නිද්දිට්ඨා - සෙ.

# නෙත්තිප්‍රකරණය

**භගවත් අර්හත් වූ ඒ සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.**

## සංග්‍රහවාරය

1. ඉන්ද්‍ර යම වරුණ කුවෙර යන ලොකපාලකයන් හෝ සතරවරමරජුන් සහිත වූ ලෝවැසියා යම් පුරුෂොත්තමයක්හු පුද ද, දවරය නමස්කාරත් කෙරේ ද, ඒ අග්‍රපුද්ගල වූ නරොත්තමයාගේ තෙල උතුම්සස්න කර්මඵල හා කුශලාකුශලාදිභෙද ධර්මයන් දන්නා නුවණැති මිනිසුන් විසින් දතයුත්තේ යි.

2. ත්‍රිපිටක පර්‍යාප්ති සඞ්ඛ්‍යාත සූත්‍රය දොළොස්පද වෙයි, සූත්‍ර යයි කියනලද ඒ හැම බුද්ධවචනය ව්‍යඤ්ජන ද අර්ත්ථ ද වෙයි. වාච්‍ය වාචකභාවයෙන් සම්බන්ධ වූ ඒ අර්ත්ථව්‍යඤ්ජන දෙක ‘ අර්ත්ථ කවරෙ යැ, ව්‍යඤ්ජන කිමැ ’ යි ස්වරූප හෙයින් දතයුත්තේ යි.

3. දේසනාදි සොළොස් හාරයක් ඇති, නන්දියාවත්තාදි නය පසක් ඇති, කුශලාකුශල විසින් ප්‍රභෙද වූ අටළොස් මූලපදයක් ඇති, පර්‍යාප්තිශාසනයාගේ අර්ත්ථ පර්‍යෙෂණ වූ, අවිපරිත සූත්‍රාර්ත්ථාවබොධයට කාරණ වූ නෙත්තිය පූජ්‍ය වූ කාත්‍යායන මහා ක්ෂීණාශ්‍රවයන් වහන්සේ විසින් දේශනා කරනලද්දීය.

4. ෂොඩශහාරයෝ ව්‍යඤ්ජනද්වාරයෙන් සූත්‍රයාගේ අර්ත්ථසංවර්ණනා වෙති. නන්දියාවත්ත තිපුක්ඛල සීහවික්කීළිත යන නයත්‍රය අර්ත්ථද්වාරයෙන් ම සූත්‍රාර්ත්ථ ප්‍රතිපාදනා කෙරෙයි. තෙල හාර නය දෙක අර්ත්ථනිශ්චය විසින් පරිගෘහීත වූයේ සූත්‍රානුරූප කොට නොහොත් සියලු සූත්‍රය සංවර්ණනා කෙරෙයි.

5. නෙත්තිසංවර්ණනාවිෂය වූ ව්‍යඤ්ජනප්‍රබන්ධ සංඛ්‍යාත යම් දේශනාවක් ඇද්ද, දේශනාර්ත්ථ සංඛ්‍යාත යම් දේශිතයකුත් ඇද්ද, තෙල දේශනා දේශිත යන දෙක මැ අනුපාද පරිනිර්වාණය පර්‍යන්ත කොට ඇති සම්පත්තීනට කාරණ හෙයින් දතයුත්තේය. ඒ විජානනයෙහි ලා මතු කියන හාරනයානුපූර්වය නවාඞ්ගශාසනයාගේ අර්ත්ථපර්‍යෙෂණ වෙයි.

# විභාගවාරො

## 1. උද්දෙසවාරො

තත්ථ කතමෙ සොළස හාරා : දෙසනා විචයො යුත්ති පදට්ඨානො ලක්ඛණො චතුබ්‍යූහො ආවට්ටො විභත්ති පරිවත්තනො වෙවචනො පඤ්ඤත්ති ඔතරණො සොධනො අධිට්ඨානො පරික්ඛාරො සමාරොපනො ඉති.

තස්සානුගීති :

1. දෙසනා විචයො යුත්ති - පදට්ඨානො ච ලක්ඛණො,
චතුබ්‍යූහො ච ආවට්ටො - විභත්ති පරිවත්තනො.

2. වෙවචනො ච පඤ්ඤත්ති - ඔතරණො ච සොධනො,
අධිට්ඨානො පරික්ඛාරො - සමාරොපනො, සොළස[1].

3. එතෙ සොළස හාරා – පකිත්තිතා අත්ථතො අසංකිණ්ණා,
එතෙසං චෙව භවති – විත්ථාරතයා නයවිභත්ති'ති.

තත්ථ කතමෙ පඤ්ච නයා: නන්දියාවට්ටො[2] තිපුක්ඛලො සීහවික්කීළිතො දිසාලොචනො අඞ්කුසො ඉති.

තස්සානුගීති :

4. පඨමො නන්දියාවට්ටො – දුතියො ච තිපුක්ඛලො,
සීහවික්කීළිතො නාම – තතියො නයලඤ්ඡකො[3]

---

1. සොළසො—මජසං
2. නන්දියාවත්තො—සිමු
3. නයලඤ්ඡකො—මජසං.

# විභාගවාරය

## 1. උද්දෙසවාරය

එහි සොළොස් හාරයෝ කවරහ: ආස්වාදදිය විභාග කිරීම ලක්ෂණ කොට ඇති ' දෙශනා 'හාර යැ, සූත්‍රයෙහි එන පද ප්‍රශ්නාදිය විමසීම ලක්ෂණ වූ ' විචය 'හාර යැ, සූත්‍රාගත අර්ත්ථව්‍යඤ්ජනයන්ගේ යුක්ත්‍යයුක්තිවිචාරණා ලක්ෂණ වූ ' යුක්ති 'හාර යැ, සූත්‍රාගත කුශලාකුශලාදි ධර්මයන්ගේ පදට්ඨාන (ආසන්නකාරණ) නිර්ධාරණ ලක්ෂණ වූ ' පදට්ඨාන 'හාර යැ, සමාන ලක්ෂණ ධර්මයන් නහා දක්වන ' ලක්ෂණ 'හාර යැ, ව්‍යඤ්ජනද්වාරයෙන් නිර්වචනාදි විභාවනලක්ෂණ වූ ' චතුබ්‍යූහ 'හාර යැ, සභාගවිෂභාග ධර්මයන් ආවර්තන ලක්ෂණ වූ ' ආවට්ට 'හාර යැ, සඞ්කිලෙසවොදනධර්මයන් විභාග කිරීම ලක්ෂණ වූ ' විභක්ති' හාර යැ, කුශලාකුශලධර්මයන්ට ප්‍රතිපක්ෂ හෙයින් පරිවර්තන ලක්ෂණ වූ ' පරිවර්තන 'හාර යැ, පර්‍ය්‍යායශබ්ද දැක්වීම ලක්ෂණ කොට ඇති ' වෙවචන ' හාර යැ, එක් ධර්මාර්ත්ථයක් විවිධ ප්‍රඥප්තීන් විභාවනලක්ෂණ වූ ' පඤ්ඤත්ති 'හාර යැ, ප්‍රතීත්‍යසමුත්පාදදිද්වාරයෙන් සූත්‍රාර්ත්ථයාගේ අවතරණලක්ෂණ වූ' ඔතරණ 'හාර යැ, සූත්‍රාගතපදපදර්ත්ථාදීන්ගේ ශෝධනලක්ෂණ වූ ' ශොධන 'හාර යැ, සූත්‍රාගතධර්මයන්ගේ සාමාන්‍ය විශෙෂ නිර්ධාරණලක්ෂණ වූ ' අධිට්ඨාන 'හාර යැ, ධර්මයන්ගේ හේතුප්‍රත්‍යය නිර්ධාරණලක්ෂණ වූ ' පරික්ඛාර 'හාර යැ, පදට්ඨානාදිමුඛයෙන් ධර්මයන්ගේ සමාරොපණලක්ෂණ වූ ' සමාරොපන 'හාර යැ යන මොහු යි.

ඒ හාරොද්දෙසයාගේ සුඛග්‍රහණ පිණිස මේ අනුගීති යැ :

1. දේසනා යැ විචය යැ යුක්ති යැ පදට්ඨාන යැ ලක්ඛණ යැ චතුබ්‍යූහ යැ ආවට්ට යැ විභත්ති යැ පරිවත්තන යැ.

2. වෙවචන යැ පඤ්ඤත්ති යැ ඔතරණ යැ සොධන යැ අධිට්ඨාන යැ පරික්ඛාර යැ සමාරොපන යැ යනු සොළොස් හාරයෝ යි.

3. අර්ත්ථහෙයින් අසඞ්කීර්ණ වූ තෙල සොළොස් හාරයෝ ප්‍රකාශ කරන ලදහ. මේ සොළොස් හාරයන්ගේ මැ විස්තර හෙයින් නයවිභාගය වේ යයි.

එහි පඤ්චනය කවරේ යැ : තෘෂ්ණා අවිද්‍යා දෙකින් සංකිලෙසපක්ෂයෙහි ද ශමථ විදර්ශනා දෙකින් වොදනපක්ෂයෙහි ද සූත්‍රාර්ත්ථය සිවිසස් සමග යෙදීමෙන් වර්ණනා කරන ' නන්දියාවට්ට ' නය යැ, අකුශලමූලයෙන් හා කුශලමූලයෙන් සංකිලෙස වොදන පක්ෂයෙහි සූත්‍රාර්ත්ථ සිවිසස් සමග යොදන ' තිපුක්ඛල ' නය යැ, විපර්‍ය්‍යාසයන්ගෙන් සංකිලෙසපක්ෂයෙහි ද ඉන්ද්‍රියයන්ගෙන් වොදන පක්ෂයෙහි ද සූත්‍රාර්ත්ථ සිවිසස් සමග යොදන ' සීහවික්කීළිත ' නය යැ, අර්ත්ථනයත්‍රයට දිසාභූත ධර්මයන් විමසන ' දිසාලොචන ' නය යැ, දිසාභූත කුශලාකුශලයන්ගේ සමානයනලක්ෂණ වූ ' අඞ්කුස ' නය යැ යන මොහු යි.

ඒ නයොද්දෙසයාගේ මේ අනුගීති යැ :

4. සූත්‍රාර්ත්ථප්‍රකාශක වූ පළමුවැනි ' නන්දියාවට්ට ' නය ද දෙවැනි ' තිපුක්ඛල ' නය ද තුන්වැනි ' සීහවික්කීළිත ' නම් නය ද වෙති.

5. දිසාලොචනමාහංසු-චතුත්ථං නයමුත්තමං,
පඤ්චමො අඞ්කුසො නාම-සබ්බෙ පඤ්ච නයා, ගතා'ති

තත්ථ කතමානි අට්ඨාරස මූලපදානි: නව පදානි කුසලානි, නව පදානි අකුසලානි.

තත්ථ කතමානි නව පදානි අකුසලානි: තණ්හා අවිජ්ජා ලොභො දොසො මොහො සුභසඤ්ඤා සුඛසඤ්ඤා නිච්චසඤ්ඤා අත්තසඤ්ඤා'ති ඉමානි නව පදානි අකුසලානි, යත්ථ සබ්බො අකුසලපක්ඛො සඞ්ගහං සමොසරණං ගච්ඡති.

තත්ථ කතමානි නව පදානි කුසලානි: සමථො විපස්සනා අලොභො අදොසො අමොහො අසුභසඤ්ඤා දුක්ඛසඤ්ඤා අනිච්චසඤ්ඤා අනත්තසඤ්ඤා'ති. ඉමානි නව පදානි කුසලානි, යත්ථ සබ්බො කුසලපක්ඛො සඞ්ගහං සමොසරණං ගච්ඡති.

තත්‍රිදං උද්දානං:

6. තණ්හා ච අවිජ්ජාපි ච-ලොභො දොසො තථෙව මොහො ච,
චතුරො ච විපල්ලාසා[1]-කිලෙසභූමී නව පදානි

7. සමථො ච විපස්සනා ච-කුසලානි ච යානි තීණි මූලානි,
චතුරො සතිපට්ඨානා-ඉන්ද්‍රියභූමී නව පදානි.

8. නවහි ච පදෙහි කුසලා-නවහි ච යුජ්ජන්ති අකුසලා පක්ඛා,
එතෙ ඛො මූලපදා-භවන්ති අට්ඨාරස පදානී'ති

1. චත්තාරො විපල්ලාසා – සු.

5. සතරවැනි නයවරය ' දිසාලොචන ' යයි කීහු. පස්වැනි නය ' අඞකුස ' නම් වේ. මෙසේ සියලු පඤ්චනය දත්නාලදී.

එහි අටළොස් මූලපදයෝ කවරහ ' නවපද කෙනෙක් කුශලයෝ යැ, නවපද කෙනෙක් අකුශලයෝ යි.

එහි අකුශල නවපදයෝ කවරහ : තණ්හා යැ අවිජ්ජා යැ ලොභ යැ දොස යැ මොහ යැ සුභසඤ්ඤා යැ සුඛසඤ්ඤා යැ නිච්චසඤ්ඤා යැ අත්තසඤ්ඤා යැ මේ නවපදයෝ අකුශලයෝ යැ. යම් නවපදයෙකැ සියලු අකුශලපක්ෂය සංග්‍රහයට සමොසරණයට යේ ද එබඳු නවපදයෝ යි.

එහි කුශලනවපදයෝ කවරහ : සමථ යැ විපස්සනා යැ අලොභ යැ අදොස යැ අමොහ යැ අසුභසඤ්ඤා යැ දුක්ඛසඤ්ඤා යැ අනිච්චසඤ්ඤා යැ අනත්තසඤ්ඤා යැ යන මේ නවපදයෝ කුශලයෝ යැ. යම් නවපදයෙකැ හැම කුශලපක්ෂය සංග්‍රහයට සමොසරණයට යේ ද එබඳු නවපදයෝ යි.

එහි ඉම් සංග්‍රහවචන යැ :

6. තෘෂ්ණා ද අවිද්‍යා ද ලොභය ද ද්වෙෂය ද එසේ මැ මොහය ද සතර විපර්‍යාසයෝ ද යන නව පදයෝ ක්ලේශභූමි වෙති.

7. ශමථය ද විදර්ශනා ද අලොභාදි තුන් කුශලමූලයෝ ද අශුභසංඥාදි සතර සති පට්ඨානයෝ ද යන නවපදයෝ ශ්‍රද්ධාදි විමුක්තිපරිපාචනීය ඉන්ද්‍රියයන්ගේ සමවසරණ ස්ථාන හෙයින් ඉන්ද්‍රියභූමි නම් වෙත්.

8. ශමථාදි නවපදයෙන් කුශලපක්ෂයෙහි ධර්මයෝ ද තෘෂ්ණාදි නවපදයෙන් අකුශල පක්ෂයෙහි ධර්මයෝ ද යොදනු ලැබෙත්. මෙල අටළොස් පදයෝ මූලපද වෙත් යයි.

# 2. නිද්දෙසවාරො

**තත්ථ සංඛෙපතො නෙත්ති කිත්තිතා :**

1. අස්සාදාදීනවතා[1]-නිස්සරණම්පි ච ඵලං උපායො ච,
ආණත්ති ච භගවතො-යොගීනං දෙසනාහාරො

2. යං පුච්ඡිතඤ්ච විස්සජ්ජිතඤ්ච-සුත්තස්ස යා ච අනුගීති,
සුත්තස්ස යො පවිචයො-හාරො විචයොති නිද්දිට්ඨො.

3. සබ්බෙසං හාරානං-යා භූමි යො ච ගොචරො තෙසං,
යුත්තායුත්තපරික්ඛා[2]-හාරො යුත්තීති නිද්දිට්ඨො.

4. ධම්මං දෙසෙති ජිනො-තස්ස ච ධම්මස්ස යං පදට්ඨානං,
ඉති යාව සබ්බධම්මා-එසො හාරො පදට්ඨානො.

5. වුත්තම්හි එකධම්මෙ-යෙ ධම්මා එකලක්ඛණා කෙචි,
වුත්තා භවන්ති සබ්බෙ-සො හාරො ලක්ඛණො නාම.

6. නෙරුත්තමධිප්පායො-බ්‍යඤ්ජනමථ දෙසනානිදානඤ්ච,
පුබ්බාපරානුසන්ධී[3]-එසො හාරො චතුබ්‍යූහො

7. එකම්හි පදට්ඨානෙ-පරියෙසති සෙසකං පදට්ඨානං,
ආවට්ටති[4] පටිපක්ඛෙ-ආවට්ටො නාම සො හාරො.

8. ධම්මං ච පදට්ඨානං- භූමිං ච විභජතෙ[5] අයං හාරො,
සාධාරණෙ අසාධාරණෙ ච-නෙය්‍යො විභත්තීති.

9. කුසලාකුසලෙ ධම්මෙ-නිද්දිට්ඨෙ භාවිතෙ පහීනෙ ච,
පරිවත්තති පටිපක්ඛෙ-හාරො පරිවත්තනො නාම.

---

1. අස්සාදදීනවතො - පු.
2. යුත්තායුත්තිපරික්ඛා - පු, සිමු.
3 පුබ්බාපරෙන සන්ධි - පු.
4. ආවත්තති - සිමු.
5. විභජ්ජතෙ - සිමු.

# 2. නිද්දෙසවාරය

ඒ උද්දේසපාඨයෙහි සැකෙවින් නෙත්තිප්‍රකරණය කියනලදී. (දැන් ලක්ෂණාදිය නිර්දෙශ කරනු ලැබේ.)

1. සුඛසොමනස්සාදි ආස්වාදය ද ත්‍රෛභූමක සංස්කාර සඞ්ඛ්‍යාත ආදීනවය ද ආර්‍ය්‍ය මාර්ග නිර්වාණ සඞ්ඛ්‍යාත නිස්සරණය ද ශ්‍රැතමයඥානාදි දෙසනාඵලය ද ආර්‍ය්‍යමාර්ගයට පදට්ඨාන වූ පූර්වභාගප්‍රතිපද සඞ්ඛ්‍යාත උපාය ද චතුස්සත්‍යකර්මස්ථානයෙහි යුක්ත ප්‍රයුක්ත වූ වෛනෙයයන් සඳහා ආඥාර්හ වූ භාග්‍යවතුන් වහන්සේගේ විධාන සඞ්ඛ්‍යාත ආණත්ති ද යන මේ (හෙවත් ආස්වාදදීන්ගේ විභාගලක්ෂණ වූ සංවර්ණනා විශේෂය) ' දෙසනාහාර ' නම් වේ.

2. සූත්‍රයාගේ යම් පෘච්ඡාවකුත් ඇද්ද යම් විසඳීමකුත් ඇද්ද අනුගීති සංඛ්‍යාත යම් සංග්‍රහගාථා ඇද්ද, එසේම සූත්‍රාගත ආස්වාදදියකුත් ඇද්ද ඒ හැම සෙවීම ලක්ෂණ කොට ඇති හාරය ' විචයහාර ' නමැයි දක්වන ලද්දේය.

3. සියලු හාරයන්ගේ ව්‍යඤ්ජන සංඛ්‍යාත යම් භූමියක් ඇද්ද සූත්‍රාර්ත්ථ සංඛ්‍යාත යම් ගොචරයෙකුත් ඇද්ද ඒ අර්ත්ථව්‍යඤ්ජනයන්ගේ මහා – අපදෙසයන් හා යුක්ත්‍ය යුක්තිබව දැක්වීම ලක්ෂණ කොට ඇත්තේ ' යුත්තිහාර ' නමැයි දක්වන ලද්දේය.

4. ජිතපඤ්චමාර වූ බුදුහු දහම් දෙසති. ඒ කුශලාදි භෙද වූ ධර්මයට කාරණ වූ යොනිසොමනසිකාරාදි යම් පදට්ඨානයක් ඇද්ද, මෙසේ සූත්‍රාගත සියලු ධර්මයනට පදට්ඨාන (ආසන්නකාරණ) දැක්වීම ලක්ෂණ වූ තෙල හාරය ' පදට්ඨාන ' නම් වේ.

5. කුශලාදි හෝ ස්කන්ධාදි හෝ එක් ධර්මයක් සූත්‍රයෙහි වදළ කල්හි කුශලාදි ස්කන්ධාදි භාවයෙන් සමානලක්ෂණ වූ යම් ධර්ම කෙනෙක් වෙත් ද, ඒ හැම ධර්මයෝ සූත්‍රයෙහි නොදක්වනලද ද එළවා වර්ණනා කිරීම ලක්ෂණ කොට ඇති ඒ හාරය ' ලක්ඛණ හාර ' නම් වේ.

6. ව්‍යඤ්ජනද්වාරයෙන් සූත්‍රාගත පදනිර්වචන සංඛ්‍යාත නිරුක්තය ද දේශකයන්ගේ අධිප්‍රාය ද යළි දේශනානිදානය ද පූර්වාපරානුසන්ධි ද යන චතුර්විධ ලක්ෂණයන් වර්ණනා කිරීම ලක්ෂණ කොට ඇති තෙල හාරය ' චතුබ්‍යූහ ' නම් වේ.

7. ආරම්භධාතු ආදි වූ (පරක්කමධාතු ආදියට) පදට්ඨාන වූ එක් ධර්මයක් දේශනා රූඪ කල්හි ඒ ධර්මයට විෂභාගතායෙන් (ප්‍රමාදදියට ආසන්නකාරණ වූ කොසජ්ජාදි) අවශේෂ පදට්ඨානධර්මය ගවේෂණ කෙරෙයි, සොයා ප්‍රතිපක්ෂධර්මයන් ආවර්තන කෙරෙයි, (මෙසේ සභාගවිෂභාග වශයෙන් ආවර්තන ලක්ෂණ වූ) ඒ හාරය ' ආවට්ටහාර ' නම් වේ.

8. සාධාරණවශයෙන් ද, අසාධාරණවශයෙන් ද, කුශලාදිභේද වූ ධර්මය ද විශේෂාධිගමකාරණ වූ පදට්ඨානය ද පෘථග්ජනභූමි ආදි භූමිය ද (යම් හාරයෙක්) විභාග හෙයින් ප්‍රකාශ කෙරේ ද, මේ හාරය ' විභත්තිහාර ' නමැයි දතයුතු.

9. වර්ණනා කරනු ලබන සූත්‍රයෙහි වදළ භාවිතව්‍ය වූ ද ප්‍රහාතව්‍ය වූ ද කුශලාකුශල ධර්මයන් ඔවුනට ප්‍රතිපක්ෂ වූ අකුශලකුශලයන්ගේ වශයෙන් පරිවර්තන කෙරෙයි. ඒ හාරය ' පරිවත්තනහාර ' නම් වේ.

10. වෙවචනානි බහූනි තු-සුත්තෙ වුත්තානි එකධම්මස්ස,
යො ජානාති සුත්තවිදූ-වෙවචනො නාම සො හාරො.

11. එකං භගවා ධම්මං- පඤ්ඤත්තීහි විවිධාහි දෙසෙති,
සො ආකාරො ඤෙය්‍යො-පඤ්ඤත්තී නාම හාරො'ති.

12. යො ච පටිච්චුප්පාදො- ඉන්ද්‍රියඛන්ධා ච ධාතුආයතනා,
එතෙහි ඔතරති යො-ඔතරණො නාම සො හාරො.

13. විස්සජ්ජිතම්හි පඤ්හෙ-ගාථාය පුච්ඡිතායමාරබ්භ,
සුද්ධාසුද්ධපරික්ඛා-හාරො සො සොධනො නාම.

14. එකත්තතාය ධම්මා-යෙපි ච වෙමත්තතාය නිද්දිට්ඨා,
තෙ න විකප්පයිතබ්බා-එසො හාරො අධිට්ඨානො.

15 යෙ ධම්මා යං ධම්මං-ජනයන්තිප්පච්චයා පරම්පරතො,
හෙතුමවකඩ්ඪයිත්වා-එසො හාරො පරික්ඛාරො.

16. යෙ ධම්මා යම්මූලා-යෙ චෙකත්ථා පකාසිතා මුනිනා,
තෙ සමරොපයිතබ්බා-එස සමාරොපනො හාරො.

17. තණ්හඤ්ච අවිජ්ජම්පි ච-සමථෙන විපස්සනාය යො නෙති,
සච්චෙහි යොජයිත්වා-අයං නයො නන්දියාවට්ටො.[1]

18. යො අකුසලෙ සමූලෙහි-නෙති කුසලෙ ච කුසලමූලෙහි,
භූතං තථං අවිතථං-තිපුක්ඛලං තං නයං ආහු.

19. යො නෙති විපල්ලාසෙහි-කිලෙසෙ[2] ඉන්ද්‍රියෙහි සද්ධම්මෙ,
එතං නයං නයවිදූ-සීහවික්කීළිතං ආහු.

20. වෙය්‍යාකරණෙසු හි යෙ-කුසලාකුසලා තහිං තහිං වුත්තා,
මනසා වොලොකයතෙ-තං ඛු දිසාලොචනං ආහු.

---

1. නන්දියාවත්තො - සිමු.
2. සංකිලෙසෙ - පු.

10. නවාඞ්ගශාසන සංඛ්‍යාත තෙවළාදහමෙහි වදළ එක් පදර්ථයක් පිළිබඳ බොහෝ වූ මැ වෙවචනයන් සූත්‍රයෙහි නිපුණ වූ යම් ධර්මකථිකයෙක් සූත්‍රවර්ණනායෙහි ලා ප්‍රකාශ කෙරෙයි. ඒ හාරය ' වෙවචන ' නම් වේ.

11. භාග්‍යවත් බුදුහු ස්කන්ධාදී එක් ධර්මයක් නික්ෂෙප - ප්‍රභවාදි විවිධ ප්‍රඥප්තීන් දේශනා කෙරෙති. ඒ එක් මැ ධර්මාර්ත්ථයක් අනෙකප්‍රඥප්තීන් පනවන ආකාරය ' පඤ්ඤත්තිහාර ' නමැයි දතයුත්තේය.

12. යම් ප්‍රතීත්‍යමුත්පාදයෙක් ඉන්ද්‍රිය ස්කන්ධ ධාතු ආයතන කෙනෙක් වෙද්ද සූත්‍රාගත පදර්ත්ථද්වාරයෙන් ඒ ප්‍රතීත්‍යසමුත්පාදදීන්ගේ යම් අවතරණයෙක් ඇද්ද ඒ අවතරණලක්ෂණ වූ සංවර්ණනා විශෙෂය ' ඔතරණහාර ' නම් වේ.

13. ගාථාදේශනායෙහි ලා යම් අර්ථයක් අරභයා විචාළ ප්‍රශ්නය බුද්ධාදීන් විසින් විසඳු කල්හි එහි පද ආරම්භාදීන්ගේ ශොධිතාශොධිතභාවය විචාරණලක්ෂණ වූ ඒ හාරය ' සොධනහාර ' නම් වේ.

14. එකත්තතා සංඛ්‍යාත සාමාන්‍යයෙන් ද වෙමත්තතා සංඛ්‍යාත විශෙෂයෙන් ද යම් ධර්ම කෙනෙක් සූත්‍රයෙහි වදරනලද්දහු ද ඒ ධර්මයෝ (එහි සාමාන්‍ය විශෙෂ කිමැයි) විකල්පන නොකළයුත්තාහුය. මෙසේ ධර්මයන්ගේ සාමාන්‍යවිශෙෂනිශ්චයලක්ෂණ වූ තෙල හාරය ' අධිට්ඨානහාර ' නම් වේ.

15. අවිද්‍යාදි යම් ප්‍රත්‍යයධර්ම කෙනෙක් සංස්කාරාදි යම් ප්‍රත්‍යයොත්පන්නධර්මයක් සහජාතප්‍රත්‍යයභාවයෙන් පරම්පරප්‍රත්‍යයව අනුරූපසන්තානඝටනවශයෙන් උපදවත් ද, ඒ ජනකාදි හෙතුව සූත්‍රයෙන් නිශ්චය කොට වර්ණනා කරන තෙල හාරය ' පරික්ඛාරහාර ' නම් වේ.

16. යම් ශීලාදි ධර්ම කෙනෙක් යම් සමාධිආදි ධර්ම කෙනකුන්ට මූල වූවාහු යළි යම් ධර්ම කෙනෙක් ඒකාර්ථ වූවාහු බුද්ධමුනිහු විසින් වදරනලදහු ද ඒ ධර්මයෝ පදට්ඨානාදි විසින් සමාරොපණ කොට වර්ණනා කළයුත්තාහුය. තෙල ' සමාරොපනහාර ' නම් වේ.

(මෙසේ ගාථා විසින් සොළොස් හාර නිර්දෙශ කොට දැන් නය නිර්දේශ කෙරෙති.)

17. යම් සංවර්ණනා විශේෂයෙක් සූත්‍රාගත තෘෂ්ණාවත් අවිද්‍යාවත් සංක්ලේශ පක්ෂයට ද ශමථ විදර්ශනා දෙකින් වොදන පක්ෂයට චතුස්සත්‍යයන් සමග යොද පමුණුවා ද, මේ නය ' නන්දියාවට්ට ' නම් වේ.

18. යම් සංවර්ණනානය විශේෂයෙක් ලෝභාදි අකුශලමූලයන් සමග ද්වාදශ චිත්තොත්පාද සංඛ්‍යාත සියලු අකුශලධර්මයන් ද අලොභාදි කුශලමූලයන් සමග සියලු චාතුර්භූමක කුශලධර්මයන් ද භූත තථ අවිතථ කොට සූත්‍රාර්ත්ථය චතුස්සත්‍යයොජනා ද්වාරයෙන් පමුණුවා ද ඒ නයවිශෙෂය ' තිපුක්ඛල ' නමැයි කීහු.

19. යම් සංවර්ණනානයවිශෙෂයෙක් අශුභයෙහි ශුභ යැ යනාදි චතුර්විධ විපර්යාසයන්ගෙන් ක්ලෙශයන් හෙවත් සංක්ලෙශපක්ෂය ද ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගෙන් ප්‍රතිපත්ති ප්‍රතිවෙධ සද්ධර්මය හෙවත් වොදනපක්ෂය ද සියුසස් සමග යොද නයන ලක්ෂණ වූ තෙල නය සද්ධර්මනය දන්නාහු ' සීහවික්කීළිත ' නමැයි කීහු.

20. නන්දියාවට්ටාදි ඒ ඒ අර්ත්ථනය යොදනු සඳහා කරනලද සූත්‍රාර්ත්ථ විස්සජ්ජනයෙහි ලා ඒ ඒ තැන කියනලද ඒ ඒ නයට දිශාභූත වූ යම් කුශලාකුශලධර්ම කෙනෙක් ඇද්ද, ඒ ධර්මයන් මේ ප්‍රථම දිශා යැ යනාදීන් සිතින් මැ අවලොකන කෙරෙයි, ඒ පරීක්ෂාව මැ ' දිසාලොචන ' යැයි කීහු.

21. ඔලොකෙත්වා දිසලොචනෙන- උක්ඛිපිය යං සමානෙති,
සබ්බෙ කුසලාකුසලෙ-අයං නයො අඞ්කුසො නාම.

22. සොළස හාරා පඨමං-දිසලොචනතො[1] දිසා විලොකයිත්වා,
සංඛිපිය අඞ්කුසෙන හි-නයෙහි තීහි නිද්දිසෙ සුත්තං.

23 අක්ඛරං පදං බ්‍යඤ්ජනං-නිරුත්ති තථෙව නිද්දෙසො,
ආකාරඡට්ඨවචනං-එත්තාව බ්‍යඤ්ජනං සබ්බං.

24. සඞ්කාසනා පකාසනා-විවරණා විභජනුත්තානීකම්මපඤ්ඤත්ති,
එතෙහි ඡහි පදෙහි-අත්ථො කම්මඤ්ච නිද්දිට්ඨං.

25 තීණි ච නයා අනූනා-අත්ථස්ස ච ඡප්පදානි ගණිතානි,
නවහි පදෙහි භගවතො-වචනස්සත්ථො සමායුත්තො.

26. අත්ථස්ස නව පදානි-බ්‍යඤ්ජනපරියෙට්ඨියා චතුබ්බීස,
උභයං සඞ්කලයිත්වා[2] තෙත්තිංසා එත්තිකා නෙත්තී'ති.

නිද්දෙසවාරො නිට්ඨිතො.

---

1. දිසාලොචනෙන - සු.
2. සඞ්ඛෙපයතො - සු.

21. දිසාලොචනනය කරණකොටගෙන ප්‍රථමාදි දිශාභාවයෙන් පරීක්ෂා කොට සූත්‍රයෙන් නගාගෙන හැම කුශලාකුශලධර්මයන් ඒ ඒ නයයොජනාවශයෙන් යම් සමානයනයෙක් (පැමිණැවීමෙක්) ඇද්ද මේ 'අඞ්කුසනය' නම් වේ.

22. ව්‍යඤ්ජනපර්‍යෙෂණ හෙයින් පළමු කොට සොළසහාරයෝ යෙදියයුත්තාහ. දිසාලොචනනයින් ප්‍රථමදිශාදිය අවලොකන කොට අඞ්කුසනයින් දිශාභූතධර්මයන් සූත්‍රයෙන් නිර්ධාරණ කොට නන්දියාවට්ටාදි තුන්නයින් සූත්‍රය වර්ණනා කරන්නේයි.

23. (දැන් ද්වාදශපද නිර්දෙශ කෙරෙති : 'අක්ඛරං පදං' යනාදීන්) අපරිමයාසිත පදයෙහි වර්ණ සංඛ්‍යාත 'අක්ඛර' යැ, නාමාඛ්‍යාතාදි චතුර්විධ 'පද' යැ පදයෙන් කියනලද අර්ත්ථප්‍රකාශක පදසමුදයලක්ෂණ වූ වාක්‍යසංඛ්‍යාත 'ව්‍යඤ්ජන' යැ. වාක්‍යවිභාගයෙන් කියන ලද නිර්වචන සංඛ්‍යාත 'නිරුක්ති' යැ, එසෙයින් මැ නිරවශෙෂ දෙශනා හෙයින් නිර්වචනවිස්තර සංඛ්‍යාත 'නිද්දෙස' යැ, පදයන්ගෙන් වාක්‍යවිභාග සංඛ්‍යාත සවැනි වචන වූ 'ආකාර' යැ, යන ස්යලු ව්‍යඤ්ජනය මෙතෙක් මැ වේ. (ගාථා බන්ධ විසින් 'ආකාර' පදය අන්තයෙහි ලා කිව ද පදනුක්‍රමතා රිසියහු එය ව්‍යඤ්ජන පදයට අනතුරු කොට ගතයුතුය.)

24. සැකෙවින් ප්‍රකාශ කරන 'සඞ්කාසනා' යැ, ප්‍රථමප්‍රකාශන සංඛ්‍යාත 'පකාසනා' යැ, විස්තර කිරීම් සංඛ්‍යාත 'විවරණා' යැ, විභාග කිරීම් සංඛ්‍යාත 'විභජනා' යැ, ප්‍රකට කිරීම යයි කියනලද 'උත්තානීකම්ම' යැ, ප්‍රකාරයෙන් ඥපන සංඛ්‍යාත 'පඤ්ඤත්ති' යැ යන මේ ෂට්පදයෙන් සූත්‍රාර්ත්ථය ද උද්ඝාටනාදි වූ වෛනෙයයන්ගේ චිත්තප්‍රබොධනක්‍රියාව ද දක්වනලදි. (මේ අර්ත්ථපදයන්ගෙන් පිළිවෙළින් අක්ඛර පද ආදි ව්‍යඤ්ජනපදයෙන් දක්වන අර්ත්ථාකාරය ගන්නා ලද වේ යයි දතයුතු.)

25. අනූන වූ නන්දියාවට්ටාදි තුන් නය ද සඞ්කාසනාදි විසින් ගණන ලද අර්ත්ථපද සය ද යන නවපදයෙන් හෙවත් නව කොටසින් භාග්‍යවත්හුගේ වචනසංඛ්‍යාත සූත්‍රාර්ත්ථය මොනොවට යොදන ලද්දේයි.

26. යථෝක්ත අර්ථපද නවය ද ව්‍යඤ්ජනපර්‍යෙෂණ හෙයින් ෂොඩශහාර යැ ව්‍යඤ්ජනපද ෂට්ක යැ කර්මනය දෙක යැ යන සූවිසිපදය දැයි මේ දෙක සම්පිණ්ඩන කොට තෙතිස් නෙත්තිපද කෙනෙක් වෙති. නෙත්ති මෙතෙක් මැ වන්නීය' යි.

('සංඛෙපයතො' යන පාඨයෙහි සංක්ෂිප්ත කොට (එක්කොට) ගන්නාහට යැ යන අර්ථ යි. කිසි කෙනෙක් අටළොස් මූලපදයනුදු එක්කොට නෙත්ති අවයව එක් පනසෙකැයි කියති. මූලපද සංවර්ණනා විශෙෂයෙක් නොවූයෙන් නෙත්තියෙහි ලා නොගිණුබව සැලැකියැ යුතුය.)

නිද්දෙසවාරය නිමි.

# 3. පටිනිද්දෙසවාරො

## 3. 1. 1.

### දෙසනාහාරවිභඞ්ගො

තත්ථ කතමො දෙසනාහාරො: "අස්සාදාදීනවතා"ති ගාථා, අයං දෙසනාහාරො. කිං දෙසයති: අස්සාදං ආදීනවං නිස්සරණං ඵලං උපායං ආණත්තිං.

"ධම්මං වො භික්ඛවෙ දෙසිස්සාමි ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසිස්සාමී"ති

තත්ථ කතමො අස්සාදො:

1. "කාමං කාමයමානස්ස තස්ස චෙ තං සමිජ්ඣති,
   අද්ධා පීතිමනො හොති ලද්ධා මච්චො යදිච්ඡතී"ති

අයං අස්සාදො,

තත්ථ කතමො ආදීනවො:

2. තස්ස චෙ කාමයානස්ස ඡන්දජාතස්ස ජන්තුනො,
   තෙ කාමා පරිහායන්ති සල්ලවිද්ධොව රුප්පතී"ති

අයං ආදීනවො,

තත්ථ කතමං නිස්සරණං:

3. "යො කාමෙ පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරො,
   සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තතී"ති

ඉදං නිස්සරණං,

තත්ථ කතමො අස්සාදො:

4. "ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා ගවාස්සං දාසපොරිසං,
   ථියො බන්ධූ පුථූ කාමෙ යො නරො අනුගිජ්ඣතී"ති

අයං අස්සාදො,

# 3. පටිනිද්දෙසවාරය

## 3. 1. 1

## දේසනාහාරවිභඞ්ගය

එහි දේසනාහාර කවරෙ යත් : ' අස්සාදදීනවතා ' යන ගාථා යි. මේ දෙසනාහාර යැ. කුමක් දෙශනා කෙරෙති යත් : ආස්වාදය ආදීනවය නිස්සරණය ඵලය උපායය ආණත්තිය යන මේ දෙසති.

'' මහණෙනි, තොපට ආදිකලණ වූ මැදකලණ වූ අවසනැ කලණ වූ අර්ථසම්පත්ති යෙන් සාර්ථ වූ ව්‍යඤ්ජනසම්පත්තියෙන් සව්‍යඤ්ජන වූ එළැවියැයුතු නැතියෙන් ඒකාන්තපරිපූර්ණ වූ හළයුතු නැතියෙන් පරිශුද්ධ වූ දහමක් දෙසමි. සඟුන්බඹසර පවසමි '' යි.

එහි ආස්වාද කවරෙ යැ :

1. මනාපිය රූපාදි ත්‍රෛභූමක වස්තුකාමය කැමැතිවන ඒ සත්වහට ඉදින් ඒ කාමවස්තුව සමෘද්ධ වේ නම් (ලැබේ නම්) ඒ සත්ත්ව රිසිවූ කාමය ලැබ ඒකාන්තයෙන් තුටු සිත්ඇතියේ වෙයි.

ඉච්ඡිතලාභ ප්‍රීතිමනස්කතාදිය ආස්වාද කටයුතු හෙයින් මේ ආස්වාද යි.

එහි ආදීනව කවරෙ යැ :

2. වස්තුකාමයන් කැමතිවන උපන් තෘෂ්ණා ඇති ඒ සත්ත්වයාගේ ඒ වස්තුකාමයෝ ඉදින් පිරිහෙත් නම්, එකල්හි හේ අයෝමයාදි ශල්‍යයෙකින් විදුනාලද්දකු සෙයින් පෙළේ යයි.

විපරිණාමානුපස්සනායෙන් පෙළෙනුයෙන් මේ ආදීනව යි.

එහි නිස්සරණ කවරෙ යැ :

3. යම් මහණෙක් (ජීවත්වනු කැමැති පුරුෂයෙක්) තමාගේ පාදය කෙරෙන් සර්පයකුගේ හිස සෙයින් වස්තුකාම ක්ලෙශකාමයන් (විෂ්කම්භණ විසින් හෝ සමුච්ඡෙද විසින් හෝ) දුරුකෙරේ ද ඒ මහණ ලොවැ විසත්තිකා සංඛ්‍යාත තෘෂ්ණාව ස්මෘතිමත්ව ඉක්මවාලයි.

මේ නිවන් අරමුණු කොට ඇති මාර්ගඥානයෙන් තෘෂ්ණාව දුරුලීම නිස්සරණ යි.

එහි ආස්වාද කවරෙ යැ.

4. යම් මිනිසෙක් හැල් ආදි කෙත් හෝ ගෘහවස්තු ආදි වතු හෝ අමුරන් හෝ ගවයන් අසුන් හෝ දස්කම්කරුපුරුෂයන් හෝ ස්ත්‍රීන් හෝ නෑයන් හෝ වෙනත් මනාපිය රූපාදි බොහෝ කාමවස්තූන් ක්ලේශකාම වශයෙන් පුනපුනා ප්‍රාර්ත්ථනා කෙරේ ද.

මේ කෙත් වත් ආදීන්ගේ පුනපුනා ප්‍රාර්ත්ථනාව ආස්වාද යි.

තත්ථ කතමො ආදීනවො :

5. "අබලා නං බලීයන්ති මද්දන්තෙ නං පරිස්සයා,
තතො නං දුක්ඛමන්වෙති නාවං භින්නමිවොදකන්ති"

අයං ආදීනවො :

තත්ථ කතමං නිස්සරණං :

6. "තස්මා ජන්තු සදා සතො කාමානි පරිවජ්ජයෙ,
තෙ පහාය තරෙ ඔඝං නාවං සිත්වාව පාරගූ"ති

ඉදං නිස්සරණං,

තත්ථ කතමං ඵලං :

7. "ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ඡත්තං මහන්තං යථ වස්සකාලෙ,
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී"ති.

ඉදං ඵලං,

තත්ථ කතමො උපායො :

8. "සබ්බෙ ධම්මා අනත්තාති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා"ති.

අයං උපායො,

තත්ථ කතමා ආණත්ති :

9. "චක්ඛුමා විසමානීව විජ්ජමානෙ පරක්කමෙ,
පණ්ඩිතො ජීවලොකස්මිං පාපානි පරිවජ්ජයෙ"ති.

"සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු මොඝරාජා"ති ආණත්ති. "සදා සතො"ති උපායො.

"අත්තානුදිට්ඨිං ඌහච්ච එවං මච්චුතරො සියා"ති ඉදං ඵලං.

එහි ආදීනව කවරෙ යැ :

5. අබල වූ කෙලෙස්හු ඒ කාමගිද්ධ මිනිසා (ප්‍රකට වූ ද අප්‍රකට වූ ද) උපද්‍රවයෝ ඔහු මැඩපියති. එහෙයින් සිදුරු වූ නැවකට ජලය වදනා සෙයින් ජාත්‍යාදි දුක ඔහු අනුව යෙයි.

මේ ජාත්‍යාදි දුක් අනුබඳනාබව ආදීනව යි.

එහි නිස්සරණ කවරැ :

6. එහෙයින් සත්ත්ව තෙමේ හැම කල්හි සිහිඇතිවැ කාමයන් දුරුකරන්නේ යැ, මෙසේ ඒ කාමයන් දුරුකොට බිඳුණු නැව දිය ඉස පරතෙර යන්නකු සෙයින් චතුරොඝය තරණය කරන්නේ යි.

මේ චතුරොඝතරණය කොට අනුපාදිශෙෂව පිරිනිවීම නිස්සරණ යි.

එහි ඵලය කවරෙ යැ :

7. දනාදි පුණ්‍යධර්මය එකාන්තයෙන් ඒ ධර්මයෙහි හැසිරෙන පුඟුල්හු (දිට්ඨධම්මික සාම්පරායික අනර්ථයෙන්) රක්නේය. වැසිකලැ මහත් වූ ඡත්‍රය එය ධරන්නාහු යම්සේ රකී ද එමෙනි. ධර්මය මොනොවට පරිචිත කල්හි තෙල අනුසස වෙයි : ධර්මචාරි පුද්ගල අපායාදි දුගතියට නොයෙ යයි.

මේ දිට්ඨධම්මිකාදි අනර්ථයෙන් රැකීම ධර්මයාගේ ඵල යි.

එහි උපාය කවරෙ යැ :

8. සියලු සඞ්ඛත සංඛ්‍යාත ප්‍රත්‍යයොත්පන්නධර්මයෝ අනාත්මයෝ යයි මෙසේ යම් ක්ලේශ (විදසුන් තෙදගන්වා) අනාත්මානුදර්ශන ප්‍රඥයෙන් දකී ද, එකල්හි (පෙර මැ අනිත්‍යදුඃඛයන් දුටුහෙයින්) විදර්ශනාගොචර වූ පඤ්චස්කන්ධදුඃඛයෙහි නිර්වෙදයට පැමිණෙයි. තෙල නිර්වෙදය විශුද්ධිසංඛ්‍යාත ආර්‍යමාර්ගයට උපාය (මාර්ග) වේ යයි.

මේ නිබ්බිදානය විසුද්ධි අධිගමයට හේතුබැවින් උපාය යි.

එහි ආණත්ති කවර යැ :

9. ඇස්ඇති පුරුෂයෙක් කායිකවීර්‍යය පවත්නා කල්හි විෂමභූමිප්‍රදේශ හෝ චණ්ඩතායෙන් විෂම වූ ඇත් අස් ආදීන් හෝ දුරුකොට යන්නා සේ සත්ලොවැ නුවණැති පණ්ඩිත පුරුෂ පාපයන් දුරැලන්නේ යි.

' පව් දුරැලියයුතුය ' යනු ධර්මරාජ වූ බුදුරදුන්ගේ අණ යැ. මේ ආණත්ති යි.

මෙසේ වෙන වෙන සූත්‍රයෙහි ආ ඵල උපාය ආණත්ති උදහරණ කොට යළි එක් මැ සූත්‍රයෙහි ආ සැටි දක්වන්නට පාරායනවර්ගයෙහි මොඝරාජසූත්‍රය නිදසුන් කෙරෙති.

' මෝඝරාජය, සියලු මැ සංස්කාරලෝකය (වසයෙහි නො පවත්නාබව සැලකීම් වශයෙන් හෝ සිස්බව නුවණින් දකීම් වශයෙන් හෝ) ශූන්‍ය වශයෙන් බලව ' යන ධර්මරාජයන් ගේ වචනය විධාන වශයෙන් ' ආණත්ති ' යැ.

' හැම කල්හි ස්මෘතිමත් වූයෙහි ' යනු ' උපාය යැ. (ස්මෘතියෙන් දර්ශනය වන හෙයිනි.)

' විංශද්වස්තුක ආත්ම (සත්කාය) දෘෂ්ටිය උදුරාපියා (නසා) මෙසේ මරණය ඉක්ම වන්නෙයෙහි වන්නේය ' යන මේ දේශනා ඵලය යි.

(ආස්වාදදිය උදහරණ විසින් දක්වා දූන් පුද්ගලවිභාගයෙන් දේශනාවිභාගය වදරති :)

තත්ථ භගවා උග්ඝටිතඤ්ඤුස්ස පුග්ගලස්ස නිස්සරණං දෙසෙති. විපඤ්චිතඤ්ඤුස්ස පුග්ගලස්ස ආදීනවං ච නිස්සරණං ච දෙසෙති. නෙය්‍යස්ස පුග්ගලස්ස අස්සාදං ච ආදීනවං ච නිස්සරණං ච දෙසෙති.

තත්ථ චතස්සො පටිපදා චත්තාරො පුග්ගලා ච, තණ්හාචරිතො මන්දො සතින්ද්‍රියෙන දුක්ඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය නිය්‍යාති සතිපට්ඨානෙහි නිස්සයෙහි, තණ්හාචරිතො උදත්ථො[1] සමාධින්ද්‍රියෙන දුක්ඛාය පටිපදාය ඛිප්පාභිඤ්ඤාය නිය්‍යාති ඣානෙහි නිස්සයෙහි, දිට්ඨිචරිතො මන්දො විරියින්ද්‍රියෙන සුඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය නිය්‍යාති සම්මප්පධානෙහි නිස්සයෙහි, දිට්ඨිචරිතො උදත්ථො[1] පඤ්ඤින්ද්‍රියෙන සුඛාය පටිපදාය ඛිප්පාභිඤ්ඤාය නිය්‍යාති සච්චෙහි නිස්සයෙහි.

උභො තණ්හාචරිතා සමථපුබ්බඞ්ගමාය විපස්සනාය නිය්‍යන්ති රාගවිරාගාය චෙතොවිමුත්තියා, උභො දිට්ඨිචරිතා විපස්සනාපුබ්බඞ්ගමෙන සමථෙන නිය්‍යන්ති අවිජ්ජාවිරාගාය පඤ්ඤාවිමුත්තියා.

තත්ථ යෙ සමථපුබ්බඞ්ගමාහි පටිපදාහි නිය්‍යන්ති, තෙ නන්දියාවට්ටෙන නයෙන හාතබ්බා. යෙ විපස්සනාපුබ්බඞ්ගමාහි පටිපදාහි නිය්‍යන්ති, තෙ සීහවික්කීළිතෙන නයෙන හාතබ්බා.

ස්වායං හාරො කත්ථ සම්භවති[2] : යස්ස[3] සත්ථා වා ධම්මං දෙසෙති අඤ්ඤතරො වා ගරුට්ඨානියො සබ්‍රහ්මචාරී, සො තං ධම්මං සුත්වා සද්ධං පටිලභති, තත්ථ යා වීමංසා උස්සාහනා තුලනා උපපරික්ඛා, අයං සුතමයීපඤ්ඤා, තථා සුතෙන නිස්සයෙන යා වීමංසා තුලනා උපපරික්ඛා මනසානුපෙක්ඛනා, අයං චින්තාමයීපඤ්ඤා. ඉමාහි ද්වීහි පඤ්ඤාහි[4] මනසිකාරසම්පයුත්තස්ස යං ඤාණං උප්පජ්ජති දස්සනභූමියං වා භාවනාභූමියං වා අයං භාවනාමයීපඤ්ඤා. පරතො ඝොසා සුතමයීපඤ්ඤා. පච්චත්තසමුට්ඨිතා යොනිසොමනසිකාරා චින්තාමයීපඤ්ඤා, යං පරතො ච ඝොසෙන පච්චත්තසමුට්ඨිතෙන ච යොනිසොමනසිකාරෙන ඤාණං උප්පජ්ජති අයං භාවනාමයීපඤ්ඤා.

යස්ස ඉමා ද්වෙ පඤ්ඤා අත්ථි සුතමයී චින්තාමයී ච, අයං උග්ඝටිතඤ්ඤූ, යස්ස සුතමයී පඤ්ඤා අත්ථි චින්තාමයී නත්ථි අයං විපඤ්චිතඤ්ඤූ.[5] යස්ස නෙව සුතමයී පඤ්ඤා අත්ථි න චින්තාමයී, අයං නෙය්‍යො.

සායං ධම්මදෙසනා කිං දෙසයති : චත්තාරි සච්චානි දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. ආදීනවො ඵලං ච දුක්ඛං, අස්සාදො සමුදයො, නිස්සරණං නිරොධො, උපායො ආණත්ති ච මග්ගො, ඉමානි චත්තාරි සච්චානි, ඉදං ධම්මචක්කං.

---

1. උදත්තො - මජසං. = උදත්ථො - සිමු.
2. සමුට්ඨිතො - සෙ. අ.
3. තස්ස - සෙ. අ.
4. ඉමාසු ද්වීසු පඤ්ඤාසු - සු.
5. විපචිතඤ්ඤූ - සිමු.

එහි භාග්‍යවතුන් වහන්සේ උද්ඝටිතඥ (උද්දිෂ්ටමාත්‍රයෙන් අවබොධ කරන) පුද්ගලහට නිස්සරණ දේශනාව දෙසනසේක. විපඤ්චිතඥ (විස්තරයෙන් නිර්දිෂ්ට කල්හි අවබොධ කරන) පුද්ගලහට ආදීනවය ද නිස්සරණය ද දෙසනසේක. ප්‍රතිනිර් දේශයෙන් අවබෝධ කරවියයුතු නෙයපුද්ගලහට අස්සාදය ද ආදීනවය ද නිස්සරණය ද දෙසනසේකි.

(ප්‍රතිපදවිභාගයෙන් ඒ පුද්ගලයන් විභාග කෙරෙති.) එහි ප්‍රතිපද සතරක් ද, ප්‍රති පන්නක පුද්ගලයෝ සතරදෙනෙක් ද වෙති : තෘෂ්ණාචරිත ඇති මොහාධික (මන්ද) පුද්ගල ස්මෘතීන්ද්‍රියයෙන් ලැසිවූ අභිඥ ඇති දුක්වූ ප්‍රතිපදයෙන් නිශ්‍රය වූ සතිපට්ඨානයන් ගෙන් නිර්යාණය කෙරෙයි. (සසරදුකින් නික්මයෙයි.) තෘෂ්ණාචරිත ඇති උදත්ථ (.උදරප්‍රාඥ)' පුද්ගල සමාධීන්ද්‍රියයෙන් ශීඝ්‍ර වූ අභිඥ ඇති දුඃඛප්‍රතිපදයෙන් නිශ්‍රය වූ ධ්‍යානයන්ගෙන් නියර්‍යාණය කෙරෙයි. දෘෂ්ටිචරිත ඇති මොහාධිකපුද්ගල වීර්‍යෙන්ද්‍රිය යෙන් ලැසිවූ අභිඥ ඇති සුඛ ප්‍රතිපදයෙන් නිශ්‍රය වූ සම්‍යක්ප්‍රධානයන්ගෙන් නියර්‍යාණය කෙරෙයි. දෘෂ්ටිචරිත ඇති උදත්ථ (උදරප්‍රාඥ) පුද්ගල ප්‍රඥෙන්ද්‍රියයෙන් ශීඝ්‍ර වූ අභිඥ ඇති සුඛප්‍රතිපදයෙන් නිශ්‍රය වූ ආයර්‍යසත්‍යයන්ගෙන් නියර්‍යාණය කෙරේ.

තෘෂ්ණාචරිත ඇති පුද්ගලයෝ දෙදෙන ශමථය පූර්වඞ්ගම කොට ඇති විදර්ශනායෙන් රාගවිරාග (රාගප්‍රහාණයකරන) අනාගාමිඵලසමාධියෙන් නියර්‍යාණය කෙරෙති. දෘෂ්ටි චරිතපුද්ගලයෝ දෙදෙනා විදර්ශනාපූර්වඞ්ගම ශමථයෙන් අවිද්‍යාප්‍රහාණය කරන අර්හත් ඵලප්‍රඥයෙන් නිර්යාණය කෙරෙත්.

එහි යම් කෙනෙක් ශමථපූර්වඞ්ගම ප්‍රතිපද දෙකින් සසරදුක ඉක්මවායෙත් ද, ඔහු නන්දියාවට්ටනයින් පමුණුවාලියැයුත්තාහ. යම් කෙනෙක් විදර්ශනාපූර්වඞ්ගම ප්‍රතිපද දෙකින් සසරදුක ඉක්මවායෙත් ද, ඔහු සීහවික්කීළිතනයින් පමුණුවාලියැයුත්තාහ.

ඒ මේ හාරය කොහි ලැබෙයි යත් : ක්ෂණසම්පත් ලැබූ යම් පුහුලක්හට ශාස්තෘන් වහන්සේ හෝ ගරුකටයුතු අන්‍යතර සබ්‍රහ්මචාරී කෙනෙක් හෝ දහම් දෙසති. හේ ඒ දහම් අසා (බුදුන් දහම් කෙරෙහි) සැදැහැ උපදවයි. ඒ යථාශ්‍රැතධර්මයෙහි පද පදර්ත්ථ විමසන විමංසායෙක් ධාරණපරිචයෙහි උත්සාහයෙක් සසඳා තුලනය කිරිමෙක් මහාපදෙස යෙහි බහා පිරික්සීමෙක් වේ ද, මේ ' සුතමයී ' ප්‍රඥ නමු. එසෙයින් ඒ ශ්‍රැතය උපනිශ්‍රය කොට යම් විමසීමෙක් තුලනයෙක් පිරික්සීමෙක් සිතින් පුනපුනා බැලීමෙක් වේ ද, මේ ' චින්තාමයී ' ප්‍රඥ නමු. මේ යථෝක්ත ප්‍රඥදෙකින් රූපාරූපපරිග්‍රහාදි මනසිකාරයෙහි යුක්තප්‍රයුක්ත වූවහුට දර්ශනභූමියෙහි හෝ භාවනාභූමියෙහි හෝ යම් ඥනයෙක් උපදීද මේ ' භාවනාමය ' ප්‍රඥ නමු. (බුද්ධ . බුද්ධශ්‍රාවකාදි) අනෙකක්හුගේ දේශනාහේතුයෙන් උපන් නුවණ ' සුතමයපඤ්ඤ ' නමු. තමා තුළ පහළවූ යෝනිසොමනසිකාරයෙන් උපන් නුවණ ' චින්තාමයපඤ්ඤ ' නමු. පරතෝඝෝස සංඛ්‍යාත අනෙකක්හුගේ දේශනායෙනුදු තමාතුළ උපන් යෝනිසොමනසිකාර හේතුයෙනුදු යම් නුවණෙක් උපදීද මේ ' භාවනාමයපඤ්ඤ ' නමු.

යමක්හට ශ්‍රැතමය වූ ද චින්තාමය වූ ද මේ ප්‍රඥවෝ දෙදෙනෙක් ඇද්ද මෙතෙම ' උද්ඝටිතඥ ' නම් වේ. යමක්හට ශ්‍රැතමයප්‍රඥ ඇද්ද, චින්තාමයප්‍රඥ නැද්ද, මෙතෙම විපඤ්චිතඥ නම් වේ. යමක්හට ශ්‍රැතමයප්‍රඥ නොමැ ඇද්ද, චින්තාමයප්‍රඥ නොමැ ඇද්ද මෙතෙම ' නෙයපුද්ගල ' නම් වේ.

මේ යථෝක්ත ධර්මදේශනාව කුමක් දෙසයි යත් : චතුස්සත්‍ය යි : දුඃඛ යැ, සමුදය යැ, නිරොධ යැ, මාර්ග යි. ආදීනවය හා ඵලය හා දුඃඛ නම. අස්වාදය සමුදය නම. නිස්සරණය නිරොධ නම. උපාය හා ආණත්ති හා මාර්ග නමි. මේ චතුස්සත්‍ය යි මේ (බුදුරදුන්ගේ සිවුසස් විසින් සාමුක්කංසිකදෙසනාව) ධර්මචක්‍ර නම් වේ.

යථා'හ භගවා: "ඉදං දුක්ඛන්ති මෙ භික්ඛවෙ බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පටිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං" (සබ්බං ධම්මචක්කං.)

තත්ථ අපරිමාණා පදා අපරිමාණා අක්ඛරා අපරිමාණා බ්‍යඤ්ජනා අපරිමාණා ආකාරා නෙරුත්තා නිද්දෙසා. එතස්සෙව අත්ථස්ස සංකාසනා පකාසනා විවරණා විභජනා උත්තානීකම්මං පඤ්ඤත්ති ඉතිපි'දං දුක්ඛං අරියසච්චං.

"අයං දුක්ඛසමුදයො'ති මෙ භික්ඛවෙ බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං -පෙ- අයං දුක්ඛනිරොධො'ති මෙ භික්ඛවෙ -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති මෙ භික්ඛවෙ බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පටිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං"

තත්ථ අපරිමාණා පදා අපරිමාණා අක්ඛරා අපරිමාණා බ්‍යඤ්ජනා අපරිමාණා ආකාරා නෙරුත්තා නිද්දෙසා. එතස්සෙව අත්ථස්ස සංකාසනා පකාසනා විවරණා විභජනා උත්තානීකම්මං පඤ්ඤත්ති ඉතිපි'දං දුක්ඛනිරොධගාමිනීපටිපදාඅරියසච්චං.

තත්ථ භගවා අක්ඛරෙහි සංකාසෙති, පදෙහි පකාසෙති, බ්‍යඤ්ජනෙහි විවරති, ආකාරෙහි විභජති, නිරුත්තීහි උත්තානීකරොති, නිද්දෙසෙහි පඤ්ඤපෙති.[1]

තත්ථ භගවා අක්ඛරෙහි ච පදෙහි ච උග්ඝාටෙති,[2] බ්‍යඤ්ජනෙහි ච ආකාරෙහි ච විපඤ්චයති, නිරුත්තීහි ච නිද්දෙසෙහි ච විත්ථාරෙති. තත්ථ උග්ඝාටනා[3] ආදි, විපඤ්චනා මජ්ඣෙ, විත්ථාරණා පරියොසානං.

සොයං ධම්මවිනයො උග්ඝටියන්තො උග්ඝටිතඤ්ඤුපුග්ගලං විනෙති, තෙන නං ආහු ආදිකල්‍යාණොති, විපඤ්චියන්තො විපඤ්චිතඤ්ඤුපුග්ගලං[4] විනෙති, තෙන නං ආහු: මජ්ඣෙකල්‍යාණොති. විත්ථාරියන්තො නෙය්‍යපුග්ගලං විනෙති, තෙන නං ආහු: පරියොසානකල්‍යාණොති.

තත්ථ ඡප්පදානි අත්ථො: සංකාසනා පකාසනා විවරනා විභජනා උත්තානීකම්මං පඤ්ඤත්ති. ඉමානි ඡප්පදානි අත්ථො. ඡප්පදානි බ්‍යඤ්ජනං: අක්ඛරං පදං බ්‍යඤ්ජනං ආකාරො නිරුත්ති නිද්දෙසො. ඉමානි ඡප්පදානි බ්‍යඤ්ජනං. තෙනාහ භගවා: "ධම්මං වො භික්ඛවෙ දෙසිස්සාමි ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනන්ති".

1. පඤ්ඤපෙති - මජසං.
2. උග්ඝටෙති - මජසං.
3. උග්ඝටනා - මජසං.
4. විපචිතඤ්ඤූ - සීමු.

මෙසේ වදළහ, භාග්‍යවත්හු : '' මහණෙනි, මා විසින් මේ දුඃඛාය්‍ය්‍යසත්‍යයයි බරණැස් නුවර සමීපයෙහි ඉසිපතන නම් වූ මුවළැව්හි දී මහණක්හු විසින් හෝ බමුණක්හු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොවැ කිසිවක්හු විසින් හෝ නොවළහාලියැහෙන (ප්‍රතිෂෙධ නොකළ හැකි) අනුත්තර වූ ධර්මචක්‍රය පවත්වන ලද.''

ඒ චතුස්සත්‍යධර්මදේශනායෙහි අපරිමාණ පදයෝ අපරිමාණ අක්ෂරයෝ අපරිමාණ ව්‍යඤ්ජනයෝ අපරිමාණ ආකාරයෝ නෛරුක්තයෝ නිර්දෙශයෝ වෙති. තෙල චතුස්සත්‍ය සංඛ්‍යාත අර්ත්ථයාගේ මැ සඞ්කාශන ප්‍රකාශන විවරණ විභාගකිරීම ප්‍රකට කිරීම ප්‍රඥප්ති වෙයි. මෙසෙයිනුදු මේ දුඃඛාය්‍ය්‍යසත්‍යය දතයුතු.

'' මහණෙනි, මා විසින් ' මේ දුඃඛසමුදයාය්‍ය්‍යසත්‍යය ' යි බරණැස ඉසිපතන නම් වූ මුවළැව්හි දී අනුත්තර වූ දම්සක් පවත්වන ලද . . . මහණෙනි, මා විසින් ' මේ දුඃඛනිරොධාය්‍ය්‍යසත්‍යය ' යි . . . මහණෙනි, මා විසින් ' මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදය්‍ය්‍ය සත්‍යය ' යි බරණැස ඉසිපතන නම් වූ මුවළැව්හි දී මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොවැ කිසිවක්හු විසින් හෝ ප්‍රතිෂෙධ නොකළහෙන අනුත්තර වූ දම්සක් පවත්වන ලද.''

(ද්වාදසපදයන්ගේ අන්‍යොන්‍ය විෂයවිෂයීභාවය දක්වති :) ඒ ආය්‍ය්‍යසත්‍යදේශනා යෙහි අපරිමාණ පදයෝ අපරිමාණ අක්ෂරයෝ අපරිමාණ ව්‍යඤ්ජනයෝ අපරිමාණ ආකාර නෛරුක්ත නිර්දෙශයෝ වෙති. තෙල අර්ත්ථයාගේ මැ සඞ්කාශන ප්‍රකාශන විවරණ විභජන උත්තානීකරණ ප්‍රඥප්ති වේ. මෙසෙයිනුදු මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදය්‍ය්‍යසත්‍යය දතයුතු.

ඒ චතුස්සත්‍යදේශනායෙහි භාග්‍යවත්හු අක්ෂරයන් කරණ කොටගෙන සැකෙවින් දෙසනසේක. පදයන්ගෙන් ප්‍රකාශ කරනසේක. ව්‍යඤ්ජනයන්ගෙන් විවරණ කරන සේක. ආකාරයන්ගෙන් විභාග කරනසේක. නිර්වචනවිභාග සංඛ්‍යාත නිරුක්තීන් ගෙන් ප්‍රකට කරනසේක. නිරවශේෂ දේශනා සංඛ්‍යාත නිර්දේශයන්ගෙන් පනවන සේක.

(ව්‍යඤ්ජනපදයන්ගේ කෘත්‍යසාධනය දක්වති :) ඒ සිව්සස් දෙසුම්හි භාග්‍යවත්හු අක්ෂරයනුදු පදයනුදු කරණ කොටගෙන උද්දේස කෙරෙති. (.සැකෙවින් වදරති.) ව්‍යඤ්ජනයනුදු ආකාරයනුදු කරණ කොටගෙන නිද්දේස (විපඤ්චන) කෙරෙති. නිරුක්තීනුදු නිර්දෙශයනුදු කරණ කොටගෙන පටිනිද්දේස (විස්තර) කරනසේක. එහි උද්දේසය (දෙශනායෙහි) ආදි වෙයි, නිද්දෙසය මධ්‍ය වෙයි, පටිනිද්දෙසය (විස්තාරණය) පය්‍ය්‍යවසාන වේ.

(දුන් අර්ත්ථපදයන්ගේ ව්‍යාපාරය දක්වති :) ඒ ධර්මවිනය උද්දේස කරනු ලබනුයේ උද්ඝටිතඥ පුද්ගලයා විනයන කෙරෙයි (හික්මවයි.) එයින් ඒ ධර්මවිනය ' ආදිකල්‍යාණ ' යි වදළහ. නිද්දෙස කරනු ලබනුයේ විපඤ්චිතඥ පුද්ගලයා විනයන කෙරෙයි, එයින් ඒ ධර්මවිනය ' මධ්‍යකල්‍යාණ ' යි වදළහ. පටිනිද්දෙස (විස්තර) කරනු ලබනුයේ නෙයපුද්ගලයා විනයන කෙරෙයි, එයින් ඒ ධර්මවිනය ' පය්‍ය්‍යවසාන කල්‍යාණ ' යි වදළහ.

ඒ චතුස්සත්‍යදේශනායෙහි සපද කෙනෙක් අර්ත්ථ යැ : සඞ්කාසනා යැ පකාසනා යැ විවරණා යැ විභජනා යැ උත්තානීකම්ම යැ පඤ්ඤත්ති යි. මේ ෂට්පදයෝ අර්ත්ථ යි. සපද කෙනෙක් ව්‍යඤ්ජන යැ : අක්ඛර යැ පද යැ බ්‍යඤ්ජන යැ ආකාර යැ නිරුක්ති ය. නිද්දෙස යි. මේ ෂට්පදයෝ ව්‍යඤ්ජන යි. එයින් වදළහ, භාග්‍යවත්හු : '' ධම්මං වො භික්ඛවෙ, දෙසිස්සාමි ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං '' යි.

‘‘කෙවල’’න්ති ලොකුත්තරං, න මිස්සං ලොකියෙහි ධම්මෙහි; ‘‘පරිපුණ්ණ’’න්ති පරිපූරං අනූනං අනතිරෙකං; ‘‘පරිසුද්ධං’’ති නිම්මලං සබ්බමලාපගතං පරියොදාතං උපට්ඨිතං සබ්බවිසෙසානං. ඉදං වුච්චති තථාගතපදං ඉතිපි තථාගතනිසෙවිතං ඉතිපි තථාගතාරඤ්ජිතං[1] ඉතිපි. අතො චෙතං බ්‍රහ්මචරියං පඤ්ඤායති. තෙනාහ භගවා: ‘‘කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙස්සාමී’’ති,

කෙසං අයං ධම්මදෙසනා : යොගීනං. තෙනාහ ආයස්මා මහා කච්චායනො :

‘‘අස්සාදදීනවතා-නිස්සරණම්පි ච ඵලං උපායො ච,
ආණත්ති ච භගවතො-යොගීනං දෙසනාහාරො’’ති.

නියුත්තො දෙසනාහාරො.

## 3. 1. 2

## විචයහාරවිභඞ්ගො

තත්ථ කතමො විචයො හාරො : ‘‘යං පුච්ඡිතං ච විස්සජ්ජිතං චා’’ති ගාථා, අයං විචයො හාරො. කිං විචිනති : පදං විචිනති පඤ්හං විචිනති විස්සජ්ජනං විචිනති පුබ්බාපරං විචිනති අස්සාදං විචිනති ආදීනවං විචිනති නිස්සරණං විචිනති ඵලං විචිනති උපායං විචිනති ආණත්තිං විචිනති අනුගීතිං විචිනති සබ්බෙ නව සුත්තන්තෙ විචිනති

යථා කිං භවෙ[2] : යථා ආයස්මා අජිතො පාරායනෙ භගවන්තං පඤ්හං පුච්ඡති.

1. ‘‘කෙනස්සු නිවුතො ලොකො (ඉච්චායස්මා අජිතො)
කෙනස්සු නප්පකාසති
කිස්සාභිලෙපනං[3] බ්‍රූසි
කිංසු තස්ස මහබ්භයං’’ති.

ඉමානි චත්තාරි පදානි පුච්ඡිතානි, සො එකො පඤ්හො; කස්මා; එකවත්ථුපරිග්ගහා, එවං හි ආහ : ‘‘කෙනස්සු නිවුතො ලොකො’’ති ලොකාධිට්ඨානං පුච්ඡති. ‘‘කෙනස්සු නප්පකාසතී’’ති ලොකස්ස අප්පකාසනං පුච්ඡති. ‘‘කිස්සාභිලෙපනං බ්‍රූසී’’ති ලොකස්ස අභිලෙපනං පුච්ඡති. ‘‘කිංසු තස්ස මහබ්භයං’’ති තස්සෙව ලොකස්ස මහාභයං පුච්ඡති. ලොකො තිවිධො : කිලෙසලොකො භවලොකො ඉන්ද්‍රියලොකො.

1. තථාගතරඤ්ජිතං - සීමු, මජසං.
2. භවෙය්‍ය - පු.
3. කිංසවාභිලෙපනං - පු.

" කෙවලං " යනු : ලෝකෝත්තර වූ ලෞකිකධර්මයන් හා අමිශ්‍ර වූ, " පරිපුණ්ණං " යනු : හාත්පසින් පිරුණු නොඅඩු නොවැඩි වූ, " පරිසුද්ධං " යනු : නිර්මල වූ සියලු මලයන්ගෙන් අපගත වූ පර්‍ය්‍යවදත වූ (උතුරුමිනිස්දහම් සංඛ්‍යාත වූ අධිශීලශික්ෂාදි සංඛ්‍යාත වූ හෝ) සියලු විශේෂයන් එළැඹ සිටුනා තැන් වූ දහමක් යනු යි. මේ ශික්ෂාත්‍රය සංගෘහීත ශාසනබ්‍රහ්මචර්‍ය්‍ය තථාගත ගඳැත්හු කෙලෙස්ගහන මැඩපියා ගිය මගැයි ද තථාගතයන් විසින් සෙවුනාලදැයි ද තථාගතයන් සර්වඥතාඥානදන්තයෙන් ත්‍රෛභූමක ධර්මයන් කිහිරිකළ තැනැයි ද කියනු ලැබේ. මෙකරුණෙන් තෙල සසුන් බඹසර පැනේ. එයින් වදළහ, භාග්‍යවත්හු : " කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙස්සාමි " යි.

මේ ධර්මදේශනා කවුරුන් සඳහා ද යත් : චතුස්සත්‍යකර්මස්ථානික යෝගීන් සඳහා යි. එයින් වදළහ, ආයුෂ්මත් මහාකච්චායන තෙරණුවෝ :

" අස්සාදදීනවතා – පෙ – දෙසනාහාරො " යි.

දෙසනාහාරය යොදනලදී.

## 3. 1. 2

## විචයහාරවිභඞ්ගය

එහි විචයහාර කවරෙ යත් : " යං පුච්ඡිතඤ්ච විස්සජ්ජිතඤ්ච " යන ගාථා යි. මේ විචයහාර යි. කුමක් සොයා ද යත් : පදය සොයයි, ප්‍රශ්නය — විසඳුම — පූර්වාපරය — ආස්වාදය — ආදීනවය — නිස්සරණය — ඵලය — උපාය — ආණත්තිය — අනුගීතිය සොයයි, සියලු සුත්තගෙය්‍යාදි නවසූත්‍රාන්තයන් සොයයි.

ඒ කෙබඳු වෙයි යත් : ආයුෂ්මත් අජිත තෙරණුවෝ පාරායනයෙහි භාග්‍යවතුන් වහන්සේගෙන් මෙසේ පැන පුළුවුස්ති :

1. (ආයුෂ්මත් අජිත මෙසේ පුළුවුස්සි) සත්ත්වලොක තෙම කවරක්හු විසින් වසනලද ද ? කුමක් හේතු කොට ප්‍රකාශයට නොපැමිණේ ද ? ඒ ලෝවැසියාට කුමක් අභිලේපන (ඇලීම) යයි වදරනලද ද ? ඒ සත්ත්ව ලෝක හට මහත් භයහේතුව කුමක් දූ ? යි.

මේ ප්‍රශ්න විසින් කියනලද පද (වාක්‍ය) සතරෙකි. හේ එක ප්‍රශ්නයෙක් වෙයි. කුමක් හෙයින යත් : ලෝක සංඛ්‍යාත එක් වස්තුවක් මුඛ්‍යවශයෙන් ගත් හෙයිනි. එහෙයින් මැ කියයි : " කෙනස්සු නිවුතො ලොකො " යී සත්ත්වලෝකය මුඛ්‍ය කොට පුළුවුස්සි. " කෙනස්සු නප්පකාසති " යී ලෝකයාගේ ප්‍රකාශ නොවීම පුළුවුස්සි (විචාරයි.) " කිස්සාභිලෙපනං බ්‍රූසි " යී ලෝකයාගේ (මක්කටාභිලෙපනයක් සෙයින්) ඇලීම විචාරයි. " කිංසු තස්ස මහබ්භයං " යී එ ලෝකයාගේ මැ මහත් භය විචාරයි. ලෝකය ත්‍රිවිධ යැ : (රාගාදි කෙලෙස් බිහිලි බැවින්) කාමාවචරසත්ත්ව සංඛ්‍යාත ක්ලෙශ ලෝක යැ, රූපාවචරසත්ත්ව සංඛ්‍යාත භවලොක යැ, අරූපාවචරසත්ත්ව සංඛ්‍යාත ඉන්ද්‍රියලොක යි.

තත්ථ විස්සජ්ජනා :

2. "අවිජ්ජාය නිවුතො ලොකො (අජිතාති භගවා)
විවිච්ඡා[1]පමාදා නප්පකාසති,
ජප්පාභිලෙපනං බ්‍රූමි
දුක්ඛමස්ස මහබ්භය"න්ති.

ඉමානි චත්තාරි පදානි ඉමෙහි චතූහි, පදෙහි විස්සජ්ජිතානි, පඨමං පඨමෙන, දුතියං දුතියෙන, තතියං තතියෙන, චතුත්ථං චතුත්ථෙන, "කෙනස්සු නිවුතො ලොකො"ති පඤ්හෙ "අවිජ්ජාය නිවුතො ලොකො"ති විස්සජ්ජනා, නීවරණෙහි නිවුතො ලොකො, අවිජ්ජා නීවරණා හි සබ්බෙ සත්තා; යථාහ භගවා : "සබ්බසත්තානං භික්ඛවෙ සබ්බපාණානං සබ්බභූතානං පරියායතො එකමෙව නීවරණං වදාමි, යදිදං අවිජ්ජා ; අවිජ්ජානීවරණා හි සබ්බෙ සත්තා සබ්බසො ච භික්ඛවෙ අවිජ්ජාය නිරොධා චාගා පටිනිස්සග්ගා නත්ථි සත්තානං නීවරණන්ති වදාමී"ති. තෙන ච පඨමස්ස පදස්ස විස්සජ්ජනා යුත්තා.

"කෙනස්සු නප්පකාසතී"ති පඤ්හෙ "විවිච්ඡා පමාදා නප්පකාසතී"ති විස්සජ්ජනා, යො පුග්ගලො නීවරණෙහි නිවුතො සො විවිච්ඡති, විවිච්ඡා නාම වුච්චති විචිකිච්ඡා, සො විචිකිච්ඡන්තො නාභිසද්දහති, අනභිසද්දහන්තො විරියං නාරභති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං සච්ඡිකිරියාය, සො ඉධපමාදමනුයුත්තො විහරති, පමත්තො සුක්කෙ ධම්මෙ න උපාදියති, තස්ස තෙ අනුපාදියමානා නප්පකාසන්ති, යථාහ භගවා :

3. "දූරෙ සන්තො පකාසන්ති හිමවන්තොව පබ්බතො,
අසන්තෙත්ථ න දිස්සන්ති රත්තිඛිත්තා[2] යථා සරා."

"තෙ ගුණෙහි පකාසන්ති කිත්තියා ච යසෙන වා"ති.

තෙන ච දුතියස්ස පදස්ස විස්සජ්ජනා යුත්තා.

"කිස්සාභිලෙපනං බ්‍රූසී"ති පඤ්හෙ- "ජප්පාභිලෙපනං බ්‍රූමී"ති විස්සජ්ජනා, ජප්පා නාම වුච්චති තණ්හා, සා කථං අභිලිම්පති ; යථාහ භගවා :

"රත්තො අත්ථං න ජානාති රත්තො ධම්මං න පස්සති,
අන්ධතමං තදා හොති යං රාගො සහතෙ නර"න්ති.

සා'යං තණ්හා ආසත්තිබහුලස්ස පුග්ගලස්ස එවං අභිජප්පාති කරිත්වා, තත්ථ ලොකො අභිලිත්තො නාම භවති. තෙන ච තතියස්ස පදස්ස විස්සජ්ජනා යුත්තා.

---

1. වෙවිච්ඡා - මජසං.
2. රත්තිං ඛිත්තා - මජසං.

එහි මේ විසඳීම යැ :

2. (අජිත' යි බුදුහු වදරති) ධර්මස්වභාව ප්‍රතිච්ඡාදනලක්‍ෂණ අවිද්‍යාව විසින් සත් ලොව වසන ලද, විචිකිත්සා ප්‍රමාද හේතුයෙන් ප්‍රකාශයට නොපැමිණෙයි, තෘෂ්ණාව අභිලේපන (ඇලීම) යයි කියමි, ජාත්‍යාදි සසරදුක ඒ ලෝකහට මහත් භය වේ යයි.

පෘච්ඡාගාථායෙහි මේ සතරපදයෝ විස්සජ්ජනගාථායෙහි මේ සතරපදයෙන් විසඳනලදහ. ප්‍රථම පදය ප්‍රථම පදයෙන් ද දෙවැන්න දෙවැන්නෙන් ද තෙවැන්න තෙවැන්නෙන් ද සතරවැන්න සතරවැන්නෙන් ද විසඳන ලදි. (ඒ මෙසේයැ : '' කෙනස්සු නිවුතො ලොකො '' යන ප්‍රශ්නයෙහි '' අවිජ්ජාය නිවුතො ලොකො '' යනු විසඳීම යැ, නීවරණයන් විසින් ලෝවැසිතෙම වසනලද, එසේ මැය : හැම සත්හූ අවිද්‍යා නීවරණ ඇත්තාහ. මේ වදළහ, බුදුහු : ' මහණෙනි, හැම සත්නට හැම ප්‍රාණීන්ට හැම භූතයනට කාරණහෙයිඃ එක් මැ නීවරණයක් කියමි. ඒ කවර යැ : අවිද්‍යා යි. හැම සත්හූ අවිද්‍යානීවරණඇත්තාහූ මැය. තවද මහණෙනි, සර්වප්‍රකාරයෙන් අවිද්‍යාවගේ අනුත්පාදනිරොධයෙන් ත්‍යාගයෙන් දුරලීමෙන් සත්ත්වයනට නීවරණ නැතැයි කියමි' යි. ඒ '' අවිජ්ජාය නිවුතො ලොකො '' යන පදයෙන් '' කෙනස්සු නිවුතො ලොකො '' යන පළමුවන පදයාගේ විසඳීම යොදනලදි.

'' කෙනස්සු නප්පකාසති '' යන ප්‍රශ්නයෙහි '' විවිච්ඡා පමාද නප්පකාසති '' යනු විසඳීම යැ. යම් පුහුලෙක් නීවරණයන් විසින් පිහිත ද, ඒ පුද්ගල සැකකරයි. විචිකිත්සාව '' විවිච්ඡා '' නමැයි කියනුලැබෙ. හේ සැකකරනුයේ නොහදහයි. හැදූහිලි නොකරනුයේ අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන් ප්‍රත්‍යක්‍ෂකරනු පිණිස වීර්‍ය්‍යාරම්භ නොකෙරෙයි. හේ මෙලොවැ ප්‍රමාදයෙහි අනුයුක්ත ව වෙසෙයි. ප්‍රමත්ත වූයේ කුශලධර්මයන් සමාදන් කොට නොවැඩෙයි. ඔහුගේ සන්තානයෙහි නොපවත්නාවූ ඒ කුශලධර්මයෝ (ඒ පුහුල්හු) ප්‍රකාශ නොකෙරෙත්. මෙසේ වදළහ : බුදුහු —

3. (උත්පන්න කුශලමූල ඇති භාවිත භාවනා ඇති) සාධුහු දුර සිටියාහු ද හිමවත් පර්වතය සෙයින් ප්‍රකාශ වෙති. (බුදුනුවණට පැනෙති.) මෙලොවැ අසාධු වූ බාල පුද්ගලයෝ රාත්‍රියෙහි විදුනාලද සරයන් (ඊතල) සෙයින් නොපැනෙත්.

ඒ සජ්ජනයෝ ගුණයන් කරණකොටගෙන කීර්තියෙනුදු පරිවාරයශසිනුදු ප්‍රකාශ වෙත් ' යි.

ඒ '' විවිච්ඡා පමාද නප්පකාසති '' යන පදයෙන් ''කෙනස්සු නප්පකාසති'' යන දෙවැනි පදයාගේ විසඳීම යොදන ලදී.

'' කිස්සාභිලෙපනං බ්‍රූසි '' යන ප්‍රශ්නයෙහි ''ජප්පාභිලෙපනං බ්‍රූමි'' යනු විසඳීම යැ. තෘෂ්ණාව ' ජප්පා ' නමැයි කියනු ලැබෙ. ඒ තෘෂ්ණාව කිසෙයින් (පුරුෂයා රූපාදි විෂයෙහි) අලවයි යත් : මෙසේ වදළහ බුදුහු —

4. රාගයෙන් රත්වූයේ ආත්මාර්ථාදි අර්ථය නොදනී, රාගයෙන් රත්වූයේ කුශලාදි භේද වූ ධර්මය නොදකී, රාග තෙමේ යම් කලෙක මිනිසා සහන්‍ය කෙරේද එකල්හි මහත්වූ මෝහාන්ධකාරය වේ ' යයි.

මේ තෘෂ්ණාව ඇලීම (ආසක්තිය) බහුල කොට ඇති පුහුල්හට මෙසේ පර්යුත්ථාන කාරණ යයි කොට ඒ තෘෂ්ණායෙන් ලොවැසි තෙම වෙසෙසින් ඇලුණේ නම් වේ. තවද ඒ ' ජප්පාභිලෙපනං බ්‍රූමි ' යන පදයෙන් තුන්වැනි ' කිස්සාභිලෙපනං බ්‍රූසි ' යන පදයාගේ විසඳීම යොදනලද වේ.

''කිංසු තස්ස මහබ්භය''න්ති පඤ්හො ''දුක්ඛමස්ස මහබ්භය''න්ති විස්සජ්ජනා. දුවිධං දුක්ඛං: කායිකං ච චෙතසිකං ච. යං කායිකං ඉදං දුක්ඛං, යං චෙතසිකං ඉදං දොමනස්සං. සබ්බෙ සත්තා හි දුක්ඛස්ස උබ්බිජ්ජන්ති නත්ථි භයං දුක්ඛෙන සමසමං, කුතො වා පන තස්ස උත්තරිතරං, තිස්සො දුක්ඛතා: දුක්ඛදුක්ඛතා විපරිණාමදුක්ඛතා සංඛාරදුක්ඛතා; තත්ථ ලොකො ඔධිසො කදාචි කරහචි දුක්ඛදුක්ඛතාය මුච්චති, තථා විපරිණාමදුක්ඛතාය. තං කිස්ස හෙතු: හොන්ති ලොකෙ අප්පාබාධාපි දීඝායුකාපි. සංඛාරදුක්ඛතාය පන ලොකො අනුපාදිසෙසාය නිබ්බානධාතුයා මුච්චති, තස්මා සංඛාරදුක්ඛතා දුක්ඛං ලොකස්සාති කත්වා දුක්ඛමස්ස මහබ්භයන්ති. තෙන ච චතුත්ථස්ස පදස්ස විස්සජ්ජනා යුත්තා. තෙනාහ භගවා: ''අවිජ්ජාය නිවුතො ලොකො''ති.

5. ''සවන්ති සබ්බධි සොතා (ඉච්චායස්මා අජිතො)
සොතානං කිං නිවාරණං,
සොතානං සංවරං බ්‍රූහි
කෙන සොතා පිථීයරෙ''ති[1]

ඉමානි චත්තාරි පදානි පුච්ඡිතානි. තෙ ද්වෙ පඤ්හා; කස්මා: ඉමෙ හි බව්හාධිවචනෙන පුච්ඡිතා. එවං සමාපන්නස්ස ලොකස්ස එවං සංකිලිට්ඨස්ස ලොකස්ස කිං වොදානං වුට්ඨානං ඉති: එවං හි ආහ: ''සවන්ති සබ්බධි සොතා''ති. අසමාහිතස්ස සවන්ති අභිජ්ඣාබ්‍යාපාදපමාදබහුලස්ස. තත්ථ යා අභිජ්ඣා අයං ලොභො අකුසලමූලං, යො බ්‍යාපාදො අයං දොසො අකුසලමූලං, යො පමාදො අයං මොහො අකුසලමූලං. තස්සෙවං අසමාහිතස්ස ඡසු ආයතනෙසු තණ්හා සවන්ති: රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා. යථාහ භගවා: ''සවතීති ඛො භික්ඛවෙ ඡන්නෙතං අජ්ඣත්තිකානං ආයතනානං අධිවචනං. චක්ඛු සවති මනාපිකෙසු රූපෙසු, අමනාපිකෙසු පටිහඤ්ඤති, සොතං-පෙ-ඝානං-පෙ-ජිව්හා-පෙ-කායො-පෙ- මනො සවති මනාපිකෙසු ධම්මෙසු අමනාපිකෙසු පටිහඤ්ඤතී''ති.

ඉති සබ්බා ච සවති සබ්බථා ච සවති. තෙනාහ: ''සවන්ති සබ්බධි සොතා''ති. ''සොතානං කිං නිවාරණ''න්ති පරියුට්ඨානවිඝාතං පුච්ඡති, ඉදං වොදානං. ''සොතානං සංවරං බ්‍රූහි කෙන සොතා පිථීයරෙ''ති අනුසයසමුග්ඝාතං පුච්ඡති, ඉදං වුට්ඨානං.

තත්ථ විස්සජ්ජනා[2]:

6. ''යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා)
සති තෙසං නිවාරණං,
සොතානං සංවරං බ්‍රූමි
පඤ්ඤායෙතෙ පිථීයරෙ''ති.

1. පිධීයරෙ - මජසං.
2. විසජ්ජනා - මජසං.

"කිංසු තස්ස මහබ්භයං" යන ප්‍රශ්නයෙහි : "දුක්ඛමස්ස මහබ්භයං" යනු විසඳීම යැ. දුක වෙදැරුම් යැ : කායිකදුඃඛ යැ, චෛතසිකදුඃඛ යි. කයෙහි උපන්නේ දුක යැ, සිත්හි උපන්නේ දෙමනසි. එසේ මැයි, සියලු සත්ත්වයෝ දුකට තැතිගනිති. දුක හා සමසම වූ බියෙක් නැත. ඒ දුකට වැඩිතරම් බියෙක් කොහි හෝ යැ. දුක්ඛතා තුනෙකි : දුක්ඛ–දුක්ඛතා යැ, විපරිණාමදුක්ඛතා යැ, සංඛාරදුක්ඛතා යි. එහි ලෝවැසි තෙමේ අවධිවශයෙන් කිසි කලෙක (ආත්මොපක්‍රමමූලකාදි) දුක්ඛ දුක්ඛතායෙන් මිදෙයි. එසේ ම විපරිණාමදුක්ඛතායෙනුදු මිදෙයි. ඒ කවරහෙයින යත් : ලොවැ අල්පාබාධ වූවාහු ද දීර්ඝායුෂ්ක වූවාහු ද වෙත්. සංඛාරදුක්ඛතායෙන් වැලිත් ලෝවැසි අනුපාදිශෙෂ නිර්වාණධාතුයෙන් මිදෙයි. එහෙයින් සංස්කාරදුඃඛය ලොකයාහට දුකැයි කොට 'දුක්ඛමස්ස මහබ්භයං' යි වදරන ලදි. එයින් 'කිංසු තස්ස මහබ්භයං' යන සතරවැනි පදයාගේ විසඳීම යොදන ලද වේ. එයින් වදළහ, බුදුහු : "අවිජ්ජාය නිවුතො ලොකො" යි.

5. (ආයුෂ්මත් අජිත මෙසේ පුළුවුස්සි :) තෘෂ්ණාදි ශ්‍රෝතස්හු සියලු රූපාදි ආයතන යන්හි ගලාබසිති. ඒ ශ්‍රෝතසුන්ගේ ආවරණය කිම ? ආරක්ෂාව කවර යැයි සේයි. ශ්‍රෝතසුන්ගේ සංවරය වදළමැනැව, කවර දහමකින් තෘෂ්ණාදි ශ්‍රෝතස්හු වසනු ලැබෙත් ද ' යි.

මේ ප්‍රශ්න විසින් පුළුවුස්නාලද වාක්‍ය සතරෙකි : ඒ සතරපදයෝ ප්‍රශ්න දෙකෙකි. කුමක් හෙයින යත් : මේ අර්ථයෝ බහුවචනයෙන් පුළුවුස්නාලද හෙයිනි. මෙසේ ව්‍යසනාපන්න වූ ලෝවැසියාගේ මෙසේ දශක්ලේශවස්තුයෙන් සංක්ලිෂ්ට වූ ලෝවැසියාගේ (ශමථවිදර්ශනාසංඛ්‍යාත) ව්‍යවදානය (මාර්ගසංඛ්‍යාත) ව්‍යුත්ථානය කවරෙයයි. එසෙයින් මැ කී : "සවන්ති සබ්බධි සොතා" යී. අභිධ්‍යා ව්‍යාපාද ප්‍රමාදබහුල කොට ඇති අසමාහිතයාහට තෘෂ්ණාදි ශ්‍රොතස්හු ගලාබසිති. එහි යම් යම් අභිධ්‍යාවක් ඇද්ද, මෝ ලොභඅකුශලමූල යැ, යම් ව්‍යාපාදයෙක් ඇද්ද, මේ ද්වෙශ–අකුශලමූල යැ, යම් ප්‍රමාදයෙක් ඇද්ද, මේ මොහ–අකුශලමූල යි. මෙසේ (නානාලම්බනයෙහි විසුරුණු සිත් ඇති) අසමාහිත වූ ඔහුට ෂඩායතනයෙහි තෘෂ්ණා පවතී : රූපතණ්හා යැ සද්ද තණ්හා යැ ගන්ධතණ්හා යැ රසතණ්හා යැ ඵොට්ඨබ්බතණ්හා යැ ධම්මතණ්හා යි. මේ වදළහ, බුදුහු : " මහණෙනි, ' සවති ' යනු ආධ්‍යාත්මික වූ ෂඩායතනයනට නෙල නමෙකි. චක්ෂුස මනාවඩන රූපවිෂයෙහි පවතී, අමනාපික රූපයන්හි ගැටෙයි, ශ්‍රොත්‍රස . . . ඝ්‍රාණය . . . ජිහ්වාව . . . කාය . . . මනස මනාවඩන ධර්මයන්හි පවතී, අමනාපික ධර්මයන්හි ගැටෙ " යයි.

මෙසේ සියල්ලෙනුදු පවතී, සර්වප්‍රකාරයෙනුදු පවතී, එයින් කී : ' සවන්ති සබ්බධි සොතා ' යී. " සොතානං කිං නිවාරණං " යී පර්‍යුත්ථානයාගේ විඝාතය — නැසීම පුළුවුස්සි. මේ ව්‍යවදාන — පර්‍යුත්ථානප්‍රහාණ යි. " සොතානං සංවරං බ්‍රෑහි කෙන සොතා පිථීයරෙ " යී අනුසය නැසීම පුළුවුස්සි. මේ මාර්ගසංඛ්‍යාත ව්‍යුත්ථාන යි.

එහි මේ විසඳීම යැ :

6. (අජිත ' යී බුදුහු වදරති :) ලොවැ තෘෂ්ණාදි යම් ශ්‍රොතස් කෙනෙක් වෙත් ද, විදර්ශනාසම්ප්‍රයුක්ත වූ ස්මෘතිය යැ ඒ ශ්‍රෝතසුන්ගේ ආවරණයැ ආරක්ෂාව නුයි (ඒ ස්මෘතිය ම) ශ්‍රෝතසුන්ගේ සංවරයයි කියමි, මාර්ගප්‍රඥායෙන් නෙල ශ්‍රෝතස්හු (සර්වප්‍රකාරයෙන්) වසනුලැබෙත්. (නූපදියදී සමුච්ඡෙද කරනු ලැබෙතී සේයි.)

කායගතාය සතියා භාවිතාය බහුලීකතාය චක්ඛු නාවිඤ්ඡති මනාපිකෙසු රූපෙසු අමනාපිකෙසු න පටිහඤ්ඤති. සොතං -පෙ- ඝානං - ජිව්හා - කායො - මනො නාවිඤ්ඡති මනාපිකෙසු ධම්මෙසු අමනාපිකෙසු න පටිහඤ්ඤති. කෙන කාරණෙන සංවුතනිවාරිතත්තා ඉන්ද්‍රියානං, කෙන තෙ සංවුතා නිවාරිතා: සතිආරක්ඛෙන, තෙනාහ භගවා: "සති තෙසං නිවාරණ"න්ති.

පඤ්ඤාය අනුසයා පහීයන්ති, අනුසයෙසු පහීනෙසු පරියුට්ඨානා පහීයන්ති, තස්ස[1] අනුසයස්ස පහීනත්තා. තං යථා, ඛන්ධවන්තස්ස රුක්ඛස්ස අනවසෙසමූලුද්ධරණෙ කතෙ පුප්ඵඵලපවාල[2]ඞ්කුරසන්තති සමුච්ඡින්නා භවති. පිදහිතා පටිච්ඡන්නා, කෙන: පඤ්ඤාය. තෙනාහ භගවා: "පඤ්ඤායෙතෙ පිධීයරෙ"ති.[3]

7. "පඤ්ඤා චෙව සති ච (ඉච්චායස්මා අජිතො)
නාමරූපං ච මාරිස;
එතං මෙ පුට්ඨො පබ්‍රූහි
කත්ථෙ'තං උපරුජ්ඣතී"ති.

8. යමෙතං පඤ්හං අපුච්ඡි අජිත, තං වදාමි තෙ,
යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති;
විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣතී"ති

අයං පඤ්හො[4] අනුසන්ධිං පුච්ඡති, අනුසන්ධිං පුච්ඡන්තො කිං පුච්ඡති: අනුපාදිසෙසං නිබ්බානධාතුං, තීණි ච සච්චානි සඞ්ඛතානි නිරොධධම්මානි දුක්ඛං සමුදයො මග්ගො, නිරොධො අසඞ්ඛතො. තත්ථ සමුදයො ද්වීසු භූමීසු පහීයති: දස්සන භූමියා ච භාවනාභූමියා ච. දස්සනෙන තීණි සංයොජනානි පහීයන්ති: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො: භාවනාය සත්ත සංයොජනානි පහීයන්ති: කාමච්ඡන්දො බ්‍යාපාදො රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා ච නිරවසෙසා[5] තෙධාතුකෙ ඉමානි දස සංයොජනානි, පඤ්චොරම්භාගියානි පඤ්චුද්ධම්භාගියානි. තත්ථ තීණි සංයොජනානි සක්කායදිට්ඨි විචිකිච්ඡා, සීලබ්බතපරාමාසො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අධිට්ඨාය නිරුජ්ඣන්ති, සත්ත සංයොජනානි කාමච්ඡන්දො බ්‍යාපාදො රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා ච නිරවසෙසා අඤ්ඤින්ද්‍රියං අධිට්ඨාය නිරුජ්ඣන්ති

යං පන එවං ජානාති: "ඛීණා මෙ ජාතී"ති ඉදං ඛයෙ ඤාණං, නාපරං ඉත්ථත්තායා"ති පජානාති ඉදං අනුප්පාදෙ ඤාණං, ඉමානි ද්වෙ ඤාණානි අඤ්ඤාතාවින්ද්‍රියං, තත්ථ යඤ්ච අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං යඤ්ච අඤ්ඤින්ද්‍රියං ඉමානි අග්ගඵලං අරහත්තං පාපුණන්තස්ස නිරුජ්ඣන්ති. තත්ථ යඤ්ච ඛයෙ ඤාණං යං ච

---

1. කිස්ස - මජ්ඣං.
2. පල්ලව - මජ්ඣං.
3. විධීයරෙති - මජ්ඣං.
4. පඤ්හෙ - මජ්ඣං.
5. අවිජ්ජාවසෙසා - මජ්ඣං

කායගතස්මෘතිය භාවිත කල්හි බහුලීකෘත කල්හි චක්ෂුස මනවඩන රූපවිෂයෙහි (අභිධ්‍යාදීනට ප්‍රවෘත්තිද්වාරවශයෙන් චිත්තසන්තානය හෝ පුද්ගලයා) ආකර්ෂණ නොකෙරෙයි, අමනාපික රූපවිෂයෙහි නොගැටෙයි. ශ්‍රෝත්‍රය . . . ඝ්‍රාණය . . . ජිහ්වාව . . . කාය . . . මනස මනවඩන ධර්මයන්හි ආකර්ෂණ නොකෙරෙයි, අමනාපික ධර්මයන්හි නො ගැටේ. කවර හෙයින යත් : ඉන්ද්‍රියයන් සංවෘත-නිවාරිත හෙයිනි. කවරක්හු විසින් ඒ ඉන්ද්‍රියයෝ වසනලද්දහු වළහනලද්දහු ද යත් : සිහි නම් ඇති ආරක්ෂකයා විසිනි. එයින් වදළහ, බුදුහු — '' සති තෙසං නිවාරණං '' යි.

මාර්ගඥානයෙන් අනුශයධර්මයෝ ප්‍රහීණ වෙති, අනුශය ප්‍රහීණ කල්හි පර්‍ය්‍යුත්ථාන ක්ලේශයෝ ප්‍රහීණ වෙති. ඒ අනුශය ප්‍රහීණ බැවිනි. යම්සේ කඳ ඇති රුකක්හුගේ නිරවශේෂ කොට මුල් උදුරාලූ කල්හි මල්පලපලූ හා අඞ්කුරසන්තතිය සමුච්ඡින්න වේ ද, එසෙයින් අනුශය ප්‍රහීණ කල්හි පර්‍ය්‍යුත්ථාන ක්ලේශසන්තතිය සමුච්ඡින්න (සිඳුනාලද) වෙයි, වසන ලද වෙයි, ප්‍රතිච්ඡන්න වේ. කවරක්හු විසින යත් : මාර්ගප්‍රඥව විසිනි. එයින් වදළහ බුදුහු — '' පඤ්ඤායෙතෙ පිථීයරෙ '' යි.

7. (ආයුෂ්මත් අජිත මෙසේ විචාරයි :) නිදුකාණන් වහන්ස, මාර්ග ප්‍රඥව ද ස්මෘතිය ද කදවශේෂ නාමරූපය ද යන තෙල සියල්ල කොතැන්හි ලා නිරුද්ධ වේ ද, තෙල මා විසින් පුළුවුස්නාලදසේක් වදළ මැනව.

8. අජිතය, තෙල (කත්ථෙතං උපරුජ්ඣති ' යි) යම් ප්‍රශ්නයක් විචාළෙහි ද, එය තොපට කියමි, යම් තැනෙක ලා නාමයත් රූපයත් නිරවශේෂ කොට නිරුද්ධ වේ ද, (එය තොපට කියමි,) ඒ (පශ්චිම) විඥානයාගේ නිරොධය සමග මැ මේ විඥානනිරොධ යෙහි ලා තෙල නාමරූප නිරුද්ධ වේ යයි.

මේ ප්‍රශ්නය අනුසන්ධිය විචාරයි. අනුසන්ධි පුළුවුස්නේ කුමක් විචාරයි යත් : අනුපාදිශේෂ නිර්වාණධාතුව ද, ප්‍රත්‍යයසමවායෙන් උපන් නිරුද්ධවන පියවිඇති දුක්ඛ යැ සමුදය යැ මග්ග යැ යන තුන් සත්‍යයන් ද විචාරයි. නිරොධසත්‍යය අසංඛත යි. එහි සමුදය දර්ශනභූමියෙහි ද භාවනාභූමියෙහි ද යන භූමි දෙක්හි ප්‍රහීණ වෙයි. දර්ශනයෙන් සක්කායදිට්ඨි යැ විචිකිච්ඡා යැ සීලබ්බතපරාමාස යැ යන තුන්සංයොජනයෝ ප්‍රහීණ වෙති, භාවනායෙන් කාමච්ඡන්ද යැ ව්‍යාපාද යැ රූපරාග යැ අරූපරාග යැ මාන යැ උද්ධච්ච යැ නිරවශේෂ අවිජ්ජා යැ යන සත්සංයොජනයෝ ප්‍රහීණ වෙත්, මොහු කාමාදි ත්‍රෛධාතුකයෙහි දසසංයොජනයෝ යැ, ඔරම්භාගිය පසෙක, උද්ධම්භාගිය පසෙකි. ඔවුන් කෙරෙහි ' සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස ' යන තුන් සංයොජනයෝ අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රියයට පැමිණ නිරුද්ධ වෙති, ' කාමච්ඡන්ද යැ ව්‍යාපාද යැ රූපරාග යැ අරූපරාග යැ මාන යැ උද්ධච්ච යැ අවිජ්ජා ' යැ යන සත් සංයෝජනයෝ අඤ්ඤින්ද්‍රියට පැමිණ නිරවශේෂව නිරුද්ධ වෙත්.

තවද යම්හෙයකින් '' මාගේ ජාතිය ක්ෂයවූ '' යැයි මෙසේ යම් ඥානයකින් දන ගනී ද, ප්‍රත්‍යවෙක්ෂාවට නිමිත්ත වූ මේ ඥානය ක්ෂයඥාන (ඛයෙ ඤාණ) නම, මේ රහත්බව පිණිස අනෙකක් නැතැ ' යි යම් ඥණයකින් දනගනී ද, මේ අනුත්පාදඥාන අනුප්පාදෙ ඤාණ) නම් වේ. මේ ඥානද්වය අඤ්ඤතාවින්ද්‍රිය යි. එහි යම් අනඤ්ඤ තඤ්ඤස්සාමීතින්ද්‍රියයකුත් යම් අඤ්ඤින්ද්‍රියයකුත් ඇද්ද මේ ඉන්ද්‍රිය දෙක අග්‍රඵල වූ අර්හත්වයට පැමිණෙන්නහුට නිරුද්ධ වෙයි. එහි යම් ක්ෂයඥානයකුත් යම් අනුත්පාද

අනුප්පාදෙ ඤාණං ඉමානි ද්වෙ ඤාණානි එකා පඤ්ඤා, අපි ච ආරම්මණසඞ්කෙතෙන ද්වෙ නාමානි ලභන්ති: ඛීණා මෙ ජාතීති පජානන්තස්ස ඛයෙ ඤාණන්ති නාමං ලභති; නාපරං ඉත්ථත්තායාති පජානන්තස්ස අනුප්පාදෙ ඤාණන්ති නාමං ලභති. සා පජානනට්ඨෙන පඤ්ඤා යථාදිට්ඨං අපිලාපනට්ඨෙන සති.

තත්ථ යෙ පඤ්චුපාදානක්ඛන්ධා ඉදං නාමරූපං. තත්ථ යෙ ඵස්සපඤ්චමකා ධම්මා ඉදං නාමං, යානි පඤ්චින්ද්‍රියානි රූපානි ඉදං රූපං, තදුභයං නාමරූපං විඤ්ඤාණසම්පයුත්තං. තස්ස නිරොධං භගවන්තං පුච්ඡන්තො ආයස්මා අජිතො පාරායනෙ එවමාහ.

9. "පඤ්ඤා චෙව සතී ච (ඉච්චායස්මා අජිතො) නාමරූපඤ්ච මාරිස,
එතං මෙ පුට්ඨො පබ්රූහි කත්ථෙ'තං උපරුජ්ඣතී"ති.

තත්ථ සති ච පඤ්ඤා ච චත්තාරි ඉන්ද්‍රියානි, සති ද්වෙ ඉන්ද්‍රියානි: සතින්ද්‍රියං ච සමාධින්ද්‍රියං ච, පඤ්ඤා ද්වෙ ඉන්ද්‍රියානි: පඤ්ඤින්ද්‍රියං ච විරියින්ද්‍රියං ච යා ඉමෙසු චතූසු ඉන්ද්‍රියෙසු සද්දහනා ඔකප්පනා ඉදං සද්ධින්ද්‍රියං.

තත්ථ යා සද්ධාධිපතෙය්‍යා චිත්තෙකග්ගතා අයං ඡන්දසමාධි, සමාහිතෙ චිත්තෙ කිලෙසානං වික්ඛම්භනතාය පටිසඞ්ඛානබලෙන වා භාවනාබලෙන වා ඉදං පහානං[1], තත්ථ යෙ අස්සාසපස්සාසා විතක්කවිචාරා සඤ්ඤාවෙදයිතා සරසඞ්කප්පා ඉමෙ සඞ්ඛාරා, ඉති පුරිමකො ච ඡන්දසමාධි කිලෙසවික්ඛම්භනතාය ච පහානං ඉමෙ ච සඞ්ඛාරා, තදුභයං ඡන්දසමාධිපධානසංඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං.

තත්ථ යා විරියාධිපතෙය්‍යා චිත්තෙකග්ගතා අයං විරියසමාධි-පෙ- තත්ථ යා චිත්තාධිපතෙය්‍යා චිත්තෙකග්ගතා අයං චිත්තසමාධි-පෙ- තත්ථ යා වීමංසාධිපතෙය්‍යා චිත්තෙකග්ගතා, අයං වීමංසාසමාධි, සමාහිතෙ චිත්තෙ කිලෙසානං වික්ඛම්භනතාය පටිසඞ්ඛානබලෙන වා භාවනාබලෙන වා ඉදං පහානං, තත්ථ යෙ අස්සාසපස්සාසා විතක්කවිචාරා සඤ්ඤාවෙදයිතා සරසඞ්කප්පා ඉමෙ සඞ්ඛාරා. ඉති පුරිමකො ච වීමංසාසමාධි කිලෙසවික්ඛම්භනතාය ච පහානං ඉමෙ ච සංඛාරා, තදුභයං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. සබ්බො සමාධි ඤාණමූලකො ඤාණපුබ්බඞ්ගමො ඤාණානුපරිවත්තී.

1. පධානං - පු.

ඥානයකුත් ඇද්ද මේ ඥානද්වය එක් ප්‍රඥාවකි. තවද (ඛයෙ අනුප්පාදෙ යන) ආලම්බන සංඥායෙන් නම් දෙකක් ලැබෙති. ' මාගේ ජාති ක්ෂය වූ යැ' යි දන්නාහුට ' ඛයෙ ඤාණ ' යන නාමය ලැබෙයි. ' මේ අර්හත්වය පිණිස කළයුතු අනෙකක් නැතැ ' යි දන්නාහුට ' අනුප්පාදෙ ඤාණ ' යන නාමය ලැබෙයි. (යට ශ්‍රොතසුත්ගේ පිධානයයි කී යම් ප්‍රඥාවක් ඇද්ද) ඕ ප්‍රජානනස්වභාවයෙන් ' පඤ්ඤා ' නමු. අවගාහනාර්ත්ථයෙන් ' සති ' නම් වූ යැයි.

එහි යම් පඤ්චොපාදනස්කන්ධ කෙනෙක් ඇද්ද මේ නාමරූප යි. ඒ නාමරූප දෙක්හි යම් ඵස්සපඤ්චමක වූ ධර්මකෙනෙක් ඇද්ද මේ නාම යැ, යම් රූපී වූ පඤ්චින්ද්‍රිය කෙනෙක් ඇද්ද මේ රූප යි. ඒ උභයනාමරූපය විඥානය හා සම්ප්‍රයුක්ත යැ. ඒ නාම රූපයාගේ නිරොධය භාග්‍යවතුන් වහන්සේගෙන් පුළුවුස්නා ආයුෂ්මත් අජිතතෙරණුවෝ පාරායනයෙහි මෙසේ පුළුවුත්හ :

9. ' පඤ්ඤා චෙව සතී ච — පෙ — '' (යට ව්‍යාඛ්‍යාත යි.)

එහි සති හා පඤ්ඤා හා සතර ඉඳුරෝ යැ, ' සති ' ඉන්ද්‍රිය දෙකෙකි : සතින්ද්‍රිය හා සමාධින්ද්‍රිය හා යැ. ' පඤ්ඤා ' ඉන්ද්‍රිය දෙකෙකි : පඤ්ඤින්ද්‍රිය හා විරියින්ද්‍රිය හා යි. මේ සතර ඉන්ද්‍රියයන්හි යම් හැදෑහීමෙක් බැසගෙන සිටීමෙක් ඇද්ද මේ සද්ධින්ද්‍රිය යි.

එහි ශ්‍රද්ධා අධිපති කොට ඇති යම් චිත්තෛකාග්‍රතාවක් ඇද්ද මේ ඡන්දසමාධි යැ, විදර්ශනාසමාධියෙන් සිත සමාහිත කල්හි ප්‍රත්‍යවෙක්ෂාබලයෙන් හෝ භාවනාබලයෙන් හෝ කෙලෙසුන් විෂ්කම්භණ (යටපත්) වනබැවින් මේ ප්‍රහාණ යැ. එහි යම් ආස්වාස ප්‍රස්වාස කෙනෙක් විතර්කවිචාර කෙනෙක් සංඥාවෙදයිත කෙනෙක් සරසංකල්ප කෙනෙක් වෙද්ද මොහු සංස්කාරයෝ යි. මෙසේ පූර්ව වූ ඡන්දසමාධිය ද ක්ලේශවිෂ් කම්භණතායෙන් ප්‍රහාණය ද මේ (අස්සාසපස්සාසාදි) සංස්කාරයෝ ද යන (ඡන්දසමාධි යඞ්ඛ්‍යාත වූ ද ප්‍රධානසඞ්ඛාර සඞ්ඛ්‍යාත වූ ද වීර්‍ය්‍යය යන) ඒ දෙවැදෑරුම් වූ තදඞ්ගාදි විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ (ක්ලේශපරිත්‍යාග නිර්වාණප්‍රස්කන්දන සංඛ්‍යාත දෙවැදෑරුම්) වොස්සග්ගයට පිරිනැමෙන ඍද්ධිපාදය වඩයි.

එහි වීර්‍ය්‍යය අධිපති කොට ඇති යම් චිත්තෛකාග්‍රතාවක් ඇද්ද, මේ වීර්‍ය්‍ය සමාධි යැ, . . . එහි චිත්තය අධිපති කොට ඇති යම් චිත්තෛකාග්‍රතාවක් ඇද්ද, මේ චිත්තසමාධි යැ, . . . එහි විමංසාව අධිපති කොට ඇති යම් චිත්තෛකාග්‍රතාවක් ඇද්ද, මේ විමංසා සමාධි යැ විදර්ශනාසමාධියෙන් සිත සමාහිත කල්හි ප්‍රත්‍යවෙක්ෂාබලයෙන් හෝ භාවනාබලයෙන් හෝ කෙලෙසුන් විෂ්කම්භණ වනබැවින් මේ ප්‍රහාණ යැ, එහි යම් ආස්වාස ප්‍රාස්වාස කෙනෙක් විතර්කවිචාර කෙනෙක් සංඥාවෙදයිත කෙනෙක් සරසංකල්ප කෙනෙක් වෙද්ද, මොහු සංස්කාරයෝ යි. මෙසේ පූර්ව වූ විමංසාසමාධිය ද ක්ලෙශවිෂ්කම්භණතායෙන් ප්‍රහාණය ද මේ (අස්සාසපස්සාසාදි) සංස්කාරයෝ ද යන (විමංසාසමාධිසංඛ්‍යාත වූ ද පධානසංඛාර සංඛ්‍යාත වූ ද වීර්‍ය්‍යය යන) ඒ දෙවැදෑරුම් වූ තදඞ්ගාදි විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ ක්ලේශ පරිත්‍යාග නිර්වාණප්‍රස්කන්දන සංඛ්‍යාත වොස්සග්ගයට පිරිනැමෙන ඍද්ධිපාදය වඩයි. (සමාධිඥානමූලක වූයේ හුදු විමංසාසමාධිය මැ මතු නොවැ) සියලු මැ සමාධිය (පූර්වභාගප්‍රඥායෙන්) ඥානමූලක යැ. හුදු (උපචාරප්‍රඥායෙන්) ඥානපූර්වඞ්ගම යැ, (අපර්ණප්‍රඥායෙන්) ඥානානුපරිවර්ති වේ.

10. යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ,
යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා.

ඉති විවටෙන චෙතසා අපරියොනද්ධෙන සප්පභාසං චිත්තං භාවෙති. පඤ්චින්ද්‍රියානි කුසලානි චිත්තසහභූනි චිත්තෙ උප්පජ්ජමානෙ උප්පජ්ජන්ති, චිත්තෙ නිරුජ්ඣමානෙ නිරුජ්ඣන්ති. නාමරූපං ච විඤ්ඤාණහෙතුකං විඤ්ඤාණපච්චයනිබ්බත්තං. තස්ස මග්ගෙන හෙතු උපච්ඡින්නො, විඤ්ඤාණං අනාහාරං අනභිනන්දිතං අප්පතිට්ඨිතං අප්පටිසන්ධිකං, තං නිරුජ්ඣති, නාමරූපම්පි අහෙතුකං අප්පච්චයං පුනබ්භවං න නිබ්බත්තයති, එවං විඤ්ඤාණස්ස නිරොධා පඤ්ඤා ච සති ච නාමරූපඤ්ච නිරුජ්ඣති. තෙනාහ භගවා :

11. "යමෙතං පඤ්හං අපුච්ඡි අජිත තං වදාමි තෙ,
යත්ථ නාමං ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති,
විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙ'තං උපරුජ්ඣතී"ති.

12. "යෙ ච සඞ්ඛාතධම්මාසෙ (ඉච්චායස්මා අජිතො)
යෙ ච සෙඛා පුථූ ඉධ,
තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්රූහි මාරිසා"ති

ඉමානි තීණි පදානි පුච්ඡිතානි. තෙ තයො පඤ්හා, කිස්ස : සෙඛාසෙඛවිපස්සනාපුබ්බඞ්ගමපහානයොගෙන. එවඤ්හි ආහ : "යෙ ච සඞ්ඛාතධම්මාසෙ"ති අරහන්තානං[1] පුච්ඡති. "යෙ ච සෙඛා පුථූ ඉධා"ති සෙඛං පුච්ඡති. "තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්රූහි මාරිසා"ති විපස්සනාපුබ්බඞ්ගමං පහානං පුච්ඡති. තත්ථ විස්සජ්ජනා :

13. "කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය (අජිතාති භගවා)
මනසා නාවිලො සියා,
කුසලො සබ්බධම්මානං සතො භික්ඛු පරිබ්බජෙ"ති.

භගවතො සබ්බං කායකම්මං ඤාණපුබ්බඞ්ගමං ඤාණානුපරිවත්ති, සබ්බං වචීකම්මං ඤාණපුබ්බඞ්ගමං ඤාණානුපරිවත්ති, සබ්බං මනොකම්මං ඤාණපුබ්බඞ්ගමං ඤාණානුපරිවත්ති, අතීතෙ අංසෙ අප්පටිහතං ඤාණදස්සනං, අනාගතෙ අංසෙ අප්පටිහතං ඤාණදස්සනං, පච්චුප්පන්නෙ අංසෙ අප්පටිහතං ඤාණදස්සනං.

1. අරහත්තං - සිමු, මජසං.

10. (සමාධිය පූර්වනිවාසානුස්මෘතිඥානානුපරිවර්ති බැවින්) පෙර අතීත ජාතීන්හි ස්කන්ධාදිය යම්සේ දතහැකි වේ ද, එසෙයින් (සමාධිය අනාගතාංශඥානානුපරිවර්ති බැවින්) අනාගතජාතීන්හි ස්කන්ධාදිය දතහැකි වෙයි, (සමාධිය චේතොපරියඥානානුපරිවර්ති බැවින්) අනාගතයෙහි සත්දවසෙක පරසත්ත්වයන්ගේ සිත යම්සේ දතහැකි වේ ද, එසෙයින් අතීතයෙහි සත්දවසෙක පරසත්වයන්ගේ සිත දතහැකි වෙයි, යම්සේ දිවාභාගයෙහි ඇස්ඇති සත්ත්වයනට චක්ෂුර්විඥෙය රූපය සුවිඥෙය ද, එසෙයින් (සමාධිය දිව්‍යචක්ෂුර්ඥානානුපරිවර්ති බැවින්) රාත්‍රියෙහි (චතුරඞ්ගසමන්වාගත අන්ධකාරයෙහිදු නොදක්කහැකි රූපායතනයෙක් නැත, රාත්‍රියෙහි යම්සේ ද එසෙයින් දහවල්හිදු කිසිවකින් පිළිසන්ව ඇති ඉතා සියුම් වූ ද ඉතා දුරු වූ ද රූපය දක්කහැකි වේ.

මෙසේ අභිඥපරිපන්ථ වූ කෙලෙසුන් විසින් නොමඩනාලද විවෘත වූ සිතින් සප්‍රභාස වූ චිත්තය වඩයි. (ශෛක්ෂයාගේ ඍද්ධිපාදසංයුක්ත වූ) චිත්තය සමග උපන් කුශල වූ පඤ්චෙන්ද්‍රියයෝ සිත උපදනා කල්හි උපදිති, සිත නිරුද්ධ වන කල්හි නිරුද්ධ වෙත්. විඥනය හෙතු කොටඇති විඥනප්‍රත්‍යයෙන් උපන් නාමරූපය ද (එසේ ම) නිරුද්ධ වේ. ඒ විඥනයාගේ (තෘෂ්ණා අවිද්‍යාදි) හේතුව මාර්ගයෙන් නසනලද වෙයි. විඥනය අනාහාර වූයේ තෘෂ්ණාඅභිනන්දනා රහිත වූයේ ප්‍රාර්ථනා රහිත වූයේ (එහෙයින් ම) අප්‍රතිසන්ධික වූයේ එය නිරුද්ධ වෙයි. නාමරූපය ද අහේතුක වූයේ අප්‍රත්‍යය වූයේ පුනර්භවය නූපදවයි. මෙසේ (චරිම) විඥනයාගේ නිරොධයෙන් ප්‍රඥව ද ස්මෘතිය ද නාමරූපය ද නිරුද්ධ වේ.

එයින් වදළහ : බුදුහු —

11. '' යමෙතං පඤ්හං අපුච්ඡි — පෙ — උපරුජ්ඣති.'' (යට ව්‍යාඛ්‍යාත යි.)

12. (ආයුෂ්මත් අජිත මෙසේ පුළුවුස්සි :) ' නිදුකාණෙනි, මෙලොවැ (අනිත්‍යාදි විසින්) විමසනලද සංස්කාරධර්ම ඇති යම් රහත් කෙනෙකුත් වෙත් ද, බොහෝ වූ යම් ශෛක්ෂ කෙනෙකුත් වෙත් ද, මා විසින් පුළුවුස්නාලද (ශෛක්ෂාශෛක්ෂධර්මයෙහි) නිපුණ වූ මුඹවහන්සේ ඒ ශෛක්ෂාශෛක්ෂයන්ගේ ප්‍රතිපත් (මට) වදළ මැනැවැ ' යි.

මේ ප්‍රශ්න විසින් පුළුවුස්නාලද පද (වාක්‍ය) තුනෙකි. ඔහු ප්‍රශ්න තුනොකි, කවර හෙයින යත් : ශෛක්ෂයන් ද අශෛක්ෂයන් ද විදර්ශනාපූර්වඞ්ගම ප්‍රහාණයන් ද පුළුවුස්නා විධියෙනි. එසෙයින් මැ කී : '' යෙ ච සඞ්ඛාතධම්මා සෙ '' යි රහත්හු පුළුවුස්සි. '' යෙ ච සෙඛා පුථූ ඉධ '' යි ශෛක්ෂයා පුළුවුස්සි. '' තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්‍රෑහි මාරිස '' යි විදර්ශනාපූර්වඞ්ගම වූ ප්‍රහාණය පුළුවුස්සි. එහි මේ විසඳුම යැ :

13. (අජිත, යි බුදුහු වදරති :) ක්ලේශකාමයෙන් වස්තුකාමයන්හි ගිජු නොවන්නේය, (ව්‍යාපාදවිතර්කාදිය දුරැලමින්) සිතින් නොකැලැඹුණේ වන්නේය (අනිත්‍යාදි විසින් විමංසිත හෙයින්) සියලු දහම්හි කුශල වූ මහණ (කායානුපස්සනාදීන්) ස්මෘතිමත් වැ ඉරියව් පවත්වන්නේය ' යි.

භාග්‍යවතුන් වහන්සේගේ සියලු කායකර්මය ඥනය පෙරදැරි කොට ඇතියේ ඥනය අනුව පවතී, සියලු වාක්කර්මය ඥනපූර්වඞ්ගම යැ, ඥනය අනුව පවතී, සියලු මනඃකර්මය ඥනපූර්වඞ්ගම යැ, ඥනය අනුව පවතී, අතීතාංශයෙහි ඥනදර්ශනය අප්‍රතිහත (අනාවරණ) යැ, අනාගතාංශයෙහි ඥනදර්ශනය අප්‍රතිහත යැ, ප්‍රත්‍යුත්පන්නාංශයෙහි ඥනදර්ශනය අප්‍රතිහත යි.

5—සිපි 04440 (79/08)

කො ච ඤාණදස්සනස්ස පටිඝාතො : යං අනිච්චෙ දුක්ඛෙ අනත්තනියෙ[1] ච අඤ්ඤාණං අදස්සනං, අයං ඤාණදස්සනස්ස පටිඝාතො. යථා ඉධ පුරිසො තාරකරූපානි පස්සෙය්‍ය නො ච ගණනසඞ්ඛෙතෙන ජානෙය්‍ය, අයං ඤාණදස්සනස්ස පටිඝාතො. භගවතො පන අප්පටිහතං ඤාණදස්සනං, අනාවරණඤාණදස්සනා හි බුද්ධා භගවන්තො

තත්ථ සෙඛෙන ද්වීසු ධම්මෙසු චිත්තං රක්ඛිතබ්බං : ගෙධා ච රජනීයෙසු ධම්මෙසු දොසා ච පරියුට්ඨානීයෙසු. තත්ථ යා ඉච්ඡා, මුච්ඡා, පත්ථනා, පිහායනා[2] කීළනා, තං භගවා වාරෙන්තො එවමාහ : “කාමෙසු නාභිගිජ්ඣෙය්‍යා”ති.

“මනසා නාවිලො සියා”ති පරියුට්ඨානවිඝාතං ආහ.

තථා හි : සෙඛො අභිගිජ්ඣන්තො අනුප්පන්නං ච කිලෙසං උප්පාදෙති උප්පන්නං ච කිලෙසං ඵාතිකරොති යො පන අනාවිලසඞ්කප්පො අනභිගිජ්ඣන්තො වායමති, සො අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, සො උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, සො අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, සො උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීයොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති.

කතමෙ ච අනුප්පන්නා පාපකා අකුසලා ධම්මා : කාමවිතක්කො, ව්‍යාපාදවිතක්කො විහිංසාවිතක්කො, ඉමෙ අනුප්පන්නා පාපකා අකුසලා ධම්මා. කතමෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා : අනුසයා අකුසලමූලානි, ඉමෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා. කතමෙ අනුප්පන්නා කුසලා ධම්මා : යානි සොතාපන්නස්ස ඉන්ද්‍රියානි, ඉමෙ අනුප්පන්නා කුසලා ධම්මා. කතමෙ උප්පන්නා කුසලාධම්මා : යානි අට්ඨමකස්ස ඉන්ද්‍රියානි ඉමෙ උප්පන්නා කුසලා ධම්මා, යෙන කාමවිතක්කං වාරෙති ඉදං සතින්ද්‍රියං, යෙන ව්‍යාපාදවිතක්කං වාරෙති ඉදං සමාධින්ද්‍රියං, යෙන විහිංසාවිතක්කං වාරෙති ඉදං විරියින්ද්‍රියං, යෙන උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති ඉදං පඤ්ඤින්ද්‍රියං, යා ඉමෙසු චතූසු ඉන්ද්‍රියෙසු සද්දහනා ඔකප්පනා ඉදං සද්ධින්ද්‍රියං. තත්ථ සද්ධින්ද්‍රියං කත්ථ දට්ඨබ්බං : චතූසු සොතාපත්තිඅඞ්ගෙසු විරියින්ද්‍රියං කත්ථ දට්ඨබ්බං : චතූසු සම්මප්පධානෙසු. සතින්ද්‍රියං කත්ථ දට්ඨබ්බං : චතූසු සතිපට්ඨානෙසු, සමාධින්ද්‍රියං කත්ථ දට්ඨබ්බං චතූසු ඣානෙසු. පඤ්ඤින්ද්‍රියං කත්ථ දට්ඨබ්බං : චතූසු අරියසච්චෙසු. එවං සෙඛො සබ්බෙහි කුසලෙහි ධම්මෙහි අප්පමත්තො වුත්තො භගවතා, අනාවිලතාය මනසා. තෙනාහ භගවා : මනසා නාවිලො සියා”ති.

1. අනත්තානි – මජසං.
2. පියායනා – මජසං.

ඥානදර්ශනයාගේ ප්‍රතිඝාතය (නොපැවැත්ම) කවරෙ යැ : අනිත්‍යයෙහි දුකෙහි අනාත්මයෙහි යම් නොදනුමෙක් නොදක්මෙක් ඇද්ද මෙ ඥානදර්ශනයාගේ නොපැවැත්ම යි. යම්සේ පුරුෂයෙක් තාරකරූපයන් දක්නේ නමුදු ගණන විසින් නොදක්නේය, මෙ ඥානදර්ශනයාගේ නොපැවැත්ම යැ. එකෙකුදුවත් භාග්‍යවතුන් වහන්සේගේ ඥානදර්ශනය අප්‍රතිහත යි. එසේ මැ ය, භාග්‍යවත් බුදුවරයෝ අනාවරණ ඥානදර්ශන ඇත්තාහ.

ඒ විසඳුමෙහි ශෛක්ෂ විසින් දෙතැනෙක්හි සිත රැක්කයුතු යැ : රජනීය (රාගයට කාරණවූ) ධර්මයන්හි තෘෂ්ණායෙන් ද ආඝාතයට කාරණ වූ ධර්මයන්හි ද්වේෂයෙන් ද (යන දෙතැන්හි යැ.) එහි යම් අරමුණු කැමැතිවන ඉච්ඡායෙක් මුසපත්විමෙන් ප්‍රාර්ථනායෙක් ආශායෙක් ලාලනයෙක් ඇද්ද, බුදුහු එය වළහනසේක් ' කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය 'යි වදළහ.

මනසා නාවිලො සියා ' යි ආඝාතයා ගේ නොපැවැත්ම වදළහ. ඒ එසේ මැය: ශෛක්ෂ (කාමවස්තූන්හි) ගිජුවූයේ නූපන් කෙලෙස් උපදවයි, උපන් ක්ලේශයන් දියුණු කෙරෙයි. වැලි යමෙක් ව්‍යාපාදයෙන් නොකැලැඹුණු සිත්ඇති ව ගිජු නොවෙමින් වෑයම් කෙරේ ද, හේ නූපන් ලාමක අකුශල ධර්මයන් නූපදනා පිණිස කුශලච්ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි. කායික චෛතසික වීර්‍ය්‍යය කෙරෙයි. සිත නඟාසිටුවයි, ප්‍රධන්වීර්‍ය්‍යය කෙරෙයි. හේ උපන් ලාමක අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලච්ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්‍ය්‍යාරම්භ කෙරෙයි, සිත දැඩිවගනී. ප්‍රධන්වීර්‍ය්‍යය කෙරෙයි. හේ නූපන් කුශලධර්මයන් උපදනා පිණිස ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්‍ය්‍යාරම්භ කෙරෙයි, සිත නඟා සිටුවයි, ප්‍රධන්වීර්‍ය්‍යය කෙරෙයි. හේ උපන් කුශලධර්මයන්ගේ ස්ථිතියට නොනැසීමට බහුලත්වයට විපුලත්වයට වැඩීමට පරිපූරණයට ඡන්දය උපදවයි, වෑයම් කෙරෙයි, වීර්‍ය්‍යාරම්භ කෙරෙයි, සිත නඟාසිටුවයි, ප්‍රධන්වීර්‍ය්‍යය කෙරේ.

යළි නූපන් ලාමක අකුශලධර්මයෝ කවරහ : කාමවිතර්ක යැ, ව්‍යාපාදවිතර්ක යැ, විහිංසාවිතර්ක යැ, මොහු නූපන් ලාමක අකුශලධර්මයෝ යි. උපන් ලාමක අකුශල ධර්මයෝ කවරහ : අනුසය වූ අකුසලමූලයෝ යැ, මොහු උපන් ලාමක අකුශල ධර්මයෝ යි. නූපන් කුශලධර්මයෝ කවරහ : ශ්‍රොතාපන්නයාගේ යම් ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය කෙනෙක් ඇද්ද, මොහු නූපන් කුශලධර්මයෝ යි. උපන් කුශලධර්මයෝ කවරහ : (සෝවාන්පල පසක්කිරීමට පිළිපන්) අෂ්ටමකයාගේ යම් ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය කෙනෙක් ඇද්ද, මොහු උපන් කුශලධර්මයෝ යි. යම් සතිපට්ඨානභාවනායෙකින් කාමවිතර්කය වළහා ද, මෙ ' සතින්ද්‍රිය ' යි. යම් අවික්ෂේපයෙකින් ව්‍යාපාදවිතර්කය වළහා ද, මෙ ' සමාධීන්ද්‍රිය ' යි. යම් වීර්‍ය්‍යයෙකින් විහිංසාවිතර්කය වළහා ද, මෙ ' විරියින්ද්‍රිය ' යි. යම් ප්‍රඥායෙකින් උපනුපන් ලාමක අකුශලධර්මයන් දුරු කෙරේ ද, බැහැර කෙරේ ද, විගතාන්ත කෙරේ ද, අනාභාවයට පමුණුවා ද, නො ඉවසා ද, මෙ ' පඤ්ඤින්ද්‍රිය ' යි. මෙ සති ආදි සතර ඉන්ද්‍රියයන්හි යම් හැදහීමෙක් බැසගැනීමෙක් ඇද්ද මෙ ' සද්ධින්ද්‍රිය ' යි. එහි සද්ධින්ද්‍රිය කොහි දතයුතු ද යත් : සතර ශ්‍රොතාපත්තිඅඞ්ගයෙහි දතයුතු යැ, විරියින්ද්‍රිය කොහි දතයුතු ද යත් : සතර සම්‍යක්ප්‍රධානයෙහි දතයුතු යැ, සතින්ද්‍රිය කොහි දතයුතු ද යත් : සතර සතිපට්ඨානයෙහි දතයුතු යැ, සමාධින්ද්‍රිය කොහි දතයුතු ද යත් : සතර ධ්‍යානයෙහි දතයුතු යැ, පඤ්ඤින්ද්‍රිය කොහි දතයුතු ද යත් : සතර ආර්‍ය්‍යසත්‍යයෙහි දතයුත්තේ යි. මෙසේ ශෛක්ෂ සියලු කුශලධර්මයන්ගෙන් (සමන්විත වූයේ) භාග්‍යවතුන් විසින් අප්‍රමත්ත වූයේ වනැයි වදරනලද්දේය, සිතින් අනාවිල බැවිනි. එයින් වදළහ, බුදුහු — '' මනසා නාවිලො සියා '' යි,

"කුසලො සබ්බධම්මාන"න්ති ලොකො නාම තිවිධො: කිලෙසලොකො භවලොකො ඉන්ද්‍රියලොකො. තත්ථ කිලෙසලොකෙන භවලොකො සමුදාගච්ඡති, සො ඉන්ද්‍රියානි නිබ්බත්තෙති, ඉන්ද්‍රියෙසු භාවියමානෙසු නෙය්‍යස්ස පරිඤ්ඤා භවති. සා දුවිධෙන උපපරික්ඛිතබ්බා: දස්සනපරිඤ්ඤාය ච භාවනාපරිඤ්ඤාය ච. යදා හි සෙඛො ඤෙය්‍යං පරිජානාති තදා නිබ්බිදාසහගතෙහි සඤ්ඤාමනසිකාරෙහි නෙය්‍යං පරිඤ්ඤාතං භවති. තස්ස ද්වෙ ධම්මා කොසල්ලං ගච්ඡන්ති: දස්සනකොසල්ලඤ්ච භාවනාකොසල්ලඤ්ච.

තං ඤාණං පඤ්චවිධෙන වෙදිතබ්බං: අභිඤ්ඤා පරිඤ්ඤා පහානං භාවනා සච්ඡිකිරියා. තත්ථ කතමා අභිඤ්ඤා: යං ධම්මානං සලක්ඛණෙ[1] ඤාණං ධම්මපටිසම්භිදා අත්ථපටිසම්භිදා ච, අයං අභිඤ්ඤා. තත්ථ කතමා පරිඤ්ඤා: එවං අභිජානිත්වා යා පරිජානනා ඉදං කුසලං ඉදං අකුසලං ඉදං සාවජ්ජං ඉදං අනවජ්ජං ඉදං කණ්හං ඉදං සුක්කං ඉදං සෙවිතබ්බං ඉදං න සෙවිතබ්බං, ඉමෙ ධම්මා එවං ගහිතා ඉදං ඵලං නිබ්බත්තෙන්ති තෙසං එවං ගහිතානං අයං අත්ථොති, අයං පරිඤ්ඤා. එවං පරිජානිත්වා තයො ධම්මා අවසිට්ඨා භවන්ති: පහාතබ්බා භාවෙතබ්බා සච්ඡිකාතබ්බා ච. තත්ථ කතමෙ ධම්මා පහාතබ්බා; යෙ අකුසලා. තත්ථ කතමෙ ධම්මා භාවෙතබ්බා; යෙ කුසලා. තත්ථ කතමෙ ධම්මා සච්ඡිකාතබ්බා; යං අසඞ්ඛතං.[2], යො එවං ජානාති, අයං වුච්චති අත්ථකුසලො ධම්මකුසලො කල්‍යාණතාකුසලො ඵලතාකුසලො ආයකුසලො අපායකුසලො උපායකුසලො මහතා කොසල්ලෙන සමන්නාගතොති. තෙනාහ භගවා: "කුසලො සබ්බධම්මාන"න්ති.

"සතො භික්ඛු පරිබ්බජෙ"ති තෙන දිට්ඨධම්මසුඛවිහාරත්ථං අභික්කන්තෙ පටික්කන්තෙ ආලොකිතෙ විලොකිතෙ සම්මිඤ්ජිතෙ[3] පසාරිතෙ සඞ්ඝාටිපත්තචීවරධාරණෙ අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ උච්චාරපස්සාවකම්මෙ ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සතෙන සම්පජානෙන විහාතබ්බං. ඉමා ද්වෙ චරියා අනුඤ්ඤාතා භගවතා: එකා විසුද්ධානං එකා විසුජ්ඣන්තානං. කෙ විසුද්ධා: අරහන්තො, කෙ විසුජ්ඣන්තා: සෙඛා. කතකිච්චානි හි අරහතො ඉන්ද්‍රියානි.

යං බොජ්ඣං තං චතුබ්බිධං: දුක්ඛස්ස පරිඤ්ඤාභිසමයෙන, සමුදයස්ස පහානාභිසමයෙන, මග්ගස්ස භාවනාභිසමයෙන, නිරොධස්ස සච්ඡිකිරියාභිසමයෙන, ඉදං චතුබ්බිධං බොජ්ඣං. යො එවං ජානාති අයං වුච්චති සතො අභික්කමති සතො පටික්කමති ඛයා රාගස්ස ඛයා දොසස්ස ඛයා මොහස්ස. තෙනාහ භගවා: "සතො භික්ඛු පරිබ්බජෙ"ති. තෙනාහ:

14. "කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය (අජිතාති භගවා) මනසානාවිලො සියා,
කුසලො සබ්බධම්මානං සතො භික්ඛුපරිබ්බජෙ"ති.

---

1. සලක්ඛණෙ - සීමු.
2. යා අසංඛතාධාතු - අ.
3. සමිඤ්ජිතෙ - මජසං

" කුසලො සබ්බධම්මානං " යනු : ලෝකය නම් ත්‍රිවිධ වෙයි, ක්ලේශලෝක ය. භවලෝක යැ ඉන්ද්‍රියලෝක යි. එහි (කාමාවචරධර්ම සංඛ්‍යාත) ක්ලේශලෝකය නිසා (රූපාරූපධර්ම සංඛ්‍යාත) භවලෝකය පහළවෙයි. (මහද්ගත ධර්මයන්හි සිටි) හෙතෙම ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් උපදවයි. ඉන්ද්‍රියයන් වඩනුලබන කල්හි ඥෙයධර්මයාගේ පරිඥාව වෙයි. ඒ පරිඥාව දෙපරිද්දෙකින් විමසියයුත්තීය : දර්ශනපරිඥායෙන් ද භාවනාපරිඥායෙන් ද යන දෙකිනි. ඒ මෙසේ යැ : යම් කලෙක ශෛක්ෂපුද්ගල දතයුත්ත දනාගනී ද, එකල්හි නිර්වෙදසහගත වූ සංඥාමනස්කාරයන්ගෙන් ඥෙයය පරිඥාත වෙයි. ඔහුට ධර්මයෝ දෙදෙනෙක් කෞශල්‍යයට යෙති : දර්ශනකෞශල්‍යය ද භාවනාකෞශල්‍යය ද යන දෙකයි.

ඒ ඥානය පස් පරිද්දෙකින් දතයුතු යැ : අභිඤ්ඤා යැ පරිඤ්ඤා යැ පහාන යැ භාවනා යැ සච්ඡිකිරියා යි. එහි අභිඤ්ඤා කවර යැ : රූපාරූපධර්මයන්ගේ කර්කශත්වාදි ස්වලක්ෂණයෙහි යම් ඥානයක් ඇද්ද එය ධම්මපටිසම්භිදත් අර්ථපටිසම්භිදත් වෙයි. මෙ 'අභිඤ්ඤා ' යි. එහි පරිඤ්ඤා කවර යැ : මෙසේ අභිජානනය කොට මේ කුශල යැ මේ අකුශල යැ මේ සාවද්‍ය යැ මේ අනවද්‍ය යැ මේ කෘෂ්ණධර්ම යැ මේ ශුක්ලධර්ම යැ මේ සේවිතව්‍ය යැ මේ න සේවිතව්‍ය යැ මේ දහම්හු මෙසේ (අනිත්‍යාදීන් කලාපසම්මර්ශනාදි විසින්) ගන්නා ( — සම්මර්ශන කරන) ලද්දහු මේ උදයව්‍යයඥානාදි) ඵලය (පරිපාටීන්) උපදවති, මෙසේ ප්‍රවර්තිත වූ ඒ උදයව්‍යයඥානාදීන්ගේ මේ (සත්‍ය ප්‍රතිවෙධ සංඛ්‍යාත) අර්ථය යි (අනිත්‍යාදි විසින්) යම් දැනීමක් ඇද්ද, මෙ ' පරිඤ්ඤා ' යි. මෙසේ පරිජානනය කොට ප්‍රහාතව්‍යයෝ ද භාවිතව්‍යයෝ ද සාක්ෂාත් කර්තව්‍යයෝ ද යන තුන් ධර්මයෝ අවශිෂ්ට වූවාහු වෙත්. එහි ප්‍රහාතව්‍යධර්මයෝ කවරහ : අකුශල වූ (සමුදයපාක්ෂික) යම් ධර්ම කෙනෙක් ඇද්ද, ඔහු යැ. එහි භාවිතව්‍යධර්මයෝ කවරහ : කුශල වූ (සම්මාදිට්ඨි ආදි) යම් මාර්ගධර්ම කෙනෙක් ඇද්ද ඔහු යැ, එහි සාක්ෂාත්කර්තව්‍ය ධර්මයෝ කවරහ : යම් අසංඛත වූ නිවනක් ඇද්ද එය යි. යමෙක් මෙසේ දනාගනී ද, මෙතෙම ප්‍රත්‍යයොත්පන්න අර්ථයෙහි (පාළිඅර්ථයෙහි හෝ) කුශල යැ ප්‍රත්‍යයධර්මයෙහි (පාළිධර්මයෙහි හෝ) කුශල යැ කල්‍යාණතා — සතරනයෙහි (දෙශනායුක්තියෙහි හෝ) කුශල යැ අර්හත්ඵලයෙහි කුශල යැ ආය — වෘද්ධියෙහි කුශල යැ අපාය — හානියෙහි කුශල යැ උපායයෙහි කුශල යැ මහත් වූ කෞශල්‍යයෙන් යුක්ත යැ යි කියනු ලැබේ. එයින් වදළහ, බුදුහු — " කුසලො සබ්බධම්මානං " යී.

" සතො භික්ඛු පරිබ්බජෙ " යනු : ඒ අශෛක්ෂ මහණහු විසින් ඉභාත්මසුව විහරණය සඳහා ඉදිරියට යැමෙහි පෙරළා ඊමෙහි ඉදිරිය බැලීමෙහි අනුදික් බැලීමෙහි (අත්පා ආදිය) හැකිළීමෙහි දිගුකිරීමෙහි සඟළපාසිවුරු දැරීමෙහි වැළඳීමෙහි පීමෙහි කෑමෙහි රසවිඳීමෙහි මලමුකිසෙහි ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදිවැරීමෙහි බිණීමෙහි නොබැණ සිටීමෙහි සිහි ඇතියහු සම්‍ප්‍රඥාන ඇතියහු වාස කළයුතු. භාග්‍යවතුන් විසින් මේ වයසීා දෙකක් අනුදත්නාලදහ : එකක් විශුද්ධ වූ අශෛක්ෂයන්ගේ යැ, එකක් විශුද්ධ වන ශෛක්ෂයන්ගේ යි. විශුද්ධයෝ කවරහ : රහත්හු යැ, විශුද්ධ වන්නාහු කවරහ : ශෛක්ෂයෝ යි. රහත්හුගේ (ශ්‍රද්ධාදි) ඉන්ද්‍රියයෝ කෘතකෘත්‍යයෝ මැයි.

අවබොධ කටයුතු යමක් ඇද්ද ඒ බොද්ධව්‍යය චතුර්විධ යැ : දුඃඛසත්‍යය පරිඥාභිසමයෙනැ, සමුදයසත්‍යය ප්‍රහාණාභිසමයෙනැ, මාර්ගසත්‍යය භාවනාභිසමයෙනැ, නිරොධ සත්‍යය සාක්ෂාත්ක්‍රියාභිසමයෙනැයි. මේ චතුර්විධ බොද්ධව්‍යය යමෙක් මෙසේ දන ගනී ද, මේ අශෛක්ෂ (ස්මෘති විපුලත්වයට පැමිණියේ) රාගය ක්ෂය විමෙන් ද්වෙෂය ක්ෂය විමෙන් මොහය ක්ෂය විමෙන් සිහිඇති වැ ඉදිරියට යයි, සිහිඇති වැ පෙරළා එයි. එයින් වදළහ, බුදුහු : " සතො භික්ඛු පරිබ්බජෙ " යී. එයින් වදළහ :

14. කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය — පෙ — සතො භික්ඛු පරිබ්බජෙ " යී.

එවං පුච්ඡිතබ්බං එවං විස්සජ්ජිතබ්බං සුත්තස්ස ච අනුගීති අත්ථතො ච බ්‍යඤ්ජනතො ච සමානයිතබ්බා[1] අත්ථාපගතං හි බ්‍යඤ්ජනං සම්ඵප්පලාපං භවති. දුන්නික්ඛිත්තස්ස පදබ්‍යඤ්ජනස්ස අත්ථොපි දුන්නයො භවති. තස්මා බ්‍යඤ්ජනුපෙතං[2] සඞ්ගායිතබ්බං සුත්තං ච පවිචිනිතබ්බං කිං ඉදං සුත්තං ආහච්චවචනං අනුසන්ධිවචනං නීතත්ථං නෙය්‍යත්ථං සංකිලෙසභාගියං වාසනාභාගියං නිබ්බෙධභාගියං අසෙඛභාගියං, කුහිං ඉමස්ස සුත්තස්ස සබ්බානි සච්චානි පස්සිතබ්බානි, ආදිමජ්ඣපරියොසානෙ'ති. එවං සුත්තං පවිචෙතබ්බං.

තෙනාහ ආයස්මා මහාකච්චානො: "යං පුච්ඡිතං ච විස්සජ්ජිතඤ්ච සුත්තස්ස යා ච අනුගීතී"ති ත

නියුත්තො විචයො හාරො.

## 3. 1. 3

## යුත්තිහාරවිභඞ්ගො

තත්ථ කතමො යුත්තිහාරො: "සබ්බෙසං හාරානන්ති" අයං යුත්තිහාරො. කිං යොජෙති[3]: චත්තාරො මහාපදෙසා: බුද්ධාපදෙසො සඞ්ඝාපදෙසො සම්බහුලත්ථෙරපදෙසො එකත්ථෙරපදෙසො: ඉමෙ චත්තාරො මහාපදෙසා. තානි පදබ්‍යඤ්ජනානි සුත්තෙ ඔතාරයිතබ්බානි, විනයෙ සන්දස්සයිතබ්බානි, ධම්මතායං උපනික්ඛිපිතබ්බානි. කතමස්මිං සුත්තෙ ඔතාරයිතබ්බානි: චතූසු අරියසච්චෙසු. කතමස්මිං විනයෙ සන්දස්සයිතබ්බානි: රාගවිනයෙ දොසවිනයෙ මොහවිනයෙ. කතමියං[4] ධම්මතායං උපනික්ඛිපිතබ්බානි: පටිච්චසමුප්පාදෙ. යදි චතූසු අරියසච්චෙසු අවතරති කිලෙසවිනයෙ සන්දිස්සති ධම්මතඤ්ච න විලොමෙති, එවං ආසවෙ න ජනෙති. චතූහි මහාපදෙසෙහි යං යං යුජ්ජති යෙන යෙන යුජ්ජති යථා යථා යුජ්ජති තං තං ගහෙතබ්බං.

පඤ්හං පුච්ඡිතෙන කති පදානි පඤ්හොති පදසො පරියොගාහිතබ්බං විචෙතබ්බං. යදි සබ්බානි පදානි එකං අත්ථං අභිවදන්ති, එකො පඤ්හො. අථ චත්තාරි පදානි එකං අත්ථං අභිවදන්ති, එකො පඤ්හො. අථ තීණි පදානි එකං අත්ථං අභිවදන්ති, එකො පඤ්හො. අථ ද්වෙ පදානි එකං අත්ථං අභිවදන්ති, එකො පඤ්හො. අථ එකං පදං එකං අත්ථං අභිවදති, එකො පඤ්හො. තං උපපරික්ඛමානෙන අඤ්ඤාතබ්බං: කිං ඉමෙ ධම්මා නානත්ථා නානාබ්‍යඤ්ජනා, උදාහු ඉමෙසං ධම්මානං එකො අත්ථො බ්‍යඤ්ජනමෙව නානන්ති. යථා කිං භවෙ? යථා සා දෙවතා භගවන්තං පඤ්හං පුච්ඡති

---

1. සමානෙතබ්බා - මජසං.
2. අත්ථබ්‍යඤ්ජනුපෙතං - සීමු, මජසං,
3. යොජයති - මජසං.
4. කතමිස්සං - මජසං.

මෙසේ ප්‍රශ්න කළයුතු යැ, මෙසේ විසඳියයුතු යැ, යළි සූත්‍රයාගේ (සූත්‍රාන්තරදේශනා සංඛ්‍යාත) අනුගීතිය අර්ථහෙයින් ද ව්‍යඤ්ජනහෙයින් ද (සූත්‍රය හා) සමාන කළයුතු යැ යම්හෙයකින් අර්ථයෙන් අපේත වූ ව්‍යඤ්ජනය සම්ඵප්‍රලාප වේ ද, වරදවා තබනලද පදව්‍යඤ්ජනයාගේ අර්ථයත් පමුණුවාලියැ නොහෙනු වේ ද, එහෙයින් (ස්වභාවනිරුක්ති සංඛ්‍යාත) ව්‍යඤ්ජනයෙන් යුක්ත කොට සඞ්ගායනා කටයුතු. සූත්‍රය ද විමසියැ යුතු යැ : කිමැ මේ සූත්‍රය (සම්මාසම්බුදුන් තමන් වහන්සේ විසින් මැ වදළ) ආහච්චවචන යැ, (ශ්‍රාවකභාෂිත වූ) අනුසන්ධිවචන යැ, නීතාර්ථය යැ, නෙයාර්ථ යැ, සංකිලෙසභාගයෙහි වූයෙකැ, නිර්වෙධභාගයෙහි වූයෙකැ, අශෛක්ෂභාගයෙහි වූයෙකැ, මේ සූත්‍රයාගේ ආදි මධ්‍ය පර්‍ය්‍යවසානයන් කෙරෙහි කොහි ලා දුඃඛාදි සියලු සත්‍යයෝ දක්කයුත්තාහු දැයි මෙසේ සූත්‍රය විමසියැයුත්තේ යි.

එයින් වදළහ, ආයුෂ්මත් මහාකාත්‍යායනස්ථවිරයන් වහන්සේ : යං පුච්ඡිතඤ්ච විස්සජ්ජිතඤ්ච සුත්තස්ස යා ච අනුගීති '' යි.

විචයහාරය යොදනලදී.

## 3. 1. 3

## යුක්තිහාරවිභඞ්ගය

එහි යුක්තිහාරය කවරෙ යැ : සබ්බෙසං හාරානං '' යන මෙ යුක්තිහාර යි. කුමක් යොද යැ යත් : සතර මහාඅපදේසයෝ යි : බුද්ධාපදෙස යැ සඞ්ඝාපදෙස යැ සම්බහුලත්ථෙරාපදෙස යැ, එකත්ථෙරාපදෙස යි. මොහු සතර මහා–අපදෙසයෝ යි. (කිසිවක්හු විසින් එළවනලද සූත්‍රයක හෝ සංවර්ණකයා විසින් සංවර්ණනාවශයෙන් ලබන සූත්‍රයාගේ හෝ) ඒ අර්ථපද ව්‍යඤ්ජනපදයෝ සූත්‍රයෙහි බහාලියැයුත්තාහ විනයෙහි ලා සසඳාලියැයුත්තාහ, ධර්මතායෙහි බස්වාලියැයුත්තාහ. කවර සූත්‍රයෙක අවතරණ කළයුත්තාහ යත් : සතර ආර්‍ය්‍යසත්‍යසූත්‍රයෙහි යැ. කවර විනයෙක සසඳාලියැ යුත්තාහ යත් : රාගවිනයෙහි දෙසවිනයෙහි මොහවිනයෙහි යැ. කවර ධර්මතායෙක බස්වාලියැයුත්තාහ යත් : ප්‍රතීත්‍යසමුත්පාද ධර්මතායෙහි යි. ඉදින් චතුරාර්‍ය්‍යසත්‍යයෙහි බැසැගනී නම්, ක්ලේශවිනයෙහි ලා සැසැඳේ නම්, ධර්මතාවට ද විරුද්ධ නොවේ නම මෙසේ කාමාදි ආශ්‍රවයන් නූපදවා නම්, සතර මහාපදෙසයන් හා යම් යම් අර්ථධර්ම, ජාතයෙක් යෙදේද, යම් යම් කරුණෙකින් යෙදේ ද, යම් යම් ප්‍රකාරයෙකින් යෙදේ ද ඒ ඒ අර්ථධර්මජාතය (සූත්‍රයෙන් නහා සංවර්ණනාවශයෙන්) ගතයුත්තේ යි.

(යුක්ති නිර්ධාරණය දක්වති :)

ප්‍රශ්නයක් පුළුවුස්නාලද කල්හි ඒ ප්‍රශ්නයෙහි කෙතෙක් පද ඇද්ද ' යි පදවශයෙන් පර්‍ය්‍යවගාහනය කළයුතු යැ, විමසිය යුතු යැ : ඉදින් සියලු පදයෝ එක් අර්ථයක් ප්‍රකාශ කෙරෙත් නම් එක් ප්‍රශ්නයෙකි. තවද සතර පද කෙතෙක් එක අර්ථයක් කියත් නම්, එක ප්‍රශ්නයෙකි. පද තුනක් එක අර්ථයක් කියත් නම් එක ප්‍රශ්නයෙකි. පද දෙකක් එක අර්ථයක් කියත් නම් එක ප්‍රශ්නයෙකි. එක පදයෙක් එක අර්ථයක් කියා නම් එක ප්‍රශ්නයෙකි. ඒ ප්‍රශ්නය විමසනුවහු විසින් මෙසේ දතයුතු යැ : කිමැ මේ පාළිධර්මයෝ නානාර්ථ වූවාහු නානාබ්‍යඤ්ජන වූවාහු ද, නොහොත් මෙ ධර්මයන්ගේ අර්ථය එකෙක් ද, බ්‍යඤ්ජන මතුයෙක් නානා (වෙනස්) වී ද ' යි දතයුතු, ඒ කෙබඳු ද යත් : ඒ දෙව් මෙසේ භාග්‍යවතුන් පැන පුළුවුස්සි.

1. "කෙනස්සුබ්භාහතො ලොකො කෙනස්සු පරිවාරිතො,
කෙන සල්ලෙන ඔතිණ්ණො කිස්ස ධූපායිතො සදා"ති

ඉමානි චත්තාරි පදානි පුච්ඡිතානි. තෙ තයො පඤ්හා. කථං ඤායති භගවා හි දෙවතාය විස්සජ්ජෙති.

2. "මච්චුනාබ්භාහතො ලොකො ජරාය පරිවාරිතො,
තණ්හාසල්ලෙන ඔතිණ්ණො ඉච්ඡාධූපායිතො සදා"ති.

තත්ථ ජරා ච මරණඤ්ච ඉමානි ද්වෙ සඞ්ඛතස්ස සඞ්ඛතලක්ඛණානි, ජරායං ඨිතස්ස අඤ්ඤථත්තං මරණං වයො. තත්ථ ජරාය ච මරණස්ස ච අත්ථතො නානත්තං, කෙන කාරණෙන: ගබ්භගතාපි හි මීයන්ති න ච තෙ ජිණ්ණා භවන්ති, අත්ථි ච දෙවානං මරණං න ච තෙසං සරීරානි ජීරන්ති. සක්කතෙව ජරාය පටිකම්මං කාතුං න පන සක්කතෙ මරණස්ස පටිකම්මං කාතුං, අඤ්ඤත්‍රෙව ඉද්ධිමන්තානං ඉද්ධිවිසයා.

යං පනාහ: "තණ්හාසල්ලෙන ඔතිණ්ණො"ති, දිස්සන්ති වීතරාගා ජීරන්තාපි මීයන්තාපි, යදි ච යථා ජරාමරණං එවං තණ්හාපි සියා. එවං සන්තෙ සබ්බෙ යොබ්බනට්ඨාපි විගතතණ්හා සියුං, යථා ච තණ්හා දුක්ඛස්ස සමුදයො, එවං ජරාමරණම්පි සියා දුක්ඛස්ස සමුදයො, න ච සියා තණ්හා දුක්ඛස්ස සමුදයො න හි ජරාමරණං දුක්ඛස්ස සමුදයො, තණ්හා දුක්ඛස්ස සමුදයො, යථා ච තණ්හා මග්ගවජ්ඣා, එවං ජරාමරණම්පි සියා මග්ගවජ්ඣං. ඉමාය යුත්තියා අඤ්ඤමඤ්ඤෙහි කාරණෙහි ගවෙසිතබ්බං.

යදි ච සන්දිස්සති යුත්තිසමාරූළ්හං අත්ථතො ච අඤ්ඤත්තං, බ්‍යඤ්ජනතොපි ගවෙසිතබ්බං: සල්ලාති වා ධූපායනාති වා, ඉමෙසං ධම්මානං අත්ථතො එකත්තං, න හි යුජ්ජති ඉච්ඡාය ච තණ්හාය ච අත්ථතො අඤ්ඤත්තං. තණ්හාය අධිප්පායෙ අපරිපූරමානෙ නවසු අඝාතවත්ථූසු කොධො ච උපනාහො ච උප්පජ්ජති. ඉමාය යුත්තියා ජරාය ච මරණස්ස ච තණ්හාය ච අත්ථතො අඤ්ඤත්තං.

යං පනිදං භගවතා ද්වීහි නාමෙහි අභිලපිතං 'ඉච්ඡා'තිපි 'තණ්හා'තිපි, ඉදං භගවතා බාහිරානං වත්ථූනං ආරම්මණවසෙන ද්වීහි නාමෙහි අභිලපිතං "ඉච්ඡා"තිපි 'තණ්හා'තිපි. සබ්බා හි තණ්හා අජ්ඣොසානලක්ඛණෙන එක ලක්ඛණා, යථා සබ්බො අග්ගි උණ්හත්තලක්ඛණෙන එක ලක්ඛණො, අපි ච උපාදානවසෙන අඤ්ඤමඤ්ඤානි නාමානි ලභති: 'කට්ඨග්ගී'තිපි තිණග්ගී'තිපි 'සකලිකග්ගී'තිපි 'ගොමයග්ගී'තිපි 'ථුසග්ගී'තිපි 'සංකාරග්ගී'තිපි, සබ්බො හි අග්ගි උණ්හත්තලක්ඛණොව, එවං සබ්බා තණ්හා අජ්ඣොසානලක්ඛණෙන එකලක්ඛණා. අපි තු ආරම්මණඋපාදානවසෙන අඤ්ඤමඤ්ඤෙහි නාමෙහි අභිලපිතා: "ඉච්ඡා" ඉතිපි "තණ්හා" ඉතිපි 'සල්ලා' ඉතිපි 'ධූපායනා' ඉතිපි 'සරිතා' ඉතිපි 'විසත්තිකා' ඉතිපි 'සිනෙහො' ඉතිපි 'කිලමථො'

a. දෙවතාසුත්ත - අට්ඨවග්ග

1. ලෝවැසි කවරක්හු විසින් හැමකල්හි අභිහත (නසනුලැබේ) ද ? කුමකින් පරිවෘත (වකුරනුලැබේ) ද ? කවර ශල්‍යයෙකින් අවකීර්ණ (ඇතුළතපිවිසෙනලද) ද ? කිමෙකින් දවනලද ද ? යි.

මේ පුළුවුස්නාලද පද සතරෙකි. ඔහු ප්‍රශ්න තුනෙකි. කෙසේ දත්නාලැබෙයි යත් : මෙසේ යැ — බුදුහු ඒ දෙව්හට මෙසේ විසඳන සේක :

2. මරහු විසින් යත්ලොව හැම කල්හි නසනලද, ජරායෙන් හාත්පසින් වකුරන ලද තෘෂ්ණාශල්‍යයෙන් පිවිසෙනලද, ආශායෙන් දවනලදු ' යි.

එහි ජරාව ද මරණය ද යන මේ දෙක සංඛත (පඤ්චස්කන්ධ)යාගේ සංඛත ලක්ෂණයෝ යැ, ජරායෙහි සිටියහුගේ අන්‍යථාත්ව වූ මරණය ව්‍යය වෙයි. එහි ජරාව ද මරණය ද අර්ථ හෙයින් නානාත්ව වෙයි, කවර කරුණෙන යත් : යම්හෙයෙකින් ගැබ් හොත්තාහු ද මියයෙති, ඔහු ජීර්ණ වූවාහු නො ද වෙත්. තවද දෙවියනට මරණ ඇත, ඔවුන්ගේ සිරුරු නො ද දිරති. ජරාවට පිළියම් කරන්නට ශක්‍ය මැ ය. එතෙකුදුවත් සෘද්ධිමතුන්ගේ සෘද්ධිවිෂය තබා මරණයට පිළියම් කරන්නට නො හැකි වේ.

යළි " තණ්හාසල්ලෙන ඔතිණ්ණො " යී වදළහ. වීතරාගයෝ දිරන්නාහු ද මියන්නාහු ද පැනෙති. ඉදින් ජරාමරණ යම් සේ ද තණ්හාවත් එබඳු වී නම්, එසේ ඇති කල හැම යොවුන්වියෙහි සිටියාහු මැ විගතතෘෂ්ණ වන්නාහ, යම් සේ තණ්හාව දුක්ඛ සමුදය වේ ද, එපරිදි ජරාමරණ ද දුක්ඛසමුදය වන්නේය, තණ්හාව දුක්ඛසමුදය නො ද වේ නම්, ජරාමරණ දුක්ඛසමුදය නො මැ වේ, තණ්හාව දුකට සමුදය වෙයි. යම් සේ තණ්හාව මාර්ගවධ්‍ය වී නම්, එපරිදි ජරාමරණ ද මාර්ගවධ්‍ය වන්නේය. (මෙසෙයින් ජරාමරණ හා තණ්හාව අනන්‍ය නොවේ.) මේ යුක්තියෙන් අන්‍යාන්‍ය කාරණයෙන් විමසියයුතු යි.

තවද ඉදින් යුක්තිසමාරූඪ වූයේ අර්ථහෙයිනුදු අන්‍යත්වය දක්නාලැබේ නම්, ව්‍යඤ්ජනවශයෙනුදු (අන්‍යත්වය) විමසියැ යුතු ය : ' සල්ල ' යී ද ' ධූපායන ' යී ද (තෘෂ්ණා ඉච්ඡා යන) මේ ධර්මයන්ගේ අර්ථ හෙයින් එකත්වය වෙයි. ' ඉච්ඡා ' වගේ ද ' තණ්හා ' වගේ ද අර්ථ හෙයින් අන්‍යත්වය නො යෙදේ මැ යි. තෘෂ්ණායෙන් අදහස නො පිරෙන කල්හි නවවැදෑරුම් ආඝාතවස්තු විෂයෙහි ක්‍රෝධයත් උපනාහයත් උපදී. (ජරා මරණ විපයර්‍යාසයෙහි ක්‍රොධය නූපදී.) මේ යුක්තියෙන් ජරාවගේ ද මරණයාගේ ද තණ්හාවගේ ද අර්ථහෙයින් අන්‍යත්වය වේ.

තවද භාග්‍යවතුන් විසින් ' ඉච්ඡා ' යයි ද ' තණ්හා ' යයි ද නම් දෙකකින් යම් අභිලපනයක් කරනලද ද, මෙය භාග්‍යවතුන් විසින් බාහිර වූ රූපාදි වස්තූන් අරමුණු කිරීම්වශයෙන් ඉච්ඡා යී ද තණ්හා යී ද නම් දෙකකින් අභිලපිත විය. (වදරනලද.) ඒ එසේ මැ ය. (නාම වශයෙන් ප්‍රභෙද වූ) සියලු තෘෂ්ණාව අධ්‍යවසාන (අරමුණෙහි බැස ගැනීම්) ලක්ෂණයෙන් සමාන ලක්ෂණ ඇත්තීය. යම්සේ සියලු ගින්න උෂ්ණත්ව ලක්ෂණයෙන් සමාන ලක්ෂණ වේ ද, එතෙකුදු වත් (ඇවිළැගන්නා කාෂ්ටාදි) උපාදනයන්ගේ වශයෙන් ' කට්ඨග්ගි ' යැ ' තිණග්ගි ' යැ ' සකලිකග්ගි ' යැ ' ගොමයග්ගි ' යැ ' ථුසග්ගි ' යැ ' සඞ්කාරග්ගි ' යැයි ද අන්‍යාන්‍ය වූ නම් ලබා නමුදු සියලු මැ ගින්න උෂ්ණත්වලක්ෂණ වේ මැ ය. එසෙයින් සියලු තෘෂ්ණාව අධ්‍යවසාන (ගැලීසිටීම්) ලක්ෂණයෙන් සමානලක්ෂණ ඇත්තීය. එතෙකුදු වත් (අරමුණු කැමැති වේ නුයි) ' ඉච්ඡා ' යී ද (තෘෂ්ණා කෙරේ නුයි) ' තණ්හා ' යී ද (විෂ පෙවූ ශල්‍යයක් වැනි නුයි) ' සල්ල ' යී ද (සන්තාපනාර්ථයෙන්) ' ධූපායනා ' යී ද (ශීඝ්‍රශ්‍රොතස් ඇති නදියක් වැනි නුයි) ' සරිතා ' යී ද (පැතිරීම් ආදි අර්ථයෙන්) ' විසත්තිකා ' යී ද (ස්නෙහ කිරීම් වශයෙන්) ' සිනෙහ ' යී ද (නානාගතියෙහි ක්ලම්නු උපදවනුයෙන්) ' කිලමථ ' යී ද

ඉතිපි 'ලතා' ඉතිපි 'මඤ්ඤනා' ඉතිපි 'බන්ධො' ඉතිපි 'ආසා' ඉතිපි 'පිපාසා' ඉතිපි 'අභිනන්දනා' ඉතිපි. සබ්බා හි තණ්හා අජ්ඣොසානලක්ඛණෙන එකලක්ඛණා, යථා ච වෙවචනෙ වුත්තා :

3. "ආසා පිහා ච[1] අභිනන්දනා ච
අනෙකධාතූසු සරා පතිට්ඨිතා,
අඤ්ඤාණමූලප්පභවා පජප්පිතා
සබ්බා මයා බ්‍යන්තිකතා සමූලකා[2]"ති.

තණ්හායෙතං වෙවචනං, යථාහ භගවා : "රූපෙ තිස්ස අවිගතරාගස්ස අවිගතච්ඡන්දස්ස අවිගතපෙමස්ස අවිගතපිපාසස්ස අවිගතපරිළාහස්ස අවිගතතණ්හස්ස, (එවං) වෙදනාය-පෙ-සඤ්ඤාය-පෙ-සඞ්ඛාරෙසු-පෙ-විඤ්ඤාණෙ අවිගතරාගස්ස අවිගතච්ඡන්දස්ස අවිගතපෙමස්ස අවිගතපිපාසස්ස අවිගතපරිළාහස්ස" අවිගතතණ්හස්ස, (සබ්බං සුත්තං විත්ථාරෙතබ්බං) තණ්හායෙතං වෙවචනං, එවං යුජ්ජති.

සබ්බො දුක්ඛූපචාරො කාමතණ්හාසඞ්ඛාරමූලකො, න පන යුජ්ජති සබ්බො නිබ්බිදූපචාරො කාමතණ්හාපරික්ඛාරමූලකො, ඉමාය යුත්තියා අඤ්ඤමඤ්ඤෙහි කාරණෙහි ගවෙසිතබ්බං.

යථා හි[3] : භගවා රාගචරිතස්ස පුග්ගලස්ස අසුභං දෙසෙති, දොසචරිතස්ස භගවා පුග්ගලස්ස මෙත්තං දෙසෙති, මොහචරිතස්ස භගවා පුග්ගලස්ස පටිච්චසමුප්පාදං දෙසෙති, යදි හි භගවා රාගචරිතස්ස පුග්ගලස්ස මෙත්තං චෙතොවිමුත්තිං දෙසෙය්‍ය සුඛං වා පටිපදං දන්ධාභිඤ්ඤං සුඛං වා පටිපදං ඛිප්පාභිඤ්ඤං විපස්සනාපුබ්බඞ්ගමං වා පහානං දෙසෙය්‍ය, න යුජ්ජති දෙසනා. එවං යං කිඤ්චි රාගස්ස අනුලොමප්පහානං දොසස්ස අනුලොමප්පහානං මොහස්ස අනුලොමප්පහානං සබ්බං තං විචයෙන හාරෙන විචිනිත්වා යුත්තිහාරෙන යොජෙතබ්බං යාවතිකා ඤාණස්ස භූමි.

මෙත්තාවිහාරිස්ස සතො ව්‍යාපාදො චිත්තං පරියාදාය ඨස්සතීති න යුජ්ජති දෙසනා, බ්‍යාපාදො පහානං අබ්භත්ථං ගච්ඡතීති යුජ්ජති දෙසනා, කරුණාවිහාරිස්ස සතො විහෙසා චිත්තං පරියාදාය ඨස්සතීති න යුජ්ජති දෙසනා, විහෙසා පහානං අබ්භත්ථං ගච්ඡතීති යුජ්ජති දෙසනා. මුදිතාවිහාරිස්ස සතො අරති චිත්තං පරියාදාය ඨස්සතීති න යුජ්ජති දෙසනා, අරති පහානං අබ්භත්ථං ගච්ඡතීති යුජ්ජති දෙසනා. උපෙක්ඛාවිහාරිස්ස සතො රාගො චිත්තං පරියාදාය ඨස්සතීති න යුජ්ජති දෙසනා, රාගො පහානං අබ්භත්ථං ගච්ඡතීති යුජ්ජති දෙසනා. අනිමිත්තවිහාරිස්ස සතො නිමිත්තානුසාරි තෙන තෙනෙව විඤ්ඤාණං පවත්තතීති න යුජ්ජති දෙසනා, නිමිත්තප්පහානං අබ්භත්ථං ගච්ඡතීති යුජ්ජති දෙසනා. අසම්මි

1. පිපාසා - සිමු.
2 සමූලිකා - සිමු
3. යථාහ - සිමු.

(වෙළාගන්නා හෙයින්) ' ලතා ' යී ද (මාගේ යයි මඤ්ඤනා වශයෙන්) ' මඤ්ඤනා ' යී ද (දුර ගියහු පවා ඇද බැඳතබනුයෙන්) ' බන්ධ ' යී ද (ආශංසනාර්ථයෙන්) ' ආසා ' යී ද (අරමුණුරස බොනු රිසිවනුයෙන්) ' පිපාසා ' යී ද (අභිනන්දනාර්ථයෙන්) ' අභිනන්දනා ' යී ද ආලම්බන . උපාදාන වශයෙන් අන්‍යාන්‍ය නාමයෙන් වදරනලද්දීය. සියලු මැ තෘෂ්ණාව අධ්‍යවසාන ලක්ෂණයෙන් සමානලක්ෂණ ඇත්තීය. එයින් කියන ලදු, වෙවචනහාරවිභඞ්ගයෙහි :

3. අනාගතාර්ථ ආශංසනය කරන ආශාව ද වර්තමානාර්ථ ප්‍රාර්ථනා කරන පිහාව ද නිෂ්පන්න අර්ථය ප්‍රතිපාලන කරන අභිනන්දනාව ද චක්ඛු ආදි අනෙක ධාතු විෂයෙහි පිහිටි අවිද්‍යාමූලය ප්‍රභව කොට ඇති තෘෂ්ණා සංඛ්‍යාත සියලු ප්‍රජල්පිතයෝ මූල සහිත වූවාහු මා විසින් විගතාන්ත කරනලද්දහු යයි.

මෙල (ආසා ආදිය) තණ්හාවට පර්‍යායවචන යි. එයින් වදාළහ, බුදුහු — '' තිස්සය, රූපයෙහි අවිගත (තදඞ්ගාදි විසින් පහව නො ගිය) රාග ඇති අවිගත ඡන්දය ඇති අවිගත ප්‍රේමය ඇති අවිගත පිපාසා ඇති අවිගත පරිදාහ ඇති අවිගත තෘෂ්ණා ඇතියහුට, (මෙසේ) වෙදනායෙහි . . . සංඥායෙහි . . . සංස්කාරයන්හි . . . විඥානයෙහි අවිගත (පහව නොගිය) රාග ඇති අවිගතඡන්ද ඇතියහුට අවිගතප්‍රේම ඇතියහුට අවිගතපිපාසා ඇතියහුට අවිගත පරිදාහ ඇතියහුට අවිගතතෘෂ්ණා ඇතියහුට '' (ඛන්ධසංයුත්තයෙහි සියලු තිස්ස සූත්‍රය විස්තර කටයුතු.) මෙල රාගාදිය තණ්හාවට පර්‍යායවචන යි. මෙසේ ' ඉච්ඡා තණ්හා ' අනන්‍ය හෙයින් ' ප්‍රශ්න තුනෙකැ ' යි කියන ලද්ද යෙදෙයි. යුක්ති සංගත වේ.

(අන් අයුරෙකින් යුක්තිගවේෂණය දක්වති.)

සියලු දුඃඛප්‍රවෘත්තිය කාමතෘෂ්ණාව ප්‍රත්‍යය කොට ඇති සංස්කාර මුල්කොට හෙතු කොට ඇත්තේය යනු (යෙදෙයි.) එතෙකුදු වත් සියලු නිර්වෙදප්‍රවෘත්තිය කාමතෘෂ්ණාවට පරිෂ්කාර වූ වස්තුකාමය හෙතු කොට ඇත්තේ යැ යනු නො යෙදෙයි. (නිබ්බිදූපචාරය : කාමවස්තුවිපරිනාමයෙන් උපදනා අනභිරතිය ද ඤාණනිබ්බිදාව දයි දෙ පරිදි වෙයි. එහෙයින් සියලු නිබ්බිදූපචාරය කාමතණ්හාපරික්ඛාරමූලක යැ යනු නොයෙදේ යයි කියන ලදි.) යට කී මේ දෙවැදෑරුම් යුක්තියෙන් අන්‍යොන්‍ය කාරණයෙන් (ඒ ඒ පාළි ප්‍රදෙශයෙහි) යුක්ති ගවේෂණය කළයුතු.

ඒ එසේ මැ යැ : බුදුහු රාගචරිත ඇති පුද්ගලහට අශුභය දේශනා කෙරෙති, බුදුහු දෙසචරිත ඇති පුද්ගලයාට මෛත්‍රිය දෙසති, බුදුහු මොහචරිත ඇති පුද්ගලයාට ප්‍රතීත්‍ය සමුත්පාදය දෙසති. ඉදින් බුදුහු රාගචරිත ඇති පුඟුල්හට මෙත්තාචෙතොවිමුත්තිය දේශනා කරන්නාහු නම් සුඛප්‍රතිපත් ඇති දන්ධාභිඥාව හෝ සුඛප්‍රතිපත් ඇති ක්ෂිප්‍රාභිඥාව හෝ විදර්ශනා පූර්වඞ්ගම ප්‍රහාණය හෝ දෙසන්නාහු නම් දේශනාව නො යෙදෙයි. මේ නයින් යම කිසි රාගයාගේ අනුරූපප්‍රහාණයෙක් (ප්‍රහාණයට සමර්ථ වූ කරුණෙකැයි සේයි.) ද්වෙෂයාගේ අනුරූපප්‍රහාණයෙක් මොහයාගේ අනුරූපප්‍රහාණයෙක් ඇද්ද ඒ සියල්ල (සංවර්ණනා කරන ආචාර්‍ය්‍යවරයාගේ) ප්‍රතිභානඥනයට භූමි (විෂය) වූ පමණින් විචයහාරයෙන් (පදප්‍රශ්නාදිය) විමසා යුක්තිහාරයෙන් යෙදියයුතු.

මෛත්‍රීවිහාරලාභී වූවහුගේ සිත ව්‍යාපාදය මැඩැගෙන සිටිනේ යැ යන දේශනාව (කථාව) නො යෙදෙයි, ව්‍යාපාදය ප්‍රහාණයට නැඹීමට යෙයි යන දේශනාව යෙදෙයි. කරුණාවිහාරලාභී වූවහුගේ සිත විහිංසාව මැඩැගෙන සිටිනේ යැ යන දේශනාව නො යෙදෙයි, විහිංසාව ප්‍රහාණයට අභ්‍යස්තයට යෙයි යන දේශනාව යෙදෙයි. මුදිතාවිහාරලාභී වූවහුගේ සිත අරතිය මැඩැගෙන සිටිනේ යැ යන දේශනාව නො යෙදෙයි, අරතිය ප්‍රහාණයට අභ්‍යස්තයට යෙයි යන දේශනාව යෙදෙයි. උපෙක්ෂා විහාරලාභී වූවහුගේ සිත රාගය මැඩැගෙන සිටිනේ යැ යන දේශනාව නො යෙදෙයි, රාගය ප්‍රහාණයට අභ්‍යස්තයට යෙයි යන දේශනාව යෙදෙයි. අනිමිත්තවිහාර (අනිත්‍යානුදර්ශනද්වාරයෙන් ලැබූ පලසමවත්) ඇතියහුගේ සංස්කාරනිමිත්තානුසාරි

විගතං, අයමහස්මීති න සමනුපස්සාමි. අථ ච පන මෙ කිස්මීති කථස්මීති විචිකිච්ඡා කථංකථාසල්ලං චිත්තං පරියාදාය ඨස්සතීති න යුජ්ජති දෙසනා, විචිකිච්ඡා කථංකථාසල්ලං පහානං අබ්භත්ථං ගච්ඡතීති යුජ්ජති දෙසනා.

යථා වා පන පඨමං ඣානං සමාපන්නස්ස සතො කාමරාගබ්‍යාපාද විසෙසාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, හානාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. අවිතක්කසහගතා වා සඤ්ඤාමනසිකාරා හානාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, විසෙසාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. දුතියං ඣානං සමාපන්නස්ස සතො විතක්කවිචාරසහගතා සඤ්ඤාමනසිකාරා විසෙසාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, හානාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. උපෙක්ඛා සුඛසහගතා වා සඤ්ඤාමනසිකාරා හානාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, විසෙසාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. තතියං ඣානං සමාපන්නස්ස සතො පීතිසුඛසහගතා සඤ්ඤාමනසිකාරා විසෙසාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, හානාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. උපෙක්ඛාසති පාරිසුද්ධිසහගතා වා සඤ්ඤාමනසිකාරා හානාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, විසෙසාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. චතුත්ථං ඣානං සමාපන්නස්ස සතො උපෙක්ඛාසුඛසහගතා සඤ්ඤාමනසිකාරා විසෙසාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, හානාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා, ආකාසානඤ්චායතනසහගතා වා සඤ්ඤාමනසිකාරා හානාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, විසෙසාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා.

ආකාසානඤ්චායතනං සමාපන්නස්ස සතො රූපසහගතා සඤ්ඤාමනසිකාරා විසෙසාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, හානාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. විඤ්ඤාණඤ්චායතනසහගතා වා සඤ්ඤාමනසිකාරා හානාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, විසෙසාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස සතො ආකාසානඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා විසෙසාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, හානාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. ආකිඤ්චඤ්ඤායතනසහගතා වා සඤ්ඤාමනසිකාරා හානාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, විසෙසාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස සතො විඤ්ඤාණඤ්චායතනසහගතා සඤ්ඤාමනසිකාරා විසෙසාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, හානාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසහගතා වා සඤ්ඤාමනසිකාරා හානාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, විසෙසාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස සතො සඤ්ඤූපචාරා විසෙසාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා, හානාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. සඤ්ඤාවෙදයිතනිරොධසහගතා වා සඤ්ඤාමනසිකාරා හානාය සංවත්තන්තීති න යුජ්ජති දෙසනා. විසෙසාය සංවත්තන්තීති යුජ්ජති දෙසනා. කල්ලතාපරිචිතං චිත්තං න ච අභිනීහාරං ඛමතීති න යුජ්ජති දෙසනා, කල්ලතාපරිචිතං චිත්තං අථ ච අභිනීහාරං ඛමතීති යුජ්ජති දෙසනා. එවං සබ්බෙ නව සුත්තන්තා යථාධම්මං යථාවිනයං යථාසත්ථුසාසනං සබ්බතො විචයෙන හාරෙන විචිනිත්වා යුත්තිහාරෙන යොජෙතබ්බා'ති. තෙනාහ ආයස්මා මහාකච්චානො: "සබ්බෙසං හාරානං යා භූමි යො ච ගොචරෙ තෙසං"'ති.

නියුත්තො යුත්තිහාරො

විඥනය ප්‍රහීණ වූ ඒ ඒ නිමිත්ත සමග මැ පවතී යන දේශනාව නො යෙදෙයි, නිත්‍යාදි නිමිත්ත ප්‍රහාණයට අභ්‍යස්තයට යෙයි යන දේශනාව යෙදෙයි. (උපාදනස්කන්ධයන්හි දෘෂ්ටි මාන විසින් උපදනා) මම වෙමි යන මඤ්ඤිතය පහවිය, මේ රූපාදිය ' මම වෙමි ' නො දක්මි, එතෙකුදු වත් ' කවරෙකිම් ද, කෙසේ වෙම් ද, යන විචිකිච්ඡා සංඛ්‍යාත කථංකථාශල්‍යය මාගේ සිත හාත්පසින් මැඩැගෙන සිටිනේ ය යන කථාව නොයෙදෙයි විචිකිච්ඡා කථංකථාශල්‍යය ප්‍රහාණයට අභ්‍යස්තයට යෙයි යන දේශනාව යෙදෙයි.

තවද අනෙකෙකි : පළමුවන දෑහැනට සමවත්හට කාමරාගව්‍යාපාදයෝ විශෙෂාධිගමය පිණිස පවත්නාහ යන කථාව නො යෙදෙයි, පිරිහීමට පවත්නාහ යන කථාව යෙදෙයි, නොහොත් අවිතර්ක සහගත සංඥමනසිකාරයෝ පරිහානියට වැටෙති යන කථාව නොයෙදෙයි, විශෙෂාධිගමයට වැටෙති යන දේශනාව යෙදේ. දෙවැනි දෑහැනට සමවත්නහුට විතර්කවිචාර සහගත සංඥමනසිකාරයෝ විශෙෂාධිගමයට වැටෙති යන කථාව නොයෙදෙයි, පිරිහීමට වැටෙති යන දේශනාව යෙදෙයි, නොහොත් උපෙක්ෂාසුව සහගත සංඥමනසිකාරයෝ හානියට වැටෙති යන කථාව නොයෙදෙයි, විශෙෂාධිගමයට වැටෙති යන දේශනාව යෙදේ. තුන්වැනි දෑහැනට ප්‍රීති සුව සහගත සංඥමනසිකාරයෝ විශෙෂාධිගමයට වැටෙති යන කථාව නොයෙදෙයි, හානියට වැටෙති යන දේශනාව යෙදෙයි, නොහොත් උපෙක්ෂාස්මෘතිපාරිශුද්ධිය හා සහගත වූ සංඥමනසිකාරයෝ හානියට වැටෙති යන කථාව නො යෙදෙයි, විශේෂාධිගමයට වැටෙති යන දේශනාව යෙදේ. සිවුවන දෑහැනට සමවන්නහුට උපෙක්ෂාසුව සහගත සංඥමනසිකාරයෝ විශෙෂාධිගමයට වැටෙති යන කථාව නො යෙදෙයි, හානියට වැටෙති යන දේශනාව යෙදෙයි, නොහොත් ආකාසානඤ්චායතන සහගත වූ සංඥමනසිකාරයෝ හානියට වැටෙති යන කථාව නො යෙදෙයි, විශෙෂාධිගමයට වැටෙති යන දේශනාව යෙදේ.

ආකාසානඤ්චායතන සමවත් සමවන්නහුට රූපසහගත සංඥමනසිකාරයෝ විශෙෂාධිගමයට පවත්නාහ යන කථාව නො යෙදෙයි, හානියට වැටෙති යන කථාව යෙදෙයි, නොහොත් විඤ්ඤාණඤ්චායතන සහගත සංඥමනසිකාරයෝ හානියට වැටෙති යන කථාව නො යෙදෙයි, විශෙෂාධිගමයට වැටෙති යන දේශනාව යෙදේ. විඤ්ඤාණඤ්චායතනයට සමවන්නහුට ආකාසානඤ්චායතන සහගත සංඥමනසිකාරයෝ විශෙෂාධිගමයට වැටෙති යන කථාව නොයෙදෙයි, හානියට වැටෙති යන දේශනාව යෙදෙයි, නොහොත් ආකිඤ්චඤ්ඤායතන සහගත සංඥමනසිකාරයෝ හානියට වැටෙති යන කථාව නො යෙදෙයි, විශෙෂාධිගමයට වැටෙති යන දේශනාව යෙදේ. ආකිඤ්චඤ්ඤායතනයට සමවන්නහුට විඤ්ඤාණඤ්චායතන සහගත වූ සංඥමනසිකාරයෝ විශෙෂාධිගමයට වැටෙති යන කථාව නො යෙදෙයි, හානියට වැටෙති යන දේශනාව යෙදෙයි, නොහොත් නේවසඤ්ඤානාසඤ්ඤායතන සහගත වූ සංඥමනසිකාරයෝ හානියට වැටෙති යන කථාව නො යෙදෙයි, විශෙෂාධිගමයට වැටෙති යන දෙශනාව යෙදේ. නේවසඤ්ඤානාසඤ්ඤායතන සමවත් සමවන්නහුට පටු වූ සංඥාඛ්‍යාතය කරන චිත්තොත්පාදයෝ (ආකිඤ්චඤ්ඤායතනධර්මයෝ) විශෙෂාධිගමයට වැටෙති යන කථාව නො යෙදෙයි, හානියට වැටෙති යන දේශනාව යෙදෙයි, නොහොත් සඤ්ඤාවෙදයිත නිරොධ සහගත වූ සංඥමනසිකාරයෝ හානියට වැටෙති යන කථාව නො යෙදෙයි, විශෙෂය පිණිස පවත්නාහ යන දේශනාව යෙදේ. කල්‍යතාපරිචිත වූ (වශීභාවයෙන් ප්‍රගුණ කළ) චිත්තය නො ද අභිනීහාරක්ෂම වෙයි යන කථාව නො යෙදෙයි, වැලින් කල්‍යතාපරිචිත වූ චිත්තය අභිනීහාරක්ෂම වෙයි යන දේශනාව යෙදේ. මෙසේ සියලු නවසූත්‍රාන්තයෝ දහම් වූ පරිදි විනය වූ පරිදි ශාස්තෘශාසනය වූ පරිදි සර්වප්‍රකාරයෙන විචයහාරයෙන් විචිනනය කොට (විමසා) යුක්තිහාරයෙන් යෙදිය යුත්හාහ ' යි. එයින් වදළහ, ආයුෂ්මත් මහාකාත්‍යායනස්ථවිරයන් වහන්සේ : '' සබ්බෙසං හාරානං යා භූමියො ච ගොචරො තෙසං '' යි.

යුක්තිහාරය යොදනලදී.

## 3. 1. 4

## පදට්ඨානහාරවිභඞ්ගො

තත්ථ කතමො පදට්ඨානො හාරො: "ධම්මං දෙසෙති ජිනො"ති අයං පදට්ඨානො හාරො. කිං දෙසෙති: සබ්බධම්මයාථාවඅසම්පටිවෙධ-ලක්ඛණා අවිජ්ජා, තස්සා විපල්ලාසා පදට්ඨානං. අජ්ඣොසානලක්ඛණා තණ්හා, තස්සා පියරූපං සාතරූපං පදට්ඨානං. පත්ථනලක්ඛණො ලොභො, තස්ස අදින්නාදානං පදට්ඨානං. වණ්ණසණ්ඨානබ්‍යඤ්ජනගහණ-ලක්ඛණා සුභසඤ්ඤා, තස්සා ඉන්ද්‍රියාසංවරො පදට්ඨානං. සාසවඵස්ස උපගමනලක්ඛණා සුඛසඤ්ඤා, තස්සා අස්සාදො පදට්ඨානං. සඞ්ඛත-ලක්ඛණානං ධම්මානං අසමනුපස්සනලක්ඛණා නිච්චසඤ්ඤා, තස්සා විඤ්ඤාණං පදට්ඨානං. අනිච්චසඤ්ඤා දුක්ඛසඤ්ඤා අසමනුපස්සනලක්ඛණා අත්තසඤ්ඤා, තස්සා නාමකායො පදට්ඨානං.

සබ්බධම්මසම්පටිවෙධලක්ඛණා විජ්ජා, තස්සා සබ්බං නෙය්‍යං පදට්ඨානං. චිත්තවික්ඛෙප පටිසංහරණලක්ඛණො සමථො, තස්ස අසුභා පදට්ඨානං. ඉච්ඡාවචරපටිසංහරණලක්ඛණො අලොභො. තස්ස අදින්නාදානා වෙරමණී පදට්ඨානං. අබ්‍යාපජ්ඣ[1]ලක්ඛණො අදොසො, තස්ස පාණාතිපාතා වෙරමණී පදට්ඨානං. වත්ථු අවිප්පටිපාදන[2]ලක්ඛණො අමොහො. තස්ස සම්මාපටිපත්ති පදට්ඨානං. විනීලකවිපුබ්බකගහණ-ලක්ඛණා අසුභසඤ්ඤා, තස්සා නිබ්බිදා පදට්ඨානං; සාසවඵස්ස පරිඤ්ඤාණලක්ඛණා දුක්ඛසඤ්ඤා, තස්සා වෙදනා පදට්ඨානං. සඞ්ඛත-ලක්ඛණානං ධම්මානං සමනුපස්සනලක්ඛණා අනිච්චසඤ්ඤා, තස්සා උප්පාදවයා පදට්ඨානං සබ්බධම්මානං අභිනිවෙසලක්ඛණා අනත්ත-සඤ්ඤා, තස්සා ධම්මසඤ්ඤා පදට්ඨානං.

පඤ්චකාමගුණා කාමරාගස්ස පදට්ඨානං. පඤ්චින්ද්‍රියානි රූපීනි රූපරාගස්ස පදට්ඨානං ඡළායතනං භවරාගස්ස පදට්ඨානං. නිබ්බත්ති-භාවානුපස්සිතා පඤ්චන්නං උපාදානක්ඛන්ධානං පදට්ඨානං. පුබ්බෙනිවා-සානුස්සති ඤාණදස්සනස්ස පදට්ඨානං.

ඔකප්පනලක්ඛණා සද්ධා, අධිමුත්තිපච්චුපට්ඨානා ච අනාවිලලක්ඛණො පසාදො, සම්පසීදනපච්චුපට්ඨානො ච. අභිපත්තියන[3] ලක්ඛණා සද්ධා, තස්සා අවෙච්චප්පසාදො, පදට්ඨානං අනාවිලලක්ඛණො පසාදො තස්ස සද්ධා පදට්ඨානං. ආරම්භලක්ඛණං විරියං, තස්ස සම්මප්පධානං පදට්ඨානං අපිලාපනලක්ඛණා සති, තස්සා සතිපට්ඨානං පදට්ඨානං. එකග්ගලක්ඛණො සමාධි, තස්ස ඣානානි පදට්ඨානං. සම්පජානන-ලක්ඛණා පඤ්ඤා, තස්සා සච්චානි පදට්ඨානං

1. අබ්‍යාපජ්ජ - මජසං.
2. අවිප්පටිපත්ති - මජසං.
3. අභිපත්ථියන - සීමු.

## 3. 1. 4

## පදට්ඨානහාරවිභඞ්ගය

එහි පදට්ඨානහාරය කවරේ යත් : '' ධම්මං දෙසෙති ජිනො '' යන මේ පදට්ඨාන හාර යැ, කුමක් දෙසන සේක් ද යත් : අවිද්‍යාව සියලු (චතුස්සත්‍ය) ධර්මයන්ගේ අවිපරීත ස්වභාවය ප්‍රතිවෙධ නො කිරීම ලක්ෂණ කොට ඇත්තීය. ඒ අවිද්‍යාවට චතුර්විධ විපල්ලාසයෝ පදට්ඨාන — ආසන්නකාරණ යි. තෘෂ්ණාව (අරමුණෙහි) බැයැගෙන සිටීම ලක්ෂණ කොට ඇත්තීය. ඒ තෘෂ්ණාවට ප්‍රියස්වභාවය මධුරස්වභාවය පදට්ඨාන යැ. ලොභය (ඉෂ්ටවස්තු) ප්‍රාර්ථනා කිරීම ලක්ෂණ කොට ඇත්තේ යැ, ඒ ලොභයට අදත්තා දානය පදට්ඨාන යැ. ශුභසංඥව පැහැ සටහන් ව්‍යඤ්ජනයන් ග්‍රහණය කිරීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඒ ශුභසංඥවට ඉන්ද්‍රිය අසංවරය පදට්ඨාන යැ. සුඛසංඥව සාස්‍රව වූ ස්පර්ශයට පැමිණ සිටීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඊට ආස්වාදය පදට්ඨාන යැ. නිත්‍ය සංඥව (උත්පාදදි) සඞ්ඛත ලක්ෂණ ඇති ධර්මයන් නුවණින් නො දැකීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඊට විඥනය පදට්ඨාන යැ. ආත්මසංඥව අනිත්‍ය දුඃඛසංඥවන් නොදැකීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඒ ආත්මසංඥවට නාමකය පදට්ඨාන යි.

මාර්ගඥනවිද්‍යාව සියලු ධර්මයන් මොනොවට ප්‍රතිවෙධ කිරීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඒ විද්‍යාවට චතුස්සත්‍ය සංඛ්‍යාත සකල ඥෙයධර්මය පදට්ඨාන — ආසන්න කාරණ යැ. සමථය චිත්තවික්ෂේප සංඛ්‍යාත ඖද්ධත්‍යය විෂ්කම්භණ කිරීම ලක්ෂණ කොට ඇත්තේ යැ, ඒ සමථයට අශුභයෝ පදට්ඨාන යැ. අලොභය ඉච්ඡාවචර විෂ්කම්භණය ලක්ෂණකොට ඇත්තේ යැ, ඒ අලොභයට අදත්තාදාන විරමණය පදට්ඨාන යැ. අද්වෙෂය නිදුක්ඛව ලක්ෂණ කොට ඇත්තේ යැ, ඒ අද්වෙෂයට ප්‍රාණවධ විරමණය පදට්ඨාන යැ. අමොහය වස්තූන්ගේ අවිප්‍රතිපාදනය ලක්ෂණ කොට ඇත්තේ යැ. ඒ අමොහයට සම්‍යක්ප්‍රතිපත්තිය පදට්ඨාන යැ. අශුභසංඥව විනීලක විපුබ්බක නිමිත්තග්‍රහණය ලක්ෂණ කොට ඇත්තී යැ, ඒ අශුභසංඥවට නිර්විදඥනය පදට්ඨාන යැ. දුඃඛසංඥව ආස්‍රව සහිත ස්පර්ශයාගේ පරිජානනය ලක්ෂණ කොට ඇත්තී යැ, ඒ දුඃඛසංඥවට වෙදනාව පදට්ඨාන යැ. අනිත්‍යසංඥව සංඛතලක්ෂණ ධර්මයන් නුවණින් දැකීම ලක්ෂණ කොට ඇත්තී යැ, එයට උත්පාදව්‍යයය පදට්ඨාන යැ. අනාත්මසංඥව සියලු ධර්මයන්හි අභිනිවෙසය — බැසගෙන සිටීම ලක්ෂණ කොට ඇත්තී යැ, එයට ධර්මමාත්‍ර යැ යන සංඥව පදට්ඨාන යි.

පඤ්ච කාමගුණයෝ කාමරාගයට පදට්ඨාන යැ. රූපී වූ පඤ්චෙන්ද්‍රියයෝ (රූප සංඛ්‍යාත කය ඇරැබ උපදනා) රූපරාගයට පදට්ඨාන යැ. මන සංඛ්‍යාත ෂෂ්ටායතනය (භවනිකාන්ති වශයෙන් පවත්නා) භවරාගයට පදට්ඨාන යැ. (රූපාභිනන්දනාදි වශයෙන්පවත්නා නිර්වෘතිභවානුදර්ශීභාවය පඤ්චොපාදනස්කන්ධයන්ට පදට්ඨාන යැ. පූර්වනිවාසානුස්මෘතිය කර්මස්වකෘතඥනදර්ශනයට පදට්ඨාන යි.

ශ්‍රද්ධාව (හැදැහිලිවශයෙන්) අරමුණට බැසගැනීම — නිශ්චය කිරීම ලක්ෂණ කොට ඇත්තිය, අධිමුක්තිය — නිශ්වය කිරීම වැටැහීම කොට ද ඇත්තී වෙයි. ප්‍රසාදය (චිත්තකාලුෂ්‍යාපගමයෙන්) නො කැලැඹීම ලක්ෂණ කොට ඇත්තේ යැ, සම්ප්‍රසාදනය වැටැහීම කොට ද ඇත්තේ වෙයි. ශ්‍රද්ධාව හැදැහීම ලක්ෂණ කොට ඇත්තී යැ, එයට අවෙත්‍යප්‍රසාදය පදට්ඨාන යැ. ප්‍රසාදය අකාලුෂ්‍යය ලක්ෂණ කොට ඇත්තේ යැ, එයට ශ්‍රද්ධාව පදට්ඨාන යැ. වීර්‍ය්‍යය ආරම්භය ලක්ෂණ කොට ඇත්තේ යැ, එයට චතුර්විධ සම්‍යක්ප්‍රධානය පදට්ඨාන යැ. ස්මෘතිය අසම්මොසය (සිහිකිරීම) ලක්ෂණ කොට ඇත්තී යැ, එයට සතරසතිපට්ඨානය පදට්ඨාන යැ. සමාධිය එකාග්‍රතා (එක අරමුණක් අග්‍රබව) ලක්ෂණ කොට ඇත්තේ යැ, එයට ධ්‍යානයෝ පදට්ඨාන යැ. ප්‍රඥව සම්‍යග් ඥනය ලක්ෂණ කොට ඇත්තී යැ, එයට සත්‍යයෝ පදට්ඨාන යි.

අපරො නයො : අස්සාදමනසිකාරලක්ඛණො අයොනිසො මනසිකාරො, තස්ස අවිජ්ජා පදට්ඨානං. සච්චසම්මොහනලක්ඛණා අවිජ්ජා, සා සඞ්ඛාරානං පදට්ඨානං. පුනබ්භවවිරොහණලක්ඛණා සඞ්ඛාරා, තෙ විඤ්ඤාණස්ස පදට්ඨානං. ඔපපච්චයිකනිබ්බත්තිලක්ඛණං විඤ්ඤාණං, තං නාමරූපස්ස පදට්ඨානං. නාමකායරූපකායසඞ්ඝාතලක්ඛණං නාමරූපං, තං සළායතනස්ස පදට්ඨානං. ඉන්ද්‍රියවවත්ථානලක්ඛණං සළායතනං, තං ඵස්සස්ස පදට්ඨානං. චක්ඛුරූපවිඤ්ඤාණසන්නිපාතලක්ඛණො ඵස්සො. සො වෙදනාය පදට්ඨානං : ඉට්ඨානිට්ඨානුභවනලක්ඛණා වෙදනා සා තණ්හාය පදට්ඨානං. අජ්ඣොසානලක්ඛණා තණ්හා, සා උපාදානස්ස පදට්ඨානං. ඔපපච්චයිකං උපාදානං, තං භවස්ස පදට්ඨානං. නාමකාය-රූපකායසම්භවනලක්ඛණො භවො, සො ජාතියා පදට්ඨානං. ඛන්ධානං පාතුභවනලක්ඛණා ජාති, සා ජරාය පදට්ඨානං. උපධිපරිපාකලක්ඛණා ජරා, සා මරණස්ස පදට්ඨානං. ජීවිතින්ද්‍රියුපච්ඡෙදලක්ඛණං මරණං, තං සොකස්ස පදට්ඨානං. උස්සුක්කකාරකො සොකො, සො පරිදෙවස්ස පදට්ඨානං. ලාලප්පකාරකො පරිදෙවො, සො දුක්ඛස්ස පදට්ඨානං. කායසම්පීළනං දුක්ඛං, තං දොමනස්සස්ස පදට්ඨානං. චිත්තපීළනං දොමනස්සං, තං උපායාසස්ස පදට්ඨානං. ඔදහනකාරකො උපායාසො, සො භවස්ස පදට්ඨානං. ඉමානි භවඞ්ගානි යදා සමග්ගානි නිබ්බත්තානි භවන්ති සො භවො, තං සංසාරස්ස පදට්ඨානං.

නිය්‍යානිකලක්ඛණො මග්ගො, සො නිරොධස්ස පදට්ඨානං. තිත්ථඤ්ඤුතා පීතඤ්ඤුතාය පදට්ඨානං. පීතඤ්ඤුතා මත්තඤ්ඤුතාය පදට්ඨානං. මත්තඤ්ඤුතා අත්තඤ්ඤුතාය පදට්ඨානං. අත්තඤ්ඤුතා පුබ්බෙකතපුඤ්ඤතාය පදට්ඨානං, පුබ්බෙකතපුඤ්ඤතා පතිරූපදෙසවාසස්ස පදට්ඨානං. පතිරූපදෙසවාසො සප්පුරිසූපනිස්සයස්ස පදට්ඨානං. සප්පුරිසූපනිස්සයො අත්තසම්මාපණිධානස්ස පදට්ඨානං. අත්තසම්මාපණිධානං සීලානං පදට්ඨානං. සීලානි අවිප්පටිසාරස්ස පදට්ඨානං. අවිප්පටිසාරො පාමුජ්ජස්ස පදට්ඨානං. පාමුජ්ජං පීතියා පදට්ඨානං. පීති පස්සද්ධියා පදට්ඨානං. පස්සද්ධි සුඛස්ස පදට්ඨානං. සුඛං සමාධිස්ස පදට්ඨානං. සමාධි යථාභූතඤාණදස්සනස්ස පදට්ඨානං. යථාභූතඤාණදස්සනං නිබ්බිදාය පදට්ඨානං. නිබ්බිදා විරාගස්ස පදට්ඨානං. විරාගො විමුත්තියා පදට්ඨානං. විමුත්ති විමුත්තිඤාණදස්සනස්ස පදට්ඨානං. එවං යො කොචි උපනිස්සයො, යො කොචි පච්චයො, සබ්බො සො පදට්ඨානං. තෙනාහ ආයස්මා මහාකච්චානො : "ධම්මං දෙසෙති ජිනො"ති.

නියුත්තො පදට්ඨානො හාරො.

අනෙක් නයෙකි : අයොනිසො මනසිකාරය (සංයොජනීය ධර්මයන්හි) ආස්වාද වශයෙන් මෙනෙහිකිරීම ලක්ෂණ කොට ඇත්තේ යැ, ඒ අයොනිසොමනසිකාරයට අවිද්‍යාව පදට්ඨාන (— ආසන්නකාරණ) යැ. අවිද්‍යාව සිව්සස්හි මුළාවීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඒ අවිද්‍යාව සංස්කාරයන්ට පදට්ඨාන යැ. සංස්කාරයෝ පුනර්භවයාගේ විරූහණය (විපාකධර්මතාව) ලක්ෂණ කොට ඇත්තාහු යැ, ඔහු ප්‍රතිසන්ධිවිඥානයට පදට්ඨාන යැ. විඥානය උපප්‍රාප්තිභව වශයෙන් ඉපදීම ලක්ෂණ කොට ඇත්තේ යැ, එ විඥානය නාමරූපයට පදට්ඨාන යැ. නාමරූපය අරූප – රූපකාය දෙදෙනාගේ සමූහභාවය ලක්ෂණ කොට ඇත්තේ යැ, එය ෂඩායතනයට පදට්ඨාන යි. ෂඩායතනය චක්ෂුරාදි ෂඩින්ද්‍රියයන්ගේ නියම කිරීම ලක්ෂණ කොට ඇත්තේ යැ, එය ස්පර්ශයට පදට්ඨාන යි. ස්පර්ශය චක්ෂුරින්ද්‍රිය රූපාලම්බන චක්ෂුර්විඥානයන්ගේ සන්නිපාතය ලක්ෂණ කොට ඇත්තේ යැ, එය වෙදනාවට පදට්ඨාන යි. වෙදනාව ඉෂ්ටානිෂ්ට අරමුණුරස විඳීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඒ වෙදනාව තෘෂ්ණාවට පදට්ඨාන යි. තෘෂ්ණාව අරමුණෙහි ගැලීසිටීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඒ තෘෂ්ණාව උපාදනයට පදට්ඨාන යි. උපාදනය උපප්‍රාප්තිස්කන්ධයන් උපදවනු වෙයි, එය භවයට පදට්ඨාන යි. භවය නාමකාය රූපකායයන් ඉපදීම ලක්ෂණ කොට ඇත්තේ යැ, එය ජාතියට පදට්ඨාන යි. ජාතිය ස්කන්ධයන්ගේ හටගැනීම ලක්ෂණ කොට ඇත්තී යැ, ඒ ජාතිය ජරාවට පදට්ඨාන යි. ජරාව ආත්මභාවය මිහිකිරීම ලක්ෂණ කොට ඇත්තී යැ, එය මරණයට පදට්ඨාන යි. මරණය ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීම ලක්ෂණ කොට ඇත්තේ යැ, එය ශොකයට පදට්ඨාන යි. ශොකය චිත්තසන්තාපය කරනු වෙයි, එය පරිදෙවයට පදට්ඨාන යි. පරිදෙවය වැලැපීම කරනු වෙයි, එය කායික දුකට පදට්ඨාන යි. දුක රූපකාය පෙළනු වෙයි, එය දෙම්නසට පදට්ඨාන යි. දෙම්නස සිත පෙළනු වෙයි, ඒ දෙම්නස උපායාසයට පදට්ඨාන යි. උපායාසය (ආත්මනිශ්‍රය) අභ්‍යන්තරය දවනු වෙයි, එය භවයට පදට්ඨාන යි. යම් කලෙක මේ භවයට අවයව වූ ක්ලෙශයෝ — (කර්මභව විපාකභව සංඛ්‍යාත අංගයෝ) සමග්‍ර වූවාහු උපන්නාහු වෙත් ද, හේ භව නම, ඒ භවය සංසාරයට පදට්ඨාන යි.

මාර්ගය නිමිත්ත පවත්ති දෙකින් නැඟීසිටීම ලක්ෂණ කොට ඇත්තේ යැ, ඒ මාර්ගය නිරොධයට පදට්ඨාන යි. තීර්ථ සංඛ්‍යාත බහුශ්‍රැතයකු පයිරුපාසන කරනබව ධර්මොප සංහිත ප්‍රාමොද්‍යයට පදට්ඨාන යැ, පිතඤ්ඤුතාව මාත්‍රඥභාවයට පදට්ඨාන යැ, අත්තඤ්ඤුතාව තමා පඤ්චපධානියඞ්ගයෙන් යුක්තබව දන්නා ආත්මඥභාවයට පදට්ඨාන යැ, අත්තඤ්ඤුතාව පෙර කළ පින් ඇති බවට පදට්ඨාන යැ, පූර්වකෘත පුණ්‍යභාවය ප්‍රතිරූපදේශවාසයට පදට්ඨාන යැ, ප්‍රතිරූපදේශවාසය සත්පුරුෂොපනිශ්‍රයට පදට්ඨාන යැ. සත්පුරුෂොපනිශ්‍රය ආත්මසම්‍යක්ප්‍රණිධානයට පදට්ඨාන යැ, ආත්ම සම්‍යක්ප්‍රණිධානය ශීලයනට පදට්ඨාන යැ, ශීලයෝ අවිප්‍රතිසාරයට පදට්ඨාන යැ, අවිප්‍රතිසාරය ප්‍රාමොද්‍යයට පදට්ඨාන යැ, ප්‍රාමොද්‍යය ප්‍රීතියට පදට්ඨාන යැ, ප්‍රීතිය ක්ලේශදරථ සන්හිඳීමට පදට්ඨාන යැ, පස්සද්ධිය සුඛයට පදට්ඨාන යැ, සුඛය සමාධියට පදට්ඨාන යැ, සමාධිය යථාභූතඥානදර්ශනයට පදට්ඨාන යැ, යථාභූතඥානදර්ශනය (තරුණවිදර්ශනාව) නිර්වෙදය (බලවවිපස්සනාව) ට පදට්ඨාන යැ, නිබ්බිදව විරාගයට පදට්ඨාන යැ, විරාගය විමුක්තියට පදට්ඨාන යැ, විමුක්තිය විමුක්තිඥානදර්ශනයට පදට්ඨාන යි. මෙසේ යම් කිසි බලවත් ප්‍රත්‍යය සංඛ්‍යාත උපනිශ්‍රයෙක් යම් කිසි ශෙෂප්‍රත්‍යයෙක් වේ ද එ හැම පදට්ඨාන යි ආසන්න කාරණ වේ. එයින් වදළහ, ආයුෂ්මත් මහාකාත්‍යායනස්ථවිරයන් වහන්සේ : “ ධම්මං දෙසෙති ජිනො ” යි.

පදට්ඨානහාරය යොදන ලදී.

## 3. 1. 5

## ලක්ඛණහාරවිභඞ්ගො

තත්ථ කතමො ලක්ඛණො හාරො: වුත්තම්හි එකධම්මෙ''ති අයං ලක්ඛණො හාරො. කිං ලක්ඛයති; යෙ ධම්මා එකලක්ඛණා තෙසං ධම්මානං එකස්මිං ධම්මෙ වුත්තෙ අවසිට්ඨා ධම්මා වුත්තා භවන්ති. යථා කිං භවෙ; යථාහ භගවා: ''චක්ඛුං භික්ඛවෙ අනවට්ඨිතං ඉත්තරං පරිත්තං පභඞ්ගු පරතො දුක්ඛං බ්‍යසනං චලං කුක්කුලං සඞ්ඛාරං වධකං අමිත්තමජ්ඣෙ''. ඉමස්මිං චක්ඛුස්මිං වුත්තෙ අවසිට්ඨානි අජ්ඣත්තිකානි ආයතනානි වුත්තානි භවන්ති. කෙන කාරණෙන; සබ්බානි හි ඡ අජ්ඣත්තිකානි ආයතනානි වධකට්ඨෙන එකලක්ඛණානි.

යථා චාහ භගවා: ''අතීතෙ රාධ, රූපෙ අනපෙක්ඛො හොහි, අනාගතං රූපං මා අභිනන්දි පච්චුප්පන්නස්ස රූපස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය චාගාය පටිනිස්සග්ගාය පටිපජ්ජ, ඉමස්මිං රූපක්ඛන්ධෙ වුත්තෙ අවසිට්ඨා ඛන්ධා වුත්තා භවන්ති. කෙන කාරණෙන: සබ්බෙ හි පඤ්චක්ඛන්ධා යමකොවාදසුත්තෙ වධකට්ඨෙන එකලක්ඛණා වුත්තා යථා චාහ භගවා:

1. ''යෙසං ච සුසමාරද්ධා නිච්චං කායගතා සති,
අකිච්චං තෙ න සෙවන්ති කිච්චෙ සාතච්චකාරිනො''

ඉති කායගතාය සතියා වුත්තාය වුත්තා භවන්ති වෙදනාගතා සති චිත්තගතා සති ධම්මගතා ච. තථා 'යං කිඤ්චි දිට්ඨං වා සුතං වා මුතං වා''ති වුත්තෙ වුත්තං භවති විඤ්ඤාතං.

යථා චාහ භගවා: ''තස්මාතිහ ත්වං භික්ඛු-පෙ-කායෙ කායානුපස්සී විහරාහි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං''.

''ආතාපී''ති විරියින්ද්‍රියං; ''සම්පජානො''ති පඤ්ඤින්ද්‍රියං; ''සතිමා''ති සතින්ද්‍රියං; ''විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං''ති සමාධින්ද්‍රියං; එවං කායෙ කායානුපස්සිනො විහරතො චත්තාරො සතිපට්ඨානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. කෙන කාරණෙන: එකලක්ඛණත්තා චතුන්නං ඉන්ද්‍රියානං. චතූසු සතිපට්ඨානෙසු භාවියමානෙසු චත්තාරො සම්මප්පධානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. චතූසු සම්මප්පධානෙසු භාවියමානෙසු චත්තාරො ඉද්ධිපාදා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. චතූසු ඉද්ධිපාදෙසු භාවියමානෙසු පඤ්චින්ද්‍රියානි භාවනා පාරිපූරිං ගච්ඡන්ති. පඤ්චසු ඉන්ද්‍රියෙසු භාවියමානෙසු පඤ්ච බලානි භාවනා පාරිපූරිං ගච්ඡන්ති. පඤ්චසු බලෙසු භාවියමානෙසු සත්ත බොජ්ඣඞ්ගා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. සත්තසු බොජ්ඣඞ්ගෙසු භාවියමානෙසු අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනා පාරිපූරිං ගච්ඡති. සබ්බෙ ච[1] බොධඞ්ගමා ධම්මා බොධිපක්ඛියා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. කෙන කාරණෙන: සබ්බෙ හි බොධඞ්ගමා ධම්මා[2] බොධිපක්ඛියා නීයානිකා[3]ලක්ඛණෙන එකලක්ඛණා. තෙ එකලක්ඛණත්තා භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

---

1. සබ්බෙච - මජ්සං.
2. බොජ්ඣඞ්ගා ධම්මා - සීමු.
3 නියානිකා - මජ්සං, නෙය්‍යානිකා - පු.

## 3. 1. 5

## ලක්ඛණහාරවිභඞ්ගය

එහි ලක්ෂණහාරය කවරෙ යත් : '' වුත්තම්හි එකධම්මෙ '' යි නිර්දිෂ්ට වූ මෙය ලක්ෂණහාර යැ. කිනම් ධර්මයක් ලකුණු කෙරෙයි යත් : ස්කන්ධාදි යම් ධර්ම කෙනෙක් සමාන ලක්ෂණ වූවාහු ද, ඒ ධර්මයන් අතුරෙන් එක් ධර්මයක් කී කල්හි අවශිෂ්ට ධර්මයෝ කියනලද්දහු වෙත්. ඒ කිසෙයින් වන්නේ යැ යත් : මෙසෙයින් වදළහ, බුදුහු — '' මහණෙනි චක්ඛායතනය එක් අරමුණෙක නො පවත්නා හෙයින් අනවස්ථිත යැ වහා නැසෙන හෙයින් ඉත්වර යැ කල් නො පවත්නා හෙයින් පරිත්ත යැ වහා බිඳෙන සුලු යැ ස්වවශයෙහි නො පවත්නේ යැ දුකට හේතු යැ ව්‍යසනහේතු යැ සැලෙන පියවි ඇත්තේ යැ උෂ්ණ භස්මයක් බඳු යැ ප්‍රත්‍යයොත්පන්න යැ අමිත්‍රයන් මැද පවත්නේ යැ '' යි. මේ චක්ෂුරායතනය වදළ කල්හි සෙසු ආධ්‍යාත්මික ආයතනයෝ කියනලද්දහු වෙති. කවර හෙයින යත් : යම් හෙයකින් සියලු ආධ්‍යාත්මික ෂඩායතනයෝ වධකාර්ථයෙන් සමානලක්ෂණ වෙත් ද එහෙයිනි.

මෙසේත් වදළහ, බුදුහු : '' රාධය, අතීත රූපයෙහි අපේක්ෂා රහිත වෙව, අනාගත රූපය නහමක් අභිනන්දනා කර, ප්‍රත්‍යුත්පන්න රූපයාගේ නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස ත්‍යාගය පිණිස දුරලීම පිණිස පිළිපදුව '' යි. මේ රූපස්කන්ධය වදළ කල්හි ඉතිරිවැ සිටි ස්කන්ධයෝ කියනලද්දහු වෙති. කවර කරුණින යත් : සියලු මැ පඤ්චස්කන්ධයෝ යමකොවාද සූත්‍රයෙහි වධකාර්ථයෙන් සමානලක්ෂණ ඇත්තාහු වදරනලදහ.

මෙසේත් වදළහ, බුදුහු :

1. යම් කෙනකුන් විසින් නිරතුරු කාගියා සී මොනොවට ආරබ්ධ වී ද, ඔහු කෘත්‍යයෙහි සතතභාවයෙන් කරනසුලු වූවාහු නො කටයුතු නො සෙවුනාහු වෙත්.

මෙසේ කායගතාසතිය වදළ කල්හි වෙදනාගතාසති චිත්තගතාසති ධම්මගතාසති ද වදරනලද්දහු වෙත්. එසෙයින් '' යං කිඤ්චි දිට්ඨං වා සුතං වා මුතං වා '' යි වදළ කල්හි ' විඤ්ඤාත ' ය වදරනලද වේ.

මෙසේත් වදළහ, බුදුහු : '' එහෙයින් මහණ, මෙහි ලා තෙපි . . . කෙලෙස් තවන වැර ඇතිව සම්‍යක් ප්‍රඥ ඇතිව ස්මෘතිමත්ව කායලෝකයෙහි අභිධ්‍යා දෞර්මනස්‍ය දුරු කොට රූපකයෙහි (කේසලෝමාදි) කය අනිත්‍යාදි විසින් පුනපුනා බලමින් වාස කරව '' (මෙහි) '' ආතාපී '' යනු වීර්‍යෙන්ද්‍රිය යි. '' සම්පජානො '' යනු ප්‍රඥෙන්ද්‍රිය යි, '' සතිමා '' යනු ස්මෘතීන්ද්‍රිය යි, '' විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං '' යනු සමාධීන්ද්‍රිය යි. මෙසේ කයෙහි කායානුදර්ශීව වාස කරනුවහුට සතර සිවටන්හු භාවනායෙන් පිරීමට යෙති. කවර කරුණින යත් : සතර ඉන්ද්‍රියයන්ගේ සමානලක්ෂණත්වය හෙයිනි. සතර සිවටන් වැඩෙන කල්හි සතර සම්‍යක්ප්‍රධානයෝ භාවනායෙන් පිරීමට යෙති. සතර සම්‍යක්ප්‍රධානයන් වැඩෙත් ම සතරඍද්ධිපාදයෝ භාවනායෙන් පිරීමට යෙත්. සතර ඍද්ධිපාදයන් වැඩෙත් ම පඤ්චෙන්ද්‍රියයෝ භාවනායෙන් වැඩීමට යෙති. පඤ්චේන්ද්‍රියයන් වැඩෙත් ම පඤ්ච බලයෝ භාවනායෙන් පිරීමට යෙති. පඤ්චබලයන් වැඩෙත් ම සප්ත බොධ්‍යඞ්ගයෝ භාවනායෙන් පිරීමට යෙති. සප්ත බොධ්‍යඞ්ගයන් වැඩෙත් ම ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය භාවනායෙන් පරිපූර්ණබවට යෙයි, ආර්‍ය්‍යමාර්ගඥාන — බොධයට යන බොධිපාක්ෂික වූ හැම ධර්මයෝ ද භාවනායෙන් පරිපූර්ණබවට යෙත්. කවර කරුණින යත් : බොධඞ්ගම වූ බොධිපාක්ෂික වූ හැම ධර්මයෝ නෛර්‍ය්‍යාණික ස්වභාවයෙන් සමානලක්ෂණ වූවාහු ද එහෙයිනි. ඒ දහම්හු සමානලක්ෂණ හෙයින් භාවනායෙන් වැඩීමට යෙත්.

එවං අකුසලා ධම්මා එකලක්ඛණත්තා පහානං අබ්භත්ථං ගච්ඡන්ති : චතුසු සතිපට්ඨානෙසු භාවියමානෙසු විපල්ලාසා පහීයන්ති, ආහාරා චස්ස පරිඤ්ඤං ගච්ඡන්ති, උපාදානෙහි අනුපාදානො භවති, යොගෙහි ච විසංයුත්තො භවති, ගන්ථෙහි ච විප්පයුත්තො භවති, ආසවෙහි ච අනාසවො භවති ඔඝෙහි ච නිත්තිණ්ණො භවති, සල්ලෙහි ච විසල්ලො භවති, විඤ්ඤාණට්ඨිතියො චස්ස පරිඤ්ඤං ගච්ඡන්ති, අගතිගමනෙහි ච න අගතිං ගච්ඡති, එවං අකුසලාපි ධම්මා එකලක්ඛණත්තා පහානං අබ්භත්ථං ගච්ඡන්ති

යත්ථ වා පන රූපින්ද්‍රියං දෙසිතං, දෙසිතා තත්ථෙව රූපධාතු රූපක්ඛන්ධො රූපඤ්චායතනං. යත්ථ වා පන සුඛා වෙදනා දෙසිතා, දෙසිතං තත්ථ සුඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං දුක්ඛසමුදයො ච අරියසච්චං. යත්ථ වා පන දුක්ඛා වෙදනා දෙසිතා, දෙසිතං තත්ථ දුක්ඛින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං දුක්ඛං ච අරියසච්චං. යත්ථ වා පන අදුක්ඛමසුඛා වෙදනා දෙසිතා, දෙසිතං තත්ථ උපෙක්ඛින්ද්‍රියං සබ්බො ච පටිච්චසමුප්පාදො. තෙන කාරණෙන : අදුක්ඛමසුඛාය හි වෙදනාය අවිජ්ජා අනුසෙති, අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. සො ච සරාග-සදොස-සමොහ-සංකිලෙසපක්ඛෙන හාතබ්බො. වීතරාග-වීතදොස-වීතමොහ අරියධම්මෙහි හාතබ්බො.

එවං යෙ ධම්මා එකලක්ඛණා කිච්චතො ච ලක්ඛණතො ච සාමඤ්ඤතො ච චුතූපපාතතො ච තෙසං ධම්මානං එකස්මිං ධම්මෙ වුත්තෙන අවසිට්ඨා ධම්මා වුත්තා භවන්ති. තෙනාහ ආයස්මා මහාකච්චානො : "වුත්තම්හි එකධම්මෙ"ති.

නියුත්තො ලක්ඛණො හාරො.

## 3. 1. 6

## චතුබ්‍යූහහාරවිභඞ්ගො

තත්ථ කතමො චතුබ්‍යූහො හාරො : "නෙරුත්තමධිප්පායො"ති අයං. බ්‍යඤ්ජනෙන සුත්තස්ස නෙරුත්තඤ්ච අධිප්පායො ච නිදානඤ්ච පුබ්බාපරසන්ධි ච ගවෙසිතබ්බා.[1]

1. ගවෙසිතබ්බො - මජසං.

මෙසේ අකුශලධර්මයෝ ද (පහානෙකට්ඨතා විසින්) සමානලක්ෂණ ඇති බැවින් ප්‍රහාණයට නැඟීමට යෙති : සතර සීවටන් වඩනු ලබත් මැ (අශුභයෙහි ශුභ යැ යනාදි) සතර විපල්ලාසයෝ ප්‍රහීණ වෙති. ඔහුට සතර ආහාරයෝ ද පරිඥනයට යෙති. කාමාදි සතර උපාදනයෙන් උපාදන රහිත වූයේ වෙයි, සතර යෝගයන්ගෙනුදු විසංයුක්ත වෙයි, සතර ග්‍රන්ථයන්ගෙනුදු විප්‍රයුක්ත වෙයි, කාමාදි ආස්‍රවයන්ගෙනුදු අනාස්‍රව වෙයි. සතර ඔඝයන්ගෙනුදු උත්තීර්ණ වූයේ වෙයි, ශල්‍යයන්ගෙනුදු විගතශල්‍ය වෙයි, ඔහුට සතර විඥනස්ථිතිහු ද පරිඥනයට යෙති, ඡන්දදි අගතිගමනයෙනුදු අගතියට නොයෙයි. මෙසේ අකුශලධර්මයෝ ද සමානලක්ෂණ බැවින් ප්‍රහාණයට අභ්‍යස්තයට යෙත්.

තවද යම් දෙශනායෙක්හි (රුප්පන ලක්ෂණ වූ අෂ්ටවිධ) රූපෙන්ද්‍රියය වදරනලද ද එහි මැ රූපධාතු රූපස්කන්ධ රූපායතනය ද දෙසන ලද්දහු වෙත්. තවද යම් තැනෙක සුඛවෙදනාව දෙසන ලදද, එහි සුඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය දුක්ඛසමුදය ආර්‍යසත්‍යය ද දේසිත යැ, තවද යම් දේශනායෙක දුක්ඛවෙදනාව දෙසන ලදු ද, එහි දුක්ඛින්ද්‍රිය දෙමනස්සින්ද්‍රිය දුක්ඛආර්‍යසත්‍යය ද දෙසිත යැ. තවද යම් තැනෙක අදුක්ඛමසුඛවෙදනාව දෙසන ලදු ද, එහි උපෙක්ඛින්ද්‍රියය ද සියලු පටිච්චසමුප්පාදය ද දේසිත යි. කවර කරුණින යත් : අදුක්ඛමසුඛ වෙදනායෙහි අවිද්‍යාව අනුශය කෙරෙයි, එහෙයිනි. අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති, සංස්කාරප්‍රත්‍යයෙන් විඥනය වෙයි, විඥනප්‍රත්‍යයෙන් නාමරූපය වෙයි, නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතනය වෙයි, ෂඩායතනප්‍රත්‍යයෙන් ස්පර්ශය වෙයි, ස්පර්ශප්‍රත්‍යයෙන් වෙදනාව වෙයි, වෙදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වෙයි, තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදනය වෙයි, උපාදනප්‍රත්‍යයෙන් භවය වෙයි, භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි, ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණය වෙයි, ශෝක යැ පරිදේව යැ දුඃඛ යැ දෞර්මනස්‍ය යැ උපායාස යැ යන මොහු වෙත්. ඒ අනුලොමදෙශිත ප්‍රතීත්‍යසමුත්පාදය සරාග — සදෙස — සමොහ වූ සංක්ලෙශපක්ෂය හා පැමිණවියැයුත්තේ යැ, (ප්‍රතිලොමදෙශිත ප්‍රතීත්‍යසමුත්පාදය) වීතරාග — වීතදෙස — වීතමොහ වූ ආර්‍යධර්මයන් හා පැමිණවියැයුත්තේ යි.

මෙපරිද්දෙන් යම් ධර්ම කෙනෙක් (පඨවි ආදි වූ ද ඵස්සාදි වූ ද රූපාරූපධර්මයන්ගේ සංධාරණ සංඝට්ටනාදි) කෘත්‍ය හෙයින් ද, (කක්ඛළ ඵුසනාදි) ස්වභාවලක්ෂණ හෙයින් ද, (රුප්පන නමනාදි) සාමාන්‍යලක්ෂණ හෙයින් ද, (සඞ්ඛතධර්මයන්ගේ) භඞ්ග – උත්පාද හෙයින් ද, සමානලක්ෂණ වූවාහු නම්, ඒ ධර්මයන් අතුරෙන් එක් ධර්මයක් වදළ කල්හි අවශිෂ්ට ධර්මයෝ කියනලද්දහු වෙත්. එයින් වදළහ : ආයුෂ්මත් මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ — '' වුත්තම්හි එකධම්මෙ '' යි.

ලක්ඛණහාරය යොදනලද්දේ යි.

## 3. 1. 6

## චතුබ්‍යූහහාරවිභඞ්ගය

එහි චතුබ්‍යූහහාරය කවරෙ යත් : '' නෙරුත්තමධිප්පායො '' යන නිර්දේශ යැ, මේ චතුබ්‍යූහහාරයි. ව්‍යඤ්ජනද්වාරයෙන් සූත්‍රයාගේ නිර්වචනය ද, (දේශකයාණන්ගේ) අදහස ද, දේශනානිදනය (කාරණය) ද, පූර්වාපරානුසන්ධිය ද, සෙවියයුත්තාහ.

1. තත්ථ කතමං නෙරුත්තං; යා නිරුත්ති පදසංහිතා යං ධම්මානං නාමසොඤාණං, යදා හි භික්ඛු අත්ථස්ස නාමං ජානාති ධම්මස්ස ච නාමං ජානාති, තථා තථා නං අභිනිරොපෙති, අයං වුච්චති අත්ථකුසලො ධම්මකුසලො බ්‍යඤ්ජනකුසලො නිරුත්තිකුසලො පුබ්බාපරකුසලො දෙසනාකුසලො අතීතාධිවචනකුසලො අනාගතාධිවචනකුසලො පච්චුප්පන්නාධිවචනකුසලො ඉත්ථාධිවචනකුසලො පුරිසාධිවචනකුසලො නපුංසකාධිවචනකුසලො එකාධිවචනකුසලො අනෙකාධිවචනකුසලො. එවං සබ්බානිපි කාතබ්බානි ජනපදනෙරුත්තානි සබ්බා ච ජනපද නිරුත්තියො, අයං නිරුත්ති පදසංහිතා.

2. තත්ථ කතමො අධිප්පායො;

1. "ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ඡත්තං මහන්තං යථ වස්සකාලෙ,
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී"ති.

ඉධ භගවතො කො අධිප්පායො; යෙ අපායෙහි පරිමුච්චිතුකාමා භවිස්සන්ති තෙ ධම්මචාරිනො භවිස්සන්තීති අයං එත්ථ භගවතො අධිප්පායො.

2. "චොරො යථා සන්ධිමුඛෙ ගහීතො
සකම්මුනා හඤ්ඤතෙ[1] බජ්ඣතෙ ච,
එවං අයං පෙච්ච පජා පරත්ථ
සකම්මුනා හඤ්ඤතෙ[1] බජ්ඣතෙ චා"ති.

ඉධ භගවතො කො අධිප්පායො; සංචෙතනිකානං කතානං කම්මානං උපචිතානං දුක්ඛවෙදනීයානං අනිට්ඨං අකන්තං විපාකං පච්චනුභවිස්සතීති, අයං එත්ථ භගවතො අධිප්පායො.

3. "සුඛකාමානි භූතානි යො දණ්ඩෙන විහිංසති,
අත්තනො සුඛමෙසානො පෙච්ච සො න ලභතෙ සුඛන්ති",

ඉධ භගවතො කො අධිප්පායො; යෙ සුඛෙන අත්ථිකා භවිස්සන්ති තෙ පාපකම්මං න කරිස්සන්තීති අයං එත්ථ භගවතො අධිප්පායො.

4. "මිද්ධී යදා හොති මහග්ඝසො ච
නිද්දායිතා සම්පරිවත්තසායී,
මහාවරාහොව නිවාපපුට්ඨො
පුනප්පුනං ගබ්භමුපෙති මන්දො"ති.

ඉධ භගවතො කො අධිප්පායො; යෙ ජරාමරණෙන අට්ටීයිතුකාමා භවිස්සන්ති තෙ භවිස්සන්ති භොජනෙ මත්තඤ්ඤුනො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා පුබ්බරත්තාපරරත්තං ජාගරියානුයොගමනුයුත්තා විපස්සකා කුසලෙසු ධම්මෙසු සගාරවා ච සබ්‍රහ්මචාරීසු ථෙරෙසු නවෙසු මජ්ඣිමෙසූති. අයං එත්ථ භගවතො අධිප්පායො.

---

1. හඤ්ඤති - මජසං.

එහි නෛරුක්තය කවරෙ යත් : පදයන්හි සංහිත වූ — යෙදුණාවූ යම් නිරුක්තියක් ඇද්ද එය යි. යම් හෙයෙකින් ඵෙදයධර්මයන්ගේ (ඵස්ස – වෙදනා – ඛන්ධ – ධාතු – තිස්ස – ඵුස්සාදි) නාමවශයෙන් දනීම වේ ද එහෙයිනි. ඒ එසේ මැය : යම් කලෙක මහණ ශබ්දාභිධෙය වූ අර්ථයාගේ (නාමප්‍රඥප්ති විසින් මෙනම් ඇතැ ' යි) නාමය දනී ද ස්වභාවධර්මයාගේත් නාමය දනී ද, (එකල්හි) ඒ ඒ අර්ථ – ධර්මය ඒ ඒ පරිදි ව්‍යවහාරයට නඟයි — දෙසයි. මේ මහණ පෙළඅරුත්හි නිපුණ යැ, පෙළදහම්හි නිපුණ යැ, (අක්ෂර වාක්‍යසංඛ්‍යාත) ව්‍යඤ්ජනයෙහි නිපුණ යැ, නිර්වචනයෙහි කුශල යැ, (දේශනාව පිළිබඳ) පූර්වාපරයෙහි නිපුණ යැ, ධර්මදේශනායෙහි නිපුණ යැ, අතීතප්‍රඥප්තියෙහි නිපුණ යැ, අනාගතප්‍රඥප්තියෙහි නිපුණ යැ, වර්තමානප්‍රඥප්තියෙහි නිපුණ යැ, ස්ත්‍රීප්‍රඥප්තියෙහි නිපුණ යැ, පුරුෂප්‍රඥප්තියෙහි නිපුණ යැ, නපුංසකප්‍රඥප්තියෙහි නිපුණ යැ, එකවචනයෙහි නිපුණ යැ, අනෙකවචනයෙහි නිපුණ යැයි කියනු ලැබේ. මෙපරිද්දෙන් සියලු මැ ජනපදනිරුක්ති සංඛ්‍යාත සත්වව්‍යවහාරපදයෝ (සූත්‍රයෙහි නිර්වචන වශයෙන්) කියැ යුත්තාහු ය, සියලු ලොකසංඥාවෝ ද කියැයුත්තාහු ය. මේ ' නිරුක්ති පදසංහිතා ' යි.

(2) එහි අධිප්පාය කවරෙ යත් :

1. දනාදි කුශලධර්ම තෙමේ ඒකාන්තයෙන් ඒ ධර්මයෙහි හැසිරෙන පුහුල්හු (දිට්ඨධම්මික සම්පරායික අනර්ථයෙන්) රක්නේය, වැසිකලැ මහත් වූ ඡත්‍රය එය ධරන්නාහු යම්සේ රකී ද එමෙනි, ධර්මය මොනොවට පරිචිත කල්හි තෙල අනුසස වෙයි. ධර්මචාරි පුද්ගල අපායාදි දුගතියට නොයේ යයි.

මේ දේශනායෙහි ලා භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරේ යැ : අපායෙන් මිදෙනු කැමැති යම් කෙනෙක් වෙත් ද, ඔහු ධර්මචාරී වන්නාහ ' යි, මේ තෙල දේශනායෙහි ලා භාග්‍යවතුන් වහන්සේගේ අදහස යි.

2. ගෘහසන්ධිමුඛයෙහි (හිමියන් හෝ රාජපුරුෂයන් විසින්) ගන්නාලද සොරෙක් සිය සොරකම් හේතුයෙන් යම් පරිදි කම්කටොලින් පෙළනුලැබේ ද (සිරබැඳුම් ආදියෙන්) බඳනාත් ලැබේ ද එසෙයින් මේ සත්ත්වප්‍රජාව මියැ පරලොවැ දී සිය පව්කැමින් පෙළනු ලැබෙයි, බඳනාත් ලැබෙ යයි.

මෙහි ලා භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරෙ යැ : සිතා කරනලද රැස්කරනලද දුක් වෙදනා උපදවන කර්මයන්ගේ අනිෂ්ට වූ අමධුර වූ විපාකය විඳින්නේය ' යි මේ තෙල දේශනායෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස යි.

3. යමෙක් සුව කැමැති වූ සත්ත්වයන් දඬින් වෙහෙසා ද, තමහට සුව රිසියෙන ඒ හිංසක පුද්ගල පරලොව ගොස් සුව නොලබා යයි.

මෙහිලා භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරෙ යැ : යම් කෙනෙක් සුඛාර්ථීහු වන්නාහු ද ඔහු පව්කම් නො කරන්නාහයි මේ තෙල දෙශනායෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස යි.

4. යම් කලෙක පුරුෂ ථීනමිද්ධයෙන් මඩනාලදුයේ බොහෝ කොට අනුභව කරන්නේත් වෙද, හුන් සිටි තැන නිදනසුලු වූයේ පෙරළි පෙරළී හෝනේ වේ ද, දමූ කුඩු ඇ ශූකරනිවාපයෙන් පුස්නාලද මහත් ගම්හුරකු මෙන් වූ ' දුෂ්ප්‍රාඥ ' පුද්ගල පුනපුනා (පිළිසඳ විසින්) මවුකුසයට පැමිණේ යයි.

මේ දේශනායෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරේ යැ : යම් කෙනෙක් ජරාමරණහේතුයෙන් දුක්වන්නාහු ද, ඔහු භෝජනයෙහි මාත්‍රඥ වූවාහු ඉන්ද්‍රියයන්හි පියූ දෙර ඇත්තාහු පූර්වරාත්‍රාපරරාත්‍රයෙහි නිදි වැරීමෙහි යෙදුණාහු කුශලධර්මයන්හි විදර්ශක වූවාහු ස්ථවිර නවක මධ්‍යම වූ සබ්‍රම්සරුන් කෙරෙහි සගෞරව වූවාහු ද වන්නාහ ' යි, මේ තෙල දෙශනායෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස යි.

5. "අප්පමාදො අමතපදං පමාදො මච්චුනො පදං
අප්පමත්තා න මීයන්ති යෙ පමත්තා යථා මතා"ති.

ඉධ භගවතො කො අධිප්පායො; යෙ අමතපරියෙසනං පරියෙසිතුකාමා භවිස්සන්ති තෙ අප්පමත්තා විහරිස්සන්තීති, අයං එත්ථ භගවතො අධිප්පායො. අයං අධිප්පායො

3. තත්ථ කතමං නිදානං; යථා සො ධනියො ගොපාලකො භගවන්තං ආහ :

6. "නන්දති පුත්තෙහි පුත්තිමා
ගොමිකො ගොහි තථෙව නන්දති,
උපධීහි නරස්ස නන්දනා
න හි සො නන්දති යො නිරූපධී"ති.

භගවා ආහ :

7. "සොචති පුත්තෙහි පුත්තිමා
ගොමිකො ගොහි තථෙව සොචති,
උපධීහි නරස්ස සොචනා
න හි සො සොචති යො නිරූපධී"ති.

ඉමිනා වත්ථුනා ඉමිනා නිදානෙන එවං ඤායති : ඉධ භගවා බාහිරං පරිග්ගහං උපධිං ආහාති.

යථා ච මාරො පාපිමා ගිජ්ඣකූටා පබ්බතා පුථුසිලං පාතෙසි භගවා ආහ :

8. "සචෙපි[1] කෙවලං සබ්බං ගිජ්ඣකූටං චලෙස්සසි,
නෙව සම්මා විමුත්තානං බුද්ධානං අත්ථි ඉඤ්ජිතං.

9. "නභං ඵලෙය්‍ය පථවී චලෙය්‍ය
සබ්බෙව පාණා උදසන්තසෙය්‍යුං,
සල්ලම්පි චෙ උරසි පකම්පයෙය්‍යුං[2]
උපධීසු තාණං න කරොන්ති බුද්ධා"ති

ඉමිනා වත්ථුනා ඉමිනා නිදානෙන එවං ඤායති : ඉධ භගවා කායං උපධිං ආහාති.

යථා චාහ :

10. "න තං දළ්හං බන්ධනමාහු ධීරා
යදායසං දාරුජං බබ්බජං ච,[3]
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු
පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා"ති

ඉමිනා වත්ථුනා ඉමිනා නිදානෙන එවං ඤායති : ඉධ භගවා බාහිරෙසු වත්ථූසු තණ්හං ආහාති.

1. සචෙම්පි - සං.
2. කම්පයෙය්‍යුං - මජසං.
3. පබ්බජඤ්ච - මජසං.

5. කුශලධර්මයෙහි ස්මෘති අවිප්‍රවාස සඞ්ඛ්‍යාත අප්‍රමාදය නිර්වාණාමෘතයාගේ අධිගමයට කාරණ වෙයි, ස්මෘතිවිප්‍රවාස සඞ්ඛ්‍යාත ප්‍රමාදය (ප්‍රමත්තයා ජාතිය නො ඉක්මවූ හෙයින්) මරණයට කාරණ යැ, අප්‍රමත්ත වූවාහු (වහා මාර්ගඵලාධිගම කරන හෙයින්) නොමියන්නාහ, ප්‍රමත්ත වූ යම් කෙනෙක් වෙත් ද ඔහු (ප්‍රමාදමරණයෙන් මළහෙයින්) මළවුන් වැන්නාහ ' යි.

මෙහි ලා භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරෙ යැ : යම් කෙනෙක් නිවන සොයනු කැමැති වෙත් ද, ඔහු අප්‍රමත්ත ව වාසය කරන්නාහ ' යි. මේ තෙල දේශනායෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස යි. මේ අධිප්පාය යි.

(3) එහි නිදන කවරෙ යත් : ඒ මෙසේ යැ. ඒ ධනිය ගොපලු භාග්‍යවතුන් වහන්සේට මේ කීයැ :

6. පුතුන් ඇතියේ පුතුන් සමග හෝ පුතුන් කරණකොට සතුටු වෙයි, එසෙයින් ම ගවයන් ඇතියේ ගවයන් කරණකොට සතුටු වෙයි, කාමගුණූපධීන් කරණකොට මිනිසාට සතුට වෙයි, යමෙක් උපධි රහිත වේ ද හේ නො මැ සතුටු වේ යයි.

බුදුහු මේ වදළහ :

7. පුතුන් ඇතියේ පුතුන් කරණකොට ශෝක කෙරෙයි, ගවයන් ඇතියේ ගවයන් කරණකොට එසෙයින් මැ ශෝක කෙරෙයි, උපධීන් කරණකොට මිනිසාට ශෝකය වෙයි, යමෙක් කාමගුණූපධි රහිත වේ ද, හේ නො මැ ශොක කෙරේ යයි.

මේ පුත්ත ගවාදි කීර්තන සංඛ්‍යාත කාරණයෙන් මේ නිදනයෙන් මෙසේ මේ දේශනායෙහි බුදුහු බාහිර වස්තුව ' උපධි ' යයි කොට වදළහ ' යි හැහෙයි.

මෙසේත් නිදසුන් වෙයි : පවිටු මාර ගිජුකුළු පවුයෙන් මහත්වූ සෙලක් පෙරළි යැ. බුදුහු මේ වදළහ :

8. ඉදින් සියලු මැ ගිජුකුළු පව්ව සලන්නෙහි නමුදු උපධීන් කෙරෙන් මොනොවට මිදුණු බුදුවරයන්ගේ කම්පායෙක් නැත් මැ යි.

9. අහස පැලේ නමුදු පොළොව සැලේ නමුදු නොහොත් සියලු මැ ප්‍රාණිහු තැති ගන්නාහු නමුදු ඉදින් ශල්‍යයකුදු ළෙහි ගසන්නාහු නමුදු බුදුවරයෝ උපධීන් කෙරෙහි ත්‍රාණ (රැකීමක්) නො කෙරෙත්' යී.

මේ වස්තු (කාරණ) යෙන් මේ නිදනයෙන් මෙසේ හැහෙයි : මේ දේශනායෙහි ලා බුදුහු කය උපධි කොට වදළසේකැ' යි.

මෙසේත් වදුළහ !

10. අයෝමය වූ ද දූවමුවා වූ ද බබුස්තණමුවා වූ ද යම් බන්ධනයෙක් ඇද්ද ධීරයෝ එය දැඩි බැඳුමෙකැයි නො කියති, මිණිකොඩොල්හිදු අඹුදරුවන් කෙරෙහිදු අධික රාගයෙන් ඇලුණු යම් අපෙක්ෂාවක් ඇද්ද —

මේ වස්තුයෙන් මේ නිදනයෙන් මෙසේ මේ දේශනායෙහි බුදුහු බාහිර වස්තුවිෂයෙහි තෘෂ්ණාව වදළසේකැ ' යි හැහෙයි.

යථා චාහ :

11. "එතං දළ්හං බන්ධනමාහු ධීරා
ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං,
එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති
අනපෙක්ඛිනො කාමසුඛං පහායා"ති

ඉමිනා වත්ථුනා ඉමිනා නිදානෙන එවං ඤායති : ඉධ භගවා බාහිර වත්ථුකාය තණ්හාය පහානං ආහාති.

යථා චාහ :

12. "ආතුරං අසුචිං පූතිං දුග්ගන්ධං දෙහනිස්සිතං,
පග්ඝරන්තං දිවා රත්තිං බාලානං අභිනන්දිතං"ති

ඉමිනා වත්ථුනා ඉමිනා නිදානෙන එවං ඤායති : ඉධ භගවා අජ්ඣත්තිකවත්ථුකාය තණ්හාය පහානං ආහාති.

යථා චාහ :

13. "උච්ඡින්ද සිනෙහමත්තනො
කුමුදං සාරදිකංව පාණිනා,
සන්තිමග්ගමෙව බ්‍රූහය
නිබ්බානං සුගතෙන දෙසිත"න්ති.

ඉමිනා වත්ථුනා ඉමිනා නිදානෙන එවං ඤායති : ඉධ භගවා අජ්ඣත්තික වත්ථුකාය තණ්හාය පහානං ආහාති. ඉදං නිදානං.

4. තත්ථ කතමො පුබ්බාපරසන්ධි :

යථාහ :

14. "කාමන්ධා ජාලසඤ්ඡන්නා[1] තණ්හාඡදනඡාදිතා,
පමත්තබන්ධුනා[2] බද්ධා, මච්ඡා'ව කුමිනාමුඛෙ.
ජරාමරණමන්වෙන්ති වච්ඡො ඛීරපකො'ව මාතර"න්ති.

අයං කාමතණ්හා වුත්තා. සා කතමෙන පුබ්බාපරෙන යුජ්ජති.

යථා චාහ :

15. "රත්තො අත්ථං න ජානාති රත්තො ධම්මං න පස්සති,
අන්ධතමං තදා හොති යං රාගො සහතෙ නර"න්ති.

ඉති අන්ධතාය ච සඤ්ඡන්නතාය ච සායෙව තණ්හා අභිලපිතා. යඤ්චාහ : "කාමන්ධා ජාලසඤ්ඡන්නා තණ්හාඡදනඡාදිතා"ති. යඤ්චාහ : "රත්තො අත්ථං න ජානාති රත්තො ධම්මං න පස්සතී"ති. ඉමෙහි පදෙහි පරියුට්ඨානෙහි සායෙව තණ්හා අභිලපිතා. යං අන්ධකාරං අයං දුක්ඛ-සමුදයො, යා ච තණ්හා පොනොභවිකා.

1. ජාලසච්ඡන්නා - සිමු
2. බන්ධනා - පු.

මෙසේත් වදළහ :

11. පහත (සිවු අපාය) ට ඇදලන ලිහිල් වූ මිදීමට දුෂ්කර වූ තෙල කාමාපෙක්ෂාව දැඩිවූ බන්ධනයෙකැ ' යි (බුද්ධාදී) ප්‍රාඥයෝ කියති, කාමාපෙක්ෂා නැත්තාහු තෙල බන්ධනය ද සිඳ කම්සුව හැරපියා ගිහිගෙන් නික්මයෙත්, යයි.

මේ වස්තුයෙන් මේ නිදනයෙන් බුදුහු බාහිර වස්තුගත තෘෂ්ණාවගේ ප්‍රහාණය වදළහ ' යි හැහේ.

මෙසේත් වදළහ :

12. උපද්‍රවයෙන් ආතුර වූ අපවිත්‍ර වූ කුණු වූ දුගඳ ඇති සිරුර ඇසිරිකළ මලය දවරැයෙහි වැගිරෙන (මේ කය) බාලයන් විසින් (තෘෂ්ණා මාන දෘෂ්ටීන්) අභිනන්දිත වේ යයි.

මේ වස්තුයෙන් මේ නිදනයෙන් බුදුහු මේ දේශනායෙහි ලා අධ්‍යාත්මවස්තුගත තෘෂ්ණාවගේ ප්‍රහාණය වදළසේකැ ' යි හැහේ.

මෙසේත් වදළහ :

13. සරාකලැ හටගත් කුමුදුමලක් අතින් (සිඳින්නාක්) මෙන් තමාගේ තෘෂ්ණා සංඛ්‍යාත ස්නේහය (රහත්මගින්) සිඳලව (අෂ්ටාඞ්ගික) ශාන්තිමාර්ගය මැ වඩව, සුගතයන් විසින් නිවන (ශාන්ත යයි) දේශිත හෙයිනි.

මේ වස්තුයෙන් මේ නිදනයෙන් මෙහි ලා බුදුහු අධ්‍යාත්මවස්තුගත වූ තෘෂ්ණාවගේ ප්‍රහාණ වදළසේකැ ' යි හැහේ. මේ '' නිදන '' යි.

(4) ඒ චතුබ්‍යූහයෙහි පුබ්බාපරසන්ධි කවරෙ යත් :

මේ වදළහ :

14. ක්ලේශකාමයෙන් අන්ධ වූ තෘෂ්ණාජාලයෙන් වෙළුණු තෘෂ්ණා සංඛ්‍යාත අන්ධකාරයෙන් වැසුණු කෙමිනමුවෙහි (බැඳුණු) මසුන් මෙන් ප්‍රමාද නමැති බන්ධනයෙන් බැඳුණු සත්ත්වයෝ මව්දෙන කරා එන කිරි බොන වස්සකු මෙන් ජරාවට හා මරණයට පුනපුනා පැමිණෙත් යයි.

මේ කාමතෘෂ්ණාව වදරනලදු. ඒ කාමතෘෂ්ණාව පූර්ව වූ හෝ අපර වූ හෝ කවර දෙශනාන්තරයක් සමග යෙදේ ද යත් :

මෙසේත් වදළහ :

15. රාගයෙන් රක්ත වූයේ (ස්වාර්ථාදී) අර්ථය නො දනී, රාගරක්ත වූයේ ධර්මය නො දකී, යම් කලෙක රාගය තෙමේ මිනිසා සහන (අභිභවන) ය කෙරේ ද, එකල්හි බහල වූ අන්ධකාරය වේ යයි.

මෙසේ අන්ධතායෙන් ද සඤ්ඡන්නතායෙන් ඒ යට ගයෙහි කී තෘෂ්ණාව ම කියන ලද්දීය. '' කාමන්ධා ජාලසඤ්ඡන්නා තණ්හාඡදනඡාදිතා '' යී යම් තෘෂ්ණාවකුත් වදළසේක් ද, '' රත්තො අත්ථං න ජානාති රත්තො අත්ථං න පස්සති '' යී යම් තෘෂ්ණාවකුත් වදළසේක් ද, ක්ලේශපරියුට්ඨානය දක්වන මේ පදයන්ගෙන් ඒ කාම තෘෂ්ණාව මැ වදරනලද්දීය. කාම සංඛ්‍යාත යම් අන්ධකාරයක් ඇද්ද මේ දුක්ඛසමුදය යි, පුනර්භවය ඇතිකරන යම් තෘෂ්ණාවක් ඇද්ද එය යි.

යඤ්චාහ: කාමා''ති ඉමෙ කිලෙසකාමා, යඤ්චාහ: ජාලසඤ්ඡන්නා''ති එතෙසං යෙව කාමානං පයොගෙන පරියුට්ඨානං දස්සෙති, තස්මා කිලෙසවසෙන ච පරියුට්ඨානවසෙන ච තණ්හා බන්ධනං වුත්තං. යෙ එදිසිකා තෙ ජරමරණං අන්වෙන්ති. අයං භගවතා යථානික්ඛිත්ත-ගාථාබලෙන දස්සිතා ජරමරණමන්වෙන්ති''ති.

16. ''යස්ස පපඤ්චා ඨිති ච නත්ථි
සන්දානං[1] ''පලිඝං ච වීතිවත්තො,
තං නිත්තණ්හං මුනිං චරන්තං
න විජානාති සදෙවකොපි ලොකො''ති.

'පපඤ්චා' නාම: තණ්හාදිට්ඨිමානා තදභිසංඛතා ච සඞ්ඛාර 'ඨිති' නාම: අනුසයා. 'සන්දානං' නාම තණ්හාය පරියුට්ඨානං. යානි ඡත්තිංසතණ්හාය ජාලිනියා විචරිතානි. 'පලිඝො' නාම: මොහො. යෙ ච පපඤ්චා සඞ්ඛාරා යා ච ඨිති යං සන්දානං[1] ච යං පලිඝං ච යො එතං සබ්බං සමතික්කන්තො අයං වුච්චති නිත්තණ්හො ඉති.

තත්ථ පරියුට්ඨානසඞ්ඛාරා දිට්ඨධම්මවෙදනියා වා උපපජ්ජවෙදනියා වා, අපරපරිවෙදනීයා වා, එවං තණ්හා තිවිධං ඵලං දෙති: දිට්ඨෙ වා ධම්මෙ උපපජ්ජෙ වා අපරෙ වා පරියායෙ. එවං භගවා ආහ: ''යං ලොභපකතං කම්මං කරොති කායෙන වාචාය මනසා තස්ස විපාකං අනුභොති දිට්ඨෙ වා ධම්මෙ උපපජ්ජෙ වා අපරෙ වා පරියායෙ''ති. ඉදං භගවතො පුබ්බාපරෙන යුජ්ජති. තත්ථ පරියුට්ඨානං දිට්ඨධම්මවෙදනීයං වා කම්මං උපපජ්ජවෙදනීයං වා කම්මං අපරපරියාය වෙදනීයං[2] වා කම්මං. එවං කම්මං තිධා විපච්චති: දිට්ඨෙ වා ධම්මෙ උපපජ්ජෙ වා අපරෙවා පරියායෙ. යථාහ: ''යෙඤ්ච බාලො ඉධ පාණාතිපාතී හොති - පෙ - මිච්ඡාදිට්ඨී හොති, තස්ස දිට්ඨෙ වා ධම්මෙ විපාකං පටිසංවෙදෙති උපපජ්ජෙ වා අපරෙ වා පරියායෙ''ති. ඉදං භගවතො පුබ්බාපරෙන යුජ්ජති. තත්ථ පරියුට්ඨානං පටිසංඛානබලෙන පහාතබ්බං, සඞ්ඛාරා දස්සනබලෙන, ඡත්තිංසතණ්හාවිචරිතානි භාවනා-බලෙන පහාතබ්බානීති. එවං තණ්හාපි තිධා පහීයති. යා නිත්තණ්හතා අයං සඋපාදිසෙසා නිබ්බානධාතු, භෙදා කායස්ස අයං අනුපාදිසෙසා නිබ්බානධාතු.

පපඤ්චො නාම වුච්චති අනුබන්ධො, යං චාහ භගවා: ''පපඤ්චොති අතීතානාගතපච්චුප්පන්නං චක්ඛුවිඤ්ඤෙය්‍යං රූපං ආරබ්භා''ති. යං චාහ භගවා:- ''අතීතෙ රාධ, රූපෙ අනපෙක්ඛො හොහි අනාගතං රූපං මා අභිනන්දි, පච්චුප්පන්නස්ස රූපස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය චාගාය පටිනිස්සග්ගාය පටිපජ්ජා''ති. ඉදං භගවතො පුබ්බාපරෙන

1. සඞ්ඛානං - කත්ථචි.
2. අපරපරිය වෙදනීයං - සීමු.
අපරපරියාය වෙදනීයං - මජසං.

" කාම " යි යමකුත් වදළසේක් ද, මොහු ක්ලේශකාමයෝ යැ, "ජාල සඤ්ජන්නා " යි යමකුත් වදළසේක් ද, ඒ කාමයන්ගේ මැ සමුදචාරයෙන් පරියුට්ඨානය දක්වනසේක. එහෙයින් ක්ලේශවශයෙන් ද පරියුට්ඨානවශයෙන් ද තෘෂ්ණාව බන්ධන යයි වදරනලදී. යම් කෙනෙක් තෘෂ්ණාබන්ධන ඇත්තාහු ද ඔහු ජරාමරණයට පුනපුනා එති. භාග්‍යවතුන් විසින් යථානික්ඛිත්ත ගාථාබලයෙන් " ජරාමරණමන්වෙන්ති " යි මේ සංසාර ප්‍රවෘත්තිය දක්වනලද්දීය.

16. යම් ක්ෂීණාස්‍රවයක්හට (තෘෂ්ණා දෘෂ්ටි මාන) ප්‍රපඤ්චයෝත් (කාමාදි) අනුශය ධර්මයෝත් නැද්ද, තණ්හාපරියුට්ඨාන සංඛ්‍යාත සන්දනයත් මොහ සංඛ්‍යාත පළිඝයත් (යමෙක්) ඉක්මැවූයේ ද, තෘෂ්ණා රහිත ව ඉරියව් පවත්වන ඒ ක්ෂීණාස්‍රව මුනිහු සදෙවක ලොකයා ද (චරිම නාමරූප නිරොධයෙන් පසු කොහි උපන්හු දැයි) නො දනී යයි.

' පපඤ්ච ' නම් : තෘෂ්ණා දෘෂ්ටි මානයෝ ද, ඒ තෘෂ්ණාදීන් විසින් රැස්කරනලද සංස්කාරයෝ ද වෙති. ' ඨිති ' නම් : අනුශයයෝ යි. ' සන්දන ' නම් : තෘෂ්ණාවගේ පයඖත්ථාන යැ, සතිස්වැදෑරුම් තෘෂ්ණාජාලිනියගේ යම් විචරිතයෝ වෙත් ද ඔහු යි. ' පළිඝ ' නම් : මොහය යි. යම් පපඤ්ච සංස්කාර කෙනෙක් වෙත් ද, අනුශය සංඛ්‍යාත යම් ඨිතියක් වේ ද, සන්දන සංඛ්‍යාත යම් තෘෂ්ණාවිචරිත කෙනෙක් වෙත් ද, මොහ සංඛ්‍යාත යම් පළිඝයකුත් වේ ද, යමෙක් තෙල සංස්කාරාදි සියල්ල මොනොවට ඉක්මවූයේ ද, මේ ක්ෂීණාස්‍රව ' නිත්තණ්හ ' යයි කියනු ලැබේ.

එහි පරියුට්ඨානසඞ්ඛාරයෝ දෘෂ්ටධර්ම (ඉහාත්ම) යෙහි වින්දයුතු විපාක ඇත්තාහු හෝ උපපද්‍ය (අනන්තර) ආත්මභාවයෙහි වින්දයුතු විපාක ඇත්තාහු හෝ අපරාපරිය (අපර අපර) ආත්මභාවයන්හි වින්දයුතු විපාක ඇත්තාහු හෝ වෙති. මෙසේ තෘෂ්ණාව ප්‍රත්‍යක්ෂ ආත්මභාවයෙහි හෝ අනන්තර ආත්මභාවයෙහි හෝ අපරාපරිය ආත්මභාව යෙහි හෝ ත්‍රිවිධ විපාකඵලය දෙයි. බුදුහු මෙසේ වදළහ : " කයින් වචනයෙන් සිතින් ලොභහෙතුයෙන් කරනලද යම් කර්මයක් ඇද්ද, ඒ කර්මයාගේ විපාකය මේ අත්බැවිහි හෝ අනතුරු අත්බැවිහි හෝ අපරආත්මභාවයක හෝ විඳී " යයි. මේ දෙශනාව භාග්‍යවතුන් වහන්සේගේ පූර්වාපරදෙශනා හා යෙදෙයි. එහි තණ්හාපරියුට්ඨානය දිට්ඨධම්මවෙදනීය කර්මයක් හෝ උපපජ්ජවෙදනීය කර්මයක් හෝ අපරාපරියවෙදනීය කර්මයක් හෝ වෙයි. මෙසේ කර්මය තුන්පරිද්දෙකින් විපාක දෙයි : ඉහාත්මයෙහි හෝ උපපද්‍යආත්මභාවයෙහි හෝ අපරපරියාය ආත්මභාවයෙහි හෝ යි. මෙසේ වදළහ : " ඉදින් බාල තෙමේ මෙලොවැ ප්‍රාණවධ කරන්නේ වේ ද . . . මිසදිටු ඇත්තේ වේ ද, ඒ කර්මයාගේ විපාකය ඉහාත්මයෙහි හෝ උපපද්‍යආත්මයෙහි හෝ අපරපරියාය ආත්මයක හෝ විඳී " යයි. භාග්‍යවතුන් වහන්සේගේ මේ දෙශනාව පූර්වාපරය හා යෙදෙයි. එහි තණ්හාවිචරිතය ප්‍රතිපක්ෂභාවනාබලයෙන් ප්‍රහාණ කළයුතු යැ, (දිට්ඨිගත සම්ප්‍රයුක්ත සතර සිත්හි හා විචිකිච්ඡාසම්ප්‍රයුක්ත සිතෙහි ද) සංස්කාරයෝ දර්ශන (ප්‍රථම මාර්ගඥාන) බලයෙන් ද, (දර්ශනප්‍රහීණාවශෙෂ) සතිස් තෘෂ්ණාවිචරිතයෝ භාවනා බලයෙන් ද ප්‍රහාණය කළයුත්තාහු යයි මෙසේ තෘෂ්ණාව ද තුන්පරිද්දෙකින් ප්‍රහීණ වෙයි. යම් නිෂ්තෘෂ්ණාබවක් වේ ද මේ සඋපාදිසේස නිර්වාණධාතු යැ, කරජකය බිඳීමෙන් (යම් නිවනක් වේ ද) මේ අනුපාදිසේස නිර්වාණධාතු යි.

තෘෂ්ණාදීන්ගේ අනුප්‍රබන්ධවශයෙන් පැවැත්ම ' පපඤ්ච ' නමැයි කියනු ලැබේ. මෙ ද වදළහ බුදුහු : " අතීතානාගතප්‍රත්‍යුප්පන්න වූ චක්ෂුර්විඥානයෙන් දතයුතු රූපය නිසා ප්‍රපඤ්ච (තෘෂ්ණාදීන්ගේ අනුබන්ධප්‍රවෘත්තිය) කෙරේ ය " යි. මෙ ද වදළහ බුදුහු : " රාධය, අතීත රූපයෙහි අපෙක්ෂා රහිත වෙව, අනාගත රූපාලම්බනය නහමක් අභිනන්දනය කර, ප්‍රත්‍යුප්පන්න රූපයාගේ නිර්වෙදය පිණිස නො ඇලීම පිණිස නිරුද්ධ කිරීම පිණිස ත්‍යාගය පිණිස දුරලීම පිණිස පිළිපද " යි. මේ සූත්‍රය භාග්‍යවතුන් වහන්සේගේ පූර්වාපරදෙශනාව හා යෙදෙයි. (මෙහි) යම් ප්‍රපඤ්චයෙකුත් වේ ද, යම්

ජුජ්ජති. යො චාපි පපඤ්චො යෙ ච සඞ්ඛාරා යා ච අතීතානාගතපච්චුප්පන්නස්ස අභිනන්දනා, ඉදං එකත්තං. අපි ච අඤ්ඤමඤ්ඤෙහි පදෙහි අඤ්ඤමඤ්ඤෙහි අක්ඛරෙහි අඤ්ඤමඤ්ඤෙහි බ්‍යඤ්ජනෙහි අපරිමාණා ධම්මදෙසනා වුත්තා භගවතා. එවං සුත්තෙන සුත්තං සංසන්දයිත්වා පුබ්බාපරෙන සද්ධිං යොජයිත්වා සුත්තං නිද්දිට්ඨං භවති.

සචායං[1] පුබ්බාපරසන්ධි චතුබ්බිධො: අත්ථසන්ධි බ්‍යඤ්ජනසන්ධි දෙසනාසන්ධි නිද්දෙසසන්ධීති.

තත්ථ අත්ථසන්ධි ඡප්පදානි: සංකාසනා පකාසනා විවරණා විභජනා උත්තානීකම්මතා පඤ්ඤත්තීති.

බ්‍යඤ්ජනසන්ධි ඡප්පදානි: අක්ඛරං පදං බ්‍යඤ්ජනං ආකාරො නිරුත්ති නිද්දෙසොති.

දෙසනාසන්ධි: න ච පථවිං[2] නිස්සාය ඣායති ඣායී ඣායති ච, න ච ආපං නිස්සාය ඣායති ඣායී ඣායති ච, න ච තෙජං නිස්සාය ඣායති ඣායී ඣායති ච, න ච වායුං නිස්සාය ඣායති ඣායී ඣායති ච, න ච ආකාසානඤ්චායතනං නිස්සාය -පෙ- න ච විඤ්ඤාණඤ්චායතනං නිස්සාය -පෙ- න ච ආකිඤ්චායතනං නිස්සාය -පෙ- න ච නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නිස්සාය -පෙ- න ච ඉමං ලොකං නිස්සාය න පි පරං ලොකං නිස්සාය. ඣායති ඣායී ඣායති ච, යමිදං උභයමන්තරෙන දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං විතක්කිතං විචාරිතං මනසානුචින්තිතං තම්පි න නිස්සාය ඣායති ඣායී ඣායති ච, අයං සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනිස්සිතෙන චිත්තෙන න ඤායති ඣායන්තො.

යථා මාරො පාපිමා ගොධිකස්ස කුලපුත්තස්ස විඤ්ඤාණං සමන්නෙසන්තො න ජානාති න පස්සති. සො හි පපඤ්චාතීතො තණ්හාපහානෙන, දිට්ඨිනිස්සයොපිස්ස නත්ථි. යථා ච ගොධිකස්ස එවං වක්කලිස්ස. සදෙවකෙන ලොකෙන සමාරකෙන සබ්‍රහ්මකෙන සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනිස්සිතචිත්තා න ඤායන්ති ඣායමානා. අයං දෙසනාසන්ධි.

1. සො චායං - මජසං.
2. පථවිං - මජසං.

සංස්කාර කෙනෙක් වෙත් ද, යම් අතීතානාගතප්‍රත්‍යුත්පන්න ධර්මයාගේ අභිනන්දනා යෙකුත් වේ ද, මේ දේශනාවචනය සමානාර්ථ වෙයි. එතෙකුදුවත් — අන්‍යොන්‍ය (වෙන වෙන) පදයෙන් අන්‍යොන්‍ය අක්ෂරයෙන් අන්‍යොන්‍ය ව්‍යඤ්ජනයෙන් භාග්‍යවතුන් විසින් අපරිමාණ ධර්මදෙශනාව වදරනලදි. මෙසේ සූත්‍රයෙන් සූත්‍රය සංසන්දනා කොට පූර්ව වූ හෝ අපර වූ හෝ දෙශනාව සමග යොද සූත්‍රය විස්තර කරන ලද වේ.

තවද මේ පූර්වාපරසන්ධිය ' අත්ථසන්ධි බ්‍යඤ්ජනසන්ධි දේසනාසන්ධි නිද්දෙස සන්ධි '' යයි චතුර්විධ වෙයි.

එහි (ක්‍රියාකාරකාදීන්ගේ වශයෙන් අර්ථයාගේ සම්බන්ධය දක්වන) අර්ථසන්ධිය : සඞ්කාසනා (සැකෙවින් ප්‍රකාශ කිරීම) යැ පකාසනා (පළමු කොට ප්‍රකාශකිරීම) යැ විවරණ (විස්තර කිරීම) යැ විභජනා (විභාග කිරීම) යැ උත්තානීකම්ම (ප්‍රකට කිරීම) යැ පඤ්ඤත්ති (ප්‍රකාරයෙන් හඳපන) යැ යන ෂට්පදයෝ යි.

(පදයක් පදන්තරය සමග සම්බන්ධය දක්වන) බ්‍යඤ්ජන සන්ධිය : (අපර්‍යවසිත පදයෙහි වර්ණ සංඛ්‍යාත) අක්ඛර යැ (නාමාඛ්‍යාතාදි) පද යැ (වාක්‍ය සංඛ්‍යාත පදසමුදය ලක්ෂණ) බ්‍යඤ්ජන යැ (වාක්‍යවිභාග ලක්ෂණ වූ) ආකාර යැ (නිර්වචන සංඛ්‍යාත) නිරුත්ති යැ (නිර්වචන විස්තාර සංඛ්‍යාත) නිද්දෙස යැ යන ෂට්පදයෝ යි.

(දේශනාව දේශනාන්තරයක් සමග සංසන්දනය කරන) දේසනාසන්ධිය නම් : '' ඵලසමාපත්ති ධ්‍යානයෙන් ධ්‍යාන කරනුයේ (විෂය සංඛ්‍යාත) පෘථිවිය නිශ්‍රය කොට නො ද ධ්‍යාන කෙරෙයි, එහෙත් හේ (සියලු සංස්කාරයන්ගෙන් නික්මගිය නිවන අරමුණු කොට) ධ්‍යාන කෙරෙයි. ධ්‍යාන කරනුයේ ආපය නිසා නො ද ධ්‍යාන කෙරෙයි, එහෙත් නිවන අරමුණු කොට ධ්‍යාන කෙරෙයි. ධ්‍යාන කරනුයේ තේජස නිසා නො ද ධ්‍යාන කෙරෙයි, එහෙත් නිවන අරමුණු කොට ධ්‍යාන කෙරෙයි. ධ්‍යාන කරනුයේ වායුව නිසා නො ද ධ්‍යාන කෙරෙයි, එහෙත් (නිවන අරමුණු කොට) ධ්‍යාන කෙරෙයි. නො ද ආකාසානඤ්චායතනය නිසා . . . නො ද විඤ්ඤාණඤ්චායතනය නිසා . . . නො ද ආකිඤ්චඤ්ඤායතනය නිසා . . . නො ද නේවසඤ්ඤානාසඤ්ඤායතනය නිසා . . . (දිට්ඨධම්ම වූ සත්ත්වසන්තාන සංඛ්‍යාත) මේ ලෝකය නිසා . . . ධ්‍යාන කරනුයේ (භවාන්තරසංක්ෂෙපයට ගිය සත්ත්වසන්තාන සංඛ්‍යාත) පරලෝකය නිසා නො ද ධ්‍යාන කෙරෙයි, එහෙත් නිවන අරමුණු කොට ධ්‍යාන කෙරෙයි. ඉධලෝක පරලෝක දෙක විනා අනින්ද්‍රිය බද්ධ වූ (සොයා හෝ නො සොයා) ප්‍රාප්ත වූ — ලැබුණු (ලද හෝ නො ලද හෝ) පර්‍යෙෂණ කළ විතර්කණ විචාරණ කළ සිතින් පුනපුනා සිතනලද යම් රූපායතනයක් ශබ්දයතනයක් ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යායතනයක් ධර්මාලම්බන පර්‍යාපන්න වූ විඥානයක් ඇද්ද, ධ්‍යාන කරනුයේ එ ද නිශ්‍රය කොට ධ්‍යාන නො කෙරෙයි. එහෙත් නිවන අරමුණු කොට ධ්‍යාන කෙරෙයි. මේ ක්ෂීණාශ්‍රව තෘෂ්ණා දෘෂ්ටි නිශ්‍රය රහිත වූ සිතින් යුක්තව ධ්‍යාන කරනුයේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි මහණබමුණන් සහිත වූ දෙවිමිනිසුන් සහිත වූ ප්‍රජාව විසින් නො දන්නා ලැබෙයි.

පවිටු මාර ගොධික කුලපුත්‍රයාගේ (පිරිනිවීමෙන් පසු) විඥානය සොයනුයේ යම් පරිදි නො දනී ද නො දකී ද, යම්හෙයෙකින් ඒ ගොධික කුලපුත් තෘෂ්ණාප්‍රහාණයෙන් ප්‍රපඤ්චයන් ඉක්මැවූයේ ද, ඔහුට දෘෂ්ටිනිශ්‍රයත් නැද්ද එහෙයිනි. ගොධික කුලපුත්හුගේ යම්සේ ද වක්කලිතෙරුන්ගේ ද එසේ යි. දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයා විසින් මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාව විසින් තෘෂ්ණාදෘෂ්ටි නිශ්‍රය නැතිව ධ්‍යාන කරන්නාහු නො දන්නා ලැබෙත්. මේ ' දේසනාසන්ධි ' යැ.

තත්ථ කතමො[1] නිද්දෙසසන්ධි : නිස්සිතචිත්තා අකුසලපක්ඛෙන නිද්දිසිතබ්බා. අනිස්සිතචිත්තා කුසලපක්ඛෙන නිද්දිසිතබ්බා. නිස්සිතචිත්තා කිලෙසෙන[2] නිද්දිසිතබ්බා. අනිස්සිතචිත්තා වොදානෙන නිද්දිසිතබ්බා. නිස්සිතචිත්තා සංසාරප්පවත්තියා නිද්දිසිතබ්බා. අනිස්සිතචිත්තා සංසාරනිවත්තියා නිද්දිසිතබ්බා. නිස්සිතචිත්තා තණ්හාය ච අවිජ්ජාය ච නිද්දිසිතබ්බා. අනිස්සිතචිත්තා සමථෙන ච විපස්සනාය ච නිද්දිසිතබ්බා. නිස්සිතචිත්තා අහිරිකෙන ච අනොත්තප්පෙන ච නිද්දිසිතබ්බා. අනිස්සිතචිත්තා හිරියා ච ඔත්තප්පෙන ච නිද්දිසිතබ්බා. නිස්සිතචිත්තා අසතියා ච අසම්පජඤ්ඤෙන ච නිද්දිසිතබ්බා, අනිස්සිතචිත්තා සතියා ච සම්පජඤ්ඤෙන ච නිද්දිසිතබ්බා, නිස්සිතචිත්තා අයොනියා ච අයොනිසො මනසිකාරෙන ච නිද්දිසිතබ්බා. අනිස්සිතචිත්තා යොනියා ච යොනිසො මනසිකාරෙන ච නිද්දිසිතබ්බා. නිස්සිතචිත්තා කොසජ්ජෙන ච දොවචස්සෙන ච නිද්දිසිතබ්බා, අනිස්සිතචිත්තා විරියාරම්භෙන ච සොවචස්සෙන ච නිද්දිසිතබ්බා, නිස්සිතචිත්තා අස්සද්ධියෙන ච පමාදෙන ච නිද්දිසිතබ්බා. අනිස්සිතචිත්තා සද්ධාය ච අප්පමාදෙන ච නිද්දිසිතබ්බා. නිස්සිතචිත්තා අසද්ධම්මසවණෙන ච අසංවරෙන ච නිද්දිසිතබ්බා. අනිස්සිතචිත්තා සද්ධම්මසවණෙන ච සංවරෙන ච නිද්දිසිතබ්බා, නිස්සිතචිත්තා අභිජ්ඣාය ච බ්‍යාපාදෙන ච නිද්දිසිතබ්බා. අනිස්සිතචිත්තා අනභිජ්ඣාය ච අබ්‍යාපාදෙන ච නිද්දිසිතබ්බා. නිස්සිතචිත්තා නීවරණෙහි ච සංයොජනියෙහි ච නිද්දිසිතබ්බා. අනිස්සිතචිත්තා රාගවිරාගාය ච චෙතොවිමුත්තියා අවිජ්ජාවිරාගාය ච පඤ්ඤාවිමුත්තියා නිද්දිසිතබ්බා. නිස්සිතචිත්තා උච්ඡෙදදිට්ඨියා ච සස්සතදිට්ඨියා ච නිද්දිසිතබ්බා. අනිස්සිතචිත්තා සඋපාදිසෙසාය ච අනුපාදිසෙසාය ච නිබ්බානධාතුයා නිද්දිසිතබ්බා. අයං නිද්දෙසසන්ධි. තෙනාහ ආයස්මා මහාකච්චායනො : "නෙරුත්තමධිප්පායො"ති.

නියුත්තො චතුබ්‍යූහො හාරො.

## 3. 1. 7

## ආවට්ටහාරවිභඞ්ගො

තත්ථ කතමො ආවට්ටො හාරො : "එකම්හි පදට්ඨානෙ"ති අයං.

1. "ආරභථ[3] නික්ඛමථ[4] යුඤ්ජථ බුද්ධසාසනෙ,
ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරො"ති.

1. කතමා – සීමු.
2. සංකිලෙසෙන – සීමු.
3. ආරම්භථ – මජසං.
4. නික්කමථ – මජසං.

එහි නිද්දේසසන්ධි කවරෙ යැ : තෘෂ්ණාදෘෂ්ටීන් නිශ්‍රිත සිත් ඇත්තාහු අකුශල පක්ෂයෙන් (පුග්ගලාධිට්ඨානදෙසනායෙහි ලා) දක්වියයුත්තාහ, අනිශ්‍රිත සිත් ඇත්තාහු කුශලපක්ෂයෙන් දක්වියයුත්තාහ. නිශ්‍රිත සිත් ඇති පුද්ගලයෝ ක්ලේශයෙන් දක්විය යුත්තාහ, අනිශ්‍රිත සිත් ඇති පුද්ගලයෝ ව්‍යවදානයෙන් දක්විය යුත්තාහ. නිශ්‍රිතචිත්තයෝ සංසාරප්‍රවෘත්තියෙන් දක්වියයුත්තාහ, අනිශ්‍රිතචිත්තයෝ සංසාර නිවෘත්තියෙන් දක්විය යුත්තාහ. නිශ්‍රිතචිත්තයෝ තෘෂ්ණායෙන් ද අවිද්‍යායෙන් ද දැක්විය යුත්තාහ. අනිශ්‍රිත චිත්තයෝ ශමථයෙන් ද විදර්ශනායෙන් ද දක්විය යුත්තාහ, නිශ්‍රිත සිත් ඇත්තාහු අහිරික අනොත්තප්ප දෙකින් දක්වියයුත්තාහ. අනිශ්‍රිතචිත්තයෝ හිරි ඔත්තප්ප දෙකින් දක්වියයුත්තාහ. නිශ්‍රිතචිත්තයෝ අසති අසම්පජඤ්ඤ දෙකින් දක්වියයුත්තාහ, අනිශ්‍රිතචිත්තයෝ සති සම්පජ්ජඤ්ඤ දෙකින් දක්විය යුත්තාහ. නිශ්‍රිතචිත්තයෝ අනුපාය අනුපායමනසිකාර දෙකින් දක්වියයුත්තාහ, අනිශ්‍රිතචිත්තයෝ උපාය උපායමනසිකාර දෙකින් දක්වියයුත්තාහ. නිශ්‍රිත සිත් ඇත්තාහු කුසීදභාවයෙන් ද දුර්වචභාවයෙන් ද දක්වියයුත්තාහ, අනිශ්‍රිත සිත් ඇත්තාහු වීය්‍ය්‍යාරම්භ යෙන් ද සුවචභාවයෙන් ද දක්වියයුත්තාහ. නිශ්‍රිත සිත් ඇත්තාහු අශ්‍රද්ධායෙන් ද ප්‍රමාද යෙන් ද දක්වියයුත්තාහ, අනිශ්‍රිත සිත් ඇත්තාහු ශ්‍රද්ධායෙන් ද අප්‍රමාදයෙන් ද දක්විය යුත්තාහ. නිශ්‍රිතචිත්තයෝ අසද්ධර්මශ්‍රවණයෙන් ද අසංවරයෙන් ද දක්වියයුත්තාහ, අනිශ්‍රිතචිත්තයෝ සද්ධර්මශ්‍රවණයෙන් ද සංවරයෙන් ද දක්වියයුත්තාහ. නිශ්‍රතචිත්තයෝ අභිධ්‍යායෙන් ද ව්‍යාපාදයෙන් ද දක්වියයුත්තාහ., අනිශ්‍රිතචිත්තයෝ අනභිධ්‍යායෙන් ද අව්‍යාපාදයෙන් ද දක්වියයුත්තාහ. නිශ්‍රිත සිත් ඇත්තාහු නීවරණයන්ගෙන් ද සංයෝජන යන්ගෙන් ද දක්වියයුත්තාහ, අනිශ්‍රිත සිත් ඇත්තාහු රාගවිරාග චෙතොවිමුක්තියෙන් ද අවිජ්ජාවිරාග පඤ්ඤාවිමුක්තියෙන් ද දක්වියයුත්තාහ. නිශ්‍රිත සිත් ඇත්තාහු උච්ඡෙද දෘෂ්ටියෙන් ද ශාශ්වතදෘෂ්ටියෙන් ද දක්වියයුත්තාහ, අනිශ්‍රිත සිත් ඇත්තාහු සඋපාදිසෙස වූ ද අනුපාදිසෙස වූ ද නිර්වාණධාතුයෙන් දක්වියයුත්තාහ. මේ ' නිද්දෙස සන්ධි ' යි. එයින් වදළහ — ආයුෂ්මත් මහාකාත්‍යායන මහතෙරණුවෝ : '' තෙරුත්තමධිප්පායො '' යි.

චතුබ්‍යූහ හාරය යොදනලදී.

## 3. 1. 7

## ආවට්ටහාරවිභඞ්ගය

එහි ' ආවට්ට ' හාරය කවරෙ යත් : '' එකම්හි පදට්ඨානෙ '' යන මේ නිර්දේශ ගාථාව යැ.

1. ආරම්භධාතු සංඛ්‍යාත වීය්‍ය්‍ය කරවූ, කෞසීද්‍යයෙන් නික්මයන නිෂ්ක්‍රමධාතු සංඛ්‍යාත වීය්‍ය්‍ය කරවූ, ශමථ විදර්ශනා සංඛ්‍යාත බුද්ධශාසනයෙහි යුක්තප්‍රයුක්ත වවූ, බලසම්පන්න ඇත්රජෙක් බටදඬින් කළ ගෙයක් ඇසිල්ලෙකින් වනසන්නාක් මෙන් මරහුගේ කාමාදි ක්ලේශසේනාව විද්ධ්වංසන කරව ' යි.

"ආරභථ නික්කමථා"ති විරියස්ස පදට්ඨානං. "යුඤ්ජථ බුද්ධසාසනෙ"ති සමාධිස්ස පදට්ඨානං. "ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරො"ති පඤ්ඤාය පදට්ඨානං. "ආරභථ නික්කමථා"ති විරියින්ද්‍රියස්ස පදට්ඨානං. "යුඤ්ජථ බුද්ධසාසනෙ"ති සමාධින්ද්‍රියස්ස පදට්ඨානං. "ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරො"ති පඤ්ඤින්ද්‍රියස්ස පදට්ඨානං. ඉමානි පදට්ඨානානි දෙසනා.

අයුඤ්ජන්තානං වා සත්තානං යොගෙ යුඤ්ජන්තානං වා ආරම්භො, තත්ථ යෙ න යුඤ්ජන්ති තෙ පමාදමූලකා න යුඤ්ජන්ති. සො පමාදො දුවිධො: තණ්හාමූලකො අවිජ්ජාමූලකො ච. තත්ථ අවිජ්ජාමූලකො: යෙන අඤ්ඤාණෙන නිවුතො ඤෙය්‍යට්ඨානං නප්පජානාති පඤ්චක්ඛන්ධා උප්පාදවයධම්මාති අයං අවිජ්ජාමූලකො. යො තණ්හාමූලකො සො තිවිධො: අනුප්පන්නානං භොගානං උප්පාදාය පරියෙසන්තො පමාදං ආපජ්ජති, උප්පන්නානං භොගානං ආරක්ඛනිමිත්තං පරිභොගනිමිත්තඤ්ච පමාදං ආපජ්ජති, අයං ලොකෙ චතුබ්බිධො පමාදො, එකවිධො අවිජ්ජාය, තිවිධො තණ්හාය. තත්ථ අවිජ්ජාය නාමකායො පදට්ඨානං, තණ්හාය රූපකායො පදට්ඨානං. තං කිස්ස හෙතු: රූපීසු භවෙසු අජ්ඣොසානං අරූපීසු සම්මොහො. තත්ථ රූපකායො රූපක්ඛන්ධො නාමකායො චත්තාරො අරූපිනො ඛන්ධා. ඉමෙ පඤ්චක්ඛන්ධා කතමෙන උපාදානෙන සඋපාදානා: තණ්හාය ච අවිජ්ජාය ච. තත්ථ තණ්හා ද්වෙ උපාදානානි: කාමූපාදානං ච සීලබ්බතුපාදානඤ්ච. අවිජ්ජා ද්වෙ උපාදානානි: දිට්ඨුපාදානඤ්ච අත්තවාදුපාදානඤ්ච. ඉමෙහි චතූහි උපාදානෙහි යෙ සඋපාදානා ඛන්ධා ඉදං දුක්ඛං. චත්තාරි උපාදානානි අයං සමුදයො. පඤ්චක්ඛන්ධා දුක්ඛං. තෙසං භගවා පරිඤ්ඤාය ච පහානාය ච ධම්මං දෙසෙති, දුක්ඛස්ස පරිඤ්ඤාය සමුදයස්ස පහානාය.

තත්ථ යො තිවිධො තණ්හාමූලකො පමාදො අනුප්පන්නානං භොගානං උප්පාදාය පරියෙසති, උප්පන්නානං භොගානං ආරක්ඛණං ච කරොති පරිභොගනිමිත්තඤ්ච. තස්ස සම්පටිවෙධෙන රක්ඛණා පටිසංහරණා, අයං සමථො. සො කථං භවති: යදා ජානාති කාමානං අස්සාදං ච අස්සාදතො ආදීනවං ච ආදීනවතො නිස්සරණං ච නිස්සරණතො ඔකාරං ච සඞ්කිලෙසං ච වොදානං ච නෙක්ඛම්මෙ ච ආනිසංසං, තත්ථ යා වීමංසා උපපරික්ඛා අයං විපස්සනා. ඉමෙ ද්වෙ ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති: සමථො ච විපස්සනා ච. ඉමෙසු ද්වීසු ධම්මෙසු භාවියමානෙසු ද්වෙ ධම්මා පහීයන්ති: තණ්හා ච අවිජ්ජා ච. ඉමෙසු ද්වීසු ධම්මෙසු පහීනෙසු චත්තාරි උපාදානානි නිරුජ්ඣන්ති, උපාදාන-නිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා

" ආරභථ නික්ඛමථ " යනු : (වීර්‍යාරම්භයෙහි යොදවන හෙයින්) වීර්‍යයට පදට්ඨාන (ආසන්න කාරණ) යි. " යුඤ්ජථ බුද්ධසාසනෙ " යනු : සමාධියට පදට්ඨාන යි. " ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරො " යනු : ප්‍රඥාවට පදට්ඨාන යි. " ආරභථ නික්ඛමථ " යනු : විරියින්ද්‍රියට පදට්ඨාන යි. " යුඤ්ජථ බුද්ධසාසනෙ " යනු : සමාධින්ද්‍රියට පදට්ඨාන යි. " ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරො " යනු : පඤ්ඤින්ද්‍රියට පදට්ඨාන යි. මෙ කියනලද වීර්‍යාදීන්ගේ පදට්ඨානයෝ " ආරභථ නික්ඛමථ " යනාදි දේශනාව යි. (වීර්‍යාරම්භවස්තු ආදීහු නො වෙති සේ යි.)

(මෙසේ පදට්ඨාන වශයෙන් අර්ථනිර්ධාරණය කොට දූන් එය සභාගවිසභාග වශයෙන් ආවර්තන කරන්නට තන් භූමි දක්වති.) භාවනායෝගයෙහි නොයෙදෙන නො මුකළනුවණැති සත්ත්වයන්ගේ මතු අවබෝධය පිණිස ද යෝගයෙහි යෙදෙන මුකළ නුවණැති සත්ත්වයන්ගේ ඉහාත්මයෙහි අවබොධය පිණිස ද මේ දේශනාරම්භය වේ. එහි යම් කෙනෙක් භාවනායෝගයෙහි නො යෙදෙත් ද, ඔහු ප්‍රමාදමූලක ව නො යෙදෙත්. ඒ ප්‍රමාදය : තණ්හාමූලක යැ අවිජ්ජාමූලක යැයි දෙවැදැරුම් වෙයි. එහි අවිද්‍යාමූලක ප්‍රමාදය : (පඤ්චස්කන්ධයාගේ ස්වලක්ෂණ සාමාන්‍යලක්ෂණ ප්‍රතිච්ඡාදන කරන) යම් සම්මොහයකින් වැසුණේ පඤ්චස්කන්ධය උදයව්‍යයස්වභාව ඇතැ ' යි (' ඉතිරූපං ' යනාදීන් පැවති) ඥාන ප්‍රවෘත්තිකාරණය නො දනී ද, මේ අවිජ්ජාමූලක ප්‍රමාද යි. යම් තණ්හාමූලක ප්‍රමාදයෙක් ඇද්ද එය ත්‍රිවිධ යැ : නූපන් භොගයන්ගේ ඉපදීම පිණිස (උපාය) පර්‍යෙෂණ කරනුයේ ප්‍රමාදයට පැමිණෙයි. උපන් භෝගයන්ගේ ආරක්ෂාව නිමිති කොට ද පරිභොගය නිමිති කොට ද ප්‍රමාදයට පැමිණෙයි. ලොවැ මේ චතුර්විධ ප්‍රමාදය යි. අවිද්‍යායෙන් ඒකවිධ යැ, තෘෂ්ණායෙන් ත්‍රිවිධ යි. එහි අවිද්‍යාවට නාමකාය පදට්ඨාන (ආසන්නකාරණ) යැ, තෘෂ්ණාවට රූපකාය පදට්ඨාන යි. එ කවර හෙයින යත් : රූපධර්මයන් කෙරෙහි (තෘෂ්ණාවශයෙන්) අභිනිවෙශය ද, අරූපභවධර්මයන් කෙරෙහි (ඵස්සාදීන්ගේ අතිසූක්ෂමස්වභාව හෙයින් ද සන්තති ආදි ඝනවිනිර්භොගය දුෂ්කර හෙයින් ද) සම්මොහය ද වෙයි, එහෙයිනි. එහි රූපකාය රූපස්කන්ධ යැ නාමකාය සතර අරූපීස්කන්ධයෝ යි. මේ පඤ්චස්කන්ධයෝ කවර උපාදානයෙකින් සඋපාදාන වෙති යත් : තෘෂ්ණායෙන් ද අවිද්‍යායෙන් ද උපාදාන සහිත වෙත්. එහි තෘෂ්ණාව කාමූපාදාන ද සීලබ්බතූපාදාන දැයි උපාදාන දෙකකි. අවිද්‍යාව දිට්ඨූපාදානය ද අත්තවාදූපාදානය දැයි උපාදාන දෙකකි. මේ සතර උපාදානයෙන් සඋපාදාන වූ යම් ස්කන්ධ කෙනෙක් වෙත් ද, මේ දුක්ඛ යැ, යම් සතර උපාදානයෝ වෙත් ද මේ සමුදය යැ, පඤ්චස්කන්ධයෝ දුක්ඛ යි. භාග්‍යවතුන් වහන්සේ ඒ දුක්ඛ සමුදය දෙදෙනාගේ පරිඥානය පිණිස ද ප්‍රහාණය පිණිස ද දහම් දෙසන සේක. දුක්ඛයාගේ පරිඥානය පිණිස යැ සමුදයාගේ ප්‍රහාණය පිණිස යි.

එහි තෘෂ්ණාමූලක වූ යම් ත්‍රිවිධ ප්‍රමාදයෙක් නූපන් භෝගයන්ගේ ඉපදීම පිණිස උපාය සොයා ද, උපන් භෝගයන්ගේ ආරක්ෂාවත් පරිභෝගනිමිත්තත් කෙරේ ද, ඒ ප්‍රමාදයාගේ (ආස්වාදදිය) මොනොවට දැනීමෙන් ස්වකීය චිත්තසන්තානය රැකීමෙක් ප්‍රමාදයට ප්‍රතිපක්ෂවශයෙන් හැකිළීමෙක් වේ ද, මේ සමථය යි, ඒ සමථය කිසෙයින් වේ යැ යත් : යම් කලෙක වස්තුකාමක්ලේශකාමයන්ගේ ආස්වාදය ද ආස්වාදමාත්‍රයෙන් ආදීනවය ද අදීනවයෙන් නිස්සරණය ද නිස්සරණයෙන් (කාමයන්ගේ) ලාමකබව ද කෙලෙසිලිබව ද විශුද්ධවීම ද නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ද දැනගනී. ඒ යථොක්ත ශමථය ඇති කල්හි යම් විමංසා සංඛ්‍යාත ප්‍රඥාවක් විමසීමක් ඇද්ද මේ විදර්ශනා යි. ශමථය ද විදර්ශනාව ද යන ධර්මයෝ දෙදෙන භාවනායෙන් පිරිමට යෙත්. මේ ධර්ම දෙක වැඩෙන කල්හි තෘෂ්ණාව ද අවිද්‍යාව ද යන ධර්මයෝ දෙදෙන ප්‍රහීණ වෙති. මේ තණ්හා අවිජ්ජා ධර්මදෙක ප්‍රහීණ කල්හි සතර උපාදානයෝ නිරුද්ධ වෙත්. උපාදාන නිරොධ යෙන් භවනිරොධය වෙයි, භවනිරොධයෙන් ජාතිනිරොධය වෙයි, ජාතිනිරොධයෙන්

ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. ඉති පුරිමකානි ච ද්වෙ සච්චානි දුක්ඛං සමුදයො ච, සමථො ච විපස්සනා ච මග්ගො, භවනිරොධො නිබ්බානං. ඉමානි චත්තාරි සච්චානි. තෙනාහ භගවා: "ආරභථ නික්ඛමථා"ති.

2. "යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති,
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං"

අයං තණ්හානුසයො, කතමිස්සා තණ්හාය: භවතණ්හාය. යො එතස්ස ධම්මස්ස පච්චයො අයං අවිජ්ජා, අවිජ්ජාපච්චයා හි භවතණ්හා. ඉමෙ ද්වෙ කිලෙසා තණ්හා ච අවිජ්ජා ච. තානි චත්තාරි උපාදානානි, තෙහි චතූහි උපාදානෙහි යෙ සඋපාදානා ඛන්ධා ඉදං දුක්ඛං, චත්තාරි උපාදානානි අයං සමුදයො, පඤ්චක්ඛන්ධා දුක්ඛං, තෙසං භගවා පරිඤ්ඤාය ච පහානාය ච ධම්මං දෙසෙති, දුක්ඛස්ස පරිඤ්ඤාය සමුදයස්ස පහානාය, යෙන තණ්හානුසයං සමූහනති[1] අයං සමථො, යෙන තණ්හානුසයස්ස පච්චයං අවිජ්ජං වාරයති අයං විපස්සනා, ඉමෙ ද්වෙ ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති: සමථො ච විපස්සනා ච, තත්ථ සමථස්ස ඵලං රාගවිරාගා චෙතොවිමුත්ති, විපස්සනාය ඵලං අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති. ඉති පුරිමකානි ච ද්වෙ සච්චානි දුක්ඛං සමුදයො ච, සමථො ච විපස්සනා ච මග්ගො, ද්වෙ ච විමුත්තියො නිරොධො, ඉමානි චත්තාරි සච්චානි. තෙනාහ භගවා: "යථාපි මූලෙ අනුපද්දවෙ"ති.

3. "සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපනං[2] එතං බුද්ධාන සාසන"න්ති

සබ්බපාපං නාම තීණි දුච්චරිතානි: කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. තෙ දස අකුසලකම්මපථා: පාණාතිපාතො අදින්නාදානං කාමෙසු මිච්ඡාචාරො මුසාවාදො පිසුණාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපො අභිජ්ඣා ව්‍යාපාදො මිච්ඡාදිට්ඨි. තානි ද්වෙ කම්මානි චෙතනා චෙතසිකඤ්ච. තත්ථ යො ච පාණාතිපාතො යා ච පිසුණාවාචා යා ච ඵරුසාවාචා ඉදං දොසසමුට්ඨානං, යඤ්ච අදින්නාදානං යො ච කාමෙසු මිච්ඡාචාරො යො ච මුසාවාදො ඉදං ලොභසමුට්ඨානං, යො සම්ඵප්පලාපො ඉදං මොහසමුට්ඨානං. ඉමානි සත්ත කාරණානි චෙතනාකම්මං. යා අභිජ්ඣා අයං ලොභො අකුසලමූලං, යො බ්‍යාපාදො අයං දොසො අකුසලමූලං, යා මිච්ඡාදිට්ඨි අයං මිච්ඡාමග්ගො. ඉමානි තීණි කාරණානි චෙතසිකං කම්මං, තෙනාහ: චෙතනාකම්මං චෙතසිකං කම්මන්ති.

අකුසලමූලං පයොගං ගච්ඡන්තං චතුබ්බිධං අගතිං ගච්ඡති: ඡන්දා දොසා භයා මොහා. තත්ථ යං ඡන්දාගතිං ගච්ඡති ඉදං ලොභසමුට්ඨානං. යං දොසාගතිං ගච්ඡති ඉදං දොසසමුට්ඨානං. යං භයා ච මොහා ච අගතිං ගච්ඡති ඉදං මොහසමුට්ඨානං. තත්ථ ලොභො අසුභාය පහීයති, දොසො මෙත්තාය, මොහො පඤ්ඤාය. තථා ලොභො උපෙක්ඛාය පහීයති, දොසො මෙත්තාය ච කරුණාය ච, මොහො මුදිතාය පහානං අබ්භත්ථං ගච්ඡති. තෙනාහ භගවා: "සබ්බපාපස්ස අකරණ"න්ති.

1. සමූහනති - මජසං
2. පරියොදපනං - මජසං.

ජරාමරණය ද සෝකපරිදේවදුක්ඛදොමනස්සුපායාසයෝ ද නිරුද්ධ වෙත්. මෙසේ තෙල (සුඛය හා) අමිශ්‍ර වූ දුඃඛරාශිහුගේ නිරොධය වේ. මෙසේ පූර්ව වූ දුක්ඛය ද සමුදය ද යන සත්‍ය දෙක යැ, ශමථයත් විදර්ශනාවත් මාර්ග යැ, භවනිරොධය නිර්වාණ යි. මේ චතුස්සත්‍යයෝ යි. එයින් වදළහ, බුදුහු — '' ආරභථ නික්ඛමථ '' යී.

2. යම්සේ භූමිගත අවයව සංඛ්‍යාත මූලය සිඳීම් ආදියෙන් උපද්‍රව රහිත කල්හි එහෙයින් ම දැඩිව සිටි කල්හි සිඳිනලද්දවූ ද වෘක්ෂය වධාලා වැඩේ ද, එසෙයින් ම තණ්හානුසය සංඛ්‍යාත ආත්මභාව වෘක්ෂයාගේ මූලය මාර්ගඥානපරශුයෙන් නොසුන් කල්හි මේ පඤ්චස්කන්ධදුඃඛය පුනපුනා උපදී.

මේ තෘෂ්ණානුශය කවර තෘෂ්ණාවකගේ යැ යත් : භවතෘෂ්ණාවගේ යි. තෙල භවතෘෂ්ණධර්මයට යමෙක් ප්‍රත්‍යය වේ ද, මේ අවිද්‍යාව යි. ඒ එසේ මැ ය, අවිද්‍යා ප්‍රත්‍යයෙන් භවතෘෂ්ණාව වේ. තණ්හාව ද අවිද්‍යාව ද යන මේ දෙක ක්ලේශයෝ යි. ඔහු සතර උපාදනයෝ වෙති. ඒ සතර උපාදනයෙන් සඋපාදන වූ යම් ස්කන්ධ කෙනෙක් ඇද්ද මේ දුක්ඛ යැ, සතර උපාදන කෙනෙක් ඇද්ද මේ සමුදය යි. පඤ්චස්කන්ධයෝ දුක යි. බුදුහු දුක්ඛ සමුදය දෙදෙනාගේ පරිඥාව පිණිස ද ප්‍රහාණය පිණිස ද දහම් දෙසන සේක. දුක්ඛයාගේ පරිඥානය පිණිස යැ සමුදයාගේ ප්‍රහාණය පිණිස යි. යම් දහමකින් තණ්හානුසය නසා ද මේ සමථ යැ, යමකින් තණ්හානුසයට ප්‍රත්‍යය වූ අවිද්‍යාව වළහා ද, මේ විපස්සනා යි. ශමථය ද විදර්ශනාව ද යන මේ ධර්මයෝ දෙදෙන භාවනායෙන් සම්පූර්ණ වීමට යෙති. එහි ශමථයාගේ ඵලය රාගවිරාග චෙතොවිමුත්ති යැ, විදර්ශනාවගේ ඵලය අවිද්‍යාවිරාග ප්‍රඥාවිමුත්ති යි. මෙසේ පූර්ව වූ දුක්ඛය ද සමුදය ද යන සත්‍යයෝ දෙදෙන යැ, ශමථයත් විදර්ශනාවත් මග්ග යැ, විමුත්තිහු දෙදෙන නිරොධ යි. මේ චතුස්සත්‍යයෝ වෙත්. එයින් වදළහ, බුදුහු : '' යථාපි මූලෙ අනුපද්දවෙ '' යී.

3. සියලු අකුශලය නො ඉපදවීම ද, චාතුර්භූමක කුශලයා ගේ ප්‍රතිලාභය ද, (රහත් මඟින්) ස්වකීය චිත්තසන්තානය පවිත්‍ර කිරීම ද යන තෙල සියලු බුදුවරයන්ගේ අනුශාසනා යි.

'' සබ්බපාප '' නම් : කායදුශ්චරිතය වාග්දුශ්චරිතය මනොදුශ්චරිතය යන තුන් දුශ්චරිතයෝ යි. ඔහු දශඅකුශල කර්මපථයෝ යැ : පාණාතිපාත යැ අදින්නාදන යැ කාමෙසු මිච්ඡාචාර යැ මුසාවාද යැ පිසුනාවාචා යැ ඵරුසාවාචා යැ සම්ඵප්පලාප යැ අභිජ්ඣා යැ ව්‍යාපාද යැ මිච්ඡාදිට්ඨි යි. ඔහු චෙතනා කර්මය ද චෙතසික කර්මය දැයි කර්මයෝ දෙදෙනෙක් වෙති. එහි යම් පාණාතිපාතයෙක් පිසුනාවාචායෙක් ඵරුසාවාචා යෙක් ඇද්ද, මේ දෙසසමුට්ඨාන යැ, යම් අදින්නාදනයෙක් කාමෙසුමිච්ඡාචාරයෙක් මුසාවාදයෙක් ඇද්ද, මේ ලොභසමුට්ඨාන යැ, යම් සම්ඵප්පලාපයෙක් වේ ද මේ මොහ සමුට්ඨාන යි. මේ සත් කරුණ චෙතනාකර්ම යැ, යම් අභිධ්‍යාවක් ඇද්ද මේ ලොභ අකුශලමූල යැ, යම් ව්‍යාපාදයෙක් ඇද්ද මේ දෙසඅකුශලමූල යැ, යම් මිත්‍ථ්‍යාදෘෂ්ටියක් ඇද්ද මේ මිත්‍ථ්‍යාමාර්ග යි. මේ තුන් කරුණ චෙතසික කර්ම යි. එයින් කීහ : '' චෙතනාකම්මං චෙතසිකං කම්මං '' යී.

අකුශලමූලය ප්‍රයොගයට යනුයේ සිවුවැදෑරුම් අගතියට යෙයි : ඡන්දයෙන් දෙසයෙන් භයින් මොහයෙනි. එහි ඡන්දහේතුයෙන් යම් අගතියකට යේ ද මේ ලෝභසමුට්ඨාන යැ, දෙසයෙන් යම් අගතියකට යේ ද මේ දෙසසමුට්ඨාන යැ, භයින් ද මොහයෙන් ද යම් අගතියකට යේ ද මේ මොහසමුට්ඨාන යි. ඔවුන් කෙරෙහි ලොභය අසුභභාවනායෙන් ප්‍රහීණ වෙයි, ද්වේශය මෙත්තාභාවනායෙන් ප්‍රහීණ වෙයි, මොහය පඤ්ඤාභාවනායෙන් ප්‍රහීණ වේ. එසේ මැ ලොභය උපෙක්ඛායෙන් ප්‍රහීණ වෙයි, ද්වේශය මෙත්තායෙන් ද කරුණායෙන් ද ප්‍රහීණ වෙයි, මොහය මුදිතායෙන් ප්‍රහාණයට අභ්‍යස්තයට යේ. එයින් වදළහ, බුදුහු : '' සබ්බපාපස්ස අකරණං '' යී.

සබ්බපාපං නාම අට්ඨ මිච්ඡත්තානි: මිච්ඡාදිට්ඨි මිච්ඡාසංකප්පො මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තො මිච්ඡාආජීවො මිච්ඡාවායාමො මිච්ඡාසති මිච්ඡාසමාධි, ඉදං වුච්චති සබ්බපාපං. ඉමෙසං අට්ඨන්නං මිච්ඡත්තානං යා අකිරියා අකරණං අනජ්ඣාචාරො, ඉදං වුච්චති සබ්බපාපස්ස අකරණං. අට්ඨසු මිච්ඡත්තෙසු පහීනෙසු අට්ඨ සම්මත්තානි සම්පජ්ජන්ති, අට්ඨන්නං සම්මත්තානං යා කිරියා කරණං අජ්ඣාචාරො අයං වුච්චති "කුසලස්ස උපසම්පදා". "සචිත්තපරියොදපන"න්ති අතීතස්ස මග්ගස්ස භාවනා කිරියං දස්සයති, චිත්තෙ පරියොදපිතෙ පඤ්චක්ඛන්ධා පරියොදපිතා භවන්ති. එවං හි භගවා ආහ: "චෙතොවිසුද්ධත්ථං භික්ඛවෙ තථාගතෙ බ්‍රහ්මචරියං වුස්සතී"ති.[1] දුවිධා හි පරියොදපනා නීවරණපහානං ච අනුසයසමුග්ඝාතො ච. ද්වෙ ච පරියොදපනභූමියො, දස්සනභූමි ච භාවනාභූමි ච. තත්ථ යං පටිවෙධෙන පරියොදපෙති, ඉදං දුක්ඛං, යතො පරියොදපෙති අයං සමුදයො, යෙන පරියොදපෙති අයං මග්ගො, යං පරියොදපිතං අයං නිරොධො. ඉමානි චත්තාරි සච්චානි. තෙනාහ භගවා: "සබ්බපාපස්ස අකරණ"න්ති.

4. "ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ඡත්තං මහන්තං යථ වස්සකාලෙ,
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී"ති.

ධම්මො නාම දුවිධො: ඉන්ද්‍රියසංවරො මග්ගො ච. දුග්ගති නාම දුවිධා: දෙවමනුස්සෙ වා උපනිධාය අපායා දුග්ගති, නිබ්බානං වා උපනිධාය සබ්බා උප්පත්තියො දුග්ගති. තත්ථ යා සංවරසීලෙ අඛණ්ඩකාරිතා අයං ධම්මො සුචිණ්ණො අපායෙහි රක්ඛති. එවං භගවා ආහ: "ද්වෙමා භික්ඛවෙ සීලවතො ගතියො දෙවා ච මනුස්සා ච.

එවඤ්ච නාලන්දායං නිගමෙ අසිබන්ධකපුත්තො ගාමණී භගවන්තං එතදවොච: "බ්‍රාහ්මණා භන්තෙ පච්ඡාභූමකා කාමණ්ඩලුකා සෙවාලමාලිකා උදකොරොහකා අග්ගිපරිචාරකා, තෙ මතං කාලකතං උය්‍යාපෙන්ති නාම සඤ්ඤාපෙන්ති නාම සග්ගං නාම උග්ගමෙන්ති-[1] භගවා පන භන්තෙ පහොති තථා කාතුං, යථා සබ්බො ලොකො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යා'ති.

තෙන හි ගාමණී තං යෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි. යථා තෙ ඛමෙය්‍ය තථා නං බ්‍යාකරෙය්‍යාසි, තං කිම්මඤ්ඤසි ගාමණී ඉධස්ස පුරිසො පාණාතිපාතී අදින්නාදායී කාමෙසු මිච්ඡාචාරී මුසාවාදී පිසුනාවාචො ඵරුසාවාචො සම්ඵප්පලාපී අභිජ්ඣාලූ බ්‍යාපන්නචිත්තො මිච්ඡාදිට්ඨිකො, තමෙනං මහාජනකායො සඞ්ගම්ම සමාගම්ම ආයාචෙය්‍ය ථොමෙය්‍ය පඤ්ජලිකො අනුපරිසක්කෙය්‍ය: "අයං පුරිසො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතූ"ති, තං කිම්මඤ්ඤසි ගාමණී අපිනු සො පුරිසො මහතො ජනකායස්ස ආයාචනහෙතු වා ථොමනහෙතු වා පඤ්ජලිකං අනුපරිසක්කනහෙතු වා, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යාති, නො හෙතං භන්තෙ.

1. ඔක්කාමෙන්ති – මජසං.

" සබ්බපාප " නම් : මිථ්‍යාදෘෂ්ටි යැ මිථ්‍යාසංකල්ප යැ මිථ්‍යාවාක් යැ මිථ්‍යාකර්මාන්ත යැ මිථ්‍යාආජීව යැ මිථ්‍යාව්‍යායාම යැ මිථ්‍යාස්මෘති යැ මිත්ථ්‍යාසමාධි යැ යන අටවැදූරුම් මිච්ඡත්තයෝ යි. මේ ' සබ්බපාප ' යයි කියනු ලැබේ. මේ අටවැදූරුම් මිථ්‍යාත්වයන්ගේ යම් අක්‍රියාවක් අකරණයක් අනධ්‍යාචාරයෙක් (නො ඉපදවීමෙක්) ඇද්ද මේ " සබ්බපාපස්ස අකරණං " යයි කියනු ලැබේ. අෂ්ට මිථ්‍යාත්වයන් ප්‍රහීණ කල්හි අෂ්ට සම්‍යක්ත්වයෝ සම්පාදනය වෙති. අටවැදැරුම් සම්‍යක්ත්වයන්ගේ යම් ක්‍රියාවක් කරණයක් අධ්‍යාචාරයෙක් (ඉපදූවීමෙක්) වේ ද මේ " කුසලස්ස උපසම්පද " යී කියනු ලැබේ. " සචිත්තපරියොදපනං " යී අතීත මාර්ග යාගේ භාවනාක්‍රියාව දක්වනසේක. චිත්තය පවිත්‍ර කළ කල්හි පඤ්චස්කන්ධයෝ පරියොදපනය කළාහු වෙත්. ඒ එසේ මැ යැ : බුදුහු මෙසේ වදළහ : " මහණෙනි චෙතොවිසුද්ධිය සඳහා තථාගතයන් කෙරෙහි බඹසර වසන්නෝය " යි. ඒ එසේ මැ යැ : නීවරණප්‍රහාණය ද අනුශය සමුද්ඝාතය දූයි පරියොදපනය දෙවැදූරුම් වෙයි. දර්ශනභූමි ද භාවනාභූමි දූයි පරියොදපනභූමි ද දෙකෙකි. එහි යමක් ප්‍රතිවෙධ සංඛ්‍යාත පරිඥාහි සමයෙන් පරියොදපනය කෙරේ ද මේ දුක්ඛ යැ, යමක්හු කෙරෙන් පිරිසිදුකෙරේ ද මේ සමුදය යැ, යමක් කරණ කොට පරියොදපනය කෙරේ ද මේ මාර්ග යැ, යමක් පරියොදපිත ද මේ නිරොධ යි. මේ චතුස්සත්‍යයෝ යි. එයින් වදළහ. බුදුහු : " සබ්බපාපස්ස අකරණං " යී.

4. දනාදි කුශලධර්ම තෙමේ ඒකාන්තයෙන් ඒ ධර්මයෙහි හැසිරෙන පුහුල්හු (දිට්ඨධම්මික සම්පරායික අනර්ථයෙන්) රක්නේය, වැසිකලැ මහත්වූ ඡත්‍රය එය ධරන්නහු යම්සේ රකී ද එමෙනි, ධර්මය මොනොවට පරිචිත කල්හි තෙල අනුසස් වෙයි, ධර්මචාරී පුද්ගල අපායාදි දුගතියට නොයේ යයි.

ධර්මය නම් : ඉන්ද්‍රියසංවර යැ මාර්ග යැයි ද්විවිධ යැ, දුර්ගති නම් ද්විවිධ යැ : දේවමනුෂ්‍යයන් හෝ උපනිධි කොට සතර අපායයෝ දුර්ගති යැ, නිර්වාණය හෝ උපනිධි කොට සියලු උපප්‍රාප්තීහු දුර්ගති යැ. එහි සංවරසීලයෙහි යම් අඛණ්ඩකාරිබවක් ඇද්ද මේ සංවරශීලධර්මය මොනොවට ආචීර්ණ වූයේ සතර අපායෙන් රකී. බුදුහු මෙසේ වදළහ : " මහණෙනි සිල්වත්හට දේවගතිය ද මනුෂ්‍යගතිය දූයි මේ ගති දෙකක් වෙති " යී.

තවද මෙසේ ඇත : නාලන්දනිගමයෙහි අසිබන්ධක පුත්‍ර වූ ගාමණී භාග්‍යවතුන් වහන්සේට තෙල කී : " වහන්ස පශ්චාද්භූමි වැසි බ්‍රාහ්මණයෝ කමඬලු ඇත්තාහු සෙවෙල්මාලා ඇත්තාහු උදයසවස ජලාවගාහ කරන්නාහු ගිනි පුදන්නාහු, ඕහු මළහු කලුරියකළහු උඩලොවට යවති, මොනොවට යවති, (පිරිවරා සිට හවන, බඹලොවට යවයි කියමින්) ස්වර්ගයට යවති, වහන්ස භාග්‍යවතුන් වහන්සේ වැලිත් යම් පරිදි සියලු ලෝවැසි තෙමේ කාබුන් මරණින් මතු සුගති වූ ස්වර්ගලොකයට පිළිසඳ විසින් පැමිණේ නම්, එසේ කරන්නට පොහොසත් සේක් දූ " යි.

ග්‍රාමණී එසේ නම් මෙ කරුණෙහි ලා තොප මැ පුළුවුස්මි, තොපට යම්සේ හැගේ නම් එසෙයින් එය ප්‍රකාශ කරව, ග්‍රාමණී ඒ කිමැයි හඟනාව, මෙ ලොවැ පුරුෂයෙක් ප්‍රාණවධ කරනුයේ අයිනාදන් ගන්නේ කාමයෙහි මිසහසර ඇතියේ මුසවා කියනුයේ පිසුනුබස් ඇතියේ පරොස්බස් ඇතියේ සිස් වදන් කියනුයේ අභිධ්‍යා බහුල කොට ඇතියේ ව්‍යාපාද සිත් ඇතියේ මිසදිටු ඇතියේ වේ ද, මහාජනසමූහයා තෙලපුහුල්හු වෙත එක්වගෙන ' මේ පුරුෂ කාබුන් මරණින් මතු සුගති වූ ස්වර්ගලෝකයට පැමිණේව ' යි අයදනේ නම් පසස්නේ නම් ඇඳිලිබැඳ සිසාරායන්නේ නම්, ග්‍රාමණී ඒ කිමැයි හඟනාව, කිම ඒ පුරුෂ මහාජනසමූහයා අයදනාහෙයින් වේවයි පසස්නා හෙයින් වේව' යි බඳැඳිලි වැ සිසාරායන හෙයින් වේවයි කාබුන් මරණින් මතු සුගති ස්වර්ගලෝකයට පැමිණෙන්නේ දූ' යි.

සෙය්‍යථාපි ගාමණි පුරිසො මහතිං පුථුසිලං ගම්භීරෙ උදකරහදෙ පක්ඛිපෙය්‍ය, තමෙනං මහාජනකායො සඞ්ගම්ම සමාගම්ම ආයාචෙය්‍ය ථොමෙය්‍ය පඤ්ජලිකො අනුපරිසක්කෙය්‍ය උම්මුජ්ජ භො පුථුසිලෙ උප්ලව භො පුථුසිලෙ ථලමුප්ලව භො පුථුසිලෙ'ති. තං කිම්මඤ්ඤසි ගාමණි අපිනු සා මහතී පුථුසිලා මහතො ජනකායස්ස ආයාචනහෙතු වා ථොමනහෙතු වා පඤ්ජලිකං අනුපරිසක්කනහෙතු වා උම්මුජ්ජෙය්‍ය වා උප්ලවෙය්‍ය වා ථලං වා උප්ලවෙය්‍යාති, නො හෙතං භන්තෙ. එවමෙව ඛො ගාමණි යො සො පුරිසො පාණාතිපාතී-පෙ-මිච්ඡාදිට්ඨිකො, කිඤ්චාපි තං මහාජනකායො සඞ්ගම්ම සමාගම්ම ආයාචෙය්‍ය ථොමෙය්‍ය පඤ්ජලිකො අනුපරිසක්කෙය්‍ය : අයං පුරිසො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජතූති. අථ ඛො සො පුරිසො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය.

තං කිං මඤ්ඤසි ගාමණි ඉධස්ස පුරිසො පාණාතිපාතා පටිවිරතො -පෙ- සම්මාදිට්ඨිකො, තමෙනං මහාජනකායො සඞ්ගම්ම සමාගම්ම ආයාචෙය්‍ය ථොමෙය්‍ය පඤ්ජලිකො අනුපරිසක්කෙය්‍ය : අයං පුරිසො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතූති. තං කිම්මඤ්ඤසි ගාමණි අපිනු සො පුරිසො මහතො ජනකායස්ස ආයාචනහෙතු වා ථොමනහෙතු වා පඤ්ජලිකං අනුපරිසක්කනහෙතු වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍යාති, නො හෙතං භන්තෙ. සෙය්‍යථාපි ගාමණි පුරිසො සප්පිකුම්භං වා තෙලකුම්භං වා ගම්භීරං උදකරහදං ඔගාහිත්වා භින්දෙය්‍ය, තත්‍ර යස්ස[1] සක්ඛරකඨලං තං[2] අධොගාමි අස්ස, යඤ්ච ඛ්වස්ස තත්‍ර සප්පි වා තෙලං වා. තං උද්ධංගාමි අස්ස, තමෙනං මහාජනකායො සඞ්ගම්ම සමාගම්ම ආයාචෙය්‍ය ථොමෙය්‍ය පඤ්ජලිකො අනුපරිසක්කෙය්‍ය : ඔසීද භො සප්පිතෙල, සංසීද භො සප්පිතෙල, අවං ගච්ඡ භො සප්පිතෙලාති. තං කිම්මඤ්ඤසි ගාමණි, අපිනු තං සප්පිතෙලං මහතො ජනකායස්ස ආයාචනහෙතු වා ථොමනහෙතු වා පඤ්ජලිකං අනුපරිසක්කනහෙතු වා ඔසීදෙය්‍ය වා සංසීදෙය්‍ය වා අවං වා ගච්ඡෙය්‍යාති? නො හෙතං භන්තෙ. එවමෙව ඛො ගාමණි යො සො පුරිසො පාණාතිපාතා පටිවිරතො -පෙ- සම්මාදිට්ඨිකො, කිඤ්චාපි තං මහාජනකායො සඞ්ගම්ම සමාගම්ම ආයාචෙය්‍ය ථොමෙය්‍ය පඤ්ජලිකො අනුපරිසක්කෙය්‍ය : "අයං පුරිසො කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං, විනිපාතං නිරයං උපපජ්ජතූති අථ ඛො සො පුරිසො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍ය" ඉති ධම්මො සුචිණ්ණො අපායෙහි රක්ඛති.

තත්ථ යා මග්ගස්ස තික්ඛතා අධිමත්තතා අයං ධම්මො සුචිණ්ණො සබ්බාහි උපපත්තීහි රක්ඛති. එවං භගවා ආහ :

5. "තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො,
සම්මාදිට්ඨිපුරෙක්ඛාරො ඤත්වාන උදයබ්බයං;
ථිනමිද්ධාභිභූ භික්ඛු සබ්බා දුග්ගතියො ජහෙ"ති

1. යාස්ස - සීමු, මජසං.
2. සක්ඛරා වා කඨලා වා සා - සීමු, මජසං.

වහන්ස තෙල නො වේ මැ ය. ග්‍රාමණි යම්සේ පුරුෂයෙක් මහත්වූ ඝනසෙලක් ගැඹුරු දියවිලෙක්හි බහාලන්නේ ද, මහාජනසමූහයා තෙල ශෛලය වෙත එක්වගෙන ' භවත් ශෛලය උඩ නැඟෙව භවත් ශෛලය ඉල්පෙව භවත් ශෛලය ගොඩට පිහිනව ' යි අයදනේ නම් පසස්නේ නම් බඳැඳිලිව සියාරා යන්නේ නම්, ග්‍රාමණි ඒ කිමැයි හඟනාව, කිම ඒ මහත් ඝනසෙල මහාජනසමූහයා අයදනාහෙයින් වේවයි පසස්නාහෙයින් වේවයි ඇඳිලිබැඳ සියාරා යනහෙයින් වේවයි උඩට නැඟෙන්නේ හෝ ඉල්පෙන්නේ හෝ ගොඩට පිහිනන්නේ හෝ වේ ද ' යි. වහන්ස තෙල නොවේ මැ ය. එසෙයින් ම ග්‍රාමණි ඒ පුරුෂ ප්‍රාණවධ කරනුයේ . . . මිසදිටු වූයේ වෙයි, එතෙකුදු වත් මහාජනසමූහයා ඔහු සමීපයට රැස්වගෙන ' මේ පුරුෂ කාබුන් මරණින් මතු සුගති ස්වර්ගලෝකයට පැමිණේව ' යි අයදනේ නමුදු පසස්නේ නමුදු බඳැඳිලිව සියාරා ඇවිදුනේ නමුදු වැලි ඒ පුරුෂ කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට (පිළිසඳ විසින්) පැමිණෙන්නේය.

ග්‍රාමණි ඒ කිමැයි හඟනාව, මෙලොවැ පුරුෂයෙක් ප්‍රාණවධයෙන් වැළැකියේ . . . සම්‍යග්දෘෂ්ටි ඇත්තේ වන්නේ ය. මහාජනසමූහයා තුලුහු වෙත රැස්වගෙන " මේ පුරුෂ කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණේව ' යි අයදනේ යැ පසස්නේ යැ බඳැඳිලිව සියාරා ඇවිදුනේ යැ, ග්‍රාමණි ඒ කිමැයි හඟනාව, කිම ඒ පුරුෂ මහාජනසමූහයා අයදනාහෙයින් වේවයි පසස්නාහෙයින් වේවයි බඳැඳිලිව සියාරා යන හෙයින් වේවයි කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණෙන්නේ ද ? යි. වහන්ස තෙල නොවේ මැ ය. ග්‍රාමණි යම්පරිදි පුරුෂයෙක් ගිතෙල්කළයක් හෝ තෙල්කළයක් හෝ ගැඹුරු දියවිලකට බස්වා බිඳිනේ නම්, එහි යම් කැටක් හෝ කැබිලිති හෝ වූ නම් එය යටට බස්නේය. එහි යම් ගිතෙලක් හෝ තෙලක් හෝ වී නම් එය උඩට යනු වන්නේය, මහාජනසමූහයා තෙල සප්පිතෙලය වෙත රැස්වගෙන ' භවත් සප්පිතෙලය දියෙහි ගැලෙව, භවත් සප්පිතෙලය මැනැවින් ගැලෙව, භවත් සප්පිතෙලය යටට යව ' යි අයදනේ නම් පසස්නේ නම් බඳැඳිලිව සියාරායන්නේ නම්, ඒ කිමැයි හඟනාව ග්‍රාමණි කිම ඒ සප්පිතෙලය මහාජනසමූහයාගේ ආයාචනාහේතුයෙන් වේවයි පසස්නා හේතුයෙන් වේවයි බඳැඳිලිව සියාරායන හෙයින් වේවයි දියෙහි ගැලෙන්නේ හෝ මැනැවින් ගැලෙන්නේ හෝ යටට හෝ යන්නේ ද ' යි. වහන්ස තෙල නොවේ මැ ය. එසෙයින් මැ ග්‍රාමණි ඒ පුරුෂ ප්‍රාණඝාතයෙන් වෙන්වූයේ . . . සම්‍යග්දෘෂ්ටි ඇතියේ වෙයි, එහෙත් මහාජනසමූහයා ඔහු වෙත රැස්ව සිට ' මේ පුරුෂ කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණේව ' යි අයදනේ නමුදු පසස්නේ නමුදු බඳැඳිලිව සියාරා ඇවිදුනේ නමුදු වැලි ඒ පුරුෂ කාබුන් මරණින් මතු සුගති ස්වර්ගලෝකයට පැමිණෙන්නේය " මෙසේ ශීලසංවර සංඛ්‍යාත කුශලධර්මය මොනොවට පරිචිත වූයේ සතර අපායෙන් රකී.

ඒ දෙවැදෑර ම ධර්මයන් කෙරෙහි ආර්‍ය්‍යමාර්ගධර්මයාගේ යම් තියුණුබවක් අධිමාත්‍ර බවක් ඇද්ද මේ මාර්ගධර්මය සුචීර්ණ වූයේ සකල උපප්‍රාප්තිභවයෙන් රකී. බුදුහු මෙසේ වදළහ :

5. (යම් හෙයෙකින් අරක්ඛිත සිත් ඇතියේ මාරවශීව සසර මැ වෙසේ ද) එහෙයින් සතිසංවරයෙන් රක්නාලද සිත් ඇතිවන්නේ යැ, නෙක්ඛම්මාදි සම්‍යක්සඞ්කල්ප ගොචර කොට ඇතිවන්නේ යැ, (කම්මස්සකතා යථාභූතඤාණ ලක්ෂණ) සම්‍යග්දෘෂ්ටිය පෙරටු කොට ඇතියේ (පඤ්චස්කන්ධයෙහි සමපනස් වැදෑරුම්) උදයව්‍යය දැන (භඞ්ගානු පස්සනාදි වශයෙන් විදසුන් වඩා) රහත්මගින් ථිනමිද්ධය නැසූ ක්ෂීණාශ්‍රව මහණ සියලු දුර්ගති දුරුකරන්නේ යි.

තත්ථ දුග්ගතීනං හෙතු තණ්හා ච අවිජ්ජා ච. තානි චත්තාරි උපාදානානි. තෙහි චතූහි උපාදානෙහි යෙ සඋපාදානා ඛන්ධා ඉදං දුක්ඛං, චත්තාරි උපාදානානි සමුදයො, පඤ්චක්ඛන්ධා දුක්ඛං. තෙසං භගවා පරිඤ්ඤාය ච පහානාය ච ධම්මං දෙසෙති දුක්ඛස්ස පරිඤ්ඤාය සමුදයස්ස පහානාය තත්ථ තණ්හාය පඤ්චින්ද්‍රියානි රූපීනි පදට්ඨානං අවිජ්ජාය මනින්ද්‍රියං පදට්ඨානං, පඤ්චින්ද්‍රියානි රූපීනි රක්ඛන්තො සමාධිං භාවයති තණ්හඤ්ච නිග්ගණ්හාති. මනින්ද්‍රියං රක්ඛන්තො විපස්සනං භාවයති අවිජ්ජඤ්ච නිග්ගණ්හාති. තණ්හානිග්ගහෙන ද්වෙ උපාදානානි පහීයන්ති: කාමුපාදානඤ්ච සීලබ්බතුපාදානඤ්ච. අවිජ්ජානිග්ගහෙන ද්වෙ උපාදානානි පහීයන්ති: දිට්ඨුපාදානඤ්ච අත්තවාදුපාදානඤ්ච. චතූසු උපාදානෙසු පහීනෙසු ද්වෙ ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති: සමථො ච විපස්සනා ච. ඉදං වුච්චති බ්‍රහ්මචරියන්ති. තත්ථ බ්‍රහ්මචරියස්ස ඵලං චත්තාරි සාමඤ්ඤඵලානි: සොතාපත්තිඵලං සකදාගාමිඵලං අනාගාමිඵලං අරහත්තං අග්ගඵලං, ඉමානි චත්තාරි බ්‍රහ්මචරියඵලානීති. ඉති පුරිමකානි ච ද්වෙ සච්චානි දුක්ඛං සමුදයො ච, සමථො ච විපස්සනා ච බ්‍රහ්මචරියඤ්ච මග්ගො. බ්‍රහ්මචරියස්ස ඵලානි ච තදාරම්මණා ච අසඞ්ඛතා ධාතු නිරොධො, ඉමානි චත්තාරි සච්චානි. තෙනාහ: "ධම්මො හවෙ රක්ඛතී"ති. තත්ථ යං පටිවෙධෙන රක්ඛති ඉදං දුක්ඛං, යතො රක්ඛති අයං සමුදයො, යෙන රක්ඛති අයං මග්ගො, යං රක්ඛති අයං නිරොධො. ඉමානි චත්තාරි සච්චානි. තෙනාහ ආයස්මා මහාකච්චානො: "එකම්හි පදට්ඨානෙ"ති.

නියුත්තො ආවට්ටො හාරො.

## 3. 1. 8

## විභත්තිහාරවිභඞ්ගො

තත්ථ කතමො විභත්තිහාරො: "ධම්මඤ්ච පදට්ඨානං භූමිං චා"ති. ද්වෙ සුත්තානි වාසනාභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච, ද්වෙ පටිපදා පුඤ්ඤභාගියා ච ඵලභාගියා ච. ද්වෙ සීලානි සංවරසීලඤ්ච පහානසීලඤ්ච. තත්ථ භගවා වාසනාභාගියං සුත්තං පුඤ්ඤභාගියාය පටිපදාය දෙසෙති. සො සංවරසීලෙ ඨිතො තෙන බ්‍රහ්මචරියෙන බ්‍රහ්මචාරී භවති. තත්ථ භගවා නිබ්බෙධභාගියං සුත්තං ඵලභාගියාය පටිපදාය දෙසෙති සො පහානසීලෙ ඨිතො තෙන බ්‍රහ්මචරියෙන බ්‍රහ්මචාරී භවති.

තත්ථ කතමං වාසනාභාගියං සුත්තං: වාසනාභාගියං නාම සුත්තං "දානකථා සීලකථා සග්ගකථා කාමානං ආදීනවො, නෙක්ඛම්මෙ ආනිසංසො"ති, තත්ථ කතමං නිබ්බෙධභාගියං සුත්තං: නිබ්බෙධභාගියං නාම සුත්තං යා චතුසච්චප්පකාසනා. වාසනාභාගියෙ සුත්තෙ නත්ථි පජානනා නත්ථි මග්ගො නත්ථි ඵලං. නිබ්බෙධභාගියෙ සුත්තෙ අත්ථි පජානනා අත්ථි මග්ගො අත්ථි ඵලං. ඉමානි චත්තාරි සුත්තානි. ඉමෙසං චතුන්නං සුත්තානං දෙසනාය ඵලෙන සීලෙන බ්‍රහ්මචරියෙන සබ්බතො විචයෙන හාරෙන විචිනිත්වා යුත්තිහාරෙන යොජෙතබ්බානි, යාවතිකා ඤාණස්ස භූමි.

එහි තෘෂ්ණාව ද අවිද්‍යාව ද දුර්ගතීන්ට හේතු යැ, ඔහු සතර උපාදානයෝ වෙති, ඒ සතර උපාදානයෙන් සළුපාදානවූ යම් ස්කන්ධ කෙකෙනෙක් ඇද්ද, මේ දුක යැ, සතර උපාදානයෝ සමුදය යැ, පඤ්චස්කන්ධයෝ දුක්ඛ යි. බුදුහු ඒ දුක්ඛ සමුදය දෙදෙනාගේ පරිඥාව ද ප්‍රහාණය ද සඳහා දහම් දෙසනසේක. දුඃඛයාගේ පරිඥාව පිණිස යැ, සමුදයයාගේ ප්‍රහාණය පිණිස යි. එහි තෘෂ්ණාවට රූපී පඤ්චේන්ද්‍රියයෝ පදට්ඨාන යැ, අවිද්‍යාවට මනඉන්ද්‍රිය පදට්ඨාන යි. රූපී පඤ්චේන්ද්‍රියයන් රක්නේ සමාධිය වඩයි. තෘෂ්ණාව ද නිගනී. මනඉන්ද්‍රිය රක්නේ විදර්ශනාව වඩයි, අවිද්‍යාව ද නිගනී. තෘෂ්ණානිග්‍රහයෙන් කාමූපාදනය ද සීලබ්බතූපාදනය ද යන උපාදනයෝ දෙදෙන ප්‍රහීණ වෙති, අවිද්‍යා නිග්‍රහයෙන් දිට්ඨූපාදනය ද අත්තවාදූපාදනය ද යන උපාදනයෝ දෙදෙන ප්‍රහීණ වෙත්. සතර උපාදනයන් ප්‍රහීණ කල්හි ශමථය ද විදර්ශනාව ද යන ධර්මයෝ දෙදෙන භාවනා යෙන් පාරිපූරියට යෙත්. මේ ' බ්‍රහ්මචරිය ' යි කියනු ලැබේ. එහි බ්‍රහ්මචර්‍ය්‍යයාගේ ඵලය: ශ්‍රොතාපත්තිඵල සකෘදගාමිඵල අනාගාමිඵල අර්හත්ව අග්‍රඵල යන සතර ශ්‍රාමණ්‍ය ඵලයෝ යැ. මේ සතර බ්‍රහ්මචර්‍ය්‍යඵලයෝ යි. මෙසේ දුඃඛය ද සමුදය ද යන පළමු කී සත්‍යයෝ දෙදෙන යැ, ශමථය ද විදර්ශනාව ද බ්‍රහ්මචර්‍ය්‍යය ද මාර්ග යැ, බ්‍රහ්මචර්‍ය්‍යයාගේ ඵලයෝ ද තදාලම්බන වූ අසඞ්ඛතධාතුව ද නිරොධ යි. මේ චතුස්සත්‍යයෝ යි. එයින් වදළහ : '' ධම්මො හවෙ රක්ඛති '' යි. ඒ දේශනායෙහි ප්‍රතිවෙධයෙන් යමක් රකී ද මේ දුඃඛ යැ, යමක්හු කෙරෙන් රකී ද මේ සමුදය යැ, යමක් කරණකොට රකී ද මේ මාර්ග යැ, යමක් රකී ද මේ නිරොධ යි. මේ චතුස්සත්‍යයෝ යි. එයින් වදළහ, ආයුෂ්මත් මහාකාත්‍යායනස්ථවිරයන් වහන්සේ : '' එකම්හි පදට්ඨානෙ '' යනාදිය.

ආවට්ටහාරය යොදනලදී.

## 3. 1. 8

## විභත්තිහාරවිභඞ්ගය

එහි විභත්තිහාරය කවරෙ යැ : '' ධම්මං ච පදට්ඨානං භූමිං ච '' යනාදි නිද්දෙස ගාථා යි. ' වාසනාභාගිය ' සූත්‍ර ද ' නිබ්බෙධභාගිය ' සූත්‍ර දූ යි සූත්‍ර දෙකෙකි. ' පුඤ්ඤභාගිය ' ප්‍රතිපද ද ' ඵලභාගිය ' ප්‍රතිපද දූ ' යි ප්‍රතිපද දෙකෙකි. ' සංවර ' සීලය ද ' පහාන ' සීලය දූ ' යි ශීල දෙකෙකි. ඒ සූත්‍ර–ප්‍රතිපද–ශීලයන් කෙරෙහි භාග්‍යවතුන් වහන්සේ වාසනාභාගිය සූත්‍රය පුඤ්ඤභාගිය ප්‍රතිපදව සඳහා දෙසන සේක. ඒ (ධර්මප්‍රතිග්‍රාහක) පුද්ගලසංවරශීලයෙහි සිටියේ ඒ සංවරශීල සංඛ්‍යාත ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යායෙන් බඹසර ඇත්තේ වෙයි. එහි භාග්‍යවතුන් වහන්සේ නිබ්බෙධභාගිය සූත්‍රය ඵලභාගිය ප්‍රතිපදව සඳහා දෙසන සේක. ඒ (නිබ්බෙධභාගිය දෙශනාප්‍රතිග්‍රාහක) පුද්ගල ප්‍රහාණශීලයෙහි සිටියේ ඒ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයෙන් බඹසර ඇත්තේ වේ.

එහි වාසනාභාගිය සූත්‍රය කවරෙ යැ : ' දානකථා සීලකථා ස්වර්ගකථා කාමයන්ගේ ආදීනව නෛෂ්ක්‍රම්‍යයෙහි ආනෘශංස ' යන මේ වාසනාභාගිය සූත්‍ර නම් වෙයි. එහි නිබ්බෙධභාගිය සූත්‍රය කවරෙ යැ : යම් චතුස්සත්‍යය ප්‍රකාශ කිරීමෙක් වේ ද, මේ නිබ්බෙධභාගිය සූත්‍ර නම් වේ. වාසනාභාගිය සූත්‍රයෙහි ආර්‍ය්‍යමාර්ගයට පදට්ඨාන වූ වුත්ථානගාමිනී විදර්ශනාප්‍රඥාව නැත, ආර්‍ය්‍යමාර්ගය නැත, ශ්‍රාමණ්‍යඵලය නැති. නිබ්බෙධ භාගිය සූත්‍රයෙහි වුත්ථානගාමිනී විදර්ශනාප්‍රඥාව ඇත, ආර්‍ය්‍යමාර්ගය ඇත, ශ්‍රාමණ්‍ය ඵලය ඇති. (යථොක්ත වාසනාභාගිය නිබ්බෙධභාගිය සූත්‍ර යැ වක්ෂ්‍යමාන සඞ්කිලෙස භාගිය අසෙක්ඛභාගිය සූත්‍ර යැ යන) මේ සතර සූත්‍රයෝ යි. මේ සතර සූත්‍රයන්ගේ දේශනා නයින් ද දේශනාඵලයෙන් ද ශීලයෙන් ද බ්‍රහ්මචර්‍ය්‍යයෙන් ද සර්වප්‍රකාරයෙන් (විචයහාර විෂය වූ එකොළොස් තැන්හි ලා සංක්ෂිප්ත කොට) විචයහාරයෙන් විචිනනය කොට (සොයා) යුක්තිහාරයෙන් ඥානයාගේ භූමිය යම්තාක් වේ ද ඒතාක් යෙදියයුත්තාහු ය.

තත්ථ කතමෙ ධම්මා සාධාරණා : ද්වෙ ධම්මා සාධාරණා : නාම සාධාරණා වත්ථුසාධාරණා ච. යං වා පන කිඤ්චි අඤ්ඤම්පි එවං ජාතියං. මිච්ඡත්තනියතානං සත්තානං අනියතානඤ්ච සත්තානං දස්සනා පහාතබ්බා කිලෙසා සාධාරණා. පුථුජ්ජනස්ස සොතාපන්නස්ස ච කාමරාගබ්‍යාපාදා සාධාරණා. පුථුජ්ජනස්ස අනාගාමිස්ස ච උද්ධංභාගියා සංයොජනා සාධාරණා. යං කිඤ්චි අරියසාවකො ලොකියං සමාපත්තිං සමාපජ්ජති, සබ්බා සා අවීතරාගෙහි සාධාරණා, සාධාරණා හි ධම්මා එවං අඤ්ඤමඤ්ඤං පරං පරං සකං සකං විසයං නාතිවත්තන්ති, යොපිමෙහි ධම්මෙහි සමන්නාගතො න සො තං ධම්මං උපාතිවත්තති ඉමෙ ධම්මා සාධාරණා.

තත්ථ කතමෙ ධම්මා අසාධාරණා : යාව දෙසනං උපාදාය ගවෙසිතබ්බා : සෙක්ඛාසෙක්ඛා භබ්බාභබ්බාති. අට්ඨමකස්ස ච සොතාපන්නස්ස කාමරාගබ්‍යාපාදා සාධාරණා ධම්මතා අසාධාරණා. අට්ඨමකස්ස ච අනාගාමිස්ස උද්ධංභාගියා සංයොජනා සාධාරණා, ධම්මතා අසාධාරණා. සබ්බෙසං සෙක්ඛානං නාමං සාධාරණං, ධම්මතා අසාධාරණා. සබ්බෙසං පටිපන්නකානං නාමං සාධාරණං, ධම්මතා අසාධාරණා. සබ්බෙසං සෙක්ඛානං සෙක්ඛසීලං සාධාරණං, ධම්මතා අසාධාරණා. එවං විසෙසානුපස්සිනා හීනුක්කට්ඨමජ්ඣිමං උපාදාය ගවෙසිතබ්බං

දස්සනභූමි නියාමාවක්කන්තියා පදට්ඨානං. භාවනාභූමි උත්තරිකානං ඵලානං පත්තියා පදට්ඨානං. දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා සමථස්ස පදට්ඨානං, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා විපස්සනාය පදට්ඨානං. දානමයං පුඤ්ඤකිරියවත්ථු පරතොඝොසස්ස සාධාරණං පදට්ඨානං. සීලමයං පුඤ්ඤකිරියවත්ථු චින්තාමයියා පඤ්ඤාය සාධාරණං පදට්ඨානං. භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු භාවනාමයියා පඤ්ඤාය සාධාරණං පදට්ඨානං දානමයං පුඤ්ඤකිරියවත්ථු පරතො ච ඝොසස්ස සුතමයියා ච පඤ්ඤාය සාධාරණං පදට්ඨානං. සීලමයං පුඤ්ඤකිරියවත්ථු චින්තාමයියා ච පඤ්ඤාය යොනිසො ච මනසිකාරස්ස සාධාරණං පදට්ඨානං. භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු භාවනාමයියා ච පඤ්ඤාය සම්මාදිට්ඨියා ච සාධාරණං පදට්ඨානං. පතිරූපදෙසවාසො විවෙකස්ස ච සමාධිස්ස ච සාධාරණං පදට්ඨානං. සප්පුරිසූපනිස්සයො තිණ්ණං ච අවෙච්චප්පසාදානං සමථස්ස ච සාධාරණං පදට්ඨානං. අත්තසම්මාපණිධානං හිරියා ච විපස්සනාය ච සාධාරණං පදට්ඨානං. අකුසලපරිච්චාගො කුසලවීමංසාය ච සමාධින්ද්‍රියස්ස ච සාධාරණං පදට්ඨානං. ධම්මස්වාක්ඛාතතා කුසලමූලරොපණාය ච ඵලසමාපත්තියා ච සාධාරණං පදට්ඨානං. සඞ්ඝසුප්පටිපන්නතා සඞ්ඝසුට්ඨුතාය සාධාරණං පදට්ඨානං. සත්ථුසම්පදා අප්පසන්නානඤ්ච පසාදාය පසන්නානං ච භියොභාවාය සාධාරණං පදට්ඨානං. අප්පටිහතපාතිමොක්ඛතා දුම්මඞ්කූනං ච පුග්ගලානං නිග්ගහාය පෙසලානඤ්ච පුග්ගලානං ඵාසුවිහාරාය සාධාරණං පදට්ඨානං. තෙනාහ මහාකච්චානො : ''ධම්මඤ්ච පදට්ඨාන''න්ති.

නියුත්තො විභත්තිහාරො

එහි සාධාරණ (සමාන) වූ ස්වභාවධර්මයෝ කවරහ : (කුශලාකුශලාදි) නාමයෙන් සාධාරණයෝ ද සමානවස්තුක හෙයින් වස්තුසාධාරණයෝ දැයි සාධාරණ ධර්මයෝ දෙදෙනෙකි. තවද කෘත්‍ය ප්‍රත්‍යය ප්‍රතිපක්ෂාදි වශයෙන් සමාන වූ යම් කිසි අන්‍ය වූත් ස්වභාවයෙක් ඇද්ද ඒ සාධාරණ ධර්ම යි. මාතෘවධාදි මිථ්‍යත්තනියත සත්ත්වයන්ගේ ද අනියත සත්ත්වයන්ගේ ද ශ්‍රොතාපත්තිමාර්ග සංඛ්‍යාත දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ක්ලෙශයෝ සාධාරණයෝ යැ, පුහුදුන්හට ද සෝවන්හට ද කාමරාග – ව්‍යාපාදයෝ සාධාරණ යැ, පුහුදුන්හට ද අනගැමිහට ද උද්ධංභාගියසංයොජනයෝ සාධාරණ යැ, ආර්‍ය්‍යශ්‍රාවක යම් කිසි ලෞකික සමාපත්තියකට සමවදී ද එ හැම අවීතරාගයන් හා සාධාරණ යැ. එ එසේ මැය, සාධාරණධර්මයෝ මෙසේ ඔවුනොවුන් වෙනවෙන ම ස්වකීය ස්වකීය විෂය නො ඉක්මවති. යම් පුද්ගලයෙකුත් මේ ලෞකික සමාපත්තිධර්මයන්ගෙන් සමන්වාගත වූයේ ද ඒ පුද්ගල ඒ ධර්මය නො ඉක්මවයි. මේ සාධාරණ ධර්මයෝ යි.

එහි අසාධාරණධර්මයෝ කවරහ : ආර්‍ය්‍යයන් කෙරෙහි, ශෛක්ෂ අශෛක්ෂයෝ යැ, අනාර්‍ය්‍යයන් කෙරෙහි භව්‍ය අභව්‍යයෝ යැයි (ඒ ඒ පුද්ගලයාට ප්‍රත්‍යාත්මනියත වශයෙන්) වදළ දෙශනාව ගෙන අසාධාරණ ධර්මයෝ සෙවියයුත්තාහ. (සෝවන්මඟ පත් අෂ්ටමකයාහට ද සෝවන්හට ද කාමරාගව්‍යාපාදයෝ සාධාරණයෝ යැ ධර්මස්වභාව අසාධාරණ යි. (ද්වාදශශ්‍රමණයන් කෙරෙහි අෂ්ටමක වූ) අනාගාමිමාර්ගස්ථයාහට ද අනාගාමීහට ද උද්ධංභාගිය සංයොජනයෝ සාධාරණයහ, ධර්මස්වභාව අසාධාරණ යි. සියලු ශෛක්ෂයනට ' සෙක්ඛ ' යන නාමය සාධාරණ යැ, ධර්මස්වභාව අසාධාරණ යි. සියලු ප්‍රතිපන්නකයනට ' පටිපන්නක ' යන නාමය සාධාරණ යැ, ධර්මස්වභාව අසාධාණ යි. සියලු ශෛක්ෂයනට ශෛක්ෂශීලය සාධාරණ යැ, ධර්මස්වභාව අසාධාරණ යි. මෙසේ (ආර්‍ය්‍යයනට කී සෙයින් අන්‍යයනට ද) අසාධාරණතාවිශෙෂ දක්නහු විසින් හීන ප්‍රණීත මධ්‍යම ධර්මස්වභාව ගෙන අසාධාරණතා සෙවියයුතු යි.

(මෙසේ ධම්මවිභත්ති දක්වා භූමි – පදට්ඨානවිභත්ති වදරති.) සොතාපත්තිමග්ග සංඛ්‍යාත දර්නභූමිය සම්මත්තනියාමයට පැමිණීමට පදට්ඨාන (ආසන්නකාරණ) යැ, භාවනාභූමිය මතුමතුයෙහි ඵලප්‍රාප්තියට පදට්ඨාන යැ, දුක්ඛපටිපදව දන්ධාභිඤ්ඤ- සමථයට පදට්ඨාන යැ, සුඛ පටිපදව ඛිප්පාභිඤ්ඤ විපස්සනාවට පදට්ඨාන යැ, දනමය පුණ්‍යක්‍රියා වස්තුව පරතෝඝෝස (ධර්මශ්‍රවණ) යට සාධාරණ පදට්ඨාන යැ, ශීලමය පුණ්‍යක්‍රියා වස්තුව චින්තාමයි ප්‍රඥවට සාධාරණ පදට්ඨාන යැ, භාවනාමය පුණ්‍යක්‍රියා වස්තුව (මත්තෙහි ධ්‍යාන සංඛ්‍යාත විදර්ශනා සංඛ්‍යාත) භාවනාමයි ප්‍රඥවට සාධාරණ පදට්ඨාන යි. යළිදු දනමය පුණ්‍යක්‍රියාවස්තුව පරතොඝොසයට ද සුතමයි ප්‍රඥවට ද සාධාරණ පදට්ඨාන යැ, ශීලමයපුණ්‍යක්‍රියාවස්තුව චින්තාමයි ප්‍රඥවට ද යොනිසො මනසිකාරයට ද සාධාරණ පදට්ඨාන යැ, සමථභාවනාමය පුණ්‍යක්‍රියාවස්තුව (මත්තෙහි ධ්‍යාන – විදර්ශනා) භාවනාමයි ප්‍රඥවට ද සම්මාදිට්ඨියට ද සාධාරණ පදට්ඨාන යි. ප්‍රතිරූපදෙශවාසය කායචිත්තවිවෙකයට ද උපචාර අපර්ණා සමාධියට ද සාධාරණ පදට්ඨාන යැ, සත්පුරුෂොපනිශ්‍රය බුද්ධාදීන් පිළිබඳ ත්‍රිවිධ අවෛත්‍යප්‍රසාදයට (ගුණ දැන පැහැදීමට) ද ශමථයට ද සාධාරණ පදට්ඨාන යැ, ආත්මසම්‍යක්ප්‍රණිධානය පාපජුගුප්සා ලක්ෂණ ලජ්ජාවට ද විදර්ශනාවට ද සාධාරණ පදට්ඨාන යැ, අකුශලපරිත්‍යාගය කුසලවීමංසා සංඛ්‍යාත පටිසඞ්ඛානුපස්සනාවට ද සමාධින්ද්‍රියට ද සාධාරණ පදට්ඨාන යැ, ධර්ම ස්වාඛ්‍යාතභාවය කුසලමූලරොපණයට ද ඵලසමාපත්තියට ද සාධාරණ පදට්ඨාන යැ, සඞ්ඝසුප්‍රතිපන්නභාවය සඞ්ඝයාගේ සුට්ඨුභාවයට සාධාරණ පදට්ඨාන යැ, ශාස්තෘ සම්පදව අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට ද ප්‍රසන්නයන්ගේ ප්‍රසාදභූයස්ත්වයට ද සාධාරණ පදට්ඨාන යැ, අප්‍රතිහත ප්‍රාතිමොක්ෂ ඇතිබව දුශ්ශීලපුද්ගලයන්ගේ නිග්‍රහයට ද ප්‍රියශීල පුද්ගලයන්ගේ සුඛවිහරණයට ද සාධාරණ පදට්ඨාන යි. එයින් වදළහ, මහාකාත්‍යායන මහරහතුන් වහන්සේ : '' ධම්මං ච පදට්ඨානං '' යනාදිය.

විභත්තිහාරය යොදනලද්දේ යි.

## 3. 1. 9

## පරිවත්තන හාරවිභඞ්ගො

තත්ථ කතමො පරිවත්තනො හාරො? "කුසලාකුසලෙ ධම්මෙ"ති. සම්මාදිට්ඨිස්ස පුරිසපුග්ගලස්ස මිච්ඡාදිට්ඨි නිජ්ජිණ්ණා භවති, යෙ චස්ස මිච්ඡාදිට්ඨිපච්චයා උප්පජ්ජෙය්‍යුං අනෙකෙ පාපකා අකුසලා ධම්මා තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති, සම්මාදිට්ඨිපච්චයා චස්ස අනෙකෙ කුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස භාවනා පාරිපූරිං ගච්ඡන්ති. සම්මාසඞ්කප්පස්ස පුරිසපුග්ගලස්ස මිච්ඡාසඞ්කප්පො නිජ්ජිණ්ණො භවති, යෙ චස්ස මිච්ඡාසඞ්කප්පපච්චයා උප්පජ්ජෙය්‍යුං අනෙකෙ පාපකා අකුසලා ධම්මා, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති, සම්මාසඞ්කප්පපච්චයා චස්ස අනෙකෙ කුසලා ධම්මා සම්භවන්ති, තෙ චස්ස භාවනා පාරිපූරිං ගච්ඡන්ති, එවං සම්මාවාචස්ස -පෙ- සම්මාකම්මන්තස්ස - සම්මාආජීවස්ස - සම්මාවායාමස්ස සම්මාසතිස්ස - සම්මාසමාධිස්ස - සම්මාවිමුත්තිස්ස[1] - සම්මාවිමුත්තිඤාණ-දස්සනස්ස පුරිසපුග්ගලස්ස මිච්ඡාවිමුත්තිඤාණදස්සනං නිජ්ජිණ්ණං භවති, යෙ චස්ස මිච්ඡාවිමුත්තිඤාණදස්සනපච්චයා උප්පජ්ජෙය්‍යුං අනෙකෙ පාපකා අකුසලා ධම්මා, තෙ චස්ස නිජ්ජිණ්ණා හොන්ති. සම්මා-විමුත්තිඤාණදස්සනපච්චයා චස්ස අනෙකෙ කුසලා ධම්මා සම්භවන්ති. තෙ චස්ස භාවනා පාරිපූරිං ගච්ඡන්ති.

යස්ස වා පාණාතිපාතා පටිවිරතස්ස පාණාතිපාතො පහීනො හොති, අදින්නාදානා පටිවිරතස්ස අදින්නාදානං පහීනං හොති, බ්‍රහ්මචාරිස්ස අබ්‍රහ්මචරියං පහීනං හොති, සච්චවාදිස්ස මුසාවාදො පහීනො හොති, අපිසුණවාචස්ස පිසුණාවාචා පහීනා හොති, සණ්හවාචස්ස ඵරුසා වාචා පහීනා හොති, කාලවාදිස්ස සම්ඵප්පලාපො පහීනො හොති, අනභිජ්ඣාලුස්ස අභිජ්ඣා පහීනා හොති, අබ්‍යාපන්නචිත්තස්ස බ්‍යාපාදො පහීනො හොති, සම්මාදිට්ඨිස්ස මිච්ඡාදිට්ඨි පහීනා හොති.

යෙ ච ඛො කෙචි අරියං අට්ඨඞ්ගිකං මග්ගං ගරහන්ති, තෙසං සන්දිට්ඨිකා සහධම්මිකා ගාරය්හා වාදානුවාදා[2] ආගච්ඡන්ති. සම්මාදිට්ඨිං ච තෙ භවන්තො ධම්මං ගරහන්ති. තෙන හි යෙ මිච්ඡාදිට්ඨිකා තෙසං භවන්තානං පුජ්ජා ච පාසංසා ච (එවං) සම්මාසඞ්කප්පං -පෙ- සම්මාවාචං- සම්මාකම්මන්තං - සම්මාආජීවං - සම්මාවායාමං - සම්මාසතිං - සම්මා-සමාධිං - සම්මාවිමුත්තිං - සම්මාවිමුත්තිඤාණදස්සනඤ්ච තෙ භවන්තො ධම්මං ගරහන්ති. තෙන හි යෙ මිච්ඡාවිමුත්තිඤාණදස්සනා තෙසං භවන්තානං පුජ්ජා ච පාසංසා ච.

යෙ ච ඛො කෙචි එවමාහංසු: භුඤ්ජිතබ්බා කාමා පරිභුඤ්ජිතබ්බා කාමා ආසෙවිතබ්බා කාමා නිසෙවිතබ්බා කාමා භාවයිතබ්බා කාමා බහුලීකාතබ්බා කාමා"ති. කාමෙහි වෙරමණී තෙසං අධම්මො. යෙ වා පන කෙචි එවමාහංසු: "අත්තකිලමථානුයොගො ධම්මො"ති, නිය්‍යානිකො තෙසං ධම්මො අධම්මො. යෙ ච ඛො කෙචි එවමාහංසු: "දුක්ඛො ධම්මො"ති, සුඛො තෙසං ධම්මො අධම්මො. යථා වා පන භික්ඛුනො සබ්බසඞ්ඛාරෙසු අසුභානුපස්සිනො විහරතො සුභසඤ්ඤා

1. සම්මාවිමුත්තස්ස - මජසං.
2. වාදානුපාතා - පු.

## 3. 1. 9

# පරිවත්තන හාරවිභඞ්ගය

එහි පරිවත්තනහාරය කවරේ යැ: "කුසලාකුසලෙ ධම්මෙ" යනාදි නිද්දෙස ගාථා යැ, (පූර්වභාගසම්‍යග්දෘෂ්ටියෙන් හෝ මාර්ගසම්‍යග්දෘෂ්ටියෙන් හෝ) සම්‍යග්දෘෂ්ටි ඇති පුරුෂ පුද්ගලහට මිථ්‍යාදෘෂ්ටිය (පූර්වනයින් විදර්ශනා සම්‍යග්දෘෂ්ටියෙන් විෂ්කම්භිතව, පශ්චිමනයින් ශ්‍රොතාපත්තිමාර්ගසම්‍යග්දෘෂ්ටියෙන් සමුච්ඡින්නව) ප්‍රහීණ වෙයි. ඔහුට මිථ්‍යාදෘෂ්ටිහේතුයෙන් යම් අනේකප්‍රකාර වූ ලාමක අකුශලධර්ම කෙනෙක් උපදනාහු නම් ඒ අකුශලයෝ ද ඔහු විසින් නිර්ජීර්ණ වූවාහු (ප්‍රහීණ කරනලද්දාහු) වෙත්. සම්‍යග්දෘෂ්ටිහෙතුයෙනුදු ඔහුට නොයෙක් (ශමථ විදර්ශනා) කුශලධර්මයෝ උපදිත්, ඔහුට ඒ කුශලධර්මයෝ ද භාවනායෙන් වැඩීමට යෙත්. සම්‍යක්සංකල්ප ඇති පුරුෂ පුද්ගලහට මිථ්‍යාසංකල්පය නිර්ජීර්ණ (ප්‍රහීණ) වෙයි. ඔහුට මිථ්‍යාසංකල්ප හෙතුයෙන් යම්බඳු නොයෙක් ලාමක අකුශලධර්මයෝ උපදනාහු නම් ඔහුට ඒ අකුශල ධර්මයෝ ද ප්‍රහීණ වෙත්. සම්‍යක්සංකල්පහෙතුයෙනුදු ඔහුට නොයෙක් කුශලධර්මයෝ උපදිත්, ඔහුට ඒ කුශලයෝ ද භාවනායෙන් වැඩීමට යෙත්. (මෙසේ) සම්‍යග්වචන ඇති ... සම්‍යක්කර්මාන්ත ඇති — සම්‍යගාජීව ඇති — සම්‍යග්ව්‍යායාම ඇති — සම්‍යක් ස්මෘති ඇති — සම්‍යක්සමාධි ඇති — සම්‍යග්විමුක්ති ඇති — සම්‍යග්විමුක්තිඥානදර්ශන ඇති පුරුෂ පුද්ගලහට මිථ්‍යාවිමුක්තිඥානදර්ශනය ප්‍රහීණ වෙයි, ඔහුට මිථ්‍යාවිමුක්ති ඥානදර්ශන හෙතුයෙන් යම් අනෙකප්‍රකාර වූ ලාමක අකුශලධර්ම කෙනෙක් උපදනාහු නම් ඒ අකුශලයෝ ද ඔහු විසින් ප්‍රහීණ කරනලද්දාහු වෙත්. සම්‍යග්විමුක්තිඥානදර්ශන හෙතුයෙනුදු ඔහුට නොයෙක් කුශලධර්මයෝ උපදිත්. ඒ කුශලධර්මයෝ ද ඔහුට භාවනායෙන් පාරිපූරියට යෙත්.

තවද ඒ පණිවායෙන් වැළැකුණුහට ප්‍රාණවධය ප්‍රහීණ වෙයි, අයිනාදනින් වෙන්වූවහුට අදින්නාදනය ප්‍රහීණ වෙයි, බඹසර ඇත්තහුට අබ්‍රහ්මචරිය ප්‍රහීණ වෙයි, සත්‍යවාදීහට මෘෂාවාදය ප්‍රහීණ වෙයි, පිසුනුබස් නැතියහුට පිසුනුවාක් ප්‍රහීණ වෙයි, සිලුටුවදන් ඇතියහුට පරුෂවාක් ප්‍රහීණ වෙයි, කාලවාදීහට සම්ප්‍රලාප ප්‍රහීණ වෙයි, අනභිධ්‍යාලුහට අභිධ්‍යා ප්‍රහීණ වෙයි, අව්‍යාපන්න සිත් ඇතියහුට ව්‍යාපාදය ප්‍රහීණ වෙයි, සම්‍යග්දෘෂ්ටි ඇතියහුට මිථ්‍යාදෘෂ්ටි ප්‍රහීණ වේ.

තවද යම් කෙනෙක් ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය ගරහත් ද, ඔවුනට සාන්දෘෂ්ටික වූ සකාරණ වූ ගැරැහියැ යුතු වාදනුවාදයෝ පැමිණෙත්. ඒ භවත්හු සම්‍යග්දෘෂ්ටි ධර්මය ද ගරහත්. එකරුණෙන් ම ඒ භවත්නට යම් මිථ්‍යාදෘෂ්ටික කෙනෙක් වෙත් ද, ඔහු පිදිය යුත්තාහු ද පැසැසියයුත්තාහු ද වෙත්. (මෙසේ) සම්‍යක්සංකල්පය ... සම්‍යග්වචනය — සම්‍යක්කර්මාන්තය — සම්‍යගාජීවය — සම්‍යග්ව්‍යායාමය — සම්‍යක්ස්මෘතිය — සම්‍යක් සමාධිය — සම්‍යග්විමුක්තිය — ඒ භවත්හු සම්‍යග්විමුක්තිඥානදර්ශන ධර්මය ගරහත්, එ කරුණෙන් ම ඒ භවත්නට මිථ්‍යාවිමුක්තිඥානදර්ශන ඇති යම් කෙනෙක් වෙත් ද, ඔහු පිදියයුත්තාහු ද පැසැසියයුත්තාහු ද වෙත්.

යළි තවද යම් කෙනෙක් මෙසේ කියත් ද: "වස්තුකාමයෝ වැළැඳියයුත්තාහ, වස්තුකාමයෝ පරිභොග කළයුත්තාහ, වස්තුකාමයෝ ආසේවන කළයුත්තාහ, වස්තු කාමයෝ නිරතුරු සෙවන කළයුත්තාහ, ක්ලේශකාමයෝ වැඩියයුත්තාහ, ක්ලේශ කාමයෝ බහුලකළයුත්තාහ" යි. ඔවුනට කාමයන් කෙරෙන් වෙන්වීම අධර්ම යැ. යළි යම් කෙනෙක් මෙසේ හෝ කියත් ද: "අත්තකිලමථානුයොගය ධර්ම" යැයි ඔවුනට නෛර්‍ය්‍යාණික වූ විදර්ශනාව සමග ආර්‍ය්‍යමාර්ගධර්මය අධර්ම යැ. තවද යම් කෙනෙක් මෙසේ කියත් ද: "පව් නසම්හයි කරන ශරීරතාපන දුඃඛය ධර්ම" යැයි. ඔවුනට අනවද්‍ය ප්‍රත්‍යයපරිභොගසුඛ සංඛ්‍යාත ධර්මය අධර්ම යැ. තවද (සුභසඤ්ඤාදි

පහීයන්ති, දුක්ඛානුපස්සිනො විහරතො සුඛසඤ්ඤා පහීයන්ති, අනිච්චානුපස්සිනො විහරතො නිච්චසඤ්ඤා පහීයන්ති, අනත්තානුපස්සිනො විහරතො අත්තසඤ්ඤා පහීයන්ති, යං යං වා පන ධම්මං රොචයති වා උපගච්ඡති වා, තස්ස තස්ස ධම්මස්ස යො පටිපක්ඛො, ස්වාස්ස අනිට්ඨිතො අජ්ඣාපන්නො භවති. තෙනාහ, ආයස්මා මහාකච්චානො: "කුසලාකුසලෙ ධම්මෙ"ති.

නියුත්තො පරිවත්තනො හාරො.

## 3. 1. 10

## වෙවචනහාරවිභඞ්ගො

තත්ථ කතමො වෙවචනො හාරො: "වෙවචනානි බහූනී"ති. යථා එකං භගවා ධම්මං අඤ්ඤමඤ්ඤෙහි වෙවචනෙහි නිද්දිසති. යථාහ භගවා:

1. "ආසා පිහා ච අභිනන්දනා ච
අනෙකධාතූසු සරා පතිට්ඨිතා,
අඤ්ඤාණමූලප්පභවා පජප්පිතා
සබ්බා මයා බ්‍යන්තිකතා සමූලකා"ති

ආසා නාම වුච්චති: යා භවිස්සස්ස අත්ථස්ස ආසිංසනා, අවස්සං ආගමිස්සතීති ආසාස්ස උප්පජ්ජති. පිහා නාම යා වත්තමානකස්ස අත්ථස්ස පත්ථනා, සෙය්‍යතරං වා දිස්වා එදිසො භවෙය්‍යන්ති පිහාස්ස උප්පජ්ජති. අත්ථනිප්ඵත්තිපටිපාලනා අභිනන්දනා නාම, පියං වා ඤාතිං අභිනන්දති, පියං වා ධම්මං අභිනන්දති, අප්පටිකූලතො වා අභිනන්දති. අනෙකධාතූති: චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු ඝානධාතු ගන්ධධාතු ඝානවිඤ්ඤාණධාතු ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු. සරාති කෙචි රූපාධිමුත්තා කෙචි සද්දාධිමුත්තා කෙචි ගන්ධාධිමුත්තා කෙචි රසාධිමුත්තා කෙචි ඵොට්ඨබ්බාධිමුත්තා කෙචි ධම්මාධිමුත්තා. තත්ථ යානි ඡ ගෙහසිතානි දොමනස්සානි යානි ච ඡ ගෙහසිතානි සොමනස්සානි යානි ච ඡ නෙක්ඛම්මසිතානි දොමනස්සානි යානි ච ඡ නෙක්ඛම්මසිතානි සොමනස්සානි, ඉමානි චතුවීස පදානි තණ්හාපක්ඛො, තණ්හාය එතං වෙවචනං. යා ඡ උපෙක්ඛා ගෙහසිතා අයං දිට්ඨිපක්ඛො. සායෙව පත්ථනාකාරෙන ධම්මනන්දී ධම්මපෙමං ධම්මජ්ඣොසානන්ති තණ්හාය එතං වෙවචනං.

චිත්තං මනො විඤ්ඤාණන්ති චිත්තස්ස එතං වෙවචනං. මනින්ද්‍රියං මනොධාතු මනායතනං විජානනාති මනස්සෙතං වෙවචනං.

පරිවර්තන) මෙසේ යැ : සියලු ත්‍රෛභූමක සංස්කාරයන්හි අශුභානුදර්ශී ව වාසය කරන මහණහට අශුභයෙහි ශුභ යැයි ගන්නා විපරීත සංඥා ප්‍රහීණ වෙයි, දුඃඛානුදර්ශීව වාසය කරන්නහුට දුඃඛයෙහි සුඛ යැයි ගන්නා සංඥා ප්‍රහීණ වෙයි, අනිත්‍යානුදර්ශීව වාසය කරන්නහුට අනිත්‍යයෙහි නිත්‍ය යයි ගන්නා විපරීතසංඥා ප්‍රහීණ වෙයි, අනාත්මානුදර්ශීව වාසය කරන්නහුට ආත්මසංඥා ප්‍රහීණ වෙයි. තවද යම් යම් ධර්මයක් රුචි කෙරෙයි හෝ පැමිණෙයි හෝ වේ ද ඒ ඒ ධර්මයට ප්‍රතිපක්ෂ වූ යම් ධර්මයෙක් ඇද්ද ඒ ධර්මය ඊට අනිෂ්ට හෙයින් අභ්‍යුපගත වූයේ — දන්නාලද්දේ වේ. එයින් වදළහ, ආයුෂ්මත් මහාකාත්‍යායන මහරහතුන් වහන්සේ : '' කුසලාකුසලෙ ධම්මෙ '' යනාදිය.

පරිවත්තනහාරය යොදන ලද්දේ යි.

## 3. I. 10

## වෙවචනහාර විභඞ්ගය

එහි වෙවචනහාරය කවරෙ යැ : '' වෙවචනානි බහූනි '' යනාදි නිද්දෙසගාථා යි. ඒ මෙසේ යැ. භාග්‍යවතුන් වහන්සේ එක් ධර්මයක් අන්‍යොන්‍ය පර්‍ය්‍යායවචනයන්ගෙන් දක්වන සේක. මෙසේ වදළහ, බුදුහු :

1. අනාගතාර්ථ ප්‍රාර්ථනා කරන ආශාව ද අනාගත ප්‍රත්‍යුත්පන්නාර්ථවිෂය වූ තෘෂ්ණා සංඛ්‍යාත පිහාව ද නිෂ්පන්නාර්ථ ප්‍රතිපාලන කරන අභිනන්දනාව ද චක්ඛුධාතු ආදි අනෙක ධාතුවිෂයෙහි පිහිටි අවිද්‍යාමූලය ප්‍රභව කොට ඇති තෘෂ්ණා සංඛ්‍යාත සියලු ප්‍රජපිල්තයෝ මා විසින් මූලසහිතව විගතාන්ත කරනලද්දහු යයි.

අනාගත වූ ඊප්සිතාර්ථයාගේ යම් ආශංසනයක් වේ ද එය ' ආසා ' නමැයි කියනු ලැබේ. ' අවශ්‍යයෙන් ඊප්සිතාර්ථය ලැබෙන්නේය ' යි ඔහුට ආශාව උපදී. වර්තමාන අර්ථයාගේ යම් ප්‍රාර්ථනාවක් වේ ද එය ' පිහා ' නම, ශ්‍රේෂ්ඨතරයකු හෝ දැක ' මෙබඳු වෙම්ව ' යි ඔහුට පිහා (කැමැත්ත) උපදී. අර්ථනිෂ්පත්තිප්‍රතිපාලනය (නිපන් අර්ථය රැකීම) ' අභිනන්දනා ' නම, (සත්වසංස්කාරකෙලායනය අභිනන්දනා යි) ප්‍රිය ඥාතියකු හෝ අභිනන්දන කෙරෙයි (සතුටින් පිළිගනී.) ප්‍රිය වූ රූපාදි ආලම්බනධර්මය හෝ අභිනන්දන කෙරෙයි. (ප්‍රතිකූල ආලම්බනයෙහිද විපර්‍ය්‍යාස විසින්) අප්‍රතිකූල හෙයින් අභිනන්දන කෙරෙයි. '' අනෙකධාතු '' යනු : ' චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණ ධාතු, සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු, ඝානධාතු ගන්ධධාතු ඝානවිඤ්ඤාණ ධාතු, ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු, කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු, මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු, යන මොහු යැ. '' සරා '' යනු : කිසි කෙනෙක් රූපයෙහි ඇලුණාහුය, කිසි කෙනෙක් ශබ්දයෙහි ඇලුණාහ, කිසි කෙනෙක් ගන්ධයෙහි ඇලුණාහ, කිසි කෙනෙක් රසයෙහි ඇලුණාහ, කිසි කෙනෙක් පහසෙහි ඇලුණාහ, කිසි කෙනෙක් ධර්මාලම්බනයෙහි ඇලුණාහු වෙත්. එහි යම් සවැදෑරුම් ගෘහශ්‍රිත දෙම්නස් වෙදනා කෙනෙක් වෙත් ද, යම් ෂට්ගෘහශ්‍රිත සොම්නස් කෙනෙකුත් වෙත් ද, යම් ෂට්නෛෂ්ක්‍රම්‍යශ්‍රිත දෙම්නස් කෙනෙකුත් වෙත් ද, යම් ෂට්නෛෂ්ක්‍රම්‍යශ්‍රිත සොම්නස් කෙනෙකුත් වෙත් ද, මේ සූවිසි පදයෝ තෘෂ්ණාපක්ෂය වෙයි, තෙල තෘෂ්ණාවට වෙවචන යි. යම් සවැදෑරුම් ගෘහශ්‍රිත උපේක්ෂාවක් වේ ද මේ දෘෂ්ටිපක්ෂ යි, ඒ තෘෂ්ණාව ම ප්‍රාර්ථනාකාරයෙන් පවත්නා හෙයින් ධම්මනන්දි ධම්මපෙම ධම්මජ්ඣොසාන යි ද වේ. තෙල තෘෂ්ණාවට වෙවචන යි.

චිත්ත යැ මනොවිඤ්ඤාණ යැ යන තෙල චිත්තයට වෙවචන යැ, මනින්ද්‍රිය යැ, මනොධාතු යැ, මනායතන යැ, විජානනා යැ යන මේ මනසට පර්‍ය්‍යාය වචන යි.

6—සී 04440 (79/08)

පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං අධිපඤ්ඤාසික්ඛා පඤ්ඤා පඤ්ඤාක්ඛන්ධො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො ඤාණං සම්මාදිට්ඨි තීරණා විපස්සනා ධම්මෙ ඤාණං අත්ථෙ ඤාණං අන්වයෙ ඤාණං ඛයෙ ඤාණං අනුප්පාදෙ ඤාණං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං චක්ඛු විජ්ජා බුද්ධි භූරි මෙධා ආලොකො, යං වා පන කිඤ්චි අඤ්ඤම්පි එවං ජාතියං පඤ්ඤාය එතං වෙවචනං. පඤ්චින්ද්‍රියානි ලොකුත්තරානි, සබ්බා පඤ්ඤා, අපි ච ආධිපතෙය්‍යට්ඨෙන සද්ධා, ආරම්භට්ඨෙන විරියං, අපිලාපනට්ඨෙන සති, අවික්ඛෙපට්ඨෙන සමාධි, පජානනට්ඨෙන පඤ්ඤා.

යථා ච බුද්ධානුස්සතියං වුත්තං: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා" බලනිප්ඵත්තිගතො වෙසාරජ්ජප්පත්තො අධිගතපටිසම්භිදො චතුයොගවිප්පහීනො අගතිගමනවීතිවත්තො උද්ධටසල්ලො නිරූළ්හවණො මද්දිතකණ්ටකො නිබ්බාපිතපරියුට්ඨානො බන්ධනාතීතො ගන්ථවිනිවෙඨනො අජ්ඣාසයවීතිවත්තො භින්නන්ධකාරො චක්ඛුමා ලොකධම්මසමතික්කන්තො අනුරොධවිරොධවිප්පයුත්තො ඉට්ඨානිට්ඨෙසු ධම්මෙසු අසඞ්ඛෙපගතො බන්ධනාතිවත්තො ඨපිතසඞ්ගාමො අභික්කන්තතරො උක්කාධරො ආලොකකරො පජ්ජොතකරො තමොනුදො රණඤ්ජහො අපරිමාණවණ්ණො අප්පමෙය්‍යවණ්ණො අසඞ්ඛෙය්‍යවණ්ණො ආභඞ්කරො පභඞ්කරො ධම්මොභාසපජ්ජොතකරොති ච බුද්ධා භගවන්තොති ච බුද්ධානුස්සතියා එතං වෙවචනං.

යථා ච ධම්මානුස්සතියං වුත්තං: "ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො[1] පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි" යදිදං මදනිම්මදනො පිපාසවිනයො ආලයසමුග්ඝාතො වට්ටුපච්ඡෙදො සුඤ්ඤතො අතිදුල්ලභො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං.

2. "අසඞ්ඛතං[2] නන්තමනාසවං ච
සච්චං ච පාරං නිපුණං සුදුද්දසං,
අජජ්ජරං ධුවමපලොකිතං ච
අනිදස්සනං නිප්පපඤ්චං ච සන්තං

---

1. ඔපනෙය්‍යිකො - මජසං.
2. අසඞ්ඛතං අනතං - මජසං.

පඤ්ඤින්ද්‍රිය පඤ්ඤාබල අධිපඤ්ඤාසික්ඛා පඤ්ඤා පඤ්ඤාක්ඛන්ධ ධම්මවිචය සම්බොජ්ඣඞ්ග ඤාණ සම්මාදිට්ඨි තීරණා විපස්සනා ධම්මෙඤාණ අත්ථෙඤාණ අන්වයෙඤාණ ඛයෙඤාණ අනුප්පාදෙඤාණ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය අඤ්ඤින්ද්‍රිය අඤ්ඤාතාවින්ද්‍රිය චක්ඛු විජ්ජා බුද්ධි භූරි මෙධා ආලොක යැ යනු ද, යළි යම් කිසි මෙබඳු ස්වභාව ඇති පඤ්ඤා පජානනා ආදි අනිකුදු වචන හෝ ඇද්ද තෙල ප්‍රඥාවට වෙවචන යි. 'ඛයෙඤාණං' යනාදි පඤ්චෙන්ද්‍රියයෝ ලොකොත්තරප්‍රඥාවට වෙවචනයෝ යැ, ඉතිරි සියලු පඤ්ඤාවෙවචනයෝ ලෞකික ලොකොත්තරමිශ්‍රයෝ යි. තවද අධිමොක්ෂ ලක්ෂණයෙහි අධිපතිභාවාර්ථයෙන් 'සද්ධා' යැ ආරම්භාර්ථයෙන් 'විරිය' යැ අපිලාපනාර්ථයෙන් 'සති' යැ අවික්ෂෙපාර්ථයෙන් 'සමාධි' යැ ප්‍රජානනාර්ථයෙන් 'පඤ්ඤා' යි.

යළි බුද්ධානුස්සතිනිද්දෙසයෙහි මෙසේ වදරන ලදි: "ඒ භාග්‍යවත් බුදුහු මෙ කරුණෙන් 'අරහං' යැ 'සම්මාසම්බුද්ධ' යැ 'විජ්ජාචරණසම්පන්න' යැ 'සුගත' යැ 'ලොකවිදූ' යැ 'අනුත්තර පුරිසදම්මසාරථි' යැ 'දෙවමනුස්සානං සත්ථා' යැ 'භගවා' යැ. දසබලයෙහි නිමාවට ගියහෙයින් 'බලනිප්ඵත්තිගත' යැ අටපිරිස්හි විසාරද වූයෙන් 'වෙසාරජ්ජප්පත්ත' යැ පටිසම්භිදාඅධිගම කළ හෙයින් 'අධිගතපටිසම්භිද" යැ ප්‍රහීණකළ කාමාදි යොග ඇතියෙන් 'චතුයොගවිප්පහීන' යැ 'අගතිගමනවීතිවත්ත' යැ උපුළ රාගාදි ශල්‍ය ඇතියෙන් 'උද්ධටසල්ල' යැ ගොපිත ඉන්ද්‍රිය ඇතියෙන් 'නිරුළ්හවණ' යැ මැඩැපී කෙලෙස් ඇතියෙන් 'මද්දිත කණ්ටක' යැ නැසූ රාගාදි පරියුට්ඨාන ඇතියෙන් 'නිබ්බාපිතපරියුට්ඨාන' යැ නැසූ සංයොජන ඇතියෙන් 'බන්ධනාතීත' යැ පියූ අභිධ්‍යාදි කායග්‍රන්ථ ඇතියෙන් 'ගන්ථවිනිවෙඨන' යැ ඉක්මවූ භවතෘෂ්ණාදිය ඇතියෙන් 'අජ්ඣාසයවීතිවත්ත' යැ බුන් අවිද්‍යා ඇතියෙන් 'භින්නන්ධකාර' යැ පසැස් ඇතියෙන් 'චක්ඛුම' යැ ඉක්මවූ අටලෝදහම් ඇතියෙන් 'ලොකධම්මසමතික්කන්ත' යැ අනුනය ප්‍රතිඝ රහිත හෙයින් 'අනුරොධවිරොධවිප්පයුත්ත' යැ ඉටුඅනිටු දහම්හි නොහැකිළෙනුයෙන් 'ඉට්ඨානිට්ඨෙසු ධම්මෙසු අසඞ්ඛෙපගත' යැ ඉක්මවූ බන්ධන ඇතියෙන් 'බන්ධනාතිවත්ත' යැ හළ විවාද ඇතියෙන් 'ඨපිතසඞ්ගාම' යැ 'අභික්කන්තතර' යැ නැණපහන් දරනුයෙන් 'උක්කාධර' යැ 'ආලොකකර' යැ 'පජ්ජොතකර' යැ මෝහතම දුරුකරනුයෙන් 'තමොනුද' යැ ක්ලේශරණ දුරුකරනුයෙන් 'රණඤ්ජහ' යැ අප්‍රමාණ වූ ශරීරවර්ණ ගුණවර්ණ ඇතියෙන් 'අපරිමාණවණ්ණ' යැ පමණ නොකළහෙන වර්ණ ඇතියෙන් 'අප්පමෙය්‍යවණ්ණ' යැ සඞ්ඛ්‍යා නොකළහෙන වර්ණ ඇතියෙන් 'අසඞ්ඛෙය්‍යවණ්ණ යැ 'ආභඞ්කර' යැ 'පභඞ්කර' යැ ධම්මෙ භාසපජ්ජොතකර' යී ද 'බුද්ධා භගවන්තො' යී ද බුද්ධානුස්මෘතියට තෙල වෙවචන යි.

තවද ධම්මානුස්සතිනිද්දෙසයෙහි මෙසේ වදරන ලදි: 'භාග්‍යවතුන් විසින් ධර්මය 'ස්වාක්ඛාත' යැ සිය සතන්හි රාගාදිය දුරුකිරීමෙන් තමා මැ දූක්කයුතු නුයි 'සන්දිට්ඨික' යැ ඵලදනය සඳහා කල් නොඉක්මේ නුයි 'අකාලික' යැ එව බලව' යි කියනුවට සුදුසු නුයි 'එහිපස්සික' යැ තම සතන්හි පමුණුවාලීමට නිසි නුයි 'ඔපනයික' යැ විඥයන් විසින් තමතමා කෙරෙහි ලා දතයුතු නුයි 'පච්චත්ත වෙදිතබ්බ' යැ. ඒ දහම ඊට පැමිණ මානමදදිය නිම්මද වේ නුයි 'මදනිම්මදන' යැ කාමපිපාසාදිය අපගම වේ නුයි 'පිපාසවිනය' යැ කාමාලයාදිය නැසේ නුයි 'ආලය සමුග්ඝාත' යැ කර්මාදි තුන්වට සිඳේ නුයි 'වට්ටුපච්ඡෙද' යැ 'සුඤ්ඤත' යැ 'අති දුල්ලභ' යැ 'තණ්හක්ඛය' යැ 'විරාග' යැ 'නිරොධ' යැ 'නිබ්බාන' යි.

2. කිසි ප්‍රත්‍යයෙකින් නො කරනලද නුයි 'අසඞ්ඛත' යැ අන්ත (විනාශ) නැත් නුයි 'අනන්ත' යැ ආශ්‍රවයනට අරමුණු නොවේ නුයි 'අනාසව' යැ අවිපරීතස්වභාව හෙයින් 'සච්ච' යැ පරතීර බැවින් 'පාර' යැ නිපුණඥානවිෂය හෙයින් ද සූක්ෂ්ම හෙයින් ද 'නිපුණ' යැ අනුපචිත ඥානසම්භාර ඇතියන් විසින් නොදක්කහේ නුයි සුදුද්දස' යැ

3. අමතං පණීතං ච සිවං ච ඛෙමං
තණ්හක්ඛයො අච්ඡරියං ච අබ්භුතං,
අනීතිකං'නීතිකධම්මමෙව ච,[1]
නිබ්බානමෙතං සුගතෙන දෙසිතං.

4. අජාතං අභූතං අනුපද්දවඤ්ච
අකතං අසොකං ච අථො විසොකං,
අනුපසග්ගං'නුපසග්ගධම්මං
නිබ්බානමෙතං සුගතෙන දෙසිතං.

5. ගම්භීරඤ්චෙව දුප්පස්සං උත්තරං ච අනුත්තරං,
අසමං අප්පටිසමං ජෙට්ඨං සෙට්ඨන්ති වුච්චති.

6. ලෙනඤ්ච තාණං අරණං අනඞ්ගණං
අකාච[2] මෙතං විමලන්ති වුච්චති,
දීපො සුඛං අප්පමාණං පතිට්ඨා
අකිඤ්චනං අප්පපඤ්චන්ති වුත්ත"න්ති.

ධම්මානුස්සතියා එතං වෙවචනං.

යථා ච සඞ්ඝානුස්සතියං වුත්තං: "සුපටිපන්නො උජ්ජුපටිපන්නො ඤායපටිපන්නො සාමීචිපටිපන්නො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස" සීලසම්පන්නො සමාධිසම්පන්නො පඤ්ඤාසම්පන්නො විමුත්තිසම්පන්නො විමුත්තිඤාණදස්සනසම්පන්නො සත්තානං සාරො සත්තානං මණ්ඩො සත්තානං උද්ධාරො සත්තානං එසිකා සත්තානං සුරභිපසූනං[3] පුජ්ජො දෙවානං මනුස්සානං චාති සඞ්ඝානුස්සතියා එතං වෙවචනං.

1. අනීතිකධම්මං - මජසං.
2. අකාම - අට්ඨකථා.
3. සුරභි පසූනං - සිමු, මජසං.

ජාතිජරායෙන් අනුපද්‍රැත හෙයින් ' අජජ්ජර ' යැ ස්ථිර බැවින් ' ධුව ' යැ ජරාමරණයෙන් නොබිඳේ නුයි ' අපලොකිත ' යැ මසැසිනුදු දිවැසිනුදු නොදක්කහේ නුයි ' අනිදස්සන ' යැ රාගාදි ප්‍රපඤ්ච නැතියෙන් ' නිප්පපඤ්ච ' යැ කෙල්ශාභිසංස්කාරයන්ගේ ව්‍යුපශමයට කාරණ බැවින් ' සාන්ත ' යි.

3. අමෘතයට හේතුබැවිනුදු භඞ්ග නැතියෙනුදු ' අමත ' යැ උත්තමාර්ථයෙන් ' පණීත ' යැ වර්තදුඃඛ නැතියෙන් ' සිව ' යැ සතර යෝගයෙන් අනුපද්‍රව බැවින් ' ඛෙම ' යැ තෘෂ්ණාක්ෂය වේ නුයි ' තණ්හක්ඛය ' යැ කාලාන්තරයෙහි දක්කයුතු හෙයින් ' අච්ඡරිය ' යැ එහෙයින් ම ' අබ්භුත ' යැ අනන්තරායබවට හෙතුවනුයෙන් ' අනීතික ' යැ අනන්තරායස්වභාවට හේතුවන හෙයින් ' අනීතිකධම්ම ' යැයි මේ නිවන සුගතයන් විසින් දෙසනලදි.

4. නූපදනා සැහැවි ඇතියෙන් ' අජාත ' යැ එහෙයින් ම ' අභූත ' යැ උපද්‍රව නැති බැවින් ' අනුපද්දව ' යැ ප්‍රත්‍යයෙකින් නොකරනලද නුයි ' අකත ' යැ ශොක නැත් නුයි ' අසොක ' යැ නැවත ශොකහෙතු විගමයෙන් ' විසොක ' යැ කිසිවකු විසින් පීඩිත නොවන බැවින් ' අනුපසග්ග ' යැ (එසේම) ' අනුපසග්ගධම්ම ' යැ යි ද තෙල නිවන සුගතයන් විසින් දෙසනලදි.

5. ගැඹුරු නුවණට ගොචර හෙයින් ' ගම්භීර ' යැ සම්‍යක් ප්‍රතිපත් නැතිව දක්නට නොහැකි වන බැවින් ' දුප්පස්ස ' යැ සියලු ලොව උත්තරණය කොට සිටියේ නුයි ' උත්තර ' යැ තෙල දහමට උත්තරයෙක් නැත් නුයි ' අනුත්තර ' යැ සදෘශයක්නු නැතියෙන් ' අසම ' යැ ප්‍රතිභාගයකු නැතියෙන් ' අප්පටිසම ' යැ උත්තමාර්ථයෙන් ' ජෙට්ඨ ' යැ ප්‍රශස්‍යතම නුයි ' සෙට්ඨ ' යයි ද කියනු ලැබෙ.

6. සසරදුකින් පීඩිතයන් විසින් නිලීන කළයුතු නුයි ' ලෙන ' යැ සසරදුකින් රක්නාහෙයින් ' තාණ ' යැ රණාභාවයෙන් ' අරණ ' යැ අඞ්ගණාභාවයෙන් ' අනඞ්ගණ ' යැ නිදෙස් බැවින් ' අකාච ' යැ රාගාදි මලාපගමයෙන් තෙල ' විමල ' යි ද කියනු ලැබෙ. සතර ඔඝයෙන් වතුරු නොගන්නා හෙයින් ' දීප ' යැ ව්‍යුපශම සුඛතායෙන් ' සුඛ ' යැ පමණ නො කළහේ නුයි ' අප්පමාණ ' යැ සසරසයුරෙහි නොගැලෙනුයෙන් ' පතිට්ඨා ' යැ රාගාදි කිඤ්චනාභාවයෙන් ' අකිඤ්චන ' යැ තෘෂ්ණාදි ප්‍රපඤ්චාභාවයෙන් ' අප්පපඤ්ච ' යයි ද වදරනලද්දේ යි.

තෙල ධම්මානුස්සතියට වෙවචන යි.

තවද සඞ්ඝානුස්සතියෙහි මෙසේ වදරනලදි : සම්‍යක්ප්‍රතිපත්හි මොනොවට පිළිපන් හෙයින් ' සුපටිපන්න ' යැ මැදුම්පිළිවෙත්හි පිළිපන් හෙයින් ' උජුපටිපන්න ' යැ ඤාය සංඛ්‍යාත නිවනට පිළිපන් හෙයින් ' ඤායපටිපන්න ' යැ සාමීචිකර්මාර්හව පිළිපන් හෙයින් ' සාමීචිපටිපන්න ' යැ අෂ්ට පුරුෂ පුද්ගල වූ යම් සතර පුරුෂයුගල කෙනෙක් වෙත් ද භාග්‍යවතුන් වහන්සේගේ තෙල ශ්‍රාවක සඞ්ඝ දුරසිට අවුත් පිදීමට සුදුසු නුයි ' ආහුනෙය්‍ය ' යැ අමුතුසත්කාරයට සුදුසු නුයි ' පාහුනෙය්‍ය ' යැ දක්ෂිණාර්හ නුයි ' දක්ෂිණෙය්‍ය ' යැ අඤ්ජලිකර්මාර්හ නුයි ' අඤ්ජලිකරණීය ' යැ ලොවට ' අනුත්තර පුඤ්ඤක්ඛෙත්ත ' යැ. ' සීලසම්පන්න ' යැ ' සමාධිසම්පන්න ' යැ ' පඤ්ඤා සම්පන්න ' යැ ' විමුත්තිසම්පන්න ' යැ ' විමුත්තිඤාණදස්සනසම්පන්න ' යැ සාරගුණ යොගයෙන් සත්ත්වයන් කෙරෙහි ' සාර ' යැ සත්ත්වයන් කෙරෙහි ' මණ්ඩ ' යැ ගුණ විසින් මැ උද්ධරණය කටයුතු නුයි සත්ත්වයන් කෙරෙහි ' උද්ධාර ' යැ අචල ගුණ ඇතියෙන් සත්ත්වයන් කෙරෙහි ' එසිකා ' යැ ගුණසොභාසුරභිභාවයෙන් සත්ත්වයන් කෙරෙහි ' පසූන ' යැ (සුවඳ කුසුමයෙකැයි සේයි.) දෙවියන් විසිනුදු මිනිසුන් විසිනුදු ' පූජ්‍ය ' යැයි. තෙල සඞ්ඝානුස්සතියට වෙවචන යි.

යථා ච සීලානුස්සතියං වුත්තං: "යානි තානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි අරියානි අරියකන්තානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධි සංවත්තනිකානි". අලඞ්කාරො ච සීලං උත්තමඞ්ගොපසොභණතාය, නිධානඤ්ච සීලං සබ්බදොභග්ගසමතික්කමනට්ඨෙන, සිප්පඤ්ච සීලං අක්ඛණවෙධිතාය, වෙලා ච සීලං අනතික්කමනට්ඨෙන, ධඤ්ඤඤ්ච සීලං දළිද්දොපච්ඡෙදනට්ඨෙන, ආදාසො ච සීලං ධම්මවොලොකනතාය, පාසාදො ච සීලං වොලොකනට්ඨෙන, සබ්බභූමානුපරිවත්ති ච සීලං අමතපරියොසානන්ති සීලානුස්සතියා එතං වෙවචනං.

යථා ච චාගානුස්සතියං වුත්තං: "යස්මිං සමයෙ අරියසාවකො අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො"ති චාගානුස්සතියා එතං වෙවචනං. තෙනාහ ආයස්මා මහාකච්චානො: "වෙවචනානි බහූනී"ති.

නියුත්තො වෙවචනො හාරො.

## 3. 1. 11

## පඤ්ඤත්තිහාරවිභඞ්ගො

තත්ථ කතමො පඤ්ඤත්තිහාරො: "එකං භගවා ධම්මං පඤ්ඤත්තීහි විවිධාහි දෙසෙතී"ති. යා පකතිකථාය දෙසනා අයං නික්ඛෙපපඤ්ඤත්ති. කා ච පකතිකථාය දෙසනා: චත්තාරි සච්චානි, යථා භගවා ආහ: "ඉදං දුක්ඛ"න්ති. අයං පඤ්ඤත්ති පඤ්චන්නං ඛන්ධානං ඡන්නං ධාතූනං අට්ඨාරසන්නං ධාතූනං ද්වාදසන්නං ආයතනානං දසන්නං ඉන්ද්‍රියානං නික්ඛෙපපඤ්ඤත්ති.

"කබලිංකාරෙ චෙ භික්ඛවෙ ආහාරෙ අත්ථි රාගො අත්ථි නන්දී අත්ථි තණ්හා, පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං විරූළ්හං, යත්ථ පතිට්ඨිතං විඤ්ඤාණං විරූළ්හං, අත්ථි තත්ථ නාමරූපස්ස අවක්කන්ති. යත්ථ අත්ථි නාමරූපස්ස අවක්කන්ති අත්ථි තත්ථ සඞ්ඛාරානං වුඩ්ඪි. යත්ථ අත්ථි සඞ්ඛාරානං වුඩ්ඪි අත්ථි තත්ථ ආයතිං[1] පුනබ්භවාභිනිබ්බත්ති. යත්ථ අත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, අත්ථි තත්ථ ආයතිං ජාතිජරාමරණං, යත්ථ අත්ථි ආයතිං ජාතිජරාමරණං සසොකං තං භික්ඛවෙ සදරං සඋපායාසන්ති වදාමි,

1. ආයති - සීමු, මජසං.

තවද සීලානුස්සති නිද්දේසයෙහි මෙසේ වදරන ලදි : '' ඒ ශීලයෝ නොකඩ බැවින් ' අඛණ්ඩ ' යැ නොසිදුරු බැවින් ' අච්ඡිද්ද ' යැ නො කබර බැවින් ' අසබල ' යැ අතර තුරෙහි නොබිඳුණු හෙයින් කල්මාෂ නොවූයෙන් ' අකම්මාස ' යැ නිර්දෙෂ හෙයින් ' අරිය ' යැ බුද්ධාදි ආර්‍යයනට කාන්ත හෙයින් ' අරියකන්ත ' යැ තෘෂ්ණාදසව්‍යතායෙන් මිදුණු හෙයින් ' භුජිස්ස ' යැ බුද්ධාදි විඥයන් විසින් ප්‍රශස්ත හෙයින් ' විඤ්ඤුප්පසත්ථ ' යැ තෘෂ්ණාදෘෂ්ටීන් පරාමර්ශ නොකළහෙයින් ' අපරාමට්ඨ ' යැ උපචාරසමාධි ආදිය පිණිස පවත්නාහෙයින් ' සමාධිසංවත්තනික ' යැ. ගුණයන් කෙරෙහි උත්තමාඞ්ග වූ ප්‍රඥව හොබවනුයෙන් සීලය ' අලඞ්කාර ' ද වෙයි, සියලු දුර්භගතා ඉක්මවන අටින් සීලය ' නිධාන ' ද වෙයි, අක්ෂණවෙධී බැවින් සීලය ' සිප්ප ' ද වෙයි, සීමා නොඉක්මවන අටින් සීලය ' වෙලා ' ද වෙයි, දිළිඳුබව නසන අටින් සීලය ' ධඤ්ඤ ' ද වෙයි, ශමථ විදර්ශනාදිධර්ම අවලොකන කරනබැවින් සීලය ' ආදස ' ද වෙයි, අභිඥචක්ෂුසින් ලොව බලනඅටින් සීලය ' පාසාද ' ද වෙයි, අමෘතය පර්‍යවසාන කොට ඇති සීලය ' සබ්බභූමානුපරිවත්ති ' ද වේ යයි. තෙල සීලානුස්සතියට වෙවචන යි.

යළිදු චාගානුස්සතියෙහි මෙසේ වදරන ලදි : '' යම් කලෙක ආර්‍යශ්‍රාවක ගිහිගෙයි වෙසේ ද එකල විපුළ ත්‍යාග ඇතියෙන් ' මුත්තචාග ' යැ දන්දීමෙන් දෙවූ අත්ඇතියෙන් ' පයතපාණි ' යැ වොස්සග්ග (දන) යෙහි ඇලුණෙන් ' වොස්සග්ගරත ' යැ යදනාට නිසි වූයෙන් ' යාචයොග ' යැ දීමෙහි සංවිභාගයෙහි ඇලුණෙන් ' දනසංවිභාගරත ' වේ යැයි. චාගානුස්සතියට තෙල වෙවචන යි. එයින් වදළහ, ආයුෂ්මත් මහාකාත්‍යායනස්ථවිරයන් වහන්සේ '' වෙවචනානි බහූනි '' යනාදිය.

වෙවචනහාරය යොදනලද්දේ යි.

## 3. 1. 11

## පඤ්ඤත්තිහාරවිභඞ්ගය

එහි පඤ්ඤත්තිහාරය කවරෙ යැ : ' එකං භගවා ධම්මං පඤ්ඤත්තීහි විවිධාහි දෙසෙති '' යනාදි නිද්දෙසගාථා යැ, ප්‍රකෘතිකථායෙන් (භාග්‍යවතුන් වහන්සේගේ ස්වාභාවිකධර්මකථායෙන්) යම් දේශනාවක් ඇද්ද මේ (වෛනෙයසන්තානයෙහි යථාභිප්‍රෙතාර්ථය නික්ෂෙප කෙරෙයි — තබා නුයි) ' නික්ඛෙපපඤ්ඤත්ති ' නම. යළි ප්‍රකෘතිකථායෙන් කරන දෙශනා කවර : චතුස්සත්‍යයෝ යි. '' ඉදං දුක්ඛං '' යි බුදුහු මෙසේ වදළහ. (අතීතාදි අනෙක භෙදභින්න වූ රූපාරූපධර්මයන් ප්‍රභෙද නොකොට පීළනාදි අර්ථසාමාන්‍යයෙන් එක්රැස් කොට ගැනීමට කාරණ වූ) ' දුක්ඛං ' යන මේ ප්‍රඥප්තියෙක, එය පඤ්චස්කන්ධයන්ගේ ෂඩ්ධාතූන්ගේ අටළොස් ධාතූන්ගේ දෙළොස් ආයතනයන්ගේ දස ඉන්ද්‍රියයන්ගේ නික්ෂෙපප්‍රඥප්ති යි.

'' මහණෙනි, ඉදින් කවළීකාරාහාරයෙහි රාගය ඇද්ද නන්දිය (ගෙහසිත සොම්නස) ඇද්ද තෘෂ්ණා ඇද්ද, ඒ තෘෂ්ණායෙහි ප්‍රතිසන්ධිජනක විඥනය පිහිටියේ වැඩුණේ වෙයි, යම් ත්‍රෛභූමක වර්තයෙහි ප්‍රතිසන්ධිවිඥනය පිහිටියේ වැඩුණේත් වේ ද, ඒ ත්‍රෛභූමක වර්තයෙහි නාමරූපයාගේ අවක්‍රාන්තිය ඇත. යම් තැනෙක නාමරූපයාගේ අවක්‍රාන්තිය ඇද්ද, ඒ නාමරූපයෙහි සංස්කාරයන්ගේ වැඩීම ඇත. යම් තැනෙක සංස්කාරයන්ගේ වෘද්ධිය ඇද්ද එහි මත්තෙහි පුනර්භවයාගේ පහළවීම ඇත. යම් තැනෙක පුනර්භවයාගේ පහළවීම ඇද්ද, එහි ස්කන්ධයන්ගේ අභිනිර්වෘතිලක්ෂණ ජාතිය හා පරිපාක – භේදලක්ෂණ ජරාමරණ ඇත. යම් තැනෙක මතුයෙහි ජාතිජරාමරණ ඇද්ද, මහණෙනි එය ශොක සහිත ය දහ සහිත ය උපායාස සහිත යයි කියමි.

ඵස්සෙ චෙ -පෙ- මනොසඤ්චෙතනාය චෙ -පෙ- විඤ්ඤාණෙ චෙ භික්ඛවෙ ආහාරෙ අත්ථි රාගො අත්ථි නන්දි අත්ථි තණ්හා පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං විරූළ්හං, යත්ථ පතිට්ඨිතං විඤ්ඤාණං විරූළ්හං, අත්ථි තත්ථ නාමරූපස්ස අවක්කන්ති, යත්ථ අත්ථි නාමරූපස්ස අවක්කන්ති, අත්ථි තත්ථ සඞ්ඛාරානං වුද්ධි, යත්ථ අත්ථි සඞ්ඛාරානං වුද්ධි, අත්ථි තත්ථ ආයතිං[1] පුනබ්භවාභිනිබ්බත්ති, යත්ථ අත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති අත්ථි තත්ථ ආයතිං ජාතිජරාමරණං, යත්ථ අත්ථි ආයතිං ජාතිජරාමරණං, සසොකං තං භික්ඛවෙ සදරං සඋපායාසන්ති වදාමි" අයං පභවපඤ්ඤත්ති දුක්ඛස්ස ච සමුදයස්ස ච.

"කබළීකාරෙ චෙ භික්ඛවෙ ආහාරෙ නත්ථි රාගො නත්ථි නන්දි නත්ථි තණ්හා, අප්පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං අවිරූළ්හං, යත්ථ අප්පතිට්ඨිතං විඤ්ඤාණං අවිරූළ්හං, නත්ථි තත්ථ නාමරූපස්ස අවක්කන්ති. යත්ථ නත්ථි නාමරූපස්ස අවක්කන්ති, නත්ථි තත්ථ සඞ්ඛාරානං වුද්ධි, යත්ථ නත්ථි සඞ්ඛාරානං වුද්ධි, නත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, යත්ථ නත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, නත්ථි තත්ථ ආයතිං ජාතිජරාමරණං, යත්ථ නත්ථි ආයතිං ජාතිජරාමරණං අසොකං තං භික්ඛවෙ අදරං අනුපායාසන්ති වදාමි. ඵස්සෙ චෙ -පෙ- මනොසඤ්චෙතනාය චෙ -පෙ- විඤ්ඤාණෙ චෙ භික්ඛවෙ ආහාරෙ නත්ථි රාගො නත්ථි නන්දි නත්ථි තණ්හා, අප්පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං අවිරූළ්හං. යත්ථ අප්පතිට්ඨිතං විඤ්ඤාණං අවිරූළ්හං, නත්ථි තත්ථ නාමරූපස්ස අවක්කන්ති. යත්ථ නත්ථි නාමරූපස්ස අවක්කන්ති, නත්ථි තත්ථ සඞ්ඛාරානං වුද්ධි, යත්ථ නත්ථි සඞ්ඛාරානං වුද්ධි, නත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, යත්ථ නත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, නත්ථි තත්ථ ආයතිං ජාතිජරාමරණං, යත්ථ නත්ථි ආයතිං ජාතිජරාමරණං, අසොකං තං භික්ඛවෙ අදරං අනුපායාසන්ති වදාමි" අයං පරිඤ්ඤාපඤ්ඤත්ති දුක්ඛස්ස, පහානපඤ්ඤත්ති සමුදයස්ස, භාවනාපඤ්ඤත්ති මග්ගස්ස, සච්ඡිකිරියාපඤ්ඤත්ති නිරොධස්ස.

"සමාධිං භික්ඛවෙ භාවෙථ අප්පමත්තො නිපකො සතො, සමාහිතො භික්ඛවෙ භික්ඛු යථාභූතං පජානාති, කිඤ්ච යථාභූතං පජානාති: චක්ඛුං[2] අනිච්චන්ති යථාභූතං පජානාති රූපා අනිච්චාති යථාභූතං පජානාති, චක්ඛුවිඤ්ඤාණං අනිච්චන්ති යථාභූතං පජානාති, චක්ඛුසම්ඵස්සො අනිච්චොති යථාභූතං පජානාති, යම්පිදං[3] චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි අනිච්චන්ති යථාභූතං පජානාති, සොතං -පෙ- ඝානං-ජිව්හා-කායො-මනො අනිච්චොති යථාභූතං පජානාති, ධම්මා අනිච්චාති යථාභූතං පජානාති, මනොවිඤ්ඤාණං අනිච්චන්ති යථාභූතං පජානාති, මනොසම්ඵස්සො අනිච්චොති යථාභූතං පජානාති, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි අනිච්චන්ති යථාභූතං පජානාති" අයං භාවනාපඤ්ඤත්ති මග්ගස්ස, පරිඤ්ඤාපඤ්ඤත්ති දුක්ඛස්ස, පහානපඤ්ඤත්ති සමුදයස්ස, සච්ඡිකිරියාපඤ්ඤත්ති නිරොධස්ස.

---

1. ආයති - සීමු, මජ්ඣං.
2. චක්ඛු - සීමු, මජ්ඣං.
3. යම්දං - සීමු.

ඉදින් ඵස්සාහාරයෙහි . . . ඉදින් මනොසඤ්චෙතනාහාරයෙහි . . . මහණෙනි, ඉදින් විඤ්ඤාණාහාරයෙහි රාගය ඇද්ද නන්දිය ඇද්ද තෘෂ්ණා ඇද්ද, එහි පටිසන්ධිවිඤ්ඤාණය පිහිටියේ වැඩුණේ වෙයි. යම් තැනෙක පටිසන්ධිවිඤ්ඤාණය පිහිටියේ වැඩුණේ වේ ද, එහි නාමරූපයාගේ අවක්‍රාන්තිය ඇත. යම් තැනෙක නාමරූපයාගේ අවක්‍රාන්තිය ඇද්ද, එතැන්හි සංස්කාරයන් ගේ වැඩීම ඇත. යම් තැනෙක සංස්කාරයන්ගේ වැඩීම ඇද්ද, එතැන්හි මතු පුනර්භවයාගේ පහළවීම ඇත. යම් තැනෙක මතු පුනර්භවයාගේ පහළවීම ඇද්ද එතැන්හි මතු ජාති ජරා මරණ ඇත. යම් තැනෙක මත්තෙහි ජාති ජරා මරණ ඇද්ද, මහණෙනි, එය ශොකසහිත ය දහ සහිත ය උපායාස සහිත යයි කියමි.'' මේ දෙශනාව දුක්ඛසත්‍යයාගේ ද සමුදයසත්‍යයාගේ ද පභව (සමුට්ඨාන) ප්‍රඥප්ති යි. (විපාක වට්ටයාගේ ද සංස්කාරයන්ගේ ද තෘෂ්ණාප්‍රත්‍යයභාවය දක්වූ හෙයිනි.)

''මහණෙනි, ඉදින් කවලීකාරාහාරයෙහි රාගය නැද්ද නන්දිය නැද්ද තෘෂ්ණා නැද්ද එහි ප්‍රතිසන්ධි විඥනය නොපිහිටියේ නොවැඩුණේ වෙයි. යම් තැනක ප්‍රතිසන්ධි විඥනය නොපිහිටියේ ද නොවැඩුණේ ද, එහි නාමරූපයාගේ අවක්‍රාන්තියෙක් නැත. යම් තැනෙක නාමරූපයාගේ අවක්‍රාන්තියෙක් නැද්ද එහි සංස්කාරයන්ගේ වැඩීමෙක් නැත. යම් තැනෙක සංස්කාරයන්ගේ වැඩීමෙක් නැද්ද, එහි ආයති පුනර්භවයාගේ අභිනිර්වෘත්තියෙක් නැත. යම් තැනෙක මතුයෙහි පුනර්භවයාගේ පහළවීමෙක් නැද්ද, එහි මතුයෙහි ජාති ජරා මරණ නැත. යම් තැනෙක මතු ජාති ජරා මරණ නැද්ද, මහණෙනි, එය ශොක රහිත යැ දරථ රහිත යැ උපායාස රහිත යැයි කියමි. ඉදින් ඵස්සාහාරයෙහි ... ඉදින් මනොසඤ්චෙතනාහාරයෙහි ... මහණෙනි ඉදින් විඤ්ඤාණාහාරයෙහි රාගය නැද්ද නන්දි නැද්ද තෘෂ්ණා නැද්ද, එහි ප්‍රතිසන්ධි විඥනය නොපිහිටියේ නොවැඩුණේ වෙයි. යම් තැනෙක විඥනය නොපිහිටියේ නොවැඩුණේ වේ ද, එහි නාමරූපයාගේ අවක්‍රාන්ති යෙක් නැත. යම් තැනෙක නාම රූපයාගේ අවක්‍රාන්තිය නැද්ද, එහි සංස්කාරයන්ගේ වැඩීමෙක් නැත. යම් තැනෙක සංස්කාරයන්ගේ වැඩීමෙක් නැද්ද, එහි මතු පුනර්භවයා ගේ පහළ වීමෙක් නැත. යම් තැනෙක මතු පුනර්භවයාගේ පහළ වීමෙක් නැද්ද. එහි මතු ජාති ජරා මරණ නැත. යම් තැනෙක මතු ජාති ජරා මරණ නැද්ද, එතැන අශොක යැ දරථ රහිත යැ අනුපායාස යැයි කියමි'' මේ දේශනාව දුඃඛසත්‍යයාගේ පරිඥප්‍රඥප්ති යැ, සමුදය සත්‍යයාගේ ප්‍රහාණප්‍රඥප්ති යැ මාර්ගසත්‍යයාගේ භාවනාප්‍රඥප්ති යැ නිරොධ සත්‍යයාගේ සාක්ෂාත් ක්‍රියා ප්‍රඥප්ති යි.

''මහණෙනි අප්‍රමත්ත වූයේ ප්‍රඥවත්ව ස්මෘති ඇතියේ සමාධිය වඩව, මහණෙනි, (උපචාර අර්පණා සමාධියෙන්) සමාහිත වූ මහණ යථාස්වභාවයෙන් දනගනී, කුමක් යථාභූත ව දනගනී ද යත් : චක්ෂුස අනිත්‍ය යයි යථාභූතව දනගනී. රූපයෝ අනිත්‍යයහ යි යථාභූතව දනගනී, චක්ෂුර්විඥනය අනිත්‍ය යයි යථාභූතව දනගනී. චක්ඛු සම්ඵස්සය අනිත්‍ය යයි යථාභූතව දනගනී. චක්ඛුසම්ඵස්ස හේතුයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදනාවකුත් උපදී නම් එ ද අනිත්‍ය යයි යථාභූතව දනගනී. ශ්‍රොත්‍රය ... ඝ්‍රාණය ... ජිහ්වාව ... කායය ... මනස අනිත්‍ය යයි යථාභූතව දනගනී, ආලම්බන ධර්මයෝ අනිත්‍ය වූහ'යි යථාභූතව දනගනී, මනො විඤ්ඤණය අනිත්‍ය යයි යථා භූතව දන ගනී, මනොසම්ඵස්සය අනිත්‍ය යයි යථාභූතව දනගනී. මනොසම්ඵස්ස හෙතුයෙන් සුව වූ හෝ දුක්වූ හෝ නොදුක් නොසුව වූ හෝ යම් වෙදනාවකුත් උපදී ද එ ද අනිත්‍ය යයි යථාභූතව දනගනී.'' මේ දෙශනාව මාර්ගයාගේ භාවනාප්‍රඥප්ති යැ දුඃඛයාගේ පරිඥ ප්‍රඥප්ති යැ සමුදයයාගේ ප්‍රහාණ ප්‍රඥප්ති යැ නිරොධයාගේ සාක්ෂාත් ක්‍රියා ප්‍රඥප්ති යි.

"රූපං රාධ විකිරථ විධමථ විද්ධංසෙථ විකීළනිකං[1] කරොථ (පඤ්ඤාය) තණ්හක්ඛයාය පටිපජ්ජථ. තණ්හක්ඛයා දුක්ඛක්ඛයො දුක්ඛක්ඛයා නිබ්බානං. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං විකිරථ විධමථ විද්ධංසෙථ විකීළනිකං කරොථ (පඤ්ඤාය) තණ්හක්ඛයාය පටිපජ්ජථ. තණ්හක්ඛයා දුක්ඛක්ඛයො, දුක්ඛක්ඛයා නිබ්බානං" අයං නිරොධපඤ්ඤත්ති නිරොධස්ස, නිබ්බිදාපඤ්ඤත්ති අස්සාදස්ස, පරිඤ්ඤාපඤ්ඤත්ති දුක්ඛස්ස, පහානපඤ්ඤත්ති සමුදයස්ස, භාවනාපඤ්ඤත්ති මග්ගස්ස, සච්ඡිකිරියාපඤ්ඤත්ති නිරොධස්ස.

"සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති" අයං පටිවෙධපඤ්ඤත්ති සච්චානං, නික්ඛෙපපඤ්ඤත්ති දස්සනභූමියා, භාවනාපඤ්ඤත්ති මග්ගස්ස, සච්ඡිකිරියාපඤ්ඤත්ති සොතාපත්තිඵලස්ස.

"සො ඉමෙ ආසවාති යථාභූතං පජානාති, අයං ආසවසමුදයොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති, ඉමෙ ආසවා අසෙසං නිරුජ්ඣන්තීති යථාභූතං පජානාති" අයං උප්පාදපඤ්ඤත්ති ඛයෙ ඤාණස්ස, ඔකාසපඤ්ඤත්ති අනුප්පාදෙ ඤාණස්ස, භාවනාපඤ්ඤත්ති මග්ගස්ස, පරිඤ්ඤාපඤ්ඤත්ති දුක්ඛස්ස, පහානපඤ්ඤත්ති සමුදයස්ස, ආරම්භපඤ්ඤත්ති විරියින්ද්‍රියස්ස, ආසාටනාපඤ්ඤත්ති ආසාටිකානං, නික්ඛෙපපඤ්ඤත්ති භාවනාභූමියා, අභිනිඝාතපඤ්ඤත්ති පාපකානං අකුසලානං ධම්මානං.

"ඉදං දුක්ඛන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි, අයං දුක්ඛසමුදයොති මෙ භික්ඛවෙ -පෙ- අයං දුක්ඛනිරොධොති මෙ භික්ඛවෙ -පෙ- අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි" අයං දෙසනාපඤ්ඤත්ති සච්චානං, නික්ඛෙපපඤ්ඤත්ති සුතමයියා පඤ්ඤාය, සච්ඡිකිරියාපඤ්ඤත්ති අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියස්ස, පවත්තනාපඤ්ඤත්ති ධම්මචක්කස්ස.

"තං ඛො පනිදං දුක්ඛං පරිඤ්ඤෙය්‍යන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. සො ඛො පනායං දුක්ඛසමුදයො පහාතබ්බොති මෙ භික්ඛවෙ -පෙ- සො ඛො පනායං දුක්ඛනිරොධො සච්ඡිකාතබ්බොති මෙ භික්ඛවෙ -පෙ- සා ඛො පනායං දුක්ඛනිරොධගාමිනීපටිපදා භාවෙතබ්බාති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි" අයං භාවනාපඤ්ඤත්ති මග්ගස්ස, නික්ඛෙපපඤ්ඤත්ති චින්තාමයියා පඤ්ඤාය, සච්ඡිකිරියාපඤ්ඤත්ති අඤ්ඤින්ද්‍රියස්ස.

1. විකීළනියං - මජසං

''රූපය විසුරුව විධමන කරව විධ්වංසන කරව ක්‍රීඩාවිගමය කරව, (ප්‍රඥයෙන්) තෘෂ්ණාක්ෂය පිණිස පිළිපදුව. තෘෂ්ණාක්ෂය වීමෙන් දුඃඛක්ෂය වෙයි. දුක්ඛක්ෂය වීමෙන් නිර්වාණය වෙයි. වෙදනාව ... සඤ්ඤාව ... සඞ්ඛාරයන් ... විඤ්ඤාණය විකිරණ විධමන විධ්වංසන කරව, ක්‍රීඩාවිගමය කරව, (ප්‍රඥයෙන්) තෘෂ්ණාක්ෂය පිණිස පිළිපදුව, තෘෂ්ණාව ක්ෂය වීමෙන් දුක් ක්ෂය වෙයි. දුක් ක්ෂයවීමෙන් නිර්වාණය වේ.'' මේ දෙශනාව නිරොධ සත්‍යයාගේ රොධ සංඛ්‍යාත තෘෂ්ණානිරොධය පැනවීම යැ ආස්වාදයාගේ නිබ්බිද ප්‍රඥප්ති යැ දුක්ඛයාගේ පරිඤ්ඤාපඤ්ඤත්ති යැ සමුදයාගේ පහානපඤ්ඤත්ති යැ මාර්ගයාගේ භාවනාපඤ්ඤත්ති යැ නිරොධයාගේ සච්ඡිකිරියා පඤ්ඤත්ති යි.

''හේ (තෘෂ්ණාව තබා ත්‍රෛභූමක පඤ්චස්කන්ධය) 'මේ දුකැ' යි ඇති සැටියෙන් දැනගනී. 'මේ (තෘෂ්ණාව) දුක්ඛ සමුදය යැ' යි ඇති සැටි දැනගනී. 'මේ (නිවන) දුක්ඛ නිරොධ යැයි යථාභූතව දැනගනී, මේ (අරි අටඟිමග) දුක්ඛනිරොධගාමිනී පටිපද යැයි යථාභූතව දැන ගනී.'' මෙය චතුස්සත්‍යයන්ගේ ප්‍රතිවෙධ ප්‍රඥප්ති යැ දර්ශන භූමි (ස්‍රොතාපත්ති මාර්ගයාගේ) නික්ෂෙප ප්‍රඥප්ති යැ මාර්ගයාගේ භාවනාපඤ්ඤත්ති යැ සොතාපත්ති ඵලයාගේ සච්ඡිකිරියාපඤ්ඤත්ති යි.

හේ, ''මොහු ආස්‍රවයෝ ය' යි තත්වූ පරිදි දැනගනී, 'මේ ආස්‍රව සමුදය' යි යථාභූතව දැනගනී. 'මේ ආස්‍රවනිරොධය' යි යථාභූතව දැනගනී, 'මේ ආස්‍රව නිරොධගාමිනී ප්‍රතිපදය' යි යථාභූතව දැනගනී, මේ ආස්‍රවයෝ නිරවශෙෂව නිරුද්ධ වෙති යථාභූතව දැනගනී'' මේ ආස්‍රවක්ෂයඥනයාගේ උත්පාදප්‍රඥප්ති යැ, අනුත්පාදඥනයාගේ ස්ථාන ප්‍රඥප්ති යැ, මාර්ගයාගේ භාවනාප්‍රඥප්ති යැ දුක්ඛයාගේ පරිඥප්‍රඥප්ති යැ සමුදයයාගේ ප්‍රහාණප්‍රඥප්ති යැ විරියින්ද්‍රියයාගේ ආරම්භ ප්‍රඥප්ති යැ ක්ලෙශආසාටිකා (ඉභද) වන්ගේ නීහරණ ප්‍රඥප්ති යැ භාවනාභූමිය පිළිබඳ නික්ෂෙප ප්‍රඥප්ති යැ ලාමක අකුශල ධර්මයන්ගේ අභිඝාත (නැසීම) ප්‍රඥප්ති යි.

''මහණෙනි, 'මේ දුඃඛසත්‍යය' යි මා විසින් පෙර නොඇසුවිරූ ධර්මවිෂයෙහි නුවණැස උපන, සත්‍යඥනය උපන, ප්‍රඥව උපන, විද්‍යාව උපන, ආලොකය උපන. මහණෙනි 'මේ දුක්ඛසමුදය' යි මා විසින් . . . මහණෙනි 'මේ දුක්ඛනිරොධය' යි මා විසින් . . . මහණෙනි 'මේ දුක්ඛනිරොධගාමිනී පටිපද' යයි මා විසින් පෙර නොඇසුවිරූ ධර්මයන්හි නුවණැස උපන, සත්‍යඥනය උපන, ප්‍රඥව උපන, විද්‍යාව උපන, ආලොකය උපන.'' මේ චතුස්සත්‍යයන්ගේ දෙශනාප්‍රඥප්ති යැ ශ්‍රුතමයී ප්‍රඥවගේ නික්ෂෙප ප්‍රඥප්ති යැ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියයාගේ සාක්ෂාත්ක්‍රියාප්‍රඥප්ති යැ ධර්මචක්‍රයාගේ ප්‍රවර්තනප්‍රඥප්ති යි.

''තවද මහණෙනි, මේ දුක්ඛසත්‍යය දතයුතු (ඉක්මැවියයුතු) යයි මා විසින් පෙර නොඇසුවිරූ ධර්මයන්හි නුවණැස උපන, ඤාත්‍යඥනය උපන, ප්‍රඥව උප්න, විද්‍යාව උපන, ආලොකය උපන. යළි මහණෙනි මේ දුක්ඛසමුදය මා විසින් ප්‍රහාණය කළයුතු යයි . . . යළි මහණෙනි මේ දුක්ඛනිරොධය මා විසින් ප්‍රත්‍යක්ෂ කටයුතු යයි . . . යළි මහණෙනි මේ දුක්ඛනිරොධගාමිනීපටිපදව මා විසින් වැඩියයුත්තී යයි පෙර නො ඇසුවිරූ ධර්මයන්හි නුවණැස උපන, ඤාත්‍යඥනය උපන, ප්‍රඥව උපන, විද්‍යාව උපන, ආලොකය උපන.'' මේ මාර්ගයාගේ භාවනාප්‍රඥප්ති යැ චින්තාමයී ප්‍රඥවගේ නික්ෂෙපප්‍රඥප්ති යැ අඤ්ඤින්ද්‍රියයාගේ සච්ඡිකිරියාපඤ්ඤත්ති යි.

"තං ඛො පනිදං දුක්ඛං පරිඤ්ඤාතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. සො ඛො පනායං දුක්ඛසමුදයො පහීනොති මෙ භික්ඛවෙ -පෙ- සො ඛො පනායං දුක්ඛනිරොධො සච්ඡිකතොති මෙ භික්ඛවෙ -පෙ- සා ඛො පනායං දුක්ඛනිරොධගාමිනී පටිපදා භාවිතාති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි" අයං භාවනාපඤ්ඤත්ති මග්ගස්ස, නික්ඛෙපපඤ්ඤත්ති භාවනාමයියා පඤ්ඤාය, සච්ඡිකිරියාපඤ්ඤත්ති අඤ්ඤාතාවිනො ඉන්ද්‍රියස්ස, පවත්තනාපඤ්ඤත්ති ධම්මචක්කස්ස.

1 "තුලමතුලඤ්ච සම්භවං භවසඞ්ඛාරමවස්සජි මුනි,
අජ්ඣත්තරතො සමාහිතො අභිදා[1] කවචමිවත්තසම්භවං"ති.

'තුල'න්ති සඞ්ඛාරධාතු; 'අතුල'න්ති නිබ්බානධාතු; තුලමතුලඤ්ච සම්භව'න්ති අභිඤ්ඤාපඤ්ඤත්ති සබ්බධම්මානං, නික්ඛෙපපඤ්ඤත්ති ධම්මපටිසම්භිදාය; 'භවසඞ්ඛාරමවස්සජි මුනී'ති පරිච්චාගපඤ්ඤත්ති සමුදයස්ස, පරිඤ්ඤාපඤ්ඤත්ති දුක්ඛස්ස, 'අජ්ඣත්තරතො සමාහිතො'ති භාවනාපඤ්ඤත්ති කායගතාය සතියා, ඨිතිපඤ්ඤත්ති චිත්තෙකග්ගතාය, 'අභිදා කවචමිවත්තසම්භව'න්ති අභිනිබ්බිදාපඤ්ඤත්ති චිත්තස්ස, උපාදාන පඤ්ඤත්ති සබ්බඤ්ඤුතාය, පදාලනාපඤ්ඤත්ති අවිජ්ජණ්ඩකොසානං. තෙනාහ භගවා: 'තුලමතුලඤ්ච සම්භව'න්ති.

2. "යො දුක්ඛමද්දක්ඛි යතොනිදානං
කාමෙසු සො ජන්තු කථං නමෙය්‍ය,
කාමා හි ලොකෙ සඞ්ගොති ඤත්වා
තෙසං සතීමා විනයාය සික්ඛෙ"ති

'යො දුක්ඛ'න්ති වෙවචනපඤ්ඤත්ති ච දුක්ඛස්ස පරිඤ්ඤාපඤ්ඤත්ති ච, 'යතොනිදාන'න්ති පභවපඤ්ඤත්ති ච සමුදයස්ස පහානපඤ්ඤත්ති ච, 'අද්දක්ඛී'ති වෙවචනපඤ්ඤත්ති ච ඤාණචක්ඛුස්ස පටිවෙධපඤ්ඤත්ති ච, කාමෙසු සො ජන්තු කථං නමෙය්‍යා'ති වෙවචනපඤ්ඤත්ති ච කාමතණ්හාය අභිනිවෙසපඤ්ඤත්ති ච, කාමා හි ලොකෙ සඞ්ගොති ඤත්වා'ති පච්චත්ථිකතො දස්සනපඤ්ඤත්ති කාමානං, කාමා හි අඞ්ගාරකාසූපමා මංසපෙසූපමා පාවකකප්පා පපාත උරගොපමා ච. 'තෙසං සතීමා'ති අපචයපඤ්ඤත්ති පහානාය, නික්ඛෙපපඤ්ඤත්ති කායගතාය සතියා, භාවනාපඤ්ඤත්ති මග්ගස්ස, 'විනයාය සික්ඛෙ'ති පටිවෙධපඤ්ඤත්ති රාගවිනයස්ස දොසවිනයස්ස මොහවිනයස්ස, 'ජන්තු'ති වෙවචනපඤ්ඤත්ති යොගිස්ස, යදා හි යොගී කාමා සඞ්ගොති පජානාති, සො කාමානං අනුප්පාදාය කුසලෙ ධම්මෙ උප්පාදයති, සො අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය වායමති. අයං වායාමපඤ්ඤත්ති අප්පත්තස්ස පත්තියා, නික්ඛෙපපඤ්ඤත්ති ඔරමත්තිකාය අසන්තුට්ඨියා. තත්ථ සො උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා

1. අභින්දි - මජ්සං.

තවද මහණෙනි මේ දුඃඛසත්‍යය මා විසින් පරිඥත යැයි පෙර නොඇසුවිරූ ධර්මයන්හි නුවණැස උපන, ඥානදර්ශනය උපන, ප්‍රඥව උපන, විද්‍යාව උපන, ආලොකය උපන. යළි මහණෙනි මේ දුක්ඛසමුදය මා විසින් ප්‍රහීණ යැයි . . . යළි මහණෙනි මේ දුක්ඛනිරොධය මා විසින් පසක්කරනලදැයි . . . යළි මහණෙනි මේ දුක්ඛනිරොධගාමිනී පටිපදව මා විසින් වඩනලදැයි පෙර නොඇසුවිරූ ධර්මයන්හි නුවණැස උපන, ඥානදර්ශනය උපන, ප්‍රඥව උපන, විද්‍යාව උපන, ආලොකය උපන.'' මේ මාර්ගයාගේ භාවනා ප්‍රඥප්ති යැ භාවනාමයී ප්‍රඥවගේ නික්ෂෙපප්‍රඥප්ති යැ අඤ්ඤතාවී ඉන්ද්‍රියයාගේ සාක්ෂාත් ක්‍රියා ප්‍රඥප්ති යැ ධර්මචක්‍රයාගේ ප්‍රවර්තන ප්‍රඥප්ති යි.

1. බුද්ධමුනිහු කාමාවචර කර්මය ද (අතුලවූ) මහද්ගත කර්මය ද නොහොත් කාමාවචර රූපාවචර කර්මය හා අරූපාවචරකර්මය ද ඒ භවහෙතුක කර්ම රැස්කරන පුනර්භවසංස්කාරය දුරුකළහ. (නොහොත් අතුල වූ නිවන ද භවය ද තුලනය කරමින් ස්කන්ධමූල වූ භවසංස්කාරය ආර්‍යමාර්ගඥනයෙන් දුරුකළහ.) විදර්ශනා විසින් අධ්‍යාත්මයෙහි ඇලුණාහු උපචාර අපර්ණාසමාධීන් සමාහිතව (යුද්ධශීර්ෂයෙහි මහා යොධයෙක්) සන්නාහය මෙන් ආත්මසම්භව වූ සියලු ක්ලෙශජාතය බිඳලූහ' යි.

(මේ දෙශනායෙහි) ' තුලං ' යනු සංස්කාරධාතු යැ ' අතුලං ' යනු නිර්වාණධාතු යැ ' තුලමතුලං ච සම්භවං ' යනු සියලු ධර්මයන්ගේ අභිඥප්‍රඥප්ති යැ ධර්මප්‍රතිසම්භිදවගේ නික්ෂෙපප්‍රඥප්ති යැ ' භවසඞ්ඛාරමවස්සජි මුනි ' යනු සමුදයයාගේ පරිත්‍යාගප්‍රඥප්ති යැ දුක්ඛයාගේ පරිඥප්‍රඥප්ති යැ ' අජ්ඣත්තරතො සමාහිතො ' යනු කායගතාසතියගේ භාවනාප්‍රඥප්ති යැ චිත්තෙකග්ගතාවගේ ස්ථිතිප්‍රඥප්ති යැ ' අභිද කවචමිවත්තසම්භවං ' යනු (ආයුසංස්කාරය හැරීම් වශයෙන්) චිත්තයාගේ අභිනිබ්බිද (අභිනීහරණ) ප්‍රඥප්ති යැ සර්වඥභාවයාගේ ග්‍රහණප්‍රඥප්ති යැ අවිද්‍යාණ්ඩකොෂයන්ගේ ප්‍රදලනාප්‍රඥප්ති යි. එයින් වදළහ, බුදුහු : '' තුලමතුලං ච සම්භවං '' යී.

2. ආරබ්ධවිදර්ශක වූ යමෙක් සියලු ත්‍රෛභූමක දුඃඛය දුටුයේ ද යම් හේතුවකින් දුක උපදී නම් ඒ කාරණ වූ තෘෂ්ණාවත් දකී ද ඒ පටිපන්නක පුරුෂ සවස්තුක වූ ක්ලේශකාම යන්හි කවර කරුණෙකින් නැමේ ද (නො නැමේ මැයැ.) යම් හෙයෙකින් මෙලොවැ කාමයෝ (පසමිතුරු වෙත්ද එහෙයින්) බන්ධනයෙකැයි දැන ස්මෘතිමත් වූයේ ඒ කාම යන්ගේ විනය පිණිස ත්‍රිවිධ ශික්ෂායෙහි හික්මෙන්නේ යි.

' යො දුක්ඛං ' යනු දුඃඛසත්‍යයාගේ වෙවචන ප්‍රඥප්ති ද පරිඤ්ඤ ප්‍රඥප්ති ද වෙයි, ' යතො නිදානං ' යනු සමුදයසත්‍යයාගේ ප්‍රභවප්‍රඥප්ති ද ප්‍රහාණප්‍රඥප්ති ද වෙයි, ' අද්දක්ඛි ' යනු ඥනචක්ෂුස්හුගේ වෙවචනප්‍රඥප්ති ද ප්‍රතිවෙධප්‍රඥප්ති ද වෙයි, ' කාමෙසු සො ජන්තු කථං නමෙය්‍ය ' යනු කාමතෘෂ්ණාවගේ වෙවචනප්‍රඥප්ති ද අභිනිවෙශප්‍රඥප්ති ද වෙයි ' කාමා හි ලොකෙ සඞ්ගොති ඤත්වා ' යනු කාමයන් පසමිතුරු හෙයින් දර්ශනය පැනවීම යැ ඒ එසේ මැය—කාමයෝ අඞ්ගාරකර්ෂුවකට බඳු උපමා ඇතියහ, මස් වැදල්ලකට බඳු උපමා ඇතියහ, දිලියෙන ගින්නක් බන්දඹ, ප්‍රපාතයකට හා උරගුන්ට බඳු උපමා ඇතියහ, ' තෙසං සතිමා ' යනු ප්‍රහාණයාගේ අපචයපඤ්ඤත්ති ද කායගතා සතියගේ නික්ඛෙපපඤ්ඤත්ති ද මාර්ගයාගේ භාවනාපඤ්ඤත්ති ද වෙයි. ' විනයාය සික්ඛෙ ' යනු රාගවිනයාගේ දෙසවිනයාගේ මොහවිනයාගේ ප්‍රතිවෙධප්‍රඥප්ති යැ ' ජන්තු ' යනු යොගීහුගේ වෙවචනප්‍රඥප්ති යැ ඒ එසේ මැය—යම් කලෙක යොගාවචර ' කාමයෝ සඞ්ගයෙකැ ' යි දැනගනී ද එකල හේ කාමයන්ගේ අනුත්පාදය පිණිස කුශල ධර්මයන් උපදවයි, හේ නූපන් කුශලධර්මයන්ගේ ඉපදීම පිණිස වැයම් කරයි, මේ නොපත් මාර්ගඵලයන්ගේ ප්‍රාප්තිය පිණිස වායාමපඤ්ඤත්ති යැ, අල්පමාත්‍රගුණයෙන් සතුටු නොවීම පිළිබඳ නික්ඛෙපපඤ්ඤත්ති යැ, එහි ඒ යොගාවචර උපන් කුශල

වායමන්තී'ති අයං අප්පමාදපඤ්ඤත්ති භාවනාය, නික්ඛෙපපඤ්ඤත්ති විරියින්ද්‍රියස්ස, ආරක්ඛපඤ්ඤත්ති කුසලානං ධම්මානං, ඨිතිපඤ්ඤත්ති අධිචිත්තසික්ඛාය. තෙනාහ භගවා. ''යො දුක්ඛමද්දක්ඛි යතො නිදාන''න්ති.

3. ''මොහසම්බන්ධනො ලොකො භබ්බරූපොව දිස්සති
උපධිසම්බන්ධනො බාලො තමසා පරිවාරිතො,
අස්සිරී විය ඛායති පස්සතො නත්ථි කිඤ්චනං''ති

'මොහසම්බන්ධනො ලොකො'ති දෙසනාපඤ්ඤත්ති විපල්ලාසානං, 'භබ්බරූපොව දිස්සතී'ති විපරීතපඤ්ඤත්ති ලොකස්ස, උපධිසම්බන්ධනො බාලො'ති පභවපඤ්ඤත්ති පාපකානං ඉච්ඡාචරානං, කිච්චපඤ්ඤත්ති පරියුට්ඨානානං, බලවපඤ්ඤත්ති කිලෙසානං, විරූහනාපඤ්ඤත්ති සඞ්ඛාරානං, තමසා පරිවාරිතො'ති දෙසනාපඤ්ඤත්ති අවිජ්ජන්ධකාරස්ස වෙවචනපඤ්ඤත්ති ච. අස්සිරී විය ඛායතී'ති දස්සනපඤ්ඤත්ති දිබ්බචක්ඛුස්ස, නික්ඛෙපපඤ්ඤත්ති පඤ්ඤාචක්ඛුස්ස, 'පස්සතො නත්ථි කිඤ්චන'න්ති පටිවෙධපඤ්ඤත්ති සත්තානං, රාගො කිඤ්චනං දොසො කිඤ්චනං මොහො කිඤ්චනං. තෙනාහ භගවා : ''මොහසම්බන්ධනො ලොකො''ති.

''අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසඞ්ඛතං, නො චෙ තං භික්ඛවෙ අභවිස්ස අජාතං අභූතං අකතං අසඞ්ඛතං, න යිධ ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ. යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි අජාතං අභූතං අකතං අසඞ්ඛතං, තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායතී''ති.

'නො චෙ තං භික්ඛවෙ අභවිස්ස අජාතං අභූතං අකතං අසඞ්ඛත'න්ති දෙසනාපඤ්ඤත්ති නිබ්බානස්ස වෙවචනපඤ්ඤත්ති ච, 'න යිධ ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථා'ති වෙවචනපඤ්ඤත්ති සඞ්ඛතස්ස උපනයනපඤ්ඤත්ති ච, 'යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි අජාතං අභූතං අකතං අසඞ්ඛත'න්ති වෙවචනපඤ්ඤත්ති නිබ්බානස්ස ජොතනාපඤ්ඤත්ති ච, 'තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායතී'ති අයං වෙවචනපඤ්ඤත්ති නිබ්බානස්ස, නිය්‍යානිකපඤ්ඤත්ති මග්ගස්ස, නිස්සරණපඤ්ඤත්ති සංසාරතො. තෙනාහ භගවා : 'නො චෙ තං භික්ඛවෙ අභවිස්සා'ති.

තෙනාහ ආයස්මා මහාකච්චායනො : ''එකං භගවා ධම්මං පඤ්ඤත්තීහි විවිධාහි දෙසෙතී''ති.

**නියුත්තො පඤ්ඤත්තිහාරො.**

ධර්මයන්ගේ ස්ථිතිය පිණිස වෑයම් කෙරෙයි යන මෙය භාවනාව පිළිබඳ අප්පමාද පඤ්ඤත්ති යැ විරියින්ද්‍රියයාගේ නික්ඛෙපපඤ්ඤත්ති යැ කුශලධර්මයන්ගේ ආරක්ඛ පඤ්ඤත්ති යැ අධිචිත්තශික්ෂාව පිළිබඳ ඨිතිපඤ්ඤත්ති යි. එයින් වදළහ බුදුහු ; '' යො දුක්ඛමද්දක්ඛි යතො නිදානං '' යි.

3. මේ ලෝවැසිතෙම අවිද්‍යාහේතුක සංයෝජනයන්ගෙන් බැඳුණේ (විපරීතා ධ්‍යාශය ඇතියේ මායා සාඨෙය්‍ය දෙකින් වැසුණුපියවි ඇතියේ) භව්‍යස්වරූපයක් මෙන් දක්නාලැබෙයි, ක්ලෙශ අභිසංස්කාරොපධීන් විසින් බැඳුණු බාලතෙමේ සම්මොහතමසින් පරිවෘත වූයේ (පණ්ඩිතයනට) නිශ්‍රීකයකු මෙන් වැටැහෙයි, නුවණැසින් දක්නහුට ගතයුතු කිසිවක් නැති ' යි.

' මොහසම්බන්ධනො ලොකො ' යනු විපල්ලාසයන්ගේ දෙශනාපඤ්ඤත්ති යැ ' භබ්බරූපොව දිස්සති ' යනු ලොකයාගේ විපරීතපඤ්ඤත්ති යැ ' උපධිසම්බන්ධනො බාලො ' යනු ලාමක ඉච්ඡාවචරයන්ගේ ප්‍රභවප්‍රඥප්ති යැ පර්‍ය්‍යුත්ථානයන්ගේ කෘත්‍ය ප්‍රඥප්ති යැ ක්ලෙශයන්ගේ බලවපඤ්ඤත්ති යැ සංස්කාරයන්ගේ විරූහනාපඤ්ඤත්ති යැ, ' තමසා පරිවාරිතො ' යනු අවිද්‍යාන්ධකාරයාගේ දේශනාප්‍රඥප්ති යැ වෙවචනප්‍රඥප්ති ද වෙයි, ' අස්සිරී විය බායති ' යනු දිව්‍යචක්ෂුස්හුගේ දර්ශනප්‍රඥප්ති යැ ප්‍රඥාචක්ෂුස්හුගේ නික්ෂෙපප්‍රඥප්ති යැ, ' පස්සතො නත්ථි කිඤ්චනං ' යනු සත්ත්වයන්ගේ ප්‍රතිවෙධ ප්‍රඥප්ති යැ, රාගය කිඤ්චන යැ දෙසය කිඤ්චන යැ මොහය කිඤ්චන යි. එයින් වදළහ බුදුහු '' මොහසම්බන්ධනො ලොකො '' යි.

'' මහණෙනි (හෙතුප්‍රත්‍යයසමවායෙන්) නූපන් (හෙතු රහිත වැ තෙමේ මැ) නො පහළ වූ (හෙතු ප්‍රත්‍යයෙන්) නො කරනලද ප්‍රත්‍යයෙන් අසංස්කෘත වූ නිර්වාණධාතුව පරමාර්ථවශයෙන් ඇත. මහණෙනි අජාත අභූත අකත අසඞ්ඛත වූ ඒ නිර්වාණධාතුව ඉදින් නො වී නම්, මේ ලෝකයෙහි හේතුප්‍රත්‍යයෙන් උපන් භවගත් කරනලද සියලු සඞ්ඛතධර්මයාගේ නිස්සරණයෙක් නො පැනෙන්නේය, තවද මහණෙනි යම් හෙයෙකින් අජාත අභූත අකත අසඞ්ඛත වූ නිර්වාණධාතුව ඇද්ද, එහෙයින් ජාත වූ භූත වූ කෘතවූ හෙතුප්‍රත්‍යයන් විසින් සමවායෙන් කරනලද ධර්මජාතයාගේ නිස්සරණය පැනේ '' යයි වදළසේක.

නො චෙතං භික්ඛවෙ අභවිස්ස අජාතං අභූතං අකතං අසඞ්ඛතං ' යනු නිර්වාණයාගේ දෙශනාපඤ්ඤත්ති ද වෙවචනපඤ්ඤත්ති ද වෙයි, ' න ඉධ ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ ' යනු සඞ්ඛතයාගේ වෙවචන පඤ්ඤත්ති ද උපනයනපඤ්ඤත්ති ද වෙයි, ' යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි අජාතං අභූතං අකතං අසඞ්ඛතං ' යනු නිර්වාණයාගේ වෙවචනපඤ්ඤත්ති ද ජොතනාපඤ්ඤත්ති (ප්‍රතිඥා කළ අර්ථසිද්ධිය ප්‍රකාශ කිරීම) ද වෙයි, ' තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායති 'යනු මේ නිර්වාණයාගේ වෙවචන පඤ්ඤත්ති ද, මාර්ගයාගේ නෛර්‍ය්‍යාණිකප්‍රඥප්ති ද, සංසාරයෙන් නික්මයෑම පැනවීම ද වේ. එයින් වදළහ, බුදුහු : නො චෙතං භික්ඛවෙ අභවිස්ස '' යනාදිය.

එයින් වදළහ, ආයුෂ්මත් මහාකාත්‍යායන මහරහතුන් වහන්සේ : '' එකං භගවා ධම්මං පඤ්ඤත්තීහි විවිධාහි දෙසෙති '' යි.

පඤ්ඤත්තිහාරය යොදනලද්දේ යි.

## 3. 1. 12

## ඔතරණහාරවිභඞ්ගො

තත්ථ කතමො ඔතරණො හාරො: යො ච පටිච්චුප්පාදො"ති.

1. "උද්ධං අධො සබ්බධි විප්පමුත්තො
අයමහමස්මීති[1] අනානුපස්සී
එවං විමුත්තො උදතාරි ඔඝං
අතිණ්ණපුබ්බං අපුනබ්භවායා"ති.

'උද්ධ'න්ති රූපධාතු ච අරූපධාතු ච, 'අධො'ති කාමධාතු, 'සබ්බධි විප්පමුත්තො'ති තෙධාතුකෙ. අයං අසෙඛාවිමුත්ති, තානියෙව අසෙඛානි පඤ්චින්ද්‍රියානි අයං ඉන්ද්‍රියෙහි ඔතරණා, තානියෙව අසෙඛානි පඤ්චින්ද්‍රියානි විජ්ජා, විජ්ජුප්පාදා අවිජ්ජානිරොධො, අවිජ්ජානිරොධා සංඛාරනිරොධො, සංඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. අයං පටිච්චසමුප්පාදෙහි ඔතරණා, තානියෙව අසෙඛානි පඤ්චින්ද්‍රියානි තීහි ඛන්ධෙහි සංගහිතානි සීලක්ඛන්ධෙන සමාධික්ඛන්ධෙන පඤ්ඤාක්ඛන්ධෙන, අයං ඛන්ධෙහි ඔතරණා. තානියෙව අසෙඛානි පඤ්චින්ද්‍රියානි සඞ්ඛාරපරියාපන්නානි යෙ සඞ්ඛාරා අනාසවා නො ච භවඞ්ගා තෙ සඞ්ඛාරා ධම්මධාතුසඞ්ගහිතා. අයං ධාතුහි ඔතරණා. සා ධම්මධාතු ධම්මායතන පරියාපන්නං යං ආයතනං අනාසවං නො ච භවඞ්ගං අයං ආයතනෙහි ඔතරණා.

'අයමහමස්මී'ති අනානුපස්සී'ති අයං සක්කායදිට්ඨියා සමුග්ඝාතො, සා සෙඛා විමුත්ති, තානියෙව සෙඛානි පඤ්චින්ද්‍රියානි, අයං ඉන්ද්‍රියෙහි ඔතරණා, තානියෙව සෙඛානි පඤ්චින්ද්‍රියානි විජ්ජා. විජ්ජුප්පාදා අවිජ්ජා නිරොධො, අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො, (එවං සබ්බොපි පටිච්චසමුප්පාදො) අයං පටිච්චසමුප්පාදෙහි ඔතරණා. සායෙව විජ්ජා, පඤ්ඤාක්ඛන්ධො, අයං ඛන්ධෙහි ඔතරණා. සා යෙව විජ්ජා සඞ්ඛාර පරියාපන්නා. යෙ සඞ්ඛාරා අනාසවා නො ච භවඞ්ගා, තෙ සඞ්ඛාරා ධම්මධාතුසඞ්ගහිතා, අයං ධාතුහි ඔතරණා. සා ධම්මධාතු ධම්මායතන පරියාපන්නා යං ආයතනං අනාසවං නො ච භවඞ්ගං, අයං ආයතනෙහි ඔතරණා. සෙඛාය ච විමුත්තියා අසෙඛාය ච විමුත්තියා විමුත්තො උදතාරි ඔඝං අතිණ්ණපුබ්බං අපුනබ්භවාය තෙනාහ භගවා "උද්ධං අධො"ති.

---

1. යම්හාති – සීමු.

## 3. 1. 12

## ඔතරණහාරවිභඞ්ගය

එහි ඔතරණහාරය කවරේ යැ : '' යො ච පටිච්චුප්පාදෙ '' යනාදි නිද්දෙසගාථා යැ

1. උඩ රූපාරූපධාතුයෙහි ද යට කාමධාතුයෙහි ද යන සියලු ත්‍රෛධාතුක ලොකයෙහි අශෛක්ෂවිමුක්තියෙන් මිදුණු රහත් මහණ ' මේ මම වෙමි ' නො දක්නා සුලු වූයේ මෙසේ සෛක්ෂාසෛක්ෂවිමුක්තියෙන් මිදුණේ පුනර්භවය නොවනු පිණිස පෙර තරණය නො කළවිරූ කාමාදි චතුරොඝය තරණය කළේ යයි.

' උද්ධං ' යනු රූපධාතුව ද අරූපධාතුව ද යන දෙක යැ, ' අධො ' යනු කාමධාතු යැ, ' සබ්බධි විප්පමුත්තො ' යනු ත්‍රෛධාතුක ලෝකයෙහි මේ (විරාගතා සංඛ්‍යාත) අශෛක්ෂ ඵලවිමුක්ති යැ, ඒ අශෛක්ෂවිමුක්තියෙහි යෙදුණු ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ යැ අශෛක්ෂ පඤ්චෙන්ද්‍රියයෝ යැ, මේ (අශෛක්ෂවිමුක්තියෙන් නිර්ධාරණ කළ) ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ගෙන් (සූත්‍රසංවර්ණනාවට) අවතරණ (බැසගැනීම) යි. ඒ අශෛක්ෂ පඤ්චෙන්ද්‍රියයෝ මැ ' විද්‍යා ' නම් වෙයි, මාර්ගඥානවිද්‍යාව ඉපදීමෙන් අවිද්‍යානිරොධය වෙයි, අවිද්‍යා නිරොධයෙන් සංස්කාරනිරොධය වෙයි, සංස්කාරනිරොධයෙන් විඥානනිරොධය වෙයි, විඥානනිරොධයෙන් නාමරූපනිරොධය වෙයි, නාමරූපනිරොධයෙන් ෂඩායතනනිරොධය වෙයි, ෂඩායතනනිරොධයෙන් ස්පර්ශනිරොධය වෙයි, ස්පර්ශනිරොධයෙන් වෙදනා නිරොධය වෙයි, වෙදනානිරොධයෙන් තෘෂ්ණානිරොධය වෙයි, තෘෂ්ණානිරොධයෙන් උපාදානනිරොධය වෙයි, උපාදානනිරොධයෙන් භවනිරොධය වෙයි, භවනිරොධයෙන් ජාතිනිරොධය වෙයි, ජාතිනිරොධයෙන් ජරාමරණය ද සොකපරිදෙවදුක්ඛදෙමනස්සු පායාසයෝ ද නිරුද්ධ වෙති. මෙසේ මෙල සියලු දුඃඛරාශිහුගේ නිරොධය වේ. මේ පටිච්චසමුප්පාදයෙන් සූත්‍රවර්ණනාවට බැසගැනීම යි. ඒ අශෛක්ෂ පඤ්චෙන්ද්‍රියයෝ මැ ශීලස්කන්ධයෙන් සමාධිස්කන්ධයෙන් ප්‍රඥාස්කන්ධයෙන් යන ත්‍රිවිධ ස්කන්ධයෙන් සංගෘහීත වූවාහු ය, මේ ස්කන්ධයන්ගෙන් අවතරණ යි. ඒ අශෛක්ෂ පඤ්චෙන්ද්‍රියයෝ මැ සංස්කාරස්කන්ධයෙහි ඇතුළුවූ අනාස්‍රව වූ නො ද භවාඞ්ග වූ යම් සංස්කාර කෙනෙක් ඇද්ද ඒ සංස්කාරයෝ ධර්මධාතුයෙන් සංගෘහීතයහ, මේ ධාතූන්ගෙන් අවතරණ යි. ඒ ධර්මධාතුව අනාස්‍රව වූ නො ද භවාඞ්ග වූ යම් ආයතනයෙක් ඇද්ද එය ධර්මායතන පර්‍යාපන්න යැ, මේ ආයතනයන්ගෙන් (සූත්‍රවර්ණනාවට) අවතරණ යි.

' අයමහමස්මීති අනානුපස්සී ' යනු මේ සත්කායදෘෂ්ටිහුගේ සමුද්ඝාත යැ, ඒ ශෛක්ෂ ඵලවිමුක්ති යි. ඒ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ මැ ශෛක්ෂ පඤ්චෙන්ද්‍රියයෝ යැ, මේ ඉන්ද්‍රියයන් ගෙන් සූත්‍රවර්ණනාවට අවතරණ යි. ඒ ශෛක්ෂ පඤ්චෙන්ද්‍රියයෝ මැ මාර්ගඥාන විද්‍යා යැ, විද්‍යොත්පාදය ප්‍රත්‍යය කොටගෙන අවිද්‍යානිරොධය වෙයි, අවිද්‍යානිරොධයෙන් සංස්කාරනිරොධය වෙයි. (මෙසේ සියලු මැ පටිච්චසමුප්පාදය වෙයි.) මේ පටිච්ච සමුප්පාදයෙන් අවතරණ යි. එ මැ විද්‍යාව ප්‍රඥාස්කන්ධ යැ, මේ ස්කන්ධයන්ගෙන් අවතරණ යි. එ මැ විද්‍යාව සංස්කාරස්කන්ධපර්‍යාපන්න යැ, යම් සංස්කාර කෙනෙක් අනාස්‍රව වූවාහු නො ද භවාඞ්ග වෙත් ද ඒ සංස්කාරයෝ ධර්මධාතුයෙන් සංගෘහීතයහ. මේ ධාතූන්ගෙන් අවතරණ යි. ඒ ධර්මධාතුව අනාස්‍රව වූ නො ද භවාඞ්ග වූ යම් ආයතන යෙක් ඇද්ද, ඒ ධර්මායතනයෙහි පර්‍යාපන්න යැ, මේ ආයතනයන්ගෙන් අවතරණ යි. ශෛක්ෂවිමුක්තියෙන් ද අශෛක්ෂවිමුක්තියෙන් ද කෙලෙසුන් කෙරෙන් විමුක්ත වූයේ පුනර්භවය නොවනු පිණිස පෙර තරණය නො කළවිරූ කාමාදි චතුරොඝය තරණය කළේ යි. එයින් වදළහ, බුදුහු : '' උද්ධං අධො '' යනාදිය.

9—සිබ 04440 (79/02)

“නිස්සිතස්ස චලිතං අනිස්සිතස්ස චලිතං නත්ථි, චලිතෙ අසති පස්සද්ධි, පස්සද්ධියා සති නති න හොති, නතියා අසති ආගති ගති න හොති, ආගතිගතියා අසති චුතූපපාතො න හොති, චුතූපපාතෙ අසති නෙවි’ධ න හුරං න උභයමන්තරෙන එසෙවන්තො දුක්ඛස්සා”ති.

‘නිස්සිතස්ස චලිත’න්ති නිස්සයො නාම දුවිධො: තණ්හානිස්සයො දිට්ඨිනිස්සයො ච, තත්ථ යා රත්තස්ස චෙතනා අයං තණ්හානිස්සයො, යා මූළ්හස්ස චෙතනා අයං දිට්ඨිනිස්සයො. චෙතනා පන සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, (එවං සබ්බො පටිච්චසමුප්පාදො) අයං පටිච්චසමුප්පාදෙහි ඔතරණා. තත්ථ යා රත්තස්ස වෙදනා අයං සුඛා වෙදනා, යා සම්මූළ්හස්ස වෙදනා, අයං අදුක්ඛමසුඛා වෙදනා, ඉමා වෙදනා වෙදනාක්ඛන්ධො. අයං ඛන්ධෙහි ඔතරණා. තත්ථ සුඛා වෙදනා ද්වෙ ඉන්ද්‍රියානි, සුඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං ච, අදුක්ඛමසුඛා වෙදනා උපෙක්ඛින්ද්‍රියං, අයං ඉන්ද්‍රියෙහි ඔතරණා. තානියෙව ඉන්ද්‍රියානි සඞ්ඛාරපරියාපන්නානි යෙ සඞ්ඛාරා සාසවා භවඞ්ගා, තෙ සඞ්ඛාරා ධම්මධාතුසඞ්ගහිතා, අයං ධාතූහි ඔතරණා. සා ධම්මධාතු ධම්මායතනපරියාපන්නා යං ආයතනං සාසවං භවඞ්ගං, අයං ආයතනෙහි ඔතරණා.

‘අනිස්සිතස්ස චලිතං නත්ථී’ති සමථවසෙන වා තණ්හාය අනිස්සිතො විපස්සනාවසෙන වා දිට්ඨියා අනිස්සිතො, යා විපස්සනා අයං විජ්ජා විජ්ජුප්පාදා අවිජ්ජානිරොධො, අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො. (එවං සබ්බො පටිච්චසමුප්පාදො) අයං පටිච්චසමුප්පාදෙහි ඔතරණා. සා යෙව විපස්සනා පඤ්ඤාක්ඛන්ධො, අයං ඛන්ධෙහි ඔතරණා. සා යෙව විපස්සනා ද්වෙ ඉන්ද්‍රියානි: විරියින්ද්‍රියං ච පඤ්ඤින්ද්‍රියං ච, අයං ඉන්ද්‍රියෙහි ඔතරණා. සා යෙව විපස්සනා සඞ්ඛාරපරියාපන්නා යෙ සඞ්ඛාරා අනාසවා නො ච භවඞ්ගා, තෙ සඞ්ඛාරා ධම්මධාතු සඞ්ගහිතා, අයං ධාතූහි ඔතරණා. සා ධම්මධාතු ධම්මායතනපරියාපන්නා යං ආයතනං අනාසවං නො ච භවඞ්ගං, අයං ආයතනෙහි ඔතරණා.

‘පස්සද්ධියා සතී’ති දුවිධා පස්සද්ධි: කායිකා ච චෙතසිකා ච; යං කායිකං සුඛං අයං කායිකා පස්සද්ධි, යං චෙතසිකං සුඛං අයං චෙතසිකා පස්සද්ධි, පස්සද්ධකායො සුඛං වෙදයති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතො යථාභූතං පජානාති, යථාභූතං පජානන්තො නිබ්බින්දති, නිබ්බින්දන්තො විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති[1] ‘ඤාණං හොති ‘ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා’ති පජානාති. සො න නමති රූපෙසු න සද්දෙසු න ගන්ධෙසු න රසෙසු න ඵොට්ඨබ්බෙසු න ධම්මෙසු, ඛයා රාගස්ස ඛයා දොසස්ස ඛයා මොහස්ස, යෙන රූපෙන තථාගතං තිට්ඨන්තං චරන්තං පඤ්ඤාපයමානො පඤ්ඤාපෙය්‍ය, තස්ස රූපස්ස

1. විමුත්තමත්ථීති - සිමු.

" තෘෂ්ණා දෘෂ්ටිවශයෙන් නිශ්‍රිත වූවහුට විෂ්පන්දන (පොපියනු) වෙයි, නිශ්‍රය රහිත වූ ක්ෂීණාශ්‍රව හට චලිත (විෂ්පන්දිත) යෙක් නැති. චලිතය නැති කල්හි කාය චිත්තදරථයන්ගේ සන්හිඳීම වෙයි, පස්සද්ධිය ඇති කල්හි රූපාදි ආලම්බනයෙහි නැමීම නො වෙයි, නතිය නැති කල්හි පටිසන්ධි විසින් ආගමනය ද චුති විසින් ගමනය ද නො වෙයි. ආගති ගති නැති කල්හි ච්‍යුති උපප්‍රාප්ති නො වෙයි. චුති උපපාත නැති කල්හි මෙලොවැ නො මැ වෙයි, පරලොවැ නො වෙයි, උභයලොකයෙහි මැ නො වෙයි, මෙය මැ වට්ටදුක්ඛයාගේ අන්තය වේ " යයි.

'නිස්සිතස්ස චලිතං' යනු නිස්සය නම් : තණ්හානිස්සය ද දිට්ඨිනිස්සය ද ' යි ද්විවිධ යැ, එහි රූපාදියෙහි ඇලුණහුගේ යම් තෘෂ්ණාචෙතනාවක් ඇද්ද මේ තෘෂ්ණානිශ්‍රය (අභිනිවේශය) යැ, අරමුණෙහි මුළාවූවහුගේ යම් චෙතනාවක් ඇද්ද මේ දෘෂ්ටිනිශ්‍රය යැ, චෙතනා වූ කලි සංස්කාරයෝ යි. සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වෙයි, විඥානප්‍රත්‍යයෙන් නාමරූපය වෙයි. (මෙසේ සියලු පටිච්චසමුප්පාදය යි) මේ පටිච්චසමුප්පාදයෙන් (සූත්‍රවර්ණනාවට) බැසගැනීම යි. එහි අනුරක්තයාගේ යම් වෙදනාවක් ඇද්ද මේ සුඛවෙදනා යැ, සම්මුළ්හ වූවහුගේ යම් වෙදනාවක් ඇද්ද මේ අදුක්ඛමසුඛවෙදනා යැ, මේ වෙදනාවෝ වෙදනාස්කන්ධ යැ, මේ ස්කන්ධයන්ගෙන් අවතරණ යි. එහි සුඛ වෙදනාව සුඛින්ද්‍රිය ද සොමනස්සින්ද්‍රිය දූයි ඉන්ද්‍රිය දෙකෙකි. අදුක්ඛමසුඛවෙදනාව උපෙක්ඛින්ද්‍රිය යැ, මේ ඉන්ද්‍රියයන්ගෙන් අවතරණ යි. ඒ ඉන්ද්‍රියයෝ මැ සාශ්‍රව වූ භවාඞ්ග වූ යම් සංස්කාර කෙනෙක් ඇද්ද ඒ සංස්කාරයන්හි ඇතුළුවූවාහුය, ඒ සංස්කාරයෝ ධර්මධාතුයෙහි සංගෘහීතයහ, මේ ධාතූන්ගෙන් අවතරණ යි. ඒ ධර්මධාතුව සාශ්‍රව භවාඞ්ග වූ යම් ආයතනයෙක් ඇද්ද ඒ ධර්මායතනයෙහි පර්‍ය්‍යාපන්න යැ. මේ ආයතනයන් ගෙන් අවතරණ යි.

'අනිස්සිතස්ස චලිතං නත්ථි' යනු සමථවශයෙන් හෝ තෘෂ්ණායෙන් අනිශ්‍රිත වූයේ විදර්ශනාවශයෙන් හෝ දෘෂ්ටියෙන් අනිශ්‍රිත වූයේ වෙයි. යම් විදර්ශනාවක් ඇද්ද මේ විද්‍යා යැ, විද්‍යොත්පාදයෙන් අවිද්‍යානිරොධය වෙයි, අවිද්‍යානිරොධයෙන් සංස්කාර නිරොධය වෙයි, සංස්කාරනිරොධයෙන් විඥානනිරොධය වෙයි, (මෙසේ සියලු පටිච්ච සමුප්පාදය වෙයි.) මේ පටිච්චසමුප්පාදයෙන් අවතරණ යි. ඒ විදර්ශනාව මැ ප්‍රඥ ස්කන්ධ යැ, මේ ස්කන්ධයන්ගෙන් අවතරණ යි. ඒ විදර්ශනාව මැ විරියින්ද්‍රිය ද පඤ්ඤින්ද්‍රිය ද යන ඉන්ද්‍රිය දෙක වෙයි, මේ ඉන්ද්‍රියයන්ගෙන් අවතරණ යි. ඒ මැ විදර්ශනාව අනාශ්‍රව වූ නො ද භවාඞ්ග වූ යම් සංස්කාර කෙනෙක් ඇද්ද ඒ සංස්කාරයන්හි පර්‍ය්‍යාපන්න යැ, ඒ සංස්කාරයෝ ධර්මධාතුයෙහි සංගෘහීතයහ, මේ ධාතූන්ගෙන් අවතරණ යි. ඒ ධර්මධාතුව අනාශ්‍රව වූ නො ද භවාඞ්ග වූ යම් ආයතනයෙක් ඇද්ද ඒ ධර්මායතනයෙහි පර්‍ය්‍යාපන්න යැ, මේ ආයතනයන්ගෙන් අවතරණ යි.

'පස්සද්ධියා සති' යනු කායිකපස්සද්ධිය ද චෙතසිකපස්සද්ධිය දූයි පස්සද්ධි දෙවැදෑරුම් වෙයි, කරජකය ඇසිරිකළ යම් සුවයෙක් ඇද්ද මේ කායිකපස්සද්ධි යැ, සිත ඇසිරිකළ යම් සුවයෙක් ඇද්ද මේ චෙතසිකපස්සද්ධි යි. සන්හුන් කය ඇතියේ කායික චෛතසික සුවය ලබයි, සුව ඇතියහුගේ සිත සමාධියට පැමිණෙයි, සමාහිත වූයේ යථාභූතව (තතුසේ) දැනගනී, යථාභූතව දන්නේ (සංස්කාරයන්හි) උකටලී වෙයි, උකටලීවනුයේ නොඇලෙයි, විරාගයෙන් කෙලෙසුන් කෙරෙන් මිදෙයි, විමුක්ත කල්හි 'මිදිණැ' යි ප්‍රත්‍යවෙක්ෂාඥානය වෙයි, ජාතිය ක්ෂය වූයැ, බඹසර වැස නිමවනලද, සිවුමග කරණී කරන ලද, මාර්ගකෘත්‍යය පිණිස හෝ ක්ලේශක්ෂය පිණිස අන් කටයුත්තෙක් නැති ' යි දැනගනී, ඒ ක්ෂීණාශ්‍රව රූපවිෂයෙහි නො නැමෙයි, ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය – ධර්මවිෂයෙහි නො නැමෙයි. රාගය ක්ෂය කළ හෙයින් ද්වෙෂය ක්ෂය කළ හෙයින් මොහය ක්ෂය කළ හෙයිනි. යම් රූපූපාදානයක් හෙතු කොටගෙන භවයෙහි සිටින්නාවූ චුතිපටිසන්ධි විසින් හැසිරෙන්නාවූ සත්ත්වයා පනවනුයෙක් පනවා නම්

ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා රූපසඞ්ඛයෙ විමුත්තො තථාගතො අත්ථීතිපි න උපෙති, නත්ථීතිපි න උපෙති, අත්ථි නත්ථීතිපි න උපෙති, නෙවත්ථි නො නත්ථීතිපි න උපෙති, අථ ඛො ගම්භීරො අප්පමෙය්‍යො අසඞ්ඛෙය්‍යො නිබ්බුතොති යෙව සඞ්ඛං ගච්ඡති, ඛයා රාගස්ස ඛයා දොසස්ස ඛයා මොහස්ස.

යාය වෙදනාය -පෙ- යාය සඤ්ඤාය -පෙ- යෙහි සඞ්ඛාරෙහි -පෙ- යෙන විඤ්ඤාණෙන තථාගතං තිට්ඨන්තං චරන්තං පඤ්ඤපයමානො පඤ්ඤපෙය්‍ය, තස්ස විඤ්ඤාණස්ස ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා විඤ්ඤාණසඞ්ඛයෙ විමුත්තො තථාගතො අත්ථීතිපි න උපෙති, නත්ථීතිපි න උපෙති. අථ ඛො ගම්භීරො අප්පමෙය්‍යො අසඞ්ඛෙය්‍යො නිබ්බුතොති යෙව සඞ්ඛං ගච්ඡති.

'ආගතී'ති ඉධාගති : ගතී'ති පෙච්චභවො, ආගතිගතිපි න භවන්ති. 'නෙවිධා'ති ඡසු අජ්ඣත්තිකෙසු ආයතනෙසු. 'න හුරං'ති ඡසු බාහිරෙසු ආයතනෙසු 'න උභයමන්තරෙනා'ති ඵස්සසමුදිතෙසු ධම්මෙසු අත්තානං න පස්සති. 'එසෙවන්තො දුක්ඛස්සා'ති පටිච්චසමුප්පාදො. සො දුවිධො : ලොකිකො ච ලොකුත්තරො ච. තත්ථ ලොකිකො අවිජ්ජාපච්චයා සඞ්ඛාරා යාව ජරාමරණා, ලොකුත්තරො සීලවතො අවිප්පටිසාරො ජායති, යාව නාපරං ඉත්ථත්තායාති පජානාති. තෙනාහ භගවා 'නිස්සිතස්ස චලිතං අනිස්සිතස්ස චලිතං නත්ථි -පෙ- එසෙවන්තො දුක්ඛස්සා'ති.

2. "යෙ කෙචි සොකා පරිදෙවිතා වා
දුක්ඛඤ්ච ලොකස්මිං අනෙකරූපං,
පියං පටිච්ච පභවන්ති එතෙ
පියෙ අසන්තෙ න භවන්ති එතෙ.

3. තස්මා හි තෙ සුඛිනො වීතසොකා
යෙසං පියං නත්ථි කුහිඤ්චි ලොකෙ,
තස්මා අසොකං විරජං පත්ථයානො
පියං න කයිරාථ කුහිඤ්චි ලොකෙ"ති

"යෙ කෙචි සොකා පරිදෙවිතා වා දුක්ඛඤ්ච ලොකස්මිං අනෙකරූපං පියං පටිච්ච පභවන්ති එතෙ"ති අයං දුක්ඛා වෙදනා, "පියෙ අසන්තෙ න භවන්ති එතෙ"ති අයං සුඛා වෙදනා, අයං වෙදනාක්ඛන්ධො. අයං ඛන්ධෙහි ඔතරණා. වෙදනා පච්චයා පන තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණං. (එවං සබ්බං.) අයං පටිච්චසමුප්පාදෙහි ඔතරණා. තත්ථ සුඛා වෙදනා ද්වෙ ඉන්ද්‍රියානි: සුඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියඤ්ච. දුක්ඛා වෙදනා ද්වෙ ඉන්ද්‍රියානි: දුක්ඛින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං ච. අයං ඉන්ද්‍රියෙහි ඔතරණා. තානියෙව ඉන්ද්‍රියානි සඞ්ඛාරපරියාපන්නානි යෙ සඞ්ඛාරා සාසවා භවඞ්ගා, තෙ සඞ්ඛාරා ධම්මධාතුසංගහිතා, අයං ධාතූහි ඔතරණා. සා ධම්මධාතු ධම්මායතනපරියාපන්නා යං ආයතනං සාසවං භවඞ්ගං, අයං ආයතනෙහි ඔතරණා.

ඒ රූපූපාදනය ක්ෂය වීමෙන් විරාගයෙන් නිරුද්ධ වීමෙන් ත්‍යාගයෙන් දුරලීමෙන් රූපසඞ්ඛය සංඛ්‍යාත නිවනෙහි විමුක්ත වූ ක්ෂීණාශ්‍රව පුද්ගල (ආත්මයත් ලෝකයත් ශාශ්වත ව) ඇතැයි ද (තෘෂ්ණා දෘෂ්ටිඋපය විසින්) නො ගනී, නැතැයි (අශාශ්වත යයි) ද නො ගනී, (ඒකත්‍යශාශ්වත විසින්) ඇත්තේත් නැත්තේත් වේ යයි ද නො ගනී, (අමරා වික්ෂෙප විසින්) නො මැ ඇත්තේත් නැති නොවූයේත් වේ යයි ද නො ගනී, වැලි ක්ලේශාභාවයෙන් ගැඹුරු වූයේ අප්‍රමෙය වූයේ අසඞ්ඛ්‍ය වූයේ පිරිනිවියේ යැ යි මැ සඞ්ඛ්‍යාවට යෙයි. රාගක්ෂය ද්වෙෂක්ෂය මොහක්ෂය වූ හෙයිනි.

යම් වෙදනාවක් හෙතු කොට . . . යම් සංඥාවක් හෙතු කොට . . . යම් සංස්කාරයන් හෙතු කොට . . . යම් විඥානයක් හෙතු කොට භවයෙහි සිටින්නාවූ ද හැසිරෙන්නාවූ ද සත්ත්වයා පනවනුයෙක් පනවා නම්, ඒ විඥානයාගේ ක්ෂය වීමෙන් විරාගයෙන් නිරොධයෙන් ත්‍යාගයෙන් දුරලීමෙන් විඥානක්ෂය සංඛ්‍යාත නිවනෙහි විමුක්ත වූ ක්ෂීණාශ්‍රව පුද්ගල (ආත්මයත් ලොකයත් තෘෂ්ණා දෘෂ්ටීන්) ඇතැයි ද නො ගනී, නැතැයි ද නො ගනී, ඇතැයි නැතැයි ද නො ගනී, නො මැ ඇත නැත්තේත් නො වේ යයි ද නො ගනී. වැලි ගම්භීර වූයේ අප්‍රමෙය වූයේ අසඞ්ඛ්‍ය වූයේ පිරිනිවියේ මැ යයි සංඛ්‍යාවට යේ.

' ආගති ' යනු පරලොවින් මෙලොවට පැමිණීම යැ, ' ගති ' යනු මෙලොවින් පුනර්භව සංඛ්‍යාත පරලොවට යෑම යැ, මෙලොවට පැමිණීම ද පරලොවට යෑම ද නො වෙත්. ' නෙවිධ ' යනු ෂඩ් ආධ්‍යාත්මික ආයතනයන්හි ' න හුරං ' යනු ෂඩ්වහිරායතනයන්හි, ' න උභයමන්තරෙන ' යනු ද්වාරප්‍රවෘත්ත වූ ඵස්සය සමග උපන් (විඤ්ඤාණ වෙදනා සඤ්ඤා චෙතනා විතක්ක විචාරාදි) ධර්මයන්හි ආත්මය නො දකී. ' එසෙවන්තො දුක්ඛස්ස ' යනු පටිච්චසමුප්පාද යැ, ඒ පටිච්චසමුප්පාදය ලෞකික ද ලොකොත්තර දැයි දෙවැදෑරුම් වෙයි. එහි ලෞකික පටිච්ච සමුප්පාදය : '' අවිජ්ජා පච්චයා සඞ්ඛාරා ' යනු පටන් කොට ' ජරාමරණ ' දක්වා වෙයි. ලොකුත්තරපටිච්ච සමුප්පාදය : ' සීලවතො අවිප්පටිසාරො ජායති ' යනු පටන් කොට ' නාපරං ඉත්ථත්තායාති පජානාති ' යනු දක්වා වෙයි. එයින් වදළහ, බුදුහු : නිස්සිතස්ස චලිතං අනිස්සිතස්ස චලිතං නත්ථි – පෙ – එසෙවන්තො දුක්ඛස්ස '' යි.

2. සත්ලොවැ යම් කිසි ශොකයෝ හෝ පරිදෙවයෝ හෝ වෙත් ද, අනෙකප්‍රකාර වූ දුකකුත් වේ ද, ප්‍රිය වස්තුව නිසා තෙල ශොකාදීහු උපදිති, ප්‍රිය වස්තු නැති කල්හි තෙල ශොකාදීහු නො වෙත්.

3. යම් කෙනකුන්ට ලොවැ කිසි තැනෙක්හි ප්‍රිය වූවකු නැද්ද, එහෙයින් ඒ විගත ශෝක වූ රහත්හු සුව ඇත්තාහු වෙති, එකරුණෙන් නිශ්ශොක වූ විරජ වූ නිවන ප්‍රාර්ථනා කරනුයේ ලොවැ කිසි තැනෙක්හි (කිසි වස්තුවක්) ප්‍රිය නො කරන්නේ යි.

'' යෙ කෙචි සොකා පරිදෙවිතා වා . දුක්ඛං ච ලොකස්මිං අනෙකරූපං පියං පටිච්ච පභවන්ති එතෙ '' යනු මේ දුක්ඛවෙදනා යැ, '' පියෙ අසන්තෙ න භවන්ති එතෙ '' යනු මේ සුඛවෙදනා යැ, මේ වෙදනාස්කන්ධ යැ, මේ ස්කන්ධයන්ගෙන් අවතරණ යි. යළි වෙදනාප්‍රත්‍යයෙන් තණ්හාව වෙයි, තෘෂ්ණාප්‍රත්‍යයෙන් උපාදන වෙයි, උපාදනප්‍රත්‍යයෙන් භවය වෙයි, භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි, ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වෙයි. (සියල්ල මෙසේ යි.) මේ පටිච්චසමුප්පාදයෙන් අවතරණ යි. එහි සුඛවෙදනාව සුඛින්ද්‍රිය ද සොමනස්සින්ද්‍රිය ද ' යි ඉන්ද්‍රිය දෙකෙකි, දුක්ඛවෙදනාව දුක්ඛින්ද්‍රිය ද දෙමනස්සින්ද්‍රිය ද ' යි ඉන්ද්‍රිය දෙකෙකි, මේ ඉන්ද්‍රියයන්ගෙන් අවතරණ යි. එ මැ ඉන්ද්‍රියයෝ සාශ්‍රව වූ භවාඞ්ග වූ යම් සංස්කාර කෙනෙක් ඇද්ද ඒ සංස්කාරයන්හි පර්‍යාපන්නයෝ යැ, ඒ සංස්කාරයෝ ධර්මධාතුයෙහි සංගෘහීතයහ, මේ ධාතුන්ගෙන් අවතරණ යි. ඒ ධර්මධාතුව සාශ්‍රව වූ භවාඞ්ග වූ යම් ආයතනයෙක් ඇද්ද, ඒ ධර්මායතනයෙහි පර්‍යාපන්න යැ, මේ ආයතනයන්ගෙන් අවතරණ යි.

4. "තස්මා හි තෙ සුඛිනො වීතසොකා
යෙසං පියං නත්ථි කුහිඤ්චි ලොකෙ,
තස්මා අසොකං විරජං පත්ථයානො
පියං න කයිරාථ කුහිඤ්චි ලොකෙ"ති

ඉදං තණ්හාපහානං, තණ්හානිරොධා උපාදානනිරොධො. උපාදාන-නිරොධා භවනිරොධො. (එවං සබ්බං) අයං පටිච්චසමුප්පාදෙහි ඔතරණා. තං යෙව තණ්හාපහානං සමථො, සො සමථො ද්වෙ ඉන්ද්‍රියානි: සතින්ද්‍රියං සමාධින්ද්‍රියං ච. අයං ඉන්ද්‍රියෙහි ඔතරණා. සො යෙව සමථො සමාධික්ඛන්ධො, අයං ඛන්ධෙහි ඔතරණා. සො යෙව සමථො සඞ්ඛාර-පරියාපන්නො යෙ සඞ්ඛාරා අනාසවා නො ච භවඞ්ගා, තෙ සඞ්ඛාරා ධම්මධාතුසඞ්ගහිතා. අයං ධාතූහි ඔතරණා. සා ධම්මධාතු ධම්මා-යතනපරියාපන්නා යං ආයතනං අනාසවං නො ච භවඞ්ගං. අයං ආයතනෙහි ඔතරණා. තෙනාහ භගවා: "යෙ කෙචි සොකා" ති.

5. "කාමං කාමයමානස්ස තස්ස චෙ තං සමිජ්ඣති,
අද්ධා පීතිමනො හොති ලද්ධා මච්චො යදිච්ඡති.

6 තස්ස චෙ කාමයානස්ස ඡන්දජාතස්ස ජන්තුනො,
තෙ කාමා පරිහායන්ති සල්ලවිද්ධො'ව රුප්පති.

7. යො කාමෙ පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරො,
සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තතී"ති.

තත්ථ යා පීතිමනතා අයං අනුනයො. යදාහ: "සල්ලවිද්ධොව රුප්පතී"ති, ඉදං පටිඝං, අනුනයපටිඝං ච පන තණ්හාපක්ඛො. තණ්හාය ච පන දස රූපීනි ආයතනානි පදට්ඨානං. අයං ආයතනෙහි ඔතරණා. තානියෙව දස රූපීනි ආයතනානි රූපකායො නාම සම්පයුත්තො, තදුභයං නාමරූපං. නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා. (එවං සබ්බං) අයං පටිච්චසමුප්පාදෙහි ඔතරණා. තදෙව නාමරූපං පඤ්චක්ඛන්ධා. අයං ඛන්ධෙහි ඔතරණා. තදෙව නාමරූපං අට්ඨාරස ධාතුයො, අයං ධාතූහි ඔතරණා. තත්ථ යො රූපකායො ඉමානි පඤ්ච රූපීනි ඉන්ද්‍රියානි, යො නාමකායො ඉමානි පඤ්ච අරූපීනි ඉන්ද්‍රියානි, ඉමානි දස ඉන්ද්‍රියානි. අයං ඉන්ද්‍රියෙහි ඔතරණා.

තත්ථ යදාහ:

8. "යො කාමෙ පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරො,
සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තතී"ති.

අයං සඋපාදිසෙසනිබ්බානධාතු. අයං ධාතූහි ඔතරණා. සායෙව සඋපාදිසෙසනිබ්බානධාතු විජ්ජා, විජ්ජුප්පාදා අවිජ්ජානිරොධො, අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො. (එවං සබ්බං.) අයං පටිච්චසමුප්පා-දෙහි ඔතරණා. සායෙව විජ්ජා පඤ්ඤාක්ඛන්ධො. අයං ඛන්ධෙහි ඔතරණා. සායෙව විජ්ජා ද්වෙ ඉන්ද්‍රියානි: වීරියින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං ච. අයං ඉන්ද්‍රියෙහි ඔතරණා. සායෙව විජ්ජා සඞ්ඛාරපරියාපන්නා යෙ සඞ්ඛාරා,

4. '' තස්මා හි තෙ සුඛිනො වීතසොකා – පෙ – පියං න කයිරාථ කුහිං චි ලොකෙ '' යනු මේ තෘෂ්ණාප්‍රහාණ යි. තෘෂ්ණානිරොධයෙන් උපාදානනිරොධය වෙයි, උපාදාන නිරොධයෙන් භවනිරොධය වෙයි. (සියල්ල මෙසේ යි.) මේ පටිච්චසමුප්පාදයෙන් සූත්‍රවර්ණනාවට බැසගැනීම යි. එ මැ තෘෂ්ණාප්‍රහාණය ශමථ යැ, ඒ ශමථය සතින්ද්‍රිය ද සමාධීන්ද්‍රිය ද ' යි ඉන්ද්‍රිය දෙකෙකි. මේ ඉන්ද්‍රියයන්ගෙන් අවතරණ යි. එ මැ ශමථය සමාධිස්කන්ධ වෙයි. මේ ස්කන්ධයන්ගෙන් අවතරණ යි. එ මැ ශමථය අනාශ්‍රව වූ නො ද භවාඞ්ග වූ යම් සංස්කාර කෙනෙක් ඇද්ද ඒ සංස්කාරයෙහි පර්‍ය්‍යාපන්න යැ, ඒ සංස්කාරයෝ ධර්මධාතුයෙහි සංගෘහීත වෙති, මේ ධාතූන්ගෙන් අවතරණ යි. ඒ ධර්ම ධාතුව අනාශ්‍රව වූ නො ද භවාඞ්ග වූ යම් ආයතනයෙක් ඇද්ද, ඒ ධර්මායතනයෙහි පර්‍ය්‍යා පන්න යැ., මේ ආයතනයන්ගෙන් අවතරණ යි. එයින් වදළහ, බුදුහු : '' යෙ කෙචි සොකා '' යනාදිය.

5. වස්තුකාමය කැමැතිවන සත්ත්වහට ඉදින් ඒ කාමය සමෘද්ධ වේ නම්, එකල්හි ඒ සත්ත්ව තෙමේ කැමැති වස්තුව ලැබ එකාන්තයෙන් සතුටුසිත් ඇතියේ වේ.

6. ඒ වස්තුකාමයන් කැමැතිවන උපන් තෘෂ්ණා ඇති ඒ පුද්ගලයාගේ ඒ කාමයෝ ඉදින් පිරිහෙත් නම්, එකල්හි හේ විෂපීත ශල්‍යයෙකින් විදුනාලද්දකු සෙයින් පීඩාවට පැමිණේ.

7. යමෙක් තමාගේ පාදය කෙරෙන් සර්පයාගේ හිස දුරුකරන්නා සේ වස්තුකාම ක්ලෙශකාමයන් (විෂ්කම්භණ හෝ සමුච්ඡෙද හෝ විසින් එහි ඡන්දරාග දුරැලීමෙන්) දුරුකෙරේ ද, හෙතෙම ලොවැ මේ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ස්මෘතිමත් වැ ඉක්මවා ලන්නේ ' යි.

එහි යම් ' පීතිමන ' තායෙක් ඇද්ද මේ අනුනය යි. ' සල්ලවිද්ධොව රුප්පති ' යි යමක් වදළසේක් ද මේ ප්‍රතිඝ යි. අනුනය පටිඝ වැලිත් තෘෂ්ණාපක්ෂ යි. යළි තෘෂ්ණාවට රූපී දසආයතනයෝ පදට්ඨාන යැ, මේ ආයතනයන්ගෙන් අවතරණ යි. එමැ දස රූපීආයතනයෝ නාමය හා සම්ප්‍රයුක්ත වූ රූපකාය වෙයි, ඒ දෙක නාමරූප යි. නාමරූපප්‍රත්‍යයෙන් ෂඩායතනය වෙයි, ෂඩායතනප්‍රත්‍යයෙන් ඵස්සය වෙයි, ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනාව වෙයි, වෙදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වෙයි. (සියල්ල මෙසේ යි.) මේ පටිච්චසමුප්පාදයෙන් අවතරණ යි. එමැ නාමරූපය පඤ්ච ස්කන්ධ යැ, මේ ස්කන්ධ යන්ගෙන් අවතරණ යි. එමැ නාමරූපය අටළොස් ධාතුහු යැ, මේ ධාතූන්ගෙන් අවතරණ යි. එහි යම් රූපකායයෙක් ඇද්ද මොහු පඤ්ච රූපීඉන්ද්‍රියයෝ යැ, යම් නාමකායයෙක් ඇද්ද මොහු පඤ්ච අරූපීඉන්ද්‍රියයෝ යැ, මොහු දස ඉන්ද්‍රියයෝ වෙති. මේ ඉන්ද්‍රියයන්ගෙන් අවතරණ යි.

එහි යමක් වදළසේක් ද :

8. '' යො කාමෙ පරිවජ්ජෙති – පෙ – සතො සමතිවත්තති '' යි.

මේ සඋපාදියෙසනිබ්බානධාතු යැ, මේ ධාතූන්ගෙන් අවතරණ යි. එමැ සඋපාදිසෙස නිබ්බානධාතුව විද්‍යා යැ, විද්‍යොත්පාදයෙන් අවිද්‍යානිරොධය වෙයි, අවිද්‍යානිරොධයෙන් සංස්කාරනිරොධය වේ. (සියල්ල මෙසේ යි.) මේ ප්‍රතීත්‍යසමුත්පාදයෙන් අවතරණ යි. එමැ විද්‍යාව ප්‍රඥස්කන්ධ යැ, මේ ස්කන්ධයන්ගෙන් අවතරණ යි. එමැ විද්‍යාව වීර්‍ය්‍යීන්ද්‍රිය ද පඤ්ඤින්ද්‍රිය ද ' යි ඉන්ද්‍රිය දෙකෙකි, මේ ඉන්ද්‍රියයන්ගෙන් අවතරණ යි. එමැ විද්‍යාව අනාශ්‍රව වූ නො ද භවාඞ්ග වූ යම් සංස්කාරකෙනෙක් ඇද්ද ඒ සංස්කාරයෙහි

අනාසවා, නො ච භවඞ්ගා, තෙ සඞ්ඛාරා ධම්මධාතුසඞ්ගහිතා. අයං ධාතූහි ඔතරණා. සා ධම්මධාතු ධම්මායතනපරියාපන්නා යං ආයතනං අනාසවං නො ච භවඞ්ගං, අයං ආයතනෙහි ඔතරණා. තෙනාහ භගවා : ''කාමං කාමයමානස්සා'' ති.

එත්තාවතා පටිච්ච - ඉන්ද්‍රිය - ඛන්ධ - ධාතු - ආයතනානි සමොසරණොතරණානි භවන්ති. එවං පටිච්ච - ඉන්ද්‍රිය - ඛන්ධ - ධාතු - ආයතනානි ඔතාරෙතබ්බානි. තෙනාහ ආයස්මා මහාකච්චානො : ''යො ච පටිච්චුප්පාදො'' ති :

නියුත්තො ඔතරණො හාරො.

## 3. 1. 13

## සොධනහාරවිභඞ්ගො

තත්ථ කතමො සොධනො හාරො : ''විස්සජ්ජිතම්හි පඤ්හෙ'' ති ගාථා. යථා ආයස්මා අජිතො පාරායනෙ භගවන්තං පඤ්හං පුච්ඡති :

1. ''කෙනස්සු නිවුතො ලොකො කෙනස්සු නප්පකාසති,
කිස්සාභිලෙපනං බ්‍රූසි කිංසු තස්ස මහබ්භය''න්ති?.

2. ''අවිජ්ජාය නිවුතො ලොකො (අජිතාති භගවා)
විවිච්ඡා පමාදා නප්පකාසති,
ජප්පාභිලෙපනං බ්‍රූමි දුක්ඛමස්ස මහබ්භය''න්ති.

'කෙනස්සු නිවුතො ලොකො'ති පඤ්හෙ 'අවිජ්ජාය නිවුතො ලොකො'ති භගවා පදං සොධෙති නො ච ආරම්භං. 'කෙනස්සු නප්පකාසතී'ති පඤ්හෙ 'විවිච්ඡා පමාදා නප්පකාසතී'ති භගවා පදං සොධෙති නො ච ආරම්භං. 'කිස්සාභිලෙපනං බ්‍රූසී'ති පඤ්හෙ 'ජප්පාභිලෙපනං බ්‍රූමී'ති භගවා පදං සොධෙති නො ච ආරම්භං. 'කිංසු තස්ස මහබ්භය'න්ති පඤ්හෙ 'දුක්ඛමස්ස මහබ්භය'න්ති භගවා පදං සොධෙති, සුද්ධො ආරම්භො. තෙනාහ භගවා : ''අවිජ්ජාය නිවුතො ලොකො''ති.

3. ''සවන්ති සබ්බධි සොතා (ඉච්චායස්මා අජිතො)
සොතානං කිං නිවාරණං?,
සොතානං සංවරං බ්‍රූහි කෙන සොතා පිධීයරෙ''ති?.

පයඨාපන්න යැ, ඒ සංස්කාරයෝ ධර්මධාතුයෙහි සංගෘහීතයෝ යැ, මේ ධාතුන්ගෙන් අවතරණ යි. ඒ ධර්මධාතුව අනාස්‍රව වූ නො ද භවාඞ්ග වූ යම් ආයතනයෙක් ඇද්ද ඒ ධර්මායතනයෙහි පයඨාපන්න යැ, මේ ආයතනයන්ගෙන් අවතරණ යි. එයින් වදාළහ, බුදුහු : '' කාමං කාමයමානස්ස '' යනාදිය.

මෙතෙකින් පටිච්චසමුප්පාද – ඉන්ද්‍රිය – ස්කන්ධ – ධාතු – ආයතනයෝ ඒ ඒ ධර්ම පදයෙහි සමොසරණ – ඔතරණ වූවාහු වෙත්. මෙපරිද්දෙන් පටිච්චසමුප්පාද – ඉන්ද්‍රිය – ඛන්ධ – ධාතු – ආයතනයෝ නවාඞ්ගශාසනධර්මයෙහි අවතරණය කටයුත්තාහුය. එයින් වදාළහ, ආයුෂ්මත් මහාකාත්‍යායන මහරහතුන් වහන්සේ : '' යො ච පටිච්චුප්පාදෙ '' යනාදිය.

ඔතරණහාරය යොදනලද්දේ යි

## 3. 1. 13

## සොධනහාරවිභඞ්ගය

එහි සොධනහාරය කවරෙ යැ : '' විස්සජ්ජිතම්හි පඤ්හෙ '' යනාදි නිද්දෙසගාථා යි. ආයුෂ්මත් අජිත පාරායනයෙහි භාග්‍යවතුන් වහන්සේගෙන් මෙසේ පැන පුළුවුස්සි :

1. (ආයුෂ්මත් අජිත මෙසේ පුළුවුස්සි) ලෝවැසි තෙමේ කුමකින් වැසුණේ ද ? කුමක් හෙතු කොට ප්‍රකාශයට නො පැමිණේ ද ? ඒ ලෝවැසිහට කුමක් අභිලෙපන (ඇලීම) යයි වදරනදු ද ? ඒ ලෝවැසියාට මහත් භයහෙතුව කුමක් දු ' යි.

2. (අජිත ' යි බුදුහු මෙසේ වදරති) ධර්මස්වභාව ප්‍රතිච්ඡාදනලක්ෂණ අවිද්‍යාව විසින් සත්ලොව වසනලද, විචිකිත්සා ප්‍රමාද හෙතුයෙන් ප්‍රකාශයට නො පැමිණෙයි, තෘෂ්ණාව අභිලෙපන යයි කියමි, ජාත්‍යාදි වට්ටදුක්ඛය ඒ ලෝවැසිහට මහත් භයහෙතුව වේ යයි.

' කෙනස්සු නිවුතො ලොකො ' යන ප්‍රශ්නයෙහි ' අවිජ්ජාය නිවුතො ලොකො ' යි බුදුහු (අජිත තෙරුන් ප්‍රශ්නවශයෙන් අසනලද) පදය (එහි අර්ථය විසඳන හෙයින්) ශොධනය කරනසේක, එහෙත් (දැනගන්නට රිසිවූ අර්ථය නිමාවට නොගිය හෙයින්) ආරම්භය ශොධනය නො කෙරෙති. ' කෙනස්සු නප්පකාසති ' යන ප්‍රශ්නයෙහි ' විවිච්ඡා පමාද නප්පකාසති ' යි බුදුහු (තදර්ථවිසර්ජනයෙන්) පදය ශොධනය කෙරෙති, ඊප්සිතාර්ථය නො නිමියෙන් නො ද ආරම්භශොධනය කෙරෙති. ' කිස්සාභිලෙපනං බ්‍රෑසි ' යන ප්‍රශ්නයෙහි ' ජප්පාභිලපනං බ්‍රෑමි ' යි පදය ශොධනය කෙරෙති, නො ද ආරම්භශොධනය කෙරෙති. ' කිංසු තස්ස මහබ්භයං ' යන ප්‍රශ්නයෙහි ' දුක්ඛමස්ස මහබ්භයං ' යි බුදුහු පදය ශොධනය කෙරෙති, (දැනගනුකැමැති අර්ථය ප්‍රබොධ කළ බැවින්) ආරම්භය ශුද්ධ වී, එයින් වදාළහ, බුදුහු : '' අවිජ්ජාය නිවුතො ලොකො '' යනාදිය.

3. (ආයුෂ්මත් අජිත මෙසේ පුළුවුස්සි :) තෘෂ්ණාදි ස්‍රොතස්හු සියලු රූපාදි ආයතන යන්හි ගලාබසිති, ඒ ස්‍රොතසුන්ගේ ආවරණය කිම ? ආරක්ෂාව කවරැ ' යි සේයි, ස්‍රොතසුන්ගේ සංවරය වදළ මැනැව, කවර දහමෙකින් තෘෂ්ණාදි ස්‍රොතස්හු වසනු ලැබෙත් දු ? යි.

4. "යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා)
සති තෙසං නිවාරණං.
සොතානං සංවරං බෲමි පඤ්ඤායෙතෙ පිථීයරෙ"ති.

'සවන්ති සබ්බධි සොතා සොතානං කිං නිවාරණ'න්ති පඤ්හෙ 'යානි සොතානි ලොකස්මිං සති තෙසං නිවාරණ'න්ති භගවා පදං සොධෙති නො ච ආරම්භං. 'සොතානං සංවරං බෲහි කෙන සොතා පිථීයරෙ'ති පඤ්හෙ 'සොතානං සංවරං බෲමි පඤ්ඤායෙතෙ පිථීයරෙ'ති සුද්ධො ආරම්භො. තෙනාහ භගවා: "යානි සොතානි ලොකස්මිං"ති.

5. "පඤ්ඤා චෙව සති ච (ඉච්චායස්මා අජිතො)
නාමරූපං ච මාරිස,
එතං මෙ පුට්ඨො පබෲහි කත්ථෙතං උපරුජ්ඣතී"ති?

පඤ්හෙ :

6. "යමෙතං පඤ්හං අපුච්ඡි[1] අජිත තං වදාමි තෙ,
යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති;
විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣතී"ති.

සුද්ධො ආරම්භො. තෙනාහ භගවා: "යමෙතං පඤ්හං අපුච්ඡී"ති. යත්ථ එවං සුද්ධො ආරම්භො, සො පඤ්හො විස්සජ්ජිතො භවති. යත්ථ පන ආරම්භො අසුද්ධො න තාව සො පඤ්හො විස්සජ්ජිතො භවති. තෙනාහ ආයස්මා මහාකච්චානො "විස්සජ්ජිතම්හි පඤ්හෙ"ති.

නිට්ඨිතො සොධනො හාරො.

## 3. 1. 14

## අධිට්ඨානහාරවිභඞ්ගො

තත්ථ කතමො අධිට්ඨානො හාරො: "එකත්තතාය ධම්මා යෙ පි ච වෙමත්තතාය නිද්දිට්ඨා"ති. යෙ තත්ථ නිද්දිට්ඨා තථා තෙ ධාරයිතබ්බා.

'දුක්ඛ'න්ති එකත්තතා, තත්ථ කතමං දුක්ඛං: ජාති දුක්ඛා, ජරා දුක්ඛා, ව්‍යාධි දුක්ඛො, මරණං දුක්ඛං, අප්පියෙහි සම්පයොගො දුක්ඛො, පියෙහි විප්පයොගො දුක්ඛො, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා: රූපා දුක්ඛා, වෙදනා දුක්ඛා, සඤ්ඤා දුක්ඛා, සඞ්ඛාරා දුක්ඛා, විඤ්ඤාණං දුක්ඛං.' අයං වෙමත්තතා.

1. පුච්ඡසි පඤ්හං - සිමු.

4. (අජිත ' යී බුදුහු වදරති :) ලොවැ තෘෂ්ණාදි යම් ස්‍රොතස් කෙනෙක් වෙත් ද, විදර්ශනාසම්ප්‍රයුක්ත ස්මෘතිය ඒ ස්‍රොතසුන්ගේ ආරක්ෂාව නුයි (ඒ ස්මෘතිය මැ) ස්‍රොතසුන්ගේ සංවරය යි කියමි, මාර්ගප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු (සර්වාකාරයෙන්) වසනුලැබෙත්. (සමුච්ඡෙද කරනු ලැබෙති සේයි.)

'' සවන්ති සබ්බධි සොතා සොතානං කිං නිවාරණං '' යන ප්‍රශ්නයෙහි ' යානි සොතානි ලොකස්මිං සති තෙසං නිවාරණං ' යී බුදුහු පදය ශොධනය කෙරෙති, නො ද ආරම්භය ශුද්ධ කෙරෙත්. ' සොතානං සංවරං බ්‍රෑහි කෙන සොතා පිථීයරෙ ' යන ප්‍රශ්නයෙහි ' සොතානං සංවරං බ්‍රෑමි පඤ්ඤායෙතෙ පිථීයරෙ ' යී (දනගන්නට රිසිවූ අර්ථය අවබොධ කරවනලද හෙයින්) ආරම්භය ශුද්ධ යි. එයින් වදළහ බුදුහු : '' යානි සොතානි ලොකස්මිං '' යනාදිය.

5. (ආයුෂ්මත් අජිත මෙසේ පුළුවුස්සි) නිදුකාණන් වහන්ස, මාර්ගප්‍රඥාව ද සමෘතිය ද තදවශෙෂ නාමරූපය ද යන තෙල සියල්ල කොතැන්හි ලා නිරුද්ධ වේ ද ? තෙල කරුණ මා විසින් පුළුවුස්නාලද සේක් වදළ මැනැවැ ' යි.

6. අජිතයැ තෙල (කත්ථෙතං උපරුජ්ඣති ' යී) යම් ප්‍රශ්නයක් පුළුවුස්හි ද, එය තොපට කියමි, යම් තැනෙක ලා නාමයත් රූපයත් නිරවශෙෂ කොට නිරුද්ධ වේ ද, (පශ්චිම) විඥානයාගේ නිරොධය හා මැ (පෙරපසු නො ව ) ඒ විඥානනිරොධයෙහි මැ තෙල නාමරූපය නිරුද්ධ වෙයි. (විඥානනිරොධය ඉක්මැ නොයෙයි.)

මෙ ගාථාදේශනායෙන් ආරම්භය ශුද්ධ වී. එයින් වදළහ, බුදුහු : '' යමෙතං පඤ්හං අපුච්ඡි '' යනාදිය. යම් ප්‍රශ්නවිසර්ජනයෙකැ දනගනු කැමැති අර්ථ සංඛ්‍යාත ආරම්භය ශුද්ධ වූයේ ද, ඒ ප්‍රශ්නය විසඳනලදුයේ වෙයි, වැළි යම් තැනෙක ආරම්භය අශුද්ධ වූයේ ද, තව ඒ ප්‍රශ්නය නො විසඳනලදුයේ වේ. එයින් වදළහ, ආයුෂ්මත් මහා කාත්‍යායනස්ථවිරයන් වහන්සේ : '' විස්සජ්ජිතම්හි පඤ්හෙ '' යනාදිය.

සොධනහාරය යොදන ලද්දේ යි

## 3. 1. 14

## අධිට්ඨානහාරවිභඞ්ගය

එහි අධිට්ඨානහාරය කවරෙ යැ : '' එකත්තතාය ධම්මා යෙ'පි ච වෙමත්තතාය නිද්දිට්ඨා '' ආදි නිද්දෙසගාථා යි. එහි යම් ධර්ම කෙනෙක් එකත්තතා වෙමත්තතා (සාමාන්‍ය විශෙෂභාව) වශයෙන් දක්වනලද්දහු ද, ඒ ධර්මයෝ එසෙයින් ධැරියයුත්තාහ, (එහි සාමාන්‍ය විශෙෂ කිමැයි විකල්පන නො කටයුත්තාහ.)

' දුක්ඛ ' යනු එකත්ව (සාමාන්‍ය) යැ, (ජාත්‍යාදි විශෙෂ අපෙක්ෂා නො කොට කී හෙයිනි.) එහි දුඃඛසත්‍යය කවරෙ යැ : ජාතිය දුක යැ ජරාව දුක යැ ව්‍යාධිය දුක යැ මරණය දුක යැ අප්‍රියයන් හා සම්ප්‍රයොගය දුක යැ ප්‍රියයන් කෙරෙන් විප්‍රයොගය දුක යැ රිසිවූ යමක් නො ලබා නම් එද දුක යැ සැකෙවින් පඤ්චොපාදනස්කන්ධයෝ දුක්ඛයහ. රූප දුක් යැ වෙදනා දුක් යැ සංඥා දුක් යැ සංස්කාර දුක් යැ විඥානය දුක් යි : මෙ දුඃඛ සත්‍යයාගේ විශේෂ ප්‍රකාශ කළහෙයින් වෙමත්තතා යි.

‘දුක්ඛසමුදයො’ති එකත්තතා, ‘තත්ථ කතමො දුක්ඛසමුදයො : යා’යං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං : කාමතණ්හා භවතණ්හා විභවතණ්හා, අයං වෙමත්තතා.

‘දුක්ඛනිරොධො’ති එකත්තතා. ‘තත්ථ කතමො දුක්ඛනිරොධො : යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො.’ අයං වෙමත්තතා.

‘දුක්ඛනිරොධගාමිනීපටිපදා’ති එකත්තතා. ‘තත්ථ කතමා දුක්ඛනිරොධගාමිනී පටිපදා : අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං : සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.’ අයං වෙමත්තතා.

‘මග්ගො’’ති එකත්තතා. ‘තත්ථ කතමො මග්ගො : නිරයගාමී මග්ගො තිරච්ඡානයොනිගාමී මග්ගො පෙත්තිවිසයගාමී මග්ගො අසුරයොනිගාමියො[1] මග්ගො සග්ගගාමියො මග්ගො මනුස්සගාමී මග්ගො නිබ්බානගාමී මග්ගො’. අයං වෙමත්තතා.

‘නිරොධො’ති එකත්තතා. ‘තත්ථ කතමො නිරොධො : පටිසඞ්ඛානිරොධො, අප්පටිසඞ්ඛානිරොධො, අනුනයනිරොධො, පටිඝනිරොධො, මානනිරොධො, මක්ඛනිරොධො, පළාසනිරොධො, ඉස්සානිරොධො, මච්ඡරියනිරොධො, සබ්බකිලෙසනිරොධො. අයං වෙමත්තතා.

‘රූප’න්ති එකත්තතා. ‘තත්ථ කතමං රූපං චාතුම්මහාභූතිකං[2] රූපං චතුන්නං ච මහාභූතානං උපාදාය රූපස්ස පඤ්ඤත්ති. තත්ථ කතමානි චත්තාරි මහාභූතානි : පඨවිධාතු[3] ආපොධාතු තෙජොධාතු වායොධාතු.

ද්වීහි ආකාරෙහි ධාතුයො පරිගණ්හාති සඞ්ඛෙපෙන ච විත්ථාරෙන ච. කථං විත්ථාරෙන ධාතුයො පරිගණ්හාති : වීසතියා ආකාරෙහි පඨවිධාතුං විත්ථාරෙන පරිගණ්හාති. ද්වාදසහි ආකාරෙහි ආපොධාතුං විත්ථාරෙන පරිගණ්හාති. චතූහි ආකාරෙහි තෙජොධාතුං විත්ථාරෙන පරිගණ්හාති. ඡහි ආකාරෙහි වායොධාතුං විත්ථාරෙන පරිගණ්හාති.

කතමෙහි වීසතියා ආකාරෙහි පඨවිධාතුං විත්ථාරෙන පරිගණ්හාති: ‘අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො, මංසං නහාරූ[4] අට්ඨි අට්ඨිමිඤ්ජා[5] වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථකෙ මත්ථලුඞ්ගන්ති. ඉමෙහි වීසතියා ආකාරෙහි පඨවිධාතුං විත්ථාරෙන පරිගණ්හාති.

කතමෙහි ද්වාදසහි ආකාරෙහි ආපොධාතුං විත්ථාරෙන පරිගණ්හාති : ‘අත්ථි ඉමස්මිං කායෙ පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තන්ති. ඉමෙහි ද්වාදසහි ආකාරෙහි ආපොධාතුං විත්ථාරෙන පරිගණ්හාති.

1. අසුරයොනි - සීමු.
2. චාතුමහාභූතිකං - මජසං.
3. පඨවිධාතු - මජසං.
4. නහාරු -මජසං .
5. අට්ඨිමඤ්ජං - මජසං.

' දුක්ඛසමුදය ' යනු එකත්තතා (සාමාන්‍ය) යැ, ' එහි දුක්ඛසමුදය කවරෙ යැ : පුනර්භවය ඇතිකරන නන්දිරාගය හා සහගත වූ ඒ ඒ භවයෙහි සිත් අලවන යම් තෘෂ්ණාවක් ඇද්ද, ඒ මෙසේ යැ : කාමතෘෂ්ණා යැ භවතෘෂ්ණා යැ විභවතෘෂ්ණා යි. මේ වෙමත්තතා (විශෙෂතා) යි.

' දුක්ඛනිරොධ ' යනු එකත්තතා යැ. එහි දුක්ඛනිරොධ කවරෙ යැ : ඒ ත්‍රිවිධ තෘෂ්ණාවගේ මැ යම් නිරවශෙෂ කොට මාර්ගයෙන් නිරුද්ධ වීමෙක් ත්‍යාගයෙක් දුරලීමෙක් මිදීමෙක් අනාලයෙක් ඇද්ද එය යි. මේ වෙමත්තතා යි.

' දුක්ඛනිරොධගාමිනී පටිපද ' යනු ඒකත්තතා යැ. එහි දුක්ඛනිරොධගාමිනී පටිපද කවර : මෙ මැ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ග යැ, ඒ මෙසේ යැ : සම්‍යග්දෘෂ්ටි යැ සම්‍යක් සංකල්ප යැ සම්‍යග්වාචා යැ සම්‍යක්කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යග්ව්‍යායාම යැ සම්‍යක්ස්මෘති යැ සම්‍යක්සමාධි යි. මේ වෙමත්තතා යි.

' මග්ග ' යනු ඒකත්තතා යැ. ' එහි මාර්ග කවරෙ යැ : නිරයගාමී(නිරයට යන) මාර්ග යැ තිරශ්චීනයොනිගාමී මාර්ග යැ ප්‍රෙත්‍යවිෂයගාමී මාර්ග යැ අසුරයොනියට හිතවූ මාර්ග යැ ස්වර්ගගාමී මාර්ග යැ මනුෂ්‍යලොකගාමී මාර්ග යැ නිර්වාණගාමී මාර්ග යි. මේ (මාර්ගයාගේ) විශෙෂතා යි.

නිරොධ යනු ඒකත්තතා යැ. එහි නිරොධ කවරෙ යැ : අනිත්‍යාදි වශයෙන් ප්‍රත්‍යවෙක්ෂා කොට ප්‍රතිපක්ෂභාවනාවෙන් නිරොධ යැ සංඛතධර්මයන්ගේ සරසනිරොධ යැ හෙවත් ක්ෂණික නිරොධ යැ අනුනයනිරොධ යැ ප්‍රතිඝනිරොධ යැ මානනිරොධ යැ මක්ඛනිරොධ යැ පලාස (යුගග්‍රාහ) නිරොධ යැ ඊර්ෂ්‍යානිරොධ යැ මාත්සර්‍ය්‍යනිරොධ යැ සර්වක්ලෙශයන්ගේ නිරොධ යි. මේ නිරොධයාගේ වෙමත්තතා යි.

'රූප' යනු එකත්තතා යැ. එහි රූප කවරෙ යැ : සතර මහාභූතයන්ගෙන් හටගත් රූප යැ සතර මහාභූතයන් නිසා රූපයාගේ ප්‍රඥප්ති වෙයි. එහි සතර මහාභූතයෝ කවරහ : පෘථිවිධාතු යැ අබ්ධාතු යැ තෙජොධාතු යැ වායුධාතු යි.

සංක්ෂෙපයෙන් ද විස්තාරයෙන් දැයි දෙයාකාරයෙකින් ධාතුන් පරිග්‍රහණය කෙරෙයි: කිසෙයින් විස්තර විසින් ධාතුන් පරිග්‍රහණ කෙරෙයි යත් : විසිආකාරයෙකින් පෘථිවි ධාතුව විස්තර විසින් පිරිගනී, දෙළොස්අයුරෙකින් අබ්ධාතුව විස්තර විසින් පිරිගනී, සියුඅයුරෙකින් තෙජොධාතුව විස්තර විසින් පිරිගනී, සයාකාරයෙකින් වායොධාතුව විස්තර විසින් පරිග්‍රහණ කෙරෙයි.

කවර විසිඅයුරින් පෘථිවිධාතුව විස්තර විසින් පිරිගනී යැ යත් : මේ කයෙහි කෙස් ඇත, ලොම් නිය දත් සම් මස් නහර ඇට ඇටමිදුලු වකුගඩු හදවත අක්මා දලබුව බඩදිව පපුමස අතුණු අතුණුබහන් නොපැසුණු අහර පැසුණු අහර හිස්කබලෙහි සිටි හිස්මුල් යන මොහු ඇති. මේ විසිආකාරයෙන් පෘථිවිධාතුව විස්තර විසින් පරිග්‍රහණ කෙරෙයි.

කවර දෙළොස්අයුරින් ආපොධාතුව විස්තර විසින් පිරිගනී යැ යත් : මේ කයෙහි පිත් සෙම් සැරව ලේ සෝදිය මේදස් කඳුළු වුරුණුතෙල් කෙළ සොටු සඳමිදුලු මූ ඇතැ ' යි මේ දෙළොස් අයුරින් ආපොධාතුව පරිග්‍රහණ කෙරෙයි.

කතමෙහි චතූහි ආකාරෙහි තෙජොධාතුං විත්ථාරෙන පරිග්ගණ්හාති: 'යෙන ච සන්තප්පති යෙන ච ජීරීයති[1] යෙන ච පරිඩය්හති යෙන ච අසිතපීතඛායිතසායිතං සම්මා පරිණාමං ගච්ඡතී'ති, ඉමෙහි චතූහි ආකාරෙහි තෙජොධාතුං විත්ථාරෙන පරිග්ගණ්හාති.

කතමෙහි ඡහි ආකාරෙහි වායොධාතුං විත්ථාරෙන පරිග්ගණ්හාති: 'උද්ධංගමා වාතා අධොගමා වාතා කුච්ඡිසයා වාතා කොට්ඨසයා වාතා අඞ්ගමඞ්ගානුසාරිනො වාතා අස්සාසො පස්සාසො ඉති' ඉමෙහි ඡහි ආකාරෙහි වායොධාතුං විත්ථාරෙන පරිග්ගණ්හාති.

එවං ඉමෙහි ද්වාචත්තාරීසාය ආකාරෙහි විත්ථාරෙන ධාතුයො සභාවභාවතො[2] උපලක්ඛයන්තො තුලයන්තො පරියොගාහන්තො පරිවීමංසන්තො පච්චවෙක්ඛන්තො න කිඤ්චි ගය්හූපගං පස්සති කායං වා කායපදෙසං වා: යථා චන්දනිකං පවිචිනන්තො න කිඤ්චි ගය්හූපගං පස්සෙය්‍ය, යථා සඞ්කාරධානං[3] පවිචිනන්තො න කිඤ්චි ගය්හූපගං පස්සෙය්‍ය, යථා වච්චකුටිං පවිචිනන්තො න කිඤ්චි ගය්හූපගං පස්සෙය්‍ය, යථා සිවථිකං[4] පවිචිනන්තො න කිඤ්චි ගය්හූපගං පස්සෙය්‍ය, එවමෙවං ඉමෙහි ද්වාචත්තාරීසාය ආකාරෙහි එවං විත්ථාරෙන ධාතුයො සභාවභාවතො උපලක්ඛයන්තො තුලයන්තො පරියොගාහන්තො පරිවීමංසන්තො පච්චවෙක්ඛන්තො න කිඤ්චි ගය්හූපගං පස්සති කායං වා කායපදෙසං වා. තෙනාහ භගවා:

"යා චෙව ඛො පන අජ්ඣත්තිකා පඨවිධාතු යා ච බාහිරා පඨවිධාතු, පඨවිධාතුරෙවෙසා තං නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා පඨවිධාතුයා නිබ්බින්දති පඨවිධාතුයා චිත්තං විරාජෙති. යා චෙව ඛො පන අජ්ඣත්තිකා ආපොධාතු යා ච බාහිරා ආපොධාතු -පෙ- යා චෙව ඛො පන අජ්ඣත්තිකා තෙජොධාතු යා ච බාහිරා තෙජොධාතු -පෙ- යා චෙව ඛො පන අජ්ඣත්තිකා වායොධාතු යා ච බාහිරා වායොධාතු, වායොධාතුරෙවෙසා තං නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා වායොධාතුයා නිබ්බින්දති වායොධාතුයා චිත්තං විරාජෙති. අයං වෙමත්තතා.

'අවිජ්ජා'ති එකත්තතා. 'තත්ථ කතමා අවිජ්ජා: දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං. යං එවරූපං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසල්ලක්ඛණා

1. ජීරති - සීමු.
2. සභාවතො - සීමු, මජසං.
3. සඞ්කාරට්ඨානං - සීමු, මජසං.
4. සිවථිකං - මජසං

කවර සතර අයුරින් තේජොධාතුව විස්තර විසින් පරිග්‍රහණ කෙරෙයි යත් : යම් තෙජොධාතුවකින් තැවේ ද, යම් තෙජොධාතුවකින් ජරාවට පැමිණේ ද, යම් තේජො ධාතුවකින් පරිදහයට පැමිණේ ද, යම් තෙජොධාතුවකින් අසිත යැ පීත යැ ඛායිත යැ සායිත යැ යන මේ මනාකොට පරිණාමයට යේ ද, උක්තප්‍රකාර වූ මේ සතර ආකාරයෙන් තෙජොධාතුව විස්තර විසින් පරිග්‍රහණ කෙරෙයි.

කවර ෂඩාකාරයෙන් වායොධාතුව විස්තර විසින් පිරිගනී යැ යත් : උද්ගාරාදිය ඇති කරන ඌර්ධවඞ්ගම වාත යැ මල මූ ආදිය බැහැරකරන අධොගම වාත යැ අතුණින් පිටත්හි වූ වාත යැ අතුණු ඇතුළත්හි වූ වාත යැ ධමනිජාලානුසාරයෙන් සියලු සිරුරැ අඟපසඟ අනුවපැතිරෙනුවූ සම්මිඤ්ජන පසාරණාදිය උපදවන වාත යැ ආශ්වාස ප්‍රශ්වාස යැ යන මේ ෂඩාකාරයෙන් වායොධාතුව විස්තර විසින් පරිග්‍රහණ කෙරෙයි.

මෙසේ මේ දෙසාලිස් ආකාරයෙන් විස්තර වශයෙන් ධාතූන් ස්වභාව ලක්ෂණ විසින් උපධාරණය කරනුයේ තුලනය කරනුයේ පර්‍යවගාහන කරනුයේ හාත්පසින් විමසනුයේ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ කය හෝ කායප්‍රදෙශයක් හෝ ගතයුතු කිසිවක් නො දකී. යම්සේ ගම්දෙර ගවරවළක් විමසනුයේ ගතයුතු කිසිවක් නොදක්නේ ද, යම්සේ කසළගොඩක් විමසනුයේ ගතයුතු කිසිවක් නොදක්නේ ද, යම්සේ වැසිකිළියක් විමසනුයේ ගතයුතු කිසිවක් නො දක්නේ ද, යම්සේ අමුසොහොනක් විමසනුයේ ගතයුතු කිසිවක් නොදක්නේ ද, එපරිදි මැ මේ දෙසාලිස් ආකාරයෙන් මෙසේ විස්තර විසින් ධාතූන් ස්වභාවලක්ෂණ වශයෙන් උපධාරණය කරනුයේ තුලනය කරනුයේ විමසා බලනුයේ විමංසනය කරනුයේ ප්‍රත්‍යවෙක්ෂා කරනුයේ කය හෝ කායප්‍රදෙශයක් හෝ ගතයුතු නොදකී. එයින් වදළහ, බුදුහු :

" යම් ආධ්‍යාත්මික පෘථිවීධාතුවක් ඇද්ද යම් බාහිර පෘථිවීධාතුවකුත් ඇද්ද තෙල පෘථිවීධාතු මැ ය, ඒ පෘථිවීධාතුව ' තෙල මාගේ නොවෙයි, තෙලෙ මම් නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේ යැ ' යි මෙසේ මෙය යථාභූත කොට සම්‍යක්ප්‍රඥයෙන් දක්කයුතු යැ, මෙසේ තෙල පෘථිවීධාතුව සම්‍යක්ප්‍රඥයෙන් දැක පෘථිවීධාතුයෙහි උකටලී වෙයි, පෘථිවීධාතුයෙහි සිත නොඇලවයි. යම් ආධ්‍යාත්මික ආපොධාතුවක් ඇද්ද යම් බාහිර ආපොධාතුවකුත් ඇද්ද . . . යම් ආධ්‍යාත්මික තේජොධාතුවක් ඇද්ද යම් බාහිර තේජොධාතුවකුත් ඇද්ද . . . යම් ආධ්‍යාත්මික වායොධාතුවක් ඇද්ද යම් බාහිර වායො ධාතුවකුත් ඇද්ද තෙල වායොධාතු' මැ ය, එය' මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේ යැ ' යි මෙසේ මෙය යථාභූත කොට සම්‍යග්ඥනයෙන් දක්කයුතු යැ මෙසේ තෙල යථාභූතව සම්‍යග්ඥනයෙන් දැක වායොධාතුයෙහි උකටලී වෙයි, වායොධාතුයෙහි සිත නො ඇලවයි.'' මේ ධාතූන්ගේ වෙමත්තතා (විශෙෂතා) යි.

අවිජ්ජා යනු එකත්තතා යැ. එහි අවිජ්ජා කවර යැ : දුඃඛසත්‍යයෙහි නොදැනීම දුක්ඛසමුදයෙහි නොදැනීම දුක්ඛනිරොධයෙහි නොදැනීම දුක්ඛනිරොධගාමිනී පටිපදයෙහි නොදැනීම පූර්වාන්තයෙහි නොදැනීම අපරාන්තයෙහි නොදැනීම පූර්වාන්තාපරාන්තයෙහි නොදැනීම ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්හි නොදැනීම යි. මෙබඳුවූ යම් නොදැනීමෙක් අදර්ශනයෙක් අනභිසමයෙක් අනවබොධයෙක් අසම්බොධයෙක් අප්‍රති වෙධයෙක් (ධර්මස්වභාවය) නො සැලැකීමෙක් අනුපලක්ෂණයෙක් අප්‍රත්‍යුපලක්ෂණයෙක්

අනුපලක්ඛණා අපච්චුපලක්ඛණා අසමපෙක්ඛණං අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, අයං වෙවචනතා.

‘විජ්ජා’ති එකත්තතා, ‘තත්ථ කතමා විජ්ජා: දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං පුබ්බන්තෙ ඤාණං අපරන්තෙ ඤාණං පුබ්බන්තාපරන්තෙ ඤාණං ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු ඤාණං. යා එවරූපා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං.’ අයං වෙවචනතා.

‘සමාපත්ති’ති එකත්තතා. තත්ථ කතමා සමාපත්ති: සඤ්ඤාසමාපත්ති අසඤ්ඤාසමාපත්ති නෙවසඤ්ඤානාසඤ්ඤාසමාපත්ති විභූතසඤ්ඤාසමාපත්ති නිරොධසඤ්ඤාසමාපත්ති. අයං වෙවචනතා.

‘ඣායී’ති එකත්තතා. තත්ථ කතමො ඣායී: අත්ථි සෙඛො ඣායී, අත්ථි අසෙඛො ඣායී, අත්ථි නෙවසෙඛොනාසෙඛො ඣායී, ආජානීයො ඣායී, අස්සඛලුඞ්කො ඣායී, දිට්ඨුත්තරො ඣායී, තණ්හුත්තරො ඣායී, පඤ්ඤුත්තරො ඣායීති. අයං වෙවචනතා.

‘සමාධි’ති එකත්තතා. තත්ථ කතමො සමාධි: සරණො සමාධි, අරණො සමාධි, සවෙරො සමාධි, අවෙරො සමාධි, සබ්‍යාපජ්ජො සමාධි, අබ්‍යාපජ්ජො සමාධි, සප්පීතිකො සමාධි, නිප්පීතිකො සමාධි, සාමිසො සමාධි, නිරාමිසො සමාධි, සසඞ්ඛාරො සමාධි, අසඞ්ඛාරො සමාධි, එකංසභාවිතො සමාධි, උභයංසභාවිතො සමාධි, උභතොභාවිතභාවනො සමාධි, සවිතක්කසවිචාරො සමාධි, අවිතක්කවිචාරමත්තො සමාධි, අවිතක්කඅවිචාරො සමාධි, හානභාගියො සමාධි, ඨිතිභාගියො සමාධි විසෙසභාගියො සමාධි, නිබ්බෙධභාගියො සමාධි, ලොකියො සමාධි, ලොකුත්තරො සමාධි, මිච්ඡාසමාධි, සම්මාසමාධි, අයං වෙවචනතා.

සමව නොබැලීමෙක් ප්‍රත්‍යක්ෂ නොකිරීමෙක් (චිත්තසන්තානයාගේ) අපවිත්‍රතායෙක් බාලබවෙක් අසම්ප්‍රජන්‍යයෙක් මොහයෙක් ප්‍රමොහයෙක් සම්මොහයෙක් අවිද්‍යායෙක් අවිද්‍යාඕඝයෙක් අවිද්‍යායොගයෙක් අවිද්‍යාඅනුශයයෙක් අවිද්‍යාපර්යුත්ථානයෙක් අවිද්‍යා පරිඝයෙක් මොහඅකුශලමූලයෙක් ඇද්ද, එයයි. මේ අවිද්‍යාවගේ වෙමත්තතා යි.

'විජ්ජා' යනු ඒකත්තතා යැ. එහි විජ්ජා කවර යැ : දුඃඛසත්‍යයෙහි දැනීම දුක්ඛ සමුදයෙහි දැනීම දුක්ඛනිරොධයෙහි දැනීම දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදයෙහි දැනීම පූර්වාන්ත යෙහි දැනීම අපරාන්තයෙහි දැනීම පූර්වාන්තාපරාන්තයෙහි දැනීම ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍ය සමුත්පන්නධර්මයන්හි දැනීම යි. යම් මෙබඳුවූ ප්‍රඥවක් ප්‍රජානනාකාරයෙක් (අනිත්‍යාදිය) විමසීමෙක් වෙසෙසින් විමසීමෙක් (අනිත්‍යාදිධර්මයන්ගේ ලක්ෂණවශයෙන්) විමසීමෙක් සැලැකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පණ්ඩිතබවෙක් කෞශල්‍යයෙක් නිපුණබවෙක් (අනිත්‍යාදීන්ගේ) විභාවනයෙක් චින්තායෙක් උපපරීක්ෂාවෙක් භූරි (පෘථුල) ප්‍රඥවෙක් ධාරණප්‍රඥවෙක් පරිණායිකාවක් විදර්ශනාවක් සම්‍යග්ඥනයෙක් ප්‍රඥප්‍රතොදයෙක් ප්‍රඥයෙක් ප්‍රඥ ඉන්ද්‍රියයෙක් ප්‍රඥබලයෙක් ප්‍රඥශස්ත්‍රයෙක් ප්‍රඥ ප්‍රාසාදයෙක් ප්‍රඥ ආලොකයෙක් ප්‍රඥ අවභාසයෙක් ප්‍රඥප්‍රද්‍යොතයෙක් ප්‍රඥරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෙක් මාර්ගාඞ්ග වූ මාර්ගපර්‍යාපන්න වූ ධර්මයෙක් වේ ද එයයි. මේ විද්‍යාවගේ වෙමත්තතා යි.

'සමාපත්ති' යනු ඒකත්තතා යැ. එහි සමාපත්ති කවර යැ : (සංඥයෙන් යුත්) සංඥසමාපත්ති යැ (සංඥවිරාග භාවනාවශයෙන් පැවැති අසංඥභවොපප්‍රාප්තිය උපදවන) අසංඥසමාපත්ති යැ නෛවසංඥනාසංඥසමාපත්ති යැ (විඤ්ඤණඤ්චායතනසමාපත්ති සංඛ්‍යාත) විභූතසංඥසමාපත්ති යැ නිරොධසංඥසමාපත්ති යි. මේ වෙමත්තතා යි.

'ඣායී' යනු ඒකත්තතා යැ. එහි ඣායී (ධ්‍යාන කරනුයේ) කවරෙ යැ : ශෛක්ෂ වූ ධ්‍යාන කරන්නෙක් ඇත, අශෛක්ෂ වූ ධ්‍යානකරන්නෙක් ඇත, නේවසේඛනාසේඛ වූ (පුහුදුන්) ධ්‍යානකරන්නෙක් ඇත, ආජානෙය අශ්වයකු බඳු ව ධ්‍යාන කරන්නේ යැ අස්කුණ්ඩයකු බඳුව ධ්‍යාන කරන්නේ යැ දෘෂ්ටිගතිකව ධ්‍යානලාභී වූ ධ්‍යාන කරන්නේ යැ තෘෂ්ණාගතිකව ධ්‍යානකරනුයේ යැ ප්‍රඥධිකව ලක්ෂණොපනිධ්‍යානයෙන් ධ්‍යාන කරන්නේ යයි. මේ වෙමත්තතා යි.

'සමාධි' යනු ඒකත්තතා යැ. එහි සමාධි කවරෙ යැ : අකුශලචිත්තෛකාග්‍රතා සංඛ්‍යාත සරණසමාධි ය කුශලාව්‍යාකෘත වූ (ලොකොත්තර වූ හෝ) අරණසමාධි යැ ප්‍රතිසචිත්ත යෙහි එකාග්‍රතා සංඛ්‍යාත සවෛරසමාධි යැ මෙත්තාචෙතොවිමුක්ති සංඛ්‍යාත අවෛර සමාධි යැ සප්‍රතිඝ වූ සව්‍යාපජ්ඣසමාධි යැ අප්‍රතිඝ වූ අව්‍යාපජ්ඣ සමාධි යැ සප්‍රීතික සමාධි යැ නිෂ්ප්‍රීතිකසමාධි යැ ලෞකික වූ සාමිසසමාධි යැ ලොකොත්තර වූ නිරාමිස සමාධි යැ දන්ධාභිඥ වූ සසංඛාරසමාධි යැ ක්ෂිප්‍රාභිඥ වූ අසංඛාරසමාධි යැ ශුෂ්කවිදර්ශක යාගේ ඒකංසභාවිත සමාධි යැ ශමථයානිකයාගේ උභයංසභාවිත සමාධි යැ (කායසක්ඛි පුද්ගලයාගේ ද උභතොභාගවිමුක්තයාගේ ද) උභතොභාවිතභාවන සමාධි යැ සවිතර්ක සවිචාර සමාධි යැ අවිතර්කවිචාරමාත්‍ර වූ සමාධි යැ අවිතර්කඅවිචාර සමාධි යැ (අප්‍රගුණ වූ ප්‍රථමධ්‍යානාදි) හානභාගිය සමාධි යැ (තදනුධම්මතා සතිය පිහිටීම වශයෙන්) ඨිතිභාගිය සමාධි යැ විශෙෂාධිගමය පිණිස පවත්නා විශේෂභාගිය සමාධි යැ නිර්වෙධභාගිය සමාධි යැ ලෞකික සමාධි යැ ලෝකෝත්තර සමාධි යැ මිථ්‍යාසමාධි යැ සම්‍යක්සමාධි යැ යන මේ සමාධි නම් වේ. මේ සමාධීහුගේ වෙමත්තතා යි.

10—ඕපී 04440 (79/08)

‘පටිපදා’ති එකත්තතා. ‘තත්ථ කතමා පටිපදා: ආගාළ්හා පටිපදා, නිජ්ඣාමා පටිපදා, මජ්ඣිමා පටිපදා, අක්ඛමා පටිපදා, ඛමා පටිපදා, සමා පටිපදා, දමා පටිපදා, දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා’ති. අයං වෙමත්තතා.

‘කායො’ති එකත්තතා. තත්ථ කතමො කායො: නාමකායො රූපකායො ච. තත්ථ කතමො රූපකායො: කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨී අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං මත්ථලුඞ්ගන්ති. අයං රූපකායො. නාමකායො නාම වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං ඵස්සො මනසිකාරොති අයං නාමකායොති. අයං වෙමත්තතා.

එවං යො ධම්මො, යස්ස ධම්මස්ස සමානභාවො, සො ධම්මො තස්ස ධම්මස්ස එකත්තතාය එකීභවති, යෙන යෙන වා පන විලක්ඛණො තෙන තෙන වෙමත්තතං ගච්ඡති, එවං සුත්තෙ වා වෙය්‍යාකරණෙ වා ගාථායං වා පුච්ඡිතෙන වීමංසිතබ්බං, කිං එකත්තතාය පුච්ඡති උදාහු වෙමත්තතායාති. යදි එකත්තතාය පුච්ඡිතං, එකත්තතාය විස්සජ්ජයිතබ්බං. යදි වෙමත්තතාය පුච්ඡිතං, වෙමත්තතාය විස්සජ්ජයිතබ්බං. යදි සත්තාධිට්ඨානෙන පුච්ඡිතං, සත්තාධිට්ඨානෙන විස්සජ්ජයිතබ්බං. යදි ධම්මාධිට්ඨානෙන පුච්ඡිතං, ධම්මාධිට්ඨානෙන විස්සජ්ජයිතබ්බං. යථා යථා වා පන පුච්ඡිතං. තථා තථා විස්සජ්ජයිතබ්බං. තෙනාහ ආයස්මා මහාකච්චානො ‘‘එකත්තතාය ධම්මා’ති.

නියුත්තො අධිට්ඨානො හාරො

## 3, I, 15

## පරික්ඛාරහාරවිභඞ්ගො

තත්ථ කතමො පරික්ඛාරො හාරො: ‘‘යෙ ධම්මා යං ධම්මං ජනයන්ති’’ති. යො ධම්මො යං ධම්මං ජනයති, තස්ස සො පරික්ඛාරො. කිංලක්ඛණො පරික්ඛාරො: ජනකලක්ඛණො පරික්ඛාරො. ද්වෙ ධම්මා ජනයන්ති: හෙතු ච පච්චයො ච. තත්ථ කිංලක්ඛණො හෙතු, කිංලක්ඛණො පච්චයො: අසාධාරණලක්ඛණො හෙතු, සාධාරණලක්ඛණො පච්චයො. යථා කිං භවෙ: යථා අංකුරස්ස නිප්ඵත්තියා බීජං අසාධාරණං, පඨවී

'පටිපද' යනු ඒකත්තතා යැ. එහි පටිපද කවර යැ : කාමසුඛානුයොග සංඛ්‍යාත ආගාළ්හපටිපද යැ අත්තකිලමථානුයොග සංඛ්‍යාත නිජ්ඣාමපටිපද යැ මධ්‍යමප්‍රතිපද යැ ප්‍රධන්භූමියෙහි ශීතාදිය නො ඉවසන අක්ඛමපටිපද යැ ශීතාදිය ඉවසන ඛමපටිපද යැ උපන් කාමාදි විතර්කයන් සන්හිඳුවන සමපටිපද යැ මනස සවැනි කොට ඇති ඉන්ද්‍රියයන් දමනය කරන දමපටිපද යැ දන්ධාභිඤ්ඤ වූ දුක්ඛපටිපද යැ ඛිප්පාභිඤ්ඤ වූ දුක්ඛපටිපද යැ දන්ධාභිඤ්ඤ වූ සුඛපටිපද යැ ඛිප්පාභිඤ්ඤ වූ සුඛපටිපද යි. මේ පටිපදයෙහි වෙමත්තතා යි.

'කාය' යනු ඵකත්තතා යැ. එහි කාය කවරෙ යැ : නාමකාය ද රූපකාය ද වෙයි. එහි රූපකාය කවරෙ යැ : කෙස් ලොම් නිය දත් සම් මස් නහර ඇට ඇටමිදුලු වකුගඩු හදවත අක්මා දලබු බඩදිව පපුමස අතුණු අතුණුබහන් නොපැසුණු අහර පැසුණු අහර පිත් සෙම් සැරව ලේ සෝදිය මේදස් කඳුළු වුරුණුතෙල් කෙළ සොටු සඳමිදුලු මූ හිස්මුල් යන මේ යැ. මේ රූපකාය යි. නාමකාය නම් ; වේදනා සඤ්ඤ චෙතනා චිත්ත ඵස්ස මනසිකාර යන මේ නාමකාය යි. මේ වෙමත්තතා යි.

මෙසේ ජාති ආදි යම් ධර්මයෙක් එයින් අන්‍ය වූ ජරා ආදි අන් ධර්මයකට දුක්ඛාදි භාවයෙන් සමානබව ඇද්ද, ඒ ජාත්‍යාදි ධර්මය ඒ ජරාදි ධර්මයට (දුක්ඛාදි) සමානස්වභාව යෙන් (සමානශබ්දභිධෙයත්වයෙන්) ඵකත්වයට පැමිණෙයි. (මේ ඵකත්ව ලක්ෂණ යැ.) යළි යම් යම් ස්වභාවයෙකින් (යම් ධර්මයෙක් යම් ධර්මයකට) විසදෘශ ලක්ෂණ ඇද්ද ඒ ඒ ස්වභාවයෙන් (ඒ ධර්මය ඒ ධර්මයට) වෙමත්තතාවට–විසදෘශබවට පැමිණෙයි. (මේ වෙමත්තතායෙහි ලක්ෂණ යැ.) මෙසේ සූත්‍රයෙහි හෝ වෙය්‍යාකරණයෙහි හෝ ගාථා යෙහි හෝ පුළුවුස්නාලද්දහු විසින් කිම ඵකත්තතායෙන් විචාරා ද නොහොත් වෙමත්තතා යෙන් විචාරා දැයි විමසියැයුතු ය. ඉදින් ඵකත්තතායෙන් පුළුවුස්නාලද නම් ඵකත්තතා යෙන් විසදියැයුතු ය. ඉදින් වෙමත්තතායෙන් පුළුවුස්නාලද නම්, වෙමත්තතායෙන් විසදියැයුතු ය. ඉදින් සත්ත්වප්‍රඥප්තිමුඛයෙන් පුළුවුස්නාලද නම්, සත්වප්‍රඥප්ති වශයෙන් විසදියැයුතු ය. ඉදින් ධර්මවශයෙන් පුළුවුස්නාලද නම්, ධර්මවශයෙන් විසදියැයුතු ය. යළි යම් යම් පරිද්දෙකින් පුළුවුස්නාලද නම් ඒ ඒ පරිද්දෙන් විසදියැ යුත්තේ යි. එයින් වදළහ, ආයුෂ්මත් මහාකාත්‍යායන මහරහතුන් වහන්සේ : " ඵකත්තතාය ධම්මා " යනාදිය.

අධිට්ඨානහාරය යොදනාලද්දේ යි.

## 3, 1, 15

## පරික්ඛාරහාරවිභඞ්ගය

එහි පරික්ඛාරහාරය කවරෙ යැ : " යෙ ධම්මා යං ධම්මං ජනයන්ති " යනාදි නිද්දෙසගාථා යැ. යම් හෙතු ප්‍රත්‍යය ධර්මයෙක් යම් ඵලධර්මයක්හු උපදවා ද, ඒ ඵල ධර්මයට ඒ හෙතුප්‍රත්‍යයධර්මය පරිෂ්කාර යි. පරික්ඛාරය කුමක් ලක්ෂණ කොට ඇත්තේ යැ යත් : පරික්ඛාරය ජනක ලක්ෂණ යැ. ධර්මයෝ දෙදෙනෙක් (ඵලය) උපදවති, හෙතු ද ප්‍රත්‍යය ද යන දෙක යි. ඒ දෙදෙනා අතුරෙහි හේතුව කුමක් ලක්ෂණ කොට ඇත්තේ ද, ප්‍රත්‍යය කුමක් ලක්ෂණ කොට ඇත්තේ ද යත් : හේතුව අසාධාරණ ලක්ෂණ යැ, ප්‍රත්‍යය සාධාරණලක්ෂණ යි. ඒ කුමක් මෙන් වේ ද යත් : ඒ මෙසේ යැ, අඞ්කුරයාගේ නිෂ්පත්තියට (හටගැනීමට) බීජය අසාධාරණ කාරණ යැ, පඨවිය ද ආපය ද

ආපො ච සාධාරණා. අඞ්කුරස්ස හි පථවී ආපො ච පච්චයො, සභාවො හෙතු, යථා වා පන ඝටෙ දුද්ධං පක්ඛිත්තං දධි භවති, න චත්ථි එකකාලසමවධානං දුද්ධස්ස ච දධිස්ස ච, එවමෙව නත්ථි එකකාලසමවධානං හෙතුස්ස ච පච්චයස්ස ච.

අයං හි සංසාරෙ සහෙතුසප්පච්චයො නිබ්බත්තො. වුත්තං හි : "අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං". එවං සබ්බො පටිච්චසමුප්පාදො. ඉති අවිජ්ජා අවිජ්ජාහෙතු, අයොනිසො මනසිකාරො පච්චයො. පුරිමිකා අවිජ්ජා පච්ඡිමිකාය අවිජ්ජාය හෙතු. තත්ථ පුරිමිකා අවිජ්ජා අවිජ්ජානුසයො, පච්ඡිමිකා අවිජ්ජා අවිජ්ජාපරියුට්ඨානං. පුරිමිකො අවිජ්ජානුසයො පච්ඡිමිකස්ස අවිජ්ජාපරියුට්ඨානස්ස හෙතුභූතො පරිබ්‍රූහනාය බීජඞ්කුරො විය සමනන්තරහෙතුතාය. යං පන යත්ථ ඵලං නිබ්බත්තති, ඉදං තස්ස පරම්පරහෙතුතාය හෙතුභූතං. දුවිධො හි හෙතු : සමනන්තරහෙතු පරම්පරහෙතු ච. එවං අවිජ්ජායපි දුවිධො හෙතු : සමනන්තරහෙතු පරම්පරහෙතු ච.

යථා වා පන ථාලකඤ්ච වට්ටි ච තෙලඤ්ච පදීපස්ස[1] පච්චයභූතං, න සභාවහෙතු, න හි සක්කා ථාලකං ච වට්ටිං ච තෙලඤ්ච අනග්ගිකං දීපෙතුං, පදීපස්ස පච්චයභූතං. පදීපො විය සභාවො හෙතු හොති. ඉති සභාවො හෙතු, පරභාවො පච්චයො, අජ්ඣත්තිකො හෙතු, බාහිරො පච්චයො. ජනකො හෙතු, පරිග්ගාහකො පච්චයො, අසාධාරණො හෙතු, සාධාරණො පච්චයො.

අවුපච්ඡෙදත්ථො සන්තතිඅත්ථො, නිබ්බත්තිඅත්ථො ඵලත්ථො, පටිසන්ධිඅත්ථො පුනබ්භවත්ථො, සම්පලිබොධත්ථො පරියුට්ඨානත්ථො, අසමුග්ඝාතත්ථො අනුසයත්ථො, අසම්පටිවෙධත්ථො අවිජ්ජත්ථො, අපරිඤ්ඤාතත්ථො[2] විඤ්ඤාණස්ස බීජත්ථො. යත්ථ අවුපච්ඡෙදො තත්ථ සන්තති, යත්ථ සන්තති තත්ථ නිබ්බත්ති, යත්ථ නිබ්බත්ති තත්ථ ඵලං, යත්ථ ඵලං තත්ථ පටිසන්ධි, යත්ථ පටිසන්ධි තත්ථ පුනබ්භවො, යත්ථ පුනබ්භවො තත්ථ පලිබොධො, යත්ථ පලිබොධො තත්ථ පරියුට්ඨානං, යත්ථ

1. දීපස්ස - සීමු.
2. පරිඤ්ඤාතත්ථො - සීමු.

සාධාරණ කාරණ වෙත්. එසේ මැය අඞ්කුරයට පඨවිය ද ආපය ද ප්‍රත්‍යය යැ, (සමාන ඵල නිපදවන හෙයින්) සමානභාව වූ බීජය හෙතු යි. තවද යම්සේ කළයෙහි කිරි බහාලන ලදුයේ දිහි වෙයි, දුග්ධ (කිරි) යාගේ ද දධියගේ ද සමකල්ව එක්වීමෙක් නො ද ඇති. (කාලාන්තරයෙහි කිරි දිහිබවට පැමිණෙයි, ප්‍රත්‍යයාන්තරසමායොගය එයිනි.) එපරිදි මැ හෙතුහුගේත් ප්‍රත්‍යයාගේත් සමකල්ව එක්ව සිටීමෙක් නැති. (හෙතු ඵලයන්ගේ මෙන් ම එකකාලසමවධානයෙක් හෙතු ප්‍රත්‍යයන්ගේ ද නැත. ප්‍රත්‍යය ඵලය හා එකාන්ත යෙන් භින්නකාල නො වේ. මෙසේ හෙතුප්‍රත්‍යයන්ගේ ද විශෙෂය වේ.)

මේ සංසාරය වනාහි සහෙතුසප්‍රත්‍යය වැ උපන්නේ යැ, වදරනලද මැ ය : '' අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති, සංස්කාරප්‍රත්‍යයෙන් විඥනය වෙයි.'' මෙසේ සියලු පටිච්චසමුප්පාදය වේ. මෙපරිද්දෙන් අවිද්‍යාව අවිද්‍යාවට හෙතු යි, අයොනිසොමනසිකාරය ප්‍රත්‍යය වේ. පූර්වයෙහි වූ අවිද්‍යාව පශ්චිම වූ අවිද්‍යාවට හෙතු වෙයි. එහි පූර්ව වූ අවිද්‍යාව (අප්‍රහීණව පුනපුනා උපදනා හෙයින්) අවිද්‍යානුශය ය, පසුව උපන් අවිද්‍යාව (කුශලචිත්තය පැහැරගන්නා හෙයින්) අවිද්‍යාපර්යුත්ථාන යි. පූර්ව වූ අවිද්‍යානුශය පශ්චිම වූ අවිජ්ජාපරියුට්ඨානයාගේ වැඩීමට හෙතුවූයේ බීජයට අඞ්කුරය මෙන් සමනන්තරහෙතුභාවයෙනි. (බීජය අඞ්කුරයට සමනන්තර හෙතුයෙන් හෙතු වෙයි, අඞ්කුරයෙන් හටගත් ඵලයාගේ බීජයට ද පළමු බීජය පරම්පරහෙතුයෙන් හෙතු වෙයි. මෙසේ අවිද්‍යාවගේ හෙතුභාවය ද දතයුතු යැ) යළි යම් තැනකැ යම් ඵලයක් උපදී ද, මේ බීජය ඒ ඵලයට පරම්පරහෙතුභාවයෙන් හෙතු වූයේ යි. ඒ එසේ මැ යැ. හෙතුව ද්විවිධ වෙයි : සමනන්තරහෙතු ද පරම්පරහෙතු ද කියා යි. මෙපරිද්දෙන් අවිද්‍යාවගේ ද හෙතුව දෙවැදෑරුම් වෙයි : සමනන්තරහෙතු ද පරම්පරහෙතු ද කියා යි.

තවද යම්සේ ප්‍රදීපයට ප්‍රත්‍යය වූ පහන්කබල ද වැටිය ද තෙල් ද සමාන කාරණ වූ හෙතු නො වේ ද, යම්හෙයෙකින් පහනට ප්‍රත්‍යය වූ පහන්කබල ද වැටිය ද තෙල් ද ගිනි නැතිව දල්වන්නට නො හැකි වේ ද එහෙයිනි. ප්‍රදීපය මෙන් සමානභාව හේතුව වෙයි. මෙසේ (පහන දැල්වීමට ගින්න මෙන්) සමානභාවය හෙතු යැ. (පහන්කබල වැටිය තෙල් මෙන් අසමාන වූ) අන්‍යභාවය ප්‍රත්‍යය යැ, නියතඅධ්‍යාත්මයෙහි වූයේ හෙතු යැ, බාහිර වූයේ ප්‍රත්‍යය යැ, ජනක වූයේ හෙතු යැ, පරිග්‍රාහක (උපස්තම්භක) වූයේ ප්‍රත්‍යය යැ අසාධාරණ (ආවෙණික) වූයේ හෙතු යැ, සාධාරණ (අන්‍ය ප්‍රත්‍යයොත්පන්නයනට ද සමාන) වූයේ ප්‍රත්‍යය යි.

අනුපච්ඡින්න වූ (නොසිඳුණු) හේතුප්‍රත්‍යය සංඛ්‍යාත කාරණයාගේ හා ඵලයාගේ අවුපච්ඡෙදර්ථය කාරණඵලසම්බන්ධ හෙයින් සන්තති අර්ථ යැ, (කාරණඵලභාවයෙන් සම්බන්ධ බව සන්තති නම, කාරණඵලයන්ගේ නො සිඳී පැවැත්ම අවුපච්ඡෙද නම, යම් ඵලයෙක් අන්‍යත්ඵලයකට කාරණ නොවී නිරුද්ධ වේ නම් එය උපච්ඡින්න නම් වෙයි රහත්හුගේ චුතිචිත්තය මෙනි. යම් ඵලයෙක් තමහට අනුරූප වූ ඵලයකට හේතු වී නිරුද්ධ වේ නම්, එය අනුපච්ඡින්න වූයේ මැ වෙයි, හේතුඵල සම්බන්ධය විද්‍යමාන හෙයිනි.) කාරණයෙන් උපන් ඵලයාගේ නිර්වෘතිඅර්ථය ඵලාර්ථ යැ, අනන්තරභව පටිසන්ධාන වශයෙන් පවත්නා ප්‍රතිසන්ධිඅර්ථය පුනර්භවාර්ථ යැ, සම්‍යක්ප්‍රතිපදව බාධාකරන සම්පළිබොධාර්ථය පරියුත්ථානාර්ථ යැ, ආර්‍යමාර්ගයෙන් කෙලෙසුන් මුලුසුන් නොකළ අර්ථය අනුශයාර්ථ යැ, චතුස්සත්‍යයාගේ අසම්ප්‍රතිවෙධාර්ථය අවිද්‍යාර්ථ යැ, අපරිඥතාර්ථය ප්‍රතිසන්ධි විඥනයාගේ නාමරූපාඞ්කුරයට කාරණහෙයින් බීජාර්ථ යි. යම් රූපාරූපප්‍රවෘත්ති යෙක්හි හේතුඵලයන්ගේ අනුපච්ඡෙදය වේ ද එහි සන්තතිව්‍යවහාරය වෙයි, යම් තැනෙක සන්තතිය ඇද්ද එහි නිර්වෘතිය වෙයි, යම් තැනෙක නිර්වෘතිය ඇද්ද එහි ඵලය වෙයි, යම් තැනෙක ඵලය ඇද්ද එහි ප්‍රතිසන්ධිය වෙයි, යම් තැනෙක ප්‍රතිසන්ධිය වේ ද එහි පුනර්භවය වෙයි, යම් තැනෙක පුනර්භවය ඇද්ද එහි පළිබොධය (කුසල්සිතට බාධාකිරීම) වෙයි, යම් තැනෙක පළිබොධය වේ ද, එහි

පරියුට්ඨානං තත්ථ අසමුග්ඝාතො, යො අසමුග්ඝාතො තත්ථ අනුසයො, යො අනුසයො තත්ථ අසම්පටිවෙධො, යො අසම්පටිවෙධො තත්ථ අවිජ්ජා, යා අවිජ්ජා තත්ථ සාසවං විඤ්ඤාණං අපරිඤ්ඤාතං, යං සාසවං විඤ්ඤාණං අපරිඤ්ඤාතං තත්ථ බීජත්තො.

සීලක්ඛන්ධො සමාධික්ඛන්ධස්ස පච්චයො, සමාධික්ඛන්ධො පඤ්ඤාක්ඛන්ධස්ස පච්චයො, පඤ්ඤාක්ඛන්ධො විමුත්තික්ඛන්ධස්ස පච්චයො, විමුත්තික්ඛන්ධො විමුත්තිඤාණදස්සනක්ඛන්ධස්ස පච්චයො. තිත්ථඤ්ඤුතා පීතඤ්ඤුතාය[1] පච්චයො, පීතඤ්ඤුතා පත්තඤ්ඤුතාය පච්චයො, පත්තඤ්ඤුතා[1] අත්තඤ්ඤුතාය පච්චයො.

යථා වා පන චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තත්ථ චක්ඛු ආධිපතෙය්‍යපච්චයතාය පච්චයො, රූපා ආරම්මණපච්චයතාය පච්චයො, ආලොකො සන්නිස්සයතාය පච්චයො, මනසිකාරො සභාවො හෙතු. සඞ්ඛාරා විඤ්ඤාණස්ස පච්චයො, සභාවො හෙතු. විඤ්ඤාණං නාමරූපස්ස පච්චයො, සභාවො හෙතු. නාමරූපං සළායතනස්ස පච්චයො, සභාවො හෙතු. සළායතනං ඵස්සස්ස පච්චයො, සභාවො හෙතු. ඵස්සො වෙදනාය පච්චයො, සභාවො හෙතු. වෙදනා තණ්හාය පච්චයො, සභාවො හෙතු. තණ්හා උපාදානස්ස පච්චයො, සභාවො හෙතු. උපාදානං භවස්ස පච්චයො, සභාවො හෙතු. භවො ජාතියා පච්චයො, සභාවො හෙතු. ජාති ජරාමරණස්ස පච්චයො, සභාවො හෙතු. ජරාමරණං සොකස්ස පච්චයො, සභාවො හෙතු. සොකො පරිදෙවස්ස පච්චයො, සභාවො හෙතු. පරිදෙවො දුක්ඛස්ස පච්චයො, සභාවො හෙතු. දුක්ඛං දොමනස්සස්ස පච්චයො, සභාවො හෙතු. දොමනස්සං උපායාසස්ස පච්චයො, සභාවො හෙතු. එවං යො කොචි උපනිස්සයො, සබ්බො සො පරික්ඛාරො. තෙනාහ ආයස්මා මහාකච්චායනො: "යෙ ධම්මා යං ධම්මං ජනයන්තී"ති.

නියුත්තො පරික්ඛාරො හාරො

## 3, 1, 16

### සමාරොපණහාරවිභඞ්ගො

තත්ථ කතමො සමාරොපණො හාරො: "යෙ ධම්මා යම්මූලා යෙ චෙකත්ථා පකාසිතා මුනිනා"ති. එකස්මිං පදට්ඨානෙ යත්තකානි

1. මත්තඤ්ඤුතා සීමු.

ක්ලේශයන්ගේ පර්යුත්ථානය වෙයි, යම් තැනෙක පර්යුත්ථානය ඇද්ද එහි ක්ලේශයන්ගේ අසමුද්ඝාතය වෙයි, යම් තැනෙක අසමුද්ඝාතය වේ ද එහි අනුශය වෙයි, යම් තැනෙක අනුශය ඇද්ද එහි සත්‍යයන්ගේ අසම්ප්‍රතිවේධය වෙයි, යම් තැනෙක අසම්ප්‍රතිවේධය ඇද්ද එහි අවිද්‍යාව වෙයි, යම් තැනෙක අවිද්‍යාව වේ ද එහි අපරිඥාත වූ සාස්‍රව විඥානය වෙයි, යම් තැනෙක අපරිඥාත වූ ආස්‍රවසහිත විඥානය වේ ද එහි ප්‍රතිසන්ධිවිඥානයාගේ විජාර්ථය වේ.

ශීලස්කන්ධය සමාධිස්කන්ධයට ප්‍රත්‍යය වෙයි, සමාධිස්කන්ධය ප්‍රඥාස්කන්ධයට ප්‍රත්‍යය වෙයි, ප්‍රඥාස්කන්ධය ඵලසමාධි සංඛ්‍යාත විමුක්තිස්කන්ධයට ප්‍රත්‍යය වෙයි, විමුක්තිස්කන්ධය ප්‍රත්‍යවෙක්ෂාඥාන සංඛ්‍යාත විමුක්තිඥානදර්ශනස්කන්ධයට ප්‍රත්‍යය වේ. තීර්ථ සංඛ්‍යාත බහුශ්‍රුතයන් ඇසිරිකරනබව ධර්මොපසංහිත ප්‍රීතියට ප්‍රත්‍යය වෙයි, පීතඤ්ඤුතාව පත්තඤ්ඤුතා සංඛ්‍යාත භාවනායෙන් විශේෂප්‍රාප්තිය දැනීමට ප්‍රත්‍යය වෙයි, පත්තඤ්ඤුතාව අත්තඤ්ඤුතා සංඛ්‍යාත පඤ්ච පධානියඞ්ගයෙන් සමන්විත වූ ආත්ම ස්වභාව දැනීමට ප්‍රත්‍යය වේ.

තවද යම්පරිදි චක්ෂුරින්ද්‍රියය ද රූපාලම්බනයන් ද නිසා චක්ෂුර්විඥානය උපදී ද, එහි චක්ෂුරින්ද්‍රිය අධිපතිභාව (ඉන්ද්‍රිය) ප්‍රත්‍යයභාවයෙන් (චක්ෂුර්විඥානයට) ප්‍රත්‍යය වෙයි, රූපාලම්බනයෝ ආරම්මණප්‍රත්‍යයභාවයෙන් ප්‍රත්‍යය වෙයි, ආලෝකය උපනිශ්‍රය ප්‍රත්‍යයභාවයෙන් ප්‍රත්‍යය වෙයි, මනසිකාර සංඛ්‍යාත ක්‍රියාමනොධාතුව (චක්ෂුර්විඥානය හා සමානබැවින්) සභාව හේතු යි. කුශලාදි අභිසංස්කාරයෝ ප්‍රතිසන්ධිවිඥානයට ප්‍රත්‍යය වෙයි, (නාමස්කන්ධභාවයෙන් සමාන හෙයින්) සභාව හේතු යි. ප්‍රතිසන්ධිවිඥානය නාමරූපයට ප්‍රත්‍යය වෙයි, සමානභාවය හේතු යැ. නාමරූපය සළායතනයට ප්‍රත්‍යය වෙයි, සභාව හේතු යැ, සළායතනය ඵස්සයට ප්‍රත්‍යය වෙයි, සභාව හේතු යැ. ඵස්සය වේදනාවට ප්‍රත්‍යය වෙයි, සභාව හේතු යැ. වේදනාව තණ්හාවට ප්‍රත්‍යය වෙයි, සභාව හෙතු යැ. තණ්හාව උපාදානයට ප්‍රත්‍යය වෙයි, සභාව හේතු යැ. උපාදානය භවයට ප්‍රත්‍යය වෙයි, සභාව හේතු යැ. භවය ජාතියට ප්‍රත්‍යය වෙයි, සභාව හේතු යැ. ජාතිය ජරාමරණයට ප්‍රත්‍යය වෙයි, සභාව හේතු යැ. ජරාමරණය සෝකයට ප්‍රත්‍යය වෙයි, සභාව හේතු යැ. සෝකය පරිදේවයට ප්‍රත්‍යය වෙයි, සභාව හේතු යැ. පරිදේවය දුක්ඛයට ප්‍රත්‍යය වෙයි, සභාව හේතු යැ. දුක්ඛය දෙමනස්සයට ප්‍රත්‍යය වෙයි, සභාව හේතු යැ. දෙමනස්සය උපායාසයට ප්‍රත්‍යය වෙයි, සභාව හේතු යි. මෙසේ යම් කිසි උපනිශ්‍රයප්‍රත්‍යයෙක් ඇද්ද එ හැම (ස්වකීය ඵලය පරිෂ්කරණ – අභිසංස්කරණ කරන හෙයින්) ' පරික්ඛාර ' නම් වේ. එයින් වදළහ, ආයුෂ්මත් මහාකාත්‍යායන මහරහතුන් වහන්සේ : '' යෙ ධම්මා යං ධම්මං ජනයන්ති '' යනාදිය.

**පරික්ඛාරහාරය යොදනලද්දේ යි.**

## 3, 1, 16

## සමාරොපණහාරවිභඞ්ගය

ඒ සොළොස් හාරයන් කෙරෙහි සමාරොපනහාරය කවරෙ යැ : '' යෙ ධම්මා යම්මූලා යෙ චෙකත්ථා පකාසිතා මුනිනා '' යනාදි නිද්දෙසගාථා යැ. පදට්ඨාන වූ (කාරණභූත) එකධර්මයක් සූත්‍රයෙන් ගත්කල්හි යම් පමණ අන්‍යධර්මයන්ගේ

පදට්ඨානානි ඔතරන්ති, සබ්බානි තානි සමාරොපයිතබ්බානි. යථා ආවට්ටෙ හාරෙ බහුකානි පදට්ඨානානි ඔතරන්ති. තත්ථ සමාරොපණා චතුබ්බිධා: පදට්ඨානං වෙවචනං භාවනා පහානමිති.

තත්ථ කතමා පදට්ඨානෙන සමාරොපණා:

1. "සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපනං එතං බුද්ධාන සාසන"න්ති.

තස්ස කිං පදට්ඨානං: තීණි සුචරිතානි කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං. ඉදං පදට්ඨානං. තත්ථ යං කායිකං වාචසිකං ච සුචරිතං, අයං සීලක්ඛන්ධො. මනොසුචරිතෙ යා අනභිජ්ඣා අබ්‍යාපාදො ච, අයං සමාධික්ඛන්ධො. යා සම්මාදිට්ඨි, අයං පඤ්ඤාක්ඛන්ධො ඉදං පදට්ඨානං. තත්ථ සීලක්ඛන්ධො සමාධික්ඛන්ධො ච සමථො, පඤ්ඤාක්ඛන්ධො විපස්සනා. ඉදං පදට්ඨානං. තත්ථ සමථස්ස ඵලං රාගවිරාගා චෙතොවිමුත්ති. විපස්සනාය ඵලං අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති. ඉදං පදට්ඨානං.

වනං වනථස්ස පදට්ඨානං. කිඤ්ච වනං, කො ච වනථො: වනං නාම පඤ්ච කාමගුණා, තණ්හා වනථො. ඉදං පදට්ඨානං. වනං නාම නිමිත්තග්ගාහො ඉත්ථීති වා පුරිසොති වා, වනථො නාම තෙසං තෙසං අඞ්ගපච්චඞ්ගානං අනුබ්‍යඤ්ජනග්ගාහො: අහො චක්ඛු අහො සොතං අහො ඝානං අහො ජිව්හා අහො කායො ඉති, ඉදං පදට්ඨානං. වනං නාම ච අජ්ඣත්තිකබාහිරානි ආයතනානි අපරිඤ්ඤාතානි. යං තදුභයං පටිච්ච උප්පජ්ජති සංයොජනං, අයං වනථො. ඉදං පදට්ඨානං. වනං නාම අනුසයො, වනථො නාම පරියුට්ඨානං. ඉදං පදට්ඨානං. තෙනාහ භගවා: "ඡෙත්වා වනං ච වනථං චා"ති. අයං පදට්ඨානෙන සමාරොපනා.

තත්ථ කතමා වෙවචනෙන සමාරොපණා: රාගවිරාගා චෙතොවිමුත්ති සෙක්ඛඵලං, අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති අසෙක්ඛඵලං ඉදං වෙවචනං. රාගවිරාගා චෙතොවිමුත්ති අනාගාමිඵලං, අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති අග්ගඵලං අරහත්තං. ඉදං වෙවචනං. රාගවිරාගා චෙතොවිමුත්ති කාමධාතුසමතික්කමනං, අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති තෙධාතුකසමතික්කමනං, ඉදං වෙවචනං. පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං අධිපඤ්ඤාසික්ඛා පඤ්ඤාක්ඛන්ධො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඤාණං සම්මාදිට්ඨි තීරණා සන්තීරණා හිරි විපස්සනා ධම්මෙ ඤාණං. සබ්බං ඉදං වෙවචනං. අයං වෙවචනෙන සමාරොපණා.

පදට්ඨානයෝ ඒ ධර්මයෙහි බැසගෙන සිටිත් ද, ඒ සියලු ධර්මයෝ (නිර්ධාරණවශයෙන්) එළවා දේශනායෙහි ආරොපණ කළයුත්තාහුය. (දෙශනාරූඪධර්මයන් මෙන් සලකා කියැයුත්තාහුය.) යම්සේ ආවර්තහාරයෙහි බොහෝ පදට්ඨානධර්මයෝ බැසගනිත් ද එමෙනි. එහි සමාරොපනය චතුර්විධ යැ : පදට්ඨාන යැ වෙවචන යැ භාවනා යැ පහාන යැ' යි. (මෙහි පදට්ඨාන වෙවචනයෝ කුමක් හෙයින් ගන්නා ලද්දහු ද පදට්ඨාන වෙවචනහාර දෙකෙහි එය විභාග කරනලද නො වේ ද යත් : මෙහි භාවනා ප්‍රහාණ දෙදෙනාගේ අධිට්ඨාන විෂය දක්වීම පිණිස ද ඔවුන්ගේ අධිවචනවිභාග දක්වීම පිණිස ද ගන්නාලදැයි දතයුතු.)

එහි පදට්ඨාන වශයෙන් සමාරොපණා කවර යත් :

1. 'කායදුශ්චරිතාදි සියලු අකුශලය නො කිරීම යැ චාතුර්භූමක කුශලයාගේ ප්‍රතිලාභය යැ රහත්මගින් ස්වකීය චිත්තයාගේ ව්‍යවදාන (පිරිසුදුකිරීම) යැ යන මෙල බුදුවරයන්ගේ ශාසන යැ — අවවාද යැ' යි.

ඒ බුද්ධශාසනයට කුමක් පදට්ඨාන වෙයි යත් : කායසුචරිත යැ වචීසුචරිත යැ මනොසුචරිත යැ යන තුන් සුචරිතයෝ යැ, මේ පදට්ඨාන යි. එහි කායික වූ ද වාචසික වූ ද යම් සුචරිතයෙක් ඇද්ද මේ ශීලස්කන්ධ යැ. මනොසුචරිතයෙහි අනභිධ්‍යාව ද අව්‍යාපාදය ද යන මේ සමාධිස්කන්ධ යැ. යම් සම්‍යග්දෘෂ්ටියක් ඇද්ද මේ ප්‍රඥාස්කන්ධ යැ. මේ ශාසනයට පදට්ඨාන යි. එහි ශීලස්කන්ධය ද සමාධිස්කන්ධය ද සමථ යැ, ප්‍රඥාස්කන්ධය විදර්ශනා යැ, මේ (සමථවිපස්සනාවනට) පදට්ඨාන යි. එහි ශමථයාගේ ඵලය රාගවිරාග චෙතොවිමුත්ති යැ, විදර්ශනාඵලය අවිජ්ජාවිරාග පඤ්ඤාවිමුත්ති යැ, මේ (විමුත්ති) පදට්ඨාන යි.

කාමගුණ සංඛ්‍යාත වනය කාමතෘෂ්ණා සංඛ්‍යාත වනථයට පදට්ඨාන යැ, වනය කිමැ වනථය කවරෙ යැ යත් : ' වන ' නම් පඤ්ච කාමගුණයෝ යැ, තෘෂ්ණාව ' වනථ ' යැ, මේ පදට්ඨාන යි. ' වන ' නම් ස්ත්‍රී යැ හෝ පුරුෂ යැ හෝ යි නිමිතිවශයෙන් ගැනීම යැ. ' වනථ ' නම් ඒ ඒ අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගේ අනුව්‍යඤ්ජනවශයෙන් ගැනීම යැ : ඇස මැනවැ කන මැනවැ නැහැය මැනව දිව මැනවැ කය මැනවැ' යි. මේ පදට්ඨාන යි. යළි ' වන ' නම් අභිසමය විසින් අපරිඥාත වූ ආධ්‍යාත්මික බාහිරෂඩායතනයෝ යැ, ඒ උභය ආයතනය නිසා යම් සංයොජනයෙක් උපදී ද මේ ' වනථ ' නම, මේ (සංයොජනයනට) පදට්ඨාන යි. එයින් වදාළහ, බුදුහු : '' ඡෙත්වා වනං ච වනථං ච '' යී. මේ පදට්ඨාන යෙන් සමාරොපණා යි.

එහි වෙවචනයෙන් සමාරොපණා කවර යත් : රාගවිරාග චෙතොවිමුත්ති යැ සෙඛඵල යැ (යනු අනාගාමිඵලයට ද) අවිජ්ජාවිරාග පඤ්ඤාවිමුත්ති යැ අසෙඛඵල යැ (යනු රහත්ඵලයට ද) මේ වෙවචන යි. රාගවිරාග චෙතොවිමුත්ති යැ අනාගාමිඵල යැ (යනු ද) අවිජ්ජාවිරාග පඤ්ඤාවිමුත්ති යැ අග්ගඵල යැ අරහත්ත යැ (යනු ද පිළිවෙළින් අනාගාමිඵල රහත්ඵලයනට) මේ වෙවචන යි. රාගවිරාග චෙතොවිමුත්ති යැ කාම ධාතු සමතික්කමන යැ (යනු ද) අවිජ්ජාවිරාග පඤ්ඤාවිමුක්ති යැ තෙධාතුකසමතික්ක මන යැ (යනු ද තතිය චතුත්ථ ඵලයනට) මේ වෙවචන යි. පඤ්ඤින්ද්‍රිය යැ පඤ්ඤා බල යැ අධිපඤ්ඤාසික්ඛා යැ පඤ්ඤාක්ඛන්ධ යැ ධම්මවිචයසම්බොජ්ඣඞ්ග යැ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග යැ ඤාණ යැ සම්මාදිට්ඨි යැ තීරණ යැ සන්තීරණ යැ හිරිය විපස්සනා යැ ධම්මෙඤාණ යැ යන මේ සියල්ල පඤ්ඤාවෙවචන යි. මේ වෙවචනයෙන් සමාරොපණා යි.

තත්ථ කතමා භාවනාය සමාරොපණා: යථාහ භගවා “තස්මාතිහ ත්වං භික්ඛු කායෙ කායානුපස්සී විහරාහි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං”. ‘ආතාපී’ති විරියින්ද්‍රියං; ‘සම්පජානො’ති පඤ්ඤින්ද්‍රියං; “සතිමා’ති සතින්ද්‍රියං; ‘විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්ස’න්ති සමාධින්ද්‍රියං. එවං කායෙ කායානුපස්සිනො විහරතො චත්තාරො සතිපට්ඨානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. කෙන කාරණෙන; එකලක්ඛණත්තා චතුන්නං ඉන්ද්‍රියානං, චතූසු සතිපට්ඨානෙසු භාවියමානෙසු චත්තාරො සම්මප්පධානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. චතූසු සම්මප්පධානෙසු භාවියමානෙසු චත්තාරො ඉද්ධිපාදා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. චතූසු ඉද්ධිපාදෙසු භාවියමානෙසු පඤ්චින්ද්‍රියානි භාවනා පාරිපූරිං ගච්ඡන්ති. (එවං සබ්බෙ,) කෙන කාරණෙන: සබ්බෙ හි බොධඞ්ගමා ධම්මා බොධිපක්ඛියා නීයානිකලක්ඛණෙන එකලක්ඛණා. තෙ එකලක්ඛණත්තා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. අයං භාවනාය සමාරොපණා.

තත්ථ කතමා පහානෙන සමාරොපණා: කායෙ කායානුපස්සී විහරන්තො අසුභෙ සුභන්ති විපල්ලාසං පජහති. කබලිඞ්කාරො චස්ස ආහාරො පරිඤ්ඤං ගච්ඡති. කාමූපාදානෙන ච අනුපාදානො භවති කාමයොගෙන ච විසංයුත්තො භවති. අභිජ්ඣාකායගන්ථෙන ච විප්පයුජ්ජති, කාමාසවෙන ච අනාසවො භවති. කාමොඝඤ්ච උත්තිණ්ණො භවති. රාගසල්ලෙන ච විසල්ලො භවති. රූපූපිකා චස්ස විඤ්ඤාණට්ඨිති පරිඤ්ඤං ගච්ඡති. රූපධාතුයා චස්ස රාගො පහීනො භවති. න ච ඡන්දා අගතිං ගච්ඡති.

වෙදනාසු වෙදනානුපස්සී විහරන්තො දුක්ඛෙ සුඛන්ති විපල්ලාසං පජහති. ඵස්සො චස්ස ආහාරො පරිඤ්ඤං ගච්ඡති භවූපාදානෙන ච අනුපාදානො භවති. භවයොගෙන ච විප්පයුත්තො භවති. බ්‍යාපාදකායගන්ථෙන ච විප්පයුජ්ජති. භවාසවෙන ච අනාසවො භවති. භවොඝඤ්ච උත්තිණ්ණො භවති දොසසල්ලෙන ච විසල්ලො භවති. වෙදනූපිකා චස්ස විඤ්ඤාණට්ඨිති පරිඤ්ඤං ගච්ඡති. වෙදනාධාතුයා චස්ස රාගො පහීනො භවති. න ච දොසා අගතිං ගච්ඡති.

චිත්තෙ චිත්තානුපස්සී විහරන්තො අනිච්චෙ නිච්චන්ති විපල්ලාසං පජහති. විඤ්ඤාණං චස්ස ආහාරො පරිඤ්ඤං ගච්ඡති. දිට්ඨුපාදානෙන ච අනුපාදානො භවති. දිට්ඨියොගෙන ච විප්පයුත්තො භවති. සීලබ්බතපරාමාසකායගන්ථෙන ච විප්පයුජ්ජති. දිට්ඨාසවෙන ච අනාසවො භවති. දිට්ඨොඝඤ්ච උත්තිණ්ණො භවති. මානසල්ලෙන ච විසල්ලො භවති. සඤ්ඤූපිකා චස්ස විඤ්ඤාණට්ඨිති පරිඤ්ඤං ගච්ඡති. සඤ්ඤාධාතුයා චස්ස රාගො පහීනො භවති, න ච භයා අගතිං ගච්ඡති.

එහි භාවනායෙන් සමාරොපණා කවර යැ : මෙසේ වදළහ, බුදුහු : '' එහෙයින් මහණ තෙපි කයෙහි කය අනුව දක්නේ ආතාපන වීර්‍යඇති ව සම්‍යග්ඥාන ඇති ව සිහි ඇතිව කායලෝකයෙහි අභිධ්‍යා දෞර්මනස්‍ය දුරුකොට වාසය කරව '' යි. ආතාපී යනු වීර්‍යෙන්ද්‍රිය යැ, සම්පජානො යනු ප්‍රඥෙන්ද්‍රිය යැ, සතිමා යනු ස්මෘතීන්ද්‍රිය යැ, විණෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං යනු සමාධීන්ද්‍රිය යි. මෙසේ කයෙහි කායානුදර්ශීව වාස කරනුවහුට සතර සිවටන්හු වැඩීමෙන් පිරිමට යෙති. කවර කරුණින යත්: සතර ඉන්ද්‍රියයන් සමානලක්ෂණ ඇතිබැවිනි. සතර සිවටන් වැඩෙන කල්හි සතර සම්‍යක්ප්‍රධානයෝ භාවනායෙන් පිරිමට යෙති, සතර සම්‍යක්ප්‍රධානයන් වැඩෙන කල්හි සතර ඍද්ධිපාදයෝ භාවනායෙන් පිරිමට යෙති, සතර ඍද්ධිපාදයන් වැඩෙන කල්හි පඤ්චෙන්ද්‍රියයෝ භාවනායෙන් පිරිමට යෙති. (සියල්ල මෙසේ කියයුතු) කවර කරුණින යත් : යම් හෙයෙකින් බෝධ සංඛ්‍යාත ආර්‍යමාර්ගයට යන බෝධිපක්ෂයෙහි වූ සියලු ධර්මයෝ නෛර්‍යාණිකලක්ෂණයෙන් සමානලක්ෂණ ඇත්තාහු ද එහෙයිනි. ඔහු සමානලක්ෂණ ඇතිහෙයින් භාවනායෙන් පාරිපූරියට යෙත්. මේ භාවනා සමාරොපණා යි.

එහි ප්‍රහාණයෙන් සමාරොපණා කවර යත් : කයෙහි කායානුදර්ශීව වාසය කරනුයේ 'අශුභයෙහි ශුභ යැ' යන විපර්‍යාසය දුරුකෙරෙයි, ඔහුට කවලීකාරාහාරය ද පරිඥහි සමයට පැමිණෙයි, කාමොපාදනයෙනුදු උපාදන රහිත වෙයි, කාමයොගයෙනුදු විසංයුක්ත වෙයි, අභිධ්‍යාකායග්‍රන්ථයෙනුදු වෙන් වෙයි, කාමාස්‍රවයෙනුදු අනාස්‍රව වෙයි, කාමොඝය ද උත්තරණය කෙළේ වෙයි, රාගශල්‍යයෙනුදු විශල්‍ය වෙයි, ඔහුට රූපය අරමුණු කිරීම් වශයෙන් පැමිණියයුතු විඥානස්ථිතිය ද පරිඥනයට යෙයි, ඔහුට රූපධාතුයෙහි රාගය ද ප්‍රහීණ වෙයි, නො ද ඡන්දයෙන් අගතියට යෙයි.

වේදනායෙහි වේදනානුදර්ශීව වාසය කරනුයේ දුඃඛයෙහි සුඛ යැ යන විපර්‍යාසග්‍රහණය දුරුකෙරෙයි, ඔහුට ඵස්සාහාරය ද පරිඥවට යෙයි, භවොපාදනයෙන් ද අනුපාදන වෙයි, භවයොගයෙනුදු විප්‍රයුක්ත වෙයි, ව්‍යාපාදකායග්‍රන්ථයෙනුදු විප්‍රයුක්ත වෙයි, භවාස්‍රවයෙනුදු ආස්‍රව රහිත වෙයි, භවොඝය ද උත්තීර්ණ වූයේ වෙයි, ද්වේෂශල්‍යයෙනුදු විගතශල්‍ය වෙයි, ඔහුට වෙදනූපග විඥානස්ථිතිය ද පරිඥහිසමයට යෙයි, වෙදනාධාතුයෙනුදු ඔහුගේ රාගය ප්‍රහීණ වෙයි, නො ද ද්වෙෂයෙන් අගතියට යෙයි.

චිත්තයෙහි චිත්තානුදර්ශීව වාසය කරනුයේ අනිත්‍යයෙහි නිත්‍ය යැ යන විපර්‍යාසය දුරුකෙරෙයි, ඔහුට විඥානාහාරය ද පරිඥහිසමයට යෙයි, දෘෂ්ටි – උපාදනයෙනුදු උපාදන රහිත වෙයි, දෘෂ්ටියොගයෙනුදු විප්‍රයුක්ත වෙයි, ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථයෙනුදු විප්‍රයුක්ත වෙයි, දෘෂ්ට්‍යාස්‍රවයෙනුදු අනාස්‍රව වෙයි, දෘෂ්ටි – ඔඝය ද උත්තීර්ණ වෙයි, මානශල්‍යයෙනුදු විශල්‍ය වෙයි, ඔහුට සඤ්ඤූපග විඥානස්ථිතිය ද පරිඥහිසමයට යෙයි, සංඥාධාතුයෙනුදු ඔහුගේ රාගය ප්‍රහීණ වෙයි, නො ද භයහෙතුයෙන් අගතියට යෙයි.

ධම්මෙසු ධම්මානුපස්සී විහරන්තො අනත්තනි අත්තාති විපල්ලාසං පජහති. මනොසඤ්චෙතනා චස්ස ආහාරො පරිඤ්ඤං ගච්ඡති. අත්තවාදුපාදානෙන ච අනුපාදානො භවති අවිජ්ජා යොගෙන ච විසංයුත්තො භවති. ඉදංසච්චාභිනිවෙස කායගන්ථෙන ච විප්පයුජ්ජති අවිජ්ජාසවෙන ච අනාසවො භවති. අවිජ්ජොඝඤ්ච උත්තිණ්ණො භවති. මොහසල්ලෙන ච විසල්ලො භවති. සඞ්ඛාරූපිකා චස්ස විඤ්ඤාණට්ඨිති පරිඤ්ඤං ගච්ඡති. සඞ්ඛාරධාතුයා චස්ස රාගො පහීනො භවති. න ච මොහා අගතිං ගච්ඡති. අයං පහානෙන සමාරොපනා. තෙනාහ ආයස්මා මහාකච්චායනො:

"යෙ ධම්මා යංමූලා යෙ චෙකත්ථා පකාසිතා මුනිනා,
තෙ සමාරොපයිතබ්බා එස සමාරොපනො හාරො"ති.

නියුත්තො සමාරොපනො හාරො

නිට්ඨිතො ච හාරවිභඞ්ගො

## 3, 2, 1

## දෙසනාහාරසම්පාතො

1. "සොළස හාරා පඨමං දිසලොචනෙන දිසා විලොකෙත්වා,
සංඛිපිය අඞ්කුසෙන හි නයෙහි තීහි නිද්දිසෙ සුත්තන්ති.

වුත්තා තස්සා නිද්දෙසො කුහිං දට්ඨබ්බො: හාරසම්පාතෙ. තත්ථ කතමො දෙසනාහාරසම්පාතො:

2. "අරක්ඛිතෙන චිත්තෙන[1] මිච්ඡාදිට්ඨිහතෙන ච,
ථීනමිද්ධාභිභූතෙන වසං මාරස්ස ගච්ඡතී"ති.

'අරක්ඛිතෙන චිත්තෙනා'ති කිං දෙසයති; පමාදං. තං මච්චුනො පදං. 'මිච්ඡාදිට්ඨිහතෙන චා'ති මිච්ඡාදිට්ඨිහතං නාම වුච්චති යදා අනිච්චෙව නිච්චන්ති පස්සති. සො විපල්ලාසො. සො පන විපල්ලාසො කිං ලක්ඛණො: විපරීතගාහලක්ඛණො විපල්ලාසො. සො කිං විපල්ලාසයති: තයො ධම්මෙ, සඤ්ඤං චිත්තං දිට්ඨිමිති. සො කුහිං විපල්ලාසයති: චතූසු අත්තභාවවත්ථූසු—රූපං අත්තතො සමනුපස්සති රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං, එවං වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො

1. කායෙන - උදාන

ස්කන්ධාදි ධර්මයන්හි ධර්මානුදර්ශීව වාසය කරනුයේ ආත්ම නොවූයෙහි ආත්ම යැ යන විපර්‍යාසය දුරුකෙරෙයි. ඔහුට මනෝසඤ්චේතනාහාරය ද පරිඥාභිසමයට යෙයි, ආත්මවාදෝපාදනයෙනුදු අනුපාදන වෙයි, අවිද්‍යායොගයෙනුදු විසංයුක්ත වෙයි, ඉදම් සත්‍යාභිනිවෙශකායග්‍රන්ථයෙනුදු විප්‍රයුක්ත වෙයි, අවිද්‍යාස්‍රවයෙනුදු අනාස්‍රව වෙයි, අවිද්‍යෞඝය ද උත්තීර්ණ වෙයි, මොහශල්‍යයෙනුදු විශල්‍ය වෙයි, ඔහුට සංස්කාරූපග විඥානස්ථිතිය ද පරිඥාභිසමයට යෙයි. සංස්කාරධාතුයෙනුදු ඔහුගේ රාගය ප්‍රහීණ වෙයි, නො ද මොහයෙන් අගතියට යෙයි. මේ ප්‍රහාණයෙන් සමාරොපණා යි.එයින් වදළහ, ආයුෂ්මත් මහාකාත්‍යායන මහරහතුන් වහන්සේ :

" යෙ ධම්මා යම්මූලා – යෙ වෙකත්ථා පකාසිතා මුනිනා,
තෙ සමරොපයිතබ්බා එස සමාරොපණො හාරො " යි.

සමාරොපණහාරය යොදනලද්දේ යි.

## 3. 2. 1

## දේසනාහාරසම්පාතය

1. පළමු කොට (ව්‍යඤ්ජනපර්‍යෙෂණ හෙයින්) සොළස හාරයෝ යෙදිය යුත්තාහ. දිසාලොචන නයින් ප්‍රථමදිශාදිය අවලොකන කොට අඞ්කුසනයින් දිශාභූත ධර්මයන් සූත්‍රයෙන් නිර්ධාරණ කොට නන්දියාවත්තාදි අර්ථනයත්‍රයෙන් සූත්‍රය වර්ණනා කරන්නේ යි.

මේ ගාථාව උද්දෙසයෙහි ලා වදරනලද්දී ය. ඒ ගාථායෙහි නිද්දෙසය කොහි දී දක්කයුත්තේ යැ යත් : හාරසම්පාතයෙහි දක්කයුතු. (හාරවිභඞ්ගවාරයෙහි නොයෙක් සූත්‍රප්‍රදේශයන්ගෙන් ඒ ඒ හාරයන්ගේ විභාගය දක්වනලද්දේ ය. සූත්‍රයන්හි හාරයන්ගේ යෝජනාක්‍රමය දක්වීම හාරසම්පාතවාරයෙහි ස්වරූපය යි.) එහි දෙසනාහාරසම්පාතය කවරෙ යැ :

2. ස්මෘතිආරක්ෂාභාවයෙන් අගුප්ත වූ ශාශ්වතාදි මිථ්‍යාභිනිවෙශයෙන් දූෂිත වූ චිත්තචෛතසිකයන්ගේ අකල්‍යතාලක්ෂණ ථීන – මිද්ධ දෙකින් මඩනාලද ෂඩ්විඥානකාය සංඛ්‍යාත චිත්තය හේතු කොටගෙන ක්ලේශාදි සියලු මාරයාගේ වසයට (යථාකාම කරණීයවබට) පැමිණේ ය ' යි.

අරක්ඛිතෙන චිත්තෙන ' යි කුමක් දෙසනාසේක් ද යත් : ප්‍රමාදය යි, ඒ ප්‍රමාදය (ගුණ මරණහෙයින්) මෘත්‍යුමාරයාගේ වසයට කාරණ වෙයි. මිච්ඡාදිට්ඨිහතෙන ච යනු යම් කලෙක ' අනිත්‍යයෙහි නිත්‍ය යයි දකී ද එකල මිසදිටුයෙන් දූෂිත නමැයි කියනු ලැබෙ. ඒ නිත්‍යදර්ශනය විපර්‍යාසග්‍රාහ යැ. ඒ විපල්ලාසය වැලිත් කුමක් ලක්ෂණ කොට ඇත්තේ යැ යත් : විපල්ලාසය විපරීතව ගැනීම ලක්ෂණ කොට ඇත්තේ යැ. ඒ විපරීත ග්‍රාහය කුමක් විපර්‍යස්ත කෙරෙයි යත් : සංඥා යැ චිත්ත යැ දෘෂ්ටි යැ යන තුන් ධර්මයන් විපර්‍යස්ත කෙරෙයි. හේ කොහි විපර්‍යස්ත කෙරෙයි යත් : (පඤ්චස්කන්ධ සංඛ්‍යාත) ආත්මභාවවස්තු සතරෙහි යැ — රූපය ආත්මහෙයින් දෘෂ්ටිවශයෙන් දකී, (ගිනිසිළත් එළියත් මෙන් රූප – ආත්ම නොවෙන් කොට ගැනීමෙනි.) ආත්මය රූපවත් යයි හෝ දකී, (රුකෙහි සෙවණ මෙන් අරූපය ආත්ම යයි ගැනීමෙනි.) ආත්මයෙහි රූපය ඇතැයි හෝ දකී, (මලෙහි සුවඳ මෙන් අරූපය මැ ආත්මය යි ගැනීමෙනි) රූපයෙහි ආත්මය ඇතැයි හෝ දකී. (කරඬුයෙහි මැණික මෙන් අරූපය මැ ආත්මයයි ගැනීමෙනි.) මෙසේ වෙදනාව . . . සංඥාව . . . , සංස්කාරයන් . . . විඥානය ආත්ම විසින් දකී, ආත්මය

සමනුපස්සති විඤ්ඤාණවන්තං වා අත්තානං අත්තනි වා විඤ්ඤාණං විඤ්ඤාණස්මිං වා අත්තානං. තත්ථ රූපං පඨමං විපල්ලාසවත්ථු: අසුභෙ සුභන්ති, වෙදනා දුතියං විපල්ලාසවත්ථු: දුක්ඛෙ සුඛන්ති, සඤ්ඤා සඞ්ඛාරා ච තතියං විපල්ලාසවත්ථු: අනත්තනි අත්තාති, විඤ්ඤාණං චතුත්ථං විපල්ලාසවත්ථු: අනිච්චෙ නිච්චන්ති.

ද්වෙ ධම්මා චිත්තස්ස සංකිලෙසා: තණ්හා ච අවිජ්ජා ච. තණ්හානිවුතං චිත්තං ද්වීහි විපල්ලාසෙහි විපල්ලාසීයති: අසුභෙ සුභන්ති දුක්ඛෙ සුඛන්ති. දිට්ඨිනිවුතං චිත්තං ද්වීහි විපල්ලාසෙහි විපල්ලාසීයති: අනිච්චෙ නිච්චන්ති අනත්තනියෙ අත්තාති. තත්ථ යො දිට්ඨිවිපල්ලාසො සො අතීතං රූපං අත්තතො සමනුපස්සති, අතීතං වෙදනං -පෙ- අතීතං සඤ්ඤං -පෙ- අතීතෙ සඞ්ඛාරෙ -පෙ- අතීතං විඤ්ඤාණං අත්තතො සමනුපස්සති. තත්ථ යො තණ්හාවිපල්ලාසො සො අනාගතං රූපං අභිනන්දති, අනාගතං වෙදනං - අනාගතං සඤ්ඤං - අනාගතෙ සඞ්ඛාරෙ - අනාගතං විඤ්ඤාණං අභිනන්දති, ද්වෙ ධම්මා චිත්තස්ස උපක්කිලෙසා: තණ්හා ච අවිජ්ජා ච. තාහි විසුජ්ඣන්තං චිත්තං විසුජ්ඣති. තෙසං අවිජ්ජානීවරණානං තණ්හාසංයොජනානං පුබ්බා කොටි න පඤ්ඤායති. සන්ධාවන්තානං සංසරන්තානං සකිං නිරයං සකිං තිරච්ඡානයොනිං සකිං පෙත්තිවිසයං සකිං අසුරකායං සකිං දෙවෙ සකිං මනුස්සෙ.

'පීනමිද්ධාභිභූතෙනා'ති පීනං[1] නාම යා චිත්තස්ස අකල්ලතා අකම්මනියතා, මිද්ධං නාම යං කායස්ස ලීනත්තං. "වසං මාරස්ස ගච්ඡතී"ති කිලෙසමාරස්ස ච සත්තමාරස්ස ච වසං ගච්ඡති සො හි නිවුතො සංසාරාභිමුඛො හොති. ඉමානි භගවතා ද්වෙ සච්චානි දෙසිතානි: දුක්ඛං සමුදයො ච. තෙසං භගවා පරිඤ්ඤාය ච පහානාය ච ධම්මං දෙසෙති: දුක්ඛස්ස පරිඤ්ඤාය සමුදයස්ස පහානාය. යෙන ච පරිජානාති යෙන ච පජහති, අයං මග්ගො. යං තණ්හාය අවිජ්ජාය ච පහානං, අයං නිරොධො, ඉමානි චත්තාරි සච්චානි. තෙනාහ භගවා: "අරක්ඛිතෙන චිත්තෙනා"ති තෙනාහායස්මා මහාකච්චානො: "අස්සාදදීනවතා"ති.

**නියුත්තො දෙසනාහාරසම්පාතො**

## 3, 2, 2

## විචයහාරසම්පාතො

තත්ථ කතමො විචයහාරසම්පාතො: තත්ථ තණ්හා දුවිධා: කුසලාපි අකුසලාපි. අකුසලා සංසාරගාමිනී, කුසලා අපචයගාමිනී පහානතණ්හා. මානොපි දුවිධො: කුසලොපි අකුසලොපි. යං මානං නිස්සාය මානං පජහති, අයං මානො කුසලො යො පන මානො දුක්ඛං නිබ්බත්තයති, අයං මානො අකුසලො. තත්ථ යං නෙක්ඛම්මසිතං දොමනස්සං "කුදස්සු නාමාහං තං ආයතනං සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සං, යං

1. පීනං - මජ්ජනං.

විඤ්ඤාණවත් යයි හෝ ආත්මයෙහි විඤ්ඤාණය ඇතැයි හෝ විඤ්ඤාණයෙහි ආත්මය ඇතැයි හෝ දෘෂ්ටිවශයෙන් දකී. එහි රූපය ' අශුභයෙහි ශුභ යැ ' යන පළමුවන විපර්‍යාසවස්තු යැ, වේදනාව ' දුඃඛයෙහි සුඛ යැ ' යන දෙවැනි විපර්‍යාසවස්තු යැ, සංඥාව ද සංස්කාරයෝ ද ' අනාත්මයෙහි ආත්ම යැ ' යන තුන්වැනි විපර්‍යාසවස්තු යැ, විඤ්ඤාණය ' අනිත්‍යයෙහි නිත්‍ය යැ ' යන සිවුවැනි විපර්‍යාසවස්තු යි.

තෘෂ්ණාව ද අවිද්‍යාව ද යන ධර්මයෝ දෙදෙන චිත්තයම සංක්ලේශයෝ යැ, තෘෂ්ණායෙන් වැසුණු සිත ' අශුභයෙහි ශුභ යැ,දුඃඛයෙහි සුඛ යැ, යන විපර්‍යාස දෙකින් විපර්‍යස්ත කෙරෙයි. දෘෂ්ටියෙන් වැසුණු සිත ' අනිත්‍යයෙහි නිත්‍ය යැ අනාත්මයෙහි ආත්ම යැ ' යන විපර්‍යාස දෙකින් විපර්‍යස්ත කෙරෙයි. එහි යම් දිට්ඨිවිපල්ලාසයෙක් ඇද්ද එය අතීතරූපය ආත්ම විසින් දකී, අතීත වේදනාව . . . අතීත සංඥාව . . . අතීත සංස්කාරයන් . . . අතීත විඤ්ඤාණය ආත්ම විසින් දකී. එහි යම් තණ්හා විපල්ලාසයෙක් ඇද්ද එය අනාගත රූපය සප්‍රීතික තෘෂ්ණාවෙන් සතුටු වෙයි, අනාගත වේදනාව . . . අනාගත සංඥාව . . . අනාගත සංස්කාරයන් . . . අනාගත විඤ්ඤාණය කැමැතිවෙයි. තෘෂ්ණාව ද අවිද්‍යාව ද යන ධර්මයෝ දෙදෙන සිතට උපක්ලේශ වෙති. ඒ තෘෂ්ණා අවිද්‍යා දෙකින් විශුද්ධ වන සිත සියලු කෙලෙසුන්ගෙන් විශුද්ධ වෙයි. අවිජ්ජානීවරණ ඇති තණ්හා සංයෝජන ඇති (සිත නොරක්නාලද මිසදිටුයෙන් දූෂිත වූ) ඒ සත්ත්වයන්ගේ වරක් නිරයෙහි වරක් තිරිසන්යොන්හි වරක් ප්‍රෙත්‍යවිෂයෙහි වරක් අසුරකායයෙහි වරක් දෙව්ලොවැ වරක් මිනිස්ලොවැ සංධාවන සංසරණ කරනුවන්ගේ සසර පූර්වකොටිය නො පැනේ.

ථිනමිද්ධාභිභූතෙන යනු ථීන නම් : චිත්තයාගේ යම් අකල්‍යබවක් අකර්මණ්‍යබවක් ඇද්ද එයයි. මිද්ධ නම් : කායයාගේ යම් හැකිලුණුබවක් ඇද්ද එය යි. වසං මාරස්ස ගච්ඡති යනු ක්ලේශමාරයාගේ ද සත්ත්වමාරයාගේ ද වසයට පැමිණෙයි. යම්හෙයෙකින් හේ තෘෂ්ණාදෘෂ්ටීන් වැසුණේ සසරට අභිමුඛ වූයේ ද එහෙයිනි. භාග්‍යවතුන් විසින් දුක්ඛසත්‍යය ද සමුදයසත්‍යය ද යන මේ සත්‍යයෝ දෙදෙන දේශනා කරනලද්දහුය. බුදුහු ඒ සත්‍යද්වයාගේ පරිඥාව පිණිස ද ප්‍රහාණය පිණිස ද දහම් දෙසනසේක. දුක්ඛයාගේ පරිඥානය පිණිස යැ සමුදයයාගේ ප්‍රහාණය පිණිස යි. යමකින් පරිඥානය කෙරේ ද යමකින් ප්‍රහාණය කෙරේ ද මේ මාර්ග යැ. තෘෂ්ණාවගේත් අවිද්‍යාවගේත් යම් ප්‍රහාණයෙක් ඇද්ද මේ නිරොධ යි. මේ චතුස්සත්‍යයෝ යි. එයින් වදළහ, බුදුහු : '' අරක්ඛිතෙන චිත්තෙන '' යනාදිය. එයින් වදළහ. ආයුෂ්මත් මහාකාත්‍යායන මහරහතුන් වහන්සේ '' අස්සාදදීනවතා '' යනාදිය.

**දේසනාහාර සම්පාතය යොදන ලද්දේ යි.**

## 3. 2. 2

## විචයහාරසම්පාතය

එහි විචයහාරසම්පාතය කවරෙ යැ : ඒ දෙසනාහාරයෙහි විපල්ලාසහෙතුභාවයෙන් නිර්ධාරණ කළ තෘෂ්ණාව කුශල ද අකුශල දැයි ද්විවිධ වන්නී ය. අකුශල තෘෂ්ණාව සසරට පමුණුවන්නී ය, (සංසාරනායිකා යයි සේයි.) කුශලතෘෂ්ණාව අපචය සංඛ්‍යාත නිවනට පමුණුවන ප්‍රහාණතෘෂ්ණා යි. මානය ද දෙවැදෑරුම් වෙයි : කුශල ද අකුශල දැයි කියා යි. (සෙවිතව්‍ය වූ) යම් මානයක් නිසා මානය ප්‍රහාණ කෙරේ ද, මේ මානය කුශල යැ, යළි යම් මානයෙක් දුක උපදවා ද, මේ මානය අකුශල යි. එහි යම් නෛෂ්ක්‍රම්‍ය නිශ්‍රිත වූ දෙම්නසෙක් ඇද්ද, '' ආර්‍යයෝ ශාන්ත වූ අර්හත්ඵල සංඛ්‍යාත යම් ආයතනයක් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාස කෙරෙත් ද, කවද නම් මම ඒ ආයතනය ප්‍රත්‍යක්ෂ කොට

අරියා සන්තං ආයතනං සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තී''ති, තස්ස උප්පජ්ජති පිහා, පිහාපච්චයා දොමනස්සං, අයං තණ්හා කුසලා රාගවිරාගා චෙතොවිමුත්ති, තදාරම්මණා කුසලා අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති.

තස්සා කො පවිචයො: අට්ඨ මග්ගඞ්ගානි: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධීති. සො කත්ථ දට්ඨබ්බො: චතුත්ථෙ ඣානෙ පාරමිතාය. චතුත්ථෙ හි ඣානෙ අට්ඨඞ්ගසමන්නාගතං චිත්තං භාවයති පරිසුද්ධං පරියොදාතං අනඞ්ගණං විගතූපක්කිලෙසං මුදුං[1] කම්මනියං ඨිතං ආනෙඤ්ජප්පත්තං. සො තත්ථ අට්ඨවිධං අධිගච්ඡති: ඡ අභිඤ්ඤා ද්වෙ ච විසෙසෙ. තං චිත්තං යතො පරිසුද්ධං තතො පරියොදාතං, යතො පරියොදාතං තතො අනඞ්ගණං, යතො අනඞ්ගණං තතො විගතූපක්කිලෙසං, යතො විගතූපක්කිලෙසං තතො මුදුං යතො මුදුං තතො කම්මනියං, යතො කම්මනියං තතො ඨිතං, යතො ඨිතං තතො ආනෙඤ්ජප්පත්තං; තත්ථ අඞ්ගණා ච උපක්කිලෙසා ච තදුභයං තණ්හාපක්ඛො, යා ච ඉඤ්ජනා යා ච චිත්තස්ස අට්ඨිති අයං දිට්ඨිපක්ඛො.

චත්තාරි ඉන්ද්‍රියානි දුක්ඛින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං සුඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියඤ්ච චතුත්ථජ්ඣානෙ නිරුජ්ඣන්ති. තස්ස උපෙක්ඛින්ද්‍රියං අවසිට්ඨං භවති.

සො උපරිමං සමාපත්තිං සන්තතො මනසි කරොති. තස්ස උපරිමං සමාපත්තිං සන්තතො මනසිකරොතො චතුත්ථජ්ඣානෙ ඔළාරිකා සඤ්ඤා සණ්ඨහති, උක්කණ්ඨා ච පටිඝසඤ්ඤා. සො සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනසමාපත්තිං සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අභිඤ්ඤාභිනීහාරෙ රූපසඤ්ඤා, වොකාරෙ නානත්තසඤ්ඤා සමතික්කමති. පටිඝසඤ්ඤා චස්ස අබ්භත්ථං ගච්ඡති. එවං සමාහිතස්ස තස්ස ඔභාසො අන්තරධායති, දස්සනඤ්ච රූපානං. සො සමාධි ඡළඞ්ගසමන්නාගතො පච්චවෙක්ඛිතබ්බො: අනභිජ්ඣාසහගතං මෙ මානසං සබ්බලොකෙ, අබ්‍යාපන්නං මෙ චිත්තං සබ්බසත්තෙසු, ආරද්ධං මෙ විරියං පග්ගහිතං, පස්සද්ධො

1. මුදු – සිඹු, මර්ජසං.

ඊට පැමිණ වාසකෙරෙම් ද '' යි. ඔහුට පිහා සංඛ්‍යාත ඊර්ෂ්‍යාව උපදී, පිහාප්‍රත්‍යයෙන් දෙම්නස වෙයි, මේ තණ්හාව කුශල වෙයි. (කිසෙයින් කුසල් වෙයි යත්,) යම් රාගවිරාග චෙතොවිමුත්තියක් ඇද්ද එය අරමුණු කොට ඇති තණ්හාව අනවද්‍යාර්ථයෙන් කුසල් වෙයි, යම් අවිජ්ජාවිරාගපඤ්ඤාවිමුත්තියක් ඇද්ද එය අරමුණු කොට ඇති තණ්හාව කුශලාරම්මණ හෙයින් අනවද්‍යාර්ථයෙන් කුසල් වේ.

ඒ පඤ්ඤාවිමුක්තියගේ පච්චය කවරෙ යැ : සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යන අෂ්ට මාර්ගාඞ්ගයෝ යි. ඒ පච්චය කොතැන්හි ලා දක්කයුතු යැ යත් : චතුර්ථධ්‍යානයෙහි උත්කර්ෂයට පැමිණිභාවනායෙහි ලා දක්කයුතු. ඒ එසේ මැ යැ, චතුර්ථධ්‍යානයෙහි අෂ්ටාඞ්ගයෙකින් සමන්වාගත චිත්තය වඩයි. (ඒ අෂ්ටාඞ්ගය නම් :) උපෙක්ඛාසති පාරිසුද්ධියෙන් පරිශුද්ධ වූ පරිශුද්ධ හෙයින් ම පරියොදත — ප්‍රභාස්වර වූ විගත රාගාදි අඞ්ගණ ඇතියෙන් අනඞ්ගණ වූ අනඞ්ගණ හෙයින් ම අපගත උපක්ලේශ ඇති සුභාවිත හෙයින් මෘදු වූ (වශීභාවප්‍රාප්ත) මෘදු හෙයින් ම කර්මක්ෂම වූ පරිශුද්ධභාවාදියෙහි සිටි හෙයින් ස්ථිත වූ ස්ථිත හෙයින් ම අනිඤ්ජන — අචල බවට පැමිණි සිත වඩයි. ඒ චතුර්ථධ්‍යානලාභී යොගී තෙම ඒ චතුර්ථධ්‍යානයෙහි අටවැදෑරුම් ගුණයට පැමිණෙයි : (ඒ කවරෙ යැ,) ඉද්ධිවිධාදි ෂඩභිඥා යැ මනොමයඉද්ධි විපස්සනාඥාණ යන ගුණවිශෙෂ දෙකට ද පැමිණෙයි. ඒ චතුර්ථධ්‍යානචිත්තය (උපෙක්ඛාසතිපාරිසුද්ධි සංඛ්‍යාත) යම් හෙතුවකින් පරිශුද්ධ ද එහෙයින් පරියොදත යැ යම්හෙයෙකින් පර්‍ය්‍යවදත ද එහෙයින් අනඞ්ගණ යැ යම්හෙයෙකින් අනඞ්ගණ ද එහෙයින් විගතොපක්ලෙශ යැ යම්හෙයෙකින් විගතොපක්ලෙශ ද එහෙයින් මෘදු යැ යම්හෙයෙකින් මෘදු වී ද එහෙයින් කර්මණ්‍ය යැ යම්හෙයෙකින් කර්මක්ෂම ද එහෙයින් ස්ථිත යැ යම්හෙයෙකින් ස්ථිත වී ද එහෙයින් අනිඤ්ජනප්‍රාප්ත යි. එහි අඞ්ගණ ද උපක්ලෙශ ද යන දෙක තෘෂ්ණාපක්ෂයෙහි වෙයි, චිත්තයාගේ යම් චලනයෙක් ඇද්ද චිත්තයාගේ යම් අනවස්ථානයෙක් ඇද්ද මේ දෙක දෘෂ්ටිපක්ෂයෙහි වේ.

දුක්ඛින්ද්‍රිය දෙමනස්සින්ද්‍රිය සුඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය ද යන සතර ඉන්ද්‍රියයෝ චතුර්ථධ්‍යානයෙහි නිරුද්ධ වෙති. ඒ යෝගීහුගේ උපෙක්ඛින්ද්‍රිය අවශිෂ්ට වූයේ වේ.

ඒ යොගාවචර මතුයෙහි වූ ආකාසානඤ්චායතන සමාපත්තිය (අඞ්ගශාන්තතායෙන් ද ආලම්බනශාන්තතායෙන් ද) ශාන්තවශයෙන් මෙනෙහි කෙරෙයි, උපරිම සමාපත්තිය ශාන්තහෙයින් මෙනෙහිකරන ඔහුට චතුර්ථධ්‍යානයෙහි ඖදරික (අවූපසන්ත) යැ යන සංඥාව එළඹසිටී, පටිසසඤ්ඤා සංඛ්‍යාත පඤ්ච විඥානසංඥායෙහි උත්කණ්ඨා (අනභිරතිය) ද පිහිටයි. ඒ යොගාවචර සර්වප්‍රකාරයෙන් රූපසංඥාවත් ඉක්මැවීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තගමයෙන් නානාලම්බනයෙහි පැවැති සංඥාවන් නො මෙනෙහි කිරීමෙන් කසිණුග්ඝාටිමාකාසය අනන්ත යයි ආකාසානඤ්චායතන සමාපත්තිය උපයා ඊට පැමිණ වාසකෙරෙයි. රූපාවචරසංඥාව පඤ්චවිධ අභිඥාර්ථයාගේ අභිනීහාරමාත්‍ර යෙකි, (අරූපාවචරසමාපත්තීන් මෙන් ශාන්ත නොවෙයි සේයි.) නානාත්වසංඥාව නානාලම්බනයෙහි චිත්තයාගේ ආකුලප්‍රවෘත්තියෙකැයි (එහි ආදීනව දැක රූපාවචර සමාපත්ති) ඉක්මවයි. (ආකාසානඤ්චායතනසමාපත්තිය උපදවන) ඒ යොගීහුගේ දසවිධ පටිඝ (විඥාන) සංඥාව ද අභ්‍යස්තයට යෙයි. (මෙයින් ප්‍රථමාරූප්‍යසමාපත්තිය ප්‍රකාශ කළහ.) මෙසේ (උක්තප්‍රකාරයෙන් චතුර්ථධ්‍යානයෙහි චිත්තෛකාග්‍රතාව ද ඉක්මැවීමෙන්) සමාහිත වූ (යළි) ශාන්ත වූ ආරූප්‍යසමාධියෙන් සමාහිත වූවහුගේ රූපාවචරධ්‍යානාවභාසය ද රූපාවචරධ්‍යානචක්ෂුසින් කසිණරූපදර්ශනය ද අතුරුදහන් වෙයි. ඒ යථොක්ත රූපාරූපසමාධිය (උපකාරක පරිෂ්කාරස්වභාව වූ) ෂඩඞ්ගයෙන් සමන්වාගත වූයේ ප්‍රත්‍යවෙක්ෂා කටයුත්තේය, (පුනපුනා සිතියැයුතු යැයි සේයි.) ප්‍රිය - සාතරූප වූ සියලු සත්ත්ව – සංස්කාරලොකයෙහි මාගේ සිත අනභිධ්‍යාසහගත යෑ, මාගේ සිත සියලු සත්ත්වයන් කෙරෙහි ව්‍යාපාදයට නො පැමිණියේ යැ, මා විසින් වීර්‍ය්‍ය

මෙ කායො අසාරද්ධො, සමාහිතං මෙ චිත්තං අවික්ඛිත්තං, උපට්ඨිතා මෙ සති අපම්මුට්ඨා, තත්ථ යඤ්ච අනභිජ්ඣාසහගතං මානසං සබ්බලොකෙ යඤ්ච අබ්‍යාපන්නං චිත්තං සබ්බසත්තෙසු යඤ්ච ආරද්ධං විරියං පග්ගහිතං යඤ්ච සමාහිතං චිත්තං අවික්ඛිත්තං, අයං සමථො. යො පස්සද්ධො කායො අසාරද්ධො අයං සමාධිපරික්ඛාරො. යා උපට්ඨිතා සති අපම්මුට්ඨා[1] අයං විපස්සනා.

සො සමාධි පඤ්චවිධෙන වෙදිතබ්බො: අයං සමාධි පච්චුප්පන්නසුඛොති ඉතිස්ස පච්චත්තමෙව ඤාණදස්සනං පච්චුපට්ඨිතං භවති. අයං සමාධි ආයතිං සුඛවිපාකොති ඉතිස්ස පච්චත්තමෙව ඤාණදස්සනං පච්චුපට්ඨිතං භවති. අයං සමාධි අරියො නිරාමිසොති ඉතිස්ස පච්චත්තමෙව ඤාණදස්සනං පච්චුපට්ඨිතං භවති. අයං සමාධි අකාපුරිසසෙවිතොති ඉතිස්ස පච්චත්තමෙව ඤාණදස්සනං පච්චුපට්ඨිතං භවති. අයං සමාධි සන්තො චෙව පණීතො ච පටිප්පස්සද්ධිලද්ධො ච එකොදිභාවාධිගතො ච න සසඞ්ඛාරනිග්ගය්හ වාරිතවතො[2] චාති ඉතිස්ස පච්චත්තමෙව ඤාණදස්සනං පච්චුපට්ඨිතං භවති. තං ඛො පනිමං සමාධිං සතො සමාපජ්ජාමි සතො වුට්ඨහාමීති ඉතිස්ස පච්චත්තමෙව ඤාණදස්සනං පච්චුපට්ඨිතං භවති. තත්ථ යො ච සමාධි පච්චුප්පන්නසුඛො යො ච සමාධි ආයතිං සුඛවිපාකො අයං සමථො, යො ච සමාධි අරියො නිරාමිසො යො ච සමාධි අකාපුරිසසෙවිතො යො ච සමාධි සන්තො චෙව පණීතො ච පටිප්පස්සද්ධිලද්ධො ච එකොදිභාවාධිගතො ච න සසඞ්ඛාරනිග්ගය්හ වාරිතවතො ච යඤ්චාහං තං ඛො පනිමං සමාධිං සතො සමාපජ්ජාමි සතො වුට්ඨහාමීති අයං විපස්සනා.

සො සමාධි පඤ්චවිධෙන වෙදිතබ්බො: පීතිඵරණතා, සුඛඵරණතා, චෙතොඵරණතා, ආලොකඵරණතා, පච්චවෙක්ඛණානිමිත්තං. තත්ථ යො ච පීතිඵරණො යො ච සුඛඵරණො යො ච චෙතොඵරණො අයං සමථො, යො ච ආලොකඵරණො යඤ්ච පච්චවෙක්ඛණානිමිත්තං අයං විපස්සනා.

දස කසිණායතනානි: පඨවීකසිණං ආපොකසිණං තෙජොකසිණං වායොකසිණං නීලකසිණං පීතකසිණං ලොහිතකසිණං ඔදාතකසිණං ආකාසකසිණං විඤ්ඤාණකසිණං. තත්ථ යඤ්ච පඨවීකසිණං යඤ්ච ආපොකසිණං (එවං සබ්බං) යඤ්ච ඔදාතකසිණං, ඉමානි අට්ඨ කසිණානි සමථො, යඤ්ච ආකාසකසිණං යඤ්ච විඤ්ඤාණකසිණං අයං විපස්සනා. එවං සබ්බො අරියො මග්ගො යෙන යෙන ආකාරෙන වුත්තො, තෙන තෙන සමථවිපස්සනෙන යොජයිතබ්බො. තෙ තීහි ධම්මෙහි සඞ්ගහිතා:

1. අසම්මුට්ඨා - මජසං
2. වාරිතගතො - මජසං.

ආරබ්ධ වූයේ දැඩිව ගන්නාලද, මාගේ නාමකය සැහැල්ලු වූයේ දරථ රහිත යැ, මාගේ සිත සමාහිත වූයේ එහෙයින් අවික්ෂිප්ත යැ, මාගේ ස්මෘතිය එළැඹසිටියා එහෙයින් නොමුළාවූ යැ' යි පුනපුනා සිතියැයුතු. එහි සියලු ලෝකයෙහි අනභිධ්‍යාසහගත යම් සිතෙක් වේ ද, සියලු සත්ත්වයන් කෙරෙහි අව්‍යාපන්න වූ යම් සිතෙකුත් වේ ද, දැඩිව ගන්නාලද යම් ආරබ්ධ වීර්‍ය්‍යයෙක් වේ ද, අවික්ෂිප්ත වූ යම් සමාහිත චිත්තයෙක් වේ ද, මේ සමථ යැ. දරථ රහිත වූ යම් ප්‍රශ්‍රබ්ධ කායයෙක් වේ ද, මේ සමාධිපරිෂ්කාර යැ, නොමුළා වූ යම් උපස්ථිත ස්මෘතියක් ඇද්ද, මේ විදර්ශනා යි.

ආර්‍ය්‍යමාර්ගඵල වූ ඒ අරහත්ඵලසමාධිය (මතු කියන) පඤ්චප්‍රකාරයෙන් දතයුතු : මේ සමාධිය (සම්වත් සම්වත් කෙණෙහි සුවහෙයින්) ප්‍රත්‍යුත්පන්නසුඛ යයි මෙසේ ඔහුට තමා කෙරෙහි මැ ඥානදර්ශනය එළැඹැසිටියේ වෙයි, මේ සමාධිය (පූර්වපූර්ව සමාධිය පසුපසුව උපදනා සමාධියට ප්‍රත්‍යය හෙයින්) මතුයෙහි සුඛවිපාක ඇතැයි මෙසේ ඔහුට තමා කෙරෙහි මැ ඥානදර්ශනය එළැඹසිටියේ වෙයි, මේ සමාධිය කෙලෙසුන් කෙරෙන් දුරුවැ සිටිහෙයින් ආර්‍ය්‍ය යැ කාමාමිෂාදි ආමිෂාභාවයෙන් නිරාමිෂ යැයි මෙසේ ඔහුට තමා කෙරෙහි මැ ඥානදර්ශනය එළැඹසිටියේ වෙයි, මේ සමාධිය අලාමක වූ බුද්ධාදි මහාපුරුෂයන් විසින් සෙවුනාලදැයි මෙසේ ඔහුට තමා කෙරෙහි මැ ඥානදර්ශනය එළැඹ සිටියේ වෙයි, මේ සමාධිය අඞ්ගශාන්තතායෙන් සර්වක්ලෙශදරථශාන්තතායෙන් ශාන්ත ද අතෘප්තිකර හෙයින් ප්‍රණීත ද කෙලෙස් සන්හිඳුවීමෙන් ලබනලද ද එකොදි භාවයෙන් අධිගත ද සප්‍රයොගයෙන් ප්‍රත්‍යනීකධර්මයන් නිග්‍රහ කොට කෙලෙසුන් වළහා (අල්ප ගුණඇති සාස්‍රව සමාධි මෙන්) නොලබනලදැයි ද මෙසේ ඔහුට තමා කෙරෙහි මැ ඥානදර්ශනය එළැඹසිටියේ වෙයි. තවද ' මේ අර්හත්ඵලසමාධියට සිහිඇතිවැ සමවදිමි, සිහිඇතිවැ සමවතින් නැඟීසිටිමි ' මෙසේ ඔහුට තමා කෙරෙහි මැ ඥානදර්ශනය එළැඹ සිටියේ වේ. එහි යම් සමාධියෙක් ප්‍රත්‍යුත්පන්නසුඛ වූයේ ද යම් සමාධියෙක් මතුයෙහි සුඛවිපාක ඇත්තේ ද මේ සමථ යැ. යම් සමාධියෙක් ආර්‍ය්‍ය නිරාමිෂ වූයේ ද යම් සමාධි යෙක් අකාපුරුෂසෙවිත වූයේ ද යම් සමාධියෙක් ශාන්තවූයේ ප්‍රණීත වූයේත් කිලෙස පටිප්පස්සද්ධියෙන් ලද්දයේත් එකොදිභාවයෙන් අධිගත වූයේත් සසංඛාරයෙන් ප්‍රත්‍යනීකයන් නිග්‍රහ කොට කෙලෙසුන් නො වැළැහුයේත් වේද තවද මම මේ සමාධියට සිහිඇතිව සමවදිමි සිහිඇතිව නැඟීසිටිමි යන මේ විදර්ශනා යි.

ඒ අර්හත්ඵලසමාධියට පූර්වභාගප්‍රතිපදයෙහි කියනලද රූපාවචර චතුර්ථධ්‍යාන සමාධිය පස් අයුරෙකින් දතයුත්තේ යැ : ප්‍රීතිය පැතිරෙමින් උපදනා ප්‍රථම ද්විතීය ධ්‍යානයන්හි ප්‍රඥාසංඛ්‍යාත පීතිඵරණතා යැ සුඛය පැතිරෙමින් උපදනා ධ්‍යානත්‍රයෙහි ප්‍රඥා සංඛ්‍යාත සුඛඵරණතා යැ මෙරමා සිත් ස්පර්ශකරමින් උපදනා චෙතොපරියඥාණ සංඛ්‍යාත චෙතොඵරණතා යැ ආලොකය පැතිරවීමෙන් උපදනා දිබ්බචක්ඛුඥාණ සංඛ්‍යාත ආලොකඵරණතා යැ ප්‍රත්‍යවෙක්ෂානිමිත්ත යැ යන පස් ආකාරයෙනි. එහි යම් පීතිඵරණ යෙක් සුඛඵරණයෙක් යම් චෙතොඵරණයෙකුත් ඇද්ද මේ සමථ යැ, යම් ආලොක ඵරණයෙකුත් යම් පච්චවෙක්ඛණානිමිත්තකුත් ඇද්ද මේ විදර්ශනා යි.

කසිණායතනයෝ දසදෙනෙකි : පඨවිකසිණ යැ (කසිණනිමිත්තෙහි උපන් ධ්‍යානය යි,) ආපොකසිණ යැ තෙජොකසිණ යැ වායොකසිණ යැ නීලකසිණ යැ පීත කසිණ යැ ලොහිතකසිණ යැ ඔදාතකසිණ යැ ආකාසකසිණ යැ විඤ්ඤාණකසිණ යි. ඒ දසකසිණයන් කෙරෙහි යම් පඨවිකසිණයකුත් යම් ආපොකසිණයකුත් (මෙසේ සියල්ල) යම් ඔදාතකසිණයකුත් ඇද්ද, මේ අට කසිණයෝ සමථ යැ, යම් ආකාසකසිණයකුත් යම් විඤ්ඤාණකසිණයකුත් ඇද්ද, මේ විදර්ශනා යි. මෙසේ (සතිපට්ඨානාදි පූර්වභාග ප්‍රතිපදාභෙදයෙන් භින්න වූ) සියලු ආර්‍ය්‍යමාර්ගය යම් යම් ආකාරයෙකින් වදරන ලද ද ඒ ඒ ආකාරයෙන් ශමථ විදර්ශනා වශයෙන් යෙදියැයුත්තේ යි. ඒ ශමථාධිෂ්ඨාන වූ විදර්ශනාධර්මයෝ අනිච්චතායෙන් දුක්ඛතායෙන් අනත්තතායෙන් යන ත්‍රිවිධ විදර්ශනා ධර්මයන්ගෙන් සංගෘහීතයහ. ගණනට ගියාහ ' යි සේයි. ඒ (ආර්‍ය්‍යමාර්ගාධිගමයට

අනිච්චතාය දුක්ඛතාය අනත්තතාය. සො සමථවිපස්සනං භාවයමානො තීණි විමොක්ඛමුඛානි භාවයති. තීණි විමොක්ඛමුඛානි භාවයන්තො තයො ඛන්ධෙ භාවයති, තයො ඛන්ධෙ භාවයන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවයති.

රාගචරිතො පුග්ගලො අනිමිත්තෙන විමොක්ඛමුඛෙන නීයාති, අධිචිත්තසික්ඛාය සික්ඛන්තො ලොභං අකුසලමූලං පජහන්තො සුඛවෙදනීයං ඵස්සං අනුපගච්ඡන්තො සුඛං වෙදනං පරිජානන්තො රාගමලං පවාහෙන්තො රාගරජං නිද්ධුනන්තො රාගවිසං වමෙන්තො රාගග්ගිං නිබ්බාපෙන්තො රාගසල්ලං උප්පාටෙන්තො රාගජටං විජටෙන්තො.

දොසචරිතො පුග්ගලො අප්පණිහිතෙන විමොක්ඛමුඛෙන නීයාති, අධිසීලසික්ඛාය සික්ඛන්තො දොසං අකුසලමූලං පජහන්තො දුක්ඛවෙදනීයං ඵස්සං අනුපගච්ඡන්තො දුක්ඛං වෙදනං පරිජානන්තො දොසමලං පවාහෙන්තො දොසරජං නිද්ධුනන්තො දොසවිසං වමෙන්තො දොසග්ගිං නිබ්බාපෙන්තො දොසසල්ලං උප්පාටෙන්තො දොසජටං විජටෙන්තො.

මොහචරිතො පුග්ගලො සුඤ්ඤතවිමොක්ඛමුඛෙන නීයාති, අධිපඤ්ඤසික්ඛාය සික්ඛන්තො මොහං අකුසලමූලං පජහන්තො අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං අනුපගච්ඡන්තො අදුක්ඛමසුඛං වෙදනං පරිජානන්තො මොහමලං පවාහෙන්තො මොහරජං නිද්ධුනන්තො මොහවිසං වමෙන්තො මොහග්ගිං නිබ්බාපෙන්තො මොහසල්ලං උප්පාටෙන්තො මොහජටං විජටෙන්තො.

තත්ථ සුඤ්ඤතවිමොක්ඛමුඛං පඤ්ඤක්ඛන්ධො, අනිමිත්තවිමොක්ඛමුඛං සමාධික්ඛන්ධො, අප්පණිහිතවිමොක්ඛමුඛං සීලක්ඛන්ධො. සො තීණි විමොක්ඛමුඛානි භාවයන්තො තයො ඛන්ධෙ භාවයති, තයො ඛන්ධෙ භාවයන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවයති. තත්ථ යා ච සම්මාවාචා, යො ච සම්මා කම්මන්තො යො ච සම්මාආජීවො, අයං සීලක්ඛන්ධො, යො ච සම්මාවායාමො යා ච සම්මාසති යො ච සම්මාසමාධි අයං සමාධික්ඛන්ධො, යා ච සම්මාදිට්ඨි යො ච සම්මාසඞ්කප්පො අයං පඤ්ඤක්ඛන්ධො, තත්ථ සීලක්ඛන්ධො ච සමාධික්ඛන්ධො ච සමථො, පඤ්ඤක්ඛන්ධො විපස්සනා.

යො සමථවිපස්සනං භාවෙති, තස්ස ද්වෙ භවඞ්ගානි භාවනං ගච්ඡන්ති: කායො චිත්තඤ්ච. භවනිරොධගාමිනී පටිපදා ද්වෙ පදානි: සීලං සමාධි ච. සො හොති භික්ඛු භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤො. කායෙ භාවියමානෙ ද්වෙ ධම්මා භාවනං ගච්ඡන්ති: සම්මාකම්මන්තො සම්මාවායාමො ච, සීලෙ භාවියමානෙ ද්වෙ ධම්මා භාවනං ගච්ඡන්ති: සම්මාවාචා සම්මාආජීවො ච, චිත්තෙ භාවියමානෙ ද්වෙ ධම්මා භාවනං ගච්ඡන්ති: සම්මාසති සම්මාසමාධි ච. පඤ්ඤාය භාවියමානාය ද්වෙ ධම්මා භාවනං ගච්ඡන්ති: සම්මාදිට්ඨි සම්මා සඞ්කප්පො ච.

යුක්තප්‍රයුක්ත වූ) යොගී තෙමේ (කලෙක සමථයට සමවැදීම් වශයෙන් කලෙක විදර්ශනා සම්මර්ශණවශයෙන්) ශමථවිදර්ශනා වඩනුයේ තුන් විමොක්ෂමුඛයන් වඩයි. තුන් විමොක්ෂමුඛයන් වඩනුයේ සීල සමාධි පඤ්ඤ යන තුන් ස්කන්ධයන් වඩයි, තුන් ස්කන්ධයන් වඩනුයේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය වඩයි.

රාගචරිත ඇති පුද්ගල අධිචිත්තශික්ෂායෙහි හික්මෙනුයේ ලොභඅකුශලමූලය දුරු කරමින් සුඛවෙදනාවට හිත වූ ස්පර්ශයට තෘෂ්ණායෙන් නො පැමිණෙනුයේ සුඛවෙදනාව (විපරිණාමාදීන් දුකැයි) පරිජානනය කරනුයේ රාගමලය සෝදහරිමින් රාගරජස් සලාහරිමින් රාගවිෂය වමනය කරමින් රාගාග්නිය නිවමින් රාගශල්‍යය උපුටාහරිමින් රාගජටාව (අවුල) නිරාකුල කරනුයේ අනිමිත්තවිමොක්ෂමුඛයෙන් වර්තදුඃඛයෙන් නික්මැයෙයි.

දෙසචරිත ඇති පුද්ගල අධිශීලශික්ෂායෙහි හික්මෙනුයේ ද්වෙෂඅකුශලමූලය දුරු කරමින් දුක්ඛවෙදනාව ට හිතවූ ස්පර්ශය ට තෘෂ්ණාවශයෙන් නොපැමිණෙනුයේ දුක් වෙදනාව පරිජානනය කරමින් දෙසමලය සෝදහරිමින් ද්වෙෂරජස් සලාහරිමින් ද්වෙෂ විෂය වමනය කරමින් ද්වෙෂාග්නිය නිවමින් ද්වෙෂශල්‍යය උපුටාහරිමින් ද්වෙෂජටාව නිරාකුල කරනුයේ අප්පණිහිත විමොක්ෂමුඛයෙන් වට්ටදුක්ඛයෙන් නික්මැයෙයි.

මොහචරිත ඇති පුද්ගල අධිප්‍රඥශික්ෂායෙහි හික්මෙනුයේ මොහඅකුශලමූලය දුරු කරමින් අදුක්ඛමසුඛවෙදනාවට හිත වූ ස්පර්ශයට තෘෂ්ණාවශයෙන් නොපැමිණෙනුයේ අදුක්ඛමසුඛවෙදනාව පරිජානනය කරමින් මොහමලය ප්‍රවාහය කරමින් මොහරජස් නිර්ධූනනය කරමින් මොහවිෂ වමනය කරමින් මොහාග්නිය නිවමින් මොහශල්‍යය උපුටාහරිමින් මොහජටාව විජටනය කරනුයේ ශූන්‍යතවිමොක්ෂමුඛයෙන් වර්තදුඃඛයෙන් නිර්යාණය කෙරෙයි.

ඒ විමොක්ෂමුඛයන් කෙරෙහි ශූන්‍යතවිමොක්ෂමුඛය ප්‍රඥස්කන්ධ යැ, අනිමිත්ත විමොක්ෂමුඛය සමාධිස්කන්ධ යැ, අප්‍රණිහිතවිමොක්ෂමුඛය ශීලස්කන්ධ යි. ඒ යොගාවචර තුන් විමොක්ෂමුඛයන් වඩනුයේ තුන් ස්කන්ධයන් වඩයි, තුන් ස්කන්ධයන් වඩනුයේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය වඩයි, එහි යම් සම්‍යග්වචනයෙක් යම් සම්‍යක් කර්මාන්තයෙක් යම් සම්‍යගාජීවයෙක් ඇද්ද මේ ශීලස්කන්ධ යැ, යම් සම්‍යග්ව්‍යායාම යෙක් යම් සම්‍යක්ස්මෘතියක් යම් සම්‍යක්සමාධියෙක් ඇද්ද මේ සමාධිස්කන්ධය යැ, යම් සම්‍යග්දෘෂ්ටියක් යම් සම්‍යක්සංකල්පයෙක් ඇද්ද මේ ප්‍රඥස්කන්ධ යි. එහි ශීල ස්කන්ධය ද සමාධිස්කන්ධය ද සමථ යැ, ප්‍රඥස්කන්ධය විදර්ශනා යි.

යමෙක් ශමථවිදර්ශනා වඩා ද ඔහුට උපප්‍රාප්තිභවයට අඞ්ග වූ කය ද සිත ද යන ධර්මයෝ දෙදෙන වැඩීමට යෙති. ශීලය ද සමාධිය ද යන පාදධර්මයෝ දෙදෙන භව නිරොධගාමිනී පටිපද යි. සීලසමාධියෙහි සිටි ඒ මහණ (ආභිසමාචාරික ශීලය පිරීමෙන්) භාවිතකාය වෙයි, (ආදිබ්‍රහ්මචරියක ශීලය පිරීමෙන්) භාවිතසීල වෙයි, භාවිතචිත්ත භාවිතපඤ්ඤ වෙයි, කය වඩනුලබන කල්හි සම්මාකම්මන්ත ද සම්මාවායාම ද යන ධර්මයෝ දෙදෙන වැඩීමට යෙති, සීලය භාවියමාන කල්හි සම්මාවාචා ද සම්මාආජීව ද යන ධර්මයෝ දෙදෙන වැඩීමට යෙති, චිත්තය භාවියමාන කල්හි සම්මාසති ද සම්මා සමාධි ද යන ධර්මයෝ දෙදෙන වැඩීමට යෙති, ප්‍රඥව වඩනුලබන කල්හි සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප ද යන ධර්මයෝදෙදෙන වැඩීමට යෙත්.

තත්ථ යො ච සම්මාකම්මන්තො යො ච සම්මාවායාමො සියා කායිකො සියා චෙතසිකො. තත්ථ යො කායසංගහො සො කායෙ භාවිතෙ භාවනං ගච්ඡති යො චිත්තසඞ්ගහො සො චිත්තෙ භාවිතෙ භාවනං ගච්ඡති. සො සමථවිපස්සනං භාවයන්තො පඤ්චවිධං අධිගමං අධිගච්ඡති: ඛිප්පාධිගමො ච හොති, විමුත්තාධිගමො ච හොති, මහාධිගමො ච හොති, විපුලාධිගමො ච හොති, අනවසෙසාධිගමො ච හොති. තත්ථ සමථෙන ඛිප්පාධිගමො ච මහාධිගමො ච විපුලාධිගමො ච හොති, විපස්සනාය විමුත්තාධිගමො ච අනවසෙසාධිගමො ච හොති.

තත්ථ යො දෙසෙති සො දසබලසමන්නාගතො සත්ථා ඔවාදෙන සාවකෙ න විසංවාදෙති. සො තිවිධං: ඉදං කරොථ, ඉමිනා උපායෙන කරොථ, ඉදං වො කුරුමානානං හිතාය සුඛාය භවිස්සති. සො තථා ඔවදිතො තථානුසිට්ඨො තථා කරොන්තො තථා පටිපජ්ජන්තො තං භූමිං න පාපුණිස්සතීති නෙතං ඨානං විජ්ජති, සො තථා ඔවදිතො තථානුසිට්ඨො සීලක්ඛන්ධං අපරිපූරයන්තො තං භූමිං අනුපාපුණිස්සතීති නෙතං ඨානං විජ්ජති. සො තථා ඔවදිතො තථානුසිට්ඨො සීලක්ඛන්ධං පරිපූරයන්තො තං භූමිං අනුපාපුණිස්සතීති ඨානමෙතං විජ්ජති.

සම්මාසම්බුද්ධස්ස තෙ සතො ඉමෙ ධම්මා අනභිසම්බුද්ධාති නෙතං ඨානං විජ්ජති, සබ්බාසවපරික්ඛීණස්ස තෙ සතො ඉමෙ ආසවා අපරික්ඛීණාති නෙතං ඨානං විජ්ජති, යස්ස තෙ අත්ථාය ධම්මො දෙසිතො, සො න නීයාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායාති නෙතං ඨානං විජ්ජති. සාවකො ඛො පන තෙ ධම්මානුධම්මපටිපන්නො[1] සාමීචිපටිපන්නො[2] අනුධම්මචාරී සො පුබ්බෙන අපරං උළාරං විසෙසාධිගමං න සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

යෙ ඛො පන ධම්මා අන්තරායිකා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති නෙතං ඨානං විජ්ජති. යෙ ඛො පන ධම්මා අනීයානිකා තෙ නිය්‍යන්ති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායාති නෙතං ඨානං විජ්ජති. යෙ ඛො පන ධම්මා නීයානිකා තෙ නිය්‍යන්ති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායාති ඨානමෙතං විජ්ජති. සාවකො ඛො පන තෙ සඋපාදිසෙසො අනුපාදිසෙසං නිබ්බානධාතුං අනුපාපුණිස්සතීති නෙතං ඨානං විජ්ජති.

දිට්ඨිසම්පන්නො මාතරං ජීවිතා වොරොපෙය්‍ය හත්ථෙහි වා පාදෙහි වා සුහතං කරෙය්‍යාති නෙතං ඨානං විජ්ජති, පුථුජ්ජනො මාතරං ජීවිතා වොරොපෙය්‍ය හත්ථෙහි වා පාදෙහි වා සුහතං කරෙය්‍යාති ඨානමෙතං විජ්ජති. එවං පිතරං ... අරහන්තං භික්ඛුං ... දිට්ඨිසම්පන්නො පුග්ගලො සඞ්ඝං භින්දෙය්‍ය සඞ්ඝෙ වා සඞ්ඝරාජිං ජනෙය්‍යාති, නෙතං ඨානං විජ්ජති. පුථුජ්ජනො සඞ්ඝං භින්දෙය්‍ය සඞ්ඝෙ වා සඞ්ඝරජිං

---

1. ධම්මානුධම්මං, පටිපටිපන්නො - සීමු.
ධම්මානුධම්මප්පටිපන්නො - ම. ඡ. සං.
2. සාමීචිප්පටිපන්නො - ම. ඡ. සං.

එහි යම් සම්‍යක්කර්මාන්තයෙක් යම් සම්‍යග්ව්‍යායාමයෙක් ඇද්ද එය කායික ද වන්නේ යැ, චෛතසික ද වන්නේ යැ, එහි සම්මාකම්මන්ත වායාමයන් අතුරෙහි යමෙක් කායසංග්‍රහ වේ ද, එය කය භාවිත කල්හි වැඩීමට යෙයි, යමෙක් චිත්තසංග්‍රහ වේ ද, එය සිත භාවිත කල්හි වැඩීමට යෙයි. ඒ යොගාවචර ශමථවිදර්ශනා දෙක වඩනුයේ (අවස්ථා විශෙෂවශයෙන්) පඤ්චවිධ වූ ආයඁමාර්ගාධිගමයට පැමිණෙයි : (ඒ මෙසේ යැ,) වහා එකචිත්තක්ෂණිකව මාර්ගාධිගම කරන්නේ නුයි ඛිප්පාධිගම ද වෙයි, ප්‍රහාතව්‍යයන් අත්‍යන්තවිමුක්තිවශයෙන් දුරුකරනුයෙන් විමුත්තාධිගම ද වෙයි, මහත් වූ ලොකොත්තර ශීලස්කන්ධාදිය අධිගම කරනුයෙන් මහාධිගම ද වෙයි, විපුලව අධිගම කරනුයෙන් විපුලාධිගම ද වෙයි, තමා විසින් අධිගන්තව්‍ය වූ කිසිවක් අනවශෙෂ කරනුයෙන් අනව සෙසාධිගම ද වේ. ඒ අධිගමයන් කෙරෙහි ශමථයෙන් ඛිප්පාධිගම ද මහාධිගම ද විපුලාධිගම ද වෙයි, විදර්ශනායෙන් විමුත්තාධිගම ද අනවසෙසාධිගම ද වේ.

එහි යම් ශාස්තෘ කෙනෙක් දහම් දෙසනසේක් ද දශබලසමන්වාගත ඒ ශාස්තෘහු අවවාදයෙන් ශ්‍රාවකයන් විසංවාදනා නො කෙරෙති, (නො රවටති,) ඒ ශාස්තෘහු තුන් ප්‍රකාරයෙකින් අවවාද කෙරෙති : (සරණගමන ශීලසමාදනාදි) ‘මෙය කරවු, මේ උපායෙන් කරවු, මෙය කරන තොපට හිත පිණිස සුව පිණිස වන්නේය ’යි. එපරිදි අවවාද කරනු ලැබූ එපරිදි අනුසස්නාලද ඒ ශ්‍රාවක ඒ අනුශාසනා පරිදි කරනුයේ එසේ පිළිපදනේ ඒ (දස්සන භාවනා) භූමියට නොපැමිණෙන්නේ ය යන තෙල කාරණය විද්‍යමාන නොවේ. ඒ ශ්‍රාවක එසේ අවවාද කරනලදුයේ එසේ අනුසස්නාලදුයේ ශීල ස්කන්ධය පරිපූර්ණ නො කරනුයේ ඒ භූමියට පැමිණෙන්නේයැ යන තෙල කරුණ නොවේ. එසේ අවවාද කරනලද එසේ අනුසස්නාලද ඒ ශ්‍රාවක ශීලස්කන්ධය පරිපූර්ණ කරනුයේ ඒ (දර්ශන භාවනා) භූමියට පැමිණෙන්නේයැ යන තෙල කරුණ වන්නේයි.

සම්‍යක්සම්බුද්ධයෙමි ප්‍රතිඥ කරන තොප විසින් මෙනම් ධර්මයෝ අනභි සම්බුද්ධයහ ’ යි (සකාරණව ප්‍රතිචොදනාකරන) තෙල කරුණ නොවෙයි, සර්වාස්‍රව පරික්ෂීණ යයි ප්‍රතිඥ කරන තොප විසින් මෙනම් ආස්‍රවයෝ අපරික්ෂීණයහ ’ යි ප්‍රති චොදනා කරන තෙල කරුණ නොවෙයි, තොප විසින් යම් රාගාදිප්‍රහාණයක් සඳහා අසුභභාවනාදි ධර්මයෙක් දෙසනලදද ඒ ධර්මය එසේ පිළිපන්නහුට මොනොවට දුඃඛක්ෂය පිණිස නො පවත්නේයැ යන තෙල කරුණ නො වෙයි. යළි තොපගේ ශ්‍රාවකයෙක් ධර්මානුධර්මයෙහි පිළිපන්නේ සම්‍යක්ප්‍රතිපන්න වූයේ අනුරූපධර්මයෙහි හැසිරෙනසුලු වේ ද, පූර්වකාලයට වඩා අපරකාලප්‍රවෘත්ත වූ උදර වූ අභිඤ්ඤපටිසම්භිදදි විශෙෂාධිගමය ප්‍රත්‍යක්ෂ නො කරන්නේයැ යන තෙල කරුණ නො වේ.

තවද යම් ධර්ම කෙනෙක් මාර්ගඵලයනට අන්තරායකර වූවාහු ද ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස සමර්ථ නො වේ යැ යන තෙල කරුණ නො වෙයි, යළි යම් ධර්ම කෙනෙක් අනෛයඁාණික වෙත් ද, ඒ ධර්මයෝ එය පිළිපදනහුට මැනැවින් දුක් ක්ෂයවීම පිණිස පැමිණෙති යන තෙල කරුණ නො වෙයි, යළි යම් ධර්ම කෙනෙක් නෛයඁාණික වෙත් ද ඒ ධර්මයෝ එය පිළිපදනහුට මැනැවින් දුක් ක්ෂයවීම පිණිස පැමිණෙති යන තෙල කරුණ විද්‍යමාන වෙයි, යළි ඔබගේ ශ්‍රාවකයෙක් සඋපාදිසෙස වූයේ අනුපාදිසෙසනිබ්බානධාතුවට පැමිණෙන්නේයැ යන තෙල කරුණ විද්‍යමාන නො වේ.

මාර්ගදෘෂ්ටිසම්පන්න සෝවන් පුද්ගල ජනික මව දිවියෙන් තොරකරන්නේයැ අතින් හෝ පයින් හෝ අධිකව හිංසාකරන්නේයැ යන තෙල කරුණ නො වෙයි, පුහුදුන් පුද්ගල ජනික මව දිවියෙන් තොරකරන්නේයැ අතින් හෝ පයින් හෝ සුහතව හිංසා කරන්නේයැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි. මෙසේ ජනක පියා . . . රහත් මහණ . . . දිට්ඨිසම්පන්න පුද්ගල සමග සඞ්ඝයා බිඳුනේයැ සඞ්ඝයා කෙරෙහි සඞ්ඝරාජිය හෝ උපදවන්නේයැ යන තෙල කරුණ නො වෙයි, පුහුදුන් පුද්ගල සඞ්ඝයා බිඳුනේයැ සඞ්ඝයා

ජනෙය්‍යාති ඨානමෙතං විජ්ජති. දිට්ඨිසම්පන්නො තථාගතස්ස දුට්ඨචිත්තො ලොහිතං උප්පාදෙය්‍ය, පරිනිබ්බුතස්ස වා තථාගතස්ස දුට්ඨචිත්තො ථූපං භින්දෙය්‍යාති නෙතං ඨානං විජ්ජති. පුථුජ්ජනො තථාගතස්ස දුට්ඨචිත්තො ලොහිතං උප්පාදෙය්‍ය, පරිනිබ්බුතස්ස වා තථාගතස්ස දුට්ඨචිත්තො ථූපං භින්දෙය්‍යා'ති ඨානමෙතං විජ්ජති. දිට්ඨිසම්පන්නො අඤ්ඤං සත්ථාරං අපදිසෙය්‍ය අපි ජීවිතහෙතූති නෙතං ඨානං විජ්ජති, පුථුජ්ජනො අඤ්ඤං සත්ථාරං අපදිසෙය්‍යාති ඨානමෙතං විජ්ජති. දිට්ඨිසම්පන්නො ඉතො බහිද්ධා අඤ්ඤං දක්ඛිණෙය්‍යං පරියෙසෙය්‍යාති නෙතං ඨානං විජ්ජති. පුථුජ්ජනො ඉතො බහිද්ධා අඤ්ඤං දක්ඛිණෙය්‍යං පරියෙසෙය්‍යාති ඨානමෙතං විජ්ජති. දිට්ඨිසම්පන්නො කුතූහලමඞ්ගලෙන සුද්ධිං පච්චෙය්‍යාති නෙතං ඨානං විජ්ජති. පුථුජ්ජනො කුතූහලමඞ්ගලෙන සුද්ධිං පච්චෙය්‍යාති ඨානමෙතං විජ්ජති.

ඉත්ථී රාජා චක්කවත්ති සියාති නෙතං ඨානං විජ්ජති. පුරිසො රාජා චක්කවත්ති සියාති ඨානමෙතං විජ්ජති. ඉත්ථී සක්කො දෙවානමින්දො සියාති නෙතං ඨානං විජ්ජති. පුරිසො සක්කො දෙවානමින්දො සියාති ඨානමෙතං විජ්ජති. ඉත්ථී මාරො පාපිමා සියාති නෙතං ඨානං විජ්ජති. පුරිසො මාරො පාපිමා සියාති ඨානමෙතං විජ්ජති. ඉත්ථී මහාබ්‍රහ්මා සියාති නෙතං ඨානං විජ්ජති. පුරිසො මහාබ්‍රහ්මා සියාති ඨානමෙතං විජ්ජති. ඉත්ථී තථාගතො අරහං සම්මාසම්බුද්ධො සියාති නෙතං ඨානං විජ්ජති. පුරිසො තථාගතො අරහං සම්මාසම්බුද්ධො සියාති ඨානමෙතං විජ්ජති.

ද්වෙ තථාගතා අරහන්තො සම්මාසම්බුද්ධා අපුබ්බං අචරිමං එකිස්සා ලොකධාතුයා උප්පජ්ජෙය්‍යුං ධම්මං වා දෙසෙය්‍යුන්ති නෙතං ඨානං විජ්ජති. එකොව තථාගතො අරහං සම්මාසම්බුද්ධො එකිස්සා ලොකධාතුයා උප්පජ්ජිස්සති ධම්මං වා දෙසිස්සතීති ඨානමෙතං විජ්ජති.

තිණ්ණං දුච්චරිතානං ඉට්ඨො කන්තො පියො මනාපො විපාකො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති. තිණ්ණං දුච්චරිතානං අනිට්ඨො අකන්තො අප්පියො අමනාපො විපාකො භවිස්සතීති ඨානමෙතං විජ්ජති. තිණ්ණං සුචරිතානං අනිට්ඨො අකන්තො අප්පියො අමනාපො විපාකො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති, තිණ්ණං සුචරිතානං ඉට්ඨො කන්තො පියො මනාපො විපාකො භවිස්සතීති ඨානමෙතං විජ්ජති.

අඤ්ඤතරො සමණො වා බ්‍රාහ්මණො වා කුහකො ලපකො නෙමිත්තිකො කුහනලපනනෙමිත්තිකත්තං පුබ්බඞ්ගමං කත්වා පඤ්චනීවරණෙ අප්පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ චතූසු සතිපට්ඨානෙසු අනුපට්ඨිතස්සති විහරන්තො සත්තබොජ්ඣඞ්ගෙ අභාවයිත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣිස්සතීති නෙතං ඨානං විජ්ජති, අඤ්ඤතරො සමණො වා බ්‍රාහ්මණො වා සබ්බදොසාපගතො පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ චතූසු සතිපට්ඨානෙසු උපට්ඨිතස්සති විහරන්තො සත්තබොජ්ඣඞ්ගෙ භාවයිත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣිස්සතීති ඨානමෙතං විජ්ජති. යං එත්ථ ඤාණං හෙතුසො ඨානසො අනොධිසො, ඉදං වුච්චති ඨානාඨානඤාණං පඨමං තථාගතබලං. ඉති (1)

කෙරෙහි සඞ්ඝරාජිය හෝ උපදවන්නේයැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි. දිට්ඨි සම්පන්න පුද්ගල දුෂ්ට සිත්ඇතිව තථාගතයන්ගේ කයෙහි ලෙහෙ උපදවන්නේ යැ දුෂ්ට සිත්ඇතිව පිරිනිවි තථාගතයන්ගේ සධාතුක ස්තූපය හෝ බිඳින්නේයැ යන තෙල කරුණ නො වෙයි, පුහුදුන් පුද්ගල දුෂ්ට සිත්ඇතිව තථාගතයන්ගේ සිරුරෙහි ලෙහෙ උපද වන්නේයැ දුෂ්ට සිත් ඇතිව පිරිනිවි තථාගතයන්ගේ සධාතුක ස්තූපය හෝ බිඳින්නේයැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි. දිට්ඨිසම්පන්න පුද්ගල ජීවිතහෙතුයෙන් නමුදු අන්‍ය ශාස්තෘවරයකු (මේ මාගේ ශාස්තෘ යයි) දක්වන්නේයැ යන තෙල කරුණ නො වෙයි, පුහුදුන් පුද්ගල අන්‍ය ශාස්තෘවරයකු අපදෙසකරන්නේයැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි. දිට්ඨිසම්පන්න පුද්ගල මෙසස්නෙන් බැහැර අන්‍ය දක්ෂිණියයකු සොයන්නේයැ යන තෙල කරුණ නො වෙයි, පුහුදුන් පුද්ගල මෙසස්නෙන් බැහැර අන්‍ය දක්ෂිණාහර්යකු සොයන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි. දිට්ඨිසම්පන්න පුද්ගල කොතුහල (දිට්ඨශ්‍රුතමුත) මඞ්ගලයෙන් ආත්මශුද්ධිය හදහන්නේයැ යන තෙල කරුණ නො වෙයි, පෘථග්ජන පුද්ගල දිට්ඨශ්‍රුතමුතමඞ්ගලයෙන් ආත්මශුද්ධිය හදහන්නේයැ යන තෙල කරුණ විද්‍යමාන වේ.

ස්ත්‍රිය සක්විතිරජ වන්නේයැ යන තෙල කරුණ නො වෙයි, පුරුෂයෙක් සක්විතිරජ වන්නේයැ යන තෙල කරුණ වෙයි. ස්ත්‍රිය ශක්‍රදෙවේන්ද්‍ර වන්නේයැ යන තෙල කරුණ නො වෙයි, පුරුෂයෙක් ශක්‍රදෙවේන්ද්‍ර වන්නේයැ යන තෙල කරුණ වෙයි. ස්ත්‍රිය පාපිමත් මාර වන්නේයැ යන තෙල කරුණ නො වෙයි, පුරුෂයෙක් පාපිමත් මාර වන්නේයැ යන තෙල කරුණ වෙයි. ස්ත්‍රිය මහාබ්‍රහ්ම වන්නේයැ යන තෙල කරුණ නො වෙයි, පුරුෂයෙක් මහාබ්‍රහ්ම වන්නේයැ යන තෙල කරුණ වෙයි. ස්ත්‍රිය තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධ වන්නේයැ යන තෙල කරුණ නො වෙයි, පුරුෂයෙක් තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධ වන්නේයැ යන තෙල කරුණ විද්‍යමාන වේ.

තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ දෙනමක් පෙරපසු නොවැ එකවට එක් ලොකධාතුයෙක්හි උපදනාහු යැ ධර්මය හෝ දෙසන්නාහු යැ යන තෙල කරුණ නො වෙයි, එක් මැ තථාගත අර්හත් සම්මාසම්බුද්‍ධ කෙනෙක් එක් ලොකධාතුයෙක්හි උපදනාහ, ධර්මය හෝ දෙශනා කරන්නාහ යන තෙල කාරණය විද්‍යමාන වේ.

ත්‍රිවිධ දුශ්චරිතයන්ගේ ඉෂ්ට කාන්ත ප්‍රිය මනාප වූ විපාකය වන්නේයැ යන තෙල කරුණ නො වෙයි, ත්‍රිවිධ දුශ්චරිතයන්ගේ අනිෂ්ට අකාන්ත අප්‍රිය අමනාප වූ විපාකය වන්නේයැ යන තෙල කරුණ වෙයි. ත්‍රිවිධ සුචරිතයන්ගේ අනිෂ්ට අකාන්ත අප්‍රිය අමනාප වූ විපාකය වන්නේයැ යන තෙල කරුණ නො වෙයි, ත්‍රිවිධ සුචරිතයන්ගේ ඉෂ්ට කාන්ත ප්‍රිය මනාප වූ විපාකය වන්නේයැ යන තෙල කරුණ විද්‍යමාන වේ.

පාපෙච්ඡව සම්භාවනා රිසියෙන් ජනයා විස්මයපත් කරනුයෙන් කුහක වූ ප්‍රත්‍යය ඇසිරි කොට බිණුම් වශයෙන් ලපක වූ ප්‍රත්‍යය උපදවන නිමිති කරනුයෙන් නෛමිත්තක වූ අන්‍යතර මහණෙක් වේවයි බමුණෙක් වේවයි කුහනලපනනෛමිත්තක බව පෙරදැරි කොට සිතට උපක්ලෙශ වූ ප්‍රඥව දුර්වල කරන පඤ්චනිවරණයන් සමුච්ඡෙද නො කොට සතර සීවටන්හි නොඑළැඹසිටි සිහි ඇතිව වාසය කරනුයේ සප්ත බොධ්‍යඞ්ගයන් නො වඩා අනුත්තර සම්‍යක්සම්බොධිය අවබොධ කරන්නේයැ යන තෙල කරුණ නො වෙයි, පාරමීප්‍රතිපක්ෂ වූ සියලු දෙෂයන්ගෙන් අපගත අන්‍යතර ශ්‍රමණයෙක් වේවයි බ්‍රාහ්මණයෙක් වේවයි සිතට උපක්ලෙශ වූ ප්‍රඥව දුර්වල කරන පඤ්චනීවරණයන් සමුච්ඡෙද කොට සතර සතිපට්ඨානයන්හි එළැඹසිටි සිහිඇතිව වාසය කරනුයේ සප්ත බොධ්‍යඞ්ගයන් වඩා අනුත්තර සම්‍යක්සම්බොධිය අධිගම කරන්නේයැ යන තෙල කාරණය විද්‍යමාන වේ. මෙහි ස්ථානාස්ථාන දෙකට හෙතුවශයෙන් එකෙණෙහි මැ (ආවර්ජනසමනන්තරව) අනවශෙෂ කොට පැවති යම් ඥනයෙක් ඇද්ද මේ ඨානාඨානඥණය පළමුවන තථාගත බලයැ ' යි කියනු ලැබෙ. (1)

ඨානාඨානගතා සබ්බෙ ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා, කෙචි සග්ගූපගා කෙචි අපායූපගා කෙචි නිබ්බානූපගා. එවං භගවා ආහ :

1. "සබ්බෙ සත්තා මරිස්සන්ති මරණන්තං හි ජීවිතං,
 යථාකම්මං ගමිස්සන්ති පුඤ්ඤපාපඵලූපගා,

2. නිරයං පාපකම්මන්තා පුඤ්ඤකම්මා ච සුගතිං,
 අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා"ති.

"සබ්බෙ සත්තා"ති අරියා ච අනරියා ච සක්කායපරියාපන්නා ච සක්කායවීතිවත්තා ච; "මරිස්සන්ති"ති ද්වීහි මරණෙහි : දන්ධමරණෙන ච අදන්ධමරණෙන ච; සක්කායපරියාපන්නානං අදන්ධමරණං සක්කායවීතිවත්තානං දන්ධමරණං. "මරණන්තං හි ජීවිත"න්ති ඛයා ආයුස්ස ඉන්ද්‍රියානං උපරොධා ජීවිතපරියන්තො මරණපරියන්තො ; "යථාකම්මං ගමිස්සන්ති"ති කම්මස්සකතා ; "පුඤ්ඤපාපඵලූපගා"ති කම්මානං ඵලදස්සාවිතා ච අවිප්පවාසො ච ; "නිරයං පාපකම්මන්තා"ති අපුඤ්ඤසංඛාරා ; "පුඤ්ඤකම්මා ච සුගති"න්ති පුඤ්ඤසංඛාරා සුගතිං ගමිස්සන්ති ; අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා"ති සබ්බසංඛාරානං සමතික්කමනං. තෙනාහ භගවා : "සබ්බෙ-පෙ-අනාසවා"ති.

"සබ්බෙ සත්තා මරිස්සන්ති මරණන්තං හි ජීවිතං
යථාකම්මං ගමිස්සන්ති පුඤ්ඤපාපඵලූපගා
නිරයං පාපකම්මන්තා"ති

ආගාළ්හා ච නිජ්ඣාමා ච පටිපදා. "අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා"ති මජ්ඣිමා පටිපදා.

"සබ්බෙ සත්තා මරිස්සන්ති මරණන්තං හි ජීවිතං
යථාකම්මං ගමිස්සන්ති පුඤ්ඤපාපඵලූපගා
නිරයං පාපකම්මන්තා"ති

අයං සංකිලෙසො; එවං සංසාරං නිබ්බත්තයති. "සබ්බෙ සත්තා මරිස්සන්ති -පෙ- නිරයං පාපකම්මන්තා"ති ඉමෙ තයො වට්ටා: දුක්ඛවට්ටො කම්මවට්ටො කිලෙසවට්ටො. "අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා"ති තිණ්ණං වට්ටානං විවට්ටනා.

"සබ්බෙ සත්තා මරිස්සන්ති -පෙ- නිරයං පාපකම්මන්තා"ති ආදීනවො; "පුඤ්ඤකම්මා ච සුගති"න්ති අස්සාදො; "අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා"ති නිස්සරණං.

"සබ්බෙ සත්තා මරිස්සන්ති -පෙ- නිරයං පාපකම්මන්තා"ති හෙතු ච ඵලඤ්ච; පඤ්චක්ඛන්ධා ඵලං, තණ්හා හෙතු. "අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා"ති මග්ගො ච ඵලඤ්ච.

(1) මෙසේ උක්තප්‍රකාරයෙන් ස්ථානාස්ථානභාවයට ගිය සියලු සංඛතධර්මයෝ ක්ෂය ස්වභාව ඇති ව්‍යයස්වභාව ඇති විරාගස්වභාව ඇති නිරුද්ධ වන ස්වභාව ඇති වෙත්. (ඒ සත්ත්වාඛ්‍ය සංඛතයන් කෙරෙහි) ධර්මචාරී කිසිකෙනෙක් ස්වර්ගයට යන්නාහු අධර්මචාරී කිසිකෙනෙක් නිරයට යන්නාහු ආර්‍ය්‍යමාර්ගයට පිළිපන් කිසි කෙනෙක් නිවනට යන්නාහු වෙත්. බුදුහු මෙසේ වදළහ :

1. ආර්‍ය්‍ය වූ ද අනාර්‍ය්‍ය වූ ද සියලු සත්ත්වයෝ මැරෙන්නාහ, යම්හෙයෙකින් ජීවිතෙන්ද්‍රිය මරණය අන්ත කොට ඇත්තේ ද එහෙයිනි, පුණ්‍යපාපඵලයට පැමිණියාහු කම්වූපරිදි පරලොව යන්නාහ.

2. පාපකර්ම ඇත්තාහු නිරයට ද පුණ්‍යකර්ම ඇත්තාහු සුගතියට ද යන්නාහ, යළි සසරබිය දක්නා අන්‍යයෝ ආර්‍ය්‍යමාර්ගය වඩා අනාශ්‍රව වූවාහු පිරිනිවෙත් යයි.

සබ්බෙ සත්තා යනු : ආර්‍ය්‍යයෝ ද අනාර්‍ය්‍යයෝ ද සත්කායපර්‍ය්‍යාපන්නයෝ ද සත්කාය ඉක්මැවූවාහු ද වෙති, මරිස්සන්ති යනු :දන්ධමරණයෙන් ද අදන්ධමරණයෙන් ද යන දෙවැදෑරුම් මරණයෙන්, සත්කායපර්‍ය්‍යාපන්නයනට අදන්ධමරණය ද සත්කාය ඉක්මවූවනට දන්ධමරණය ද වෙයි. මරණන්තං හි ජීවිතං යනු : ආයුක්ෂය වීමෙන් ඉන්ද්‍රියයන්ගේ උපච්ඡෙදයෙන් ජීවිතයාගේ පර්‍ය්‍යන්තය මරණපර්‍ය්‍යන්තය යි. යථා කම්මං ගමිස්සන්ති යනු : කර්මය ස්වකීය කොට ඇතිබව යැ, පුඤ්ඤපාපඵලූපගා යනු : කර්මයන්ගේ ඵලය ප්‍රත්‍යක්ෂව දක්නාසුලුබව ද කර්මඵලයෙන් අවිප්‍රවාස බව ද දක්වයි. නිරයං පාපකම්මන්තා යි අපුණ්‍යාභිසංස්කාරයෝ දක්වනලදහ. පුඤ්ඤකම්මා ච සුග්ගතිං යනු : පුණ්‍යාභිසංස්කාරහෙතුයෙන් සුගතියට යන්නාහ. අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා යනු : සියලු සංස්කාරයන්ගේ ඉක්මවීම යි.
එයින් වදළහ, බුදුහු : " සබ්බෙ – පෙ – අනාසවා " යි.

" සබ්බෙ සත්තා මරිස්සන්ති මරණන්තං හි ජීවිතං
යථාකම්මං ගමිස්සන්ති පුඤ්ඤපාපඵලූපගා,
නිරයං පාපකම්මන්තා " යනු :

කාමසුඛල්ලිකානුයොග සංඛ්‍යාත ආගාළ්හ පටිපදව ද අත්තකිලමථානුයොග සංඛ්‍යාත නිජ්ඣාම පටිපදව ද යන දෙක යි, " අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා ' යනු : මජ්ඣිම පටිපද යි.

" සබ්බෙ සත්තා මරිස්සන්ති මරණන්තං හි ජීවිතං
යථාකම්මං ගමිස්සන්ති පුඤ්ඤපාපඵලූපගා,
නිරයං පාපකම්මන්තා " යනු :

මෙ සංක්ලෙශ යැ, මෙසේ සංසාරය නිපදවයි, " සබ්බෙ සත්තා මරිස්සන්ති – පෙ – නිරයං පාපකම්මන්තා " යනු : දුක්ඛවට්ට යැ කම්මවට්ට යැ කිලෙසවට්ට යැ යන මේ තුන්වර්තයෝ යි. " අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා " යනු : තුන් වර්තයන්ගේ විවර්තනය (නැසීම) යි.

" සබ්බෙ සත්තා මරිස්සන්ති – පෙ – නිරයං පාපකම්මන්තා " යනු : ආදීනව යැ. " පුඤ්ඤකම්මා ච සුග්ගතිං " යනු : ආස්වාද යැ, " අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා " යනු : නිස්සරණ යි.

" සබ්බෙ සත්තා මරිස්සන්ති – පෙ – නිරයං පාපකම්මන්තා " යනු : හෙතු ද ඵල ද යන දෙක යැ, පඤ්චස්කන්ධයෝ ඵල යැ, තණ්හාව හෙතු යි. " අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා " යනු : මාර්ගය ද ඵලය ද යන දෙක යි.

“සබ්බෙ සත්තා මරිස්සන්ති -පෙ- නිරයං පාපකම්මන්තා”ති අයං සංකිලෙසො; සො සංකිලෙසො තිවිධො: තණ්හාසංකිලෙසො දිට්ඨිසංකිලෙසො දුච්චරිතසංකිලෙසොති. තත්ථ තණ්හාසංකිලෙසො තීහි තණ්හාහි නිද්දිසිතබ්බො: කාමතණ්හාය භවතණ්හාය විභවතණ්හාය. යෙන යෙන වා පන වත්ථුනා අජ්ඣොසිතො තෙන තෙනෙව නිද්දිසිතබ්බා, තස්සා විත්ථාරො ඡත්තිංසාය තණ්හාය ජාලිනියා විචරිතානි. තත්ථ දිට්ඨිසංකිලෙසො උච්ඡෙදසස්සතෙන නිද්දිසිතබ්බො. යෙන යෙන වා පන වත්ථුනා දිට්ඨිවසෙන අභිනිවිසති ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති තෙන තෙනෙව නිද්දිසිතබ්බො. තස්සා විත්ථාරො ද්වාසට්ඨිදිට්ඨිගතානි. තත්ථ දුච්චරිතසංකිලෙසො චෙතනාචෙතසිකකම්මෙන නිද්දිසිතබ්බො. තීහි දුච්චරිතෙහි: කායදුච්චරිතෙන වචීදුච්චරිතෙන මනොදුච්චරිතෙන. තස්ස විත්ථාරො දසඅකුසලකම්මපථා. “අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා”ති ඉදං වොදානං; තයිදං වොදානං තිවිධං: තණ්හාසංකිලෙසො සමථෙන විසුජ්ඣති, සො සමථො සමාධික්ඛන්ධො. දිට්ඨිසංකිලෙසො විපස්සනාය විසුජ්ඣති, සා විපස්සනා පඤ්ඤාක්ඛන්ධො. දුච්චරිතසංකිලෙසො සුචරිතෙන විසුජ්ඣති, තං සුචරිතං සීලක්ඛන්ධො.

“සබ්බෙ සත්තා මරිස්සන්ති මරණන්තං හි ජීවිතං,
යථාකම්මං ගමිස්සන්ති පුඤ්ඤපාපඵලූපගා;
නිරයං පාපකම්මන්තා”ති

අපුඤ්ඤපටිපදා, “පුඤ්ඤකම්මා ච සුග්ගති”න්ති පුඤ්ඤපටිපදා; “අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා”ති පුඤ්ඤපාපසමතික්කමපටිපදා; තත්ථ යා ච පුඤ්ඤපටිපදා යා ච අපුඤ්ඤපටිපදා අයං එකා පටිපදා සබ්බත්ථ ගාමිනී, එකා අපායෙසු එකා දෙවෙසු, යා ච පුඤ්ඤපාපසමතික්කමපටිපදා, අයං තත්ථතත්ථගාමිනී පටිපදා.

තයො රාසී: මිච්ඡත්තනියතො රාසි සම්මත්තනියතො රාසි අනියතො රාසි. තත්ථ යො ච මිච්ඡත්තනියතො රාසි, යො ච සම්මත්තනියතො රාසි එකා පටිපදා තත්ථතත්ථගාමිනී. තත්ථ යො අනියතො රාසි අයං සබ්බත්ථගාමිනී පටිපදා. කෙන කාරණෙන: පච්චයං ලභන්තො නිරයෙ උප්පජ්ජෙය්‍ය, පච්චයං ලභන්තො තිරච්ඡානයොනීසු උප්පජ්ජෙය්‍ය, පච්චයං ලභන්තො පෙත්තිවිසයෙසු උප්පජ්ජෙය්‍ය, පච්චයං ලභන්තො අසුරෙසු උප්පජ්ජෙය්‍ය පච්චයං ලභන්තො දෙවෙසු උප්පජ්ජෙය්‍ය, පච්චයං ලභන්තො මනුස්සෙසු උප්පජ්ජෙය්‍ය, පච්චයං ලභන්තො පරිනිබ්බායෙය්‍ය. තස්මායං සබ්බත්ථගාමිනී පටිපදා, යං එත්ථ ඤාණං හෙතුසො ඨානසො අනොධිසො, ඉදං වුච්චති සබ්බත්ථගාමිනීපටිපදා ඤාණං, දුතියං තථාගතබලං. ඉති (2)

සබ්බත්ථගාමිනී පටිපදා අනෙකධාතුලොකො. තත්ථතත්ථගාමිනී පටිපදා නානාධාතුලොකො. තත්ථ කතමො අනෙකධාතුලොකො: චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු, සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු, ඝානධාතු ගන්ධධාතු ඝානවිඤ්ඤාණධාතු, ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු, කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු, මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු, පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු ආකාසධාතු විඤ්ඤාණධාතු කාමධාතු

" සබ්බෙ සත්තා මරිස්සන්ති – පෙ – නිරයං පාපකම්මන්තා " යනු : මේ සංක්ලෙශ යැ, ඒ සංකිලෙසය ' තණ්හාසංකිලෙස දිට්ඨිසංකිලෙස දුශ්චරිතසංකිලෙස ' යි ත්‍රිවිධ යි. එහි තණ්හාසංකිලෙසය කාමතණ්හායෙන් භවතණ්හායෙන් විභවතණ්හායෙන් යන තුන්වැදෑරුම් තෘෂ්ණායෙන් දක්වියයුත්තේ යැ. තවද යම් යම් වස්තුයෙකින් හෝ අධ්‍යවසිත (බැසගන්නාලද්දේ) ද ඒ ඒ වස්තුයෙන් මැ දක්වියයුත්තේ යි. ඒ තෘෂ්ණා විස්තාරය ෂට්ත්‍රිංශත් තෘෂ්ණාජාලිනියගේ විචරිතයෝ යි. එහි දිට්ඨිසංකිලෙසය උච්ඡෙද ශාශ්වත දෙකින් දක්වියයුත්තේ යැ, යළි යම් යම් වස්තුයෙකින් දෘෂ්ටිවශයෙන් ' මෙය මැ සැබව අන්‍යය මොස යැ ' යි බැසගනී ද, ඒ ඒ වස්තුයෙන් මැ දක්වියයුත්තේ යි. ඒ දෘෂ්ටිවිස්තරය ද්වාෂෂ්ටි දෘෂ්ටිගතයෝ යි. එහි දුශ්චරිතසංකිලෙසය චෙතනාකර්මයෙන් චෛතසිකකර්මයෙන් දක්වියයුත්තේ යැ, කායදුශ්චරිතයෙන් වාග්දුශ්චරිතයෙන් මනො දුශ්චරිතයෙන් යන තුන් දුශ්චරිතයෙනි. ඒ දුශ්චරිතවිස්තාරය දශඅකුශලකර්මපථයෝ යි. " අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා " යන මේ වොදානා යැ. ඒ ව්‍යවදානය ත්‍රිවිධ යැ : තණ්හාසංකිලෙසය සමථයෙන් විශුද්ධ වෙයි, ඒ සමථය සමාධි ස්කන්ධ යි. දිට්ඨිසංකිලෙසය විදර්ශනායෙන් විශුද්ධ වෙයි, ඒ විදර්ශනාව ප්‍රඥාස්කන්ධ යි. දුශ්චරිතසංකිලෙසය සුචරිතයෙන් විශුද්ධ වෙයි, ඒ සුචරිතය ශීලස්කන්ධ යි.

" සබ්බෙ සත්තා මරිස්සන්ති මරණන්තං හි ජීවිතං
යථාකම්මං ගමිස්සන්ති පුඤ්ඤපාපඵලූපගා
නිරයං පාපකම්මන්තා " යනු :

අපුණ්‍යප්‍රතිපද යැ, පුඤ්ඤකම්මා ච සුග්ගතිං යනු : පුණ්‍යප්‍රතිපද යැ, අපරෙ ච මග්ගං භාවෙත්වා පරිනිබ්බන්ති අනාසවා යනු : පුණ්‍යපාපසමතික්‍රමප්‍රතිපද යි. එහි යම් පුණ්‍යප්‍රතිපදවකුත් යම් අපුණ්‍යප්‍රතිපදවකුත් ඇද්ද මෝ සර්වත්‍රගාමිනී වූ එක් ප්‍රතිපදවකි. එයින් එක් ප්‍රතිපදවක් සතර අපායෙහි ද, එකක් දෙවියන් කෙරෙහි ද උපතට හෙතු යි. යම් පුණ්‍ය පාප සමතික්‍රමප්‍රතිපදවක් ඇද්ද මෝ ඒ ඒ තැන්හි දී මැ නිවනට යනසුලු ප්‍රතිපදයි. (යළි ඒ ප්‍රතිපදවන්ගේ මැ විභාග දක්වති ' තයො රාසි ' යනාදීන් —)

මිච්ඡත්තනියත රාසි යැ සම්මත්තනියත රාසි යැ අනියත රාසි යැයි තුන් රාසියෙකි. එහි යම් මිච්ඡත්තනියත රාසියෙක් ඇද්ද යම් සම්මත්තනියත රාසියෙකුත් ඇද්ද මේ ඒ ඒ තැන යනසුලු වූ එක පටිපදවකි. එහි යම් අනියත රාසියෙක් ඇද්ද මේ සර්වත්‍රගාමිනී ප්‍රතිපද යි. කවර කරුණින යත් : අවිද්‍යාදි ප්‍රත්‍යය ලබනුයේ නිරයෙහි උපදනේ යැ, ප්‍රත්‍යය ලබනුයේ තිරිසන්යොන්හි උපදනේ යැ, ප්‍රත්‍යය ලබනුයේ ප්‍රෙත්‍යවිෂයෙහි උපදනේ යැ, ප්‍රත්‍යය ලබනුයේ අසුරනිකායෙහි උපදනේ යැ, ප්‍රත්‍යය ලබනුයේ දෙව්ලොවැ උපදනේ යැ, ප්‍රත්‍යය ලබනුයේ මිනිස්ලොවැ උපදනේ යැ, ප්‍රත්‍යය ලබනුයේ පිරිනිවෙන්නේ යි. එහෙයින් මෝ සබ්බත්ථගාමිනී පටිපද යි. මේ ප්‍රතිපදයෙහි හෙතු වශයෙන් ප්‍රත්‍යයවශයෙන් අනවශෙෂ කොට පැවැති යම් ඥානයෙක් ඇද්ද මේ ' සබ්බත්ථ ගාමිනීපටිපද ඤාණය ' දෙවැනි තථාගතබලය යි කියනු ලැබෙ. (2)

මෙසේ උක්තප්‍රකාර වූ සබ්බත්ථගාමිනී පටිපදව අනෙකධාතුලොක යැ, තත්ථතත්ථ ගාමිනී පටිපදව නානාධාතුලොක යි. එහි අනෙකධාතුලොක කවරෙ යැ : චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු යැ, සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු යැ, ඝානධාතු ගන්ධධාතු ඝානවිඤ්ඤාණධාතු යැ, ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු යැ, කාය ධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු යැ, මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණ ධාතු යැ. පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යැ. ආකාසධාතු විඤ්ඤාණධාතු යැ කාමධාතු බ්‍යාපාදධාතු විහිංසාධාතු යැ, නෙක්ඛම්මධාතු අව්‍යාපාද

බ්‍යාපාදධාතු විහිංසාධාතු නෙක්ඛම්මධාතු අබ්‍යාපාදධාතු අවිහිංසාධාතු දුක්ඛධාතු දොමනස්සධාතු අවිජ්ජාධාතු සුඛධාතු සොමනස්සධාතු උපෙක්ඛාධාතු රූපධාතු අරූපධාතු නිරොධධාතු සඞ්ඛාරධාතු නිබ්බානධාතු, අයං අනෙකධාතු ලොකො.

තත්ථ කතමො නානාධාතුලොකො: අඤ්ඤා චක්ඛුධාතු අඤ්ඤා රූපධාතු අඤ්ඤා චක්ඛුවිඤ්ඤාණධාතු (එවං සබ්බා) අඤ්ඤා නිබ්බාන-ධාතු, යං එත්ථ ඤාණං හෙතුසො ඨානසො අනොධිසො, ඉදං වුච්චති අනෙකධාතුනානාධාතුඤාණං තතියං තථාගතබලං. ඉති (3)

අනෙකධාතුනානාධාතුකස්ස ලොකස්ස යං යදෙව ධාතුං සත්තා අධිමුච්චන්ති, තං තදෙව අධිට්ඨහන්ති අභිනිවිසන්ති, කෙචි රූපාධිමුත්තා කෙචි සද්දාධිමුත්තා කෙචි ගන්ධාධිමුත්තා කෙචි රසාධිමුත්තා කෙචි ඵොට්ඨබ්බාධිමුත්තා කෙචි ධම්මාධිමුත්තා කෙචි ඉත්ථාධිමුත්තා කෙචි පුරිසාධිමුත්තා කෙචි චාගාධිමුත්තා කෙචි හීනාධිමුත්තා කෙචි පණීතාධිමුත්තා කෙචි දෙවාධිමුත්තා කෙචි මනුස්සාධිමුත්තා කෙචි නිබ්බානාධිමුත්තා. යං එත්ථ ඤාණං හෙතුසො ඨානසො අනොධිසො “අයං වෙනෙය්‍යො අයං න වෙනෙය්‍යො අයං සග්ගගාමී අයං දුග්ගතිගාමී”ති, ඉදං වුච්චති සත්තානං නානාධිමුත්තිකතාඤාණං චතුත්ථං තථාගතබලං ඉති. (4)

තෙ යථාධිමුත්තා ච භවන්ති, තං තං කම්මසමාදානං සමාදියන්ති, තෙ ඡබ්බිධං කම්මං සමාදියන්ති: කෙචි ලොභවසෙන, කෙචි දොසවසෙන, කෙචි මොහවසෙන, කෙචි සද්ධාවසෙන, කෙචි විරියවසෙන කෙචි පඤ්ඤාවසෙන. තං විජ්ජමානං දුවිධං සංසාරගාමි ච නිබ්බානගාමි ච.

තත්ථ යං ලොභවසෙන දොසවසෙන මොහවසෙන ච කම්මං කරොති, ඉදං කම්මං කණ්හං කණ්හවිපාකං. තත්ථ යං සද්ධාවසෙන විරියවසෙන ච කම්මං කරොති, ඉදං කම්මං සුක්කං සුක්කවිපාකං. තත්ථ යං ලොභවසෙන[1] දොසවසෙන[1] මොහවසෙන[1] සද්ධාවසෙන ච කම්මං කරොති, ඉදං කම්මං කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං. තත්ථ යං විරියවසෙන[3] පඤ්ඤාවසෙන ච කම්මං කරොති, ඉදං කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මුත්තමං කම්මසෙට්ඨං කම්මක්ඛයාය සංවත්තති.

චත්තාරි කම්මසමාදානානි: අත්ථි කම්මසමාදානං පච්චුප්පන්නසුඛං ආයතිං ච දුක්ඛවිපාකං, අත්ථි කම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛං ආයතිං ච සුඛවිපාකං, අත්ථි කම්මසමාදානං පච්චුප්පන්නදුක්ඛඤ්චෙව ආයතිං ච දුක්ඛවිපාකං, අත්ථි කම්මසමාදානං පච්චුප්පන්නසුඛඤ්චෙව ආයතිං ච සුඛවිපාකං, යං එවංජාතියං[2] කම්මසමාදානං. ඉමිනා පුග්ගලෙන අකුසලකම්මසමාදානං උපචිතං අවිපක්කං විපාකාය පච්චුපට්ඨිතං, න ච භබ්බො අභිනිබ්බිද[4] ගන්තුන්ති. තං භගවා න ඔවදති. යථා දෙවදත්තං කොකාලිකං සුනක්ඛත්තං ලිච්ඡවිපුත්තං. යෙ වා පනඤ්ඤෙපි සත්තා මිච්ඡත්තනියතා.

---

1. වසෙන ච – සීමු
2. එවං ජාතිකං – සීමු.
3. විරිය වසෙන ච – සීමු
4. අභිනිබ්බිධා – සීමු.

ධාතු අවිහිංසාධාතු යැ දුක්ඛධාතු දොමනස්සධාතු අවිජ්ජාධාතු සුඛධාතු සොමනස්සධාතු උපෙක්ඛාධාතු යැ, රූපධාතු අරූපධාතු නිරොධධාතු යැ. මේ අනෙකධාතු ලොක යි.

එහි නානාධාතුලොක කවරෙ යැ : චක්ඛුධාතුව ලක්ෂණ හෙයින් අන්‍ය යැ, රූපධාතු අන්‍ය යැ, චක්ඛුවිඤ්ඤාණධාතු අන්‍ය යැ, (සියල්ල මෙසේ යි). නිබ්බානධාතුව ලක්ෂණ හෙයින් අන්‍ය වෙයි. මේ අනෙකධාතු නානාධාතුලොකයෙහි හෙතුවශයෙන් ප්‍රත්‍යය වශයෙන් අනවශෙෂ කොට පවත්නා යම් ඥානයෙක් ඇද්ද, මේ අනෙකධාතු නානාධාතු ඥානය තුන්වැනි තථාගතබලය යි කියනුලැබේ. (3)

මෙසේ අනෙකධාතුනානාධාතුක ලොකය පිළිබඳ යම් යම් මැ හීනාදි ස්වභාවයක් සත්ත්වයෝ හීනාදි ස්වභාවයෙන් අධිමුක්ත වෙත් ද (අදහස් කෙරෙත් ද) ඒ ඒ ස්වභාවය මැ අධිෂ්ඨාන කෙරෙති තෘෂ්ණාවශයෙන් පිවිසෙති. (අධිමුක්තිවිෂය විභාග කෙරෙති :) කිසි සත්ත්ව කෙනෙක් රූපාධ්‍යාශය ඇත්තාහුය, කිසිවෙක් ශබ්දාධිමුක්ත යැ කිසිවෙක් ගන්ධාධිමුක්ත යැ කිසිවෙක් රසාධිමුත්ත යැ කිසිවෙක් ඵොට්ඨබ්බාධිමුත්ත යැ කිසිවෙක් ධම්මාධිමුත්ත යැ කිසිවෙක් ඉත්ථාධිමුත්ත යැ කිසිවෙක් පුරිසාධිමුත්ත යැ කිසිවෙක් ත්‍යාගාධිමුත්ත යැ කිසිවෙක් හීනාධිමුත්ත යැ කිසිවෙක් ප්‍රණීතාධිමුත්ත යැ කිසිවෙක් දෙවාධි මුත්ත යැ කිසිවෙක් මනුෂ්‍යාධිමුත්ත යැ කිසිවෙක් නිර්වාණාධිමුක්ත වෙත්. මේ අධි මුත්තිවිෂයෙහි හෙතුවශයෙන් ප්‍රත්‍යයවශයෙන් අනවධිවශයෙන් ‘ මේ සත්ත්ව වෛනෙය යැ මේ විනයන නොකළ හැක්ක මේ ස්වර්ගගාමී යැ මේ දුර්ගතිගාමී යැ ’ යි පවත්නා යම් ඥානයෙක් ඇද්ද මෙය සත්ත්වයන්ගේ නානාධිමුක්තිකතාඥාණ නම් වූ සතරවැනි තථාගතබලයැ ’ යි කියනුලැබේ. (4)

මෙසේ ඒ (හීන – ප්‍රණීතාධිමුක්ති ඇති) සත්ත්වයෝ යම් යම් පරිදි අධ්‍යාශය ඇත්තාහු වෙත් ද, අධිමුත්ති අනුරූප වූ ඒ ඒ කර්මසමාදනය කෙරෙත් ද, ඔවුහු සවැදෑරුම් කර්ම සමාදනය කෙරෙත් : කිසිවෙක් ලොභවශයෙන් කිසිවෙක් ද්වෙෂවශයෙන් කිසිවෙක් මොහවශයෙන් කිසිවෙක් ශ්‍රද්ධාවශයෙන් කිසිවෙක් වීර්‍ය්‍යවශයෙන් කිසිවෙක් ප්‍රඥා වශයෙන් කර්මසමාදන කෙරෙත්. ඒ කර්මය විභාග කරනුලබනුයේ සංසාරගාමී කර්මය ද නිර්වාණගාමී කර්මය දූ ’ යි දෙවැදෑරුම් වේ.

එහි ලොභවශයෙන් ද ද්වෙෂවශයෙන් ද මොහවශයෙන් ද යම් කර්මයක් කෙරේ නම් මේ කර්මය කෘෂ්ණ වූයේ කෘෂ්ණ විපාක ඇත්තේ යැ, එහි ශ්‍රද්ධාවශයෙන් ද වීර්‍ය්‍ය වශයෙන් ද යම් කර්මයක් කෙරේ නම් මේ කර්මය ශුක්ල වූයේ ශුක්ලවිපාක ඇත්තේ යැ, එහි ලොභවශයෙන් ද ද්වෙෂවශයෙන් ද මොහවශයෙන් ද ශ්‍රද්ධාවශයෙන් ද යම් කර්මයක් කෙරේ නම්, මේ කර්මය කෘෂ්ණශුක්ල වූයේ කෘෂ්ණශුක්ලවිපාක ඇත්තේ යැ, එහි වීර්‍ය්‍යවශයෙන් ද ප්‍රඥාවශයෙන් ද යම් කර්මයක් කෙරේ නම්, මේ කර්මය (සතර මාර්ග චෙතනාව) අකණ්හ යැ අසුක්ක යැ අකෘෂ්ණඅශුක්ල විපාක ඇත්තේ යැ මෙය කර්මයන් කෙරෙහි උත්තම යැ කර්මයන් කෙරෙහි ශ්‍රෙෂ්ඨ යැ කර්මක්ෂය සංඛ්‍යාත නිවන පිණිස පවත්නේ යි.

කර්මසමාදනයෝ සතරදෙනෙක් වෙති : ප්‍රත්‍යුත්පන්නයෙහි සුඛ වූ මතුයෙහි දුක්ඛ විපාක වූ ද කර්මසමාදනයෙක් ඇත, ප්‍රත්‍යුත්පන්නයෙහි දුක් වූ මතුයෙහි සුඛවිපාක වූ ද කර්මසමාදනයෙක් ඇත, ප්‍රත්‍යුත්පන්නයෙහි දුක් වූ ද මතුයෙහි දුක්ඛවිපාක වූ ද කර්ම සමාදනයෙක් ඇත, ප්‍රත්‍යුත්පන්නයෙහි සුඛ වූ ද මතුයෙහි සුඛවිපාක වූ ද කර්මසමාදනයෙක් ඇති. යම් අන්‍යවූත් මෙබඳු ප්‍රකාර ඇති කර්මයෙකි. (ඒ කර්මවිපාකයෙහි බුදුරදුන්ගේ ඥානය පවත්නා අයුරු දක්වති :) ‘ මේ පුහුල්හු විසින් අකුශලකර්මයෙක් විපාකදනයට සමර්ථ පරිදි රැස්කරනලද, එය විපාක නොදෙනලදුවැ විපාක දීමට කළ අවකාශ ඇත, අභිනිබ්බිද සංඛ්‍යාත ආර්‍ය්‍යමාර්ගය අවබොධ කරන්නට නො ද සුදුසුවනැ ’ යි, බුදුහු ඔහුට අවවාද නොකරනසේක. දෙවදත්ත, කොකාලික, සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර යන මොවුන් මෙනි. (විපාකාවරණයෙන් වැසුණු පුහුල්හට භවවාසනා සඳහා දහම් දෙසති, අජාසත්හට මෙනි.)

ඉමෙසං ච පුග්ගලානං උපචිතං අකුසලං න ච තාව පාරිපූරිං ගතං, පුරා පාරිපූරිං ගච්ඡති, පුරා ඵලං නිබ්බත්තයති, පුරා මග්ගං ආවාරයති, පුරා වෙනෙය්‍යත්තං සමතික්කමතීති. තෙ භගවා අසමත්තෙන ඔවදති, යථා පුණ්ණඤ්ච ගොවතිකං අචෙලඤ්ච කුක්කුරවතිකං. ඉමස්ස ච පුග්ගලස්ස අකුසලකම්මසමාදානා පරිපූරමානං මග්ගං ආවාරයිස්සති, පුරා පාරිපූරිං ගච්ඡති, පුරා ඵලං නිබ්බත්තයති, පුරා මග්ගං ආවාරයති, පුරා වෙනෙය්‍යත්තං සමතික්කමතීති තං භගවා අසමත්තං ඔවදති, යථා ආයස්මන්තං අඞ්ගුලිමාලං.

සබ්බෙසං මුදුමජ්ඣාධිමත්තතා : තත්ථ මුදු ආනෙඤ්ජාභිසඞ්ඛාරා, මජ්ඣං අවසෙසකුසලසඞ්ඛාරා, අධිමත්තං අකුසලසඞ්ඛාරා. යං එත්ථ ඤාණං හෙතුසො ඨානසො අනොධිසො "ඉදං දිට්ඨධම්මවෙදනීයං ඉදං උපපජ්ජවෙදනීයං ඉදං අපරාපරියවෙදනීයං ඉදං නිරයවෙදනීයං ඉදං තිරච්ඡානවෙදනීයං ඉදං පෙත්තිවිසයවෙදනීයං ඉදං අසුරවෙදනීයං ඉදං දෙවවෙදනීයං ඉදං මනුස්සවෙදනීයං"ති. ඉදං වුච්චති අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං හෙතුසො ඨානසො අනොධිසො විපාකවෙමත්තතාඤාණං පඤ්චමං තථාගතබලං ඉති (5)

තථා[1] සමාදින්නානං කම්මානං සමාදින්නානං ඣානානං විමොක්ඛානං සමාධීනං සමාපත්තීනං අයං සංකිලෙසො ඉදං වොදානං ඉදං වුට්ඨානං එවං සංකිලිස්සති එවං වොදායති එවං වුට්ඨහතීති ඤාණං අනාවරණං.

තත්ථ කති ඣානානි : චත්තාරි ඣානානි. කති විමොක්ඛා : එකාදස ච අට්ඨ ච සත්ත ච තයො ච ද්වෙ ච. කති සමාධී : තයො සමාධී: සවිතක්කො සවිචාරො සමාධි, අවිතක්කො විචාරමත්තො සමාධි, අවිතක්කො අවිචාරො සමාධි. කති සමාපත්තියො : පඤ්ච සමාපත්තියො : සඤ්ඤාසමාපත්ති, අසඤ්ඤාසමාපත්ති, නෙවසඤ්ඤානාසඤ්ඤාසමාපත්ති විභූතසඤ්ඤාසමාපත්ති,[2] නිරොධසමාපත්ති.

තත්ථ කතමො සංකිලෙසො : පඨමස්ස ඣානස්ස කාමරාගබ්‍යාපාදා සංකිලෙසො, යෙ ච කුක්කුටජ්ඣායී ද්වෙ පඨමකා යො වා පන කොචි හානභාගියො සමාධි, අයං සංකිලෙසො. තත්ථ කතමං වොදානං : නීවරණපාරිසුද්ධි පඨමස්ස ඣානස්ස යෙ ච කුක්කුටජ්ඣායී ද්වෙ පච්ඡිමකා යො වා පන කොචි විසෙසභාගියො සමාධි, ඉදං වොදානං. තත්ථ කතමං වුට්ඨානං : යං සමාපත්ති වුට්ඨානකොසල්ලං, ඉදං වුට්ඨානං. යං එත්ථ ඤාණං හෙතුසො ඨානසො අනොධිසො, ඉදං වුච්චති සබ්බෙසං ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසවොදානවුට්ඨානඤාණං ඡට්ඨං තථාගතබලං ඉති (6)

1. ඉති තථා - මජසං.
2. විභූතසමාපත්ති - සීමු.

තවද මිච්ඡත්තනියත වූ යම් අන්‍ය සත්ත්ව කෙනෙක් හෝ වෙත් ද, මේ පුද්ගලයන් විසිනුදු කරන්නට ආරබ්ධ වූ අකුශලය තවම නො ද පිරිමට ගියේ යැ, ඇසිල්ලෙකින් පිරිමට යෙයි, ඇසිල්ලෙකින් ඵලය උපදවයි, ඇසිල්ලෙකින් මාර්ගය ආවරණ කෙරෙයි, ඇසිල්ලෙකින් වෛනෙයත්වය ඉක්මවායැ ' යි කර්මය අපරිපූර්ණ වූ ඔවුනට බුදුහු අවවාද කරනසේක. පූර්ණ ගොවතිකයහට ද අචෙල කුක්කුරවතිකයහට ද මෙනි. යළි මේ පුහුල්හුගේ අකුශලකර්මසමාදනය පරිපූර්ණ වනුයේ මාර්ගය ආවරණ කරන්නේ යැ, 'ඇසිල්ලෙකින් පිරිමට යෙයි, ඇසිල්ලෙකින් අකුශලඵලය උපදවයි, ඇසිල්ලෙකින් මාර්ගය ආවරණ කෙරෙයි, ඇසිල්ලෙකින් වෛනෙයත්වය ඉක්මවායැ ' යි බුදුහු අපරිපූර්ණ කර්මය ඇති ඔහුට අවවාද කරනසේක. ආයුෂ්මත් අඞ්ගුලිමාලයනට මෙනි.

බලනිර්දෙශයෙහි කියනලද සියලු කර්මයන්ගේ මෘදු – මධ්‍ය – තීව්‍රභාවය වෙයි : එහි ආනෙඤ්ජාභිසඞ්ඛාරයෝ මෘදු යැ, අවසෙස කුසලසඞ්ඛාරයෝ මධ්‍ය යැ, අකුසල සඞ්ඛාරයෝ තීව්‍ර යි. මේ කර්මවිෂයෙහි හෙතුවශයෙන් ප්‍රත්‍යයවශයෙන් පැවැති " මේ කර්මය දෘෂ්ටධර්මයෙහි (මෙ අත්බවෙහි) වින්දයුතු ඵල ඇත්තේ යැ, මේ කර්මය උපපද්‍ය භවයෙහි (අනතුරු අත්බවහි) වින්දයුතු ඵල ඇත්තෙ යැ, මේ කර්මය අපරපරියායයෙහි (මෙයින් අන්‍ය වූ කිසි අත්බවෙක) වින්දයුතු විපාක ඇත්තෙ යැ, මේ කර්මය නිරයෙහි විපාක වින්දයුතු යැ, මෙය තිරශ්චීනයොනියෙහි වින්දයුතු යැ, මෙය ප්‍රෙතවිෂයෙහි වින්දයුතු යැ, මෙය අසුරකායෙහි වින්දයුතු යැ, මෙය දෙව්ලොවැ වින්දයුතු යැ, මෙය මිනිස්ලොවැ වින්දයුතු යැ " යි දන්නා යම් ඥනයෙක් ඇද්ද මෙය අතීතානාගත ප්‍රත්‍යුත්පන්න කර්මසමාදනයන්ගේ හෙතු විසින් ප්‍රත්‍යය විසින් අනොධි විසින් ' විපාක වෙමත්තතාඤණ ' නම් පස්වැනි තථාගතබලය යී කියනුලැබෙ. (5)

යට කී පරිදි සමාදනය කළ කර්මයන්ගේ සමාදනය කළ ධ්‍යානයන්ගේ විමොක්ඛ – සමාධි – සමාපත්තීන්ගේ මේ (ප්‍රතිපක්ෂධර්ම විසින්) කිලිටිබව යැ මේ (ප්‍රතිපක්ෂ ධර්මයන් කෙරෙන්) විශුද්ධිය යැ මේ ප්‍රගුණධ්‍යාන හා භවාඞ්ගවුට්ඨාන යැ, මේ ආකාර යෙන් ධ්‍යානාදිය කිලිටි වන්නේ යැ, මෙසේ විශුද්ධ වෙයි, මෙසේ වුට්ඨානය වේ යැයි පැවැති ඥනය අනාවරණඥන යි.

ඒ ධ්‍යානාදීන් කෙරෙහි ධ්‍යානයෝ කෙතෙක යත් : චතුක්කනය විසින් රූපාවචර ධ්‍යානයෝ සතර දෙනෙකි. විමොක්ෂයෝ කෙතෙක යත් : (රූපී රූපානි පස්සති යනාදි අට යැ සුඤ්ඤතාදි තුන යැයි) විමොක්ෂ එකොළොසක් ද, (ලොකොත්තරවිමොක්ෂ හැර) අටක් ද (එහි මැ නිරොධසමාපත්තිය හැර) සතක් ද (සූත්‍රාන්තපරියායෙන්) ශූන්‍යතාදි විමොක්ෂ තුනක් ද (අභිධර්මපරියායෙන් අනිමිත්තවිමොක්ෂය නො ලැබෙනුයෙන්) සුඤ්ඤත අප්පණිහිත යයි විමොක්ෂ දෙකක් ද වෙති. සමාධි කෙතෙක යත් : සවිතර්ක සවිචාර සමාධි යැ අවිතර්ක විචාරමාත්‍ර සමාධි යැ අවිතර්ක අවිචාර සමාධි යැයි සමාධි තුනෙකි. සමාපත්ති කෙතෙක යත් : සඤ්ඤසමාපත්ති යැ අසඤ්ඤසමාපත්ති යැ නෙවසඤ්ඤනාසඤ්ඤසමාපත්ති යැ විභූතසඤ්ඤසමාපත්ති යැ නිරොධසමාපත්ති යැයි සමාපත්තීහු පස් දෙනෙක් වෙත්.

එහි සංකිලෙස කවරෙ යැ : ප්‍රථමධ්‍යානයට කාමරාගව්‍යාපාදයෝ සංකිලෙස යැ, කුක්කුටධ්‍යාන යයි කියනලද යම් ප්‍රථමද්විතීය ධ්‍යාන දෙක වෙත් ද යළි යම් හානභාගිය සමාධියෙක් හෝ වේ ද මේ සංකිලෙස යි. එහි වොදන කවරෙ යැ : ප්‍රථමධ්‍යානයට නීවරණපාරිශුද්ධිය ද කුක්කුටජ්ඣායී වූ යම් පශ්චිම ධ්‍යාන දෙක වෙත් ද යළි විසෙස භාගිය වූ යම් සමාධියෙක් වේ ද මේ වොදන යි. (ධ්‍යාන උපදවා එයින් සෑහීමට පැමිණ මතුයෙහි වෑයම් නොකරනුයේ ' කුක්කුටජ්ඣායී නම් වේ.) එහි වුට්ඨාන කවරෙ යැ : යම් සමවතින් නැඟීසිටීමෙහි කුශලතායෙක් ඇද්ද, මේ වුට්ඨාන යි. මෙහි හෙතුවශයෙන් ප්‍රත්‍යයවශයෙන් අනවධිවශයෙන් පැවැති යම් ඥනයෙක් ඇද්ද, මෙය සියලු ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්තීන්ගේ සංකිලෙසවොදනවුට්ඨාන නම් වූ සවැනි තථාගත බලයැ යි කියනු ලැබෙ. (6)

තස්සෙව සමාධිස්ස තයො ධම්මා පරිවාරා : ඉන්ද්‍රියානි බලානි විරියමිති. තානීයෙව ඉන්ද්‍රියානි විරියවසෙන බලානි භවන්ති, අධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියානි, අකම්පියට්ඨෙන බලානි. ඉති තෙසං මුදුමජ්ඣාධිමත්තතා : අයං මුදින්ද්‍රියො අයං මජ්ඣින්ද්‍රියො අයං තික්ඛින්ද්‍රියොති. තත්ථ භගවා තික්ඛින්ද්‍රියං සංඛිත්තෙන ඔවාදෙන ඔවදති, මජ්ඣින්ද්‍රියං භගවා සංඛිත්තවිත්ථාරෙන ඔවදති, මුදින්ද්‍රියං භගවා විත්ථාරෙන ඔවදති. තත්ථ භගවා තික්ඛින්ද්‍රියස්ස මුදුකං ධම්මදෙසනං උපදිසති මජ්ඣින්ද්‍රියස්ස භගවා මුදුතික්ඛං ධම්මදෙසනං උපදිසති, මුදින්ද්‍රියස්ස භගවා තික්ඛං ධම්මදෙසනං උපදිසති. තත්ථ භගවා තික්ඛින්ද්‍රියස්ස සමථං උපදිසති, මජ්ඣින්ද්‍රියස්ස භගවා සමථවිපස්සනං උපදිසති, මුදින්ද්‍රියස්ස භගවා විපස්සනං උපදිසති. තත්ථ භගවා තික්ඛින්ද්‍රියස්ස නිස්සරණං උපදිසති, මජ්ඣින්ද්‍රියස්ස භගවා ආදීනවං ච නිස්සරණඤ්ච උපදිසති, මුදින්ද්‍රියස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච උපදිසති, තත්ථ භගවා තික්ඛින්ද්‍රියස්ස අධිපඤ්ඤාසික්ඛාය පඤ්ඤපයති, මජ්ඣින්ද්‍රියස්ස භගවා අධිචිත්තසික්ඛාය පඤ්ඤපයති, මුදින්ද්‍රියස්ස භගවා අධිසීලසික්ඛාය පඤ්ඤපයති. යං එත්ථ ඤාණං හෙතුසො ඨානසො අනොධිසො “අයං ඉමං භූමිං භාවනඤ්ච ගතො ඉමාය ච වෙලාය ඉමාය ච අනුසාසනියා එවං ධාතුකො චායං, අයං චස්ස ආසයො අයං ච අනුසයො” ඉති. ඉදං වුච්චති පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තවෙමත්තතාඤාණං සත්තමං තථාගතබලං ඉති. (7)

තත්ථ යං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං : එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකානිපි ජාතිසතානි අනෙකානිපි ජාතිසහස්සානි අනෙකානිපි ජාතිසතසහස්සානි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො අමුත්‍ර උදපාදිං, තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො, සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

තත්ථ සග්ගූපගෙසු ච සත්තෙසු මනුස්සූපගෙසු ච සත්තෙසු අපායූපගෙසු ච සත්තෙසු “ඉමස්ස පුග්ගලස්ස ලොභාදයො උස්සන්නා අලොභාදයො මන්දා, ඉමස්ස පුග්ගලස්ස අලොභාදයො උස්සන්නා ලොභාදයො මන්දා, යෙ වා පන උස්සන්නා යෙ වා පන මන්දා, ඉමස්ස

ධ්‍යානාදි පර්‍ය්‍යායයෙන් යට කියනලද ඒ සමාධිහුගේ මැ ඉන්ද්‍රියයෝ යැ බලයෝ යැ වීර්‍ය්‍ය යැ යි පරිවාර වූ ධර්මයෝ තිදෙනෙක් වෙති. (සද්ධා සති පඤ්ඤා යන) ඒ ඉන්ද්‍රියයෝ මැ වීර්‍ය්‍යයාගේ වශයෙන් බල නම් වෙති. අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියයෝ යැ, අකම්ප්‍යාර්ථයෙන් බලයෝ යි. මෙසේ ඒ ඉන්ද්‍රියයන්ගේ මේ පුද්ගල මෘදුඉන්ද්‍රිය ඇත්තේ යැ මේ මධ්‍යමඉන්ද්‍රිය ඇත්තේ යැ මේ තියුණුඉන්ද්‍රිය ඇත්තේ යැ යි මෘදුමධ්‍යමඅධිමාත්‍රභාවය වෙයි. ඒ වෛනෙයයන් කෙරෙහි බුදුහු තියුණු ඉන්ද්‍රිය ඇත්තහුට සංක්‍ෂිප්ත වූ උද්දෙශමාත්‍ර වූ අවවාදයෙන් අවවාද කරනසේක. මධ්‍යම ඉන්ද්‍රිය ඇතියහුට බුදුහු සංක්‍ෂිප්තය විස්තර කිරීමෙන් නොහොත් උද්දෙසනිද්දෙස දෙකින් අවවාද කරන සේක. මෘදුඉන්ද්‍රිය ඇතියහුට බුදුහු විස්තරයෙන් නොහොත් උද්දෙසනිද්දෙසපටිනිද් දෙස විසින් අවවාද කරනසේක. ඔවුන් කෙරෙහි බුදුහු තියුණු ඉන්ද්‍රිය ඇත්තහුට සැහැල්ලු වූ (අපායභය වට්ටභයාදීන් සන්තර්පනවශයෙන් බර නොකොට) දහම් දෙසන සේක, මධ්‍යමඉන්ද්‍රිය ඇතියහුට බුදුහු මෘදුතීක්ෂණ වූ ධර්මදෙශනාව කරනසේක, මෘදු ඉන්ද්‍රිය ඇත්තහුට බුදුහු තියුණු ධර්මදෙශනාව කරන සේක. ඔවුන් කෙරෙහි බුදුහු තියුණු ඉඳුරන් ඇතියහුට සමථය (අධික කොට) දක්වනසේක, මැදුම් ඉඳුරන් ඇතියහුට බුදුහු සමථවිදර්ශනා (සමධුර කොට) දක්වනසේක, මෘදුඉඳුරන් ඇතියහුට බුදුහු සාතිශය විදර්ශනාව දක්වනසේක. එහි බුදුහු තියුණුඉඳුරන් ඇතියහුට නිස්සරණය දෙසනසේක, මැදුම්ඉඳුරන් ඇතියහුට ආදීනවය ද නිස්සරණය ද දෙසනසේක, මෘදුඉඳුරන් ඇතියහුට බුදුහු අස්සාද ආදීනව නිස්සරණ ද දෙසනසේක. එහි බුදුහු තියුණුඉඳුරන් ඇතියහුට අධිප්‍රඥශික්ෂාව පනවනසේක, මැදුම්ඉඳුරන් ඇතියහුට බුදුහු අධිචිත්තශික්ෂාව පනවන සේක, මුදුඉඳුරන් ඇතියහුට බුදුහු අධිශීලශික්ෂාව පනවනසේක. මේ ඉන්ද්‍රියපරොපරතා යෙහි හෙතුවශයෙන් ප්‍රත්‍යයවශයෙන් අනාවධිවශයෙන් ' මේ පුද්ගල මේ වෙලායෙහි මෘදුමධ්‍යතීක්ෂ්ණභෙද වූ මේ අනුශාසනායෙන් ද මේ භූමියට ද මේ භාවනාවට ද ගියේ යැ, යෙයි, යන්නේ යැ, මේ පුද්ගල හීනාදිමෙබඳු ස්වභාව ඇත්තේ ද මොහුගේ ශාශ්වතාදි මේ ආශය ද කාමරාගාදි මේ අනුසය ඇත්තේ ද වේ යයි පැවැති යම් ඥානයක් ඇද්ද මෙය පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ ඉන්ද්‍රියපරොපරියත්තවෙමත්තතාඥාණ නම් වූ සත්වැනි තථාගතබලය යී කියනුලැබේ. (.7)

එහි අනේකප්‍රකාර වූ පෙරවිසූ කඳපිළිවෙළ සිහිකෙරෙති, ඒ මෙසේ යැ : එක් ජාතියකුදු ජාතිදෙකකුදු ජාති තුනකුදු ජාති සතරකුදු ජාති පසකුදු ජාති දසයකුදු ජාති විස්සකුදු ජාති තිසකුදු ජාති සතලිසකුදු ජාති පනසකුදු ජාති සියයකුදු ජාති දහසකුදු ජාති සියදහසකුදු නොයෙක් සියගණන් ජාති ද නොයෙක් දහස්ගණන් ජාති ද නොයෙක් සුවහස්ගණන් ජාති ද නොයෙක් සංවර්තකල්පයන් ද නොයෙක් විවතර්කල්පයන් ද නොයෙක් සංවර්ත විවර්ත කල්පයන් ද ' අසුවල් තැනැ මෙසේ නම් ඇතිවීමි, මෙබඳු ගොත් ඇතියෙම් මෙබඳු පැහැඇතියෙම් මෙබඳු ආහාරඇතියෙම් මෙසේ සුවදුක් වින්දෙම් මෙසේ ආයුපර්‍ය්‍යන්ත ඇතියෙම් වීමි, එ මම එයින් සැවැ අසුවල් තැනැ උපන්මි, එහිදු මෙ නම් ඇති වීමි, මෙබඳු ගොත්ඇතියෙම් මෙබඳු පැහැඇතියෙම් මෙබඳු ආහාරඇතියෙම් මෙබඳු සුවදුක් වින්දෙම් මෙබඳු ආයුපර්‍ය්‍යන්ත ඇතියෙම් වීමි, එ මම එයින් සැවැ මෙහි උපන්මි මෙසේ ආකාර සහිත වූ උද්දෙස සහිත වූ අනෙකප්‍රකාර පූර්වනිවාසය සිහිකෙරෙයි.

ඒ දසබලඥාණයන් කෙරෙහි ස්වර්ගයට පැමිණි සත්ත්වයන් කෙරෙහි ද මිනිස්බවට පැමිණි සත්ත්වයන් කෙරෙහි ද අපායට පැමිණි සත්ත්වයන් කෙරෙහි ද " මේ පුහුල්හට ලොභාදි අකුශලයෝ උත්සන්න වූහ, අලොභාදි කුශලයෝ අල්ප වූහ. මේ පුහුල්හට අලොභාදිහු උත්සන්නයහ, ලොභාදීහු අල්ප වූහ, යම් ධර්ම කෙනෙක් උත්සන්න හෝ වෙත් ද යම් ධර්ම කෙනෙක් මන්ද හෝ වෙත් ද, අසුවල් කල්පකොටියෙහි හෝ

පුග්ගලස්ස ඉමානි ඉන්ද්‍රියානි උපචිතානි, ඉමස්ස පුග්ගලස්ස ඉමානි ඉන්ද්‍රියානි අනුපචිතානි, අමුකායං වා කප්පකොටියං කප්පසතසහස්සෙ වා කප්පසහස්සෙ වා කප්පසතෙ වා කප්පෙ වා අන්තරකප්පෙ වා උපඩ්ඪකප්පෙ වා සංවච්ඡරෙ වා උපඩ්ඪසංවච්ඡරෙ වා මාසෙ වා පක්ඛෙ වා දිවසෙ වා මුහුත්තෙ වා, ඉමිනා පමාදෙන වා පසාදෙන වා''ති තං තං භවං භගවා අනුස්සරන්තො අසෙසං ජානාති.

තත්ථ යං දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති: චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා, ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචී -පෙ- මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා. තත්ථ සග්ගූපගෙසු ච සත්තෙසු -පෙ- අපායූපගෙසු ච සත්තෙසු ඉමිනා පුග්ගලෙන එවරූපං කම්මං අමුකායං කප්පකොටියං උපචිතං කප්පසතසහස්සෙ වා කප්පසහස්සෙ වා කප්පසතෙ වා කප්පෙ වා අන්තරකප්පෙ වා උපඩ්ඪකප්පෙ වා සංවච්ඡරෙ වා උපඩ්ඪසංවච්ඡරෙ වා මාසෙ වා පක්ඛෙ වා දිවසෙ වා මුහුත්තෙ වා ඉමිනා පමාදෙන වා පසාදෙන වාති. ඉමානි භගවතො ද්වෙ ඤාණානි පුබ්බෙනිවාසානුස්සති ඤාණඤ්ච දිබ්බචක්ඛු ච අට්ඨමං නවමං තථාගතබලං ඉති. (8-9)

තත්ථ යං සබ්බඤ්ඤුතා පත්තා, විදිතා සබ්බධම්මා, විරජං විමලං උප්පන්නං සබ්බඤ්ඤුතඤාණං, නිහතො මාරො බොධිමූලෙ, ඉදං භගවතො දසමං බලං සබ්බාසවපරික්ඛයං ඤාණං. දසබලසමන්නාගතා හි බුද්ධා භගවන්තොති. (10)

නියුත්තො විචයො හාරසම්පාතො.

## 3, 2, 3.

තත්ථ කතමො යුත්තිහාරසම්පාතො:

''තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො,
සම්මාදිට්ඨිපුරෙක්ඛාරො ඤත්වාන උදයබ්බයං;
ථිනමිද්ධාභිභූ භික්ඛු සබ්බා දුග්ගතියො ජහෙ''ති.

කප්සුවහස්හි හෝ කප්දහසෙහි හෝ කප්සියෙහි හෝ කපෙහි හෝ අතුරුකපෙහි හෝ අඩකපෙහි හෝ හවුරුද්දෙහි හෝ අඩවසෙහි හෝ මාසයෙහි හෝ අඩමසෙහි හෝ දවසෙහි හෝ මොහොතෙහි හෝ මේ ප්‍රමාදයෙන් වේවයි මේ ප්‍රසාදයෙන් වේවයි මේ පුහුල්හු විසින් මේ ඉන්ද්‍රියයෝ රැස්කරනලදහ, මේ පුහුල්හු විසින් මේ ඉන්ද්‍රියයෝ රැස් නො කරන ලදහ '' බුදුහු ඒ ඒ භවය සිහිකරමින් අශෙෂ කොට දන්නාසේක.

එහි දිට්ඨිවිසුද්ධියට හෙතු හෙයින් ද උපක්ලෙශ විරහිත හෙයින් ද විශුද්ධ වූ මිනිසැය ඉක්මැසිටි දිවඇසින් චුතවන්නාවූ ද උපදනා වූ ද (මොහනිස්සන්දයෙන් පරිහීන ජාති කුල භොගාදි විසින්) හීන වූ (අමොහනිස්සන්දයෙන් ජාති කුල භොගාදි විසින්) ප්‍රණීත වූ (අදෙසනිස්සන්දයෙන්) සුන්දරවර්ණ ඇති (දෙසනිස්සන්දයෙන්) දුර්වර්ණ වූ සුගතියට ගිය නොහොත් (අලොභනිස්සන්දයෙන්) මහද්ධන ඇති දුගතියට ගිය නොහොත් (ලොභ නිස්සන්දයෙන්) දරිද්‍ර වූ සත්ත්වයන් දක්නාසේක. කම්වූ පරිදි පරලොවගිය සත්ත්වයන් දන්නාසේක : ඒකාන්තයෙන් මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තවූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්තවූවාහු මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආයෙඝ්‍රාපවාද කළාහු මිසදිටුවූවාහු මිසදිටුහෙතුයෙන් අකුශලකර්මාසමාදන කළාහු වෙති, ඔහු කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණියාහ. වැලි මේ භවත් සත්ත්වයෝ කාය සුචරිතයෙන් සමන්විතවූවාහු වචී . . . මනොසුචරිතයෙන් සමන්විත වූවාහු ආයඝ්‍රයනට උපවාද නො කළාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන කළාහු වෙති, ඔහු කාබුන් මරණින් මතු සුගති ස්වර්ගලොකයට පැමිණියාහු වෙත්. එහි ස්වර්ගයට පැමිණි සත්ත්වයන් කෙරෙහි ද . . . අපායට පැමිණි සත්ත්වයන් කෙරෙහි ද මේ පුහුල්හු විසින් මෙබඳු කර්මයෙක් අසුවල් කල්පකොටියෙහි රැස්කරනලද, කප්සුවහස්හි හෝ කප්දහසෙහි හෝ කප්සියෙහි හෝ අතුරුකපෙහි හෝ අඩකපෙහි හෝ වසරෙහි හෝ අඩවසරෙහි හෝ මසෙහි හෝ අඩමසෙහි හෝ දවසෙහි හෝ මොහොතෙහි හෝ මේ ප්‍රමාදයෙන් වේවයි මේ ප්‍රසාදයෙන් වේව ' යි මෙබඳු කර්මයෙක් රැස්කරනලදැ ' යි දන්නා යම් ඥානයෙක් ඇද්ද, පුබ්බෙනිවාසානුස්සති ඤාණය ද දිබ්බචක්ඛු ඤාණය ද යන භාග්‍යවතුන් වහන්සේගේ මේ ඥානයෝ දෙදෙන අටවැනි නවවැනි තථාගතබල යි. (8 . 9)

ඒ දසබලඥානයන් කෙරෙහි භාග්‍යවතුන් විසින් යම් සර්වඥභාවයෙක් අධිගම විසින් ප්‍රාප්ත ද සර්වධර්මයෝ අවබොධ කරනලද්දහු ද රාගාදි රජස්රහිත වූ විගත වූ ක්ලෙශමල ඇති යම් සර්වඥතාඥානයෙක් උපන්නේ ද, බොධිමූලයෙහි ක්ලෙශමාර නසනලද්දේ ද, මේ භාග්‍යවතුන් වහන්සේගේ දසවැනි බලය වූ සර්වාශ්‍රවපරික්ෂයඥාන යි. ඒ එසේ මැය : භාග්‍යවත් බුදුවරයෝ දසබලසමන්වාගත වූවාහු යි. (10)

විචයහාරසම්පාතය යොදනලද්දේ යි.

## 3. 2. 3

ඒ හාරසම්පාතයන් කෙරෙහි යුක්තිහාරසම්පාතය කවරෙ යැ :

1. (අරක්ෂිත සිත්ඇතියේ මාරවශී වැ සසර මැ සිටුනේ යැ,) එහෙයින් සතිසංවර යෙන් රක්නාලද සිත්ඇතිවන්නේ යැ නෙක්ඛම්මාදි සම්‍යක්සංකල්ප ගොචර කොට ඇතිවන්නේ යැ (කම්මස්සකතා යථාභූතඤාණලක්ෂණ) සම්මාදිට්ඨිය පෙරටුකොට ඇතියේ (සමපනස්) උදයව්‍යය දුන රහත්මඟින් ථිනමිද්ධය නැසූ ක්ෂීණාශ්‍රව මහණ සියලු දුර්ගති දුරුකරන්නේ යි.

''තසමා රකඛිතචිතත'සස සමමාසඞකපපගොචරො''ති රකඛිතචිතත'සස සමමාසඞකපපගොචරො භවිසසතීති යුජජති, සමමාසඞකපපගොචරො සමමාදිටඨි භවිසසතීති යුජජති, සමමාදිටඨිපුරෙකඛාරො විහරනෙතා උදයබබයං පටිවිජඣිසසතීති යුජජති, උදයබබයං පටිවිජඣනෙතා සබබා දුගගතියො ජහිසසතීති යුජජති, සබබා දුගගතියො ජහනෙතා සබබානි දුගගතිවිනිපාතභයානි සමතිකකමිසසතීති යුජජතීති.

නියුතෙතා යුතතිහාරසමපාතො.

## 3, 2, 4.

තතථ කතමො පදටඨානො හාරසමපාතො : ''තසමා රකඛිතචිතත'සස සමමාසඞකපපගොචරො''ති ගාථා ''තසමා රකඛිතචිතත'සසා''ති තිණණං සුචරිතානං පදටඨානං ; ''සමමාසඞකපපගොචරො''ති සමථසස පදටඨානං ; සමමාදිටඨිපුරෙකඛාරො''ති විපසසනාය පදටඨානං ; ඤතවාන උදයබබය''නති දසසනභූමියා පදටඨානං ; ''ථීනමිදධාභිභූ භිකඛූ''ති විරියසස පදටඨානං ; ''සබබාදුගගතියො ජහෙ''ති භාවනාය පදටඨානං.

නියුතෙතා පදටඨානො හාරසමපාතො.

## 3, 2, 5.

තතථ කතමො ලකඛණො හාරසමපාතො : ''තසමා රකඛිතචිතත'සස සමමාසඞකපපගොචරො''ති ගාථා. ''තසමා රකඛිතචිතත'සස සමමාසඞකපපගොචරො''ති ඉදං සතිනද්‍රියං ; සතිනද්‍රියෙ ගහිතෙ ගහිතානි භවනති පඤචිනද්‍රියානි. ''සමමාදිටඨිපුරෙකඛාරො''ති සමමාදිටඨියා ගහිතාය ගහිතො භවති අරියො අටඨඞගිකො මගගො. තං කිසස හෙතු : සමමාදිටඨිතො හි සමමාසඞකපපො පභවති, සමමාසඞකපපතො සමමාවාචා පභවති, සමමාවාචතො සමමාකමමනෙතා පභවති, සමමාකමමනතතො සමමාආජීවො පභවති, සමමාආජීවතො සමමාවායාමො පභවති, සමමාවායාමතො සමමාසති පභවති, සමමාසතිතො සමමාසමාධි පභවති, සමමාසමාධිතො සමමාවිමුතති පභවති, සමමාවිමුතතිතො සමමාවිමුතති ඤණදසසනං පභවති.

නියුතෙතා ලකඛණො හාරසමපාතො.

## 3, 2, 6.

තතථ කතමො චතුබ්‍යූහො හාරසමපාතො : ''තසමා රකඛිතචිතත'සස සමමාසඞකපපගොචරො''ති ගාථා. ''තසමා රකඛිතචිතත'සසා''ති රකඛිතං පරිපාලීයතීති එසා නිරුතති. ඉධ භගවතො කො අධිපපායො : යෙ දුගගතීහි පරිමුචචිතුකාමා භවිසසනති, තෙ ධමමචාරිනො භවිසසනතීති

රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො යනු: රක්නාලද සිත්ඇතියේ සම්‍යක් සංකල්ප ගොචර කොට ඇත්තේ වන්නේ යැ යන මේ අර්ථය යෙදෙයි, සම්‍යක්සංකල්ප ගොචර කොට ඇති පුද්ගල සම්‍යග්දෘෂ්ටි වන්නේ යැ යනු යෙදෙයි, සම්මාදිට්ඨිසංඛ්‍යාත විදර්ශනාඥනය පෙරටු ඇතිව වසනුයේ උදයව්‍යය ප්‍රතිවෙධ කරන්නේ යැ යන අර්ථය යෙදෙයි, උදයව්‍යය ප්‍රතිවෙධ කරනුයේ දුර්ගති සංඛ්‍යාත සියලු භව ගති දුරුකරන්නේ යැ යන අර්ථය යෙදෙයි, සියලු දුර්ගති දුරුකරනුයේ සියලු දුර්ගතිවිනිපාතභය (සසරභය ද) ඉක්මවන්නේ යැ යන අර්ථය යෙදේ යයි.

යුත්තිහාරසම්පාතය යොදන ලද්දේ යි.

## 3, 2, 4

එහි පදට්ඨානහාරසම්පාතය කවරෙ යත් : "තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්ප ගොචරො" යනාදි ගාථා නිදර්ශන යැ, තස්මා රක්ඛිතචිත්තස්ස යනු මේ ත්‍රිවිධ සුචරිතයනට පදට්ඨාන (ආසන්නකාරණ) වචන යැ. සම්මාසඞ්කප්පගොචරො යනු (සම්‍යක්සංකල්ප බහුලයහට නීවරණප්‍රහාණය සුකර නුයි) සමථයට ආසන්නකාරණ යැ, සම්මාදිට්ඨි පුරෙක්ඛාරො යනු (දෙවැදෑරුම් සම්මාදිට්ඨියෙහි සිටියේ සසරදුක ඉක්මැවීමට උපාය වූ විදර්ශනා වඩා නුයි) විදර්ශනාවට පදට්ඨාන යැ, ඤත්වාන උදයබ්බයං යනු දර්ශනභූමියට පදට්ඨාන යැ, ථිනමිද්ධාභිභූ භික්ඛු යනු වීර්‍ය්‍යයට පදට්ඨාන යැ, සබ්බා දුග්ගතියො ජහෙ යනු භාවනාවට පදට්ඨාන යි. (විශෙෂකාරණ වන්නේ යි.)

පදට්ඨානහාරසම්පාතය යොදනලද්දේ යි.

## 3, 2, 5

එහි ලක්ඛණහාරසම්පාත කවරෙ යැ : "තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්ප ගොචරො" යන ගාථා යැ. තස්මාරක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො යන මේ (ඉන්ද්‍රියයන්හි ගුත්තද්වාරතායෙන් නෙක්ඛම්මවිතර්කාදිය බහුල වේ නුයි) සතින්ද්‍රිය යි. සතින්ද්‍රිය ගත්කල්හි (ඉන්ද්‍රියලක්ෂණයෙන් විමුත්තිපරිපාචනභාවයෙන් හෝ සමාන ලක්ෂණ හෙයින්) පඤ්චෙන්ද්‍රියයෝ ගන්නාලද්දහු වෙත්. සම්මාදිට්ඨිපුරෙක්ඛාරො යනු සම්මාදිට්ඨිය ගත්කල්හි ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය ගන්නාලද වෙයි. එ කවර හෙයින : සම්මාදිට්ඨියෙන් සම්මාසඞ්කප්පය උපදී (සම්භව වෙයි.) සම්මාසඞ්කප්පයෙන් සම්මාවාචා උපදී, සම්මාවාචායෙන් සම්මාකම්මන්ත උපදී, සම්මාකම්මන්තයෙන් සම්මා ආජීව උපදී, සම්මාආජීවයෙන් සම්මාවායාම උපදී, සම්මාවායාමයෙන් සම්මාසති උපදී, සම්මාසතියෙන් සම්මාසමාධි උපදී, සම්මාසමාධියෙන් සම්මාවිමුත්ති උපදී, සම්මාවිමුත්ති යෙන් සම්මාවිමුත්තිඤාණදස්සන උපදී එහෙයිනි.

ලක්ඛණහාරසම්පාතය යොදනලදී.

## 3, 2, 6

එහි චතුබ්‍යූහහාරසම්පාත කවරෙ යැ : "තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්ප ගොචරො" යන ගාථා යැ. තස්මා රක්ඛිතචිත්තස්ස යනු (රක්ඛියතීති) රක්ඛිතං, (මේ පදවශයෙන් නිර්වචන යැ,) පරිපාලියති යනාදිය (අර්ථවශයෙන් නිර්වචන යි.) මේ නිරුත්ති යැ. මේ දෙශනායෙහි භාග්‍යවතුන් වහන්සේගේ අදහස කවරේ යැ : 'යම් කෙනෙක් දුගතියෙන් මිදෙනු කැමැති වන්නාහු ද, ඔහු ධම්මචාරි වන්නාහ' යන මෙය

අයං එත්ථ භගවතො අධිප්පායො. කොකාලිකො හි සාරිපුත්තමොග්ගල්ලානෙසු ථෙරෙසු චිත්තං පදොසයිත්වා මහාපදුමනිරයෙ උප්පන්නො, භගවා ච සතිආරක්ඛෙන චෙතසා සමන්නාගතො, සුත්තම්හි වුත්තං: "සතියා චිත්තං රක්ඛිතබ්බං"ති.

නියුත්තො චතුබ්යූහො හාරසම්පාතො.

## 3, 2, 7.

තත්ථ කතමො ආවට්ටො හාරසම්පාතො: "තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො"ති ගාථා. "තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො"ති අයං සමථො; "සම්මාදිට්ඨිපුරෙක්ඛාරො"ති විපස්සනා; "ඤත්වාන උදයබ්බය"න්ති දුක්ඛපරිඤ්ඤා; "ථීනමිද්ධාභිභූ භික්ඛූ"ති සමුදයපහානං; "සබ්බාදුග්ගතියො ජහෙ"ති අයං නිරොධො; ඉමානි චත්තාරි සච්චානි.

නියුත්තො ආවට්ටො හාරසම්පාතො.

## 3, 2, 8

තත්ථ කතමො විභත්තිහාරසම්පාතො; "තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො"ති ගාථා. කුසලපක්ඛො කුසලපක්ඛෙන නිද්දිසිතබ්බො, අකුසලපක්ඛො අකුසලපක්ඛෙන නිද්දිසිතබ්බො.

නියුත්තො විභත්ති හාරසම්පාතො

## 3, 2, 9

තත්ථ කතමො පරිවත්තනො හාරසම්පාතො: "තස්මා රක්ඛිත-චිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො"ති ගාථා. සමථවිපස්සනාය භාවිතාය නිරොධො ඵලං පරිඤ්ඤාතං දුක්ඛං සමුදයො පහීනො මග්ගො භාවිතො පටිපක්ඛෙන.

නියුත්තො පරිවත්තනො හාරසම්පාතො

## 3, 2, 10

තත්ථ කතමො වෙවචනහාරසම්පාතො; "තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො"ති ගාථා. "තස්මා රක්ඛිතචිත්තස්සා"ති චිත්තං මනො විඤ්ඤාණං මනින්ද්‍රියං මනායතනං විජානනා විජානිතත්තං, ඉදං වෙවචනං. "සම්මාසඞ්කප්පගොචරො"ති නෙක්ඛම්මසඞ්කප්පො අබ්‍යා-පාදසඞ්කප්පො අවිහිංසාසඞ්කප්පො, ඉදං වෙවචනං. "සම්මාදිට්ඨි-පුරෙක්ඛාරො"ති සම්මාදිට්ඨි නාම පඤ්ඤාසත්ථං පඤ්ඤාඛග්ගො පඤ්ඤාරතනං පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාපතොදො පඤ්ඤාපාසාදො, ඉදං වෙවචනං.

නියුත්තො වෙවචනො හාරසම්පාතො

රක්ඛිතචිත්තො අස්ස යනාදීන් ඉන්ද්‍රියසංවරාදිය ද දුර්ගතිප්‍රහාණය ද වදරන) භාග්‍යවතුන් වහන්සේගේ මේ ගාථාදෙශනායෙහි අදහස යැ, යම්හෙයකින් කොකාලික මහණ සැරියුත් මුගලන් තෙරවරුන් කෙරෙහි සිත ප්‍රදුෂ්‍ය කොට මහාපදුමනිරයෙහි උපන්නේ ද එහෙයිනි. භාග්‍යවතුන් වහන්සේ ද සිහියෙන් රක්නාලද සිතින් සමන්වාගත වූසේක. සූත්‍රයෙහි '' සතියා චිත්තං රක්ඛිතබ්බං '' යී වදරනලදි. (මේ දෙශනානුසන්ධි දැක්වීම යි.)

**චතුබ්‍යූහහාරසම්පාතය යොදනලදී.**

## 3. 2. 7

එහි ආවට්ටහාරසම්පාත කවරෙ යැ : '' තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්ප ගොචරො '' යනාදි ගාථාව නිදර්ශන යි. තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො යනු (නෙක්ඛම්මසඞ්කප්ප බහුල කොට ඇතියේ කසිණාදි වශයෙන් ලැබූ චිත්තෛකාග්‍රතායෙන් කෙලෙසුන්ගෙන් සිත රක්නාලද වේ නුයි) මේ සමථ යැ, සම්මාදිට්ඨිපුරෙක්ඛාරො යනු විදර්ශනා යැ (විදර්ශනාව ප්‍රඥ ප්‍රධාන හෙයිනි.) ඤත්වාන උදයබ්බයං යනු දුඃඛ සත්‍යයාගේ පරිඥ යැ, ථීනමිද්ධාභිභූ භික්ඛු යනු සමුදය ප්‍රහාණ යැ, සබ්බා දුග්ගතියො ජහෙ යන මේ නිරොධ යි. මේ චතුස්සත්‍යයෝ යි.

**ආවට්ටහාරසම්පාතය යොදනලදී.**

## 3. 2. 8

එහි විභත්තිහාරසම්පාත කවරෙ යැ : '' තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්ප ගොචරො '' යනාදි ගාථා යි. කුශලපක්ෂය චක්ඛුසංවරාදි කුශලපක්ෂයෙන් දැක්වියැ යුත්තේ යැ, අකුශලපක්ෂය චක්ඛුඅසංවරාදි අකුශලපක්ෂයෙන් දැක්වියැයුත්තේ යි.

**විභත්තිහාරසම්පාතය යොදනලදී.**

## 3. 2. 9

එහි පරිවත්තනහාරසම්පාත කවරෙ යැ : '' තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්ප ගොචරො '' යනාදි ගාථා යි. ලෞකික ශමථවිදර්ශනා වැඩූ කල්හි (' අරක්ඛිතෙන චිත්තෙන ' යනාදි ගාථාවට නොහොත් විභත්තිහාරයෙහි දැක්වූ අකුශලපක්ෂයට) ප්‍රති පක්ෂවශයෙන් නිරොධය ඵල යැ දුක්ඛය පරිඥත යැ සමුදය ප්‍රහීණ යැ මාර්ගය භාවිත යි.

**පරිවත්තනහාරසම්පාතය යොදනලදී.**

## 3. 2. 10

එහි වෙවචනහාරසම්පාත කවරෙ යැ : '' තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්ප ගොචරො '' යනාදි ගාථා යි. තස්මා රක්ඛිතචිත්තස්ස යනු ' චිත්ත, මනො, විඤ්ඤාණ මනින්ද්‍රිය, මනායතන, විජානනා, විජානිතත්ත ' මේ චිත්තවෙවචන යැ, සම්මාසඞ්කප්ප ගොචරො යනු ' නෙක්ඛම්මසඞ්කප්ප, අව්‍යාපාදසඞ්කප්ප, අවිහිංසාසඞ්කප්ප, මේ සම්මාසඞ්කප්පවෙවචන යැ. සම්මාදිට්ඨිපුරෙක්ඛාරො යනු සම්මාදිට්ඨි නම : ' පඤ්ඤ සත්ථ, පඤ්ඤාඛග්ග, පඤ්ඤාරතන, පඤ්ඤාපජ්ජොත, පඤ්ඤාපතොද, පඤ්ඤාපාසාද මේ සම්මාදිට්ඨියට වෙවචන යි.

**වෙවචනහාරසම්පාතය යොදනලදී.**

## 3, 2. 11

තත්ථ කතමො පඤ්ඤත්තිහාරසම්පාතො: "තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරොති''ති ගාථා. 'තස්මා රක්ඛිතචිත්තස්සා'ති පදට්ඨානපඤ්ඤත්ති සතියා; සම්මාසඞ්කප්පගොචරො''ති භාවනාපඤ්ඤත්ති සමථස්ස; "සම්මාදිට්ඨිපුරෙක්ඛාරො ඤත්වාන උදයබ්බය''න්ති දස්සනභූමියා නික්ඛෙපපඤ්ඤත්ති; "ථීනමිද්ධාභිභූ භික්ඛු''ති සමුදයස්ස අනවසෙසප්පහානපඤ්ඤත්ති; "සබ්බා දුග්ගතියො ජහෙ''ති භාවනාපඤ්ඤත්ති මග්ගස්ස.

**නියුත්තො පඤ්ඤත්තිහාරසම්පාතො**

## 3, 2, 12

තත්ථ කතමො ඔතරණො හාරසම්පාතො: "තස්මා රක්ඛිතචිත්ත'ස්ස සම්මාසඞ්කප්පගොචරො''ති ගාථා. "තස්මා රක්ඛිතචිත්ත'ස්ස සම්මාසංකප්පගොචරො සම්මාදිට්ඨිපුරෙක්ඛාරො''ති සම්මාදිට්ඨියා ගහිතාය ගහිතානි භවන්ති පඤ්චින්ද්‍රියානි, අයං ඉන්ද්‍රියෙහි ඔතරණා. තානියෙව ඉන්ද්‍රියානි විජ්ජා. විජ්ජුප්පාදා අවිජ්ජානිරොධො, අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, (එවං සබ්බං) අයං පටිච්චසමුප්පාදෙන ඔතරණා. තානියෙව පඤ්චින්ද්‍රියානි තීහි ඛන්ධෙහි සඞ්ගහිතානි: සීලක්ඛන්ධෙන සමාධික්ඛන්ධෙන පඤ්ඤාක්ඛන්ධෙන, අයං ඛන්ධෙහි ඔතරණා. තානියෙව පඤ්චින්ද්‍රියානි සඞ්ඛාරපරියාපන්නානි යෙ සඞ්ඛාරා අනාසවා නො ච භවඞ්ගා, තෙ සඞ්ඛාරා ධම්මධාතුසඞ්ගහිතා. අයං ධාතූහි ඔතරණා. සා ධම්මධාතු ධම්මායතනපරියාපන්නා, යං ආයතනං අනාසවං නො ච භවඞ්ගං අයං ආයතනෙහි ඔතරණා.

**නියුත්තො ඔතරණො හාරසම්පාතො**

## 3, 2, 13

තත්ථ කතමො සොධනො හාරසම්පාතො: "තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො''ති ගාථා. යත්ථ ආරම්භො සුද්ධො සො පඤ්හො විස්සජ්ජිතො භවති. යත්ථ පන ආරම්භො න සුද්ධො, න තාව සො පඤ්හො විස්සජ්ජිතො භවති.

**නියුත්තො සොධනො හාරසම්පාතො**

## 3, 2, 14

තත්ථ කතමො අධිට්ඨානො හාරසම්පාතො: "තස්මා රක්ඛිත චිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො''ති ගාථා, "තස්මා රක්ඛිතචිත්තස්සා''ති එකත්තතා; චිත්තං මනො විඤ්ඤාණං, අයං වෙමත්තතා, "සම්මාසඞ්කප්පගොචරො''ති එකත්තතා; නෙක්ඛම්මසඞ්කප්පො, අබ්‍යාපාදසඞ්කප්පො, අවිහිංසාසඞ්කප්පො, අයං වෙමත්තතා. සම්මාදිට්ඨිපුරෙක්ඛාරො''ති එකත්තතා; සම්මාදිට්ඨි නාම යං දුක්ඛෙ ඤාණං

## 3. 2. 11

එහි පඤ්ඤත්තිහාරසම්පාත කවරෙ යැ : '' තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්ප ගොචරො '' යන ගාථා යැ. තස්මා රක්ඛිතචිත්තස්ස යනු ස්මෘතියගේ පදට්ඨාන ප්‍රඥප්ති යැ, සම්මාසඞ්කප්පගොචරො යනු සමථයාගේ භාවනා ප්‍රඥප්ති යැ, සම්මාදිට්ඨි පුරෙක්ඛාරො ඤත්වාන උදයබ්බයං යනු දර්ශනභූමියගේ නික්ෂෙපප්‍රඥප්ති යැ, ථිනමිද්ධාභිභූ භික්ඛු යනු සමුදයාගේ අනවශෙෂප්‍රහාණ ප්‍රඥප්ති යැ, සබ්බා දුග්ගතියො ජහෙ යනු මාර්ගයාගේ භාවනා ප්‍රඥප්ති යි.

පඤ්ඤත්තිහාරසම්පාතය යොදන ලදී.

## 3. 2. 12

එහි ඔතරණහාරසම්පාත කවරෙ යැ : '' තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්ප ගොචරො '' යනාදි නිදර්ශන ගාථා යැ, තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො සම්මාදිට්ඨිපුරෙක්ඛාරො යනු සම්මාදිට්ඨිය ගත් කල්හි සද්ධාදි පඤ්චෙන්ද්‍රියයෝ ගන්නා ලද්දහු වෙති. මේ ඉන්ද්‍රියයන්ගෙන් අවතරණ යැ. එ මැ ඉන්ද්‍රියයෝ විද්‍යාව වෙයි, විද්‍යාව ඉපදීමෙන් අවිද්‍යානිරොධය වෙයි, අවිද්‍යානිරොධයෙන් සඞ්ඛාරනිරොධය වෙයි, සඞ්ඛාරනිරොධයෙන් විඤ්ඤාණනිරොධය වෙයි, (මෙසේ සියල්ල) මේ පටිච්චසමුප්පාද යෙන් අවතරණ යැ. එ මැ පඤ්චෙන්ද්‍රියයෝ සීලස්කන්ධයෙන් සමාධිස්කන්ධයෙන් ප්‍රඥාස්කන්ධයෙන් යන තුන් ස්කන්ධයෙන් සඞ්ගෘහීත වෙති. මේ ස්කන්ධයන්ගෙන් අවතරණ යැ. එ මැ පඤ්චෙන්ද්‍රියයෝ අනාස්‍රව වූ නො ද භවාඞ්ග වූ යම් සංස්කාර කෙනෙක් ඇද්ද ඒ සංස්කාරයන්හි පර්‍ය්‍යාපන්න වෙති, ඒ සංස්කාරයෝ ධර්මධාතුයෙන් සංගෘහීතයහ. මේ ධාතුන්ගෙන් අවතරණ යැ. ඒ ධර්මධාතුව ධර්මායතනයෙහි පර්‍ය්‍යා පන්න යැ, අනාස්‍රව වූ නො ද භවාඞ්ග වූ යම් ආයතනයෙක් ඇද්ද එහි යැ, මේ ආයතනයන් ගෙන් අවතරණ යි.

ඔතරණහාරසම්පාතය යොදන ලදී.

## 3. 2. 13

එහි සොධනහාරසම්පාත කවරෙ යැ : ''තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්ප ගොචරො '' යනාදි ගාථා යැ. යම් දේශනායෙක දැනගනු කැමැති අර්ථ සංඛ්‍යාත ආරම්භය ශුද්ධ ද, ඒ ප්‍රශ්නය විසඳන ලද වෙයි, යළි යම් තැනෙක ආරම්භය ශුද්ධ නො වේ ද, ඒ ප්‍රශ්නය තව නො විසඳනලද්දේ වේ.

සොධනහාරසම්පාතය යොදන ලදී.

## 3. 2. 14

එහි අධිට්ඨානහාරසම්පාත කවරෙ යැ : '' තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්ප ගොචරො '' යනාදි ගාථා යැ. තස්මා රක්ඛිතචිත්තස්ස යනු (සාමාන්‍යයෙන් දෙසනලද හෙයින්) එකත්තතා යැ, ' චිත්තං මනො විඤ්ඤාණං ' මේ වෙමත්තතා යි. සම්මා සඞ්කප්පගොචරො යනු එකත්තතා යැ, නෙක්ඛම්මසඞ්කප්ප යැ, අව්‍යාපාදසඞ්කප්ප යැ අවිහිංසාසඞ්කප්ප යැ යන මේ වෙමත්තතා යි. සම්මාදිට්ඨිපුරෙක්ඛාරො යනු එකත්තතා යැ, සම්මාදිට්ඨි නම් : යම් දුක්ඛයෙහි ඥානයෙක් දුක්ඛසමුදයෙහි ඥානයෙක්

දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං මග්ගෙ ඤාණං හෙතුස්මිං ඤාණං හෙතුසමුප්පන්නෙසු ධම්මෙසු ඤාණං පච්චයෙ ඤාණං පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු ඤාණං, යං තත්ථ තත්ථ යථාභූතඤාණදස්සනං අභිසමයො සම්පටිවෙධො සච්චාගමනං, අයං වෙමත්තතා: ඤත්වාන උදයබ්බය”න්ති එකත්තතා: උදයෙන-අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං; (එවං සබ්බං,) සමුදයො භවති, වයෙන අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, (එවං සබ්බං) නිරොධො හොති. අයං වෙමත්තතා. “ථීනමිද්ධාභිභූ භික්ඛූ”ති එකත්තතා, ථීනං නාම යා චිත්තස්ස අකම්මනියතා, මිද්ධං නාම යං කායස්ස ලීනත්තං, අයං වෙමත්තතා. “සබ්බා දුග්ගතියො ජහෙ”ති එකත්තතා; දෙවමනුස්සෙ වා උපනිධාය අපායා දුග්ගති, නිබ්බානං වා උපනිධාය සබ්බා උප්පත්තියො දුග්ගති. අයං වෙමත්තතා.

නිට්ඨිතො අධිට්ඨානො හාරසම්පාතො

## 3, 2, 15

තත්ථ කතමො පරික්ඛාරො හාරසම්පාතො: “තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො”ති ගාථා අයං සමථවිපස්සනාය පරික්ඛාරො.

නිට්ඨිතො පරික්ඛාරො හාරසම්පාතො

## 3, 2, 16

තත්ථ කතමො සමාරොපනො හාරසම්පාතො:

“තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්පගොචරො,
සම්මාදිට්ඨිපුරෙක්ඛාරො ඤත්වාන උදයබ්බයං;
ථීනමිද්ධාභිභූ භික්ඛු සබ්බා දුග්ගතියො ජහෙ”ති.

“තස්මා රක්ඛිතචිත්තස්සා”ති තිණ්ණං සුචරිතානං පදට්ඨානං, චිත්තෙ රක්ඛිතෙ තං රක්ඛිතං භවති කායකම්මං වචීකම්මං මනොකම්මං. “සම්මාදිට්ඨිපුරෙක්ඛාරො”ති සම්මාදිට්ඨියා භාවිතාය භාවිතො භවති අරියො අට්ඨඞ්ගිකො මග්ගො, කෙන කාරණෙන: සම්මාදිට්ඨිතො හි සම්මාසඞ්කප්පො පභවති, සම්මාසඞ්කප්පතො සම්මාවාචා පභවති, සම්මාවාචාතො සම්මාකම්මන්තො පභවති, සම්මාකම්මන්තතො සම්මාආජීවො පභවති, සම්මාආජීවතො සම්මාවායාමො පභවති, සම්මා-වායාමතො සම්මාසති පභවති, සම්මාසතිතො සම්මාසමාධි පභවති, සම්මාසමාධිතො සම්මාවිමුත්තිඤාණදස්සනං පභවති, අයං අනුපාදිසෙසො පුග්ගලො අනුපාදිසෙසා ච නිබ්බානධාතු.

නිට්ඨිතො සමාරොපනො හාරසම්පාතො

තෙනාහ ආයස්මා මහාකච්චානො:

“සොළස හාරා පඨමං දිසලොචනෙන දිසා විලොකෙත්වා,
සංඛිපිය අඞ්කුසෙන හි නයෙහි තීහි නිද්දිසෙ සුත්ත”න්ති.

නිට්ඨිතො හාරසම්පාතො

දුක්ඛනිරොධයෙහි ඥානයෙක් දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදයෙහි ඥානයෙක් මාර්ගයෙහි ඥානයෙක් හෙතුයෙහි ඥානයෙක් හෙතුසමුත්පන්නධර්මයන්හි ඥානයෙක් ප්‍රත්‍යයෙහි ඥානයෙක් ප්‍රත්‍යයසමුත්පන්නධර්මයන්හි ඥානයෙක් ඇද්ද, ඒ ඒ ධර්මයෙහි යම් යථා භූතඥානදර්ශනයෙක් අභිසමයයෙක් සම්ප්‍රතිවෙධයෙක් සත්‍ය හෙයින් විෂයාවබොධයෙක් ඇද්ද, මේ වෙමත්තතා යි. ඤත්වාන උදයබ්බයං යනු එකත්තතා යැ. උදයඥානයෙන් – අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති, සංස්කාරප්‍රත්‍යයෙන් විඥානය වෙයි, (මෙසේ සියල්ල) සමුදය වේ. ව්‍යයඥානයෙන් – අවිද්‍යානිරොධයෙන් සංස්කාරනිරොධය වෙයි, සංස්කාරනිරොධයෙන් විඥානනිරොධය වෙයි, (මෙසේ සියල්ල) නිරොධය වේ. මේ වෙමත්තතා යි. ථීනමිද්ධාභිභූ භික්ඛු යනු එකත්තතා යැ, ' ථීන ' නම් : චිත්තයාගේ යම් අකර්මණ්‍යබවක් ඇද්ද එයයි, ' මිද්ධ ' නම් කායයාගේ යම් හැකුළුණුබවක් ඇද්ද එයයි. මේ වෙමත්තතා යි. සබ්බා දුග්ගතියො ජහෙ යනු එකත්තතා යැ, දෙවිමිනිසුන් පිණිස අපායයෝ දුර්ගති යැ, නිර්වාණය හෝ පිණිස සියලු උපප්‍රාප්තිහු දුර්ගති යැ. මේ වෙමත්තතා යි.

**අධිට්ඨානහාරසම්පාතය යොදනලදී.**

## 3. 2. 15

එහි පරික්ඛාරහාරසම්පාත කවරෙ යැ : '' තස්මා රක්ඛිතචිත්තස්ස සම්මාසඞ්කප්ප ගොචරො '' යන ගාථා යැ, මේ ගාථාධර්මය ශමථ විදර්ශනා දෙකට පරිෂ්කාර යි.

**පරික්ඛාරහාරසම්පාතය යොදනලදී.**

## 3. 2. 16

ඒ සොළොස් හාරසම්පාතයන් කෙරෙහි සමාරොපනහාරසම්පාත කවරෙ යැ :

'' තස්මා රක්ඛිතචිත්තස්ස – පෙ – සබ්බා දුග්ගතියො ජහෙ '' යනු නිදර්ශන යි. තස්මා රක්ඛිතචිත්තස්ස යනු ත්‍රිවිධ සුචරිතයනට පදට්ඨාන යි. චිත්තය රක්ෂිත කල්හි ඒ කායකර්මය වාක්කර්මය මනඃකර්මය රක්නාලද වෙයි. සම්මාදිට්ඨිපුරෙක්ඛාරො යනු සම්‍යග්දෘෂ්ටිය භාවිත කල්හි ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය භාවිත වෙයි. කවර කරුණින යත් : සම්‍යග්දෘෂ්ටියෙන් සම්‍යක්සංකල්පය උපදී, සම්‍යක්සංකල්පයෙන් සම්‍යග්වචනය උපදී, සම්‍යග්වචනයෙන් සම්‍යක්කර්මාන්තය උපදී, සම්‍යක්කර්මාන්තයෙන් සම්‍යගාජීවය උපදී, සම්‍යගාජීවයෙන් සම්‍යග්ව්‍යායාමය උපදී, සම්‍යග්ව්‍යායාමයෙන් සම්‍යක්ස්මෘතිය උපදී, සම්‍යක්ස්මෘතියෙන් සම්‍යක්සමාධිය උපදී, සම්‍යක්සමාධියෙන් සම්‍යග්විමුක්තිය උපදී, සම්‍යග්විමුක්තියෙන් සම්‍යග්විමුක්තිඥානදර්ශනය උපදී, එහෙයිනි. මේ අනුපාදිශෙෂපුද්ගල ද අනුපාදිශෙෂනිර්වාණධාතු ද වේ.

**සමාරොපනහාරසම්පාතය යොදනලද වේ.**

එයින් වදළහ, ආයුෂ්මත් මහාකාත්‍යායන මහරහතුන්වහන්සේ :

'' ව්‍යඤ්ජන පර්‍යෙෂ්ණ විසින් පළමු කොට සොළසහාරයෝ යෙදියැයුත්තාහ, දිසාලොචනනයින් ප්‍රථමදිශාදිය අවලොකන කොට අඞ්කුසනයින් දිශාභූත ධර්මයන් සූත්‍රයෙන් නිර්ධාරණ කොට නන්දියාවට්ටාදි තුන් නයින් සූත්‍රය වර්ණනා කරන්නේ ය '' යි.

**හාරසම්පාතය යොදනලද්දේ යි.**

## නයසමුට්ඨානං

### 3, 3, 1-5

තත්ථ කතමං නයසමුට්ඨානං: පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජාය ච භවතණ්හාය ච. තත්ථ අවිජ්ජා නීවරණං, තණ්හාසංයොජනං. අවිජ්ජානීවරණා සත්තා අවිජ්ජාසංයුත්තා[1] අවිජ්ජාපක්ඛෙන විචරන්ති, තෙ වුච්චන්ති "දිට්ඨිචරිතා"ති. තණ්හාසංයොජනා සත්තා තණ්හාසංයුත්තා[2] තණ්හාපක්ඛෙන විචරන්ති, තෙ වුච්චන්ති "තණ්හාචරිතා"ති. දිට්ඨිචරිතා ඉතො බහිද්ධා පබ්බජිතා අත්තකිලමථානුයොගමනුයුත්තා විහරන්ති තණ්හාචරිතා ඉතො බහිද්ධා පබ්බජිතා කාමෙසු කාමසුඛල්ලිකානුයොගමනුයුත්තා විහරන්ති.

තත්ථ කිං කාරණං යං දිට්ඨිචරිතා ඉතො බහිද්ධා පබ්බජිතා අත්තකිලමථානුයොගමනුයුත්තා විහරන්ති, තණ්හාචරිතා ඉතො බහිද්ධා පබ්බජිතා කාමෙසු කාමසුඛල්ලිකානුයොගමනුයුත්තා විහරන්ති: ඉතො බහිද්ධා නත්ථි සච්චවවත්ථානං කුතො චතුසච්චප්පකාසනා සමථ-විපස්සනාකොසල්ලං වා උපසමසුඛප්පත්ති වා. උපසමසුඛස්ස අනභිඤ්ඤා විපරීතචෙතා එවමාහංසු: නත්ථි සුඛෙන සුඛං, දුක්ඛෙන නාම සුඛමධිගන්තබ්බං, යො කාමෙ පටිසෙවති සො ලොකං වඩ්ඪයති, යො ලොකං වඩ්ඪයති සො බහුං පුඤ්ඤං පසවතී"ති. තෙ එවංසඤ්ඤී එවංදිට්ඨී දුක්ඛෙන සුඛං පත්ථයමානා කාමෙසු පුඤ්ඤසඤ්ඤී අත්තකිලමථානුයොගමනුයුත්තා ච විහරන්ති කාමසුඛල්ලිකානුයොගමනුයුත්තා ච.

තෙ තදභිඤ්ඤා සන්තා රොගමෙව වඩ්ඪයන්ති ගණ්ඩමෙව වඩ්ඪයන්ති සල්ලමෙව වඩ්ඪයන්ති. තෙ රොගාභිතුන්නා ගණ්ඩපටිපීළිතා සල්ලානුවිද්ධා නිරයතිරච්ඡානයොනිපෙතාසුරෙසු උම්මුජ්ජනිමුජ්ජානි කරොන්තා උග්ඝාතනිග්ඝාතං පච්චනුභොන්තා රොගගණ්ඩසල්ලභෙසජ්ජං න වින්දන්ති. තත්ථ අත්තකිලමථානුයොගො කාමසුඛල්ලිකානුයොගො ච සංකිලෙසො, සමථවිපස්සනා වොදානං, අත්තකිලමථානුයොගො කාමසුඛල්ලිකානුයොගො ච රොගො; සමථවිපස්සනා රොගනිග්ඝාතකභෙසජ්ජං අත්තකිලමථානුයොගො කාමසුඛල්ලිකානුයොගො ච ගණ්ඩො, සමථවිපස්සනා ගණ්ඩනිග්ඝාතකභෙසජ්ජං. අත්තකිලමථානුයොගො කාමසුඛල්ලිකානුයොගො ච සල්ලො, සමථවිපස්සනා සල්ලුද්ධරණභෙසජ්ජං.

තත්ථ සංකිලෙසො දුක්ඛං, තදභිසඞ්ගො තණ්හා සමුදයො, තණ්හානිරොධො දුක්ඛනිරොධො, සමථවිපස්සනා දුක්ඛනිරොධගාමිනී පටිපදා. ඉමානි චත්තාරි සච්චානි: දුක්ඛං පරිඤ්ඤෙය්‍යං සමුදයො පහාතබ්බො මග්ගො භාවෙතබ්බො නිරොධො සච්ඡිකාතබ්බො.

1. අවිජ්ජාය සංයුත්තා - සීමු.
2. තණ්හාය සංයුත්තා - සීමු.

# නයසමුට්ඨානය

## 3. 3. 1-5

එහි නයසමුට්ඨාන කවරෙ යැ: අවිද්‍යාවගේ ද භවතෘෂ්ණාවගේ ද පූර්වකොටිය (මුල්කාලය) නො පැනෙයි. එහි අවිද්‍යාව නීවරණ යැ, තෘෂ්ණාව සංයොජන යි. අවිද්‍යා නීවරණ ඇති සත්ත්වයෝ අවිද්‍යායෙන් මිශ්‍රිත වූවාහු (නොහොත් අවිද්‍යායෙන් අභිනිවෙශවස්තුන්හි බැඳුණාහු) අවිද්‍යාපක්ෂයෙන් (අවිද්‍යාසහායයෙන්) අරමුණෙහි පවතිත්. ඔහු 'දිට්ඨිචරිතයෝ' යයි කියනු ලැබෙත්. තෘෂ්ණාසංයොජන ඇති සත්ත්වයෝ තෘෂ්ණායෙන් සංයුක්ත වූවාහු තෘෂ්ණාපක්ෂයෙන් (අට්ඨසත තණ්හාවිචරිතයෙන්) අරමුණෙහි පවතිත්. ඔහු 'තණ්හාචරිතයෝ යයි කියනු ලැබෙත්. දිට්ඨිචරිත ඇති මේ ශාසනයෙන් බාහිර වූ පැවිද්දෝ ආත්මක්ලමථානුයොගයෙහි යෙදුණාහු වාසය කෙරෙති. තණ්හාචරිත ඇති මේ ශාසනයෙන් බාහිර වූ පැවිද්දෝ කාමයන්හි කාමසුඛල්ලිකානුයොගයෙහි යෙදුණාහු වාසය කෙරෙත්.

යම් හෙයෙකින් දිට්ඨිචරිත ඇති මෙසස්නෙන් බැහැර පැවිද්දෝ ආත්මපරිතාපනානුයෝගයෙහි යෙදුණාහු වාසය කෙරෙත් ද, තණ්හාචරිත ඇති මෙ සස්නෙන් බැහැර පැවිද්දෝ කාමයන්හි කාමසුඛල්ලිකානුයොගයෙහි යෙදුණාහු වාසය කෙරෙත් ද, එහි කරුණු කිම යත්: මේ ශාසනයෙන් බැහැර චතුස්සත්‍යය ව්‍යවස්ථා කොට දැනීමෙක් නැත, චතුස්සත්‍ය දේශනායෙක් කොහි යැ, ශමථවිදර්ශනා භාවනා කෞශල්‍යයෙක් වේවයි ක්ලේශයන්ගේ සුඛාධිගමයෙක් වේව' යි කොහි යැ. උපසමසුඛය නො දන මිථ්‍යාභිනිවෙශයෙන් විපරීත සිත් ඇත්තාහු මෙසේ කීහු: 'සුවයෙන් සුව ලැබීමෙක් නැත, කායඛෙදන දුඃඛයෙන් ම සුව ලැබියයුතු යැ යි ද, යමෙක් කාමයන් සෙවන කෙරේ ද හේ ආත්මභාව සංඛ්‍යාත ලොකය වඩයි, (පිනවයි,) නොහොත් පුත්‍රනප්තෘපරම්පරායෙන් සත්ත්වලොකය වඩයි, යමෙක් ලොකය වඩා ද හේ බොහෝ පින් රැස්කෙරේ යැ' යි ද කීහු, මෙබඳු සංඥා ඇති මෙබඳු දෘෂ්ටි ඇති ඔහු දුකින් සුව පතන්නාහු කාමයන්හි පුණ්‍යසංඥා ඇත්තාහු ආත්මක්ලමථුයෙහි යෙදුණාහු ද කාමසුඛල්ලිකානුයොගයෙහි යෙදුණාහු ද වාස කෙරෙත්.

ඔව්හු එබඳු සංඥා ඇත්තාහු ආත්මභාවරොගය මැ හෝ ක්ලෙශරොගය මැ මතුමතුයෙහි වඩති, ආත්මභාව (ක්ලෙශ) ගණ්ඩය මැ වඩති, ක්ලෙශශල්‍යය මැ වඩත්. ඔව්හු ආත්මභාවරොගයෙන් ව්‍යාධිත වූවාහු ගණ්ඩයෙන් පීඩිත වූවාහු ශල්‍යයෙන් විදුනාලද්දාහු නිරය තිරශ්චීනයොනි ප්‍රෙත අසුරකායයෙහි ච්‍යුති උත්පත්ති විසින් උම්මුජ්ජන නිමුජ්ජන කරන්නාහු උච්චාවචභාවය විඳුනාහු යථොක්ත රොගගණ්ඩශල්‍යයනට පිළියම් (භෛෂජ්‍ය) නොලබත්. එහි අත්තකිලමථානුයොගය ද කාමසුඛල්ලිකානුයොගය ද සංක්ලෙශ යැ, ශමථවිදර්ශනා ව්‍යවදානය යැ, අත්තකිලමථානුයොගය ද කාමසුඛල්ලිකානුයොගය ද රොග යැ, සමථවිපස්සනා රොග නසන භෛෂජ්‍ය යැ. අත්තකිලමථානුයොගය ද කාමසුඛල්ලිකානුයොගය ද ගණ්ඩ යැ, සමථවිපස්සනා ගඩු නසන භෛෂජ්‍ය යැ. අත්තකිලමථානුයොගය ද කාමසුඛල්ලිකානුයොගය ද ශල්‍ය යැ, ශමථවිදර්ශනා දෙක (ස්කන්ධදුඃඛ සංඛ්‍යාත) හුල් උදුරන ඔබෙහෙති.

එහි සංක්ලෙශ වූ රූපාරූප කය දුඃඛසත්‍ය යැ, එහි අභිසඞ්ග වූ (ඇලෙන) තෘෂ්ණාව සමුදයසත්‍ය යැ, තෘෂ්ණානිරොධය දුඃඛනිරොධසත්‍ය යැ, ශමථවිදර්ශනා දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදසත්‍ය යැ. මේ චතුස්සත්‍යයෝ යි. දුඃඛය පරිඥෙය (පිරිසිඳ දතයුතුයැ), සමුදය ප්‍රහාතව්‍ය යැ, මාර්ගය භාවිතව්‍ය යැ, නිරොධය සාක්ෂාත්කර්තව්‍ය යි.

තත්ථ දිට්ඨිචරිතා රූපං අත්තතො උපගච්ඡන්ති, වෙදනං-පෙ-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං අත්තතො උපගච්ඡන්ති, තණ්හාචරිතා රූපවන්තං අත්තානං උපගච්ඡන්ති, අත්තනි වා රූපං රූපස්මිං වා, අත්තානං, වෙදනාවන්තං-පෙ-සඤ්ඤාවන්තං-පෙ-සඞ්ඛාරවන්තං-පෙ-විඤ්ඤාණවන්තං අත්තානං උපගච්ඡන්ති, අත්තනි වා විඤ්ඤාණං විඤ්ඤාණස්මිං වා අත්තානං. අයං වුච්චති වීසතිවත්ථුකා සක්කායදිට්ඨි.

තස්සා පටිපක්ඛො ලොකුත්තරා සම්මාදිට්ඨි, අන්වායිකා සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි, අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො. තෙ තයො ඛන්ධා: සීලක්ඛන්ධො සමාධික්ඛන්ධො පඤ්ඤාක්ඛන්ධො. සීලක්ඛන්ධො සමාධික්ඛන්ධො ච සමථො, පඤ්ඤාක්ඛන්ධො විපස්සනා. තත්ථ සක්කායො දුක්ඛං, සක්කායසමුදයො දුක්ඛසමුදයො, සක්කායනිරොධො දුක්ඛනිරොධො, අරියො අට්ඨඞ්ගිකො මග්ගො දුක්ඛනිරොධගාමිනීපටිපදා. ඉමානි චත්තාරි සච්චානි. දුක්ඛං පරිඤ්ඤෙය්‍යං සමුදයො පහාතබ්බො මග්ගො භාවෙතබ්බො නිරොධො සච්ඡිකාතබ්බො.

තත්ථ යෙ රූපං අත්තතො උපගච්ඡන්ති, වෙදනං-පෙ-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං අත්තතො උපගච්ඡන්ති, ඉමෙ වුච්චන්ති, 'උච්ඡෙදවාදිනො'ති. යෙ රූපවන්තං අත්තානං උපගච්ඡන්ති, අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං, යෙ වෙදනාවන්තං-පෙ- යෙ සඤ්ඤාවන්තං -පෙ-යෙ සඞ්ඛාරවන්තං-පෙ-යෙ විඤ්ඤාණවන්තං අත්තානං උපගච්ඡන්ති, අත්තනි වා විඤ්ඤාණං විඤ්ඤාණස්මිං වා අත්තානං, ඉමෙ වුච්චන්ති 'සස්සතවාදිනො'ති.

තත්ථ උච්ඡෙදසස්සතවාදා උභො අන්තා, අයං සංසාරපවත්ති තස්ස පටිපක්ඛො මජ්ඣිමා පටිපදා අරියො අට්ඨඞ්ගිකො මග්ගො, අයං සංසාරනිවත්ති. තත්ථ පවත්ති දුක්ඛං, තදභිසඞ්ගා තණ්හා සමුදයො, තණ්හානිරොධො දුක්ඛනිරොධො, අරියො අට්ඨඞ්ගිකො මග්ගො දුක්ඛනිරොධගාමිනී පටිපදා, ඉමානි චත්තාරි සච්චානි. දුක්ඛං පරිඤ්ඤෙය්‍යං සමුදයො පහාතබ්බො මග්ගො භාවෙතබ්බො නිරොධො සච්ඡිකාතබ්බො.

තත්ථ උච්ඡෙදසස්සතං සමාසතො වීසතිවත්ථුකා සක්කායදිට්ඨි, විත්ථාරතො ද්වාසට්ඨි දිට්ඨිගතානි. තෙසං පටිපක්ඛො තෙචත්තාලීසං බොධිපක්ඛියා ධම්මා, අට්ඨ විමොක්ඛා, දස කසිණායතනානි. ද්වාසට්ඨි දිට්ඨිගතානි මොහජාලං අනාදි අනිධනප්පවත්තං. තෙචත්තාලීසං බොධිපක්ඛියා ධම්මා ඤාණවජිරං මොහජාලප්පදාලනං. තත්ථ මොහො අවිජ්ජා, ජාලං භවතණ්හා. තෙන වුච්චති: "පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජාය ච භවතණ්හාය චා"ති

එහි (දෙවැදැරුම් චරිතයන් කෙරෙහි) දෘෂ්ටිචරිතයෝ රූපය ආත්මවශයෙන් ගනිති වේදනාව . . . සංඥාව . . . සංස්කාරයන් . . . විඥානය ආත්ම වීසින් ගනිත්. තෘෂ්ණා චරිතයෝ ආත්මය රූපවත් යැයි හෝ ආත්මයෙහි රූපය ඇතැයි හෝ රූපයෙහි ආත්මය ඇතැයි හෝ ගනිති, ආත්මය වේදනාවත් යැ . . . ආත්මය සංඥාවත් යැ . . . ආත්මය සංස්කාරවත් යැ . . . ආත්මය විඥානවත් යැ හෝ ආත්මයෙහි විඥානය ඇතැයි හෝ විඥානයෙහි, ආත්මය ඇතැයි හෝ ගනිත්. මේ විංශද්වස්තුක සත්කායදෘෂ්ටි යයි කියනු ලැබේ. (පඤ්චස්කන්ධයන් කෙරෙහි එකෙකි ස්කන්ධයෙක සතර පරිද්දෙකින් උපදනා ග්‍රාහයාගේ වශයෙන් විසිවැදැරුම් වූ දෘෂ්ටිය පඤ්චස්කන්ධය ඇති කල්හි හෝ කයෙහි විද්‍යමාන වූ දෘෂ්ටි නුයි සක්කායදිට්ඨී නමු.)

ඒ සත්කායදෘෂ්ටියට ලොකොත්තර සම්‍යග්දෘෂ්ටිය ප්‍රතිපක්ෂ යැ. සම්මාසඞ්කප්ප සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යන මොහු (ඒ පඨමමග්ගසම්මාදිට්ඨියට) අනුගාමීහු වෙති. මේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ග යැ. ඔහු ' සීලක්ඛන්ධ සමාධික්ඛන්ධ පඤ්ඤාක්ඛන්ධ යන තුන් ස්කන්ධයෝ යැ. ශීල ස්කන්ධය ද සමාධිස්කන්ධය ද ශමථ යැ, ප්‍රඥාස්කන්ධය විදර්ශනා යි, එහි සත්කාය දුඃඛසත්‍ය යැ. සත්කායසමුදය දුඃඛසමුදය යැ. සත්කාය නිරොධය දුක්ඛනිරොධය යැ, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය දුක්ඛනිරොධගාමිනී පටිපද යි. මොහු චතුස්සත්‍යයෝ යි. දුඃඛසත්‍යය පරිඥෙය (පිරිසිඳ දතයුත්තේ) යැ, සමුදය සත්‍යය ප්‍රහාතව්‍ය යැ, මාර්ගසත්‍යය භාවිතව්‍ය (වැඩියැයුත්තේ) යැ, නිරොධසත්‍යය සාක්ෂාත් කර්තව්‍ය යි.

ඒ විංශද්වස්තුක සත්කායදෘෂ්ටියෙහි යම් කෙනෙක් රූපය ආත්මවශයෙන් ගනිත් ද, වේදනාව . . . සංඥාව . . . සංස්කාරයන් . . . විඥානය ආත්මවශයෙන් ගනිත් ද, මොහු උච්ඡෙදවාදීහු යයි කියනු ලැබෙත්. යම් කෙනෙක් ආත්මය රූපවත් යයි ගනිත් ද, ආත්මයෙහි රූපය ඇතැයි හෝ රූපයෙහි ආත්මය ඇතැයි හෝ ගනිත් ද, යම් කෙනෙක් ආත්මය වේදනාවත් යයි . . . යම් කෙනෙක් ආත්මය සංඥාවත් යයි . . . යම් කෙනෙක් ආත්මය සංස්කාරවත් යයි . . . යම් කෙනෙක් ආත්මය විඥානවත් යයි ආත්මයෙහි විඥානය ඇතැයි හෝ විඥානයෙහි ආත්මය ඇතැයි හෝ ගනිත් ද, මොහු ශාශ්වතවාදීහු යයි කියනු ලැබෙත්.

එහි උච්ඡෙද ශාශ්වතවාදයෝ උභයාන්තයෝ යැ, මේ සංසාරප්‍රවෘත්තිය යි. ඊට ප්‍රතිපක්ෂ වූයේ මධ්‍යමප්‍රතිපද සංඛ්‍යාත ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ග යැ, මේ සංසාරයාගේ නිවෘත්තිය යි. එහි සංසාරප්‍රවෘත්තිය දුඃඛසත්‍ය යැ, එහි අභිසඞ්ග (ඇලීම) වූ තෘෂ්ණාව සමුදයසත්‍යය යැ, තෘෂ්ණානිරොධය දුඃඛනිරොධ යැ, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය දුඃඛ නිරොධගාමිනී ප්‍රතිපද යි. මේ චතුස්සත්‍යයෝ යැ. දුඃඛය පරිඥෙය යැ, සමුදය ප්‍රහාතව්‍ය යැ, මාර්ගය භාවිතව්‍ය යැ, නිරොධය සාක්ෂාත්කර්තව්‍ය යි.

එහි උච්ඡෙද ශාශ්වත දෙක සැකෙවින් විංශද්වස්තුක සත්කායදෘෂ්ටි යැ, විස්තර හෙයින් දෙසැට දෘෂ්ටිගතයෝ යි. ඔවුනට ප්‍රතිපක්ෂ වූයේ තෙසාලිස් බොධිපාක්ෂික ධර්මයෝ යැ, අෂ්ටවිමොක්ෂයෝ යැ, දසකසිණායතනයෝ යි. ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ (පූර්වකොටිය නො පැනෙනුයෙන්) අනාදි වූ (ප්‍රතිපක්ෂාධිගමයක් නැති කල්හි සන්තාන වශයෙන් නො සිඳී පවත්නා හෙයින්) අනිධනප්‍රවෘත්ත වූ මොහජාලය යි. තෙසාලිස් බොධිපාක්ෂිකධර්මයෝ මොහජාලය ප්‍රදලන කරන විදර්ශනාඥාන මාර්ගඥාන සංඛ්‍යාත ඥානවජ්‍රය (වජිරූපම ඤාණ) යි. එහි මොහය අවිජ්ජා යැ, ජාලය භවතණ්හා යි. එයින් කියනුලැබෙයි : " පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජාය ච භවතණ්හාය ච " යි.

තත්ථ දිට්ඨිචරිතො අස්මිං සාසනෙ පබ්බජිතො සල්ලෙඛානුසන්තතවුත්ති භවති සල්ලෙඛෙ තිබ්බගාරවො, තණ්හාචරිතො අස්මිං සාසනෙ පබ්බජිතො සික්ඛානුසන්තතවුත්ති භවති සික්ඛාය තිබ්බගාරවො, දිට්ඨිචරිතො සම්මත්තනියාමං ඔක්කමන්තො ධම්මානුසාරී භවති, තණ්හාචරිතො සම්මත්තනියාමං ඔක්කමන්තො සද්ධානුසාරී භවති, දිට්ඨිචරිතො සුඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ඛිප්පාභිඤ්ඤාය ච නිය්‍යාති, තණ්හාචරිතො දුක්ඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ඛිප්පාභිඤ්ඤාය ච නිය්‍යාති, තත්ථ කිං කාරණං: යං තණ්හාචරිතො දුක්ඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ඛිප්පාභිඤ්ඤාය ච නිය්‍යාති, තස්ස හි කාමා අපරිච්චත්තා භවන්ති. සො කාමෙහි විවෙචියමානො දුක්ඛෙන පටිනිස්සරති දන්ධං ච ධම්මං ආජානාති. යො පනා'යං දිට්ඨිචරිතො, අයං ආදිතො යෙව කාමෙහි අනත්ථිකො භවති. සො තතො විවෙචියමානො ඛිප්පඤ්ඤෙව පටිනිස්සරති ඛිප්පඤ්ඤෙව ධම්මං ආජානාති.

දුක්ඛාපි පටිපදා දුවිධා: දන්ධාභිඤ්ඤා ච ඛිප්පාභිඤ්ඤා ච. සුඛාපි පටිපදා දුවිධා: දන්ධාභිඤ්ඤා ච: ඛිප්පාභිඤ්ඤා ච. සත්තාපි දුවිධා: මුදින්ද්‍රියාපි තික්ඛින්ද්‍රියාපි. යෙ මුදින්ද්‍රියා, තෙ දන්ධං ච පටිනිස්සරන්ති, දන්ධඤ්ච ධම්මං ආජානන්ති, යෙ තික්ඛින්ද්‍රියා තෙ ඛිප්පඤ්ච පටිනිස්සරන්ති, ඛිප්පඤ්ච ධම්මං ආජානන්ති. ඉමා චතස්සො පටිපදා, යෙ හි කෙචි නීයිංසු වා, නිය්‍යන්ති වා, නීයිස්සන්ති වා, තෙ ඉමාහි එව චතූහි පටිපදාහි. එවං අරියා චතුක්කමග්ගං පඤ්ඤපෙන්ති අබුධජනසෙවිතාය බාලකන්තාය රත්තවාසිනියා නන්දියා භවතණ්හාය ආවට්ටනත්ථං. අයං වුච්චති නන්දියාවට්ටස්ස නයස්ස භූමීති. තෙනාහ: "තණ්හඤ්ච අවිජ්ජම්පි ච සමථෙන"ති.

"වෙය්‍යාකරණෙසු හි යෙ කුසලා'කුසලා"ති තෙ දුවිධෙන උපපරික්ඛිතබ්බා: ලොකවට්ටානුසාරී ච ලොකවිවට්ටානුසාරී ච. වට්ටං නාම සංසාරො, විවට්ටං නිබ්බානං, කම්මකිලෙසා හෙතු සංසාරස්ස. තත්ථ කම්මං චෙතනා, චෙතසිකඤ්ච නිද්දිසිතබ්බං. තං කථං දට්ඨබ්බං: උපචයෙන[1] සබ්බෙපි කිලෙසා චතූහි විපල්ලාසෙහි නිද්දිසිතබ්බා. තෙ කත්ථ දට්ඨබ්බා: දසවත්ථුකෙ කිලෙසපුඤ්ජෙ.

කතමානි දස වත්ථූනි: චත්තාරො ආහාරා චත්තාරො විපල්ලාසා චත්තාරි උපාදානානි චත්තාරො යොගා චත්තාරො ගන්ථා චත්තාරො ආසවා චත්තාරො ඔඝා චත්තාරො සල්ලා චතස්සො විඤ්ඤාණට්ඨිතියො චත්තාරි අගතිගමනානි. පඨමෙ ආහාරෙ පඨමො විපල්ලාසො, දුතියෙ ආහාරෙ දුතියො විපල්ලාසො, තතියෙ ආහාරෙ තතියො විපල්ලාසො, චතුත්ථෙ ආහාරෙ චතුත්ථො විපල්ලාසො. පඨමෙ විපල්ලාසෙ පඨමං උපාදානං, දුතියෙ විපල්ලාසෙ දුතියං උපාදානං, තතියෙ විපල්ලාසෙ තතියං උපාදානං. චතුත්ථෙ විපල්ලාසෙ චතුත්ථං උපාදානං. පඨමෙ උපාදානෙ පඨමො යොගො, දුතියෙ උපාදානෙ දුතියො යොගො, තතියෙ උපාදානෙ තතියො යොගො, චතුත්ථෙ උපාදානෙ චතුත්ථො යොගො. පඨමෙ යොගෙ පඨමො ගන්ථො, දුතියෙ යොගෙ දුතියො

---

1. උපචයෙන - සිමු.

එහි දිට්ඨිචරිතයා මෙ සස්නෙහි පැවිදිවූයේ සල්ලෙඛයෙහි අනුපද්‍රැත පැවැතුම් ඇතියේ (හෙවත් සල්ලෙඛයෙහි සතතක්‍රියා ඇතියේ) සල්ලෙඛයෙහි දැඩි ගෞරව ඇත්තේ වෙයි. තණ්හාචරිතයා මෙ සස්නෙහි පැවිදිවූයේ අච්ඡිද්‍ර වූ චතුපාරිසුද්ධිසීලයෙහි සිටියේ ශික්ෂායෙහි දැඩි ගෞරව ඇත්තේ වෙයි. දිට්ඨිචරිතයා සම්මත්තනියාම (ආර්යමාර්ග) යට බැසගන්නේ (ප්‍රඥාධික හෙයින්) ධම්මානුසාරී වෙයි. තණ්හාචරිතයා ආර්යමාර්ග සම්මත්තනියාමයට බැසගන්නේ (ශ්‍රද්ධාධික හෙයින්) සද්ධානුසාරී වෙයි. දිට්ඨිචරිතයා සුඛ වූ ප්‍රතිපත් ඇති දන්ධාභිඥයෙන් ද ක්ෂිප්‍රාභිඥයෙන් ද සසරින් නික්මැයෙයි, තණ්හාචරිතයා දුක් වූ ප්‍රතිපත් ඇති දන්ධාභිඥයෙන් ද ක්ෂිප්‍රාභිඥයෙන් ද නික්මැයෙයි, යම් හෙයෙකින් තණ්හාචරිතයා දුක්ඛපටිපද ඇති දන්ධාභිඥයෙන් ක්ෂිප්‍රාභිඥයෙන් නිර්යාණය කෙරේද, එහි කරුණු කිම යත් : යම් හෙයෙකින් ඔහු විසින් කාමයෝ අපරිත්‍යක්ත වූවාහු වෙත්ද, හේ කාමයන්ගෙන් මුදනුලබනුයේ දුකසේ මිදෙයි, ලැසිවැ ධර්මය ද අවබොධ කෙරෙයි එහෙයිනි. යළි යම් දිට්ඨිචරිතයෙක් වේ ද මේ තෙමේ ආදියෙහි මැ කාමයන්ගෙන් අපෙක්ෂාරහිත වෙයි, හේ ඒ කාමයෙන් වෙන්කරනු ලබනුයේ වහා මැ මිදෙයි, වහා ධර්මය ද දැනගනී.

දුක්ඛපටිපදව ද : 'ඛිප්පාභිඤ්ඤා යැ දන්ධාභිඤ්ඤා යැ' යි ද්විවිධ වෙයි. සුඛපටිපදව ද 'දන්ධාභිඤ්ඤ යැ ඛිප්පාභිඤ්ඤ යැ' යි ද්විවිධ වේ. සත්ත්වයෝ ද, 'මුදින්ද්‍රිය ද තික්ඛින්ද්‍රිය ද' යි ද්විවිධ වෙති. යම් කෙනෙක් මුදින්ද්‍රිය වෙත් ද ඔහු ලැසි වැ කෙලෙසුන්ගෙන් මිදෙති ලැසි වැ ධර්මය ද දැනගනිත්. යම් කෙනෙක් තික්ඛින්ද්‍රිය වෙත් ද ඔහු වහා කෙලෙසුන්ගෙන් මිදෙති වහා ධර්මය ද දැනගනිත්. මොහු සතර ප්‍රතිපදවෝ යි. යම් කෙනෙක් පෙර නිර්යාණය කළාහු හෝ දැන් නිර්යාණය කෙරෙති හෝ මතු නිර්යාණය කරන්නාහු හෝ වෙත් ද, ඔහු මේ සතර ප්‍රතිපදයෙන් මැ යි. මෙසේ බුද්ධාදි ආර්යයෝ අපණ්ඩිත ජනයා විසින් සෙවුනාලද බාලයනට කාන්ත වූ රාගයෙන් මඩනාලදුවන් කෙරෙහි පවත්නා නන්දි සංඛ්‍යාත භවතෘෂ්ණාව සමුච්ඡෙදය පිණිස සතර ප්‍රතිපද සංඛ්‍යාත මාර්ගය පනවත්. මේ නන්දියාවට්ට නයභූමි යයි කියනු ලැබේ. එයින් වදළහ, '' තණ්හං ච අවිජ්ජංපි ච සමථෙන '' යනාදිය.

'' වෙය්‍යාකරණෙසු හි යෙ කුසලාකුසලා '' යනාදීන් දක්වන ලද ඒ දිසාභූත ධර්මයෝ දෙපරිද්දෙකින් විමසියැයුත්තාහ : ලොක සංඛ්‍යාත වට්ටය අනුව පවත්නාහු ද ලොකයෙන් විවට්ටය (වෙන්වීම) සංඛ්‍යාත නිවනට අනුලොම වශයෙන් යන්නාහු දැයි කියා යි. 'වට්ට' නම් සංසාර යැ, 'විවට්ට' නම් නිර්වාණ යි. කර්මක්ලෙශයෝ සංසාරයට හෙතු වෙති. එහි කර්මය චෙතනා වූයේ ද චෙතසික වූයේ ද දැක්වියැයුතු යැ, එය කෙසේ දතයුතු වෙයි යත් : විපාකදනයට නිසි පරිදි රැස්කිරීමෙනි. සියලු මැ ක්ලෙශයෝ සතර විපල්ලාසයන්ගෙන් දැක්වියැයුත්තාහ. ඒ විපල්ලාසයෝ කොතැන්හි දැක්කයුත්තාහු ද යත් : දශවස්තුක ක්ලෙශපුඤ්ජයෙහි යි.

කවර දශවස්තුහු යැ යත් : සතර ආහාරයෝ යැ සතර විපල්ලාසයෝ යැ සතර උපාදනයෝ යැ සතර යොගයෝ යැ සතර ග්‍රන්ථයෝ යැ සතර ආස්‍රවයෝ යැ සතර ඔඝයෝ යැ සතර ශල්‍යයෝ යැ සතර විඤ්ඤාණට්ඨිති යැ සතර අගතිගමනයෝ යි. ප්‍රථම ආහාරයෙහි ප්‍රථම විපල්ලාසය වෙයි, දෙවැනි ආහාරයෙහි දෙවැනි විපල්ලාසය යැ තෙවැනි ආහාරයෙහි තෙවැනි විපල්ලාසය යැ සතරවැනි ආහාරයෙහි සතරවැනි විපල්ලාසය වෙයි. ප්‍රථම විපල්ලාසය අප්‍රහීණකල්හි ප්‍රථම උපාදන යැ දෙවැනි විපල්ලාසයෙහි දෙවැනි උපාදන යැ තෙවැනි විපල්ලාසයෙහි තෙවැනි උපාදන යැ සතරවැනි විපල්ලාසයෙහි සතරවැනි උපාදනය වෙයි. ප්‍රථම උපාදනයෙහි ප්‍රථම යොගය පවතී, දෙවැනි උපාදනයෙහි දෙවැනි යොගය යැ තෙවැනි උපාදනයෙහි තෙවැනි යොගය යැ සතරවැනි උපාදනයෙහි සතරවැනි යොගය වෙයි. ප්‍රථම යොගවිෂයෙහි ප්‍රථම ග්‍රන්ථය යැ

ගන්ථො, තතියෙ යොගෙ තතියො ගන්ථො, චතුත්ථෙ යොගෙ චතුත්ථො ගන්ථො. පඨමෙ ගන්ථෙ පඨමො ආසවො, දුතියෙ ගන්ථෙ දුතියො ආසවො, තතියෙ ගන්ථෙ තතියො ආසවො, චතුත්ථෙ ගන්ථෙ චතුත්ථො ආසවො. පඨමෙ ආසවෙ පඨමො ඔඝො, දුතියෙ ආසවෙ දුතියො ඔඝො, තතියෙ ආසවෙ තතියො ඔඝො, චතුත්ථෙ ආසවෙ චතුත්ථො ඔඝො. පඨමෙ ඔඝෙ පඨමො සල්ලො, දුතියෙ ඔඝෙ දුතියො සල්ලො. තතියෙ ඔඝෙ තතියො සල්ලො, චතුත්ථෙ ඔඝෙ චතුත්ථො සල්ලො, පඨමෙ සල්ලෙ පඨමා විඤ්ඤාණට්ඨිති, දුතියෙ සල්ලෙ දුතියා විඤ්ඤාණට්ඨිති. තතියෙ සල්ලෙ තතියා විඤ්ඤාණට්ඨිති, චතුත්ථෙ සල්ලෙ චතුත්ථී විඤ්ඤාණට්ඨිති. පඨමායං විඤ්ඤාණට්ඨිතියං පඨමං අගතිගමනං, දුතියායං විඤ්ඤාණට්ඨිතියං දුතියං අගතිගමනං, තතියායං විඤ්ඤාණට්ඨිතියං තතියං අගතිගමනං, චතුත්ථියං[1] විඤ්ඤාණට්ඨිතියං චතුත්ථං අගතිගමනං.

තත්ථ යො ච කබළිංකාරො[2], ආහාරො යො ච ඵස්සො ආහාරො, ඉමෙ තණ්හාචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා, යො ච මනොසඤ්චෙතනාහාරො යො ච විඤ්ඤාණාහාරො, ඉමෙ දිට්ඨිචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා, තත්ථ යො ච 'අසුභෙ සුභ'න්ති විපල්ලාසො, යො ච 'දුක්ඛෙ සුඛ'න්ති විපල්ලාසො, ඉමෙ තණ්හාචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. යො ච 'අනිච්චෙ නිච්ච'න්ති විපල්ලාසො යො ච 'අනත්තනි අත්තා'ති විපල්ලාසො, ඉමෙ දිට්ඨිචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. තත්ථ යඤ්ච කාමුපාදානං යඤ්ච භවූපාදානං, ඉමෙ තණ්හාචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. යඤ්ච දිට්ඨුපාදානං යඤ්ච අත්තවාදුපාදානං, ඉමෙ දිට්ඨිචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. තත්ථ යො ච කාමයොගො යො ච භවයොගො, ඉමෙ තණ්හාචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. යො ච දිට්ඨියොගො යො ච අවිජ්ජායොගො, ඉමෙ දිට්ඨිචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. තත්ථ යො ච අභිජ්ඣා කායගන්ථො යො ච බ්‍යාපාදො කායගන්ථො, ඉමෙ තණ්හාචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. යො ච පරාමාසකායගන්ථො යො ච ඉදංසච්චාභිනිවෙසකායගන්ථො, ඉමෙ දිට්ඨිචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා තත්ථ යො ච කාමාසවො යො ච භවාසවො, ඉමෙ තණ්හාචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. යො ච දිට්ඨාසවො, යො ච අවිජ්ජාසවො, ඉමෙ දිට්ඨිචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. තත්ථ යො ච කාමොඝො යො ච භවොඝො, ඉමෙ තණ්හාචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. යො ච දිට්ඨොඝො යො ච අවිජ්ජොඝො, ඉමෙ දිට්ඨිචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. තත්ථ යො ච රාගසල්ලො යො ච දොසසල්ලො, ඉමෙ තණ්හාචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. යො ච මානසල්ලො යො ච මොහසල්ලො ඉමෙ දිට්ඨිචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. තත්ථ යා ච රූපූපගා විඤ්ඤාණට්ඨිති යා ච වෙදනූපගා විඤ්ඤාණට්ඨිති, ඉමෙ තණ්හාචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. යා ච සඤ්ඤූපගා විඤ්ඤාණට්ඨිති යා ච සඞ්ඛාරූපගා විඤ්ඤාණට්ඨිති, ඉමෙ දිට්ඨිචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. තත්ථ යඤ්ච ඡන්දා අගතිගමනං යඤ්ච දොසා අගතිගමනං, ඉමෙ තණ්හාචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා. යඤ්ච භයා අගතිගමනං යඤ්ච මොහා අගතිගමනං, ඉමෙ දිට්ඨිචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා.

1. චතුත්ථායං - සීමු.
2. කබළීකාරො - මජ්ඣං.

දෙවැනි යොගයෙහි දෙවැනි ග්‍රන්ථය යැ තෙවැනි යොගයෙහි තෙවැනි ග්‍රන්ථය යැ සිව්වැනි යොගයෙහි සිව්වැනි ග්‍රන්ථය වෙයි. ප්‍රථම ග්‍රන්ථයෙහි ප්‍රථම ආස්‍රවය පවතී, දෙවැනි ග්‍රන්ථයෙහි දෙවැනි ආස්‍රව යැ තෙවැනි ග්‍රන්ථයෙහි තෙවැනි ආස්‍රව යැ සතරවැනි ග්‍රන්ථයෙහි සතරවැනි ආස්‍රවය පවතී. ප්‍රථම ආස්‍රවයෙහි ප්‍රථම ඔඝය යැ දෙවැනි ආස්‍රවයෙහි දෙවැනි ඔඝය යැ තෙවැනි ආස්‍රවයෙහි තෙවැනි ඔඝය යැ සතරවැනි ආස්‍රවයෙහි සතරවැනි ඔඝය වෙයි. ප්‍රථම ඔඝයෙහි ප්‍රථම ශල්‍ය යැ දෙවැනි ඔඝයෙහි දෙවැනි සල්ල යැ තෙවැනි ඔඝයෙහි තෙවැනි සල්ල යැ සතරවැනි ඔඝයෙහි සතරවැනි සල්ලය වෙයි. ප්‍රථම සල්ලයෙහි ප්‍රථම විඤ්ඤාණට්ඨිතිය පවතී, දෙවැනි සල්ලයෙහි දෙවැනි විඤ්ඤාණට්ඨිතිය යැ තෙවැනි සල්ලයෙහි තෙවැනි විඤ්ඤාණට්ඨිතිය යැ සතරවැනි සල්ලයෙහි සතරවැනි විඤ්ඤාණට්ඨිතිය පවතී. ප්‍රථම විඤ්ඤාණට්ඨිතියෙහි ප්‍රථම අගතිගමනය වෙයි, දෙවැනි විඤ්ඤාණට්ඨිතියෙහි දෙවැනි අගතිගමනය යැ තෙවැනි විඤ්ඤාණට්ඨිතියෙහි තෙවැනි අගතිගමනය යැ සතරවැනිවිඤ්ඤාණට්ඨිතියෙහි සතරවැනි අගතිගමනය පවතී.

එහි යම් කවලීකාරාහාරයෙක් ඇද්ද යම් ඵස්සාහාරයෙකුත් ඇද්ද මොහු තණ්හාචරිත පුද්ගලහට උපක්ලෙශ යැ, යම් මනොසඤ්චෙතනාහාරයෙකුත් යම් විඤ්ඤාණාහාරයෙකුත් ඇද්ද මොහු දිට්ඨිචරිත පුද්ගලහට උපක්ලෙශ යි. එහි යම අසුභයෙහි සුභ යැයි විපල්ලාසයෙක් ඇද්ද යම් දුක්ඛයෙහි සුඛ යැයි විපල්ලාසයෙකුත් ඇද්ද මොහු තණ්හාචරිත පුද්ගලහට උපක්ලෙශ යැ, යම් අනිත්‍යයෙහි නිත්‍ය යැයි විපල්ලාසයෙකුත් අනාත්මයෙහි ආත්ම යැයි විපල්ලාසයෙකුත් ඇද්ද මොහු දිට්ඨිචරිත පුඟුල්හට උපක්ලෙශ යි. එහි යම් කාමූපාදනයෙකුත් යම් භවූපාදනයෙකුත් ඇද්ද මොහු තණ්හාචරිත පුඟුලාට උපක්ලෙශ යැ, යම් දිට්ඨූපාදනයෙකුත් යම් අත්තවාදූපාදනයෙකුත් ඇද්ද මොහු දිට්ඨිචරිත පුඟුලාට උපක්ලෙශ යි. එහි යම් කාමයොගයෙකුත් යම් භවයොගයෙකුත් ඇද්ද මොහු තණ්හාචරිත පුඟුලාට උපක්ලෙශ යැ යම් දිට්ඨියොගයෙකුත් යම් අවිජ්ජායොගයෙකුත් ඇද්ද මොහු දිට්ඨිචරිත පුඟුලාට උපක්ලෙශ යි. එහි යම් අභිජ්ඣාකායගන්ථයෙකුත් ව්‍යාපාදකායගන්ථයෙකුත් ඇද්ද මොහු තණ්හාචරිත පුඟුලාට උපක්ලෙශ යැ, යම් පරාමාසකායගන්ථයෙකුත් යම් ඉදංසච්චාභිනිවෙසකායගන්ථයෙකුත් ඇද්ද මොහු දිට්ඨිචරිත පුඟුලාට උපක්ලෙශ යි. එහි යම් කාමාසවයෙකුත් යම් භවාසවයෙකුත් ඇද්ද මොහු තණ්හාචරිත පුඟුලාට උපක්ලෙශ යැ, යම් දිට්ඨාසවයෙකුත් යම් අවිජ්ජාසවයෙකුත් ඇද්ද මොහු දිට්ඨචරිත පුඟුලාට උපක්ලෙශ යි. එහි යම් කාමොඝයෙකුත් යම් භවොඝයෙකුත් ඇද්ද මොහු තණ්හාචරිත පුඟුලාට උපක්ලෙශ යැ, යම් දිට්ඨොඝයෙකුත් යම් අවිජ්ජොඝයෙකුත් ඇද්ද මොහු දිට්ඨිචරිත පුඟුලාට උපක්ලෙශ යි. එහි යම් රාගසල්ලයෙකුත් යම් දොසසල්ලයෙකුත් ඇද්ද මොහු තණ්හාචරිත පුඟුලාට උපක්ලෙශ යැ, යම් මානසල්ලයෙකුත් යම් මොහසල්ලයෙකුත් ඇද්ද මොහු දිට්ඨිචරිත පුඟුලාට උපක්ලෙශ යි. එහි යම් රූපූපගවිඤ්ඤාණට්ඨිතියකුත් යම් වෙදනූපගවිඤ්ඤාණට්ඨිතියකුත් ඇද්ද මොහු තණ්හාචරිත පුඟුලාට උපක්ලෙශ යැ, යම් සඤ්ඤූපගවිඤ්ඤාණට්ඨිතියකුත් යම් සඞ්ඛාරූපගවිඤ්ඤාණට්ඨිතියකුත් ඇද්ද මොහු දිට්ඨිචරිත පුඟුලාට උපක්ලෙශ යි. එහි යම් ඡන්දයෙන් අගතිගමනයෙකුත් යම් දොසයෙන් අගතිගමනයෙකුත් ඇද්ද මොහු තණ්හාචරිත පුඟුලාට උපක්ලෙශ යැ, යම් භයින් අගතිගමනයෙකුත් මොහයෙන් අගතිගමනයෙකුත් ඇද්ද මොහු දිට්ඨචරිත පුද්ගලහට උපක්ලෙශයෝ යි.

තත්ථ කබළීකාරෙ ආහාරෙ අසුභෙ සුභන්ති විපල්ලාසො, ඵස්සෙ ආහාරෙ දුක්ඛෙ සුඛන්ති විපල්ලාසො. විඤ්ඤාණෙ ආහාරෙ අනිච්චෙ නිච්චන්ති විපල්ලාසො, මනොසඤ්චෙතනාය ආහාරෙ අනත්තනි අත්තාති විපල්ලාසො.

පඨමෙ විපල්ලාසෙ ඨිතො කාමෙ උපාදියති, ඉදං වුච්චති කාමුපාදානං. දුතියෙ විපල්ලාසෙ ඨිතො අනාගතං භවං උපාදියති, ඉදං වුච්චති භවුපාදානං. තතියෙ විපල්ලාසෙ ඨිතො සංසාරාභිනන්දිනිං දිට්ඨිං උපාදියති, ඉදං වුච්චති දිට්ඨුපාදානං. කසයිදං[1] උපාදියති, ඉදං වුච්චති අත්තවාදුපාදානං.

කාමුපාදානෙන කාමෙහි සංයුජ්ජති, අයං වුච්චති කාමයොගො. භවුපාදානෙන භවෙහි සංයුජ්ජති, අයං වුච්චති භවයොගො. දිට්ඨුපාදානෙන පාපිකාය දිට්ඨියා සංයුජ්ජති, අයං වුච්චති දිට්ඨියොගො. අත්තවාදුපාදානෙන අවිජ්ජාය සංයුජ්ජති, අයං වුච්චති අවිජ්ජායොගො.

පඨමෙ යොගෙ ඨිතො අභිජ්ඣාය කායං ගන්ථති, අයං වුච්චති අභිජ්ඣාකායගන්ථො. දුතියෙ යොගෙ ඨිතො බ්‍යාපාදෙන කායං ගන්ථති, අයං වුච්චති බ්‍යාපාදකායගන්ථො. තතියෙ යොගෙ ඨිතො පරමාසෙන කායං ගන්ථති, අයං වුච්චති පරමාසකායගන්ථො. චතුත්ථෙ යොගෙ ඨිතො ඉදං සච්චාභිනිවෙසෙන කායං ගන්ථති, අයං වුච්චති ඉදංසච්චාභිනිවෙසකායගන්ථො.

තස්ස එවං ගන්ථිතා කිලෙසා ආසවන්ති, කුතො ච වුච්චති 'ආසවන්තී'ති[2], අනුසයතො වා පරියුට්ඨානතො වා. තත්ථ අභිජ්ඣා-කායගන්ථෙන කාමාසවො, බ්‍යාපාදකායගන්ථෙන භවාසවො, පරමාසකාය-ගන්ථෙන දිට්ඨාසවො, ඉදං සච්චාභිනිවෙසකායගන්ථෙන අවිජ්ජාසවො.

තස්ස ඉමෙ චත්තාරො ආසවා වෙපුල්ලං ගතා ඔඝා භවන්ති, ඉති ආසවවෙපුල්ලා ඔඝවෙපුල්ලං. තත්ථ කාමාසවෙන කාමොඝො, භවාසවෙන භවොඝො, දිට්ඨාසවෙන දිට්ඨොඝො, අවිජ්ජාසවෙන අවිජ්ජොඝො.

තස්ස ඉමෙ චත්තාරො ඔඝා අනුසයසහගතා අජ්ඣාසයමනුපවිට්ඨා. හදයං ආහච්ච තිට්ඨන්ති, තෙන වුච්චන්ති "සල්ලා"ති. තත්ථ කාමොඝෙන රාගසල්ලො, භවොඝෙන දොසසල්ලො, දිට්ඨොඝෙන මානසල්ලො, අවිජ්ජොඝෙන මොහසල්ලො.

---

1. කප්පියං - සීමු, මජසං.
2. අස්සවන්තා - නෙ අ.

එහි කබලීකාරාහාරයෙහි ' අසුභයෙහි සුභ යැ ' යන විපල්ලාසය වෙයි, ඵස්සාහාර යෙහි ' දුක්ඛයෙහි සුඛ යැ ' යන විපල්ලාසය වෙයි, විඤ්ඤාණාහාරයෙහි ' අනිත්‍යයෙහි නිත්‍ය යැ ' යන විපල්ලාසය වෙයි, ' මනොසඤ්චෙතනාහාරයෙහි අනාත්මයෙහි ආත්ම යැ ' යන විපල්ලාසය වෙ.

ප්‍රථම විපර්‍යාසයෙහි සිටියේ ක්ලෙශකාමයෙන් වස්තුකාමයන් දැඩි වැ ගනී, මෙය කාමූපාදන යී කියනු ලැබෙයි. දෙවැනි විපර්‍යාසයෙහි සිටියේ අනාගතභවය දැඩිවැ ගනී, මේ භවූපාදන යී කියනුලැබෙයි. තුන්වැනි විපර්‍යාසයෙහි සිටියේ සංසාරය අභිනන්දනා කරන භවදෘෂ්ටිය දැඩි වැ ගනී, මේ දිට්ඨුපාදන යී කියනු ලැබෙයි. සතරවැනි විපර්‍යාස යෙහි සිටියේ (අත්මයක් නැතිකල්හි) මේ කර්මඵලය කවරක්හුගේ දැ ' යි ආත්මය දැඩිවැ ගනී, මේ අත්තවාදූපාදන යී කියනු ලැබේ.

කාමරාග සංඛ්‍යාත කාමූපාදනයෙන් වස්තුකාමයන් සමග සත්ත්වයා සංයොග කරනුලැබෙයි, මේ කාමයොග යි කියනු ලැබෙයි. භවූපාදනයෙන් භවය සමග සත්ත්ව යොදනු ලැබෙයි, මේ භවයොග යි කියනු ලැබෙයි. අහෙතුකදෘෂ්ටි ආදි දිට්ඨුපාදනයෙන් ලාමක දෘෂ්ටිය සමග සත්ත්ව යොදනු ලැබෙයි, මේ දිට්ඨියොග යි කියනු ලැබෙයි. අත්තවාදූපාදනයෙන් සකල වට්ටදුක්ඛය සමග සත්ත්ව යොදනු ලැබෙයි, මේ අවිජ්ජා යොග යී කියනු ලැබේ.

ප්‍රථම යොගයෙහි සිටියේ (පරායත්තයෙහි දැඩි ලොභලක්ෂණ වූ) අභිධ්‍යායෙන් නාමකය ග්‍රන්ථන කරයි (ගටයි), මේ අභිජ්ඣාකායගන්ථ යී කියනුලැබෙයි. දෙවැනි යොගයෙහි සිටියේ භවරාගවශයෙන් ව්‍යාපාදයෙන් නාමකය ගොතයි, මේ ව්‍යාපාදකාය ගන්ථ යී කියනු ලැබෙයි. තුන්වැනි යොගයෙහි සිටියේ දෘෂ්ටිපරාමර්ශයෙන් නාමකය ගොතයි, මේ පරාමාසකායගන්ථ යී කියනු ලැබෙයි. සතරවැනි යොගයෙහි සිටියේ ' මෙය මැ සැබැව අන්‍යය මොස යැ ' යන ඉදංසත්‍යාභිනිවෙසයෙන් නාමකය ගොතයි, මේ ඉදංසච්චාභිනිවෙසකායගන්ථ යී කියනු ලැබේ.

ඒ අභිධ්‍යාදීන් සමන්වාගත පුද්ගලහට මෙසේ අභිධ්‍යාදීන් නාමකය ගෙතී සිටි ක්ලෙශයෝ ආස්‍රවභාවයෙන් පවතිත්. යළි කවර හෙතුවකින් ඒ කෙලෙස්හු හාත්පසින් වැගිරෙත් දැයි කියනු ලැබේ : (අප්‍රහීණ හෙයින්) අනුසය වශයෙන් හෝ පරියුට්ඨාන (සමුදාචාර) වශයෙන් හෝ හාත්පසින් වැගිරෙත්. ඒ ආස්‍රවයන් කෙරෙහි අභිධ්‍යාකාය ග්‍රන්ථයෙන් කාමාසවය ද ව්‍යාපාදකායග්‍රන්ථයෙන් භවාසවය ද පරාමාසකායග්‍රන්ථයෙන් දිට්ඨාසවය ද ඉදංසත්‍යාභිනිවෙස කායග්‍රන්ථයෙන් අවිජ්ජාසවය ද උපදනේ යි.

ඒ පුද්ගලහට මේ සතර ආසවයෝ විපුලබවට ගියාහු (වට්ටයෙහි අවසීදනාර්ථයෙන්) ඕඝයෝ වෙති. මෙසේ ආසවයන්ගේ විපුලභාවයෙන් ඕඝයන්ගේ විපුලබව වෙයි. ඒ ඕඝයන් කෙරෙහි කාමාසවයෙන් කාමෞඝ වෙයි, භවාසවයෙන් භවෞඝ වෙයි, දිට්ඨා සවයෙන් දිට්ඨෞඝ වෙයි, අවිද්‍යාසවයෙන් අවිජ්ජෞඝ වෙ.

ඔහුට මේ සතර ඕඝයෝ අනුසයසහගත වූවාහු (අනුසයභාවය නොහැර පැවැත්තාහු) සිතට පිවිසියාහු ළෙහි හැනී සිටිත්. එහෙයින් ' ශල්‍යයෝ යී කියනු ලැබෙත්. (පීඩා ජනනය ද උද්ධරාලියැ නොහැකිබව ද ශල්‍යාර්ථ යැ.) ඒ ශල්‍යයන් කෙරෙහි කාමෞඝය හෙතු කොටගෙන රාගසල්ල වෙයි, භවෞඝයෙන් දෙසසල්ල වෙයි, දෘෂ්ටිඕඝයෙන් (තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම යයි දෘෂ්ටි විසින් ගන්නා හෙයින්) මානසල්ල වෙයි, අවිද්‍යෞඝයෙන් මොහසල්ල වෙ.

තස්ස ඉමෙහි චතූහි සල්ලෙහි පරියාදින්නං විඤ්ඤාණං චතූසු ධම්මෙසු සණ්ඨහති. රූපෙ වෙදනාය සඤ්ඤාය සඞ්ඛාරෙසු. තත්ථ රාගසල්ලෙන තදුපසෙවිතෙන විඤ්ඤාණෙන රූපූපගා විඤ්ඤාණට්ඨිති, දොසසල්ලෙන තදුපසෙවිතෙන විඤ්ඤාණෙන වෙදනූපගා විඤ්ඤාණට්ඨිති, මානසල්ලෙන තදුපසෙවිතෙන විඤ්ඤාණෙන සඤ්ඤූපගා විඤ්ඤාණට්ඨිති, මොහසල්ලෙන තදුපසෙවිතෙන විඤ්ඤාණෙන සඞ්ඛාරූපගා විඤ්ඤාණට්ඨිති.

තස්ස ඉමාහි චතූහි විඤ්ඤාණට්ඨිති උපත්ථද්ධං විඤ්ඤාණං චතූහි ධම්මෙහි අගතිං ගච්ඡති ඡන්දා දොසා භයා මොහා. තත්ථ රාගෙන ඡන්දාගතිං ගච්ඡති, දොසෙන දොසාගතිං ගච්ඡති, භයෙන භයාගතිං ගච්ඡති, මොහෙන මොහාගතිං ගච්ඡති ඉති ඛො තඤ්ච කම්මං ඉමෙ ච කිලෙසා. එස හෙතු සංසාරස්ස. එවං සබ්බෙ කිලෙසා චතූහි විපල්ලාසෙහි නිද්දිසිතබ්බා.

තත්ථ ඉමා චතස්සො දිසා : කබළිංකාරෙ ආහාරෙ අසුභෙ සුභන්ති විපල්ලාසො කාමූපාදානං කාමයොගො අභිජ්ඣාකායගන්ථො කාමාසවො කාමොඝො රාගසල්ලො රූපූපගා විඤ්ඤාණට්ඨිති ඡන්දා අගතිගමනන්ති පඨමා දිසා.

ඵස්සෙ ආහාරෙ දුක්ඛෙ සුඛන්ති විපල්ලාසො භවූපාදානං භවයොගො බ්‍යාපාදකායගන්ථො භවාසවො භවොඝො දොසසල්ලො වෙදනූපගා විඤ්ඤාණට්ඨිති දොසා අගතිගමනන්ති දුතියා දිසා.

විඤ්ඤාණාහාරෙ අනිච්චෙ නිච්චන්ති විපල්ලාසො දිට්ඨුපාදානං දිට්ඨියොගො පරාමාසකායගන්ථො දිට්ඨාසවො දිට්ඨොඝො මානසල්ලො සඤ්ඤූපගා විඤ්ඤාණට්ඨිති භයා අගතිගමනන්ති තතියා දිසා.

මනොසඤ්චෙතනාහාරෙ අනත්තනි අත්තාති විපල්ලාසො අත්තවාදූ-පාදානං අවිජ්ජායොගො ඉදංසච්චාභිනිවෙසකායගන්ථො අවිජ්ජාසවො අවිජ්ජොඝො මොහසල්ලො සඞ්ඛාරූපගා විඤ්ඤාණට්ඨිති මොහා අගතිගමනන්ති චතුත්ථී දිසා.

තත්ථ යො ච කබළිඞ්කාරො ආහාරො යො ච අසුභෙ සුභන්ති විපල්ලාසො කාමූපාදානං කාමයොගො අභිජ්ඣාකායගන්ථො කාමාසවො කාමොඝො රාගසල්ලො රූපූපගා විඤ්ඤාණට්ඨිති ඡන්දා අගතිගමනන්ති ඉමෙසං දසන්නං සුත්තානං එකො අත්ථො, බ්‍යඤ්ජනමෙව නානං, ඉමෙ රාගචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා.

තත්ථ යො ච ඵස්සො ආහාරො යො ච දුක්ඛෙ සුඛන්ති. විපල්ලාසො භවූපාදානං භවයොගො බ්‍යාපාදකායගන්ථො භවාසවො භවොඝො දොසසල්ලො වෙදනූපගා විඤ්ඤාණට්ඨිති දොසා අගතිගමනන්ති ඉමෙසං දසන්නං සුත්තානං එකො අත්ථො, බ්‍යඤ්ජනමෙව නානං, ඉමෙ දොසචරිතස්ස පුග්ගලස්ස උපක්කිලෙසා.

මේ චතුර්විධ ශල්‍යයෙන් හාත්පසින් ගන්නාලද ඔහුගේ විඥනය රූපයෙහි වේදනායෙහි සංඥයෙහි සංස්කාරයන්හි යන ආලම්බන වූ සතර ධර්මයන් කෙරෙහි පිහිටා සිටී. එහි රාගශල්‍යය හේතු කොටගෙන නන්දි සංඛ්‍යාත තෘෂ්ණායෙන් උපසික්ත (තෙත්) වූ විඥනයෙන් යුත් රූපූපගවිඤ්ඤණට්ඨිති වෙයි, ද්වේෂශල්‍යය හේතු කොටගෙන තෘෂ්ණායෙන් තෙත්වූ (නන්දූපසේචන) විඥනයෙන් යුත් වේදනූපගවිඤ්ඤණට්ඨිති වෙයි, මානශල්‍යය හේතු කොටගෙන තෘෂ්ණායෙන් තෙත්වූ විඥනයෙන් යුත් සඤ්ඤූපග විඤ්ඤණට්ඨිති වෙයි, මෝහශල්‍යය හේතු කොටගෙන තෘෂ්ණායෙන් තෙත්වූ විඥනයෙන් යුත් සඞ්ඛාරූපග විඤ්ඤණට්ඨිති වේ.

මේ සතර විඥනස්ථිතීන් විසින් උපස්තම්භිත වූ ඔහුගේ විඥනය ඡන්දයෙන් දොසයෙන් භයින් මෝහයෙන් යන සතර ධර්මයෙන් අගතියට යෙයි. එහි රාගය හේතු කොට ගෙන ඡන්දගතියට පැමිණෙයි, ද්වේෂය හේතු කොට දෝසාගතියට පැමිණෙයි, භය හේතු කොට භයාගතියට පැමිණෙයි, මෝහය හේතු කොට මෝහාගතියට පැමිණේ, මෙසේ උක්තප්‍රකාරයෙන් ඒ (යට කී) චේතනා චෛතසික කර්මය ද, මේ දශවස්තුක ක්ලෙශයෝ ද වෙත්. තෙල (කර්ම ක්ලෙශ දෙක) සංසාරයට හේතු වේ. මෙසේ සියලු ක්ලෙශයෝ සතර විපල්ලාසයන්ගෙන් දක්වියැයුත්තාහ.

එහි මේ දිසාභූත ධර්මයෝ යැ: කබළිඞ්කාරාහාර යැ අසුභයෙහි සුභ යැ යන විපල්ලාස යැ කාමූපාදන යැ කාමයොග යැ අභිජ්ඣාකායග්‍රන්ථ යැ කාමාසව යැ කාමෝඝ යැ රාගසල්ල යැ රූපූපගවිඤ්ඤණට්ඨිති යැ ඡන්දයෙන් අගතිගමන යැ යන දශධර්මයෝ ප්‍රථම දිශා යි.

ඵස්සාහාර යැ දුක්ඛයෙහි සුඛ යැ යන විපල්ලාස යැ භවූපාදන යැ භවයොග යැ ව්‍යාපාදකායග්‍රන්ථ යැ භවාසව යැ භවෝඝ යැ දෝසසල්ල යැ වේදනූපගවිඤ්ඤණට්ඨිති යැ ද්වේෂයෙන් අගතිගමන යැ යන දශධර්මයෝ ද්විතීය දිශා යි.

විඤ්ඤණාහාර යැ අනිත්‍යයෙහි නිත්‍ය යැ යන විපල්ලාස යැ දිට්ඨුපාදන යැ දිට්ඨි යොග යැ පරාමාසකායග්‍රන්ථ යැ දිට්ඨාසව යැ දිට්ඨොඝ යැ මානසල්ල යැ සඤ්ඤූපග විඤ්ඤණට්ඨිති යැ භයින් අගතිගමන යැ යන දශධර්මයෝ තෘතීය දිශා යි.

මනොසඤ්චේතනාහාර යැ අනාත්මයෙහි ආත්ම යැ යන විපල්ලාස යැ අත්තවාදූපාදන යැ අවිජ්ජායොග යැ ඉදංසච්චාභිනිවෙසකායග්‍රන්ථ යැ අවිජ්ජාසව යැ අවිජ්ජොඝ යැ මෝහසල්ල යැ සඞ්ඛාරූපගවිඤ්ඤණට්ඨිති යැ මෝහයෙන් අගතිගමන යැ යන දශධර්මයෝ චතුර්ථ දිශා යි.

ඒ දිසාභූත ධර්මයන් කෙරෙහි යම් කවළීකාරාහාරයෙක් ඇද්ද යම් අසුභයෙහි සුභ යැ යන විපල්ලාසයෙක් ඇද්ද කාමූපාදන යැ කාමයොග යැ අභිජ්ඣාකායගන්ථ යැ කාමාසව යැ කාමොඝ යැ රාගසල්ල යැ රූපූපගවිඤ්ඤණට්ඨිති යැ ඡන්දගතිගමනය යන මේ දසවැදෑරුම් සූත්‍රයන්ගේ අර්ථය එකෙකි. ව්‍යඤ්ජනය මැ නානා වෙයි. (මේ දශවිධ සූත්‍රපදයන්ගෙන් සවස්තුක තෘෂ්ණාව කියනලදි. 'දසන්නං සුත්තානං' යනු සූත්‍රයෙහි එක් පදයක් ගත්හෙයින් එකදෙශයෙහි සමුදයව්‍යවහාරය යි, 'පටො දඩ්ඪො, සමුද්දො දිට්ඨො' යනු මෙනි.) මේ ප්‍රථම දිශාභාවයෙන් කියනලද කබළිඞ්කාරාහාරාදි ධර්මයෝ රාගචරිත පුද්ගලහට උපක්ලෙශයෝ යි.

එහි යම් ඵස්සාහාරයෙක් ඇද්ද යම් දුක්ඛයෙහි සුඛ යැ යන විපල්ලාසයෙක් ඇද්ද භවූපාදන යැ භවයොග යැ ව්‍යාපාදකායග්‍රන්ථ යැ භවාසව යැ භවොඝ යැ දෝසසල්ල යැ වේදනූපගවිඤ්ඤණට්ඨිති යැ දෝසාගතිගමන යැ යන මේ දසවැදෑරුම් සූත්‍රපදයන්ගේ අර්ථය එකෙකි, ව්‍යඤ්ජනය මැ නානා වෙයි. මේ ද්‍විතියදිසාභාවයෙන් කියනලද ඵස්සාහාරාදි ධර්මයෝ දෝසචරිත පුද්ගලහට උපක්ලෙශයෝ යි:

තත්ථ යො ච විඤ්ඤාණාහාරො යො ච අනිච්චෙ නිච්චන්ති විපල්ලාසො දිට්ඨුපාදානං දිට්ඨියොගො පරාමාසකායගන්ථො දිට්ඨාසවො දිට්ඨොඝො මානසල්ලො සඤ්ඤූපගා විඤ්ඤාණට්ඨිති භයා අගතිගමනන්ති ඉමෙසං දසන්නං සුත්තානං එකො අත්ථො බ්‍යඤ්ජනමෙව නානං, ඉමෙ දිට්ඨිචරිතස්ස මන්දස්ස උපක්කිලෙසා.

තත්ථ යො ච මනොසඤ්චෙතනාහාරො යො ච අනත්තනි අත්තාති විපල්ලාසො අත්තවාදුපාදානං අවිජ්ජායොගො ඉදංසච්චාභිනිවෙසකායගන්ථො අවිජ්ජාසවො අවිජ්ජොඝො මොහසල්ලො සඞ්ඛාරූපගා විඤ්ඤාණට්ඨිති මොහා අගතිගමනන්ති ඉමෙසං දසන්නං සුත්තානං එකො අත්ථො බ්‍යඤ්ජනමෙව නානං, ඉමෙ දිට්ඨිචරිතස්ස උදත්තස්ස උපක්කිලෙසා.

තත්ථ යො ච කබළිංකාරාහාරො යො ච ඵස්සො ආහාරො, ඉමෙ අප්පණිහිතෙන විමොක්ඛමුඛෙන පරිඤ්ඤං ගච්ඡන්ති, විඤ්ඤාණාහාරො සුඤ්ඤතාය, මනොසඤ්චෙතනාහාරො අනිමිත්තෙන.

තත්ථ යො ච අසුභෙ සුභන්ති විපල්ලාසො යො ච දුක්ඛෙ සුඛන්ති විපල්ලාසො, ඉමෙ අප්පණිහිතෙන විමොක්ඛමුඛෙන පහානං අබ්භත්ථං ගච්ඡන්ති, අනිච්චෙ නිච්චන්ති විපල්ලාසො සුඤ්ඤතාය, අනත්තනි අත්තාති විපල්ලාසො අනිමිත්තෙන.

තත්ථ කාමුපාදානං ච භවුපාදානං ච අප්පණිහිතෙන විමොක්ඛමුඛෙන පහානං ගච්ඡන්ති, දිට්ඨුපාදානං සුඤ්ඤතාය, අත්තවාදුපාදානං අනිමිත්තෙන.

තත්ථ කාමයොගො ච භවයොගො ච අප්පණිහිතෙන විමොක්ඛමුඛෙන පහානං ගච්ඡන්ති, දිට්ඨියොගො සුඤ්ඤතාය, අවිජ්ජායොගො අනිමිත්තෙන.

තත්ථ අභිජ්ඣාකායගන්ථො ච බ්‍යාපාදකායගන්ථො ච අප්පණිහිතෙන විමොක්ඛමුඛෙන පහානං ගච්ඡන්ති, පරාමාසකායගන්ථො සුඤ්ඤතාය, ඉදංසච්චාභිනිවෙසකායගන්ථො අනිමිත්තෙන.

තත්ථ කාමාසවො ච භවාසවො ච අප්පණිහිතෙන විමොක්ඛමුඛෙන පහානං ගච්ඡන්ති, දිට්ඨාසවො සුඤ්ඤතාය, අවිජ්ජාසවො අනිමිත්තෙන.

තත්ථ කාමොඝො ච භවොඝො ච අප්පණිහිතෙන විමොක්ඛමුඛෙන පහානං ගච්ඡන්ති, දිට්ඨොඝො සුඤ්ඤතාය, අවිජ්ජොඝො අනිමිත්තෙන.

තත්ථ රාගසල්ලො ච දොසසල්ලො ච අප්පණිහිතෙන විමොක්ඛමුඛෙන පහානං ගච්ඡන්ති, මානසල්ලො සුඤ්ඤතාය, මොහසල්ලො අනිමිත්තෙන.

තත්ථ රූපූපගා ච විඤ්ඤාණට්ඨිති වෙදනූපගා ච විඤ්ඤාණට්ඨිති අප්පණිහිතෙන විමොක්ඛමුඛෙන පරිඤ්ඤං ගච්ඡන්ති, සඤ්ඤූපගා සුඤ්ඤතාය, සඞ්ඛාරූපගා අනිමිත්තෙන.

එහි යම් විඤ්ඤාණාහාරයෙක් ඇද්ද යම් අනිත්‍යයෙහි නිත්‍ය යැ යන විපල්ලාසයෙක් ඇද්ද දිට්ඨුපාදාන යැ දිට්ඨියොග යැ පරාමාසකායග්‍රන්ථ යැ දිට්ඨාසව යැ දිට්ඨොඝ යැ මානසල්ල යැ සඤ්ඤූපගවිඤ්ඤාණට්ඨිති යැ භයාගතිගමන යැ යන මේ දසවැදෑරුම් සූත්‍රපදයන්ගේ අර්ථය එකෙකි, ව්‍යඤ්ජනය මැ නානා වෙයි. මේ විඤ්ඤාණාහාරාදි දශධර්මයෝ මොහාධික (මන්ද) දිට්ඨිචරිත පුද්ගලහට උපක්ලෙශයෝ යි.

එහි යම් මනොසඤ්චෙතනාහාරයෙක් ඇද්ද යම් අනාත්මයෙහි ආත්ම යැ යන විපල්ලාසයෙක් ඇද්ද අත්තවාදූපාදාන යැ අවිජ්ජායොග යැ ඉදංසච්චාභිනිවෙසකාය ග්‍රන්ථ යැ අවිජ්ජාසව යැ අවිජ්ජොඝ යැ මොහසල්ල යැ සඞ්ඛාරූපගවිඤ්ඤාණට්ඨිති යැ මොහාගතිගමන යැ යන මේ දසවැදෑරුම් සූත්‍රපදයන්ගේ අර්ථය එකෙක් වෙයි ව්‍යඤ්ජනය මැ නානා වෙයි. මේ මනොසඤ්චෙතනාහාරාදි දශධර්මයෝ තියුණු ප්‍රඥ ඇති දිට්ඨිචරිත පුද්ගලහට උපක්ලෙශයෝ යි.

එහි යම් කවලීකාරාහාරයෙකුත් යම් ඵස්සාහාරයෙකුත් ඇද්ද මොහු අප්‍රණිහිත විමොක්ෂමුඛයෙන් පරිඥවට යෙති, විඤ්ඤාණාහාරය ශූන්‍යතවිමොක්ෂමුඛයෙන් ද මනොසඤ්චෙතනාහාරය අනිමිත්තවිමොක්ෂමුඛයෙන් ද පරිඥවට යෙයි.

එහි යම් අසුභයෙහි සුභ යැ යන විපල්ලාසයෙකුත් යම් දුක්ඛයෙහි සුඛ යැ යන විපල්ලාසයෙකුත් ඇද්ද, මොහු අප්‍රණිහිතවිමොක්ෂමුඛයෙන් ප්‍රහාණයට අභ්‍යස්තයට යෙති, අනිත්‍යයෙහි නිත්‍ය යැ යන විපල්ලාසය ශූන්‍යතවිමොක්ෂමුඛයෙන් ද, අනාත්මයෙහි ආත්ම යැ යන විපල්ලාසය අනිමිත්තවිමොක්ෂමුඛයෙන් ද ප්‍රහාණයට අභ්‍යස්තයට යෙයි.

එහි කාමූපාදානය ද භවූපාදානය ද අප්‍රණිහිත විමොක්ෂමුඛයෙන් ප්‍රහාණයට යෙයි, දිට්ඨුපාදානය ශූන්‍යත විමොක්ෂමුඛයෙන් ද අත්තවාදූපාදානය අනිමිත්තවිමොක්ෂයෙන් ද ප්‍රහාණයට යේ.

එහි කාමයොගය ද භවයොගය ද අප්‍රණිහිත විමොක්ෂමුඛයෙන් ප්‍රහාණයට යෙයි, දිට්ඨියොගය ශූන්‍යතවිමොක්ෂමුඛයෙන් ද අවිජ්ජායොගය අනිමිත්තවිමොක්ෂමුඛයෙන් ද ප්‍රහාණයට යේ.

එහි අභිධ්‍යාකායග්‍රන්ථය ද ව්‍යාපාදකායග්‍රන්ථය ද අප්‍රණිහිතවිමොක්ෂමුඛයෙන් ප්‍රහාණයට යෙයි, පාරාමසකායග්‍රන්ථය ශූන්‍යතවිමොක්ෂමුඛයෙන් ද ඉදංසච්චාභිනිවෙස කායග්‍රන්ථය අනිමිත්තවිමොක්ෂමුඛයෙන් ද ප්‍රහාණයට යේ.

එහි කාමාසවය ද භවාසවය ද අප්‍රණිහිත විමොක්ෂමුඛයෙන් ප්‍රහාණයට යෙයි, දිට්ඨාසවය ශූන්‍යතවිමොක්ෂමුඛයෙන් ද, අවිජ්ජාසවය අනිමිත්තවිමොක්ෂමුඛයෙන් ද ප්‍රහාණයට යේ.

එහි කාමොඝය ද භවොඝය ද අප්‍රණිහිතවිමොක්ෂමුඛයෙන් ප්‍රහාණයට යෙයි. දිට්ඨොඝය ශූන්‍යතවිමොක්ෂමුඛයෙන් ද අවිජ්ජොඝය අනිමිත්තවිමොක්ෂමුඛයෙන් ද ප්‍රහාණයට යේ.

එහි රාගසල්ලය ද දෙසසල්ලය ද අප්‍රණිහිතවිමොක්ෂමුඛයෙන් ප්‍රහාණයට යෙයි, මානසල්ලය ශූන්‍යතවිමොක්ෂමුඛයෙන් ද, මොහසල්ලය අනිමිත්තවිමොක්ෂ මුඛයෙන් ද, ප්‍රහාණයට යේ.

එහි රූපූපගවිඤ්ඤාණට්ඨිතිය ද වෙදනූපගවිඤ්ඤාණට්ඨිති ද අප්‍රණිහිත විමොක්ෂ මුඛයෙන් පරිඥවට යෙයි, සඤ්ඤූපගවිඤ්ඤාණට්ඨිතිය ශූන්‍යතවිමොක්ෂමුඛයෙන් ද සඞ්ඛාරූපගවිඤ්ඤාණට්ඨිතිය අනිමිත්තවිමොක්ෂමුඛයෙන් ද පරිඥවට යේ.

තත්ථ ඡන්දා ච අගතිගමනං දොසා ච අගතිගමනං අප්පණිහිතෙන විමොක්ඛමුඛෙන පහානං ගච්ඡන්ති, භයා අගතිගමනං සුඤ්ඤතාය, මොහා අගතිගමනං අනිමිත්තෙන විමොක්ඛමුඛෙන පහානං ගච්ඡන්ති.

ඉති සබ්බෙ ලොකවට්ටානුසාරිනො ධම්මා නීයන්ති තෙලොකා තීහි විමොක්ඛමුඛෙහි. තත්‍රිදං නීයානං චතස්සො පටිපදා චත්තාරො සතිපට්ඨානා චත්තාරි ඣානානි චත්තාරො විහාරා චත්තාරො සම්මප්පධානා චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා චත්තාරි අධිට්ඨානානි චතස්සො සමාධිභාවනා චත්තාරො සුඛභාගියා ධම්මා චතස්සො අප්පමාණා.

පඨමා පටිපදා පඨමං සතිපට්ඨානං, දුතියා පටිපදා දුතියං සතිපට්ඨානං, තතියා පටිපදා තතියං සතිපට්ඨානං, චතුත්ථා පටිපදා චතුත්ථං සතිපට්ඨානං. පඨමං සතිපට්ඨානං පඨමං ඣානං, දුතියං සතිපට්ඨානං දුතියං ඣානං, තතියං සතිපට්ඨානං තතියං ඣානං, චතුත්ථං සතිපට්ඨානං චතුත්ථං ඣානං. පඨමං ඣානං පඨමො විහාරො, දුතියං ඣානං දුතියො විහාරො, තතියං ඣානං තතියො විහාරො, චතුත්ථං ඣානං චතුත්ථො විහාරො. පඨමො විහාරො පඨමං සම්මප්පධානං, දුතියො දුතියං, තතියො තතියං, චතුත්ථො විහාරො චතුත්ථං සම්මප්පධානං පඨමං සම්මප්පධානං පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො, දුතියං දුතියො, තතියං තතියො, චතුත්ථං සම්මප්පධානං චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො. පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො පඨමං අධිට්ඨානං, දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො දුතියං අධිට්ඨානං, තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො තතියං අධිට්ඨානං, චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො චතුත්ථං අධිට්ඨානං. පඨමං අධිට්ඨානං පඨමා සමාධිභාවනා, දුතියං අධිට්ඨානං දුතියා සමාධිභාවනා, තතියං අධිට්ඨානං තතියා සමාධිභාවනා, චතුත්ථං අධිට්ඨානං චතුත්ථා සමාධිභාවනා. පඨමා සමාධිභාවනා පඨමො සුඛභාගියො ධම්මො, දුතියා සමාධිභාවනා දුතියො සුඛභාගියො ධම්මො, තතියා සමාධිභාවනා තතියො සුඛභාගියො ධම්මො, චතුත්ථා සමාධිභාවනා චතුත්ථො සුඛභාගියො ධම්මො. පඨමො සුඛභාගියො ධම්මො පඨමං අප්පමාණං, දුතියො සුඛභාගියො ධම්මො දුතියං අප්පමාණං, තතියො සුඛභාගියො ධම්මො තතියං අප්පමාණං, චතුත්ථො සුඛභාගියො ධම්මො චතුත්ථං අප්පමාණං.

පඨමා පටිපදා භාවිතා බහුලීකතා පඨමං සතිපට්ඨානං පරිපූරෙති, දුතියා පටිපදා භාවිතා බහුලීකතා දුතියං සතිපට්ඨානං පරිපූරෙති, තතියා පටිපදා භාවිතා බහුලීකතා තතියං සතිපට්ඨානං පරිපූරෙති, චතුත්ථා පටිපදා භාවිතා බහුලීකතා චතුත්ථං සතිපට්ඨානං පරිපූරෙති, පඨමො සතිපට්ඨානො භාවිතො බහුලීකතො පඨමං ඣානං පරිපූරෙති, දුතියො සතිපට්ඨානො භාවිතො බහුලීකතො දුතියං ඣානං පරිපූරෙති, තතියො සතිපට්ඨානො භාවිතො බහුලීකතො තතියං ඣානං පරිපූරෙති, චතුත්ථො සතිපට්ඨානො භාවිතො බහුලීකතො චතුත්ථං ඣානං පරිපූරෙති, පඨමං ඣානං භාවිතං බහුලීකතං පඨමං විහාරං පරිපූරෙති, දුතියං ඣානං භාවිතං බහුලීකතං දුතියං විහාරං පරිපූරෙති, තතියං ඣානං භාවිතං බහුලීකතං තතියං විහාරං පරිපූරෙති, චතුත්ථං ඣානං භාවිතං බහුලීකතං චතුත්ථං විහාරං පරිපූරෙති, පඨමො විහාරො භාවිතො

එහි ඡන්දයෙන් අගතිගමනය ද ද්වෙෂයෙන් අගතිගමනය ද අප්‍රණිහිතවිමොක්ෂමුඛයෙන් ප්‍රහාණයට යෙයි, භයින් අගතිගමනය ශූන්‍යතවිමොක්ෂමුඛයෙන් ද මොහයෙන් අගතිගමනය අනිමිත්තවිමොක්ෂමුඛයෙන් ද ප්‍රහාණයට යෙ.

මෙසේ ආහාරාදි සියලු ලොක සංඛ්‍යාත සංසාරවට්ටය අනුව යනසුලු ධර්මයෝ අනිත්‍යානුදර්ශනාදි ත්‍රිවිධවිමොක්ෂමුඛයෙන් ත්‍රෛලොකවර්තයෙන් නික්මැ යෙත්. එහි මෙ නිර්යාණය යැ සතර ප්‍රතිපදවෝ යැ සතර සතිපට්ඨානයෝ යැ සතර ධ්‍යානයෝ යැ (දිව්‍ය බ්‍රහ්ම ආර්‍ය ආනෙඤ්ජ යන) සතර විහාරයෝ යැ සතර සම්‍යක්ප්‍රධානයෝ යැ සතර ආශ්චර්‍ය්‍යඅද්භූතධර්මයෝ යැ සතර අධිෂ්ඨානයෝ යැ සතර සමාධිභාවනාවෝ යැ ඉන්ද්‍රිය සංවරාදි සතර සුඛභාගියධර්මයෝ යැ සතර අප්‍රමාණධර්මයෝ යි.

පළමුවන පටිපදව පළමුවන සතිපට්ඨාන යැ, දෙවන පටිපදව දෙවන සතිපට්ඨාන යැ, තෙවන පටිපදව තෙවන සතිපට්ඨාන යැ, සිවවන පටිපදව සිවවන සතිපට්ඨාන යි. ප්‍රථම සතිපට්ඨානය ප්‍රථමධ්‍යාන යැ, දෙවන සතිපට්ඨානය ද්විතීයධ්‍යාන යැ, තෙවන සතිපට්ඨානය තෘතීයධ්‍යාන යැ, සිවවන සතිපට්ඨානය චතුර්ථධ්‍යාන යි. ප්‍රථමධ්‍යානය ප්‍රථම විහාර යැ, ද්විතීයධ්‍යානය ද්විතීයවිහාර යැ, තෘතීයධ්‍යානය තෘතීය විහාර යැ, චතුර්ථධ්‍යානය චතුර්ථවිහාර යි. ප්‍රථම විහාරය ප්‍රථම සම්‍යක්ප්‍රධාන යැ, ද්විතීය විහාරය ද්විතීය සම්‍යක්ප්‍රධාන යැ, තෘතීය විහාරය තෘතීය සම්‍යක්ප්‍රධාන යැ, චතුර්ථ විහාරය චතුර්ථ සම්‍යක්ප්‍රධාන යි. ප්‍රථම සම්‍යක් ප්‍රධානය ප්‍රථම ආශ්චර්‍ය්‍ය අද්භූතධර්ම යැ, දෙවැන්න — දෙවැන්න යැ, තෙවැන්න — තෙවැන්න යැ, සතරවැනි සම්‍යක්ප්‍රධානය සතරවැනි ආශ්චර්‍ය්‍ය අද්භූතධර්ම යි. ප්‍රථම ආශ්චර්‍ය්‍ය අද්භූතධර්මය ප්‍රථම අධිට්ඨාන යැ, දෙවැනි ආශ්චර්‍ය්‍ය අද්භූතධර්මය දෙවැනි අධිට්ඨාන යැ, තෙවැනි ආශ්චර්‍ය්‍ය අද්භූතධර්මය තෙවැනි අධිට්ඨාන යැ, සිවවැනි ආශ්චර්‍ය්‍ය අද්භූතධර්මය සිවවැනි අධිට්ඨාන යි. පළමුවන අධිට්ඨානය පළමුවන සමාධිභාවනා යැ, දෙවැනි අධිට්ඨානය දෙවැනි සමාධිභාවනා යැ, තෙවැනි අධිට්ඨානය තෙවැනි සමාධිභාවනා යැ, සිවවැනි අධිට්ඨානය සිවවැනි සමාධි භාවනා යි. පළමුවන සමාධිභාවනාව පළමුවන සුඛභාගියධර්ම යැ, දෙවැනි සමාධි භාවනාව දෙවැනි සුඛභාගියධර්ම යැ, තෙවැනි සමාධිභාවනාව තෙවැනි සුඛභාගියධර්ම යැ· සිවවැනි සමාධිභාවනාව සිවවැනි සුඛභාගියධර්ම යි. පළමුවන සුඛභාගියධර්මය පළමුවන අප්පමාණ යැ, දෙවැනි සුඛභාගියධර්මය දෙවැනි අප්පමාණ යැ, තෙවැනි සුඛභාගියධර්මය තෙවැනි අප්පමාණ යැ, සිවවැනි සුඛභාගියධර්මය සිවවැනි අප්පමාණ යි.

පළමුවන පටිපදව භාවිත බහුලීකෘත වූවා පළමුවන සතිපට්ඨානය පරිපූර්ණ කෙරෙයි, දෙවැනි පටිපදව භාවිත බහුලීකෘත වූවා දෙවැනි සතිපට්ඨානය පුරයි, තෙවැනි පටිපදව භාවිත බහුලීකෘත වූවා තෙවැනි සතිපට්ඨානය පුරයි, සිවවැනි පටිපදව භාවිත බහුලීකෘත වූවා සිවවැනි සතිපට්ඨානය පුරයි. පළමුවන සතිපට්ඨානය භාවිත බහුලීකෘත වූයේ ප්‍රථමධ්‍යානය පුරයි, දෙවැනි සතිපට්ඨානය භාවිත බහුලීකෘත වූයේ ද්විතීයධ්‍යානය පුරයි, තෙවැනි සතිපට්ඨානය භාවිත බහුලීකෘත වූයෙ තෘතීයධ්‍යානය පුරයි, සිවවැනි සති පට්ඨානය භාවිත බහුලීකෘත වූයෙ චතුර්ථධ්‍යානය පුරයි. ප්‍රථමධ්‍යානය භාවිත බහුලීකෘත වූයේ ප්‍රථම විහාරය පුරයි, ද්විතීයධ්‍යානය භාවිත බහුලීකෘත වූයේ ද්විතීය විහාරය පුරයි, තෘතීයධ්‍යානය භාවිත බහුලීකෘත වූයෙ තෘතීය විහාරය පුරයි, චතුර්ථධ්‍යානය භාවිත බහුලීකෘත වූයෙ චතුර්ථ විහාරය පුරයි. ප්‍රථම විහාරය භාවිත බහුලීකෘත වූයෙ නූපන්

බහුලීකතො අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදං පරිපූරෙති, දුතියො විහාරො භාවිතො බහුලීකතො උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානං පරිපූරෙති, තතියො විහාරො භාවිතො බහුලීකතො අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදං පරිපූරෙති, චතුත්ථො විහාරො භාවිතො බහුලීකතො උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතිං අසම්මොසං භිය්‍යොභාවං පරිපූරෙති, පඨමං සම්මප්පධානං භාවිතං බහුලීකතං මානප්පහානං පරිපූරෙති, දුතියං සම්මප්පධානං භාවිතං බහුලීකතං ආලයසමුග්ඝාතං පරිපූරෙති, තතියං සම්මප්පධානං භාවිතං බහුලීකතං අවිජ්ජාපහානං පරිපූරෙති, චතුත්ථං සම්මප්පධානං භාවිතං බහුලීකතං භවූපසමං පරිපූරෙති, මානපහානං භාවිතං බහුලීකතං සච්චාධිට්ඨානං පරිපූරෙති, ආලයසමුග්ඝාතො භාවිතො බහුලීකතො චාගාධිට්ඨානං පරිපූරෙති, අවිජ්ජාපහානං භාවිතං බහුලීකතං පඤ්ඤාධිට්ඨානං පරිපූරෙති, භවූපසමො භාවිතො බහුලීකතො උපසමාධිට්ඨානං පරිපූරෙති, සච්චාධිට්ඨානං භාවිතං බහුලීකතං ඡන්දසමාධිං පරිපූරෙති, චාගාධිට්ඨානං භාවිතං බහුලීකතං විරියසමාධිං පරිපූරෙති, පඤ්ඤාධිට්ඨානං භාවිතං බහුලීකතං චිත්තසමාධිං පරිපූරෙති, උපසමාධිට්ඨානං භාවිතං බහුලීකතං වීමංසාසමාධිං පරිපූරෙති, ඡන්දසමාධි භාවිතො බහුලීකතො ඉන්ද්‍රියසංවරං පරිපූරෙති, විරියසමාධි භාවිතො බහුලීකතො තපං පරිපූරෙති, චිත්තසමාධි භාවිතො බහුලීකතො බුද්ධිං පරිපූරෙති, වීමංසාසමාධි භාවිතො බහුලීකතො සබ්බූපධිපටිනිස්සග්ගං පරිපූරෙති. ඉන්ද්‍රියසංවරො භාවිතො බහුලීකතො මෙත්තං පරිපූරෙති, තපො භාවිතො බහුලීකතො කරුණං පරිපූරෙති, බුද්ධි භාවිතා බහුලීකතා මුදිතං පරිපූරෙති, සබ්බූපධිපටිනිස්සග්ගො භාවිතො බහුලීකතො උපෙක්ඛං පරිපූරෙති.

තත්ථ ඉමා චතස්සො දිසා; පඨමා පටිපදා පඨමො සතිපට්ඨානො පඨමං ඣානං පඨමො විහාරො පඨමො සම්මප්පධානො පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො සච්චාධිට්ඨානං ඡන්දසමාධි ඉන්ද්‍රියසංවරො මෙත්තා ඉති පඨමා දිසා.

දුතියා පටිපදා දුතියො සතිපට්ඨානො දුතියං ඣානං දුතියො විහාරො දුතියො සම්මප්පධානො දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො චාගාධිට්ඨානං විරියසමාධි තපො කරුණා ඉති දුතියා දිසා,

තතියා පටිපදා තතියො සතිපට්ඨානො තතියං ඣානං තතියො විහාරො තතියො සම්මප්පධානො තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො පඤ්ඤාධිට්ඨානං චිත්තසමාධි බුද්ධි මුදිතා ඉති තතියා දිසා,

චතුත්ථා පටිපදා චතුත්ථො සතිපට්ඨානො චතුත්ථං ඣානං චතුත්ථො විහාරො චතුත්ථො සම්මප්පධානො චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො උපසමාධිට්ඨානං වීමංසාසමාධි සබ්බූපධිපටිනිස්සග්ගො උපෙක්ඛා ඉති චතුත්ථා දිසා.

තත්ථ පඨමා පටිපදා පඨමො සතිපට්ඨානො පඨමං ඣානං පඨමො විහාරො පඨමො සම්මප්පධානො පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මො සච්චාධිට්ඨානං ඡන්දසමාධි ඉන්ද්‍රියසංවරො මෙත්තා ඉති ඉමෙසං දසන්නං සුත්තානං එකො අත්ථො බ්‍යඤ්ජනමෙව නානං. ඉදං රාගචරිතස්ස පුග්ගලස්ස භෙසජ්ජං.

ලාමක අකුශලධර්මයන්ගේ අනුත්පාදය පරිපූර්ණ කෙරෙයි, ද්විතීය විහාරය භාවිත බහුලීකෘත වූයේ උපන් ලාමක අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පුරයි, තෘතීය විහාරය භාවිත බහුලීකෘත වූයේ නූපන් කුශලධර්මයන්ගේ උත්පාදය පුරයි, චතුර්ථ විහාරය භාවිත බහුලීකෘත වූයේ උපන් කුශලධර්මයන්ගේ ස්ථිතිය අසම්මෝසය (නො නැසීම) බහුලබව පරිපූර්ණ කෙරේ. ප්‍රථම සම්‍යක්ප්‍රධානය භාවිත බහුලීකෘත වූයේ මානප්‍රහාණය පුරයි, දෙවැනි සම්‍යක්ප්‍රධානය භාවිත බහුලීකෘත වූයේ ආලයසමුද්ඝාතය පුරයි, තෙවැනි සම්‍යක් ප්‍රධානය භාවිත බහුලීකෘත වූයේ අවිද්‍යාප්‍රහාණය පුරයි, සිවුවැනි සම්‍යක්ප්‍රධානය භාවිත බහුලීකෘත වූයේ භවයාගේ උපසමය පුරයි. මානප්‍රහාණය භාවිත බහුලීකෘත වූයේ සත්‍යාධිෂ්ඨානය පුරයි, ආලයසමුද්ඝාතය භාවිත බහුලීකෘත වූයේ ත්‍යාගාධිෂ්ඨානය පුරයි, අවිද්‍යාප්‍රහාණය භාවිත බහුලීකෘත වූයේ ප්‍රඥාධිෂ්ඨානය පුරයි, භවෝපශමය භාවිත බහුලීකෘත වූයේ (ක්ලෙශ) උපශමාධිෂ්ඨානය පුරයි, සත්‍යාධිෂ්ඨානය භාවිත බහුලීකෘත වූයේ ඡන්දසමාධිය පුරයි, ත්‍යාගාධිෂ්ඨානය භාවිත බහුලීකෘත වූයේ වීර්‍ය්‍යසමාධිය පුරයි, ප්‍රඥාධිෂ්ඨානය භාවිත බහුලීකෘත වූයේ චිත්තසමාධිය පුරයි, උපශමාධිෂ්ඨානය භාවිත බහුලීකෘත වූයේ විමංසාසමාධිය පුරයි. ඡන්දසමාධිය භාවිත බහුලීකෘත වූයේ ඉන්ද්‍රිය සංවරය පුරයි, වීර්‍ය්‍යසමාධිය භාවිත බහුලීකෘත වූයේ (පුණ්‍යධර්ම සංඛ්‍යාත) තපස පුරයි, චිත්තසමාධිය භාවිත බහුලීකෘත වූයේ (බොජ්ඣඞ්ගභාවනා සංඛ්‍යාත) බුද්ධිය පුරයි, විමංසා සමාධිය භාවිත බහුලීකෘත වූයේ සබ්බූපධිපටිනිස්සග්ගය පුරයි. ඉන්ද්‍රියසංවරය භාවිත බහුලීකෘත වූයේ මෛත්‍රාව පුරයි, තපස භාවිත බහුලීකෘත වූයේ කරුණාව පුරයි, බුද්ධිය භාවිත බහුලීකෘත වූවා මුදිතාව පුරයි, සබ්බූපධිපටිනිස්සග්ගය (නිවන) භාවිත බහුලීකෘත වූයේ උපෙක්ෂාව පරිපූර්ණ කෙරේ.

ඒ වොදානපක්ෂයෙහි මේ සතර දිශාවෝ යැ : ප්‍රථම පටිපද යැ ප්‍රථම සතිපට්ඨාන යැ ප්‍රථම ධ්‍යාන යැ ප්‍රථම (දිබ්බ) විහාරය යැ ප්‍රථම සම්‍යක්ප්‍රධාන යැ ප්‍රථම අච්ඡරිය අබ්භූත ධර්ම යැ සච්චාධිට්ඨාන යැ ඡන්දසමාධි යැ ඉන්ද්‍රියසංවර යැ මෛත්‍රා යැ යනු ප්‍රථම දිශාභූත ධර්ම යි.

දෙවැනි පටිපද යැ දෙවැනි සතිපට්ඨාන යැ දෙවැනි ධ්‍යාන යැ දෙවැන් (බ්‍රහ්ම) විහාර යැ දෙවැනි සම්‍යක්ප්‍රධාන යැ දෙවැනි අච්ඡරිය අබ්භූත ධර්ම යැ චාගාධිට්ඨාන යැ විරියසමාධි යැ තපස යැ කරුණා (අප්‍රාමාණ්‍ය) යැ යනු ද්විතීය දිශාභූත ධර්ම යි.

තෘතීය ප්‍රතිපද යැ තෙවැනි සතිපට්ඨාන යැ තෙවැනි ධ්‍යාන යැ තෙවැණි (අරිය) විහාර යැ තෙවැනි සම්‍යක්ප්‍රධාන යැ තෙවැනි අච්ඡරිය අබ්භූත ධර්ම යැ පඤ්ඤාධිට්ඨාන යැ චිත්තසමාධි යැ (බොජ්ඣඞ්ගභාවනා) බුද්ධි යැ මුදිතා (අප්‍රාමාණ්‍ය) යැ යනු තෘතීය දිශාභූත ධර්ම යි.

සතරවැනි පටිපද යැ සිවුවැනි සතිපට්ඨාන යැ සිවුවැනි ධ්‍යාන යැ සිවුවැනි (ආනෙඤ්ජ) විහාර යැ සිවුවැනි සම්‍යක්ප්‍රධාන යැ සිවුවැනි අච්ඡරිය අබ්භූත ධර්ම යැ උපසමාධිට්ඨාන යැ විමංසාසමාධි යැ සබ්බූපධිපටිනිස්සග්ග යැ උපෙක්ඛා (අප්‍රාමාණ්‍ය) යැ යනු චතුර්ථ දිශාභූත ධර්ම යි.

ඒ දිශාභූත ධර්මයන් කෙරෙහි පඨම පටිපද යැ පඨම සතිපට්ඨාන යැ පඨම ඣාන යැ පඨම විහාර යැ පඨම සම්මප්පධාන යැ පඨම අච්ඡරිය අබ්භූතධම්ම යැ සච්චාධිට්ඨාන යැ ඡන්දසමාධි යැ ඉන්ද්‍රියසංවර යැ මෙත්තා යැ යන මේ දසවැදෑරුම් සූත්‍රපදයන්ගේ අර්ථය එකෙකැ ව්‍යඤ්ජනය මැ නානා වෙයි. මේ රාගචරිත පුද්ගලහට බෙහෙති.

දුතියා පටිපදා දුතියො සතිපට්ඨානො දුතියං ඣානං දුතියො විහාරො දුතියො සම්මප්පධානො දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මො චාගාධිට්ඨානං විරියසමාධි තපො කරුණා ඉති ඉමෙසං දසන්නං සුත්තානං එකො අත්ථො බ්‍යඤ්ජනමෙව නානං. ඉදං දොසචරිතස්ස පුග්ගලස්ස භෙසජ්ජං.

තතියා පටිපදා තතියො සතිපට්ඨානො තතියං ඣානං තතියො විහාරො තතියො සම්මප්පධානො තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො පඤ්ඤාධිට්ඨානං චිත්තසමාධි බුද්ධි මුදිතා ඉති ඉමෙසං දසන්නං සුත්තානං එකො අත්ථො බ්‍යඤ්ජනමෙව නානං. ඉදං දිට්ඨිචරිතස්ස මන්දස්සපුග්ගලස්ස භෙසජ්ජං.

චතුත්ථා පටිපදා චතුත්ථො සතිපට්ඨානො චතුත්ථං ඣානං චතුත්ථො විහාරො චතුත්ථො. සම්මප්පධානො චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො උපසමාධිට්ඨානං වීමංසාසමාධි සබ්බූපධිපටිනිස්සග්ගො උපෙක්ඛා ඉති ඉමෙසං දසන්නං සුත්තානං එකො අත්ථො බ්‍යඤ්ජනමෙව නානං. ඉදං දිට්ඨිචරිතස්ස උදත්තස්ස භෙසජ්ජං.

තත්ථ දුක්ඛා ච පටිපදා දන්ධාභිඤ්ඤා දුක්ඛා ච පටිපදා ඛිප්පාභිඤ්ඤා අප්පණිහිතං විමොක්ඛමුඛං, සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා සුඤ්ඤතවිමොක්ඛමුඛං, සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා අනිමිත්තවිමොක්ඛමුඛං.

තත්ථ කායෙ කායානුපස්සිතා සතිපට්ඨානං ච වෙදනාසු වෙදනානුපස්සිතා සතිපට්ඨානං ච අප්පණිහිතං විමොක්ඛමුඛං, චිත්තෙ චිත්තානුපස්සිතා සුඤ්ඤතා විමොක්ඛමුඛං, ධම්මෙසු ධම්මානුපස්සිතා අනිමිත්තං විමොක්ඛමුඛං.

තත්ථ පඨමඤ්ච ඣානං දුතියං ච ඣානං අප්පණිහිතං විමොක්ඛමුඛං තතියං ඣානං සුඤ්ඤතා, චතුත්ථං ඣානං අනිමිත්තං විමොක්ඛමුඛං.

තත්ථ පඨමො ච විහාරො දුතියො ච විහාරො අප්පණිහිතං විමොක්ඛමුඛං, තතියො විහාරො සුඤ්ඤතා, චතුත්ථො විහාරො අනිමිත්තං විමොක්ඛමුඛං.

තත්ථ පඨමං ච සම්මප්පධානං දුතියං ච සම්මප්පධානං අප්පණිහිතං විමොක්ඛමුඛං, තතියං සම්මප්පධානං සුඤ්ඤතා, චතුත්ථං සම්මප්පධානං අනිමිත්තං විමොක්ඛමුඛං.

තත්ථ මානප්පහානං ච ආලයසමුග්ඝාතො ච අප්පණිහිතං විමොක්ඛමුඛං අවිජ්ජාපහානං සුඤ්ඤතා, භවූපසමො අනිමිත්තං විමොක්ඛමුඛං.

තත්ථ සච්චාධිට්ඨානං ච චාගාධිට්ඨානං ච අප්පණිහිතං විමොක්ඛමුඛං, පඤ්ඤාධිට්ඨානං සුඤ්ඤතා, උපසමාධිට්ඨානං අනිමිත්තං විමොක්ඛමුඛං.

තත්ථ ඡන්දසමාධි විරියසමාධි ච අප්පණිහිතං විමොක්ඛමුඛං, චිත්තසමාධි සුඤ්ඤතා, වීමංසාසමාධි අනිමිත්තං විමොක්ඛමුඛං.

දෙවැනි පටිපද යැ දෙවැනි සතිපට්ඨාන යැ දෙවැනි ධ්‍යානය දෙවැනි විහාර යැ දෙවැනි සම්මප්පධාන යැ දෙවැනි අච්ඡරිය අබ්භූත ධර්ම යැ වාගාධිට්ඨාන යැ විරියසමාධි යැ (පුණ්‍යධර්ම) තපස යැ කරුණා යැ යන මේ දසවැදෑරුම් සූත්‍රපදයන්ගේ අර්ථය එකෙකැ, ව්‍යඤ්ජනය මැ නානා වෙයි, මේ දෙසචරිත පුද්ගලහට බෙහෙති.

තෙවැනි පටිපද යැ තෙවැනි සතිපට්ඨාන යැ තෙවැනි ධ්‍යාන යැ තෙවැනි විහාර යැ තෙවැනි සම්මප්පධාන යැ තෙවැනි අච්ඡරිය අබ්භූත ධර්ම යැ පඤ්ඤාධිට්ඨාන යැ චිත්ත සමාධි යැ (බොජ්ඣඞ්ගභාවනා) බුද්ධි යැ මුදිතා යැ යන මේ දසවැදෑරුම් සූත්‍රපදයන්ගේ අර්ථය එකෙකැ, ව්‍යඤ්ජනය මැ නානා වෙයි. මේ මන්ද වූ (මොහාධික) දිට්ඨිචරිත පුද්ගලහට බෙහෙති.

සිව්වැනි පටිපද යැ සිව්වැනි සතිපට්ඨාන යැ සිව්වැනි ධ්‍යාන යැ සිව්වැනි විහාර යැ සිව්වැනි සම්මප්පධාන යැ සිව්වැනි අච්ඡරිය අබ්භූත ධර්ම යැ උපසමාධිට්ඨාන යැ විමංසා සමාධි යැ සබ්බූපධිපටිනිස්සග්ග යැ උපෙක්ඛා යැ යන මේ දසවැදෑරුම් සූත්‍රපදයන්ගේ අර්ථය එකෙකැ, ව්‍යඤ්ජනය මැ නානා වෙයි. මේ උදත්ථ (උදර ප්‍රඥ ඇති) දිට්ඨිචරිත පුද්ගලහට බෙහෙති.

එහි (ඒ වොදනධර්මයන් කෙරෙහි) දන්ධාභිඤ්ඤ වූ දුක්ඛපටිපදව ද ඛිප්පාභිඤ්ඤ වූ දුක්ඛපටිපදව ද අප්‍රණිහිත විමොක්ෂමුඛ යැ, දන්ධාභිඤ්ඤවූ සුඛපටිපදව ශූන්‍යතවිමොක්ෂ මුඛ යැ, ඛිප්පාභිඤ්ඤ වූ සුඛපටිපදව අනිමිත්තවිමොක්ෂමුඛ යි.

එහි කයෙහි කය අනුව දක්නා සතිපට්ඨානය ද වෙදනාවන්හි වෙදනා අනුව දක්නා සතිපට්ඨානය ද අප්‍රණිහිත විමොක්ෂමුඛ යැ, චිත්තයෙහි චිත්තානුපස්සී සතිපට්ඨානය ශූන්‍යත විමොක්ෂමුඛ යැ, ධර්මයන්හි ධම්මානුපස්සී සතිපට්ඨානය අනිමිත්තවිමොක්ෂ මුඛ යි.

එහි ප්‍රථමධ්‍යානය ද ද්විතීයධ්‍යානය ද අප්‍රණිහිත විමොක්ෂමුඛ යැ, තෘතීයධ්‍යානය ශූන්‍යතවිමොක්ෂමුඛ යැ, චතුර්ථධ්‍යානය අනිමිත්තවිමොක්ෂමුඛ යි.

එහි ප්‍රථමවිහාරය ද ද්විතීය විහාරය ද අප්‍රණිහිත විමොක්ෂමුඛ යැ, තෘතීය විහාරය ශූන්‍යත විමොක්ෂමුඛ යැ, චතුර්ථවිහාරය අනිමිත්තවිමොක්ෂමුඛ යි.

එහි ප්‍රථම සම්‍යක්ප්‍රධානය ද ද්විතීය සම්‍යක්ප්‍රධානය ද අප්‍රණිහිත විමොක්ෂමුඛ යැ, තෘතීය සම්‍යක්ප්‍රධානය ශූන්‍යතවිමොක්ෂමුඛ යැ, චතුර්ථ සම්‍යක්ප්‍රධානය අනිමිත්ත විමොක්ෂමුඛ යි.

එහි මානප්‍රහාණය ද ආලයසමුද්ඝාතය ද අප්‍රණිහිත විමොක්ෂමුඛ යැ, අවිද්‍යාප්‍රහාණය ශූන්‍යතවිමොක්ෂමුඛ යැ, භවූපසමය අනිමිත්තවිමොක්ෂමුඛ යි.

එහි සත්‍යාධිට්ඨානය ද වාගාධිට්ඨානය ද අප්‍රණිහිතවිමොක්ෂමුඛ යැ, පඤ්ඤාධිට්ඨානය ශූන්‍යතවිමොක්ෂමුඛ යැ, උපසමාධිට්ඨානය අනිමිත්තවිමොක්ෂමුඛ යි.

එහි ඡන්දසමාධිය ද විරියසමාධිය ද අප්‍රණිහිතවිමොක්ෂමුඛ යැ, චිත්තසමාධිය ශූන්‍යතවිමොක්ෂමුඛ යැ, විමංසාසමාධිය අනිමිත්තවිමොක්ෂමුඛ යි.

14—ජී 04440 (79/08)

තත්ථ ඉන්ද්‍රියසංවරො ච තපො ච අප්පණිහිතං විමොක්ඛමුඛං, බුද්ධි සුඤ්ඤතා සබ්බූපධිපටිනිස්සග්ගො අනිමිත්තං විමොක්ඛමුඛං.

තත්ථ මෙත්තා ච කරුණා ච අප්පණිහිතං විමොක්ඛමුඛං, මුදිතා සුඤ්ඤතා, උපෙක්ඛා අනිමිත්තං විමොක්ඛමුඛං.

තෙසං වික්කීළිතං; චත්තාරො ආහාරා, තෙසං පටිපක්ඛො චතස්සො පටිපදා චත්තාරො විපල්ලාසා, තෙසං පටිපක්ඛො චත්තාරො සතිපට්ඨානා චත්තාරි උපාදානානි, තෙසං පටිපක්ඛො චත්තාරි ඣානානි. චත්තාරො යොගා, තෙසං පටිපක්ඛො චත්තාරො විහාරා, චත්තාරො ගන්ථා, තෙසං පටිපක්ඛො චත්තාරො සම්මප්පධානා චත්තාරො ආසවා තෙසං පටිපක්ඛො චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා චත්තාරො ඔඝා, තෙසං පටිපක්ඛො චත්තාරි අධිට්ඨානානි. චත්තාරො සල්ලා, තෙසං පටිපක්ඛො චතස්සො සමාධිභාවනා චතස්සො විඤ්ඤාණට්ඨිතියො, තෙසං පටිපක්ඛො චත්තාරො සුඛභාගියා ධම්මා. චත්තාරි අගතිගමනානි, තෙසං පටිපක්ඛො චතස්සො අප්පමාණා.

සීහා : බුද්ධා පච්චෙකබුද්ධා සාවකා ච හතරාගදොසමොහා ; තෙසං වික්කීළිතං භාවනා සච්ඡිකිරියා බ්‍යන්තිකිරියා ච, වික්කීළිතං ඉන්ද්‍රියාධිට්ඨානං, වික්කීළිතං විපරියාසානධිට්ඨානං ච ඉන්ද්‍රියානි සද්ධම්මගොචරො, විපරියාසා කිලෙසගොචරො අයං වුච්චති සීහවික්කීළිතස්ස ච නයස්ස දිසාලොචනස්ස ච නයස්ස භූමීති. තෙනාහ. "යො නෙති විපල්ලාසෙහි කිලෙසෙ" "වෙය්‍යාකරණෙසු හි යෙ කුසලාකුසලා" ති ච.

තත්ථ යෙ දුක්ඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ඛිප්පාභිඤ්ඤාය ච නීයන්ති ඉමෙ ද්වෙ පුග්ගලා. යෙ සුඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ඛිප්පාභිඤ්ඤාය ච නීයන්ති ඉමෙ ද්වෙ පුග්ගලා. තෙසං චතුන්නං පුග්ගලානං අයං සංකිලෙසො: චත්තාරො ආහාරා චත්තාරො විපල්ලාසා චත්තාරි උපාදානානි චත්තාරො යොගා චත්තාරො ගන්ථා චත්තාරො ආසවා චත්තාරො ඔඝා චත්තාරො සල්ලා චතස්සො විඤ්ඤාණට්ඨිතියො චත්තාරි අගතිගමනානීති. තෙසං චතුන්නං පුග්ගලානං ඉදං වොදානං : චතස්සො පටිපදා චත්තාරො විහාරා චත්තාරො සම්මප්පධානා චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා චත්තාරි අධිට්ඨානානි චතස්සො සමාධිභාවනා චත්තාරො සුඛභාගියා ධම්මා චතස්සො අප්පමාණා ඉති.

තත්ථ යෙ දුක්ඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ඛිප්පාභිඤ්ඤාය ච නීයන්ති ඉමෙ ද්වෙ පුග්ගලා යෙ සුඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ඛිප්පාභිඤ්ඤාය ච නීයන්ති ඉමෙ ද්වෙ පුග්ගලා. තත්ථ යො සුඛාය පටිපදාය ඛිප්පාභිඤ්ඤාය ච නීයාති අයං උග්ඝටිතඤ්ඤූ, යො සාධාරණාය අයං විපඤ්චිතඤ්ඤූ, යො දුක්ඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය නීයාති අයං නෙය්‍යො.

එහි ඉන්ද්‍රියසංවරය ද තපස ද අප්‍රණිහිතවිමොක්ෂමුඛ යැ, බුද්ධිය ශූන්‍යතවිමොක්ෂමුඛ යැ, සබ්බූපධිපටිනිස්සග්ගය අනිමිත්තවිමොක්ෂමුඛ යි.

එහි මෛත්‍රීව ද කරුණාව ද අප්‍රණිහිතවිමොක්ෂමුඛ යැ, මුදිතාව ශූන්‍යතවිමොක්ෂමුඛ යැ, උපෙක්ඛාව අනිමිත්තවිමොක්ෂමුඛ යි.

(අසන්තසනාදි විශෙෂයොගයෙන් සිංහසදෘශ වූ) ඒ බුද්ධාදීන්ගේ (භාවනා සච්ඡිකිරියා පහාන සංඛ්‍යාත) වික්‍රීඩිතය හෙවත් පැවැත්ම වෙයි : (සංකිලෙස පක්ෂයෙහි) සතර ආහාරයෝ වෙති, (වොදාන පක්ෂයෙහි) සතර ප්‍රතිපදාවෝ ඔවුනට ප්‍රතිපක්ෂ යැ, (එසේ මැ) සතර විපල්ලාසයෝ වෙති, සතර සතිපට්ඨානයෝ ඔවුනට ප්‍රතිපක්ෂ යැ. සතර උපාදානයෝ වෙති, සතර ධ්‍යානයෝ ඔවුනට ප්‍රතිපක්ෂ යැ. සතර යොගයෝ වෙති, (දිබ්බාදි) සතර විහාරයෝ ඔවුනට ප්‍රතිපක්ෂ යැ. සතර ග්‍රන්ථයෝ වෙති, සතර සම්‍යක්ප්‍රධානයෝ ඔවුනට ප්‍රතිපක්ෂ යැ. සතර කාමාදි ආසවයෝ වෙති, සතර ආශ්චර්‍ය්‍ය අද්භූතධර්මයෝ ඔවුනට ප්‍රතිපක්ෂ යැ. සතර ඔඝයෝ වෙති, සතර අධිෂ්ඨානයෝ ඔවුනට ප්‍රතිපක්ෂ යැ. සතර ශල්‍යයෝ වෙති, සතර සමාධිභාවනාවෝ ඔවුනට ප්‍රතිපක්ෂ යැ. සතර විඤ්ඤාණට්ඨිතිහු වෙති, සතර සුඛභාගිය ධර්මයෝ ඔවුනට ප්‍රතිපක්ෂ යැ. සතර අගතිගමනයෝ වෙති, සතර අප්‍රමාණ්‍යයෝ ඔවුනට ප්‍රතිපක්ෂ යි.

(සමුච්ඡෙදප්‍රහාණ විසින්) නසනලද රාගද්වෙෂමොහ ඇති සම්මාසම්බුද්ධහු ද පසේ බුදුහු ද සව්වෝ ද (අසන්ත්‍රාස බල පරාක්‍රමාදි විශෙෂයොගයෙන්) සිංහසදෘශ වෙති, ඒ සිංහසදෘශ බුද්ධාදීන්ගේ බොධ්‍යඞ්ගධර්මයන්ගේ භාවනාව ඵලනිර්වාණයන් ප්‍රත්‍යක්ෂ කිරීම දශවස්තුක ක්ලෙශපුඤ්ජය ප්‍රහාණය කිරීම ද වික්‍රීඩිත යැ, (ඉන්ද්‍රියාධිෂ්ඨාන) ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම භාවනා සච්ඡිකිරියා ද වික්‍රීඩිත යැ, විපර්‍ය්‍යාසයන්ගේ නො පැවැත්ම ප්‍රහාණය අනුත්පාදනය ද වික්‍රීඩිත යි. ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ සද්ධර්මයට ගොචර වූවාහුය, විපල්ලාසයෝ සංක්ලෙෂපක්ෂයට ගොචර යි. පැවැත්මට හෙතු යි. මෙ සීහවික්කීළිතනයට ද දිසාලොචනනයට ද භූමි යයි කියනුලැබෙ. "ශො නෙති විපල්ලාසෙහි කිලෙසෙ" යනු ද "වෙය්‍යාකරණෙසු හි යෙ කුසලාකුසලා" යනු ද එයින් කිහ.

ඒ පුද්ගලයන් කෙරෙහි යම් කෙනෙක් දුක්ඛපටිපද ඇති දන්ධාභිඥයෙන් ද ක්ෂිප්‍රාභිඥයෙන් ද නියර්‍ය්‍යාණය කෙරෙත් ද, මේ පුද්ගලයෝ දෙදෙනෙකි. යම් කෙනෙක් සුඛපටිපද ඇති දන්ධාභිඥයෙන් ද ක්ෂිප්‍රාභිඥයෙන් ද නියර්‍ය්‍යාණය කෙරෙත් ද මේ පුද්ගලයෝ දෙදෙනෙකි. ඒ සතර පුද්ගලයනට මේ සංක්ලෙශ යැ : සතර ආහාරයෝ යැ සතර විපල්ලාසයෝ යැ සතර උපාදානයෝ යැ සතර යොගයෝ යැ සතර ග්‍රන්ථයෝ යැ සතර ආසවයෝ යැ සතර ඔඝයෝ යැ සතර ශල්‍යයෝ යැ සතර විඤ්ඤාණට්ඨිති යැ සතර අගතිගමනයෝ යැ යන මොහු යි. ඒ සතර පුද්ගලයනට මේ වොදාන යැ : සතර ප්‍රතිපද යැ සතර සතිපට්ඨානයෝ යැ සතර ධ්‍යානයෝ යැ සතර විහාරයෝ යැ සතර සම්‍යක් ප්‍රධානයෝ යැ සතර ආශ්චර්‍ය්‍ය අද්භූතධර්මයෝ යැ සතර අධිෂ්ඨානයෝ යැ සතර සමාධි භාවනා යැ සතර සුඛභාගියධර්මයෝ යැ සතර අප්‍රමාණ්‍යයෝ යැ යන මොහු යි.

ඒ පුද්ගලයන් කෙරෙහි දුක්ඛපටිපද ඇති දන්ධාභිඥයෙන් ද ක්ෂිප්‍රාභිඥයෙන් ද යම් කෙනෙක් නිර්යාණය කෙරෙත් ද, මොහු පුද්ගලයෝ දෙදෙනෙකි. සුඛපටිපද ඇති දන්ධාභිඥයෙන් ද ක්ෂිප්‍රාභිඥයෙන් ද යම් කෙනෙක් නියර්‍ය්‍යාණය කෙරෙත් ද, මොහු පුද්ගලයෝ දෙදෙනෙකි. ඒ පුද්ගලයන් සතරදෙනා කෙරෙහි යමෙක් සුඛපටිපද ඇති ක්ෂිප්‍රාභිඥයෙන් නිර්යාණය කෙරේ ද මේ පුද්ගල උද්ඝටිතඥ වෙයි. යමෙක් සාධාරණ ප්‍රතිපදයෙන් ('දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා' යන ප්‍රතිපද දෙකින් නික්මැයේ ද,) මේ විපඤ්චිතඥ පුද්ගල වෙයි. යමෙක් දුක්ඛපටිපද ඇති දන්ධාභිඥයෙන් සසරදුකින් නික්මැයේ ද මේ නෙය්‍යපුද්ගල වේ.

තත්ථ භගවා උග්ඝටිතඤ්ඤුස්ස පුග්ගලස්ස සමථං උපදිසති, නෙය්‍යස්ස විපස්සනං, සමථවිපස්සනං විපඤ්චිතඤ්ඤුස්ස. තත්ථ භගවා උග්ඝටිතඤ්ඤුස්ස පුග්ගලස්ස මුදුකං ධම්මදෙසනං උපදිසති; තික්ඛං නෙය්‍යස්ස, මුදුතික්ඛං විපඤ්චිතඤ්ඤුස්ස පුග්ගලස්ස. තත්ථ භගවා උග්ඝටිතඤ්ඤුස්ස පුග්ගලස්ස සංඛිත්තෙන ධම්මං දෙසයති, සංඛිත්තවිත්ථාරෙන විපඤ්චිතඤ්ඤුස්ස, විත්ථාරෙන නෙය්‍යස්ස. තත්ථ භගවා උග්ඝටිතඤ්ඤුස්ස පුග්ගලස්ස නිස්සරණං උපදිසති, විපඤ්චිතඤ්ඤුස්ස ආදීනවං ච නිස්සරණං ච උපදිසති, නෙය්‍යස්ස අස්සාදඤ්ච ආදීනවං ච නිස්සරණං ච උපදිසති. තත්ථ භගවා උග්ඝටිතඤ්ඤුස්ස අධිපඤ්ඤාසික්ඛං පඤ්ඤපයති, අධිචිත්තං විපඤ්චිතඤ්ඤුස්ස, අධිසීලං නෙය්‍යස්ස.

තත්ථ යෙ දුක්ඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ච ඛිප්පාභිඤ්ඤාය ච නීයන්ති ඉමෙ ද්වෙ පුග්ගලා, යෙ සුඛාය පටිපදාය දන්ධාභිඤ්ඤාය ඛිප්පාභිඤ්ඤාය ච නීයන්ති ඉමෙ ද්වෙ පුග්ගලා. ඉති ඛො චත්තාරි හුත්වා තීණි භවන්ති. උග්ඝටිතඤ්ඤූ විපඤ්චිතඤ්ඤූ නෙය්‍යොති.

තෙසං තිණ්ණං පුග්ගලානං අයං සංකිලෙසො : තීණි අකුසලමූලානි : ලොභො අකුසලමූලං දොසො අකුසලමූලං මොහො අකුසලමූලං, තීණි දුච්චරිතානි : කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං, තයො අකුසලවිතක්කා : කාමවිතක්කො බ්‍යාපාදවිතක්කො, විහිංසාවිතක්කො තිස්සො අකුසලසඤ්ඤා : කාමසඤ්ඤා බ්‍යාපාදසඤ්ඤා විහිංසාසඤ්ඤා තිස්සො විපරීතසඤ්ඤා : නිච්චසඤ්ඤා සුඛසඤ්ඤා අත්තසඤ්ඤා, තිස්සො වෙදනා : සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා, තිස්සො දුක්ඛතා : දුක්ඛදුක්ඛතා සඞ්ඛාරදුක්ඛතා විපරිණාමදුක්ඛතා, තයො අග්ගී : රාගග්ගි දොසග්ගි මොහග්ගි, තයො සල්ලා : රාගසල්ලො දොසසල්ලො මොහසල්ලො, තිස්සො ජටා : රාගජටා දොසජටා මොහජටා, තිස්සො අකුසලූපපරික්ඛා : අකුසලං කායකම්මං අකුසලං වචීකම්මං අකුසලං මනොකම්මං, තිස්සො විපත්තියො : සීලවිපත්ති දිට්ඨිවිපත්ති ආචාරවිපත්තීති.

තෙසං තිණ්ණං පුග්ගලානං ඉදං වොදානං : තීණි කුසලමූලානි : අලොභො කුසලමූලං අදොසො කුසලමූලං අමොහො කුසලමූලං, තීණි සුචරිතානි : කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං, තයො කුසලවිතක්කා : නෙක්ඛම්මවිතක්කො අබ්‍යාපාදවිතක්කො අවිහිංසාවිතක්කො, තයො සමාධි : සවිතක්කො සවිචාරො සමාධි අවිතක්කො විචාරමත්තො සමාධි අවිතක්කො අවිචාරො සමාධි, තිස්සො කුසලසඤ්ඤා : නෙක්ඛම්මසඤ්ඤා අබ්‍යාපාදසඤ්ඤා අවිහිංසාසඤ්ඤා, තිස්සො අවිපරීතසඤ්ඤා: අනිච්චසඤ්ඤා දුක්ඛසඤ්ඤා අනත්තසඤ්ඤා, තිස්සො කුසලූපපරික්ඛා : කුසලං කායකම්මං කුසලං වචීකම්මං කුසලං මනොකම්මං, තීණි සොචෙය්‍යානි : කායසොචෙය්‍යං වචීසොචෙය්‍යං මනොසොචෙය්‍යං, තිස්සො සම්පත්තියො : සීලසම්පත්ති සමාධිසම්පත්ති පඤ්ඤාසම්පත්ති, තිස්සො සික්ඛා : අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා, තයො ඛන්ධා : සීලක්ඛන්ධො සමාධික්ඛන්ධො පඤ්ඤාක්ඛන්ධො, තීණි විමොක්ඛමුඛානි : සුඤ්ඤතං අනිමිත්තං අප්පණිහිතන්ති.

ඒ පුද්ගලයන් කෙරෙහි බුදුහු උග්ඝටිතඤ්ඤු පුද්ගලහට සමථය දෙසනසේක, නෙයපුද්ගලහට විදර්ශනාව ද විපඤ්චිතඤ්ඤු පුද්ගලහට සමථවිපස්සනා දෙක ද දෙසන සේකි. ඔවුන්කෙරෙහි බුදුහු උග්ඝටිතඤ්ඤු පුද්ගලහට මෘදු (සැහැල්ලු) වූ ධර්මදෙශනාව දෙසනසේක, නෙය්‍යපුද්ගලහට (අපායභය දක්වීම් ආදියෙන්) තියුණු වූ දෙශනාව ද, විපඤ්චිතඤ්ඤු පුද්ගලහට (සංවෙග දනැවීම් ආදියෙන්) මුදු තියුණු දෙශනාව ද දෙසන සේකි. එහි බුදුහු උග්ඝටිතඤ්ඤු පුද්ගලහට සැකෙවින් (උද්දෙසමාත්‍රයෙන්) දහම් දෙසනසේක, විපඤ්චිතඤ්ඤු පුද්ගලහට සංක්ෂෙපවිස්තරයෙන් (උද්දෙස නිද්දෙස විසින්) ද, නෙය්‍ය පුද්ගලහට විස්තරයෙන්ද (උද්දෙස නිද්දෙස පටිනිද්දෙස වශයෙන්) දහම් දෙසනසේකි. එහි බුදුහු උද්ඝටිතඥ පුද්ගලහට නිස්සරණය දක්වනසේක, විපඤ්චිතඥ පුද්ගලහට ආදීනවය ද නිස්සරණය ද දෙසනසේක, නෙය්‍යපුද්ගලහට අස්සාදය ද ආදීනව ද නිස්සරණය ද දෙසනසේකි. එහි බුදුහු උග්ඝටිතඤ්ඤු පුද්ගලහට අධිප්‍රඥශික්ෂාව පනවනසේක, විපඤ්චිතඤ්ඤු පුද්ගලහට අධිචිත්තශික්ෂාව ද, නෙය්‍ය පුද්ගලහට අධිශීලශික්ෂාව ද පනවනසේකි.

ඒ පුද්ගලයන් කෙරෙහි යම් කෙනෙක් දුක්ඛපටිපද ඇති දන්ධාභිඥයෙන් හා ක්ෂිප්‍රාභිඥයෙන් නියර්‍යාණය කෙරෙත් ද, මොහු පුද්ගලයෝ දෙදෙනෙකි, යම් කෙනෙක් සුඛපටිපද ඇති දන්ධාභිඥයෙන් හා ක්ෂිප්‍රාභිඥයෙන් හා නියර්‍යාණය කෙරෙත් ද, මොහු පුද්ගලයෝ දෙනෙක් වෙත්. මෙසේ උක්තප්‍රකාරයෙන් පුද්ගලයන් සතරදෙනකු වැ. උග්ඝටිතඤ්ඤු විපඤ්චිතඤ්ඤු නෙය්‍ය යි පුද්ගලයෝ තිදෙනෙක් වෙත්.

ඒ තුන්වැදෑරුම් පුද්ගලයනට මෙ සංකිලෙස යැ: අකුශලමූල තුනකි: ලොභ අකුශලමූල යැ ද්වෙෂ අකුශලමූල යැ මොහ අකුශලමූල යි. දුශ්චරිත තුනෙකි: කාය දුශ්චරිත යැ වාග්දුශ්චරිත යැ මනොදුශ්චරිත යි. අකුශලවිතර්කයෝ තිදෙනෙකි: කාමවිතර්ක යැ ව්‍යාපාදවිතර්ක යැ විහිංසාවිතර්ක යි. අකුශලසංඥ තුනෙකි: කාමසංඥ යැ ව්‍යාපාදසංඥ යැ විහිංසාසංඥ යි. විපරීතසංඥ තුනෙකි: නිත්‍යසංඥ යැ සුඛසංඥ යැ ආත්මසංඥ යි. වෙදනා තුනෙකි: සුඛවෙදනා යැ දුක්ඛවෙදනා යැ අදුක්ඛමසුඛවෙදනා යි. දුක්ඛතා තුනෙකි: දුක්ඛදුක්ඛතා යැ සංඛාරදුක්ඛතා යැ විපරිණාම දුක්ඛතා යි. ගිනි තුනෙකි: රාගාග්නියැ ද්වෙෂාග්නි යැ මොහාග්නි යි. ශල්‍යයෝ තිදෙනෙකි: රාගශල්‍ය යැ ද්වෙෂශල්‍ය යැ මොහශල්‍ය යි. ජටා තුනෙකි: රාගජටා යැ ද්වෙෂජටා යැ මොහජටා යි. අකුශලොපපරීක්ෂා තුනෙකි: අකුශල කායකර්ම යැ අකුශල වාක්කර්ම යැ අකුශල මනඃකර්ම යි. විපත්ති තුනෙකි: ශීලවිපත්ති යැ දෘෂ්ටි විපත්ති යැ ආචාරවිපත්ති යැ යන මෙ සතිස් ධර්මයෝ සංකිලෙස යි.

ඒ තුන් පුද්ගලයනට මෙ වොදන යැ: කුශලමූල තුනෙකි: අලොභකුසලමූල යැ අදෙසකුසලමූල යැ අමොහකුසලමූල යි. සුචරිත තුනෙකි: කායසුචරිත යැ වචී සුචරිත යැ මනොසුචරිත යි. කුශලවිතර්කයෝ තිදෙනෙකි: නෛෂ්ක්‍රම්‍යවිතර්ක යැ අව්‍යාපාදවිතර්ක යැ අවිහිංසාවිතර්ක යි. සමාධීහු තිදෙනෙකි: සවිතර්කසවිචාර සමාධි යැ අවිතර්කවිචාරමාත්‍ර සමාධි යැ අවිතර්කඅවිචාර සමාධි යි. කුශලසංඥ තුනෙකි: නෛෂ්ක්‍රම්‍යසංඥ යැ අව්‍යාපාදසංඥ යැ අවිහිංසාසංඥ යි. අවිපරීතසංඥ තුනෙකි: අනිත්‍යසංඥ යැ දුඃඛසංඥ යැ අනාත්මසංඥ යි. කුශලොපපරීක්ෂා තුනෙකි: කුශල කායකර්ම යැ කුශල වාක්කර්ම යැ කුශල මනඃකර්ම යි. සුචිභාව තුනෙකි: කායසොචෙය්‍ය යැ වචීසොචෙය්‍ය යැ මනොසොචෙය්‍ය යි. සම්පත් තුනෙකි: ශීල සම්පත්ති යැ සමාධිසම්පත්ති යැ ප්‍රඥසම්පත්ති යි. ශික්ෂා තුනෙකි: අධිශීලශික්ෂා යැ අධිචිත්තශික්ෂා යැ අධිප්‍රඥශික්ෂා යි. ස්කන්ධ තුනෙකි: ශීලස්කන්ධ යැ සමාධි ස්කන්ධ යැ ප්‍රඥස්කන්ධ යි. විමොක්ෂමුඛ තුනෙකි: ශූන්‍යත යැ අනිමිත්ත යැ අප්‍රණිහිත යැ යන මෙ සතිස් ධර්මයෝ වොදාන යි.

ඉති ඛො චත්තාරි හුත්වා තීණි භවන්ති, තීණි හුත්වා ද්වෙ භවන්ති: තණ්හාචරිතො ච දිට්ඨිචරිතො ච, තෙසං ද්වින්නං පුග්ගලානං අයං සංකිලෙසො: තණ්හා ච අවිජ්ජා ච අහිරිකඤ්ච අනොත්තප්පඤ්ච, අසති ච අසම්පජඤ්ඤං ච, අයොනිසොමනසිකාරො ච කොසජ්ජඤ්ච දොවචස්සඤ්ච අහඞ්කාරො ච මමංකාරො ච අස්සද්ධා ච පමාදො ච අසද්ධම්මසවණඤ්ච අසංවරො ච අභිජ්ඣා ච ව්‍යාපාදො ච නීවරණඤ්ච සංයොජනඤ්ච කොධො ච උපනාහො ච මක්ඛො ච පලාසො ච ඉස්සා ච මච්ඡෙරඤ්ච මායා ච සාඨෙය්‍යඤ්ච සස්සතදිට්ඨි ච උච්ඡෙදදිට්ඨි චාති.

තෙසං ද්වින්නං පුග්ගලානං ඉදං වොදානං: සමථො ච විපස්සනා ච හිරී ච ඔත්තප්පඤ්ච සති ච සම්පජඤ්ඤඤ්ච යොනිසොමනසිකාරො ච විරියාරම්භො ච සොවචස්සඤ්ච ධම්මෙඤාණං ච අන්වයෙඤාණඤ්ච ඛයෙඤාණඤ්ච අනුප්පාදෙඤාණඤ්ච සද්ධා ච අප්පමාදො ච සද්ධම්මසවණඤ්ච සංවරො ච අනභිජ්ඣා ච අබ්‍යාපාදො ච රාගවිරාගා ච චෙතොවිමුත්ති අවිජ්ජාවිරාගා ච පඤ්ඤාවිමුත්ති අභිසමයො ච අප්පිච්ඡතා ච සන්තුට්ඨි ච අක්කොධො ච අනුපනාහො ච අමක්ඛො ච අපලාසො ච ඉස්සාපහානඤ්ච මච්ඡරියපහානඤ්ච විජ්ජා ච විමුත්ති ච සඞ්ඛතාරම්මණො ච විමොක්ඛො අසඞ්ඛතාරම්මණො ච විමොක්ඛො සඋපාදිසෙසා ච නිබ්බානධාතු අනුපාදිසෙසා ච නිබ්බානධාතූති. අයං වුච්චති තිපුක්ඛලස්ස ච නයස්ස අංකුසස්ස ච නයස්ස භූමීති. තෙනාහ: "යො අකුසලෙ සමූලෙහි නෙතී"ති, "ඔලොකයිත්වා දිසලොචනෙනා"ති ච.

තිපුක්ඛලං නයසමුට්ඨානං.

## 3, 4.

## සාසනපට්ඨානං

තත්ථ අට්ඨාරස මූලපදා කුහිං දට්ඨබ්බා: සාසනපට්ඨානෙ. තත්ථ කතමං සාසනපට්ඨානං: සංකිලෙසභාගියං සුත්තං, වාසනාභාගියං සුත්තං, නිබ්බෙධභාගියං සුත්තං, අසෙඛභාගියං සුත්තං, සංකිලෙසභාගියඤ්ච වාසනාභාගියඤ්ච සුත්තං, සංකිලෙසභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච සුත්තං, සංකිලෙසභාගියඤ්ච අසෙඛභාගියඤ්ච සුත්තං, සංකිලෙසභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච අසෙඛභාගියඤ්ච සුත්තං, සංකිලෙසභාගියඤ්ච වාසනාභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච සුත්තං, වාසනාභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච සුත්තං, තණ්හාසංකිලෙසභාගියං සුත්තං, දිට්ඨිසංකිලෙසභාගියං සුත්තං, දුච්චරිතසංකිලෙසභාගියං සුත්තං, තණ්හාවොදානභාගියං සුත්තං, දිට්ඨිවොදානභාගියං සුත්තං, දුච්චරිතවොදානභාගියං සුත්තං.

තත්ථ සංකිලෙසො තිවිධො: තණ්හාසංකිලෙසො, දිට්ඨිසංකිලෙසො, දුච්චරිතසංකිලෙසො. තත්ථ තණ්හාසංකිලෙසො සමථෙන විසුජ්ඣති. සො සමථො සමාධික්ඛන්ධො. දිට්ඨිසංකිලෙසො විපස්සනාය විසුජ්ඣති. සා විපස්සනා පඤ්ඤාක්ඛන්ධො. දුච්චරිතසංකිලෙසො සුචරිතෙන විසුජ්ඣති. තං සුචරිතං සීලක්ඛන්ධො, තස්ස සීලෙ පතිට්ඨිතස්ස යදි ආසත්ති උප්පජ්ජති භවෙසු, එවං සා'යං සමථවිපස්සනා භාවනාමයං පුඤ්ඤකිරියවත්ථු භවති. තත්‍රූපපත්තියා[1] සංවත්තති.

1. තත්‍රූපපත්තියා - මජසං.

මේ උක්තප්‍රකාරයෙන් පුද්ගලයන් සතරදෙනකු වී තිදෙනෙක් වෙති. තිදෙනකු වී දෙනෙක් වෙති : තෘෂ්ණාචරිත ඇත්තේ ද දෘෂ්ටිචරිත ඇත්තේ දැයි කියා යි. ඒ දෙවැදැරුම් පුද්ගලයනට මේ සංකිලෙස වෙයි : තෘෂ්ණා යැ අවිද්‍යා යැ අහිරික යැ අනොත්තප්ප යැ අසති යැ අසම්පජඤ්ඤ යැ අයොනිසොමනසිකාර යැ කුසීදබව යැ දුර්වචබව යැ අහංකාර යැ මමංකාර යැ අශ්‍රද්ධා යැ ප්‍රමාද යැ අසද්ධර්මශ්‍රවණ ය අසංවර යැ අභිධ්‍යා යැ ව්‍යාපාද යැ නීවරණ යැ සංයොජන යැ ක්‍රොධ යැ උපනාහ යැ මක්ඛයැ පලාස යැ ඊර්ෂ්‍යා යැ මාත්සර්‍ය්‍ය යැ මායා යැ සාඨෙය්‍ය යැ ශාශ්වතදෘෂ්ටි යැ උච්ඡෙදදෘෂ්ටි යැ ද යන මේ සංකිලෙස යි.

ඒ තණ්හාචරිත දිට්ඨිචරිත පුද්ගලයන් දෙදෙනාට මේ වොදාන වෙයි : සමථ යැ, විදර්ශනා යැ හිරි යැ ඔත්තප්ප යැ සති යැ සම්පජඤ්ඤ යැ යොනිසොමනසිකාර යැ වීර්‍ය්‍යාරම්භ යැ සුවචබව යැ ධර්මයෙහි ඥාන යැ අන්වයෙහි ඥාන යැ ක්ෂයඥාන යැ අනුත්පාදයෙහි ඥාන යැ ශ්‍රද්ධා යැ අප්‍රමාද යැ සද්ධර්මශ්‍රවණ යැ සංවර යැ අනභිධ්‍යා යැ අව්‍යාපාද යැ රාගවිරාගචෙතොවිමුත්ති යැ අවිජ්ජාවිරාගපඤ්ඤාවිමුත්ති යැ අභිසමය යැ අල්පෙච්ඡතා යැ සන්තුෂ්ටි යැ අක්‍රොධ යැ අනුපනාහ යැ නොමකු බව යැ අපලාස (යුගග්‍රාහ නැතිබව) යැ ඊර්ෂ්‍යාප්‍රහාණ යැ මාත්සර්‍ය්‍ය ප්‍රහාණ යැ විද්‍යා යැ විමුක්ති යැ සංඛතාරම්මණවිමොක්ෂ යැ අසංඛතාරම්මණවිමොක්ෂ යැ සඋපාදිසෙස නිර්වාණධාතු යැ අනුපාදිසෙසනිර්වාණධාතුව ද යන මේ වොදාන යි. මේ තිපුක්ඛල නයට ද අංකුස නයට ද භූමි යයි කියනු ලැබේ. යො අකුසලෙ සමූලෙහි නෙති යනාදිය ද '' ඔලොකයිත්වා දිසලොචනෙන '' යනාදිය ද එයින් වදළහ.

නයසමුට්ඨානය යොදන ලද්දේ යි

## 3, 4.

## ශාසනප්‍රස්ථානය

ඒ මූලපදවිභාගයෙහි අටළොස් මූලපදයෝ කොහි ලා දක්කයුත්තාහු යැ යත් : සාසනපට්ඨානයෙහි දක්කයුතු. එහි සාසනපට්ඨාන කවරෙ යැ : (1) සංකිලෙසභාගිය සූත්‍ර යැ, (2) වාසනාභාගිය සූත්‍ර යැ, (3) නිබ්බෙධභාගිය සූත්‍ර යැ, (4) අසෙඛභාගිය සූත්‍ර යැ, (5) සංකිලෙසභාගිය ද වාසනාභාගිය ද සූත්‍ර යැ, (6) සංකිලෙසභාගිය ද නිබ්බෙධ භාගිය ද සූත්‍ර යැ, (7) සංකිලෙසභාගිය ද අසෙඛභාගිය ද සූත්‍ර යැ, (8) සංකිලෙසභාගිය ද නිබ්බෙධභාගිය ද අසෙඛභාගිය ද සූත්‍ර යැ, (9) සංකිලෙසභාගිය ද වාසනාභාගිය ද නිබ්බෙධ භාගිය ද සූත්‍ර යැ, (10) වාසනාභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍ර යැ, (11) තණ්හාසංකිලෙස භාගිය සූත්‍ර යැ, (12) දිට්ඨිසංකිලෙසභාගිය සූත්‍ර යැ, (13) දුච්චරිතසංකිලෙසභාගිය සූත්‍ර යැ, (14) තණ්හාවොදානභාගිය සූත්‍ර යැ, (15) දිට්ඨිවොදානභාගිය සූත්‍ර යැ, (16) දුච්චරිත වොදානභාගිය සූත්‍ර යි.

එහි සංකිලෙසය ත්‍රිවිධ යැ : තණ්හාසංකිලෙස යැ දිට්ඨිසංකිලෙස යැ දුච්චරිත සංකිලෙස යි කියා යි. ඒ ත්‍රිවිධ සංකිලෙසයන් කෙරෙහි තණ්හාසංකිලෙසය සමථයෙන් විසුද්ධ වෙයි, ඒ සමථය සමාධිස්කන්ධ යි. දිට්ඨිසංකිලෙසය විදර්ශනායෙන් විසුද්ධ වෙයි, ඒ විදර්ශනාව ප්‍රඥාස්කන්ධ යි. දුශ්චරිතසංකිලෙසය සුචරිතයෙන් විසුද්ධ වෙයි, ඒ සුචරිතය ශීලස්කන්ධ යි. ශීලයෙහි පිහිටි ඔහුට ඉදින් භවයෙහි ආසක්ති (භව ප්‍රාර්ථනාව) උපදී නම්, මෙසේ ඒ පුද්ගලහට මේ ශමථ – විදර්ශනා (විපාකඵල උපදවන හෙයින්) භාවනාමය පුණ්‍යක්‍රියාවස්තු වෙයි. ඒ ඒ භවයෙහි උපත පිණිස පවතී.

ඉමානි චත්තාරි සුත්තානි සාධාරණානි කතානි අට්ඨ භවන්ති, තානියෙව අට්ඨ සුත්තානි සාධාරණානි කතානි සොළස භවන්ති, ඉමෙහි සොළසෙහි සුත්තෙහි භින්නෙහි නවවිධං සුත්තං භින්නං භවති. ගාථාය ගාථා අනුමිනිතබ්බා. වෙය්‍යාකරණෙන වෙය්‍යාකරණං අනුමිනිතබ්බං. සුත්තෙන සුත්තං අනුමිනිතබ්බං.

## 3, 4, 1

(1) තත්ථ කතමං සංකිලෙසභාගියං සුත්තං :

1. ''කාමන්ධා ජාලසඤ්ඡන්නා තණ්හාඡදනඡාදිතා,
පමත්තබන්ධනා බද්ධා මච්ඡාව කුමිනාමුඛෙ ;
ජරාමරණමන්වෙන්ති වච්ඡො ඛීරපකොව මාතර''න්ති

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

''චත්තාරිමානි භික්ඛවෙ අගතිගමනානි, කතමානි චත්තාරි : ඡන්දා අගතිං ගච්ඡති, දොසා අගතිං ගච්ඡති, භයා අගතිං ගච්ඡති, මොහා අගතිං ගච්ඡති, ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අගතිගමනානි. ඉදමවොච භගවා ඉදං වත්වාන සුගතො අථාපරං එතදවොච සත්ථා.

2. ඡන්දා දොසා භයා මොහා යො ධම්මං අතිවත්තති,
නිහීයති තස්ස යසො කාළපක්ඛෙව චන්දිමා''ති.

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

3. ''මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා,
මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොති වා ;
තතො නං දුක්ඛමන්වෙති චක්කංව වහතො පද''න්ති.

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

4. ''මිද්ධී යදා හොති මහග්ඝසො ච නිද්දායිතා සංපරිවත්තසායී,
මහාවරාහොව නිවාපපුට්ඨො පුනප්පුනං ගබ්භමුපෙති මන්දො''ති

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

5. 'අයසාව මලං සමුට්ඨිතං තදුට්ඨාය''[1] තමෙව ඛාදති,
එවං අතිධොනචාරිනං සානි[2] කම්මානි නයන්ති දුග්ගති''න්ති.

ඉදං සංකිලෙසභාගි ං සුත්තං.

---

1. තතුට්ඨාය – මජසං.
2. තානි – සිමු.

මේ 'සංකිලෙසභාගියා 'දි සතර සූත්‍රයෝ ('සංකිලෙසභාගියං ච වාසනාභාගියං ච ' යනාදීන්) මිශ්‍ර කරනලද්දහු සූත්‍ර අටක් වෙති. එ මැ සූත්‍ර අට (ත්‍රික වශයෙන්) මිශ්‍ර කරන ලද්දහු සොළොස් සූත්‍ර කෙනෙක් වෙත්. පට්ඨානනයින් විභාග කරනලද මේ සොළොස් වැදෑරුම් සූත්‍රයෙන් ' සුත්ත ගෙය්‍යාදි පර්‍ය්‍යාප්තිශාසන සංඛ්‍යාත නවවිධ සූත්‍රය සොළොස් පරිද්දෙකින් විභාග කරනලද්දේ වේ. (මේ සොළසවිධ පට්ඨානයෙන් අසංගෘහීත වූ පර්‍ය්‍යාප්තිශාසනප්‍රදේශයෙක් නැතැ ' යි සේයි.) ගාථායෙන් ගාථාව (මේ ගාථාව වැනි ගාථා සංකිලෙසභාගිය යැ යනාදීන්) අනුමාන කොට හෙවත් තර්කණ කොට දතයුතු යැ, වෙය්‍යාකරණයෙන් වෙය්‍යාකරණය අනුමිනිතව්‍ය යැ, සූත්‍රයෙන් සූත්‍රය අනුමිනිතව්‍ය යි.

## 3. 4. 1

(1) ඒ සොළොස් සූත්‍රයන් කෙරෙහි සංකිලෙසභාගිය සූත්‍රය කවරෙ යැ :

1. ක්ලේශකාමයෙන් අන්ධ වූ තෘෂ්ණාජාලයෙන් වෙළුණු තෘෂ්ණා සංඛ්‍යාත අන්ධකාරයෙන් වැසුණු කෙමිනමුවෙහි මසුන් මෙන් ප්‍රමාදය හේතු කොටගෙන කාමගුණ සංඛ්‍යාත බන්ධනයෙන් බැඳුණු සත්ත්වයෝ මවු දෙන කරා කිරි බොන වස්සකු මෙන් ජරාමරණයට පුනපුනා පැමිණෙති.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

" මහණෙනි, මේ අගතිගමනයෝ සතර දෙනෙකි, කවර සතරදෙනෙක යත් ඡන්දහෙතුයෙන් අගතියට යෙයි, (නො කටයුතු කෙරෙයි,) ද්වේෂයෙන් අගතියට යෙයි, භයින් (භයහෙතුයෙන්) අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි. මහණෙනි, මේ සතර අගතිගමනයෝ යි. බුදුහු මේ වදාළහ, සුගත වූ ශාස්තෘන් වහන්සේ මේ වදරා යළි තෙල ගාථාධර්මය වදාළසේක.

2. ඡන්දහේතුයෙනුදු ද්වේෂහේතුයෙනුදු භයහේතුයෙනුදු මෝහහේතුයෙනුදු යමෙක් දහම් ඉක්මැ යේ නම් ඔහුගේ කීර්ති - පරිවාරයශස් අවපස සඳු සෙයින් පිරිහේ යයි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

3. වෙදනාදි චෛතසිකධර්මයෝ සිත පෙරවුකොට ඇත්තාහ, සිත ශ්‍රේෂ්ඨ කොට ඇත්තාහ, සිතින් මැ නිපදවන ලද්දහ, ඉදින් ප්‍රදුෂ්‍ය වූ සිතින් යුක්තව (මුසාවාදදිය) බෙණේ නම් හෝ (ප්‍රාණවධාදිය) කෙරේ නම් හෝ ඒ හේතුයෙන් විය උසුලන ගොනුගේ පිය අනුව යන ගැල්සක මෙන් විපාකදුඃඛය ඒ පුද්ගලයා අනුව යෙයි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

4. යම් කලෙක පුරුෂ ථීනමිද්ධයෙන් මඩනාලදුයේ බොහෝ කොට බුදින්නේත් වේ ද, හුන් සිටි තැන නිදනසුලු වූයේ පෙරළිපෙරළි හෝනේ වේ ද, දමු කුඩු ඇ ශූකර නිවාපයෙන් පුස්නාලද මහත් ගම්හූරකු සෙයින් ඒ දුෂ්ප්‍රාඥ පුද්ගල පුනපුනා (පිළිසඳ විසින්) මවුකුසට පැමිණේ යයි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

5. යකඩින් මැ නැඟුණු මලය ඒ යකඩයෙන් මැ නැඟී යම් සේ ඒ යකඩය මැ කා වනසා ද එපරිද්දෙන් සිවුපසය (මේ සඳහා මෙතෙක් පමණැයි) ප්‍රත්‍යවෙක්ෂාප්‍රඥව ඉක්මැවූවහු (සිවුපසය නොපස්විකා වළඳන මහණහු) (සිය සතන්හි උපන් හෙයින්) ස්වකීය කර්මයෝ දුගතියට පමුණුවත් යයි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

6. "චොරො යථා සන්ධිමුඛෙ ගහීතො,
සකම්මුනා හඤ්ඤති බජ්ඣතෙ ච
එවං අයං පෙච්ච පජා පරත්ථ
සකම්මුනා හඤ්ඤතෙ බජ්ඣතෙ චා''ති,

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

7. "සුඛකාමානි භූතානි යො දණ්ඩෙන විහිංසති,
අත්තනො සුඛමෙසානො පෙච්ච සො න ලභතෙ සුඛ''න්ති

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

8. "ගුන්නං චෙ තරමානානං ජිම්හං ගච්ඡති පුඞ්ගවො;
සබ්බා තා ජිම්හං ගච්ඡන්ති නෙත්තෙ ජිම්හගතෙ සති.

9. "එවමෙවං මනුස්සෙසු යො හොති සෙට්ඨසම්මතො,
සො චෙ අධම්මං චරති පගෙව ඉතරා පජා;
සබ්බං රට්ඨං දුඛං සෙති රාජා චෙ හොති අධම්මිකො''ති

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

10 "සුකිච්ඡරූපා වතිමෙ මනුස්සා
කරොන්ති පාපං උපධීසු රත්තා,
ගච්ඡන්ති තෙ බහුජනසන්නිවාසං
නිරයං අවීචිං කටුකං භයානක''න්ති.

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

11. "ඵලං වෙ කදලිං හන්ති ඵලං වෙළුං ඵලං නළං,
සක්කාරො කාපුරිසං හන්ති ගබ්භො අස්සතරිං යථා''ති

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

12. "කොධමක්ඛගරු භික්ඛු ලාභසක්කාරකාරණා,
සුඛෙත්තෙ පූතිබීජංව සද්ධම්මස්මිං න රූහති''ති

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

"ඉධාහං භික්ඛවෙ එකච්චං පුග්ගලං පදුට්ඨචිත්තං, එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි, යථා ඛො අයං පුග්ගලො ඉරියති යඤ්ච පටිපදං පටිපන්නො යඤ්ච මග්ගං සමාරූළ්හො ඉමම්හි චායං සමයෙ කාලං කරෙය්‍ය යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ, තං කිස්ස හෙතු: චිත්තං හිස්ස භික්ඛවෙ පදුට්ඨං, චිත්තප්පදොසහෙතු ඛො පන භික්ඛවෙ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං ඉති වුච්චති.

6. ගෘහසන්ධිමුඛයෙහි (ගෙහිමියන් හෝ රාජපුරුෂයන් විසින්) ගන්නාලද සොරෙක් සිය සොරකම හේතුයෙන් යම් පරිදි කම්කටොලින් පෙළනුලැබේ ද, (සිරබැඳුම් ආදියෙන්) බඳනාක් ලැබේ ද, එසෙයින් මේ සත්ත්වප්‍රජාව මියැ පරලොවැ දී සිය පවකැමින් පෙළනු ලැබෙයි, බඳනාක් ලැබේ යයි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

7. සුව කැමැති වූ සත්ත්වයන් යමෙක් දඬුවමින් වෙහෙසා ද, තමහට සුව රිසියෙන හේ පරලොවැ දී සුව නොලබා යයි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

8. මහොසය තරණය කරන ගවයන් අතුරෙහි ඉදින් පුංගවයා (යූථපති වූ ප්‍රධාන වෘෂභ) කුටිලව යේ ද, පරිණායක ගවයා කුටිලව ගිය කල්හි එ හැම ගාවිහු කුටිලව යෙත්.

9. එපරිදි මැ මිනිසුන් කෙරෙහි යමෙක් ශ්‍රෙෂ්ඨ යයි සම්මත වේ ද, ඉදින් ඒ ශ්‍රෙෂ්ඨ පුරුෂ කායදුශ්චරිතාදි අධර්මයෙහි හැසිරේ ද, ඔහු අනුව යන ඉතිරි ප්‍රජාව කැල මැය, (කියනු කිමැ) ඉදින් රජ නොදැහැමි වේ නම් සියලු රටවැසි ජනයා දුකසේ වෙසේ යයි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

10. පඤ්චකාමගුණොපධීන්හි ඇලුණා වූ එහෙයින් මැ වෙසෙසින් දුකට පැමිණි ස්වභාව ඇති මේ මනුෂ්‍යයෝ ඒකාන්තයෙන් පවකම් කෙරෙති, පාපකාරී ඔවුහු (පව් කරන) බොහෝදෙනාට වාසස්ථාන වූ කටුක වූ බියදනවන අවීචි නිරයට යෙති.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

11. එලය ඒකාන්තයෙන් (පත්වැටී තුපදනා හෙයින්) කෙසෙල්ගස නසා ද, එලය (ඔසධිහු එලපාකාවසාන හෙයින්) මහහුණ නසා ද, එලය රණහුණ නසා ද, ගර්භය යම්සේ වෙළඹ නසා ද, එසෙයින් සත්කාරය අසත්පුරුෂයා නසා යයි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

12. ප්‍රත්‍යයලාභය හා සත්කාරය හේතුකොටගෙන ක්‍රොධය ගුණමකුබව ගරු කොට වෙසෙන මහණ මහා කෙතෙහි වපුළ කුණු වූ බිජුවටක් සෙයින් ශාසනසද්ධර්ම යෙහි ශීලාදි ගුණයෙන් නොවැඩේ යයි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

" මහණෙහි, මම මෙලොවැ ඇතැම් පුහුලකු ප්‍රදුෂ්ට වූ සිත් ඇතියනු මාගේ සිතින් ඔහුගේ සිත මෙසේ පිරිසිඳ දනිමි : (මේ පුද්ගල යම්සේ ඉරියව් පවත්වා ද යම් පිළිවෙතකට පිළිපන්නේ ද, යම් මඟකට පිවිසියේ ද) මේ පුද්ගල මෙ සමයෙහි කළුරිය කෙරේ නම්, (හිසින් හෝ කරින්) ගෙනඑනලද්දක් යම්සේ බහාතැබූයේ ද, එසෙයින් නිරයෙහි උපදනේ යැ. එ කවර හෙයින යත් : මහණෙනි ඔහුගේ සිත ප්‍රදුෂ්ට යැ එහෙයිනි. තවද මහණෙනි, මෙසේ මෙ ලොවැ ඇතැම් සත්ත්ව කෙනෙක් චිත්තප්‍රදෙෂහෙතුයෙන් කාබුන් මරණින් මතු අපාය දුර්ගති විනිපාත වූ නිරයට පැමිණෙත්. බුදුහු තෙල කරුණ වදළහ, එහි ලා තෙල මෙසේ කියනුලැබේ.

13. "පදුට්ඨචිත්තං ඤත්වාන එකච්චං ඉධ පුග්ගලං,
එතමත්ථං ව්‍යාකාසි බුද්ධො භික්ඛූන සන්තිකෙ.

14. "ඉම්හි චායං සමයෙ කාලං කයිරාථ පුග්ගලො,
නිරයම්හි උපපජ්ජෙය්‍ය චිත්තං හිස්ස පදූසිතං.
චිත්තප්පදොසහෙතු හි සත්තා ගච්ඡන්ති දුග්ගතිං,

15 යථාහතං නික්ඛිපෙය්‍ය එවමෙව තථාවිධො
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො'පපජ්ජතී''ති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුත'න්ති.

ඉදං සංකිලෙසභාගියං සුත්තං,

16. සචෙ භායථ දුක්ඛස්ස සචෙ වො දුක්ඛමප්පියං,
මා'කත්ථ පාපකං කම්මං ආවි වා යදි වා රහො.

17. සචෙ ච පාපකං කම්මං කරිස්සථ කරොථ වා,
න වො දුක්ඛා පමුත්‍යත්ථි උපෙච්චා'පි පලායත'න්ති.

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

18. "අධම්මෙන ධනං ලද්ධා මුසාවාදෙන චූභයං,
මමෙති බාලා මඤ්ඤන්ති තං කථන්නු භවිස්සති :

19. අන්තරායා සු භවිස්සන්ති සම්භත'ස්ස විනස්සති,
මතා සග්ගං න ගච්ඡන්ති නනු එත්තාවතා හතා''ති

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

20. "කථං ඛණති අත්තානං කථං මිත්තෙහි ජීරති,
කථං විවට්ටතෙ ධම්මා කථං සග්ගං න ගච්ඡති

21. ලොභා ඛණති අත්තානං ලුද්ධො මිත්තෙහි ජීරති,
ලොභා විවට්ටතෙ ධම්මා ලොභා සග්ගං න ගච්ඡතී''ති

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

22. "චරන්ති බාලා දුම්මෙධා අමිත්තෙනෙව අත්තනා,
කරොන්තා පාපකං කම්මං යං හොති කටුකප්ඵලං.

23. න තං කම්මං කතං සාධු යං කත්වා අනුතප්පති,
යස්ස අස්සුමුඛො රොදං විපාකං පටිසෙවතී''ති.

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

13. මෙලොවැ ප්‍රදුෂ්ට සිත්ඇති ඇතැම් පුහුලකු (සිතින් සිත) දැන බුදුහු මහණුන් හමුයෙහි තෙල කරුණ ප්‍රකාශ කළසේක.

14. ඉදින් මෙසමයෙහි මේ පුද්ගල කලුරිය කරන්නේ නම් නිරයට පැමිණෙන්නේ යැ, ඔහුගේ සිත ප්‍රදුෂ්ට හෙයිනි. චිත්තප්‍රදෝෂහේතුයෙන් සත්ත්වයෝ දුගතියට යෙත් මැයි.

15. ගෙන එනලද්දක් යමසේ බහාතබන්නේ ද, එපරිදි මැ එබඳු වූ ඒ දුෂ්ප්‍රාඥ පුද්ගල කය බිඳීමෙන් මතු නිරයට පැමිණේ යයි.

භාග්‍යවතුන් විසින් මේ අර්ථය ද වදාරන ලදැ ' යි මා විසින් අසනලදි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

16. ඉදින් දුකට බියවවු නම්, ඉදින් තොපට දුක අප්‍රිය නම්, හෙළියෙහි හෙවයි නොහොත් රහසි වැ වෙවයි පවකම් නහමක් කරවු.

17. ඉදින් පවකම් මතු කරන්නවු නම් දුන් කරවු නම් හෝ දුනැ දුනැ පලායන්නාවු ද තොපට දුකින් මිදීමෙක් නැති.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

18. අධර්මයෙනුදු මුසවා බිණීමෙනුදු (සවිඤාන – අවිඤාන) උභය ධනය ලැබ බාලයෝ මේ මාගේ ධනයැයි සිතති. කිසෙයින් ඒ ධනය ඔවුන් අයත් වේ ද ?

19. (අධර්මව්‍යවහාරාදීන් ලත් හෙයින්) රාජාන්තරායාදි උපද්‍රවයෝ වන්නාහ, ඔහු විසින් රැස්කරනලද්ද වැනැසෙයි, මළාහු සුගතියට නොයති, මෙතෙකින් (දිට්ඨධම්මික සම්පරායික හානියෙක්) නවුවාහු නො යි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

20. කිසෙයින් තමා ගුණඛණනයෙන් කණි ද, කිසෙයින් මිත්‍රභාවයෙන් පිරිහේ ද, කිසෙයින් ධර්මයෙන් වැටේ ද, කිසෙයින් ස්වර්ගයට නො යේ ද ?

21. ලොභහෙතුයෙන් තමා කණී, ලුබ්ධ වූයේ මිත්‍රභාවයෙන් පිරිහෙයි, ලොභ හෙතුයෙන් ධර්මයෙන් වැටෙයි, ලොභහෙතුයෙන් ස්වර්ගයට නොයේ යයි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

22. මෙලොවැ පරලොවැ අර්ථානර්ථ නොදත් බාලයෝ යම් කර්මයෙක් කටුක විපාක වේ ද, එබඳු පාපකර්මය කරමින් තමහට සතුරකු බඳු වූ ආත්මභාවයෙන් යුක්ත ව හැසිරෙත්.

23. යම් කර්මයක් කොට සිහිකළ කෙණෙහි තැවේ ද, යම් කර්මයක්හුගේ අනිෂ්ට විපාකය කඳුළුමුසු මුහුණින් යුතුව හඩමින් විඳී ද, එබඳු අකුසලකර්මය නො කරනලද්දේ මැනැවි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

24. "දුග්ඝරං දුතිතික්ඛං ච අව්‍යත්තෙන සාමඤ්ඤං,
බහූහි තත්ථ සම්බාධා යත්ථ බාලො විසීදති.

25. යො හි අත්ථං ච ධම්මං ච භාසමානෙ තථාගතෙ,
මනං පදොසයෙ බාලො මොඝං ඛො තස්ස ජීවිතං.

26. එතස්සා'හං අරහාමි
දුක්ඛස්ස ඉතො ච පාපියතරං භන්තෙ,
යො අප්පමෙය්‍යෙසු තථාගතෙසු
චිත්තං පදොසෙමි අවිතරාගො"ති.

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

27. "අප්පමෙය්‍යං පමිණන්තො කො'ධ විද්වා විකප්පයෙ,
අප්පමෙය්‍යං පමායන්තං නිවුතං මඤ්ඤෙ අකිස්සව"න්ති.

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

28. "පුරිසස්ස හි ජාතස්ස කුඨාරි ජායතෙ මුඛෙ,
යාය ඡින්දති අත්තානං බාලො දුබ්භාසිතං භණං.

29. "න හි සත්ථං සුනිසිතං විසං හලාහලං ඉව,
එවං විරද්ධං පාතෙති වාචා දුබ්භාසිතා යථා"ති

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

30 "යො නින්දියං පසංසති තං වා නින්දති යො පසංසියො,
විචිනාති මුඛෙන සො කලිං කලිනා තෙන සුඛං න වින්දති

31. අප්පමත්තො අයං කලි යො අක්ඛෙසු ධනපරාජයො.
සබ්බස්සා'පි සහා'පි අත්තනා අයමෙව මහන්තතරො කලි
යො සුගතෙසු මනං පදොසයෙ.

32. සතං සහස්සානං නිරබ්බුදානං,
ඡත්තිංසති පඤ්ච ච අබ්බුදානි,
යමරියගරහී නිරයං උපෙති,
වාචං මනඤ්ච පණිධාය පාපක"න්ති

ඉදං සංකිලෙසභාගියං සුත්තං

24. නොවියත් මඳ නුවණැත්තහු විසින් ශ්‍රමණභාවය (වත්පිළිවත් පිරිමාදි විසින් ආභිසමාචාරිකශීලය නො පිරියැහෙතුයෙන්) දුෂ්කර යැ, (සමාදානයෙහි පටන් නො කඩ කොට ආදිබ්‍රහ්මචරියක ශීලය මුදුන්පත්කළයුතු හෙයින්) නො සිතියැහැක්ක. (ශීලසංවරාදියට පරිබන්ධ වූ) යම් විෂභාගාරම්මණාදියෙක්හි බාල පුද්ගල වෙසෙසින් ගැලේ ද එහෙයින් ඒ ශ්‍රමණභාවයෙහි (දුන්නිවත්ථ-දුප්පාරුතමාතුගාමසම්මද්දදි) ... සම්බාධයෝ බොහෝ වෙත් මැ යි.

25. තථාගතයන් වහන්සේ අර්ථයත් ධර්මයත් වදරන කල්හි යම් බාලයෙක් සිත ප්‍රදුෂ්‍ය කෙරේ ද, ඔහුගේ ජීවිතය සිස් වූයේ මැ යි.

26. වහන්ස, අවීතරාග වූ යම්බඳු මම අප්‍රමෙය ගුණ ඇති තථාගතයන් කෙරෙහි සිත ප්‍රදුෂ්‍ය කෙරෙම් ද, ඒ මම තෙල ව්‍යසනයට ද මෙයිනුදු ලාමකතර දුකට ද සුදුසු වෙමි යි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

27. මේ ලොවැ අප්‍රමෙය ගුණඇති ක්ෂීණාස්‍රවයකු මෙතෙක් ශීල යැ සමාධි යැ යනාදීන්) ප්‍රමාණ කරන කවර ප්‍රාඥයෙක් විකල්පනය කරන්නේ ද (රහතෙක් මැ රහතකු ප්‍රමාණයෙන් විකල්පන කරන්නේ යැයි සේ යි)). අප්‍රමෙය ක්ෂීණාස්‍රවයකු ප්‍රමාණ කරන්නහු නුවණ නැති අවකුජ්ජප්‍රාඥයකු කොට සිතමි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

28. දුර්භාෂිත කියන බාල තෙමේ අවියක් වැනි යම් පරුෂවචනයෙකින් (කුසල මූලය සිඳිමෙන්) තමා සිඳපියා ද, උපන් පුරුෂයාගේ මුවෙහි එබඳු රළුබස් නමැති කුඨාරිය උපදනේ මැ ය.

29. යම්පරිදි ආර්‍යෝපවාද වශයෙන් කියන ලද දුර්භාෂිත වචනය අපරාධ කළ පාපී පුද්ගලයා මෙසේ නිරයෙහි හෙළා ද එබඳු හලාහල විෂයයක් සෙයින් සුනිශිත (මොනවට මුවහත් කරන ලද) ශස්ත්‍රයෙක් නැත් මැ යි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

30. යමෙක් නිගාකළයුත්තහු පසසසා ද, පැසැසියයුතු යමෙක් වේ නම් ඔහුට හෝ නිගාකෙරේ ද, හේ මුවින් අපරාධය (අකුසල්) රැස්කෙරෙයි, ඒ අපරාධය හේතු කොට ගෙන සුව නොලබා.

31. දූකෙළියෙහි ලා යම් ධනපරාජයක් ඇද්ද, මේ අපරාධය (පරාජය) අල්පමාත්‍ර යැ යමෙක් බුද්ධාදි සුගතයන් කෙරෙහි සිත ප්‍රදුෂ්‍ය කෙරේ ද, තමා ද සමග සර්වස්වය (තමාගේ සියලු ධනය) ද නසන මේ මැ අපරාධය මහත්තර (අතිශයින් මහත්) වේ.

32. ආර්‍යයනට ගරහනුයේ පාපක වූ වචනය ද සිත ද පිහිටුවා යම් (පදුම නම්) නිරයකට පැමිණේ ද, (එහි ආයුෂ්ප්‍රමාණය) නිරර්බුදගණනින් සිය දහසක් හා සතිසක් ද, අර්බුද පසක් ද වේ.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

33. "යො ලොභගුණෙ අනුයුත්තො
සො වචසා පරිභාසති අඤ්ඤෙ
අස්සද්ධො අකදරියො[1] අවදඤ්ඤූ
මච්ඡරි පෙසුනියං අනුයුත්තො

34. මුඛදුග්ග, විභූත, අනරිය
භූනහු පාපක දුක්කටකාරි
පුරිසන්තකලි අවජාතකපුත්ත
මා බහුභාණිධ නෙරයිකො'සි.

35. රජමාකිරසෙ අහිතාය
සන්තෙ ගරහසි කිබ්බිසකාරි
බහූනි දුච්චරිතානි චරිත්වා
ගච්ඡසි පපතං චිරරත්ත"න්ති.

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

## 3, 4, 2

(2) තත්ථ කතමං වාසනාභාගියං සුත්තං.

1. "මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා,
මනසා චෙ පසන්නෙන භාසති වා කරොති වා;
තතො නං සුඛමන්වෙති ඡායා'ව අනපායිනී"ති

ඉදං වාසනාභාගියං සුත්තං

මහානාමො සක්කො භගවන්තං එතදවොච: "ඉදං භන්තෙ කපිලවත්ථු ඉද්ධං චෙව ඵීතං ච බහුජනං[2] ආකිණ්ණමනුස්සං සම්බාධබ්‍යූහං. සො ඛො අහං භන්තෙ භගවන්තං පයිරුපාසිත්වා මනොභාවනීයෙ වා භික්ඛූ සායණ්හසමයං කපිලවත්ථුං පවිසන්තො භන්තෙන'පි හත්ථිනා සමාගච්ඡාමි, භන්තෙන'පි අස්සෙන සමාගච්ඡාමි, භන්තෙන'පි රථෙන සමාගච්ඡාමි, භන්තෙන'පි සකටෙන සමාගච්ඡාමි, භන්තෙන'පි පුරිසෙන සමාගච්ඡාමි. තස්ස මය්හං භන්තෙ තස්මිං සමයෙ මුස්සතෙ'ව භගවන්තං ආරබ්භ සති, මුස්සති ධම්මං ආරබ්භ සති, මුස්සති සඞ්ඝං ආරබ්භ සති. තස්ස මය්හං භන්තෙ එවං හොති: "ඉමම්හි චා'හං සමයෙ කාලං කරෙය්‍යං කා මය්හං ගති,[3] කො අභිසම්පරායො'ති.

1. අකරියො - සීමු.
2. බාහුජඤ්ඤං - මජසං.
3. මය්හංගති - මජසං.

33. යමෙක් ලොභගුණ (තෘෂ්ණා) යෙහි පුනපුනා යෙදුණේ ද, හේ සැදැහැ නැතියේ තදමසුරු වූයේ බුද්ධාදීන්ගේ පවා බස් නොදන්නේ පංච මාත්සය්‍ර්‍යයෙන් යුක්ත වූයේ පෙහෙසුන් ඩිණිමෙහි යෙදුණේ වචනයෙන් අන්‍යයනට පරිභව කෙරෙයි.

34. මුඛවිෂමය, (විෂම බස් ඇතිය) මුසවා ඇතිය, අනාය්‍ර්‍යය, වෘද්ධිනාශකය, ලාමකය, පාපකාරිය, පුරුෂාධමය, කාලකණ්නිය, (භාග්‍යවතුන් වහන්සේගේ) අවජාත පුත්‍රය, මෙහි (මේ අත්බැවෙහි දී) නහමක් බොහෝ කොට බණනු වෙහි නිරිසත් වෙහි.

35. පාපකාරිය, (තෝ) සන්හුන් කෙලෙස් ඇති රහත්නට නිගා කෙරෙහි, තමහට අවැඩ පිණිස තමා කෙරෙහි කෙලෙස්රජස් වගුරුවා බොහෝ දුශ්චරිත කොට බොහෝ කල් පැසියැයුතු පදුමනිරයට යෙහි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යි.

තෘෂ්ණා දෘෂ්ටි දුශ්චරිත වශයෙන් ත්‍රිවිධ සංක්ලේශයන්ගේ ස්වභාවභෙදයෙන් ද අවස්ථාභෙදයෙන් ද, අනෙකප්‍රභෙද ඇති බව දක්වන්නට නොයෙක් සූත්‍රපදයන්ගෙන් නිදසුන් ඇරැදක්වන ලද සංකිලෙසභාගිය සූත්‍ර යි.

## 3, 4, 2

(2) ඒ සොළොස් සූත්‍රයන් කෙරෙහි වාසනාභාගිය සූත්‍ර කවරෙ යැ :

1. වෙදනාදි ස්කන්ධත්‍රය සංඛ්‍යාත ධර්මයෝ චාතුර්භූමක චිත්තය පෙරදැරි කොට ඇත්තාහු යැ, සිත අධිපති කොට ඇත්තාහු යැ, සිතින් මැ නිපන්නාහු යැ, ඉදින් අනභිධ්‍යාදීන් ප්‍රසන්න වූ සිතින් යුක්තව කියා නම් හෝ කෙරේ නම් හෝ ඒ හෙතුයෙන් තමා නොහැර යන සෙවණැල්ලක් සෙයින් කායික චෛතසික විපාකසුඛය ඒ පුද්ගලයා කැටිව යේ යයි.

මේ වාසනාභාගිය සූත්‍ර යැ.

මහානාම ශාක්‍යරජ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකෙළේ යැ : " වහන්සැ, මේ කිඹුල්වත්පුරය වස්ත්‍රාභරණාදීන් සමෘද්ධ යැ, ආහාරපාන ධනධාන්‍යාදීන් විපුල යැ, බොහෝ ජනයා ඇත, මිනිසුන්ගෙන් නිරතුරු ද වෙයි, සම්බාධ වූ විථි ඇත්තේ යි. වහන්සැ, මම භාග්‍යවතුන් වහන්සේ හෝ මනවඩන භික්ෂූන් වහන්සේ හෝ ඇසිරි කොට සවස්චේලෙහි කිඹුල්වතට පිවිසෙනුයෙම් පෙ ා දමුණු ඇතකු හමුවට ද යෙමි, නො දමුණු අසකු ද හමුවට යෙමි, නො දමුණු රියකුදු හමුවට යෙමි, නො දමුණු ගැලකුදු හමුවට යෙමි, නො දමුණු පුරුෂයකුදු හමුවට යෙමි. වහන්සැ, එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ අරභයා මාගේ සතිය නැසේ මැ යැ, දහම් ඇරැබැ සිහි නැති වෙයි, සඟුන් ඇරැබ සිහි නැති වේ. වහන්සැ, මට මෙසේ සිතෙයි : මේ සමයෙහි මම කලුරිය කෙරෙම් නම් මාගේ උපත කෙසේ වන්නේ ද, අභිසම්පරාය (පරලොව) කවරේ ද " යි.

මා භායි මහානාම මා භායි මහානාම, අපාපකං තෙ මරණං භවිස්සති, අපාපිකා තෙ කාලකිරියා. චතූහි ඛො මහානාම ධම්මෙහි සමන්නාගතො අරියසාවකො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කතමෙහි චතූහි: ඉධ මහානාම අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: "ඉතිපි සො භගවා අරහං-පෙ-සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. ධම්මෙ-පෙ-සඞ්ඝෙ -පෙ-අරියකන්තෙහි සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි පෙ- සමාධිසංවත්තනිකෙහි. සෙය්‍යථාපි මහානාම රුක්ඛො පාචීනනින්නො පාචීනපොණො පාචීනපබ්භාරො, සො මූලෙහි ඡින්නො කතමෙන පපතෙය්‍යාති: යෙන භන්තෙ, නින්නො යෙන පොණො යෙන පබ්භාරො'ති. එවමෙව ඛො මහානාම ඉමෙහි චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. මා භායි මහානාම මා භායි මහානාම, අපාපකං තෙ මරණං භවිස්සති අපාපිකා තෙ කාලකිරියා''ති.

ඉදං වාසනාභාගියං සුත්තං.

2. සුඛකාමානි භූතානි යො දණ්ඩෙන න හිංසති,
අත්තනො සුඛමෙසානො පෙච්ච සො ලභතෙ සුඛ''න්ති

ඉදං වාසනාභාගියං සුත්තං.

3. "ගුන්නං චෙ තරමානානං උජුං ගච්ඡති පුඞ්ගවො,
සබ්බා ගාවී උජුං යන්ති නෙත්තෙ උජුගතෙ සති

4. එවමෙව මනුස්සෙසු යො හොති සෙට්ඨසම්මතො,
සො චෙව ධම්මං චරති පගෙව ඉතරා පජා,
සබ්බං රට්ඨං සුඛං සෙති රාජා චෙ හොති ධම්මිකො''ති.

ඉදං වාසනාභාගියං සුත්තං

"භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති: නිට්ඨිතචීවරො, භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී'ති. තෙන ඛො පන සමයෙන ඉසිදත්තපුරාණා ථපතයො[1] සාකෙතෙ[2] පටිවසන්ති කෙනචිදෙව කරණීයෙන. අස්සොසුං ඛො ඉසිදත්තපුරාණා ථපතයො සම්බහුලා කිර භික්ඛූ භගවතො චීවරකම්මං කරොන්ති නිට්ඨිතචීවරො භගවා තෙමාසච්චයෙන චාරිකං පක්කමිස්සතී'ති.

අථ ඛො ඉසිදත්තපුරාණා ථපතයො මග්ගෙ පුරිසං ඨපෙසුං; යදා ත්වං අම්භො පුරිස පස්සෙය්‍යාසි භගවන්තං ආගච්ඡන්තං අරහන්තං සම්මාසම්බුද්ධං. අථ අම්හාකං ආරොචෙය්‍යාසී'ති. ද්විහතීහං ඨිතො ඛො සො පුරිසො අද්දස භගවන්තං දූරතො'ව ආගච්ඡන්තං, දිස්වාන යෙන ඉසිදත්තපුරාණා ථපතයො තෙනුපසඞ්කමි, උපසංකමිත්වා ඉසිදත්ත පුරාණෙ ථපතයො එතදවොච: අයං සො භන්තෙ භගවා ආගච්ඡති අරහං සම්මාසම්බුද්ධො, යස්සදානි කාලං මඤ්ඤථා'ති.

1. ගහපතයො - සං. අ.
2. සාධුකෙ - සං. නි.

" මහානාම, නහමක් බියපත්ව, මහානාම, නහමක් බියපත් වෙව, තොපගේ මරණය අලාමක වන්නේය, තොපගේ කාලක්‍රියාව නොලමු වන්නීය. මහානාමය කරුණු සතරෙකින් සමන්වාගත ආර්‍ය්‍යශ්‍රාවක නිවනට නැමුණේ නිර්වාණප්‍රවණ වූයේ නිවනට නතුවූයේ යැ, කවර සතරෙකින යත් : මහානාමය, මෙ සස්නෙහි ආර්‍ය්‍යශ්‍රාවක බුදුන් කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් සමන්වාගත වෙයි : ' ඒ භාග්‍යවත් බුදුහු මෙ කරුණෙනුදු අර්හත් වූහ . . . දෙව්මිනිසුනට ශාස්තෘයහ, හගවත් වූහ ' යි. ධර්මයෙහි . . . සඞ්ඝයා කෙරෙහි . . . අඛණ්ඩ වූ . . . සමාධිය පිණිස පවත්නා ආර්‍ය්‍යකාන්ත ශීලයෙන් සමන්වාගත වෙයි. යම් පරිදි මහානාමය ප්‍රාචීනනිම්න වූ ප්‍රාචීනප්‍රවණ වූ ප්‍රාචීනප්‍රාග්භාර වූ රුකෙක් වේ ද, එ රුක මුලින් සිඳුනාලදුයේ කවර දෙසෙකින් බිමැ හෙන්නේ ද ? යම් දෙසෙකැ නැමුණේ යම් දෙසෙකැ ඇලවූයේ යම් දෙසෙකැ බරවූයේ නම් එදෙසෙහි යැ. එපරිදි මැ මහානාමය මේ සතර දහමින් සමන්වාගත ආර්‍ය්‍යශ්‍රාවක නිර්වාණනිම්න නිර්වාණප්‍රවණ නිර්වාණප්‍රාග්භාර වේ. නහමක් බියපත් වවූ මහානාමයෙනි, නහමක් බියපත් වවූ මහානාමයෙනි, තොපගේ මරණය අලාමක වන්නේයැ, තොපගේ කාලක්‍රියාව අලාමක වන්නීයැ " යි.

මේ වාසනාභාගිය සූත්‍ර යැ.

2. සුව කැමැති සත්නට යමෙක් දඬින් හිංසා නො කෙරේ ද, තමහට සුව රිසියෙන හේ පරලොව ගොස් සුව ලබා යයි.

මේ වාසනාභාගිය සූත්‍ර යැ.

3. මහවතුරු තරණය කරන ගවයන් කෙරෙහි ඉදින් යූථපති පුංගව ඍජුව යේ නම් පරිණායකයා ඍජුව ගිය කල්හි සියලු ගාවිහු ඍජුව යෙත්.

4. එසෙයින් මැ මිනිසුන් කෙරෙහි අධිපති කොට සම්මත වූ යමෙක් වේ ද, ඉදින් මේ දහම්හි හැසිරේ නම්, ඉතිරි ප්‍රජාව කැල මැ ය. (කියනු කිමැ.) ඉදින් රජ දැහැමි වේ නම් සියලු රටවැසියා සුවසේ වෙසේ යයි.

මේ වාසනාභාගිය සූත්‍ර යැ.

" භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඩුසිටුහුගේ දෙව්රම් වෙහෙර වැඩවසත සේක. එසමයෙහි බොහෝ වහන්දැ ' සිවුරු කොට නිමැවූ බුදුහු තුන්මසක් ඇවෑමෙන් චාරිකාවට පිවිසෙන සේකැ ' යි භාග්‍යවතුන් වහන්සේට සිවුරු කෙරෙති. තවද එසමයෙහි ඉසිදත්ත යැ පුරාණ යැ යන ථපතීහු (වඩුදෙටුවෝ දෙදෙන) කිසි යම් කටයුත්තෙකින් සාකේතයෙහි වෙසෙති. ඉසිදත්ත පුරාණ ථපතීහු ' සිවුරු කොට නිමවාලූ බුදුහු තුන්මසක් ඇවෑමෙන් චාරිකාවට පිවිසෙන්නාහ ' යි බොහෝ වහන්දැ භාග්‍යවතුන් වහන්සේට සිවුරු කෙරෙත්ල ' යි ඇසූහ.

ඉක්බිති ඉසිදත්ත පුරාණ ථපතීහු මහ පුරුෂයකු රඳවූහ : ' එම්බා පුරුෂය, තෙපි යම් කලෙක හගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ වඩනාසේක් දක්නාවූ නම්, එකල අපට දන්වාලව ' යි. දෙතුන් දවසක් සිටි ඒ පුරුෂ දුරදී මැ වඩනා භාග්‍යවතුන් වහන්සේ දැක ඉසිදත්ත පුරාණ ථපතීන් කරා එළැඹ ඔවුනට තෙල කී : ' හිමියෙනි, මෙ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ වඩනාසේක, දුන් බුදුන් දක්නට කල් දන්නාවූ ' යැයි.

අථ ඛො ඉසිදත්තපුරාණා ථපතයො යෙන භගවා තෙනුපසංකමිංසු උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධිංසු, අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම යෙන අඤ්ඤතරං රුක්ඛමූලං තෙනුපසංකමි, උපසංකමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. ඉසිදත්තපුරාණා'පි ඛො ථපතයො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො ඉසිදත්තපුරාණා ථපතයො භගවන්තං එතදවොචුං.

යදා මයං භන්තෙ භගවන්තං සුණොම සාවත්ථියා කොසලෙසු චාරිකං පක්කමිස්සතී'ති, හොති නො තස්මිං සමයෙ අනත්තමනතා හොති දොමනස්සං දූරෙ නො භගවා භවිස්සතීති, යදා පන මයං භන්තෙ භගවන්තං සුණොම සාවත්ථියා කොසලෙසු චාරිකං පක්කන්තොති, හොති නො තස්මිං සමයෙ අනත්තමනතා හොති දොමනස්සං දූරෙ නො භගවා'ති.

යදා මයං භන්තෙ භගවන්තං සුණොම කාසීසු මගධෙසු චාරිකං පක්කමිස්සතී'ති, හොති නො තස්මිං සමයෙ අනත්තමනතා හොති දොමනස්සං දූරෙ නො භගවා භවිස්සතී'ති. යදා පන මයං භන්තෙ භගවන්තං සුණොම කාසීසු මගධෙසු චාරිකං පක්කන්තොති, අනප්පකා නො තස්මිං සමයෙ අනත්තමනතා හොති අනප්පකං දොමනස්සං දූරෙ නො භගවාති.

යදා මයං භන්තෙ ගගවන්තං සුණොම මගධෙසු කාසීසු චාරිකං පක්කමිස්සතී'ති හොති නො තස්මිං සමයෙ අත්තමනතා හොති සොමනස්සං, ආසන්නෙ නො භගවා භවිස්සතීති. යදා පන මයං භන්තෙ භගවන්තං සුණොම මගධෙසු කාසීසු චාරිකං පක්කන්තොති, හොති නො තස්මිං සමයෙ අත්තමනතා හොති සොමනස්සං ආසන්නෙ නො භගවා'ති.

යදා මයං භන්තෙ භගවන්තං සුණොම කොසලෙසු සාවත්ථියං චාරිකං පක්කමිස්සතී'ති, හොති නො තස්මිං සමයෙ අත්තමනතා හොති සොමනස්සං ආසන්නෙ නො භගවා භවිස්සතී'ති. යදා පන මයං භන්තෙ භගවන්තං සුණොම සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙති, අනප්පකා නො තස්මිං සමයෙ අත්තමනතා හොති අනප්පකං සොමනස්සං ආසන්නෙ නො භගවා'ති.

තස්මාතිහ ථපතයො, සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො පබ්බජ්ජා, අලං ච පන වො ථපතයො අප්පමාදායා'ති, අත්ථි ඛො නො භන්තෙ එතම්හා සම්බාධා අඤ්ඤො සම්බාධො සම්බාධතරො චෙව සම්බාධසංඛාතතරො චා'ති, කතමො පන වො ථපතයො එතම්හා සම්බාධා අඤ්ඤො සම්බාධො සම්බාධතරො චෙව සම්බාධසංඛාතතරො චාති.

ඉක්බිති ඉසිදත්ත පුරාණ ථපතීහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ වැද භාග්‍යවතුන් වහන්සේ පිටුපසින් අනුගමන් කළහ. එසද බුදුහු මඟින් ඉවත්වැ එක්තරා රුක්මුලකට එළැඹ පැනැවූ අසුන්හි වැඩහුන්සේක. ඉසිදත්ත පුරාණ ථපතීහු ද භාග්‍යවතුන් වහන්සේ වැද එකත්පස්වැ හුන්හ. එකත්පස්වැ හුන් ඉසිදත්ත පුරාණ ථපතීහු භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැලකළහ :

වහන්ස, ඇපි යම් කලෙක ' භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවරින් නික්මැ කොසොල් දනව්වෙහි චාරිකාවට පිවිසෙන්නාහ ' යි අසමෝ ද එසමයෙහි අපට ' භාග්‍යවතුන් වහන්සේ අපට දුර වන්නාහ ' යි නොසතුටුබව වෙයි, දොම්නස වෙයි. යළි වහන්ස, යම් කලෙක ඇපි ' භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවරින් නික්මැ කොසලයෙහි චාරිකාවට පිවිසියාහ ' යි අසමෝ ද අපට එකල ' භාග්‍යවතුන් වහන්සේ අපට දුර වූහ ' යි නොසතුට ද දොම්නස ද වේ.

වහන්ස, ඇපි යම් කලෙක ' භාග්‍යවතුන් වහන්සේ කසීරටින් නික්මැ මගධ ජනපදයෙහි චාරිකාවට වඩනාහ ' යි අසමෝ ද, එසමයෙහි ' භාග්‍යවතුන් වහන්සේ අපට දුර වන්නාහ ' යි අපගේ නොසතුට වෙයි, දොම්නස වෙයි. වහන්ස, යළි යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ ' කසීරටින් නික්මැ මගධජනපදයෙහි චාරිකාවට වැඩියහ ' යි අසමෝ ද එසමයෙහි ' භාග්‍යවතුන් වහන්සේ අපට දුර වූසේකැ ' යි අපගේ අනල්ප වූ නොසතුට වෙයි, අනල්ප වූ දොම්නස වේ.

වහන්ස, ඇපි යම් කලෙක ' භාග්‍යවතුන් වහන්සේ මගධරටින් නික්මැ කසීරටැ චාරිකාවට වඩනාහ ' යි අසමෝ ද, එසමයෙහි ' භාග්‍යවතුන් වහන්සේ අපට ආසන්නයෙහි වන්නාහ ' යි අපගේ තුටුසිතැතිබව වෙයි, සොම්නස වෙයි. යළි වහන්ස ඇපි යම් කලෙක ' භාග්‍යවතුන් වහන්සේ මගධරටින් නික්මැ කසීරටැ චාරිකාවට පිවිසියාහ ' යි අසමෝ ද, එකල ' භාග්‍යවතුන් වහන්සේ අපගේ ආසන්නයෙහි වූහ ' යි අපගේ සතුට වෙයි, සොම්නස වේ.

වහන්ස, යම් කලෙක ඇපි ' භාග්‍යවතුන් වහන්සේ කොසොල්රටැ සැවැත්නුවර චාරිකාවට පිවිසෙන්නාහ ' යි අසමෝ ද, එකල ' භාග්‍යවතුන් වහන්සේ අපගේ ආසන්න යෙහි වන්නාහ ' යි අපට අත්තමනතා වෙයි, සොම්නස වෙයි, යළි වහන්ස, ඇපි යම් කලෙක ' භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනයෙහි අනේපිඩු මහසිටුහුගේ අරමෙහි වැඩවසනාසේකැ ' යි අසමෝද එසද ' භාග්‍යවතුන් වහන්සේ අපගේ ආසන්න යෙහි වැඩවසනසේකැ ' යි අපට අනල්ප වූ සතුටු සිත්ඇතිබව වෙයි, අනල්ප වූ සොම්නස වේ යයි සැලකළෝ.

එසේ හෙයින් ථපතියෙනි, මෙහිලා (මෙල කරුණ දතයුතු යැ:) ගෘහවාසය සම්බාධ යැ, කෙලෙස්රජස් උපදනා තැනි, පැවිද්ද අභ්‍යවකාශයෙකි. තොප විසින් අප්‍රමාදය වඩන්නට සුදුසු මැයි. වහන්ස, අපට මෙල සරාවාසසම්බාධයට වඩා සම්බාධතර වූ ද අතිශයින් සම්බාධ සංඛ්‍යාත වූ ද අන්‍ය සම්බාධයෙක් ඇතැ ' යි. ථපතියෙනි, තොපගේ මෙල සම්බාධයට වඩා සම්බාධතර වූ ද සම්බාධසඞ්ඛ්‍යාත තර වූ ද අන්‍ය සම්බාධය කවරේ ද ? යි.

ඉධ මයං භන්තෙ යදා රාජා පසෙනදිකොසලො උය්‍යානභූමිං ගන්තුකාමො[1] හොති යෙ තෙ රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස නාගා ඔපවය්හා, තෙ කප්පෙත්වා යා තා රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පජාපතියො පියා මනාපා තා[2] එකං පුරතො එකං පච්ඡතො නිසීදාපෙම. තාසං ඛො පන භන්තෙ භගිනීනං එවරූපො ගන්ධො හොති, සෙය්‍යථාපි නාම ගන්ධකරණ්ඩකස්ස තාවදෙව විවරියමානස්ස යථා තං රාජාරහෙන ගන්ධෙන විභූසිතානං. තාසං ඛො පන භන්තෙ භගිනීනං එවරූපො කායසම්ඵස්සො හොති, සෙය්‍යථාපි නාම තූලපිචුනො වා කප්පාසපිචුනො වා යථා තං රාජකඤ්ඤානං සුඛෙධිතානං, තස්මිං ඛො පන භන්තෙ සමයෙ නාගො'පි රක්ඛිතබ්බො හොති, තා'පි භගිනියො රක්ඛිතබ්බා හොන්ති. අත්තාපි රක්ඛිතබ්බො හොති. න ඛො පන මයං භන්තෙ අභිජානාම තාසු භගිනීසු පාපකං චිත්තං උප්පාදෙතා. අයං ඛො නො භන්තෙ එත්තකො සම්බාධො අයඤ්ච සම්බාධො සම්බාධතරෙ චෙව සම්බාධ-සඞ්ඛාතතරෙ චා'ති.

තස්මාතිහ ථපතයො, සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො පබ්බජ්ජා, අලං ච පන වො ථපතයො අප්පමාදාය. චතූහි ඛො ථපතයො, ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති. අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො, කතමෙහි චතූහි: ඉධ ථපතයො සුතවා අරියසාවකො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති. ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති, ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති මුත්තචාගො පයතපාණී වොස්සග්ගරතො යාචයොගො දානසංවිභාගරතො අප්පටිවිභත්තං සීලවන්තෙහි කල්‍යාණධම්මෙහි, ඉමෙහි ඛො ථපතයො චතූහි ධම්මෙහි සමන්නාගතො අරියසාවකො සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො. තුම්හෙ ඛො ථපතයො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතා: ඉති'පි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති-ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- යං ඛො පන කිඤ්චි කුලෙ දෙය්‍යධම්මං, සබ්බං තං අප්පටිවිභත්තං සීලවන්තෙහි කල්‍යාණධම්මෙහි, තං කිම්මඤ්ඤථ ථපතයො කතිවිධා තෙ කොසලෙසු මනුස්සා යෙ තුම්හාකං සමසමා යදිදං දානසංවිභාගෙහී'ති? ලාභා නො භන්තෙ සුලද්ධං නො භන්තෙ, යෙසං නො භගවා එවං ජානාතී''ති.

ඉදං වාසනාභාගියං සුත්තං.

5. ''එකපුප්ඵං චජිත්වාන සහස්සං කප්පකොටියො,[4]
දෙවෙ චෙව මනුස්සෙ ච සෙසෙන පරිනිබ්බුතො''

ඉදං වාසනාභාගියං සුත්තං.

6. ''අස්සත්ථෙ [?] හරිතො'භාසෙ සංවිරූළ්හම්හි පාදපෙ,
එකං බුද්ධගතං සඤ්ඤං අලභිස්සං[5] පතිස්සතො.

---

1. නිය්‍යාතුකාමො - මජසං.
2. තාසං - සිමු.
3. සහස්ස - සිමු.
4. අසීතිකප්පකොටියො - පු.
5. අලභිත්ථං - මජසං

වහන්ස, මෙහි ඇපි යම් කලෙක පසේනදි කොසොල්රජ උයන්බිමට යනු කැමැති වේ ද, පසේනදි කොසොල්රජුගේ රාජවාහනයොග්‍ය වූ යම් හස්තීහු වෙත් ද, ඔවුන් කල්පනය කොට (සරසා) පසේනදි කොසොල්රජුගේ ප්‍රිය මනාප වූ යම් දේවීහු වෙත් ද, ඔවුන් එකක පෙරටුයෙහි එකක පිටුපස හිඳුවම්හ. තවද වහන්ස, ඒ බිහුණන්ගේ එකෙණෙහි විවර කරනුලබන සුවඳකරඬුවක මෙන් ගන්ධය වෙයි, රාජාර්හ වූ ගන්ධයෙන් විභූෂිත වූවන්ගේ මෙනි. යළි වහන්ස, ඒ භගිනීන්ගේ ඉඹුල්පුළුනට හෝ කපුපුළුනට බඳුවූ කයපහස වෙයි, සුවසේ වැඩුණු රජදුන්ගේ මෙනි. තවද ස්වාමීනි, එසමයෙහි ඇතු ද රැක්කයුතු වෙයි, ඒ භගිනීහු ද රැක්කයුතු වෙති, තෙමේ ද රැක්කයුතු වේ. යළි වහන්ස, ඇපි ඒ බිුණන් කෙරෙහි පව්ටු සිතක් උපදවන්නමෝ නොදනුම්හ, වහන්ස, මේ වූ කලී අපට තෙල සම්බාධයට වඩා සම්බාධතර වූ ද සම්බාධසඞ්ඛ්‍යාතතර වූ ද අන්‍ය සම්බාධය වේ ' යයි.

ථපතියෙනි, (යම් හෙයෙකින් තෙල සම්බාධ ඇද්ද) එහෙයින් මෙහි ලා ගෘහවාසය සම්බාධ යැ රජස්පථ (කෙලෙස්රජස් උපදනා තැන්) යැ, ප්‍රව්‍රජ්‍යාව අභ්‍යවකාශ යැ, තොප විසින් අප්‍රමාදය මැ කරනු සඳහා සුදුසු වෙයි. (පැවිදි වූව තොපට ඒ සම්බාධය නැති සේයි.) ථපතියෙනි සතර ධර්මයෙකින් සමන්වාගත ආර්‍යශ්‍රාවක මාර්ගශ්‍රොතසට පැමිණියේ අවිනිපාතධර්ම (පෘථග්ජනභාව සංඛ්‍යාත විරූපයෙහි නො හෙන පියවි) ඇතියේ ධර්මනියාමයෙන් නියත වූයේ උපරිමාර්ග සංඛ්‍යාත සම්බොධිය පරායණ කොට ඇතියේ වෙයි. කවර සතරෙකින යත් : ථපතියෙනි, මෙ සස්නෙහි ශ්‍රැතවත් ආර්‍ය ශ්‍රාවක බුදුන් කෙරෙහි අවලප්‍රසාදයෙන් සමන්වාගත වෙයි : ඒ භගවත් බුදුහු මෙ කරුණෙනුදු . . . දෙව්මිනිසුනට ශාස්තෘ වූහ, භාග්‍යවත්හ ' යි. ධර්මයෙහි . . . සංඝයා කෙරෙහි . . . පහවගිය මසුරුමල ඇති සිතින් යුතු වැ මුක්තත්‍යාග වැ (දන් දෙනුවට) දෙව්අත් ඇති වැ ත්‍යාගයෙහි ඇලුණේ ඉල්ලීමට නිසි වැ දන සංවිභාගයෙහි ඇලුණේ ගෘහවාස කෙරෙයි. කලණදම් ඇති සිල්වතුන් හා දෙය ධර්මය මෙතෙක් දියයුතු යැ යි නොබෙදනා ලද යැ. ථපතියෙනි, මෙ සතර දහමින් සමන්වාගත වූ ආර්‍ය ශ්‍රාවක මාර්ගශ්‍රොතසට පැමිණියේ අවිනිපාතධර්ම ඇතියේ ධර්මනියාමයෙන් නියත වූයේ සම්බොධිය පරායණ කොට ඇතියේ වෙයි. ථපතියෙනි, තෙපි බුදුන් කෙරෙහි අවල ප්‍රසාදයෙන් සමන්වාගත වූවහු යැ : ඒ භාගවත් බුදුහු මෙකරුණෙනුදු . . . දෙව් මිනිසුනට ශාස්තෘ වූහ. භාග්‍යවත්හ 'යි. ධර්මයෙහි . . . සංඝයා කෙරෙහි . . .තවද කුලයෙහි යම්කිසි දෙයධර්මයෙක් ඇද්ද එ හැම කලණදහම් ඇති සිල්වතුන් හා මෙතෙක් දියයුතු යැයි) නො බෙදනා ලද වෙයි. ථපතියෙනි, එ කුමැයි හඟිවු ද, යම් කෙනෙක් දනසංවිභාගයෙන් තොප හා සමසම වෙත් ද, කොසොල්රට එබඳු මිනිස්සු කෙනෙක් වෙත් ද 'යි. භාග්‍යවතුන් වහන්සේ යම් අප පිළිබඳ කොට මෙසේ දන්නාසේක් ද, එය වහන්ස අපට ලාභයෙක, අපට සුලබ්ධයෙකැ 'යි.

මේ වාසනාභාගිය සූත්‍ර යැ.

5. එක (සමන්) මලක් පුද අත්බැව් දහසක් දෙව්ලොව ද මිනිස්ලොව ද සැරිසරා ශේෂකුශලයෙන් කෙලෙස්පිරිනිවනින් පිරිනිවියෙමි.

මේ වාසනාභාගිය සූත්‍ර යැ.

6. මොනොවට වැඩුණු නිල්වන් වූ ඇසතු රුක්මුල හුන් මම සිහිඇතිව එක මැ බුද්ධගත (බුද්ධානුස්මෘති) සංඥව ලැබීමි.

7. අජ්ජ තිංසං තතො කප්පා නාභිජානාමි දුග්ගතිං,
තිස්සො විජ්ජා සච්ඡිකතා තස්සා සද්ධාය වාහසා"ති*

ඉදං වාසනාභාගියං සුත්තං.

8. "පිණ්ඩාය කොසලං පුරං පාවිසි අග්ගපුග්ගලො,
අනුකම්පකො පුරෙභත්තං තණ්හානිග්ඝාතකො මුනි.

9. පුරිසස්ස වටංසකො හත්ථෙ සබ්බපුප්ඵෙහි[1] ලඞ්කතො,
සො අද්දසාසි සම්බුද්ධං භික්ඛුසඞ්ඝපුරක්ඛතං.

10 පවිසන්තං රාජමග්ගෙන දෙවමානුසපූජිතං,
හට්ඨො චිත්තං පසාදෙත්වා සම්බුද්ධමුපසඞ්කමි.

11. සො තං වටංසකං සුරභිං වණ්ණවන්තං මනොරමං,
සම්බුද්ධස්සූ'පනාමෙසි පසන්නො සෙහි පාණිභි.

12. තතො අග්ගිසිඛාවණ්ණා බුද්ධස්ස ලපනන්තරා,
සහස්සරංසී විජ්ජුරිව ඔක්කා නික්ඛමි ආනනා.

13. පදක්ඛිණං කරිත්වාන සීසෙ ආදිච්චබන්ධුනො,
තික්ඛත්තුං පරිවෙඨෙත්වා මුද්ධනන්තරධායථ.

14. ඉදං දිස්වාන අච්ඡරියං අබ්භුතං ලොමහංසනං,
එකංසං චීවරං කත්වා ආනන්දො එතදබ්‍රවි.

15. කො හෙතු සිතකම්මාය බ්‍යාකරෙහි මහාමුනෙ,
ධම්මාලොකො භවිස්සති කඞ්ඛා විතර නො මුනෙ.

16. යස්ස තං සබ්බධම්මෙසු සදා ඤාණං පවත්තති,
කඞ්ඛිං වෙමතිකං ථෙරං ආනන්දං එතදබ්‍රවි.

17. යො සො ආනන්ද පුරිසො මයි චිත්තං පසාදයි,
චතුරාසීති කප්පානි දුග්ගතිං න ගමිස්සති.

18. දෙවෙසු දෙවසොභග්ගං දිබ්බං රජ්ජං පසාසිය,
මනුජෙසු මනුජින්දො රාජා රට්ඨෙ භවිස්සති.

19. සො චරිමං පබ්බජිත්වාන සච්ඡිකත්වාන ධම්මතං,
පච්චෙකබුද්ධො ධුතරාගො වටංසකො නාම භවිස්සති.

20. නත්ථි චිත්තෙ පසන්නම්හි අප්පිකා නාම දක්ඛිණා,
තථාගතෙ වා සම්බුද්ධෙ අථ වා තස්ස සාවකෙ.

21. එවං අචින්තියා බුද්ධා බුද්ධධම්මා අචින්තියා,
අචින්තියෙසු පසන්නානං විපාකො හොති අචින්තියො"

ඉදං වාසනාභාගියං සුත්තං.

---

* ඵාතිංසෙ ඉතො කප්පෙ - යං සද්ධමලභිං තදා,
තස්සා සද්ධාය වාහසා - පත්තො මෙ ආසවක්ඛයො,
-සණ්ඨිත ථෙරාපදාන.

1. සබ්බං පුප්ඵෙහි - සී. මු.

7. ඒ කපින් දත් තිස්වැනි කල්පය වෙයි, (මෙ අතර) දුගතිය නොදනිමි, ඒ බුද්ධගත සංදෙවාසනාවෙන් ත්‍රිවිද්‍යා පසක් කරනලද්දු යි.

මේ වාසනාභාගිය සූත්‍ර යැ.

8. අග්‍රපුද්ගල වූ (සත්නට) අනුකම්පා කරන තණ්හාව සමුච්ඡේද කළ බුද්ධමුනිහු පෙරබත්හි පිඬුසිඟා කොසොල්පුරයට පිවිසියේක.

9. පුරුෂයෙක්හුගේ අතෙහි නොයෙක් මලින් සරසනලද මල්කඩෙක් විය. හේ භික්ෂුසඞ්ඝයා විසින් පෙරටුකරනලද සම්බුදුන් දිටි.

10. හටුවූ හේ සිත පහදවා දෙව්මිනිසුන් විසින් පුදනලද, මහමහිත් වඩනා සම්බුදුන් කරා එළැඹියේ යැ.

11. හේ සුවදැති පැහැපත්වූ ඒ මනරම මල්කඩ පහන්වූයේ සියතින් සම්බුදුන්ට පිදී.

12. ඉක්බිති බුදුරදුන්ගේ ගිනිසිළුපැහැ ඇති තොල්සඟළ අතුරින් වූ මුවින් දහස්රැස් ඇති විදුලියක් සෙයින් ප්‍රභාව නික්මිණි.

13. ඒ ප්‍රභාව ආදිත්‍යබන්ධුහුගේ ශීර්ෂය පැදකුණු කොට තුන්වරක් පරිවර්තිත වැ මූර්ධන සමීපයෙහි අතුරුදහන් වී.

14. ලොමුදහන අද්භූත වූ මෙ ආශ්චර්‍ය්‍යය දක අනඳතෙරණුවෝ සිවුර එකස් කොට (වැඳ) තෙල සැලකළෝ :

15. මහාමුනි වූ තථාගතයන් වහන්ස, සිනා පහළකිරීමට කාරණ කවර, වදළ මැනැවැ, දහම්එළි වනාතේ යැ, මුනීන්ද්‍රයන් වහන්ස අපගේ සැක දුරුකළ මැනැවි.

16. ආකාංක්‍ෂා පටිබද්ධ හෙයින් සියලු ධර්මවිෂයෙහි හැම කල්හි යම් කෙනෙකුන්ගේ ඥානය පවතී ද, ඒ බුදුහු සැකයෙන් උපන් විමති ඇති අනඳ තෙරණුවනට තෙල වදළසේක :

17. ආනන්දය, යම් ඒ පුරුෂයෙක් මා කෙරෙහි සිත පැහැදවී ද, හේ සුවාසූ කපක් දුගතියට නොයන්නේ යැ.

18. දෙව්ලොවැ දිව්‍යසම්පත්තීන් අග්‍ර වූ දිව්‍යරාජ්‍යය කොට මිනිස්ලොවැ සියලු රටෙහි මනුජේන්ද්‍ර වූ රජ වන්නේ යැ.

19. හේ චරිමජාතියෙහි පැවිදිවැ ධර්මස්වභාව (සිවුසස් දහම්) පසක් කොට නැසූ රාග ඇති වටංසක නම් පසේබුදු වන්නේ යැ.

20. තථාගත සම්බුද්ධයන් කෙරෙහි හෝ යළි ඒ තථාගතයන්ගේ ශ්‍රාවකයකු කෙරෙහි හෝ සිත පහන් කල්හි අල්ප වූ දක්ෂිණාවක් නම් නැති.

21. මෙසේ බුදුවරයෝ අචින්ත්‍යයහ, බුද්ධධර්මයෝ අචින්ත්‍යයහ, අචින්ත්‍ය වූ බුද්ධාදීන් කෙරෙහි පහන් වූවනට අචින්ත්‍ය වූ විපාක වෙ.

මේ වාසනාභාගිය සූත්‍ර යැ.

"ඉධ'හං[1] භික්ඛවෙ එකච්චං පුග්ගලං පසන්නචිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි: (යථා ඛො අයං පුග්ගලො ඉරියති යඤ්ච පටිපදං පටිපන්නො යඤ්ච මග්ගං සමාරූළ්හො,) ඉමම්හි චා'යං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය, යථා'භතං නික්ඛිත්තො එවං සග්ගෙ. තං කිස්ස හෙතු: චිත්තං හි'ස්ස භික්ඛවෙ පසන්නං.[2] චිත්තප්පසාදහෙතු ඛො පන එවමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යා'ති. එතමත්ථං භගවා අවොච. තත්ථෙතං වුච්චති:

22. "පසන්නචිත්තං ඤත්වාන එකච්චමිධ පුග්ගලං,
එතමත්ථං වියාකාසි බුද්ධො[3] භික්ඛූන සන්තිකෙ.

23. ඉමම්හි චා'යං සමයෙ කාලං කයිරාථ[4] පුග්ගලො,
සුගතිං උපපජ්ජෙය්‍ය චිත්තං හි'ස්ස පසාදිතං,
චෙතොපසාදහෙතු හි සත්තා ගච්ඡන්ති සුගතිං.

24 යථාභතං නික්ඛිපෙය්‍ය එවමෙවං[5] තථාවිධො,
කායස්ස භෙදා සප්පඤ්ඤො සග්ගං සො උපපජ්ජති.

අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතන්''ති

ඉදං වාසනාභාගියං සුත්තං.

25. "සුවණ්ණඡ්දනං[6] නාවං නාරි ආරුය්හ තිට්ඨසි,
ඔගාහසෙ[7] පොක්ඛරණිං පදුමං ඡින්දසි පාණිනා.

26. කෙන තෙ තාදිසො වණ්ණො අනුභාවො[8] ජුති ච තෙ,
උප්පජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසි'ච්ඡිතා,
පුච්ඡිතා දෙවතෙ සංස කිස්ස කම්මස්සිදං ඵලං.

27. සා දෙවතා අත්තමනා දෙවරාජෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි සක්කස්ස ඉති මෙ සුතං.

28. අද්ධානං පටිපන්නා'හං දිස්වා ථූපං මනොරමං,
තත්ථ චිත්තං පසාදෙසිං කස්සපස්ස යසස්සිනො.

29. පදුමපුප්ඵෙහි පූජෙසිං පසන්නා සෙහි පාණිහි,
තස්සෙව කම්මස්ස ඵලං විපාකො
එතාදිසං කතපුඤ්ඤා ලභන්ති''

ඉදං වාසනාභාගියං සුත්තං

---

1. ඉධාහං – සිමු, මජසං.
2. පසාදිතං – සිමු.
3. සත්ථා – සිමු.
4. කාලංකිරියා – සිමු.
5. එවමෙතං – සිමු.
6. සුවණ්ණච්ඡදනං – මජසං.
7. ඔගාහසි – මජසං.
8. ආනුභාවො – සිමු, මජසං.

'' මහණෙනි, මම මෙ ලොවැ පහන්සිත් ඇති ඇතැම් පුඟුලකු මෙසේ මාගේ සිතින් ඔහුගේ සිත පිරිසිඳ දැනගනිමි : (මේ පුද්ගල යම් පරිදි ඉරියවු පවත්වා ද, යම් පිළිවෙතකට පිළිපන්නේ ද, යම් මඟකට පිවිසියේ ද) මේ පුද්ගල මෙ සමයෙහි කළුරිය කරන්නේ නම්, (හිසින් හෝ කරින්) ගෙනඑනලද්දක් යම්සේ බහාතැබුයේ ද එපරිදි ස්වර්ගයෙහි උපදනේ යැ. ඊට හෙතු කවරෙ යැ : මහණෙනි, ඔහුගේ සිත ප්‍රසන්න හෙයිනි. චිත්ත ප්‍රසාදහෙතුයෙන් වැලිත් මෙසේ මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් කාබුන් මරණින් මතු සුගති වූ ස්වර්ගලොකයට පැමිණෙන්නේ යැ '' යි. බුදුහු තෙල කරුණ වදළසේක, එහි ලා තෙල (ගාථා) කියනු ලැබෙ :

22. මෙලොවැ ඇතැම් පුද්ගලයකු පහන්සිත් ඇතියහු දැන බුදුහු භික්ෂූන් හමුයෙහි තෙල කරුණ ප්‍රකාශ කළසේක :

23–24. මේ පුද්ගල මෙසමයෙහි කළුරිය කරන්නේ නම්, (පිළිසඳ විසින්) සුගතියට පැමිණෙන්නේ යැ, ඔහුගේ සිත ප්‍රසාදිත හෙයිනි. එසේ මැය, චිත්තප්‍රසාදහෙතුයෙන් සත්ත්වයෝ සුගතියට යෙති, ගෙනඑනලද්දක් යම්සේ බහාතබා ද එපරිදි මැ එබඳු වූ ඒ සප්‍රාඥ පුද්ගල කය බිඳීමෙන් ස්වර්ගයට පැමිණේ.

භාග්‍යවතුන් විසින් මේ අර්ථය ද වදරනලදැ ' යි මා විසින් අසනලද යයි.

මෙ වාසනාභාගිය සූත්‍ර යැ.

25. එම්බා ස්ත්‍රිය, තෝ රන්සෙවෙණි ඇති නැවට නැඟී සිටිව, පොකුණට බස්නාව, අතින් පියුම් තෙළනාව.

26. තිගේ කවර පිනෙකින් එබඳු පැහැසටහන ද අනුභාව (තෙජස) ද තිගේ බැබැළීම ද වේ නම් සිතින් කැමැතිවනලද යම් කිසි භෝගයෝ වෙත් නම් ඔහුදු උපදිත් දැ? යි අප විසින් පුළුවුස්නා ලද දෙවදුනි, කියව, මේ කිනම් කර්මයෙක විපාකයෙක් දැ යි,

27. දෙවිරජහු විසින් පුළුවුස්නාලද තුටුසිත් ඇති ඒ දෙවදු පැන පුළුවුස්නාලදු වැ සක්දෙවිඳුට මෙසේ පැවැසූ යයි මාවිසින් අසනලදි.

28. අදන්මඟට පිළිපන් මම යශස්වී වූ කසුප්බුදුන්ගේ මනරම් දගබ දැක එහි සිත පැහැදවිමි.

29. පහන්වූ මම සියතින් නෙළුම්මල් පිදිමි, එ මැ කර්මයාගේ මෙ ඵලවිපාක යි. කළ පින් ඇත්තාහු මෙබඳු සම්පත් ලබත්.

මෙ වාසනාභාගිය සූත්‍ර යැ.

දානකථා සීලකථා සග්ගකථා පුඤ්ඤකථා පුඤ්ඤවිපාකකථා

ඉදං වාසනාභාගියං සුත්තං.

30. අපිචාපි පංසුථූපෙසු උද්දිස්ස කතෙසු දසබලධරානං.
තත්ථපි කාරං කත්වා සග්ගෙසු නරා පමොදන්ති”

ඉදං වාසනාභාගියං සුත්තං.

31. “දෙවපුත්තසරීරවණ්ණා සබ්බෙ සුභගසණ්ඨිතා,
උදකෙන පංසුං තෙමෙත්වා ථූපං වඩ්ඪෙථ කස්සපං.

32. අයං සුගතෙන සුගතස්ස ථූපො
මහෙසිනො දසබලධම්මධාරිනො,
යම්හි ඉමෙ දෙවමනුජා පසන්නා
කාරං කරෙන්තා ජරමරණා පමුච්චරෙ”

ඉදං වාසනාභාගියං සුත්තං.

33. “උළාරං වත තං ආසි යාහං ථූපං මහෙසිනො,
උප්පලානි ච චත්තාරි මාලං ච අභිරොපයිං.

34. අජ්ජ තිංසං තතො කප්පා නාභිජානාමි දුග්ගතිං,
විනිපාතං න ගච්ඡාමි ථූපං පූජෙත්වා සත්ථුනො”

ඉදං වාසනාභාගියං සුත්තං.

35. “ද්වත්තිංසලක්ඛණධරස්ස
විජිතවිජයස්ස ලොකනාථස්ස,
සතසහස්සං කප්පෙ
මුදිතො ථූපං අපූජෙසි.

36. යං මයා පසුතං පුඤ්ඤං
තෙන ච පුඤ්ඤෙන දෙවසොභග්ගං,
රජ්ජානි ච කාරිතානි
අනාගන්තූන විනිපාතං.

37. යං චක්ඛුං අදන්තදමකස්ස සාසනෙ පණිහිතං තථා,
චිත්තං තං මෙ සබ්බං ලද්ධං විමුත්තචිත්තම්හි විධූතලතොති”

ඉදං වාසනාභාගියං සුත්තං.

38. “සාමාකපත්ථොදනමත්තමෙව හි
පච්චෙකබුද්ධම්හි අදාසි දක්ඛිණං,
විමුත්තචිත්තෙන අඛිලෙ අනාසවෙ
අරණවිහාරිම්හි අසංගමානසෙ.

දානකථා, සීලකථා, සග්ගකථා, පුඤ්ඤකථා, පුඤ්ඤවිපාකකථා වෙති.

මෙ වාසනාභාගිය සූත්‍ර යැ.

30. දශබලධර වූ බුදුවරයන් උදෙසා (සිරුරුද පිහිටුවා) කළ මැටිමුවා ස්තූපයන්හිදු පවා සත්කාර කොට මනුෂ්‍යයෝ දෙව්ලොවැ සතුටු වෙත්.

මෙ වාසනාභාගිය සූත්‍ර යැ.

31. දිව්‍යපුත්‍රයකුගෙ ශරීරයට බඳු වර්ණඇත්තිය ශෝභායෙන් යුත් සටහන් ඇත්තිය දියෙන් පස් තෙමා කසුප්බුදුන්ගෙ සැය වඩන්නේ යැ.

32. ශොභන ගාත්‍ර ඇත්තිය ප්‍රසන්න වූ මෙ දිව්‍යමනුෂ්‍යයෝ යම් ස්තූපයෙක්හි සත්කාර කරන්නාහු ජරාමරණයෙන් මිදෙත් ද, මහර්ෂි වූ දශබලධර්මධාරි වූ සුගතයන් වහන්සේගෙ මෙ ඒ ස්තූපය යි.

මෙ වාසනාභාගිය සූත්‍ර යැ.

33. මම මහර්ෂින්ගෙ යම් සැයකට උපුල්මල් සතරක් ද මල්දමක් ද නහා පිදීම් ද, මා විසින් කළ ඒ කුශලය එකාන්තයෙන් උදර විය.

34. එතැන් සිට දන් තිස්කපෙකි, ශාස්තෘන් වහන්සේගේ ධාතුචෛත්‍යය පුදූ දුගතිය නොදනිමි, විනිපාතයට නොගියෙමි.

මෙ වාසනාභාගිය සූත්‍ර යැ.

35. දෙතිස් මහාපුරුෂලක්ෂණ ධරන්නාවූ දිනතලද මාරසංග්‍රාම ඇති ලෝකනාථයන් වහන්සේගේ ස්තූපය පුද මම ආයුෂ්කල්ප සියදහසක් සතුටු වූයෙමි.

36. මා විසින් යම් පිනක් රැස්කරනලද ද, ඒ පිනින් අපායොත්පත්තියට නො පැමිණ දෙවියන් කෙරෙහි සුභගභාවය ලදමි, (මිනිස්ලොවැ) රාජ්‍යයෝ ද කරවනලද්දහ.

37. අදාන්තයන් දමනය කරන බුදුරදුන්ගෙ ශාසනයෙහි යම් නුවණැසක් තබනලද ද, එසේමැ සිත පිහිටුවනලද ද ඒ හේතුයෙන් මා විසින් සියලු සම්පත් ලබනලද, සමුච්ඡෙද කළ තෘෂ්ණාලතා ඇතියෙම කෙලෙසුන් කෙරෙන් මිදුණු සිත් ඇති වීමි.

මෙ වාසනාභාගිය සූත්‍ර යැ.

38. කෙලෙසුන් කෙරෙන් මිදුණු සිත්ඇති වෙනොවිල රහිත හෙයින් අඛිල වූ අනාස්‍රව වූ කෙලෙස් රණ නැතියෙන් අරණවිහාරී වූ නොඇලුණු සිත්ඇති පසේබුදුන් කෙරෙහි බොඩහමු නැළියක බත් පමණ වූ මැ දක්ෂිණාව දිනිමි.

39. තස්මිඤ්ච ඔකප්පයි ධම්මමුත්තමං
තස්මිඤ්ච ධම්මෙ පණිධෙසිං මානසං
එවං විහාරීහි මෙ සංගමො සියා
භවෙ කුදස්සු'පි ච මා අපෙක්ඛවා.

40. තස්සෙව කම්මස්ස විපාකතො අහං
සහස්සක්ඛත්තුං කුරූසූපපජ්ජථ,
දීඝායුකෙසු අමමෙසු පාණිසු
විසෙසගාමීසු අහීනගාමීසු.

41. තස්ස ච කම්මස්ස විපාකතො අහං
සහස්සක්ඛත්තුං තිදසො'පපජ්ජථ,
විචිත්‍ර මාලාභරණානුලෙපිසු
විසිට්ඨකායූ'පගතො යසස්සිසු.

42. තස්සෙව කම්මස්ස විපාකතො අහං
විමුත්තචිත්තො අඛිලො අනාසවො,
ඉමෙහි මෙ අන්තිම දෙහධාරිහි
සමාගමො ආසි හිතාහිතාසිහි.

43. පච්චක්ඛං ඛ්විමං අවච තථාගතො ජිනො
සමිජ්ඣතෙ සීලවතො යදිච්ඡති,
යථා යථා මෙ මනසා විචින්තිතං
තථා සමිද්ධං අයමන්තිමො භවො''

ඉදං වාසනාභාගියං සුත්තං.

44. ''එකතිංසම්හි කප්පම්හි ජිනො අනෙජො,
අනන්තදස්සී භගවා සිඛී'ති,
තස්සා'පි රාජා භාතා සිඛණ්ඩී
බුද්ධෙ ච ධම්මෙ ච අභිප්පසන්නො.

45. පරිනිබ්බුතෙ ලොකවිනායකම්හි
ථූපං සකාසි විපූලං මහන්තං,
සමන්තතො ගාවුතිකං මහෙසිනො
දෙවා'තිදෙවස්ස නරුත්තමස්ස.

46. තස්මිං මනුස්සා බලිමාභිහාරී
පග්ගය්හ ජාතීසු මනං පහට්ඨා,
වාතෙන පුප්ඵං පති තස්ස එකං
තාහං ගහෙත්වාන තස්සෙව'දාසිං.

47. සො මං අවොචා'තිපසන්නචිත්තො
තුය්හෙව චෙතං පුප්ඵං දදමි,
තා'හං ගහෙත්වා අභිරොපයෙසිං
පුනප්පුනං බුද්ධමනුස්සරන්තො.

39. ඒ පසේබුදුන් කෙරෙහි උත්තමධර්මය ඇතැයි හැදහීමි, උන්වහන්සේ අවබෝධකළ ඒ ධර්මයෙහි ද සිත පිහිටුවීමි, මෙබඳු විහරණ ඇත්තවුන් සමග මාගේ සංගමය වේවයි ද කිසිදු භවයෙක්හි තනහමක් අපෙක්ෂා ඇති වෙමව ' යි ද සිත පිහිටුවීමි.

40. ඒ මැ කර්මයාගේ විපාකයෙන් මම (දහසක් අවුරුද්දට) දීර්ඝායු ඇති විශෙෂ ස්වභාව ඇති ලද සම්පත් නොපිරිහෙන පියවි ඇති (මාගේ යැ යන) පරිග්‍රහ රහිත වූ සත්ත්වයන් ඇති උත්තරකුරුයෙහි දහසක්වර උපන්මි.

41. ඒ මැ කර්මයාගේ විපාකයෙන් මම විශිෂ්ට වූ දිව්‍යශරීරයට පැමිණියෙම් විචිත්‍ර වූ මාලාභරණ ගන්ධාලෙප ඇති පරිවාර - කීර්තියශස් ඇති ත්‍රිදශ (තව්තිසා) යෙහි දහසක්වර උපන්මි.

42. ඒ මැ කර්මයාගේ විපාකයෙන් මම විමුක්ත වූ සිත් ඇති චෙතොඛිල රහිත වූ ක්ෂීණාශ්‍රව වූයෙමි. මේ අන්තිමදෙහධාරී වූ කුශලාකුශලයන් ඉක්මවාලූ රහතුන් සමග මාගේ සංගමය වී.

43. ජිතපඤ්චමාර වූ තථාගතයෝ (සිල්වත්) යමක් පතා නම් සිල්වත්හුගේ ප්‍රණිධිය සමෘද්ධ වේ යයි යමක් වදළාහු ද, මේ වචනය ප්‍රත්‍යක්ෂ මැ යි, මා විසින් යම් යම් පරිදි සිතින් සිතනලද ද එය එසෙයින් සමෘද්ධ විය. මේ මාගේ අන්තිම භවය යි.

මේ වාසනාභාගිය සූත්‍ර යැ.

44. මෙයින් එක්තිස්වන කපෙහි පස්මරුන් දිනූ තෘෂ්ණාරහිත වූ අනන්තදර්ශී වූ ' සිඛී ' යන නම් ඇති භාග්‍යවත්හු ලොවැ පහළවූහ. ඒ බුදුන්ගේ භ්‍රාතෘ වූ ' සිඛණ්ඩී ' නම් රජ බුදුන් කෙරෙහි ද ධර්මය කෙරෙහි ද අතිශයින් පහන් වී.

45. ලෝකවිනායක වූ සිඛී බුදුන් පිරිනිවී කල්හි ඒ රජ මහර්ෂි වූ දෙවාතිදෙව වූ නරොත්තමයන්ගේ (ධාතු පිහිටුවා) හාත්පසින් ගවුපමණ වූ විපුල වූ මහත් ස්තූපයක් කෙළේයි.

46. පහවූසිත් ඇති මිනිසෙක් සුගතිභවයෙහි සිත දැඩිවගෙන ඒ සැයෙහි පූජා එළැවී යැ, ඔහුගේ එක මලක් සුළඟින් වැටිණ, මම එය ගෙන ඔහුට මැ දිනිමි.

47. ඉතා පහන් සිතැති හේ මට මෙසේ කී : 'තෙල පුෂ්පය තොපට මැ දෙමි' මම ඒ මල ගෙන පුනපුනා බුදුගුණ මෙනෙහිකරමින් පූජා කෙළෙමි.

48. අජ්ජ තිංසං තතො කප්පා නාභිජානාමි දුග්ගතිං,
විනිපාතං න ගච්ඡාමි ථූපපූජායිදං ඵලං”

ඉදං වාසනාභාගියං සුත්තං.

49. “කපිලං නාම නගරං සුවිභත්තං මහාපථං,
ආකිණ්ණමිද්ධං ඵීතං ච බ්‍රහ්මදත්තස්ස රාජිනො.

50. කුම්මාසං වික්කිණිං තත්ථ පඤ්චාලානං පුරුත්තමෙ,
සො’හං අද්දසිං සම්බුද්ධං උපරිට්ඨං යසස්සිනං.

51. හට්ඨො චිත්තං පසාදෙත්වා නිමන්තෙසිං නරුත්තමං,
අරිට්ඨං ධුවභත්තෙන යං මෙ ගෙහස්මිං විජ්ජථ.

52. තතො ච නත්තිකො පුණ්ණො පුණ්ණමාසී උපට්ඨිතා,
නවං දුස්සයුගං ගය්හ අරිට්ඨස්සො’පනාමයිං.

53. පසන්නචිත්තං ඤත්වාන පටිග්ගණ්හි නරුත්තමො,
අනුකම්පකො කාරුණිකො තණ්හානිග්ඝාතනො මුනි.

54. තාහං කම්මං කරිත්වාන කල්‍යාණං බුද්ධවණ්ණිතං,
දෙවෙ චෙව මනුස්සෙ ච සන්ධාවිත්වා තතො චුතො.

55. බාරාණසියං නගරෙ සෙට්ඨිස්ස එකපුත්තකො,
අඩ්ඪෙ කුලස්මිං උපපජ්ජිං පාණෙහි ච පියතරො.

56. තතො ච විඤ්ඤුතං පත්තො දෙවපුත්තෙන චොදිතො,
පාසාදා ඔරුහිත්වාන සම්බුද්ධමුපසඞ්කමිං.

57. සො මෙ ධම්මමදෙසයි අනුකම්පාය ගොතමො,
දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං[1].

58. අරියං චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං,
චත්තාරි අරියසච්චානි මුනි ධම්මමදෙසයි.

59. තස්සා’හං වචනං සුත්වා විහරිං සාසනෙ රතො,
සමථං පටිවිජ්ඣා’හං රත්තින්දිවමතන්දිතො.

60. අජ්ඣත්තං ච බහිද්ධා ච යෙ මෙ විජ්ජිංසු[2] ආසවා,
සබ්බෙ ආසුං සමුච්ඡින්නා න ච උප්පජ්ජරෙ පුන.

61. පරියන්තකතං දුක්ඛං චරිමො’යං සමුස්සයො,
ජාතිමරණසංසාරො නත්ථි දානි පුනබ්භවො”ති.

ඉදං වාසනාභාගියං සුත්තං.

---

1. අතික්කමමං – සිමු.
2. විජ්ඣිංසු – සිමු.

48. එතැන් සිට දැන් කල්ප තිසෙකි, මම දුර්ගතිය නොදනිමි, විනිපාතයට (අපායට) නොගියෙමි, ධූපයට මල් පිදීමෙහි මේ විපාක යි.

මේ වාසනාභාගිය සූත්‍ර යැ.

49. බඹදත් රජහුගේ මොනොවට බෙදනලද මහාමාර්ග ඇති, මිනිසුන් විසින් ගැවැසිගත් ස්වර්ණාභරණාදීන් සමෘද්ධ වූ, උපභොගවස්තුයෙන් විපුල වූ කපිල නම් නුවරෙක් විය.

50. පඤ්චාල වැසියන්ගේ ඒ උතුම් නගරයෙහි මම කොමුපිඩු විකිණිමි, එහි දී මම අහසැ වැඩසිටි යශස්වි වූ අරිට්ඨ නම් පසේබුදුන් දිටිමි.

51. හටුවූයෙම් සිත පහදවා මාගේ ගෙහි යමක් ඇද්ද එයින් නරොත්තම වූ අරිට්ඨ පසේබුදුන් ධුව (නිති) බතින් පැවැරිමි.

52. යළි එසඳ ඉල්මස පිරුණේ පණ්ඩුරසිය පැමිණියා යැ, (එකල) නව පිළිසහළක් ගෙන අරිට්ඨපසේබුදුන්ට පිරිණැමීමි.

53. මා පහන් සිතැත්තහු දැන නරොත්තම වූ අනුකම්පා කරන කාරුණික වූ තෘෂ්ණා නැසූ මුනි වූ පසේබුදුහු එය පිළිගත්හ.

54. මම බුදුවරුන් විසින් පසස්නාලද ඒ කුශලකර්මය කොට දෙව්ලොවැ ද මිනිස් ලොවැ ද සන්ධාවන කොට එයින් චුත වූයෙම්.

55. බරණැස්නුවර ආඪ්‍ය (මහාසාර) කුලයෙහි සිවුහුගේ ප්‍රාණයට ද වඩා ප්‍රියතර වූ එක් මැ පුත්‍ර වැ උපන්මි.

56. එක්බිති නුවණැතිබවට පැමිණියෙම් දිව්‍යපුත්‍රයකු විසින් මෙහෙයනලදුයෙම් ප්‍රාසාදයෙන් බැස සම්බුද්ධයන් කරා එළැඹියෙමි.

57. ඒ ගෞතම බුදුහු මට අනුකම්පායෙන් දහම් දෙසූසේක: දුක්ඛය ද දුක්ඛසමුදය ද දුක්ඛනිරොධය ද —

58. දුක්ඛූපසමයට යනසුලූ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය ද යන චතුරාර්‍ය්‍යසත්‍ය යයි කියනලද ධර්මය මුනිහු දෙසූසේක.

59. මම ඒ බුදුන්ගේ වදන් අසා ශාසනයෙහි ඇලුණෙම් වාස කෙළෙමි, දවරැයෙහි නොමැලි වූ මම මාර්ගසමාධිය ප්‍රතිවෙධ කෙළෙමි.

60. අධ්‍යාත්මවිෂය වූ ද බාහ්‍යවිෂය වූ ද මාගේ යම් ආස්‍රව කෙනෙක් විද්‍යමාන වූහු ද, එ හැම ආස්‍රවයෝ සමුච්ඡින්න වූහ, යළි නො ද උපදනාහ.

61. වට්ටදුක්ඛය කෙළවර කරනලද, මේ චරිම ශරීරය වෙයි, දැන් ‘පුනර්භව’ යි කියනලද ජාතිමරණ සංඛ්‍යාත සංසාරය නැති.

මේ වාසනාභාගිය සූත්‍ර යි.

(මේ වාසනාභාගයෙහි වූ පින්කම් ප්‍රකාශ කරන සූත්‍රපද උදහරණවශයෙන් දක්වනලද වාසනාභාගිය සූත්‍ර මෙසේ උක්තප්‍රකාරයෙන් දතයුත්තේ යි.)

## 3, 4, 3

(8) තත්ථ කතමං නිබ්බෙධභාගියං සුත්තං :

''උද්ධං අධො සබ්බධි විප්පමුත්තො
අයමහමස්මීති අනානුපස්සී
එවං විමුත්තො උදතාරි ඔඝං
අතිණ්ණපුබ්බං අපුනබ්භවායා''ති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං

''සීලවතො ආනන්ද, න චෙතනා කරණීයා : කින්ති මෙ අවිප්පටිසාරෙ ජායෙය්‍යා'ති, ධම්මතා එසා ආනන්ද, යං සීලවතො අවිප්පටිසාරො ජායෙය්‍ය.

අවිප්පටිසාරිනො[1] ආනන්ද, න චෙතනාකරණීයා :- කින්ති මෙ පාමොජ්ජං ජායෙය්‍යාති, ධම්මතා එසා ආනන්ද, යං අවිප්පටිසාරිනො පාමොජ්ජං ජායෙය්‍ය.

පමුදිතෙන ආනන්ද, න චෙතනා කරණීයා :- කින්ති මෙ පීති ජායෙය්‍යා'ති, ධම්මතා එසා ආනන්ද යං පමුදිතස්ස පීති ජායෙය්‍ය.

පීතිමනස්ස ආනන්ද, න චෙතනා කරණීයා :- කින්ති මෙ කායො පස්සම්භෙය්‍යා'ති, ධම්මතා එසා ආනන්ද, යං පීතිමනස්ස කායො පස්සම්භෙය්‍ය.

පස්සද්ධකායස්ස ආනන්ද, න චෙතනා කරණීයා :- කින්තා'හං සුඛං වෙදියෙය්‍ය'න්ති, ධම්මතා එසා ආනන්ද, යං පස්සද්ධකායො සුඛං වෙදියෙය්‍ය.

සුඛිනො ආනන්ද, න චෙතනා කරණීයා :- කින්ති මෙ සමාධි ජායෙය්‍යා'ති. ධම්මතා එසා ආනන්ද, යං සුඛිනො සමාධි ජායෙය්‍ය.

සමාහිතස්ස ආනන්ද, න චෙතනා කරණීයා : 'කින්තාහං යථාභූතං පජානෙය්‍ය'න්ති. ධම්මතා එසා ආනන්ද, යං සමාහිතො යථාභූතං පජානෙය්‍ය.

යථාභූතං පජානතා ආනන්ද, න චෙතනා කරණීයා : 'කින්ති මෙ නිබ්බිද ජායෙය්‍යා'ති. ධම්මතා එසා ආනන්ද, යං යථාභූතං පජානන්තො නිබ්බින්දෙය්‍ය.

නිබ්බින්දන්තෙන ආනන්ද, න චෙතනා කරණීයා. : 'කින්ති මෙ විරාගො ජායෙය්‍යා'ති. ධම්මතා එසා ආනන්ද, යං නිබ්බින්දන්තො විරජ්ජෙය්‍ය.

විරජ්ජන්තෙන ආනන්ද න චෙතනා කරණීයා : 'කින්ති මෙ විමුත්ති ජායෙය්‍යා'ති. ධම්මතා එසා ආනන්ද, යං විරජ්ජන්තො විමුච්චෙය්‍ය.

---

1. අප්පටිසාරිනා - මජසං.

## 3. 4. 3

(3) එහි නිබ්බෙධභාගිය සූත්‍ර කවරෙ යැ.

1. උඩ රූපාරූපලොකයෙහි ද යට කාමලොකයෙහි ද යන සියලු සංස්කාරයන්හි වෙසෙසින් (කෙලෙසුන් කෙරෙන්) මිදුණු ' මෙ මම වෙමි ' (දෘෂ්ටිවශයෙන් රූපාදිය) නොදක්නා මෙසේ විමුක්ත වූ ක්ෂීණාස්‍රව පෙර තරණය නොකළවිරූ (කාමාදි චතුර්) ඔඝය පුනර්භව නොවනු පිණිස තරණය කළේ යි.

මෙ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

" ආනන්දය, සිල්වත්හු විසින් ' කිසෙයින් මට අවිප්පටිසාරය උපදනේ ද ' යි චෙතනා නො කටයුතු යැ. ආනන්දය යම් හෙයෙකින් සිල්වත්හට අවිප්‍රතිසාර උපදනේ ද තෙල ධර්මතා ධර්මස්වභාව යැ.

ආනන්දය විපිළිසර නැතියහු විසින් ' කිසෙයින් මට ප්‍රාමොද්‍යය උපදනේ ද ' යි සිත් නො උපදවියැයුතු යැ. යම් හෙයෙකින් අවිප්‍රතිසාරීහට ප්‍රාමොද්‍යය උපදනේ ද, ආනන්දය, තෙල ධර්මතා යැ.

ආනන්දය ප්‍රමුදිතයා විසින් ' කිසෙයින් මට ප්‍රීති උපදනේ ද යි චෙතනා නො කටයුතු යැ. යම් හෙයෙකින් ප්‍රමුදිතයාහට ප්‍රීති උපදනේ ද ආනන්දය තෙල ධර්මතා යැ.

ආනන්දය, ප්‍රීතිසිත් ඇතියහු විසින් ' කිසෙයින් මාගේ කය සන්හිඳේ ද ' යි චෙතනා නොකටයුතු යැ, යම් හෙයෙකින් ප්‍රීතිමනස්කයාගේ කය සන්හිඳේ ද, ආනන්දය තෙල ධර්මතා යැ.

ආනන්දය සන්හුන් කය ඇතියහු විසින් ' කිසෙයින් මම සුව විඳුනෙම් ද ' යි චෙතනා නො කටයුතු යැ. යම් හෙයෙකින් සන්හුන් කය ඇතියේ සුව විඳුනේ ද, ආනන්දය තෙල ධර්මතා යැ.

ආනන්දය සුව ඇතියහු විසින් ' කිසෙයින් මට සමාධි උපදනේ ද ' යි චෙතනා නො කටයුතු යැ. යම් හෙයෙකින් සුවඇතියහුට සමාධි උපදනේ ද, ආනන්දය තෙල ධර්මතා යැ.

ආනන්දය සමාහිතයා විසින් ' කිසෙයින් මම (තරුණවිදර්ශනාඥානයෙන්) යථාභූතව දනැගනිම් ද ' යි චෙතනා නො කටයුතු යැ. යම් හෙයෙකින් සමාහිත වූයේ යථාභූත ව දනැගනී ද, ආනන්දය තෙල ධර්මතා යැ.

ආනන්දය යථාභූතව (විදසුන්නැණින්) දන්නහු විසින් ' කිසෙයින් මට නිබ්බිද (නිර්වෙදඥානය) උපදනේ ද ' යි චෙතනා නො කටයුතු යැ. යම් හෙයෙකින් යථාභූතව දන්නේ නිර්වෙදයට පැමිණේ ද, ආනන්දය තෙල ධර්මතා යැ.

ආනන්දය නිර්වෙදයට පැමි ණියහු විසින් ' කිසෙයින් මට විරාගය උපදනේ ද ' යි චෙතනා නොකටයුතු යැ යම් හෙයෙකින් නිර්විග්න වූයේ විරාගයට පැමිණේ ද ආනන්දය, තෙල ධර්මතා යැ.

ආනන්දය විරාගයට පැමිණෙන්නාහු විසින් ' කිසෙයින් මාගේ විමුක්තිය උපදනේ ද ' යි චෙතනා නො කටයුතු යැ. යම් හෙයෙකින් විරාගයට පැමිණෙනුයේ විමුක්ත වන්නේ ද, ආනන්දය තෙල ධර්මතා යැ.

විමුත්තෙන ච ආනන්ද, න චෙතනා කරණීයා: ‘කින්ති මෙ විමුත්තිඤාණදස්සනං උප්පජ්ජෙය්‍යා’ති, ධම්මතා එසා ආනන්ද යං විමුත්තස්ස විමුත්තිඤාණදස්සනං උප්පජ්ජෙය්‍යා”ති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

2. “යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස,
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතො පජානාති සහෙතු ධම්ම”න්ති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

3. “යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස,
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතො ඛයං පච්චයානං අවෙදී”ති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

4. “කිං නු කුජ්ඣසි මා කුජ්ඣි අක්කොධො තිස්ස තෙ වරං,
කොධමානමක්ඛවිනයත්ථං හි තිස්ස බ්‍රහ්මචරියං වුස්සතී”ති

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

5. කදා'හං නන්දං පස්සෙය්‍යං ආරඤ්ඤං පංසුකූලිකං,
අඤ්ඤාතුඤ්ඡෙන යාපෙන්තං කාමෙසු අනපෙක්ඛින”න්ති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

6. “කිංසු ඡෙත්වා[1] සුඛං සෙති කිංසු ඡෙත්වා න සොචති,
කිස්සස්ස එකධම්මස්ස වධං රොචෙසි ගොතමා”ති?

7. කොධං ඡෙත්වා සුඛං සෙති කොධං ඡෙත්වා න සොචති,
කොධස්ස විසමූලස්ස මධුරග්ගස්ස (බ්‍රාහ්මණ:[2]) දෙවතෙ,
වධං අරියා පසංසන්ති තඤ්හි ඡෙත්වා න සොචතී”ති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

8. “කිංසු හනෙ උප්පතිතං කිංසු ජාතං විනොදයෙ,
කිං චස්සු පජහෙ ධීරෙ කිස්සාභිසමයො සුඛො?.

9 කොධං හනෙ උප්පතිතං රාගං ජාතං විනොදයෙ,
අවිජ්ජං පජහෙ ධීරෙ සච්චාභිසමයො සුඛො”ති

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

---

1. කිංසු ඣත්වා - සං.
2. දෙවතෙ - සං.

ආනන්දය, විමුක්තවූවහු විසින් 'කිසෙයින් මට විමුක්තිඥානදර්ශනය උපදනේ දැයි චේතනා නො කටයුතු යැ, (නො සිතිය යුතු යැ,) යම් හෙයෙකින් මාර්ගවිමුක්තියෙන් විමුක්ත වූවහුට විමුක්තිඥානදර්ශනය උපදනේ ද (එහෙයිනි.) ආනන්දය මෙල ධර්මතා '' යි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

2. සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍ය ඇති (ආරම්මණලක්ඛණ – උපනිධ්‍යානලක්ෂණ) ධ්‍යානයෙන් ධ්‍යාන කරන බාහිතපාප ඇති ක්ෂීණාස්‍රවහට යම් ඇසිල්ලෙක (අනුලොම ප්‍රත්‍යයාකාරප්‍රතිවෙධය සිද්ධකරන) බොධිපාක්ෂිකධර්මයෝ පහළවෙත් ද, එකල්හි ඔහුගේ සියලු (අටවැදෑරුම්) කාංක්ෂාවෝ දුරුවෙති, යම් හෙයෙකින් සහෙතුක වූ දුඃඛස්කන්ධ ධර්මය දැනගනී ද එහෙයිනි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

3. සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍ය ඇති ධ්‍යාන කරන ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණහට යම් ඇසිල්ලෙක බොධිපාක්ෂිකධර්මයෝ පහළවෙත් ද, එකල ඔහුගේ සියලු සැක දුරුවෙයි, යම් හෙයෙකින් ප්‍රත්‍යයන්ගේ ක්ෂය (නිරොධය) ප්‍රතිවෙධ කෙළේ ද එහෙයිනි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

4. තිස්සය, කුමක්හෙයින් කිපෙහි ? නහමක් කිපෙව, තොපට ක්‍රොධ නොකිරීම උතුම්, තිස්සය ක්‍රොධ මාන මකුබව යන මොවුන්ගේ විනය පිණිස මැ සසුන් බඹසර වෙසෙ යැයි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

5. කවර දවසෙක, මම ආරණ්‍යක වූ පාංශුකූලිකාඞ්ග ඇති ගෙපිළිවෙළින් පිඩු සිඟාහැසිරැ මිශ්‍රකභොජනයෙන් යැපෙන වස්තුකාමක්ලෙශකාමයන්හි අපෙක්ෂා රහිත වූ 'නන්ද' දක්නෙම් ද ' යි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

6. කුමක් නසා සුවසේ හොවී ද, කුමක් නසා ශොක නොකෙරේ ද, ගෞතමයන් වහන්ස, කවර එක් ධර්මයක්හුගේ වධය රුචිකරවූ ද ' යි.

7. ක්‍රෝධය නසා (ක්‍රොධපරිදාහයෙන් නොදැවෙනුයෙන්) සුවසේ හොවී, ක්‍රෝධය නසා (ක්‍රොධනාශයෙන් නට දෙම්නස් ඇතියෙන්) ශෝක නො කෙරෙයි, දෙවිය, විෂ (දුක්ඛ) මූල ඇති (කිපියහුට පෙරළා කිපීම ආදීන්) මධුර අන්තය ඇති ක්‍රෝධයාගේ වධය (නැසීම) බුද්ධාදි ආර්‍ය්‍යයෝ පසසති, ඒ ක්‍රෝධය මාර්ගයෙන් සමුච්ඡෙද කොට ශොක නො කෙරේ මැයි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

8. සමුදාචාරවශයෙන් උපන් කුමක් නසන්නේ ද, උපන් කුමක් තම සන්තානයෙන් දුරු කරන්නේ ද, ධීරතෙමේ කුමක් ප්‍රහීණ කරන්නේ ද, කුමක් අවබොධ කිරීම සුවවන්නේ ද ?

9. මාර්ගයෙන් නොනැසූ හෙයින් සමුදාචාර වශයෙන් උපන් ක්‍රෝධය නසන්නේ ය, උපන් රාගය දුරුකරන්නේ ය, ප්‍රාඥතෙමේ අවිද්‍යාව ප්‍රහීණ කරන්නේ ය, චතුස්සත්‍යාවබොධය සුව වන්නේ යි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

10. "සත්තියා විය ඔමට්ඨො ඩය්හමානො'ව මත්ථකෙ,
කාමරාගප්පහානාය සතො භික්ඛු පරිබ්බජෙ.

11. සත්තියා විය ඔමට්ඨො ඩය්හමානො'ව මත්ථකෙ,
සක්කායදිට්ඨිප්පහානාය සතො භික්ඛු පරිබ්බජෙ"ති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

12. සබ්බෙ ඛයන්තා නිචයා පතනන්තා සමුස්සයා,
සබ්බෙසං මරණමාගම්ම සබ්බෙසං ජීවිතමද්ධුවං;
එතං භයං මරණෙ පෙක්ඛමානො
පුඤ්ඤානි කයිරාථ සුඛාවහානි.

13. සබ්බෙ ඛයන්තා නිචයා පතනන්තා සමුස්සයා,
සබ්බෙසං මරණමාගම්ම සබ්බෙසං ජීවිතමද්ධුවං;
එතං භයං මරණෙ පෙක්ඛමානො
ලොකාමිසං පජහෙ සන්තිපෙක්ඛො"ති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං

14 "සුඛං සයන්ති මුනයො න තෙ සොචන්ති මාවිධ,
යෙසං ඣානරතං චිත්තං පඤ්ඤවා සුසමාහිතො;
ආරද්ධවිරියො පහිතත්තො ඔඝං තරති දුත්තරං.

15. විරතො[1] කාමසඤ්ඤාය[2] සබ්බසංයොජනාතිගො,
නන්දීභව[3]පරික්ඛීණො සො ගම්භීරෙ න සීදතී"ති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

16. "සද්දහානො අරහතං ධම්මං නිබ්බානපත්තියා,
සුස්සූසා ලභතෙ පඤ්ඤං අප්පමත්තො විචක්ඛණො.

17. පතිරූපකාරී ධුරවා උට්ඨාතා වින්දතෙ ධනං,
සච්චෙන කිත්තිං පප්පොති දදං මිත්තානි ගන්ථති:
අස්මා ලොකා පරං ලොකං සවෙපෙච්ච න සොචති"ති

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

18. "සබ්බගන්ථප්පහීනස්ස විප්පමුත්තස්ස තෙ සතො,
සමණස්ස න තං සාධු යදඤ්ඤමනුසාසති.

19. යෙන කෙනචි වණ්ණෙන සංවාසො සක්ක, ජායති,
න තං අරහති සප්පඤ්ඤො මනසා අනුකම්පිතුං.

---

1. විරත්තො - සු.
2. කාමසඤ්ඤාසු - සු.

10. අඩයට්යෙකින් උඩ සිට පහර දෙනුලැබුවකු සෙයින් හිස දවෙන්නකු සෙයින් කාමරාගයාගේ ප්‍රහාණය පිණිස මහණ සිහි ඇතිවැ වාසකරන්නේ යැ.

11. අඩයට්යකින් උඩ සිට පහර දෙනුලැබුවකු සෙයින් හිස ගිනිගත්තකු සෙයින් සත්කායදෘෂ්ටිය ප්‍රහාණය කිරීම පිණිස මහණ සිහිඇති වැ වාසකරන්නේ යි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

12. සියලු (රැස්කළ) භොගයෝ නැසීම අන්ත කොට ඇත්තාහුය, සමුස්සය සංඛ්‍යාත ශරීරයෝ වැටීම අන්තකොට ඇත්තාහුය, සියල්ලනට මරණය පැමිණසිටියේ යැ. සියල්ලන්ගේ අනිත්‍ය වෙයි, මරණයෙහි ලා තෙල බිය දක්නේ සුව එළවන පින් කරන්නේ යැ.

13. සියලු භොගයෝ ක්ෂයවීම අන්ත කොට ඇත්තාහ, සමුස්සයයෝ වැටීම අන්ත කොට ඇත්තාහ, සියල්ලනට මරණය එළැඹ සිටියේ යැ, සියල්ලන්ගේ ජීවිතය අනිත්‍ය යැ, මරණයෙහි ලා තෙල භය දක්නේ ශාන්තිසංඛ්‍යාත නිවන අපෙක්ෂා කරනුයේ ලොකාමිස සංඛ්‍යාත කාමගුණය දුරුකරන්නේ යි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

14. මෙ සස්නෙහි යම් කෙනකුන්ගේ සිත ධ්‍යානයෙහි ඇලුණේ ද, ඒ ක්ෂීණාශ්‍රව මුනිහු සුවසේ හොවිති, ශොක නො කෙරෙති, ප්‍රඥවත් වූ මොනොවට සමාහිත සිත්ඇති ආරබ්ධවීර්‍ය්‍ය ඇති නිවනට මෙහෙයූ සිත් ඇතියේ දුකසේ තරණය කළයුතු කාමාදි චතුරොඝය තරණය කෙරේ.

15. කාමසංඥයෙන් (සමුච්ඡෙදවිරතියෙන්) වෙන්වූ සියලු සංයෝජනයන් ඉක්මවා සිටී නන්දි සංඛ්‍යාත තෘෂ්ණාව හා භවත්‍රය ක්ෂය වූ ඒ ක්ෂීණාශ්‍රව ගැඹුරු වූ සසරසයුරෙහි නො ගැළේ යි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

16. නිවනට පැමිණීම පිණිස බුද්ධාදි රහතුන්ගේ දහම් හදහනුයේ දහම් අසනු කැමැති අප්‍රමත්ත වූ විචක්ෂණ පුද්ගල ලෞකික ලොකොත්තර ප්‍රඥව ලබා.

17. (දේශකාලාදිය නො ඉක්මැ) අනුරූප වැ ක්‍රියා කරන (චෛතසික වීර්‍ය්‍ය වශයෙන්) නොතැබූ ධුර ඇති (කායිකවශයෙන්) උත්ථානවීර්‍ය්‍ය ඇතියේ ලෞකික ලොකොත්තර ධනය ලබා වාක්සත්‍යයෙන් කීර්තියට පැමිණෙයි, කැමැති දැ දෙනුයේ මිත්‍රයන් සම්පාදනය කෙරෙයි, මෙ ලොවින් පරලොවට යන හේ ඒකාන්තයෙන් පරලොවැ දී ශෝක නො කෙරේ යයි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

18. සියලු කායග්‍රන්ථයන් ප්‍රහීණ කළ තුන් භවයෙන් මිදුණු ශ්‍රමණ වූ ඔබට යම් අනෙකක්හට අනුශාසනා කෙරේ ද, එය නො මැනැවි.

19. සක්කය, යම් කිසි කරුණෙකින් එක්තැනැ විසීමෙක් (සමාගමයෙක්) වේද, ඒ අනුකම්පිතව්‍ය පුඟුලාට සිතින් අනුකම්පා නො කරන්නට සප්‍රාඥසම්බුද්ධයෝ නො සුදුසු වෙති.

20. මනසා චෙ පසන්නෙන යදඤ්ඤමනුසාසති,
න තෙන හොති සංයුත්තො යානුකම්පා අනුද්දයා"ති

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

21. "රාගො ච දොසො ච කුතො නිදානා
අරතී රතී ලොමහංසො කුතොජා,
කුතො සමුට්ඨාය මනොවිතක්කා
කුමාරකා ධංකමිවොස්සජන්ති.

22. රාගො ච දොසො ච ඉතො නිදානා
අරතී රතී ලොමහංසො ඉතොජා,
ඉතො සමුට්ඨාය මනොවිතක්කා
කුමාරකා ධංකමිවොස්සජන්ති.

23. ස්නෙහජා අත්තසම්භූතා නිග්‍රොධස්සෙව ඛන්ධජා,
පුථූ විසත්තා කාමෙසු මාලුවාව විතතා වනෙ

24. යෙ නං පජානන්ති යතො නිදානං
තෙ නං විනොදෙන්ති සුණොහි යක්ඛ,
තෙ දුත්තරං ඔඝමිමං තරන්ති
අතිණ්ණපුබ්බං අපුනබ්භවාය"ති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

දුක්කරං භගවා සුදුක්කරං භගවා'ති,

25. "දුක්කරං වා පි කරොන්ති (කාමදාති භගවා)
සෙඛා සීලසමාහිතා
ඨිතත්තා අනගාරියුපෙතස්ස
තුට්ඨි හොති සුඛාවහා'ති.

දුල්ලභා භගවා යදිදං තුට්ඨීති

26. "දුල්ලභං වාපි ලභන්ති (කාමදාති භගවා) චිත්තවූපසමෙ රතා,
යෙසං දිවා ච රත්තො ච භාවනාය රතො මනො'ති.

දුස්සමාදහං භගවා යදිදං චිත්තන්ති,

27. "දුස්සමාදහං වාපි සමාදහන්ති (කාමදාති භගවා) ඉන්ද්‍රියූපසමෙ රතා,
තෙ ඡෙත්වා මච්චුනො ජාලං අරියා ගච්ඡන්ති කාමද'ති.

දුග්ගමො භගවා විසමො මග්ගො'ති,

28. දුග්ගමෙ විසමෙ වාපි අරියා ගච්ඡන්ති කාමද,
අනරියා විසමෙ මග්ගෙ පපතන්ති අවංසිරා;
අරියානං සමො මග්ගො අරියා හි විසමෙ සමා"ති

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

20. ඉදින් පහන් සිතින් යම් අනෙකක්හට අනුශාසනා කෙරේද, යම් අනුකම්පාවක් අනුද්දයාවක් ඇද්ද ඒ අනුශාසනයෙන් සංයුක්ත වූයේ නො වේ යයි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

21. රාගයත් ද්වෙෂයත් කුමක් නිදන කොට ඇත්තාහු ද ? අධිකුශලධර්මයෙහි නො ඇල්ම ද පස්කම්ගුණයෙහි ඇල්ම ද චිත්තොත්‍රාසලක්ෂණ රොමහර්ෂ ද යන මොහු කොයින් උපන්නාහු ද ? කාමාදි මනොවිතර්කයෝ කොයින් ඉපිද කුමරුවෝ කවුඩකු හුයින් පා බැද හරින්නාක් මෙන් කුශලචිත්තය බැඳහරිත් ද ?

22. රාගය ද ද්වෙෂය ද මේ ආත්මභාවය නිදන කොට ඇත්තාහ, අරතිය ද රතිය ද රොමහර්ෂ ද යන මොහු මේ ආත්මභාවයෙන් උපන්නාහ, මනොවිතර්කයෝ මේ ආත්මභාවයෙන් ඉපද කුමරුවෝ කවුඩකු හුයෙන් බැඳ හරින්නාක් මෙන් කුශලචිත්තය බැඳ හරිත්.

23. නුගරුකෙහි කඳින් උපන් ප්‍රරොහ (අරළු) මෙන් ස්නෙහයෙන් උපන් රාගාදීහු පඤ්චස්කන්ධ සංඛ්‍යාත ආත්මයෙහි හටගත්තාහු වෙනෙහි ඒ ඒ රුක්හි පැතිරගිය මාලුවාලිය මෙන් රාගාදි ක්ලෙශයෝ අනෙකප්‍රකාර වැ වස්තුද්වාරාරම්මණාදි වීසින් පැතුරුණාහු වෙත්.

24. යක්ෂය, මේ අස : යම් කෙනෙක් ඒ රාගාදි ක්ලෙශගහනය යමක් නිදන කොට උපනැයි දනිත් ද, ඔහු ඒ තණ්හාසිනෙහ සංඛ්‍යාත නිදනය (සමුදයසත්‍යය) මාර්ගඥානයෙන් දුරුකෙරෙති, ඔහු පුනර්භව නොවනු පිණිස පෙර තරණය නොකළවිරූ දුකසේ තරණය කළයුතු චතුරොඝය තරණය කෙරෙත්.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

භාග්‍යවතුන් වහන්ස (දීඝකලක් එකාන්තපරිශුද්ධ වූ ශ්‍රමණධර්මය කිරීම) දුෂ්කර යැ, භාග්‍යවතුන් වහන්ස ඉතා දුෂ්කර යැ ' යි.

25. (කාමද යි බුදුහු මෙසේ වදළහ :) ශීලයෙන් සමුපේත වූ ශෛක්ෂයෝ ප්‍රතිෂ්ඨිතස්වභාව ඇත්තාහු දුෂ්කර වූ ද ශ්‍රමණධර්මය කෙරෙති, අනාගාරික සංඛ්‍යාත ශාසනයට පැමිණියහුට (පැවිදිවූවහුට) සිවුපසයෙන් (යථාලාභාදි වීසින්) සතුටුවීම සුව එළවනු වෙයි.

භාග්‍යවතුන් වහන්ස යම් තුෂ්ටියක් ඇද්ද එය දුර්ලභ වූ යැ ' යි.

26. (කාමද යි බුදුහු) යම් කෙනකුන්ගේ සිත දවල්හිදු රැයිදු භාවනායෙහි ඇලුණේ ද, චිත්තවූපසමයෙහි ඇලුණු ඒ ශෛක්ෂයෝ දුර්ලභ වූ ද තුෂ්ටිය ලබත්.

භාග්‍යවතුන් වහන්ස යම් සිතක් ඇද්ද එය සමාධියෙහි යෙදීම දුෂ්කර යැ ' යි.

27. (කාමද යි බුදුහු) ඉන්ද්‍රියොපශමයෙහි ඇලුණාහු එකඟකිරීමට දුෂ්කර වූ ද සිත සමාධියෙහි යොදවති, කාමද, ඒ ආර්‍ය්‍යයෝ මරහුගේ ක්ලෙශජාලය සිඳ (නිවනට) යෙත්.

භාග්‍යවතුන් වහන්ස මාර්ගය දුර්ගම යැ, විෂම යැ ' යි.

28. කාමද, ආර්‍ය්‍යයෝ (පූර්වභාගප්‍රතිපද වශයෙන්) දුර්ගම වූ විෂම වූ ද මාර්ගයෙහි යෙති, අනාර්‍ය්‍යයෝ විෂම මාර්ගයෙහි (ඥනශීර්ෂයෙන්) අධඃශීර්ෂ වැ (මාර්ගයෙහි) වැටෙති, ආර්‍ය්‍යයනට ඒ මාර්ගය මැ සම වෙයි, ආර්‍ය්‍යයෝ විෂම වූ සත්ත්වකායයෙහි සමවූවාහු යැ එහෙයිනි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

29. ඉදං හි තං ජෙතවනං ඉසිසඞ්ඝනිසෙවිතං,
ආවුත්ථං ධම්මරජෙන පීති සඤ්ජනනං මම.

30. කම්මං විජ්ජා ච ධම්මො ච සීලං ජීවිතමුත්තමං,
එතෙන මච්චා සුජ්ඣන්ති න ගොත්තෙන ධනෙන වා.

31. තස්මා හි පණ්ඩිතො පොසො සම්පස්සං අත්ථමත්තනො,
යොනිසො විචිනෙ ධම්මං එවං තත්ථ විසුජ්ඣති.

32. සාරිපුත්තො'ව පඤ්ඤාය සීලෙන උපසමෙන ච,
යො හි පාරගතො[1] භික්ඛු එතා'ව පරමො සියාති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

33. අතීතං නාන්වාගමෙය්‍ය නප්පටිකඞ්ඛෙ අනාගතං,
යදතීතං පහීනං තං අප්පත්තං ච අනාගතං.

34. පච්චුප්පන්නං ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති,
අසංහීරං අසංකුප්පං තං විද්වා මනුබ්‍රූහයෙ.

35. අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ,
න හි නො සංගරං තෙන මහාසෙනෙන මච්චුනා.

36. එවං විහාරිං ආතාපිං අහොරත්තමතන්දිතං,
තං වෙ භද්දෙකරත්තො'ති සන්තො ආචික්ඛතෙ මුනී''ති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

''චත්තාරිමානි භික්ඛවෙ, සච්ඡිකාතබ්බානි. කතමානි චත්තාරි: අත්ථි භික්ඛවෙ, ධම්මා චක්ඛුනා පඤ්ඤාය ච සච්ඡිකාතබ්බා, අත්ථි ධම්මා සතියා පඤ්ඤාය ච සච්ඡිකාතබ්බා, අත්ථි ධම්මා කායෙන පඤ්ඤාය ච සච්ඡිකාතබ්බා, අත්ථි ධම්මා පඤ්ඤාය වෙදිතබ්බා පඤ්ඤාය ච සච්ඡිකාතබ්බා.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා චක්ඛුනා පඤ්ඤාය ච සච්ඡිකාතබ්බා: දිබ්බචක්ඛුං සුවිසුද්ධං අතික්කන්තමානුසකං චක්ඛුනා පඤ්ඤාය ච සච්ඡිකාතබ්බං.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා සතියා පඤ්ඤාය ච සච්ඡිකාතබ්බා: පුබ්බෙ නිවාසානුස්සති සතියා පඤ්ඤාය ච සච්ඡිකාතබ්බා.

1. යොපි පාරඞ්ගතො - සිමු. මජසං.

29. භික්ෂුසඞ්ඝයා විසින් නිති සෙවුනාලද ධර්මරාජයන් වහන්සේ විසින් වාස කළ මේ ජේතවනය මට ප්‍රීති උපදවනු වෙයි.

30. මාර්ගචේතනා සංඛ්‍යාත කර්මය ද මාර්ගප්‍රඥා සංඛ්‍යාත විද්‍යාව ද සමාධිපාක්ෂික ධර්මය ද සිල්වත්හුගේ ජීවිතය ද උතුම් වෙයි, තෙල කර්මාදිය හෙතු කොටගෙන සත්ත්වයෝ විශුද්ධ වෙති, ගොත්‍රයෙන් හෝ වයි ධනයෙන් හෝ වයි විශුද්ධ නො වෙත්.

31. එහෙයින් මැ පණ්ඩිත පුරුෂ තමහට වැඩ පසස්නේ සමාධිපාක්ෂික ධර්මය නුවණින් විමසන්නේ යැ, මෙසේ ඒ ආර්‍ය්‍යමාර්ගයෙහි විශුද්ධ වෙයි.

32. ප්‍රඥායෙන් ද ශීලයෙන් ද ක්ලෙශොපශමයෙන් ද ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මැ ශ්‍රෙෂ්ඨ වෙති, නිර්වාණපාරයට පැමිණි යම් මහණෙක් වේ ද හේ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පරම කොට ඇති වන්නේ යයි.

මේ නිබ්බෙධ භාගිය සූත්‍ර යැ.

33. අතීත පඤ්චස්කන්ධය තෘෂ්ණා දෘෂ්ටීන් අනුගමනය නො කරන්නේ යැ, අනාගත පඤ්චස්කන්ධය තෘෂ්ණා දෘෂ්ටීන් නො පතන්නේ යැ යමක් අතීත ද එය ප්‍රහීණ යැ යමක් අනාගත ද එය නො පැමිණියේ යැ, එහෙයිනි.

34. යමෙක් ප්‍රත්‍යුත්පන්න වූ (යම් ධර්මයෙක් ඇද්ද) ඒ ධර්මය ඒ ඒ තැන්හි අනිත්‍යාදි විසින් විදර්ශනා කෙරේ ද, නුවණැති මහණ (රාගාදීන් විසින්) අසංහිර වූ අසංකොප්‍ය වූ ඒ විදර්ශනාව වඩන්නේ යැ.

35. අද මැ ආතාපන වීර්‍ය්‍යය කටයුතු යැ, සෙට මරණය කවරෙක් දත හෙන්නේ ද, (මරණ කාරණ වූ ගිනි විෂ ශස්ත්‍රාදි) මහත් වූ සෙනා ඇති ඒ මරහු සමඟ (මිත්‍ර සන්ථවාදි) සංගරයෙක් (ගිවිසුමෙක්) නැත් නු!

36. මෙබඳු විහරණ ඇති කෙලෙසුන් තවන වැර ඇති දවරයෙහි අනලස් වූ ඒ සුහුලා එකාන්තයෙන් භද්දෙකරත්ත යි (රාගාදිය සන්හුන් බැවින්) ශාන්ත වූ බුද්ධ මුනිහු ප්‍රකාශ කෙරෙත් යයි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යැ.

මහණෙනි, මේ සාක්ෂාත්කර්තව්‍යයෝ (ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයෝ) සතර දෙනෙක් වෙති. කවර සතර දෙනෙක යත්: මහණෙනි ඇසින් ද නුවණින් ද නොහොත් චක්ෂුර්භූත වූ ප්‍රඥායෙන් පසක් කළ යුතු දහම් ඇත, ස්මෘතියෙන් ද ප්‍රඥායෙන් ද නොහොත් ස්මෘතිසම්ප්‍රයුක්ත ප්‍රඥායෙන් පසක් කළ යුතු දහම් ඇත, නාමකයින් ද ප්‍රඥායෙන් ද පසක් කළයුතු දහම් ඇත. ප්‍රඥායෙන් දතයුතු නුවණින් පසක් කළයුතු දහම් ඇති.

මහණෙනි, චක්ෂුසින් ද ප්‍රඥායෙන් ද ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයෝ කවරහ ; සුවිශුද්ධ වූ මිනිසැස ඉක්ම සිටි දිවඇස චක්ෂුසින් ද ප්‍රඥායෙන් ද ප්‍රත්‍යක්ෂ කටයුතු යැ.

මහණෙනි, ස්මෘතියෙන් ද ප්‍රඥායෙන් ද ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයෝ කවරහ ; පූර්වනිවාසානුස්මෘතිය සතියෙන් ප්‍රඥායෙන් ද ප්‍රත්‍යක්ෂ කටයුතු යැ.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා කායෙන පඤ්ඤාය ච සච්ඡිකාතබ්බා: ඉද්ධිවිධා නිරොධො[1] කායෙන පඤ්ඤාය සච්ඡිකාතබ්බා.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා පඤ්ඤාය වෙදිතබ්බා පඤ්ඤාය ච සච්ඡිකාතබ්බා: ආසවානං ඛයෙ ඤාණං පඤ්ඤාය වෙදිතබ්බං පඤ්ඤාය ච සච්ඡිකාතබ්බං''ති.

ඉදං නිබ්බෙධභාගියං සුත්තං.

## 3, 4, 4

(4) තත්ථ කතමං අසෙඛභාගියං සුත්තං.

1. ''යස්ස සෙලූපමං චිත්තං ඨිතං නා'නුපකම්පති,
විරත්තං රජනීයෙසු කොපනෙය්‍යෙ න කුප්පති
යස්සෙවං භාවිතං චිත්තං කුතො තං දුක්ඛමෙස්සතී''ති

ඉදං අසෙඛභාගියං සුත්තං.

''ආයස්මතො ච සාරිපුත්තස්ස චාරිකා දසමං වෙය්‍යාකරණං කාතබ්බ''න්ති

ඉදං අසෙඛභාගියං සුත්තං.

2. ''යො බ්‍රාහ්මණො බාහිතපාපධම්මො,
නිහුහුංකො[2] නික්කසාවො යතත්තො,
වෙදන්තගූ වුසිතබ්‍රහ්මචරියො
ධම්මෙන සො බ්‍රහ්මවාදං වදෙය්‍ය,
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ''ති

ඉදං අසෙඛභාගියං සුත්තං.

3. ''බාහිත්වා පාපකෙ ධම්මෙ යෙ චරන්ති සදා සතා,
ඛීණසංයොජනා බුද්ධා තෙ වෙ ලොකස්මිං බ්‍රාහ්මණා''ති

ඉදං අසෙඛභාගියං සුත්තං.

4. ''යත්ථ ආපො ච පඨවී තෙජො වායො න ගාධති,
න තත්ථ සුක්කා ජොතන්ති ආදිච්චො නප්පකාසති.
න තත්ථ චන්දිමා භාති තමො තත්ථ න විජ්ජති,

5. ''යදා ච අත්තනා වෙදි මුනි මොනෙන බ්‍රාහ්මණො,
අථ රූපා අරූපා ච සුඛදුක්ඛා පමුච්චතී''ති.

ඉදං අසෙඛභාගියං සුත්තං.

---

1. නිරොධා - සිමු, මජසං.
2. {නිහුහුංකකො - සිමු,
{නිහුංහුංකො - මජසං.

මහණෙනි, නාමකයින් ද ප්‍රඥයෙන් ද ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්මයෝ කවරහ ; සඳ්දිට්ඨිකොට්ඨාශයෝ ද නිරොධය (නිවන) ද නාම කයින් ද ප්‍රඥයෙන් ද ප්‍රත්‍යක්ෂ කටයුතු යැ.

මහණෙනි, කවර දහම්හු ප්‍රඥයෙන් දතයුත්තාහු ප්‍රඥයෙන් ප්‍රත්‍යක්ෂ කටයුත්තාහු ද යත් : ආස්‍රවයන්ගේ ක්ෂය ඥනය ප්‍රඥයෙන් දතයුතු යැ ප්‍රඥයෙන් ප්‍රත්‍යක්ෂ කටයුතු යැයි.

මේ නිබ්බෙධභාගිය සූත්‍ර යි.

## 3. 4. 4.

(4) එහි අසෙඛභාගිය සූත්‍ර කවරෙ යැ :

1. යමක්හුගේ සිත සෙල්පව්වක් සෙයින් සිටියේ අටලෝදහමින් නො සැලේ ද, රාගය ඉපදීමට කාරණ වූ ත්‍රෛභූමක ධර්මයන්හි නො ඇලුණේ ද, කොප ඉපැද්මට කාරණ වූ ආඝාත වස්තු විෂයෙහි නො කිපේ ද, යමක්හුගේ සිත මෙසේ භාවිත ද ඔහු කරා දුකෙක් කොයිබින් එන්නේ දැයි.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

තවද ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ චාරිකා දහවැනි වෙය්‍යාකරණය කටයුත්තේ යැ යි.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

2. බාහිතපාප බ්‍රාහ්මණ වූ යමෙක් බැහැර කළ පාපධර්ම ඇත්තේ ද, (ක්‍රොධ මාන විසින්) හු හුං කාර නැත්තේ ද, කෙලෙස් කසට නැත්තේ ද සංයම කළ සිත් ඇත්තේ ද මාර්ග ඥනයෙන් නිවනට (වෙදන්තයට) පැමිණි යේ ද වැස නිම වූ මහබඹසර ඇත්තේ ද, යමක්හුගේ (සන්තානයෙහි) ලොවැ කිසි අරමුණෙක්හි දු (රාගාදි) උත්සදයෝ නැත් ද, හේ ධර්මයෙන් (මම බ්‍රාහ්මණයෙමි) බ්‍රහ්මවාදය කියන්නේ යයි.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

3. යම් කෙනෙක් ලාමක අකුශලධර්මයන් දුරු කොට හැමකල්හි සිහි ඇතිවැ හැසිරෙත් ද ක්ෂය කරන ලද සංයොජන ඇති සත්‍යාවබොධය කළ ඔවුහු ලොව ඒකාන්ත යෙන් බ්‍රාහ්මණ වෙත්.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

4. යම් නිර්වාණධාතුයෙක්හි ආපොධාතුවත් පඨවිධාතුවත් තේජොධාතුවත් වායොධාතුවත් නො පිහිටා ද, ඒ නිවනෙහි ශුභතාරකාවෝ නො බබළති, හිරු ආලොක නො කෙරෙයි, එහි සඳ නො බබළයි එහි අඳුරෙක් නැති.

5. යම් කලෙක මුනි වූ ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තමා විසින් ආත්මප්‍රත්‍යක්ෂ වූ මොන සංඛ්‍යාත මාර්ගඥනයෙන් (නිර්වාණය) අවබොධ කෙළේ ද, එකල්හි රූපධර්මයෙන් ද අරූපධර්මයෙන් ද සුවදුක් දෙකින්ද වෙසෙසින් මිදේ යයි.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

6. “යදා සකෙසු ධම්මෙසු පාරගූ හොති බ්‍රාහ්මණො,
අථ එතං පිසාචඤ්ච පක්කුලඤ්චා’ති වත්තතී”ති

ඉදං අසෙඛභාගියං සුත්තං.

7. “නාභිනන්දති ආයන්තිං පක්කමන්තිං න සොචති,
සඞ්ගා සඞ්ගාමජිං මුත්තං තමහං බ්‍රූමි බ්‍රාහ්මණ”න්ති

ඉදං අසෙඛභාගියං සුත්තං.

8. “න උදකෙන සුචී හොති බහ්වෙත්ථ න්හායතී ජනො,
යම්හි සච්චං ච ධම්මො ච සො සුචී සො ච බ්‍රාහ්මණො”ති.

ඉදං අසෙඛභාගියං සුත්තං.

9. “යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස,
විධූපයං තිට්ඨති මාරසෙනං
සූරියොව ඔභාසයමන්තලික්ඛ”න්ති.

ඉදං අසෙඛභාගියං සුත්තං.

10. “සන්තින්ද්‍රියං පස්සථ ඉරියමානං
තෙවිජ්ජපත්තං අපහානධම්මං
සබ්බානි යොගානි උපාතිවත්තො
අකිඤ්චනො ඉරියති පංසුකූලිකො.

11. “තං දෙවතා සම්බහුලා උළාරා
බ්‍රහ්මවිමානං උපසඞ්කමිත්වා
ආජානීයං ජාතිබලනිසෙධං
නිධා නමස්සන්ති පසන්නචිත්තා.

12 “නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
යස්ස තෙ නාභිජානාම කින්ති[1] නිස්සාය ඣායසී”ති.

ඉදං අසෙඛභාගියං සුත්තං.

13. “සහායා වතිමෙ භික්ඛූ චිරරත්තං සමෙතිකා,
සමෙති නෙසං සද්ධම්මො ධම්මෙ බුද්ධප්පවෙදිතෙ.

14. සුවිනීතා කප්පිනෙන ධම්මෙ අරියප්පවෙදිතෙ,
ධාරෙන්ති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහිනි”න්ති.

ඉදං අසෙඛභාගියං සුත්තං.

---

1. කිං තං - මජසං

6. යම් කලෙක ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ ස්වකීය (පඤ්චස්කන්ධ) ධර්මයන්හි පරිඥාහි සමය වශයෙන් (නොහොත් ශීලාදි ධර්මයන්හි පාරිපූරි වශයෙන්) පාරයට ගියේ වේ ද, එකල්හි තෙල පිශාචයා ද, (තා කියනලද) පක්කුලකරණය ද ඉක්මැ සිටී යයි.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

7. (තමා සමීපයට) එන තෙනැත්තිය සිතින් නොපිළිගනී, පෙරළායන තෙනැත්තියට ශොක නො කෙරෙයි. (රාගාදි පඤ්ච) සඞ්ගයෙන් මිදුණු ඒ සඞ්ගාමජී මහණ බ්‍රාහ්මණ යැයි මම් කියමි යි.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

8. මේ ගයාතීර්ථයෙහි බොහෝ ජන තෙමේ ස්නානය කෙරෙයි, එහෙත් දියෙහි ගැලීම් ආදීන් (පාපමලයෙන්) ශුද්ධවීමෙක් නැති. යමක්හු කෙරෙහි පරමාර්ථසත්‍යයත් මාර්ගඵලධර්මයත් ඇද්ද, හේ පවිත්‍ර වූයේ වෙයි. හේ බ්‍රාහ්මණ ද වේ යයි.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

9. සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍ය ඇති ධ්‍යාන කරන ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණහට යම් ඇසිල්ලෙක බොධිපාක්ෂිකධර්මයෝ පහළවෙත් ද, එකල්හි අන්තරීක්ෂය ආලෝක කරමින් සිටුනා හිරු සෙයින් දස කෙලෙස්මරසෙන් විධ්වංසන කෙරෙමින් සිටී යයි.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

10. සන්හුන් ඉඳුරන් ඇති ත්‍රිවිද්‍යාවට පැමිණි අපරිහානස්වභාව ඇතිවැ ඉරියව් පවත්වන්නාහු බලව, සියලු කාමාදි යොගයන් ඉක්මවාලූ පාංශුකූල චීවරධර වූ (ඒ ක්ෂීණාස්‍රව) රාගාදි කිඤ්චන රහිත ව වෙසෙයි.

11. උදර වූ බොහෝ දේවතාවෝ බඹවිමනට එළඹ පුරුෂාජානෙය වූ ජාතිබලය ප්‍රතිෂෙධ කළ ඒ ක්ෂීණාස්‍රවයා පහන්සිත් ඇත්තාහු කායාදි තුන්දොරින් නමස්කාර කෙරෙත්.

12. තෙපි කවර අරමුණක් නිසා ධ්‍යාන කරහු දැ ' යි තොපගේ ඒ ධ්‍යානාලම්බනය නොදනුම්හ, පුරුෂාජානෙයය තොපට නමස්කාර වේවා, පුරුෂොත්තමය තොපට නමස්කාර වේවා ' යි.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

13. ඒකාන්තයෙන් සභාය වූ මේ භික්ෂූහු බොහෝකලක් සමවූ සම්මාදිට්ඨි ආදි ලබධි ඇත්තාහු යැ, එහෙයින් බුදුරදුන් විසින් ප්‍රවිදිත වූ සද්ධර්මයෙහි ඔවුන්ගේ ප්‍රතිපත්ති ආදි සද්ධර්මය සම වේ.

14. කප්පින තෙරුන් විසින් ආර්‍ය්‍යයන් විසින් ප්‍රවිදිත වූ ධර්මයෙහි මොනොවට හික්මවනලද්දහු සේනාසහිත මරහු දිනා අන්තිම ශරීරය ධරත් යයි.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

15\. "නයිදං සිථිලමාරබ්භ නයිදං අප්පෙන ථාමසා,
නිබ්බානං අධිගන්තබ්බං සබ්බගන්ථප්පමොචනං.

16\. අයඤ්ච දහරො භික්ඛු අයමුත්තමපොරිසො,
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහිනි"න්ති.

ඉදං අසෙඛභාගියං සුත්තං.

17\. "දුබ්බණ්ණකො ලූඛචීවරො මොඝරාජා සදා සතො,
ඛීණාසවො විසංයුත්තො කතකිච්චො අනාසවො.

18\. තෙවිජ්ජො ඉද්ධිප්පත්තො ච චෙතොපරියායකොවිදො,
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහිනි"න්ති.

ඉදං අසෙඛභාගියං සුත්තං.

"තථාගතො භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො රූපස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො සම්මාසම්බුද්ධො'ති වුච්චති. භික්ඛු'පි භික්ඛවෙ පඤ්ඤාවිමුත්තො රූපස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො පඤ්ඤාවිමුත්තො'ති වුච්චති.

තථාගතො භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො 'සම්මාසම්බුද්ධො'ති වුච්චති. භික්ඛු'පි භික්ඛවෙ පඤ්ඤාවිමුත්තො-පෙ-විඤ්ඤාණස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො 'පඤ්ඤාවිමුත්තො'ති වුච්චති.

තත්‍ර භික්ඛවෙ කො විසෙසො කො අධිප්පායො කිං නානාකරණං තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පඤ්ඤාවිමුත්තෙන භික්ඛුනා'ති? භගවම්මූලකා නො භන්තෙ ධම්මා-පෙ-තථාගතො භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො මග්ගානුගා ච භික්ඛවෙ එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතා. අයං ඛො භික්ඛවෙ විසෙසො අයං අධිප්පායො ඉදං නානාකරණං තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පඤ්ඤාවිමුත්තෙන භික්ඛුනා"ති.

ඉදං අසෙඛභාගියං සුත්තං.

## 3, 4, 5

(5) තත්ථ කතමං සංකිලෙසභාගියඤ්ච වාසනාභාගියඤ්ච සුත්තං :

1\. "ඡන්නමතිවස්සති විවටං නාතිවස්සති,
තස්මා ඡන්නං විවරෙථ එවං තං නාතිවස්සති"

"ඡන්නමතිවස්සතී"ති සංකිලෙසො ; "විවටං නාතිවස්සතී"ති වාසනා : "තස්මා ඡන්නං විවරෙථ එවං තං නාතිවස්සතී"ති අයං සංකිලෙසො ච වාසනා ච.

ඉදං සංකිලෙසභාගියඤ්ච වාසනා භාගියඤ්ච සුත්තං.

15. සියලු ක්ලේශග්‍රන්ථයන් මුදලන්නා වූ මේ නිවන ලිහිල්වැ වියර්ය කොට නොලැබියැ හැක්ක, මේ නිවන අල්ප වූ ශක්තියෙන් නොලැබියැ හැක්ක.

16. මේ තරුණ මහණෙක, මේ උතුම් පුරුෂයෙක, හේ සෙන් සහිත මරු දිනා අන්තිම ශරීරය ධරා යයි.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

17. දුර්වර්ණ වූ රුක්ෂ වූ සිවුරුඇති හැමකල්හි සමාපත්තිමත් වූ මොඝරාජ ක්ෂීණාස්‍රව වූයේ විගත සංයොජන ඇතියේ සිවුමහින් කළ කිස ඇතියේ ආස්‍රව රහිත වූයේ යැ.

18. ත්‍රිවිද්‍යාඇතියේ ලැබූ සෘද්ධි ඇත්තේ ද චෙතොපරියඥානයෙහි නිපුණවූයේ ද වෙයි, හේ සෙන් සහිත මරු දිනා අන්තිම දෙහය ධරා යයි.

මේ අසෙඛභාගිය සූත්‍ර යැ.

" මහණෙනි, තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයෝ රූපයාගේ නිර්වෙද (විදර්ශනා) යෙන් නො ඇලීමෙන් නිරුද්ධ කිරීමෙන් නො ගැනීමෙන් (සමුච්ඡෙදවිමුක්තියෙන්) මිදුණාහු ' සම්බුද්ධ ' යි කියනුලැබෙති. මහණෙනි, මහණ ද (විදර්ශනා වශයෙන්) පඤ්ඤාවිමුත්ත වූයේ රූපයාගේ නිබ්බිදයෙන් විරාගයෙන් නිරොධයෙන් ග්‍රහණය නො කොට විමුක්ත වූයේ ' පඤ්ඤාවිමුත්ත ' යි කියනුලැබේ.

මහණෙනි, තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයෝ වෙදනාවගේ . . . සංඥාවගේ . . . සංස්කාරයන්ගේ . . . විඥානයාගේ නිබ්බිදයෙන් විරාගයෙන් නිරොධයෙන් ග්‍රහණය නො කොට විමුක්ත වූවාහු ' සම්මාසම්බුද්ධ ' යි කියනු ලැබෙති. මහණෙනි, මහණ ද ප්‍රඥාවිමුක්ත වූයේ . . . විඥානයාගේ නිර්වෙදයෙන් විරාගයෙන් නිරුද්ධ කිරීමෙන් (නිත්‍යාදි වශයෙන්) ග්‍රහණය නො කොට කෙලෙසුන් කෙරෙන් මිදුණේ ' පඤ්ඤා විමුත්ත ' යි කියනුලැබේ.

මහණෙනි, එහි ලා පඤ්ඤාවිමුත්ත මහණහු හා තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන්ගේ විශෙෂය කවරෙ යැ අධිකප්‍රයොගය කවරෙ යැ නානාකරණය කවරෙ යැ ' යි ? වහන්ස, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල කොට ඇත්තාහ . . . මහණෙනි, තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයෝ නූපන් ආර්‍යමාර්ගය උපදවන්නාහ, අසංජාත මාර්ගය ජනනය කරන්නාහ, අනෙකක්හු විසින් ප්‍රකාශ නොකළ මාර්ගය ප්‍රකාශ කරන්නාහ, මාර්ගඥයහ මාර්ගය ප්‍රකට කරනුවහ මාර්ගයෙහි නිපුණයහ. තවද මහණෙනි, මෙකල ශ්‍රාවකයෝ මාර්ගය අනුව යන්නාහු පසුව යෙදුණාහු වාස කෙරෙත්. මහණෙනි, පඤ්ඤාවිමුත්ත මහණහු හා තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන්ගේ මේ වූකලි විශෙෂ යැ මේ අධිකප්‍රයොග යැ මේ නානාකරණ යැ " යි.

මේ අසෙඛභාගිය සූත්‍ර යි.

## 3. 4. 5

(ඊ) එහි සංකිලෙසභාගිය ද වාසනාභාගිය ද සූත්‍ර කවරෙ යැ .

1. වසනලද ඇවැත් ඇතියහු කෙලෙස්වැසි අතිශයින් තෙමයි, විවෘත වූයේ අතිශයින් නොතෙමයි, එහෙයින් ප්‍රතිච්ඡන්න වූ ඇවත ප්‍රකට කරවූ, මෙසේ ඒ දොෂය හෙවත් ඇවැත් ඇතියහු කෙලෙස්වැසි අතිශයින් නො තෙමයි.

ඡන්නමතිවස්සති යනු සංකිලෙස යැ, විවටං නාතිවස්සති යනු වාසනා යැ, තස්මා ඡන්නං විවරෙථ එවං තං නාතිවස්සති යනු මේ සංකිලෙස ද වාසනා ද වේ.

මේ සංකිලෙසභාගිය ද වාසනාභාගිය ද සූත්‍ර යැ.

17—ඍබ 04440 (79/06)

“චත්තාරොමෙ මහාරාජ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං කතමෙ චත්තාරො: තමො තමපරායණො, තමො ජොතිපරායණො, ජොති තමපරායණො, ජොති ජොතිපරායණො”ති. තත්ථ යො ච පුග්ගලො ජොති තමපරායණො යො ච පුග්ගලො තමො තමපරායණො, ඉමෙ ද්වෙ පුග්ගලා සංකිලෙසභාගියා; යො ච පුග්ගලො තමො ජොතිපරායණො යො ච පුග්ගලො ජොති ජොතිපරායණො ඉමෙ ද්වෙ පුග්ගලා වාසනාභාගියා”.

ඉදං සංකිලෙසභාගියඤ්ච වාසනාභාගියඤ්ච සුත්තං.

## 3. 4. 6

(6) තත්ථ කතමං සංකිලෙසභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච සුත්තං.

1. “න තං දළ්හං බන්ධනමාහු ධීරා
යදායසං දාරුජං බබ්බජං ච,
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු
පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා”ති

අයං සංකිලෙසො.

2. “එතං දළ්හං බන්ධනමාහු ධීරා
ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං
එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති
අනපෙක්ඛිනො කාමසුඛං පහායා”ති

අයං නිබ්බෙධො

ඉදං සංකිලෙසභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච සුත්තං

“යඤ්ච භික්ඛවෙ චෙතෙති, යඤ්ච පකප්පෙති, යඤ්ච අනුසෙති, ආරම්මණමෙතං හොති විඤ්ඤාණස්ස ඨිතියා ආරම්මණෙ සති පතිට්ඨා තස්ස විඤ්ඤාණස්ස හොති, තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හොති. ආයතිං පුනබ්භවාභිනිබ්බත්තියා සති ආයතිං ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

නො චෙ භික්ඛවෙ චෙතෙති, නො චෙ පකප්පෙති, අථ චෙ අනුසෙති, ආරම්මණමෙතං හොති විඤ්ඤාණස්ස ඨිතියා, ආරම්මණෙ සති පතිට්ඨා තස්ස විඤ්ඤාණස්ස හොති. තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති හොති. ආයතිං පුනබ්භවාභිනිබ්බත්තියා සති ආයතිං ජාතිජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති”ති.

අයං සංකිලෙසො.

" මහරජ ලොවැ විද්‍යමාන වූ මේ පුද්ගලයෝ සතරදෙනෙකි : කවරසතරදෙනෙක යත් : අඳුරෙන් යුතුවැ අඳුරට යන්නේ යැ, අඳුරෙන් යුතු වැ එළියට යන්නේ යැ, එළියෙන් යුතුවැ අඳුරට යන්නේ යැ, එළියෙන් යුතුවැ එළියට යන්නේ යී. ඔවුන් කෙරෙහි යම් පුඟුලෙක් ජොති තමපරායණ ද යම් පුඟුලෙක් තමො තමපරායණ ද, මේ පුඟුලෝ දෙදෙන සංකිලෙසභාගිය වෙති. යම් පුඟුලෙක් තමො ජොතිපරායණ ද යම් පුඟුලෙක් ජොති ජොතිපරායණ ද මේ පුඟුලෝ දෙදෙන වාසනාභාගිය වෙත්.

මේ සංකිලෙසභාගිය ද වාසනාභාගිය ද සූත්‍ර යි.

## 3. 4. 6

(6) එහි සංකිලෙසභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍ර කවරෙ යැ :

1. හැකිලිබැඳුම් සංඛ්‍යාත යමුවා වූ ද අන්දුබන්ධන සංඛ්‍යාත දවමුවා වූ ද රජ්ජුබන්ධන සංඛ්‍යාත බබුස්තණමුවා වූ ද යම් බන්ධනයෙක් ඇද්ද එය බුද්ධාදි පණ්ඩිත පුරුෂයෝ දඬි බැඳුමෙකැයි නො කියති, (අයි ආදියකින් සිදලියැහෙන හෙයිනි.) මිණිකොඬොල් දූපුතුන් අඹුන් කෙරෙහි බලවත් රාගයෙන් ඇලුණු යම් අපෙක්ෂායෙක් ඇද්ද —

මේ සංකිලෙස යැ.

2. (සිවුඅපායෙහි හෙළන හෙයින්) යටට ඇදලන ලිහිල්වූ සිඳීමට දුෂ්කර වූ තෙල බන්ධනය දඬිවූවෙකැයි ධීරයෝ කියති. කාමයන්හි අපෙක්ෂා රහිත වූවාහු තෙල බන්ධනය ද සිඳ කාමසුඛය හැරපියා ගිහිගෙන් නික්මැයෙත් යයි.

මේ නිබ්බෙධ යැ.

මේ සංකිලෙසභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍ර යැ.

" මහණෙනි යම් අරමුණක් (අකුශලචෙතනා වශයෙන්) සිතා ද, යමක් (කාය වාක්කර්මභාවයට පැමිණවීම් වශයෙන්) කෙරේ ද, යමක් (අප්‍රහීණ භාවයෙන් සන්තාන ගතව) පවතී ද, තෙල අරමුණ අභිසංස්කාර විඥානයාගේ පැවැත්මට ප්‍රත්‍යය වෙයි. (යථොක්ත) ආලම්බන සංඛ්‍යාත ප්‍රත්‍යය ඇතිකල්හි (කර්මය දුවවා ප්‍රතිසන්ධි ආකර්ශණයට සමර්ථ බව සපයනුයෙන්) ඒ අභිසංස්කාර විඥානයාගේ පිහිටීම වෙයි. ඒ විඥානය පිහිටි කල්හි විරූඪ කල්හි මතුයෙහි පුනර්භව සංඛ්‍යාත විඥානාදීන්ගේ ඉපදීම වෙයි. මතුයෙහි පුනර්භවයාගේ ඉපදීම ඇතිකල්හි මතුයෙහි ජාති ජරාමරණ ද ශොක පරිදෙව දුක්ඛ දෞමනස්ස උපායාසයෝ ද හටගනිත්. මෙසේ තෙල හුදු දුඃඛරාශිහුගේ සමුදය වේ.

මහණෙනි, ඉදින් (අකුශල චෙතනා) නො සිතා ද, ඉදින් (කායවාක්කර්ම) නො කෙරේ ද, ඉදින් එකල අනුශයවශයෙන් පවතී ද, තෙල අරමුණ අභිසංස්කාර විඥානයාගේ ස්ථිතිය පිණිස වෙයි. ආලම්බනය ඇතිකල්හි ඒ විඥානයාගේ පිහිටීම වෙයි., ඒ විඥානය පිහිටි කල්හි විරූඪ කල්හි මතුයෙහි පුනර්භවයාගේ ඉපදීම වෙයි, මතුයෙහි පුනර්භවයාගේ ඉපදීම ඇතිකල්හි මතුයෙහි ජාති ජරා මරණ ද ශෝක පරිදේව දුක්ඛ දෞමනස්ස උපායාසයෝ ද හටගනිත්. මෙසේ තෙල හුදු දුඃඛරාශිහුගේ සමුදය වේ යයි.

මේ සංකිලෙස යැ.

"යතො ච ඛො භික්ඛවෙ නො චෙතෙති නො ච පකප්පෙති නො ච අනුසෙති ආරම්මණමෙතං න හොති විඤ්ඤාණස්ස ඨිතියා, ආරම්මණෙ අසති පතිට්ඨා තස්ස විඤ්ඤාණස්ස න හොති, තස්මිං අප්පතිට්ඨිතෙ විඤ්ඤාණෙ අවිරූළ්හෙ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති න හොති, ආයතිං පුනබ්භවාභිනිබ්බත්තියා අසති ජාතිජරාමරණං සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

අයං නිබ්බෙධො;

ඉදං සංකිලෙසභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච සුත්තං.

## 3. 4. 7

(7) තත්ථ කතමං සංකිලෙසභාගියඤ්ච අසෙඛභාගියඤ්ච සුත්තං:

"සමුද්දො සමුද්දොති ඛො භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො භාසති. නෙසො භික්ඛවෙ අරියස්ස විනයෙ සමුද්දො, මහා එසො භික්ඛවෙ උදකරාසි මහා උදකණ්ණවො. චක්ඛු භික්ඛවෙ පුරිසස්ස සමුද්දො, තස්ස රූපමයො වෙගො"ති.

අයං සංකිලෙසො;

"යො තං රූපමයං වෙගං සහති, අයං වුච්චති භික්ඛවෙ අතාරි චක්ඛුසමුද්දං සඋම්මිං සාවට්ටං සගාහං[1]. සරක්ඛසං තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො"ති.

අයං අසෙඛො;

"සොතං භික්ඛවෙ -පෙ- ඝානං -පෙ- ජිව්හා -පෙ- කායො -පෙ- මනො භික්ඛවෙ පුරිසස්ස සමුද්දො තස්ස ධම්මමයො වෙගො"ති.

අයං සංකිලෙසො;

"යො තං ධම්මමයං වෙගං සහති, අයං වුච්චති භික්ඛවෙ අතාරි[2] මනොසමුද්දං සඋම්මිං සාවට්ටං සගාහං[1] සරක්ඛසං තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො"ති.

අයං අසෙඛො;

---

1. සගහං – සිමු, මජසං.
2. අතරි – මජසං.

මහණෙනි, යම් තැනෙක පටන් (අකුශලචේතනා වශයෙන්) නොද සිතා ද, නො ද (කායවාක්කර්ම) කෙරේ ද නො ද අනුශය වශයෙන් පවතී ද, තෙල අරමුණ කර්ම විඥානයාගේ පැවැත්මට ප්‍රත්‍යය නො වේ, ආලම්බනය නැති කල්හි ඒ අභිසංස්කාර විඥානයාගේ පිහිටීමෙක් නො වෙයි, ඒ විඥානය අප්‍රතිෂ්ඨිත කල්හි අවිරූඪ කල්හි මතුයෙහි පුනර්භවයාගේ පහළවීමෙක් නො වෙයි, මතුයෙහි පුනර්භවයාගේ අභිනිබ්බත්තිය නැති කල්හි ජාති ජරා මරණ ද සොක පරිදෙව දුක්ඛ දෞමනස්ස උපායාසයෝ ද නිරුද්ධ වෙත්. මෙසේ තෙල සකල දුඃඛස්කන්ධයාගේ නිරොධය වේ '' යයි.

මේ නිබ්බෙධ යැ.

මේ සංකිලෙසභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍ර යි.

## 3. 4. 7

(7) එහි සංකිලෙසභාගිය ද අසෙඛභාගිය ද සූත්‍ර කවරෙ යැ :

'' මහණෙනි, අශ්‍රුතවත් පෘථග්ජන සමුද්ද, සමුද්ද (මුහුද) යි කියයි, මහණෙනි, ආර්‍ය්‍යවිනයෙහි තෙල (ලවණසාගරය) සමුද්ද නො වෙයි, මහණෙනි තෙලෙ මහාඋදක රාශියෙක, මහා උදකාර්ණවයෙකි, මහණෙනි, චක්ෂුස පුරුෂහට සමුද්ද (මුහුද) වෙයි, ඒ චක්ෂුස්සමුද්‍රයාගේ (පියවි මුහුදෙහි අපමණ රළ වේගය සෙයින්) නීලාදී අරමුණු විසින් රූපමය වේගය වේ '' යයි

මේ සංකිලෙස යැ.

'' යමෙක් ඒ රූපමය වේගය (රාගාදි කෙලෙස් නූපදවමින් උපෙක්ෂකභාවයෙන්) ඉවසා ද මහණෙනි මේ තෙමේ (කෙලෙස් නමැති) රළ සහිත වූ (කෙලෙස් නමැති) දිය සුළි සහිත වූ (කෙලෙස් නමැති මකරාදි) ග්‍රාහයන් සහිත වූ (කෙලෙස් නමැති) රකුසන් සහිත වූ චක්ෂුස්සමුද්‍රය තරණය කෙළේ යැ, උත්තීර්ණ වූ ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ නිර්වාණ පාරයට ගියේ නිර්වාණස්ථලයෙහි සිටී යයි කියනුලැබේ '' යි.

මේ අසෙඛ යැ.

'' මහණෙනි, ශ්‍රොත්‍රය ... ඝ්‍රාණය ... ජිහ්වාව ... කායය ... මහණෙනි මනස පුරුෂහට සමුද්‍ර වෙයි, මනස්සමුද්‍රයාගේ (ආලම්බන වූ) ධර්මමය වේගය වේ '' යයි.

මේ සංකිලෙස යැ.

'' යමෙක් ඒ ධර්මමය වේගය (උපෙක්ෂකභාවයෙන්) ඉවසා ද, මහණෙනි මේ තෙමේ (ක්‍රොධ උපායාස වශයෙන්) කෙලෙස් රළ සහිත වූ (කාමගුණවශයෙන්) ස්ලෙයාවර්ත සහිත වූ (මාතුගාම වශයෙන්) ග්‍රාහයන් සහිත වූ රාක්ෂසයන් සහිත වූ මනස්සමුද්‍රය තරණය කෙළේ යැ, උත්තීර්ණ ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ නිර්වාණපාරයට ගියේ නිර්වාණස්ථලයෙහි සිටී යයි කියනු ලැබේ '' යි.

මේ අසෙඛ යැ.

“ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො, අථාපරං එතදවොච සත්ථා :

1. “යො ඉමං සමුද්දං සගාහං[1] සරක්ඛසං
සඋම්මිභයං දුත්තරං අච්චතරි,[2]
ස වෙදගූ වුසිතබ්‍රහ්මචරියො
ලොකන්තගූ පාරගතො’ති වුච්චතී’’ති.

අයං අසෙඛො ;

ඉදං සංකිලෙසභාගියඤ්ච අසෙඛභාගියඤ්ච සුත්තං.

“ඡ ඉමෙ භික්ඛවෙ බළිසා ලොකස්මිං අනයාය සත්තානං බ්‍යාබාධාය[3] පාණීනං. කතමෙ ඡ ; සන්ති භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා ; තං චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු ගිලබළිසො මාරස්ස අනයං ආපන්නො බ්‍යසනං ආපන්නො යථාකාමකරණීයො පාපිමතො.

සන්ති භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්දා-පෙ-ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා-පෙ-ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා-පෙ-කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා-පෙ-මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු ගිලබළිසො මාරස්ස අනයං ආපන්නො බ්‍යසනං ආපන්නො යථාකාමකරණීයො පාපිමතො’’ති.

අයං සංකිලෙසො ,

“සන්ති ච ඛො භික්ඛවෙ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති න අජ්ඣොසාය තිට්ඨති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු න ගිලබළිසො මාරස්ස අභෙදි බළිසං පරිභෙදි බළිසං න අනයං ආපන්නො න බ්‍යසනං ආපන්නො න යථාකාමකරණීයො පාපිමතො.

සන්ති ච භික්ඛවෙ සොතවිඤ්ඤෙය්‍යා සද්දා - පෙ - ඝාන - ජිව්හා - කාය - මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තං චෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු න ගිලබළිසො මාරස්ස අභෙදි බළිසං පරිභෙදි බළිසං න අනයං ආපන්නො න බ්‍යසනං ආපන්නො න යථාකාමකරණීයො පාපිමතො”ති.

අයං අසෙඛො ;

ඉදං සංකිලෙසභාගියඤ්ච අසෙඛභාගියඤ්ච සුත්තං

1. සගහං - සිමු. මජ්සං.
2. අච්චතරි - මජ්සං.
3. බ්‍යාපාදය - සිමු.

බුදුහු මේ වදළහ. මේ වදරා යළි සුගත වූ ශාස්තෘන් වහන්සේ අන්‍ය වූ තෙල ගාථාව වදළහ.

1. යමෙක් ග්‍රාහයන් සහිත වූ රාක්ෂසයන් සහිත වූ ඌර්මිභය සහිත වූ උත්තරණය දුෂ්කර වූ මේ චක්ෂුරාදි සමුද්‍රය ඉක්මැවූයේ ද, මාර්ගඥානවෙදයාගේ අන්තයට ගිය වැසූ නිමවූ මහබඹසර ඇති ඒ ක්ෂීණාශ්‍රව සංස්කාරලොකයෙහි අන්තයට ගියේ යැ, නිර්වාණ පාරයට ගියේ යැයි කියනු ලැබෙ.

මේ අසෙඛ යැ.

මේ සංකිලෙසභාගිය ද අසෙඛභාගිය ද සූත්‍ර යැ.

" මහණෙනි, ලොවැ මේ බඩිශයෝ (බිළි) සදෙනෙක් සත්ත්වයන්ට අනර්ථ පිණිස ප්‍රාණීන්ට දුක් පිණිස පවත්නාහු වෙති, කවර සදෙනෙක යත් : මහණෙනි, ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන ප්‍රියස්වභාව වූ ක්ලෙශකාම සහිත වූ සිත් අලවන චක්ෂුර්විඥානයෙන් දතයුතු රූපයෝ ඇත. ඉදින් මහණ ඒ රූපයට සප්‍රීතික තෘෂ්ණායෙන් සතුටු වේ ද තෘෂ්ණා වශයෙන් බෙණේ ද, එහි ගැලිසිටී ද මහණෙනි මේ මහණ ක්ලෙශමාරයාගේ රූප තෘෂ්ණාබඩිශය ගිලගෙන සිටියේ අනර්ථයට පැමිණියේ පාපිමත්හු විසින් රිසිසේ කටයුතු බවට පැමිණියේ යයි කියනු ලැබෙ.

මහණෙනි, ශ්‍රොත්‍රවිඥෙය ශබ්දයෝ ... ඝ්‍රාණවිඥෙයගන්ධයෝ ජිව්භාවිඥෙය රසයෝ ... කායවිඥෙය ස්ප්‍රෂ්ටව්‍යයෝ ... ඉෂ්ට කාන්ත මනාප ප්‍රියරූප කාමොපසංහිත රජනීය වූ මනොවිඥෙය ධර්මයෝ ඇත. ඉදින් මහණ ඒ ධර්මාලම්බනය සතුටුවේ ද, ප්‍රියබස් කියා ද එහි ගැලී සිටී ද මහණෙනි, මේ මහණ කෙලෙස්මරහුගේ ධර්මාලම්බන නමැති බිළිය ගිලගෙන සිටියේ අනර්ථයට පැමිණියේ ව්‍යසනයට පැමිණියේ පාපිමත්හු විසින් යථාකාමකරණීය වූයේ යයි කියනු ලැබෙ "යි.

මේ සංකිලෙස යැ.

" තවද මහණෙනි, ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමොපසංහිත වූ රජනීය වූ රූපයෝ ඇත්තාහ. ඉදින් මහණ ඒ රූපයට තෘෂ්ණාවශයෙන් සතුටු නොවේ ද තෘෂ්ණාවශයෙන් නො බෙණේ ද එහි ගැලී නො සිටී ද, මහණෙනි මේ මහණ කෙලෙස් මරහුගේ රූපතෘෂ්ණාබඩිශය ගිලගෙන නො සිටියේ මාරබළිසය බින්දේ යැ, මාරබළිසය හාත්පසින් බින්දේ යැ, අනර්ථයට නො පැමිණියේ ව්‍යසනයට නො පැමිණියේ පාපිමත්හු විසින් යථාකාමකරණීය නො වූයේ යයි කියනු ලැබෙ.

මහණෙනි, ශ්‍රොතවිඥෙය වූ ශබ්දයෝ ... ඝ්‍රාණ ... ජිහ්වා ... කාය ... මනො විඥෙය වූ ඉෂ්ට කාන්ත මනාප ප්‍රියස්වරූප කාමොපසංහිත රජනීය වූ ධර්මාලම්බනයෝ ඇත්තාහ, ඉදින් මහණ ඒ ධර්මාලම්බනයට තෘෂ්ණාවශයෙන් සතුටු නො වේ ද, තෘෂ්ණා වශයෙන් නො බෙණේ ද, එහි ගැලී නො සිටී ද, මහණෙනි මේ මහණ මාරයාගේ ධර්ම තෘෂ්ණා නමැති බළිසය ගිලගෙන නො සිටියේ මාරබළිසය බින්දේ යැ, මාරබළිසය හාත්පසින් බින්දේ යැ. අනර්ථයට නො පැමිණියේ ව්‍යසනයට නො පැමිණියේ පාපි මත්හු විසින් කැමැතිසේ කළයුතු නො වූයේ මැයි කියනු ලැබෙ " යි.

මේ අසෙඛ යැ.

මේ සංකිලෙසභාගිය ද අසෙඛභාගිය ද සූත්‍ර යි.

## 3. 4. 8

(8) තත්ථ කතමං සංකිලෙසභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච අසෙඛභාගියඤ්ච සුත්තං :

1. “අයං ලොකො සන්තාපජාතො
ඵස්සපරෙතො රොදං[1] වදති අත්තතො,[2]
යෙන යෙන හි මඤ්ඤති
තතො තං හොති අඤ්ඤථා

2. අඤ්ඤථාභාවී භවසත්තො ලොකො
භවපරෙතො භවමෙවාභිනන්දති,
යදභිනන්දති තං භයං
යස්ස භායති තං දුක්ඛ”න්ති

අයං සංකිලෙසො ;

“භවවිප්පහානාය ඛො පනිදං බ්‍රහ්මචරියං වුස්සතී”ති.

අයං නිබ්බෙධො ;

“යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා භවෙන භවස්ස විප්පමොක්ඛමාහංසු, සබ්බෙ තෙ අවිප්පමුත්තා භවස්මා’ති වදාමි.

යෙ වා පන කෙචි සමණා වා බ්‍රාහ්මණා වා විභවෙන භවස්ස නිස්සරණමාහංසු, සබ්බෙ තෙ අනිස්සටා භවස්මා’ති වදාමි. උපධි හි[3] පටිච්ච දුක්ඛමිදං සම්භොතී”ති.

අයං සංකිලෙසො ;

“සබ්බුපාදානක්ඛයා නත්ථි දුක්ඛස්ස සම්භවො”ති.

අයං නිබ්බෙධො ;

“ලොකමිමං පස්ස, පුථූ අවිජ්ජාය පරෙතං භූතං භූතරතං භවා අපරිමුත්තං.[4] යෙ හි කෙචි භවා සබ්බධි සබ්බත්ථතාය[5] සබ්බෙ තෙ භවා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා”ති.

අයං සංකිලෙසො ;

3. “එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො,
භවතණ්හා පහීයති විභවං නාභිනන්දති

---

1. රොගං – උදාන, මජ්සං.
2. අත්තතො – උදාන.
3. උපධිංහි – මජ්සං.
4. භූතා භූතරතා යනාදි ප්‍රථමා බහුවචන යුක්ත පුරාණ පාඨයෙක් ද ඇත.
5. සබ්බත්ථතායං – සිමු.

## 3. 4. 8

(8) එහි සංකිලෙසභාගිය ද නිබ්බෙධභාගිය ද අසෙඛභාගිය ද සූත්‍ර කවරේ යැ :

1. මේ සත්ත්වලෝක තෙමේ (ඥතිව්‍යාසනාදීන්) උපන් ශෝක සන්තාප ඇත්තේ නොයෙක් දුඃඛස්පර්ශයෙන් මඩනාලදුයේ තමා විසින් පහස්නා ලද දුක (මෙබන්දක් මාගේ සතුරකුටත් නොවේවයි) වැළපෙමින් කියයි. (රොගා වදති අත්තතො යන පාඨයෙහි ඵස්සපච්චයෙන් උපදනා වෙදනා සංඛ්‍යාත රොගය ආත්මවශයෙන් කියයි). යම් යම් පරිද්දෙකින් මැ තමාගේ දුකට පිළියම් සිතත් ද, ඒ දුකට එයින් අන් පරිද්දෙකින් පිළියම් කටයුතු වේ.

2. කාමාදි භවයෙහි හෝ අභිවෘද්ධියෙහි ඇලුණු ලෝවැසි තෙමේ (තමා සිතන සැටියෙන්) අන් පරිද්දෙකින් මැ වනසුලු වෙයි. එතෙකුදුවත් භවයෙහි ඇලුණේ භවය මැ කැමැති වෙයි, (ප්‍රාර්ථනා කෙරෙයි,) යම් භවයක් හෝ අභිවෘද්ධියක් කැමැති වේ ද, එය බියෙකි. යම් ජරාමරණාදියෙකින් බිය වේ ද, එය දුකෙකි ' යි

මේ සංකිලේස යැ.

'' යළි භවය වෙසෙසින් ප්‍රහාණය පිණිස මැ මේ (මා විසින් අධිගත) මහ බඹසර වෙසෙන්නේ යැ '' යන—

මේ නිබ්බෙධ යැ.

'' යම් කිසි මහණකෙනෙක් වේවයි බමුණුකෙනෙක් වේවයි රූපභවයෙන් හෝ අරූපභවයෙන් නොහොත් භවදෘෂ්ටියෙන් භව (සංසාර) යාගේ මිදීම (ශුද්ධිය) කියත් ද, ඔහු සියල්ලෝ භවයෙන් නොමිදුණාහ ' යි කියමි.

'' යළි යම් මහණකෙනෙක් වේවයි බමුණුකෙනෙක් වේවයි උච්ඡෙදයෙන් භවයාගේ නිස්සරණය කියත් ද, ඔහු සියල්ලෝ භවයෙන් නො නික්මුණා ' යි කියමි. බන්ධාදි උපධීන් නිසා මේ සසරදුක හටගනී '' යන —

මේ සංකිලේස යැ.

'' සියලු කාමාදි උපාදානයන්ගේ ක්ෂයවීමෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැත,'' යන —

මේ නිබ්බෙධ යැ.

(බුදුහු තමන් වහන්සේගේ සිත අමතන සේක :) වෙන වෙන පඤ්චස්කන්ධ වූ අවිද්‍යායෙන් මඩනාලද ස්ත්‍රීපුරුෂයන් ඔවුනොවුන් කෙරෙහි ඇලුණු එහෙයින් ම භවයෙන් නො මිදුණු මේ සත්ත්වලොකය බල. (ප්‍රථමාබහුවචන පාඨයෙහි : ' මේ සත්ත්වලොකය බල ' බොහෝ වූ නොහොත් වෙන් වෙන් වූ අවිද්‍යායෙන් වැඩුණු භූත සංඛ්‍යාත පඤ්චස්කන්ධයෝ මවුපිය දුදරු ආදි සංඥයෙන් ඔවුනොවුන් කෙරෙහි ඇලුණාහු භවයෙන් නොමිදුණාහ,) යම් කිසි කාමාදි භවයෝ වෙත් ද, උඩ යට ආදි සියලු තැන්හි සර්ව භාවයෙන් ඒ හැම භවයෝ අනිත්‍යයහ දුඃඛයහ විපරිණාමස්වභාව වූහ '' යි.

මේ සංකිලෙස යැ.

3. මෙසේ ත්‍රිලක්ෂණ ප්‍රතිවෙධාකාරයෙන් තෙල භව සංඛ්‍යාත පඤ්චස්කන්ධය තත්වූ පරිදි විදර්ශනා සහිත මාර්ගඥානයෙන් දක්නාහට භවතෘෂ්ණාව ප්‍රහීණ වෙයි, උච්ඡෙදය ද නො කැමැති වේ.

සබ්බසො තණ්හානං ඛයා[1] අසෙසවිරාගනිරොධො නිබ්බාන''න්ති.

අයං නිබ්බෙධො;

4. "තස්ස නිබ්බුතස්ස භික්ඛුනො,
අනුපාදනා පුනබ්භවො න හොති,
අභිභූතො මාරො විජිතසඞ්ගාමො[2]
උපච්චගා සබ්බභවානි තාදී''ති.

අයං අසෙඛො;

ඉදං සංකිලෙසභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච අසෙඛභාගියඤ්ච සුත්තං.

"චත්තාරො'මෙ භික්ඛවෙ පුග්ගලා. කතමෙ චත්තාරො: අනුසොතගාමී පටිසොතගාමී ඨිතත්තො තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො''ති.

තත්ථ යො'යං පුග්ගලො අනුසොතගාමී, අයං පුග්ගලො සංකිලෙසභාගියො. තත්ථ යො ච පුග්ගලො පටිසොතගාමී යො ච ඨිතත්තො, ඉමෙ ද්වෙ පුග්ගලා නිබ්බෙධභාගියා. තත්ථ යො'යං පුග්ගලො තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො, අයං අසෙඛො.

ඉදං සංකිලෙසභාගියං ච නිබ්බෙධභාගියං ච අසෙඛභාගියං ච සුත්තං

## 3. 4. 9

(9) තත්ථ කතමං සංකිලෙසභාගියං ච වාසනාභාගියං ච නිබ්බෙධභාගියං ච සුත්තං:

"ඡළාභිජාතියො: අත්ථි පුග්ගලො කණ්හො කණ්හාභිජාතිකො කණ්හං ධම්මං අභිජායති, අත්ථි පුග්ගලො කණ්හො කණ්හාභිජාතිකො සුක්කං ධම්මං අභිජායති, අත්ථි පුග්ගලො කණ්හො කණ්හාභිජාතිකො අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං අච්චන්තනිට්ඨං[3] නිබ්බානං ආරාධෙති, අත්ථි පුග්ගලො සුක්කො සුක්කාභිජාතිකො කණ්හං ධම්මං අභිජායති. අත්ථි පුග්ගලො සුක්කො සුක්කාභිජාතිකො සුක්කං ධම්මං අභිජායති, අත්ථි පුග්ගලො සුක්කො සුක්කාභිජාතිකො අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං අච්චන්තනිට්ඨං නිබ්බානං ආරාධෙති

තත්ථ යො ච පුග්ගලො කණ්හො කණ්හාභිජාතිකො කණ්හං ධම්මං අභිජායති, යො ච පුග්ගලො සුක්කො සුක්කාභිජාතිකො කණ්හං ධම්මං අභිජායති, ඉමෙ ද්වෙ පුග්ගලා සංකිලෙසභාගියා.

---

1. තණ්හාසංඛයා - සිමු.
2. විජිතො සංගාමො - සිමු.
3. අච්චන්තං නිට්ඨං - සිමු.

සර්වප්‍රකාරයෙන් තෘෂ්ණාවන්ගේ ක්ෂය වීමෙන් අශේෂ කොට ආර්‍යමාර්ගයෙන් වූ අනුත්පාදනිරොධය නිර්වාණ යැ '' යන —

මේ නිබ්බෙධ යැ.

4. ඒ කෙලෙස් පිරිනිවනින් නිවුණු මහණහට උපාදාන රහිත හෙයින් පුනර්භවය නො වේ. ක්ලෙශාදි පඤ්චමාර මඩනාලද, ක්ලෙශසඞ්ග්‍රාමය දිනාලද, සුඛදුක්ඛාදියෙහි තාදී වූයේ සියලු භවයන් ඉක්මැවූයේ '' යි.

මේ අසේඛ යැ.

මේ උදානය සංකිලෙසභාගිය ද නිබ්බෙධභාගිය ද අසෙඛභාගිය ද සූත්‍ර යැ.

'' මහණෙනි, මේ පුද්ගලයෝ සතරදෙනෙක, කවර සතරදෙනෙක යත් : අනුසොතගාමී යැ, පටිසොතගාමී යැ, ඨිතත්ත යැ, චතුරොඝතරණය කොට පරතෙරට ගිය නිවන් තෙලෙහි සිටුනා ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ යැ යන මොහු යි.

මේ පුද්ගලන් සතරදෙනා කෙරෙහි යම් පුහුලෙක් අනුසොතගාමී වේ ද මේ පුද්ගල සංකිලෙසභාගී යැ, එහි යම් පුහුලෙක් පටිසොතගාමී වේ ද, යම් පුහුලෙක් ඨිතත්ත වේ ද මේ පුද්ගලයෝ දෙදෙන නිබ්බෙධභාගිය වෙති, එහි යම් පුහුලෙක් ඔඝතරණය කොට පාරයට ගියේ නිවන්තෙලෙහි සිටුනා බ්‍රාහ්මණ වේ ද මේ පුද්ගල අසෙඛ යි.

මේ සංකිලෙසභාගිය ද නිබ්බෙධභාගිය ද අසෙඛභාගිය ද සූත්‍ර යි.

## 3. 4. 9

(9) එහි සංකිලෙසභාගිය ද වාසනාභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍ර කවරෙ යැ :

'' අභිජාතීහු සදෙනෙකි : කෘෂ්ණ වූ කෘෂ්ණාභිජාති (නීචකුල) ඇති පුද්ගලයෙක් ඇත, හේ කෘෂ්ණ වූ අකුශලධර්මය රැස්කෙරෙයි, කෘෂ්ණ වූ කෘෂ්ණාභිජාති ඇති පුද්ගලයෙක් ඇත, හේ ශුක්ල වූ කුශලධර්මය රැස්කෙරෙයි, කෘෂ්ණ වූ කෘෂ්ණාභිජාති ඇති පුද්ගලයෙක් ඇත, හේ අකෘෂ්ණ අශුක්ල වූ අකණ්හඅසුක්කවිපාක උපදවන අත්‍යන්තනිෂ්ඨා වූ අර්හත්ව සංඛ්‍යාත නිවන උපදවයි. ශුක්ල වූ ශුක්ලාභිජාති (උසස්කුල) ඇති පුහුලෙක් ඇත, හේ අකුශලධර්ම රැස්කෙරෙයි, ශුක්ල වූ ශුක්ලාභිජාති ඇති පුහුලෙක් ඇත, හේ කුශලධර්ම රැස්කෙරෙයි, ශුක්ල වූ ශුක්ලාභිජාති ඇති පුහුලෙක් ඇත, හේ අකෘෂ්ණ අශුක්ල වූ අකෘෂ්ණඅශුක්ල විපාක ඇති අත්‍යන්තනිෂ්ඨා වූ අර්හත්ව සංඛ්‍යාත නිවන උපදවයි.

ඒ පුහුලන් සදෙනා කෙරෙහි යම් පුහුලෙක් කෘෂ්ණ වූ කෘෂ්ණජාති ඇතියේ අකුශල ධර්ම රැස්කෙරේ ද, යම් පුහුලෙක් ශුක්ල වූ ශුක්ලාභිජාති ඇතියේ අකුශලධර්ම රැස්කෙරේ ද මේ පුද්ගලයෝ දෙදෙන සංකිලෙසභාගිය වෙති.

තත්ථ යො ච පුග්ගලො කණ්හො කණ්හාභිජාතිකො සුක්කං ධම්මං අභිජායති, යො ච පුග්ගලො සුක්කො සුක්කාභිජාතිකො සුක්කං ධම්මං අභිජායති, ඉමෙ ද්වෙ පුග්ගලා වාසනාභාගියා.

තත්ථ යො ච පුග්ගලො කණ්හො කණ්හාභිජාතිකො අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං අච්චන්තනිට්ඨං නිබ්බානං ආරාධෙති, යො ච පුග්ගලො සුක්කො සුක්කාභිජාතිකො අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං අච්චන්තනිට්ඨං නිබ්බානං ආරාධෙති, ඉමෙ ද්වෙ පුග්ගලා නිබ්බෙධභාගියාති.

ඉදං සංකිලෙසභාගියඤ්ච වාසනාභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච සුත්තං.

"චත්තාරිමානි භික්ඛවෙ කම්මානි. කතමානි චත්තාරි: අත්ථි කම්මං කණ්හං කණ්හවිපාකං, අත්ථි කම්මං සුක්කං සුක්කවිපාකං, අත්ථි කම්මං කණ්හං සුක්කං කණ්හසුක්කවිපාකං, අත්ථි කම්මං අකණ්හං අසුක්කං අකණ්හඅසුක්කවිපාකං කම්මං කම්මුත්තමං කම්මසෙට්ඨං කම්මක්ඛයාය සංවත්තති".

තත්ථ යඤ්ච කම්මං කණ්හං කණ්හවිපාකං, යඤ්ච කම්මං කණ්හං සුක්කං කණ්හසුක්කවිපාකං, අයං සංකිලෙසො. යඤ්ච කම්මං සුක්කං සුක්කවිපාකං, අයං වාසනා. යඤ්ච කම්මං අකණ්හං අසුක්කං අකණ්හ අසුක්කවිපාකං කම්මං කම්මුත්තමං කම්මසෙට්ඨං කම්මක්ඛයාය සංවත්තති, අයං නිබ්බෙධොති.

ඉදං සංකිලෙසභාගියඤ්ච වාසනාභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච සුත්තං.

## 3. 4. 10

(10) තත්ථ කතමං වාසනාභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච සුත්තං:

1. "ලද්ධාන මානුසත්තං ද්වෙ කිච්චං අකිච්චමෙව ච,
සුකිච්චං චෙව පුඤ්ඤානි සංයොජනවිප්පහානං වා"ති.

"සුකිච්චං චෙව පුඤ්ඤානී"ති වාසනා; "සංයොජනවිප්පහානං වා"ති නිබ්බෙධො;

2. "පුඤ්ඤානි කරිත්වාන සග්ගා සග්ගං වජන්ති කතපුඤ්ඤා,
සංයොජනප්පහානා ජරාමරණා විමුච්චන්තී"ති.

"පුඤ්ඤානි කරිත්වාන සග්ගා සග්ගං වජන්ති කතපුඤ්ඤා"ති වාසනා; "සංයොජනප්පහානා ජරාමරණා විමුච්චන්තී"ති නිබ්බෙධොති.

ඉදං වාසනාභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච සුත්තං.

එහි යම් පුහුලෙක් කෘෂ්ණ වූයේ කෘෂ්ණාභිජාති ඇතියේ කුශලධර්ම රැස්කෙරේ ද, යම් පුහුලෙක් ශුක්ල වූ ශුක්ලාභිජාති ඇතියේ කුශලධර්ම රැස්කෙරේ ද, මේ පුද්ගලයෝ දෙදෙන වාසනාභාගිය වෙති.

එහි යම් පුහුලෙක් කෘෂ්ණ වූ කෘෂ්ණාභිජාති ඇතියේ අකෘෂ්ණ අශුක්ල වූ අකෘෂ්ණ ශුක්ල විපාක ඇති අත්‍යන්ත නිෂ්ඨා වූ අර්හත්ව සංඛ්‍යාත නිවන ආරාධනය කෙරේ ද, යම් පුහුලෙක් ශුක්ල වූ ශුක්ලාභිජාති ඇතියේ අකෘෂ්ණ අශුක්ල වූ අකෘෂ්ණාශුක්ල විපාක ඇති අත්‍යන්තනිෂ්ඨා වූ අර්හත්ව සංඛ්‍යාත නිර්වාණය අධිගම කෙරේ ද, මේ පුද්ගලයෝ දෙදෙන නිබ්බෙධභාගිය වූවාහු '' යයි.

මේ සංකිලෙසභාගිය ද වාසනාභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍ර යැ.

'' මහණෙනි, මේ කර්මයෝ සතරදෙනෙකි, කවර සතරදෙනෙක යත් : කෘෂ්ණ වූ කෘෂ්ණවිපාක ඇති කර්මයෙක් ඇත, ශුක්ල වූ ශුක්ලවිපාක ඇති කර්මයෙක් ඇත, කෘෂ්ණ ශුක්ල වූ කෘෂ්ණශුක්ලවිපාක ඇති කර්මයෙක් ඇත, අකෘෂ්ණ අශුක්ල වූ අකෘෂ්ණාශුක්ල විපාක ඇති කර්මයෙක් ඇත, කර්මයන් කෙරෙහි උත්තම වූ කර්මශ්‍රෙෂ්ඨ වූ ඒ කර්මය කර්මක්ෂය පිණිස පවත්නේ '' යි.

එහි කෘෂ්ණ වූ කෘෂ්ණවිපාක ඇති යම් කර්මයෙකුත් කෘෂ්ණ ශුක්ල වූ කෘෂ්ණශුක්ල විපාක ඇති යම් කර්මයෙකුත් වේ ද, මේ සංකිලෙස යැ. එහි ශුක්ල වූ ශුක්ලවිපාක ඇති යම් කර්මයෙකුත් වේ ද, මේ වාසනා යැ. අකෘෂ්ණ අශුක්ල වූ අකෘෂ්ණාශුක්ලවිපාක ඇති යම් කර්මයෙක් වේ ද, කර්මොත්තම වූ කර්මශ්‍රෙෂ්ඨ වූ ඒ කර්මය කර්මක්ෂය පිණිස පවතී. මේ නිබ්බෙධ යි.

මේ සංකිලෙසභාගිය ද වාසනාභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍ර යි.

## 3. 4. 10

(10) එහි වාසනාභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍ර කවරෙ යැ.

1. මනුෂ්‍යභාවය ලැබ කටයුතු දය ද නො කටයුතු දය ද යන දෙක කෙරෙති. එහෙත් මොනොවට කටයුතු වූයේ කුසල් හෝ සංයොජනය ප්‍රහාණය හෝ යි.

'සුකිච්චං චෙවපුඤ්ඤානි' යනු වාසනා යැ. 'සංයොජනවිප්පහානං, යනු නිබ්බෙධ යි.

2. පින්කම් කොට කළ පින් ඇත්තාහු ස්වර්ගයෙන් ස්වර්ගයට යෙති සංයොජන යන්ගේ ප්‍රහාණයෙන් ජරාමරණයෙන් මිදෙත් යයි.

'පුඤ්ඤානි කරිත්වාන සග්ගා සග්ගං වජන්ති කතපුඤ්ඤා' යනු වාසනායැ. 'සංයොජනප්පහානා ජරාමරණං විමුච්චන්ති' යනු නිබ්බෙධ යි.

මේ වාසනා භාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍ර යැ.

"ද්වෙමානි භික්ඛවෙ පධානානි, කතමානි ද්වෙ : යො ච අගාරස්මා අනගාරියං පබ්බජිතෙසු චීවර-පිණ්ඩපාත-සෙනාසන-ගිලානපච්චය-භෙසජ්ජපරික්ඛාරං පරිච්චජති, යො ච අගාරස්මා අනගාරියං පබ්බජිතෙසු සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාන"න්ති.

තත්ථ "යො අගාරස්මා අනගාරියං පබ්බජිතෙසු චීවර-පෙ-පරික්ඛාරං පරිච්චජති," අයං වාසනා, "යො අගාරස්මා අනගාරියං පබ්බජිතෙන සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං"

අයං නිබ්බෙධො ;

ඉදං වාසනාභාගියඤ්ච නිබ්බෙධභාගියඤ්ච සුත්තං.

තත්ථ තණ්හාසංකිලෙසභාගියං සුත්තං තණ්හාපක්ඛෙනෙව නිද්දිසිතබ්බං. තීහි තණ්හාහි : කාමතණ්හාය භවතණ්හාය විභවතණ්හාය. යෙන යෙන වා පන වත්ථුනා අජ්ඣොසිතා තෙන තෙනෙව නිද්දිසිතබ්බා. තස්සා තණ්හාය විත්ථාරෙ ඡත්තිංසතණ්හාජාලිනියා විචරිතානි.

තත්ථ දිට්ඨිසංකිලෙසභාගියං සුත්තං දිට්ඨිපක්ඛෙනෙව නිද්දිසිතබ්බං උච්ඡෙදසස්සතෙන, යෙන යෙන වා පන වත්ථුනා දිට්ඨිවසෙන අභිනිවිසති ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති තෙන තෙනෙව නිද්දිසිතබ්බං තස්සා විත්ථාරෙ-ද්වාසට්ඨි දිට්ඨිගතානි.

තත්ථ දුච්චරිතසංකිලෙසභාගියං සුත්තං චෙතනාය චෙතසිකකම්මෙන නිද්දිසිතබ්බං, තීහි දුච්චරිතෙහි : කායදුච්චරිතෙන වචීදුච්චරිතෙන මනොදුච්චරිතෙන. තස්ස විත්ථාරෙ දසඅකුසලකම්මපථා.

තත්ථ තණ්හාවොදානභාගියං සුත්තං සමථෙන නිද්දිසිතබ්බං. දිට්ඨිවොදානභාගියං සුත්තං විපස්සනාය නිද්දිසිතබ්බං. දුච්චරිත වොදානභාගියං සුත්තං සුචරිතෙන නිද්දිසිතබ්බං.

තීණි අකුසලමූලානි, තං කිස්ස හෙතු සංසාරස්ස නිබ්බත්තියා, තථා නිබ්බත්තෙන සංසාරෙ කායදුච්චරිතං කායසුචරිතං වචීදුච්චරිතං වචීසුචරිතං මනොදුච්චරිතං මනොසුචරිතං.

ඉමිනා අසුභෙන කම්මවිපාකෙන ඉදං බාලලක්ඛණං නිබ්බත්තතීති.

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

ඉමිනා සුභෙන කම්මවිපාකෙන ඉදං මහාපුරිසලක්ඛණං නිබ්බත්තතී'ති.

ඉදං වාසනාභාගියං සුත්තං.

මහණෙනි, මේ ප්‍රධන්විර්යයෝ (නොහොත්) උත්තම කර්මයෝ) දෙදෙනෙක් වෙති, කවර දෙදෙනෙක යත් : යමෙක් ගිහිගෙන් නික්මැ සසුන්හි පැවිදිවූවන් විෂයෙහි සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර පරිත්‍යාග කෙරේ ද, ගිහිගෙන් නික්මැ සසුන්හි පැවිදිවූවන් කෙරෙහි යම් සියලු උපධීන්ගේ දුරැලීමෙක් තෘෂ්ණාක්ෂය යෙක් විරාග සංඛ්‍යාත මාර්ගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් ඇද්ද, යන මේ දෙක,, යි.

එහි යමෙක් ගිහිගෙන් නික්මැ සසුන්හි පැවිදිවූවන් විෂයෙහි සිවුරු ... පිරිකර පරිත්‍යාග කෙරේ ද, '' මේ වාසනා යැ. ගිහිගෙන් නික්මැ සසුන්හි පැවිදි වූවන් කෙරෙහි යම් සියලු උපධීන්ගේ දුරැලීමෙක් තෘෂ්ණාක්ෂයයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් ඇද්ද' මේ නිබ්බෙධ යි.

මේ වාසනාභාගිය ද නිබ්බෙධභාගිය ද සූත්‍ර යි.

ඒ සොළොස් වැදැරුම් සූත්‍රයන් කෙරෙහි තණ්හාසංකිලෙසභාගිය සූත්‍රය තෘෂ්ණා පක්ෂයෙන් මැ දක්විය යුතු යැ. කාමතණ්හායෙන් භවතණ්හායෙන් විභවතණ්හායෙන් යන තණ්හා තුනෙනි, නොහොත් උච්ඡෙදදි යම් යම් වස්තුයෙකින් බැසගන්නා ලද ද ඒ ඒ වස්තුයෙන් මැ දක්විය යුතු යැ. ඒ තෘෂ්ණාවගේ විස්තරය ෂට්ත්‍රිංශත් තෘෂ්ණා ජාලිනියගේ විවරිතයෝ යි.

එහි දිට්ඨිසංකිලේසභාගිය සූත්‍රය දෘෂ්ටිපක්ෂයෙන් මැ දක්විය යුතු යැ. උච්ඡෙද ශාස්වත දෘෂ්ටි දෙකෙහි නොහොත් අමරාවික්ඛෙපාදි යම් යම් වස්තුයෙකින් මෙය මැ සැබැවැ අන්‍යය තුච්ඡ යැ යි දෘෂ්ටිවශයෙන් බැසගනී ද, ඒ ඒ වස්තුයෙන් මැ දක්විය යුතුයැ. ඒ දෘෂ්ටියගේ විස්තරය දෙසැට දෘෂ්ටිගතයෝ යි.

එහි දුශ්චරිත සංකිලෙසභාගිය සූත්‍රය චෙතනායෙන් ද චෛතසික කර්මයෙන් ද දක්විය යුතු යැ. කායදුශ්චරිතයෙන් වාග්දුශ්චරිතයෙන් මනොදුශ්චරිතයෙන් යන තුන් දුශ්චරිතයෙනි. ඒ දුශ්චරිතයාගේ විස්තරය දශඅකුශල කර්මපථයෝ යි.

එහි තණ්හාවොදනභාගිය සූත්‍රය සමථයෙන් දක්විය යුතු යැ. දිට්ඨිවොදනභාගිය සූත්‍රය විදර්ශනායෙන් දක්විය යුතු යැ. දුච්චරිතවොදනභාගිය සූත්‍රය සුචරිතයෙන් දක්විය යුතු යි.

අකුශලමූලයෝ තිදෙනෙක් වෙති, ඒ කවරහෙයින යත් : සංසාරයාගේ ඉපදීම ඇති හෙයිනි. එසේ උපන් සසරෙහි කායදුශ්චරිත යැ කායසුචරිත යැ වාග්දුශ්චරිත යැ වාග්සුචරිත යැ මනොදුශ්චරිත යැ මනස්සුචරිත යැ (යන මේ උපදවයි).

මේ කායදුශ්චරිතාදි අනිෂ්ට වූ කර්මවිපාකයෙන් (පූර්වභවයෙහි දුශ්චරිතසමඞ්ගී බැවින් මේ බාලයෙකැයි දක්වා ලියැහෙන) බාලලක්ෂණය උපදී යයි.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

මේ කායසුචරිතාදි ඉෂ්ට වූ කර්මවිපාකයෙන් (පූර්වභවයෙහි සුචරිත සමඞ්ගී බැවින් මේ පණ්ඩිතයෙකැ යි දක්වා ලියැහෙන) මේ මහාපුරුෂ (පණ්ඩිත) ලක්ෂණය උපදී '' යයි.

මේ වාසනාභාගිය සූත්‍ර යි.

තත්ථ සංකිලෙසභාගියං සුත්තං චතූහි කිලෙසභූමීහි නිද්දිසිතබ්බං : අනුසයභූමියා පරියුට්ඨානභූමියා සංයොජනභූමියා උපාදානභූමියා. සානුසයස්ස පරියුට්ඨානං ජායති, පරියුට්ඨිතො සංයුජ්ජති, සංයුජ්ජන්තො උපාදියති, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. ඉමාහි චතූහි කිලෙසභූමීහි සබ්බෙ කිලෙසා සඞ්ගහං සමොසරණං ගච්ඡන්ති.

ඉදං සංකිලෙසභාගියං සුත්තං.

වාසනාභාගියං සුත්තං තීහි සුචරිතෙහි නිද්දිසිතබ්බං. නිබ්බෙධභාගියං සුත්තං චතූහි සච්චෙහි නිද්දිසිතබ්බං. අසෙඛභාගියං සුත්තං තීහි ධම්මෙහි නිද්දිසිතබ්බං බුද්ධධම්මෙහි පච්චෙකබුද්ධධම්මෙහි සාවකභූමියා, ඣායිවිසයෙ නිද්දිසිතබ්බන්ති.

තත්ථ කතමෙ අට්ඨාරස මූලපදා : ලොකියං ලොකුත්තරං ලොකියඤ්ච ලොකුත්තරඤ්ච, සත්තාධිට්ඨානං ධම්මාධිට්ඨානං සත්තාධිට්ඨානං ච ධම්මාධිට්ඨානං ච, ඤාණං ඤෙය්‍යං ඤාණඤ්ච ඤෙය්‍යං ච, දස්සනං භාවනා දස්සනං ච භාවනා ච, සකවචනං පරවචනං සකවචනඤ්ච පරවචනඤ්ච, විසජ්ජනීයං අවිසජ්ජනීයං විසජ්ජනීයඤ්ච අවිසජ්ජනීයඤ්ච, කම්මං විපාකො කම්මඤ්ච විපාකො ච, කුසලං අකුසලං කුසලඤ්ච අකුසලඤ්ච, අනුඤ්ඤාතං පටික්ඛිත්තං අනුඤ්ඤාතඤ්ච පටික්ඛිත්තඤ්ච, ථවො චාති.

(1) තත්ථ කතමං ලොකියං :

1. "න හි පාපං කතං කම්මං සජ්ජු ඛීරංව මුච්චති,
ඩහන්තං බාලමන්වෙති භස්මච්ඡන්නොව පාවකො"ති

ඉදං ලොකියං.

"චත්තාරිමානි භික්ඛවෙ අගතිගමනානී"ති (සබ්බං) -පෙ- නිහීයතෙ තස්ස යසො කාළපක්ඛෙව චන්දිමා"ති.

ඉදං ලොකියං.

"අට්ඨිමෙ භික්ඛවෙ ලොකධම්මා. කතමෙ අට්ඨ : ලාභො ච අලාභො ච අයසො ච යසො ච නින්දා ච පසංසා ච සුඛඤ්ච දුක්ඛං ච ඉමෙ ඛො භික්ඛවෙ අට්ඨ ලොකධම්මා"ති.

ඉදං ලොකියං.

එහි සංකිලෙසභාගිය සූත්‍රය අනුසයභූමියෙන් පරියුට්ඨානභූමියෙන් සංයොජන භූමියෙන් උපාදානභූමියෙන් යන සතර ක්ලේශභූමියෙන් (ක්ලේශ අවස්ථායෙන්) දක්විය යුතු යැ. අනුශය සහිත අප්‍රහීණ අනුශය ඇතියහුට (ප්‍රත්‍යය සමායොගය ඇති කල්හි) රාගාදීන්ගේ පරියුට්ඨානය වෙයි. රාගාදීන් පරියුට්ඨිත සිත් ඇතියේ කාමරාගාදි සංයොජනයෙන් බැඳෙයි, බැඳෙනුයේ උපාදානය කෙරෙයි, උපාදානප්‍රත්‍යයෙන් භවය වෙයි, භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ යැ ශොක පරිදෙව දුක්ඛ දෞමනස්ස උපායාසයෝ හටගනිත්, මෙසේ මෙත සියලු දුඃඛරාශිහුගේ සමුදය වේ. මේ සතර ක්ලේශභූමියෙන් සකල ක්ලේශයෝ සංග්‍රහයට සමොසරණයට යෙත්.

මේ සංකිලෙසභාගිය සූත්‍ර යැ.

වාසනාභාගිය සූත්‍රය ත්‍රිවිධ සුචරිතයෙන් දක්විය යුතු යැ, නිබ්බෙධභාගිය සූත්‍රය චතුස්සත්‍යයෙන් දක්විය යුතු යැ. අසෙඛභාගිය සූත්‍රය බුද්ධධර්මයෙන් ප්‍රත්‍යෙක බුද්ධධර්මයෙන් ශ්‍රාවකභූමියෙන් යන තුන් ධර්මයෙන් දක්විය යුතු යැ. ධ්‍යායීන් විෂයෙහි දක්විය යුත්තේ යයි.

(මෙසේ සොළොස් වැදෑරුම් ශාසනපට්ඨානය නානාසූත්‍රයන්ගෙන් උදහරණ වශයෙන් විභාග කොට යළි අටවිසි අයුරෙකින් ශාසනපට්ඨානය දක්වනුවෝ පට්ඨාන විභාගය ද මූල පදයෙන් සංග්‍රහවන හෙයින් මූලාපදමර්ශ කෙරෙති).

ඒ පට්ඨානවිභාගයෙහි අටළොස් මූලපදයෝ කවරහ : ලෞකිකාර්ථ ඇති ලොකිය සූත්‍ර යැ ලොකොත්තරාර්ථ ඇති ලොකුත්තර සූත්‍ර යැ පෙදෙසෙක ලෞකික ද පෙදෙසෙක ලොකොත්තර අර්ථ ද වදළ ලොකිය ද ලොකුත්තර ද සූත්‍ර යැ. සත්ත්ව ප්‍රඥප්ති විසින් වදළ සත්තාධිට්ඨාන සූත්‍ර යැ ධර්ම වශයෙන් ම වදළ 'ධම්මාධිට්ඨාන සූත්‍රය යැ උභයවශයෙන් වදළ සත්තාධිට්ඨාන ද ධම්මාධිට්ඨාන ද සූත්‍ර යැ. (මෙපරිද්දෙන්) ඤාණ සූත්‍ර යැ ඤෙය්‍යා සූත්‍ර යැ. ඤාණ ද ඤෙය්‍යා ද සූත්‍ර යැ. දස්සන සූත්‍ර යැ භාවනා සූත්‍ර යැ දස්සන භාවනා සූත්‍ර යැ, සකවචන යැ, පරවචන යැ, සකවචන පරවචන යැ, විස්සජ්ජනිය යැ අවිස්සජ්ජනිය යැ විස්සජ්ජනිය ද අවිස්සජ්ජනිය ද සූත්‍ර යැ, කම්ම යැ විපාක යැ කම්ම ද විපාක ද සූත්‍ර යැ, කුසල යැ අකුසල යැ කුසල අකුසල සූත්‍ර යැ, අනුඤ්ඤාත සූත්‍ර යැ පටික්ඛිත්ත සූත්‍ර යැ අනුඤ්ඤාත පටික්ඛිත්ත සූත්‍ර යැ. (යළි බුද්ධාදීන්ගේ ගුණස්තව වශයෙන් වදළ) ථව සූත්‍ර දැයි අටවිසි සූත්‍ර කෙනෙක් වෙත්.

(1) ඒ අටවිසි සූත්‍රයන් කෙරෙහි **ලෞකිය** සූත්‍ර කවරෙ යැ :

1. කරනලද පාපකර්මය එකෙණෙහි (දෙනගෙන් දෙවනලද ධාරොෂ්ණ) ක්ෂීරය දීහිබවට නොයන්නාක් මෙන් නො මැ විපාක දෙයි, භළුයෙන් වැසුණු සහලභරක් සෙයින් පව්කම් කළ බාලයා දවමින් ඔහු ලුහුබැඳ යේ යයි.

මේ ලොකිය සූත්‍ර යැ.

" මහණෙනි, මේ අගතිගමනයෝ සතර දෙනෙකි' යි (සියල්ල) ... ඔහුගේ යසස් අවපසැ සඳ සෙයින් පිරිහේ" යයි. මේ ලොකිය සූත්‍ර යැ.

" මහණෙනි, මේ ලොකධර්මයෝ අටදෙනෙකි, කවර අටෙක යත් : ලාභය ද අලාභය ද අයශස් ද යශස් ද නින්ද ද ප්‍රශංසා ද සුව ද දුක් ද යන මහණෙනි, මේ ලොක ධර්මයෝ අටදෙන වෙත් " යයි.

මේ ලොකිය සූත්‍ර යි.

18—ඹ 8 04440 (79/08)

(2) තත්ථ කතමං ලොකුත්තරං :

2. “යස්සින්ද්‍රියානි සමථං ගතානි
අස්සා යථා සාරථිනා සුදන්තා,
පහීනමානස්ස අනාසවස්ස
දෙවාපි තස්ස පිහයන්ති තාදිනො”ති.

ඉදං ලොකුත්තරං.

“පඤ්චිමානි භික්ඛවෙ ඉන්ද්‍රියානි ලොකුත්තරානි, කතමානි පඤ්ච : සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං. සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්චින්ද්‍රියානි ලොකුත්තරානී”ති.

ඉදං ලොකුත්තරං

(3) තත්ථ කතමං ලොකියඤ්ච ලොකුත්තරඤ්ච :

“ලද්ධාන මානුසත්තං ද්වෙ කිච්චං අකිච්චමෙව චා”ති ද්වෙ ගාථා. යං ඉහ “සුකිච්චං චෙව පුඤ්ඤානී”ති ච “පුඤ්ඤානි කරිත්වාන සග්ගා සග්ගං වජන්ති කතපුඤ්ඤා”ති ච ඉදං ලොකියං. යං ඉහ ‘සංයොජන විප්පහානං චා”ති ච “සංයොජනප්පහානා ජරාමරණා විමුච්චන්තී”ති ච ඉදං ලොකුත්තරං.

ඉදං ලොකියඤ්ච ලොකුත්තරඤ්ච.

“විඤ්ඤාණෙ හි භික්ඛවෙ ආහාරෙ සති නාමරූපස්ස, අවක්කන්ති හොති, නාමරූපස්ස අවක්කන්තියා සති පුනබ්භවො. හොති, පුනබ්භවෙ සති ජාති හොති, ජාතියා සති ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති, සෙය්‍යථාපි භික්ඛවෙ මහාරුක්ඛො, තස්ස යානි චෙව මූලානි අධොගමානි යානි ච තිරියඞ්ගමානි සබ්බානි තානි උද්ධං ඔජං අභිහරන්ති, එවං හි සො භික්ඛවෙ මහාරුක්ඛො තදාහාරො තදුපාදානො චිරං දීඝමද්ධානං තිට්ඨෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ විඤ්ඤාණෙ ආහාරෙ සති නාමරූපස්ස අවක්කන්ති හොති, (සබ්බං)-පෙ-එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතී”ති. ඉදං ලොකියං.

විඤ්ඤාණෙ චෙ භික්ඛවෙ ආහාරෙ අසති නාමරූපස්ස අවක්කන්ති න හොති, නාමරූපස්ස අවක්කන්තියා අසති පුනබ්භවො න හොති, පුනබ්භවෙ අසති ජාති න හොති, ජාතියා අසති ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. සෙය්‍යථාපි භික්ඛවෙ මහාරුක්ඛො, අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාලපිටකං ආදාය, සො තං රුක්ඛං මූලෙ ඡින්දෙය්‍ය, මූලෙ ඡෙත්වා පලිඛණෙය්‍ය, පලිඛණිත්වා මූලානි උද්ධරෙය්‍ය අන්තමසො උසීරනාළිමත්තානිපි, සො තං රුක්ඛං ඛණ්ඩාඛණ්ඩිකං ඡින්දෙය්‍ය, ඛණ්ඩාඛණ්ඩිකං ඡෙත්වා ඵාලෙය්‍ය, ඵාලෙත්වා සකලිකං සකලිකං කරෙය්‍ය සකලිකං කත්වා වාතාතපෙ විසොසෙය්‍ය, වාතාතපෙ විසොසෙත්වා අග්ගිනා ඩහෙය්‍ය, අග්ගිනා ඩහිත්වා මසිං කරෙය්‍ය, මසිං කත්වා මහාවාතෙ වා ඔපුනෙය්‍ය නදියා වා සීඝසොතාය පවාහෙය්‍ය,

(2) එහි ලොකුත්තර සූත්‍ර කවරෙ යැ :

2. යම් මහණක්හුගේ චක්ඛුරාදි ඉන්ද්‍රියයෝ දක්ෂ රියැදුරක්හු විසින් මොනොවට දමනය කළ අසුන් මෙන් ශමථයට (දමුණුබවට) ගියාහු ද, ප්‍රහීණවූ මානඇති අනාශ්‍රව වූ ලාභාලාභාදියෙහි තාදිවූ ඒ ක්ෂීණාශ්‍රවහට දෙවියෝද (මනුෂ්‍යයෝද) කැමැති වෙත් යයි.

මේ ලොකුත්තර සූත්‍ර යැ.

" මහණෙනි, මේ ලොකොත්තර ඉන්ද්‍රිය පසෙකි, කවර පසෙක යත් : සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යන මහණෙනි, මේ ලොකොත්තර පඤ්චින්ද්‍රියයෝ යි.

මේ ලොකුත්තර සූත්‍ර යි.

(3) එහි ලෞකිය ද ලොකුත්තර ද සූත්‍ර කවරෙ යැ.

" ලද්ධාන මානුසත්තං ද්වෙ කිච්චං අකිච්චමෙව ච " යනාදි දෙගය නිදසුනි. මෙහි යම් " සුකිච්චං චෙව පුඤ්ඤානි " යනු ද " පුඤ්ඤානි කරිත්වාන සග්ගා සග්ගං වජන්ති කතපුඤ්ඤ " යනු ද මේ ලෞකිය යැ. මෙහි යම් " සංයොජන විප්පහානං ච " යනු ද " සංයොජනප්පහානා ජරාමරණා විමුච්චන්ති " යනු ද මේ ලොකුත්තර යැ.

මේ ලෞකිය ද ලොකුත්තර ද සූත්‍ර යැ.

" මහණෙනි, විඤ්ඤාණාහාරය ඇතිකල්හි නාමරූපයාගේ අවක්‍රාන්තිය වෙයි, නාමරූපයාගේ අවක්‍රාන්තිය ඇතිකල්හි පුනර්භවය වෙයි, පුනර්භවය ඇතිකල්හි ජාතිය වෙයි, ජාතිය ඇතිකල්හි ජරාමරණ යැ සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ වෙත්, මෙසේ මෙතල කෙවල දුක්ඛක්ඛන්ධයාගේ සමුදය වේ. මහණෙනි, මහරුකෙක් යම්සේ ද, ඒ රුකෙහි යටට බස්නා යම් මුල් වේ ද සරසට යන යම් මුල් වේ ද ඒ හැම මුල් උඩට ඔජාව ගෙනයති, මහණෙනි, මෙසේ මැ ඒ මහරුක ඒ ඔජාව ආහාර කොට ඇතියේ එය උපාදන කොට ඇතියේ බොහෝ දිගුකලක් පවත්නේ යැ. එසෙයින් මැ මහණෙනි, විඤ්ඤාණාහාරය ඇතිකල්හි නාමරූපයාගේ අවක්‍රාන්තිය වෙයි. . . . මෙසේ මෙතල කෙවල දුක්ඛක්ඛන්ධයාගේ සමුදය වේ " යයි. මේ ලෞකිය යැ.

" මහණෙනි, ඉදින් විඤ්ඤාණාහාරය නැතිකල්හි නාමරූපයාගේ අවක්‍රාන්තිය නො වෙයි, නාමරූපාවක්‍රාන්තිය නැතිකල්හි පුනර්භවය නො වෙයි, පුනර්භවය නැති කල්හි ජාතිය නො වෙයි, ජාතිය නැතිකල්හි ජරාමරණ යැ සෝක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නිරුද්ධ වෙති. මෙසේ මෙතල කේවල දුක්ඛක්ඛන්ධයාගේ නිරොධය වේ. මහණෙනි, යම්පරිදි මහරුකෙක් වේ ද, එකල පුරුෂයෙක් උදල්ලක් පැසක් ගෙන එන්නේ යැ, හේ ඒ රුක මුලැ සිඳුනේ යැ, මුලැ සිඳ අවට කණිනේ යැ, අවට කැණැ යටත් පිරිසෙයින් සැවැන්නමුල් පමණවූද මුල් උදුරන්නේ යැ, හේ ඒ රුක කුදුමහත් කඩ කොට සිඳුනේ යැ, කඩකඩවැ සිඳ පළන්නේ යැ, පළා කැබැලි කැබැලි කරන්නේ යැ, කැබැලි කොට අව්සුළෙහි වියළන්නේ යැ, වාතාතපයෙහි වියළා ගින්නෙන් දවන්නේ යැ, ගින්නෙන් දවා හළුකරන්නේ යැ, හළු කොට මහසුළෙහි හෝ පිඹැ හරින්නේ යැ, සැඩදිය ඇති නදියක හෝ උල්පවාහරින්නේ යැ. මහණෙනි, මෙසේ ඒ

එවඤ්හි සො භික්ඛවෙ මහාරුක්ඛො උච්ඡින්නමූලො අස්ස තාලාවත්ථුකතො අනභාවං ගතො, ආයතිං අනුප්පාදධම්මො. එවමෙව ඛො භික්ඛවෙ විඤ්ඤාණෙ ආහාරෙ අසති නාමරූපස්ස අවක්කන්ති න හොති, නාමරූපස්ස අවක්කන්තියා අසති (සබ්බං)-පෙ-එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"ති ඉදං ලොකුත්තරං.

ඉදං ලොකියඤ්ච ලොකුත්තරඤ්ච.

(4) තත්ථ කතමං සත්තාධිට්ඨානං:

3 "සබ්බා දිසා අනුපරිගම්ම චෙතසා
නෙවජ්ඣගා පියතරමත්තනා ක්වචි,
එවම්පියො පුථු අත්තා පරෙසං
තස්මා න හිංසෙ පරං අත්තකාමො"[1]ති.

ඉදං සත්තාධිට්ඨානං.

4. "යෙ කෙචි භූතා භවිස්සන්ති වාපි[2]
සබ්බෙ ගමිස්සන්ති පහාය දෙහං
තං සබ්බජානිං කුසලො[3] විදිත්වා
ආතාපි සො[4] බ්‍රහ්මචරියං චරෙය්‍යා"ති.

ඉදං සත්තාධිට්ඨානං.

"සත්තහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතං කල්‍යාණමිත්තං අපි විවෙචියමානෙන පනාමියමානෙන ගලෙ'පි පනුජ්ජමානෙන[5] යාවජීවං න විජහිතබ්බං. කතමෙහි සත්තහි: පියො ච හොති ගරු ච භාවනීයො ච වත්තා ච වචනක්ඛමො ච ගම්භීරං ච කථං කත්තා න ච අට්ඨානෙ නියොජකො, ඉමෙහි ඛො භික්ඛවෙ සත්තහි-පෙ-න විජහිතබ්බං. ඉදමවොච භගවා ඉදං වත්වාන සුගතො අථාපරං එතදවොච සත්ථා:

5. "පියො ච ගරු භාවනීයො වත්තා ච වචනක්ඛමො,
ගම්භීරඤ්ච කථං කත්තා නො චට්ඨානෙ නියොජකො;
තං මිත්තං මිත්තකාමෙන යාවජීවම්පි සෙවියා"න්ති.

ඉදං සත්තාධිට්ඨානං.

(5) තත්ථ කතමං ධම්මාධිට්ඨානං;

6. "යඤ්ච කාමසුඛං ලොකෙ යං චිදං දිවියං සුඛං,
තණ්හක්ඛයසුඛස්සෙතෙ කලං නාග්ඝන්ති සොළසිං"ති.

ඉදං ධම්මාධිට්ඨානං

1. පරමත්තකාමො - මජ්සං.
2. සොච - සිමු, යෙ වාපි - මජ්සං.
3 සබ්බං ජානිකුසලො - සිමු.
4. ආතාපියො - මජ්සං.
5. විහනමජ්ජමානෙන - මජ්සං, පමජ්ජමානෙන - සිමු.
6. නො ච - මජ්සං,

මහරුක උසුන්මුල් ඇත්තේ තල්වත්තක් මෙන් කරනලද්දේ අනභාවයට ගියේ මතු නූපදනාසුලු වූ ඇතිවන්නේ යැ. එසෙයින් මැ මහණෙනි, විඥ්ඤණාහාරය නැතිකල්හි නාමරූපයාගේ අවක්‍රාන්තිය නො වෙයි, නාමරූපයාගේ අවක්‍රාන්තිය නැතිකල්හි . . . මෙසේ මෙතෙල කෙවල දුක්ඛක්ඛන්ධයාගේ නිරොධය වේ '' යයි. මේ ලොකුත්තර යැ.

මේ ලොකිය ද ලොකුත්තර ද සූත්‍ර යි.

(4) එහි සත්තාධිට්ඨාන කවරෙ යැ :

3. සියලු දසදිගුන් සිතින් විමසාගොස් තමහට වඩා ඉතාප්‍රිය වූවකු කිසිතැනෙක්හි නො මැ දක්නේ යැ, එසෙයින් අන්‍යායතනට වෙන වෙන මැ ස්වකීය ආත්මය ප්‍රිය වෙයි එහෙයින් තමහට සුව කැමැත්තේ මෙරමා නො පෙළන්නේ යි.

මේ සත්තාධිට්ඨාන යැ.

4. යම් සත්ත්ව කෙනෙක් උපන්හු ද යම් කෙනෙකුන් මතු උපදනාහු ද ඒ සියල්ලෝ දේහය හැරපියා පරලොව යන්නාහ, පණ්ඩිතපුරුෂ ඒ සියලු පරිහානිය (සියලු සත්ත්වයන් ගේ විනාශය) මරණසති වශයෙන් දැන කෙලෙස් තවන වැරඇති ව බඹසර වසන්නේ යි.

මේ සත්තාධිට්ඨාන යැ.

'' මහණෙනි, සප්තාඞ්ගයෙකින් සමන්වාගත කල්‍යාණමිත්‍රයා වෙන්කරනු ලබන්නහු විසිනුදු බැහැර කරනුලබන්නහු විසිනුදු ගෙලෙහිදු ගෙන නෙරනුලබන්නහු විසිනුදු නො හළයුතු යැ, කවර සතකින යත් : ප්‍රිය වූයේ ද වෙයි, පාෂාණච්ඡත්‍රයක් මෙන් ගුරු වූයේ ද සම්භාවනා කටයුත්තේ ද වක්තෘ වූයේ ද වචනක්ෂම වූයේ ද චතුස්සත්‍යාදි ගම්භීර කථා කරන්නේ ද නො ද අස්ථානයෙහි යොදනුයේ ද වෙයි. මහණෙනි, මේ සතකින් සමන්වාගත . . . නො හළයුත්තේ '' යි. බුදුහු මේ වදාළ සේක, මේ වදරා සුගත වූ ශාස්තෘන් වහන්සේ යළි අනෙකුදු මෙතෙල ගාථාධර්මය වදළහ :

5. යමෙක් ප්‍රිය වූයේ වේ ද ගුරු වූයේ ද භාවනීය ද වක්තෘ වේ ද වචනක්ෂම වේ ද ගැඹුරු කථා කරන්නේ ද නො ද අස්ථානයෙහි යොදවන්නේ වේ ද, මිත්‍රයන් කැමැතියහු විසින් ඒ කල්‍යාණමිත්‍රයා යාවජ්ජීවයෙන් සෙවනය කළයුත්තේ යයි.

මේ සත්තාධිට්ඨාන දේශනා යි.

(5) එහි ධම්මාධිට්ඨාන කවරෙ යත් :

6. ලොවැ යම් කාමසහගත සුඛයෙක් වේ ද, දිව්‍යවිහාර වශයෙන් ලැබියයුතු යම් රූපසමාපත්තිසුඛයෙක් වේ ද, මෙතෙල සුඛයෝ තෘෂ්ණාක්ෂය සංඛ්‍යාත නිවන්සුවයාගේ සොළොස්වන කලාවට නො අගනාහු වෙත් යයි.

මේ ධම්මාධිට්ඨාන යැ.

7. "සුසුඛං වත නිබ්බානං සම්මාසම්බුද්ධදෙසිතං,
අසොකං විරජං ඛෙමං යත්ථ දුක්ඛං නිරුජ්ඣතී"ති.

ඉදං ධම්මාධිට්ඨානං.

(6) තත්ථ කතමං සත්තාධිට්ඨානඤ්ච ධම්මාධිට්ඨානං ච :

8. "මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච ඛත්තියෙ,
රට්ඨං සානුචරං හන්ත්වා"ති.

ඉදං ධම්මාධිට්ඨානං.

"අනීඝො යාති බ්‍රාහ්මණො"ති.

ඉදං සත්තාධිට්ඨානං.

ඉදං සත්තාධිට්ඨානං ච ධම්මාධිට්ඨානඤ්ච.

"චත්තාරො මෙ භික්ඛවෙ ඉද්ධිපාදා, කතමෙ චත්තාරො : ඡන්දසමාධිපධානසංඛාරසමන්නාගතො ඉද්ධිපාදො, විරිය-පෙ-චිත්ත-පෙ-වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො"ති.

ඉදං ධම්මාධිට්ඨානං.

"සො කායෙ'පි චිත්තං සමොදහති, චිත්තෙ'පි කායං සමොදහති. කායෙ සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච ඔක්කමිත්වා උපසම්පජ්ජ විහරතී"ති. ඉදං සත්තාධිට්ඨානං.

ඉදං සත්තාධිට්ඨානඤ්ච ධම්මාධිට්ඨානඤ්ච.

(7) තත්ථ කතමං ඤාණං :

9. "යං තං ලොකුත්තරං ඤාණං සබ්බඤ්ඤූ යෙන වුච්චති,
න තස්ස පරිහානත්ථි සබ්බකාලෙ පවත්තතී"ති.

ඉදං ඤාණං.

10. "පඤ්ඤා හි සෙට්ඨා ලොකස්මිං යා'යං නිබ්බානගාමිනී[1]
යාය සම්මා පජානාති ජාතිමරණසඞ්ඛය'න්ති.[2]

ඉදං ඤාණං.

(8) තත්ථ කතමං ඤෙය්‍යං :

11. "කිත්තයිස්සාමි තෙ සන්තිං (ධොතකා'ති භගවා)
දිට්ඨෙ ධම්මෙ අනීතිහං,
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං.

1. නිබ්බෙධගාමිනී - ඉති.
2. ජාතිභව පරික්ඛයං - ඉති.

7. යම් තැනෙක්හි සකලවට්ටදුක්ඛය නිරුද්ධ වේ ද, සම්‍යක්සම්බුද්ධයන් විසින් දෙසනලද ශෝකරහිත වූ විරජ වූ නිර්භය වූ ඒ නිවන ඒකාන්තයෙන් අතිශයින් සුව වූයේ යි.

මේ ධම්මාධිට්ඨාන යි.

(6) එහි සත්තාධිට්ඨාන ද ධම්මාධිට්ඨාන ද සූත්‍ර කවරෙ යැ :

8. ' තෘෂ්ණා සංඛ්‍යාත මව ද අස්මිමාන නමැති පියා ද ශාශ්වත උච්ඡෙදදෘෂ්ටි සංඛ්‍යාත ක්ෂත්‍රිය රජුන් දෙදෙනා ද නන්දිරාග නමැති අයකැමියා සහිත ද්වාදශායතන නමැති රට ද, (රහත්මගනුවණ නමැති අසිපතින්) වනසා ' යන —

මේ ධම්මාධිට්ඨාන යැ.

' බාහිතපාප වූ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ නිදුක් වැ නිවන් පුර වදනේ යැ ' යන —

මේ සත්තාධිට්ඨාන යැ.

මේ සත්තාධිට්ඨාන ද ධම්මාධිට්ඨාන ද වූ දේශනා යැ.

" මහණෙනි මේ සෘද්ධිපාදධර්මයෝ සතර දෙනෙකි, කවර සතරදෙනෙක යත් : කත්තුකම්‍යතාඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍යයෙන් සමන්වාගත සෘද්ධිපාද යැ විරිය . . . චිත්ත . . . විමංසා සමාධියෙන් හා සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍යයෙන් සමන්වාගත සෘද්ධිපාද යැ යන මොහු යි.

මේ ධම්මාධිට්ඨාන යැ.

" හෝ කරජකයෙහිදු පාදකධ්‍යානචිත්තය බහාලයි, පාදකධ්‍යානචිත්තයෙහිදු කරජකය බහාලයි, කයෙහි සුඛසංඥාව ද ලඝුසංඥාව ද එළවා ඊට පැමිණ වාස කෙරෙයි " යන —

මේ සත්තාධිට්ඨාන යැ.

මේ සත්තාධිට්ඨාන ද ධම්මාධිට්ඨාන ද දේශනා යි.

(7) එහි ඤාණ කවරෙ යැ :

9. ලෝකය තරණය කොට සිටි යම් ඥානයෙක් වේ ද, යම් ඥානයක් හේතු කොට ගෙන සර්වඥයයි කියනු ලැබේ ද, ඒ ඥානයාගේ පිරිහීමෙක් නැත, (ආවජ්ජනාපටිබද්ධ හෙයින්) සියලු කල්හි පවතී ' යයි.

මේ ඤාණ යැ.

10. නිවනට පමුණුවන යම් ප්‍රඥාවක් ඇද්ද යම් විදර්ශනා සහිත මාර්ගඥානයෙකින් ජාතිමරණක්ෂය සංඛ්‍යාත නිවන හා අර්හත්වය මැනැවින් දනගනී ද ලොවැ ඒ ප්‍රඥාව මැ ශ්‍රෙෂ්ඨ වන්නීය ' යි.

මේ ඤාණ යැ.

(8) එහි ඤෙය්‍ය කවරෙ යැ :

11. (බුදුහු මෙසේ වදළහ, ධොතකය) ස්මෘතිමත් වැ හැසිරෙනුයේ දක්නාලද දෘෂ්ටාදි ධර්මයෙහි නොහොත් මෙ අත්බවෙහි මැ තමහට ප්‍රත්‍යක්ෂ වූ යම් දහමක් දන ලොවැ විසත්තිකා නම්වූ තෘෂ්ණාව තරණය කරන්නේ නම් ඒ ශාන්තිය (නිවන ද) නිර්වාණගාමිනී ප්‍රතිපත් ද) තොපට ප්‍රකාශ කරන්නෙමි.

12. තඤ්චා'හං අභිනන්දාමි (ඉච්චායස්මා ධොතකො)
මහෙසි සන්තිමුත්තමං,
යං විදිත්වා සතො චරං
තරෙ ලොකෙ විසත්තිකං.

13. යං කිඤ්චි සම්පජානාසි (ධොතකා'ති භගවා)
උද්ධං අධො තිරියං චා පි මජ්ඣෙ,
එතං විදිත්වා සඞ්ගොති ලොකෙ
භවාභවාය මාකාසි තණ්හ''න්ති.

ඉදං ඤෙය්‍යං.

"චතුන්නං භික්ඛවෙ අරියසච්චානං අනනුබොධා අප්පටිවෙධා එවමිදං දීඝමද්ධානං සන්ධාවිතං සංසරිතං මමඤ්චෙව තුම්හාකං ච. තයිදං භික්ඛවෙ දුක්ඛං අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං, දුක්ඛසමුදයො[1] අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං, දුක්ඛනිරොධො[2] අරියසච්චං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං අනුබුද්ධං පටිවිද්ධං, උච්ඡින්නා භවතණ්හා, ඛීණා භවනෙත්ති, නත්ථි'දානි පුනබ්භවො'ති. ඉදමවොච භගවා ඉදං වත්වාන සුගතො අථා'පරං එතද'වොච සත්ථා:

14. චතුන්නං අරියසච්චානං යථාභූතං අදස්සනා,
සංසිතං[3] දීඝමද්ධානං තාසු තාසෙව'ව ජාතිසු

15. තානි එතානි දිට්ඨානි භවනෙත්ති සමූහතා,
උච්ඡින්නං මූලං දුක්ඛස්ස නත්ථි''දානි පුනබ්භවො''ති.

ඉදං ඤෙය්‍යං.

(9) තත්ථ කතමං ඤාණං ච ඤෙය්‍යං ච:

"රූපං අනිච්චං වෙදනා අනිච්චා සඤ්ඤා අනිච්චා සංඛාරා අනිච්චා විඤ්ඤාණං අනිච්ච''න්ති ඉදං ඤෙය්‍යං.

"එවං ජානං එවං පස්සං අරියසාවකො රූපං අනිච්චන්ති පස්සති, වෙදනා අනිච්චාති පස්සති, සඤ්ඤා-පෙ-සංඛාරා-පෙ-විඤ්ඤාණං අනිච්චන්ති පස්සතී''ති ඉදං ඤාණං.

"සො පරිමුච්චති රූපෙන පරිමුච්චති වෙදනාය පරිමුච්චති සඤ්ඤාය පරිමුච්චති සඞ්ඛාරෙහි පරිමුච්චති විඤ්ඤාණම්හා පරිමුච්චති දුක්ඛස්මා'ති වදාමී'ති.

ඉදං ඤාණං ච ඤෙය්‍යං ච.

"සබ්බෙ සඞ්ඛාරා අනිච්චා''ති ඉදං ඤෙය්‍යං.

"යදා පඤ්ඤාය පස්සතී''ති ඉදං ඤාණං.

---

3. දුක්ඛසමුදයං - මජසං.
4. දුක්ඛනිරොධං - මජසං.
5. සංසරිතං - සීමු.

12. (ආයුෂ්මත් ධොතක මෙසේ කී :) මහර්ෂීන් වහන්ස, ස්මෘතිමත් ව හැසිරෙනුයේ යම් දහමක් දැන ලොවැ විසත්තිකා (තෘෂ්ණා) ව තරණය කරන්නේ නම් මම නුඹ වහන්සේගේ ඒ ධර්මදේශනාව ද රුස්මි, උත්තම වූ ඒ ශාන්තිය ද රුස්මි.

13. (බුදුහු මෙසේ වදළහ, ධොතකය,) (අනාගතකාලාදි) උඩ ද (අතීතකාලාදි) යට ද (වර්තමානකාලාදි) මැද සරස ද වූ යම් කිසි ධර්මජාතයක් තෙපි දන්නවූ නම් තෙල ලොවැ සඞ්ග යැයි දැන කුදුමහත් භවයෙහි තෘෂ්ණා නො කරව ' යි.

මේ ඥෙයය යැ.

'' මහණෙනි, චතුරාර්‍යසත්‍යයන්ගේ නො දැනීමෙන් ප්‍රතිවෙධ නො කිරීමෙන් මෙසේ මේ දීර්ඝකාලය මුළුල්ලෙහි භවයෙන් භවයට යෑමෙන් මාගේ ද තොපගේ ද සන්ධාවනය විය. පුනපුනා යෑමෙන් සංසරණය විය. මහණෙනි, ඒ දුඃඛාර්‍යසත්‍යය අවබොධ කරනලද ප්‍රතිවෙධ කරනලද, දුඃඛසමුදයාර්‍යසත්‍යය අවබොධ කරනලද ප්‍රතිවෙධ කරනලද, දුඃඛනිරොධාර්‍යසත්‍යය අවබොධ කරනලද ප්‍රතිවෙධ කරනලද, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍යසත්‍යය අවබොධ කරනලද ප්‍රතිවෙධ කරනලදි. භවතෘෂ්ණාව මුලුසුන් කරන ලදු, භවරජ්ජුව ක්ෂය වූ යැ, දැන් පුනර්භවයෙක් නැතැ ' යි බුදුහු මේ වදළහ. මේ වදරා යළිදු සුගත වූ ශාස්තෘන් වහන්සේ තෙල ගාථා වදළසේක :

14. චතුරාර්‍යසත්‍යය යථාභූතව නො දැක්ම හේතු කොටගෙන දිඝකලක් මුළුල්ලෙහි ඒ ඒ ජාතීන්හි මැ සංසරණය විය.

15. ඒ තෙල චතුස්සත්‍යයෝ දක්නා ලදහ, භවනායිකාව නසනලද්දීය, දුඃඛයාගේ මූලය උදුරා කරන ලද, දැන් පුනර්භවයෙක් නැති ' යි.

මේ ඥෙයය දේශනා යි.

(9) එහි ඤාණ ද ඥෙයය ද කවරෙ යැ :

'' රූපය අනිත්‍ය යැ වෙදනා අනිත්‍ය යැ සංඥා අනිත්‍ය යැ සංස්කාරයෝ අනිත්‍යයහ විඥානය අනිත්‍ය යැ '' යන මේ ' ඥෙයය ' යි.

'' මෙසේ දන්නා මෙසේ දක්නා ආර්‍යශ්‍රාවක ' රූපය අනිත්‍ය ' යි දකී, ' වෙදනා අනිත්‍ය වූ යැ ' යි දකී; සංඥාව . . . සංස්කාරයෝ . . . ' විඥානය අනිත්‍ය යැ ' යි දකී '' යන මේ ' ඤාණ ' යැ.

'' හේ රූපයෙන් මිදෙයි, වෙදනායෙන් මිදෙයි, සංඥායෙන් මිදෙයි, සංස්කාරයන් කෙරෙන් මිදෙයි, විඥානයෙන් මිදෙයි, දුකින් මිදේ යයි කියමි '' යන මේ ' ඤාණ ද ඥෙයය ' ද වේ.

'' සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ '' යන මේ ඥෙයය යැ.

'' යම් කලෙක විදර්ශනාප්‍රඥායෙන් දකී ද '' යන මේ ඤාණ යැ.

"අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා"ති ඉදං ඤාණං ච ඤෙය්‍යං ච.

සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති -පෙ- සබ්බෙ ධම්මා අනත්තා"ති ඉදං ඤෙය්‍යං.

"යදා පඤ්ඤාය පස්සතී"ති ඉදං ඤාණං.

"අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා"ති ඉදං ඤාණං ච ඤෙය්‍යං ච.

"යෙ හි කෙචි[1] සොණ, සමණා වා බ්‍රාහ්මණා වා අනිච්චෙන රූපෙන දුක්ඛෙන විපරිණාමධම්මෙන සෙය්‍යොහමස්මීති වා සමනුපස්සන්ති, සදිසොහමස්මීති වා සමනුපස්සන්ති, හීනොහමස්මීති වා සමනුපස්සන්ති, කිමඤ්ඤත්‍ර යථාභූතස්ස අදස්සනා, අනිච්චාය වෙදනාය -පෙ- අනිච්චාය සඤ්ඤාය -පෙ- අනිච්චෙහි සඞ්ඛාරෙහි -පෙ- අනිච්චෙන විඤ්ඤාණෙන දුක්ඛෙන විපරිනාමධම්මෙන සෙය්‍යොහමස්මීති වා සමනුපස්සන්ති, සදිසොහමස්මීති වා සමනුපස්සන්ති, හීනොහමස්මීති වා සමනුපස්සන්ති කිමඤ්ඤත්‍ර යථාභූතස්ස අදස්සනා"ති. ඉදං ඤෙය්‍යං.

'යෙ ච ඛො කෙචි සොණ, සමණා වා බ්‍රාහ්මණා වා අනිච්චෙන රූපෙන දුක්ඛෙන විපරිණාමධම්මෙන සෙය්‍යොහමස්මීති'පි න සමනුපස්සන්ති, සදිසොහමස්මීතිපි න සමනුපස්සන්ති, හීනොහමස්මීතිපි න සමනුපස්සන්ති, කිමඤ්ඤත්‍ර යථාභූතස්ස දස්සනා, අනිච්චාය වෙදනාය -පෙ- අනිච්චාය සඤ්ඤාය -පෙ අනිච්චෙහි සඞ්ඛාරෙහි -පෙ- අනිච්චෙන විඤ්ඤාණෙන දුක්ඛෙන විපරිණාමධම්මෙන සෙය්‍යොහමස්මීතිපි න සමනුපස්සන්ති, සදිසොහමස්මීති පි න සමනුපස්සන්ති, හීනොහමස්මීති පි න සමනුපස්සන්ති, කිමඤ්ඤත්‍ර යථාභූතස්ස දස්සනා"ති. ඉදං ඤාණං.

ඉදං ඤාණං ච ඤෙය්‍යං ච

(10) තත්ථ කතමං දස්සනං :

16. "යෙ අරියසච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි,
කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා,
න තෙ භවං අට්ඨමං ආදියන්තී"ති.

ඉදං දස්සනං.

17. "යථින්දඛීලො පඨවිං සිතො සියා
චතුබ්භි වාතෙහි අසම්පකම්පියො,
තථූපමං සප්පුරිසං වදමි
යො අරියසච්චානි අවෙච්ච පස්සතී"ති.

ඉදං දස්සනං.

1. යෙච ඛො කෙචි - සීමු.

"එකල පඤ්චස්කන්ධදුඃඛයෙහි නිර්වෙදයට පැමිණෙයි, තෙල විශුද්ධියට මාර්ග වේ," යන මේ සෑුණ ද ඤෙයාා ද වේ.

"සියලු සංස්කාරයෝ දුඃඛයහ යි . . . සියලු ධර්මයෝ අනාත්මයහ" යි යන මේ ඤෙයාා යැ.

යම් කලෙක විදර්ශනාප්‍රඥයෙන් දකී ද" යන මේ සැුණ යැ.

"එකල්හි ස්කන්ධදුඃඛයෙහි නිර්වෙදයට පැමිණෙයි, තෙල විශුද්ධියට මාර්ග වෙයි" යන මේ සැුණ ද ඤෙයාා ද වේ.

"සොණය, යම්කිසි මහණෙකෙනෙක් වේවයි බමුණුකෙනෙක් වේවයි අනිත්‍ය වූ දුක් වූ විපරිණාම ස්වභාව වූ රූපයෙන් යුක්ත ව 'මම ශ්‍රෙෂ්ඨ වෙමි' හෝ දකිත් ද : 'මම සදෘශ වෙමි' හෝ දකිත් ද, 'මම හීන වෙමි' හෝ දකිත් ද, මෙහි යථා භූතව නොදැක්ම විනා අන් කවර කරුණෙක් ඇද්ද, අනිත්‍ය වූ වෙදනායෙන් . . . අනිත්‍ය වූ සංඥයෙන් . . . අනිත්‍ය වූ සංස්කාරයන්ගෙන් . . . අනිත්‍ය වූ දුක්වූ විපරිණාම ස්වභාව වූ විඥනයෙන් යුක්තව 'මම ශ්‍රෙෂ්ඨ වෙමි' හෝ දකිත් ද, 'මම සදෘශ වෙමි' හෝ දකිත් ද, 'මම හීන වෙමි' හෝ දකිත් ද, මෙහි යථාභූතව නො දැක්ම විනා අන් කවර කරුණෙක් ඇද්ද" යි. මේ ඤෙයාා යැ.

"සොණය යම් කිසි මහණෙකෙනෙක් වේවයි බමුණුකෙනෙක් වේව' යි අනිත්‍ය වූ දුක් වූ විපරිණාමස්වභාව වූ රූපයෙන් යුක්ත ව 'මම ශ්‍රෙෂ්ඨ වෙමි' කියාත් නො දකිත් ද 'මම සදෘශයෙමි' කියාත් නො දකිත් ද, 'මම හීන වෙමි' කියාත් නො දකිත් ද, මෙහි අවිපරිතව දැක්ම විනා අන් කවර කරුණෙක් ඇද්ද, අනිත්‍ය වූ වෙදනායෙන් . . . අනිත්‍ය වූ සංඥවෙන් . . . අනිත්‍ය වූ සංස්කාරයන්ගෙන් . . . අනිත්‍ය වූ දුක් වූ විපරිණාමස්වභාව වූ විඥනයෙන් යුක්ත ව 'මම ශ්‍රෙෂ්ඨ වෙමි' කියාත් නො දකිත් ද, 'මම සදෘශ වෙමි' කියාත් නො දකිත් ද, 'මම හීන වෙමි' කියාත් නො දකිත් ද, මෙහි ලා කතසේ දැක්ම විනා අන් කවර කරුණෙක් ඇද්ද" යි. මේ සැුණ යැ.

මේ දේශනාව සැුණ ද ඤෙයාා ද වේ.

(10) එහි 'දස්සන' කවරෙ යත් :

16 යම් කෙනෙක් ගම්භීර ප්‍රඥඇති සර්වඥයන් වහන්සේ විසින් මොනොවට, දෙසනලද ආර්‍යසත්‍යයන් මාර්ගඥනයෙන් ප්‍රත්‍යක්ෂ කෙරෙත් ද, ඔහු (දිව්‍යරාජ්‍යාදියට පැමිණ) අතිශයින් ප්‍රමත්ත වෙත් නමුදු ඔවුහු අටවැනි භවයක් (පිළිසඳ විසින්) නොගනිත්, (සත්වැනි භවයෙහි විදසුන් වඩා රහත් වෙති සේයි.)

මේ දස්සන යැ.

17. යම්සේ පොළොව තුළ බැසැගෙන සිටි ඉන්ද්‍රකීලය සතරදිගින් හමන සුළඟින් සොලවාලියැ නො හැකි වේ ද, යමෙක් චතුරාර්‍යසත්‍යයන් ප්‍රඥයෙන් බැසැගෙන දකී ද ඒ උත්තම පුරුෂයා ඒ ඉන්ද්‍රකීල බඳු උපමා ඇත්තකු කොට කියමි.

මේ දස්සන යැ.

"චතූහි භික්ඛවෙ සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං බ්‍යාකරෙය්‍ය ඛීණනිරයොම්හි. ඛීණතිරච්ඡානයොනි, ඛීණපෙත්තිවිසයො, ඛීණාපායදුග්ගතිවිනිපාතො, සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො සත්තක්ඛත්තුපරමං[1] දෙවෙ ච මනුස්සෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සාමීති. කතමෙහි චතූහි: ඉධ භික්ඛවෙ අරියසාවකස්ස තථාගතෙ සද්ධා නිවිට්ඨා පතිට්ඨිතා විරූළ්හා මූලජාතා අසංහාරියා සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං සහ ධම්මෙන. ධම්මෙ ඛො පන නිට්ඨං ගතො හොති. ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි යදිදං මදනිම්මදනො-පෙ-නිරොධො නිබ්බානං. සඞ්ඝධම්මියා ඛො පනස්ස හොන්ති ඉට්ඨා කන්තා පියා මනාපා ගිහී චෙව පබ්බජිතා ච අරියකන්තෙහි ඛො පන සීලෙහි සමන්නාගතො හොති අඛණ්ඩෙහි අච්ඡිද්දෙහි අසබලෙහි අකම්මාසෙහි භුජිස්සෙහි විඤ්ඤුප්පසත්ථෙහි අපරාමට්ඨෙහි සමාධිසංවත්තනිකෙහි. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි සොතාපත්තියඞ්ගෙහි සමන්නාගතො අරියසාවකො ආකඞ්ඛමානො අත්තනාව අත්තානං බ්‍යාකරෙය්‍ය ඛීණනිරයොම්හි ඛීණතිරච්ඡානයොනි, ඛීණපෙත්තිවිසයො ඛීණාපායදුග්ගතිවිනිපාතො සොතාපන්නොහමස්මි අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො සත්තක්ඛත්තුපරමං දෙවෙ ච මනුස්සෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සාමී"ති.

ඉදං දස්සනං.

(11) තත්ථ කතමා භාවනා:

18. "යස්සින්ද්‍රියානි[2] සුභාවිතානි
අජ්ඣත්තං බහිද්ධා ච සබ්බලොකෙ,
නිබ්බිජ්ඣ ඉමං පරං ච ලොකං
කාලං කඞ්ඛති භාවිතො ස දන්තො[3]"ති.

අයං භාවනා.

"චත්තාරිමානි භික්ඛවෙ ධම්මපදානි. කතමානි චත්තාරි: අනභිජ්ඣා ධම්මපදං අබ්‍යාපාදො ධම්මපදං සම්මාසති ධම්මපදං සම්මාසමාධි ධම්මපදං. ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි ධම්මපදානී"ති.

අයං භාවනා.

(12) තත්ථ කතමං දස්සනං ච භාවනා ච:

19. "පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්ච චුත්තරි භාවයෙ,
පඤ්ච සඞ්ගාතිගො භික්ඛු ඔඝතිණ්ණොති වුච්චති"ති.

---

1. පරමො - සීමු.
2. යස්සින්ද්‍රියානීධ - සීමු.
3. සුදන්තො - සීමු.

" මහණෙනි, සතර සොතාපත්ති – අඞ්ගයෙන් සමන්වාගත ආර්‍ය්‍යශ්‍රාවක කැමැති වනුයේ තෙමේ මැ තමා පාළනකරන්නේ යැ : ' ක්ෂීණ වූ නිරය ඇතියෙම් වෙමි, ක්ෂීණ වූ තිරශ්චීනයොනි ඇතියෙමි, ක්ෂීණ වූ ප්‍රෙතවිෂය ඇතියෙමි, ක්ෂීණ වූ අපායදුර්ගති විනිපාත ඇතියෙමි, මම සෝවන් වූයෙමි, (පෘථග්ජන) විරූපයෙහි නො වැටෙන සැහැවි ඇතියෙම, (මාර්ගනියාමයෙන්) නියත වූයෙම. (මතු මාර්ගත්‍රය සංඛ්‍යාත) සම්බොධිය පරායන කොට ඇතියෙම් සත්වරක් පරම කොට දෙව්ලොව ද මිනිස්ලොව ද සන්ධාවන සංසරණ කොට දුක් කෙළවර කරන්නෙමි, කවර සතර අඟෙකින යත් : මහණෙනි, මෙ සස්නෙහි ආර්‍ය්‍යශ්‍රාවකහට තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධාව නිවිෂ්ට වූවා පිහිටියා වැඩුනී හටගත් මුල් ඇත්තී මහණකු හෝ බමුණකු හෝ දෙවියකු හෝ මරකු හෝ බඹකු හෝ ලොවැ අන් කිසිවකු විසින් හෝ සහෙතුක වැ උගුළුවාලියැ නො හැකි වෙයි. යළි මානමදදි මද නිර්මර්දනය කරන . . . නිරොධ සංඛ්‍යාත යම් නිවනෙක් ඇද්ද, භාග්‍යවතුන් විසින් ඒ ධර්මය ස්වාඛ්‍යාත යැ සංදෘෂ්ටික යැ අකාලික යැ එහිපස්සික යැ උපනයනයට සුදුසු යැ විඥයන් විසින් තමන් කෙරෙහි ලා දතයුතු යැයි ධර්මයෙහි නිෂ්ඨාවට ගියේ වෙයි. යළි ඔහුට ගිහි වූ ද පැවිදි වූ ද සබ්‍රහ්මචාරීහු ඉෂ්ට වූවාහු කාන්ත ප්‍රිය මනාප වූවාහු වෙත්. යළිදු ආර්‍ය්‍යකාන්ත වූ අඛණ්ඩ වූ අච්ඡිද්‍ර වූ අශබල වූ අකල්මාස වූ නිදස වූ විඥයන් විසින් පසස්නාලද අපරාමෘෂ්ට වූ සමාධිය පිණිස පවත්නා ශීලයෙන් සමන්වාගත වේ. මහණෙනි, මේ සතර සොතාපත්ති අඞ්ගයෙන් සමන්වාගත ආර්‍ය්‍යශ්‍රාවක කැමැතිවනුයේ තෙමේ මැ තමා පාළකරන්නේ යැ : ක්ෂය වූ නිරය ඇතියෙමි, ක්ෂය වූ තිරිසන්යොන් ඇතියෙමි, ක්ෂය වූ ප්‍රෙතවිෂය ඇතියෙමි, ක්ෂීණ වූ අපායදුර්ගති විනිපාත ඇතියෙමි, මම සෝවන් වූයෙම වෙමි, (පෘථග්ජනභාව සංඛ්‍යාත) විරූපයෙහි නො හෙනපියවි ඇතියෙම (මාර්ගනියාමයෙන්) නියත වූයෙම (මතු මාර්ගත්‍රය සංඛ්‍යාත) සම්බොධිය පරායන කොට ඇතියෙම සත්වරක් පරම කොට දෙව්ලොවැ ද මිනිස්ලොවැ ද භවයෙන් භවයට සංධාවන කොට පුනපුනා සංසරණ කොට දුක් කෙළවර කරන්නෙමි."

මේ දස්සන යි.

(11) එහි භාවනා කවර යැ :

18 යම් ආර්‍ය්‍යපුද්ගලයක්හු විසින් ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ මොනොවට වඩනලද්දහු ද, සියලු ලොවැ (උද්ධංභාගිය ඔරංභාගිය සංයොජන දුරැලීම් වශයෙන්) අධ්‍යාත්ම බාහිර වූද මෙලොව පරලොව ද ප්‍රතිවෙධ කොට භාවිත සිත්ඇති දමුණු ඉඳුරන් ඇති හෙතෙම මරණකාලය කැමැති වේ යයි. (මෙය සූත්‍රනිපාතඅටුවාව හා නොයෙදෙයි.)

මේ භාවනා යැ.

" මහණෙනි, මේ ධර්මකොට්ඨාසයෝ සතරදෙනෙකි, කවර සතරදෙනෙක යත් : අලොභය හෝ අලොභශීර්ෂයෙන් අධිගත ධ්‍යාන විදර්ශනා මාර්ග ඵල නිර්වාණ සංඛ්‍යාත අනභිධ්‍යා ධර්මපද යැ, බ්‍රහ්මවිහාරවශයෙන් අධිගත අව්‍යාපාද ධර්මපද යැ, දසානුස්සති ආදි විසින් අධිගත සම්මාසති ධර්මපද යැ, දසකසිණ ආනාපාන වශයෙන් අධිගත සම්මා සමාධි ධර්මපද යැ. මහණෙනි, මේ සතර ධර්මපදයෝ ' යි.

මේ භාවනා යි.

(12) එහි දස්සන ද භාවනා ද කවරෙ යැ :

19. (සිඳිනුයේ) පඤ්ච ඔරම්භාගිය සංයොජනයන් සිඳුනේ යැ, (දුරලනුයේ) පඤ්ච උද්ධංභාගිය සංයොජනයන් දුරලන්නේ යැ, (සංයොජන දුරැලීම සඳහා) මතුයෙහි ශ්‍රද්ධාදි පඤ්චෙන්ද්‍රියයන් වඩන්නේ යැ, රාගාදි පඤ්ච සංගයන් ඉක්මවාලූ මහණ චතුරොඝය තරණය කෙළේයයි කියනු ලැබේ යි.

“පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ”ති ඉදං දස්සනං. “පඤ්ච චුත්තරි භාවයෙ පඤ්ච සඞ්ගාතිගො භික්ඛු ඔඝතිණ්ණොති වුච්චතී”ති අයං භාවනා.

ඉදං දස්සනං ච භාවනා ච.

“තීණිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි තීණි: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං.

කතමං ච භික්ඛවෙ, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, භික්ඛු අනභිසමෙතස්ස දුක්ඛස්ස අරියසච්චස්ස අභිසමයාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අනභිසමෙතස්ස දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස -පෙ- දුක්ඛනිරොධස්ස -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චස්ස අභිසමයාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, ඉදං භික්ඛවෙ, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං”ති

ඉදං දස්සනං.

“කතමං ච භික්ඛවෙ, අඤ්ඤින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති, ඉදං භික්ඛවෙ, අඤ්ඤින්ද්‍රියං.

කතමං ච භික්ඛවෙ, අඤ්ඤාතාවින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති, ඉදං භික්ඛවෙ, අඤ්ඤාතාවින්ද්‍රිය”න්ති.

අයං භාවනා.

ඉදං දස්සනං ච භාවනා ච.

(13) තත්ථ කතමං සකවචනං:

20. “සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපනං එතං බුද්ධාන සාසන”න්ති.

ඉදං සකවචනං.

“තීණිමානි භික්ඛවෙ බාලස්ස බාලලක්ඛණානි, බාලනිමිත්තානි බාලාපදානානි, යෙහි බාලං බාලොති පරෙ සඤ්ජානන්ති, කතමානි තීණි: බාලො භික්ඛවෙ දුච්චින්තිතචින්තී ච හොති, දුබ්භාසිතභාසී ච හොති, දුක්කටකම්මකාරී ච හොති, ඉමානි ඛො භික්ඛවෙ තීණි බාලස්ස බාලලක්ඛණානි බාලනිමිත්තානි බාලාපදානානි.

පඤ්ච ජිනෙද පඤ්ච ජහෙ යන මේ දස්සන යැ. පඤ්ච වුත්තරි භාවයෙ පඤ්ච සංගාතිගො භික්ඛු ඔඝතිණ්ණොති වුච්චති යන මේ භාවනා යැ.

මේ දෙශනාව දස්සන ද භාවනා ද වෙයි.

" මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ තිදෙනෙක් වෙති, කවර තිදෙනෙක යත් : පෙර අවබොධ නොකළ ධර්මය දැනගනිමි පිළිපන්නහුට ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි උපන් ඉන්ද්‍රිය යැ, ඒ ධර්මයන් ම දන්නා අයුරින් ස්‍රොතාපත්තිඵලාදි සතැන්හි උපන් ඉන්ද්‍රිය යැ, අඤ්ඤාතාවීහුගේ අර්හත්ඵලධර්මයන්හි උපන් ඉන්ද්‍රිය යි.

මහණෙනි, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය කවරෙ යැ : මහණෙනි, මෙසස්නෙහි මහණ ප්‍රවෙධ නොකළ දුඃඛායඖසත්‍යයාගේ ප්‍රතිවෙධය පිණිස කත්තුකම්‍යතා කුසලච්ඡන්දය උපදවයි වැයම් කෙරෙයි වීය්‍යඖරම්භ කෙරෙයි සිත දැඩිකොට ගනී ප්‍රධන් වීය්‍යඖය කෙරෙයි. දුඃඛසමුදයායඖසත්‍යයාගේ . . . දුඃඛනිරොධායඖසත්‍යයාගේ . . . දුඃඛනිරොධගාමිනීප්‍රතිපදයඖසත්‍යයාගේ ප්‍රතිවෙධය පිණිස ඡන්දය උපදවයි වැයම් කෙරෙයි වීය්‍යඖරම්භ කෙරෙයි සිත දැඩි කොට ගනී ප්‍රධන්වීය්‍යඖය කෙරෙයි. මහණෙනි, මේ' අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රිය ' යි. මේ දස්සන යැ.

" මහණෙනි, අඤ්ඤින්ද්‍රිය කවරෙ යැ : මහණෙනි, මෙ සස්නෙහි මහණ මේ දුක යැයි අවිපරීතව දැනගනී, මේ දුක්ඛසමුදයයැයි අවිපරීතව දැනගනී, මේ දුක්ඛනිරොධයැයි අවිපරීතව දැනගනී, මෙ දුක්ඛනිරොධගාමිනී පටිපද යයි අවිපරීතව දැනගනී. මහණෙනි, මේ අඤ්ඤින්ද්‍රිය යැ."

" මහණෙනි, අඤ්ඤාතාවින්ද්‍රිය කවරෙ යැ : මහණෙනි, මෙ සස්නෙහි මහණ ආස්‍රවයන්ගේ ක්ෂය වීමෙන් අනාස්‍රව වූ අර්හත්ඵලසමාධිය ද අර්හත්ඵලප්‍රඥාව ද ඉහාත්ම යෙහි මැ තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාස කෙරෙයි, ජාතිය ක්ෂය වූ යැ, මහබඹසර වැසනිමවනලද, කරණී කරනලද, ඉත්ථභාවය සඳහා අන් කටයුත්තෙක් නැතැ ' යි දැනගනී. මහණෙනි, මේ ' අඤ්ඤාතාවින්ද්‍රිය ' යි. මේ භාවනා යැ."

මෙ දෙශනාව දස්සන් ද භාවනා ද වේ.

(13) එහි සකවචන කවරෙ යැ :

20. සියලු අකුශලය නො ඉපැදවීම ද චාතුර්භූමක කුශලයාගේ ප්‍රතිලාභය ද රහත් මගින් ස්වකීය චිත්තසන්තානය පවිත්‍ර කිරීම ද යන තෙල සියලු බුදුවරයන්ගේ අනුශාසනා යි.

මේ සකවචන යැ.

" මහණෙනි, මේ බාලයාගේ බාලලක්ෂණයෝ බාලනිමිත්තයෝ බාලචරිතයෝ තිදෙනෙක් වෙති. යම් ලක්ෂණයෙකින් බාලයා ' මේ බාලයෙකැ ' යි අන්‍යයෝ හැඳින ගනිත් ද, (එබඳු වූවාහුය.) කවර තුනෙක යත් : මහණෙනි, බාලයා නපුරු සිතිවිලි සිතනුයේ ද වෙයි, නපුරු බස් බණනුයේ ද වෙයි, නපුරුකම් කරනුයේ ද වෙයි. මහණෙනි, මේ තුන බාලයාගේ බාලලක්ෂණයෝ බාලනිමිත්තයෝ බාලඅපදානයෝ වෙත්.

"තීණිමානි භික්ඛවෙ පණ්ඩිතස්ස පණ්ඩිතලක්ඛණානි පණ්ඩිතනිමිත්තානි පණ්ඩිතාපදානානි, යෙහි පණ්ඩිතං පණ්ඩිතොති පරෙ සඤ්ජානන්ති. කතමානි තීණි: පණ්ඩිතො, භික්ඛවෙ සුචින්තිතචින්තී ච හොති, සුභාසිතභාසී ච හොති, සුකතකම්මකාරී ච හොති. ඉමානි ඛො භික්ඛවෙ තීණි පණ්ඩිතස්ස පණ්ඩිතලක්ඛණානි පණ්ඩිතනිමිත්තානි පණ්ඩිතාපදානානී"ති.

ඉදං සකවචනං.

(14) තත්ථ කතමං පරවචනං:

21 "පථවිසමො නත්ථි විත්ථතො
නින්නො පාතාලසමො න විජ්ජති,
මෙරුසමො නත්ථි උන්නතො
චක්කවත්ති සදිසො නත්ථි පොරිසො"ති

ඉදං පරවචනං.

"හොතු දෙවානමින්ද, සුභාසිතෙන ජයොති. හොතු වෙපචිත්ති සුභාසිතෙන ජයොති. භණ වෙපචිත්ති, ගාථනති. අථ ඛො භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො ඉමං ගාථං අභාසි:

22. "භිය්‍යො බාලා පකුජ්ඣෙය්‍යුං[1] නො චස්ස පටිසෙධකො,
තස්මා භුසෙන දණ්ඩෙන ධීරො බාලං නිසෙධයෙ"ති.

භාසිතාය ඛො පන භික්ඛවෙ වෙපචිත්තිනා අසුරින්දෙන ගාථාය අසුරා අනුමොදිංසු දෙවා තුණ්හී අහෙසුං. අථ ඛො භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො සක්කං දෙවානමින්දං එතදවොච: භණ දෙවානමින්ද ගාථනති. අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො ඉමං ගාථං අභාසි:

23. "එතදෙව අහං මඤ්ඤෙ බාලස්ස පටිසෙධනං,
පරං සංකුපිතං ඤත්වා යො සතො උපසම්මතී"ති

භාසිතාය ඛො භික්ඛවෙ සක්කෙන දෙවානමින්දෙන ගාථාය දෙවා අනුමොදිංසු, අසුරා තුණ්හී අහෙසුං. අථඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො වෙපචිත්තිඅසුරින්දං එතදවොච භණ වෙපචිත්ති ගාථනති. අථ ඛො භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො ඉමං ගාථං අභාසි:

24. "එතදෙව තිතික්ඛාය වජ්ජං පස්සාමි වාසව,
යදා නං මඤ්ඤති බාලො භයා ම්‍යායං තිතික්ඛති:
අජ්ඣාරූහති දුම්මෙධො ගොව භිය්‍යො පලායින"න්ති

1. පකුප්පෙය්‍යුං - සු.

මහණෙනි, මේ පණ්ඩිතයාගේ පණ්ඩිතලක්ෂණයෝ පණ්ඩිතනිමිත්තයෝ පණ්ඩිත චරිතයෝ තිදෙනෙක් වෙති, යම් ලකුණෙකින් පණ්ඩිතයා 'මේ පණ්ඩිතයෙකැ' යි අන්‍යයෝ දනගනිත් ද, (එබඳු වූවාහුය.) කවර තුනෙක යත් : මහණෙනි, පණ්ඩිතයා මනාසිතුවිලි සිතනුයේ ද වෙයි, මනාබස් බණනුයේ ද වෙයි, සුකෘතක්‍රියා කරනුයේ ද වෙයි. මහණෙනි, මේ තුන පණ්ඩිතයාගේ පණ්ඩිතලක්ෂණයෝ පණ්ඩිත නිමිත්තයෝ පණ්ඩිතඅපදානයෝ වෙත් " යයි.

මේ සකවචන යි.

(14) එහි පරවචන කවරේ යැ :

21. පෘථිවිය හා සම වූ විස්තෘත (පැතුරුණු) දයෙක් නැත, පාතාලය හා සම වූ නිම්නයෙක් නො වේ. මේරුපර්වතය සම වූ උන්නත වස්තුයෙක් නැත, සක්විති රජු හා සදෘශ වූ උත්තම පුරුෂයෙක් නැති ' යි.

මේ පරවචන යැ.

" දේවේන්ද්‍රය සුභාෂිතයෙන් ජය වේව ' යි, වෙපචිත්තිය සුභාෂිතයෙන් ජය වේව ' යි, වෙපචිත්තිය ගාථාවක් කිය යි. ඉක්බිති මහණෙනි, වෙපචිත්ති අසුරෙන්ද්‍ර මේ ගාථාව කී :

22. බාලයෝ වළකනුයෙක් නො වූයේ නම් මතුමතුයෙහි (බෙහෙවින්) විරුද්ධ වන්නාහ, එහෙයින් ප්‍රාඥතෙමේ දඩි දඬුවමින් බාලයා වළහන්නේ යැ.

මහණෙනි, වෙපචිත්ති අසුරෙන්ද්‍රයා විසින් ගාථාව කීකල්හි අසුරයෝ අභිනන්දනා කළහ, දෙවියෝ නො බැණ හුන්හ. ඉක්බිති, මහණෙනි, වෙපචිත්ති අසුරෙන්ද්‍ර සක්දෙවිඳුට මෙසේ කී : දේවේන්ද්‍රය ගාථාවක් කිය ' යි, ඉක්බිති මහණෙනි, ශක්‍රදෙවේන්ද්‍ර මේ ගාථාව කී :

23. යමෙක් සතුරා කිපියහු දන සිහිඇති වැ ඉවසා ද, මම් තෙල ඉවසීම මැ බාලයාගේ වැළැක්ම යැයි සිතමි.

මහණෙනි සක්දෙවිඳු විසින් ගාථාව කී කල්හි දෙවියෝ අනුමෝදන් වූහ, අසුරයෝ නො බැණ හුන්හ, යළි මහණෙනි, සක්දෙවිඳු වෙපචිත්ති අසුරිඳුට තෙල කී : ' වෙපචිත්තිය ගාථාවක් කිය ' යි. ඉක්බිති මහණෙනි, වෙපචිත්ති අසුරිඳු මේ ගාථාව කී :

24. වාසවය, යම් කලෙක බාලතෙමේ ' මෙතෙම් මට බියපත්වැ ඉවසා යැ ' යි ඔහු ගෙන සිතා ද තෙල කරුණ මැ ඉවසීමෙහි දෝෂය කොට දකිමි. අඥානතෙමේ පැරදූ පලායන ගවයකු මැඩගෙන යන ගවමුළක් සෙයින් ඉවසනුවහු බෙහෙවින් මැඩගෙන යයි.

19—ඕබී 04440 (79/06)

භාසිතාය ඛො පන භික්ඛවෙ වෙපචිත්තිනා අසුරින්දෙන ගාථාය අසුරා අනුමොදිංසු, දෙවා තුණ්හී අහෙසුං අථ ඛො භික්ඛවෙ වෙපචිත්ති අසුරින්දො සක්කං දෙවානමින්දං එතදවොච. භණ දෙවානමින්ද, ගාථන්ති. අථ ඛො භික්ඛවෙ, සක්කො දෙවානමින්දො ඉමා ගාථායො අභාසි :

25. ''කාමං මඤ්ඤතු වා මා වා භයා ම්‍යායං තිතික්ඛති,
සදත්ථපරමා අත්ථා ඛන්ත්‍යා භිය්‍යො න විජ්ජති.

26. යො හවෙ බලවා සන්තො දුබ්බලස්ස තිතික්ඛති,
තමාහු පරමං ඛන්තිං නිච්චං ඛමති දුබ්බලො.

27. අබලං තං බලං ආහු යස්ස බාලබලං බලං,
බලස්ස ධම්මගුත්තස්ස පටිවත්තා න විජ්ජති.

28. තස්සෙව තෙන පාපියො යො කුද්ධං පටිකුජ්ඣති,
කුද්ධං අපටිකුජ්ඣන්තො සඞ්ගාමං ජෙති දුජ්ජයං.

29. උභින්නමත්ථං චරති අත්තනො ච පරස්ස ච,
පරං සංකුපිතං ඤත්වා යො සතො උපසම්මති.

30. උභින්නං තිකිච්ඡන්තානං අත්තනො ච පරස්ස ච,
ජනා මඤ්ඤන්ති බාලොති යෙ ධම්මස්ස අකොවිදා''ති.

''භාසිතාසු ඛො පන භික්ඛවෙ, සක්කෙන දෙවානමින්දෙන ගාථාසු දෙවා අනුමොදිංසු අසුරා තුණ්හී අහෙසු''න්ති.

ඉදං පරවචනං.

(15) තත්ථ කතමං සකවචනං ච පරවචනං ච :

''යඤ්ච පත්තං යඤ්ච පත්තබ්බං උභයමෙතං රජානුකිණ්ණං ආතුරස්සානුසික්ඛතො. යෙ ච සික්ඛාසාරා, සීලං වතං ජීවිතං බ්‍රහ්මචරියං උපට්ඨානසාරා, අයමෙකො අන්තො. යෙ ච එවංවාදිනො එවංදිට්ඨිනො නත්ථි කාමෙසු දොසොති, අයං දුතියො අන්තො. ඉච්චෙතෙ උභො අන්තා කටසිවඩ්ඪනා කටසියො දිට්ඨිං වඩ්ඪෙන්ති, එතෙ උභො අන්තෙ අනභිඤ්ඤාය ඔලීයන්ති එකෙ අතිධාවන්ති එකෙ''ති

ඉදං පරවචනං.

යෙ ච ඛො තෙ උභො අන්තෙ අභිඤ්ඤාය තත්‍ර ච න අහෙසුං, තෙ න ච අමඤ්ඤිංසු, වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනායා''ති.

ඉදං සකවචනං.

අයං උදානො සකවචනං ච පරවචනං ච.

තවද මහණෙනි, වෙපචිත්ති අසුරින්ද්‍ර විසින් ගාථාව කී කල්හි අසුරයෝ අනුමෝදන් වූහ. දෙවියෝ නොබැණ හුන්හ. ඉක්බිති මහණෙනි, වෙපචිත්ති අසුරේන්ද්‍ර සක්දෙවිඳුට මෙසේ කී : ' දෙවේන්ද්‍රය ගාථාවක් කිය ' යි. එකල මහණෙනි, සක්දෙවිඳු මේ ගාථාව කී :

25. ඒකාන්තයෙන් ' මෙතෙම මට බියෙන් ඉවසා ' යයි සිතාවා හෝ නොසිතා වා හෝ අර්ථයෝ ස්වාර්ථය පරම කොට ඇත්තාහ, (ඒ අර්ථයන් කෙරෙහිද) ක්ෂාන්තියට වඩා අධික වූ අර්ථයෙක් නැති.

26. ඒකාන්තයෙන් යමෙක් බලවත් වූයේ දුබලයාහට ඉවසා ද එය පරම ක්ෂාන්තිය යයි (නුවණැතියෝ) කියති, දුර්වලයා නිරතුරු ඉවසයි.

27. අඥනබලය යමක්හුගේ බලය වේ ද, අබල වූ ඒ අඥනබලය බලයෙකැයි කියති, ධර්මයෙන් රක්ෂිත වූවහුගේ නොහොත් ධර්මය රක්නහුගේ (ක්ෂාන්ති) බලයට අභිභවා බණන්නෙක් නැති.

28. යමෙක් කිපියහුට පෙරලා කිපේ ද, ඒ කෝපය හේතු කොටගෙන ඔහුට මැ පාපය වෙයි, කිපියහුට පෙරලා නො කිපෙනුයේ දිනියැ නො හෙන සංග්‍රාමය දිනයි.

29. යමෙක් මෙරමා කිපියහු දැන සිහි ඇතිවැ ඉවසා ද, හේ තමහට ද පරහට ද යන දෙපක්ෂයට මැ අර්ථය සිද්ධකෙරෙයි.

30. යම් කෙනෙක් ධර්මයෙහි නිපුණ නොවෙත් ද, ඒ අදබල් ජනයෝ තමහට ද පරහට ද යන දෙපක්ෂයට මැ වැඩ සිදුකරන්නාහු බාලයෙකැ ' යි සිතත් යයි.

මහණෙනි, සක්දෙවිඳුන් විසින් ගාථාවන් කීකල්හි දෙවියෝ අනුමොදන් වූහ, අසුරයෝ තුෂ්ණිම්භූත වූහ ' යි.

මේ පරවචන යි.

(15) එහි සකවචන ද පරවචන ද කවරෙ යැ :

'' කෙලෙස් බහුල පුද්ගලයන් අනුව හික්මෙන රාගාදිකෙලෙසින් ආතුරවූවහුට ලැබූ (මෙකල වළඳනා) යම් කාමොපකරණයෙක් ඇද්ද මතු ලැබියයුතු යම් කාමොපකරණ යෙකුත් ඇද්ද මෙල උභය කාමොපකරණය රාගරජස් ආදීන් අවකීර්ණ යැ. සමාදනය කළ ශීලව්‍රතාදිය සාරවශයෙන් ගත් යම් කෙනෙක් ශීලය ව්‍රතය ආජීවය මෛථුනවිරතිය යන මේ සංසාරශුද්ධිය ' යි සාරභෙයින් ගත්තාහු වෙත් ද, මේ එක් අන්තයෙක. යම් කෙනෙක් කාමයන් සේවනයෙහි දෙෂයෙක් නැතැ ' යි මෙසේ කියන්නාහු මෙසේ ලබ්ධි ඇත්තාහු වෙත් ද, මේ දෙවැනි අන්තය යැ. මෙල උභයාන්තයෝ (මතුමත්තෙහි ජරාමරණයෙන්) කටසි (තෘෂ්ණ අවිද්‍යා) වඩනාහුය, කටසීහු දෘෂ්ටිය වඩත්. මෙල උභයාන්තයන් නො දැන ඇතැම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් ඇලෙති, ඇතැම් කෙනෙක් අතිධාවනය කෙරෙත් '' යයි.

මේ පරවචන යැ.

යම් ආර්‍ය්‍යපුද්ගල කෙනෙක් ඒ උභයාන්තයන් විශිෂ්ටඥනයෙන් දැන ඒ උභයාන්ත යෙහි නො වැටුණාහු වෙත් ද ඔවුහු (තෘෂ්ණාදෘෂ්ටිමාන වශයෙන්) නො ද සිතත්. (අනුපාදපරිනිර්වාණයෙන් පිරිනිවි) ඔවුනට (මරණින් මතු ඇතැයි) පැනැවීමට කර්මාදි වර්තයෙක් නැතැ ' යි.

මේ සකවචන යැ.

මේ උදනය සකවචන ද පරවචන ද වේ.

“රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච : ඉධ මය්හං භන්තෙ, රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි : කෙසං නු ඛො පියො අත්තා, කෙසං අප්පියො අත්තාති. තස්ස මය්හං භන්තෙ එතදහොසි : යෙ ඛො කෙචි කායෙන දුච්චරිතං චරන්ති වාචාය දුච්චරිතං චරන්ති මනසා දුච්චරිතං චරන්ති, තෙසං අප්පියො අත්තා. කිඤ්චාපි තෙ එවං වදෙය්‍යුං : ‘පියො නො අත්තා’ති. අථ ඛො තෙසං අප්පියො අත්තා. තං කිස්ස හෙතු : යඤ්හි අප්පියො අප්පියස්ස කරොති, තං තෙ අත්තනාව අත්තනො කරොන්ති, තස්මා තෙසං අප්පියො අත්තා. යෙ ච ඛො කෙචි කායෙන සුචරිතං චරන්ති වාචාය සුචරිතං චරන්ති මනසා සුචරිතං චරන්ති, තෙසං පියො අත්තා. කිඤ්චාපි තෙ එවං වදෙය්‍යුං ‘අප්පියො නො අත්තා’ති, අථ ඛො තෙසං පියො අත්තා. තං කිස්ස හෙතු : යං හි පියො පියස්ස කරෙය්‍ය, තං තෙ අත්තනාව අත්තනො කරොන්ති, තස්මා තෙසං පියො අත්තා’ති.

එවමෙතං මහාරාජ, එවමෙතං මහාරාජ, යෙ හි කෙචි මහාරාජ කායෙන දුච්චරිතං චරන්ති වාචාය දුච්චරිතං චරන්ති මනසා දුච්චරිතං චරන්ති, තෙසං අප්පියො අත්තා. කිඤ්චාපි තෙ එවං වදෙය්‍යුං ‘පියො නො අත්තා’ති, අථ ඛො තෙසං අප්පියො අත්තා. තං කිස්ස හෙතු : යං හි මහාරාජ, අප්පියො අප්පියස්ස කරෙය්‍ය, තං තෙ අත්තනාව අත්තනො කරොන්ති, තස්මා තෙසං අප්පියො අත්තා. යෙ ච ඛො කෙචි මහාරාජ කායෙන සුචරිතං චරන්ති වාචාය සුචරිතං චරන්ති මනසා සුචරිතං චරන්ති, තෙසං පියො අත්තා. කිඤ්චාපි තෙ එවං වදෙය්‍යුං ‘අප්පියො නො අත්තා’ති, අථ ඛො තෙසං පියො අත්තා. තං කිස්ස හෙතු : යං හි මහාරාජ, පියො පියස්ස කරෙය්‍ය, තං තෙ අත්තනාව අත්තනො කරොන්ති, තස්මා තෙසං පියො අත්තාති. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා :

31. “අත්තානඤ්චෙ පියං ජඤ්ඤා න නං පාපෙන සංයුජෙ,
න හි තං සුලභං හොති සුඛං දුක්කටකාරිනා.

32. අන්තකෙනාධිපන්නස්ස ජහතො මානුසං භවං,
කිං හි තස්ස සකං හොති කිඤ්ච ආදාය ගච්ඡති ;
කිං චස්ස අනුගං හොති ඡායාව අනපායිනී.

33. උභො පුඤ්ඤඤ්ච පාපඤ්ච යං මච්චො කුරුතෙ ඉධ,
තං හි තස්ස සකං හොති තං ච ආදාය ගච්ඡති ;
තං චස්ස අනුගං හොති ඡායාව අනපායිනී.

34. තස්මා කරෙය්‍ය කල්‍යාණං නිචයං සම්පරායිකං,
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණින”න්ති.

ඉදං සුත්තං පරවචනං. අනුගීති සකවචනං.

ඉදං සකවචනඤ්ච පරවචනඤ්ච.

" පසේනදි කොසොල්රජ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළේ යැ : ' වහන්ස, එකලා වැ විවෙකී වැ හුන් මට මෙබඳු චිත්තපරිවිතර්කයෙක් උපන : කවර කෙනකුන්ට ආත්මය ප්‍රිය ද, කවර කෙනකුන්ට ආත්මය අප්‍රිය ද ' යි. වහන්ස, එසේ සිතන මට මේ සිත විය : ' යම් කෙනෙක් කයින් දුසිරිත කෙරෙත් ද බසින් දුසිරිත කෙරෙත් ද සිතින් දුසිරිත කෙරෙත් ද, ඔවුනට ආත්මය අප්‍රිය යැ, ඔවුහු ' අපට ආත්මය ප්‍රිය යැ ' යි මෙසේ කියතුදු වැලි ඔවුනට ආත්මය අප්‍රිය යැ, එ කවර හෙයිනැ : සතුරෙක් සතුරාට යමක් මැ කෙරේ ද, එය ඔවුහු තුමූ මැ තමහට කෙරෙති. එහෙයින් ඔවුනට ආත්මය අප්‍රිය යැ, තවද යම් කිසි කෙනෙක් කයින් සුචරිතය කෙරෙත්ද බසින් සුචරිතය කෙරෙත් ද සිතින් සුචරිතය කෙරෙත් ද, ඔවුනට ආත්මය ප්‍රිය යැ, ඔවුහු අපට ආත්මය අප්‍රිය යැ ' යි මෙසේ කියන්නාහු නමුදු වැලි ඔවුනට ආත්මය ප්‍රිය යැ, ඒ කවර හෙයිනැ : මිතුරෙක් මිතුරකුට යමක් මැ කෙරේ ද එය ඔවුහු තුමූ මැ තමහට කෙරෙති. එහෙයින් ඔවුනට ආත්මය ප්‍රිය වේ " යයි.

" මහරජ, තෙල කරුණ එසේ මැ ය, මහරජ, තෙල එසේ මැ ය, මහරජ, යම් කෙනෙක් කයින් දුසිරිත කෙරෙත් ද වචනයෙන් දුසිරිත කෙරෙත් ද සිතින් දුසිරිත කෙරෙත් ද, ඔවුනට ආත්මය අප්‍රිය යැ, ඔවුහු ' අපට ආත්මය ප්‍රිය යැ ' යි කියන්නාහු නමුදු වැලි ඔවුනට ආත්මය අප්‍රිය යැ, එ කවර හෙයිනැ : මහරජ, සතුරෙක් සතුරකුට යමක් මැ කෙරේ ද, එය ඔවුහු තුමූ මැ තමහට කෙරෙති, එහෙයින් ඔවුනට ආත්මය අප්‍රිය වේ. තවද මහරජ, යම් කෙනෙක් කයින් සුසිරිත කෙරෙත් ද බසින් සුසිරිත කෙරෙත් ද සිතින් සුසිරිත කෙරෙත් ද, ඔවුනට ආත්මය ප්‍රිය යැ, ඔවුහු ' අපට ආත්මය අප්‍රිය යැ ' යි මෙසේ කියන්නාහු නමුදු වැලි ඔවුනට ආත්මය ප්‍රිය යැ, එ කවර හෙයිනැ : මහරජ, මිතුරෙක් මිතුරකුට යමක් මැ කරන්නේ ද, එය ඔවුහු තුමූ මැ තමහට කෙරෙති. එහෙයින් ඔවුනට ආත්මය ප්‍රිය වේ " යයි. බුදුහු මේ වදාළහ, මේ වදරා යළි සුගත වූ ශාස්තෘන් වහන්සේ තෙල වදාළසේක :

31. ඉදින් ආත්මය තමහට ප්‍රිය යයි දන්නේ නම්, ඒ ආත්මය පාපය හා නො යොදන්නේ යැ, දුෂ්කෘත කරන්නහුට (තමා රිසියෙන) ඒ සුවය නො මැ සුලභ වේ.

32. මරණයෙන් මඩනාලද මනුෂ්‍ය ආත්මභාවය හරනාවූ ඔහුට කුමක් නම් තමා අයත් වේ ද, කුමක් හැරගෙන පරලොවට යේ ද, තමා නොහැර යන සෙවණැල්ල සෙයින් කුමක් ඔහු අනුව යන්නේ වේ ද —

33. මෙ ලොවැ සත්ත්වයා පින ද පව ද යන දෙවැදෑරුම් වූ යම් කර්මයක් රැස්කෙරේ ද, එය මැ ඔහුට තමා අයත් වෙයි, ඒ කර්මය ගෙන පරලොව යෙයි, ඔහුගේ ඒ කර්මය තමා නොහැර යන සෙවණැල්ල සෙයින් අනුව යන්නේ වේ.

34. එහෙයින් පරලොවැ විපාකඵලය රැස්කරනුයේ කුසලය කරන්නේ යැ, සත්ත්වයන්ට පරලොවැ දී පුණ්‍යයෝ පිහිට වෙත් යයි.

මෙ සූත්‍රය පරවචන යැ, අනුගීතිය සකවචනයි.

මෙ සකවචන ද පරවචන ද වේ.

(16) තත්ථ කතමං විසජ්ජනීයං :

පඤ්හෙ පුච්ඡිතෙ ඉදං අභිඤ්ඤෙය්‍යං ඉදං පරිඤ්ඤෙය්‍යං ඉදං පහාතබ්බං ඉදං භාවෙතබ්බං ඉදං සච්ඡිකාතබ්බං ඉමෙ ධම්මා එවං ගහිතා ඉදං ඵලං නිබ්බත්තයන්ති තෙසං එවං ගහිතානං අයං අත්ථො ඉති.

ඉදං විසජ්ජනීයං.

"උළාරො බුද්ධො භගවා"ති බුද්ධුළාරතං ධම්මස්වාක්ඛාතතං සඞ්ඝසුප්පටිපන්නතඤ්ච එකංසෙනෙව නිද්දිසෙ. "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා"ති "සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා"ති "සබ්බෙ ධම්මා අනත්තා"ති එකංසෙනෙව නිද්දිසෙ. යං වා පනඤ්ඤම්පි එවං ජාතියන්ති.

ඉදං විසජ්ජනීයං.

(17) තත්ථ කතමං අවිසජ්ජනීයං.

35 "ආකඞ්ඛතො තෙ නරදම්මසාරථි
දෙවා මනුස්සා මනසා විචින්තිතං,
සබ්බෙ න ජඤ්ඤා[1] කසිණාපි පාණිනො
සන්තං සමාධිං අරණං නිසෙවතො.
"කිං තං භගවා ආකඞ්ඛතී"ති.

ඉදං අවිසජ්ජනීයං.

"එත්තකො භගවා සීලක්ඛන්ධෙ[2] සමාධික්ඛන්ධෙ පඤ්ඤාක්ඛන්ධෙ විමුත්තික්ඛන්ධෙ විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙ ඉරියායං පභාවෙ හිතෙසිතායං කාරුණායං ඉද්ධිය"න්ති.

ඉදං අවිසජ්ජනීයං.

"තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස ලොකෙ උප්පාදා තිණ්ණං රතනානං උප්පාදො : බුද්ධරතනස්ස ධම්මරතනස්ස සඞ්ඝරතනස්ස".

"කිං පමාණානි තීණි රතනානී"ති ඉදං අවිසජ්ජනීයං බුද්ධවිසයො අවිසජ්ජනීයො. පුග්ගලපරොපරඤ්ඤුතා අවිසජ්ජනීයා.

"පුබ්බා භික්ඛවෙ කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සකිං නිරයං සකිං තිරච්ඡානයොනිං සකිං පෙත්තිවිසයං සකිං අසුරයොනිං සකිං දෙවෙ සකිං මනුස්සෙ සන්ධාවතං සංසරතං".

---

1. න ජානෙය්‍යුං - අට්ඨකථා.
2. සීලක්ඛන්ධෙන - පු.

(16) එහි විස්සජ්ජනීය කවරෙ යත් :

ප්‍රශ්නයක් විචාළකල්හි ' මෙය අභිඥෙය යැ මෙය පරිඥෙය යැ මෙයප්‍රහාතව්‍ය යැ මෙය භාවිතව්‍ය යැ මෙය ප්‍රත්‍යක්ෂ කටයුතු යැ මේ කුශලාකුශලධර්මයෝ මෙසේ රැස් කරනලද්දාහු (ඉෂ්ට හෝ අනිෂ්ට හෝ) මේ විපාකඵලය උපදවති, මෙසේ රැස්කරනලද ඒ කර්මයන්ගේ මේ අර්ථ යැ ' යි.

මේ විස්සජ්ජනීය වෙයි.

' භාග්‍යවත් බුදුහු උදර වූහ ' යි (විචාළ කල්හි) බුදුරදුන්ගේ උදරබව ද ධර්මය ස්වාක්ඛාත බව ද සඞ්ඝයාගේ සුප්‍රතිපත්තිය ද ඒකාන්තයෙන් මැ දක්වන්නේ යැ, සියලු සංස්කාරයෝ අනිත්‍යයහ ' යි ද සියලු සංස්කාරයෝ දුක් වූහ ' යි ද සියලු ධර්මයෝ අනාත්මයහ ' යි ද ඒකාන්තයෙන් මැ ප්‍රකාශ කරන්නේ යැ, මෙබඳු ස්වභාව ඇති යම් අනික් පැනයකුදු විසඳන්නේ යි.

මේ විස්සජ්ජනීය යි.

(17) එහි අවිස්සජ්ජනීය කවරෙ යැ :

35. නරදම්සැරිය, (සත්ත්වයන්ගේ හිතාර්ථය) කැමැතිවන නුඹවහන්සේ විසින් (කරුණායෙන් සිහිල් වූ) සිතින් සිතනලද අර්ථය දෙවියෝ ද මනුෂ්‍යයෝ ද සියලු අනවශෙෂ ප්‍රාණීහු ද නො දන්නාහුය, ශාන්ත වූ අරණ සමාධිය සෙවුනා බුදුරදුන්ගේ චින්තිතය ' භාග්‍යවත්හු කුමක් කැමැති වෙත් දැ ' යි අන්‍යයනට අවිසය වේ.

මේ අවිස්සජ්ජනීය වෙයි.

" බුදුහු ශීලස්කන්ධහේතුයෙන් සමාධිස්කන්ධයෙන් ප්‍රඥස්කන්ධයෙන් විමුක්ති ස්කන්ධයෙන් විමුක්තිඥනදර්ශනස්කන්ධයෙන් කායවාක්සමාචාරය හෙතු කොටගෙන අනුභාවයෙන් හිතෙසිතා (මෛත්‍රී) යෙන් කරුණායෙන් ඍද්ධිහේතුයෙන් මෙපමණ වන්නාහ ' යි.

මේ අවිස්සජ්ජනීය වෙයි.

" මහණෙනි, තථාගත අරහත් සම්‍යක් සම්බුද්ධයන්ගේ ලොවැ පහළවීමෙන් බුද්ධරත්නය ධර්මරත්නය සඞ්ඝරත්නය යන තුනුරුවන්ගේ පහළවීම වේ."

' රත්නත්‍රය (ගුණවිසින්) කිපමණ දැ ' යි මේ අවිස්සජ්ජනීය වෙයි, බුද්ධවිසය අවිස්සජ්ජනීය වෙයි, පුද්ගලපරාවර දන්නාබව අවිස්සජ්ජනීය වේ.

" මහණෙනි, අවිද්‍යානීවරණ ඇති තණ්හාසංයොජනයෙන් බැඳුණු (එහෙයින්) වරෙක නිරයට ද වරෙක තිරිසන්යොනට ද වරෙක ප්‍රෙතවිෂයට ද වරෙක අසුරනිකායට ද වරෙක දෙව්ලොවෙහි ද වරෙක මිනිස්ලොවැ ද භවයෙන් භවයට සන්ධාවන කරන පුනපුනා භවයෙහි සැරිසරන සත්ත්වයන්ගේ පූර්වකොටිය නො පැනෙයි."

“කතමා පුබ්බා කොටී”ති අවිසජ්ජනීයං. “න පඤ්ඤායතී”ති සාවකානං ඤාණවෙකල්ලෙන. දුවිධා බුද්ධානං භගවන්තානං දෙසනා: අත්තූපනායිකා ච පරූපනායිකා ච. ‘න පඤ්ඤායතී’ති පරූපනායිකා; ‘නත්ථි බුද්ධානං භගවන්තානං අප්පජානනා’ති[1] අත්තූපනායිකා; යථා භගවා කොකාලිකං භික්ඛුං ආරබ්භ අඤ්ඤතරං භික්ඛුං එවමාහ:

‘සෙය්‍යථාපි භික්ඛු, වීසතිඛාරිකො කොසලකො තිලවාහො -පෙ- තතෙවච එකො අබ්බුදො නිරයො. සෙය්‍යථාපි භික්ඛු, වීසති අබ්බුදා නිරයා, එවමෙකො නිරබ්බුදො නිරයො, සෙය්‍යථාපි භික්ඛු, වීසති නිරබ්බුදා නිරයා, එවමෙකො අබබො නිරයො සෙය්‍යථාපි භික්ඛු, වීසති අබබා නිරයා, එවමෙකො අටටො නිරයො. සෙය්‍යථාපි භික්ඛු, වීසති අටටා නිරයා, එවමෙකො අහහො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති අහහා නිරයා. එවමෙකො කුමුදො නිරයො. සෙය්‍යථාපි භික්ඛු, වීසති කුමුදා නිරයා, එවමෙකො සොගන්ධිකො නිරයො, සෙය්‍යථාපි භික්ඛු, වීසති සොගන්ධිකා නිරයා, එවමෙකො උප්පලකො නිරයො. සෙය්‍යථාපි භික්ඛු, වීසති උප්පලකා නිරයා, එවමෙකො පුණ්ඩරීකො නිරයො. සෙය්‍යථාපි භික්ඛු, වීසති පුණ්ඩරීකා නිරයා, එවමෙකො පදුමො නිරයො. පදුමං ඛො පන භික්ඛු, නිරයං කොකාලිකො භික්ඛු උපපන්නො සාරිපුත්ත මොග්ගල්ලානෙසු චිත්තං ආඝාතෙත්වා”ති.

යං වා පන කිඤ්චි භගවා ආහ: අයං අප්පමෙය්‍යො අසංඛෙය්‍යොති, සබ්බං තං අවිසජ්ජනීයන්ති.

ඉදං අවිසජ්ජනීයං.

(18) තත්ථ කතමං විසජ්ජනීයං ච අවිසජ්ජනීයං ච:

යදා සො උපකො ආජීවකො භගවන්තං ආහ: “කුහිං ආවුසො ගොතම, ගමිස්සසී”ති. භගවා ආහ:

36. “බාරාණසිං ගමිස්සාමි ආහනතුං[2] අමතදුන්දුභිං,
ධම්මචක්කං පවත්තෙතුං ලොකෙ අප්පතිවත්තිය”න්ති.

උපකො ආජීවකො ආහ: “ජිනොති ඛො ආවුසො හො ගොතම පටිජානාසී”ති, භගවා ආහ:

37. “මාදිසා වෙ ජිනා[3] හොන්ති යෙ පත්තා ආසවක්ඛයං,
ජිතා මෙ පාපකා ධම්මා තස්මාහං උපකා ජිනො”ති.

---

1. අවිජානනාති - මජසං.
2. ආහං තං - මජසං
ආහඤ්ඤං - මනි, මපා.
3. ජිනා වෙ මාදිසා - සිමු.

' පූර්වකෝටිය කවර ද ' යි අවිස්සජ්ජනීය වෙයි, ' නො පැනෙයි ' යනු ශ්‍රාවකයන්ගේ ඥානවෛකල්‍යය හෙයිනි. භාග්‍යවත් බුදුවරයන්ගේ දේශනාව අත්තූපනායිකා (තමන් වහන්සේ එළවා දක්වියැයුතු) දේශනාව ද පරූපනායිකා දෙශනාව ද ' යි දෙවැදෑරුම් වෙයි, (එහි) න පඤ්ඤායති යනු (මෙරමා එළවාදක්වන) පරූපනායිකා දේශනා යි. " . . . " නත්ථි බුද්ධානං භගවන්තානං අප්පජානනා යනු අත්තූපනායිකා දෙශනා යි. ඒ මෙසේ යැ : බුදුහු කොකාලික භික්ෂු අරබයා අන්‍යතර මහණක්හට මෙසේ වදළසේක :

" මහණ, යම්පරිදි විසිඛාරියකින් යුත් කොසොල්රට වහරට පැමිණි තිලවාහයෙක් (තලගැලෙක්) වේ ද . . . අබ්බුදනිරයක ආයු නො ගෙවේ මැ ය. මහණ, අබ්බුදනිරය විස්සක් යම්සේ ද එක නිරබ්බුදනිරය එබඳු වෙයි. මහණ, නිරබ්බුදනිරය විස්සක් යම්සේ ද, එක අබබනිරය එබඳු වෙයි. මහණ, අබබනිරය විස්සක් යම්බඳු ද එක අටට නිරය එබඳු වෙයි. මහණ, අටටනිරය විස්සක් යම්සේ ද එක අහහනිරය එබඳු වෙයි. මහණ, අහහ නිරය විස්සක් යම්සේ ද එක කුමුදනිරය එබඳු වෙයි. මහණ, කුමුදනිරය විස්සක් යම්සේ ද එක සොගන්ධිකනිරය එබඳු වෙයි. මහණ, සොගන්ධිකනිරය විස්සක් යම්සේ ද එක උප්පලකනිරය එබඳු වෙයි. මහණ, උප්පලකනිරය විස්සක් යම්පරිදි ද එක පුණ්ඩරීක නිරය එසේ යැ, මහණ, පුණ්ඩරීකනිරය විස්සක් යම්සේ ද එක පදුමනිරය එසේ යැ. මහණ, කොකාලික භික්ෂු සාරිපුත්තමොග්ගල්ලානයන් කෙරෙහි සිත ප්‍රදූෂ්‍ය කොට පදුම නිරයට පැමිණියේ " යයි.

තවද බුදුහු යම් කිසිවක් ' මෙය අප්‍රමෙය යැ අසංඛෙය්‍යය ' යි වදළසේක් ද ඒ සියල්ල නො විසදියයුතු වේ යයි.

මේ අවිස්සජ්ජනීය දේශනා යි.

(18) එහි කවරෙක් විස්සජ්ජනීය ද අවිස්සජ්ජනීය ද වේ යැ යත් :

යම් කලෙක ඒ උපක ආජීවක භාග්‍යවතුන් වහන්සේට ' ඇවැත්නි ගෞතමයෙනි, කොහි යන්නවූ ද ' යි කීයේ ද, බුදුහු මෙසේ වදළහ :

36. දහම්අමාබෙරය ගසන්නට, ලොවැ අනෙකක්හු විසින් පවත්වාලියැ නොහෙන දම්සක් පවත්වන්නට බරණැසට යන්නෙමි ' යි.

උපක ආජීවක මෙසේ කී : ' ඇවැත්නි ගෞතමයෙනි,' ජින ' යි මැ පිළින කරවූ ද ' යි. බුදුහු වදළහ :

37. යම් කෙනෙක් ආස්‍රවක්ෂයට (නිවනට) පැමිණියාහු ද, මාබඳු වූවාහු එකාන්ත යෙන් ජින නම් වෙති. මා විසින් අකුශලධර්මයෝ දිනාලදහ, උපකය එහෙයින් මම ජින වෙමි ' යි.

“කථං ජීවො” “කෙන ජීවො”ති විස්සජ්ජනීයං ; “කතමො ජීවො”ති අවිස්සජ්ජනීයං, “කතමො ආසවක්ඛයො : රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො”ති විස්සජ්ජනීයං ; කිත්තකො ආසවක්ඛයො”ති අවිස්සජ්ජනීයං ;

ඉදං විස්සජ්ජනීයඤ්ච අවිස්සජ්ජනීයඤ්ච.

“අත්ථි තථාගතො”ති විස්සජ්ජනීයං ; “අත්ථි රූපං”ති විස්සජ්ජනීයං. “රූපං තථාගතො”ති අවිස්සජ්ජනීයං, “රූපවා තථාගතො”ති අවිස්සජ්ජනීයං, “රූපෙ වා තථාගතො”ති අවිස්සජ්ජනීයං, “තථාගතෙ රූප”න්ති අවිස්සජ්ජනීයං. එවං “අත්ථි වෙදනා-පෙ-සඤ්ඤා-සංඛාරා-අත්ථි විඤ්ඤාණ”න්ති විස්සජ්ජනීයං. “විඤ්ඤාණං තථාගතො”ති අවිස්සජ්ජනීයං, විඤ්ඤාණවා තථාගතො”ති අවිස්සජ්ජනීයං, විඤ්ඤාණෙ තථාගතො”ති අවිස්සජ්ජනීයං, “තථාගතෙ විඤ්ඤාණ”න්ති අවිස්සජ්ජනීයං. “අඤ්ඤත්‍ර රූපෙන තථාගතො”ති අවිස්සජ්ජනීයං, අඤ්ඤත්‍ර වෙදනාය -පෙ- සඤ්ඤාය - සඞ්ඛාරෙහි - විඤ්ඤාණෙන තථාගතො”ති අවිස්සජ්ජනීයං, “අයං සො තථාගතො අරූපකො අවෙදනකො අසඤ්ඤකො අසඞ්ඛාරකො අවිඤ්ඤාණකො”ති අවිස්සජ්ජනීයං.

ඉදං විස්සජ්ජනීයඤ්ච අවිස්සජ්ජනීයඤ්ච.

“පස්සති භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ චවමානෙ උපපජ්ජමානෙ (එවං සබ්බං) -පෙ-යථාකම්මූපගෙ සත්තෙ පජානාති”ති විස්සජ්ජනීයං, “කතමෙ සත්තා” කතමො තථාගතො”ති අවිස්සජ්ජනීයං.

ඉදං විස්සජ්ජනීයඤ්ච අවිස්සජ්ජනීයඤ්ච.

“අත්ථි තථාගතො”ති විස්සජ්ජනීයං, “අත්ථි තථාගතො පරම්මරණා”ති අවිස්සජ්ජනීයං.

ඉදං විස්සජ්ජනීයං ච අවිස්සජ්ජනීයං ච.

(19) තත්ථ කතමං කම්මං :

38. “අන්තකෙනාධිපන්නස්ස ජහතො මානුසං භවං,
කිං හි තස්ස සකං හොති කිඤ්ච ආදාය ගච්ඡති ;
කිඤ්චස්ස අනුගං හොති ඡායාව අනපායිනී”

39. “උභො පුඤ්ඤඤ්ච පාපං ච යං මච්චො කුරුතෙ ඉධ,
තං හි තස්ස සකං හොති තං ච ආදාය ගච්ඡති ;
තඤ්චස්ස අනුගං හොති ඡායාව අනපායිනී”ති.

ඉදං කම්මං.

" කිසෙයින් ජිත වේ ද ? ' කවර කරුණෙකින් ජිත වේ ද ' යි විස්සජ්ජනීය වෙයි. ' කවරෙක් ජිත වේ ද ' යි අවිස්සජ්ජනීය යැ. ' ආස්‍රවක්ෂය කවරේ ද ? රාගක්ෂය ද්වේෂක්ෂය මොහක්ෂය ' යි විස්සජ්ජනීය යැ. ' ආස්‍රවක්ෂය කිපමණ වේ ද ' යි අවිස්සජ්ජනීය යි.

මේ විස්සජ්ජනීය ද අවිස්සජ්ජනීය ද වේ.

' තථාගත (සත්ත්ව) ඇද්ද ' යි විස්සජ්ජනීය යැ, ' රූපය ඇද්ද ' යි විස්සජ්ජනීය යැ, ' රූපය තථාගත ද ' යි අවිස්සජ්ජනීය යැ, ' තථාගත රූපවත් ද ' යි අවිස්සජ්ජනීය යැ, 'රූපයෙහි හෝ තථාගතා වේ ද ' යි අවිස්සජ්ජනීය යැ, ' තථාගත කෙරෙහි රූපය වේ ද 'යි අවිස්සජ්ජනීය යි. මෙසේ ' වෙදනා ඇද්ද . . . සංඥා . . . සංස්කාර . . . විඥාන ඇද්ද 'යි විස්සජ්ජනීය යැ, ' විඥානය තථාගත ද ' යි අවිස්සජ්ජනීය යැ, ' තථාගත විඥානවත් ද ' යි අවිස්සජ්ජනීය යැ, ' විඥානයෙහි තථාගත ඇද්ද 'යි අවිස්සජ්ජනීය යැ, 'තථාගත කෙරෙහි විඥානය ඇද්ද ' යි අවිස්සජ්ජනීය යැ, රූපයෙන් අන් තැනක තථාගත වේ ද යි අවිස්සජ්ජනීය යැ ' වෙදනායෙන් අන් තැනෙක . . . සංඥායෙන් . . . සංස්කාරයන් ගෙන් . . . විඥානයෙන් අන් තැනෙක තථාගත වේ ද ' යි අවිස්සජ්ජනීය යැ, මේ ඒ තථාගත රූප නැතියෙක් ද ? අවෙදක අසංඥක අසංස්කාරක අවිඥානක ද ' යි අවිස්සජ්ජනීය වේ.

මේ විස්සජ්ජනීය ද අවිස්සජ්ජනීය ද වේ.

බුදුහු විශුද්ධ වූ මිනිසැස ඉක්මවා සිටි දිවැසින් (මෙලොවින්) චුත වන්නාවූ ද (පරිසන්ධි විසින් මෙලොවට) පැමිණෙන්නාවූ ද සත්ත්වයන් දක්නාසේක් ද, . . . කම්වූ පරිදි පරලොව යන සත්ත්වයන් දන්නාසේක් ද ' යි විස්සජ්ජනීය යැ, කවර සත්ත්වයෝ ද ? තථාගත කවරේ ද ' යි අවිස්සජ්ජනීය යැ.

මේ විස්සජ්ජනීය ද අවිස්සජ්ජනීය ද වේ.

' තථාගත ඇද්ද ' යනු විස්සජ්ජනීය යැ, ' තථාගත මරණින් මතු ඇද්ද' යනු අවිස්සජ්ජනීය යි.

මේ විස්සජ්ජනීය ද අවිස්සජ්ජනීය ද වේ.

(19) එහි කම්ම කවරෙ යැ :

38, 39. (32, 33 ගාථාසන්න බලන්න).

මේ කර්ම යැ.

"පුනච පරං භික්ඛවෙ, බාලං පීඨසමාරූළ්හං වා මඤ්චසමාරූළ්හං වා ඡමාය[1] වා සෙමානං, යානිස්ස පුබ්බෙ පාපකානි කම්මානි කතානි කායෙන දුච්චරිතානි වාචාය දුච්චරිතානි මනසා දුච්චරිතානි, තානිස්ස තම්හි සමයෙ ඔලම්බන්ති අජ්ඣොලම්බන්ති අභිප්පලම්බන්ති. සෙය්‍යථාපි භික්ඛවෙ, මහන්තානං[2] පබ්බතකූටානං ඡායා සායන්හසමයං පඨවියා ඔලම්බන්ති අජ්ඣොලම්බන්ති අභිපලම්බන්ති, එවමෙව ඛො භික්ඛවෙ බාලං පීඨසමාරූළ්හං වා මඤ්චසමාරූළ්හං වා ඡමාය[1] වා සෙමානං යානිස්ස පුබ්බෙ පාපකානි කම්මානි කතානි කායෙන දුච්චරිතානි වාචාය දුච්චරිතානි මනසා දුච්චරිතානි, තානිස්ස තම්හි සමයෙ ඔලම්බන්ති අජ්ඣොලම්බන්ති අභිප්පලම්බන්ති. තත්‍ර භික්ඛවෙ බාලස්ස එවං හොති: අකතං වත මෙ කල්‍යාණං අකතං කුසලං අකතං භීරුත්තාණං, කතං පාපං කතං ලුද්දං කතං කිබ්බිසං, යා ච හොති[3] අකතකල්‍යාණානං අකතකුසලානං අකතභීරුත්තාණානං කතපාපානං කතලුද්දානං කතකිබ්බිසානං ගති, තං ගතිං පෙච්ච ගච්ඡාමීති සො සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජතීති.

පුනච පරං භික්ඛවෙ, පණ්ඩිතං පීඨසමාරූළ්හං වා මඤ්චසමාරූළ්හං වා ඡමාය වා සෙමානං, යානිස්ස පුබ්බෙ කල්‍යාණානි කම්මානි කතානි කායෙන සුචරිතානි වාචාය සුචරිතානි මනසා සුචරිතානි, තානිස්ස තම්හි සමයෙ ඔලම්බන්ති අජ්ඣොලම්බන්ති අභිප්පලම්බන්ති. සෙය්‍යථාපි භික්ඛවෙ මහන්තානං පබ්බතකූටානං ඡායා සායන්හසමයං පඨවියං ඔලම්බන්ති අජ්ඣොලම්බන්ති අභිප්පලම්බන්ති, එවමෙව ඛො භික්ඛවෙ පණ්ඩිතං පීඨසමාරූළ්හං වා මඤ්චසමාරූළ්හං වා ඡමාය වා සෙමානං යානිස්ස පුබ්බෙ කල්‍යාණානි කම්මානි කතානි කායෙන සුචරිතානි වාචාය සුචරිතානි මනසා සුචරිතානි, තානිස්ස තම්හි සමයෙ ඔලම්බන්ති අජ්ඣොලම්බන්ති අභිප්පලම්බන්ති. තත්‍ර, භික්ඛවෙ පණ්ඩිතස්ස එවං හොති: අකතං වත මෙ පාපං අකතං ලුද්දං අකතං කිබ්බිසං කතං කල්‍යාණං කතං කුසලං කතං භීරුත්තාණං, යා ච හොති[3] පාපානං අකතලුද්දානං අකතකිබ්බිසානං කතකල්‍යාණානං කතකුසලානං කතභීරුත්තාණානං ගති, තං ගතිං පෙච්ච ගච්ඡාමීති. සො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජති කතං මෙ පුඤ්ඤං අකතං පාපං, යා භවිස්සති ගති අකතපාපස්ස අකතලුද්දස්ස අකතකිබ්බිසස්ස කතපුඤ්ඤස්ස කතකුසලස්ස කතභීරුත්තාණස්ස, තං පෙච්ච ගතිං ගච්ඡාමීති විප්පටිසාරො න ජායති. අවිප්පටිසාරිනො ඛො භික්ඛවෙ ඉත්ථියා වා පුරිසස්ස වා ගිහිනො වා පබ්බජිතස්ස වා භද්දකං මරණං භද්දිකා කාලකිරියාති වදාමීති.

ඉදං කම්මං.

"තීණිමානි භික්ඛවෙ දුච්චරිතානි, කතමානි තීණි: කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. ඉමානි ඛො භික්ඛවෙ තීණි දුච්චරිතානි.

---

1. ඡමායං – මජසං.
2. මහතං – මජසං.
3. යාවතා හොති – සීමු, මජසං.

'' යළිදු මහණෙනි, බාලයා පීඨයෙහි නැඟීහුන්නහුට හෝ මඤ්චයෙහි නැඟීහුන්නහුට හෝ බිමැ හෝනහුට හෝ ඔහු විසින් පෙර කරනලද කායදුශ්චරිත වාග්දුශ්චරිත මනොදුශ්චරිත වූ යම් පාපකර්ම කෙනෙක් ඇද්ද, එසමයෙහි ඔහුට ඒ කර්මයෝ එළැඹ සිටිති, අධ්‍යවලම්බන අභිප්‍රලම්බන වෙත්. මහණෙනි, යම්පරිදි සවස්කාලයෙහි මහත් පර්වතකූටයන්ගේ සෙවණැලි පොළෝතෙලෙහි පැතිරේද, මහණෙනි, එපරිදි මැ පීඨයෙහි නැඟීහුන් වේවයි මඤ්චයෙහි නැඟීහුන් වේවයි බිමැ හෝනා වේවයි බාලයාහට ඔහු විසින් කළ කායදුශ්චරිත වාග්දුශ්චරිත මනොදුශ්චරිත වූ යම් පෙර කළ පාපකර්ම කෙනෙක් ඇද්ද, එකල්හි ඒ කර්මයෝ එළැඹ සිටිත්. ඒ වැටහීම ආපාථගත කල්හි බාලයාහට මෙසේ සිත් වෙයි : මා විසින් කල්‍යාණයෙක් නොකරනලද මැ ය, කුශලයෙක් නොකරනලද මැ යැ, බියට පිහිටෙක් නොකරනලද මැ යැ, පව් කරනලද, කර්කශකර්ම කරනලද, කිලිටිකම් කරනලද. කලණකම් නොකළ කුසල් නොකළ බියට පිහිට නොකළ පව් කළ කැකුළකම් කළ කිලිටිකම් කළ ඇත්තනට යම් ගතියෙක් ඇද්ද, පරලොවැ ඒ ගතියට යෙමි. හේ ශොක කෙරෙයි, ක්ලාන්ත වෙයි, වැලැපෙයි ළෙහි පැහැර හඬයි, සම්මොහයට පැමිණේ යයි.

යළිදු මහණෙනි, පණ්ඩිතයා පීඨයෙහි නැඟීසිටියහුට වේවයි මඤ්චයෙහි නැඟීසිටියහුට වේවයි බිමැ හෝනහුට වේවයි ඔහු විසින් පෙර කරනලද කායසුචරිත වචීසුචරිත මනෝසුචරිත වූ යම් කුශලකර්ම කෙනෙක් ඇද්ද, එසමයෙහි ඔහුට ඒ කුශලකර්මයෝ එළැඹැ සිටිති, අධ්‍යවලම්බන අභිප්‍රලම්බන වෙත්. යම්පරිදි මහණෙනි, මහත් පර්වතකූටයන්ගේ සෙවණැලි සවස්කලැ පොළෝතෙලෙහි අවලම්බන අධ්‍යවලම්බන අභිප්‍රලම්බන වශයෙන් පැතිරෙත් ද, එපරිදි මැ මහණෙනි, පණ්ඩිතයා පීඨයෙහි නැඟීසිටියහු හෝ මඤ්චයෙහි නැඟීසිටියහු හෝ බිමැ හෝනහු හෝ ඔහු විසින් පෙර කරනලද කායසුචරිත වචීසුචරිත මනොසුචරිත වූ යම් කුශලකර්ම කෙනෙක් ඇද්ද එසමයෙහි ඔහුට ඒ කර්මයෝ අවලම්බන අධ්‍යවලම්බන අභිප්‍රලම්බන වශයෙන් එළැඹ සිටිත්. එහි දී මහණෙනි, පණ්ඩිතහට මෙබඳු සිතෙක් වෙයි : 'ඒකාන්තයෙන් මා විසින් පව් නොකරනලද රෞද්‍රකර්ම නොකරනලද කිල්බිෂ නොකරනලද කල්‍යාණය කරනලද කුශලය කරනලද භයපරිත්‍රාණය කරනලද, නොකළ පව් ඇති නොකළ රළුකම් ඇති නොකළ කිලිටිකම් ඇති කළ කලණ ඇති කළ කුසල් ඇති කළ භයට පිහිට ඇති සත්නට යම්බඳු ගතියෙක් වේද, පරලොවැ දී ඒ ගතියට යෙමි ' විප්‍රතිසාරය නූපදී, ' මහණෙනි, විපිළිසර නැති ස්ත්‍රියගේ හෝ පුරුෂයාගේ හෝ ගිහියාගේ හෝ පැවිද්දගේ හෝ මරණය සොඳුරු වෙයි, කාලක්‍රියාව සොඳුරුවන්නී යයි කියමි ' යි.

මේ කර්ම යැ.

'' මහණෙනි, මේ දුශ්චරිත තුනෙකි, කවර තුනෙක යත් : කායදුශ්චරිතය වාග්දුශ්චරිතය මනොදුශ්චරිත යි. මහණෙනි, මේ තුන් දුශ්චරිතයෝ '' යි.

තීණිමානි භික්ඛවෙ, සුචරිතානි. කතමානි තීණි: කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං. ඉමානි ඛො භික්ඛවෙ, තීණි සුචරිතානී''ති.

ඉදං කම්මං.

(20) තත්ථ කතමො විපාකො:

''ලාභා වො භික්ඛවෙ, සුලද්ධං වො භික්ඛවෙ ඛණො වො පටිලද්ධො බ්‍රහ්මචරියවාසාය, දිට්ඨා මයා භික්ඛවෙ, ඡ ඵස්සායතනිකා නාම නිරයා, තත්ථ යං කිඤ්චි චක්ඛුනා රූපං පස්සති අනිට්ඨරූපං යෙව පස්සති නො ඉට්ඨරූපං, අකන්තරූපං යෙව පස්සති නො කන්තරූපං, අමනාපරූපංයෙව පස්සති නො මනාපරූපං, යං කිඤ්චි සොතෙන -පෙ- ඝානෙන -පෙ- ජිව්හාය -පෙ- කායෙන -පෙ- යං කිඤ්චි මනසා ධම්මං විජානාති අනිට්ඨධම්මං යෙව විජානාති නො ඉට්ඨධම්මං, අකන්තධම්මං යෙව විජානාති නො කන්තධම්මං, අමනාප ධම්මං යෙව විජානාති, නො මනාපධම්මං ලාභා වො භික්ඛවෙ, සුලද්ධං වො භික්ඛවෙ, ඛණො වො පටිලද්ධො බ්‍රහ්මචරියවාසාය.

දිට්ඨා මයා භික්ඛවෙ, ඡ ඵස්සායතනිකා නාම සග්ගා. තත්ථ යං කිඤ්චි චක්ඛුනා රූපං පස්සති ඉට්ඨරූපංයෙව පස්සති නො අනිට්ඨරූපං, කන්තරූපංයෙව පස්සති නො අකන්තරූපං, මනාපරූපංයෙව පස්සති නො අමනාපරූපං, යං කිඤ්චි සොතෙන සද්දං සුණාති -පෙ- ඝානෙන -පෙ- ජිව්හාය -පෙ- කායෙන -පෙ- මනසා ධම්මං විජානාති ඉට්ඨධම්මංයෙව විජානාති නො අනිට්ඨධම්මං, කන්තධම්මංයෙව විජානාති නො අකන්ත ධම්මං, මනාපධම්මංයෙව විජානාති නො අමනාපධම්මං, ලාභා වො භික්ඛවෙ, සුලද්ධං වො භික්ඛවෙ, ඛණො වො පටිලද්ධො බ්‍රහ්මචරිය වාසායා''ති.

අයං විපාකො.

40. ''සට්ඨි වස්සසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
නිරයෙ පච්චමානානං කදා අන්තො භවිස්සති.

41. නත්ථි අන්තො කුතො අන්තො න අන්තො පති දිස්සති,
තදා හි පකතං පාපං මම[1] තුය්හං ච මාරිසා''ති.

අයං විපාකො.

(21) තත්ථ කතමං කම්මං ච විපාකො ච:

42. ''අධම්මචාරී හි නරො පමත්තො
යහිං යහිං ගච්ඡති දුග්ගතිං යො,
සො නං අධම්මො චරිතො හනාති
සයං ගහීතො යථා කණ්හසප්පො''

---

1 මමං - ජාතක.

'' මහණෙනි, මේ සුචරිත තුනෙකි, කවර තුනෙක යත් : කායසුචරිතය වාක්සුචරිතය මනස්සුචරිත යි. මහණෙනි, මේ තුන් සුචරිතයෝ '' ය යි.

මේ කර්ම යි.

(20) එහි විපාක කවරෙ යැ :

'' මහණෙනි, තොපට (මනුෂ්‍යාත්මප්‍රතිලාභාදීහු) ලාභයෝ යැ, මහණෙනි, තොප විසින් (පැවිදි වැ ලද චතුපාරිසුද්ධිසීලාදිය) සුලබ්ධ යැ, තොප විසින් බ්‍රහ්මචරිය පිණිස (අෂ්ට අක්ෂණවිනිර්මුක්ත වූ නවවැනි) ක්ෂණය ප්‍රතිලබ්ධ යැ. මහණෙනි, මා විසින් ෂට 'ඵස්සායතනික' නම් නිරයෝ දක්නා ලදහ, එහි ඇසින් යම් කිසි රූපයක් දකී ද, අනිෂ්ට රූපයක් මැ දකී, ඉෂ්ටරූපයක් නොදකී, අකාන්තරූපයක් මැ දකී, කාන්තරූපයක් නොදකී, අමනාපරූපයක් මැ දකී, මනාපරූපයක් නො දකී. කනින් යම් කිසි ශබ්දයක් . . . නැහැයෙන් . . . දිවින් . . . කයින් . . . සිතින් යම් කිසි ධර්මයක් දැනගනී ද, අනිෂ්ට ධර්මයක් මැ දනී, ඉෂ්ටධර්මයක් නොදනී, අකාන්තධර්මයක් මැ දනී, කාන්තධර්මයක් නොදනී, අමනාපධර්මයක් මැ දනී, මනාපධර්මයක් නොදනී. මහණෙනි, තොපට ලාභයෝ යැ, මහණෙනි, තොප විසින් සුලබ්ධ යැ, තොප විසින් බඹසරවස් විසීම පිණිස තොපවිසින් (නවවැනි සම්පත්) ක්ෂණය ලද්දේ යි.

මහණෙනි, මා විසින් සවැදෑරුම් 'ඵස්සායතනික' නම් ස්වර්ගයෝ දක්නාලදහ, එහි ඇසින් යම් කිසි රුවක් දකී ද, ඉෂ්ටරූපයක් මැ දකී, අනිෂ්ටරූපයක් නොදකී. කාන්ත රූපයක් මැ දකී, අකාන්තරූපයක් නොදකී, මනාපරූපයක් මැ දකී, අමනාපරූපයක් නොදකී. කනින් යම් කිසි ශබ්දයක් අසා ද . . . නැහැයෙන් . . . දිවින් . . . කයින් . . . සිතින් යම් කිසි ධර්මයක් දැනගනී ද, ඉෂ්ටධර්මයක් මැ දනී, අනිෂ්ටධර්මයක් නොදනී, කාන්තධර්මයක් මැ දනී, අකාන්තධර්මයක් නොදනී, මනාපධර්මයක් මැ දනී, අමනාප ධර්මයක් නොදනී. මහණෙනි, තොපට (මනුෂ්‍යාත්මභාවාදීහු) ලාභයෝ යැ, මහණෙනි, තොප විසින් (චතුපාරිසුද්ධිසීලාදිය) සුලබ්ධ යැ, තොප විසින් බඹසරවස් පිණිස සම්පත් ක්ෂණය ලබනලද '' යි.

මේ විපාක යැ.

40. නිරයෙහි පැසෙන අපට සර්වප්‍රකාරයෙන් සැටවාදහසෙක් පිරුණාහුය, කවර කලෙක අන්තයෙක් වන්නේ ද —

41. අන්තයෙක් නැත, අන්තයෙක් කොහි යැ, අන්තයෙක් නො දක්නා ලැබෙයි! නිදුක, යම්හෙයෙකින් එකල මා විසින් ද තොප විසින් ද පව් කරන ලදැයි.

මේ විපාක යි.

(21) එහි කම්ම ද විපාක ද කවරෙ යැ :

42. ප්‍රමත්ත වූ එහෙයින් මැ අධර්මචාරි වූ යම් මිනිසෙක් යම් යම් තැනෙක දුගතියට යේද, තමා විසින් ගත්නාලද කෘෂ්ණසර්පයෙක් යම්සේ ද එමෙන් තමා විසින් රක්නළ ඒ අධර්මය ඒ අධර්මචාරියා නසයි.

43. "න හි ධම්මො අධම්මො ච උභො සමවිපාකිනො,
අධම්මො නිරයං නෙති ධම්මො පාපෙති සුග්ගතිං"

ඉදං කම්මං ච විපාකො ච.

"මා භික්ඛවෙ පුඤ්ඤානං භායිත්ථ, සුඛස්සෙතං භික්ඛවෙ, අධිවචනං ඉට්ඨස්ස කන්තස්ස පියස්ස මනාපස්ස යදිදං පුඤ්ඤානීති. අභිජානාමි ඛො පනාහං භික්ඛවෙ, දීඝරත්තං කතානං පුඤ්ඤානං දීඝරත්තං[1] ඉට්ඨං කන්තං පියං මනාපං විපාකං පච්චනුභූතං සත්ත වස්සානි මෙත්තචිත්තං භාවෙත්වා සත්ත සංවට්ටවිවට්ටකප්පෙ න ඉමං ලොකං පුනරාගමාසිං, සංවට්ටමානෙ සුදං[2] භික්ඛවෙ, කප්පෙ ආභස්සරූපගො හොමි, විවට්ටමානෙ කප්පෙ සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජාමි, තත්‍ර සුදං[2] භික්ඛවෙ, බ්‍රහ්මා හොමි මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථු දසො වසවත්ති. ඡත්තිංසක්ඛත්තුං ඛො පනාහං භික්ඛවෙ, සක්කො අහොසිං දෙවානමින්දො. අනෙකසතක්ඛත්තුං රාජා අහොසිං චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො කො පන වාදො පදෙසරජ්ජස්ස

තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි : කිස්ස නු ඛො මෙ ඉදං කම්මස්ස ඵලං කිස්ස කම්මස්ස විපාකො යෙනාහං එතරහි එවං මහිද්ධිකො එවං මහානුභාවොති. තස්ස මය්හං භික්ඛවෙ, එතදහොසි : තිණ්ණං ඛො මෙ ඉදං කම්මානං ඵලං තිණ්ණං කම්මානං විපාකො යෙනාහං එතරහි එවං මහිද්ධිකො, එවං මහානුභාවො, සෙය්‍යථිදං : දානස්ස දමස්ස සංයමස්සාති.

තත්ථ යඤ්ච දානං යො ච දමො, යො ච සංයමො, ඉදං කම්මං. යො තප්පච්චයා විපාකො පච්චනුභූතො, අයං විපාකො.

තථා "චූළකම්මවිභඞ්ගො" වත්තබ්බො, යං සුභස්ස මාණවස්ස තොදෙය්‍යපුත්තස්ස දෙසිතං. තත්ථ යෙ ධම්මා අප්පායුකදීඝායුකතාය සංවත්තන්ති, බව්හාබාධඅප්පාබාධතාය - අප්පෙසක්ඛමහෙසක්ඛතාය — දුබ්බණ්ණසුවණ්ණතාය—නීචකුලිකඋච්චාකුලිකතාය—අප්පභොගමහාභොගතාය—දුප්පඤ්ඤපඤ්ඤවන්තතාය ච සංවත්තන්ති, ඉදං කම්මං. යා තත්ථ අප්පායුකදීඝායුකතා-පෙ-දුප්පඤ්ඤපඤ්ඤවන්තතා, අයං විපාකො

ඉදං කම්මං ච විපාකො ච.

(22) තත්ථ කතමං කුසලං :

44 "වාචානුරක්ඛී මනසා සුසංවුතො
කායෙන ච අකුසලං න[3] කයිරා,
එතෙ තයො කම්මපථෙ විසොධයෙ
ආරාධයෙ මග්ගං ඉසිප්පවෙදිත"න්ති.

ඉදං කුසලං.

---

1. දීඝරත්තං - කත්ථචි ඌනං.
2. සුදං - සීමු.
3. නා කුසලං - මජසං

43. ධර්මය ද අධර්මය ද යන දෙක නො මැ සම විපාක ඇත්තාහු වෙති, අධර්මය නිරයට පමුණුවයි, ධර්මය සුගතියට පමුණුවා ' යි.

මේ කර්ම ද විපාක ද වෙයි.

" මහණෙනි, පිනට නොබියව්, මහණෙනි, මේ පින් යැ යනු ඉෂ්ට වූ කැමැතිවූ ප්‍රියවූ මනවඩනා සුවයට නෙල නමෙකි. මහණෙනි, මම දීර්ඝරාත්‍රයෙහි (මාවිසින්) කරනලද පුණ්‍යයන්ගේ ඉෂ්ට වූ කාන්ත වූ ප්‍රිය වූ මනාප වූ විපාකය දීර්ඝකාලයක් විඳිනා ලද්දේ දනිම් මැ ය. සත් හවුරුද්දක් මුළුල්ලෙහි මෛත්‍රීසිත් වඩා සංවට්ට විවට්ටකල්ප සතක් මේ මිනිස්ලොවට පෙරළා නොආයෙමි. මහණෙනි, කල්පය නැසෙන කල්හි ආභස්සර බඹලොවට පැමිණියෙම් වෙමි, කල්පය හටගන්නා කල්හි සිස්වූ බඹවිමනක උපදිමි. මහණෙනි, මම එහි බ්‍රහ්ම වෙමි, (බ්‍රහ්මපාරිසජ්ජ බ්‍රහ්මපුරෝහිතයන් කෙරෙහි) මහාබ්‍රහ්ම වෙමි, ඔවුන් අභිභවනය කරනසුලු වූයෙම් අනභිභූත වෙමි, ඒකාන්තයෙන් තුන්කල් දක්නෙම් (ස්වකීය චිත්තය) වශයෙහි පවත්වනසුලු වෙමි. තවද මහණෙනි, මම සතිස්වරක් දේවේන්ද්‍ර වූ ශක්‍ර වූයෙමි. අනේකියවර දැහැමිවූ දැහැමින් රජ වූ සියුසයුරු අන්ත කොට ඇති පොළොව දිනූ සිය ජනපදයෙහි තහවුරුබවට පැමිණි සත්රුවනින් සමන්වාගත සක්විති රජ වීමි. ප්‍රදේශරාජ්‍යය ගෙන කියනු කවරෙ යැ.

මහණෙනි, මට (පැසුළු සක්විතිකලැ) මෙබඳු සිතෙක් විය : ' යම් හෙයෙකින් මම මෙකල මෙසේ මහත් සෘද්ධි ඇතියෙම් මෙසේ මහත් අනුභාව ඇතියෙම් මේ කවර කර්මයක්හුගේ ඵලයෙක් ද ? කවර කර්මයක විපාකයෙක් ද ' යි. මහණෙනි, මට මෙල සිත විය : යම් පිනෙකින් මම මෙකල මෙසේ මහත්සෘද්ධි ඇතියෙම් මහත්අනුභාව ඇතියෙම් ද, මේ මාගේ තුන් කර්මයක්හුගේ ඵල යැ, තුන් කර්මයක්හුගේ විපාක යි : ඒ මෙසේ යැ : ආහාරාදි දෙයධර්මදන යැ චක්ෂුරාදි ඉන්ද්‍රියදමන යැ කායවාක්සංයම යැ, යන කර්මයන්ගේ යි.

එහි යම් දනයෙක් යම් ඉන්ද්‍රියදමනයෙක් යම් කායවාක්සංයමයෙක් ඇද්ද මේ කර්ම යැ. ඒ හේතුයෙන් යම් විපාකයෙක් විඳිනාලද්දේ ද මේ විපාක යි.

එසේ මැ (මැදුම්සඟියැ) චුල්ලකම්මවිභඞ්ග සූත්‍රය කියැයුත්තේයැ : තොදෙය්‍යපුත්‍ර සුභමාණවකහට යමක් දෙසනලද ද, එහි යම් ධර්ම කෙනෙක් අල්පායුෂ්ක දීර්ඝායුෂ්ක බවට වැටෙත් ද, බහ්වාබාධ අල්පාබාධ බවට — අල්පයශස්ක මහායශස්ක බවට — දුවර්ණ සුවර්ණ බවට — නීචකුලික උච්චාකුලික බවට — අල්පභෝග මහාභෝග බවට — දුෂ්ප්‍රාඥ ප්‍රඥවත් බවට වැටෙත් ද, මේ කර්ම යැ. එහි යම් අල්පායුෂ්ක දීර්ඝායුෂ්ක බවක් . . . දුෂ්ප්‍රඥ ප්‍රඥවත්බවක් ඇද්ද මේ විපාක යි.

මේ කර්ම ද විපාක ද වේ.

(22) එහි කුසල කවරෙ යැ :

44. වාග්දුශ්චරිතය දුරැලීමෙන් වචනය රක්නාසුලු වූයේ අභිධ්‍යාදිය දුරැලීමෙන් සිතින් මොනොවට සංවෘත වූයේ කයිනුදු ප්‍රාණවධාදී අකුශලය නො කරන්නේ යැ, මෙසේ තුන් කර්මපථය පිරිසිදුකරන්නේ යැ, බුද්ධාදි ඍෂීන් විසින් ප්‍රවිදිත වූ ආර්‍යමාර්ගය සිද්ධකරන්නේ යි.

මේ කුසල යැ.

20—88 04440 (79/08)

45. "යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කටං,
සංවුතං තීහි ඨානෙහි තමහං බ්‍රූමි බ්‍රාහ්මණ"න්ති.

ඉදං කුසලං.

"තීණිමානි භික්ඛවෙ, කුසලමූලානි. කතමානි තීණි: අලොභො කුසලමූලං අදොසො කුසලමූලං අමොහො කුසලමූලං. ඉමානි ඛො භික්ඛවෙ, තීණි කුසලමූලානී"ති

ඉදං කුසලං.

"විජ්ජා භික්ඛවෙ, පුබ්බඞ්ගමා කුසලානං ධම්මානං සමාපත්තියා අන්වදෙව[1] හිරිඔත්තප්පං චා"ති.

ඉදං කුසලං.

(23) තත්ථ කතමං අකුසලං:

46. "යස්ස අච්චන්තදුස්සිල්‍යං මාලුවා සාලමිවොත්ථතං,
කරොති සො තථත්තානං යථා නං ඉච්ඡතී දිසො"ති.

ඉදං අකුසලං.

47. "අත්තනා හි කතං පාපං[2] අත්තජං අත්තසම්භවං,
අභිමත්ථති දුම්මෙධං වජිරං වස්මමයං මණිං"ති.

ඉදං අකුසලං.

48. දස කම්මපථෙ නිසෙවිය
අකුසලා කුසලෙහි විවජ්ජිතා,
ගරහා භවන්ති දෙවතෙ,
බාලමති නිරයෙසු පච්චරෙ"ති.

ඉදං අකුසලං.

"තීණිමානි භික්ඛවෙ අකුසලමූලානි. කතමානි තීණි: ලොභො අකුසලමූලං දොසො අකුසලමූලං මොහො අකුසලමූලං. ඉමානි ඛො භික්ඛවෙ තීණි අකුසලමූලානී"ති.

ඉදං අකුසලං.

(24) තත්ථ කතමං කුසලං ච අකුසලං ච:

49 "යාදිසං වපතෙ බීජං තාදිසං හරතෙ ඵලං,
කල්‍යාණකාරී කල්‍යාණං පාපකාරී ච පාපක"න්ති.

---

1. අනුදෙව - මජ්සං, සංකි.
2. අත්තනා'ව කතං කම්මං - ධම්මපද

45. යමක්හුගේ කයින් වචනයෙන් සිතින් දුෂ්කෘත (අපායසංවත්තනික කර්ම) යෙක් නැද්ද, මේ කායාදි තුන් කරුණෙන් සුසංවෘත වූ ඔහු මම බ්‍රාහ්මණ යයි කියමි.

මේ කුසල යැ.

" මහණෙනි, මේ කුසලමූලයෝ තිදෙනෙක් වෙති, කවර තිදෙනෙක යත් : අලොභ කුසලමූල යැ අදොසකුසලමූල යැ අමොහකුසලමූල යි. මහණෙනි, මේ තුන් කුසල මූලයෝ " යි.

මේ කුසල යැ.

" මහණෙනි, කුශලධර්මයන්ගේ ඉපැදීමට (කම්මස්සකතඤාණ සංඛ්‍යාත) විද්‍යාව (සහජාත උපනිශ්‍රය වශයෙන්) පූර්වඞ්ගම වෙයි, හිරි ද ඔතප් ද එක්වැ මැ උපදනේ " යි.

මේ කුසල යි.

(23) එහි අකුසල කවරෙ යැ :

46. යමක්හුගේ ඒකාන්තදුශ්ශීලභාවය සල්රුකක් වැතිරගෙන වැඩුණු මාලුවා ලතාවක් මෙන් ඔහුගේ ආත්මභාවය වැළඳගෙන සිටීයේ ද, යම්සේ සතුරෙක් තම සතුරාට අනර්ථ කැමැති වේ ද, එපරිද්දෙන් ගේ තමහට අනර්ථ කෙරේ යයි.

මේ අකුසල යැ.

47. වජ්‍රය තමහට උත්පත්තිස්ථාන වූ පාෂාණමය මැණික (කඩකඩ කොට) අපරිභොග කරන්නාක් මෙන් තමා කෙරෙහි උපන් තමා කෙරෙහි හටගත් තමා විසින් ම කරනලද පාපය දුෂ්ප්‍රාඥ වූ පව්වූ පුද්ගලයා (අපායාදියෙහි ලා) මඩනේ යි.

මේ අකුසල යැ.

48. දෙව්ය, අඥානපුද්ගලයෝ දශ අකුශලකර්මපථය කොට කුශලයෙන් තොර වූවාහු (නුවණැතියන් විසින්) ගැරහියැයුත්තාහු වෙති, අඥානබුද්ධි ඇති ඔවුහු නරකයන්හි පැසෙත් යයි.

මේ අකුසල යැ.

" මහණෙනි, මේ අකුශලමූලයෝ තිදෙනෙක් වෙති, කවර තිදෙනෙක යත් : ලෝභ අකුසල මූල යැ දෙසඅකුසල මූල යැ මෝහඅකුසල මූල යි. මහණෙනි, මේ තුන් අකුශල මූලයෝ යි.

මේ අකුසල යි.

(24) එහි කුසල ද අකුසල ද කවරෙ යැ :

49. යම්බඳු බිජුවටක් වපුරා ද, එබඳු වූ ශස්‍යඵලය හැරගනී, එසෙයින් කුසල් කරනහුලූ වූයේ කුශලඵලය ද පව් කරනහුලූ වූයේ අකුශලඵලය ද විඳුනේ යි.

තත්ථ යං ආහ: "කල්‍යාණකාරී කල්‍යාණ"න්ති ඉදං කුසලං, යං ආහ: "පාපකාරී ච පාපක"න්ති ඉදං අකුසලං.

ඉදං කුසලං ච අකුසලං ච.

50. "සුභෙන කම්මෙන වජන්ති සුග්ගතිං
අපායභූමිං අසුභෙන කම්මුනා,
ඛයා ච කම්මස්ස විමුත්තචෙතසො
නිබ්බන්ති තෙ ජොතිරිවින්ධනක්ඛයා".

තත්ථ යං ආහ: සුභෙන කම්මෙන වජන්ති සුග්ගති"න්ති ඉදං කුසලං, යං ආහ: "අපායභූමිං අසුභෙන කම්මුනා"ති ඉදං අකුසලං.

ඉදං කුසලඤ්ච අකුසලඤ්ච.

(25) තත්ථ කතමං අනුඤ්ඤාතං:

51. "යථාපි භමරො පුප්ඵං වණ්ණගන්ධං අහෙඨයං,
පලෙති රසමාදාය එවං ගාමෙ මුනී චරෙ"ති.

ඉදං අනුඤ්ඤාතං.

තීණිමානි භික්ඛවෙ, භික්ඛූනං කරණීයානි. කතමානි තීණි: ඉධ භික්ඛවෙ, භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො, ආරද්ධවිරියො ඛො පන හොති, ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං භාවනාය සච්ඡිකිරියාය, පඤ්ඤවා ඛො පන හොති උදයබ්බයගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. ඉමානි ඛො භික්ඛවෙ භික්ඛූනං තීණි කරණීයානී"ති.

ඉදං අනුඤ්ඤාතං.

"දස ඉමෙ භික්ඛවෙ, ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා. කතමෙ දස: වෙවණ්ණියම්හි අජ්ඣුපගතොති. පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං-පෙ-ඉමෙ ඛො භික්ඛවෙ, දස ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා"ති.

ඉදං අනුඤ්ඤාතං.

"තීණිමානි භික්ඛවෙ කරණීයානි. කතමානි තීණි: කායසුචරිතං වචීසුචරිතං මනොසුචරිතං. ඉමානි ඛො භික්ඛවෙ තීණි කරණීයානී"ති.

ඉදං අනුඤ්ඤාතං.

එහි කල්‍යාණකාරී කල්‍යාණං යී යමක් වදළාහු ද මේ කුසල යැ. පාපකාරී ච පාපකං යී යමක් වදළාහු ද මේ අකුසල යැ.

මේ කුසල ද අකුසල ද වෙයි.

50. සුභ වූ කුශලකර්මයෙන් සුගතියට යෙති, අකුශලකර්මයෙන් අපායභූමියට යෙති, යළි කර්මක්ෂය වීමෙන් විමුක්ත සිත්ඇති ඒ රහත්හු දර ක්ෂයවීමෙන් ගින්න මෙන් පිරිනිවෙත්.

එහි '' සුභෙන කම්මෙන වජන්ති සුග්ගතිං '' යී යමක් වදළාහු ද, මේ කුසල යැ. ' අපාය භූමිං අසුභෙන කම්මුනා ' යී යමක් වදළාහු ද, මේ අකුසල යැ.

මේ දේශනාව කුසල ද අකුසල ද වේ.

(25) එහි අනුඤ්ඤාත කවරෙ යැ :

51. යමසේ බමරා පුෂ්පය ද වර්ණය හා ගන්ධය ද නො නසා මල්රස ගෙන පෙරළා යේ ද, එසෙයින් මුනි තෙමේ ගම්හි පිඩුසිඟා හැසිරෙන්නේ යි.

මේ අනුඤ්ඤාත යැ.

'' මහණෙනි, මේ භික්ෂූන් විසින් කරණී තුනක් වෙති, කවර තුනෙක යත් : මහණෙනි, මෙ සස්නෙහි මහණ ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත වූයේ ආචාරගොචර දෙකින් යුක්ත වූයේ අණුමාත්‍ර වරදෙහි භය දක්නාසුලු වැ වාස කෙරෙයි, කුශල වූ කායකර්ම වාක්කර්මයෙන් සමන්විත වැ පරිශුද්ධ ආජීව ඇතියේ ශික්ෂාපදයන් සමාදන්ව ගෙන හික්මෙයි, යළි ස්ථිර වූ දැඩි පරාක්‍රම ඇතියේ රුකුළු වැරඇතියේ වෙයි, අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුශලධර්මයන්ගේ වැඩීම පිණිස ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස නො හැඹු වීර්‍ය්‍ය ඇත්තේ වෙයි. යළි ප්‍රඥ ඇත්තේ වෙයි, ආර්‍ය්‍ය වූ (ලොභාදීන්ගේ) නිර්වෙධය කරන මනා කොට දුඃඛක්ෂයට පමුණුවන උදයව්‍යයපරිග්‍රාහක වූ ප්‍රඥයෙන් සමන්වාගත වේ. මහණෙනි, මේ භික්ෂූන්ගේ තුන් කරණීහු වෙත් '' යයි.

මේ අනුඤ්ඤාත යැ.

'' මහණෙනි, මේ දශධර්මයෝ පැවිද්ද විසින් නිරතුරු ප්‍රත්‍යවෙක්ෂා කටයුත්තාහ, කවර දසයෙක යත් : විවර්ණබවට පැමිණියෙමි වෙමි නිරතුරු සිතියැයුතු . . . මහණෙනි, මේ දශධර්මයෝ පැවිද්ද විසින් නිරතුරු සිතියැයුත්තාහ '' යි.

මේ අනුඤ්ඤාත යැ.

'' මහණෙනි, මේ කරණී තුනෙක, කවර තුනෙක යත් : කායසුචරිත යැ වාක්සුචරිත යැ මනස්සුචරිත යි. මහණෙනි, මේ තුන් කරණීහු '' යි.

මේ අනුඤ්ඤාත යැ.

(26) තත්ථ කතමං පටික්ඛිත්තං:

52. "නත්ථි පුත්තසමං පෙමං නත්ථි ගොසමිතං ධනං,
නත්ථි සූරියසමා ආභා සමුද්දපරමා සරා"ති.

භගවා ආහ:

53. 'නත්ථි අත්තසමං පෙමං නත්ථි ධඤ්ඤසමං ධනං,
නත්ථි පඤ්ඤාසමා ආභා වුට්ඨි වෙ පරමා සරා"ති.

එත්ථ යං පුරිමකං, ඉදං පටික්ඛිත්තං.

"තීණිමානි භික්ඛවෙ, අකරණීයානි. කතමානි තීණි: කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. ඉමානි ඛො භික්ඛවෙ, තීණි අකරණීයානී"ති.

ඉදං පටික්ඛිත්තං.

(27) තත්ථ කතමං අනුඤ්ඤාතං ච පටික්ඛිත්තං ච:

54. "කිංසූධ භීතා ජනතා අනෙකා
මග්ගො ච නෙකායතනො[1] පවුත්තො,
පුච්ඡාමි තං ගොතම භූරිපඤ්ඤ,
කිස්මිං ඨිතො පරලොකං න භායෙ"ති.

55. "වාචං මනඤ්ච පණිධාය සම්මා
කායෙන පාපානි අකුබ්බමානො,
බව්හන්නපානං ඝරමාවසන්තො
සද්ධො මුදූ සංවිභාගී වදඤ්ඤූ;
එතෙසු ධම්මෙසු ඨිතො චතූසු
ධම්මෙ ඨිතො පරලොකං න භායෙ"ති.

තත්ථ යං ආහ: "වාචං මනං ච පණිධාය සම්මා"ති ඉදං අනුඤ්ඤාතං; "කායෙන පාපානි අකුබ්බමානො"ති ඉදං පටික්ඛිත්තං; "බව්හන්නපානං ඝරමාවසන්තො සද්ධො මුදූ සංවිභාගී වදඤ්ඤූ එතෙසු ධම්මෙසු ඨිතො චතූසු ධම්මෙ- ඨිතො පරලොකං න භායෙ"ති ඉදං අනුඤ්ඤාතං;

ඉදං අනුඤ්ඤාතඤ්ච පටික්ඛිත්තං ච.

56. "සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපනං එතං බුද්ධානසාසනං"

තත්ථ යං ආහ: "සබ්බපාපස්ස අකරණ"න්ති ඉදං පටික්ඛිත්තං, යං ආහ: "කුසලස්ස උපසම්පදා"ති ඉදං අනුඤ්ඤාතං.

ඉදං අනුඤ්ඤාතං ච පටික්ඛිත්තං ච.

---

1. නෙකායතනං - සං.

(26) එහි පටික්ඛිත්ත කවරෙ යැ :

52. පුත්‍රප්‍රේමය හා සම වූ ප්‍රේමයෙක් නැත, ගවධනය හා සම වූ ධනයෙක් නැත, සූර්‍යාලෝකය සම වූ අවභාසයෙක් නැත, සියලු ජලාසයෝ සමුද්‍රය පරම කොට ඇත්තාහ ' යි.

බුදුහු මෙසේ වදළහ :

53. ආත්මප්‍රේමය සම වූ ප්‍රේමයෙක් නැත, ධාන්‍යසම වූ ධනයෙක් නැත, ප්‍රඥාලෝකය සම වූ අවභාසයෙක් නැත, ජලාසයෝ වර්ෂාව පරම කොට ඇත්තාහ ' යි

මෙහි පූර්ව වූ යම් වචනයක් ඇද්ද එහි — මේ පටික්ඛිත්ත යි.

'' මහණෙනි, මේ අකරණීය තුනෙකි, කවර තුනෙක යත් : කායදුශ්චරිත යැ වාග් දුශ්චරිත යැ මනොදුශ්චරිත යි. මහණෙනි, මේ තුන් අකරණීය යෝ '' යි.

මේ පටික්ඛිත්ත යි.

(27) එහි අනුඤ්ඤාත ද පටික්ඛිත්ත ද කවරෙ යැ :

54. පෘථිවිසම විස්තෘත ප්‍රඥා ඇති ගෞතමයන් වහන්ස මුඹවහන්සේ පුළුවුස්මි, (අටතිස් අරමුණු විසින්) නොයෙක් කරුණු ඇති මාර්ගය ද ප්‍රකාශ කරනලද්දේය, මෙලොවැ නොයෙක් ජනසමූහයෝ කුමකින් බියපත් වූවාහු ද, කවර ධර්මයෙක්හි සිටියේ (මෙලොවින් යනුයේ) පරලොවට බිය නොවන්නේ ද ' යි.

55. වචනය ද සිත ද මනාකොට පිහිටුවා කයින් පව් නොකරන බොහෝ ආහාරපාන ඇති කුලගෙයි වසන ශ්‍රද්ධා ඇති මෘදු වූ දානසංවිභාග ඇති ප්‍රතිග්‍රාහකයන්ගේ බස් දන්නා මේ සතරදහම්හි සිටි පුද්ගල ධර්මයෙහි සිටියේ පරලොවට බිය නොවන්නේ යයි.

එහි ''...'' වාචං මනං ච පණිධාය සම්මා''...'' යි යමක් වදළසේක් ද, මේ ' අනුඤ්ඤාත ' යැ, කායෙන පාපානි අකුබ්බමානො ''...'' යන මේ ' පටික්ඛිත්ත ' යැ, '' බව්හන්නපානං ඝරමාවසන්තො සද්ධො මුදූ සංවිභාගී වදඤ්ඤූ එතෙසු ධම්මෙසු ඨිතො චතුසු ධම්මෙ ඨිතො පරලොකං න භායෙ '' යන මේ අනුඤ්ඤාත යැ.

මේ අනුඤ්ඤාත ද පටික්ඛිත්ත ද වෙයි.

56. සියලු අකුසල් නොකිරීම ද චාතුර්භූමක කුශලයාගේ ප්‍රතිලාභය ද (රහත්මගින්) ස්වකීය චිත්තසන්තානය පවිත්‍ර කිරීම ද යන මෙල සියලු බුදුවරයන්ගේ අනුශාසනායි.

එහි ''...'' සබ්බපාපස්ස අකරණං ''...''යි යමක් වදළසේක් ද මේ ' පටික්ඛිත්ත ' යැ. කුසලස්ස උපසම්පදා, යි යමක් වදළසේක් ද මේ අනුඤ්ඤාත යැ.

මේ අනුඤ්ඤාත ද පටික්ඛිත්ත ද වෙයි,

"කායසමාචාරම්පහං දෙවානමින්ද, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පති. වචීසමාචාරම්පහං දෙවානමින්ද, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති, පරියෙසනම්පහං දෙවානමින්ද, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති.

කායසමාචාරම්පහං දෙවානමින්ද, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති. ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපඤ්ච ඛො කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති, එවරූපො කායසමාචාරො න සෙවිතබ්බො, තත්ථ යං ජඤ්ඤා කායසමාචාරං ඉමං ඛො මෙ කායසමාචාරං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, එවරූපො කායසමාචාරො සෙවිතබ්බො. කායසමාචාරම්පහං දෙවානමින්ද දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි ඉති යන්තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං. වචීසමාචාරං පෙ

පරියෙසනම්පහං දෙවානමින්ද, දුවිධෙන වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පීති. ඉති ඛො පනෙතං වුත්තං, කිඤ්චෙතං පටිච්ච වුත්තං: යථාරූපඤ්ච ඛො පරියෙසනං සෙවතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති, එවරූපා පරියෙසනා න සෙවිතබ්බා. තත්ථ යං ජඤ්ඤා පරියෙසනං, ඉමං ඛො මෙ පරියෙසනං සෙවතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තීති, එවරූපා පරියෙසනා සෙවිතබ්බා. පරියෙසනම්පහං දෙවානමින්ද දුවිධෙන, වදාමි: සෙවිතබ්බම්පි අසෙවිතබ්බම්පි. ඉති යං තං වුත්තං, ඉදමෙතං පටිච්ච වුත්තං.

තත්ථ යං ආහ: "සෙවිතබ්බම්පී"ති ඉදං අනුඤ්ඤාතං. යං ආහ: "න සෙවිතබ්බම්පී"ති ඉදං පටික්ඛිත්තං.

ඉදං අනුඤ්ඤාතං ච පටික්ඛිත්තං ච.

(28) තත්ථ කතමො ථවො:

57 "මග්ගානට්ඨඞ්ගිකො සෙට්ඨො සච්චානං චතුරො පදා,
විරාගො සෙට්ඨො ධම්මානං ද්විපදානං ච චක්ඛුමා"ති.

අයං ථවො.

"තීණිමානි භික්ඛවෙ, අග්ගානි, කතමානි තීණි: යාවතා භික්ඛවෙ සත්තා අපදා වා ද්විපදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා, තථාගතො තෙසං අග්ගමක්ඛායති සෙට්ඨමක්ඛායති පවරමක්ඛායති, යදිදං අරහං සම්මාසම්බුද්ධො.

යාවතා භික්ඛවෙ, ධම්මානං පණ්ණත්ති සඞ්ඛතානං වා අසඞ්ඛතානං වා, විරාගො තෙසං ධම්මානං අග්ගමක්ඛායති සෙට්ඨමක්ඛායති පවරමක්ඛායති, යදිදං මදනිම්මදනො–පෙ–නිරොධො නිබ්බානං.

" දේවේන්ද්‍රය, මම කායසමාචාරය ද සේවිතව්‍ය ද අසේවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි, දේවේන්ද්‍රය, මම වාක්සමාචාරය ද සේවිතව්‍ය ද අසේවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි, දේවේන්ද්‍රය, මම පර්යේෂණය ද සේවිතව්‍ය ද අසේවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි.

" දේවේන්ද්‍රය, මම කායසමාචාරය ද සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමියි මෙසේ තෙල කියනලද, තෙල කුමක් සඳහා කියනලද ද යත් : යම්බඳු කාය සමාචාරයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙබඳු කායසමාචාරය නො සෙවියැයුත්තේ යැ. එහි යම් කායසමාචාරයක් ' මේ කාය සමාචාරය සෙවුනා මට අකුශලධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙති ' යි දන්නේ ද, මෙබඳු වූ කායසමාචාරය සෙවියැ යුත්තේ යැ. ' දේවේන්ද්‍රය, මම කායසමාචාරය ද සෙවිතව්‍ය ද අසෙවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ යමක් කියනලද ද මෙය තෙල කරුණ සඳහා කියනලද්දේය. වාක්සමාචාරය . . .

දේවේන්ද්‍රය, මම පර්යේෂණය ද සේවිතව්‍ය ද අසේවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ තෙල කියනලද, තෙල කුමක් සඳහා කියනලද යැ යත් : ' යම්බඳු පර්යේෂණයක් සෙවුනාහට අකුශලධර්මයෝ වැඩෙත් ද, කුශලධර්මයෝ පිරිහෙත් ද, මෙබඳු පර්යේෂණය නො සෙවියැයුතු යැ. එහි යම් පර්යේෂණයක් සෙවුනාහට ' මේ පර්යේෂණය සෙවුනා මට අකුශලධර්මයෝ පිරිහෙති, කුශලධර්මයෝ වැඩෙති ' යි, දන්නේ ද, මෙබඳු පර්යේෂණය සෙවියැයුතු යැ. දේවේන්ද්‍රය, මම පර්යේෂණය ද සේවිතව්‍ය ද අසේවිතව්‍ය ද ' යි දෙපරිද්දෙකින් කියමි ' යි මෙසේ යමක් කියනලද ද මෙය තෙල කරුණ සඳහා කියන ලදි.

ඒ දේශනායෙහි " සේවිතබ්බම්පි " යි යමක් වදළ සේක් ද මේ " අනුඤ්ඤාත " යැ. ' න සෙවිතබ්බං ' යි යමක් වදළසේක් ද මේ ' පටික්ඛිත්ත ' යැ.

මේ අනුඤ්ඤාත ද පටික්ඛිත්ත ද වේ.

(28) ඒ ශාසනපට්ඨානයෙහි ථව සූත්‍ර කවරෙ යැ :

57. ජඞ්ගමාදි මාර්ගයන් අතුරෙන් අෂ්ටාඞ්ගික ආර්‍ය්‍යමාර්ගය උතුම් වෙයි, සත්‍යයන් අතුරෙන් දුක්ඛාදි (ආර්‍ය්‍යසත්‍යප්‍රකාශක) සතර පදය උතුම් වෙයි, ධර්මයන් අතුරෙන් නිර්වාණසංඛ්‍යාත විරාගය උතුම් වෙයි, දේවමනුෂ්‍යාදි දෙපාඇත්තවුන් අතුරෙන් පසැස්ඇති තථාගතයෝ උතුම් වෙත්.

මේ ථව (ස්තව) දෙශනා යැ.

" මහණෙනි, මේ අග්‍ර (උත්තම) යෝ තිදෙනෙක් වෙති, කවර තිදෙනෙක යත් : මහණෙනි, අපාද වූ හෝ ද්විපාද හෝ චතුෂ්පාද හෝ බහුප්පාද හෝ රූපී හෝ අරූපී හෝ සංඥී හෝ අසංඥී හෝ නෙවසංඥීනාසංඥී වූ හෝ යම් පමණ සත්ත්ව කෙනෙක් ඇද්ද, ඒ සත්ත්වයන් අතුරෙන් යම් අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් වෙද්ද ඒ තථාගතයෝ ගුණයෙන් අග්‍ර වූහ ' යි කියනුලැබෙති, ශ්‍රෙෂ්ඨ වූහ ' යි ප්‍රවර වූහ ' යි කියනුලැබෙත්.

මහණෙනි, සංඛත (ප්‍රත්‍යයෙන් කරනලද) වූ හෝ අසංඛත වූ හෝ ධර්මයන්ගේ යම් පමණ ප්‍රඥප්තියක් ඇද්ද, ඒ ධර්මයන් අතුරෙන් යම් රාගමදදිය නිර්මද කරන . . . නිරොධ සංඛ්‍යාත නිර්වාණයෙක් වේ ද, ඒ විරාග (නිර්වාණ) ධර්මය අග්‍ර යයි කියනු ලැබෙයි, ශ්‍රෙෂ්ඨ යයි ප්‍රවර යයි කියනුලැබෙ.

යාවතා භික්ඛවෙ, සඞ්ඝානං පණ්ණත්ති ගණානං පණ්ණත්ති මහාජනසන්නිපාතානං පණ්ණත්ති තථාගතසාවකසඞ්ඝො තෙසං අග්ගමක්ඛායති සෙට්ඨමක්ඛායති පවරමක්ඛායති යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා-පෙ-පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා''ති.

58. ''සබ්බලොකුත්තරො සත්ථා ධම්මො ච කුසලක්ඛතො,[1]
ගණො ච නරසීහස්ස තානි තීණි විසිස්සරෙ.

59. සමණපදුමසඤ්චයො ගණො
ධම්මවරො ච විදූන සක්කතො,
නරවරදමකො ච චක්ඛුමා
තානි තීණි ලොකස්ස උත්තරි.

60. සත්ථා ච අප්පටිසමො
ධම්මො ච සබ්බො නිරූපදහො,
අරියො ච ගණවරො
තානි ඛලු විසිස්සරෙ තීණි.

61. සච්චනාමො ජිනො ඛෙමො
සබ්බාභිභූ සච්චධම්මො,
සත්ථුසෙඤ්ඤු තස්ස උත්තරි
අරියසඞ්ඝො නිච්චං විඤ්ඤූන පූජිතො
තානි තීණි ලොකස්ස උත්තරි.''

62. ''එකායනං ජාතිඛයන්තදස්සී
මග්ගං පජානාති හිතානුකම්පී,
එතෙන මග්ගෙන තරිංසු පුබ්බෙ
තරිස්සන්ති යෙ ච[2] තරන්ති ඔඝං.
තං තාදිසං දෙවමනුස්සසෙට්ඨං
සත්තා නමස්සන්ති විසුද්ධිපෙක්ඛා''ති.

අයං ථවො'ති.

තත්ථ ලොකියං සුත්තං ද්වීහි සුත්තෙහි නිද්දිසිතබ්බං: සංකිලෙසභාගියෙන ච වාසනාභාගියෙන ච. ලොකුත්තරම්පි සුත්තං තීහි සුත්තෙහි නිද්දිසිතබ්බං: දස්සනභාගියෙන ච භාවනාභාගියෙන ච අසෙක්ඛභාගියෙන ච. ලොකියඤ්ච ලොකුත්තරඤ්ච යස්මිං සුත්තෙ යං යං පදං දිස්සති සංකිලෙසභාගියං වාසනාභාගියං වා, තෙන තෙන ලොකියන්ති නිද්දිසිතබ්බං, දස්සනභාගියං වා භාවනාභාගියං වා අසෙක්ඛභාගියං වා යං යං පදං දිස්සති, තෙන තෙන ලොකුත්තරන්ති නිද්දිසිතබ්බං.

වාසනාභාගියං සුත්තං සංකිලෙසභාගියස්ස සුත්තස්ස නිඝාතාය, දස්සනභාගියං සුත්තං වාසනාභාගියස්ස සුත්තස්ස නිඝාතාය, දස්සනභාගියං සුත්තං වාසනාභාගියස්ස සුත්තස්ස පටිනිස්සග්ගාය· භාවනාභාගියං සුත්තං දස්සනභාගියස්ස සුත්තස්ස පටිනිස්සග්ගාය, අසෙක්ඛභාගියං සුත්තං භාවනාභාගියස්ස සුත්තස්ස පටිනිස්සග්ගාය, අසෙක්ඛභාගියං සුත්තං දිට්ඨධම්මසුඛවිහාරත්ථං.

---

1. කුසලමක්ඛතො - සිමු.
2. යෙ චාපි - සිමු.

මහණෙනි, යම් පමණ සමූහයන්ගේ ප්‍රඥප්තියක් ගණයන්ගේ ප්‍රඥප්තියක් මහාජන සන්නිපාතයන්ගේ ප්‍රඥප්තියක් ඇද්ද, ඒ සමූහයන් අතුරෙන් අෂ්ට පුරුෂපුද්ගල වූ . . . ලොවට අනුත්තර පින්කෙත්වූ යම් පුරුෂයුගල සතරක් ඇද්ද, ඒ තථාගතශ්‍රාවක සංඝ අග්‍ර යයි කියනුලැබෙයි, ශ්‍රෙෂ්ඨ යයි ප්‍රවර යයි කියනුලැබේ යි.

58. සියලු ලෝකයා කෙරෙහි උත්තරීතර වූ ශාස්තෘන් වහන්සේ ද අනවද්‍ය වූ (ප්‍රතිපක්ෂ රාගාදීන් විසින් සියලු තීර්ථකයන් විසින් හෝ) අක්ෂත වූ ධර්මය ද නරසිංහ වූ තථාගතයන්ගේ ශ්‍රාවක සංඝයා ද යන ඒ රත්නත්‍රය (සියලු රත්නයන් කෙරෙන්) විශෙෂ වේ.

59. ශ්‍රමණොත්ත පද්මසමූහය වූ ආර්‍ය්‍යගණයා ද විඥයන් විසින් සත්කාර කරනලද නවලොකෝත්තර ධර්ම වරය ද නරොත්තම වූ පුරුෂදම්‍යයන් දමනය කරන බුදුහු ද යන ඒ රත්නත්‍රය ලොවට උත්තරීතර වේ.

60. අප්‍රතිසම වූ ශාස්තෘන් වහන්සේ ද රාගපරිදාහාදි දුහ රහිත වූ සියලු ධර්මය ද ආර්‍ය්‍ය වූ උත්තම ගණයා ද යන ඒ රත්නත්‍රය ඒකාන්තයෙන් විශෙෂ වේ.

61. සත්‍ය වූ (අවිතථ වූ) සංඥ ඇති නිර්භය වූ සියලු ලොව තමන් ගුණයෙන් අභිභවා සිටි ජිතපඤ්චමාරයන් වහන්සේ ද සත්‍ය වූ සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර ධර්මය ද ඒ ධර්මයට උත්තරීතර වූ අන් ධර්මයකුදු නැති, විඥයන් විසින් නිති පුදනලද ආර්‍ය්‍යසංඝයා ද යන ඒ රත්නත්‍රය ලොවට උතුම් වේ.

62. ජාතිය පිළිබඳ අත්‍යන්තක්ෂය සංඛ්‍යාත අන්තය (නිර්වාණය) ප්‍රත්‍යක්ෂ කළ ඒ ඒ හිතයෙන් සත්ත්වයන්ට අනුකම්පා කරන සර්වඥයන් වහන්සේ ඒකායන මාර්ගය (ස්වයම්භූඥානයෙන්) දන්නාසේක, පෙර කාමෞඝාදිය තරණය කළ යම් කෙනෙක් වෙත්ද ඔහු මේ මඟින් තරණය කළාහුය, මතු තරණය කරන්නාහුය, දැනුදු තරණය කෙරෙත්.

63. අත්‍යන්තවිශුද්ධිය අපේක්ෂා කරන සත්ත්වයෝ දෙව්මිනිසුන් කෙරෙහි ශ්‍රෙෂ්ඨ වූ තාදෘශ වූ ඒ සර්වඥයන් නමස්කාර කෙරෙත් යයි.

මේ ස්තව සූත්‍ර යි.

(මෙසේ දෙවැදෑරුම් ශාසනපට්ඨානය නානාසූත්‍රපද උදාහරණ කරමින් විභාග කොට මෙවිට සංකිලෙසභාගිය සූත්‍රාදිය හා සංසන්දනය කොට දක්වන සේක.)

ඒ ශාසනපට්ඨානයෙහි ' ලොකිය ' සූත්‍රය සංකිලෙසභාගිය ද වාසනාභාගිය ද යන සූත්‍ර දෙකින් දක්වියැයුතු යැ. ' ලොකුත්තර ' සූත්‍රය දස්සනභාගිය ද භාවනාභාගිය ද (නිබ්බෙධභාගිය සූත්‍රය මැ දෙපරිද්දෙකින් කියනලදි) අසෙක්ඛභාගිය ද යන තුන් සූත්‍රයෙන් දක්වියැයුතු යි. යම් සූත්‍රයෙකැ ලෞකික වූ ද ලොකොත්තර වූ ද සංකිලෙසභාගිය හෝ වාසනාභාගිය හෝ යම් යම් පදයෙක් දක්නා ලැබේ ද, ඒ ඒ පදයෙන් ' ලොකිය ' යි දක්වියැයුතු යැ. දස්සනභාගිය හෝ භාවනාභාගිය හෝ අසෙක්ඛභාගිය හෝ යම් යම් පදයෙක් දක්නා ලැබේ ද, ඒ ඒ පදයෙන් ' ලොකුත්තර ' යි දක්වියැයුතු යි.

වාසනාභාගියසූත්‍රය සංකිලෙසභාගිය සූත්‍රයාගේ (සූත්‍රාර්ථයාගේ යයි සේයි) ප්‍රහාණය පිණිස වෙයි, දස්සනභාගිය සූත්‍රය වාසනාභාගිය සූත්‍රයාගේ ප්‍රහාණය පිණිස වෙයි, දස්සන භාගිය සූත්‍රය වාසනාභාගිය සූත්‍රයාගේ දුරුලීම පිණිස වෙයි, භාවනාභාගිය සූත්‍රය දස්සන භාගිය සූත්‍රයාගේ දුරුලීම පිණිස වෙයි, අසෙක්ඛභාගිය සූත්‍රය භාවනාභාගිය සූත්‍රයාගේ දුරුලීම පිණිස වෙයි, අසෙක්ඛභාගිය සූත්‍රය ඉහාත්මසුඛවිහරණය පිණිස වේ.

ලොකුත්තරං සුත්තං සත්තාධිට්ඨානං ඡබ්බීසතියා පුග්ගලෙහි නිද්දිසිතබ්බං. තෙ තීහි සුත්තෙහි සමන්වෙසිතබ්බා : දස්සනභාගියෙන භාවනාභාගියෙන අසෙක්ඛභාගියෙන චාති.

තත්ථ දස්සනභාගියං සුත්තං පඤ්චහි පුග්ගලෙහි නිද්දිසිතබ්බං : එකබීජිනා කොලංකොලෙන සත්තක්ඛත්තුපරමෙන සද්ධානුසාරිනා ධම්මානුසාරිනා චාති. දස්සනභාගියං සුත්තං ඉමෙහි පඤ්චහි පුග්ගලෙහි නිද්දිසිතබ්බං. භාවනාභාගියං සුත්තං ද්වාදසහි පුග්ගලෙහි නිද්දිසිතබ්බං : සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නෙන, සකදාගාමිනා, අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නෙන, අනාගාමිනා, අන්තරාපරිනිබ්බායිනා, උපහච්චපරිනිබ්බායිනා, අසඞ්ඛාරපරිනිබ්බායිනා, සසඞ්ඛාරපරිනිබ්බායිනා, උද්ධංසොතෙන අකනිට්ඨගාමිනා, සද්ධාවිමුත්තෙන, දිට්ඨිප්පත්තෙන, කායසක්ඛිනා චාති. භාවනාභාගියං සුත්තං ඉමෙහි ද්වාදසහි පුග්ගලෙහි නිද්දිසිතබ්බං. අසෙක්ඛභාගියං සුත්තං නවහි පුග්ගලෙහි නිද්දිසිතබ්බං : සද්ධාවිමුත්තෙන, පඤ්ඤාවිමුත්තෙන, සුඤ්ඤතවිමුත්තෙන, අනිමිත්තවිමුත්තෙන, අප්පණිහිතවිමුත්තෙන, උභතොභාගවිමුත්තෙන, සමසීසිනා, පච්චෙකබුද්ධසම්මාසම්බුද්ධෙහි චාති. අසෙක්ඛභාගියං සුත්තං ඉමෙහි නවහි පුග්ගලෙහි නිද්දිසිතබ්බං. එවං ලොකුත්තරං සුත්තං සත්තාධිට්ඨානං ඉමෙහි ඡබ්බීසතියා පුග්ගලෙහි නිද්දිසිතබ්බං.

ලොකියං සුත්තං සත්තාධිට්ඨානං එකූනවීසතියා පුග්ගලෙහි නිද්දිසිතබ්බං : තෙ චරිතෙහි නිද්දිට්ඨා සමන්වෙසිතබ්බා, කෙචි රාගචරිතා, කෙචි දොසචරිතා, කෙචි මොහචරිතා, කෙචි රාගචරිතා ච දොසචරිතා ච, කෙචි රාගචරිතා ච මොහචරිතා ච, කෙචි දොසචරිතා ච මොහචරිතා ච, කෙචි රාගචරිතා ච දොසචරිතා ච මොහචරිතා ච. රාගමූලෙ ඨිතො රාගචරිතො, රාගමූලෙ ඨිතො දොසචරිතො, රාගමූලෙ ඨිතො මොහචරිතො, රාගමූලෙ ඨිතො රාගචරිතො ච දොසචරිතො ච මොහචරිතො ච, දොසමූලෙ ඨිතො දොසචරිතො දොසමූලෙ ඨිතො මොහචරිතො, දොසමූලෙ ඨිතො රාගචරිතො, දොසමූලෙ ඨිතො රාගචරිතො ච දොසචරිතො ච මොහචරිතො ච. මොහමූලෙ ඨිතො මොහචරිතො, මොහමූලෙ ඨිතො රාගචරිතො, මොහමූලෙ ඨිතො දොසචරිතො, මොහමූලෙ ඨිතො රාගචරිතො ච දොසචරිතො ච මොහචරිතො චාති. ලොකියං සුත්තං සත්තාධිට්ඨානං ඉමෙහි එකූනවීසතියා පුග්ගලෙහි නිද්දිසිතබ්බං.

වාසනාභාගියං සුත්තං සීලවන්තෙහි නිද්දිසිතබ්බං. තෙ සීලවන්තා පඤ්ච පුග්ගලා : පකතිසීලං සමාදානසීලං චිත්තප්පසාදෙ සමථො විපස්සනා චාති. වාසනාභාගියං සුත්තං ඉමෙහි පඤ්චහි පුග්ගලෙහි නිද්දිසිතබ්බං. ඉමෙහි පඤ්චහි ධම්මෙහි.[1]

ලොකුත්තරං සුත්තං ධම්මාධිට්ඨානං තීහි සුත්තෙහි නිද්දිසිතබ්බං. දස්සනභාගියෙන භාවනාභාගියෙන අසෙක්ඛභාගියෙන ච.

---

1. මජසං - ඉමෙහි පඤ්චහි ධම්මෙහීති ඌනං.

සත්ත්වාධිෂ්ඨාන වූ ලොකුත්තර සූත්‍රය සවිසිපුද්ගලයන්ගෙන් දක්වියැයුතු යැ. ඒ සවිසි පුද්ගලයෝ දස්සනභාගිය ද භාවනාභාගිය ද අසෙක්ඛභාගිය ද යන තුන් සූත්‍රයන්ගෙන් සමන්වෙෂණය කළයුත්තාහු ය.

එහි දස්සනභාගිය සූත්‍රය ඒකබීජ කොලංකොල සත්තක්ඛත්තුපරම සද්ධානුසාරි ධම්මානුසාරී ද යන පඤ්ච පුද්ගලයන්ගෙන් දක්වියැයුතු යැ, දස්සනභාගිය සූත්‍රය මෙ පඤ්ච පුද්ගලයන්ගෙන් දක්වියැයුතු. භාවනාභාගිය සූත්‍රය දොළොස් පුද්ගල කෙනකුන්ගෙන් දක්වියැ යුතු යැ: සකෘදගාමිඵල පසක්කිරීමට පිළිපන්නෙ යැ සකෘදගාමී යැ අනාගාමිඵල පසක්කිරීමට පිළිපන්නෙ යැ අනාගාමී යැ අන්තරාපරිනිබ්බායී යැ උපපච්චපරිනිබ්බායී යැ අසඞ්ඛාරපරිනිබ්බායී යැ සසඞ්ඛාරපරිනිබ්බායී යැ උද්ධංසොතඅකනිට්ඨගාමී යැ සද්ධාවිමුත්ත යැ දිට්ඨිප්පත්ත යැ කායසක්ඛි යැ යන මෙ දොළොස් පුද්ගලයන්ගෙන් භාවනාභාගිය සූත්‍රය දක්වියැයුතු. අසෙක්ඛභාගිය සූත්‍රය පුද්ගලයන් නවදෙනකුන්ගෙන් දක්වියැයුතු යැ. සද්ධාවිමුත්ත යැ පඤ්ඤාවිමුත්ත යැ සුඤ්ඤතවිමුත්ත යැ අනිමිත්තවිමුත්ත යැ අප්පණිහිතවිමුත්ත යැ උභතොභාගවිමුත්ත යැ සමසීසී යැ පච්චෙකබුද්ධ යැ සම්මාසම්බුද්ධ යැ යන මෙ නවපුද්ගලයන්ගෙන් අසෙක්ඛභාගිය සූත්‍රය දක්වියැ යුතු. මෙසේ සත්ත්වාධිෂ්ඨාන වූ ලොකුත්තර සූත්‍රය මෙ සවිසි පුද්ගලයන්ගෙන් දක්වියැයුතු.

සත්ත්වාධිෂ්ඨාන වූ ලොකිය සූත්‍රය එකුන්විසි පුද්ගල කෙනකුන්ගෙන් දක්වියැ යුතු යැ: ඒ පුද්ගලයෝ චරිතයන්ගෙන් දක්වනලද්දහු සමන්වෙෂණ කටයුත්තාහ: කිසිවෙක් රාගචරිතයෝ යැ කිසිවෙක් දෝසචරිතයෝ යැ කිසිවෙක් මෝහචරිතයෝ යැ කිසිවෙක් රාගචරිත ද දෙසචරිත ද වූහ, කිසිවෙක් රාගචරිත ද මොහචරිත ද වූහ, කිසිවෙක් දෙසචරිත ද මොහචරිත ද වූහ, කිසිවෙක් රාගචරිත ද දෙසචරිත ද මොහචරිත ද වූහ. රාගමුඛයෙහි සිටි රාගචරිත යැ, රාගමුඛයෙහි සිටි (රාගාධික) දෙසචරිත යැ, රාගමුඛයෙහි සිටි මොහචරිත යැ, රාගමුඛයෙහි සිටි රාග – දෙස – මොහචරිත යැ. දෙසමුඛයෙහි සිටි දෙසචරිත යැ, දෙසමුඛයෙහි සිටි මොහචරිත යැ, දෙසමුඛයෙහි සිටි රාගචරිත යැ, දෙසමුඛයෙහි සිටි රාග – දෙස – මොහචරිත යැ, මොහමුඛයෙහි සිටි මොහචරිත යැ, මොහමුඛයෙහි සිටි රාගචරිත යැ, මොහමුඛයෙහි සිටි දෙසචරිත යැ, මොහමුඛයෙහි සිටි රාග – දෙස – මොහචරිත ඇත්තේ යයි සත්ත්වාධිෂ්ඨාන වූ ලොකිය සූත්‍රය මෙ එකුන්විසි පුද්ගලයන්ගෙන් දක්වියැ යුතු.

වාසනාභාගිය (ලොකිය සත්ත්වාධිෂ්ඨාන) සූත්‍රය සීලවන්තාදි පුද්ගලයන්ගේ වශයෙන් දක්වියයුතු යැ. ඒ සිල්වත්හු පුද්ගලයෝ පස්දෙනෙකි: (සම්පත්තවිරති සංඛ්‍යාත) ප්‍රකෘති ශීල යැ, (පුද්ගලාධිෂ්ඨානයෙහි ඒ ඒ ශීලයෙන් යුත් පුද්ගලයා යි.) සමාදානශීල යැ, (කර්මඵලශ්‍රද්ධා රත්නත්‍රයෙහි ශ්‍රද්ධා යන) චිත්තප්‍රසාද යැ, ශමථ යැ, විදර්ශනා ද ' යි වාසනාභාගිය සූත්‍රය මෙ පස් පුහුලන්ගෙන් දක්වියැයුතු යැ. (ධර්මාධිෂ්ඨානසූත්‍රය ප්‍රකෘතිශීලාදි) මෙ පඤ්චධර්මයන්ගෙන් (දක්වියැයුතු.)

ධර්මාධිෂ්ඨාන වූ ලොකුත්තර සූත්‍රය දස්සනභාගිය භාවනාභාගිය අසෙක්ඛභාගිය ද යන තුන් සූත්‍රයන්ගෙන් දක්වියැයුතු.

ලොකියඤ්ච ලොකුත්තරඤ්ච සත්තාධිට්ඨානඤ්ච ධම්මාධිට්ඨානඤ්ච උභයෙන නිද්දිසිතබ්බං. ඤාණං පඤ්ඤාය නිද්දිසිතබ්බං. පඤ්ඤින්ද්‍රියෙන පඤ්ඤාබලෙන අධිපඤ්ඤාසික්ඛාය ධම්මවිචයසම්බොජ්ඣඞ්ගෙන සම්මාදිට්ඨියා තීරණාය සන්තීරණාය ධම්මෙ ඤාණෙන අත්ථෙ ඤාණෙන අන්වයෙ ඤාණෙන ඛයෙ ඤාණෙන අනුප්පාදෙ ඤාණෙන අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියෙන අඤ්ඤින්ද්‍රියෙන අඤ්ඤාතාවින්ද්‍රියෙන චක්ඛුනා විජ්ජාය බුද්ධියා භූරියා මෙධාය, යං යං වා පන ලබ්භති තෙන තෙන පඤ්ඤාධිවචනෙන නිද්දිසිතබ්බං.

ඤෙය්‍යං අතීතානාගතපච්චුප්පන්නෙහි අජ්ඣත්තබහිද්ධෙහි හීනපණීතෙහි දූරසන්තිකෙහි සඞ්ඛතාසඞ්ඛතෙහි කුසලාකුසලාබ්‍යාකතෙහි, සඞ්ඛෙපතො වා ඡහි ආරම්මණෙහි නිද්දිසිතබ්බං. ඤාණඤ්ච ඤෙය්‍යඤ්ච තදුභයෙන නිද්දිසිතබ්බං, පඤ්ඤා'පි ආරම්මණභූතා ඤෙය්‍යා, යං කිඤ්චි ආරම්මණභූතං අජ්ඣත්තිකං වා බාහිරං වා, සබ්බං තං සඞ්ඛතෙන අසඞ්ඛතෙන ච නිද්දිසිතබ්බං.

දස්සනං[1] භාවනා සකවචනං පරවචනං විස්සජ්ජනීයං අවිස්සජ්ජනීයං කම්මං විපාකොති සබ්බත්ථ තදුභයං සුත්තෙන යථා නිද්දිට්ඨං තථා උපධාරයිත්වා ලබ්භමානතො නිද්දිසිතබ්බං, යං වා පන කිඤ්චි භගවා අඤ්ඤතරං වචනං භාසති, සබ්බං තං යථා නිද්දිට්ඨං ධාරයිතබ්බං.

දුවිධො හෙතු: යඤ්ච කම්මං යෙ ච කිලෙසා. සමුදයො කිලෙසා තත්ථ කිලෙසා සංකිලෙසභාගියෙන සුත්තෙන නිද්දිසිතබ්බා. සමුදයො සංකිලෙසභාගියෙන ච වාසනාභාගියෙන ච සුත්තෙන නිද්දිසිතබ්බො.

තත්ථ කුසලං චතූහි සුත්තෙහි නිද්දිසිතබ්බං: වාසනාභාගියෙන දස්සනභාගියෙන භාවනාභාගියෙන අසෙක්ඛභාගියෙන ච. අකුසලං සංකිලෙසභාගියෙන නිද්දිසිතබ්බං. කුසලං ච අකුසලං ච තදුභයෙහි නිද්දිසිතබ්බං.

අනුඤ්ඤාතං භගවතො අනුඤ්ඤාය නිද්දිසිතබ්බං. තං පඤ්චවිධං: සංවරො පහානං භාවනා සච්ඡිකිරියා කප්පියානුලොමොති. යං දිස්සති තාසු තාසු භූමිසු තං කප්පියානුලොමෙන නිද්දිසිතබ්බං. භගවතා පටික්ඛිත්තං පටික්ඛිත්තකාරණෙන නිද්දිසිතබ්බං. අනුඤ්ඤාතඤ්ච පටික්ඛිත්තඤ්ච තදුභයෙන නිද්දිසිතබ්බං.

ථවො පසංසාය නිද්දිසිතබ්බො. සො පඤ්චවිධෙන වෙදිතබ්බො: භගවතො, ධම්මස්ස, අරියසඞ්ඝස්ස, අරියධම්මානං සික්ඛාය ලොකියගුණසම්පත්තියාති. එවං ථවො පඤ්චවිධෙන නිද්දිසිතබ්බො.

---

1. දස්සනා – සිමු.

සත්ත්වාධිෂ්ඨාන ද ධර්මාධිෂ්ඨාන ද වූ ලෞකිය ද ලෝකෝත්තර ද සූත්‍රය (ලෞකිය ලෝකෝත්තර) දෙකින් දක්වියයුතු. (යම් සූත්‍රයෙක ප්‍රඥාව ප්‍රකාශිත ද ඒ) ' පඤ්ඤා ' පදයෙන් ' ඤාණ ' සූත්‍රය දක්වියයුතු යැ, පඤ්ඤින්ද්‍රිය යැ පඤ්ඤාබල යැ අධිපඤ්ඤා සික්ඛා යැ ධම්මවිචයසම්බොජ්ඣඞ්ග යැ සම්මාදිට්ඨි යැ තීරණ යැ සන්තීරණ යැ ධම්මෙ ඤාණ යැ අන්වයෙ ඤාණ යැ ඛයෙ ඤාණ යැ අනුප්පාදෙ ඤාණ යැ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය යැ අඤ්ඤින්ද්‍රිය යැ අඤ්ඤාතාවින්ද්‍රිය යැ චක්ඛු යැ විජ්ජා යැ බුද්ධි යැ භූරි යැ මෙධා යැ යන (පඤ්ඤාපරියාය) පදයෙන් ' ඤාණ ' සූත්‍ර යී දක්වියයුතු යම් යම් පදයක් හෝ ලැබේ ද, පඤ්ඤාධිවචන වූ ඒ පදයෙන් ' ඤාණ ' සූත්‍ර යයි දක්වියැ යුතු.

' ඤෙය්‍ය ' සූත්‍රය අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ආධ්‍යාත්මික බාහිර වූ හීනප්‍රණීත වූ දූරසන්තික වූ සඞ්ඛතාසඞ්ඛත වූ කුසලාකුසලාව්‍යාකෘත වූ ෂඩාලම්බනයෙන් සැකෙවින් හෝ (විස්තරයෙන් හෝ දක්වියයුතු. ඤාණ ද ඤෙය්‍ය ද සූත්‍රය ඒ උභයලක්ෂණයෙන් දක්වියයුතු යැ, ප්‍රඥාව ද ප්‍රඥාන්තරයකට ආලම්බන වූවා ' ඤෙය්‍ය ' නම් වේ. යම් කිසි ඤාණයට විෂය වූ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ රූපාදියක් ඇද්ද ඒ සියල්ල සඞ්ඛත භාවයෙන් ද අසඞ්ඛතභාවයෙන් ද ' ඤෙය්‍ය ' යී දක්වියයුතු.

දස්සන යැ භාවනා යැ සකවචන යැ පරවචන යැ විස්සජ්ජනීය යැ අවිස්සජ්ජනීය යැ කම්ම යැ විපාක යැ යන සියලු තැන්හි ද තදුභයමිශ්‍ර සූත්‍රය ද ඒ ඒ සූත්‍රයෙහි යම්සේ දක්වන ලද ද එසේ උපධාරණය කොට ලැබෙන පදයන්ගේ වශයෙන් දක්වියයුතු. තවද භාග්‍යවතුන් වහන්සේ යම් කිසි අන්‍යතර වචනයක් (සූත්‍රයෙහි) වදාරනසේක් ද, ඒ සියල්ල (සියලු සූත්‍රය ලෞකියාදීන් කෙරෙහි එකක් වශයෙන් හෝ උභය වශයෙන් හෝ) යම් පරිදි දක්වනලද ද එපරිද්දෙන් ගතයුතු.

හේතුව ද්විවිධ යැ : යම් කර්මයෙක් වේ ද, යම් ක්ලේශයෝත් වෙත් ද ඒ දෙක යැ, (සක්ලෙශ වූ මැ කර්මය විපාකයට හෙතු වෙයි සේයි.) සමුදය ඇත්තේ (සමුදය පක්ෂයෙහි වූවාහු) ක්ලෙශවත්හු යැ, එහි ක්ලෙශයෝ සංකිලෙසභාගිය සූත්‍රයෙන් දක්වියැ යුත්තාහු යැ, සමුදය සංකිලෙසභාගිය ද වාසනාභාගිය ද වූ සූත්‍රයෙන් දක්වියැයුත්තේ ය.

එහි කුසලය වාසනාභාගිය දස්සනභාගිය භාවනාභාගිය අසෙක්ඛභාගිය ද යන යතර සූත්‍රයෙන් දක්වියැයුතු යැ. අකුසලය සංකිලෙසභාගිය සූත්‍රයෙන් දක්වියැයුතු යැ. කුසලය ද අකුසලය ද තදුභය සූත්‍රයන්ගෙන් දක්වියැයුතු.

අනුඤ්ඤාතය භාග්‍යවතුන් වහන්සේගේ අනුඤ්ඤාතවචනයෙන් දක්වියැයුතු යැ, එය පඤ්චවිධ යැ : සංවර යැ පහාන යැ භාවනා යැ සච්ඡිකිරියා යැ කප්පියානුලොම යැ ' යි. (පෘථග්ජනභූමි ආදි) ඒ ඒ භූමියෙහි යමක් දක්නාලැබේ ද, ඒ ඒ භූමියෙහි එය (කප්පිය) කප්පියානුලොමයෙන් දක්වියැයුතු යැ. භාග්‍යවතුන් විසින් ප්‍රතික්ෂෙප කරනලද්ද ප්‍රතික්ෂිප්ත කාරණයෙන් දක්වියැයුතු යැ. අනුඤ්ඤාත ද පටික්ඛිත්ත ද වූයේ ඒ දෙකින් දක්වියැයුතු.

ථව සූත්‍රය ප්‍රශංසායෙන් දක්වියැයුත්තේ යැ, හේ පඤ්ච ප්‍රකාරයෙකින් දතයුත්තේ යැ: භාග්‍යවතුන් වහන්සේ යැ, නිර්වාණධර්ම යැ, ආර්‍ය්‍යසඞ්ඝයා යැ, මාර්ගඵලසංඛ්‍යාත ආර්‍ය්‍යධර්මයෝ යැ, ශික්ෂාව පිළිබඳ ලෞකිකගුණසම්පත්තිය යැයි මෙසේ ස්තවය පඤ්චප්‍රකාරයෙන් දක්වියැයුත්තේ යි.

ඉන්ද්‍රියභූමි නවහි පදෙහි නිද්දිසිතබ්බා, කිලෙසභූමි නවහි පදෙහි නිද්දිසිතබ්බා. එවමෙතානි අට්ඨාරස පදානි හොන්ති: නව පදානි කුසලානි නව පදානි අකුසලානීති. තථා හි වුත්තං: "අට්ඨාරස මූලපදා කුහිං දට්ඨබ්බා: සාසනපට්ඨානෙ"ති. තෙනාහ ආයස්මා මහාකච්චායනො:

"නවහි පදෙහි කුසලා නවහි ච යුජ්ජන්ති අකුසලා පක්ඛා,
එතෙ ඛලු මූලපදා භවන්ති අට්ඨාරස පදානී"ති.

නියුත්තං සාසනපට්ඨානං.

එත්තාවතා සමත්තා නෙත්ති යා ආයස්මතා මහාකච්චායනෙන භාසිතා භගවතා අනුමොදිතා මූලසඞ්ගීතියං සඞ්ගීතාති.

නෙත්තිප්පකරණං නිට්ඨිතං.

ඉන්ද්‍රියභූමිය සමථාදි නව පදයෙන් දක්වියැයුත්තී යැ, කිලෙසභූමිය තණ්හාදි නව පදයෙන් දක්වියැයුත්තී යැ, මෙසේ තෙල අටළොස් පදයෝ වෙති. කුශල වූ නව පදයෝ යැ අකුශල වූ නව පදයෝ යි. එහෙයින් මැ කියන ලදි: ''අට්ඨාරස මූලපද කුහිං දට්ඨාබ්බා, සාසනපට්ඨානෙ''යි. එයින් වදළහ ආයුෂ්මත් මහාකාත්‍යායන මහ රහතුන් වහන්සේ: ''නවහි පදෙහි කුසලා — පෙ — භවන්ති අට්ඨාරස පදනි'' යි.

සාසනපට්ඨානය යොදනලද්දේ යි.

ආයුෂ්මත් මහාකච්චායන තෙරණුවන් විසින් වදරනලද භාග්‍යවතුන් විසින් අනුමොදිත වූ මූලසඞ්ගීතියෙහි ලා සඞ්ගීත වූ නෙත්තිය මෙතෙකින් සමාප්ත යි.

## නෙත්තිප්‍රකරණය නිමි.

ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් විසින් ලියනලද නෙත්තිප්පකරණව්‍යාඛ්‍යානය නිමියේ යි.

*"Wherever the Buddha's teachings have flourished,*

*either in cities or countrysides,*

*people would gain inconceivable benefits.*

*The land and people would be enveloped in peace.*

*The sun and moon will shine clear and bright.*

*Wind and rain would appear accordingly,*

*and there will be no disasters.*

*Nations would be prosperous*

*and there would be no use for soldiers or weapons.*

*People would abide by morality and accord with laws.*

*They would be courteous and humble,*

*and everyone would be content without injustices.*

*There would be no thefts or violence.*

*The strong would not dominate the weak*

*and everyone would get their fair share."*

✻THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL✻

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

**✻ The Vows of Samantabhadra ✻**

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

**✻ The Vows of Samantabhadra Avatamsaka Sutra ✻**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha’s Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

**NAMO AMITABHA**

南無阿彌陀佛

《斯里蘭卡巴利文：小部阿含經：無礙解道・指導論》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, No. 55, Sec. 1, Hang Chow South Road, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website: http://www.budaedu.org

Mobile Web: m.budaedu.org

**This book is strictly for free distribution, it is not to be sold.**

නොමිලයේ බෙදාදීම පිණිසයි.

Printed in Taiwan

500 copies; September 2019

SR075 - 17062